(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මානකර මත්‍රුම් මේල් මාකාණ අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) මානකර මත්‍රුම් මේල් මාකාණ අපිවිරුත්ති අමෙච්චිනාල් නටෙමුරෙප්පටුත්තප්පටුම් මානකරත් තිට්ටත්තින් (Megapolis Plan) කීළ් 2017ආම් ආණ්ටු තොටක්කම් මුන්නෝක්කියුළ්ළ 03 ආණ්ටුකළ් වරෙයිල් සීත්තාවක්කෙප් පිරතේස චෙයලාළර් පිරිවිර්කාකත් තිට්ටමිටප්පට්ටුළ්ළ අපිවිරුත්ති නිකළ්ච්චිත්තිට්ටංකළ් යාවෙ එන්පතෙයුම්;

(ii) ඒර්කෙනවේ ඒතේනුම් නිකළ්ච්චිත්තිට්ටංකළ් ආරම්පික්කප්පට්ටුළ්ළතායින්, අවෙ යාවෙ එන්පතෙයුම්;

(iii) ආරම්පිප්පතර්කු එතිර්ප්පාර්ක්කප්පටුම් නිකළ්ච්චිත් තිට්ටංකළ් තිට්ටවට්ටමාක ආරම්පික්කප් පටවුළ්ළ තිකතිකළ් යාවෙ එන්පතෙයුම්;

(iv) ඉතර්කෙන අරස මර්‍රුම් තනියාර් මුතලීටුකළ් මේර්කොළ්ළප්පටුමා එන්පතෙයුම්;

(v) ආමෙනින්, අම්මුතලීටුකළ් තනිත්තනියේ යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ආ) (i) ඒර්කෙනවේ ආරම්පික්කප්පට්ටුළ්ළ අල්ලතු ආරම්පික්ක එතිර්ප්පාර්ක්කප්පටුම් නිකළ්ච්චිත්තිට්ටංකළුක්කාක ඔතුක්කප්පට්ටුළ්ළ නිතිත් තොකෙ එව්වළවෙන්පතෙයුම්;

(ii) තර්සමයම් සෙලවිටප්පට්ටුළ්ළ නිතිත් තොකෙ එව්වළවු එන්පතෙයුම්;

(iii) ඉතර්කාකක් කටන් තොකෙකළ් පෙර්‍රුක් කොළ්ළප්පටුමා එන්පතෙයුම්;

(iv) ආමෙනින්, කටන් පෙර්‍රුක්කොළ්ළප්පටුම් නිරුවනංකළ් මර්‍රුම් කටන් තොකෙ එව්වළවෙන්පතෙයුම්;

(v) ඉන්‍රෙල්, අරසාංකත්තිනාල් ඔතුක්කප්පට්ටුළ්ළ නිතිත් තොකෙ එව්වළවෙන්පතෙයුම්;

අවර් ඉච්සපෙයිල් මේලුම් අරිවිප්පාරා?

(ඉ) ඉන්‍රෙල්, ඒන්?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House-

(i) the development programmes intended for Seethawaka Divisional Secretary's Division starting from year 2017 to next 3 years, under the Megapolis plan which is implemented by the Ministry of Megapolis and Western Development;

(ii) the programmes, if any, has already been started;

(iii) the exact dates from which the scheduled programmes will be commenced;

(iv) whether state and private investments are made in this regard; and

if so, separately of aforesaid investments?

(b) Will he also inform this House-

(i) the allocations made for the scheduled programmes or for the programmes that have already been started;

(ii) the amount of money that has already been spent;

(iii) whether loans will be obtained in this regard;

(iv) if so, the institutions from which the loans will be obtained and the amounts; and

(v) if not, the amount of money allocated by the Government?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) බස්නාහිර මහානගර සැලසුම (Megapolis Plan) අප අමාත්‍යාංශය විසින් 2016 ජනවාරි මස අවසන් කරන ලදි. නමුත්, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීත්‍යානුකූල අධිකාරිය (Megapolis Authority) හෝ ඒ සම්බන්ධයෙන් වන රාජ්‍ය ආයෝජන සිදු වී නොමැත. ඒ නිසා අප විසින් ව්‍යාපෘති කාර්යාල 07ක් පවත්වාගෙන යන අතර විවිධ ආයතන හා අමාත්‍යාංශ හරහා එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් පහත පරිදි වනු ඇත.

අනු අංකය	ව්‍යාපෘතිය
නාගරික සංවර්ධන අධිකාරිය යටතේ	
අවිස්සාවේල්ල නගර සංවර්ධන ව්‍යාපෘති	
01	ප්‍රජා ශාලාව ඉදි කිරීම - ගලපිටමඩ, අවිස්සාවේල්ල
02	බහු මහල් වාහන අංගනය ඉදි කිරීම - අවිස්සාවේල්ල
03	අවිස්සාවේල්ල රෝහල් මංසන්ධියේ සිට අමිනිරිගල මාර්ගය දක්වා ඉදි කිරීමට යෝජිත අතුරු මාර්ගය හා සීතාවක ගඟ හරහා ඉදි කිරීමට යෝජිත පාලම
04	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල ඇති වගා නොකරන කුඹුරු ඉඩම් තුළ භූදර්ශන හා සියලු පහසුකම් සහිත වාහන අංගනයන් ඉදි කිරීම
05	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි පවත්නා ප්‍රධාන මාර්ග පුළුල් කර මගීන් සඳහා පහසුවෙන් ගමන් කළ හැකි පරිදි පදික වේදිකා ඉදි කිරීම
06	අවිස්සාවේල්ල සමුපකාර සමිතිය පවතින ඉඩමෙහි වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම
07	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල සිට පොලිස් ස්ථානය දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
08	නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීම
09	බස් නැවතුම් පොළ අසල ත්‍රිරෝද රථ අංගනයක් ඉදි කිරීම
10	බැංකු හා මූල්‍ය ආයතන සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදි කිරීම
11	අවිස්සාවේල්ල බැංකු හා මූල්‍ය ආයතන සඳහා ඉදි කිරීමට යෝජිත ගොඩනැඟිලි භූමිය තුළ පවත්නා නිවාස පුනස්ථාපනය කිරීම - මානික්කවත්ත, අවිස්සාවේල්ල
12	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීම
හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති	
13	සති පොළ අදියර - II
14	පවතින පොළ භූමිය පවරාගෙන වාණිජ හා විනෝද කටයුතු ආශ්‍රිත ව්‍යාපෘතියක් සිදු කිරීම
15	සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය • කුලී වෙළඳුන් සඳහා තාවකාලික වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම • සාලාව නව නගර සංවර්ධනය

(ii)
- ප්‍රජා ශාලාව ඉදි කිරීම - ගලපිටමඩ, අවිස්සාවේල්ල
- හංවැල්ල නගරයේ කුලී වෙළඳුන් සඳහා තාවකාලික වෙළඳ සංකීර්ණය ඉදි කිරීම

(iii)

අනු අංකය	ව්‍යාපෘතිය	ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වර්ෂය
01	බහු මහල් වාහන අංගනය ඉදි කිරීම - අවිස්සාවේල්ල	2018
02	අවිස්සාවේල්ල රෝහල් මංසන්ධියේ සිට අමිනිරිගල මාර්ගය දක්වා ඉදි කිරීමට යෝජිත අතුරු මාර්ගය හා සීතාවක ගඟ හරහා ඉදි කිරීමට යෝජිත පාලම	2019
03	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල ඇති වගා නොකරන කුඹුරු ඉඩම් තුළ භූදර්ශන හා සියලු පහසුකම් සහිත වාහන අංගනයන් ඉදි කිරීම	2019
04	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි පවත්නා ප්‍රධාන මාර්ග පුළුල් කර මගීන් සඳහා පහසුවෙන් ගමන් කළ හැකි පරිදි පදික වේදිකා ඉදි කිරීම	2019
05	අවිස්සාවේල්ල සමුපකාර සමිතිය පවතින ඉඩමෙහි වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම	2020
06	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල සිට පොලිස් ස්ථානය දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම	2020
07	නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීම	2020
08	බස් නැවතුම් පොළ අසල ත්‍රිරෝද රථ අංගනයක් ඉදි කිරීම	2020
09	බැංකු හා මූල්‍ය ආයතන සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදි කිරීම	2020
10	අවිස්සාවේල්ල බැංකු හා මූල්‍ය ආයතන සඳහා ඉදි කිරීමට යෝජිත ගොඩනැඟිලි භූමිය තුළ පවත්නා නිවාස පුනස්ථාපනය කිරීම - මානික්කවත්ත, අවිස්සාවේල්ල	2020
11	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීම	2020
12	සති පොළ අදියර - II	2018
13	පවතින පොළ භූමිය පවරාගෙන වාණිජ හා විනෝද කටයුතු ආශ්‍රිත ව්‍යාපෘතියක් සිදු කිරීම	2018
14	සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය	2018

(iv) ඔව්.

(v)

අනු අංකය	ව්‍යාපෘතිය	ආයෝජන මූලාශ්‍රය
01	ප්‍රජා ශාලාව ඉදි කිරීම - ගලපිටමඩ, අවිස්සාවේල්ල	රාජ්‍ය
02	බහු මහල් වාහන අංගනය ඉදි කිරීම - අවිස්සාවේල්ල	රාජ්‍ය
03	අවිස්සාවේල්ල රෝහල් මංසන්ධියේ සිට අමිනිරිගල මාර්ගය දක්වා ඉදි කිරීමට යෝජිත අතුරු මාර්ගය හා සීතාවක ගඟ හරහා ඉදි කිරීමට යෝජිත පාලම	රාජ්‍ය
04	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල ඇති වගා නොකරන කුඹුරු ඉඩම් තුළ භූ දර්ශන හා සියලු පහසුකම් සහිත වාහන අංගනයන් ඉදි කිරීම	පුද්ගලික
05	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි පවත්නා ප්‍රධාන මාර්ග පුළුල් කර මගීන් සඳහා පහසුවෙන් ගමන් කළ හැකි පරිදි පදික වේදිකා ඉදි කිරීම	රාජ්‍ය
06	අවිස්සාවේල්ල සමුපකාර සමිතිය පවතින ඉඩමෙහි වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම	පුද්ගලික
07	අවිස්සාවේල්ල ශාන්ත මරියා විදුහල අසල සිට පොලිස් ස්ථානය දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරීම	රාජ්‍ය
08	නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීම	රාජ්‍ය
09	බස්නැවතුම්පළ අසල ත්‍රිරෝද රථ අංගනයක් ඉදි කිරීම	රාජ්‍ය

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

අනු අංකය	ව්‍යාපෘතිය	ආයෝජන මූලාශ්‍රය
10	බැංකු හා මූල්‍ය ආයතන සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදි කිරීම	පුද්ගලික
11	අවිස්සාවේල්ල බැංකු හා මූල්‍ය ආයතන සඳහා ඉදි කිරීමට යෝජිත ගොඩනැඟිලි භූමිය තුළ පවත්නා නිවාස පුනස්ථාපනය කිරීම - මානික්කවත්ත, අවිස්සාවේල්ල	රාජ්‍ය
12	අවිස්සාවේල්ල නගර මධ්‍යයෙහි මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීම	රාජ්‍ය
13	සති පොළ අදියර - II	රාජ්‍ය
14	පවතින පොළ භූමිය පවරාගෙන වාණිජ හා විනෝද කටයුතු ආශ්‍රිත ව්‍යාපෘතියක් සිදු කිරීම	පුද්ගලික
15	සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය • කුලී වෙළඳුන් සඳහා තාවකාලික වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම • සාලාව නව නගර සංවර්ධනය	රාජ්‍ය

(ආ) (i)

අනු අංකය	ව්‍යාපෘතිය	වෙන් කර ඇති මුදල (රු.මිලියන)
අවිස්සාවේල්ල නගර සංවර්ධන ව්‍යාපෘති		
01	ප්‍රජා ශාලාව ඉදි කිරීම - ගලපිටමඩ, අවිස්සාවේල්ල	12.5
හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති		
01	සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය • කුලී වෙළඳුන් සඳහා තාවකාලික වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම	25.0

(ii)

අනු අංකය	ව්‍යාපෘතිය	වැය කර ඇති මුදල (රු.මිලියන)
අවිස්සාවේල්ල නගර සංවර්ධන ව්‍යාපෘති		
01	ප්‍රජා ශාලාව ඉදි කිරීම - ගලපිටමඩ, අවිස්සාවේල්ල	2.39
හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති		
01	සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය • කුලී වෙළඳුන් සඳහා තාවකාලික වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම	16.7

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(v) ඉහත (ආ) (i) හි පිළිතුර

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 1874/'17 - (2), ගරු ඉම්රාන් මහරූෆ් මහතා.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 12960/'17 - (2), ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 1979/'17 - (2), ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(මාණ්පුමිකු அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 - 1981/'17 - (2), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 4 - 1517/'17 - (2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්ඩලික උදය ප්‍රභාත් ගම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කල් තබන ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1647/'17 - (2), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්ඩලික හේෂාන් විතානගේ)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්ඩලික ෆයිසර් මුස්තාපා)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කල් තබන ලදී.
Question ordered to stand down.

මහපොළ භාරකාර අරමුදල: විස්තර
மஹபொல நம்பிக்கைப் பொறுப்பு நிதியம்: விபரம்
MAHAPOLA TRUST FUND: DETAILS

1728/'17

6. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(ii) ඔවුන් පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iii) වර්ෂ 2010 සිට 2017 දක්වා මෙම අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය සහ මුදල් ලබාදුන් මූලාශ්‍ර වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2010 සිට 2017 දක්වා මහපොළ භාරකාර අරමුදලේ පුනරාවර්තන වියදම් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) වර්ෂ 2005 සිට 2017 දක්වා මහපොළ භාරකාර අරමුදල මඟින් ශිෂ්‍යත්ව ප්‍රදාන හා පුනරාවර්තන නොවන කාර්යයන් සඳහා කරන ලද ගෙවීම්, එක් එක් වර්ෂය සහ කාර්යය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹபொல நம்பிக்கைப் பொறுப்பு நிதியத்தின் பணிப்பாளர் சபை அங்கத்தவர்கள் யாவர் என்பதையும்;

(ii) இவர்கள் யாரால் நியமிக்கப்படுகின்றார்கள் என்பதையும்;

(iii) 2010 தொடக்கம் 2017ஆம் ஆண்டு வரையில் இந்நிதியத்திற்குக் கிடைத்த பணத்தொகைகள் மற்றும் நிதி கிடைக்கப்பட்ட மூலங்கள் ஆண்டு அடிப்படையில் தனித்தனியே யாவை என்பதையும்;

(iv) 2010 தொடக்கம் 2017ஆம் ஆண்டு வரையில் மஹபொல நம்பிக்கை நிதியத்தின் மீண்டுவரும் செலவினம் ஆண்டு அடிப்படையில் தனித்தனியே யாவை என்பதையும்;

(v) 2005 தொடக்கம் 2017ஆம் ஆண்டுவரை மஹபொல நம்பிக்கைப்பொறுப்பு நிதியத்தின் ஊடாக புலமைப்பரிசில் செலுத்துவதற்கும் மீண்டுவரும் செயற்பாடுகள் அல்லாத செயற் பாடுகளுக்கும் மேற்கொள்ளப்பட்ட கொடுப் பனவுகள், ஒவ்வோர் ஆண்டு மற்றும் செயற்பாடு அடிப்படையில் தனித்தனியே யாவை என்ப தையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House-

(i) the names of the members of the Board of Directors of the Mahapola (Higher Education) Trust Fund;

(ii) their appointing authority;

(iii) separately, the monies received by this Fund from the year 2010 to year 2017 and the funding sources year basis;

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(iv) separately, the recurrent expenditure of the Mahapola (Higher Education) Trust Fund in respect of each year from the year 2010 to year 2017; and

(v) the payments made by the Mahapola (Higher Education) Trust Fund for granting scholarships and non-recurrent purposes separately in respect of each year and purpose from the year 2005 to year 2017?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහපොළ හාරකාර මණ්ඩලයේ සාමාජිකයන් කවුරුන්ද යන්න පහත දැක්වේ.

- නිල බලයෙන් පත්වන සාමාජිකයන් පස්දෙනෙකි.
  1. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ගරු ප්‍රියසාද් ඩෙප් මහතා
  2. වෙළෙඳ විෂය භාර අමාත්‍යතුමා, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මහතා
  3. වෙළෙඳ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් වාන්දනී විජයවර්ධන මහත්මිය
  4. උසස් අධ්‍යාපන පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ඩී.සී. දිසානායක මහතා
  5. අධ්‍යාපනය පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා
- ප්‍රාරම්භක භාරකරු වශයෙන් වෙළෙඳ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් දෙදෙනෙකි.
  1. නීතිඥ (ආචාර්ය) වික්‍රම වීරසූරිය මහතා
  2. නීතිඥ අනිල් රාජකරුණා මහතා

(ii) මහපොළ හාරකාර මණ්ඩලය 1981 අංක 66 දරන පනතට අනුව නිල බලයෙන් පත්වන සාමාජිකයන් පස්දෙනෙක් හා ප්‍රාරම්භක භාරකරු වශයෙන් වෙළෙඳ විෂය භාර අමාත්‍යවරයා විසින් සාමාජිකයන් දෙදෙනෙක් පත් කරනු ලැබේ.

(iii) පිළිතුරු - ඇමුණුම 1 *

(iv) පිළිතුරු - ඇමුණුම 2 *

(v) පිළිතුරු - ඇමුණුම 3 *

(ආ) අදාළ නැත.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගංවතුර හා නායයාම් හේතුවෙන් දේපොළ අහිමි වූවන්: වන්දි
வெள்ளப்பெருக்கு மற்றும் மண்சரிவினால் சொத்துக்களை இழந்தோர்: நட்டஈடு
LOSS OF PROPERTY DUE TO FLOODS AND LANDSLIDES: COMPENSATION

1960/'17

12. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி சார்பாக)
(The Hon. Dinesh Gunawardena the Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2017 මැයි මස 26 වන දින සිට ජූනි මස 05 වන දින දක්වා ඇති වූ ගංවතුර හා නායයාම් හේතුවෙන්,

(i) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් ලබාදෙන වන්දි මුදල;

(ii) සම්පූර්ණයෙන් හා අර්ධ වශයෙන් හානි වූ නිවාස සඳහා ලබාදෙන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිවාස ගංවතුරින් යටවීම හේතුවෙන් සියලු දේපළ අහිමි වූ නිවෙස් හිමියන් සඳහා ලබාදෙන වන්දි මුදල කොපමණද;

(iv) එම වන්දි මුදල් ලබාදීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2017 மே மாதம் 26ஆம் திகதி முதல் யூன் மாதம் 05ஆம் திகதி வரை ஏற்பட்ட வெள்ளப்பெருக்கு மற்றும் மண்சரிவு காரணமாக;

(i) உயிரிழந்த ஆளொருவருக்கு வழங்கப்படுகின்ற நட்டஈட்டுத்தொகை எவ்வளவு;

(ii) முழுமையாக மற்றும் பகுதியளவில் சேதமடைந்த வீடுகளுக்கு வழங்கப்படுகின்ற நட்டஈட்டுத் தொகை தனித்தனியே எவ்வளவு;

(iii) வீடுகள் வெள்ளத்தில் மூழ்கியமை காரணமாக சகல சொத்துக்களையும் இழந்துள்ள வீட்டு உரிமையாளர்களுக்கு வழங்கப்படுகின்ற நட்டஈட்டுத் தொகை எவ்வளவு;

(iv) மேற்படி நட்டஈட்டுத் தொகையை வழங்க எடுக்கும் காலம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:-

(a) Will he inform this House that due to floods and landslides that occurred from 26 May to 05 June 2017-

(i) the amount of compensation given to a deceased person;

(ii) separately, the amount of compensation paid to fully or partially damaged houses;

(iii) the amount of compensation paid to householders who lost all their properties owing to the houses being fully submerged by floodwaters; and

(iv) the time to be taken for the payment of compensations?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වාභාවික ආපදාවන් හේතුවෙන් සිදුවන ජීවිත හානියකදී ලබාදෙන රු.100,000.00ක වන්දි මුදල 2017 මැයි මස 26 වන දින සිට ජූනි මස 05 වන දින දක්වා ඇති වූ ගංවතුර හා නායයාම් ආපදාවේදී ලබා දෙන ලදී.

(ii) ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ස්වාභාවික ආපදාවන් හේතුවෙන් සිදුවන නිවාස හානියකදී රු.මි.2.5ක උපරිම රක්ෂණාවරණයක් හිමි වේ. ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරන හානි තක්සේරු කමිටුවක් මඟින් පූර්ණ හෝ අර්ධ ලෙස හානියට පත් නිවාස තක්සේරු කර එම හානි තක්සේරු වාර්තාකම ලබා දීම සිදු කරයි.

(iii) ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ නිවාස හානි සඳහා ලබාදෙන උපරිම වන්දි මුදල වන රු.මි.2.5ක මුදලින් නිවසෙහි ගෘහ උපකරණ හානි සඳහා රු.25,000.00ක මුදලක් ලබා දේ. නිවසට සිදු වූ හානියද තාක්ෂණික නිලධාරියෙකුගෙන් යුත් කමිටුවක් මඟින් තක්සේරු කර එම හානි තක්සේරු මුදල ලබා දීම සිදු කරයි.

(iv) නිවාස හානි තක්සේරු කර අදාළ හානි තක්සේරු අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සමඟ ජාතික රක්ෂණාහාර අරමුදල වෙත ලබා දුන් පසු ජාතික රක්ෂණාහාර අරමුදල මඟින් වන්දි මුදල් ඍජුවම ප්‍රතිලාභීන්ගේ ගිණුමට බැර කිරීම, ප්‍රතිලාභියාගේ නමට චෙක්පතක් නිකුත් කිරීම හා අදාළ බැංකු ගිණුම් විස්තර ලබා දී නොමැති ප්‍රතිලාභීන්ගේ මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රතිලාභීන් වෙත චෙක්පතකින් ලබා දීමට කටයුතු කරයි.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 15 - 1991/'17 - (2), ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න, ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

යා/ගුරුනගර් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් ඉංග්‍රීසි ගුරුවරුන් ලෙස පත් කිරීම
யா/குருநகர் உயர்தொழில்நுட்பக் கல்லூரி ஆங்கில டிப்ளோமாதாரிகளை ஆங்கில ஆசிரியர்களாக நியமித்தல்
APPOINTMENT OF ENGLISH DIPLOMA HOLDERS OF ADVANCED TECHNOLOGICAL INSTITUTE, J/GURUNAGAR AS ENGLISH TEACHERS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

නන්‍රි, ගෞරව සභාපතිතුමනි! යාපනය, කුරුනගර් උසස් තාක්ෂණ විද්‍යාපීඨයේ, කඩිනම් 2016, 2017 සහ 2018 වසරවල් තුළ ඉංග්‍රීසි ඩිප්ලෝමා උපාධිය ලබා ඇති 83 ක් පමණ උපාධිධාරීන් තවමත් රැකියා අවස්ථා නොමැතිව සිටිනවා. ඔවුන් ඉංග්‍රීසි ඩිප්ලෝමා උපාධිය ලබා ඇති බවට ඔවුන්ට ලබා දී ඇති සහතිකය ඉදිරිපත් කළ විට,

II

රටේ විවිධ ප්‍රදේශවල සිදුවෙමින් පවතින ජන වාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා

நாட்டின் பல்வேறு பிரதேசங்களில் இடம்பெறும் இன மோதல்கள்

ETHNIC CLASHES IN DIFFERENT PARTS OF THE COUNTRY

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)

(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Bismillahir Rahmanir Raheem.

With your permission, Hon. Speaker, under Standing Order 23(2), I wish to raise this issue before this House.

ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණය අවසාන වීමෙන් පසු රටේ විවිධ ප්‍රදේශවල -විශේෂයෙන් අම්පාර සහ මහනුවර දිස්ත්‍රික්කවල- ජන වාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා, ආගමික ස්ථානවලට පහර දීම් සහ මහජන දේපළවලට හානි කිරීම වැනි ක්‍රියා මතු වෙමින් පවතී. මෙම සිද්ධීන් හුදකලාව සිදු නොවන්නක් බව සහ සංවිධානාත්මක කණ්ඩායම් සහ පුද්ගලයන් කුමන්ත්‍රණකාරී ලෙස රට සහ ආණ්ඩුව අස්ථාවර කිරීමේ අරමුණ ඇතිව විශේෂයෙන් එක ජන කොටසකට එරෙහිව මෙහෙයවන බව පැහැදිලි වේ.

මෙම ක්‍රියාදාමයේ ආසන්නතම සිදුවීම වූයේ ඊයේ, එනම් මාර්තු මස පස්වන දින මහනුවර දිස්ත්‍රික්කයේ දිගන, තෙල්දෙනිය ආදී ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන සිදු වූ අවාසනාවන්ත සිද්ධියයි. මෙම සිද්ධීන් දෙස සියුම්ව අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ යම් සිද්ධියක් මුල් කර ගෙන එම සිදුවීම් සිදු වූ ස්ථානවලට සංවිධානාත්මක කණ්ඩායම් සහ පුද්ගලයන් පැමිණ බරපතළ ලෙස ප්‍රචණ්ඩත්වය මුදා හැරීමයි. ප්‍රචණ්ඩත්වය මුස්ලිම් ජනතාවට එරෙහිව සිදු කරන්නක් බව මතුපිටින් බැලූ බැල්මට පෙනී ගියත්, සත්‍ය වශයෙන්ම එහි අභ්‍යන්තරයේ දුෂ්ට චේතනාවන් රාශියක් ඇති බව පැහැදිලි කර ගත යුතුව ඇත.

දිගන ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලක සිදු වූ ආරවුලක් හේතු කොට ගෙන අවාසනාවන්ත ලෙස එක් සිංහල තරුණයෙකුට ජීවිතය නැති වූ අතර, ඒ සම්බන්ධයෙන් සැක පිට මුස්ලිම් ජාතිකයන් සිව් දෙනෙකු පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. ඊයේ දිනයේ දී එම තරුණයාගේ අවමඟුල පැවැත්වූ අතර, එයට සහභාගි වීමේ මුවාවෙන් පැමිණි පිරිස් සංවිධානාත්මකව මුස්ලිම් ජනතාවගේ ජීවිත, දේපොළ, දේවස්ථාන සහ වෙළෙඳ සැල් ඉලක්ක කර ප්‍රහාරයට ලක් කරන ලදී.

මේ දක්වා වාර්තා වූ තොරතුරු අනුව මුස්ලිම් දේවස්ථාන, ව්‍යාපාරික ස්ථාන, නිවාස සහ මෝටර් රථ වාහන ගණනාවකට අලාභානි සිදු කොට ඇත. පොලීසිය විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ඇදිරිනීතිය පනවා නොසන්සුන්තාව යම්තාක් දුරකට පාලනය කිරීමට උත්සාහ දැරුවත්, තවදුරටත් එම තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය වී නොමැති අතර, එම ප්‍රදේශවල ජන ජීවිතය බොහෝ දුරට අඩාල වී ඇත.

එමෙන්ම, පසුගිය පෙබරවාරි 26වෙනි සඳුදා රාත්‍රියෙහි අම්පාර නගරයේ සිදු වූ ප්‍රචණ්ඩකාරී හා ජාතිවාදී ප්‍රකෝපකාරී සිද්ධීන් හේතු කොට ගෙන මුස්ලිම් සිද්ධස්ථානයක් සහ නගරයේ පිහිටි ආපන ශාලා තුනකට බලවත් අලාභානි සිදු වී ඇත.

මෙම සිදුවීමෙන් පසු අම්පාර නගරයේ නොසන්සුන් සහගත තත්ත්වයක් ඇති වූ අතර, ජනවර්ග දෙකක් අතර ගැටුමකටද පසුබිම් සැකසෙන්නට විය. එම නොසන්සුන්තාව සහ නීතිය හා සාමය බිඳ වැටීම් දින ගණනාවක්ම පැවති අතර, මේ වන විට යම්තාක් දුරකට පාලනයකට යටත් කොට ඇති බව පෙනේ.

ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ඇතුළු මේ සම්බන්ධයෙන් වෙහෙස නොබලා ක්‍රියා කළ බලධරයන්ට මේ අවස්ථාවේ දී මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. ඉහත පරිදි මුස්ලිම් දේවස්ථාන, ආපනශාලාවලට සහ ව්‍යාපාර ස්ථානවලට පහර දී අලාභහානි කිරීම සහ බලවත් ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ඇති කිරීම එකම ක්‍රියාවලියකදී නීති විරෝධී ජන රාශියක් විසින් සිදු කළ බවට පැහැදිලි හා සෘජු සාක්ෂිවලින් හෙළි විය. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය සහ ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳව බලවත් ප්‍රශ්න ගණනාවක් මතු කර ඇත.

පොලීසිය විසින් අම්පාර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත මුල්වරට වාර්තා කරමින් සඳහන් කර සිටියේ, ඉහත සිදුවීම් ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියාවක් සහ ජන කොටස් අතර කැලඹීම් ඇති කළ සිද්ධියක් බවයි. එම නිසා පොලීසිය අධිකරණයට ප්‍රකාශ කර සිටියේ, මෙම කරුණු ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් යටතට වැටෙන බවත්, ඒ අනුව ක්‍රියා කළ යුතු බවත්ය. පසුව පොලීසිය විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද වාර්තාවලින් හෙළි වූයේ, ඉහත සිද්ධීන් පෞද්ගලික ආරවුලක් මත ආරම්භ වූ හෙයින් ඉහත පනත යටතේ නඩු පැවරීමට හේතුවක් නොමැති බවත්, රටේ පවතින සාමාන්‍ය නීතිය අනුව නීතිය ක්‍රියාත්මක විය යුතු බවත්ය.

එමෙන්ම ඉහත සිද්ධීන් එකම ක්‍රියාවලියක සිදු වූ මුස්ලිම් දේවස්ථානයට පහර දී අලාභ හානි කිරීම, ආපනශාලා කීපයක්, ව්‍යාපාරික ස්ථාන කීපයක් විනාශ කිරීම සහ ජන වාර්ගික නොසන්සුන්තාව ඇති කිරීම යන්න අධිකරණයට වසන් කොට සාමාන්‍ය ප්‍රචණ්ඩ ක්‍රියාවක ස්වරූපයෙන් අධිකරණයට වාර්තා කර ඇත. එසේම, මෙම සිදුවීම් නීති විරෝධී ජනරාශියක් - unlawful assembly - විසින් සිදු කරන ලද එකක් බවද අධිකරණයෙන් වසන් කර ඇති බව පෙනේ.

ඉහත සඳහන් සමස්ත ප්‍රචණ්ඩකාරී ක්‍රියා ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ආරම්භ කිරීම සඳහා දායක වූ සංවිධානාත්මක කණ්ඩායම් සහ පුද්ගලයන් යොදා කරන ලද හාස්‍ය ජනක උපක්‍රමයක් බව තහවුරු වී ඇත.

කරුණු වාර්තා වන අන්දමට පෙබරවාරි 26 වන දින රාත්‍රියේ මුස්ලිම් ජාතිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන, ආපන ශාලාවකට පැමිණි පුද්ගලයෙකු එහිදී ඔහුට ආහාරයට ලබා දුන් දෙයක පෙත්තක් ඇතුළු කර තිබූ බවත්, එය "වද පෙත්තක්" බවට ඔහුට චෝදනා කරමින් සමස්ත ක්‍රියාවලියම ආරම්භ කරන ලදී. මෙහිදී මෙම පුද්ගලයා විසින් කලින් සංවිධානය කරනු ලැබූ පුද්ගලයන්ට දුරකථන ඇමතුම් ලබා දෙමින් එම ආපන ශාලාවේ අළෙවි කරන ආහාරවලට "වද පෙති" දමන බවත්, එමඟින් සිංහල ජනතාවගේ සංඛ්‍යාව අඩු කිරීමට මුස්ලිම් ජාතිකයන් උත්සාහ කරන බවටත් චෝදනා කළ බව වාර්තා වේ. ආහාර සමඟ වද පෙති මිශ්‍ර කිරීමෙන් වඳභාවය ඇති කළ නොහැකි බවට වෛද්‍ය විද්‍යාත්මකව කරුණු ඉදිරිපත් කරමින් පවතී.

පසුගිය දා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද නිල ප්‍රවෘත්ති නිවේදනයේ ද මේ පිළිබඳව තහවුරු කර ඇත. මෙයින් පැහැදිලිව පෙනී යන්නේ මුස්ලිම් ජනතාවට සහ මුස්ලිම් පූජනීය ස්ථානවලට පහර දීම, දේපළවලට හානි සිදු කිරීම සහ ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට යම් කණ්ඩායමක් හා පුද්ගලයන් කිසිම පදනමක් නැති හේතූන් උපයෝගී කර ගන්නා බවයි.

මේ ආකාරයේ අවාසනාවන්ත සිදුවීම් ඉදිරියේදී ඇති කිරීමට බොහෝ දුරට ඉඩ ඇති බව මගේ හැඟීමයි. ඔවුන් උත්සාහ කරන්නේ පවතින ආණ්ඩුව අස්ථාවර කර ඔවුන්ගේ පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීම බව පැහැදිලිය.

මෙම සිද්ධියේ බරපතළම කරුණ වන්නේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම භාරව සිටින පොලිස් දෙපාර්තමේන්තුවේ හැසිරීමයි. එම ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන්නේ, අම්පාර පොලීසිය පක්ෂපාතී ලෙස සහ වෘත්තීය නොවන ආකාරයට ක්‍රියා කර ඇති බවටයි. මෙයින් පෙනී යන්නේ සියලුම ජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට බැඳී සිටින පොලිස් දෙපාර්තමේන්තුව මෙම සිද්ධියේදී පක්ෂග්‍රාහී වී ඇති අන්දමයි. එම පක්ෂපාතීත්වය ප්‍රචණ්ඩ කටයුතු මැඩ පැවැත්වීම, ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම සහ සාමය ආරක්ෂා කිරීම දක්වා පැවැති බව එම ප්‍රදේශයේ ජනතාව කථා කරන සිද්ධීන්ය.

එම සිද්ධියේදී පොලීසිය ක්‍රියා කළ ආකාරය පසුගිය කාලයේ තඹුත්තේගම සහ ගිංතොට සිදු වූ සිදුවීම්වලදී ක්‍රියා කළ ආකාරයට වඩා භාත්පසින්ම වෙනස් බව පෙන්වා දිය යුතුව ඇත. එම සිද්ධිවලදී පොලීසිය ක්ෂණිකව ක්‍රියා කර වුදිතයින්ට එරෙහිව නඩු පවරා නීතිය ක්‍රියාත්මක කරන ලදී.

ජාතීන් අතර සංහිඳියාව සහ ජනවාර්ගික සාමය ඇති කිරීමට ආණ්ඩුව වගකීමෙන් ක්‍රියා කරන අවස්ථාවේ, විධායකයේ එක් කොටසක් ඉහත ආකාරයෙන් කටයුතු කිරීම කිසිසේත් අනුමත කළ නොහැක.

මේ වන විටත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර ප්‍රජාව අප රට පිළිබඳ ඇති කරගෙන තිබෙන යහපත් මතය විනාශ කර, රට අස්ථාවරභාවයට පත් කර, අගාධයට ඇද දැමීමත්, අපකීර්තියට පත් කිරීමත්, ජනතාවගේ ආර්ථික තත්ත්වය කඩාකප්පල් කිරීමත් මේ ආකාරයේ සිදුවීම්වල දුෂ්ට අරමුණ බව ප්‍රකාශ කළ යුතුව ඇත.

ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ බලධාරීන් එම තත්ත්වය පාලනය කිරීමට කඩිනමින් දැක්වූ යහපත් ප්‍රතිචාරය සම්බන්ධයෙන් නැවතත් ස්තුතිවන්ත වන අතර, ඉදිරියේදී මේ ආකාරයේ සිදුවීම් කිසිම ජන කොට්ඨාසයකට සිදු නොවිය යුතු බව අවධාරණය කරමි.

රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මූලික අයිතිවාසිකම්, යුක්තිය ඉටුකිරීම සහ ජාතීන් අතර සාමය හා සංහිඳියාව ප්‍රාර්ථනා කරන සමාජයේ සියලු ජන කොටස් නියෝජනය කරන, විශේෂයෙන් පූජ්‍ය පක්ෂය, දේශපාලනඥයින්, සිවිල් සමාජය, වෘත්තිකයින් සහ යුක්තිය අගය කරන සියලුදෙනා ඉදිරියේදී මෙවන් අවාසනාවන්ත සිදුවීම් වීම වැළැක්වීමට වහා පියවර ගත යුතු බව අවධාරණය කරමි.

එසේ කිරීමෙන් පමණක් ජන කොටස් අතර ඇතිවී තිබෙන අවිශ්වාසය, සැකය සහ බිය ඉවත් කර, සියලු දෙනාටම එක්ව ජීවත් විය හැකි දේශයක් බිහි කළ හැකි බව මගේ හැඟීමයි.

අවසාන වශයෙන් මා ඉල්ලා සිටින්නේ, ඉහත සිදුවීම සම්බන්ධයෙන් සහ ඉහත සිදුවීමට සම්බන්ධ වූ අනෙකුත් සිද්ධීන් කිහිපයක් ගැන සොයා බලා වාර්තා කිරීමට ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන ලෙසත්, විපතට පත්වූවන්ට කඩිනමින් වන්දි මුදල් සහ සහන ලබා දෙන ලෙසත්ය.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම. ගරු අධිකරණ අමාත්‍යතුමිය.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
JUDICATURE (AMENDMENT) BILL

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 මාර්තු 20 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நீதி அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 மார்ச் 20, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice; to be read a Second time upon Tuesday, 20th March, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තැබීම, ගරු සභානායකතුමා. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරයෙකුගේ හදිසි ප්‍රශ්නයක් ගැන මට ඔබතුමාට කියන්න තිබෙනවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා අද දින අධිකරණයට කැඳවා තිබෙනවා. පාර්ලිමේන්තුව රැස්වෙන අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ රැඳී සිටින්නට මන්ත්‍රීවරයෙකුට මෙතෙක් නිබුණු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඒ පහසුකම හා අයිතිය අද දරුණු ලෙස උල්ලංඝනය වී තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මේ අයිතිවාසිකම ගැන මීට පෙරද අපි ගරු කථානායකතුමා හමු වී කරුණු කියා, ඔබතුමාද අදාළ බලධාරින්ට ඒ බව දැන්වූවා. නමුත්, ඇයි අද දිනයේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට හිමි අයිතිය අවලංගු වී තිබෙන්නේ? හෙට දිනයේ තව මන්ත්‍රීවරුන් කී දෙනෙකුට මේ අයිතිවාසිකම අවලංගු වෙනවාද? ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම්, මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් වහාම මෙයට මැදිහත් වෙන ලෙස ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම සොයා බලන්නම්. [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කරුණ සම්බන්ධයෙන්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කරුණට අදාළ එක කොටසක් ඉතුරු වුණා. එය නම් මෙයයි. අපේ මන්ත්‍රීතුමෙක් අධිකරණයට ලියුමක් ඉදිරිපත් කරනවා, "අද දවසේ පාර්ලිමේන්තුව රැස්වෙන බවත්, ඒ නිසා පාර්ලිමේන්තුවේ සිටිය යුතු බවත්" කියා. එය, මහලේකම්තුමාගේ ලියුමක්. ඒ ලියුම කියවලා බලලා ඒ මහෙස්ත්‍රාත්තුමා කියලා තිබෙනවා; "ඔව්, ඔබට ඕනෑ නම් යන්න පුළුවන් පාර්ලිමේන්තුවට. නමුත් මම නඩුව අහනවා." කියලා. මෙවැනි ප්‍රකාශයක්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන අධිකරණ අමාත්‍යතුමියත් එක්ක සාකච්ඡා කරන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අධිකරණයෙන් එවැනි ප්‍රකාශයක් කරපු බව ඒ තත්ත්වයට භාජනය වූ ගරු මන්ත්‍රීවරයෙක් අද අපට වාර්තා කළා. මම මේ වෙලාවේ ඒ කියපු අයගේ නම කියන්න ඕනෑ නැහැ. ඔබතුමාගේ අවධානයටයි මම මේ කරුණ යොමු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ ගැන හොයලා බලන්නම්. [බාධා කිරීමක්] ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා. ඊට පසුව සභානායකතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා සඳහන් කරපු කාරණාවට දෙයක් එකතු කරන්නයි මම උත්සාහ දරන්නේ.

ගරු කථානායකතුමනි, අද දවසේ චිතරක් නොවෙයි, හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට අදාළ නඩු කටයුතු මේ සතිය පුරාවටම ක්‍රියාත්මක වෙනවා. මේ සම්බන්ධයෙන් අපි ඔබතුමා සමඟ සාකච්ඡා කළා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ සිද්ධිය ගැන පමණක් නොවෙයි, මොන පක්ෂයක මන්ත්‍රීවරයෙක් වුණත්; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ ගරු කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමා සමඟ සාකච්ඡාවට දෙකක් පවත්වලා තිබෙනවා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය නැවත සිද්ධ වෙනවා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට මේ සතිය පුරාම අධිකරණයේ රැඳී සිටීමට නියමිත වෙලා තිබෙනවා. ඒ වාගේම මේ සතිය පුරාම පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නට පක්ෂ නායකයන් විධියට ඔබතුමන්ලා තීන්දු කරලා තිබෙනවා. ඒ නිසා මෙය ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන එක් මන්ත්‍රීවරයෙකුට අදාළ සිද්ධියක් විධියට පමණක් අර්ථ නිරූපණය කරගන්නේ නැතුව, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාටම එල්ල වන බරපතළ තර්ජනයක් විධියට සැලකිල්ලට ගන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ විධියට තමයි අපි පක්ෂ භේදයකින් තොරව කටයුතු කරන්නේ. මම අද සොයා බලන්නම්. ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරන්න ඕනෑ. ආණ්ඩුව ඒ සඳහා ඇප කැප වී සිටිනවා. නමුත්, අපරාධ නීතිය ක්‍රියාත්මක වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද වෙනස් වෙන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමා නීතිපතිවරයාත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය පියවර ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

රටේ ස්ථාන කිහිපයක ඇති වී තිබෙන ජාතිවාදී ගැටුම් පාලනය කිරීම
நாட்டின் பல்வேறு பகுதிகளில் இடம்பெறும் இன மோதல்களைக் கட்டுப்படுத்துதல்
CONTROL OF ETHNIC CLASHES IN CERTAIN PARTS OF THE COUNTRY

[අ.භා. 1.30]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"යළිත් වරක් රට තුළ තැනින් තැන ජාතිවාදී ගැටුම් ඇති වෙමින් තිබේ. මාස කිහිපයකට කලින් ගිංතොට්දිද, පසු ගියදා අම්පාරේදී සහ ඊයේ පෙරේදා මහනුවර තෙල්දෙනියේදීද ඇතිවූයේ එවැනි සිදුවීමය. මේ සිදුවීම්වල ආරම්භය සාමාන්‍ය සංසිද්ධියක් වුවත්, රට තුළ පැතිර පවත්නා ජාතිවාදී දේශපාලනය විසින් ඒවා ජාතිවාදී ගැටුම් දක්වා දුර ගෙනයෑමට සමත්ව තිබේ. රට තුළ තිස් අවුරුදු යුද්ධයක් දක්වා වර්ධනය වූයේත් ඊට කලින් ඇති වූ මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට එවකට පැවැති ආණ්ඩු අසමත් වීම හේතුවෙන්ය.

යළිත් රට තුළ ජාතිවාදී ගැටුම් ඇවිලවීමට ඉඩ නොදීමට නම් කවර ජාතියකට අයත් වුවත් අපරාධකරුවන් නීතිය හමුවට පැමිණවීමටත්, ජාතිවාදී දේශපාලනය පැරදවීමටත්, ජාතික සමගිය ආරක්ෂා කිරීමටත් රජය කටයුතු කළ යුතු බව මෙම සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද මේ ආන්දෝලනයට තුඩු දී තිබෙන සිදුවීම තමයි, පෙබරවාරි 22වැනි දා පහරකෑමකට ලක් වූ කුමාරසිංහ කියන 42 හැවිරිදි මහත්මයා පසුගිය දෙවැනිදා මිය ගොස් තිබීම. පහරකෑමට ලක් වූ කුමාරසිංහ මහත්මයා සිංහල වන අතර, පහරදීම සිදු කර තිබෙන්නේ මුස්ලිම් අයයි. මැද මහනුවර ජීවත් ව සිටියදී මියගිය කුමාරසිංහ මහත්මයාගේ මරණය සම්බන්ධයෙන් අපේ කනගාටුව, ශෝකය විශේෂයෙන්ම අපි පළ කරන්න ඕනෑ. ඒ වාගේම මේ සිදුවීම් පදනම් කරගෙන ඊයේ-පෙරේදා දෙදින තුළ ඇතිවූ සිදුවීම්වලින්; තවමත් පහව නොගොස් තිබෙන සිදුවීම්වලින්, 28 හැවිරිදි අබ්දුල් බාසිත් නම් මුස්ලිම් තරුණයෙක් මිය ගොස් තිබෙනවා. ඔහුගේ මරණය සම්බන්ධවත් අපේ කනගාටුව, ශෝකය අපි පළ කරනවා.

ගරු කථානායකතුමනි, ජීවිතවලට හානි වන මෙවැනි සිදුවීම්වලට අපි කනගාටුවීමෙන්, ශෝකවීමෙන් පමණක් එලක් ලැබෙවි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපිත්, මේ රටේ පොදුජන ව්‍යාපාර විශාල සංඛ්‍යාවකුත් අපේ රටේ මේ වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදය පරාජයට පත් කිරීම සඳහා බොහෝ කාර්යයන් ඉටු කර තිබෙනවා.

අපි ඕනෑම සිදුවීමක් අර්ථ කථනය කිරීමේදී සහ ඒ සිදුවීම් හරහා මතුවිය හැකි ජාතිවාදී ප්‍රවණතා පරාජයට පත් කිරීම වෙනුවෙන් සහ සියලු ජන කොටස්වල සම අයිතිය -භාෂාවේ අයිතිය, ආගම ඇදහීමේ අයිතිය, තමන්ගේ සංස්කෘතියේ අයිතිය- පිළිගන්නා දේශපාලන ව්‍යාපාරයක්. එම නිසා මේ ජාතිවාදයට එරෙහිව ජාතික සමගිය ගොඩනැඟිය යුතුය කියන තේමාව, ඒ සටන අපි කාලයක් මුළුල්ලේම මේ රටේ දියත් කර තිබුණා; ඒ සඳහා අපි උත්සාහ කරමින් සිටියා. හැබැයි ගරු කථානායකතුමනි, ඒ ශිෂ්ට සම්පන්න සටන, ඒ ශිෂ්ට සම්පන්න දේශපාලනය -එක් ජාතිකත්වයක් හුදකලා කොට වෙනස් කොට සැලකීම වෙනුවට සෑම ජන කොටස්වලම සාධාරණ අයිතීන් සම ලෙස පිළිගන්නා ශිෂ්ට සම්පන්න දේශපාලනය,- පරාද වී තිබෙන බව තමයි පෙන්නුම් කර තිබෙන්නේ. ඒ වෙනුවට ගෝත්‍රවාදී, ජාතිවාදී, මුග්ධ, වියරු ජාතිවාදය ජයග්‍රහණය කොට තිබෙන බව තමයි මේ සිදුවීම්වලින් පෙන්නුම් කරන්නේ. එම නිසා සිංහල, දෙමළ, මුස්ලිම් ජනයාගේ ජාතික සමගියත්, ඔවුන්ගේ සාධාරණ ආරක්ෂාවත්, ඔවුන්ගේ සාධාරණ අයිතීන් සහ ඔවුන්ගේ දේශපාලන අයිතියත් වෙනුවෙන් පෙනී සිටි දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපට ඒ ගැන කම්පනයක් තිබෙනවා. මේ ජාතිවාදය පරාජයට පත් කරන්න අපි තවමත් අසමත් වී තිබෙනවා. ඒ වෙනුවට මේ ජාතිවාදය ජයග්‍රහණය කොට තිබෙනවා; උත්සන්න වී තිබෙනවා.

අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අසමගි කොට, බෙදා වෙන් කොට එකට සිටීමක් කවර හෝ දේශපාලන ව්‍යාපාරයක්, සංවිධානයක් ප්‍රාර්ථනා කරනවා නම්; එසේ කල්පනා කරනවා නම් එය සිහිනයක් පමණයි. මේ ජාතිවාදීන්ට කළ හැකි වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර සැකය, අවිශ්වාසය, වෛරය, ක්‍රෝධය වර්ධනය කිරීම පමණයි; සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා බෙදා වෙන් කිරීම පමණයි. ජනතාව අතර සමගිය ගොඩනඟන්න මේ ජාතිවාදීන්ට පුළුවන්කමක් නැහැ. ඒ ඒ ජාතීන් කථා කරන භාෂාව අනුව, අදහන ආගම අනුව, තමන්ගේ සංස්කෘතීන් අනුව බෙදුණු රාජ්‍යයක් බවට පත් වෙනවා නම්, සතුරු කඳවුරු නියෝජනය වන ජනරාශීන් බවට පත් වනවා නම්, ඒ රට එකට පවතින්නේ නැහැ ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, එවැනි රටක කිසිදු ජන කොටසකගේ ආරක්ෂාව සුරක්ෂිත වන්නේ නැහැ. එවැනි ගැටුම්කාරී රටකට කිසිදු අනාගතයක්; සුබවාදී අනාගතයක් නිර්මාණය කර ගන්න හැකි වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා අපි කවර ජාතිකත්වයන් නියෝජනය කළත්, කවර දේශපාලන ව්‍යාපාරයන් නියෝජනය කළත් අපි හැම දෙනාම මේ මුග්ධ, වියරු, ගෝත්‍රවාදී ජාතිවාදය ප්‍රතික්ෂේප කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, හැබැයි, මේ ජාතිවාදය පැනනඟින්නේ හුදකලා ලෙස, තමන්ගේ සිත තුළ පහළ වුණු ඕපපාතික සිතිවිලි අනුව ඇති වුණු සිදුවීම් හැටියට නොවෙයි. ජාතිවාදය පිළිබඳව සැබෑ බල වුවමනාව සහිත දේශපාලනයක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මේ ජාතිවාදය උත්සන්න කරන, ජාතිවාදී ක්‍රියා මාර්ගවලට හවුල් වන ජාතිවාදය තමන්ගේ මහා උත්තුංග දේශපාලනයක් යයි සලකන අයගෙන් පිරිසක් මේ පිටුපස තිබෙන දේශපාලන වුවමනාව දන්නවා. මේ අය යම් දේශපාලන වුවමනාවකට අනුව හැසිරෙන බව දන්නවා. ඒ වාගේම මේ ජාතිවාදී ගැටුම් පිටුපස සිටින බොහෝ දෙනෙක් එම දේශපාලන වුවමනාව දන්නේත් නැහැ. මෙය හුදකලා ලෙස, ඕපපාතික ලෙස කොහේ හරි තරුණයකුගේ ඔළුවේ මතු වන මනස්ගාතයක් වෙනුවෙන් නොවෙයි, මෙය පැහැදිලි දේශපාලන වුවමනාවක් වෙනුවෙන් දියත් වෙමින් පවතිනවා. ජාතිවාදය පදනම් කොට ගත් දේශපාලනයක් අපේ රටේ යටි බිම් තලයේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. එය විටෙක උඩ කරළියට එනවා; තව විටෙක යට කරළියට යනවා; තවත් විටෙක උත්සන්න වෙනවා; තවත් විටෙක යටපත් වෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, උත්සන්න වෙමින්ද, යටපත් වෙමින්ද මෙම ජාතිවාදී දේශපාලනය වර්ධනය වෙමින් පවතිනවා.

[ගරු අනුර දිසානායක මහතා]

මේක ඇත්ත. මෙය අතිශය විනාශකාරී ලෙස, විසකුරු ලෙස පැතිරෙමින්, වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් තිබෙනවා. මෙහි සැඟවී තිබෙන දේශපාලනය කවරක්ද? මෙහි දේශපාලන අරමුණු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, බලය ලබා ගන්නා ලද අය තමන්ගේ බලය දිගු කාලීන ලෙස පවත්වා ගැනීම වෙනුවෙන් ජාතිවාදය ඉතිහාසයේත් උපයෝගී කර ගෙන තිබෙනවා; වර්තමානයේත් උපයෝගී කර ගන්නවා. බලය අහිමිවූවන් තමන්ගේ බල න්‍යාය පත්‍රය අත්පත් කර ගැනීම වෙනුවෙන් බල ව්‍යාපෘතිය ජාතිවාදය හරහා දියත් කරමින් තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, එකිනෙකට ප්‍රතිපාර්ශ්වීය වුණත්, ආණ්ඩුව තමන්ගේ බලය පවත්වා ගැනීම වෙනුවෙන් හිතාමතා මේ ජාතිවාදී ප්‍රවණතාව වර්ධනය වෙන්න ඉඩකඩ දෙනවා; එසේ නැතිනම් වර්ධනය වීම දැක්කේ නැහැ වාගේ අහක බලාගෙන ඉන්නවා. මේකයි ඇත්ත තත්ත්වය. පිළිගන්නේ නැත්නම්, -පිළිගන්න වෙනවා- මම තමුන්නාන්සේලාට සාධකත් එක්ක කියන්නම්.

තමුන්නාන්සේලා ආර්ථික වශයෙන් අසමත් වුණු රාජ්‍යයක් ගොඩනඟා තිබෙනවා. තමුන්නාන්සේලා පොදු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගන්න බැරි රාජ්‍යයක් ගොඩනගා තිබෙනවා. මේ සිදුවීම් විශේෂයෙන් පළාත් පාලන මැතිවරණයෙන් පසුව වර්ධනය වී තිබුණත්, තමුන්නාන්සේලාගේ ගැටලුව වී තිබුණේ කුමක්ද? අග්‍රාමාත්‍ය ධුරයේ කවුරු වාඩිවෙයිද, තමන්ගේ අමාත්‍ය ධුරය වෙනුවට වෙන අමාත්‍ය ධුරයක් තමන්ට ලැබෙයිද, එම අමාත්‍ය ධුරය අර අමාත්‍ය ධුරයට වඩා මුදල් සංසරණය වෙන එකක්ද යනාදිය තමයි තමුන්නාන්සේලාගේ ගැටලු බවට පත් වෙලා තිබුණේ. තමුන්නාන්සේලාගේ බොහෝ අය පසුගිය දවස්වල මාධ්‍ය හරහා කළ සෑම ප්‍රකාශයක් පිටුපසම තිබුණේ ජනතාව පිළිබඳව තමුන්නාන්සේලාගේ තිබෙන වගකීම සහ බැඳීම නොවෙයි. තමුන්නාන්සේලාගේ ඒ හැම ප්‍රකාශයක් ඇතුළේම තිබුණේ පෞද්ගලිකව තමුන්නාන්සේලාගේ බල ව්‍යාපෘතිය ආරක්ෂා කර ගන්නේ කොහොමද, එය දියත් කරන්නේ කොහොමද කියන වුවමනාවයි. අගමැතිකම රැකෙයිද, නැද්ද; වෙන කෙනෙක් වාඩිවෙයිද, නැද්ද; තිබුණු ඇමතිකම රැකෙයිද, නැද්ද; ලොකු ඇමතිකමක් ලැබෙයිද, නැද්ද; ජනාධිපතිවරයාට තව සැරයක් ජනාධිපති වෙන්න පුළුවන් වෙයිද; බැරිද යනාදී කාරණයි. මේ නිසා රටේ ජනතාව පිළිබඳවත්, ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳවත් බැඳීම මුළුමනින්ම අත් හැර, තමුන්නාන්සේලාගේ පටු බල වුවමනාව වෙනුවෙන් පසුගිය මාසයේ සිට -මැතිවරණයෙන් පසු කාල පරිච්ඡේදයේ සිට- කටයුතු දියත් වෙමින් තිබෙනවා. මැතිවරණයට පෙරත් එහෙමයි. ඒ නිසා තමුන්නාන්සේලාට මේ සිදුවීම් එක පසෙකින් අදාළ නැහැ. එක පසෙකින් තමුන්නාන්සේලාට මෙම සිදුවීම් ආශීර්වාදයක්.

ගරු කථානායකතුමනි, සිංහල, දෙමළ, මුස්ලිම් ජනයාගේ අස්වැන්න නෙළන කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. සමහර කුඹුරු, කන්න තුන-හතරක් වගා නොකර සිට වගා කරපු ඒවා. හැබැයි, තමුන්නාන්සේලා එක අමාත්‍ය මණ්ඩල රැස්වීමක කථා කළාද, එක පොදු සාකච්ඡාවක් හරහා කථා කළාද, මෙවර වී මිලදී ගන්නේ කොහොමද කියලා? එම ප්‍රශ්නයට සිංහල, දෙමළ, මුස්ලිම් කවුරුත් මුහුණ දෙනවා. ඒ වාගේම රැකියා විරහිතභාවයෙන් පෙළෙන උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් -50,000කට අධික ප්‍රමාණයක්- ඉන්නවා.

ඒ අය අතර දෙමළ, මුස්ලිම්, සිංහල තරුණයන් ඉන්නවා. තමුන්නාන්සේලා ඒ ගැටලුවලට විසඳුම් සොයනවාද? අපේ රටේ ජනතාව සෞඛ්‍යමය වශයෙන් විශාල අනාරක්ෂිතතාවක වෙළී සිටිනවා. ඒ සෞඛ්‍ය අනාරක්ෂිතතාව සිංහල, දෙමළ, මුස්ලිම් කවුරුත් -පහළ පන්තියේ ජනයා- නියෝජනය කරනවා. ඒ සඳහා තමුන්නාන්සේලා විසඳුම් සොයනවාද? තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳව විශාල ගැටලුවකට අපේ රටේ පොදු ජනයා මුහුණ දී සිටිනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේලා කොයි තරම් ප්‍රමාණයකට සැලකිල්ලෙන් අවධානය යොමු කරනවාද? අවධානය යොමු කරන්නේ නැහැ. ඒ නිසා අද සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනයාගේ අරගළය බවට පත් විය යුතුව තිබුණේ තමන්ගේ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා වූ සටනක්. සිංහල, දෙමළ, මුස්ලිම් ගොවි ජනතාවට, සිංහල, දෙමළ, මුස්ලිම් රැකියා විරහිත තරුණයාට, සෞඛ්‍යමය වශයෙන් අනාරක්ෂිත තත්ත්වයට පත් වී සිටින සිංහල, දෙමළ, මුස්ලිම් ජනයාට එකට සාමූහික අරගළයක් තිබුණා. හැබැයි තමුන්නාන්සේලා හරි සතුටුයි, ඒ අරගළය තමුන්නාන්සේලාට අද එල්ල වන්නේ නැති එක ගැන. ඒ වෙනුවට සිංහල ජනයා මුස්ලිම් ජනතාවට එරෙහිවත්, මුස්ලිම් ජනයා සිංහල ජනයාට එරෙහිවත් වෛරය, ක්‍රෝධය, සැකය, අවිශ්වාසය වර්ධනය කරන සමාජයක් ගොඩ නඟා තිබෙනවා. මේ සියලුදෙනාගේ විරෝධය තමුන්නාන්සේලාට එල්ල වෙන්න තිබියදී තමුන්නාන්සේලා මොකද කරන්නේ? සිංහල ජනයා මුස්ලිම් ජනතාවට එරෙහිවත්, මුස්ලිම් ජනයා සිංහල ජනතාවට එරෙහිවත් පෙළ ගස්වනවා. එය තමුන්නාන්සේලාට ආශීර්වාදයක් නොවෙයිද? තමුන්නාන්සේලා දිශාවට එල්ල විය යුතු අර්බුදය, තමුන්නාන්සේලා දිශාවට එල්ල විය යුතු අභියෝගය ඒ ගැටුම් හරහා පහළ පන්තිය නියෝජනය කරන ජනතාව අතර වන ගැටුම් බවට, ජනතාව අතර අවිශ්වාසය, සැකය බවට තමුන්නාන්සේලා වර්ධනය කොට තිබෙනවා. ඒ නිසා මෙම ජාතිවාදී ගැටුම් තමුන්නාන්සේලාට ආශීර්වාදයක් බවට පත් වී තිබෙනවා. මා පසුව කියන්නම්, තමුන්නාන්සේලා මේවාට දායක වුණේ කොහොමද, මේවා ආරක්ෂා කළේ කොහොමද, මේවා වර්ධනය වන්න ඉඩ හැදුවේ කොහොමද කියා. ඒ නිසා මෙය තමුන්නාන්සේලාට අත් හරින්න බැරි වගකීමක්. ඒ පළමු කාරණයයි.

දෙවන කාරණය මොකක්ද? බලය අහිමි වූවන්. ගරු කථානායකතුමනි, යළි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, ආර්ථිකයේ මහා සංවර්ධනය පිළිබඳව, සියලු ජනතාවගේ සම අයිතීන් පිළිබඳව, සාධාරණ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පිළිබඳ සෑම සටනක්ම, සෑම සටන් පාඨයක්ම ඉතිහාසයේ පාලනය විසින් ඔවුන්ට අහිමි කොට තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ බලය ලබා ගැනීමේ න්‍යාය පත්‍රය යටි බිම් තලයේ ක්‍රියාත්මක වෙමින් තිබෙන ජාතිවාදය බවට පත් වී තිබෙනවා. දැන් මේ පාර්ලිමේන්තුවේ ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ඉන්නවා නම්, එතුමා මා සමඟ එකඟ වනවා ඇති. එතුමා මට ප්‍රකාශ කළා, පසුගිය පළාත් පාලන මැතිවරණයේදී එතුමාගේ අම්පාරේ අපේක්ෂකයන් කිව්වේ මොනවාද කියා. මා එතුමා උපුටා දක්වනවා, එතුමා සිටියා නම්. එතුමා නැති නිසා මා ඒ ගැන කියන්නේ නැහැ. එතුමා කිව්වා ඔවුන් මොනවාද කිව්වේ කියා. තමුන්නාන්සේලාගේ බලය අහිමි වූවන්ගේ දේශපාලනය ජාතිවාදය මත පදනම් වෙච්ච දේශපාලනයක් බවට පරිවර්තනය වී තිබෙනවා. එක පසකින් ආණ්ඩුව බලය ආරක්ෂා කරගැනීම වෙනුවෙනුත්, තවත් පසකින් තවත් කොටසක් බලය ලබාගැනීම වෙනුවෙනුත් මේ ජාතිවාදය පාපන්දුවක් බවට පත් කොට ගෙන තිබෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, ඉතිහාසයේත් ජාතිවාදයේ මහා ගොදුරු බවට පත් වුණේ මේ ජාතිවාදය කරපින්නාගෙන බලය ගත්තු අය හෝ බලය ආරක්ෂා කරපු අය නොවෙයි. උතුරේත්, දකුණේත් මේ මහා ජාතීවාදී වියරුවෙන් මියගියේ සාමාන්‍ය අම්මා තාත්තාගේ දරුවන්; නැති වුණේ සාමාන්‍ය අම්මා තාත්තාගේ දේපළ; අනාරක්ෂිත බවට පත් කළේ සාමාන්‍ය අම්මා තාත්තාගේ පවුල් ජීවිත. ඒ නිසා ජාතිවාදය වපුරන්නන්ගේ ජීවිතවලට මේවා තර්ජන නොවෙයි. මේවා තර්ජන බවට පත්වී තිබෙන්නේ පහළ පන්තියේ මිනිසුන්ට.

ගරු කථානායකතුමනි, මේ වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදය නිසා බලය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සහ බලය ලබා ගැනීම වෙනුවෙන් ප්‍රතිපක්ෂ ලෙස එක වුවමනාවකට කටයුතු කරමින් තිබෙන පාර්ශ්වයන් බවට පත්වී තිබෙනවා. ඒක තමයි මෙම ජාතිවාදයේ සැබෑ අරුත. එය ඒ තරම් ප්‍රබල නිසා තමයි ගරු කථානායකතුමනි, ජාතිවාදය වෙනුවට ජාතික සමගිය ඇති කිරීමට අපි අසමත් වී තිබෙන්නේ. ජාතිකත්වය හුදකලා කරනවා වෙනුවට හැම ජනතාවගේම ජන අයිතීන් තහවුරු කිරීමට දේශපාලනය සමත්වී තිබෙනවාද? ඒක අසමත්. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳ කම්පනයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අසාර්ථක වී තිබෙනවා; අපි අසමත් වී තිබෙනවා. අපට හැකියාවක් ලැබී නැහැ, ජාතික සමගිය දේශපාලනයෙන් උඩට ගෙනෙන්න. සියලු ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීමේ රාජ්‍යය උඩට ගෙනෙන්න අපි අසමත් වී තිබෙනවා. බලලෝභීත්වයෙන් මත්වී තිබෙන, ලබා ගන්නා ලද බලය කෙසේ හෝ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන කණ්ඩායම්වල පාපන්දුවක් බවට අද මේ ජාතිවාදය පත්වී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ දියත් වෙමින් තිබෙන මහා විෂකුරු දේශපාලනය අපි පරාජයට පත් කළ යුතු නැද්ද? තව ජීවිත කීයක්, තව සිදුවීම් කීයක් සිදුවිය යුතු ද?

පසුගිය 2014 ජූනි මාසයේ අලුත්ගම, බේරුවල දර්ගා නගරයේ සිදුවූ සිදුවීම බලන්න. ගරු කථානායකතුමනි, මේවා ක්ෂණික කෝපය නිසා වූ සිදුවීම් නොවෙයි. ඉතාම සැලසුම් සහගත ලෙස, සංවිධානාත්මකව, එවකට පැවති රාජ්‍ය පාලනයේ ආශිර්වාදය සහිතව, ආරක්ෂාව සහිතව මැදිහත් වූ විනාශකාරී ක්‍රියාමාර්ග. ඒවා මහ දවාලේ ආරක්ෂක හමුදා ඉදිරිපිට සිදුවෙච්ච ඝාතනයන් සහ පහරදීම්. ඒක තමයි එදාත් දියත් වුණේ. ඒ වාගේම 2017 නොවැම්බර් මාසයේ ගිංතොටදී සිද්ධ වුණේ මොකක්ද? ගරු කථානායකතුමනි, ඒ ගිංතොට සිදුවීම ගැන අපේ වජිර අබේවර්ධන අමාත්‍යතුමා දන්නවා ඇති. ඒවා ඉතාම සැලසුම් සහගත සිදුවීම්. මොකක් හරි සිදුවීමක් අහම්බෙන් සිද්ධ වෙනවා. හැබැයි, ඒ අහඹු සිදුවීමට සැලසුම් සහගත ජාතිවාදී නඩයන් මැදිහත් වෙනවා. සමහර ඒවා පොලීසිය මධ්‍යයේ, පළාතේ දේශපාලනඥයාගේ රැකවරණ මධ්‍යයේ, පළාතේ දේශපාලනඥයාගේ ආරක්ෂාව මධ්‍යයේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ගිංතොටදීත් අපි ඒක දැක්කා.

ගරු කථානායකතුමනි, මත්පැන් බී, මුස්ලිම් කඩෙකට ගොස් කොත්තු සමඟ හරක් මස් ඉල්ලන බෞද්ධයා කිසිදු විද්‍යාත්මක පදනමක් නැතිව වද පෙති තිබෙනවා යැයි කියා -එහෙම බෞද්ධයෙක් නම් වද කරන්නත් ඕනෑ- ඇති වූ සිද්ධියට දැක්වූ ප්‍රතිචාරය මොකක්ද? තමුන්නාන්සේලාට ආණ්ඩුවක් තිබෙනවා; මාධ්‍ය තිබෙනවා; බලයක් තිබෙනවා. නමුත් මේ ප්‍රවණතාව පරාජයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක වූ අවස්ථා එකක් මට කියන්න. ඒ සම්බන්ධයෙන් කළ එක රූපවාහිනී වැඩසටහනක් පෙන්වන්න. ඒ වෙනුවෙන් ආණ්ඩුව හැටියට කළ එක මාධ්‍ය සාකච්ඡාවක් පෙන්වන්න. තමුන්නාන්සේලා මොකක්ද කළේ? තමුන්නාන්සේලා ඒ තත්ත්වය නිදැල්ලේ වර්ධනය වෙන්න ඉඩ හැරියා. පළාත් පාලන මැතිවරණයෙන් පසුව තමුන්නාන්සේලාට ඇති වූ මාරාන්තික ප්‍රහාරය යටපත් වෙන්න නම් ඒ වාගේ සිදුවීම් උඩට එන එකට තමුන්නාන්සේලා කැමැතියි. තමුන්නාන්සේලාගේ අභ්‍යන්තර ගැටුම් පසුව දා පත්තරවල ප්‍රධාන ශීර්ෂ පාඨය වනවා වෙනුවට, අම්පාරේ සිදු වුණා වාගේ සිදුවීම් පසුව දා පත්තරවල ප්‍රධාන ශීර්ෂ පාඨය වනවාට තමුන්නාන්සේලා කැමැතියි. ඒ නිසා තමුන්නාන්සේලා දැනුවත්ව එවැනි සිදුවීම් වර්ධනය වීම සඳහා ඉඩකඩ ලබා දුන්නා. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව මේ රටේ සියලු පුරවැසියන්ගේ ආරක්ෂාව මේ රටේ ජනතාව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට භාරදී තිබුණා. නමුත් තමුන්නාන්සේලා තමුන්නාන්සේලා සතුව තිබෙන ඒ වගකීම අත්හැරලා තිබෙනවා. ඒ ජනතාවගේ ආරක්ෂාව, ඒ ජනතාවගේ දේපළ පිළිබඳව තිබෙන ආරක්ෂාව, ඒ අයට බියෙන් සැකෙන් තොරව ජීවත්වීමට තිබෙන අයිතිය පිළිබඳ වගකීමක් තිබෙන ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා ඒ වගකීම අත්හැරියා. තමුන්නාන්සේලා හරි සතුටුයි, බිය ජනක තත්ත්වයක් රටේ නිර්මාණය වෙනවාට. තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් මොකද කරන්නේ? මේ තත්ත්ව යටතේ තමුන්නාන්සේලාට කඩිමුඩියේ හදිසි නීතිය පනවා ගන්න පුළුවන්. අද කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වෙලා තිබෙනවා හදිසි නීතිය පනවන්න. හදිසි නීතිය දැම්මාම වෙන ආණ්ඩුවක් එනවාද? නැහැ, මේ ආණ්ඩුවමයි තිබෙන්නේ. හදිසි නීතිය දාපුවාම වෙන ජනාධිපතිවරයෙක් එනවාද? හදිසි නීතිය දැම්මාම වෙන ඇමතිවරයෙක්, අගමැතිවරයෙක් එනවාද? හදිසි නීතිය දැම්මාම ඇමති මණ්ඩලය වෙනස් වෙනවාද? නැහැ, මේ ඇමති මණ්ඩලයමයි, මේ අගමැතිවරයාමයි, මේ ජනාධිපතිවරයාමයි ඉන්නේ. මේ ජාතිවාදී ප්‍රවණතා වර්ධනය වීම සඳහා දැනුවත්ව සැලසුම් සහගතව නිහඬව හිඳීමෙන් ඒවාට ආශිර්වාද කරපු කණ්ඩායම තමයි හදිසි නීතිය යටතේ රටේ පාලනය කරන්නේත්. තමුන්නාන්සේලා මෙවැනි තත්ත්ව උපයෝගි කර ගන්නවා, ජනතාව මර්දනය කිරීම සඳහා මර්දන නීති ගෙනෙන්න. ඒකයි තමුන්නාන්සේලාගේ අදහස. ඇයි ඒ? තමුන්නාන්සේලා හම්බන්තොට වරායේ නැහෙනහිර ජැටිය විකුණන කොට, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය විකුණන්න සැලසුම් කරනකොට, මත්තල ගුවන් තොටුපොළ විකුණන්න සැලසුම් කරනකොට තමුන්නාන්සේලාගේ ඒ විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තියට එරෙහිව මේ රටේ ජනතාව පෙළ ගැහෙනවා. ඒ පෙළ ගැහෙන ජනතාව මර්දනය කිරීම සඳහා තමයි තමුන්නාන්සේලා මේ හදිසි නීතිය උපයෝගි කර ගන්නේ.

මේ වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදී ප්‍රවණතාව පරාජයට පත් කිරීම සඳහා තමුන්නාන්සේලාට කිසිසේත්ම හදිසි නීතියේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ. ඒ සඳහා සාමාන්‍ය නීතිය ඕනෑවටත් වඩා ප්‍රමාණවත්, තමුන්නාන්සේලා සාමාන්‍ය නීතිය හරියට ක්‍රියාත්මක කළා නම්. හැබැයි තමුන්නාන්සේලා අද උත්සාහ කරමින් තිබෙනවා, සාමාන්‍ය නීතිය යටපත් කරලා හදිසි නීතිය පනවන්න. ඒ අන් කවරක් සඳහාවත් නොවෙයි, ජනතාවගේ පොදු අයිතිවාසිකම් පිළිබඳ සටන මර්දනය කරන්නයි. මේවා බොර දියේ මාළු බානවා වාගේ වැඩ. අද සමාජයේ මහා කැලඹීමක් ඇති වී තිබෙනවා; ජාතිවාදී ගැටුම් උත්සන්න වී තිබෙනවා. ඒ උත්සන්න වූ ජාතිවාදී ගැටුම් සමනය කරනවා වෙනුවට තමුන්නාන්සේලා තමුන්නාන්සේලා සතුව තිබෙන මර්දන නීති, මර්දන හස්තය ශක්තිමත් කර ගැනීම සඳහා අද කැබිනට් මණ්ඩල තීන්දු අරගෙන තිබෙනවා. තමුන්නාන්සේලා හදිසි නීතිය පැනවූවාට තමුන්නාන්සේලාගේ දේශපාලන උවමනාව වෙනස් වන්නේ නැහැ. තමුන්නාන්සේලා හදිසි නීතිය පැනවූවාට ජනතාවගේ උවමනාවන් ඉටු කරන්න තමුන්නාන්සේලා සමත් වන්නේ නැහැ. තමුන්නාන්සේලා හදිසි නීතිය උපයෝගි කර ගන්නේ ජනතාවගේ පොදු අයිතිවාසිකම් පිළිබඳ සටන් මර්දනය කරන්න පමණයි.

ගරු කථානායකතුමනි, දිගන සහ තෙල්දෙණිය ප්‍රදේශවල ඇති වූ සිදුවීම ගැන බලමු. අපි දන්නවා, පෙබරවාරි 22 වන දා තමයි මේ ගැටුම සිද්ධ වුණේ. සිංහල රියදුරෙක් සහ ත්‍රී රෝද රථයක ගමන් ගත් මුස්ලිම් තරුණයන් පිරිසක් අතර පාරේ ඇති වූ ගැටුමක් දුර දිග ගොස්, සැලසුම් කොට, රැකවල් දාගෙන සිට - පාර වහගෙන, ඒ රියදුරා එනකල් සිට- අල්ලාගෙන පහර දී මාරාන්තික තුවාල ඇති කර තිබෙනවා. 22 වන දා රෝහල්ගත වී, දින 8ක පමණ කාලයකට පසුව මාර්තු 2 වන දා ඔහු මිය ගියා. අපේ රටේ ඕනෑ තරම් ගැටුම් සිදු වී තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, අපේ රටේ මෙවැනි මිනී මැරුම්, මෙවැනි ගැටුම් 490ක් 2016 වසරේ සිදු වී තිබෙනවා. 2017 වසරේ 452ක් සිදු වී තිබෙනවා. ඒ නිසා අපේ රටේ සිදු වූ එකම මාරාන්තික ප්‍රහාරය හා එකම මිනී මැරුම දිගනදී සිදු වූ මේ මිනී මැරුම නොවෙයි. 2017 වසරේ 452ක් සහ 2016 වසරේ 490ක් සිදු වී තිබෙනවා. 2016 වසරේ අපේ රටේ ළමා දූෂණ 291ක් සහ 2017 වසරේදී 232ක් සිදු වී තිබෙනවා. 2017 වසරේ අපේ රටේ ස්ත්‍රී දූෂණ 290ක් සහ 2016 වසරේ 346ක් සිදු වී තිබෙනවා. අපේ රටේ ස්ත්‍රී දූෂණ සිදු වෙනවා; ළමා දූෂණ සිදු වෙනවා; මිනී මැරුම් සිදු වෙනවා; අපරාධ සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ මිනී මැරුම්, අපරාධ කොතෙක් සිදුවුවත්, සිංහල පිරිසක් විසින් මුස්ලිම් කෙනෙකුට අලාභහානි සිදු කළොත්, මුස්ලිම් පිරිසක් විසින් සිංහල පිරිසකට අලාභහානි සිදු කළොත්, එය පොදු අපරාධ ගණයේ අපරාධයක් ලෙස නොසලකා ජාතිවාදී ගැටුමක් බවට පරිවර්තනය කරනවා. ඒ නිසා රටේ මේ වෙලාවේ වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදී ප්‍රවණතා පිළිබඳව ආණ්ඩුවක් විධියට තමුන්නාන්සේලාට යම් අවබෝධයක් හෝ හැඟීමක් තිබුණා නම් මේවා සිද්ධ වන්නේ නැහැ. සිහි මූර්ඡාභාවයට පත් වූ, සිහිය විකෘතිභාවයට පත් වූ, බමන මතින් සිටින ආණ්ඩුවක් නම් මේවා තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේලා බලයෙන් මුසපත් වී සිටින ආණ්ඩුවක් නම් මේවා පෙනෙන්නේ නැහැ. ඒක හරි. තමුන්නාන්සේලාගේ බලය ගිලිහී යෑම නිසා ඇති වී තිබෙන මානසික වියවුලෙන් කටයුතු කරනවා නම් මේ තත්ත්වය පෙනෙන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා සිහි බුද්ධියෙන් සහ විකෘති නොවුණු මනසකින් මේ රටේ දේශපාලනය කරනවා නම්, මේ සිදුවීම කවර ආකාරයෙන් වර්ධනය විය හැකිද කියන සරල මැනීමක් තමුන්නාන්සේලාට කරන්න තිබුණා. විවිධ දේශපාලන බල කඳවුරුවල වුවමනාව මත බිම් තලයේ ජාතිවාදී ප්‍රවණතා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ ප්‍රවණතා විටෙක උඩට එනවා; විටෙක යටපත් වෙමින් තිබෙනවා. ඒ ප්‍රවණතා උඩට එමින්, යටපත් වෙමින් වර්ධනය වෙමින් තිබෙනවා. මේකයි, අපේ රටේ තිබෙන ජාතිවාදය. මාධ්‍යවල හැසිරීම, සමාජ ජාලවල හැසිරීම, එක් එක් සිදුවීම්වලට දෙන අර්ථ කථනය කියන මේ ඔක්කෝම දිහා බැලුවාම අපට එය පැහැදිලියි. ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල බෝම්බයක් පුපුරන කොට "ත්‍රස්තවාදියා බෝම්බ ගෙනාවා" යැයි කියන දේශපාලකයන් සිටින රටක, එල්ටීටීඊ පළමු ප්‍රහාරය පටන් ගත්තා යැයි කියලා උද්දාමයෙන් ජනතාව ආමන්ත්‍රණය කරන රටක, මෙවැනි සිදුවීමක් කවර ආකාරයෙන් උපයෝගි කර ගනීද කියන එක සම්බන්ධයෙන් අවම අවබෝධයක්වත් තමුන්නාන්සේලාට තිබිය යුතුව තිබුණා, තමුන්නාන්සේලා සිහි මූර්ඡාභාවයට මනස විකල් නොවුණු ආණ්ඩුවක් නම්. 22 වෙනි දා රාත්‍රියේ මේ සිදුවීම වූවාට පසුව මෙය වර්ධනය විය හැකි දිශා පිළිබඳව තමුන්නාන්සේලාට හොඳ අවබෝධයක් ලබා ගත යුතුව තිබුණා. මේ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. තමුන්නාන්සේලා සතුව තමයි, රාජ්‍ය බුද්ධි අංශය තිබෙන්නේ. තමුන්නාන්සේලා සතුව තමයි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙන්නේ. පෙනෙන ආණ්ඩුව මෙය වුණාට තමුන්නාන්සේලාගේ රාජ්‍ය මීට වඩා විහිදිලා තිබෙන බව අපි දන්නවා. අපට අග්‍රාමාත්‍යවරයෙක් පෙනෙන්න ඉන්නවා; සභානායකවරයෙක් පෙනෙන්න ඉන්නවා; ආණ්ඩු පක්ෂ සංවිධායකවරයෙක් පෙනෙන්න ඉන්නවා. හැබැයි, තමුන්නාන්සේලා මෙහෙම පෙනෙන්න සිටියාට මීට වඩා රාජ්‍යයක් බිම් තලයේ තිබෙනවා. ඒ සඳහා රාජ්‍ය බුද්ධි අංශ තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙනවා, ඔවුන් විසින් මිලදී ගන්නා ලද ඔත්තුකරුවන් ඉන්නවා. මෙවැනි රාජ්‍ය යන්ත්‍රණයක් බිම් තලයේ තිබෙනවා.

තමුන්නාන්සේලා එළියට පෙනෙන්න ලස්සනට ඇඳගෙන හිටියාට, සිනා වෙමින් හිටියාට තමුන්නාන්සේලාගේ යටි බිම්ගත රාජ්‍ය යාන්ත්‍රණයක් තිබෙනවා. මේ රාජ්‍ය ජාන්ත්‍රණය තිබෙන්නේ කුමක් වෙනුවෙන්ද? අපි එකඟ නොවුණත් ඒ රාජ්‍ය යාන්ත්‍රණය තමයි මේ ඇති වී තිබෙන තත්ත්වයන් පිළිබඳව පූර්ව අවබෝධයක්, පූර්ව නිගමනයක්, මේ ඇති වී තිබෙන තත්ත්වයන් පිළිබඳව පූර්වයෙන් වාර්තාවන් ආණ්ඩුවට ලබා දිය යුතුව තිබෙන්නේ. තමුන්නාන්සේලා අපේ රැස්වීම්වල කියපුවා කියනවා; ආපු ගණන කියනවා; ආපු බස් ගණන කියනවා; ආපු බස්වල නම්බර්ස් කියනවා. ඔය තිබෙන්නේ. වෙනම ෆයිල් තිබෙනවා. අහඹරුවාදා උදේ රැස්වෙලා ආරක්ෂක මණ්ඩලයේ දී ඒවා ගැන කථා කරනවා. අහවල් මැයි දිනයට කීයක් ආවාද, ආවේ කොහෙන්ද, බස් කීයද, බස්වලට සල්ලි කොහෙන්ද ආදී දේවල්. තමුන්නාන්සේලා මේ වාගේ දෙවල් සොයනවා නේ. අහඹරුවාදා රැස්වෙන ආරක්ෂක මණ්ඩලයේ දී මේවා ගැන කථා කරනවා නේ. තමුන්නාන්සේලාගේ රාජ්‍යයක් මෙහෙයවනවා. හැබැයි තමුන්නාන්සේලා මෙහෙයවන ඒ රාජ්‍ය ඇතුළේ මේ තොරතුරු තමුන්නාන්සේලාට එන්නේ නැහැයි කියලා තමුන්නාන්සේලා පිළිගන්නවාද? මම ඒකයි අහන්නේ.

පිට සිට, රාජ්‍යයෙන්, ආණ්ඩුවෙන් එළියේ සිට මේ ඇති වී තිබෙන වර්ධනයන් පිළිබඳව අපට අනුමානයන් තිබෙනවා, මෙය ගමන් කළ හැකි දිශාවන් පිළිබඳව අපට නිරීක්ෂණ තිබෙනවා. හැබැයි තමුන්නාන්සේලාට රාජ්‍යයක් ලෙස ඒවා සොයා ගැනීම සඳහා නිශ්චිත යාන්ත්‍රණයන් තිබියදී, තමුන්නාන්සේලාට එය නොපෙනෙනවා කියලා අපි විශ්වාස කළ යුතුද? අපි එසේ විශ්වාස නොකළ යුතුයි. අපි දන්නවා මේවා තමුන්නාන්සේලාට වාර්තා වෙන බව. එහෙම නම් මොකක්ද සිදු විය යුතුව තිබුණේ? 22වෙනි දායින් පසුව ඇති විය හැකිව තිබෙන තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය වෙන, වර්ධනය වීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණා. මොනවාද ගත්ත ක්‍රියාමාර්ග කියලා මම දැන ගන්නට කැමැතියි. පසුගිය 22වෙනි දා සිට ගත් ක්‍රියා මාර්ග මොනවාද? ඊයේ හවස තුනට එස්ටීඑෆ් එක කැඳවපු එක, සවස තුනහමාරට ඇඳිරිනීතිය දාපු එක, අද උදේ ඇමති මණ්ඩලය රැස්වෙලා හදිසි නීතිය දාන්න තීරණය කළ එක ගැන නොවෙයි. තමුන්නාන්සේලා පශ්චාත් මරණ පරීක්ෂකවරු නොවෙයි කියන එක මතක තබා ගන්න. තමුන්නාන්සේලාට ආණ්ඩුවක් ලබා දීලා තිබෙන්නේ පශ්චාත් මරණ පරීක්ෂණ කිරීම සඳහා නොවෙයි. යම් කිසි සිදු වීමක් සිදු වූවාට පසුව එම සිදුවීම වාර්තා කිරීම සඳහා තමුන්නාන්සේලා ඕනෑ නැහැ. ඒවා වාර්තා කරන්නට අපේ රටේ මාධ්‍ය ආයතන තිබෙනවා. වෙනත් වාර්තාකරුවන් අපට ඕනෑ නැහැ; පශ්චාත් මරණ පරීක්ෂණකවරුන් අපට ඕනෑ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබෙන්නේ මොකටද? යම් දෙයක් සිදු වුණාට පසුව එම සිදුවීම ගැන වාර්තා අපට එපා. තමුන්නාන්සේලා මෑත කාලයේ හැම දාමත් කළේ එහෙමයි. ගිංතොට සිද්ධිය සිදු වුණාට පසුව අපට වාර්තා කළා. අම්පාර සිද්ධිය සිදු වුණාට පසුව පාර්ලිමේන්තුවට වාර්තා කළා. දැන් දිගන සහ තෙල්දෙණියේ සිදුවීම්වලින් පසුව අපට වාර්තා කරනවා. මේ ආණ්ඩුව පශ්චාත් මරණ පරීක්ෂකවරුන්ගේ ආණ්ඩුවක්ද? සිදුවීම් සිදු වුණාට පසුව වාර්තා කරන්නට සිටින ආණ්ඩුවක්ද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබෙන්නේ සිදු විය හැකි දේ උපකල්පනය කොට එය වැළැක් වීම සඳහායි.

අද තමුන්නාන්සේලා පශ්චාත් මරණ පරීක්ෂකවරුන්ගේ තත්ත්වයට පත් වී තිබෙන්නේ අන් කවරක් නිසාවත් නොවෙයි, මේ වර්ධනය වන තත්ත්වයට තමුන්නාන්සේලා කැමැති නිසායි. මා අදත් කියන්නේ ඒකයි. තමුන්නාන්සේලා එයට කැමැතියි. මුස්ලිම් ජනතාව, මුස්ලිම් ජාතිවාදී දේශපාලනයකට තල්ලු වන තරමට තමුන්නාන්සේලා කැමැතියි. ඇයි, ඒ? තමුන්නාන්සේලාට ඒ ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ නැහැ. ජාතිවාදී

නායකයන්ගේ ප්‍රශ්න විසඳුවාම ඉවරයි. තමුන්නාන්සේලාට ජනතාවගේ ප්‍රශ්නය විසඳීම අසීරුයි, ජාතිවාදී නායකයන්ගේ ප්‍රශ්නය විසඳීම ලේසියි. ඒ නිසා මුස්ලිම් ජනයා ජාතිවාදී කෝණයකට තල්ලු වීම නිසා තමුන්නාන්සේලා කල්පනා කරනවා, එය ජාතිවාදී මුස්ලිම් දේශපාලන ව්‍යාපාරයක් විසින් අත්පත් කර ගත්තාට පසුව ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ නැහැ, ජාතිවාදී නායකයන්ගේ ප්‍රශ්නය විසඳන එක ලේසියි කියලා. අපි දන්නවා, මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ නායකයන්ගේ ප්‍රශ්න විසඳපු ආකාරය. දෙමළ ජනතාවගේ ප්‍රශ්නය විසඳීම තමුන්නාන්සේලාට අමාරුයි. ඒ නිසා තමුන්නාන්සේලා අවධානය යොමු කරන්නේ, දෙමළ ජනතාව මුහුණ දී තිබෙන ගැටලුවලට විසඳුම් සෙවීම පිළිබඳව නොවෙයි, දෙමළ ජාතිවාදී නායකයන්ගේ ගැටලුවලට විසඳුම් සෙවීම පිළිබඳවයි. තමුන්නාන්සේලාට නායකයන්ට විසඳුම් සොයා දෙන්න ලේසියි; ජනතාවට විසඳුම් සොයා දෙන්න අමාරුයි. සිංහල ජනතාව සිංහල ජාතිවාදී කෝණයකට තල්ලු කරන එක තමුන්නාන්සේලාට හොඳයි. ඒ ඇඳගන්නා ඇඳුමෙන් විතරක්ම සිංහල, බෞද්ධ මහා සංස්කෘතියේ, මහා ප්‍රතාපවත් නායකයන් හැටියට පෙනී සිටීමින් අනෙක් ඔක්කොම අපරාධ වසා ගන්න තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ජනතාවගේ ගැටලු විසඳනවා වෙනුවට ජාතිවාදී දේශපාලනය වර්ධනය වන එක තමුන්නාන්සේලාට හිතකරයි. ඉතිහාසයේ සිටම මෙය උපයෝගී කර ගත් බව මේ පාර්ලිමේන්තුවේ මේ කෙටි ඉතිහාසය තුළ ඕනෑවටත් වඩා වැඩියෙන් අපි දැකලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ සඳහා ශත වර්ෂ ගණන් ඉතිහාසයට යන්න ඕනෑ නැහැ. අවුරුදු 30ක්, අවුරුදු 35ක් ඇතට ගියොත්, මේවා උපයෝගී කර ගත් හැටි ඕනෑවටත් වඩා තමුන්නාන්සේලාට දැන ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, 1981 සංවර්ධන සභා මැතිවරණය ඉතා සරල මැතිවරණයක්. ජාතික ප්‍රශ්නයට යම් විසඳුමක් ලෙස තමයි දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමයක් හදමුයි කියලා තමුන්නාන්සේලාගේ පාර්ශ්වයෙන් යෝජනා කළේ. හැබැයි යාපනය ජනතාවට ඒ සඳහා සාධාරණ ඡන්දයක් තිබුණාද? ජනතාවගේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන සභාවක් හදනවා. හැබැයි ඒ ජනතාවට එහි නියෝජිතයන් තෝරා පත් කර ගන්න තමුන්නාන්සේලා ඉඩ දුන්නේ නැහැ. තමුන්නාන්සේලා පන්නලින්, කුරුණෑගලින් කෝච්චි පුරවා ගෙන ගියා යාපනයට. යාපනයේ සංවර්ධන සභා මැතිවරණයෙන් නියෝජිතයන් තෝරා ගන්න ජනතාවට අයිතිය දුන්නේ නැහැ. ඒ වෙනුවට කෝච්චි පුරවාගෙන යාපනයට අරගෙන ගිහින් සමහර ඡන්ද පෙට්ටි පිරෙව්වේ පන්නල පොලීසියෙන්. මතක තබා ගන්න, ගාමිණීලා තුන්දෙනෙක් ගියේ. පන්නල පොලීසියයි ඡන්ද පෙට්ටි පිරෙව්වේ. මැතිවරණ කොමසාරිස්තුමාගේ වාර්තාවේ අදත් තිබෙනවා, යාපනයේ ඡන්ද පෙට්ටි විශාල ප්‍රමාණයක් අතුරුදහන්ය කියලා. ඇයි? එදාත් තමුන්නාන්සේලා බලය වෙනුවෙන් සංවර්ධන සභා වැනි සොච්චම් ආයතනයකටවත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තමන්ගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා ඒ ජනතාවට අයිතිය ලබා දුන්නේ නැහැ. ඇයි? තමුන්නාන්සේලාගේ අණ සක බලනොපවත්නා කඩ ඉමක් කොහේවත් තිබෙන්න ඕනෑ නැහැ කියන අධිෂ්ඨානයේ තමයි තමුන්නාන්සේලා හිටියේ. ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම තුළින් තමයි ප්‍රභාකරන් වැනි මරාගෙන මැරෙන බෝම්බකරුවන් නිර්මාණය කළේ කියන කාරණය මතක තබා ගන්න.

1983 මේ විධියටම අර්බුදයක් ආවා, ගරු කථානායකතුමනි. වෘත්තීය සමිති ව්‍යාපාර සටන් වැදිලා තිබුණා. ආණ්ඩුවේ ආර්ථිකය කඩා වැටෙමින් තිබුණා. 1977 ආරම්භ කරන ලද මහා සංවර්ධනය මිථ්‍යාවක් බව ජනතාවට ඒත්තු ගැන්වෙමින් තිබුණා. ජනතාවගේ විරෝධය වර්ධනය වෙමින් තිබුණා. තමුන්නාන්සේලා එදාත්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න වෙන් කරපු කාලය නම් අවසානයි. ඒ නිසා ඉක්මනින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තමුන්නාන්සේලා එදාත් මේ ජාතිවාදී ගැටුම් උපයෝගී කර ගත් බව මතක තබා ගන්න. ඒ නිසා තමුන්නාන්සේලාට තිබෙන්නේ අපකීර්තිමත්, කැත ඉතිහාසයක්. ජනතාවගේ ප්‍රශ්න විසඳනවා වෙනුවට රාජ්‍ය පාලනය වෙනුවෙන් -ආණ්ඩු පාලනය වෙනුවෙන්- ජාතිවාදී ගැටුම් උපයෝගී කර ගත් අපකීර්තිමත්, කැත ඉතිහාසයක ඔටුනු පළන් නායකයන් තමයි ඔබතුමන්ලා. එයම තමයි අදත් තමුන්නාන්සේලා මේ දියත් කරමින් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, දේශපාලන ව්‍යාපාරයේ යෙදෙන අය හැටියට අපි හැම දෙනාටම වගකීමක් පැවරී තිබෙනවා. අපේ දේශපාලන කෝණය, දේශපාලන මතවාද, ආර්ථික සැලැසුම් පිළිබඳව අපිට විවිධ වෙනස්කම් තිබෙන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, අපි කාටවත් වග කීමක් නැහැ, යුක්ති සහගත අයිතියක් නැහැ, අපේ රටේ දේශපාලන පොර පිටිය ජාතිවාදී මඩ ගොහොරුවේ ගිල්වන්න. ඒ සඳහා කාටවත් අයිතියක් නැහැ. කවුරුවත් එය සිදු නොකළ යුතුයි. ජාතිවාදී මඩ ගොහොරුවේ ගිල්වීමෙන් කෙටි කාලීන ලෙස ලබන ජයග්‍රහණය තුළින් තමන්ට උන්මාදයට පත් වෙන්න පුළුවන් වේවි. හැබැයි, දිගු කාලීන ලෙස අපේ රටත්, අපේ රටේ ජනතාවත් -අපේ රටේ පුරවැසියනුත්- නරකාදියකට ඇදගෙන ගිය ආකාරය ඉතිහාසයෙන් අපට ඕනෑ තරම් ඔප්පු කර පෙන්වන්න පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි පහක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා දේශපාලන ව්‍යාපාර හැටියට මේ ජාතිවාදී ප්‍රවණතාව ප්‍රතික්ෂේප කළ යුතුව තිබෙනවා. මේ රටේ මාධ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් තිබුණත්, අතුරු මාධ්‍ය ආයතන ප්‍රබල වී තිබෙනවා. ඒ නිසා ඒවා අධීක්ෂණය කිරීම වාගේම විශේෂයෙන්ම ජාතිවාදී ප්‍රවණතාවන් වර්ධනය කිරීම සඳහා දරන ප්‍රයත්නයන් වැළැක්වීම සඳහාත් කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම මේ රටේ ජනතාවටත් වග කීමක් පැවරිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ අවුරුදු තිහක යුද්ධයක් තිබුණා. මේ මහ පොළොව කඳුළුවලින් තෙත් වුණා; ලේවලින්

[ගරු අනුර දිසානායක මහතා]

තෙත් වුණා; ඇති තරම් දේපළ නැති වුණා; ජීවිත අහිමි වුණා. අපි ඕනෑවටත් වඩා වැඩියෙන් යුද්ධයෙන් බැට කාපු මිනිසුන්ගෙන් සමන්විත රාජ්‍යයක්.

අපේ පරම්පරාව යුද්ධ කර තිබෙනවා. අපි අහනවා, අපේ දරුවන්ගේ පරම්පරාවටත් යුද්ධයක් ඇති කළ යුතුද? ඒ සඳහා කිසිවෙකුටත් අයිතියක් නැහැ. අපේ පරම්පරාව අවුරුදු තිහක් යුද්ධ කර ගත්තා නම්, අපේ අනාගත පරම්පරාවන්ට අපේ රටේ යළි යුද්ධයක් ඇති වීමට තිබෙන ඉඩකඩ සියල්ල ඇහිරිය යුතුව තිබෙනවා. ඒ ඇහිරීම විසින් තමුන්නාන්සේලාට ක්‍රියාත්මක වෙන්න මූලික වගකීමක් තිබෙනවා. මහා බලයක් ලෙස මේ ජාතිවාදය වර්ධනය වෙමින් තිබෙන බව අපි දන්නවා. ආරම්භයේදී මේ ජාතිවාදයට එරෙහි අපේ හඬ හුදකලා වෙන්නට පුළුවන්. ආරම්භයේ දී අපේ හඬ ප්‍රබල නොවෙන්නට පුළුවන්. ගරු කථානායකතුමනි, හැබැයි ශක්තියේ හඬ මේ රටේ ස්ථාවර හඬ බවට පරිවර්තනය කළ යුතුව තිබෙනවා. එම නිසා දිගන සහ තෙල්දෙණියේ ඇති වූ සිදුවීම් අවසාන සිදු වීම් බවට පරිවර්තනය කිරීමේ වගකීම දැන් තමුන්නාන්සේලාට තිබෙනවා. කිසිදු ජාතිවාදියෙකුට තමන්ට රිසි සේ ගෙවල් ගිනි තියලා, කඩ ගිනි තියලා, පුරවැසියන්ට තර්ජන එල්ල කරලා, භයංකාර තත්ත්වයක් හදලා රිසි සේ ඔවුන්ට මේ රටේ ඔහේ ඕනෑ දෙයක් කරන්න ඉඩකඩ සකස් කරන්නට තමුන්නාන්සේලා ලැහැස්තිද?

ගරු කථානායකතුමනි, මා නැවතත් කියන්නේ මෙය ක්ෂණික සිදුවීමක් නොවෙන බවයි. මෙය ඒ මොහොතේ ඇති වෙච්ච ගැටුමක ප්‍රතිඵලයක් හෝ ඒ මොහොතේ සිදුවුණු අනතුරක ප්‍රතිඵලයක් හෝ නොවෙයි. මේ සිදු වීමේ ආරම්භය සිදු වුණේ පෙබරවාරි 22වැනිදා. සිද්ධියට අදාළ තරුණයා මිය ගියේ මාර්තු 02වැනිදා. හැබැයි, ගිනි තැබීම පටන් ගත්තේ පෙරේදා රාත්‍රියේ. ඊයේ දහවල් පොලීසිය ඉදිරිපිට මහා මාර්ගයේ පොලු අරගෙන, මුහුණු වසාගෙන මේ කළේ සැලසුම් සහගත ගිනි තැබීමක්, ගරු කථානායකතුමනි. මතක තබා ගන්න. මේක සැලසුම් සහගත ගිනි තැබීමක්. මෙය ඕපපාතික ලෙස, හුදකලා සිදුවීමක් ලෙස මතු වුණු ක්ෂණික කෝපයක් නොවෙයි. මෙය සැලසුම්කොට තිබෙනවා. සංවිධානාත්මකව කැඳවා තිබෙනවා; සංවිධානාත්මකව මුහුණු ආවරණය කර ගෙන තිබෙනවා; සංවිධානාත්මකව පහරදීම සඳහා අවශ්‍ය උපකරණ ගෙනැවිත් තිබෙනවා; සංවිධානාත්මකව ගිනි තැබීම සඳහා අවශ්‍ය උපකරණ ගෙනැවිත් තිබෙනවා; සංවිධානාත්මකව පලායාම සඳහා සැලසුම්කොට තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් අවසාන කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ජාතිවාදීව සංවිධානාත්මකව එල්ල කළ ප්‍රහාරයක් මෙතැන තිබෙනවා. එම නිසා, කවර වර්ගයේ ජාතිවාදියකුට වුවත් අපේ රටේ නීතියේ තිබෙන බලවත්ම කරුණුවලින් ක්‍රියාත්මක විය යුතුය කිය යෝජනාව අපි කරනවා. තමුන්නාන්සේලා එය ක්‍රියාත්මක නොකරන බවත් අපි දන්නවා. එම නිසා මේ රටේ පොදු ජනතාවට වගකීමක් තිබෙනවා. මේ ජාතිවාදී දේශපාලනය ප්‍රතික්ෂේපකොට ජාතික සමගියත්, සියලු ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් අපේ රටේ දේශපාලනය, පොදු දේශපාලනයක් බවට පරිවර්තනය කිරීමේ වගකීමට අපි කවුරුත් උර දිය යුතුය කියා කල්පනා කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Rajavarothiam Sampanthan to second the Motion.

[2.08p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Hon. Speaker. I will second the Motion moved by the Chief Opposition Whip and may I have your indulgence to say a few words.

There have been two incidents, Sir, that have occurred recently: one in Ampara a few days ago and the other one, more recently, in Kandy. The incident in Ampara occurred consequent to a suspicion pertaining to some activities in an eating house. If what is being said had happened in that eating house, I think, that is a matter which needs to be investigated and appropriate action taken against the persons responsible. But, instead of such action being taken according to the law, violence has been unleashed against a particular community - eating houses have been destroyed, a mosque has been damaged and other business establishments have been damaged. A large crowd engaged in these activities. They went to the scene of these activities using a large number of motorcycles and a bus and engaged in such violence. It appears that the police station is not very far away, but these people seem to have been able to engage in all these activities and get away from the scene without their activities being stopped in anyway by the law enforcement authorities.

A few days later, consequent to an accident where a youth had been injured, some other youth of the same community as the injured youth had set upon the driver of the vehicle responsible for the accident and apparently severely assaulted him. The youth so assaulted succumbed to his injuries in hospital. Consequent to the death of the youth, who happened to be from the majority community, a large number of shops, four mosques, a large number of houses and members of a particular community have been attacked. The properties concerned - the shops, the mosques, the large number of houses - have been very severely damaged and members of a particular community have been physically attacked. I am informed that one person was killed as a result of being caught up within a fire that emanated from a burning house.

Such incidents, Sir, have occurred in the past too. But, for some time now, particularly after the change in Government, we did not hear of such incidents and I want to say that the occurrence of such incidents is clearly unacceptable.

It is indicative of a sense of impunity. People seem to have the confidence that they can engage in such acts and think the arm of the law would not reach them and that the rule of law would not be enforced against them. It is

not sufficient for some action to be taken after the incident is over. The role of the law enforcement authorities is called into serious question.

I want to pose the question, Sir, as to whether we have reached a stage when people think that the law enforcement authorities can be taken for granted and that the law enforcement authorities are not a deterrent to whatever activities they are engaged in? Non-observance of the rule of law can only result in chaos in governance. I do not wish to exacerbate the situation by making any remark that may not be moderate, but I do want to pose the question as to whether such incidents happening intermittently and frequently are indicative of a purely law and order situation or is there a deeper dimension to it? To what extent is the role of the State responsible from the point of view of the deeper dimension? Are all citizens in this country treated as equals? Do all of them have justice on the basis of equality under the present structure of the State? Does the structure of governance in this country, as the State is presently constituted, not have an impact on the behaviour of different citizens belonging to different communities?

Do the people of a particular community have the feeling that they are superior and others are inferior; the other persons are second-class citizens while they are superior citizens. What is this attributable to? Is it not attributable to the nature of the State, the structure of governance in this country? What is the point in your having four or five Ministers of a particular community in your Government when those people whom the Ministers represent are not safe in this country? What is the point in positions of power and influence being given to persons of different communities if they cannot achieve for their people, what their people deserve? If that is not achievable under the present State structure, under the present system of governance, there must be alterations and amendments and advancement of that system of governance to enable all the people in this country to feel that they are equal without any one community feeling that they are superior to the others.

It is my submission, Sir, that such incidents are not purely a law and order situation. There is a much deeper dimension. Some people feel that they are superior and that the others must submit themselves to such superiority. This must be eradicated. I think that is the prime cause of the trouble.

It is, I think, Sir, the duty of the State to ensure that the system of governance in this country is altered in such a way as to ensure that all the people of this country feel equal. Such incidents, Sir, have an impact on the county as a whole. Our country is facing numerous difficulties on the human rights front, violations of human rights laws, violations of international humanitarian laws, on the question of the ascertainment of the truth, on the dispensation of justice and on the question of accountability. Our country is facing numerous difficulties in the international arena. We are called upon to answer many questions. Our economy is in a perilous state. The country must come out of all these. The country must be redeemed from all these.

We have brought this situation upon ourselves by not doing what we needed to do at the right time. If what had to be done was done at the right time, this country would not have come to this situation. This country would have been a very advanced, developed country like Singapore or Thailand. Other countries are moving forward. We are moving backwards. That is what is happening in this country. This situation must change and I think, Sir, one of the primary changes that we need is that there must be a change in the structure of governance. That is fundamental. So that Sir, I would respectfully urge that while the law enforcement authorities do pull up their socks and ensure that all citizens of this country are treated equally, we also need to address the most fundamental issue of the structure of the governance in this country being altered in such a way that you serve the needs of the people in the way that people desire, not merely by conferring positions or power on a few individuals.

Thank you, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

[අ.භා. 2.20]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும் சட்டம், ஒழுங்கு பற்றிய அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs and Minister of Law and Order)

ගරු කථානායකතුමනි, අද දින මා මෙම ප්‍රකාශය සිදු කරන්නේ පසුගිය දිනවල දිගන ප්‍රදේශයේ ඇතිවූ නොසන්සුන්කාරී තත්ත්වය හා ඊට පෙර අම්පාරේ ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමටයි.

පසුගිය 26 වන දින රාත්‍රියේ අම්පාර ඩී.එස්. සේනානායක වීදියේ, කාසිම් නම් හෝටලයක ආහාර ලබා ගැනීමට පැමිණි පුද්ගලයින්ට ලබා දෙන ලද ආහාරවල යම් ආගන්තුක ද්‍රව්‍යයක් ඇතුළත්ව තිබීම පිළිබඳව ඇතිවූ බහින්බස්වීමක් දුරදිග යෑම හේතුවෙන් ගැටුම්කාරී තත්ත්වයක් ඇතිවී තිබෙනවා. ඉන් අනතුරුව, කලහකාරී පිරිස් විසින් එම වෙළෙඳ සල ඇතුළු එම ප්‍රදේශයේ මුස්ලිම් වෙළෙඳ සැල් හතරකට මෙන්ම මුස්ලිම් දේවස්ථානයකටද අලාභහානි සිදු කොට තිබෙනවා. මෙම සිද්ධිය වාර්තා වූ වහාම අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට පොලීසිය විසින් කටයුතු කර තිබෙනවා. නමුත්, නීතිය ක්‍රියාත්මක වීමේ යම් අඩු පාඩුවක් තිබූ බවට මා වෙත වාර්තා වුණා. එම නිසා පොලිස්පතිගේ නියෝගය මත මඩකලපුව දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පතිගේ අධීක්ෂණය යටතේ මෙම සිද්ධිය පිළිබඳව වෙනම විමර්ශනයක් සිදු කරමින් පවතිනවා.

එසේම, පසුගිය 22 වන දින අලුයම 2.00ට පමණ තෙල්දෙණිය පොලිස් වසමේ, කරලියද්ද ඉන්ධන පිරවුම්හලට ලොරි රථයකින් පැමිණි රියැදුරෙකුට ත්‍රිරෝද රථයකින් පැමිණි මුස්ලිම් තරුණයින් සිව් දෙනෙකු විසින් පහරදීමක් සිදු කර

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

තිබෙනවා. ඉහත පහරදීමෙන් ඇතිවූ තුවාල හේතුකොටගෙන තුවාලකරු මහනුවර මහ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව, මාර්තු මස 03 වන දින අලුයම මිය ගොස් තිබෙනවා. මෙම පහරදීමේ සිද්ධියට අදාළ සැකකරුවන් 04 දෙනා අත් අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කොට තිබෙනවා. ඒ එක් අයෙක්වත් නිදහසේ නැහැ. ඒ අයට විරුද්ධව වහාම ක්‍රියා කරනවා. නීතිය තමන්ගේ අතට ගන්න කාටවත් අයිතියක් නැහැ.

දෙවනුව, මෙම සිද්ධිය පාදක කරගනිමින් පසුගිය මාර්තු 04 වන දින රාත්‍රියේ අන්තවාදී පිරිසක් කලහකාරී ලෙස හැසිරෙමින්, තෙල්දෙණිය පොලිස් වසමේ මුස්ලිම් වෙළෙඳ සැලක් හා ඊට යාබද වෙළෙඳ සැලකට ගිනි තබා හානි කොට තිබෙනවා.

මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා පොලීසිය ඒ අවස්ථාවේදීම කටයුතු කර ඇති අතර, ජංගම මුර සංචාර, පොලිස් විශේෂ කාර්ය බලකාය හා අතිරේක පොලිස් කණ්ඩායම් යොදවා ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කොට තිබෙනවා. සිද්ධියට අදාළව සැකකරුවන් 24 දෙනෙකු එම අවස්ථාවේදීම තෙල්දෙණිය පොලීසිය මඟින් අත් අඩංගුවට ගෙන ඇති අතර, එම සැකකරුවන් 24 දෙනා අද දින තෙල්දෙණිය මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2018.03.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබෙනවා.

තත්ත්වය එසේ තිබියදී, නැවතත් ඊයේ දින දහවල් කාලයේදී අන්තවාදී පිරිස් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණා. මේ සියලු ක්‍රියා ක්ෂණික සිදුවීම් නොව, සංවිධානගත සිදුවීම්. ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියාපු කාරණා ගැන මමත් එකඟ වෙනවා.

තත්ත්වය තව දුරටත් ව්‍යාප්ත වීම මැඩ පැවැත්වීම සඳහා මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට බලපාන ලෙස ඊයේ දහවල් සිට අද උදෑසන 6.00 දක්වා පොලිස් ඇඳිරි නීතිය ද පනවනු ලැබුවා. එසේම පල්ලෙකැලේ හා තෙල්දෙණිය පොලිස් බල ප්‍රදේශවල ඇඳිරි නීතිය තවදුරටත් ක්‍රියාත්මක වෙනවා.

එසේම දිගන ප්‍රදේශයේ ගිනි ගැනීමට ලක් වූ වෙළෙඳ සැලක් තුළ වයස අවුරුදු 24ක පුද්ගලයකුගේ මෘත ශරීරයක් තිබී අද උදෑසන හමු වී තිබෙනවා. මේ අම්පාරේ හා දිගන සිදුවීම් දෙකම මුස්ලිම් ජනතාව ඉලක්ක කරගෙන ඇති වුණු සිද්ධීන්. මේ පිළිබඳවත් විමර්ශන සිදුවන අතර වැඩිදුර විමර්ශන සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක්ද පිටත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊයේ සවස ජාතික ආරක්ෂක මණ්ඩලය රැස් වුණා. සාමාන්‍ය ජන ජීවිතය කිසිදු බාධාවකින් තොරව ගෙන යාමට අවශ්‍ය වටපිටාව සකස් කරන ලෙසටත්, කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට එරෙහිව වහාම නීතිය ක්‍රියාත්මක කරන ලෙසටත්, ඕනෑම ආකාරයක නොඝන්සුන්කාරී තත්ත්වයක් පාලනය කිරීමට සූදානම්ව සිටින ලෙසටත් එහිදී ආරක්ෂක ප්‍රධානීන්ට හා පොලීසියට අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා. ඊයේ දින රාත්‍රිය පුරා මහජන නියෝජිතයින්, ආගමික නායකයින්, පොලිස්පති, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සමඟ දුරකථනයෙන් සම්බන්ධ වෙමින් තත්ත්වය පාලනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, මෙම සියලු ජාතිවාදී හා ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් රජයක් වශයෙන් අප තරයේ හෙළා දකිනවා. වගකිව යුතු රජයක් වශයෙන් මෙවැනි නීති විරෝධී හා ප්‍රචණ්ඩ ක්‍රියා අනුමත කිරීමට කිසිදු හැකියාවක් නැහැ. තිස්වසරක කුරිරු යුද්ධයකින් පීඩා විඳි රටක් වශයෙන් සාමයේ, එකමුතුකමේ හා නිදහසේ වටිනාකම අප සියලු දෙනා ඉතා හොඳින් දන්නවා.

දේශපාලන බල තණ්හාවෙන් සිටින සමහර කොටස් සාමාන්‍ය ජන ජීවිතය කඩාකප්පල් කිරීමට විවිධ උපක්‍රම, විවිධ කඩාකප්පල්කාරී ක්‍රියාවන් සැලසුම් කරමින් සිටින බව පෙනෙන්නට තිබෙනවා. ඔවුන්ගේ එකම තුරුම්පුව ජාතිවාදය ඇවිස්සීමයි. රට තුළ භීෂණය ඇති කොට ජන ජීවිතය කඩාකප්පල් කොට හෝ බලය ලබා ගැනීම ඔවුන්ගේ එකම අරමුණයි. ජාතීන් අතර වෛරී හැඟීම් ඇති වන ආකාරයේ නොමඟ යවන සාවද්‍ය තොරතුරු පතුරුවා හැරීම, විශේෂයෙන්ම සමාජ ජාලා හරහා විකෘති තොරතුරු පතුරුවා හැරීම වැනි ක්‍රියා සංවිධානාත්මකව සිදු වන බව පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා.

පසුගිය මාස නවය තුළ, එක් කණ්ඩායමක් සැලසුම් සහගතව, මුස්ලිම් ජාතියෙන් සිංහල ජාතියට තර්ජනයක් සිදුවන බවට සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරයක් සිදු කර තිබෙනවා; ඒ සඳහා අසත්‍ය සංඛ්‍යාලේඛන ඉදිරිපත් කොට තිබෙනවා. සමහර මුස්ලිම් සංවිධාන මෙයට පිළිතුරු දී තිබෙනවා. දීර්ඝ කාලයක් තුළ මේ කණ්ඩායම ජාතිවාදය පතුරුවා තිබෙනවා. මෙයින් උණුසුම් තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. මේ රටේ බහුතරය සිංහල බෞද්ධයන්. අපි සිංහල බෞද්ධයෝ ලෙස ඒ උරුමය ආරක්ෂා කරනවා. ඒ උරුමයට හෝ අයිතිවාසිකම්වලට හානියක් වෙලා නැහැ; තර්ජනයක් වෙලා නැහැ. එසේ සිදුවීමට අපි ඉඩ දෙන්නේත් නැහැ.

මෙම සංවිධානාත්මක හා කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට එරෙහිව දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට රජය කිසිසේත් පසුබට වන්නේ නැහැ. ශ්‍රී ලාංකිකයන් ලෙස වෙනත් ජාතීන් හා ආගම් මේ රටේ ජීවත් වෙනවා. සියලු ජාතීන්ට හා ආගම්වලට කිසිම හිරිහැරයක් නැතිව තමන්ගේ සංස්කෘතිය භුක්ති විඳීමටත්, ආගම ඇදහීමටත් අයිතියක් තිබෙනවා. මෙය තමයි මහාමාන්‍ය ඩී.එස් සේනානායක මැතිතුමාගේ සිට පැවත එන ශ්‍රී ලාංකික සංකල්පය. අපි එය ආරක්ෂා කරනවා. එබැවින්, මුස්ලිම් දේවස්ථානවලට සිදු වූ හානිය පිළිබඳව අපගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

අපේ පුවත් පත් කියවන්නේ ලංකාවේ ජනතාව පමණයි. ඒවාට විදේශ රටවල ප්‍රසිද්ධියක් නැහැ. නමුත් සමාජ මාධ්‍ය මුළු ලෝකයටම පොදුයි. වෛරය ඇති කරන මෙවැනි පුවත් හා ලිපි ලෝකයට ප්‍රචාරය කිරීමෙන් සිදු වන්නේ සිංහල ජාතිය අපකීර්තියට පත් කිරීම පමණයි. පොලීසිය මාර්ගයෙන් නීතිය හා සාමය ආරක්ෂා කිරීම ආණ්ඩුවේ වගකීමයි. මේ අවස්ථාවේදී පොලීසිය නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ක්‍රියා කළා. අඩු පාඩුකම්ද ඇති වුණා. ඒ නිසා ස්වල්ප ස්ථානවල නීතියේ බිඳ වැටීමක් සිදු වුණා. ඒ පිළිබඳව දැන් පොලිස්පතිතුමා පරීක්ෂණ පවත්වනවා. ඒ පිළිබඳ පරීක්ෂා කිරීමෙන් අනතුරුව තමන්ගේ කාර්ය ඉටු නොකරපු නිලධාරීන් ඉන්නවා නම්, ඔවුන් පිළිබඳව ක්‍රියා කරනවා.

එහෙත් මම එක් කාරණයක් කියන්න කැමැතියි. පොලිස් සේවයේ නිලධාරීන් බොහෝ දෙනෙක් නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා විශාල උත්සාහයක් ගත් බව මම මෙතැනදී ප්‍රකාශ කරනවා. ඒ අයට අපි ප්‍රශංසා කරන්න ඕනෑ.

හානියට පත් වුණු ඒ ගොඩනැඟිලි සඳහා, ඒ ව්‍යාපාර සඳහා, ඒ තුවාල ලැබූ අය සඳහා වන්දි ගෙවීමටත්, සහන ලබා දීමටත් අපි ක්‍රියා කරනවා. ඒක විතරක් මදි. අද නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීම ගැන විශ්වාසය අඩු වෙලා තිබෙනවා. ඒ විශ්වාසය ඇති කිරීම ගැන අප ගන්නා නීතිමය ක්‍රියාමාර්ගවලින් ඔප්පු කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම නොඝන්සුන්කාරී තත්ත්වයේදී ඉතා ඉවසිලිවන්තව හා බුද්ධිමත්ව කටයුතු කොට තත්ත්වය

පාලනය කිරීමට කැප වූ මහා සංඝරත්නය, මුස්ලිම් මවුලව්වරුන් ඇතුළු පූජ්‍ය පක්ෂය, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මෙන්ම අනෙකුත් සියලු ජන කොටස් වෙතටත් මාගේ විශේෂ ස්තුතිය පිරිනැමීමට කැමැතියි.

විශේෂයෙන්ම දිගන බෞද්ධ, මුස්ලිම් සියලුදෙනාම එකතුවෙලා මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ ගත්තා. පිටින් ආ පුද්ගලයන් තමයි ඒ තත්ත්වය අවුල් කළේ. එසේම මෙම අවාසනාවන්ත සිද්ධිය හේතුවෙන් හානි වූ ජීවිත හා දේපළ වෙනුවෙන් කඩිනමින් වන්දි ලබා දීමටද රජය විසින් කටයුතු කරනු ලබන බව මම මේ අවස්ථාවේ යළිත් ප්‍රකාශ කරනවා. ජාතිවාදය මතින් තම අරමුණු ඉටුකර ගැනීමට මාන බලන දේශද්‍රෝහීන්ගේ ගොදුරු බවට පත් නොවී ඉවසිලිවන්තව, බුද්ධිමත්ව හා විචක්ෂණශීලීව කටයුතු කරන ලෙස රටේ සියලුම ජනතාවගෙන් අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා.

දින 7කට හදිසි නීතිය ක්‍රියාත්මක කරන්නත්, වුවමනා නම් කෙටි කාලයකට තවත් නීති රීති පනවන්නත් කැබිනට් මණ්ඩලය තීරණය කළ බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම කියන්න කැමැතියි.

[අ.භා. 2.30]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අපේ සමාජය ඉතාම අවාසනාවන්ත හා කනගාටුදායක සිදුවීමකට ගොදුරු වී තිබීම මෙම විවාදය පැවැත්වීමේ හේතුව බවට පත්වී තිබෙනවා.

විශේෂයෙන්ම, අපේ රටේ ජීවත් වන අතිමහත් බහුතර සිංහල ජනතාවත්, දෙමළ ජනතාවත්, මුස්ලිම් ජනතාවත් අතර තිබෙන සුහදතාව, එකට ජීවත් වීමේ වාතාවරණය, පලුදු වන ක්‍රියාවන්වලට දේශපාලන ක්ෂේත්‍රයේ අපි කිසි ලෙසකින්වත් ඉඩ නොතැබිය යුතුයි. ශ්‍රී ලාංකික පුරවැසියන් සියලුදෙනාට රටේ ඕනෑම තැනක ජීවත් වීමට, වෙළෙඳාම් කිරීමට, ජීවන උපායයන් පවත්වාගෙන යෑමට තිබෙන අයිතිය අපි පිළිගන්නවා.

පසුගිය දිනවල සිදු වූ සිදුවීම් කිහිපයක් පිළිබඳව මේ සභාවට කරුණු ඉදිරිපත් වූ අවස්ථාවේ, පළමු කොටම, එම සිදුවීම්වලදී ජීවිතක්ෂයට පත්වූ ජනතාව වෙනුවෙන් ඒකාබද්ධ විපක්ෂයේ ශෝකය හා කනගාටුව පිරිනමන්න කැමැතියි.

දෙවනුව, අපේ රටේ ජනතාවගේ දේපළ, ජීවනෝපාය මාර්ගයන්, වස්තූන්වලට හානි සිදුවී තිබීම ගැන අපි කනගාටු වන අතර, එය සම්පූර්ණ පහත් නින්දිත ක්‍රියාවක් ලෙස ප්‍රතික්ෂේප කරනවා. මහනුවර දිස්ත්‍රික්කයේ දිගන, තෙල්දෙණිය ආදී ප්‍රදේශවල පසුගිය දා මුහුණ දීමට සිදු වූ තත්ත්වයන් හා සමානව ඊට පෙරාතුව අම්පාර නගරයේ හා අවට තිබුණු තත්ත්වයන් ගැනත් ගරු රවුෆ් හකීම් ඇමතිතුමා සඳහන් කළා. මෙවැනි සිදුවීම් අපේ රටේ කොයි ප්‍රදේශයක සිදු වුණත් නීතිය වහා ක්‍රියාත්මක වීමේ වගකීම තිබෙන්නේ රජය අතේයි. රජයක පළමු ක්‍රියාවලිය වන්නේ සිදුවීමකදී වහා ක්‍රියා කිරීමයි. වහා ක්‍රියා නොකරන තාක් කාලයක් අර්බුදය උත්සන්න වෙනවා. අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළ සමහර කාරණා සමඟ මම ද එකතු වෙනවා. මොකද, අද සමාජ වෙබ් අඩවි හරහා යම් ප්‍රවෘත්තියක් අපේ ගමේ විතරක් නොවෙයි, රටේ විතරක් නොවෙයි ලොව පුරා පැතිරෙනවා. එවැනි ප්‍රවෘත්ති පැතිර යාමට තිබෙන අවස්ථා නිසා මෙවැනි සිදුවීම් පිළිබඳ තොරතුරු ගලා යෑමත්, අනෙක් රටවලින් මේ රටට ගලා ඒමත් කිසි ලෙසකින් පාලනය කරන්න බැහැ. එය පාලනය කර ගන්න පුළුවන් වන්නේ සදාචාරාත්මක වගකීමකින් ඒ තොරතුරු පිළිබඳ හසුරුවන අය හැසිරුණොත් පමණයි. එය සමාජයක් මුහුණ දෙන බරපතළ අර්බුදයේ එක ලක්ෂණයක්. ඒ අර්බුදය නිසා පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටේ නීතිය හා සාමය වේගයෙන් කඩා වැටීමකට පරිවර්තනය වී තිබෙන බව විටින් විට අපි මේ සභාවේ සඳහන් කර තිබෙනවා. එම සිදුවීම දෙමළ ජනතාව හා සම්බන්ධව ද, මුස්ලිම් ජනතාව හා සම්බන්ධව ද, සිංහල ජනතාවට එරෙහිව ද, මේ සභාවේදී අපි කරුණු ඉදිරිපත් කරමින් දිගටම කියා සිටියේ මේ තත්ත්වය රටේ නීතිය හරියාකාරව ක්‍රියාත්මක කිරීමේ කඩා වැටීමක් නිසා ඇති වූ සිදුවීමක් හැටියටයි. ඒකාබද්ධ විපක්ෂය කනගාටුවෙන් යුතුව එය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. කුමාරසිංහ මහතාට තර්ජනය කර, ඔහුට පහර දී දවස් ගණනාවකට පසු -මාර්තු මාසයේ දෙවැනි දා- ඔහු ජීවිතක්ෂයට පත් වුණා. මේ අතරතුර කාලයේ මෙවැනි කැළඹීමක් තිබුණේ නැහැ.

ඊළඟ කාරණය මේකයි. ඔහු ජීවිතක්ෂයට පත් වූ දවසේ - දෙවැනි දා - හෝ පසුව දා හෝ මෙවැනි කැළඹීමක් තිබුණේ නැහැ. දැන් තිබෙන ප්‍රශ්නය වන්නේ, එයින් පසුව මෙම කැළඹීම ඇති කළේ කවුද යන්නයි. එය සොයා ගැනීම, ඒ සඳහා කටයුතු කිරීම අපේ රටේ නීතිය හා අපරාධ පිළිබඳව කටයුතු කරන අංශ වහා සක්‍රිය විය යුතු මාර්ග ලෙස අපි සලකනවා. පොදුවේ, ඊයේ පෙරේදා අනුරාධපුරය, රාජාංගනය, තඹුත්තේගම ප්‍රදේශවල කළ මහා පරිමාණ පොලිස් වැටලීමක් නිසා -පොලිසියේ ක්‍රියාකාරිත්වය නිසා- ඇති වුණු මහා කැළඹීම අපි දැක්කා. අපි ජනතාව සමඟ කටයුතු කරන්නේ කෙසේද, කළ යුත්තේ කුමක්ද කියන දෙය දේශපාලනඥයන්ට බොහෝ විට දේශනා කරන්න පුළුවන් ඇති. නමුත් නීතිය ක්‍රියාත්මක කරන අය ඒ දෙපැත්තම බලන්නේ නැත්නම්, තදබල ක්‍රියාවක ප්‍රතිඵලයකින් සියලු දේ මර්දනය වෙනවාය කියා හිතාගෙන කටයුතු කරන කොට, එවන් අවස්ථාවක සාධාරණ, අසාධාරණ දෙගොල්ලන්ම එයට ගොදුරු වෙනවා. ගරු අගමැතිතුමනි, මා හිතන විධියට ආණ්ඩුව පැත්තෙන් බලන්න ඕනෑ අන්න ඒ කාරණයයි. සාධාරණ මිනිසුන්ටත් ගහනවා, අසාධාරණ මිනිසුන්ටත් ගහනවා. එය කැළඹීමකට අනිවාර්ය හේතු සාධකය වෙනවා. ඊට පසුව අපේ රටේ නීතිය අනුව අනිවාර්යයෙන්ම මේ සියලුදෙනා පොලිස් ස්ථාන කරා ගාල් කරනවා; අත් අඩංගුවට ගන්නවා.

දිගන ප්‍රදේශයේ වුණු සිදුවීම දිහා බලන්න. වෙනත් සිදුවීමක් නිසා, මරණ ගෙදරට පැමිණෙමින් තිබුණු බස් රථයේ ගමන් කළ සියලුදෙනාටම දඬුවම් කළා; ඔවුන් අරගෙන ගියා. බස් රථයේ පැමිණි අය බේරා ගැනීමට පොලීසිය වෙත ඉදිරිපත් වුණු සියලුදෙනාටත් ඒ භයානක තත්ත්වයටම මුහුණ පාන්න සිද්ධ වුණා. මේ ගැටුම පැතිරී යාම මෙම අවාසනාවන්ත සිද්ධිය උත්සන්න කරවීමට පාවිච්චි කරන ලද හේතු සාධකය බව පැහැදිලියි. කෙසේ වෙතත්, ඒකාබද්ධ විපක්ෂය ලෙස අපි ප්‍රකාශ කරන්නේ මෙපමණයි. කඩ සාප්පුව තුළ ඇති වුණු ගින්නෙන් හෝ එහි පිරුණු දුම් පටලය නිසාවෙන් ඊයේ දිනයේ එම මුස්ලිම් තරුණයා ජීවිතක්ෂයට පත් වුණා.

මේ අතරතුර ඇදිරි නීතිය පනවන්නට කටයුතු කරමින් ජනතාව අසාධාරණයට පත් වන තත්ත්වයක් ඇති කරන්න එපා කියලා අපේ ගරු දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා පොලීසියෙන් විශේෂයෙන් ඉල්ලීමක් කළා. ඒ ගැන පොලීසියේ ඉහළ පෙළ දන්නවා. මන්ත්‍රීතුමකු හැටියට මම ඒ ගැන වැඩි විස්තරයක් කියන්නේ නැහැ. සිංහල හෝ මුස්ලිම් කියලා නොවෙයි, සියලු දෙනාම වෙනුවෙන් ඒ විධියට මේ තත්ත්වය වර්ධනය වීම වළක්වන්න එතුමා මැදිහත් වුණා. ඒ ක්‍රියාවලිය, ඒ ඉල්ලීම, ඒ ඉදිරිපත් කළ අදහස සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. නමුත් ගරු දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා කිව්ව කාරණාව නිවැරදි හා සාධාරණ බව දැන් තේරුම් ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම අහන්න කැමැතියි, දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මොකක්ද කියලා. කොහේද ඒක තිබෙන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(*மாண்புமிகு தினேஷ் குணவர்தன*)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)
මගෙන් අහගන්න එපා, වෙච්ච දේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(*மாண்புமிகு தினேஷ் குணவர்தன*)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේට සිංහල තේරෙන්නේ නැත්නම් මොනවා කරන්නද? තමුන්නාන්සේට කරන්න තිබෙන දේ තමයි ඔය කරලා තිබෙන්නේ. ඔබගේ මහාමාර්ග අමාත්‍ය ධුරය නැති වී ඔබට දැන් ඉතුරු වී තිබෙන්නේ මහනුවර විතරයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
දැන් ඔබතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(*மாண்புமிகு தினேஷ் குணவர்தன*)
(The Hon. Dinesh Gunawardena)
මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
You go ahead, Hon. Member.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(*மாண்புமிகு தினேஷ் குணவர்தன*)
(The Hon. Dinesh Gunawardena)
ආණ්ඩුව හැටියට මේකට වග කියන්න ඕනෑ; මේ සිදු වුණු සිදු වීමේ වගකීම ගන්න ඕනෑ. අගමැතිතුමා කිව්ව කතන්දරවල ආපස්සට යන්න මම උත්සාහ දරන්නේ නැහැ. මෙවැනි සිදු වීම් බලා ගෙන ඉඳලා, පසු ගිය කාල පරිච්ඡේදවල උතුරුකරයේ ඇති වුණු සිද්ධීන්, මේ ප්‍රදේශවල දෙමළ ජනතාවට සිදු වුණු සිද්ධීන් බලාගෙන ඉඳලා, ඒවා පැතිරී යනවා පැය ගණනාවක්, දවස් ගණනාවක් බලාගෙන ඉඳලා සිදු වුණු අවාසනාවන්ත තත්ත්වය අදත් අපේ රටට කළු ලපයක් වී තිබෙනවා. අපි කිසිවකු එවැනි දේ අනුමත කරන්නේ නැහැ; අනුමත කිරීමට උනන්දු වන්නේත් නැහැ. අද මම වගකීමෙන් යලිත් කියා සිටින්න කැමැතියි, මේ හැම ජන කොට්ඨාසයකම ආරක්ෂාව ආණ්ඩුව සැපයිය යුතුය කියලා. ඒ වාගේම වැරදි තොරතුරු ගමන් කිරීමට ඉඩ දීමේ භයානක තත්ත්වය වැළැක්වීමේ ක්‍රියාවලියේ මහා වගකීමත් ආණ්ඩුවට තිබෙනවා.

දෙවැනි කාරණය, මම යලිත් වරක් ආරක්ෂක අංශවලින් ඉල්ලීමක් කරනවා. ඒ අයගෙන් සමහර කොටස් හොඳ රාජකාරියක් කරනවා. නමුත් සමහර කොටස් ගන්නා හදිසි ක්‍රියා මාර්ග නිසා ඇති වන ප්‍රතික්‍රියාව, පසුව මිනිස් ක්‍රියාදාමයක් වෙනවා. නිකම් ඉන්න මිනිස්සුන්ට කදුළු ගෑස් ගහන කොට ඒ ජනතාව කුපිත වෙනවා. ඉලක්ක බලා කළ යුතු ක්‍රියාවකදී, එසේ නොකර, තොග වශයෙන් එල්ල කොට කදුළු ගෑස් ගැසීම නිසා ඇති විය හැකි විපාක තමයි මේවා. මම මේවා පිළිබඳව උපදෙස් දෙන්න යන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔව්, ඔබතුමන්ලා ඔක්කොම කරලා -[බාධා කිරීමක්] මේක යට කුමන්ත්‍රණයක් තිබෙනවා. ඒ කුමන්ත්‍රණය හෙළිදරවු කර ගැනීම ඉතාම වැදගත්. මම අගමැතිතුමාට ඉතාම වගකීමෙන් කියනවා, මේ කුමන්ත්‍රණකාරී බරපතළ සිද්ධිය පැතිර යාමට තුඩු දෙන නිසා, අද අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම රැස්වෙලා තීරණයක් ගත්තා, හෙට 50,000කට අධික ජනතාවක් නුගේගොඩට පැමිණීමට නියමිතව තිබුණු මහා රැළිය අවලංගු කරන්නට. මේ අවාසනාවන්ත සිද්ධිය පැතිරවීමට වැරදියට හෝ උත්සාහ දරන ආණ්ඩුව ඇතුළේ ඉන්න කණ්ඩායම්වලට අවශ්‍ය ආයුධ අපි සපයන්නේ නැහැයි කියලා, අපි අපේ රැස්වීම අවලංගු කරන්න තීරණයක් ගත්තා. ඒ, මුස්ලිම් ජනතාව සහ සිංහල ජනතාව අතර තිබෙන සමගිය වෙනුවෙන් අපි ගත්ත තීරණයක්. මේ සිද්ධියේ අනුගාමිකයන්ගේ පිටුපස ඉන්නේ කවුද කියලා තමුන්නාන්සේලා හෙළිදරව් නොකර බොරුවට චෝදනා කරන්න පුළුවන්. පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව ජයග්‍රාහී අය මේක කළාය කියලා හකීම් ඇමතිතුමා ප්‍රකාශ කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේ ව්‍යාපෘති විවිධ දේශපාලන බලවේගයන් තුළ තිබෙනවාය කියලා ප්‍රකාශ කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා. අපගේ ඒකාබද්ධ විපක්ෂය එවැනි කිසිම ව්‍යාපෘතියක් හෝ බලවේගයක් සමඟ කටයුතු කරන්නේ නැහැ. ඒ විධියට කටයුතු කරන්නේ ආණ්ඩුවේ උදව්, ආණ්ඩුවේ ආරක්ෂාව ඇතිව, ආණ්ඩුවේ හෙවණැල්ලේ ජීවත් වන අය. පළමුව ඒ අය ගැන අවශ්‍ය නීතිමය පියවර ගන්නය කියා අපි මේ අවස්ථාවේ ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

මෙය පැතිර යාමට තවදුරටත් හේතු සාධක ඇති නොකර රට සන්සුන් කර, අපේ රටේ සිංහල, දෙමළ හා මුස්ලිම් කියන සියලු ජනතාව එක්ව අපි බලාපොරොත්තු වුණු, අපේ විශ්වාසය තිබෙන, අපේ අනාගත රට ගොඩනැගීමේ කාර්යයට එකම විශ්වාසයෙන් යුතුව කටයුතු කළ හැකි දවස අපි නිර්මාණය කරමු.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

[අ.භා. 2.44]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்*)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, අද ඇත්ත වශයෙන්ම බෞද්ධයන් හැටියට අපි සියලු දෙනාම කනගාටු විය යුතු දවසක්. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු ඉස්සෙල්ලාම ඉගැන්වූ පාඩම තමයි කළගුණ සැලකීම. ඉන් අනතුරුව උන් වහන්සේට ධර්මය කියා දුන් අන්‍ය ආගමික ප්‍රභූවරුන්, නායකයින් හමු වෙලා ඔවුන්ට කෘතගුණ දැක්වූවා. බුදුන් වහන්සේ අපට ඉගැන් වූ ධර්මයෙහි පැහැදිලිව සඳහන් වෙන්නේ අනෙක් ආගම්වලට ගරු

කරන්න කියන එකයි. නමුත් එම සාරධර්ම සියල්ලම කඩ කරමින් පසුගිය දවස් කිහිපය තුළ ආවේශ වුණු පිරිසක් මේ කටයුතු කරන ආකාරය අපි දැක්කා. මම ඇත්ත වශයෙන්ම කියන්න කැමැතියි, මෙම සිදුවීම්වලට සම්බන්ධ වුණු අයගෙන් සියයට 95ක් පිටින් ආපු අයයි කියන එක. මොකද, පළාතේ මන්ත්‍රීවරයෙක් හැටියට මම දන්නවා, මෙයට අදාළ මුල් සිද්ධිය වුණායින් පසුව පළාතේ භික්ෂූන් වහන්සේලා සහ මුස්ලිම් ආගමික නායකයින් එක්කාසු වෙලා මේ ප්‍රශ්නය සමථයකට පත් කරගෙන තිබුණු බව.

මුස්ලිම් ව්‍යාපාරිකයන් හා සිංහල ව්‍යාපාරිකයන් එක්කාසු වෙලා අර මිය ගිය පුද්ගලයාගේ පවුලේ අයට ඉතාම විශාල දීමනාවක් දෙන්නත් සාකච්ඡා කරලා තිබුණා. නමුත් පිටින් ආපු පිරිස් සිටියා. ඇත්තවශයෙන්ම මේක බුද්ධි අංශයේ ප්‍රමාදයක්. අම්පාරේ සිදුවීම ඇති කරපු යම් යම් පුද්ගලයන් මේ ප්‍රදේශයේ සැරිසරන බව කවුරුත් සියැසින් දුටුවා. අම්පාරේ සිදුවීම ඇති කරපු පුද්ගලයෝ මේ ප්‍රදේශයේ ඉන්නවා කියලා අපිටත් ඇවිල්ලා කිව්වා. නමුත් බුද්ධි අංශයේ කඩා වැටීමක් නිසා මේ කටයුත්ත පොලීසියේ ඉහළ මට්ටමේ අයට දැනුම් දුන්නේ නැහැ කියලා මා හිතනවා.

අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ කථාවෙන් බළලා එළියට පැන්නා කියලා මා කියන්න කැමැතියි. එතුමා කිව්වා අහිංසක මිනිසුන්ට පහර දුන්නා කියලා. එහෙම පහරදීමක් වුණේ නැහැ. අත් අඩංගුවට පත් වූ මිනිසුන්ට ඇප ගන්න පොලීසිවලට ගියේ කවුද? ඔබතුමන්ලා දන්නවා. පොලීසිවල එම පුද්ගලයන්ගේ නම් සටහන් කරලා තිබෙනවා. කවුද ගියේ කියලා ඒවායෙන් බලා ගන්න පුළුවන්. අත් අඩංගුවට පත් මිනිසුන් එළියට දමන්න කියලා පොලීසිවලට ගිහිල්ලා කෑ ගැහුවේ කවුද? Defendersවලින් උඩට, පහළට ගියේ කවුද කියන එක ගැන එම පළාතේ මිනිසුන් ඔක්කෝම දැක්කා. සත්‍යය වසන් කරන්න හදන්න එපා. මෙම සිදුවීම බෞද්ධයන් හැටියට අප සියලු දෙනාටම විශාල ලජ්ජාවක්.

මහනුවර හිටපු රජවරුන් විශේෂයෙන්ම සුළු ජාතීන්ට හොඳට සැලකුවා. මහනුවර පරම්පරා හතරක් -අවසාන පරම්පරා හතර- රජ කෙරුවේ, ද්‍රවිඩ රජවරු. හැබැයි, එකම වෙනස වූයේ ඔවුන් බෞද්ධාගම වැළඳ ගත් එකයි. බෞද්ධාගම වැළඳ ගත් නිසා තමයි සිංහල රාජ වංශයට අයිතිවාසිකම පෑවේත්. මහනුවර සෙනරත් රජතුමා තමයි නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව පදිංචි කෙරෙව්වේ. මුස්ලිම් ජනතාව පදිංචි කෙරෙව්වා විතරක් නොවෙයි, ඔලන්ද ජාතිකයින් එක්ක ගිවිසුමක් අත්සන් කරලා මහනුවර සෙනරත් රජතුමා මුස්ලිම් අයට වෙළෙඳාම් කිරීමේ අයිතිය පවා ලබා දුන්නා. මහනුවර රජවරුන් සුළු ජාතීන්ට සැලකුවා. ජෝසප් වාස් පියතුමා අවසන් හුස්ම හෙළුවේ මහනුවර. මහනුවර රජවරුන් ද්‍රවිඩ, මුස්ලිම්, ක්‍රිස්තියානි වැනි ආගම් නිදහසේ ප්‍රචාරය කරන්න ඉඩ දීලා තිබුණා. ඒ වාගේ සංස්කෘතියක් තිබෙන ප්‍රදේශයක ජනතාව මේ වාගේ දෙයක් කරන්නේ නැහැ. මේ පිරිස පිටින් ආවේ. එසේ පිටින් පැමිණි පුද්ගලයන් ගැන පොලීසිය දන්නවා. අපිටත් ආරංචි ආවා. අපිත් කිව්වා. නමුත් අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පුද්ගලයන් එන එක ගැන ගණන් ගත්තේ නැහැ.

බුද්ධි අංශයේ කඩා වැටීමක් සිද්ධ වුණා. පළාතේ මන්ත්‍රීවරයකු හැටියට, බෞද්ධයකු හැටියට මම කනගාටුව ප්‍රකාශ කරනවා, මුස්ලිම් ජනතාවට. අපට මෙය විශාල ලජ්ජාවක්. අහිංසක මුස්ලිම් ප්‍රජාව දේශපාලනඥයන් වන අපෙන් කවදාවත් රස්සා ඉල්ලනවාද? ඔවුන් රස්සා ඉල්ලන්නේ නැහැ. ඔවුන්, ව්‍යාපාර කරගෙන නිදහසේ තමන්ගේ ආගම අදහන අය. ඒ වාගේ අයට මේ විධියට හිරිහැර කිරීම අපේ බෞද්ධ ප්‍රතිපත්තිවලට සම්පූර්ණ පටහැනි ක්‍රියාවක්.

මා හිතන්නේ අප පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරන්න ඕනෑ කියායි. අප බෞද්ධයන් හැටියට මුස්ලිම් ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ, මේ සිද්ධ වෙච්ච අපරාධය ගැන. මම ඒ ගැන පෞද්ගලිකව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු අග්‍රාමාත්‍යතුමා සඳහන් කළ ආකාරයට ඒ සියලුදෙනාට අවශ්‍ය වන්දි මුදල ලබා දෙන්න අප කටයුතු කළ යුතුයි.

සිංහල පුද්ගලයෙක් නැති වුණා. ඊයේ රාත්‍රියේ තවත් මුස්ලිම් ජාතිකයෙක් නැති වෙලා තිබෙනවා. ඒ මුස්ලිම් තරුණයා කාමරයට ගිහින් හැංගුණා. පවුලේ අනෙක් අය එළියට දිව්වා. ඔක්කෝම සිතුවා ඒ පුද්ගලයාත් එළියට දිව්වා කියා. නමුත් කාමරයට වෙලා සිටි නිසා දුම් හිර වෙලා ඒ තරුණ මහතාගේ ජීවිතය නැති වුණා. He got choked. මේවා ඇත්ත වශයෙන්ම අමානුෂික ක්‍රියා. මේවාට අත්පුඩි ගහන අය ඉන්නවා මේ පාර්ලිමේන්තුවේ. නමුත් මා ඒ අයට කියන්න කැමතියි, මෙලොව උසාවියෙන් බේරුණාට පරලොව උසාවියෙන් බේරෙන්න බැරි බව. අන්න ඒක මතක තියාගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)
පරලොව නොවෙයි, මෙලොව.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පරලොවත් උසාවියක් තිබෙනවා. මේවාට අත්පුඩි ගහන අයට, අපරාධකරුවන් බේරාගන්න යන අයට පරලොව උසාවියේදී කවදා හෝ උත්තර දෙන්න සිදු වන බව ප්‍රකාශ කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ප.ව. 2.50]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்றைய தினமும் இன்றைய தினமும் இந்த நாட்டிலே ஏற்பட்ட அசம்பாவித நிகழ்வுகளானவை, 1953களிலிருந்து இன்றுவரை இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற பல்வேறுபட்ட விடயங்களை ஞாபகத்துக்குக் கொண்டுவருகின்றன. அதாவது, ஓர் இனத்தின்மீது கொலை முயற்சிகள் அல்லது அழிவு முயற்சிகள் எவ்வாறு கட்டவிழ்த்துவிடப்படுகின்றன? இலங்கை நாட்டுக்குள் ஏனைய இனங்கள் சேர்ந்து வாழ முடியாதவாறு சில சக்திகள் எவ்வாறு செயற்படுகின்றன? என்பவற்றைத் திரும்பவும் நாட்டிலே நடைபெறுகின்ற இவ்வாறான சில சம்பவங்கள் ஞாபகப்படுத்திக் கொண்டிருக்கின்றன. 1953ஆம் ஆண்டு அல்லை- கந்தளாயிலே இவ்வாறுதான் பொலிஸார் பார்த்திருக்க, சாதாரண விவசாயிகள் 154 பேர் வெட்டிப் படுகொலை செய்யப்பட்டார்கள். இதைத் தொடர்ந்து இந்த நாட்டிலே தமிழ் மக்களுக்கு எதிராகப் பல்வேறுபட்ட இனப் படுகொலைகள் மேற்கொள்ளப்பட்டன. தமிழர்கள் இவ்வாறான இனப் படுகொலைகளையெல்லாம் சந்தித்து, இன்று இந்த நாட்டின் பிரஜைகளாக வாழ்வதற்கும் தங்களுடைய அரசியல் உரிமைகளைப் பெற்று வாழ்வதற்கும் முயற்சிக்கின்ற காலகட்டத்தில், நேற்றைய தினம் கண்டியிலே தமிழ் பேசும் முஸ்லிம் மக்கள்மீது மிகக் கொடூரமானதும் காட்டுமிராண்டித்தனமானதுமான தாக்குதல் சம்பவங்கள் கட்டவிழ்த்துவிடப்பட்டன. அந்தச் சம்பவங்களைப் பொலிசார் பார்த்துக்கொண்டு நின்றிருக்கிறார்கள். புலனாய்வுத்துறையினரும்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

පොලිසාරුම් මිනිසුන් මේ ප්‍රශ්නය ගැන කිසිම විසඳුමක් ගන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන අපි ඉතා ගැඹුරින් කල්පනා කළ යුතුයි.

படாதவாறு இந்த நாட்டின் சூழல் அமைய வேண்டும். *[இடையீடு]* கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அவர்களுடைய பிரச்சினைக்கு நீங்கள் ஒரு முடிவை எட்டினால்தான் நாங்கள் இங்கு தொடர்ந்து பேசமுடியும். *[இடையீடு]* தொடர்ந்து இடையீடு இடம்பெறுவதால் இத்துடன் என்னுடைய உரையை நிறைவு செய்கின்றேன்.

[2.57p.m.]

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

Hon. Deputy Chairman of Committees, it is very unfortunate that this incident is used by certain quarters for their political benefit. As you know, Hon. Sumanthiran, there is a law in this country. One should not look at the law from a communal or racial perspective. I think any Muslim, any Sinhalese or any Tamil expects the law and order is to be carried out equally; but unfortunately in certain instances we see a breakdown of law. When there is violence, when there is tension, when there is arson, it is unfortunate that continuously the police have sometimes failed in carrying out their duties. Therefore, even though I am a member of the Cabinet, I urge the Government to take more meaningful steps in preventing such occurrences. It has happened in the past, it is happening now and it will happen in the future, but if we all work towards the Sri Lankan identity, whatever the ethnicity - a Muslim or a Sinhala or a Tamil - we should accept that what is wrong is wrong and what is right is right.

Sir, we have subscribed to the International Covenant on Civil and Political Rights. As you know, if you incite racial hatred, it is a non-bailable offence and you can get a conviction in the High Court for a period of ten years. But no government has had the political will to charge in terms of this Covenant or the Statute. Therefore, people have taken the law into their own hands at numerous occasions. I grieve with the families who have lost lives.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Hon. Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා ඊයේ සිට, [බාධා කිරීම්] Let me speak. මේ සිදුවීම සම්බන්ධයෙන් සියලු දෙනාම කනගාටුව ප්‍රකාශ කළා. ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් කනගාටුව ප්‍රකාශ කළා. මමත් කථානායකවරයා වශයෙන් සිද්ධිය වෙච්ච වෙලාවේ ඉඳලා දවසට තුන්-හතර වතාවක් පොලිස්පතිවරයාට කථා කළා. අද දැනට දෙවතාවක් කථා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභා ගර්භයේ ඉඳගෙන බාධා කිරීමෙන් මේ තත්ත්වය තවත් අවුල් වෙනවා හැර වෙන දෙයක් වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලාගේ අසුන්වලට යන්න කියලා. ආරක්ෂාව ලබාදීම සම්බන්ධව දැනටමත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. නැවත වරක් මා ඒ ගැන අගමැතිතුමාට කියන්නම්. [බාධා කිරීම්] I will give you that assurance. තමුන්නාන්සේලා අසුන්වලට ගියේ නැත්නම් මට සභාව කල් දමන්න සිද්ධ වෙනවා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, the Hon. Leader of the House.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අද කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා, හදිසි නීතිය පනවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්. ඒ ගැන මම දන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ආරක්ෂාව වෙනුවෙන් අපි කැපවෙලා සිටිනවා. [බාධා කිරීම්] අපට ඒ සඳහා අවශ්‍ය සහයෝගය දෙන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

යුද හමුදාව, මහනායක හාමුදුරුවරු ඒ ඔක්කෝම,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ඒ සියලු දෙනාම.

ගරු මන්ත්‍රීතුමන්ලාට මිනිත්තු තුනක් දෙනවා, කරුණාකර වාඩි වෙන්න. සභාවේ වැඩ කටයුතු පටන් ගන්න අවස්ථාව දෙන්න. එහෙම නැත්නම් සභාව කල් දමන්න සිද්ධ වෙනවා. වැඩ කටයුතු අවුල් කරන්න එපා. ඔබතුමන්ලා ඔය කරන්නේ සාධාරණ ක්‍රියාවලියක් නොවෙයි. [බාධා කිරීම්] Are you prepared to get back to your seats, Hon. Members? I will give you three minutes to go back. - [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමන්ලා කියන්නේ පොහොට්ටුවෙන් ආරක්ෂා කරලා දෙන්න කියලා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහොම හරි ආරක්ෂාව ලබා දෙන්න. Hon. Prime Minister, do you want to say anything? මම මෙතුමන්ලාට කිව්වා, දැනටම පියවර අරගෙන තිබෙන බව.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Yes. I think the Government is taking all possible measures to protect the people, especially the Muslims. As you know, we are also inquiring into where there have been lapses - as was pointed out. We are taking the necessary steps. - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Are you prepared to get back and start the proceedings, Hon. Members?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Parliament must function for the grievances to come up.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනෙක් මන්ත්‍රීවරුන්ටත් කථා කරන්න අවස්ථාව දෙන්න. අලුතෙන් ආපු මන්ත්‍රීතුමාත් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් පිළිබඳව ඉගෙන ගන්න. The new MP, I think you also should learn the Parliamentary practices.- [*Interruption.*]

[ඉනික්බිතිව, ඝෝෂා කරමින් සිටි මුස්ලිම් මන්ත්‍රීවරු තම අසුන් වෙත ගියහ.]
[இச்சந்தர்ப்பத்தில் கோஷமிட்டுக்கொண்டிருந்த முஸ்லிம் உறுப்பினர்கள் தமது ஆசனங்களுக்கு சென்றனர்.]
[Thereupon Muslim Members who were creating an uproar went back to their Seats.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will go ahead now. Hon. Faiszer Musthapha, please continue with your speech.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Speaker, this country has suffered continuously because of private incidents being used by certain politicians for their political will. Religious hatred is the easiest political tool for the bankrupt politicians to achieve their political ambitions. Our Government also, during this occurrence, could have acted more swiftly; the police could have acted with much more responsibility. This has resulted in some of our Hon. Members coming to the Well of the House, especially the Muslim Members of Parliament, showing that they have lost their confidence as to how law and order is being carried out.

கடந்த காலங்களைப் பொறுத்தவரையில் எமது சகோதர மக்களாகிய முஸ்லிம் மக்களுக்கு எதிரான வன்முறைத் தாக்குதல் சம்பவங்கள் தொடர்ந்து இடம்பெற்று வந்துள்ளன. இவ்வாறான சம்பவங்கள் தம்புள்ளை, மாவனல்ல, காலி- ஜிந்தோட்டை, களுத்துறை, கொழும்பு, குருநாகல் என ஆரம்பித்து அண்மையில் அம்பாறையிலும் இப்போது திகனயிலும் என மேலும் தொடர்கின்ற நிலைமைகளையே காணக்கூடியதாக இருக்கின்றது. அம்பாறையில் இடம்பெற்ற சம்பவங்களின் சூடு தணியுமுன்னரே திகன சம்பவம் நடைபெற்றிருக்கின்றது. கடந்த பெப்ரவரி மாதம் 22ஆம் திகதி நடந்த ஒரு சம்பவத்தின் பின்னணியாகவே நேற்றைய வன்முறைகள் இடம்பெற்றிருக்கின்றன. இந்தச் சம்பவத்தினை ஆராய்கின்றபொழுது, இது முற்றுமுழுதாக முஸ்லிம் மக்களின் சொத்துக்களை அழிப்பதற்காக மேற்கொள்ளப்பட்ட செயற்பாடாகவே காணப்படுகின்றது. மேற்படி சம்பவங்களின் போது பொலிஸார் இயன்றளவில் தங்களது கடமைகளை நிறைவேற்றியதாகத் தெரிய வந்தாலும், பொலிஸாரையும் மீறிய நிலையிலே முஸ்லிம் மக்களுக்குச் சொந்தமான சொத்துக்கள் பாரியளவில் அழிக்கப்பட்டுள்ளதாகவும் அங்கிருந்து கிடைக்கின்ற தகவல்கள் தெரிவிக்கின்றன. ஊரடங்கு அமுலில் இருந்தபோதிலும் நகரப் பகுதிகள் தவிர்ந்த ஏனைய உட்புறக் குடியிருப்புப் பகுதிகள்மீது தாக்குதல்கள் இடம்பெற்றுள்ளன என்றும் தெரிய வருகின்றது. ஒரு தனிப்பட்ட பிரச்சினையானது இனப் பிரச்சினையாக மாற்றப்பட்டிருப்பதை இங்கு சுட்டிக்காட்டாமல் இருக்க முடியாது.

எனவே, இத்தகைய சம்பவங்கள் இடம்பெறாமல் தவிர்ப்பதற்கான காரணிகள் குறித்தும் ஆராய வேண்டியுள்ளது. அதேநேரம், இத்தகைய செயற்பாடுகள் திட்டமிட்ட வகையில் மேற்கொள்ளப்பட்டு வருவதையும் இங்கே சுட்டிக்காட்ட வேண்டும். அதாவது, ஏதாவதொரு சம்பவம் இடம்பெறும் வரையில் பார்த்திருந்து அல்லது வேண்டுமென்றே ஒரு சம்பவத்தை உருவாக்கி, அதிலிருந்து ஆரம்பித்து இத்தகைய வன்முறைகள் முன்னெடுக்கப்பட்டு வருவதையும் அவதானிக்க முடிகின்றது. குறிப்பாக, நான் இந்தச் சபையிலே ஒரு விடயத்தைக் கூற வேண்டும். அதாவது தமிழ் - சிங்களப் புத்தாண்டு அண்மிக்கின்ற காலப்பகுதிகளில் முஸ்லிம் மக்களுக்குச் சொந்தமான வர்த்தக நிலையங்களில் பொருட்களை குறிப்பாக, ஆடைகளை சிங்கள மக்கள் வாங்கக் கூடாதெனப் பிரசாரங்கள் மேற்கொள்ளப்படுவது வழமையாகி வருகின்றது. இதன் பின்னணியில் சுயலாப வர்த்தகர்கள் சிலர் இருக்கின்றனரேயன்றி, வேறொன்றும் கிடையாது. அந்த வகையில்தான் மேற்படி சம்பவங்களையும் பார்க்க வேண்டியுள்ளது. இந்த வருட தமிழ் - சிங்களப் புத்தாண்டு அண்மித்து வருகின்ற காலகட்டத்திலேயே மேற்படி சம்பவங்களும் இடம்பெற்றுள்ளன. அதாவது, முஸ்லிம் மக்களது வர்த்தக நிலையங்கள் அழிக்கப்பட்டு வருகின்றன.

இன்றைய காலகட்டத்தைப் பொறுத்தவரையில் தமிழ், முஸ்லிம் மக்களில் பலரும் அரச தொழில்வாய்ப்புகள் மறுக்கப்பட்டவர்களாகவே இருக்கின்றனர். கடந்தகால யுத்தம் இதற்கொரு காரணமாக இருக்கலாம். இவ்வாறு அரச தொழில்வாய்ப்புகள் மறுக்கப்படுகின்ற மக்கள் வர்த்தகத்தில் ஈடுபடுகின்றபோது, அவர்களது வர்த்தக நிலையங்களையும் தாக்கி அழிக்க முற்பட்டால் அந்த மக்கள் தங்களது வாழ்வாதாரங்களுக்காக வேறு என்ன தொழிலைச் செய்ய முடியும்? என்பதையும் சிந்தித்துப் பார்க்க வேண்டும்.

எனவே, தங்களது சுயலாபங்களுக்காக இனவாதத்தினைப் பூசிக்கொண்டு, இந்த நாட்டைப் பின்தள்ளிச் செல்லாது, எல்லோரும் இணைந்து இந்த நாட்டினை முன்னேற்றுவதற்கு முன்வரவேண்டும். ஏனைய விடயங்களைச் செயற்படுத்தி னாலும் இனவாதத்தினை ஒழிக்க முடியாவிட்டால் எம்மால் ஒருபோதும் முன்னேற முடியாது என்பதை இந்தச் சபையிலே வலியுறுத்திக் கூற விரும்புகின்றேன். "தயவுசெய்து எவராக இருந்தாலும் இனவாதத்தைப் பூசிக்கொண்டு திரியாதீர்கள்! மனித நேயத்துடன் வாழ்ந்துபார்க்க முன்வாருங்கள்!" என நான் அவர்களிடம் அழைப்பு விடுக்கின்றேன். இந்த நாட்டில் கடந்த 30 வருட யுத்தத்திற்குப் பின்னரான காலப்பகுதியானது இனங்களுக் கிடையில் சந்தேகங்களை அகற்றி, பரஸ்பர நம்பிக்கையினை வளர்க்கின்ற காலகட்டமாக மாற்றப்பட்டிருக்க வேண்டும். அதனை நிறைவேற்றுவதற்குத் தவறிய ஒரு நிலையிலேயே இத்தகைய அசம்பாவிதங்கள் தொடருகின்றன. இந்த நிலையில்,

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

இந்த நாட்டில் பொறுப்புக் கூற வேண்டிய அனைத்துத் தரப்பினரும் குறிப்பாக அரசியல்வாதிகள், ஊடகங்கள், சமூக மற்றும் மதத் தலைவர்கள் மிகவும் நிதானமாக நடந்துகொள்ள வேண்டியது அவசியமாகும். அதேநேரம், அனைத்து இன மக்களும் புரிந்துணர்வுடன், சில விட்டுக் கொடுப்புகளுடன் நடந்து கொள்ள வேண்டும் எனவும் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், கடந்த 22ஆம் திகதி இடம்பெற்ற குறித்த சம்பவம் காரணமாக எம்.ஜி. குமாரசிங்க என்பவர் உயிரிழந்துள்ளார். அன்னாருக்கு எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக் கொள்வதுடன், அவரது மறைவு காரணமாகப் பாதிக்கப் பட்டுள்ள அனைவருடனும் எனது துயரங்களைப் பகிர்ந்து கொள்கிறேன். அதேவேளை, பாதிக்கப்பட்டுள்ள முஸ்லிம் மக்களுக்கும் எனது வேதனையைத் தெரிவித்துக் கோள்கின்றேன். அத்துடன், குமாரசிங்கவினது இழப்புத் தொடர்பிலும் பாதிக்கப்பட்ட முஸ்லிம் மக்களது சொத்து இழப்புகள் தொடர்பிலும் இந்த அரசு விரைந்து இழப்பீடுகளை வழங்க நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 4.09]

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද රටේ ඇති වී තිබෙන අවාසනාවන්ත තත්ත්වය තුළ මම පළමුවෙන්ම මොරගහමුල කුමාරසිරි මහතාගේ පවුලේ උදවියටත්, අබ්දුල් බාසිත් මහතාගේ පවුලේ උදවියටත් කනගාටුව පළ කරන්නට කැමැතියි. පසුගිය සතියේ අම්පාරේ ඇති වුණු සිද්ධියක් මුල් කරගෙන දේපොළ හානියක් සිද්ධ වුණා. ඇත්තටම එය ඒ අවස්ථාවේදී හදිසියේ ඇති වුණු දෙයක්. නමුත් ඊට කලින් තවත් දෙයක් සිදු වුණා. මුස්ලිම් ජනතාව සිංහල උදවියට වඳ පෙති දෙනවා කියලා එක් කණ්ඩායමක් විසින් අන්තර්ජාලයේ නොයෙක් වෙබ් අඩවි හරහා ප්‍රචලිත කරමින් සිටියා. අම්පාරේ මුස්ලිම් හෝටලයකින් කෑම කාපු කණ්ඩායමකට පිටි ගුලියක් වාගේ මොනවා හෝ දෙයක් හම්බ වෙලා තිබෙනවා. ඒක වඳ පෙත්තක් කියලා සැක කළ ඒ අය, ඒ අසළ මරණ ගෙදරක සිටි කණ්ඩායමකුත් එකතු කරගෙන ඇවිත් කලහකාරී ලෙස හැසිරීම නිසා එහි අවාසනාවන්ත සිදු වීමක් වුණා.

මම දන්නවා, දැනට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා වුණු මෙවැනි තවත් සිදුවීමක්. අම්පාරේ ඉඳලා මඩකළපුවට ගිය සිංහල පාසල් දරුවෝ කණ්ඩායමක් කෑම කන්න මඩකළපුවේ හෝටලයකට ගිය අවස්ථාවේදී එක් අයෙක් දෙමළෙන් කියලා තිබෙනවා, "දෙමළ ළමයි එක පෝලිමකට හැදෙන්න, සිංහල ළමයි තව පෝලිමකට හැදෙන්න" කියලා. සාමාන්‍යයෙන් දෙමළ කථා කරන ළමයි එක පෝලිමකටත්, සිංහල කථා කරන ළමයි එක පෝලිමකටත් හැදෙන්න කියලා කියන්නේ ළමයින්ව කළමනාකරණය කරන්න පහසු වෙන්න. නමුත්, ඒ අවස්ථාවේදී දෙමළ තේරෙන එක්කෙනෙක් ගිහින් කිව්වා, "වෙන පෝලිමකට හැදෙන්න කියලා කිව්වේ කෑමවලට වහ ටිකක් හෝ මොනවා හෝ දාල තිබෙන නිසායි. ඒ නිසා කන්න එපා" කියලා. අන්තිමට අර දරුවෝ මඩකළපුවෙන් කෑම කන්නේ නැතිව අම්පාරට ඇවිල්ලා මේ සිද්ධිය කිව්වා. ඉන් පසුව ඊළඟ දවසේ පාසල්වල ඉන්න ඔක්කොම ළමයි ඇවිල්ලා එතැන යුද පිටියක් බවට පරිවර්තනය වුණා. එදා කාර්යාලවල වැඩ කළ දෙමළ නිලධාරීන්, බැංකුවල සිටි නිලධාරීන් කාර්තිව් හන්දියට ගෙනිහින් දාන්න පවා මට සිද්ධ වුණා.

මෙවැනි ආකාරයේ පොඩි සිද්ධියකින් අපේ ජනතාව නොමඟ යවන්නට පුළුවන්. සිංහල පළාත්වල චිතරක් නොවෙයි, දෙමළ පළාත්වල චිතරක් නොවෙයි, මුස්ලිම් පළාත්වල චිතරක් නොවෙයි රටේ හැම තැනකම මේ ආකාරයට ජාතිවාදය අවුස්සලා කලබල ඇති කරන්න පුළුවන්. මේක අපි දැක්කා ඉතිහාසයේ ඉඳන්ම. ඇත්තටම මේක ඇති කරන්නේ දේශපාලනඥයෝ. මොකද, දේශපාලනඥයෝ කල්පනා කරනවා ජාතිවාදය අවුස්සලා එය ඡන්දය ලබා ගන්න ප්‍රයෝජනට ගන්නේ කොහොමද කියලා. ඇත්තටම මේක පුංචි සිද්ධියක්. එදා අම්පාරේ ඇති වුණු සිද්ධිය වෙනුවෙන් මම පැය තුනහමාරක් හතරක් විතර ගත කළා. ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමාටත් මම ඒ අවස්ථාවේදී කථා කළා.

එතුමාට කථා කරලා මා කිව්වා, "අම්පාරේ මේ ප්‍රශ්නය දැනට විසඳිලා තිබෙනවා. මෙහි පැවති කලබලකාරී තත්ත්වය දැන් මැඩ පවත්වාගෙන තිබෙනවා. මේ ප්‍රශ්නය අනික් ප්‍රදේශවලටත් පැතිරෙන්නට පුළුවන්. ඒ නිසා ඔබතුමා මඩකළපුව ප්‍රදේශයට, කල්මුනේ ප්‍රදේශයට මේ ප්‍රශ්නය පැතිරෙන්න දෙන්නේ නැතුව, කෙසේ හෝ මෙය නවත්වා ගන්න ඕනෑ"යි කියලා. එදින රාත්‍රියේදීම මා රවුන් හකීම් ඇමතිතුමාටත් දුරකථනයෙන් කථා කරන්න උත්සාහ කළා. නමුත් එතුමාගේ ආරක්ෂක නිලධාරීන් කිව්වා, "එතුමා නිදි. එතුමාට දැන් කථා කරන්න පුළුවන්කමක් නැහැ"යි කියලා. මේ ආකාරයට දේශපාලන නායකයන්ට කථා කරලා මා කල්පනා කළේ, මේ ප්‍රශ්නය මෙතැනින් එහාට යන්න දෙන්නේ නැතුව මැඩ පවත්වා ගන්නයි. ඇත්තටම අම්පාර ප්‍රදේශයේ ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳිලා තිබුණා. ඒ සම්බන්ධයෙන් මා අද විශේෂයෙන්ම දිසාපතිතුමාටත් කථා කළා. එතකොට මට දැන ගන්නට ලැබුණා, කච්චේරියේ සේවය කරන සියලුම මුස්ලිම් ජනතාව සේවයට පැමිණ සිටින බවත්, කිසිම කලබැගෑනියක් නැති බවත්. ඒ චිතරක් නොවෙයි.

මගේ කර්මාන්තශාලාවල සිංහල, දෙමළ, මුස්ලිම් හැම කෙනෙක්ම එකට වැඩ කරනවා. ඇත්තටම එතැන සහෝදරකම එකම ආකාරයට තිබෙනවා. සමහර මුස්ලිම් හෝ දෙමළ දරුවෙක් රැකියාවට ආවාම, ටික දවසක් යනකොට ඔහු සිංහල භාෂාව හොඳට ඉගෙන ගෙන, සියලුදෙනාම සහෝදර සහෝදරියන් වාගේ රැකියාවේ යෙදෙනවා. මෙවැනි වාතාවරණයක් තිබෙන රටක, ශ්‍රී ලාංකිකයන් හැටියට අපට ජීවත් වන්න පුළුවන් වාතාවරණයක් තිබෙන අවස්ථාවක, අවුරුදු 30ක යුද්ධයකින් අවුරුදු ගණනක් පිටිපස්සට ගිහින් අද යම්තම් ඔළුව උස්සන්න හදන අවස්ථාවේදී විශේෂයෙන්ම අපේ මුස්ලිම් දේශපාලන නායකයන්ගෙනුත්, අපේ ආගමික නායකයන්ගෙනුත්, ඒ වාගේම යම්කිසි ශක්තියක් තිබෙන සියලුදෙනාගෙනුත් මා ඉල්ලීමක් කරනවා, මේ අවස්ථාවේදී ජාතිවාදය අවුස්සන්නේ නැතුව මේ ප්‍රශ්නය නිරාකරණය කර ගෙන, සමඟිව අපි ඉදිරියට යමුයි කියලා. ඒ චිතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නීතිය හරියටම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මා සතුටු වනවා, නාවකාලිකව හෝ හදිසි නීතිය පනවා මෙය සමථයකට පත් වන තුරු නීතිය තදින්ම ක්‍රියාත්මක කරන්න ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් අද හොඳ තීරණයක් ගැනීම ගැන. මොකද, නීතිය තදින්ම ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, නොයෙක් නොයෙක් අය නීතිය තමන්ගේ අතට ගන්නවා. රට අස්ථාවර කරන්න මාන බලන කණ්ඩායමක් මෙහි ඉන්නවා. එය අපට හොඳටම තේරුණා. මොකද මේ සිද්ධිය අහම්බෙන් සිදු වුණත්, ඊට පස්සේ මේ සිද්ධිය අතට ගත් කණ්ඩායමක් ක්‍රියාත්මක වෙලා මෙය වෙනතකට ගෙන යන්න පුළුවන්තරම් උත්සාහයක් දැරුවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි අම්පාරේ මුස්ලිම් පල්ලියේ තාප්පය පෙරළා දැම්මේ. ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් අඩුම වශයෙන් 200දෙනෙක්වත් කවදාවත්

මෙවැනි දේවල්වලට කැමැත්තක් දක්වන්නේ නැහැයි කියලා මා විශ්වාස කරනවා. නමුත් කණ්ඩායමක් දේශපාලන වාසි ගන්න බලාගෙන ඉන්නවා. දේශපාලන වාසි ගන්න බලාගෙන වැඩ කටයුතු කරන්න ගියොත්, අපි ලෝකය ඉදිරියේ අපවාදයට ලක්වෙලා, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි ඉදිරියට යන ගමන යන්නට බැරි වෙනවා. ඒ නිසා මා නැවතත් කියනවා, රජයක් හැටියට අපි මේ ප්‍රශ්නය මෙතැනින් ඉදිරියට පැතිරිලා යන්න ඉඩ දෙන්නේ නැහැයි කියලා.

දැනට සමහර මුස්ලිම් ව්‍යාපාරිකයන්ගේ දේපොළ හානියට පත්වෙලා තිබෙනවා.

අනිවාර්යයෙන්ම රජයෙන් ඒ දේපළවලට වන්දි ගෙවන්න ඕනෑ. මොකද, අවුරුදු ගණනාවක් තිස්සේ ඔවුන් බොහොම අමාරුවෙන් ධාර්මිකව හම්බ කර ගත් මුදල් ඇතුළු දේපළ ඔක්කෝම එක රැයකින් ගිනිබත් වෙලා තිබෙනවා.

ඇත්තටම 1956 වසරේදී කල්මුනේදී මගේ පවුලත් මෙවැනිම ආකාරයට ජාතිවාදී කෝලාහලවලට ගොදුරු වෙලා ඔවුන්ගේ ව්‍යාපාරත් මේ ආකාරයෙන් සම්පූර්ණයෙන්ම පිළිස්සී ගියා. එම නිසා මේ තත්ත්වය ගැන හොඳින්ම තේරුම් ගත් පුද්ගලයෙකු හැටියට මා දන්නවා, ඒකේ කොයි තරම් වේදනාවක් තිබෙනවාද කියලා. මගේ දෙමව්පියෝ ඒ ගැන කොයි තරම් වේදනාවකින් අපි එක්ක කථා කරලා තිබෙනවාද? එම නිසා මෙවැනි දෙයක් නැවත ඉදිරියට ඇති නොවන්නට වග කිව යුතු පුද්ගලයන් හැටියට අපි එකතුව වැඩ කරමු කියලා පවසමින් මා නවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු වාසුදේව නානායක්කාර මහතා.

[අ.භා. 4.20]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මා හිතන්නේ මට පෙර කථා කළ ඒකාබද්ධ විපක්ෂයේ කථිකයන් කියන්නත් ඇති, දැන් රටේ තිබෙන ආතතිය නිසා හත් වෙනිදාට අපි නියම කර ගෙන තිබුණු රැස්වීම නොපවත්වන්න අපි තීරණයක් ගත්තා කියලා. ඒ, කිසියම් ආකාරයකට කූට සැලසුම්වලට; කුමන්ත්‍රණවලට ඉඩ නොතබන්නයි. එසේ කිරීම අමාරුයි.

එසේ කිරීමට අමාරු නමුත් අපි වග කීමෙන් යුතු තීරණයක් ගත්තා. දැන් මෙතැන "වහෙන් ඔරෝ" භාෂාවෙන් කියැවුණා, මේ ක්‍රියාදාමයන් පිටුපස ආණ්ඩුව අස්ථාවර කිරීමේ වුවමනාවක් තිබෙනවාය කියා. කාගේ හිතේද තියෙන්නේ? මේ ක්‍රියාදාමයන්වලට මිනිස්සු පොලඹවන අය කවුරුන්ද? ඒ අයගේ හිතේ තිබෙන්න පුළුවන් දෙය ආණ්ඩුව අස්ථාවර කිරීමද? නැහැ. ඒ අයගේ හිතේ තිබෙන දෙය තමයි, තමන් ඇති කර ගත්තා වූ මේ ජනවාර්ගික වෛරය මත පහරදීම. එසේ නැත්නම් ප්‍රචණ්ඩත්වය මුදා හැරීම. එසේ කිරීම තුළින් ඒ පුද්ගලයා එක්තරා කාලකණ්ණි තෘප්තියක් ලබනවා. එයයි ජනවාර්ගික ගැටුම්වල ස්වභාවය.

එදා ඉන්දියාවේ හින්දුවරුන්, මුස්ලිම්වරුන් අතර විශාල වශයෙන් ගැටුම් ඇතිවෙන වෙලාවේ ගාන්ධිතුමා දිගටම උපවාස කළා, " එහෙනම් මම කන්නේ නැතිව මැරිලා යනවා. මට කමක් නැහැ. මෙහෙම අපේ මිනිස්සු රණ්ඩු වෙනවා නම්, මරා ගන්නවා නම්. මේ මොන අපරාධයක්ද?" කියා. එතුමාගේ ඒ සත්‍යාග්‍රහ ව්‍යාපාර හුහක් දුරට ප්‍රයෝජනවත් වුණා, යම් ප්‍රමාණයකට මිනිස්සුන්ව මොළොක් කරන්න." අනේ! අපේ ගාන්ධිජීට මොකුත් වුණොත් අපි මොකද කරන්නේ'" කියන හැඟීමෙන් යුතුව මිනිස්සු පසුබාලා එම ක්‍රියාවලියෙන් ටිකක් ඈත් වෙන්නට පටන් ගත්තා. එවැනි ගුණධාර්මික බලපෑමක් කිරීමට මහජන නියෝජිතයෝ හැටියට අපි සියලුදෙනාටම වග කීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේද විපක්ෂයේද කියන කාරණාව උඩ නොවෙයි, මම මේ ප්‍රශ්නයට එළඹෙන්නේ. මේ රටේ ලාංකීය එක්සත්කම වෙනුවෙන් සමාජයේ තිබිය යුතු මානුෂීය ගුණධර්ම වෙනුවෙන් අපි කවුරුත් මැදිහත් විය යුතුයි. මේ අවස්ථාවේදී ආණ්ඩුව අස්ථාවර කරන්නයි හදන්නේ කියා "වහෙන් ඔරෝ "භාෂාවෙන් අපට චෝදනා කරන්න එපා. අපි මේ ආණ්ඩුවත් එක්ක විරුද්ධයි. එහි කිසිම සැකයක් නැහැ. නමුත් අපි ජාතිවාදය ආගම්වාදය මුල් කරගෙන ආණ්ඩුවක් අස්ථාවර කරනවාය කියන්නේ ඒක අපටම කැඳවා ගන්න හෙණපතයක්. ජනවාර්ගික වෛරයෙන් කැලඹීම් ඇති කරවා අපි ආණ්ඩුවක් අස්ථාවර කරනවා නම්, ඒක අපිම අප කරා කැඳවන මහා අකුණු සැරයක් තරම් මහා භයානක ආයුධයක්. ඔය කියමනක් තිබෙනවානේ, "ඇහැට ඇහැක් දතට දතක්" කියා. ගාන්ධිතුමා කිව්වා, "මගේ ඇහැට නුඹේ ඇහැ **දියන්** කියා අපි හැමෝම ඇහැට ඇහැක් අරගන්න ගියොත් ලෝකයේ අපි හැමෝම අන්ධයෝ බවට පත් වෙයි." කියා. ඇයි? කාටවත් ඇස් පෙනෙන්නේ නැහැ. මේ වෙලාවේ මම ඒ කියමන කිව්වේ, අපි එක්තරා තලයක ඉඳගෙන මේ ප්‍රශ්නය ගැන විමසන්න එළඹෙන්න වුවමනා වන නිසයි.

අපි මේ ආණ්ඩුව පරාජය කරලායි තිබෙන්නේ. තියුණු ලෙස පරාජය කරලා තමයි තිබෙන්නේ. මේ ආණ්ඩුව පරාජය කිරීම පමණයි අපට වුවමනා වන්නේ. ඒ ගැන කිසිම සැකයක් නැහැ. පුළුවන් නම් මේ ආණ්ඩුව පාර්ලිමේන්තුව ඇතුළේ පරාජය කරන්න බලන්න ඕනෑ, අපි මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ගැන තිබෙන විරුද්ධත්වය මත. පුද්ගලයෝ ගැන නොවෙයි. අපි දැනට පළාත් පාලන ඡන්දයෙන් ජයග්‍රහණයක් ලබා තිබෙනවා. එම ජයග්‍රහණය ප්‍රමාණවත් ජයග්‍රහණයක්. දැන් අපට වුවමනා කරන්නේ පළාත් සභා මැතිවරණය, මහ මැතිවරණය පවත්වා මේ රටේ ප්‍රතිපත්තිමය සංවාදයක්- විවාදයක් හරහා මේ රටේ අලුත් ආණ්ඩු පාලනයක් බිහි කිරීම පිළිබඳ බලාපොරොත්තුවක්. හැබැයි, අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. නිකම්ම බලයක් දෙන්න කියලා නොවෙයි. නමුත් මෙතැන කථාව ගියේ නම්, ඒ තරම් හොඳ විධියට නොවෙයි. බලය ගන්න ඕනෑ නම් ජාතිවාදය පාවිච්චි කරන්න. ජාතිවාදය පාවිච්චි කරන්නෝ බොහෝ විට බලය ගන්නට කෑදර කමින් ඉන්නා වූ පුද්ගලයින්. මම නම් ඒක එහෙම පිළිගන්නේ නැහැ. මේ ජනවාර්ගික වෛරය ඇවිළි ඇවිළී යන්නේ භාවයන්ගේ කැලඹීමක් තුළින්.

එක් එක් කෙනාගේ තිබෙන්නා වූ දැනුම මිනුම, පරිණතභාවයේ මට්ටම අනුවයි ඒ කැලඹීම, ආතතිය ඇවිත් ඔය කියන භාවය කැලඹී මිනිසුන් වෛරයට පොළඹ වන්නේ. ඒවා පාවිච්චි කරන්න පුළුවන්, දේශපාලන අවි හැටියට. නමුත්, ඒවා දේශපාලන අවි හැටියට පාවිච්චි කරලා බලයක් අරගෙන ඒ බලයට පවතින්න බැහැ. මොකද, තමන් පාවිච්චි කරන්නේ මහා භයානක දෙයක්. ඒ භයානක දෙය අවසානයේදී භයානක විපාක ඇති කරනවා, කවුරු කොයි කාලයේ ආණ්ඩු කළත්, කොයි විධියට ආණ්ඩුවක් ගෙන ගියත්.

අම්පාරේ සිද්ධියෙන් නේ මේ මෑත කාලයේ ගැටුම ආරම්භ වුණේ. ඊට ඉස්සෙල්ලා ගිංතොට සිද්ධියක් වුණා. ජනවාර්ගික ගැටුම් පණහකට වැඩි ගණනක් මගේ ජීවිත කාලය තුළ මම

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

දැකලා ඇති. සුළු පරිමාණයේ ගැටුම්, මධ්‍ය පරිමාණයේ ගැටුම්, ටිකක් පළල්ව විහිදුණු ගැටුම් ඒ අතර තිබෙනවා. මේ හැම අවස්ථාවකදීම අපේ හිත්වල විශාල ගින්නක් ඇති වුණා. "මේ මනුෂ්‍යයා වෙනත් ජන වර්ගයකට අයිති අයෙක්, මේ මනුෂ්‍යයා වෙනත් ආගමක් අදහන අයෙක්" වැනි හේතු මත මනුෂ්‍යයන් හිතේ වෛරයක් ඇති කර ගන්නේ කොහොමද? හිතක ඒ වෛරය මතු වෙන්න පුළුවන් වන්නේ කොහොමද? මෙන්න මේක මට නම් තේරුම් ගන්න හරිම අමාරු දෙයක්. ඒක තේරුම් ගැනීමට තමයි අපි උත්සාහ කළ යුතු වන්නේ.

මට මතකයි, 83 කළු ජූලිය. අපේ පක්ෂය වන නව සමසමාජ පක්ෂය එදා තහනම් කළා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා. කොමියුනිස්ට් පක්ෂයත් තහනම් කළා, ජනතා විමුක්ති පෙරමුණත් තහනම් කළා. තහනම් කරලා අසූතුනේ කළු ජූලිය අපේ පිටින් යවන්න උත්සාහ කළා. අපේ ජීවිතවලට ඒ වෙලාවේ අවදානමක් තිබුණා. මොකද, අපි ගත්තු ස්ථාවරය මත අපි හිටියේ සියලු ජනවර්ගයන්ට සමානව සැලකෙන්න ඕනෑ; සියලු ජනවර්ගයන් අතරේ සමඟිය ගොඩ නඟන්න ඕනෑයි කියන මතයේ. ජනවාර්ගික වෛරයට විරුද්ධව අපි පෙනී සිටියා. ඒ නිසා අපට භයක් ඇති වුණා, ඒ වෙලාවේ තිබුණු වාතාවරණය තුළ අපට අනතුරක්, අවදානමක් තිබෙවිද කියලා. ඇයි ඉතින් ඒ ජේ.ආර්. ජයවර්ධන මහත්තයාත් කළේ මහා පුදුම, බරපතළ අපරාධයක් නේ. හරියටම අපේ පක්ෂය තහනම් කළේ ඒ කෝලාහලයට හේතුව, ඒ කෝලාහලයට මුල් වුණේ අපේ පක්ෂයයි කියන අර්ථයෙන්ම නොවැ. ඊට පස්සේ අපි කිසියම් නීතියක් ඉදිරියට හෝ යම්කිසි නීතියේ ක්‍රියාදාමයකට හසු වුණා නම් සමහර විට අනුකම්පා විරහිතව අපට දඬුවම් විඳින්න ඉඩ තිබුණා. ඒ අවදානම සැලකීමට අරගෙන අපි ඒ අවස්ථාවේ හැංගුණා. අසූතුනේ කළු ජූලියත් එක්ක අපේ පක්ෂය තහනමට ලක් කළා; අපේ කාර්යාලවලට සීල් තැබුවා; අපේ පත්තර නැවැත්තුවා. අපි වහාම සැහවී යටි තලයේ සිටියා. ජනතා විමුක්ති පෙරමුණත් යටි තලයේ සිටියා. මාස හයක, හතක විතර කාලයකින් පස්සේ නැවත යථා තත්ත්වය ආවා. මහජන පක්ෂයක් ඇති වුණා, විජය කුමාරණතුංග මතු වුණා. ජාතික සමඟියේ හඬ නැවතත් රටේ රැව් දෙන්න පටන් ගත්තා. ඒත් සමඟම අපි හීන්දු කළා, යටි තලයෙන් එළියට ඇවිත් විවෘත දේශපාලනයට එන්න.

දැන් බලන්න, ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කොච්චර අපරාධයක්ද කළේ කියලා. රාජ්‍ය නායකයා දින කීයක් නිහඬව සිටියාද, ටෙලිවිෂන් එකටවත්, රේඩියෝ එකටවත් ඇවිත් වචනයක් නොකියා? ඊළඟට බලන්න, මේ පක්ෂ තහනම් කරලා, පක්ෂවල පත්තර තහනම් කරලා අප අත් අඩංගුවට ගන්න නියම කරලා, අපි දන්නා කියන ගෙවල් පවා පෙරළාගෙන, හැම තැනම ඇවිදලා බැලුවත් අප අල්ලන්න බැරි වුණා. ඒ අතින් මම සතුටුයි, ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ඒ උපක්‍රම පරාජය කරන්න අපට නැවතත් හැකිවීම ගැන. ඒ අවස්ථාවේදී එයට අප කෙළින්ම වුදිතයන් බවට පත් කිරීමෙන් කෙතරම් භයානක දෙයක්ද සිදු වුණේ?

දැන් මේ වෙලාවේ මේ වාගේ තත්ත්වයක් තුළ අපි කෙළින්ම ඉලක්කයක් අරගෙන "මෙන්න මේ පක්ෂය, මෙන්න මේ පුද්ගලයින්, මෙන්න මේ දේශපාලන ධාරාව මේ අපරාධයේ වගකිව යුත්තන්ය" කියමින් තහනම් කිරීම්, හදිසි නීතිය පාවිච්චි කිරීම් කළොත්, ඔන්න ඔතැනයි මෙහි භයානකකම තියෙන්නේ. දැන් මේ නීතිය තදින්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත්, හදිසි නීතිය කියන එක අවම ලෙස පමණක් අපි යොදා ගන්න ඕනෑ. මොකද, හදිසි නීති තත්ත්වය යටතේ තමයි බොහෝ දේවල් සාමාන්‍ය නීතියට පිටින් වෙන්නේ.

කතරගම රූමතියගේ මිනී මැරුමේ සිට මේ රට පුරා සිදුවුණු එබඳු මහා බිහිසුණු සිද්ධි දාමයක් අපි දන්නවා. මේවා සිදු වෙන්න පුළුවන්. රජයේ යම් නිලධාරියෙක්ගේ ක්‍රියාත්මක වීම තුළ ඇති වෙන්න පුළුවන් අවදානම් තත්ත්වයන් එක්කයි මේවා වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සියලු ජන වර්ගයන් වෙනුවෙන් අපේ සහෝදරත්වය ප්‍රකාශ කරන්න ඕනෑ. සිංහලයෙක් හැටියට මට සිංහල හැඟීම තිබෙනවා. නමුත්, ලාංකිකයෙක් හැටියට මට ලාංකීය හැඟීම තිබෙනවා. ඒ වාගේ අපි හැමෝටම තමන්ගේ ජන වර්ගය, ආගම ගැන තමන් තුළ තිබෙන හැඟීමට අතිරේකව ලාංකීය වූ හැඟීමකින් අපේ සිත් පුබුදුවා ගන්නට පුළුවන් විය යුතුයි. අවසාන වශයෙන් මේ සඳහා තිබෙන්නේ එකම වචනයයි. 'සමානත්වය' තමයි මේකට තිබෙන උත්තරය. දේශන පැවැත්වීමවත්, මේකේ තිබෙන හොඳ, නරක ගැන,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කථාව අවසාන කරන්නයි යන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපට තිබෙන්නේ සමානත්වයෙන් සැලකීමයි. "Standardization" කියන එකෙන් - ප්‍රමිතිකරණයෙන්- එදා උතුරේ යුද ගින්නක් ඇවිලෙව්වා. ඇයි? ඒ, සමානත්වයෙන් තොරව සැලකීම නිසායි. සමානත්වය කියන පදනම හැම තැනම තිබෙන්නට ඕනෑ; ක්‍රියාත්මක වෙන්නටත් ඕනෑ. කිසිම ආකාරයකට සැකමුසුව, ජන වාර්ගික වෛරය ඇති වන කතන්දරවලට ගොදුරු නොවෙන්නට අපි බලන්න ඕනෑ.

මේ අවස්ථාවේ හානියට පත් වුණු සියලුම ජන වර්ගයන්ට අයත් ඒ සහෝදරවරුන්ගේ පවුල්වලට අපගේ කනගාටුව පළකරන අතර, හැකිතරම් ඉක්මනින් ඔවුන්ගේ හානි පූරණය කර දෙන්නට ඕනෑ. මේ මිථ්‍යාවන්ගෙන් මිදිලා, මෙවැනි විනාශයකට මේ රට ගොදුරු වෙන්නට ඉඩ නොහරින්නට අප තුළ තිබෙන අධිෂ්ඨානය මොළවා ගන්නට මේ රටේ ඉන්න සියලුම බුද්ධිමත්, හේතුවාදී ජනතාවට හැකිවේවා යි පතමින් මගේ කථාව අවසන් කරනවා.

[පි.ප. 4.34]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்றும் நேற்று முன்தினமும் கண்டிப் பகுதியில் இடம்பெற்ற வன்முறைச் சம்பவங்கள், மீண்டும் இந்த நாடு கொடிய இனவாதச் சேற்றுக்குள் புதைக்கப்பட்டு, நிம்மதியற்ற, சமாதானம் சீர்குலைக்கப்பட்ட, அச்சம் சூழ்ந்த ஒரு சூழலுக்குள் எமது மக்களைத் தள்ளிவிடுமோ என்ற அச்சத்தை ஏற்படுத்தியுள்ளது. ஒரு சாரதி சில இளைஞர்களால் தாக்கப்பட்டு உயிரிழந்த சம்பவமானது தனிப்பட்ட நபர்களுக்கிடையே முறுகல் நிலைமையை உருவாக்கியது. இது ஒரு சட்டபூர்வமான தண்டனைக்குரிய குற்றவியல் குற்றமாகும். இத்தாக்குதலை நடத்திய சில இளைஞர்கள் கைது செய்யப்பட்டு, விளக்கமறியலில் வைக்கப்பட்டுள்ளனர். இப்படியான விரும்பத்தகாத முறைமீறல் சம்பவங்கள் என்பன இடம்பெறுகின்ற சம்பவங்கள்தான். இருந்தபோதிலும் தனிப்பட்ட நபர்களுக்கிடையிலான மோதல்கள்

ஏன், கொலைகள் தொடர்பாகக்கூட நடவடிக்கை எடுப்பதற்காகவே பொலிஸ் திணைக்களம், நீதிமன்றம், சிறைச் சாலை என்பன உள்ளன. ஆனால், இப்படியான சம்பவங்களுக்கு இனவாதம் பூசப்பட்டு, தனிப்பட்ட நபர்களுக்கிடையேயான பிரச்சினைகளை இனங்களுக் கிடையேயான மோதல்களாக மாற்றி, ஒரு பிரதேசத்தையே வன்முறைகளுக்குள் தள்ளுவது எவ்விதத்திலும் அனுமதிக்கப் படக்கூடியதல்ல. இது நாட்டின் ஒட்டுமொத்த அமைதியையும் குலைக்கும் ஒரு பயங்கரவாத நடவடிக்கை என்றே நாம் கருதுகிறோம்.

கண்டிப் பகுதியில் சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் நீண்டகாலமாகவே ஒற்றுமையாகவும் ஒருவருக்கொருவர் நல்லுறவைப் பேணியும் வாழ்ந்து வருகின்றனர். இந்நிலையில் கண்டி மாவட்டத்தையே கலங்க வைக்கும் இன மோதல்கள் கட்டவிழ்த்துவிடப்படுகின்றன என்றால், அதற்குப் பின்னால் இனவாதக் கரங்கள் வலிமையுடன் செயற்பட்டுள்ளன என்பதை எம்மால் தெளிவாகவே புரிந்துகொள்ள முடியும். எனவே, இப்பிரச்சினையைப் பற்றியும் இதன் உண்மையான மூலம் தொடர்பிலும் இது பெருப்பிக்கப்பட்டு மோசமான வன்முறையாக மாற்றப்பட்டமையின் பின்னாலுள்ள சக்திகள் பற்றியும் நாம் தெளிவான ஒரு புரிதலுக்கு வரவேண்டியவர்களாக உள்ளோம். சாதாரணமாக வன்முறைகளில் முன்னின்று செயற்படும் ஏவல் பிசாசுகளைக் கைது செய்வதும் அவர்களுக்குத் தண்டனை அளிப்பதும் பிரச்சினைகளுக்குத் தீர்வாக அமையப்போவதில்லை. பிரச்சினையின் மூலவேர் கண்டுபிடிக்கப்பட்டு, அது அகழ்ந்தெடுக்கப்பட்டு அழிக்கப்படாவிட்டால், இத்தகைய துர்ப்பாக்கிய நிலைமைகள் மீண்டும் மீண்டும் முளைவிடும் என்பதில் எவ்வித சந்தேகத்துக்கும் இடமில்லை. அந்தச் செயற்பாட்டைச் சட்டத்தின் மூலமோ நீதிமன்றத்தின் மூலமோ நிறைவேற்றிவிட முடியாது. எனவே, அடிப்படையில் இவற்றுக்குப் பின்னால் நின்று செயற்படும் அரசியல் ஆதாயத்துக்காக இனவாதத் தீயை மூட்டிவிடும் தீயசக்திகள் இனங்காணப்பட வேண்டும். அவர்களைக் கட்டுப்படுத்தும் வகையில் துணிச்சலான நடவடிக்கைகளை எடுப்பதுடன், அவர்களை மக்கள் மத்தியில் அம்பலப்படுத்தும் முயற்சிகளும் வேகமாக எடுக்கப்பட வேண்டும்.

கடந்த அரசாங்கக் காலத்தில் தம்புள்ளையில் தொடங்கி பேருவளை - அளுத்கம வரை இவ்வாறான சம்பவங்கள் இடம்பெற்றன. அந்த வகையில் பள்ளிவாசல்கள் தாக்கப்படுவதும் முஸ்லிம்களின் புனித நூலான அல் - குர்ஆன் வீதியில் தூக்கி வீசப்படுவதும் முஸ்லிம்களின் வர்த்தக நிலையங்கள் மற்றும் குடியிருப்புக்கள் தாக்கி அழிக்கப்படுவதும் தொடர்ந்தும் இடம்பெற்றுவந்தன. இப்படியான முறைமீறல்களுக்கு எதிராகக் காத்திரமான எந்த நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. இவற்றின் உச்சக்கட்டமாக பேருவளை - அளுத்கமவில் உயிரிழப்புக்கள் உட்படப் பேரழிவுகள் ஏற்பட்டன. இவற்றின் பின்னால் "பொதுபலசேனா" என்ற இனவாத அமைப்பு நின்று செயற்பட்டு, வன்முறைகளை அரங்கேற்றியது என்பது தெரிந்திருந்தும் அவ்வமைப்பின் முக்கியஸ்தர்கள் சட்டத்தின் முன் நிறுத்தப்படவில்லை. அந்த வகையில் முஸ்லிம் அரசியல் தலைமைகளின் கொதிப்பும் குமுறல்களும் மதிக்கப்படாமலே புறமொதுக்கப்பட்டன. ஆகவே, பொதுபலசேனாவின் பின்னணியில் கடந்த அரசாங்கத்தின் சில வலிமை வாய்ந்த நபர்கள் இருந்துள்ளனர் என்பதை எவரும் மறந்துவிட முடியாது.

இலங்கையின் இன்றைய சிங்கள அரசியலில் இனவாதம் என்பது, சில தரப்பினரால் வலிமை மிக்க அரசியல் ஆயுதமாகப் பயன்படுத்தப்பட்டு வருகிறது என்பதை முஸ்லிம் அரசியல் தலைமைகள் புரிந்துகொள்ள வேண்டும். தமிழ் பேசும் மக்கள் என்ற முறையிலும் இலங்கையின் சிறுபான்மை இனங்கள் என்ற முறையிலும் தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் ஒன்றிணைந்து செயற்பட வேண்டும் என்பதில் அவர்கள் உறுதியான நிலைப்பாட்டை எடுக்க வேண்டும். இது சிங்கள இனவாதச் சக்திகள் சிறுபான்மை இனங்களுக்கு எதிராக மேற்கொண்டுவரும் ஒடுக்குமுறை நடவடிக்கைகளிலிருந்து அந்த மக்களைப் பாதுகாக்க தவிர்க்க முடியாத ஒரு தேவையாகவுள்ளது. இன்று சில முஸ்லிம் தலைவர்கள் வடக்கு, கிழக்கு இணைப்புக்கு எதிராகக் குரல் கொடுத்து வருகின்றனர். வடக்கு, கிழக்கு இணைப்பு என்பது, முஸ்லிம் மக்களையும் தமிழ் மக்களையும் ஒன்றிணைத்துப் பலமான சக்தியாக உருவாக்கிவிடும் என்ற காரணத்தால், இனவாத சக்திகள் அதைக் கடுமையாக எதிர்த்தன. அதேவேளையில் வடக்கு, கிழக்கு இணைப்பை எதிர்க்கும் முஸ்லிம் தலைமைகள் சிங்கள இனவாதிகளின் அபிலாசைகளுக்கு ஏற்பச் செயற்படுகின்றன என்பதைப் புரிந்துகொண்டு அந்த மாயையிலிருந்து விடுபடவேண்டும் என்று உரிமையுடன் கேட்டுக்கொள்கின்றேன்.

நாம் இனவாதச் சக்திகளைத் திருப்திப்படுத்துவதன்மூலம் எமக்கான உரிமைகளைப் பெறமுடியும் என நினைப்பது எவ்வளவு முட்டாள்தனம் என்பதை அண்மையில் ஜிந்தோட்டை, அம்பாறை, கண்டி போன்ற இடங்களில் இடம்பெற்ற வன்முறைகள் உணர்த்தி நிற்கின்றன. எனவே, அம்பாறை, கண்டி ஆகிய மாவட்டங்களில் இடம்பெற்ற சம்பவங்கள் தொடர்பாக உண்மைக் குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டுச் சட்டத்தின் முன் நிறுத்தப்பட வேண்டும் என்பதையும் அவர்களின் பின்னால் நின்று அவர்களை இயக்கிய இனவாதச் சக்திகள் மக்கள் முன் அம்பலப்படுத்தப்பட்டு, அவர்களின் நடவடிக்கைகள் கட்டுக்குள் கொண்டுவரப்பட வேண்டும் என்பதையும் நான் இந்த உயரிய சபையில் வலியுறுத்த விரும்புகின்றேன். அதேவேளையில் முஸ்லிம்களுக்கு எதிரான அநீதிகளைக் கண்டித்துத் தமிழ் மக்களும் தமிழ் மக்களுக்கு எதிரான அநீதிகளைக் கண்டித்து முஸ்லிம் மக்களும் தமிழ் பேசும் மக்கள் என்ற முறையிலும் ஒடுக்கப்படும் சிறுபான்மை இனங்கள் என்ற வகையிலும் குரல் கொடுக்க வேண்டுமென்று இத்தருணத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

2015ஆம் ஆண்டு ஆட்சி மாற்றம் ஏற்பட்டபின்பு ஒரு நல்ல சூழ்நிலை உருவாகும் என்றே எதிர்பார்க்கப்பட்டது. அவ்வகையிலேயே முஸ்லிம் மக்களும் தமிழ் மக்களும் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் பதவிக்கு வருவதற்கும் இன்றைய அரசாங்கம் ஆட்சிக்கு வரவும் பேராதரவு வழங்கினர். ஆனால், அதன் பிறகு சில காலம் இனவாத வன்முறைகள் இடம்பெறாதபோதிலும் அண்மைக் காலங்களில் அவை முளைவிட ஆரம்பித்துள்ளன. காலி ஜிந்தோட்டையில் முஸ்லிம்களுக்கு எதிராக வன்முறைகள் கட்டவிழ்த்து விடப்பட்டபோதிலும் அவை ஆபத்தான கட்டத்தை எட்டாத அளவுக்குக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவரப்பட்டன. ஆனால், அம்பாறையில் திட்டமிட்ட வகையில், முஸ்லிம் உணவகங்களில் உள்ள உணவுகளில் கர்ப்பத்தடை மருந்து சேர்க்கப்படுகின்றது என்ற பொய்ப் பரப்புரைமூலம் பல கடைகள் அடித்து நொருக்கப்பட்டதுடன் பள்ளிவாசலும் சேதமாக்கப்பட்டது. அதன் மதில் உடைக்கப் பட்டதுடன் அங்கிருந்த வாகனங்களும் தீக்கிரையாக்கப்பட்டன. இது தொடர்பாக உரிய நடவடிக்கைகள் எடுக்கப்படும் என்ற மக்களின் எதிர்பார்ப்புக்கு மாறாக, கைது செய்யப்பட்ட ஒரு சிலரும் பிணையில் விடுவிக்கப்பட்டனர். அதுமட்டுமின்றி இரவு 10.30க்குத் தொடங்கப்பட்ட கலவரங்கள் அதிகாலை ஒருமணி வரை தொடர்ந்தபோதிலும் அவ்விடத்துக்குப் பொலிசார் வரவில்லை. இப்படியான அலட்சியமான நடவடிக்கைகள் இனவாதச் சக்திகளுக்கு அச்சமின்றி வன்முறைகளைத் தொடர்வதற்கான துணிச்சலைக் கொடுக்கும் என்பதில் சந்தேகமில்லை.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே! உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Sir, please give me one more minute.

එනවේ, අම්පාරෙ විවකාරත්තිල් උරිය නදවදික්කෙ එදුක්කත් තවරියමෙයාලේයේ කණ්ඩි වන්මුරෙකළ් පිරමාණ්ඩමාන අළවිල් වෙදික්කක්කූදිය වාය්ප්පෙ උරුවාක්කියතෙන්පතෙ නාම් නම්පුකිරෝම්. අතුමට්ටුමින්රි, ඉනවාතච් චක්තිකළුක්කු එතිරාක ජනාතිපතියුම් චරි, පිරමරුම් චරි ඒන්, ඉරුක්කමාන නදවදික්කෙකළෙ එදුක්කත් තයංකුකින්රාර්කළ් එන්පතෙ එම්මාල් පුරින්තුකොළ්ළ මුදියවිල්ලෙ. I think the Adjournment Motion we are debating today is shameful. අතාවතු, නාංකළ් ඉන්රු විවාතිත්තුක් කොණ්ඩිරුක්කින්ර විදයම් වෙට්කප්පදක්කූදියතු එන්පතෙ ඉන්ත ඉදත්තිල් චොල්ලි, එනතු උරෙයෙ මුදිත්තුක්කොළ්ළ විරුම්පුකින්රේන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
නන්ත්‍රි! අදුත්තු කෙළරව මුජිපුර් රහූමාන් අවර්කළ්!

[අ.භා. 4.41]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹூமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ ඇති වෙලා තිබෙන මේ අර්බුදකාරී වාතාවරණය පිළිබඳව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ගෙන එන ලද කල් තැබීමේ යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අහිංසක තරුණයාගේ මරණය ඉස්සරහට දාගෙන, ඒ හරහා මුළු රටටම ජාතිවාදී, ආගම්වාදී විෂබීජ පතුරුවා ගෙන මේ කරන විනාශය දිහා අපි බලාගෙන ඉන්නවා. කුමාරසිංහ සහෝදරයාගේ වියෝව පිළිබඳව අපේ ශෝකය ඒ පවුල්වලට ප්‍රකාශ කරන අතරම ඒ ඝාතනයට සම්බන්ධ වෙච්ච පිරිස්වලට තරාතිරම නොබලා අනිවාර්යයෙන්ම දඬුවම් කළ යුතුයි කියන අදහසේ මම ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2009දී මේ රටේ යුද්ධය අවසාන කරලා අලුත් රටක් බලාපොරොත්තුවෙන් එදා අපි කාලය ගත කළා. ඒ කුරිරු යුද්ධය හරහා මේ රටේ සමාජය ජාතිවාදී, ආගම්වාදී කොටස්වලින් භේදභින්න වෙලා, අපි එකිනෙකා අතර සැකය, වෛරය, ක්‍රෝධය පතුරුවාගෙන ජීවත් වුණා. යුද්ධය අවසාන වුණාට පස්සේ අපට අලුත් බලාපොරොත්තු ඇති වුණා. නමුත් ඒ අලුත් බලාපොරොත්තු සියලු දේවල් එක සැණින්ම විනාශයට පත් වුණා.

එදා යුද්ධය අවසාන වුණාට පස්සේ මේ රටේ ඇති කරන්න තිබුණු, අපි බලාපොරොත්තු වෙච්ච වෙනස, සංහිඳියාව, සමඟිය, අලුත් රටක් හදන්න ඕනෑය කියන ඒ පණිවුඩය එදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවට දීගන්න බැරි වුණා. ඒ වෙනුවට මේ රටේ නොයෙකුත් ජාතිවාදී, ආගම්වාදී සංවිධානවලට දේශපාලන වුවමනාවන් ඉෂ්ට කර ගන්න ඒ වාගේම ඒ සංවිධානවලට වැඩ කරන්න පුළුවන් වාතාවරණය හදලා දුන්නා. එදා ඒ ආණ්ඩුවේ හිටපු ඉහළ නායකයන්ගේ, ආරක්ෂක ලේකම්තුමාගේ පූර්ණ සහයෝගය, පූර්ණ ආශීර්වාදය උඩ ඔවුන් මේ රටේ නීතිය අතට අරගෙන මේ රටේ සුළු ජන කොටස් බය කරන්න කටයුතු කළා. තැන් තැන්වලට ගිහිල්ලා කඩ ගිනි තැබූ, ඒ කඩ වර්ජනය කරන්න කියලා කිව්ව, පොලිස් නිලධාරීන් බලාගෙන ඉන්න කොට මේ රටේ නීතිය ඒ අයගේ අතට අරගෙන එහෙම ක්‍රියා කරපු කාලයක් තිබුණා. ඒ කාලයේ එහෙම ක්‍රියාත්මක වෙනකොට මට මතකයි, එදා අපේ විපක්ෂ නායකතුමා හැටියට හිටපු වර්තමාන අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා. එදා රාජපක්ෂ ජනාධිපතිතුමාට කිව්වා, "මේ දේ කරන්න දෙන්න එපා. මේක ඉතාම භයංකාරයි. මෙහෙම සෙල්ලම් කරන්න දෙන්න එපා" කියලා. නමුත් එදා හිටපු ආණ්ඩුව ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ. ඒක නවත්වන්න උත්සාහ කළේ නැහැ. අන්තිමට ඒක ගිහිල්ලා බේරුවල දර්ගා නරගයෙන් කෙළවර වුණා අපට මතකයි. එදා මහා විනාශයක් සිද්ධ වුණා.

ඒ විනාශයත් එක්ක අපි 2015දී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලයට පත් කරන්න කාරණා කිහිපයක් ගැන කථා කළා. අපි කථා කළා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන. අපි කථා කළා, මේ රටේ ඒකාධිපති ව්‍යවස්ථාව අයින් කරන්න ඕනෑ, ජනාධිපති ක්‍රමය අයින් කරන්න ඕනෑය කියලා. ඊළඟට අපි කථා කළා, මේ රටට අලුත් මැතිවරණ ක්‍රමයක් ගෙනෙන්න ඕනෑය කියලා. ඊළඟට මේ රටේ වංචා දූෂණ නවත්වන්න ඕනෑ, ඒ වංචා දූෂණවලට සම්බන්ධ වෙච්ච පිරිස්වලට දඬුවම් දෙන්න ඕනෑය කියන එක අපි කථා කළා. මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රකරණය එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංවිධාන කරන්න ඕනෑය කියලා අපි කථා කළා. ඒ සියලු දේවල් කථා කරන ගමන් අපි වැදගත් දෙයක් ඒ මැතිවරණ වේදිකාවල කථා කළා. ඒ වැදගත් දේ තමයි, මේ රටේ සංහිඳියාව, මේ රටේ ජාතික සමඟිය, මේ රටේ ජාතීන් අතර විශ්වාසය ඇති කරන්න ඕනෑය කියන එක. ජාතීන් අතර වෛරය ඇති කරන පිරිස්වලට දඬුවම් දෙන්න ඕනෑ, පසු ගිය කාලයේ මේවා ඇති කරන්න ඉඩ දුන්නා, අපි මේවා නවත්වන්න ඕනෑ, අලුත් සමාජයක් හදන්න ඕනෑය කියන අලුත් බලාපොරොත්තුවක් අපි මේ සමාජය තුළ එදා ඇති කළා.

2015දී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දීපු උදවිය නොයෙකුත් බලාපොරොත්තු ඇතුව ඡන්දය දුන්නා. සමහර උදවිය ඡන්දය දුන්නා, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න. සමහර උදවිය ඡන්දය දුන්නා, මේ රටේ මාධ්‍ය නිදහස ඇති කරන්න. සමහර උදවිය ඡන්දය දුන්නා, මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය නැති කරන්න. ඒ වාගේම මේ රටේ උතුරු - නැගෙනහිර දෙමළ කථා කරන ජනතාව ඔවුන්ගේ ප්‍රශ්න විසඳාගෙන ඔවුන්ට, මේ රටේ නිදහසේ ජීවත් වෙන්න අවශ්‍ය ඒ පරිසරය හදාගන්න ඕනෑය කියලා ඡන්දය දුන්නා.

එදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩු කාලයේ ඇති කරපු ඒ භීතිය, ඒ දේපොළ විනාශය, ඒ සියලු දේවල් දැකලා, අපට මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පරිසරය හදන්න කියලා දකුණේ ජීවත් වන, මේ රටේම ජීවත් වන මුස්ලිම් ජනතාව හැටියට අපි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද හුඟක් අයට ඒක අමතක වෙලා තිබෙනවා. අද හුඟක් අය භීතාගෙන ඉන්නවා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය දුන්නේ හොරු අල්ලන්න කියලා. හොරු අල්ලන්න කියන එක, ඒ මාතෘකාව, ඒ සටන් පාඨය, ඒ වේදිකාවේ තිබුණු එක මාතෘකාවක් විතරයි. අපේ ආගම අදහාගෙන, අපේ සංස්කෘතිය රැකගෙන, අනෙකුත් ජන කොටස් එක්ක මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් පරිසරය හදලා දෙන්න කියලා තමයි අපි සියලුදෙනාම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය දීලා ඉල්ලා සිටියේ; ඒකට තමයි අපි ඡන්දය දුන්නේ. අපි වෙන වෙන දේවල්වලට ඡන්දය දුන්නේ නැහැ. නමුත්, මේ රටේ ජන කොටස් එක එක ක්‍රියා මාර්ග උඩ ඡන්දය දීලා තිබෙනවා. පිරිසක් හොරු අල්ලන්න ඡන්දය දීලා තිබෙනවා, පිරිසක් පවුල්වාදය අවසන් කරන්න ඡන්දය දීලා තිබෙනවා, පිරිසක් ජනාධිපති ක්‍රමය නැති කරන්න ඡන්දය දීලා තිබෙනවා, පිරිසක් මේ රටේ ඒකාධිපතිවාදය අවසන් කරන්න

ඡන්දය දීලා තිබෙනවා. නමුත් මේ රටේ සුළු ජන කොටස්වල බලාපොරොත්තුව තිබුණේ ඒ එකක්වත් නොවෙයි. මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් පරිසරය නිර්මාණය කරන්න සහ අපේ හිත්වල තිබෙන ඒ බිය නැති කරන්නයි අපි ඡන්දය දුන්නේ. ඒක වෙනුවෙන් තමයි මේ රටේ දෙමළ කථා කරන සුළු ජන කොටස් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015දී අපි මේ ආණ්ඩුව හැදුවේ විශාල බලාපොරොත්තු එක්කයි. නමුත්, අවුරුදු දෙකහමාරක් වෙන කොට ඒ බලාපොරොත්තු අපේ හිත්වලින් අද කඩා වැටිලා තිබෙනවා. එහෙම වුණේ, ඊයේ-පෙරේදා වෙච්ච සිද්ධිය නිසා විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ -2015 ඉඳලා- සිද්ධීන් 200ක් විතර වෙලා තිබෙනවා. අපි දැක්කා ගිංතොට වෙච්ච සිද්ධිය. මෑතකදී අපි දැක්කා අම්පාරේ වෙච්ච සිද්ධිය.

ඊළඟට අපි ඊයේ පෙරේදා දැක්කා, මහනුවර දිස්ත්‍රික්කයේ දිගන ඇති වූ සිද්ධිය. ඊළඟට කුරුණෑගල, කෑගල්ල වාගේ දිස්ත්‍රික්කවල, මහියංගනය ප්‍රදේශයේ නොයෙකුත් සිද්ධි ඇති වුණා. ඒ එක සිද්ධියක්වත් පාලනය කරගන්න අපට බැරි වුණා. ඒ එක් වූදිතයෙක්වත් අත් අඩංගුවට අරගෙන නීතිය ඉදිරියට ගෙනැල්ලා දඬුවම් දෙන්න අපට බැරි වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්න ඕනෑ මේ අවුරුදු දෙකහමාර තුළ තැනින් තැන සංවිධානාත්මකව ඇති වුණු කරන ලද සිද්ධි හරහා වෛරය, ක්‍රෝධය ඇති කරන ප්‍රකාශ හැම තැනම ප්‍රසිද්ධියේ පළ වුණා. ඒවා සමාජ ජාලවල - social media - පළ වුණා. සමාජ මාධ්‍ය තුළ පළ වුණා. අපි ඒ ගැන පැමිණිලි කළා. මම පෞද්ගලිකව පොලිස් මූලස්ථානයට ගිහිල්ලා පැමිණිලි 4ක්, 5ක් කරලා තිබෙනවා. අද ඒවාට මොනවා වුණාද කියලා දන්නේ නැහැ; ඒවා විභාග වෙනවාද කියලා දන්නේ නැහැ. අපි දීපු කට උත්තරවලට, අපි ඉදිරිපත් කළ පැමිණිලිවලට මොනවාද කළේ කියලා අපි දන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මෙතැනදී කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. කණ්ඩායම් රැස්වීම්වලදී මම ජනාධිපතිතුමාට කිහිප වතාවක්ම නැඟිටලා කිව්වා, "ජනාධිපතිතුමනි, දැන් තත්ත්වය බරපතළයි. දැන් නැවත ජාතිවාදය, ආගම්වාදය හිස ඔසවාගෙන එනවා. ඒක නවත්වන්න තමුන්නාන්සේ මැදිහත් වෙන්න" කියලා මම කිහිප වතාවක්ම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටියා. අපේ කණ්ඩායම් රැස්වීම්වලදී මම නැඟිටලා ඒ පිළිබඳව විග්‍රහ කළා. නමුත් කියන්න කනගාටුයි, රජයක් හැටියට ඒක නවත්වන්න අපි අපොහොසත් වෙලා තිබෙනවා. අපි ඒ වරද පිළිගන්න ඕනෑ. අපට ඡන්දය දීපු ජනතාව ආරක්ෂා කරන්න අද අපට බැරිවෙලා තිබෙනවා. ජනතාව අප ගැන තැබූ විශ්වාසය අපි කඩා බිඳ දමා තිබෙනවා. මේ රටේ ජනතාවගේ විශ්වාසය අපි කොහොමද නැවත ගොඩනහන්නේ? ඔවුන් ආරක්ෂා කරගන්න අපට බැරිවෙලා තිබෙනවා. මම ඊයේ මහනුවර දිස්ත්‍රික්කයේ දිගන ප්‍රදේශයට ගියා. මමයි, සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමායි, ආශු මාරසිංහ මන්ත්‍රීතුමායි, අබ්දුල් හලීම් ඇමතිතුමාත් එක්ක ඒ ජනතාව බලන්න ගියාම ඔවුන්ගේ අදෝනාව අපි දැක්කා; ඔවුන්ගේ බිය අපි දැක්කා. ඔවුන්ගේ සිත් තුළ ඇති කර තිබෙන භය, ඒ භීතිය අපි දැක්කා. නමුත්, ඔවුන් වෙනුවෙන් අපි මොකක්ද ලබා දෙන්නේ? ආණ්ඩුවේ මන්ත්‍රීවරු හැටියට ඔවුන්ට ලබාදෙන්න පුළුවන් වගකීම මොකක්ද? අපට ඔවුන් වෙනුවෙන් කියන්න පුළුවන් දේවල් මොනවාද? අද ඔවුන්ගේ කඩවල්, ඔවුන්ගේ නිවාස, ඔවුන්ගේ වාහන 160කට වඩා වැඩි ප්‍රමාණයක් විනාශ කරලා තිබෙනවා. ඒ එකක්වත් විනාශ කළේ මහ රෑ ඇවිල්ලා නොවෙයි. ඒ එකක්වත් කඩලා දැම්මේ මහ රෑ ඇවිල්ලා නොවෙයි; පාන්දර ඇවිල්ලා නොවෙයි. මහ දවල් 2ට, 3ට පොලු අරගෙන පාර දිගේ මැරයන් ඇවිල්ලා, කඩවල් ඉලක්ක කරලා පහර දීලා තමයි මෙම විනාශය කළේ. සමහර තැන්වල පොලීසිය බලාගෙන සිටියා, සමහර තැන්වල STF එක බලාගෙන සිටියා. සමහර තැන්වලදී ඔවුන්ට කරගන්න දෙයක් නැතුව නිහඬව බලාගෙන සිටියා. මේ කොල්ලකාරී, උමතු ජාතිවාදීන්ගේ හැසිරීම මෙල්ල කරගන්න බැරිව ඔවුන් අසරණ වෙලා සිටියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රට යන්නේ කොහේටද? මේ විධියට මේ රටට ඉස්සරහට යන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි යන්නේ අලුත් රටක් හදන්න, අපි යන්නේ අලුත් ගමනක්, අපි යන්නේ ශ්‍රී ලාංකිකයන් හැටියට ජීවත් වෙන්න පුළුවන් රටක් හදන අලුත් ගමනක්, ජාතිවාදයෙන්, ආගම්වාදයෙන් තුරන් වුණු රටක් හදන්න කියලා අපි මැතිවරණ වේදිකාවල බෙරිහන් දුන්නා. අපි කියපු හැම එකක්ම අද බොරු වෙලා තිබෙනවා. අපි කියපු දේවල් හැම එකක්ම අද ජනතාව ඉදිරියේ "ගහට කැපූ ඉනි වාගේ" නිෂ්ඵල වෙලා තිබෙනවා. ඇයි ඒ? අපට ජාතිවාදීන් මෙල්ල කරන්න බැරි වුණා. අපි ජාතිවාදීන් මෙල්ල කළේ නැහැ. යම් සිදුවීම් ඇස් පනා පිට සිදු වෙද්දී, අපි ඒ සඳහා ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. ඒවාට විරුද්ධව අපි කථා කළේ නැහැ. ඒවා නවත්වන්න අපි උත්සාහ කළේ නැහැ. අපි දන්නවා, මේ ඔක්කෝම දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව සිදු වන වැඩ බව. ඒ ගැන අපට කිසිම වාදයක් නැහැ, විවාදයක් නැහැ. ඒ සියලු දේවල් අපි පිළිගන්නවා. මේ සිද්ධි පිටුපස දේශපාලන නායකයෝ ඉන්නවා. මේ පිටුපස වෙනම දේශපාලන ක්‍රියාමාර්ග තිබෙනවා. මේ රටේ සිංහල-මුස්ලිම් කෝලාහලයක් ඇති කරලා, වෛරය ඇති කරලා ඒ මඟින් සන්තෝෂ වන පිරිසක් ඉන්නවා. ඒ හරහා තමන්ගේ දේශපාලන බලය ආරක්ෂා කරගන්නා පිරිසක් මේ රටේ ඉන්නවාය කියන එකත් අපි දන්නවා. නමුත්, අද අපට ඒක කියන්න බැහැ. මොකද, අපි ඒකට ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. ඒ නිසා ආණ්ඩුවක් හැටියට අද අපි අසමත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ තිබූ පැමිණිලි අනුව ක්‍රියාත්මක වෙනවා වෙනුවට, ඒ කණ්ඩායම්වලට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නවා වෙනුවට අපි මොකක්ද කළේ? ඒ කණ්ඩායම්වලට බේරිලා යන්න පුළුවන් දේවල් අපි කළා. සමහර තැන්වල "බී වාර්තා" අපි වෙනස් කළා. සමහර තැන්වලදී අපි නීතිය ලිහිල් කළා. සමහර තැන්වලදී දකින දේවල් අපි නොදැක්කා වගේ සිටියා. අන්න ඒ වාගේ ක්‍රියාමාර්ග තමයි අපි පසු ගිය කාලයේ ගත්තේ.

ඔවුන් අත් අඩංගුවට ගන්නවා වෙනුවට, ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට, ඔවුන් සමාජය ඉදිරියට ගෙනැල්ලා ඔවුන්ගේ ජාතිවාදී හෙළුව පෙන්වන්නේ නැතිව ඔවුන් ආරක්ෂා කරන ක්‍රියාදාමයක් තුළ අපි පසුගිය කාලයේ වැඩ කළා. ඔවුන්ට නීතියෙන් රිංගලා යන්න පුළුවන් දේවල් අපි කළා. ඒ හන්දා තමයි අද අපට මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න වුණේ. එදා අපි ආණ්ඩුව ගත්ත දවසේ ඉඳන් අද වෙනකම් අපි හරියට නීතිය ක්‍රියාත්මක කරලා තිබුණා නම්, අපි ජාතිවාදයට, ආගම්වාදයට ඉඩ නොදී හිටියා නම් අද අපට මේ සිදුවීම් නවත්වාගන්න තිබුණා. අපි හරියට නීතිය ක්‍රියාත්මක කරලා තිබුණා නම්, අද අපි නුවර, දිගන ගැන කථා කරන එක, ගිංතොට ගැන කථා කරන එක, ජාතිවාදය අවුස්සන නොයෙකුත් දේවල් ගැන කථා කරන එක අපට නවත්වා ගන්න තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා අද අපේ අසමත්වීමක් තිබෙනවා. එදා ගිංතොට නගරයේ වෙච්ච සිදුවීමත්, පසුගිය දිනවල නුවර වෙච්ච සිදුවීමත් ඉතා පැහැදිලිව කුමන්ත්‍රණකාරී විධියට සිද්ධ වුණාය කියන එක අපි සියලුදෙනාම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

පිළිගන්නවා. නුවර තරුණයාගේ මරණය සිද්ධ වෙච්ච තැන ඉඳන් දිගන නගරයට කිලෝමීටර් 25ක, 27ක ඈත තිබෙන ප්‍රදේශයකට සංවිධානාත්මකව පහරදීම ඉතාම බේදජනකයි. ඒ තුළ පොලීසියේ කාර්යභාරය, බුද්ධි අංශයේ කාර්යභාරය, පොලීසිය බාරව හිටපු එතුමන්ලාගේ කාර්යභාරය, ඒ ප්‍රදේශය බාරව හිටපු DIG මහත්වරුන්ගේ කාර්යභාරය ගැන අපට අද ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අද ඒ ගොල්ලන් ඒකට වගකියන්න ඕනෑ.

ඊළඟට, අම්පාරේ වෙච්ච සිදුවීම බලන්න. හෝටලයක කෑම සම්බන්ධයෙන් වෙච්ච සිදුවීමක් අන්තිමට කෙළවර වුණේ මුස්ලිම් දේවස්ථානයකට පහරදීලා. ඒ පහරදීපු දේවස්ථානය ඒ කෑම කඩයට කිලෝමීටරයක් වාගේ ඈත දුරින් තිබෙන්නේ. එහෙම නම් ඇයි මේ වාගේ දේවල් වෙනකම් පොලීසිය ක්‍රියාත්මක නොවුණේ? පොලීසිය ඇයි බලාගෙන හිටියේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ නීතියක් තිබෙන බවත් මම කියන්න ඕනෑ. යම් තැනෙක අපරාධයක් සිද්ධ වෙනවා නම්, යම් කෙනෙක් යම් දෙයක් නීති විරෝධී සිද්ධ කරනවා නම් එවැනි තැනකදී පොලීසිය ක්ෂණිකව ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේ වෙලාවකදී පොලීසිය බලාගෙන ඉන්නේ නැහැ. ඒකට ජනාධිපතිතුමා කථා කරන්න ඕනෑ නැහැ. ඒකට අගමැතිතුමා කථා කරන්න ඕනෑ නැහැ. ඒකට පොලීසිය බාරව ඉන්න ඇමතිතුමා කථා කරන්න ඕනෑ නැහැ. යම් අපරාධයක් ක්‍රියාත්මක වෙනවා නම් පොලීසිය වහාම ඒ අපරාධය නවත්වන්න ක්‍රියා මාර්ග ගන්නවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ කොළඹ නගරවල SAITM ප්‍රශ්නය මුල් කරගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය වටලනකොට, අගමැති කාර්යාලය වටලනකොට, ජනාධිපති කාර්යාලය වටලනකොට පොලීසිය අවම බලය යොදලා, අඩුම ගණනේ කඳුළු ගෑස් ගහලා හරි ඒවා විසුරුවා හරින ආකාරය අපි දැක්කා. නමුත්, අම්පාරේදී කඳුළු ගෑස් ගැහුවේ නැහැ. දිගනදී කඳුළු ගෑස් ගැහුවේ නැහැ. ඇයි ඒ? මුස්ලිම් ජනතාවට ප්‍රශ්නයක් වුණාම, මුස්ලිම් කඩවලට ගහන්න ගත්තාම, මුස්ලිම් දේවස්ථානවලට ගහන්න ගත්තාම එවැනි තැනකදී පොලීසියට ක්‍රියාත්මක වෙන්න ජනාධිපතිතුමා කියන්න ඕනෑ; අගමැතිතුමා කියන්න ඕනෑ; පොලීසිය බාරව ඉන්න ඇමතිතුමා කියන්න ඕනෑ. එහෙම කිව්වාම තමයි පොලීසිය ක්‍රියාත්මක වෙන්නේ. නමුත් අපරාධ සිද්ධ වෙනකොට, අනෙකුත් නීති විරෝධී දේවල් සිද්ධ වෙනකොට ඒවාට ක්‍රියාත්මක වෙන්න කියලා පොලීසියට කවුරුවත් කියන්න ඕනෑ නැහැ. එවැනි තැන්වලදී පොලීසිය සැනෙකින් ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මට මේ ගැනත් කියන්න දෙන්න. දැන් අපි ඉතිහාසය ගැන කථා කරනවා. අනාගතය ගැන අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? අපට අනාගතය ගැන වැඩ පිළිවෙළක් තිබෙනවා ද? අනාගතයේදී මේ සිදුවීම් නවත්වාගන්න වැඩ පිළිවෙළක් අපට තිබෙනවා ද? මට නම් එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. මට එක දෙයක් පෙනෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනාගතය අඳුරුයි. අපේ ඇස්පනාපිට ඒක පෙනෙනවා. අපි ඒක කියන්න ඕනෑ. දහසකුත් බලාපොරොත්තු එක්ක තමයි මේ රජය අපි ගොඩ නැඟුවේ. දහසක් අධිෂ්ඨානත් එක්ක තමයි යහ පාලන ආණ්ඩුව අපි ගොඩ නැඟුවේ. ඒ යහ පාලන ආණ්ඩුව ගොඩ නඟන්න අපි එදා ජීවිත පූජාවෙන් වැඩ කළා. එදා රාජපක්ෂ රෙජීමයේ තිබුණු තර්ජනවලට මුහුණදීලා, නොයෙකුත් ආකාරයේ ගර්ජනවලට මුහුණදීලා, නොයෙකුත් ආකාරයේ ජීවිත තර්ජනවලට මුහුණදීලා මේ පාලනය ගොඩ නඟන්න අපි අවංකව කැප වෙලා වැඩ කළා. නමුත්, ඒ ගොඩ නඟපු පාලනය අද අඳුරක් වෙලා තිබෙන බව අපට පෙනෙනවා. අපට යන දිසාවක් පෙනෙන්නේ නැහැ. අපට යන මාවතක් පෙනෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටක් හැටියට, මේ රටේ ජීවත් වන ජනතාව හැටියට අපි සියලුදෙනාටම වගකීමක් තිබෙනවා. නැවත මේ රට ගෝත්‍රවාදයට ඇදගෙන යන්න දෙන්න එපා. නැවත මේ රට මිලේච්ඡත්වයට ඇදගෙන යන්න දෙන්න එපා. නැවත මේ රට යුද්ධයකට ඇදගෙන යන්න දෙන්න එපා. අපි බොහොම අමාරුවෙන් ගොඩ නඟන මේ රටේ ගැටුම් ඇති කරන සුළු පිරිසක් ඉන්නවා. අපේ රට මිලේච්ඡත්වයට ගෙන යන ඒ සුළු පිරිසට, ජාතිවාදයට ගෙන යන ඒ සුළු පිරිසට, අප අගාධයකට ගෙන යන ඒ සුළු පිරිසට එරෙහිව වහාම අපි ක්‍රියාත්මක වුණේ නැත්නම්, වහාම අපි ක්‍රියා මාර්ග ගන්නේ නැත්නම්, වහාම ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ දරුවන්ටයි, අපේ දරුවන්ටයි මේ රටේ ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් තියෙයි කියලා මට විශ්වාස කරන්න අමාරුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 4.58]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய ஒத்திவைப்பு வேளை விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் முன்வைக்க விரும்புகின்றேன். மிகவும் வெட்கப்படக்கூடிய, வேதனைப்படக்கூடிய விடயம் சம்பந்தப் பட்ட ஒரு கருப்பொருள் தொடர்பில் இன்று நாங்கள் பேசிக்கொண்டிருக்கின்றோம். சரித்திரபூர்வமாகப் பார்க்கின் றபோது, இந்த நாட்டில் 1915ஆம் ஆண்டில் கம்பளை என்னும் இடத்தில் முஸ்லிம்களுக்கு எதிரான இனக்கலவரமொன்று அப்போதிருந்த பெரும்பான்மை இனத்தவர்களால் உருவாக் கப்பட்டது. அதற்கு அடுத்ததாக 1958ஆம் ஆண்டுக் காலப்பகுதியில் தமிழர்களுக்கு எதிராகப் பெரும்பான்மை இனத்தவர்களால் இனக்கலவரமொன்று உருவாக்கப்பட்டது. இப்படி 1960களில், 1977களில், 1983களில் என்று தொடர்ச்சியாக இனக்கலவரங்கள் ஏற்பட்டு வந்தன. இப்போது நாங்கள் நல்லாட்சியென்று தலைப்பிட்ட அரசாங்கத்தின் பதவிக்காலத் தில்கூட முஸ்லிம்களுக்கு - ஒரு சிறுபான்மை இனத்துக்கு எதிரான வன்முறை உருவாக்கப்பட்டிருக்கின்றது. இன்று நாங்கள் 20ஆம் நூற்றாண்டைக் கடந்து 21ஆம் நூற்றாண்டில் வாழ்ந்துகொண்டிருக்கின்றோம். இந்த நூற்றாண்டுகளில் தொடர்ச்சியாக ஏற்பட்டுவந்த இன வன்முறைகளை அல்லது ஒடுக்குமுறைகளை அரசாங்கத்தினால் முழுமையாகக் கட்டுப் படுத்த முடியவில்லையா? என்ற கேள்வி எழுகின்றது.

ஒரு நாடு கட்டியெழுப்பப்பட வேண்டுமாக இருந்தால், அங்கு சமத்துவம், சகோதரத்துவம் கட்டியெழுப்பப்பட வேண்டும் என்பது எங்களுக்குத் தெரியும். மாறாக, இனத்துவம், இனத்துவேஷம் உருவாக்கப்படுமாக இருந்தால், அந்த நாட்டில் நிரந்தரமான அமைதியையோ, நிரந்தர அபிவிருத்தியையோ காண முடியாது. சிங்கப்பூர் பிரதமர் லீ குவான் யூ அவர்கள் தன்னுடைய நாட்டைக் கட்டியெழுப்புகின்றபோது - அபிவிருத்தி செய்கின்றபோது

முதலில் அந்த நாட்டிலுள்ள பல்லின மக்கள் மத்தியில், "நாங்கள் எல்லோரும் சிங்கப்பூர் பிரஜைகள்" என்று சொல்லக்கூடிய விதத்தில் ஓர் அசைக்க முடியாத இன ஐக்கியத்தைக் கட்டியெழுப்பினார். முதலில் அந்த இன ஐக்கியத்தை உருவாக்கிய பின்னர்தான் அவர் தனது நாட்டை அபிவிருத்தி செய்ய முற்பட்டார். ஆனால், துரதிருஷ்டவசமாக எமது நாடு இனங்களுக்கிடையில் ஐக்கியத்தை ஏற்படுத்துகின்ற விடயத்தில் இன்னமும் பின்னுக்கே நிற்கின்றது. அந்த விடயத்தில் ஒரு முற்போக்கான கொள்கையைக் கடைப்பிடித்திருந்தால், எமது நாட்டில் இவ்வாறான துரதிருஷ்டவசமான சம்பவங்கள் நிகழ்ந்திருக்க மாட்டாது.

அம்பாறையில் ஓர் உணவகத்தில் இடம்பெற்ற சம்பவத்தை அடிப்படையாகக்கொண்டு, அப்பிரதேசத்திலுள்ள ஏனைய இரண்டு உணவகங்களும் தாக்கப்பட்டுச் சின்னாபின்னமாக்கப்பட்டதோடு அவற்றுக்குப் பக்கத்திலிருந்த பள்ளிவாசலும் தாக்கப்பட்டுச் சின்னாபின்னமாக்கப்பட்டது. இப்போது கண்டி மாவட்டத்திலே திகன, தெல்தெனிய போன்ற இடங்களில் இந்த மிலேச்சத்தனமான செயற்பாடுகள் அரங்கேற்றப்பட்டுக் கொண்டிருக்கின்றன. அங்கு அப்பாவி இளைஞனான குமாரசிங்க என்ற சிங்களக் குடிமகன் கொலைசெய்யப்பட்டிருக்கின்றார். அதையடுத்து, அப்துல் பாஸித் என்ற முஸ்லிம் குடிமகன் கொல்லப்பட்டிருக்கின்றார். இரண்டு பேரும் இனத்தால் வேறுபட்டிருந்தாலும் மொத்தத்தில் அவர்கள் இருவரும் இலங்கைக் குடியரசின் குடிமக்கள் என்பதை நாங்கள் மறந்துவிடக்கூடாது. இந்த வன்முறையினால் சம்பந்தப் பட்டவர்கள் வெற்றியைப் பெற்றுவிட்டார்கள் என்று மார்தட்டிச் சொல்ல முடியாது.

தற்போது ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் பேரவைக் கூட்டத்தொடர் ஜெனீவாவில் நடைபெற்றுக் கொண்டிருக்கின்ற நிலையில் இப்படியான ஒரு துர்ப்பாக்கியமான, வெட்கப்படக்கூடிய ஒரு செயற்பாடு இடம்பெற்றிருக்கின்றது. இன்று மியன்மாரில் நடக்கின்ற சம்பவத்தையிட்டு உலகம் அந்த நாட்டை அருவருப்பாகப் பார்த்துக்கொண்டிருக்கின்றது. அந்த வரிசையில் இலங்கையும் இடம்பெற்றுவிடப் போகின்றதோ என்று சந்தேகிக்க வேண்டிய ஒரு சூழ்நிலை இன்று ஏற்பட்டிருக்கின்றது. ஒவ்வோர் இன வன்முறை இடம்பெறுகின்றபோதும் இதுதான் கடைசி நிகழ்வாக இருக்க வேண்டும்; இதற்குப் பிறகு இப்படியான ஒரு துர்ப்பாக்கியமான - துரதிருஷ்டவசமான நிலை ஏற்படக் கூடாது என்று நாங்கள் கூறிக்கொண்டிருக்கின்றோம். ஆனால், இன வன்மங்கள் - இன வன்முறைகள் தொடர்ந்தேர்ச்சியாக நடந்துகொண்டிருக்கின்றன.

இன்று மட்டக்களப்பிலே இருக்கின்ற ஒரு மதகுரு அங்கு அவரது துவேஷத்தனமான நடவடிக்கைகளால் பலவிதமான பிரச்சினைகளை உருவாக்கியிருந்தார். அதே மதகுருவின் முகம் தெல்தெனிய சம்பவத்திலும் பளிச்சிட்டுத் தெரிவதைப் பத்திரிகைகளில் காணக்கூடியதாக இருக்கிறது. அந்தவகையில், இந்த நாட்டில் குற்றவாளிகள் முறையாகத் தண்டிக்கப்படாதவரை, அவர்களின் வாரிசுகளும் தொடர்ந்து அதனைச் செய்துகொண்டிருப்பார்கள் என்பதில் எந்தவிதமான சந்தேகமுமில்லை.

"வெள்ளம் வருவதற்கு முன்பு அணைகட்ட வேண்டும்" என்று சொல்வார்கள். ஆனால், இன்று வெள்ளம் வந்த பின்னர் அணைகட்டுகின்ற செயற்பாடுகளில்தான் அரசு ஈடுபடுகின்றது. நாங்கள் முற்போக்கான சிந்தனைகளைக் கொண்டிராதுவிட்டால் மீண்டும் மீண்டும் பிற்போக்குவாதம் என்கின்ற நரகத்திற்குள் வீழ்ந்துகொண்டுதான் இருப்போம். அதேநேரம், எமது நாட்டில் அபிவிருத்தியை ஏற்படுத்துவதும் நல்லாட்சியை ஏற்படுத்துவதும் கடினமான காரியமாக அமைந்துவிடும். எனவே, நல்லாட்சி பற்றிச் சிந்திக்கின்ற சிந்தனையாளர்கள் உண்மையில் கோட்பாட்டு ரீதியில் நல்லாட்சியைப் பற்றிச் சிந்திக்காமல், செயற்பாட்டு ரீதியில் சிந்திக்கின்ற நிலைமைக்கு வரவேண்டும். ஓர் இனத்தை அடிமைப்படுத்தியும் கட்டுப்படுத்தியும் அவர்களின் தலைகளில் குட்டிக்கொண்டும் சவாரி செய்துகொண்டும் ஆட்சி செய்யலாமென்று நினைப்பது தப்பான கணக்காகும். கடந்த காலத்திலும் பேரினவாதம் என்பது முழுவீச்சில் இருந்ததன் காரணத்தினால்தான் தமிழ்த் தீவிரவாதம் உருவாகியது. இந்த நாட்டில் தமிழ்த் தீவிரவாதம் 35 ஆண்டுகள் மிகவும் வன்மமான நிலையில் சென்றுகொண்டிருந்ததற்குக் காரணமாக இருந்ததும் இந்தப் பேரினவாதம்தான். இப்போது "தமிழ்த் தீவிரவாதத்தை அடக்கிவிட்டோம்" என்று மார்தட்டிக்கொண்டு இன்னுமொரு முஸ்லிம் தீவிரவாதத்தை உருவாக்குவதற்குச் சம்பந்தப்பட்டவர்கள் செயற்படுகின்றார்களோ என்று சந்தேகிக்க வேண்டியிருக்கின்றது.

"குட்டக்குட்டக் குனிந்துகொண்டிருப்பவனும் மடையன்; குனியக்குனியக் குட்டுகின்றவனும் மடையன்" என்று கூறுவார்கள். இனிமேலும் 'நல்லாட்சி' என்பதற்குச் சான்றிதழ் பெற வேண்டுமாக இருந்தால், தயவுசெய்து இப்படியான சின்னத்தனமான, பிற்போக்கான, வெட்கப்பட வேண்டிய, கேவலமான செயற்பாடுகளை அரசு கட்டுப்படுத்தி இந்த நாட்டுக்குப் பெருமை சேர்க்க வேண்டும். இந்த விடயத்தில், தாங்கள் சண்டியர்கள் என்று யாராவது மார்தட்டினால், அவர்கள் இந்த நாட்டுக்கு அவமானத்தை ஏற்படுத்துகின்றவர்களாகவே கருதப்படுவார்கள். இனியும் இந்த நாட்டில் இந்தக் கொடுஞ்செயல்கள், கெட்ட செயல்கள், கேவலமான செயல்கள் நடந்தேறக்கூடாது. அதேநேரம், இன்று நாட்டில் இருக்கின்ற சிறுபான்மை மக்கள் இந்தக் கொடுமையான செயற்பாடுகள் பற்றி உணர்ந்து, தெளிந்து, தாம் ஐக்கியப்பட்டுச் செயற்பட வேண்டும் என்பதனை இந்த நிகழ்வுகள் மூலமாக வெளிக்கொணர்வார்கள் என்பதையும் இங்கு கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Ameer Ali Shihabdeen. Before that, will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair.

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)

I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[பி.ப. 5.05]

ගරු අමීර් අලි ෂිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கிராமிய பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற ஓர் அசாதாரண சூழ்நிலை பற்றிப் பேசுவதற்காக இன்று நாங்கள் கூடியிருக்கின்றோம். கடந்த காலத்திலே தம்புள்ளையிலும் அளுத்கமவிலும் தெஹிவளையிலும் கிராண்ட்பாஸ் பள்ளிவாசலிலும் இடம்பெற்ற அசம்பாவிதங்களைப் பற்றிப் பேசப்பட்டது. அதன் காரணமாக இந்த நாட்டிலே இருக்கின்ற சிறுபான்மைச் சமூகம் அப்போதைய ஆட்சித் தலைவராக இருந்த மஹிந்த ராஜபக்ஷ அவர்களை ஆட்சியிலிருந்து தூக்கியெறிந்தது. 'நல்லாட்சி' என்ற ஒரு சொற்பதத்தோடு மாத்திரம் இந்த அரசாங்கத்தை வழிநடத்திக் கொண்டிருக்கின்ற தலைவர்கள் இந்தப் பேச்சைத் தெளிவாக விளங்கிக்கொள்ள வேண்டுமென்று நான் எதிர்பார்க்கின்றேன். ஆனால், இப்பொழுதும் அதே பிரச்சினைகள் எழுந்துகொண்டுதான் இருக்கின்றன. மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்திலே சிறுபான்மைச் சமூகத்தினர் விசேடமாக தமிழ் சமூகத்தினரும் முஸ்லிம் சமூகத்தினரும் எதைப் பிழையென்று சொன்னார்களோ, அதே பிழை இடம்பெறுவதற்கு இந்த நல்லாட்சியிலும் இருக்கின்றவர்கள் அல்லது அதனோடு தொடர்புடையவர்கள் உரமூட்டிக் கொண்டிருக்கின்றார்கள் என்ற விடயத்தை நான் இங்கு பலமாகச் சொல்லியாக வேண்டும்.

இம்முறை அம்பாறையிலே பிரச்சினை ஆரம்பித்தது. அங்குள்ள ஒரு முஸ்லிம் ஹோட்டலிலே அதிகமாக வியாபாரம் நடக்கின்றது என்ற காரணத்தினால் அந்த ஹோட்டலை இல்லாமற்செய்ய வேண்டுமென்று அந்தப் பிரதேசத்திலே இருக்கின்ற பௌத்த பேரினவாதிகளும் அவர்களோடு தொடர்புடையவர்களும் எடுத்த முனைப்பினால்தான் அம்பாறையிலே இருந்த 2 - 3 ஹோட்டல்களையும் அவற்றுக்கு அண்மையிலிருந்த பள்ளிவாசலையும் உடைத்தார்கள். அந்த ஹோட்டலில் இருந்தவர்கள் பிழையாக நடந்திருந்தால் அந்த ஹோட்டலை உடைத்திருக்கலாம்; அதன் உரிமையாளர் பிழை செய்திருந்தால் அவரைத் தாக்கியிருக்கலாம்! அதேநேரம், அம்பாறை நகரத்திலே இருந்த அந்தப் பள்ளிவாசல் இந்த நாட்டிலிருக்கின்ற பௌத்த மத நிறுவனங்களுக்கோ, பௌத்த தலைவர்களுக்கோ எந்தத் தவறையும் செய்யவில்லை; தவறு செய்யுமாறு எவருக்கும் போதிக்கவுமில்லை. ஆனால், அந்தப் பள்ளிவாசல் தாக்கப்பட்டிருக்கின்றது. இன்று நாங்கள் கண்டி, தெல்தெனியவில் இடம்பெற்ற சம்பவங்களைப் பற்றி விவாதித்துக்கொண்டிருக்கின்றோம். தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் பேசுவதுபோன்று கவலையான, வெட்கப்படவேண்டிய ஒரு தலைப்பின்கீழ் இன்று நாங்கள் பேசிக்கொண்டிருக்கின்றோம். ஆனால், இந்த நாட்டை எதிர்காலத்திலே எப்படிக் கட்டியெழுப்புவது, இந்த நாட்டிலே சமானத்தையும் இறுதித் தீர்வையும் எப்படி எட்டுவது போன்ற விடயங்கள்தான் இங்கே பேசப்பட வேண்டியவைகளாகும். ஆனால், இன்று மீண்டும் பூச்சிய நிலை ஏற்பட்டுவிட்டதோ என்று எண்ணத் தோன்றுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசேடமாக கண்டி, தெல்தெனிய, திகன பிரதேசத்திலே எற்பட்டிருக்கின்ற அசாதாரண சூழ்நிலையினால் இந்த நாட்டிலே இருக்கின்ற முஸ்லிம்கள் மிகவும் விரக்தியடைந்த நிலையில் இருந்துகொண்டிருக்கின்றார்கள். இந்த நிலைமையைச் சீர்செய்ய எந்தப் பங்களிப்பைச் செய்வதற்கும் எந்தத் தியாகத்தைச் செய்வதற்கும் தாங்கள் தயாராக இருக்கின்ற செய்தியையும் அவர்கள் சொல்லிக்கொண்டுதான் இருக்கின்றார்கள். இது இலங்கையின் ஒவ்வொரு மூலையிலும் வாழ்ந்துகொண்டிருக்கின்ற முஸ்லிம் மக்களுடைய - இளைஞர்களுடைய குரலாக இருந்து கொண்டிருக்கின்றது.

As has been mentioned already Sir, this issue of enforced disappearances, of persons suddenly disappearing in this country has existed for a long, long time. We are aware that during the JVP insurrection in the '70s and the late '80s this happened and several tens of thousands of youth disappeared. As a matter of fact, Hon. Mahinda Rajapaksa, who was then an Opposition Member of Parliament, on behalf of those people even went to Geneva, to the UN, with documents to explain what was happening to the international community in regard to the people in this country. So, this is a matter Sir, which has been going on for a long time and we had a war for several decades. It came to an end in 2009. Both during the war and after the war came to an end, there has been a very widespread complaint by people in this country, particularly from the North and the East, that a large number of citizens who are Tamils have disappeared. You are aware, Sir, that over the past several years, these people who are the next of kin of the disappeared persons have been demonstrating and demanding that they be made aware of what happened to their next of kin, many of whom were surrendered by them to the authorities, whether it be the police or the army, and I think it is a very legitimate demand which must be addressed. Today, the Sri Lankan Government is moving to enact a law to bring into operation the international convention pertaining to enforced disappearances and prescribing several offences that have been committed and can be committed in the future under that law.

There are a few points I want to make in regard to the overall situation relating to this matter. There seems to be an impression sought to be created by some people in this country that the international community is interfering somewhat unnecessarily in the affairs of this country and that that is not acceptable, that this must be terminated and that such action on the part of the international community impinges on the sovereignty of this country. We all want the sovereignty of our country protected. There can be no question about that. When you talk in terms of sovereignty, it has certain definitions. It does not mean the freedom of the wild ass, that in the name of sovereignty you can do whatever you like, violate all international conventions, violate international treaties, violate commitments made by you to the international community and say that we are sovereign, we can do what we like and nobody else can talk about what we do. That is not acceptable, Sir. That is not in keeping either with domestic or international law and is something which is outrageous in my respectful submission. Even beyond that, an effort is sometimes made to make out that the international community is supportive of the LTTE and is against the Sri Lankan Armed forces.

I think nothing had been further from the truth, Sir. We all know that the LTTE was engaged in a war. They had reasons good or bad or both good and bad for the commencement of the war. They fought the war for a long period of time, for over 30 years. They gave the Sri Lankan State a real run, there is no question about that. Eventually, they were defeated.

But what must be remembered is that the international community, particularly countries like India, completely backed the Sri Lankan State in regard to the conduct of the war against the LTTE. The LTTE was banned in all those countries. The LTTE's efforts to muster support for the war in that country in various ways was hindered, impeded and prevented. Many countries gave you vital intelligence in regard to various activities of the LTTE, particularly the movement of arms. You worked in close collaboration with countries like India, which supported you completely to eradicate the LTTE because you made out that the LTTE was a hindrance to a political resolution and that is why the LTTE was eliminated. You stated that there would be a resolution politically and those countries supported you in the belief that you will keep your commitment. But the fact of the matter is that, up to date, though nine years have lapsed since the end of the war, and though it is almost two-and-a-half years since the present Government came into power, we have not yet - though we do concede that there have been some movements towards the political resolution - been able to achieve a political resolution of the conflict. Despite the commitments made by the previous Government to the international community, particularly to India, to Secretary-General to the UN and the commitment made by even the present Government to the international

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

community, there has been no final resolution, a political resolution of the conflict yet. You must not forget, Sir, that you were able to win the war primarily because of the support you received from the international community. That cannot be denied.

I wish to make this point, Sir, because the misperception and misrepresentation that the international community is seeking to punish Sri Lanka because Sri Lanka defeated the LTTE must not prevail in this country and if that impression continues to prevail in this country that would not be helpful towards movement in the right direction and towards bringing about a political resolution of the conflict.

Having said that, I want to make a few comments in regard to the Hon. Minister's speech. I am sorry I was not here during the whole of the Hon. Minister's speech, I came only towards the very end of it. But I heard that the Hon. Minister very clearly stated that this law would apply only to the future and not in regard to what happened in the past. I do not know why that should be so, Sir. Nobody is targeting anyone in particular. The Sri Lankan security forces fought the war on behalf of the Sri Lankan Government. They were engaged in a war in keeping with the policy of the Sri Lankan Government to eradicate the LTTE. They were carrying out the directions of the Government. I do not think they committed any offence whatever in their war against the LTTE. But beyond that if the members of the security forces have been guilty of excesses against unarmed civilians, even against unarmed combatants, if they had disappeared after they surrendered to the Sri Lankan security forces, I do not think that can be put on the same basis as the Sri Lankan forces being engaged legitimately in the conduct of a war as per the policy decisions of the State. There must be a distinction drawn between the actions of the Sri Lankan security forces in pursuance of the policy enunciated by the Government, in pursuance of the decision made by the State and excesses committed by them against unarmed civilians or even unarmed combatants. What this law seeks to deal with is the responsibility of the State which cannot be denied. The law seeks to deal with such actions, not actions pertaining to the war in which the forces were engaged in accordance with the policy of the Government, if they went beyond that and they took into custody unarmed civilians, took into custody unarmed combatants or such persons surrendered to them and if they have been done away with, if they were females if they have been raped and killed that must be dealt with. There should be no question about that and such crimes must be prosecuted. If we do not prosecute those crimes, is it your position that you are not prosecuting such crimes for the reason that such crimes were committed either explicitly or impliedly with your sanction. If you are not prepared to prosecute them it would mean that you sanctioned or approved either implicitly or explicitly the commission of such crimes by such people. I do not think that is acceptable. There must be a clear distinction drawn between the conduct of the war by the security forces in keeping with the policy of the State and the excesses committed by the security forces pertaining to unarmed Tamil civilians and unarmed combatants.

Therefore, Sir, I think, while on the whole, the law fills a vacuum that has existed in our legal system for quite some time, the Government must ensure that the law is applied in such a way that the victims of such actions on the part of whomever are satisfied, that the laws of this country are applicable to what happened to their next of kin and that those persons are dealt with.

I would with those submissions, Sir, conclude my speech, but I do think that it is a duty of the Government to rethink this whole question of this law being made applicable only to the future and not to the past. Sri Lanka is facing enough problems on the international front on the question of violations of human rights laws, international humanitarian laws, accountability, truth and justice and I do not think that we should be seemed to be dodging or not facing up to situations that we have to face up to. I think, Sir, the Government should rethink its decision in regard to this matter.

Thank you.

[பி.ப. 3.05]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Sports)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, கடந்த யுத்த காலத்தில் வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள் பற்றிய பிரச்சினைக்கு இந்த நாடு இன்னமும் ஒரு தீர்வுக்கு வராத சூழலில், மீண்டும் நாட்டின் பல்வேறு பாகங்களிலும் இனச் சுத்திகரிப்புச் செயற்பாடு - நான் பேசிக் கொண்டிருக்கின்ற இச்சந்தர்ப்பத்தில்கூட - இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்தபின்பு இந்த விடயம் சம்பந்தமாக எடுத்துக் கூறப்பட்டது. அதாவது, இந்த நாட்டில் சிறுபான்மைத் தமிழ், முஸ்லிம் மக்களுக்கு எதிராகச் செயற்படுகின்ற இனவாதக் குழுக்களைக் கட்டுப்படுத்துவதற்குப் புதிய சட்டங்களைக் கொண்டுவர வேண்டும் என்று இந்த நாட்டின் சிறுபான்மைக் கட்சிகள் அதேபோன்று பெரும்பான்மைத் தேசியக் கட்சிகளின் சில பிரதிநிதிகள் பலமுறை இந்த அரசிடம் கூறியிருக்கின்றார்கள். குறிப்பாக, மதங்களுக்கு எதிராகச் செயற்படுபவர்களுக்கும் மத ஸ்தலங்களைத் தாக்குகின்றவர்களுக்கும் கடும் தண்டனை அளிக்கின்ற வகையில் மதநிந்தனைச் சட்டத்தை அமுல்படுத்தியும் அதேபோன்று அவ்வாறான குழுக்களைக் கட்டுப்படுத்துகின்ற வகையில் புதிய சட்டங்களைக் கொண்டுவந்தும் நடவடிக்கை எடுக்க வேண்டும் என்று நாம் இந்தச் சபையில் பல்வேறு சந்தர்ப்பங்களிலும் கூறி வந்தோம். ஆனால், இந்த நாட்டின் அரசும் அதன் தலைமையும் இவ்விடயத்தில் கவனயீனமாக இருந்ததால், அன்று அம்பாறை

நகரின் பள்ளிவாசல் உட்பட, வியாபாரத் தலங்கள் அழிக்கப்பட்டன. அது சம்பந்தமாகப் பலமுறை நாங்கள் கூறியிருந்தும் அங்கிருந்த பொலிஸாரோ, பாதுகாப்புப் படையினரோ தகுந்த நேரத்தில் செயற்படவில்லை. அவர்கள் குறித்த செயற்பாடுகளைக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவர முயற்சிக்காமையால் அவர்களை மீறி அங்கு சில சம்பவங்கள் இடம்பெற்று அந்த மக்களுக்கு அநீதி இழைக்கப்பட்டுள்ளது.

இது சம்பந்தமாகப் பிரதமர் அவர்கள் தலையிட்டு அந்தப் பிரதேசத்திற்கு வந்து இந்தப் பிரச்சினைகளுக்கு ஒரு முழுமையான தீர்வை வழங்க வேண்டும் என்பதற்காகவும் எதிர்காலத்தில் ஏனைய இடங்களிலும் இத்தகைய வன்முறைச் சம்பவங்கள் இடம்பெறக்கூடாது என்பதற்காகவும் அங்கு வருமாறு நாங்கள் அவருக்கு அழைப்பு விடுத்தோம். அவர் கடந்த 3ஆந் திகதி வருவதாக இருந்தும் அம்பாறையிலிருந்த ஓர் அமைச்சர் அதற்குத் தடையை ஏற்படுத்தியிருந்தார். மீண்டும் வருமாறு நாங்கள் வலுக்கட்டாயப்படுத்தியதனால், எமது அழுத்தம் காரணமாக அவர் அங்கு வந்தார். ஆனால், பாதிக்கப்பட்ட அம்பாறைப் பிரதேசத்திலுள்ள பள்ளிவாசலைப் பார்வையிடுவதற்குக்கூடப் பிரதமருக்குத் தைரியமில்லாமல், துறைமுக அபிவிருத்தி என்ற போர்வையில் ஒலுவில் பிரதேசத்திற்கு வந்து எங்களுடைய முஸ்லிம் சமூகத்தின் பிரதிநிதிகளைச் சந்தித்தார். அப்பொழுது அந்த மாவட்டத்தின் பாராளுமன்றப் பிரதிநிதி என்ற அடிப்படையில், "இந்த அநீதியான செயற்பாடுகள் அம்பாறையுடன் முடிந்துவிட வேண்டும்" என்று நான் கூறினேன். அத்துடன், "உள்நாட்டுப் பாதுகாப்புக்குப் பொறுப்பான அமைச்சர் என்ற ரீதியில் நீங்கள் சரியான பாதுகாப்பு ஏற்பாடுகளைச் செய்து குறித்த செயற்பாடுகளைக் கட்டுப்பாட்டுக்குக் கொண்டுவாருங்கள்" என்று நாங்கள் அவரிடம் கூறியிருந்தோம். அதற்குப் பிரதமர் அவர்கள் செவிசாய்க்கவில்லை.

அடுத்த தினம் கண்டிப் பகுதியில் ஒரு சிங்கள இளைஞர் நாலு முஸ்லிம் இளைஞர்களால் கொல்லப்பட்டார். அந்த நாலு இளைஞர்களும் செய்த கொடூரத்தை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அந்தப் பெரும்பான்மையினச் சகோதரர் அநியாயமாகக் கொல்லப்பட்டிருப்பதை நியாயப்படுத்துவதற்கு எந்தக் கட்டத்திலும் நாங்கள் தயாரில்லை. ஆனால், அந்த விடயத்தை மையமாக வைத்து இனவாதக் குழுக்கள் கண்டி, திகன பிரதேசத்தில் குறித்த செயற்பாடுகளில் ஈடுபட்டுள்ளன. இப்பொழுதும் திகன பிரதேசத்தில் ஒரு பதற்றமான சூழ்நிலை நிலவுவதாக எனக்குத் தொலைபேசி அழைப்பு வந்திருக்கின்றது. அன்றிரவும் நேற்றும் நான் அந்தப் பிரதேசத்திற்குச் சென்றிருந்தேன். பள்ளிவாசல்கள் மற்றும் வீடுகள் அதேபோன்று வியாபார ஸ்தலங்கள் எல்லாம் அங்கு அழிக்கப்பட்டிருந்தன. ஒரு முஸ்லிம் இளைஞரும் படுகொலை செய்யப்பட்டிருந்தார். அங்கு பாதுகாப்பு ஏற்பாடுகள் சரிவரச் செய்யப்படாமையே இதற்கான காரணமாகும். நேற்றுக் காலை ஜனாதிபதி அவர்கள் அவசரகாலச் சட்டத்தைப் பிரகடனப்படுத்திய பின்புதான் இராணுவம் அதேபோன்று ஏனைய படைகளும் அங்கு வந்து முகாமிட்டு பாதுகாப்பு நடவடிக்கைகளில் ஈடுபட்டன. இருந்தாலும், அங்கு நேற்றிரவும் தாக்குதல் நடத்தப்பட்டுள்ளது. அது மட்டுமல்ல, நான் பேசிக் கொண்டிருக்கின்ற இவ்வேளையிலும்கூட கண்டி மாவட்டத்தின் பல இடங்களில் கொடூரத் தாக்குதல்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. பெண்கள் தங்களது உயிரைப் பாதுகாப்பதற்காகக் காடுகளுக்குள் ஓடிக் கொண்டிருக்கின்றார்கள். அங்கு சரியான பாதுகாப்பு முறைமை ஏற்படுத்தப்படவில்லை. அதற்கான முழுப் பொறுப்புக்களையும் இந்த அரசு ஏற்க வேண்டுமென்பதுதான் எமது சமூகத்தின் குற்றச்சாட்டாக இருக்கின்றது.

இன்று இந்த நாடு பெரும் படைகளை வைத்திருக்கின்ற போதிலும் அங்கு சரியான பாதுகாப்பு நடைமுறை ஏற்படுத்தப் படவில்லை. இராணுவம், கடற்படை, விமானப்படை, பொலிஸ் என்று படைகளை வைத்திருக்கின்ற அரசு, அந்த மாவட்டத்தின் குறித்த பிரதேசங்களில் முன்னெச்சரிக்கை யாகப் பாதுகாப்பு ஏற்பாடுகளைச் செய்வதற்கு ஏன் தயங்கியது? தங்களுக்கு எதிராகக் கொண்டு வரப்படவிருக் கின்ற நம்பிக்கையில்லாப் பிரேரணை அதேபோன்று மத்திய வங்கிமீதான குற்றச்சாட்டுக்களை வேறு திசைக்குத் திருப்புவதற்காகவா, இவ்வாறான இனக் கலவரங்கள் அரசுக்குத் தேவைப்படுகின்றது? என்று எமது முஸ்லிம் சமூகம் இன்று சந்தேகிக்கின்றது. ஆனால், இந்த நாடு பல யுத்த அனுபவங்களைக் கொண்டுள்ளது. நாட்டில் வன்முறை ஏற்படப் போகின்றது என்று முன்கூட்டியே அறிந்திருந்தால், அதற்கேற்பச் செயற்பட்டிருக்கலாம். அதாவது, கண்டி மாவட்டத்தில் எங்கெங்கு முஸ்லிம் மக்களுடைய பிரதேசங்கள், வணக்கஸ்தலங்கள் இருக்கின்றன என்பதை இன்றைய நவீன ஜீ.பீ.எஸ். வசதிகளுக்கேற்ப இலகுவாக அறிந்து ஓரிரு மணித்தியாலங்களுக்குள் அவ்விடங்களுக்கு ஆயிரக்கணக்கான படைவீரர்களை அனுப்பி அந்த இடங்களைப் பாதுகாக்கக்கூடிய வாய்ப்பு இந்த அரசுக்கு இருந்தது. ஆனால், அவர்கள் ஏன், இதைச் செய்யத் தவறினார்கள்? என்பதுதான் எங்களுடைய கேள்வியாக இருக்கின்றது.

இன்று நாங்கள் மிகுந்த வெட்கத்துடன் பேசுகின்றோம். இருந்தபோதிலும் இன்று நிலைமை கட்டுக்கடங்காமல் போய்க்கொண்டிருக்கின்றது. ஆனால், எப்பொழுதுமே முஸ்லிம் இளைஞர்கள் மற்றும் பொதுமக்கள் அஹிம்சையை விரும்புகிறவர்கள். நேற்றுக் கிழக்கு மாகாணத்தில் இடம்பெற்ற ஹர்த்தால் என்ற நடவடிக்கையைக் காட்டி, இப்பொழுது சம்பந்தப்பட்டவர்கள் கற்களைக் கைகளில் எடுத்திருக் கிறார்கள். மக்கள் இதனால் மிகுந்த பயத்தில் இருக்கின்றார்கள். நாளை அவை ஆயுதங்களாக மாறுகின்ற சூழ்நிலை ஏற்பட்டால், இந்த நாடு எங்கே போய் முடியுமென்பதுதான் எங்களுடைய கேள்வியாகும். நேற்று முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சபாபீடத்தின் மத்தியில் வந்து அமர்ந்து போராடியபொழுது அந்தச் செயற்பாடு இங்கு ஏளனமாகப் பார்க்கப்பட்டது. குறிப்பாக, ஆளுங்கட்சியில் இருக்கின்ற அமைச்சர்கள் பலர் பாதுகாப்பு ஏற்பாடுகள் சரி செய்யப்பட்டுவிட்டது - எல்லாம் முடிந்துவிட்டது என்ற வகையில் கூறினார்கள். ஆனால், நடந்தது என்ன? எங்களுடைய இந்தப் போராட்டம் நடந்த ஓரிரு மணித்தியாலங்களில் மீண்டும் தாக்குதல் தொடுக்கப் பட்டது. இந்தத் தாக்குதல் யாரால் மேற்கொள்ளப்படுகின்றது? குறித்த முஸ்லிம் இளைஞனுடைய ஜனாஸா அடக்கம் செய்யப்பட்டபோது அங்கு நானும் சென்றிருந்தேன். அங்கு அந்த ஜனாஸா அமைதியான முறையில் அடக்கம் செய்யப்பட்டது. ஆனால், அந்த உடல் அடக்கம் செய்யப்பட்டு ஓரிரு மணித்தியாலங்களில் மீண்டும் மெனிக்கின்ன பிரதேசத்திலுள்ள பள்ளிவாசல் தீக்கிரையாக்கப்பட்டது. அந்த வகையில் இன்று அக்குரணை, அம்பத்தன, கட்டுகஸ் தோட்டை என்று கண்டி மாவட்டத்தின் பல்வேறு பிரதேசங்கள் கட்டுக்கடங்காத வன்முறையினால் போர்க் களங்களாக மாறியிருக்கின்றன.

இவ்வாறான நிலைமைகளால் இந்த அரசாங்கத்தில் அங்கம் வகிக்கின்ற எங்களுக்கு வெட்கமாக இருக்கின்றது. அதாவது, இன்று எங்களுடைய சமூக இளைஞர்களே எங்களை நோக்கி, “உங்களுடைய அமைச்சுப் பதவிகளை இராஜினாமா செய்யுங்கள்! உங்களுக்கு வெட்கமில்லையா?" என்றெல்லாம்

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

කේට්කින්නාර්කළ්. ආකවේ, අරසියල් රීතියාක නාංකළ් නිර්වාණප්පටුත්තප්පට්ටුල්ලෝම්. "ආටෙකළින්නි නීංකළ් සෙල්ලුංකළ්" එන්රු අවර්කළ් එංකළිටම් සොල්කින්ර අළවුක්කු නිලෙමෙ මාරියිරුක්කින්රතු. එනවේතාන් අරසින් තලෙමෙයිල් ඉරුක්කින්ර මාණ්පුමිකු පිරතමර් අවර්කළුක්කු ඔරු විටයත්තෙච් සොල්ල විරුම්පුකින්රෝම්. අතාවතු, "නීංකළ් පෙරුම් අරසියල් නෙරුක්කටිකළෙච් සන්තිත්තුක් කොණ්ටිරුක්කිරීර්කළ්! ඔරු නම්පික්කෙයිල්ලාප් පිරේරණෙයෙ එතිර්නෝක්කියිරුක්කින්ර උංකළුක්කු ඉරුතියාක එච්චරික්කෙ සෙය්කින්රෝම්; ඉන්ත නාට්ටිලිරුක්කින්ර 21 මුස්ලිම් පාරාළුමන්ර උරුප්පිනර්කළුම් අන්තප් පිරේරණෙ වරුකින්ර පොළුතු උංකළුක්කු එතිරාක වාක්කළික්ක වේණ්ටිය ඔරු සූල්නිලෙ වරුම් එන්පතෙ නාංකළ් ඉන්ත ඉටත්තිල් කූරික්කොළ්ළ විරුම්පුකින්රෝම්; අන්ත නිලෙමෙ වරාමලිරුක්ක වේණ්ටුමෙන්රාල් ඉන්ත නාට්ටින් නාලාපුරමුම් ඉරුක්කින්ර මුස්ලිම් සමූකම් මර්රුම් සිරුපාන්මෙ යිනංකළෙච් පාතුකාප්පතර්කාක උංකළුතෙය පටෙකළින් අතියුච්ච පලත්තෙ නීංකළ් පයන්පටුත්ත වේණ්ටුම්; අතාවතු, පටෙකළුක්කුක් කටුමෙයාන අතිකාරංකළෙක් කොටුත්තු සිරුපාන්මෙච් සමූකංකළුක්කුප් පාතුකාප්පුක් කොටුංකළ්!" එන්රු කූරි, විටෙපෙරුකින්රේන්. නන්රි.

[අ.හා. 3.15]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ඉඩ ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අනුව මේ රටට ගෙන ආ යුතු නීති රීති මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර පවත්වනු ලබන මේ විවාදයේදී අපට පෙන්වා දීමට තිබෙන කරුණු කිහිපය දැක්වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මේ ජාත්‍යන්තර සම්මුතිය ලංකාවේ නීතියක් බවට පරිවර්තනය කිරීමේ පනත් කෙටුම්පත මේ ආකාරයට ගෙනෙන්නට පෙර මේ රටේ පුද්ගලයන්ව බලහත්කාරයෙන් අවතැන් කිරීම, අතුරුදහන් කිරීම, රැඳවීම, පුද්ගලයන්ට අවහිර කිරීම, පුද්ගලයන්ගේ නිදහසට බාධා කිරීම වාගේ නීති අපේ රටේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ තිබෙනවා. අද මේ ගෙනෙන පනත් කෙටුම්පතේ තිබෙන අලුත් දේවල් වන්නේ යම් කෙනෙකු අත් අඩංගුවට ගෙන රඳවා තබා ගනිමින් ඔහු අත් අඩංගුවට ගත් බව නොපිළිගැනීම, එහෙම නැත්නම් රහසිගතව අත් අඩංගුවේ රඳවා ගැනීම ආදියයි. මේ වාගේ තවත් අතිරේක කරුණු මේ සම්මුතිය හරහා ගෙන එන මේ පනත් කෙටුම්පතේ තිබෙනවා. මම නම් කල්පනා කරන්නේ මේ නීති, අණපනත්වල තිබෙන කරුණු පුළුවන් තරම් ඒකාබද්ධ විය යුතුයි කියලායි. මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලාත් තිබෙනවා, දණ්ඩ නීති සංග්‍රහයේ ඊට අදාළ වගන්ති. ඒ වගන්තිවලට තව තවත් අවශ්‍ය සංශෝධන එකතු වෙනවා නම් මම හිතන විධියට මේ අවශ්‍යතාව ඉටු වෙනවා. සම්මුතිය පනතක් බවට පරිවර්තනය කිරීමට අපට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් යම් බල කිරීමක් තිබෙනවා නම් ඒක වෙනම කාරණයක්. යම් සම්මුතියක් අත්සන් කළාම එය අත්සන් කළ රටවලට එය නීතියක් බවට පෙරළීමට බල කිරීමක් තිබෙනවා නම් එය වෙනම ප්‍රශ්නයක්. එසේ නැත්නම් මම කල්පනා කරන්නේ දැනට බොහෝ දුරට මේ කරුණු ඇතුළත්ව තිබෙන අපේ නීති රාමුවට, අතිරේකව අඩු පාඩුව තිබෙන දේවල් සංශෝධන ලෙස එකතු කරන්නට අපට බැරිද කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තිලක් මාරපන මැතිතුමා මූලාසනය දැරූ කාරක සභාවකදී තමයි අපි මේ කාරණය සාකච්ඡා කළේ. ඒ අවස්ථාවේදී අපි ප්‍රධාන වශයෙන් කරුණු දෙකකට යොමු වුණා. ඉන් එක කරුණක් තමයි මම මේ සඳහන් කළ කරුණ. ඒ වෙලාවේ අපට ඒකට පිළිතුරු ලැබුණා. ඒ ලැබුණු පිළිතුරුවල තිබුණේ මේවා වෙනම සම්මුතියක් ලෙස නීතිගත විය යුතු බවයි.

මම දන්නේ නැහැ, ඉන්දියාව හෝ දකුණු ආසියාතික රටවල් මේ සම්මුතියේ අත්සන්කරුවන් හැටියට ඉන්නවාද, ඉන්නවා නම් ඒ අය තමන්ගේ රටවල මේ සම්මුතියට අනුකූලව අණපනත් පැනවීමට ක්‍රියා කර තිබේද කියලා. ඒ තොරතුරු ලබා ගැනීමට මම උත්සාහ කළා. නමුත් මට ඒ තොරතුරු ලබා ගැනීමට බැරි වුණා. මම දන්නේ නැහැ අපට දැන් වන විට ඒ පිළිබඳව තොරතුරක් රජයේ පාර්ශ්වය වෙතින් දැන ගන්නට පුළුවන්ද කියලා. මේ පනත් කෙටුම්පතින් උදර්පනය කියන කාරණය නිශ්චිත කරලා නැහැ. විදේශිකයෙක් ලංකාවේදී අපරාධයක් කොට හෝ විදේශයකදී අපරාධයක් කොට ලංකාවේ සැඟවී ඉන්නවා නම්, නීතියෙන් පැන යමින්, බේරී යමින්, සැඟවෙමින් ඉන්නවා නම් - a fugitive- ඒ පුද්ගලයා සොයලා අදාළ වූ රටවලට උදර්පනය කිරීමේ නීතියක් තිබෙනවා. උදර්පන නීතියට අතිරේකව, උදර්පනය කිරීමේ ඉල්ලීමක් ලැබුණු විට, එම උදර්පනය සලකා බැලීමට ඇමතිවරයාට අයිතියක් තිබෙනවාය කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා.

මම එදා කාරක සභාවේදී පෙන්නුවා වාගේම අද පෙන්වා සිටින්නේත් මෙය ලංකාවේ පුරවැසියන්ට බලපාන්නේ නැති බවයි. එය අපි ඉතා පැහැදිලිව කිව යුතුයි. එසේ නොකියන තුරු එය එක්තරා විධියකට විවාදයට තුඩු දිය හැකි විවෘත ප්‍රශ්නයක් හැටියට ඉතිරි වෙන්න පුළුවන්.

මට අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා, "මෙය ලංකාවේ පුරවැසියන් කෙරෙහි බලපාන්නේ නැති බවට ආණ්ඩු පාර්ශ්වයෙන් දැන්වීමක් ලැබිලා තිබෙනවා." කියලා. එයට එකඟයි කියලා එහි සඳහනක් කරන්න මම කැමැතියි. මම හිතන්නේ එය එසේ වෙනවා නම් හොඳයි කියලායි. එතකොට අපට ඒ කාරණාව විවෘතව අවසන් කළ හැකි ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ වාගේම මේ සම්මුතියෙන් මතු වෙන නීතිය, ඒ අනුව කළ යුතු උදර්පනය, ඒ අනුව ඇති වන ඉල්ලීම් යන මේ සියල්ලම බලපාන්නේ ලංකාවේ පුරවැසියන් නොවන අයට බව අපට ප්‍රකාශ වීමට හැකි නම්, අපට මේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳන්න පුළුවන්.

උදර්පන නීතිය අංක 8 දරන උදර්පන පනත යටතේ 1977 වසරේ තමයි නීතිගත කරලා තිබෙන්නේ. එම නීතියේ සඳහන් කරුණු සියල්ල මේ පනත් කෙටුම්පත යටතේත් අදාළ වන අතර, එම උදර්පන නීතියට අලුත් ඡේදයක්, එහෙම නැත්නම් අලුත් උපඡේදයක් අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතට එකතු කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව එම සංශෝධනය උදර්පන නීතියට එකතු වෙනවා. අනෙක් ඒවා ගැනත් මම කිව්වේ ඒකම තමයි. උදර්පන නීතියට අලුත් ඡේදයක් එකතු වෙනවා වාගේම, අපේ රටේ හුඟ කලක සිට මිනිසුන්ව බලෙන් තියා ගන්න බැහැ, මිනිසුන්ව සඟවා ගන්න බැහැ, මිනිසුන්ව රඳවා ගන්න බැහැ කියන වටිනා නීති ටික තිබෙනවා. මේ නීතිවලට තවත් එකතු කළ යුතු දේවල් එකතු කළා නම්, මේ කාරණය මීට වඩා ලෙහෙසි වෙනවා කියලායි මම හිතන්නේ.

උදර්පනය කිරීමට හේතු වන කරුණු කියන එක ගැන සාකච්ඡා වුණා. මේ කමිටුවේදීත් සාකච්ඡා වුණා. යම් රටක් විසින්

උදර්පනය කිරීමට හේතු වන වැරැදි සිදු කරන ලද පුද්ගලයන්, එම අපරාධය සිදු කිරීමට යොදා ගත්තා වූ ස්ථානය ඒ රට නම්, තිබෙන්නා වූ ගිවිසුම් අනුව එම පුද්ගලයන් උදර්පනය කිරීමට එම රටට අයිතියක් තිබෙනවා. ගිවිසුම් තිබෙන රටවල් එක්ක විතරයි අපට මේ ගනුදෙනුව තිබෙන්නේ. නමුත් දැන් මේ නීතිය අනුව, මේ සම්මුතියට අත්සන් කරපු සියලු රටවලට සම්මුතික රටවල් හැටියට එම අයිතිය ලැබෙනවා. එහෙම අයිතිය ලැබෙනකොට ඒ අයට එම ඉල්ලීම කළ හැකි වන්නේ එම අපරාධය, වරද කරන ලද්දේ යම් රටක නම් ඒ රටේ කරන ලද එම අපරාධය පිළිබඳ එම රටට අදාළ පුද්ගලයා අවශ්‍ය වී තිබෙන බව පෙනී යනවා නම්, ඒ සඳහා අපේ රටට එම පුද්ගලයා සම්බන්ධයෙන් ඉල්ලීමක් කළොත් එම පුද්ගලයා උදර්පනය කිරීම සලකා බැලීමට අපේ අමාත්‍යවරයාට වගකීමක් තිබෙන බව තමයි මෙහි සඳහන් වන්නේ.

මේ කාරණාව සම්බන්ධයෙන් වූ සාකච්ඡාව අපට ඉතා නිරවුල්ව අවසන් කරන්න පුළුවන්. බලහත්කාරයෙන් රඳවා තබා ගැනීමේ වරද කවුරුත් පිළිගන්නා වරදක්. නමුත්, මේක වරදක් කියලා අපි කොපමණ පිළිගත්තත්, සමහර වෙලාවට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් බලහත්කාරයෙන් පුද්ගලයන් රඳවා ගෙන සිටින බව අප කවුරුත් දන්නවා. එසේ රඳවා ගෙන හිඳිමින් රඳවා ගෙන නැති බව ප්‍රකාශ කරනවා. මේ නීතියේ හැටියට දැන් ඒක ලොකු වරදක්. ඒක දීර්ඝ කාලීන සිර දඬුවමක් ලැබිය හැකි වරදක්. නමුත්, දැන් වුණත් කවුරු හෝ බලහත්කාරයෙන් රඳවා ගෙන සිටියොත්, නැත්නම් ඒ පුද්ගලයාට තමන්ගේ නිදහස අහිමි කරලා ඒ පුද්ගලයා යම් අත් අඩංගුවක තබා ගෙන ඔහු එසේ අත් අඩංගුවක සිටින බව ප්‍රකාශ නොකිරීම, නැත්නම් එසේ නොපිළිගැනීම අපේ රටේ දැනට තිබෙන නීතිය අනුවත් එක්තරා විධියක බරපතළ වරදක්. ඔය කියන abduction, wrongful confinement කියන්නා වූ වරදවල මූලික ස්වභාවය තමයි එක පැත්තකින් රඳවා ගෙන සිටීම. නමුත්, අනික් පැත්තෙන් රඳවා ගත් බව නොපිළිගෙන ඉන්නවා. මේක පොලීසියට ගහන්න බැහැයි කියනවා වාගේ නීතියක්. පොලීසියට ගහන්න පුළුවන් බලයක් නීතියෙන් නැහැ. නමුත්, පොලීසියට සාධාරණ බලයක් පාවිච්චි කළ හැකියි, යම් කිසි තත්ත්වයක් පාලනය කර ගන්න. ඒ වාගේ අවස්ථාවලදී තමයි නීතිය ක්‍රියාවට නැඟීමට යොමු වන අය නීතියේ මුවාවෙන් සැහවෙමින් එක්තරා විධියකට මේ නීතියේ නොකළ යුතු යැයි කියන දේ සිදු කරන ක්‍රම යොදා ගන්නේ.

එක කියමනක් මා ඊයේ දැක්කා. සත්‍යතාවේ හඬක්, සත්‍යතාවේ පෙනුමක් ඇති විධියේ වචනවලින් යම් අසත්‍යයන් ඉදිරිපත් කිරීමට සමහරුන්ට තිබෙන හැකියාව අපේ රටේ බරපතළ කාරණයක් වෙලා තිබෙනවා. ඒ නිසා මෙවැනි අවස්ථාවකත් මෙය නොකළ යුතුයි කියලා නීතියේ තිබුණාට මේවා යම් මුවාවකින් කළ හැකි විධියට ඉඩක් ලැබෙන තත්ත්වය වළක්වන්නත් අපි පියවර ගත යුතු බව කියමින් මා නිහඬවනවා. ස්තුතියි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද කියලා දැනගන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
විනාඩි 10යි.

[අ.භා. 3.26]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය බලගැන්වීම සඳහා අපේ රටේ නීතියක් සම්පාදනය කිරීම සම්බන්ධයෙනුයි අපි මේ විවාදය පවත්වාගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ නීති අපේ රටේ පාර්ලිමේන්තුවට සම්මත කරන්න සිදුවීම අහම්බෙන් වූ දෙයක් නොවෙයි. නිදහසින් පස්සේ සෑහෙන කාලයක් උතුරේත්, දකුණේත් අපි ඉතාම දරුණු ගණයේ සිවිල් යුද්ධවලට සමාජයක් හැටියට මුහුණ දුන්නා. අපි ඒවාට විවිධ නම් දීලා කැරැල්ල කිව්වත්, නැඟිටීම කිව්වත්, බෙදුම්වාදය කිව්වත්, අවසන් වශයෙන් ගත්තාට පස්සේ ඒවා අපට පොදුවේ හඳුන්වන්න පුළුවන්, 'සිවිල් යුද්ධ' කියලා. සිවිල් යුද්ධයක ස්වභාවය තමයි, සමස්ත සමාජයම සමස්ත සාපරාධීකරණයකට ලක් වීම. ඒක රජය වෙන්න පුළුවන්, ආරක්ෂක අංශ වෙන්න පුළුවන්, සටන් වදින්නන් වෙන්න පුළුවන්, අරගළ කරන්නන් වෙන්න පුළුවන්, ජනමාධ්‍ය වෙන්න පුළුවන්, රාජ්‍ය සේවය වෙන්න පුළුවන්, පොදු ජන සමාජය වෙන්න පුළුවන්. ඕනෑම සමාජයක් සමස්ත සාපරාධීකරණයකට ලක් වීමයි සිවිල් යුද්ධයකින් සිද්ධ වන්නේ. නමුත්, අපි සමාජයක් හැටියට දීර්ඝ කාලීනව පෙන්වා දුන්නේ මොකක්ද? ශිෂ්ට සම්පන්න දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් හැටියට ඒවා විසඳාගන්න අපි කල් ගන්නවා, නැත්නම් ඒවා අමතක කරනවා, අපි අසමත් වනවා කියන එකයි අපි පෙන්වා දුන්නේ. අපේ රට වාගේ රටවල ඇතිවන මේ ප්‍රශ්න ජාත්‍යන්තරකරණයට ලක් වුණේ ඒ නිසායි. ඒවා අපි කැමැති දේවල් නොවෙයි. නමුත්, ඒවා සිද්ධ වෙලා තිබෙන දේවල්.

ඒ යථාර්ථයට අපට මුහුණ දෙන්න සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා තමයි, මේ ප්‍රශ්න විසඳීමේදී ජාත්‍යන්තරය එක්කත් අපට වැඩ කරන්න සිද්ධවෙලා තිබෙන්නේ. නමුත් මගේ මූලික අදහස තමයි, ජාත්‍යන්තර සම්මුතියක් තිබුණත්, නැතත්; ජාත්‍යන්තරය එය අපෙන් ඉල්ලුවත්, නැතත් අපේ සමාජයට මෙවැනි යන්ත්‍රණයක්, මෙවැනි ක්‍රියාදාමයක් අද අත්‍යවශ්‍යවෙලා තිබෙනවාය කියන එක. අද අපි මේ කථා කරන්නේත් අපේ ලංකාවේ සමාජය එක්තරා ආකාරයකට බියෙන් සලිතවෙලා තිබෙන අවස්ථාවකයි; ඕනෑ නම් අනාගත සිවිල් යුද්ධයක බීජ අපට දකින්න පුළුවන් අවස්ථාවකයි. එම නිසා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි මේ දෙස ඉතාම වගකීමකින් යුක්තව බලන්න අවශ්‍යයි.

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා උදර්පන නීතිය සම්බන්ධයෙන් එක කාරණාවක් ඉදිරිපත් කළා. මා එතුමාට ඉතාම ගරු කරනවා. උදර්පන නීතිය සම්බන්ධයෙන් පැහැදිලිතාවක් ලැබෙන්න ඕනෑ. ලංකාවේ පුරවැසියන්ට බලනොපාන ආකාරයට මෙය සඳහන් වන්න ඕනෑය කියන ඒ යෝජනාව වැදගත් යෝජනාවක් හැටියට මම සලකනවා. මම හිතනවා, ඒ සම්බන්ධයෙන් රජය පැත්තෙන් ශුභවාදී ප්‍රතිචාරයක් දක්වයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන අවස්ථාවේදී ඉතාම වැරැදි අවබෝධයක් මේ රටේ සමාජගත කරන්න යම් යම් පිරිස් උත්සාහ ගත්තා. ඒක හරියට කොත්තු රොටියේ ගහපු වඳ පෙත්ත වාගෙයි. මේ පනත් කෙටුම්පත ගැන කිව්වේ මොකක්ද? මේ පනත් කෙටුම්පත, මේ රටේ පැවති යුද්ධයේදී ත්‍රස්තවාදය පරාජය කරන්න කටයුතු කළ

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

යුද හමුදාවල සේවය කළ ආරක්ෂක සෙබළුන් දං ගෙඩියට ගෙන යන්න සකස් කළ පනත් කෙටුම්පතක්ය කියලා මේ සම්බන්ධයෙන් ඉතාමත් නරක, වැරැදි චිත්‍රයක් සමාජගත කරන්න සමහර අය උත්සාහ ගත්තා.

විශේෂයෙන්ම මා මේ අවස්ථාවේ කියන්න කැමැතියි, එවැනි කුණු වූ අධ්‍යාත්මයන් ඇති පුද්ගලයන් අද ඇතිවෙලා තිබෙන තත්ත්වයන් සම්බන්ධයෙනුත් ඒ ආකාරයටම වැඩ කර ගෙන යනවාය කියන එක. මම හිතන හැටියට මේ ගැන අවධානයට ලක් කරන්න ඕනෑ හොඳම වෙලාව තමයි මේ අවස්ථාව. අපි පහු කරගෙන ආපු සිවිල් යුද ඉතිහාසය මහා භයානක ඉතිහාසයක්; අප සියලුදෙනාගේම මනුෂ්‍යත්වය අහිමි කරපු ඉතිහාසයක්. එහෙම නම්, එයින් ගොඩ එන්න සිටින අපි දියුණු මනුෂ්‍යයන් හැටියටයි වැඩ කරගෙන යන්න ඕනෑ. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත වන මේ අවස්ථාවේදී, ජාත්‍යන්තර සම්මුතියට අදාළ නීතියක් ලංකාවේ බලගැන්වෙන මේ අවස්ථාවේදී, මේ සමාජය නැවත භයෙන් සලිත කරන්න, වැරැදි චිත්‍ර මවා පාන්න, මේවා සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කරලා සමාජයේ ඉදිරි ගමන වළක්වන්න නොවෙයි අපි වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මේ නීතිය ශිෂ්ට සම්පන්න නීතියක් හැටියට පිළිගෙන ඉදිරියට යන්න අවශ්‍ය වන්නේ, අනාගතයේදී මේ රටේ මෙවැනි සිවිල් යුද්ධ ඇති වීම වැළැක්වීම සඳහා ගන්නා වූ පූර්ව සූදානමක් හැටියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ අවස්ථාවේදී සිංහල සමාජය සහ මුස්ලිම් සමාජය අතර ලොකු ආතතියක්, එකිනෙකා කෙරෙහි සැකයක්, බියක් ඇතිවෙලා තිබෙනවා. මීට අවුරුදු ගණනාවකට කලින් දළදා මාලිගය ඉදිරිපිට එල්ටීටීඊ ත්‍රස්තවාදී බෝම්බයක් පිපිරුණු වෙලාවේ, මේ රටේ සිංහල, බෞද්ධ සමාජය ඉතාම සාමකාමීව හැසිරුණා. නමුත් පසුගිය දා සිදු වුණු සිද්ධියෙන් පස්සේ එවැනි තත්ත්වයක් දකින්න ලැබුණේ නැහැ. මෙයින් පෙනෙන්නේ මොකක්ද? මෙය හුදෙක් නිසර්ගයෙන්, අහම්බෙන් මිනිසුන් තුළ තිබෙන ජාතිවාදී, වර්ගවාදී හැඟීම් එළියට දමනවා පමණක් යයි කියා හිතන්න අමාරුයි. මේවා පිටි පස්සේ ලේ සුවඳට ඉව අල්ලන, අපේක්ෂා භංගත්වයට පත් වූ යම් යම් පිරිස් කටයුතු කරනවාය කියන එක අපට පෙනෙන්න තිබෙනවා. එම නිසා අපි මේ අවස්ථාවේදී, මහ ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම දේශපාලන පක්ෂවල නායකයන්ගෙන් සමන්විත සර්වපාක්ෂික සමූළුවක් කැඳවන්නය කියලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. සමාජයේ පවතින බිය සැක තුරන් කරලා, සමාජයේ ආවේගශීලීව වැඩ කරන පිරිස් පාලනය කරලා, සිංහල, දෙමළ, මුස්ලිම් ජන වර්ගවල සමඟිය ආරක්ෂා කරලා, දැනට ඇති වී තිබෙන වෛරීසහගතබව නිවන්න මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ නායකයන්ට යම්කිසි කාර්ය භාරයක් පවරන්න කියලා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. ඒ වෙනුවෙන් සර්වපාක්ෂික සමූළුවක් කැඳවා, මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම නායකයන් එකාවන්ව සමඟි බැම්මෙන් වැඩ කරලා, මේ ඇතිවෙලා තිබෙන ආතතිය, භය තුරන් කරන්න සියලුදෙනාම ඉදිරිපත්වෙලා වැඩ කරන්න කියලා මේ වැදගත් පනත් කෙටුම්පත සම්මත කර ගන්න යන මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. සමහර අය යෝජනා කළ පමණින් ජාතිවාදී, ආගම්වාදී හැඟීම් තුරන් වන්නේ නැහැයි කියලා මම කියන්න කැමැතියි. ඒවා තුරන් කරපු සමාජයක් තිබෙනවාය කියන එක යථාර්ථයක් නොවෙයි. තමන්ගේ ජාතියට, තමන්ගේ ආගමට, තමන්ගේ රටට දක්වන ඇල්ම ඉතාම හොඳ දෙයක්. නමුත් ඒකෙන් අගතියට ගිහිල්ලා; ඒකෙන් අන්ධභාවයට පත්වෙලා; වෛරයට, ද්වේෂයට පත්වෙලා වැඩ කරනවා නම් ඒක දියුණු සමාජයක ලක්ෂණයක් නොවෙයි. කෙනෙකු තමන්ගේ ආගම මුවාවෙන් ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට යනවා නම් ඔහුගේ ආගමිකත්වය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැත්නම් ඒ ආගම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ දෙකම අදාළයි. කවුරු හෝ ආගම වෙනුවෙන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලට යනවා නම් ඔහුගේ ආගමිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැත්නම් ඔහු අදහන ආගම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මෙන්න මේ තත්ත්වය පිළිබඳව සිතා බලන්න හොඳ අවස්ථාවක් අද අපේ සමාජයට උදාවෙලා තිබෙනවා. අපි, අප ගැනම, අපේ ක්‍රියාකාරකම් ගැනම බරපතළව ආපස්සට හිතා බලන්න ඕනෑවෙලා තිබෙනවා. ජනමාධ්‍යයට සම්බන්ධ කෙනෙකු හැටියට මම විශේෂයෙන්ම මේ වෙලාවේදී සඳහන් කරන්න කැමැතියි, මේ සෘජු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා හදිසි නීතිය, ආරක්ෂක හමුදා සහ බිම් මට්ටමේ සංහිඳියාව පමණක් නොව අපේ සන්නිවේදන සංහිඳියාවත් ඉතාම වැදගත්වෙලා තිබෙන බව. අපේ සන්නිවේදන අවකාශය බිම් මට්ටමට වඩා; ආයුධ අරගෙන ගිනි තියන්න, කපන්න, කොටන්න යන අයට වඩා දුර්ගන්ධයට පත්වෙලා තිබෙනවා; වඩා ප්‍රචණ්ඩත්වයට ලක්වෙලා තිබෙනවා. අද අපට යම් යම් පියවර ගන්න වෙලා තිබෙනවා, සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් යම් තාක්ෂණ නියාමනයන් ඉදිරිපත් කර ගන්න. තාවකාලිකව මුත් ඒවා අද අවශ්‍යවෙලා තිබෙනවා.

ඉන්දියාව, ප්‍රංශය, ජර්මනිය ආදී හැම රටකම වාගේ මේ වාගේ සිද්ධීන් ඇති වුණු වෙලාවන්හිදී යම් යම් පියවර ගන්න වෙලා තිබෙනවා. අද මේ රටට විශේෂයෙන්ම අලුත් නීතියක් අවශ්‍යවෙලා තිබෙනවා. වෛරී ප්‍රකාශන වැළැක්වීම සඳහා වූ - වෛරී ප්‍රකාශනවලට එහෙමත් නැත්නම් Hate speechesවලට එරෙහි - නීතියක් අද මේ පාර්ලිමේන්තුව සම්මත කර ගන්න අවශ්‍යවෙලා තිබෙනවා. මම ඉතා පැහැදිලිව කියන්න කැමතියි, මේක ඉතාම විවාදාත්මක බව.

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට එරෙහි වූවක් හැටියට මෙය අර්ථ කථනය කරන්න පුළුවන්. මේ වාගේ නීති-රීති ඉදිරිපත් කරපු හැම සමාජයකම මේ වාගේ විවාද ඇති වුණා; මේ වාගේ අභියෝග මතු වුණා. නමුත් ඒවා සම්මත කරගෙන, මේ ඇති කර ගන්නා වූ ගැටුම්වලින් පුළුවන් තරම් ඈත් වෙන්න ඒ සමාජවලට හැකියාවන් තිබෙනවා. අපි ඒ පුරෝගාමී කටයුතුත් කරන්න අවශ්‍යයි. මේ වාගේ පනත් කෙටුම්පත්, මේ වාගේ සම්මුති බලාත්මක කරන වෙලාවේදී ඒ දිහාත් යොමු වෙන්න ඕනෑ කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 3.36]

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தப் பாராளுமன்ற அவையிலே "வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாயம்" என்ற ஒரு சட்டமூலம் கொண்டுவரப்பட்டிருக்கின்றது. இது ஆங்கிலத்திலே International Convention for the Protection of All Persons from Enforced Disappearance என்று சொல்லப் படுகின்றது. இதனை ஒரு முன்னேற்றகரமான நடவடிக்கை என்று நாங்கள் குறிப்பிடலாம். 'வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்பட்டவர்கள்' என்ற இந்தச் சொல் எங்கிருந்து வந்தது? யுத்த காலத்தில், யுத்தம் முடிவடைந்த காலத்தில் போரினால் காணாமற் போனவர்கள் பற்றியதாகத்தான் இந்தச் சட்டமூலம் இருக்குமென்று நாங்கள் எதிர்பார்த்தோம்.

அதிலிருந்துதான் இந்தச் சொல்லாட்சியும் வருகின்றது. இது சாதாரணமாகக் காணாமல் போனவர்கள் பற்றிய விடயம் அல்ல. போர் காலத்திலும் அதற்குப் பின்னரும் வலுக்கட்டாயமாக - enforced disappearances - காணாமலாக்கப்பட்டவர்கள் பற்றியதாக இருக்க வேண்டும். அந்த வகையில் இதற்குச் சரியான ஓர் அர்த்தம் இருக்க வேண்டும். ஆகவே, அமைச்சர் அவர்கள் இந்தச் சட்டமூலத்தைச் சமர்ப்பித்து எதிர்கால நடைமுறைகளை ஒட்டியதாகப் பேசியதை நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. அப்படியுமிருக்கலாம். அதாவது, இடம்பெற்ற ஒரு நிகழ்ச்சியானது சட்டரீதியானதாக இல்லாமல் நீதி முறைமைக்கு எதிரானது என்றால் அது தொடர்பில் சட்டம் கொண்டுவரப்படலாம். அந்த வகையில் ஒரு சட்டமூலம் கொண்டுவரப்படுகின்றபொழுது அது அந்த மக்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தக்கூடியதாக இருக்க வேண்டும். குறித்த நடவடிக்கைகள் எதிர்காலத்திலே நடைபெறாமல் தடுப்பதும் அதனுடைய ஒரு முக்கியமான பகுதியாக இருக்க வேண்டும். போருக்குப் பின்னர் கிட்டத்தட்ட 16,000 - 20,000 பேர் காணாமல் ஆக்கப்பட்டார்கள் என்ற ஒரு பதிவு இருக்கின்றது. இன்று வெவ்வேறு சர்ந்தர்ப்பங்களில் காணாமலாக்கப்பட்டவர்கள் இருந்தால், அவர்கள் பற்றியும் விசாரிக்கப்பட்டுத் தீர்மானம் எடுக்க வேண்டும். ஆயினும், அந்த விடயங்களைவிட இவர்களுடைய விடயம்தான் மிகவும் முக்கியமானது.

இலங்கையில் இனப்பிரச்சினை தீர்க்கப்படாமல், பல ஜனநாயகப் போராட்டங்கள் இராணுவ ரீதியாக அடக்கியொடுக்கப்பட்ட காரணத்தினால் இராணுவத்தினருக்கும் விடுதலைப் புலிகளுக்கும் இடையில் ஓர் ஆயுதப் போராட்டம் நடைபெற்றது. அந்தக் காலகட்டத்தில் காணாமலாக்கப்பட்டவர்கள் கிட்டத்தட்ட 20,000 பேர் என்று சொன்னால், அந்த மக்கள் தங்களுடைய கைகளில் ஆயுதங்களைக் கொண்டுபோனவர்கள் அல்லர்; போர் முடியும் தறுவாயில் இராணுவத்தினரிடம் சரணடைந்தவர்கள். அதாவது, அவர்களுடைய பெற்றோர் அல்லது உடன்பிறந்தவர்களால் இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டவர்கள். ஆகவே, அவர்களுக்கு நீங்கள் பதில் சொல்ல வேண்டும். ஏனைய விடயங்களாயின் பொதுவாக ஆராய்ந்து அவற்றுக்கான தீர்வைக் காணலாம். ஆனால், இந்தச் சட்டத்தினுடைய வலுவானது அப்படி இராணுவத்தினரிடம் கையளிக்கப்பட்டவர்கள் எங்கே இருக்கின்றார்கள்? என்று கேட்கும்போது விடை காணக்கூடியதாக இருக்க வேண்டும். அந்தப் பெற்றோர் அவர்களைத் தேடி இன்றைக்கும் தெருத்தெருவாக அலைந்து தேடிக்கொண்டிருக்கின்றார்கள் - அரசாங்கத்திடம் பதில் சொல்லுமாறு கேட்டுக் கொண்டிருக்கின்றார்கள்; சர்வதேச நாடுகளிடமும் கேட்கின்றார்கள்.

இன்று இந்தச் சட்டமூலமானது, போர் முனையிலும் போருக்குப் பின்னரும் ஏற்பட்ட போர்க் குற்றங்களை விசாரிப்பதற்கென, 2012ஆம் ஆண்டில் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையிலே பல நாடுகளுடைய இணக்கத்துடனான பிரேரணையின் அடிப்படையில் கொண்டுவரப் பட்டிருக்கின்றது. ஆகவே, காணாமலாக்கப்பட்டவர்களுடைய பிரச்சினைக்கு அந்த அடிப்படையிலிருந்துதான் தீர்வு காணப்படல் வேண்டும். குறித்த சம்பவங்கள் சென்ற ஆட்சிக்காலத்திலே இடம்பெற்றிருந்தாலும் இந்த ஆட்சி அதற்குப் பொறுப்புச் சொல்லவேண்டிய கடப்பாட்டைக் கொண்டிருக்கின்றது என்பதையும் நாங்கள் வலியுறுத்த விரும்புகின்றோம். இனப்பிரச்சினைக்குத் தீர்வு காணப்படும்; காணாமலாக்கப்பட்டவர்கள் விடயத்தில் தீர்வு கிடைக்கும் என்ற நம்பிக்கையோடுதான் இந்த அரசாங்கத்திற்கு எங்களுடைய மக்கள் வாக்களித்தார்கள்; ஜனாதிபதியையும் தேர்ந்தெடுப்பதற்கு உதவினார்கள். அந்த மக்களுக்கு நாங்கள் பதில் சொல்லக் கடமைப்பட்டிருக்கின்றோம்.

ஐ.நா. மனித உரிமைகள் பேரவையின் கூட்டத்தொடர் நடைபெற்றுக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே, இச்சட்டமூலத்தை அவர்கள் ஏற்றுக்கொள்வார்கள் என்று நான் நம்பிக்கை கொள்ளவில்லை. எங்களுடைய மக்களும் இதனை ஏற்றுக்கொள்ளமாட்டார்கள். ஏனெனில், இந்தச் சட்டமூலம் காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு ஒரு விடையாக அமையும் என்று நாங்கள் நம்பவில்லை. எனவே, இதற்காக நியமிக்கப்பட்ட ஆணைக்குழுவினால் குறித்த விடயம் முறையாக விசாரிக்கப்பட்டு, அதற்கு விடை காண்பதனூடாகக் குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட்டு, அதன்பின்னர் அந்த மக்கள் யார் யார் தமது உறவுகள் என்பதை அடையாளப் படுத்துவதன்மூலம் அவர்களுக்குரிய நிவாரணத்தை வழங்குகின்ற வகையிலும், இனிமேல் இவ்வாறான சம்பவங்கள் நடைபெறாத வகையிலும் ஒரு சட்டத்தைக் கொண்டுவருவதுதான் அடிப்படையில் மிக முக்கியமானதும் நீதியானதுமாகும். இருந்தபோதிலும், மனித உரிமைகள் பேரவையினுடைய தீர்மானத்தையிட்டுச் சமாதானம் சொல்வதற்காகவே இன்று இந்தச் சட்டமூலத்தை நீங்கள் சமர்ப்பித்திருக்கின்றீர்கள்.

இந்த நாட்டிலே போரில் ஈடுபட்டுக் குற்றமிழைத்தவர்களும் அதற்கு அப்பால் சமகாலத்திலே குறிப்பாக அரசாங்கத்தின் சார்பில் ஆயுதம் வைத்துக்கொண்டு சர்வதேச நீதி நெறிமுறைகளுக்கு மாறாகக் குற்றமிழைத்தவர்களும் இருக்கின்றார்கள். ஆனால், ஆயுதம் ஏந்தாத மக்கள் - பாதுகாப்புக் கருதி ஒன்றுகூடிய மக்கள் - பாதுகாப்பான இடத்துக்கு வாருங்கள் என்று அழைக்கப்பட்ட மக்கள், அதைவிடப் போரின் இறுதிக் கட்டத்திலே "ஆயுதத்தைவிட்டு நாங்கள் சரணடைகின்றோம்" என்று இராணுவத்திடம் சரணடைந்தவர்கள் பற்றித்தான் உங்களிடத்தில் நாங்கள் கேட்கின்றோம். அவ்வாறு கையளிக்கப்பட்டவர்கள் எங்கே? என்று உங்களிடம் வேண்டுகோள் விடுக்கின்றோம். இங்கே கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்கள் இருக்கின்றார். மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்த காலத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்புடன் பேச்சுவார்த்தை நடத்தியபோது, அவர் முன்னிலையிலும் காணாமல் ஆக்கப்பட்டவர்கள் விடயம் பேசப்பட்டது. அந்தநேரத்தில், கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள் "அதற்கான ஒரு பதிவு இருக்கின்றது" என்று பதில் சொன்னார்.

காணாமலாக்கப்பட்ட மக்களில் இராணுவத்தினரிடம் சரணடைந்தவர்களுடைய பட்டியல் உங்களிடம் இருக்கிறதா, இல்லையா? என்று நாங்கள் கேட்கின்றோம். அது பதியப்பட்டிருந்ததாக எங்களுக்குத் தகவல் கிடைத்தது. ஆகவே, அந்தப் பதிவு சம்பந்தமான தகவல்களை இப்போது பகிரங்கப்படுத்த வேண்டுமென்று கேட்கின்றோம். அதனடிப்படையில் மேதகு ஜனாதிபதி அவர்கள் நியமித்திருக்கின்ற ஆணைக்குழு விசாரணை நடத்த வேண்டும். அதைவிட, பொதுமக்கள் கொல்லப்பட்டார்களா, இல்லையா? என்பது பற்றிச் சொல்ல வேண்டும். அவர்கள் கொல்லப்பட்டிருக்கலாம்! ஆகவே, அவர்களுக்கு என்ன நடந்தது என்பதைச் சொல்லவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்திற்கு, இந்த ஆணைக்குழுவிற்கு இருக்கவேண்டும். அதுதான் முக்கியமானது.

இந்த நாட்டிலே ஓர் இனப்பிரச்சினை தீர்க்கப்படவில்லை என்பதால், ஜனநாயக ரீதியான போராட்டங்கள் எழுந்தபோது அவை இராணுவ ரீதியாக அடக்கியொடுக்கப்பட்டன. அந்த ஆயுதப் போர் நடைபெற்றபோது சர்வதேச ரீதியாக அதாவது,

[ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා]

නෝර්වේ නාට්ඨනුඩෙය අනුසරණෙයුඩන් විඩුතලෛප් පුලිකළුම් අරසාඞ්කමුම් පෝර් නිරුත්තම් සෙය්යප්පට්ටදු. අතනුඩෙය ඉලක්කු ඉන්ත නාට්ඩින් ඉනප්පිරච්චිනෛක්කුත් තීර්වු කාණප්පට වේණ්ඩුම් එන්පතාකුම්. උළ්ළක සුයනිර්ණය උරිමෛ අඩිප්පඩෛයිල් සමස්ඨික් කට්ටමෛප්පුඩනාන ඔර් අරසියල් තීර්වු එට්ටප්පට වේණ්ඩුම් එන්රු අඞ්කේ ඉණක්කම් කාණප්පට්ටදු. ආනාල්, අදු නඩෛමුරෛක්කු වරවිල්ලෛ. ආනඩියාල්, ඔර් අරසියල් ඉලක්කෛ අඩෛවදර්කාක ඉන්ත නාට්ඨනුඩෙය පෝර් ඉරුන්තදේ තවිර, මක්කළ් කාණාමලාක්කප් පඩුවදර්කාක අල්ල. ඉන්රු යුත්තම් මුඩිවඩෛන්තුවිට්ටදු. ආකෙයිනාල්, සරණඩෛන්තවර්කළ් මක්කළාක ඉරුන්තාලුම් සරි, පෝරාළිකළාක ඉරුන්තාලුම් සරි අවර්කළ් එඞ්කේ එන්පතර්කුප් පතිල් සොල්ලවේණ්ඩිය කඩප්පාඩු, අවර්කළින් කුඨුම්පඞ් කළුක්කු නිවාරණමළික්ක වේණ්ඩිය කඩප්පාඩු, අවර්කළ් තොඩර්පිල් මුළුමෙයාක විසාරික්කක්කූඩිය තත්තුවඞ්කළ් ඉන්ත ආණෛක්කුළුවුක්කු ඉරුක්කවේණ්ඩුම්. ආනාල්, සර්වතේස රීතියාක ඉන්ත අරසුක්කු අමුත්තඞ්කළ් වන්තතනාල්, 7 - 8 ආණ්ඩුකළුක්කුප් පින්නර් ඉන්රු කොණ්ඩුවරප්පට්ටුළ්ළ ඉන්තච් චට්ඨමූලම් තෙළිවර්රතාක, සරියාන ඔරු තත්තුවත්තෛක් කොණ්ඩිරුක්කාතතාක, උණ්මෛකළ් වෙළියේ කොණ්ඩුවර මුඩියාතතාක, පොරුප්පුක්කූරුවතිලිරුන්තු පින්වාඞ්කක් කූඩියතාක ඉරුප්පතනාල් ඉතනෛ නාඞ්කළ් ඒර්රුක් කොළ්ළවිල්ලෛ.

මේතකු ජනාතිපති අවර්කළිඩමුම් කෞරව පිරතමර් අවර්කළිඩමුම් ඉන්තච් චමයත්තිල් නාඞ්කළ් ඔරු කෝරික්කෛයෛ මුන්වෛක්කින්රෝම්. අතාවතු, ඉන්ත ආණෛක්කුළු කටන්ත කාලත්තිල් කුරිප්පාකප් පෝර්ක්කළත්තිලේ සරණඩෛන්තවර්කළ්, ඉරාණුවත්තිනරිඩම් කෛයළික්කප්පට්ටවර්කළ් තොඩර්පිල් චම්පන්තප්පට්ට කුඨුම්පඞ්කළුක්කු උණ්මෛයෛ වෙළිප්පඩුත්ති, අතර්කුරිය නිවාරණත්තෛක් කාණවේණ්ඩුම්. ඉන්ත නාට්ඨින් ඉනප්පිරච්චිනෛ තොඩර්පිල් නල්ලිණක්කම් ඒර්පඩුවතර්කුරිය පොරුප්පෛ ඉන්ත ආණෛක්කුළු මූලමාක අරසාඞ්කම් නිරෛවේර්ර වේණ්ඩිය කඩප්පාඩිරුක්කින්රතු එන්රු තිට්ට වට්ටමාක නාන් කූරිවෛක්ක විරුම්පුකින්රේන්. ඉන්ත උණ්මෛකළ් වෙළියේ කොණ්ඩුවරප්පඩාවිට්ටාල්, ඉන්ත නාට්ඩිල් ඔර් අරසියල් තීර්වු ඒර්පඩුවතර්කු ඉඩමිල්ලෛ; නල්ලිණක්කම් ඒර්පඩුවතර්කු ඉඩමිල්ලෛ. ආකවේ, අතෛ උණර්න්තු ඉන්තච් චට්ඨමූලත්තිල් තෙළිවාන තිරුත්ත මොන්රෛක් කොණ්ඩුවරවේණ්ඩුම්. අතාවතු, සරණඩෛන්තවර්කළාවතු එඞ්කේ ඉරුක්කින්රාර්කළ්? අල්ලතු අවර්කළ් ඉල්ලෛයා? එන්පතෛ නීඞ්කළ් කුරිප්පිඩුවතර්කු උණ්මෛයෛ වෙළිප්පඩුත්තුම් වකෛයිල් ඉන්තච් චට්ඨමූලත්තෛ මාර්රි යමෛක්ක වේණ්ඩුමෙන්රු කේට්ඩුක්කොණ්ඩු, විඩෛ පෙරුකින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අද මේ සාකච්ඡාවට ගෙන තිබෙන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත පිළිබඳව මගේ අදහස් දැක්වීමට අවතීර්ණ වීමට කලින්, මේ රටේ අද උද්ගත වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කරුණු කිහිපයක් මේ ගරු සභාව හමුවේ තබන්න මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශ ආවරණ වන විධියට ඒ පැතිර යමින් තිබෙන ගැටුම්කාරී වාතාවරණය ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. ඒ අවාසනාවන්ත තත්ත්වය පාලනය කිරීමට සුදුසු පියවර ගන්න මේ ආණ්ඩුව තවමත් පොහොසත් වෙලා තිබෙනවාය කියලා අපට පෙනෙන්නේ නැහැ. ආණ්ඩුව තුළම ඉන්න ඇතැම් කල්ලි උත්සාහ කරනවා මේ තත්ත්වය රටේ අනෙක් ප්‍රදේශ කරා ව්‍යාප්ත කරන්න. මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් සිංහල ජන සමාජයේ කාලයක් තිස්සේ ගොඩ නැඟුණු යම්කිසි තැති ගැන්මක් තිබෙනවා වෙන්නට පුළුවන්. මේ මෑතක සිට ඔවුන් අඳින පළඳින විධිය වෙනස් වෙන්න ගන්නවා. අරාබි අනන්‍යතාව ලංකාව ඇතුළට ගෙනෙන්න හදනවා. ඒ විතරක් නොවෙයි. ඒ සමාජයේ ඇතැම් අන්තවාදී කණ්ඩායම් කිපෙන සුලු ප්‍රකාශ පසුගිය කාලය තුළ සිදු කරන්න ගත්තා. මේ වාගේ විවිධ හේතු නිසා සිංහල ජන සමාජයේ ඇතැම් කොටස් තුළ යම්කිසි ආතතියක් තිබිය හැකිව තිබෙනවා.

පුද්ගලයකු මරා දැමුවා, මුස්ලිම් තරුණයන් තුන්හතර දෙනෙක් එකතු වෙලා. ඒ සිද්ධිය තමයි උපයෝගී කොට ගැනුණේ, මොකක් හෝ තිබුණු ආතතියක්, ගබඩා කර ගෙන තිබුණු ආතතියක් පිට කර හරින්න.

අපේ සමාජය විවිධත්වයෙන් පිරුණු සමාජයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. තිස් අවුරුදු යුද්ධයකින් මේ රටේ දෙමළ, සිංහල ජනතාව බැට කෑවා. ඒ වෙදනාවෙන් පීඩා වින්දා. මේ ඉදිරිපත් කර තිබෙන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත වැනි පනත් කෙටුම්පත් ගැන මේ ගරු සභාවේ අද සාකච්ඡා කරලා වාද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේත් ඒ අතීතයෙන් ගලා එන සිද්ධි දාමයේ කොටසක් ලෙසයි. මා හිතන විධියට මේ ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා, මේ රටේ තිබුණු සාමකාමී ජීවන තත්ත්වය රකින්න. ආණ්ඩුව කෙරෙහි මහජනයා තුළ විශ්වාසයක් නැහැ. සිංහල ජන සමාජය විශේෂයෙන්ම හිතනවා ආණ්ඩුව තමන් ආරක්ෂා කරන්නේ නැහැ කියලා. මුස්ලිම් ජන සමාජයටත් අද ඒ පිළිගැනීමට එන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඇත්තටම අද මේ රටේ ආණ්ඩුවක් නැති තත්ත්වයකටයි පත්වෙලා තිබෙන්නේ. එහෙම තත්ත්වයක් යටතේ තමුන්නාන්සේලා කරමින් ඉන්නේ මොකක්ද? ජිනීවා සමුළුවේදී එකඟ වුණා ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක ගිවිසුමකට. ඇමෙරිකා එක්සත් ජනපදය ලංකාවට රැහැනිව ගෙනාපු යෝජනාවට එකඟ වුණු ලෝක ඉතිහාසයේ පළමුවැනි රට ලංකාව. කිසියම් රටකට එරෙහිව ඇමෙරිකාව හෝ වෙනත් කවුරු හෝ ගෙනාපු යෝජනාවකට සම අනුග්‍රාහකත්වයත් දරපු එකම රට මේ රට. අබල දුබල වුණු පාලනයක් තිබෙන අද, ජාත්‍යන්තරව එකඟ වුණු ඒ කොන්ත්‍රාත්තුව ඉටු කිරීම පමණයි මේ රටේ සිද්ධ වෙන්නේ. මේ පනත් කෙටුම්පතත් ඒ කොන්ත්‍රාත්තුවලට අයිති පනත් කෙටුම්පතක්. අපි මේ සමස්ත සංදර්භය තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගිනි නිවනවා වෙනුවට මොකක්ද කරන්නේ? CID එකේ ලොක්කා ශානි අබේසේකර මහනුවරට යවලා, ලොහාන් රත්වත්තේයි, දිළුම් අමුණුගමයි තමයි මේවා මෙහෙයවුවේ කියලා වාර්තාවක් හදන්න

කියලා උපදෙස් දීලා තිබෙනවා. මේ වෙලා තිබෙන විපත හරහාත් දේශපාලන කුපාඩිකම් කරන්නයි හදන්නේ. මා මේ කියන්නේ දැන් මහනුවර තිබෙන තත්ත්වය ගැන. කවුරු හෝ තමන්ගේ විරුද්ධවාදියකු පිට ඒක පටවලා අත හෝදා ගන්න වාගේම, ඒකෙනුත් මොකක් හෝ දේශපාලන වාසියක් ගන්න බලනවා.

දැන් බලන්න, මේ කලබලකාරී තත්ත්වයත් එක්ක මේ පනත් කෙටුම්පත ගැන සමාජයේ සාකච්ඡාවක් සිද්ධ වුණේ නැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන විසකුරුභාවය ගැන කථා වුණේ නැහැ. ඔබතුමා දන්නවා, මේක ඕපපාතිකව එන පනත් කෙටුම්පතක් නොවෙයි. මංගල සමරවීර හිටපු විදේශ ඇමතිවරයා ඇමෙරිකානු යෝජනාවට එකඟ වුණා. ඒ යෝජනාවේ තිබෙනවා කළ යුතු කාර්යභාරය මොනවාද කියලා. රණ විරුවන් දඩයම් කරන්නේ ඒ න්‍යාය පත්‍රයට අනුවයි. අභූත චෝදනා එල්ල කරලායි රණ විරුවන් දඩයම් කරන්නේ.

දැන් බලන්න, නාවික හමුදාවේ හිටපු ප්‍රධාන නිලධාරියෙක් තමයි කොමදෝරු දසනායක කියන්නේ. කොමදෝරු දසනායකට ඇප ලැබුණා. ඔහුට විරුද්ධව සාක්ෂිය දීපු හිටපු එල්ටීටීඊ් සාමාජිකයා අධිකරණයට ඇවිල්ලා කිව්වා, "මේ සාක්ෂිය මගෙන් බලෙන් ගත්තේ. ඇත්ත සිද්ධිය මෙන්න මේකයි" කියලා. ඒ නිසා ඔහුට ඇප ලැබුණා. අද CID එක කරන්නේ රණ විරුවන්ට විරුද්ධව බොරු සාක්ෂි හදන එක; ගෝඨාභය රාජපක්ෂ දඩයම් කරන්න බොරු සාක්ෂි හදන එක. එම නිසා මේ සන්දර්භය යටතේ තමයි අපට මේ පනත් කෙටුම්පත ගැන කියවන්න වෙන්නේ. මේ පනත් කෙටුම්පතේ තිබෙන අකුරුවලින් විතරක් මේ තත්ත්වය මනින්න බැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන අකුරුවලින්, වාක්‍යවලින් විතරක් මේ තත්ත්වය මනින්න බැහැ. අපි ඒක තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරුදහන් වූවන්ගේ තොරතුරු විමර්ශනය කරන කාර්යාලයක් පිහිටුවනවා. ව්‍යවස්ථාදායක මණ්ඩලයෙන් ඒ මණ්ඩලයේ ප්‍රධානීන් හැටියට ඉන්න අයගේ නම් ටික ජනාධිපතිට යවනවා. ඒ අය අතර ඉන්නේ නිමල්කා ප්‍රනාන්දු ඇතුළු කුප්‍රකට කොටි හිතවාදී නඩයක්. ජිනීවා මානව හිමිකම් සමුළුවට ගිහින් මේ රටේ හමුදාවට විරුද්ධව අභූත චෝදනා නඟන නිමල්කා ප්‍රනාන්දු මැතිනිය ඇතුළු කුප්‍රකට කොටි හිතවාදී නඩයක් තමයි ඒ මණ්ඩලයේ ඉන්නේ. ඒ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අපේ පරණවිතාන මහත්මයාගේ නායකයාත් ඉන්නවා. ඒ පාර්ලිමේන්තු රණවක මහත්මයා. එතුමා සිංහල බෞද්ධ; බෞද්ධාදරයට එරෙහි. නමුත් නිමල්කා ප්‍රනාන්දුගේ නමත් සම්මත වෙලා යනවා. අරුම පුදුම කාලයේ වැඩ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හරි නම් අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ ප්‍රධානීන් කරන්න ඕනෑ, මධ්‍යස්ථ පිරිසක්; මෙහෙම දෙයක් වෙලා ද නැද්ද කියලා සාධාරණව සොයන පිරිසක්. නමුත් එහෙම පිරිසකට නොවෙයි ඒ කාර්යාලය භාර වෙන්නේ. තමුන්නාන්සේලාට ඒ නම් ටික දෙන්නේත් පිටරටින්; ඇමෙරිකන් තානාපති කාර්යාලයෙන්. ඒ න්‍යාය පත්‍රයට අනුව සියල්ල දිගේලි වෙනවා. ඒ කාර්යාලය වැඩ පටන් ගන්නවා. අපේ හමුදාව පුද්ගලයන් අතුරුදහන් කරලා බලෙන් තියා ගත්තාය කියලා බොරු සාක්ෂි හදලා, රණ විරුවන් දඩයම් කරන්න බදු ගෙවන ජනතාවගේ සල්ලිවලින් ඒ කාර්යාලය නඩත්තු වෙනවා. ලෝකයේ කොහේද මෙහෙම දෙයක් වෙලා තිබෙන්නේ?

තමුන්නාන්සේලා ඔළුව උඩ තියාගෙන ඉන්න ඇමෙරිකා එක්සත් ජනපදය මේ ප්‍රඥප්තියට අත්සන් කරලා තිබෙනවා ද? තමුන්නාන්සේලා අසල්වාසී ඉන්දියාවෙන් අහලා බලන්න, ඒ ප්‍රඥප්තියට අත්සන් කළාට ඒ රට ඇතුළේ එය නීතියක් හැටියට බලාත්මක වෙන්න ඉඩ දීලා තිබෙනවාද කියලා? නමුත් මේ රටේ මේ සිද්ධ වෙන්නේ වෙන මොකවත් නොවෙයි. මේ රටේ මේ වෙන්නේ, මේ රටේ හමුදාව යුද අපරාධ කළාය කියන මිථ්‍යාව සනාථ කරන්න, නොවෙච්ච දෙයක් වුණාය කියලා සනාථ කර පෙන්වන්න වුවමනා කරන උපකරණ ටික, යාන්ත්‍රණය අපිම අපේ වියදමින් හදලා දෙන එක. මෙහෙම රූකඩ පාලනයක් නම් ලංකා ඉතිහාසයේ කවදාවත් අපට දකින්න ලැබුණේ නැහැ.

ගරු තිලක් මාරපන විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාට අපි ගරු කරනවා. ඔබතුමා මහත්මයෙක්. නමුත් ඔබතුමාගේ මහත්මාකමට කරන්න දෙයක් නැහැ, ඇමති හැටියට තමුන්නාන්සේට මේ කරුමයට කර ගහන්න වෙනවා. එහෙම හිතුවාම ඔබතුමා ගැනත් අපට දුක හිතෙනවා. මේක මහා පාපකර්ම පනත් කෙටුම්පතක්. මේ ගැන බොහොම ලස්සන කථා ටිකක් කියන්න පුළුවන්. "අතුරුදහන් කිරීමක් වුණොත් එතැනින් එහාට විතරයි මේ පනත බලපාන්නේ. ලංකාවේ කෙනෙක් වෙන රටක උසාවියකට ගෙන ගිහින් නඩු අහන්න බැහැ." එහෙම කියන්න පුළුවන්. තමුන්නාන්සේ එහෙම කිව්වාට මේ පනත් කෙටුම්පතේ කොහේවත් එහෙම දෙයක් නැහැ. තමුන්නාන්සේ මේ ගරු සභාවට පනත් කෙටුම්පතට අදාළ සංශෝධන දීලාත් නැහැ. දැන් සභාවේ තිබෙන පනත් කෙටුම්පතයි අපි සාකච්ඡාවට ගන්නේ. තමුන්නාන්සේ යමක් කටින් කිව්වාට ඒක නීතියක් බවට පත් වෙන්නේ නැහැ. එහෙම නම් ඒ සංශෝධනය මේ සභා ගැබ තුළ තිබෙන්නට ඕනෑ. ඒ සංශෝධනය මේ සභා ගැබ තුළ නැතිව, විෂය භාර අමාත්‍යවරයාගේ මුවින් පළ කරන අදහස් මත පමණක් පදනම්ව මේ පනත් කෙටුම්පත ගැන සහතිකයක් දෙන්න අපි කාටවත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත මේ තිබෙන විධියට සම්මත වුණොත්, අපේ හමුදා නිලධාරින්ට විරුද්ධව මේ ප්‍රඥප්තියට අත්සන් කර තිබෙන ඕනෑම රටක උසාවියකදී නඩු අහන්න පුළුවන්. ඒ අය ඒ රටට ඉල්ලුවොත් භාර දෙන්න ලංකා රජය බැඳිලා ඉන්නවා. තමුන්නාන්සේ අපට ඒ සංශෝධනය පෙන්වුවා නම් අපට මේ ටික නොකියා ඉන්න පුළුවන්. ඒ අය ඒ යම් රටකට ඉල්ලුවොත් භාර දෙන්න ලංකා රජය බැඳිලා ඉන්නවා.

මීට ටික දවසකට කලින් එල්ටීටීඊ් හිතවාදීන් මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයට ඇවිත් උද්ඝෝෂණය කරනකොට, ලංකාවේ කොඩිය පාගනකොට, මහා බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ හිටපු නිලධාරියෙක්, ආරක්ෂක හමුදා සාමාජිකයෙක් එතුමාගේ නිල ඇඳුමේ තිබෙන ලංකාවේ ජාතික කොඩිය පෙන්වපු එකේ වරදට, බෙල්ල ඉස්සරහින් ඇඟිල්ල ගෙන ගිය එකේ වරදට වහාම ලංකාවට පටවා එව්වා, එතුමාට ආරක්ෂාව නැහැ කියලා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඩයස්පෝරාවේ න්‍යාය පත්‍රයට දුවන ආණ්ඩුවක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා වාගේ කෙනෙක් මේ පාප කර්මයට කර ගහන එක අපට දුකක්. මේක අනාගතයේ මේ රටේ මිනිස්සු මහා ද්‍රෝහී ලියවිල්ලක් ලෙස සලකන පනත් කෙටුම්පතක්. මේක හුදකලා පනත් කෙටුම්පතක් නොවෙයි. සමස්ත ක්‍රියාදාමය සමඟයි මේ ගැන සලකා බලන්න වෙන්නේ. අද දැනුවත් වුවමනාවක් තිබෙනවා ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව ක්‍රියාත්මක වෙන්න. ඒක ඩයස්පෝරාව මඟින් එන වුවමනාවක්. ඒ වුවමනාව තමයි ඇමෙරිකාව ඇතුළු ඒ රටවල් නියෝජනය කරන්නේ. ඒක තමයි ඩයස්පෝරාව ඇතුළු ඒ රටවල් නියෝජනය කරන්නේ. ඒකට තමයි මංගල සමරවීර මහත්මයලා අවනත වුණේ; යටත් වුණේ. ඒක ලෝකය දිනා ගත්තා නොවෙයි. ලෝකය දිනා ගත්තා නම් ඇමෙරිකා එක්සත් ජනපදය මොකද අපේ ආණ්ඩුව කාලයේත් නතර නොකරපු ජීඑස්පී සහනය නතර

[ගරු විමල් වීරවංශ මහතා]

කළේ? ලෝකය දිනා ගත් නිසා ද එහෙම කළේ? අපේ ආණ්ඩුව කාලයේත් තිබුණා, ජීඑස්පී බදු සහනය. ඒවා නතර කළේ ඇයි?

ලෝකය දිනා ගත්තා නොවෙයි, තමුන්නාන්සේලා ලෝකයේ බලවතුන්ට යටත් වුණා. තමන්ගේ රාජ්‍යයට සාමය දිනා දුන් ආරක්ෂක හමුදා පාවා දෙන්න ඕනෑ කරන දේවල්වලට "කරන්නන් ස්වාමිනී" කියලා එකඟ වුණා. 2013 මැයි මාසයේ ගෝලීය දෙමළ සංසදයේ ප්‍රධානීන් එක්ක සාකච්ඡාවක් සිංගප්පූරුවේ සිද්ධ වුණා. ඒක තිබෙන්නේ TamilNet වෙබ් අඩවියේ. ඒ සාකච්ඡාවට ගියේ කවුද? අද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විධියට කටයුතු කරන මංගල සමරවීර, (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න. ඊළඟට, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ප්‍රධානි තම්ල් මාරන්. මේ අය තමයි එක්සත් ජාතික පක්ෂයේ වුවමනාව පැත්තෙන් එම සාකච්ඡාවට ගියේ. අර පැත්තෙන් ආවා, ගෝලීය දෙමළ සංසදයේ ප්‍රධානීන්.

ගරු ඇමතිතුමනි, එම TamilNet වාර්තාවේ ගෝලීය දෙමළ සංසදය කියනවා, "රාජපක්ෂ රෙජීමය පලවා හරින්න මංගල සමරවීර හිඟන්නෙක් සේ අපෙන් උදව් ඉල්ලා හිටියා. අපි කොන්දේසි දහයකට -ප්‍රතිපත්ති දහයකට - යටත්ව රාජපක්ෂ රෙජීමය පළවා හරින්න එකඟ වුණා" කියලා. අන්න ඒ ප්‍රතිපත්ති දහයේ තිබෙනවා, යුද අපරාධ කරපු රණවිරුවන් දඩයම් කිරීම කියලා. ඒ ප්‍රතිපත්ති දහයෙන් පළමුවැනි එක තමයි, නාමකරණය කුමක් වුවත් අභ්‍යන්තර ස්වයං පාලනය ලැබෙන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම. බල පෙරළියට දෙමළ ඩයස්පෝරාවේ සහාය ගැනීම සඳහා මේ රටට අහිතකර එකඟතාවක් එතැන ඇති වුණා. අන්න ඒ එකඟතාවට අදාළ පියවර තමයි මේ ගන්නේ. දෙමළ ජාතික සන්ධානය අඩන්නේ ඒවා ප්‍රමාදයි කියලා. ඒගොල්ලන්ට තිබෙන්නේ ඒ ප්‍රශ්නය. නමුත් මේ වෙන්නේ, එම එකඟතාවට අදාළ දේවල්. මහ බැංකුව, ස්වර්ණ මහල් - ඊඒපී - ජාලයට අයත් ආයතන එල්ටීටීඊ මුදල්වලින් දුවන මැලේසියාව හරහා එන සමාගමකට දෙනවා. නමුත් ඊට වඩා වැඩි ලංසුවක් මේ රටේ ව්‍යාපාරිකයකු තබා තිබෙනවා.

''ස්වර්ණවාහිනී'' නාලිකාව ඇතුළු ඊඒපී මාධ්‍ය ජාලයට අයිති ආයතන මිලදී ගන්න අර එල්ටීටීඊ මුදල් තිබෙන, පිටින් ආ ඒ ව්‍යාපාරිකයාට වඩා ''හිරු'' එෆ් එම් නාලිකාවේ අයිතිකාර සමාගම වැඩි ලංසුවක් තබා තිබෙද්දීත්, මහ බැංකුව ඒක දෙන්නේ කාටද? විදේශයෙන් එන සමාගමට. මොකක්ද හේතුව? අද මේ රටේ පෞද්ගලික ආයතන හෝ මොනවා හෝ විකිණෙන ඒවා ගන්න ඩයස්පෝරාව පැත්තෙන් එනවා නම්, ඒ ගොල්ලන්ට තමයි අවස්ථාව දෙන්නේ. "හිරු" මාධ්‍ය ජාලය ඒ ආයතන ගන්න ඊට වඩා වැඩි ලංසුවක් ඉදිරිපත් කළත්, ඒ ගොල්ලන්ට දෙන්නේ නැහැ. එතැනට මේ ආණ්ඩුව පත් වෙලා ඉවරයි. අද කළු සල්ලිවල තිප්පොළක් හැටියට මේ රට හංවඩු ගහලා ඉවරයි. මේ රට කළු සල්ලි තිප්පොළක් වුණේ කොහොමද? දෙමළ ඩයස්පෝරාවේ ගොඩ ගැහිලා තිබෙන, එල්ටීටීඊ එක වෙනුවෙන් ගොඩ ගහපු සල්ලි අද කළු සල්ලි හැටියට මේ රට ඇතුළට එනවා. ඒ නිසා කරුණාකරලා ඒක තේරුම් ගන්න. මේ ගත වෙච්ච අවුරුදු තුන ඇතුළත තමුන්නාන්සේලා මේ රට නැඟිටින්න බැරි වෙන විධියේ විපතකට ඇද වටිටා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය අවසන් වෙන්න විනාඩියකට කලින් පොඩි අනතුරු ඇඟවීමක් කළා නම් මනරම්. එකපාරටම අවසන් කිව්වාම නවත්වා ගන්න බැහැ නේ. බස් එකක් වුණත් එහෙම නවත්වා ගන්න බැහැ, gear මාරු කර ගන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි 13ක් ලබා දුන්නා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත්වලින් ඉරණම තීරණය වෙන්නේ කාගේද? මේ රටට සාමය දිනා දුන් රණවිරුවන්ගේ. ඔබතුමා කිව්වාට මේක අතීතයට බලපාන්නේ නැහැ කියලා, මේකේ කොහේවත් එහෙම සඳහනක් නැහැ. බලය කියන්නේ තාවකාලිකව ලැබෙන දෙයක්. ඒ තාවකාලිකව ලැබෙන බලය තමන්ගේ රටත්, ලාංකීය ජාතියත් බිල්ලට දීලා තහවුරු කර ගන්න හදනවා නම් ඒක සාර්ථක වෙන්නේ නැහැ. මේ රටේ ජන මතය තමුන්නාන්සේලා දන්නවා. ඒ ජන මතය දිනා බලන්න. කාට පොරොන්දු වුණත්, ඒ ජන මතයට රැහැණි අණ පනත් ගෙන එන එක නවත්වන්න. එහෙම නොවුණොත් තමුන්නාන්සේලාට වෙන්නේ, පසුගිය පළාත් පාලන මැතිවරණයටත් වඩා අන්ත පරාජයකට ඇද වැටෙන්නයි. කවුරුවත් හිතනවා නම් මේ රටේ ජනතාව අඳ, ගොළු, බිහිරි පාසලක් කියලා, ඒක එහෙම නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් අපි ඉතා වගකීමෙන් මේ කාරණය පිළිබඳව ඉල්ලීමක් කරනවා. කන්ද උඩරට -මහනුවර- දැන් ඇවිලෙන ගින්න නිවන්න. ගින්න අවුළුවපු අය කවුද කියලා තමුන්නාන්සේලා දන්නවා. කුලියාපිටියේ කඩවලට ගිනි තිබ්බා. ඒකට පිරිස රැගෙන ආපු වාහනය සීසීටීවී කැමරාවල තිබෙනවා. වාහනය අයිති කාටද? එක්සත් ජාතික පක්ෂ නාගරික මන්ත්‍රී එරාන් හල්පගේට. පොලීසිය ගියා ඔහුව අත් අඩංගුවට ගන්න. නමුත්, ගන්න දෙන්නේ නැහැ, උඩින් එනවා, calls. මම මේ ඉතා වගකීමෙන් කියන්නේ. එතකොට යූඑන්පී නාගරික මන්ත්‍රී කුලියාපිටියේ මුස්ලිම් කඩවලට ගිනි තියන්නේ කොහොමද? මේක අවුළුවන්නේ කවුද? මේ අපරාධ කර කර මේ රට නාස්ති කරන්න එපා. දේශපාලනය කරමු. ඒත් සමාජයක හදවත් ගිනි තිබ්බොත්; සමාජයක හදවත් සිදුරු කළොත්, ඒවා නැවත පිළියම් කරන්න ලෙහෙසි වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ නිසා, ජාතියක ඉරණමත් එක්ක පාපන්දු කෙළින එක නවත්වන්න කියා ඉල්ලා සිටිමින්, මේ පනත් කෙටුම්පතට අපේ තිබෙන විරුද්ධත්වය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.03]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත මෑත කාලයේදී ඉතාමත්ම

විවාදාත්මක වුණු පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත ගැන බැලුවාම, මෑතකදී මෙතරම් අසත්‍ය තොරතුරු ප්‍රචාරය කළ, මෙතරම් වැරැදි මත ඇති කළ පනත් කෙටුම්පතක් නැති තරම්. නීතිය පිළිබඳ ඉතාමත්ම හොඳ දැනුමක් තිබෙන, නීති මහාචාර්යවරු පවා මේකේ තිබෙන වගන්ති පිළිබඳ වැරදි අර්ථ නිරූපණයන් දුන්නා. එක වැරදි අර්ථ නිරූපණයක් තමයි, මෙම නීතිය අතීතයට බලපානවාය කියන කාරණය.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් යටතේ, 13.(1) ව්‍යවස්ථාවේ ඉතාමත්ම පැහැදිලිව තිබෙනවා, යම් කිසි අපරාධ නීතියක් බලපාන්නේ අනාගතයට පමණයි කියලා. ඒක ඉතාම පැහැදිලියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ සියල්ලටම ඉහළ නිසා, එම කරුණ මේ පනත් කෙටුම්පතේ විශේෂයෙන් සඳහන් වීම අවශ්‍ය නැහැ. ඒ වාගේම, මෙම දණ්ඩන වගන්තිය අතීතයට බලපාන්නේ නැහැ. ඒක බොහොම පැහැදිලියි.

අතීතයට බලපාන පරිදි අපි ජාත්‍යන්තර සම්මුතියක් අත්සන් කරලා තිබෙනවා නම්, විශේෂයෙන් වගන්තියක් ඇතුළත් කරලා ප්‍රතිපාදන ඇතුළත් කරන්න පුළුවන් කියලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගියා. මේ පනත් කෙටුම්පතේ දණ්ඩන වගන්තිය ආපසු ක්‍රියාත්මක වීමට සුළු හෝ ඉඩක් තිබෙනවා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයට මෙයට ඉඩ දෙන්නේ නැහැ. එහෙම නිබුණා නම් කියනවා, "මේ සඳහා ජන මත විචාරණයක් අවශ්‍යයි" කියලා. එහෙම කිව්වේ නැහැ. එසේ ආපසු ක්‍රියාත්මක වන පරිදි retrospective clause එකක් නැත්නම්, කිසිම අවස්ථාවක අපේ රටේ නීතිය අනුව අපරාධයක්, දණ්ඩන වගන්තියක් අතීතයට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම වෙන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර නිසායි. ඒ නිසා ඒ පිළිබඳව කිසිම අවිශ්වාසයක් තබා ගත යුතු නැහැ.

අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "Dualist" රටක් කියලා. අපේ රටේ නීතිය අනුව ජාත්‍යන්තර වශයෙන් යම් කිසි ප්‍රඥප්තියක් අත්සන් කරපු පළියට, එය මේ රටේ නීතිය බවට පත් වන්නේ නැහැ. Monist රටවල් ගත්තාම, හොඳම උදාහරණය තමයි නෙදර්ලන්තය. එම රටේ ජාත්‍යන්තර ප්‍රඥප්තියක් ස්වංක්‍රීයවම රටේ නීතිය බවට පත්වෙනවා. අපට එහෙම එකක් නැහැ. එම නිසා මෙම පනත් කෙටුම්පත ගෙන ඒමෙන්, "International Convention for the Protection of All Persons from Enforced Disappearance" කියන ප්‍රඥප්තිය මේ රටේ නීතිය බවට පත්වෙනවාය කියන එක මිථ්‍යා මතයක්. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඒක මිථ්‍යාවක්. කනගාටුවට කාරණය වන්නේ, ඒ පිළිබඳව වැඩියෙන්ම කථා කළේ මේ රටේ දහස් ගණන් නීතිඥවරුන් බිහි කිරීම සඳහා නීතිය උගන්වපු මහාචාර්යවරු වීමයි. ඒක තමයි කනගාටුවට කාරණය. එහෙම නොවෙයි වෙන්නේ. අපේ රට dualist රටක්. එම නිසා අපට ඕනෑ විධියටයි අපි පනත හදන්නේ. අපි නීති හදන්නේ අපට ඕනෑ විධියටයි. මෙම විවාදය තුළ එක් කාරණයක් සඳහන් වුණා. එහෙම නම්, දණ්ඩ නීති සංග්‍රහයට පමණක් සංශෝධන ගේන්න අපට බැරි ඇයි කියලා සඳහනක් කෙරුණා. දණ්ඩනයක් නම් පමණක් කෙරෙන්නේ, එහෙම නම් අපට ඒක කරන්න තිබුණා. නමුත්, මෙම පනතේ පරාසය ඊට වඩා විශාලයි, වැඩියි. උදාහරණයක් වශයෙන් 15(1) වගන්තියෙහි මෙසේ සඳහන් වෙනවා:

"No person shall be held in secret detention."

ඒ කියන්නේ රහසේ රඳවා තබා ගැනීම තහනම් කියන එකයි. ඒ වාගේ දේවල් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කරලා වැඩක් නැහැ, දාන්න බැහැ. දණ්ඩ නීති සංග්‍රහයේ තිබෙන්නේ, වරදවල් ප්‍රකාශයට පත් කරලා ඒවාට දඩුවම් නියම කිරීමයි. ඊටත් එහා ගිහිල්ලා අයිතිවාසිකම් පිළිබඳව, චින්දිතයන්ගේ සහ ඔවුන්ගේ නෑදෑයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව, ඒ වාගේම නීතිඥවරුන්ගේ සහාය ලබා ගැනීම - the right to representation by an attorney-at-law - පිළිබඳව, ඒ ආදිය සියල්ල මේකේ තිබෙනවා. ඒවා දණ්ඩ නීති සංග්‍රහයට දාන්න බැහැ. ඉතින්, චින්දිතයන්ට අදාළ වන එවැනි වැදගත් වෙනත් ප්‍රතිපාදන ගණනාවක් මෙහි තිබෙන නිසා තමයි දණ්ඩ නීති සංග්‍රහයට පමණක් මේක ඇතුළු කරලා, දණ්ඩන වගන්තියක් ඇතුළත් කිරීමට හැකියාව නැත්තේ.

මීට අදාළව අද තිබෙන තත්ත්වය පිළිබඳව මම වැඩියෙන් කථා කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ නීති කොච්චර ගෙනාවත් වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කළේ නැත්නම්. මේ දවස්වල මහනුවර පැත්තේ විවිධ සිදුවීම් සිදුවෙනවා. ඒ පිළිබඳව අපි කවුරුත් කම්පාවෙලා සිටින්නේ. මම මහනුවර පළාතේ කෙනෙක් නිසා, ඒ පළාතේ ඉපදිලා හැදුණු වැඩුණු කෙනෙක් නිසා මට මේ දවස් වකේ සෑම මිනිත්තු කිහිපයකටම සැරයක් දුරකථන පණිවුඩ ලැබෙනවා. මෙන්න මෙතැන සිද්ධියක් වෙනවා, මෙන්න මෙතැන තවත් සිද්ධියක් ඇති වෙනවා කියලා. ඒ තැන් ගැන කියන්න මම කැමැති නැහැ. තවත් අවුස්සන්න මම කැමති නැහැ. තවත් ඇවිස්සෙන්න කිසිම ඉඩක් නොතබා මම කථා කරන්නම්. දැන් තවත් පළාත්වලට පැතිරෙමින් තිබෙනවා කියලා කියනවා. සමහර පළාත්වල බොහොම වගකිව යුතු පුද්ගලයින්ගෙන් ඊයේ ලැබුණු ආරංචිය තමයි, සමහර තැන්වලදී පොලීසිය බලාගෙන සිටියා කියන එක. සමහර තැන්වලදී පොලීසිය කියලා තිබෙනවා, "අපට වෙඩි තියන්න අවසර නැහැ, වෙඩි තියන්න අපට නියෝග දීලා නැහැ" කියන එක. කවුරුත් කියන්නේ නැහැ, මිනිස්සුන්ව මරන්න කියලා. නමුත්, සාමය ආරක්ෂා කර ගැනීම සඳහා බලය පාවිච්චි කරන්න පුළුවන්. පොලීසියට ලබාදී තිබෙන සාමාන්‍ය උපදේශය වන්නේත්, මරන්න වෙඩි තියන්න නොවෙයි, අවස්ථාවේ හැටියට අවම බලය පාවිච්චි කරන්න කියන එකයි. ඒ වාගේම අපේ දණ්ඩ නීති සංග්‍රහය අනුව, ඕනෑම කෙනෙකුගේ දේපළ හෝ ජීවිත ආරක්ෂා කිරීම සඳහා වෙනත් ඕනෑම කෙනෙකුට බලය පාවිච්චි කරන්න පුළුවන්. ඒක ඕනෑම සිවිල් පුද්ගලයෙකුට කරන්න පුළුවන්. කනගාටුවෙන් වුණත් විශේෂයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. ඊයේ තැන්නකුඔුර, මැණික්හින්න ප්‍රදේශවල ඇති වුණු සිද්ධිවලදී පොලීසිය කියලා තිබෙනවා, "අපට කරන්න දෙයක් නැහැ, අපට බලයක් නැහැ, අපට කියලා නැහැ" කියලා. ඒ කියන්නේ උඩට වෙඩි තියන්නද යන්නේ? උඩට වෙඩි තියලා මේ වැඩේ කරන්න බැහැ. එම නිසා මේ පිළිබඳව action ගන්න - ක්‍රියාත්මක වෙන්න - ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
Sir, please give me one or two more minutes because this is so important; මේක ඉතාම වැදගත් කාරණයක්. මහනුවර ප්‍රදේශයෙන් දැනුත් ලැබෙන ආරංචි තිබෙනවා. අකුරණ ප්‍රදේශයෙන් ආරංචි ලැබෙනවා. ඇත්තද, නැත්තද කියා අපි දන්නේ නැහැ. ඒ පිළිබඳව සොයා බලන්න විතරයි අපට පුළුවන්. නමුත්, මේ පිළිබඳව වහාම ක්‍රියාත්මක වන්න ඕනෑ. මේ නීති හදන්නේ, හදිසි නීතිය දාලා තිබෙන්නේ කොස් කොටන්න නොවෙයි. ඒ කඩුව දීලා තිබෙන්නේ කොස් කොටන්න නොවෙයි. මේ රටේ හදිසි නීතිය යටතේ preventive detention කරන්න තිබෙනවා. වරදක් කළේ නැතත්, යම්කිසි කෙනෙකුගේ ක්‍රියා නිසා වරදක් වෙන්න ඉඩ තිබෙනවා නම්, ඒ බවට සාක්ෂි තිබෙනවා නම්, හේතු තිබෙනවා නම්, preventive detention සිදු කරන්න පුළුවන්.

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

මේ හදිසි නීතිය යටතේ අද preventive detention පාවිච්චි කරන්න පුළුවන්. ඒක බොහොම ලේසියි. මේ ප්‍රශ්න අවුස්සන අය ඉන්නවා නම්, ඒ පිළිබඳව සාක්ෂි තිබෙනවා නම්, ඒ පිළිබඳව විශ්වාස තිබෙනවා නම්, -අත්තනෝමතිකව නොවෙයි,- යම්කිසි පදනමක් තිබෙනවා නම් ක්‍රියාත්මක වෙන්නට පුළුවන්. එම නිසා preventive detention පාවිච්චි කරන්න ආණ්ඩුව වහාම ක්‍රියාත්මක විය යුතුයි. හදිසි නීති පනවලා විතරක් වැඩක් නැහැ. ඇදිරිනීතිය රෑට විතරක් දාලා වැඩක් නැහැ. සමහර තැන්වලට දවලුත් ඇදිරිනීතිය දාන්න ඕනෑ. මේකට කොහොමද මුහුණ දෙන්නේ කියලා අපි බොහොම බරපතළ ලෙස සාකච්ඡා කළ යුතුයි. ඊළඟ දින කිහිපයේදී වෙනත් පළාත්වලටත් මේක පැතිරීමේ භයානකකම තිබෙනවා.

අවසාන වශයෙන්, I would like to tell this because my name was mentioned. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, සිංගප්පූරුවේදී දෙමළ කණ්ඩායම් සමඟ කරපු සාකච්ඡාවකට මා සහභාගී වූ බවට. එයට සහභාගී වූයේ කුමන අවුරුද්දේදීද කියලා නම් මට මතක නැහැ. ඒක සම්පූර්ණ ඇත්ත. මම කවදාවත් "නැහැ" කියලා නැහැ. මේ රටේ තිබෙන ජනවාර්ගික ගැටලුව එක තනි රටක් තුළ විසඳා ගැනීම සඳහා තමයි අපි සාකච්ඡා කෙරුවේ. Global Tamil Forum එකේ බොහෝ අදහස් සමඟ මම එකඟ වෙන්නේ නැහැ; I do not agree with the opinions of the Global Tamil Forum. නමුත්, ඔවුන් එක්ක කථා කරන්න ඕනෑ; ඔවුන් එක්ක සාකච්ඡා කරන්නේ නැතිව මේවා කරන්න බැහැ. ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට තමයි Global Tamil Forum එකට සම්බන්ධ වෙලා හිටපු Reverend Father S. J. Emmanuel වගේ අය අද ලංකාවට එන්නේ. ඒ කාලයේ ඒ ගොල්ලන් කථා කළේ, -

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේලා එකඟ වෙච්ච ප්‍රතිපත්ති දහය ඒ TamilNet වාර්තාවේ තිබෙනවා. ඒ දහයේ පළමුවැනි එක තමයි, ලේබලය කුමක් වුවත් අභ්‍යන්තර ස්වයං පාලනයක් ලැබෙන විධියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඊළඟට, රණවිරු දඩයම. මේ ඔක්කෝම ඒ දහය තුළ තිබෙනවා. තමුන්නාන්සේලා සාකච්ඡා කළා විතරක් නොවෙයි, මේ රට පාවා දෙන එකඟතාවකට ගියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු (කලානිති) ජයම්පති වික්‍රමරත්න)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
That is not a point of Order. එහි තිබෙන්නේ මේ රට තුළ සිටින විවිධ ජන කොටස්වලට තමන්ගේ කටයුතු කර ගැනීමට බලය ලැබෙන පරිදි මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය වෙනස් කරන්න ඕනෑ කියලායි. ඒක අද නොවෙයි මම හැමදාම කියපු දෙයක්. ඒක මම දැනුත් කියනවා; ඉදිරියටත් කියනවා.

[ප.ප. 4.14]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ළස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேச சமவாயச் சட்டமென்பது எங்களுக்கு அவசியமானதொன்றாகும். ஏனெனில், வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப்பட்டவர்களால் ஏற்படுகின்ற வலியினை உணர்ந்தவர்கள் நாங்கள். எனவே, அத்தகையதொரு விடயம் தொடர்பில் எமது மக்களினதும் எனதும் வேதனைகளைப் பகிர்ந்துகொள்வதற்கு இங்கு வாய்ப்பளித்தமை குறித்து நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எனது உடன் பிறந்த சகோதரர் வலுக்கட்டாயமாகக் காணாமற்போகச் செய்யப்பட்டவர்; என்னுடன் இருந்த உடன் பிறவாச் சகோதரர்கள் பலர் வலுக்கட்டாயமாகக் காணாமற்போகச் செய்யப்பட்டவர்கள்; நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற தமிழ் பேசுகின்ற மக்களின் உறவுகளில் பலர் காணாமற்போகச் செய்யப்பட்டவர்கள். இங்கே இருக்கின்ற மக்கள் விடுதலை முன்னணி உள்ளிட்ட இடதுசாரிக் கட்சிகளின் உறுப்பினர்கள் பலரும் காணாமற் போகச் செய்யப்பட்டவர்கள்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති)(තිරුමති) சுதர்ஷினி பர்னாந்து புள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)
I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු எட்வட் குணசேகர අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இந்த நாட்டிலே காணாமற்போகச் செய்யப்பட்ட வர்களுக்கு வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என்று திசைகள் கிடையாது. காணாமற்போகச் செய்யப்பட்டவர்களின் வேதனைகளை அவர்களின் உறவுகளே அறிவர். அந்த வேதனைகளை வார்த்தைகளால் கூறி, உணரவைக்க முடியாது. அதனால்தான் இன்று ஒரு வருடமும் 35 நாட்களு மாகக் காணாமற்போன உறவுகளைக் கண்டறிவதற்கான போராட்டத்தில் ஈடுபட்டுள்ள எமது மக்களின் வேதனைகள் பலருக்கும் இங்கே புரியாமல் இருக்கின்றன. தமிழ் அரசியல் கைதிகள் குறித்து நான் கதைக்கின்றபோதெல்லாம், "எமது நாட்டிலே அரசியல் கைதிகள் என எவருமே கிடையாது" என்று சிலர் கூறுகின்றனர். அதேவேளையில், "காணாமற் போனோர் என இங்கு எவருமே இல்லை" என எவராலும் கூற முடியாத வகையில், இன, மத பேதங்களின்றி இந்த நாட்டில் நபர்கள் காணாமற்போன சம்பவங்கள் இடம்பெற்றுள்ளன. எனவேதான் காணாமற்போனோரைக் கண்டறிவது தொடர்பி லான விசாரணைகளை 1971ஆம் ஆண்டிலிருந்து ஆரம்பிக்கும் படி நாம் ஏற்கெனவே கோரியிருந்தோம்.

அதேநேரம், நபர்கள் காணாமற்போன சம்பவங்கள், கொலைச் சம்பவங்கள் என்பன திசை திருப்பப்பட்டுள்ள நிலைமைகளும் இல்லாமல் இல்லை. கொழும்பில் வைத்து 11 தமிழ் இளைஞர்கள் கடத்தப்பட்டபோது, அது தொடர்பிலான குற்றச்சாட்டு திசைதிருப்பப்பட்டது. இப்போது இச்சம்பவம் தொடர்பில் மேற்கொள்ளப்பட்டு வருகின்ற நீதி விசாரணை களிலிருந்து உண்மை வெளிவந்து கொண்டிருக்கின்றது. அதேபோன்று காணாமற்போனோர் தொடர்பில் விசாரணை களை மேற்கொண்டிருந்த ஜனாதிபதி ஆணைக்குழு முன்பா கவும் சில குற்றச்சாட்டுகள் திசைதிருப்பப்பட்டிருந்தன. அவை தொடர்பிலும் நீதி விசாரணை அவசியம் வேண்டும் என்றே நாங்கள் இந்த அரசிடமும் கோரிக்கைகளை முன்வைத் திருந்தோம். அத்தகைய நீதி விசாரணைகளின்போதுதான் அவற்றின் உண்மைகளும் வெளிவரும். இத்தகைய திசைதிருப்பல்களில் அரசியல்வாதிகள் சிலர், ஊடக அதிபர்கள் சிலர், சில அரச சார்பற்ற நிறுவனங்கள் என பல்துறை யினருக்கும் பங்குண்டு. அரசியல் உள்நோக்கங்கள் காரணமாகவும் காழ்ப்புணர்ச்சிகள் காரணமாகவும் சிலரது பிழைப்புக்காகவும் இவை இவ்வாறு திசைதிருப்பப்பட்டன.

அதேபோன்று, பல்வேறு அரசியல் கொலைச் சம்பவங்கள் தொடர்பிலான குற்றச்சாட்டுகளும் திசைதிருப்பப்பட்டன. இன்று அச்சம்பவங்கள் தொடர்பில் நீதி விசாரணைகள் மேற்கொள்ளப்பட்டு உண்மைகள் வெளிவந்துகொண்டிருக் கின்றன. இத்தகைய நிலைமைகள் காணப்படுகின்ற நிலையில், காணாமற்போகச் செய்தல் தொடர்பில் ஒருவர்மீது அல்லது ஒரு தரப்பினர்மீது குற்றச்சாட்டுகள் சுமத்தப்பட்டால், அது பற்றிப் பக்கசார்பற்ற முறையிலான விசாரணைகள் மேற்கொள்ளப்பட்டு, அக்குற்றச்சாட்டு பொய்யானது எனக் கண்டறியப்பட்டால், அதன் உண்மைத் தன்மையைப் பகிரங்கப்படுத்த வேண்டும் என்பதுடன், பொய்யான குற்றச்சாட்டுச் சுமத்தியவருக்கு எதிராக தற்போதுள்ள சட்ட முறைமைகளுக்கு அமைவாக நடவடிக்கை எடுப்பதற்கும் குற்றஞ்சாட்டப்பட்டவருக்கு ஏற்படுகின்ற சமூக, பொருளாதார, உடல், உள ரீதியிலான பாதிப்புகளுக்கேற்ப இழப்பீடுகளை வழங்குவதற்குமான உரிய ஏற்பாடுகளை மேற்படி சட்டமூலம் கொண்டிருக்க வேண்டும் என்பதையும் நாம் தொடர்ந்து வலியுறுத்தி வருகின்றோம்.

'பலிக்கு உட்படுத்தப்பட்டவர்' என்பது காணாமற்போக்கப் பட்ட ஆள் மற்றும் வலுக்கட்டாயமாகக் காணாமற்போக்கப் படுதலின் நேரடி விளைவாகத் தீங்குற்ற எவரேனும் 'தனியாள்' என்று பொருளாகும்' என இந்தச் சட்டமூலத்திலே குறிப்பிடப்பட்டுள்ளது. அதுமட்டுமல்ல, 'காணாமற்போகச் செய்தார்' எனப் பொய்யான குற்றச்சாட்டுச் சுமத்தப்படுபவரும் பலிக்கு உட்படுத்தப்படுகின்றார் என்பதை இந்தச் சபையின் அவதானத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். அத்துடன், காணாமற்போனோர் தொடர்பிலான குற்றச்சாட்டுகளைத் திசைதிருப்புவதில் முன்னின்று உழைத்தவர்களையும் காணாமற்போகச் செய்தல் தொடர்பில் பக்கச்சார்புடன் செயற்படுகின்றவர்களையும் காணாமற்போனோர் பற்றிய அலுவலகப் பணிகளில் ஈடுபடுத்தக்கூடாது என்ற கோரிக்கையையும் இங்கு நான் முன்வைக்க விரும்புகின்றேன். காணாமற்போனோர் அலுவலக உறுப்பினர்கள் தெரிவு தொடர்பில் காணாமற்போனோரது உறவுகளிடையேயும் சில சிங்களத் தரப்பினரிடையேயும் எதிர்ப்பு நிலை காணப்படுகின்றது. மேற்படி உறுப்பினர்கள் தெரிவானது, "இராணுவத்தையும் இந்த நாட்டையும் காட்டிக் கொடுக்கும் ஏற்பாடு" எனச் சிங்களத் தரப்பினர் சிலர் கூறுகின்றனர். அதேநேரம், "காணாமற்போனோர் தொடர்பான அலுவல கமானது காலம் கடத்தும் செயற்பாடே அன்றி, அதனால் எங்களுக்கு எவ்விதமான தீர்வுகளும் கிட்டாது" எனக் காணாமற்போனோரின் உறவினர்கள் தெரிவிக்கின்றனர்.

யுத்தத்திற்குப் பின்னரான காலப்பகுதியில் எமது மக்கள் சார்ந்து எழுந்த பல பிரச்சினைகளுக்கு உரிய தீர்வுகள் எட்டப் படவில்லை. ஒரு பிரச்சினையுடன் இன்னொரு பிரச்சினை, இன்னொரு பிரச்சினையுடன் மேலுமொரு பிரச்சினை எனப் பிரச்சினைகள் நாளுக்குநாள் பெருகி, ஓர் இடத்தில் தேங்கிக் கிடந்த நிலைமையிலேயே, "இந்தப் பிரச்சினைகளுக்கெல்லாம் உரிய தீர்வுகளைப் பெற்றுத் தருவார்கள்" என வாக்குறுதி யளித்து, இந்த அரசை ஆட்சிக்குக் கொண்டுவந்திருந்தார்கள். ஆனாலும், இன்று வரையில் எமது மக்களது பிரச்சினைகள் எதுவுமே தீர்ந்ததாக இல்லை. மேலும் வேறு பல பிரச்சினைகளும் பெருகி, நாடே பிரச்சினைகளுக்குள்ளா கியுள்ள ஒரு நிலைமையே காணப்படுகின்றது. காணாமற் போனவர்களைக் கண்டறிதல் என்பது வெறும் தகவல்களைப் பெறுதல் என்பதல்ல; உண்மைகள் கண்டறியப்பட வேண்டும்; பாதிக்கப்பட்டவர்களுக்கு நீதி, நியாயங்கள் கிடைக்க வேண்டும்; பரிகாரங்கள் கிட்ட வேண்டும். இவை அனைத்துமே இந்த நாட்டில் மீண்டுமோர் இன ரீதியிலான பிரிவினைகளுக்கு வித்திடாமல், தேசிய நல்லிணக்கத்தைக் கருத்திற்கொண்டு மேற்கொள்ளப்படல் வேண்டும்.

கடந்தகால யுத்தம் என்பது, எதிர்கால தேசிய நல்லிணக்கத்திற்கான பாடமாக அமைய வேண்டுமேயன்றி, எதிர்காலத்தில் இன்னுமொரு யுத்தத்திற்கான பாலமாக இருந்துவிடக்கூடாது. கடந்தகால யுத்தமானது கற்றறிந்த பாடமாக இருக்கவேண்டும். மாறாக, கழற்றியெறிந்த பாடமாக இருக்கக்கூடாது. கற்றறிந்த பாடங்களின் வேதனைமிக்க கதாபாத்திரங்களாகவே இன்று காணாமற்போனோரது உறவினர்கள் காத்திருக்கின்றார்கள். காணாமற்போன தங்களது உறவுகளைத் தேடிச் செல்லும் பயணத்தில், அவர்கள் இன்று கிளிநொச்சி, கந்தசுவாமி ஆலய முன்றலில் திக்குத் தெரியாமல் தவித்துக்கொண்டிருக்கிறார்கள். இவ்வாறு ஜனநாயக ரீதியிலான போராட்டத்தில் ஈடுபட்டாவது காணாமற்போன தங்களது உறவுகளைக் கண்டறிவதற்கான பாதையில் வெளிச்சத்தைக் கொண்டுவரலாம் என்ற அவர்களது எதிர்பார்ப்புகளும் தற்போது தகர்க்கப்பட்டு வருவதாகவே உணரமுடிகின்றது. காணாமற்போனோரைக் கண்டறி

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

වතුර්කාන අලුවලකම තොටර්පිල් ආරම්පත්තිල් එමතු මක්කළුක්කු ඔරු නම්පික්කෙ ඉරුන්තතු. ඉන්රු පොරුප්පුමික්ක මක්කළ් පිරතිනිතිකළාක ඉරුක්ක වේණ්ටියවර්කළ් පලරුම් තෙරිවිත්තු වරුකින්ර ඔන්රුක්කොන්රු මුරණාන කරුත්තුකළාල්, අම්මක්කළතු නම්පික්කෙ සිතෙන්තුළ්ළතාකවේ තෙරිය වරුකින්රතු.

එනවේ, මේර්පටි කාණාමර්පෝනෝරෛක් කණ්ටරිවතර්කාන අලුවලකම් තොටර්පිල්, අතන් පණිකළ් තොටර්පිල් නාට්ටු මක්කළුක්කු විළක්කමාක අරිවුරුත්තප්පටල් වේණ්ටුම්. "වළුක්කට්ටායමාකක් කාණාමර්පෝක්කප්පටුතලිලිරුන්තු එල්ලා ආට්කළෛයුම් පාතුකාත්තල් පර්රිය සර්වතේස සමවායම්" එන්කින්ර ඉන්තච් චට්ටමූලත්තිර්කු අමෙවාක, මේර්පටි කාණාමර්පෝනෝරෛක් කණ්ටරිවතර්කාන අලුවලකමුම් සෙයර්පටුමා?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
Just give me one more minute, Sir.

අල්ලතු කාණාමර්පෝක්කප්පට්ටෝරෛයුම් කණ්ටරිවතු තොටර්පිල් සෙයර්පටුමා? එන්පතුතාන් එමතු මක්කළිටෙයේ නිලවුකින්ර කේල්වියාක ඉරුක්කින්රතු. අතාවතු, ඉන්ත අලුවලකම් ආරම්පික්කප්පට්ට තිකති මුතර්කොණ්ටු එතිර්කාලත්තිල් කාණාමර්පෝක්කප්පටුවෝර් තොටර්පිල් මාත්තිරමේ කණ්ටරියුමා? අල්ලතු ඉතර්කු මුන්පාකක් කටන්ත කාලත්තිල් කාණාමර්පෝක්කප්පට්ටෝර් තොටර්පිලුම් කණ්ටරියුමා? ඉතර්කු මුන්පාකක් කටන්ත කාලත්තිල් කාණාමර්පෝක්කප්පට්ටෝර් තොටර්පිලුම් කණ්ටරියුම් එන්රාල්, අතු එප්පෝතිරුන්තු? එන්පතු තොටර්පිල් මක්කළුක්කුත් තෙළිවුපටුත්තප්පටල් වේණ්ටුම්. ඉතු සම්පන්තමාක පොතුමක්කළුක්කු අරිවුරුත්තප්පට්ටු, කලන්තුරෛයාටප්පට්ටු, මක්කළ් තෙළිවිනෛප් පෙර ඒර්පාටුකළ් මේර් කොළ්ළප්පටල් වේණ්ටුම්. අව්වාරිල්ලාමල්, ඔව්වොරු වරුම් ඔව්වොරු කරුත්තෛ මුන්වෛත්තාල්, එමතු මක්කළ් මත්තියිල් තේවෛයර්ර මුරණ්පාටුකළ් තෝර්රුවික්කප්පටුම් එන්පතෛක්කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 4.23]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උතය පිරපාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පසු ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබුණා, "මම මේකට අත්සන් තබන්නේ නැහැ." කියා. "ඒ නිසා මේ පනත ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔබ බිය විය යුතු නැහැ. රණ විරුවා සුරක්ෂිතයි." කියාත් එතුමා ප්‍රකාශ කර තිබුණා. නමුත් අපිට මතකයි, 2017 ඔක්තෝබර් මාසයේ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවෙක් -United Nations Special Rapporteur - ලංකාවට ගොඩ බැස්ස දවසේ - හරියටම එදා උදෑසන ලංකාවට එනවා නම්- උදෑසනම ජනාධිපතිතුමා එම පනත් කෙටුම්පතට අත්සන් කරලා එය නීතියක් බවට; ක්‍රියාත්මක වීමක් බවට පත් කළා. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවනු ලැබුවා. පසුගිය අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් වුණා. හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ, කොටි භීතවාදීන් ලෙසට දීර්ඝ කාලයක් සමාජයේ ස්ථාපිත වුණු චරිත ගණනාවක් අද රණ විරුවන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට පත් කර තිබෙනවා. තොරතුරු එක්රැස් කිරීම මීසක්, නඩු පැවරීමේ අයිතියක් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නැහැ. ඒක පෙන්වලා තමයි, "බය වෙන්න එපා. මේ පනතින් ඔබට හානියක් නැහැ." කියා තමයි මේ ආණ්ඩුව රටේ ජනතාවට, රණ විරුවන්ට ප්‍රකාශ කළේ. දැන් ඔන්න අතුරුදහන් චිත්‍රපටයේ දෙවන කොටස තමයි ආරම්භ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේදී මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන්න එය න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබියදී අපි දෙවතාවක්ම ගිහින් එම පනතේ භයානකත්වය පෙන්නුවාම, අතිගරු ජනාධිපතිතුමා ආණ්ඩුවේ නායකයන්ට කථා කරලා එය කල් දැම්මා. "කල් දැමීම නොවෙයි විය යුත්තේ. මේක නරකයි නම් අද විවාද කරලා සම්මත කළත් නරකයි. හෙට විවාද කරලා සම්මත කළත් නරකයි. මේක සදහටම න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න." කියා අපි කිව්වා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. දෙවතාවක් කල් දැම්මා. එදා එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවාට බිය වුණා වාගේම, මෙදා මාර්තු මාසයේ ශ්‍රී ලංකාව පිළිබඳ සමාලෝචනයක යෙදෙන මානව හිමිකම් කොමිසමේ සැසි වාරය පැවැත්වෙන නිසා ඔන්න දඩිබිඩියේ මේ පනත් කෙටුම්පත ආපසු පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙනවා.

මේ පනත් කෙටුම්පතින් මොකද වන්නේ? ඇයි අපි මේකට බය වන්නේ? මේ පනත් කෙටුම්පත පිළිබඳ අපිට අවබෝධයක් නැහැ කියා කියමු. මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රාඥයන්ට වාගේ අපිට තේරෙන්නේ නැහැ කියා නේ කියන්නේ. නීතිය පිළිබඳ මහාචාර්යවරුන්ටත් තේරෙන්නේ නැහැ කියා නේ දැන් එතුමන්ලා ප්‍රකාශ කළේ. අපිට තේරෙන්නේම නැහැය කියමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 196 අතුරින් මෙය අත්සන් තබා ක්‍රියාත්මක කිරීම පිළිගෙන තිබෙන්නේ - ratify කර තිබෙන්නේ - රටවල් 58ක් පමණයි. එම සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 196න්ම 58ක් පමණයි මෙය පිළිගෙන තිබෙන්නේ. රටවල් 138ක් මෙම පනත තමන්ගේ රටේ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර තිබෙනවා. අපිට තේරෙන්නේ නැත්නම්, ලෝක ප්‍රජාව මේ පනත ගැන දරන අදහස මොකක්ද කියා අපි සොයා බලමු. ලෝක ප්‍රජාවේ සාතිශය බහුතරය -යුද්ධයක් තිබුණු රටවල් නොවෙයි, සාමකාමී රටවල් පවා- එය පිළිගන්නේ නැහැ. "මේ පනත අපේ රටේ ස්වාධීනත්වයට, ස්වෛරීභාවයට, රටේ පැවැත්මට අනතුරක්, මෙවැනි ප්‍රඥප්ති අපි අත්සන් නොකළ යුතුයි." කියා ජාත්‍යන්තරයේ සාතිශය බහුතරය- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල් 196න් රටවල් 138ක්ම- මෙම ප්‍රඥප්තිය තමන්ගේ රටේ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒ නිසාම මෙම පනත් කෙටුම්පතේ වගන්තියක්වත් කියවන්නේ නැතිව, ප්‍රඥප්තියේ වගන්තියක්වත් කියවන්නේ නැතිව අපිට නිගමනයට එළඹෙන්න පුළුවන්, ලෝකය පුරා සාතිශය බහුතරයක් රටවල් මෙම පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරන්නේ මෙය රටකට අවදානම් වන නිසායි කියලා. අද ලෝකයේ බලවතුන් කියන ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය විතරක් නොවෙයි කලාපයේ බලවතා වන ඉන්දියාවත් මෙය තමන්ගේ රට තුළ ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පතේ 3වැනි වගන්තිය අතිශයින්ම භයානකයි. මම එය කියවන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පතේ 3 (1) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"යම් තැනැත්තකු රජයේ නිලධරයකු වශයෙන් සිටීමින් හෝ රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරමින් හෝ රජයේ බලය පැවරීම සහාය සහ අනුදැනුම ඇතිව ක්‍රියා කරමින් -

(අ) වෙනත් යම් තැනැත්තකු සිර භාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබාගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; සහ"

රාජ්‍ය අධිකාරිය පිළිබඳවයි මෙහි ප්‍රශ්නය තිබෙන්නේ. ත්‍රස්තවාදියාට මේකේ ප්‍රශ්නයක් නැහැ. පාතාලයට ප්‍රශ්නයක් නැහැ. පැහැරගෙන ගිහින් අතුරුදහන් කළා කියන චෝදනාව පාතාලයටවත්, ත්‍රස්තවාදියාටවත් එන්නේ නැහැ. රජයේ හමුදා ඉලක්ක කර ගනිමින්මයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ අටවන වගන්තියෙන් කියන්නේ මොකක් පිළිබඳවද? උදර්පණය පිළිබඳව. ඒ කියන්නේ, මේ සම්මුතියට අත්සන් තබා තිබෙන වෙනත් රටක්, ඒ රටේ නඩුවක් ඇසීම සඳහා හෝ නඩුවකින් වැරදිකරු බවට පත් කළාවූ හෝ පුද්ගලයෙක් -ලංකාවේ සිටින පුද්ගලයෙක්- ඉල්ලනවා නම්, ලබා දිය යුතුයි කියන එකයි.

මම අහගෙනයි ආණ්ඩුව පැත්තෙන් කිව්වා, -මන්ත්‍රීතුමා කවුද කියලා මට මතක නැහැ.- අපේ රටේ පුරවැසියන්ට මෙය අදාළ නැහැ කියලා. මේ අටවන වගන්තියෙන් ඉතා පැහැදිලිව කියන්නේ, "...යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා...." කියලායි. එතකොට පුරවැසියෙකු වන, පුරවැසියෙකු නොවන ඕනෑම පුද්ගලයෙක් "යම් තැනැත්තකු" යන්නෙහි නිර්වචනයට අයත් වනවා. එහෙම නම් අපේ රණවිරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන්න යන ක්‍රියාදාමය අතිශයින්ම පැහැදිලියි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමසාරිස්වරයා ශ්‍රී ලංකාව පිළිබඳව 2015 වසරේදී ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් නිර්දේශ දෙක තමයි ශ්‍රී ලංකාව කළා කියන යුද අපරාධ පිළිබඳව ලෝකයේ ඕනෑම රටක නඩු පැවරීමේ අවස්ථාව - universal jurisdiction - සැලසිය යුතුයි කියන එක සහ එක්සත් ජාතීන්ගේ විශේෂ අධිකරණයක් පිහිටුවා යුද අපරාධ චෝදනා විමර්ශනය කළ යුතුයි කියන එක. මම හිතන විධියට ඒ 38 සහ 40 වගන්ති වෙන්න ඕනෑ. නිශ්චිතව කියන්න මට දැන් මතක නැහැ. එවැනි නිර්දේශ දෙකක් තිබෙනවා. දැන් නඩු අහන්නේ පිට රට. පිට රට නඩු අහන්න ලංකාවේ සිදු වුණු දේ ගැන තොරතුරු කෝ? ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්ම රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරින්ට රාජ්‍ය ආයතනයක් හදා දීලා තිබෙනවා, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය" කියලා. රජයේ වියදමින් එන්ජීඕකාරයෝ ටික තොරතුරු හොයලා රාජ්‍ය මුද්‍රාව යටතේ පිට රටවලට ලබා දෙනවා, හමුදාව අහවල් යුද අපරාධ කළා කියලා. එතකොට ඒ රටවල නඩු පවරනවා. ඒ රටවල නඩු පැවරුවාට අපේ රණවිරුවන් සුරක්ෂිතයි කියලා අපි හිතනවා. මොකද, ඒ අය ඉන්නේ ලංකාවේ නිසා. නමුත් එහෙම නැහැ. දැන් පළමුවන පියවරෙන් ඒ පනත සම්මත කළා. තොරතුරු සෙවීම ආරම්භ කළා. දැන් මේ ප්‍රඥප්තිය පිළිගෙන අපි මේ පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ සම්මත කළොත්, අන්න, විදේශ රටක් අපේ රණවිරුවෙක් ඔවුන්ගේ රටේ පැවැත්වෙන නඩු විභාගයක් සඳහා අවශ්‍යයි කියා ඉල්ලා සිටියොත්, මේ අටවන වගන්තිය යටතේ භාර දීමට අපි බැඳී ඉන්නවා.

අපි දන්නවා, දැනටමත් බ්‍රසීලයෙන් අපේ හිටපු හමුදාපතිවරයෙක් පිළිබඳ මෙවැනි ඉල්ලීමක් ලැබී තිබෙන බව. ඇත්තටම රටට ඉල්ලීමක් ආවේ නැතත් ඒ රටේ නඩු පැවරීමක් සිදු වුණා. මේ ප්‍රඥප්තිය පිළිගැනීමෙන් පසු, මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු, පනතේ අටවන වගන්තිය යටතේ එවැනි රටක් ඉල්ලා සිටියොත්, අදාළ රණවිරුවා ඒ අදාළ රටට භාර දීමට මෙරට නීතියෙනුත් ජාත්‍යන්තර නීතියෙනුත් අපි බැඳී සිටිනවා. අන්න ඒකයි, මේ පනතේ තිබෙන භයානකත්වය.

අපි දන්නවා, හැමෝම පිළිගන්නවා, මේ ආණ්ඩුවට තිබෙන ලොකුම තර්ජනය රටේ ඉන්න ජනප්‍රියම පුද්ගලයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා කියලා. හිටපු ජනාධිපතිවරයෙක් විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව යටතේ එතුමාට මුක්තියක් ලැබී තිබෙනවා. ජනාධිපති ධුර කාලයේ කරපු කිසිම වැරැද්දක් සම්බන්ධයෙන් එතුමාට විරුද්ධව මේ රටේ නඩු පවරන්න බැහැ. එහෙම නම් දැන් මොකක්ද කරන්න ඕනෑ? හැබැයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් තොරතුරු එකතු කරලා, වෙනත් රටක නඩු පවරලා, ඒ රටෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ රටට භාර දෙන්න කියලා ඉල්ලා සිටියොත්, මේ අටවන වගන්තිය යටතේ ඒ ඉල්ලීම ඉටු කරන්න ශ්‍රී ලංකා ආණ්ඩුව බැඳී ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මට වැඩිපුර විනාඩි තුනක කාලයක් ලබා දුන්නා. ඒ විනාඩි තුනත් දුන්නා නම් හොඳයි. චමල් රාජපක්ෂ මැතිතුමාගේ කාලයෙන් මට විනාඩි තුනක කාලයක් ලබා දෙන්න. ආණ්ඩුව අතුරුදහන් වීම පිළිබඳව පොඩ්ඩක් කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. චමල් රාජපක්ෂ මැතිතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා. ඒකෙන් මට අවශ්‍ය ප්‍රමාණය ගන්න කියා කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුද්ගලයින් අතුරුදහන් වීම පිළිබඳව මේ ආණ්ඩුව සංවේදියි. හැබැයි මේ වන විට රටේ ආණ්ඩුව අතුරුදහන් වෙලා තිබෙනවා. මේ රටේ සිංහල සහ මුස්ලිම් ජනතාව අතර, එකිනෙකා අතර ඇති වුණු අවිශ්වාසය වෛරයක් බවට ඔඩු දුවලා, මේ වන විට එය ගැටුමක් බවට පත් වෙලා තිබෙනවා. මේ අවිශ්වාසය දුරු කිරීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. සෑම පුරවැසියෙකුගේම ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. නමුත් අද මේ රටේ ආණ්ඩුවක් නැද්දෝ කියලා ජනතාවට, ලෝක ප්‍රජාවට හිතෙන ආකාරයෙන් තමයි රටේ කටයුතු සිදු වන්නේ. ඇඳිරි නීතිය ක්‍රියාත්මක වෙනවා කියා කියනවා. හැබැයි ප්‍රචණ්ඩ ක්‍රියාවල නැවතීමක් සිදු වෙලා නැහැ. මේ ගැටුම ඇති වුණේ ඇයි කියන ප්‍රශ්නය පිළිබඳව මේ වන විට රටේ ප්‍රචාරය වන්නේ මිථ්‍යාවක් නිසා සත්‍ය තත්ත්වය පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල පුද්ගලයෙක් මැර ප්‍රහාරයකට ලක් වී මිය යාම නොවෙයි ගැටුම ආරම්භ වීමට හේතුව. ඒ ප්‍රහාරය එල්ල කළ අය පොලීසියෙන් ක්ෂණිකව අත් අඩංගුවට ගත්තා, අධිකරණයෙන් රක්ෂිත බන්ධනාගාරගත කළා, රටේ නීතිය ක්‍රියාත්මක වන බව දැක්කා. ජනතාව නීතිය අතට ගන්න ගියේ නැහැ;

නිහඬව තමන්ගේ වැඩවල යෙදී සිටියා. ඒ අතර, පසුගිය ඉරිදා රාත්‍රියේ මිය ගිය පුද්ගලයාගේ ගමේ කඩ මණ්ඩියේ කඩ පහක්

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

ගිනි ගත්තා, පොලිස් ආරක්ෂාව තිබියදී. පොලිස් ආරක්ෂාව තිබියදී! ඒකයි සැකය. ඉන් කඩ දෙකක් මුස්ලිම්, කඩ තුනක් සිංහල. එය සිංහල අය කළාද, මුස්ලිම් අය කළාද, තුන්වැනි පාර්ශ්වයක් කළාද කවුරුවත් දන්නේ නැහැ. හැබැයි, මළ ගෙදර පැමිණෙමින් සිටි බසයක් පොලිසියෙන් නතර කරලා 24 දෙනෙක් අහේතුකව අත් අඩංගුවට ගත්තවා. මළ ගෙදර පැමිණෙන පිරිස් වාහන පිටින් හරවලා යවන්න පොලීසිය පටන් ගන්නවා. මෙන්න මෙතැනින් ඇති වුණු කෝපය තමයි ගැටුමට මූලාරම්භය වන්නේ. එහෙම නැතිව, සිංහල පුද්ගලයෙක් මරා දැම්මා කියලා, සිංහල මිනිස්සු තිරස්චීන විධියට මුස්ලිම් අයට පහර දෙන්න ගියාය කියන එක සම්පූර්ණ අසත්‍ය කථාවක්. ඒ වෙලාවේ පොලීසිය නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතිව, පක්ෂග්‍රාහීව කටයුතු කරනවාය කියන හැඟීම තමයි නීතිය අතට ගන්න ජනතාව පෙළඹෙව්වේ. ඒ නිසා අහේතුකව මේ 24 දෙනා අත් අඩංගුවට ගන්න පොලීසියට කිව්වේ කවුද? මෙහෙම අත් අඩංගුවට ගැනීමෙන් පසුව දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා, "මේ අය නිදහස් නොකළහොත් ගැටුමක් ඇති වීමේ අවදානමක් තිබෙනවා" කියලා පොලීසියට කිව්වාම නියෝජ්‍ය පොලිස්පතිතුමා වහසි බස් දොඩනවා, "ඔබතුමා කලබල නොවී ඉන්න, ඒ හරිය අපි බලා ගන්නම්" කියලා. ඔය තියෙන්නෙ බලා ගත්ත අපූරුව!

අවසාන වශයෙන්, මම අහන්නේ නියෝජ්‍ය පොලිස්පතිට අක්‍රිය වෙන්න කිව්වේ කවුද, ඇඳිරි නීතිය කඩ කරමින් කලබල ඇති කරන්න පුද්ගලයන්ට බලය දුන්නේ කවුද කියන එකයි. මේ ප්‍රශ්නවලට අද විසඳුම් ලැබිය යුතුයි. අපට මතකයි, 1981 යාපනයේ පුස්තකාලය ගිනි තබලා මහා කලබලයක් ඇති කරලා ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබියදීයි; ඒ වාගේම 1983 සිංහල-දෙමළ කලබලයක් ඇති කරලා "කළු ජූලිය" කියලා අපේ ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබියදීයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් කොංග්‍රසයේ නායක ගරු රවුෆ් හකීම් මැතිතුමා - මගේ මිත්‍රයා- ඊයේ සඳහන් කළා, "පළාත් පාලන මැතිවරණය පැවැත්වීමෙන් පසුව මුස්ලිම් අයට පහර දීමේ ප්‍රවණතාවක් තිබේ" කියලා. ඒ ගැන මම ඉතාමත් කනගාටු වෙනවා. රවුෆ් හකීම් මැතිතුමාට අමතක වුණා; පළාත් පාලන මැතිවරණයට මාස එකහමාරකට කලින් ගිංතොට සිද්ධියක් ඇති වුණු බව; පසුගිය මාස හය තුළ සිදුවීම් තුනක් ඇති වුණු බව. හැබැයි, මේක පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ඇති වුණු දෙයක් නොවෙයි. කලින් සිටම ආපු එකේ දිගුවක් තමයි මැතිවරණයෙන් පසුවත් යන්නේ. මෙයින් අපට ඇති වාසියක් නැහැ. හැබැයි, මේ කලබලය ඇති වෙන්න කලින් අගමැතිතුමා ඉවත් කිරීම පිළිබඳව රටේ සංවාදයක් තිබුණා; බැඳුම්කර වංචාව පිළිබඳව රටේ සංවාදයක් තිබුණා; බඩු මිල ඉහළ යාම ගැන ජනතාව ඉන්නේ කේන්තියෙන් කියලා මැතිවරණ ප්‍රතිඵල බැලීමෙන් පසුව රටේ සංවාදයක් තිබුණා. ඒ සියල්ල පැත්තකට ගිහිල්ලා අද රටේ මාතෘකාව "සිංහල-මුස්ලිම් සමගිය ගොඩනඟන්නේ කෙසේද?" කියන එකයි. කවුද, අවසාන ලාභය ලබා තිබෙන්නේ? ඒ, මේ ආණ්ඩුවයි; අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවයි. එදා 1981 යාපනයේ වුණු දේ ගැනත්, 1983 රට පුරාම සිදු වුණු දේ ගැනත් රාජන් හූල් සඳහන් කරනවා. එතුමා කියනවා, 1983දී ඇති වුණු ආණ්ඩු විරෝධය, එක්සත් ජාතික පක්ෂය උපක්‍රමිකව දෙමළ විරෝධයක් බවට හැරෙව්වාය කියලා. "එවැනි දෙයක් යළිත් මේ රටේ සිදු වන්න ඉඩ තියන්න එපා" කියලා ඉතාම ඕනෑකමින් ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා සිටිමින්, මේ ගැටුමෙන් විපතට පත් සියලුදෙනා වෙනුවෙන්ම ශෝකය පළ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 21ක් තිබෙනවා.

[අ.භා. 4.37]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡා කරන මාතෘකා කිහිපය අතරින්, විශේෂයෙන්ම "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු නැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත" ගැන කෙටියෙන් අදහසක් දක්වනවා. මොකද, මේ පනත් කෙටුම්පත අද සම්මත නොකර එකඟ වුණු විධියට ඉදිරියටත් සාකච්ඡා කරාවිය කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වාගේම එහි සාමාජිකයෙක්. බලහත්කාරය නිසා අතුරුදහන් වීම පිළිබඳව ඉතිහාසයක් අපට තිබෙනවා. අපි දන්නවා, අද මේ පාර්ලිමේන්තුවෙත් ඉන්නවා කියලා, එදා 'කළු බළල්ලු', 'කහ බළල්ලු', 'ප්‍රා','සා', 'කොළ කොටි' ආදී නම්වලින් ඇවිල්ලා රාජ්‍ය බලය බලහත්කාරයෙන් පාවිච්චි කරලා; රාජ්‍ය බලයට එහා ගිය - ඉක්මවා ගිය- බලයක් පාවිච්චි කරලා අතුරුදහන් කිරීම්වලට ලක් කළ අය. ඇත්තටම මම කැමැති නැහැ, මගේ දරුවෙක්වත්, මාවත්, මා වාගේම සාමාන්‍ය ජනතාවත් තව කවුරු හෝ විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කරනවාට. සුනාමියක් ආවොත් කරන්න දෙයක් නැහැ. සුනාමිය කියන්නේ ස්වභාවික විපතක්. හැබැයි, තව කෙනෙකුගේ බලය විසින් තව කෙනකු අතුරුදහන් කරන්න කාට හෝ පුළුවන්ද? ජාතිවාදයෙන් ඔළුව අවුල් කරගෙන කථා කරන සමහර අයට විවිධ හේතු තියෙන්න පුළුවන්. නමුත් මට හැඟෙන දේ තමයි, තමන්ට රාජ්‍ය බලය ලැබුණු වෙලාවක මිනිසුන් අතුරුදහන් කරන්න බලාපොරොත්තු වන කට්ටියට තමයි මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න පුළුවන් වන්නේ කියන එක.

මොකද, තමන්ට රාජ්‍ය බලය අරගෙන සාමාන්‍ය ජනතාව, වැඩ වර්ජනය කරන අය, දේශපාලන ක්‍රියාකාරීන් අතුරුදහන් කරන්න කැමැත්තෙන් ඉන්නා කෙනෙකුට මේකට විරුද්ධ වෙන්න පුළුවන්. මම කියන්නේ නැහැ, මෙම නීතිය පාර්ලිමේන්තුවෙන් සම්මත වුණු නිසාම ඊට පසුව අතුරුදහන් කිරීම් නතර වෙනවා කියලා. එහෙම වෙන්නේත් නැහැ. හැබැයි, 1988-89 කාලයේ ඉතිහාසය අපිට මතකයි. අඩු තරමේ අතුරුදහන් වුණු කෙනෙක් එසේ අතුරුදහන් වීම අපරාධයක් කියලාවත් සැලකුවේ නැහැ. එසේ අතුරුදහන් වීම ඔප්පු කළත්, ඒක අපරාධයක් කියලා සැලකුවේත් නැහැ. අපේ රටේ එවැනි ඉතිහාසයක් තිබුණා; සිවිල් යුද්ධ නිසා ඇති වුණු ඉතිහාසයක් තිබුණා. අනාගතයේ එහෙම විය යුතු නැහැ. අනාගතයේ එහෙම නොවෙන්න ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකාවෙන් ගෙනෙන නීතියක් හෝ තිබෙනවා නම් කමක් නැහැ. ඒකට රට නොවෙයි, ප්‍රශ්නය. ලංකාවේ නීතියක් නැත්නම්, ජාත්‍යන්තරව හෝ සම්මුතියක් තිබෙනවා නම් ඒක හොඳයි කියලා පිළිගන්න ඕනෑ, ජාතිවාදී නරුම මානසිකත්වයෙන් එළියට ඇවිල්ලා. ඒ නිසා අපි මේ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න ඕනෑ කියලා මා කියනවා.

මගේ රටේ ජනතාව මොන පක්ෂයකට අයිති වුණත් -එක්සත් ජාතික පාක්ෂිකයෙක් වුණත්, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්

වුණත්, මම අදහස් කරන, මම පිළිගන්නා දේශපාලන මතය පිළිනොගන්නා කෙනෙකු වුණත්- බලහත්කාරයෙන් අතුරුදහන් වෙනවාට මම කැමැති නැහැ. අපිට එහෙම කැමැති වෙන්න පුළුවන්ද? සාමාන්‍ය, සරල අදහසින් ගත්තොත් බලහත්කාරයෙන් පුද්ගලයෙක් අතුරුදහන් කරන්න තව කෙනෙකුට පුළුවන්ද? ඒකට කැමැති වෙන්න පුළුවන්ද? මේ තුළ තිබෙන නීති-රීති, අණපනත් හෝ වගන්ති ගැන නොවෙයි, මම මේ කියන්නේ. හරයෙන් ගත්තොත්, හරයෙන්ම කෙනෙකුට තව කෙනෙකුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එකඟ වෙන්න පුළුවන්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා, බලහත්කාරයෙන් මිනී මරද්දී. මට කනගාටු ඒ ගැනයි. අද අපේ රටේ එක තැනක මිනිසුන් බියෙන් ජීවත් වෙනවා. ඔවුන්ට රෑය ගත කරන්න බැහැ. මොකද, සිංහල කෙනා මුස්ලිම් කෙනා මරයිද, මුස්ලිම් කෙනා සිංහල කෙනා මරයිද කියලා බයෙන් ඔවුන් ඉන්නේ. මිනිස්සු මරණයට බයෙන් ජීවත් වෙද්දී, අපි මේ පාර්ලිමේන්තුවේදී බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා. ඒක තමයි ලොකුම විහිළුව. මොකද, අපි කථා කරනවා, "ඔයා බලහත්කාරයෙන් අතුරුදහන් කරන්න ඉඩ දෙන්නේ නැහැ" කියලා. හැබැයි, අපි බලහත්කාරයෙන් මරනවා. බලහත්කාරයෙන් අතුරුදහන් කරන්නේ නැහැ කියලා කථා කරනවා. හැබැයි, අද අපි, මිනිහෙක් තව මිනිහෙක්ව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට විරුද්ධ වීම ගැන, පක්ෂ වීම ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරද්දී, බලහත්කාරයෙන් මරනවා. සිංහල කෙනා මුස්ලිම් කෙනා මරන්න හොයනවා, මුස්ලිම් කෙනා සිංහල කෙනා මරන්න හොයනවා. මේ පාර්ලිමේන්තුවේදී අපි බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම ගැන නීති කථා කරනවා. විහිළු නේද? අපි විහිළුවට ලක් වෙලා නේද? මේ පාර්ලිමේන්තුව විහිළුවක් නොවෙයිද? කල්පනා කරලා බලන්න. අද අපි මේ පාර්ලිමේන්තුවේ මෙහෙම කථා කරන එක ගැන කනගාටු වෙන්න ඕනෑ. නමුත් මානෘකාවක් තිබෙන නිසා, කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2001 ඉඳලා මේ රටේ කර්මාන්ත, ව්‍යාපාර වෙනුවෙන් බරපතළ තර්ජනයක් වුණු ලෝක වෙළෙඳ සංවිධානය -WTO - සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා හැටියට ගෙනා, 2001 අන්තර් ජාතික වෙළෙඳ හා වාණිජ විෂය භාර අමාත්‍යාංශයේ ඇමතිවරයා ඉදිරිපත් කරලා, 2005 මැයි 12 අමාත්‍ය මණ්ඩලයේ තීරණය අරගෙන, 2006 නැවත මේ පාර්ලිමේන්තුවට ගෙනා ප්‍රභාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත - Anti-Dumping and Countervailing Duties Bill - සහ ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත - Safeguard Measures Bill - කියන පනත් කෙටුම්පත් දෙක ගැනත් සාකච්ඡා කරන්න ඕනෑ.

මේ ප්‍රභාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු කියන පනත් කෙටුම්පත 2001 ඉඳලා පාර්ලිමේන්තුවේ කථා වෙන එකක්. මම පැහැදිලිව කියනවා, ජනතා විමුක්ති පෙරමුණ හැටියට 2006දී අපි මේකට විරුද්ධ වුණු බව. අපේ විරෝධතාව නිසා පාර්ලිමේන්තුවේ එය සම්මත නොකර නතර කළා. හැබැයි, අපි එතැනින් නතර වුණේ නැහැ. අපේ විරෝධතාවට පදනම් වුණු හේතු එක්ක අපි දිගටම ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කළා; ඔබතුමන්ලා එක්ක හැප්පුණා; වාද-විවාද කළා. අපි කර්මාන්ත මණ්ඩල හම්බ වුණා; ව්‍යාපාරික සංගම් හම්බ වුණා; අපේ රටේ දේශීය කර්මාන්තකරුවන් මුණ ගැහුණා; ඔවුන්ගේ යෝජනා ගෙනාවා. මේ ප්‍රභාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු කියන පනත් කෙටුම්පත එක පැත්තකින් හොඳ යෝජනාවක්. ඒ හොඳ අරමුණට අපි සම්පූර්ණයෙන් එකඟයි.

හොඳ අරමුණ තමයි, undervalue කරලා ලංකාවට භාණ්ඩ ගෙනෙන එක වළක්වාගෙන දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීම කියන අරමුණ. ඒ අරමුණ එක්ක අපට විවාදයක් නැහැ. හැබැයි ඒක WTO එකේ කමිටුවක් නම් කරලා WTO එකේම -ලෝක වෙළෙඳ සංවිධානයේම- අරමුණ එක්ක කටයුතු කරපු එක සම්බන්ධයෙන් අපි සංශෝධන ඉදිරිපත් කළා. ගරු අමාත්‍යතුමනි, ඒ බව ඔබතුමා දන්නවා. මා මෙය සරල උදාහරණයකින් කියන්නම්. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ලෝකයේ තිබෙන කසි කබල් භාණ්ඩ ගෙනැල්ලා ලංකාවේ දේශීය කර්මාන්ත, ව්‍යාපාර විනාශ වන එක වළක්වා ගන්න එක රජයේ වගකීමක්. ඒකට අපි එකඟයි. ඒක තමයි undervalue කරන එකට විරුද්ධ වෙන්නේ. හැබැයි, දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට සෙස් බදු ක්‍රමයක් දැන් තිබෙනවා; සෙස් බදු පැනවීමක් දැන් තිබෙනවා. උදාහරණයකට ගන්න පුළුවන්, බිස්කට් කර්මාන්තය. ලංකාවේ බිස්කට් කර්මාන්තයේ ඉන්නවා, ප්‍රධාන බිස්කට් ව්‍යාපාරිකයන්. ඒ අය බිස්කට් නිෂ්පාදනය කරනවා. පිට රටින් බිස්කට් කිලෝ එකක් ගෙනෙනවා නම් කිලෝ එකට රුපියල් 200ක් බදු ගහනවා. එතකොට, පිට රටවලින් ගෙනැල්ලා රුපියල් 200ක් වැඩිපුර දීලා කන්න කැමැති අයට ඒ බිස්කට් කන්න පුළුවන්. එහෙම නැත්නම් ලංකාවේ බිස්කට් කන්න පුළුවන්. එය විසින් කරනු ලබන්නේ ලංකාවේ ව්‍යාපාරිකයා ආරක්ෂා කරන එකයි. හැබැයි, ඔබතුමන්ලාගේ ප්‍රභාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර යටතේ නිදහස් වෙළෙඳ පොළ පදනමින් ජාත්‍යන්තර කර්මාන්තකරුවකු කිව්වොත්, 'ලංකාවේ බිස්කට් කර්මාන්තයට ඇතුළු වෙන්න මට මේ බද්ද බාධාවක් වෙලා තිබෙනවා. මේක ඉවත් කර දෙන්න ඕනෑ' කියා, ඔබතුමන්ලා ඒ ව්‍යාපාරිකයාට දේශීය වෙළෙඳ පොළට එන්න ඉඩ හදන්න ඕනෑ. ඒ, ඔබතුමන්ලා ජාත්‍යන්තර නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට අත්සන් කර තිබෙන නිසායි; මේ ළඟදී සිංගප්පූරුව සමඟත් වෙළෙඳ ගිවිසුමක් අත්සන් කළ නිසායි. දේශීයව පනවන මේ බද්ද ඉවත් කරලා ඒ ජාත්‍යන්තර ව්‍යාපාරිකයාට, කර්මාන්තකරුවාට ලංකාවේ වෙළෙඳ පොළට එන්න ඉඩ දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය දැන් ඔබතුමන්ලාට තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා මේ ආරක්ෂණ පියවර යටතේ යෝජනා කරන්නේ දේශීය කර්මාන්තකරුවාටයි.

දේශීය ව්‍යාපාරිකයාට යෝජනා කරනවා, 'ඔබේ කර්මාන්තයට ආනයන වෙළෙඳ පොළෙන් -පිට රටින්- ගෙනෙන භාණ්ඩයකින් තර්ජනයක් තිබෙනවා නම් ඒ තර්ජනය ඔප්පු කරන්න' කියා; 'ඒ තර්ජනය ඔප්පු කළොත් ආරක්ෂා කරන්නම්. නැත්නම් ආරක්ෂා කරන්න බැහැ' කියා. ඕක තමයි කතන්දරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තර්ජනය තිබෙන දේශීය කර්මාන්තකරුවා මා නම්, මා ඔප්පු කරන්න ඕනෑ මගේ කර්මාන්තයට, මගේ ව්‍යාපාරයට මෙන්න මේ තරම් තර්ජනයක් තිබෙනවා කියා. එය ඔප්පු කිරීම සඳහා මම තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. කර්මාන්තකරුවා තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. බරපතළ හානියක් සම්බන්ධයෙන් නම් දේශීය නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම සොයන්න ඕනෑ. දැන් බිස්කට් හදන එක පැත්තක තියලා මා සොයාගෙන යන්න ඕනෑ, ලංකාවේ බිස්කට් කර්මාන්තයේ දේශීය නිෂ්පාදනය කොච්චර ප්‍රමාණයක්ද කියා. මම ඒ තොරතුරු ටික සොයාගෙන ඇවිල්ලා ඔබතුමාගේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට ඔප්පු කරන්න ඕනෑ. නිෂ්පාදනයේ ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම ගැන සොයන්න ඕනෑ. මගේ නිෂ්පාදනය කොච්චරද, ලංකාවට බිස්කට් කොච්චර ඕනෑද, මිනිස්සු කොච්චර බිස්කට් කනවාද, කොච්චර කන්න හිතාගෙන ඉන්නවාද කියන ටික මම සොයාගෙන එන්න ඕනෑ. ඉන්වෙන්ට්‍රි මට්ටම්වල සිදුවූ වෙනස්වීම්, වෙළෙඳ පොළ කොටස්, අළෙවි මට්ටම්වල සිදු වූ වෙනස් වීම් -ඒ කියන්නේ අර තර්ජනය නිසා අළෙවියේ වෙච්ච වෙනස්කම්- දේශීය කර්මාන්තයේ සේවා නියුක්තියේ සහ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

වැටුප්වල මිල මට්ටම් ගැන සොයන්න ඕනෑ. මගේ බිස්කට් කර්මාන්තශාලාවේ සේවය කරන 300 දෙනා විතරක් නොවෙයි, ලංකාවේ බිස්කට් කර්මාන්තයේ කීදෙනෙකු ඉන්නවාද, ඒ අයගේ වැටුප් මට්ටම් මොනවාද කියන ටික සොයා ගෙන ගිහින් මම ඔප්පු කරන්න ඕනෑ. මිල මට්ටම්වල වෙනස්වීම්, උද්ධමනය ගැන සොයන්න ඕනෑ. අවුරුදු කීයක ඒවාද කියා මම දන්නේ නැහැ. අධ්‍යක්ෂ ජනරාල්තුමා සතුටු වන කල්ද, එතුමා කැමැති තාක් කල් ද, එතුමා සතුටු කරන්නද කියා මම දන්නේ නැහැ. ඵලදායිතාව, ලාභ අලාභ, ආයෝජන මත ප්‍රතිලාභ, මුදල් ගලනය, බරපතළ තර්ජනයක් ඇති වීමට අදාළ විය හැකි වෙනත් යම් තොරතුරු ආදි ඔක්කෝම දේශීය කර්මාන්තකරුවා සොයා ඔප්පු කරන්න ඕනෑ. ඔප්පු කරන්න බැරි වුණොත්? මේ කර්මාන්තකරුවා කර්මාන්තය කරන එක පැත්තක තියලා මේ තොරතුරු සොයන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. ඒ තොරතුරු ඔප්පු කරගන්න බැරි වුණොත්, අර කියපු බද්ද ඉවත් කරනවා. ඒ බද්ද ඉවත් කරලා විදේශ කර්මාන්තකරුවාට එන්න ඉඩ හදනවා. මොකද, ඒ විදේශ කර්මාන්තකරුවාට ගිහින් ජාත්‍යන්තරයට කියන්න පුළුවන්, 'මෙයාට මේක ඔප්පු කර ගන්න බැරි වුණා. මට ඒ සඳහා යන්න ඉඩ දෙන්න ඕනෑ' කියා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඒ කාරණය දැන ගන්න කැමැතියි. [බාධා කිරීමක්] රංගේ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා ඔය අභ්‍යන්තර ප්‍රශ්න පොඩ්ඩක් පැත්තක තියලා ඇමතිතුමාට මේ විවාදයට සම්බන්ධ වෙන්න ඉඩ දෙන්න. ඔබතුමා අභ්‍යන්තර ප්‍රශ්න ගැන පසුව කථා කරන්න; මේ සඳහා ඉඩ දෙන්න. මොකද, එතුමා විෂය භාර ඇමතිතුමා නිසා.

ජාත්‍යන්තර කර්මාන්තකරුවෙකුට, ජාත්‍යන්තර තරගකරුවෙකුට අපි කිව්වොත්, ඔයාට එහෙම මේ රටට එන්න බැහැ, අපේ දේශීය කර්මාන්තයට ඔබේ කර්මාන්තය බරපතළ හානියක් බව ඔප්පු වෙලා තිබෙනවා, ඔබේ කර්මාන්තය බරපතළ හානියක් බව දේශීය කර්මාන්තකරුවා ඔප්පු කරලා තිබෙනවා, ඒ නිසා ඔයාට එන්න අයිතියක් නැහැ කියලා, එයා ඒක පිළිගන්නවාද නැද්ද? එයා ඒක පිළිනොගෙන කාර්මික ආරවුල් අධිකරණයට - Industrial Court එකට - ගියොත් අපි මොකද කරන්නේ? ඒ ප්‍රශ්නයට මේ පනත් කෙටුම්පතේ උත්තරයක් නැහැ. මම කියන කාරණය ඇමතිතුමාට තේරෙනවා ඇති කියලා මා විශ්වාස කරනවා. අපි ඔප්පු කරනවා, ජාත්‍යන්තරයෙන් එන කර්මාන්තකරුවා අපේ දේශීය කර්මාන්තයට බරපතළ තර්ජනයක්, ඒ නිසා අපේ දේශීය කර්මාන්තය බිඳ වැටෙනවා කියලා. අපේ කර්මාන්තයේ තත්ත්වය මෙහෙමයි, ජාත්‍යන්තර තරගකරුවා ආවොත් මෙහෙමයි කියලා අපි ඔප්පු කරනවා. ඒ ඔප්පු කිරීම කවුද පිළිගන්නේ? ඒ හේතුව පෙන්වලා අපට ඒ ජාත්‍යන්තර කර්මාන්තකරුවා නවත්වන්න පුළුවන්ද? දැන් අපි පනවා තිබෙන බද්ද නිසා නම් ඒ නැවැත්වීම කරන්න පුළුවන්. මොකද, දැන් පනවා තිබෙන බද්ද නිසා ස්වාභාවික වරණයක් ඇතිවන නිසා. උදාහරණයට බිස්කට් කර්මාන්තයම ගත්තොත්, බිස්කට් කිලෝ එකට රුපියල් 200ක බද්දක් පනවා තිබෙනකොට, බිස්කට් වැඩි මිලට අරගෙන කන්න කැමති කට්ටිය -ඔබතුමන්ලා වාගේ කට්ටිය- අරගෙන කයි. නමුත් සාමාන්‍ය මිනිස්සු කන එකක් නැහැ. [බාධා කිරීමක්] සාමාන්‍ය මිනිස්සු අපේ දේශීය කර්මාන්තයේ තිබෙන මන්ච් හෝ මැලිබන් හෝ බිස්කට් කයි. ඇයි ඒ? ඒවායේ මිල ස්වාභාවිකවම මේ බද්ද විසින් පාලනය කරලා තිබෙන නිසා. හැබැයි, දැන් එහෙම නොවෙයි සිද්ධ වෙන්න යන්නේ. දැන් යෝජනා කරනවා, "දේශීය කර්මාන්තකරුවාගේ කර්මාන්තයට පිට රටින් එන කර්මාන්තකරුවා තර්ජනයක් කියලා ඔප්පු කරන්න ඕනෑය" කියලා. ඒක ඔප්පු කර ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ? ඒ වාගේම අපි හිතමු ඒක ඔප්පු කළා කියලා. ඔප්පු කළාට පස්සේ අර විදේශීය කර්මාන්තකරුවා මේ රටට නැවිත් ඉන්නවාද? එහෙම නැවිත් ඉන්නවාය කියලා මේ පනතින් අපට මොකක්ද තිබෙන assurance එක? ඒ විදේශීය කර්මාන්තකරුවාට යන්න පුළුවන්නේ අපට විරුද්ධව Industrial Court එකට. අන්න එතැන තමයි බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ තිබෙන ලොකුම දේ මේකයි. මම ඒ ගැන සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අධ්‍යක්ෂ ජනරාල්වරයාම තමයි අවසානයේ තීරණය කරන්නේ, මේ ඔක්කෝම තොරතුරු මත මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවාද නැද්ද කියලා. [බාධා කිරීමක්] ඒක තමයි. දේශීය කර්මාන්තකරුවා කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ නොකිරීම තීරණය කරන්නේ තනි අධ්‍යක්ෂ ජනරාල්වරයා. දේශීය කර්මාන්තකරුවා මාස ගණනක් තමුන්ගේ කර්මාන්තය නතර කරගෙන ඉඳලා තොරතුරු හොයලා, කර්මාන්තය ගැන ලංකාවේම තොරතුරු හොයලා, මුළු සේවා නියුක්තිය හොයලා, ඵලදායිතාව හොයලා -ඒ ඔක්කෝම හොයලා- ගිහිල්ලා දුන්නාට පස්සේ, ඕනෑ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට කියන්න පුළුවන් 'මම මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවා' කියලා. අනික් අතට ඒ කියන්නේ මොකක්ද? අර ජාත්‍යන්තර කර්මාන්තකරුවාට එන්න ඉඩ හදන්න ඕනෑය කියන එකයි. මෙතැන තමයි බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ. මෙහිදී ජාත්‍යන්තර ලෝක වෙළඳ සංවිධානයේ තිබෙන මුළු රාමුවම අපට සම්පූර්ණයෙන් වෙනස් කරන්න බැරි වුණත්, මුළු අවශ්‍යතාවම වෙනස් කරන්න බැරි වුණත් අපි සැලකිය යුතු යෝජනා ප්‍රමාණයක් සංශෝධන හැටියට ලබා දුන්නා. ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක් ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා. නමුත් මෙන්න මෙතැන මේ ගැටේ තිබෙනවා. ඒ මොකක්ද? දේශීය කර්මාන්තයට තර්ජනයක් තියෙනවාය කියලා අපි ඔප්පු කළත්, එය විසින් ඒ එන විදේශ කර්මාන්ත ආක්‍රමණය නතර කළ හැකි ද? ඒ ගොල්ලන්ට අවස්ථාවක් තිබෙනවා නේද අපට විරුද්ධව Industrial Court එකට යන්න? ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ කාරණය ගැන මොනවා හරි කියනවාද? දැන්ම මේ ප්‍රශ්නය බෙරලා දුන්නොත් ලොකු දෙයක්. මේක තමයි මෙතැන තිබෙන බරපතළම ප්‍රශ්නය. [බාධා කිරීමක්] අධ්‍යක්ෂ ජනරාල්වරයාට පරීක්ෂණයක් නවත්වන්නත් පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ගැටලුව.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ තිබෙනවා තවත් කාරණාවක්. විභාග කිරීමේදී, ඒ කියන්නේ දේශීය කර්මාන්තකරුවා job එක නවත්වලා, බිස්කට් හදන එක නවත්වලා, පාවහන් හදන එක නවත්වලා, තමන්ට තිබෙන තර්ජනය ඔප්පු කරන්න යනවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ළඟට. ගිහිල්ලා කියනවා, "මගේ කර්මාන්තයට මෙච්චර තර්ජනයක් තිබෙනවා, දැන් ඉන්දියානු කොම්පැනි එන්න හදනවා, චීන කොම්පැනි එන්න හදනවා, ජාත්‍යන්තර වෙළඳ සංවිධාන යෝජනා අනුව යුරෝපා කර්මාන්තශාලා එන්න හදනවා, ඒ නිසා අපේ කර්මාන්තය කඩා වැටෙනවා" කියලා. ඒ පැමිණිල්ල විභාග කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා මූලසුන දැරිය යුතු අතර, රහස්‍යභාවය සුරැකීමට ඔහු වගබලා ගත යුතුයි. සහභාගීවීමට උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන්ට ස්වකීය අදහස් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් දෙන්න ඕනෑ. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ විභාගය කරන්න ඕනෑ. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ ඔක්කෝම ටික කළාය කියලා හිතමු. ලංකාවේ කර්මාන්තකරුවන් සියයක් පැමිණිලි 100ක් ගෙනාවොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට මොකද වෙන්නේ? ඒ පැමිණිලි විභාග කරන්න අවුරුදු කීයක් යයි ද?

සභාපති හැටියට ඔහු විතරක් පුටුවේ වාඩි වෙලා කටයුතු කරනවා. මේක කොයිතරම් ප්‍රායෝගික නොවන යෝජනාවක්ද? ඒ නිසා තමයි අපි ඔබතුමන්ලාට තවත් සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ. ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පත සම්මත කරනවා නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අමතරව අඩුම තරමින් ඔහු නැති වෙලාවක මේ පැමිණිලි විභාග කරලා අවසන් කරන්න ඔහු නම්

කරන තව පුද්ගලයෙක්වත් ඇතුළත් කළ යුතුයි. ඒ මොනවා කළත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මේ හරහා අපේ රටේ දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න පුළුවන්ද? මම දන්නා තරමට දැන් ඔබතුමන්ලා චීන සිල්ලර කඩවලට පවා ලංකාවට එන්න අවසර දීලා තිබෙනවා. ඒ කියන්නේ, දැන් ලංකාවේ චීන සිල්ලර කඩ දමන්නයි හදන්නේ. දැන් අපේ රටේ පාරිභෝගිකයන්ට තිබෙන්නේ චීන භාෂාව ඉගෙන ගන්න විතරයි. ගරු ඇමතිතුමනි, එහෙම එකක් නැද්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
ආයෝජකයෙක් එනකොට තමයි එහෙම කරන්න වෙන්නේ. අපේ අදහස ලංකාවට branded goods ගෙන්වා ගන්නයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, Anti-dumping Act එකක් අපට ඕනෑ. අද අපේ රටට සරුංගල් පවා ගෙනෙනවා. අපේ රටේ airport එකට ගියොත්, එහෙම නැත්නම් harbour එකට ගියොත් පෙනෙනවා, ලෝකයේ තිබෙන ඔක්කෝම කුණුගොඩවල් ලංකාවට ගෙනෙන බව. ඒ ගෙන්වන බහුතරයක් දේවල් ගෙනෙන්නේ undervalue කරලා. ඒ කියන්නේ, මිල අඩුවෙන් පෙන්වලා ගෙන්වනවා. ඒ නිසා ලංකාවේ වෙළෙඳ පොළට ආරක්ෂාවක් ඕනෑ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
ඒක තමයි මම කලින් කිව්වේ,-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි මම කියන්නේ. ඔබතුමන්ලා anti-dumping එක අස්සේ safeguard එකකුත් දානවා නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
අපේ කර්මාන්තකරුවන්ට ඒ දෙකම අවශ්‍යයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, කර්මාන්තකරුවාට ඒ දෙකම අවශ්‍ය බව මාත් පිළිගන්නවා. නමුත් බිස්කට් කර්මාන්තකරුවා බිස්කට් හදන එක පැත්තක තියලා, මේ තොරතුරු කොහොමද හොයා ගන්නේ? මේ තොරතුරු ගන්න පුළුවන් ලංකාවේ තිබෙන යාන්ත්‍රණය මොකක්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
අපේ Industrial Ministry එකේ ඒ තොරතුරු තිබෙනවා. ඒකට වෙන කොහේවත් යන්න ඕනෑ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මොකක්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
අපේ Industrial Ministry එකේ Commerce Department එකේ ඒ තොරතුරු ඔක්කෝම තිබෙනවා. නිෂ්පාදනය කළ ඒවා, කවුද නිෂ්පාදනය කරන්නේ යනාදී වශයෙන් ඔක්කෝම තොරතුරු තිබෙනවා. ඒවා ලේසියෙන් ලබා ගන්න පුළුවන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමා, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් ඒ තොරතුරු ලබා නොදුන්නොත් හෝ ලබා ගන්න බැරි වුණොත්, ඒ මත පදනම් වෙලා කර්මාන්තකරුවාට සහනයක් තිබෙනවා ද, මේ පරීක්ෂණයේදී ඔබතුමන්ගේ දෙපාර්තමේන්තුව අවශ්‍ය පරිදි තොරතුරු ලබා නොදුන්න නිසා මේ කරුණු ඔප්පු කර ගන්න බැරි වුණා කියලා කියන්න? අපි හිතමු, මම කර්මාන්තකරුවෙක් කියලා. මට අවශ්‍ය තොරතුරු ඕනෑ කරලා තිබෙනවා කියලා හිතමු. ආනයනය කරන ලද නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරුබදු වර්ගීකරණය, එම නිෂ්පාදනයට අදාළ බදු යනාදියේ තොරතුරු ඕනෑ කරනවා කියලා හිතන්න.

මම බිස්කට් නිෂ්පාදනය කරනවා නම්, මම ඔප්පු කරන්න ඕනෑ, වෙන රටකින් ලංකාවට ආනයනය කරන බිස්කට්වල මට්ටම, ප්‍රමාණය, ඒවාට පනවන බදු යනාදී ඒ සියල්ල. එහෙම නැත්නම් මට මගේ නඩුව ඔප්පු කරන්න බැහැ නේ. ඒක ඔප්පු කරගන්න ප්‍රමාණවත් තරම් තොරතුරු කවුරු හරි මට ලබා නොදුන්නොත්, මට සාක්ෂියක් තිබෙනවාද මේ තොරතුරු ඔප්පු කර ගන්න බැරි වුණේ මගේ නිෂ්පාදනයේ වරදක් නිසා නොවෙයි, මට තොරතුරු සපයපු ආයතනවල වරදක් නිසා කියලා? ඊට උපකාර වන එක වගන්තියක් හරි මේ පනත් කෙටුම්පතේ තිබෙනවාද? එහෙම නම් දැන් එහෙම වගන්තියක් මේ පනත් කෙටුම්පතේ තිබෙන්න එපායැ. ඒ තොරතුරු නිසි පරිදි ඔප්පු කර ගන්න නොහැකිවන කෙනෙකුට ලැබෙන සහනය මොකක්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
ඒ තොරතුරු ලබා දෙන්න පුළුවන්. ඒකයි මම කියන්නේ, කාට හරි වුවමනා නම් දෙන්න පුළුවන් කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(iv) ஆமெனில், அத்திகதி யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) மேலே அ (ii) இல் குறிப்பிடப்பட்ட வனாந்தரங்களினுள் தற்போது வீடுகள், சுற்றுலாக் கைத்தொழிலுடன் தொடர்புடைய ஹோட்டல்கள் அல்லது வேறு நிர்மாணிப்புகள் உள்ளனவா;

(ii) ஆமெனில், மேற்படி நிர்மாணிப்புகள் காரணமாக வனாந்தரத்துக்கு ஏற்படும் தாக்கங்கள் பற்றி ஆய்வு செய்யப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister, Minister of National Policies and Economic Affairs and Minister of Law and Order:

(a) Will he table-

(i) the area of forest land belonging to the Department of Forest Conservation;

(ii) the names of those forests; and

(iii) the extent of each forest in acres separately?

(b) Will he inform this House-

(i) whether the boundaries of the aforesaid forests have been demarcated;

(ii) if so, the date of demarcation of boundaries was carried out;

(iii) if not, whether measures will be taken to demarcate the boundaries; and

(iv) if so, the date?

(c) Will he also inform this House-

(i) whether houses, hotels related to tourism industry or other constructions are in the forests mentioned in a (ii) above; and

(ii) if so, whether a study has been carried out on the impact caused to the forest due to the aforesaid constructions?

(d) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර දසලක්ෂ අනූහත්දහස් පන්සියපහක් පමණ වේ. (1,097,505.6678)

(ii) එම වනාන්තරයන්හි නම් ඇතුළත් ලේඛනය ඇමුණුමෙහි සඳහන් වේ.

(iii) එක් එක් වනාන්තරයෙහි විශාලත්වය වෙන් වෙන් වශයෙන් ඇමුණුමෙහි සඳහන් වේ.

(ආ) (i) වනාන්තර වැඩි ප්‍රමාණයක සීමා මායිම් ලකුණු කර ඇත.

(ii) අදාළ වනාන්තර ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කළ දිනය, සීමා නිර්ණය කරනු ලැබූ දිනයට අදාළ වන අතර, ඒ පිළිබඳ තොරතුරු ඇමුණුමෙහි සඳහන් වේ.

(iii) මායිම් සලකුණු කර නොමැති වනාන්තරවල සීමා නිර්ණය කිරීමේ ක්‍රියාවලිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරයි.

(iv) සෑම වසරකම ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත ඉලක්ක ලබා දී ඒ අනුව සීමා නිර්ණය සිදු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

(ඇ) (i) ඇතැම් වනාන්තර තුළ එවැනි ඉදිකිරීම් පවතී. එවැනි ඉදිකිරීම් සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. නීතිමය ක්‍රියාමාර්ග සිදු කිරීම තුළින් අනාගතයේ දී මෙම තත්ත්වය මහහරවා ගැනීමට අපේක්ෂා කෙරේ.

(ii) ඇතැම් වනාන්තරවල අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳ අධ්‍යයනයක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. එම අධ්‍යයනයන් තුළින් අදාළ වනාන්තරවලට මෙවැනි ඉදිකිරීම් හේතුවෙන් සිදුවන අහිතකර පාරිසරික බලපෑම හඳුනාගෙන ඇති අතර, එම තත්ත්වය මහහරවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ඈ) පැන නොනඟී.

ඇමුණුම **සභාගත*** කරමි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, විෂයභාර අමාත්‍යතුමා වශයෙන් සිටින අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් සවිස්තර පිළිතුරු ලබාදීම ගැන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මා පළමු අතුරු ප්‍රශ්නය අහනවා. පිළිතුරේ ඉතා පැහැදිලිව සඳහන් වුණා, ගැසට් කරපු වනාන්තර තුළ අනවසර ඉදිකිරීම් විශාල ප්‍රමාණයක් තිබෙන බව.

ගරු කථානායකතුමනි, තව ගැටලුවක් තිබෙනවා. ලෝක උරුමයක් වූ සිංහරාජ වනාන්තරය මගේ දිස්ත්‍රික්කයේත් එක මායිමක් වනවා. සිංහරාජයට මායිම්ව තිබෙන සමහර සංචාරක හෝටල් සිංහරාජ වනාන්තරයේ නිල මායිම් නොතකා තමුන්ගේ හෝටලයෙන් මායිම් හදාගෙන තිබෙනවා. මෙහි භයානක තත්ත්වය වචනයෙන් දෙකෙන් කිව්වොත් ගරු කථානායකතුමනි, ඒගොල්ලන්ගේ මායිම්වලින් ඒගොල්ලෝ ප්‍රවේශ මාර්ග හදාගෙන සිංහරාජය ඇතුළට ගිහිල්ලා එහි තිබෙන ජානමය වැදගත්කමක් ඇති පැළෑටි විශේෂ, සත්ව විශේෂ එකතු කරනවා. ඒ වාගේම ඒවා විකුණනවා; විදේශිකයන්ට අළෙවි කරනවා; දේශීය ජාවාරම්කාරයන්ට අළෙවි කරනවා. මෙය වැළැක්වීමට බලපාන බරපතළ ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මදිකම. දෙවැනි කාරණය, ඒ අයට ලබා දෙන ගිනි අවිවල ශක්තිය මදිකම. මොකද, ජාවාරම්කාරයන් ළඟ T-56 ගිනි අවි තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නය මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ජාවාරම්කාරයන් ළඟ T-56 ගිනි අවි තිබෙනවා; මේගොල්ලෝ ළඟ repeaters තිබෙනවා. Repeaters සහ T-56 ගිනි අවි දෙපැත්තේ තිබෙන කොට repeaters තිබෙන අය පරදිනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය අවධානය යොමු කරලා තිබෙනවාද, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දිගු කාලීන ක්‍රියා මාර්ගයකට එළඹිලා තිබෙනවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම සිංහරාජ සහ අනෙකුත් සංරක්ෂිත වනාන්තර මායිම් ආශ්‍රිතව ගොඩනැඟිලි ඉදිකිරීම් සහ මාර්ග සඳහා අවසර ලබා දීම පිළිබඳ ප්‍රශ්නයක් අපේ ගරු මන්ත්‍රීතුමා මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ මොන යම් හෝ අවසරයක් ලබා දීලා තිබෙනවා නම් පාරිසරික ඇගයීමකට ලක් කරලා තමයි ඒ අවසරය ලබා දීලා තිබෙන්නේ. ඒ වාගේම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කලින් ඉඳලා කරගෙන ආපු මොන යම් හෝ දෙයක් තිබෙනවා නම් ඒ පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාරිසරික ඇගයීමකට ලක් කරලා තිබෙනවා. ඉන් අනතුරුව ඒවාට මේ වන විට නීතිමය කටයුතුත් සිදු කරමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමා ඒ කාරණයේදී මතු කරපු දෙවැනි ප්‍රශ්නය හැටියට ගත්තේ, අපේ ක්ෂේත්‍ර නිලධාරීන් පිළිබඳවයි. ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණය අඩුයි කියන එක අපි බොහොම පැහැදිලිව පිළිගන්නවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා සඳහන් කළ කාරණය හරි. මේ වන විට අලුතින් ක්ෂේත්‍ර නිලධාරීන් 320ක් බඳවා ගැනීම සඳහා විභාගය පවත්වා අවසන්. එම නිසා ක්ෂේත්‍රයට අවශ්‍ය නිලධාරීන් 320ක් බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීතුමා මතු කළ අනෙක් කාරණය ගිනි අවි ලබා දීම පිළිබඳවයි. අපි මේ පිළිබඳව විවිධ අවස්ථාවල දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ගැටලුව තිබෙන්නේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ගිනි අවි ලබා දීලා, ඔවුන් කැලෑවට ගියාම, ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳවයි. දැනට පොලිසියේ සහ අවශ්‍ය නම් STF එකේ ආරක්ෂාව ලබා දීලා අවශ්‍ය වැටලීම් කටයුතු සිදු කරනවා. හැබැයි, නිලධාරීන්ට ගිනි අවි ලබා දීලා, ඔවුන් කැලය තුළට ගිහින් ක්‍රියාත්මක වෙනකොට මොන වාගේ තත්ත්වයක් ඇති වෙයිද කියන එක පිළිබඳව අපට හරියාකාරව කියන්න පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි. මේ කාරණාව පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා වුණා. හැබැයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ට ලැබෙන ආකාරයටම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ට ගිනි අවි ලබා දීම පිළිබඳව මේ වන විට අපි එකඟතාවකට ඇවිත් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

පරිසර සංරක්ෂණ ක්‍රියාවලියේදී WhatsApp, Imo, Viber වැනි දේවලින් සාධනීය දෙයක් සිදු වෙනවා. ඊයේ යම් කිසි කාරණයක් නිසා -ජාතීන් අතර, ආගම් අතර සංහිඳියාවට බාධා වෙනවා කියලා- ඒවා තාවකාලිකව අත් හිටුවන්න වුණා. ඒක හරි. හැබැයි, මේ facebook, Viber, WhatsApp, Imo වැනි නව තාක්ෂණ සන්නිවේදනය පරිසර දූෂණ ක්‍රියාවලියේදී, එහෙම නැත්නම් පරිසරයට වින කටින ක්‍රියාවලියේදී අපට තොරතුරු දැන ගැනීමට ලොකු ශක්තියක් වෙලා තිබෙනවා. විශේෂයෙන් විල්පත්තුව පිළිබඳව අපේ ආණ්ඩුවට චෝදනා එනවා. හැබැයි, කලින් ආණ්ඩුවටත් මේ චෝදනාවෙන් ගැලවෙන්න බැහැ. පරිසර සංරක්ෂණය ගැන කථා කරනකොට, Facebook එකේ මේ ගැන පොටෝ එකක් හෝ, විඩියෝ එකක් හෝ, පාර්ලිමේන්තුවේ අපි දෙදෙනා කථා කරන මේ සංවාදයේ වීඩියෝ පටය හෝ දැම්මොත් "Facebook තොරතුරු සම්බන්ධයෙන් බොලා නිහඬද?" කියලා අහනවා. ඒ වාගේම "විල්පත්තුව ගැන නිහඬද?" කියලා අහනවා. ගරු කථානායකතුමනි, facebook වාගේ සමාජ ජාල වෙබ් අඩවිවල පරිසර සංරක්ෂණයට අදාළ බොහෝ වැදගත් කාරණා පළ වෙනවා. ඒ වාගේම පරිසර විනාශ ගැනත් බොහෝ දෙනා photos ගහලා දමනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය මොකක්ද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේවා monitor කරලා, ඒ ගැන සොයා බලන විශේෂ ඒකකයක් හෝ කණ්ඩායමක් අමාත්‍යාංශය සතුව ඉන්නවාද? මනුෂ්‍යයන් මේ වාගේ දෙයක් facebook එකේ දාන්නේ නිකම් නොවෙයි, හේතුවක් ඇතිවයි. හේතුවක් නැතිව දාන ඒවා ගැන වෙනම හොයමු. කථානායකතුමාටත් මතක ඇති, අර උකුස්සෙක් මස් කරපු සිද්ධියක් තිබුණා. නූතන සමාජ ජාල වෙබ් අඩවිවල යන මේ වාගේ දේවල් හොයලා, ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා එවැනි සිද්ධි ගැන වෙනම විමර්ශනයක් කරන ඒකකයක් තිබෙනවාද? විල්පත්තුවට හෝ වේවා, වෙනත් තැනකට හෝ අගතියක් වෙද්දී ඒ ගැන හොයා බලන ක්‍රමවේදයක් අමාත්‍යාංශයට තිබෙනවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා වශයෙන් පත් වුණාට පස්සේ, සියලු දෙනාම - පාසලේ ඉන්න ශිෂ්‍යයා දක්වා, අවසාන කණ්ඩායම දක්වාම- පරිසරය වෙනුවෙන් කථා කරන කණ්ඩායමක් බවට පත් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියපු විධියට යම් ප්‍රශ්නයක් ඇති වෙනවා නම්, සමාජ ජාල හෝ ඒ මොනවා හරි දෙයක් මඟින් ඒ සියලු කාරණා එළියට එනවා. වැලි තොටුපොළක් වේවා, ගහක් කපන එකක් වේවා ඒ කුමක් හෝ දෙයක් සම්බන්ධ තොරතුරු ලැබෙනවා. ඉස්සරත් මේවා සිද්ධ වුණා. හැබැයි, අද යම් දෙයක් වෙනවා නම්, ඒ සියලු දේවල් සමාජ ජාල මාධ්‍ය හරහා එළියට එනවා.

ගරු කථානායකතුමනි, අපි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට මේ වන විටත් පොලිස් ඒකකයක් ස්ථාපිත කරලා තිබෙනවා; අනුයුක්ත කරලා තිබෙනවා. අපි එම ඒකකයට වෙනම අංකයක් ලබා දීලා එතැනින් අවශ්‍ය වැටලීම් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙනම වැටලීම් ඒකකයක් අපි ස්ථාපිත කරලා තිබෙනවා. ඒ කණ්ඩායම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා වෙනම ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරියකු හැටියට අධ්‍යක්ෂවරයෙක් පත් කරලා තිබෙනවා. යම් කිසි විධියකින් අපේ වන සංරක්ෂණ කලාපවල ඒ කටයුතු හරියාකාරව සොයා බලන්නේ නැහැ කියලා අපට පැමිණිල්ලක් එනවා නම්, අමාත්‍යාංශයේ ඉන්න විමර්ශන නිලධාරියා හරහා වෙනම කණ්ඩායමක් යවලා පරීක්ෂණයක් කරන්න කටයුතු කරගෙන යනවා. මේ අංශ තුන හරහා යම් හානියක් වෙනවා නම් ඒ පිළිබඳ පුළුල්ව පරීක්ෂණ කරන ක්‍රමවේදයක් සකස් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 - 1216/'16-(3), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 1403/'16-(2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේ තත්ත්වය වෙනස් කරගන්න වෙනවා. මොකද, මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ දෙවන වරට. තුන්වන වරක් අවස්ථාව දෙනවා කියලා ස්ථාවර නියෝගවල ඇතුළත් වුණාට, තුන් වරක් වෙනකල්ම මෙලෙසින් ප්‍රශ්නය කල් දැමීම සාධාරණ නැහැ. මේක අරාජික තත්ත්වයක්. ඔබතුමා ඊයේ ස්ථාවර නියෝගත් සංශෝධනය කළා. අපි එයට ගරු කරනවා. නමුත් අඩුම තරමින් මේ උත්තරීතර සභාව රැස් වන අවස්ථාවට අමාත්‍යවරු ගෙන්වා ගන්නවත් ඔබතුමා යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා, වහාම ක්‍රියාත්මක වන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

දෙවන වරට තමයි මේ ප්‍රශ්නයට කල් ඉල්ලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ඒක තමයි. ආයෙත් කල් ගන්න එපා. තුන්වන වතාවේදී පිළිතුරු දෙනකල් හැම අවස්ථාවේදීම බලාගෙන ඉන්න අමාරුයි නේ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සිනමාශාලා ඩිජිටල්කරණය: රජයේ මැදිහත්වීම
சினிமா மண்டபங்களை டிஜிட்டல் மயமாக்கல்: அரசாங்கத் தலையீடு
DIGITALIZATION OF CINEMA HALLS: GOVERNMENT INTERVENTION

1497/'16

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිනමාශාලා ඩිජිටල් කිරීමේ අවශ්‍යතාව පිළිගන්නේද;

(ii) එසේ නම්, සිනමාශාලා ඩිජිටල් කිරීමට රජය මැදිහත් නොවන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පොදු නිර්වාහක මත්‍රිතුමා සහ මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) இலங்கையில் சினிமா மண்டபங்கள் டிஜிட்டல் மயமாக்கப்படுவதன் அவசியத்தை ஏற்றுக் கொள்வாரா;

(ii) ஆமெனில், சினிமா மண்டபங்களை டிஜிட்டல் மயமாக்குவதற்கு அரசாங்கம் தலையீடு செய்யாமல் இருப்பது ஏன்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House-

(i) whether he admits that there is a need to digitalize cinema halls in Sri Lanka; and

(ii) if so, of the reason why the Government is not intervening in the matter of digitalizing cinema halls in Sri Lanka?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

ශ්‍රී ලංකාවේ පවතින සිනමාශාලා පෞද්ගලික හිමිකරුවන් සතු ඒවා වේ. ලාංකික සිනමා ක්ෂේත්‍රයේ ආරම්භයේ සිටම දිවයින තුළ පවත්නා සිනමාශාලා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම සඳහා 35mm ප්‍රක්ෂේපණ යන්ත්‍ර භාවිත කරනු ලැබුවද, අනෙකුත් රටවල සිනමා ක්ෂේත්‍රය ඩිජිටල් තාක්ෂණය භාවිත කරනු ලබයි. දැනට දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන සෙලියුලොයිඩ් සේයාපට නවීන තාක්ෂණය හමුවේ අභාවයට යමින් පවතී.

එබැවින්, දේශීය චිත්‍රපට කර්මාන්තය නව තාක්ෂණය සමඟ ගැළපීම සඳහා දිවයිනේ ඇති සියලුම සිනමාශාලා සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම කළ යුතුව ඇති අතර, ඒ සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් සිනමාශාලා සඳහා 2K තාක්ෂණය (අංකිත) හඳුන්වා දීමට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

දැනට දිවයින පුරා ක්‍රියාත්මක තත්ත්වයේ සිනමාශාලා 173ක් පවතී. එම සිනමාශාලාවලින් 2K සිනමාශාලා 53ක් ද, 4K සිනමාශාලා 03ක් ද, අවර තාක්ෂණයෙන් චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමාශාලා (E) 85ක් ද, 35mm පටල පට මඟින් චිත්‍රපට ප්‍රදර්ශනය කරනු ලබන සිනමාශාලා 32ක්ද පවතී. ඉහත සිනමාශාලා 173 අතරින් සිනමාශාලා 117ක් අංකිත තාක්ෂණයට පරිවර්තනය කළ යුතුව ඇත.

සිනමාශාලාවකට ඩිජිටල් ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට රුපියල් මිලියන 7ක් පමණ වැය වේ. දිවයිනේ සිනමාශාලා 117ක් අංකිත තාක්ෂණයට පරිවර්තනය කළ යුතුව පවතින නිසා ඒ සඳහා විශාල මුදලක් දැරීමට සිදුවන බැවින්, සිනමාශාලා හිමියන් පෞද්ගලික වියදමින් සිනමාශාලා ඩිජිටල්කරණය කර ගත යුතු වේ. එබැවින්, සිනමාශාලා සඳහා ණය ලබා දීම සම්බන්ධයෙන් මේ වන විට ජාතික චිත්‍රපට සංස්ථාව බැංකු සමඟ සාකච්ඡා කරමින් සිටී.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වශයෙන් කටයුතු කළ කාලයේ මේ පිළිබඳව මා අවධානය යොමු කළා. ඇත්තටම සිනමා ශාලා හිමියන් ඉල්ලා සිටින්නේ රජයේ ආධාරයක් නොවෙයි, යම් කිසි ආකාරයක පහසුදායී ණය ක්‍රමවේදයක්. දැනටමත් ඔබතුමා පිළිගන්නවා ඇති, මෙහි සැලකිය යුතු මට්ටමක ප්‍රමාදයක් තිබෙන බව.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, චිත්‍රපට සංරක්ෂණය පිළිබඳව අවධානය යොමු කරනවා කියලා ඔබතුමන්ලා අය වැයේ දී පොරොන්දු වුණා. ඒ සඳහා යම් මුදල් ප්‍රතිපාදනයකුත් වෙන් කළා. හැබැයි, මම දන්නා හැටියට තවමත් ඒ කටයුත්තට අත තියලා නැහැ. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. මේක තිබෙන්නේත් පෞද්ගලික අංශය සතුව නිසා ඔවුන් මිලිමීටර් 35 reel එක සම්පූර්ණයෙන් විනාශ කරලා තමයි මේ සංරක්ෂණය කරන්නේ. ගරු ඇමතිතුමනි, චිත්‍රපටි සංරක්ෂණයට රජය වෙගවත් මැදිහත්වීමක් කරන්නට ගනු ලබන පියවර මොනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා කිව්වා වාගේ ඒ වෙලාවේ අය වැයෙනුත් මුදල් වෙන් කරලා තිබුණා. ඒ වන විට මම විෂය භාර අමාත්‍යවරයාව සිටි නිසා මම දන්නවා, මුදල් වෙන් කර ගන්නට පුළුවන් වුණු බව. නමුත් වර්තමාන ප්‍රගතිය පිළිබඳව මේ පිළිතුරේ දක්වා නැහැ. එම නිසා ඒ පිළිබඳව උත්තර දෙන්නට ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කරමු.

ගරු කථානායකතුමනි, සිනමාශාලා ඩිජිටල්කරණය ඉතාම හදිසියි. ඔබතුමා අය වැය විවාදයේදීත් ඉතා වැදගත් අදහස් ප්‍රකාශ කළා. අපි ඒ වෙලාවේ දින වකවානු යොදාගෙන, සිනමාශාලා හිමියන් ගෙන්වලා මේ වැඩ කටයුත්ත ඉස්සරහට ගෙන යන්න හදන විට අමාත්‍ය මණ්ඩලයේ යම් වෙනසක් සිදු වුණා. දැන් වර්තමාන අමාත්‍යතුමා ඒ කටයුත්තට අත ගහලා තිබෙනවා. මම හිතන විධියට සිනමාශාලා ඩිජිටල්කරණය කිරීම ඉතාම අවශ්‍ය කාරණයක්. ඒ කටයුත්ත කඩිනමින් කර ගන්නට අපි ඔක්කොම එකතු වෙමු.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි විටින් විට පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරනවා, තැනින් තැන පැන නඟින ජාතිවාදී ගැටුම් පිළිබඳව. ඇත්තටම යුද්ධ කාලයේදීත්, යුද්ධය අවසන් වෙලා අවුරුදු දහයක් ගත වෙලත් අපි තවම ජාතිවාදී දෘෂ්ටිය, මතවාදය පැරදවීම සඳහා සිනමාවෙන් කරන්නට ඕනෑ දේවල් ටික කරලා නැහැ. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසුවත්, අප්‍රිකාවේ වර්ණභේදවාද අරගළයෙන් පසුවත්, එම රජය මැදිහත්වෙලා ජනතාව අතර සංහිඳියාව, සමඟිය ඇති කිරීම සඳහා සිනමාව පාවිච්චි කළා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දැන් අපේ රටේ 2008 ඉඳන්ම ඓතිහාසික කථා මුල් කර ගත් සිනමා පටවලට තමයි වැඩි අවධානයක් යොමු වෙලා තිබෙන්නේ. ඒවාට තමයි පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයනුත් මුදල් ආයෝජනය කරන්නේ. සිනමාව පැත්තෙන් ජාතිවාදී දෘෂ්ටිය පරාජය කිරීම සඳහා රජයට කරන්නට පුළුවන් දේවල් මොනවාද කියා සොයා බලා, ඒ වාගේම එවැනි චිත්‍රපටි අධ්‍යක්ෂවරුන් සඳහා, චිත්‍රපටි සඳහා යම් ප්‍රතිපාදනයක් ලබා දීලා මේ ක්‍රියාවලිය වේගවත් කරන්න කියලායි මම යෝජනා කරන්නේ.

එහෙම නැත්නම්, මොකක් හෝ සිදු වීමක් වුණාට පස්සේ ඒ ගැන සාකච්ඡා කිරීමෙන් හෝ වඳ පෙත්ත ගැන කථා කිරීමෙන් හෝ ප්‍රයෝජනයක් වන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එතුමා හැම දාම සිනමාවේ උන්නතිය වෙනුවෙන් ඉතාම හරවත් අදහස් ඉදිරිපත් කරනවා. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ඇමතිතුමා යටතේයි මේ විෂයය තිබෙන්නේ. මේ කාරණය එතුමාගේ අවධානයට යොමු කරනවා.

විදුහල්පති සේවයේ III වැනි පන්තිය සමත් වූ පිරිස:විදේශ පුහුණුව

அதிபர் சேவையின் III ஆம் வகுப்புச் சித்தியடைந்தோர்: வெளிநாட்டுப் பயிற்சி
PRINCIPALS QUALIFIED IN GRADE III OF SRI LANKA PRINCIPAL SERVICE: OVERSEAS TRAINING

1650/'17

5. ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) පසුගියදා පැවැත්වූ විදුහල්පති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විභාගයෙන් සමත් වූ පිරිස අතරින් විදේශ පුහුණුව සඳහා තෝරාගත් සංඛ්‍යාව කොපමණද;

(ii) විදේශ පුහුණුව සඳහා බඳවා ගත් අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) විදේශ පුහුණුව සඳහා තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) විශාල වියදමක් දරා විභාග පවත්වා, පුහුණුවක් ලබාදුන් මෙම පිරිස මෙතෙක් විධිමත් ලෙස පළාත් සභා මඟින් ස්ථානගත කර නොමැති බව දන්නේද;

(v) මෙම ගැටලුව විසඳීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த தினத்தில் நடத்தப்பட்ட பாடசாலை அதிபர் சேவையின் III ஆம் வகுப்புக்கு ஆட்சேர்ப்பதற்கான பரீட்சையில் சித்தியடைந்தவர்களில் வெளிநாட்டுப் பயிற்சிக்காகத் தெரிவு செய்யப்பட்டவர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) வெளிநாட்டுப் பயிற்சிக்காகத் தெரிவு செய்யப் பட்டவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(iii) வெளிநாட்டுப் பயிற்சிக்காகத் தெரிவுசெய்யப் படும்போது பின்பற்றிய முறைமை யாதென்பதையும்;

(iv) பெரும் செலவினைச் செய்து பரீட்சை நடத்தப் பட்டு பயிற்சியும் வழங்கப்பட்ட இவர்கள் இதுவரை மாகாண சபைகளினால் உரிய இடங் களுக்கு நியமிக்கப்படவில்லை என்பதையும்;

(v) இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of persons selected for overseas training, out of the persons who got through the examination which was held recently to make recruitments for Grade III of Sri Lanka Principal Service;

(ii) the names and the addresses of the persons who were selected for overseas training;

(iii) the methodology adopted in making selections for overseas training;

(iv) whether he is aware that aforesaid group of persons who were selected by way of examinations, spending huge amounts of money and providing training, have not been posted by Provincial Councils in a formal manner; and

(v) whether steps will be taken to remedy this issue?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 278කි. ඇමුණුම 01 බලන්න.

(ii) ඇමුණුම 02 බලන්න.

(iii) 2016 වසරේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවාගත් විදුහල්පතිවරුන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් පැවැත්වූ දිශානිමුඛ කිරීමේ පාඨමාලාව අවසානයේ පැවැත්වූ විභාගයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලබාදුන් ලකුණු අනුව විදේශ චාරිකාව සඳහා තෝරා ගන්නා ලදී.

<u>සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙළ</u>

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් පැවැත්වූ දිශානිමුඛ කිරීමේ පාඨමාලාව අවසානයේ සිදු කළ

පරීක්ෂණයෙන් අපේක්ෂකයා ලබාගත් අවසාන ලකුණ වෙනුවෙන් මුළු ලකුණු සංඛ්‍යාවෙන් සියයට 60ක්ද,

අපේක්ෂකයන් පාඨමාලාවට පැමිණීමේ දින ගණන අනුව මුළු ලකුණු සංඛ්‍යාවෙන් සියයට 20ක්ද,

අපේක්ෂකයන් විසින් විදේශ අත්දැකීම් අනාගත වෘත්තියට යොදා ගැනීම පිළිබඳ යෝජනා ඇතුළත් ලේඛන සඳහා සියයට 20ක්ද ලබා දෙන ලදී. ඇමුණුම 03හි වැඩිදුරටත් විස්තර වේ. ඇමුණුම් **සභාගත*** කරමි.

(iv) 2016.05.09 දිනැතිව පත්වීම් ලද සියලුම නිලධාරීන් අංක අමප/16/1813/742/025 - 1 හා 2016.09.27 හා 2016.10.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව විදුහල්පති සේවයේ පුරප්පාඩු සහිත පළාත් සභා පාසල්වල විදුහල්පතිවරුන් ලෙසටම ස්ථානගත කිරීම සඳහා පළාත් සභාව වෙත මුදා හැර ඇත.

(v) ඔව්.

දිගින් දිගටම මේ පිළිබඳව පළාත් සභා දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

පිළිතුරු සැපයීම වෙනුවෙන් මා පළමුවෙන්ම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිවරයා හැටියට අපේ රටේ අධ්‍යාපනය සඳහා විශාල කාර්ය භාරයක් කරන ඇමතිවරයෙකු ලෙස අපි දකිනවා. ඔබතුමා රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා විශාල මුදලක් යොදවනවා.

විශේෂයෙන්ම විදුහලක විදුහල්පතිවරයා කියන්නේ පරිපාලන වශයෙන් සිටින ප්‍රධානියා. පරිපාලන වශයෙන් සිටින ප්‍රධානියා තෝරා පත් කර ගන්නේ විභාග සහ සම්මුඛ පරීක්ෂණ පවත්වලා. ඔවුන්ට විශාල දැනුමක් ලබා දෙන්න ඔවුන්ව විදේශ සංචාර සඳහාත් යොමු කොට තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, තිබෙන ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා අමාත්‍යාංශ යටතේ මේ තෝරා පත් කිරීම් කරලා, විදුහල්පතිවරු නිදහස් කළාට පළාත් සභා මට්ටමින් තවම මේ අදාළ විදුහල්පතිවරුන්ට හිමිකමක් ලබා දීලා නැහැ. විදුහල්පතිවරුන්ට දැනුම ලබා දීලා, පරිපාලන වශයෙන් ඒ පාසල පවත්වාගෙන යන ආකාරයේ වැඩ පිළිවෙළක් පළාත් සභාව විසින් විදුහල්පතිවරුන්ට ලබා දීලා නැහැ. මේ පිළිබඳව අපි දීර්ඝ වශයෙන් කථා කරනවා වාගේම දීර්ඝ වශයෙන් යෝජනා ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩලය එවැනි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා; අනුමත කරලා තිබෙනවා. එසේ තිබියදී මේ කටයුත්ත නොකර සිටීම පිළිබඳව ඔබතුමන්ලා හොයා බලා තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කියපු කාරණය සම්පූර්ණයෙන්ම ඇත්ත. අපි තුන්වැනි ශ්‍රේණියේ විදුහල්පතිවරුන් භාරදහසක් පමණ බඳවා ගනු ලැබුවා, කිසිම දේශපාලන පදනමක් නැතිව විභාග පවත්වලා, ඒ විභාගයේ ලකුණු මත. ඒ භාරදහස බඳවාගෙන ඔවුන්ට හොඳ නේවාසික පුහුණුවක් ලබා දුන්නා. ඒ නේවාසික පුහුණුවෙන් උපරිම ලකුණු ලබා ගත් අයට විදේශීය පුහුණුවත් ලබා දීලා දැන් පද්ධතියට දාලා තිබෙනවා; පළාත් සභාවලට යොමු කරලා තිබෙනවා. නමුත් පළාත් සභා විදුහල්පතිවරු ලෙස ඒ අය ස්ථානගත කළේ නැහැ. ඊට පස්සේ මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා කැබිනට් එකෙනුත් අනුමැතියක් ගත්තා, මේ බඳවා ගත් විදුහල්පතිවරුන්, විදුහල්පතිවරුන් ලෙසම පළාත් සභා පාසල්වලත් ස්ථානගත කරන්න කියලා. නමුත්, කනගාටුවට කාරණාව නම් තවමත් උපගුරුවරු වැඩ බලන එකයි. ඉතාම සුළු කොටසයි දාලා තිබෙන්නේ විදුහල්පතිවරුන් වශයෙන්. උපගුරුවරු වැඩ බලනවා. මේ සම්බන්ධයෙන් මම රාජ්‍ය සේවා කොමිසමත් දැනුවත් කරලා තිබෙනවා.

මේ වැඩබලන සමහර උපගුරුවරු ක්‍රීඩා ගුරුවරු. පරිපාලන හැකියාව නැති ගුරුවරු තමයි විදුහල්පතිවරුන් වශයෙන් වැඩ බලන්නේ. මේකෙදී මෙතැනින් එහාට මට කරන්න දෙයක් නැහැ. මා අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කර තිබෙනවා; ගරු අගමැතිතුමා දැනුවත් කර තිබෙනවා; කැබිනට් එක දැනුවත් කර තිබෙනවා; PSC එක දැනුවත් කර තිබෙනවා; ගන්න පුළුවන් හැම ක්‍රියාමාර්ගයක්ම අරගෙන තිබෙනවා. මේක පළාත් මට්ටමින් අධ්‍යාපනය කඩා වැටෙන්න, පරිපාලනය කඩා වැටෙන්න යම් ප්‍රධාන හේතුවක් ලෙස මම දකිනවා. විදුහල්පතිවරුන් භාරදහසක් මෙම පද්ධතිය තුළ ඉන්නවා. නමුත්, තවමත් උපගුරුවරු විශාල පිරිසක් වැඩ බලනවා. සුදුසු අයට අවස්ථාව දීලා නැහැ. පළාත් සභාවලින් ඇහුවාම කියනවා, "ඒ ගොල්ලන්ට පාසල් දුන්නා. ඒ අය යන්නේ නැහැ" කියලා. දීලා තිබෙන්නේ යන්න බැරිම ඒවාට. අති දුෂ්කර ඒවාට දීලා තිබෙන්නේ. කවුරුවත් යන්නේ නැති ඒවාට තමයි දීලා තිබෙන්නේ හොයලා බලපුවාම.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඇත්තටම ඔබතුමාටත් තේරෙන්න ඇති, මේක බරපතළ ප්‍රශ්නයක් බව. අපේ ප්‍රදේශය ගත්තත්, අපේ දිස්ත්‍රික්කයේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් තිබෙනවා වාගේම අධ්‍යාපනය අතිනුත් යම් පහත් මට්ටමකයි තිබෙන්නේ. නමුත්, මේ යන්ත්‍රණය ශක්තිමත් කර ගන්න වැඩ පිළිවෙළක් අපට අත්‍යවශ්‍යයි. මොකද, විදුහල්පති ශ්‍රේණියේ පත් කරපු කණ්ඩායම තවම ඒ පාසල්වලට නොයාම තුළ සහ ලබා නොදීම තුළ එක් පැත්තකින් විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා, අධ්‍යාපනය ලබන අපේ දරුවන්ට. එහෙම වුණොත් අපේ රට තුළ වර්තමානයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නවලට ඉදිරියටත් අපට මුහුණ දෙන්න වේවි.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමාත් කිව්වා වාගේ මේක ඉතාම වැදගත් ජාතික ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔව්, ගරු කථානායකතුමනි. ඒ වාගේම, මේ කරුණ කෙරෙහිත් සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම විදුහල්පතිවරු සම්බන්ධයෙන් විතරක් නොවෙයි, පළාත් මට්ටමින් උපාධිධාරි ගුරුවරුන් බඳවා ගන්නත් අයිතිය තිබෙන්නේ එම පළාත්වලටයි. උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීමේදී, ඔවුන් හදාරපු විෂයයන් අනුව, ඒ ඒ විෂයයන්වලට බඳවා ගන්න කියලා මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. නමුත්, පළාත්වලින් practice එකක් විධියට, උපාධිධාරින් ඒ හදාරණ ලද විෂයයට නොව වෙනත් විෂයයන් උගන්වන්න බඳවා ගන්නවා. මේ නිසා අධ්‍යාපනයේ ගුණාත්මක බව සම්පූර්ණයෙන් වැටෙනවා. විශේෂයෙන්ම පළාත් මට්ටමෙන් රාජ්‍ය සේවා කොමිෂන් තිබෙනවා. කැබිනට් මණ්ඩලයත් අනුමත කර තිබියදී පළාත් රාජ්‍ය සේවා කොමිසම මෙවා පිළිබඳව අවධානය යොමු කරන්නේ නැහැ. උදාහරණයක් විධියට කිව්වොත්, ආර්ථික විද්‍යාව සම්බන්ධ උපාධියක් ගත් ගුරුවරයෙක් සිංහල උගන්වන්න දමනවා, එහෙම නැත්නම් ප්‍රාථමික විෂයයන් උගන්වන්න දමනවා.

ගරු කථානායකතුමනි, ගුරු තුලනය කිරීම සඳහා අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි පසුගිය දවස්වල කිව්වා 60,000ක ගුරු හිඟයක් තිබෙනවා, 40,000ක අතිරික්තයක් තිබෙනවාය කියලා. ඇත්තවශයෙන්ම 20,000යි ගුරු හිඟය වශයෙන් තිබෙන්නේ. නමුත්, දේශපාලන බලපෑම් සහ විවිධ හේතු මත පළාත් සභාව ගුරු තුලනය කරන්නේ නැහැ. මීට වඩා ගුරු තුලනය කරන්න පුළුවන්. ජාතික පාසල්වල අතිරික්ත ගුරුවරු සියල්ලන්ටම අපි වැටුප් ගෙවන්නම්, අනුයුක්ත කරලා අතිරික්ත පිරිස ඔක්කෝම වෙනත් තැන්වලට දමන්න කියලා මම කිව්වා. දැන් බොහෝ දෙනෙක් ඒ විධියට දමලා තිබෙනවා. පාසල්වල ගුරුවරු අතිරික්තව තබා ගෙන සිටීම අපරාධයක්. ඒ නිසා මේක පළාත් මට්ටමෙන් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේත් අවධානය යොමු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ආණ්ඩුකාරවරු කැඳවලා ඔය ගැන අපට සාකච්ඡාවක් කරන්න පුළුවන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා එය කරනවා නම් ලොකු දෙයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිඛිතව මාව දැනුවත් කරන්න. අපි ආණ්ඩුකාරවරු කැඳවලා ඒ කාර්යය කරන්න බලමු. ඒකේ වටිනාකමක් තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිවරයා හැටියට මම ආණ්ඩුකාරතුමන්ලාත් කැඳවලා මේ ගැන සාකච්ඡා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා ලිඛිතව නැවත වරක් එවන්න. මම ඉතා ඉක්මනින් සාකච්ඡා කරන්නම්.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න.

ගරු බුද්ධික පතිරණ මැතිතුමා ඉක්මනින් කථා කරන්න. ඊට පසුව ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න ආණ්ඩුකාරවරු ගෙන්වනවා කියලා ඔබතුමා කිව්වා. මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. මේ සිද්ධියත් එක්කම බැඳුණු තවත් කාරණයක් තිබෙනවා, ඔබතුමාට අයිති වපසරිය තුළ ඔබතුමාගේ අවධානය යොමු කළ යුතු. එදාට මේ ගැනත් කථා කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒක ලිඛිතව එවන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ තමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ගන්නා තීන්දු සම්බන්ධයෙන් පළාත් සභා නොසලකා හැරීම. ඒක පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක්වන කාරණයක්. ඒ සම්බන්ධයෙනුත් යම් කිසි මැදිහත් වීමක් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ ගැනත් කථා කරන්නම්.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඒ ඒ පළාත්වලට ගුරුවරුන් බඳවා ගැනීමේදී ඒ සඳහා ක්‍රියාත්මක වෙන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කියලා. එහෙම නොවෙයි, අදාළ පළාත් ඇමතිවරයා අනිවාර්යයෙන්ම මේකට අත ගහනවා කියලා මා විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, ඇත්තටම අධ්‍යාපනය පැත්තෙන් විදුහල්පති තනතුරක්වත් දරලා නැති සමහර මහ ඇමතිවරු ඉන්නවා. මම ඔවුන්ට අපහාස කරනවා නොවෙයි, විදුහල්පතිකමක් හෝ ගුරු වෘත්තිය හෝ ඒ කිසිවක් නොදරපු සමහර මහ ඇමතිවරු ඉන්නවා. ඒ ගොල්ලෝ ක්‍රියාත්මක කරන්නේ තමන්ගේ ඔළුවේ තිබෙන දේ මිසක් මේ රටේ, මේ මහ පොළොවේ තිබෙන දේ නොවෙයි. ඒකයි මේ අපරාධය වෙලා තිබෙන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, එතුමා කියන එක හරි. නමුත්, පත්වීම් බලධාරියා වෙන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවනේ. ඒ නිසා ඇමතිවරුන්ගේ මැදිහත්වීම මත තමයි මේවා කරන්නේ. හැබැයි, පත්වීම් බලධාරියාත් එහෙම කරද්දී අපි කොහොමද එතැනින් එහාට යන්නේ? උදාහරණයක් විධියට කිව්වොත්, උතුරු මැද පළාතේ,-

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ඒ අය නියෝග පිළිපදින්නේ නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔව්. උතුරු මැද පළාතේ එක විටක,- දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවලට බලය තිබෙන්නේ, උපාධිධාරීන් බඳවා ගන්න විතරයිනේ. එක වතාවක් උතුරු මැද පළාතේ ප්‍රධානීන් ඇවිල්ලා එහෙම නොවන අයත් බඳවා ගන්න රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය අරගෙන ගියා. ඊට පස්සේ අපි ඒකට විරුද්ධත්වය දක්වලා, ගරු කථානායකතුමාටත් කියලා තමයි උපාධිධාරී නොවන අය බඳවා ගැනීම නැවැත්තුවේ. අපි මේ දේවල් කොච්චර විධිමත් කරන්න හැදුවත්, පරණ ගෝත්‍රික යුගයට තමයි යන්න හදන්නේ. ඒ ගොල්ලන්ට තමයි ඡන්දය දෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු ඇමතිතුමා ඒ ටික ඉදිරිපත් කරන්න. අපි අවශ්‍ය පියවර ගන්නම්.

උඩුනුවර ලෝක ප්‍රකට පෞරාණික සිද්ධස්ථාන:පොදු පහසුකම්
உலகப் பிரசித்தி பெற்ற உடுநுவர புராதன வழிபாட்டுத்தலங்கள்:பொது வசதிகள்
WORLD FAMOUS HISTORICAL PLACES OF WORSHIP IN UDUNUWARA : COMMON AMENITIES

1754/'17

6. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා ඇති ගඩලාදෙණිය, ලංකාතිලක සහ ඇම්බැක්ක යන සිද්ධස්ථාන ඉතා වැදගත් ලෝක ප්‍රකට ස්ථාන බව පිළිගන්නේද;

(ii) මෙම ස්ථාන නැරඹීම සඳහා දිනපතා දේශීය හා විදේශීය සංචාරකයන් දහස් ගණනක් පැමිණෙන බව දන්නේද;

(iii) මෙම ස්ථානවල පොදු පහසුකම් නොමැති වීම හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් දැඩි අසීරුතාවන්ට ලක්වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම ස්ථානවල අඩු පාඩුව පවතින පොදු පහසුකම් ලබාදීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ කඩිනමින් වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේනම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உடுநுவர பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள கடலாதெணிய, லங்காதிலக்க மற்றும் அம்பெக்க எனும் வழிபாட்டுத்தலங்கள் உலக பிரசித்தி பெற்றுள்ள, மிக முக்கியமான புராதன இடங்களென்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) மேற்படி இடங்களை பார்வையிட நாள்தோறும் ஆயிரக்கணக்கான உள்நாட்டு மற்றும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் வருகின்றன ரென்பதை அறிவாரா;

(iii) மேற்படி இடங்களில் பொது வசதிகள் இல்லாமையின் காரணமாக உள்நாட்டு மற்றும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் கடும் அசௌகரியங்களுக்கு உள்ளாகின்றனர் என்பதை ஏற்றுக்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி இடங்களில் குறைபாடாக உள்ள பொது வசதிகளைப் பெற்றுக்கொடுக்க அவரது அமைச்சின்கீழ் துரித வேலைத்திட்டமொன்றைத் தயாரிப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்வாறென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism Development and Christian Religious Affairs:

(a) Will he inform this House-

(i) whether he accepts that the Gadaladeniya, Lankatilaka and Embakke Temples located in the Udunuwara Divisional Secretary's Division are very important world famous ancient places;

(ii) whether he is aware that thousands of local and foreign tourists arrive each day to visit these sites; and

(iii) local and foreign tourists face severe embarrassment due to lack of common amenities in these places?

(b) Will he also inform this House-

(i) whether he will adopt a course of action under his Ministry to provide common amenities that are lacking in these places expeditiously; and

(ii) if so, in what manner?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) නැත. සමහර අවස්ථාවන්හිදී යම් අපහසුතාවන්ට පත් විය හැකි බව පිළිගනිමි.

(ආ) (i) ඔව්. වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

(ii) 2017 වර්ෂයේදී ගඩලාදෙණිය සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහත සඳහන් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කර අවසන් කරන ලදී.

1. වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීම.
2. දේශීය විදේශීය සංචාරකයින් සඳහා පානීය ජල පහසුකම් ස්ථාපිත කිරීම.
3. ගඩලාදෙණිය සිද්ධස්ථානයේ වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීම.
4. ගඩලාදෙණිය සිද්ධස්ථානයේ දේවාල වීදිය කාපට් අතුරා සංවර්ධනය කිරීම.

ලංකාතිලක රජමහ විහාරයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු ද අවසන් කර ඇත.

ඓතිහාසික ඇම්බැක්කේ රජමහ විහාරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ පළමු අදියර යටතේ

2018 වර්ෂයේ පහත සඳහන් සංවර්ධන කාර්යය ඉටු කිරීමට තීරණය කර ඇත.

1. ආරක්ෂක බැම්මක් ඉදිකිරීම.
2. දෙස් විදෙස් සංචාරකයින් සඳහා වැසිකිළි සංකීර්ණයක් ඉදිකිරීම.

(ඇ) අදාළ නොවේ.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සම්බන්ධව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දැනට සිදු කෙරෙන වැඩ කටයුතු පිළිබඳව සතුටු වෙනවා. ඒ වාගේම, මේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කරන්න අවශ්‍ය පහසුකම් සපයනවාද කියලා දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, අපි අදාළ ඇමතිතුමාගේ අවධානයට එය යොමු කර වන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -2073/'17- (2), ගරු ඩග්ලස් දේවානන්දා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -2120/'17- (2), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -2126/'17- (2), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -2187/'17- (2), ගරු ප්‍රසන්න රණතුංග මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 -2189/'17- (2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 -2192/17- (2), ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 -2194/17- (2), ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ පසු ගිය අවුරුද්දේ හත්වැනි මාසයේයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අයියෝ, හුඟක් කල් ගිහින් නේ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
දැන් මාස හතකට අධික කාලයක් ගත වෙලා තිබෙනවා. දරුවෙක් කුසට පිළිසිඳ ගත්තාට පසු ප්‍රශ්නය ඇහුවාම, දරුවා ඉපදිලා ඇවිදිනකොටවත් උත්තරය ලැබෙන්නේ නැත්නම් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන එකේ තේරුමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මාසයකින් පිළිතුරු ලබාදෙන්නම්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාසයකින් පිළිතුරු ලබා දෙන්න එතුමා පොරොන්දු වුණා, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඇමතිවරුත් මාරු වෙලා තිබෙනවා. මාසයකින් ඔබතුමාට පිළිතුරු ලබාදෙන්නම්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාසයකින් පිළිතුරු ලබාදෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -2196/'17- (2), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 -2233/'17- (2), ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ත්‍රස්තවාදී ප්‍රහාර නිසා විනාශ වූ රාජ්‍ය ආයතන : අම්පාර දිස්ත්‍රික්කය

பயங்கரவாதத் தாக்குதலால் அழிவடைந்த அரச நிறுவனங்கள்: அம்பாறை மாவட்டம்

GOVERNMENT INSTITUTIONS DESTROYED BY TERRORIST ATTACKS : AMPARA DISTRICT

1216/'16

2. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் 1983ஆம் ஆண்டுக்குப் பின்னர் அழிக்கப்பட்டுள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iii) அழிவடைந்துள்ள மேற்படி சொத்துகள் பற்றி அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ளக்கூடிய மதிப் பீடொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அச்சொத்துகளின் மொத்த பெறுமதி யாதென்பதையும்;

(v) அழிக்கப்பட்டுள்ள ஒவ்வொரு சொத்து தொடர்பாகவும் பொறுப்புக்கூற வேண்டிய பயங்கரவாதிகளுக்கு எதிராகச் சட்ட நடவடிக் கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவையென் பதையும்;

(vii) மேற்படி (i) - (vi) வரை விசாரிக்கப்பட்டுள்ள தகவல்கள் தொடர்பான முழுமையான அறிக் கையொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the number of government institutions in the Ampara district;

(ii) the number of government institutions that were destroyed by the LTTE terrorists after 1983;

(iii) whether a government approved valuation has been done on the destroyed property;

(iv) if so, the total value of the said property;

(v) whether legal action has been taken against the terrorists who were responsible for the said destruction;

(vi) if so, what those steps are; and

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(vii) whether a comprehensive report with regard to the facts that have been questioned in above (i) to (vi) will be submitted?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජ්‍ය ආයතන 585කි.

(ii) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද රාජ්‍ය ආයතන 14කි.

(iii) විනාශ වූ දේපළ පිළිබඳ රජයේ පිළිගත් තක්සේරුවක් සිදු කළ ආයතන 6ක් ද, තක්සේරුවක් සිදු නොකළ ආයතන 8ක් ද පවතී.

(iv) විනාශ වූ දේපළ පිළිබඳ රජයේ පිළිගත් තක්සේරුවක් සිදු කර ඇති ආයතන 6ක හානි වූ දේපළවල සම්පූර්ණ වටිනාකම රුපියල් 15,488,586කි. ආයතන දෙකක දළ වශයෙන් සිදු කර ඇති තක්සේරු වටිනාකම (රුපියල් 4,500,000) ද සමඟ මුළු වටිනාකම රුපියල් 19,988,586ක් වේ.

(v) නීතිමය පියවර ගත් ආයතන 5ක් පවතී. නමුත් මෙම දිස්ත්‍රික්කය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට ලක්වූ ප්‍රදේශයක් බැවින්, එවැනි පරිසරයක් එම ප්‍රදේශය තුළ එම වකවානුවේදී නොතිබීම නිසා නීතිමය පියවර ගැනීමේ ප්‍රශ්නයක් පැවති අතර, නීතිමය පියවර ගැනීම සඳහා තොරතුරු සොයා ගත නොහැකි ආයතන 08ක් ද, නීතිමය පියවර නොගත් ආයතන 01ක් ද පවතී.

(vi) ආයතන 04ක් සඳහා අමිපාර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවට තොරතුරු වාර්තා වී ඇති අතර, අනෙකුත් ආයතන සම්බන්ධයෙන් එම වකවානුවේදී සිවිල් පරිපාලනයේ පැවති අර්බුදකාරී තත්ත්වය නිසා එවැනි පියවර ගෙන නොමැති ආයතන 05ක් මෙන්ම එවැනි පියවර ගැනීම සඳහා තොරතුරු සොයා ගත නොහැකි ආයතන 05ක් ද පවතී.

(vii) දැනට ලැබී ඇති වාර්තාව ඉදිරිපත් කරමි.

ඇමුණුම් අංක 01*, 02*, 03* බලන්න.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 2073/'17-(2), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 2120/'17-(2), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 2187/'17-(2), ගරු ප්‍රසන්න රණතුංග මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ප්‍රසන්න රණතුංග මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 2189/'17-(2), ගරු වී. රංජිත් ද සොයිසා මහතා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇමති මණ්ඩලයේ සංඛ්‍යාව කියන්න කල් ගන්න ඕනෑ නැහැ නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නිතර වෙනස් වෙනවානේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11. [බාධා කිරීම්] මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ගන්නවා කිව්වා නේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
නැහැ, නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී ගරු විමල් වීරවංශ මන්ත්‍රීවරයා කරපු ප්‍රකාශයක් සම්බන්ධවයි මා රීති ප්‍රශ්නය පැන නැඟුවේ. එය ඉතා බරපතළ ප්‍රකාශයක්. කුලියාපිටිය ප්‍රදේශයේ කඩවලට ගිනි තබා තිබෙනවා කියලා එතුමා ඊයේ සඳහන් කළා. එයට මන්ත්‍රීවරයෙක් සම්බන්ධයි, ඒ වාගේම පොලීසියට ඉහළින් ආපු බලපෑමක් නිසා නිදහස් කරලා කියලාත් සඳහන් කළා. මෙය සම්පූර්ණයෙන් අසත්‍යයක්. පොලීසියත් ඒ සම්බන්ධයෙන් වාර්තා කරලා තිබෙනවා. කඩවලට ගිනි තබලාත් නැහැ. සිද්ධි දෙකක් සිදුවෙලා තිබෙනවා. කොන්තු රොටී සාදන තැනක වීදුරුවකට පහර දීමෙන් එය කැඩීමක් විතරයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම කිසිම මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරයෙකුට සම්බන්ධ කෙනෙක් ඒ සම්බන්ධව අත්අඩංගුවට අරගෙනත් නැහැ; එම සිද්ධියට ඇතුළත් වෙලාත් නැහැ. පොලීසිය ඒ සම්බන්ධයෙන් වාර්තා කරලා තිබෙනවා. ඒ නිසා මේ වාගේ අවස්ථාවක ජාතිවාදය අවුස්සන්න, ඒ වාගේම තමන්ගේ විවිධ පෞද්ගලික පරමාර්ථ ඉෂ්ට කර ගන්න කටයුතු කරන්න එපා කියලා මම කියනවා. මොකද, පොඩි ඡන්දයක් දිනලා මේ විධියට රටේ ආරාවුල් ඇති කරනවා නම්, ලොකු ඡන්දයක් දිනුවොත් එහෙම මේ රටේ මොන තත්ත්වයක් ඇති වෙයිද කියලා මා මේ අවස්ථාවේදී අසා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මතු කළේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. මොකද, රටේ ඇති වී තිබෙන ජාතිවාදී කැරලි කෝලාහල හා ප්‍රචණ්ඩත්වය මර්දනය කිරීම සඳහා හිටපු ජනාධිපතිතුමා ඇතුළුව ඒකාබද්ධ විපක්ෂයේ අපි සියලුදෙනා පූර්ණ සහයෝගය පළ කර තිබෙන අවස්ථාවක, රජයේ පුවත්පතක් වන "දිනමිණ" පුවත් පතෙහි මහනුවර සිද්ධිය පිළිබඳව අද දිනයේ පළ කර තිබෙන පුවතක් සම්බන්ධයෙන් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"මහනුවර සිද්ධිය පිටුපස අදිසි හස්තය හෙළි වෙයි

පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 2ක්, අලුත් පක්ෂයක ප්‍රා. සභා මන්ත්‍රීවරු 2ක්

මන්ත්‍රී ලේකම්වරයෙක්, පක්ෂ සංවිධායකවරයෙක්

කලහකාරීන් පිට පළාත්වලින් ගෙන්වලා"

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ වගකිව යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ගැනයි ජාතික පුවත් පතක පළමුවැනි පිටුවේ මේ විධියට පළ කරන්නේ. ඒ අනුව මේ ජාතිවාදය අවුස්සන්නේ අපිද, තමුන්නාන්සේලාද කියන ප්‍රශ්නය බොහොම පැහැදිලියි. ආණ්ඩුව මෙවැනි තත්ත්වයකට පත් වෙන්න එපා. කොහේද තිබෙන්නේ සාක්ෂි? මන්ත්‍රීවරු අල්ලලා හිරේ දාන එකද කරන්න ඕනෑ, රටක් ගිනිගන්නකොට? පාර්ලිමේන්තුව කියන්නේ ප්‍රබුද්ධ ස්ථානයක්; රටේ ව්‍යවස්ථාදායකය.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර මැතිතුමනි, ඉක්මනින් කියන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ඊයේ විමල් වීරවංශ මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය, දැන් මහනුවර තිබෙන ජාතිවාදී අරගළය වයඹට, කුරුණෑගලට ගේන්න දරපු උත්සාහයක් විධියට හඳුන්වන්න පුළුවන්. මේක ඊයේ පෙරේදා එකපාරටම වුණු සිදුවීමක් නොවෙයි. පසුගිය කාලයේ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

වීරවංශලා, ගම්මන්පිලලා වාගේ ජාතිවාදීන් වපුරපු බිජු තමයි මේ ගින්නට හේතු වුණේ. ඒ නිසා පැහැදිලිවම කියනවා, ඊයේ කුලියාපිටියේ සිද්ධියත් පසුගිය කාලයේ ඔවුන් වපුරපු ඔවුන්ගේ අවශ්‍යතාවයි; ඒ ගින්නයි කියලා. ඊයේ ප්‍රකාශය අර හනුමාගේ ගිනි තැබිල්ල වාගේ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයටත් ගෙනෙන්න හදපු උත්සාහයක් කියලා ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා. [බාධා කිරීමක්] මෙතුමාට අවස්ථාව දුන්නා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම දැක්කා, ලේක් හවුස් ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ආණ්ඩුවේ පුවත් පත. ඒ පුවත් පත ආණ්ඩුවේ නිල මතය ප්‍රකාශ කරන බව අපි පිළිගන්නවා. ඒ වාගේම එම ප්‍රකාශය උපුටා දක්වලා තිබෙන්නේ, කැබිනට් ප්‍රකාශක රාජිත සේනාරත්න අමාත්‍යතුමා ඊයේ කැබිනට් තීන්දු තීරණ දැනුම් දීමේ සාකච්ඡාවකදී මේ කරුණු කියපු බවයි. ගරු කථානායකතුමනි, ඊයේ පැවති කැබිනට් සාකච්ඡාව මම දැක්කා, සජීවීව රූපවාහිනියේ විකාශය වුණා. එතැනදී මාධ්‍යවේදීන් අසන ප්‍රශ්නවලට කැබිනට් ප්‍රකාශක රාජිත සේනාරත්න අමාත්‍යතුමා ඉතා පැහැදිලිව පිළිතුරු ලබාදෙනවා, මෙම ගැටුම් සඳහා මන්ත්‍රීවරු දෙදෙනෙක් හවුල්වී තිබෙන බව; ඒ වාගේම නවක පක්ෂයක සංවිධායකවරයෙක් හවුල්වී තිබෙන බව; ඒ වාගේම මේ පළාත් පාලන මැතිවරණයේදී තේරීපත් වූ මන්ත්‍රීවරු දෙදෙනෙක් මේකට හවුල්වී තිබෙන බව. ඒ වාගේම මන්ත්‍රීවරයෙකුගේ ලේකම්වරයෙකු මෙයට හවුල්වී තිබෙන බව එතුමා ඔවුන්ගේ නම් කියන්නේ නැතිව පොදුවේ මේ පෙන්නුම් කරන්නේ මෙහි දේශපාලන හස්තයක් තිබෙන බවයි.

මන්ත්‍රීවරු ඉන්නවා නම්, සංවිධායකවරු ඉන්නවා නම්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉන්නවා නම් මන්ත්‍රීවරයෙකුගේ ලේකම්වරයෙකු මේ සඳහා අනුබල දීලා තිබෙන බවට තොරතුරු තිබෙනවා නම්, දේශපාලන හස්තයක් ඇති බවයි පෙන්නුම් කරන්නේ. ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරපු කරුණුවල ඉතා පැහැදිලිව පෙන්නුම් කරලා තිබෙනවා, මේ පිටුපස ඉතාමත් පැහැදිලි දේශපාලන ක්‍රියාකාරිත්වයක් තිබෙන බව. දේශපාලන ක්‍රියාකාරිත්වයක් මේ පිටුපස ඇතිබව පොදුවේ කවුරු අතරත් මතයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, "මහනුවර සිද්ධිය පිටුපස අදිසි හස්තය හෙළිවෙයි" දිණමිණ පුවත් පත වාර්තා කරන්නේ ඒ විධියට. ඒ අනුව දැන් හෙළිවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසුගිය කාලය පුරාවටම ක්‍රමානුකූලව මේ ජාතිවාදය වර්ධනය වෙමින් ආවා. එය ඕනෑම මොහොතක කුඩා ගිනිකුරකින් පවා ඇවිළීමට ප්‍රමාණවත් වන තරමේ ජාතිවාදී මතයක් විධියට පෝෂණය වෙලා තිබෙනවා.

ඇති තරම් පෙට්‍රල් බිමට වක් කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මේ "ජාතිවාදය" තමන්ගේ දේශපාලන බල වුවමනාව වෙනුවෙන් මේ රටේ වැපිරුවා. ඒ වැපිරීමේ ප්‍රතිඵල නිසා තමයි අද සිංහල, මුස්ලිම් සාමාන්‍ය ජනතාව අතර මේ ගැටුම් නිර්මාණය වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන දිනපතාම පොලීසිය අපට වාර්තා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම අවසන් වශයෙන් කියන්නේ දැන් ආණ්ඩුව-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පරීක්ෂා කරලා වාර්තාව ඉදිරිපත් කරයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක්, අලුත් පක්ෂයක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු දෙදෙනෙක්, මන්ත්‍රී ලේකම්වරයෙක්, පක්ෂ සංවිධායකවරයෙක්, කලහකාරීන් පිට පළාත්වලින් ගෙන්වලා කියලා පත්තරේ සඳහන් වනවා. ඒ කවුද කියලා දැන් ඉතා පැහැදිලියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ පරීක්ෂණ අවසන් වෙනතෙක් සිටිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ව්‍යංගව කියන්න එපා. ඊයේ කැබිනට් අමාත්‍යවරයා ප්‍රකාශ කළා, ඒ පිළිබඳ පරීක්ෂණ කළා කියලා. ඒ පරීක්ෂණවලින් ඔහු තොරතුරු අනාවරණය කරලා තිබෙනවා. ඒ නිසා ඒ කවුද කියන එක පිළිබඳ නිශ්චිතව නම් ගම් සහිතව අද දිනයේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. එය තමයි ගරු කථානායකතුමනි, අපේ ඉල්ලීම. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ සාකච්ඡාව ඇතිවුණේ අපේ අධ්‍යාපන ඇමතිතුමා කුලියාපිටිය සම්බන්ධව සඳහන් කරපු සිද්ධියකින්. මේ කාරණය අපේ බන්දුල ගුණවර්ධන මැතිතුමාත් පැහැදිලිව සඳහන් කළා; දැන් අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් සඳහන් කළා; මහනුවර සිද්ධිය පිටුපස පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක්, අලුත් පක්ෂයක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු දෙදෙනෙක් සිටින බවත්, ඔවුන් අත් අඩංගුවට ගැනීම සඳහා කටයුතු කරන්න රජය බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරනවා කියා. මහජන මන්ත්‍රීවරයෙක්ගේ තිබෙන අයිතිය පිළිබඳ අපි ඔබතුමාට කරුණු කියලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත්, මගේ හිත මිත්‍ර ජනතා විමුක්ති පෙරමුණටත් මම

සිහිපත් කරන්න කැමතියි, 1983 කළු ජූලිය ඇති වන වෙලාවේ මම මේ පාර්ලිමේන්තුවේ සිටි බව. එදා එක්සත් ජාතික පක්ෂයේ අග්‍රාමාත්‍යවරයා හා ඇමති මණ්ඩලය ඇවිල්ලා කිව්වේ මොකක්ද? "මෙය පිටුපස දේශපාලන හස්තයක් තිබෙනවා. අප විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරනවා; ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය තහනම් කරනවා; ඒ වාගේම නව සමසමාජ පක්ෂය තහනම් කරනවා" කියලායි. එදා ඔවුන්ගේ මන්ත්‍රීවරු හැටියට පාර්ලිමේන්තුවේ හිටියේ සරත් මුත්තෙට්ටුවේගම මහතා විතරයි. කළු ජූලිය දියත් කළා කියලා හදිසි නීතිය යටතේ නායකයන්, නිලධාරීන් ඔක්කෝම අරගෙන ගිහිල්ලා මීගමුවේ බන්ධනාගාරයට දැම්මා. නමුත්, අවසානයේදී මාස ගණනාවක් යන්න කලින් හෙළිදරවු වුණා, ඔප්පු වුණා, කළු ජූලිය ක්‍රියාත්මක කළේ එක්සත් ජාතික පක්ෂයේ නායකයන් හා ඔවුන් විසින් ලකුණු කරන ලද ඡන්ද පොත්වලින් කියලා. අද දක්වා ඒ කළු ලපය පවතිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. දැන් අවසන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු කියන්නේ මහජන නියෝජිතයෝ. මහජන නියෝජිතයන්ට ප්‍රශ්නයක් වන තැනකට යන්න අයිතියක් තිබෙනවා; පොලීසියකට යන්න අයිතියක් තිබෙනවා. මේ කලහකාරී තත්ත්වය ඇති කරපු අය වහලා, මේ කනගාටුදායක ජාතිවාදී ගින්දර, අපලය වෙන අයගේ කරපිටට පටවන්න හදන වෙලාවේ මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ලෙස. අපි ඉතාම වග කීමෙන් කියනවා, අසත්‍ය චෝදනා කරන්න එපා; පත්තරයක් අව්වු ගහගන්න පුළුවන් වූ පළියට වගකීමක් නැති ප්‍රකාශ කරන්න එපා කියා. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලනවා මේ අසත්‍ය චෝදනාවලින් ගරු මන්ත්‍රීවරු ආරක්ෂා කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මීට ඉස්සෙල්ලා ජාතිවාදී කෝලාහලය ඇති වුණු කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල දර්ගා නගරය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මා විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, මේ වෙලාවේදී රජයේ වගකීම වෙන්නේ විපක්ෂය නියෝජනය කරන අයට ඇඟිල්ල දික් කිරීමට පෙර මේ වෙනුවෙන් අද ගත යුතු ක්‍රියා මාර්ගයට අවතීර්ණ වන ලෙසටයි, ගරු කථානායකතුමනි. අද මේ ආණ්ඩුවේ පත්තරෙන් දෙන පණිවුඩය මොකක්ද, ගරු කථානායකතුමනි? මේ පණිවුඩයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙකු ගැන කියනවා. ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනා කවුද? ගරු කථානායකතුමනි, ඊයේ සහ පෙරේදා දවසේ අපි නියෝජනය වුණේ අපේ දිස්ත්‍රික්කයේ. අපි නියෝජනය වුණේ, අපි නියෝජනය කරන සිංහල හා මුස්ලිම් ජනතාවගේ සමගිය ඇති කරන්න. එතකොට අපට යන්න සිද්ධ වනවා, පල්ලියට; අපට යන්න සිද්ධ වනවා, පන්සලට; අපට යන්න සිද්ධ වනවා, පොලීසියට. මේ ආණ්ඩුව උත්සාහ කරන්නේ මහජන නියෝජිතයාට තිබෙන අයිතියත් නැති කරන්න නම් ගරු කථානායකතුමනි, මේ ගිනි දැල්ල නිවන්න අපි ඒ තැන්වලට යන කොට අපි කෙසේද එයට මුහුණ දෙන්නේ?

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. සිංහල ජනතාව බහුතරයක් එක්ක ජීවත් වන මහජන නියෝජිතයන්ට මේක දැනෙනවා අඩුයි. මුස්ලිම් ජනතාව බහුතරයක් එක්ක ජීවත් වන මුස්ලිම් මහජන නියෝජිතයන්ට මේක තේරෙනවා අඩුයි. හැබැයි, සිංහල හා මුස්ලිම් කියන කොටස් දෙකම ඉන්න තැන ජීවත් වන මහජන නියෝජිතයාගේ ඇඟට මේක දැනෙනවා, ගරු කථානායකතුමනි. මේ ගිනි ගන්නේ, සිංහල ජනතාව හෝ මුස්ලිම් ජනතාව නෙවෙයි. මේ ගිනි ගන්නේ, ශ්‍රී ලාංකික ජාතිය. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ රටේ තුන්වන පුරවැසියා. ඔබතුමා මෙයට ඇහුම් කන් දෙන්න. ගරු කථානායකතුමනි, ජනතාව අසරණ වෙලා සිටින කොටු වුණු ගම්මාන තිබෙනවා. ඔබතුමා ඉතා ඉක්මනින් ඒවාට ආරක්ෂක අංශවල අය යොදවන්න. ඒ ගම්මානවල ඉන්නේ සිංහල ජනතාව වෙන්න පුළුවන්; මුස්ලිම් ජනතාව වෙන්න පුළුවන්. ඒ කොටු වුණු ගම්මාන තනි කරන්න එපා කියන්න.

ආරක්ෂක අංශ ඒ ස්ථානවලට යොදවන්න කියන්න. ඒ යුතුකම ඉටු කරන්න. රාජිත සේනාරත්න කියන කැබිනට් ප්‍රකාශකවරයා කැබිනට් ප්‍රකාශකකමෙන් ටික කාලයකට අයින් කරන්න, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි. මේ ගිනි දැල්ල නිවන්න අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. මේ සම්බන්ධයෙන් අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මේ සම්බන්ධයෙන් අපි දිනපතාම ආරක්ෂක ලේකම්, පොලිස්පති ඇතුළු අදාළ අංශ සමඟ සාකච්ඡා කරනවා. මෙහි වැදගත්කම තේරුම් ගිහිල්ලා තිබෙනවා. අවශ්‍ය පියවර ගන්නවා. බොහොම ස්තුතියි.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, අපි මෙතැනින් මේ කථාව අවසන් කරමු.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, පසුගිය දිනෙක අම්පාරේදීත් මෙවැනි සිද්ධියක් වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. ඔබතුමා අද උදේත් මට ඒ ගැන කිව්වා, මට මතකයි. ඒ නිසා කෙටියෙන් සඳහන් කරන්න.

ගරු ඩී.ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, මේක සැලසුම් සහගත කුමන්ත්‍රණයක් නොවන බව. කඩේකට ගිහිල්ලා ඇති වුණු සිද්ධියක්. ඒ සිද්ධිය අවාසනාවන්ත සිද්ධියක් බවට පත් වෙලා ව්‍යාප්ත වුණා. දැන් මෙතැනදී ඒක අපේ පිට දමන්න උත්සාහ කරමින් ඉන්නවා. ඊයේ අම්පාරේ කඩ වහලා තිබුණා. ඒ කඩ වැහුවේ, ව්‍යාපාරිකයෙක් අත් අඩංගුවට ගැනීමට විරුද්ධවයි. වැදගත් ව්‍යාපාරිකයෙක් අත් අඩංගුවට අරගෙන පොලීසිය ඔහුට චෝදනා කරනවා, "මංකොල්ලකාරයෙක්" කියලා. ඔහු උසාවියට ඉදිරිපත් කරලා, දැන් මාස ගණනාවකට රිමාන්ඩ් කරලා තිබෙනවා. ඒ සිද්ධිය වූ මොහොතේ ඔහු හිටියේ මළ ගෙදරක; සමහර අය හිටියේ පන්සලක වැඩක. ඒ අය අත් අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කළා. ඔවුන් එහෙම මාස ගණනාවක් ඉන්නකොට ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු ඉවරයි; පවුල් ජීවිත අවුල් වෙනවා. ඒ නිසා නීතිය අයුතු විධියට පාවිච්චි කරන්න එපා කියලායි මම කියන්නේ. අම්පාරේ සිංහල, මුස්ලිම් ජනතාව අවුරුදු සිය දහස් ගණනක් එකට ජීවත් වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි. රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා. අපි දැන් ප්‍රධාන කටයුතුවලට යමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. මම කාටත් අවස්ථාව දෙනවා. නමුත් ඒකේ සීමාවක් තියාගන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය සමනය කිරීම සඳහා වැඩසටහනක් අවශ්‍යයි. මා දන්නවා, ඔබතුමා නිරන්තරයෙන් විශේෂ මැදිහත්වීමක් කරන බව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම දවසට තුන් සැරයක් කථා කරනවා, පොලිස්පතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, දිසාපතිවරු ඇතුළු අයට. ඒ වාගේම මම දන්නවා, ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ඊයේත් ඒ ප්‍රදේශයට ගිහිල්ලා සාකච්ඡා කරලා ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ, මෙය වර්ධනය වීම වැළැක්වීම පිණිස. ඒක හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක අපි කාගේත් යුතුකමක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ සිදුවීම් මේ ආකාරයෙන් ව්‍යාප්ත වන්න මේ සිද්ධිය නිමිත්ත බවට පත් වෙලා තිබුණාට, මේ වර්ධනය වෙමින් තිබෙන්නේ ජාතිවාදී ප්‍රවණතාව. මොකද, ඒක තමයි ඕනෑ වෙලාවක පත්තු වීමට ඉඩ තිබෙන්නේ. ගරු කථානායකතුමනි, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා ඉතා පැහැදිලි අදහසක් -මම ඒක පිළිගන්නවාද, නැද්ද කියන එක නොවෙයි- මේ රටට කියා තිබෙනවා, මන්ත්‍රීවරු සම්බන්ධ බව, දේශපාලනය සම්බන්ධ බව. ඒ නිසා දැන් ආණ්ඩුවේ වගකීම තමයි ඒ කවුද, මොකක්ද, එහෙම කියන්න තිබෙන හේතු මොනවාද -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් රහස් පොලීසිය මහින් සම්පූර්ණ පරීක්ෂණයක් කෙරෙනවා. රහස් පොලීසියේ වාර්තාව රජයට ඉදිරිපත් කළාට පසුව අපට ඒ ගැන කථා කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එහෙම නම්, එම වාර්තාවලින් පසුව තමයි කැබිනට් ප්‍රකාශක ඒ කරුණු කියන්න ඕනෑ. ඒ පරීක්ෂණ කටයුතු සිදුවෙමින් තිබියදී, කැබිනට් ප්‍රකාශක කොහොමද එහෙම කියන්නේ? කැබිනට් ප්‍රකාශකවරයා ආණ්ඩුවේ වගකීමක් සහිතව ඒ කරුණු කියලා තිබෙන නිසා, ඒ කවුද කියලා දැන ගැනීමට අපට අයිතිය තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මටත් කියලා තිබුණා කරුණු ඉදිරිපත් කරනවා කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, අපි කුමන දේශපාලන මතිමතාන්තර දැරුවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් පිළිබඳවයි,- [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ ගරු මන්ත්‍රීවරු දෙදෙනෙක් පිළිබඳවයි. මේ ගරු සභාවේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පිළිබඳව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක තමයි මම කිව්වේ. මම යෝජනා කළේත් අපි ඒ වාර්තාව ආවාට පසුව මේ ගැන කථා කරමු කියලායි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

සියලු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂකයා වශයෙන් ඔබතුමාට යුතුකමක් තිබෙනවා, වගකීමක් තිබෙනවා. මේ ගරු සභාව

නියෝජනය කරන මන්ත්‍රීවරු 225 දෙනාගෙන් කවුරු හරි කෙනෙක් මේ ජාතිවාදී ගිනිදැල් අවුලන්න සම්බන්ධ වුණා නම්, ඒ පිළිබඳ ඇත්ත රටට හෙළිදරව් කරන්නේ නැතිව මෙවැනි ප්‍රවෘත්ති ඉදිරිපත් කළාම මොකද වෙන්නේ? එදා ජනතා විමුක්ති පෙරමුණ තහනම් කළේ එහෙම කරලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒක කිව්වා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම කරලා ඒ ඔක්කොම හිරේ දැම්මා. ජාතිවාදය ඇවිළුවේ ජනතා විමුක්ති පෙරමුණ කියලායි එදා කිව්වේ. ඒ නිසා මේ කරුණු නිවැරදි කරන්න ඔබතුමා මැදිහත් වෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි දැන් අනෙක් කටයුතුවලට යමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, සිසිර ජයකොඩි මන්ත්‍රීවරයා කුලප්පු වෙන එක ගැන මම ඒ තරම් කලබල වෙන්නේ නැහැ. මොකද, අබ කාපු අයගේ මොළය දන එක මම පිළිගන්නවා. මේ ජාතිවාදී ප්‍රවණතාව වර්ධනය කොට, මෙවැනි ඉතා කුඩා සිදුවීම් පවා මහා බරපතළ ව්‍යසනයක් බවට පත් කිරීමේ දේශපාලනයක් අපේ රටේ තිබෙනවා. දැන් මේ සිදුවීමට අදාළ අය ආණ්ඩුව භදුනා ගෙන තිබෙනවා නම් ඒ අය හෙළි කරන්න. මම කියන්නේ එච්චරයි. ආණ්ඩුව ඒ අය හඳුනා ගෙන තිබෙනවා නම් අපට ඒ අය ගැන දැන ගැනීමට අයිතියක් තිබෙනවා. මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. එයින් දෙදෙනෙක් පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. ඒ දෙදෙනා කවුද? මොන සාධක මතද එහෙම කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ වාර්තාව ලැබුණාට පසුව ඒ ගැන කථා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපට සාධාරණ අයිතියක් තිබෙනවා, ඒ ගැන දැන ගන්න.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, එතුමාට මා සම්බන්ධයෙන් කිසිම චෝදනාවක් කරන්න පුළුවන්කමක් නැහැ. එතුමන්ලා ඊයේ අතුරුදහන් වූවන්ගේ පනත පිළිබඳව ආණ්ඩුවේ පැත්තට කථා කරලා සංශෝධන දෙකක් ඉදිරිපත් කළා. ඒ සංශෝධන ආණ්ඩුවෙන් ඉදිරිපත් කළේ නැති වුණාම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු දෙදෙනා දිව්වා. අපි එතුමන්ලා යනකොට "හූ" කිව්වා. එතුමන්ලා ඉදිරිපත් කරපු සංශෝධන දෙකට අවස්ථාව දෙන්නේ නැතිව තිබියදීත්, තවම කඩේ යන එක තමයි කරන්නේ. අද අනුර කුමාර දිසානායක ආණ්ඩුවේ ප්‍රකාශකයා බවට පත් වෙලා. එතුමා අද ආණ්ඩුවේ ප්‍රකාශකයා වෙලා. ඒ නිසා තමුන්ගේ- [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ කණ්ඩායම මෙහෙමම තමයි හැසිරෙන්නේ. ඒ අය සමහර කරුණු දන්නේ නැහැ. සමහර කරුණු සම්බන්ධයෙන් බොරු කියනවා; ඔහේ වාචාලකමට කියවනවා.

ගරු කථානායකතුමනි, ඊයේ පනත් කෙටුම්පත් කීපයක් විවාදයට ගත්තා. එකක් තමයි, Anti-Dumping and Countervailing Duties Bill එක. ඒකට අපි සංශෝධන දෙකක් ඉදිරිපත් කළා. ආණ්ඩුව ඒ සංශෝධන දෙක භාර ගත්තා. අනෙක් පනත් කෙටුම්පතට අපි සංශෝධන ඉදිරිපත් කළේ නැහැ. මේ මන්ත්‍රීතුමා හිතනවා, සංශෝධන කිව්වාම හැම පනතකටම වලංගුයි කියලා. ඒකවත් දන්නේ නැති අය. ඔන්න ඔය විධියට තමයි මේ රට ගිනි තියන්නේත්. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] ඔය විධියට තමයි රට ගිනි තියන්නේත්. බාගෙට අහගන්නවා; බාගෙට කියවනවා. ඒ නිසා හරියට අහගන්න කියන්න. සිද්ධ වුණු දේ හරියට සොයන්න කියන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11-2189/'17-(2), ගරු රංජිත් ද සොයිසා මහතා. ප්‍රශ්නය අහනවාද? පිළිතුර සභාගත කරනවාද? [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මොකුත් ඇහෙන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, 11වෙනි ප්‍රශ්නය අහනවාද? [බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරු වාඩිවෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු රංජිත් ද සොයිසා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, 11වෙනි ප්‍රශ්නයට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පිළිතුරු දුන්නා, සතියක කාලයක් ඉල්ලනවා කියලා. ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සිටින ගණන කියන්න සතියක් කල් ඉල්ලනවා නම්, මොකක්ද මේ විහිළුව? ඔබතුමා මේකට ඉඩ දෙනවාද? ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සිටින සංඛ්‍යාව කියන්න සති දෙකක් ඕනෑද? ඒ සංඛ්‍යාව කියා ගන්න බැරිව නිකම් විහිළු කරන්න එපා. "අගමැතිතුමා සුමාන දෙකකට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය ධුරයේ වැඩ බලනු ලැබේ" කියලාවත් කියන්න. මේ ගණන කියා ගන්න බැහැයි කියන්නේ ඔබතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙන නිසායි හරියට මේ ගණන කියා ගන්න බැරි. ඒකයි ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order, Hon. Member?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ඊයේ Anti-Dumping and Countervailing Duties Bill එක, Safeguard Measures Bill එක සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාවේදී සහ ඡන්ද විමසීම් කරන අවස්ථාවේදී මා මේ සභා ගැබේ රැඳී සිටියා.

ඒ ගැන සාවද්‍ය කරුණක් ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා සභාගත කළා. අපි කිසිදු අවස්ථාවක බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සංශෝධනයක් ගෙනාවේ නැහැ. ඒ නිසා කරුණාකරලා ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මා ඒ ගැන බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එය හැන්සාඩ්ගත වෙන්න බැහැ. එය සාවද්‍ය ප්‍රකාශයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ ප්‍රකාශය හැන්සාඩ්ගත වෙන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කරුණාකර ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් හැන්සාඩ් වාර්තාව බලන්න කියලා මා කිව්වා. [බාධා කිරීම්] හොඳයි. වාඩි වෙන්න.

දෙවන වටය. ප්‍රශ්න අංක 12, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමනි, කරුණාකර වාඩි වෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මීට කලින් අහපු 11 වන ප්‍රශ්නයට අගමැතිතුමා සතියක් කල් ඉල්ලා තිබුණා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා බොහොම සරල ප්‍රශ්නයක් විධියට ඇහුවා, කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් සංඛ්‍යාව කියන්න බැරිද කියලා. මෙම ප්‍රශ්නයෙන් අලුතින් වැඩි කරන ලද අමාත්‍යාංශවලට වැය කරන ලද ප්‍රතිපාදන ආදිය පිළිබඳ ගොඩක් විස්තර අහලා තිබෙනවා. ඒකයි සතියක් කල් ඉල්ලා තිබෙන්නේ. ලබන සතියේ අපි ඒ පිළිතුර ඉදිරිපත් කරන්නම්. බලාගෙන ඉන්න අය හිතයි, ඇමති මණ්ඩලයේ ඇමතිවරුන්ගේ ගණන විතරයි අහලා තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්] ලබන සතියේ පිළිතුර දෙන්නම්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 -2192/'17- (2), ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, තුන්වන වතාවටයි මේ ප්‍රශ්නයට කල් ඉල්ලන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඔව්. තුන් වතාවක් කල් ඉල්ලන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන් වතාවක් කල් ඉල්ලන්න පුළුවන් කියලා හැම වෙලාවේම ඒකෙන් ප්‍රයෝජන ගන්න එපා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
මේ ආණ්ඩුවට උත්තර දෙන්න බැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඒ කාලයේ උත්තර දෙන්නේ නැතුවම හිටියා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වන වතාවේදී අනිවාර්යයෙන්ම පිළිතුරු දෙන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -2196/'17 - (2), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 -2233/'17 - (2), ගරු ඩී.වී. චානක මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ප්‍රධාන කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් මෙම කාරණය මා ඔබතුමාගේ අවධානයට ගෙන එන්නට කැමැතියි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සහ ඊයේ අලුතෙන් අනුමත කරන ලද ස්ථාවර නියෝග අනුව මෙම කාරණය ඔබතුමාගේ අවධානයට ගෙන එන්නේ එම පනත අත්සන් තැබීමට බොහෝවිට ඔබතුමා වෙත අද දින එවීමට ඉඩ ඇති නිසා. ඊයේ සිදු වූ සිද්ධිය ගැන අපි බොහොම කනගාටු වෙනවා. ඊයේ එම පනත විවාදය සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේ ගරු මාරපන ඇමතිතුමා ප්‍රකාශයක් කළා. එම ප්‍රකාශය අනුව අප සමහත් සාකච්ඡා කළා. ඊයේ දිනයේ එම විවාදය අවසන් නොකර අද දිනයට හෝ හෙට දිනයට කල් තබා, ඒ අතරතුර සංශෝධනයක් ඉදිරිපත් වන බව කිව්වා. කාරක සභා අවස්ථාවේ සංශෝධනය ඉදිරිපත් කිරීමේදී ගරු කථානායකතුමා මූලාසනයේ සිටියා. ඒ අවස්ථාවේ දී ගරු ඇමතිතුමා සංශෝධනයක් ඉදිරිපත් කළා. එම සංශෝධනය මන්ත්‍රීවරුන්ට බෙදා හැර තිබුණේ නැහැ. එය ස්ථාවර නියෝග හා සම්ප්‍රදාය උල්ලංඝනය කිරීමක්.

දෙවැනි කාරණය, දෙමළ බසින් මෙම සංශෝධනය ලැබී නැති බව ඔබතුමා වෙත මහ ලේකම්වරයා දැනුම් දුන්නා. එය ඔබතුමා මයික්‍රෝෆෝනයෙන් ප්‍රකාශ කළා. ගරු ඇමතිතුමාත් කිව්වා, "ඔව්, දෙමළ බසින් ලබා දී නැහැ" කියා. එය ස්ථාවර නියෝග කඩ කිරීමක්. ගිය සතියේ සුමන්තිරන් මන්ත්‍රීතුමා මහ බැංකු බැඳුම්කර වාර්තාව දෙමළ බසින් නැහැ කියපු වෙලාවේ පාර්ලිමේන්තුව කල් තැබුවා, එය දෙමළ බසින් නැති නිසා. ඊයේ ඉදිරිපත් කර තිබුණු එම සංශෝධනය දෙමළ බසින් නැති බව ගරු ඇමතිතුමාත් පිළිගත්තා; ඔබතුමාත් පිළිගත්තා; මහ ලේකම්වරයාත් පිළිගත්තා. එහෙම තියෙද්දී ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබුණු මේ සංශෝධනය අගමැතිතුමා විසින් ඉල්ලා අස්කර ගත්තා. ස්ථාවර නියෝග අනුව ඇමතිවරයා විසින් සංශෝධනයක් ඉදිරිපත් කර තිබුණා. නමුත් ගරු අගමැතිතුමා කලබලයෙන් ඇවිත් කිව්වා, "සංශෝධනය ඉල්ලා අස්කර ගන්නවා" කියලා. මේ පිළිබඳව ඇතිවුණු වාදය උඩ අපි කියනවා, ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් ඔබතුමා ඡන්ද විමසීමක් කළ බව. ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කරන ලද එම ඡන්ද විමසීම වලංගු නැහැ කියලා අපි කියනවා, ගරු කථානායකතුමනි. එම නිසා සවස අනුගමනය කළ පිළිවෙත සම්පූර්ණ ස්ථාවර නියෝග විරෝධී වැඩ පිළිවෙළක්. ගරු චන්ද්‍රසිරි ගජධීර මන්ත්‍රීතුමා කථාවක් කරන්න ඉල්ලුවා. එතුමා කථාවක් කර තිබුණේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථාවක් ඉල්ලුවේ පස්සේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා සවස 2.00 සිට මේ ගරු සභාවේ සිටියා, එතුමාට කථාවක් කරන්න අවශ්‍යම නිසා. එතුමා මේ පිළිබඳව දක්වන උනන්දුව අනෙක් මන්ත්‍රීවරුන් හා සමාන වාගේම විශේෂත්වයක් තිබෙන නිසා. එතුමා නියෝජනය කරන්නේත් දේශපාලන පක්ෂයක්. අපේ ඒකාබද්ධ විපක්ෂය ඇතුළේ කොමියුනිස්ට් පක්ෂයේ අදහස කියන්න එතුමා බලාපොරොත්තුවෙන් සිටියා. ඒ වාගේම අපේ තව මන්ත්‍රීවරුන් කථා කරන්න හිටියා, එතුමන්ලාට අවස්ථාව දුන්නේ නැහැ. හැබැයි, මුලදී කිව්වා අවස්ථාව දෙනවා, එහෙම බැරි වුණොත් අපි වෙනත් දිනයකට කල් දමනවා කියලා. මෙය අවුල් කිරීම නොවෙයි, මෙය විසඳා ගන්නා ක්‍රම වේදයකට ඇමතිතුමා එකඟ වී ඒ අනුව කටයුතු කිරීමයි අපට අවශ්‍යව තිබුණේ. එම පිළිවෙත උල්ලංඝනය කොට මෙය සම්මත කිරීම වලංගු නැහැ කියා මා හිතනවා. එම නිසා යළිත් වරක් මෙය වලංගු කිරීම සඳහා සභාවට ගෙන ඒම කළ යුතුව තිබෙනවා. එසේ නැත්නම් ඔබතුමාගේ මූලාසනයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග කඩ කිරීමක් කර තිබෙන බවයි කියන්නට තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද පෙර වරු 11.30 ට පැවැත් වෙන පක්ෂ නායකයන්ගේ රැස්වීමේ දී මම මේ පිළිබඳව සාකච්ඡා කර පැහැදිලි කර ගැනීමක් කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ කාරණයේ දෙපැත්තක් තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කරමු.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, අපි මේ ගරු සභාවේ දී ඔබතුමාගේ වචනය, ඔබතුමාගේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව උපරිම ලෙස විශ්වාස කරනවා. ඒ අනුව ඊයේ මතු වුණු තත්ත්වය තුළ ඔබතුමා ඉතා පැහැදිලිව සඳහන් කළා, "අද දිනයේ ඡන්දය ගන්නේ නැහැ, හෙට දිනයේ තමයි ඡන්දය ගන්නේ" කියා. ඔබතුමා මූලාසනය ලෙස මේ ගරු සභාවට කළ ප්‍රකාශය නිසා, අපි උදේ මේ සභාවේ ඉඳලා ඔබතුමාගේ වචනය විශ්වාස කරලා, ඇත්තටම ඊයේ දිනයේ මේ සඳහා ඡන්දය ගන්නේ නැහැ කියා සිතලා අපි පිටව ගියා. නමුත්, ඊට පසුව ඡන්දය ගන්නට යන බව ප්‍රකාශ වූ අවස්ථාවේ දී මමත්, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත්, ගරු තිලක් මාරපන ඇමතිතුමාව භෝජන ශාලාවේ දී මුණ ගැසුණා. එතුමා කිව්වා, "අපි හැම පැත්තෙන්ම බැණුම් අහනවා නේ. ඒ නිසා අපි සංශෝධනයක් දානවා. මේක අතීතයට බලපාන්නේ නැහැ. ශ්‍රී ලාංකිකයන්ට බලපාන්නේත් නැහැ" කියලා. ඒක නේ ඉතාම වැදගත් කරුණ. රටක් වශයෙන්, ජාතියක් වශයෙන් ශ්‍රී ලාංකිකයන්ට මේක අදාළ වෙන්නේ නැහැ කියන වගන්තිය අනිවාර්යයෙන්ම ගේනවා කිව්වා. ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමාත් සාක්ෂි දරනවා ඇති, ඒ අවස්ථාවේ දී එතුමාත් කිව්වා "ඔව් එහෙනම් ඒ සංශෝධනය සහිතව සම්මත කරන්න" කියා. දැන් වැරැදි දෙකක් සිදු වෙලා තිබෙනවා. එකක්, ඔබතුමා කියපු ආකාරයට ඡන්දය ගන්නේ නැහැ කියපු පනත් කෙටුම්පතක් සඳහා ඡන්දය ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට පොඩ්ඩක් ඉඩ දෙන්න ගරු මන්ත්‍රීතුමා. "අවශ්‍ය වුණොත් කල් දමනවා" කියන එක හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එක දවසකට එක තීන්දුවක්, තව දවසකට තව තීන්දුවක්. එහෙම වෙන්නේ කොහොමද? එතකොට මේ ආයතනය විහිළුවක් බවට පත් වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කරුණ ගැන අපි පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරමු. [බාධා කිරීම්]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ කවදා ද කියලා ගරු ඇමතිතුමා කිව්වා නම් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
සති දෙකකින් පිළිතුරු දෙනවා. ඊළඟ පාර්ලිමේන්තු සතියේ දී පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පෙර වරු 11.30ට පක්ෂ නායක රැස්වීමක් පැවැත්වෙනවා. ඊට සහභාගී වන ලෙස සියලුම සභික ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා.

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු.
සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම,
මුදල් පනත යටතේ නියෝග අනුමත කිරීම,
සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය අනුමත කිරීම,

ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටපු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අටෙක්කලනාතන්] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்களே! உங்களுடைய point of Order என்ன?

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த உயரிய சபையிலே எதிர்க்கட்சித் தலைவர் கௌரவ இரா. சம்பந்தன் அவர்களால் என்னுடைய பேச்சுரிமை தொடர்ச்சியாக மறுக்கப்பட்டுக்கொண்டிருக்கிறது. இது தொடர்பாக நான் கடந்த 21ஆம் திகதி கௌரவ சபாநாயகர் அவர்களுக்கு எழுத்துமூலம் தெரிவித்திருந்தேன். அதேபோல் நேற்று 07ஆம் திகதியும் தெரிவித்திருந்தேன். என்னுடைய இந்தச் சிறப்புரிமை மீறப்பட்டிருப்பது தொடர்பாக இரண்டு தடவைகள் கௌரவ சபாநாயகர் அவர்களுக்கு எழுத்துமூலம் தெரிவித்திருக்கிறேன். ஆனால், இதுவரைக்கும் அதற்குரிய பதிலைப் பெற்றுத்தரவில்லை. இதுதொடர்பில் நான் உங்களுடனும் நேரில் பேசியிருக்கிறேன். நீங்களும் எதிர்க் கட்சித் தலைவர் அவர்களுடன் பேசி எனக்குரிய நேரத்தைப் பெற்றுத்தருவதாகக் கூறியிருக்கின்றீர்கள். ஆகவே, 225 உறுப்பினர்கள் இருக்கின்ற, கண்ணியமானதும் ஜனநாயகத்தைப் பேணுகின்றதுமான இந்தச் சபையிலே எனக்கு மட்டும் இந்த உரிமை தொடர்ச்சியாக மறுக்கப்பட்டு வருகிறது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்களே! இன்று காலை 11.30 மணிக்கு Party Leaders' meeting நடைபெற விருக்கின்றது. அதில் கலந்தாலோசித்து உங்களுக்கு ஒரு முடிவு பெற்றுத்தரப்படும்.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
தயவுசெய்து, நீங்கள் என்னுடைய கருத்தை ஒரு நிமிடம் கேட்கவேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இது point of Order இல்லை.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்கு முன்னரும் நீங்கள் இந்தப் பதிலைச் சொல்லியிருந்தீர்கள். செயலாளர் நாயகத்திடம் முறையிட்ட நேரத்தில், அது தொடர்பில் கட்சித் தலைவர்களது கூட்டத்தில் பேசி, எனக்குரிய நேரத்தைப் பெற்றுத்தருவதாகக் கூறியிருக்கின்றீர்கள். இப்படி நேரம் மறுக்கப்படுவதானது நீங்களும் நானும் பிரதிநிதித்துவப்படுத்துகின்ற வன்னித் தேர்தல் மாவட்ட மக்களின் குரல்வளையை நசுக்குவதற்குச் சமமானது. இந்தச் சபையில் எதிர்க்கட்சித் தலைவர் அவர்கள் இந்த வேலையைத்தான் தொடர்ச்சியாகச் செய்துகொண்டிருக்கிறார். இன்றைக்கு நாங்கள் எவ்வளவோ விடயங்களைப் பேச வேண்டியிருக்கிறது. ஆனால், என்னுடைய உரிமை மறுக்கப்படுகின்றது. தயவுசெய்து இந்த உரிமையைப் பெற்றுத்தருவதற்குரிய நடவடிக்கையை நீங்கள் எடுக்கவேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி! கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்களே, இன்று காலை 11.30 மணிக்கு நடைபெறவிருக்கின்ற கட்சித் தலைவர்களின் கூட்டத்தில் உங்களுடைய விடயம் சார்பாக முடிவெடுக்கப்படும்.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත
மதுவரி (திருத்தம்) சட்டமூலம்
EXCISE (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.33]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" යි මා යෝජනා කරනවා.

එමෙන්ම මුදල් පනත යටතේ නියෝග සහ සුරාබදු ආඥාපනත යටතේ නිවේදනයත් අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනවා. මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා විවාදය ආරම්භ කරනවා ඇති.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[පූ.භා. 11.34]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත්, මුදල් පනත යටතේ නියෝග සහ සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය ගැනත් අද දින සාකච්ඡා කිරීමට නියමිතව තිබෙනවා. මෙයින් මුදල් පනත යටතේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

නියෝගය ඉදිරිපත් කර තිබෙන්නේ, රට තුළට ගලා එන විදේශීය ටෙලිනාට්‍ය, චිත්‍රපට සම්බන්ධයෙන් සහ ඒවායින් දේශීය කර්මාන්තයට වන බලපෑම සැලකිල්ලට ගනිමිනුයි. විදේශීය ටෙලිනාට්‍ය නිසා දේශීය කර්මාන්තයට ඇති වන බලපෑම අවම කරන්න තමයි මේ නියෝග අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සම්බන්ධයෙන් වන බද්ද මීට ප්‍රථමයෙන් කිහිප වතාවක්ම සංශෝධනය කර තිබෙනවා. 2017 අය වැය තුළිනුත් එවැනි යෝජනාවක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව, අපේ ජාතික කර්මාන්තය -දේශීය කර්මාන්තය- ආරක්ෂා කර ගැනීමයි. ඉතින් මම ඒ ගැන වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ඒක කරන්න වුණු හේතුව පමණයි මෙතැන සඳහන් කළේ. ඒ වාගේම අපි තව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවා. සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 15 වන වගන්තිය යටතේ එන සංශෝධන කීපයක් තමයි ඒ තුළින් ඉදිරිපත් කර තිබෙන්නේ. මෙය 2017 ඔක්තෝබර් මාසයේ 24 වැනිදා ගැසට් පත්‍රයේ පළ කළ සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පතයි. මෙයින් ඉදිරිපත් කර තිබෙන්නේ රා නිපදවනු ලබන ගසකින් රා මැදීමට හෝ රා බෑමට වලංගු බලපත්‍රයක් ලබා ගැනීම පිළිබඳවයි. මෙම පනත කිහිප විටක්ම සංශෝධනය කරලා තිබෙනවා. මෙය ක්‍රියාත්මකව තිබුණත්, ඊටපසුව එය අහෝසි කළා; සම්පූර්ණයෙන්ම නිදහස් කළා. මේ සඳහා වලංගු බලපත්‍රයක් ලබා ගත යුතුයි කියන අදහස තමයි දැන් නැවතත් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. 2011- 2013දී කිතුල්, තල් සහ පොල් ගස් මැදීමට, රා බෑමට බලපත්‍ර ගැනීම අවශ්‍ය නොවන පරිදි තමයි එදා සංශෝධනය කළේ. ඒ අනුව බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ. නමුත්, ඒ හේතුවෙන් නිෂ්පාදිත රා ප්‍රමාණය හා ඉස්කාගාරවලට ලැබෙන රා ප්‍රමාණය අධීක්ෂණය කිරීමේ යම් කිසි අපහසුතාවක් සුරාබදු දෙපාර්තමේන්තුවට තිබෙනවා. ඒවා ගැන සොයා බලා තමයි, මෙවැනි ආකාරයට බලපත්‍රයක් ලබා ගත යුතුයි කියලා අපි මේ සංශෝධනය දැන් ඉදිරිපත් කරන්නේ. කිතුල් ගස් හැර රා නිපදවන වෙනත් ගසකින් රා මැදීමට හෝ රා බෑමට බලපත්‍ර ලබා ගත යුතුයි කියන සංශෝධනය තමයි මෙහිදී අප ඉදිරිපත් කරන්නේ. මෙමඟින්, සුරාබදු දෙපාර්තමේන්තුවට රා නිෂ්පාදන අධීක්ෂණය කිරීමට හැකි වන අතර, රට තුළ නීති විරෝධී ලෙස රා නිෂ්පාදනය කිරීම පාලනය කරන්නත් අප මෙය ඉඩ ප්‍රස්ථාවක් කර ගන්නවා.

මම විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න අවශ්‍යයි. රජය මද්‍යසාර ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා වැනි මතයක් පසුගිය කාලයේ ඇති කළා. ඇත්තටම ඒ මතය සම්පූර්ණයෙන්ම අපි ප්‍රතික්ෂේප කරනවා. අපේ අරමුණ ඒක නොවෙයි. අපේ අරමුණ, සත්‍ය වශයෙන්ම මද්‍යසාර භාවිතය අඩු කිරීමයි. 2003- 2005 අතර කාලයේ ශුද්ධ මද්‍යසාර ගත්තොත්, ලංකාවේ භාවිතය තිබුණේ ලීටර් 2.2ක් පමණයි.

2008 - 2010 වන විට එම ප්‍රමාණය ලීටර් 3.7කට පමණ වැඩි වෙලා තිබෙනවා. මේ දත්ත මම උපුටාගෙන තිබෙන්නේ WHO එකේ "Global status report on alcohol and health 2014" කියන වාර්තාවෙන්. 2017 වන විට ශුද්ධ මද්‍යසාර - pure alcohol - භාවිතය තවත් ඉහළට යනවා කියලා මේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ඇත්තටම අපි මේක අවම කර ගත යුතුයි. ආසියාවේ හුඟක් රටවල වාර්තාගත වෙලා තිබෙන මද්‍යසාර භාවිතය ලංකාවට වඩා අඩුයි. "වාර්තාගත ප්‍රමාණය" කියන්න හේතුවක් තිබෙනවා. සමහර රටවල මද්‍යසාර භාවිතය නීතියෙන් තහනම් කරලා තිබෙනවා. නමුත් එය භාවිතා වන බව හැමෝම දන්නවා. මැද පෙරදිග වාගේ ආසියාවේ සමහර රටවල් තිබෙනවා, ආගමික හේතූන් වාගේ කාරණා නිසා මද්‍යසාර භාවිතය අවම කරලා තිබෙන නමුත් එය වාර්තාගත ප්‍රමාණයෙන් මැනිය නොහැකි. මොකද, වාර්තාගත නොවන භාවිතයක් තිබෙන නිසා.

ආසියානික රටවලින් ලංකාවට වඩා වැඩි මද්‍යසාර භාවිතයක් තිබෙන රටවල් තමයි ඉන්දියාව සහ තායිලන්තය. ඉන්දියාවේ ලංකාවට වැඩිය ශුද්ධ මද්‍යසාර භාවිතය සිදු වෙනවා. අපේ ප්‍රමාණය ලීටර් 4.5ක් වන විට ඉන්දියාවේ ප්‍රමාණය ලීටර් 4.6ක් පමණ වෙනවා. තායිලන්තයේ ශුද්ධ මද්‍යසාර භාවිතය ලීටර් 8.3ක් පමණ වෙනවා. අනෙක් රටවල ඊට වඩා අඩුයි.

ඒ එක්කම කියන්නට අවශ්‍ය කාරණය මෙයයි. "Hard liquor" සහ "soft liquor" කියලා වර්ග දෙකක් තිබෙනවා. "Hard liquor" කියලා කියන්නේ අධි සැර මද්‍යසාරය. Pure alcohol content එක සියයට 40කට වැඩිය තිබෙන ඒවාට තමයි අධි සැර මද්‍යසාර කියලා කියන්නේ. ඒ pure alcohol content එක සියයට 4 - 6ත් අතරේ තිබෙනවා නම් ඒකට මද සැර - soft liquor - කියනවා. ලංකාවේ අධි සැර මද්‍යසාර භාවිතය වැඩියි. ඒ කියන්නේ අරක්කු වාගේ අධි සැර මද්‍යසාරය මුළු වාර්තාගත මද්‍යසාර භාවිතයෙන් සියයට 85ක් පමණ වෙනවා. ඒ වාගේම බීර වාගේ දේවල් භාවිතය සියයට 13ක් පමණ වෙනවා. මම මේ ඉදිරිපත් කරන දත්ත සියල්ලම උපුටාගෙන තිබෙන්නේ WHO එකේ "Global status report on alcohol and health 2014" නමැති වාර්තාවෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව නීත්‍යානුකූල නොවන මද්‍යසාර - illicit liquor - භාවිතයකුත් තිබෙන බව අපි දන්නවා. කසිප්පු වැනි දේවල් භාවිතයත් වැඩිවෙලා තිබෙනවා. මේ වාගේ නීත්‍යානුකූල නොවන, අධිසැර, සෞඛ්‍යයට හානිකර -ඒවාට "මද්‍යසාරය" කියලාම කියන්න බැහැ - මද්‍යසාර භාවිතය හුඟක් ඉහළයි. ඒ තුළින් පුද්ගලයෙකුගේ සෞඛ්‍යයට විශාල හානියක් සිදු වෙනවා. ඒ විතරක් නොවෙයි, රජයක් හැටියට සෞඛ්‍යය වෙනුවෙන් වැය කරන වියදමත් ඉහළට යමින් පවතිනවා. ඇත්තටම අපි ඒ වියදම අඩු කරන්නේ කොහොමද කියන එකට තමයි අපේ අවධානය යොමුවන්නේ.

මොකද, සුමාන කීපයකට කලින් රටේ වැරදි මතයක් ඇති කරන්න හදපු බව අපි දන්නවා. විශේෂයෙන්ම කාන්තාවන්ට නීත්‍යානුකූලව මද්‍යසාර ලබා ගැනීමට අපේ රටේ බාධාවක් තිබුණා. ඔවුන්ට සම අයිතියක් තිබුණේ නැහැ. පිරිමින්ට තිබෙන අයිතිය කාන්තාවන්ට තිබුණේ නැහැ. ඒ අයිතිය සම කරන්න තමයි එම වැයම තිබුණේ. නමුත් ඒ තත්ත්වය කැබිනට් මණ්ඩලයෙන් ප්‍රතික්ෂේප කළා. නමුත් ඒක සම අයිතිය පිළිබඳ ප්‍රශ්නයක්. ලංකාවේ පැය හයක්, අටක් තැබෑරුම් ඇරලා තිබෙන කාල වේලාව අඩු කරන්න ඕනෑ කියලා කවුරුත් එකතුවෙලා කියනවා නම් එයට අපිත් රජයක් හැටියට එකඟ වනවා. මෙතැන තිබෙන්නේ කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මොකද, අපේ අරමුණ මද්‍යසාර භාවිතය අඩු කිරීමයි. නමුත් කලින් ප්‍රශ්නය තිබුණේ කාන්තාවන්ගේ සම අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳවයි.

අද ජාත්‍යන්තර කාන්තා දිනයයි. අපේ රජය හැම තිස්සේම පෙනී සිටින්නේ කාන්තාවන්ට සම අයිතියක් ලබා දීමටයි. කාන්තාවන් කරන දේ සහ පිරිමින් කරන දේ වෙනස් වෙන්නට පුළුවන්ද? The role of the woman and the role of the man will differ, but we are totally committed to the equality of gender that males and females will not be discriminated. Therefore, the law must always reflect equality for women. That is the stand of our Government and our attempt recently is basically to clear some of the old laws based on gender parity. It was not intended to increase

the consumption of alcohol in this country. In fact, we are opposed to the increased consumption of alcohol and every step must be taken to reduce the consumption of alcohol.

මට මේක ගැන කථා කරන්න විශේෂ අයිතියක් තිබෙනවා. මොකද, මම මද්‍යසාර භාවිතා නොකරන කෙනෙක්. නමුත්, පුද්ගලයෙක් හැටියට තමන්ගේ පෞද්ගලික තීරණ ගන්න සෑම වැඩිමහල් කෙනෙකුටම අයිතිය තිබෙන්නට ඕනෑ කියලා මම පිළිගන්නවා. මගේ මතය වෙනත් කෙනෙකුට ඉදිරිපත් කරලා, ඔහු ලවා ඒ මතය ක්‍රියාත්මක කරන්න මට බැහැ කියන එකයි මගේ මතය. ඒ වාගේම, මේ වගේ පෞද්ගලික දේවල් ගැන බැලුවාම, හැම තිසේසේම රජයකටවත් පුද්ගලයෙකුගේ මතය රජයේ මතයෙන් පාලනය කරන්න බැහැ කියලා මම විශ්වාස කරනවා. පුද්ගල අයිතිවාසිකම ආරක්ෂා කරන විධියට, ඒ වාගේම කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට තමයි අපි රජයක් හැටියට, ඒ වාගේම පාර්ලිමේන්තුවක් හැටියට නීති රීති හදන්නට ඕනෑ. නමුත්, අපේ රජයේ අරමුණ තමයි, මද්‍යසාර භාවිතය අඩු කරන එක. මොකද, විශාල ලෙස මද්‍යසාර භාවිතා වීම නිසා සෞඛ්‍යයට වන හානියත්, ඒ වාගේම පවුලට වන හානියත් ඉතා විශාලයි. මම ඒක කියන්න අවශ්‍ය නැහැ, දරුවන්ගේ අධ්‍යාපනයටත්, දරුවන්ගේ අනාගතයටත් ඒකෙන් සිදුවන හානිය හැමෝම දන්නවා. එම නිසා තමයි අඩුම ගණනේ මේ කරන ක්‍රියාවලිය නීත්‍යානුකූල කළ යුතුයි කියන අදහස අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි කිතුල් ගසකින් හැර වෙනත් ගසකින් රා නිපදවීමේදී රා මැදීමට හෝ රා බෑමට බලපත්‍ර ලබාගත යුතුයි කියන කාරණය අපි මේ නියමයන් හරහා අද පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. බදු හරහා පමණක් රජයකට මේ වෙනස් කිරීම් කරන්නට බැහැ. පුද්ගල හැසිරීමවත්, ඒ වාගේම මද්‍යසාර භාවිතයත් වෙනස් කරන්න බදු හරහා පමණක් පුළුවන්කමක් නැහැ, ඒ හරහා මේ අරමුණුවලට යන්නට බැහැ. මොකද අපි දන්නවා, මද්‍යසාරවලට ඇබ්බැහි වුණු යම් පුද්ගලයෙක් දවසකට රුපියල් 1,500ක ආදායමක් සොයා ගත්තත්, එයින් රුපියල් 800ක් මත් ද්‍රව්‍ය සඳහා වන පුද්ගල අවශ්‍යතාවන් සඳහා වැය වුණොත් නිවසට ගෙනයන මුදල හුඟක් අඩුය වනවා. ඒ මුදලින් මුළු පවුලම නඩත්තු කරන්නට බැහැ. ඒ නිසා මේවා බදු පැනවීමෙන් විතරක් කරන්නට බැහැ. මොකද, බදු අය කරන ප්‍රමාණය වැඩි කළත් පවුලට තමයි එයින් වන හානිය බලපාන්නේ. මොකද, ඒ පුද්ගලයා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා නම්, ඒ ඇබ්බැහිකමින් ඉදිරියට එන්නට බැහැ. ඒ නිසා මද්‍යසාර භාවිතය අඩු කිරීම අත්‍යවශ්‍යයි. ඒක රජයකට පමණක් තනිව කරන්න බැහැ. සමාජය හරහා තමයි ඒක කරන්නට වෙන්නේ. අපි මේක හෙළා දකිනවා විතරක් නොවෙයි, මේක පුද්ගල ජීවිත පාලනය පිළිබඳව මතු වන ප්‍රශ්නයක්. බෞද්ධ වේවා, ඉස්ලාම් වේවා, හින්දු වේවා, කිතුනු වේවා, මේ සෑම ආගම් ධර්මයකම සඳහන් වෙනවා එක්කෝ මද්‍යසාර භාවිතය සම්පූර්ණයෙන්ම හෙළා දකින්න ඕනෑ, භාවිත නොකළ යුතුයි; එහෙම නැත්නම් මද්‍යසාර භාවිත කරනවා නම් ඒක පාලනයක් ඇතිව විය යුතුයි කියලයි. ඒ කියන්නේ, සෞඛ්‍යයටවත්, සමාජයටවත්, පවුලටවත් හානියක් නොවන විධියට මද්‍යසාර භාවිත කළ යුතුයි. ඒකේ වගකීම ගත යුත්තේ පාර්ලිමේන්තුව හෝ රජය නොවෙයි. ඒකේ වගකීම තිබෙන්නේ සමාජයටයි. ඒ වාගේම එහි විශාල වගකීමක් ආගමික සිද්ධස්ථානවලටත්, ආගමික නායකයින්ටත් තිබෙනවා. ඒ අයගේ වගකීම ඉෂ්ට කරන්නට රජයට කුමන හෝ ආකාරයකින් දායකත්වය දක්වන්න පුළුවන් නම්, අපි රජයක් හැටියටත් ඒ දායකත්වය දක්වන්න ලැහැස්තියි. ස්තුතියි.

[மு. ப. 11.48]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற மதுவரித் திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்கு எனக்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

Hon. Deputy Chairman of Committees, with this Excise (Amendment) Bill, Section 15 of the Excise Ordinance (Chapter 52) is amended by the repeal of paragraphs (b) and (c) of that section, and the substitution therefor of the following, I quote:

" '(b) no tree producing toddy, other than kithul tree shall be tapped;

(c) no toddy shall be drawn or lowered from any tree other than the kithul tree.' "

Sir, I humbly tell you that this amendment is wrong. We have to make some amendments to Clause 2 of the Bill. Therefore, I request you to insert the words "palmyrah tree and coconut tree", immediately after the words "kithul tree" in Clause 2 (b) and 2 (c).

I have already submitted my amendment to the Table Office.

இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற மதுவரி (திருத்தம்) சட்டமூலத்தில் கித்துள் மரத்தைப் பற்றி மட்டும் குறிப்பிடப் பட்டிருக்கிறது. வடக்கு, கிழக்கைப் பொறுத்தவரையில், அங்கு பனை, தென்னை ஆகிய மரங்கள் முக்கியமான வளமாக இருப்பதால், இத்திருத்தத்தில் பனை, தென்னை மரங்களை விடுத்து, தனியாகக் கித்துள் மரம் மட்டும் உள்ளீர்ப்புச் செய்யப்பட்டிருப்பது தவறாகும். எனவே, இந்தச் சட்ட மூலத்தில் அதற்கான ஒரு மாற்றத்தை நான் எதிர்பார்க்கின்றேன். முல்லை. மாவட்டத்தைப் பொறுத்தவரை, அங்கு எட்டுக்கும் மேற்பட்ட Cooperative societies - கூட்டுறவுச் சங்கங்கள் செயற்பட்டு வருகின்றன. எமது மக்கள் முள்ளிவாய்க்காலிலிருந்து இடம்பெயர்ந்து செட்டிகுளம் அகதி முகாம்களில் வசித்து, மீண்டும் தமது நிலங்களுக்கு மீள்குடியேறச் சென்றபோது எந்தவித சொத்துக்களோ மற்றும் உதவிகளோ அற்ற நிலையில்தான் சென்றனர் என்பது இங்கு குறிப்பிடத்தக்கது.

தமிழீழ விடுதலைப் புலிகளின் காலத்தில் புதுக்குடியிருப் பில் கள் வடிசாலையொன்று சிறப்பாக இயங்கிவந்தது. அங்கு உற்பத்தி செய்யப்பட்ட கள்ளானது போதைக்காகப் பயன் படுத்தப்படவில்லை. மாறாக, அதிலிருந்து வடித்தெடுக்கப்பட்ட alcohol இலிருந்து சத்திரசிகிச்சைக்குத் தேவையான surgical spirit தயாரிக்கப்பட்டது. அதுமட்டுமல்ல, வன்னிப் பிரதேசத் தில் வினாகிரியும் தயாரிக்கப்பட்டு அதற்குரித்தான உற்பத்திப் பொருட்கள் தயாரிக்கப்பட்டன. பனை வெல்லமும் தயாரிக்கப் பட்டது. எனவே, கள்ளை நல்ல விடயங்களுக்குப் பயன் படுத்தும்பொழுது, அது நன்மையானதாக இருக்கும். மாறாக, மது போதை போன்ற கெட்ட விடயங்களுக்குப் பயன் படுத்துகின்றபோது அது கெடுதியானதாகவே இருக்கும். இன்று வன்னியின் நிலைமை என்னவெனில், அங்கு தினசரி உற்பத்தி செய்யப்படுகின்ற பெருந்தொகையான - பல மில்லியன் போத்தல் வரையிலான கள், மாதாந்தம் நிலத்திலே ஊற்றப்படுகின்றது.

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

අන්දත් තොழිலை வாழ்வாதாரமாக நம்பியிருக்கும் குடும்பங்கள் இதனால் மிகவும் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. 2016ஆம் ஆண்டுக்கான அரசின் வரவு செலவுத் திட்டத்தில் கள் அடைக்கின்ற நிலையங்களுக்கான வருடாந்தப் புதுப்பித்தல் கட்டணம் 10 இலட்சம் ரூபாயாக மாற்றம்பெற்றது. இது முன்னர் 2 இலட்சம் ரூபாயாகும். வெளிநாடுகளிலிருந்து மிகப் பெரிய தாங்கிகளில் surgical spirit - மதுசாரத்தை இறக்குமதி செய்து, அதிலிருந்து குடி சாராயங்கள் தயாரித்து விற்பனை செய்யும் நிலையங்கள் தொடர்பில் இவ்வாறு கட்டணம் அறவிடுவது பொருந்தக் கூடும். ஏனெனில், சம்பந்தப்பட்டவர்கள் வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்பட்ட spirit க்கு வாசனை சேர்த்து, தண்ணீருடன் கலந்து ஒரு கலவையை உருவாக்கி, போத்தலில் அடைக்கப்பட்ட கள் என்ற போர்வையில் அதனை விற்கின்றார்கள். எனவே, அவ்வாறான உற்பத்திக்கு இந்த வரி விதிப்பு பொருந்தும். ஆனால், சாதாரண மக்களின் இயற்கையான கள் உற்பத்திக்கு இந்த வரி விதிப்புத் தடையாக இருக்கின்றது. அந்தவகையில், 2016இல் அறிவிக்கப்பட்ட இந்த வரி விதிப்பின் பின்னர் வன்னிப் பிரதேசத்தில் கள்ளை உற்பத்தி செய்யும் மக்கள் பெரிதும் பாதிக்கப்பட்டிருக் கின்றார்கள் என்பதை இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இன்று முல்லைத்தீவு மாவட்டத்தில் மட்டும் கள் உற்பத்தித் தொழிலில் 1,128 அங்கத்துவக் குடும்பங்கள் ஈடுபடுகின்றன. அதேநேரம், 256 குடும்பங்களைச் சேர்ந்தோர் பணியாளர் களாக இருக்கின்றனர். இந்நிறுவனங்களில் சார்ந்திருக்கும் மகளிர் குழுக்களின் தொகை 1,030 ஆகும். பனை, தென்னை வளத்தை வாழ்வாதாரமாகக்கொண்டு 1,009 குடும்பங்கள் வாழ்கின்றன. ஒட்டுமொத்தமாக கிட்டத்தட்ட 13,696 குடும்பங்களைச் சேர்ந்தவர்கள் இந்தப் பனை, தென்னை வளத்தை நம்பி வாழ்ந்து கொண்டிருக்கின்றார்கள்.

Hon. Minister, last year you increased the tax from Rs. 200,000 to Rs. 1 million for toddy production. I tell you that you can do it for the companies functioning around Colombo or in big towns. This is not suitable for the cooperative societies which depend on toddy tapping from palmyrah and coconut trees. They are poor people. Please consider this and divide the tax imposed into two. Natural toddy tapping cooperative societies should be given an exemption for their production. You are correct, Hon. State Minister, you can impose Rs. 1 million tax from the companies which import spirits from other countries and make artificial toddy here. I am not opposing that. I am requesting you only to exempt the natural toddy tapping from this tax.

Secondly, you have mentioned only “kithul tree” in the Excise (Amendment) Bill. Therefore, I kindly request you to include “palmyrah tree" and "coconut tree” along with "kithul". Thank you very much.

[ප.භා.11.56]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම (52වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම පිළිබඳ විවාදය කරන මේ අවස්ථාවේදී, මෙම විවාදයට වඩා අද මේ රට පත් වී තිබෙන ඉරණම ගැන කථා කිරීම ඉතාම වැදගත් කියලා මම විශ්වාස කරනවා.

අද ජාත්‍යන්තර කාන්තා දිනය බව අපි දන්නවා. කාන්තාවන්ගේ දිනය සමරන අද දිනයේදී, එම කාන්තාව සිංහල කාන්තාවක්, සිංහල අම්මා කෙනෙක් වෙන්න පුළුවන්; එම කාන්තාව මුස්ලිම් කාන්තාවක්, මුස්ලිම් අම්මා කෙනෙක් වෙන්න පුළුවන්; එම කාන්තාව ද්‍රවිඩ කාන්තාවක්, ද්‍රවිඩ අම්මා කෙනෙක් වෙන්න පුළුවන්. හැබැයි, ඒ මොන ජාතියකට අයිති වුණත්, මොන ආගමක් ඇදහුවත් ඒ හැම අම්මා කෙනෙකුටම, හැම කාන්තාවකටම මානව නිදහස තිබෙනවා. නමුත් ඔවුන්ට තමන්ගේ හිත් තුළ මරණ බියකින් එහෙම නැත්නම් වෙනත් බියකින් ජීවත් වෙන්න සිදු වීම, රට තුළ තමන් ජීවත් වෙන්නේ කෙසේද කියන ප්‍රශ්නය මේ වනවිට මේ රටේ අද දවස තුළත් ඇති වෙලා තිබීම කනගාටුවට කරුණක් කියන එක මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මීට දින දෙක-තුනකට ඉස්සෙල්ලා මහනුවර දිස්ත්‍රික්කයේ, තෙල්දෙණිය ප්‍රදේශයේ ඇති වූ යම් ප්‍රශ්නයක් හේතුවෙන් මේ වනවිට මේ රටේ ජාතීන් දෙකක ජාතිවාදී මානසිකත්වයක් ඇති ඉතාම සුළු කොටසක් නිසා අද මේ රට ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට ගොදුරු වෙලා තිබෙන බව අපි දන්නවා. ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ රටේ ඉතිහාසයේ අවුරුදු 30ක් පැවැති යුද්ධයක් අවසන් කළ බව අපි දන්නවා. ඒ යුද්ධයේ ඉතිහාසය සමඟ අවුරුදු 30ක් ජීවත් වුණු, එය අත්විඳපු ජනතාව ඒ ගැන දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු 30ක යුද්ධය දෙස ආපසු හැරී බලන කොට, ඒ යුද්ධය ඇතිවීමට බලපෑ හේතු සාධක ගැන යළි සිහි කල්පනා කරන කොට, අසූතුනේදී මේ රටේ ඇති වුණු ජූලි කලබලය ප්‍රධාන සාධකයක් වෙන බව පෙනී යනවා. මූලාසනයේ සිටින ඔබතුමා බොහොම පැහැදිලිවම ඒ ගැන දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ආණ්ඩුවක් හැටියට ආණ්ඩුවක යුතුකම සහ වගකීම ඉටු නොකරපු නිසා, මේ රටේ ජාතිවාදී කැරැල්ලක් ඇති වෙලා ඒ තුළින් එල්ටීටීඊ සංවිධානය ශක්තිමත් වෙලා අපේ රට ලෝකයෙන් අවුරුදු 30ක් පස්සට ගිය රටක් බවට පරිවර්තනය වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගේ හෘදය සාක්ෂියෙන් අහනවා, 83 අවුරුද්දේ ජූලි කලබලය සිද්ධ වෙන කොට, එදාත් ද්‍රවිඩ ජාතිකයන්ව අමු-අමුවේ මරා දමන කොට, ඔවුන්ගේ වෙළෙඳ සැල්-ගෙවල් ගිනිබත් කරන කොට, මේ රටේ ජීවත් වෙච්ච ද්‍රවිඩ, සිංහල මිනිසුන්ගේ සහෝදරත්වය නැති කරන කොට, ඒ ද්‍රවිඩ සහෝදරයයි, සිංහල සහෝදරයයි එකට ගෙවල් දෙකේ තමන්ගේ කෑම ටික බෙදා හදාගෙන කාපු ඒ මනුෂ්‍යත්වය නැති කරනකොටත් එදා මේ රට පාලනය කළේ එක්සත් ජාතික පක්ෂය නේද කියලා. එක්සත් ජාතික පක්ෂය එදා රට පාලනය කරපු අවස්ථාවේදී ඒ ප්‍රශ්නයට විසඳුමක් දුන්නා නම්, එල්ටීටීඊ සංවිධානය මේ රටේ මේ තරම් තත්ත්වයට පත් වෙන්නේ නැහැ කියන එක අද මේ ගැන කරන කථිකාවන්වලදී මතු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම නම්, පෙර අපේ අතින් සිදුවුණු වැරදි ගැන නැවත සිතන්න දැන් කාලය ඇවිල්ලා තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇතිවෙලා තිබෙන මොහොතක ආණ්ඩුවක් හැටියට මේ වෙලාවේදී ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක ගැන වගකීමකින් කටයුතු කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට මතකයි, එදා අපේ රජය කාලයේ අලුත්ගම, දර්ගා නගරයේ පොසොන් පෝය දවසේ ඇති වුණු සිද්ධිය පිළිබඳව. ඒ සිද්ධිය අවාසනාවන්ත සිද්ධියක්. ඒ

අවාසනාවන්ත සිද්ධිය වූ අවස්ථාවේදී මහජන නියෝජිතයන් හැටියට අපේ යුතුකම සහ වගකීම අපි එදා ඉටු කළා. මොකක්ද, අපේ යුතුකම වුණේ? දර්ගා නගරයේ ඇවිළෙන ගිනි දැල්ල මහනුවරට දියයුතු නැහැ, දර්ගා නගරයේ ඇති වෙච්ච ගිනි දැල්ල ගාල්ලට දියයුතු නැහැ, දර්ගා නගරයේ ඇති වෙච්ච ගිනි දැල්ල හම්බන්තොටට දියයුතු නැහැ; මඩකළපුවට දියයුතු නැහැ. ඒක දර්ගා නගරයෙන්ම අවසන් කර ගන්න ඕනෑ. සිංහල-මුස්ලිම් කියන ජන කොටස් දෙකම ඉන්නා ප්‍රදේශයක එවැනි ප්‍රශ්නයක් ඇති වෙච්ච වෙලාවක දේශපාලන නායකයන්, ආගමික නායකයන්, ඒ ප්‍රදේශයේ සිටින මේ ජාතීන්වල සංහිඳියාව ඇති කරන සියලුදෙනා එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා දර්ගා නගරයේ සිද්ධියෙන් වෙන තැනකට ගිනි තියන්න ඉඩ තිබ්බේ නැහැ. රජයක් හැටියට එදා හිටපු රජය ඒ යුතුකම සහ වගකීම ඉටු කළා. නමුත් අද මොකක්ද, සිද්ධ වුණේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුව රැස්වෙලා තිබෙන මොහොතේ, මේ පාර්ලිමේන්තුවේ අපි කථා කරන මොහොතේ මොකක්ද, සිද්ධ වෙන්නේ? අපි දැන් පාර්ලිමේන්තුවේ කථා කරනවා. නමුත් මුස්ලිම් බහුතරයක් ජීවත් වෙන, ඒ මුස්ලිම් ජනතාව ඉන්න මායිමේ ජීවත් වෙන සිංහල කෙනෙක් ඉන්නවා නම්, ඔහු මරණ භයේ ජීවත් වෙනවා. ඒ වාගේම සිංහල බහුතරයක් ජීවත් වෙන ගමකට ආසන්නව මුස්ලිම් පවුලක් ජීවත් වෙනවා නම්, ඒ අයත් මේ වන විට මරණ භයේ ජීවත් වෙනවා. ඒ අයට ගෙදරින් ඉවත් වෙලා යන්න පුළුවන්කමක් නැහැ. මොකද, තමන් හරිහම්බ කරගත්ත දේ, තමන්ගේ නිවහන, තමන්ගේ දරුවන් දාලා යන්න ඒ අයට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ ජාතිවාදී ගිනි දැල්ල කවුරු හෝ දිගින් දිගට ගෙනියන්න උත්සාහ කරනවා නම් රජයක වගකීම තමයි ඒකට අවශ්‍ය කරන පිළිතුර ලබාදීම. නමුත් රජයක් හැටියට ඒ යුතුකම ඉටු නොකර දැන් මොකක්ද, සිද්ධ වෙන්නේ? පෙරේදා රාත්‍රියේදී මේ රටේ මුස්ලිම් ජනතාවගේ මුස්ලිම් දේවස්ථානවල ඉන්න ඒ පාදිලිතුමන්ලා ඇවිල්ලා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඇතුළු අපේ පක්ෂ නායකයන්ව හමු වුණා. ඒ හමු වුණු වෙලාවේ එතුමන්ලා ප්‍රකාශ කළේ මොකක්ද ? "අපි ගියා, ආණ්ඩුව හමු වෙන්න; අපි ජනාධිපතිතුමා හමු වුණා; අපි අගමැතිතුමා හමු වුණා; හමු වෙලා අපේ ප්‍රශ්නය කිව්වා. හැබැයි, අපිට ලැබුණු ප්‍රතිඵලය මොකක්ද? අපි බලාපොරොත්තු වුණේ, ක්ෂණික ප්‍රතිඵලයක්. අපට අවශ්‍ය කළේ ඒ වෙලාවේම එතුමන්ලා ඒකට අවතීර්ණ වීමයි. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ" කියන එකයි ඔවුන් කිව්වේ. ඒ විධියට තමයි ඔවුන් කල්පනා කළේ; ඔවුන්ට වැටහී තිබෙන්නේ.

අද මේ ආණ්ඩුව තුළ ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවේ නායකයා කවුද කියන එක සොයාගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. ඒක මේ ප්‍රශ්නයට බලපා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. "මේක අගමැතිතුමාගේ වගකීමක්" කියා ජනාධිපතිතුමා මේ ප්‍රශ්නය අගමැතිතුමාට යැව්වාම, අගමැතිතුමා ජනාධිපතිතුමාට යැව්වාම, ඒ අවශ්‍ය කරන උපදෙස නිසි ලෙස ආරක්ෂක අංශවලට දෙන්න බැරිකමක් තිබෙනවා නම් මේ ගිනි දැල්ල නිවන්නේ කොහොමද? මේ ගැන ඉතිහාසගත වන විධියට කථා කරන්න අපිට පසුව පුළුවන්. හැබැයි පළමුවෙන්ම අපි කළ යුතු වන්නේ සිංහල, මුස්ලිම් ජාතීන් දෙකේම ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමයි. දෙවනුව අපි කළ යුතු වන්නේ මේ ජාතීන් දෙකටම අයිති වන දේපළක් තිබෙනවා නම්, ඒවා විනාශ වෙනවා නම්, ඒවා බේරා ගැනීමයි. මෙහිදී ජීවිතයක් නැති වුණොත් ඒක සිංහල ජාතිකයෙකුගේ ජීවිතයක් හෝ මුස්ලිම් ජාතිකයෙකුගේ ජීවිතයක් විතරක් නොවෙයි; බෞද්ධ ආගමිකයෙකුගේ හෝ ඉස්ලාම් ආගමිකයෙකුගේ ජීවිතයක් විතරක් නොවෙයි. එය මේ මහ පොළොවේ ඉපදුණු ශ්‍රී ලාංකිකයෙකුගේ ජීවිතයක්. මේ ගිනි තියන්නේ ශ්‍රී ලංකා මාතාවගේ අයිතියක්. මේ ගිනි තියන්නේ ශ්‍රී ලංකා මාතාවගේ අයිතියේ තිබෙන උරුමයක්. එය වැළැක්වීම වෙනුවෙන් අපි පෙළ ගැහෙන්න ඕනෑ. විශේෂයෙන්ම මගේ පෞද්ගලික මතය මේකයි. ජාතිවාදී කෝලාහලය ඇවිළුණු මේ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනාම සභා ගැබට එන්න ඕනෑ. සභා ගැබට ඇවිත් මේ සභා ගැබ තුළදී තමයි අපි තීන්දු ගන්න ඕනෑ. මේ ජාතිවාදී කෝලාහලය නිවන තුරු අපි පක්ෂ, පාට සියල්ල අතහරින්න ඕනෑ. අපි 225දෙනාම තීන්දුවක් ගන්න ඕනෑ.

දේශපාලනය කරන වෙලාවට අපි දේශපාලනය කරමු. අපි භාරව ඉන්න දිස්ත්‍රික්කවලට ගිහින් අපේ පක්ෂ පැත්තක තියලා අත් අල්ලා ගනිමු. අත් අල්ලාගෙන ගිහින් අපි දිස්ත්‍රික්කයේ වාඩි වෙමු. පන්සලේ හාමුදුරුවන්ට අඩ ගහමු; මුස්ලිම් පල්ලියේ පූජකතුමාට අඩ ගහමු; කෝවිලේ පූජකතුමාට අඩ ගහමු. ඒ හැමෝටම අඩ ගහලා, දේශපාලනඥයෝ වශයෙන් අපි අත් අල්ලාගෙන, "අපි බෙදිලා නැහැ, ඔබ බෙදෙන්නත් එපා" කියන පණිවුඩය ඒ අයට දුන්නොත්, මේ ජාතිවාදී කැරැල්ලට විසඳුමක් ලැබෙනවා කියන එක අපිට හොඳට දැනෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ වෙලාවෙත් අපි පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනවාට වඩා එය කරන්න පුළුවන් නම් හොඳයි. කවුද, මේකට නායකත්වය දෙන්නේ? කවුද, මේ ගැන යෝජනා කරන්නේ? කවුද -[බාධා කිරීමක්] බොහොම ස්තුතියි. මම හිතනවා, ඒ විධියට යෝජනාව ස්ථිර කිරීමවත් කරනවා නම් හොඳයි කියලා. [බාධා කිරීමක්] දැන් බලන්න, මෙතැනම තිබෙන ළදරුකම. අපේ රටේ ජාතිවාදී කෝලාහලයක් ඇවිලිලා තිබෙන අවස්ථාවේදීත් ඒක විහිළුවකට ගන්න තරම්, මේ මැරෙන ජීවිතත් තමන්ගේ දේශපාලන ඔඩොක්කුවට වාසියකට දා ගන්න පුළුවන් තරම්, ගිනි ගන්න කඩයක් ඇතුළෙන් එන ගිනි දැල්ල තමන්ගේ දේශපාලන වාසියකට හරවා ගන්න පුළුවන් තරම් මානසිකත්වයක් තිබෙන ළදරු පාසල් දරුවන් වාගේ මේ වාගේ දේශපාලකයන් ඉන්නා තුරු මේ රටේ ගිනි දැල් නිවන්න හම්බ වෙන්නේ නැහැ. 1983 ජූලි කලබලයට වග කියන්න ඕනෑ පරම්පරාවලින් එන අයයි මේ. [බාධා කිරීමක්]1983දී උතුරේ සිටි ද්‍රවිඩ ජනතාවත් එක්ක තිබුණ මනුස්සකම නැති කරපු අයයි, මේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අද විවාදය මොකක්ද කියලා දන්නවාද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඔව්. අද විවාදය සුරාබදු ගැන. හැබැයි, මේ මන්ත්‍රීවරයාට අද විවාදය ලොකු වෙලා තිබෙනවා, රටේ මිනිස්සුන්ගේ පවතින මාරාන්තික බියට වැඩිය. මේ රටේ මිනිසුන් "තුන් බියකින්" ජීවත් වෙන්නේ. එදා විශාලා මහනුවර මිනිස්සු තුන් බියකින් ජීවත් වුණේ. විශාලා මහනුවර දුර්භික්ෂ බිය, රෝග බිය, අමනුෂ්‍ය බිය කියන තුන් බියෙන් බිය වුණු මිනිසුන්ට එදා මේ වාගේ තත්ත්වයක් තමයි පැවතුණේ. එදා, බුදුහාමුදුරුවෝ ධර්මය දේශනා කරලායි එම තුන්බිය නැති කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගොල්ලන් දම්වැල්වලින් බැන්දාට ඉන්නේ නැහැ. කටට මුඛවාඩම් දැම්මාට මුඛවාඩම අස්සෙනුත් තමන්ගේ ජන්මෙට වැඩිය පුරුද්ද එළියට එනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙලාවේ දෙපැත්තට බෙදිලා ඇඟිල්ල දිගු කර ගන්නා වූ දේශපාලනයෙන් ඉවත් වෙන්න ඕනෑ. අර මීය යන අහිංසක මිනිසුන්ගේ ජීවිතවලට වග කියන්න ඕනෑ. මුස්ලිම් අම්මලා අඬනවා. සිංහල අම්මලා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අඬනවා. ඔබ ජීවත්වන දිස්ත්‍රික්කයට වැඩිය සිංහල, මුස්ලිම් ජනතාව ජීවත්වෙන දිස්ත්‍රික්කයක ප්‍රාදේශීය සභාවක -බේරුවල- හිටපු සභාපතිවරයෙක් මම; හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙක් මම; හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මම; හිටපු ඇමතිවරයෙක් මම; දැන් නැවතත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මම. අපි මුස්ලිම් මනුෂ්‍යයාත් එක්ක එකට පල්ලියට ගිහිල්ලා එක "සවන්" එකේ අත දාගෙන කාලා තිබෙනවා. ඒ මුස්ලිම් මනුෂ්‍යයා අපේ පන්සලේ තිබෙන උත්සවයට කොඩි අදින්න ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් හැටියට එහෙම මිනිසුන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. අපි අතර ප්‍රශ්න තියෙයි. හැබැයි, හැම දේකටම දේශපාලනය මුල් කර ගන්න එපා. හැම දෙයකටම දේශපාලනය මුල් කර ගත්තොත්, අවසානයේදී අපට කොහේටද යන්න සිද්ධ වන්නේ? ඔබතුමා පදිංචි වෙලා ඉන්නේ මුස්ලිම් ජනතාවක් ජීවත් වෙන ප්‍රදේශයක නම්, ඔබතුමා ඇසුරු කරලා තිබෙන්නේ මුස්ලිම් ජනතාව නම්, " අපට ඉන්න බයයි" කියලා ඔබතුමාට මුස්ලිම් සහෝදරයෙකුගෙන් දුරකථන ඇමතුමක් ලැබෙනවා නම්, "අපට ඉන්න බයයි" කියලා සිංහල කෙනෙක්ගෙන් ඔබට දුරකථන ඇමතුමක් ලැබෙනවා නම්, මොකක්ද, සිද්ධ වෙන්නේ? අපි අත් නොවිඳපු මර බියකින් අද ඒ අය ජීවත් වෙනවා. ඊයේ රාත්‍රිය, පෙරේදා රාත්‍රිය, ඊට ඉස්සර දවසේ රාත්‍රිය මේ ජාතීන් දෙකේම ජනතාව-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මට ජනතා විමුක්ති පෙරමුණෙන් විනාඩි පහක්-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have already taken 19 minutes. Now, you have only two more minutes.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
Okay.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ ප්‍රශ්නය දෙස බොහොම පැහැදිලිව බැලිය යුතු වෙනවා. අද මුලින්ම මේ ප්‍රශ්නයට මේ විධියටයි අවතීර්ණ වෙන්න ඕනෑ. පළමුවෙන්ම කරන්න ඕනෑ, රාජ්‍ය ආරක්ෂාව අනුව අවදානම් තිබෙන තැන් තෝරා ගැනීමයි. ඒවායේ රාජ්‍ය ආරක්ෂණ කවුන්සිල් එකතු වෙන්න ඕනෑ. ඒවායේ කථා කරන්න ඕනෑ. උතුර, නැඟෙනහිර ඉන්න අපේ හමුදාවන් කැඳවන්න ඕනෑ. ඒ අය කැඳවලා රටේ අස්ථාවරභාවය නැති කර ගන්න ඕනෑ. ඒකට උත්සාහ කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. නමුත් මොකක්ද කරන්නේ? සම කැබිනට් ප්‍රකාශක ඇවිල්ලා කියනවා, අලුත් පක්ෂයක සාමාජිකයෝ මේකට සම්බන්ධව ඉන්නවා; අලුත් පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉන්නවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වනතුරු කළුතර දිස්ත්‍රික්කයේ කිසිම තැනක ජාතිවාදී කලහකාරී තත්ත්වයක් ඇති වෙලා නැහැ. ඇති වෙන්නත් එපා කියලා මා දෙවියන්ගෙන් ඉල්ලනවා. අපි ඒ සියලුදෙනා එක්ක කථා කරනවා. හැබැයි, හෙට දවසේ අපි ඒ ගැන කථා කරන්න යන කොට සම කැබිනට් ප්‍රකාශක කියයි, "අන්න ජාතිවාදී කැරැල්ලක් ඇති කරන්න යනවා." කියලා. මේකටද ආණ්ඩුව කියන්නේ? මේ ආණ්ඩුවට එල්ලෙන්න වැල් නැහැ. මේ ආණ්ඩුවට එල්ලෙන්න වැල් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ආණ්ඩුව ඇතුළේ විප්ලව. මේ ආණ්ඩුව දෙදරා ගිහිල්ලා. මේ ආණ්ඩුව හදපු පක්ෂ දෙක ඉන්නේ නයයි, මුගටියයි වාගෙයි. ගං වතුර නිසා දෙදෙනාම එක කොටේ උඩ යනවා. දෙදෙනාම වතුරට පනින්නේ නැහැ. නයයි, මුගටියයි වාගේ ඉන්න පක්ෂ දෙකක් එකතු වෙලා හැදුණු ආණ්ඩුවක් යනකොට ප්‍රශ්න තිබෙනවා. හැබැයි, අපට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. ඔබේ ආණ්ඩුවේ ප්‍රශ්න ඔබ විසඳා ගන්න. ඔබ ආණ්ඩුව කරගෙනත් යන්න. හැබැයි, මේ රටේ සිංහල ජනතාවගේ, මුස්ලිම් ජනතාවගේ, ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න කියලා අපි මේ ආණ්ඩුවට කියනවා. ඒක විපක්ෂයට භාර දෙන්න එපා. ඒක විපක්ෂයේ වගකීමක් නොවෙයි. මේ රට පාලනය කරන්නේ විපක්ෂයේ අපිද?

TNA එක නියෝජනය කරන මගේ සහෝදර මන්ත්‍රීවරුනි, එදා උතුරේ ඇති වුණු ප්‍රශ්නයෙන් අපි දෙගොල්ලෝම කොච්චර දුක් වින්දාද කියලා ඔබතුමන්ලා දන්නවා. එය විසඳා ගත්තාට පස්සේ තව ප්‍රශ්නයකටද මේ මුල පුරන්නේ? එහෙම නම් අද මේ ආණ්ඩුවේ වගකීම ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා. මේ රටේ ආගමික නායකයෝ කියනවා වාගේ, කාටද ගිහිල්ලා මේ ප්‍රශ්න කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. [බාධා කිරීම්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
Please give me two more minutes.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
One minute දෙන්නම්.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි මට බාධා කිරීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා මේ මොහොතේ සිට හෝ අවශ්‍ය දේවල් හදුනා ගන්න කියලා. ඒවා දේශපාලනඥයන් හදුනා ගන්න ඕනෑ නැහැ. රජයේ බුද්ධි අංශ යොදවා ඒවා හදුනා ගන්න. කොතැනක හෝ අන්තවාදී කොටස් බිහි වෙන්න හදනවා නම්, අන්තවාදී කොටස් නැගිටින්න හදනවා නම් එය වැළැක්වීමට අවශ්‍ය කරන පසු බිම හදන්න. මම ආණ්ඩුවේ ඉන්න කෙනෙකුට හෝ වෙනත් කිසිම කෙනෙකුට විරුද්ධව මේ සම්බන්ධව ඇඟිල්ල දික් කරන්නේ නැහැ. මේක අහඹු සිද්ධියක්. හැබැයි, මේ සිද්ධිය වුණාට පස්සේ ඒක දේශපාලන ගනුදෙනුවකට ලඝු කරන්න යනවා නම්, ඒක කවුරු කළත් වැරදියි කියන එක බොහොම වග කීමකින් කියනවා.

මේ රටේ සියලු ජාතීන් ජීවත් වෙන්න ඕනෑ. අපි පුංචි කාලයේ මේ සියලු ජාතීන් හැදුණේ එකට. මේ රටේ සියලු ජනතාවට තමන්ගේ ආගම අදහන්න අයිතියක් තිබෙන්න ඕනෑ. ඒ නිදහස ඒ අයට බුක්ති විඳින්න දෙන්න ඕනෑ. අන්න ඒක ලබා දීම රජයේ වග කීමක්. රජයේ ඒ වගකීම ඉටු කරන්න කියලා තමයි අපි මේ හඬ නගා කියන්නේ. අපි මේ හඬ නගා කියන්නේ ඒක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් අපි මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. මේ රටේ ඉන්න සියලු සිංහල ජනතාවගෙන් අපි අත් දෙක එකතු කරලා ඉල්ලනවා, "ඔබ කිසිම දවසක මුස්ලිම් සහෝදරයෙකුට එරෙහිව කිසිම දෙයක් කරන්න එපා." කියලා. මුස්ලිම් ජනතාවගෙන් අපි අත් දෙක එකතු කරලා ඉල්ලනවා, "ඔබ කවදාවත් සිංහල සහෝදරයෙකුට එරෙහිව කිසිම දෙයක් කරන්න නිතන්න එපා." කියලා. අද අපි ප්‍රාර්ථනා කරනවා, "මේ ජාතිවාදී ගිනි දැල්ල මේ රට තුළ නැවතත් හිස ඔසවන්න දෙන්න එපා." කියලා. ඒ වගකීම රජයට භාර කරමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is Hon. Karunarathna Paranawithana.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මේ සභාවේ ගණපූරණය නැහැ.

පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තිබුණෙන්-

පාරාළුමන්ත්‍රම් කණක්කිටප්පට්ටු, කූට්ට නටප්පෙණ් ඉල්ලෙ යෙනක් කණ්ටතනාල්, පිරිවු මණි අඩික්කප්පට වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

පිරකු, කූට්ට නටප්පෙණ් ඉරුන්තතනාල් -

Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present-

[අ.භා.12.22]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ථාවර නියෝගවලට අනුව, අද දින සාකච්ඡා කෙරෙන විෂයයට අදාළවම කථා කරන්න මා කැමැතියි. මීට කලින් කථා කළ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු ඔක්කෝම වැදගත් කරුණු. ඒ කරුණුවලට අදාළව අපි ඊයේත් කථා කළා. ඒ අනුව තමයි අපිත් කිව්වේ, සර්ව පාර්ශ්වික සමුළුවක් කැඳවලා, එකම සමහි බැම්මකින් මේ ප්‍රශ්නය විසඳන්න ඉදිරිපත් වෙමු කියලා.

සුරාබදු පනත සංශෝධනය සඳහා කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ, රටේ සුරාබදු ප්‍රතිපත්තිය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. සුරාබදු සම්බන්ධයෙන් අපේ රටේ කිසියම් ව්‍යාකූලභාවයක් තිබෙනවා. සුරාව -මද්‍යසාරය- ආදායම් මූලාශ්‍රයක්ද, එහෙම නැත්නම් ජාතික උවදුරක්ද කියන කාරණයේදී අපි කොතැනද ඉන්නේ කියන එක අපි හොඳට පැහැදිලි කර ගන්න ඕනෑ. රජය භාණ්ඩාගාරය පැත්තෙන් සුරාබදු යෝජනා ඉදිරිපත් කරනකොට, රටේ ඇති වන පොදු මතය තමයි රජය මත්පැන් -මද්‍යසාර- ප්‍රවර්ධනය කරන්න -වැඩි කරන්න- වැඩ කරනවාය කියන එක. මේ රජයටත් පසුගිය කාලයේ ඒ වාගේ චෝදනා එල්ල වුණා. නමුත් පොදුවේ ගත්තොත්, කාලාන්තරයක් තිස්සේ මේ රටේ හැම රජයක්ම පාහේ තමන්ගේ ජාතික ප්‍රතිපත්තිය බවට පත් කරගෙන තිබුණේ සුරාව ප්‍රවර්ධනය කිරීම නොවෙයි, සුරාව මර්දනය කිරීමයි; සුරාවෙන් ඈත් කිරීමයි. ඒ පුරුදුවලින් ජනතාව ඈත් කිරීමට රජයක් විධියට අපිත් ප්‍රතිපත්ති සකස් කරලා තිබෙනවා. පසුගිය රජය කාලයේ "මතට නිත" කියලා ප්‍රතිපත්තියක් අරගෙන ගියා. ඒ වාගේම වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, "මතින් නිදහස් රටක්" නිර්මාණය කිරීමයි. ඒ සම්බන්ධයෙන් විවිධ වැඩසටහන්, විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති, විවිධ පරිපාලන ප්‍රතිපත්ති, විවිධ නීති, දණ්ඩන නීති යනාදී සියලු දේවල් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව, මේ මත්පැන් -මද්‍යසාර- කියන්නේ ආදායම් මූලාශ්‍රයකට වඩා ජාතික උවදුරක් බව අප පිළිගැනීමයි.

ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා වාගේ රජයක් ප්‍රතිපත්ති හදද්දී මූලධර්මවාදී විධියට යම් යම් තීරණවලට එළඹෙන්න බැහැ. "මතට නිත" කිව්වාට, "මතින් නිදහස් රටක්" කිව්වාට, ඇත්ත වශයෙන්ම අපේ ඉලක්කය විය යුත්තේ අඩුම තරමින් බෙබදුකමටවත් නිත තැබීමටයි; බෙබදුකමින්වත් නිදහස් වීමටයි. ඒ අනුව තමයි අපේ සුරා ප්‍රතිපත්තිය සකස් කරන්න ඕනෑ.

අපි ඉතාම ආඩම්බරයෙන් කියන්න කැමැතියි, මේ රජය මේ අවුරුදු තුනක කාලය ඇතුළත විශේෂයෙන්ම දේශපාලනඥයන්ට මත්පැන් බලපත්‍ර දීමෙන් වැළකී තිබෙන බව. එහෙම ගත්තාම, සුරාව ප්‍රවර්ධනය කිරීම පැත්තට නොවෙයි අපි ගමන් කරලා තිබෙන්නේ, සුරාව මර්දනය කර ගැනීම පැත්තටයි. ඒ පුරුදුවලින් ජනතාව ඈත් කර ගැනීමේ පැත්තට තමයි අපි යොමු වෙලා තිබෙන්නේ කියන කාරණය පැහැදිලි කරන්න ඕනෑ. ඒ වුණාට, පසුගිය කාලයේ භාණ්ඩාගාරයෙන් ආපු යෝජනා වැරදි විධියට අර්ථ කථනය වුණා. ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාත් ප්‍රකාශ කළා වාගේ ප්‍රධාන වශයෙන්ම ඉන් එකක් තමයි, සුරා මිලදී ගැනීම, විකිණීම සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට පනවා තිබුණු යම් යම් තහංචි ඉවත් කරන්න ගෙනාපු යෝජනාවක් සම්බන්ධයෙන් කළ වැරදි අර්ථ කථනය.

ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද දවසේ මම මතක් කරන්න කැමැතියි, මේ රටේ නීති පද්ධතිය තුළ සුරා නීතිය පමණක් නොවෙයි, කාන්තාවන්ට නීතිය ඉදිරියේ සමානත්වය නොලැබෙන ආකාරයේ නීති-රීති ගණනාවක් තිබෙන බව. එවැනි නීති-රීති ගොඩක් තිබෙනවා. අපේ රටේ කාන්තා කටයුතු භාර ඇමැතිතුමිය ඒ ඔක්කොම එකතු කරලා එක දවසක එක නීති සංශෝධනයක් හැටියට ඉදිරිපත් කළා නම් හොඳයි කියලා මම හිතනවා. මහා භාණ්ඩාගාරයේ මුදල් ඇමතිතුමාගේ යෝජනාවක් හැටියට නොවෙයි, වෙන පැත්තකින්, වෙන කෝණයකින් ඉදිරිපත් කළා නම්, මේ වාගේ වැරදි අර්ථකථනවලට මේවා ලක්

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

වන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, සුරාව සම්බන්ධයෙන් අපි අනුගමනය කළ යුතු ප්‍රධාන ජාතික ප්‍රතිපත්තිය මේ කාන්තා නීතියටත් අදාළ වෙනවා. ඒකේදී අපි කිව්වා වාගේ සෑහෙන කාලයක් තිස්සේ, සෑම රජයක්ම සුරාව ප්‍රවර්ධනය නොකරනවා නම්, ඒ නීති වුණත් අපි සකස් කළ යුත්තේ එම මූලික ප්‍රතිපත්තිය දිහා බලලායි. මේ රටේ අවුරුදු 15ට වැඩි කාන්තා ජනගහනයෙන් සියයට 01යි මත්පැන්වලට යොමු වෙලා තිබෙන්නේ. මේක අපේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නොවෙයි. මත්පැන් වැඩිපුර භාවිත කරන රටවල පවා කාන්තා ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් මත්පැන්වලට යොමු වෙලා නැති බව අපි සිහියේ තබාගෙන ඒ වාගේ දේවල්වලට යොමු වෙනවා නම් වඩා හොඳයි කියන එකයි අපි හිතන්නේ. කොහොම වුණත්, මේ සම්බන්ධයෙන් මේ රටේ ඇති වෙලා තිබෙන වැරැදි මත නිවැරදි කරගෙන අපි ඉදිරියට යන්නට ඕනෑ.

ඊළඟට, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ කිතුල් ගස් හැර, රා නිස්සාරණය කරන අනෙකුත් ගස්වලින් රා මැදීම සඳහා බලපත්‍ර ලබා ගත යුතුයි කියන කාරණය සඳහායි. මීට කලින් අපේ ගරු මන්ත්‍රීතුමෙක් කථා කරලා කිව්වා, එම ගස් දෙකත් බලපත්‍රවලින් නිදහස් කරන්න කියලා. එහෙම නම් මේ සංශෝධනය ගෙනෙන එකේ තේරුමක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ සංශෝධනය ගෙන එන්නේ පොල් ගස්වලින් සහ තල්ගස්වලින් රා මැදීම සඳහා බලපත්‍ර නිකුත් කරන්නයි. ඒකෙන් ඉතා වැදගත් දෙයක් සිදු වෙනවා. ඒක තමයි -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා. දහවල් 12.30ට lunch interval ලබා දෙන්න ඕනෑ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
හොඳයි. මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
එම ගස් දෙකටත් බලපත්‍ර ලබා දීමෙන් රජයට මේවා පිළිබඳ සොයා බැලීම සඳහා හොඳ අවස්ථාවක් ලැබෙනවා. එතකොට තිබෙන ගස් ගණන දන්නවා, බලපත්‍රලාභීන්ගේ සංඛ්‍යාව දන්නවා. එතකොට නීත්‍යානුකූල නොවන සුරා පාලනය කිරීමට අවස්ථාවක් ලබා දෙනවා. එම නිසා විපක්ෂයෙන් කථා කරපු මන්ත්‍රීතුමාට අපි කියන්න කැමැතියි, මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනය ඉතාම වැදගත් ප්‍රතිපත්තියක් මත පදනම් වෙලා තිබෙන කාරණයක් බව. එහෙම නැතිව වෙනත් ජන කොටසක්, වෙනත් ප්‍රදේශයක් හෝ වෙනත් කර්මාන්තයක් දුර්මුඛ කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන සංශෝධනයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. නීත්‍යානුකූල නොවන සුරා සම්බන්ධයෙන් ගත්තාම, ගම් බිම් පුරා බෙබදුකම වැඩි කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වෙලා තිබෙන්නේ කසිප්පු වසංගතයයි. මේ සම්බන්ධයෙන් විවිධ වාද තිබෙනවා. නීත්‍යානුකූල මත්පැන්වල මිල වැඩි වෙන්න, වැඩි වෙන්න කසිප්පු බෝවීමත් වැඩි වෙනවාය කියලා අදහසක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් මගේ ළඟ සංඛ්‍යාලේඛන නැති නිසා මම මේ වාදයේ පැටලෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් පොදුවේ අපි අනුගමනය කළ යුතු කාරණය තමයි, මත්පැන්වල මිල අඩු කිරීම සුදුසු නැහැ කියන එක. නීත්‍යානුකූල මත්පැන්වල මිල අඩු නොකර කසිප්පු වසංගතය මර්දනය කිරීම සඳහා අපි පියවර ගත යුතුව තිබෙනවා. එහිදි අද තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි පොලීසිවලට අදාළ බලතල නොමැති වීමේ ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමැතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
එම නිසා වැටලීම් සම්බන්ධයෙන් පොලීසිවලට මීට වඩා බලතල ලබා දිය යුතුයි කියන අදහස ඉදිරිපත් කරමින්, මේ වැදගත් සංශෝධනය ඉදිරිපත් කරපු මුදල් රාජ්‍ය අමාත්‍යතුමාට මේ වේලාවේ අපගේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. Sitting is suspended for lunch till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. (Dr.) Nalinda Jayathissa.

[අ.භා.1.30]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී මුදල් අමාත්‍යවරයා හෝ රාජ්‍ය අමාත්‍යවරයා මෙතැන සිටියා නම් හොඳයි. විශේෂයෙන් රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සේවය කරන ලද සේවකයන්ගේ ප්‍රශ්න කිහිපයක් මට ඉදිරිපත් කරන්න තිබෙනවා. රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව 1992 පෙබරවාරි 27 වෙනි දා තමයි පෞද්ගලීකරණය කළේ. ඒ වෙනකොට ඒ සංස්ථාවේ සේවයේ යෙදී සිටි සේවකයන් 2,000ක් පමණ ඔවුන්ගේ දුක්ගැනවිල්ල පසුගිය කාලය තිස්සේ විවිධ ආයතන වෙතත්, මේ පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන්ගේ ඉල්ලීම් මේවායි. මේ ආයතනය පෞද්ගලීකරණය කිරීමේදී ඒ සේවකයන්ට පොරොන්දු වුණා, පෞද්ගලීකරණය හේතුවෙන් ඉවත් කරන ලද සේවක සේවිකාවන් වෙත රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත සියයට 10ක කොටස් නිකුත්

කරන්නට. නමුත්, ඒ සේවක සේවිකාවන් කරුණු ඉදිරිපත් කරනවා, රජයේ තක්සේරුවටත් වඩා අඩු මුදලකට තමයි මේ ආයතනය පෞද්ගලීකරණය කළේ, එම නිසා ඔවුන්ට ලැබිය යුතු කොටස් නිසි වටිනාකමට ලැබුණේ නැහැයි කියලා. ඒ වාගේම ප්‍රාග්ධනය සියයට සියයකින් වැඩි කරලා බෝනස් කොටස් නිකුත් කිරීමේදී ඒ වෙනකොට කොටස් විකුණා සිටි සේවකයින්ට එම කොටස් යලි ලබා දුන්නේ නැහැයි කියන චෝදනාව කරමින්, ඒ කොටස් ලබා දෙන්න කියන ඉල්ලීමත් ඔවුන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන් ඊටත් වඩා වැදගත් කරුණක් ඉදිරිපත් කරනවා. 1996 මාර්තු 6 වෙනිදා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපතිවරිය වශයෙන් සිටි කාලයේ මේ සම්බන්ධයෙන් පත් කළ ජනාධිපති කොමිෂන් සභාව විසින් නිකුත් කළ වාර්තාව තිබෙනවා. ඒ වාර්තාව අනුව කොමිසම විසින් පිළිගන්නවා, මේ සේවකයින්ට අසාධාරණයක් වුණා, එම නිසා මේ පිළිබඳව අපක්ෂපාතී පරීක්ෂණයක් කරලා ඒ සේවකයන්ට සාධාරණ වන්දියක් ලබා දෙන්න ඕනෑය කියලා. මා මේ ප්‍රශ්නය මේ පාර්ලිමේන්තුවට මීට කලිනුත් ඉදිරිපත් කළා. ඒ වෙලාවේ මුදල් අමාත්‍යවරයා ලෙස සිටි රවි කරුණානායක ඇමතිතුමා කිව්වා, "මෙවැනි ජනාධිපති කොමිෂන් සභා වාර්තාවක් නැහැ, ඒක හොයා ගන්නත් බැහැ" කියලා. නමුත්, අද මට ඒ වාර්තාව සභාගත කරන්න පුළුවන්. මීට අදාළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ සේවකයන්ට සාධාරණය ඉටු කරන්න කියලා. ඒ වාගේම ඔවුන් තමන්ගේ දුක්ගැනවිල්ල පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවටත් ඉදිරිපත් කළා. ඒ කාරක සභාවේ තීන්දුව බවටත් පත් වුණේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව ඔවුන්ට සාධාරණයක් ඉටු කරන්නය කියන එකයි. මෙම සිද්ධියට අදාළ 2,000කට ආසන්න පිරිසෙන් බොහොමයක් දෙනා දැනටමත් මිය ගොස්. දැනට ජීවත්ව සිටිමින් සැදෑ සමය ගෙවන ඉතිරි සේවකයන්ට යම් කිසි ආකාරයක සාධාරණයක් ඉටු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් වීමක් කරන්න කියන ඉල්ලීම මා මේ වෙලාවේ ඉදිරිපත් කරන්න කැමැතියි.

අංක 2044/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ නියෝගත් අද මුදල් රාජ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළා. ඒ අනුව විදේශීය ටෙලිනාට්‍ය සඳහා තිබෙන බදු, සංශෝධනය කිරීමකුත් ඉදිරිපත් කර තිබෙනවා. මේ විදේශීය ටෙලිනාට්‍ය බදු සම්බන්ධයෙන් අපේ රටේ පසුගිය වසර දෙක තුන තුළ සාකච්ඡාවක් තිබුණා, විදේශීය ටෙලිනාට්‍ය නිසා දේශීය ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයම අර්බුදයකට ගිහිල්ලා තිබෙනවා කියලා. මොකද, දැන් කොතරම් පරිශ්‍රමයක් දරා ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කළත්, රූපවාහිනී නාලිකා ඒ ටෙලිනාට්‍යයක කථාංගයක් - episode එකක් - මිලදී ගන්නේ ඉතාමත් අඩු මුදලකට. සමහර විට රුපියල් 80,000කට හෝ 100,000කට වාගේ මුදලකට තමයි මිලදී ගන්නේ. එම නිසා දේශීය ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ නළු නිළියන්, අධ්‍යක්ෂවරු, කැමරා ශිල්පීන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල සිටින අයට ප්‍රමාණවත් පරිදි දීමනාවක් ගෙවන්න විධියක් නැහැ. එම නිසා දක්ෂ හැකියාවන් තිබෙන අය ක්ෂේත්‍රයෙන් ඉවත් වෙමින් යනවා. ඒ නිසාම තමයි දේශීය ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ නිරත 2,000කට ආසන්න වූ විවිධ ශිල්පීන් එකතු වෙලා මීට අවුරුදු දෙකකට කලින් මහජන පුස්තකාලයේදී ආණ්ඩුවට ලොකු බල කිරීමක් කළේ තමන්ගේ ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු විසඳන්න කියලා. ඒ බලපෑම නිසාම ආණ්ඩුවට සිද්ධ වුණා, 2017 අය වැය කථාවට මේ සම්බන්ධයෙන් යෝජනාවක් ඇතුළත් කරන්න.

ඒ අනුව 2017 අය වැය කථාවේ 343වෙනි යෝජනාවේ මේ විධියට සඳහන් වනවා:

> "චිත්‍රපට නිෂ්පාදකයන් හා දේශීය කලාකරුවන් විසින් සිංහල හා දෙමළ භඩ කවන ලද විදේශීය චිත්‍රපට හා ටෙලිනාට්‍ය විකාශනය කිරීම පිළිබඳවද තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව විනාඩි 30 ක කොටසක් සඳහා දැනට පවතින රුපියල් 90,000 ක බදු මුදල රුපියල් 300,000 දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා. එසේ එකතු කරනු ලබන මුදල දේශීය චිත්‍රපට කර්මාන්තය දියුණු කිරීමට යොදා ගැනීමට අපේක්ෂා කරනවා."

මම දැන ගන්නට කැමැති පළමුවෙනි කාරණය මෙයයි. එදා 2017දී අය වැය කථාවේදී මුදල් අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුව හමුවේ තබන ලද මේ යෝජනාව, විනාඩි 30ක කථාංගයක් වෙනුවෙන් අය කරන බදු මුදල රුපියල් 300,000 දක්වා වැඩි කරනවා කියන යෝජනාව රුපියල් 150,000 දක්වා අඩු වුණේ මොකද? ඒ වෙලාවේ ආණ්ඩුව ඒක ඉදිරිපත් කළේ මේ රුපියල් 300,000 ගෙවන්නේ නැහැ කියලා හෝ ගෙවාගන්න බැහැ කියලා හෝ දැනගෙනමද? එහෙම නැත්නම් ඒ වෙලාවේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ තිබුණු ඉල්ලීම යටපත් කරන්නද, ඒකට මොකක් හෝ දීලා වට වංගුවක් ගහන්නද? ඊට වසර එකහමාරකට දෙකකට පසුව එන ගැසට් නිවේදනයේ සඳහන් වෙන්නේ දිනකට පළමු විකාශන කාල පරිච්ඡේද හතර සඳහා රුපියල් 150,000යි කියලා. මේ රුපියල් 300,000 බදු ප්‍රමාණය රුපියල් 150,000 දක්වා අඩු වුණේ ඇයි කියලා දැන ගන්නට මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ කාරණය මෙයයි. මීට කලින් රුපියල් 90,000ක බද්දක් ගැහුවා එක කථාංගයක් සඳහා. ඒකෙන් මුදලක් එකතු වුණා. ඒ මුදල පාවිච්චි කළේ මොකටද? මම දන්නා හැටියට ටෙලි නාට්‍යවලට ගහපු බද්දෙන් එකතු වුණු රුපියල් මිලියන 1,500කට ආසන්න මුදලක් භාණ්ඩාගාරයේ තිබෙනවා, දේශීය ටෙලි නාට්‍ය හෝ සිනමාවේ ප්‍රවර්ධනයට යොදවන්නේ නැතිව. මම කැමැතියි මුදල් රාජ්‍ය ඇමතිතුමා කියනවා නම් ඒ ටෙලි නාට්‍ය බද්දෙන් එකතු කර ගත්ත මුදලට ඉදිරියේදී කරන්නට බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ ගැසට් නිවේදනය අනුව විදේශීය ටෙලි නාට්‍ය සඳහා බද්දක් අය කළාට මෙහි තිබෙනවා බද්ද ගෙවීමෙන් නිදහස් වීම සඳහා ඉල්ලුම් කරන්නට පුළුවන් යම් කොන්දේසි ප්‍රමාණයක් දාලා. ඒ තමයි, ළමයින්ට විනෝදය සැපයීම සඳහා වන වැඩසටහන්, ආගමික වැඩසටහන්, ප්‍රධාන චරිත හෝ නිෂ්පාදන කාර්ය මණ්ඩලයේ බහුතරය ශ්‍රී ලාංකීය පුරවැසියන් වන ආදී වශයෙන් අවස්ථා කිහිපයක් සඳහන් කරලා තිබෙනවා. මේ විදේශීය ටෙලි නාට්‍ය ගෙන්වන අය ඉන්දියාව, කොරියාව, ජපානය වාගේ කුමන හෝ රටක ටෙලි නාට්‍යයක තිබෙන එක ළමා චරිතයක් පදනම් කරගෙන මේ වගන්තියෙන් රිංගා යන්නට උත්සාහ කරනවා. මේ දවස්වල එහෙම ප්‍රවණතාවක් තිබෙනවා. ඒක ළමයින්ට විනෝදය සැපයීම සඳහා වන වැඩසටහනක් නොවෙන්නත් පුළුවන්. නමුත් මේ ගේන ටෙලි නාට්‍යයේ ඇති ළමයෙකුගේ චරිතයක් පදනම් කරගෙන මේ බදු නිදහස ලබා ගන්නට උත්සාහ කරනවා. ඒ වාගේම මෙහි සඳහන් වෙනවා ප්‍රධාන චරිත හා නිෂ්පාදන කාර්ය මණ්ඩලයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලාංකිකයන් වුණොත් බදු නිදහසක් දෙනවා කියලා. ඇත්තටම මේක හොඳයි. නමුත් පසුගිය කාලයේ අපේ රටේ චිත්‍රපටි නිෂ්පාදකයින් ගිහින් දකුණු ඉන්දියාවේ, ඉතාලියේ චිත්‍රපටි නිෂ්පාදනය කළා, ටෙලි නාට්‍ය නිෂ්පාදනය කළා. හැබැයි ඒ අයට මේ බදු සහනය හම්බ වුණේ නැහැ. කලිනුත් මේ කොන්දේසිය තිබුණා. මේ ගැසට් පත්‍රයේ සඳහන් කරලා තිබෙන ආකාරයට ප්‍රධාන නළුවා, ප්‍රධාන නිළිය, සහාය නළුවා, සහාය නිළිය වාගේ ප්‍රධාන චරිත හා අධ්‍යක්ෂවරයා, සංගීත අධ්‍යක්ෂවරයා, සහාය අධ්‍යක්ෂවරයා, කැමරා ශිල්පියා, තිර නාටක ශිල්පියා වාගේ නිෂ්පාදන කාර්ය මණ්ඩලයෙන් භාගයකට වැඩි පිරිසක් ශ්‍රී ලාංකිකයන් වුණොත් බදු සහන දෙනවා කියලා තමයි කියන්නේ. නමුත්, මම හිතනවා මීට වඩා මේ ගැන

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අවධානය යොමු කරන්නට ඕනෑ කියලා. අපේ අධ්‍යක්ෂවරයෙක් පිට රටක නළු නිළියන්, ඉතිරි කාර්ය මණ්ඩලය, තාක්ෂණ ශිල්පීන් යොදගෙන ටෙලි නාට්‍යයක් හෝ සිනමා පටයක් අධ්‍යක්ෂණය කරනවා නම් ඔහුට විශේෂ වරප්‍රසාදයක් දෙන්නට ඕනෑ. ඔහු අපගේ හැකියාව, දක්ෂතාව ලෝකයට, ජාත්‍යන්තරයට අරගෙන යනවා. අපේ එහෙම අය ඉන්නේ අතළොස්සයි. විමුක්ති ජයසුන්දර වාගේ අය කිහිප දෙනෙකු පමණයි මෑත කාලයේ ඉන්නේ. එවැනි අයට මේ සහනය දෙන්නට ඕනෑ. මේ ගැසට් පත්‍රයේ සඳහන් කාර්ය මණ්ඩලයෙන් අඩක් කියන ප්‍රමාණය වෙනුවට ලාංකීය අධ්‍යක්ෂවරයෙක් විසින් අධ්‍යක්ෂණය කරන ලද නිර්මාණයක් තිබෙනවා නම් ඒකටත් මේ බදු සහනය දෙන්න කියන ඉල්ලීම කරන්නට මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ ගැසට් නිවේදනයේ සඳහන් වෙනවා මුල් පිටපත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නිෂ්පාදනය කරනු ලැබූ සහ හඬ නොකැවූ නිර්මාණයක් නම් බදු සහනය දෙන්න පුළුවන් කියලා. අපට වුවමණා කරන්නේ දෙමළ භාෂාවෙන් තිබෙන මුල් පිටපත නොවෙයි. අපේ රටේ දෙමළ ටෙලි නාට්‍ය හෝ චිත්‍රපට නිෂ්පාදනය කරන අයටයි මේ බදු සහනය ලබා දෙන්නට ඕනෑ, ඔවුන්ගේ ප්‍රවර්ධනය සඳහායි ආණ්ඩුව යම් බදු සහනයක් සලසන්නට ඕනෑ.

අපේ රටේ දෙමළ සිනමාව, දෙමළ ටෙලි නාට්‍ය නිෂ්පාදනය බිඳ වැටිලායි තිබෙන්නේ. ඒ නිසා ඔවුන්ට සහන දෙන්න ඕනෑකමයි තිබෙන්නේ. එහෙම නැත්නම් මේකෙන් රිංගා යන්න පුළුවන් විධියට යම්කිසි ආකාරයක සිදුරු ඇති කරලා තිබෙනවා.

මීට කලින් ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව අපින් අදහස් විශාල ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අපි මේ සම්බන්ධයෙන් විවාදයක් කළා. ඒ වෙලාවේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ ශිල්පීන් ඉදිරිපත් කළ යෝජනා ගණනාවක් තිබුණා. එක යෝජනාවක් තමයි, ටෙලි නාට්‍ය නියාමනය කිරීම සඳහා මණ්ඩලයක් ඇති කරන්න ඕනෑය කියන කාරණය. ඒ සඳහා දැන් ඔවුන්ගේ පැත්තෙන් හොඳ සූදානමක් තිබෙනවා. අධ්‍යක්ෂවරුන්, සහාය අධ්‍යක්ෂවරුන් ඇතුළු ක්ෂේත්‍ර 10ක, 12ක පමණ සංසද ගොඩ නහාගෙන තිබෙනවා. ඒ සංසදවලින් ටෙලිවිෂන් වෘත්තිකයන්ගේ ජාතික සම්මේලනය හදාගෙන තිබෙනවා. ඒ නිසා නියාමන මණ්ඩලයක් පිහිටුවීමට අවශ්‍ය කරන පසුබිම දැන් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

දෙවන කාරණය විධියට ඔවුන් ඉල්ලා සිටියා, නියාමන මණ්ඩලය විසින් ටෙලි නාට්‍ය සම්බන්ධයෙන් ප්‍රමිතිකරණයක් කරන්නය; ඒ, බී, සී, ඩී ආකාරයට යම් වර්ගීකරණයක් -ශ්‍රේණිගත කිරීමක්- කරන්නය කියලා. ඒ ශ්‍රේණිගත කිරීම අනුව ඒ සඳහා අවම මිලක් තීන්දු කරන්නය කියලාත් ඉල්ලා සිටියා. මෙන්න මේ සියලු කාරණා සම්පූර්ණ වුණොත් තමයි බදු පැනවීමත් සාර්ථක වෙලා ඒ තුළින් යම්කිසි ආකාරයක වාසියක්, ප්‍රයෝජනයක් අපේ දේශීය කර්මාන්තයට අත්පත් වන්නේ. මේ කරුණුවලට අමතරව දැන් මේ අවස්ථාවේ ඇති වී තිබෙන ජාතික අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරලා, ටෙලි නාට්‍ය, සිනමාව ඇතුළු කලාත්මක වැඩසටහන්, කලාත්මක අංශ ජාතික අවශ්‍යතාව වෙනුවෙන් යොදා ගන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, දැන් අපි මොන මාතෘකාව පිළිබඳව විවාද කළත්, අවසානයේදී ඒ විවාදය රටේ පවතින ජාතිවාදී ගැටුම් එක්ක ගැට ගැහෙනවාය කියන එක. මනුෂ්‍ය ඝාතන, දේපොළ ගිනි තැබීම්, ව්‍යාපාරවලට පහරදීම් ආදී ජනතාව බියට, සැකයට, ත්‍රාසයට පත් කරන සිදුවීම් ගණනාවක් තැනින් තැන දියත් වෙලා තිබෙනවා. මෙවැනි සිද්ධියක් ඊයේ මහනුවර ඇති වුණා. අද එය කොහේට කඩාගෙන පහත් වෙයිද කියලා ජනතාව කල්පනා කරමින් ඉන්නවා. ඔබතුමාට මතක ඇති, මීට කලිනුත්, 2014 ජුනි මාසයේදී මෙවැනි තත්ත්වයක් කලුතර දිස්ත්‍රික්කයේ දර්ගා නගරයේ ඇති වුණාය කියලා. එය දර්ගා නගරයෙන්, බේරුවල නගරයෙන් රට පුරා තැන් තැන්වලට ව්‍යාප්ත වෙන්න පටන් ගත්තා. අපි ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේත්, එළියේත්, ජනමාධ්‍ය ඔස්සේත් සාකච්ඡා කළා. ජාතික සමඟිය ගැන, සංහිඳියාව ගැන බොහෝ දේවල් කිව්වා. එවැනි සිද්ධියක් වුණාට පස්සේ ආණ්ඩුවෙන් යම් වන්දියක් දෙනවා. එය ප්‍රමාණවත් වන්නේත් නැහැ. ඊට පස්සේ සිද්ධිය යටපත් වනවා. කොත්තුවක තිබෙන පිටි ගුලියක් හෝ මාර්ග අනතුරක් හෝ ළමා අපචාරයක් හෝ ස්ත්‍රී දූෂණයක් හෝ හොරකමක් හෝ පහර දීමක් හෝ මනුෂ්‍ය ඝාතනයක් හෝ පදනම් කරගෙන නැවත ජාතිවාදී ගැටුම උත්සන්න වෙලා මහා විශාල හානියක් රටට සිද්ධ වනවා. තව සති කිහිපයකට පස්සේ අපට බලාගන්න පුළුවන්, ජාතිවාදී උන්මත්තකයින් විසින් ඇති කරන ලද හානියේ බරපතළකම කොපමණද කියලා. මේ තත්ත්වය අපේ සංචාරක ව්‍යාපාරයට කොහොම බලපායිද, අපේ විදේශ ආයෝජනයට කොහොම බලපායිද, රටේ ප්‍රතිරූපයට කොහොම බලපායිද කියලා අපට බලන්නට පුළුවන්. මේ ගැටුම් නිරාකරණය කරන්න නම්, අඩු ගණනේ ගැටුම් අවම කරන්න නම්, විශේෂයෙන් රජයක් හැටියට ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ.

අම්පාරේ සිද්ධිය වුණාට පස්සේ ආණ්ඩුව සෞඛ්‍ය අමාත්‍යාංශය යොදාගෙන වඳ පෙති පිළිබඳව රටේ ජනතාව දැනුවත් කරන්න පටන් ගත්ත බව මා දැක්කා. මේ අවස්ථාවේ අපේ රටේ ජනතාවට උපත් පාලනය ගැන හෝ වඳ පෙති ගැන හෝ අත්‍යවශ්‍යයෙන් මහා ලොකු දැනුමක් දෙන්න ඕනෑ නැහැ. අපේ රටේ ජනතාවට ඒ ගැන සාමාන්‍ය දැනුමක් තිබෙනවා. අපේ තරුණ තරුණියන් ඒ ගැන දන්නවා. හැබැයි ඒ සිදු වීමෙන් පස්සේ ආණ්ඩුව කිව්වේ, "වඳ පෙති පිළිබඳව ජනතාවට දැනුමක් නැහැ. ඒ ගැන සෞඛ්‍ය අමාත්‍යාංශය ලවා දැනුවත් කරන්න ඕනෑ"යි කියලායි. හැබැයි ඔය පෙත්ත එන්න කලින් වඳ spray ගැන, ඇඳුම්වලට ගැහුවාය කියන විවිධ spray වර්ග ගැන, කඩවල්වල තිබෙන toffee ගැන ආණ්ඩුව මොනවත් කියන්න ගියේ නැහැ. ඒ කාලයේ සද්ද නැතුව ඉඳලා, ඒවා ඔඩු දුවන්න ඉඩ දීලා, ඒවා වඩා වර්ධනය වෙන්න ඉඩ දීලා, මේ වෙලාවේ මේ සිද්ධිය අල්ලාගෙන, වඳ පෙත්ත තමයි මෙයට මූලික වුණේ කියලා දැන් ප්‍රචාරයක් දියත් කරගෙන යනවා. මා හිතන හැටියට ඒ වඳ පෙත්තේ කථාව යට යාවි. හැබැයි තවත් දවසක, තවත් සිද්ධියක් ඇතිවෙලා මේ ප්‍රශ්නය ඔඩු දුවාවි. ඒ නිසා ආණ්ඩුවක් හැටියට දැන් කරන්න තිබෙන්නේ, මේ රටේ වැපිරිලා තිබෙන ජාතිවාදී ප්‍රවණතාව, ජාතිවාදී දෘෂ්ටිවාදය පරාජය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡා ආරම්භ කරන්න වැඩ පිළිවෙළක් පටන් ගන්න එකයි.

ජාතිවාදී තැටිය රත් වෙලයි තිබෙන්නේ. පිරිසක් එකතුවෙලා ඒ තැටියට ගින්දර දමනවා. එහි සිංහල අන්තවාදීන් ඉන්නවා; මුස්ලිම් අන්තවාදීන් ඉන්නවා; දෙමළ අන්තවාදීන් ඉන්නවා. මේ අය ගින්දර දමමින් තැටිය රත් කරනවා. තැටියට වතුර බින්දුවක් වැටුණොත් -මොකක් වුණත්- ඒකෙන් හානියක් වෙනවා. ඒ නිසා අපි දැන් බලන්නට ඕනෑකම තිබෙනවා, මෙන්න මේ තැටිය රත් කරන අයත් ඉවත් කරගෙන තැටිය නිවා ගන්නේ කොහොමද කියලා. එවැනි දැක්මක් තිබෙනවා නම් සිනමාව, ටෙලි නාට්‍යය, කලාව තුළින් ජනතාව අතර සමඟිය ඇති කරන්නට, ජාතීන් අතර සංහිඳියාව ඇති කරන්නට, මනුෂ්‍යත්වය පිළිබඳව ගැඹුරු අදහසක් මේ සමාජයට දෙන්නට මේ මාධ්‍යයන් පාවිච්චි කරන්න අපිට පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ලාංකීය -දේශීය- සිනමාව අවුරුදු 70ක් පහු කරලා තිබෙනවා. හැබැයි, යුද්ධය අවසන් වෙලා අවුරුදු දහයක් ගත වෙලා තිබියදීත්, මේ රටේ ජාතීන් අතර තිබෙන සැකය, අවිශ්වාසය තුරන් කරන්නට අපේ සිනමාව කොච්චර මැදිහත් වුණාද? අපේ ටෙලි නාට්‍යය ක්ෂේත්‍රය ඒ වෙනුවෙන් කොච්චර මැදිහත්වෙලා තිබෙනවාද? 2008 අවුරුද්දෙන් පස්සේ, "අබා" චිත්‍රපටයෙන් පටන්ගෙන වර්තමානයේ විකාශනය -ප්‍රදර්ශනය- වන "කාල" සිනමා පටය දක්වා දිගින් දිගටම විකාශනය වුණේ එකම දෘෂ්ටි වාදයක් පදනම් කර ගත් සිනමා පට. ඒක ඇතුළත කොහේවත් ජාතික සමඟිය ගොඩ නඟන දේවල් තිබුණේ නැහැ. ඒක ඇතුළත ජාතීන් අතර අවිශ්වාසය දුරු කරන දේවල් තිබුණේ නැහැ. ඒක ඇතුළත "හැම දෙනාම සමාන මවිටමේ පුරවැසියන්" කියලා කියන යෝජනාවන් තිබුණේ නැහැ. අතරින් පතර පුංචි පුංචි චිත්‍රපට ටිකක් ආවා තමයි. හැබැයි, රටක් හැටියට අපි බරපතළ තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඕනෑ වෙලාවක පලුදු කරන්න පුළුවන්, ඕනෑ වේලාවක කිව් කවලා ඇහැ ඇරවලා ගන්න පුළුවන්, ඕනෑම වේලාවක මූඩිය ඇරලා එළියට ගන්න පුළුවන් භූතයා යටපත් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ගැඹුරු සංවාදයක් මේ කලාව හරහා අපි කළේ නැහැ. පසු ගිය කාලයේ අපේ රටේ පැවතුණු චිත්‍රපටි කර්මාන්තය දිහා බැලුවොත් එය ඔප්පු වනවා. මේ රටේ පෞද්ගලික ආශය, ව්‍යාපාරිකයන් වැනි අය මුදල් ආයෝජනය කළේ මම කලින් කියපු ඓතිහාසික, ජාතිකවාදී, විවිධ අර්ථ කථනයන් සහිත, වැල යන අතට මැස්ස ගහන වර්ගයේ චිත්‍රපටිවලටයි. රාජ්‍යාන්වය, යුද වාදය, බලහත්කාරයෙන් මිනිසුන් පීඩාවට පත් කිරීම තමයි ඒ චිත්‍රපටිවලින් උත්කර්ෂයට නැංවුවේ. ඒවාට තමයි මේ ව්‍යාපාරිකයන් ආයෝජනය කළේ. ඒවා තමයි ලාභ ලැබුවේ. ඒ නිසා තමයි "අබා" වාගේ චිත්‍රපටයකට රුපියල් ලක්ෂ 800ක් විතර කෙනෙකු ආයෝජනය කරන්නේ. හැබැයි, අඩු ගණනේ යුද්ධය අවසන් වුණාට පස්සේවත් මේ රටේ තිස් වසරක යුද්ධයක් නැවත ඇති නොවන්නට, ආයුධ අතට නොගන්නට, ජනතාව අතර මනුෂ්‍යත්වය වගා කරන්නට අවශ්‍ය කරන නිර්මාණ බිහි වුණා නම් එහෙම නිර්මාණ බිහි වුණේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුවෙනුයි. අපි තවම කථා කරන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා අධ්‍යක්ෂණය කරපු "සරුංගලය" චිත්‍රපටය ගැනයි. අපි තවම කතා කරන්නේ ධර්මසේන පතිරාජ මහතා අධ්‍යක්ෂණය කරපු "පොන්මනී" ගැනයි. මෑත කාලයේ අශෝක හඳගම වාගේ අධ්‍යක්ෂවරු, විමුක්ති ජයසුන්දර වාගේ නව පරපුරේ අධ්‍යක්ෂවරු, ප්‍රසන්න විතානගේ වැනි අධ්‍යක්ෂවරු බිහි කළ නිර්මාණ අතලොස්සක් තිබෙනවා. හැබැයි, ඒ නිර්මාණ අබිබවා යන ආකාරයට චිත්‍රපට කර්මාන්තයත්, ටෙලි නාට්‍ය කර්මාන්තයත් යොදා ගෙන තිබෙන්නේ රටේ පවතින මේ ජාතිවාදී ප්‍රවණතාව ඉස්මතු කරන්නටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි හේතුවට පිළියම් කරන්නේ නැතිව ඵලය අල්ලා ගෙන මොනවා කළත් වැඩක් වෙන්නේ නැහැ. මේ තිබෙන ගැටුම් අවම කරන්න නම්, මනුෂ්‍ය ඝාතන නතර කරන්න නම්, මේ තිබෙන දේපළ විනාශය නැති කරන්න නම් අපිට මෙන්න මේ ජාතිවාදී දෘෂ්ටිවාදය තීරණාත්මකව පරාජයට පත් කරන්නට වුවමනා කරනවා. එය පරාජය කිරීම ගෙදරින් පටන් ගන්න පුළුවන්. හය හමාරේ ඉඳලා රෑ නවය හමාර වනතුරු තිබෙන හොඳම කාල වේලාව රූපවාහිනියේ හැම channel එකක්ම අද වෙන් කරගෙන තිබෙන්නේ විවිධ ආකාරයෙන් එන විදේශීය ටෙලි නාට්‍ය වෙනුවෙනුයි. අද සමහර නාලිකා ප්‍රවෘත්ති විකාශනයත් රෑ 9.55ට, 9.50ට දාගෙන තිබෙනවා. ඒ ටෙලි නාට්‍යවලට ඉඩකඩ ලබා දෙන්නට. දරුවන් හඳන, දරුවන්ට ගෙදරදී අධ්‍යාපනයක් ලබා දෙන තරුණ මව්වරුන්ට යම්කිසි අදහසක් -මතයක්- කා වද්දන්න පුළුවන් හොඳම belt එක තමයි අපි මේ නිස්කාරණේ මුදල් වෙනුවෙන් නාස්ති කරගෙන යන්නේ.

ඒක රූපවාහිනී ආයතනයට ලාභ ලබා දෙන්නට පුළුවන්. හැබැයි, මතක තබා ගන්න. මේ රටේ ජනතාව මේ විධියට ඇන කොටා ගෙන- සිංහල මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, සිංහල මනුෂ්‍යයා මුස්ලිම් මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා සිංහල මනුෂ්‍යයා දෙස සැකයෙන්, අවිශ්වාසයෙන් බලන රටකට ඉස්සරහට යන්න බැහැ. ඒ කියන්නේ, කවර හෝ පුංචි සිදුවීමකින් අවුළවන්නට පුළුවන් රටකට ඉස්සරහට යන්න බැහැ. රටක් හැටියට අපි ලජ්ජා වන්නට ඕනෑ, කොත්තුවක තිබෙන පිටි ගුලියකට රටේ මෙච්චර විනාශයක් කරන්න පුළුවන් නම්; පාරේ සිදුවන බයිසිකල් අනතුරකට නැත්නම් රථවාහන අනතුරකට රටේ මෙච්චර දේපළ විනාශයක්, මනුෂ්‍ය ඝාතනයන්, දේපළ හානි සිද්ධ කරන්න පුළුවන් නම්; රටේ සිදුවන ස්ත්‍රී දූෂණයකට, රටේ කෙරෙන ළමා අපචාරයකට රටේ මෙච්චර හානියක් කරන්න පුළුවන් නම්, අපි කවර රටක්ද නිර්මාණය කර තිබෙන්නේ කියන එක ගැන. ඔබතුමා දන්නවා, මෙවැනි සිද්ධීන් සාමාන්‍ය සමාජයක සිද්ධ වෙන දේවල් බව. ඒවාට තරාතිරම නොබලා, ජාතිය, කුලය, ගෝත්‍රය නොබලා දඬුවම් කරන්න ඕනෑ. ඒකට තමයි පොලීසියක් තිබෙන්නේ. හැබැයි, අද මේ රටේ හදා තිබෙන දෘෂ්ටිවාදය නිසා, මේ මතවාදය නිසා, රටේ මහා ගැටුමක් නිර්මාණය කරන්නට මෙවැනි ඕනෑම සරල සිදුවීමකට පුළුවන්කමක් ලැබෙනවා. එම නිසා අපි පටන් ගන්නවා නම් පටන් ගන්න තිබෙන්නේ, මේ වරදකරුවන් නීතිය හමුවට පමුණුවන අතරේම, කොහොමද මේ ජාතිවාදී ප්‍රවණතාව පරදවන්නේ කියන කාරණයෙන්. එවැනි අවස්ථාවක අපට ප්‍රයෝජනයට ගන්නට පුළුවන් ඉතා හොඳ මාධ්‍යයක් අපි අතහරිමින් යන්නේ. ජනමාධ්‍යවලින්, චිත්‍රපටවලින්, ටෙලි නාට්‍යවලින්, ගීතවලින් පසුගිය කාලයක් තිස්සේ ජනතාවගේ මනසට දාපු මේ මතවාද තමයි තැන් තැන්වල පුපුරා යන්නේ. ඒක එක වෙලාවක ඡන්ද බවට පත් වෙන්නට පුළුවන්. සමහරවිට ඡන්ද ජයග්‍රහණ ලබාගන්නට පුළුවන්. හැබැයි, රටක් හැටියට සමාජයක් හැටියට ඒක බරපතළ අනතුරක්. එම නිසා අපි යෝජනා කරන්නේ, දැන්වත් අපි ඒ කටයුත්ත පටන් ගනිමු කියායි. යුද්ධයෙන් පස්සේ අවුරුදු දහයක් ගත වෙලා තිබෙනවා. ඒ කාලය තුළ අපි ජාතික සමගියක් හදන්න කටයුතු කළේ නැහැ. මිනිසුන් භය කරන්නට පුළුවන් ආකාරයට අලුත් සතුරන් සොය සොයා අපි යනවා. මේ රටේ ඉපදුණු, මේ රටේ ජීවත් වන, මේ රටේ මියයන හැම ශ්‍රී ලාංකික පුරවැසියකුටම 'ශ්‍රී ලාංකීය' කියන හැඟීම දනවන්නේ කොහොමද; ඔවුන් මේ රටේ සංවර්ධනයට දායක කර ගන්නේ කොහොමද; අනෙකා දෙවන පෙළ පුරවැසියෙකු ලෙස නොසිතා ඔවුන් තමන්ගේ සමානයන් හැටියට සිතන්නට පුරුදු කරන්නේ කොහොමද, එවැනි මානසිකත්වයක් වර්ධනය කර ගන්නා ආකාරයට අපේ මාධ්‍යය යොදා ගනිමු; අපේ දරුවන්ගේ ඔළුවලට ඒ ආකල්ප ඇතුළත් කරමු.

අපි දන්නවා, තමුන්නාන්සේලා ටෙලි නාට්‍යවලින් මේ රටේ වෙන වෙන ප්‍රශ්න ගැන කථා කරන්නට අකමැති වෙයි. බඩු මිල ගැන, ජීවන වියදම ගැන, ආර්ථික ප්‍රශ්න ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට තමුන්නාන්සේලා අකැමැති වෙයි. හැබැයි අපි කාටත් කොන්දේසි විරහිතව එකඟවන්නට පුළුවන් කාරණාවක් තමයි මේ රටේ ජාතික සමගිය සම්බන්ධ කාරණය. අපි එහි ආදීනව වුවමනාතරම් අත් විඳ තිබෙනවා. වුවමනා තරම්! අපි කිහිප සැරයක්ම වළකට වැටී තිබෙන වෙලාවේ අපි යෝජනා කරන්නේ වළකට වැටීම මොළයට ලාභයක් කර ගන්නට අඩුතරමින් දැන්වත් කටයුතු කර ගන්න ඕනෑ කියන එකයි. රූපවාහිනියේ තිබෙන ටෙලි නාට්‍ය සියල්ල, අපේ චිත්‍රපට මාධ්‍යය සහ ගීත යන මේ සියලු කලා මාධ්‍යයන් සහ අනෙක් පැත්තෙන් ක්‍රීඩාව ආදියත් උපයෝගී කර ගෙන මේ රට පුරා පැන නැඟෙමින් පවතින, කෙටි කාලීනව කෙනෙකුට දේශපාලන ජයග්‍රහණ අත්පත් කර ගන්නට පුළුවන් එහෙත් දීර්ඝ කාලීනව රටක් අගාධයට හෙළන්නට පුළුවන් මේ ජාතිවාදී දෘෂ්ටිවාදය පරාජය කිරීම සඳහා මේ මාධ්‍ය යොදා ගන්නය කියා ඉල්ලීමක් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Ajith Mannapperuma.

[අ.භා.1.55]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට ඕනෑ.

නීතිවිරෝධී මත්පැන් වැටලීම, නඩු දැමීම පිළිබඳව පොලීසියට යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ කාලය වෙනකොට පොලීසිය, ගමේ භාෂාවෙන් කියනවා නම් කසිප්පු අල්ලන, නැත්නම් නීතිවිරෝධී මත්පැන් වැටලීම සිදුකිරීම අධෛර්යවත් වුණු ප්‍රශ්නයක් තිබෙනවා. අපට දැන ගන්නට ලැබෙන තොරතුරු අනුව කළුතර උසාවිය, මතුගම උසාවිය, මාතර උසාවිය ආදී සමහර උසාවිවල නීතිවිරෝධී මත්පැන් වැටලීම සම්බන්ධයෙන් පොලීසිය යොමු කර තිබෙන නඩු ප්‍රතික්ෂේප කිරීම නිසා අද ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

නමුත්, කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වුණු නඩු අංක 28136/2003 යටතේ, 2003.09.29 වැනිදා එම්.පී. මොහිදීන් අතිරේක මහෙස්ත්‍රාත්තුමා විසින් මේ සඳහා නඩු පැවරිය හැකි බවට නියෝගයක් කරලා තිබෙනවා. නමුත්, ඒ සම මට්ටමේ තිබෙන අනෙකුත් උසාවි මෙය අභියෝගයට ලක් කරලා "නඩු පැවරීමට නොහැකියි" කියන කථාව කියලා තිබෙනවා.

විශේෂයෙන්ම මෙම නඩුවේදී, "සෘජුව සුරාබදු ආඥාපනත යටතේ අධිකරණයට ඉදිරිපත් වූ නඩු පැවරිය හැකි යැයි තීරණය කරමි. තවද, පොලීසියට මෙම නඩුවේ සැකකරුවන්ට විරුද්ධව අධිකරණයේ සෘජුවම නඩු පැවරිය හැකි බවට මා නියෝග කරමි" කියලා කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ අතිරේක මහේස්ත්‍රාත් එම්.පී. මොහිදීන් මහතා තීන්දුව දීලා තිබෙනවා. නමුත්, එහෙම තීන්දුවක් දීලා තිබියදීයි ඊට සම මට්ටමේ තිබෙන කළුතර, මතුගම, මාතර උසාවි පොලීසියට නඩු පවරන්න බැහැයි කියන ස්ථාවරයේ ඉඳගෙන නඩු භාර ගන්නේ නැති ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. විශේෂයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ අතිරේක මහෙස්ත්‍රාත්වරයකු දීපු තීන්දුවක් නිසයි අනෙක් උසාවිවලින් මේ නියෝගය ගණන් ගන්නේ නැත්තේ. මේක appeal එකක් තුළින් හෝ Supreme Court එකේ හෝ High Court එකේ තීන්දුවක් විධියට ආවා නම් මේ තීන්දුව අභියෝගයට ලක් වෙන්නේ නැහැ. මේ කාරණය අභියෝගයට ලක් වීම නිසා අද ලංකාවේ සමහර පොලීසිවලින් නීති විරෝධී මත්පැන් වැටලීම නවතා තිබෙනවා. සුරාබදු ආඥාපනතේ 33වැනි වගන්තියේ සඳහන් වෙනවා, "ඇමතිවරයා විසින් නියෝග කරන ලද බලය දුන්නොත් තමයි පොලිස් නිලධාරියකුට මේ සඳහා යන්න පුළුවන්" කියලා. නමුත්, අපට දැන ගන්නට තිබෙන ආකාරයට 1956 පෙබරවාරි 22වැනිදා 13529 දරන ගැසට් පත්‍රයෙන් එදා පොලීසියට ඒ සඳහා බලය පවරා තිබෙනවා, මුදල් ඇමතිවරයා විසින්. නමුත්, අපට තේරෙන විධියට මේ බලය පැවරීම 1966.03.09වැනිදා නැවත අවලංගු වෙලා තිබෙනවා. ඒ නිසා මේ කාර්යය සාර්ථක වෙන්න නම් එදා මොහිදීන් අතිරේක මහෙස්ත්‍රාත්තුමා දුන්නු තීන්දුව appeal එකක් තුළින් හෝ High Court එකේ හෝ Supreme Court එකේ තීන්දුවක් බවට පත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් සුරාබදු ආඥාපනතේ 33වැනි වගන්තිය ප්‍රකාර මේ සම්බන්ධයෙන් පොලීසියට බලය ලබා දෙන ගැසට් නිවේදනයක් නිකුත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ සම්බන්ධයෙන් රජයේ දැඩි අවධානයට ලක් වෙන්න ඕනෑ. මොකද, මේ නීතිය අනුව නීතිවිරෝධී මත්පැන් වටලන්න පුළුවන්කම තිබෙන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවට විතරයි, නීති විරෝධී මත්පැන් සඳහා නඩු දමන්න පුළුවන් සුරාබදු දෙපාර්තමේන්තුවට විතරයි කියන තැනට ලංකාවේ උසාවි ආවොත් ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා කියා මම හිතනවා.

මේ රටේ නීතිවිරෝධී මත්පැන් සම්බන්ධ වැටලීම් දවසකට දහස් ගණනක් සිදු වෙනවා. ඒ වාගේම ඒවාට නඩු පැවරෙනවා. එක්ලක්ෂ විසිදහසක විතර නඩු ප්‍රමාණයක් පැවරෙනවා වසරකට. ඒවායින් රුපියල් මිලියන 1,114ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 111කට වැඩි ප්‍රමාණයක් දඩ වශයෙන් රජය අය කර ගන්නවා. ඉතින් පොලීසිය මඟින් කරන මේ කාර්යය සුරාබදු දෙපාර්තමේන්තුවට කරන්න ශක්තිය තිබෙනවාද? පොලීසියට වාගේ මේවා වටලා, අත්අඩංගුවට අරගෙන, ඒවාට එරෙහිව නඩු පැවරීමේ හැකියාව සුරාබදු දෙපාර්තමේන්තුවට තිබෙනවාද? මොකද, ඒ ගොල්ලන්ට strength එකක් නැහැ. ඒ විතරක් නොවෙයි, කාර්ය මණ්ඩලයක්, නිලධාරි මණ්ඩලයක් ඒ අයට නැහැ; යාන වාහන නැහැ. පොලීසිය නම් ඒ කටයුතුවලදී අවිආයුධ පාවිච්චි කරනවා.

ඒ හැකියාව නැහැ. පොලීසියට මිස සුරාබදු දෙපාර්තමේන්තුවට මේ කණ්ඩායම් අවනත කර ගන්න පුළුවන්ද? එහෙම වුණොත් මේ නීතිය වහාම සංශෝධනය කරන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැනට දකුණු පළාතේ අධිකරණවල උද්ගත වෙලා තිබෙන ප්‍රශ්නය අනෙක් පළාත්වලත් උද්ගත වුණොත් මොකද වෙන්නේ? දැන් එන්න එන්නම ගම් මට්ටමෙන් නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය අඩු වෙමින් පවතිනවා; එදාට වඩා අද අඩු වෙලා තිබෙනවා. නමුත්, මේ තත්ත්වය උද්ගත වුණොත්, ආපහු මේ හොර මත්පැන් පෙරීමේ ජාවාරම එන්න එන්නම වැඩි වෙලා නැවතත් මේ රට පැරණි තිබුණු තැනටම -නීති විරෝධී මත්පැන්වලින් ගහණ රටක් බවට- පත් වෙනවා. අද වන විට නීත්‍යානුකූල මත්පැන් බෝතලයක මිල බොහෝ ලෙස ඉහළ ගිහින් තිබෙන බව අපි දන්නවා. ඒ නිසා රටේ ජනතාවටත් ඒක ලෙහෙසි වෙලා නැහැ. මත්පැන් පානය කරන කෙනෙකුට පොඩ්ඩක් හරි හවසට පානය කරන්න ලෙහෙසි වෙලා නැහැ. ඒ නිසාම හොර මත්පැන්වලට යොමු වෙන ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා. පොලීසියට මේ විධියට වැටලීම්වලින් ඉවත් වෙන්න වුණොත්,-පොලීසිය ඉවත් වෙනවා නොවෙයි. ඉවත් වෙන එක පොලීසියට ලෙහෙසියි. නමුත්, නීතිය තුළ පොලීසියට ඉවත් වෙන්න සිද්ධ වෙනවා නම්- රටට කරන්න තිබෙන රාජකාරියක්, රට වෙනුවෙන් කරන්න තිබෙන යුතුකමක් නැතිවී ගොස් රට ස්ථාවරත්වයට ගෙන ඒම දවසින් දවස ආපස්සට යනවා. ඒ වාගේම, නීත්‍යානුකූල මත්පැන් බෝතලයක මිල අධික වෙන කොට, ගමේ පෙරන හොර මත්පැන් බෝතලයක මිල -නීති විරෝධී මත්පැන් බෝතලයක මිල- අඩු වෙලා ඒවා ව්‍යාප්ත වෙන්න පටන් ගනීවි. මෙය එන්න එන්නම තිබෙන ගැටලුවක්. ඒ ගැන මුදල් ඇමතිවරයා හෝ අධිකරණය යම් තීන්දුවක් අරගෙන මේක පිරිසිදු තීන්දුවක් බවට පත් කරලා රාජ්‍ය නිලධාරියාට, නැත්නම් පොලිස් නිලධාරි මහත්මයාට වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කරලා දෙන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ප්‍රශ්නය දැන් ඉතාම බරපතළ විධියට පැන නැඟිලායි තිබෙන්නේ. සුරාබදු නිලධාරීන්ට බැහැ මේ හොර කසිප්පු නිප්පොළවල් අල්ලන්න. පොලීසිය වැටලීම්වලින් ඉවත් වෙලා තිබෙනවා. ඔබතුමා දැන් නෛතික කටයුතු (දූෂණ

විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා. ඒ නිසා, නීතිපති දෙපාර්තමේන්තුවත් කැඳවලා මේ සම්බන්ධයෙන් යම් කිසි ආකාරයක සාකච්ඡාවක් කරලා මේක පැරණි තැනටම අරගෙන යන්න බැරිද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමා, Narcotic Bureau එක මඟින් මේ දේ appeal කරලා තිබෙනවා. මොකද, එක නඩුවකින් තීන්දුව දීලා තිබෙනවා පොලීසියට වැටලීම් කරන්න පුළුවන් කියලා. මම අර කිව්වා වාගේ, 2003දී කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා පොලීසියට බලය තිබෙනවා කියලා. නමුත්, සමාන මට්ටමේ උසාවි නිසා ඒ තීන්දුව අභියෝගයට පත් කරනවා. මම පොලීසියෙන් ඇහුවාම කියනවා, "දැන් මේ ගැන High Court එකට appeal කරලා තිබෙනවා. ඒකෙන් තීන්දුවක් දුන්නොත් මහෙස්ත්‍රාත් අධිකරණය කැමැති වෙන්න පුළුවන්" කියලා. මම මේ ගැන විස්තර හොයන කොට තමයි මේ කාරණය දැන ගත්තේ. ඔබතුමා කිව්වා වාගේ, ඊළඟ ආංශික අධීක්ෂණ කාරක සභාවට අපි මේ කාරණය යොමු කරලා ඒකට කඩිනම් විසඳුමක් හොයා ගනිමු. ඒ වාගේම මේ අවස්ථාවේදී අපි මුදල් ඇමතිතුමාටත් කියනවා, එතුමා මේ පිළිබඳව නියෝගයක් දුන්නොත්, ගැසට් පත්‍රයක් මඟින් පොලීසිය බල ගැන්නුවොත් ඒ ප්‍රශ්නය අවසන් වෙන බව. එහෙම නොවුණොත්, දැනට මත්පැන් අඩු වේගෙන ගියත්, ඔබතුමා කියනවා වාගේම මේ රට මත්පැන් තිප්පොළක් බවට පත් වෙනවාය කියලා අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොර මත්පැන් ජාවාරම් සමාජයේ වෙනවා වාගේම, කුඩු, ගංජා, වේදනා නාශක බෙහෙත් වාගේ දේවලුත් දැන් මත් ද්‍රව්‍ය වශයෙන් භාවිත වෙනවා; ඊට වඩා විනාශකාරී විධියට භාවිත වෙන්න පටන් අරගෙන තිබෙනවා. ලංකාවේ වැඩියෙන්ම භාවිත වෙන්නේ හෙරොයින් කියන මත්කුඩු. ඊළඟට, කොකේන්. ගංජා වාගේ දේවලුත් පාවිච්චි වෙනවා. නමුත්, ලංකාවේ ගංජා නිෂ්පාදනය කිරීම, ගංජා වැවීම එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. මොකද, මේ උවදුර මර්දනය කර ගැනීම සඳහා ත්‍රිවිධ හමුදාව විශාල ශක්තියක් ලබා දෙනවා. ඒ වාගේම, ඒක සාර්ථක වෙමින් පවතිනවා. නමුත්, ලංකාවට ඉන්දියාවෙන් ගෙනෙන කේරළ ගංජා එන්න එන්නම වැඩි වෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒකත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, ලංකාව මුහුදෙන්ම වට වුණු රටක් නිසා, විවිධ පැතිවලින් බෝට්ටු පැමිණ ගංජා ප්‍රවාහනය කරනවාය කියලා අපට තොරතුරු දැනගන්න තිබෙනවා. ලංකාවේ මුහුදේ යාත්‍රා කරන බෝට්ටු ලක්ෂ 3ක් විතර තිබෙනවා. නිරන්තරයෙන්ම බෝට්ටු ලක්ෂ 2කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක තත්ත්වයේ මුහුදේ පාවෙමින් තිබෙනවා. නමුත්, මේවා පරීක්ෂා කිරීමට, මේවා නියාමනය කිරීමට රජයට හැකියාවක් නැති වෙලා තිබෙනවා.

මම දන්නේ නැහැ කොහොමද ඒක කරන්නේ කියලා. සෙනහ ගැවසෙන්නේ නැති සමහර වෙරළ තීරයන් තිබෙනවා. අන්න ඒ වෙරළ තීරයන් හරහා තමයි ඒ වාගේ බෝට්ටු විශාල වශයෙන් එන්නේ. ඒ සඳහා යම් ආරක්ෂක ක්‍රමවේදයක් නිර්මාණය කරන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය ගොඩක් දුරට විසඳෙයි කියලා මම හිතනවා.

මත් කුඩු ප්‍රශ්නය ගැන බැලුවත් ඒ වාගේම තමයි. විශේෂයෙන්ම ලංකාවේ භූගෝලීය පිහිටීම දිහා බලන විට, අපේ ලංකාව ලෝකයට මත් කුඩු බෙදන තිප්පොළක් විධියට පාවිච්චි කරන එක මත් කුඩු ජාවාරම්කාරයින්ට හරිම වාසියි. මොකද, ඇෆ්ගනිස්ථානයෙන්, ලාහෝර්වලින්, මියන්මාර්වලින්, ඒ වාගේම පාකිස්තානය, තායිලන්තය වාගේ රටවල්වලින් තමයි මත් කුඩු එන්නේ. ඉන්දියාවේ භූගෝලීය පිහිටීම බැලුවාම බෝට්ටුවකින් ලංකාවට ළඟාවීම ලෙහෙසියි, ලංකාවේ සිට බෙදා හරින එකත් ලෙහෙසියි. ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව අපට මේ රට වාණිජ කේන්ද්‍රස්ථානයක් කරගන්න බැරි වුණාට, ඉන්දියන් සාගරය තුළ ලංකාවේ පිහිටීම අනුව ලංකාව වාණිජ කේන්ද්‍රස්ථානයක් කරගන්න මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයින්ට පුළුවන් වෙලා තිබෙනවා. මත් කුඩු ජාවාරම කියන එක පොඩි ගනු දෙනුවකුත් නොවෙයි. සාමාන්‍යයෙන් කොකේන් ග්‍රෑම් එකක් -සුළු ප්‍රමාණයක්- රුපියල් 16,000කටත් වඩා වැඩි වෙනවා. එතකොට කිලෝග්‍රෑම් එකක් කීයක් වෙනවාද? හෙරොයින් ග්‍රෑම් එකක් ගත්තොත් රුපියල් 12,000කට වඩා වැඩියි. ගංජා කිලෝග්‍රෑම් එකක් ගත්තොත්, ඒක රුපියල් 60,000කට වඩා වැඩියි. මොකද, මෙම මත් ද්‍රව්‍ය ව්‍යාපාර සුළු පරිමාණයෙන් නොව, මහා පරිමාණයෙන් මුදල් සංසරණය වන ව්‍යාපාර නිසා ඒවා නවත්වා ගැනීම ලෙහෙසි වෙලා නැහැ. මහා පරිමාණයෙන් මුදල් සංසරණය නීති විරෝධී ව්‍යාපාර නිසා මේ ව්‍යාපාරවලින් අධික ලාභ තිබෙනවා. ඒ නිසා අදාළ බලධාරින්ට මුදල් දීලා ඔවුන්ගේ ප්‍රශ්න විසඳාගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා අපි මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි වඳ පෙත්තකට කෑ ගහන වෙලාවේ, කුඩු පෙත්තක් ගැන, එහෙම නැත්නම් පාසල් යන දරුවන්ව විනාශ කරන පෙති ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. පාන් පිටි ගුලියක් ගැන කථා කරලා තමයි රටක් අවුළුවන්න පුළුවන් වෙලා තිබෙන්නේ. නමුත්, රටක් ඇවිළෙමින් පවතින මත් පෙත්ත ගැන කථා කරන්න අද කට්ටිය අඩුයි.

මත් කුඩු වාගේ දේවල් Airport එක හරහා ගුවන් මඟින් ලංකාවට එන අවස්ථා විශාල වශයෙන් තිබෙනවා. මම ඒ පිළිබඳව බලධාරින්ගේ අවධානය යොමු කරවනවා. අපි ලංකාවෙන් ගුවන්ගත වන විට, එහෙම නැත්නම් ශ්‍රී ලංකා භූමියේ සිට වෙනත් රටකට යනකොට airport එකේදී අපේ මුළු ශරීරයම check කරනවා; scan කරලා බලනවා. ඒ වාගේම අපි ගෙනයන බෑග් සියල්ලම check කරලා, scan කරලා බලනවා. නමුත්, අපි පිට රටක ඉඳලා ලංකාවට එනකොට අපේ බෑග් check කරන්නේ නැහැ; අපේ බෑග් පරීක්ෂා කරන්නේ නැහැ; අපව scan කරලා බලන්නේ නැහැ. අපි යනකොට check කරලා බලනවා, මොනවාද ගෙනියන්නේ කියලා. අපේ ඇඟේ මොනවා හරි තිබෙනවාද කියලා බලනවා. නමුත්, අපි ගුවන් තොටින් බැහැලා ආපහු එනකොට මඟියා හෝ මඟියාගේ බෑග් එක පරීක්ෂා කරන ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මම ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරවනවා.

මෙම උවදුර නවත්වාගන්න පුළුවන් තවත් ක්‍රමයක් තමයි ගුවනින් එන මත් ද්‍රව්‍ය සහ මත් කුඩු නැවැත්වීම. Airport එක හරහා යන පුද්ගලයන් scan කරනවා වාගේම, Airport එකෙන් එළියට එනකොටත් ඒ විධියේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනවා නම්, අපට ගොඩක් සතුටුදායක ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක පාසල් දරුවන් සහ සාමාන්‍ය තරුණයන් අතර තිබෙන ප්‍රශ්නයක්. තරුණයින් ඖෂධ ශාලාවේ -ෆාමසි එකේ- විකුණන්න තිබෙන පෙති වර්ග - pharmaceutical drugs - වැඩි ප්‍රමාණයක් පානය කරලා මත් වන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට, ට්‍රැමඩෝල් වාගේ වේදනා නාශක පෙති ගන්න පුළුවන්. මත් වීම සඳහා භාවිතා කරන පෙති බොහෝමයක් වේදනා නාශක පෙති. ශරීරයට අවශ්‍ය ඒවායින් ග්‍රෑම් 5යි නම්, ග්‍රෑම් 50ක් බීලා ඒ මඟින් මත්වෙනවා. එතකොට කොහොමද ඒක නවත්වන්නේ? ඒ සඳහා නීති හදන්න වෙනවා. ඒක නවත්වන්න පොලීසියට පුළුවන්ද? වේදනා නාශක පෙති ටිකක් ෆාමසියෙන් සල්ලි දීලා අරගෙන ඒවා ලොකු ප්‍රමාණයක් තබාගත්තාය කියලා පොලීසියට ඔහුව අත් අඩංගුවට ගන්න පුළුවන්ද? කොහොමද ඒක කරන්නේ? එහෙම කරන්න පොලීසියට බලයක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමාගේ කාලය මට ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
පොලීසියට එහෙම වැටලීම් කළ හැකිද? අපි මත් ද්‍රව්‍ය ගැන ගොඩක් කථා කරනවා. "මත් ද්‍රව්‍ය" කියන උවදුරින් මුළු රටම ඇවිළෙමින් පවතිනවා. තරුණ පරම්පරාව විනාශ වෙමින් පවතිනවා. ඒ නිසා අපට මේ සඳහා වැදගත් ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙනවා.

මෙවැනි අය අත්අඩංගුවට ගන්න පොලීසියට බලයක් තිබෙනවාද? Pharmaceutical drugs පාවිච්චි කරන කෙනෙක් අත් අඩංගුවට ගන්න පුළුවන් වන්නේ food inspector කෙනෙකුට හෝ drug inspector කෙනෙකුටයි. නමුත්, පොලීසියට එවැනි හැකියාවක් නැහැ. එහෙම නම් පොලීසියට ඒ කටයුතු කරන්න පුළුවන් විධියට අපට මේ නීති සංශෝධනය කරන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ හිරගෙවල්වල ඉන්න අයගෙන් තුනෙන් එකක් මත් ද්‍රව්‍ය භාවිතය නිසා සිරගතවූ අය. එහෙම නම්, අපි හිරගෙවල් හද හදා ඉන්නවාද, නැත්නම් මේ රටින් මත් ද්‍රව්‍ය තුරන් කරනවා ද කියලා අපට හිතන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි දන්න විධියට මේ රටේ සිද්ධ වෙන අපරාධ, මිනීමැරුම් වාගේ දේවල් වැඩිපුරම සංවිධාන කරන්නේ, සැලසුම් කරන්නේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) Nalinda Jayathissa to the Chair?

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன) - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research)
"ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (DR.) NALINDA JAYATHISSA *took the Chair.*

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
அதன்படி பி.ப. 5.23 மணிக்கு பாராளுமன்றம், 2018 மார்ச் 09, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Parliament adjourned accordingly at 5.23 p.m. until 10.30 a.m. on Friday, 09th March, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 259 - இல. 04
Volume 259 - No. 04

2018 මාර්තු 09වන සිකුරාදා
2018 மார்ச் 09, வெள்ளிக்கிழமை
Friday, 09th March, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

වෙළෙඳ නැව් පනත:
නියෝග

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම

කල් තැබීමේ යෝජනාව:

பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

வணிகக் கப்பற்றொழில் சட்டம்:
ஒழுங்குவிதிகள்

தேசிய கல்வி ஆணைக்குழுவின் தலைவர் மற்றும் உப தலைவரின் ஊதியங்கள் மற்றும் ஆணைக்குழு அங்கத்தவர்களின் கொடுப்பனவுகளைத் திருத்தியமைத்தல்

ஒத்திவைப்புப் பிரேரணை:
ராஜாங்கனை விவசாயிகளின் ஆர்ப்பாட்டத்தின்போதான கொடூரத் தாக்குதல்

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

MERCHANT SHIPPING ACT:
Regulations

REVISION OF REMUNERATION OF THE CHAIRMAN AND THE VICE-CHAIRMAN AND THE ALLOWANCES OF THE MEMBERS OF THE NATIONAL EDUCATION COMMISSION

ADJOURNMENT MOTION:
Formal Investigation into Brutal Assault on Farmers' Protest at Rajanganaya

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මාර්තු 09වන සිකුරාදා
2018 மார்ச் 09 வெள்ளிக்கிழமை
Friday, 09h March, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
சனாதிபதியிடமிருந்து வந்த செய்தி
MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී ඇත.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/ පීඑස්ඒ/00/1/14/4

2018 මාර්තු මස 06 වන දින

ගරු කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

මහජන ආරක්ෂක ආඥා පනත

මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2018.03.06 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මඟින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ 2018 ක් වූ මාර්තු මස 06 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ම විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 මාර්තු 09වන සිකුරාදා, එනම් අද දින අපර භාග 3.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Business and Commerce on "Intellectual Property (Amendment) Bill" and "Annual Performance Report of the Ministry of Industry and Commerce for the year 2016", which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වන්දිම වීරක්කොඩි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-685/'16-(2), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2-1222/'16-(2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

විසිතුරු මත්ස්‍ය කර්මාන්තය : ණය පහසුකම්
அலங்கார மீன்வளர்ப்புக் கைத்தொழில்: கடன் வசதிகள்
ORNAMENTAL FISH INDUSTRY: LOAN FACILITIES

1405/'16

3.ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 176ට අනුව, විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ව්‍යාපාර ඇරඹීම සඳහා සහනදායී පදනමින් ණය පහසුකම් ලබා දුන් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) වර්ෂ 1977 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍ය අපනයන මඟින් ඉපයූ විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් අපනයනකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) අය වැය යෝජනාවට අනුව, විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන්ට ණය පහසුකම් ලබා දීමේදී විශේෂයෙන් ලබා දුන් සහන කවරේද;

(v) 2017 වර්ෂය වෙනුවෙන් එකී සහන තවදුරටත් වලංගු වන්නේද;

(vi) විසිතුරු මසුන් අපනයන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරන රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව සෑහීමට පත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

.කඩ්ඩොළිල් මට්රුම් නීරග වළමූල අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2016 வரவு செலவுத்திட்டத்தின் 176ஆம் இலக்கம் முன்மொழிவின் பிரகாரம், அலங்கார மீன்வளர்ப்புக் கைத்தொழிலை ஆரம்பிப்பதற்குச் சலுகை அடிப்படையில் கடன் வசதிகள் வழங்கப்பட்டுள்ள ஆட்கள் அல்லது நிறுவனங் களின் பட்டியலொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) 1977ஆம் ஆண்டு முதல் இன்றுவரை அலங்கார மீன்களை ஏற்றுமதி செய்வதன்மூலம் ஈட்டிக் கொள்ளப்பட்ட வெளிநாட்டுச் செலாவணியின் அளவு ஒவ்வோராண்டின் அடிப்படையில் யாது என்பதையும்;

(iii) இலங்கையின் அலங்கார மீன்களை ஏற்றுமதி செய்வோரின் பெயர்ப்பட்டியலைச் சமர்ப்பிப் பாரா என்பதையும்;

(iv) வரவு செலவுத்திட்ட முன்மொழிவின் பிரகாரம், அலங்கார மீன் ஏற்றுமதியாளர்களுக்கு கடன் வசதிகளைப் பெற்றுக்கொடுக்கும்போது வழங்கப்பட்ட விசேட சலுகைகள் யாவை என்பதையும்;

(v) 2017ஆம் ஆண்டுக்கு மேற்படி சலுகைகள் தொடர்ந்தும் செல்லுபடியாகுமா என்பதையும்;

(vi) அலங்கார மீன்களை ஏற்றுமதி செய்யும் கைத்தொழிலை மேம்படுத்தும் பொறுப்பை ஏற்றுள்ள அரச நிறுவனங்களின் நடவடிக்கைகள் தொடர்பாக திருப்தியடைய முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) whether a list of individuals or institutions for whom loans with concessionary interests were provided to start ornamental fish businesses will be submitted in terms of Budget Proposal No. 176 of 2016;

(ii) separately, in terms of each year, the foreign exchange earned by way of ornamental fish exports from 1977;

(iii) whether a list of ornamental fish exporters will be submitted;

(iv) the special concessions provided at the time that the loan facilities were granted to ornamental fish exporters as per the Budget Proposal;

(v) whether aforesaid concessions are still in effect for year 2017; and

(vi) whether the functions of the State institutions that holds the responsibility of the promotion of ornamental fish exports industry are satisfactory?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
මම උත්තරය දෙන්නද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඇමතිතුමා නැතුව අතුරු ප්‍රශ්න අහන්න විධියක් නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මෙහෙම කරමු, ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා උත්තරය දෙන්න. අතුරු ප්‍රශ්න ඇමතිතුමාට refer කරන්න පුළුවන් නේ. නැත්නම් රවුමේ එන කොට ගොඩක් කාලයක් යනවා. ඒක ඔබතුමාට පාඩුයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමා, ඔබතුමා උත්තරය කියවන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට උත්තර දෙනවා.

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 176හි එසේ සඳහන් වුවද ණය යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොතිබුණි.

(ii) 1983 සිට 1985 දක්වා සහ 1990 වර්ෂයේ සිට මේ දක්වා දත්ත ඇමුණුම I මඟින් ඉදිරිපත් කර ඇත. (මූලාශ්‍ර - අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය)

(iii) ඔව්. ඇමුණුම II මඟින් ඉදිරිපත් කර ඇත. (මූලාශ්‍ර - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය)

(iv) ඉහත (අ) (i)හි දක්වා ඇති පරිදි ණය ලබා දීමක් සිදු වී නොමැත.

(v) අදාළ නොවේ.

(vi) ඔව්.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අය වැය යෝජනා වශයෙන් ප්‍රතිපාදන වෙන් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කරන අය වැය සම්මත කර ගත්තත්, ඒ යෝජනා හුදු වචන හා ප්‍රලාප බවට පත් වෙලා තිබෙන එක තමයි ඇත්ත. ඒ නිසා ඔබතුමාටත්, මේ ගරු සභාවටත් විශාල වගකීමක් පැවරෙනවා. රටේ රාජ්‍ය මූල්‍ය හැසිරවීමේදී යෝජනාවක් කළොත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන දෙයක් තමයි අය වැය ලේඛනය යටතේ කියවන්න ඕනෑ. මේක ගරු අමාත්‍යතුමන්ලාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඉතිහාසයේ කවර දිනක හෝ නැති ලෙස 2015, 2016, 2017 වර්ෂවල මේ මහ පොළොවේ ප්‍රායෝගික යථාර්ථයන් නොවන යෝජනා රාශියක් මුදල් අමාත්‍යාංශය ඉදිරිපත් කරපු නිසා ආණ්ඩුව බොරුකාරයකු බවට පත් වෙලා තිබෙනවා. එය කිරීමෙන් අමාත්‍යවරයායි අපහසුතාවට පත් වන්නේ. මුදල් අමාත්‍යවරයා කර බේරා ගන්නවා. ඒ නිසා ප්‍රායෝගික නොවන යෝජනා, කරන්න බැරි දේවල් අය වැය යෝජනා හැටියට ඉදිරිපත් කරන්න එපා කියන එක අප කවුරුත් එකතු වෙලා අය වැය සකසන ක්‍රියාවලියට ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ගරු සභාව නොමඟ යැවීමක් තමයි සිද්ධ වන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1575/'17- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කීවෙනි වතාවටද මේ ප්‍රශ්නය අහන්නේ?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙන්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා මේ ගැන විශේෂයෙන් අවධානය යොමු කරවනවා. පිළිතුරු දෙන්න ගරු අමාත්‍යවරුන් ඉන්න ඕනෑ කියන එක අපේ අලුත් ස්ථාවර නියෝගවලත් තිබෙනවා. මා ඒ කෙරේ අවධානය යොමු කරවන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මේක සරල ප්‍රශ්නයක්. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමාගේ නම හා ලිපිනය අසා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට තේරෙනවා. ඒ කෙරේ අවධානය යොමු කරවන්න, ගරු අමාත්‍යතුමා. අසා තිබෙන්නේ සුළු දේවල්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
උත්තරය එවා නැහැ. සරල ප්‍රශ්නයක්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1738/'17 - (2), ගරු චමින්ද විජේසිරි මහතා.
[සභා ගර්භය තුළ නැත.]

[ගරු කථානායකතුමා]

ප්‍රශ්න අංක 6 - 1744/'17 - (2), ගරු විජිත හේරත් මහතා. [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 7 - 1997/'17 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 2109/'17- (2), ගරු ඩග්ලස් දේවානන්දා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 - 2175/'17 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 2203/'17 - (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 2204/'17 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම අසමී.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 2215/'17 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 2221/'17 - (1), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 - 2284/'17 - (2), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 - 2433/'17 - (2), ගරු ඩී.වී. චානක මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

බිත්තර ආනයනය/අපනයනය : විස්තර
முட்டை இறக்குமதி/ஏற்றுமதி: விபரம்
IMPORT / EXPORT OF EGGS : DETAILS

685/'16

1. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)
මාණ්පුමිකු කේ.කේ. පියතාස - මාණ්පුමිකු පුත්තික පතිරණ සාර්පාක)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Buddhika Pathirana)
ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ආහාරය සඳහා ගන්නා බිත්තර වර්ග මොනවාද;

(ii) එම බිත්තරවල වාර්ෂික අවශ්‍යතාව වෙන් වෙන්ව දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාව බිත්තර ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ ආනයනය කළ බිත්තර ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බිත්තර ආනයනය සඳහා 2016 වර්ෂයේදී වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකාව බිත්තර අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ අපනයනය කළ බිත්තර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 වර්ෂයේදී බිත්තර අපනයනයෙන් ශ්‍රී ලංකාව ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කිරාමියප් පොරුළාතාර අලුවල්කළ් පට්රිය අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෙයිල් උණවුක්කාකප් පයන්පටුත්තප්පටුම් මුට්ටෙ වකෙකළ් යාවෙයෙන්පතෙයුම්;

(ii) අන්ත මුට්ටෙකළුක්කාන සරාසරි වරුටාන්තත් තේවෙයානතු තනිත්තනියාක සරාසරි එව්වළවෙන්පතෙයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) ඉලංකෙ මුට්ටෙකළෙ ඉරක්කුමති සෙය්කින්රතා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, අන්ත මුට්ටෙ වකෙකළ් යාවෙයෙන්පතෙයුම්;

(iii) 2016ආම් ආණ්ටිල් ඉරක්කුමති සෙය්යප්පට්ට මුට්ටෙකළින් එණ්ණික්කෙ තනිත්තනියාක යාතෙන්පතෙයුම්;

(iv) මුට්ටෙකළෙ ඉරක්කුමති සෙය්වතර්කාක 2016ආම් ආණ්ටිල් සෙලවිටප්පට්ට පණත් තොකෙ යාතෙන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) (i) ඉලංකෙ මුට්ටෙකළෙ ඒර්රුමති සෙය්කින්රතා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, අන්ත මුට්ටෙ වකෙකළ් යාවෙයෙන්පතෙයුම්;

(iii) 2016ආම් ආණ්ටිල් ඒර්රුමති සෙය්යප්පට්ට මුට්ටෙකළින් එණ්ණික්කෙ තනිත්තනියාක යාතෙන්පතෙයුම්;

(iv) 2016ආම් ආණ්ටිල් මුට්ටෙ ඒර්රුමතියින් මූලම් ඉලංකෙ පෙර්රුක්කොණ්ට වරුමානම් එව්වළවෙන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඊ) ඉන්රේල්, ඒන්

asked the Minister of Rural Economic Affairs:

(a) Will he state -

(i) the varieties of eggs consumed as a food item in Sri Lanka; and

(ii) separately, the gross annual requirement of eggs?

(b) Will he inform this House-

(i) whether eggs are imported to Sri Lanka;

(ii) if so, the varieties of aforesaid eggs;

(iii) separately, the quantity of eggs imported in the year 2016; and

(iv) the amount of money spent on importation of eggs in 2016?

(c) Will he also inform this House -

(i) whether Sri Lanka exports eggs;

(ii) if so, aforesaid varieties of eggs;

(iii) separately, the quantity of eggs, exported in the year 2016; and

(iv) the income earned by Sri Lanka in 2016 by exporting eggs?

(d) If not, why?

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)

(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ප්‍රධාන වශයෙන් කිකිළි බිත්තර වන අතර ඉතා සුළු වශයෙන් වටු බිත්තර, තාරා බිත්තර, කලුකුම් බිත්තර

(ii) කිකිළි බිත්තර දළ වශයෙන් මිලියන 2300ක් (මිලියන දෙදහස් තුන්සියයක්) පමණ වේ.

(ආ) (i) ඔව්.

(ii) රැක්කවීම් සඳහා කිකිළි බිත්තර (Hatching Eggs)

(iii) රැක්කවීම් සඳහා කිකිළි බිත්තර 68,400 (හැට අටදහස් හාරසියයි)

(iv) රු.40,176,412.00 (හාරසිය එක්ලක්ෂ හැත්තෑහයදහස් හාරසිය දොළහයි)

(ඇ) (i) ඔව්.

(ii) කිකිළි බිත්තර හා වටු බිත්තර

(iii) කිකිළි බිත්තර - 4,087,276 (හතළිස්ලක්ෂ අසූහත්දහස් දෙසියහැත්තෑහයයි.)

වටු බිත්තර - 5,578 (පන්දහස් පන්සිය හැත්තෑඅටයි.)

(iv) රු.95,096,312.27 (නවසිය පනස්ලක්ෂ අනූහයදහස් තුන්සියදොළහයි ශත විසිහතයි)

(ඇ) පැන නොනඟී.

ත්‍රස්තවාදී ක්‍රියා නිසා විනාශ වූ රාජ්‍ය ආයතන: මුලතිව් දිස්ත්‍රික්කය

பயங்கரவாத நடவடிக்கைகளால் அழிக்கப்பட்ட அரச நிறுவனங்கள்: முல்லைத்தீவு மாவட்டம்
GOVERNMENT INSTITUTIONS DESTROYED BY TERRORIST ACTS: MULLAITIVU DISTRICT

1222/'16

2. **ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன- மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Padma Udayashantha Gunasekara)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தில் அமைந்துள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யையும்;

(ii) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் 1983ஆம் ஆண்டுக்குப் பின்னர் அழிக்கப்பட்டுள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யையும்;

(iii) அழிவடைந்துள்ள மேற்படி சொத்துகள் பற்றி அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ளக்கூடிய மதிப் பீடொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அச்சொத்துகளின் மொத்த பெறுமதி யாதென்பதையும்;

(v) அழிக்கப்பட்டுள்ள ஒவ்வொரு சொத்து தொடர் பாகவும் பொறுப்புக்கூற வேண்டிய பயங்கர வாதிகளுக்கு எதிராகச் சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவை யென்பதையும்;

(vii) மேற்படி (i) - (vi) வரை விசாரிக்கப்பட்டுள்ள தகவல்கள் தொடர்பான முழுமையான அறிக்கை யொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the number of Government institutions in the Mullaitivu District;

(ii) the number of Government institutions that were destroyed by the LTTE terrorists after 1983;

(iii) whether a Government approved valuation has been done on the destroyed property;

(iv) if so, the total value of the said property;

(v) whether legal action has been taken against the terrorists who were responsible for the said destruction;

(vi) if so, what those steps are; and

(vii) whether a comprehensive report with regard to the facts that have been questioned in above (i) to (vi) will be submitted?

(b) If not, why?

ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - Deputy Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජ්‍ය ආයතන 123කි.

(ii) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද රාජ්‍ය ආයතන 51කි.

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව තක්සේරුවක් කිරීම සම්බන්ධව ලේඛනගත තොරතුරු නොමැත.

(iv) ලේඛනගත තොරතුරු නොමැති නිසා එම දේපළවල සම්පූර්ණ වටිනාකම සඳහන් කළ නොහැකිය.

(v) එවැනි පරිසරයක් එම ප්‍රදේශය තුළ එම වකවානුවේදී නොතිබීම නිසා නීතිමය පියවර ගෙන නොමැත.

(vi) එම වකවානුවේදී සිවිල් පරිපාලනයේ පැවති අර්බුදකාරී තත්ත්වය නිසා එවැනි පියවර ගෙන නැත.

(vii) දැනට ලැබී ඇති වාර්තාව ඉදිරිපත් කරමි.

අමුණා ඇත. ඇමුණුම්* අංක 01 සහ 02

(ආ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1738/'17 - (2), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2015-2017 කාලය තුළ විදේශ ආයෝජන: විස්තර
2015-2017 வரையான வெளிநாட்டு முதலீடுகள்: விபரம்
FOREIGN INVESTMENTS DURING 2015 - 2017 PERIOD: DETAILS

1744/'17

6. **ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු විජිත හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு விஜித ஹேரத் சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Vijitha Herath)
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015, 2016 සහ 2017 යන වර්ෂවලදී ලැබූ විදේශ ආයෝජන ප්‍රමාණය;

(ii) එකී වර්ෂවලදී නැවත ඉවත් කරගෙන ඇති, කලින් ලැබී තිබූ විදේශ ආයෝජන ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் கிடைக்கப்பெற்ற வெளிநாட்டு முதலீடுகளின் அளவு;

(ii) மேற்படி ஆண்டுகளில் அகற்றிக்கொள்ளப் பட்டுள்ள, ஏற்கெனவே கிடைக்கப் பெற்றிருந்த வெளிநாட்டு முதலீடுகளின் அளவு;

ஒவ்வொரு வருடத்தின் பிரகாரம் தனித்தனியாக யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House separately in respect of each of the years -

(i) the amounts of foreign investments received in 2015, 2016 and 2017; and

(ii) the amounts of foreign investments which had existed in the preceeding years and have been removed?

(b) If not, why?

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Hon. Speaker, I table* the Answer.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) The Foreign Direct Investment received during the following years 2015, 2016 and 2017 are as follows;

Year	FDI Received (USD Mn)
2015	969.7
2016	801.0
2017	1,710.3

(ii) It is not very clear what is meant by "Foreign investment which had existed in the preceding years and have been removed". However, we provide herewith the project agreements terminated during 2015, 2016 and 2017 (terminated after commencement of commercial operation).

Reasons for termination of these companies are related with land issues, non-compliance with the agreement with BOI, market issues, financial issues of the companies et cetera.

Year	No. of Projects terminated	Estimated Investment (USD. Mn.)		
		Foreign	Local	Total
2015	22	23.31	10.97	34.28
2016	67	53.98	27.89	81.87
2017	148	73.29	173.52	246.81

Capitalized items such as building, plant and machineries can be transferred to another BOI or Non-BOI company, but may not necessarily be removed from the country.

(b) Not Relevant.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එතුමා ආයෝජනය ගැන වැදගත් ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ. ආයෝජන වේගයෙන් අඩු වී තිබෙන බව ගරු ඇමතිතුමා පිළිගන්නවාද? බලාපොරොත්තු වූ ඉලක්කයට පැමිණ නැති බව ඔබතුමා පිළිගන්නවාද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
නැහැ, පිළිගන්න බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
හම්බන්තොට වරායේ ගනුදෙනුව මෙතැනින් ඉවත් කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඔව්, හම්බන්තොට වරාය නැතුව. හම්බන්තොට වරායෙන් අපට ඇවිල්ලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 292ක් පමණයි. ඊට අමතරව ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7ක් ඇවිල්ලා තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
කීයක්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7ක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක ප්‍රධාන ප්‍රශ්නයෙන් පිටස්තරව අහපු ප්‍රශ්නයක්. ඒ ගැන වෙනම විස්තර ලබා දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ළඟ ඒ විස්තර තිබෙනවා නම් අපට ලබාදෙන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
තිබෙනවා. මගේ ළඟ breakdown එකක් තිබෙනවා. අවශ්‍ය නම් සභාගත කරන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම් සභාගත කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
මම ඒ විස්තර ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2109/'17- (2), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -2175/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -2203/'17- (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -2284/'17- (2), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 -2433/'17- (2), ගරු ඩී.වී. චානක මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට උත්තර ලැබෙන්නේම නැහැනේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ,-

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මහජනතාවගේ ඡන්දයෙන් පත් වෙච්ච මන්ත්‍රීවරු හැටියට අපට අපේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න අහන්න තමයි මේ අවස්ථාව තිබෙන්නේ. නැත්නම් අමාත්‍යාංශ ගානේ ගිහිල්ලා දණ ගහලා තමයි ඉතිරි වැඩ ටික කරගන්න වෙන්නේ. අපි අහන ප්‍රශ්නවලට උත්තර හම්බ වෙන්නේ නැත්නම් ඒක මහජනතාවගේ ඡන්දයට නිගරු කිරීමක්. මගේ ආසනයේ ජාතික පාසල් දෙකයි තිබෙන්නේ. එයින් එක පාසලක් ගැන ප්‍රශ්නයක් අහලා දැන් මාස 6ක් වෙනවා. තවමත් ඒකට උත්තරයක් නැහැ. මේ ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ එම පාසලේ පහසුකම් වැඩිදියුණු කරන සැලැස්ම ගැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන මේ කරුණුවලට මාත් කිප විටක්ම අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා තමයි අපි ස්ථාවර නියෝග වෙනස් කරන කොට අසන ප්‍රශ්නවලට පිළිතුරුදීමට ඇමතිවරුන්ගේ පැමිණීමේ අවශ්‍යතාවත් ඇතුළත් කරලා තිබෙන්නේ. මේ ගැන අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දැනුවත් කරලා ඒ ස්ථාවර නියෝග ක්‍රියාත්මක වන විධියට කටයුතු කරන්න සිද්ධ වෙනවා. අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම මේ විධියට කල් දැමීම ගැන මගේ කනගාටුවත් ප්‍රකාශ කරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා සඳහන් කරපු කරුණට අතිරේකව මේ කරුණ ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. දැන් අපි නව ස්ථාවර නියෝග අනුමත කරලා දුන්නා. ඒ අනුව හැම අමාත්‍යාංශයකම උපදේශක කාරක සභා පිහිටුවන්න අනුමත කළා. මේවා පටන් ගන්නේ කවදාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කිව්වේ පුළුවන් තරම් ඉක්මනින් වැඩ පටන් ගන්න විධියට,- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පුළුවන් තරම් ඉක්මනින් කියන එක ස්ථිර පිළිතුරක් නොවෙයි. ඔබතුමා කථානායකතුමා හැටියට දවස් 30ක් ඇතුළතදී මේ කාරක සභා පටන් ගන්න,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දවස් 30ක් නොවෙයි, ඊටත් ඉස්සර වෙලා කරන්නයි මම උත්සාහ කළේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊට කලින් පටන් ගන්න පුළුවන් නම් වඩාත් හොඳයි. දවස් 30ක් කියන්නේ, ඊට පස්සේ අවුරුද්ද නේ. ඊට කලින් පටන් ගන්න කියලායි මම කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දවස් 30ක් කියන්නේ අවුරුද්දක් නොවෙයි; 30 days. දවස් 30ක් කියන්නේ අවුරුද්දක් නොවෙයි. [බාධා කිරීමක්] ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා කථා කරන්න.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. මගේ හිතේ තිබුණේත් ඒ ප්‍රශ්නයම මතු කරන්නයි. මරික්කාර් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටත් ඒක හොඳ පිළිතුරක්.

හැබැයි, සමහර වෙලාවට අපෙන් අහන ප්‍රශ්නවල තොරතුරු ලබාගන්න කාල වේලාවක් ගත වෙනවා. අපි හිතාමතාම පිළිතුරු ප්‍රමාද කරන්නේ නැහැ. ඒ තොරතුරු ලැබුණු ගමන් අපි පාර්ලිමේන්තුවට ඇවිත් ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න බැඳී සිටිනවා. අද මගෙන් ප්‍රශ්නයක් අහලා තිබුණු නිසා මම පාර්ලිමේන්තුවට ආවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි, ගරු ඇමතිතුමනි. සමහර ප්‍රශ්න මාස හය, හත, අට කල් ගිහින් තිබෙනවා. ඒක සාධාරණ නැහැ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ගරු කථානායකතුමනි, ඒ නිසා උපදේශක කාරක සභා යළිත් ක්‍රියාත්මක කළොත් හොඳයි කියා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. අපි උත්සාහ කරන්නේ අප්‍රේල් 01වැනි දා සිට උපදේශක කාරක සභා පටන් ගන්නයි. නමුත් එහෙම කරන්න බැරි වුණොත් කියලා හිතලා තමයි මම "ඉතා ඉක්මනින්" කියා කිව්වේ. එහෙම බැරි වුණොත් 15වැනි දා වන විට අනිවාර්යයෙන්ම පටන් ගන්නවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා විශේෂයෙන්ම කිව්වා අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහපු ප්‍රශ්නයක් ගැන. මම එතුමාට සාධාරණයක් ඉටු කරන්න ඕනෑ. අධ්‍යාපන ඇමතිතුමා සාමාන්‍යයෙන් හැම දාම වගකීමෙන් ප්‍රශ්නවලට උත්තර දෙනවා. අද ප්‍රශ්නයට එතුමා කල් ඉල්ලා තිබෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මම පොඩි නිවැරදි කිරීමක් කරන්නට ඕනෑ. මම අධ්‍යාපන ඇමතිතුමා සම්බන්ධව නොවෙයි කිව්වේ. පොදුවේ අපිට සිදු වන දෙයක් ගැනයි කිව්වේ. සමහර ඇමතිවරු ඇවිත් උත්තර දෙනවා. අපි ඒ බව දන්නවා. බොහෝ ඇමතිවරු එහෙම කරන්නේ නැති එක ගැනයි මම කිව්වේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාගේ උත්තරය ඒ තරම් සාධාරණ නැහැ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නම, ලිපිනය, වැටුප් සහ දීමනා ගැන තමයි අද මගේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ. එතුමාගේ payslip එකක් ගත්තා නම් ඒක පාර්ලිමේන්තුවට එවන්න තිබුණා, ගරු ඇමතිතුමනි. ඒ නිසා එය කිසිසේත්ම සාධාරණ නැහැ.

ඊළඟට, මෙම කාරණය ගැනත් මා අහන්න කැමැතියි. මේ පාර්ලිමේන්තු සැසිය ආරම්භ කළාට පසුව අලුත් ව්‍යුහයක් හැටියට ආංශික අධීක්ෂණ කාරක සභා හඳුන්වා දුන්නා. ඒවාට රැස් වෙන්න මේ පාර්ලිමේන්තුව ඉඩ මදියි කියලා තමයි කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ල ගන්න ඕනෑය කියා යෝජනාවක් ගෙනැවිත්, අලුත් ගොඩනැඟිල්ලක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ලබා ගත්තේ. ඒ සඳහා මාසිකව රුපියල් ලක්ෂ 247 ගණනේ වියදම් කරලා, වහලා තිබුණු ගොඩනැඟිල්ලට මාස 16ක් කුලියත් ගෙව්වා. ගරු කථානායකතුමනි, මෙම ආංශික අධීක්ෂණ කාරක සභා තවමත් පැවැත්වෙන්නේ මේ පාර්ලිමේන්තු සංකීර්ණය; මේ පරිශ්‍රය තුළයි. මාසයකට රුපියල් ලක්ෂ 247 ගණනේ වියදම් කරලා, ගොඩනැඟිල්ලක් අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ගරු මන්ත්‍රීතුමා, ඒ ගොඩනැඟිල්ල අපි ඉල්ලා ගත් දෙයක් නොවෙයි. කැබිනට් මණ්ඩලයෙන් මුදල් වෙන් කරලා තමයි අපට එම ගොඩනැඟිල්ල ලබා දුන්නේ. පාර්ලිමේන්තුව කිසිම අවස්ථාවක එම ගොඩනැඟිල්ල ඉල්ලුවේ නැහැ.

දෙවැනි කරුණ මෙයයි. අපිට මේ ගොඩනැඟිල්ලේ භුක්තිය බාර දුන්නේ ගිය මාසයේ. එහි පදිංචි වීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු දැනට නාවික හමුදාව විසින් සිදු කරමින් පවතිනවා. නමුත් මට තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක නොවෙයි. එම ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සියයට 40ක් විතර එක රැස්වීමකටවත් සහභාගීවෙලා නැහැ. රැස්වීම පවත්වන්න අවශ්‍ය පහසුකම් කොහේ හෝ සකස් කරලා දෙන්න පුළුවන්. නමුත් අපට අවශ්‍ය වන්නේ සියලු දෙනාගේම සහභාගිත්වයයි. ඔබතුමා මේ ප්‍රශ්නය නැඟීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒක ඔබතුමාගේ වරදක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මේ සඳහා කැබිනට් පත්‍රිකාවක් දැම්මේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කැබිනට් පත්‍රිකා දැම්මේ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

වරද ඔබතුමාගේ නොවෙයි. අගමැතිතුමා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ, "ගොඩනැඟිල්ල අත්පත් කර ගැනීම ඉතාම හදිසි කාරණයක්" කියලායි. එහෙම නේද, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමාටත් ඕනෑ වුණේ මේ ආංශික අධීක්ෂණ කාරක සභාව ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්නයි. නමුත් එම ගොඩනැඟිල්ල බාර දීමටම අවුරුදු එක හමාරකට වඩා ගත වුණා. එම කාරණය පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ඔබතුමා කියපු කාරණය සත්‍යයි. පෙරේදා පැවති ගෘහ්‍ය කාරක සභාවේදී මම මේ කාරණය පිළිබඳව පැහැදිලිවම කිව්වා. සමහර ආංශික අධීක්ෂණ කාරක සභාවල අපි චිතරයි ඉන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්. ඒක තමයි මම සඳහන් කළේ. ඒ වාගේ මම මේ කාරණය කෙරෙහිත් ගරු සභාව දැනුවත් කරන්න කැමතියි. එම ගොඩනැඟිල්ලට අවශ්‍ය ගෘහ භාණ්ඩ කිසිම දෙයක් අපි අලුතින් ගන්නේ නැහැ. අපි තිබෙන ගෘහ භාණ්ඩ repair කරලා ගන්න බලාපොරොත්තු වනවා, මහජන මුදල් ඉතිරි කිරීම සඳහා.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, යෝජනා අංක 1.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු, විෂය අංක 153 සහ 154.

විෂය අංක 153, වෙළඳ නැව් පනත යටතේ නියෝග ඉදිරිපත් කිරීමට - ගරු මහින්ද සමරසිංහ මැතිතුමා.

වෙළඳ නැව් පනත : නියෝග
வணிகக் கப்பற்றொழில் சட்டம்: ஒழுங்குவிதிகள்
MERCHANT SHIPPING ACT: REGULATIONS

[පූ.භා. 10.47]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වගන්තිය යටතේ 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 04 දිනැති 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඒ සමඟම විෂය අංක 154 යටතේ එන "ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම" යෝජනාවද සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[පූ.භා. 10.48]

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, මෙම නියෝගය පිළිබඳව මම බොහොම කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි. වෙරළාසන්න කුඩා වාණිජ යාත්‍රා නියාමනය සම්බන්ධයෙන් 2017.05.04 දිනැති අංක 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් තමයි අපි මෙම නියෝග පනවා තිබෙන්නේ. මීටර් 5කට නොඅඩු සහ මීටර් 24කට නොවැඩි දිගින් යුතු සහ 100කට නොවැඩි මඟින් ප්‍රමාණයක් රැගෙන යන හෝ මඟින් 24කට නොවැඩි ප්‍රමාණයකට එක් රැයක් සඳහා නවාතැන් පහසුකම් ලබා දෙන, ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජල තීරයේ කාර්යයේ නියැළී සිටින භාණ්ඩ ප්‍රවාහන හා මගී ප්‍රවාහන යාත්‍රා වන වාණිජ යාත්‍රා හෝ ලාභයක් හෝ ප්‍රදානයක් ලැබීම සඳහා භාවිත කරනු ලබන විනෝද යාත්‍රා නියාමනය සඳහා අවශ්‍ය නීතිරීති දේශීය නීති පද්ධතියට ඇතුළත් කරන්න තමයි මෙම නියෝග පනවා තිබෙන්නේ. අපි මෙම නියෝග ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව තමයි සකස් කරලා තිබෙන්නේ. මගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නාවික ලේකම් කාර්යාලයෙන් තමයි මේ නියෝග සියල්ලක්ම පිළියෙල කරලා, ගැසට් කරලා අද දින ඉදිරිපත් කරන්න කටයුතු කරලා තිබෙන්නේ.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මෙවැනි දේවල් කරනකොට තනිව වාඩිවෙලා නීතිරීති හදලා ඉදිරිපත් කරන සිරිතක් අපේ නැති බව. මේ ක්ෂේත්‍රයට අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා, ඒ අයගේත් අදහස් ලබාගෙන, ජාත්‍යන්තර ප්‍රමිතීන් අධ්‍යයනය කරලා ඒ සියල්ලක්ම පදනම් කරගෙන තමයි මේ නියෝග හදලා අපි ඉදිරිපත් කරන්නේ. ඇත්ත වශයෙන්ම අද

[ගරු මහින්ද සමරසිංහ මහතා]

සංචාරක ව්‍යාපාරය විශාල වර්ධනයකට යොමු වෙන අවස්ථාවේදී පිළිවෙළකට වැඩ කිරීමේ අවශ්‍යතාව, ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව වැඩ කිරීමේ අවශ්‍යතාව පැන නැඟීමත් එක්කයි දැන් අපි මේ නියෝග පනවා තිබෙන්නේ. ඒ නිසා මා මේ නියෝග බොහොම සතුටින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එකී නියෝග අනුමත කිරීම සඳහා සියලු දෙනාගේ සහයෝගය අපට ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් මා එම නියෝග ඉදිරිපත් කරන්න කැමතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.
මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.50]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා.

1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ ඉදිරිපත් කරන ලද නියෝග පිළිබඳ යම් කිසි අදහස් ප්‍රමාණයක් ප්‍රථමයෙන් මා ඉදිරිපත් කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද දිනයේ ඉදිරිපත් කරනු ලබන මෙම නියෝග "කුඩා වාණිජ යාත්‍රා නියෝග" කියලා තමයි හඳුන්වන්නේ. අපේ රටේ වරාය ආශ්‍රිතව දියුණු කරන්න තිබෙන පැති රාශියක් ගැන මේ ව්‍යාපාරය හා සම්බන්ධ නාවිකයන් සහ එම සමාගම්වලට සැලකිය යුතු අවබෝධයක් තිබෙනවා. 1970 දශකයේ තමයි ලංකාවේ වෙළෙඳ නැව් සහ වරාය සම්බන්ධ පනත් කෙටුම්පත් හරියාකාරව සම්මත වුණේ. අපේ දැනීමේ හැටියට පසුගිය අවුරුදු 40කට ආසන්න කාලයක් තිස්සේ වෙළෙඳ නැව් සහ ලංකාවේ වරාය ආශ්‍රිත අනෙකුත් කටයුතු දියුණු කිරීමට අවශ්‍ය කරන නීතිමය සහ ආයතනික ව්‍යුහයන් දියුණු කරලා යාවත්කාලීන කරලා නැහැ. ඒ නිසා ලංකාවට වරායක් වශයෙන් ලබාගත හැකි ආදායම්, අලුතෙන් පටන් ගන්න පුළුවන් කර්මාන්ත යුද්ධයෙන් පසුව විශාල ප්‍රමාණයක් මේ නිසා අහිමි වෙලා තිබෙනවා.

අද දිනයේදී ඉදිරිපත් කරන ලද කුඩා වාණිජ යාත්‍රා නියෝග නමින් හඳුන්වන මෙම නියෝග සම්බන්ධ ගැසට් පත්‍රය 2017 මැයි මාසයේ 4වෙනිදා හිටපු වරාය හා නාවික අමාත්‍යවරයා විසින් තමයි සකස් කරලා තිබෙන්නේ. ඒ අනුව නාවික කටයුතු සම්බන්ධව පාවිච්චි කරන සමහර කුඩා වාණිජ යාත්‍රා සංචාරක අරමුණුවලින් පාවිච්චි කරන ඒවා. සමහර ඒවා bunkeringවලට වුවත් පාවිච්චි කරන්න පුළුවන් විවිධාකාර ඒවා.

මේවා සම්බන්ධයෙන් නියෝග සකස් කිරීම අවශ්‍යයි කියන එක ගැන විවාදයක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා සාකච්ඡා කරලා තමයි නියෝග ඉදිරිපත් කළේ කියලා. ඔබතුමාගේ ලේකම්වරයා සමඟ, "Off-Port Service Boat Owners and Operators" කියන සංවිධානය මේ සම්බන්ධව කථා කරලා තිබුණා. මම දැක්කා පසුගිය දිනක ඔවුන් පුවත් පතකත් පළ කරලා තිබුණා, ලංකාවේ වරාය ආශ්‍රිත කටයුතුවලට අදාළ අණ පනත් හා ආයතන ව්‍යුහයන් කොහොමද දියුණු වෙන්න ඕනෑ කියලා. ඔවුන් හේතු රාශියක් ඉදිරිපත් කරලා තිබුණා. ගරු කථානායකතුමනි, එම සංවිධානය මා වෙත එවූ ලිපියක් හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, ඔවුන් පැහැදිලිව මේ ලිපියෙන් කියා සිටින්නේ, අද දිනයේදී සම්මත කරන්න යන නියෝග එම සංවිධාන සමඟ සාකච්ඡා කරලා, එම සංවිධානවල පුද්ගලික අවශ්‍යතාවලට පමණක් නොවෙයි, රටේ අනාගත අවශ්‍යතාවන්ට අනුව සකස් කර නොමැති බවයි. ගරු ඇමතිතුමනි, Off-Port Service Boat Owners and Operators සංවිධානයෙන් මා වෙත එවන ලද ලිපිය මම ඔබතුමාට එවනවා. ඔවුන් පැහැදිලිව කියන දේ තමයි, ඇතැම් නියෝග අනුව අවාසියක් වන බව. ඉදිරිපත් කර ඇති නියෝග අනුව මේ සංවිධානයෙන් ඉදිරිපත් කරන එක තර්කයක් මම උදාහරණයක් හැටියට කියන්නම්. ගරු කථානායකතුමනි, යාත්‍රාවක් ලියා පදිංචි කරන්න අවශ්‍යතා රාශියක් මේ නියෝගවලට ඇතුළත් කර තිබෙනවා. එකක්, වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා -කලින් කියන විධියට නම්, රෙජිස්ට්‍රාර්වරයා.- විසින් නිකුත් කරන ලද සමීක්ෂණ සහතිකය. ඒ විධියට අවශ්‍යතා ගොඩක් තිබෙනවා. ඒක අවාසියක්. හැබැයි, 6වන කොන්දේසියේ එහෙම කියලා, 7වන කොන්දේසියේ මෙහෙම තිබෙනවා:

"එසේ වුවද, අයදුම්කරුවකුහට ඔහු අයදුම් කරන අවස්ථාවේ දී ඉහත දක්වන ලද සියලු ලේඛන සැපයීමට නොහැකි වුවහොත්, එම ලේඛන සැපයීමට අපොහොසත්වීම අයදුම්කරුගේ වැරැද්දක් හේතුවෙන් සිදු නොවූ බවට නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑහීමට පත් වීම මත-

(අ) ඒ වෙනුවට නැව් රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් යම් අදාළ ලේඛන සැපයීමට අයදුම්කරුට නියම කිරීම; හෝ

(ආ) එය සැපයීමේ අවශ්‍යතාවයෙන් අයදුම්කරු නිදහස් කිරීම, සහ අයදුම්කරුට එම යාත්‍රාව සම්බන්ධයෙන්, මාස තුනක කාලසීමාවක් සඳහා තාවකාලික ලියා පදිංචි සහතිකයක් ලබාදීම සිදු කළ හැකිය."

මෙහි තිබෙන්නේ හරිම තාක්ෂණික වචන නිසා සරල අදහස එන්නේ නැහැ. මේ මොකක්ද කියන්නේ? ගරු කථානායකතුමනි, මේකේ සම්පූර්ණ කළ යුතු -මේ form එකත් ලොකු එකක්.- කොන්දේසි 24ක් තිබෙනවා. ඒ කොන්දේසි 24 එහෙම දාලා තිබෙන අතර, එක වගන්තියක් තිබෙනවා, ඒ කියන්නේ, නැව් රෙජිස්ට්‍රාර්වරයාට මේ ලේඛනවලින් -අනිවාර්යයෙන් නිශ්චිත කරපු එකක්, දෙකක් නොවෙයි- ඕනෑම එකක් සම්බන්ධව, ඒක ඉදිරිපත් කර ගන්න බැරි නම්, ඒ සම්බන්ධව ඔහුට අභිමතය දීලා තිබෙනවා. නාවික කටයුතු සම්බන්ධ ව්‍යාපාරික සමාගම් එකක්වත් පුංචි පෙට්ටි කඩ නොවෙයි. වරාය වාගේ එකක් එක්ක කරන ව්‍යාපාරවලට කවුරුවත් අනවබෝධයෙන් එන්නේ නැහැ. විශාල දැනුමක් සහ විශාල ප්‍රාග්ධනයක් සහිතව තමයි එන්නේ. ගරු කථානායකතුමනි, මා දන්නා තරමින් ලංකාවේ මේ කටයුතුවලට සම්බන්ධ වෙලා ඉන්න හැම කෙනෙක්ම විදේශීය නැව් සමාගම්වල, විදේශීය වරායවල සුවිශාල කාලයක් කටයුතු කරලා තමයි ලංකාවේ මේ කටයුතුවලට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ අය කවුරුවත් පොඩි බබ්බු නොවෙයි.

අද දිනය සහිතව ඔවුන් මට එවා තිබෙන ලිපියෙන් කියන දෙය මොකක්ද? දැනටත් වරාය කිව්වාම අපට මුහුදු වාගේම මතක් වෙන්නේ දූෂණය. මුහුදු තරම්ම විශාල දූෂණයක් මේ වරාය ආශ්‍රිත දේවල්වල තිබෙනවා. නැව් අධ්‍යක්ෂවරයාට තමන්ට ඕනෑ පරිදි මේ ආකාරයට licence දෙන්න හෝ නොදෙන්න කොන්දේසි පනවා ගැනීම ඇතුළත ඒකම තමයි මෙතැනත් සිදු වෙන්නේ කියලායි ඔවුන් කියන්නේ. ඔවුන් එවන ලද ලිපියේ මූලික කරුණු ප්‍රමාණයක් මම ගරු ඇමතිතුමාට කියවන්නම්. ඔබතුමාට එවූ ලිපියේත් කරුණු රාශියක් තිබෙනවා. ඔවුන්ගේ පළමුවැනි තර්කය තමයි, මේ සම්මත කරන ලද නියෝග, ලංකාවේ සම්මත කරන්න අවශ්‍ය නීතිමය තත්ත්වය නැහැ කියන එක. උදාහරණයක් වශයෙන් ඔවුන් මතු කරන දෙය තමයි, "Small Coastal Vessels Regulations in a code named SCV Code unpublished" කියලා. ඔවුන් කියන්නේ මේක තිබෙන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලාච්චුවේ, ඒක publish කරලා නැහැ කියලායි.

ඔබතුමා මේ සංවිධාන සමඟ සාකච්ඡා කරන්න. ඔවුන් කියන්නේ මේ regulations හදන්න එපා කියලා නොවෙයි. ඔවුන් කියන්නේ ලංකාවේ මේ කර්මාන්තය ඉදිරියට ගෙනයන්න පුළුවන් විධියට සහ දූෂණය අවම කරන්න පුළුවන් විධියට මේ regulations හදන්න කියලායි. මම මේ සංවිධානය පිළිබඳ වාර්තාවක් බැලුවා. ගරු කථානායකතුමනි, සිංගප්පුරු වරාය ගත්තොත්, අපි හිතාගෙන ඉන්නේ සිංගප්පුරු වරායට වැඩිපුරම එන්නේ බඩු කන්ටේනර් ගෙන යන නැව් කියලා නේ. මම බැලුව වාර්තා අනුව සිංගප්පුරු වරායට පසුගිය වසරේ vessels 130,000ක් පමණ ඇවිත් තිබෙනවා. එම vessels 130,000න් 45,000ක් මගී නෞකා - passenger vessels-. ලංකාවට අදාළව ගත්තොත්, මා දන්නා තරමින් කොළඹ වරායේ මගී පර්යන්තයක්වත් නැහැ. ඒවාට අදාළ පහසුකම් ඇති කරන්න, ඒවාට අදාළ දේශීය හෝ විදේශීය ව්‍යාපාරිකයන් දියුණු කරන්න, ඉදිරියට ගන්න කිසිම වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා අපට පෙනෙන්නේ නැහැ.

මම පුද්ගලයෙකු ගැන කියනවා නොවෙයි. මම දන්නේ නැහැ, අධ්‍යක්ෂතුමා කවුද කියලා. ඒක මට අදාළත් නැහැ. මේ සංවිධාන විසින් දිගටම ඉදිරිපත් කරන ලද දේ තමයි, තමන්ගේ ලාච්චුවේ තබා ගෙන ඉන්න පළ නොකරපු -ප්‍රසිද්ධ නොකරපු- SCV code එකක් පාවිච්චි කර ගෙන විශාල වශයෙන් මෙතැන අකටයුතුකම් සිද්ධ වනවාය කියන කාරණය. එම නිසා ඔබතුමාගෙන් ඔවුන් ඇත්තටම ඉල්ලා සිටින්නේ, මේ නියෝග සම්මත කරන්න කලින් එම සංවිධාන සමඟ සාකච්ඡා කරලා තීන්දුවකට එන්න කියලායි. අද දිනයේ මේ නියෝග සම්බන්ධයෙන් වාද විවාද කළාට ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමාට එම ලිපිය එව්වා. ඔවුන්ගේ comprehensive plan එකකුත් එහි තිබෙන බව මම දැක්කා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ තිබුණු නිසා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි මීට මාස තුනකට පමණ කලින් දැනගත්තා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මීට මාස තුනකට කලින් පවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ නිසා මා දන්නවා. අද දිනයේ මේ නියෝගය සාකච්ඡා කරන නිසා වුණු දෙයක් නොවෙයි. එම නිසා මම විශේෂයෙන් මගේ කථාවේදී මේ ලිපිය ගැන කරුණු කීපයක් කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් ඇහුම්කන් දෙනවා නම් හොඳයි. එම ලිපියේ ඔවුන් පැහැදිලිව මේ ගැන කියනවා.

I quote:

"...the current Minister of Ports and Shipping as it is totally against the law of this country due to the reasons given below specially it is apparent that the then Minister has been misled by the Director General of Merchant Shipping which does not contain the required 'Regulations' which are otherwise made into Small Coastal Vessels Regulations in a code named SCV Code unpublished and kept in the drawers of DGMS only to wield...".

ගරු ඇමතිතුමනි, ඔවුන් පැහැදිලිව මෙසේ කියනවා:

"1. These Regulations have been made by the Minister only on the advice of the Director General of Merchant Shipping, who has no authority to make Regulations.
2. The said Regulations are disputing the currently valid two Ordinances namely, Boats Ordinance of 65 and Master Attendants Ordinance of 1900, both of which are currently valid.
3. A Regulation gazetted by the Minister cannot supersede the Ordinances passed by Parliament, which are enactments.
4. The small boats below 24 metres operated in the country in Sri Lankan ports by such boat operators are not required to register them under Merchant Shipping Regulations.
5. It is not possible to enforce Merchant Shipping Regulations on boats licensed under Boats Ordinance or Master Attendants Ordinance."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට වඩා මේ සම්බන්ධයෙන් කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් මේවා බොහෝ දෙනෙකුට ලොකු අවබෝධයක් තිබෙන ව්‍යාපාර නොවන බව. ඒ වාගේම අතිවිශාල ආදායමක් ලංකාවට ගෙනැල්ලා දෙන්න පුළුවන් ක්ෂේත්‍රයක්. මම ගරු ඇමතිතුමාට මෙම ව්‍යාපාරිකයන්ගේ, මෙම සමාගම්වල අයගේ ඉල්ලීම ඉදිරිපත් කළා. ඔවුන් මට දැනුම් දුන්නා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා සමඟත් සාකච්ඡා කළ බව. නමුත් ඊයේ දිනයේ මම ඔවුන් සමඟ නැවත කථා කරන විට තමයි ඔවුන් දැන ගත්තේ අද දිනයේ මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙනවා කියන එක. ඒ නිසා මේ පිළිබඳව අදාළ ආයතනයත් සමඟ සාකච්ඡා කරන්න. අදාළ ව්‍යාපාරය කරන්නේ ඔබතුමා නොවෙයි; ශ්‍රී ලංකා ආණ්ඩුව නොවෙයි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

2017 මැයි මාසයේ මෙය ගැසට් කරලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කරන්න. පැහැදිලි කිරීමට වඩා මට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ -

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

හරි, මම ඒ ගැන සාකච්ඡා කරන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කරන්න, ඇමතිතුමනි. ඔබතුමා පිළිතුරු කථාව කරනවා නේ. මගේ ප්‍රධාන ඉල්ලීම තිබෙන්නේ, - [බාධා කිරීමක්] මට මගේ වෙලාව අවශ්‍යයි. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමාගේ කථාවේදී පැහැදිලි කරන්න. මේ ගොල්ලන් ඉදිරිපත් කරන දේ - [බාධා කිරීමක්] මා හිතන්නේ නැහැ, මේ අය මෝඩ අයයි කියලා; ඒ වාගේම ආණ්ඩුවෙන් මොනවා හෝ සහනාධාරයක් බලාපොරොත්තු වනවාය කියලා.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මෙය ගැසට් කරලා තිබෙන්නේ 2017 මැයි මාසයේ 04 වනදායි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මා ඒ ගැන කිව්වා. මගේ කථාවේදී මා කිව්වා, එය අර්ජුන රණතුංග ඇමතිතුමායි කළේ කියලා. - [බාධා කිරීමක්] Director-General සම්බන්ධව නොවෙයි. අදාළ ඇමතිවරයා සමඟ තමයි සාකච්ඡාව ඉල්ලන්නේ. අද දිනයේදී මෙම නියෝග සම්මත කළාට පස්සේ ඒ මිනිසුන්ට ඒක වැඩක් නැහැ කියලායි ඒ ගොල්ලෝ කියන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මෙය ගැසට් කරලා තිබෙන්නේ අවුරුද්දකට පෙරයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අර්ජුන රණතුංග ඇමතිවරයා මේ කරපු දේ සම්බන්ධ ගැටලු නිසා තමයි ඔවුන් මෙහෙම සංවිධානයක් විධියට මේ සම්බන්ධයෙන් විශාල වශයෙන් ලියා, දැනුවත් කිරීම් කරලා, conference පවත්වා විශාල වැඩ කොටසක් කරලා තිබෙන්නේ. ඔබතුමා මේ ධුරයට පත් කරලා දැන් මාස කිහිපයයි වෙන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
දැනටමත් ක්‍රියාත්මක වනවා. ඒ ගොල්ලන් හමු වෙන්න මා සූදානම්. ඒ සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. මා ඒ ගොල්ලන්ට කථා කරලා ඒ ගොල්ලන් ගෙන්වා ගන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා එයට ඇහුම් කන් දෙන්නය කියන ඉල්ලීම මා කරනවා. මොකද, ඔවුන් පැහැදිලිව චෝදනා කරලා තිබෙනවා. අදාළ පුද්ගලයා ගැන නොවෙයි මා කියන්නේ. මා දන්නේ නැහැ, ඒ නිලධාරියා කවුද කියලා. ලියා පදිංචි කිරීම්වලදී පැහැදිලිවම විශාල වශයෙන් වංචා, දූෂණ සිද්ධ වනවා. නමුත් ඔවුන්ගේ ප්‍රශ්නය ඒක නොවෙයි. ඔවුන්ට අවශ්‍ය වන්නේ, ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදි ලංකාවේ මේ නීති රීති සකස් කරන්නයි; ආයතන ව්‍යුහයක් සකස් කරන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනයේදී වෙළඳ නැව් පනත යටතේ නියෝග පිළිබඳ විවාදය සම්බන්ධ මගේ කථාව අතරේ මම හිතුවා, විශේෂයෙන්ම අද දිනයේදී රටේ වැඩි සාකච්ඡාවකට ලක් වෙලා තිබෙන ජාතිවාදී ගැටලුව සම්බන්ධවත් යම්කිසි අදහස් දැක්වීමක් කරන්න ඕනෑය කියලා. මොකද, මේ විධියට ගියොත් අපට නැව්වලින් තමයි කන්න වෙන්නේ.

රටක් වශයෙන් ගත්තොත්, සතියක විතර කාලයක් තිස්සේ අප අත් දකිමින් සිටින ජාතිවාදී තත්ත්වය අඩුවීමකින් තොරව දිගටම වර්ධනය වන තත්ත්වයක් ඇති වෙලා තිබෙන බවත් දැනෙනවා. අපි දන්නා තරමින් ඊයේත් බේරුවල ප්‍රදේශයේ කඩ දෙකකට පහර දීලා තිබෙනවා. ඒ වාගේම, අද දිනයේදී තවත් එවැනි දේවල් සිදුවීමට නියමිත බවට යම් යම් පුද්ගලයන් අප දැනුවත් කරනවා, "අහවලාට කියන්න, පොලීසියට කියන්න, අහවල් අය දැනුවත් කරන්න" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංචාරකයන් දැනටත් ලංකාවට එන්නේ නැහැ. මොකද, සම්පූර්ණයෙන්ම රටේ සමාජ මාධ්‍යය නතර කරලා තිබෙන කොට, ලංකාවේ මහාවිශාල ජාතිවාදී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා ලෝකයේ තිබෙන සියලු මාධ්‍යය වාර්තා කරන කොට සංචාරකයන් එන්නේ නැහැ. ලංකාවට එල්ටීටීඊ සංවිධානය අවුරුදු ගණනකදී කරපු හානිය මේ සතිය තුළ සිදුවූ ඒ ජාතිවාදී තත්ත්වයන් නිසාම ඇති වෙනවා. අද ඒ සම්බන්ධව යම්කිසි සංවේදී බවක් ඇති වී තිබෙන නිසා මම හිතුවා, ඒ ගැනත් යම් අදහසක් කියන්න ඕනෑ කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ ජනතාව පසුගිය අවුරුදු 15 ඇතුළත - 2000 සිට 2015 දක්වා අවුරුදු 15 ඇතුළත- රට එක තැනකට ගෙනැල්ලා, ඉස්සරහට ගෙන යන්න මේ රටේ පාලකයන්ට විශාල අවස්ථා තුනක් ලබා දුන්න බව. එක අවස්ථාවක් තමයි 2004 සුනාමිය. 2004 සුනාමියෙන් අපට විනාශයක් වුණාට සිංහල, දෙමළ, මුස්ලිම් භේදයෙන් තොරව මුළු රටම එකතු වුණු බව අපි දැක්කා. එහෙම එකතු වෙලා රටක් වශයෙන් ඉස්සරහට ගෙන යන්න කියලා රටේ නායකයන්ට අවස්ථාවක් හදලා දුන්නා. රට යම් කිසි විධියකින් එක මානසිකත්වයකට ආවා. නමුත් අපි දන්නවා, විශේෂයෙන්ම එවකට හිටපු ජනාධිපතිවරිය සහ ඒ ආණ්ඩුවේ හිටපු උද්ධව්ච පුද්ගලයන්, දේශපාලන නායකයන් ඒ අවස්ථාව සහමුලින්ම අතහැරලා ඒ සුනාමිය සම්පූර්ණයෙන්ම රට විනාශ කරන, රට බෙදෙන තත්ත්වයට පත් කළ බව. ඊට පස්සේ 2009දී යුද්ධය අවසන් වීමෙන් පසුව මේ රටේ සාතිශය බහුතරයක් ජනතාව - මා කියන්නේ නැහැ, රටේ සියලුම දෙමළ ජනතාවත් ඒ හැඟීමෙන්ම හිටියා කියලා.- මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට යම්කිසි අවස්ථාවක් දුන්නා, රට යම්කිසි තැනකට ගෙන යන්න; ඉස්සරහට ගෙන යන්න. හැබැයි, එතුමා බල ලෝභය නිසා ඒ අවස්ථාවත් විනාශ කර ගත්ත බව අපි දන්නවා. ඒ වාගේම 2015දී එතරම්ම ශක්තිමත් නැතත් අවුරුදු ගණනාවකට පස්සේ මේ රටේ දේශපාලනඥයන්ගේ හයියෙන් නොවෙයි, -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හයියෙන්වත්, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ හයියෙන්වත් නොවෙයි- මේ රටේ අතිශය බහුතරයක් ජනතාව එකතු වෙලා රාජපක්ෂ පාලනය පරද්දලා යම්කිසි ජන වරමක් ලබා දුන්නා, ජාතිවාදයෙන්, පවුල්වාදයෙන් තොරව රට ඉස්සරහට ගෙන යන්න කියලා. මේ පාලකයන් විසින් අද ඒ ජනවරමත් කාබාසිනියා කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විධියට රට එක තැනකට ගෙනැල්ලා, ඉස්සරහට ගෙන යන්න අපේ රටේ ජනතාව අවුරුදු 15ක් ඇතුළත, ඇත්තටම ගත්තොත් අවුරුදු 15ක් නොවෙයි, අවුරුදු 13ක් ඇතුළත ජාතික වශයෙන් අතිශය වැදගත් අවස්ථා තුනක් මේ නායකයන්ට ලබා දී තිබෙනවා. හැබැයි, මේ නායකයන් පෙන්වා තිබෙන දේ තමයි කොපමණ අවස්ථා ගෙනැත් දුන්නත් රට අහලක්වත් ඉස්සරහට ගෙන යන්න ඔවුන් අසමත් කියන එක; ඔවුන්ට බැහැ කියන එක. ඒ නිසා මේ ඇතිවෙලා තිබෙන ජාතිවාදී තත්ත්වය තුළ - ඔබතුමාත් දන්නවා, මේ ගැන ගොඩාක් අය කථා කරලාත් තිබෙනවා - විශේෂයෙන්ම සිංහල බෞද්ධ ජනතාව තුළ විශාල මානසික භයක් ඇති කර තිබෙනවා; ඇතිවෙලා තිබෙනවා. රට බෙදෙන්න යනවා; කොටි සංවිධානය නැඟිටලායි තිබෙන්නේ; සිංහල ජාතිය වඳ වෙනවා; බෞද්ධ සිද්ධස්ථාන ඔක්කොම විනාශ වෙනවා; රට ඉවරයි ආදී වශයෙන් විශාල බියකට සිංහල ජනතාව ඇත්තටම අද පත්වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් අපි සිංහල ජනතාව අතර ජාතිවාදීන් කියලා හඳුන්වන පිරිස පමණක් නොවෙයි, ක්‍රියාකාරීව ජාතිවාදයට යන අය නොවෙයි, සාමාන්‍ය සිංහල අයගෙන් ඇහුවොත් වැඩි පිරිසකගේ ඔළුව තුළ තිබෙන දේ තමයි රට ඉවරයි; රට බෙදෙන්න යනවා; දැන් රටේ සිංහල ජාතිය වඳ වීගෙන යනවාය කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක තමයි සිංහල ජනතාව තුළ ඇති වෙලා තිබෙන දැඩි මානසිකත්වය. ඒ මානසිකත්වයට අදාළ කරන සිද්ධිය අරගෙන බැලුවොත්; දැන් රට

බෙදෙන්න යනවාද, එල්ටීටීඊ සංවිධානය නැඟිටලාද, බෞද්ධ සිද්ධස්ථාන විශාල වශයෙන් ලංකාවේ විනාශ වෙනවාද, සිංහල ජාතිය වඳ වෙනවාද මේ කරුණු කාරණා සම්බන්ධ සිදුවීම් වශයෙන් ගත්තොත්, මේ සමහර ඒවාට කියන්න කිසිම දෙයක් නැහැ. සමහර කරුණුවලට සමහර උදාහරණ තිබෙනවා. මොකද, අපේ රටේ තවම සිංහල ජාතිවාදයත්, දෙමළ ජාතිවාදයත්, මුස්ලිම් ජාතිවාදයත් තිබෙන නිසා, සමහර දේවල්වලට උදාහරණ තිබෙනවා. නමුත් හුඟක් දේවල්වලට අදාළව ගත්තොත් නිශ්චිත සාධක නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොඳම උදාහරණය තමයි, පසුගිය දවස්වල අම්පාරේ සිදු වුණු සිදුවීම. "වඳ පෙති" කියලා තමයි ඒ ගැටුම පටන් ගත්තේ. සිංහල බෞද්ධ තරුණයෙක් මුස්ලිම් කඩේකට ගිහිල්ලා, හරක් මස් කන්න ඉල්ලලා, හරක් මස් නැති වුණාට පස්සේ කුස්සියේ තිබුණු කෑම එකේ වඳ පෙති තිබුණා කියලා තමයි මහා විශාල ජාතිවාදී ගින්නක් පටන් ගත්තේ. ඒ තරුණයාට වර්ණ අන්ධතාවය තිබෙන්න හේතුවක් නැහැ. රස පරීක්ෂකවරයා කියලා තිබෙනවා, ඒක වඳ පෙත්තක් නොවෙයි, පිටි ගුලියක් කියලා. නමුත් ඔහු ඒ පිටි ගුලිය ඇතුළේ වඳ පෙති දැක්කේ කොහොමද? මම හිතන්නේ නැහැ, ඔහු ඒක සැලසුම් සහගතව හිතාගෙන ගියා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙලා තිබෙන දේ මේකයි. මිනිසුන්ගේ ඔළුවේ විශාල බියක් ඇති කරලා තිබෙනවා; විශාල මානසිකත්වයක් ඇති කරලා තිබෙනවා, මෙහෙම දේවල් සිද්ධ වෙනවා කියලා. විශේෂයෙන් පසුගිය අවුරුදු 5 තිස්සේ ඒ තත්ත්වය ඇති වුණා. අපි ඔබතුමාට කියන්න ඕනෑ, මේ භීතිය ඉබේ ඇති වෙච්ච දෙයක් නොවෙයි කියන එක. මට වෙලාව තිබුණොත් මම හරියට ඒ ගැන කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ එකක්වත් සාමාන්‍ය මිනිසුන්ගේ අත් දැකීම් නොවෙයි. ඒ අයගෙන් අහන්න, තමන්ගේ අත් දැකීම මොකක්ද කියලා. සිංහල ජාතිය වඳ වෙනවා; සිංහල බෞද්ධ පන්සල් කැඩෙනවා; අරවා මේවා කියන අයගෙන් තමන්ට ඒ සම්බන්ධයෙන් සාක්ෂියක් තිබෙනවාද කියා අහන්න බලන්න. එහෙම සාක්ෂියක් නැහැ. අපි දන්නවා, අන්තවාදයක් තිබෙනවා කියලා. මේ ජාතිකත්ව තුනේම අන්තවාදයක් තිබෙනවා. ඉතාම සුළුවෙනුයි තිබෙන්නේ. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? සිංහල බෞද්ධ ජනතාවගේ මනසේ ඇති කරලා තිබෙනවා, මහා විශාල භානියක් වෙමින් තිබෙනවා කියලා. ඔවුන් ඒකට භයෙන් ඉන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔවුන් ඒකට භයෙන් ඉන්නවා. ඒ නිසා ඒ භය වෙච්ච මිනිස්සු ඕනෑම දේකට රවටවන්න, ඕනෑම දේකට අල්ලා ගන්න ලෙහෙසියි. ඔබතුමා එය දන්නවා. ඒ නිසා තමයි වඳ පෙත්ත ප්‍රශ්නයක් වුණේ. එතකොට කවුරුවත් ප්‍රශ්න කරන්නේ නැහැ නේ, සිංහල මිනිහා මොකටද හරක් මස් කන්න ගියේ කියලා.

මොකද, 'සිංහල බෞද්ධයෝ" කියා කතා කරන ගොඩක් අය හරක් මස් කෑමට විරුද්ධයි. නමුත්, හරක් මස් කන්න ගියේ ඇයි කියන එක ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දකින දෙයක් තිබෙනවා. මේ අවුරුදු 5ක විතර කාලය තිස්සේ අපේ රටේ ඇති වෙන්න ජාතිවාදී පෙට්ටල් වක්කරලා තිබෙනවා. මේ මහ පොළොව ජාතිවාදී අදහස්වලින්, ආගම්වාදී අදහස්වලින් ඇති වෙන්න පොහවා තිබෙනවා. සිංහල ජාතිවාදිනුත් එහෙමයි; මුස්ලිම් ජාතිවාදිනුත් එහෙමයි. යුද්ධය පැරදුණු නිසා දෙමළ ජාතිවාදින් අඩුයි. මේ පොළොව සම්පූර්ණයෙන් ජාතිවාදයෙන් පොහවලායි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැබැයි ඒ ජාතිවාදී තත්ත්වය තිබුණාට ඒක විශාල පරිමාණයේ ප්‍රහාරයන් බවට පත් වුණේ අඩුවෙන්. ඔබතුමා දන්නවා, 2009 වර්ෂය අවසාන වන විටත් මේ රටේ මුස්ලිම් ජනතාව සිටියා; මුස්ලිම් මිනිස්සු ඔය විධියටම පල්ලි හැදුවා; ඒ අයගේ ආගමික කටයුතු පල්ලිවල කළා; සිකුරාදාට ඒ වතාවත් කළා; business කළා. 2009 වර්ෂයේදී යුද්ධය අවසන් වන කල් මේ ආකාරයේ කිසිම ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. 2009 වර්ෂය වන කල්ම යුද්ධයත් එක්ක විශේෂයෙන්ම එල්ටීටීඊ සංවිධානයට එරෙහිවයි ප්‍රශ්නයක් තිබුණේ. සමහර රටවල දෙමළ ජනතාවටත් එරෙහිව ඒ ප්‍රශ්නය තිබුණා. හැබැයි 2009 වර්ෂයෙන් පසුව පාලකයන්ට වෙන මොකුත් මාතෘකාවක් නැති වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා බලන්න 2010 වර්ෂයේ ජනාධිපතිවරණයේ ඡන්ද ප්‍රතිඵලවලින් පසුව තමයි අපේ රටේ අප අසා තිබුණේ නැති ප්‍රශ්නයක් වූ හලාල් ප්‍රශ්නය මතු කරගෙන ජාතිවාදය නැවත වතාවක් ඇති වුණේ. මුස්ලිම් මිනිසුන් හලාල් විධියට කන එක මේ රටේ තිබුණු දෙයක්; ලෝකයේත් තිබෙන දෙයක්. හැබැයි එය ප්‍රශ්නයක් කළා. මොකක්ද මේ කරන්නේ? සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන් අතර වෙනස්කම් තිබෙනවා. අපි පිළිගන්නවා, අප අතර වෙනස්කම් තිබෙනවා කියා. සංස්කෘතික වශයෙන් බොහොම සීමිත වෙනස්කම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ වෙනස්කම්, වෙනස්කම් ලෙස ගන්නේ නැතිව ඒවා ප්‍රශ්න බවට පත් කරනු ලබනවා, දේශපාලනය විසින්. 2010 වර්ෂය වන කල් හලාල් ප්‍රශ්නයක් වෙලා තිබුණේ නැහැ. එහෙම නම්, 2010 වර්ෂයේ ජනාධිපතිවරණය අවසන් වුණාට පසුව -ඒ ඔක්කෝම වුණාට පසුව- හලාල් ප්‍රශ්නයක් වෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලිව කාරණයක් කියනවා. මා කියන්න යන්නේ නැහැ, මහින්ද රාජපක්ෂ මහත්මයා සෘජුව ගිහින් අහවල් තැන අහවල් ජාතිවාදයට ඇද්දා; අහවල් ජාතිවාදයට උදවු කළා කියා. නමුත් අපට ඉතා පැහැදිලිව පෙනෙනවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියන එක. 2010 වර්ෂයෙන් පසුව හලාල් ප්‍රශ්නය ඇති වුණේ නිකම් නොවෙයි. අප දන්නා තරමින් දේශපාලන නායකත්වය හමුදාවට නිගා දෙන සමහර කණ්ඩායම් යොදාගෙන බෞද්ධ අන්තවාදී සංවිධාන හැදුවා. ඒක තමයි ඇත්ත. එහෙම තමයි අද ඔය අන්තවාදී බෞද්ධ සංවිධාන ඇති වුණේ. ඒවා නිකම් ඇති වුණා නොවෙයි. ඊට පසුව තමයි -2011 ඉඳන් තමයි- මුස්ලිම් විරෝධය සම්පූර්ණයෙන්ම හැදුවේ. ඒකට උදව් වන මුස්ලිම් අන්තවාදී භාවිතාවකුත් තිබෙනවා. හැබැයි ඒ මුස්ලිම් අන්තවාදය තවම අපේ රටේ වැඩිම භානිය කරන්නේ මුස්ලිම් ජනතාවටයි. මම වගකීමෙන් කියනවා, මුස්ලිම් අන්තවාදයෙන් වැඩිම භානියට ලක් වෙලා තිබෙන්නේ මුස්ලිම් ජනතාව බව. අපේ රටේදී වැඩිම භානියට ලක් වෙලා තිබෙන්නේ මුස්ලිම් ජනතාව. අඩු වයසෙන් දරුවන් විවාහ වෙන එකට විරුද්ධව කථා කරන එක මුස්ලිම් නායකයෙක් අපට පෙනෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලංකාවට ඉස්ලාම් ආගම වෙනුවට අරාබි සංස්කෘතිය කර තියාගෙන පටවා ගෙන ආවේ, ලංකාවේ ගැහැණු ළමයින්ට, පිරිමි ළමයින්ට -කාටත්- ඉගෙන ගන්න සමාන අයිතිවාසිකම් තිබෙද්දී, ලංකාවේ කාන්තාවන්ට- දකුණු ආසියාවේ කාන්තාවන්ට- යම්කිසි අයිතිවාසිකම් තිබෙද්දී ඒවා උල්ලංඝනය කරලායි. සමහර මුස්ලිම් පාසල් දැරියෝ මුහුණ වහගෙන මේ පාර්ලිමේන්තුව බලන්න එනවා අපි දැක තිබෙනවා. අපට ඒ ගැන දුක හිතෙනවා. මම මේ පාර්ලිමේන්තුවේ ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරුන්ගෙන් අහලා තිබෙනවා, "අඩු ගණනේ ඔබතුමන්ලා මේකට විරුද්ධ වෙන්නේ නැත්තේ ඇයි, මේකට විරුද්ධව කථා කරන්නේ නැත්තේ ඇයි?" කියලා. ඒ නිසා, මුස්ලිම් අන්තවාදය විසින් තවම ලංකාවේ වැඩිම භානිය කර තිබෙන්නේ මුස්ලිම් සමාජයට. මුස්ලිම් ජනතාව හෝ මුස්ලිම් අන්තවාදය ගිහින් සිංහල බෞද්ධ අයට හෝ දෙමළ හින්දු අයට හෝ කළ කරදරය මොකක්ද කියලා අපි සාධක ඇතිව ඇහුවොත් කියන්න තිබෙන කරුණු ඉතාම අඩුයි. මම ඒකයි කිව්වේ. අද මේ මුස්ලිම් ජනතාවට එරෙහිව ගොඩනඟා තිබෙන ජාතිවාදය සිංහල මනුස්සයා තුළ ඇති කරපු දෙයක් මිසක්, සිංහල ජනතාව තුළ ස්වාභාවිකව, ඇත්ත තත්ත්වයක් විසින් ඇති වෙච්ච දෙයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, මේ සිද්ධියට කලින් නැහෙනහිර පළාතේ, මඩකළපුව ප්‍රදේශයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් සංරක්ෂණය කරන්න තීන්දු කර

[ගරු බිමල් රත්නායක මහතා]

තිබූ පන්සලක් ඩෝසර් කළා. පන්සලක් ඩෝසර් කරනවාය කියන්නේ පුරාවිද්‍යාත්මක හා ආගමික පැත්තෙන් ගත්තොත් මහා බරපතළ දෙයක්. හැබැයි, එහිදී අපි දැක්කාද මෙහෙම නැඟිටීමක්? එදා මෙහෙම නැඟිටීමක් අපි දැක්කේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ සිද්ධිය වුණේ මාස දෙක තුනකට කලින්. ඊට පස්සේ ඒ ඩෝසර් කරපු අය අත් අඩංගුවට ගත්තා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් නැවත පරණ ආකාරයටම එතැනම පන්සලක් - දාගැබක්- හදන්න තීන්දු කළා. එදා මෙහෙම මොකුත් කලබලයක් ආවේ නැහැ. හැබැයි ඔබතුමා බලන්න, මේ දිගන සිද්ධිය දිහා. නැත්නම් ඊට කලින් අම්පාරේ සිද්ධිය දිහා. ඒ තැන්වලදී මොකක්ද වෙලා තිබෙන්නේ? රාජපක්ෂ මහත්මයාට ජනවරමක් ලැබුණා, මේ පළාත් පාලන ඡන්දයේදී. ඒ ජනවරම ඇතුළේ -ඒ රාජපක්ෂවාදීන් අතර- රාජපක්ෂ මහත්මයා විසින් දැනුවත්ව නඩත්තු කරන, අන්ත ජාතිවාදී, අන්ත ආගම්වාදී, අන්ත යුද්වාදී පිරිසක් ඉන්නවා. ඒක පැහැදිලි සත්‍යයක්. ඒකෙන් තමයි මේ ජාතිවාදයට භෞතික බලය - physical power- ආවේ. 2010 මැතිවරණය ඉවර වෙලා තමයි "හලාල්" සිද්ධිය පටන් ගත්තේ. මේ රටේ හැම දාම හලාල් තිබුණා. ඒක ප්‍රශ්නයක් වුණේ මැතිවරණයෙන් පස්සේ. මේ මැතිවරණයෙන් පස්සේ මේ සිද්ධි ඇති වුණා. මම ඒකයි කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අහන්නේ මේකයි. මඩකළපුවේ පන්සල ඩෝසර් කරපු වෙලාවේ ඒ ගැන කිසිම හා - හූවක් කරපු නැති මේ මහා සිංහල බෞද්ධ යැයි කියා ගන්නා උදවිය ඇයි මේ වද පෙත්තකට මරාගෙන මැරෙන්නේ? මේ සිද්ධිය ඇති වුණේ පෙබරවාරි 10 වෙනි දාට පස්සේ. පන්සල ඩෝසර් වුණේ ජනවාරි මාසයේ. මම තව උදාහරණයක් ගන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඔබතුමා දන්නවා, මේ විශාලම සිද්ධිය ඇති වුණේ දිගන ප්‍රදේශයේ බව. දිගන ප්‍රදේශයේ, අම්බාල කියන ගමේ තරුණයෙකුගේ මරණයත් එක්කයි මේ සිද්ධිය ඇති වුණේ. මම ඒ ගැන ටිකක් වැඩිපුර සොයා බැලුවා. ඒ ප්‍රදේශයේ ඉන්න අයගෙන් අහලා සොයා බැලුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි ඇත්ත මොකක්ද? මේ සිදුවීම වුණේ පෙබරවාරි 22 වන දා. ඒ තරුණයා මැරුණේ මාර්තු 2 වන දා, සිද්ධියෙන් දවස් අටකට පස්සේ. මේ දවස් අට ඇතුළතදී අම්බාල කියන සිංහල ගමේ මිනිස්සු කලබලයක් කළාද? නැහැ. මුස්ලිම් තරුණයන් පිරිසක් ගහලා තමයි මේ තරුණයා මැරුණේ. ඒ ගමේ අයට ඒ තරහ තියෙන්න ඇති. නමුත් ඒ අම්බාල කියන සිංහල ගමේ අයගෙන් මුස්ලිම් ජනතාවට විරුද්ධව එකම එක ක්‍රියා මාර්ගයක්වත්, එකම එක උද්ඝෝෂණයක්වත්, එකම එක ප්‍රහාරයක්වත් සිද්ධ වෙලා තිබුණේ නැහැ. පෙබරවාරි 22වන දා තමයි ඒ සිංහල තරුණයාට පහර දුන්නේ. හැබැයි මාර්තු 2වන දා, මළ සිරුර වළ දාන දවස වෙනතුරු කිසිවක් සිද්ධ වුණේ නැහැ. අදත් ඒ ගමේ මොකුත් සිද්ධ වෙලා නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් රටේ මිනිස්සු හිතනවා, මේ තරුණයාගේ ගම දිගන කියලා. නැහැ. ඒ තරුණයාගේ ගම අම්බාල. එතැන සිට දිගනට කිලෝමීටර් 20ක් තිබෙනවා. Google ගිහින් බලන්න. දිගන කියන ගිනිගත් නගරයත් අම්බාල කියන ගමත් අතර කිලෝමීටර් 20ක් තිබෙනවා. අද වනතුරුත් අම්බාල කියන ගමේ එකම සිංහල තරුණයෙක්වත් මේ ජාතිවාදී කෝලාහලවලට අත් අඩංගුවට අරගෙන නැහැ. ඔවුන් ජාතිවාදී කෝලාහලවලට ගිහින් නැහැ. මම කියන්නේ නැහැ, ඔවුන් තුළ ජාතිවාදී හැඟීම් නැතිව ඇති කියලා. ඔවුන් තුළ ජාතිවාදී හැඟීම් ඇති. ඔවුන් තුළ වෛරයක් ඇති, ඔවුන්ගේ යාළුවා මරපු එකට. හැබැයි අම්බාල ගමේ එක තරුණයෙක්වත්, මේ මැරුණු තරුණයාගේ එක ඥාතියෙක්වත් ජාතිවාදී ක්‍රියාවලට සම්බන්ධ වෙලා අත් අඩංගුවට පත් වෙලා නැහැ. ඊට කිලෝමීටර් 20ක් ඇතින් තමයි මේ ඔක්කෝම කතන්දර ටික වෙන්න පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩි තුන හතරක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපි කියන්නේ මේකයි. තමන්ගේ කෙනෙකු නැති වුණාම ඒ වේගය, ඒ තරහා එන්න ඕනෑ කාටද? තමන්ටයි. ඒක එන්න ඕනෑ තමන්ගේ මිනිස්සුන්ටයි; තමන්ගේ ඥාතීන්ටයි. හැබැයි, අම්බාල කියන ගමේ කොහේවත් එවැනි තත්ත්වයක් නැතිව තිබියදී, ඒ හැඟීම එනවා පිටින්. මම දැක්කා මේ සිද්ධිය ඇතැම් පුවත් පත්වල වාර්තා කළ විධිය. මේ ජාතිවාදය සැලසුම් සහගතව සිංහල මනුස්සයාගේ ඔළුවට බලෙන් බස්සන දෙයක්; දෙමළ මනුස්සයාගේ ඔළුවට බස්සන දෙයක්; මුස්ලිම් මනුස්සයාගේ ඔළුවට බස්සන දෙයක් කියලා මම කිව්වේ ඒකයි. අම්බාල ගමේ කිසිදු මනුස්සයෙක් ජාතිවාදී ගැටුමකට යන්නේ නැතිව තිබියදී, දිගන ප්‍රදේශයේදී විතරක් ඒ තත්ත්වය ඇති වෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පොලිස් දෙපාර්තමේන්තුවට කථා කරලා මේ තත්ත්වය මොකක්ද කියලා විස්තර දැන ගත්තා. මම දැක්කා, ඊයේ "දිවයින" පත්තරේ කතුවැකිය. මම දැන් ඒක ඉදිරිපත් කරන්නම්. ඒකේ කියලා තිබෙන්නේ මොකක්ද? සිංහල තරුණයාට 22වැනි දා පහර දුන්නාට පස්සේ "දිවයින" පත්තරේ කතුවැකියේ කියා තිබෙන්නේ මොකක්ද?

"...සිංහල තරුණයා මළ විට සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට මුස්ලිම් තරුණයන් සිව්දෙනා අත් අඩංගුවට ගෙන රිමාන්ඩ් කළ යුතු වූ නමුදු එබන්දක් සිදු වූයේ නැත. සිංහල තරුණයාගේ අවමඟුල් දිනයේදී චිතක දෙකකට ගිනි තබන ලදී. පළමු වැනි චිතකය තරුණයාගේ සිරුර දවන චිතකය ය. දෙවැනි චිතකය වූ කලී ජාතිවාදී චිතකය ය..." කියලා.

මේ මහා ගින්නක් තිබෙන වෙලාවක "දිවයින" පත්තරේ කතුවැකිය කියනවා, මේ තරුණයාට පහර දුන්නු අය අත් අඩංගුවට ගත්තේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සිද්ධිය ගැන දැනගත් දවසේ ඉඳන් මේ සම්බන්ධයෙන් කරුණු හොයපු නිසා, පොලිස්පති නිල කාර්යාලයෙන් ලැබුණු වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා. මම මේ ලංකාවේ පොලීසිය වෙනුවෙන් කථා කරනවා නොවෙයි. පොලීසියත් එක්ක අපට බේරා ගන්න ගොඩක් ගනු දෙනු තිබෙනවා.

මේ පහර දීම සිද්ධ වුණේ 22වැනි දා. එදිනම රාත්‍රියේ එක් කෙනකු අත් අඩංගුවට අරගෙන රිමාන්ඩ්ගත කර තිබෙනවා. අනෙක් සැකකරුවන් දෙදෙනා 24වැනි දා අත් අඩංගුවට ගෙන රිමාන්ඩ්ගත කර තිබෙනවා. මේ වාර්තාව අනුව, මගේ දැනීමේ හැටියට ඔවුන් මාර්තු මාසයේ 21වැනි දා වනතුරු රිමාන්ඩ් කර තිබෙනවා. අතරමැදදී ඔවුන්ට ඇප දීලා නැහැ. දැන් එතකොට මේ පත්තරවලින් මොකක්ද මේ කියන්නේ? මෙවැනි ප්‍රවෘත්ති නිසා ජනතාවට මතයක් එනවා, "ඒ තරුණයාට ගහලා මැරුවාට අඩු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගණනේ අත් අඩංගුවට ගත්තේවත් නැහැ. ඒ නිසා තමයි සිංහල අය ගිහිල්ලා මෙහෙම කළේ" කියලා. ඒ නිසා මේ ප්‍රවෘත්තිය ඉතාම වැරදියි. මේවායේ වන්දිය ගෙව්වේ කොහොමද? මම හිතන විධියට අද පූජාපිටිය ප්‍රදේශයේ තව සිංහල තරුණයකු මැරිලා තිබෙනවා. ඒ වාගේම කෝටි ගණනින් දේපොළ හානි වෙලා තිබෙනවා. අපි රටක් වශයෙනුත් විශාල ගැටලුවකට මුහුණ පාලා තිබෙනවා. මම මේ පත්තරේ නිසාම මේ ප්‍රවෘත්තිය උදාහරණයට ගත්තා නොවෙයි. පොදුවේ ජාතිවාදය කියන එක ඇත්ත සහ බොරු කරුණු මත ඇවිස්සෙන බව පෙන්වන්නයි මේ ප්‍රවෘත්තිය උදාහරණයට ගත්තේ.

අවසාන වශයෙන් මම කියන්නේ එක දෙයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාවට ඇත්ත කියන්න. කොටි සංවිධානය තමිල්නාඩුවේදී ගිය පෙළපාළි යාපනයේදී කරපු ඒවා කියලා "UPFA - A Brighter Future" කියන facebook page එකෙන් පෙන්වද්දී, නැහැ, ඒවා තමිල්නාඩුවේදී කළේ කියලා අපි මේ පාර්ලිමේන්තුවේදී ඔප්පු කර පෙන්නුවා. මොකද, තමිල්නාඩුවේ බයිසිකල්වලට තමයි "TN" ලෙස ආරම්භ වන registration numbers තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි මේ රටේ සිටින නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරුන්ට, රටේ ජනාධිපතිවරයාට, අගමැතිවරයාට කිසිම හැඟීමක්, වගකීමක් නැහැ ජාතිවාදය අවුළුවන්න යොදාගත් කරුණු බොරු ඒවා කියලා පෙන්වන්න. නීතිය හා සාමය සම්බන්ධයෙන් හිටපු සාගල රත්නායක ඇමතිවරයාට අපි ඒ දවස්වල ඇතිවෙන්න කිව්වා, "බොරුවට ජාතිවාදය හදනවා, මෙහි ඇත්ත මොකක්ද, බොරුව මොකක්ද කියලා ඔබතුමන්ලා කරුණාකරලා කියන්න" කියලා. ඒත් ඒ එක කාරණයක් සම්බන්ධයෙන්වත් එහෙම කටයුතු කළේ නැහැ. දැනුත් එහෙම තමයි වෙන්නේ.

මේ ජාතිවාදී මත හදන්නේ බොරුව මත; ඇත්ත මත නොවෙයි. ඒ නිසා අපි අවසාන වශයෙන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ඒ බොරුව මොකක්ද කියන එක සිංහල, දෙමළ, මුස්ලිම් භේදයෙන් තොරව ජනතාවට කියන්න. අපි මුස්ලිම් නායකයන්ගෙනුත් ඒ ඉල්ලීම කරනවා. අඩු ගණනේ සිංහල සහ දෙමළ ජනතාව අතර ජාතිවාදයට විරුද්ධව කථා කරන ප්‍රමාණවත් පිරිසක් සිටීම පිළිබඳව අපි සතුටු වෙනවා. සිංහල ජාතිවාදයට විරුද්ධව කථා කරන සිංහල මිනිස්සු ඉන්නවා. දෙමළ ජාතිවාදයට විරුද්ධව කථා කරන දෙමළ මිනිස්සු ඉන්නවා. අපි මුස්ලිම් නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා, මුස්ලිම් ජාතිවාදයට විරුද්ධව කථා කරන්න පටන් ගන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නැතුව මේ ප්‍රශ්නය විසඳන්න බැහැ කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.26]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද Merchant Shipping Act එක යටතේ නියෝග ගැන කථා කරන්න තිබුණත්, පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ මිත්‍ර ගරු බිමල් රත්නායක මැතිතුමා ඉදිරිපත් කළ කාරණාවලට යම් පිළිතුරක් දෙන්න ඕනෑ.

එතුමාගේ මතය එතුමා ඉතාම ස්වාධීනව ඉදිරිපත් කළා. අපි ඒකට ගරු කරනවා. එතුමා කිව්වා, "සාමාන්‍ය සිංහල ජනතාව තුළ බියක් ඇති කරලා තිබෙනවා, ජාතිවාදී පෙට්ටල් හලලා තිබෙනවා, ඒ පෙට්ටල්වලින් තෙත් වෙලා තිබෙනවා" කියලා. එතකොට ඕනෑම වෙලාවක කවුරුන් හෝ කෙනෙක් ගිනිකූරක් ගැහුවොත් ඒ පෙට්ටල් පත්තු වෙලා මහා ලොකු ගින්නක් ඇතිවෙලා විනාශයක් වෙනවා කියලා එතුමා කිව්වා. කවුද ඒ විධියට පෙට්ටල් වත් කරන්නේ? කවුද ඒකට ගිනිකූරු දාන්නේ? එතුමා හොඳ කථාවක් කිව්වා. සමාවෙන්න, මාත් එතුමා කියපු දේ කියනවා. තමිල්නාඩුවල සිදු වුණු උද්ඝෝෂණයක් ලංකාවේ උතුරු ප්‍රදේශයේ සිදු වුණා කියලා ඔබතුමන්ලාගේ පක්ෂයේ "UPFA - A Brighter Future" කියන official facebook page එක හරහා තමයි ප්‍රසිද්ධ කළේ. එහෙම කරන අවස්ථාවලදී ඔබතුමන්ලා කල්පනා කරන්නේ නැද්ද, කවදා හරි, කවුරු හරි ගිනිකූරක් ගහන තෙක් ඔබතුමන්ලා විසින් ජාතිවාදය නමැති පෙට්ටල් හලනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමන්ලා දන්නවා ද අද මේ රටේ internet හරහා, - ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගරු සභාවේ ඉන්න. ඔබතුමාට මම මේ කථාව කියන්න ඕනෑ. ඔබතුමා මේ කථාව අහන්න. [බාධා කිරීම්] ඔබතුමාත් Royal College එකේ "ටයි" එක තමයි වෙනදාට දමා ගෙන එන්නේ. ඔබතුමා මේ සභාවෙන් යන්න එපා. ඔබතුමන්ලා කරන මේ ජාතිවාදී වැඩ කටයුතු ගැන කථා කරනකොට ඔබතුමා පිටුපස හැරිලා යනවා. [බාධා කිරීම්] ගරු සී.බී. රත්නායක මැතිතුමනි, මම කිව්වේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා,- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

Hon. Dinesh Gunawardena, what is your point of Order?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු රාජ්‍ය ඇමතිතුමා අපව පෞද්ගලිකව විවේචනය කිරීම ගැන මම කනගාටු වෙනවා. එතුමා උගත් කෙනෙක්. UPFA එකේ ලේකම් මහින්ද අමරවීර ඇමතිතුමා. සභාපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)

(The Hon. (Dr.) Harsha De Silva)

එතකොට ඔබතුමන්ලා UPFA එකේ නොවෙයිද? එහෙම නම්, ඔබතුමන්ලාගේ පක්ෂය මොකක්ද? ඔබතුමා UPFA එකේ නොවෙයි නම්, ඔබතුමාගේ පක්ෂය මොකක්ද? පොහොට්ටුව පක්ෂයක්ද? SLPPද? What is your Party? ඔබතුමාගේ පක්ෂය මොකක්ද? UPFA තමයි ඔබතුමාගේ පක්ෂය. ඔබතුමාට වෙන පක්ෂයක් නැහැ. අන්න, එතුමා සභාවෙන් යනවා. He is going away. He cannot face the music. He is leaving. එතුමා සභාවෙන් යනවා. කථාව මේකයි. You must understand what is going on in the social media today. "Trolls"ලා ඉන්නවා, "Bots"ලා ඉන්නවා. සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඒ ගැන ඔබතුමා දන්නෙත් නැහැ; මම දන්නෙත් නැහැ. මමත් ඒ ගැන ළඟදී ඉඳලා තමයි ඉගෙන ගන්නේ. මොකක්ද වෙන්නේ? ඔබතුමා ගැන මම වැරැද්දක් කියනවා නොවෙයි. මම ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියපු උදාහරණය ගත්තා විතරයි. එච්චරයි මම කළේ. මම දැකපු දෙයක් නොවෙයි. එතුමා කියපු නිසයි මම කිව්වේ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

එතුමා කිව්වා කියලයි මම කිව්වේ. ඒ නිසා අද හරි වේගයෙන් අපට බොරු ප්‍රචාරය කරන්න පුළුවන්. ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, Facebook හරහා, Twitter හරහා, WhatsApp හරහා ඕනෑම කෙනෙක්ට ඕනෑම දෙයක් කියන්න පුළුවන්. එතකොට අපි කොහොමද මේවායේ ඇත්ත, බොරුව හොයන්නේ? අවසාන වශයෙන් අපට මොකක්ද වුණේ? අපට සිද්ධ වුණා, මේ Facebook , WhatsApp කෙටි කාලයකට අවහිර කරන්න. එහෙම තහනම් කළාට පස්සේ මොකක්ද වුණේ? බොරු ප්‍රචාරය වෙන එක නැවතුණා. බොරු ප්‍රචාරය වීම නැවතීමත් සමහම අපි දැක්කා, සිද්ධ වෙන්න ගිය ජාතිවාදී කෝලාහල එක පාරටම නැති වෙලා ගිහින්, අද වන විට තත්ත්වය සමථයකට පත් වෙලා තිබෙන ආකාරය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කියන්න ඕනෑ වෙලා තිබෙන්නේ අම්පාරේ, තෙල්දෙනියේ, දිගන වෙච්ච සිද්ධි සම්බන්ධයෙන් අපි ජනාධිපති කොමිසමක් පත් කරමු කියන එකයි.

ගරු සී.බී. රත්නායක මහතා
(මාණ්පුමිකු ச.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
අපි ඒකට එකඟයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා ඒකට එකඟ වෙනවා. මේ පාර්ලිමේන්තුවේදී මම යෝජනා කරනවා, අම්පාර, දිගන, තෙල්දෙනිය ප්‍රදේශවල සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා.

ගරු සී.බී. රත්නායක මහතා
(මාණ්පුමිකු ச.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඕනෑම කොමිසමක් පත් කරන්න. මේ රටේ පුරවැසියෙක් හැටියට මේ කාරණයේ දී මම ඒකට එකඟයි. අපි රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන තමයි බලන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒකට එකඟයි කිව්වා.

අපිට ඇත්ත දැනගන්න ඕනෑ. තෙල්දෙනිය, දිගන ප්‍රදේශවල සිදු වූ ජාතිවාදී කෝලාහලවලට මුල් වුණේ සිංහල තරුණයකු ඝාතනය කිරීමේ සිද්ධිය කියන එක අපි සියලු දෙනාම දන්නවා. එම තරුණයාගේ ඝාතකයින්ට දැඩි දඬුවම් ලබා දෙන්න ඕනෑය කියා අපි කියනවා. අපේ පොලීසිය මේ කට්ටියව අත් අඩංගුවට ගත්තේ නැහැ කියා රටේ මතයක් ගෙන ගියා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා, එම ඝාතනයට සම්බන්ධ සැකකරුවන් ඊට පසු දිනම අත් අඩංගුවට ගෙන රිමාන්ඩ බන්ධනාගාරගත කළ බව. ඒ කෙසේ වෙතත්, ඔවුන්ට දැඩි දඬුවම් ලබාදෙන්න නීතිය ඉදිරියට ගෙනෙන්න වෙනවා. ඒ විතරක් නොවෙයි, මේ ඝාතකයින් යම්කිසි අන්තවාදී අදහස් දරන පිරිසක්ද කියා සොයා බලන්න ඕනෑ. එහෙම නැත්නම් මේක හදිසියේ සිදුවුණු වැඩක්ද, -

ගරු සී.බී. රත්නායක මහතා
(මාණ්පුමිකු ச.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
නීතියේම තිබෙනවා, දැඩි දඬුවම් දෙන්න පුළුවන් කියලා. ඒවා ක්‍රියාත්මක කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. අපි සතුටු වෙනවා, මේ ක්‍රියාදාමයේ මූලිකයා වන අමිත් නැමැති පුද්ගලයාව ඊයේ වනකොට අත් අඩංගුවට ගත්තා කියලා අද පුවත් පත්වල පළ වෙලා තිබෙනවා. ඔහුව අත් අඩංගුවට ගෙන කොළඹට ගෙනාවා කියලා සඳහන් වෙනවා.

ගරු සී.බී. රත්නායක මහතා
(මාණ්පුමිකු ச.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
අපි දෙපැත්තම ගැන සොයා බලන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. ඒක සම්පූර්ණයෙන්ම හරි. ඒ විතරක් නොවෙයි, මේ සිද්ධිය මුල් කරගෙන මේ ප්‍රදේශවල ඇති වුණු ජාතිවාදී කෝලාහල පිටුපස සිටින අන්තවාදී කණ්ඩායම් කවුද කියා සොයන්න ඕනෑ. මේක සිංහල ජාතිවාදය පමණක් නොවෙයි. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, යුද්ධයෙන් පසුව අද වන විට දෙමළ ජාතිවාදය බොහෝ දුරට සමනය වෙලා තිබෙනවා. නමුත් මුස්ලිම් ජාතිවාදය මේ රටේ තිබෙනවා. මේ මුස්ලිම් ජාතිවාදය ගැනත් අපි සොයා බලන්න ඕනෑ. මොකද, එක පැත්තකට විතරක් මේ බෝලය පාස් කරලා හරියන්නේ නැහැ. ඒ නිසා තමයි මම කියන්නේ, ස්වාධීනව මේ ගැන සොයා බලන්න ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා.

මේ දවස්වල ජනාධිපති කොමිසම් හරහා බොහෝ දේවල් සිද්ධ වන බව අපි දන්නවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සිද්ධ වුණු කටයුතු ගැන සොයා බලන්න තවත් ජනාධිපති කොමිසමක් පත් කරන්න යනවා කියලාත් මට ආරංචියි. නමුත් මේ කථාව ඊටත් වඩා වැදගත්. කවුද පෙට්‍රල් වක් කරන්නේ, කවුද ගිනිකූරු ගහන්නේ, කවුද මේවාට උල්පන්දම් දෙන්නේ කියා අපි සොයන්න ඕනෑ. මොකද අපේ රටේ ජාතිවාදී අය ඉන්නේ බොහොම සුළු පිරිසයි; අන්තවාදී අය ඉන්නේ බොහොම සුළු පිරිසයි. බහුතරයක් ජනතාව එහෙම නැහැ. මම අද ඉතාම ගෞරවයෙන් රාජකීය විද්‍යාලයේ "ටයි" එක දමාගෙන එනවා. අපේ ඉස්කෝලේ සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, ක්‍රිස්තියානි, කතෝලික, ඉස්ලාම් සියලු දරුවෝ එකට ඉගෙන ගත්තා. සිංහල, දෙමළ, මුස්ලිම් දරුවෝ එක පන්තියේ හිටියා. අවුරුදු 30ක් තිස්සේ අපි විඳපු දුක නැවත මේ රටට ගෙනෙනවාට අපි කිසිදු විධියකින් කැමැති නැහැ. මම නැවතත් කියන්නේ, සිංහල වුණත්, දෙමළ වුණත්, මුස්ලිම් වුණත් අන්තවාදී, ජාතිවාදී කණ්ඩායම්වලට අපි කිසිසේත්ම ඉඩ නොදිය යුතු බවයි.

නැවතත් මම කියන්නේ, එක කණ්ඩායමක් පිළිබඳව පමණක් නොවෙයි සියලු කණ්ඩායම් ගැන අපි හොයලා බලන්න ඕනෑ කියලායි. මෙවැනි ජාතිවාදී ගැටුම් පසුගිය කාලයේ වරින් වර අපේ රටේ ඇති වුණු බව අපි දන්නවා. මෙය සාමකාමීව ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට තර්ජනයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ප්‍රජාතන්ත්‍රවාදයට මේක තර්ජනයක්. ඒ නිසා තමයි මම නැවතත් කියන්නේ ආසන්නම සිදුවීම් තුන - අම්පාර, තෙල්දෙනිය, දිගන ප්‍රදේශවල සිදු වූ ජාතිවාදී කෝලාහල- මූලික කරගෙන පරීක්ෂණයක් පවත්වන්න ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා. මේ සිද්ධිවලට අනුබල දෙන සිංහල, මුස්ලිම් ජාතිවාදී, අන්තවාදී කණ්ඩායම් ලංකාවේ ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා මේ කොමිසම මඟින් හොයා බලන්න ඕනෑ. සමාජ ජාල මඟින් මෙවැනි අන්තවාදී අදහස් තරුණයන් තුළ වපුරන සිංහල, මුස්ලිම්, දෙමළ කණ්ඩායම් ගැන පුළුල් පරීක්ෂණයක් කරන්න ඕනෑ. එම පරීක්ෂණයෙන් සොයා ගන්නා කරුණු අනුව මේ කණ්ඩායම්වලට එරෙහිව තදින්ම නීතිය

ක්‍රියාත්මක කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, අපි මේ ප්‍රශ්නය මෙතැනින් අවසන් කරන්න ඕනෑ. මේ තත්ත්වය මේ විධියට ඉදිරියට ගිහිල්ලා, ඔවුන්ව දමනය කර ගන්න බැරි වුණොත් එහෙම මේ රටේ මහා ව්‍යසනයක් -මහා විනාශයක්- සිදු වෙනවා. ඒක එල්ටීටීඊ් එකත් එක්ක යුද කළා වාගේ නොවෙයි, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා. මේ යුද්ධය පටන් ගත්තොත් එහෙම සම්පූර්ණයෙන්ම මේ රටේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් සියලුම දෙනා විනාශවෙලා යනවා. අපි කෑ කෝ ගැහුවාට මේ රටේ සමාජ වෙබ් අඩවි හරහා බොරු ප්‍රචාරය කිරීම වළක්වන්නේ කොහොමද? විශාල බොරු ප්‍රමාණයක් මිනිසුන් හදලා, ඒවා ඇත්ත ඒවා වාගේ ඉදිරිපත් කරනවා. මම කලිනුත් කිව්වේ ඒකයි. අපි පාවිච්චි කරනවා, artificial intelligence; අපි පාවිච්චි කරනවා, Bot and Troll armies. Hon. Deputy Chairman of Committees, these things are called "Bots and Trolls". They do not actually exist.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු ඇමතිතුමා, මම කියන්නේ මේකයි. මොන websites තිබුණත් අපි යුද්ධය අවසන් කරලා, සාමය දිනා ගන්න කටයුතු කළා. මාධ්‍යකරුවන් මොන කට කථා පතුරුවන්න ගියත් ඒ යුද්ධය අපි නිමා කර ගත්තා. ඒ නිසා මේ කාරණයේදී හංගන්නේ නැතිව මේ සියලු දේ හෙළිදරව් කරනවා නම් කිසි ගැටලුවක් ඇති වෙන්නේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමාත් එක්ක මම එකඟ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I will take only two more minutes and conclude.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු ඇමතිතුමා, තව කොච්චර කාලයකට රජයෙන් Facebook ඇතුළු සියලුම සමාජ වෙබ් අඩවි block කරලා තබන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා, [බාධා කිරීමක්] මම උත්තර දෙන්නම්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
I am asking you, for how long are you going to restrict it?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I will answer your question.

ගරු සේමසිංහ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙයයි. අපි තාවකාලිකව තමයි facebook සහ WhatsApp block කරලා තිබෙන්නේ. පැය 72කට block කළේ. මම හිතන විධියට පැය 72 සෙනසුරාදා වෙනකොට අහවර වෙනවා. ඉන් පසුව නැවතත් ඒවා ක්‍රියාත්මක වෙනවා. නමුත් මම කියන්නේ මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබ තරුණයෙක්. ඔබතුමා මටත් වඩා අවුරුදු 10ක් විතර තරුණයි. අපේ මේ තරුණ කණ්ඩායම් තමයි මේවාට ඇවිස්සෙන්නේ. අපි මීට වඩා විනයානුකූලව, මීට වඩා වගකීමකින් - responsibility එකකින් - යුතුව සමාජජාල වෙබ් අඩවි තුළ තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. ඒකයි අපි ඇවිළුණේ, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියපු කථාවට. අපිට වගකීමක් තිබෙනවා, ගරු ශෙහාන් මන්ත්‍රීතුමනි. ඔබතුමාට වගකීමක් තිබෙනවා; මට වගකීමක් තිබෙනවා. ජාතිවාදය අවුළන විධියේ බොරු හදලා, වෙන වෙන රටවල පටිගත කළ වීඩියෝ ගෙනැල්ලා මෙහේ පෙන්වලා "බලන්න, මෙහෙම වෙනවා" කියලා කියන කොට, බයක් ඇති වෙනවා. සාමාන්‍ය සිංහල අය මේ ජාතිවාදයේ නැහැ. නමුත් බයක් ඇති වෙලා තිබෙනවා. සාධාරණ බයක් ඇති වෙලා තිබෙනවා. අර වඳ පෙත්තේ කථාව ගැන බලන්න. ඒක වඳ පෙත්තක් නොවෙයිනේ, පිටි ගුළියක්නේ, දෙයියනේ! ඒක පිටි ගුළියක්නේ. ඒ නිසා මම ඉදිරිපත් කළ කාරණාව නැවතත් තහවුරු කරමින්, මේ සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමක් පත් කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.38]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපිට කථා කරන්න තිබෙන්නේ වෙළඳ නැව් පනත යටතේ නියෝග ගැන වුණත්, විවාදය සම්පූර්ණයෙන් වෙනත් පැත්තකට ගිහින් තිබෙනවා. පසුව එන කරීකයෙක් හැටියට මේ කෙරුණු කථාවලට ප්‍රතිචාර දැක්වීමක් නොකර යන්න මට බැහැ. ඒ නිසා ඒවාට ප්‍රතිචාරයක් දක්වන්න මට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂගේ බල ලෝභය ගැන ගරු බිමල් රත්නායක මන්ත්‍රීවරයා සඳහන් කළා. ඒකට මම උත්තරයක් දෙන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා තමන්ගේ බලය අත් හරින්නේ තම ධුර කාලය අවසන්වීමට අවුරුදු 2කට කලින්. එසේ අත් හැරලා තමයි ජනාධිපතිවරණයකට යන්නේ. බල ලෝභය පිළිබඳව චෝදනා කිරීමේදී අනිත් ඒවායේදී වාගේම සාක්ෂි තිබෙන්න ඕනෑ කියලා අපි කිව යුතුව තිබෙනවා. බල ලෝභය හා ජාතිවාදය යන මේ දෙකම ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් කථා කරපු ඒ මන්ත්‍රීවරු අපි මත ආරෝපණය කරන්න, අපේ ඒකාබද්ධ විපක්ෂය මත ආරෝපණය කරන්න, අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය මත ආරෝපණය කරන්න උත්සාහ කළා. ඇත්තටම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ උතුරු පළාත් සභාව පිහිටුවන්නේ නිදහස් සාධාරණ ඡන්දයක් තියලා. ඉතින් බල ලෝභයකින් ක්‍රියා කරනවා නම්, ඒ පළාත්වල පළාත් සභා පිහිටුවීමට ක්‍රියා කරනවාට වඩා පළාත් සභාව නැතුව පාලනය තවදුරටත් ගෙනියන්න ක්‍රියා කිරීම තමයි බලාපොරොත්තු වෙන්න ඕනෑ. ඒ නිසා මා කියනවා, මේ තමන්ගේ දේශපාලන විරුද්ධවාදීකම් උඩ බලලෝභී චෝදනා එල්ල කරනවාට වඩා සාක්ෂි මත පදනම් වූ බල ලෝභයක් පෙන්වා, ඒ චෝදනා මත අපට පරීක්ෂණයකට ඉදිරිපත් වෙන්න කියනවා නම්, ඒක අපට කළ හැකියි කියලා. අපි ලැබූ අත්දැකීම් අනුව 1983 කළු ජූලිය අවස්ථාවේ ජේ.ආර්. ජයවර්ධන මහතා අපි තමයි එහි වැරදිකාරයෝ කියලා කෙළින්ම කිව්වා. මම මේ කාරණය

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කලිනුත් කිව්වා. ජේවීපී එක තමයි ඒ අපරාධ කළේ කියලා කිව්වා. අපේ පක්ෂ තහනම් කළා. අන්තිමට ඒක බොරුවක් වුණා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා බරපතළ විධියට එදා කරපු චෝදනා අන්තිමට බොරු වුණා. ඒ අතර, ඉතාම පැහැදිලිව පසුව පෙනී ගියා එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් 83 කළු ජූලියේ ගිනි ඇවිළීම් පිටුපස හිටි බව. මේවා අලුත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු දැනගත යුතුයි. හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා වාගේ අය සිරිල් මැතිව්ගේ ඉතිහාසය දැනගත යුතුයි. සිරිල් මැතිව්හා එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය දැන ගත යුතුයි. "සියරට" කියලා පත්තරයක් තිබුණා, එක්සත් ජාතික පක්ෂයේ නිල පුවත්පත වශයෙන්. 1950 ගණන්වල තිබුණු ජාතිවාදී කෝලාහලය වේලාවේ එම පුවත්පතේ "දෙමළු මරව්, මරව්" කියලා කෙළින්ම සිරස්තලයක් පළ වුණා. මේවාගේ ඉතිහාසයක් තිබෙන පක්ෂයක් ඒක. වුවමනා වෙච්ච වෙලාවට ජාතිවාදය පාවිච්චි කරනවා, තමන්ගේ බලය තහවුරු කර ගන්න. ඒ තමයි එක්සත් ජාතික පක්ෂයේ හැටි. නමුත් ඒ අතර, අපි තේරුම් ගන්න ඕනෑ ලංකාව එක්සත් කිරීමේ ප්‍රශ්නය තිබෙනවා. ලංකාව තවමත් එකම ලාංකීය ජාතියක් හැටියට එක්සත් නොකරපු රටක්. මේ ප්‍රශ්නය තවමත් ඉතුරු වෙලා තිබෙනවා. යටත් විජිත රටක් හැටියට හිටපු අපි ඒ කාලයෙන් අද කාලයට පැමිණුනත් ලංකාව එක්සත් කිරීම කියන ප්‍රශ්නය තවමත් ඉතුරු වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය වටේ තමයි මේ ජාතික හැඟීම් පිළිබඳ ප්‍රශ්නය, ජාතික වෙනස්කම් පිළිබඳ ප්‍රශ්නය, ජාතික බිය සැක පිළිබඳ ප්‍රශ්නය මතු වී තිබෙන්නේ. ලාංකීයභාවයේ එක්සත් බව ඇති වෙනවා නම්, මේ සිංහල, දෙමළ, මුස්ලිම් වශයෙන් තිබෙන ඒ ජනවාර්ගික විවිධත්වය ප්‍රශ්නයට හේතුවක් වෙන්නේ නැහැ. ලාංකීය එක්සත්කමක් නැති තත්ත්වයක් තුළ, ලාංකීය එක්සත් බවක් කරා යන්නට බැරිවීම තුළ අපි තවමත් මේ ප්‍රශ්නයට මුහුණ දෙමින් ඉන්නවා. ඒ නිසා සිංහල බහුතර ජනතාව, බෞද්ධ ජනතාව, දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව අතර තමන්ගේ විවිධ හිමිකම් පිළිබඳව තිබෙන්නා වූ අපේක්ෂාවන් සමඟ තමන්ට ඒ හිමිකම් නැතිවී යනවාය, තමන්ගේ තිබෙන්නා වූ ඒ ජනවාර්ගික බලය තමන්ට නැතිවී යනවාය කියන බිය ඇති වෙමින් තිබෙනවා.

මෙම බිය, සැක තත්ත්වය අපට මහහරවා ගන්න පුළුවන් වෙන්නේ ලාංකීය එක්සත්කම කරා ගමන් කිරීම තුළිනුයි. මේ ලාංකීය එක්සත්කමේ ප්‍රශ්නය බරපතළ දේශපාලන අභියෝගයක්. අපට මෙය නිකම්ම වචනයෙන්, නීතියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. එය මේ රටේ ජනතාවගේ මානසිකත්වය එක්තරා තැනකට ගෙනෙන්න වුවමනායි. දැන්, සිංහල ජනතාව ගැන මුස්ලිම් ජනතාව තුළ භයක් සහ මුස්ලිම් ජනතාව ගැන සිංහල ජනතාව තුළ භයක් තිබෙනවා. මේ භය ඇති වෙලා තිබෙන්නේ, කරන ලද බොරු වැපිරීම් නිසාය කියන එක මම සම්පූර්ණයෙන්ම පිළිගන්නේ නැහැ. බොරු වැපිරීම් නිසාම පමණක් නොවෙයි. බොරුවලට අමතරව, තවත් ජනවර්ගයකගේ පැවැත්මෙන් තමන්ගේ පැවැත්මට එක්තරා විධියකට තර්ජනයක් එනවාය කියන සංඥානනය වූ භයක් - a perceived fear - තිබෙනවා; it is not an actual fear, but a perceived fear. අපි මේක හරියට තේරුම් ගත්තොත්, අපට මේ ප්‍රශ්නයට ප්‍රවේශ වෙන්න පුළුවනි. ඒ නිසා උඩින් පල්ලෙන් අත ගාන්නේ නැතිව ලාංකික එක්සත් බව මුල් කරගෙන මේකට අපි ප්‍රවේශ වෙන්න ඕනෑ. හැබැයි, අපි එකක් දන්නවා. සිංහල, දෙමළ, මුස්ලිම් හෝ ජනවාර්ගික බලය අන් ජනවර්ගයන්ට ආධිපත්‍යයේ තර්ජනයක් ඇති කරවන ආකාරයෙන් මතුවී දැනෙන්නට පටන් ගත්තොත් මෙම ප්‍රශ්නය බරපතළ වනවා. තමන්ගේ ජනවාර්ගික බලය ආධිපත්‍යයක් හැටියට අන් ජනවර්ගයන් මත ආරෝපණය වෙනවාය කියන අදහස අන් ජනවර්ගයන්ට ඇතිවීම තුළ ඒ ජනවර්ගයන් මතින් ප්‍රතික්‍රියාවන් මතු වෙනවා. මේ නිසා අපි කවුරුත් කිසිදු ජනවර්ගයක ආධිපත්‍යයක්, අන් ජනවර්ගය මත ආරෝපණය කිරීම හෝ පවත්වා ගැනීම කියන අදහසින් තොර වූ ලාංකීයභාවයක, පොදු බවක අදහසට අපි ගමන් කිරීමට වුවමනා කරන නෛතික ව්‍යවස්ථාමය රාමුව අපි ඇති කරගත යුතු බව අපේ අදහසයි. ජනතා විමුක්ති පෙරමුණේ බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා, අපේ ජයග්‍රහණයන්වලින් පසුව තමයි මේ හලාල් ප්‍රශ්නය එන්නේ කියලා.

2010දී අපි ජයග්‍රහණය කළා. ඊට පස්සේ හලාල් ප්‍රශ්නය ආවා. පසුගිය දිනවල පැවැති පළාත් පාලන ඡන්දය අපි ජයග්‍රහණය කළා. ඊට පස්සේ මුස්ලිම් - සිංහල ගැටුම ඇති වුණා. ඒකෙන් නිගමනය කර තිබෙන්නේ, අපේ ඒකාබද්ධ විපක්ෂය -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- ජයග්‍රහණය කරන්නේ කොයි අවස්ථාවේද ඒ ජයග්‍රහණයත් එක්ක මේ ප්‍රශ්න මතු වෙන බව. මේ සිද්ධි දාමය ගත්තාම එක්තරා විධියක ඇත්තක් තිබෙනවා. ඒවායේ අනු පිළිවෙළ එසේ තමයි පෙළ ගැසී තිබෙන්නේ. ඒ වුණාට අපි බලන්න ඕනෑ, මේකෙන් ලබන ලාභ ප්‍රයෝජනය කුමක්ද කියා.

දැන් අපි හලාල් ප්‍රශ්නය ගත්තොත්, හලාල් ප්‍රශ්නය මතු කළේ එක්තරා අන්තවාදී සංවිධානයක් බව අපි කවුරුත් දන්නවා. ඒ සංවිධානය එම ප්‍රශ්නය මතු කළේ ඇයි? ඒකට පසුබිම් වූ බලපෑම් ආවේ කොහෙන්ද, අරමුදල් ආවේ කොහෙන්ද කියා හොඳින් හෙළිදරව් වුණා. ඒ තමයි, නෝර්වේ රාජ්‍ය. නෝර්වේ රාජ්‍යයෙන් ඒ සඳහා එම සංවිධානයට ආධාර මුදල් ලබා දී තිබෙන බවත් හෙළිදරව් වුණා. අපේ එදා තිබුණු ආණ්ඩුවට විරුද්ධව මේ රටේ යම් බලපෑම් කරපු රාජ්‍යයක් තමයි, නෝර්වේ රාජ්‍ය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ කාරණය කියලා මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ රටේ තිබුණු යුද්ධය අවසන් කරන්නට අපි ගත්ත උත්සාහය වළක්වන්නට නෝර්වේ රාජ්‍ය එදා ක්‍රියා කළා. එදා අපේ ආණ්ඩුවට විරුද්ධව උසිගැන්වීමක් ඇති කරවීමට නෝර්වේ රාජ්‍ය උදව් වුණාය කියන එක අපේ චෝදනාවයි. ඒ අනුව අපට බලයක් ලැබුණු වහාම අපට විරුද්ධ බලවේග අප සමඟ මුසු වෙමින් අපට විරුද්ධව ජනවාර්ගික භේදවාදය ඇවිස්සෙන ක්‍රියාදාමයකට මුල පුරනවා. ඒ තත්ත්වයන් යටතේ අපි අමාරුවේ වැටෙනවා. එදා හලාල් ප්‍රශ්නය ඇති වීම නිසා අමාරුවේ වැටුණේ කවුද? අපි. ඒකෙන් ලාභ ප්‍රයෝජන ලැබුවේ කවුද? අපේ විරුද්ධවාදීන්. මෙවරත් අපි ලැබූ ජයග්‍රහණයෙන් පස්සේ මේ කෝලාහලය තුළින් කවුද ලාභ ප්‍රයෝජනය ලබන්නේ? අපි කරා ක්‍රමානුකූලව එමින් සිටි මුස්ලිම් ජනතාව අපි කරා පැමිණ, අපි සමඟ සම්බන්ධ වීමේ ක්‍රියාවලිය වැළැක්වීමේ ක්‍රියාදාමයක් මේ ආගම් භේදවාදය තුළ මතු වුණා නේද?

එතකොට මෙය කාට විරුද්ධව, කවුරු වෙනුවෙන්, මොන හඬින් කිව්වත් අපි බලන්න ඕනෑ, අන්තිම වශයෙන් එහි ලාභ ප්‍රයෝජන ලැබුවේ කවුද කියලායි. ඒ නිසා ගරු ඇමතිතුමාට මා කියනවා, ඉක්මනින් මේ රෙගුලාසි පනවන්න කියලා. රෙගුලාසි පනවලා, ලංකාවේ නැව් ඒජන්තවරුන්ගේ ක්‍රියා කලාපය හසුරුවන්න, නියාමනය කරන්න එතුමා ක්‍රියා කරයි කියා මා බලාපොරොත්තු වනවා. අපි ඒ වෙනුවෙන් නඩුවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරමින් මා නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.49]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අදහස් දැක්වීමට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. අද මේ විවාදයේදී අපේ මන්ත්‍රීවරු හා ඇමතිවරු -කථිකයෝ- කිහිප දෙනෙක්ම කථා කළා, නුවර ප්‍රශ්නයේ අද තත්ත්වය සම්බන්ධව. එහි විකාශනය ගත්තොත්, අප සියලු දෙනාම පිළිගන්නවා; ඒ මත දේශපාලන න්‍යාය පත්‍රයක් තිබෙන බව. ඒ සංවිධාන වැඩ කරන්නේ, එක එක අයගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් බව අප සියලු දෙනාම පිළිගන්නවා. මේ රටේ දේශපාලන නායකයෝ හැටියට අපි ඒවා නවත්වන්න මොනවාද කරලා තිබෙන්නේ කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා. අද ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදී හිටපු ආරක්ෂක ලේකම්තුමා බොදුබල සේනා සංවිධානය ආරක්ෂා කරන්න විශාල වැඩ කොටසක් කළා. ඒ සංවිධානයේ කාර්යාලය විවෘත කළේ, ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්තුමා. එදා බොදුබල සේනා සංවිධානයට මේ රටේ නීතිය අතට අරගෙන වැඩ කරන්න මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් විශාල සහයෝගයක් ලැබුණා. ඒක අප කවුරුත් දන්නා දෙයක්. පසුගිය මැතිවරණ වේදිකාවලදීත් අපි කිව්වා, "රාජපක්ෂ ආණ්ඩුව තමයි මේ රටේ ජාතිවාදය ඇති කරන්න මූලිකවම සියලු ආධාර ලබා දුන්නේ." කියලා. ඒ සියලු දේවල් කියලා තමයි අපි බලයට ආවේ.

අවුරුදු දෙකහමාරක පමණ කාලයක් තුළදී රජයක් හැටියට අපට පුළුවන් වුණාද, ඒ ජාතිවාදය, ආගම්වාදය නවත්වන්න? හර්ෂ ද සිල්වා මැතිතුමා සභාවෙන් පිටතට යනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මා හිතන විධියට ඔබතුමා මේ සභාවේ හිටියොත් හොඳයි. මොකද, ඔබතුමාගේ කථාවේදී කියපු දේවල්වලට ඔබතුමාටත් උත්තර දෙන්න තිබෙනවා. රජයක් හැටියට අපි දැන් අවුරුදු දෙකහමාරක් පමණ තිස්සේ බලයේ ඉන්නවා. අපි අපේ හෘදය සාක්ෂියට එකඟව කථා කරමු කෝ. අවුරුදු දෙකහමාර තුළදී අපි රජයක් හැටියට ජාතිවාදය නවත්වන්න ගත්ත ක්‍රියා මාර්ග මොනවාද? ජාතිවාදය පරාජය කරන්න ගත්ත ක්‍රියා මාර්ග මොනවාද? අපි එක ක්‍රියා මාර්ගයක්වත් අරගෙන නැහැ. කණ්ඩායම් රැස්වීම්වලදී මම අතිගරු ජනාධිපතිතුමාට පෞද්ගලිකව කිව්වා, "මේක නවත්වන්න, විනාශයක් වෙන්නයි යන්නේ. මුස්ලිම් ජනතාව ඉලක්ක කරගෙන සමාජ ජාල මාධ්‍යවල, එක එක තැන්වල දෙන ප්‍රචාරය නවත්වන්න." කියලා. ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියලා මා ඇහුවා. ගරු අගමැතිතුමාට මා පැමිණිලි කළා. පොලිසිය භාරව හිටපු ගරු ඇමතිතුමාට පෞද්ගලිකව පැමිණිලි කළා. හතර-පස් වතාවක් පොලිස් මූලස්ථානයට ගිහිල්ලා මා මගේ නමින් දමපු පැමිණිලි තිබෙනවා. ඒ එකක්වත් කළේ නැහැ. ඒක නවත්වන්න ආණ්ඩුවක් හැටියට කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ ආණ්ඩුව තුළ තවත් රැඳී ඉන්න එක ගැන මම ලජ්ජා වෙනවා. කණ්ණාඩියක් ඉදිරියට ගිහින් කථා කරනවා වාගේ තමයි මම අද කථා කරන්නේ. ඇයි? මම මේ ආණ්ඩුව තුළ ඉඳගෙන, "මේක නවත්වන්න. මහා විශාල හානියක් මේ රටට වෙනවා. මේ ජාතිවාදයට ඉඩ දෙන්න එපා.

අපි අවුරුදු 30ක් යුද්ධයක් නිසා දුක් විඳලා, මේ රට විනාශ වුණා. නැවත මේ ජාතිවාදය ඇති වෙන්න දෙන්න එපා." කියලා හැමදාම මේ වෙනුවෙන් හඬ නඟපු, මේ රටේ ජාතික සමඟිය වෙනුවෙන් කථා කරපු කෙනෙක් මම. අපට මේක නවත්වන්න බැරි වුණා. අපට නවත්වන්න බැරි වෙලා තමයි අන්තිමට නුවර ගිහින් පිපිරුණේ. මේක දවසින් දෙකෙන් ආපු දෙයක් නොවෙයි. මේක අවුරුදු ගණනක් සංවිධානය වෙලා කළේ. මේක ඇතුළේ දේශපාලනයක් තිබෙනවා. හරි. ඒ දේශපාලනය කරන කණ්ඩායම්වලට මේ ආණ්ඩුව අස්ථාවර කරන්න ඕනෑ; මේ ආණ්ඩුව වටිටන්න ඕනෑ; පාර්ලිමේන්තු ඡන්දයක් ඉතා ඉක්මනින් ලබා ගන්න ඕනෑ කියන දේශපාලන න්‍යාය පත්‍රයක් තිබෙනවා. නමුත්, අපි රජයක් හැටියට ඒකට ඉඩ දෙන්නේ ඇයි? ඒකට විරුද්ධව අපට ක්‍රියා මාර්ග ගන්න බැරි ඇයි? අපට දක්ෂ බුද්ධි අංශයක් තිබෙනවා. පොට්ටු අම්මාන් හිටපු තැන සොයා ගන්න පුළුවන් වුණු බුද්ධි අංශයක් අපට තිබෙනවා; ප්‍රභාකරන් හිටපු තැන සොයා ගන්න පුළුවන් වුණු බුද්ධි අංශයක් අපට තිබෙනවා. නමුත්, අමිත් වීරසිංහ අවුරුදු දෙකහාමාරක් මේ රටේ කරපු දේවල්, ජාතිවාදී සංවිධානවල නායකයෝ මේ ගැටුම නිර්මාණය කරන්න කරපු දේවල් සොයා ගන්න මේ බුද්ධි අංශයට බැරි වුණා. ඒකයි තිබෙන ප්‍රශ්නය. අපට පොට්ටු අම්මාන්ව සොයා ගන්න පුළුවන් වුණා; ප්‍රභාකරන් හිටපු තැන සොයා ගන්න පුළුවන් වුණා. අපේ බුද්ධි අංශ මේක සොයා ගන්න අසමත් වුණාද මම දන්නේ නැහැ. එහෙම නැත්නම් මේක නවත්වන්න අපේ ආණ්ඩුවට වුවමනාවක් තිබුණේ නැද්ද? ඒකයි මට තිබෙන ගැටලුව. දැන් හුඟක් අය මුස්ලිම් ජාතිවාදය ගැන කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුස්ලිම් ජාතිවාදයක් තිබෙනවා නම් ඒක හරියට කියන්න. මේ පක්ෂවල මුස්ලිම් නායකයෝ ඉන්නවා නේ. රවුෆ් හකීම් ජාතිවාදිද? රිසාඩ් බදියුදීන් ජාතිවාදිද? එහෙම නම් ඒ දෙන්නාව මේ ආණ්ඩුවේ තියාගෙන ඉන්නේ ඇයි? එහෙම නම් ඒක කියන්න ඕනෑ. මම ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ නේ. එහෙම නම් කවුද මුස්ලිම් ජාතිවාදය අවුස්සන්නේ? ඒක කරන්නේ රවුෆ් හකීම්ද, රිසාඩ් බදියුදීන්ද? ඒක නිශ්චිතව කියන්න ඕනෑ. එහෙම නැතිව රිසාඩ් බදියුදීන් සහ රවුෆ් හකීම් කරන දේවල්වලට සමස්ත මුස්ලිම් ජනතාව පළි නැහැ. මුස්ලිම් ජනතාව ඒකට වග කියන්න ඕනෑ නැහැ. මතක තියා ගන්න, මුස්ලිම් ජනතාවගෙන් සියයට 90ක් ඡන්දය දෙන්නේ එක්සත් ජාතික පක්ෂයට බව.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා, ඒක තමයි මම කිව්වේ මේක හොයන්න පුළුවන් එකම ක්‍රමවේදය ස්වාධීන ජනාධිපති කොමිසමක් පත් කිරීම කියලා. කවුද මේ රටේ ජාතිවාදය අවුළුවන්නේ කියන එක එතකොට කාට කාටත් පෙනෙයි. ඒකයි මම කිව්වේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

හරි. අපි කොමිසම පත් කරලා බලමු, රාජ්‍ය ඇමතිතුමා. එහෙම නම් මුස්ලිම් ජාතිවාදයක් තිබෙනවා නේ. දැන් මේ නුවර සිද්ධිය ඇති වුණේ මුස්ලිම් ජාතිවාදය නිසාද? මුස්ලිම් ජාතිවාදය නිසාද නුවර සිද්ධිය ඇති වුණේ? ගිංතොට සිද්ධිය ඇති වුණේ මුස්ලිම් ජාතිවාදය නිසාද? සිංහල තරුණයෙකුයි, මුස්ලිම් තරුණයෙකුයි ගහගෙන මැරුණා. මැරුණාට පසුව අමිත් වීරසිංහ දිගන leaflets බෙදලා මුස්ලිම් කඩවලට ගහන්න සිංහල මිනිසුන්ව කුපිත කළා.

මුස්ලිම් ජාතිවාදයත් එක්ක එම සිද්ධියේ තිබෙන සම්බන්ධය මොකක්ද? එදා පොලීසිය හරියට ක්‍රියාත්මක වෙලා ඒ පිරිස අත් අඩංගුවට ගත්තා නම්, මේ විනාශය වෙන්නේ නැහැ. ඒක ගැන කථා කරන්නේ නැතිව අපි බලනවා, මේ දෙකම ෂේප් කරන්න. "නැහැ, මුස්ලිම් ජාතිවාදයකුත් තිබෙනවා. ඒ නිසා තමයි සිංහල මිනිස්සු කුපිත වෙලා ඉන්නේ. ඒ නිසා සිංහල මිනිස්සු ගහනවා. ඒ නිසා අපි මේක balance කරන්න ඕනෑ"ය කියලා බැලන්ස් න්‍යායවල් කථා කරන්න එපා. ඔබතුමන්ලා කෙළින් හිටගන්න. කොන්ද පණ ඇතිව කෙළින් කියන්න, "ජාතිවාදයට අපි විරුද්ධයි." කියලා. ඒක මොන ජාතිවාදය වුණත් අපි විරුද්ධයි.

[ගරු මුජීබුර් රහුමාන් මහතා]

ඒක කියන්න ඕනෑ. ඒක කියන්නේ නැතිව මෙතැනට ඇවිල්ලා අරකට බටර් ගාලා මේකට බටර් ගාලා "ෂේප් න්‍යාය" කථා කරලා වැඩක් නැහැ.

බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා, මුහුණ වහන එක ගැන. මුහුණ වහන්නේ ඒ අයගේ පෞද්ගලික වුවමනාවට. එහෙම මුහුණ වහන එක ගැන කථා කරනවා නම්, එහෙම නම් ඇරගෙන යන ඒවා ගැනත් කථා කරන්න එපායැ. දැන් සමහරු භාගෙට ඇඳගෙන යන්නේ. ඇයි, ඒක ගැන කථා කරන්නේ නැත්තේ? කොට ගවුම් ඇඳගෙන යනවා, කොට කලිසම් ඇඳගෙන යනවා, brassiere එක විතරක් ඇඳගෙන යනවා. ඇයි, ඒකට විරුද්ධව කථා කරන්නේ නැත්තේ? ඇරගෙන යන්න අයිතිය තිබෙනවා වාගේම වහගෙන යන්නත් අයිතිය තිබෙනවා. ඇරගෙන යන්න පුළුවන් නම්, වහගෙනත් යන්න පුළුවන්. ඒ නිසා වහගෙන යන ඒවා ගැන විතරක් කථා කරන්න එපා. ඇරගෙන යන ඒවා ගැනත් කථා කරන්න. ඇරගෙන යන ඒවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ නේ? කථා කරන්නේ වහගෙන යන ඒවා ගැන. වහගෙන යන්නේ ඒ ගොල්ලන්ගේ වුවමනාවට. අපි කවුරුත් කියලා නැහැ, මුහුණ වහගෙන යන්න කියලා. මගේ බිරිඳ ඉන්නවා, එතුමිය මුහුණ වහගෙන යන්නේ නැහැ. මගේ බිරිඳට මම උපදෙස් දීලාත් නැහැ, මුහුණ වහන්න කියලා. එතුමිය hijab එකක් දමාගෙනයි යන්නේ. සමහර මුස්ලිම් කාන්තාවන් මුහුණ වහගෙන යන්නේ ඒ කාන්තාවන්ගේ වුවමනාවට. ඒ වාගේම ඇරගෙන යන කාන්තාවනුත් මේ රටේ ඉන්නවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් කථා කරනකොට වහගෙන යන එක ගැන විතරක් කථා කරන්න එපා කියලායි මම කියන්නේ. භාගෙට ඇඳගෙන යන ඒවා ගැනත් කථා කරන්න. ඒවාත් හොඳ නැහැයි කියලා කියන්න. අපේ රටේ සමීක්ෂණයක් කරලා හොයාගෙනත් තිබෙනවා, කාන්තා දූෂණ වැඩි වෙන්න කාන්තාවන්ගේ ඇඳුම පිළිබඳ ප්‍රශ්නයකුත් හේතු වෙලා තිබෙනවාය කියලා. ඒ වාගේ දේවලුත් මේ රටේ පසුගිය කාලයේ කථා වුණා. එම නිසා සමහර තැන්වල කියනවා, වහගෙන යන එක හොඳයි කියලා. පසුගිය කාලයේ ඩෙංගු මදුරුවා බෝ වනකොට බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල්වලට අණ දුන්නා, ඒ පළාතේ පාසල් දරුවන් පන්ජාබ් ඇඳුම ඇඳගෙන පාසලට එන්න, ඩෙංගු මදුරුවාගෙන් බේරෙන්න ඒ ඇඳුම හොඳයි කියලා. ඒ නිසා මම කියන්නේ නිකම් අපි කොනකින් දෙකකින් අල්ලා වැඩක් නැහැ, ප්‍රශ්නයේ ඇත්ත ස්වභාවය හඳුනාගන්න ඕනෑය කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වූ මේ සිද්ධියත් එක්ක මම කියනවා, CID මහත්වරුන්ට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා.

2018 මාර්තු මස 8 වෙනි දා "දිවයින" පත්තරයේ කතු වැකියේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "... මහනුවර, දිගන, තෙල්දෙණිය යන පෙදෙස් දවාගෙන පැමිණි එම ගින්න මේ වන විට කටුගස්තොට පාලම පසුකර තවත් දුර ගමන් කිරීමට සූදානමිය. අම්පාරෙන් හා මඩකලපුවෙන් නුවර බලා පැමිණි අපගේ මුස්ලිම් සහෝදරවරුන් දහස් ගණනක් මෙය ලියන මොහොතෙත් මහනුවර මුස්ලිම් පල්ලි වටකරගෙන සිටියහ. ....."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කාලය අවසානයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අන්තිම විනාඩිය.

බලන්න, මේ ලියා තිබෙන බොරුව. අම්පාරේ සිට නුවරට ආවා ලු, මේ පල්ලි ආරක්ෂා කරන්න.

මේ කවුද ලියන්නේ? 2018 මාර්තු 08වෙනි දින "දිවයින" පත්තරයේ කතු වැකිය. මම CID එකේ සහ NIB එකේ මහත්වරුන්ට කියනවා, වහාම මේවා ගැන පරීක්ෂණයක් කරන්න කියලා. ජාතික පුවත් පත් කියලා කියන පත්තර මේ රටේ ජාතිවාදය, ආගම්වාදය සහ වර්ගවාදය අවුස්සන්න, සැකය, වෛරය ඇති කරන්න කරන දේවල්, මේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම එක කාරණයක් කියන්නට කැමැතියි. මේ රටේ පුරවැසියෙක් හැටියට මම ඉතාම කැමැතියි, මේ රටේ ජීවත් වන සියලු ජන කොටස් සමඟ එකට ජීවත් වන්නට. නමුත් කියන්නට කනගාටුයි, මේ මොහොත වන විට අපේ අනාගතය අඳුරු බව පේනවා. අපේ අනාගතය ගැන කිසිම එළියක් මට දකින්නට නැහැ. ආණ්ඩු පක්ෂය තුළත්, විපක්ෂය තුළත් මේ අඳුර නැති කරන්නට පුළුවන් එළියක් හෝ "මේ රටේ ජනවාර්ගික අර්බුදයක් නැතිව, ජාතික සමඟිය ඇතිව අපි සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරමු"යි කියන ඒ පණිවුඩය මට තවම දකින්නට ලැබෙන්නේ නැහැ. නමුත් මට දකින්නට ලැබෙන එක දෙයක් තිබෙනවා. මේක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න. ඒ තමයි, මගේ දුවා දරුවන්ටත් අනාගතයේදී මේ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙන රටක් විධියට තමයි අපට තවමත් මේ රට පිළිබඳව පෙනෙන්නේ කියන එක. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා, subject එකට අදාළව කථා කරන්න.

[පූ.භා. 11.58]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කරන සංශෝධනයෙන් නාවුක ක්ෂේත්‍රයේ බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ ලියා පදිංචි කිරීම ඉතාම හොඳයි. නමුත් ලංකාවේ කුඩා නාවික යාත්‍රා මඟින් ස්වයං රැකියා කරන විශාල පිරිසක් ඉන්නවා. නැව්වල කාර්ය මණ්ඩල වරායට ගෙනෙන, නැව්වලට ආහාර ද්‍රව්‍ය සපයන, නැව්වල repairsවලට සම්බන්ධ වන කුඩා නාවික යාත්‍රා හැම වරායකම තිබෙනවා. මෙතෙක් කල් පැවතුණේ, වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අධීක්ෂණය යටතේ, එතුමාගේ සමීක්ෂණයකින් පසුව ඒ නාවික යාත්‍රා සහතික කරලා ලියා පදිංචි කිරීමයි. ඒ සඳහා ඉතාම සුළු මුදලක් තමයි නැව් අධ්‍යක්ෂ ජනරාල්තුමා අය කළේ. නමුත් මේ නියෝග නිසා ඒ කුඩා ව්‍යාපාරිකයන්ට මේ කටයුත්ත කරන්නට බැරි වෙන තත්ත්වයකට පත් වෙනවා. අද තමුන්නාන්සේලා මේ නියෝග තුළින් යෝජනා කරලා තිබෙනවා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
I propose that the Hon. Bimal Rathnayake do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදටත් මේ රටේ තිබෙන කුඩා නාවික යාත්‍රා සියල්ලම වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්තුමා යටතේයි ලියා පදිංචි වෙලා තිබෙන්නේ. දැනට එම ලියා පදිංචිය සිදු වෙන්නේ වාර්ෂිකව එතුමාගේ නිලධාරීන් ගිහින් ඒ යාත්‍රාව පරීක්ෂා කරලා ලබා දෙන සහතිකය අනුවයි. ඒ ලියා පදිංචිය කරන අවස්ථාවේදී වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්තුමා සහතිකයක් දෙනවා, මේ යාත්‍රාවට වරාය තුළ පමණයි යාත්‍රා කරන්නට පුළුවන්, එහෙම නැත්නම් වරායේ සිට මෙපමණ නාවුක සැතපුම් ප්‍රමාණයක් තුළ පමණයි යාත්‍රා කළ හැක්කේ කියලා. ඒ සඳහා සුළු මුදලක් අය කරනවා. නමුත් දැන් මේ නියෝග තුළින් ලියා පදිංචියේදී ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 01ක් අය කරනවා. ඒ වාගේම අවම ගාස්තුව ඇමෙරිකානු ඩොලර් 750යි. උපරිම ගාස්තුව ඇමෙරිකානු ඩොලර් 10,000යි. ඊට අමතරව වාර්ෂිකව මේ නැව පරීක්ෂා කිරීමේ ගාස්තුව හැටියට ඇමෙරිකානු ඩොලර් 500ක් යෝජනා කරලා තිබෙනවා.

සමීක්ෂණ සහතිකය නිකුත් කරන්න තව ඩොලර් 100ක් ඕනෑ. එය කුඩා යාත්‍රාවකට උසුලන්න බැරි බරක් වෙනවා. ඊට අමතරව, යාත්‍රාව වරායේ නවතා තිබීම වෙනුවෙන් තවත් රුපියල් 75,000ක් පමණ වාර්ෂිකව ගෙවනවා. එහෙම වුණොත් කුඩා යාත්‍රා හිමියකුට මේ කටයුත්ත කරන්න බැරි වෙනවා. ඊට අමතරව, වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබුණු පරීක්ෂා කිරීමේ බලය සමාගම් කිහිපයකට භාර දෙනවා. එහෙම වුණාම ඒ සමාගම්වලට තමයි මෙහි බලය යන්නේ. මේ තුළින් කුඩා යාත්‍රාවලට විශාල අපහසුවක් ඇති වනවා, ඒවා පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වනවා. සංචාරක ව්‍යාපාරයට යන්න, වරාය නරඹන්න යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් එක්ක ගෙන යන්න, වරාය නරඹන්න එන ජනතාව එක්ක ගෙන යන්න වැනි විවිධ කාර්යයන්වලට මේ කුඩා යාත්‍රා තිබෙනවා. මා හිතන හැටියට ලංකාවේ මේ කුඩා යාත්‍රා 10,000ක් විතර තිබෙනවා. මේ නියෝග තුළින් කුඩා යාත්‍රා හිමියන්ට රැකියාව අහිමි වනවා; මෙය කරන්න බැරි තත්ත්වයට පත් වනවා. මේ පිළිබඳව නැවත සලකා බලන්නය කියා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමාගේ කථාවට මම ඇහුම් කන් දුන්නා. ජාතිවාදය අවුස්සන්න කටයුතු කරන කවුරුවත් මේ සභාවේ නැහැ. නමුත් මේ රජය එක කටයුත්තක් කළා. මේ රටේ හිටපු හොඳම බුද්ධි නිලධාරි මහත්වරුන් සියලුදෙනාම අද ඉන්නේ හිරේ; එහෙම නැත්නම් රිමාන්ඩ් එකේ. ඒ අයගේ සේවාව ලබා ගන්න බැරි වුණා. ඒ සේවාව ලබාගෙන තිබුණා නම් මෙවැනි සිද්ධියක් වනකොට ඒ කාරණාව සම්බන්ධයෙන් රජය දැනුවත් කරන්න පුළුවන්කම තිබුණා. පසුගිය යුද්ධ සමයේ විවිධ අවස්ථාවලදීත් ඔවුන් මේ රටේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළා; කල් වේලා ඇතිව ඒ තොරතුරු රජයට ලබා දුන්නා. තමුන්නාන්සේලා ඒවා සියල්ලම අමතක කර දමා දේශපාලන පළිගැනීම්වලට, විවිධ චෝදනා ඉදිරිපත් කරලා ඒ සියලුදෙනාගේම සේවය එක්කෝ තහනම් කරලා තිබෙනවා, නැත්නම් රිමාන්ඩ් කරලා තිබෙනවා. ඒ වාගේ විවිධ ප්‍රශ්න මතු කරලා තිබෙනවා. ඔවුන්ගේ ඒ වටිනා සේවය ලබා ගත්තේ නැති එකට උත්තරයක් තමයි අද මේ ඇතිවෙලා තිබෙන්නේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපි එදා 7 වන දා රැස්වීමක් පවත්වන්නයි සැලසුම් කර තිබුණේ. අපි ඒ රැස්වීම නැවැත්වූවේ ඇයි? ඒ, ඒ තුළින් මේ රටේ යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණොත්, එය අපේ ජාතික සමගියට හානියක් වන නිසායි. එහෙම කළේ බොහොම දුර දිග කල්පනා කරලායි. මේ ප්‍රශ්නය නිසා අපි මේ රජයට මඩ ගහනවා නොවෙයි. තමුන්නාන්සේලාගේ දුර්වලකම් හේතුවෙන් මේ ප්‍රශ්නය දුර දිග යෑම නිසා තමයි මෙවැනි තත්ත්වයකට පත් වුණේ. නමුත් ඒ තත්ත්වය මැඩ පවත්වා යළිත් යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳව අපි දැන් සතුටු වනවා. මේ රටේ කිසිම දේශපාලනඥයකුවත්, කිසිම කෙනකුවත් කැමැති නැහැ, අපි අතර තිබෙන මුස්ලිම්, දෙමළ, සිංහල සමඟිය නැති කරන්න.

මේ රටේ අපි ඒ දුක අවුරුදු තිහක් තිස්සේ වින්දා. මොන දේශපාලන පක්ෂ කථා කළත්, මේ රටේ ජනතාව ඒ දුක වින්දා. ඒ නිසා, අද ඒ දුක විඳින එක නවත්වන්න අවශ්‍යයි. නමුත් පසුගිය මැතිවරණයේදී ජනතාව අපට ශක්තිය දීපු නිසා, මේ සිද්ධිය අරගෙන ඒකට හානියක් කරන්න පුළුවන්ද කියලා දැන් සමහරු බලනවා. මේ රටේ ජනතාව දන්නවා, මේකෙන් මොකද වුණේ කියලා. ඒ නිසා අපි කාටවත් චෝදනා කරන්නේ නැහැ. නමුත්, ඒ වෙලාවේ නීතිය හා සාමය භාර ඇමතිතුමා හැටියට හිටියේ අගමැතිතුමා. අගමැතිතුමාට ඒක කරන්න බැරි නිසා තමයි රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමාට දුන්නේ. මම ඒක අගය කරනවා. ඒ වාගේම, අපේ බුද්ධි අංශයේ අය සියල්ලන් රිමාන්ඩ් කරලායි ඉන්නේ. ඒ අයගේ සේවය ලබා ගත්තා නම් මෙවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. මෙන්න මේ වාගේ බරපතළ අඩු පාඩුකම් තමුන්නාන්සේලාගේ රජය යටතේ වුණා. පසුගිය කාලයේ දේශපාලන පළි ගැනීම් හැටියට එවැනි අය රිමාන්ඩ් කළ නිසා, මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙන මොහොතකදී ඒ වෙනුවෙන් නිසියාකාරව ක්‍රියා කරන්න රජයට නිසි උපදෙස් නොලැබුණාය කියන එක මම මේ සභාවේදී කියන්න කැමැතියි. එහෙම උපදෙස් ලැබුණා නම් මේ ප්‍රශ්නය මෙපමණ දුරක් යන්නේ නැතිව නවත්වා ගන්න පුළුවන්කම තිබුණා. මේ වැඩ පිළිවෙළ අපි අනුමත කරන්නේ නැහැ. නමුත්, රජයේ තිබෙන දුර්වලකම නිසා, රජය මෙවැනි අවස්ථාවල දුර දිග බලා ක්‍රියා නොකරපු නිසා මේ ප්‍රශ්නය ඇති වුණාය කියන එක මම කියන්න කැමැතියි. නමුත්, දැනට රටේ ඇති වී තිබෙන මේ ප්‍රශ්නය දුර දිග නොගිහින් මේ මොහොතේ හෝ සමථයට පත්වීම පිළිබඳව අද අපි සතුටු වනවා. ඒ නිසා අපි රජයෙන් ඉල්ලන්නේ, රටට, මහ ජනයාට ශක්තිමත්ව ඉදිරියට යන්න පුළුවන් වැඩ පිළිවෙළකට යාම සඳහා දැන්වත් ඔය වෛරී දේශපාලනය නවත්වන්න කියලායි.

තමුන්නාන්සේලාගේ මාධ්‍ය ප්‍රකාශක රාජිත සේනාරත්න මැතිතුමා රූපවාහිනී-පෙරේදා මාධ්‍ය සාකච්ඡාවට ගිහින් කිව්වේ මොනවාද කියලා තමුන්නාන්සේලා දැක්කා. ඒවා වැරදි වැඩ. මහ ජනයාට වක්‍රව කියන්න උත්සාහ කරනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු අලුත් දේශපාලන පක්ෂය මේකට හවුල් වුණාය කියලා. නමුත්, ඒවා මහ ජනයා පිළිගන්නේ නැහැ. අපි ඒවා පිළිකුලෙන් ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා, මේ වාගේ කටයුතු නවත්වන්න කියලා අපි රජයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, මෙවැනි ඇමතිවරු මෙයින් ඉවත් කරන්න කියලාත් අපි ඉල්ලා සිටිනවා. තවදුරටත් මේ රටට ආරක්ෂාව ඕනෑ නම්, සාමය ඕනෑ නම්, සමගිය ඕනෑ නම්, මේ වාගේ ජරා කථා කියන ඇමතිවරු ඉවත් කරන්න කියලා මේ සභාවේදී මම කියන්න කැමැතියි.

අපි දීර්ඝව මේ ගැන කථා කරනවා; මේ ගැන අපි විමර්ශනයෙන් බලා ගෙන සිටිනවා. මේ ප්‍රශ්නය සමථයකට පත් කර මේ රටට සාමය ඇති කරන්න අපේ දේශපාලන පක්ෂය වන, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට දෙන්න පුළුවන් ඉහළම සහයෝගය රජයට ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[අ.භා. 12.07]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, ඉතාම වැදගත් කරුණු කීපයක් සම්බන්ධයෙන් කතා කරන්න මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. අද මේ අවස්ථාව වන විටත් හැම කෙනකුම කතා කරන්නේ ජාතික සංහිඳියාව ගැනයි. මට කලින් කතා කළ හිටපු අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාට පළමුවෙන්ම මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ මොහොතේදී එතුමන්ලා ප්‍රකාශ කරන්නේ මේ හැම දෙයක්ම වෙනුවෙන් ආණ්ඩුව වග කියන්න ඕනෑ කියායි. අලුත්ගම සිද්ධිය ගැන කතා කරන කොට එදා ආණ්ඩුව විපක්ෂයට ඇඟිල්ල දිගු කළා. තමන්ගේ ආණ්ඩුවේ තිබෙන අඩු පාඩුකම් පිළිබඳව එදා කතා කළේ නැහැ. අද කියනවා, දිගන, තෙල්දෙණිය සිද්ධිය සම්බන්ධයෙන් ආණ්ඩුව අනිවාර්යයෙන් වග කියන්න ඕනෑ කියා. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයකුව සිටි ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාට අපි උපදෙස් දෙන්න ඕනෑ නැහැ. කවුරු කළත්, කොහොම සිද්ධ වුණත් මෙය මේ රටේ ඉතිහාසයේ පාලකයන් සියලුදෙනා වග කියන්න ඕනෑ දෙයක්. ඉතිහාසය මකා දමා කතා කරන්න පුළුවන්කමක් නැහැ, හිටපු ගරු අමාත්‍යතුමනි.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු මන්ත්‍රීතුමා, මා ඔබතුමාගේ කතාවට විරුද්ධව කතා කරනවා නොවෙයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔබතුමා කියන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
තමුන්නාන්සේලා බුද්ධි අංශය ශක්තිමත්ව තියාගෙන සිටියා නම් ඒ සිද්ධි ගැන මීට වඩා හොඳින් දැනගන්න තමුන්නාන්සේලාට පුළුවන් වනවා. දේශපාලන මත භේද උඩ, දේශපාලන වෛරය නිසා ඒ මිනිසුන් රිමාන්ඩ් කරලා, සේවය තහනම් කර තිබුණු නිසා ඒ සේවය ලබා ගන්න තමුන්නාන්සේලාට බැරි වුණා කියන එකයි මා කියන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු හිටපු අමාත්‍යතුමනි, ඔබතුමා කියන විධියට, බුද්ධි අංශයේ දෙතුන් දෙනකු බන්ධනාගාරගත වීම නිසා මුළු රටෙම බුද්ධි අංශය අකර්මණ්‍ය වන්න බැහැ. බුද්ධි අංශයේ තවත් අය ඉන්නට ඕනෑ. මේ සිද්ධිය සම්බන්ධයෙන් රජය හැටියට අපි වගකීම භාර ගන්නවා. යම් අඩු පාඩුවක් වුණා නම් අපි එය ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. අපි එය භාර ගන්නවා. හැබැයි එය නිවැරදි වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගන, තෙල්දෙණිය සිද්ධිය සම්බන්ධයෙන් අද බොහෝ දෙනෙක් කතා කරනවා. අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අදාළ නම් කිව්වා. එහෙම නම් ඒ පිළිබඳව සොයන්න එච්චර අමාරුකමක් නැහැ. සභානායක අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා ප්‍රකාශ කළා, එතුමා ළඟ CD එකක් තිබෙනවා, එය දාලා බලා අත් අඩංගුවට ගන්න පුළුවන් කියා. අද පාරකදී මිනීමැරුමක් වුණාම, යම්කිසි පහර දීමක් වුණාම, හොරකමක් කළාම -supermarket එකක හොරකමක් කළාම- අදාළ පුද්ගලයන් එවේලේම, ඊට පසුවදාම අතටම අල්ලාගන්න පුළුවන් වාතාවරණයක් මේ රටේ තාක්ෂණයත් එක්ක අද තිබෙනවා. එහෙම නම් මම හිතනවා, දිගන, තෙල්දෙණිය වෙච්ච සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න අනිවාර්යයෙන්ම පුළුවන් කියා; මෙය යටපත් කරන්න කවුරුවත් මහන්සි ගන්නේ නැහැ කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, ඉතිහාසය දිහා බැලුවාම අපි දන්නවා, හැම රජයක්ම, හැම පාලකයකුම මේකට වග කියන්න ඕනෑ කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1947 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂය බිහි කරන කොට අප ආවේ සියලු ජාතින් එක්ක එකතු වූ පක්ෂයක් හැටියටයි; සියලු ජාතින්ට ගෞරව කරන පක්ෂයක් හැටියටයි කියා තමුන්නාන්සේලා දන්නවා. අද කියනවා, මේ ආණ්ඩුව විශ්වාස භංග යෝජනාව වසාගන්න, එහෙම නැත්නම් බැලුම්කර සිදුවීම වසාගන්න අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා, මේ සිද්ධිය වුණාට පසුව ඒ ඔක්කෝම වැහෙනවා කියා. මතක තියාගන්න, මේ සිදු කරන්නේ වැරදි ප්‍රචාරයි කියන එක. ආණ්ඩුවට නොයෙක් විධියේ මඩ ගහන්න කටයුතු කරමින් අද මෙවැනි වැරදි දේවල් ප්‍රචාරය කරනවා. අපි එදා කිව්වා, පුළුවන් නම් විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න කියා. අපේ මන්ත්‍රීවරුන් කීපදෙනකු දීපු ලණු කාලා එය ගෙනෙන්න ලැහැස්ති වුණා. ඔබතුමන්ලාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් ගිහින් කිව්වේ මොකක්ද? අත්සන් ටික තිබෙනවා, අහඹරුවාදා අපි එය පෙන්වනවා, අපි එය බදාදා ඉදිරිපත් කරනවා කියා කිව්වා. නමුත් කරපු දෙයක් නැහැ. 'කන්දක් විලි ලා මී පැටියකු වැදුවා වාගේ' කිසිම දෙයක් නැහැ. එය පුස්සක් බවට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුවට ගහන්න අද මෙය පාවිච්චි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දැන් කථා කරන්න ඕනෑ, අද දිනට අදාළ මාතෘකාව ගැන. මට මතකයි මම අවුරුදු ගණනක් -1994 ඉඳලා 2000 දක්වා- හිටපු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයකු වූ ආචාර්ය රිවර්ඩ් පතිරණ මැතිතුමා සමඟ එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට බොහොම ළඟින් කටයුතු කළා. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අපි කීප වතාවක් සැලකිලිමත් වුණා. ඊට පසුව පත් වුණු අධ්‍යාපන අමාත්‍යවරු, -අද මේ පාර්ලිමේන්තුවේ සිටින ගරු බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා ආදී අය- විවිධ යෝජනා ගෙනාවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කොමිෂන් සභාව තිබෙන්නේ, මේ රටේ අධ්‍යාපනය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට උපදෙස් දීලා ඒ උපදෙස්වල තිබෙන යම් යම් යෝජනා ක්‍රියාත්මක කරන්නයි; එතුමාගේ අධීක්ෂණය යටතේ, එතුමාගේ අධ්‍යාපන කාර්ය සාධන බලකාය යටතේ කටයුතු කරන්නයි.

මම දන්නා ඉතිහාසයේ හැමදාම එක තැන පල්වෙන අධ්‍යාපන ක්‍රමයක් තමයි අපට තිබුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අධ්‍යාපනය වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වැය කළා. එදා ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන්ට පින් සිද්ධ වෙන්න එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් යටතේ අපි මේ රටේ නිදහස් අධ්‍යාපනය ලබා දුන්නා. ඊළඟට අපි නොමිලයේ පොත් ටික ලබා දුන්නා; නොමිලයේ නිල ඇඳුම් ලබා දුන්නා; මහපොළ ශිෂ්‍යත්ව දුන්නා. ඒ විධියට හැම දේම නොමිලයේ ලබා දීලා වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න අපි කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපි දන්නවා, එදා මෙදා අතරතුර බලන විට ලංකාවේ උපාධිධාරින්ට අද යන එන මං නැතිව ඉන්න බව. ඒ අයට තමන්ගේ දක්ෂතාවන්, හැකියාවන් තුළින් ඉදිරියට යන්න පුළුවන්කමක් නැහැ. අද කාර්යාලයකට ගිහින් බැලුවාම තමන්ට හරියට පුටුවක් මේසයක් නැතිව සංවර්ධන නිලධාරින් දුසිම් ගණන් ඉන්නවා. ඒ අයට හරියට කාර්ය නියමයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර අවස්ථාවල හරියට සංගීත පුටු තරගය වාගෙයි. එක්කෙනෙක් කෑමට යන්න ඕනෑ, අනෙක් එක්කෙනාට වාඩිවෙන්න. එහෙම නැත්නම් එක්කෙනෙක් වැසිකිළියට යන්න ඕනෑ, අනෙක් එක්කෙනාට වාඩිවෙන්න. මෙවැනි කාර්යාල පද්ධතියක් තමයි තිබෙන්නේ. මේ සියලුම දෙනා එක්කෝ කලා අංශයෙන් හොඳම උපාධිය ලැබූ අය; විශේෂ ගෞරව උපාධි ලැබූ අය. එහෙම නම් ඇත්ත වශයෙන්ම මේ රටේ අධ්‍යාපනය සකස් වෙන්න ඕනෑ, මේ රටේ ව්‍යාත්තියකට, මේ රටේ නිෂ්පාදනයට, මේ රටේ කෘෂිකර්මාන්තයට ගැළපෙන ආකාරටයි. මම දන්නේ නැහැ, ජාතික අධ්‍යාපන කොමිසම මේ සඳහා මොන තරම් සැලසුම් සකස් කළාද කියලා.

අද ජාතික සංහිඳියාව ගැන විශේෂයෙන්ම කථා කරනවා. වසර තිහක යුද්ධය අවසන් කරලා, අපි මේ රට ඉතාමත්ම නිර්මාණශීලී රටක් බවට පරිවර්තනය කරන්න කටයුතු කළා. අපි කිව්වා, මේක අධ්‍යාපනය තුළින් ඇති වෙන්න ඕනෑ කියලා; අපි වෙනසක් දකින්න ඕනෑ කියලා. දැකපු වෙනස මොකක්ද? මේ වාර්ගික අර්බුදය නිසා අවුරුදු තිහක යුද්ධයෙන් බැට කාලා ඒ භීෂණය අපේ හදවත් තුළ තැන්පත් වෙලා තිබෙනවා. සිංහල වෙන්න පුළුවන්, දමිළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන් මේ රටේ ජනතාව විශාල වශයෙන් ඝාතනයට ලක්වෙලා, රට අරාජිකවෙලා, රටේ සම්පත්, දේපොළ විනාශ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ඔබතුමා දන්නවා 1971 කැරැල්ල ගැනත්, 1988 - 89 කාලයේ සිදු වුණු දේවල් ගැනත්. ඒ දේවල් සම්බන්ධයෙන් යම් යම් සහන දුන්න බව අපි දන්නවා. විශේෂයෙන්ම තරුණ අසහනය පිළිබඳ කොමිෂන් සභා පත් කළා. හැබැයි, අද වන තෙක්ම මේ අසහනයට පිළියම් සොයන්නට අපට පුළුවන්කමක් ලැබුණාද කියන එක ගැන බලන්න ඕනෑ. ජාතික සංහිඳියාව ඇති වෙන්න ඕනෑ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළිනුයි; පාසල තුළින් ඇති වෙන්න ඕනෑ. අද තිබෙන පාසල් මොනවාද? ආනන්ද කියයි, නාලන්ද කියයි, රාජකීය කියයි, විශාඛා කියයි, ධර්මරාජ කියයි. තවත් සමහර පාසල් බෞද්ධ පාසල් බවට පත් කරමින් යනවා. ඉංග්‍රීසි අධ්‍යාපනය හොඳට ලබා දෙන St. Thomas' College, Wesley College වාගේ සමහර පාසල් තිබෙනවා. ඒ පාසල් වෙනම තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තවත් girls' schools, boys' schools තිබෙනවා. ඒ කියන්නේ පිරිමි පාසල් සහ කාන්තා පාසල්. මේ පාසල්වල තත්ත්වයන් දිහා බලන විට අද මේ වර්ගයන් එතැනම බෙදලා තිබෙනවා. අද අපි ජාතීන් ගැන කථා කරනවා; ජාතීන් හැටියට බෙදන්න එපා කියනවා. සිංහල, මුස්ලිම්, දමිළ ජනතාව විධියට බෙදන්න එපා කියලා කථා කරන අපි, පාසල් තුළ ගැහැණු පිරිමි වෙන් කරනවා. අද වෙනම පාසල් පද්ධතියක් හදනවා. නමුත් මිශ්‍ර පාසලක ඉගෙන ගත් කෙනෙක් හැටියට මම දන්නවා, අපි සහෝදර සහෝදරියන් හැටියට පාසල තුළ උසස් පෙළ ඉගෙන ගත්ත හැටි. අද ධර්මාශෝක විද්‍යාලය වාගේ විද්‍යාල දිහා බලන්න. මධ්‍ය මහා විද්‍යාල සංකල්පය මේ රට තුළ නිර්මාණය කරලා ඒ තුළින් මේ හැදියාව හදන්න ඕනෑ. එක අම්මාගේ කුසේ උපන් අයියලා, මල්ලිලා, අක්කලා, නංගිලා පාසලට ගියාට පස්සේ පාසලේ බිත්ති හතරින් වෙන් කරන තත්ත්වයකට පත් කර තිබෙනවා. ඒ නිසා මේ රටේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මීට වඩා වෙනස් වෙන්න ඕනෑ. අපි කැමැතියි, එහි සභාපතිතුමාගේ, උප සභාපතිතුමාගේ කාර්ය මණ්ඩලයේ වැටුප් වැඩි කරන්න; අවශ්‍ය දේවල් ලබාදෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අවශ්‍ය වෙනවා, ගෙවී ගිය කාල පරිච්ඡේදය තුළ - භය නැතිව මම මේ සභාවට යෝජනා කරනවා- 1994 සිට අවුරුදු 25කට ආසන්න කාලයක් තිස්සේ සිද්ධ වෙච්ච වෙනස්කම් පිළිබඳව අපට කියන්න කියලා. ඒ තුළින් අධ්‍යාපනයේ සංවර්ධනයක් ඇති වුණාද කියලා අපට කියන්න. ආකල්පමය වෙනස්වීමක් ඇති වුණාද කියලා අපට පැහැදිලි කරන්න. යමකට යම් දෙයක් කරන කොට පසුබිම් වාර්තාවක් තියෙන්න ඕනෑ, මේ ආයතනය තුළින් මෙන්න මේ දේවල් සිද්ධ වුණා; මෙන්න මේ නිසා මෙහි ප්‍රගතියක් තිබුණා; මේ නිසා අධ්‍යාපනයේ යම් යම් සංවර්ධනයන් වෙලා තිබුණා; ඒ නිසා මේ අයගේ වැටුප් , වෙතන, දීමනා වැඩි කරන්න ඕනෑ; ඒකෙන් අපට යම් දෙයක් ලබන්න පුළුවන් කියා. අපි අපේ දරුවන්ට පොත් ටික නොමිලයේ දෙන්නේ ඇයි; නිල ඇඳුම් ටික නොමිලයේ දෙන්නේ ඇයි?

එදිනෙදා කුලී වැඩ කරන, වත්තේ, ෆැක්ටරියේ වැඩ කරන, රබර් කඳුළෙන්, තේ දල්ලෙන් ජීවිතය ගැට ගසාගෙන ඉන්න දුප්පත් අනිංසක ජනතාවගේ දරුවන්, අනිංසක ධීවරයන්ගේ දරුවන් අනාගතයේ හැම දාමත් වත්තේ, ෆැක්ටරියේ වැඩ කරන කම්කරුවකු කරන්න, ධීවරයකු කරන්න, කුඹුරක් කොටන අයකු කරන්න නොවෙයි අපේ බලාපොරොත්තුව. අද ඒ ආකල්ප පැත්තකට දමලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව නවීන ලෝකයට ගැළපෙන, ඉතා හොඳ, ශිෂ්ට සම්පන්න, විනයගරුක පුද්ගලයකු මේ රටේ බිහි කරන්නයි. දක්ෂතා එක්ක සමාජයට හොඳ පුරවැසියකු නිර්මාණය කරන්නයි. ඒකට අපට ඉඩ ලැබුණේ නැහැ. ඒ නිසා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව බලන්න ඕනෑ, අපි මේ කථා කරන අවස්ථාව වන කොට මේ රටේ ඇති වෙලා තිබෙන ඉතාම අවාසනාවන්ත ඛේදවාචකයට පිළිතුරක් දෙන්න පුළුවන්ද කියන එක. අපි හැම දාම අධ්‍යාපන සැලසුම් හදනවා; විවිධ දේවල් කරනවා.

දැන් බලන්න, තාක්ෂණික විෂයය සම්බන්ධයෙන් ඇතිකර තිබෙන වෙනස. මා ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක එතුමන්ලාගේ සංකල්පයක්. හැබැයි, අපි ඒ සංකල්පය ඉදිරියට ගෙන යන්නට ඕනෑ. ඒක වහන්න, ඒක නතර කරන්න, ඒකට මුදල් ප්‍රතිපාදන නොදී ඉන්න අපි කටයුතු කරන්නේ නැහැ. ඒක හොඳ සංකල්පයක්. ඉහළට අධ්‍යාපනය ලබන්න බැරි අයගේ අතේ හුරුව අනුව, දක්ෂතා අනුව, ව්‍යාත්තීය පුහුණුව අනුව ඉස්සරහට යන්න පුළුවන් බොහොම සාර්ථක වැඩ පිළිවෙළක් තමයි ඒක. ඒ විතරක් නොවෙයි. අපේ රජය ඉදිරියට ගෙනාවා, විෂයයන් 09ම අසමත් වුණු -විෂයන් 09ටම "ඩබ්ලිව්" තිබෙන- දරුවන් යම්කිසි ව්‍යාප්තියි 26කට, නැත්නම් විෂයයන් 26කට සම්බන්ධ කරලා ඒ අයට අනාගතයේ ඉස්සරහට යන්න පුළුවන් වැඩ පිළිවෙළක්. ඒක අද ක්‍රියාත්මක වෙනවා. හැම දිස්ත්‍රික්කයකටම එක් පාසලක් තුළ ඒ සංකල්පය ක්‍රියාත්මක වෙනවා. මේක හොඳ සංකල්පයක්. මම දන්නේ නැහැ, මේක ජාතික අධ්‍යාපන කොමිසමේ සංකල්පයක් අනුව ආපු එකක්ද කියලා. කෙසේ වෙතත්, ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, දුර දක්නා නුවණින් යුතුව මේ කටයුත්ත ආරම්භ කරලා සාර්ථකව කරගෙන යෑම ගැන. මීපාවල ජාතික පාසල තිබෙන්නේ මගේ නිවස ඉදිරිපිට. ඒ පාසලේත් මේ වැඩ පිළිවෙළ ගෙන යනවා.

විශේෂයෙන්ම අපි ජාතික සංහිඳියාව ගැන කථා කරන කොට දෙමළ පාසල්, මුස්ලිම් පාසල්, සිංහල පාසල් වෙනම තිබෙන්නේ ඇයි කියන එක බලන්න ඕනෑ. ඇයි සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජාතීන් තුනම එකට ඉන්න පාසලක් නිර්මාණය කරන්න බැරි? ඒ සඳහා තවමත් අපි ප්‍රමාදයි. නමුත් අපි කථා කරනවා, සංහිඳියාව ගැන. උදාහරණයක් හැටියට ගත්තොත්, ආනන්ද විද්‍යාලයේ මුස්ලිම් ළමයි ඉන්නවා. ඒ ආනන්ද විද්‍යාලයෙන් අද නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා හැටියට පත් වෙලා ඉන්න ගරු රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා වැනි ශ්‍රේෂ්ඨ සිංහල මහජන නියෝජිතයන් - අපි එතුමාට සුබ පතනවා - බිහිවෙන කොට, මුස්ලිම් සහ ද්‍රවිඩ නායකයන්ද මේ සමාජයට බිහි වෙනවා. ඒ නිසා

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ජාතික සංහිඳියාව ඇති කරන්න පුළුවන් ප්‍රධානම දේ, කේන්ද්‍රස්ථානය, එහි උල්පත අධ්‍යාපනය තුළින් අපි ආරම්භ කරන්නට ඕනෑ. සංහිඳියාව පිළිබඳ මාතෘකාව පළමුවැනි පන්තියේ ඉඳලා ඒ දරුවන්ගේ හදවත් තුළට දමන්න ඕනෑ. නොයෙක් විධියට වර්ග භේද වාදය පෙන්වලා ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට ජාතිවාදය වපුරා දේශපාලන වශයෙන් ගන්නා වූ යම් යම් ක්‍රියා මාර්ග මුලිනුපුටා දමන්න පුළුවන්කමක් තිබෙනවා මේ වැඩ පිළිවෙළට. මේ වන විටත් අතිගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ තමයි ජාතික සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශයක් පිහිටුවා තිබීම.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනුම් දීමක් කරන්න තිබෙනවා. අද දින දිවා ආහාර විවේකයෙන් තොරව සභාවේ කටයුතු පවත්වා ගෙන යෑම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

සභාවේ කටයුතු ඉදිරියට ගෙන යෑමට මූලාසනය ගැනීම සඳහා සභාපති මණ්ඩලයේ සාමාජිකයකු කැඳවා ගන්නා ලෙසත් ගරු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලනවා. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමය වෙනස් කරන්නට පුළුවන්, ජාතික සංහිඳියාවක් මේ රටේ නිර්මාණය කරන්න පුළුවන් විශේෂ හැකියාවක් ජනාධිපතිතුමාට තිබෙනවා. එතුමාට මේ කොමිෂන් සභාවේ නිර්දේශ වහාම දෙන්නට ඕනෑ. තවත් මේ කටයුතු ප්‍රමාද කරන්නට ඕනෑ නැහැ. තවත් මේ තත්ත්වයට මුහුණ දෙන්නට අපට පුළුවන්කමක් නැහැ. වාර්ගික අර්බුදයක් තුළින් නැවතත් ජාතිවාදී කෝලාහල ඇති වෙන්නට බැහැ. ඒක අලුත්ගම වුණා; ගිංතොට වුණා; අම්පාරේ වුණා. හැබැයි, භයානක විධියට දිගන, තෙල්දෙණිය ප්‍රදේශයේ වුණා.

එහෙම නම් අපි ලෑස්තිද, තවත් ප්‍රදේශයක මෙවැනි තත්ත්වයක් ඇතිවන විධියට කටයුතු කරන්න? මේ ප්‍රශ්න විසඳන්න නම් සාකච්ඡා කරලා විතරක් වැඩක් නැහැ. පාර්ලිමේන්තුව තුළ කිඹුල් කඳුළු හෙළන සමහරු මේවාට උඩ ගෙඩි දීලා, මේ වාගේ දේවල් නිර්මාණය කරලා, ආණ්ඩුවට ඇහිල්ල දිගු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉතාම පැහැදිලිව මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න ඕනෑය කියලා මම කියනවා. හැම දේකටම කොමිෂන් සභා හදන මේ වෙලාවේ, වෙච්ච වැරැදි පිළිබඳව, සිදු වුණු ඉතාම සාහසික දේවල් පිළිබඳව, එවැනි කොමිසමක් හරහා හෝ වහාම කටයුතු කරන්නට ඕනෑ. හැබැයි, ඒ සඳහා වැඩි කාලයක් යවන්න බැහැ. කෝප් කමිටුවේ වාර්තා අරගෙන කෙටි කලක් තුළ ඒ ගැටලුවලට යම් කිසි විසඳුමක් දෙන්න, එහෙම නැත්නම් වරදකරුවන්ට වහාම දඬුවම් කරන්න කටයුතු කළා වාගේ, අපි මේ සම්බන්ධයෙන්ද වහාම කටයුතු කරන්න ඕනෑ. මේ සිද්ධිය තුළ යම් දේකට වැරදිකරුවන් ඉන්නවා නම් ඔවුනුත්, ඒවාට රහස්‍ය අන්දමින් හෝ ඕනෑම අයුරකින් උපකාර කරපු අය ඉන්නවා නම් ඔවුන්ද ඇතුළු මේ විනාශය ඇති කරපු සියලුදෙනා තරාතිරම නොබලා අධිකරණය වෙත ගෙනැල්ලා එක දිගට නඩු අහන්න ඕනෑ. එවැනි අධිකරණයක් දැන් අපි ස්ථාපිත කරලා තිබෙනවා. එම කාරක සභාවේ සාමාජිකයන් හැටියට තමුන්නාන්සේලා-අපි දූෂණවලට - corruption - විරුද්ධව කටයුතු කිරීම සඳහා මහාධිකරණ 3ක් හදන්න තීන්දු කරලා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය විනිශ්චයකාරවරු, රජයේ නීතිඥවරු - State Counsellors - ගණන වැඩි කරලා තිබෙනවා. ඒ අයට වැටුප් සකස් කරලා තිබෙනවා. එහෙම නම් ඒ පහසුකම් පාවිච්චි කරලා දැන්ම මේ සිද්ධිය පළමුවැනි නඩුව හැටියට විභාග කරන්න. මේක කල් දාන්නට අවශ්‍ය නැහැ. දිගන, තෙල්දෙණිය ප්‍රදේශවල සිදු වුණු මේ භයානක තත්ත්වයට පිළියම් කරන්නට අවශ්‍ය නම්, මෙම සිද්ධිය පළමුවැනි නඩුව හැටියට විභාග කරන්න තීන්දුවක් අරගෙන තරාතිරම නොබලා අපරාධකරුවන්ට දඬුවම් කරන්නට හැකි වාතාවරණයක් නිර්මාණය කරන්නට ඕනෑ. එතකොට ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනින් විතරක් නවතින්න හොඳ නැහැ. මෙතෙක් කල් සිදු වුණු මෙවැනි අපරාධවලින් විනාශ වුණු දේපළවලට, වාර්ගික, ජාතිවාදී කෝලාහල තුළින් විනාශ වුණු දේපළවලට වන්දි ගෙව්වේ කවුද? කලුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමා ඒක දන්නවා. ඒ සඳහා වන්දි ගෙව්වේ කවුද? දුක් විඳින අහිංසක මිනිස්සු කඩේට ගිහිල්ලා ගන්න පාන් ගෙඩියට, හාල් ටිකට, සීනි ටිකට, පරිප්පු ටිකට, තෙල් ටිකට ගහන බදුවලින් එකතු කරන සල්ලි තමයි මේ විනාශ වුණ ගෙවල් දොරවල් හදලා දෙන්න, වන්දි මුදල් ගෙවන්න යොදවලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා විනාශ වුණේ දේපළ වෙන්න පුළුවන්, ජීවිත වෙන්න පුළුවන්, ඒ සඳහා ගෙවන සෑම වන්දියක්ම ඉතාම සාහසික ලෙස මේ අපරාධ නිර්මාණය කළ අපරාධකරුවන්ගෙන් අය කරගත යුතුය කියන යෝජනාවකුත් මම ගෙනෙනවා. ඒ අයගෙන් අයකර ගන්න පුළුවන් ආකාරයට නීතිය බලගන්වන්නට ඕනෑය කියන කාරණයත් සොයා බැලිය යුතුයි. අපි දන්නවා, ඒක එහෙම වුණොත් එක්කෙනෙක්වත් මෙවැනි අපරාධ කරන්න පාරට බහින්නේ නැහැ කියලා. එහෙම වුණොත් ඒ අපරාධකරුවන් දන්නවා, තමුන්ට වන්දි ගෙවන්න වෙනවා කියලා. ඒක අපි ප්‍රායෝගිකව පෙන්වන්න ඕනෑ. එහෙම නැතුව ඒ ගැන අපි අද මෙතැන කථා කරලා විතරක් වැඩක් නැහැ. තව සතියක් දෙකක් යනකොට ඇඳිරි නීතියත් නැති වෙයි, හදිසි නීතියත් නැතිවෙයි. සුළු සිද්ධියක් හරහා නැවත මෙවැනි ව්‍යසනයක් ඇති වෙන්නට පුළුවන්. අපි ඒකට මුහුණ දෙන්නට ඕනෑ. ඒ සඳහා දැන් සිටම මේ කටයුතු කරන්න ඕනෑ. එහෙම වුණොත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සුදු අලියෙක් බවට පත්වෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
අපි ලෑස්තියි ඒ අයගේ වැටුප් වැඩි කරන්න. ඒ එක්කම අවශ්‍ය කටයුතු කරන්නත් අපි සූදානම්. මෙහි ප්‍රතිඵලය මොකක්ද, කොයි

ආකාරයට සිද්ධ වුණාද කියලා පාර්ලිමේන්තුව හැටියට ඒ හැම දෙයක් ගැනම අපි පසු පස සිට බලනවා. ඒ සඳහා අවශ්‍ය කාරක සභා තිබෙනවා. ඒ නිසා ජාතික අධ්‍යාපන කොමිසම වහාම රැස් වෙන්නට ඕනෑ. ඔවුන්ගේ භූමිකාව පිළිබඳව, පසුගිය කාලයේ කරපු ඒවා, නොකරපු ඒවා පිළිබඳව අපි පශ්චාත් පරීක්ෂණ පවත්වනවා නොවෙයි. හැබැයි, ලබන අවුරුද්දේ ඉඳලාවත් අඩු ගණනේ සහජීවනය කියන මාතෘකාව පාසල් syllabus එකට, අපේ දරුවන්ගේ අධ්‍යාපනයට එකතු කරන්නට ඕනෑ. ඒ පිළිබඳව පොත් නිර්මාණය කරන්නට ඕනෑ. දරුවන්ට පළමුවැනි පන්තියේ සිටම මේ පිළිබඳව අවබෝධයක් දෙන්නට ඕනෑ. ඒ වාගේම ගුරුවරුන්ට පුහුණුවක් දෙන්නට ඕනෑ. සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාට එකට ජීවත් වෙන්නට පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑ. පාසල් වර්ග කරලා, පැත්තකට දාලා, කොන් කරලා තබන්නට අවශ්‍ය නැහැ. ඒ හොඳ කටයුතු සඳහා මුදල් වියදම් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ සිද්ධ වෙලා විනාශ වෙලා යන දේපළ වෙනුවෙන් වියදම් කරන කෝටි ගණන්, ප්‍රකෝටි ගණන් මුදල අධ්‍යාපනයට ආයෝජනය කළොත්, ඒ තුළින් මේ රටේ ජනතාව අතර සහජීවනයක් ඇතිවෙයි කියා මා විශ්වාස කරනවා. එහෙම නම්, සුදු අලි බවට පත්වෙලා තිබෙන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වැනි කොමිෂන් සභා ඉදිරියේදී ශක්තිමත් වෙලා, ප්‍රාණවත් වෙලා, අතිගරු ජනාධිපතිතුමාට හොඳ උපදෙස් ලබාදෙන ආයතන බවට පත්වෙලා, ඒ තුළින් මේ රටේ අධ්‍යාපනයේ සංවර්ධනයක් ඇතිවෙලා, ආකල්ප වර්ධනය කරන්නට අවශ්‍ය පසු බිමක් සකස් වෙයි කියා බලාපොරොත්තු වෙමින්, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 12.28]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා වෙන මේ වැදගත් කාරණයේදී පළාත් සභාවක හිටපු අධ්‍යාපන ඇමතිවරයෙක් විධියට ජාතික අධ්‍යාපන කොමිසමේ කාර්ය භාරය පිළිබඳව මම විශේෂයෙන්ම කථා කරන්න කැමැතියි. එම කොමිසමේ නිලධාරින්ට වැටුප් වැඩි කිරීම පිළිබඳව අපි එකඟ වෙනවා. ඔවුන් මේ ජාතියේ අධ්‍යාපනය හදන, ඒකට සැලසුම් හදන, ප්‍රතිපත්ති හදන ආයතනයක වැඩ කරන නිලධාරින්. මේ ආයතනය 1992දී එවකට රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා තරුණ අසහන කොමිසම් වාර්තාවේ නිර්දේශයක් අනුව පිහිටුවපු ආයතනයක්. දැන් අවුරුදු 25ක් මේ ආයතනය මේ රටේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපි ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සැලසුම් කරලා හදපු ප්‍රතිපත්ති අනුව අවුරුදු 25කට පස්සේ මේ රටේ අධ්‍යාපනය හැදුනා ද කියන කාරණය මේ මොහොතේ අපි සාකච්ඡාවට ගන්න ඕනෑ. ජාතියේ අධ්‍යාපනයේ ඉදිරි දැක්ම හදන මේ ආයතනයට මා දන්නා විධියට මේ අවුරුද්දේ රුපියල් හාරකෝටි අනූහතරලක්ෂයක් වෙන් කරලා තිබෙනවා. මේ රටේ අනෙකුත් ආයතනවලට කරන වියදම එක්ක බලද්දී මේක ලොකු මුදලක් නොවෙයි. මොකද, ජාතියේ අනාගතය හදන්න සිටින දරු පරපුරක් යහපත් පුරවැසියන් කරන්න මහ හදන ආයතනයකට වැඩියෙන් මුදල් වෙන් කළාට කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ එදා මේ අධ්‍යාපන කොමිෂන් සභා පිහිටුවීමේ අරමුණු අද ඉෂ්ට වෙලා තිබෙනවාද කියන එකයි. අධ්‍යාපනයේ ජාතික අරමුණු නවයක් එදා ඉදිරිපත් කළා. ඒකෙන් ප්‍රධානම කාරණය තමයි, ශ්‍රී ලාංකීය ජාතියක් නිර්මාණය කිරීම. ඊයේ-පෙරේදා ඉඳලා මේ මොහොත දක්වාම මේ සභාවේත්, රටේ සියලුදෙනාත් කථා කරන්නේ ජාතියේ බෙදීම, බිඳීම, කඩාවැටීම පිළිබඳවයි. මේ ආයතනය පිහිටුවලා 25 අවුරුද්දකට පස්සේ ලේ නම් හැලෙන්නේ, කඳුලු නම් ගලන්නේ, ගොඩ ගැහෙන්නේ මලමිනී නම්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවක් පිහිටුවීමේ අරමුණ ඉෂ්ට වී තිබේද? මහපොළොවේ යථාර්ථයත්, මේ බිමේ යථාර්ථයත්, කොමිසමේ පරමාර්ථයත් ඉෂ්ට වෙලා නැහැ කියන එක තමයි මම කියන්නේ. ඒකේ ඉන්න නිලධාරින් විවේචනය කරන්න මට වුවමනාවක් නැහැ. මේ සභාව ඇතුළේ ඉතිහාසය පුරාම ජාතික සංහිඳියාව ගැන, ජාතික සමගිය ගැන වචන කෝටි ගණනක් අපි පාවිච්චි කරලා තිබෙනවා. හැබැයි, මේ සභාවේ ඒවා ගැන කථා කරන අය වේදිකාවේ එකක් කියලා, වේදිකාවෙන් බැහැලා තව එකක් කියලා තිබෙනවා. ඒක තමයි ඇත්ත.

අපි අද මේ රටේ ජනමාධ්‍ය, මාධ්‍ය ජාලා සියල්ල පරිහරණය කරලා බැලුවොත් හැමතැනම තිබෙන්නේ ලේ. එක්කෝ, වාහන අනතුරු. නැත්නම්, මරා දැමීම්, විනාශ කිරීම්, දූෂණය, හොරකම්, වංචාව, නැති බැරිකම, දුප්පත්කම, ස්ත්‍රී දූෂණ, දරුවන්ට හිංසා කිරීම් ආදී මේ සියල්ලන්ගෙන්ම අපේ රට පිරිලා. සමහර තාත්තලා කුඩා දරුවෝ දූෂණය කරලා මරනවා. මුණුපුරෝ ආච්චිලා දූෂණය කරලා මරනවා. හැමතැනම ටයි කෝට් හොරුත් ඉන්නවා. සාමාන්‍ය අය විතරක් නොවෙයි, ටයි කෝට් හොරුත් ඉන්නවා. කිසිම තැනෙක සැනසිල්ලක් නැහැ. සොඳුරු දර්ශන, සුන්දර සිතිවිලි මේ සමාජයෙන් පළා ගියේ ඇයි? අපි අධ්‍යාපනයේ අරමුණු ඉෂ්ට කරගෙන නැහැ කියන එකයි මට මෙතැනදී කියන්න තිබෙන්නේ. ඒ නිසා අපි අධ්‍යාපනය ලඝු කළා, විභාගයකට. A - 9 , A - 3 සහ 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵලවලට අපි අධ්‍යාපනය ලඝු කළා.

යහපත් දරුවෙක්, ජීවිතය සමත් කරන දරුවෙක් වෙනුවට අපි හැදුවේ විභාග සමත් කරන යාන්ත්‍රික මිනිහෙක්. අනෙකාට අසංවේදී, අනෙකාට ඇහුම්කන් නොදෙන, අනෙකාගේ දුක බෙදාගත නොහැකි, ආත්මාර්ථකාමී, අනෙකා යටපත් කොට තමන්ම නැඟී සිටින මිනිසුන් විධියට අපි හැදුවේ දෙපා සතුන්. අපි මිනිහෙක් කියා කිව්වේ එක්කෝ ටයි කෝට් අඳින, රැකියාවක් කරන කෙනෙකුටයි. එහෙම නැත්නම් අතේ, කරේ රත්තරන් දිලිසෙන කෙනෙකුටයි. මනුෂ්‍ය ගුණ ධර්මවලින් පිරුණු දරුවෙක් හදනවා වෙනුවට, විභාග සහතිකයක් ඔලුවේ තියාගෙන අපි දැනුත් ඇවිදිනවා. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරින් කවුරුන් හෝ අද මේ සභාවේ රජයේ නිලධාරින්ගේ මැදිරියේ

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

සිටිනවා නම් මම කියන්නේ, මේ සමාජයේ ගලන කඳුළුවලට, ලේවලට, ගොඩ ගැහෙන මළ මිනීවලට තමුන්නාන්සේලා සියලුදෙනා අපිත් එක්ක වගකිව යුතු බවයි. ජීවිත ප්‍රශ්න පත්‍රයට උත්තර ලියන්න බැරි, ඒත් විභාග ප්‍රශ්න පත්‍රයට උත්තර ලියන දරුවෝ තමයි අපි හදලා තිබෙන්නේ. විභාග ප්‍රශ්න පත්‍රයට උත්තර ලිව්වාට, ජීවිත ප්‍රශ්න පත්‍රය ඉස්සරහා නිරුත්තර සමාජයක් අපි හදලා තිබෙනවා. අපි හැම දාම මේ ගැන මහා විද්වත් සාකච්ඡා පවත්වා තිබෙනවා. හැබැයි ප්‍රායෝගිකව මහ පොළොවේ පැළ කරපු දේ, ඒක නොවෙයි කියලා දැන් අපි තේරුම් ගන්න ඕනෑ. අපි ශ්‍රී ලාංකීය ජාතියක් නිර්මාණය කළේ නැහැ. ජාතික අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණුවලින් එකක් වුණු ශ්‍රී ලාංකීය ජාතියක් අපි නිර්මාණය කළේ නැහැ. වර්ගවාදය, අන්තවාදය, ආගම්වාදය, කුලවාදය කියන මේ එකක්වත් අඩු නැතිව මේ මහ පොළොවේ තවම තිබෙනවා. මැතිවරණයකදී අපි අපේක්ෂකයන් තෝරන කොටත් කුලය බලලා තිබෙනවා. අපි ඇත්ත වසන් කරගෙන කථා කරන්න ඕනෑ නැහැ.

අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමා කිව්වා, පසුගිය මැතිවරණයේ ප්‍රතිඵලවලින් පසුව තමයි හුහක් දේවල් මේ රටේ ඇවිලෙන්න පටන් ගත්තේ කියලා. සියලුදෙනාම මේ කාරණය මතය තියාගන්න ඕනෑ. අපි ජයග්‍රහණය කළේ වර්ගවාදයෙන් නොවෙයි; අන්තවාදයෙන් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයත්, මමත් සාමාජිකයකු වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකතු වෙලා හදපු ආණ්ඩුව පසුගිය තුන් අවුරුද්ද තුළ මේ රටේ වපුරපු දෙයින් අපේ ගොවීන්ට කන්න නැත්නම්, ඔවුන් ඉන්නේ බඩගින්නේ නම්, ඔවුන් මේ ආණ්ඩුවට ඡන්දය දෙන්නේ නැහැ. කුඹුරට පොහොර ටික නැත්නම්, දරුවාට රස්සාව නැත්නම්, ගමේ බෝක්කුව, පාර හැදුණේ නැත්නම්, ජීවත් වෙන්න මහක් නැත්නම්, හෙටක් පේන්නේ නැත්නම් ඒ අය සතුටින්ද ඉන්නේ? අන්න ඒ අයගේ විරෝධයයි මේ ආණ්ඩුවට එරෙහිව එල්ල වුණේ. ඒක මුස්ලිම් විරෝධයෙන්, දෙමළ විරෝධයෙන් හදපු එකක් නොවෙයි.

තමුන්නාන්සේලාට ඉතිහාසය මතක තිබෙනවා නම්, විසිහය අවුරුද්දක්ම මම ජීවත් වුණේ යුද්ධයත් එක්කයි. එක මිනී වළේ මිනී පෙට්ටි 53ක් තැන්පත් කරපු ගෝනගල ඝාතනය සියැසින් දැකපු මිනිහෙක් මම. ඔවුන් මැරුම් කෑවේ සිංහල නිසායි. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. මඩකලපුවේ කාත්තන්කුඩි පල්ලියේදී මුස්ලිම්වරු 173දෙනෙක් මැරුම් කෑවේ ඒ අය මුස්ලිම් වූ නිසායි. ඒ වාගේම මගේ දිස්ත්‍රික්කය වන අම්පාරේ බිසීසී හන්දියේදී දෙමළ මිනිසුන් සිංහල මිනිසුන් අතින් මැරුම් කෑවේ ඔවුන් දෙමළ වූ නිසායි. දෙමළාට දෙමළ වීම නිසා මරණය නම්, සිංහලයාට සිංහල වීම නිසා මරණය නම්, මුස්ලිම්වරුන්ට මුස්ලිම් නිසා මරණය නම්, අපි හැදුවේ කුමන රටක් ද? අපි ඔක්කොම ලජ්ජා වන්නට ඕනෑ. එකිනෙකාට චෝදනා කර ගන්නා එක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. යථාර්ථය නම් මේ මහ පොළොවේ හැලෙන ලේවලට, හැලෙන කඳුළුවලට අපි වග කියන්නට ඕනෑ. අපි සියලුදෙනා එයට වග කියන්නට ඕනෑ. මම බෞද්ධයෙක්. මම සිංහලයෙක් වීමට වඩා මම ආඩම්බර වෙන්නේ මම බෞද්ධයෙක් වීම නිසායි. "සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නීරෝගි වෙත්වා, සුවපත් වෙත්වා" කියපු දහමක් අදහන රටක අනුගමනීය පෙළිවෙත අප තුළ නැහැ. අපි අහස උසට බුදු පිළිම හැදුවාට; අසූඅට රියන් බුදු පිළිම හැදුවාට අපේ පපු කැවුතුවල බුදුගුණ කොච්චර තිබෙනවාද කියා අපිම සමාලෝචනය කර බැලිය යුතුයි. අල් කුරාණයේ කියන දෙය, භගවත් ගීතාවේ කියන දෙය, බයිබලයේ කියන දෙය මහපොළවේ නැත්නම් වැඩක් වෙන්නේ නැහැ. අපි පන්සල් හැදුවාට, අපි පල්ලි හැදුවාට, අපි කෝවිල් හැදුවාට අපි මිනිස්සු හැදුවේ නැහැ. හදලා තිබෙන්නේ මිනිස්කමක් නැති දෙපා සතුන්. ජාතික අධ්‍යාපන කොමිසමේ කවුරු හෝ මෙතැන මම මේ කියන දෙය අහගෙන ඉන්නවා නම් තමුන්නාන්සේලා කරුණාකර මේ බෙදවාචකයෙන් මේ රට බේරා ගන්න. තනතුරු බේරා ගැනීම නොවෙයි කළ යුත්තේ.

ඉතිහාසයේ ජාතික අධ්‍යාපන කොමිසමට හුඟ දෙනෙක් පත් කර තිබෙන්නේ දේශපාලන පරාජිතයෝ. එසේ නැත්නම් දේශපාලකයන්ගේ ඥාතීන්, හිතවතුන්. එය විද්වතුන්ගේ ස්වාධීන කොමිසමක් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක තබා ගන්න ඕනෑ, ලෙයින් ලියැවුණු ඉතිහාසයක්, කඳුලෙන් ලියැවුණු ඉතිහාසයක් තිබුණු බව. ඒ ඉතිහාසය වෙනස් කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. දෙමළ මිනිහාට දෙමළ විධියටත්, මුස්ලිම් මිනිහාට මුස්ලිම් විධියටත්, සිංහල මිනිහාට සිංහල විධියටත් මේ රටේ මහපොළොවේ පය තියලා ඇවිදින්නට උතුරේ බිම්බෝම්බ පහළොස් ලක්ෂයක් ඉවත් කළා. ඒ බිම් බෝම්බ ඇතිරුවේත් මහින්ද ද? මුස්ලිම් මිනිහා කුඹුරට යනකොට මරා දැම්මේ මහින්ද ද? සිංහල මිනිහා සිංහල වීම නිසා පන්සලේදී මැරුවේ මහින්ද ද? මහින්ද නේද ඒ ඔක්කොටම ජීවිත දානය දුන්නේ? ඔවුන් හැමදෙනාටම මේ මහ පොළොවේ ජීවත් වෙන්න උරුමය හදා දුන්නා. මහින්ද මේකේ වැරදි කාරයෙක් කර ගන්න එපා. ඒක සාපරාධී අපරාධයක්. ඔහු චිත්තිකරුවෙක් නොවෙයි. ඔහු ගැලවුම්කරුවෙක්. ගැලවුම්කරුවා චිත්තිකරුවෙක් කරන්න තමුන්නාන්සේලා උදේ සිට රෑ වෙනතුරු මේ සභාවේ ඉඳලා සාක්ෂි සොයනවා. විමලවීර දිසානායක මෙතැන හුස්ම ගන්නේ මහින්ද නිසා. මහින්ද හිටියේ නැත්නම් විමලවීර දිසානායකටත් මරණය. මේ සභාවේ ඉන්න හුඟ දෙනෙකුට මරණය. ඒ මරණයේ දේශයට ජීවිතය දුන් මිනිසා චිත්තිකරුවෙක් කරන්න උදේ සිට රෑ වනතුරු කථා කරනවා. එම නිසා මේ සිදුවන අපරාධවලට මහින්ද අල්ලා ගන්න එපා; පොහොට්ටුව අල්ලා ගන්න එපා; පොදුජන පෙරමුණ අල්ලා ගන්න එපා. කිසි දවසක මහින්ද රාජපක්ෂ මුස්ලිම් මිනිසුන්ට විරුද්ධව කිසිවක් කර නැහැ. ඔවුන්ගේ ජීවිත බේරා දෙන්න මහින්ද කටයුතු කළා. යන්න කල්මුනේට; යන්න අක්කරපත්තුවට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසාන කරන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)ts
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රදේශවල වැඩි කාලයක් ජීවත් වුණු මුස්ලිම් මිනිසුන්ට ඒ පාරවල් හදා දී, විදුලිය ලබා දී, රෝහල්, පාසල් හදා දී තිබෙනවා. මේ සියල්ල මුස්ලිම් ජනයාට ගොඩ නහා දුන්නේ මහින්ද. ඒ මුස්ලිම් මිනිසුන් අතරට මහින්ද ද්‍රෝහියෙක් කරන්න උත්සාහ කරන්න එපාය කියා මතක් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Seyed Ali Zahir Moulana.

[12.40 p.m.]

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Bismillahir Rahmanir Raheem.

Thank you, Hon. Presiding Member. I rise on a day that brings to a close what can be argued as one of our country's darkest weeks in its history. I rise to speak today, not as a Muslim, but as a patriotic and a nationalistic Sri Lankan.

Sir, before the discourse and the blame game blurs the clarity of what is absolutely fundamental, I wish to state the obvious. The feelings of the silent majority in our country - patriotic Sinhalese, Tamils, Muslims, Burghers and all others who comprise of our rich diverse and proud heritage, all resonate - is simply this : "We have been there before and we are headed fast towards the precipice once more."

We have seen what the civil conflict which ended in 2009 did to our people and to our country. We are still reeling with its aftermath, which has set us back decades and robbed us of tens of thousands of our country's mothers, fathers and children - who could have been productive individuals today. Those 30 years destroyed our economy, our educational system which we hold so dear and it also distorted our society in such a way preventing us from achieving our truest potential - the real "Wonder of Asia."

At a time when we are on the mend, the recent attacks in Kandy, Ampara, Gintota, Aluthgama and other areas can be drawn a parallel to a return to the dark days of July, 1983, when some undesirable elements on both sides of the divide created a fear psychosis and a sense of alienation, which spiraled ultimately towards a civil war.

Today, we are in a similar predicament, where undesirable elements have spread a campaign of hate and fear against not only the Muslim community, but against our fellow Sri Lankans. Moreover, they are attempting to pose a threat to our strongest weapon - our identity as a united Sri Lanka, citizens of one resplendent, diverse and rich nation.

While our identity remains largely intact, it is absolutely imperative that the responsibility thrust upon us by our fellow citizens of preserving our ideals, beliefs and harmonious co-existence lies predominantly with us - the Government.

I must state, to give credit to where it is due, that this Government has gone further than others in ensuring that equality and human rights of all Sri Lankans are adhered to, honoured and given due precedence. However, the events of the last few weeks are evident that we still have a long road ahead for us.

It is absolutely evident that some time needs to be spent pondering on the past to ensure that those mistakes are not committed again. This is relevant to the immediate past and to that of 1983 when mobs in Colombo ran amok, looting and murdering while most of the police and armed forces just looked on and did little.

Yet today, while the situation in Kandy has reverted to a proverbial calm, largely due to the presence of the police and the military and through the enactment of a State of Emergency - for the first time in seven years - such escalation of conflict could have been avoided in its entirety at the very inception, had the relevant authorities exercised the same due process of jurisprudence that it exercise with regard to all forms of violations. Had that been done, these violent attacks would not have scaled up so drastically and caused pain and fear to all Sri Lankans.

Sir, the arrests made yesterday of the ringleaders of the repugnant group could have been made earlier, let alone weeks if not months and years ahead. Why? Because the laws of our country allow us to do so. If only impartial justice prevailed, then Chapter 15, Sections 219A and B of the Penal Code provides the precedent to bring them to justice. Let Kandy, and the unfortunate history be a testament and a precedent that justice should prevail and be exercised in its entirety to indict and punish any group or individual who incites and promotes hate speech in our country, irrespective of his race, religion or creed.

Further, it is an increasingly evident aspect that the road to reconciliation and inclusion needs to be better paved, and that the Government is in a severe need to increase its vitality in driving intensive programmes of social inclusion and co-existence, because no matter how much infrastructure is developed, the people who live in an around them need to live in a land of mutual respect, admiration and harmony.

Looking ahead, we should brace ourselves to face the unfortunate after-effects of Kandy, its economic setbacks and the divisive agenda that could follow.

However, Sir, this is also an opportune time for us to act not just as a Government but as true patriotic Sri Lankans. The world is watching us. Are we to slip back into the folds of divisiveness that has plagued our history or do we to rise from the ashes of Digana, Teldeniya, Pallekele, Thambuttegama, Menikhinna, Akurana and other areas and show them that we are a united and a free Sri Lanka?

Moreover, we have to show this to ourselves and we have a responsibility to show the same to the generations that follow to ensure that no matter what obstacles those undesirable elements attempt to throw in our path, we are one Sri Lanka.

[ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා]

Having said that, Sir, when we particularly talk about incidents such as acts of ethnic violence, attacks on mosques and causing damage to properties of people, that have been emerging in various other places of the country, especially in the Ampara and Kandy Districts, it is very obvious that these are not isolated incidents, but are acts that are being carried out in a conspiratorial manner by organized factions and individuals against one particular community with the objective of destabilizing the country and the Government.

The latest of this series of incidents are the unfortunate ones that occurred in the Kandy District centering on areas such as Digana and Teldeniya last Monday, 05th of March. What becomes clear when carefully focusing attention on these incidents is that organized groups and individuals have on account of certain incidents arrived at the places where the incidents have occurred and unleashed violence in a severe manner. Although, on the surface, it looks as if violence is unleashed against Muslims, it should be made clear that myriad sinister motives exist in the background.

Sir, one Sinhalese youth called Kumarasinghe has lost his life in an unfortunate manner due to a clash that occurred in a fuel filling station in Digana area and the police have arrested four Muslim persons suspected in connection with it. The funeral of the youth was held on March 4th and gangs by pretense of attending the funeral brought the lives, properties, mosques and shops of Muslim people under orchestrated attacks.

According to the information reported so far, damages have been inflicted on more than 25 mosques, hundreds of shops, houses and vehicles belonging to the Muslim people. Although the police imposed curfew in the Kandy District and tried to curb the unrest to a certain extent, the situation was not under total control and the lives of the community in the areas has been disrupted to a great extent.

Similarly, due to the violent and racially provocative incidents that had occurred in the Ampara Town on the night of 26th February, severe damage had been caused to a Muslim place of worship and three cafes located in the town.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡා කරන විෂයට අදාළව කථා කරන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Let me finish these few things and come to the point.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Following this incident, a tense situation was brewing in the Ampara Town and the background was growing towards a clash between the two communities. That unrest and disruption of law and order continued for a number of days and seem to have been brought under control to a certain extent.

Under the given circumstances, it is commendable of the President, the Prime Minister and the authorities who acted sincerely in this regard to bring the situation somewhat under control, though incidents continuously took place .

Clear and direct evidence disclosed the fact that attacking and damaging of mosques and restaurants and causing a tumultuous situation was carried out by an unlawful assemblage of persons in one continuous act.

Many questions have been raised regarding the manner in which action was taken in this regard and how the law was enforced.

What the police have reported initially to the court of law was that the above-mentioned incidents were acts of racial violence and an incident which created unrest among communities. The police told the court that the acts, therefore, fall under the International Covenant on Civil and Political Rights and action should be taken accordingly. But the police's latter reports to the court pointed out that there is no reason to file action under the above-mentioned law as the incidents started due to a personal dispute and action should be taken under the ordinary law of the country.

At the same time, the above-mentioned incidents had been reported to court as if they were normal acts of violence, concealing the fact that the attacking and damaging a mosque, destroying several shops and creating ethnic unrest were committed by unlawful assemblage of people. That was concealed from the court, which by itself is a biased and unacceptable offence on the part of the police. Sir, the overall incidents referred to above are confirmed to have been a ridiculous tactic orchestrated by organized groups and persons who contributed to trigger off ethnic violence.

According to the facts reported, a person who came to an eatery run by a Muslim on the night of 26th February alleged that a tablet had been included into the food that was ordered by the consumer, which triggered the whole series of events. It is reported that the person concerned gave telephone calls to pre-organized mobs, telling them that “fertility-impairing tablets” are mixed into the food sold at the eatery called Cassim Restaurant in Ampara Town and that the Muslims are attempting thereby to reduce the population of Sinhalese.

Nevertheless facts are being put forth in medical science circles that infertility cannot be caused by mixing tablets with food. This has been confirmed in the official communique' issued by the Director General of Health

Services subsequently. This clearly manifests that a certain group and individuals are using baseless ground to conjure a negative image of the Muslims and attack them and their places of worship, to damage properties and to trigger violence.

It is my impression that it is highly probable that unfortunate incidents of this nature may be recurrent in time to come. It is clear that they attempt to destabilize the Government to achieve their narrow political goals.

The most serious aspect of this incident is the conduct of the Police Department, which is supposed to be preserving and enforcing law and order, have failed in their duties. Therefore the people of the area complain that the Ampara Police have acted in a biased and unprofessional manner. The people of the area have lost confidence in the Police as they believe that such prejudice prevailed aiming the law enforcement authorities who instead of suppressing the violence and taking action against the perpetrators in order to preserve law and order.

It should be pointed out that the manner in which the police have acted during the incident is totally different from their action during the incidents that occurred in Thambuththegama and Gintota. During those two incidents, the police acted immediately and enforced law and order by filing action against the perpetrators.

At a time when the Government is acting with responsibility to bring about reconciliation and ethnic unity, on the other hand, the above-mentioned conduct on the part of the law and order, which is another arm of the executive, cannot be approved of.

It should be stated that the sinister motives behind the incidents of this nature are to destroy the good impression which the United Nations and the international community already have of our country . Such motive will only lead to destabilize the country and drag it into an abyss and thereby to disrupt the economic activities of the people.

As I speak here now the Muslims in this country are about to go for Jummah prayers whilst our security forces have assured for the peaceful conduct of Jummah prayers all over the country. While thanking His Excellency the President, the Hon. Prime Minister and the authorities for their good response that was made promptly to control the situation, I stress that such unfortunate incidents should not happen to any community.

Again I stress that all those representatives who respect the country's democracy, fundamental rights, exercise of justice, peace and reconciliation among communities especially the clergy, politicians, civil society, professionals and all those who treasure justice, should take immediate action to prevent recurrence of such unfortunate incidents like this in future.

Only through taking such action can we ensure the elimination of distrust, suspicion and fear that has emerged among communities and the creation of a nation in which all can live together.

Finally, I would like to request that a Presidential Commission of Inquiry be appointed - already it has been asked by our Leader, the Hon. Rauff Hakeem - to investigate and report on the above-mentioned incidents and grant compensation and relief to those affected persons and justice be prevailed.
Thank you, Hon. Chair.

[අ.භා. 12.58]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයේ ප්‍රස්තුත කරුණට වඩා භාත්පසින්ම වෙනස් වූ, පසුගිය දා දිගන හා තෙල්දෙනිය ප්‍රදේශවල සිදු වූ සිද්ධීන් හා සම්බන්ධිතව ඇති වූ ගැටුම් පිළිබඳව මේ ගරු සභාවේ සියලු මන්ත්‍රීවරු අදහස් දැක්වූවා. ජන වර්ග අතර ගැටුම් ඇති කිරීම සම්බන්ධයෙන් සහ ජාතිවාදී ගැටුම් නිර්මාණය කරන්න මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත්, එතුමාට විශාල බලයක් ලබා දීමට පොහොට්ටුවට ඡන්දය දුන් ජනතාවත් මේ පිටුපස ඉන්නවාය කියන ඉතාම අසාධාරණ, අයුක්තිසහගත චෝදනාව එල්ල කරන්න දරපු උත්සාහය ඉතාම පිළිකුලෙන් යුතුව අපි හෙළා දකිනවා. මක්නිසාදයත්, මේ රටේ කිසිම ජන වර්ගයකට විරුද්ධව විශේෂයෙන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා තමන්ගේ පාලන කාලය තුළදී ක්‍රියාත්මක වෙලා නැහැ. මේ රටේ ජාතිවාදී දැවැන්ත ගිනි දැල් ඇති වෙලා මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක්, වර්ග කිලෝමීටර් 18,800ක් රටෙන් වෙන් වෙලා ගැලවිලා යන්න උත්සාහ කරන අවස්ථාවේදී; සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජාතීන්ට ඔවුන්ගේ ජීවිත පිළිබඳව තර්ජනයක් තිබෙන අවස්ථාවේදී; හයෙන් හා සැකයෙන් තොරව එක දවසක්වත් රටේ ජීවත්ව ඉන්න බැරි අවස්ථාවේදී යුද්ධය නතර කරලා සාමය උදා කරලා, 2009 වර්ෂයේ සිට 2014 එතුමාගේ පාලනය අවසන් වන තෙක් ඇඳිරි නීතිය හෝ හදිසි නීතිය නැතිව මේ රටේ සාමකාමී වාතාවරණයක් නිර්මාණය කිරීමේ කාර්ය භාරය ඉෂ්ට කළේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයායි. ඒක තමයි ඉතිහාසයේ සත්‍යය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහින්ද රාජපක්ෂ යුගයේ අවසන් කළ හදිසි නීතිය නැවත ඇති කරන්න සිද්ධ වුණේ යහ පාලන රජයට අවුරුදු තුනක් ගත වීමෙන් පසුවය කියන කාරණයම ගත්තාම චෝදනාවේ වැරදිකරුවෝ විය යුත්තේ කවුද කියන එක ඉතාම පැහැදිලියි. මෙවැනි ගැටුමක් ඇති වුණාම මොකක්ද කරන්න ඕනෑ? එදා මහින්ද රාජපක්ෂ විධායක ජනාධිපතිවරයා රටේ නොසිටි අවස්ථාවක; මෛත්‍රීපාල සිරිසේන -වර්තමාන ජනාධිපතිවරයා- වැඩ බලපු ජනාධිපතිවරයා ලෙස හිටපු අවස්ථාවක; රාජිත සේනාරත්න ඇමතිවරයා තමන්ගේ ප්‍රදේශයේ නොසිටි අවස්ථාවක තමයි, අලුත්ගම සිද්ධිය නිර්මාණය කළේ. ඒ සිද්ධිය නිර්මාණය කරපු උස හීන්දැරි අය කවුද කියලා මුළු රටම දන්නවා. එවිට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා රටට පැමිණි විගස කළේ මොකක්ද? එතුමා දිවා ආහාරයවත් ගන්නේ නැතිව ගැටුම ඇති වූ ස්ථානයට ගිහිල්ලා ඒ පීඩාවට පත් වුණු සියලු පාර්ශ්වයන් මුණ ගැසුණා. එතුමා මුස්ලිම් ආගමික නායකයන්, බෞද්ධ ආගමික නායකයන් ඇතුළු ප්‍රදේශයේ සිටින අදාළ සියලුදෙනා මුණ ගැසී ඒ තත්ත්වය පාලනය කරලා ඒ ගැටුමෙන් විනාශයට පත් වූ දේපළ ඉතාම කෙටි කාලයක් තුළදී නැවත එවැන්නක් සිද්ධ වුණාද කියලා තේරුම් ගන්නවත් බැරි වන ලෙස සකස් කළා. ඒ පිළිබඳව වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වන මහින්ද සමරසිංහ මැතිතුමාත් සාක්ෂි දරනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ඒ සිද්ධිය එතැනින් එහාට පැතිරෙන්න ඉඩ දෙන්නේ නැතිව එය අලුත්ගමට විතරක් සීමා කළා. එහෙනම්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මහින්ද රාජපක්ෂ ජාතිවාදය අවුළන්නද, නිවන්නද හැදුවේ? එතුමා ජාතිවාදය නිවන්නයි හැදුවේ. නමුත්, ඒ ඇති වූ සිද්ධිය දිගනට හෝ වෙනත් ප්‍රදේශයකට පමණක් සීමා කරන්න තමුන්නාන්සේලාගේ රජයට බැරි වුණා. එහෙම කරන්න බැරි වුණේ රජයේ නොහැකියාව නිසායි. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා ලෙස සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා, මහින්ද රාජපක්ෂ ක්‍රමයට, මේ පිළිබඳව ක්ෂණිකව මැදිහත් වෙලා ක්‍රියා කළා නම්, මේ ප්‍රශ්නය මෙතරම් දුර දිග යන්නේ නැහැ. දැන් සියල්ල වෙලා හමාරයි. අපි ඉතිහාසය මතක තබා ගන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ නායකයන් විසින්, එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් විසින් ජන වාර්ගික ගැටුම නිර්මාණය කරලා එහි වෝදනාව හැම විටම විපක්ෂයට දමන එක තමයි ඔවුන්ගේ පුරුද්ද.

අසූතුනේදී ලංකාවේ අවාසනාවන්ත ජූලි කලබලය ඇති වූ අවස්ථාවේදී විධායක ජනාධිපතිවරයා වශයෙන් සිටියේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමායි. ඕනෑ තරම් කඩ සාප්පු කඩන්න, ගිනි තබන්න, දෙමළ ජනතාව මරන්නට -මේ සියලු දෙයට- නිදහස ලබා දීලා, ඒ කිසිවක් සිද්ධ නොවුණු ආකාරයට එතුමා අහක බලාගෙන සිටියා. එයින් තමයි මේ රටට අවුරුදු 30ක් වන්දි ගෙවන්න සිද්ධ වුණු මහා දැවැන්ත ව්‍යසනය ඇති වුණේ. එක්සත් ජාතික පක්ෂයේ තගාලා, මැරයෝ තමයි කඩ සාප්පු සම්පූර්ණයෙන් කඩලා, ගිනි තබා, අමු-අමුවේ දෙමළ මිනිසුන් පිච්චුවේ. එහෙම නැතුව වමේ ව්‍යාපාරය හෝ ප්‍රගතිශීලී ව්‍යාපාරය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි. නමුත් එහි සම්පූර්ණ වැරැද්ද පැටෙව්වේ ජනතා විමුක්ති පෙරමුණටයි. මේවා කළේ ජනතා විමුක්ති පෙරමුණ තමයි කියලා ජනතා විමුක්ති පෙරමුණ තහනම් සංවිධානයක් කළා. වාසුදේව නානායක්කාර මැතිතුමන්ලාගේ පක්ෂ තහනම් කළා. කොම්යුනිස්ට් පක්ෂයේ නායකයෝ සිරභාරයට ගත්තා. වැරැද්ද සම්පූර්ණයෙන් පටවා, ජනතා විමුක්ති පෙරමුණ සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයෙන් පළවා හරින තත්ත්වය නිර්මාණය කිරීමේ කාර්ය භාරය කරලා, මහා ව්‍යසනයක් ඇති කළා. මිනිසුන් තොග වශයෙන් මැරෙන දේශයක් බවට මේ රට පරිවර්තනය වුණේ එහෙමයි.

එහෙම කරපු අය අද මහින්ද රාජපක්ෂට චෝදනා කරනවා නම්, ජනවාර්ගික අර්බුදය, ජාතිවාදය හදන්නේ අපි කියලා චෝදනා කරනවා නම්, මේ ප්‍රශ්නයේදීත් සියලු මුස්ලිම් නායකවරුන්, ආගමික නායකවරුන් කැඳවා මේ ගින්න නිවීම සඳහා රට වෙනුවෙන් ආණ්ඩුවට දෙන්න පුළුවන් ඕනෑම සහයෝගයක් දෙන බවට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ප්‍රමුඛ ඒකාබද්ධ විපක්ෂයේ නායකයන් ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළාය කියන ටික මම සඳහන් කරන්නම ඕනෑ. එසේ සඳහන් කරන්නේ, මේ කරපු චෝදනාව නිසායි. මේ සඳහා ජනාධිපති කොමිෂන් සභා පත් කරලා, ඇදි-ඇදී යාමෙන් මෙම ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් දේශපාලන පක්ෂ නායකවරුන් මේ ගරු සභාව නියෝජනය කරනවා, සිංහල දේශපාලන පක්ෂ නායකවරුන් මේ ගරු සභාව නියෝජනය කරනවා, ඒ වාගේම දෙමළ දේශපාලන පක්ෂ නායකවරුන් මේ ගරු සභාව නියෝජනය කරනවා. මේ, ව්‍යවස්ථාදායකය; නීතිය හදන තැන. එහෙම නම් මේ සිද්ධිය ගැන සොයා බලන්න, ඊට වග උත්තරකරුවන් කවුද කියලා ඉතාම කෙටි කාලයකින් සොයා බලන්න තිබෙන හොඳම ක්‍රමය, මේ සියලු පක්ෂ නායකයන්ගෙන් සැදුම්ලත් පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් පත් කිරීම පමණයි. ඒ නිසා ඇදි-ඇදී තිබෙන, වාර්තා විතරක් එන දෙයකට වඩා ප්‍රායෝගික, යථාර්ථවාදී විසඳුමක් සොයන ක්‍රමයකට යන්න පුළුවන් විධියේ, සිද්ධිය ඇතිවීමට වග උත්තරකරුවන් කවුද කියලා සොයා බලන්න පුළුවන් විධියේ -හැම දේශපාලන පක්ෂයකටම සහභාගි වෙන්න පුළුවන් වෙන ආකාරයට සිංහල, මුස්ලිම් හා දෙමළ කියන සියලු ජන කොටස් නියෝජනය කරන නායකයන්ගෙන් සමන්විත- පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් පත් කරන්න කියලා අපි යෝජනා කරනවා. තේරීම් කාරක සභාව තුළදී අවශ්‍ය සාක්ෂි කැඳවන්න පුළුවන්; අනෙක් සියලු පක්ෂවලට එකිනෙකාට ඇඟිල්ල දිගු කරන්නේ නැතුව, චෝදනාවක් තිබෙනවා නම් චෝදනාවට මුහුණ දෙන්න පුළුවන්; නැවත මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්න ගතයුතු ක්‍රියා මාර්ග නිර්දේශ කරන්න පුළුවන්. ඒ නිර්දේශ සඳහා යම්කිසි නීතිමය වෙනසක් අවශ්‍ය නම්, ඒ වෙනස කරන්නට මේ ගරු සභාවට ඉඩප්‍රස්ථා ලැබෙනවා. ඒ නිසා අපි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන්, ජනතාව අලුතින් බලය ලබා දුන් පොහොට්ටුව දේශපාලන ජාතික බලවේගය වෙනුවෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ ඇති වුණු ගැටුම් පිළිබඳව සම්පූර්ණ විමර්ශනය කරලා නැවත එවැනි තත්ත්වයක් ඇති නොවී සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් කියන සියලු ජන වර්ගවලට කැමැති තැනක ජීවත් වෙන්න හා ජීවනෝපාය සලසා ගන්න පුළුවන් විධියට, සාමය ඇති දේශයක් ඇති කිරීම සඳහා වන නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය තේරීම් කාරක සභාව පත් කරන්න කියලා.

ඊළඟට, අපි තව දෙයක් ඉල්ලා සිටින්න කැමැතියි. තමුන්නාන්සේලා මැතිවරණයට කලින් කිව්වා, බෙරුවල සිද්ධිය පිළිබඳව සම්පූර්ණයෙන් සොයා බලනවාය කියලා. එහෙම නම් දැන් රාජ්‍ය බලය තිබෙන්නේ තමුන්නාන්සේලාට නිසා එදා බේරුවල ඇති වුණු කුමන්ත්‍රණකාරී සිද්ධිය දියත් කළේ කවුද කියන එකත් මේ විධියටම සොයා බලන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා. එවැනි ක්‍රියා කරපු අය කවුද කියලා පක්ෂ, පාට බලන්නේ නැතුව සොයා බලා අවශ්‍ය දඬුවම් කරන්නත්, තනතුරු දරමින් බැටලූ හම් පොරවා ගෙන ඉන්නා අයගේ බැටලූ හම ගැලවිලා එන විධියේ නිර්දේශ කරන්නත් පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අද දින යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ ඉදිරිපත් කර තිබෙන කරුණු පිළිබඳව මා සඳහන් කරන්න කැමැතියි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අවශ්‍ය වැටුප් වැඩිවීම් වෙනවා නම්, අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. මම හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා. මේ ජාතික අධ්‍යාපන කොමිසම මහින් රට, ජාතිය බලාපොරොත්තු වෙන මහා පළල් සේවාව ඉෂ්ට වෙලා නැති බව කනගාටුවෙන් වුණත් සඳහන් කරන්න ඕනෑ. ලෝකයේ රටවල් අපව පසු කරගෙන ගිහිල්ලා තිබෙනවා. ජාතික අධ්‍යාපන කොමිසම පිහිටුවා දීර්ඝ කාලයක් වෙනවා. මෙම කොමිසම වාර්තා හදලා, ඒවා දෙන්නේ ජනාධිපතිතුමාට. ජනාධිපතිතුමාට දෙන වාර්තා එසේ ක්‍රියාත්මක වෙනවාද කියලා බලන්න අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධතාවක් නැහැ.

මම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටියදීත්, දැනුත් රටේ තිබෙන විශාල ප්‍රශ්නයක් තමයි පස්වෙනි වසරේ ශිෂ්‍යත්වය, දරුවන් නොමරා මැරීම. මෙය, දරුවන්ගේ විභාගයක් නොවෙයි, දෙමව්පියන්ගේ විභාගයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. පුංචි දරුවන්ගේ ළමා කාලය අපි උදුරා ගෙන තිබෙනවා. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ දරුවාට ළමා කාලයක් නැති කරලා තිබෙනවා. මෙහෙම තත්ත්වයක් ලෝකයේ අනෙක් රටවල නැහැ; මහජන චීනයේ නැහැ; ජපානයේ නැහැ; කොරියාවේ නැහැ; ඉන්දියාවේ නැහැ. මෙවැනි අසීමිත බරක් පුංචි දරුවන් මත පටවන තත්ත්වය වෙනස් කරන්න අපි නිර්දේශ ඉදිරිපත් කළා. පහ වසරේ ශිෂ්‍යත්ව ක්‍රමය සරල කරලා, ශිෂ්‍යාධාර දීම සඳහා පැවැත්වෙන

විභාගයක් ලෙස පමණක් පවත්වන්න නිර්දේශ ඉදිරිපත් වුණා. එය තවම ඉෂ්ට වුණේ නැහැ. විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනස් කරන්න ඕනෑ. විභාග සහතික හැටහුටහමාරක් තිබෙනවා. නමුත් කරන්න රස්සාවක් ලැබෙන්නේ නැහැ. විභාගය සමත්; ජීවිතය අසමත්. ලක්ෂ ගණනක් සිටිනා ශිෂ්‍යයන්ට වෙනස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් අපි සකස් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒක, ආණ්ඩු වෙනස් වෙනකොට වෙනස් වෙන්නේ නැති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක්. ඒක අද වන තුරු ක්‍රියාත්මක කරලා නැහැ. තැනින් තැන අල්ලා ගෙන විවිධ වෙනස්කම් කිරීම තුළින් අලුතෙන් ඇති කරපු වෙනස්කම්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

මම අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී, රටේ ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කරමින් විද්‍යා, කලා, වාණිජ විෂයධාරා පමණක් තිබුණ රටේ "තාක්ෂණවේදය" යනුවෙන් විෂය ධාරාවක් හඳුන්වා දුන්නා. ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, තාක්ෂණය සඳහා විද්‍යාව වාගේ විෂයයන් ගම් පළාත්වලට ගෙනිච්චා. ඒ විෂය ධාරාව සඳහා ඉතා විශාල ඉල්ලුමක් තිබුණත් එහි අඩු පාඩු නිවැරදි කරලා ප්‍රායෝගිකව වඩා ඵලදායී විෂය ධාරාවක් බවට පත් කරන්නේ කොහොමද කියන එක පිළිබඳ ජාතික අධ්‍යාපන කොමිසම ප්‍රමාණවත් මැදිහත්වීමක් වෙලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික අධ්‍යාපන කොමිසමේ නිලධාරි වැටුප් මීට වඩා වැඩියෙන් වැඩි වුණත් කමක් නැහැ. එක ආණ්ඩුවක් කරපු යහපත් වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නේ නැතිව හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හදපු මහින්දෝදය ද්විතීයික පාසල් දහස නැවත සංවර්ධනය කිරීම සඳහා ජනාධිපතිතුමා සම්බන්ධ කර ගනිමින්, අධ්‍යාපන අමාත්‍යාංශය යොමු කරන්න කටයුතු කරන්න මැදිහත් වන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මහතා

[අ.භා. 1.10]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන්නේ ඉතාමත් වැදගත් නියෝග කිහිපයක්. අද රටේ සංවර්ධනයත් එක්ක සංචාරක ව්‍යාපාරය දියුණු වෙමින් ඉදිරියට යනකොට, වෙරළබඩ සංචාරක ව්‍යාපාරය දියුණු වෙනකොට කුඩා හා මධ්‍යම පන්තියේ යාත්‍රා, වාණිජ යාත්‍රා භාවිත කරන්න සිදු වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ පනත් කෙටුම්පතේ කියන අන්දමට, මේ ගැසට් පත්‍රයේ කියන අන්දමට මීටර් 5ට නොඅඩු මීටර් 25ට වැඩි නොවෙන යාත්‍රාවලට මේ බලපත්‍ර ලබා ගැනීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමතියි. ඒ මන්ද, අපි අනෙක් රටවල දකින දෙයක් තමයි ඒ යාත්‍රාව අනුව; ඒ බෝට්ටු අනුව තිබෙන පහසුකම් මොකටද පාවිච්චි කරන්නේ කියන එක අනුව තමයි ඒ සඳහා මිල මුදල් අය කිරීම සහ බලපත්‍ර නිකුත් වෙන්නේ කියන එක. අපි දන්නවා, අද සංචාරක ව්‍යාපාරයත් එක්ක සුඛෝපභෝගී යාත්‍රාත්, මත්ස්‍යයන් බැලීමට යන යාත්‍රාත්, ඒ වාගේම විනෝදයට පාවිච්චි කරන water scooter කියන යාත්‍රාත් භාවිත කරන බව. මේ යාත්‍රා සංචාරකයන් හෝ අපේ රටේ සිටින ජනතාව හෝ පාවිච්චි කරන විට ඒ ජනතාවගේ ආරක්ෂණය ගැනත් අප බැලිය යුතුයි. මොකද, මෙම යාත්‍රා පාවිච්චි කරනකොට එම ජනතාවගේ ආරක්ෂාව කියන එකත් වැදගත් වෙනවා.

එපමණක් නොවෙයි අද කිතුල්ගල වාගේ ප්‍රදේශවල rafting කියන ක්‍රීඩාව තිබෙනවා. ඒ rafting ක්‍රීඩාවට පාවිච්චි කරන බෝට්ටුවල තිබෙන ආරක්ෂාව මොන වාගේද, ඒවා පරීක්ෂා වෙන්නේ කොහොමද, ඒවාට බලපත්‍ර නිකුත් වෙන්නේ කොහොමද කියන එකත් ඉතා වැදගත් වෙනවා. එපමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද සංචාරක ව්‍යාපාරය සංවර්ධනය වීමත් සමඟ වැව්වල කුඩා ඔරු පදවන්න අවස්ථාව සලසා තිබෙනවා. ඒ ඔරුවල සංචාරකයන් ගෙන යනවා. එපමණක් නොවෙයි, දෙපයින් පදවන්න පුළුවන් බෝට්ටු තිබෙනවා. අපි දකිනවා, මේ පාර්ලිමේන්තුව අසල තිබෙන වැවේත් ඒ වාගේ බෝට්ටු පදිනවා. හැබැයි ඒවායේ යන අයගේ ආරක්ෂාව සඳහා කටයුතු යොදා නැහැ. ඒ නිසා ඒ ගැනත් පොඩ්ඩක් හිතා බලන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අද මේ සංවර්ධනයත් එක්ක අපේ වර්තමාන රජය මේ විධියට කටයුතු කරගෙන යනකොට, අපේ ඇමතිවරු මේ වාගේ නියාමනයක් කරලා ආරක්ෂාව සලසනකොට, බලපත්‍රයක් නිකුත් කරලා, ලියා පදිංචි කරලා, වගකීමක් ඇතුව ඒ වාගේ දෙයක් කරනකොට, අද රටේ ඊට වඩා වෙනස් දේවල් සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගැන අපට හරිම දුකයි. අපි සියලු දෙනාම ලාංකිකයන් හැටියට 2015 ජනවාරි 08වන දා මේ රටේ සැබෑ වෙනසක් ඇති කරලා, සෑම දෙනාම එක ජාතියක් හැටියට ජීවත් වෙන්න වැඩ පිළිවෙළක් අරගෙන ඉදිරියට ගිය මේ ගමනේදී අද මේ ඇති වෙලා තිබෙන බෙදවාචකය අපි හෙළා දකිනවා. ඒ වාගේම සිංහල මන්ත්‍රීවරු හැටියට, බෞද්ධයින් හැටියට මේ වාගේ දේවල් දකිනකොට අපට දුක හිතෙනවා. මොකද, අපේ දරුවන්ට අපි මේ හදන්න හදන අනාගතය, අධ්‍යාපනික වශයෙන් අපි හදන්න හදන අනාගතය - අපේ දරුවන්ට අනාගතයක් තිබෙනවාද කියලා අපට මේ වෙලාවේ ප්‍රශ්න කරන්න වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි- හදන්න අපි සියලු දෙනාම කටයුතු කරන්නේ, අපි සෑම දෙනාටම සමානව මේ රටේ ජීවත් වෙන්න සැලැස්වීමත් එක්කයි. අද මේ රටේ සමානතාවක් තිබෙනවාද කියලාත් අපට ප්‍රශ්න කරන්න වෙලා තිබෙනවා. මොකද, සමහර අයට සමානතාවක් නැහැ. සෑම දෙයක්ම තවම එදා වාගේ තැන් තැන්වල දේශපාලනීකරණය වෙලා තිබෙනවා. එසේ දේශපාලනීකරණය වීම හේතුවෙන් තමයි අද මේ වාගේ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, සමහර වෙලාවට අපේ ආසනවල වැඩ කර ගන්න ගියාම සුළු ජාතීන්ට අවශ්‍ය විධියට අවශ්‍ය දේවල් ඉටු වන්නේ නැති බව. ඒ වාගේම සමහර වෙලාවට අපේ මහ ජාතියට අවශ්‍ය දේවල් සිදු වන්නේ නැහැ. ඒ නිසා මේ වාගේ ගැටුම්කාරී තත්ත්වයන් ඇති වෙනවා.

ඊළඟට, අද මේ සමාජ ජාල මාධ්‍ය දිහා බැලුවාම ඒවායේ -ඔය Facebook එකේ එහෙම - සෑම විටම යන්නේ, අන්තවාදී ක්‍රමවේදයක්. අපි දන්නවා, ඕනෑම රටක මේ දේවල් නවත්වන්න

[ගරු සන්දිත් සමරසිංහ මහතා]

පුළුවන් බව. මේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරු හැටියට අපට දැකියි, මීට කලින් මෙවා නැවැත්වුවේ නැති එක ගැන. එදා ඒ දේවල් කළා නම් අද මේ තත්ත්වයට පත් වන්නේ නැහැ. අද මේ රටේ තිබෙන අන්තවාදයට, එහෙම නැත්නම් මේ ජාතිවාදයට ලොකුම හේතුව තමයි පත්තරයක වුණත් - මාධ්‍ය නිදහස තිබෙන බව ඇත්ත- පළ වන දේවල් මොනවාද කියලා බලලා, ජාතිවාදයට එරෙහිව කරන දෙයක් තිබෙනවා නම් ඒවා නැවැත්වීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවීම.

අද මේ ඉදිරිපත් කර තිබෙන නියෝගවලට අදාළ ගැසට් පත්‍රයේත් තිබෙන දෙයක් තමයි ශ්‍රී ලංකා ධජය යට මේ සියලු දෙයක්ම සිදු වනවාය කියන එක. ඒක ඉතා ලස්සනයි. අපටත් ඕනෑ ඒ දෙය ඒ විධියට වෙන්නයි. අපේ ගරු ඇමතිතුමා ඒ ගැසට් පත්‍රිකාවේ පළ කරලා තිබෙන්නේ, සෑම යාත්‍රාවක්ම ශ්‍රී ලංකා ධජය යටතේ ලියා පදිංචි වෙලා කටයුතු කරන්න ඕනෑය කියන එකයි. හැබැයි ඒ ධජය යට මෙවැනි දේවල් සිද්ධ වනකොට අපට දැකියි. මොකද, අපි දැක්කා, ශ්‍රී ලංකා ධජය යට අවුරුදු තිහක යුද්ධයක් තිබුණා. ඒ යුද්ධය ඉවර වුණා. යුද්ධය ඉවර වෙලා අපි මේ සංහිඳියාවත් එක්ක යනකොට, මේ නියාමනයන්, මේ සෑම දෙයක්ම කරන එක ඉතා වැදගත්. ඒක ඉතා හොඳයි. ඒ නිසා ගරු ඇමතිතුමා මේ කටයුත්ත කිරීම පිළිබඳව අපි අගය කරනවා. අපට ඒ ලියා පදිංචි කිරීම් අවශ්‍යයි.

ඊළඟට, අපි අර කරපු යෝජනාවලටත් පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කියලා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාල වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ප.ප. 1.18]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்குச் சந்தர்ப்பம் தந்ததற்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்றையதினம் தேசிய கல்வி ஆணைக்குழுவின் தலைவர் மற்றும் உப தலைவரின் ஊதியங்கள் மற்றும் ஆணைக்குழு அங்கத்தவர்களின் கொடுப்பனவுகளைத் திருத்தியமைத்தல் முதலிய விடயங்கள் சம்பந்தமான விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. உண்மையிலேயே அரச உத்தியோகத்தர்கள் செய்கின்ற சேவைகளுக்கேற்ப கொடுப்பனவுகள் வழங்கல், மீள்பரிசீலனை செய்தல் அல்லது அதிகரித்தல் என்பன நிச்சயமாக அவர்களுக்கு அரசினால் செய்யவேண்டிய ஒரு கட்டாயக் கடமையாக இருக்கின்றது.

யுத்த காலத்திலே அரச சேவையில் தங்களை அர்ப்பணித்துச் சேவை செய்த பல உத்தியோகத்தர்கள் இருக்கின்றார்கள். இன்று யுத்தம் முடிவடைந்து 10 வருடங்களாகின்ற வேளையிலும் அவர்கள் அந்த யுத்த நேரத்திலே செய்த சேவைகளுக்கான கொடுப்பனவுகள் மற்றும் சம்பளங்கள் சரியான வகையிலே மீள்பரிசீலனை செய்யப்படாத நிலைமை தொடர்ந்து இருந்துவருகின்றது. யுத்த காலத்திலே தங்களுடைய உயிரையும் பணயம் வைத்துப் போதிய கொடுப்பனவுகள் இல்லாமல் தற்காலிக அடிப்படையிலே முல்லைத்தீவு, கிளிநொச்சி போன்ற யுத்தம் நடந்த மாவட்டங்களிலே உத்தியோகத்தர்கள் பலர் சேவையாற்றி வந்திருக்கிறார்கள். குறிப்பாக, பிரதேச செயலகங்களில், மேலதிக மாவட்டப் பதிவாளர் அலுவலகத்தின்கீழ் முகாமைத்துவ உதவியாளர் என்ற அடிப்படையில் உள்வாங்கப்பட்ட உத்தியோகத்தர்கள் பலர் சேவையாற்றி வந்திருக்கிறார்கள். அவர்களுக்கான நிரந்தர நியமனங்கள் கொடுக்கப்படாமை மட்டுமல்ல, யுத்தம் முடிவடைந்ததன் பின்பு அவர்களது சேவைகள் நிறுத்தப்பட்டமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். அங்கு கடமையாற்றிய உத்தியோகத்தர்களது பெயர்கள், அவர்கள் எவ்வளவு காலம் கடமையாற்றினார்கள், அந்த மாவட்டத்தின் ஒவ்வொரு பிரதேச செயலகத்திலும் அவர்கள் சார்பான வெற்றிடங்கள் எத்தனை போன்ற விபரங்கள் அடங்கிய விரிவான ஒரு கடிதம் மாவட்டச் செயலாளர் அவர்களால் Secretary, Ministry of Home Affairs' க்கு 2016.06.27ஆம் திகதி எழுதப்பட்டது. ஆனால், இதுவரை அதற்கான எதுவித பதிலும் இல்லை. நீண்டகாலமாகப் பணியாற்றிய அந்த உத்தியோகத்தர்கள் இன்று வருமானம் எதுவுமற்ற நிலையில் இருக்கிறார்கள். ஆனால், அவர்கள் அந்தத் தொழில்களுக்கான தகுதியுடன் இருக்கின்றார்கள். எனவே, யுத்த நேரத்திலே சேவையாற்றிய, பாதிக்கப்பட்ட இந்த உத்தியோகத்தர்கள் தொடர்பாக மீள்பரிசீலனை செய்வதற்கென யுத்தம் இடம்பெற்ற பிரதேசங்களுக்காக விசேட குழு அமைக்கப்பட்டு, அவர்களுக்குரிய நிரந்தர நியமனங்கள் மற்றும் கொடுப்பனவுகளை வழங்குவதற்கு நடவடிக்கையெடுக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු තාරානාත් බස්නායක මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Tharanath Basnayaka - Deputy Minister of Telecommunication and Digital Infrastructure)

"ගරු අශෝක ප්‍රියන්ත මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අශෝක ප්‍රියන්ත මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அசோக்க பிரியந்த அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. ASHOKA PRIYANTHA *took the Chair.*

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

இந்த யுத்த காலத்திலே ஏ-9 வீதி மூடப்பட்டு போக்குவரத்துகள் தடைப்பட்டிருந்த வேளையிலே, அரச உத்தியோகத்தர்களுக்கான வினைத்திறன்காண் தடைப்

பரீட்சைகள் கொழும்பிலும் வவுனியாவிலும் நடைபெற்றன. ஆனால், போக்குவரத்துகள் தடைசெய்யப்பட்டதன் காரணமாக அங்குள்ள உத்தியோகத்தர்கள் தங்களுடைய வினைத் திறமைகாண் தடைப் பரீட்சைக்கு உரிய காலத்திலே தோற்றிச் சித்தியெய்த முடியாத நிலை ஏற்பட்டிருந்தது. இதனால், யுத்தகாலத்திலிருந்து இன்றுவரை அந்த உத்தியோகத்தர்கள் தங்களுடைய சரியான வேதனத்தைப் பெறமுடியாதிருக் கின்றார்கள். யுத்தம் முடிவடைந்ததன் பின்னர் அந்தப் பரீட்சையில் சித்தியடைந்தாலும் உரிய வேதன அளவுத் திட்டத்தில் அவர்கள் நியமிக்கப்படவில்லை. அப்படியான பல உத்தியோகத்தர்கள் எங்களது மாவட்டத்திலே சேவையாற்றிக் கொண்டு வருகின்றார்கள். இதனால் அவர்கள் தங்களுடைய ஊதியத்தில் பெருமளவை இழக்கிறார்கள். ஆனால், யுத்த காலத்திலும் இடப்பெயர்வு வேளைகளிலும் அவர்கள் தங்களுடைய உயிரைப் பணயம் வைத்துச் சேவையை வழங்கியவர்கள்.

அதுமட்டுமல்ல, இந்த உத்தியோகத்தர்களில் பலர் இறந்திருக்கிறார்கள்; அவயவங்களை இழந்திருக்கிறார்கள். ஆனால், அவர்களுக்குரிய இழப்பீட்டுக் கொடுப்பனவுகள் வழங்கப்படவில்லை. கடமை நேரத்தில் உயிரிழந்த அல்லது அவயவங்களை இழந்த உத்தியோகத்தர்களுக்கு அரசினுடைய சுற்றுநிருபங்களுக்கு அமைவாகக் கொடுக்கப்பட வேண்டிய கொடுப்பனவுகள்கூடக் கிடைக்கப்பெறாத நிலையில் இன்றும் பல உத்தியோகத்தர்கள் இருக்கின்றார்கள். இதை அடிப்படையாக வைத்துக்கொண்டு மாவட்ட அரசாங்க அதிபர் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்குப் பல கடிதங்களை எழுதியிருக்கிறார். 2016.08.15ஆம் திகதி இது தொடர்பான கடிதங்கள் மாவட்டச் செயலாளரால் சம்பந்தப்பட்ட அமைச்சுக்களினுடைய செயலாளர்களுக்கு அனுப்பப்பட்டும், இது தொடர்பாக எதுவித நடவடிக்கைகளும் இதுவரை எடுக்கப்படாமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும்.

இந்த உத்தியோகத்தர்களது சேவைகளுக்கேற்ப அவர்களுக்கு ஊக்குவிப்புக் கொடுப்பனவுகள் வழங்காத அதேவேளை, வடக்கு, கிழக்குப் பகுதியிலே காணப்படுகின்ற வெற்றிடங்களைத் தென்பகுதி உத்தியோகத்தர்களைக் கொண்டு நிரப்புவது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். முக்கியமாக, தற்பொழுது அங்கு மின்மானி வாசிப்பவர்களாக சகோதார சிங்கள உத்தியோகத்தர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்கள். அவர்கள் என்ன எழுதுகிறார்கள், என்ன கூறுகிறார்கள், எதை வாசிக்கிறார்கள் என்றுகூட அந்தப் பாவனையாளர்களுக்குத் தெரியாதிருக்கிறது. யுத்த காலத்திலே மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட நிலையிலும் கல்வி கற்ற, தகுதியான இளைஞர், யுவதிகள் அங்கு இருக்கின்ற வேளையிலே, அங்கிருக்கின்ற வெற்றிடங்களை நிரப்புவதற்கு அரசியல் நோக்கத்துக்காக - தங்களுடைய அரசியலைப் பலப்படுத்துவதற்காக தென்பகுதியைச் சேர்ந்த உத்தியோகத்தர்களை நியமிப்பதென்பது நல்லிணக்கத்துக்கும் நல்லாட்சிக்கும் மேலும் குந்தகமான விடயங்களாகவே அமைகின்றன. ஆகவே, தங்களது முன்னேற்றத்துக்கான வினைத்திறன்காண் தடைப் பரீட்சையை யுத்த காலத்திலே எழுத முடியாமல் பின்னர் எழுதிச் சித்தியெய்திய அல்லது உரிய காலத்திற்குப் பின்பு - யுத்தம் முடிவடைந்ததன் பின்பு அப்பரீட்சையை எழுதிச் சித்தியெய்திய உத்தியோகத்தர் களுக்கு நிவாரணம் வழங்குவதற்கென ஒரு குழுவை அமைத்து, அதனூடாக நேரடியாக விசாரணைகளை மேற்கொண்டு சரியான வேதனங்களை அவர்களுக்குப் பெற்றுக்கொடுக்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும்.

இதேபோல், கல்வி நிருவாக சேவைக்கான ஆட்சேர்ப்பு தொடர்பிலும் எமது வடக்கு, கிழக்குப் பகுதியிலே பல முரண்பாடுகள் காணப்படுகின்றன. அதாவது 2017.07.17ஆம் திகதி நடைபெற்ற கல்வி நிர்வாக சேவைக்கான ஆட்சேர்ப்புப் பரீட்சையில் 400 இற்கும் மேற்பட்டோர் சித்தியெய்தினர். ஆனால், இன விகிதாசாரம் பேணப்படாமல் சிங்களவர்கள் 107 பேரும் தமிழர் 3 பேரும் இஸ்லாமியர் 2 பேருமாக 112 பேர் மட்டும் உள்வாங்கப்பட்டிருக்கின்றார்கள். ஆகவே, இந்த விடயம் தொடர்பாகவும் விசேட கவனம் செலுத்தி இன விகிதாசார அடிப்படையில் அவ்வுத்தியோகத்தர்களைச் சேர்த்துக்கொள்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

மேலும், வட பகுதியிலும் கிழக்குப் பகுதியிலும் பல பொதுவான பிரச்சினைகள் காணப்படுகின்றன. அது குடிநீர்ப் பிரச்சினையாக இருக்கலாம் அல்லது ஏனைய மீன்பிடி தொடர்பான பிரச்சினைகளாக இருக்கலாம். அப்பிரச்சினைகள் தொடர்ந்துகொண்டே இருக்கின்றன. அதாவது, அனுமதியற்ற வள்ளங்கள் அங்கு வருகின்றன. ஆனால், அவ்வாறு தென்பகுதியிலிருந்து வருகின்ற அனுமதியற்ற வள்ளங்களுக்கும் அதில் வருபவர்களுக்கும் அங்கிருக்கின்ற பொலிஸ் நிர்வாகத்தினர் துணைபோகின்றனர். யுத்தத்திலே அனைத்துச் சொத்துசுகங்களையும் இழந்து வெறுங்கையோடு மீள்குடியேறிய எமது மீனவர்கள் சாதாரண நிலையில் தங்களுடைய மீன்பிடித் தொழிலைச் செய்யமுடியாது மிகவும் பாதிக்கப்படுகின்றனர் என்பது எங்களால் இங்கு தொடர்ந்தும் சுட்டிக்காட்டப்பட்டு வருகின்ற விடயமாகும். மாவட்ட நிர்வாக ரீதியாக இது தொடர்பில் எதுவித நடவடிக்கையும் எடுக்கமுடியாத நிலைமை காணப்படுவது மட்டுமல்ல, இதற்கான அனுமதிகள் எங்கு வழங்கப்படுகின்றன? எவ்வாறு வழங்கப்படுகின்றன? இந்த வள்ளங்கள் எங்கிருந்து வருகின்றன? என்ற கேள்விகளுக்கு அந்த மாவட்டத்திலுள்ள அத்துறை சார்ந்த உத்தியோகத்தர்கள்கூடப் பதில்கூற முடியாத நிலையில் இருக்கின்றார்கள். ஆகவே, இந்த மக்கள் அனைவரையும் மேலும் நசுக்குகின்ற வகையில் பலராலும் – அவர்கள் அரச உத்தியோகத்தர்களாக இருக்கலாம், அல்லது ஏனைய தொழில் சார்ந்தவர்களாக இருக்கலாம் - எமது மாவட்டங்களில் தொடர்ந்தும் அநீதி இழைக்கப்பட்டுக் கொண்டு வருகின்றது. எனவே, இந்தப் பிரச்சினைகளைச் சுமுகமாகத் தீர்த்துவைக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
நன்றி!

இறுதியாக, இந்த அரசாங்கம் அந்த மாவட்டத்தோடு இணைந்த விசேட குழுக்களை அமைத்து அங்கிருக்கின்ற தீர்க்கப்படாத பிரச்சினைகளை உடனடியாகத் தீர்க்கக்கூடிய வகையிலே நடவடிக்கை எடுக்க வேண்டும் என்று இந்த அதியுயர் சபையிலே கேட்டுக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 1.29]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)

The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉතාමත් වැදගත් නියෝගයක් සහ යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා. ඉන් පළමුවෙනි එක, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ විෂයභාර අමාත්‍යවරයා විසින් වෙළෙඳ නැව් පනත යටතේ අපේ රටේ කුඩා වෙළඳ නැව් පිළිබඳව ඉදිරිපත් කර තිබෙන නියෝගය. මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන සම්බන්ධයෙන් විශේෂයෙන්ම ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. රටක් විධියට ගත්තාම, ඉතාම කාලෝචිත අවශ්‍යතාවක් මේ අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබනවා. සංචාරක ව්‍යාපාරය සහ ප්‍රවාහන ක්ෂේත්‍රය මුල් කරගෙන එවැනි නැව් ලියා පදිංචි කිරීමේ නියාමන කටයුතු මේ තුළින් සිද්ධ වෙනවා. මෙහිදී ගමන් ගන්නා මගියෙකු විසින් ගෙවිය යුතු අවම බදු මුදලක් සම්බන්ධයෙන් සඳහන් වුණා. එය ඩොලර් 100ක් හෝ 108කට ආසන්න මුදල් ප්‍රමාණයක්. එම නිසා අපේ ආංශික කාරක සභාවේදී අපි එදා තීරණය කළා, දේශීය, විදේශීය සංචාරකයන් විධියට වර්ගීකරණයක් කරලා මේ බදු මුදල පිළිබඳව යම් සංශෝධනයක් ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. ඒ අනුව එම සංශෝධනය පිළිබඳව ඉදිරියේ දී ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කර කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. අපේ රටේ සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු වන අවස්ථාවකදී මෙයින් විශාල රුකුලක් ඇති වෙනවා. ඒ වාගේම අපේ රටේ පොදු ප්‍රවාහන සේවයේ දී මුහුණ දෙන මාර්ග තදබදය වැනි තත්ත්වයන්ටත් වරාය හා නාවික කටයුතු අමාත්‍යාතුමා විසි අද ගෙනැවිත් තිබෙ නියෝග තුළින් ශක්තිමත් නව පොදු ප්‍රවාහන සේවාවක් ඇති කිරීමට දායකත්වය ලැබෙනවා කියන කාරණයත් සඳහන් කරමින්, මා ඉහතින් සඳහන් කළ සංශෝධනය පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මේ අවස්ථාවේදී විශේෂ ඉල්ලීමක් කරනවා.

ඊට අමතරව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධව තමයි ඊළඟ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කටයුතු කරන නිලධාරීන්ගේ වැටුප් මේ ආකාරයෙන් නොවෙයි, කුමන ආකාරයකින් වැඩි කළත් පාර්ලිමේන්තුව විධියට අපි ඒකට විරෝධතාවක් ඇති කරන්නේ නැහැ. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් තමයි මේ කොමිෂන් සභාව ස්ථාපිත කරලා තිබෙන්නේ. මෙම කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු, කොමිෂන් සභාවේ සංයුතිය, කොමිෂන් සභාවට පැවරී තිබෙන බලතල, කොමිෂන් සභාවේ කාර්ය භාරය මොනවාද කියලා දීර්ඝ වශයෙන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ සඳහන් වෙලා තිබෙනවා. වෙනත් විධියකින් කියනවා නම්, අපේ රටේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ඒ අදාළ වාර්තා ඉදිරිපත් කිරීම තමයි මේ කොමිෂන් සභාවට පැවරී තිබෙන ප්‍රධානතම වගකීම විධියට තිබෙන්නේ. ඒ අනුව මේ කොමිෂන් සභාව විසින් 1991 ඉඳන් මේ දක්වා අපේ රටේ සියලුම විධායක ජනාධිපතිවරුන්ට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අදාළ කරුණු කොපමණ ඉදිරිපත් කරලා තිබෙනවාද, ඒ ඉදිරිපත් කරලා තිබෙන කරුණුවලින් අදාළ විෂයභාර අමාත්‍යවරුන් අපේ රටේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිපත්තියට කොච්චර ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවාද කියන එක පිළිබඳව අපි යම්කිසි ආකාරයක පසු විපරමක් කළ යුතුව තිබෙනවා.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 1991දී ස්ථාපිත කළේ, අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට පොදු ප්‍රතිපත්ති, පොදු තීරණ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න. ඒ වාගේම මෙහිදී අංශ තුනක් ගැන සඳහන් වනවා. "අධ්‍යාපනය" කියලා කිව්වාම සාමාන්‍යයෙන් පාසල් අධ්‍යාපනය විතරයි සැලකිල්ලට ගැනෙන්නේ. නමුත් මේ කොමිෂන් සභාව ස්ථාපිත කළේ, පාසල් අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය කියන අංශ තුනම අරමුණු කරගෙනයි. මේ අංශ තුන සඳහාම ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අවශ්‍ය කරන කරුණු පිළිබඳව තමයි මේ කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දිය යුතු වන්නේ. ඒක ඉතාමත් ප්‍රායෝගිකයි. මොකද, පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා අපේ රටේ අධ්‍යාපන ක්‍රියාවලිය එක තැනකින් තමයි ක්‍රියාත්මක විය යුතු වන්නේ. ඒ නිසා "අධ්‍යාපනය" කියන දේ නිර්වචනය කළායින් පස්සේ පාසල් අධ්‍යාපනය පමණක් නොවෙයි, සමස්ත ක්‍රියාවලිය අධ්‍යාපනය විධියට තමයි සලකන්න සිද්ධ වෙන්නේ. එම නිසා පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළවල් සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඒවා සකස් විය යුතු වන්නේ සහ ක්‍රියාත්මක කළ යුතු වන්නේ කුමන ආකාරයෙන්ද කියන එක පිළිබඳව යෝජනා ලබා දීමේ වගකීම පැවරී තිබෙන්නේ මේ කොමිෂන් සභාවටයි. නමුත්, අපි ඉතාමත් අකැමැත්තෙන් වුවත් කිව යුතු දෙයක් තිබෙනවා. ඒ තමයි, වර්තමානයේදී පමණක් නොවෙයි, අපි දන්නා පරිදි 1991 ඉඳන් මේ කොමිෂන් සභාව වාර්තා ඉදිරිපත් කරලා තිබෙන බව.

ඒ වාර්තා ඉදිරිපත් කළත්, ඉන් අනතුරුව අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඒ වාර්තාවලින් කොපමණ ප්‍රමාණයක් තොරතුරු ලබාගෙනද අපේ රටේ අධ්‍යාපන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ, වෘත්තීය පුහුණුව පිළිබඳව වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ, උසස් අධ්‍යාපනය පිළිබඳව වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කියන කාරණා පිළිබඳව පසු විපරමක් කිරීම මම හිතන්නේ වැටුප් සංශෝධනය කරනවා වාගේම අනිවාර්යයෙන්ම කළ යුතු කාර්ය භාරයක් බවට පත් වෙනවා. ඒ කටයුත්ත ඉතාම ඉක්මනින් කළ යුතුයි. මේ අවස්ථාවේදී අපි යෝජනා කරන්නේ මෙයයි. පාර්ලිමේන්තුවේත් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවක් තිබෙනවා; විවිධ කාරක සභා තිබෙනවා. ඒ නිසා කුමන හෝ තැනකින් මේ වගකීම අපි ඉටු කළ යුතුයි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දීම පමණක් අපේ වගකීම සේ සලකා එතැනින් ඉවත් වෙන්නේ නැතිව, මේ කොමිෂන් සභාව තුළින් රටට නිසි ප්‍රයෝජනයක් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට මේ පාර්ලිමේන්තුවටත් වගකීමක් තිබෙනවා කියන කාරණය අපි අවබෝධ කරගෙන කටයුතු කළ යුතුව තිබෙනවා.

මේ කොමිෂන් සභාවේ සංයුතිය සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳව අපි අවධානය යොමු කළ යුතුයි. ඒ කොමිෂන් සභාවේ සංයුතිය අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා නියෝජනය කරන අතිරේක ලේකම්වරයෙකුගෙන් සමන්විත විය යුතුයි. එම නිසා අධ්‍යාපන ප්‍රතිපත්ති වැනි කරුණු සකස් කිරීමේදී මේ කොමිෂන් සභාවේ සංයුතිය පිළිබඳව විශාල වෙනසක් ඇති විය යුතුයි. පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු, තවත් අමාත්‍යාංශ කීපයක ලේකම්වරයා

හෝ ඔහුගේ නියෝජිතයෙකු කියන ඒ සංයුතිය අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ යෝජනා සකස් කිරීමේදී කොතෙක් දුරට පිටිවහල් වෙනවාද කියලා අපි බලන්න ඕනෑ. එම නිසා මෙවැනි කොමිෂන් සභාවක එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශවල නිලධාරීන් අවශ්‍ය වුණත්, අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිපත්ති තීන්දු තීරණ ගැනීමේදී -ඒ තීන්දු තීරණ සකස් කිරීමේදී- මේ කොමිෂන් සභාවලට තිබෙන සංයුතිය පිළිබඳව සලකා බැලිය යුතුයි. වර්තමානයේදී අධ්‍යාපන අංශය මුහුණපා තිබෙන අභියෝගවලට පිළිතුරු සෙවීමට මේ කොමිෂන් සභාවේ සාමාජිකයන් නම් කිරීම පිළිබඳව වෙනසක් අනිවාර්යයෙන්ම ඇති විය යුතුව තිබෙනවා. මේ කොමිෂන් සභාවේ වාර්තාව ජනාධිපතිවරයාට ලබා දීමෙන් අනතුරුව ඒ වාර්තාවේ සඳහන් කරුණු අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කුමන ආකාරයකවත් වැඩ පිළිවෙළක් නැහැ. සමහර වාර්තාවල ඉතා වටිනා අදහස්, යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අධ්‍යාපනය සම්බන්ධයෙන් අනුකාරක සභාවක් පත් කරලා, මේ පිළිබඳ වාර්තාවක් අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම කාරක සභාවට මේ කොමිෂන් සභාවේ නියෝජිතයන් අපි කැඳෙව්වා. එම නියෝජිතයනුත් කැඳවලා ඒ අයගේ අදහස් සහ යෝජනා ලබා ගත්තා. ඒ අයගේ අදහස් සහ යෝජනා ලබාගෙන මේ වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න අපිට නිසි දායකත්වයක් ලබා ගැනීමට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා මේ කාරණය පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ.

මේ කොමිෂන් සභාවේ සංයුතිය පිළිබඳව වාගේම මේ කොමිෂන් සභාවට පැවරී තිබෙන වගකීම් අනුව ඉදිරිපත් කරනු ලබන වාර්තාවල තිබෙන යෝජනා කොතෙක් දුරට ක්‍රියාත්මක වෙනවාද කියන කාරණය පිළිබඳව අනිවාර්යයෙන්ම දැනට වඩා වැඩි අවධානයක් අපි යොමු කළ යුතුව තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළකින් තොරව මේ කටයුත්ත කළ නොහැකියි. අද මේ පාර්ලිමේන්තුව මඟින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමේ යෝජනාව තුළින් බලාපොරොත්තු වන අරමුණු, වර්තමානයේ මේ කොමිෂන් සභාව තිබෙන ආකාරයෙන් තිබුණොත් ඉන් කුමන ආකාරයකින්වත් ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියන කාරණය කනගාටුවෙන් වුණත් අපි සඳහන් කරන්න ඕනෑ.

අද අපට රටක් විධියට අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව අන් කිසිදු කාලයකටත් වඩා තිබෙනවා. ඉතිහාසයේ සෑම ආණ්ඩුවක්ම මේ පිළිබඳව කිව්වා. ඒ වාගේම සෑම ආණ්ඩුවක්ම විසින්ම අධ්‍යාපනය සම්බන්ධයෙන් යම් යම් හොඳ දේවල් කරලා තිබෙනවා වාගේම, වර්තමානය තුළ තිබෙන අභියෝග සහ ඉදිරියේදී මේ රට දියුණු රටක් කරා ගෙන යෑමේදී අධ්‍යාපනයෙන් ලැබිය යුතු දායකත්වය අනිවාර්යෙන්ම දැනට වඩා අවශ්‍යව තිබෙනවා. වර්තමානයේ අපේ රට මුහුණ පා තිබෙන සෑම ප්‍රශ්නයකටම, -විරැකියාව පිළිබඳ ප්‍රශ්නය වෙන්න පුළුවන්; ජාතීන් අතර අසමගිය පිළිබඳ ප්‍රශ්නය වෙන්න පුළුවන්; යම්කිසි ආකාරයකට සංස්කෘතිය පිරිහීම පිළිබඳ ප්‍රශ්න වෙන්න පුළුවන්.- මේ සෑම ප්‍රශ්නයකටම මූලික ආරම්භය ඇති වන්නේ අධ්‍යාපනයෙන් කියන එක අපි අමතක කළ යුතු වන්නේ නැහැ. එම නිසා වර්තමානයේ අපි රටක් විධියට මුහුණ පා තිබෙන සෑම ජාතික ප්‍රශ්නයකටම ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ අධ්‍යාපනය කියන එක අපි අමතක කළ යුතු වන්නේ නැහැ. වර්තමානයේ අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නය භෞතිකව ගොඩනැඟිලි ලබා දීලා, පරිගණක ලබා දීලා, ගුරුවරුන් ලබා දීලා පමණක් විසඳන්න බැහැ. විශ්වවිද්‍යාලවලට භෞතික සම්පත් ලබා දීලා, නේවාසිකාගාර පහසුකම් ලබා දීලා, වෘත්තීය අධ්‍යාපනයට අලුතෙන් පාඨමාලා ඇති කරලා, වෘත්තීය අධ්‍යාපන සහතික තිබෙන අය එම අධ්‍යාපන ආයතනවලින් පිට කරලා පමණක් වර්තමානයේ මේ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීමට මොනම ආකාරයකටවත් පුළුවන්කම ලැබෙන්නේ නැහැ. විෂය මාලා පිළිබඳ අදහස් යෝජනා ඉදිරිපත් කිරීමට, පර්යේෂණ කිරීමට, ජාත්‍යන්තර වශයෙන් අනෙකුත් රටවල තිබෙන අත් දැකීම් ලබා ගෙන කටයුතු කිරීමට මෙම කොමිෂන් සභාවට පැවරී තිබෙනවා. වාර්තා ඉදිරිපත් කිරීමට අමතරව කාර්ය භාර රැසක්ම මෙම කොමිෂන් සභාවට පැවරී තිබෙනවා. මෙම කොමිෂන් සභාව සෑම අවස්ථාවකම කියන්නේ, "කොමිෂන් සභාවට පැවරී තිබෙන්නේ ජනාධිපතිවරයාට වාර්තාව ඉදිරිපත් කිරීම පමණයි." කියලායි. ඇතැම් අවස්ථාවල මෙම කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට කැඳවීමේදී ප්‍රශ්නකාරී තත්ත්වයන්ට මුහුණ පෑවා. "අපේ කොමිෂන් සභාවට පැවරී තිබෙන්නේ ජනාධිපතිවරයාට එම ප්‍රතිපත්ති සහ වාර්තා ඉදිරිපත් කිරීම පමණයි, අපි පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කිරීමට බැඳිලා නැහැ" කියන මතය පවා සමහර අවස්ථාවලදී ඒ අය ඉදිරිපත් කළා. නමුත්, එවැනි මට්ටමකට සිතිය යුතු වන්නේ නැහැ. නීතිමය තත්ත්වය අනුව මෙම කොමිෂන් සභාවට පැවරී තිබෙන වගකීම වන්නේ ජනාධිපතිවරයා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම පමණයි කියන එක අපි පිළිගන්නවා. නමුත්, කොමිෂන් සභාව විධියට එම කරුණ හෝ හරි හැටි ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් මීට වඩා වැඩි අවධානයක්, සම්බන්ධතාවක් ඇති කර ගත යුතුව තිබෙනවා. වැටුප් වැඩි කිරීමට පමණක් පාර්ලිමේන්තුවට මෙම යෝජනාව ආවා වාගේම, එම කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති සකස් කිරීමේදී, වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධතාවක් ඇති කරගෙන, පාර්ලිමේන්තු මහජන නියෝජිතයන්ගේත් අදහස් යෝජනා ලබා ගෙන එම ප්‍රතිපත්ති සකස් කළොත්, ඉතාම ඵලදායී ආකාරයෙන් මෙම කටයුතු ඉටු කර ගැනීමට පුළුවන්කම තිබෙනවා.

එම නිසා අපි අද පාර්ලිමේන්තුව විධියට මෙම කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ පාරිශ්‍රමික හා දීමනා සඳහා අපි සියලු දෙනාගේම අනුමැතිය ලබා දෙනවා වාගේම අපි එම කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරනවා. ඒ තමයි, එම කොමිෂන් සභාවට පැවරී ඇති කටයුතු රාජකාරියක් විධියට හිතන්නට එපා කියන එක. එතුමන්ලාට අදාළ කටයුතු ජාතික අවශ්‍යතාවක්, ජාතික යුතුකමක් හැටියට හිතලා, රටක් විධියට ප්‍රධාන අවශ්‍යතාවක් වෙලා තිබෙන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක අවශ්‍යතාව වෙනුවෙන් නායකත්වය ලබා දීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, සභාපතිවරයා සහ උපසභාපතිවරයා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. පාර්ලිමේන්තුව විධියට එකී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීමේදී අපේ සහයෝගය, දායකත්වය අවංකවම ලබා දෙන බව සඳහන් කරමින්, ජාතික වැදගත්කමකින් යුතු මේ කටයුතු ඉටු කරන ලෙස ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.48]

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)

(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැහැ. නමුත් එතුමාගේ කථාවේදී එතුමාට ලැබුණු ලිපියක් පිළිබඳව සඳහන් කළා. Off-Port Service Boat Owners and Operators කියන සංවිධානයෙන් එතුමාටත් එවලා තිබුණා කිව්වා මේ රෙගුලාසිවල තිබෙන ඇතැම් අඩු පාඩු පිළිබඳව. ඒ වාගේම එතුමා මගෙන්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

ඉල්ලීමක් කළා මේ අයව හම්බ වෙන්න කියලා. ඇත්ත වශයෙන්ම මගේ කාලයේ නොවෙයි මේ රෙගුලාසි හැදුවේ. ගරු අර්ජුන රණතුංග මැතිතුමා අමාත්‍ය ධුරය දැරූ 2017 මැයි මාසයේ 02 දින තමයි එතුමාගේ අත්සනින් ගැසට් නිවේදනය පිට කළේ. ඇත්තටම දැනටත් මේ ගැසට් නිවේදනයේ තිබෙන රෙගුලාසි ක්‍රියාත්මකයි. අවුරුද්දකට කිට්ටු කාලයක් ක්‍රියාත්මක කරලා පනතේ විධිවිධාන අනුව තමයි අද ඒ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට කටයුතු කරලා තිබෙන්නේ. එතුමාට මම කිව්වා, "මේවා හදන විට නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඒ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා ඒ අයගේත් අදහස් අරගෙන මේ රෙගුලාසි සකස් කරලා තමයි ඒ ගැසට් නිවේදනය මඟින් ඒවා ක්‍රියාත්මක කරන්නට පටන් අරගෙන තිබෙන්නේ." කියලා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මගෙන් ඉල්ලීමක් කළා, මේ අයව කොහොම හරි හම්බ වෙන්න කියලා. ඇත්තටම මම ඒ කියපු දේත් එක්තරා මට්ටමකින් අභියෝගයට ලක් කළා, මේ අයව හමු වුණාද නැද්ද කියන එක සඳහන් කරලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහා මේ කාරණයත් මම කියන්නට කැමැතියි. මේ Off-Port Service Boat Owners and Operators කියන සංවිධානයේ බෝට්ටු, නැව් අයිනි ලොකුම කොම්පැනි හැටියට සඳහන් වෙන්නේ Ceyline Maritime Services (Pvt.) Limited කියන කොම්පැනිය, GAC Shipping Limited කියන කොම්පැනිය, Master Divers (Pvt.) Limited කියන කොම්පැනිය සහ Wilhelmsen Meridian කියන කොම්පැනියයි. මේ කොම්පැනි හතරම මේ Off-Port Service Boat Owners and Operators කියන සංවිධානයේ සාමාජිකයෝ හැටියට ඉන්නවා. ඒ letterhead එක මම ළඟ තිබෙනවා. ඒ letterhead එක බලාගෙනයි මම කියන්නේ. මේ අය තමයි විශාලම නැව් කොම්පැනි. ඒ නිලධාරියා මට මේ වාර්තාව සහතික කරලා එවලා තිබෙනවා. මීට පෙර එතුමාව හම්බ වෙලා මේ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. සාකච්ඡා කිරීමෙන් අනතුරුව තමයි මේ රෙගුලාසි ඒ කාලයේ ගැසට් නිවේදනයක් හරහා පනවන්නට කටයුතු කරලා තිබෙන්නේ. ඒ වාගේම මම කියනවා නාවික හමුදාව සමඟ සාකච්ඡා කළා, සංචාරක සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළා කියලා. මේ සියලුම පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා තමයි මේ රෙගුලාසි අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ හැන්සාඩ් වාර්තාව කියවන විට එතුමාත් දැන ගනී. මේ සමහර අය ඇවිල්ලා කථා කළාට, ඇත්ත වශයෙන්ම කරලා තිබෙන දේවල් සම්පූර්ණයෙන්ම කියන්නේ නැහැ. ඒ අය මොකක් හෝ කොනක් අල්ලාගෙන, එක පැත්තක් පමණක් මේ මන්ත්‍රීවරුන්ට කියලා, ඒ අය හරහා එක එක ප්‍රකාශ ඉදිරිපත් කරන්න පෙළඹෙනවා. ඇත්ත වශයෙන්ම එය නිවැරැදි කිරීමක් හැටියට තමයි මෙය ඉදිරිපත් කරන්නේ. ඒ විතරක් නොවෙයි.

මෙහිදී වැදගත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. මා ඒ යෝජනා සටහන් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා සඳහන් කළා, නැව් පරීක්ෂා කරන්න පෞද්ගලික අංශයටත් දෙනවාය කියලා. මුලින්ම නාවික ලේකම් කාර්යාලයෙන් නැව් පරීක්ෂා කිරීම කරන්න පියවර ගන්නය, එසේ කරන්න බැරි නම් පමණක් පෞද්ගලික අංශයට යන්නය කියලා මා දැන් නියෝගයක් දෙනවා. මොකද, අපට එය කරන්න පුළුවන්කම තිබෙනවා නම් අපි ප්‍රමුඛත්වය දිය යුත්තේ රජයේ ආයතනයකටයි. ඒ කටයුතු පෞද්ගලික අංශයට දෙන්නේ නැතුව එතුමන්ලා ඒ වගකීම භාර ගන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා, "ලේකම් කාර්යාලයේ ප්‍රධානියා -අධ්‍යක්ෂ ජනරාල්වරයා- කවුද කියන එකත්, ඔහු පත් කරලා තිබෙන්නේ කොහොමද කියන එකත් එතුමා දන්නේ නැහැයි." කියලා. මා කියන්න කැමැතියි, ඔහු රජයේ සේවකයෙක් බවත්, එය දේශපාලන පත්වීමක් නොවන බවත්. ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වන්නේ අමාත්‍යාංශය යටතේයි. රජයේ සේවකයෙක් තමයි එහි ප්‍රධානියා -අධ්‍යක්ෂ ජනරාල්- හැටියට ඉන්නේ. ඒ කාර්යාලයේ කිසිම කෙනෙකු දේශපාලන වශයෙන් පත් කරලා නැහැ. ඒ ලේකම් කාර්යාලයේ කිසිම රැකියාවකට කිසිම කෙනෙකු දේශපාලන වශයෙන් පත් කරලා නැහැ. ඒ නිසා රජයේ නිලධාරියකු මෙහෙයවන කාර්යාලයක් හැටියට ඒ ලේකම් කාර්යාලය ස්වාධීනව කටයුතු කරන බවට සහතික කරන්න මා කැමැතියි. අඩු පාඩු තිබෙනවා නම් ඒ අඩු පාඩු ඉදිරියේදී සම්පූර්ණ කරගෙන, ඒ ලේකම් කාර්යාලය හරහා විශාල සේවයක් කරන්න අපි සූදානම්ය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම

தேசிய கல்வி ஆணைக்குழுவின் தலைவர் மற்றும் உப தலைவரின் ஊதியங்கள் மற்றும் ஆணைக்குழு அங்கத்தவர்களின் கொடுப்பனவுகளைத் திருத்தியமைத்தல்

REVISION OF REMUNERATION OF THE CHAIRMAN AND THE VICE-CHAIRMAN AND THE ALLOWANCES OF THE MEMBERS OF THE NATIONAL EDUCATION COMMISSION

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ස්ථාපිත මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා දීමනා එකී පනතේ 4 (8) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු හෙයින්ද;

2017.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින් ද;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට පිළිවෙළින් රු. 75,000/-ක් සහ රු. 60,000/-ක් වශයෙන් මාසික පාරිශ්‍රමිකයන් ගෙවීමටත්;

(ii) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට එක් රැස්වීම් වාරයක් සඳහා රු. 6,000/-ක දීමනාවක් ගෙවීමටත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 (iv)හි විධිවිධාන පරිදි සභාපතිවරයා සඳහා ලීටර් 225ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් සහ උප සභාපතිවරයා සඳහා ලීටර් 170ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් ලබා දීමටත්;

ඊට අනුකූලව, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට සහ සාමාජිකයන් වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පාරිශ්‍රමික හා දීමනා ගෙවනු ලැබීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු මහින්ද සමරසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද සමරසිංහ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

රාජාංගනය ගොවි උද්ඝෝෂණයේදී අමානුෂික ලෙස පහරදීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක්
ராஜாங்கனை விவசாயிகளின் ஆர்ப்பாட்டத்தின்போதான கொடூரத் தாக்குதல் பற்றிய முறைசார்ந்த விசாரணை
FORMAL INVESTIGATION INTO BRUTAL ASSAULT ON FARMERS' PROTEST AT RAJANGANAYA

[අ.භා. 1.55]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු ශෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" මේ වන විට වසර දෙකහමාරක් එනම් කන්න හතරක (04) කාලයක් ගොවිතැන් කටයුතු සිදු වී නොමැති අවස්ථාවක ජල කළමනාකරණය සම්බන්ධයෙන් රජයේ පාර්ශ්වය ගොවි ජනතාවට ඇහුම් කන් නොදී රාජාංගනය ගොවි උද්ඝෝෂණය අතරතුර අමානුෂික ලෙස පහර දීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආණ්ඩු පාර්ශ්වය විසින් සිදු කළ යුතු යැයි යෝජනා කිරීම ."

පසුගිය පෙබරවාරි 28 වන දින තඹුත්තේගම ගොවි උද්ඝෝෂණයේදී ඇති වුණු තත්ත්වය සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ස්තුතිවන්ත වනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් තමයි දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. මේ යෝජනාව සම්බන්ධයෙන් පූර්ව වශයෙන් ඊයේ දහවල් 12.00ට පෙර ආණ්ඩු පාර්ශ්වයට දැනුම් දී තිබෙනවා. හැබැයි මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේදී කිසිදු අමාත්‍යවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කිසිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මේ සභාවේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මන්ත්‍රීවරයෙක් ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
මන්ත්‍රීවරයෙක් යම්තම් ආවා. මා අහන්නේ, මේ කරුණුවලට උත්තර දෙන්නේ කවුද කියලායි. මේ සභාවේ නිස් පුටුවලට කථා කරන්න කියලාද කියන්නේ? ඒ නිසා කල් තැබීමේ යෝජනාවට පිළිතුරු ලබා දීම සඳහා කරුණාකරලා වග කිව යුතු අමාත්‍යවරයකු මේ ගරු සභාවට කැඳවන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ හොඳ ප්‍රශ්නයක්. එය සභාවේ අවධානයට යොමු කරනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු ශෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
අවධානයට යොමු කරන්න නොවෙයි, -

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
අවධානයට යොමු කරන්න සභාවේ කෙනෙක් නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාවේ කටයුතු වේලාසනින් අවසන් වීම තමයි මෙයට හේතුව.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජාංගණය ගොවි ජනපදයේ ඇති වුණු උද්ඝෝෂණයේදී පොලීසියේ නිල කබායට මුවා වෙලා සිවිල් ඇඳුමින් සැරසීගෙන හිටපු පිරිසක් ඉතාම අමානුෂික ආකාරයට ඒ ගොවි ජනතාවට එළවා එළවා පහර දුන්නා. තමුන්නාන්සේත් දකින්න ඇති, පොලු අරගෙන ඇවිල්ලා කොහොමද ඒ පහර දීම සිදු කළේ කියලා. අද මම ඉදිරිපත් කරන මේ යෝජනාවට අදාළව පිළිතුරු දීමට ඇමතිවරු කිහිප දෙනෙක් ඉන්නවා. නීතිය හා සාමය සම්බන්ධ නව ඇමතිතුමා ඊයේ තමයි දිවුරුම් දුන්නේ; අද වැඩ භාර ගන්න ඇති. හැබැයි, රජයේ වග කීමක් තිබෙනවා, මෙවැනි අනිශයින් වැදගත් අවස්ථාවක මේ සභාවේ ඉඳලා එයට උත්තර දෙන්න. මේ වාගේ ඉතාමත් ඛේදජනක තත්ත්වයක් සිදු වුණු අවස්ථාවක විෂය භාර ඇමතිවරයෙක්, එහෙම නැත්නම් ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන ප්‍රධාන ඇමතිවරයෙක් මෙතැන ඉඳලා, අපට ඇහුම්කන් දීලා, රජයේ පාර්ශ්වයෙන් ගන්නා වැඩ පිළිවෙළ ගැන කියන්න අද මේ සභාවේ නැහැ.

මේ විධියට මර්දනය කළේ ගොවි ජනතාව විතරක් නොවෙයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් එළියට බැහැලා උද්ඝෝෂණය කරලා තමුන්ගේ ව්‍යක්තීය අයිතිවාසිකම් ඉල්ලන කොට මේ ආකාරයටම පොලු මුගුරු අරගෙන ඇවිල්ලා දිගින් දිගටම පහර දීමක් සිදු වුණා. සංවිධානාත්මකව රජය විසින් මේ පහර දීම සඳහා අවශ්‍ය කටයුතු කළාද, රජයේ මැරවරයෝ ගිහිල්ලා ඒ ගොවි ජනතාවට පහර දුන්නාද කියන කාරණාව තමයි අපට මෙතැනදී පැහැදිලි කර ගත යුත්තේ. අද වෙන කල් රජයේ පාර්ශ්වයෙන් කිසිදු ඇමතිවරයෙක්, කිසිදු මන්ත්‍රීවරයෙක් මේ රාජාංගණය ගොවි උද්ඝෝෂණය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක මතයක් පළ කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් පෞද්ගලික වුවමනාවක් ඉටු කර ගැනීම වෙනුවෙන් නොවෙයි ගියේ. තමන්ගේ අක්කර 37,000ක් වුණු ගොවි බිම් ටික එක පැත්තකින් නියඟයෙන් බැට කනවා; අනෙක් පැත්තෙන් පොහොර ටික නැහැ; අනෙක් පැත්තෙන් රජයෙන් ලබා දෙන සහනාධාර ටික නැහැ. මේ කිසිම සහනාධාරයක් නොමැති අවස්ථාවක ඒ ජලය ලබා ගැනීමේදී ජනතාව තුළ තිබෙන සැකය දුරු කර ගැනීම සඳහා පාලකයන් ඇහුම්කන් නොදෙන හින්දා තමයි ජනතාව පාරට බැහැලා ඒ උද්ඝෝෂණය කළේ. එය ආරම්භයේදී සාමකාමී උද්ඝෝෂණයක් බවට පත් වුණා. හැබැයි, සංවිධානාත්මකව සිවිල් ඇඳුමෙන් සැරසිලා මේ ගොවි ජනතාවට දිගින් දිගටම පහර දුන්නේ කවුද කියලා දැන ගන්න අපට අවශ්‍යයි. මේ ඉල්ලීමේදී කිසිම කෙනෙක් පානීය ජලය ලබා දෙනවාට විරුද්ධ නැහැ. පානීය ජලය ලබා දෙන අතරතුර ගොවි ජනතාවගේ ගොවි බිම්වලට අවශ්‍ය ජලය ලබා ගැනීම ගැන තමයි කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුරුවිල වැවේ මේ වාගේ යෝජනා ක්‍රමයක් ආරම්භ කළා. එවැනි අවස්ථාවක අවබෝධතා ගිවිසුමකට ආවා, ගොවි සංවිධානත් එක්ක. මහවැලි ජලාශයේ වතුර අරගෙන ගොවි ජනතාවට බොන්න ජලය ලබා දෙනවා වාගේම ගොවි තැනට අවශ්‍ය ජලය ලබා දෙන්න පහසුකම් ටික සැලසුවා. අනෙක් පැත්තෙන් මහකනදරාව ආශ්‍රිතව ආරම්භ කරපු අනුරාධපුර උතුර ජල යෝජනා ක්‍රමයත් එහෙමයි. එහිදී අමාත්‍යාංශය සමඟ එකඟතාවකට ආවා, උතුරු මැද ඇළ හරහා මහකනදරාවට ජලය ගෙනැල්ලා ඒ ජලය පාවිච්චි කරලා ගොවි තැනටයි, පානීය ජලය සඳහායි ලබා දෙන්න. මේ අවස්ථාවේ නම්, රජයේ කිසිම නියෝජිතයෙක් ඉදිරිපත් වුණේ නැහැ, මේ ගොවි ජනතාවට කථා කරන්න. රජයේ නියෝජිතයන් කිව්වේ, නිලධාරීන්ට ගිහිල්ලා මේ අවශ්‍යතාව ඉටු කරන්න කියලා. හැබැයි, මෙවැනි දහස් ගණනක් ජනතාව පාරට බැහැලා දේශපාලනඥයන්ගෙන් - මහජන නියෝජිතයන්ගෙන් - බලාපොරොත්තු වෙන උත්තරය කිසිමදාක නිලධාරීන්ට ලබා දෙන්න බැහැ. රජයේ නියෝජිතයන් ජනතාව ඉදිරියට ගිහිල්ලා කථා කරන්න මැළි වෙද්දී, භය වෙද්දී, හැංගෙද්දී අර ප්‍රාදේශීය ලේකම්තුමිය සහ මහ දිසාපතිතුමා සම්බන්ධ කරලා විසඳුමක් දෙන්න කටයුතු කළා. ඒක නිසා මේකේ අමානුෂික පහර දීමක් සිදු වුණා. මේ පහර දීම ඉතාම පැහැදිලිව සංවිධානාත්මක කරපු පහර දීමක්. ඒක හින්දා අපි මේ සභාවට මේ කාරණය යෝජනා කරනවා. මේක තඹුත්තේගමදී සිදු වුණු එක සිද්ධියක් වෙන්න පුළුවන්. හැබැයි, ඉදිරියේදීත් මෙවැනි සිදුවීම් ඇති නොවන ආකාරයට රජය කටයුතු කරන්න ඕනෑ.

රජය විසින් ජනතාවට ඇහුම් කන් දෙන්නේ නැත්නම් ජනතාව ආණ්ඩුවට තේරෙන භාෂාවෙන් කථා කරන්න පටන් ගන්නවා. ඊට වඩා ආණ්ඩුව කළ යුතු වන්නේ සානුකම්පිතව ජනතාව දිහා බලලා ජනතාවගේ ප්‍රශ්න, ගැටලුවලට අවශ්‍ය විසඳුම් ලබා දෙන එකයි. ඒ හින්දා අපි රජයෙන් ඉල්ලනවා, කරුණාකරලා සාධාරණ, ස්වාධීන පරීක්ෂණයක් මේ සම්බන්ධයෙන් කරන්න කියලා. මේ රජය වැරැදි පූර්වාදර්ශයක් දෙනවා. පූර්වාදර්ශයක් දීලා රජය අභිංසක ජනතාවට පණිවුඩයක් දෙනවා, "මේ ආණ්ඩුව ගෙන යන ඒකාධිපති ක්‍රමයට විරුද්ධව කවුරුහරි කට ඇරලා වීදි බැස්සොත් මේ විධියට එළවා එළවා තිරිසනුන්ට ගහන ආකාරයට කටයුතු කරන්න රජය සූදානම් වෙනවා" කියලා. රජය නියෝජනය කරන, වග කියන කිසිදු ඇමතිවරයෙක් මේ අවස්ථාවට ඇවිල්ලා පිළිතුරු ලබා දෙන්න අපොහොසත් වීම ගැන අපි කනගාටු වෙනවා.

ඒ නිසා අපි වහාම ගරු කථානායකතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. ගරු කථානායකතුමාට මෙම කල් තැබීමේ යෝජනාව කල් වේලා ඇතිව අපි භාර දෙන්නේ, අදාළ ඇමතිවරයා, එහෙම නැත්නම් එතුමා නියෝජනය කරමින් රජයේ පාර්ශ්වයෙන් මේ සඳහා පිළිතුරු ලබා දෙයි කියන බලාපොරොත්තුවෙන්. ඒ නිසා, කරුණාකරලා ගරු කථානායකතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා. රජය ජනතාවට ඇහුම්කන් දුන්නේ නැත්නම් ඉදිරියේදීත් මේ වාගේ උද්ඝෝෂණ රාශියක් ඇති වෙයි.

විශේෂයෙන්ම අමතක කරන්න එපා, මේ වෙන කොට ගොවි ජනතාව තමන්ගේ කන්න 5ක් වගා කරලා නැහැයි කියන එක. එවැනි අවස්ථාවක ඔවුන් ඉතාම අසීරුවෙන් ජීවත් වෙන්නේ; තුන්වේල කන්නේ ඉතාම අමාරුවෙන්; තමන්ගේ හෙට දවස ගැන බලාපොරොත්තුවක් නැතිව ඉන්නේ. මේ විධියට රට අස්ථාවර වෙලා තිබෙන මොහොතක, කෘෂි කර්මාන්තය පිළිබඳව ගොවියාට අමතක කරන්න වෙලා තිබෙන යුගයක මෙවැනි ආකාරයට රජය කටයුතු කිරීම ඉතාම ඛේදජනක තත්ත්වයක්. ඒ නිසා, වහාම මේ ගැන පරීක්ෂණයක් පවත්වලා, සිදු වුණු අසාධාරණය සම්බන්ධයෙන් මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා අපි නැවත වාරයක් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා. 2.04]

ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද කල් තැබීමේ යෝජනාව ස්ථිර කරන අතර, මේ සභාවේ අපට ඉදිරිපසින් ඇති ආණ්ඩු පක්ෂයේ හිස් පුටුවලට මේ අවස්ථාවේ කථා කරන්න සිදුවීම ගැන මම කනගාටු වෙනවා. ගොවියාත්, ගොවිතැනත් පිළිබඳව මේ ආණ්ඩුවේ ආකල්පය කුමක්ද කියලා මේ හිස් පුටුවලින් අපට දැනගන්න, දැකගන්න පුළුවන්. මෙය තමයි ශ්‍රී ලංකාවේ උත්තරීතර සභාව. මේ උත්තරීතර සභාව තමයි මේ රටේ ජනතාවගේ දුක් ගැනවිලි, ගැටලු ඉදිරිපත් කොට විසඳුම් ලබා ගන්න, සහනයන් ලබා ගන්න තිබෙන ස්ථානය. ඒ ස්ථානය පාළු පිටිටනියක් වුණාම, වග කිවයුතු සියලුදෙනා වගකීමෙන් මහහැර ගියාම කුමක්ද සිදු වන්නේ? මේක අද විතරක් සිදු වුණු දෙයක් නොවෙයි. පසුගිය කාල සීමාව තුළම අපි මේ තත්ත්වය දැක්කා. අපි මේ සම්බන්ධව නිතරම ගරු කථානායකතුමාට දැනුම් දුන්නා.

පාර්ලිමේන්තුව රැස්වෙන දිනක වියදම ගැන කථා කරනවා; ඒකේ සංඛ්‍යා ලේඛන ගැන කථා කරනවා. හැබැයි, පාර්ලිමේන්තුව රැස් වෙන්නේ මෙහෙම නම්, එයින් මේ රටට, ජාතියට ප්‍රයෝජනයක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරුමැද පළාතේ, නැගෙනහිර පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, හම්බන්තොට, කුරුණෑගල මේ හැම ප්‍රදේශයකම වසර ගණනක් තිස්සේ නියඟයක් තිබෙනවා. ඒක මේ ආණ්ඩුවේ වරදක් නිසා සිදුවූවක් කියා මම කියන්නේ නැහැ. හැබැයි, මෙම ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, ජාතියට කන්න දුන්නු, ජාතියේ කුසගින්න නිවපු, ජාතියේ ජීවනාලිය බඳු ගොවියාගේ ඉරණම පිළිබඳ මීට වැඩිය අවධානයකින් කටයුතු කරන්න. රටට පාන් පිටි ගෙන්වන පිටි සමාගම්වලට මේ ආණ්ඩුව අවුරුද්දකට රුපියල් කෝටි 3,200ක් බදු සහන වෙනුවෙන් වියදම් කරනවා. මෙන්ඩිස් ස්පෙෂල් අරක්කු සමාගමට අරක්කු පෙරන්න බදු සහන දෙනවා. හැබැයි, ජාතියට කන්න දුන්නු, ජාතියේ කුසගින්න නිවපු ගොවියෝ අද හාමතේ ඉන්නේ. ලෝක ආහාර සංවිධානයෙන් කියනවා, මේ පළාත්වල ගොවි පවුල් තුන්ලක්ෂයක් රෑට නිදාගන්න යන්නේ එක්කෝ කුසගින්නේ, එක්කෝ අර්ධ කුසගින්නේ කියලා. ජාතියට කන්න දුන්නු ගොවියා මේ බෙදනීය ඉරණමේ දුක් විඳින කොට, ඒකේ විසඳුම්කරුවා විය යුත්තේ පවතින ආණ්ඩුව. හැබැයි, ආණ්ඩුවේ කවුරුවත් මේකට සවන් දෙන්නවත් මේ සභාවේ නැහැ. සමාගම්කරුවෝ වෙනුවෙන්, ජාත්‍යන්තර ව්‍යාපාරිකයෝ වෙනුවෙන්, ඒ සියල්ල වෙනුවෙන් පෙනී සිටින්න, footnotes දමන්න ඇමතිවරු ඉන්නවා; මන්ත්‍රීවරු ඉන්නවා. අර්ජුන් ඇලෝසියස් වෙනුවෙන් පෙනී සිටින්න කට්ටිය ඉන්නවා. හැබැයි, ජාතියේ ගොවියා වෙනුවෙන් පෙනී සිටින්න කවුරුවත් නැති තත්ත්වයක් තමයි අද මේ සභාවෙන් පෙනී යන්නේ. ඒකට මූලාසනයේ ඉන්න ඔබතුමා වග කිවයුතුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නමුත්, මේක බෙදවාචකයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑත කාලයේදී අනුරාධපුර, මහවිලච්චියේ එක ගොවියෙක් උදේ 9.00ට විතර තමන්ගේ ගෙදර තිබෙන කැත්ත අරගෙන කඩයකට යනවා. ඒ කැත්ත අරගෙන ඇවිල්ලා හන්දියේ තිබෙන කඩේ මුදලාලිට දීලා කියනවා, "මේක තියාගෙන මට රුපියල් 200ක් දෙන්න" කියලා. ඔහු ගොවියාගේ මුහුණ දිහා බලාගෙන ඉඳලා කැත්ත ගන්නේ නැතුව අහනවා, "ඇයි" කියලා. ඇයි කියලා අහපුවාම ගොවියා කියනවා, "මගේ පුංචි පුතාට දවස් තුනක් සහලවලා උණ. මට පොඩි එකාට බෙහෙත් ටිකක් ගන්න යන්න විධියක් නැහැ. මුදලාලි, මේ කැත්ත තියාගෙන රුපියල් 200ක් දෙන්න" කියලා. මේ ජාතියේ ගොවියාගේ ඉරණමයි. අද අම්පාරේ වැව්වල වතුර නැහැ. මේ යල කන්නයේ වගා කරන්න විධියක් නැහැ. මහ කන්නයේ ගොයම් කැපුවා. හාල් කිලෝ එක රුපියල් 100යි. වී කිලෝ එක රුපියල් 28යි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සහතික මිලක් තිබෙනවා කියලා කියනවා. මෙච්චර මිලකට ගන්නවා කියලා කියනවා. නමුත් ගන්න තැනක් නැහැ. පසුගිය ආණ්ඩුවෙන් ගබඩා හැදුවා. අපට බැන්නාට, අපි වැව් හැදුවා; අපි වතුර දුන්නා; අපි ගොවියා නඟා සිටෙව්වා. හැබැයි, අද ගොවියාට මේ කන්නයේත් වගා කරන්න විධියක් නැහැ. ඔහුගේ ඉරණම කුමක්ද?

මේ රටේ නීතිය මොකක්ද? වරාය විකුණනවාට විරුද්ධ වෙන එකාට ගහනවා. වරාය විකුණන එකා ආරක්ෂා කරනවා. රාජාංගණය වැවේ වතුර විකුණන එකාට ආරක්ෂාව දෙනවා. විකුණනවාට විරුද්ධ එකා ගුටි කනවා. අද මේ ආණ්ඩුව කන්න ගණනක් වගා කරන්න බැරුව දහදුක් විඳින, බඩ ගින්නේ ඉන්න ගොවියාට පොලීසිය දාලා ගහනවා නම්, තමුන්නාන්සේලාට ඡන්දය දෙන්න ඕනෑ කියලා කියනවා නම් මොකාද ඡන්දය දෙන්න ඉන්නේ? කවුද ඡන්දය දෙන්න ඉන්නේ? කුමකටද මේ ආණ්ඩුවට ඡන්දය දෙන්නේ? අපට එක්සත් ජාතික පක්ෂය එක්ක වෛරයකුත් නැහැ. මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න අය එක්ක තරහකුත් නැහැ. තමුන්නාන්සේලා තව අවුරුදු දෙකක් මේ ආණ්ඩුව ගෙන යන්න. ඒක ප්‍රශ්නයකුත් නැහැ. මට නම් කිසි ප්‍රශ්නයක් නැහැ. තව අවුරුදු දෙකක් මේ ආණ්ඩුව ගෙන යන්න. හැබැයි, රටට වෙන්නේ මොකක්ද කියලා බලන්න. ගොවියාට වෙන්නේ මොකක්ද කියලා බලන්න.

ගොවියා කරගැට පිරිච්ච අතින් තමුන්නාන්සේලාගේ දේදුණු විප්ලවයට 2015 ජනවාරි 8වැනි දා උදේ පාන්දර ඇවිල්ලා ඡන්දය දුන්නා. ඒ, මහින්දගේ කාලයට වඩා වැඩිය හොඳ ජීවිතයක් ගත කිරීමේ බලාපොරොත්තුවෙන්. හැබැයි, ඔවුන්ට කුමක්ද සිදු වුණේ? ඒ විරෝධය නේද, පසුගිය මැතිවරණයේදී පෙන්වූවේ? සංඛ්‍යා ලේඛන, දත්ත වෙනස් කර කර ඒක වසන් කරන්න හැදුවාට, ඒක වසන් කරන්න බැහැ. මේ මහ පොළොවේ තිබෙන තිත්ත ඇත්ත අපි තේරුම් ගන්න ඕනෑ. ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමායි, මමයි මේ සභාවේ කථා කරලා ගියාට ගොවියාගේ කුස පිරෙන්නේ නැහැ; ඔහුගේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා ජාතියේ කුස ගින්න නිවපු මේ ගොවියාගේ ප්‍රශ්නයට අවධානය යොමු කරන්න. මේ මොහොතේ කුස පොත්ත පිටට ඇලිච්ච ඒ ගොවියාගේ ඉරණමට තමුන්නාන්සේලා අවධානය යොමු කරන්නේ නැත්නම් මේ ආණ්ඩුවට හෙණ හත ගහනවා. කතරගම දෙයියනේ! බලන්න ඕනෑ, මේ අපරාධය දිහා.

ජාතියකට කන්න දුන්නු ගොවියාගේ ඉරණම ගැන බලන්නේ නැත්නම්, මේ දුක දිහා බලන්නේ නැත්නම් මොකක්ද මේකේ තේරුම? කෘෂිකර්ම ඇමතිවරු කොච්චර හිටියත් වැඩක් නැහැ. හිස් ගොඩනැඟිලිවලට කෝටි ගණන් ගෙවනවා. හැබැයි, ගොවියාගේ දුකට පිහිට වෙන්න ආණ්ඩුවට සල්ලි නැහැ. බලන්න කෙනෙක් නැහැ. ඒ මදිවට පොලීසිය දාලා බිම දාගෙන පහර දෙනවා. මේ රටම දැක්කා, ගහපු ගැහිල්ල. ඔවුන් අපරාධකාරයෝද? ඔවුන් ත්‍රස්තවාදියෝද? තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු, අතේ කරගැට තිබෙන ගොවීන්ට නේද පහර දුන්නේ? මම දිගට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේක තමයි ජාතියේ ඉරණම. මම මේ සභාවේ හිස් පුටුවලට කථා කරන එකේ තේරුමක් නැහැ. මිනිස්සුනේ! හෘදය සාක්ෂියක් ඇති මිනිස්සුනේ! උඹලා දැන් ඉවසුවා ඇති. අතේ කරගැට තිබෙන ගොවි ජනතාවට මේ ජාතික සභාවේ ඉඳලා මම මේ කාරණය කියන්න කැමැතියි. නුඹලා නැඟිටපල්ලා. ඉඩම් ටික විකුණනවා. ගොවියාට වතුර නැහැ. කන්න නැහැ. ගමේ කිසිවක් සිද්ධ වන්නේ නැහැ. මේ සභාවේ කයිවාරු ගැහුවාට ඒ වචනවලින් ඔවුන්ගේ දුක නිවෙන්නේ නැහැ. ඒ නිසා හෘදය සාක්ෂියක් ඇති මිනිස්සුනේ! නැඟිටපල්ලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කළා නේද? මීළඟට, අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙයට පිළිතුරු කථාව කරන්නේ කවුද කියා මම මුලින්ම දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේකට අදාළව ඉන්නේ නීතිය හා සාමය පිළිබඳ අලුත් ඇමතිතුමා. එතුමා අද, දැන් ටිකකට කලින් තමයි දිවුරුම් දුන්නේ. එතුමා කිව්වා මේ ප්‍රශ්න සියල්ලටම සවන් දීලා,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා විතරක් නොවෙයි, මේකට වග කියන්න ඕනෑ,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
නිවැරදි පිළිතුරක් ඉදිරි පාර්ලිමේන්තු දිනයේදී ලබා දෙනවා කියලා. මොකද, අද එතුමා වැඩ භාර ගත් දවස. ඒක අපි කවුරුත් දන්නවා.

[අ.භා. 2.12]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි ප්‍රශ්නය මේකයි. එතුමා අද වැඩ භාර ගත් දවස නිසා, එතුමාට උත්තර දෙන්න එන්න බැරි වෙන්න පුළුවන්. ඒ, එතුමාට. හැබැයි, ආණ්ඩුවක් ලෙස තමුන්නාන්සේලාගේ පොලිස් දෙපාර්තමේන්තුව විසුරුවා හැරලා පොලිස් දෙපාර්තමේන්තුව අද පිහිටෙව්වා නොවෙයි නේ. අමාත්‍යවරයා නැති වුණාට, අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉන්නවා නේ. අමාත්‍යාංශයේ ලේකම්වරයා මාරු වුණේ නැහැ නේ. අමාත්‍යාංශය වෙනස් වුණේ නැහැ නේ. ඒ බිල්ඩින් මාරු කළේ නැහැ නේ. එතකොට තමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවට නිශ්චිත වශයෙන් පිළිතුරක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ සඳහන් කරුණු දෙකක් ඉතා වැදගත් වනවා. එකක් තමයි රාජාංගනය ගොවි ජනපද ව්‍යාපාරයේ අක්කර 37,000කට වැඩියෙන් කුඹුරු වගාවන් තිබෙනවා. ඒ වාගේම පවුල් විශාල ප්‍රමාණයක ප්‍රධාන වශයෙන් තමන්ගේ ජීවනෝපාය වන කෘෂිකර්මාන්තය පෝෂණය වන්නේ මේ රාජාංගන ව්‍යාපාරයෙන් සැපයෙන වතුරවලින්. ඒ නිසා රාජාංගනය වැවේ වතුර පිළිබඳ යම් තීන්දුවකට -තීරණයකට- එළඹෙනවා නම් අනිවාර්ය ලෙස එම ගොවි ජනතාවට අවබෝධය ලබා දීමකින්, එම ගොවි ජනතාවට කරුණු පැහැදිලි කිරීමකින් සහ එම ගොවි ජනතාවගේ ගොවිතැන් පිළිබඳව සුරක්ෂිතභාවයකින් තොරව තීන්දු තීරණවලට එළඹෙන එක වැරැදියි.

අද ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාවේ සඳහන් වන්නේ ග්‍රාම නිලධාරී වසම් 42කට අයත් ගොවි ජනපදවල ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා ඇති කරන ව්‍යාපෘතියක් ගැනයි. එවැනි ව්‍යාපෘතියකුත් අවශ්‍යයි, ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒ පළාත්වල වකුගඩු රෝගය විශාල ලෙස පැතිරෙමින් තිබෙනවා. පානීය ජලය සඳහා අවශ්‍ය වන පිරිසිදු වතුරවල හිඟයක් තිබෙනවා. සමහර සමීක්ෂණ වාර්තාවලින් ඉදිරිපත්වෙලා තිබෙනවා, ගැඹුරු පොළොවේ -පොළොව යට- තිබෙන වතුර පාවිච්චි කරනවාට වඩා මතුපිට තලයේ වතුර පාවිච්චි කිරීමෙන් වකුගඩු රෝගය පැතිරීමට බාධා ඇති කරන්න පුළුවන් කියලා. ඒ පැත්තෙන් බැලුවාම ඒ ජනතාවට පානීය ජල ව්‍යාපෘතියක් ලබා දෙන්න ඕනෑකම තිබෙනවා. මේ පානීය ජල ව්‍යාපෘතිය සඳහා උපයෝගී කර ගන්නේත් රාජාංගනය වැවේ වතුරයි. එම වතුර ඒ පළාත්වල ජීවත් වන ජනතාවට තමන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තය නඩත්තු කර ගැනීම වෙනුවෙනුත් අවශ්‍ය වෙනවා; තමන්ගේ පානීය ජලය සඳහාත් අවශ්‍ය වෙනවා. හැබැයි දැන් කාලාන්තරයක් තිස්සේ ඒ ජනතාව මුහුණ දී තිබෙන ප්‍රශ්නයක් තිබෙනවා. එම වතුර කෘෂිකර්මාන්තය සඳහාවත් ප්‍රමාණවත් වී තිබුණේත් නැහැ. ඒ නිසා එම වතුරම පානීය ජලය සඳහා උපයෝගී කර ගන්නවා නම්, කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාවගේ ජීවනෝපායට විශාල ප්‍රශ්නයක් පැන නඟිනවා. ඒ නිසා ආණ්ඩුව විසින් එයට පැහැදිලි පිළිතුරක් ලබා දිය යුතුව තිබුණා.

රාජාංගනය වැවේ වතුර පානීය ජල ව්‍යාපෘතියක් සඳහා ලබා ගන්නවා නම් ඒ පානීය ජල ව්‍යාපෘතිය සඳහාවත් ලබා ගන්නා වතුර කලා වැව හරහා මුදා හැරීම පිළිබඳව තීන්දුවක් ගත යුතුව තිබුණා. පානීය ජලය සඳහා වසරකට කොපමණ ජලය ප්‍රමාණයක් උපයෝගී කර ගන්නවාද, ඒ වතුර කොච්චර ප්‍රමාණයක් නැවත රාජාංගනය වැවට ලබා දෙන්න පුළුවන්ද කියන එක පිළිබඳව එකඟතාවකට ආ යුතුව තිබෙනවා. ඒ කිසිදු එකඟතාවක් නැතිව, කිසිදු අවබෝධයකින් තොරව තමුන්නාන්සේලා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ගියා. ඒ නිසා තමන්ගේ ප්‍රධාන ජීවනෝපාය බවට පත් වී තිබෙන කෘෂිකර්මාන්තයටත් රාජාංගනය වැවේ වතුර හිඟ වන තත්ත්වයක් තුළ එම ගොවි ජනතාවගේ නැඟී සිටීම වළක්වන්න බැහැ. ඒක සාධාරණයි. මොකද, ඔවුන් ඉල්ලා සිටින්නේ තමන්ගේ කෘෂිකර්මාන්තය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන වතුර ප්‍රමාණය ආරක්ෂා කර දෙන ලෙසයි. ගොවි ජනතාව එහෙම ඉල්ලන්න එපාද? ඒවාට ඇහුම්කන් දෙන්නේ නැත්නම්, ඒ පිළිබඳව නිශ්චිත අදහසක් ඉදිරිපත් කරන්නේ නැත්නම්, වග කිවයුතු ඇමතිවරයෙක් ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්නේ නැත්නම්, ඒ ජනතාවට කරන්නට තිබෙන සාධාරණ දේ තමයි තමන්ගේ ජීවනෝපාය වෙනුවෙන් පාරට බහින එක. ඒ නිසා එදා රාජාංගන වැවේ වතුරවලින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාව තමන්ගේ ජීවනෝපාය පිළිබඳව බරපතළ ගැටලුවක් පිළිබඳ අරගළයක තමයි නිරත වුණේ. ඒක සාධාරණයි. ඒක යුක්ති සහගතයි. හැබැයි, තමුන්නාන්සේලා ඒකට ප්‍රතිචාර දැක්වුවේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගොවි ජනතාව මුහුණ දී තිබෙන ගැටලුවලට විසඳුම් ලබා දෙනවා වෙනුවට, ඒ පිළිබඳව නිශ්චිත පිළිතුරක් ලබා දෙනවා වෙනුවට ඒකට ප්‍රතිචාර දැක්වුයේ ඒ අයට පහර දීලායි. ඒ අයට පහර දීම තමයි තමුන්නාන්සේලාගේ ප්‍රතිචාරය බවට පත් වී තිබෙන්නේ. තමන්ට ජීවත්වීම සඳහා ලබා දෙන වතුර ටික අහිමි වනවා නම්, ඒ පිළිබඳ ඇති වන විශාල වේදනාව නිසා විරෝධය පැන නඟින්නේ එම ජනතාව අතරින්ම තමයි. ඒ නිසා ඒ උද්ඝෝෂණය අතිශය සාධාරණ උද්ඝෝෂණයක්. ඒ තමයි, තමන්ගේ ජීවනෝපාය වෙනුවෙන් වතුර ටික ආරක්ෂා කර දෙන්නය කියන සටන. හැබැයි තමුන්නාන්සේලා ඒකට ප්‍රතිචාර දැක්වුයේ පහර දෙමින්, අත් අඩංගුවට ගනිමින්. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා දැන් පුරුද්දක් බවට පත් කරගෙන තිබෙනවා එවැනි ජනතා උද්ඝෝෂණවලට තමුන්නාන්සේලාගේ මැර කණ්ඩායම් යොදවන

එක. මීට පෙර පාර්ලිමේන්තුවේදී මවිසින් දීර්ඝ ලෙස පැහැදිලි කරනු ලැබුවා, කොළොන්නාව තෙල් ගබඩා සංකීර්ණය ආසන්නයේ සිදුවූ ප්‍රහාරයේදී පොලු සහිතව සිටින අයගේ ඡායාරූප ද පෙන්වමින්.

මේ පාර්ලිමේන්තුවේදී මා ස්ථාවර නියෝග 23(2) යටතේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් නඟා තිබෙනවා, එම මැර කණ්ඩායම් හදුනාගෙන තිබෙනවාද, පොලු අරගෙන ආ අය හඳුනාගෙන තිබෙනවාද, ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර තිබෙනවාද, කිසිවකු අත් අඩංගුවට ගන්න සමත් වී තිබෙනවාද කියලා. ඒ ප්‍රශ්න මේ පාර්ලිමේන්තුව හමුවේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ වන තෙක් ඒවාට පිළිතුරක් ලබා දීලා නැහැ. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය ධුරය වෙනත් කෙනකු අතට මාරු වුණත් පිළිතුරක් ලබා දීලා නැහැ. එදා ඒ මැර කණ්ඩායම් ජනතා උද්ඝෝෂණ මැඩ පැවැත්වීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග ගැන ප්‍රශ්න කර තිබියදීත් තමුන්නාන්සේලා ඒවාට පිළිතුරක් නොදී, තඹුත්තේගමදී නැවත එවැනි මැර කණ්ඩායම් යොදවපු බව අපි දැක්කා. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් දැනගන්න කැමැතියි, ජනතා උද්ඝෝෂණ මැඩ පැවැත්වීම වෙනුවෙන් නිල පොලිස් යන්ත්‍රණ වෙනුවට තවත් අතුරු හමුදාවක්, මැර කණ්ඩායම් තමුන්නාන්සේලා භාවිත කර තිබෙනවාද, ඒ අය පොලිසියට අනුබද්ධ අය නොවෙයිද, එසේ නම් ඒ අය පොලු අරගෙන පොලිසිය ඉදිරිපිට රැඳෙන්නේ කොහොමද, ඒ අය සාමාන්‍ය ගොවි ජනතාවට පහර දීලා ඔසවා ගෙන පොලිසියට අරගෙන යන්නේ කොහොමද කියන ප්‍රශ්නවලට පිළිතුරු. ඒ පිළිබඳ ඡායාරූප තිබෙනවා, වීඩියෝ දර්ශන තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිවිල් ඇඳුමින් සැරසී හිටපු ඒ පිරිස් තමයි ගොවි ජනතාවට පහර දීලා පොලිසියට ඇදගෙන යන්නේ. ඒ නිසා ඔවුන් පොලිසිය හා ඒකාබද්ධව ක්‍රියාත්මක වන මැර කණ්ඩායම් ද කියන ප්‍රශ්නයට තමුන්නාන්සේලාගෙන් පිළිතුරක් ලබා ගන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය භාර රවුල් හකීම් අමාත්‍යවරයා මේ ජල ව්‍යාපෘතිය පිළිබඳව පාර්ලිමේන්තුවට නිශ්චිත වශයෙන් පිළිතුරක් ලබා දිය යුතුව තිබෙනවා. ඒ වාගේම, එම වතුර ලබා ගන්නේ නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් රාජාංගණය වැවට අතිරේක වතුර ලබා දීම සඳහා සකස් කර තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද කියා වාරිමාර්ග අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම, එම ජනතා උද්ඝෝෂණය මැඩ පැවැත්වීම වෙනුවෙන් අතුරු හමුදා, මැර කණ්ඩායම් යොදා ගන්නට අවසර දී තිබේද, එසේ නම් ඒ මැර කණ්ඩායම් කවුද, ඔවුන්ට අණ දෙන්නේ කවුද කියන ඒවා නීතිය හා සාමය භාර අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑකම තිබෙනවා. ඒ නිසා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යවරයාත්, ජල සම්පාදන අමාත්‍යවරයාත්, ඒ වාගේම නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාත් මේ පාර්ලිමේන්තුවට පැමිණ මේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතුව තිබුණා. දැන් ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, නීතිය හා සාමය අමාත්‍යවරයා අද දිවුරුම් දීපු නිසා එතුමාට එන්න බැහැ කියලා. එහෙම නම් ඇයි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයාට ඇවිත් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි? ඇයි, ජල සම්පාදන අමාත්‍ය රවුල් හකීම් මහතාට මේ ව්‍යාපෘතිය ගැන කියන්න බැරි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පෙන්නුම් කර තිබෙන්නේ අන් කවරක් හෝ නොව, ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව මේ අමාත්‍යවරුන්, මේ ආණ්ඩුව දක්වන ආකල්පයයි. 'තමුන්නාන්සේලා මොනවා ඇහුවත්, තමුන්නාන්සේලා මොනවා කිව්වත් අපට අදාළ නැත' කියන ස්ථාවරයේ තමයි මේ ආණ්ඩුව ඉන්නේ. ඒ නිසා තමයි ආන්දෝලනයට තුඩු දී තිබෙන මෙවැනි ප්‍රශ්නයක්, ගොවි ජනතාවගේ ජීවිතයත් එක්ක ගැට ගැසී තිබෙන ප්‍රශ්නයක්, රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්, ගොවි ජනතාවට සාධාරණ උද්ඝෝෂණයක් කිරීමට තිබෙන අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් කෙරේ අද තමුන්නාන්සේලාගේ සැලකිල්ල මේ විධියට යොමු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේදී ජනතාව පිළිබඳව තමන්ගේ වගකීම මුළුමනින් අත් හැරපු විධියට තමයි මේ යෝජනාව සම්බන්ධයෙන් මේ ආණ්ඩුව කටයුතු කර තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව අපේ විරෝධය ප්‍රකාශයට පත් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 2.21]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජාංගණය වැවේ ජල ගැටලුව සම්බන්ධ විවාදය අවස්ථාවේ අදහස් පළ කිරීමේදී විශේෂයෙන් මතක් කර දෙන්න ඕනෑ කරුණක් තිබෙනවා. වකුගඩු රෝගය උතුරු මැද පළාතේ පැතිරී යෑමත් එක්ක, බාල පොහොර ලබා දීමේ ගැටලුවත් එක්ක 2012 වර්ෂය වන කොට -මා පළාත් සභාවේ සිටි කාලයේ- යෝජනාවලියක් ආවා. ඒ තමයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති මධ්‍යම පරිමාණයේ වැව්වලින් බීමට ජලය ලබා දීමේ ව්‍යාපෘතිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට නුවර වැවෙන්, තිසා වැවෙන්, තුරුවිලවැවෙන් බීමට වතුර දෙනවා. ඊට අමතරව කනදරා වැව, රාජාංගනය වැව, විලච්චිය වැව සහ නීලබැමම ව්‍යාපෘතිය තිබෙනවා. මේ වැව්වලින් බීමට ජලය ලබා දීමේ ව්‍යාපෘති සැලසුම් කළේ මේ යහ පාලන ආණ්ඩුවෙන් නොවෙයි. එදා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවෙන් තමයි මේ යෝජනාව ගෙනැවිත්, මිනුම් කටයුතු කළේ. කලාවැවෙන් පාත් වෙන වතුරෙන් අවුරුද්දට දෙවරක් වාන් දමන වැවක් විධියට තමයි රාජාංගන වැව හඳුනා ගෙන තිබුණේ. රාජාංගන වැව කියන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නීලබැමම ව්‍යාපෘතියට කලින් තිබෙන අවසාන වැව. මේ වැව අවුරුද්දට දෙපාරක් වාන් දානවා. ඒ නිසා මේ වැවෙන් වතුර ගන්න පුළුවන් කියන මතයේ ඉඳගෙන තමයි එදා මේ උදව්ය කටයුතු කළේ. හැබැයි, මේ ව්‍යාපෘතිය සැලසුම් කළාට, මේ ව්‍යාපෘතිය කරන්න සල්ලි තිබුණේ නැහැ; i-Road ව්‍යාපෘතිය වාගේම තමයි, මේ ව්‍යාපෘතිවලටත් සල්ලි තිබුණේ නැහැ. මේ ව්‍යාපෘතිවලට සල්ලි ගෙනාවේ අපි. අපේ ආණ්ඩුව කළේ මේ ව්‍යාපෘතියට සල්ලි දීලා ක්‍රියාත්මක කිරීම පමණයි. මිනිසුන්ට බොන්න වතුර නැති වෙනකොට ආණ්ඩුවක් විධියට අපට උඩ බලාගෙන ඉන්න බැහැ. ඒ නිසා අපේ ආණ්ඩුව මේ ව්‍යාපෘතිය පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාට අද රතුපස්වල සිද්ධිය අමතක වෙලා තිබෙනවා; කටුනායක සිද්ධිය අමතක වෙලා තිබෙනවා; හලාවත සිද්ධිය අමතක වෙලා තිබෙනවා. මෙහිදී පැහැදිලිවම කියන්න ඕනෑ කරුණක් තිබෙනවා. මම මේ සිද්ධිය ඇති වූ වෙලාවේ ප්‍රාදේශීය ලේකම්ට කථා කර ඇහුවා, ඇයි මේ ගැටුම ඇති වුණේ කියලා. ප්‍රාදේශීය ලේකම් කිව්වේ,"මන්ත්‍රීතුමා, අපි දන්නේත් නැහැ. මම ගොවි සංවිධානයේ නියෝජිතයන් එක්ක සාකච්ඡාවට ගියා. ඒ සාකච්ඡාව කරන්න ඉස්සෙල්ලා තමයි මේ ප්‍රහාරය එල්ල වුණේ" කියලායි. ඔවුන් මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉල්ලීමක් කළේ නැහැ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මේ ව්‍යාපෘතිය ගැන කොහෙන්වත් ඉල්ලීමක් කරලා තිබුණේ නැහැ; අපෙන් ඇහුවේ නැහැ. මේ ගොවි ජනතාව ඒ සාකච්ඡාවට සහභාගි වෙන අවස්ථාවේදී කොහේවත් යන මැරයන් කණ්ඩායමක් තමයි පාරවල් ටික වහලා මේ ප්‍රහාරය එල්ල කළේ. පොලිසිය ඇතුළට ගහන හැටි අපි දැක්කා. නමුත් ඒ

[ගරු වන්දිම ගමගේ මහතා]

පැත්ත ගැන කථා කරන්නේ නැහැ. මෙහිදී අපි පැහැදිලිව මේ ටික අහන්න ඕනෑ. ඒ ගල් කොහෙන්ද එතැනට ආවේ? ඒ පොලු කොහෙන්ද එතැනට ආවේ? සංවිධානාත්මකව ආවේ නැත්නම් කොහෙන්ද ඒ ගල්, පොලු එතැනට ආවේ? තඹුත්තේගම නගරයේ කොහේවත් ගල් ගොඩ ගහලා නැහැ. අද එහේ පාරවල් හදන්නේ නැහැ. පාරවල් ඔක්කොම හදලා ඉවරයි. පොලු ගොඩ ගහන්නත් අවශ්‍යතාවක් නැහැ. එහෙම නම් ඒ පොලු කොහෙන්ද එතැනට ආවේ? ඒ ගල් කොහෙන්ද එතැනට ආවේ? මේ පිටුපස සංවිධානාත්මක දේශපාලන ව්‍යාපෘතියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඡන්දය දුන් ගොවි සංවිධාන ඒ පළාතේ ඉන්නවා. අපි ඒ ගොවීන්ට කථා කරලා ඇහුවාම, ඒ ගොවි සංවිධානවලින් කිව්වේ මොකක්ද? වෙන මොකුත් නොවෙයි ඔවුන් කිව්වේ. "අනේ සර්, අපි දන්නේ නැහැ. අපි නම් ආවේ සාකච්ඡාවට තමයි. සාකච්ඡාව යන අතරතුර වෙනත් පිරිසක් මේක සංවිධානය කරලා තිබුණා. ඒ මිනිස්සු තමයි ගහන්න පටන් ගත්තේ" කියලා තමයි ඔවුන් කිව්වේ. දැන් මෙතැනට ඇවිත් බයිලා දොඩවනවා. ඔය බයිලා කියලා මේ ප්‍රශ්නවලින් මිදී යන්න බැහැ. මෙහිදී මොකක්ද ඒ අය කිව්වේ? ජනතාව අතරට ඒ අය ගෙන ගිය මතය තමයි, දවසකට අක්කර අඩි 38ක් වැවේ වතුර ගන්නවාය කියන එක. මිනිස්සු මේ කථාවලින් විකාර වුණා. වැවකින් දවසකට අක්කර අඩි 38ක් අරගෙන ආණ්ඩුවක් ජල ව්‍යාපෘතියක් කරනවාද? මේ කථා නිසා මිනිස්සු කලබල වුණා. ඔවුන් ඒ ගැන අපෙන්වත් ඇහුවේ නැහැ. අපි එක්ක කථා කළේත් නැහැ. මේ අය බොරුවට අනවශ්‍ය ගැටුමක් මවලා මිනිසුන්ට ගැස්සෙව්වා. අපි දැක්කා, මේ යෝජනා ගෙනෙන මන්ත්‍රීවරු මාධ්‍ය සාකච්ඡා තියලා මිනිසුන්ට ගැහුව එක ගැන හිනා වෙන හැටි. මිනිසුන්ට ගැහුවාය කියලා හිනා වෙනවා. ගොවි ජනතාවට පහර දුන්නා කියලා හිනා වෙනවා! ජනතාව ඉදිරියට දාලා, ජනතාව අන්දවලා, ජනතාව පීඩනයට ලක් කරලා හිනා වුණේ එදා එතැනදී විතරක් නොවෙයි. දකුණේ, හම්බන්තොට ව්‍යාපෘති පටන් ගන්න ගිය වෙලාවේත් ඒක වුණා. එදා කර්මාන්ත ව්‍යාපෘති පටන් ගන්න ගිය වෙලාවේ, මිනිස්සු අපේ රැස්වීම ඇතුළට යවලා ගැටුමක් ඇති කරවලා මිනිස්සු ගැටෙන හැටි බලමින් හිනා වෙවී හිටියා. මේ ලේ පිපාසාව පසුගිය කාලයේ තිබුණු ආණ්ඩුවලට තිබුණාට අපට නැහැ කියන එක පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජල ව්‍යාපෘතිය හරහා මේ ගෙන එන්නට හදන ආණ්ඩු විරෝධී ව්‍යාපාරය හුදෙක්ම දේශපාලන ව්‍යාපෘතියක් විතරයි. මේ අය කවදාද කිව්වේ රාජාංගනය වැවෙන් වතුර ගන්න එපා කියලා? මොකක්ද ඒ වෙනුවෙන් ගෙන ගිය මතය? ගෙන ගිය මතය තමයි, රාජාංගනය වැවේ වතුර ටිකෙන් දවසට අක්කර අඩි 38ක් පිටට පොම්ප කරලා බෝතල් කරලා විකුණනවාය කියන එක. මම ඇහුවා, දවසකට වතුර අක්කර අඩි 38ක් බෝතල් කරලා කොහේටද විකුණන්නේ කියලා. මේක අක්කර අඩි දහසකට ආසන්න ප්‍රමාණයක් තිබෙන වැවක්. ඒකෙන් දවසකට අක්කර අඩි 38ක් කොහේටද පොම්ප කරන්නේ? ඒවා මොන බෝතල්වලටද දාන්නේ? ඒවා ලීටර් කීයේ බෝතල් ද? ඒ මොකුත් කරුණු නැහැ. ජනතාව නිකම් ඇවිස්සුවා. මේ උදව්යට ඕනෑකම තිබුණේ, මේ අදිසි දේශපාලන හස්තයට ඕනෑකම තිබුණේ, මිනිස්සු අවුස්සලා, මිනිස්සු පාරට බස්සවලා, කෑ ගහලා ආණ්ඩුව අපහසුතාවට පත් කරනවා වාගේම ජනතාව අපහසුතාවට පත් කරන්නයි. අපි මේ ව්‍යාපෘතිය ගැන සොයා බැලුවාට පස්සේ පෙනුණා, කිසිසේත්ම දවසකට වතුර අක්කර අඩි 38ක් ගන්නේ නැහැ කියලා. අක්කර අඩි 38ක් යනවා කියන එක අමූලික බොරුවක් බව පැහැදිලිවම කියන්නට ඕනෑ. බොරු කියලා ජනතාව අන්දලා, ජනතාව මුළා කරලා තමයි මේ විරෝධතාව කළේ. මොකටද? දේශපාලනික වශයෙන් ප්‍රසිද්ධියක් ලබා ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ පහත් මට්ටමේ දේශපාලන ව්‍යාපෘති කරන එක වැරැදියි කියන එක මා පැහැදිලිවම කියන්නට ඕනෑ. අක්කර අඩි 38ක් යනවා කියන කථාව මම ඇහුවෙත් එදායි. මේක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් කරන ව්‍යාපෘතියක්. මේක සම්පූර්ණයෙන් නඩත්තු කරන්නේ, පවත්වා ගෙන යන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසිනුයි. මේකේ ඉදිකිරීම් චිතරයි චීන සමාගමෙන් කරන්නේ. නමුත්, මේ ජල ව්‍යාපෘතිය චීන සමාගමකට විකුණන්න යනවා කියලා ජනතාව ඇන්දුවා. මේක තමයි එදා ඉඳන්ම ගෙනාපු කථාන්දරය. චීනයට Port City එක විකුණුවේ අපි නොවෙයි. ෂැංග්‍රිලා හෝටලයට අක්කර 06ක් විකුණුවේ අපි නොවෙයි. මේවා විකුණුවේ අපි නොවෙයි. මේ අය අද මෙතැනට ඇවිල්ලා සාප කරනවා. සාප කරගන්න ඕනෑ තමන්ටමයි. වෙන කාටවත් නොවෙයි. මිනිස්සුන්ව අපහසුතාවට පත් කරලා, ගැටුම්වලට පොළඹවා දැන් මෙතැනට ඇවිල්ලා සාප කරනවා.

නියහය නිසා කන්න හතරක් වගා කරන්න බැරි වුණු බව ඇත්ත. අපි පසුගිය කාලයේ වගා හානි සඳහා ආධාර දුන්නා. ඒ වාගේම නියං සහනාධාර දුන්නා. දැනටත් දෙනවා. මේ අවුරුද්දෙත් දෙනවා. එම ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරනවා. ජනතාව වෙනුවෙන් පසුගිය කාලයේ අපි සහන 22ක් දීලා තිබෙනවා. ඒ හැම දෙයක්ම දීලා තමයි අද අපි මෙහෙම කථා කරන්නේ. අපට කවුරුවත් ජනතාව බලාගන්න හැටි උගන්වන්න ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂය එදා ඉඳන්ම ජනතාව බලා ගත්ත පක්ෂයක්. මේ පක්ෂයේ හිටපු නායකයකු වන ඩඩ්ලි සේනානායක මහත්මයා තමයි හාල් සේරුව නොමිලයේ දෙන්න පටන් ගත්තේ. ඒක මතක තියා ගන්න. එදා ඔය කට්ටිය එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව, ඩඩ්ලි සේනානායක මහත්මයාට විරුද්ධව එළියට බැස්සේ නොමිලේ හාල් සේරු දෙකක් දෙනවා කියමිනුයි. අන්තිමට හාල් සේරු දෙකක් නොවෙයි, මූනිස්සම් ටික තමයි දුන්නේ. එහෙම තමයි ඒ අය දේශපාලනය කළේ. එවැනි ආතක් පාතක් නැති දේශපාලනඥයන් පිරිසක් මේ පාර්ලිමේන්තුවට රිංගලා කථාන්දර හදනවා, රාජාංගන ව්‍යාපාරය ගැන. හොඳට මතක තියා ගන්න, එදා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ මේ ව්‍යාපෘති ගෙනැල්ලා, සල්ලි තිබුණේ නැති නිසා; බංකොලොත් වෙලා හිටපු නිසා තමයි එය ක්‍රියාත්මක නොකළේ. අද අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කොට නොයෙකුත් ප්‍රශ්න ඇති කරනවා. ප්‍රශ්න තිබෙනවා නම් මේ ව්‍යාපෘතිය ආපස්සට ගන්න අපි ලෑස්තියි. ඔය කියන තරම් විශාල ජල ප්‍රමාණයක් යනවා නම් අපි ලෑස්තියි වෙනත් ජලාශයක් නිර්මාණය කරන්න. අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරන එජපාවල-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. කරුණාකර මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු අශෝක ප්‍රියන්ත මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு அசோக்க பிரியந்த அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ASHOKA PRIYANTHA *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එප්පාවල ප්‍රදේශයේ තවත් මහා පරිමාණ ජලාශයක් ඉදි කරන්න ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම වැව් 2,400ක පමණ ප්‍රමාණයක් හාරලා, ශුද්ධ කරලා ජල ධාරිතාව වැඩි කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා. යහ පාලන ආණ්ඩුව ඉදිරියේ දී ඒවා කරනවා. හැබැයි, මේවා එකක්වත් දේශපාලන ව්‍යාපෘති නොවන බව හොඳට මතක තියා ගන්න. අපි කවදාවත් ජනතාවට සංවර්ධනය ගෙනැල්ලා දේශපාලනය කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. බෝඩ් ගහලා, රජයේ මාධ්‍ය පාවිච්චි කරලා, රජයේ ගුවන් විදුලිය පාවිච්චි කරලා පසුගිය කාලයේ අපි කරපු සංවර්ධනය ගැන කිය කියා ගියේ නැහැ. එහෙම කළා නම් රජයේ මාධ්‍යයට වෙන මොනවත් කරන්න හම්බ වෙන්නේ නැහැ. උදේ ඉඳන් රූ වෙනකම් අපි කරපු වැඩ ගැන තමයි කියන්න වෙන්නේ.

අපි එහෙම කරන ආණ්ඩුවක් නොවෙයි. අපි වැඩ කළාට ඒ කරපු වැඩ ගැන ප්‍රසිද්ධියක් ගන්න ගියේ නැහැ. අපි පම්පෝරි ගහන්න ගියේ නැහැ; කට වාචාලකම් දොඩවන්න ගියේ නැහැ. ඒ නිසා තමයි ආණ්ඩුව මොනවාද කළේ කියන එක සම්බන්ධයෙන් පසුගිය කාලයේ ජනතාව දැනුවත් නොවුණේ. තමන්ගේ දේශපාලනය ගොඩගන්න මෙවැනි දේශපාලන ව්‍යාපෘති කරලා ජනතාව බිලි ගන්න එපාය කියන එක අපි පැහැදිලිවම කියනවා. ජනතාව ගොනාට අන්දවන්න එපා; ජනතාව නොමඟ යවන්න එපා. මේ රටේ ජනතාව ගැන හිතලායි අපි මේ සියලු දේවල් කරන්නේ. මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ ව්‍යාපෘතියේ යම්කිසි වෙනසක් සිදු වෙන්න ඕනෑ නම්, අපි ගොවීන් එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කරන්න ලෑස්ති බව. රාජාංගනයෙන් ලබා ගන්නා ජල ප්‍රමාණය අඩු කරන්න අපි ලෑස්තියි. ඒ වාගේම නීලබැමිම ව්‍යාපාරයෙන් ලබා ගන්නා ජල ප්‍රමාණය ඒකට එකතු කරන්න අපි ලෑස්තියි. ඒ වාගේම තවත් වැව්වලින් ජලය ලබා ගන්නත්, වැව් සංවර්ධනය කරන්නත් අපි ලෑස්තියි. අපි ජනතාව වෙනුවෙන් ඕනෑම දෙයක් කරන්න ලෑස්ති ආණ්ඩුවක්. ඒ නිසා බොරු බේගල් ඇද බාලා තමන්ගේ ජනප්‍රියතාව වෙනුවෙන් ජනතාව බිලි ගන්න ලෑස්ති වෙන්න එපාය කියමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.32]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබාදුන් පිළිතුරත්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් ලබාදුන් පිළිතුරත් යන පිළිතුරු දෙකම ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබෙන පිළිතුරු මා පළමුවෙන් ඉදිරිපත් කරනවා.

2011 වසර වන විට දිවයින පුරා පැතිර යමින් තිබුණු වකුගඩු රෝගය හේතුවෙන් පිරිසිදු ජල සැපයුම ව්‍යාප්ත කිරීම සඳහා කඩිනම් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම රජයේ විශේෂිත ප්‍රමුඛතාවක් වූ අතර, අනුරාධපුර දිස්ත්‍රික්කය මෙම උවදුරට දැඩි ලෙස ගොදුරු වූ ප්‍රදේශයක් වශයෙන් සලකා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජල සම්පාදන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ආරම්භ කිරීමට යෝජනා සකස් කර ඇත.

දැනටමත් කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ප්‍රමාණවත් නොවන තත්ත්වයක් තුළ මෙම ව්‍යාපෘති සඳහා ජල මූලාශ්‍ර සකසා ගැනීම අභියෝගාත්මක වූ නමුත්, මෙම රෝග තත්ත්වයෙහි ඇති දරුණු බව හා එමඟින් සමාජයට, විශේෂයෙන් රජරට ගොවි ප්‍රජාවට ඇති වන බලපෑම් සැලකිල්ලට ගෙන දැනට භාවිත වන වාරිමාර්ග ජලාශවල ජලය අතිරික්තව ඇති අවස්ථාවල එම ජල ප්‍රමාණ භාවිතා කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව, 2011 වසරේ එවක පැවැති ජල තත්ත්වය සැලකිල්ලට ගෙන තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජලය ලබා දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මූලික අනුමැතිය ලබාදී ඇති අතර, එම අවස්ථාවේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර ගොවීන් දැනුවත් කර ඇත.

එසේ වෙතත් පසුගිය වසර එකහමාරක කාලය තුළ පැවැති දැඩි නියඟය නිසා රාජාංගන ව්‍යාපාරයේ ජලය හිඟයක් ඇති වූ අතර, එයින් ගොවීන් කලබලයට පත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම අවාසනාවන්ත තත්ත්වය ඇති විය. දැනට අතිගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කර ඇති අතර, ගොවි ජනතාව, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ජලය හිඟ වසරවලදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ස්ථිර තීරණවලට එළැඹීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සුදුසුය. එය තමයි වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් එවා තිබෙන පිළිතුර.

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් එවා තිබෙන පිළිතුරත් මම ඉදිරිපත් කරන්නම්. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තඹුත්තේගම, රාජාංගනය සහ ගල්නෑව යන ප්‍රදේශවල පවුල් 53,000කගේ පමණ ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා China Geo Engineering Corporation නමැති චීන සමාගම මඟින් තඹුත්තේගම නගරයේ ඉදි කරමින් පවතින පානීය ජල යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසු ඒ සඳහා රාජාංගනය ජලාශයේ ජලය යොදා ගැනීමට සැලසුම් කර ඇති බැවින්, ඉදිරියේදී වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ප්‍රමාණවත්ව නොලැබීමේ අවදානමක් ඇති බවට චෝදනා කරමින් එම ව්‍යාපෘතියට විරෝධය දැක්වීමට රාජාංගනය වම් ඉවුර හා දකුණු ඉවුර ගොවි සංවිධාන 64ක පමණ සාමාජිකයන් 2,000කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් තඹුත්තේගම පොලිස් වසමේ උද්ඝෝෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇති බවට 2018.02.27 දින බුද්ධි අංශය මඟින් වාර්තා කර ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව එම උද්ඝෝෂණ ව්‍යාපාරය සිදු කිරීමේ දී සිදුවිය හැකි මහජන පීඩාව වැළැක්වීම සහ රාජ්‍ය හා පොදු දේපළ ආරක්ෂා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති උතුරු මැද පළාත විසින් නියෝජ්‍ය පොලිස්පති අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක වෙත සහ අනුරාධපුර කොට්ඨාස භාර පොලිස් අධිකාරි වෙත පහත සඳහන් උපදෙස් ලබාදී ඇති බව වාර්තා කර ඇත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

- එම උද්ඝෝෂණ ව්‍යාපාරයේ සංවිධායකයින් අදාළ බලධාරින් මඟින් දැනුවත් කර ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරීම.
- උද්ඝෝෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් විස්තරාත්මක නිවැරදි බුද්ධි තොරතුරු, නිලධාරින් මඟින් ලබා ගැනීමට කටයුතු කිරීම.
- උද්ඝෝෂණ ව්‍යාපාරය හේතුවෙන් දෛනික ජන ජීවිතයට ඇතිවන ගැටලු හා රාජ්‍ය හා පොදු දේපළ ආරක්ෂා කිරීම සඳහා කල්වේලා ඇතිව අධිකරණයට කරුණු වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාර්ග අවහිරයක් වූ අවස්ථාවක විකල්ප මාර්ග හා රථවාහන ගමනාගමනය සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- හදිසි අවස්ථාවකදී කටයුතු කිරීම සඳහා කැරලි මර්දන කණ්ඩායම්, අමතර සහායක නිලධාරි කණ්ඩායම් සහ ජල ප්‍රහාරක රථ සූදානම් කිරීම.
- කොටියාස ඡායාරූප / වීඩියෝ නිලධාරින් මඟින් උද්ඝෝෂණ ව්‍යාපාරය ඡායාරූප / වීඩියෝගත කිරීම.

ඒ අනුව, එම ගොවි ජනතාවගේ ගැටලුව සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කිරීමට මූලස්ථාන පොලිස් පරීක්ෂක තඹුත්තේගම විසින් අදාළ බලධාරින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. උද්ඝෝෂණ ව්‍යාපාරය සිදු වුවහොත් සාමාන්‍ය මහ ජනතාවගේ දෛනික ජීවිතයට බාධාවක් ඇතිවිය හැකි හෙයින්ද, රාජ්‍ය හා මහජන දේපළවලට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම සඳහා අධිකරණයට අංක 196/2018 යටතේ "ඒ" වාර්තාවක් ඉදිරිපත් කරමින් උද්ඝෝෂණය සිදු කිරීම වැළැක්වීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට පියවර ගෙන ඇත.

එසේ තිබියදීත් එම සංවිධායකයින් උද්ඝෝෂණකරුවන් 2,000ක පමණ පිරිසක් සමඟ තඹුත්තේගම පොලිස් වසමේ අනුරාධපුර කොටියාස මායිම වන කලාවැව අසල 2018.02.28 වන දින පැය 0900 සිට පැය 1200 පමණ දක්වා මාර්ග අවහිර කරමින් රැඳී සිට ඇති බවත්, එම අවස්ථාවේ එම මාර්ගයේ අනුරාධපුර දෙස සිට කුරුණෑගල දෙසට ගමන් ගත් වාහන සහ කුරුණෑගල සිට අනුරාධපුර දෙසට පැමිණි වාහන කල්වේලා ඇතිව රථවාහන නිලධාරින් යොදා ගනිමින් විකල්ප මාර්ග ඔස්සේ ගමන් කරවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව එම උද්ඝෝෂකයින්ට සාමකාමී උද්ඝෝෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය සලසාදීමට පියවර ගෙන තිබේ. එසේ පැය තුනක පමණ කාලයක් මාර්ග අවහිර කරමින් සිටි උද්ඝෝෂණකරුවන් අනුරාධපුර-පාදෙනිය ප්‍රධාන මාර්ගය ඉදිරියට පැමිණ ඇති අතර, තඹුත්තේගම පොලිස් ස්ථානය අසල වටරවුමේ මාර්ග සියල්ල හරස් කරමින් උද්වේගකාරීව හැසිරීම හේතුවෙන් එම අවස්ථාව වන විට පාසල් අවසන්වී නිවෙස් බලා යන දරුවන්ට, දෙමාපියන් සහ රාජ්‍ය සේවකයින්ට මෙම විරෝධතාව දැඩි බාධාවක් වූ හෙයින් අනුරාධපුර කොටියාස භාර පොලිස් අධිකාරී විසින් විරෝධතාකරුවන් අමතා ඔවුන්ට මාර්ග අවහිර නොකර සාමකාමී උද්ඝෝෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත. එම අවස්ථාවේ තලාව ප්‍රාදේශීය ලේකම් පැමිණ ඔවුන් සමඟ සාකච්ඡා කර අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සමඟ සාකච්ඡාවක් සඳහා යාමට ඔවුන්ට පොලිස් ආරක්ෂාව සහ පොලිස් බස් රථයෙන් යාමට අවශ්‍ය සහාය දෙන බව ද දන්වා සිටියත්, ඔවුන් විසින් ඒ සඳහා කිසිදු යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. එම උද්ඝෝෂණකරුවන් විසින් අධිකරණ නියෝග හා පොලිසිය විසින් ඔවුන් වෙත ලබා දුන් උපදෙස්වලට දැඩි ලෙස විරෝධය දක්වමින් ඉතා කළහකාරී ලෙස හැසිරෙමින් කටයුතු කළ හෙයින්, එයින් සිදුවිය හැකි රාජ්‍ය මහජන දේපළ හානිය මෙන්ම මහජනතාවගේ ආරක්ෂාව සඳහාද කැරලි මර්දන කණ්ඩායම් සහ ජල ප්‍රහාරක රථ උපයෝගී කර ගනිමින් අවම බලය යොදවා විරෝධතාකරුවන් විසුරුවා හැරීම සඳහා කටයුතු කර ඇත.

මෙම සිද්ධියේදී අධිකරණ නියෝගයට අවනත නොවී තඹුත්තේගම පොලිස් ස්ථානයට ගල් මුල්වලින් පහර දී පොලිස් වාහනවලට හා දේපළවලට අලාභහානි සිදු කරමින් පොලිස් නිලධාරින් තුවාල කිරීමට කටයුතු කළ පිරිමි සැකකරුවන් 54ක් හා සැකකාරියන් 05ක් අත් අඩංගුවට ගෙන අංක බී-280/18 යටතේ තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් පියවර ගෙන ඇති බව වාර්තා කර ඇත.

අධිකරණය මඟින් පිරිමි සැකකරුවන් 6ක් හා සැකකාරියන් 3 දෙනෙකු රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදාහැර සෑම මසකම අවසන් ඉරු දින පැය 0900ත්, 1200ත් අතර කාලය තුළ පොලිස් ස්ථානයේ පෙනී සිටීම සඳහා නියෝග ලබාදී ඇත. අනෙක් සැකකරුවන් හා සැකකාරියන් 2018.03.05 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බව වාර්තා කර ඇත. 2018.03.01 දින මෙම සිද්ධියට අදාළව නායකත්වය ලබා දෙන ලද රාජාංගනය ජලාශයේ ගොවි සංවිධාන එකමුතුවේ සම සභාපති වන යාය 10, ගැමුණුපුර, රාජාංගනය, ලිපිනයේ පදිංචි නිහාල් වන්නිආරච්චි යන අය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක තඹුත්තේගම විසින් කරන ලද දැනුම් දීමකට අනුව ස්ථානාධිපති රාජාංගනය විසින් අත් අඩංගුවට ගෙන 2018.03.02 දින තඹුත්තේගම මහෙස්ත්‍රාත් උසාවිය වෙත වැඩිදුර වාර්තාවක් මඟින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැකකරු 2018.03.05 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. 2018.03.02 දින අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද මෙම සිද්ධියට අදාළව රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි සැකකාරියන් දෙදෙනාට රුපියල් ලක්ෂයක ශරීර ඇප මත සෑම මසකම අවසන් ඉරු දින පැය 0900ත්, 1200ත් අතර කාලය තුළ පොලිස් ස්ථානයේ පෙනී සිටීම සඳහා නියෝග ලබා දෙමින් මහේස්ත්‍රාත්තුමිය විසින් ඇප ලබාදී ඇති බව වාර්තා කර ඇත. 2018.03.05 දින අධිකරණයේ මෙම නඩුව නැවත කැඳවන අවස්ථාවේ බන්ධනාගාර ගතව සිටි ගොවි සංවිධානයේ සභාපති ඇතුළු සෙසු සැකකරුවන් 51ක් දෙනා රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදාහැර සෑම මසකම අවසන් ඉරු දින පැය 0900ත්, 1200ත් අතර කාලය තුළ පොලිස් ස්ථානයේ පෙනී සිටීම සඳහා නියෝග ලබාදී ඇත. නැවත මෙම නඩුව 2018.04.02 දින අධිකරණයේ කැඳවීමට නියමිතව ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු තඹුත්තේගම පොලිස් ස්ථානය මඟින් පවත්වනු ලබන බව පොලිස්පති විසින් වැඩිදුරටත් වාර්තා කර ඇත.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.42ට, 2018 මාර්තු මස 20 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 2.42 மணிக்கு பாராளுமன்றம், 2018 மார்ச் 20, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 2.42 p.m. until 1.00 p.m. on Tuesday, 20th March, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 259 - இல. 5
Volume 259 - No. 5

2018 මාර්තු 20වන අඟහරුවාදා
2018 மார்ச் 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th March, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

කථානායකතුමාගේ සහතිකය

විගණකාධිපතිවරයාගේ වාර්තාව

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

යුද්ධයෙන් පීඩාවට පත් වූ නිටපු බෙදුම්වාදී සංවිධාන සාමාජිකයන්ට වන්දි

භාර (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

අධිකරණ සංවිධාන පනත:

නියෝග

නීති අධ්‍යාපන සභා ආඥාපනත:

රීති

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත:

නියෝග

කල් තැබීමේ යෝජනාව:

මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 23ක සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு

நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் சபாநாயகரது சான்றுரை

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

யுத்தத்தினால் பாதிக்கப்பட்ட முன்னாள் பிரிவினைவாத இயக்க உறுப்பினர்களுக்கான நட்டஈடு

நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம்முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

நீதித்துறைச் சட்டம்:

ஒழுங்குவிதிகள்

சட்டக் கல்விப் பேரவைக் கட்டளைச் சட்டம்:

ஒழுங்குவிதிகள்

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:

கட்டளை

ஒத்திவைப்புப் பிரேரணை:

முல்லைத்தீவு மாவட்டத்தின் 23 கிராம அலுவலர் பிரிவுகளில் சமூர்த்தித் திட்டத்தை அமுல்படுத்துதல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Active Liability Management Bill: Determination of the Supreme Court

Judicature (Amendment) Bill: Petitions to the Supreme Court

Speaker's Certificate

AUDITOR-GENERAL'S REPORT

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Compensation for Former Members of Separatist Movements Affected by War

TRUSTS (AMENDMENT) BILL:

Read a Second, and the Third time and passed as amended

JUDICATURE ACT:

Regulations

COUNCIL OF LEGAL EDUCATION ORDINANCE:

Rules

SRI LANKA EXPORT DEVELOPMENT ACT:

Order

ADJOURNMENT MOTION:

Implementation of Samurdhi Programme in 23 Grama Niladhari Divisions of Mullaitivu District

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මාර්තු 20වන අඟහරුවාදා
2018 மார்ச் 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th March, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
ACTIVE LIABILITY MANAGEMENT BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court:

1

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of the ordinary exercise of jurisdiction of the Supreme Court under Article 121 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read with Rule 63 of the Supreme Court Rules of 1978 against the Bill titled "Active Liability Management"

SC SD No.1/2018

N. Dharshana Weraduwage, Attorney-at-Law
No.281/J/1, Cemetery Road, Pore, Athurigiriya.
Petitioner

Vs

Attorney General,
Attorney General's Department, Colombo 12
Respondent

SC SD 2/2018

Nagananda Kodithuwakku, Attorney-at-Law
No. 99, Subadrarama Road, Nugegoda.
Petitioner

Vs

1. Attorney General,
Attorney General's Department, Colombo 12

2. Ranil Wickramasinghe, Prime Minister,
Prime Minister's Office,
58, Sir Earnest De Silva Mawatha, Colombo 7
Respondents

SC SD 3/2018

Jayakodi Arachchige Sisira Jayakodi
526,Galborella,
Kelaniya
Petitioner

Vs

Attorney General,
Attorney General's Department, Colombo 12
Respondent

SC SD 4/2018

Bandula Chandrasiri Gunawardane
No. 142, Jambugasmulla Mawatha,
Nugegoda.
Petitioner

Kalyananda Thiranagama
No.233/1, Cotta Road
Colombo 8.

Intervenient Petitioner

Vs

Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.
Respondent

SC SD 5/2018

Mohamad Fuvard Mohamad Muzammil
342/1/4, EW Perera Mawatha, Kotte Road,
Pitakotte
Petitioner

Vs

Hon. Attorney General,
Attorney General's Department,
Colombo 12
Respondent

SC SD 6/2018

Kapila Gamage
24A, Dewani Patumaga, Pethiyagoda,
Kelaniya
Petitioner

Vs

Hon. Attorney General,
Attorney General's Department,
Colombo 12
Respondent

Before:

Sisira J de Abrew — Judge of the Supreme Court
Nalin Perera — Judge of the Supreme Court
Vijith Malalgoda — Judge of the Supreme Court

Counsel:

N. Dharshana Weraduwage,
the Petitioner appeared in person in SCSD 1/2018
Nagananda Kodithuwakku,
the Petitioner appeared in person in SCSD 2/2018
Kushan de Alwis President's Counsel with
C.G.Witharana and C. Fernando for the Petitioner
in SCSD 3/2018
Manohara de Silva President's Counsel with C
Witharana and C.Botheju for the Petitioner and
Kalyananda Thiranagama for the Intervenient

Petitioner in SCSD 4/2018
W.D. Rodrigo President's Counsel with Canishka
G. Witharana for the Petitioner in SCSD 5/2018
Canishka G. Witharana with Chandra Perera for
the Petitioner in SCSD 6/2018
Arjuna Obeysekara Senior DSG with S Gnanaraj
State Counsel for the Respondents in SCSD
1/2018,2/2018,3/2018,4/2018,5/2018 and 6/2018

The Court assembled for the hearing at 10.00 a.m. on 27.2.2018, 28.2.2018 and 2.3.2018

A Bill titled "Active Liability Management Act No. 2018" was published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka on 19th January 2018 and placed on the Order Paper of Parliament on 19th February 2018.

The long title of the Bill reads as 'An act to authorize the raising of loans in or outside Sri Lanka for the purpose of Active Liability Management to improve public debt management in Sri Lanka and to make provisions for matters connected therewith or incidental thereto.'

The above named petitioners presented petitions to this Court in respect of the above Bill in terms of Article 121 of the Constitution. The said petitions were taken up for consideration. Learned Counsel appearing for the petitioners and the learned Senior Deputy Solicitor General made submissions. The Petitioners, in their petitions have stated that several Clauses of the Bill titled 'Active Management Liability Bill (hereinafter referred to as the Bill) are inconsistent with Articles 3,4(a), 12(1),12(2),14(1)(g),27(2)(a),27(3) 148, 149 and 150 of the Constitution. The Petitioners made submissions and filed written submissions. The Petitioners contended that in terms of Clause 3 of the Bill, the Parliament can, almost every month, raise a loan during a particular financial year; that the total of loans so raised would exceed ten percent of the total outstanding debt; and that the Parliament ignoring the limits given in the Appropriation Act and/or budget debt, can raise loans. They contended that as a result of Clause 3 of the Bill, the country would fall into serious debt and that therefore this Clause would violate Article 3 and 4(a) of the Constitution. In order to consider the above contention of the Petitioners, it is necessary to consider Articles 3 and 4(a) of the Constitution and Clause 3 of the Bill. Article 3 of the Constitution reads as follows.

> "In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of Government, fundamental rights and the franchise."

Article 4(a) of the Constitution reads as follows.

> "The Sovereignty of the People shall be exercised and enjoyed in the following manner:-
>
> (a) The legislative power of the People shall be exercised by Parliament, consisting of elected representatives of the People and by the People at a Referendum;"

Clause 3 of the Bill reads as follows.

> "The Parliament may, from time to time, by resolution, approve to raise a sum of money during a particular financial year which shall not exceed *ten percentum* of the total outstanding debt as at the end of the preceding financial year, as a loan whether in or outside Sri Lanka, in terms of the relevant laws for moneys to be raised including the provisions of the Monetary Law Act (Chapter 422), the Local Treasury Bills Ordinance (Chapter 417), Registered Stocks and Securities Ordinance (Chapter 420), or the Foreign Loans Act, No. 29 of 1957, for and on behalf of the Government for the purposes of refinancing and pre-financing of public debts of the Government."

Does Clause 3 of the Bill permit the Parliament to approve loans total of which would exceed ten percent of the total outstanding debt as at the end of the preceding financial year? In considering this question the following words in Clause 3 of the Bill are important. "The Parliament may, from time to time, by resolution, approve to raise a sum of money during a particular financial year which shall not exceed *ten percentum* of the total outstanding debt as at the end of the preceding financial year." When we consider the Clause 3 of the Bill and especially the aforementioned words in Clause 3 of the Bill, we are unable to agree with the contention of the Petitioners. When we consider the Clause 3 of the Bill, we are of the opinion that the Parliament can, in terms of this Bill, only approve loans total of which would not exceed ten percent of the total outstanding debt as at the end of the preceding financial year. For the above reasons, this court rejects the above contention of the Petitioners and hold that Clause 3 of the Bill does not violate any of the Articles of the Constitution. However for the purpose of avoiding doubts, the learned Senior Deputy Solicitor General submitted an amended version of Clause 3 of the Bill which reads as follows.

*"The Parliament may, **during a particular financial year**, from time to time, by resolution,*

*approve to raise **sums** of money **the total of** which shall not exceed ten percentum of the total outstanding debt as at the end of the preceding financial year, as a loan whether in or outside Sri Lanka, in terms of the relevant laws for moneys to be raised including the provisions of the Monetary Law Act (Chapter 422), the Local Treasury Bills Ordinance (Chapter 417), Registered Stocks and Securities Ordinance (Chapter 420), or the Foreign Loans Act, No. 29 of 1957, for and on behalf of the Government for the purposes of refinancing and pre-financing of public debts of the Government."*

Before we deal with the arguments advanced regarding Clause 4 of the Bill, we would like to state below the said Clause. Clause 4 of the Bill reads as follows.

"Clause 4

(1) The Minister shall with the approval of the Cabinet of Ministers and subject to the provisions of section 3 of this Act and section 114 of the Monetary Law Act (Chapter 422), decide on the matters pertaining to and incidental to the refinancing and pre-financing of public debts including-

(a) the sum of money to be raised by a loan;

(b) the mode of raising such loan; and

(c) the manner in which such payment obligations of the Government are settled as he may deem fit including the buying-back of existing debt and switching existing debt with new debt.

(2) The decision made by the Minister under subsection (1) shall be communicated in writing to the Registrar through the Minister assigned the subject of Central Bank of Sri Lanka

(3) The Registrar may, subject to the terms of such communication and to any direction as the Minister may issue in that behalf-

(a) make all such arrangements as may be necessary to raise such loan; and

(b) effect such arrangements to settle obligations of the Government upon the most favourable terms that may be obtained in the interest of the Government."

The contention of the Petitioners was that under Clause 4 of the Bill, the Minister can, without disclosing the details of the loan, seek approval of the Cabinet to act under this Clause. The Petitioners therefore contended that the Minister can arbitrarily raise loans. Therefore they contended that the Parliament would not have the full control over the public finance and as such Article 148 of the Constitution would be violated.

The Petitioners next contended that the Minister can, after getting the approval of the Cabinet of Ministers, act on his own to raise loans and as such raising of loans would not be brought to the notice of the Parliament; that thereby Clause 4 of the Bill would violate Article 148 of the Constitution; and that violating Article 148 of the Constitution would amount to a violation of Articles 3 and 4(a) of the Constitution. We would first consider whether the Clause 4 of the Bill would violate Article 148 of Constitution. Article 148 of the Constitution reads as follows:

"Parliament shall have full control over public finance. No tax, rate or any other levy shall be imposed by any local authority or any other public authority, except by or under the authority of a law passed by Parliament or of any existing law."

According to Clause 4 of the Bill before the Minister proceeding to take the loan stipulated in this Bill, he first will have to take the approval of the Cabinet of Ministers. At this stage it is necessary to consider Articles 42(2) and 44(4) of the Constitution which read as follows.

Article 42 (2)-

"The Cabinet of Ministers shall be collectively responsible and answerable to Parliament."

Article 44 (4)-

"Every Minister appointed under paragraph (1) shall be responsible to the Cabinet of Ministers and to Parliament."

From the above Articles of the Constitution it is clear that every Minister is responsible to the Cabinet of Ministers and to the Parliament. Under Clause 4 of the Bill, the Minister first will have to take the approval of the Cabinet of Ministers. Then how can the Minister arbitrarily raise loans?

Further we would like to consider the following words in Clause 4 of the Bill. 'The Minister shall with the approval of the Cabinet of Ministers and **subject to the provisions of section 3 of this Act** and section 114 of the Monetary Law Act (Chapter 422), decide on the matters….. .'(Emphasis added). Thus the Minister has to take the decision to raise the loan stipulated in this Bill subject to the provisions of Clause 3 of this Bill. The following words in Clause 3 of the Bill are important. 'The Parliament may, from time to time, by resolution, approve to raise a sum of money…' Therefore according to Clause 3 of the Bill, the approval of the Parliament has to be obtained to raise the loan. Thus the decision to raise the loan will have to be brought to the notice of the Parliament. Under these circumstances, how can one argue that the Parliament will not have control over the loan that is going to be raised under this Bill? The loan will have to be obtained with the approval of the Parliament. The Parliament can take a decision to approve or disapprove the loan. Thus the Parliament has full control over loan that is going to be raised and as such the Parliament will have full control over public finance. Therefore the argument that when a loan is raised under and in terms of the provisions of the above Bill, the Article 148 of the Constitution would be violated is without merit. Considering all the aforementioned matters, we hold that when the Minister obtains a loan under and in terms of this Bill, it would not violate Article 148 of the Constitution. If it does not violate Article 148 of the Constitution, the contention raised by the Petitioners that it would violate Article 3 and 4(a) of the Constitution does not arise for consideration.

The Petitioners made submissions regarding the post of 'Registrar' stated in Clause 4(2) and 4(3) of the Bill. For the purpose of convenience we will reproduce below Clause 4(2) and 4(3) of the Bill.

Clause 4(2):-

The decision made by the Minister under subsection (1) shall be communicated in writing to the Registrar through the Minister assigned the subject of Central Bank of Sri Lanka.

Clause 4(3):-

"The Registrar may, subject to the terms of such communication and to any direction as the Minister may issue in that behalf-

(a) make all such arrangements as may be necessary to raise such loan; and

(b) effect such arrangements to settle obligations of the Government upon the most favourable terms that may be obtained in the interest of the Government."

The Petitioners made following submissions with regard to the 'Registrar' stated in Clause 4(2) and 4(3) of the Bill.

1. The bill does not indicate whether the 'Registrar' is a Public Servant.
2. The bill does not indicate that the 'Registrar' is a citizen of this country.
3. The bill does not contain a Clause that the 'Registrar' should take oaths under 6th Amendment to the Constitution.

All the above matters would arise for consideration if the post of registrar has been newly created by this Bill. Has it been newly created by this Bill. Clause 14 of the Bill defines the 'Registrar'. It reads as follows.

" 'Registrar' means the Registrar appointed under the provisions of the Registered Stock and Securities Ordinance (Chapter 420)"

Section 48 of the Registered Stock and Securities Ordinance (Chapter 420) reads as follows.

"For the purpose of this Ordinance-

(a) The Monetary Board of the Central Bank shall appoint a person to be or act as the Registrar, and

(b) Such Monetary Board shall be the trustees of the sinking fund established for each loan."

Therefore it is seen that the post of 'Registrar' stated in in Clause 4(2) and 4(3) of the Bill is not a new post created by this Bill and it is a post that has been created by the Registered Stock and Securities Ordinance (Chapter 420)". Further we would like to point out Section 120 of the Monetary Law. It states that every member of the Monetary Board and every officer or servant of the Central Bank shall be deemed to be a Public Servant within the meaning and for the purpose of the Penal Code. The above legal provision would nullify the above contentions of the Petitioners. For the above reasons, we reject the above contention of the Petitioners.

The Petitioners made submissions regarding Clause 5 of the Bill which reads as follows.

"Any loan raised for and on behalf of the Government for the purposes of refinancing and pre-financing of public debts of the Government shall be exempted from the application of the provisions of section 2 (1)*(b)* of the Appropriation Act, No. 30 of 2017 and also from the application of the provisions of any annual Appropriation Act which is enacted after the date of commencement of the Appropriation Act No.30 of 2017."

The Petitioners contended that since the loans raised under this Bill are exempted from the application of the provisions of section 2(1)(b) of the Appropriation Act No.30 of 2017 and future Appropriation Acts, the loans so raised would not be within the knowledge of the Parliament and that therefore Clause 5 of the Bill would violate Article 148 of the Constitution and as a result the said Clause would also violate Articles 3 and 4(a) of the Constitution. We now advert to this contention. Although the loans raised under the Bill are exempted from the application of the provisions of section 2 (1)(b) of the Appropriation Act No.30 of 2017 and future Appropriation Acts, the loans stipulated under this Bill will have to be raised with the approval of the Parliament. This situation is evident when one reads Clause 3 and 4 of the Bill. Further under Clause 7 of the Bill, the details of all the loans raised should be tabled in the Parliament. Thus how can one argue that the loans raised under this Bill would not be within the knowledge of the Parliament? If the loans are raised with the approval of the Parliament, the Parliament will have full control of public finance. Therefore the Clause 5 of the Bill would not and cannot violate Article 148 of the Constitution. If the Clause 5 of the Bill does not violate Article 148 of the Constitution, the argument that it would violate Articles 3 and 4(a) of the Constitution does not arise for consideration. For the above reasons, we reject the said contention advanced by the Petitioners and hold that Clause 5 of the Bill does not violate Article 148 of the Constitution.

We will state below Clause 6 of the Bill since the Petitioners made submissions regarding the said Clause. Clause 6 of the Bill reads as follows.

6 (1)- "Any loan raised under this Act where-

(*a*) the monetary unit is Sri Lanka rupees shall be retained in one or more accounts maintained by the Deputy Secretary to the Treasury as may be nominated by the Secretary to the Treasury, in writing, on that behalf, at the Central Bank of Sri Lanka or at a licensed commercial bank subject to the provisions of section 107 of the Monetary Law Act (Chapter 422);

(b) the monetary unit is foreign currency shall be retained in one or more accounts maintained by the Deputy Secretary to the Treasury as may be nominated by the Secretary to the Treasury, in writing, on that behalf, at the Central Bank of Sri Lanka.

(2) The principal money and the interest, if any, which is in any account maintained at the Central Bank of Sri Lanka or at a licensed commercial bank shall be part of the Consolidated Fund as assets of Sri Lanka but as a ring-fenced account.

(3) The Moneys retained under subsection (1) shall only be used for the purposes of refinancing and pre-financing of public debts in achieving the objective of this Act."

The Petitioners contended that depositing the money in the loans raised under this Bill at a licensed commercial bank would violate Article 148 of the Constitution and if it violates Article 148 of the Constitution, it would amount to a violation of Articles 3 and 4(a) of the Constitution. We now advert to this contention. In order to appreciate the above contention it is necessary to consider section 107 of the Monetary Law Act (Chapter 422) which reads as follows.

"The Central Bank shall be the official depository of the Government and or agencies or institutions referred to in subsection (1) of section 106.

Provided, however that the Monetary Board may authorize one or more commercial banks operating in Sri Lanka to accept Government deposits, subject to such rules and regulations as the board may prescribe."

According to Clause 6 of the Bill, depositing of money in the loans raised under the Bill should be done subject to the provisions of section 107 of the Monetary Law Act. According to Section 107 of the Monetary Law Act (Chapter 422), the Monetary Board has the power to deposit Government deposits in one or more commercial banks operating in Sri Lanka. Therefore the money raised in the form of loans under this Bill would be deposited in accordance with the law prevailing in this country. Thus depositing of money raised in the form of loans under this Bill cannot violate the Constitution. If a person or an agency of the Government acts in accordance with the law prevailing in this country, can such an act be construed as a violation of the Constitution? If this question is answered in the affirmative, we would be declaring that acting in accordance with the prevailing law of the country is a violation of the Constitution. Further if this question is answered in the affirmative, this court would indirectly challenge the validity of the prevailing law. At this stage we would like to consider Articles 16 (1) and 80 (3). Article 16(1) of the Constitution reads as follows.

"All existing written law and unwritten law shall be valid and operative notwithstanding any inconsistency with the preceding provisions of this Chapter."

Article 80(3) of the Constitution reads as follows.

"Where a Bill becomes law upon the certificate of the President or the Speaker, as the case may be being endorsed thereon, no court or tribunal

shall inquire into, pronounce upon or in any manner call in question, the validity of such Act on any ground whatsoever."

When the above Articles of the Constitution are considered, we are of the opinion that this Court has no jurisdiction to inquire into or pronounce upon the validity of an existing written law enacted by the Parliament. For the above reasons, we hold that if a person or an agency of the Government acts in accordance with the law prevailing in this country, such an act cannot be construed as a violation of the Constitution. Thus, when money raised in the form of a loan under this Bill is deposited in a licensed Commercial Bank subject to the provisions of Section 107 of the Monetary Law Act (Chapter 422), such an act cannot violate the Constitution. When we consider all the above matters, we reject the above contention of the Petitioners and hold that Clause 6 of the Bill would not violate Article 148 of the Constitution Therefore, the argument that Clause 6 of the Bill would violate Articles 3 and 4(a) of the Constitution would not arise for consideration.

The Petitioners made submissions regarding Clause 10(3) and 10(4) of the Bill which read as follows.

10(3)- "Every regulation made by the Minister shall be published in the *Gazette* and shall come into operation on the date of such publication, or on such later date may be specified in the regulation."

10(4)- "Every regulation made by the Minster shall, within three months after its publication in the *Gazette*, be brought before Parliament for approval. Any such regulation which is not so approved shall be deemed to be rescinded as from the date of its disapproval, but without prejudice to anything previously done thereunder"

According to Clause 10(4) of the Bill, if the Parliament disapproves the regulations made by the Minister it shall be deemed to be rescinded from the date of its disapproval but what was done during the period of publication and its disapproval will not be rescinded. However, we note that according to Clause 3 of the Bill, loans will have to be raised with the approval of the Parliament. Thus the Minister cannot make regulations to nullify the said Clause or to deviate from the procedure laid down in the Bill. Although the Petitioners contended that Clause 10(4) of the Bill violates the Constitution, similar provision has earlier been enacted by the Parliament when Foreign Exchange Act No.12of 2017 was enacted by the Parliament. Section 29(3) of Foreign Exchange Act No.12of 2017 reads as follows. "Every regulation made under subsection (1) shall, within three months from the date of its publication in the *Gazette*, be placed before Parliament for approval. Every regulation which is not so approved shall be deemed to be rescinded as from the date of disapproval, but without prejudice to anything previously done there under"

It has to be stated here that similar provisions are found in Excise (Special Provisions) Act No.13 of 1989 [Section 29(3)] and Value Added Tax Act No.14 of 2002 [Section 75(3)]. Therefore the provisions found in Clause 10(4) of the Bill have become the existing law of the country. If this court makes a declaration that Clause 10(4) violates the Constitution, this court would be indirectly declaring that Section 29 (3) of Foreign Exchange Act No.12of 2017, Section 29(3) of Excise (Special Provisions) Act No.13 of 1989 and Section 75(3) of Value Added Tax Act No.14 of 2002 violate the Constitution. But when we consider Articles16 and 80(3) of the Constitution, we are of the opinion that this Court has no jurisdiction to inquire into or pronounce upon the validity of an existing written law enacted by the Parliament. Court must accept the existing law enacted by the Parliament as valid law. For the above reasons, we reject the above argument of the Petitioners and hold that Clause 10(3) and 10(4) of the Bill do not violate the Constitution.

The Petitioners made submissions regarding Clause 13 of the Bill which reads as follows.

"In the event of any conflict or inconsistency between the provisions of this Act and the provisions of any other written law, the provisions of this Act shall prevail."

The Petitioners contended that on the strength of this Clause the Minister can bypass the existing laws and raise loans. But according to Clause 3 and 7 of the Bill, if the Minister is going to raise a loan mentioned in the Bill, he should first obtain the approval of the Parliament. Therefore we are unable to accept the above argument.

The Petitioners made submissions regarding Clause 9 of the Bill. Therefore it is necessary to state below the said Clause. It reads as follows.

"A person, being-

(a) a member of the Monetary Board;
(*b*) an officer, employee, servant or agent of the Central Bank of Sri Lanka; or
(c) an officer, employee, servant or agent of the Ministry of the Minister,

shall not be held liable in any suit, prosecution or other legal proceeding for anything done or purported to be done in the discharge or intended discharge of his obligations under this Act or any regulation, Order, decision or directive issued and made thereunder, if he proves that he acted in good faith and exercised all due diligence, reasonable care and skill."

They contended that this Clause would violate Article 12(1) of the Constitution. We now advert to this contention. Article 12(1) of the Constitution reads as follows.

"All persons are equal before the law and are entitled to the equal protection of the law."

When considering the above argument, the following words of the said Clause should be noted. "If he proves that he acted in good faith and exercised all due diligence, reasonable care and skill."

Therefore the burden is on the said person to prove the said ingredients. Thus the contention that Clause 9 of the Bill would violate Article 12(1) of the Constitution cannot be accepted. For the above reasons, we hold that Clause 9 of the Bill does not violate Article 12(1) of the Constitution.

This court has examined the provisions of the Bill and in our opinion they do not violate the Constitution.

For the reasons stated above, we make a determination that the Active Liability Management Bill is not inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

Sisira J de Abrew
Judge of the Supreme Court.

Nalin Perera
Judge of the Supreme Court.

V.K. Malalgoda PC
Judge of the Supreme Court.

II

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

JUDICATURE (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "අධිකරණ සංවිධාන (සංශෝධන)" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හතක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III

කථානායකතුමාගේ සහතිකය

சபாநாயகரது சான்றுரை

SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව අනුව, 2018 මාර්තු මස 19වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

- ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු
- ආරක්ෂණ පියවර
- සුරාබදු (සංශෝධන)

විගණකාධිපතිවරයාගේ වාර්තාව

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස; සහ
- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XII හා XIII කොටස් සහ තෙවැනි කාණ්ඩයේ **V** කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තාව සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8, 14 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ මෝටර් වාහන (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 143 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය

යටතේ මෝටර් වාහන (අධිවේගී මහාමාර්ග) නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iv) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 215අ වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ස්ථානීය දඩ නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

එම වාර්තාව සහ නියෝග ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 1004 දරන සුරාබදු නිවේදනය) ඉදිරිපත් කරමි.

එම නිවේදනය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා හා සංස්කෘතික කටයුතු පීඨයේ දර්ශන හා ඇගයුම් අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 01 දිනැති අංක 1995/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ දර්ශනය හා මනෝවිද්‍යාව අධ්‍යයන අංශයක් සහ ව්‍යවහාර විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන්, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූනි 16 දිනැති අංක 1867/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2051/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

එම නියමය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on -

(i) Orders under Section 3 of Excise (Special Provisions) Act, No. 13 of 1989;

(ii) Note on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates; and

[ගරු මොහොමඩ් නවවි මහතා]

(iii) Revision of Salaries and Allowances of the Hon. Chief Justice and the Judges of the Superior Courts which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත;

(ii) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(v) 2015 වර්ෂය සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී. බී. ඒකනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, උඩුගම්පොල, විදියවත්ත, වෙන්දේසිවත්ත, සෙත්සිරි යන ලිපිනයෙහි පදිංචි එස්.එස්.ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලක්කී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, තලාතුඔය, ඩොම්පිටිය, බෝගහලන්ද, අංක 103 දරන ස්ථානයෙහි පදිංචි බී.ජී.ජයසේන බෝගහලන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-689/'16-(2), ගරු බුද්ධික පතිරණ මහතා-*[සභා ගර්භය තුළ නැත.]*

ත්‍රස්තවාදී ක්‍රියා නිසා විනාශ වූ රාජ්‍ය ආයතන: ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය
பயங்கரவாத நடவடிக்கைகளால் அழிவடைந்த அரச நிறுவனங்கள் : திருகோணமலை மாவட்டம்
GOVERNMENT INSTITUTIONS DESTROYED BY TERRORIST ACTS: TRINCOMALEE DISTRICT

1224/'16

2. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் அமைந்துள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் 1983ஆம் ஆண்டுக்குப் பின்னர் அழிக்கப்பட்டுள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்,

(iii) அழிவடைந்துள்ள மேற்படி சொத்துகள் பற்றி அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ளக்கூடிய மதிப் பீடொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அச்சொத்துகளின் மொத்த பெறுமதி யாதென்பதையும்;

(v) அழிக்கப்பட்டுள்ள ஒவ்வொரு சொத்து தொடர் பாகவும் பொறுப்புக்கூற வேண்டிய பயங்கர வாதிகளுக்கு எதிராகச் சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவை யென்பதையும்;

(vii) மேற்படி (i) - (vi) வரை விசாரிக்கப்பட்டுள்ள தகவல்கள் தொடர்பான முழுமையான அறிக்கை யொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) the number of government institutions in the Trincomalee District;

(ii) the number of government institutions that were destroyed by the LTTE terrorists after 1983;

(iii) whether a government approved valuation has been done on the destroyed property;

(iv) if so, the total value of the said property;

(v) whether legal action has been taken against the terrorists who were responsible for the said destruction of each property;

(vi) if so, what those steps are; and

(vii) whether a comprehensive report with regard to the facts that have been questioned in above (i) to (vi) will be submitted?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රාජ්‍ය ආයතන 1046 කි.

(ii) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද රාජ්‍ය ආයතන 104කි.

(iii) එම වකවානුවේ පැවති තත්ත්වය අනුව එවැනි ක්‍රියාදාමයක් සිදු කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාවක් තිබී නැත.

(iv) තක්සේරුවක් කර නොමැති හෙයින් විටිනාකම සඳහන් කළ නොහැකිය.

(v) එවැනි පරිසරයක් එම ප්‍රදේශය තුළ එම වකවානුවේදී නොතිබීම නිසා නීතිමය පියවර ගැනීමේ ප්‍රශ්නයක් ඇත.

(vi) එම වකවානුවේදී සිවිල් පරිපාලනයේ පැවති අර්බුදකාරී තත්ත්වය නිසා එවැනි පියවර ගෙන නැත.

(vii) දැනට ලැබී ඇති වාර්තාව ඇමුණුම 01 හැටියට ඉදිරිපත් කරමි. ඇමුණුම **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව පෙනී යන්නේ, ලෝකයේ අංක එකේ ත්‍රස්තවාදී ව්‍යාපාරයක් වූ එල්ටීටීඊ ත්‍රස්තවාදී ව්‍යාපාරය අවුරුදු 30ක පමණ කාලයක් පුරා මේ රටට කරපු විනාශය පිළිබඳව ශ්‍රී ලංකා රජයට -පැවති හෝ පවතින කුමන රජයකට වුවත්- තක්සේරු වාර්තාවක් නැහැ කියන එකයි. එතුමාගේ පිළිතුරට අනුව, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතන 1,046න් 104ක් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් 1983න් පස්සේ විනාශ කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් ගෙන නැහැ කියා එතුමා වාර්තා කළා. මේ රටේ ඉතිහාසයේ අවුරුදු 30ක් පුරාවට කරපු මහා විනාශයට වග කියන්න ඕනෑ ඒ එල්ටීටීඊ ත්‍රස්වාදී ව්‍යාපාරය අද ජීනීවා මානව හිමිකම් කවුන්සිලයට යනවා, අපේ රටේ හමුදාව මානව හිමිකම් කඩ කළාය, අපරාධ කළාය කියලා. නමුත් ඒ වාගේ මහා අපරාධ කරපු, විනාශ කරපු එල්ටීටීඊ ත්‍රස්තවාදී ව්‍යාපාරයට විරුද්ධව අපි ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

අපට ඒ සම්බන්ධයෙන් තක්සේරුවක් කරන්න බැරි ඇයි? රජය ඒ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරක් ලබා දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාට පිළිතුරක් දෙන්න පුළුවන්ද?

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
එම ප්‍රශ්නයට පිළිතුර දීලා ඉවරයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. එම විනාශයට වග කිව යුතු ත්‍රස්තවාදීන් හඳුනාගෙන තිබෙනවාද, නැද්ද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, නැහෙනහිර පළාතේ සමහර ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්, උතුරු පළාතේ වුණු සිදුවීම් නිශ්චිත ලෙස පොලීසියට වාර්තා වුණු බව. ඒ වෙලාවේ හමුදා බල ප්‍රදේශවලටත් වාර්තා වුණා. නමුත් අපට සැකයක් තිබෙනවා, එහෙම වාර්තා නොවෙනවා කියලා වාර්තා කරන්නේ කොහොමද කියලා. මෙන්න මේ ස්ථානය විනාශ වුණා කියලා දන්නවා නම්, ඒ දේපළවල වටිනාකම පිළිබඳව දළ වශයෙන් හරි තක්සේරුවක් කළ හැකියි. ඒක ලංකාවේ ඉතිහාසයට අයත් වන සාපරාධී විනාශයක්. කුමන රජයක් බලයට පැමිණියත් ඒක කළ යුතු කාර්යයක්; රාජ්‍යයේ කාර්යයක් බව මා අවධාරණය කරනවා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධව ඔබතුමන්ලාට වග කීමෙන් පිළිතුරක් ලබා දිය හැකිද කියන එකයි මාගේ ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ ප්‍රශ්නයටත් පිළිතුර ලබා දෙන්න පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය ස්වදේශ කටයුතු ඇමතිතුමාට යොමු කරන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ප්‍රශ්න අංක 3 - 1420/'16 - (2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. මේ දෙවන වතාවට අහන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ අවසන් වතාව. තුන්වන වතාවේ පිළිතුර දෙන්න ඕනෑ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
අවස්ථා තුනක් දීලා තිබෙනවා නේ. ගරු ඇමතිතුමා තුන්වන වතාවේ දී පිළිතුරු ලබා දෙයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දුම්රිය මැදිරි පෞද්ගලික ආයතනවලට ලබා දීම : අයවිය යුතු හිඟ මුදල්
புகையிரதப் பெட்டிகளைத் தனியார் நிறுவனங்களுக்கு வழங்கியமை: அறவிட வேண்டிய நிலுவைத் தொகை
GRANT OF RAILWAY CARRIAGES TO PRIVATE INSTITUTIONS: ARREARS DUE

1752/'17

4. **ගරු ලකී ජයවර්ධන මහතා**
(මාණ්පුමිකු ලක්කි ජූයවර්තන)
(The Hon. Lucky Jayawardana)
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය මැදිරි පෞද්ගලික ආයතනවලට ලබා දී තිබේද;

(ii) එසේ නම්, දුම්රිය මැදිරි ලබා දී ඇති කාලය, පදනම, ලබා දී ඇති ආයතන, සලකා බැලූ නිර්ණායක, එම මැදිරි සම්බන්ධ කළ දුම්රිය සහ මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කොන්දේසි ප්‍රකාරව, දුම්රිය මැදිරි පවරා ඇති ආයතනවලින් දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු සියලු මුදල් මේ වනවිට ලබාගෙන තිබේද;

(ii) හිඟ මුදල් අයවිය යුතු ආයතන කවරේද;

(iii) එක් එක් ආයතනයෙන් අයවිය යුතු හිඟ මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) දුම්රිය මැදිරි ලබාදීමෙන් මේ වනවිට දුම්රිය දෙපාර්තමේන්තුවට අලාභයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, මුළු අලාභය කොපමණද;

(iii) එම අලාභය දුම්රිය දෙපාර්තමේන්තුවට කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්‌කුවරත්තු මත්‌රුම් සිවිල් විමාන සේවෙකල් අමෛච්චරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෙ පුකෙයිරත තිණෙක්කළත්තුක්කුච් චොන්තමාන පුකෙයිරතප් පෙට්ටිකළ් තනියාර් නිරුවනංකළුක්කු වළංකප්පට්ටුළ්ළනවා;

(ii) ආමෙනිල්, පුකෙයිරතප් පෙට්ටිකළ් වළංකප් පට්ටුළ්ළ කාලම්, අටිප්පටෙ, වළංකප්පට්ටුළ්ළ නිරුවනංකළ්, කවනත්තිර් කොළ්ළප්පට්ට අළවුකෝල්කළ්, ඉප්පෙට්ටිකළ් ඉණෙක්කප් පට්ට පුකෙයිරතංකළ් මත්‌රුම් පෙට්ටිකළින් එණ්ණික්කෙ වෙව්වේරාක යාතු;

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) නිපන්තනෙකළින්පටි, පුකෙයිරතප් පෙට්ටිකළ් වළංකප්පට්ටුළ්ළ නිරුවනංකළිලිරුන්තු පුකෙ යිරතත් තිණෙක්කළත්තුක්කු අරවිටප්පට වේණ්ටිය සකල පණත්තොකෙකළුම් ඉන්ර ළවිල් පෙර්රුක්කොළ්ළප්පට්ටුළ්ළතා;

(ii) නිලුවෙත් තොකෙකළ් අරවිටප්පටවේණ්ටිය නිරුවනංකළ් යාවෙ;

(iii) ඔව්වොරු නිරුවනත්තිලිරුන්තුම් අරවිටප්පට වේණ්ටිය නිලුවෙත් තොකෙ වෙව්වේරාක යාතු ;

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(இ) (i) පුකෙයිරතප් පෙට්ටිකළෙ වළංකියතාල් ඉතුවරෙ පුකෙයිරත තිණෙක්කළත්තුක්කු නට්ටම් ඒර්පට්ටුළ්ළතා;

(ii) ආමෙනිල්, මොත්ත නට්ටම් එව්වළවු;

(iii) ඉන්නට්ටත්තෙප් පුකෙයිරතත් තිණෙක් කළත්තුක්කුත් තුරිතමාක අරවිට්ටුක්කොළ්ළ නටවටික්කෙ මේර්කොළ්වාරා ;

එන්පතෙ අවර් කුරිප්පිටුවාරා?

(ஈ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) whether railway carriages belonging to Department of Sri Lanka Railways have been given for use of private institutions; and

(ii) if so, the duration, basis, given institutions and criteria in respect of such granting and the scheduled trains to which they are attached and the number of carriages attached to each such train, separately?

(b) Will he also inform this House-

(i) whether all the moneys due towards the Department of Sri Lanka Railways have been obtained from the institutions to which these carriages have been granted;

(ii) what institutions are in arrear in payments; and

(iii) what amounts are due from the respective institutions, separately?

(c) Will he state-

(i) whether a loss has been caused to Department of Sri Lanka Railways due to this grant of the use of railway carriages;

(ii) if so, what the total loss is; and

(iii) whether he will take action to recover that loss to Department of Sri Lanka Railways expeditiously?

(d) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. සංචාරක ව්‍යාපාර කටයුතු සඳහා බදු පදනම මත දුම්රිය මැදිරි සංවර්ධනය සහ මෙහෙය වීම පිණිස සේවා සැපයුම්කරුවන් ප්‍රසම්පාදනය කිරීම මැයෙන් අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් මහනුවර, බදුල්ල, උතුරු නැගෙනහිර, දකුණ යන මාර්ග 05 සඳහා මිල දීමනා කැඳවූ අතර එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් පුද්ගලික ආයතනයට මහනුවර මාර්ගය හැර අනෙකුත් සියලු මාර්ගද, සුම්කෝ ලංකා ආයතනයට මහනුවර මාර්ගය සඳහා මැදිරි ධාවනය සඳහා වන නව ටෙන්ඩරයද ප්‍රධානය කරන ලදී.

නමුත්, ඉහත ආයතන දෙකම එම ටෙන්ඩරයෙන් ඉවත් වී ඇති බැවින් මහනුවර මාර්ගය සඳහා වන දෙවන වැඩිම මිල දීමනාකරු වන බිලූ ලයින් ආයතනයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මහනුවර මාර්ගයේ ටෙන්ඩරය පිරිනමා ඇති අතර ගිවිසුම්ගත වීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඉතිරි සියලුම මාර්ගවල ටෙන්ඩර් කැඳවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට දෙපාර්තමේන්තුවේ කමිටුවක් පත්කර ඇති අතර වයිස්රෝයි විශේෂ දුම්රිය, වයිස්රෝයි 2 විශේෂ දුම්රිය මැදිරිය ජේ.එෆ් ටුවර්ස් යන ආයතනයට ලබා දී ඇත.

(ii) ඔව්. පහත පරිදි වේ.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ආයතනය	ගිවිසුම් කාලය	ලබාදුන් පදනම	නිර්ණායක	මැදිරි සම්බන්ධ කළ දුම්රිය	මැදිරි සංඛ්‍යාව
ජේ.එෆ්. ටුවර්ස් ආයතනය	වසර 05 කාලයකි. වෛස්රෝයි විශේෂ දුම්රියට අදාළ ගිවිසුම 2021.05.01 දිනෙන් අවසන් වන අතර වයිස්රෝයි 2 විශේෂ දුම්රිය මැදිරියට අදාළ ගිවිසුම 2017.11.22 දිනෙන් අවසන් වී ඇත.	ගිවිසුම්ගත පදනමක් මත ලබා දී ඇත.	ධාවනයෙන් ඉවත් කර තිබූ දුම්රිය සහ දුම්රිය මැදිරි නවීකරණය කර ධාවනයට එක් කිරීම සහ ධාවනය වන දුම්රියන්ට සුඛෝපභෝගී මැදිරි අමුණා ධාවනය කිරීම.	වාෂ්ප එන්ජිම හෝ ඉල්ලීම මත ඩීසල් එන්ජිම සමඟ විශේෂ දුම්රියක් ලෙස වයිස්රෝයි විශේෂ දුම්රිය වයිස්රෝයි විශේෂ දුම්රියට හෝ ඉල්ලීම මත ධාවනය වන වෙනත් දුම්රියකට වයිස්රෝයි 2 විශේෂ දුම්රිය මැදිරිය.	05 01

(ආ) (i) නැත.

(ii) ජේ.එෆ්. ටුවර්ස් ආයතනය - වයිස්රෝයි විශේෂ දුම්රිය

එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් පුද්ගලික ආයතනය

(iii) ජේ.එෆ්. ටුවර්ස් ආයතනයෙන් රුපියල් 9,788,540.98කි.

එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් පුද්ගලික ආයතනය රුපියල් 108,000කි.

(ඇ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) මෙහිදී අලාභයක් සිදුවී නොමැති බව සඳහන් කරන අතර, ඉහත (ආ) iii හි සඳහන් හිඟ මුදල් අය කර ගැනීමට පහත පරිදි ක්‍රියා කර ඇත.

වෛස්රෝයි දුම්රිය හා වෛස්රෝයි 2 දුම්රිය මැදිරි ධාවනය හා නිරාකරණය නොවූ ගැටලු සම්බන්ධයෙන් අප අමාත්‍යාංශයේ දී 2017.12.21 දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැති විශේෂ සාකච්ඡාවේ දී එකඟතාවකට එළඹ ඇත. ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් ආයතනය 2016.05.02 සිට 2021.05.01 දක්වා කාල පරිච්ඡේදය සඳහා නව ගිවිසුමකට එළඹී තිබෙන අතර, එකී කාලය තුළ ඉහත සඳහන් හිඟ මුදල් කාර්තුවකට රුපියල් 500,000.00 බැගින් අවමයකට යටත්ව සියලු හිඟ මුදල් අදාළ ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ ගෙවා නිම කිරීමට අදාළ සමාගම වෙනුවෙන් සහභාගි වූ තැනැත්තා එකඟ වී ඇත. එසේම, මෙම ගෙවීම් පරිපාටිය සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු බවටත්, එම අනුමැතිය ලද පසුව දෙපාර්ශ්වය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටත් එහිදී එකඟතාව පළ කර ඇත.

මැදිරි ධාවනය ආරම්භ කළ මුල් කාලයේ දුම්රිය ස්ථාන මඟින් නිකුත් කළ ප්‍රවේශ පත්‍ර ආදායම් ගිණුම්ගත කළ ආකාරය අපැහැදිලි වීම නිසා එක්ස්පෝ ආයතනයට අදාළව රුපියල් 108,000ක හිඟ මුදලක් පවතින අතර, එම මුදල අය කර ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

(ඈ) දෙපාර්තමේන්තුවට අලාභයක් සිදුවී නොමැත. ධාවනයෙන් ඉවත් කළ මැදිරි යොදාගෙන ඇති බැවින් දෙපාර්තමේන්තුවට අමතර ආදායමක් ලැබී ඇති අතර, සුඛෝපභෝගී සංකල්පය මඟින් අතර ජනප්‍රිය වීම නිසා නව මඟින් පිරිසක් දුම්රියෙන් ප්‍රවාහනය සලසා ගැනීම සඳහා යොමු වී ඇත.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලැබිය යුතු හිඟ මුදල ශශයෙන් රුපියල් අනූහත් ලක්ෂයක පමණ මුදලක් තිබෙනවා. මේ මුදල දෙපාර්තමේන්තුවට පාඩුවක් නොවෙයි කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා. ඇත්තෙන්ම මේ මුදල පාඩුවක් නොවෙයිද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල අපට පාඩුවක් නොවෙයි. විශේෂයෙන්ම ඉවත දමා තිබුණු දුම්රිය මැදිරි අරගෙන ඒ අයගේ වියදමින් ඒවා නැවත සකස් කර තිබෙනවා. මේකෙන් වෙලා තිබෙන්නේ අපේ ආදායම වැඩි වීමක්.

මේකේ ගෙවීම් ප්‍රමාද වුණු නිසා අපි රුපියල් ලක්ෂ 5 බැගින් ඒ මුදල ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. දැන් ඒ සඳහා ගිවිසුම්ගත වෙලා තිබෙනවා. මේකෙන් පාඩුවක් වෙලා නැහැ, අපට ඒ ආදායම අමතර ආදායමක් විධියට ඇවිල්ලා තිබෙනවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. දෙපාර්තමේන්තුව මේ විධියට මුදල් අය විය යුතු අයගෙන් ඒ මුදල් අය කර නොගෙන, මේ අයට මේ පහසුකම ලබා දුන්නේ මොන හේතුවක් නිසාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මේ උත්තරයේදී මම කිව්වා ඒ පිළිබඳව ලේකම්වරයා සමඟ සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා කියලා. එතැනින් අපට ලැබෙන්නට තිබෙන්නේ රුපියල් ලක්ෂ 97ක් පමණයි. එයත් දැන් කාර්තුවකට රුපියල් ලක්ෂ 5 බැගින් ලැබෙනවා. ඊට අමතරව දිනපතා ආදායම ලැබෙනවා. මොකද, 2021 වෙනකම් මේකේ ගිවිසුම් කාලය තිබෙනවා. අනෙක් රු.108,000ක මුදල දැනටමත් අය කරගෙන අවසන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 1898/'17-(2), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 1998/'17- (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ මහා පරිමාණ වංචා දූෂණ පිළිබඳව සොයා බැලීමේ ජනාධිපති විමර්ශන කොමිසමේ සංඛ්‍යා ලේඛන ප්‍රමාණයක්. මේ වන විට මේ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරලාත් තිබෙනවා. එම නිසා මේ තොරතුරු ඉදිරිපත් කරන්නට බැහැයි කියලා ගරු අග්‍රාමාත්‍යතුමා මාසයක කාලයක් ඉල්ලා සිටින එක සාධාරණ නැහැ, දූෂිතයන් ආරක්ෂා කිරීමට වෙනම වුවමනාවක් නැත්නම්. මේ තොරතුරු දැන් තිබෙනවා නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමා මාසයක් කල් ඉල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරවන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -2070/'17 - (1), ගරු ඩග්ලස් දේවානන්ද මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2015 වර්ෂයේ වෛද්‍ය පීඨයට සුදුසුකම් ලැබූවන්: දකුණු පළාත
2015இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றோர் : தென்மாகாணம்
STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: SOUTHERN PROVINCE

2133/'17

8. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் காலி, மாத்தறை மற்றும் அம்பாந்தோட்டை மாவட்டங் களிலிருந்து தோற்றியுள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මාණවර්කළින් එණ්ණික්කෙයුම් සතවීතමුම් එව්වළවෙන්පතෙයුම්;

(iii) මරුත්තුව පීටත්තිර්කාන තකෙමෙයෙ පෙට්රුල්ල මාණවර්කළින් එණ්ණික්කෙයුම් සතවීතමුම් එව්වළවෙන්පතෙයුම්;

(iv) මරුත්තුව පීටත්තිර්කාන තකෙමෙයෙ පෙට්රුල්ල මාණවන් අල්ලතු මාණවියින් ආකක්කුරෙන්ත පෙරුපේරු, Z පෙරුමති, කල්වි කට්ර පාටසාලෙ මට්රුම් තෙරිවුසෙය්යප්පට්ට මරුත්තුව පීටම් යාතෙන්පතෙයුම්;

ඔව්වොරු මාවට්ටත්තින්පටි තනිත්තනියාක අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the GCE (Advanced Level) Examination in the Biology stream in 2015 from Galle, Matara and Hambantota Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance out of the said number;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

ගාල්ල දිස්ත්‍රික්කය - 3118

මාතර දිස්ත්‍රික්කය - 2494

හම්බන්තොට දිස්ත්‍රික්කය - 2096

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

ගාල්ල දිස්ත්‍රික්කය - 1710

මාතර දිස්ත්‍රික්කය - 1378

හම්බන්තොට දිස්ත්‍රික්කය - 1088

එම සංඛ්‍යාව අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

ගාල්ල දිස්ත්‍රික්කය - 54.84 %

මාතර දිස්ත්‍රික්කය - 55.25 %

හම්බන්තොට දිස්ත්‍රික්කය - 51.91 %

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

ගාල්ල දිස්ත්‍රික්කය - 83

මාතර දිස්ත්‍රික්කය - 64

හම්බන්තොට දිස්ත්‍රික්කය - 47

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

ගාල්ල දිස්ත්‍රික්කය - 4.85 %

මාතර දිස්ත්‍රික්කය - 4.64 %

හම්බන්තොට දිස්ත්‍රික්කය - 4.32 %

(iv) එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු :

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය
4832620	ඩී.එම්. ජයවර්ධන	ගාල්ල	ගා/රිච්මන්ඩ් විද්‍යාලය	භෞතික විද්‍යාව	B	2.0020	රුහුණු විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
4967380	සී.එම්. කොඩිතුවක්කු	මාතර	මා/රාහුල විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.9776	රුහුණු විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	A		
5169240	බී.එස්. ලියනගේ	හම්බන්තොට	පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට ඉදිරිපත්ව ඇත.	භෞතික විද්‍යාව	B	1.9303	රජරට විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	A		

(ஆ) பதில் தரப்படவில்லை.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

2015 වර්ෂයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේත් වෛද්‍ය පීඨය සඳහා අවම සුදුසුකම බවට පත් වෙලා තිබුණේ "ඒ" දෙකයි, "බී" එකයි. මෙහෙම තිබියදී, වෛද්‍ය පීඨ සඳහා පෞද්ගලිකත්වයට ඉඩ කඩ ලබා දෙන්නට අවම සුදුසුකම "සී" දෙකයි "එස්" එකයි කියලා තමුන්නාන්සේලා යෝජනාවක් සම්මත කර ගන්නවා. පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරන කොට තමුන්නාන්සේලාගේ තර්කය තමයි, වෛද්‍ය පීඨයට ඇතුළත් වෙන්න බැරි, Z-score එක දශම ගණනක් අඩු අයට තමයි මේ අවස්ථාව දෙන්නේ කියන කාරණය. හැබැයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අයට රජයේ වෛද්‍ය පීඨයකට ඇතුළත් වෙන්න තිබෙන අවම මට්ටම තමයි "ඒ" දෙකයි "බී" එක කියන මට්ටම. ඒ නිසා තමුන්නාන්සේලා ඉදිරිපත් කළ තර්කයේ කිසිම සාධාරණයක් නැහැ. මේ ආකාරයට "සී" දෙකයි "එස්" එකයි වාගේ ඉතාම අවම සුදුසුකමක් මේ සඳහා නිර්දේශ කරන්න හේතුව මොකක්ද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඇත්තටම ඔබතුමාගේ මේ ප්‍රශ්නයට දෙන්න පුළුවන් උත්තරය මේකයි. කෙනෙකුගේ දක්ෂකම, හැකියාව, අනාගතයේ ඔහු මොන වාගේ තැනකට යන්න පුළුවන්ද, මොන වාගේ වෘත්තීයකටද සුදුසු කියන එක, පහේ ශිෂ්‍යත්වයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ප්‍රතිඵලවලින්ම මනින්න බැහැ. ඒ සඳහා තව බොහෝ දේවල් අවශ්‍යයි. වෛද්‍යවරයෙක් වෙන්න වුණත් වෙන ක්‍රමයක් නැති නිසා, මේ ව්‍යුහගත අධ්‍යාපන ක්‍රමය -structured education system- තුළ අන්තිමට විභාග ක්‍රමයකට යන්න වීම තමයි ඇත්තටම අපට සිදු වෙලා තිබෙන කරදරය. ඒ හැර දරුවෙකුගේ වෙනත් දක්ෂතා මනින්න පුළුවන්කමක් නැහැ. ගිරව් වාගේ කට පාඩම් කරලා, ටියුෂන් පන්ති ගානේ ගිහිල්ලා, ඊටපස්සේ මේ විධියට විභාගය ලියලා "ඒ" සාමර්ථ තුනක් ගත්තත්, එවැනි ලකුණු ලබා ගන්නා අය ඇතුළේ වෛද්‍ය වෘත්තිය සඳහා කොයිතරම් සුදුසු අය සිටිනවාද කියන එක මට නම් ලොකු ප්‍රශ්නයක්.

තවත් බොහෝ දක්ෂතා තිබෙන්න ඕනෑ. වෛද්‍යවරයෙක් වුණාම රෝගියකු සමඟ කථා කරලා, හරියටම ඔහුගේ ලෙඩේ තෝරා ගන්න - ඔබතුමාත් වෛද්‍යවරයෙක් හැටියට සුදුසුකම් ලබා තිබෙනවා. - අන්තර් පුද්ගල හැකියාව -interpersonal intelligence - කියන එක තිබෙන්න ඕනෑ . ඒවා උසස් පෙළ විභාගයෙන් මනින්න පුළුවන්ද? ශල්‍ය වෛද්‍යවරයෙක් වෙන්න නම් මොළය සමායෝජනය කර ගෙන, වෙන තැන් කපන්නේ නැතිව අත පාවිච්චි කරලා හරියට කපන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. ඒකට අපි කියනවා වාලක බුද්ධිය -kinesthetic intelligence- කියලා. මේ විවිධ බුද්ධීන් පරීක්ෂා කරන්න ක්‍රමයක් ඇත්තේ නැහැ. ඒ නිසා මම හිතනවා, යම් මට්ටමක අවම සුදුසුකමක් තිබුණාට කමක් නැහැ කියලා.

මට මතකයි එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල, අසූ ගණන්වල "C" එකයි "S" දෙකයි ගත්ත අය "C" දෙකයි "S" එකයි ගත්ත අය ඕනෑ තරම් වෛද්‍ය විද්‍යාලයට ගිය බව. ඒ නිසා උසස් පෙළ විභාගයේදී අඩු ලකුණු ගත්තත් ඉතා හොඳ ප්‍රවීණ වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන් අය මේ අතර ඉන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ වාගේම තමයි "A" තුන ගත්තත් වෛද්‍යවරයෙක් හැටියට විශාල හානියක් කරන්න පුළුවන් අයත් ඉන්න පුළුවන්. මට තේරෙන විධියට ඒක තමයි යථාර්ථය වන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පාර්ලිමේන්තු පරිශ්‍රයේ තණකොළ කපන්න කම්කරුවන් බඳවා ගන්නකොටත් යම් කිසි සුදුසුකමක් ඉල්ලනවා නේද? ඒකටත් සාමාන්‍ය පෙළ මේච්චර සමත් වෙන්න අවශ්‍යයි කියලා ඉල්ලනවා. ඒ කියන්නේ ක්‍රිකට් කණ්ඩායමට බඳවා ගැනීමේදී වේවා, ඕනෑම වෘත්තීයකට බඳවා ගැනීමේදී ලෝකයේ පිළිගත් මොකක් හෝ සම්ප්‍රදායක් තිබෙනවා. ඒක සංකල්පීය තලයේ පා වෙවී තිබුණාට වැඩක් නැහැ, ගරු ඇමතිතුමනි. මොනවා හෝ නිර්ණායකයක් දමලා තිබෙන්නේ ඒකටයි. එහෙම නම් තමුන්නාන්සේලා "C" දෙකයි "S" එකයි දමන්නේ ඇයි? ඒකත් අයින් කරන්න පුළුවන් නේ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
සාම්ප්‍රදායික වශයෙන් තමයි මේ "C" දෙකයි "S" එක කියන සුදුසුකම දීලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නැහැ, නැහැ, ඒක සම්ප්‍රදාය නොවෙයි. [බාධා කිරීමක්]

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඒක තමයි මම ඔබතුමාට උත්තරයක් දුන්නේ. මේක තවදුරටත් ගැඹුරින් හදාරන්න ඕනෑ. අධ්‍යාපනය කියන්නේ උසස් පෙළ විභාගය නොවෙයි. අධ්‍යාපනය කියන්නේ සමස්ත සංවර්ධනය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගැඹුරින් හදාරන්න. හැබැයි, මේ අලුතින් ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය වෙනයි, අපි මුහුණ දෙන ප්‍රශ්නය වෙනයි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
අධ්‍යාපනය කියන්නේ කෙනෙකුගේ සමස්ත සංවර්ධනය. ඒ නිසා අපි උසස් පෙළ විභාගයෙන් මනිනවා නම් - [බාධා කිරීමක්]

ඒක තමයි මම කිව්වේ. මේ ව්‍යුහගත රාමුව ඇතුළේ මේ වාගේ ක්‍රමයක් යනකොට අපි අනෙක් හැම දේවල් ගැනම හිතලා මේ වාගේ මට්ටමකට ආපු එක සාධාරණයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන දීර්ඝ සාකච්ඡාවක් කරන්න. මෙතැනදී ඒක කරන්න අමාරුයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නැහැ, නැහැ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ප්‍රශ්නය ඇහුවාට ඒකට උත්තරයක් හම්බ වුණේ නැහැ නේ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කරන්න කැමැතිද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
නැහැ, නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තරයක් දුන්නා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නා නම්, එතුමා කැමති නම් විතරයි මට ඊළඟ ප්‍රශ්නයට ඉඩ දෙන්න පුළුවන්.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක් සඳහා ඉඩ දෙනවාට ඔබතුමා කැමති නම්, මට ඒක allow කරන්න පුළුවන්. ඒක, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කැමැත්ත. මට බල කරන්න බැහැ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, පසු ගිය කාලයේ ආන්දෝලනයට තුඩු දීපු ප්‍රශ්නයක් තමයි SAITM එක පිළිබඳ ප්‍රශ්නය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, ජනාධිපතිතුමාත් මැදිහත් වෙලා උත්සවයකුත් තියලා නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගත්තා. පසුගිය අගෝස්තු මාසයේ ඉඳලා සෞඛ්‍ය අමාත්‍යාංශය රුපියල් මිලියන 300 ගණනේ ඒ ආයතනයට ගෙවනවා. SAITM එක පත්තරේ දැන්වීමක් දමනවා, ඒ රෝහල විකුණනවා කියලා. නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගත්තු ආයතනයක් නම්, එහි පාලන අධිකාරිය කොහොමද එය විකුණන්නට පත්තරේ දැන්වීමක් දමන්නේ?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
උසස් පෙළ ප්‍රතිඵල පිළිබඳ ප්‍රශ්නයට ඕක අදාළ නැහැ නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කිරිඇල්ල ඇමතිතුමාත් ඉන්න නිසා එතුමාගෙන් උත්තරයක් ගන්න පුළුවන්.

මිරිදිය ධීවර කර්මාන්තය: වයඹ පළාත

நன்னீர் மீன்பிடிக் கைத்தொழில்: வடமேல் மாகாணம்
FRESHWATER FISHING: NORTH-WESTERN PROVINCE

2143/'17

9. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය ජලජ වගාව සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීමේ සමීක්ෂණයක් ඔබ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, වයඹ පළාත තුළ මිරිදිය ධීවර කර්මාන්තයට සුදුසු ස්ථාන ලෙස හඳුනාගෙන ඇති ස්ථාන කවරේද;

(iii) එම ස්ථාන අතරින්, මිරිදිය ධීවර කර්මාන්තය දැනටමත් ආරම්භ කර ඇති ස්ථාන කවරේද;

(iv) සෙසු ස්ථානවල මිරිදිය ධීවර කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කටාපොළිල් මත්‍රුම් නීරක වළමූල අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் நன்னீர் நீரின வளர்ப்புக்குப் பொருத்தமான இடங்களை இனங்காண்பதற் கான மதிப்பாய்வொன்று தங்களது அமைச்சி னால் மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், வடமேல் மாகாணத்தில் நன்னீர் மீன்பிடிக் கைத்தொழிலுக்குப் பொருத்தமான

இடங்களாக இனங்காணப்பட்டுள்ள இடங்கள் யாவையென்பதையும்;

(iii) அவ்விடங்களில் நன்னீர் மீன்பிடிக் கைத்தொழில் ஏற்கெனவே ஆரம்பிக்கப்பட்டுள்ள இடங்கள் யாவையென்பதையும்;

(iv) ஏனைய இடங்களில் நன்னீர் மீன்பிடிக் கைத்தொழிலை ஆரம்பிப்பதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) whether your Ministry has conducted a survey to identify suitable places for freshwater aqua culture in Sri Lanka;

(ii) if so, the places that have been identified in the North-Western Province as suitable for freshwater fishing;

(iii) the places where freshwater fishing has already been started out of those places; and

(iv) the steps taken by the Ministry to start freshwater fishing in other places?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. ශ්‍රී ලංකාවේ මිරිදිය ජලජීවී වගාව සඳහා සුදුසු නිත්‍ය ජලාශ හා කාලීන ජලාශ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගෙන ඇත. පොකුණු සැකසීම සඳහා සුදුසු ඉඩම් දැනට හඳුනා ගෙන මිරිදිය මත්ස්‍ය වගාව සිදු කරන අතර, තවදුරටත් එවැනි ඉඩම් හඳුනා ගනිමින් ඒවායේ මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කෙරේ.

(ii) මිරිදිය ධීවර කර්මාන්තයට සුදුසු ස්ථාන ලෙස වයඹ පළාත තුළ හඳුනාගත් ප්‍රදේශ ඇමුණුම I මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) එම පළාත තුළ මිරිදිය ධීවර කර්මාන්තය සඳහා සුදුසු බවට තාක්ෂණිකව හඳුනාගත් ඇමුණුම Iහි සඳහන් ස්ථානවල මිරිදිය ධීවර කර්මාන්තය දැනටමත් ආරම්භ කර ඇත.

(iv) ශ්‍රී ලංකාවේ තිබෙන තාක්ෂණිකව හඳුනාගත් සියලුම ජලාශ සඳහා අවශ්‍ය වගා පාදක ධීවර කර්මාන්ත සංවර්ධනය කිරීමට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය මිලියන 300ක් වන අතර, දැනට මිලියන 82ක් පමණ නිෂ්පාදනය කරනු ලැබේ. 2020 වන විට මෙම මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 150ක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදි කරමින් පවතින අතර, දැනට පවතින අභිජනන මධ්‍යස්ථාන පුළුල් කරමින් පවතී. ඒ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ මිරිදිය ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කල්අරාව නව අභිජනන මධ්‍යස්ථානයක් හා උඩවලව නව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදි කර ඇත. තවද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයක් සෙවනපිටියේ ඉදි වෙමින් පවතී. එමෙන්ම මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය නැවත ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන ක්‍රියාකාරී මට්ටමට පත් කර ඇති අතර, කලාවැව, ඉඟිනියාගල, උඩවලව යන, දැනට ක්‍රියාත්මකව පවතින ජලජීවී වගා අභිජනන මධ්‍යස්ථාන පුළුල් කිරීමට ද කටයුතු යොදා ඇත. මීට අමතරව වෙරළාසන්න ප්‍රදේශවල ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ කරදිය මසුන් අභිජනන මධ්‍යස්ථානයක් ද ඉදි කර ඇත.

පසුගිය අවුරුදු තුන තුළ මිරිදිය මත්ස්‍ය අභිජනනාගාර පුළුල් කිරීමට හා අලුතින් ඉදි කිරීමට රුපියල් මිලියන 1,494.29ක් යොදවා ඇති අතර, මේ වර්ෂයේදී රුපියල් මිලියන 1,015ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව 2020 වන විට මත්ස්‍ය පැටවුන් මිලියන 150ක් නැන්පත් කර, 2025 වන විට තවත් මිලියන 150ක් බැගින් පෞද්ගලික අංශය සම්බන්ධ කරගනිමින් සියලුම ජලාශවල මත්ස්‍ය පැටවුන් නැන්පත් කර, 2025 වන විට මෙට්‍රික් ටොන් 263,200ක මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනීමටයි කටයුතු කරමින් පවතින්නේ.

(ආ) පැන නොනඟී.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්න ඇහුවාම උත්තර ලැබෙනවා ද? යොමු කිරීමක් නේද වෙන්නේ?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔව්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අපට ඒකෙදී අසාධාරණයක් වෙනවා නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සමහර අවස්ථාවල වෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අපි ප්‍රශ්නයක් යොමු කළාම න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා මාස ගණනකට පසුව එය යොමු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

කරනවා, න්‍යාය පත්‍රයට. ඒක න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා ගරු ඇමතිවරයකුගෙන් අහනවා. නවක මන්ත්‍රීවරයකු විධියට මම මේ කථා කරන්නේ ගරු ඇමතිවරුන්ට විරුද්ධව නොවෙයි. දැන් අපි ප්‍රශ්නයක් ඇසුවාම ඒ ප්‍රශ්නය යොමු කළාට අපට උත්තරයක් ලැබෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ කාරණය කිහිප විටකදීම ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් අවධානයට යොමු කළා. අලුත් ස්ථාවර නියෝග බලපවත්වන්නේ අප්‍රේල් මාසයේ 15වැනිදාට පසුවයි. ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ගරු ඇමතිතුමා හෝ ගරු නියෝජ්‍ය ඇමතිතුමා පැමිණීම අත්‍යවශ්‍යයි කියලා අලුතින් ස්ථාවර නියෝගවල අපි සඳහන් කර තිබෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අශෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
ඇමතිවරු මාත් සමඟ තරහා වෙන්න එපා. ගරු කථානායකතුමනි, එහෙම නැතිනම් ප්‍රශ්නයට උත්තර දීම සඳහා කල් ගත්තත් කමක් නැහැ. එතකොට අපට අමාත්‍යාංශයේ පිළිතුර දැනගන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මාත් ඒක පිළිගන්නවා. එහෙම වුණොත් ඒක ප්‍රශ්නය අහන පාර්ශ්වයටත්, පිළිතුරු දෙන පාර්ශ්වයටත් දෙපැත්තටම ගෞරවයක්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අශෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මම අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ. ප්‍රශ්න අහලා වැඩක් නැති නිසා අහන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. හැබැයි, ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවොත් සොයා බලා පිළිතුරු අරගෙන එවයි. මීට ඉස්සෙල්ලා සමහර මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්නවලට ඒ විධියට කරලා තිබෙනවා. ඔබතුමා කැමති නම් එහෙම කරන්න පුළුවන්. අවශ්‍ය නැත්නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මේ ප්‍රශ්නයෙන් පස්සේ අහමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මෙතුමා කිහිප අවස්ථාවක් කියලා තිබෙනවා මම දැක්කා.

ප්‍රශ්න අංක 10 -2180/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරපාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම : නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
புதிய கட்டிடம் நிர்மாணித்தல் : நானாட்டான் பிரதேச செயலகம்
CONSTRUCTION OF A NEW BUILDING: NANATTAN DIVISIONAL SECRETARIAT

2223/'17

11.ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දීර්ඝ කාලයක් මුළුල්ලේ පැරණි ගොඩනැඟිල්ලක ක්‍රියාත්මකවීම හේතුවෙන්, සේවාවන් ලබා ගැනීමට පැමිණෙන ජනතාව මෙන්ම, එහි සේවය කරන නිලධාරින්ද විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මවිසින් යොමු කරන ලද 2017.07.06 දිනැති ලිපිය පිළිබඳවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, ඉදිරියේදී නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார் மாவட்டத்தில் நானாட்டான் பிரதேச செயலகம் நீண்ட காலமாகப் பழைய கட்டிட மொன்றில் இயங்கி வருவதன் காரணமாக, சேவைகளைப் பெற்றுக்கொள்ள வரும் மக்களும் அதேபோன்று அங்கு பணியாற்றும் அலுவலர்களும் பல்வேறு அசௌகரியங்களை எதிர்கொள்கின்றனர் என்பதையும்;

(ii) நானாட்டான் பிரதேச செயலகத்திற்குப் புதிய கட்டிடமொன்றை நிர்மாணிப்பது தொடர்பாக என்னால் அனுப்பப்பட்ட 2017.07.06ஆம் திகதிய கடிதம் தொடர்பாகவும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், எதிர்வரும் காலத்தில் நானாட்டான் பிரதேச செயலகத்திற்கான புதிய கட்டிடமொன்றை நிர்மாணிப்பதற்காக நிதி ஏற்பாடுகளை ஒதுக்குவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Is he aware that -

(i) the people who come to get services from the Nanattan Divisional Secretariat in the Mannar District and the officers who are serving in that office face various difficulties as the said office is situated in a very old building for a long period of time; and

(ii) a letter dated 06.07.2017 sent by me with regard to the construction of a new building for the Nanattan Divisional Secretariat?

(b) Will he inform this House whether action will be taken in future to allocate money to construct a new building for the Nanattan Divisional Secretariat?

(c) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වර්තමාන ගොඩනැඟිල්ල 2004 වසරේදී ඉදිකර ඇත. 2016 වසරේදී නව රැස්වීම් ශාලාවක් ඉදිකර ඇති අතර, එමඟින් ඉඩකඩ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට විසඳී ඇත.

(ii) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් 2017.07.06 වන දින ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව මා දැනුවත් බව දන්වමි.

(ආ) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ලබාදෙන ලෙස ඉල්ලා සිටීමින් එහි ප්‍රාදේශීය ලේකම් විසින් 2017.07.31 දින දිස්ත්‍රික් ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම, ඉහත ඉල්ලීම්වලට අනුව ගොඩනැඟිල්ල ලබා දීමට කටයුතු කරමින් සිටී.

මන්නාරම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු අනෙකුත් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මේ වන විට නව ගොඩනැඟිලි ලබාදී ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, if you have any Supplementary Questions, you may ask now.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே! எனது கேள்விக்கு விடையளித்தமைக்காகத் தங்களுக்கு நன்றி கூறுகின்றேன். மன்னார் மாவட்டச் செயலகம் புதிதாக அமைக்கப்பட்டது. அதேபோன்று நானாட்டான் பிரதேச செயலகத்துக்குப் புதிய கட்டிடமொன்றைப் பெற்றுக்கொடுப்பதற்கு தற்பொழுது நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது என்று குறிப்பிட்டீர்கள். அதற்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இப்பொழுது முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்க விரும்புகின்றேன். அதாவது, எங்களுடைய பிரதேசத்தில் மட்டுமல்ல, இலங்கையில் இருக்கின்ற அனைத்துப் பிரதேசங்களிலும் ஒரு கிராம சேவகர் 7 அல்லது 8 கிராமங்களை உள்ளடக்கியதாகச் சேவை செய்யவேண்டிய ஒரு சூழ்நிலை இருக்கின்றது. அதேநேரத்தில் சில கிராம சேவகர் பிரிவுகளுக்குக் கிராம சேவகர் இல்லாத காரணத்தினால், அயலில் இருக்கின்ற கிராம சேவகர் அந்தக் கிராம மக்களுக்குச் சேவையாற்ற வேண்டிய தேவை இருக்கின்றது. அந்த வகையில் 7-8 கிராமங்களை உள்ளடக்கிய கிராமசேவகர் பிரிவுகளும் இருக்கின்றன. குறிப்பாக வவுனியாவில் கிட்டத்தட்ட 14,000 குடும்பங்களைக் கொண்ட கிராமசேவகர் பிரிவு இருக்கிறது. ஆகவே, குறிப்பிட்ட மக்கள் தொகை யினருக்கு ஒரு கிராம சேவகர் பிரிவு என்ற அடிப்படையில், கிராம சேவகர் பிரிவுகளின் எல்லைகளைப் புதிதாக நிர்ணயம் செய்வதற்குக் கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, මම මන්නාරමේ ගිය වෙලාවේත් ගරු මන්ත්‍රීතුමා මේ කාරණය ඉදිරිපත් කළා. ඒ නිසා තමයි අපි ඒ ප්‍රදේශවල විශ්‍රාම ගිය අය හොයලා කොන්ත්‍රාත් පදනම මතත් පත් කිරීම් බොහොමයක් සිදු කළේ. ඒ අතර, මේ මාසයේ අග හෝ අප්‍රේල් සිංහල අවුරුද්දට කලින් ඒ ප්‍රදේශයේ සියලුම පුරප්පාඩු ටික පිරවීමට දැන් විභාග දෙපාර්තමේන්තුවෙන් අදාළ ප්‍රතිඵල ලැබිලා තිබෙනවා. ඒ අනුව පත්වීම් ටික සිදු කරනවා.

ඒ එක්කම, එතුමා කියපු සීමා නිර්ණය සඳහා වූ කමිටුව පත් කිරීමේ බලය තිබෙන්නේ පනත අනුව අවුරුදු 5කට වරක්. මේ අවුරුද්දේ -2018- අපි එම කමිටුව පත් කර තිබෙනවා. ඒ අනුව ඉතාම ඉක්මනින් සීමා නිර්ණය ප්‍රශ්නයත් අවසන් කිරීමට අපි කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Are you satisfied with the Answer, Hon. Member or do you want to ask one more question?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
The second Supplementary Question will be asked by the Hon. Bimal Rathnayake.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, පොදු වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක් ගැනයි මම ඔබතුමාගෙන් අහන්නේ.

හැදුනුම්පත් නිකුත් කිරීමේදී විශේෂයෙන්ම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ වෙනත් අයත් දැනුවත් කරමින්, ඔවුන්ගේ උප්පැන්න සහතික මාස 6ක් ඇතුළත ලබාගත යුතුයි, ඒ වාගේම විවාහ වුණු අයගේ එම විවාහ සහතික මාස 6ක් ඇතුළත ලබාගත යුතුයි, එසේ නැතිව ඔවුන් සතුව තිබෙන නීත්‍යානුකූල සහතිකයෙන් -ඔබතුමන්ලා කලින් ලබාදුන් සහතිකයෙන්- එය කරන්න බැහැ කියා ඔබතුමන්ලා අලුතින් නියෝගයක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය ලියන්න බලාපොරොත්තුවෙන් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන් මේ ප්‍රශ්නය නිසා සුවිශාල කරදරයකට මුහුණ පා සිටිනවා.

දෙවැනි කාරණය මෙකයි. වතුකරය තුළ ඉපදුණු සුවිශාල ජනතාවක් වන්නියේ ජීවත් වෙනවා. ඔවුන්ගේ උප්පැන්න සහතික ඇත්තටම තිබෙන්නේ නුවරඑළිය, මස්කෙලිය, යටියන්තොට, දැරණියගල වැනි ප්‍රදේශවලයි. මේ නියෝගය නිසා ඔවුන්ට දවස් තුන හතරක් නිවාඩු දමාගෙන එහේ ගිහින් තමයි මේ කටයුතු කරගන්න වන්නේ. එහේ ගියත් මේවා හොයාගන්නත් හම්බ වෙන්නේ නැහැ. මේ නිසා අනවශ්‍ය, සුවිශාල ප්‍රශ්නයකට පොදු ජනතාව මුහුණ පා සිටිනවා. ඒ නිසා ඔබතුමා මෙන්න මේ, "මාස 6ක් ඇතුළත පමණයි විවාහ සහතික වලංගු, උප්පැන්න සහතික මාස 6ක් ඇතුළත පමණයි වලංගු" කියන නියෝගය ඉවත් කරලා, නීත්‍යානුකූලව ඔවුන් සතුව තිබෙන සහතිකවලින් පැරණි විධියට හැදුනුම්පත හදාගන්න අවස්ථාව ලබා නොදෙන්නේ ඇයි කියන ප්‍රශ්නයයි මම අහන්නේ.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, අපේ එස්.බී. නාවින්න ඇමතිතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ කාරණයක් හැටියට ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා සඳහන් කළ එම කාරණය දැනට සති දෙකකට කලින් මතු වුණා. ඒ අතරේ, මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දිග පෝලිම් ඇති වෙන්න පටන් ගත්තා. පසුව අපි එම නියෝගය සම්පූර්ණයෙන්ම අත් හිටෙව්වා. දැනට ඒ අවශ්‍යතාව මතු වන්නේ නැහැ. පැරණි ක්‍රමයට දැන් ආපහු ඒවා නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට මේ තොරතුරු ලබා දුන්නේ ග්‍රාම නිලධාරි මහත්මයෙක්, ඊයේ. එම නියෝගය ඉවත් කළාය කියන පණිවුඩය එම ප්‍රදේශවලට ගිහින් නැහැ.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
මම ඒක ආපසු පරීක්ෂා කර බලන්නම්. මොකද ගිය සතියේම අපි සම්පූර්ණයෙන්ම නියෝගය දුන්නා, පැරණි ක්‍රමයට ඒ නිකුත් කිරීමේ කටයුතු සිදු කරන්න කියලා. යම්කිසි තැනකට එම නියෝගය ලැබී නැත්නම් මම එය නිවැරදි කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 -2232/'17- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ඔබතුමාගේ අමාත්‍යාංශයට යොමු වෙලා මාස කීපයක් වෙනවා. මෙය බොහොම සෘජු පිළිතුරක් දිය හැකි ප්‍රශ්නයක්.

ඔබතුමන්ලාට මේ ප්‍රශ්නයට පිළිතුර ලබා ගන්නට බැරි වීම මට නම් තේරුම් ගත නොහැකියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා වෙන දා නම් සාමාන්‍යයෙන් පිළිතුරු ලබා දෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර සති දෙකකින් ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා ලබන වතාවේ පිළිතුර ලබා දෙයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 2290/'17 - (1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 - 2315/'17 - (1), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 - 2322/'17 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 - 689/'16 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මනච්චේනයි සහ ඉරුදයපුරම් ගම්මානවලට මූලික පහසුකම්: පියවර
மணற்சேனை, இருதயபுரம் கிராமங்களுக்கு அடிப்படை வசதிகள்: நடவடிக்கை
BASIC FACILITIES TO MANACHCHENAI AND IRUDAYAPURAM VILLEGES: STEPS TAKEN

2070/'17

7. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා භින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2013 වර්ෂයේදී ත්‍රිකුණාමලය, මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මනච්චේනයි සහ ඉරුදයපුරම් ගම්මානවල පවුල් 125කට අධික සංඛ්‍යාවක් නැවත පදිංචි කරන ලද බවත්;

(ii) එම ජනතාව එම ගම්මානවල නැවත පදිංචි කළ කාලයේ සිට මූලික පහසුකම් හා ස්ථිර නිවාස ලබා නොදීම හේතුවෙන් දැඩි පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම ගම්මානවලට මූලික පහසුකම් සහ ස්ථිර නිවාස පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு மீள்குடியேற்ற மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013ஆம் ஆண்டில் திருகோணமலை, மூதூர் பிரதேச செயலாளர் பிரிவைச் சேர்ந்த மணற் சேனை இருதயபுரம் கிராமங்களில் 125க்கும் அதிகமான குடும்பங்கள் மீள்குடியேற்றப் பட்டுள்ளனரென்பதையும்;

(ii) மேற்படி மக்கள் அக்கிராமங்களில் மீள்குடியேற் றப்பட்ட காலம் தொடக்கம், அடிப்படை வசதிகளும் நிரந்தர வீடுகளும் வழங்கப் படாமையினால் கடுமையாகப் பாதிக்கப் பட்டுள்ளனரென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கிராமங்களுக்கு அடிப்படை வசதி களையும் நிரந்தர வீடுகளையும் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

asked Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that-

(i) more than 125 families have been resettled in the village called Irudayapuram in Manachchenai belonging to the Mutur Divisional Secretary's Division in the Trincomalee District in the year 2013; and

(ii) these people have been severely affected as they have not been provided with basic facilities and permanent houses since the time of resettlement in these villages;

(b) Will he inform this House-

(i) whether he will take steps to provide these villages with basic facilities and permanent housing facilities; and

(ii) if so, on which date?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)
Hon. Speaker, I **table*** the Answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) No.

Resettlement activities have not been conducted in 2013 in Manachchenai village belonging to Irudayapuram Grama Niladhari Division in Mutur Divisional Secretary's Division in Trincomalee District. However, people displaced from Manachchenai village in the year 2006 have returned to their original places in 2009.

(ii) Out of 171 families resettled in 2009, 31 families have been provided with permanent houses and 84 families have been provided with lavatory facilities so far.

Balance 140 families are to be provided with permanent houses and 87 families are in need of sanitary facilities.

(b) (i) Basic facilities and permanent houses can be provided to these families if necessary funding is allocated for both purposes.

(ii) Funds have not been allocated for providing houses in the year 2018. Only Rs. 750 million has been allocated for all other facilities other than housing facilities and the facilities will be provided based on priority within the allocated sum.

(c) Does not arise.

ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිසංස්කරණය කළ වැව් : ප්‍රතිපාදන
கலேவெல பிரதேச செயலாளர் பிரிவில் மறுசீரமைக்கப்பட்ட வாவிகள் : நிதி ஏற்பாடுகள்
REHABILITATION OF TANKS IN GALEWELA DIVISIONAL SECRETARY'S DIVISION: ALLOCATION

2322/'17

15. ගරු හේෂාන් විතානගේ මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Heshan Withanage on behalf of the Hon. (Mrs) Rohini Kumari Wijerathna)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 වර්ෂයේදී, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, මාතලේ ගොවිජන සංවර්ධන කොමසාරිස් කාර්යාලය මඟින් ආරම්භ කළ ව්‍යාපෘතිය යටතේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රතිසංස්කරණය කළ එක් එක් වැවට වෙන් කළ ප්‍රතිපාදන මුදල සහ පෝෂිත කුඹුරු අක්කර ප්‍රමාණය කවරේද;

(ii) ප්‍රතිසංස්කරණය සඳහා කොන්ත්‍රාත්තුව ලබා ගත් එක් එක් ගොවි සංවිධානය, ග්‍රාම නිලධාරී වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් කොන්ත්‍රාත්තුවෙන් එම ගොවි සංවිධානවලට ලැබුණු ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ගොවි සංවිධානයේ ගිණුමට ලාභය බැර වී තිබේ නම්, එම තොරතුරු සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ගොවි සංවිධාන විසින් ලබා ගත් ව්‍යාපෘති කොන්ත්‍රාත්තු උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබේ නම්, එම උප කොන්ත්‍රාත් ගිවිසුම් සභාගත කරන්නේද;

(ii) ගිවිසුම්ගත නොවී වාචික එකඟතාවයෙන් උප කොන්ත්‍රාත් ලබා දීමට ගොවිජන සංවර්ධන නිලධාරීන් එකඟත්වය ලබා දී තිබේද;

(iii) එක් එක් ව්‍යාපෘතියෙන් ගොවි සංවිධානවලට ලැබී ඇති ප්‍රතිලාභ, කොමිස් මුදල කොපමණද;

(iv) ගොවි සංවිධානවලට උප කොන්ත්‍රාත් ලබා දීමෙන් ලැබුණු ප්‍රතිලාභ, කොමිස් මුදල් හා එය කොන්ත්‍රාත්තුවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டு கமத்தொழில் அமைச்சின் மாத்தளை கமநல அபிவிருத்தி ஆணையாளர் அலுவலகத்தினால் ஆரம்பிக்கப்பட்ட கருத் திட்டத்தின்கீழ் கலேவெல பிரதேச செயலாளர் பிரிவில் மறுசீரமைப்புச் செய்யப்பட்ட ஒவ்வொரு வாவிக்கும் ஒதுக்கப்பட்ட நிதி

ஏற்பாட்டுத் தொகை மற்றும் நீர் பாய்ச்சப் படுகின்ற வயல்களின் அளவு ஏக்கரில் யாதென்பதையும்;

(ii) மறுசீரமைப்புப் பணிகளுக்கான ஒப்பந்தத்தைப் பெற்றுக்கொண்ட ஒவ்வொரு கமக்காரர் அமைப்பும் கிராம சேவகர் பிரிவின் பிரகாரம் தனித்தனியாக யாதென்பதையும்;

(iii) ஒவ்வோர் ஒப்பந்தத்தின் மூலமும் மேற்படி கமக்காரர் அமைப்புகளுக்குக் கிடைக்கப்பெற்ற இலாபம் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iv) கமக்காரர் அமைப்பின் கணக்கிற்கு இலாபம் வரவு வைக்கப்பட்டிருப்பின், அத்தகவல்களைச் சபாபீடத்திற்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கமக்காரர் அமைப்புகளால் பெற்றுக்கொள்ளப் பட்ட கருத்திட்ட ஒப்பந்தங்கள் உப ஒப்பந்த காரர்களுக்கு பெற்றுக்கொடுக்கப்பட்டிருப்பின், குறிப்பிட்ட உப ஒப்பந்தங்களுக்கான உடன்படிக் கைகளைச் சபையில் சமர்ப்பிப்பாரா என்ப தையும்;

(ii) உடன்படிக்கைகளுக்கு வராமல் வாய்மூல இணக்கப்பாட்டுடன் உப ஒப்பந்தங்களைப் பெற்றுக்கொடுப்பதற்கு கமநல அபிவிருத்தி உத்தியோகத்தர்கள் இணக்கம் தெரிவித் துள்ளனரா என்பதையும்;

(iii) ஒவ்வொரு கருத்திட்டத்தின் மூலமும் கமக்காரர் அமைப்புகளுக்குக் கிடைத்துள்ள அனுகூலங்கள், தரகுத் தொகைகள் எவ்வளவென்பதையும்;

(iv) கமக்காரர் அமைப்புகளுக்கு உப ஒப்பந்தங்கள் வழங்கப்பட்டதன்மூலம் கிடைத்துள்ள அனு கூலங்கள், தரகுத் தொகைகள் மற்றும் அது ஒப்பந்தத்தின் விகிதாசாரமாக எவ்வளவென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state-

(i) the provisions apportioned for each tank rehabilitated in the Galewela Divisional Secretary's Division and the number of acres of paddy fields fed from each such tank under the project initiated by the Agrarian Development Commissioner's Office of Matale of the Ministry of Agriculture in the year 2016;

(ii) separately, by each Grama Niladhari Division, the name of each farmer organization which secured the contract for rehabilitation;

(iii) separately, the profit made by the said farmer organizations from each contract; and

(iv) if the profit had been credited to the account of the farmer organization, whether details of same can be tabled?

(b) Will he inform this House-

(i) if the project contracts secured by farmer organizations had been awarded to subcontractors, whether he will table such subcontract agreements;

(ii) whether the Agrarian Development Officers have granted consent to award subcontracts by verbal agreement without entering into agreements;

(iii) the benefits and the commission received by farmer organizations from each project; and

(iv) the benefits and commissions received by farmer organizations by awarding subcontracts and the same as a percentage of the contract?

(c) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)

(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

අනු අංකය	වැවේ නම	වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය		පෝෂිත කුඹුරු අක්කර ප්‍රමාණය
		(රුපියල්)	මුදල අකුරෙන්	
1	බම්බාව වැව (පන්සලේවැව)	719,733.36	රු.හත්ලක්ෂ දහනවදහස් හත්සිය තිස්තුනයි ශත තිස් හයයි	80
2	පිස්සිගේ වැව	1,978,537.75	රු.දහනවලක්ෂ හැත්තෑ අටදහස් පන්සිය තිස් හතයි ශත හැත්තෑපහයි.	14
3	ඉමදාන වැව	2,867,379.45	රු.විසිඅටලක්ෂ හැටහත්දහස් තුන්සිය හැත්තෑනවයයි ශත හතළිස්පහයි.	60
4	පාළු සියඹලා වැව	2,295,784.20	රු.විසිදෙලක්ෂ අනූපන්දහස් හත්සියඅසුහතරයි ශත විස්සයි.	48
5	කලහකැලේ වැව	337,789.42	රු.තුන්ලක්ෂ තිස්හත්දහස් හත්සියඅසුනවයයි ශත හතළිස් දෙකයි	48 රූඩ් 3
6	රාලලෑ රොටවැව	2,777,940.00	රු.විසිහත්ලක්ෂ හැත්තෑහත්දහස් නවසිය හතළිහයි	49
7	පහළ වැව	2,278,913.50	රු.විසිදෙලක්ෂ හැත්තෑඅටදහස් නවසිය දහතුනයි ශත පනහයි	15
8	ගමේ වැව	2,178,000.00	රු.විසිඑක්ලක්ෂ හැත්තෑඅටදහසයි	21
9	සිංහාර වැව	1,782,000.00	රු.දාහත්ලක්ෂ අසූදෙදහසයි	13 රූඩ් 2
10	උඩවැව	2,613,600.00	රු.විසහයලක්ෂ දහතුන්දහස් හයසියයි.	30 රූඩ් 2
11	රත්මලගාවවැව	2,556,102.52	රු.විසිපන්ලක්ෂ පනස්හයදහස් එකසියදෙකයි ශත පනස්දෙකයි	32 රූඩ් 2
12	කිරිමැටියාව වැව	1,920,174.30	රු.දහනවලක්ෂ විසිදහස් එකසියහැත්තෑහතරයි ශත තිහයි	18
13	මානහිඳ ඉහල වැව	1,188,000.00	රු.එකොළොස්ලක්ෂ අසූඅටදහසයි	12 රූඩ් 3

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

14	අඹන්පොලවැව	2,072,048.49	රු.විසිලක්ෂ හැත්තෑදෙහස් හතළිස්අටයි ශත හතළිස්නවයයි	24
15	සිඟන්කුටිගම්වැව	1,161,886.00	රු.එකොළොස්ලක්ෂ හැට්එක්දහස් අටසියයසැහෙයයි	17 රුඩ 2
16	බූවැව	745,968.70	රු.හත්ලක්ෂ හතළිස්පන්දහස් නවසියහැට්අටයි ශත හැත්තෑවයි	10
17	වැගොඩපොල වැව	318,600.00	රු.තුන්ලක්ෂ දහඅටදහස් හයසියයි.	10
18	දමන අලුත් වැව	409,010.72	රු.හාරලක්ෂ නවදහස්දහයයි ශත හැත්තෑදෙකයි	20
19	සමූහ ගොවිපල වැව	1,780,913.71	රු.දාහත්ලක්ෂ අසුදහස් නවසියදහතුනයි ශත හැත්තෑඑකයි	15
20	සියඹලාවත්ත වැව	2,455,200.00	රු.විසිහතරලක්ෂ පනස්පන්දහස් දෙසියයයි	48
21	රඹවල වැව	491,737.00	රු.හාරලක්ෂ අතුඑක්දහස් හත්සියනිස්හතයි.	43
22	ගල්වඩුවාව වැව	1,104,534.46	රු.එකොළොස්ලක්ෂ හාරදහස් පන්සියනිස්හතරයි ශත හතළිස්හයයි	12
23	කඩදෙක වැව	1,995,681.30	රු.දහනවලක්ෂ අතුපන්දහස් හයසියඅසුළුකයි ශත තිහයි	31
24	දඹුබැඳිරුප්ප මහවැව	492,949.07	රු.හාරලක්ෂ අතුදෙදහස් නවසියහතළිස්නවයයි ශතහතයි	64
25	ඉහළ අලුත් වැව	687,063.00	රු.හයලක්ෂ අසූ හත්දහස් හැටතුනයි	48 රුඩ 3
26	ගලගම්මැද්ද වැව	649,908.98	රු.හයලක්ෂ හතළිස්නවදහස් නවසියඅටයි ශත අනූඅටයි	60
27	බඹරගස්වැව පහළ වැව	1,482,594.20	රු.දාහතරලක්ෂ අසුදෙදහස් පන්සියඅනූහතරයි ශත විස්සයි	95
28	බඹරගස්වැව කුඩා වැව	1,374,568.00	රු.දහතුන්ලක්ෂ හැත්තෑහතරදහස් පන්සියඅටයි ශත පනහයි	32
29	මොරගොල්ල අලුත වැව	843,615.50	රු.අටලක්ෂ හතළිස්තුන්දහස් හයසියපහළොවයි ශත පනහයි	14රුඩ 2

(ii)

අනු අංකය	වැවේ නම	ගොවිජන සේවා මධ්‍යස්ථානයේනම	ග්‍රාම නිළධාරි වසම	කොන්ත්‍රාත්තුව ලබා ගත් ගොවි සංවිධානයේ නම
1	බම්බාව වැව (පන්සලේවැව)	ගලේවෙල	බම්බාව	පුබුදු
2	පිස්සිගේ වැව	දේවහුව	පහළදිග්ගල	රන්තරු
3	ග්‍රමදාන වැව	ගලේවෙල	බඹරගස්වැව	අලුත්වැව
4	පාළු සියඹලා වැව	ගලේවෙල	දඹුණුමුල්ල	දුටුගැමුණු
5	කලහකැලේ වැව	ගලේවෙල	ගලේවෙල	රන්කෙත
6	රාලලෑ රොටවැව	ගලේවෙල	බඹරගස්වැව	මහසෙන් ii
7	පහළ වැව	ගලේවෙල	පහළවැව	අලුත්වැව
8	ගමේ වැව	ගලේවෙල	බඹරගස්වැව	ඒකාබද්ධ
9	සිංහාර වැව	ගලේවෙල	දඹුයාය	පරකුම්
10	උඩවැව	ගලේවෙල	දඹගොල්ල	එක්සත්
11	රත්මලගාව වැව	ගලේවෙල	නිලගම	නිසර
12	කිරිමැටියාව වැව	ගලේවෙල	මොරගහමඩ	ඒකාබද්ධ
13	මානහිඳ ඉහල වැව	ගලේවෙල	නිලගම	නිසර
14	අඹන්පොල වැව	ගලේවෙල	කොස්ගහහින්න	ගැමුණු
15	සිඟන්කුටිගම වැව	ගලේවෙල	යටිගල්පොත්ත	දිලෙනතරු
16	බූ වැව	වාසලකෝට්ටේ	මහවැහැර	මහවැහැර
17	වැගොඩපොල වැව	වාසලකෝට්ටේ	වැගොඩපොල	පරාකුම්
18	දමන අලුත් වැව	දේවහුව	පහළදිග්ගල	සුභදපැරකුම්
19	සමූහ ගොවිපල වැව	දේවහුව	බෙලියකන්ද	බෙලියකන්ද
20	සියඹලාවත්ත වැව	දේවහුව	පහළදිග්ගල	සියඹලාවත්තඅංක 01
21	රඹවල වැව	දේවහුව	මකුළුගස්වැව	රන්තරු
22	ගල්වඩුවාව වැව	දේවහුව	මකුළුගස්වැව	රන්තරු
23	කඩදෙක වැව	දේවහුව	මකුළුගස්වැව	රන්තරු
24	දඹුබැඳිරුප්පමහ වැව	දේවහුව	දඹුබැඳිරුප්ප	දඹුබැඳිරුප්ප
25	ඉහළ අලුත් වැව	ගලේවෙල	ආදාගල	ආදාගල
26	ගලගම්මැද්ද වැව	ගලේවෙල	අලුත්වැව	අලුත්වැව
27	බඹරගස්වැව පහළ වැව	ගලේවෙල	බඹරගස්වැව	නවගොඩ.සංවි.
28	බඹරගස්වැව කුඩා වැව	ගලේවෙල	බඹරගස්වැව	නවගොඩ.සංවි.
29	මොරගොල්ල අලුත වැව	ගලේවෙල	අලුත්වැව	මහසෙන්

(iii)

අනු අංකය	වැවේ නම	ග්‍රාමනි ළධාරි වසම	කොන්ත්‍රාත්තුව ලබාගත් ගොවි සංවිධානයේ නම	එක් එක් කොන්ත්‍රාත්තුවෙන් ගොවි සංවිධානයට ලැබුණු ලාභය	
				(රුපියල්)	මුදල අකුරෙන්
1	බම්බාව වැව (පන්සලේවැව)	බම්බාව	පුබුදු	18990.80	දහඅටදහස් නමසිය අනූවයි ශත අසුවයි.
2	පිස්සිගේ වැව	පහළදිග්ගල	රන්තරු	98926.00	අනූ අටදහස් නමසිය විසි හයයි.
3	ග්‍රමදාන වැව	බඹරගස්වැව	අලුත්වැව	74266.00	හැත්තෑ හතර දහස් දෙසිය විසිහයයි
4	පාළුසියඹලා වැව	දඹුණුමුල්ල	දුටුගැමුණු	109285.27	එක්ලක්ෂ නවදහස් දෙසිය අසූ පහයි ශත විසි හතයි.
5	කලහකැලේ වැව	ගලේවෙල	රන්කෙත	16889.47	දහසය දහස් අටසිය අසූ නමයයි ශත හතලිස් හතයි.
6	රාලලෑ රොට වැව	බඹරගස්වැව	මහසෙන් ii	15093.00	පහලොස්දහස් අනූතුනයි
7	පහළ වැව	පහළවැව	අලුත්වැව	84291.00	අසූහතර දහස් දෙසිය අනූ එකයි.
8	ගමේ වැව	බඹරගස්වැව	ඒකාබද්ධ	108010.00	එක් ලක්ෂ අටදහස් දහයයි.
9	සිංහාර වැව	දඹුයාය	පැරකුම්	84650.00	අසූහතර දහස් හයසිය පනහයි.
10	උඩ වැව	දඹගොල්ල	එක්සත්	22500.00	විසිදෙදහස් පන්සීයයි.
11	රත්මලගාව වැව	නිලගම	නිසර	125000.00	එක්ලක්ෂ විසිපන්දහයි
12	කිරිමැටියාව වැව	මොරගහමඩ	ඒකාබද්ධ	67418.00	හැටහත්දහස් හාරසිය දහඅටයි.
13	මානහිඳ ඉහල වැව	නිලගම	නිසර	59400.00	පනස් නම්දහස් හාරසියයි.
14	අඹන්පොල වැව	කොස්ගහහින්න	ගැමුණු	103422.00	එක්ලක්ෂ තුන්දහස් හාරසිය විසිදෙකයි
15	සිඟන්කුටිගම වැව	යටිගල්පොත්ත	දිලෙනතරු	52500.00	පනස්දෙදහස් පන්සීයක්
16	බූ වැව	මහවැහැර	මහවැහැර	35435.00	තිස්පන්දහස් හාරසිය තිස්පහයි.
17	වැගොඩපොල වැව	වැගොඩපොල	පරාකුම	15930.00	පහලොස්දහස් නමසිය තිහයි.
18	දමනඅලුත් වැව	පහළදිග්ගල	සුභදපැරකුම්	3010.72	තුන්දහස් සහයයි ශත හැත්තෑ දෙකයි
19	සමූහගොවිපල වැව	බෙලියකන්ද	බෙලියකන්ද	37000.00	තිස්හත්දාහකි.
20	සියඹලාවත්ත වැව	පහළදිග්ගල	සියඹලාවත්තඅංක 01	94280.00	අනූහතරදහස් දෙසිය අසූවයි.
21	රඹවල වැව	මකුළුගස්වැව	රන්තරු	24586.00	විසිහරදහස් පන්සිය අසූහයයි.
22	ගල්වඩුවාව වැව	මකුළුගස්වැව	රන්තරු	55226.00	පනස්පන්දහස් දෙසිය විසිහයයි.
23	කඩදෙක වැව	මකුළුගස්වැව	රන්තරු	87192.00	අසූහත්දහස් එකසිය අනූ දෙකයි.
24	දඹුබැඳිරුප්ප මහ වැව	දඹුබැඳිරුප්ප	දඹුබැඳිරුප්ප	12800.00	දොළොස්දහස් අටසියයි.
25	ඉහළ අලුත් වැව	ආදාගල	ආදාගල	31500.00	තිස් එක්දහස් පන්සීයයි.
26	ගලගම්මැද්ද වැව	අලුත්වැව	අලුත්වැව	2434.00	දෙදහස් හාරසිය තිස් හතරයි.
27	බඹරගස්වැව පහළ වැව	බඹරගස්වැව	නවගොඩ.සංවි.	112378.60	එක්ලක්ෂ දොළොස්දහස් තුන්සිය හැත්තෑ අටයි ශත හැටයි.
28	බඹරගස්වැව කුඩා වැව	බඹරගස්වැව	නවගොඩ.සංවි.		
29	මොරගොල්ල අලුතවැව	අලුත්වැව	මහසෙන්	42000.00	හතලිස් දෙදහයි.
				1594413.86	**පහලොස්ලක්ෂ අනූහතර දහස් හාරසිය දහතුනයි ශත අසූහයයි.**

(iv) ඔව්. ඉහත වගුවේ අවසාන තීරුවෙන් එක් එක් කර්මාන්තයට අදාළව එක් එක් කොන්ත්‍රාත්තුවෙන් ගොවි සංවිධාන වෙත ලැබුණු ලාභය ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දක්වා ඇත.

(ආ) (i) ලබා දී නොමැත.

(ii) නැත.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

යුද්ධයෙන් පීඩාවට පත් වූ හිටපු බෙදුම්වාදී සංවිධාන සාමාජිකයන්ට වන්දි
யுத்தத்தினால் பாதிக்கப்பட்ட முன்னாள் பிரிவினைவாத இயக்க உறுப்பினர்களுக்கான நட்டஈடு
COMPENSATION FOR FORMER MEMBERS OF SEPARATIST MOVEMENTS AFFECTED BY WAR

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த யுத்த காலத்தில் கடுமையாகப் பாதிக்கப்பட்டவர்களுக்கெனப் புனர்வாழ்வு அதிகாரசபையினால் நட்டஈடுகள் வழங்கப்பட்டு வரும் நிலையில், முன்னாள் இயக்க உறுப்பினர்களுக்கும் இந்த வாய்ப்பு கிட்டியிருந்தும், புனர்வாழ்வு அதிகாரசபையின் சில நிபந்தனைகள் காரணமாக முன்னாள் இயக்க உறுப்பினர் களால் மேற்படி நட்டஈடுகளைப் பெற இயலாதுள்ளதாகத் தெரிய வருகின்றது. குறிப்பாக அப்பாதிப்புக்களுக்கான சிகிச்சைகளைப் பெற்ற மருத்துவச் சான்றிதழ்கள் பாதிக்கப் பட்டவர்களிடம் கோரப்படுவதாகத் தெரிய வருகின்றது.

யுத்தம் இடம்பெற்றிருந்த காலப்பகுதியில் கடுமையாகப் பாதிக்கப்பட்டிருந்த முன்னாள் இயக்க உறுப்பினர்கள் அப்போது அந்தந்தப் பகுதிகளில் இயங்கியிருந்த மற்றும் புலிகள் இயக்கத்தினரால் செயற்படுத்தப்பட்டிருந்த மருத்துவ நிலையங்களிலேயே சிகிச்சை பெறவேண்டிய நிலையிருந்தது. அந்தக் காலகட்டங்களில் முறையான பதிவுகள் மற்றும் நோயாளி அட்டைகளைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்புகள் இருக்கவில்லை என்றும் பாதிக்கப்பட்டவர்களது காயப்பட்ட தழும்புகளைத் தவிர அவர்கள் சிகிச்சை பெற்றதற்கான வேறு ஆதாரங்கள் எதுவும் இல்லை என்றும் தற்போது அரச மருத்துவமனைகளில் மருத்துவச் சான்றிதழ்களைப் பெற இயலாதுள்ளது என்றும் மேற்படி முன்னாள் இயக்க உறுப்பினர்கள் தெரிவிக்கின்றனர்.

கடுமையாகப் பாதிக்கப்பட்டுள்ள முன்னாள் இயக்க உறுப்பினர்கள் இன்று தொழில்வாய்ப்புகள் இன்றியும் போதிய வாழ்வாதார வசதிகள் இன்றியும் தொடர்ந்தும் துயரமான வாழ்க்கையினையே மேற்கொண்டு வருகின்றனர். இத்தகைய நிலையில், இவர்களுக்கான நட்டஈடுகள் கிடைப்பின், அது இவர்களுக்குப் பெரும் உதவியாக அமையும் என்பது குறிப்பிடத்தக்கது.

எனவே, புனர்வாழ்வு அதிகாரசபையினால் கடந்த யுத்த காலகட்டத்தில் கடுமையாகப் பாதிக்கப்பட்டவர்களுக்கு வழங்கப்படுகின்ற நட்டஈடுகளை முன்னாள் இயக்க உறுப்பினர்களும் பெறுவதற்கு, இந்த மருத்துவச் சான்றிதழ் தொடர்பில் இலகுவான மாற்று ஏற்பாடுகளை முன்னெடுக்க முடியுமா?

எனது மேற்படி கேள்விக்கான பதிலையும் எடுக்கப்படக் கூடிய நடவடிக்கைகள் தொடர்பிலான விளக்கத்தையும் கௌரவ அமைச்சர் டி.எம். சுவாமிநாதன் அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் முக்கியமான ஒரு கேள்வியைக் கேட்டிருக்கின்றீர்கள். ஆனால், 1990.01.26ஆம் திகதிய 59811ஆம் இலக்கப் பத்திரத்தின்படி, அவர்களுக்கு நட்டஈடு கொடுப்பது தடைசெய்யப்பட்டிருக்கின்றது.

They say that terrorists cannot be paid compensation. எனவே, இவர்களுக்கும் நட்டஈடு கொடுக்கவேண்டும் என்ற Cabinet பத்திரமொன்றை 2016ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் நான் தாக்கல் செய்தேன். ஆனால், அது நிராகரிக்கப்பட்டுவிட்டது. ஆகையினால், இன்று அவர்களுக்கு நட்டஈடு கொடுப்பதற்கு என்னுடைய கைகளில் எதுவுமில்லை. வேண்டுமென்றால், அது சம்பந்தமான இன்னோர் அமைச்சரவைப் பத்திரத்தை நான் சமர்ப்பிக்கலாம். இது தொடர்பில் தயவுசெய்து மேதகு ஜனாதிபதி அவர்களிடமும் கௌரவ Prime Minister அவர்களிடமும் நீங்கள் கோரிக்கை விடுவது நல்லது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ அமைச்சர் அவர்களே! உங்களுடைய முயற்சிகளுக்கு நன்றி! குறித்த ஆவணங்களை என்னிடம் தந்தால், அது தொடர்பில் மேதகு ஜனாதிபதி அவர்களிடமும் கௌரவ பிரதம மந்திரி அவர்களிடமும் நான் கதைக்க முடியும்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

நான் 2016ஆம் ஆண்டு தாக்கல் செய்த Cabinet பத்திரத்தின் பிரதியை உங்களுக்குத் தருகின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම හොඳයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, කුප්‍රකට බැඳුම්කර හොරකම පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කොමිෂන් සභාව විසින් නිකුත් කළ වාර්තාව පදනම් කර ගෙන මේ පාර්ලිමේන්තුවේ මීට පෙර විවාදයක් තිබුණා. නමුත් එක්තරා මන්ත්‍රීවරයෙකුගේ කරුණු ඉදිරිපත් කිරීමක් මත, භාෂා ත්‍රිත්වයෙන්ම එම වාර්තා ලැබී නැහැ කියන පදනමින් භාෂා ත්‍රිත්වයෙන්ම එම වාර්තා ලැබෙනතුරු එකී විවාදය කල් දැම්මා, ඔබතුමාගේ නියෝගය පරිදි.

ගරු කථානායකතුමනි, භාෂා ත්‍රිත්වයෙන්ම එම කොමිෂන් සභා වාර්තා ලබා ගෙන එම විවාදය පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ඔබතුමා අරගෙන තිබෙනවාද, ඒ සම්බන්ධව පවතින තත්ත්වය මොකක්ද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කරුණ ගැන පසුගිය සඳුදාත් පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කළා. ඊයේ හැන්දෑවේ මට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලැබුණා, එම කාර්යයට මාසයක පමණ කාලයක් ගත වෙනවා කියලා. මොකද, translate කරන්න පිටු දහස් ගණනක් තිබෙන නිසා. එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හිරවෙලා තිබෙන්නේ. ලබන සිකුරාදා ඒ සම්බන්ධ විවාදය කරන්න අපි දැනටත් list කරලා තිබෙන්නේ. නමුත් එම වාර්තාව පරිවර්තනය කිරීමේ කටයුතු ප්‍රමාද නිසා, මේ බ්‍රහස්පතින්දා ඒ ගැන නැවතත් සාකච්ඡා කර විවාදය කල් දමන්න වෙයි. ඔබතුමා සඳහන් කළ ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් වුණේ එම වාර්තාව සිංහල භාෂාවෙන් පමණක් තිබීමයි. ඉංග්‍රීසි භාෂාවෙන් තිබුණා නම්, එය සාකච්ඡාවට ගැනීමට පක්ෂ නායකයන් සියලු දෙනා එකඟ වෙලා තිබුණා. නමුත් එය සිංහල භාෂාවෙන් පමණක් තිබුණු නිසා එතුමා මතු කළ විරෝධය ගැන පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කර විවාදය කල් දැමීමේ තීරණය ඒකමතිකව ගත්තා. ඒක මගේ තීරණයක් පමණක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, එම වාර්තාව භාෂා ත්‍රිත්වයෙන්ම ලැබීම වඩා වටිනා බව අපි පිළිගන්නවා. නමුත් කොමිෂන් සභා වාර්තා දෙකක් ආවානේ. ඒ දෙකෙන් එකයි සිංහල භාෂාවෙන් පමණක් තිබෙන්නේ. අනෙක් එක, ඒ කියන්නේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව එවා තිබෙන කොමිෂන් සභා වාර්තාවේ ඉංග්‍රීසි පිටපතක් දීලා තිබෙනවා. ඒ නිසා අර සිංහල භාෂාවෙන් පමණක් ලබා දී තිබෙන වාර්තාවේ ඉංග්‍රීසි හෝ දෙමළ පිටපතක් එනතෙක්, බැඳුම්කර හොරකම ගැන ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දී තිබෙන කොමිෂන් සභාවේ වාර්තාව අපට විවාදයට ගන්න පුළුවන් නේ. අනෙක් වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් හෝ දෙමළ භාෂාවෙන් ලබා දුන් පසුව, දෙවනුව විවාදයට ගන්න පුළුවන් නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ නායක රැස්වීමේදී තීරණය කළේ, එම වාර්තා දෙකම එකවර විවාදයට ගන්නා එක වඩා හොඳ බවයි. එම තීරණය ගැන තමයි මම කිව්වේ. අපි නැවත රැස්වූ විට මම ඔබතුමාගේ කරුණ ඉදිරිපත් කරන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

හොඳමයි, ගරු කථානායකතුමනි. පක්ෂ නායක රැස්වීමේදී ගන්නා තීරණය මොකක්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, කොමිෂන් සභා වාර්තාවක් ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දීලා තිබෙනවා. ඒක විවාදයට ගන්න පුළුවන්. එය, ඕනෑම පොඩි ළමයෙකුට වුණත් තේරෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාර්තා දෙකම එක දවසකදී විවාදයට ගැනීම සුදුසු බව තමයි බහුතර මතය වුණේ. මම ඔබතුමාගේ කාරණය ඉදිරිපත් කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය ගැනම යමක් සඳහන් කරන්න ඔබතුමාගෙන් අවසරයි.

ගරු කථානායකතුමනි, මෙම වාර්තා පරිවර්තනය කර ගැනීමේදී ඔබතුමා යැපෙන්නේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මත නම්, එයට බොහෝ දීර්ඝ කාලයක් ගත වෙයි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ධාරිතාව ගැන දන්නා නිසායි මම මේ ගැන කියන්නේ.

මේ සඳහා උපයෝගි කරගත හැකි වෙනත් පරිවර්තකයන් සොයා ගැනීම වඩාත් සුදුසුයි කියායි මා හිතන්නේ. මේ බැඳුම්කර වාර්තාව ගැන අපට කරන්න තිබෙන විවාදය වැළැක්වෙන ආකාරයට "පරිවර්තන ගැටලුව" මේ විධියට හරස් කර තිබීම ඉතාම අසාධාරණයි. විශේෂයෙන්ම අගමැතිට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් තිබෙන මේ වෙලාවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ජනාධිපති ලේකම් විසින් තමයි මේ ලිපිය එවලා තිබෙන්නේ. ඒවා මාසයක් ඇතුළත ලැබෙන්න සලස්වනවාය කියලා දන්වා තිබෙනවා. අපි බලමු.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඒ කරුණ සම්බන්ධයෙන්ම මාත් කරුණක් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, ඒ අතර බරපතළ වංචා, දූෂණ පිළිබඳ චෝදනා 34ක් සම්බන්ධ වාර්තාවත් තිබෙනවා. ඒ වාර්තාවත් ඒ විවාදයට සම්බන්ධයි. දැන් ඒ විවිදය කර ගන්නත් බැරි වෙලා තිබෙනවා. බැඳුම්කර වාර්තාව සම්බන්ධ විවාදයත් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මේ වාර්තා දෙකම ඉතාම ඉක්මනින් අවශ්‍යයි. තමුන් කරපු හොරකම් පිළිබඳව තිබෙන වාර්තාව ගැන පස්සේ කථා කරන්නයි, වෙන අය කරපු හොරකම් පිළිබඳව තිබෙන වාර්තාව ගැන කලින් කථා කරන්නයි කියන එක සාධාරණ නැහැ. අපි කියන්නේ ඒ වාර්තා දෙක ගැනම දැන්ම කථා කරන්න ඕනෑ කියලායි. ඒ නිසා ඔබතුමා, ජනාධිපති ලේකම්තුමා කියන කාරණය මතම ඉන්නේ නැතිව, පාර්ලිමේන්තුවේ සිටින කාර්ය මණ්ඩලයක් හෝ යොදවා ඒ කටයුත්ත කරන්න කියන ඉල්ලීම කරනවා.

මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, දැන් පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වෙන්නේ අලුත් ස්ථාවර නියෝග මතද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, 15වන දාට පස්සේ. අපි ඊයේත් ඒ ගැන කථා කළා; අද උදේත් කථා කළා. අපි පුළුවන්තරම් ඒ කටයුතු ඉක්මන් කරනවා.

අද දින ප්‍රධාන කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා සාකච්ඡා කිරීම.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත
நம்பிக்கைப்பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்
TRUSTS (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)

Sir, on behalf of the Minister of Justice, I move,

"That the Bill be now read a Second time."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 1.50]

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

ගරු කථානායකතුමනි, අද දින 1917 අංක 9 දරන භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා යෝජිත භාර (සංශෝධන) පනත් කෙටුම්පතට, නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීතිවලට සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවලට අනුමැතිය ලබා ගැනීමට තමයි නිබෙන්නේ.

මම මුලින්ම භාර ආඥාපනත සංශෝධනය කිරීම පිළිබඳව අදහස් දක්වන්න බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, 1989 වසරේ ජී-7 රටවල් එක් වී මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම යනාදී වශයෙන් ගෝලීය වශයෙන් පිළිගත් රාමුවරණ පිළිවෙත් කිහිපයක්ම සම්මත කරගෙන තිබෙනවා. මේ කටයුතු අපේ රට තුළ තවදුරටත් ශක්තිමත් කිරීම තමයි මෙම යෝජිත පනත් කෙටුම්පත මගින් සිද්ධ වන්නේ.

ලොව පුරා කලාපීය වශයෙන් ස්ථාපිත අධීක්ෂණ මධ්‍යස්ථාන අටක් පවතිනවා. මේ අධීක්ෂණ මධ්‍යස්ථාන අටෙන් අප අයිති වන්නේ ඕස්ට්‍රේලියාවේ පිහිටි ආසියා පැසිෆික් කණ්ඩායමටයි. මේ පනත් කෙටුම්පත යටතේ අප කරන්නට බලාපොරොත්තු වන කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. ඒ ඇගයීම් කමිටු වාර්තාවලට අනුව අපේ රට තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සංශෝධන ගැන තමයි අපි අද මෙතැන කථා කරන්නේ.

විශේෂයෙන්ම භාරකරුවන්ගේ ආරක්ෂකයන්ගේ සහ භාරයේ අර්ථලාභීන්ගේ අනන්‍යතාව සම්බන්ධයෙන් භාරකරුවන් විසින් ප්‍රමාණවත් නිරවද්‍ය සහ කාලීන තොරතුරු ලබා ගැනීම සහ පවත්වා ගෙන යෑමට මේ තුළින් භාරකරුවන්ට නියම කරනවා. ඒ වාගේම, කාලීන පදනමක් මත තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා එම තොරතුරු නිසි බලධාරීන් වෙත ලබාදීමත් මේ හරහා සිද්ධ වෙනවා. ඒ වාගේම වෘත්තීය භාරකරුවන් භාරය හා සම්බන්ධ නඩු කටයුතුවලට මැදිහත්වීමෙන් අනතුරුව අඩුම තරමින් වසර පහක කාලයක් යනතුරු මෙම තොරතුරු පවත්වා ගෙන යෑම සඳහා එවැනි වෘත්තීමය භාරකරුවන්ට නියම කිරීමක් මේ හරහා සිද්ධ වෙනවා.

තොරතුරු හුවමාරු කිරීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම සඳහා තිබෙන සමානුපාතික සහ නිවාරණ අනුමැතිය ඇතුළත් කිරීමත් මේ හරහා සිද්ධ වෙනවා. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම සම්බන්ධ අපරාධ වැළැක්වීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායට තිබෙන අවදානම මේ ඔස්සේ තවදුරටත් අඩුකිරීමට තමයි අප බලාපොරොත්තු වන්නේ. ගරු කථානායකතුමනි, ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මා මීට වැඩිය අදහස් දක්වන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි අද නීති අධ්‍යාපන ආඥා පනත යටතේ තවත් සුවිශේෂී රීති ගෙනැවිත් තිබෙනවා. දැනට විදුහල්පතිවරයෙක් යටතේ තමයි ශ්‍රී ලංකා නීති විද්‍යාලය පාලනය වන්නේ. දිනෙන් දින නීති විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යෑම වාගේම, අනෙකුත් කරුණු කාරණා සංකීර්ණවීමත් සමඟම පරිපාලනමය වශයෙන් විශාල ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා විදුහල්පතිවරයා වෙත පැවරිලා තිබෙන වැඩ කොටස අඩු කර ගැනීම, පරිපාලන කටයුතු අඛණ්ඩව සහතික කිරීම වාගේම, නීති විද්‍යාලයේ දෙවන පාලන අධිකාරියක් සිටිය යුතුයි කියන අදහස මත අපි නියෝජ්‍ය විදුහල්පති තනතුරක් ඇති කිරීමට තීන්දු කළා.

ගරු කථානායකතුමනි, නීති අධ්‍යාපන සභාව විසින් යෝජනා කරලා තිබෙන මේ රීති අනුමත කර ගැනීම සඳහාත් මෙම උත්තරීතර සභාවේ අනුමැතිය අපි බලාපොරොත්තු වනවා.

මම හිතන හැටියට කාලීන අවශ්‍යතා මත බොහොම වැදගත් කාරණා කීපයක් සම්මත කර ගැනීමට තමයි අද බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, අධිකරණ විෂය හා සම්බන්ධ තවත් කාරණයක් ගැන මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේ දන්නවා, පසුගිය කාලයේ නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත් විවිධ අදහස් හා මතවාද තිබුණා. විශේෂයෙන්ම අපි නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින නීතිඥවරුන්ගේ පඩි වැඩි කිරීම ඇතුළු සියලු දේවල් කෙරෙහි අවධානය යොමු කරලා, ඒ කටයුතු කාර්යක්ෂමව ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ යටතේ මේ වසරේ අලුතෙන් රජයේ නීතිඥවරු 100ක්වත් බඳවාගෙන මේ වැඩ කටයුතු බොහොම ඉක්මනින් අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ කාරණයත් මතක් කරමින්, අද ඉදිරිපත් කර තිබෙන මේ පනතට, නියෝගවලට සහ රීතිවලට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලමින් මාගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have 21 minutes.

[பி.ப. 1.56]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ல்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ சபாநாயகர் அவர்களே, நீதியமைச்சின்கீழ் வரும் விடயங்கள் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்து கொண்டு பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். "இலங்கையில் நடைமுறையில் இருக்கின்ற பயங்கரவாதத் தடைச் சட்டத்தை அகற்றி, சர்வதேச சட்டதிட்டங்களுக்கு அமைவாக ஒரு சட்டத்தை அமுல்படுத்துவோம்" என்று 2015ஆம் ஆண்டு ஐ.நா. மனித உரிமைகள் பேரவையில் இந்த அரசாங்கம் உறுதியளித்தபோதிலும், நீதித்துறையை நெறிப்படுத்துகின்ற நோக்கில் இந்த நாட்டிலுள்ள சட்டங்களில் திருத்தங்களைக் கொண்டுவருகின்ற நீதி அமைச்சு, இந்தப் பயங்கரவாதத் தடைச்சட்டத்தை ஏன் இன்னமும் நீக்கவில்லை? அதாவது, தற்பொழுது அமுலில் இருக்கின்ற பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கி, சர்வதேச மனித உரிமைகளை மதித்து நடக்கின்ற வகையில் ஒரு சட்டத்தை இயற்றாமல், நீதியமைச்சு அதனைக் காலதாமதப்படுத்துவது ஏன்? என்று நான் கேட்க விரும்புகின்றேன். இந்த அரசாங்கம் 2015ஆம் ஆண்டு உறுதியளித்தவாறு அந்தச் சட்டத்தை இன்னமும் நீக்காமல் இருப்பதனால், அந்தச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்ட இளைஞர்கள் மிகப்பெரிய துன்பத்தை அனுபவித்துக்கொண்டிருக்கிறார்கள்.

2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் ஐ.நா. மனித உரிமைகள் பேரவையில் நிறைவேற்றப்பட்ட தீர்மானத்தின் படி, இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்பட வேண்டும். ஆனால், அந்தச் சட்டத்தை நீக்குவதில் இவ்வளவு காலமும் இந்த அரசாங்கமும் நீதி அமைச்சும் ஓர் அசமந்தப் போக்கைக் கடைப்பிடித்து வருவது ஏன்? இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தின் விளைவாக எங்களுடைய பல இளைஞர், யுவதிகள் இன்றும் சிறையில் வாடிக்கொண்டிருக்கின்றார்கள். இந்தச் சட்டம் பிழையானது என்பதை இந்த அரசாங்கம் ஒத்துக்கொண்டபோதிலும் அந்தச் சட்டத்தின் அடிப்படையில் எங்களுடைய இளைஞர், யுவதிகளை நீதிமன்றங்களின்மூலம் இன்றும் ஏன், தண்டித்துக் கொண்டிருக்கின்றது? ஆகவே, நடைமுறையிலிருக்கின்ற பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்காமல் இருப்பது ஏன்? என்றும் அதனை எப்போது நீக்குவீர்கள்? என்றும் அரசாங்கத்திடமும் நீதியமைச்சிடமும் நான் கேட்க விரும்புகின்றேன்.

இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தின் விளைவாக 2008ஆம் ஆண்டு கைது செய்யப்பட்ட சச்சிதானந்தம் ஆனந்தசுதாகரன் என்ற இளைஞன் ஆயுட்தண்டனை விதிக்கப்பட்ட நிலையில் இன்று சிறையிலிருக்கின்றார். அவருக்கு 09, 10 வயதுகளையுடைய இரண்டு பிள்ளைகள் இருக்கின்றார்கள். அவர்களின் தாயார் அதாவது, சுதாகரனுடைய மனைவி கடந்த 15ஆம் திகதி இவ்வுலகைவிட்டுச் சென்றுவிட்டார். இன்று அவருடைய இரண்டு பிள்ளைகளையும் யார் பராமரிப்பது? இந்தப் பயங்கரவாதத் தடைச்சட்டத்தின் விளைவாக ஆயுட்தண்டனை அனுபவிக்கின்ற சுதாகரன் கைது செய்யப்பட்டதன் பின்பு மன அழுத்தத்தினால் சுகவீனமுற்ற அவருடைய மனைவி கடந்த 15ஆம் திகதி இறந்தார். இறுதிச் சடங்கு கடந்த 18ஆம் திகதி கிளிநொச்சியில் நடைபெற்றது. அதில் கலந்து கொள்வதற்காகச் சுதாகரன் அழைத்துவரப்பட்டார். அவருக்கு 3 மணித்தியாலங்கள் மட்டுமே அவகாசம் வழங்கப்பட்டிருந்தது. அந்த நிகழ்வின்போது தாயுடைய சடலம் மயானத்திற்கு எடுத்துச் செல்லப்படுகையில், அவருடைய மகள் தன்னுடைய தகப்பனுடன் சிறைக்குச் செல்ல ஆயத்தமாகியிருக்கின்றார். அதாவது அந்தப் 10 வயதுப் பாலகி தனது தகப்பனுடன் சிறைக்குச் செல்லத் துணிந்த சம்பவம் இரண்டு தினங்களுக்கு முன்பு கிளிநொச்சியில் நடைபெற்றது. ஆகவே, அந்தப் பிள்ளைகளுடைய கல்வி முன்னேற்றம் மற்றும் எதிர்காலத்தைக் கருத்திற்கொண்டு சிறைச்சாலையிலிருக்கின்ற சச்சிதானந்தம் ஆனந்தசுதாகரன் என்ற அந்தக் கைதிக்கு இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் பொதுமன்னிப்பு வழங்க வேண்டுமென்று அனைத்துத் தமிழ் மக்கள் சார்பாகவும் கேட்டுக்கொள்கின்றேன்.

மேதகு ஜனாதிபதி அவர்கள் நிகழ்ச்சிகளில் கலந்து கொள்கின்றபோது அங்குள்ள சிறுவர்களை அரவணைத்து, அவர்களை மகிழ்விப்பதை வழக்கமாகக் கொண்டவர். அந்த வகையில் ஜனாதிபதி அவர்கள் நிகழ்வுகளில் கலந்து கொள்கின்றபோது அங்கிருக்கின்ற சிறுவர்களை மகிழ்வித்து, அவர்களுடைய நலனில் அக்கறை கொள்கின்ற விடயம் பற்றிய செய்திகளைப் பத்திரிகைகள் மூலமும் தொலைக்காட்சி மூலமும் நாங்கள் அறிந்திருக்கின்றோம். அப்படிச் சிறுவர்களின் நலனில் அக்கறை காண்பித்துக் கொண்டிருக்கின்ற இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள், கிளிநொச்சியிலிருக்கின்ற அந்த இரண்டு பாலகரினது எதிர்காலத்தைக் கருத்திற்கொண்டு அவர்கள் விடயத்திலும் அக்கறை காட்ட வேண்டுமென்று இந்த சபையினூடாகக் கோரிக்கை விடுக்கின்றேன். ஏனென்றால், இன்று அந்தப் பாலகரின் எதிர்காலம் கேள்விக்குறி யாகியுள்ளது. தற்போது அவர்களது தாய் இறந்துவிட்டார்; பயங்கரவாதத் தடைச் சட்டத்தின் அடிப்படையில் வழங்கப்பட்ட தீர்ப்பின் பிரகாரம் தகப்பன் வாழ்நாள் முழுவதும் சிறையிலிருக்கின்ற ஆயுள் கைதியாக இருக்கின்றார். இதனால் அந்தப் பாலகருடைய கல்வி முன்னேற்றம் மற்றும் எதிர்காலம் பாதிக்கப்பட்டுள்ளது. அப்படியான சூழ்நிலையில் அவர்களுக்குள்ள மன அழுத்தத்தைப் போக்குவதற்கு ஒரேயொரு வழிதான் இருக்கிறது. அதாவது, சச்சிதானந்தம் ஆனந்தசுதாகரன் என்ற கைதிக்கு இந்த நாட்டினுடைய ஜனாதிபதி அவர்கள் பொது மன்னிப்பு அளித்தால் மட்டுமே, அந்த இரு பாலகரும் இந்த நாட்டில் இருக்கின்ற ஏனைய பாலகர்போல - சிறுவர்கள்போல வாழக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படும்.

நீதி அமைச்சர் தீர்மானிப்பதன்மூலம், சம்பந்தப்பட்ட ஆலோசகர்கள் தீர்மானிப்பதன்மூலம், சட்டமா அதிபர் தீர்மானிப்பதன்மூலம் இரண்டு - மூன்று மாத காலப் பகுதியிலேயே சம்பந்தப்பட்ட சட்டங்களில் திருத்தங்கள் கொண்டுவரப்படுகின்றன. ஆனால், 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் பயங்கரவாதத் தடைச் சட்டத்தை மாற்றியமைப்பதாகச் சொன்ன இந்த அரசாங்கம், இன்றுவரை அது சம்பந்தமாக எந்த விதமான கரிசனையும் காட்டியதாகத் தெரியவில்லை. ஆகவே, ஐ.நா. மனித உரிமைகள் பேரவைக் கூட்டம் நடைபெற்றுக் கொண்டிருக்கின்ற இந்தவேளையிலாவது பயங்கரவாதத் தடைச் சட்டம் எப்போது நீக்கப்படும் என்பதை நீதி அமைச்சானது, இந்தச் சபைக்கும் இந்த நாட்டு மக்களுக்கும் தயவுசெய்து தெளிவுபடுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இன்று கிளிநொச்சியில் இருக்கின்ற அந்த இரண்டு பாலகருடைய எதிர்கால வாழ்க்கைக்காக சச்சிதானந்தம் ஆனந்தசுதாகரன் என்ற ஆயுள் தண்டனைக் கைதியின் விடுதலையை இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் கவனத்திலெடுத்து, அவருக்கு மன்னிப்பு அளித்து விடுதலை

செய்யவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். கிளிநொச்சி மக்கள் அந்தப் பாலகருடைய எதிர்கால வாழ்க்கை கருதி, அந்தக் கைதியைக் கருணை அடிப்படையில் விடுதலை செய்யவேண்டுமென்று கோரி ஜனாதிபதி அவர்களிடம் ஒரு மனுவைக் கொடுப்பதற்காக இன்று கையெழுத்துக்களைப் பெற்றுக்கொண்டிருக்கின்றார்கள். இந்தக் கையெழுத்துப் பெறப்பட்டதன் பின்பு அவ்விரு பாலகரும் ஜனாதிபதி அவர்களைச் சந்திப்பதற்கு நீதி அமைச்சு ஒழுங்குசெய்து தரவேண்டும். அந்தக் கோரிக்கையை இந்த நாட்டினுடைய ஜனாதிபதி அவர்கள் நிறைவேற்றித் தன்னுடைய நல்லெண்ணத்தை வெளிப்படுத்த வேண்டும். அதாவது, தான் போலியாகச் சிறுவர்களை அணுகவில்லை என்பதையும் சிறுவர்களின் நலனில் உண்மையிலேயே அக்கறையுள்ள ஜனாதிபதி என்பதையும் நிரூபிப்பதாக இருந்தால், அந்தக் கைதியை விடுதலை செய்யவேண்டுமென்று கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 2.06]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)

The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

ගරු කථානායකතුමනි, ගරු අධිකරණ අමාත්‍යතුමිය මේ වෙලාවේ ඉදිරිපත් කර තිබෙන්නේ භාර පනතට, අධිකරණ සංවිධාන පනතට අදාළ, නීති විද්‍යාලයට අදාළ නීති කිහිපයක් සහ රෙගුලාසි කිහිපයක් අනුමත කර ගැනීම සඳහා වූ යෝජනාවක්.

විශේෂයෙන්ම භාර (සංශෝධන) පනත් කෙටුම්පත කළු සල්ලි ජාවාරම් මැඩලීමට, ඒ වාගේම මුදල් විශුද්ධිකරණය මැඩලීමට ගෙනෙන එකක්. ඒ වාගේම අද අපි අධිකරණ සංවිධාන පනත පිළිබඳව කථා කරනවා. එම නිසා මා මේ වෙලාව ප්‍රයෝජනයට ගන්න කැමැතියි, ඉතාම හදිසි, ජාතික වැදගත්කමක් ඇති, අධිකරණයට අදාළ කටයුත්තක් පිළිබඳව අවධානය යොමු කරන්න. මුදල් විශුද්ධිකරණය ගත්තත්, කළු සල්ලි ජාවාරම ගත්තත්, ඒවා වැටෙන්නේ බරපතළ මූල්‍ය අපරාධ ගණයටයි. අද මේ රටේ තිබෙන දැවැන්ත ජාතික අවශ්‍යතාව මොකක්ද? ගරු කථානායකතුමනි, මේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ ඉතාම බරපතළ ගණයේ -අති දැවන්ත- මූල්‍ය අපරාධ, දූෂණ, වංචා, කොල්ලකෑම් රාශියක් සිදු වෙලා තිබෙනවා. මීට සති කිහිපයකට කලින් මේ අපේ මන්ත්‍රීවරුන්ගේ මේස මතට ලොකු පොත් දෙකක් ලබා දුන්නා. එකක් තමයි අර බැදුම්කර චෝදනාව පිළිබඳ ජනාධිපති විමර්ශන වාර්තාව. ඒක අති දැවැන්ත වාර්තාවක්. ඒ වාගේම ඊට නොදෙවෙනි, පසුගිය රජය කාලයේ සිදු වුණු තවත් බරපතළ මූල්‍ය අපරාධ සහ අපරාධ වංචා පිළිබඳව තවත් විමර්ශන වාර්තා, සිද්ධි 37කට වැඩි ප්‍රමාණයකට අදාළ වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. මේවා සුළුපටු අපරාධ -පොඩි දේවල්- නොවෙයි. සමහර දේවල් මේ ලංකා ඉතිහාසයේ විතරක් නොවෙයි, ලෝක ඉතිහාසයේවත් සිදු වෙලා නැති දේවල් කියලා අපට කියන්න පුළුවන්. ඒ වාගේ මේ රට හෙල්ලුම් කාපු බරපතළ දූෂණ, වංචා, මූල්‍ය අපරාධ ගොන්නක් මේ රටේ සිදු වෙලා තිබෙනවා.

මේවා කරලා තිබෙන්නේ කවුද? ගරු කථානායකතුමනි, මේ වාර්තා කියවා ගෙන යනකොට දැඩි පිළිකුලක් ඇති වෙනවා. ඇත්තෙන්ම කිව්වොත් බඩ දහලනවා. මේවා කරලා තිබෙන්නේ සුදෝ සුදු ජාතික ඇඳුම ඇඳගෙන, දේශප්‍රේමය ගැන කථා කරමින්, මහා වීරත්වයන් ගැන කථා කරමින් ඉන්න වීරයෝ කියා ගන්නා වූ පිරිසක්. තව පිරිසක් ටයි-කෝට් ඇඳගෙන ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය, අරවා මේවා ගැන කථා කරන, මහත්වරු වාගේ ඉන්න පිරිසක්. ඒ පිරිස -දේශපාලනඥයින්, නිලධාරීන් ඇතුළු සියලුදෙනා -මාෆියාවක් හැටියට සම්බන්ධ වෙලා බොහොම වංකව එකිනෙකාට සහයෝගයෙන් තමයි මේවා කරලා තිබෙන්නේ. මේ පිළිකුල් සහගත චර්යාවෙන් මේ රට සහමුලින්ම මිදුණේ නැත්නම් මේ රටට අහලක් ඉදිරියට යන්න බැහැ. මේ දේශපාලන දූෂණයෙන් රට ගලවා ගත්තේ නැත්නම් අඩියක්වත් ඉදිරියට යන්න බැහැ. එම නිසා අද මේ රටට පිළිලයක්, පිළිකාවක් වෙලා තිබෙන මේ මහා පරිමාණ මූල්‍ය අපරාධ, වංචා, දූෂණ, වැළැක්වීමට මහා පරිමාණ ජාතික මැදිහත්වීමක් අවශ්‍ය වෙලා තිබෙනවා. මම කියාපු ඔය පිරිස ඒක රාශි වෙලා මේ කොල්ල කෑලා තිබෙන්නේ මොකක්ද? අවුරුදු ගණනාවක් තිස්සේ, -අවුරුදු 20න්, 25ට, 30ට- සිවිල් යුද්ධ ඇති වෙලා පරිපීඩිත වෙලා, විනාශ වෙලා, ලෙයින් තෙත් වුණු අපේ මේ භූමියයි. සුනාමියට, ගංවතුරට, නියඟයට අහු වෙලා බිම්බත් වුණු අපේ මේ දේශයයි. දුප්පත්කමින් පීඩාවට පත් වෙලා, හවිහරණක් නැති ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ඉන්න මේ දේශය, මේ කියන මහත්වරු, මේ කියන දේශප්‍රේමියෝ කොල්ල කෑවා කියන එක නේද මේ වාර්තාවලින් කියවිලා තිබෙන්නේ. තවදුරටත් මේ රටේ දේශපාලනයට මොකක් හරි ගෞරවයක් ඉතිරි වෙලා තිබෙනවාද? පාර්ලිමේන්තුවට, පළාත් සභාවලට, පහළ මට්ටමේ ආයතනවලට ගෞරවයක් කියලා දෙයක් ඉතිරි වෙලා තිබෙනවාද? මේ රටේ ජනතාව අද හැම අස්සක් මුල්ලක් නෑරම කථා කරන්නේ මේ කාරණය නොවෙයිද? එම නිසා අද ව්‍යවස්ථාදායකයටත්, විධායකයටත්, අධිකරණයටත් එක හා සමාන වගකීමක් තිබෙනවා, මේ රට ගමන් ගන්නා වූ දුර්දශාපන්න මාවතෙන් අනෙක් පැත්තට හරවන්න. ඒකට විශාල ධෛර්යයක්, නිර්භීතකමක්, විශාල කැපවීමක් සහ අවංකභාවයක් ඇති විය යුතුයි. එම නිසා අද මේ වේලාවේ ඒ සම්බන්ධයෙන් අධිකරණයටත් විශේෂ වග කීමක් තිබෙනවාය කියන කාරණය පෙන්වා දීමට මම කැමැතියි.

අද මේ කටයුතු සම්බන්ධයෙන් ගත්තාම, අපරාධ නඩුවකදී, එහෙම නැත්නම් ඒ හා සමාන දේවල්වලදී හැමදාම නීතියේ දැලට, රැහැනට අසු වන්නේ හාල්මැස්සෝ, කුනිස්සෝ විතරයි.

කිසිම දිනක තෝරු, මෝරු අහු වෙලා නැහැ. මේ ක්‍රියාදාමවලත් නඩු විසඳෙන ස්වභාවය ගත්තාට පස්සේ මේ කියන දේශපාලන මාෆියාව, නිලධාරී මාෆියාව, ජනමාධ්‍ය මාෆියාව එකට එකතු වෙලා එක්කෝ මේවා වසන් කරන්න, නැත්නම් අහු වුණු අය ගලවා ගන්න වංක සහයෝගයෙන් වැඩ කරනවා. කනගාටුයි කියන්න, ඒකට අධිකරණයේ තල්ලුවත් හම්බ වෙලා තිබෙනවා. කියමනක් තිබෙනවා, "යුක්තියේ පමාව, යුක්තියේ නිමාවට හේතුවක්ය" - "justice delayed is justice denied' - කියලා. ඒ වාගේම යුක්තිය ඉටු වුණාට පමණක් මදි, ඉටු වන බව පෙනෙන්නටත් අවශ්‍යයි. අද වෙලා තිබෙන්නේ මොකක්ද? නඩු කල් යන ප්‍රමාණය ගත්තාමත්, මහා බලවත් වූ අධිකරණයට කොටු වූ වැරදිකරුවන් ඉන් එළියට එන වේගය දැක්කාමත් මේ අධිකරණ ක්‍රියාදාමය පිළිබඳව; යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය පිළිබඳව අද මේ රටේ පොදු ජනතාවගේ විශ්වාසය බිඳ වැටී තිබෙනවා. මේ ආණ්ඩුවේ මුල් ගල් තුන වන විධායකය කෙරෙහි, ව්‍යවස්ථාදායකය කෙරෙහි සහ අධිකරණය කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසය බිඳ වැටෙන තත්ත්වයකදී ඇති වන්නේ අරාජිකවාදයක්. අපි අද මේ පාර්ලිමේන්තුව හැටියට කල්පනා කරලා බලන්න ඕනෑ, රට එවැනි අරාජිකවාදයකට ඇද දමනවාද කියලා. එම නිසා රට මුහුණ පා තිබෙන මේ දේශපාලන පරිපාලන දුරාචාරයෙන් රට ගලවා ගැනීම වෙනුවෙන් වගකීම් සහගත අධිකරණයකුත්, ඒ වාගේම අනෙකුත් අංශ දෙක ප්‍රතිසංවිධානය වීමත් අද අවශ්‍යයි. අධිකරණයේ ප්‍රතිසංවිධානය කියලා අපි නම්

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

අදහස් කරන්නේ ඒකයි. මේ වෙලාවේ ගරු අධිකරණ අමාත්‍යතුමිය අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශත් එක්ක යම් කිසි පනත් කෙටුම්පතක් අධිකරණ ප්‍රතිසංවිධානය වෙනුවෙන් අධිකරණ සංවිධාන පනතට සංශෝධන හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් විභාගයක් සිද්ධ වන නිසා මා ඒ සංශෝධන පනතේ අභ්‍යන්තර කරුණු කාරණා පිළිබඳව මේ වෙලාවේ කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, ඒක ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් බව අපි දැක්කා. ඒ අනුව, එම පෙත්සම්වලට එරෙහිව අපි මැදිහත්කරුවන් හැටියට උසාවි ගිහිල්ලා තිබෙනවා. අපි ගිය සතියේත්, ඊයේ දිනයේත් ඊට අදාළ කටයුතු උදෙසා උසාවියේ තමයි රැඳී සිටියේ.

ගරු කථානායකතුමනි, අපට කියන්න කනගාටුයි, මේ හොරු අල්ලන ක්‍රියාදාමය වේගවත් කරන්න යනකොට, අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කරන්න උත්සාහ ගන්න කොට ඒවාට විරුද්ධවත් පිරිසක් උසාවිවලට යනවා.

උසාවිවලට යන්නේ මොනවාටද? හොරු අල්ලන්න එපායි කියන්න, අධිකරණය වේගවත් කරන්න එපා කියන්න, කාර්යක්ෂම කරන්න එපා කියන්න. ඒ යන අය කාගේ නියෝජිතයෝද කියලා රට හමුවේ සළුපිළි ගලවලා ඔප්පු කරලා හමාරයි. අපි මේ වෙලාවේ මතක් කරන්නට කැමැතියි, ඉතාමත්ම කාර්යක්ෂම අධිකරණයක් මේ රටට අවශ්‍ය වෙලා තිබෙන බව. මේ රටේ සිද්ධ වෙලා තිබෙන අපරාධ සාමාන්‍ය මිනී මැරුම් නොවෙයි, සාමාන්‍ය හොර cheque ලියපු ඒවා වාගේ දේවල් නොවෙයි. මේ රටේ ගෞරවය කෙලෙසපු මූල්‍ය අපරාධ තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ රටේ ගෞරවය කෙලෙසූ මූල්‍ය අපරාධකරුවන්ට එරෙහිව යුක්තිය ඉෂ්ට කරන්නට රාජ්‍යයක් හැටියට අපි අසමත් වෙනවා නම් ගරු කථානායකතුමනි, අපි කොපමණ ලොකු සැලසුම් හදලා පෙන්නුවත්, -2020දී මේ රට මෙහෙම වෙනවා, 2025දී මෙහෙම වෙනවා කියලා- ඒවා නිකම් සුරංගනා කතන්දර පමණයි. මේ රජය ආවේ, මේ රජය බලයට පත් වුණේම ඉතාම ලොකු ආචාර ධර්ම සහිත පසුබිමකයි. මේ රටේ දේශපාලන දුරාචාරය, ආර්ථික දුරාචාරය, පරිපාලන දුරාචාර වෙනස් කරනවා කියලායි අපි ආවේ. එම නිසා මේ කටයුත්තේදී කිසිම කෙනෙකුට පස්ස ගහන්නට අයිතියක් නැහැ. හොරු, රට කොල්ල කාපු මිනිස්සු කොයි පැත්තේ හිටියත් අද ජනතාව ඉල්ලා සිටින්නේ ජනතාවගේ පැත්තෙන් මේවාට එරෙහිව යුක්තිය ඉෂ්ට විය යුතුයි කියලායි.

ගරු කථානායකතුමනි, පසුගිය පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල හුඟක් දෙනා නොයෙක් ආකාරයට විග්‍රහ කරනවා. ඒ විග්‍රහවලට යම් යම් හේතු සාධක, සාධාරණ කරුණු කාරණා තිබෙන්නට පුළුවන්. ආණ්ඩුව පැත්තෙන් අපි කියන්නේ අපේ ආචාර ධර්මවල පදනම තරමක් දුරට හෙල්ලිලා තිබෙන බවයි. එසේ හෙල්ලීමට බලපෑ කාරණා තමයි අපේ න්‍යාය පත්‍රයේ අංක 01 වූ මේ රට කොල්ල කාපු හොරුන්ට දඬුවම් දීමට අවුරුදු තුනක් ගිහිල්ලාත් අපි අසමත් වෙලා තිබීම සහ මේ ආණ්ඩුවටත් ඒ වාගේම බරපතළ චෝදනා ඇවිල්ලා තිබීම. අද මේ රටට අලුත් ගමන් මාර්ගයක් අවශ්‍ය වෙලා තිබෙනවා. එහෙම නම් මේ රජය කල්පනා කරන්නට ඕනෑ 2015 ජනවාරි 08වෙනි දා මේ රටේ ජනතාව දිපු ඒ ජන වරම, ඒ ජනතා න්‍යාය පත්‍රය අලුත් කරන්නට අපි සූදානම් විය යුතු බව. එහෙම නොකරන්න නොකරන්න අපි යන්නේ පරාභවයටයි.

ගරු කථානායකතුමනි, අපේ කලාපයේ අනෙක් රටවල් දිහා බලන්න. සෑම රටක්ම මේ කියන ප්‍රශ්න විසඳා ගනිමින් අද ඉස්සරහට යනවා.

සමාජ මට්ටමේ අතින් ගත්තත්, ආර්ථික මට්ටමේ අතින් ගත්තත් අපට පසු පසින් හිටපු රටවල් බොහොමයක් ඉදිරියට යද්දී, අපි ඉතාම සුළු කටයුත්තක්වත් කරන්න බැරිව, බොහොම අකර්මණ්‍යව, වැඩ කල් දමමින්, පස්ස ගහමින් ඉන්නා රාජ්‍යයක් බවට පත්වෙලා නැද්ද කියන එක මා මේ අවස්ථාවේදී ඉතාමත් අවංකවම, ඒ වාගේම මගේ හෘදය සාක්ෂිය අනුව අහන්න කැමැතියි. එම නිසා අද මේ ඇති වෙලා තිබෙන ඉතාමත් අභාග්‍යසම්පන්න තත්ත්වයෙන් ගැලවෙන්නට නම්, මේ රටේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය කියන ආයතන තුනේම අලුත් පිබිදීමක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ සඳහා නව ප්‍රතිසංවිධානයක් අවශ්‍ය වෙලා තිබෙනවා. කොටින්ම කියනවා නම්, රටට නව ජාතික දේශපාලනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. මිනී මරන්නේ නැති, හොරකම් කරන්නේ නැති, පවුල්වාදය නැති, ගජ මිතුරුවාදය නැති, වැඩ කල් දමන්නේ නැති, වැඩ අත ගාමින් ඉන්නේ නැති, ජනතා ප්‍රශ්නවලට සංවේදීව ඉක්මනට පිළිතුරු සොයන, ජනතාවගේ බිම් මට්ටමට බහින්නට පුළුවන්, ඔවුන්ගේ සංස්කෘතිය තේරුම් ගන්න පුළුවන්, න්‍යායයන් මත්තේ නොව ප්‍රායෝගික අංශවලට වැඩි කැමැත්තක් දක්වන නව දේශපාලනයක් හැටියට අපේ මේ ජාතික දේශපාලන න්‍යාය පත්‍රය අලුත් කළ යුතුව තිබෙනවා. ඒ එක් අංගයක ප්‍රධාන කොටසක් තමයි, අධිකරණය යළි පිළිසකර කර ගැනීම.

අධිකරණ සංවිධාන පනතට අද දින ඉදිරිපත් කරන සංශෝධනවලට එරෙහිව කටයුතු කරන අය මේ ජනමාධ්‍ය අවකාශයේදී මොනවාද කියන්නේ? මේ රජය අධිකරණයේ ස්වාධීනත්වය උල්ලංඝනය කරන්න හදනවාය කියලා කථා කරනවා. විනිශ්චයකාරවරියන් මහ දවාලේ පුටුවෙන් එළියට ඇදලා දමපු, සමහර අමාත්‍යාංශවල නඩු තීන්දු ලියපු ඇමතිවරුන්ට, ඒ වාගේ ඉතාමත් ගඳ ගසන ඉතිහාසයක් තිබෙන අයට පුළුවන්කමක් තිබෙනවාද, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න? අපි මේ වෙලාවේ මේ රටේ ජනතාවට සැබෑ ලෙස ආදරය කරනවා නම්, ජනතාවගේ ඡන්දයෙන් පත්වෙලා, දේශපාලන බලය තාවකාලිකව භාරගත් පිරිසක් හැටියට ඉන්නවා නම්, මේ ජාතික ප්‍රශ්නයට අපි අවංකවම සංවේදී වන්නට අවශ්‍ය වෙලා තිබෙනවා. මේ රටේ මහා පරිමාණ මූල්‍ය අපරාධ කරපු, ඔය කියන දේශ ප්‍රේමීන්, වීරයන්, මහත්වරුන් සියලුදෙනාම කෙසේ හෝ මේවායින් ගැලවෙන්න පුළුවන් පහසු මංමාවත් අද සොයාගෙන තිබෙනවා. මේවායින් රිංගන්න තිබෙන හිල් බොහොමයි. මේවායේ තිබෙන පරිපාලන ගැටලු, ක්‍රමවේදමය ප්‍රශ්න ඔස්සේ මේවායින් ගැලවෙන්න පුළුවන්ය කියන විශ්වාසය ඒ පිරිස තුළ තිබෙනවා. එම නිසා ජනතාවට මේ ආයතනය කෙරෙහි විශාල අවිශ්වාසයකුත් ඇතිවෙලා තිබෙනවා. අද මේ අවස්ථාව හොඳම අවස්ථාවක්, හොඳම වෙලාවක්.

හැම තැනකම දේශපාලනඥයා ප්‍රශ්න කෙරෙන බැවින්; මැතිවරණවලදී නොහිතන කනේ පාරවල් නොවෙයි, හරහා වැටෙන්න ජනතාව පහර ගහන බැවින්; දේශපාලනඥයාගේ ගෞරවය හැම අස්සක් මුල්ලක් නැරම කෙලසිලා තිබෙන බැවින්, අපි නිමග්න වෙලා සිටින මේ දේශපාලන කාර්ය භාරය දිහා ආපහු හැරිලා බලන්න අද අපි සියලු දෙනාටම අවශ්‍ය වෙලා තිබෙනවා. අපට ජනතාව බලය දීලා තිබෙන්නේ මොනවාටද කියන එක සම්බන්ධයෙන් අපි ආපහු හැරිලා බලන්න ඕනෑ. මොකද, දේශපාලන බලය කියන්නේ සදාකාලික දෙයක් නොවෙයි; ඒක උරුමයක් නොවෙයි; පාරම්පරිකව තමන්ට පාලනය කරන්න ලැබෙන පොල් වත්තක් නොවෙයි. ඒක තාවකාලික භාරයක්. ඒ තාවකාලික භාරයේදී, ඒක හරියට පූජා වට්ටියක් ගෙන යන්නා වාගේ අවංකවම, බොහොම සුද්ධ පවිත්‍රව කරන්නට අපේ ජන සමාජයේ දේශපාලන චර්යාව සකස් වුණේ නැත්නම්, අපේ රට විනාශ වෙන්න සුනාමි, සිවිල් යුද්ධ, නියඟ වැනි කිසිවක් එන්න අවශ්‍ය නැහැ. ඊට වඩා අපි අපිම; රට භාර ගන්නා පිරිස්ම මේ රට විනාශ කරනවාය කියන එක අපි කියන්න සූදානම්.

ගරු කථානායකතුමනි, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග ගැන කථා කරන මේ වෙලාවේ මේවා ගැන මීට වඩා කැක්කුමකින්, වුවමනාවකින්, රටේ ජනතාවත් එක්කත් ලොකු සංවාදයක් අපට කර ගෙන යන්න සිදු වෙලා තිබෙනවාය කියා මම හිතනවා. සමහර අය කල්පනා කරන්නේ හුදෙක් අයිතීන් ගැන විතරයි; අයිතිවාසිකම් ගැන පමණයි කථා කරන්නේ. හුදෙක් පුද්ගල අයිතිවාසිකම් ගැන කථා කිරීම ලිබරල්වාදයේ එක අංග ලක්ෂණයක් පමණයි. ලිබරල්වාදයට **සීමාකම්** බොහොමයක් තිබෙනවා. ඒ වාගේම, පොදු අයිතිවාසිකම ගැන විතරක් කථා කළාම, ඒකටත් එක්තරා විධියක සීමාවන් තිබෙනවා. නමුත්, අවාසනාවකට අද අපේ රටේ අධිකරණයේ කෙරෙන නඩු විභාග ගත්තත්, ඒ පනත් කෙටුම්පත් හදන්න කරන සංවාද ගත්තත්, අපට පොත්වලින් දීපු න්‍යාය අච්චුවල අපි හිරවෙලා දැඟලීමයි සිදු වෙන්නේ. බිම් මට්ටමේ ඇවිළෙන ගින්න දිහා අපි ඇස් අරින්නේ නැතිව, අනෙක් දේවල් දිහා විතරක් බලා ගෙන ඉඳලා මේ ප්‍රශ්න විසඳා ගන්න හැකියාවක් ලැබෙයි කියලා අපි හිතන්නේ නැහැ.

කවුරුත් දන්නවා රට කොල්ලකාලා තිබෙන්නේ කවුද කියන එක; කවුරුත් දන්නවා කොහොමද හොරකම් කරලා තිබෙන්නේ කියලා; කවුරුත් දන්නවා ධනය කොහාටද ගිහිල්ලා තිබෙන්නේ කියලා; කවුරුත් දන්නවා ඒ ධනය ප්‍රතිආයෝජනය කරලා තිබෙන්නේ කොහොමද කියලා. ඒවා ඇස් හමුවේ පෙනෙන්න තිබෙනවා. මේවා අල්ලා ගන්න බැරිව තමයි දහලන්නේ. ඒ බැරි වෙලා තිබෙන්නේ මොකද දන්නවාද? දේශපාලනය, පරිපාලනය, සන්නිවේදනය -ඒ කියන්නේ ජන මාධ්‍යය- මේ සියල්ලම මහා මාෆියාවන් තුනක් හැටියට එකිනෙකාට සහයෝගයෙන්; වංක සහයෝගයෙන් වැඩ කරනවාය කියන එකයි පෙනෙන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වේලාව අවසන් වී ගෙන යනවා.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්පුමිකු කරුණාරත්න පරණවිතාන)
(The Hon. Karunarathna Paranawithana)
හොඳයි, ගරු කථානායකතුමනි.

එම නිසා අද අධිකරණයට ප්‍රතිසංවිධානයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ මෙන්න මේ වංක සහයෝගය බිඳින්නයි කියන එක මේ වෙලාවේ සඳහන් කරමින්, මගේ කථාව මෙතෙකින් අවසන් කරනවා. මට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ජෝන් අමරතුංග - සුරුත්‍රාත්තුරෙ අපිවිරුත්‍ති මත්‍රුම් කිරිස්තව සමය අලුවල්කළ් අමෙච්චර්)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)
ගරු කථානායකතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විදුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
අදන්පිරගු, මාණ්පුමිකු සභාපතිවරයර් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු ලක්කි ජූයවර්දන අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.
Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[පි.ව. 2.24]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩග්ලස් දේවානන්දා)
(The Hon. Douglas Devananda)
කෞරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இன்றைய தினம் நீதித்துறையுடன் தொடர்புடைய சில சட்ட ஏற்பாடுகள் தொடர்பில் இங்கு விவாதங்கள் நடைபெறுகின்ற நிலையில், அது சார்ந்து எமது மக்கள் தொடர்ந்து எதிர்நோக்கி வருகின்ற, அவர்களின் உணர்வுடனும் உரிமைகளுடனும் தொடர்புள்ள விடயங்கள் குறித்து எனது கருத்துக்களை இங்கு தெரிவிக்க விரும்புகின்றேன். அந்த வகையில், அதற்கான வாய்ப்பினை வழங்கியமைக்கு உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

எமது நாட்டில் இதுவரையில் தீர்ப்புக்கள் வழங்கப்படாத நிலையில் சுமார் 6 இலட்சத்து 50 ஆயிரம் வழக்குகள் நிலுவையில் உள்ளதாகத் தெரிய வருகின்றது. அதேநேரம், பயங்கரவாதத் தடைச் சட்டம் மற்றும் அவசரகாலச் சட்ட விதிகளின்கீழ் கைது செய்யப்பட்டு, வழக்குகள் தொடரப்படாமலும் வழக்குகள் தொடரப்பட்டு கால தாமதங்கள் தொடரும் நிலைமையிலும் வழக்குகள் கிடப்பில் போடப்பட்ட நிலையிலும் பல வருட காலமாக தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகளின் நிலைமைகளையும் நீங்கள் சற்றுச் சிந்தித்துப் பார்க்க வேண்டும். நான் இங்கு தமிழ் அரசியல் கைதிகள் எனக் கூறுகின்றபோது, நீங்கள் "அப்படி எவரும் இல்லை" எனக் கூறலாம். அது உங்களது அரசியல் சார்ந்த பிரச்சினையாக இருக்கலாம். அதுவல்ல இங்குள்ள பிரச்சினை! இவ்வாறு கைது செய்யப்பட்டவர்கள் தொடர்பில் நீங்கள் எடுத்துள்ள நடவடிக்கைகள் என்ன? என்பதுதான் இங்குள்ள கேள்வியாகும்.

இவ்வாறு கைது செய்யப்பட்டவர்களில் சுமார் 130 பேர் வரையில் இன்னமும் தடுப்பில் இருப்பதாகவே தெரிய வருகின்றது. வெலிக்கடைச் சிறைச்சாலையில் மாத்திரம் 78 தமிழ் அரசியல் கைதிகள் தடுப்பில் இருப்பதாகவும் கூறப்படுகின்றது. இவர்களில் வழக்குத் தொடரப்படாதவர்களுக்கு வழக்கு தொடர்வதற்கோ, தொடரப்பட்டுள்ள வழக்குகளை விரைந்து முடிவுறுத்துவதற்கோ நீங்கள் இதுவரையில் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் என்ன? எனவும் கேட்க விரும்புகின்றேன். இக்கைதிகளின் பிரச்சினைகளின் தீர்வினை விரைவுபடுத்தும் நோக்கில், பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழான வழக்குகளை இரண்டு வாரங்களுக்கு ஒரு தடவை விசாரணைகளுக்கு உட்படுத்து வதற்கு உறுதியளிக்கப்பட்டிருந்தபோதிலும் அந்த வழக்குகள் ஒரு மாதத்திற்கு அல்லது ஒன்றரை மாதத்திற்கு ஒரு தடவை என்ற வகையிலேயே விசாரணைக்கு எடுத்துக் கொள்ளப்படுவதாகவும் அதிலும் முடிவுக்குக் கொண்டுவரப்

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

படுகின்ற வகையில் முறையான விசாரணைகள் மேற்கொள்ளப்படாமல், விசாரணைகளை ஒத்திவைக்கும் செயற்பாடுகளே தொடர்வதாகவும் தமிழ் அரசியல் கைதிகள் கூறுகின்றனர். இதன் காரணமாக வழக்குகள் தாக்கல் செய்யப்படாது பல வருடங்கள் தடுப்பிலிருந்த அரசியல் கைதிகள், வழக்குகள் தாக்கல் செய்யப்பட்டுத் தண்டனை பெற்றவர்களைப்போன்று தொடர்ந்தும் நீண்ட காலம் சிறைச்சாலைகளில் தண்டனை அனுபவிக்கும் நிலை ஏற்பட்டுள்ளதாகத் தெரிவிக்கின்றனர். இந்நிலையில் 2 பேர் 22 வருடங்களாகவும் 3 பேர் 18 வருடங்களாகவும் தடுத்து வைக்கப்பட்டுள்ளனர் என்றும் சிலரது வழக்குகள் கிடப்பில் போடப்பட்டுள்ளதாகவும் இவர்களது வழக்குகள் நடைபெறாததன் காரணமாக அடுத்த கட்டமாகத் தங்களுக்கு என்ன நடக்கும் என்பது புரியாமலே அவர்கள் நிலை குழம்பிப்போயுள்ளதாகவும் இக்கைதிகள் தெரிவிக்கின்றனர். அத்துடன், தங்களது வழக்குகள் விசாரணை செய்யப்பட்டு, முடிவுகள் ஏதேனும் வருமா? அல்லது நீதிமன்ற விசாரணைகள் இன்றிய நிலையில் எதுவுமே அறியக்கிடைக்காமல், வாழ்நாள் முழுவதையும் சிறையிலேயே கழிக்க நேரிடுமா? என்ற திக்கற்ற நிலையிலும் இந்தத் தமிழ் அரசியல் கைதிகள் தவித்துக் கொண்டிருக்கின்றனர். மேலும், சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டிருந்த நிலையில், அங்கு இடம்பெறுகின்ற பல்வேறு கெடுபிடிகள், சித்திரவதைகள் காரணமாக உள மற்றும் உடல் ரீதியில் பாதிக்கப்பட்டு 9 பேர் உயிரிழந்துள்ளதாகவும் அக்கைதிகள் தெரிவிக்கின்றனர்.

தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்துக்கு வாகனங்களைப் பெற்றுக்கொடுத்தார் என்ற குற்றச்சாட்டில் கடந்த 2008.02.10ஆம் திகதி கைது செய்யப்பட்டு, கொழும்பு மகசின் சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டிருந்த வவுனியாவைச் சேர்ந்த 70 வயதுடைய சண்முகநாதன் தேவகன் என்ற முதியவரது வழக்கு நீர்கொழும்பு நீதிமன்றத்தில் நடைபெற்று கடந்த வருடம் இவருக்கு 2 வருடங்கள் சிறைத் தண்டனை வழங்கப்பட்டிருந்த நிலையில், சட்ட மாஅதிபர் திணைக்களம் இவர்மீது இன்னுமொரு வழக்கினைத் தாக்கல் செய்திருந்தது. இந்நிலையில் நோய்வாய்ப்பட்டிருந்த இவர், கடந்த 12ஆம் திகதி கொழும்பு தேசிய மருத்துவமனையில் சிகிச்சைக்காகச் சேர்க்கப்பட்டு 16ஆம் திகதி பரிதாபமாக உயிரிழந்துள்ளார். அதேபோன்று, கடந்த 2008ஆம் ஆண்டு கைது செய்யப்பட்டு கொழும்பு மகசின் சிறைச்சாலையில் ஆயுள் தண்டனை அனுபவித்துவரும் கிளிநொச்சி, மருதபுரம் பகுதியைச் சேர்ந்த ஆனந்தசுதாகரன் என்பவரது மனைவி, கணவனின் பிரிவுத் துயரம் மற்றும் குடும்ப சூழ்நிலைகள் காரணமாக நோய்வாய்ப்பட்ட நிலையில், கடந்த 15ஆம் திகதி உயிரிழந்துள்ளார். இந்நிலையில், அவர் 3 மணி நேர அவகாசத்தில் மனைவியின் இறுதிக் கிரியைகளில் கலந்துகொண்டார். அவ்வேளையில், ஆனந்தசுதாகரனின் 10 வயதுப் பெண் குழந்தையானது, தாயற்ற நிலையில் செய்வதறியாது தந்தையுடன் சிறைச்சாலை வண்டியில் ஏறிய பரிதாப நிகழ்வும் எமது மண்ணில் நடந்தேறியிருக்கின்றது.

தமிழ் அரசியல் கைதிகளில் பலர்மீது ஒன்றுக்கு மேற்பட்ட வழக்குகள் கொழும்புக்கு வெளியிலுள்ள நீதிமன்றங்கள் பலவற்றிலும் தாக்கல் செய்யப்பட்டுள்ள நிலையில், தடுத்து வைக்கப்பட்டுள்ள சிறைச்சாலைகளிலிருந்து வெகுதொலை விலுள்ள நீதிமன்றங்களில் வழக்கு விசாரணைத் தவணை களுக்காகக் கொண்டுசெல்லப்படுகின்ற தமிழ் அரசியல் கைதிகள், சில தினங்கள் அந்த நீதிமன்றத்தின் நியாயாதிக்கத் திற்குட்பட்ட சிறைச்சாலைகளில் அல்லது மறியற்சாலைகளில் வைத்திருக்கப்படுகின்றபோது கொலை, கொள்ளை உள்ளிட்ட ஏனைய குற்றச் செயல்களில் தொடர்புபட்ட கைதிகளுடன் ஒன்றாக வைத்திருக்கின்ற நிலைமை ஏற்படுகின்றது. இந்நிலையில், தமிழ் அரசியல் கைதிகள் எதிர்கொள்கின்ற இடையூறுகள், கொடுமைகள் என்பன ஏராளம் என்றும் அவர்கள் தெரிவிக்கின்றனர். இத்தகைய சந்தர்ப்பங்களில் பல்வேறு தாக்குதல்களுக்கு உட்படுகின்ற நிலைமைகளும் இல்லாமலில்லை என்றும் தெரிவித்துள்ள அக்கைதிகள், முன்னர் வெலிக்கடை சிறைச்சாலையில் அரசியல் கைதிகளுக்கென தனியான ஏற்பாடுகள் மற்றும் பாதுகாப்பு என்பன இருந்தன என்றும் தற்போது அந்த நிலைமைகள் மாற்றப்பட்டு, ஏனைய குற்றவியல் வழக்குகளுடன் தொடர்புள்ள கைதிகளுடனேயே தடுத்து வைக்கப்பட்டுள்ள தாகவும் தெரிவிக்கின்றனர். அத்துடன், மாலைதீவு தாக்குதல் சம்பவம் தொடர்பில் கைது செய்யப்பட்டு, மாலைதீவில் 9 வருடங்களாகத் தடுத்து வைக்கப்பட்டு இலங்கைக்கு அனுப்பப்பட்டுள்ள மூவர், கடந்த 3 வருடங்களாக வெலிக்கடைச் சிறையில் எவ்விதமான வழக்குகளும் தாக்கல் செய்யப்படாத நிலையில் தடுத்து வைக்கப்பட்டுள்ளனர் எனவும் தெரிய வருகின்றது.

எனவே, தமிழ் அரசியல் கைதிகளின் பிரச்சினை தொடர்பில் விரைந்த, சாதகமான ஏற்பாடுகள் தேவை என்பதையே நான் மீண்டும் மீண்டும் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். அவர்கள் குற்றங்களுடன் தொடர்பு பட்டிருந்தால், அது குறித்து வழக்குகள் தாக்கல் செய்யப்பட்டுத் துரித விசாரணைகள் நடத்தப்பட்டுத் தீர்ப்புகள் வழங்கப்பட வேண்டும் அல்லது அவர்கள் விடுதலை செய்யப்பட வேண்டும். வழக்குகளும் தாக்கல் செய்யப்படாமல், தாக்கல் செய்யப்பட்ட வழக்குகளும் இழுத்தடிக்கப்பட்டு வரும் நிலையில், இந்த தமிழ் அரசியல் கைதிகளைப் பார்த்து "இவர்கள் பெரும் புலிகள்; இவர்களை விடுதலை செய்யக்கூடாது" எனத் தென்பகுதிப் பேரினவாதிகள் கூக்குரலிடுகின்றனர். இவர்களின் இந்தப் போலி ஆட்டங்களுக்குப் பயந்தே, தமிழ் அரசியல் கைதிகளின் பிரச்சினை தொடர்பில் அரசாங்கம் வீணான காலதாமதத்தை ஏற்படுத்துகின்றதென்றால், அது வேதனைக்குரியதும் வெட்கப்படக்கூடியதுமான விடயமாகும். இத்தகைய இனவாதக் குழுக்களின் குரல்களுக்கு எடுபட்டுப்போனால், அண்மையில் அம்பாறை, திகன போன்ற பகுதிகளில் ஏற்பட்ட கதிக்கே இந்த நாடு முழுமையாக ஆட்படக்கூடும் என்ற விடயத்தினையும் இங்கு சுட்டிக்காட்ட வேண்டியுள்ளது.

இனவாதத்தையும் மதவாதத்தையும் தூண்டுவோர் தொடர்பில் விசாரணைகள் மேற்கொண்டு, சட்ட நடவடிக்கை எடுப்பதற்காக ஓர் ஆணைக்குழு அமைக்கப்பட வேண்டு மெனச் சுயாதீன ஆணைக்குழுக்களை இந்த அரசு அமைக்க முற்பட்ட காலத்திலேயே நாம் வலியுறுத்தியிருந்தோம். அதேபோன்று, இந்த நாட்டில் படைகளும் பொலிசாரும் அந்தந்த மாவட்டங்களின் இன விகிதாசாரத்திற்கும் மக்கள் தொகைக்கும் ஏற்ப நிலைகொண்டிருத்தல் வேண்டும் என்றும் படைகளிலும் பொலிஸ் துறையிலும் இன விகிதாசாரம் பேணப்படல் வேண்டும் என்றும் நாம் தொடர்ந்து வலியுறுத்தியிருந்தோம். இந்த விடயங்களை நாம் இந்த நாடு குறித்த தூர நோக்குடைய பார்வையிலேயே வலியுறுத்தினோம். ஆனால், அது குறித்து நீங்கள் உரிய அவதானத்தைச் செலுத்தவில்லை. அதன் விளைவு எத்தகையது என்பதை நாம் அண்மையில் அம்பாறையிலும் கண்டி, திகனயிலும் காணக்கூடியதாக இருந்தது. எனவே, அது குறித்தும் சிந்தித்துப் பார்க்கவேண்டும். இத்தகைய சம்பவங்கள் நடந்து முடிந்த பின்னர், அவர் செய்தார், இவர்

செய்தார், நான் செய்யவில்லை, அவர் செய்யவில்லை என்றெல்லாம் கருத்துத் தெரிவித்துக்கொண்டு திரிவதில் எவ்விதமான பயனும் இல்லை. நாம் ஏற்கெனவே வலியுறுத்தியிருந்ததைப் போன்ற ஏற்பாடுகள் இந்த நாட்டில் இருந்திருப்பின் இன்று அம்பாறையிலும் கண்டி, திகனவிலும் இடம்பெற்ற சம்பவங்கள் நிகழாதிருந்திருக்கும் என்பதை இப்போதாவது ஏற்றுக்கொள்கின்றீர்களா? எனக் கேட்க விரும்புகின்றேன்.

வெறுப்புணர்வுகளைத் தூண்டுகின்ற செயற்பாடுகளுக்கு எதிரான தடைச் சட்டமூலமொன்று கொண்டுவரப்படுவதாக இருந்தது. அது, கருத்துச் சுதந்திரத்தைப் பாதிக்கும் என அதற்கு எதிராகச் செயற்பட்டவர்கள், அந்தக் கருத்துச் சுதந்திரத்தால் அண்மையில் அம்பாறையிலும் திகனயிலும் இழக்கப்பட்ட மனித உயிர்களுக்கும் எரிந்து முடிந்த சொத்துக்களுக்கும் என்ன பதில் சொல்லப் போகின்றார்கள்? என்பதைக் கேட்க விரும்புகின்றேன். அண்மையில் மேற்கொள்ளப்பட்ட முஸ்லிம் மக்கள்மீதான தாக்குதல் இலங்கையின் தண்டனை விலக்கீட்டுச் சிறப்புரிமையின் வெளிப்பாடு எனப் போர்க் குற்றச்சாட்டுகள் தொடர்பான விவகாரத்தைக் கையாண்ட அமெரிக்காவின் முன்னாள் தூதுவர் ஸ் ரீபன் ரப் கூறியிருக்கின்றார். எனவே, நாங்கள் இயற்றுகின்ற சட்டமூலங்கள் எமது நாட்டுக்குப் பொருந்துவனவாக இருத்தல் வேண்டும்.

இந்த நாடு தேசிய நல்லிணக்கத்தை நோக்கி நகர்வதாகக் கூறப்படுகின்றது. எனவே, பகைமைகள் மறுக்கப்பட வேண்டும்; இனங்களுக்கிடையே சந்தேகங்கள் அகற்றப்பட்டு, பரஸ்பர நம்பிக்கைகள் வலுப்பெற வேண்டும்;

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, give me one more minute, please.

அதனை நோக்கிய சிந்தனைகளை மக்கள் மத்தியில் வளர்ப்பதற்கான ஏற்பாடுகள் முன்னெடுக்கப்பட வேண்டும்; அதனைத் தகர்க்கின்ற செயற்பாடுகளுக்கு எதிரான சட்ட மூலங்கள் வகுக்கப்பட வேண்டும். சட்டங்கள் கடுமையாக்கப் படுவதிலிருந்துதான் இந்த நாடானது, மக்களது நலன் கருதிய செயற்பாடுகளை முன்னெடுக்க முடியும் என்கின்ற பாடங்கள் இந்த நாட்டில் செயற்பாட்டு ரீதியாகத் தொடர்ந்து கற்பிக்கப்பட்டு வருகின்றன.

அந்த வகையில், குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக் கோவை தொடர்பிலும் எமக்கு கேள்விகள் இல்லாமல் இல்லை. அதாவது, சந்தேகத்தின் பேரில் நபர் ஒருவர் கைது செய்யப்பட்டு, பொலிஸாரினால் விசாரணை செய்யப்பட்டு, வாக்குமூலம் பதிவு செய்யப்பட்டதன் பின்னர்தான் அவர் சட்டத்தரணியின் உதவியை நாட முடியுமா? என்ற கேள்வி எழுகின்றது. தமிழ் மொழியில் மாத்திரமே பரிச்சயம் கொண்ட ஒரு நபர் சந்தேகத்தின் பேரில் கைது செய்யப்படுமிடத்து, தமிழ் மொழியில் பரிச்சயமற்ற பொலிஸ் உத்தியோகத்தர்களால் வாக்குமூலங்கள் பதியப்படுகின்ற நிலைமைகள் எமது நாட்டில் இல்லாமலில்லை. இத்தகைய சந்தர்ப்பங்களில் பொலிஸாரி னால் பதிவு செய்யப்படுகின்ற வாக்குமூலங்கள் எந்தளவுக்கு உண்மைத் தன்மையுடையனவாக, சரியானவையாக இருக்கு மென்பது கேள்விக்குறியாகும். பொலிஸாருக்கு முதலில் வழங்கும் வாக்குமூலமே அநேகமான வழக்குகளில் முக்கிய சாட்சியமாக மாற்றம் பெறுகின்ற நிலைமை இருக்கின்றது. இத்தகைய நிலையில், குற்றம் செய்யாதவர்கள்கூட குற்றவாளி களாக்கப்படுகின்ற நிலைமை உருவாகக்கூடும் என்பதால், இது தொடர்பில் மீள்பரிசீலனை அவசியமாகின்றது என்ற விடயத்தையும் இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

அந்த வகையில், இந்த நாட்டில் இருக்கின்ற குழப்பங்களையே இன்னமும் தீர்க்கமுடியாதுள்ள நிலையில், அரசு மென்மேலும் குழப்பங்களை ஏற்படுத்துகின்ற செயற் பாடுகளை முன்னெடுக்காமல், இந்த நாட்டில் நாம் கற்றுக்கொண்ட பாடங்களிலிருந்து சமூக, பொருளாதார மற்றும் ஆரோக்கியமான அரசியலை நோக்கி நகர்த்துகின்ற வகையில், எமது நாட்டுக்குப் பொருத்தமான செயற்பாடுகளை முன்னெடுப்பது குறித்துச் சிந்தித்துச் செயற்படுமாறு கேட்டுக்கொண்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 2.38]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා, 2015 ජනවාරි 08වැනි දා මේ රටේ ජනතාව අපට ඡන්දය දුන්නේ ණය ගෙවන්න ඕනෑ කියලා නොවෙයි; රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න කියලා නොවෙයි; බඩු මිල අඩු කරන්න කියලා නොවෙයි; රට සංවර්ධනය කරන්න කියලා නොවෙයි. 2015 ජනවාරි 08වැනි දා සිදු වුණු විප්ලවයේ ජනතාවගේ ප්‍රධාන ඉල්ලීම් වුණේ ඒවා නොවෙයි. ජනතාව අපෙන් ඉල්ලුවේ මේ රටේ දේශපාලනය කරන අයගේ මහා පරිමාණ මුදල් සොරකම් කිරීම නවත්වලා, ඒ හොරුන්ට දඬුවම් දීලා, ඒ හොරුන් හොරකම් කළ මුදල් නැවත ජනතාවට ලබා දෙන්න කියලායි. අපි ඒ පොරොන්දු වූ ආකාරයෙන්ම FCID එක කියලා අලුත් පොලිසියක් - මූල්‍ය අපරාධ කොට්ඨාසයක්- හැදුවා. ඒ වාගේම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ජනතාවට නිර්මාණය කරලා දුන්නා. ස්වාධීන කොමිෂන් සභා හැදුවා. මම දන්නා තරමට, මේ පැමිණිලි විමර්ශනය කරලා ඒවා තුළින් ලිපිගොනු 99ක් හරිගස්සලා නඩු පවරන්න කියලා මූල්‍ය අපරාධ කොට්ඨාසය මඟින් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළා. නමුත් අද වන තෙක් පැවරිලා තිබෙන්නේ නඩු 15යි. තවමත් ඒවායින් එකක්වත් යුක්තිය පසිඳලා ජනතාවට සාධාරණත්වය ඉෂ්ට කරලා දීලා නැහැ. ඒ නඩු ඇසෙමින් පවතිනවා විතරයි. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු තුනකට පස්සේ ඊයේ පෙරේදා, බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙන් පරීක්ෂණ කරලා, කරලා පසු ගිය කාලයේ කරපු වැරදි 34ක් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළා. ඉදිරි කාලය තුළ මේවා පිළිබඳව නඩු පවරලා, මේ අපරාධ නිසා වින්දිතයන් බවට පත් වුණු ජනතාවට යුක්තිය ඉෂ්ට කර දෙන්න දැනට තිබෙන නීති පද්ධතිය තුළින් අපට පුළුවන්ද කියන එක ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා.

මේ හොරු හරිම දක්ෂයි; හරිම බලවත් කියලා අපි දන්නවා. හොරු අල්ලන්න ආපු ආණ්ඩුව අන්තිමට හොරු බවට මතයක් ජනතාව තුළ නිර්මාණය කරන්න තරම් මේ හොර කණ්ඩායම දක්ෂයි. අන්තිමට හොරු අල්ලන්න ආපු පොලීසිය හොරා වෙලා, හොරා, පොලීසිය වුණා. ඒ වාගේ තත්ත්වයකට පත් කරන්න තරම්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මේ හොරු දක්ෂයි; ඒ ජනමතය නිර්මාණය කරන්න මේ හොරු දක්ෂයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටින්ම කියනවා නම් මේ රටේ නීතිය මකුළු දැලක් වෙලා තිබීම තමයි මේකට හේතුව. ඒ කියන්නේ මේ දක්ෂ හොරුන්ට; බලවත් හොරුන්ට කඩාගෙන යන්න පුළුවන් නීතියක් මේ රටේ තිබෙන්නේ. අහිංසක, අසරණ, චූටි සතුන් මකුළු දැලට අහුවෙනවා වාගේ එවැනි අය තමයි කොටු වන්නේ. පසුගිය දවස්වල හොරු අරගෙන ගිහිල්ලා උසාවියෙන් ප්‍රශ්න කළාට පස්සේ, උසාවි පරිශ්‍රයෙන් එළියට ඇවිල්ලා නිදහස් අරගළයට පණ පොවපු වීර කැප්පෙටිපොලලා වාගේ තමයි ඒ හොරු මාධ්‍ය ඉස්සරහ හැසිරුණේ.

ඇයි මේ? නීතියේ තිබෙන අඩු පාඩු, නීතියේ තිබෙන දුර්වලතා නිසා ඒ ගොල්ලන් දන්නවා, නීතියෙන් ඒ අයට මොනවාවත් කරන්න බැහැ කියලා. මේ පවතින නීතිය ඉදිරියේ ආණ්ඩුව අසරණ වෙලා. හොරු අල්ලන්න ගිය ආණ්ඩුව මේ නීතිය ඉදිරියේ අසරණ වෙලා. මේ අය ජනමාධ්‍ය ඔස්සේ අපව අසරණ කරලා තිබෙනවා. ඇයි? ප්‍රමාණවත් හා ක්‍රමවත් නීති අපේ රටේ හැදිලා නැහැ.

විශේෂයෙන්ම පසු ගිය මැතිවරණයෙන් අපට මේකේ ප්‍රතිඵල භුක්ති විඳින්න සිද්ධ වුණා. මේ අය, "දිනුවා, දිනුවා" කියලා උදම් අනනවා. එදා ජනාධිපතිවරණයේදී ජනාධිපති වෙන්න කියලා ඡන්දය ඉල්ලුවාම, ඡන්දය ප්‍රකාශ කරපු ජනතාවගෙන් සියයට 48ක් ජනතාවගේ ඡන්දය ලබාගෙන තමයි පැරදිලා ගෙදර ගියේ. පසු ගිය මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති කරන්න කියලා කෑ ගැහුවාට ඡන්දය ප්‍රකාශ කරපු අයගෙන් අර සියයට 48ක ප්‍රමාණයවත් ගන්න බැරි වුණා. සියයට 44යි ගත්තේ. ඒ ගොල්ලන් පරාජයක් ලැබුවාට උදම් අනනවා. නමුත් අපටත් සතුටු වෙන්න බැහැ. අපටත් මේ මැතිවරණ ප්‍රතිඵලය කනේ පහරක් බවට පත් වුණා; රජයටත් කනේ පහරක් බවට පත් වුණා; අපට පාඩමක් බවට පත් වුණා.

මේ රටේ ජනතාව හොරු ඇල්ලීම පිළිබඳව රජයට අවලාද නඟන විට ජාත්‍යන්තරයත් අපට අවලාද නඟනවා. මොකද, මේ රටේ නීති ප්‍රමාණවත් නැහැ. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වාගේ දේවල් අල්ලන්න මේ රටේ නීති ප්‍රමාණවත් නැහැ කියලා ජාත්‍යන්තරයත් එහෙන් කියනවා. එහෙන් හොරු අල්ලන්න නීති ප්‍රමාණවත් නැහැ කියලා ජාත්‍යන්තරය අපට වම් කනට ගහන කොට, පසු ගිය මැතිවරණයෙන් අපේ රටේ ජනතාව දකුණු කනට ගහනවා, හොරු ඇල්ලුවේ නැහැ කියලා. එකම කථාවක් මේ කියන්නේ. රටේ නීතිය ශක්තිමත් කරන්න ඕනෑ කියන කථාවයි මේ කියන්නේ.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විශේෂයෙන්ම 2006 වසරේ මේ පිළිබඳව දැනුවත් කළා. මේක, අපේ ආණ්ඩුව වග කියන්න ඕනෑ එකක් නොවෙයි. මේ වංචා, හොරකම් කරලා තිබෙන්නේ එදා. 2006 වසරේ පළමුවැනි වතාවටත්, 2014, 2015 වසරවල දෙවැනි වතාවටත් අපේ රට මේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා ඇති නීති රීති හා ගෙන ඇති පියවරයන් දුර්වලය කියලා තේරුම් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිස් අවුරුදු යුද්ධයක් තිබුණු මේ රටේ ත්‍රස්තවාදීන්ට විවිධ රටවලින් මුදල් සපයද්දී, ත්‍රස්තවාදයට මුදල් දුන්නා කියලා අපි තවම එක නඩුවක් විතරයි පවරලා තිබෙන්නේ. අද වන තුරුත් මේ නඩුව විභාග කර අවසන් කර දඬුවම් දීමක් කරලා නැහැ. තවමත් නඩුව පවතිනවා. මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ නඩු විභාග කිරීම පිළිබඳව දුර්වලතාවක් අපේ රටේ තිබෙනවා.

පසුගිය කාලයේ අපි කථා කළා, කාල්ටන් බංගලාවේ ලිපිනයෙන් තිබුණු "සිරිලිය සවිය" ගිණුම පිළිබඳව.

එස්. රාජපක්ෂ කියන නෝනා 222222222V කියා identity card number එක දාලා සංවිධානයක් හදලා තිබෙනවා. කුමාරි කියන නෝනා 111111111V කියා identity card number එක දාලා "සිරිලිය සවිය" කියන සංවිධානය හදලා තිබෙනවා. ඒවායෙන් අයථා විධියට මුදල් ගනු දෙනු වෙලා තිබෙනවා. අපි ඒවා ගැන කථා කළා. අපි ඒවාට විරුද්ධව නඩු පැවරුවා. CSN නාලිකාවට සල්ලි හම්බ වුණේ කොහොමද කියන එක ගැන අපි කතා කළා. අපි ඒ සම්බන්ධයෙන් නඩු පැවරුවා. තවමත් එම නඩු විභාග වෙමින් පවතිනවා. නාමල් රාජපක්ෂ මහත්මයා සතු Gowers Corporate Services Private Limited එකේ රුපියල් මිලියන 30ක මුදලක් විශුද්ධිකරණය කළා කියා අපි නඩු පවරා තිබෙනවා. ඒවාත් උසාවිවල ඔහේ ඇදි ඇදී, දෝලනය වෙමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. "තාරුණ්‍යයට හෙටක්" කියන සංවිධානයට මුදල් ආවේ කොහොමද කියා අපි ප්‍රශ්න කර තිබෙනවා. මල්වානේ ගඟබඩ පාරේ රුපියල් මිලියන 200.3කට අක්කර 16ක් බැසිල් රාජපක්ෂ මහත්මයා අරගෙන තිබෙනවා කියා නඩු පවරා තිබෙනවා. එය රාජසන්තක කරන්න අවශ්‍ය කටයුතු තවම ඔහේ කෙරෙමින් පවතිනවා. උසාවිය තුළ ඒ නඩු විභාග වෙමින් පවතිනවා. එහි අවසානයක් නැහැ. ගම්පහ ඔරුතොට පාරේ රුපියල් මිලියන 150ක් වටිනා සුවිසල් මන්දිරය ගන්න සල්ලි ආවේ කොහොමද? එය ගත්තේ කොහොමද? ඒ සම්බන්ධයෙන් අපි නඩු පවරා තිබෙනවා. නමුත් නීතියේ තිබෙන දුර්වලතා හින්දා ඒවා ඔහේ පා වෙමින් පවතිනවා. රුපියල් මිලියන 50ක් වටිනා, මාතර Browns Hill ඉඩම අත් කර ගත් සල්ලි කොහෙන්ද? ඩෙසි ආචිච්ගේ මැණික් මල්ල ගෙනැල්ලා මුදල් විශුද්ධිකරණය කළේ කොහොමද? මේවා සම්බන්ධයෙන් නඩු පවරා තිබුණත් අපේ නීති පද්ධතිය ශක්තිමත් වෙලා නැහැ. ඒක තමයි ජාත්‍යන්තරය අපට විශේෂයෙන් කියන්නේ. මේ රටේ කළු සල්ලි සුදු කිරීම වැළැක්වීම පිළිබඳව වාගේම ත්‍රස්තවාදය සඳහා මුදල් යෙදවීම වැළැක්වීම පිළිබඳව නීති සකසා නැහැ. අපි දන්නවා ඇවන්ට් ගාර්ඩ් සිද්ධිය ගැන. ඇවන්ට් ගාර්ඩ් සිද්ධිය සම්බන්ධයෙන් අපි කටයුතු කර තිබෙනවා; නඩු පවරා තිබෙනවා. ත්‍රස්තවාදයට අවි සැපයුවාද කියා විමසා තිබෙනවා. ඒ වාගේම රක්නා ලංකා ආයතනය නීති විරෝධී -බලපත්‍ර නැති- ගිනි අවි පාවිච්චි කළා. ඒ සම්බන්ධයෙන් නඩු පවරා තිබෙනවා. නමුත් නීතියේ තිබෙන දුර්වල තැන් හින්දා ඒවා උසාවි තුළ පා වෙමින් පවතිනවා. ඒ හින්දා තමයි ජාත්‍යන්තර සංවිධාන, මුදල් විශුද්ධිකරණය වළක්වා ගැනීම සඳහා ඇති සංවිධාන විශේෂයෙන්ම කියන්නේ මේ නීති රීති පද්ධති තුළ ගමන් කළ යුතු තැනට අප ඇවිත් නැහැ කියා. මේක අද ඊයේ කියන කතාවක් නොවෙයි. 2006 වසරට, 2014 වසරට අදාළ කාරණා සම්බන්ධයෙන් අපට කිව්වා; අපට අවවාද දුන්නා. නමුත් අපේ ප්‍රතිචාර ප්‍රමාණවත් නැති හින්දා අද අපේ රට ජාත්‍යන්තරව අළු ලේඛනයට ඇතුළත් වෙලා තිබෙනවා. එය හරියට මෙවර පළාත් පාලන මැතිවරණයේදී අප පැරදුණා වාගේ එකක්. නමුත් ඉදිරියේදී අපට තිබෙනවා, පළාත් සභා මැතිවරණය දිනන්න; පාර්ලිමේන්තු මැතිවරණය දිනන්න; ජනාධිපතිවරණය දිනන්න. අපට කල් තිබෙනවා, ඒ අඩු-පාඩු හදාගෙන යන්න. ඒ වාගේම අද ජාත්‍යන්තරව අප අළු ලේඛනයට වැටී තිබුණත් කළු ලේඛනයට වැටෙන්න ඉස්සර වෙලා -dark grey list එකට යන්න ඉස්සර වෙලා, එහෙම නැත්නම් blacklist එකට යන්න ඉස්සර වෙලා- ඒවා නිවැරදි කර ගන්න අපට කාලය ඇවිත් තිබෙනවා.

විශේෂයෙන්ම මේ භාර පනත හරහා මුදල් විශුද්ධිකරණය, වංචා වැළැක්වීම පිළිබඳ කථාව ඇවිල්ලා තිබෙන්නේ ඒ ඔස්සේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ, 1917 වර්ෂයේ තමයි භාර ආඥාපනත ලංකාවට හඳුන්වා දුන්නේ. 1971දී තමයි අන්තිම වරට මේ ගැන කටයුතු කළේ. ඒ කියන්නේ, අවුරුදු 47කට පස්සේ තමයි අපේ ඇස් ඇරුණේ. අපේ ඇස් ඇරුණේ නැහැ. ජාත්‍යන්තරය අපේ ඇස් ඇරවනවා, "මේ නීති රීති හදා ගන්න, නැත්නම් මේ රටේ මුදල් විශුද්ධිකරණය වේවි, කළු සල්ලි සුදු කරන තත්ත්වය ඇති වේවි" කියලා. ඉන්දියන් සාගරයේ මුතු ඇටය නමින් හඳුන්වපු මේ රට, ඉන්දියන් සාගරයේ ධර්මද්වීපය නමින් හඳුන්වපු මේ රට, ජාත්‍යන්තරය තුළ "කළු සල්ලි සුදු කරන රට" බවට පත් වෙන්න ඉඩ තියන්න එපා. එහෙම නැත්නම් ජාත්‍යන්තරයේ ත්‍රස්තවාදයට උදව් කරන, අවිආයුධ සපයන රට බවට පත් කරන්න එපා කියලායි ඒ ගොල්ලන් කියා තිබෙන්නේ.

මුදල් අයථා විධියට රැස්කරන රාජ්‍ය නායකයන්ගේ තිප්පොළක් බවට මේ රට පත් වෙලා තිබුණා. මේ රට නැවත ඒ තත්ත්වයට පත් කරන්න එපා කියන එකයි එක පැත්තකින් ජනතාව කථා කරලා කියන්නේත්, අනෙක් පැත්තෙන් ජාත්‍යන්තරය කථා කරලා කියන්නේත්. මේ නීති රීති හදන්න කියලායි ඒ හැම දෙනාම කියන්නේ. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? අපේ රටට ලැබෙන විදේශ ආධාර නැති වෙනවා. මේ නීති හදා ගත්තේ නැත්නම් ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියන රට, එහෙම නැත්නම් ඉන්දියන් සාගරයේ ධර්මද්වීපය කියන රට ලෝකයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා වන හොඳ තිප්පොළක්, කුඩු ජාවාරම් කරන, නීතිවිරෝධීව සල්ලි එකතු කරන, ජාවාරම් කරන අයගේ තිප්පොළක්, මුදල් විශුද්ධිකරණය කරන අයගේ තිප්පොළක් කියලා ලෝකයේ ප්‍රචාරය වන කොට අපේ ව්‍යාපාරිකයන් අසරණ වෙනවා. ඒ විතරක් නොවෙයි. හොඳ ව්‍යාපාරිකයන් ආයෝජන සඳහා ලංකාවට එන්නේ නැහැ. අඩු පොලියට අපේ රටට ණය දෙන ඒවා නවතිනවා. අපේ රට පිළිගත නොහැකි මුදල් එකතු කරන රටක් බවට පත් වෙන බව තමයි විශේෂයෙන්ම ඒ අය කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයුම මැඩ පැවැත්වීමේ ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරන්නේ මූල්‍ය කාර්ය සාධක බලකායයි. Financial Action Task Force නමින් එය හඳුන්වනවා. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම වාගේම ගෝලීය වශයෙන් සිදුවන වැරදි වැළැක්වීම සඳහා මේ ආයතනය නිර්දේශ 40ක් ඉදිරිපත් කළා, 1988දී. 2001දී තවත් නිර්දේශ 09ක් ඉදිරිපත් කළා. ඒ ගැන තමයි ඒ ගොල්ලන් කථා කරන්නේ. මූල්‍ය කාර්ය සාධක බලකාය තමයි අප පාලනය කරන්නේ. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කණ්ඩායම -Asia/ Pacific Group on Money Laundering- මඟින් අප කලාපය නිරීක්ෂණය කරන අතර, අප මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපයේ ආරම්භක සාමාජිකයකු වනවා. අපි මේවායේ සාමාජිකයන්. නමුත්, ඒ තිබෙන ජාත්‍යන්තර ප්‍රමිති අනුව අපි වැඩ කරන්නේ නැහැ. මීට පෙර සඳහන් කළා වාගේ දේශපාලනඥයන් තමන්ගේ වාසියට ජනතා මුදල් හොරකම් කරන, එහෙම නැත්නම් මුදල් විශුද්ධිකරණය කරන රටක් බවට එදා මේ රට පත් කරලා තිබුණා.

විශේෂයෙන්ම අන්න ඒ සඳහා තමයි අපි අවධානය යොමු කළේ. සමහර අය කියන්න පුළුවන්, "ඇයි අපි ජාත්‍යන්තරය කියන දේ අහන්නේ" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කාලය අවසන්.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ජාත්‍යන්තරය කියන දේ අහන්නේ ඇයි කියලා සමහරුන්ට තිතෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් වශයෙන් අපට තනිවම ඉදිරියට යන්න බැහැ. අපේ රට සංවර්ධනය කරන්න ඕනෑ, ලෝකයත් එක්ක එකට යන්න ඕනෑ, අපේ රටට ආයෝජකයෝ එන්න ඕනෑ, වෙනත් රටවලට ගිහිල්ලා රස්සාව කරන්න අපේ මොළවලට පිළිගැනීම ලැබෙන්නට ඕනෑ. එහෙම වුණොත් තමයි අපේ රට බලවත් රටක් කරගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා අපට ජාත්‍යන්තර සමඟ අත් වැල් බැඳ ගන්න අවශ්‍ය වෙනවා. ඕස්ට්‍රේලියාවට එහෙම අවශ්‍ය නොවෙන්න පුළුවන්. ඒ අයට ඕනෑ තරම් ඛනිජ සම්පත් තිබෙනවා. ඇමෙරිකාවට, එහෙම නැත්නම් වෙනත් රටවලට එහෙම අවශ්‍ය නොවෙන්න පුළුවන්. ඒ අයට සම්පත් තිබෙනවා. නමුත්, අපේ රට ඉදිරියට යන්න නම් ජාත්‍යන්තරයත් එක්ක අත් වැල් බැඳගන්න ඕනෑ. ඒ නිසා මම මේ අවස්ථාවේ එක් කරුණක් අවධාරණය කරනවා. අපි බලය ලබාගන්නකොට මේ රට හොරුන්ගේ තිප්පොළක්, මේ රට මුදල් විශුද්ධිකරණය කරන තිප්පොළක් කියලා අපි දන්නවා. ලෝක ප්‍රසිද්ධ කැසිනෝ ව්‍යාපාර මේ රටට ගෙනැල්ලා මේ රටේ ඉඩම් කුණු කොල්ලයට දීපු හැටි අපි දන්නවා. අපි ඒවා ගැන කථා කළාට, ඒවා මැඩපැවැත්වීමට, ඒවා කරපු අයට දඬුවම් දෙන්න පුළුවන් විධියට අපේ රටේ නීති සකස් වෙලා නැහැ. ඒ නිසා ඒ ක්‍රියාදාමයේ එක් කොටසක් හැටියට භාර පනත සංශෝධනය කරලා, භාර (සංශෝධන) පනත් කෙටුම්පත - Trusts (Amendment) Bill එක- සම්මත කරගෙන, මේ රටේ කලු සල්ලි සුදු කරන්න තිබෙන ඉඩ කඩ වළකා අපේ රට කීර්තිමත් රටක් කරමුය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 2.52]

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා ඉතාම අසරණ වෙලා තමයි කථා කළේ. [බාධා කිරීමක්] ඔබතුමාම කිව්වා, "අපි දැන් ජනතාව ඉස්සරහ අසරණ වෙලා ඉන්නේ" කියලා. මේක අපි කියන කථාවක් නොවෙයි. ඔබතුමාම කිව්වා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව වැඩ බැරි ආණ්ඩුවක් කියලා. අපි කියන්න ඕනෑ කාරණය තමයි ඔබතුමා කිව්වේ.

අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පනතට සංශෝධනයකුත්, තවත් පනත් යටතේ එන නියෝග සහ රීති කිහිපයක් සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කළා. එකක් තමයි, අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ, හිටපු අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා නියෝගයක් පනවා තිබුණා, පරමාණුක බලශක්ති අධිකාරී පනත යටතේ පැනනඟින සියලු නීති කටයුතුවලට අදාළ නඩු කොළඹ මහාධිකරණයේ අහන්න ඕනෑ කියලා. වර්තමාන අමාත්‍යතුමිය එයට සංශෝධනයක් ගෙනෙනවා, "පරමාණුක බලශක්ති අධිකාරී පනත යටතේ ප්‍රකාශිතව විධිවිධාන සලසා ඇති නඩු විතරයි ඒ අධිකරණයේ අහන්න පුළුවන්" කියලා. මේකෙන් මොකක්ද අදහස් කරන්නේ කියලා අපි ඔබතුමියගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, නීති විද්‍යාලයට නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් පත් කරන්න අවශ්‍ය රීති අද ඉදිරිපත් කර තිබෙනවා. ඒක බොහොම

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

හොඳයි. නීති විද්‍යාලයට ඇතුළත් වෙන්න මේ වන විටත් විශාල තරගයක් තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. එම නිසා නීති විද්‍යාලයට ඇතුළත්වීමේ සිට ඒ සියලු කාරණා නිශ්චිතව කරන එක හොඳයි කියලා අපි කියනවා.

භාර ආඥාපනතටත් අද සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සංශෝධනයේ මුඛ්‍ය පරමාර්ථය හැටියට මේ ආණ්ඩුව පෙන්වන්න හදන්නේ, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් යම් යම් සීමා පනවන එකයි. මන්ත්‍රීවරු ගණනාවක් මේ ගැන කථා කරලා කිව්වා, "මීට කලින් අධිකරණ සංවිධාන පනතට සංශෝධනයක් ගෙනාවා, ඒ සංශෝධනය ගෙන එන එක වළක්වන්න ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු කණ්ඩායමක් උසාවියට ගිහිල්ලා කරුණු දක්වනවා, ඒකෙන් මේ හොරු අල්ලන කාර්යය ප්‍රමාද වෙලා තිබෙනවා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව මේ යෝජනා ගෙනැවිත් රටේ ජනතාවට කියනවා, "අපි හොඳ දේවල් කරන්න යනවා." කියලා. හැබැයි, මේවායේ අභ්‍යන්තරය සොයා බැලුවොත්, මේ ආණ්ඩුව අධිකරණයේ ස්වාධීනත්වය ඇති කළාද, නැති කළාද කියන කාරණය මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා තමයි මේ රටේ මිනිස්සු පසුගිය පෙබරවාරි 10වැනි දා තිබුණු පළාත් පාලන මැතිවරණයේදී මේ ආණ්ඩුව කරවන නායකයන්ට අමතක නොවන පාඩමක් ඉගැන්වූයේ කියන කාරණය අපි කියන්න ඕනෑ.

අපේ රටේ හිටපු අග්‍රවිනිශ්චයකාරවරියක් ඉවත් කිරීම ගැන මේ ගරු සභාවේදී දැන් කථා කළා. නමුත් අපි මේ ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, මොහාන් පීරිස් මහත්මයා මේ රටේ අග්‍රවිනිශ්චයකාරකමින් අයින් කළේ කොහොමද කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව යම් ආකාරයක විනිවිදභාවයකින් ඒ කටයුතු කළා. හැබැයි, මේ ආණ්ඩුව මොහාන් පීරිස් මහත්මයා අග්‍රවිනිශ්චයකාරකමින් අයින් කළේ කොහොමද කියලා කවුරුවත් දන්නේ නැහැ.

නීතිපතිවරයාගේ තනතුර ස්වාධීන කරන්න ඕනෑය කියලා නීතිපතිවරයාගේ තනතුර දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතට ගෙනැල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය හරහා ස්වාධීන තනතුරක් හැටියට පත් කළා. නමුත්, ඊට පස්සේ නීතිපතිවරයා ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමට කැඳවලා නීතිපතිවරයාගේ රෙදි ගලවපු හැටි මේ රටේ මිනිස්සු දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "දැන් නීතිපති දෙපාර්තමේන්තුවට අලුතින් නිලධාරීන් බඳවා ගන්න යනවා. වැටුප් වැඩි කරන්න යනවා." කියලා. වෙන දා නීතිපති දෙපාර්තමේන්තුවට කනිෂ්ඨ නීතිඥයන් බඳවා ගන්න ගියාම ලොකු තරගයක් තිබුණා. නමුත්, අද මේ රටේ කනිෂ්ඨ නීතිඥයන් නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන්න කැමැති නැහැ. ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන්න අකමැති වෙන කිසිදු කාරණයක් නිසා නොවෙයි. මේ ආණ්ඩුවේ පාලනය යටතේ අද නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම කෙළෙසලායි තිබෙන්නේ. ඒ නිසායි ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවට බැඳෙන්න අකැමැති. ඒ නිසා අපි කියන්න ඕනෑ, අද මේ ආණ්ඩුව විශේෂයෙන්ම මේ රටේ අධිකරණය සහ නීතිය සම්පූර්ණයෙන්ම කෙළෙසා අවසන් බව. ඒ නිසා මේ පනත් ගෙනාවාට වැඩක් නැහැ. පැහැදිලිව මේ රටේ නීතියේ, අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරන්න ඕනෑ නම්, අධිකරණයට සහ නීතිපති දෙපාර්තමේන්තුවට ස්වාධීනව වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම අද මේ ආණ්ඩුවේ තත්ත්වය පිළිබඳව අපට කියන්න කනගාටුයි. ගරු තලතා අතුකෝරල අධිකරණ ඇමතිතුමියට කලින් හිටපු අධිකරණ ඇමතිතුමා ගැන අපි දන්නවා. එතුමා නීතිඥ ප්‍රජාව ඉස්සරහා ස්වාධීන පුද්ගලයෙක් හැටියට නමක් දිනාගෙන හිටපු කෙනෙක්. නමුත් එතුමා දරපු ස්වාධීන මත නිසා, එතුමා ස්වාධීනව අදහස් ප්‍රකාශ කරපු නිසා අවසානයේදී ඉතාම පහත් ආකාරයට එතුමා අධිකරණ ඇමතිකමින් ඉවත් කරන්න මේ ආණ්ඩුව කටයුතු කළා. ඒ නිසා තමුන්නාන්සේලා "ලෝකෙට පරකාසේ - ගෙදරට මරගාතේ" ආණ්ඩුවක්. මේ ආකාරයට කටයුතු කරන්න එපා කියන කාරණය අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. මේ රටේ අධිකරණ ඉතිහාසයේ කිසිම කාලයක නොවෙච්ච කාරණා කීපයක් දැන් සිද්ධ වෙනවා. දැන් මේ රටේ නඩු අහන අධිකරණ විනිශ්චයකාරවරුන්ට විරුද්ධව උසාවියේ නඩු දමනවා.

අභියාචනාධිකරණ විනිශ්චයකාර නවාස් මැතිතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් වශයෙන් කටයුතු කරද්දි, මොහාන් පීරිස් මහත්මයා නීතිපතිවරයා හැටියට කටයුතු කළා. එතුමා නීතිපතිවරයා හැටියට විදුලිබල අමාත්‍යාංශයේ නිලධාරින් පිරිසක් සම්බන්ධයෙන් යම් උපදේශයක් ලබා දුන්නා. මෙහිදී දූෂණයක් සම්බන්ධයෙන් යම් චෝදනාවක් ඉදිරිපත් කරලා, අද වන විට මේ අයට කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ නඩු පවරා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ නීතිඥ සංගමය සහ අදාළ චිත්තිකරුවන් ඒ සම්බන්ධයෙන් සුප්‍රීම් උසාවිය ඉදිරියට ගිහින් "රිට්" ආඥාවක් ගත්තා. ඊට පසුව එහි විනිශ්චය ආසනයේ වාඩි වී සිටි ඊවා වනසුන්දර විනිශ්චයකාරතුමියට විශාල චෝදනාවක් එල්ල කරලා, මේ ආණ්ඩුවේ අල්ලස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අද ඒකට විරුද්ධව රිට් ආඥාවක් ඉල්ලා තිබෙනවා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මේ රටේ රාජ්‍ය සේවය ස්වාධීන කරනවාය කියමින් රජයේ සේවකයන්ගේ කොන්ද කැඩුවා. අපි දන්නවා අද රජයේ සේවකයෝ වැඩ කරන්නේ නැති බව. ඒ වාගේම තමයි, අද තමුන්නාන්සේලා ක්‍රම ක්‍රමයෙන් අධිකරණයේත් කොන්ද කඩමින් යනවා. අපි තමුන්නාන්සේලාට මෙන්න මේ කාරණය ගැනත් කියන්නට ඕනෑ. තමුන්නාන්සේලා මේ රටේ ස්වාධීන අධිකරණය විශ්වාස නොකළාට, මේ රටේ බහුතරයක් ජනතාව තුළ අදටත් මේ රටේ විනිශ්චයකාරවරු පිළිබඳව ලොකු විශ්වාසයක් තිබෙනවා; මේ රටේ අධිකරණ පද්ධතිය පිළිබඳව ලොකු විශ්වාසයක් තිබෙනවා. මේ ආණ්ඩුවේ ජනාධිපතිවරයාට, අගමැතිවරයාට ඕනෑ ඕනෑ විධියට මේ රටේ උසාවිය, මේ රටේ විනිශ්චයකාරවරුන් නටවන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවා නම් මේ රටේ විනිශ්චයකාරවරුවත්, මේ රටේ නීතිඥවරුවත්, අධිකරණයට සම්බන්ධ කිසි කෙනෙකුවත් ඒකට ඉඩ දෙන්නේ නැහැ කියලා අපි තමුන්නාන්සේලාට කියනවා. අද තමුන්නාන්සේලා මහා ලොකුවට කයිවාරු ගැහුවා. මෙතැන තමුන්නාන්සේලාගේ මුඛ්‍ය පරමාර්ථය වෙලා තිබෙන්නේ මොකක්ද? අද තමුන්නාන්සේලාට මේ රටේ වැඩ කරන්න බැරි හේතුව කියන්නේ නැහැ. මේ ආණ්ඩුවට විරුද්ධව මේ රටේ මිනිසුන් ඡන්දය පාවිච්චි කළේ හොරු ඇල්ලුවේ නැති නිසාය කියන කාරණය තමයි තමුන්නාන්සේලා කියන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ රාජපක්ෂවරු හොරු කියලා තමුන්නාන්සේලා 2015 ජනවාරි 8වැනි දාට ඉස්සර වෙලා මේ රටේ මතයක් ප්‍රචලිත කළා. මේ රටේ ජනතාවගේ මනස අවුල් කරලා, තමුන්නාන්සේලා ඉතාම කැත, නින්දිත විධියට තමයි අපෙන් බලය ලබාගත්තේ. "රාජපක්ෂලාගේ සල්ලි අරෙහේ තිබෙනවා; මෙහේ තිබෙනවා, අර හොරකම් කර තිබෙනවා; මේ හොරකම් කර තිබෙනවා" කියලා තමුන්නාන්සේලා කිව්වා. නමුත් ඒ එක හොරකමක් තමුන්නාන්සේලාට අල්ලන්න බැරි වුණා. තමුන්නාන්සේලා FCID එක පිහිටෙව්වා.

තමුන්නාන්සේලා අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරලා නඩු අහන එක කඩිනම් කරන්න ඉස්සර වෙලා පුළුවන් නම් මෙන්න මේ කාර්ය කරන්න කියා අපි අභියෝග කරනවා. මේ වෙන කොට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට නඩුවක් තිබෙනවා. ඒ නඩුව තමයි FCID එක නීතිගත කිරීම මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියන එක. නමුත් අපි දන්නවා, අද වන තුරු තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දුන්නේ නැති බව. අපේ ආණ්ඩුව කාලයේ හොරු අල්ලන්න තමුන්නාන්සේලාට කරන්න පුළුවන් හැම දේම කළා. හැබැයි, තමුන්නාන්සේලා කියන හොරකම් අපේ කාලයේ වුණේ නැහැ. ඒ නිසා තමයි තමුන්නාන්සේලාට හොරු අල්ලන්න බැරි වුණේ. තමුන්නාන්සේලා ඒ ලජ්ජාව වහගන්න, මේ රටේ ජනතාවගේ ඔළුව අවුල් කරලා කුමන්ත්‍රණකාරීව ලබා ගත් බලය ආපහු ශක්තිමත් කරගන්න තමයි "අපිට ඕනෑ මේ හොරු අල්ලන්න, නමුත් මේ හොරු අල්ලන්න බැහැ, මේ රටේ අධිකරණය ස්වාධීන නැහැ, අධිකරණ පද්ධතිය ශක්තිමත් නැහැ, ඒ නිසා මේ රටේ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරලා ත්‍රිපුද්ගල මහාධිකරණ කමිටුව පත් කරන්න අවසර දෙන්න" කියලා දැන් කිය කියා යන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිවරයාට අවශ්‍ය නම් අග්‍ර විනිශ්චයකාරතුමා එක්ක සාකච්ඡා කරලා මේ කාර්ය කරන්න පුළුවන්. එහෙම නම් තමුන්නාන්සේලා ඉස්සරවෙලා බැඳුම්කර නඩුව අහන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ මහාධිකරණයේ එච්සී 4648 /2009 දරන නඩුව විභාග වුණා. ඒ නඩුවෙන් විත්තිකාරයෝ නිදහස් කළත්, එම නඩු තීන්දුවේ තිබෙනවා, නැවත චෝදනාවක් නඩු දමන්න පුළුවන් කියලා. නමුත් මේ ආණ්ඩුව තවම ඒ පිළිබඳව කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. ගරු අධිකරණ ඇමතිතුමියගේ අවධානයට අපි මේ කාරණය යොමු කරවනවා.

අධිකරණය ස්වාධීන නම්, තමුන්නාන්සේලා අධිකරණයට ඇඟිලි ගහන්නේ නැත්නම්, තමුන්නාන්සේලා නීතිපති දෙපාර්තමේන්තුවට ඇඟිලි ගහන්නේ නැත්නම් මෙන්න මේ නඩුවේ විත්තිකාරයන්ට නැවත නඩු පවරන්න කියා අපි අධිකරණ ඇමතිතුමියට අභියෝග කරනවා. එසේ අභියෝග කරමින්, මට කථා කිරීමට කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.02]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. අධිකරණය තමයි රටේ විශාලම කර්තව්‍යයක් කරන ස්ථානය. එම ස්ථානය හරහා රටේ තිබෙන සියලුම වැරදි නිවැරදි කර ගන්න පුළුවන් හැකියාව අපිට ලැබෙනවා. මම මේ කාරණය පසුගිය මාසය තුළ මේ රටේ සිදු වූ කලබලකාරී තත්ත්වය හා සම්බන්ධ කරන්න කැමැතියි. පසු ගිය මාසය තුළදී මේ රටේ සිදු වෙච්ච කලබලකාරී තත්ත්වය සමථයට පත් කරන්න ආගමික නායකවරු විශාල වශයෙන් උදව් කළා.

විශේෂයෙන්ම නුවර ප්‍රදේශයේ ඇති වුණු සිද්ධිය සමථයට පත් කරන්න මල්වතු මහා නායක ස්වාමීන් වහන්සේ ඇතුළු සියලුම නායකවරු අපට උදව් කළා. අස්ගිරිය මහා නායක හිමිවරු වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන අටමස්ථානයන්හි මහානායක හිමිවරු ඇතුළු රටේ සිටින සියලුම බෞද්ධ ආගමික නායකවරු උදව් කළා. මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරුතුමා ඇතුළු සියලුම ක්‍රිස්තියානි ආගමික නායකවරු ඒ කාරණයේදී උදව් කළා. සමස්ත ලංකා ජමියතුල් උලමා ඇතුළු මුස්ලිම් ආගමික නායකවරු, හින්දු ආගමික පූජකවරු, කතෝලික පූජකතුමන්ලා ඇතුළු මේ සියලු දෙනාම රටේ ඇති වෙච්ච විශාල ප්‍රශ්නය සම්බන්ධයෙන් නිවැරදි තීන්දුවක් ගන්න ඒ අවස්ථාවේ දී අප සමඟ එකතු වුණා.

ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා, ලකී ජයවර්ධන, ආශු මාරසිංහ, රවීන්ද්‍ර සමරවීර, රිසාඩ් බදියුදීන්, මුජීබුර් රහුමාන්, රවුෆ් හකීම්, අබ්දුල් හලීම්, හිස්බුල්ලා සමඟ මමත් එම ප්‍රශ්නය ඇති වුණු අවස්ථාවේ දී නුවර ප්‍රදේශයට ගිහිල්ලා ඒ අයගේ ප්‍රශ්න පිළිබඳව සොයා බැලුවා. ඇත්තටම මීට පසුව මෙවැනි ප්‍රශ්න ඇති නොවන විධියට අපි කටයුතු කරන්නට ඕනෑ. ඒක අපේ ගරු අගමැතිතුමා, ජනාධිපතිතුමා නිතරම කියන දෙයක්. අවුරුදු තිහක් යුද කරලා, ජනතාව පීඩාවට පත්වෙලා, සමස්ත රටම නැත්තටම නැති වෙලා තිබුණු යුගයක් එදා තිබුණේ. ඒ යුගය නැති කරලා, නැවත චෝදනාවක් ශක්තිමත් රටක් ඇති කිරීම තමයි අපි නිතරම බලාපොරොත්තු වන්නේ. සිංගප්පූරුව, මැලේසියාව වාගේ අපේ රටත් ඉදිරියට අරගෙන යන්න නම් අපි ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී නැති ජාතියක් විධියට ගමන් කරන්න ඕනෑ කියන එක තමයි ගරු අගමැතිතුමා නිතරම කියන්නේ.

අද රට දිහා බලන්න. එදා රබර්, තේ, කොකෝවා වැනි බෝගවලින් රටේ ආර්ථිකය දියුණුවට පත්වෙලා තිබුණා. අපි කෘෂි කාර්මික රටක්. අවුරුදු හතරක්, පහක් කන්න අවශ්‍ය වී, මිරිස් වැනි බෝග කිසිවක් නැහැ. ඩොලරයේ අගය එන්න එන්නම පහත වැටෙනවා. ආදායමක් නැහැ. මම දන්නා විධියට එහෙම තත්ත්වයක් තිබෙද්දී තමයි මේ රටේ ජනතාවගෙන් සියයට දශම ගණනක් -ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී කල්ලියක්- මේ වාගේ ප්‍රශ්නයක් ඇති කළේ.

මේකට පැහැදිලිවම අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සිටිනා 225දෙනාම උත්තර දෙන්න ඕනෑ. එක එක්කෙනා, එක එක්කෙනාට බෝල පාස් කරනවා. පසුගිය ආණ්ඩුව පරාජය කරලා මේ ආණ්ඩුව -විපක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂය- පත් කළ අය ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ ඉන්නා 225දෙනාටම මම කියනවා, අපි 225දෙනා තමයි මේ රටේ තිබෙන ප්‍රශ්නවලට අනිවාර්යයෙන්ම උත්තර දිය යුත්තේ කියලා. අපි 225දෙනාට ලජ්ජාව තිබෙන්න ඕනෑ. අපිට බැරිද, මේ ප්‍රශ්න නවත්වන්න? මෙම ප්‍රශ්න නවත්වන්න පළමුවෙන්ම ඉදිරිපත් වුණේ මහනුවර මල්වතු-අස්ගිරි පාර්ශ්වවල නායක ස්වාමීන්වහන්සේලා. මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා මෙම ප්‍රශ්න නවත්වන්න උදව් කළේ උන්වහන්සේලා. අපි ඊයේ දිනයේදී ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වුවා. පැය එකහමාරක් පැවැති එම සාකච්ඡාවේදී, "මෙතැනින් පසුව මේ රටේ සාමය නැති කරන්න මම කවදාවත් ඉඩ දෙන්නේ නැහැ" කියලා එතුමා පැවසුවා.

අතිගරු ජනාධිපතිතුමනි, මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඔබතුමා යහපාලන රජය ගත්තේ, මේ රටේ සමඟිය ඇති කරන්නයි. අවුරුදු 30ක් තිස්සේ පැවැති යුද්ධයෙන් බැට කාපු මේ රට, විනාශ වුණු රටක්. මේ රටේ සිටින මුස්ලිම්, සිංහල, දෙමළ

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

කියන සියලුම ජාතීන් එක ජාතියක් විධියට එකතු වී ඔබතුමා කෙරෙහි ලොකු විශ්වාසයක් ඇතුව තමයි පසුගිය රජයෙන් උදුරා මේ රජය පත් කර ඔබතුමාට බලය ලබා දුන්නේ. එහෙම නම් මෙතැනින් පසුව හෝ කවදාවත් මේ රජයේ මේ වාගේ පලුදුවීමක් ඇති නොවී, සියලුම ජාතීන්ගේ නායකයා විධියට සියලුම ජාතීන්ට රැකවරණය දිය යුතු බව ඔබතුමා තේරුම් ගන්න ඕනෑ. මෙතැන ඒ තරම් දෙයක් නැහැ. අපිට දකින්න පුළුවන් සිංහල, මුස්ලිම්, දෙමළ කියන හැම ජාතියකම ජාතිවාදීන් ඉන්නා බව. සියයට දශම ගණනකින් තමයි එසේ ජාතිවාදීන් ඉන්නේ. ඔවුන් සම්බන්ධව තමයි අපි අද වනවිට විශේෂ අධිකරණ ඇති කර තිබෙන්නේ. ඔවුන් මුස්ලිම් වෙන්න පුළුවන්, සිංහල වෙන්න පුළුවන්, දෙමළ වෙන්න පුළුවන්. ඔවුන් සම්බන්ධයෙන් හරියාකාරව නීතිය ක්‍රියාත්මක කළා නම්, කවදාවත් මහ පාරට බහින්නේ නැහැ. අද බලන්න, වැරදි කරපු අයට දඬුවම් දීලා තිබෙනවා. කවුද, මහ පාරට බැස්සේ? කවුරුවත් බැස්සේ නැහැ. සමහර කල්ලි දේශපාලන වාසි ගන්න ඕනෑ නිසා පිටුපසින් ඉඳිමින් අවුස්සනවා. නමුත් මේ රට කෙරෙහි ආදරයක් තිබෙන ජනතාව කවදාවත් ඒවාට ඉඩ දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වඳ පෙත්තක් ගැන කථා කරනවා. අපිට දුකයි. ලෝකයේ කොහේවත් වඳ පෙති නැහැ. වඳ පෙත්තක් නිබුණා කියලා, ඒ වාගේම සමහර ඇඳුම් යොදාගෙන ළමයි හැදෙන්නේ නැති වෙන විධියේ වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා සමහර උදවිය කියනවා. එහෙම නිබුණා කියලා ඔප්පු කළොත්, මම හෙට පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස්වෙනවා කියලා මා අභියෝග කරනවා. ලෝකයේ කොහේවත් වඳ පෙති නැහැ. මේක අමූලික බොරුවක්; මේක ව්‍යාපාරයක්; මේක දේශපාලනයක්. මේක පිටුපස ඉන්නේ කවුද? පිට රට කාකයෝ තමයි ඉන්නේ. නෝර්වේ වාගේ රටවල් අපේ රටේ නැවත වතාවක් - අපේ රට යුද්ධය නිසා අවුරුදු 30ක් බැට කෑවා.- ලෝකයේ තිබෙන ඉතියෝපියාව, සෝමාලියාව, ටැන්සානියාව වැනි රටවල තත්ත්වයට පත් කරන්න තමයි මේ සියලු කටයුතු කරන්නේ කියලා ශ්‍රී ලාංකිකයෙක් විධියට මා කියා සිටිනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, මෙතැනින් පසුව කවදාවත් මේ විධියට ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී කටයුතුවලට ඉඩ දෙන්න එපා කියලා මම ඔබතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. පොලීසිය හාර ඇමතිතුමා සමඟ අපි ඊයේ කථා කළා. අපි එතුමාට කිව්වා, "ජාතිවාදී කටයුතු කළ අය මුස්ලිම් වෙන්න පුළුවන්. ඔවුන්ට මේ රටේ තිබෙන උපරිම දඬුවම් ඔබතුමා දෙන්න. එසේ කළේ ඇයි, කියලා අපි කවදාවත් ඔබතුමාගෙන් අහන්නේ නැහැ" කියලා. මමත්, මෙතැන සිටිනා සියලුම මුස්ලිම් නායකයෝත් ඊයේ පොලීසිය හාර ඇමතිතුමාට ඒ බව කිව්වා.

අපේ රට නිදහස ලබා ගත්තා. නමුත් අපට දැන් මහා විශාල ආර්ථික ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. එය විසඳා ගන්නවා නම්, එය කළ හැකි වන්නේ මොන විධියටද? අද ඉගෙන ගත් දොස්තර මහත්වරු ඉන්නවා; අපේ ක්‍රීඩකයෝ ඉන්නවා. එක් ක්‍රීඩකයෙකු කියා තිබෙනවා, "එකම රටක්-එකම මවක්" කියලා. මට එතුමාගේ නම මතක නැහැ. එහෙම නම් මේ රට ඉදිරියට ගමන් කළ යුත්තේ මොන විධියටද? මම දන්නා විධියට මේ රටට ආදරය කරන සියලුදෙනා ජාතිවාදී ප්‍රශ්නවලට මැදිහත් වෙන්නේ නැහැ. මේ රටේ ඉන්නා සියයට 99.9ක් පමණ වන ජනතාව මේ රට ගැන ආදරයෙන් තමයි කථා කළේ. මේක අද මුස්ලිම් ජනතාවට වෙන්න පුළුවන්; හෙට බෞද්ධ ජනතාවට වෙන්න පුළුවන්; අනිද්දා හින්දු ජනතාවට වෙන්න පුළුවන්, ක්‍රිස්තියානි ජනතාවට වෙන්න පුළුවන්. ඒ නිසා කවදාවත් කවුරුවත් මෙවැනි දෙයකට ඉඩ දෙන්න එපා කියන එක තමයි හැම එක්කෙනාගේම ඉල්ලීම වුණේ.

ඒ නිසා මේ ප්‍රශ්න නැති කරන්න උදව් කරපු, මේ ප්‍රශ්න නැති වෙන විධියට සියලුම කටයුතු කරපු අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ඒ වාගේම සියලුම මැතිඇමතිවරුන්ට මම ස්තුතිවන්ත වනවා. ඒකට හේතුව තමයි ඒ අය ඉදිරිපත් වුණු නිසා තමයි අද මෙහෙම හරි නිදහසේ ඉන්න පුළුවන් විධියට රටේ සාමය ඇති වෙලා තිබෙන්නේ. අපි මීට පස්සේ මේ රටේ නීතියට ගරු කරමු; උසාවියට ගරු කරමු. ඒ වාගේම වැරදි කරන වැරදිකාරයන්ට හරි විධියට නීතිය ක්‍රියාත්මක කෙරුවා නම් කවදාවත් වැරදිකාරයෙක් ඇති වෙන එකක් නැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ගැන ලොකු විශ්වාසයක් මේ රටේ සිටින සියයට 99.9ක ජනතාවකට තිබෙනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා ගැනත් ඒ වාගේමයි. අලුතෙන් පත් වූ අපේ පොලීසිය භාර ඇමතිතුමනි, ඔබතුමා ගැනත් ලොකු විශ්වාසයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම උසාවිය භාර අපේ තලතා අතුකෝරල ඇමතිතුමියනි, ඔබතුමිය ගැනත් ලොකු විශ්වාසයක් සියලු ජනතාවට තිබෙනවා. ඒ නිසා මා බලාපොරොත්තු වෙන විධියට, රටම බලාපොරොත්තු වන විධියට ඔබ සියලු දෙනාම හරියට නීතිය කරයි කියා විශ්වාස කරනවා. නීතියට කාටවත් හතුරුකම් කරන්න බැහැ. ඒ නිසා ඒ අයට උපරිම දඬුවම දීලා කටයුතු කරන්න ඕනෑ. එදා මේ රට ලස්සනට නිදහස් වෙච්ච වෙලාවේදී ඒ නිදහස දිනා ගන්න සියලු ජන නායකවරු ඉදිරිපත් වුණා. ඩී.එස්. සේනානායක මැතිතුමා ඇතුළු මුස්ලිම් නායකවරු ඒ සඳහා ඉදිරිපත් වුණා. ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම්, ටී.බී. ජයා වාගේ අය එදා නිදහස වෙනුවෙන් සටන් කළා. එදා වාගේ අද අපිත් එකට එකතුවෙලා තමයි මේ සටන අරගෙන යන්න ඕනෑ. ඒ නිසා අපේ රට, අපේ මව්බිම, එකම ජාතියක්, එකම රටක් කියන හැඟීමෙන් මේ රටේ ආර්ථිකය හරියට කරනවා නම්, අපට දියුණුව කරා යන්න පුළුවන්. ඒ සඳහා තවමත් අපට කාලය ඉතුරුවෙලා තිබෙනවා, ගරු ජනාධිපතිතුමනි. ඔබතුමාටයි, කැබිනට් මණ්ඩලයටයි මේ අවුරුදු දෙකක කාලය තුළදී මේවා හදාගන්න එක එච්චර දෙයක් නොවෙයි. අද ඉඳලා හරි වැඩපිළිවෙළක් ඇති කර ගත්තොත් නීතියයි, සාමයයි, සමගියයි ඇති කර ගන්න පුළුවන් කියන විශේෂ බලාපොරොත්තුවක් මට තිබෙනවා. අවසාන වශයෙන් කියනවා, මෙතැන කවුරු හරි වැරදි කෙරුවා නම්, ඒ අයට නියම විධියට නීතිය ඉටු කරන්න. ඊට පස්සේ සිංගප්පූරුවක් නොවෙයි, ලෝකයේ ඉහළම රටක් බවට ලංකාවට පත් කරන්න පුළුවන්.

මට කථා කරන්න කාල වේලාව දීපු අපේ නුවර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයේදී විශේෂ උනන්දුවක් දැක්වුවා; ඒ වාගේම අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් මේ ප්‍රශ්නයේදී විශේෂ උනන්දුවක් දැක්වුවා. ඒ ගැන ඔබ සියලු දෙනාට ස්තුතියි කියමින් මා සමු ගන්නවා.

[ප.ව. 3.15]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)

(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதித்துறையிலே ஏற்படுத்தப்பட வேண்டிய சட்டத் திருத்தங்கள் தொடர்பில் நடைபெறுகின்ற இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகவும்

மகிழ்ச்சியடைகின்றேன். அல்ஹம்துலில்லாஹ்! குறிப்பாக, இந்த நாட்டிலே நீதித்துறையிலுள்ள சட்டங்களில் பல்வேறு பட்ட திருத்தங்களைக் கொண்டுவந்து, வழக்கு விசாரணை களிலுள்ள தாமதங்களைத் தவிர்த்து, சாதாரண மக்கள் நீதிமன்றத்திலே தங்களுடைய பிரச்சினைகளுக்குரிய தீர்வு களைத் துரிதப்படுத்திப் பெற்றுக்கொள்ளக்கூடிய வகையிலான சட்டத் திருத்தங்களைச் சமர்ப்பித்துள்ள நீதியமைச்சர் அவர்களுக்கு முதலில் நன்றியையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

குறிப்பாக, ஒரு நாடு முன்னேற வேண்டுமாக இருந்தால், அந்த நாட்டின் நீதித்துறை சிறப்பாக இருக்கவேண்டும்; அந்த நாட்டில் நீதி எல்லோருக்கும் சமனாக இருக்கவேண்டும். ஒருவருக்கொருவர் வித்தியாசமாக நீதி செயற்பட முடியாது. அந்த வகையில் அரசியல் அதிகாரத்தில் இருந்தாலென்னெ, ஆன்மீக -மார்க்கத் தலைவர்களாக இருந்தாலென்ன, சாதாரண குடிமகனாக இருந்தாலென்ன "நீதிக்கு முன்னால் எல்லோரும் சமம்" என்கின்ற வகையில் இந்த நாட்டிலே சட்டம் நடைமுறைப்படுத்தப்பட்டால்தான் நாம் நாட்டைக் கட்டியெழுப்ப முடியும். இந்த நாட்டில் நாங்கள் கிட்டத்தட்ட 30 வருடங்கள் யுத்தத்தில் சிக்கித் தவித்தோம் - மிக மோசமான யுத்தத்தைச் சந்தித்தோம். 1983ஆம் ஆண்டு ஏற்பட்ட ஜூலைக் கலவரம் தொடக்கம் எமது நாடு பிரச்சினைகளுக்கு முகம்கொடுத்து வந்தது. அதாவது பாரிய கலவரங்கள், பாரிய பிரச்சினைகள், ஆயிரக்கணக்கான உயிரிழப்புக்கள், கோடிக்கணக்கான சொத்திழப்புக்கள், இலட்சக்கணக்கான மக்கள் இந்த நாட்டைவிட்டுத் தப்பியோடியமை போன்ற பல்வேறுபட்ட மோசமான சூழ்நிலைகளுக்கு நமது நாடு முகங்கொடுக்க நேர்ந்தது. இவை எல்லாவற்றுக்கும் முகங்கொடுத்து, இந்த நாட்டை யுத்தத்திலிருந்து மீட்டெடுத்து அமைதியையும் சமாதானத்தையும் கொண்டுவந்து, அதனைக் கட்டியெழுப்புவதற்கு நாம் முயற்சி எடுத்துக்கொண்டிருக்கின்ற போது, மீண்டும் இனவாதத்தைத் தூண்டி நாட்டைக் குட்டிச்சுவராக்குவதற்குச் சில சக்திகள் முயற்சிக்கின்றன.

உண்மையிலே, கடந்த அரசாங்க காலத்தில் அழுத்கம சம்பவம் இடம்பெற்றபோது, அதற்கெதிராகச் சிறுபான்மைச் சமூகத்தினர் கிளர்ந்தெழுந்து ஆட்சியையே மாற்றினார்கள். ஆனால், அழுத்கம சம்பவத்தைவிடவும் படுமோசமான செயல்கள் புதிய ஆட்சியான இந்த நல்லாட்சியிலும் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. அதிலும், கௌரவ பிரதம அமைச்சர் அவர்கள் சட்டத்துக்கும் ஒழுங்குக்கும் பொறுப்பான அமைச்சராக இருந்தும் கண்டி மாவட்டத்தின் பல இடங்களில் மிக மோசமான சம்பவங்கள் இடம்பெற்றன. இந்த நிலைமை களை நாங்கள் மிகவும் கவலையோடு பார்க்கின்றோம். அந்தப் பிரதேசங்களுக்கு நாங்கள் சென்றிருந்தோம். சட்டத்தையும் ஒழுங்கையும் நிலைநாட்ட வேண்டிய பொலிஸார், கலவரங்கள் இடம்பெறுகின்றபோது தங்களுடைய கடமையைச் செய்யாமல் துப்பாக்கிகளை வைத்துக்கொண்டு பார்த்துக்கொண்டிருந்த தாக அந்த மக்கள் எங்களிடம் சொன்னார்கள். பள்ளி வாசல்களின் பாதுகாப்புக்கென நிறுத்தப்பட்டிருந்த பத்துக்கும் மேற்பட்ட பொலிஸார் பார்த்துக்கொண்டிருக்க, 10 - 15 இளைஞர்கள் வந்து குறித்த பள்ளிவாசல்களை எரித்து நாசமாக்கிய சம்பவங்களும் இடம்பெற்றிருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்களும் கண்டி மாவட்டத்தைச் சேர்ந்தவர். கண்டியிலே அண்மையில் ஏற்பட்ட பிரச்சினையை முற்றாகக் கட்டுப்படுத்துவதற்காக கடுமையாகப் பாடுபட்ட ஒருவர்தான் கௌரவ அமைச்சர் லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள். அவர் என்னுடைய நல்ல நண்பருமாவார். මම ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා එකතු වෙලා ඒ ප්‍රශ්නයට විසඳුම් ලබා දුන්නා. ආකවේ, இதுபோன்ற பிரச்சினைகள் எதிர்காலத்திலே நடைபெறக் கூடாது. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට. එතුමා විශේෂ ප්‍රකාශයක් කළා. එතුමා හැම ප්‍රදේශයකටම ගිහිල්ලා පුළුවන් තරම් ඉක්මනින් එම ප්‍රශ්නය නවත්වන්න උත්සාහ ගත්තා. හැම පැත්තෙන්ම අපි දොස් කියන්නේ පොලීසියටයි. පොලීසිය රාජකාරී කටයුතු නිසියාකාරව කළේ නැහැ. එම නිසා තමයි එම ප්‍රශ්නය එතරම් දුරට වැඩි වුණේ. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நிலைமை தொடர்வதற்கு நாங்கள் அனுமதிக்கக் கூடாது. நான் அடிக்கடி சொல்கின்ற விடயம் "இந்த நாடு எங்கள் எல்லோருக்கும் சொந்தமானது" என்பதாகும். මේක අපේ රට. අපි ඔක්කෝම එකතු වෙලා තමයි මේ රට දියුණු කරන්න ඕනෑ. එය අපේ වගකීම. අවුරුදු 30ක් තිස්සේ පැවති කුරිරු යුද්ධය නතර කරලා, දැන් සාමය ඇති කරලා තිබෙනවා. මේ රට දියුණු වෙන්න ඕනෑ නම් අපි ආගම් භේදයෙන්, ජාති භේදයෙන් තොරව එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. ඒක අපේ වගකීම. අපි ඔක්කෝම එකතු වෙලා වැඩ කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

நாம் 1983ஆம் ஆண்டிலிருந்து இந்த நாட்டில் கட்டிக்காத்துவந்த அத்தனை நற்பெயர்களும் கடந்த இரண்டு-மூன்று வாரங்கள் இடம்பெற்ற இந்தப் பிரச்சினைகள்மூலம் இல்லாமலாக்கப்பட்டது மட்டுமல்ல, "இந்த நாடு ஓர் இனவாத நாடு; சிறுபான்மைச் சமூகங்களுக்கு பாதுகாப்பற்ற ஒரு நாடு" என்ற செய்தியும் சர்வதேச சமூகத்திற்கு மீண்டும் சொல்லப் பட்டிருக்கின்றது. அதாவது, "இந்த நாடு மோசமானது; மிலேச்சத்தமான மக்கள் வாழுகின்ற நாடு" என்று இந்த நாட்டைப் பற்றிக் கூறுகின்ற அளவுக்கு அவப்பெயர் ஏற்பட்டுள்ளது. நேற்று முன்தினம் பாதிக்கப்பட்ட மக்களுக்கு நட்டஈடுகளைக் கொடுப்பதற்காக அங்கு நான் சென்றிருந்தேன். நான் கண்டியில் இருந்தபோது, பொருளாதாரத்திலே பாரிய பிரச்சினையையும் பின்னடைவினையும் எதிர்நோக்கியிருந்த எமது நாடு, இந்த இனக்கலவரத்தின்மூலம் மேலும் பொருளாதாரச் சுமையை எதிர்கொண்டுள்ளது என்பதைத் தெரிந்துகொண்டேன். அங்கு நான் பேசிக்கொண்டிருந்த ஹோட்டல் உரிமையாளர், "சிங்கள சகோதரர்கள் தங்களுடைய திருமணங்களுக்காகக் கஷ்டப் பட்டுச் சேகரித்த இலட்சக்கணக்கான ரூபாயைக் ஹோட்டல்களுக்குக் கட்டியிருந்தார்கள்; அந்த 2 - 3 நாட்களில் மட்டும் 98 திருமணங்கள் நடத்தமுடியாமல் இரத்துச் செய்யப்பட்டன" என்று சொன்னார். உரியவர்கள் அந்தக் ஹோட்டலுக்குரிய காசையும் கட்டியிருக்கின்றார்கள். இறுதியிலே நஷ்டம் ஹோட்டலுக்கு அல்ல; திருமணம் முடிக்க இருந்த சாதாரண இளைஞர் யுவதிகளுக்குத்தான்! அதாவது, அந்த மாப்பிள்ளைமாரும் பெண்களும் பாதிக்கப்பட்டிருக் கின்றார்கள். எவ்வளவோ பாரிய இழப்பு! "ஆயிரத்துக்கும் மேற்பட்ட ஹோட்டல்களைக் கொண்டிருக்கின்ற கண்டி நகரத்திற்கான தங்களுடைய பயணங்களை எல்லா வெளிநாட்டு உல்லாசப் பயணிகளும் இரத்துச் செய்திருக்கின் றார்கள்; இதனால் பாரிய இழப்பு ஏற்பட்டிருக்கின்றது" என்றும் அவர் என்னிடம் சொன்னார். சாதாரண trishaw driver இலிருந்து பொருட்கள் supply செய்கின்றவர்கள் வரை இதனால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். வருடத்திலே ஏப்பிரல், மார்ச் மாதத்தில்தான் கண்டி நகர் சுற்றுலாத் துறையில் ஆகக்கூடுதலான வருமானத்தைப் பெறுகின்றது. இருந்தபோதிலும் இம்முறை அத்தனை வெளிநாட்டு உல்லாசப் பயணிகளும் தங்களுடைய கண்டிக்கான பயணத்தை இரத்துச் செய்திருக்கின்றார்கள்.

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

இந்த மக்கள் மத்தியிலே சிலர் விதைத்த நச்சுவிதை இன்று விளைந்துகொண்டிருக்கின்றது. பொதுபலசேனா அமைப்பின் சில பௌத்த குருமார் வெளியிலே இருந்துகொண்டு "நாங்கள் இதில் சம்பந்தப்படவில்லை" என்று இன்று சொல்கிறார்கள். அத்தனைக்கும் காரணமாக இருந்து அப்பாவி இளைஞர்கள் மத்தியிலே நச்சுவிதையை விதைத்துவிட்டு - இவ்வாறு பிழையான வழிகளைக்காட்டி, அவர்களைப் பிழையான மார்க்கங்களுக்குக் கொண்டுசென்றுவிட்டு - இனங்களுக் கிடையிலே குரோத மனப்பாங்கை உருவாக்கிவிட்டு இன்று வெளியிலே இருந்துகொண்டு அப்பாவிகளைப்போன்று செயற்படுகின்றார்கள். தங்களுடைய மஞ்சள் உடைகளுடன் சட்டத்திற்குப் பயப்படாமல் செயற்பட்டுக் கொண்டிருப்பவர் களுக்கு எதிராக ஏன், இன்னமும் சட்ட நடவடிக்கை எடுக்கவில்லை? என்று நீதித்துறை சம்பந்தமான விவாதம் இடம்பெறுகின்ற இச்சந்தர்ப்பத்தில் நான் இங்கே கேட்க விரும்புகின்றேன்.

இன்று குறிப்பாக பொலிஸ் மாஅதிபர் இராஜினாமாச் செய்ய வேண்டும்! இதற்கான முழுப்பொறுப்பையும் அவர் ஏற்க வேண்டும்! ஏனெனில் கண்டி மாவட்டத்தைப் பற்றி முழுமையாகத் தெரிந்துகொண்ட ஒருவர் பொலிஸ் மாஅதிபராக இருக்கின்றபோது - ASPஆக, SPஆக, DIGஆகப் பணியாற்றிய ஒருவர் பொலிஸ் மா அதிபராக இருகின்றபோது இவ்வளவு மோசமான கலவரம் இடம்பெற்றிருக்கின்றது. அங்கிருந்த பொலிஸார் அதைத் தடுத்து நிறுத்துவதற்கு எந்த நடவடிக்கையும் எடுக்கவில்லை. அதேநேரம், இராணுவத் தளபதியை நாங்கள் பாராட்டுகின்றோம். இராணுவத்தினர் நாட்டு மக்களுக்காக நாட்டை எவ்வாறு யுத்தத்திலிருந்து பாதுகாத்தார்களோ, அதேபோன்று இந்தக் கலவரத்தைத் தடுப்பதற்காக, இராணுவ வீரர்களைக்கொண்டு கண்டி மாவட்டத்திலே அமைதியையும் சமாதானத்தையும் நிலை நாட்டிய இந்த நாட்டின் இராணுவத் தளபதிக்கு நாட்டு மக்களின் சார்பிலே நான் நன்றியைத் தெரிவிக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொலிஸார் அன்று தங்களுடைய பணிகளைச் செய்திருந்தால் - அன்று பாதுகாப்பிலிருந்த பொலிஸார் தங்களுடைய துப்பாக்கிகளைப் பிரயோகித்திருந்தால் அல்லது கலவரத்தை நிறுத்துவதற்கு முயற்சித்திருந்தால் இந்தப் பிரச்சினைகளைத் தடுத்திருக்க முடியும். ஆனால், அவர்கள் எந்தவொரு பணியையும் செய்யவில்லை. ஆகவே, இது தொடர்பில் விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டும்! பொலிஸ் அதிபர் தொடக்கம் சம்பந்தப்பட்ட அத்தனை பேரும் இதற்குப் பொறுப்புக்கூற வேண்டும்! மத்திய மாகாணத்திற்குப் பொறுப்பான சிரேஷ்ட பிரதிப் பொலிஸ் மாஅதிபர் உட்பட சம்பந்தப்பட்ட அனைவரும் இதற்குப் பதில் சொல்லியாக வேண்டும்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்திலே எங்களுடைய நாடு தொடர்பாக, மக்கள் தொடர்பாக பல்வேறுபட்ட சட்டங்கள் இயற்றப்படுகின்றன. ஆனால், இறுதியிலே சட்டத்தை நிலைநாட்ட வேண்டியவர்கள் அமைதியாக இருக்கின்றபோது - மௌனிக்கின்றபோது - நாட்டிலே சட்டத்தை நிலைநாட்ட முடியாமல் போகின்றது. இந்தக் கலவரம் சம்பந்தமாகக் கைது செய்யப்பட வேண்டியவர்களில் பலர் இன்னமும் கைது செய்யப் படவில்லை! ஆனால், வெறுமனே அப்பாவிகளை அல்லது சிலரை மாத்திரம் கைதுசெய்துவிட்டு பிரச்சினைகளைத் தீர்த்து வைத்துவிட்டோமென்று யாரையும் ஏமாற்றக்கூடாது.

அடுத்ததாக, சட்டம், ஒழுங்கிற்குப் பொறுப்பான புதிய அமைச்சர் அவர்களை நாங்கள் பாராட்டுகின்றோம். அவர் தன்னுடைய பணியைச் சிறப்பாகச் செய்ய வேண்டும். இன்று இன்னும் பல சிங்களப் பகுதிகளிலே முஸ்லிம்களுடைய வர்த்தக நிலையங்களுக்கு, குடியிருப்புக்களுக்கு அச்சுறுத் தல்கள் விடுக்கப்படுகின்றன; அவர்களின் பயணங்களுக்கு அச்சுறுத்தல்கள் விடுக்கப்படுகின்றன. ஆகவே, உடனடியாக இது தொடர்பிலே நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். சட்டம், ஒழுங்கிற்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் சட்டத்தை நிலைநாட்டுவதை உறுதி செய்யவேண்டும். அழுத்கம சம்பவம் இடம்பெற்றபோது இனிமேல் இவ்வாறு இடம்பெறாதென்று சொல்லப்பட்டது. நல்லாட்சி அரசு ஆட்சிக்கு வந்தபோதும் இனிமேல் இந்த நாட்டிலே சகல இன மக்களும் ஒற்றுமையோடு அச்சமின்றி வாழமுடியும் என்று உறுதியளிக்கப்பட்டது. ஆனால், அதற்குப் பிறகும் ஜிந்தோட்டை என்றும் அம்பாறை என்றும் கண்டி என்றும் பல்வேறுபட்ட சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. ஆகவே, சட்டத்தையும் ஒழுங்கையும் நிலைநாட்ட வேண்டிய இந்த அரசு - அமைச்சு அளுத்கம, ஜிந்தோட்டை, அம்பாறை, கண்டி- திகன சம்பவங்கள் போன்று மீண்டும் இந்த நாட்டிலே இடம்பெறாமல் இருக்கின்ற வகையில் பொறுப்புடன் செயற்பட வேண்டும் என்று இச்சந்தர்ப்பத்திலே சொல்லிவைக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சட்டத்தினூடாகத்தான் அமைதியை நிலைநாட்ட முடியும்! இந்த நாடு ஓர் இனத்திற்கு மாத்திரம் சொந்தமானதல்ல; நாட்டிலே வாழ்கின்ற அனைத்தின மக்களுக்கும் சொந்த மானது என்பதை மிகத் தெளிவாகச் சொல்லிவைக்க விரும்புகின்றேன். ஆகவே, இந்த நாட்டிலே இருக்கின்ற சட்டம் அனைத்தின மக்களுக்கும் சமமாக இருக்கவேண்டும். இந்த நாட்டிலே இருக்கின்ற ஒவ்வோரினத்துக்கும் ஒவ்வொரு சமூகத்துக்கும் தத்தம் கலாசாரத்தைப் பின்பற்றுகின்ற உரிமை இருக்கின்றது.

முஸ்லிம்களைப் பொறுத்தவரையில், அவர்கள் ஆசியாவிலே வாழ்ந்தாலென்ன, ஆபிரிக்காவிலே வாழ்ந்தா லென்ன, அரபு நாடுகளிலே வாழ்ந்தாலென்ன, உலகத்தின் எந்த மூலைமுடுக்கில் வாழ்ந்தாலும் அவர்களுக்கு ஒரே கலாசாரம்தான்! ஒரே உடைதான்! ஒரே மார்க்கம்தான்! ஆகவே, எங்களுடைய கலாசாரத்தைப் பற்றி, எங்களுடைய உடைகளைப் பற்றி எங்களுக்கு யாரும் கற்றுத்தரவேண்டிய அவசியமமில்லை என்பதை நான் மிகத் தெளிவாக இந்தச் சபையிலே சொல்லிவைக்க விரும்புகின்றேன். இந்த நாட்டிலே வாழுகின்ற சகல இன மக்களும் தங்களுடைய அரசியல் உரிமைகளையும் கலாசாரத்தையும் பாதுகாத்துக் கொண்டு, தங்களுடைய மார்க்கக் கடமைகளைப் பேணி, அவற்றைப் பின்பற்றுவதற்கான சுதந்திரத்தோடு பாதுகாப்புடன் வாழ்வதற்கான உரிமையை உறுதிப்படுத்த வேண்டியது இந்த அரசின் பொறுப்பாகும். ஆகவே, அந்தப் பொறுப்பை இந்த அரசு ஏற்கவேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த காலங்களில் இந்த நாட்டில் ஏற்பட்ட கலவரங்கள் அல்லது இனக் குரோதங்கள் இந்த நாட்டுக்கு அவப்பெயரைப் பெற்றுத் தந்திருக்கின்றன. அதைவிட மோசமான நிலைமையைக் கடந்த இரண்டு வாரங்களில் இடம்பெற்ற சம்பவங்கள் ஏற்படுத்தி யிருக்கின்றன. இன்று ஜெனீவாவிலே ஆயிரக்கணக்கான

முஸ்லிம்கள் - வெளிநாட்டில் வாழுகின்றவர்கள் இந்த அரசுக்கு எதிராக ஆர்ப்பாட்டம் செய்கின்றார்கள்! உலகம் முழுவதிலும் இருக்கின்ற இலங்கைத் தூதுவராலயங்களுக்கு முன்னால் அந்த மக்கள் ஆர்ப்பாட்டம் செய்கின்றார்கள்! இது இந்த நாட்டை நேசிக்கின்ற எங்களுக்கு மிகவும் மனவேதனையான விடயமாகும். இந்த நாட்டின் பெயரைப் பாதுகாத்து, இந்த நாட்டுக்கு நற்பெயரைப் பெற்றுக்கொடுத்து, நாங்கள் "Sri Lankans" என்று மிகப் பெருமையோடும் கௌரவத்தோடும் வெளிநாடுகளில் சொல்லுகின்றோம். எனவே, நமது நாட்டுக்கு எந்தவகையிலும் ஓர் அவப்பெயர் ஏற்படுவதற்கு அனுமதிக்கக்கூடாது. ஆகவே, ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு இல்லாமல், நாங்கள் எல்லோரும் இணைந்து இந்த நாட்டைக் கட்டியெழுப்பி, இந்த நாட்டுக்கு நற்பெயரைப் பெற்றுக்கொடுப்பது மட்டுமல்ல, எங்களுடைய எதிர்காலச் சந்ததியினரிடம் நல்லதொரு நாட்டை ஒப்படைக்கவேண்டிய பொறுப்பும் கடமைப்பாடும் எங்களுக்கு இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கௌரவ பாராளுமன்ற உறுப்பினர்களே! இந்த நாட்டில் எங்களுக்கு முன்னர் வாழ்ந்த சமூகம் பல்வேறுபட்ட கஷ்டங்களைச் சந்தித்தது! 30 ஆண்டு கால யுத்தத்தினால் பல இளைஞர் சமூகங்கள் தங்களுடைய இளைஞர் பருவத்தையே தொலைத்தார்கள்! பாரிய இழப்புக்களுக்குப் பின்னால், இன்று நாங்கள் இந்த நாட்டை கட்டியெழுப்புகின்ற பணியை ஆரம்பித்திருக்கின்றோம். எனவே, மீண்டும் இந்த நாட்டை அவ்வாறான மோசமான நிலைக்கு இட்டுச் செல்வதற்கு அனுமதிக்கக்கூடாது. இந்த நாட்டைப் பாதுகாக்கவேண்டியது எங்களுடைய கடமை! அந்தவகையில், இந்த நாட்டிலே வாழுகின்ற சகல இன மக்களும் ஒற்றுமையோடும் அரசியல் உரிமைகளையும் பாதுகாத்துக்கொண்டு வாழ்வதற்கான சூழ்நிலைகள் இந்த நாட்டில் உருவாக்கப்படவேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Vijitha Herath. ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில், தொழிற்சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour, Trade Union Relations and Sabaragamu Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[අ.භා. 3.33]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට අදාළව අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පතට හා නියෝගවලට අපේ එකඟතාව පළ කරන අතරම, ගරු ඇමතිතුමියට මම මතක් කරන්න කැමැතියි, "අධිකරණ ක්ෂේත්‍රය තුළ මහා විප්ලවයක්, මහා වෙනසක් ඇති කරනවා" කියලා එතුමිය මෙම අමාත්‍ය ධුරයට පත් වුණු අලුතම පොරොන්දු දුන්නු බව. ඒ පොරොන්දුවල ප්‍රධාන කරුණු තමයි, විශේෂයෙන්ම විනිශ්චයකාරවරුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දීම, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඒ අයගේ වෘත්තියට ගැළපෙන වැටුපක් වාගේම ඒ අයගේ සේවා අවශ්‍යතාව සඳහා යම් යම් දීමනා ලබා දෙන්න මැදිහත් වීමක් කරන බව හා ඒ හරහා නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සහ නීතිපති දෙපාර්තමේන්තුවට වැඩි වැඩියෙන් නීතිඥවරුන්ට බැඳෙන්නට අවශ්‍ය අවකාශ ලබා දෙනවා කියන එක. ඒ වාගේම එදා -මීට මාස හතරකට කලින්- එතුමිය සහතිකයක් දුන්නා, සතියක් හෝ දෙකක් වාගේ කාලයක් ඇතුළත වෙනම අධිකරණ පිහිටුවලා, පසුගිය කාලයේ සිදු වුණු ඝාතන, වංචා හා දූෂණ පිළිබඳවත් ඒ පිහිටුවන වෙනම අධිකරණ හරහා නීතිය කඩිනමින් ක්‍රියාත්මක කරනවා කියලාත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නීති ක්ෂේත්‍රය තුළ ආන්දෝලනයට ලක් වෙලා තිබෙන කරුණක් තමයි, වෙනම අධිකරණ පිහිටුවීම කියන දේ. මේ ආණ්ඩුව බලයට පත් වන කොට මේ රටේ ජනතාවට දීපු එක් ප්‍රධාන පොරොන්දුවක් තමයි, වංචා හා දූෂණ පිළිබඳව කඩිනමින් හොයා බලනවා; වංචා හා දූෂණවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා; ඒ වැරදිකරුවන්ට දඬුවම් ලබා දෙනවා; ඒකට කිසිදු ආකාරයෙන් පැකිළෙන්නේ නැහැ කියලා. නමුත්, ඒ චෝදනාවලට ලක් වුණු අයම අද ආණ්ඩුවෙන් ප්‍රශ්න කරනවා, "දැන් අවුරුදු තුනක් ගියා, ඒ ගෙවිච්ච අවුරුදු තුනක කාලය තුළ ඔබතුමන්ලා එක හොරෙක්වත් ඇල්ලුවේ නැහැ; එක හොරෙකුටවත් දඬුවම් දුන්නේ නැහැ; එදා වෙච්ච ඒ හොරකම්වලට දඬුවම් දුන්නේ නැහැ නේද?" කියලා. ඉතිහාසයේ සරදමක් විධියට හොරුන්ටත් පුළුවන් වෙලා තිබෙනවා, "කෝ, අපව ඇල්ලුවේ නැහැ නේ?" කියලා අද ප්‍රශ්න කරන්න. "අපේ හොරකම් ඇල්ලුවේ නැහැ" කියලා කියන්න හොරුන්ට පුළුවන් වෙලා තිබෙනවා! ඒකෙන් පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, නොහැකියාව. ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට මොන තරම් කයිවාරු ගැහුවත්, මොන තරම් කථා කළත් යථාර්ථය ඒකයි.

පසුගිය කාලයේ මේ රටේ සිද්ධ වුණු බරපතළ මූල්‍ය වංචා පිළිබඳව, බරපතළ අපරාධ හා ඝාතන පිළිබඳව මේ අවුරුදු තුන ඇතුළත ඔබතුමන්ලාට බැරි වුණා, නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. ඒකට හේතුවක් ලෙස කියන්න පුළුවන්, අධිකරණවල නඩු කටයුතු ප්‍රමාදය. හැබැයි, ඒකම නොවෙයි ප්‍රධාන හේතුව. ඔබතුමිය වෙනම අධිකරණ පිහිටුවීම හරහා නීති කටයුතු කඩිනම් කරන්න යම් මැදිහත් වීමක් කරන්න බලාපොරොත්තු වනවා. ඒක මේ රටේ ජනතාවගේ අපේක්ෂාව. ජනතාව ඉල්ලා සිටින්නේ, හොරුන්ට දඬුවම් දෙන ලෙසයි. පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය වෙනස් වෙන්න බලපෑ එක හේතුවක් තමයි, ආණ්ඩුව හොරු අල්ලනවා කියලා කිව්වාට හොරු ඇල්ලුවේ නැති එක; හොරුන්ට දඬුවම් නොදීම. එතකොට ජනතාවට ගිය පණිවුඩය තමයි, එහෙම නම් හොරකම් කරලා නැහැ කියන එක. හොරු අල්ල ගන්න බැරි නම්, ඔප්පු කර ගන්න බැරි නම්, අඩුම ගානේ ඒවා පිළිබඳ නිවැරදි වාර්තාවක් ඉදිරිපත් කර ගන්න බැරි

[ගරු විජිත හේරත් මහතා]

නම්, ඒකෙන් තහවුරු වෙන්නේ, හොරකම් සිද්ධ වෙලා නැහැ කියන එක. ඒ වැරදි පණිවුඩය ගියා. ඒ වැරදි පණිවුඩය ජනතාව අතරට යන්න ඉඩ සැලසුවේ පසුගිය අවුරුදු තුනේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නොහැකියාව. ඒ නිසා තමයි දැනුත් මේ රටේ ජනතාව ඉල්ලා සිටින්නේ, කවුරුන් හෝ කෙනෙක් හොරකම් කරලා තිබෙනවා නම්, බරපතළ මූල්‍ය අපරාධ සිද්ධ කරලා තිබෙනවා නම්, නීතිය ඉස්සරහාට ගෙනැල්ලා ඒ අයට දඬුවම් දෙන්න කියලා. වැරදිකරුවන් කවුද, මොනවාද කරලා තිබෙන වැරදි, ඒවා නීතිය ඉස්සරහාට ගෙනැල්ලා, ඔප්පු කරලා පෙන්වලා, අදාළ දඬුවම් දෙන්න. එහෙම නැතුව පාර්ලිමේන්තුව ඇතුළේ, වේදිකාවල කොච්චර කථා කළත් වැඩක් නැහැ. ඒකෙන් තහවුරු වෙන්නේ නැහැ, වැරදි කළාය කියන එක. ඒකෙන් තව තවත් තහවුරු කර ගන්න පුළුවන්කම ලැබෙනවා, වැරදි කළාට වඩා දේශපාලන පළිගැනීම් කරන්න හදනවා කියලා. ඒ කාරණය ඒ අයට කියන්න ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ.

අද ඒ චෝදනා ඔප්පු කර ගන්න බැරි වීම නිසා, ඒ චෝදනා ඔප්පු කර ගන්න ඔබතුමන්ලා කඩිනම් ක්‍රියා මාර්ග නොගැනීම නිසා, හොරුන්ට පුළුවන්කම ලැබිලා තිබෙනවා, "ඒවා හොරකම් නොවෙයි. එදා හොරකම් සිද්ධ වුණේ නැහැ. මේ කරන්නේ දේශපාලන පළිගැනීමක්" කියා කියන්න.

මේක ඇත්ත නොවෙයි. ඒක කවුරුත් දන්නවා. හැබැයි, ඔප්පු කරගන්න, ඒ අයට දඬුවම් දෙන්න බැරි වුණු නිසා තමයි අද හොරුන්ට මේ උත්තරය ලැබිලා තිබෙන්නේ. ප්‍රමාද වෙලා හරි මේක වෙනස් කිරීමේ වගකීම ආණ්ඩුව සතුව තිබෙනවා. හුදෙක් "දේශපාලන පළිගැනීම්" කියන ඒ උධෘත පාඨයට යන්නේ නැතිව, සිදු වුණු සිදුවීම් පිළිබඳව මේ රටේ ජනතාව ඉතා පැහැදිලිව දන්නා කරුණු අනුව, මේ වන විටත් ජනමාධ්‍ය හරහා ඒ වාගේම විවිධ අමාත්‍යාංශ තොරතුරු හරහා හෙළිදරව් වෙලා තිබෙන කරුණු අනුව නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ නිසා වෙනම අධිකරණ පිහිටුවීම් කඩිනම් අවශ්‍යතාවක් වනවා. තවමත් ඒ අධිකරණ පිහිටුවන්න ඔබතුමන්ලාට බැරි වුණා. එදා කිව්වා, "සති දෙකක් ඇතුළත පිහිටුවනවා" කියලා. නමුත්, අද වන තුරුත් ඒ අධිකරණ පිහිටුවන්න බැරි වෙලා තිබෙනවා. දැන් මාස 4ක් ගතවෙලා තිබෙනවා.

වෙනම අධිකරණ පිහිටුවීමෙන් චූදිතයන්ට -චෝදනාවලට ලක්වූවන්ට- අදාළ චෝදනා ඔප්පු කර ගන්න එය දායක වනවා වාගේම, යමෙක් නිවැරදිකරුවෙක් නම් මාධ්‍ය හරහා හෝ රටේ ජනතාව ඉස්සරහා හෝ තමන් නිවැරදියි කිය කියා ඉන්නවාට වඩා අධිකරණය ඉස්සරහට ගිහිල්ලා තමන් නිවැරදියි කියලා ඒ නිවැරදිභාවය තහවුරු කර ගන්නත් ඒක වාසියක් වනවා. මම දැක්කා නඩු විභාගවලට මුහුණ දීපු චූදිතයන් හැමෝම වාගේ අධිකරණයට ගිහිල්ලා කිව්වේ, "තමන් නිවැරදිකරු, තමන් වැරැද්දක් කළේ නැහැ" කියලා. එහෙම නම්, වෙනම අධිකරණ පිහිටුවීම හරහා ඔවුන් නිවැරදියි කියලා ඔප්පු කර ගන්න ඔවුන්ට අවස්ථාව ලැබෙනවා. මේ අධිකරණ හරහා නඩු ටික ඉක්මනින් විභාග කරනවා නම්, තමන් නිර්දෝෂීයි කියලා කියනවා නම්, ඒ නිර්දෝෂීභාවය උසාවිය හරහාම තහවුරු කරගන්න ඔවුන්ට පුළුවන් වනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට බය වෙන්න දෙයක් නැහැ.

වෙනම අධිකරණ පිහිටුවීමට විරුද්ධ වෙන අය පසුගිය කාලයේ කියපු දෙයක් තමයි "අපි වැරදි කරලා තිබෙනවා නම් ඔප්පු කරලා පෙන්වන්න. අධිකරණයෙන් දඬුවම් දෙන්න, අධිකරණයෙන් දෙන දඬුවම් විඳින්න අපි කිසි පැකිළීමක් නැහැ. නිකම් බොරුවට අපට චෝදනා කරන්න එපා. අරවා අව්වර හොරකම් කළා, මෙව්වර හොරකම් කළා කියලා අපට නිකම් චෝදනා කරන්න එපා. අපි වැරද්දක් කරලා තිබෙනවා නම් නීතිය මඟින් අධිකරණය මඟින් ඔප්පු කරලා අපට දඬුවම් දෙන්න" කියලා. එහෙම කියපු අය තමයි "මේ අධිකරණ පිහිටුවන්න එපා" කියලා අද ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නේ. එයින් ඔවුන් පෙන්වන්නේ මොකක්ද? එක පැත්තකින් කියනවා, "නීතිය ඉස්සරහදී ඔප්පු කරලා පෙන්වන්න, අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන පෙන්වන්න. අපි ඒකට බය නෑ" කියලා. අනෙක් පැත්තෙන් ඒ අධිකරණයටම ගිහිල්ලා කියනවා, "නැහැ මෙහෙම කඩිනමින් නඩු අහන අධිකරණ පිහිටුවන්න එපා" කියලා. ඒ කියන්නේ මොකක්ද? ඒ හොරකම් හෙළිදරව් වෙනවාට බයයි. ඒක තමයි ඇත්ත. බය නැත්නම්, තමන් නිවැරදියි නම් -නිර්දෝෂී නම්- මොන අධිකරණ පිහිටෙව්වත් බය වෙන්න දෙයක් නැහැ.

ඉතිහාසයේ සිදු වූ ඝාතනවලට සම්බන්ධ නැත්නම්, -තාජුදීන් ඝාතනයට සම්බන්ධ නැත්නම්, ලසන්ත වික්‍රමතුංග ඝාතනයට සම්බන්ධ නැත්නම්- හොරකම්වලට, එදා සිදු වුණු මහා පරිමාණ වංචා, දූෂණවලට සම්බන්ධ නැත්නම් පිහිටුවන ඕනෑම අධිකරණයක් ඉස්සරහට ගිහිල්ලා තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කර ගන්න හැකියාවක් තිබෙන්න ඕනෑ. තමන් නිවැරදි නම් නිවැරදියි කියලා ඔප්පු කර ගන්න ඒ අධිකරණ පිහිටුවීම ඒ අයට අමතර වාසියක් වනවා. ඒ නිසා වෙනම අධිකරණ පිහිටුවීම අපි දකින්නේ මේ රටේ ජනතාවගේ අභිලාෂයක් විධියටයි. මේ රටේ ජනතාව හැමදාම කියපු දෙයක් තමයි "විවිධ ආණ්ඩු බලයට පත් වුණා. ආණ්ඩු මාරු වුණා. හැම ආණ්ඩුවකම ප්‍රධාන ඇමතිවරුන්ට ප්‍රබල චෝදනා එල්ල වුණා. මහා පරිමාණ හොරකම් පිළිබඳ, වංචා පිළිබඳ චෝදනා එල්ල වුණා. හැබැයි, ඉතිහාසයේ ඉදලා මේ දක්වා අපේ රටේ ප්‍රබල ඇමතිවරයෙකුට, ඇමතිවරියකට එරෙහිව තිබෙන චෝදනා ඔප්පු කරලා දඬුවම් දීපු අවස්ථාවක් අපි දැක්කේ නැහැ" කියලා.

ජනතාව හැමදාම චෝදනා කරනවා. නිලධාරීන්ගේ පැත්තෙන් මේ කරුණු හෙළිදරව් කරනවා. ජනමාධ්‍යවේදීන්ගේ පැත්තෙන් මේ කරුණු හෙළිදරව් කරනවා. හැබැයි කප්පරක් හොරකම් කරපු ඇමතිවරු -ඒ හොරු- හැමදාම නිදහස් වෙනවා. නිදහස් වෙන්නේ, ආණ්ඩු මාරුවත් එක්ක, එහෙම නැත්නම් පැනි මාරුවත් එක්ක. පැනි මාරු කරනකොට, ආණ්ඩු මාරු වනකොට තමන්ගේ පරණ හොරකම් ටික වහ ගන්න පුළුවන්. ඒක තමයි ඉතිහාසයේ ඉඳලා හැමදාම සිදු වුණු දේ.

වෙනම අධිකරණ පිහිටුවන්න කවුරුවත් බය වෙන්න ඕනෑ නැහැ. හැබැයි වෙනම අධිකරණ පිහිටුවන ක්‍රමවේදය නිවැරදි වෙන්න ඕනෑ. මේ වෙනම අධිකරණ පිහිටුවීම සම්බන්ධයෙන් නීතිඥ සංගමය උසාවියට ගිහිල්ලා තිබෙනවා. හැබැයි ඔවුන් කියන්නේ, මේ අධිකරණ පිහිටුවීමට ඔවුන් විරුද්ධ නැහැ කියලායි. සමහර මාධ්‍ය වාර්තා කරලා තිබුණා, නීතිඥ සංගමයත් මේකට විරුද්ධයි කියලා. නමුත් ඔවුන් කියන්නේ, නීතිඥ සංගමයේ සභාපතිවරයා ඉතා පැහැදිලිව කිව්වේ, "වෙනම අධිකරණ පිහිටුවනවාට අපි විරුද්ධ නැහැ, හැබැයි වෙනම අධිකරණ පිහිටුවීමේ යන්ත්‍රණයේ තාක්ෂණික වැරදි තිබෙනවා, ඒ තාක්ෂණික වැරදි නිවැරදි කරන්න ඕනෑ, අන්න ඒකටයි අපි මේ උසාවි යන්නේ." කියලායි. ඒ නිසා නීතිඥ සංගමයත් විරුද්ධයි කියලා ඒකට මුවා වෙලා, අර කම්බ හොරු ටික ඒකෙන් ආවරණයක් ගන්න හදනවා නම් ඒක වැරදියි. නීතිඥ සංගමය මේ ගැන බලන්නේ නීතිය පැත්තෙන්. වෙනම අධිකරණ පිහිටුවීම පිළිබඳව හදන ඒ කෙටුම්පතේ නීතිය පැත්තෙන් යම් යම් අඩු පාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කිරීම, ඒ චෝදනා ගොනු කිරීම, ඒවා විභාග කිරීම, තාක්ෂණික අඩු පාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කිරීම ආණ්ඩුවේ වග කීමක්; නීතිපති දෙපාර්තමේන්තුවේ, අධිකරණ ඇමතිවරියගේ වග කීමක්. නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මේ අධිකරණ අවශ්‍ය නැහැ කියලා. මේ

අධිකරණ අවශ්‍ය වෙන්නේ, ඇත්තටම මේ නඩු වසර ගණනාවක් දික් ගැස්සෙන නිසායි. දැන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ නඩු විභාග වෙමින් තිබෙනවා. හැමදාම මේ ගැන කථා කරමින් ඉන්නවා. හැබැයි චෝදනා ඔප්පු කරලා දඬුවම් දීමක් සිද්ධ වන්නේ නැහැ. අධිකරණය හමුවේ මේ ප්‍රශ්නය ඉදිරිපත් වෙලා තිබුණත්, මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කරලා, වහාම මේ අධිකරණ පිහිටුවීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුව තිබෙනවා. ඒක අධිකරණ ඇමතිවරියගේ වග කීමක්. ඒක ආණ්ඩුවේ වග කීමක්. ඇත්තටම ගත්තොත් අපේ රටේ සියලුම නඩු සම්බන්ධයෙන් තිබෙන්නේ මන්දගාමී ප්‍රතිපත්තියක්. ඉඩම් නඩු වේවා, අපරාධ නඩු වේවා, සිවිල් නඩු වේවා, ඒ හැම නඩුවක් සම්බන්ධයෙන්ම තිබෙන්නේ අවුරුදු හතර-පහ, අවුරුදු දහය-පහළොව දික් ගැස්සෙන ක්‍රියාවලියක්. ඒ නිසා තමයි මේ අධිකරණ පද්ධතිය ගැන ජනතාවගේ තිබෙන විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. නඩුවක් දා ගන්නවා කියන්නේ අමාරුවේ වැටෙන වැඩක්. ඒකට ජනතාව කැමැති නැහැ. පාරේ යනකොට මනුස්සයෙක් වාහනයක හැප්පුණත්, ඒක ඇස් දෙකෙන් දැක්කත්, සාක්ෂි දෙන්න උසාවියට යන්න බයයි, ඒක මහා කරදරයක් වන නිසා.

පසුගිය කාලයේ එවැනි සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ නීතියක් තිබුණේ නැහැ. සාක්ෂිකරුවන්, විත්දිතයන් ආරක්ෂා කිරීම සඳහා නීතිය ශක්තිමත් කරලා, මේ අධිකරණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම ආණ්ඩුවේ ප්‍රධාන වග කීමක්. අපි දකින දෙය තමයි, හොරකම් කරලා නැත්නම් කිසි කෙනෙකුට බය වෙන්න දෙයක් නැහැ කියන එක. තමන්ට "හොරෙක්" කියලා චෝදනා එනවා නම්, ඒ චෝදනාව තමන්ට අදාළ නැත්නම්, ඒ පුද්ගලයාට කරන්න තිබෙන්නේ, මේ අධිකරණ කඩිනමින් පිහිටුවන්න කියලා ඒ අධිකරණ හරහාම තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කර ගන්න එකයි. ඒක තමයි කළ යුතු දෙය. ඒ නිසා මේ වෙනම අධිකරණ පිහිටුවීම, පසු ගිය කාලයේ අපේ රටේ සිද්ධ වුණු බරපතළ ගණයේ දූෂණ චෝදනා කඩිනමින් විභාග කරලා, ඒ අයට දඬුවම් දීම සඳහා වුණු යන්ත්‍රණයක්. එය අවුරුදු තුනක් තිස්සේ පරක්කු වීම තමයි ප්‍රශ්නය. එතැන තමයි නීතිය හරියට ක්‍රියාත්මක නොවුණේ. ඒ නිසා තමයි ජනතාව අර විධියට ප්‍රතිචාරයක් දැක්වූවේ.

පසුගිය අවුරුදු තුන ඇතුළත මේ රටේ හොරු අල්ලන්න, හොරුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න, හොරුන්ට දඬුවම් දෙන්න නොහැකි වීම තමයි මේ ආණ්ඩුව කෙරෙහි වූ විශ්වාසය භංග වීමට බලපෑ ප්‍රධාන කාරණාව. රටේ ජනතාව 2015 ජනවාරි 8වන දා ඒ පරිවර්තනය කරද්දී, තමන්ගේ පැත්තෙන් ඡන්දය පාවිච්චි කරද්දී ඔවුන් බලාපොරොත්තු වුණා -ඔවුන් හිතුවා- පසුගිය කාලයේ සිදු වුණු මහා පරිමාණ හොරකම්වලට අදාළව නීතිය ක්‍රියාත්මක වෙයි කියලා.

ජනතාව මාසයක් දෙකක් බලාගෙන හිටියා; අවුරුද්දක් බැලුවා; අවුරුදු තුනක් බැලුවා. හැබැයි, ඒ අවුරුදු තුන ඇතුළත හොරුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන බවක් මේ රටේ ජනතාව දැක්කේ නැහැ. ඒවා දේශපාලන ඩීල්වලින් යට ගැහුවා. පසුගිය රජයේ හිටපු ප්‍රබල ඇමතිවරු මේ රජයට එකතු වුණා. මේ රජයේ ජනාධිපතිවරයාගේ සිට ඉහළ තනතුරුවල සිටින සියලුදෙනා අද ඒ හොරුන් ආරක්ෂා කරමින් සිටිනවා. ජනාධිපතිතුමා එක්ක ජපානයට ගිය පිරිස කවුද කියලා අපි දැක්කා. හරි පුදුමයි; හරි විහිළු සහගතයි. ජපානයේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තහවුරු කරන සාකච්ඡාවල වාඩි වෙලා හිටියේ පසුගිය කාලයේ චෝදනා තිබුණු මිනීමරුවෝ! එදා බැසිල් රාජපක්ෂලා එක්ක එකට හොරකම් කරපු කම්බ හොරු. ජපානයට ගිහින් ඒ හොරුන් එක්ක එකට වාඩි වෙලා තමයි රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වන්නේ. ඒ හොරුන්ට එරෙහිව තිබෙන චෝදනා මොනවාද කියලා මුළු රටම දන්නවා. අදටත් ඒ චෝදනා සම්බන්ධ නඩු කටයුතු අවසන් වෙලා නැහැ. අත්තනගල්ල උසාවියේ මිනී මැරුම් චෝදනාවලට ලක් වුණු පුද්ගලයා තමයි ජපානයේ රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනුවලට එක්කගෙන ගියේ. ඒ වාගේම, විශේෂ මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයේ පැමිණිලි මත අධිකරණ කිහිපයක නඩු පවරලා තිබෙන තවත් පුද්ගලයෙක් එක්ක තමයි අද සංචාරයේ යන්නේ. ඒ හොරු රකිනවා; ඒ හොරු ආරක්ෂා කරනවා. මේ ආණ්ඩුව පසුගිය අවුරුදු තුන ඇතුළත කළේ නීතිය හරියට ක්‍රියාත්මක කිරීම නොවෙයි. ඒ වෙනුවට පසුගිය අවුරුදු තුන ඇතුළත කළේ හොරුන් ආරක්ෂා කිරීම සහ හොරුන් සමඟ දේශපාලන ඩීල් දැමීම පමණයි. එම බරපතළ චෝදනාව ආණ්ඩුවට එරෙහිව අදත් තිබෙනවා. එම චෝදනාවෙන් මිදෙන්න මේ ආණ්ඩුව තවමත් සමත් වෙලා නැහැ.

අගමැතිවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙනෙනකොට, ඒ විශ්වාස භංග යෝජනාවට ඇතුළත් වෙන්න ඕනෑ ප්‍රධාන කරුණක් තමයි ඒක. පසුගිය කාලයේ මේ රටේ ජනතාවට දීපු ප්‍රධාන පොරොන්දුව තමයි, හොරු අල්ලනවා; හොරුන්ට දඬුවම් දෙනවා; හොරකම් නතර කරනවා කියන එක. නමුත් මේ තුනෙන් එකක්වත් කළේ නැහැ. එම නිසා අගමැතිවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාවේ ප්‍රධාන චෝදනාවක් වෙන්න ඕනෑ, හොරු අල්ලපු නැති එක සහ හොරුන් එක්ක ඩීල් දමපු එක. අගමැතිවරයාට එරෙහි විශ්වාස භංගය මේ රටේ ජනතාවට තහවුරු කරන්න ඒ කරුණම ප්‍රමාණවත්. මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු ප්‍රධානම කරුණ තමයි, හොරු ඇල්ලීම; හොරකම් නතර කිරීම. නමුත් හොරකම් නතර කළේ නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව හරහා හොරකම මහ පරිමාණ වශයෙන් කරලා පෙන්නුවා. එක හොරෙකුටවත් දඬුවම් දුන්නේ නැහැ. ඒ චෝදනාව ප්‍රබල චෝදනාවක්. ඒ නිසා මේ විශ්වාස භංගය රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා විතරක් නොවෙයි, මේ ආණ්ඩුවම වග කියන්න ඕනෑ දෙයක්. විශ්වාස භංග යෝජනාවේ මහ බැංකු බැඳුම්කර සිද්ධියේ කරුණු තිබෙනවා මම දැක්කා. මහ බැංකු බැඳුම්කර වංචාවේ කරුණු ඒ සඳහා වන ප්‍රධාන කරුණු තමයි. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ සිදු වුණු බරපතළ මූල්‍ය අපරාධවලට සම්බන්ධ හොරුන්ට දඬුවම් නොදීම, ඒ හොරුන් ආරක්ෂා කිරීම, ඒ හොරුන් දේශපාලන ඩීල්වලින් නිදහස් කර ගැනීම -බේරීම- කියන එකත් ප්‍රබල, ප්‍රධාන චෝදනාවක්. ඒකත් එක්ක තමයි විශ්වාස භංගය තවත් ශක්තිමත් වෙන්නේ.

අපි ඉතා පැහැදිලිව කියනවා, මෙවැනි වෙනම අධිකරණ පිහිටුවීම කඩිනමින් සිදු විය යුතුයි කියලා. මම මේ ගැන එදාත් අධිකරණ ඇමතිතුමියට කිව්වා. ඔබතුමියට මතක ඇති. මම මේ අධිකරණ පිළිබඳ යෝජනාව ගෙනෙනකොටම කිව්වා, "පුළුවන් නම් මහ බැංකු බැඳුම්කර වංචාව මේ අධිකරණයේ පළමුවැනි නඩු කටයුත්ත හැටියට විභාග කරලා පෙන්වන්න, මම අභියෝග කරනවා." කියලා. [බාධා කිරීමක්] මොකක්ද? ඔබතුමිය කියන දේ මට ඇහෙන්නේ නැහැ. ඔබතුමියට අදත් ඒක කියන්න බැරි වුණා. අද ඔබතුමිය හැංගිලා උත්තර දෙන්නේ. ඉතිහාසයේ සරදමක් විධියට අද ඔබතුමිය හැංගිලා උත්තර දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා . ඇයි ඒ? ඒ බැඳුම්කර වංචාවේ චෝදනා අද විශ්වාස භංගයේ ප්‍රධාන චෝදනා විධියටයි ඇවිත් තිබෙන්නේ. ඔබතුමිය මේ වෙනම අධිකරණ ටික කඩිනමින් පිහිටුවලා පළමුවැනි කටයුත්ත විධියට ඒ නඩුව විභාගයට ගත්තා නම් අද ඔය චෝදනා එන්නේ නැහැ. මොකද, මේ වන විට නඩුව විභාග කරලා දඬුවම් දීලාත් ඉවරයි. නමුත්, ඒක ඔබතුමියට කර ගන්න බැරි වුණා; ආණ්ඩුවට කර ගන්න බැරි වුණා. නමුත්, අදත්, තවමත් ඒ අවස්ථාව තිබෙනවා. පුළුවන් නම්, බැඳුම්කර වංචාව පිළිබඳ නඩු කටයුත්ත මේ අධිකරණයේ පළමුවැනි නඩුව හැටියට අරගෙන විභාග කරලා පෙන්වන්න.

[ගරු විජිත හේරත් මහතා]

මොකද, ඒක මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. ඔබතුමියගේ පැත්තෙන් ඒ ආදර්ශය පෙන්වූවොත් ජනතාවට විශ්වාසයක් ඇතිවනවා, 'එහෙම නම් පසුගිය කාලයේ සිද්ධ වුණු ඒ වැරදි සම්බන්ධයෙනුත් අපක්ෂපාතීව මේ අධිකරණ කටයුතු කරයි' කියලා.

මේ පිහිටුවන්න යන නව අධිකරණවලට දැන් එල්ල වන ප්‍රධානම චෝදනාව තමයි, දේශපාලන පත්වීම් හරහා පිහිටුවන අධිකරණයක්ය කියන එක. මා දන්නා විධියට නම් ඒක එහෙම එකක් නොවෙයි. මොකද, එහෙම කරන්න බැහැ. අධිකරණ ඇමතිතුමියට ඕනෑ විධියට අධිකරණ පිහිටුවන්න බැහැ. එතුමියට අධිකරණ පිහිටුවීම පිළිබඳ අණ පනත් සම්මත කරන්න පුළුවන්. හැබැයි, අධිකරණ ඇමතිතුමියට ඕනෑ විධියට ඒ අධිකරණ පිහිටුවීමේ ක්‍රියාවලිය කරන්න බැහැ. ඒ තත්ත්වය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වෙනස් කරලායි තිබෙන්නේ. කවුරු හරි ඔබතුමියට ඒ චෝදනාව එල්ල කරනවා නම්, ඒ චෝදනාවෙන් ඔබතුමිය නිදහස් කරන්න පුළුවන්. හැබැයි, ඔබතුමිය ඒ චෝදනාවෙන් නිදහස් වුණාට, ඔබතුමිය භාවිතාවෙන් ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ, මේ අධිකරණ හරහා ඇත්තටම ප්‍රමාද වුණු ඒ නඩු කටයුතු කඩිනම් කරලා වැරදිකරුවන්ට දඬුවම් දෙනවා කියලා. නමුත්, ඒ කටයුතු කඩිනමින් කරන්න පුළුවන් වෙයි කියලා අපට පෙනෙන්නේ නැහැ.

අනික් කාරණාව මෙකයි. නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු වේගවත් කරන්න, ශක්තිමත් කරන්න නීතිපති දෙපාර්තමේන්තුවට සම්බන්ධ වන නීතිඥ මහත්ම මහත්මීන්ට සරිලන වැටුප් තලයක් සකස් කිරීමේ කටයුත්ත කඩිනම් කරන්න ඕනෑ. ඒ සඳහා යම් උත්සාහයක් දරපු බව දැක්කා. නමුත්, තවමත් ඒ කටයුතු තවම සාර්ථකත්වයට ඇවිල්ලා නැහැ. ඒ නිසාම නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු තවම ක්‍රියාත්මක වන්නේ මන්දගාමී ස්වභාවයෙන්. අවුරුදු ගණනක් පැරණි නඩු තවමත් නීතිපති දෙපාර්තමේන්තුවේ ගොඩ ගැහිලා තිබෙනවා. පුංචි පුංචි නඩු විතරක් නොවෙයි, මේ රටේ ජනතාව තුළ මහා ආන්දෝලනයකට ලක් වුණු ප්‍රබල කරුණු පිළිබඳව වූ නඩු පවා තවම නීතිපති දෙපාර්තමේන්තුව තුළ ගොඩ ගැසී තිබෙනවා. අඩුම ගණනේ ඒ නඩුවත් කඩිනමින් අහලා අවසන් කර ඔප්පු කරලා පෙන්වන්න ඕනෑකම තිබෙනවා. ඒ සඳහා තමයි නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑකම තිබෙන්නේ. එහි සිටින සේවකයන් ප්‍රමාණය මදි නම්, තිබෙන පරිපාලන ව්‍යුහය ප්‍රමාණවත් මදි නම්, තිබෙන සම්පත් ප්‍රමාණය මදි නම්, ඒවා වැඩි කරලා නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම මේ රටේ වංචාවට, දූෂණයට එරෙහිව ගන්නා කඩිනම් මෙන්ම ශක්තිමත් ක්‍රියාමාර්ගයක් වනවා. නමුත්, ඒක තවමත් නිවැරදිව සිද්ධ වෙලා නැති එක කනගාටුදායක කරුණක් විධියට අපි දකිනවා.

පසුගිය කාලයේ නීති විද්‍යාලය සම්බන්ධයෙන් තිබුණු චෝදනා මේ රටේ කවුරුත් දන්නවා. එදා නීති විද්‍යාලයේ භිටපු විදුහල්පතිවරයා තමන්ට ඕනෑ සමහර ශිෂ්‍යයන් නීති විද්‍යාලයේ විභාගවලට වාඩි කෙරෙව්වේ කොහොමද කියලා ජනතාව දන්නවා. වෙනම කාමර හදලා, වෙනම පහසුකම් සපයලා, උත්තර පත්‍රය කලින් දීලා, ඒ ප්‍රශ්න පත්‍රයට උත්තර ටික කලින් ගෙදරදී ලියාගෙන ඇවිල්ලා, පැය එක හමාරක කාලයක් තිබෙන ප්‍රශ්න පත්‍රය විනාඩි විස්සෙන් ලියලා හාර දීලා ගිය ඉතිහාසය අපට මතකයි. එදා අග්‍ර විනිශ්චයකාරවරිය ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් ඉදිරියේ තිබුණු සියලු නඩු කටයුතු නවත්වලා, එහෙම හොරට පාස් වුණු නීතිඥයාගේ හොර නීති උපාධිය දෙන්න කටයුතු කරපු ඉතිහාසය අපි දැක්කා. ඒ නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා තමන්ගේ පුතාත් ඒ විධියටම නීති විද්‍යාලයේ විභාගයෙන් පාස් කරවන්න හොර විභාග ප්‍රතිඵල දීපු ඉතිහාසයත් අපි දැක්කා. රටේ ප්‍රධානියාගේ පුතාට සලකපු විධියට තමන්ගේ පුතාටත් සලකාගන්න, තමන්ගේ පුතාත් නීති විද්‍යාලයේ විභාගය පාස් කළාය කියලා හොර ප්‍රතිඵල නිකුත් කරපු හැටි අපි දැක්කා. එවැනි තත්ත්ව වෙනස් කරලා, විශ්වවිද්‍යාලයේ නීති අංශයට යන්න බැරි, නීති විද්‍යාලය හරහා හෝ නීතිඥවරයෙකු බවට පත්වන්න උත්සාහ කරන ඒ සියලු ශිෂ්‍යයන්ට ඒ අයිතිවාසිකම ලබා දෙන්න පියවරක් ගත යුතුව තිබෙනවා. ඒ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමිය යෝජනා කරලා තිබෙනවා නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් පත් කිරීමට. නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු, භාණ්ඩාගාරිකවරයෙකු පත් කළ පමණින්ම නීති විද්‍යාලයේ කටයුතු සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ. මොකද, එතැන හැම දාම බලාධිකාරයක් තිබෙනවා. නීති විද්‍යාලයට බඳවා ගැනීම, නීති විද්‍යාලයේ යම් යම් ප්‍රතිපත්ති තීන්දු තීරණ ගැනීම ඉතිහාසයේ සිටම සිද්ධ වුණේ ඒ බලාධිකාරය මතයි.

එදා භිටපු අග්‍ර විනිශ්චයකාර සරත් එන්. සිල්වා මැතිතුමාගේ බලාධිකාරය සම්පූර්ණයෙන්ම නීති විද්‍යාලයේ ක්‍රියාත්මක වුණු එක වකවානුවක් තිබුණා.

ඒකට එරෙහිව කටයුතු කරන්න කාටවත් පුළුවන් වුණේ නැහැ. එම සාමාජික මණ්ඩලයේ 14 දෙනෙකු සිටියාට අගවිනිසුරුවරයා තමන්ට ඕනෑ විධියට කටයුතු කළා. ඒ තත්ත්වය වෙනස් කරන්නට අද ඔබතුමන්ලා ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් පත් කිරීම හරහා පමණක් ඒක වෙනස් කරන්නට පුළුවන්ද? එතැන තිබෙන බලාධිකාරය අධිකරණ ඇමතිවරයාටවත් පාලනය කරන්නට බැරි වුණු දෙයක්. මට මතකයි, එදා ගරු ඩිලාන් පෙරේරා මහත්මයා නියෝජ්‍ය ඇමතිවරයාව සිටියදී නීති විද්‍යාලය තුළ සිදු වන සමහර දේවලට එතුමා එකඟ නැහැයි කියලා ප්‍රකාශ කළා. නමුත් එතුමාට බැරි වුණා ඒක වෙනස් කරන්නට. අධිකරණ ඇමතිවරයාටවත් වෙනස් කරන්නට බැරි බලාධිකාරයක් නීති විද්‍යාලය තුළ තිබුණා. නීති විද්‍යාල ව්‍යුහය ඇතුලේ ඒක තිබෙනවා. එම නිසා නීති විද්‍යාලය තුළ වෙනම බලාධිකාරයක් පවත්වාගෙන යාමේ යාන්ත්‍රණය නිවැරදි විය යුතුව තිබෙනවා. නියෝජ්‍ය විදුහල්පතිවරයෙක්, භාණ්ඩාගාරික කෙනෙක් පත් කළ පමණින් එය වෙනස් කරන්නට පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ. එම නිසා ඒ ව්‍යුහය, නීති විද්‍යාලය තුළ තිබෙන බලාධිකාරය වෙනස් කරලා එතැන සාධාරණත්වයක් ඇති කරන්නට ඔබතුමිය වහාම අවශ්‍ය පියවර ගත යුතුයි කියලා මා යෝජනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගන සිද්ධියත් එක්ක පසුගිය කාලයේ රටේ නීතියේ බිඳ වැටීම් ඇති වුණා. ඇත්තටම දිගන සිද්ධියේ ආරම්භය අහම්බයක් තමයි. ඒ රියදුරාට පහර දීම අහඹු සිද්ධියක්. නමුත් රියදුරාට පහර දුන්නාට පසුව ඇති වෙන බෙදවාචකය අහම්බයක් නොවෙයි. ඒකට ඓතිහාසික තත්ත්වයන් බලපෑවා. පසුගිය ආණ්ඩුව කාලයේ ජාතිවාදය, ආගම්වාදය පෝෂණය කරනවා අපි දැක්කා. ජනතාව බලාපොරොත්තු වුණා මේ ආණ්ඩුව ආවාට පසුව ඒ තත්ත්වය පරාජය කරලා එදා ජාති වාදයේ බීජ වපුරපු අයට එරෙහිව නීතිය

ක්‍රියාත්මක කරයි කියලා. හැබැයි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුවත් ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. එම ජාතිවාදීන් නැවත ජාතිවාදය, ආගම්වාදය අවුස්සන්නට පටන් ගත්තා. ඒක පසුගිය දශකයක, එකහමාරක ඉඳලා වර්ධනය වුණු දෙයක්. ඒක සාමාන්‍ය මාධ්‍ය හාරහා වෙන්න පුළුවන්, අන්තර්ජාල මාධ්‍ය හරහා වෙන්න පුළුවන්, බිම් මට්ටමේ කට කථා, රැස්වීම් හරහා වෙන්න පුළුවන්. මේ වාගේ විවිධ ක්‍රම පාවිච්චි කරමින් ජාතිවාදය වර්ධනය කළ තත්ත්වයක් අපි දැක්කා. ඒ ආකාරයට එය වර්ධනය වෙලා; වර්ධනය වෙලා, අවසානයේ දිගන සිද්ධිය හරහා තමයි ඒක පුපුරලා ගියේ. ඒ ඇති වුණු තත්ත්වය පාලනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලා සමත් වුණේ නැහැ. සිද්ධිය ඇති වුණාට පසුව නීතිය ක්‍රියාත්මක කළා. එතකොට හදිසි නීතිය දාලා, සමාජ වෙබ් අඩවි තහනම් කරලා, එම සිදු වීමේ ප්‍රතිඵලයට උත්තර සොයන්නට ගත්තා. හැබැයි මේ තත්ත්වය වර්ධනය වෙන එක පාලනය කරන්නට ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කළේ නැහැ. එතැනදී මොකක්ද කළේ? වෝදනාවලට ලක් වුණු බොහෝ පිරිස් අධිකරණය ඉස්සරහාට ගෙනැල්ලා නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට දේශපාලන ඩීල්වලින් ඒ අයව රඳවා තබා ගත්තා. සමහර ඇමතිවරුන්ගේ ගෙවල්වල ඒ අයව රඳවා තබාගෙන ආරක්ෂා කරලා අවසානයේ දී නීතිය මහ හැරලා ගියා. අදත් ඒ අයට එරෙහිව දඬුවම් නැහැ. එවැනි තත්ත්වයක් තුළ වර්ධනය වුණු දෙයක් තමයි පුපුරලා ගියේ. පසුගිය කාලය පුරාම මේ රටේ ජාතිවාදය, ආගම්වාදය වපුරවපු, එම ජාතිවාදී, ආගම්වාදී ප්‍රවණතාව පාලනය කිරීම සඳහා සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරන්නට එතැනදී මේ ආණ්ඩුව අසමත් වුණා . ඒකෙනුත් පෙන්වුවේ ඔබතුමන්ලාගේ අසමත්කම. දිගන සිද්ධිය තුළින් ඇති වූ එම මහා බෙදවාචකය, මානුෂිකත්වය කෙලෙසීම ඇති වෙන්නට බලපෑ හේතු පාලනය කර ගන්නට බැරි වීම ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන්නට අසමත්වීමේ ප්‍රතිඵලයක්. එම නිසා දැන්වත්, අනාගතයේදීවත් එවැනි ජාතිවාදයන්, ආගම්වාදයන් වර්ධනය වෙලා ප්‍රවණතාවන් විධියට ඉස්සරහාට යන එක පාලනය කරන්නට ඔබතුමන්ලාගේ පැත්තෙන් මොනවාද කරන්නේ කියන එක මේ රටේ ජනතාව දැන ගන්නට කැමැතියි. හදිසි නීති හෝ විවිධ මර්ධනකාරී නීතිවලින් නොවෙයි එය කළ යුත්තේ. ඔබතුමන්ලා කරන්නේ යම් කිසි සිද්ධියක් ඇති වුණාට පසුව උත්තර සොයන එක.

පසුගිය කාලයේ වෘත්තීය සමිති ක්‍රියාත්මක වුණා. අදත් අපි දකිනවා විශ්වවිද්‍යාල වෘත්තීය සමිති වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා විට ප්‍රශ්නයට උත්තර සොයන්නේ නැතිව එය වර්ධනය වෙන්නට ඉඩ හැරලා අවසානයේදී වෘත්තීය සමිති මර්දනය කරන ආකාරය. වසර ගාණක් තිස්සේ දහස් ගණනක් වූ විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට වූ අසාධාරණය ගැන විදුලිබල මණ්ඩලයේ සේවකයන් කථා කළා; සාකච්ඡා කළා. නමුත් උත්තර දුන්නේ නැහැ. එම ප්‍රශ්නය දිග්ගැස්සිලා වර්ධනය වෙන්නට ඉඩ හැරියා. අවසානයේ දී ඔබතුමන්ලා කළේ වෘත්තීය සමිති නායකයන් දඩයම් කරන එක, වෘත්තීය සමිති නායකයන්ගේ වැඩ තහනම් කිරීම.

අද ලංකා විදුලි බල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයන් කිහිපදෙනකුගේම වැඩ තහනම් කරලා තිබෙනවා. ඊයේ පෙරේදා සෙවණගල ආයතනය නැවත ඒ දේශපාලනඥයන්ටම දෙන්න හදනකොට, එයට එරෙහිව වෘත්තීය සමිති මැදිහත් වනකොට, එතැන වෘත්තීය සමිති නායකයා මාධ්‍ය සාකච්ඡාවට එනකොට ඔහුට මහදී පහර දීලා තිබෙනවා. ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම්, ලංකා විදුලි බල මණ්ඩලයේ ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ කැඳවුම්කරු රන්ජන් ජයලාල් ඇතුළු තවත් කිහිපදෙනකුගේ වැඩ තහනම් කරලා මර්දනය කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමන්ලා කරන්නේ එවැනි සිද්ධි ඇති වුණාට පස්සේ එහි ප්‍රතිඵලයට උත්තර සොයන එකයි. ඒක නොවෙයි, විසඳුම වන්නේ. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය ඔය පුටුවේ ඔය විධියටම සිටියදී මීට මාස හතරකට කලින් ඔබතුමියට කියපු දේ මා නැවතත් අවධාරණය කරනවා. එදා ඔබතුමිය පොරොන්දු වුණා, "වෙනම අධිකරණ පිහිටුවා ඒ දූෂණ, වංචාවලට සම්බන්ධ අයට වහාම දඬුවම් දෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කරනවා. විනිසුරුවරුන්ගේ වැටුප් තල සහ ඔවුන්ට අවශ්‍ය කරන අනෙකුත් පහසුකම් වහා ලබා දෙනවා. මා එය කඩිනමින් කරනවා. මා පරණ ඇමතිවරයා වගේ නොවෙයි" කියලා. නමුත් තවමත් ඒ හොරුන්ට දඬුවම් දෙනවා අපි දැක්කේ නැහැ. ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර වංචාව ප්‍රධාන නඩු නිමිත්ත කරලා උසාවියේ නඩු අහනවා අපි තවමත් දැක්කේ නැහැ. ඒ නිසා ඒ කටයුත්ත ඉක්මනින් පටන් ගන්නය කියා ඉල්ලා සිටිමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. රටක නීතිය ඒ සමාජ අවශ්‍යතාවන් අනුව වරින් වර වර්ධනය වනවා. ඒ බව ඉතිහාසය පුරාම අපි දැකලා තිබෙනවා. අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග කාරණා රාශියක් පදනම් කර ගෙන, අපරාධ රැසක් පදනම් කර ගෙන ඉදිරිපත් කර තිබෙනවා. හයවන උපලේඛනයේ මේ වැරදි සම්බන්ධයෙන් සඳහන් වනවා. මෙම නියෝග සම්මතය සඳහා අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. රටක කවර නීතියක් වුණත්, ද්වේශ සහගත නොවන ආකාරයට, රටේ යුක්තිය, සාධාරණත්වය අරමුණු කර ගනිමින් සද්භාවයෙන් පනවනවා නම් අපට එයට විරුද්ධ වෙන්න පදනමක් නැහැයි කියන එක මා කියන්න කැමැතියි. ජාතික වශයෙන් රටේ ආර්ථිකයට, ඒ වාගේම රටේ යහපත් පැවැත්මට, දේශපාලනඥයන්ට සහ විශේෂයෙන්ම රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කරන්න, ඒ සඳහා අදාළ නීතිරීති සමාජගත කිරීම වරදක් විධියට මා දකින්නේ නැහැ. අපට ආසන්නම මිත්‍ර රටක් තමයි චීනය. චීනයේ ආර්ථික වර්ධනයට බලපා තිබෙන ප්‍රධානම කාරණයක් තමයි, ඒ රට තුළ තිබෙන දූෂණය, අල්ලස, සමාජ විරෝධය නතර කරන්න, ඒවාට දඬුවම් කරන්න නීතිරීති ගෙනැවිත්, පුද්ගලයාගේ තරාතිරම බලන්නේ

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

නැතුව ඔවුන්ට දඬුවම් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙන එක.

පසුගිය දිනවල ඇති කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස්කම්වලදීත් චීන නායකයා කිව්වේ, රටක ආර්ථික ගමන් මඟ ශක්තිමත් කරන්න නම් රටේ නීති පද්ධතිය ශක්තිමත් කිරීම අවශ්‍ය බවයි. ඒ නිසා අපට එවැනි නීතිමය කරුණුවලට විරුද්ධ වෙන්න පදනමක් නැහැ. නමුත් හදිසියේ කඩිමුඩියේ නීති සම්මත කරනකොට ඒ නීතිය තුළ තිබෙන්නේ කාගෙන් හෝ පළිගැනීමක්, ද්වේශයක් නම්, මා හිතන හැටියට එය යුක්ති සහගත නැහැ.

ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබූ, මරණීය දණ්ඩනය ලැබූ, අභියාචනා ඉදිරිපත් කරලා අවුරුදු ගණන් ගතවන සිරකරුවන් අද ඉන්නවා. සිරකරුවන් බන්ධනාගාරය තුළම මිය යන අවස්ථාත් තිබෙනවා. මොවුන් වෙනුවෙන් වෙනම අධිකරණයක් හෝ පිහිටුවා මේ මිනිසුන්ට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා පසුගිය කාලයේ අපි ඉල්ලා සිටියා.

මම කියන්න ගියේ මේ කාරණයයි. "අපට හිමි මරණීය දණ්ඩනය නම්, අපේ දණ්ඩනයේ ලිහිල්භාවයක් ඇති වෙන්නේ නැත්නම්, ඒ වාගේම අපි එහෙම දඬුවම් ලබලා අපේ අභියාචනාවත් සලකන්නේ නැතිව නැවත නැවත දීර්ඝ කාලයක් සිරදඬුවම් ලබනවා නම්, අපට වධ දෙන්නේ නැතිව අපි මරා දමාපල්ලා" කියන සටන් පාඨය තමයි ඒ ගොල්ලෝ පාවිච්චි කළේ.

පසුගිය කාල පරිච්ඡේදය තුළ උතුරු, නැඟෙනහිර සන්නද්ධ අරගලයට සම්බන්ධ වුණු සමහර අය බන්ධනාගාර ගත කරලා, ඔවුන් පුනරුත්ථාපන ක්‍රියාවලියට යොදන අවස්ථාවලදී පුනරුත්ථාපනයට යන්න විධියක් නැතිව, "අපේ නඩු වහා විභාග කරපල්ලා" කියන උද්ඝෝෂණයක් මතු වුණු බව අපි දැක්කා. ඒ වෙලාවේ අනුරාධපුරයේ අධිකරණ කිහිපයක් පිහිටෙව්වා. එහෙම පිහිටුවලා ඒ නඩු විභාග කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කළා.

අද ඊට වඩා වෙනස් ස්වරූපයේ පදනමක් මත "ත්‍රිපුද්ගල මහාධිකරණයක්" පත් කරලා, ඒ මහාධිකරණයේ කවර ආකාරයේ නඩු විමර්ශනය කරනවාද කියන එක අධිකරණ සංවිධාන පනත යටතේ මේ නියෝගවල අන්තර්ගත කරලා, එක දිගට නඩු අහලා දඬුවම් කරන්න හැකි නියෝගයක් හැටියට මෙය අද ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, මේ සඳහා නඩු ඉදිරිපත් කිරීමේදී ද්විත්ව ස්වභාවයක් තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පුළුවන් අල්ලස් හෝ දූෂණ සම්බන්ධ නඩු ඉදිරිපත් කරන්න. නීතිපති දෙපාර්තමේන්තුවටත් ඒ අවස්ථාව තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවටත් පැමිණිලි ඉදිරිපත් කිරීමේ, අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමේ බලය මේ පනත යටතේ නියෝගවල දෙයාකාරයෙන්ම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ නීතිරීති අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග යටතේ ගෙන ආවත්, අද අපට පෙනෙනවා මේ අපරාධකාරයෝ අල්ලා ගන්න ක්‍රමයක් නැති බව. රටෙන් පැන්න මිනිහා රතු වරෙන්තුවටත් ගෙනෙන්න බැහැ. අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග හදලා, වෙනම අධිකරණ පිහිටුවලා අපි මේවා කඩිනම් කරන්න ක්‍රියා කළාට, ඒ විධියට රටෙන් පැනපු අපරාධකාරයෝ ගෙනෙන්න අපට එහෙම යන්ත්‍රණයක් තවමත් නැහැ. පසුගිය කාලයේ නිබුණු මහ බැංකු වංචාවට -මම ඒකට කියන්නේ "මං කොල්ලය" කියලා- මහ බැංකුවේ හිටපු අධිපතිවරයා එක පැත්තකින් තමන්ට එරෙහිව ඇති චෝදනාවට කරුණු කියන්න ස්ව කැමැත්තෙන් අධිකරණයට එන්නේ නැහැ; අනෙක් පැත්තෙන්, ඔහු හොයා ගන්නත් බැරි ආකාරයට, මේ අධිකරණ පද්ධතියට ඔහු හසු කර ගන්න බැරි විධියට සැඟවිලා ඉන්නවා. ඉතින්, අපි කොහොමද මේ නඩු ඉක්මන් කරන්නේ? ඒ නිසා මේ අධිකරණ සංවිධාන පනත යටතේ ගෙනෙන වැරදි සම්බන්ධයෙන් නඩු කඩිනම් කරන්න නම්, ඒකට පරිබාහිර යන්ත්‍රණය ශක්තිමත් වෙන්න ඕනෑ. මේ හැම එකකම අන්තර් ස්වභාවයක් තිබෙනවා.

මට පෙනෙන තව එක දෙයක් තිබෙනවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ. සමහර වැරදි සම්බන්ධයෙන් මෙවැනි ත්‍රිපුද්ගල මහාධිකරණයක නඩුවක් ඉදිරිපත් කළාට පස්සේ එය සනාථ කිරීමේ -ඔප්පු කිරීමේ- භාරය හිමි සමහර නීතිඥවරුන්ට මේ සමහර වගන්ති යටතේ තිබෙන වැරදි සම්බන්ධයෙන් ආර්ථික විද්‍යානුකූල, එහෙම නැත්නම් බැංකු පනත, විදේශ විනිමය පනත වැනි පනත් යටතේ සහ ඒ වාගේම පරිගණක අපරාධ පනත යටතට එන පරිගණක අපරාධ -තාක්ෂණික අපරාධ- සම්බන්ධයෙන් සනාථ කිරීමේ අවබෝධය ඇති, පුළුල් දැනුමක් ඇති නීති ක්ෂේත්‍රයක් අපට තිබෙන්න ඕනෑ. අපි තවම ඒ පැත්තට ගමන් කරලා නැහැ. මේවා පිළිබඳ විමර්ශනය කරන්න සමහර විනිශ්චයකාරවරු පත් කරන කොට, ඒවා පිළිබඳව අවබෝධයක් තිබෙන විනිසුරුවරුන්ගෙන් සමන්විත විනිශ්චය ආසනයක් නැත්නම්, අපට සාධාරණ යුක්තියක් බලාපොරොත්තු වෙන්න බැරි වෙයි. සමහර වෙලාවට මූලික විරෝධතා මඟින් ඒ නඩු බිඳ වැටෙන්න පුළුවන්.

අපි අද කථා කරන මේ රෙගුලාසි යටතේ නීති අධ්‍යාපනය පිළිබඳවත් අන්තර්ගත වෙනවා. මෙම මූලික තත්ත්වයන් සම්පාදනය කර ගනිමින් තමයි අපට මේ පියවර ශක්තිමත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා අපේ නීතිඥවරුන්ට, රජයේ නීතිඥවරුන්ට, විනිශ්චයකරුවන්ට පවා විවිධ ක්ෂේත්‍රවලට අදාළ වන නීතිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දෙමින්, ඔවුන්ගේ අවබෝධය පුළුල් කරමින් කවර ක්ෂේත්‍රයක වුවත් මතු වන අධිකරණ ක්‍රියාවකදී -කවරම නඩු කටයුත්තකදී- ඒ පිළිබඳව නිවැරදි නියෝගයක් දෙන්න, දක්ෂතා තිබෙන සමහර නීතිඥයන් හමුවේ පරාජය නොවී පිළිතුරක් දෙන්න පුළුවන් තැනට මේ ක්ෂේත්‍රය ශක්තිමත් වෙන්න ඕනෑ. අවශ්‍යතාවක් මත අපි කඩිමුඩියේ නීති සම්මත කළාට කිසි වරදක් නැහැ. එක පැත්තකින් මම ඒක දකිනවා "ලෝකෙට පරකාසේ - ගෙදරට මරගාතේ" වාගේ. ලෝකයට පෙන්වන්න යනවා, "මෙන්න බලන්න දැන් අපේ යහපාලනය, අපි ලෙහෙසි නැහැ, දේශපාලනඥයන්ටත් දඬුවම් දෙන්න අපි ලැහැස්තියි, අපරාධ අවම කරන්න එක දිගට නඩු අසා අවසන් කිරීම සඳහා අධිකරණ පද්ධතියක් සකස් කර ගෙන යනවා" කියලා. පාරිශුද්ධභාවය පෙන්වන්න මේක හොඳයි. නමුත් අපට අවශ්‍ය වන්නේ පළමුවෙන්ම අපරාධ වළක්වා ගැනීමයි. නීතියේ ප්‍රධානම වැදගත්කම තිබෙන්නේ ඒකයි. අපරාධ වළක්වා ගන්නත් නීතිය වැදගත්. මෙවැනි වරදක් කළොත් අපි නීතියේ රැහැනට අහු වෙනවාය කියලා, අපරාධ වළක්වා ගෙන විනයක් ඇති සමාජයක් හදන්න නීතිය හදනවා මිසක් ද්වේශ සහගත චේතනාවෙන් " හරි උඹලා බලා ගනින්, අපි දෙන දඬුවම මොකක්ද කියලා බලාගන්න පුළුවන්" කියලා එවැනි නීති හදනවා නම් එහි යුක්ති සහගත භාවයක් නැහැ.

පසුගිය පළාත් පාලන ඡන්ද කාලයේ සමහරු, සමහර දේශපාලනඥයන්ට පෙන්වුවේ වැලිකඩ බන්ධනාගාරයයි. සමහරු ජම්පර් අන්දවන්න කථා කළා. මම මේක කිව්වේ ඒ නිසායි. ඇත්ත වශයෙන්ම මේවා කථා කරලා නීති රීති සම්මත කරන කොට මේක ඇතුළේ තිබෙන විකෘතිය අපට පෙනෙනවා. මේ නීති ගේන්නේ සද්භාවයෙන්ද, එහෙම නැත්නම් කවුරු හෝ ඉලක්ක කරගෙන ඒ ඉලක්කය සඳහා නීති හදනවාද කියන එක අපට පෙනෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කාලය අවසන්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ කාලය අවසන් වුණාට කමක් නැහැ. දැන් ආණ්ඩුවේ කාලයත් අවසන් වීගෙන එනවා. ඒ නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි, රටට අවශ්‍ය නීති සම්මත කිරීම හා අධිකරණ සංවිධාන පනත යටතේ නව අධිකරණ පිහිටුවීම පිළිබඳව අපට ලොකු අර්බුදයක්, ගැටලුවක් නැහැයි කියලා. නමුත් අපි ඉල්ලා සිටිනවා, ද්වේශ සහගත අරමුණු පදනම් කරගෙන, තවත් කෙනකු ඉලක්කගතව දඩුවම් කිරීමේ අරමුණු ඇතිව නීති හදනවා නම් ඒක රටේ යුක්තියට හා සාධාරණත්වයට බාධාවක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා.

[பி.ப. 4.16]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் நீதித்துறை சம்பந்தப்பட்ட விவாதத்திலே கலந்து கொண்டு பல்வேறுபட்ட கருத்துக்களை முன்வைக்கின்றோம். இன்று சாதாரண மக்கள் நீதியை நோக்கி அல்லது நீதி சம்பந்தப்பட்ட ஒரு பரிகாரத்தை நோக்கி நீதிமன்றம் செல்வதற்குத் தயக்கம் காட்டுவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அதாவது, நீதிமன்றங்களிலே வழங்குகள் மிக நீண்ட காலமாகத் தாமதமாகின்ற காரணத்தினால் மக்கள் நீதிமன்றத்திற்குச் செல்வதற்குத் தயக்கம் காட்டுகின்றார்கள். இது ஓர் ஆரோக்கியமான சூழலை ஏற்படுத்தாது. காரணம், நீதி வேண்டுமென்றால் - அநீதிக்கு எதிராகச் செயற்பட வேண்டுமென்றால் நீதிமன்றத்திற்கு மாத்திரமே செல்லலாம். மக்கள் எதிர்பார்க்கும் நீதி அல்லது சாதகத் தன்மை அந்த நீதிமன்றத்திலே கிடைக்காமல் குறித்த வழக்குகள் மிக நீண்ட காலமாக இழுத்தடிக்கப்படுமானால், மக்கள் நம்பிக்கை இழந்து நீதிமன்றத்தைப் பயத்தோடு பார்க்கின்ற நிலைமை ஏற்படும். ஆகவே, தேங்கிக்கிடக்கும் - மிக நீண்டகாலமாக விசாரிக்கப் படாமல் இருக்கும் வழக்குகள் துரிதப்படுத்தப்படல் வேண்டும். உடனடியாகவே மக்கள் எதிர்பார்க்கும் நீதி கிடைக்கும் வண்ணம் ஆக்கபூர்வமான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும். நீதித்துறைக்குப் புதிதாக நியமிக்கப்பட்டுள்ள கௌரவ அமைச்சர் திருமதி தலதா அத்துகோரல அவர்கள் ஒரு சட்டத்தரணி என்ற வகையிலே இந்த விடயத்திற்கு முக்கியத்துவம் கொடுப்பாரென்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது.

2015ஆம் ஆண்டு நாங்கள் தேர்தல் பிரசாரங்களை மேற்கொண்டிருந்த வேளையில், இந்த நாட்டிலே முன்னைய ஆட்சியாளர்களினால் மேற்கொள்ளப்பட்ட பாரிய மோசடி, ஆட்கடத்தல், கொலை, கொள்ளை என்று பெருவாரியான குற்றச்சாட்டுக்கள் சம்பந்தமான விடயங்களை முன்வைத்ததுடன், அவற்றுக்குத் தகுந்த தண்டனை வழங்கு மாறும் மக்களிடம் கேட்டிருந்தோம். அந்தக் கோரிக்கையை ஏற்றுக்கொண்ட மக்கள், நாம் கூறியவற்றிலே உள்ள தாற்பரியத்தைப் புரிந்துகொண்ட மக்கள் ஆட்சி மாற்றத்தை ஏற்படுத்த வேண்டும், ஊழல், துஷ்பிரயோகம், களவு, கொள்ளை, கொலை என்பவற்றுடன் சம்பந்தப்பட்டவர்களை நீதிக்கு முன் நிறுத்தி தண்டனை வழங்கவேண்டும் என்ற நோக்கோடு எமக்கு வாக்களித்தார்கள். அது ஜனாதிபதித் தேர்தலாக இருக்கலாம், பொதுத் தேர்தலாக இருக்கலாம் இரண்டிலும் மக்கள் சரியான தீர்ப்பை வழங்கினார்கள். ஆனால், முன்னைய ஆட்சியாளர்கள்மீதான பல்வேறு குற்றச்சாட்டுக்கள் பற்றி விசாரிக்கப்பட்டதா? அல்லது தண்டனை வழங்கப்பட்டதா? ஆனால், நாங்கள் அதில் பின்னடைவைச் சந்தித்திருக்கிறோம் என்பதை ஏற்றுக் கொள்ளத்தான் வேண்டும்.

எமது நாட்டைப் பொறுத்தளவிலே, நீதி சிறிது தாமதித்தே கிடைப்பதை நாங்கள் பார்த்திருக்கிறோம். அதேநேரம், இன்று நீதித்துறை சரியாகச் செயற்படுகின்றது என்பதை நாங்கள் இந்த இடத்திலே சொல்லியாக வேண்டும். அதாவது, காலம் தாமதித்தேனும் நீதித்துறை சரியாக இயங்குகின்றது. ஆனால், அந்தக் காலதாமதத்தை ஏற்றுக்கொள்வதற்கு மக்கள் தயாரில்லை. இதுதான் இதிலுள்ள வித்தியாசம். அந்த வகையில் மக்கள் உடனடியாகத் தீர்வு - நீதி கிடைக்க வேண்டும் என்று எதிர்பார்த்து நிற்கின்றார்கள். இப்பொழுது பாரிய ஊழல், மோசடி பற்றி விசாரிப்பதற்கான விசேட நீதிமன்றங்களை அமைப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்பட்டிருக்கின்றது. உண்மையிலே இது வரவேற்கப்பட வேண்டிய ஒரு விடயமாகும். இது மூன்று வருடங்களுக்கு முன்பதாகவே செய்யப்பட்டிருக்க வேண்டும் என்பதுதான் எனது ஆதங்கமாகும். மூன்று வருடங்களுக்கு முன்பே இதனை மேற்கொண்டிருந்தால், இந்த நாட்டைச் சுரண்டியவர்கள், மோசடியிலே ஈடுபட்டவர்கள், கொலை மற்றும் பாதகச் செயல்களைப் புரிந்தவர்கள் எல்லோரும் இன்று தண்டனையை அனுபவித்துக்கொண்டிருப்பார்கள். ஆனால், அவர்களைத் தண்டிப்பதற்குத் தாமதமான காரணத்தால் இன்று மக்கள் மத்தியிலே ஒரு சந்தேகம் ஏற்பட்டிருக்கின்றது. அதாவது, பொய் கூறி, போலியான விடயங்களைக் கூறி மக்களுடைய வாக்குகளை அபகரித்திருக்கிறார்கள் என்ற எண்ணம் அவர்கள் மனதிலே எழுந்துள்ளது. இன்று அரசாங்கம் நடந்துமுடிந்த உள்ளூராட்சி மன்றத் தேர்தலிலே பின்னடைவைச் சந்தித்ததற்குக் காரணம் - சரியான முறையிலே வாக்குகளைப் பெறமுடியாமல் போனமைக்கான காரணம் - இதுதான் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, மக்கள் இதன்மூலம் எமக்கொரு சமிக்ஞையைக் காட்டியிருக்கிறார்கள் - கோரிக்கையை முன்வைத்திருக்கிறார்கள். அதாவது, தேர்தல் காலங்களில் சொன்னவற்றைச் செயலுருவில் காட்டுமாறு இந்தக் குட்டித் தேர்தலினூடாக உணர்த்தியிருக்கிறார்கள். இன்று நாங்கள் காலம் தாமதித்தாவது, இந்த விடயத்திலே மிகத் தீவிரமாக, சுறுசுறுப்பாக இயங்கவேண்டிய நிலைக்கு வந்திருக்கின்றோம். அந்த வகையில், விசேட நீதிமன்றங்களுக் கான ஏற்பாடானது உண்மையிலே மோசடிக்காரர்களையும் வஞ்சகர்களையும் இந்த நாட்டைச் சூறையாடியவர்களையும் தண்டிக்கின்ற ஒரு விடயமாக அமையும் என்பதிலே எந்தவித சந்தேகமுமில்லை.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

இன்று நாங்கள் சம்பந்தப்பட்டவர்கள்மீது குறை சொல்லு கின்றோம்; குற்றஞ்சாட்டுகின்றோம். அதற்கு அவர்கள், "நாங்கள் இவ்வாறான மோசடிகளில் ஈடுபடவில்லை; கொலைச் செயல்களில் ஈடுபடவில்லை; நாட்டைச் சூறையாட வில்லை" என்றெல்லாம் மறுப்புத் தெரிவிக்கின்றார்கள். இதில் பரஸ்பர சொற்போர் இடம்பெறுவதை நாங்கள் பார்க்கக் கூடியதாக இருக்கின்றது. ஆங்கிலத்திலே இதனை, "word against word" என்று சொல்லுவார்கள். ஆனால், உண்மையிலே யார் குற்றவாளி என்பதைத் தீர்மானித்துத் தண்டனை வழங்கக்கூடிய ஓர் இடம் நீதிமன்றம் மாத்திரமே! ஆகவே, சம்பந்தப்பட்டவர்களை நீதிமன்றத்தின் முன் நிறுத்துவதனூடாக, "சொன்னதைச் செய்தோம்; மக்களிடம் செய்வதாகக் கூறியதைச் செய்துகாட்டியிருக்கின்றோம்; குற்றவாளிகளுக்குத் தண்டனை பெற்றுக்கொடுத்திருக் கின்றோம்" என்று நிரூபித்து எங்களை நாங்கள் மேம்படுத்திக் கொள்ள முடியும்.

நீதிமன்றம் இன்று சுயமாக இயங்குகின்றது. அதிலே எவருக்கும் தலையிட முடியாது. முன்னரெல்லாம் அவ்வாறல்ல! நீதித் துறையிலே ஏனையவர்களின் தலையீடு இருந்தது. குறித்த ஒரு வழக்கில் எவ்வாறான தீர்ப்பு வழங்கப்படும் என்பது முன்னரே நிச்சயிக்கப்பட்ட ஒரு காலகட்டம் இருந்தது. இப்பொழுது அந்த நிலைமைக்கு ஆப்பு வைக்கப்பட்டிருக் கின்றது. நல்லாட்சியிலே அவ்வாறான ஒரு மோசமான நிலைமைக்கு இடமில்லை. இன்று நீதித்துறை சுயமாகவும் சரியாகவும் செயற்படுகின்றது. பேதமின்றித் தண்டனை வழங்கும் ஓர் இடமாக நீதிமன்றம் மாறியிருக்கின்றது. இது உண்மையிலே வரவேற்கப்பட வேண்டிய ஒரு விடயமாகும். ஏற்றத்தாழ்வு இல்லாமல் அனைவருக்கும் நீதி சமம் என்ற வகையிலே நீதித்துறை இயங்கிக்கொண்டிருக்கின்றது. அதேநேரம் நீதித்துறையைப் பலப்படுத்த வேண்டிய தார்மீகக் கடமையும் பொறுப்பும் எமக்கிருக்கின்றது. ஆகவே, இன்று விசேட நீதிமன்றங்கள் துரித கதியிலே அமையப்பெற வேண்டும். அதுமாத்திரமல்ல, எல்லாப் பிரதேசங்களிலும் நீதிமன்றங்களின் எண்ணிக்கையை அதிகரிக்க வேண்டும் அல்லது நீதிமன்றங்களின் செயற்பாட்டை அதிகரிக்க வேண்டும். இதனூடாக வருடக்கணக்கில் தேங்கிக் கிடக்கும் வழக்குகளை முடிவுக்குக் கொண்டுவருவதுடன், நீதியானதும் விரைவானதுமான தீர்வினை வழங்கக்கூடியதாகவும் இருக்கும்.

இப்பொழுது நீதிமன்றங்களில் வழக்குத் தாக்கல் செய்ய மக்கள் தயங்குகின்றார்கள். இவ்வாறு நீதியைப் பெற்றுக் கொள்ள நீதிமன்றம் செல்வதற்கு மக்கள் தயக்கம் காட்டுகின்ற நிலைமையானது, குற்றச்செயல்களைப் புரிபவர்களுக்குத்தான் சாதகமாக அமையும். அதாவது, பாதிக்கப்பட்டவர்கள் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செல்வதற்குத் தயக்கம் காட்டினால் அது குற்றம் செய்தவர்களை வலுவூட்டுவதாகவே அமையும். அந்த நிலைமை மாறுவதற்கு மக்களிடையே நம்பிக்கை ஏற்படுத்தப்பட வேண்டும். நீதித்துறையை முழுமை யாக மறுசீரமைப்பதனூடாகவே அதனை மேற்கொள்ள முடியும். அதற்கான சக்தி அனைத்தும் நல்லாட்சிக்கு இருக்கின்றது என்பதையும் இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, அரசாங்கம் இந்த விடயத்திலே துரிதமாகச் செயற்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்பொழுது நல்லதொரு நீதியமைச்சர் செயற்பட்டு வருகின்றார். எதற்கும் வளைந்து கொடுக்காத நீதியமைச் சராகவே நாங்கள் அவரைப் பார்க்கின்றோம். இந்த நல்ல அம்சங்களை வைத்துக்கொண்டு நீதித்துறையிலே மக்களுக்கு நம்பிக்கையேற்படும் வண்ணம் குறித்த செயற்பாடுகளை அவர் வியாபிக்க வேண்டும்; விஸ்தரிக்க வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். அதனூடாக நாட்டிலே நீதித் துறைக்குப் பெருமதிப்புக் கிடைக்கும் என்பதிலே எவ்வித சந்தேகமுமில்லை.

இன்று நீதிமன்றத்திலுள்ள வழக்குகள் 5 - 10 - 15 - 20 வருடங்கள் என்று இழுத்தடிக்கப்படுவதால், மக்கள் வழக்குத் தாக்கல் செய்வதற்குப் பயப்படுகின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Please give me just a few seconds, Sir.

ஒரு விடயத்தை உதாரணமாகக் குறிப்பிட விரும்பு கின்றேன். அதாவது, ஒரு சிறுமி துஷ்பிரயோகம் செய்யப்பட்டார் என்பதற்காக அவர் நீதி கேட்டு நீதிமன்றம் செல்கின்றார். ஆனால், குறித்த வழக்கு விசாரணைகள் முடிந்து தீர்ப்பு வழங்கப்படும்போது, அவர் யுவதியாகித் திருமணம் முடித்து, பிள்ளைகளோடு வாழ்கின்ற நிலைமை காணப்படுகிறது. இவ்வாறான துன்பகரமான நிலைமையும் இந்த நாட்டிலே உள்ளது. இது பற்றிச் சிறிது யோசித்துப் பாருங்கள்!

இவ்வாறான சூழ்நிலையிலிருந்து நாம் மீள்வதற்கு நீதித்துறை சக்திமயப்படுத்தப்பட வேண்டும் என்று கூறிக் கொள்வதோடு, நீதித்துறை சிறப்பாக இயங்குவதற்கான அனைத்துச் செயற்பாடுகளையும் அரசு மேற்கொள்ள வேண்டு மென்று கேட்டு, சந்தர்ப்பமளித்த கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 4.29]

ගරු සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு சுஜித் சங்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග පිළිබඳව විවාදයට ගන්නා අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමන්න ඕනෑ.

අධිකරණ සංවිධාන පනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලය පිළිබඳව තමයි අද මේ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී වැඩියෙන්ම කථා කෙරුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වසර තුන-හතරකට ඉස්සෙල්ලා මේ රටේ ලොකු ආන්දෝලනයක් ඒ වාගේම ලොකු මතයක් තිබුණා, දේශපාලනඥයනුත්, විවිධ පුද්ගලයනුත්, නිලධාරිනුත් සම්බන්ධ වෙලා මේ රටේ ඇති කළ ඒ දූෂණ තත්ත්වය පිළිබඳව. ඒක නිසා තමයි, මේ රටේ ආණ්ඩු පෙරළියකුත් සිදු වුණු අවස්ථාවේදී හැම දෙනාම කිව්වේ, මේ සම්බන්ධව නිසි ආකාරව සොයා බලා මේවාට දඬුවම් ලබා දීමේ

ක්‍රියාදාමයක් ඇති කරන්න ඕනෑය කියලා. ඒක තමයි මේ රටේ පොදු මතය වෙලා තිබුණේ.

පසුගිය කාල සීමාව තුළ වර්තමාන රජයට ලොකු චෝදනාවක් එල්ල කෙරුවා. පසුගිය මැතිවරණ කාලයේදී අපි වංචා-දූෂණ ගැන කථා කෙරුවාට ඒ අයට නිසි දඬුවම් ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කෙරුවේ නැහැ කියන එක තමයි ඒ අවස්ථාවේදී මේ රටේ මතය වෙලා තිබුණේ. අදටත් ආණ්ඩුවට තිබෙන චෝදනාව තමයි, "මේවා සම්බන්ධව චෝදනා ඉදිරිපත් කෙරුවා පමණයි. මේවාට කිසිම ආකාරයක පියවරක් ගත්තේ නැහැ" කියන එක. ඒක නිසා තමයි වර්තමාන රජයත්, අධිකරණ ඇමතිතුමියත් කල්පනා කරලා මේ සම්බන්ධව තීන්දුවක් අරගෙන තිබෙන්නේ. චෝදනාවලට ලක් වුණු, ඒ වාගේම දූෂණය සිදුකළ වුණු පුද්ගලයන් සම්බන්ධව නඩු අහන එක ඉක්මන් කරලා ඉතාම කෙටි කලකින් වැරදිකරුවන්ට නිසි ආකාරව දඬුවම් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් තමයි මේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලය එහෙම නැත්නම් මේ මහාධිකරණය පිහිටුවන්න ඕනෑය කියන එක සම්බන්ධව අදහස ඉදිරිපත් කෙරුවේ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙයයි. අපි මේ සම්බන්ධව කථා කරන කොට තවත් අවධානය යොමු කරන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. මොකද, මේවාට විතරක් දඬුවම් දීලා ප්‍රමාණවත් වන්නේ නැති නිසා. මේ සම්බන්ධව නිසි ආකාරව සොයා බැලීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ. පසුගිය කාලයේ අපි මේ ගැන කථා කෙරුවා. හුඟක් අවස්ථාවලදී ඒ දූෂණ ක්‍රියා සම්බන්ධව පොලීසිය ක්‍රියාත්මක වුණේත් නැහැ. ඒ වාගේම අධිකරණයට ඉදිරිපත් වුණු අවස්ථාවලදී අධිකරණය නිසි ආකාරව, සාධාරණව ඒ සම්බන්ධව ක්‍රියා කෙරුවේ නැහැ කියන චෝදනාව පසුගිය ආණ්ඩුවට වාගේම වර්තමානයේත් ඉදිරිපත් වෙන අවස්ථාවන් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉල්ලා සිටින්නේ මේවා සම්බන්ධව විමර්ශනය කරන්න කියලායි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරපු අවස්ථාවේදී ඒවා සම්බන්ධව විමර්ශනය කරන්නත් දීර්ඝ කාලයක් ගත වෙනවා. ඒක නිසා අධිකරණයක් පිහිටුවීමෙන් විතරක් මේ ප්‍රශ්නය විසඳෙන්නේවත්, ඒවා සම්බන්ධව කඩිනම් දඬුවම් ලබා දීමේ හැකියාවක් ලැබෙන්නේවත් නැහැ කියන එකත් මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූලික වශයෙන් මේ අධිකරණය පිහිටුවූවා වාගේම කොමිෂන් සභාත්, පොලීසියේ ක්‍රියාදාමයත් ඒ වාගේම අනෙකුත් ඒවායේ ක්‍රියාදාමයත් කඩිනම් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරුවොත්, අපට නිසි ක්‍රියාමාර්ගයක් අනුව දූෂිතයන්ට, හොරුන්ට දඬුවම් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා අපි මේ අවස්ථාවේදී අදහසක් හැටියට ඉදිරිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට අදාළ නැති වුණත් තවත් එක අදහසක් මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න ඕනෑ. මම මේ අවස්ථාවේදී යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේක අද මේ රටේ ව්‍යාපාරිකයන්ට තිබෙන ලොකු ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යාපාරික ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න උදවිය වෙක් පත්වලින් තමයි ගනුදෙනු කරන්නේ. හැම දෙනාම විශ්වාසය පදනම් කරගෙන තමයි මේ ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වෙලා සිටින්නේ. අද තිබෙන තත්ත්වය හැටියට වෙක් පතක් ඉදිරිපත් කෙරුවාට ඒ වෙක් පත්වලට මුදල් ලබා දීමේ වැඩ පිළිවෙළක් නැහැ. ඒ සම්බන්ධව ව්‍යාපාරිකයෙකුට අසාධාරණයක් සිදු වුණොත් ඒ ව්‍යාපාරිකයාට ඒ මුදල ලබා ගන්න ලොකු ක්‍රියාදාමයකට යන්න වෙනවා.

බොහෝ අවස්ථාවලදී ඒ සම්බන්ධව ක්‍රියාදාමයකට ගියත්, ඒ මුදල ලබා ගැනීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක නිසා අපි ඉල්ලා සිටින්නේ, මේ සම්බන්ධව ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලායි. ව්‍යාපාරිකයෙකුට ලබා දෙන චෙක් පතක් අගරු වුණොත්, ඒ මුදල් ලබා ගැනීමේ සාධාරණ ක්‍රියාදාමයකට යන්න පුළුවන්කමක් ඔහුට නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අප විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. චෙක්පතක් අගරු වීමක් සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කළා වුණත්, එහෙම නැත්නම් එකී චෙක්පත හා සම්බන්ධ තොරතුරු invoices සියල්ල සමඟ නිසි ආකාරව ලබා දුන්නා වුණත් අධිකරණයට ගියාට පසුව වරදකරුට දඬුවමක් ලබා දීම සම්බන්ධව ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ නැහැ. බොහෝ අවස්ථාවලදී ඒ අයට ඇප ලබා දෙනවා. ඇප ලබා දුන්නාම මොකද වෙන්නේ? වෙච්ච පාඩුවට අමතරව තවත් මුදලක් වියදම් කරලා වසර ගණනාවක් යන කල් ඒ ව්‍යාපාරිකයාට ඒ නඩුවලට පෙනී සිටින්න සිද්ධ වන තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ ගරු අමාත්‍යතුමියගෙන් මම ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් සංශෝධනයක් ගෙනැල්ලා චෙක්පත් මඟින් වංචා කරලා ව්‍යාපාරිකයන් අසීරු තත්ත්වයට පත් කරන පුද්ගලයන් සම්බන්ධවත් අධිකරණය මීට වඩා දැඩි දඬුවම් ලබා දීමේ ක්‍රියා දාමයක් ආරම්භ කරන්න කියා. ඒ සම්බන්ධයෙන් යම්කිසි සංශෝධනයක් කරන්න අවශ්‍ය නම්, ඒ සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා හෝ නිසියාකාරව දඬුවම් ලබා දීමේ ක්‍රියා මාර්ගයට යන්න ඕනෑ කියන එක මේ අවස්ථාවේදී යෝජනාවක් හැටියට ගරු අමාත්‍යතුමියට ඉදිරිපත් කරන්න කැමැතියි. මා හිතනවා, ඒක ඉතාම කාලෝචිතව අත්‍යවශ්‍යයෙන්ම කරන්න ඕනෑ කාරණයක් කියා. මොකද, එහෙම නැත්නම් සිදු වන දේ අපි දන්නවා. මේ රටේ ව්‍යාපාර හා සම්බන්ධ උදවිය නිසායි අපේ ආර්ථිකය නහා සිටුවීමේ, රැකියා අවස්ථා ලබා දීමේ, ව්‍යාපාර ක්ෂේත්‍රයේ දියුණුව ඇති කිරීමේ වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ. මේ ආදි සෑම එකක්ම රඳා පවතින්නේ විශ්වාසය පදනම් කරගෙනයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමියගෙනුත්, අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරි මහත්වරුන්ගෙනුත් මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න කියලායි. ඉදිරියේදී මේ සම්බන්ධව පනත් කෙටුම්පතක් ගෙනැල්ලා හෝ දඬුවම් ලබා දීමේ ක්‍රියා දාමයක් ඇති කරන්න කියායි මා නැවත වරක් අවධාරණය කරන්නේ. දඬුවම් ලබා දීමේ ක්‍රියා දාමයක්, මුදල් අය කර දීමේ ක්‍රියා දාමයක් ඇති වන ආකාරයේ සංශෝධන පනත් කෙටුම්පතක් ගෙනැල්ලා, අවශ්‍ය සංශෝධනයක් ඉදිරිපත් කරලා හෝ ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන් ගරු අමාත්‍යතුමිය, අධිකරණ අමාත්‍යතුමිය වශයෙන් පත් වුණාට පසුව එතුමිය මේ ක්ෂේත්‍රය තුළ ලොකු වෙනසක් ඇති කරන්න කටයුතු කර තිබුණා කියා අපි දන්නවා. පසුගිය කාලයේ අධිකරණ අමාත්‍යතුමන්ලාටත්, ඒ වාගේම රජයටත් ලොකු චෝදනා එල්ල වෙලා තිබුණේ මේ අධිකරණ ක්ෂේත්‍රය තුළින් සාධාරණයක් ඉෂ්ට වන්නේ නැහැ, හොරුන්ට දඬුවම් ලැබෙන්නේ නැහැ කියායි. ඒ සම්බන්ධයෙන් යම්කිසි විධිමත් ක්‍රියා මාර්ගයක් ආරම්භ කරලා, ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් සහිත මහාධිකරණයක් පිහිටුවා කඩිනමින් දඬුවම් ලබා දීමට ක්‍රියා කිරීම පිළිබඳව ගරු අමාත්‍යතුමිය ඇතුළු රජයටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ඒ නිලධාරි මණ්ඩලටයටත් අපේ ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.
මීළඟට, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.35]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යටතේ නියෝග ගැන කතා කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම කාලෝචිත මාතෘකාවක්. මම අනෙක් සියලුදෙනාම පැවසූ අදහස් අහගෙන සිටියා. පක්ෂ විපක්ෂ අදහස් එක එක විධියට ප්‍රකාශ වුණා, FCID එක ගැන, විශේෂ අධිකරණ ගැන, විශේෂ අධිකරණ පිහිටුවීම ගැන. "ඒවා මඟින් පළි ගන්නවා" කියා කිව්වා, "ඒක පාක්ෂිකයි" කියා කිව්වා. ඒවා සේරම ජනතාව අහගෙන සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ ප්‍රකාශ කරන්න යන්නේ පොදු ජනතාවගේ මතයයි. පොදු ජනතාව දන්නා විධියට, පොදු ජනතාව කියන විධියට, ජනමාධ්‍ය කියන විධියට ලෝකයේ-

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க — சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)
පොඩ්ඩක් ප්‍රවේශමෙන්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

එස්.බී. දිසානායක අමාත්‍යතුමා මට කියනවා, පොඩ්ඩක් ප්‍රවේශමෙන් කතා කරන්න කියා. එතුමා එහෙම කියනවා, මට නඩුවක් තිබෙන හින්දා. නමුත් හිත්ත ඇත්ත කතා කරන්න වෙනවා. හිත්ත ඇත්ත කතා කරලා ප්‍රශ්නයක් වූ නිසා ඒ සම්බන්ධයෙන් එතුමාට පළපුරුද්දක් ඇති. නමුත් මගෙන් යැපෙන්න කවුරුත් නැති හින්දා හිරේ යන්න මට කිසි ප්‍රශ්නයක් නැහැ. මට හිත්ත ඇත්ත කතා කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ටිකේ ජනමාධ්‍ය හරහා ප්‍රකාශයට පත් වුණා, ලෝකයේ දූෂිතම රටවල් හතරෙන් අපේ රට හතරවැනි තැනට පත් වෙලා තිබෙනවා කියා. ඒ රටවල් හතර තමයි ටියුනීසියාව, නයිජීරියාව, බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව. පසුගිය ටිකේ කරපු ක්‍රියාකාරකම්වලින්, කටයුතුවලින් සහ අපරාධ, මංකොල්ල කෑම්, මිනීමැරුම් නිසා දූෂිතම රටවල් හතරෙන් එකක් බවට ශ්‍රී ලංකාව පත් වෙලා හමාරයි. ඒ දේවලට සම්බන්ධ හොරු, මංකොල්ලකාරයෝ, මිනීමරුවෝ, පාතාලයේ නායකයෝ, කුඩුකාරයෝ, මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ, එතනෝල්කාරයෝ තමන්ගේ කාරිය -තමන්ගේ ඩියුටිය- up-to-date කර තිබෙනවා. ඒ ගොල්ලේ හොඳට මිනී මරලා තිබෙනවා. ඒ ගොල්ලෝ කුඩු ගෙන්වා තිබෙනවා, කිලෝ ගණන්. ඒ අය අපරාධ කර තිබෙනවා; ගෙවල් අරගෙන තිබෙනවා. නඩු භාණ්ඩ පවා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගන්න පුළුවන්, නඩු භාණ්ඩයක් හැටියට තිබෙන මල්වානේ ගෙය. මල්වානේ ගෙය හසු වෙලා තිබෙනවා. මල්වානේ ගෙය පෙනෙන්න තිබෙනවා. නමුත් ඒ වෙනුවෙන් ක්‍රියා මාර්ගයක් ගන්න කාටවත් බැරි වෙලා තිබෙනවා. නඩු භාණ්ඩයක් හැටියට තාජුඩීන්ගේ මිනිය තිබෙනවා. රගර් ක්‍රීඩකයකු මැරිලා තිබෙනවා, ඔහුගේ මිනිය තිබෙනවා. ගහලායි මරලා තිබෙන්නේ. ඒක ස්වාභාවික මරණයක් කියා කියනවා. ලසන්ත පාරේ මැරෙනවා. -පසුගිය ටිකේත් ඒවා වුණා.- එක්නැලිගොඩ අතුරුදහන් වනවා. මාධ්‍යවේදීන් 36දෙනෙක් ඝාතනය වනවා.

නමුත්, අල්ලපු කෙනකු නැහැ; ඝාතන සිදු කළ කෙනකු නැහැ. නඩු භාණ්ඩ ආදී සියල්ලම තිබියදී සොරුන්, මිනීමරුවන්, අපරාධකාරයින් තමන්ගේ කාර්යය හරියට ඉෂ්ට කරද්දී ඒ අයව අල්ලන වැඩේ, නීතිය ඉදිරියට ගෙනෙන වැඩේ සහ ඒ අයට දඬුවම් දෙන වැඩේ හරියට නොකළේ කවුද කියන එක පොදු ජනතාව අහනවා. මෙච්චර දේවල් හසු වෙලා තිබියදීත්, මෙච්චර දේවල් වෙලා තිබියදීත් ඒ කාර්යය හරියට නොකළේ කවුද කියලා පොදු ජනතාව අහනවා. මහ බැංකුවේ හොරකමක් වෙලා තිබෙනවා. ඒකට සම්බන්ධ දෙදෙනකු නම් අල්ලාගෙන තිබෙනවා. කසුන් පලිසේන සහ අර්ජුන ඇලෝසියස් කියන අය hospital එකට යවන්නේ නැතිව අද සිර ගෙදර ඉන්නවා පැදුරක්වත් නැතිව. අර්ජුන ඇලෝසියස්ගේ රුපියල් බිලියන 12ක් block කරලා තිබෙනවා; accounts 26ක් block කරලා තිබෙනවා; මෙන්ඩිස් අරක්කු සමාගම තහනම් කරලා තිබෙනවා. එතැනින් රුපියල් බිලියන 1.3ක් පසු ගිය ටිකේ ඇදලා තිබෙනවා. මේ ගැන කෝදාගොඩ මහත්මයා ළඟදිත් ප්‍රකාශයක් කළා. සොරුන් හරියට වැඩේ කරද්දී මේවා අල්ලන්නේ නැත්තේ කොතැනින්ද කියන එක ගැනයි මම අද කියන්න යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළඟදී දිනක ස්වාමීන් වහන්සේ කෙනකු බණ කියද්දී කිව්වා, "මේ රට විනාශ කළේ පාලකයිනුයි, පූජකයිනුයි" කියලා. මම නොවෙයි කිව්වේ, ස්වාමීන් වහන්සේ කෙනකුයි. ඇත්තටම එහි සත්‍යයක් තිබෙනවා. සොරුන්ව ආරක්ෂා කරන්නේ කවුද? සොරුන් අධිකරණයට යද්දී ඒ අයට පිරිත් නූල බඳින අය ඉන්නවා; ආශීර්වාද කරන අය ඉන්නවා. ඒ සොරුන් ආරක්ෂා කරන්න ඉතාම බොළඳ තර්ක ගෙනෙනවා. උදාහරණයකට ගනිමු, ඩේසි ආච්චිගේ මැණික් මල්ලේ case එක. ඩේසි ආච්චිගේ මැණික් මල්ල පිළිබඳ නඩුවේදී විනිසුරුවරයා ඉදිරිපිට නීතිඥයා කිසිම විලි ලජ්ජාවක් නැතිව කියනවා, "මගේ සේවා දායකයා ගෙදර හිටියා. මුදලාලි කෙනකු මැණික් මල්ලක් අරගෙන ඇවිත් දුන්නා. ඊට පස්සේ සතියකින් සල්ලි මල්ලක් අරගෙන ඇවිල්ලා මැණික් මල්ල ඉල්ලාගෙන ගියා" කියලා. මේ වාගේ බොළඳ තර්ක ඉදිරිපත් කරන්නේ. පසු ගිය ටිකේ අපි දැක්කා පිස්තෝල අක්කාගේ කථාව. ඒ සිද්ධියේදී නීතිඥයා ඇවිල්ලා මොකක්ද කිව්වේ? "මගේ සේවා දායිකාව සහ ඇයගේ සැමියා -සේවා දායකයා- ඉන්න තැන මගේ සේවා දායකයාට බස් රියැදුරකු බිම දාගෙන ගැහුවා" කිව්වා. ලෝකයම දැකපු දෙයක් නීතිඥයා බොරුයි කියලා කියනවා. අපරාධකරුවන්ව ආරක්ෂා කරන්නේ වෙන කවුරුවත් නොවෙයි. මාව හිරේට දැම්මත්, මට නඩු දැම්මත් ඇත්ත කථාව කියන්න ඕනෑ. මෙවැනි අපරාධකරුවන්ව ආරක්ෂා කරන්නේ, මේ රට දූෂිත list එකේ හතරවැනි තැනට ගෙනාවේ, අධිකරණය, නීතිඥයන්, ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, පූජකතුමන්ලා සහ ජනතාවයි. ඒක තමයි හිත්ත ඇත්ත. මේ රට මේ තත්ත්වයට පත් වෙන්න විධියක් නැහැ, නීතියක් කියලා දෙයක් රටේ තිබෙනවා නම්. අද මට පාර්ලිමේන්තුවේ මේ ගැන කියන්න පුළුවන් නිසායි කියන්නේ. නමුත්, මේක එළියේ කියලා තමයි ප්‍රශ්නය වුණේ. නමුත්, එළියේ කියාපු එකත්, පාර්ලිමේන්තුවේ කියන එකත් එක හා සමානයි. දෙකම ඇත්ත. අද රට විනාශ වෙලා තිබෙන්නේ, අපට කෙළින් අධිකරණයක්, නීතියක් නැති හින්දායි.

දැන් පසුගිය දවස්වල යෝජනාවක් ආවා, අධිකරණයේ විනිසුරුවරුන්ට පඩි වැඩි කරන්න; දීමනා දෙන්න; ඒ අයට තවතවත් පහසුකම් දෙන්න. මම අත් දෙකම ඔසවා ඒකට කැමැත්ත පළ කරනවා. ඇත්තටම ඒක වෙන්න ඕනෑ. පිට රටවල ඒ දේ වෙලා තිබෙනවා. අපි අන්තර්ජාලය හරහා දකිනවා, ෆ්‍රෑන්ක් කැප්‍රියෝ කියන විනිසුරුවරයා නඩු අහන හැටි. අපේ රටේ විනිසුරුවරුන්ගෙයි, ඒ විනිසුරුවරුන්ගෙයි වෙනස අපි දැකලා තිබෙනවා. ඇත්තටම විනිසුරුවරුන්ට පඩි වැඩි වෙන්න ඕනෑ; ආරක්ෂාවක් සැපයෙන්න ඕනෑ. පසුගිය කාලයේ ඒ අයට ආරක්ෂාව ලැබුණේ නැති නිසා විනිසුරුවරයකු නිවස ඉදිරිපිට ඝාතනය වුණා. ඒ තමයි කුඩු නවුෆර්ගේ නඩුව අහපු සරත් අඹේපිටිය මහත්තයා. සරත් අඹේපිටිය මහත්තයා කුඩු නවුෆර්ගේ නඩුවට තීන්දුව දුන්නා. ඉන් පසුවයි ඒ සිද්ධිය වුණේ. තමුන්ගේ අධිකරණ ක්ෂේත්‍රයේ විනිසුරුවරයාට, තමුන්ගේ ප්‍රධානියාට වෙඩි තියලා මැරුවාම තිරන්ත වරලියද්ද කියන නීතිඥයා ඒ නඩුවට කථා කළා. අපේ තවත් සමහර හිත මිතුරු නීතිඥයින් කථා කළා. මේ දේ වෙනස් වෙන්න ඕනෑ. පසු ගිය දිනවල මම නීතිඥවරුන්ගේ එක හොඳ දෙයක් දැක්කා. පසුගිය දිනවල හලාවත අවුරුදු 10ක පිරිමි දරුවකු දූෂණය කරලා මැරුවා දූෂකයෙක්. ඒ දූෂකයා මීට ඉස්සෙල්ලාත් එහෙම දේවල් කරලා තිබෙනවා. ඒ නඩුවට කිසිම නීතිඥයකු පෙනී සිටියේ නැහැ.

හලාවත උසාවියේ නීතිඥවරුන්ට ඒ වෙනුවෙන් මම මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරනවා; හිස නමා ආචාර කරනවා. ඒ ළමා ඝාතකයා වෙනුවෙන් නීතිඥවරුන් කවුරුවත් පෙනී සිටියේ නැහැ. මම එදා ඉඳලා ඒ වෙනුවෙන් සටන් කළා.

සේයා සදෙව්මි කියන අවුරුදු හතරහමාරක් වයස අභිංසක දැරිය පසු ගිය කාලයේ දූෂණය කරලා මැරුවා. ඒ සඳහා නීතිඥවරුන් 17දෙනෙක් පෙනී සිටියා. පසු ගිය කාලයේ කඩුවෙල දරුවෙක්ව මැරුවා. ඒ වෙනුවෙන් නීතිඥවරුන් පෙනී සිටියා. නමුත්, අද ඒ රැල්ල වෙනස් වෙලා තිබෙනවා. ඒ ගැන සන්තෝෂයි. හොරුන් වෙනුවෙන් ඉදිරිපත් වන අයට ගෞරවනීය නීතිඥයන් කියලා කියන්න බැහැ. පසුගිය කාලයේ මහා හොරු රැන, හොරකම් කරලා, හොරකම් කරලා තර වෙච්ච හොරු රැන උසාවියට ඇවිල්ලා එළියට එද්දී ඔවුන්ගෙන් සල්ලි ගත්ත නීතිඥයා ඔවුන්ව බේරන්න සුදු හුණු ගාන හැටි දැක්කාම ලජ්ජා හිතෙනවා. මේ දේ වෙනස් වන තුරු, අපේ රටේ මුළු ක්‍රමවේදයම - මුළු system එකම- වෙනස් වන තුරු අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත් වාගේ මොනවා ගෙනාවත් වැඩක් වෙන්නේ නැහැ කියන එකයි මගේ අදහස.

ඉතිහාසය ගැන කථා කරද්දී හිටපු මන්ත්‍රීවරයෙක් කියපු කථාවක් අහලා තමයි මම මේ කාරණය කියන්නේ. මම ඒ කථාව ගෙදරදී අහගෙන සිටියා. ඔහු අග විනිසුරුවරුන් ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ හිටපු මොහාන් පීරිස් කියන අග විනිසුරුතුමා 2015 ජනවාරි 10වෙනි දා උදේ අපේ රටේ පළමුවැනි පුරවැසියා -අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- හමුවෙන්න ආවාලු. තමන්ගේ බිරිඳත් එක්ක තුන් වතාවක් ආවාලු. ඇවිල්ලා මොනවාද කිව්වේ? "ගරු ජනාධිපතිතුමනි, මට නැවත CJ තනතුර -අග විනිසුරුකම- දෙන්න. මම තමුන්නාන්සේට ඕනෑ විධියට තීන්දු ටික set කරලා හදලා දෙන්නම්. ඔබතුමාට ඕනෑ විධියට දෙන්නම්" කියලා තිබෙනවා. ඒ වාගේම සරත් එන්. ද සිල්වා මහත්මයා කරපු ප්‍රකාශ ගැන බලන්න. එතුමා කිව්වා, "හිර ගෙදරට යවන්න ඕනෑ කෙනාව මම රජ ගෙදරට යැව්වා. මට සමාවෙන්න" කියලා. ඒ කියන්නේ, තමන් විසින්ම ලබාදුන් තීන්දුවක් ගැන එතුමා ඇවිල්ලා කියනවා. එතුමා පානදුරේ වේදිකාවකට නැගලා කිව්වා, "මම හොරාව රජ පුටුවට යැව්වා. මට සමාවෙන්න" කියලා. එහෙම කියලා ජනතාවගෙන් සමාව ඉල්ලුවා. තමන්ගේ judgment එකක් ගැන අග විනිසුරු කෙනෙක් එහෙම කියද්දී පොඩි විනිසුරුවරුන් ගැන කවර කථාද? අද මොහාන් පීරිස්ට එරෙහිවත් නඩුවක් තිබෙනවා. ඒ නඩුව දාන්න එපා කියලා අද අධිකරණයෙන් කියනවා. මෙවැනි රටක් කොහේටද යන්නේ? මෙවැනි දේවල් ලොක්කෝ කරද්දී, මෙවැනි දේවල් අග විනිසුරුවරු කරද්දී, සාමාන්‍ය විනිසුරුවරු ගැන කවර කථාද? සාමාන්‍ය විනිසුරුවරුන් හිතනවා, මහ කකුළුවා ඇදේට යනවා නම්, අපි ඇදේට ගියාම මොකද වෙන්නේ කියලා. ගුරා හිටගෙන මුත්‍රා කරනකොට ගෝලයේ දුව, දුව මුත්‍රා කරනවාලු. මහ කකුළුවා ඇදේට යද්දී, පොඩි කකුළුවෝ ටිකත් ඇදේටමයි යන්නේ. එවැනි පූර්වාදර්ශම තමයි අපට පසු ගිය කාලයේ ලැබුණේ. අපි මොහාන් පීරිස් ගැන බැලුවත්, සරත් ආබෘ ගැන බැලුවත්, සරත් එන්. ද සිල්වා ගැන බැලුවත්, ඔවුන් ගැන විමර්ශනය කළත්, ශිරාණි බණ්ඩාරනායක මහත්මිය ගැන බැලුවත් එවැනි පූර්වාදර්ශම තමයි ලැබෙන්නේ. ශිරාණි බණ්ඩාරනායක මහත්මියගේ සටනේදී අපි වෙන මතයක ඉන්නවා. නමුත් එතුමිය නාමල් රාජපක්ෂ මහත්මයාට නීති විභාගය ලියන්න AC room එකක් වෙන් කරලා දුන්නා. ඔහු විභාගය ලිව්වාට පස්සේ උම්මා එකක් දෙනවා අපි දැක්කා; kiss එකක් දීලා wish කරනවා අපි දැක්කා. ඒක තමයි ඇත්ත කථාව. ඊට පස්සේ මග නැහුම ගැන නීන්දුවක් වැරදියට දුන්නා කියලා, එතුමියගේ සැමියාගෙන් පලි ගත්තා කියලා තමයි එතුමිය ආපස්සට හැරුණේ. මේ වාගේ දූෂිත වුණු අධිකරණයක් ගැන ෆිදෙල් කැස්ත්‍රෝ කියන කියුබානු ජන නායකයා විතරයි හරි කථාවක් කියලා තිබුණේ. මම පසුගිය දිනවලත් ඒ ගැන කිව්ව නිසා නැවත ඒ ගැන කියන්න යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත නැවතත් කියන්නේ, මේ රට හදන්න නම් හොරුන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන්ට මීට වඩා සදාචාරයක් තිබෙන්නට ඕනෑ බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥ නාගානන්ද කොඩිතුවක්කු මහත්මයා අද පුවත් පතකට කියලා තිබෙනවා, තමන්ගේ නීතිඥවරයාගේ ගාස්තු ගෙවන්න බැරි නිසා සේවා දායකයා තමන්ගේ වකුගඩුව රුපියල් ලක්ෂ 13කට විකුණනවා කියලා. මෙන්න අද නාගානන්ද කොඩිතුවක්කු මහත්මයා කියලා තිබෙන කථාව. කොළඹ උසාවියේ නඩු ගාස්තු ගෙවාගන්න බැරි වුණු සේවා දායකයාගේ කරාබුයි, මාලයයි නීතිඥයා විසින් ගලවා ගන්නවා. කොහොමද තත්ත්වය? ඒක CCTV දර්ශනවල තිබෙනවා. ඒකත් හැංගුවා. මේ සේරම හංගනවා. හැමදේම හංගනවා. නමුත්, කවදාවත් පොඩි මිනිහාට ඒක නැහැ. පොල් ගෙඩි 6ක් හොරකම් කළොත්, අඹ ගෙඩි 6ක් හොරකම් කළොත්, එහෙම නැත්නම් වරකා ගෙඩියක්, කොස් ගෙඩියක් බාගත්තොත්, අන්න එයාට නම් නීතිය ලස්සනට ක්‍රියාත්මක වෙනවා.

ගෝඨාභය රාජපක්ෂ මහත්මයා තනියම යුද්ධය දිනුවා කියලා "Gota's War" කියලා පොතකුත් ලිව්වා. නමුත්, එතුමා උසාවියට භයයි. එතුමා කියනවා එතුමාට නඩු දාන්න එපාලු. එතුමා අත්අඩංගුවට නොගන්න විධියට අපේක්ෂිත ඇප -anticipatory bail- ඉල්ලනවා. Guilty හින්දා හොරා ඉස්සෙල්ලාම තමුන්ට ආවරණයක් දා ගන්නවා. මම කියන්නේ මේ වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන් තමයි වැරදි. මේ විධියට නීති හදන අය තමයි වැරදි. හොරා නොවෙයි වැරදි; අපරාධකාරයා නොවෙයි වැරදි. අපරාධකාරයා ආරක්ෂා කරන නීති හදන, නීති ක්ෂේත්‍රයේ මෙවැනි විනිසුරුවරුන්ට සහ මෙවැනි නීතිඥයන්ට හෙණ ගහනවා කියලා ජනතාව කියනවා. අපේ රටේ ජනතාව පැහැදිලිව කියනවා, "මුන්ට හෙණ ගහන්න ඕනෑ." කියලා. අද හොරු මෙතැනට ඇවිල්ලා අපට අභියෝග කරනවා, "හොරු ඇල්ලුවා ද?" කියලා. හොරු අපට අභියෝග කරනවා, "හොරු ඇල්ලුවා ද?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පක්ෂ විපක්ෂ දේශපාලනඥයන්ගෙන් සියයට 75කට වැඩිය ඉන්නේ හොරු. අපේ පැත්තේ ඉන්නේත් හොරු. අනෙක් පැත්තේ ඉන්නේත්

[ගරු රන්ජන් රාමනායක මහතා]

හොරු. මා එක්ක වාදයකට ආවොත් මා ළඟ files ටික තිබෙන නිසා සියලුදෙනාගේම පැටිකිරිය කියන්න ලෑස්තියි. එහෙම වාද විවාදයකට ආවොත් මම ඒ කරුණු ඔප්පු කරලා පෙන්වන්නම්. හැම පක්ෂයකම ඉන්න කොයි කාගේත් වත ගොත මගේ file එකේ ඇත. [බාධා කිරීමක්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? ඔබතුමා කියපු දේ මට පැහැදිලිව තේරුණේ නැහැ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගේ කථාවට සවන් දුන්නා. ඔබතුමා කියනවා දෙපාර්ශ්වයේම හොරු ඉන්නවා කියලා. එතකොට ඔබතුමා වැටෙන්නේ හොරුන්ගේ ගොඩට ද? අනෙක් ගොඩට ද? ඔබතුමා වැටෙන්නේ මොන පැත්තට ද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

නැහැ, නැහැ. අද ලංකාවේ තිබෙන්නේ පක්ෂ දෙකයි. ඉස්සෙල්ලාම එක්සත් ජාතික පක්ෂය තිබියදී සෞඛ්‍ය,-[බාධා කිරීමක්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා මට කථා කරන්න දෙන්න කෝ. මේ පක්ෂ දෙකේම ඉන්නේ හොරු. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා එවකට එක්සත් ජාතික පක්ෂයේ සෞඛ්‍ය ඇමතිවරයා. එතුමා තමයි ඒ පක්ෂයෙන් ගිහිල්ලා සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංචමහා බලවේගය පිහිටුවා ගත්තේ. ඊට පස්සේ, එතුමාටත් මැරෙන්න වුණේ හොරු අල්ලන්න ගිහිල්ලායි. එතුමා තමයි චෝල්ටර් තල්ගොඩපිටිය වාර්තාව හරහා කැබිනට් ඇමතිවරු පස්දෙනෙක් එළියට යැව්වේ. නමුත්, එතුමාටත් මැරෙන්න වුණා. මම කියන්නේ, මේ පක්ෂ දෙකේම ඉන්නේ හොරු. නමුත්, දේශපාලනය කරන ඕනෑ නිසා අපට පක්ෂයක ඉන්න වෙනවා.

අපි ජනතා විමුක්ති පෙරමුණ ගැන කථා කරනවා. ජනතා විමුක්ති පෙරමුණ කියනවා, ඔවුන් සුපිරිසිදු පක්ෂයක් කියලා. නමුත්, ඉස්සෙල්ලාම බැංකු කැඩුවේ කවුද? ඇත්ත කථාව මොකක්ද? Identity cards හොරකම් කළේ කවුද? ඒවා කියන්න ගියොත් list එකක්ම කියන්න වෙනවා. ඒ හන්දා ලංකාවේ ජනතාවගෙන් බහුතරයක් හොරු; දේශපාලනඥයනුත් හොරු. යකාගේ හැටියට විමානේ. යකාගේ හැටියට විමානේ තිබෙන්න ඕනෑ.

දැන් රුසියාවේ පුටින් හතරවැනි වතාවටත් ඒ රටේ මැතිවරණයෙන් ඉදිරියටම ඇවිල්ලා තිබෙනවා. රුසියාවේ ඡන්දවලින් සියයට 76ක් පුටින්ට ලැබිලා තිබෙනවා. ඔහුගේ දර්ශනයට රුසියන් බහුතර ජනතාව ඒකමතිකව තීරණය දීලා තිබෙනවා. නමුත්, ඒ රටේත් හරි අධිකරණයක් තිබෙනවා; හරි නීතියක් තිබෙනවා. නෝර්වේ රටේත් හරි අධිකරණයක් තිබෙනවා; හරි නීතියක් තිබෙනවා. අපි-තමුන්නාන්සේලා සියලුදෙනා පක්ෂ භේදයෙන් තොරව එකතු වෙලා හොරු අල්ලන්න එකතු වෙනවා නම් හොරකම් නවත්වන්න පුළුවන් කියන එක තමයි මගේ මතය.

අපට කවදාවත් මේ අධිකරණ ක්ෂේත්‍රයේදී පූර්වාදර්ශ චරිත හොයා ගන්න අමාරුයි. සරත් අමුණුපිටිය මහත්මයාට මගේ හිස නමා ආචාර කරනවා; එතුමාට මගේ ගෞරවයක් තිබෙනවා. අපි පසුගිය ටිකේ දැක්කා, පද්මිණී එන්. රණවක ගුණතිලක මහත්මියගේ කටයුතු. මට පුද්ගලයන්ගේ නම් කියන්න එපා කියලා තිබෙනවා. ඒ නිසා මම සමහර අයගේ නම් කියන්නේ නැහැ. ඒ අය නිර්භීත තීන්දු ගත්තා. නමුත්, ඒ අයට මරණ තර්ජන ආවා. අද අධිකරණයේ ගෞරවනීය විනිසුරුවරුන් තීන්දු දෙන්න භය වෙලා තිබෙනවා. ඇයි භය වෙලා තිබෙන්නේ? අධිකරණ විනිසුරුවරුන් හිතනවා, "ආණ්ඩුව වෙනස් වෙයි; අපෙන් පළිගනියි; මේ හොරාට දඬුවම් දුන්නොත් අපෙන් පළිගනියි." කියලා. අන්න ඒ වාගේ තත්ත්වයකට අද අධිකරණ විනිසුරුවරුන් පත් වෙලා තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රයේ උදවියත් එවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතාගේ ප්‍රකාශයක් අද "ලංකාදීප" පුවත් පතේ පළ වෙලා තිබෙනවා.

"නව අධිකරණයක් හැදීමට පාර්ලිමේන්තුවට හැකියි. විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන්නේ ආර්ථික අපරාධ විභාග කිරීමටයි. පනත් කෙටුම්පතට එරෙහි පෙත්සම් හත විභාගයේදී නීතිපති කියයි."

මේ ආර්ථික අපරාධ කියන්නේ මොනවාද? ආර්ථික අපරාධ කියද්දී අපට මතක් වෙන්නේ මොකක්ද? පසුගිය කාලයේ ආර්ථික ඝාතකයෙක් ගැන කිව්වා. කවුද ඒක කිව්වේ? අපි නොවෙයි ඒක කිව්වේ. විමල් වීරවංශ මහත්මයා තමයි කිව්වේ. ආර්ථික ඝාතකයා කිව්වේ කාටද? පී.බී. ජයසුන්දර මහත්මයා ආර්ථික ඝාතකයෙක් කියලායි කිව්වේ.

එතුමාට එහෙම කිව්වේ කවුද? විමල් වීරවංශ මහත්මයා. හැබැයි තව කෙනෙකුට "හොරා" කියන්න කලින් තමන් පූර්වාදර්ශයක් වෙන්න ඕනෑ, තමන් හොරකම් කළේ නැහැ කියලා.

අද ලංකාව දිහා බලන්න. Tax වංචා නොකළ කෙනෙක් ඉන්නවාද මේ පාර්ලිමේන්තුවේ? මම හිතන විධියට එහෙම කෙනෙක් නැහැ. තමන්ට ලැබෙන නියම ආදායම පෙන්වලා හරියටම tax ගෙවපු කෙනෙක් පසු ගිය කාලයේ හිටියේ නැහැ. මමත් එහෙමයි. අපිත් ඒ කටයුත්ත හරියට කරලා නැහැ. අපිත් tax වලට නියම ආදායම පෙන්වලා නැහැ. ඒ system එක තුළ අපි සියලුදෙනා මේ වරද කර තිබෙනවා. ලංකාව බේරා ගන්න නම්, ලංකාවට හොඳ අනාගතයක් හදා දෙන්න නම්, දියුණු වන රටක් විධියට ඉදිරියට යන්න නම් අපි සියලුදෙනා මේ තිත්ත ඇත්ත කථා කරන්න වෙනවා. ඒ දේ නොකළොත් අපි මේ කොච්චර දේවල් වෙනස් කළත්, සංශෝධන කළත් හරියන්නේ නැහැ.

ආර්ථික අපරාධ ගැන කටයුතු කරන්න තමයි මේ අධිකරණය පිහිටුවන්නේ. දැන් මේකට විරුද්ධ වෙලා තිබෙන්නේ කවුද? විරුද්ධ වෙලා තිබෙන්නේ හොරු! වෙන කවුරුවත් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තව විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙකුගෙන්ම කාලය ඉල්ලා ගත්තා. ඒ නිසා මට කථා කරන්න අවස්ථාව දෙන්න. එතුමන්ලා මට කෝල් කරලා කිව්වා ඒ කාලය ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට සුර පුරයක්, දිව්‍ය ලෝකයක් කරන්න අපේ රටේ ගෞරවනීය විනිසුරුවරුන්ට හැකියාව තිබෙනවා. ඒ අය කොන්ද කෙළින් තියාගෙන හරියට නඩු ඇහුවා නම්, ඒ නඩුවලට හරි තීන්දු දුන්නා නම් මේ රටට ඉස්සරහට යන්න පුළුවන්.

අපි පසුගිය කාලයේ රතු වරෙන්තු දැක්කා; නිල් වරෙන්තු දැක්කා. නමුත් හොරෙක් අල්ලන්න ගියාම කිසිම රටක් සහයෝගය දෙන්නේ නැහැ. මේ කාරණය ඒකට හොඳම උදාහරණයක්. අපේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කෝදාගොඩ මහත්මයා සහ රවී විද්‍යාලංකාර වැනි මහත්වරු පසු ගිය කාලයේ ඩුබායි රටට ගියා පුද්ගලයෙක් අල්ලාගෙන එන්න. එතුමන්ලා ඒ රටට ගියාම ඒ බැංකුව මොනවාද කිව්වේ? හොරෙක්, බැංකුවකට රජෙක්. මොකද, හොරා ඒ බැංකුවේ ගිණුම් හිමියෙක් -account holder- නිසා. ගිණුම් හිමියා හොරෙක්ද, වංචාකාරයෙක්ද, කුඩුකාරයෙක්ද කියන එක බැංකුවට වැඩක් නැහැ. බැංකුවට ඕනෑ account holderගේ fixed deposit එක විතරයි. බැංකුව කවදාවත් තමුන්ගේ සේවාදායකයා පාවා දෙන්නේ නැහැ. Mauritius Islandsවල බැංකු, ඩුබායි බැංකුව, ස්විස් බැංකු කවදාවත් තමුන්ගේ ගිණුම් හිමියෙක් පාවා දෙන්නේ නැහැ. ඔවුන් පසුගිය කාලයේ ඒ වාගේ දේවල් කළේ නැහැ. ගඩාෆිගේ මුදල් එයාගේ මරණයත් එක්ක බැංකුවට හිමි වෙනවා. ඉඩි අමීන්ගේ මුදල් ඔහුගේ මරණයත් එක්ක බැංකුවට හිමි වෙනවා. සදාම් හුසේන්ගේ මරණයත් එක්ක ඒ රත්තරන්, දියමන්ති ටික, මුදල් ටික බැංකුවට හිමි වෙනවා. ඒ බැංකු ලංකාවේ ඉන්න "හොර සෙට්" එකත් දොහොත් මුදුන් දීලා පිළිගන්නවා. ස්විස් බැංකුවේ මුදල් දමපු අය ලංකාවේ මේ පාර්ලිමේන්තුවේම ඉන්නවා. Panama Papersවල ඉන්න අය, Mauritius Islandsවල සල්ලි දමපු අය ඉන්නවා. ඔබතුමන්ලාට ඕනෑ නම් ඒ අයගේ නම් ටිකත් දෙන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
ඒ කවුද, කවුද? අපිටත් කියන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නමුත් කවදාවත් ඒ බැංකු අපට සහයෝගය දෙන්නේ නැහැ. ඒ බැංකු හොරු අල්ලන්න අපට සහයෝගය දෙන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීමක්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, මට කථා කරන්න දෙන්නකෝ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, එතුමාට බාධා කරන්න එපා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලන්න කියලා ජනතාව කෑ ගැහුවාට, හොරු අල්ලන්න තිබෙන අපහසුකම්, හොරු අල්ලන්න තිබෙන අමාරුකම් ගැන තමයි මම අද මේ පැහැදිලි කර දෙන්න යන්නේ.

මේ රටේ හොරු අල්ලන්න අධිකරණයෙන් සහයෝගයක් නැත; නීතිඥයන්ගෙන් සහයෝගයක් නැත; පිට රට බැංකුවලින් සහයෝගයක් නැත. Panama Papersවලින්, ඩුබායි රටෙන්, Mauritius Islandsවලින්, ඒ කොහෙන්වත් අපට සහයෝගයක් නැහැ. මොකද ඒ සියලුදෙනා ඉන්නේ හොරාගේ පැත්තේ. ඒ ගොල්ලෝ හොරාගෙන් පහසුකම් ලබනවා. හොරා ඒ අයගේ සේවා දායකයා; හොරා ඒ අයගේ client. Clientට විරුද්ධව යනවාද නීතිඥයා? පිස්සුද? Client හොඳට ගෙවනවා නේ.

පසු ගිය කාලයේ එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ කොයි තරම් අහු වුණාද? මම දන්නා නීතිඥයෙකු සමඟ මේ ගැන මම කථා කළා. පෙරේදාත් පාටි එකකදී මට එතුමා හම්බ වුණා. මම එතුමාගෙන් ඇහුවා, "අනේ සර්, ඇයි මේ හොරා වෙනුවෙන් ඔබතුමා පෙනී ඉන්නේ, ඔබතුමා දන්නවා මේ හොරා හොරකම් කළේ ජාතික මුදල්, අභිංසක දුප්පත් මිනිසුන්ගේ මුදල් කියලා. ඉතින් ඇයි මේ හොරා වෙනුවෙන් ඔබතුමා පෙනී ඉන්නේ" කියලා.

එතුමාගෙන් මම ඇහුවා, "ඔබතුමා මෙයා හොරෙක් කියලා දන්නවාද?" කියලා. එතුමා කියනවා, "මගේ client එක්ක විනාඩි පහක් කථා කරද්දි මම දන්නවා මෙයා හොරකම් කළ බව" කියලා. මම ඇහුවා, "ඔබතුමා ඔහු වෙනුවෙන් පෙනී ඉන්නේ ඇයි?" කියලා. "කරන්න දෙයක් නැහැ. එයා මගේ සේවා දායකයා -client-" කියලා එතුමා කිව්වා. මේක තමයි සැබෑ තත්ත්වය. ආසියාවේ දුෂිත රටවල් හතරින් එකකට අපේ රට ආපු විධියේ සැබෑ තත්ත්වය මේකයි. ඒ නිසා ජනතාවගෙන් මම සමාව ඉල්ලනවා. "හොරු අල්ලන්න" කියලා ජනතාව කොච්චර කෑ ගැහුවත් මේ නීතිය තිබෙන තුරු, මේ අධිකරණය තිබෙන තුරු, මේ නීතිඥවරු ඉන්න තුරු, ඒ අයට පිරිත් නූල් බඳින, ඒ අයට ආශීර්වාද කරන ලෙබ්බයන්, කපුවන්, ස්වාමීන් වහන්සේලා, ආගමික නායකයන්, ඒ අයට වාලම්පුරි හඳලා දෙන උන්, ඒ අයට එක එක දේවල් අතට දීලා ආරක්ෂාව දෙන අය ඉන්න තුරු කවදාවත් මේ හොරු අල්ලන්නට බැහැ කියන එක තමයි මට මේ අවස්ථාවේ දී කියන්න සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක විශාල බේද වාචකයක්. මේකට මුළු ක්‍රමවේදයම -system එකම- වෙනස් විය යුතුයි. මේක කියලා තමයි මට Supreme Court එකේ නඩුවක් දාලා තිබෙන්නේ. මම ඒවාට බය නැහැ. මම ඕනෑම වෙලාවක කෙළින් නින්ත ඇත්ත කථා කරලා හිරගත වෙන්න ලෑස්තියි. අපේ ඇමතිතුමාටත් වඩා කාලයක් දුන්නත් කමක් නැහැ. මම හිරේ යන්නේ කිසිම බයක් නැතිව ඇත්ත කථා කරලා. බොරු කියන්නට බැහැ. මම පිඩිත පන්තියේ, නීතියේ ආධාර නැති පොදු ජනතාවගේ හඬ වෙන්න කැමතියි. ඒ අය වෙනුවෙන් හඬක් නැහැ. අඹ ගෙඩි හය හොරකම් කරපු අම්මාට anticipatory bail ගන්න බැහැ. ඇයට අපේක්ෂිත ඇප නැහැ. ඇයට අපේක්ෂිත ඇප කොහේද? ඇය අත් අඩංගුවට ගන්නවාමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවසක ගල්කිස්ස උසාවියේදී ඇනුමක් ඇරපු පුද්ගලයෙකුට මාස හයක සිර දඬුවම් ලැබුණා. තමුන්නාන්සේලා දන්නවාද? වික්ටන් අයිවන්ගේ පොතේ ඒ ගැන සඳහන්වෙලා තිබෙනවා. බලන්න, ඇනුමක් ඇරියාට දඬුවම මාස හයයි.

අපේ හිතවත් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ පෙම්වතියක් ඩුබායි ඉඳලා ලංකාවට ගෙන්වපු ආකාරය අපි පසු ගිය දවස්වල දැක්කා. Blue warrant යැව්වා; red warrant යැව්වා; පොලීසියත් ගියා; airport එකේ ඉඳලා අරගෙන ආවා; airport එකටත් පොලීසිය ගියා. ලංකාවේ ජනතාව බොහොම ආසාවෙන් බලාගෙන හිටියා, "අනේ! හොරකම් කරපු ළමයා අහු වුණා. අඩු

[ගරු රන්ජන් රාමනායක මහතා]

ගණනේ සුමාන දෙකක් -දවස් 14ක්- ඇතුළට දමාවි" කියලා. මොන පිස්සුද? පැය භාගයෙන් එළියේ. මොකක්ද, හේතුව? නීතිඥයාගේ දක්ෂකමලු. සමහර නීතිඥවරු නැඟිට්ද්දි judge බයේ වෙවුලනවා. ඔක තමයි තත්ත්වය. හෙට මට නඩු දාවිද දන්නේ නැහැ. මේක ඇතුළේ කියන දේවල්වලට නඩු දමන්න බැරි නිසා මම බේරෙනවා. කමක් නැහැ. මේක තමයි ඇත්ත කථාව. සමහර විනිසුරුවරු සහ නීතිඥවරු නඩු fix කරනවා කියලා ආරංචියක් තිබෙනවා. ඒකේ ඇත්ත අපි පසු ගිය දවස් ටිකේ දැක්කා.

සරත් ආබෲ මහත්මයා පසුගිය ටිකේ අරලියගහ මන්දිරයට ගිහිල්ලා, drink එකක් අරගෙන, නඩු තීන්දු ලිව්වා කියලා ඔහුගේ රියදුරු මහත්මයා කිව්වා. ඊට පස්සේ ඒ ආනිසංසය පල දුන්නා. බීමත්ව බැල්කනියෙන් බල්ටියක් ගහලා ඔහුට මැරෙන්න සිදු වුණා. මම කියන්නේ මේකයි. මේ අපරාධකරුවන්ට මේ නීතිය තුළ -මේ උසාවි තුළ; මේ අධිකරණය තුළ- කවදාවත් දඬුවම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම මහ ජනතාවගෙන් ඉල්ලන්නේ පුළුවන් තරම් මුන්ට හෙණ ගහන්න කියලා ඉල්ලන්න කියලායි. මොකද, ජනතා අධිකරණයෙන්, ස්වභාව ධර්මයෙන් තමයි මේවාට දඬුවම් ලැබෙන්නේ. මේ පවතින අධිකරණයෙන් කවදාවත් බේරෙන්න බැහැ. ඇත්තම කිව්වොත් අද වනකොට මිනී මරුවන් කොච්චර බේරිලා ඉන්නවාද?

ළඟදී "දෙරණ" නාලිකාවට ආපු DIG මහත්තයෙක් ප්‍රකාශ කළා, "ලංකාවේ නඩුවලින් සියයට 95ක් අපරාධකාරයන් බේරෙනවා"කියලා. එක්කෝ සාක්ෂි නැහැ; සාක්ෂි විනාශ කරනවා; එහෙම නැත්නම් සාක්ෂිකරුවන් බය කරනවා, නැත්නම් සාක්ෂිකරුවන්ට අල්ලස් දෙනවා. ඇත්තටම දූෂිත ඉන්දියානු අධිකරණයේ තත්ත්වය ඒකයි. ඒක තමයි Ranjan Gogoi කියන්නේ. එතුමාට මගේ නමම තමයි තිබෙන්නේ. ඉන්දියාවේ Supreme Court Judgesලා -විනිසුරුවරු- තුන් දෙනෙක් කොන්ද පණ ඇතිව කෙළින්ම ඇවිල්ලා කිව්වා, "We should not sell our souls." කියලා. මෙහෙම කියන්නේ කවුද? Justice Ranjan Gogoi. මම හිතන්නේ ලංකාවේ Supreme Court Judgesලා 11 දෙනෙකු ඉන්නවා. ඒ අයට මේ වැඩ කරන්න කොන්ද පණ තියෙයි කියලා මම හිතනවා. පසු ගිය ටිකේ තමුන් කරපු අපරාධ ස්වයං විවේචනය කරලා, මිනී මරුවන්ව බේරපු ඒවා ගැන ස්වයං විවේචනයක් කරලා, Ranjan Gogoi කිව්වා වාගේ -ඉන්දියාවේ Supreme Court Judgesලා තුන් දෙනා කිව්වා වාගේ- අපේ Judgesලාත් ජනතාව ඉදිරියට ඇවිල්ලා එහෙම කියයි කියලා අපි බලාපොරොත්තු වනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මේ තරම් මුවාවෙලා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට, නීතිඥවරුන්ට මේ කරන දෝෂාරෝපණය, මේ කරන චෝදනාව මොකක්ද? මේ සම්බන්ධයෙන් ඔබතුමාත් නිහඬව ඉන්නවා. මන්ත්‍රීවරයකු විධියට පාර්ලිමේන්තු වරප්‍රසාද මේ තරම් උපයෝගී කර ගත් එතුමාම කියනවා, මෙතැන ඉඳන් කිව්වාට හිරේ යන්නේ නැහැ කියලා. හැබැයි, අද සවස 6.55 වෙනකොට මේක ජනමාධ්‍ය හරහා ප්‍රචාරය වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11දෙනාටම චෝදනා කරනවා. මොකක්ද, මේ -

[බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා චෝදනා කළා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු මන්ත්‍රීතුමනි, -

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කිහිප අවස්ථාවකදීම රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවට රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා බාධා කළා. මිනී මැරුම් කළාය කියලා කථා කරන හැම වෙලාවකම එතුමාට කේන්ති යනවා; හොරකම් කළාය කියලා චෝදනා කරන හැම අවස්ථාවකම එතුමාට කේන්ති යනවා. මේ අනුන්ගේ තොප්පි දමා ගන්නේ ඇයි? [බාධා කිරීමක්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට චෝදනා කළේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් මගේ කථාව අහන්න. [බාධා කිරීම්] නැහැ, නැහැ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් 11 දෙනාම ස්වයං විවේචනය කරන්න ඕනෑය කියනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මගේ කථාව; මගේ මතය. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ නැහැ, [බාධා කිරීමක්] සියලුදෙනාම කියලා. මම හොඳ විනිසුරුවරුන්ට ගරු කළා. මම හොඳ විනිසුරුවරුන්ට දොහොත් මුදුන් දී වඳින්නම්; සියලු ගෞරවය දෙන්නම්. මම මේ කියන්නේ දූෂිත විනිසුරුවරුන් ගැනයි. නම් වශයෙන් කිව්වොත් සරත් එන් සිල්වා, මොහාන් පීරිස් සහ සරත් ආබාa වැනි අයගේ නම් තමයි මම කිව්වේ. මම හැම දෙනා ගැනම කිව්වේ නැහැ. නමුත් මේ වාගේ දෙයකුත් තිබෙනවා. "දෙරණ" නාළිකාවේ "සිඳු" කියලා ටෙලිනාට්‍යයක් විකාශනය වෙනවා. එම නාට්‍යයේ සිටින සිඳු කියන පුංචි හාමුදුරුවෝ කියනවා, "හොරකම් කරපු අය සන්සුන් නැහැ, මිනී මරපු අය සන්සුන් නැහැ" කියලා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
සිඳු නොවෙයි, සෝරත හාමුදුරුවෝ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔව්, සෝරත කියන පුංචි හාමුදුරුවෝ කියනවා, "හොරකම් කරපු අය සන්සුන් නැහැ, මිනී මරපු අය සන්සුන් නැහැ" කියලා. සොයිසා මන්ත්‍රීතුමා සන්සුන් නැත්තේ මොකද කියලා මම දන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අනෙක් කට්ටිය බොහොම සාවධානව අහගෙන ඉන්නවා. මගේ මතය මම කිව්වේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ්ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුටම calls දීලා වේලාව ඉල්ලා ගත්තා. මට තව විනාඩි පහක කාලයක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත නැවතත් කියන්නේ මෙයයි. මේ රට භදන්න නම්, අපිට ස්වාධීන, ගෞරවනීය උසාවියක් ඕනෑ වෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මගේ වේලාවෙන් විනාඩි 5ක් ලබා දෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට විනාඩි 5ක් ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, එතුමාට වේලාවක් නැහැ. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න කෝ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
හොඳයි. අප සියලුදෙනා එකතු වෙලා පක්ෂ-පාට නැතුව හොරු අල්ලන්න ඕනෑ. සොයිසා මැතිතුමාත් අපේ පක්ෂයේ හොරුන්ට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යනවා. මම ඒකට එතුමාට මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරනවා. මම මගේ පක්ෂයේ හොරුන්ට විරුද්ධවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිසමට ගිහිල්ලා හොරෙන් ෆයිල් භාර දීලා තිබෙනවා. මොකද, මගේ පක්ෂය නිසා කෙළින් යන්න බැහැ. මම හොරෙන් තමයි යන්නේ. නමුත් මම මගේ duty එක කරනවා. මම කියන්නේ මේකයි. මේ දෙය අපි දෙගොල්ලන්ම පුරුදු වුණොත්, එය පූර්වාදර්ශයක් කර ගත්තොත් නීතියේ ස්වාධිපත්‍ය තිබෙන, නීතිය හරියාකාරව තිබෙන ලංකාවක් අපේ ජීවිත කාලයේ දී අපට දකින්නට ලැබෙයි කියලා මා හිතනවා.

අපේ ගරු ඇමතිතුමිය විශේෂ ත්‍රී-පුද්ගල මහාධිකරණ පිහිටුවන්නට මූලික වී කටයුතු කිරීම සම්බන්ධයෙන් මම එතුමියට සුබ පතනවා. මේකට විරුද්ධ වෙනවා නම්, විරුද්ධ වෙන්නේ හොරු. මේක පළි ගැනීමක් කියලා දකිනවා නම්, එසේ දකින්නේ හොරු, අපරාධකාරයෝ. අද මාධ්‍ය තුළින් මේ කථාව ප්‍රචාරය වෙයි. අපට හොරුන්ව අල්ලන්න -ග්‍රහණය කර ගන්න- බැරි වෙලා තිබෙන්නේ, හොරුන්ව නීතිය ඉදිරියට ගෙන්වන්න බැරි වෙලා තිබෙන්නේ මේ සියලුදෙනාගේම තිබෙන මැදිහත්වීම නිසායි. එම මැදිහත්වීම පෙරේදාත් තිබුණා; ඊයේත් තිබුණා; අදත් තිබෙනවා; හෙටත් තිබෙනවා. ඒක තමයි තිත්ත ඇත්ත. එම මැදිහත්වීම තිබෙනතාක් කවදාවත් මේ කටයුතු කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒක තමයි එදාත් වුණේ; අදත් වෙන්නේ; හෙටත් වෙන්නේ කියන එක මම කියනවා. නමුත් හෙට දවසේ සිදු වෙන දේ වෙනස් කර ගන්න තමයි මගේ හඬ මා අවදි කරන්නේ. ගරු ඇමතිතුමියගෙන් මා නැවත නැවතත් ඉල්ලා සිටින්නේ නීතිය කවදාවත් දුප්පත්-පොහොසත් කියලා දෙකට බෙදන්න එපා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරුතර මහා සංඝ රත්නයන් සහාවේ ගැලරියට වැඩම කර සිටින මේ අවස්ථාවේ දී මා ගරුතර මහා සංඝ රත්නයෙන් ඉල්ලා සිටිනවා, හොරෙක් අල්ලද්දී කවදාවත් උසාවි එන්න එපා, හොරා එළියට එද්දී පිරිත් නූල් බඳින්න එපා, හොරාට ආශීර්වාද කරන්න එපා කියලා.

ඒ වාගේම අපේ පූජකතුමන්ලාගෙන්, අපේ මුස්ලිම් මවුලවිතුමන්ලාගෙන්, ලෙබ්බෙලාගෙන්, ඒ වාගේම සාස්තරකාරයන්ගෙන්, ජ්‍යෝතිශ්වේදීන් නීතිඥයන්ගෙන් මේ

[ගරු රන්ජන් රාමනායක මහතා]

සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ, අර එදා හලාවත ළමා දූෂකයා -child abuser -වෙනුවෙන්; ඒ කියන්නේ child rapist වෙනුවෙන් පෙනී නොසිටි ගෞරවනීය නීතිඥවරුන්ව පූර්වාදර්ශයට ගන්න. එහෙම පූර්වාදර්ශයට අරගෙන එවැනි අය වෙනුවෙන් පෙනී සිටින්න එපා; ඒ අයව ප්‍රතික්ෂේප කරන්න. ඒ ප්‍රතික්ෂේප කිරීම හරහා මේ අපරාධ අඩු වෙනවා. අද ලොකුම තැන දෙන්නේ වැඩියෙන්ම මිනීමරපු කෙනාට. වැඩියෙන්ම කුඩු ගෙනෙන කෙනාට. වැඩියෙන්ම කුඩු ගෙනෙන කෙනා තමයි පන්සලේ හොඳම දායකයා; පල්ලියේ හොඳම දායකයා. ඔහුට තමයි ගමේ මුල් තැන; ඔහු තමයි පීත්ත පටිය කපන්නේ; ඔහු තමයි ප්‍රධාන අමුත්තා. මේ ක්‍රමය තුළ ඔහු තමයි මන්ත්‍රී වෙන්නේ; ඔහු තමයි අගමැති වෙන්නේ; ඔහු තමයි ජනාධිපති වෙන්නේ. මම කියන්නේ හොරාට නිසි දඬුවම් දෙන්න ක්‍රමවේදයක් ලංකාවේ ඇති වුණා නම්, සියලු දෙනාම ඒක තමුන්ගේ හිතෙන් හිතා ගත්තා නම්, මේ සියලු අපරාධ අඩු කරන්න පුළුවන් බවයි. එහෙම නැතිව ඒවා මේ කපේ නවත්වන්න නම් බැහැ. මොකද, මේ තණ්හාව, මෝහය, මුලාව තිබෙන තුරු ඒවා කවදාවත් නවත්වන්න බැහැ. මම නැවත නැවත කියනවා; ඒ වාගේම ජනතාවගෙන් සමාව ඉල්ලනවා, හොරු අල්ලන්න තිබෙන පමාව වෙනින් කවුරුත් නිසා නොවෙයි, මම ඒ කිව්ව පිරිස නිසාය කියන එක කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
"ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.10]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ විවාදයක් තිබෙන අද වැනි දවසක පාර්ලිමේන්තුවේ සිටිය යුතු බොහෝ අය රැඳී නොසිටීම පිළිබඳව තරුණ මන්ත්‍රීවරයෙක් විධියට, නවක මන්ත්‍රීවරයෙක් විධියට ඒ පිළිබඳව මගේ අසන්තෝෂය ප්‍රකාශ කරනවා. කෙසේ වෙතත් වග කිවයුතු ඇමතිවරියක් විධියට අධිකරණ ඇමතිවරිය මේ වෙද්දී මේ ගෞරවනීය උත්තරීතර සභා ගර්භයේ රැඳී සිටිනවා. ඒක අපට ඉතා ආඩම්බරයක් සහ රටට භාග්‍යයක් විධියට මා දකිනවා. ඒ වාගේම අපේ අධිකරණ ඇමතිතුමිය රටේ ජනතාවත්, මේ ආණ්ඩුවත් විශාල බලාපොරොත්තුවක් ඇතිව ඒ වගකීම පවරපු සහ ඒ වගකීම භාරගත් ඇමතිවරියක් විධියට මා දකිනවා. ඒ වාගේම රටේ අභිංසක, අසරණ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්නට පුළුවන්, ඒ තනතුරේ ගෞරවය රකින්න පුළුවන් ශක්තිය එතුමියට ලැබෙන්න කියා මා ප්‍රාර්ථනා කරනවා. පසුගිය දවස්වල මාධ්‍ය හරහා අපට නිතරම දකින්න ලැබුණේ පාර්ලිමේන්තුවට අපේ ගරු ඇමතිතුමිය ගෙනාපු ඒ විශේෂ අධිකරණ පිහිටුවීමේ පනත් කෙටුම්පතට විරුද්ධව, එහෙම නැත්නම් පනත් කෙටුම්පත බල රහිත කරන්න, එහෙම නැත්නම් ඒ පනත් කෙටුම්පත සුදුසු නැහැ, තවත් විධියකින් කියනවා නම් ඒ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියා විවිධ අර්ථකථන දෙමින් යම් කණ්ඩායම් තමන්ගේ මත ඉදිරිපත් කරමින් මේ රටේ ක්‍රියාත්මක කළ යුතු, මීට පෙර ක්‍රියාත්මක කිරීමට සුදුසුව තිබූ ඒ විශේෂ අධිකරණ පිහිටුවීමේ ක්‍රියාදාමය නවත්වන්නට කටයුතු කිරීමයි. ඒ දිහා බලද්දී අපට අහන්න තිබෙන්නේ ජනතාව මේ උත්තරීතර සභාවට මහජන නියෝජිතයන් විධියට එවලා තිබෙන අය හැටියට මේ මහජන නියෝජිතයන් ඇයි, ඒ ක්‍රියාදාමය නවත්වන්න යන්නේ කියායි. මොකද, මේ රටේ ජනතාවට සුබසිද්ධියක් වෙනවා නම්, සෙතක් වෙනවා නම් ඇයි, ඒවා නවත්වන්නේ? ඊට වඩා වැඩ අපට තිබෙනවා; හිටපු ගරු ඇමතිවරු, හිටපු ගරු ජනාධිපතිවරු, හිටපු ගරු අග්‍රාමාත්‍යවරුන්ගේ පහස යටතේ මේ උත්තරීතර සභාව මෙහෙයවපු අයට ඊට වඩා වැඩ තිබෙනවා. නමුත් ඒ සියල්ල පසෙක දා ලහි ලහියේ මාධ්‍ය සාකච්ඡා පවත්වමින් ඒ අතරතුරේ breaking news දමමින් ඒ අය උත්සාහ කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කරන්නට යනවා කියන අදහස ජනතාව අතරට යවන්න.

මේ රටේ ජනතාව පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මේ ආණ්ඩුවට පණිවිඩයක් දුන්නා. ආණ්ඩුවේ ඉන්න සියලු පාර්ශ්වයන්ට යම්කිසි හඬක්; රතු එළියක්; ටොක්කක් ඇන්නා, "උඹලා අපෙන් ගත්තු ජනවරමට සාධාරණය ඉටු කළේ නැහැ" කියන එක පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගමේ වැඩ කළා; ගමේ මංමාවත් හැදුවා; ගමේ ජනතාවට අවශ්‍ය කරන පහසුකම් හැදුවා; දරුවාගේ අධ්‍යාපනය හරි ක්‍රමවේදයකට ගත හැකි මාර්ග හැදුවා; අපි වැටිලා තිබුණු ආර්ථිකය නඟාසිටුවුවා. සාධාරණය ඉටු කළේ නැහැ කියන කාරණය විශ්ලේෂණය කරලා බැලුවාම අපට ඒ දේවල් පෙනෙනවා. මේ සියල්ල කරලා අපි පස්ස හැරිලා බැලුවා, මෙතරම් ජනතාව අපිත් එක්ක විරසකව, එහෙම නැත්නම් අපිත් එක්ක තරහෙන්, එහෙම නැත්නම් අපිත් එක්ක ද්වේශසහගතව ඉන්නේ ඇයි කියලා. මේ විශේෂ අධිකරණ පිහිටුවීමේ පනත් කෙටුම්පත මැතිවරණයට කලින් සැලසුම් කරලා පාර්ලිමේන්තුවට ගෙනැත් තිබුණු දෙයක්. නමුත් මැතිවරණයෙන් පස්සේ පැමිණීම විටෙක සමහරු විග්‍රහ කරනවා, මේක ද්වේශ සහගතව පළිගන්න ගෙනාපු පනත් කෙටුම්පතක් කියලා. නැහැ. මෙවැනි ක්‍රියාදාමයන්ගේ ප්‍රමාදයේ හේතුව තමයි ජනතාව තුළ කැකෑරුණු පීඩාවක් විධියට පසුගිය මැතිවරණයෙන් මේ ආණ්ඩුව නියෝජනය කරන ප්‍රධාන පක්ෂ දෙකටම පෙන්වා දුන්නේ කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. ඒ නිසා මේවා කාගෙන්වත් අහන්න ඕනෑ කාරණා නොවෙයි. මොකද, රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේ හොරා හොරාමයි.

අපි ඒකට එකඟයි. හොරා හොරකම් කරපු බඩු අහුවෙද්දි - ගෙවල් අහුවෙද්දි, බැංකු ගිණුම් අහුවෙද්දි- ඔවුන් එක්ක හිටපු

ඉහළ පෙළේ නායකයන් හමුවෙද්දි ඒවා තවත් යට ගහගෙන සිටින්නේ ඇයි? ඇයි, ඒවා තවත් යටගහන තැනට යන්නේ? එයට හේතුව විධියට අපට දැනෙන ප්‍රධාන කාරණාව තමයි අධිකරණ පද්ධතිය තුළ ඒ සඳහා තිබෙන නීතිමය අවසරය, එහෙම නැත්නම් නීතියේ මැදිහත්වීමට යම් යම් බාධා තිබීම. පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ, මේ රටේ අහිංසක ජනතාවගේ හඳවතේ; ඔවුන්ගේ අදහසේ; ඔවුන්ගේ ජීවිතයේ පණිවිඩය අරගෙනයි. එහෙමනම් ඒ පණිවිඩය ක්‍රියාත්මක කරන්න. හිටපු අයගෙන් වැඩක් නැහැ. දැනට ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාම අනාගතය ගැන හිතලා ක්‍රියා කරන්න ඕනෑ. ඊයේ වෙච්ච දේ අපට වැඩක් නැහැ. ඊයේ හඳපු අධිකරණයෙන් අද අපට නීතිය ක්‍රියාත්මක කරන්න නොහැකි නම් ඒකෙන් අපට වැඩක් නැහැ. හැබැයි ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි, දැනට පාර්ලිමේන්තුවේ ඉන්නා අපි අධිකරණයක් හදන්න ඕනෑ, හෙට එන හොරුන් අල්ලලා හිරේ දමන්න. ගැරඬින්ට භූමිතෙල් ගහලා වාගේ දහලන්නේ මෙම නීති පද්ධතිය ආවාම ඉස්සෙල්ලාම හිරේ යන අයයි. මේ කෑ ගහන්නේ, මේ නීති පද්ධතිය ආවාම දේශපාලන චේදිකාවට කලිසම ඇඳලා, සරම ඇඳලා නඟින්න බැරි කණ්ඩායමයි.

අපේ රන්ජන් රාමනායක මැතිතුමා හලාවත නීතීඥ සංගමයට ප්‍රශංසා කළා. එය මම නියෝජනය කරන දිස්ත්‍රික්කයයි. එහි තිබෙන්නේ මම නියෝජනය කරන මිනිසුන් කොටසකින් සමන්විත අධිකරණයක්. ඒ ගෞරවයේ කොටස්කාරයෙක් විධියට මමත් ඔවුන්ට ගෞරව කරනවා. අපේ සහෝදර මන්ත්‍රීවරයෙකුත් සෑම ඉරිදාම පොලීසියේ පෙනී ඉන්න ඕනෑ. පසුගිය දවසක නීතියේ අණ පිළිපදින්නේ නැතිව, එසේ පෙනී නොසිටීමේ වරදට ඔහුට අධිකරණයෙන් තීන්දුවක් දුන්නා. ඒ විධියට හැමෝටම පොදු තීන්දු දෙන අධිකරණ පද්ධති හැම තැනම නොවෙනවා කියන්නත් බැහැ. හලාවත අධිකරණයේ විනිසුරුවරු එසේ කටයුතු කරද්දි, මහෙස්ත්‍රාත්වරු වෙනත් විධියට තීන්දු දෙන තැනුත් තිබෙනවා. නමුත්, මේ රටට දැවැන්ත සේවයක් කරපු සියලුදෙනාගෙන් එකා එකා අල්ලලා හිරේ දමනවාට පසුපෙළේ නවක මන්ත්‍රීවරු විධියට අප කැමති නැහැ. නමුත්, හොරකම් කරලා රටේ ආර්ථිකයට දැඩි බාධා පමුණුවනවා නම්, රටේ ආර්ථිකය විනාශ කළා නම්, පවුල් පාලනයක් තුළ රටේ දේශපාලනය විනාශ කළා නම්, දේශපාලන පක්ෂ විනාශ කළා නම්, ඒ තුළ අනාගතයේදී රට යන්න තිබෙන ගමන පහළ දමා බාධාවට පත් කරලා තිබෙනවා නම් ඒ සියලු දෙනාට දඬුවම් කළ යුතුයි. ඒ නිසා ලඟි ලඟියේ එදා වෙච්ච දේවල් ගැන කථා කරන්නේ නැතිව, වර්තමානයේ අපි සියලු දෙනාම එකතු වෙලා විශේෂ අධිකරණ පද්ධතිය පිහිටුවලා ඊට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ.

ගරු අධිකරණ ඇමතිතුමියනි, ඒ පහසුකම් ලබා දීලා එක් විශේෂ අධිකරණයක් හෝ එවැනි අධිකරණ දහයක් හෝ පිහිටුවලා රටේ දැවැන්ත විනාශකාරී හොරකම්, තක්කඩිකම්, මැරකම් සහ මිනීමැරුම් කරපු ඒ සියලුදේට පාදක වූ දූෂිතයන්ට දඬුවම් දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම්, අප මෙම පාර්ලිමේන්තුව නියෝජනය කිරීමෙන් ඵලක් නැහැ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමෙන් අපට ගන්න තිබෙන පූර්වාදර්ශය වන්නේ, "ආණ්ඩුවක ඉන්නවා නම් මෙන්න මෙහෙම ඉඳපල්ලා. හොරකම් කරපල්ලා. එහෙම නැත්නම් හොරකම් කරලා හෝ සල්ලි හොයපල්ලා. සල්ලි හොයලා ඡන්දයකට බෙදපල්ලා." කියන එකයි. රුපියල් 5,000 නෝට්ටු ඡන්ද කාලයට කන්ටේනර් පිටින් ගම්වලට එනවා. ඒවා කොහෙන් එනවාද කියලා අපි දන්නේ නැහැ. අපි පැහැදිලිව කියනවා, පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්; ලංකාවේ තිබෙන රුපියල් 5,000 නෝට්ටු ඔක්කෝම අවලංගු කරන්න කියලා. අලුත් නෝට්ටු අච්චු ගහන්න. රුපියල් 5,000 නෝට්ටු ඡන්ද කාලයට තවමත් ලංකාවට එන්නේ කන්ටේනර් පිටින්. මෙවැනි දූෂිත තත්ත්වයක් මේ රට තුළ තිබෙනවා. වර්තමාන දූෂිත තත්ත්වයෙන් මිදෙන්න ක්‍රමවේදය හදන්න ඕනෑ එකම තැන අධිකරණ පද්ධතියයි. අද දවසේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ අධිකරණ පද්ධතිය තුළ එවන් යම් යම් නීති සහ ප්‍රතිපාදනයන් පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිඥ මහත්තුරුන්ගේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ කථා කළා. නීතිඥ මහත්වරුන්ගේ ගෞරවය හදන්න නම් කළ යුත්තේ මොකක්ද? විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ගත්තාම, පාර්ලිමේන්තුවට නියෝජිතයෙක් ආවාම ඔහුට නීතිය හැදෑරීමේ පහසුකම මීට පෙර තිබුණා. ගරු අධිකරණ ඇමතිතුමියනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම නීතිය හැදෑරීමේ පහසුකම්, නීති විද්‍යාලයට එහෙම නැත්නම් විවෘත විශ්වවිද්‍යාලයේ නීති ප්‍රවේශයට ඇතුළත් වෙන්න ක්‍රමවේදයක් හදා දෙන්න පුළුවන් නම් හොඳයි. නීතිය හදන මෙම උත්තරීතර ආයතනය තුළින් පූර්වාදර්ශ සහිතයි රට නිර්මාණය කරන්න පුළුවන් වේවි. ඒ වාගේම නීති විද්‍යාලය තුළ විනය ඇති කළ යුතුයි. නීති විද්‍යාලයට ප්‍රවේශවන දරුවන්ගේ ප්‍රමාණය වැඩි කරන්න. එක්කෙනෙක්, දෙදෙනෙක් යම් කිසි අධිකරණ පද්ධතියක් තුළ පතුරුවා ගෙන තිබෙන නීති ආධිපත්‍ය බිඳින්න.

එක්කෙනෙකුගේ හෝ දෙදෙනෙකුගේ ග්‍රහණයෙන් තමයි අධිකරණ පද්ධතිය පාලනය වෙන්නේ. ඔවුන් අධික මුදල් අය කරමින්, සේවාදායකයාව තළා පෙළා මේ රටේ නීතිය තමන්ගේ අතට අරගෙන තිබෙනවා. මම ඒ ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු නොවුණත්, අධිකරණය හොඳ තීන්දුවකට එයි කියලා අපි විශ්වාස කරනවා. විශේෂ අධිකරණ පද්ධතිය පිහිටුවන්න පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව මම කියන්නේ, අධිකරණ තුනක් නොවෙයි, දහයක් හෝ පිහිටුවලා ලංකාවේ දැනට ගොඩගැසී තිබෙන නඩු ටික අවසන් කරන්න කියායි. දවසට දෙවතාවක් හෝ නඩු කථා කරලා සැබෑ හොරු, වංචාකරුවන්, දූෂිතයන් ටික නීතිය හමුවට ගෙනැල්ලා දඬුවම් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාව මම අහගෙන සිටියා. එතුමාගේ කථාවේදී දැඩිව, ප්‍රහාරාත්මකව ආණ්ඩුවෙන් ඇහුවේ, ආණ්ඩුව කියපුවා කළාද? හොරු ඇල්ලුවාද? හොරුන්ට දඬුවම් දුන්නාද? කියා. එතුමාත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම එතුමාට කියනවා, නීතියට අවශ්‍ය කරන ප්‍රතිපාදන හදලා දීලා හොරකම් අල්ලන්න විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට ඔබතුමාත් එන්න. අපේ චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාගේ කථාවත් මම අහගෙන හිටියා. එතුමා ජ්‍යෙෂ්ඨ මෙන්ම අපේ හිටපු ඇමතිවරයෙක්. එතුමාගේ සම්පූර්ණ කථාව තුළ තිබුණේ, භය සහ බොහොම පැකිළුණු සුළු ස්වභාවයක්. "මේ නීතිය ගෙනැල්ලා පුද්ගලයන්ගෙන් පළිගන්නද හදන්නේ? මේ නීතිය ගෙනැල්ලා එක එක්කෙනාගෙන් පෞද්ගලිකව පළිගන්නද හදන්නේ?" එහෙම දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අදත් නීතිය කාටත් පොදුයි. ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන තමයි මේ හදන්න යන්නේ. හෙටත් නීතිය කාටත් පොදුයි. නීතිය ගෙනාපුවාම හොරු හැර අනික් අය භය වෙන්න ඕනෑ නැහැ. හොරුන්ට විරුද්ධව විතරයි නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබෙන්නේ. එහෙම නැත්නම් තව ටිකක් කල් යද්දි සිද්ධ වෙන්නේ, අධිකරණ පද්ධතියේ යම් යම් තැන්වල දක්ෂතා, උසස්, මහත එහෙම නැත්නම් මිල, මුදල් මත පදනම් වෙලා තීරණ ගැනීමෙන් හොරු ටික සේරම ඉතුරු වෙයි.

ගරු රන්ජන් රාමනායක මැතිතුමා කිව්වා වාගේ, තව ටිකක් කල් යද්දි හොඳ අය ටික සේරම ඇතුළට යයි. ඒක කරන්න දෙන්නේ නැතුව ගරු අධිකරණ ඇමතිතුමියනි, ඔබතුමියට ලැබිලා තිබෙන මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය අරගන්න. රට තුළ යම් තර්කයක්, යම් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන මොහොතක තමයි

[ගරු අශෝක ජ්‍රියන්ත මහතා]

ඔබතුමියට මේ අමාත්‍යාංශය ලැබෙන්නේ. මේ ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජනය අරගන්න. එය ඉතිහාසගත වෙනවා. ගරු ඇමතිතුමියනි, මේ වැඩ කටයුත්ත ඉතාමත් කඩිනමින් අවසන් කරන්න.

දැන් සමහරු අහනවා, ඉදිරියේදී නීතිය ක්‍රියාත්මක කරද්දි එක කණ්ඩායමක් ඉලක්ක කරගෙනද නීතිය ක්‍රියාත්මක කරන්නේ කියලා. අපි අහනවා, එදා අපේ ජනරල් සරත් ෆොන්සේකා මැතිතුමාට නීතිය ක්‍රියාත්මක කරද්දි ඒ ක්‍රමවේදය අනුගමනය කළාද? රජයක් විධියට අපටත් කෙනෙකුගෙන් පළිගන්න ඕනෑ නම්, නීති ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රමවේදය තිබෙනවා. හැබැයි, මානව ධර්මතා සහ මානව අයිතිවාසිකම් සුරකිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුරකිමින්, ආණ්ඩුවක් පාලනය කරන යහ පාලන රජයට එහෙම කරන්න බැහැ. ඒක තමයි මේ යහ පාලන රජයට ලබලා තිබෙන බාලගිරි, එහෙම නැත්නම් අභාග්‍ය සම්පන්න ඉරණම. මේ යහ පාලන රජය, යහ පාලනය ක්‍රියාත්මක කිරීම නිසා ඒ තුළින් අයුතු ප්‍රයෝජන ගන්න යම්කිසි පාර්ශ්වයක් උත්සාහ කරනවා. ඒ වාගේම මේ රටේ ජනතාවට තේරෙන්නේ නැහැ, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් එකතු වෙලා ගොඩ නඟපු සංහිඳියාව තුළ මේ රට කොච්චර දුර ගෙනියලා ඉතිහාසයේ ජයග්‍රාහී රටක් බවට පත් කරන්න පුළුවන්කම තිබෙනවාද කියලා. ඒක මේ රටේ ජනතාවට දැනෙන්නේ නැහැ. හැබැයි, ඒක තේරෙයි මේ සංහිඳියාව බිඳිලා අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් නැතුව නැවත පසුගිය කාලයේ තිබුණ රාජ්‍යයක් මේ රටේ ස්ථාපිත වුණොත්. ඒක පසුව තේරිලා වැඩක් නැහැ.

සිංගප්පූරුව නිර්මාණය කරන්න, දියුණු කරන්න ලී ක්වාන් යූ අගමැතිතුමා ක්‍රියා කරපු ආකාරය ගැන මම අහලා තිබෙනවා. එතුමා සිංගප්පූරුව භාර ගත්තාට පස්සේ, රට ගොඩනඟන්නේ කොහොමද කියලා දවස් ගණනාවක් නිරාහාරව කල්පනා කරලා, අවසානයේදී යෝජනා දෙකක් ඉදිරිපත් කරනවා. එක යෝජනාවක් තමයි, දූෂණය හා වංචාව සම්පූර්ණයෙන්ම හකුළා දැමිය යුතුයි. අනෙක් යෝජනාව තමයි, ජාතිවාදය සම්පූර්ණයෙන්ම හකුළා දැමිය යුතුයි. එක කණ්ඩායමක් මේ රටේ වත්මන් ආණ්ඩුව වටිටන්න මේ ක්‍රමවේද දෙකම අද පාවිච්චි කරනවා. එකක්, රටේ ජාතිවාදය පතුරවමින් මේ ආණ්ඩුව ජාතිවාදී ආණ්ඩුවක් කියන තත්ත්වයට ගෙනියලා මේ රට අස්ථාවර කරන්න උත්සාහ කරනවා. අනෙක් පැත්තෙන්, දූෂණය හා වංචාව නවත්වන්න පුළුවන් ක්‍රමවේද හැදෙන හැම අවස්ථාවකම පාරට බහින්න සූදානම් වනවා. ඒ වෙනුවෙන් හාමුදුරුවරු එකතු වනවා; ඒ වෙනුවෙන් වෙනත් කණ්ඩායම් එකතු වනවා. එකතු වෙලා ගරු රන්ජන් රාමනායක මැතිතුමා කිව්වා වාගේ, හොරා හිරේට දමන්න කලින් අධිකරණයට යද්දි උද්ඝෝෂණ පටන් ගන්නවා.

ඒ ක්‍රමවේදය වෙනස් විය යුතුයි. මේ උත්තරීතර ආයතනයට - පාර්ලිමේන්තුවට- අප මහජන නියෝජිතයන් විධියට ජනතාව එවා තිබෙන්නේ, යම් කිසි විශ්වාසයක් ඇතුවයි. ඒ විශ්වාසය මත ලංකාවේ පළමුවන වතාවට අපි ප්‍රධාන පක්ෂ දෙක එකට එකතු වෙලා, නිදහස බුක්ති විඳිමින්, අදහස් ප්‍රකාශ කරමින්, ඕනෑ කෙනෙකුට ඇඟිල්ල දිගු කරමින්, අවුරුදු දෙකහමාරක් ඉදිරියට ආවා. තව අවුරුදු දෙකකට වැඩි කාලයක් ඉදිරියට යන්න තිබෙනවා. ඒ කාල වකවානුව තුළ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න පුළුවන් ආණ්ඩුවක් තවමත් තිබෙනවා. ඒ ආණ්ඩුව නිර්මාණය කරන්න අවශ්‍ය කරන්නේ, නීතියේ ප්‍රතිපාදන විතරයි. නීතියේ ප්‍රතිපාදන හදන්න අවශ්‍ය කරන මහජන නියෝජිතයන් ප්‍රමාණය ඕනෑවටත් වඩා ඉන්නවා. සියලුදෙනාම ඒක හිතන්නේ නැහැ. නීතියට අවශ්‍ය කරන ප්‍රතිපාදන හදද්දී, යහළුවෙක්, හිතවතෙක් බේරන්න කියලා, එහෙම නැත්නම් යහළුවෙකුට, හිතවතෙකුට අඩන්තේට්ටමක් වෙයි කියලා කෙනෙක් පැත්තකට යනවා නම්, ආණ්ඩුවේ ගමන් මඟ වෙනස් කරන්න උත්සාහ කරනවා නම්, මතක තියා ගන්න, අනාගතයේ දවසක මේ පවතින ආණ්ඩුව ගැන හිතලා කලකිරෙන්න සිදු වෙනවා; පසුතැවෙන්න සිදු වෙනවා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට අදාළව අද මේ විවාදයට ගත් විශේෂ කාරණා සියල්ලම මහජන නියෝජිතයන් විධියටත්, රටේ පුරවැසියන් විධියටත් අපට ඉතාම වැදගත්. ඒ වැදගත් විවාදය, විවාදයකින් අවසන් නොවී, ඒ තුළින් නීති පද්ධතිය ශක්තිමත් වෙලා, ඉතාම කඩිනමින් දූෂිතයින්, වංචනිකයින් සම්බන්ධයෙන් කටයුතු කරන්න මෙන්ම රටේ ජනතාවගේ ස්වාධීනත්වය සහ ඔවුන්ගේ මානව අයිතිවාසිකම් සුරකින්න පුළුවන් නීති පද්ධතියක් රටට නිර්මාණය වේවා!යි ප්‍රාර්ථනා කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය.

[අ.භා. 5.26]

ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ අණ පනත් කිහිපයක් විවාදයට ගත් මේ අවස්ථාවේදී බොහෝ දෙනෙක් ඒ සම්බන්ධව අදහස් පළ කිරීම ගැන මම සන්තෝෂ වනවා. ඒ අයට මම ස්තුතිවන්ත වනවා. සමහර අය මෙහි එකම දෙයක් ගැන පමණයි කථා කළේ. ඒ, විශේෂ අධිකරණ ගැන පමණයි. අද දින සාකච්ඡාවට බඳුන් වන්නේ නැති දේ ගැන තමයි වැඩියෙන්ම කථා කළේ. අපට තවත් දවසකට ඒ සම්බන්ධයෙන් විවාද කරන්නත් බැරි වෙයි කියා මම හිතනවා. ඒ තරමට අද ඒ ගැන අදහස් ප්‍රකාශ කළා.

භාර ආඥාපනත සම්බන්ධයෙන් අද ඉදිරිපත් කළ සංශෝධනය ගැන මම යමක් කියන්න ඕනෑ. අපි දන්නවා, මේ ඇති කරන භාර සම්බන්ධයෙන් වගකීමක්, සමහර අයට, සමහර සංවිධානවලට ලැබෙන මුදල් සම්බන්ධයෙන් වගකීමක්, ඒ වාගේම ඒ මුදල් පිළිබඳව හරියාකාර විස්තර සහ වියදම් කිරීම පිළිබඳව කිසිම ක්‍රමවේදයක් නැති වීම පිළිබඳව පසුගිය කාලය පුරාවට ආන්දෝලනයට ලක් වුණා; කථාබහට ලක් වුණා කියලා. ඒ නිසා අදාළ සංශෝධන ඉදිරිපත් කරලා, අද භාරයක් ඇති කරනකොට ඒ සෑම භාරයක්ම රෙජිස්ට්‍රාර් ජනරාල් කන්තෝරුවේ

ලියාපදිංචි භාරයක් බවට පත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම ඒ භාරයේ ප්‍රතිලාභීන් හැටියට කටයුතු කරන අය ඒ භාරයේ අරමුණු හැම එකක්ම බොහොම පැහැදිලිව දක්වන්න ඕනෑ. ඒවා තමයි අද භාර ආඥාපනතට ඉදිරිපත් කළ සංශෝධනයෙන් සිදු කෙරෙන්නේ. ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කරන්න අවශ්‍ය නැහැ, මොකද, අධිකරණ කටයුතු සම්බන්ධයෙන් වන අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් හොඳට අදහස් ප්‍රකාශ කළ නිසා.

අධිකරණ සංවිධාන පනතේ සංශෝධනයක් සම්බන්ධයෙන්, ගැසට් නිවේදනයේ ඇති වුණු තාක්ෂණික දෝෂයක් නිසා එය නැවතත් ගැසට් කිරීමට සිදු වුණා. ඒ සම්බන්ධයෙන් අපේ චන්ද්‍රසිරි ගජදීර මිටපු ඇමතිතුමා කිව්වා, විජයදාස රාජපක්ෂ මිටපු ඇමතිතුමාගේ ගැසට් එක වෙනස් කරලා, වෙනත් ගැසට් එකක් ගෙනැල්ලාය කියලා.

මම කියන්න ඕනෑ, ඒවායේ කිසිම වෙනසක් සිදු වෙලා නැහැ කියලා. ගැසට් කිරීමේදී ඇති වුණු තාක්ෂණික වරදක් නිවැරදි කිරීමට පමණක් එම කරුණුම පදනම් කරගෙන අධිකරණ සංවිධාන පනතේ 60වැනි වගන්තිය යටතේ කරන ලද එම රීතිය ඉදිරිපත් කරන්නට අද අපි කටයුතු කරලා තිබෙනවා.

නීති අධ්‍යාපන සභාව යටතේ පාලනය වන නීති විද්‍යාලයට නියෝජ්‍ය විදුහල්පති තනතුරක් ඇති කරලා, ඒ සම්බන්ධයෙන් අද මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. නීති විද්‍යාලයට මෙවැනි තනතුරක අවශ්‍යතාවක් නැති චිත්තියත් සමහර අයගේ කටින් කියැවුණා. නමුත්, නීති විද්‍යාලය කියන ස්ථානයේ වැදගත්කම සහ අවශ්‍යතාව පිළිබඳව අපි මතක් කරන්නට ඕනෑ. මේ රටේ නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් කේන්ද්‍රස්ථානය වුණු තැනක විදුහල්පතිවරයා වශයෙන් සිටින තැනැත්තා හදිසියේ අසනීප වුණොත්, වෙනත් තත්ත්වයක් ඇති වුණොත් ඒ සම්බන්ධයෙන් වගකීමක් ඇතිව වැඩ කටයුතු කරගෙන යෑමට දැනට පුළුවන්කමක් නැති නිසා තමයි ඒ වාගේ තනතුරක් ඇති කරන්නට අවශ්‍ය ගැසට් එක නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපේ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහත්මයා, ගාල්ලේ මන්ත්‍රීතුමා නීතිපති තනතුර ගැන බොහොම දැඩි ආවේගයකින් කථා කළා. එහෙම නැත්නම් හොරු අල්ලන්න ඇවිත්, හොරු වෙච්ච එක ගැන කථා කළා. මේ අවස්ථාවේ ඒ ගැන කථා කරන්න මට අවශ්‍යතාවක් නැහැ. හොරු අල්ලන්න කියලා ඉල්ලීමක් තිබුණේ මේ රටේ ජනතාවගෙන්. ඒ වෙනුවෙන් කටයුතු කිරීමේදී, ඒ සඳහා අවශ්‍ය ක්‍රියා පිළිවෙළ සිදු වී ගෙන යනවා. සමහර වේලාවට සමහර අය කල්පනා කරනවා ඇති, හොරු අල්ලනවා කියලා; එහෙම නැත්නම් දේශපාලන සතුරන්ට දඬුවම් දෙනවා කියලා ඒ කාලයේ ජනරාල් සරත් ෆොන්සේකා හමුදා විරුවා අල්ලලා හිරේ දමපු විධියට හිතෙන ඕනෑම කෙනෙක් අල්ලලා හිරේ දමන්න පුළුවන් කියලා.

මේ ගරු සභාවේ අධිකරණයේ ස්වාධීනත්වය ගැනත් කථා කළා. මම දැන් මේ ගැන පොඩ්ඩක් මතක් කරන්නේ සමහර අයට ඉතිහාසය අමතක වෙලා තිබෙන නිසායි. එදා ඒ කරපු වැඩේ නිසා අද සමහර අය අපෙනුත් අහනවා, "හොරු අල්ලන්නේ නැද්ද?" කියලා. මොකද, බලාගෙන ඉන්නකොට සමහර අයට කල්පනා වෙන්නේ අල්ලාගෙන ගිහින් එක පාරම හිරේ දමන්න ඕනෑ; චෝදනාවක් හදනතුරු හෝ හිරේ තියාගෙන ඉන්න ඕනෑ කියලායි. මේ වැරැදි පූර්වාදර්ශ අපි ඉදිරියට ගෙන යන්න කැමැති නැහැ. අපි එහෙම කරන්න උත්සාහ කරන්නේත් නැහැ. යහ පාලනය ඇති කළේ මේ රටේ ස්වාධීන අධිකරණයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව මූලික කරගෙනයි.

මොහාන් පීරිස් මිටපු අගවිනිසුරුතුමා ගැනත් කථා කළා. එතුමාව එක පාරට එළියට දැම්මා කියලා කිව්වා. හැබැයි, මොහාන් පීරිස් මිටපු අගවිනිසුරුතුමා පත් කරපු විධිය ගැන කථා කළේ නැහැ. එතුමාව ගෙනැත් අවශ්‍ය අවශ්‍ය විධියට, තමන් කැමැති දේවල් කර ගන්න කථා කරපු විධිය ගැන කථා කළේ නැහැ. සමහර අය හිතාගෙන හිටියේ එම ක්‍රමවේදය ඉදිරියට ගෙන යන්න තමයි අධිකරණය නැවත කටයුතු කරගෙන යන්නේ කියලා. අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ සිටින මහාධිකරණ, අභියාචනාධිකරණ විනිසුරුතුමන්ලා කටයුතු කරන ආකාරය පිළිබඳ අපි සන්තෝෂ වෙනවා. ඒ අයට බොහොම ස්වාධීනව කටයුතු කිරීමේ අයිතිය අද ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් නායකත්වය යටතේ ඇති කරලා තිබෙනවා. සමහර වේලාවට ඒ කාලයේ පත් වුණු උදවිය ඔය තනතුරුවල වැඩියෙන් ඉන්නවා වෙන්න පුළුවන්. ඕනෑම ආකාරයේ බලපෑමක් වෙනවා කියනවා නම්, ඒ අයට ඒ සම්බන්ධයෙන් ඕනෑම චෝදනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. මොහාන් පීරිස් මහත්මයා ගැන එක පාරට කැක්කුමක් ඇති වෙලා තිබෙන්නේ, එතුමා අපේ ජනාධිපතිතුමා හමුවෙලා "නැවත අග්‍රවිනිශ්චයකාර ධුරයට තමා පත් කළොත්, තමා ජනාධිපතිතුමා එක්ක වැඩ කරන්න කැමැතියි" කියූ එක එතුමා දැනගෙන ඉඳලා නැති නිසා වෙන්න ඇති කියලායි මම හිතන්නේ.

අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළින්ම සිටින අග්‍ර විනිශ්චයකාරතුමාගේ සිට පහළට බැලුවාම නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ආදී හැම ආයතනයකම වැඩ කරන සේවකයින් තම සේවය කරන්නේ යම් කිසි බලාපොරොත්තුවක් ඇතුවයි. එහෙම වැඩ කරන හැම කෙනෙකුගේම බලාපොරොත්තුව හරි දේ කරලා තවත් ඉහළට යෑමයි. ඒ අයට හරියට වැඩ කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කිරීම සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට අධිකරණ අමාත්‍යාංශය විධියට අපි කටයුතු කරනවා.

අද එක් මන්ත්‍රීවරයෙකු යම් කිසි නඩු අංකයක් කියලා මට කිව්වා, ඒකට උත්තර දෙන්න කියලා. මම මොකටද ඒවාට උත්තර දෙන්නේ? මා හිතන්නේ තවම ඒ ගොල්ලන් තේරුම් අරගෙන නැහැ, අධිකරණ ඇමතිගේ වැඩ කටයුත්ත නඩුවල නොම්මර හොයාගෙන; නඩු නොම්මර බලාගෙන කටයුතු කරන එක නොවෙයි කියලා. එදා සිටි අය කරපු දේම අදත් කරයි කියලා ඒ අය තවමත් හිතාගෙන ඉන්නවා. නඩුවේ නොම්මරයක් තිබුණා නම්, එහෙම නැත්නම් අවශ්‍යතාව වෙනුවෙන් නඩු ගැන කටයුතු කරන්න පුළුවන් කියලා ඒ අය හිතාගෙන ඉන්නවා. මේ ගොල්ලන් දැන්වත් මේකෙන් මිදෙන්නට ඕනෑ. මේ අවස්ථාවේ ඒ කවුරුවත් සභාවේ නැති එක ගැන මම ඇත්තටම කනගාටු වනවා.

විශේෂ අධිකරණ සම්බන්ධයෙන් භය වුණු උදවිය; අනික් අයට කොන්ත්‍රාත් කරන උදවිය අද ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. උත්තරීතර ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සම්බන්ධයෙන් මොන තීන්දුවක් ලබා දුන්නත්, ඒ ලබා දෙන තීන්දුවට අපි හිස නමනවා. හැබැයි, විශේෂ අධිකරණ පත් කරනවාය කියන එක අපි ජනතාවට දුන් පොරොන්දුවක්. ඒක ඉෂ්ට කිරීම මේ රජයේ වග කීමක්. අපි එහෙම කළේ නැත්නම් හොරු ඇල්ලුවේ නැද්ද කියලා අපෙන් මිනිස්සු අහනකොට අපි කියන්නේ මොකක්ද? අපි මේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ කාගෙන්වත් දේශපාලන පළිගැනීම් කරන්න නොවෙයි. මේ රටේ දූෂිත ක්‍රියා, වංචා සහගත ක්‍රියා සිද්ධ වුණු විත්තිය රටේ හැම කෙනෙකුම දන්නවා. අපි අධිකරණ සංවිධාන පනතට ගේන සංශෝධනයත් එක්ක මොන වාගේ නඩුද එතැනට යොමු කරන්න පුළුවන් කියන එක එහි සඳහන් වෙලා තිබෙනවා. ඒක පසු කාලයක විවාදයට ගන්න තිබෙන කාරණයක්.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා බොහොම වුවමනාවෙන් හැම දාම වාගේ විනිශ්චයකාරතුමන්ලාගේ පහසුකම් ගැන, අවශ්‍යතාවන් ගැන කථා කරනවා. එතුමා එදා කථා කරන කොටත් මට කිව්වා, මාස හතරකට ඉස්සෙල්ලා කියපු දේ තවම කරලා නැහැයි කියලා. මා හිතන්නේ එතුමා තවමත් දන්නේ නැහැ, මෙම වසරේ ජනවාරි පළමුවෙනි දා සිට අධිකරණ නිලධාරීන්ට ලබා දෙන පහසුකම්වල සහ වැටුප්වල වූ වෙනස පිළිබඳව. ඒක නොදැන ඉන්න හේතුව මොකක්ද කියලා මා දන්නේ නැහැ. එතුමා මෙතැනට ආවාම විතරක් ඒක නොදැනෙනවාද, එළියේදී දැනගෙන සද්ද නැතිව ඉන්නවාද, ඇවිල්ලා බොරු කියනවාද කියලාත් මා දන්නේ නැහැ. කෙසේ වෙතත් මේ හැම එකක් සම්බන්ධයෙන්ම අපි වග කීමක් ඇතුව වැඩ කටයුතු කරනවා. මේ වැඩ කටයුතු කරන කොට කිසිම ද්වේෂයකින්, ක්‍රෝධයකින්, වෛරයකින්, කිසි කෙනෙකුගෙන් පළි ගැනීමේ චේතනාවකින් අපි වැඩ කරන්නේ නැහැයි කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

අද බැඳුම්කර ගනු දෙනුව ගැනත් කථා කළා. විශේෂ අධිකරණ පිහිටුවූවාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අනුව බැඳුම්කර ගනුදෙනුවට අදාළ නඩුව එම විශේෂ අධිකරණයක අහන්නත් ඉඩ තිබෙනවා. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. කවුරු හරි ඒවාට සම්බන්ධ වෙලා වැඩ කරලා තිබෙනවා නම්, ඒවාට උත්තර බඳින්නයි තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපට කිසිම ප්‍රශ්නයක් නැහැ.

අද සමහරු නීතිපති දෙපාර්තමේන්තුව ගැන බොහොම හෑල්ලු විධියට කථා කළා. මේ සම්බන්ධයෙන් මා කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මෙපමණ කාලයක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් තමන්ට අවශ්‍ය files යට ගහන්න නිලධාරීන්ට නොයෙකුත් බලපෑම් කරපු අය නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කෙරෙන්නේ කොහොමද කියලාවත්, ඒ නිලධාරීන්ට තිබෙන පහසුකම් ගැනවත්, නිලධාරීන්ගේ තත්ත්වය මොකක්ද කියලාවත් දැන හඳුනාගෙන සිටියාද දන්නේ නැහැ. අපි මේ වෙනකොට නීතිපතිතුමා පත් කරලා තිබෙනවා. එතුමාට හිමි තනතුර අපි එතුමාට දීලා තිබෙන්නේ. මට කියන්න තිබෙන්නේ මේකයි. ඉස්සර කරපු දේවල් එන එන හැම කෙනාම; හැම රජයක්ම; හැම ජනාධිපති කෙනෙකුම; හැම අගමැති කෙනෙකුම කරනවාය කියලා හිතේ තියා ගෙනයි තවමත් මේ අය වැඩ කරන්නේ.

මම විශේෂයෙන්ම තවත් කාරණයක් මේ අවස්ථාවේදී මතක් කරනවා. අද සම්මත කිරීමට නියමිත මේ සංශෝධන සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයේ නීති අංශයත්, අනික් නිලධාරි මහත්ම මහත්මීනුත් ගොඩක් මහන්සි වෙලා වැඩ කටයුතු කළා. නීති කෙටුම්පත් සම්පාදකතුමිය ඇතුළුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සේවය කරන සියලුදෙනාම මේ සඳහා ලොකු සහයෝගයක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවත් මේ සඳහා සහයෝගය ලබා දුන්නා. ඒ සියලු දෙනාටම මගේ ස්තුතිය පළ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අලුත් නීති එනකොට සමාජයත් එක්ක, ජනගහනයත් එක්ක පවතින ගැටලුකාරී තත්ත්වයන් හැම එකක්ම වෙනස් කර ගෙන ඉදිරියට යන්න අවශ්‍ය සහයෝගය ලබා දීම පිළිබඳව විෂය භාර ඇමතිවරිය හැටියට මගේ කෘතවේදීත්වය ඒ හැම කෙනෙකුටම පුද කරන ගමන්, මට මේ අවස්ථාව සලසා දීම ගැන මම විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු තලතා අතුකෝරල මහත්මිය]

තීරමානික්කප්පට්ටදු.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Mrs.) Thalatha Atukorale.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[The Hon. Presiding Member in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (87 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 2.- (87ஆம் அத்தியாயத்தின் 3ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 2.- *(Amendment of section 3 of Chapter 87.)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 6 වන ජේළියේ සිට 8 වන ජේළිය දක්වා ඇති ජේළි (ඒ ජේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලබන) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ඉ) ජේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් :-' ";

(2) "1 වන පිටුවේ, 14 වන ජේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) ඒ වගන්තියේ (ව) ජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ජේද එකතු කිරීමෙන්:-

(ජ) "ප්‍රකාශිත භාරය" යන්නෙන්, භාරයේ කර්තෘ විසින් භාරයේ අරමුණු නිශ්චිතව දක්වමින්, සාමාන්‍යයෙන් ලිඛිත වූ සාධන පත්‍රයක් මගින් ඇති කරනු ලබන භාරයක් අදහස් වන අතර, එහෙත් ඊට අනුමිත භාරයක් හෝ තත්වාකාර භාරයක් ඇතුළත් නොවේ;

(ට) "නියම කරනු ලබන" යන්නෙන්, මේ පනත යටතේ සාදනු' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 6අ සහ 6ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தில் 6அ மற்றும் 6ஆ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்.)

CLAUSE 3.- *(Insertion of new sections 6_A and 6_B in the principal enactment.)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලද සෑම ප්‍රකාශිත භාරයක් පිළිබඳව ම නියම කරනු ලැබිය' " ;

(2) "2 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) ප්‍රකාශිත භාරයක් හා සම්බන්ධ යම් නිශ්චල දේපළක හෝ චංචල දේපළක';

(3) "2 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ප්‍රකාශිත භාරයකට අදාළ යම් තොරතුරක් මූල්‍ය බුද්ධි ඒකකය' ";

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 19අ, 19ආ සහ 19ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.)

வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தில் 19அ,19ஆ,19இ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்.)

CLAUSE 4.- *(Insertion of new sections 19_A, 19_B and 19_C in the principal enactment.)*

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'යටතේ ප්‍රකාශිත භාරයක් ඇති කරන අවස්ථාවේ දී පහත සඳහන්' ";

(2) "3 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ප්‍රකාශිත භාරයක් ඇති කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්' ";

(3) "3 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'තැනැත්තකුගේ අර්ථලාභය පිණිස ප්‍රකාශිත භාරයක් ඇති කර' ";

(4) " 3 වන පිටුවේ,29 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' "හිමිකරු" යන්නෙන්, ප්‍රකාශිත භාරයේ ප්‍රතිලාභවල අත්‍යන්ත' ";

(5) "3 වන පිටුවේ, 32 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ප්‍රකාශිත භාරය ඇති කරනු ලබන්නේ යම් තැනැත්තකු හෝ' ";

(6) "4 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලෙස යම් අදාළ අධිකාරියක් විසින් ප්‍රකාශිත භාරයක භාරකරුවකුට' ";

(7) "4 වන පිටුවේ, 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) (අ) යම් ප්‍රකාශිත භාරයක භාරකරුවකු විසින් මූල්‍ය ව්‍යාපාර' ".

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 4, as amended, ordered to stand part of the Bill.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

5 සිට 8 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

5இலிருந்து 8வரையான வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 5 to 8 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු තලතා අතුකෝරල මහත්මිය

(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)

(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතේ සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විවාදයකින් තොරව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

අධිකරණ සංවිධාන පනත : නියෝග

நீதித்துறைச் சட்டம் : ஒழுங்குவிதிகள்

JUDICATURE ACT : REGULATIONS

ගරු තලතා අතුකෝරල මහත්මිය

(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)

(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ, අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විවාදයකින් තොරව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

Question put, and agreed to.

නීති අධ්‍යාපන සභා ආඥාපනත : රීති

சட்டக் கல்விப் பேரவைக் கட்டளைச் சட்டம் : ஒழுங்குவிதிகள்

COUNCIL OF LEGAL EDUCATION ORDINANCE : RULES

ගරු තලතා අතුකෝරල මහත්මිය

(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)

(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"(276 වැනි අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ, අධිකරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.20 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විවාදයකින් තොරව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත : නියෝගය

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம் : கட்டளை

SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

ගරු තලතා අතුකෝරල මහත්මිය

(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)

(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විවාදයකින් තොරව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

Question put, and agreed to.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විනා විවාදයකින් තොරව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 23ක සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

முல்லைத்தீவு மாவட்டத்தின் 23 கிராம அலுவலர் பிரிவுகளில் சமுர்த்தித் திட்டத்தை அமுல்படுத்துதல்

IMPLEMENTATION OF SAMURDHI PROGRAMME IN 23 GRAMA NILADHARI DIVISIONS OF MULLAITIVU DISTRICT

[பி.ப. 5.45]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கௌரவ சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர் கௌரவ எஸ்.பி. திசாநாயக்க அவர்களிடம் பின்வரும் பிரேரணையைச் சமர்ப்பிக்கின்றேன்.

> "2012ஆம் ஆண்டு முதல் முல்லைத்தீவு மாவட்டத்தில் சமுர்த்தித்திட்டம் அமுல்படுத்தப்பட்டு வருவது சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர் அவர்கள் அறிந்த விடயமே! எனினும், கரைதுறைப்பற்று மற்றும் புதுக்குடியிருப்பு ஆகிய இரண்டு பிரதேச செயலாளர் பிரிவுகளிலுமுள்ள 65 கிராம அலுவலர் பிரிவுகளில் கீழ்வரும் 23 கிராம அலுவலர் பிரிவுகளுக்கு இதுவரை சமுர்த்தித்திட்டம் அமுல்படுத்தப்படவில்லை. காரணம் 2012ஆம் ஆண்டு ஐப்பசி மாதத்திற்குப் பின்னரே, இந்த 23 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த மக்கள் மீள்குடியமர்த்தப்பட்டனர். சுமார் ஒரு வருடத்திற்கு முன்னர், இச்சபையில் இவ்விடயம் தொடர்பில் வாய்மூல விடைக்கான வினாவை எழுப்பியபோது, கௌரவ அமைச்சர் அவர்கள் 02 மாத காலத்துக்குள் இதற்கு நடவடிக்கை எடுப்பதாக வாக்குறுதியளித்தார். எனினும், இப்பிரச்சினை தொடர்பில் இதுவரை எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே, இந்த 23 கிராம அலுவலர் பிரிவுகளிலும் சமுர்த்தித் திட்டத்தினை அமுல்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க ஆவன செய்யுமாறு கேட்டுக்கொள்கின்றேன்"

குறிப்பிட்ட 23 கிராம சேவகர் பிரிவுகளாவன: தண்ணீரூற்று கிழக்கு, செம்மலை கிழக்கு, கொக்குத்தொடுவாய் மத்தி, கொக்குத்தொடுவாய் வடக்கு, குமாரபுரம், முள்ளி வாய்க்கால் மேற்கு, தண்ணிமுறிப்பு, அம்பலவன் பொக்கணை, கேப்பாப்பிலவு, கொக்குத்தொடுவாய் தெற்கு, புதுக்குடியிருப்பு கிழக்கு, புதுக்குடியிருப்பு மேற்கு, கோம்பாவில், இரணைப் பாலை, ஆனந்தபுரம், சிவன்நகர், மந்துவில், மல்லிகைத்தீவு, உடையார்கட்டு வடக்கு, உடையார்கட்டு தெற்கு, சுதந்திரபுரம், வல்லிபுனம், தேவிபுரம் என்பனவாகும். இந்த 23 கிராம சேவகர் பிரிவுகளையும் சேர்ந்த மக்கள் முற்றுமுழுதாக இடம்பெயர்ந்து கடந்த 2012ஆம் ஆண்டு மீளக் குடியமர்ந்தபோதும், அவர்களுள் ஒருவருக்கேனும் இன்றுவரை சமுர்த்தி நிவாரணம் வழங்கப்படவில்லை.

கௌரவ அமைச்சர் அவர்களே! நான் இது தொடர்பாகத் தங்களிடம் நேரடியாக இந்த உயரிய சபையில் கேள்வி எழுப்பியபோது, இரண்டு மாதங்களில் அந்த நிவாரணத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பதாகக் கூறினீர்கள். அதுமட்டுமல்ல, தங்களுடைய பணிப்பாளர் நாயகத்திடமும் நான் நேரடியாகச் சென்று இந்த விபரங்களைக் கூறியபோது, "இது தொடர்பில் நடவடிக்கை எடுத்துக்கொண்டிருக்கின்றோம்; மிக விரைவில் அந்த மக்களுக்கு அக்கொடுப்பனவுகள் கிடைக்கும்" என்று அவரும் கூறியிருந்தார். ஆனால், அந்த மக்கள் 2012ஆம் ஆண்டு மீளக்குடியேறி கிட்டத்தட்ட 06 வருடங்கள் முடிந்த நிலையிலும் அவர்களுக்குரிய சமுர்த்தி நிவாரணம் இன்றுவரை கொடுக்கப்படவில்லை என்பது மிகவும் மனவேதனையானதும் ஏற்றுக்கொள்ள முடியாததுமான ஒரு விடயமாகும். ஏனென்றால், அந்த மக்கள் யுத்தத்தினால் முற்றுமுழுதாகப் பாதிக்கப்பட்டு, தங்களது முழு உடமைகளையும் மற்றும் உறவுகளையும் இழந்தவர்கள். இன்று மீளக்குடியமர்ந்த நிலையிலும் தங்களது வாழ்வாதாரத்தை முன்கொண்டு செல்ல முடியாத வகையில் மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அத்தோடு, தொடர்ச்சியாக அங்கு நிலவுகின்ற வரட்சியானது, எங்களுடைய விவசாயிகளை மென்மேலும் துன்பப்படுத்திக் கொண்டிருக்கிறது. ஆகவே, கரைதுறைப்பற்று, புதுக்குடியிருப்பு ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளுக்குட்பட்ட அந்த 23 கிராம அலுவலர் பிரிவுகளுக்கும் சமுர்த்தி நிவாரணத்தைக் காலதாமதமின்றி வழங்கும்படி நான் கௌரவ அமைச்சர் அவர்களிடம் பணிவாகக் கேட்டுக்கொள்கின்றேன்.

தங்களுடைய திணைக்கள அதிகாரிகளால் எங்களுடைய மன்னார் மாவட்டத்தில் 1,336 பேர் அங்கவீனர்களாக அடையாளம் காணப்பட்டு, அவர்கள் தொடர்பான பதிவுகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. ஆனால், தங்களுடைய அமைச்சுக்குக்கீழ் அங்கவீனர்களுக்கு வழங்கப்படுகின்ற 3,000 ரூபாய் பணக்கொடுப்பனவானது, இவர்களில் 448 பேருக்கு மாத்திரமே 2018ஆம் ஆண்டில் வழங்கப்பட்டு வருகின்றது. ஆனால், இன்னும் 888 பேருக்குரிய கொடுப்பனவுகளைக் கொடுப்பதற்கு தங்களுடைய அமைச்சினால் நடவடிக்கைகள் எடுக்கப்படவில்லை.

கடந்தமுறை கச்சேரியில் நடைபெற்ற கூட்டத்தின்போது "இதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்படவில்லையா?" என்று தங்களுடைய திணைக்களத்தின் மாவட்ட அதிகாரியிடம் நான் கேட்டபோது, குறித்த விபரங்கள் தங்களுடைய செயலாளருக்கு அனுப்பப்பட்டிருப்பதாகவும் அமைச்சிலிருந்து அதற்குரிய பதில் கிடைத்தால் மட்டுமே அதை வழங்க முடியுமென்றும் அவர் கூறியிருந்தார். கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் நீண்டகால அனுபவம் மிக்கவர்; பாராளுமன்றத்தின் மூத்த உறுப்பினர். ஆகவே, இங்கு நான் கூறுகின்ற விடயங்கள் தொடர்பாக நீங்கள் நன்கு அறிந்திருப்பீர்கள்! இன்று இந்த அரசாங்கத்தினுடைய செயற்பாடுகள் மந்த கதியில் இடம்பெறுகின்றன. அதன் காரணமாக, இலங்கையில் எல்லா இடங்களிலும் கொடுக்கப்படுகின்ற இந்தக் கொடுப்பனவு குறிப்பிட்ட சில பிரதேசங்களில் சிலருக்குக் கொடுக்கப்படாமல் இருக்கின்றது. எனவே, மிகவும் துன்பத்திலும் வறுமையிலும் இருக்கின்ற, தற்போது வாழ்வதற்கு விருப்பமின்றி வாழ்ந்துகொண்டிருக்கின்ற அந்த மக்களுக்கு மத்தியில் இன்று சந்தேகமும் நம்பிக்கையற்ற தன்மையும் உருவாகி வருகின்றது.

ஆகவே, முல்லைத்தீவு மாவட்டத்திலிருக்கின்ற கரைதுறைப்பற்று, புதுக்குடியிருப்பு ஆகிய இரண்டு பிரதேச செயலகப் பிரிவுகளுக்குட்பட்ட 23 கிராம அலுவலர் பிரிவுகளிலும் இருக்கின்ற வறிய மக்களுக்கு மிக விரைவில் சமுர்த்தி நிவாரணம் வழங்கப்படுவதற்கும் தங்களுடைய அமைச்சால் அங்கவீனர்களுக்கு மாதக் கொடுப்பனவாக வழங்கப்பட்டு வருகின்ற 3,000 ரூபாய் கொடுப்பனவு மன்னார் மாவட்டத்திலிருக்கின்ற 888 அங்கவீனர்களுக்கு மிக

[ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා]

විරෙවිල් වලංගුකරවීමට නඩවඩික්කෙ එඩුක්කුමාරු, එංගළුඩෙය මක්කළ් සාර්බාගක් කෙළරව අමෛච්චර් අවර්ගළිඩම් මීණ්ඩුම් විනයමාගක් කේට්ටු, විඩෙපෙරුගින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා.

[பி.ப. 5.52]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சின்கீழ் இயங்குகின்ற சமுர்த்தித் திட்டம் தொடர்பாக முன்வைத்திருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை ஆமோதிப்பதுடன், என் சார்பாகவும் இப்பிரேரணைக்கு வலுவூட்ட விரும்புகின்றேன். சமுர்த்தித் திட்டம் என்பது இந்த அமைச்சின் பெயரில் சொல்லப் பட்டுள்ளவாறு சமூகத்தை வலுவூட்டுவதற்காக, அந்தச் சமூகத்தின் நலன்புரித்திட்டங்களை மேம்படுத்துவதற்காக, குறிப்பாக வறுமையை ஒழிப்பதற்காக, குறைந்த வருமானம் பெறுவோருக்குத் தங்கள் வாழ்வாதாரத்தை உயர்த்திக்கொள்வதற்காக முன்னெடுக் கப்படுகின்ற பல்வேறு வேலைத்திட்டங்களை உள்ளடக்கியது என்பதை நாங்கள் அறிவோம். இந்த அமைச்சு சார்ந்து பாராளுமன்றத்தில் அமைக்கப்பட்டிருக்கின்ற மேற்பார்வைக் குழுவின் அங்கத்தவர் என்ற வகையிலே, இந்த அமைச்சிலிருந்து வருகின்ற அதிகாரிகளிடம் உரையாடும் வாய்ப்பு எனக்குக் கிடைத்திருக் கின்றது. அந்தச் சந்தர்ப்பங்களில் இந்த அமைச்சிற்குக் கீழாக வருகின்ற பல்வேறு நிறுவனங்கள், அவை செயற்படுத்தும் செயற்பாட்டு நடவடிக்கைகள் என்பன பற்றிக் கலந்துரை யாடியதன்மூலம் பல்வேறு சமூக வலுவூட்டல் திட்டங்கள், நலன்புரித் திட்டங்கள் நடைமுறையில் இருப்பதை அறியக்கக்கூடியதாக இருக்கின்றது.

குறிப்பாக, சுயதொழில் செய்வோருக்கு அதன்மூலம் சேமலாப நிதி போன்ற திட்டத்தை வழங்குவதற்கும் அதனூடாக அவர்களுக்குப் பிரதியுபகாரமாக அவர்களது வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கும் உதவி செய்வதற்கான பல திட்டங்கள் இருக்கின்றன. அதேபோன்று, சமுர்த்தி பெறுநர்களாகத் தெரிவு செய்யப்படுபவர்களுக்கு வெறுமனே சமுர்த்தி உதவி மாத்திரமல்லாது அதனோடு தொடர்புடைய தாகப் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் மேற்கொள்ளப் படுகின்றன. குறிப்பாக, குடிநீர்க் கட்டணமாக இருக்கட்டும் அல்லது வேறு ஏதேனும் அரசு சார்ந்த கட்டணங்களாக இருக்கட்டும், அவற்றிலும் பல சலுகைகளைப் பெற்றுக் கொள்வதற்கான வாய்ப்புக்கள் எல்லாம் கிடைக்கின்றன.

ஆனால், கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் முன்வைத்திருக்கின்ற இந்தப் பிரேரணையில், மிக முக்கியமாக ஒரு விடயத்தைக் குறிப்பிட்டுள்ளார். அதாவது, 23 கிராம அலுவலர் பிரிவுகளிலுள்ள மக்களுக்குச் சமுர்த்தித் திட்டம் நடைமுறைப்படுத்துவதில் பல்வேறு சிக்கல்கள் ஏற்பட்டு, முழுவதுமாக அது கிடைக்காமற் செய்யப்பட்டுள்ளது. என்னைப் பொறுத்தவரைக்கும் இங்கு குறிப்பிடப்பட்டிருக்கும் முல்லைத்தீவு மாவட்டத்தின் 23 கிராம சேவகர் பிரிவுகளுக்கு மாத்திரமல்ல, ஏற்கெனவே சமுர்த்தித் திட்டம் நடைமுறையி லிருக்கின்ற பல மாவட்டங்களிலுமுள்ள பல்வேறு கிராமசேவகர் பிரிவுகளிலும் இந்தத் திட்டம் முழுமையாக நடைமுறைக்கு வரவில்லையோ என்கின்ற அச்சம், தெளிவின்மை இருக்கின்றது.

மக்கள் பிரதிநிதிகளான நாங்கள் மக்களைச் சந்திக்கின்றபோது அல்லது நாங்கள் நடத்துகின்ற கூட்டங்களின் பின்னர் மக்கள் எங்களைச் சந்திக்க நேரிடுகின்றபோது, சமுர்த்தி உதவிகளைப் பெறுவதில் எதிர்நோக்கும் சிரமங்கள் தொடர்பாகவும் விண்ணப்பித்தாலும் அது கிடைக்காமல் இருக்கின்ற சிக்கலான நிலைமைகள் தொடர்பாகவும் வயது முதிர்ந்த பிரஜைகள் எங்களிடம் முறையிடுகின்றனர். கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் சொன்னதுபோல அமைச்சர் அவர்கள் கிராமப்புறத்திலிருந்து வந்திருப்பவர்; கிராமத்து மக்களின் இதயத் துடிப்பை அறிந்தவர்; கிராம மக்களின் வாழ்க்கை நிலை எவ்வாறென்பதை அறிந்தவர். ஆகவே, அவரும் இது சம்பந்தமாக அறிந்திருப்பார். இன்று சமுர்த்தித் திட்டம் கிடைக்காமை முழு இலங்கையிலும் அடிமட்ட வாழ்க்கை வாழ்கின்ற மக்களின் பிரச்சினை என்ற வகையில் அதனை முறையான ஒரு திட்டத்தின்கீழ் கொண்டுவந்து உண்மை யிலேயே வறுமைக்கோட்டின்கீழ் வாழ்கின்ற மக்களின் மேம்பாட்டுக்காக, அவர்களின் நலன்புரி விடயங்களுக்காக இந்த நிவாரணம் கிடைக்கும் வண்ணம் அந்தத் திட்டத்தை மாற்றியமைக்கக்கூடிய வகையில் ஒழுங்கமைப்புக்களைச் செய்யவேண்டிய தேவைப்பாடு இருப்பதாக நாங்கள் நினைக்கின்றோம்.

இன்று இந்த நிவாரணம் வழங்குவதில் கிராமசேவகர் பிரிவுகளே கைவிடப்படுகின்ற நிலையில், ஒரு கிராமசேவகர் பிரிவுக்குள் எத்தனை சமுர்த்தி பெறுநர்கள் விடுபடுவதற்கான வாய்ப்பு இருக்கிறது? என்பதுபற்றி நாங்கள் சிந்திக்க வேண்டியிருக்கின்றது. குறிப்பாக, நான் பிரதிநிதித்துவம் செய்கின்ற நுவரெலியா மாவட்டமானது அநேகமாகப் பெருந்தோட்டங்கள் அதிகமாக இருக்கின்ற பிரதேசமாகும். பெருந்தோட்டங்களிலே வேலைசெய்கின்ற தொழிலாளர்கள் குறிப்பிட்டகால தோட்டத்தொழிலுக்குப் பின்னர் ஊழியர் சேமலாப நிதியத்தை மொத்தமாகப் பெற்றுக்கொண்டு தொடர்ந்தும் அந்த தோட்டங்களிலே வாழ்ந்து வருகின்றனர். ஆனால், அவர்கள் வாழ்க்கை பூராவும் உழைத்ததற்காகக் கிடைக்கின்ற ஊழியர் சேமலாப நிதி மிகவும் சொற்ப தொகையாக அல்லது மிகக் குறைந்தளவாக இருக்கின்றது. அப்படியிருந்தும் அந்த ஒரு சேமிப்பையும் தங்களது குழந்தைகளின் கல்விக்காக அல்லது வேறேதேனும் வாழ்க்கைத் தேவைக்காக வழங்கிவிடுகின்றனர். அதன்பிறகு, தனித்து வாழும் இத்தகைய வயோதிபர்கள் மிகக் குறைந்த வாழ்க்கை மட்டத்திலேயே இருக்கின்றார்கள். இந்த நிலையில் அவர்கள் இத்தகைய சமுர்த்தி நிவாரணம்மூலம் மிகச் சிறு தொகையைக்கூட பெற்றுக் கொள்வதில் பல்வேறு துன்பங் களை அனுபவிப்பதை நாங்கள் கண்கூடாகப் பார்க்கின்றோம்.

இன்று வருமான மட்டத்தில் மிகவும் குறைந்த வருமானம் பெறும் மக்களாக அடையாளம் காணப்பட்ட பெருந்தோட்டப் பகுதி மக்களிலிருந்து பல்கலைக்கழகத்திற்குத் தெரிவாகிச் சென்ற மாணவர்களுக்கு மகாபொல புலமைப்பரிசில் மற்றும் பல்கலைக்கழகத்தில் கொடுக்கப்படுகின்ற bursary தொகையும் கிடைக்காதிருக்கின்ற சந்தர்ப்பங்கள் பற்றி அண்மையில்

அவர்கள் எங்களிடம் முறையிட்டார்கள். அந்த மக்களது வருமானம் உயர்ந்த மட்டத்தில் இருப்பதாக அங்கிருக்கின்ற அதிகாரிகள் உறுதிப்படுத்தியதன் காரணமாக, தோட்டத் தொழிலாளர்களின் பிள்ளைகளுக்கு வருமானம் அதிகம் என்கின்ற அடிப்படையில் மகாபொல புலமைப்பரிசில் இல்லாமற்போயிருக்கிறது. கீழ்மட்டத்திலே பணியாற்றக்கூடிய அதிகாரிகள் உரிய முறையில் அணுகி அந்தச் சேவையைப் பெற்றுக்கொடுக்கவில்லை என்பதைத்தான் இந்த நிலைமை காட்டுகின்றது. அமைச்சர் எஸ்.பி. திஸாநாயக்க அவர்கள் இதற்கு முன்பு உயர் கல்வி அமைச்சராகவும் இருந்தவர். பெருந்தோட்டங்களைப் பற்றியும் அறிந்தவர். அந்த வகையில், நான் அமைச்சரின் கவனத்திற்கு இந்த விடயத்தைக் கொண்டுவர விரும்புகின்றேன்.

தோட்டத்தொழிலாளியின் பிள்ளை என்ற வகையில், நான் மகாபொல புலமைப் பரிசில் பெற்றவன். நான் அதனைப் பெற்று இன்று இருபது வருடங்களாகின்றன. நாங்கள் அப்போதைய வருமான நிலையிலிருந்தே அதனைப் பெற்றிருந்தோம். இன்று பெருந்தோட்டப் பகுதிகளிலே வருமான நிலைமை இன்னும் மோசமாகச் சென்று கொண்டிருக்கின்றது. பெரும்பாலான சந்தர்ப்பங்களில் வேலை வாய்ப்புகள் குறைவாகவே இருக்கின்றன. தோட்டங்கள் பல மூடப்பட்டிருக்கின்றன. இருக்கின்ற தொழிலைச் செய்யக் கூடிய நிலையில்தான் அந்த மக்கள் இருக்கின்றார்கள். இந்த நிலையில், அங்கிருந்து பல்கலைக்கழகத்திற்குத் தெரிவாகின்றவர்கள் மிகுந்த சிரமத்திற்கு மத்தியிலேயே தங்களது கல்வியைத் தொடருகின்றனர். இருந்தாலும்கூட, அவர்களது குடும்ப வருமான மட்டம் உயர்வெனச் சான்றிதழ் கொடுத்துவிடுவதன் காரணமாக, உயர் கல்விக்காக பல்கலைக் கழகங்களில் எமது அரசாங்கத்தினால் வழங்கப்படுகின்ற மகாபொல, bursary போன்ற நிதியங்களைப் பெற்றுக் கொள்வதில் அவர்கள் சிரமப்படுகின்றார்கள்.

இது ஒரு புறமிருக்க, அங்கே வறுமைக்கோட்டுக்குக் கீழாக வாழ்கின்ற பல வயோதிபர்களுக்கு அரசாங்கம் வழங்குகின்ற சிறு உதவியைக்கூட பெற்றுக்கொள்வதில் சிக்கல் ஏற்படு கின்றது. அதேநேரம் இந்த அமைச்சின்கீழ் செயற்படுகின்ற நிறுவனங்களின் செயற்பாட்டுத் தன்மையை நாங்கள் அவதானித்திருக்கிறோம். இந்த அமைச்சுக்கு சமூகத்தினை வலுவூட்டல் செய்வதற்கான பல்வேறு வாய்ப்புக்கள் இருக்கின்றன. அந்த வகையில் இந்த அமைச்சின்கீழாக சமூக நலன் சார்ந்த பல்வேறு செயற்பாடுகள் இடம்பெறுவதை நாங்கள் பாராட்டியிருக்கிறோம். அவர்கள் செய்கின்ற பணிகளையும் நாங்கள் மிகுந்த அவதானத்தோடு பார்க்கின்றோம். துறைசார் மேற்பார்வைக் குழுக் கூட்டங் களுக்கு வருகின்ற அதிகாரிகளூடாகத்தான் இத்தகைய சேவைகள் இடம்பெறுகின்றன என்பதை நாங்கள் தெரிந்து கொண்டோம். பிரதேச செயலக மட்டத்தில் அவற்றைச் செயற்படுத்தும்போது அங்கே கீழ்மட்டத்திலே பணியாற்று கின்ற ஊழியர்கள், நேர்மையாகவும் நியாயமாகவும் குறித்த சேவைகளைப் பெற்றுக்கொடுப்பதற்கான நடவடிக்கை களை எடுக்கின்றபட்சத்தில்-கிராம சேவகர் பிரிவு மட்டத்தில் சமுர்த்தி பயனாளிகளைத் தெரிவுசெய்கின்ற பட்சத்தில் இது போன்ற சிக்கல்கள் ஏற்படாதென்பதே எங்களது எண்ணமாகும்.

அந்த வகையில், சமுர்த்தி வேலைத்திட்டமானது அரசாங்கத்தின் வேலைத்திட்டமாக இருக்கின்றபோதும் ஓர் அரசியல் நிகழ்ச்சிநிரலுக்குக் கீழாக இயங்குகின்றதோ என்கின்ற சந்தேகம் மக்களிடத்திலே இருக்கின்றது என்பது குறித்து மக்கள் பிரதிநிதிகள் என்ற வகையில் இந்த சபையிலே சொல்ல வேண்டிய கடப்பாடு எங்களுக்கு இருக்கின்றது. குறைந்த வருமானம் பெறுகின்ற சாதாரண மக்களுக்கு, ஓர் அரசியல் கட்சியைச் சார்ந்து தாங்கள் செயற்பட்டால்தான் - குறித்த ஓர் அரசியல் கட்சிக்கு வாக்களித்தால்தான் சமுர்த்தி கிடைக்கும் என்கின்ற மனநிலை வருகின்ற அளவுக்கு சில அதிகாரிகள் - அனைத்த அதிகாரிகளையும் சொல்லவில்லை - செயற்படுவதன் காரணமாக, இது மக்களிடத்திலே ஓர் அரசியல் சார்ந்த நிகழ்ச்சித் திட்டமாக மாறியிருக்கின்றது என்ற உண்மையை இந்த உயரிய சபையிலே பதிவு செய்ய விரும்புகின்றேன். இது அத்தகைய ஒரு நிகழ்ச்சித் திட்டமாக இல்லையென்பதை நிரூபிப்பதற்கு, சமூகத்தில் இதனைப் பெறத் தகுதியுள்ள அனைத்து மக்களுக்கும் எந்தவித பாரபட்சமும் இல்லாது கிடைக்கக்கூடிய வகையில், சமுர்த்தி நிகழ்ச்சித் திட்டத்தினை நாட்டின் வறுமையை ஒழிப்பதற்கான முக்கியமான ஒரு நிகழ்ச்சித் திட்டமாக அனுபவம்மிக்க ஓர் அரசியல்வாதி என்ற வகையிலே கௌரவ அமைச்சர் அவர்கள் அமுல்படுத்துவார் என நம்புகின்றேன்.

சமுர்த்தி நிவாரணம் பெறுகின்றவர்கள் தொடர்ச்சியாக 10 - 15 வருடங்களுக்கு அதனைப் பெறுகின்றவர்களாக இருந்தால், நாட்டில் வறுமை குறையவில்லை என்பதுதான் அர்த்தம். ஒரே குடும்பத்தினரோ அல்லது ஒரே நபரோ அல்லது குறித்த சில நபர்களோ தொடர்ச்சியாக இந்த அனுகூலங்களைப் பெற்றுவருகிறார்களென்றால், அவர்கள் தொடர்ந்தும் வறுமையிலே இருக்கிறார்கள் என்பதுதான் அர்த்தம். ஆகவே, அங்கு வறுமை நீங்கவில்லை. அப்படியானால் இந்தத் திட்டத்தின் அடிப்படை நோக்கம் இல்லாமல் போய்விடுகின்றது. உண்மையின்படி 20 - 25 வருடங்கள் இந்தத் திட்டம் நடைமுறையில் இருந்தால், இத்தகைய ஒரு திட்டம் தற்போது நாட்டில் இல்லாமலாக்கப்பட்டிருக்க வேண்டும். தொடர்ச்சியாக 25 வருடங்கள் வறுமையை ஒழிப்பதற்காக மேற்கொள்ளப்பட்ட திட்டத்தின்கீழ் வறுமை ஒழிக்கப்பட்டிருக்க வேண்டும். அவ்வாறு இல்லாமல் குறிப்பிட்ட ஒரு பிரிவினர் தொடர்ச்சியாக அந்தச் சலுகைகளை அனுபவித்துக் கொண்டிருக்கிறார்கள் என்றால், வறுமையொழிப்புத் திட்டமாக அல்லாமல், குறிப்பிட்ட சில பிரிவினருக்கு சலுகை வழங்கும் திட்டமாக இது மாற்றம் பெற்றுவிட்டது என்ற ஒரு சந்தேகம் அடிமட்டத்திலே ஏற்படும். எனவே, இன்று அந்தக் கருத்தை மக்கள் மனதிலிருந்து மாற்ற வேண்டிய தேவை ஏற்பட்டிருப்பதால், மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் அதனைக் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவருகின்றோம்.

சமுர்த்தி என்பது ஒட்டுமொத்தமாக குறைந்த வருமானம் பெறுகின்ற மக்களும் அல்லது வறுமைக் கோட்டுக்குக் கீழாக இருக்கின்ற மக்களும் வறுமையிலிருந்து விடுபட்டு வெளியே வருவதற்காகப் பொதுவாக அரசாங்கத்தினால் மேற்கொள்ளப் படுகின்ற ஒரு வேலைத்திட்டமாகும். இப்பொழுது அவ்வாறானதொரு திட்டம்தான் நடைமுறைப்படுத்தப் படுகின்றது என்ற மனப்பாங்கை மக்களிடத்தில் கொண்டுவருகின்ற வகையில் இந்த வேலைத்திட்டத்தைப் பரவலாக நாடு பூராவும் நீதியும் நியாயமுமான முறையில் மேற்கொள்ள வேண்டும். அந்த வகையில் அதிகாரிகளுக்கு உரிய ஆலோசனை வழங்கி இந்தச் செயற்றிட்டத்தின் நிர்வாகத்தை மறுசீரமைத்து முன்கொண்டு செல்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டும் என்று கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 6.03]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා විසින් සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මැතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන ලද අවස්ථාවේ යෝජනාව ස්ථිර කරමින් අපේ හිතවත් තිලකරාජා මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කළා. මම මේ අවස්ථාවට සම්බන්ධ වෙන්නේ සහෝදර ජනතාවට කරන සැලකීමක් හැටියටයි. උතුරේත්, දකුණේත්, නැගෙනහිර ප්‍රදේශයේත් දෙමළ වෙන්න පුළුවන්; මුස්ලිම් වෙන්න පුළුවන්; සිංහල වෙන්න පුළුවන්, මේ රටේ හැම ජනතාවකටම රජයක් වෙනුවෙන් ලබාදෙන සමාජ සුබ සාධන වැඩ පිළිවෙළ ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි.

ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි, 1995 වසරේ මේ වැඩ පිළිවෙළේ නිර්මාතෘවරයා හැටියට ඔබතුමා ඉතාමත් විශිෂ්ඨ සේවාවක් මෙමඟින් සිදු කළා. මේ රටේ පවුල් දහඅට ලක්ෂයක් වෙනුවෙන් සමෘද්ධි වැඩසටහන ගෙනැල්ලා, එදා මේ රටේ දුගී දුප්පත්කම නැති කළා. එම වැඩ පිළිවෙළ තුළින් ඒ අයට අතහිත දීලා ඉදිරියට යන්න පුළුවන් ශක්තිය ගොඩනඟා තිබෙනවා. ඒක අපි අගය කරන්නට ඕනෑ. මේ රටේ අභිංසක, දුප්පත් ජනතාව ගොඩනඟන්නට තිබෙන ඉතාමත් වැදගත් වැඩ පිළිවෙළක් හැටියට අපි එය සලකනවා.

එදා දිවංගත ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා "ජන සවිය" වැඩසටහන ආරම්භ කළා. ඒකත් එක් එක් දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයකට පමණක් සීමා වෙලා තිබුණා. නමුත්, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට, විශේෂයෙන්ම උතුරු, නැගෙනහිර පළාතේ යම් තැනක ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවෙනවා නම්, මේ රටේ සියලුම පක්ෂවලට, සියලුම ජාතීන්ට කන් දෙන රජයක් හැටියට අපි රටේ සෑම ප්‍රදේශයකම එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා, ඒ කටයුත්ත නොපිරිහෙලා ඉටු කරන්නට ඕනෑය කියා මා හිතනවා. ඒ නිසා එතුමා සඳහන් කළ මුලතිව් දිස්ත්‍රික්කයේ, කරෙතුරෙයිපට්ටරු, ඒ වාගේම පුදුක්කුඩ්ඉරුප්පු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ ග්‍රාම නිලධාරි වසම් 23ක සිටින ජනතාව වෙනුවෙන් සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කරන්න බැරි වුණා නම්, අපි ඒ පිළිබඳව ඉතාමත්ම කනගාටු වෙනවා. මම හිතන විධියට ඒ ප්‍රදේශයේ නැවත පදිංචිවීම් සහ අවතැන්වූවන්ගේ නොයෙක් ප්‍රශ්න නිසා එසේ වන්නට පුළුවන්. නමුත්, රජය වසර තුනක කාලයක් ඉක්මවන මේ අවස්ථාවේ ජනතාව වෙනුවෙන් එම කටයුත්ත ඉෂ්ට කරන්නට ගරු අමාත්‍යතුමාට සිත් පහළ වේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ වැඩසටහන ක්‍රියාත්මක කරද්දී ඉතාමත් සද්භාවයෙනුයි කටයුතු කළේ. හැබැයි, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන විට ඒ සඳහා ගමේ නායකත්වය දෙන්න තෝරා ගත්තේ දේශපාලන පත්වීම් හරහායි. ඒක මම කියන්නට ඕනෑ. ඔබතුමාත්, මමත් එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ කටයුත්තට දායක වුණා. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් නම් කරන්නට, ඒ අයට නිර්දේශයන් ලබා දෙන්නට මමත් කටයුතු කළා. යම් කිසි ආණ්ඩුවක් බලයට පත් කරන්න වැඩ කළ පක්ෂයේ ජනතාවට, තරුණ පිරිසට අතදීමක් වශයෙනුයි එහෙම කළේ. නමුත්, ඊට පස්සේ මේ වැඩ පිළිවෙළ දේශපාලනීකරණයවීම පිළිබඳව අපි බොහෝසෙයින් කනගාටු වෙන්නට ඕනෑ. පසුගිය කාල පරිච්ඡේදය තුළ හැම මැතිවරණයකදීම ප්‍රධාන සාධකය බවට පත් වුණේ මේ සමෘද්ධි වැඩසටහනයි.

ඔබතුමා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර දැන් වන විට අවුරුදු 24කට ආසන්න කාලයක් ගත වනවා. අදටත් පවුල් දහහතර ලක්ෂයක් පමණ එයින් ප්‍රතිලාභ ලබනවා. නමුත්, වසර විස්සකට වැඩි කාලයක් තිස්සේ මේ වැඩ පිළිවෙළ අනුව ආදායම් ලබන තත්ත්වයකට පත්වී තිබෙන්නේ පවුල් ලක්ෂ හතරක්, පහක් පමණයි. මේ පිළිබඳව අධ්‍යයනය කළ කෙනෙක් හැටියට මා දන්නා සත්‍යයක් තිබෙනවා. ගම් මට්ටමෙන් පවුල් ලක්ෂ පහකට වැඩි පිරිසක් මෙහි ප්‍රතිලාභ ලබන අතර, තවත් පවුල් ලක්ෂ පහක්, හතක් අතර ප්‍රමාණයක් මේ ප්‍රතිලාභය සඳහා සුදුසුකම් තිබුණත් ඒ අයට ඒ වරම් නිම් වෙලා නැහැ. අවුරුදු විසි ගණනක් තිස්සේ එක රුපියලකින්වත් තමන්ගේ ආදායම වැඩි නොවුණාය කියලා, තවමත් මේ සමෘද්ධි ප්‍රතිලාභය ලබා ගන්නා පිරිස් ඉන්නවා. මේ වන විට මේ සම්බන්ධයෙන් ඔබතුමා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ ගැන සමාලෝචනයක් කරන්න. ඒ එක්කම, එම පවුල්වල සමාජ පසු බිම පිළිබඳ දත්තයන් එකතු කරලා ඒ සම්බන්ධයෙන් අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න නියමිතව තිබුණත්, මම හිතන ආකාරයට ඒකත් අහෝසි වුණා. "සමෘද්ධි සහනාධාරය කපනවා"යි කියලා යම් යම් විරුද්ධ මතධාරීන් අසත්‍ය චෝදනා කරලා, එවැනි විවිධ කටයුතු කළ නිසායි ඒ අවාසනාවන්ත තත්ත්වයට පත් වුණේ. වසර තුනක් තිස්සේ අපට මේ වැඩ පිළිවෙළ ප්‍රතිසංවිධානය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. කෙටි කාලයක් තුළ නැවත මෙය සමාලෝචනයට ලක් කරලා ඒ තුළින් අවශ්‍ය කටයුතු කරන්න ඔබතුමාට පුළුවන්කමක් ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

මා දන්නවා, අපේ ගම් ප්‍රදේශවල සමහර අයගේ ආදායම එදා සමෘද්ධි සහනාධාරය දෙනකොට ලැබුණු ආදායමට වඩා වැඩි වෙලා තිබෙනවාය කියලා. ඒ අය අතර යාන වාහන ලබා ගත් අය ඉන්නවා. ඒ එක්කම ට්‍රැක්ටර් වැනි දේවල් ලබා ගත් අයත් ඉන්නවා.

ඒ විතරක් නොවෙයි. ඉතාමත් අවාසනාවන්ත දේ මෙයයි. පවුලක එක පුද්ගලයකුට රජයේ රැකියාවක් ලැබුණාම -යුද හමුදාවට බැඳුණාම, පොලීසියට බැඳුණාම- ඒ පවුලේ සමෘද්ධි සහනාධාරය කපා හරින අවස්ථා තිබෙනවා. සමහර විට පෞද්ගලික ආයතනයක ලොරි රියැදුරකු වෙන්න පුළුවන්. එය ස්ථිර රැකියාවක් නොවෙයි. ඒ රියැදුරාගේ මාසික වැටුප අනුව සමෘද්ධි සංවර්ධන නිලධාරි ඉතාමත් අවාසනාවන්ත ලෙස, අකාරුණික ලෙස ඒ පවුලේ සමෘද්ධි සහනාධාරය කපා හරින අවස්ථා තිබෙනවා. සමහර විට ඒ හමුදා නිලධාරියා අම්මා, තාත්තා සමඟ එක ගෙදර වෙන්වෙලා සිටිය වුණත් ඒ පවුලේ දරුවකු සමහර විට හමුදාවේ නිලධාරියකු වශයෙන්, හමුදා භටයකු වශයෙන්, සිවිල් ආරක්ෂක භටයකු වශයෙන් රජයේ රැකියාවක් කරනවා නම් ඒ අයගේ පවුලේ අම්මාට, තාත්තාට දෙන සමෘද්ධි සහනාධාරය කපා තිබෙනවා. මා දන්නවා, සමහර තැන්වල ආබාධිත දරුවකු ඉන්න පවුලකට දීපු සමෘද්ධි සහනාධාරය කපා තිබෙනවා. සමහර විට වැන්දඹු කාන්තාවන්ගේ සමෘද්ධි සහනාධාරය කපා තිබෙනවා. ඒ නිසා මෙය මුහුණ බලා

කරන වැඩ පිළිවෙළක් බවට පත් කරන්න එපා. ඇත්ත වශයෙන්ම අවුරුදු විසි ගණනක් තිස්සේ, එකම ගමේ, එකම ග්‍රාම නිලධාරි වසමේ රාජකාරි කරන සමෘද්ධි සංවර්ධන නිලධාරින් ඉන්නවා. ඒ අය සම්බන්ධයෙන් කිසිම අධීක්ෂණයක් කරන්නේ නැහැ. සමහර විට සහකාර අධ්‍යක්ෂවරියක්, සමෘද්ධි කොමසාරිස්වරියක් ඉන්නවා. ඒ අයට මෙය පාලනය කරන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධයෙන් මූලික වශයෙන් කටයුතු කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින ප්‍රධාන නිලධාරියාට පවා මේ පිළිබඳව අධීක්ෂණය කරන්න බැහැ. ඒ බව අපි හොඳටම දැක්කා. පසුගිය කාලය තුළ "දිවි නැඟුම" ජීවනෝපාය වැඩසටහන තුළින් එක පවුලේ දෙතුන්දෙනාට සමෘද්ධි සහනාධාරය දුන්නා. ඒවා වෙනස් කරන්න බලයක් නැහැ. ඒ ලැයිස්තු සියල්ල අවසාන වශයෙන් ලැබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්ටවත් මෙය අධීක්ෂණය කරන්න බැහැ. දේශපාලන බලයෙන් හිස උදුම්මවා ගනිපු, ගමේ ඇටුවන් බැහැපු නිලධාරින් නිසා මෙවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මෙය වහාම වෙනස් කරන්න ඕනෑ. ඉතාමත් සද්භාවයෙන් මේ රටේ ඇති කරන්න ගිය වෙනස ඔබතුමාට ඇති කරන්න බැහැ. එහි අවසානාවන්ත සිද්ධිය තමයි "සමෘද්ධිය", "දිවි නැඟුම" වශයෙන් නම් කිරීම. දිවි නැඟුම කියලා ඒ බැංකුවල තිබුණු මුදල් අයථා විධියට පාවිච්චි කළා. ඒ මූල්‍ය වංචාවන් පිළිබඳව දැනට පරීක්ෂණ කටයුතු කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පත්වීම් පිළිබඳව ගත්තත්, වෙනත් රජයේ නිලධාරින් සඳහා උසස්වීම් පටිපාටියක් තිබෙනවා. මේ රටේ සනීපාරක්ෂක කම්කරුවාට පවා කළමනාකරණ සේවයට යන්න පුළුවන් විභාග ක්‍රමයක් තිබෙනවා. සානුකම්පිකව බැලුවොත් සමෘද්ධි නිලධාරින්ට උසස්වීම් රටාවක් නැහැ.

මේ අයට උසස්වීම් වැඩ පිළිවෙළක් නැහැ. ඔබතුමා හදපු සමෘද්ධි අධිකාරිය වෙනස් කරලා දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව ඇති කරන කොට ඒ අයට දුන්න පත්වීම් ලියුම බලන්න. ඒ පත්වීම් ලියුම තුළ තිබෙන්නේ මොකක්ද? අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් අත්සන් කරපු ලියුම් කැබැල්ලක් තමයි තිබෙන්නේ. ඒක මොන තරම් දුරට වලංගුද කියන ප්‍රශ්නය තිබෙනවා. සමෘද්ධි වැඩ සටහන තුළින් වන්දි මුදල් අරගෙන ගිය අය ඉන්නවා. ඒ වාගේම නොලැබුණ අය ඉන්නවා. ඒ අය තවමත් දුක්ඛිත තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඒ නිසා මෙහි ක්‍රමවත් බවක් තියෙන්න ඕනෑ. කාට වුණත් උසස්වීම් රටාවක් තියෙන්න ඕනෑ. ඒ වාගේම මාරුවීම් වැඩ පිළිවෙළක් නැහැ. ඒ අය හැමදාමත් එක තැන ඉන්න තත්ත්වයකට පත් කර තිබෙනවා. ඒ නිසා මේ සමෘද්ධි වැඩ පිළිවෙළ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. රටක පවුල් දහහතර ලක්ෂයක් කියන්නේ විශාල ප්‍රමාණයක්. පසු ගිය කාලයේ අපට වැරැද්දක් වුණා. මේ පවුල් දහහතර ලක්ෂයට දුන්න සමෘද්ධි සහනාධාරය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් සියයට දෙසියයකින් වැඩි කළා. අපි කවුරුත් කිව්වා, ඒ මුදලින් අඩු ගානේ ගමක තවත් පවුල් 30කට 40කට සමෘද්ධි සහනාධාරය දෙන්න කියලා. පවුල් දහහතර ලක්ෂයකට වැඩි කරලා දෙන කොට, ඒ මුදලින් විසිඅට ලක්ෂයකට දෙන්න පුළුවන්කම තිබුණා. ඒ අවස්ථාව පැහැර හැරියා. ඒක වැරදීමක් වෙන්න පුළුවන්; සද්භාවයෙන් කළා වෙන්න පුළුවන්; වෙනත් ක්‍රමයකට කළා වෙන්න පුළුවන්; සමෘද්ධිලාභීන් සතුටු කරන්න වෙන්න පුළුවන්. නමුත් සමහර දේවල් පිළිබඳව අපි ඉතාමත්ම කනගාටු වෙනවා. ඒ නිසා මේ රටේ තිබෙන මේ වැඩ පිළිවෙළ ඉතාමත් වැදගත්. මේ වැඩ පිළිවෙළ යටතේ නිවාස ලබා දෙනවා. ඒ වාගේම කෙනෙකු මිය ගියාට පසුව වන්දියක් නැත්නම් දීමනාවක් ලබා දෙනවා. ඒ වාගේම මේ සමෘද්ධි වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ක්‍රමයක් තිබෙනවා. සමහර අවස්ථාවල නිවසක් හදා ගන්න බැරි අහිංසක මිනිස්සුන්ට නිවසක් හදලා දීලා සතුටු වෙන්න පුළුවන් අවස්ථා තිබෙනවා. ජීවනෝපාය වැඩ සටහන ඉතාමත්ම වැදගත්. ස්වයං රැකියාවක් කරන, අඩු ගණනේ රුපියල් 1000ක් ණයට ගන්න බැරි, එදිනෙදා කාලා බීලා කාලය ගත කරන දුප්පත් අයට -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව කෙටි කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට මේ පිළිබඳව හොඳ පෘථුල දැනුමක් තිබෙන බව අපි දන්නවා. සමෘද්ධි ව්‍යාපාරයේ නිර්මාතෘවරයා හැටියට කටයුතු කළ ඔබතුමාට අපේ රජය යටතේ නැවත වරක් සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය ලබා දීම තුළින් බලාපොරොත්තු වුණු ප්‍රතිඵලය, බලාපොරොත්තු වුණු ආකාරයෙන්ම ලබා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා මම නැවත වරක් ඉල්ලීමක් කරනවා, මූලතිව් දිස්ත්‍රික්කයේ අහිංසක මිනිස්සුන්ට සමෘද්ධි ප්‍රතිලාභය ලබා දෙන්නය කියා. ඒ වාගේම සමෘද්ධි සහනාධාරය අහිමි වුණු මේ රටේ තවත් ලක්ෂ 5කට, 6කට ආසන්න අහිංසක මිනිස්සු එය ලැබෙන තෙක් බලාගෙන ඉන්නවා. අපේ රජය පත් වෙන කොට ඒ අය කිව්වේ අඩු ගාණේ රුපියල් 400ක, 500ක සමෘද්ධි සහනාධාරය අපට දෙන්න කියන එකයි. ඒ වරප්‍රසාදය තුළ ශිෂ්‍යත්ව ලබා දීම වැනි විවිධ වැඩසටහන් යටතේ ලබා දෙන බොහෝ දේවල් තිබෙනවා. දැන් ඒ සියල්ල අහිමිවෙලා තිබෙනවා. සමහර අය මෙය උපයෝගී කරගෙන ඒ දෙන දේවල් සියල්ල ඉතාමත් අකාරුණික ලෙස සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ ඉදිරියට ඉතාමත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. හැබැයි, අපි මෙහි ප්‍රතිලාභයන් ලබන්න ඕනෑ. මෙයින් ලැබෙන වාසිය තමයි ඒ අයගේ ජීවන තත්ත්වය ඉහළට ගිහිල්ලා, ඒ අයගේ ජීවන රටාව වෙනස් වෙලා, යම් පසු බිමක් තුළ යම් ඉහළ තලයකට යන්න පුළුවන්කමක් ලැබෙන එක. ඒ හැම පවුලකටම සමෘද්ධි සහනාධාරය නැති වෙන්න ඕනෑ. එහෙම නැති වෙන කොට අනෙක් පවුල්වලට දෙන්න ඕනෑ. මෙතැනදී වුණේ එහෙම නොවෙයි. කිසිම දෙයක් වුණේ නැහැ, කිසිම පරිවර්තනයක් වුණේ නැහැ, අවුරුදු විසි ගණනක් තිස්සේ සමෘද්ධි සහනාධාරය ලැබූ මිනිහාම තවදුරටත් ලබනවා. නැති අයට අවුරුදු විස්සක් තිස්සේ අබමල් රේණුවක තරම් දෙයක් සමෘද්ධි වැඩසටහන යටතේ නොලැබෙන අවස්ථා අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා ස්තුතිවන්ත වෙනවා, ගරු චාල්ස් නිර්මලනාදන් මැතිතුමා උතුරු ප්‍රදේශයේ මූලතිව් දිස්ත්‍රික්කයට බලපාන ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම ගැන. දකුණේ අපටත්, නැඟෙනහිර, බස්නාහිර ප්‍රදේශවල ජනතාවටත් ඉතාමත් බහුල ලෙස තිබෙන මෙවැනි ප්‍රශ්න පිළිබඳව ගරු අමාත්‍යතුමා හැටියට තමුන්නාන්සේ සංවේදීව කටයුතු කරාවිය කියා විශ්වාස කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු වන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.15]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුක්කුඩියිරුප්පු සහ කරෙතුරෙයිපට්ටරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ පිහිටි තුලාන 23ක් සඳහා මෙතෙක් සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක නොවීම පිළිබඳව ගරු චාල්ස් නිර්මලනාදන් මැතිතුමා ගෙනා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව යටතේ අදහස් දක්වන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා.

ඇත්තටම යුද්ධය අවසන්වෙලා 2012 වර්ෂය වන විට මුලතිව් දිස්ත්‍රික්කයේ සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වුණා. නමුත් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 65න් වසම් 23කට මේ වන තෙක් සමෘද්ධි සහනාධාරය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක නොවීම තමයි අද මේ යෝජනාවට පාදක වී තිබෙන කරුණ. ඇත්තටම මේ වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරද්දී ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම, සේවකයන් බඳවා ගැනීම, සුදුසුකම් අනුව සේවකයන් තෝරා ගැනීම වාගේම ඒ ප්‍රදේශවල තිබෙන අනෙකුත් භූගෝලීය සාධක සහ ගැටලු ඉස්මතු වෙනවා. ඒ මොනවා වුණත් යහපාලන ආණ්ඩුවක් ඇවිල්ලා අවුරුදු තුනක් ගත වුණත් මේ වැඩසටහන තවමත් ක්‍රියාත්මක නොවීම ගැන හැම දෙනාටම ගැටලුවක් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අවශ්‍ය ප්‍රතිපාදන ලබා දිය යුතුව තිබෙනවාය කියලා. තමුන්නාන්සේලා දන්නවා, අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට විශාල ණය කන්දක් තිබුණු බව. අපි ඒ ණය කන්ද ගෙවන්න පටන් ගත්තා. ඒ වාගේම යහපාලන ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරු විධියට අපි අපේ ප්‍රදේශවලට කරන්නට බලාපොරොත්තු වුණු දේවල් තවමත් කර ගන්න බැරිවෙලා තිබෙනවා. ඒ කටයුතු කොහොම වෙතත්, විශේෂයෙන්ම පසුගිය මැතිවරණවලදී ජන කොට්ඨාසයක් විධියට දෙමළ ජනතාව අපට ලබා දුන් සහයෝගය අපි අගය කරන්න ඕනෑ. ඒ නිසා මේ තුලාන 23හි ප්‍රශ්නය කඩිනමින් විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙස මා දකිනවා. මේ ප්‍රශ්නය විසඳීම සඳහා සේවකයන් බඳවා ගැනීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළින්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව තුළින් වාගේම භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධයෙන් ප්‍රශ්න තියෙන්න පුළුවන්.

"සමෘද්ධි" වැඩසටහන ගැන කථා කරද්දී, ඒක "ජනසවිය" වැඩසටහනින් පටන් ගත්තු එකක් බව කියන්න ඕනෑ. 1994දී එස්.බී. දිසානායක මැතිතුමා අමාත්‍යවරයා බවට පත් වුණාට පස්සේ "ජනසවිය" වැඩසටහන "සමෘද්ධි" සහනාධාර වැඩසටහන බවට පත් වුණා. ඔබතුමා විශාල කාර්ය භාරයක් ඒ තුළ ඉෂ්ට කළා. එදා ඔබතුමන්ලා ඒ ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන සමෘද්ධි අරමුදල රැකගන්න විශාල කර්තව්‍යයක් කළා. සමෘද්ධි බැංකුව ගොඩනැඟුවා. ඔබතුමා සමෘද්ධි වැඩසටහන වෙනුවෙන් විශාල කර්තව්‍යයක් කළා. ඒක නිසා මම විශ්වාස කරනවා, තුලාන් විසිතුනේ ප්‍රශ්නය විසඳගන්න ඔබතුමාට අවශ්‍ය ශක්තිය, ධෛර්ය ඉදිරි කෙටි කාලය තුළ ලැබෙයි කියලා. විශේෂයෙන්ම දෙමළ ජනතාව ජීවත්වන ප්‍රදේශයක මෙවැනි ප්‍රශ්නයක් උද්ගත වෙනකොට අපට ලොකු කනගාටුවක් ඇති වෙනවා.

යහපාලන ගෙනෙනකොට, සහජීවනය ගෙනෙනකොට දෙමළ ජනතාවගෙන් කොටසකට සහනාධාර නැති එක ලොකු ප්‍රශ්නයක් වෙන්නට පුළුවන්. සමෘද්ධි කියන එක සහනාධාරයක් විතරක් නොවෙයි. ඒක එක්තරා සුදුසුකමක්. යම් යම් ප්‍රතිපාදන ලබා දීමේදී, යම් යම් වැඩසටහන්වලට ඇතුළත් කර ගැනීමේදී අඩු ආදායම්ලාභීන් කියන එකට එක් මිනුම් දණ්ඩක් තමයි, සමෘද්ධි සහනාධාර ලැබීම. සමෘද්ධි සහනාධාරය කියන්නේ සහනාධාරයක් විතරක් නොවෙයි. ඒක එක්තරා මිනුම් දණ්ඩක්. ඒ මිනුම් දණ්ඩ තුළින් වෙනත් ආර්ථික ප්‍රතිලාභ ලැබෙන අවස්ථා තිබෙනවා. සමෘද්ධි සහනාධාරය ලැබීම තුළින් ජනතාවගේ දුගීකම දුරු වෙලා තිබෙනවාද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම දුගී නොවන විශාල පිරිසකට සමෘද්ධි සහනාධාරය ලැබෙනවා කියන ප්‍රශ්නයකුත් තිබෙනවා. මේ වෙනකොට සමීක්ෂණ වාර දෙකක් පවත්වලා තිබෙනවා. සමීක්ෂණවලින් හඳුනා ගැනීම් කරලා තිබෙනවා. අපට දැන ගන්නට තිබෙන විධියට යම් යම් තැන්වල විශ්‍රාම වැටුප පවා ලබන සමහර උදවියට සමෘද්ධි සහනාධාරය ලැබිලා තිබෙනවා. ඒවා, ඒ කාලයේ සිදු වුණු දේවල්.

යහපාලන ආණ්ඩුව එන්නට ඉස්සෙල්ලා, දේශපාලනය මූලික කරගෙන, දේශපාලන බලය ලබා ගැනීම සඳහා සමෘද්ධි වැඩසටහන හසුරවපු නිසා ඇති වුණු තත්ත්වයන් එක්ක එහෙම වෙලා තිබෙනවා. අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු විධියට ඉඳගන්නකොට මේ ප්‍රශ්නය එනවා. එවැනි සමහර අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම්වරු පවා දැඩි දුෂ්කරතාවකට මුහුණ දෙනවා.

සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ පසුගිය කාලයේ පාපැදි දුන්නාම, ඒ පාපැදි ගත්ත පුද්ගලයාට මෝටර්සයිකලයක් තිබෙනවා; පාපැදිය ගත්තු පුද්ගලයාට ට්‍රැක්ටරයක් තිබෙනවා. එතකොට සභාවේ ප්‍රශ්නයක් මතු වෙනවා, කොහොමද ට්‍රැක්ටරයක් තිබෙන පුද්ගලයෙකුට පාපැදියක් දෙන්නේ කියලා. සමහර ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඒ සම්බන්ධයෙන් අර්ථකථන දෙන්න උත්සාහ කරනවා. "ට්‍රැක්ටරය තිබෙනවා තමයි. මෝටර්සයිකලයක් තිබෙනවා තමයි. ත්‍රී වීලර් එකක් තිබෙනවා තමයි. හැබැයි, කුඹුරේ නියර දිගේ යන්න පාපැදියක් අවශ්‍යයි." කියලා අර්ථකථන දෙන අවස්ථා තිබෙනවා. අද එතැනට එනතුරු සමෘද්ධි වැඩසටහන ඇවිල්ලා තිබෙනවා. අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු විධියට ඉඳගෙන මේවා අහගෙන ඉන්නකොට අපට පොඩි කනගාටුවකුත් ඇති වෙනවා.

ගරු ඇමතිතුමනි, මේ තත්ත්වය ඉතා ඉක්මනට වෙනස් කරන්න ඕනෑ. මිනිස්සු අපට හිනා වෙනවා. යහපාලන ආණ්ඩුවක් ඇවිල්ලා අපට ඒක කරගන්න බැරි වුණා කියලා හිනා වෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලාට මේ කාරණයත් මතක් කරලා දෙන්නට ඕනෑ. මොන පක්ෂයක් ආණ්ඩු බලයට ආවත් රාජ්‍ය සේවකයා පවතින ආණ්ඩුවට සහයෝගය දෙන්න ඕනෑ කියන දැඩි ස්ථාවරයේ අපි ඉන්නවා. හැබැයි, සමෘද්ධි නිලධාරින් එහෙම නැහැ. ගම් මට්ටමේ ඉන්න නිලධාරින් හතර දෙනාගේම ක්‍රියා කලාපය එහෙම නැහැ. සමෘද්ධි නිලධාරින්, ගොවි නියාමකවරු, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්, ග්‍රාම නිලධාරින් කියන මේ හතර දෙනා තමයි, ගමක ඉන්න නිලධාරින්. එයින් ග්‍රාම නිලධාරින් එක්තරා මට්ටමකින් දේශපාලනයෙන් අයින් වෙලා හිටියාට අනෙක් නිලධාරින් තුන් දෙනාම දේශපාලන වැඩ තමයි කරන්නේ.

පළාත් පාලන මැතිවරණ අවස්ථාවේදී අපි දැක්කා, ඊ තිස්සේ canvassing යන සමහර නිලධාරින්. ඊ තිස්සේ canvassing යන ගොවි නියාමකලා හිටියා. ඒ ගොල්ලන් යහපාලන ආණ්ඩුව දිපු සහනාධාර ගැන කථා කළේ නැහැ. අපි සහන 22ක් විතර දීලා තිබෙනවා. අපේ මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, මහපොළ ශිෂ්‍යත්වය ගැන. මහපොළ ශිෂ්‍යත්වය දෙගුණ කළා. ඒ වගේම

ඖෂධ මිල අඩු කළා. ඒ වාගේම පාසල් දරුවන් ලක්ෂ 45කට සහනාධාර දුන්නා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප, පිං පඩිය, ගර්භිණී මාතාවන්ට දෙනු ලබන දීමනාව දෙගුණ-තෙගුණ කළා. ඒ වාගේම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරලා දෙන්න ඕනෑ. හැමෝටම අමතක වෙලා තිබ්බිච්ච දහම් පාසල් ගුරුවරයාගේ පඩිය රුපියල් 2,000 ඉඳලා රුපියල් 5,000 දක්වා වැඩි කළා. ඒ ඔක්කෝම කරලා තිබෙද්දී පොල් බෑය සහ හාල් කිලෝ එක ගැන ජනතාවට උපදෙස් දුන්නු සමෘද්ධි නිලධාරින් පිරිසක් ඉන්නවා. ඒ ගොල්ලන් ගම් මට්ටමින් ගිහිල්ලා ජනතාවට කිව්වා, "මේ රටේ ජීවත් වෙන්න අමාරුයි. හාල් කිලෝ එකේ ගණන මේකයි. පොල් ගෙඩියේ ගණන මේකයි." කියලා. හැබැයි, අපි දීපු සහන 22 ගැන ජනතාවට වචනයක්වත් කිව්වේ නැහැ. එහෙම පිරිසක් මේක ඇතුළත ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් මතක් කරලා දෙන්න ඕනෑ. අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ සහනාධාර ලැබීමට සුදුසු නැති විශාල පිරිසකටත් මේ සහනාධාරය තවමත් ලැබෙනවා. හැබැයි, සහනාධාර ලැබිය යුතු විශාල පිරිසක් ඒ සහනාධාර ලැබෙන තෙක් තවමත් බලාගෙන ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, එම නිසා උතුරේ ප්‍රශ්න තිබෙනවා වාගේම දකුණේත් ප්‍රශ්න තිබෙනවා; ඒ වාගේම උතුරුමැදත් ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා කරුණාකර ඔබතුමා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා සුදුසු පුද්ගලයන්ට, සහනාධාරය ලැබිය යුතු පුද්ගලයන්ට සහන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න, ගරු අමාත්‍යතුමනි. මේ වන විට වාර දෙකක් සමීක්ෂණ කර තිබෙනවා. ඒවා මඟින් ගැටලු හඳුනාගෙන තිබෙනවා. සුදුසු නැති පුද්ගලයන්ට සහනාධාර දෙන එක නවත්වා සුදුසු පුද්ගලයන්ට ඉතා ඉක්මනින් සහනාධාර ලබා දීමේ ක්‍රියා මාර්ගය අනුගමනය කරන්න ඕනෑ.

පසුගිය කාලයේ මැතිවරණවලදී අපට සහයෝගය දීපු උදවිය මෙවර මැතිවරණයේදී අපට විරුද්ධව කටයුතු කළා, අපේ ආණ්ඩුවත් එක්ක තිබෙන තරහට, සහනාධාර ලැබුණේ නැහැ කියන තරහට. සහනාධාර නොලැබිය යුතු පුද්ගලයන් තවමත් සහනාධාර ලබමින් ඉන්නවා කියන ගැටලුව මුල් කරගෙන, බිම් මට්ටමේ නිලධාරින්ගෙන් වන අසාධාරණකම් මුල් කරගෙන, බිය වැද්දීම් මුල් කරගෙන මෙවර මැතිවරණයේදී යහ පාලන ආණ්ඩුවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරපු විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා මේ කරුණ සාධාරණීකරණය කරන්න, අවුරුදු 3කට ඉස්සර වෙලා අපට බලය ලබා දීපු ජනතාවට සාධාරණයක් ඉටු කරන්න සමෘද්ධි සහනාධාරය ලැබීමට සුදුසු නැති, දුගී නොවන, අඩු ආදායම් ලාභීන් නොවන පවුල්වලට දෙන සහනාධාර නවත්වා ඒ සමීක්ෂණ වාර්තාවලට අනුව මෙතෙක් කල් -අවුරුදු 22ක්- මොකවත්ම ලැබී නැතිව, තවත් අවුරුදු 3ක් අපත් එක්ක බලාගෙන සිටින ජනතාවට සමෘද්ධි සහනාධාර සාධාරණ ලෙස, ඉතා ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා. ඔවුන්ට ඒ සහනාධාර ලබා දුන්නොත් අපට හැකියාව තිබෙනවා බිම් මට්ටමට ගිහින්, ගමට ගිහින් ජනතාවට කියන්න, "තමුන්නාන්සේලාට අවුරුදු 22ක් ලැබුණේ නැති සහනාධාරය අවුරුදු 25කට පසුව -අවුරුදු 3ක් ප්‍රමාද වෙලා හෝ- ලබා දෙන්න අපි කටයුතු කළා." කියා. එසේ නොකිරීම බිම් මට්ටමට දැනෙන, ජනතාවට දැනෙන විශාල අඩුවක්. එම නිසා මේ අඩුව ඉතා කඩිනමින් සම්පූර්ණ කරන්න කියන ඉල්ලීම මම තමුන්නාන්සේගෙන් කරනවා, ගරු අමාත්‍යතුමනි. මේ අඩුව සම්පූර්ණ කරලා මේ රටේ ජීවත් වන සියලු ජාතීන්ට අයත් ජනතාවට ඉදිරියේදී සාධාරණය ඉෂ්ට කරන්න කියාත්, දෙමළ ජනතාවට ඇති වෙලා තිබෙන ප්‍රශ්නය වාගේම ඒ ප්‍රදේශවල සිටින සිංහල, මුස්ලිම් ජනතාව අතරින් සහනාධාර ලැබිය යුතු පුද්ගලයන්ට එකී සහනාධාර නොලැබීම සහ ලැබීමට සුදුසුකම් නැති පුද්ගලයන්ට සහනාධාර ලැබීම කියන දෙක අතර පරස්පරය නැති කරන්න කියාත් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට පිළිතුරු කතාව කිරීමට, ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමා.

[අ. භා. 6.25]

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු වාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම මෙම යෝජනාව ස්ථිර කරපු අපේ ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාට සහ අදහස් ප්‍රකාශ කළ අපේ සියලු මන්ත්‍රීතුමන්ලාටත් මගේ විශේෂ ස්තුතිය පුද කරන්න කැමැතියි. එතුමන්ලා කියූ කාරණා සියල්ලේම ඉතාම වැදගත් තොරතුරු, සත්‍ය තොරතුරු තිබෙන බව මා ඔබතුමන්ලාට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මා කියන්න කැමැතියි, අපේ ගරු මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය ගැන. 2012 වර්ෂයේ ඉඳලා ඒ ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කළත් ඇත්තටම 2016 වර්ෂය වන තුරුම සමෘද්ධි ව්‍යාපාරය ඒ ගම්වලට ගෙන ගිහින් තිබුණේ නැහැ. ඒ නිසා ඒ ගම්වල සමෘද්ධි නිලධාරින් සිටියේ නැහැ. ඒ වාගේම සමෘද්ධි කළමනාකරුවන් සිටියේ නැහැ. ඒ නිසා පළමුවන ප්‍රශ්නය වුණේ අදාළ තොරතුරු ප්‍රාදේශීය ලේකම් හරහා අප වෙත ගෙන්වා ගන්නේ කොහොමද කියන එකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය ප්‍රශ්නය මතු කරපු වෙලාවේම මා මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා සංවර්ධන කමිටුවලට ගිහින් බැලුවොත් සත්‍ය වැටහේවි. දිසාපතිවරුන්ට, අපේ කොමසාරිස්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට අපි කිව්වා "ඒ තොරතුරු අපට වහාම එවන්න." කියා. හැබැයි ඒ අයට ඒ තොරතුරු එවන්න බැහැ. මොකද, සමෘද්ධි යන්ත්‍රණයක් ඒ ප්‍රදේශයේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලතිව් දිස්ත්‍රික්කයට සමෘද්ධි කළමනාකරුවන් 34දෙනෙකු අවශ්‍යයි. ඒ නිසා අප කළේ මේකයි. අපට තිබෙන පුරප්පාඩුවලින් කොටසක් බොහොම අමාරුවෙන් අනුමත කරවාගෙන අද වනකොට **ඒ** තැන්වලට 18දෙනෙකු දමාගෙන තිබෙනවා. අනුමත කරපු නිලධාරින්ගේ ප්‍රමාණය අනුව තමයි අපට ඒක කර ගන්න පුළුවන් වුණේ.

දෙවන කාරණය මේකයි. අපට අවශ්‍ය සමෘද්ධි නිලධාරින් 304දෙනාගෙන් 149දෙනෙකු අලුතින් පත් කර ගන්න අපට පුළුවන් වුණා. අපි ඒ අය පුහුණු කරලා පසුගිය මාසය වනකොට අදාළ ප්‍රදේශවලට යොමු කළා. ඒ නිසා මම හිතන්නේ ප්‍රාදේශීය ලේකම්වරුන්, දිසාපතිවරුන් -ඔබතුමාගේ මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් අපි අදත් මේ අය එක්ක කථා කළා,- දැන් මේ තොරතුරු අපට සකස් කර එවන්න සූදානම් වෙනවා. ඒ අතරම අපි මේ ඉතිරි පුරප්පාඩු ටිකත් පුරවන්න කටයුතු කරනවා.

[ගරු එස්.බී. දිසානායක මහතා]

ඇත්තටම, මේ හැම දිස්ත්‍රික්කයකම ඉගෙන ගත්ත දරුවන් ඉන්නවා; රැකියා නැති උපාධිධාරිනුත් ඉන්නවා. සමෘද්ධි නිලධාරින් හැටියට පත් කර ගන්න, කළමනාකරුවන් හැටියට පත් කර ගන්න පුළුවන්. ඒ නිසා මේ පත්වීම් ටික අනුමත කර ගන්න අපි කටයුතු කරමින් යනවා. ඒ නිසා මේ තොරතුරු ටික අපි කොහොම හෝ ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිසාපතිවරුන් හරහා ගෙන්වා ගන්න ඕනෑ. එහෙම නැතිව රජයේ මුදල් කාටවත් දෙන්න කිසිසේත් අපට බැහැ. ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් එහෙම නැත්නම් දිසාපති මේ වගකීම භාර ගන්නම ඕනෑ. ඒ අයගේ සහතිකයක් නැතිව අපට මේක දෙන්නම බැහැ. ඒ නිසා මම ඔබතුමන්ලාටත් කියන්න කැමැතියි, ප්‍රාදේශීය සංවර්ධන සභා රැස්වීම්වල-

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවුරුද්දෙන් ඉස්සෙල්ලා මම මූලතිව් දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ඒ අදාළ ලියුම්වල copies සහ සියලුම විස්තර අරගෙන අධ්‍යක්ෂ ජනරාල්තුමාට ගෙනැල්ලා දුන්නා. ඔබතුමා දැන් කියනවා නේ, "Documents නැහැ" කියලා. අවුරුද්දෙන් ඉස්සෙල්ලා මම මූලතිව්, District Development Committee එකට ගිහිල්ලා මේ ගැන දිගටම කථා කළා. "ඔයගොල්ලන් අමාත්‍යාංශයට යවපු ලිපියේ copy එකක් මට දෙන්න" කියලා, ඒක අරගෙන ඇවිල්ලා හිටපු ජනරාල්තුමාට මම දුන්නා. ඔබතුමා දැන් "Details නැහැ" කියලා කියපු එක -

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මට අදත් එවා තිබෙන ලේඛනය අනුව තිබෙන්නේ, මෙම ඉල්ලීම සලකා බලා මෙම සමෘද්ධි සහනාධාර ලබා දීමට යෝජිත පුද්ගලයන් පිළිබඳ විස්තර එම ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් මඟින් ලබාගෙන තමන් වෙත ඉදිරිපත් කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්තුමා අදාළ අයට දැනුම් දීලා තිබෙනවා කියලායි. තවමත් මේ තොරතුරු ලැබෙමින් පවතිනවා. ඒ නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි,-

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, මේ ලියුම දීලා තිබෙන්නේ කවදා ද? අද ද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අද නේ මට මේ උත්තරය දෙන්නේ. අද මේ උත්තරය දෙන්නේ "අපි මේ තොරතුරු ඉල්ලා තිබෙනවා. තවමත් ඒවා ලැබෙමින් පවතිනවා. මේ තොරතුරු ආපු ගමන් මේ සහනාධාර දෙන්න ආරම්භ කරනවා" කියලායි. ඒක පළමුවැනි කාරණය. හැබැයි, ඔබතුමා ඔය ගෙනැල්ලා දුන්නු තොරතුරු ඇතුළත් document එක නිල වශයෙන් ගෙනා එකක් නම්, ප්‍රාදේශීය ලේකම්වරු අනුමත කරපු එකක් නම් මම අදම ඒක බලනවා. මම ගිහිල්ලා ඒ නිලධාරින් එක්ක කථා කරලා බලනවා. මේ සහාවේ රජයේ නිලධාරින් සඳහා වෙන් කළ කුටියේත් ඒ අය ඉන්නවා. මොකද, ඒ තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරුන් අනුමත කරලා එව්වොත් අපට බොහොම ඉක්මනින් භාණ්ඩාගාරයෙන් මුදල් අරගෙන ඒ වැඩේ කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේ සිට මෙම වැඩසටහන ක්‍රියාත්මක වුණා කියලා ඔබතුමා කිව්වාට අදාළ නිලධාරින් නොමැතිකම නිසා මේ ව්‍යාපාරය ඒ ප්‍රදේශයේ පටන් අරගෙනම තිබුණේ නැහැ. තවම ඒ පැත්තේ සමෘද්ධි බැංකු නැහැ; සමෘද්ධි නිලධාරින් නැහැ. මේ නිලධාරින් ටික පත් කරගෙන මේ කටයුත්ත පටන් ගැනීම පිළිබඳ ප්‍රමාදයක් තිබෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, අදාළ නිලධාරින් නැතිකම නිසායි. ඒක තමයි පළමුවැනි දේ. ඒ නිසා මේ අය පත් කිරීමේ කටයුත්තේ කොටසක් අපි බොහොම අමාරුවෙන් අනුමත කර ගත්තා. ඉතිරි කොටසත් අපි අනුමත කරගෙන මේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න කටයුතු කරනවා.

අපේ ගරු මන්ත්‍රීවරුන් කියාපු ඊළඟ කාරණය තමයි මේ සහනාධාර නුසුදුස්සන් ගැනීම හා සුදුස්සන්ට නොලැබීම පිළිබඳ ප්‍රශ්නය. මේ ප්‍රශ්නය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මට මේ ගැන කරුණු කියා තිබෙනවා. අපි මේක පිළිබඳව ඉතාම හොඳ සමීක්ෂණයක් කළා. අපේ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා -ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා- කියාපු කාරණය සම්බන්ධයෙන් ගත්තොත්, ඇත්තටම, මාසය පුරා වැඩ තිබෙන වතුවලට අපි කවදාවත් සමෘද්ධි සහනාධාරය දුන්නේ නැහැ. හැබැයි, දැන් වත්තේ වැඩ නැති, සමෘද්ධිය ලැබිය යුතු විශාල පිරිසක් ඉන්නවා. දැන් මේ පිළිබඳව අපි කරපු සමීක්ෂණ වාර්තාව ආපුවාම ප්‍රතිඵලය වුණේ, එක පාරටම සමෘද්ධි සහනාධාර ලබාපු තුනෙන් එකකට විතර ඒ සහනාධාර නැති වෙලා අලුතින් තුනෙන් එකක් ඒකට ඇතුළත් වීමයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් රටේ පොඩි කලබලයක් ඇති වුණා. ඒක සංවිධානාත්මකව ඇතැම් සමෘද්ධි නිලධාරින් විසින්ම මෙහෙයවුවා. ඒ නිසා අමාත්‍ය මණ්ඩලය මට්ටමින්ම ඒක නතර කරන්න කියලා කිව්වා. හැබැයි, ඇත්තටම තව පොඩි ප්‍රශ්නයකුත් තිබුණා.

මොකද, මේ සමීක්ෂණය සම්බන්ධයෙන් තොරතුරු පරිගණකගත කිරීමේදී සමහර තැන්වල බරපතළ වැරදි කරලා තිබුණා. දැන් මේ කටයුතු සියල්ලම අපි අවසන් කරලා, සමීක්ෂණ වාර්තාව නිවැරදි කරගෙන, අලුතින් සහනාධාර දිය යුතු සහ සහනාධාර නොලැබිය යුතු අය පිළිබඳව තොරතුරු ඒක රාශි කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, යම් කෙනෙකුගේ ආදායම වැඩිවෙන කොට අපට ඒක දැනුණු ගමන් සහනාධාර ලබා දෙන එක නවත්වනවා කියන එක. හැබැයි, ඔහු සමෘද්ධි ව්‍යාපාරයෙන් ඉවත් කරන්නේ නැහැ. ඔහු බැංකුවේ ගනු දෙනුකරුවෙක් හැටියට ඉන්නවා; කුඩා කණ්ඩායමේ ඉන්නවා; සමෘද්ධි සමිතියේ ඉන්නවා. හැබැයි, ඔහුගේ අතට මුදලක් හම්බ වෙන්නේ නැහැ. එවැනි විශාල පිරිසක් ඉන්නවා. ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම, ගාලු දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේම ලොරි තබාගෙන, ට්‍රැක්ටර් තබාගෙන ඉතාම හොඳින් ව්‍යාපාර කටයුතු කරගෙන යන අය ඉන්නවා. නමුත්,

ඔවුන් සමෘද්ධිය එක්කත් ඉන්නවා. ඒ අය සවිබල ගැන්වුණු පවුල් හැටියට සමෘද්ධි ව්‍යාපාරයත් එක්ක දිගටම වැඩ කරගෙන යනවා. ඒ නිසා මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, අපට අවශ්‍ය සමෘද්ධි කළමනාකරුවන් 900 ගණනකගේ හිඟයක් ලංකාව පුරා තවමත් තිබෙන බව. අපට 2,700 ගණනක සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ අඩු පාඩුවක් තවමත් තිබෙනවා. ඒ සංඛ්‍යාව අපි ක්‍රමානුකූලව පුරවාගන්න ඕනෑ. වැඩිහිටි සහනාධාරය, ඒ වාගේම ආබාධිත සහනාධාරය පිළිබඳව නුවරඑළියේ මන්ත්‍රීතුමා කිව්වා. මුළු ලංකාව පුරාම වැඩිහිටි සහනාධාර ලබා ගන්නා අය ලක්ෂ 4ක් ඉන්නවා. හැබැයි, ප්‍රාදේශීය ලේකම්වරු අනුමත කරපු, දිසාපතිවරු අනුමත කරපු, මේ සහනාධාරය ඉල්ලන තවත් 170,000ක පිරිසක් ඉන්නවා. ක්‍රමානුකූලව, ටික ටික හෝ එම සහනාධාරය ලබාදීම සඳහා මුදල් අනුමත කර ගන්න උත්සාහ කළත් අපට ඒක කර ගන්න බැරි වුණා. ඒක තමයි ඇත්ත කාරණය. එසේ සහනාධාරය ඉල්ලන අයගෙන් සුළු පිරිසකට හෝ ලබා දෙන්න තමයි අපි උත්සාහ කළේ. 10,000කට, නැත්නම් 15,000කට හෝ ලබාදෙන්න තමයි අපි උත්සාහ කළේ. හැබැයි, ඒක කර ගන්න බැරි වුණා.

මේ අවස්ථාවේදී ආබාධිත දීමනාව ගැනත් මම කියන්න ඕනෑ. අපි රුපියල් 3,000ක ආබාධිත දීමනාවක් ගෙවන්නේ ලංකාවේම 31,000කටයි. හැබැයි, තව 80,000ක් දෙනා ආබාධිත දීමනාව ඉල්ලනවා. අවශ්‍ය මුදල් අනුමත කරගෙන වසරකට රුපියල් 10,000ක් හෝ රුපියල් 15,000ක් හෝ බැගින් ටික දෙනෙකුට හෝ මේ ආධාරය ලබාදෙන්න මම උත්හාස කළා. හැබැයි, මට ඒකත් කර ගන්න බැරි වුණා. ඇත්තටම වැඩිහිටි දීමනාව ලැබිය යුතු තව පිරිසක් ලංකාවේ ඉන්නවා. ඒ සඳහා අපට මුදල් නැහැ. ඒ නිසා ලබා දෙන්න විධියක් නැහැ. ඒ වාගේම ආබාධිත දීමනාව ලබාදිය යුතු පිරිසකුත් ලංකාවේ ඉන්නවා. ඒ අය කවුද කියලා තෝරලා තිබෙන්නේ. හැබැයි, අපට ඒක කර ගන්න විධියක් නැහැ.

සමෘද්ධි ව්‍යාපාරය තුළ පසුගිය කාලයේ ඇති වුණු අඩු පාඩුකම්වලට සහ ඕනෑවට වඩා දේශපාලනීකරණය වීමට ප්‍රධාන හේතුව තමයි, ඒක "දිවි නැහුම" බවට පත් කරලා ඒ මුළු ව්‍යාපාරයෙන්ම ප්‍රාදේශීය ලේකම් සහ දිසාපති ඉවත් කිරීම. ඊට පස්සේ කලාපයක් හදලා, අධ්‍යක්ෂවරු හැටියට එතැනටත් දේශපාලන පත්වීම් කිහිපයක් දීලා, ඒ අය හරහා මෙම ව්‍යාපාරය පාලනය කළා. අපි ඒක අහෝසි කරලා දැම්මා. ඒ නිසා දැන් නැවතත් ප්‍රදේශයේ සම්පූර්ණ බලධරයා වන්නේ ප්‍රාදේශීය ලේකම්. නුසුදුස්සෙක් සමෘද්ධිය ගන්නවා නම්, ඔබතුමන්ලාගේ කොටියාසයේ ප්‍රාදේශීය ලේකම්ට ඕනෑම වෙලාවක ඒක ඉවත් කරන්න පුළුවන්. ඒ වාගේම සමෘද්ධිය ලැබිය යුතු සුදුස්සෙක් ඉන්නවා නම් ඔහුට සමෘද්ධිය ලබා දෙන්නත් පුළුවන්. ඒක ඕනෑම වෙලාවක එතුමාට කරන්න පුළුවන් දෙයක්. ඒ සඳහා ඔහුට කාගේවත් අවසරයක් අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමනි, ඇමතිවරයාට ඕනෑ කෙනාට, මන්ත්‍රීවරයාට ඕනෑ කෙනාට තමයි සමෘද්ධි සහනාධාරය ලබා දෙන්නේ. ඇමතිවරු කියනවා, "මෙයාගේ සමෘද්ධිය කපන්න එපා, අහවලාට දෙන්න" කියලා. ගරු ඇමතිතුමනි, ඒ විධියට තමයි කරන්නේ. අපේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවේ කට්ටියට ඡන්දය දෙන්නේ නැත්නම් සමෘද්ධිය කපනවා කියලා අපේ ප්‍රදේශයේ ජනතාව හිතනවා. එහෙම තමයි මිනිස්සු හිතාගෙන ඉන්නේ. ඒ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

හැබැයි, ප්‍රාදේශීය ලේකම්තුමාට බලපෑම් කරලා සමෘද්ධිය වෙනස් කරන්නවත්, සමෘද්ධිය ලබා දෙන්නවත් ඇමතිවරයාට හෝ මන්ත්‍රීවරයාට පුළුවන්කමක් නැහැ. [බාධා කිරීමක්] ඒක තමයි. ඔබතුමන්ලාගේ සංවර්ධන සභාවේදී ඒ තත්ත්වය වෙනස් කර ගන්න ඕනෑ. කවුරුන් හෝ නුසුදුස්සෙකුට සමෘද්ධිය දෙනවා නම්, සංවර්ධන සභාවේදී නිවැරදිව පෙන්වලා ඒක ඉවත් කරලා, එය වෙනත් ලැබිය යුතු කෙනෙකුට දෙන්න කියලා ප්‍රාදේශීය ලේකම්ට කියන්න ඔබතුමන්ලාට පුළුවන්.

ඒ වාගේම, කිසියම් නුසුදුස්සෙක් වැඩිහිටි දීමනාව ගන්නවා නම්, ප්‍රාදේශීය සංවර්ධන සභාවේදී හරියටම ඇඟිල්ල දිගු කරලා ප්‍රාදේශීය ලේකම්වරයාට කියන්න ඔබතුමන්ලාට පුළුවන්, "ඒක සුදුස්සාට දෙන්න" කියලා. දේශපාලන අතපෙවීම්වලට ඉඩ දෙන්න එපා. මොකද, ප්‍රාදේශීය සංවර්ධන සභාවට සම්පූර්ණ බලය තිබෙනවා මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරයාට කියන්න. ප්‍රාදේශීය සංවර්ධන සභාවට පුළුවන් ප්‍රාදේශීය ලේකම්වරයාට කියන්න, "මේක බලන්න, මෙතැන වැටුප් ලබන අය ඉන්නවා; මෙතැන ආදායම් ගන්න අය ඉන්නවා; මෙතැන මේ අයට ලොරියක් තිබෙනවා; මෙයාගේ ආදායම මේච්චරයි; මේ සමෘද්ධි සහනාධාරය, නැති කෙනෙකුට දෙන්න" කියලා. ඒක කියන්න සම්පූර්ණ බලය තිබෙනවා. ඒ නිසා මම කරුණාවෙන් අපේ මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, නුසුදුස්සන්ට සමෘද්ධි සහනාධාරය දෙනවා නම් ඒ අය හරියටම හඳුනාගෙන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී ඒක වෙනස් කර ගන්න කියලා. ඒක වෙනස් කර ගන්න පුළුවන්. දැන් මේ සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව අපි ක්‍රමානුකූලව සුදුස්සන්ට සමෘද්ධිය දීම සඳහාත්, නුසුදුස්සන්ගේ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීම සඳහාත් කටයුතු කරගෙන යනවා. නමුත්, ඔවුන් දිගටම සමෘද්ධි ව්‍යාපාරයේ තියාගන්න මේ වැඩ කටයුත්ත ගෙනියන්න උත්සාහ කරනවා.

ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා පත්වීම් පිළිබඳ කාරණයක් කිව්වා. ඇත්තටම උසස්වීම් ක්‍රමයක් දැන් අපි හදලා තිබෙනවා. දැන් සමෘද්ධි නිලධාරීන්ට ශ්‍රේණි උසස්වීම් තුනක් තිබෙනවා. ඒ වාගේම, මේ අයට මැනේජර්ලා වෙන්න පුළුවන්. ඒ වාගේම මැනේජර්ලා 497දෙනෙක් දැන් අපි සහකාර අධ්‍යක්ෂවරු බවට පත් කරන්නත් කටයුතු සකස් කොට තිබෙනවා. මේ අයගේ ශ්‍රේණි උසස්වීම් සහ තනතුරු උසස්වීම් දෙකක්ම දැන් හදලා තිබෙනවා. පසුගිය කාලයේ එහෙම තමයි තිබුණේ. හැබැයි, ඒක අපි සම්පූර්ණයෙන්ම හදලා තිබෙනවා. පත්වීම් ලිපි ගැන ගරු මන්ත්‍රීතුමා කිව්වා. පත්වීම්වල තිබුණු ඒ ප්‍රශ්නයත් අද අපි විසඳලා තිබෙනවා. නිවැරැදිව ඔවුන්ගේ පත්වීම් ලබා දෙන්න අපට අධිකරණමය ක්‍රියා මාර්ග පවා ගන්න සිද්ධ වුණා. නොයෙකුත් දේවල් කර ගන්න වුණා. කොහොම හරි ඒකත් අපි දැන් අවසාන කරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා මම හිතන විධියට ඒ පත්වීම් සම්බන්ධ ප්‍රශ්නයත් දැන් අවසන්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියපු ආකාරයට යම්කිසි කෙනෙකුගේ සමෘද්ධි සහනාධාරය කපන්න හෝ යම්කිසි කෙනෙකුට සමෘද්ධි සහනාධාරය ලබාදීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරු ඒ තරම් මැදිහත් වෙන්නේ නැහැ. මොකද, ඔය සමීක්ෂණය නිසා ඒ අය මේක කල් මරලා තිබෙනවා. ඒ අය කියන්නේ, "සමීක්ෂණය කරනවා; ඒකෙන් පස්සේ තමයි තීරණය කරන්නේ." කියලා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

නැහැ, නැහැ, සියලුම සමීක්ෂණ තොරතුරු ඔවුන් ළඟ තිබෙනවා. මෙවා පරිගණකයට ඇතුළත් කිරීමේදී වෙච්ච වැරැදීම් දැන් නිවැරැදි කරමින් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා දැන් තොරතුරු තිබෙනවා. හැබැයි මන්ත්‍රීතුමා, ඔබතුමාට කෙළින්ම ඇඟිල්ල දිගු කරලා අහන්න පුළුවන්, "මෙන්න මෙයා අහවල් ගමේ අහවල් එක්කෙනා. පියසේනගේ සහනාධාරය කොහොමද එයා ගන්නේ? එයාගේ ගෙදර මෙන්න මෙහෙම වැටුප් ලබන අය ඉන්නවා. එයාට මෙච්චර ආදායමක් තිබෙනවා. එයාට ලොරියක් තිබෙනවා. කොහොමද එයා මේ සහනාධාරය ගන්නේ?" කියලා. ගමේ නිලධාරියා ඒ වාර්තාව එවන්නේ නැත්නම් ගමට නිලධාරියෙක් යවලා වාර්තාවක් අරගෙන වහාම ඒක වෙනස් කරන්න පුළුවන්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු ඇමතිතුමනි, මේ නිලධාරීන්ට යම්කිසි මාරුවීම් ක්‍රියා පටිපාටියක් අවශ්‍යයි. අවුරුදු 20ක් තිස්සේ එකම තැන ඉන්න අය තවමත් ඉන්නවා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

නැහැ, ඒකත් එහෙම නැහැ. පසුගිය අවුරුද්දේ මේ සියලුදෙනාම මාරු කළා. කිසි කෙනෙක් එක තැනක තිබ්බේ නැහැ. සියලුදෙනා මාරු කළා. මේ අවුරුද්දේ දැන් ආපහු අලුත් මාරුවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න යනවා. ඒ නිසා ඔබතුමා හොඳට බලන්න සියලුදෙනා මාරු කළා. එක්කෙනෙක්වත් එක තැන තිබ්බේ නැහැ. හැමදෙනාම මාරු කළා. ඒ මාරුවීමේ ක්‍රියා පටිපාටියත් හරියටම ක්‍රියාත්මක වෙමින් යනවා. ප්‍රධාන දේ තමයි, පසුගිය කාලයේ මේ ව්‍යාපාරයෙන් දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු සම්පූර්ණයෙන්ම අයින් කරලා තිබුණු එක. දැන් ඒ අය ආපහු මේ වැඩේ බාර අරගෙන තිබෙනවා. දිස්ත්‍රික්කයේ සමෘද්ධි කොමසාරිස්වරයෙක් ඉන්නවා. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා හැටියට දිසාපතිවරයෙක් ඉන්නවා. එම ප්‍රදේශයේ සමෘද්ධි ව්‍යාපාරයේ බලධරයා හැටියට ප්‍රාදේශීය ලේකම් ඉන්නවා. ඒ නිසා 2005 ඉඳලා 2015 දක්වාම තිබුණු ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම අපි වෙනස් කරලා, 2005ට කලින් තිබුණු ක්‍රමයට නැවත මේ වැඩේ ප්‍රාදේශීය ලේකම්වරු හරහා දිසාපතිවරුන්ට දීලා තිබෙනවා. ඒ අය ඇත්තටම දැන් මේ ව්‍යාපාරය හදාගෙන යනවා. බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාටත් බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.41ට, 2018 මාර්තු 21 වන බදාදා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.41 மணிக்குப் பாராளுமன்றம், 2018 மார்ச் 21, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.41 p.m. until 1.00 p.m. on Wednesday, 21st March, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 259 - இல. 6
Volume 259 - No. 6

2018 මාර්තු 21 වන බදාදා
2018 மார்ச் 21, புதன்கிழமை
Wednesday, 21st March, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
භූගත ජලය අසීමිත භාවිතයෙන් සිදු කරන පරිසර හානිය

කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත:
දෙවනවර කියවන ලදි.

විදේශ විනිමය පනත:
නියෝග

කල් තැබීමේ යෝජනාව:
ත්‍රිවිධ හමුදාවට ආහාර සැපයීමේ ටෙන්ඩරය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
நிலத்தடி நீரின் அதீத பாவனையால் ஏற்படும் சுற்றாடல் பாதிப்பு

கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபையில் ஏற்பட்ட சிக்கலான நிலைமை

கொழும்பு பங்குத் தொகுதிப் பரிவர்த்தனையைப் பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்:
இரண்டாம் முறை மதிப்பிடப்பட்டது

வெளிநாட்டுச் செலாவணிச் சட்டம்:
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
முப்படையினருக்கு உணவு வழங்கும் கேள்விப்பத்திரம்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Environmental Damage Caused by Over-abstraction of Groundwater

Problematic Situation Arisen in Agricultural and Agrarian Insurance Board

DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL:
Read a Second time

FOREIGN EXCHANGE ACT:
Regulations

ADJOURNMENT MOTION:
Tender for Supply of Food to Tri-forces

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මාර්තු 21 වන බදාදා
2018 மார்ச் 21, புதன்கிழமை
Wednesday, 21st March, 2018

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 01.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XII හා XIII කොටස්, හයවැනි කාණ්ඩයේ VIII, IX හා XIV කොටස් සහ දසවැනි කාණ්ඩයේ VI කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprises and Kandy Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධන හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා හා ගිණුම් ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්.

එම වාර්තා තිරසර සංවර්ධන හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, කාරක සභා වාර්තා පිළිගැන්වීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 5වැනි වාර්තාව - 2017.03.01 සිට 2017.06.30 දක්වා- එම කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විසින් පිළිගැන්වීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පස්වැනි වාර්තාව (2017.03.01 සිට 2017.06.30) හැටියට මෙම වාර්තාව මම ගරු සභාවට ඉදිරිපත් කරනවා. මේ වාර්තාවේ අපි වෙනස්කමක් කළා, ගරු කථානායකතුමනි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අපේ නිර්දේශවලට ඒ ආයතනවලින් ලබා දෙන ප්‍රතිචාරයනුත් අපි සටහනක් හැටියට මේ වාර්තාවේ 135වැනි පිටුවේ ඇතුළත් කරලා තිබෙනවා. මේ පරීක්ෂණ කරන කාල සීමාව තුළදීම අපි ඉදිරිපත් කරන ආයතනවලින් ආයතන 5ක් සියයට සියයක්ම අපේ නිර්දේශවලට ප්‍රතිචාර දක්වලා තිබෙනවා. ආයතන 4ක් අපේ නිර්දේශවලට කිසිදු ප්‍රතිචාරයක් දක්වලා නැහැ. ඒ නිසා ඉදිරියේදී මේ වාර්තා පිළිබඳව විවාද කරන අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාට මේ තත්ත්වයත් ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියලා මම හිතනවා. මේ වාර්තාවලට අදාළ කරන ප්‍රතිචාර ඉතා ඉක්මනින් ඒ ආයතනවලින් ලබාගෙන එලදායී විවාදයක් කරන්න අපි බලාපොරොත්තු වනවා. දැනට අපි මෙම වාර්තා පහට අමතරව හයවැනි වාර්තාව හැටියට බැඳුම්කර වාර්තාවත් ඉදිරිපත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි විවාද කළ යුතු වාර්තා කිහිපයක්ම තිබෙනවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරලා, ඉතා ඉක්මනින් මේ වාර්තා පිළිබඳව විවාද කරන්න දිනයක් ලබා දෙන්න කියන කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මෙම වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාපතිතුමා, අපි දැනටමත් අවධානය යොමු කරලා ගරු මුදල් අමාත්‍යතුමාත්, මුදල් ලේකම්තුමාත්, අපේ රාජ්‍ය ඇමතිතුමාත් සාකච්ඡා කරලා, මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙන් කීප විටක්ම අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදීත් මේ සඳහා අවස්ථාවක් ලබා දිය යුතුයි කියන මතයේ අපි ඉන්නවා. ඉදිරි කාලයේදී ඒ වාර්තා දෙකම - COPE සහ COPA වාර්තා - සම්බන්ධයෙන් විවාද කරන්න අවස්ථාව ලැබේවි.

මීළඟට, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින් පිළිගැන්වීම.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෙත්සම් පිළිගැන්වීම.
ගරු ටී. බී. ඒකනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය : විස්තර
பிரம்பு சார்ந்த உற்பத்திக் கைத்தொழில் : விபரம்
CANE CRAFT INDUSTRY: DETAILS

690/'16

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළෙඳ පොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය මඟින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වේවැල් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂය තුළ ලබාගත් ආදායම කොපමණද;

(iii) එකී නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්,ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) රට තුළ වේවැල් කර්මාන්තයට අවශ්‍ය වෙළෙඳ පොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොழිල් මර්‍රුම් වාණිප අලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) පිරම්පු චාර්න්ත උර්පත්තික් කෛත්තොழිලෛ වාළ්වාතාරමාකක් කොණ්ඩුළ්ළවර්කළ් තර්පෝතු අක්කෛත්තොழිලිලිරුන්දු විලකිච් චෙල්කින්‍රනර් එන්පතෛයුම්,

(ii) මූලර්පොරුළ් මර්‍රුම් චන්තෛ තොටර්පාක පිරච්චිනෛකළ් කාණප්පටුකින්‍රන එන්පතෛයුම්,

(iii) ඉතු ඉන්නාට්ටුක්කුර් පෙරුමළවු වෙළිනාට්ටුච් චෙලාවණියෛ ඊට්ටිත්තරක්කූටිය ඔරු කෛත් තොழිලාකුමෙන්පතෛයුම්,

අවර් අරිවාරා?

(ආ) (i) පිරම්පු චාර්න්ත උර්පත්තිකළ් ඒර්‍රුමති චෙය්‍යප් පටුකින්‍රනවා එන්පතෛයුම්,

(ii) ආමෙනිල්, 2015ආම් ආණ්ටිනුළ් පෙර්‍රුක් කොළ්ළප්පට්ට ඒර්‍රුමති වරුමානම් යාතෙන්පතෛයුම්

(iii) ඒර්‍රුමති චෙය්‍යප්පටුවතිල්ලෛයෙනිල්, ඒර්‍රුමති චෙය්‍ය නටවටික්කෛ එටුප්පාරා එන්පතෛයුම්,

(iv) ආමෙනිල්, අතු එත්තිකතියිලිරුන්දු එන්පතෛයුම්,

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(இ) (i) නාට්ටිනුළ් පිරම්පුක් කෛත්තොழිලුක්කුත් තේවෛයාන චන්තෛයෛ විරිවුපටුත්ත අරචාංකම් නටවටික්කෛ මේර්කොණ්ඩුළ්ළතා එන්පතෛයුම්,

(ii) ආමෙනිල්, මේර්පටි නටවටික්කෛකළ් යාවෛ යෙන්පතෛයුම්,

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஈ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Industry and Commerce:

(a) Is he aware that-

(i) the people who have made their living on cane craft industry are currently leaving that industry;

(ii) there are problems in regard to raw materials and the market; and

(iii) this industry could bring a huge amount of foreign exchange to the country?

(b) Will he inform this House-

(i) whether cane products are exported;

(ii) if so, the income earned from it in the year 2015;

(iii) if the aforesaid products are not exported, whether action will be taken to export those products; and

(iv) if so, when it will be done?

(c) Will he also inform this House-

(i) whether the Government has taken steps to expand the market required for the cane industry in the country; and

(ii) if so, the aforesaid steps?

(d) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)

(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Sir, the Answer is as follows:

(a) (i) It has been observed that there is no tendency of quitting the cane industry by the industrialists engaged in it. The number of cane craftsmen registered with the National Crafts Council, which comes under the purview of the Ministry of Industry and Commerce, was 199 in 2010 and it increased to 467 in the year 2017. Their details are given in Annex 1 and I **table*** that.

(ii) Cane artisans mainly use the types of cane such as *"ma wevel"* and *"kuda wevel"*. The Forest Department of Sri Lanka provides a limited quantity of *"kuda wevel"* to the cane craftsmen. However, the variety of *"ma wevel"* is a restricted raw material since it is preserved by the Forest Department of Sri Lanka. Earlier, the variety of *"ma wevel"* had been imported from Indonesia, but later, the Indonesian Government has banned the supply of *"ma wevel"*. Therefore, there is a huge scarcity of *"ma wevel"* in Sri Lanka.

(iii) Yes.

(b) (i) Yes.

(ii) These products are not directly exported by manufacturers in large volumes. There is no separate HS code for cane related products. Most of these products are sold for tourists and it is not reported as export

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

income. However, the Export Development Board Report indicates US Dollars 18,073 as export earnings from cane related products for 2015. I **table*** the relevant document as Annexure 2.

(iii) Not applicable.

(iv) Not applicable.

(c) (i) Yes.

(ii) National Crafts Council, National Design Centre, Industrial Development Board and Export Development Board have taken several measures to implement programmes to expand the market opportunities for cane industrialists. Some of such measures are mentioned below.

- By considering shortage of raw materials, the National Crafts Council has planned to implement cane cultivation project in collaboration with Forest Department of Sri Lanka and Sri Lanka Timber Corporation.
- Encouraging cane industrialists to participate in local and foreign trade fairs.
- Providing market opportunities through Laksala sales outlets.
- Implementing programmes to promote the production of gift items and souvenirs to suit modern market needs.
- Organizing Buyer - Seller Meetings.

(d) Not applicable.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇමතිතුමාගේ දීර්ඝ පිළිතුර තුළ පැහැදිලිව සඳහන් වුණා, වේවැල් කර්මාන්තයට තිබෙන ලොකුම බාධාව තමයි අවශ්‍ය අමුද්‍රව්‍ය -වේවැල්- ලබාගැනීමේ ගැටලුව තිබෙන බව. රක්ෂිතවල හෝ වනාන්තරවල වේවැල් කපන්න වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉඩ දෙන්නේ නැහැ. ඒ වේවැල් කැපීම නීතිවිරෝධී කාරණයක්. වේවැල් වගා කිරීම සඳහා සැලසුමක් තිබෙනවාය කිව්වාට, තවම වගා කිරීම ආරම්භ කරලාත් නැහැ. හැබැයි, මේ අමාත්‍යාංශ කිහිපය එකතු වෙලා වේවැල් වගා කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළොත්, එය මේ රටේ වේවැල් ආශ්‍රිත කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසකට ආත්ම ගෞරවයක් ඇතිව මේ කර්මාන්තය කරන්න පුළුවන්. දැන් මේ කර්මාන්තය කරන්න පුළුවන්කම තිබෙන්නේ ආත්ම ගෞරවයක් ඇතිව නොවෙයි. ඒ කර්මාන්තකරුවෙක් වේවැල් ටිකක් එක්ක අහුවුණොත් පොලිස් අත් අඩංගුවට පත් වෙනවා. ඒ නිසා, කර්මාන්තකරුවන්ට වේවැල් සැපයීම වෙනුවෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අනෙකුත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වෙලා කරන්න පුළුවන් වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
දැනටමත් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවත් එක්ක අපේ අමාත්‍යාංශය සම්බන්ධ වෙලා, ඒ ඒ සමිති සමඟ සාකච්ඡා කරලා මූලික කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමා කියන විධියට අපනයන සංවර්ධන මණ්ඩලයත් මේකට සම්බන්ධ වෙලා තිබෙනවා. නමුත්, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්නයක් තිබෙනවා කියලා ඔබතුමා දන්නවා. ඔබතුමන්ලා නියෝජනය කරන ප්‍රදේශවල දිගටම ඒ ප්‍රශ්න තිබෙන නිසා, වනසංරක්ෂණ නිලධාරිවරයා සමඟ සම්බන්ධ වෙලා ඔබතුමන්ලාටත් මේ ප්‍රශ්නවලට උදව් කරන්න පුළුවන්. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා හැටියට මේ සඳහා අපේ උදව්වත් ලබා දෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මීට දශක තුනකට පෙර -අතීතයේ- විසිතුරු භාණ්ඩවලට පමණක් නොවෙයි, ගෘහ ඒකක තුළ භාවිත කළ කිරි ගොටුවේ සිට පෙට්ටි, වට්ටි, ඉදිආප්ප වට්ටි වාගේ වේවැල් නිෂ්පාදනවලට ලොකු ඉල්ලුමක් තිබුණා. හැබැයි, වෙළෙඳ පොළට ප්ලාස්ටික් නිෂ්පාදන පැමිණීමත් එක්ක වේවැල් ආශ්‍රිත නිෂ්පාදන යට ගියා; ප්ලාස්ටික් නිෂ්පාදන කරළියට ආවා.

ප්ලාස්ටික් නිෂ්පාදන භාවිත කරන්නත් පිළිකා ඇතුළු රෝගවලට ගොදුරුවීමේ දැඩි අවදානමකට ලක් වෙලා තිබෙන තත්ත්වය තුළ, අද වන කොට ගෘහ උපකරණ ඇතුළු ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරන වේවැල් ආශ්‍රිත නිෂ්පාදනවලටත්, විශේෂයෙන් බට ආශ්‍රිත නිෂ්පාදනවලටත් නැවතත් වෙළෙඳ වටිනාකමක් සහ සමාජය තුළ ඉල්ලුමක් ඇති වෙමින් තිබෙනවා. ඒ ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට නොහැකි අභියෝගයක් තමයි තිබෙන්නේ. එම නිසා වේවැල් නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදෙන අයට අවශ්‍ය උපකරණ ලබා දීම, දිරිගැන්වීම් ලබා දීම, ඉතා අඩු පොලියට ණය ලබා දීම වාගේම, ඒ නිෂ්පාදන සඳහා දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳ පොළක් ලබා දෙන්න ග්‍රාම නිලධාරි මට්ටමෙන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන්, පළාත් හෝ ජාතික මට්ටමෙන් අමාත්‍යාංශයට යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද ගරු ඇමතිතුමනි?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ National Crafts Council එක තිබෙනවා. ඒකෙන් එවැනි නිෂ්පාදකයන්ට උදවු කරනවා. වේවැල් වගාව දියුණු කිරීමට නම් අපේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒ සඳහා වෙනම අංශ තිබෙනවා. නමුත්, නිෂ්පාදනය කරන ඒ භාණ්ඩ market කරන්න අපේ National Design Centre එක උදවු කරනවා. ඒ productions කරන අයට National Crafts Council එක උදවු කරනවා. වේවැල් වගාව දියුණු කිරීම සම්බන්ධයෙන් Agriculture Department එකේ පළාත් අධ්‍යක්ෂවරු හා ඒ අදාළ නිලධාරීන් එක්කත් සාකච්ඡා කරන්න ඕනෑ. වගා කිරීමට ණය පහසුකම් ඕනෑ නම් අපේ අමාත්‍යාංශයෙන් නිර්දේශ කරලා උදවු කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 1227/'16 - (2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා විදේශගත වී සිටින බැවින් සති දෙකකින් පිළිතුරු ලබා දෙන බව දන්වා තිබෙනවා. එම නිසා අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 - 1421/'16 - (2), ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා. සමාවෙන්න, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා. මට ඊයේත් ඒ ගැන සඳහන් කරන්න බැරි වුණා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා ඇමතිතුමා විදේශගත වී සිටින බැවින්, සති දෙකකින් පිළිතුරු ලබා දෙන බව දන්වා තිබෙනවා. එම නිසා එතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 1662/'17 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය කාර්යාල සහ කාර්ය මණ්ඩලය : විස්තර
உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு அலுவலகங்கள் மற்றும் ஆளணி: விபரம்
OFFICES AND STAFF OF MINISTRY OF INTERNAL AFFAIRS, WAYAMBA DEVELOPMENT AND CULTURAL AFFAIRS: DETAILS

2003/'17

5. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

උළුණ අලුවල්කළ්, වඩමේල් අපිවිරුත්ති මර්රුම් කලාසාර අලුවල්කළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரின் அமைச்சு அலுவலகங்களின் முகவரிகள் யாவை என்பதையும்;

(ii) அந்த அலுவலகங்களுக்காக வாடகை /குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகை தொகை எவ்வளவென்பதையும்;

(iii) 2015-2017ஆம் ஆண்டு வரை செலுத்தப் பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அமைச்சரின் பிரத்தியேக பதவியணி உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அந்தப் பிரத்தியேக பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

ஒவ்வோர் அமைச்சுக்கு ஏற்ப வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු බිමල් රත්නායක මහතා]

asked the Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the addresses of ministerial offices of the Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs;

(ii) if rent or lease is paid for the said offices, the monthly rental/lease; and

(iii) the total rent/lease paid from the year 2015 up to now in 2017?

(b) Will he also inform this House, separately in respect of each Ministry-

(i) the number of officials in the personal staff of the Minister;

(ii) the number of vehicles allocated for the said personal staff; and

(iii) the number of vehicles allocated to the Minister?

(c) If not, why?

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුර ලබා දෙන විට පෞද්ගලික අංශයෙන් ලබාගෙන තිබෙන ගොඩනැඟිලිවල ලිපින සහ කුලී මුදල් පිළිබඳ තොරතුරු පමණක් ඉදිරිපත් කළා නම් ප්‍රමාණවත්.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
මෙම පිළිතුර කියවනකොට එය පැහැදිලි වෙයි, ගරු මන්ත්‍රීතුමනි. මම ඉක්මනින් එය කියවන්නම්.

(අ) (i) 2015.09.07 දින සිට 2016.12.31 දින දක්වා -

අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

8වන මහල,

සෙත්සිරිපාය,

බත්තරමුල්ල.

2017.01.01 දින සිට මේ දක්වා -

15 වන මහල,

සුහුරුපාය,

බත්තරමුල්ල.

මේ සියලු කුලී මුදල් ගෙවා තිබෙන්නේ රජයට. UDA එකට ගෙවා තිබෙනවා, සෙත්සිරිපාය. සුහුරුපාය මුදල් ගෙවා තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශයට.

(ii) සෙත්සිරිපාය - 2015.09.07 දින සිට 2016.12.31 දින දක්වා - රු. 560,250.00

සුහුරුපාය - 2017.01.01 දින සිට - රු.129,726.94

(iii) සෙත්සිරිපාය - 2015.09.07 දින සිට 2016.12.31 දින දක්වා රු. 8,964,000.00

සුහුරුපාය - 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා රු. 1,556,723.28

මුළු මුදල - රු. 10,520,723.28

කිසිම දෙයක් මම පෞද්ගලිකව ලබාගෙන නැහැ. කුරුණෑගල තිබෙන්නේ Department of Immigration and Emigration එකේ Regional Office එක සහ Department of Registration of Persons එකේ Regional Office එක. වෙන කිසිම දෙයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමැතිතුමා, හරිද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ (අ), (ඇ) කොටස් තිබෙනවා.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

(අ) (i) 19යි.

(ii) 05 පමණි.

(iii) 03 පමණි.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යනු එක් අමාත්‍යාංශයකි.

(ඇ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ජනාධිපතිවරයා නිකුත් කර තිබෙන චක්‍රලේඛය අනුව අමාත්‍යවරයෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරි සංඛ්‍යාව කොපමණද කියලා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
දහනවයයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා වෙන් කරගෙන සිටින නිලධාරි සංඛ්‍යාව 19 බව ඔබතුමා කිව්වා. චක්‍රලේඛය අනුව කොපමණද කියලායි මම අහන්නේ.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

මා කියන්නම්. ඇමතිතුමා වශයෙන් වාහන තුනට driversලා තුන්දෙනායි. ඊළඟට, සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනායි. මාධ්‍ය ලේකම් සහ ලේකම් යන දෙදෙනා ඇතුළුව හත්දෙනායි. කාර්යාල සහායක පස්දෙනායි. හරියටම ගණන මා සොයා බලා කියන්නම්. මේ මට දුන් ලැයිස්තුව. මට සිටින සේවක සංඛ්‍යාව කොපමණද කියන එක ගැන සොයා බලා කියන්න මා උනන්දුවක් දැක්වූයේ නැහැ. මට එවා තිබෙන උත්තරයේ තිබෙන්නේ දහනවයයි කියලා. මම පාවිච්චි කරන්නේ වාහන තුනයි. ඒ වාහන තුනට driversලා තුන්දෙනෙක් ඉන්නවා. අනෙක් අයටත් එහෙමයි දීලා තිබෙන්නේ. කිසිම අමාත්‍යාංශයකට වැඩියෙන් නම් මුදල් ගෙවන්නේ නැහැ. ඒ දීලා තිබෙන ප්‍රමාණය තමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ සම්බන්ධයෙන් සොයා බලා කිව්වොත් ඇති නේද, බිමල් රත්නායක මන්ත්‍රීතුමනි? ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් හරියට සොයා බලා කරුණු ඉදිරිපත් කරන්න.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
හොඳයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එය මේ ඇමතිතුමාට පෞද්ගලික වන සේ අහපු ප්‍රශ්නයක් නොවෙයි. මා දන්නා තරමින් චක්‍රලේඛය අනුව වෙන් කළ හැකි නිලධාරීන් සංඛ්‍යාව පහළොවයි. ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා පිළිතුරු වශයෙන් දීලා තිබෙන්නේ 19යි කියලා. එතකොට වැඩිපුර හතරදෙනෙක් ඉන්නවා. එම නිසා ඒක එහෙම වෙලා තිබෙන්නේ කොහොමද කියන එක ගැන ගරු ඇමතිතුමා මේ සභාවට ලිඛිතව ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

පූනහරි ගොවිජන සේවා මධ්‍යස්ථානය : අතහැර දමා තිබෙන ට්‍රැක්ටර්

பூநகரி கமநல சேவை நிலையம் : கைவிடப்பட்ட உழவு இயந்திரங்கள்

POONAKARY AGRARIAN SERVICES CENTRE : TRACTORS LEFT IDLE

2071/'17

6. ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, පූනහරි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දෙපාර්තමේන්තුවට අයත් ට්‍රැක්ටර් 23ක් හා අත් ට්‍රැක්ටර් 8ක් කිසිම නඩත්තුවක් හෝ ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා තිබෙන බවත්;

(ii) මෙම ට්‍රැක්ටර් අනාරක්ෂිතව වර්ෂ 4ක කාලයක් පුරා එළිමහනේ තිබෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් ට්‍රැක්ටර් අලුත්වැඩියා කර භාවිතයට යොදාගැනීම සම්බන්ධයෙන් කිසියම් පියවරක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා අලුත්වැඩියා කරනු ලබන කාලය සහ අලුත්වැඩියාවෙන් පසු භාවිතයට ගනු ලබන ආකාරය කවරේද;

(iii) නොඑසේ නම්, එම ට්‍රැක්ටර් අලුත්වැඩියා කර සාධාරණ මිළ ගණන් යටතේ ගොවි සංවිධානවලට බදුදීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தில், பூநகரி, கமநல சேவை நிலையத்தில் திணைக்களத்துக்குச் சொந்தமான 23 உழவு இயந்திரங்களும் 8 இரண்டு சக்கர உழவு இயந்திரங்களும் எதுவித பராமரிப்போ அல்லது பயன்பெறுதலோ இன்றிக் கைவிடப்பட்டுள்ளன என்பதையும்;

(ii) மேற்படி உழவு இயந்திரங்கள் பாதுகாப்பற்ற நிலையில் 4 வருட காலமாகத் திறந்த வெளியில் இருக்கின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே குறிப்பிடப்பட்ட உழவு இயந்திரங்களைப் பழுதுபார்த்துப் பாவனைக்கு எடுத்தல் தொடர்பாக ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அவை பழுதுபார்க்கப்படும் காலம் மற்றும் பழுதுபார்த்ததன் பின்னர் உபயோகத்துக்கு எடுக்கப்படும் முறை யாது;

(iii) இன்றேல், மேற்படி உழவு இயந்திரங்களைப் பழுதுபார்த்து நியாயமான விலைக்கு கமநல அமைப்புக்களுக்குக் குத்தகைக்கு வழங்குவதற்கான சாத்தியம் காணப்படுகின்றதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Is he aware that-

(i) 23 tractors and 08 hand tractors belonging to the Department of Agrarian Development have been left idle without any maintenance or without making any use at the Poonakary Agrarian Services Centre in the Kilinochchi District; and

(ii) the aforesaid tractors have been left in the open for four years without any protection?

(b) Will he inform this House-

(i) whether steps have been taken to repair the aforesaid tractors and to put them to use;

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

(ii) if so, the period of time that will be taken to repair those tractors and the manner in which they will be utilized after being repaired; and

(iii) if not, whether there is a possibility of repairing those tractors and distributing them among farmer organizations at reasonable prices?

(c) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2010 වසරේ ඉන්දියානු රජයේ ආධාර යටතේ ලැබුණු රෝද 04 ට්‍රැක්ටර් 23ක් සක්‍රීය සේවයේ යොදවා ඇත. ඉන් ට්‍රැක්ටර් 13ක් මේ වන විට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර, එම අලුත්වැඩියාවෙන් පසු යම් නිශ්චිත ක්‍රමවේදයක් තුළින් හඳුනා ගනු ලබන ගොවි සංවිධාන වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම මෙම රෝද 04 ට්‍රැක්ටර් අලුත්වැඩියා කිරීමට 2018 වසර තුළ අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී තිබේ.

රෝද 02 ට්‍රැක්ටර් 08ක් ගොවීන් විසින් වාරික නොගෙවී මත නැවත දිස්ත්‍රික් කාර්යාලය වෙත අත්පත් කර ගත් ඒවා වන අතර, ඒවා නැවත ගොවි සංවිධාන වෙත ලබා දීමට කටයුතු කර ඇත.

(ii) මෙම ට්‍රැක්ටර් සේවයේ යෙදවීමේ අපහසුතා මත කාලයක් ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමියේ ගාල් කර තැබීමට සිදු වුවද ගොවි සංවිධාන, ගොවිජන සේවා මධ්‍යස්ථානය හා ගොවිජන සංවර්ධන දිස්ත්‍රික්ක කාර්යාලයට එක්ව කරන ලද ඉල්ලීම මත කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපාදන ලබා මේ වන විට ට්‍රැක්ටර් ගරාජයක් සාදා ට්‍රැක්ටර් ආරක්ෂාකාරී ලෙස රඳවා තබා ඇත.

(ආ) (i) ඔව්.

මේ වන විට 2017 වසරේ වට්ටෝරු භාණ්ඩ සමීක්ෂණයේදී අලුත්වැඩියා කළ යුතු ට්‍රැක්ටර්වල අලුත්වැඩියා කළ යුතු කොටස් හඳුනාගෙන ඉදිරි කටයුතු කර ඇත.

(ii) සහ (iii) ඔව්. ප්‍රතිපාදන සලසාගෙන මාස 06ක් ඇතුළත අලුත්වැඩියා කටයුතු කරනු ලබන අතර අවශ්‍යතා අනුව ගොවි සංවිධාන වෙත ගිවිසුම් යටතේ බදු පදනම මත ට්‍රැක්ටර් ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව ගොවි සංවිධාන 08කට ට්‍රැක්ටර් 08ක් ලබා දී ඇත. ගොවි සංවිධාන ඉල්ලීම් කරන්නේ නම් ඉහත පදනම මත ට්‍රැක්ටර් ලබා දී එලදායී ලෙස සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු කළ හැක.

(ඇ) අදාළ නැත.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே! பூநகரி, கமநல சேவைகள் நிலையத்தில் மாத்திரமல்ல, வட மாகாணத்திற்குக் கொடுக்கப்பட்ட பல உழவு இயந்திரங்கள்கூட பழுதடைந்த நிலையில் இருக்கின்றன. அவற்றையும் கவனத்திலெடுத்து விரைவில் திருத்திக்கொடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, யாழ். மாவட்டத்தைப் பொறுத்தவரையில் நெல் அறுவடையின்போது பயன்படுத்துகின்ற இயந்திரங்கள் வேறு மாவட்டங்களிலிருந்து கொண்டுவரப்படுவதால் அதிக செலவும் நேர விரயமும் ஏற்படுகின்றது. அந்தவகையில் யாழ். மாவட்டத்திலிருக்கின்ற கமநல சேவைகள் அமைப்புகளுக்குக் குத்தகை அடிப்படையில் அவற்றை வழங்க முடியுமா?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ඒ නාම ලේඛනය ලැබුණු හැටියේ ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න අපට පුළුවන්. ගොවි සංවිධානවල ඉල්ලීමක් තිබුණොත් අපට ඒවා ඒ අයට හදා දෙන්න පුළුවන්.

2015 වර්ෂයේ වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ සිසුන් : සබරගමුව පළාත

2015இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றோர் : சப்ரகமுவ மாகாணம்

STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: SABARAGAMUWA PROVINCE

2134/'17

7. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த. (உயர்தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் இரத்தினபுரி மற்றும் கேகாலை மாவட்டங் களிலிருந்து தோற்றியுள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways :

(a) Will he inform this House in respect of each District separately -

(i) the number of students who sat for the GCE (A/L) Examination in the Biology stream in 2015 from Ratnapura and Kegalle Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(c) If not, why?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

කෑගල්ල දිස්ත්‍රික්කය - 2353

රත්නපුර දිස්ත්‍රික්කය - 2647

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

කෑගල්ල දිස්ත්‍රික්කය - 1297

රත්නපුර දිස්ත්‍රික්කය - 1354

එම සංඛ්‍යාව අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

කෑගල්ල දිස්ත්‍රික්කය - 55.12%

රත්නපුර දිස්ත්‍රික්කය - 51.15%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

කෑගල්ල දිස්ත්‍රික්කය - 46

රත්නපුර දිස්ත්‍රික්කය - 65

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

කෑගල්ල දිස්ත්‍රික්කය - 3.55%

රත්නපුර දිස්ත්‍රික්කය - 4.80%

(iv) එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය
5448263	ඒ.එස්.එම්.යූ.ඩී.බී. සමරකෝන්	කෑගල්ල	කෑ/කෑගලු බාලිකා මධ්‍ය විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.8742	රජරට විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
5236266	කේ.එස්.ටී. වික්‍රමසිංහ	රත්නපුර	ර/ෆර්ගියුසන් උසස් බාලිකා විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.8844	රජරට විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මම ඊයේ උත්තරයම බලාපොරොත්තුවෙන් අතුරු ප්‍රශ්නය අහන්නේ නැහැ.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ වෙන කොට විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. පෙබරවාරි 28 වැනිදා ඉඳලා විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින් ඔවුන්ගේ මාසික හිලව් දීමනාව වැඩි කිරීම, වැටුප් වැඩි කිරීම, රක්ෂණය, බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය ඇතුළු ඉල්ලීම් කිහිපයක් මුල් කර ගෙන උද්ඝෝෂණ ක්‍රියා මාර්ගයක නියැලී ඉන්නවා. මෙයින් ශිෂ්‍යයින්ට වන අපහසුතාව ඔබතුමා දන්නවා. ඒ නිසා, අනධ්‍යයන සේවකයින්ගේ මේ ගැටලු විසඳීම සඳහා ආණ්ඩුව විධියට ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔවුන්ගේ ඉල්ලීම් ගණනාවක් තිබුණා. ඒ ඉල්ලීම් ගණනාව අතර මාසික හිලව් දීමනාව හැර අනෙක් සියලුම ප්‍රශ්න විසඳීමට වුවමනා ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. එයින් සියයට අසූවකට වැඩි ප්‍රමාණයක් විසඳලාත් තිබෙනවා.

මාසික හිලව් දීමනාවේ ප්‍රශ්නය පිළිබඳව අපි භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරගෙන යනවා. අපට අවශ්‍ය මුදල් ප්‍රමාණය ලැබෙන විධිය අනුව අපි පුළුවන් ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳලා සමථයකට පත් කරන්න බලනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාගේ අතුරු ප්‍රශ්න අවසන් වුණාට පසුව අවසරය ඇතුව ප්‍රශ්නය අහන්න. නැත්නම් disturb වෙනවා නේ. [බාධා කිරීමක්] නැහැ, මෙතුමාගේ ප්‍රශ්න ඉවර වුණාම අහන්න. නීත්‍යානුකූලව එතුමා ප්‍රශ්න අහලා ඉවර කරන්න ඕනෑ නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අසනවා ඇති.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මැතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක් නිසා අමාත්‍ය මණ්ඩලයේත්, රාජ්‍ය අමාත්‍යවරයාගේත් අවධානයටයි මා මෙය යොමු කරන්නේ. මහනුවර පිහිටා තිබෙන බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය ඔබතුමා දන්නවා. අවුරුදු සියයක් පමණ පැරණි පෞරාණික වැදගත්කමක් තිබෙන ගොඩනැඟිල්ලක තමයි මේ සෞන්දර්ය නිකේතනය පිහිටලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300කට පමණ ඉගෙන ගන්න සියලුම පහසුකම් තිබෙන මෙම ගොඩනැඟිල්ල කඩා දමලා අලුතින් ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට දරන උත්සාහයක් තිබෙනවා. මේ නිසා උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ ආචාර්යවරුන්ගේ පැත්තෙන් මේ සඳහා විශාල විරෝධයක් පළ කර තිබෙනවා. ඔබතුමාගේ අවසරය ඇතිව මම මේ ලේඛනය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

යකඩ සහ විදුලි සන්නායක ජාවාරමක් අරමුණු කරගෙන මෙම ගොඩනැඟිල්ල කඩා දැමීමට විරුද්ධව මධ්‍යම පළාත් සභාවත් ඉදිරිපත් වෙලා එය කඩා දමන්න එපා කියලා ඉල්ලා තිබෙනවා. එම ස්ථානයේ නව ගොඩනැඟිලි ඉදි කරන්න ඇති තරම් ඉඩකඩ තිබෙනවා. ඒ නිසා ජාවාරම්කරුවන්ගේ වුවමනාව සඳහා බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයට අයත් මෙම ගොඩනැඟිල්ල කඩා බිඳ දමන්නේ නැතිව නව ගොඩනැඟිල්ල ඉදි කරන්න කියලා මධ්‍යම පළාත් සභාවත්, එම සෞන්දර්ය නිකේතනයේ ආචාර්යවරු සහ ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් ඉල්ලා සිටිනවා.

රාජ්‍ය ඇමතිතුමා වශයෙන් ඔබතුමාගෙනුත් ඒ වාගේම කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන්ගෙනුත් මා ඉල්ලා සිටිනවා, මේකට මැදිහත් වී වහාම කටයුතු කරන්න කියලා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
අදම හොයලා බලලා වහාම ඒ ගැන ක්‍රියාමාර්ග ගන්නම්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහලා ඉවරයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රශ්නයක් නොවෙයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කිරීමක් ඕනෑ නම් වැඩ බලන ඇමතිතුමාගේ එකඟත්වය ඇතුව මට ඉඩ දෙන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පැහැදිලි කිරීමක්. රාජ්‍ය ඇමතිතුමා එකඟ වෙයි. [බාධා කිරීමක්]

ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයට අද වන විට වැටුප් හම්බ වෙන්නේ නැහැ. මෙහෙම ගියොත් සිංහල අවුරුද්ද පෙනී පෙනී අප්‍රේල් මාසයේත් ඒ අයට වැටුප් හම්බ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙන්නේ නැහැ. මෙතැන තිබෙන්නේ, මීට කලින් එකඟ වෙච්ච එකඟතාව ක්‍රියාත්මක නොවීමයි. එදා එකඟ වෙද්දී මේකට සල්ලි තිබුණා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමටයි; උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටයි. කවුරුත් කිව්වා, "මේක කරන්නම්." කියලා. මහා භාණ්ඩාගාරයත් එකඟ වුණා. දැන් එකඟතාව කඩකිරීම නිසා තමයි විශ්වවිද්‍යාල පද්ධතිය බිඳ වැටිලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. රාජ්‍ය ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඇත්ත වශයෙන්ම භාණ්ඩාගාරය ඒ එකඟතාවට ඇවිල්ලා නැහැ. ඒකයි තිබුණු ප්‍රශ්නය. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම කම්කරු ඇමතිවරයා විධියට හිටපු කාලයේ තමයි විශ්වවිද්‍යාලයත්, විශ්වවිද්‍යාල අනධ්‍යයන වෘත්තීය සමිති එකතු වෙලා මේ ගිවිසුමට ආවේ. මේ ගිවිසුමෙන් වාර්ෂිකව එකඟ වුණා, ඒ ගෙවීම කරන්න. ඒක නොසලකා හැරීමකුයි මේ තිබෙන්නේ. නැතුව, මේක අලුත් ඉල්ලීමක් නොවෙයි. කම්කරු අමාත්‍යාංශයත් මැදිහත් වෙලා මේ පිළිබඳව සාකච්ඡා කරලා එකඟතාවක් ඇති වුණා. [බාධා කිරීමක්] ඒ එකඟතාව ක්‍රියාත්මක නොවීම තමයි තිබෙන්නේ. නැතුව, අලුතෙන් පඩි වැඩි කරන්න කියන ඉල්ලීමක් නොවෙයි. [බාධා කිරීමක්]

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
මේ කියන එකඟතාව ඔබතුමා ඇමතිවරයා හැටියට හිටපු කාලයේ ඇති කර ගත්තු එකඟතාවක් නොවෙයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහන්න කෝ. 2016 වර්ෂයේ අමාත්‍යාංශයේ ලේකම්තුමා වාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිතුමා සහ වෘත්තීය සමිති අතර ඇති වුණු එකඟතාවක්.

අපි උපරිම උත්සාහයක් දරනවා කියා තමයි එහි තිබෙන්නේ. මාසික ගිලවූ දීමනාව 2015 වැටුපෙන් සියයට 75ක් දක්වා වසර 5ක කාලයක් තුළ ගෙවන්න. ඒක දරන උත්සාහයක්. ඇත්තටම ඒ අවුරුද්දේත් භාණ්ඩාගාරය ඒකට කිසිම අනුමැතියක් දුන්නේ නැහැ. ඒ නිසා මේ එකඟතාවේ සම්පූර්ණත්වයක් නැහැ. එය ඇති කර ගැනීම සඳහා අදත් හවස සාකච්ඡාවක් පවත්වනවා. අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි දිගින් දිගටම උත්සාහ කරනවා ඒ අයගේ අවුරුදු සතුට ආරක්ෂා වන පරිදි, පුළුවන් ඉක්මනට ඒ වැටුප් ලැබෙන පරිදි අද හෙටම එය අවසානයකට පත් කරන්න. එසේ නොවීම අපටත් ලොකු වේදනාවක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ ඉල්ලීම තිබුණා. නමුත් එකඟතාවක් තිබුණේ නැහැ. මොකද, භාණ්ඩාගාරය පැහැදිලිව කිව්වා, "මේ දීමනාව දෙන්න ඒ අයට අපහසුයි." කියා. භාණ්ඩාගාරයේ එකඟතාවක් නැහැ. මා උසස් අධ්‍යාපන ඇමති කාලයේත් මේ ඉල්ලීම කර තිබුණා. But, there was no agreement.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවත් විවාද කරන්න අවශ්‍ය නම් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා විවාද කරන්න. [බාධා කිරීමක්]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
එදා අමාත්‍යවරයා බොහොම පැහැදිලිව ඒ අයට පොරොන්දුවක් දුන්නා, මේ අවුරුද්දේදී එය දෙනවා කියා. උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රාජ්‍ය අමාත්‍යතුමා අද සාකච්ඡා කරනවා නේද? [බාධා කිරීමක්]

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
අද සාකච්ඡාවේදී මතක් කරන්න. අපි බලමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද සාකච්ඡා කරනවා නේ. අවස්ථාවක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] මෙය විසඳුණේ නැතිනම් පසුව විවාදයක් ගන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවයි, වෘත්තීය සමිතියි එකතු වෙලා එකඟ වූ ගිවිසුමක්, එය. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මගේ ප්‍රශ්නයෙනුයි මේ කාරණය පැන නැඟුණේ. හැබැයි, සිදු වී තිබෙන්නේ එකඟතාවක් නැතිකම නිසා දිගින් දිගටම ඒ වර්ජනය ඇදි ඇදී තිබීමයි. ඒ සේවකයන්ට සාධාරණයක් වෙන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. ඇමතිතුමන්ලා හැටියට ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒකට සාධාරණ පිළිතුරක් කඩිනමින් ලබා දෙන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි හිතුවේ කිරිඇල්ල අමාත්‍යතුමා අයින් වුණාම කැම්පස් ඇරලා තියාවි කියලායි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අවුරුදු සතුටට එහා ගිය ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. සයිටම් ප්‍රශ්නය නිසා කාලයක් විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ වැසී තිබුණා. අද වෛද්‍ය පීඨවල ලක්ෂ ගණනක නියැදි - specimens - පිළිබඳ අනාරක්ෂිත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේක අවුරුදු සතුටට එහා ගිය ප්‍රශ්නයක්. මොනවා හෝ හේතුවක් මත කාලයක් තිස්සේ විශ්වවිද්‍යාල වැහෙනවා; ගැටලු ඇති වෙනවා. ඒකයි මේකේ තිබෙන භයානකකම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. වහාම මේ ප්‍රශ්නය ඉවර කරන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ප්‍රශ්න අංක 8 - 2144/'17 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා විදේශගත වෙලායි ඉන්නේ. එතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 2181/'17 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 2226/'17 - (1), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் கேட்கின்றேன்.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා. එතුමාත් විදේශගත වෙලා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 2291/'17 - (1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 2316/'17 - (1), ගරු ජයන්ත සමරවීර මහතා.
[සභා ගර්භය තුළ නැත.]

දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය : විස්තර
தம்புள்ள சர்வதேச கிரிக்கெற் விளையாட்டரங்கு: விபரம்
DAMBULLA INTERNATIONAL CRICKET STADIUM: DETAILS

2323/'17

13. ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කළ දිනය කවරේද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

(iv) ක්‍රීඩාංගණය විවෘත කළ දිනයේ සිට අද දක්වා එම ක්‍රීඩාංගණයේ පැවති ටෙස්ට් තරග, එක්දින තරග සහ 20 - 20 තරග සංඛ්‍යාව කොපමණද;

(v) එම තරගවලින් ඉපැයූ ආදායම කොපමණද;

(vi) එහි සේවයේ නියුතු සේවක සංඛ්‍යාව හා එම සේවකයන් අතරින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සෘජුව අයත් සේවකයන් හා දිස්ත්‍රික්ක ක්‍රිකට් සංගමයට අයත් සේවකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම සියලු සේවකයන් ශ්‍රීලංකා ක්‍රිකට් ආයතනයට අනුයුක්ත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புள்ள சர்வதேச கிரிக்கெற் விளையாட்டரங்கு அங்குரார்ப்பணம் செய்யப்பட்ட திகதி யாது;

(ii) மேற்படி விளையாட்டரங்கினை நிர்மாணிப் பதற்காகச் செலவிட்ட மொத்தப் பணத்தொகை யாது;

(iii) மேற்படி பணத்தொகை எத்தகைய மூலங்களி லிருந்து பெறப்பட்டன;

(iv) விளையரட்டரங்கு அங்குரார்ப்பணம் செய்யப் பட்ட திகதியிலிருந்து இற்றைவரை மேற்படி விளையாட்டரங்கில் நடைபெற்ற டெஸ்ற் போட்டிகள், ஒருநாள் போட்டிகள் மற்றும் 20 - 20 போட்டிகளின் எண்ணிக்கை யாது;

(v) மேற்படி போட்டிகளிலிருந்து ஈட்டிய வருமானம் எவ்வளவு;

(vi) அங்கு சேவையில் ஈடுபட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை மற்றும் மேற்படி ஊழியர்களில் நேரடியாக இலங்கை கிரிக்கெற் நிறுவனத்தைச் சேர்ந்த ஊழியர்கள் மற்றும் மாவட்ட கிரிக்கெற் கழகத்தைச் சேர்ந்த ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(vii) மேற்படி ஊழியர்கள் அனைவரையும் இலங்கை கிரிக்கெற் நிறுவனத்துடன் இணைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he inform this House -

(i) the date on which Dambulla International Cricket Stadium was opened;

(ii) the total amount of money that was spent on the construction of the aforesaid stadium;

(iii) the sources of funding for the aforesaid construction;

(iv) the number of test matches, one-day matches and 20-20 matches that have been played at the aforesaid stadium from the date it was opened to date;

(v) the income earned through those matches;

(vi) the number of employees employed at the aforesaid stadium and out of those employees, separately the number of those who have been employed right under Sri Lanka Cricket and the number of those who belong to the District Cricket Association; and

(vii) the steps that will be taken to absorb all those employees to Sri Lanka Cricket?

(b) If not, why?

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
ගරු කථානායකතුමනි, මම නම් සභාවේ ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර දෙන්න, ගරු ඇමතිතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(i) 2001 මාර්තු 23

(ii) රුපියල් මිලියන 392

(iii) * ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් තරග විකාශන අයිතීන් ලබා දීම තුළින් උපයාගත් අරමුදල මඟින්

* ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අනුග්‍රාහක ගිවිසුම් මත ලබා එක්රැස් කරගත් අරමුදල් මඟින්

(iv) ගරු කථානායකතුමනි, මෙම ක්‍රීඩාංගණයේ ජාත්‍යන්තර ටෙස්ට් තරග ක්‍රීඩා කරන්නේ නැහැ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

1. ටෙස්ට් තරග සංඛ්‍යාව - පහත වගුවේ සඳහන් පරිදි වේ.

2. ජාත්‍යන්තර එක්දින තරග සංඛ්‍යාව - පහත වගුවේ සඳහන් පරිදි වේ.

3. 20-20 තරග සංඛ්‍යාව - 0යි

Format	Number of matches
One Day International	51
Women's One Day International	11
Under - 19s Youth Test Matches	2
Under - 19s Youth One-Day Internationals	4

(v) අවසන් වසර 7ක ප්‍රවේශ පත්‍ර විකුණුම් ආදායම රුපියල් 29,456,270යි.

(vi) 2018.02.22 දිනට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව 26කි.

ඉහත සියලුම සේවකයෝ උතුරු මැද පළාත් ක්‍රිකට් සංගමය යටතේ සේවය කරනු ලබති. ඒ අනුව, උතුරු මැද පළාත් ක්‍රිකට් සංගමයට අනුයුක්ත සේවක සංඛ්‍යාව 26යි.

ක්‍රිකට් ආයතනයට අයත් සේවකයන් - නැත.

(vii) ගරු කථානායකතුමනි, එසේ පියවර ගන්න බලාපොරොත්තුවක් නැහැ.

මොකද, මෙම ක්‍රිකට් ක්‍රීඩාංගණයේ අයිතිවාසිකම ක්‍රිකට් පාලක මණ්ඩලයට තිබුණත්, මේ වෙනකොට පරිපාලන කටයුතු පළාත් 4කට කඩලා එම පළාත් 4ට භාර දී තිබෙනවා. ඒ අනුව මෙම ක්‍රීඩාංගණයත් උතුරු මැද පළාත් ක්‍රිකට් සංගමයට අනුයුක්තව තමයි ක්‍රියාත්මක වෙන්නේ.

(ආ) 1. ක්‍රීඩාංගණය නඩත්තුව හා පාලනය පළාත් ක්‍රීඩා සංගම්හි වගකීමක් වන අතර, පළාත් ක්‍රිකට් සේවකයන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනුබද්ධ කර ගැනීම සිදු නොකෙරේ.

2. මෙය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රතිපත්ති තීරණ අනුව සහ පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදය අනුව සිදු කරනු ලබයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් පිළිතුරු දීමේදී කිව්වා, දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ජාත්‍යන්තර කාන්තා ක්‍රිකට් තරග තිබුණා කියලා. මම දැනුවත්ව නම් මට එවැනි මතකයක් නැහැ. ඔබතුමා කිව්වා, ජාත්‍යන්තර තරග 51ක් පැවැත්වූවා කියලා. ඔබතුමාට පුළුවන් නම් ඒ තරග පවත්වපු දින වකවානු කවදා ද කියලා අපව දැනුවත් කරනවා නම් හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය තිබෙන්නේ එතුමියගේ ගම් ප්‍රදේශයේ හින්දා මම එතුමියට කියන්න කැමැතියි, ඊයේ දිනයේදීත් මෙම ක්‍රීඩාංගණයේ ජාත්‍යන්තර ක්‍රිකට් තරගයක් පවත්වපු බව. කාන්තා ක්‍රිකට් තරග පවත්වන හැම දවසකම මම ඒවා ඔබතුමියට කියන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මම කියන්නේ ජාත්‍යන්තර ක්‍රිකට් තරග ගැනයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, ඒ ගැන තමයි මම කිව්වේ. ඊයෙත් තරගයක් තිබුණා. පාකිස්තානයත් එක්ක ඊයෙත් තරගයක් තිබුණා. ඒ ගැන පත්තරේත් දාලා තිබුණා. ඔබතුමියගේ ගෙදර ළඟ තිබෙන ක්‍රීඩාංගණයේ පවත්වන තරග ගැන ඔබතුමියට අවබෝධයක් නැත්නම්, මම ඔබතුමියටත් ටිකට් එවන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹிணி குமாரி விஜேரத්න)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න රට පුරාම ක්‍රීඩාංගණ හදලා ක්‍රීඩකයන් නඩත්තු කිරීම සහ පුහුණු කිරීම සඳහා විශාල මුදලක් වැය කරන බව අපි දන්නවා. ගරු ඇමතිතුමනි, නමුත් දිගින් දිගටම ක්‍රිකට් තරග පරාජයට පත් වෙන බව අපි දකිනවා. අපි දේශපාලන තත්ත්වය ගැන කථා කරද්දී, පසුගිය පළාත් පාලන මැතිවරණය දෙස බලලා සමහර අය කිව්වා, "අගමැතිතුමා ඉල්ලා අස්වෙන්නට ඕනෑ" කියලා. ගරු ඇමතිතුමනි, ඒ මතය මෙතැනට ගළපා බැලුවොත්, මේ තරම් මුදලක් වැය කරලා අපි ක්‍රිකට් ක්‍රීඩාවෙන් පරාජයට පත් වෙනවා නම් ඉල්ලා අස්වීම සිද්ධ කරන්න ඕනෑ තේරීම් කාරක සභාව ද, ගරු සභාපතිතුමා ද, එහෙම නැත්නම්, ගරු ක්‍රීඩා ඇමතිතුමා ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ක්‍රිකට් තරග පරදිනවා නම්, ඒකට කණ්ඩායමේ කැප්ටන් වග කියන්න ඕනෑ. පක්ෂයක් පරදිනවා නම්, ඒකටත් කැප්ටන් තමයි වග කියන්න ඕනෑ. ආණ්ඩුවක් පරදිනවා නම්, ආණ්ඩුවේත් කැප්ටන් තමයි වග කියන්න ඕනෑ. ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒක නිසා ක්‍රිකට් තරග පැරදීම ගැන ඕනෑ නම් වෙනම සාකච්ඡාවක් අපි කරමු. මේ වෙලාවේ ඔබතුමියට මෙවැනි ප්‍රශ්නයක් අහන්න කිව්වේ කවුද කියලා මම දන්නවා. ඒක නිසා කලබල කරන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා වර්තමානයේ අපි අලුත් පුහුණුකරුවෙක් කැඳවා තිබෙන බව. ඔහු යටතේ යම් ප්‍රමාණයක් ජයග්‍රහණ ලැබුවා; පරාජයනුත් ලැබුවා. හැම දාම අපට දිනන්න හම්බ වන්නේ නැහැ. හැම දාම පරදින්නෙත් නැහැ. අවුරුදු ගණනක් පැරදුණු අය දිනනවා; ආපසු පරදිනවා. ඒක තමයි තිබෙන තත්ත්වය. ඒ ජයග්‍රහණ සහ පරාජයන් දෙස අපි සියලුදෙනාම බොහොම උපේක්ෂාසහගතව බලන්න ඕනෑ. අපි ඉල්ලා සිටින්නේ අපේ ක්‍රිකට් කණ්ඩායම ඉහළට ගන්න පුළුවන්

තරම් ශක්තිය දෙන්න කියායි. ඒක වෙනම දේශපාලනයක් විධියට පාවිච්චි කරන්න හදන්න එපා කියන එකයි මම ඉල්ලන්නේ. ඒ වාගේම මතක තබාගත යුතු අනික් කාරණය මේකයි. ලංකාව කියන්නේ දිගින් දිගටම පැරදුණාම පොදු අපේක්ෂකයෙක් දමලා හෝ දිනන කණ්ඩායමක් හදන්න පුළුවන් රටක් කියලා බංග්ලාදේශ කට්ටිය දැනගෙන හිටියේ නැහැ. ඒ කාරණයත් ගොඩක් වැදගත් වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ක්‍රිකට් කියන්නේ මහත්වරුන්ගේ ක්‍රීඩාවක්. දැන් ඒක මහත්වරුන්ගේ හා නෝනාවරුන්ගේ ක්‍රීඩාවක් වෙලා තිබෙනවා. පිළිතුරු දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි.

ප්‍රශ්න අංක 14 -2327/'17- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දිම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"නීරෝගා" ලොතරැයිය : විස්තර
"நீரோகா" லொத்தர் : விபரம்
"NEEROGA" LOTTERY : DETAILS

2398/**'17**

15. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "නීරෝගා" ලොතරැයිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ලොතරැයියේ ආරම්භක අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම ලොතරැයිය ආරම්භයේ සිට මේ දක්වා,

(i) ලැබූ ආදායම;

(ii) ත්‍යාග වශයෙන් ලබා දුන් මුදල;

(iii) වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් ලබා දුන් මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වකුගඩු රෝගය ව්‍යාප්ත වන බැවින් එම දිස්ත්‍රික්කයට ලබා දෙන ප්‍රතිපාදන වැඩි කිරීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද; යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "நீரோகா" லொத்தர் ஆரம்பிக்கப்பட்ட திகதி யாது;

(ii) இந்த லொத்தரின் ஆரம்ப நோக்கங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) இந்த லொத்தரின் ஆரம்பம் தொடக்கம் இது வரை,

(i) பெற்ற வருமானம்;

(ii) பரிசாக வழங்கப்பட்ட பணத்தொகை;

(iii) சிறுநீரக நோயாளிகளுக்காக வழங்கப்பட்ட பணத்தொகை;

ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் வெவ் வேறாக எவ்வளவு என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) வடமேல் மாகாணத்தில், குருநாகல் மாவட்டத் தினுள் சிறுநீரக நோய் பரவிவருவதால் மேற்படி மாவட்டத்துக்கு வழங்கப்படும் நிதி ஏற்பாடு களை அதிகரிப்பதற்கான இயலுமை காணப்படு கின்றதா;

(ii) ஆமெனில், இது தொடர்பான விபரங்கள் யாவை;

என்பதையும் அவர் மேலும் இச்சபைக்கு அறிவிப் பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House-

(i) the date on which the "Neeroga" lottery was commenced;

(ii) the initial objectives behind commencing this lottery?

(b) Will he also inform this House, separately for each year-

(i) the income received;

(ii) the prize money awarded to winners;

(iii) the money given for kidney patients from the commencement of the aforesaid lottery to date, separately in each year?

(c) Will he further inform this House-

(i) whether there is any possibility of increasing the allocations provided to the Kurunegala District of the North-Western Province in view of the spreading of renal diseases in that district; and

(ii) if so, of the relevant details?

(a) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නීරෝගා ලොතරැයිය 2015 ජූනි 24 දින වෙළෙඳ පොළට හඳුන්වා දී 2015 ජූලි 25වන දින පළමු දිනුම් ඇදීම සිදු කරන ලදී.

(ii) 2015 වර්ෂයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ යෝජනාවකට අනුව වකුගඩු රෝගීන් සඳහා අරමුදලක් ගොඩනැඟීමේ කර්තව්‍යයට ජාතික ලොතරැයි මණ්ඩලයෙන් සිදු කරන සමාජ සත්කාරයේ වගකීමක් ලෙස නීරෝගා නම් ලොතරැයිය 2015 ජූනි 24වන දින වෙළෙඳ පොළට හඳුන්වා දෙන ලද අතර, 2015 ජූලි 25 දින එහි මංගල දිනුම් ඇදීම සිදු කරන ලදී.

(ආ) (i) ලැබූ ආදායම:

වර්ෂය	ලැබූ ආදායම (රු.)
2015	431,746,120.00
2016	1,307,799,800.00
2017	1,063,062,100.00

(ii) ත්‍යාග වශයෙන් ලබා දුන් මුදල:

වර්ෂය	ත්‍යාග වශයෙන් ලබාදුන් මුදල (රු.)
2015	202,920,676.00
2016	614,665,906.00
2017	515,183,229.00

(iii)

වර්ෂය	ජාතික වකුගඩු අරමුදල සඳහා බැර කර ඇති මුදල (රු.)
2015	43,174,612.00
2016	130,779,980.00
2017	105,139,434.46

(ඇ) (i) වකුගඩු අරමුදල සඳහා නීරෝගා ලොතරැයි ආදායමෙන් 10%ක ප්‍රතිශතයක් සෘජුවම බැර කරනු ලැබේ. ජාතික වකුගඩු අරමුදල වෙත මාසිකව බැර කරන මුදලින් වකුගඩු රෝග නිවාරණ අධීක්ෂණ කමිටුව මඟින් අදාළ ප්‍රතිපාදන ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.

(ii) ඉහත (ඇ) (i) පිළිතුර අදාළ වේ.

(ඈ) පැන නොනඟී.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. වකුගඩු රෝගය කියන්නේ, අපිට තිබෙන අයහපත් කෘෂි කර්මාන්ත ප්‍රතිපත්ති, සමාජ ක්‍රියාකාරකම් නිසා අපේ රටේ එක කොටසකට අත් විඳින්න සිදු වෙලා තිබෙන ක්‍රියාවලියක්. ඒ නිසා වකුගඩු රෝගියාට විතරක් ප්‍රතිකාර කළාට මදි කියායි මම කියන්නේ. රෝගියා අකර්මණ්‍ය වනවා කියලා කියන්නේ මුළු පවුලම අකර්මණ්‍ය වනවා කියන එකයි. ඔහුගේ බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ සාමාජිකයන් සියලුම දෙනා මේ රෝගය නිසා අගතියට පත් වෙනවා. මේ නීරෝගා ලොතරැයියෙන් ලැබෙන අරමුදල්වලින් ඒ රෝගියාට පමණක් නොවෙයි, ඔහුගේ මුළු පවුලම අරමුණු කර ගත් යම් දීමනාවක් ලබා දෙන්නට අදහස් කරනවාද, නැද්ද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

එහෙම යෝජනාවක් නැහැ. මේ ලොතරැයිය ඉදිරිපත් කරලා තිබෙන්නේ වගුගඩු රෝගීන් වෙනුවෙන් මුදල් වෙන් කරන්නයි. නමුත් මේක සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගන්න තීරණයක්. මෙය වකුගඩු රෝග නිවාරණ අධීක්ෂණ කමිටුව හරහා ගත් තීරණයක්. එහෙම යෝජනාවක් තිබෙනවා නම් ඒ යෝජනාව රජයට ඉදිරිපත් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කාරණය අපේ රාජ්‍ය ඇමතිතුමාට සහ මුදල් ඇමතිතුමාට කොයි විධියට අදාළ වෙනවාද කියන්න මම දන්නේ නැහැ. හැබැයි, මේ කාරණය සෞඛ්‍ය ඇමතිතුමාටත් යොමු වෙන්නට අවශ්‍යයි. වකුගඩු රෝගයට බලපාන ප්‍රධානම කාරණයක් හැටියට ග්ලයිෆොසේට් වැනි රසායනික පොහොර වර්ග භාවිතය සඳහන් කරන්න පුළුවන්. මෙවැනි හානිකර පොහොර වර්ග තහනම් කරනවා කියාත් අපි විශාල වශයෙන් ජනතාවට කිව්වා.

හැබැයි, ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නා මන්ත්‍රී කණ්ඩායම ඇතුළු බොහෝ දෙනා මේ පොහොර පිළිබඳව විවිධ විවේචන එල්ල කරනවා. ඒ වාගේම ග්ලයිෆොසේට් තහනම් කිරීම ගැන විවිධ මතවාද පළ කරනවා. අපේ ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හාමුදුරුවෝ අද සවස තුනටත් සාකච්ඡාවක් කැඳවා තිබෙනවා, ග්ලයිෆොසේට් තහනම් කරපු එක ඒ විධියටම අරගෙන යන්න, නැවතත් මේවා ක්‍රියාත්මක වෙනවා නම්, මේ ආණ්ඩුව පෙරළන්න උන්වහන්සේ මූලිකත්වය අරගෙන කටයුතු කරනවා කියලා. ඒක එක මතයක්.

අනෙක් පැත්තෙන් තව මතයක් ගෙනෙනවා, මේවා ලබා නොදුන් නිසා මේ ආණ්ඩුව පෙරළන්න අවශ්‍ය වෙන පසුබිම සකස් වෙලා තිබෙනවා කියලා. මෙහිදී මුදල් අමාත්‍යාංශය හැටියට ක්‍රියාත්මක කළ යුත්තේ අපේ ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හාමුදුරුවෝ ප්‍රමුඛ කණ්ඩායම ඉදිරිපත් කරන මතයද, අනෙක් මතයද කියන ප්‍රශ්නය පැන නඟිනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අදාළ නොවුණත් මම මේ ප්‍රශ්නය මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ග්ලයිෆොසේට් පොහොර හා වකුගඩු රෝගය අතර තිබෙන සම්බන්ධතාව ගැන නොයෙක් අදහස් තිබෙනවා. නමුත් ඒ සමහර අදහස්වලට විද්‍යාත්මක පදනමක් නැහැ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය බුද්ධි මාරඹේ මැතිතුමා මේ දෙක අතරේ සම්බන්ධතාවක් නැහැ කියලා ළඟදී කරුණු ඉදිරිපත් කර තිබුණා. වෙන වෙන අදහස් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ඉන්නා අපි විශේෂඥයන් නොවෙයි. ඒ නිසා විශේෂඥයින් මඟ පෙන්වන විධියට තමයි තීරණ ගත යුත්තේ. අතිගරු ජනාධිපතිතුමාටත් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. විද්‍යාත්මක පදනමින් තීරණ ගත යුතුයි කියලා මම හිතනවා. මේ ගැන ජනතාවට පැහැදිලි කළොත්, ජනතාව තේරුම් ගනීවි.

රජය පෙරළනවා කියන එක නම් වෙනම කථාවක්. ඒක නම් කවදාවත් කරන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මගේ නම සඳහන් කළ නිසා මට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, නීත්‍යානුකූලව අවුරුදු 5කට වරක් රජයක් පත් වෙන එක ඇත්ත. නමුත් රජය පෙරළනවාද, නැද්ද කියන එක තීරණය කරන්නේ නීත්‍යානුකූලව පත් වුණු රජය නොවෙයි, ජනතාවයි. මේ රටේ වකුගඩු රෝගීන් ලක්ෂ 3ක් ඉන්නවා. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා කියනවා, ග්ලයිෆොසේට් විද්‍යාත්මකව ඕනෑය කියා බුද්ධි මාරඹේ කිව්වාය කියලා. බුද්ධි මාරඹේ විතරද, මේ රටේ විද්‍යාඥයෙකුට ඉන්නේ? රනිල් සේනානායක මැතිතුමා අන්තර් ජාතික වශයෙන් පිළිගැනීමක් තිබෙන විද්‍යාඥයෙක්. මේ ගැන එතුමා කියලා තිබෙනවා; ප්‍රියාණී පරණගම මහත්මිය කියලා තිබෙනවා. මේ රටේ සියලුම විශ්වවිද්‍යාලවල මේ ක්ෂේත්‍රයට අදාළව සිටින විද්‍යාඥයන් 100කට වඩා පිරිසක් කමිටුවක් පත් කරලා අතිගරු ජනාධිපතිතුමාට උපදෙස් දුන්නා, මේක තහනම් කිරීමට ප්‍රථම. අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිතුමා හැටියට සිටි කාලයේ මේ පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවකදී මේ සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. ඊට පසුව වර්තමාන ජනාධිපතිතුමා රටට කිව්වා මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් මම මේක තහනම් කරනවාය කියලා. ඊට පසුව නවින් දිසානායක මැතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එසේ ඉදිරිපත් කළාට පසුව පාර්ලිමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් අතුරු කමිටුවක් පත් කළා. අතුරු කමිටුවේ හිටියේ කවුද? රාජිත සේනාරත්න මැතිතුමායි, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමායි. ආර්ථික කමිටුවක් කියලා එකක් කොහේදෝ රැස් වුණා. එම කමිටුව කවුරු පත් කළාද කියලා දන්නේත් නැහැ. ඇමෙරිකාවේ ඉඳලා කවුදෝ මිනිහෙක් ඇවිල්ලා ඉන්නවා. ඔහුට පුළුවන්ද, ග්ලයිෆොසේට් තහනම ඉවත් කරන්න? කෝ, කැබිනට් එකෙන් පත් කරපු -[බාධා කිරීම්] යහපාලනය කියන්නේ මේකද? කෝ, කැබිනට් එකෙන් පත් කරපු කමිටුව? කෝ, කමිටු වාර්තාව? ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන අයිතිය මොකක්ද, එහෙම කියන්න? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නම්. බොහොම ස්තුතියි, ගරු ස්වාමීන් වහන්ස. [බාධා කිරීම්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් විවාදයක් කරන්න අවශ්‍ය නම් අපට -

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මෙය මම ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් නිසා මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න. [බාධා කිරීම්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, ගරු ස්වාමීන් වහන්සේටද, මටද අවස්ථාව දෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මම අපේ ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ අපහසුතාවට පත් කරන්න හැදුවා නොවෙයි.

මම ඇහුවේ ඒකාබද්ධ විපක්ෂය කියන මතයද, ගරු ස්වාමීන් වහන්සේ කියන මතයද අපි පිළිගන්නේ කියන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ අදහස් දක්වා අවසානද?

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය හා මා අතර තිබෙන සම්බන්ධය, ප්‍රතිපත්තිමය සම්බන්ධයක්. ඒකාබද්ධ විපක්ෂය මේකට මා සමඟ එකතු වෙනවා නම්, ඒ පෙරහැරේ මම යන බව පැහැදිලිව කියනවා. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 12 - 2316/'17-(1), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අතිපූජ්‍ය රතන ස්වාමීන්වහන්සේ ඉදිරිපත් කරපු අදහස් ඉතා වැදගත්. අවුරුදු ගණනාවක් තිස්සේ රටට හානිකර දෙයක් වැළැක්වීම සඳහා උන්වහන්සේ දිගටම කටයුතු කරලා තිබෙනවා. අපි ඒක අගය කරනවා. අපේ ආණ්ඩුවත් ඒක අගය කළා. මේ කාරණයේදී ඒ සඳහා අවශ්‍ය කරන යම් යම් පියවර ගැනීමට ඔබවහන්සේට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරනවා. ඇමෙරිකන් කොම්පැනියට වඩා රට ලොකුයි කියන එක ඉතාම වැදගත් කියා මා ප්‍රකාශ කරනවා. ඒ වාගේම ,-[බාධා කිරීමක්] ඒ කාලයේ නොවෙයි, මේ කාලයේ. අහගන්න, මේ කාලයේ. ගරු කථානායකතුමනි, [බාධා කිරීම්] ඉතාම වැදගත්,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!
ගරු මන්ත්‍රීතුමා, ඉඳගන්න. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉඳගන්න. වැඩක් නැහැ ඔබතුමන්ලාගේ switch එක අදම off වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා 23(2) යටතේ ප්‍රකාශය කරන්න.[බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, තව විනාඩි පහකින් මේ switch ඔක්කෝම off වෙනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක කියන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මෙතුමන්ලා මේ පොහොර කතන්දරේට මේ තරම් විරුද්ධ වෙනවා නම්, ඇයි, වේදිකාවක් වේදිකාවක් ගණනේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, දැන් ඔබතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය අහන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ඉතාම වැදගත් ලිපිගොනුවක් ඔබතුමාට නැකතට භාරදෙන්න බලාගෙන ඉන්නවා. ඒ ලිපිය දැන් ඔබතුමාට භාරදෙන්න පුළුවන් ද? ඔබතුමා නිල කාමරයට යන්න කලින් විශ්වාස භංග යෝජනාවට අත්සන් කරපු ලිපි ගොනුව දැන් භාරදෙන්න පුළුවන්ද? නැත්නම් නිල කාමරයට එන්නද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නිල කාමරයට එන්න. සාමාන්‍යයෙන් ඒවා මෙතැනදී කෙරෙන්නේ නැහැ නේ.

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය අහන්න.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

භූගත ජලය අසීමිත භාවිතයෙන් සිදු කරන පරිසර හානිය
நிலத்தடி நீரின் அதீத பாவனையால் ஏற்படும் சுற்றாடல் பாதிப்பு
ENVIRONMENTAL DAMAGE CAUSED BY OVER-ABSTRACTION OF GROUNDWATER

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, හෙට -මාර්තු 22- ලෝක ජල දිනයයි. එම දිනය ලොවපුරා පානීය ජලය සැපයීම, ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කැපවෙන දිනයක් බවටත් ප්‍රකාශයට පත්ව ඇත. "Nature for Water" is the theme for this year. The Hon. Minister of City Planning and Water Supply is here, but I am not posing the Question to you. I am posing the Question to the Hon. Minister of Irrigation and Water Resources Management.

"ජලය සඳහා ස්වභාව ධර්මය" මේක තමයි තේමාව. ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මෙයයි.

(1) කොළඹ දිස්ත්‍රික්කයේ කැලණි මිටියාවතේ ආටිගල ග්‍රාමයෙහි පිහිටි American Premium Water Systems (Private) Limited කියන සමාගම භූගත ජලය අපරිමිත වශයෙන් උරා ගැනීම, ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල තත්ත්වයට සම්බන්ධ ළිංවලට හා පරිසරයට හානියක් බවට පත්ව ඇති බව අමාත්‍යතුමා පිළිගන්නේද?

(2) මෙම සමාගම වතුර බෝතල් කිරීම සඳහා ලබාගෙන ඇති අවසරය ඉක්මවා ජලය ලබාගෙන ඇත. අවසරය ලබාගෙන ඇත්තේ ලීටර් ලක්ෂ දෙකකටයි. දැන් ලීටර් ලක්ෂ හතකට වඩා පොළොවෙන් පොම්ප කර ඉවත් කරනවා. ගරු කථානායකතුමනි, ලබාගෙන ඇති අවසරය ඉක්මවා ලීටර් ලක්ෂ ගණනාවක් අසීමිත ලෙස ගනිමින්, නිකුත් කර ඇති උපදෙස් උල්ලංඝනය කිරීම පිළිබඳව දැන් ඒ ප්‍රදේශයේ මහජන විරෝධය ගැන ද නොතකා කටයුතු කරන බැවින් ලෝක ජල දිනය වන හෙට දිනයේදීවත් ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් මේ අපරාධය නැවැත්වීමට කටයුතු කරනවාද?

පානීය ජලය රට පුරා ජනතාවට ලබාදීම වෙනුවෙන් ස්වභාව ධර්මයෙන් ලැබෙන ජලය ආරක්ෂා කරදීම සඳහා ප්‍රතිපත්තියක් තිබෙනවාද?

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම මේ ප්‍රශ්නය අහන්නේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

දැන් ගරු ගරු රවුෆ් හකීම් ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානයට තව කරුණක් යොමු කරන්න කැමතියි. 2017 නොවැම්බර් 22වන දා ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය යටතේ පැවැති විවාදයේදී මේ ප්‍රශ්නය ඇහුවාම, ගරු වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා කිව්වා, "වහාම ගැසට් නිවේදන පිට කරලා නවත්වනවා" කියලා. නමුත් අද වනතුරු එම ගැසට් නිවේදනය නිකුත් කිරීමක් හෝ මෙලෙස වැරදි ලෙස පොළොවෙන් ජලය ගැනීමේ ක්‍රියාමාර්ගයට විරුද්ධව අදාළ බලධාරීන් කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ වාගේම ගරු කථානායකතුමනි,-

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order, Hon. Member?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, ඊටත් වඩා වැදගත් කරුණක් මම මතු කරන්නේ. මම ගම්පහ ආසනයේ සංවිධායකවරයා වශයෙන් කියන්නේ, මගේ රතුපස්වල ගමේ මිනිසුන් වතුර ඉල්ලද්දී වෙඩි තියලා මරපු එකත් මෙවර ජල දිනයේදී කථා කළ යුතු බවයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, it is not a point of Order.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, American Premium Water Systems (Pvt) Limited කියලා කිව්වාට, මේක ඇමෙරිකන් සමාගමක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, let the Hon. Minister reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියන්නේ ගරු රවුෆ් හකීම් ඇමතිතුමාට. American Premium Water Systems (Pvt) Limited කියලා නමක් දා ගත්තාට මේක ඇමෙරිකන් සමාගමක් නොවෙයි. මේක ජනතාවගේ ජලය උරා බොන්න හදා ගත්ත සමාගමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Minister. - [*Interruption*.] But, you have already raised the Question . -[*Interruption.*] You have raised the Question and I have allowed you some additional points too.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I have another point. So, please allow me to raise that also.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please raise that quickly. Then the Hon. Minister can reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා මේ අවස්ථාවේදීම මේ කාරණයත් නිවැරදි කර ගැනීම සඳහා. ඊයේ පාර්ලිමේන්තුවේදී මගේ මිත්‍ර නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට, නඩුකාරවරුන්ට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is a different matter. Now, let the Hon. Minister reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Let me raise this first. Hon. Speaker, I am raising an important issue.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
This is not related to the Question.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Give me just one more minute to raise this.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Minister reply the Question first. Thereafter I will give you time

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. මොකක්ද කළේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, රන්ජන් රාමනායක මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කරලා, ආණ්ඩුවේ ප්‍රතිපත්තියද ප්‍රකාශ කරලා තිබෙන්නේ කියලා අපට කියන්න. ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කරමින්, නඩුකාරවරුන්ට අපහාස කරමින්, එතුමා ඊයේ පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයක් කළා. මම ගරු කථානායකතුමාගෙන් අහනවා,- [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුව තුළ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. තවම ඒක දන්නේ නැහැ. මේක පාර්ලිමේන්තුව.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
පාර්ලිමේන්තුවේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. මම මතක් කරනවා, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා යම් අවස්ථාවකදී කරපු ප්‍රකාශයක් නිසා රුපියල් 50,000ක්ද කොහේද දඩ ගහපු බව. නිවැරදි කිරීමට යටත්ව මම මේ කියන්නේ. ප්‍රශ්නය, අදහස් ප්‍රකාශ කරන එක නොවෙයි. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා ඒ නිදහසෙන් යමෙක් පහර දෙන කොට, විශේෂයෙන් ස්වාධීන වූ අධිකරණයට පහර දෙන කොට ඒ කෙරෙහි අවධානය යොමු කරවන්න ඕනෑ. ඊයේ මූලාසනයෙන් ඒක නතර කරන්න තිබුණා. නමුත්, අද එයට ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් මොනම අධිකරණයක වේවා, විනිශ්චයකාරවරයකුට චෝදනාවක් තිබෙනවා නම්, විශේෂ යෝජනාවක් ගෙනැල්ලා ඒ ගැන විවාද කරමු. පර්ලිමේන්තුව මීට වඩා උසස් විධියට වැඩ කළොත් හොඳයි කියලායි මම හිතන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එදා ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාට දඩ ගැහුවේ නැහැ. එතුමාට කිව්වේ, පිනට -charity- ගෙවන්න කියලා. එතුමාට දඩ ගැහුවේ නැහැ. මම පාර්ලිමේන්තුවේ හිටියා නේ.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
එහෙම නම් මම ඒක නිවැරදි කරන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
He was asked to pay for charity.

අනෙක් එක, මෙතුමන්ලා තමයි අග්‍ර විනිශ්චයකාරතුමියව එළෙව්වේ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තමයි අග්‍ර විනිශ්චයකාරතුමියව එළෙව්වේ. [බාධා කිරීම්] අපි ඒකට විරුද්ධව කථා කළා. [බාධා කිරීම්] මේ අය තමයි එළෙව්වේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ප්‍රධාන කටයුතුවලට යමු.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද? අද ප්‍රධාන කටයුතුවලට යන්න තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] කථා කළාම, මෙතැන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම වචනය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීවරයා විනිශ්චයකාරවරුන්ගේ නම් කිය කියා චරිත ඝාතනයක් කළා. විනිශ්චයකාරවරුන්ගේ, නීතිඥවරුන්ගේ චරිත ඝාතනයක් කළේ. මිනිස්සුන්ගේ චරිත ඝාතනය කරන්න නොවෙයි, මේ ගරු සභාව තිබෙන්නේ. යම්කිසි විනිශ්චයකාරවරයකු පිළිබඳ එවැනි චෝදනාවක් තිබෙනවා නම්, විධිමත් පරීක්ෂණයක් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ සභාව තිබෙන්නේ චරිත ඝාතනය කරන්න නොවෙයි. ඒ වාගේම තමයි කුලියාපිටියේ සිද්ධියක් අල්ලාගෙන කඩ ගිනි තිබ්බා කියලා බොරු කිව්වා, වීරවංශ මහත්මයා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ඒ වාගේම රටේ මූලික අයිතිවාසිකම් නීතිය කඩ කරලා passports දෙකක් පාවිච්චි කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් point of Order ඉදිරිපත් කරන්න ඇති වෙන්න අවස්ථාව දුන්නා. කරුණාකරලා දැන් රවුෆ් හකීම් ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අහපු ප්‍රශ්නයට ඇත්ත වශයෙන්ම පිළිතුර දිය යුත්තේ මාගේ මිත්‍ර වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා. නමුත් අමාත්‍ය මණ්ඩලයේ සිටින ඇමතිවරුන් හැටියට මේ පිළිබඳව අපි දන්නා කාරණයක් තමයි, භූගත ජලය නළ ළිං මාර්ගයෙන් අසීමිත ලෙස ලබා ගැනීම නවතාලීම සඳහා එතුමා මෑතකදී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ බව. ඒක නියාමනය කිරීම සඳහා ගැසට් නිවේදනයක් පළ කිරීම පිළිබඳව අපි අමාත්‍ය මණ්ඩල සන්දේශයක් අනුමත කළා. ගැසට් නිවේදනය පළ වුණාද, නැද්ද කියා මා දන්නේ නැහැ. නමුත් අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කළා කියන එක මා මතක් කළ යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා අභපු ප්‍රශ්නයට උත්තරය එවා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එහෙම නම් පළමුවෙන් එම උත්තරය දෙන්න ගරු සභානායකතුමාට අවස්ථාව දෙන්නද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඇමරිකන් වෝටර් සිස්ටම් ආයතනය මඟින් භූගත ජලය ලබා ගැනීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවගේ ළිං සහ පානීය ජල තත්ත්වයට හානියක් නොවන ලෙස එම ජල ප්‍රභවවලින් ලබා ගත යුතු ජල පරිමාව නිර්ණය කර අදාළ වාර්තා අදාළ ආයතන වෙත ලබා දී ඇත. දැනට මනු සවිකර නොමැති නිසා පරිමාව ගණනය කළ නොහැකි වී ඇති අතර, මනු සවි කිරීමට කටයුතු යොදා ඇත.

   තවම ජල මනු සවිකර නැහැ කියා පිළිගන්නවා.

2. මෙම ළිං සඳහා ජල මනු සවිකර ගැනීමට උපදෙස් දී ඇති අතර, ලබා දී ඇති වාර්තාවල සඳහන් නිර්ණායකයන් උල්ලංඝනය කර වැඩිමනත් ජලය උකහා ගන්නේ නම් එම ආයතනයට විරුද්ධව ජල සම්පත් මණ්ඩලය විසින් නීතිමය කටයුතු කිරීමට පියවර ගනු ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර අනවශ්‍ය ගැටුමක් ඇති නොවන ආකාරයට පාර්ලිමේන්තුවේ කටයුතු කරන්න මැදිහත් වෙන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා වශයෙන් ඔබතුමා මේ ගරු සභාවේ නැති අවස්ථාවක, ඊයේ දිනයේ දී සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් සඳහන් කරනවා නම්, මෙම ගරු සභාවට පිළිතුරු දෙන්න බැරි, විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් යම් කාරණා සඳහන් කිරීම වළක්වන්න මූලාසනයට අවස්ථාව තිබුණා. නමුත් මූලාසනයෙන් එසේ කටයුතු කළේ නැහැ. ඔබතුමන්ලා මැදිහත් වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්ලා දහතුන්දෙනෙක් නිශ්චිත වශයෙන් නම් කරලා තිබෙනවා. මේ ආයතන දෙක අතර පැහැදිලි ගැටුමක් නිර්මාණය වන තත්ත්වය වැළැක්වීම සඳහා ඔබතුමා මැදිහත් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන සොයා බලනවා, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ස්ථාවර නියෝග 23(2) යටතේ දෙවැනි ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

II

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මතුවී ඇති ගැටලුකාරී තත්ත්වය

கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபையில்

ஏற்பட்ட சிக்கலான நிலைமை

PROBLEMATIC SITUATION ARISEN IN AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

1973 අංක 27 දරන රක්ෂණ පනත මඟින් පිහිටුවන ලද කෘෂි රක්ෂණ මණ්ඩලයට මේ වන විට වසර 45ක කාලයක් ගතවී ඇති නමුත් එම ආයතනය මෑත කාලීනව ගොවි ජනතාවගේ සහ එහි කාර්ය මණ්ඩලයේ සුභසිද්ධියට යෙදවෙනු වෙනුවට එහි ප්‍රධානීන්ගේ පෞද්ගලික වුවමනාකම් වෙනුවෙන් යෙදවෙන බවට චෝදනා නැඟී තිබෙනවා.

විශේෂයෙන්ම පෞද්ගලික රක්ෂණ සමාගමක් වසා දැමීමට වගකිව යුතු සහ ඒ සම්බන්ධයෙන් රුපියල් මිලියන 42කට අධික මුදලක් සාපරාධී සාවද්‍ය පරිහරණය පිළිබඳ නඩු පැවරී ඇති සිඩ්නි ගජනායක නම් අයෙකු වත්මන් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබ ඇති බවටත්, ඔහු පසුගිය වසර 3ක කාලය තුළ ආයතනයේ විවිධ වංචා හා දූෂණ සිදු කර ඇති බවටත් සේවකයින් විසින් චෝදනා කර තිබෙනවා. රජයේ විගණනයක ප්‍රතිඵලයක් ලෙස ඔහු විසින් වංචා කරන ලද රුපියල් ලක්ෂ 8ක මුදලක් නැවත අය කර ගැනීම තවත් එක් සිදුවීමක් පමණයි. එසේම මෙම ආයතනය පිළිබඳව කෝප් කමිටුව විසින් 2016දී සිදු කළ පරීක්ෂණයකට අනුව මොහු මණ්ඩලයේ සභාපති ධුරයෙන් ඉවත් කරන ලෙසට නිර්දේශ කරනු ලැබ සිටියදී තවමත් එම තනතුරේ රැඳී සිටීම විමතියට කරුණක්.

විශේෂයෙන් පසුගිය පෙබරවාරි මාසයේ 10වැනි දින සිට නැවත වසර තුනක කාලයක් සඳහා ඔහුගේ ධුර කාලය දීර්ඝ කර ඇති බවට ඇමතිවරයාගේ අත්සනින් යුතු ලිපියක් මේ වන විට ආයතනයට ලැබී තිබෙනවා. මෙම තැනැත්තා ඉවත් කරන ලෙසට පාර්ලිමේන්තු කමිටු නිර්දේශ කර තිබියදී, නැවතත් අවුරුදු තුනකට පත් කරන්නේ ඇයි කියලා ඔබතුමන්ලාගෙන් දැන ගැනීමට අවශ්‍යයි.

මේ දක්වා රාජ්‍ය ආයතනයක් වශයෙන් පවත්වා ගෙන එනු ලැබූ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදම් මහා භාණ්ඩාගාරය මඟින් දරනු ලැබුවා. නමුත් මේ වන විට වත්මන් සභාපතිවරයා ආයතනය භාණ්ඩාගාරයේ පාලනයෙන්

ඉවත් කරවා, ස්වයං මූල්‍ය පදනමක් යටතේ ආයතනය පවත්වා ගැනීමට කටයුතු කරන බව ප්‍රකාශ කර තිබෙනවා. මෙය එහි අරමුදල් හිතුමනාපයේ පාලනය කිරීම සඳහා දරන උත්සාහයක් බවට චෝදනා නැඟී තිබෙනවා.

එවන් තත්ත්වය තුළ සභාපතිවරයා 2018 ජනවාරි මාසයේ සිට දිස්ත්‍රික් කාර්යාලවල වැටුප් එම කාර්යාලයේ ආදායමින් සොයා ගන්නා ලෙසට නියෝග කර තිබෙනවා. ඒ අනුව 2018.01.12වැනි දින දිස්ත්‍රික් කාර්යාලවලට වැටුප් ගෙවීම අත්හිටුවමින් ලිපියක් නිකුත් කරනු ලැබ තිබෙනවා. නව තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය පත්ව ඇත්තේ බරපතළ ගැටලුකාරී තත්ත්වයකටයි. මොකද, එම කාර්යාලවලට වැටුප් උපයා ගැනීමේ හැකියාවක් නැහැ. දැන් වැටුප් ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී තිබෙනවා.

එසේම වත්මන් සභාපතිවරයා විසින් තමා කලින් සිටි රක්ෂණ සමාගමේ නිලධාරීන් ඉහළ වැටුප් හා දීමනාවලට විවිධ තනතුරුවලට බඳවා ගනිමින් වාහන රක්ෂණ යෝජනා ක්‍රම, සුවසෙත වැනි වෙනත් රක්ෂණ ක්‍රම ප්‍රවර්ධන කටයුතු අරඹා තිබෙනවා.

වාහන රක්ෂණය කිරීම වැනි දේවල්වලට වෙන ආයතන තිබෙනවා. මේ, ධීවර ජනතාවගේ සහ ගොවි ජනතාවගේ වුවමනාව වෙනුවෙන් පිහිටුවන ලද කෘෂි රක්ෂණ මණ්ඩලය.

මේ තත්ත්වය තුළ ගොවි ජනතාව වෙත ප්‍රතිලාභ ලෙස ලබා දීම සඳහා වන අරමුදල් විනාශ වී යෑමේ තර්ජනයක් ඇති වී තිබෙනවා. එසේම මණ්ඩලයේ රක්ෂණ අරමුදල් විදේශීය සමාගමක ප්‍රතිරක්ෂණය වෙනුවෙන් මිලියන 600ක් ගෙවීමට සූදානම් වන බවටද, එය කෘෂි රක්ෂණ මණ්ඩලය වැනි සීමිත කෘෂි රක්ෂණ ආදායම් උපයන ආයතනයක් අවදානමේ හෙළනු ඇති බවටද, මෙම පියවර පිටුපස රහසිගත කොමිස් ගනුදෙනුවක් ඇති බවටද සේවකයින් සැක පළ කරනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පිළිබඳව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ලබා දුන් නිර්දේශ පිළිබඳව අමාත්‍යවරයා දැනුවත්ද?

   මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා දැනුවත් නැත්නම්, මට ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්න පුළුවන්. මේ අවස්ථාවේදීත් මගේ ළඟ එම නිර්දේශ තිබෙනවා.

2. පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ පරීක්ෂණයේදී මෙම සභාපතිවරයා නුසුදුසු අයෙකු බව නිර්දේශ කරනු ලැබ තිබියදී ඔහු තවත් වසර තුනකට සභාපති ධුරයට පත් කරන ලද්දේ කෙසේද? ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාත් දන්නවා ඇති. ඔබතුමා මූලාසනය දරන එම කාරක සභාවෙන් ඔහු නුසුදුසු බව නිර්දේශ කර තිබියදී තමයි පෙබරවාරි මාසයේ 10වෙනි දා නැවත අවුරුදු තුනකට මේ සේවා දිගුව ලබා දී තිබෙන්නේ.

3. සභාපතිවරයා විසින් ස්වයං මූල්‍ය පදනමක් යටතේ ආයතනය පවත්වා ගැනීමට තීරණය කර ඇත්තේ කෙසේද? එම පියවර නීත්‍යානුකූල වන්නේද?

4. සභාපතිවරයා විසින් කාර්ය මණ්ඩල වැටුප් අදාළ දිස්ත්‍රික් කාර්යාලයේ ආදායමින් සොයා ගන්නා ලෙසට නියෝග කිරීම පිළිබඳව ආණ්ඩුව දැනුවත්ද? මේක ආණ්ඩුවේ ප්‍රතිපත්තියද? එම පියවර ගොවි ජනතාවගේ අරමුදල්වලට තර්ජනයක් නොවන්නේද?

5. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ විෂය පථයට නොවැටෙන වෙනත් රක්ෂණ ක්‍රම ආරම්භ කිරීමට රජයේ අනුමැතිය ලබාගෙන ඇත්ද? එම රක්ෂණ මුදල් කෘෂි රක්ෂණ අරමුදලට සම්බන්ධ කිරීම ඉදිරියේ ගොවි ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභයන්ට අවදානමක් නොවන්නේද?

6. රුපියල් මිලියන 600ක අවදානම් සහගත පිරිවැයක් දරමින් විදේශීය සමාගමක ප්‍රතිරක්ෂණයක් කිරීමට පියවර ගෙන ඇත්ද? එසේනම්, ඒ පිළිබඳ තීන්දුව කාගේ නිර්දේශ මත, කවර පදනමකින්, කවුරුන් විසින් ගන්නා ලද්දක්ද? මෙම පියවර නතර කිරීමට කටයුතු කරන්නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු කථානායකතුමනි, ඊළඟ රැස්වීම් සතියේ දී මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයන බව කියා සිටිනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 23.(2) යටතේ ජනවාරි මාසයේ 23 වෙනි දා ඉතා වැදගත් ප්‍රශ්නයක් විමසුවා. අග්‍රාමාත්‍යතුමාගෙන් තමයි මා ඒ සම්බන්ධයෙන් පිළිතුරු විමසා සිටියේ. නමුත්, අග්‍රාමාත්‍යතුමා පිළිතුරු ලබා දුන්නේ නැහැ. සභානායකතුමා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කර සිටියා, කඩිනමින් ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන බව. ඒ කියන්නේ ඊළඟ පියවර විදිහට ආයතනයට අයත් මූල්‍ය සමාගම් සහ මාධ්‍ය ආයතන පැවරීම පිළිබඳ ප්‍රශ්නය දැන් විශාල ආන්දෝලනයකට තුඩු දී තිබෙනවා. මෙම තත්ත්වය වර්ධනය වීමට පෙර තමයි මේ පිළිබඳව විධිමත් පිළිතුරක් ලබා දෙන්න කියලා අග්‍රාමාත්‍යතුමාගෙන් මේ පාර්ලිමේන්තුවේ දී ඉල්ලා සිටියේ.

ඔබතුමා එදා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, මෙම ඊළඟ පියවර විදිහට ආයතනය පවරා ගැනීම පිළිබඳව, එහි මූල්‍ය සමාගම, මාධ්‍ය ආයතන සහ අනෙකුත් ව්‍යාපාරික ජාලයන් පැවරීම පිළිබඳව විධිමත් පිළිතුරක් මේ පාර්ලිමේන්තුවට ලබා දෙන බව. හැබැයි දැන් සැලකිය යුතු කාලයක් -මාස දෙකකට ආසන්න කාලයක්- ගත වෙලා තිබෙනවා. නමුත් තවමත් මේ පාර්ලිමේන්තුවට පිළිතුරක් ලබා දීලා නැහැ. අග්‍රාමාත්‍යවරයාට විශ්වාසභංග යෝජනාවකුත් ඉදිරිපත් වෙලා තිබෙන තත්ත්වයක් යටතේ එම යෝජනාව විභාගයට ගන්නට පෙර, අඩුම තරමින් අගමැතිකමට තට්ටුවෙන්නට පෙර එතුමා මේ සභාවට ඇවිල්ලා පිළිතුරක් ලබා දෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I will inform the Hon. Prime Minister's Office to give an early reply.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Bimal Rathnayake, what is your point of Order?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 128අ. උසස් නිලතල පිළිබඳ කාරක සභාව පිළිබඳවයි මේ ප්‍රශ්නය නඟන්නේ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මීට පෙර ප්‍රශ්නයක් මතු කළා. උසස් නිලතල පිළිබඳ කාරක සභාව සම්බන්ධව ස්ථාවර නියෝග 128අ. (1)හි මෙසේ සඳහන් වෙනවා.

"අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදුව ඕනෑම තනතුරකට පත් කරන ලද්දා වූ හෝ ඕනෑම තනතුරක නිලයක් දැරීමට නම් කරන ලද්දා වූ හෝ ඕනෑම පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කොට බලා, එවැනි පුද්ගලයන් සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කරනු සඳහා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද මන්ත්‍රීන් දොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුත්, උසස් නිලතල පිළිබඳ කාරක සභාව යනුවෙන් හැඳින්වෙන කාරක සභාවක් වන්නේ ය."

ඒ වාගේම ස්ථාවර නියෝග 128අ.(2)හි මෙසේ සඳහන් වෙනවා:

"කාරක සභාවට ඊට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත් ඉහත (1)හි සඳහන් කවර හෝ පුද්ගලයකුගේ, ..."

ඒක තමයි ගරු කථානායකතුමනි වඩාත්ම වැදගත් වෙන්නේ.

"... යෝග්‍යතාව පූර්ණ වශයෙන් විමර්ශනය කිරීමට අවශ්‍ය වන්නා වූ සියලුම කාර්යයන් කිරීමේ බලයක් ඇත්තේ ය."

ගරු කථානායකතුමනි, ඒ අනුව කැබිනට් මණ්ඩලය ගන්නා තීරණයක් ගැන එකඟවීම හෝ එම තීරණයක් නතර කිරීමේ බලය ස්ථාවර නියෝග අනුව උසස් නිලතල පිළිබඳ කාරක සභාවට පැවරී තිබෙනවා. කෘෂි රක්ෂණ මණ්ඩලයේ ඔය කියන සභාපතිවරයා සම්බන්ධයෙන් පරීක්ෂණ අවස්ථාවේදී, -ඔබතුමාත් සිටින අවස්ථාවේදී- මමත් එහි සාමාජිකයෙක් වශයෙන් "කෝප්" එකේ නිර්දේශත් අරගෙන ගිහින් කරුණු කාරණා පෙන්වා දීලා තමයි මේ පුද්ගලයා වංචනික පුද්ගලයෙක්, ඔහු නුසුදුසුයි කියලා කිව්වේ.

ගරු කථානායකතුමනි, දැන් සිදු වෙලා තිබෙන දේ තමයි පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ නියෝගය කඩ කිරීම නිසා පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙනවා. ඒ තුළින් ඒ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් ඇත්තටම අපිව හැල්ලුවට ලක් වෙලා තිබෙනවා. එහි සභාපතිවරයා වශයෙන් මේ පාර්ලිමේන්තුවේ ප්‍රධානම පුද්ගලයා වන ඔබතුමාවත්, මේ කාරක සභාවත් සම්පූර්ණයෙන්ම දෙකයි පණහේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වරප්‍රසාද උල්ලංඝනය පිළිබඳව සොයා බලා, අදාළ ලේකම්වරයා හෝ අදාළ ඇමතිවරයාව කැඳවලා කෘෂි රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාට පමණක් නොවෙයි මේ නීතිය ක්‍රියාත්මක නොකළ පුද්ගලයන්ට එරෙහිවත් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත අනුව කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව මා සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා වූ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත - දෙවන වර කියවීම; කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත - දෙවන වර කියවීම; විදේශ විනිමය පනත යටතේ නියෝග අනුමත කිරීම.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, Item No. 1, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත අද දින විවාදයට ගන්නේ නැහැ, සිකුරාදාට විවාදයට ගන්නවා.

විෂය අංක 2, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත -

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගියා. ඊට පසුව ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් අපි ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වය පළ කළා. හිටපු ජනාධිපති හා හිටපු මුදල් ඇමති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පනත් කෙටුම්පතේ තිබෙන භයානකකම ගැන අතිගරු ජනාධිපතිතුමාටත් දැනුම් දීලා, ඒ පනත් කෙටුම්පත අද දිනයේ විවාද කිරීම නතර කළා. සිකුරාදාට මේ පනත් කෙටුම්පත විවාද කිරීම සම්බන්ධයෙන් අපි එකඟ වන්නේ නැහැ. මොකද, සංශෝධනයකින් තොරව මේ පනත් කෙටුම්පත සම්මත කරන්න ඉඩ දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. මක් නිසාද යත්, මේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට තිබෙන මුදල් බලය සම්පූර්ණයෙන් උදුරා ගන්නා පනත් කෙටුම්පතක් නිසායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට දහවල් 12.00ට Party Leaders' Meeting එක තිබෙනවා. එතකොට මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන්. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා අවසන් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය සිකුරාදාට ගන්නවා. [බාධා කිරීම්]

කැමැත්ත ඇතිව. [බාධා කිරීම්] කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත Second Reading දක්වා ගිහින් Committee Stage Discussion එක කල් දමන්න බලාපොරොත්තු වනවා. Item No. 3, විදේශ විනිමය පනත යටතේ නියෝග පිළිබඳ විවාදය අද දින පැවැත්වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විශේෂයෙන්ම ඔබතුමන්ලා අද දින විවාදයට ගන්නේ නැහැයි කියන පනත් කෙටුම්පත පිළිබඳව විශාල සමාජ ආන්දෝලනයක් ඇති වෙලා තිබුණා. ඔබතුමන්ලා අද දින මේ සභාවට ඇවිල්ලා එක වරටම කියනවා, අද දින මෙම පනත් කෙටුම්පත විවාදයට ගන්නේ නැහැයි කියලා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් කැඳවා පනත් කෙටුම්පත් පිළිබඳ විවාද කිරීම සඳහා දින නියම කරනවා. ඉන් අනතුරුව අපි විවාදවලට ලෑස්ති වෙනවා. තමුන්නාන්සේලා හිටි හැටියේ ඇවිල්ලා කියනවා, "මේ පනත් කෙටුම්පත අද දින විවාදයට ගන්නේ නැහැ, අද ඡන්දය ගන්නේ නැහැ, හෙට විවාදයට ගන්නේ නැහැ"යි කියලා. ඒ නිසා ආණ්ඩුව පාර්ලිමේන්තුව නොකැඳවා ඉන්න. මෙවැනි විකාර කරන්න එපා. අපේ මන්ත්‍රීවරු සියලුදෙනාම Debate එකට සූදානම් වෙලා පැමිණ සිටිනවා. ඔබතුමන්ලා හිටපු ගමන් කියනවා, "අද දින මේ පනත් කෙටුම්පත විවාදයට ගන්නේ නැහැ, මේ පනත් කෙටුම්පත විවාදයට ගන්නේ නැහැ"යි කියලා [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, අපි පක්ෂ නායක රැස්වීමේදී පෙන්වා දුන්නා මේක ගන්න එපා කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හෙට කථා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි පක්ෂ නායක රැස්වීමේදී පෙන්වා දුන්නා මේක ගන්න එපා කියලා. මේ ගැන ආන්දෝලනයක් තිබෙන නිසා මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ, සාකච්ඡා කරලා විවාදයට ගනිමු කියා අපි කිව්වා. පක්ෂ නායක රැස්වීමේදී තමුන්නාන්සේලා තර්ක කළා, "නැහැ, මේක ගන්න ඕනෑ" කියලා. මේක විවාදයට ගත්තේ නැත්නම් සියදිවි හානි වෙනවා වාගේ වැඩක් හැටියටයි කථා කළේ. අද ඇවිල්ලා පූස් පැටව් වාගේ කියනවා, "නැහැ, ගත්තේ නැතිවාට කමක් නැහැ" කියලා. මොකක්ද මේ විකාරය?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ නියෝග සම්බන්ධයෙන් යම් යම් අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ යෝජනා සැලකිල්ලට භාජන කරලා තමයි අපි කිව්වේ සිකුරාදාට ගනිමු කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We can discuss that tomorrow.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, සභානායකතුමා ඔබතුමාට පොරොන්දුවක් දුන්නා සිකුරාදා දිනයේ විවාද කරනවා, හැබැයි කාරක සභා අවස්ථාවට යන්නේ නැහැ, ඡන්ද විමසීමක් ගන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] නැහැ, ඒක තමයි කිව්වේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, අපි හෙට 12.00ට හමු වෙනවා. 12.00ට හමු වුණාම, we will take a decision.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට කියන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඔබතුමා සිකුරාදා වනවිට දිවයිනේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඉන්නවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමා ජිනීවා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ජිනීවා පස්සේ. මම මේ වැඩ කරනවා. ජිනීවාට වැඩිය පාර්ලිමේන්තුව, - [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
දිවයිනෙන් බැහැර වෙන්නේ නැහැ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, අපි කියන්නේ මෙයයි. මේ පිළිබඳව බරපතළ සමාජ සාකච්ඡාවක් තිබෙනවා. අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා එකඟ වනවා ඇති,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම කතිකාවක් තිබෙන නිසා තමයි අපි මේක සිකුරාදාට ගන්න කිව්වේ. [බාධා කිරීමක්] ගන්න එපා කියලාද කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, අපි හෙට පක්ෂ නායක රැස්වීමේදී කථා කරලා තීරණයක් කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමේදී කථා කරමු.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව කතිකාවක් තිබෙන එක ඇත්ත; ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය එකත් ඇත්ත. නමුත් ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා, "මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නැහැ" කියලා. අපි Sectoral Oversight Committee එකේදී ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත්, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් සමඟ මේ සම්බන්ධයෙන් ඊයේත් දීර්ඝව සාකච්ඡා කළා. සාකච්ඡා කරලා සමහර ඒවා පිළිගත්තා; සමහර ඒවා පිළිගත්තේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී වැඩ කටයුත්තකදී එහෙම වෙනවා. නමුත්, රජයට මේ පනත් කෙටුම්පත සම්මත කර ගත යුතුව තිබෙනවා. මේක රජයේ වැඩක් නොවෙයි, රටේ වැඩක්. ඒ නිසා අපි මේ පිළිබඳව සාකච්ඡා කරලා සිකුරාදාට ගන්න යොදා ගනිමු, ගරු කථානායකතුමනි. මොකද, [බාධා කිරීම්] ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ සම්බන්ධව කිසිම ගැටලුවක් නැහැ. "මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නැහැ" කියලා ශ්‍රේෂ්ඨාධිකරණය අනුමැතිය දීලා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී තමයි න්‍යාය පත්‍රය සම්බන්ධව තීරණය කරන්නේ. සිකුරාදාට න්‍යාය පත්‍රයේ තිබෙන්නේ වෙනත් කටයුතු. [බාධා කිරීමක්] සභානායකතුමා කියනවා මෙය සිකුරාදාට ගන්නවා කියලා.

ඔබතුමා කරන්න ඕනෑ, පක්ෂ නායක රැස්වීමක් කැඳවලා සාකච්ඡා කිරීම විනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ නැති හානිදායක දේවල් කිරීම නොවෙයි. එසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි, හානිදායක, ජාතියේ අවසන් විනාශය සිද්ධ වන දේවලුත් කරන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එකක් තියෙන්න පුළුවන්. ඒ නිසා අපි තර්ක කරන්න ඕනෑ නැහැ. බරපතළ හානිදායක දේ ඉවත් කරන ලෙසයි අපේ ඉල්ලීම. ඒකයි අපේ ස්ථාවරය.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව තිබෙන විධියට රාජ්‍ය මූල්‍ය පිළිබඳ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවටයි තිබෙන්නේ. 2017 පාර්ලිමේන්තුව සම්මත කළ අය වැය ලේඛනය මෙයින් නිෂ්ප්‍රභා වෙනවා. අය වැය ලේඛනයේ විධිවිධාන ඉක්මවා යනවා. ඒ වාගේම රජය වෙනුවෙන් ණය ගත්තාම ඒ ණය ගෙවන්න වෙන්නේ ජනතාවටයි. නමුත් ණය ගන්න නිලධාරීන්ට විරුද්ධව කිසිම අධිකරණයක සිවිල් හෝ අපරාධ නඩුවක් දමන්න බැහැ. සිවිල් හෝ අපරාධ නඩුවක් දමන්න බැරි වන ලෙස ආරක්ෂාවක් නිලධාරීන්ට දෙන්නේ මොකටද? ජනාධිපතිවරයකුට නැති ආරක්ෂාවක් නිලධාරීන්ට දෙන්නේ කොහොමද? මේ ආරක්ෂාව අර්ජුන මහේන්ද්‍රන්ට දීලා තිබුණා නම් ඒක පාර්ලිමේන්තුවට- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, do you want to say something?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය කියා තිබෙනවා, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නැහැයි කියලා. ඒක පැහැදිලිව කියලා තිබෙනවා. මොනවාද, මේ කියන්නේ?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත මඟින් අමාත්‍යවරයාට බලය ලැබෙනවා, දැනට ලංකාව අරගෙන තිබෙන ණය ප්‍රමාණයෙන් සියයට 10ක පංගුවක් කැමැති පොලියකට කැමැති තැනකින් ගන්න. [බාධා කිරීම්] ඒ කියන්නේ බැඳුම්කර හොරකම ඇමතිවරයාට ඕනෑ විධියට ඊට වඩා සිය දහස් ගුණයක් වැඩියෙන් කරගෙන යන්න බලය ලැබෙනවා. ඒකට විරුද්ධව උසාවි යන්න බැහැ. උසාවියෙන් මුක්තිය ලැබෙනවා. හොරකමක් කරන්න නොවෙයි නම් යන්නේ, උසාවි යන්න බැරි ඇයි? [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will discuss that tomorrow. ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඊයේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි මේ පිළිබඳව කරුණු දැක්වීම් කළා. එම කාරක සභාවේ සභාපති ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමා විසින් ලබා දුන් ඒ වාර්තාව තිබෙනවා. එහි සඳහන් වෙනවා, "වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව බන්දුල ගුණවර්ධන මහතාගේ සහ වාසුදේව නානායක්කාර මහතාගේ එකඟත්වයකින් තොරව" කියලා. එහෙම තමයි මේක ඊයේ සම්මත වුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will discuss all that tomorrow.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි මතු කළ කරුණු රාශියක් තිබෙනවා. මා ඉල්ලා සිටින්නේ අපි මතු කළ ඒ කරුණු නැවතත් සාකච්ඡාවකට භාජනය කරන්නය කියලායි. මොකද, ඒ කරුණු පිළිබඳව ඊයේ අපට නිසි පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ ආණ්ඩු පක්ෂයේ සුදුසු වෙනත් අය සමඟ, ආංශික අධීක්ෂණ කාරක සභාවට වඩා බරපතළ සාකච්ඡාවකට මෙය යොමු කරන ලෙසයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. හෙට අපි ඒක සාකච්ඡාවට භාජනය කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු. ගරු සභානායකතුමා.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත
கொழும்பு பங்குத் தொகுதிப் பரிவர்த்தனையைப் பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம்
DEMUTUALIZATION OF THE COLOMBO STOCK EXCHANGE BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Bill be now read a Second time."

The Hon. (Dr.) Harsha De Silva will start the Debate.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා. ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[2.20p.m.]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
Hon. Deputy Chairman of Committees, today we are debating two Items. One is, Regulations under the Foreign Exchange Act and the other one is Demutualization of the Colombo Stock Exchange Bill. As the Hon. Leader of the House explained, we will debate the Demutualization of the Colombo Stock Exchange Bill, but we will not go for the Third Reading or the Committee Stage today.

Let me explain in simple language what we are trying to do here.

The following Regulations and Orders, which are the subjects under discussion today, issued under the Foreign Exchange Act, No. 12 of 2017 were published in the Government Gazette (Extraordinary) No. 2045/56 dated 17th November, 2017 after obtaining approval of the Cabinet of Ministers:

Foreign Exchange (Classes of Capital Transactions in Foreign Exchange Carried on by Authorized Dealers) Regulations No. 1 of 2017.

Foreign Exchange (Opening and Maintenance of Accounts for the purpose of engaging in Capital Transactions) Regulations No. 2 of 2017.

Foreign Exchange (Opening and Maintenance of Foreign Exchange Accounts) Regulations No. 3 of 2017.

Order under Section 8 of the Foreign Exchange Act, No. 12 of 2017.

Order under Section 31 of the Foreign Exchange Act, No. 12 of 2017

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Sir, the main areas liberalized under the new Foreign Exchange Act are the following:

1. Foreign exchange transactions have been further liberalized: Under the new liberalizations, the customers are able to directly go to the respective Authorized Dealers, that is Licensed Commercial Banks and Licensed Specialized Banks and execute their transactions. The Authorized Dealers should satisfy with the *bona fides* of the transaction and conduct due diligence with respect to those transactions to avoid unauthorized transactions under the liberalized regulatory framework.

2. The current transactions have been redefined in terms of the Article XXX(d) of IMF Articles on Agreement and it includes the following areas without being subject to any limitation:

   - All payments due relating to foreign trade, other current business including services and normal short-term banking and credit facilities
   - Payments due as interest on loans and as net income from other investments
   - Payments of moderate amount for amortization of loans or for depreciation of direct investments and
   - Moderate remittances for family living expenses.

   Under the Exchange Control Act, payments of moderate amount for amortization of loans or for depreciation of direct investments was considered as a Capital Transaction, but under the new Regulations, such payments are freely permitted. Further, the limitations on entrepot trade have been fully liberalized.

3. Determination of "a person resident in Sri Lanka": With a view to bring more clarity, a new criterion for determining a person's residential status was introduced based on the specific number of days spent in Sri Lanka - that is 183 days or more in aggregate - rather than focusing on permanent place of abode as considered in previous Exchange Control Act to be in line with the definition of Inland Revenue Act. So, all what we are trying to do here is to bring the Foreign Exchange Act in line with the Inland Revenue Act.

4. Foreign currency accounts: In terms of new Regulations, 18 accounts which were in operation under the Exchange Control Act were reclassified into five main categories with a view to removing ambiguities and to bring further clarity. So, the 18 accounts have become five accounts. Those reclassified accounts are,

   - Personal Foreign Currency Accounts (PFCAs)
   - Business Foreign Currency Accounts (BFCAs)
   - Inward Investment Accounts (IIAs)
   - Capital Transaction Rupee Accounts (CTRAs)
   - Outward Investment Accounts (OIAs)

   Sir, this was done to ensure clarity and convenience in dealing in foreign exchange. Free transferability of funds among similar category of accounts were also allowed.

5. Export and import of foreign currency or Sri Lankan currency and the possession of foreign currency by a person in or resident in Sri Lanka. In terms of the new Regulations, persons departing from or arriving in Sri Lanka were permitted to carry any amount of foreign exchange legitimately acquired by such persons subject to declaration to the Customs Department of Sri Lanka, if the total value exceeds US Dollars 15,000 or its equivalent or value of currency notes exceeds US Dollars 10,000 or its equivalent in other foreign currency notes, following the international standards and norms. This limit earlier stood at US Dollars 5,000 or equivalent in other currencies. Further, any person in or resident in Sri Lanka was permitted to retain in his possession of foreign currency notes up to the value of US Dollars 10,000 or its equivalent in the form of foreign currency notes for any period subject to certain conditions to be in line with the international standards and norms.

   Sir, here again, what we are doing is liberalizing and making it easier for such transactions to take place. So, the limit of US Dollars 5,000 has been increased to US Dollars 15,000, but in the case of cash, it remains at US Dollars 10,000.

6. Inward capital transactions were further relaxed. An Inward Investment Account (IIA) was introduced by amalgamating Securities Investment Account (SIA) and Special Foreign Investment Deposit Account (SFIDA) for simplification of transactions and to bring convenience to the investors. If a person can confirm on the inward remittances he made for investments in Sri Lanka, such person can remit out such funds including capital gains without any restrictions. These are timely and are required when we compete with others in order to attract Foreign Direct Investments into the country.

   In addition, the ownership restrictions for foreigners in certain strategically important industries and industries with national interest were kept unchanged as per the restrictions imposed by the Government Gazette issued in 2002 under the previous Exchange Control Act until it is revised based on the current international dynamics.

7. Limits of Outward Capital Transactions were enhanced. Threshold limits of outward capital transactions were increased while the categories of outward investments were broadened with a view to facilitate local investors to gain international sophistication by doing business abroad. Sir, those enhanced limits in comparison with the precious limits are as follows:

   Suppose if the investor is any company listed in the Colombo Stock Exchange and if the type of investment is shares and sovereign bonds, the earlier limits were US Dollars 500,000 per annum and now it has been revised to US Dollars 2 million per calendar year.

   In the case of any investor company not listed in the Colombo Stock Exchange, if the type of investment is shares and sovereign bonds, the earlier limit was US Dollars 100,000 per annum and now this has been increased to US Dollars 500,000 per calendar year.

   Then, if the investor is any partnership registered in Sri Lanka and the type of investment is shares and sovereign bonds, the earlier limit was US Dollars 100,000 for life time and this has now been increased to US Dollars 300,000 for life time.

   In the case of any individual investing with shares and sovereign bonds, the old limit was US Dollars 100,000 for life time and the new limit is US Dollars 200,000 for life time.

   Then, if the investor is any company or a partnership and if the type of investment is setting up of overseas companies, the earlier limit was US Dollars 100,000 per annum and this has been increased to US Dollars 300,000 per calendar year.

   Sir, in addition to the investment limits, a general permission was granted to Authorized Dealers to transfer eligible migration allowance on behalf of Sri Lankan emigrants and the limits introduced in 2008 on migrant transfers were increased since the prevailing limits were old more than a decade. So, you would be glad to note the enhanced limits. Their Initial Migration Allowance (IMA) has been increased from US Dollars 150,000 per person to US Dollars 200,000 per person while their Annual Migration Allowance (AMA) has been increased from US Dollars 20,000 per person to US Dollars 30,000 per person.

8. Persons were permitted to open, maintain and operate foreign currency accounts outside Sri Lanka for following categories under a general permission without coming to the Central Bank.

   (a) When such persons go abroad temporary for business, studies or medical purposes

   (b) When they earn foreign currency by way of providing professional services

   (c) A permitted entity to invest outside Sri Lanka

   (d) An exporter of merchandise goods

   (e) Persons who have obtained valid permanent residency in another country and dual citizens.

   (f) Dual Citizens

9. Repatriation of Export Proceeds. This requirement - within 120 days and an additional grace period of 30 days - was kept unchanged for time being until those conditions are revised by the Cabinet with consideration of industry sentiments and to make it on par with international norms.

10. Issuing of corporate guarantees by companies incorporated in Sri Lanka was introduced. In the event where a company incorporated in Sri Lanka - investor- is required to provide a corporate guarantee to enable a company incorporated outside Sri Lanka -investee- in which the said investor is a shareholder to raise facilities from financial institutions in the country where the investee is incorporated, has been permitted to issue a corporate guarantee subject to a maximum limit of US Dollars 1 million.

    Now, these revisions and liberalizations have been done in order to make it easier for both local and foreign investors to engage in business activities in Sri Lanka and also for Sri Lankan companies to go overseas and invest in companies they may have established outside.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැනදී කියන්න අවශ්‍යතාව තිබෙන්නේ මේකයි. ආදි කාලයේ පනවපු ඒ රෙගුලාසි සමඟ අද අපි තරගකාරී වෙළෙඳ පොළක නියැලෙන කොට ශ්‍රී ලාංකිකයින්ට පිට රටවල ගිහිල්ලා තමන්ගේ ආයෝජන කරන්න ඒක බාධාවක් වුණා. අනික, ශ්‍රී ලාංකිකයින්, එහෙමත් නැත්නම් විදේශ සෘජු ආයෝජකයින් මෙහෙ ආයෝජන කරන්න එනකොට ඒ පරණ රෙගුලාසි නිසා නොයෙකුත් බාධක ඇති වුණා. ගෝලීයකරණයත් එක්ක ලෝකය කුඩා වෙලා. බොහෝ දෙනා නොයෙකුත් තැන්වල ආයෝජන කරනවා. අද එක දවසක් තුළ New York marketsවල ඩොලර් ට්‍රිලියන ගණන් එහාට මෙහාට යනවා. ඒවාට අවසර ඒගොල්ලන්ගේ නීතිය මඟින් ලබා දීලා තිබෙනවා. එතකොට අපට පරණ නීති එක්ක ලෝක වෙළෙඳ පොළේ තරග කරන්න අමාරු නිසා තමයි මේ ලිහිල් කිරීම් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමාට අපි මේ අවස්ථාවේදී සුබ පතනවා. එතුමා ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් තිබෙන පුද්ගලයකු බව මේ පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටතත් සියලුදෙනා දන්නවා. 1952 ඉඳලා 2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව සහ චීනය අතර ආර්ථික වෙළෙඳ සම්බන්ධතා කේන්ද්‍ර කර ගනිමින් නිබන්ධනයක් කරලා එතුමා චීන විශ්වවිද්‍යාලයකින් ආචාර්ය උපාධියක් ගත්තා. අපි එතුමාට මේ අවස්ථාවේදී සුබ පතන්න කැමැතියි.

Hon. Deputy Chairman of Committees, the next Item is the Demutualization of the Colombo Stock Exchange Bill. The Colombo Stock Exchange was incorporated as a company limited by guarantee in 1985 with the participation of seven members for the purpose of operating a stock exchange and to undertake activities associated with operating a stock exchange.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

The modernization of the Colombo Stock Exchange commenced in 1992 with the United States Agency for International Development funding a number of capital market development initiatives including the procurement of a Central Depository System to automate the clearing and settlement of share transactions carried out through the CSE. Since then, the Government through the Securities and Exchange Commission of Sri Lanka- SEC- has contributed to market development through funding initiatives in the public interest, including providing financial assistance to the CSE for the procurement of the Automated Trading System and the establishment of the CSE's branch network by utilizing the cess fund.

As a result of these initiatives, the capital market has developed to an extent where the present mutual structure has inhibited growth and development of the Colombo Stock Exchange. Arguably, an efficient stock exchange is essential to the development of a dynamic economy and promoting economic growth. Hence, it is in the national interest to undertake initiatives that will improve the governance and efficiency of the CSE. There is widespread agreement among all stakeholders including members of the CSE that it should be demutualized.

Here, I would like to state that there is an agreement by the members to demutualize but the problem is how the share split is going to be. So, in our view, it is best that there is agreement between the Government and the members of the CSE on the split of the shares and also how much an IPO will be sold in the market place wherein the funds raised through such an exercise would be used for investor education across the country.

One of the big issues is that the Colombo Stock Exchange is still small in comparison to regional players. In many countries in our region, the CSE's market capitalization is bigger than the Gross Domestic Product of that country. But unfortunately, in Sri Lanka even though we have had this Colombo Stock Exchange for a number of years - before 1985, the Brokers' Association had been there for another hundred years - we have still not been able to utilize, leverage the CSE in order to raise funds outside the banking system.

අද තිබෙන ගැටලුවක් තමයි, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයෙකුට වුණත් බැංකුවට යන්න ඕනෑ තමන්ගේ ආයෝජනය සඳහා අවශ්‍ය මුදල් ණයට ගන්න. බැංකුවකට ගියාම බැංකුවේ ඉන්න මැනේජර් මහත්තයා අහන්නේ මොකක්ද? මොකක්ද mortgage එක? තමන්ට ගෙයක් තිබෙනවාද? ඒ ගෙදර උකස් තියන්න පුළුවන්ද? ඒ ගෙදර උකස් තියලා ඒ ප්‍රමාණයට ණය දෙන්න තමයි අපේ බැංකු අවුරුදු 70ක් තිස්සේ පුරුදු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතකොට ඒ පුද්ගලයන්ට ව්‍යවසායකයන් වෙන්න තිබෙන හැකියාව අඩුයි. ඒ නිසා අපි බලන්න ඕනෑ බැංකුවලින් එහාට ගිහිල්ලා ඒ ආයෝජකයන්, ඒ ව්‍යවසායකයන් කොයි ආකාරයටද තමන්ට ආයෝජනයට අවශ්‍ය මුදල් උපයා ගන්නේ, මුදල් සොයා ගන්නේ කියලා. එතැනදී අපි කොටස් වෙළෙඳ පොළ දකිනවා, ඉතාම හොඳ වාහනයක් හැටියට. It is a good instrument to be used to raise funds outside the banking system by issuing shares to the public.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වැඩ කටයුත්ත තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා තමයි, මේ demutualization එක එහෙමත් නැත්නම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීම සඳහා මේ නීති හඳුන්වලා දෙන්නේ.

In November 2016, the SEC secured technical assistance from the Asian Development Bank - ADB - under the Capital Market Development Programme for the development of the capital market.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you have two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, please give me about five more minutes because I have to explain this.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
The Bill submitted to Parliament is the result of such technical assistance and includes several policy refinements.

The Bill facilitates the demutualization of the Exchange by converting the CSE to a company limited by shares operating on a "for profit" basis and restructuring its operations, governance structure and management for the benefit of all stakeholders, taking into account public interest. The conversion has to be carried out by way of an Act of Parliament as a change in the legal status of a company limited by guarantee to that of a company limited by shares is not contemplated in the Companies Act. So, that is the reason, Sir, that we had to come to Parliament to introduce this Bill to make that conversion possible.

What is the rationale for demutualization? This is the process through which the CSE, operating as "not for profit" member-controlled organization, is converted to a "for profit" shareholder-owned company. Demutualization will change the legal status of the CSE from a company limited by guarantee to a company limited by shares, in which shareholders will not only be stockbrokers, but also include the public when the CSE is listed on its own exchange. ඒ කියන්නේ මොකක්ද? මෙහිදී අපි කොළඹ කොටස් වෙළඳ පොළ මේ රටේ සිටින සියලුම ජනතාවට විවෘත කරනවා. එතැන සිටින තැරැව්කරුවන්ට පමණක් අයිති වෙලා තිබෙන ඒ ආයතනයේ අයිතිකාරයන් වෙන්න ශ්‍රී ලංකාවේ මිලියන 21ක් වන ජනතාවට පුළුවන්. අප මෙතැනට ගෙනෙන සංශෝධනය ඉතාම සුභවාදී සංශෝධනයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් පැහැදිලි කිරීමක් කරවා ගැනීමටයි මා අදහස් කරන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කාරක සභා අවස්ථාවේදී මෙයට සංශෝධනයක් ගෙනෙනවාද? විවාද කරන මේ කාරණය සම්බන්ධයෙන් අද ඡන්දයක් ගන්නේ නැහැ නේද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, අද මේ සම්බන්ධයෙන් ඡන්දයක් ගන්නේ නැහැ. අපි කාරක සභා අවස්ථාව කල් දමා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ අයිතිවාසිකම දැනට තිබෙන්නේ තැරැව්කරුවන්ටයි. අප එය අසාමූහීකරණය කිරීම - demutualize කිරීම- හරහා ලංකාවේ ඕනෑම කෙනකුට එහි අයිතිය ලබා ගන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තැරැව්කරුවන්ට ලබා දෙන ප්‍රතිශතය කොච්චර ද කියා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සමහර රටවල තැරැව්කරුවන්ටම සියයට සියයක් ලැබී තිබෙනවා. නමුත් මෙහිදී ඔවුන් කියනවා, සියයට 87.5ක් සහ රජයට සියයට 12.5ක් ලෙස මෙය බෙදන්න කියා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
රජයේ කොටස වැඩි කර ගැනීම සඳහා ඔබතුමා මැදිහත් වීමක් කරනවාද? ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට දන්වන්න පුළුවන්ද, මේ කොටස් දෙකේම ගණන සම්බන්ධයෙන් කැබිනට් අනුමැතිය තිබෙන්නේ කොච්චරකටද කියා?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේකට හේතුවක් තිබුණා, ගරු මන්ත්‍රීතුමා. ඒ, මේකයි. ආසියානු සංවර්ධන බැංකුවේ ණය ඩොලර් මිලියන 250ක් ලබා ගැනීම සඳහා අප කළ යුතු වැඩසටහනක් හැටියට අපි එය භාර ගෙන තිබුණා. අද ඊයේ නොවෙයි, මෙය අවුරුදු 13කට කලින් පටන් ගත් දෙයක්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. ඒ කාලයේ පටන් ගත් දෙයක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අවුරුදු 13කට කලින් පටන් ගත් දෙයක්. නමුත් මෙහිදී එකඟතාවක් නැහැ, දැනට හිමිකරුවන්ට කොපමණ දිය යුතුද කියන එක සම්බන්ධයෙන්, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි කැබිනට් අනුමැතිය තිබෙන්නේ ඔවුන්ට සියයට 60ක් දෙන්න ඕනෑ කියලායි. නමුත් ඔවුන් ඒකට එකඟ වන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපි කැමැති නැහැ මෙය අප බලෙන් අත් පත් කරගත්තා වාගේ වැඩක් වනවාට. බැසිල් රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා එදා Revival of Underperforming Enterprises or Underutilized Assets Act කියා එකක් ගෙනැල්ලා කළ අත් පත් කර ගැනීම් හරහා ආයෝජකයන්ට ලොකු ප්‍රශ්නයක් ඇති වුණා අපට මතකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා. ඒ නිසා අපේ රජය කැමැති නැහැ කැමැත්තක් නැතිව, එකඟතාවක් නැතිව මෙය කරන්න. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමා-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමාට පුළුවන් නේද, සියයට 60:40 එකට negotiate කරන්න?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ නිසා තමයි අප මෙහි තුන්වන කියවීම කල් දමලා නැවත කැබිනට් එකට ගිහිල්ලා සියයට 70:30 හෝ එවැනි ප්‍රතිශතයකට අනුමැතිය ලබා ගන්න බලාපොරොත්තු වන්නේ. The key legislative provision contained in the Bill, Sir, is the conversion of the CSE from a company limited by guarantee to a company limited by shares.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු හර්ෂ මැතිතුමනි, ඔබතුමාගේ මේ පනත් කෙටුම්පතට අදාළවම ඔය ප්‍රතිශත සම්බන්ධ ප්‍රශ්නය ගැනම මම යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. මම මේක බොහොම කෙටියෙන් අහන්නේ. සියයට 60 - 40 කියලා කැබිනට් මණ්ඩලය කියද්දී, එය සියයට 87ක් කියලා බ්‍රෝකර්කරුවන් කියද්දී අපට දැනගන්න ලැබී තිබෙනවා, ඔබතුමා සියයට 75ක් වාගේ අතරමැදි අදහසක් නියෝජනය කරනවා කියලා. මගේ දැනීමේ හැටියට මේක රුපියල් බිලියන හතරයි දශම ගණනක අරමුදලක්. ගරු මැතිතුමනි, මා පෞද්ගලිකවම ඔබතුමා ඉලක්ක කරනවා නොවෙයි. නමුත්, මේ සම්බන්ධයෙන් කටයුතු කරන ඇමතිවරයා හෝ නිලධාරිවරයා මත එය,- සියයට 1ක් කියන්නෙත් ලොකු ගණනක්. ඒක ඔබතුමාට තේරෙනවා. සියයට 75 වෙනුවට සියයට 76 වුණත් ඒක ලොකු ගණනක්. මෙය දූෂණය ඇති වීමට හැකියාව තිබෙන කරුණක් නිසා, මෙම ප්‍රතිශත සම්බන්ධ කාරණය විනිවිද පෙනෙන ආකාරයකින් කරන්නය කියන ඉල්ලීම අපි ඔබතුමාට පැහැදිලිව ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ වාගේම මෙහි රජයේ පංගුව වැඩි කරගන්න එක තමයි අත්‍යවශ්‍ය දේ විධියට අපි දකින්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ අදහස වැදගත් අදහසක්. ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතුවක් තිබෙනවා. අපි මෙම තීරණය එකඟත්වයක් ඇතිව කරන්න කැමැතියි. එකඟත්වයක් නැතිව කරන්න අපි කැමැති නැහැ. ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ලබා ගැනීම සඳහා අපි හදිසියේ මේ දේ කළාට, කවුරුන් හෝ මත බලෙන් පැටවීමක් කරන්න මගේ පෞද්ගලිකව අදහසක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මොකද අපට අවශ්‍ය වෙන්නේ ප්‍රතිශතයට වඩා මෙහි ඇති වටිනාකමයි -value එකයි-. ප්‍රතිශතය පොඩි වෙන්න පුළුවන්, ලොකු වෙන්න පුළුවන්. නමුත්, ලොකු ප්‍රතිශතයක් එක්ක අඩු වටිනාකමක් -අඩු value එකක්- තිබෙනවා නම් අපට ඒකෙන් ප්‍රයෝජනයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. Value එක තමයි අපට අවශ්‍ය වෙන්නේ. අපි මෙතැන මොකක්ද කරන්න හදන්නේ? අපි කරන්න හදන්නේ, ලබා ගන්නා මුදල් අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන්නයි. For investment education. ඒ කියන්නේ, ලංකාව පුරා ගිහිල්ලා, මෙම අරමුදල් පාවිච්චි කරලා, කොටස් වෙළෙඳ පොළේ කොයි ආකාරයටද ආයෝජනය කරන්නේ කියන එක පිළිබඳව උපදෙස් ලබාදීලා, විනිවිද භාවයකින් යුතුව ජනතාව මෙකට එකතු කර ගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා තමයි අද අපි Committee Stage එක නොපවත්වන්න තීරණය කළේ.

The Bill provides the procedure to be followed in the conversion of the CSE, a company limited by guarantee to a company limited by shares. The distribution model recommended by the ADB consultants has taken into account the financial contributions made directly by stakeholders to the CSE since its inception. The contribution by the Government and USAID and the contribution by Members through Member Fees has been recognized in the distribution of shares of the demutualized CSE.

So this is where the various compositions have been proposed by various people.

තව එක කාරණයක් මම කියන්න කැමැතියි. ආසියානු සංවර්ධන බැංකුවේ consultant කෙනෙක් කියපු පළියට රජය තීරණය කරන්න ඕනෑ නැහැ. කවුද මේ consultantsලා? කොහෙන්ද මේ consultantsලා ආවේ? මොකක්ද මේ consultantsලාට තිබෙන සම්බන්ධය? මම දකින විධියට නම් අද මේ කරුණ දේශපාලනීකරණය කරන්න ගිහිල්ලා තිබෙනවා. අද කවුරු හරි මේ කරුණු ඇතුළෙන් පත්තරවලට "ලීක්" කරලා තිබෙනවා. රජය මේ තීරණය වෙනස් කරන්න හදනවාය කියලා තිබෙනවා. අපි ඒවාට භය වෙලා මෙතැන වැඩ කරන්න කැමැති නැහැ. මම SEC එකේ මහ මිනිස්සු ඔක්කෝටම මේ දේ කියන්න කැමැතියි. ඒ අයට බැහැ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට බල කරන්න ඔවුන්ගේ consultantට මොකක්ද කරන්න ඕනෑ කියලා. කවුද consultant? කොහෙන්ද මේ consultant ආවේ? අපි දන්නවා, consultantsලාත් එක්ක වැඩ කරන හැටි. ඒ නිසා මම ඒ පුද්ගලයන් ඔක්කෝටම කියන්න කැමැතියි, ඒගොල්ලන් දැනගන්න ඕනෑ කොයි ආකාරයට ද වැඩ කරන්නේ කියලා. මේක රජයක්. මේක පාර්ලිමේන්තුවක්. මේ පාර්ලිමේන්තුවට තමයි අයිතිවාසිකම තිබෙන්නේ කොයි ආකාරයට ද ඒ කටයුතු කරන්නේ කියලා. ඒ නිසා පත්තරවලට නොයෙකුත් කථා කියලා, බොරු දේවල් ප්‍රසිද්ධ කරලා භිතන්න එපා, තමන්ට ඕනෑ විධියට, තමන්ගේ consultant ට ඕනෑ විධියට මේ වැඩ කටයුතු කරන්න පුළුවන් කියලා.

Sir please give me two more minutes to wind up. Then, "Based on the recommended model by the consultants, the Commission has had extensive discussions." කියලා කියනවා.

අද කොමිසම මොකක්ද කරලා තිබෙන්නේ? කෝ! කොටස් වෙළෙඳ පොළේ හොරකම් කරපු මිනිස්සු? ඒ අයගෙන් කවුද අල්ලාගෙන තිබෙන්නේ? මම විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවේ සිටියදී පෙන්වා දුන්නා, කොහොමද pump and dump කරන්නේ කියලා. කෝ! Pump and dump කරපු ඒ එක්කෙනෙක්වත් අල්ලාගෙන තිබෙනවා ද? ඒ කිසි මිනිහෙක් හිරේ දාලා තිබෙනවා ද? ඒවා ගැන එක investigation එකක් ඉවර කරලා තිබෙනවා ද? I like to ask the SEC what have you done? How many investigations have you completed? How many people have you prosecuted? How many people have you put behind bars? ඒවා කරලා නැහැ. මොකක්ද මේකට හේතුව? කවුද මේවා පිටුපස්සේ ඉන්නේ? මේ අදිසි හස්තය කාගේද? අර කුකුළු කොටුවේ ප්‍රශ්නයේ දි pump and dump කළේ කොහොමද කියලා අපි කිව්වා. රුපියල් 35ට කොටස් අරගෙන ඒවා රුපියල් 200ට නග්ගලා, අර්ථ සාධක අරමුදලට ඒවා වික්කේ කොහොමද කියලා මම කටේ ලේ රහ වෙනකම් මේ පාර්ලිමේන්තුවේ කිව්වා. නමුත්, Securities and Exchange Commission එකට ඒවා විභාග කරන්න තවම බැරි වෙලා තිබෙනවා. ඒ අයට මේවා කරන්න බැරි නම් කරන්න පුළුවන් මිනිස්සු ඒ තැන්වලට ගෙනෙන්න ඕනෑ. මේ මිනිසුන්ට බැරි නම් පුළුවන් මිනිස්සු ගෙනෙන්න ඕනෑ. එහෙම කරලා හරි අපට පුළුවන් වෙන්න ඕනෑ, ඉදිරි කාලසීමාවේදී මේ හොරු ටික අල්ලලා ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න.

Then, limits on ownership. In order to ensure good governance and to promote a diversified shareholding, ownership of the demutualized CSE has been limited to 5 per cent in respect of any person with a further limitation of 40 per cent being imposed on collective holdings by stockbrokers.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ අනුව එක්කෙනෙකුට සියයට 5යි තියාගන්න පුළුවන්. එතකොට කාටවත් මේ කටයුතු control කරන්න හැකියාවක් නැහැ. ඒ control කරන එක සම්බන්ධයෙන් නොවෙයි මෙතැන කථාව තිබෙන්නේ. මෙතැන කථාව තිබෙන්නේ, කාටත් සාධාරණ විධියට - equitably - මේ ප්‍රතිශතය බෙදන්නේ කොහොමද කියලායි.

Then, the governance structure. The Bill provides for the transition to a new governance structure where the majority of directors will be independent and the Chairman elected from among independent directors to ensure good governance and the interests of all stakeholders are addressed. A statutorily constituted Nomination Panel will be entrusted with the task of nominating directors to be appointed to the demutualized CSE.

මේ Nomination Panel එකට පත් කර තිබෙන්නේ කවුද? කාගෙන් අහලාද මේවා කළේ? කැබිනට් එකේත් මොනවාද වන්නේ? මේවා ගැන සාකච්ඡා වෙනවා මදි. මේ පිළිබඳව ඒ කට්ටියට දැනුම ලබාදෙන්න ඕනෑ. ඒ අයට ඒ දැනුම ලබා දීලා, මොකක්ද හරි, මොකක්ද වැරදි කියලා explain කරන්න ඕනෑ.

Then, listing of the demutualized CSE. The listing of the demutualized CSE on its own exchange is provided for in the Bill. This is expected to take place within a period of three years.

In conclusion, taking into account the positive impact demutualization will have on the capital market development, it is imperative that demutualization be facilitated by way of legislation.

Sir, I will end with this. We will bring legislation to demutualize the Stock Exchange, but we will do it on our own terms, not on the terms of some consultant who is sitting at the SEC and telling the Government how to run our affairs.
Thank you very much.

[අ.භා. 2.51]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කරුණු ඉදිරිපත් කළ කොටස් වෙළෙඳ පොළ පෞද්ගලික අංශයට බෙදා හැරීමේ තොරතුරු ඇතුළත් පනත් කෙටුම්පත පිළිබඳ විවාදය තව දිනයකට කල් තබා තිබෙන නිසා, ඒ පිළිබඳව අදහස් දක්වන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්න කැමැතියි. කොටස් වෙළෙඳ පොළේ දීර්ඝ කාලයක් ගනුදෙනු කළ බ්‍රෝකර්වරු සමඟ සාකච්ඡා කරලා, කැබිනට් මණ්ඩලයේ තීන්දු තීරණත් ප්‍රකාරව, රාජ්‍ය අංශයේ කොටසත් ආරක්ෂා කර ගනිමින්, ඔවුන්ගේ සහයෝගයත් කොටස් වෙළෙඳ පොළ ප්‍රවර්ධනය සඳහා ලබාගන්නා ආකාරයට කටයුතු කරන්න ඔබතුමා මැදිහත් වෙයි කියා මා හිතනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනීම, ප්‍රාමාණික දැනීම ඔබතුමාට තිබෙනවා. ඒ නිසා වඩා යහපත්, සංවර්ධිත කොටස් වෙළෙඳ පොළක් ගොඩනඟා ගැනීම සඳහා අපට ලබාදෙන්න පුළුවන් සහාය ලබාදෙන්න අපි කටයුතු කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඔබතුමාගේ අදහස්වලට ගරු කරනවා. මොකද, අපට අවශ්‍ය වන්නේ සියලුදෙනාගේම සහයෝගයෙන් මේ වැඩ කටයුතු ඉස්සරහට අරගෙන යන්න මිසක්, කාටවත් බලපෑම් කරලා මේවා කරගන්න නොවෙයි.

බොහොම ස්තූතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා අද දින විදේශ විනිමය පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

එක්දහස්නවසිය පනස්තුනේ විනිමය පාලන පනත යල් පැන ගිය එකක් බව අපි කවුරුත් පිළිගන්නවා. එම පනත සංශෝධනය වෙන්න අවශ්‍යයි. ඒ ගැන තර්කයක් නැහැ. නමුත් විදේශ විනිමය පිළිබඳ විශාල අර්බුදයකට මුහුණ දී සිටින අප වැනි රටක්, අද සියල්ල නිදහස් කරන ප්‍රතිපත්තිය තුළ ඇති විය හැකි අවදානම් තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වෙනවා. මක් නිසාද යත්, අපේ රටේ සංවර්ධනයට ප්‍රධාන බාධා දෙකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ආර්ථික සංවර්ධනය පිළිබඳ ද්විත්ව පරතර න්‍යාය -Two-Gap Theory of Economic Development - අනුව අප වැනි රටවල ප්‍රධාන පරතර දෙකක් තිබෙනවා. ඉන් එකක් තමයි, ඉතුරුම් හා ආයෝජන අතර තිබෙන පරතරය. ඉතිරි කිරීම් ප්‍රමාණය අඩුයි, ආයෝජන ප්‍රමාණය වැඩියි. ඉතුරුම් හා ආයෝජන අතර පරතරයේ උග්‍ර ප්‍රාග්ධන හිඟයක් තිබෙනවා. දෙවැනි එක තමයි, අපනයන හා ආනයන අතර පරතරය. අපි මෙය විදේශ විනිමය පරතරය කියා හඳුන්වනවා. මේ විනිමය පරතරය අඩු වෙන්න නම් රට තුළට ගලා එන විදේශ විනිමය -රට සල්ලි ප්‍රමාණය- වැඩි වෙන්න ඕනෑ. රටින් පිටට ගලායන විනිමය ප්‍රමාණය අඩුකර ගන්න ඕනෑ. රට ඇතුළට ගලා එන විදේශ විනිමය ප්‍රමාණය විශාල වශයෙන් වැඩිකර ගන්න පුළුවන් නම්, රටින් පිටට ගලායන විනිමය ප්‍රමාණය අඩුකරගන්න පුළුවන් නම්, වාසිදායක සංචිත ප්‍රමාණයක් ඇති වීමෙන් අපේ මුදලේ අගය ආරක්ෂා වෙනවා. ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් මුදලක් බවට පරිවර්තනය වෙනවා. නමුත් අවාසනාවකට වාගේ, නිදහස ලැබුණාට පසුව දිගින් දිගටම අපේ රටේ රුපියල අවප්‍රමාණ වන්නේ මේ විනිමය පරතරය එන්න එන්නම උග්‍ර වන නිසායි.

අපේ අපනයන ඉපැයුම් වැඩි වීමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන සඳහා වන විදේශ විනිමය ගලා යාම් ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. ඒ අනුව අපි 2005දී මේ රට බාර ගන්නකොට මුදල් අමාත්‍යාවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඩොලරයකට ගෙව්වේ රුපියල් 101යි. අවුරුදු 10ක් මේ රට ආණ්ඩු කරන කොට විදේශ විනිමය පිළිබඳ විශාල අර්බුදයක් ඇති වුණා. මක් නිසා ද යත්, ලෝක ඉතිහාසයේ වැඩිම ඛනිජ තෙල් මිල වාර්තා වුණා. ලෝකය ඛනිජ තෙලෙන් බැදුණා. ඛනිජ තෙල් අර්බුදයක් ඇති වෙලා තිබෙන අවස්ථාවේදී තෙල් ආනයනය කිරීම සඳහා සාමාන්‍යයෙන් වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක, 5ක වාගේ විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටතට ගියා. oil bill එක එනකොට ලංකා බැංකුව ඇතුළු රාජ්‍ය බැංකු හෙල්ලුණා, මේ විදේශ විනිමය ප්‍රමාණය ගෙවන්න ඕනෑ නිසා.

ලෝක ආහාර අර්බුදයක් ඇති වුණා. ආහාරවල මිල රොකට් වේගයෙන් ඉහළ ගියා. ඒ නිසා ආනයනය කරන ආනයන සඳහාත් ගෙවන්න වන විදේශ විනිමය ප්‍රමාණය විශාල ලෙස වැඩි වුණා. ලෝක මූල්‍ය අර්බුදයක් ඇති වුණා. 2007 අවුරුද්දේ ඉඳලා Mutual Bank කඩාගෙන වැටිලා, Lehman Brothers Holdings බංකොලොත්වෙලා, යුරෝපයේ ඇති වෙව්ව මූල්‍ය අර්බුදය ලෝකය පුරා හමාගෙන ගිහිල්ලා, අපේ රටෙත් මූල්‍ය අර්බුදයක් ඇතිවෙලා තිබුණා. යුද්ධය තිබුණා. ශාප ලත් තිස් අවුරුදු යුද්ධයට අවශ්‍ය වූ යුද ආයුධ හා වෙනත් දේ මිලදී ගැනීම සඳහා විදේශ විනිමය ඉතා විශාල ප්‍රමාණයක් අවශ්‍ය වුණා. ලෝක ඛනිජ තෙල් අර්බුදය, ලෝක ආහාර අර්බුදය, ලෝක මූල්‍ය අර්බුදය, යුද්ධය වැනි ඉතා විශාල අභියෝගාත්මක තත්ත්වයක් තුළ රටින් පිටතට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ගලාගෙන ගියා. නමුත් රට ඇතුළට විදේශ විනිමය වැඩිපුර ප්‍රමාණයක් ගෙන්වා ගනිමින් කෙසේ හෝ අවුරුදු 10ක කාල පරිච්ඡේදය අවසානයේ දී ඩොලරයට ගෙවන මුදල රුපියල් 131ක් බවට පත් වුණා. 2005දී අපි මේ රට බාර ගන්නකොට ඩොලරයකට ගෙව්වේ රුපියල් 101යි. දස අවුරුදු කාල සීමාවක් තුළදී ඒ ප්‍රමාණය සියයට 131ක් වෙලා තිබෙනවාය කියන්නේ ඩොලරයකට අපි ගෙවන මුදල රුපියල් 30කින් වැඩිවෙලා තිබෙනවාය කියන එකයි. අවුරුද්දකට සාමාන්‍යයෙන් වැඩිවෙලා තිබෙන්නේ රුපියල් 3යි. නමුත් මේ රජය 2015දී බලයට පත් වුණා. 2015, 2016 සහ 2017 කියන වර්ෂ තුන ගත වුණා. දැන් ලෝක ඛනිජ තෙල් අර්බුදයක් නැහැ. මොකද, ඉතා විශාල ලෙස 2015දී මුළු ලෝකයේම මිල කඩා වැටීමක් සිදු වුණා. ඛනිජ තෙල් මිල අඩු වුණා; පොහොර මිල අඩු වුණා; රසායනික ද්‍රව්‍යවල මිල අඩු වුණා; ගෑස් මිල අඩු වුණා; යකඩ මිල අඩු වුණා; සියල්ලගේම මිල කඩාගෙන වැටුණා. රබර් මිල සහ තේ මිල අඩු වුණු බව කවුරුත් දන්නා දෙයක්. 2015දී

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ලෝක ආර්ථික අවපාත තත්ත්වයක් ඇති වුණා. තවමත් එලෙසින් ඛනිජ තෙල් මිල ඉහළ ගියේ නැහැ. ඒ නිසා තෙල් ආනයනය කිරීම සඳහා සාමාන්‍යයෙන් මහින්ද රාජපක්ෂ යුගයේදී ගිය මුදල වාගේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට වැඩි ප්‍රමාණයක් මේ වනවිට ඛනිජ තෙල් ආනයන බිලෙන් ඉතුරුවෙලා තිබෙනවා. මෙවර Central Bank Report එක ආවාට පස්සේ අපිට කියන්න පුළුවන්, ඇත්තටම ඉතුරු වෙච්ච මුදල කොච්චරද කියලා. දැන් යුද්ධයක් නැහැ. යුද්ධය නැති නිසා යුද ආයුධ හා වෙනත් දේ සඳහා රටින් පිටතට ගිය මුදල් විශාල ප්‍රමාණයක් ඉතුරු වුණා. දැන් ලෝක ආහාර අර්බුදය නැහැ. ලෝකයේ ආහාර මිල ගණන් නැවත පහළට වැටුණා. ඒ නිසා විශාල මිලක් ගෙවලා ආනයනය කරන්න සිදු වුණේ නැහැ. මේ තත්ත්වය තුළ පසු ගිය වර්ෂයේ දී - 2016 ඉඳලා 2017ට- සියයට 10.19කින් නිර්යාත වැඩිවෙලා තිබෙනවා. ආනයන වැඩිවෙලා තිබෙන්නේ සියයට 9.37කින්. ඒ නිසා වාසිදායක තත්ත්වයක් ඇති වෙලා තිබුණා. ඉතාම අවාසනාවන්ත ලෙස රුපියල කඩාගෙන වැටුණා. අද වනකොට ඩොලරයේ අගය රුපියල් 158යි. අවුරුදු 3ක් තුළදී රුපියල් 27ක් ඩොලරයට වැඩිපුර ගෙවන්න සිදු වුණා. මහින්ද රාජපක්ෂ යුගය තුළදී අවුරුදු 10ටම ඩොලරයට වැඩිපුර ගෙවන්න සිදුවුණේ රුපියල් 30යි. විදේශ විනිමය අර්බුදය හේතුවෙන් වර්තමාන රජය යටතේ අවුරුදු 4ක් යනකොට ඩොලරයට රුපියල් 30ක් වැඩිපුර ගෙවන්න සිදු වෙනවා. මේ රටේ ජීවන වියදම් ප්‍රශ්නය විසඳන්න නම්, රටේ ආර්ථිකයේ වඩා ස්ථාවර තත්ත්වයක් ඇති කරන්න නම්, විදේශ ආයෝජන ආකර්ෂණය කරන්න නම් රුපියල ස්ථාවර මට්ටමකට ගෙනෙන්න ඕනෑ.

එසේ රුපියල ස්ථාවර මට්ටමකට ගෙන ඒම සඳහා රජය ප්‍රතිපත්තිමය වශයෙන් කල්පනා කරන්නට ඕනෑ දෙයක් තිබෙනවා. ආනයන ප්‍රතිපත්තියක් තුළින් අපි වක්කඩ කැඩුවා වාගේ මේ රටට සියලුම දේවල් ආනයනය කරන්නට වුණොත්, වෙන්නේ මොකක්ද? අවුරුදු සමය කියලා බිත්තර ගෙනෙන්න ලැහැස්ති වුණා; පොල් ආනයනය කරන්න ලැහැස්ති වුණා; සහල් විශාල වශයෙන් ආනයනය කරනවා. ලෝකයේ මේ වෙළෙඳ පොළ ක්‍රමයේ කේන්ද්‍රීය ස්ථානය අද ඇමෙරිකා එක්සත් ජනපදය. මගේ උගත් මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා එයට එකඟ වෙනවා ඇති. ඩොනල්ඩ් ට්‍රම්ප් මොකක්ද කරන්නේ? ඔහු දේශයේ සම්පත් හා දේශයේ මිනිසුන් මත සම්පූර්ණ විශ්වාසය තබා liberalized policy එකකින් මාරු වුණු ප්‍රතිපත්තියකට ඇමෙරිකා එක්සත් ජනපදය ගෙන යනවා. එම නිසා පසුගිය සතිවල වානේ නිෂ්පාදන හා තඹ නිෂ්පාදන සියල්ල සඳහා තීරුබදු පැනෙව්වා. ධනවාදී ආර්ථික වෙළෙඳ පොළ න්‍යායෙන් අපට උගන්වන්නේ පුළුවන් තරම් තීරුබදු ඉවත් කරන්න, රට ඇතුළට නිදහසේ භාණ්ඩ ගලා එන්න දෙන්න කියලායි. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇමෙරිකානු මහාචාර්යවරයෙකුම තමයි එම පොත් ටික ලියා තිබෙන්නේ. නමුත් අද ට්‍රම්ප් කරන්නේ තීරුබදු පනවන එකයි. සියයට 20-25 තීරුබදු පනවා තමන්ගේ රටේ කර්මාන්ත ටික නැඟිටුවන්න අලුත් ප්‍රතිපත්තියකට මාරු වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඩොනල්ඩ් ට්‍රම්ප් කරන්න යන වැඩ කටයුත්තෙන් ඇමෙරිකාවට තමයි පාඩු වෙන්නේ. මොකද, චීනයේ ෂී ජින්පිං ජනාධිපතිතුමා කියා තිබෙනවා, "ඔබතුමා සියයට 25ක් දැම්මොත්, ඇමෙරිකාවෙන් චීනයට එන ඒවාට සියයට 50ක් දමනවා" කියලා. එතකොට මේකෙන් කාටවත් යහපතක් වෙන්නේ නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ඒක තමයි, අපි බලමු. හැම දාම තිබෙන සාම්ප්‍රදායික වෙළෙඳ පොළ theory එකට සම්පූර්ණයෙන් හරස් වෙන එකක් තමයි ට්‍රම්ප් මේ දවස්වල කරන්නේ. ඔහු හිතන ක්‍රමය අනුව වෙළෙඳ පොළ ඇතුළේ සියලුම ආයෝජකයෝ චීනයට යනවා නම්, චීන වෙළෙඳ පොළ හා චීන හා ඇමෙරිකානු තරගය තුළ ලෝක වෙළෙඳ පොළ හැසිරෙන්නේ කෙසේද කියන එක පිළිබඳව අලුත් අත් දැකීම් රාශියක් එකතු වෙන්න ඉඩ තිබෙනවා. මගේ ප්‍රශ්නය මෙයයි. මෙම පනතට විරුද්ධව අපි ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගිහින් කිව්වේ, ප්‍රාග්ධන ගිණුම මෙලෙසින් විවෘත කිරීමෙන් නායිලන්තයේ වුණා වාගේ, එහෙම නැත්නම් මලයාසියාවේ වුණා වාගේ අර "සෝරෝස්"ලා මේ ටික ඔක්කෝම අරගෙන යන්න පටන් ගත්තොත් - අපිට එහෙම වුණා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාග්ධන ගිණුම එහෙම වක්කඩ කැඩුවා වාගේ විවෘත කරලා නැහැ. ඒකට limits දමලා තමයි ඒක කරලා තිබෙන්නේ. මම ඉතාම පැහැදිලිව explain කළා, අපි මොනවාද කරලා තිබෙන්නේ කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

මීට කලින් හිටපු මුදල් ඇමතිවරයා නිතරම කිව්වේ, ලෝකයේ තිබෙන ඕනෑම සල්ලියක් මෙහාට ගෙනෙන්න කියන එකයි. අභිරහස් ආයෝජන තිබෙනවා නම් අරගෙන එන්න කියලා හිටපු මහ බැංකු අධිපතිවරයාත් ප්‍රසිද්ධියේ කිව්වා. එසේ ප්‍රකාශ කරලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ දී ප්‍රකාශ කළා, එවැනි ආයෝජනවලට ඕනෑ තරම් එන්න ඉඩ දෙන්න කියලා. අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ දී තර්ක කළා. අපෙන් විනිශ්චයකාර උතුමන්ලා ඇහුවා, "ඇයි, මේ විපක්ෂයේ අය රට ඇතුළට ඩොලර් එනවාට, විදේශ විනිමය එනවාට විරුද්ධ වෙන්නේ?" කියලා. විරුද්ධත්වයක් නැහැ. නමුත් අපි දන්නවා, ලෝකයේ අපි අත්සන් කරලා තිබෙන ගිවිසුම් ප්‍රකාරව මුදල් විශුද්ධිකරණය සඳහා ඉඩප්‍රස්ථා ලැබෙන තත්ත්වයක් තුළ රටක් ඇතුළට සල්ලි ආවොත්, ඒ ඇතිවෙන කළු පැල්ලම පහසුවෙන් මකා ගන්න බැරි වෙන බව. ඔබතුමා දන්නවා, විනිමය පාලන පනත නිදහස් කළාට පසුව යුරෝපා ආර්ථික සංගමයේ පාර්ලිමේන්තුව රැස්වෙලා මුදල් විශුද්ධිකරණය පිළිබඳව ලංකාව blacklist කිරීම, එහෙම නැත්නම් අසාධු ලේඛනයට ඇතුළත් කිරීම සඳහා ඡන්ද 300 ගණනක් පාවිච්චි කළ බව.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්න කැමැතියි. Gray list කරලා තිබෙන්නේ, European Union එකේ එදා ඒ -

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

අසාධු ලේඛනය.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්. නමුත් ඒකට හේතුව තමයි අර Trusts Ordinance එකේ ප්‍රශ්නය. ඒකට Trusts (Amendment) Bill එකක් ඊයේ ගෙනාවා. මොකද, මම යම් කරුණක් ගැන සොයා බැලුවා, ගරු මන්ත්‍රීතුමනි. ඒක ඔබතුමාත් දැන ගන්නා එක හොඳයි. මම Public Trusteeටත් කථා කළා. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාටත් කථා කරලා ඇහුවා, මේ පාර්ලිමේන්තුවේ Foundations කොපමණ තිබෙනවාද කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බොහොම දෙනෙකුගේ නමින් ඒ අය පදනම් ඇති කරගෙන තිබෙනවා.

එතකොට සමහරු මේ පදනමට සල්ලි දානවා. පදනම විසින් ඒ සල්ලි නොයෙකුත් දේවල්වලට වියදම් කරනවා. නමුත් කිසිම විධියකට,-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව. එතුමාගේ වේලාවෙන් මට වේලාව දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හරි, හරි.

නමුත් කිසිම විධියකට පදනම විගණනයට භාජන වෙන්නේ නැහැ. ඒ පදනම පාර්ලිමේන්තුවෙන් පාස් කරගෙන තිබෙනවා, එහි අයිතිකාරයන් කවුද කියා දන්නේ නැහැ. ඒ නිසා තමයි මේ පදනම්වල අයිතිකාරයෝ කවුද කියා සොයා ගන්න අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ. බොහෝ නම්වලින් පදනම් ඇති කරලා, ඒවා තුළින් කළු සල්ලි සුදු කරන වැඩ පිළිවෙළක් මේ පාර්ලිමේන්තුව ඇතුළේම තිබෙනවා කියා මා ඔබතුමාට කියන්න කැමැතියි. මගේ නමින් නම් කිසිම පදනමක් මේ පාර්ලිමේන්තුවේ මම ලියා පදිංචි කරලා නැහැ. නමුත් ඒක බහුලව වෙන දෙයක්. ඉතින් ඒ නිසා අපි දැන ගන්න ඕනෑ, who are the beneficial owners of these foundations?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, මගේ නමිනුත් කිසිම පදනමක් නැහැ. නමුත් මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පදනම්වලින් වෙන්න පුළුවන් ස්වල්පයයි. ඊට වඩා ඒවා පෙන්වන්න මම තමුන්නාන්සේට උදවු කරන්නම්. රාජ්‍ය නොවන සංවිධාන ඉතාම විශාල ප්‍රමාණයක් ලංකාවේ තිබෙනවා. අවනත වෙන්නේ නැති විවිධ අරමුණු සඳහා කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන තිබෙනවා. බොහෝ විට නොදැනුවත්ව අපේ බොහෝ දෙනෙක් ඒවාට සම්බන්ධ වෙලා ඉන්නවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා, මට තව විනාඩියක් දෙන්න. මම ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. මොකද, අපි දැන ගන්න ඕනෑ කොහොමද, කාගේද මේ පදනම් කියලා. මේ සල්ලි එන්නේ කොහෙන්ද කියලා. ඒ නිසා තමයි NGOs ඔක්කෝටම මෙය අදාළ කර ගන්නේ. මේ අලුත් නීතිය හරහා අපේ පදනම් register කරන්න ඕනෑ; ඒවා විගණනය කරන්න ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ මේක කරපු නැති නිසා තමයි අප මත මේ ප්‍රශ්නය වැටුණේ. අනික් එක තමයි ඉරානය එක්ක තිබෙන ගනුදෙනු සම්බන්ධ කාරණය. අපි එහිදී පැහැදිලි කරලා දුන්නා, ඉරානයත් එක්ක නොවෙයි ගනුදෙනු කරන්නේ කියලා. කොම්පැනි ප්‍රමාණයක් ඒ ගොල්ලන් ලැයිස්තුගත කරලා තිබුණා. අපිත් ඒවා ගැසට් කළාට පසුව මේ ප්‍රශ්නය විසඳෙනවා. ඔක්තෝබර් මාසය වෙන විට අසාදු ලේඛනගත කිරීම අපි ඉවත් කරනවා. එතකොට ඒ ප්‍රශ්නය විසඳෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඊට අතිරේක තව ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. මේ රජය බලයට පත් වෙච්ච අවස්ථාවේම එරික් සෝල්හයිම් මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, චීන ආයෝජකයන් විතරක් නොවෙයි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි එකක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. මොකද, එතුමා මගේ කාලයෙන් විනාඩියක් ගත්තා.

එරික් සෝල්හයිම් කිව්වා, චීන ආයෝජකයන් ගැන විතරක් බලා ඉන්නේ නැතුව වඩා හොඳ ආයෝජකයන් එනම් එල්ටීටීඊ ඩයස්පෝරාවේ විවිධ දක්ෂතා කුසලතා සහිත ආයෝජන තිබෙනවා, ලංකාවට එන්න කියලා. ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා මම මේ කියන කාරණය ගැන පොඩ්ඩක් බලන්න ඕනෑ. අපේ මහල් නිවාස සංකීර්ණ - apartments - විශේෂයෙන් නාගරික ඒවා මුදල් විශුද්ධිකරණය සඳහා යොදා ගන්නා එක ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන තිබෙනවා. මෙවැනි කළු සල්ලි සුදු කරන්න පුළුවන් විවිධ ව්‍යාපෘති රාශියක් දැන් ඒ වෙනුවෙන් design කරලා තිබෙනවා; සකස් කරලා තිබෙනවා; නිර්මාණය කරලා තිබෙනවා. ඉතින් මේවා පිළිබඳව සොයා බලන්න අවශ්‍යයි. මේ සංශෝධන හරහා ඇති වන බුරුල තුළ එහෙම නැත්නම් ලිහිල්කරණය තුළ විවිධ ජාවාරම්කරුවන්ට රටේ ප්‍රතිරූපය කෙලසන්න දෙන ආකාරයේ ඉඩ ප්‍රස්ථා නොදිය යුතුයි කියන එක තමයි මගේ අදහස වෙන්නේ. අපි දැන් මේ "විනිමය පාලන" කියන වචනය යොදන්නේ නැහැ කිව්වා. අපි ඒකට කිව්වා, "විනිමය කළමනාකරණය" කියලා. ශ්‍රී ලංකා මහ බැංකුව දීර්ඝ කාලයක් මේ කටයුත්ත නිවැරදිව කළා. ඒ නිසා අපි ඉදිරියටත් අධීක්ෂණයක්, සුපරීක්ෂණයක් සහිතව මෙය කළ යුතු වනවා. රට ඇතුළට ලැබෙන මුදල් වැඩි වැඩියෙන් ලබන්නත්, ඒවාගේම රටින් පිටට ගලා යන අනවශ්‍ය විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීම සඳහා එක පැත්තක් ගැන දක්වන උනන්දුවටත් වඩා වැඩි උනන්දුවක් දක්වන්න අවශ්‍ය වෙනවා, රටක් වශයෙන්. රටින් පිටට විදේශ විනිමය ගලා යන ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් මේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය කටයුතු කළ යුතුයි කියන අදහස ඇතුව මගේ වචන කිහිපය අවසන් කරනවා.

[අ.භා. 3.09]

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විදේශ විනිමය පනත යටතේ නියෝග ගැන කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම 2017 අංක 12 දරන මෙම විදේශ විනිමය

[ගරු දයා ගමගේ මහතා]

පනත මඟින් රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීමේ අයිතීන් විශාල වශයෙන් පුළුල් කළා.

මෙම පනත හඳුන්වාදීමට පෙර ලංකාවේ විදේශ විනිමය ප්‍රවර්ධනය සහ නියාමනය කළේ, 1953 අංක 24 දරන විදේශ විනිමය පනත මඟිනුයි. එය අහෝසි කරලා නව්‍යතාවකින් විදේශ විනිමය ගනුදෙනු කිරීමේ අයිතිය පුළුල් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සිදු කිරීමේ අවශ්‍යතාවක් අද පවතිනවා. අපි එය සකස් කරලා තිබෙන්නේ අපේ ආර්ථිකයට වාසි වෙන අන්දමටයි. ශ්‍රී ලංකා මහ බංකුව විසින් බලය පවරලා තිබෙන වාණිජ බැංකු, මූල්‍ය ආයතන, ඒ වාගේම විශේෂ බලයලත් වෙළෙඳුන්ට විනිමය ගනුදෙනුවල යෙදෙන්න අයිතිය මෙම නව පනත මඟින් විශාල වශයෙන් පුළුල් කරලා තිබෙනවා. ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බැංකුවක විනිමය ගිණුමක් ඇත්නම්, ලංකාව තුළ හෝ පිටතදී ප්‍රාග්ධන හෝ ඕනෑම වර්ධනයකදී ඒ මුදල යොදා ගැනීමට ඉහත සඳහන් ආයතන හරහා සිදු කරන්න මෙම පනත යටතේ බලය ලබා දීලා තිබෙනවා. මෙම පහසුකම වර්ධනය කළත්, එම ගෙවීම්වල නීත්‍යානුකූලභාවය තහවුරු කර ගන්න අදාළ පුද්ගලයා විසින් අදාළ මූල්‍ය ආයතවල නිවැරදි ලේඛන අනිවාර්යෙන්ම ඉදිරිපත් කරන්න ඕනෑ. සමහර වෙලාවට යම් කිසි පුද්ගලයෙක්ට එය කරන්නට බැරි නම්, මහ බැංකුවට ලිඛිතව දන්වා දවස් 14ක් ඇතුළත තමන්ගේ මුදල්වල නිරවද්‍යතාව තහවුරු කර ගන්න ඔහුට පුළුවන්කම තිබෙනවා. හැබැයි, මේ හැම එකක්ම කරන්න පුළුවන් වන්නේ ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ මැදිහත් කර ගැනීම තුළ පමණයි. මෙම පනතේ විශේෂ ලක්ෂණයක් වන්නේ, ඕනෑම පුද්ගලයෙක් ශ්‍රී ලංකාවට ඇමෙරිකන් ඩොලර් මිලියනයක් දක්වා ගෙවන කොට අධිභාරයක් හෝ වෙනත් ගාස්තුවක් ගෙවීම අහෝසි කරලා තිබීමයි. ඒ වාගේම ඕනෑම පුද්ගලයෙකුට ඇමෙරිකන් ඩොලර් මිලියනයකට වඩා ප්‍රමාණයක් ලංකාවේ සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කළොත්, අපි ඒ සඳහා බදු නිදහස් කරලා තිබෙනවා. අවසරලත් ආයෝජකයන්ට ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කළ හැකි අවස්ථා නව පනත අනුව පුළුල් කරලා, ඒ අනුව ඔවුනට සියලු පන්තිවල කොටස් හෝ කොටස් සඳහා හිමිකමක් ලබා ගන්න පුළුවන් වනවා. එසේම ලංකාව තුළ වසර තුනකට වඩා වැඩි කාලයක් ස්ථාපනය කර තිබූ සමාගමකට ඒ ණය සුරකුම්පත් ආයෝජනය කිරීම වාගේම ඒ සමාගමට ණය ප්‍රදානය කරන්නටත් පුළුවන්. එසේම වාණිජ බැංකු කල් බදු සමාගම් මූල්‍ය සමාගම් විසින් නිකුත් කරනු ලබන සුරකුම් පත්හි ආයෝජනය කිරීම, ඒ ණය ප්‍රදානය කිරීමේ හැකියාව අපි ලබා දීලා තිබෙනවා. මොකද, දේශීය ව්‍යාපාර ගැන කථා කරනවා නම්, අද ඔවුනට ඔවුනගේ ව්‍යාපාර වර්ධනය කර ගන්නට පිටරටකට මුදල් ආයෝජනය කරන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒකටත් අපි මේ පනත මඟින් අවස්ථාව සලස්වා දීලා තිබෙනවා.

ආයෝජකයෙක් විදේශ කොටස් හා ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කරන අවස්ථාවන්වලදී ඔහු කොටස් වෙළෙඳ පොළ ලියා පදිංචිකරුවෙකු නම්, කලින් තිබුණු ඩොලර් ලක්ෂ 5 අපි මිලියන දෙකක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ලැයිස්තුගත සමාගමක් නොවේ නම්, ඩොලර් ලක්ෂයක් කියලා තිබුණු මුදල ලක්ෂ 5ක් වෙනකන් වැඩි කරලා තිබෙනවා. ලියා පදිංචි හවුල් සමාගමක් නම්, එවැනි ආයෝජනයක් කරන විට පැවති සීමාව ජීවිත කාලයටම පැවති ඩොලර් ලක්ෂයේ සීමාව අපි ලක්ෂ තුනක් වෙනකන් වැඩි කරලා තිබෙනවා. තනි පුද්ගලයෙක් එවැනි ආයෝජනයක් කරන විට ඒක ලක්ෂයේ සිට ලක්ෂ දෙක දක්වා වැඩි කරලා තිබෙනවා. සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් නම් විදේශ කාර්යාලයක් පිහිටුවන විට වර්ෂයකට පැවති සීමාව ඩොලර් ලක්ෂයේ සිට ලක්ෂ තුනක් වනකන් වැඩි කරලා තිබෙනවා. එවිට, එක පුද්ගලයෙක්ට ඩොලර් 15,000ක් වෙනකන් පිටරටින් මුදල් ගෙනෙන්න අප ඉඩ දීලා තිබෙනවා. ඊට වඩා මුදල් පිටරටින් ගෙනෙන්න තිබෙනවා නම්, Sri Lanka Customs එකෙන් ඒ ගැන දැන ගන්න පුළුවන්.

අපේ ව්‍යාපාරිකයින්ට පිට රට තිබෙන තම මුදල් ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ මුදල් ලබා ගැනීමට අපි ඉඩ දෙන්නට ඕනෑ. හැබැයි, ඒ හැම දෙයක්ම මහ බැංකුව දැනුවත් කිරීම තුළින් තමයි අපි කරන්නේ. අද අපේ රටේ අපනයන ආදායම වැඩි කරන්න අපි කටයුතු කරමින් සිටිනවා. ගරු බන්දුල ගුණවර්ධන අපේ හිටපු ඇමතිතුමා විශේෂයෙන්ම කිව්වා, "අපේ අපනයන ආදායම වැඩි කරන්න ඕනෑ." කියලා. ඔව්, අපි අපනයන ආදායම වැඩි කරන්න ඕනෑ. අපනයන ආදායම වැඩි කරන්න නම්, අපි රට තුළ විශාල ආයෝජනයකුත් සිද්ධ කරන්න ඕනෑ. ඒ ආයෝජනය සිද්ධ කරන්නේ රජය නොවෙයි, පෞද්ගලික සමාගම්. එතකොට ඒ ආයෝජනය සිද්ධ කරන්න පෞද්ගලික සමාගම් මුදල් ලබා ගන්නා ක්‍රමවේදය මොකක්ද? අපේ බැංකුවලින් පමණක් ඒ මුදල් ලබා ගන්න නම් විශාල පොලියක් ගෙවිය යුතු වනවා. විශාල පොලියක් ගෙවිවොත් එම ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ උදව්යට ඕනෑ නම් පිට රටින් මුදල් ගෙනැල්ලා ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනය කර ගන්නට, එහෙම නැත්නම් ඒවාට අවශ්‍ය කරන ආයෝජන ඇති කර ගන්නට අපි මෙතැනදී අවස්ථාව සලසා දී තිබෙනවා.

අපේ හිතවත් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, "එදා ආහාර හිඟයක් ඇති වුණ නිසා අපට ආහාර මිල වැඩි කරන්න සිද්ධ වුණා. පෙට්‍රල්, භූමිතෙල් ඇතුළු ඉන්ධන මිල වැඩි වුණ නිසා ඉතිහාසයේ කවරදාකවත් සිදු නොවුණු ආකාරයට ඉන්ධන මිල වැඩි කරන්න සිද්ධ වුණා." කියලා. මට මතකයි, එදා භූමිතෙල් මිල වැඩි කළ වෙලාවේ ධීවරයන්ට එය දරා ගන්න බැරි වුණ බව. ඒ නිසා එදා හලාවත ධීවරයෝ පාරට බැස්සා. පාරට බැස්සාම එදා මොකක්ද කළේ? එදා හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අණ දුන්නා, "වෙඩි තබන්න." කියලා. එතකොට ඒ අහිංසක ධීවරයන්ට වෙඩි තබා මරා දැමුවා. නමුත්, අපි බලයට පත් වෙලා පළමු අවුරුද්දේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආනයන වියදම රුපියල් බිලියන 150කින් අඩු කළා. අපි ඒක කළේ, 2016 අවුරුද්දේ අපේ රටේ නිෂ්පාදන වැඩි කරලා. නමුත්, අවාසනාවකට වාගේ 2017 අවුරුද්දේ බලාපොරොත්තු වූ ඉලක්කයට අපට යන්න බැරි වුණා. මොකද, එක පැත්තකින් රටේ දිස්ත්‍රික්ක 14කට දරුණු නියඟයක් ආවා. අනෙක් පැත්තෙන් දිස්ත්‍රික්ක 11කට විශාල ගංවතුර උවදුරක් ආවා. එවැනි ආපදා තත්ත්වයකට අපේ රට මුහුණ දුන්නා. එම නිසා කෘෂිකර්මය පැත්තෙන් බලාපොරොත්තු වූ ප්‍රවර්ධනය අපට ලබා ගන්න බැරි වුණා. අපේ නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම කඩා වැටුණා. එවැනි ආපදා තත්ත්වයක් නොවුණා නම්, අපේ සංවර්ධන ඉලක්කය අනිවාර්යයෙන්ම අත් කර ගන්න තිබුණා. අපි ආහාර මිල අඩු කළා. පිට රටින් ගෙන්වන ඒවායෙත් මිල අඩු කළා. ආනයනවලින් අපි අය කර ගන්නා බදු භාණ්ඩාගාරයට අහිමි වුණත්, අපි ජනතාවට ඒ සහන සලසා දුන්නා. ඉන්ධන මිල අඩු වීමේ සහනය අපි ජනතාවට සම්පූර්ණයෙන්ම ලබා දුන්නා. යුද්ධය අවසන් වෙලා අවුරුදු පහක් ගිහිල්ලාත් පසුගිය රජයට බැරි වුණා ජනතාවට සහනයක් ලබා දෙන්න. නමුත්, දින 100 අපේ ආණ්ඩුවේදී මේ සහන ටික ඔක්කෝම අපි ලබා දුන්නා. අද වන විට ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවා. නමුත්, අපි තවම භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල් මිල රුපියලකින්වත් වැඩි කළේ නැහැ. ඒ වාගේම අද ඩොලරය-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් ඉතිරිව තිබෙනවා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, "අද ඩොලරයට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා." කියලා. එදත් ඔබතුමා කැබිනට් මණ්ඩලයේ ඉඳගෙන මේවා ගැන කථා කරන්න ඇති කියා මම විශ්වාස කරනවා. ඇත්තටම එදා පැවැති රජය ඔබතුමා කියපු දේවල්වලට ඇහුම් කන් දුන්නේ නැතුව ඇති. ගරු මන්ත්‍රීතුමනි, අපේ විදේශ සංචිත ප්‍රමාණය ගැන මම ඔබතුමාට කියන්නම්. 2014දී අපේ ගෙවුම් ශේෂයේ හිඟය ඩොලර් මිලියන 8,282යි. එදා අපේ ගෙවුම් ශේෂය minus අගයක් ගත්තේ. අද ගෙවුම් ශේෂයේ අතිරික්තයක් තිබෙනවා.

2017 වසර වන විට අපි එතැන ඩොලර් බිලියන දෙකක අතිරික්තයක් ඇති කරලා තිබෙනවා. මේ විධියට විශාල වශයෙන් ඩොලර්වලින් ණය අරගෙන, අවුරුදු ගණනක් තිස්සේ ඩොලරය රුපියල් 110ට තියාගෙන රාජපක්ෂ ආණ්ඩුව කළේ, අපේ අපනයනකරුවන් සම්පූර්ණයෙන්ම විනාශ කරලා දැමීමයි. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ ඇති කරපු ඇඟලුම් කම්හල් 200 ව්‍යාපෘතිය තුළින් අපි ගමට කර්මාන්තය ගෙන ගියා විතරක් නොවෙයි, ගමේ ඉන්න තරුණ තරුණියන්ට රැකියා ලබා දුන්නා විතරක් නොවෙයි, අවසානයේදී අපේ අපනයන ආදායමෙන් සියයට 54ක් වන තුරු අපි ඇඟලුම් තුළින් මේ රටට මුදල් ලබා දුන්නා. යුද්ධයට මුදල් වියදම් කරන්න ඩොලර් ටික සොයා දුන්නේ, එදා ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ඇති කරපු ඇඟලුම් කර්මාන්ත ව්‍යාපාරය තුළ වැඩ කරපු මේ රටේ අහිංසක සේවක සේවිකාවන්. එවැනි කර්මාන්ත විනාශ කළා. එදා GSP Plus බදු සහනය අපට සම්පූර්ණයෙන්ම නැති කරලා දැම්මා. නැති කරලා දමලා, ඩොලර්වලින් ණය අරගෙන, ඩොලරය රුපියල් 110ට තියාගෙන අපනයන කර්මාන්තශාලා ටික එකින් එක වසා දැම්මා. අටසිය ගණනක්ව තිබුණු කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම වැහුණා. ඊට අමතරව ඒවායේ රැකියා කරමින් හිටපු උදවියට මේ රටේ ඉඳගෙන ආදායමක් ලබා ගන්න බැරි වීම තුළ හුඟක් උදවිය පිට රටවල රස්සා හොයාගෙන ගියා. එතකොට අපට දෙපැත්තකින් විශාල පාඩුවක් සිදු වුණා.

ඊළඟට, බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා කියන විධියට අපි අද අනිවාර්යයෙන්ම අපේ රටේ අපනයන ආදායම වැඩි කර ගන්න ඕනෑ. අපනයන ආදායම වැඩි කර ගන්න නම්, ඩොලරය අනිවාර්යයෙන්ම රුපියල් 160ට-165ට පවත්වාගෙන යන්න අවශ්‍යයි. එහෙම නැතුව අපට අපේ අපනයන ආදායම වැඩි කර ගන්න, අපේ කර්මාන්තශාලා ටික පවත්වාගෙන යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, වෙලාව අවසානයි.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මට විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලෝකයේ ආර්ථිකය කඩාගෙන වැටෙනකොට වෙනත් රටවල් තමන්ගේ අපනයන පංගුව තියා ගන්න කටයුතු කළා. ඉන්දියාව ඉන්දියාවේ රුපියල බාල්දු කළා; ඕනෑකමින් බාල්දු කළා. බාල්දු කරන්න අවශ්‍යතාවක් නැති වුණත් අපනයන වෙළෙඳ පොළ ආරක්ෂා කර ගන්න ඒ රටවල් තමන්ගේ මුදල් බාල්දු කරනවා. නමුත් අපේ රට එහෙම කළේ නැහැ. අපේ රට අපනයන ව්‍යාපාරිකයින් ගැන කිසිම තැකීමක් කළේ නැහැ. අද අපට ඒවා මුල ඉඳලා පටන් අරගන්න සිදු වෙලා තිබෙනවා. එදා 1974 වසරේදී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා ඇති කරපු යුගය, ඊට පස්සේ රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා භාර අරගෙන නැවත වෙනස් කරපු යුගය නැවතත් ඇති කරන්න අපට සිදු වෙලා තිබෙනවා. අපි ඇති කරපු අපේ අපනයන ආර්ථිකය, සියයට 38ක්ව තිබුණු අපේ අපනයන ආර්ථිකය රාජපක්ෂ ආණ්ඩුව කාලයේ සියයට 14ක් වනතුරු කඩාගෙන වැටුණා. අපි මේ ආර්ථිකය නැවත ගොඩ නහන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය හරි. අඩු වශයෙන් අපේ ආර්ථිකයෙන් සියයට 50ක්වත් අපනයන ආර්ථිකය වැඩි කළේ නැත්නම්, කවදාවත් අපට මේ අරගෙන තිබෙන ණය කන්දරාව ගෙවා ඉවර කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සඳහා විරුද්ධ පක්ෂයේ ඉඳගෙන ඔබතුමන්ලාගේ හොඳ අදහස් අපට දීලා, එහෙම නැත්නම් ඔබතුමන්ලාත් ආණ්ඩු පක්ෂයට එකතු වෙලා අපට සහයෝගය දෙන්න. අපි බලන්න ඕනෑ, රට වෙනුවෙන් අපි ඉදිරියට වැඩ කරන්නේ කොහොමද කියලායි.

ගරු බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා ලංකාව සහ චීනය අතර වෙළෙඳ සම්බන්ධතා ගැන නිබන්ධනයක් ලියලා, එතුමාට ආචාර්ය උපාධියක් ලැබුණා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, අපේ ලංකාව වෙනුවෙන් ඔබතුමා ඒ විශ්වවිද්‍යාලයෙන් ලබා ගත් ආචාර්ය උපාධිය වෙනුවෙන් මම මේ අවස්ථාවේදී ඔබතුමාට මාගේ ශුභාශිංසනය ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.24]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறும் வெளிநாட்டுச் செலவணிச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், கொழும்பு பங்குத் தொகுதிப் பரிவர்த்தனையை பரஸ்பரமற்றமயமாக்கல் சட்டமூலம் என்பவை தொடர்பான இந்த விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. J.M. Ananda Kumarasiri to take the Chair?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
Sir, I propose that the Hon. J.M. Ananda Kumarasiri do now take the Chair.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

වීසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please continue with your speech.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Thank you, Sir.

இந்த நாட்டினுடைய வருமானத்தை அதிகரித்தல், அபிவிருத்தியை மையமாகக் கொண்டு பல்வேறு திட்டங்களை உருவாக்குதல், வெளிநாட்டுப் பணத்தை எமது நாட்டில் முதலீடு செய்யக்கூடிய வகையிலே வசதிவாய்ப்புகளை ஏற்படுத்துதல் போன்ற பல்வேறுவிதமான அபிவிருத்தி தொடர்பான இலக்குகளை மையமாகக் கொண்டு இவ்வாறான பல சட்டத் திருத்தங்கள் மேற்கொள்ளப்படுகின்றன. அதன்மீது விவாதித்தல், அந்தச் சட்டங்களை நிறைவேற்றுதல், அவை சார்பான சுற்றுநிருபங்களை உருவாக்குதல் போன்ற பல்வேறு விடயங்கள் பொதுவாக வரவேற்கத்தக்கனவாக, ஏற்றுக்கொள்ளக்கூடியனவாக இருந்தாலும், இவ்வாறான சட்டதிட்டங்கள், நாடு முழுவதற்கும் பொருத்தமானவையாக அமைகின்றனவா? இலங்கை நாட்டில் வாழ்கின்ற அனைத்து மக்களுக்கும் இந்த வசதிவாய்ப்புகள் சென்றடைகின்றனவா? என்பது பற்றி ஒரு கணம் சிந்திக்க வேண்டியிருக்கின்றது. வடக்கு, கிழக்குப் பகுதிகளைப் பொறுத்தவரையில், அங்கு இவ்வாறான திட்டங்கள் அல்லது இவ்வாறு உருவாக்கப்படுகின்ற சட்டங்கள் எவ்வளவு தூரம் எமது மக்களைச் சென்று சேர்கின்றன என்பது ஒரு கேள்விக்குறியாகவே இருக்கின்றது.

30 வருட கால யுத்தத்தை அனுபவித்து, பல இழப்புகளையும் இன்னல்களையும் எதிர்கொண்ட எமது மக்கள், ஆயுதப்போராட்டம் மௌனித்த பின்பும் தங்களுடைய அடிப்படைத் தேவைகளைப் பூர்த்தி செய்யமுடியாமல் வீதியோரங்களில் சாத்வீகப் போராட்டங்களை நடத்திவருவது நாங்கள் அனைவரும் அறிந்த உண்மையாகும். அதுமட்டுமல்ல, வெளியிலே சொல்ல முடியாத எத்தனையோ பிரச்சினைகளை எமது மக்கள் தொடர்ந்தும் அனுபவித்துக்கொண்டு வருகிறார்கள். எமது பிரதேசத்தில் மாவட்ட ரீதியாக அல்லது பிரதேச ரீதியாக நடைபெறுகின்ற அபிவிருத்திக் குழுக் கூட்டங்களிலே அபிவிருத்திகள் தொடர்பான கொள்கைகள் சம்பந்தப்பட்ட கலந்துரையாடல்கள் இடம்பெறுவதற்கு அப்பால் வேறு விடயங்கள் பற்றியே கலந்துரையாடப் படுகின்றது. அதாவது இராணுவத்தால் ஆக்கிரமிக்கப் பட்டிருக்கின்ற காணிகளை விடுவிப்பது பற்றிக் கலந்துரையாடுவதிலும் தென்பகுதியிலுள்ள சிலர் அங்கு வந்து சட்டத்திற்கு முரணாகக் கடல் வளங்களைச் அள்ளிச் செல்கின்ற, சட்டத்திற்கு முரணான செயற்பாடுகளை நிறுத்துவதற்குரிய மாற்றுவழி காண்பது பற்றி வாக்குவாதங்கள் நடத்துவதிலும்தான் அந்தக் கூட்டங்களின் பெரும்பகுதியான நேரம் செலவிடப்படுகின்றது. அதேநேரம் அங்குள்ள மக்கள் வெளியிலே சொல்ல முடியாத எத்தனையோ பிரச்சினைகளைத் தொடர்ந்தும் அனுபவித்துக்கொண்டு வருகிறார்கள்.

யுத்தம் முடிவடைந்ததன் பின்னர் வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு அரச, அரச சார்பற்ற நிறுவனங்களாலே பல கோடி ரூபாய் பணம் கொட்டப்பட்டும் மக்களது அடிப்படைத் தேவைகள் பூர்த்தி செய்யப்படாத நிலையில் அதாவது, வீதிகள், குளங்கள், குளங்களுக்குரிய வாய்க்கால்கள் என்பன புனரமைக்கப்படாமல் இருக்கின்றன. அந்த வகையில் அவர்களுடைய அடிப்படைத் தேவைகளையே பூர்த்தி செய்யாத பல்வேறு விடயங்கள்தான் அந்த அபிவிருத்திக் குழுக் கூட்டங்களில் கணிசமான நேரத்தை எடுத்துக்கொள்ளும். இந்த அடிப்படைப் பிரச்சினைகளைத் தீர்க்கின்ற வகையிலே விசேடமான ஒழுங்கமைப்புக்கள் மேற்கொள்ளப்படல் வேண்டும்.

மகாவலித்திட்டத்தை அபிவிருத்தி செய்தல், அதற்கான காணிகளை வழங்குதல், பாரம்பரியமாக மக்கள் வாழ்ந்துவருகின்ற கிராம சேவையாளர் பிரிவுகளை மகாவலித் திட்டத்திற்குள் உள்வாங்கி அவற்றை வெலிஓயாப் பிரதேச செயலகத்தோடு இணைத்தல் போன்ற விடயங்கள் சம்பந்தமான கூட்டங்கள் குறிப்பாக முல்லைத்தீவு மாவட்டத்தில் நேற்றும் இடம்பெற்றிருக்கின்றன. இதற்காக வடக்கு மாகாண ஆளுநர் அலுலகத்திலுள்ள அலுவலர்களும் மகாவலி அபிவிருத்தித் திட்ட அலுவலர்களும் இணைந்து எங்களது மாவட்டப் பிரதேச செயலக, மாவட்டச் செயலக அதிகாரிகளோடு சந்திப்புக்களை மேற்கொண்டிருக் கின்றார்கள். ஆனால், இந்தச் செயற்பாடுகள் உடனடியாக நிறுத்தப்படல் வேண்டும். யுத்தத்திலிருந்து மீண்டெழுந்த மக்கள் தங்களுடைய வருமானத்தை அதிகரித்துக் கொள்ளக்கூடிய வகையில், நிலைபேறான அபிவிருத்தியை ஏற்படுத்தக்கூடிய வகையில் ஒரு நல்லிணக்கத்தோடு, நல்லுள்ளத்தோடு திட்டங்கள் வகுக்கப்பட வேண்டும். இதைவிடுத்து எமது மக்களை மேலும் நோகடிக்கச் செய்கின்ற வகையில், ஓர் இக்கட்டான நிலைக்குத் தள்ளக்கூடிய வகையில் செயற்பாடுகள் இடம்பெறுவதென்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும்.

குறிப்பாக, அங்கு யுத்த காலத்திலே இயங்கிவந்த விவசாயப் பண்ணைகள் மக்களுக்கு மிகுந்த வருமானத்தைத் தருபவையாகும். முல்லைத்தீவு, மன்னார் ஆகிய மாவட்டங் களில் உள்ள 100 ஏக்கருக்கும் மேற்பட்ட அந்தக் காணிகளை CSD எனப்படும் Civil Security Department பிடித்து வைத்திருப் பதனூடாக அந்தப் பண்ணைகளிலிருந்து இராணுவத்தினர் தொடர்ந்தும் வருமானங்களை ஈட்டிவருகின்றனர். இது குறித்து நாங்கள் அபிவிருத்திக் குழுக் கூட்டங்களில் தொடர்ந்து சுட்டிக்காட்டி வருகின்றோம். இந்த 100 ஏக்கருக்கும் மேற்பட்ட பண்ணைகளில் மேற்கொள்ளப் படுகின்ற விவசாயத்திற்கு, அவற்றுக்கு அருகிலுள்ள

குளங்களிலிருந்துதான் நீர் இறைக்கப்படுகின்றது. இதனால் அங்கு மீள்குடியேறிய மக்கள் இந்தக் குளங்களின்கீழுள்ள வயல்களில் பயிர்ச்செய்கையை மேற்கொள்ள முடியாது தொடர்ந்தும் பல துன்பங்களை அனுபவித்து வருகின்றார்கள். இவ்வாறான அடிப்படைப் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய வகையில் இந்த அரசு என்ன திட்டங்களை வகுத்திருக்கின்றது? இந்த மக்களை மேலும் நோகடிக்கச் செய்கின்ற வகையிலேதான் அரசினுடைய நடவடிக்கைகள் தொடர் கின்றன.

அங்கு உற்பத்தி செய்யப்படுகின்ற மூலப்பொருட்கள் மூலப்பொருட்களாகவே தென்பகுதிக்கு எடுத்துச்செல்லப் படுகின்றன. அவற்றை முடிவுப் பொருளாக்கக்கூடிய புதிய தொழிற்சாலைகள் அங்கு ஆரம்பிக்கப்படாதது மட்டுமல்ல, முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டானில் அமைந் திருக்கின்ற ஓட்டுத் தொழிற்சாலை உட்பட யுத்த காலத்திலே கைவிடப்பட்ட தொழிற்சாலைகள் எவையும் இதுவரை ஆரம்பிக்கப்படவில்லை. எதிர்காலத்தில் வடக்கு, கிழக்குப் பகுதிகளில் 50 ஆயிரத்துக்கும் மேற்பட்ட வீடுகள் கட்டப்பட இருப்பதனால், அந்த வீடுகளுக்கான ஓடுகளை வழங்கக்கூடிய வகையில் அங்கு ஏற்கெனவே இருந்த ஓட்டுத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். ஆனால், அந்தத் தொழிற்சாலையும் ஆரம்பிக்கப்படவில்லை. இதனால் அங்கு வறுமை தொடர்ந்து கொண்டிருக்கின்றது.

அதேநேரம் வருடாவருடம் சம்பந்தப்பட்ட அமைச்சுக் களினால் வழங்கப்படுகின்ற வாழ்வாதார நடவடிக்கைகள் எமது மக்களுக்கு நிலைபேறான வருமானத்தைத் தரக்கூடிய செயற்பாடுகளாக அமையவில்லை. அதாவது, யுத்தத்தினால் தனது கணவனை இழந்து அல்லது கணவனைத் தொலைத்து அல்லது அவயவங்களை இழந்து பாதிக்கப்பட்டிருக்கின்ற குடும்பங்களுக்கு இந்த அரசு ஓர் இலட்சம் ரூபாய் பெறுமதியான பால்மாடு, ஆடு, கோழி மற்றும் நீரிறைக்கும் இயந்திரம் போன்றவற்றை வழங்கக்கூடிய உதவித் திட்டங்களைக் கடந்த 10 வருடங்களாக மேற்கொண்டு வருகின்றதே தவிர, அந்த மக்கள் நிலைபேறான வருமானத்தை ஈட்டக்கூடிய தொழில்முயற்சிகளை ஆரம்பிப்பதற்கு நடவடிக்கைகள் எடுக்கவில்லை. இதனிலும் மேலாக, பெண்கள் குழுக்களாக இணைந்து மேற்கொள்கின்ற சிறு கைத்தொழில் முயற்சிகளை ஊக்குவிப்பதற்குரிய அல்லது உற்பத்திகளைச் சந்தைப்படுத்துவதற்குரிய வசதி வாய்ப்புக்களை ஏற்படுத் துவதற்கான எதுவித பொறிமுறைகளும் அங்கு இல்லை. பெண்கள் உள்ளூர் உற்பத்திகளில் அதாவது, அங்கு கிடைக்கின்ற மூலப்பொருட்களை முடிவுப் பொருட்களாக் குகின்ற தும்பு உற்பத்தி, கைப்பணி வேலைகள், உணவு பதனிடல் போன்ற தொழில்களில் குழுக்களாகச் சேர்ந்து ஈடுபடுகின்றபோதும் அவர்கள் அந்த உற்பத்திப் பொருட் களைச் சந்தைப்படுத்த முடியாமல் அந்தத் தொழில்களை இடைநடுவிலே கைவிட்டு விடுகின்றனர். எனவே, வடக்கு, கிழக்குப் பகுதியில் யுத்தத்திலிருந்து மீண்டெழுந்த எமது மக்கள் ஒரு நிலைபேறான வருமானத்தை ஈட்டிக்கொள்ளக்கூடிய வகையிலான பொறிமுறைகளை வகுத்துக் கொள்ளுங்கள்! அதற்கென சம்பந்தப்பட்ட அமைச்சர்கள், அது சார்ந்த அதிகாரிகள் மற்றும் உத்தியோகத்தர்கள் இணைந்து ஒரு குழுவாக வடக்கு, கிழக்குப் பகுதிக்கு விஜயம் செய்து, அங்கு நிலவுகின்ற வறுமையைப் போக்குவதற்கு எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகள் தொடர்பான திட்டங்களையும் வகுத்துக்கொள்ளுங்கள்!

அடுத்து, அந்நியச்செலாவணியை அதிகரித்தல், நாட்டை வளப்படுத்துதல் போன்ற விடயங்கள் பற்றிய திட்டங்கள் மேல் மட்டத்திலே வகுக்கப்படுவதை ஏற்றுக்கொள்கின்ற அதேவேளை, மக்களுடைய அடிப்படைப் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய வகையில் திட்டங்களை வகுக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன். அதேநேரம் யுத்தத்திலே மீண்டெழுந்த எமது மக்களும் இந்த நாட்டிலே நல்லிணக்கத்தோடு வாழக்கூடிய வகையிலே வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். தமிழ் மக்களின் வாக்குகளால் ஆட்சிக்கு வந்த இந்த அரசானது, அந்த மக்களையும் அவர்களது வாக்குப் பலத்தையும் மதித்து, அவர்களின் வாழ்வில் விடிவை ஏற்படுத்தக்கூடிய வகையிலே செயற்படுவதோடு, அந்த மக்கள்மீதான ஆக்கிரமிப்புக்களைத் தவிர்த்து அவர்கள் தங்களது நிலங்களிலே - தங்களது மண்ணிலே நிரந்தரமாகவும் நிம்மதியாகவும் வாழக்கூடிய வசதிகளை ஏற்படுத்திக் கொடுக்கவேண்டுமென்று கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)

(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)

Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රන්ජන් රාමනායක මහතා

(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)

(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ සභාවේ නැති අතරේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කීපදෙනෙකු මාගේ නම සඳහන් කරමින්, ඊයේ මා කළ ප්‍රකාශයක් ගැන වැරදි අර්ථ කථනයක් දුන්නා. එය අද රූපවාහිනියේ විකාශනය වන නිසා ඒක නිවැරදි කරන්න මට කෙටි අවස්ථාවක් දෙන්න.

මා ඊයේ කිසිදු Supreme Court විනිසුරුවරයෙකුගේ නමක් සඳහන් කළේ නැහැ. මම සඳහන් කළේ ඉන්දියාවේ Supreme Court විනිසුරුවරුන් තුන්දෙනෙකු ගැනයි. Justice Ranjan Gogoi විසින් ප්‍රකාශ කරන ලද "We should not sell our souls" කියන වැකිය අරගෙන තමයි මාගේ ප්‍රකාශය කළේ.

ඊළඟට, මම කිව්වේ හිත්තගල්ලේ ආනන්ද හිමි සඳහන් කළ දෙයක්. උන්වහන්සේ සඳහන් කළා, "මේ ලංකාව විනාශ කළේ පූජකයන් සහ පාලකයන්" කියන එක. ඒ ප්‍රකාශය තමයි මා සඳහන් කළේ. මා කිසිම අවස්ථාවක ගරු අධිකරණයටවත්, නීතියටවත් අභියෝග කළේ නැහැ. ජීවත්ව සිටින කිසිම විනිසුරුවරයෙකුගේ නමක් මා සඳහන් කළේ නැහැ. විනාඩි 34ක කථාවක් මා කරලා තිබෙනවා. ඕනෑ නම්, මගේ Facebook පිටුව සහ ජනමාධ්‍ය ඒකකය ඕනෑම කෙනෙකුට අරගෙන බලන්න පුළුවන්. වැරදි මතයක් ජනතාව අතරට යන නිසායි මා මේ ප්‍රකාශය කරන්නේ. තවමත් මා කිව්ව හැම වචනයකම වගකීම මා ගන්නවා. මා එම කිසිම වචනයක් ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මා නැවත නැවතත් කියනවා, මා ඒ කිව්වේ අද මේ හොරු, මිනීමරුවෝ, කුඩුකාරයෝ එළියේ ඉන්නේ, දේශපාලනඥයන්ගේ, ගරුතර මහා සංඝ රත්නයේ -මහා සංඝ රත්නයේ සියලුම ස්වාමීන් වහන්සේලා නොවෙයි- පිරිත් නූල් බඳින, ඒ අයට පිණ්ඩපාතයේ

[ගරු රන්ජන් රාමනායක මහතා]

යන ස්වාමීන් වහන්සේලාගේ සහ වැරදි කරන දේශපාලනඥයින්ට ඡන්දය දෙන ජනතාව ඇතුළු මේ සියලුදෙනාගේ වරද නිසාය කියන එකයි. මේ වැරදිකාරයෝ අද එළියේ ඉන්නේ ඔවුන් නිසාය කියන මතය තමයි මගේ මුළු කථාවේම මුඛ්‍යාර්ථය වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මේ පිළිබඳව දීර්ඝ වශයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, මෙම කරුණු ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කර ඒ සඳහා හෙට දිනයේ අවස්ථාවක් අරගෙන ඔබතුමාට ඒ ගැන කථා කරන්න පුළුවන්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මා ඒ වෙලාවේ සිටියේ නැති හින්දායි ඔබතුමාගෙන් මේ අවස්ථාව ඉල්ලුවේ. මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. මේ කථාව අහගෙන සිටින සියලුම ජනතාවට මා නැවත නැවත කියනවා, නැවත වතාවක් ඒ කථාව නරඹන්න කියලා. මා නැවත නැවතත් කියනවා, අධිකරණයේ දුර්වලතා, නීතියේ දුර්වලතා හින්දා, නීතිඥයෝ හොරුන්ව බේරන හින්දා තමයි අද මේ හොරු එළියේ ඉන්නේ කියලා. ඒකට අප සියලුදෙනාම සම්බන්ධයි. ඒකට ඡන්දය දුන් ජනතාව සම්බන්ධයි; දේශපාලනඥයෝ සම්බන්ධයි; පූජකවරුන් සම්බන්ධයි. විනිසුරුවරුන් සම්බන්ධයි. ඒක මා කවදාවත් ඉල්ලා අස් කර ගන්නේ නැහැ. ඉදිරියේදී මා ඕනෑම වාදයකට එන්නම්. මා හිතන විධියට ගරු කථානායකතුමාට ඒ අය යෝජනා කරලා තිබෙනවා, මේ ගැන නැවත විවාදයක් ගේන්න කියලා.

ඒ විවාදයේදී සරත් ආබාa ගැන, සරත් නන්ද සිල්වා ගැන, මොහාන් පීරිස් ගැන මා කියන්නම්. මා කිව්වා, මේ රටේ පළමුවැනි පුරවැසියා වන අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්ව කථාවක්. එතුමා තමයි කිව්වේ, ජනවාරි 10වෙනි දා උදේ මොහාන් පීරිස් කියන හිටපු අග විනිසුරුවරයා ඇවිල්ලා කිව්වා කියලා, "මට නැවත අග විනිසුරුකම දෙන්න. මා තමුන්නාන්සේට ඕනෑ තීන්දු දෙන්නම්" කියලා. ඒ වාගේම සරත් එන්. සිල්වා මහත්තයා කිව්වා, "මම හිර ගෙදර යවන්න ඕනෑ කෙනාව රජ ගෙදර යැව්වා. මට සමාවෙන්න" කියලා. ඒ කිව්වේ මහින්ද රාජපක්ෂ මහත්තයා ගැන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

අද මා විවාදයට සූදානම් වෙලා සිටියේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්නයි. නමුත්, අද ඒ පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව පැත්තකට දමා වෙනත් කාරණයක් පිළිබඳව කථා කරන නිසා මා ඉතාමත්ම කෙටියෙන් ඒ සම්බන්ධයෙන් කථා කරන්නම්.

අපේ කොටස් වෙළෙඳ පොළ පිළිබඳව සැලකිලිමත් වෙනකොට නිරන්තරයෙන්ම ආණ්ඩුවේ ස්ථාවරභාවය සහ අස්ථාවරභාවය පිළිබඳව කථාව ඉතාමත්ම වැදගත් වනවා. මේ ආණ්ඩුවට පැවැත්මක් නැත; මේ ආණ්ඩුව කඩා වැටෙනවා; බිඳ වැටෙනවා; වැඩ පිළිවෙළක් නැත; වාගේ අස්ථාවර මතවාද නිරන්තරයෙන් රට තුළ, රටේ ජනතාව තුළ, ව්‍යාපාරික පන්ති තුළ ඇති කිරීම තුළින් අපේ රටේ කොටස් වෙළෙඳ පොළ යම් යම් උච්චාවචනයන්වලට ලක්ව තිබීම අපි ඇත්ත වශයෙන්ම සලකා බලන්න ඕනෑ කාරණයක්. රටක සංවර්ධනය පිළිබඳව, රටක ස්ථාවරභාවය පිළිබඳව සලකා බලන මූලික අංගයක් හැටියට අපට කොටස් වෙළෙඳ පොළ සඳහන් කරන්න පුළුවන්. කොටස් වෙළෙඳ පොළ සාර්ථක කර ගැනීම සඳහා සහ ස්ථාවර කර ගැනීම සඳහා අද ගෙන එන පනත් කෙටුම්පත අපට ඉතාමත්ම වැදගත් කාරණයක්. මොකද, මේ වෙනකොට 15දෙනෙක් වාගේ සුළු සංඛ්‍යාවක් අතේ තිබෙන මේ කොටස් වෙළෙඳ පොළ, කොටස් වෙළඳපොළත් එක්ක ගනුදෙනු කරන සමස්ත ජාලයටම විවෘත කරලා විනිවිදභාවයකින් යුක්තව සියලු දෙනාටම පොදුවේ කටයුතු කරන්න ලබා දීම මේ අවස්ථාවේදී අපි ඇත්තටම අගය කරන්න ඕනෑ.

ඒකාබද්ධ විපක්ෂයේ නිරන්තර අවශ්‍යතාව වෙන්නේ මේ රට අස්ථාවරයි, මේ රට කඩා වැටෙනවා, මේ රට අරාජිකයි කියලා මේ රට තුළ අරාජික මානසිකත්වයක් ස්ථාපිත කරලා මේ ආණ්ඩුව බලෙන් කඩා වට්ටන එකයි. අද මේ අය විශ්වාස භංග යෝජනාවක් භාර දුන්නා. අපි සන්තෝෂ වෙනවා, අපි ස්තුතිවන්ත වෙනවා දැන් හරි, -අද හරි- ඔය ගේනවා කියමින් සිටි විශ්වාස භංග යෝජනාව භාර දුන්නු එක ගැන. මේක හරියට පොළේ පිනුම්කාරයාගේ පිනුම වාගේ තිබුණේ. විසිල් එක ගහනවා, විසිල් එක ගහනවා, වටේ යනවා, අපට මෙච්චරක් ඉන්නවා, මෙච්චරක් ඉන්නවා කියනවා, ජනතා විමුක්ති පෙරමුණ ඡන්දය දෙනවා කියනවා, අරහෙන් ඡන්දය දෙනවා කියනවා, මෙහෙන් ඡන්දය දෙනවා කියනවා. හරියට පොළේ පිනුම්කාරයාගේ පිනුම වාගේ. නමුත් පිනුම ගහන්නේ නැහැ. විසිල් එක ගහනවා, විසිල් එක ගහනවා, විසිල් එක ගහනවා, වටේ යනවා, හැඩ දානවා, ශබ්දය දානවා, ගොරවනවා විතරයි. බාලගිරි දෝෂය වාගේ, "අද නොවෙයි හෙට, අද නොවෙයි හෙට, අද නොවෙයි හෙට" කියනවා. මේ රට අරාජික කරන, මේ රට අස්ථාවර කරන වැඩසටහනේ තවත් එක ජවනිකාවක් විධියට, දෙවියන්ගේ නාමයෙන් අද ඒ විශ්වාස භංගය භාර දුන්නා. අපි සන්තෝෂයට පත් වෙනවා, අපි ස්තුතිවන්ත වෙනවා ඒකාබද්ධ විපක්ෂයට, -තමුන්නාන්සේලාට- බාලගිරි දෝෂය වාගේ, "අද නොවෙයි හෙට, අද නොවෙයි හෙට" කියපු විශ්වාස භංගය යම්තම් බාලගිරියාව අල්ලාගෙන අද භාරදීම පිළිබඳව. ඒක කරපු එක හොඳයි. අපි කථානායකතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, මේ විශ්වාස භංගය න්‍යාය පත්‍රවල පුස් කන්නට ඉඩ නොදී කඩිනමින් ගෙනැල්ලා අපේ රට අස්ථාවරද, ස්ථාවරද, වැඩි බහුතර බලය කාටද කියලා කරුණාකරලා පෙන්නුම් කරන්න කියලා. මොකද, රටේ අස්ථාවර භාවය අපේ රටේ පාලනයට විශාල බාධාවක්. මම විශේෂයෙන් කියනවා, කරුණාකරලා ඉක්මනින්ම මේ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ කාරණය විසඳලා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒකාබද්ධ විපක්ෂයත් සමඟ අපේ විශ්වාසය භංග වෙලා ඉවරයි. කවදාවත් අපට ඒකාබද්ධ විපක්ෂයත් සමඟ විශ්වාසයක් තිබුණේ නැහැ. අපිත් එක්ක තිබුණු ඒගොල්ලන්ගේ විශ්වාසය බිඳුණා කියලා අමුතුවෙන් ඒගොල්ලන් අපිට කියන්නට අවශ්‍ය වෙන්නේත් නැහැ, අපි ඒකට

කනගාටු වෙන්නේත් නැහැ. ඒකාබද්ධ විපක්ෂයත් සමඟ අපේ තිබුණු විශ්වාසය භංග වෙලා ඉවරයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි කිව්වානේ අපට මෙපමණ අත්සන් තිබෙනවා, මෙපමණ අත්සන් තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණ අත්සන් කරනවා, අහවල්ලු අත්සන් කරනවා, මෙයාලා අත්සන් කරනවා කියලා. අපේ එක්සත් ජාතික පක්ෂයෙනුත් විශාල පිරිසක් අත්සන් කරනවා කියලා කිව්වා.

මම අහනවා, අද අපේ එක්සත් ජාතික පක්ෂයේ කවුද මේකට අත්සන් කළේ, ජනතා විමුක්ති පෙරමුණේ කවුද මේකට අත්සන් කළේ කියා. ඒ වහසි බස් දොඩපු, මහා යක්ෂයෙක් මවපු විශ්වාස භංගයට කවුද අත්සන් කරලා තිබුණේ? පොහොට්ටුවේ බහුතරයකුයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන, අපේ ආණ්ඩුවේම ඉඳගෙන, අපෙන් ඇමතිකම් අරගෙන ඉන්න තුන් හතර දෙනෙකුයි විතරයි අත්සන් කරලා තිබෙන්නේ. යක්ෂයා මව මවා, දොඩව දොඩවා, කථා කර කර පැත්තකට වෙලා ඉන්නවාට වඩා යක්ෂයාව එළියට දාලා, "මෙන්න යකා" කියලා ඇරලා දාන එක තමයි මම හිතන විධියට අද අවශ්‍ය වෙන්නේ.

මම විශේෂයෙන් කියනවා, දැන් ඒකාබද්ධ විපක්ෂ කණ්ඩායමයි අපියි අතර තිබුණු විශ්වාසය භංග වෙලා ඉවරයි කියා. හැබැයි අපට එක ප්‍රශ්නයක් තිබෙනවා. අපිත් එක්ක මේ ආණ්ඩුව කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තුන් හතර දෙනෙකුත් අද මේකට අත්සන් කරලා තිබුණා කියලා අපට ආරංචි වුණා. මේ අය මොකක්ද මේ කරන්න හදන්නේ? තමන්ගේ තිබෙන දෝෂ ටික භංග කර ගන්න තමයි මේ විශ්වාස භංගයට අත්සන් කරන්නේ. තමන්ගේ තිබෙන දෝෂ ටික භංග කර ගන්න තමයි මේගොල්ලන් මේකට අත්සන් කරන්නේ. ගෙවල්වලත් අපි පෙරේත ගොටුවක් දෙනවා, එළුවෙකුගේ බෙල්ලක් කපලා බිල්ලක් දෙනවා, කුකුළෙකුගේ බෙල්ලක් කපලා බිල්ලක් දෙනවා, හරකෙකුගේ බෙල්ලක් කපලා බිල්ලක් දෙනවා. ඕනෑ නම් පසුගිය කාලයේ වාගේ ඇතෙක් මරලා දළ ටික අරගෙන හෝ බිල්ලක් දෙනවා. ඒ වාගේ බිල්ලක් දීලා තමන්ගේ දෝෂ ටික වහ ගන්න උත්සාහ කරන අපේ ආණ්ඩුව නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කිහිප දෙනෙකුත් තමන්ගේ දෝෂ ටික භංග කරගන්න මේ විශ්වාස භංගයට අත්සන් කරලා තිබුණා.

දැන් මොකටද මේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාව බිල්ලට දෙන්නේ? රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් බිල්ලට දෙන්න හදන්නේ පසුගිය මැතිවරණයෙන් යම්කිසි ආකාරයක පරාජයක් අත් වුණා කියලාද? ඒ පරාජය එක්සත් ජාතික පක්ෂයේ අපට වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මේ විශ්වාස භංගයට අත්සන් කරලා තිබෙන ටී.බී. ඒකනායක මහත්මයාලාටත්, සුසන්ත පුංචිනිලමේ මහත්මයාලාටත් අදාළයිනේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා බිල්ලට දුන්නා කියලා ටී.බී. ඒකනායක මහත්මයාගේ දෝෂය භංග වෙනවාද, සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමාගේ දෝෂය භංග වෙනවාද?

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් කියැවිවත්, එහි ක්‍රියාකාරිත්වය ගෙනයන, කොටස් වෙළෙඳ පොළ පවත්වාගෙන යන අයට එයින් කිසිදු ප්‍රතිශතයක් දෙනවාය කියලා මම පනත් කෙටුම්පතේ කොහේවත් දැක්කේ නැහැ. මෙම පනත් කෙටුම්පත තුන්වන වර කියවන අවස්ථාවේ සංශෝධන ගෙනෙන නිසා අද මෙම විවාදය අවසන් වෙන්නේ නැහැ. මම ඔබතුමන්ලාගෙන්, විශේෂයෙන්ම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මෙම ප්‍රතිශතය වෙන් කරද්දී -බෙදීම කරද්දී- කොටස් වෙළෙඳ පොළ සජීවීව පවත්වාගෙන යන, කොටස් වෙළෙඳ පොළ ක්‍රියාකාරී කරවන පිරිසටත් සියයට 10ක්වත් ලබාදෙන්න කටයුතු කරන්න කියලා. මොකද, ඔවුන් අධෛර්යවත් කරගත්තොත් stockbroker companiesවලට පවතින්නත් බැහැ. ඒ යන්ත්‍රණයේ ඉන්න පිරිස තමයි තමන් වැඩ කරන ආයතනය පවත්වාගෙන යන්න ධෛර්යයෙන් යුතුව කටයුතු කරන්නේ. කොටස් වෙළෙඳ පොළේ දර්ශන පෙන්වන කොට එහි සිටින කාර්ය මණ්ඩලය සහ එළියේ සිටින පිරිස අපි දකිනවානේ. ඔවුන් තමයි කොටස් වෙළෙඳ පොළ පවත්වාගෙන යන්නේ; අයිතිකරුවන් නොවෙයි. අයිතිකරුවන් නැත්නම් කොටස් වෙළෙඳ පොළ තුළ සමාගම් නැහැ. ඒක ඇත්ත. නමුත්, සමාගම යටතේ සිටින, ඒ අයිතිකරුවන් යටතේ සිටින ක්‍රියාකාරී පිරිස වෙනුවෙනුත් යම් ප්‍රතිශතයක් අවශ්‍යයි කියන එකයි අපේ යෝජනාව. ඇපයෙන් සීමිත සමාගම්, කොටස් වෙළෙඳ පොළේ සමාගම් බවට පත්වෙන එක ගැන නොවෙයි මම මේ කියන්නේ. මේ යෝජනාවෙන් ඒ පරිවර්තනය වෙනවා. හැබැයි, ඒ පරිවර්තනය වෙද්දී මෙම අරමුදල බෙදෙන්නේ කොහොමද? ඒ අරමුදලින් යම් ප්‍රතිශතයක් කොටස් වෙළෙඳ පොළේ ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යන සේවකයන්ටත් -වැඩ කරන අයටත්- මේ යන්ත්‍රණය තුළින්ම ලැබෙන ක්‍රමයක් හදන්න

කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. ඒක කරන්න බැරි දෙයක් නොවෙයි. ඒක කරන්න පුළුවන්. ඒ කාරණය පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටස් වෙළෙඳ පොළ නිදහස් කරන්න ඕනෑ, ආර්ථිකය මීට වඩා නම්‍යශීලි කරන්න ඕනෑ කියන අරමුණින් නම් මේ යෝජනාව ගෙනෙන්නේ, ඒ මොනවා කරන්නත් අපේ ආර්ථිකයේ ඇත්ත තත්ත්වය මොකක්ද කියන එක අපි හරියට තේරුම් ගන්න ඕනෑ. ඒ ඇත්ත තත්ත්වය හරියට දැක්කේ නැත්නම් අපට ඉදිරියට යන්න බැහැ. 2016දී සියයට 4.8ක වර්ධන වේගයක් තිබුණු අපේ රටේ 2017දී ආර්ථික වර්ධන වේගය සියයට 3.3යි. 2016දී අපේ රටේ උද්ධමනය වුණේ සියයට 4යි. අද එය සියයට 7.3ක් වෙලා තිබෙනවා. 2016දී අපේ රටේ ඍජු ආයෝජන විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 898ක් තිබුණා. එය 2017දී ඇමෙරිකානු ඩොලර් මිලියන 397යි. ඇමෙරිකානු ඩොලර් මිලියන 500කට වඩා වැඩි ප්‍රමාණයක් අඩුවෙලා තිබෙනවා. හැබැයි, අපේ ණය වැඩිවීම දිහා බැලුවොත්, 2016දී ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණය වුණේ බිලියන 9,387යි. අද වෙන කොට එය බිලියන 10,163ක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිලියන 822කින් අපේ ණය වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ කෝටි 88,200කින්. අවුරුද්දක් ඇතුළත අපේ රටේ ණය කෝටි 88,200කින් වැඩි වෙලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 500කින් ආයෝජන කඩා වැටිලා තිබෙනවා. අද උද්ධමනය වැඩි වෙලා, මිල මට්ටම් වැඩි වෙලා, රුපියල බාල්දු වෙලා. දේශපාලන අර්බුදයේදී අපි අත්පුඩි ගහන තරම් සතුටු වෙන්න පුළුවන් දේවල් නොවෙයි මේ.

විශ්වාස භංගය දිනයිද, පරදියිද, අගමැතිතුමා ඉඳියිද, යයිද, ජනාධිපතිතුමා එයිද, යයිද, ජනාධිපති ක්‍රමය තියෙයිද, නැද්ද, අර භූතයා ඇල්ලුවාද, නැද්ද, මේ පාතාල සාමාජිකයාගේ ඔළුව කොහේද තිබෙන්නේ, ඒක ගෙනිච්චාද, නැද්ද, facebook එකට මොකක් වෙයිද, ජාතිවාදය කොහොම වෙයිද කියන ඒවා අපට වාද විවාද කරන්න පුළුවන් සරල මාතෘකා. හැබැයි, 2018 අවුරුද්දේ අගෝස්තු මාසය වන විට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ණය වාරිකයයි, පොලියයි ගෙවන්න සල්ලි හොයාගන්න ඕනෑ. ඒකට අපි කොහොමද උත්තර හොයන්නේ? 2018 අගෝස්තු මාසය වන විට ණය වාරිකයයි, පොලියයි ගෙවන්න සල්ලි හොයාගන්න ඕනෑ. ඔබතුමන්ලාගේ අය වැය වාර්තාවේම තිබුණු විධියට ලංකා ඉතිහාසයේ වැඩිම ණය වාරිකයයි, පොලියයි ගෙවන අවුරුද්ද බවට 2019 අවුරුද්ද පත් වෙනවා. ඒකට කොහොමද උත්තර හොයන්නේ? අපට පෙනෙන තෙක් මානයක මේ ආර්ථික අර්බුදය සඳහා උත්තරයක් නැහැ. එහෙම නම්, මෙවැනි සරල ක්‍රියාවලියකින් විතරක් ඒ ප්‍රශ්නය විසඳන්න බැහැ. කොටස් වෙළෙඳ පොළේ ඇති කරන පුංචි පුංචි වෙනස්කම්වලින්, ඇපයෙන් සීමිත සමාගම්, සීමිත කොටස් සමාගම් බවට තල්ලු කිරීමෙන් විතරක්, මේ ලිබරල්කරණය ඇතුළේ විතරක්, මේ ලෝක ආර්ථිකය මුහුණ දී සිටින අර්බුදයේ අපි මුහුණ දෙන පංගුව පියවාගන්න පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ. ලෝක ආර්ථිකයම අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට කියනවා, මේක කරපන්, මේක කරපන්, මේ විධියට කරපන් කියලා. එහෙම කියන්නේ ඔවුන්ගේ අර්බුදය විසඳාගන්නයි. අපට උදව් කරන මුවාවෙන් තමයි එහෙම කියන්නේ. හැබැයි, ඔවුන් ඔවුන්ගේ අර්බුදය තමයි විසඳාගන්නේ. අපේ අර්බුදය නොවෙයි.

මා දන්නා විධියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ වන විට ඔබතුමන්ලාට යෝජනා කරලා තිබෙනවා, "තීරු බදු හැර අනෙකුත් සියලු බදු නිදහස් කරන්න" කියලා. තීරු බදු නොවන බදු සියල්ල බින්දුව බවට පත් කරන්න කියලා. ඒ කියන්නේ, භාණ්ඩ මත පනවා තිබෙන තීරු බදු නොවන බදු සියල්ල බින්දුව බවට පත් කරන්න කියලා ඔබතුමන්ලාට යෝජනා කරලා තිබෙනවා. එහෙම කරලා අපේ රටේ මොන කර්මාන්තය ද, මොන ව්‍යාපාරය ද පවතින්නේ? අද පිට රටින් ගෙනෙන බිස්කට් කිලෝග්‍රෑම් එකකට රුපියල් 200ක බද්දක් පනවනවා. පිට රට බිස්කට්වලට රුපියල් 200ක් බදු පනවන නිසා තමයි අපේ රටේ මිනිස්සු දේශීය බිස්කට් කන්නේ. දේශීය බිස්කට් හොඳයි. හැබැයි, පිට රටින් ගෙනෙන බිස්කට් කිලෝග්‍රෑම් එකකට අය කරන රුපියල් 200ක බද්ද නිදහස් වුණොත් අපේ රටේ සරුංගල් තිබෙන ගානට බිස්කටුත් එනවා. අපේ රටේ දැන් චීන සරුංගල් තිබෙනවා නේ. චීන බිස්කටුත් එනවා. චීන බිස්කට් අපේ රටට තවම එන්නේ නැත්තේ බිස්කට් කිලෝ එකකට රුපියල් 200ක බද්දක් ගහන නිසායි. හැබැයි, තීරු බදු නොවන බදු බින්දුව කළොත්, අපි නම් හැටියට කියන දේශීය බිස්කට් කර්මාන්තය බිඳ වැටෙනවා. චීන බිස්කට් කාලා අපේ දරුවෝ හිතයි, "අපි චීන්නු" කියලා. මේක තමයි වෙන්නේ. පාවහන් ගත්තත් එහෙමයි. අද පාවහන් යුගලයකට අඩු තරමින් රුපියල් 300ක බද්දක් තිබෙනවා. ඒ නිසා අපේ කැමැත්ත, අකැමැත්ත පැත්තක තියලා මිල ගැන හිතලා අපේ රටේ පාවහන් අපි පළඳිනවා. ලංකාවේ පාවහන් නිෂ්පාදකයන්ට පුළුවන් වෙලා තිබෙනවා, ලංකාවට අවශ්‍ය පාවහන් සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට අවශ්‍ය පාවහන් සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරන්න අද අපේ රටේ පාවහන් නිෂ්පාදකයින්ට හැකි වෙලා තිබෙනවා. හැබැයි, ඔය රුපියල් 300ක බද්ද ඉවත් කළොත් මොකද වෙන්නේ? තීරු බදු නොවන බදු බින්දුව කිරීමේ පදනම යටතේ ඔය බද්ද ඉවත් කරන්න වෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරි, ලෝක වෙළෙඳ සංවිධානය හරි කියන්නේ ඒක ඉවත් කරලා ඒ ගොල්ලන්ගේ නිෂ්පාදනවලට අපට ඉඩ දෙන්න කියලායි. මොකද, ඒ ගොල්ලන්ගේ අර්බුදය විසඳා ගන්න. දැන් ඒ ගොල්ලන්ගේ රටවල නිෂ්පාදන ගෙනියන්න තැනක් නැහැ. ලෝක වෙළෙඳ පොළ පිරිලා ඉවරයි. ඒ ගොල්ලන්ගේ අර්බුදය අපි විසඳනකොට අපේ අර්බුදය අපේ කර උඩට එනවා. අපේ අර්බුදය මොකක්ද? අපි ණය ගෙවාගන්න බැරි රටක්. අපේ තිබෙන factories ටිකත් වැහිලා ගියොත් මොකද වෙන්නේ? ඔබතුමන්ලාගේ ගම් මට්ටමේ තිබෙන garment factories ටික වැහුණොත්, rubber factories ටික වැහුණොත්, මේ වාගේ විකාර දේවල් වෙලා තේ කර්මාන්තශාලා ටික වැහුණොත්, අපේ බිස්කට් කර්මාන්තශාලා ටික වැහුණොත් මොකද වෙන්නේ? අපේ ජනතාව කොහේටද වැටෙන්නේ? ඒක සරල නැහැ. හැබැයි, අපට ඉදිරි අවුරුදු තුන ඇතුළත ඒ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපි ඒකට කැමැති නැහැ. නමුත්, ඒක වෙනවා. අපේ කැමැත්ත නොවෙයි, නමුත් ඒ අර්බුදයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා ඒ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

කථික ලැයිස්තුවේ ඉතිරි කථිකයින් නැති බවයි පෙනෙන්නේ.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත. දෙවැනිවර කියවීම. සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Ayes.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, විෂය අංක 2හි කාරක සභාව අවස්ථාව තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We are not taking up Item No. 01 today. We debated the Second Reading of the Bill Item No. 02 and put off the Committee Stage.

විදේශ විනිමය පනත : නියෝග
வெளிநாட்டுச் செலாவணிச் சட்டம் : ஒழுங்குவிதிகள்
FOREIGN EXCHANGE ACT : REGULATIONS

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Presiding Member, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That the Regulations made by the Minister of National Policies and Economic Affairs under Section 29 read with Section 7 of the Foreign Exchange Act, No. 12 of 2017, and published in the Gazette Extraordinary No. 2045/56 of 17th November 2017, which were presented on 19.02.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ANANDA KUMARASIRI *left the Chair and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කථා කරන්න.

ත්‍රිවිධ හමුදාවට ආහාර සැපයීමේ ටෙන්ඩරය
முப்படையினருக்கு உணவு வழங்கும் கேள்விப்பத்திரம்
TENDER FOR SUPPLY OF FOOD TO TRI-FORCES

[අ.භා. 5.02]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ත්‍රිවිධ හමුදාවට ආහාර සැපයීමේ ටෙන්ඩරය සම්බන්ධයෙන් යහ පාලන රජය බලයට පත්වීමෙන් පසු විවෘත හා විනිවිදභාවයක් සහිත ක්‍රමවේදයක් අනුගමනය කළද, පසුගිය වර්ෂයේ සිට ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා හා තාක්ෂණ කමිටුවේ සභාපතිවරයා ඇතුළු කිහිප දෙනෙකුගේ ක්‍රියා කලාපය නිසා නැවත දූෂිත තත්ත්වයට මෙම ටෙන්ඩරය පත්වී ඇත. මේ හේතුවෙන් 2018 වර්ෂයේ රුපියල් කෝටි 200ක -බිලියන දෙකක- පමණ අලාභයක් සිදු වන බව දැනටමත් වාර්තා වේ. එබැවින්, 2018 වර්ෂයේ ප්‍රදානය කිරීමට අපේක්ෂිත ටෙන්ඩරය තාවකාලිකව අත්හිටුවා පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙසද, එතෙක් තාවකාලිකව පසුගිය වර්ෂයේ ටෙන්ඩරය දීර්ඝ කර පවත්වාගෙන යා යුතු බවද, මෙම දූෂිත ගනුදෙනුව පිටුපස සිටින සියලුම නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කළාට පසුව මම යෝජනාව පිළිබඳව කථා කරන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද කාලීන යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව පසු ගිය පාර්ලිමේන්තු සතියේ අද වාගේම බදාදා දවසක එන්න තිබුණු යෝජනාවක්. නමුත් මහනුවර දිස්ත්‍රික්කයේ යම් යම් ප්‍රදේශවල ඇති වූ ඉතාම අවාසනාවන්ත සිද්ධි නිසා එදින මෙම යෝජනාව විවාදයට ගන්න බැරි වුණා. හැබැයි ඒකෙන් එක යහපතකුත් වුණා. එදින මේ යෝජනාව විවාදයට ගත්තා නම් මේකට අද පිළිතුරු කථා දෙකෙන් එකක් කරන මොනරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා රාජ්‍ය පරිපාලන හා ප්‍රතිසංස්කරණ ඇමතිවරයා විධියට පමණයි මෙම යෝජනාවට උත්තර දෙන්නේ. පසුව එතුමා නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයා ලෙස පත් වුණු නිසාම මේ කාරණයේ දී එතුමාට ලොකු වගකීමකුත් ඉෂ්ට කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේක මේ පෙරළුණු පිට හොඳයි කියනවා නොවෙයි. හැම නරකක්ම පිටුපස ඊට වඩා හොඳ දෙයකුත් තිබෙනවාය කියන එකයි. පියවරක් පස්සට තැබුවොත් පියවර දෙකක් ඉස්සරහට යන්න පුළුවන් කියන කාරණය ඉතිහාසය නැවත වරක් අපට සනාථ කර දී තිබෙනවා - one step backward, two steps forward. සයිබීරියාව වැනි රටවලට ගිහිල්ලා ඇවිත් අද සංචිතයේ ඉන්න ආරක්ෂක අමාත්‍යාංශයේ දූෂිත හිටපු ප්‍රධාන ගණකාධිකාරිවරියත්, ඒ වාගේම ඇයට විවිධ වරප්‍රසාද, වරදාන දෙමින් තමන්ගේ මඩිය තර කරගන්නා ජාවාරම්කාර ව්‍යාපාරිකයෝ කීපදෙනෙකුත් කිව්වේ, ගිය වර අගමැතිතුමා මේ යෝජනාව අකුළා ගන්න කිව්වා කියලායි. එහෙම කියපු අයට අද නැවිට අකුළාගෙන කකුල් දෙක අස්සේ ගහගන්න සිද්ධ වෙලා තිබෙනවා. රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමාගේ ශක්තියෙන්; එතුමා ගත්ත ක්ෂණික ක්‍රියාමාර්ග නිසා, අද මේ යෝජනාව ඇවිත් තිබෙනවා.

අද මේ යෝජනාවට රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමාත්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් පිළිතුරු දෙනවා. ඒ යෝජනාව මම දැන් ඉදිරිපත් කර තිබෙනවා.

මේ කාරණයේදී ජාවාරම්කාරයෝ සති දෙකක් බඩ පිනුම් ගැහුවා. ආරක්ෂක අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් ඒකට වග කියන්න ඕනෑ. ජනාධිපතිතුමාත්, ආරක්ෂක ලේකම්තුමාත් ගැන අපිට සාපේක්ෂ විශ්වාසයක් තිබෙනවා. "සාපේක්ෂ" කියන වචනය මම බොහොම පරිස්සමින් කියනවා. "සාපේක්ෂ විශ්වාසයක්." බුදු බණ අනුව මේ ශරීරයවත් අපේ නොවෙයි. ශරීරයවත් අපේ නොවෙන කොට අපිට වෙන කෙනෙක් ගැන guarantee එකක් දෙන්න බැහැ. ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ගණකාධිකාරිනී කමනි හෙට්ටිආරච්චි, මේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විධියට සිටි ජී.එස්. විතානගේ, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, තාක්ෂණ කමිටුවේ සභාපති සරත් කුමාර කියන අය එකතු වෙලා කළ මේ වින්නැහිය "යහපාලන ආණ්ඩුව" කියන කිරි කළයට එකතු කළ තවත් ගොම බින්දුවක් විධියටයි ඉතිහාසයේ ලියැවෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 වනකොට මේ ආහාර සැපයීමේ ටෙන්ඩරය තිබුණේ බිලියන 40කට. පූර්ව සුදුසුකම් පරීක්ෂණයේදී දූෂිත නිලධාරීන් සහ සමහර දේශපාලනඥයන් එදා එකතුවෙලා "පූර්ව සුදුසුකම්" නමින් කළේ තමුන්ට පඩුරු පාක්කුඩම් ගෙනි යන්නේ නැති අයව හලලා දමපු එකයි. ඉතුරු අය එකතුවෙලා, මේසයක වාඩිවෙලා තමයි ටෙන්ඩර් ලිව්වේ. එක් කෙනෙකු එකකට අඩුවෙන් මිල දානවා. කථා කරගෙන අනික් අය ඒකට වැඩියෙන් මිල දානවා. එක් කෙනෙකුට අඩුවෙන් ලියනකොට අනික් අය වැඩියෙන් මිල දාලා ලියනවා. මේ විධියට ටෙන්ඩරයේ මිල පවත්වාගෙන ගියා. බිලියන 40ක්! යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ 2016 පළමුවැනි ටෙන්ඩරය 2015 ක්‍රියාත්මක කළා.

එදා ජෝන් අමරතුංග මැතිතුමා අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ සහ පසු කාලීනව රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ -එම අමාත්‍යාංශ දෙකේ- ස්ථිර ලේකම්වරයා විධියට, සතොසේ සභාපතිවරයා විධියට වාගේම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විධියට කටයුතු කරපු ටී.එම්.කේ.බී. තෙන්නකෝන් මැතිතුමා සියලු දෙනාටම එම ටෙන්ඩරයට ඉදිරිපත් වෙන්න අවස්ථාව ලබා දුන්නා. මොකක්ද, වුණේ? බිලියන 40 ටෙන්ඩරය බිලියන 17, බිලියන 18 සීමාව දක්වා පහතට වැටුණා. ජාවාරම්කාරයන් ඇන හිටියා. පසුව මේ ගොල්ලන් වෙන ක්‍රමයක් හොයා ගත්තා. ඒ ක්‍රමයටම ගැළපෙන්න ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරිය විධියට කටයුතු කරපු දූෂිත නිලධාරිනියක වුණු කමනි හෙට්ටිආරච්චි, ජී.එස්. විතානගේ සහ තාක්ෂණික ඇගැයීම් කමිටු සභාපති සරත් කුමාර කියන මේ කට්ටිය සෙට් වුණා. 2016 පිරිසිදුව ක්‍රියාත්මක වෙච්ච ටෙන්ඩරයට ආපසු 2017 දූෂිත තත්ත්වයක් ඇති වුණා. අඩුම මිල ගණන් වාගේම ගුණාත්මක භාණ්ඩ ඉදිරිපත් කරපු අය හේතු දැක්වීමකින් තොරව කපා දාලා, තමුන්ට මේ ටෙන්ඩරය අහිමි වෙන්නේ මොන හේතුවටද කියලා කියන්නේ නැතිව, වැඩි අයට එය ලබා දීමට අත්තනෝමතිකව කටයුතු කළා. ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ගණකාධිකාරිවරිය මේ කටයුත්ත සිදු කරන්න අවශ්‍ය යන්ත්‍රණය සකස් කර ගත් බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ යන්ත්‍රණයේ ප්‍රතිඵලයක් විධියට හිටපු ආරක්ෂක ලේකම්තුමාගේ යුගයේදී මේ ගණකාධිකාරිවරිය ආරක්ෂක අමාත්‍යාංශයේ ඇමතිට, රාජ්‍ය ඇමතිට, ලේකම්ට වැඩිය බලයක් තිබෙනවා කියලා උත්තරාරෝපණය කර ගනිමින්, නැති බලයක් පෙන්වමින් කටයුතු කළ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එම කටයුත්ත ඒ ආකාරයටම ක්‍රියාත්මක වෙද්දි ආරක්ෂක අමාත්‍යාංශයේ සම්පූර්ණ ක්‍රමවේදයම බිඳ වැටුණා.

රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමාට මම මගේ අතේ තිබෙන ලේඛනයක් පෙන්වන්න කැමතියි. ඔබතුමාට මම මේ ලේඛනය බලන්න විතරක් දෙන්නම්. මේ ලේඛනය photocopy එකක් නොවෙයි; original ලියුමක්. මේ ලියුමේ ආරක්ෂක අමාත්‍යාංශයේ date stamp එක තිබෙනවා; ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ කාර්යාලයේ date stamp එක ගහලා තිබෙනවා. හැබැයි, මේ ලියුම තිබෙන්න ඕනෑ ආරක්ෂක අමාත්‍යාංශයේ file එකේ නේද? ඒ ලියුම දැන් මගේ අතේ තිබෙන්නේ කොහොමද? පැණි වරකා ගහටත් හෙණ ගහලා නැද්ද කියා මම අහනවා. රටේ බරපතළම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ ලිපි ගොනුවේ - file එකේ - තිබෙන්න ඕනෑ ලියුමක් බුද්ධික පතිරණගේ අතේ තිබෙනවා. එහෙනම් ආරක්ෂක

[ගරු බුද්ධික පතිරණ මහතා]

අමාත්‍යාංශයට ආරක්ෂාව කෝ? ඉස්සෙල්ලාම ආරක්ෂක අමාත්‍යාංශයට ආරක්ෂාව දී ගන්න වෙවි. ස්ථිර ලේකම්ගේ කාර්යාලයේ ලිපි ගොනුවේ තිබෙන්න ඕනෑ ලියුම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අතට ඒම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය ලජ්ජා වෙන්න ඕනෑ. හෙලුවැල්ලෙන් යන්න ඕනෑ, ආරක්ෂක අමාත්‍යාංශය; ලජ්ජා වන්න ඕනෑ. මේවා ගැන පරීක්ෂණ කෝ? ආරක්ෂක අමාත්‍යාංශයම නිදිගත වෙලාද තිබෙන්නේ? ඒකයි අද ආරක්ෂක අමාත්‍යාංශයට අත් වෙලා තිබෙන ඉරණම. මෙහෙම ගියොත් ආරක්ෂක අමාත්‍යාංශය බල්ලෙක්ගේ අධෝ මුඛයේ තිබෙන රෝම කූපයකටත් වඩා බලු වෙනවා කියලා මම යහ පාලන ආණ්ඩුව තුළ ඉන්න මන්ත්‍රීවරයෙකු විධියට ලජ්ජාවෙන් වුණත් සඳහන් කරන්න ඕනෑ.

මම 2017.12.06 වැනිදා මංගල සමරවීර මුදල් ඇමතිතුමාට ලේඛනයක් ඉදිරිපත් කරමින් මේ කාරණය ගැන කිව්වා. 2017 දෙසැම්බර් මාසයේ 09 වැනිදා හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. එදා තමයි අය වැය විවාදයේ අවසාන දවස.

මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තමයි එදා විවාදයට ගත්තේ. මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගත් එදින, ජනතා විමුක්ති පෙරමුණේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉතා හොඳ කථාවක් කළා. එතුමා කිව්වා, මේ වංචාව සිදු වෙන ආකාරය. ඒ වාගේම එදා ආරක්ෂක ලේකම් යන යන තැනට, ආරක්ෂක ලේකම්ගේ ඇහේ එල්ලිලා, මැක්කියක්, කිනිතුල්ලියක් වාගේ යන මේ ගණකාධිකාරිවරිය ගැන ඉතා පැහැදිලිව එතුමා කිව්වා. ගරු බිමල් රත්නායක මැතිතුමා ඒ ගැන කියපු 2017 දෙසැම්බර් 09 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 3,781 තිරුව මම උපුටා දක්වනවා. මෙන්න මෙහෙමයි එතුමා කිව්වේ:

> "අපි හොඳටම දන්නවා, ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන නිලධාරියා සමඟ තැනින් තැනට ගෙනි යන ගණකාධිකාරිවරියක් ඉන්න බව. ඒක ප්‍රසිද්ධ කරුණක්. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් ඒ කරුණ ඉතා පැහැදිලිව අවස්ථා ගණනාවකදී පෙන්නුම් කරනු ලැබුවා."

මෙහෙම කිව්වේ මම නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා. මේක තමයි ඇත්ත කථාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ මොහොතේදී මෙම නිලධාරි කුටියේ ආරක්ෂක අමාත්‍යාංශය නියෝජනය කරන එක නිලධාරියෙකුවත් නැහැ. නමුත් අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට උත්තර එවන්න කියලා සභානායක කාර්යාලයෙන් ලියුමක් යැවූ බව මා දන්නවා. ආරක්ෂක ලේකම්තුමාගේ නමට ලියුම යැව්වේ. ආරක්ෂක ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකුට මෙතැනට ඇවිල්ලා වාඩි වෙලා ඉන්න කියලා ලියුම යැව්වා. නමුත් එන්නේ නැහැ, එන්න බැහැ. වස්තුයක් ඇදගෙන එන්න බැහැ. දියවන්නාව පටන් ගන්නා තැන වස්තුය ගලවා තබා, ටයි එක විතරක් බෙල්ලේ බැඳගෙන හෙලුවැල්ලෙන් තමයි මේක ඇතුළට එන්න වෙන්නේ, මේ කරලා තිබෙන වැඩ ටිකත් එක්ක. මේ කරපු වංචාව නිසා තමයි අද ආරක්ෂක අමාත්‍යාංශයේ ලොකු-ලොක්කෝ එක්කෙනෙක්වත් එන්නේ නැතුව ගරු රුවන් විජයවර්ධන මැතිතුමාට file එක එවා, පැමිණීම මහ ඇරලා තිබෙන්නේ. ඉස්සර කිව්වේ, දේශපාලනඥයෝ හොරකම් කළා කියලායි. යහපාලන ආණ්ඩුව යටතේ දේශපාලනඥයින්ගේ හොරකම් අවම වෙලා තිබුණත්, ඒකට හරියන්නත් එක්ක තොගයට - wholesale ගණනට -, දුසිමට නිලධාරීන් හොරකම් කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ගණකාධිකාරිවරියට කියන්න පුළුවන් වෙලා තිබෙන්නේ, "නඩු දැම්මාට බය නැහැ. ලේකම්තුමා මාව බලා ගන්නවා. ලේකම්තුමා හිටියේ නීතිපති දෙපාර්තමේන්තුවේ." කියලා. එසේ කියමින් වර්තමාන ලේකම්තුමාත් විනාශ කරනවා. ඒකට හොඳම උදාහරණය මම කියන්නම්. "ශ්‍රී ලංකා ගාර්ඩියන්" කියන වෙබ් අඩවියට ගිහින්, "කමනි හෙට්ටිආරච්චි" කියලා Google search කළා නම්, මේ ගැන බලන්න පුළුවන්. එතකොට "කවුද බොස්" කියලා එන්නේ කවුරු ගැනද? කපිල වෛද්‍යරත්න මහත්මයාගේ පින්තූරයත්, ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ගණකාධිකාරිතුමියගේ පින්තූරයත් තමයි එන්නේ. මේ වාගේ දූෂිත, චෞර කාන්තාවක් නිසා, කපිල වෛද්‍යරත්න මහත්මයාත් අපරාදේ මඩ කනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඒ ගැන සඳහන් මෙම ලියවිල්ල **සභාගත*** කරනවා, ඉතිහාසයේ කොටසක් බවට පත් වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්තු මාසයේ දෙවැනි දා කියන්නේ ඓතිහාසික දවසක් බව මම සඳහන් කරන්න ඕනෑ. 1815 මාර්තු මාසයේ 02 වැනි දා මේ රට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් වුණා. රන්ජන් විජේරත්න මැතිතුමා මියගිය දවසත් මාර්තු 02 වැනි දා. සිංහල භාෂා දිනය යෙදී තිබෙන්නේත් මාර්තු 02 වැනි දාට. වෙනත් කාරණයක් ගැන කථා කරපු වේලාවේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා මට කිව්වා, "මට පැය තුනක් දෙන්න" කියලා. පැය තුනක් යනකොට, එතුමා මට ආපසු දුරකථන ඇමතුමක් දෙන්න තරම් ලෙන්ගතු වුණා. ඒ අවස්ථාවේදී එතුමා කිව්වා, "ජනාධිපතිතුමා කිව්වත් ගියේ නැති මේ චෞර නිලධාරිනිය, වර්තමාන ආරක්ෂක ලේකම්තුමා යටතේ කොහොම හිටියාද කියලා කාටත් ප්‍රශ්නයක් වෙලා තිබෙන මේ නිලධාරිනිය ඔන්න මාරු කළා, pool එකටම. නිකම් නොවෙයි, 'ගියේ නැත්නම් සේවය අතහැර යෑමේ ලියුමත් ගහනවා' කියලා මම ගෙන්වා තදින්ම අවවාද කරලයි මාරු කළේ" කියලා. හැබැයි, 02 වැනි දා එසේ ගියාට, ඊට පසුව මොකක්ද වුණේ කියලා අපි දන්නවා. මාර්තු 03 වැනි දා සහ 04 වැනි දා කියන්නේ නිවාඩු - සෙනසුරාදා සහ ඉරිදා- දවස් දෙක. 05 වැනි දා ඇය ආපසු ආවා. එසේ ඇවිල්ලා පරණ දිනයක් දමා -ඒ කියන්නේ, පෙබරවාරි 26 දිනය දමා- නාවික හමුදා මූලස්ථානයට යවන්න ලියුමක් ගැහුවා. නමුත් මේ ලියුම නාවික හමුදා මූලස්ථානයට යන්නේ, මාර්තු 12 වැනි දා. නාවික හමුදා මූලස්ථානයයි, ආරක්ෂක අමාත්‍යාංශයයි තිබෙන්නේ හූවක දුරින් බව අපි දන්නවා. එතකොට පෙබරවාරි 26 ගහපු ලියුමක් නාවික හමුදා මූලස්ථානයට යන්න මාර්තු 12 වැනි දා දක්වා කාලයක් ගත වෙනවාද? නැහැ. මේ ලියුම ගැහුවේ මාර්තු 05 වැනිදායින් පසුවයි. ඇත්ත කථාව ඒකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලියුමත් **සභාගත*** කරනවා. ඒ වාගේම තව ලියුමක් තිබෙනවා. ඒ ලියුම පෙබරවාරි 28 දිනය යොදා ගැහුවා. මේ විධියට ලියුම් ගණනාවක් ගැහුවා.

නීතිය හා සාමය භාර ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමනි, මේ දූෂිත නිලධාරිනිය මාරු කළාට ප්‍රමාණවත් වන්නේ නැහැ. දැන් අපරාධ පරීක්ෂණ කොට්ඨාස තිබෙන්නේ ඔබතුමා යටතේ. මම මේ දූෂිත වංචාව පිළිබඳව 2015දී කථා කළාම, මේ ගැන හෙව්වේ නැහැ. "අන්න පුතේ හඳ" කියලා පෙන්නුවාම, හඳ දිහා බලන්නේ නැතුව අත දිහා බැලුවා වාගේ එදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මාව ගෙන්නුවා. එසේ ගෙන්වා මට මේ තොරතුරු ලැබුණේ කොහෙන්ද කියලා ඇසුවා. මම ඒ ගැන ගරු අගමැතිතුමාට කිව්වාම, එතුමා කිව්වා, "පාර්ලිමේන්තුවේදී මේ සියල්ල සභාගත කරන්න. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කියන්න ඔබ බැඳිලා නැහැ" කියලා. ඒ නිසා මම ගරු රංජිත් මද්දුම බණ්ඩාර නීතිය හා සාමය භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙසේ backdate කරලා, පසු දාතම යෙදූ ලියුම් ගැහුවේ කොහොමද කියන එක ගැන සම්පූර්ණයෙන් පරීක්ෂණයක් කරන්න කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ඇය මාරු කළාට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයේ නිල රථ පාවිච්චි කළා. මා දන්නා විධියට තවමත් නිල රථ පාවිච්චි කරනවා. ආරක්ෂක අමාත්‍යාංශයේ නිල රථවල නොම්මර මා ළඟ තිබෙනවා. නමුත් ආරක්ෂක අමාත්‍යාංශයේ නිල රථවල නොම්මර කියන එක වැරදියි. මම වග කිව යුතු මන්ත්‍රීවරයෙක් විධියට ඒක දන්නවා. මොකද, ආරක්ෂාව අතින් වැදගත් පුද්ගලයෙක් හෙට දවසේ ඒ රථයේ යන්න පුළුවන්. මම ඒ නොම්මර ප්‍රකාශ කළොත්, මේ නිල රථය ආරක්ෂක අමාත්‍යාංශයට අයිතියි කියලා මුළු රටම දැන ගන්නවා. ඒ නිසා මම කියන්නේ නැහැ. නමුත් රුවන් විජයවර්ධන මැතිතුමනි, මාරු කරපු නිලධාරිනිය කාගේ අනුහසින්ද මේවා කරන්නේ කියලා සොයා බලන්න. එක්කෝ ජනාධිපතිතුමා අවසර දෙන්න ඕනෑ. නමුත් ජනාධිපතිතුමා කපිල වෛද්‍යරත්න මැතිතුමාටත්, සරත් කුමාර මැතිතුමාටත් දුරකථනයෙන් කථා කරනකොට මම ජනාධිපතිතුමා ඉදිරියේ හිටියා. ජනාධිපතිතුමා ඇහුවේ, මම මාරු කරපු කෙනා ආයෙමත් මොකට මේකට වද්ද ගන්නවාද, මොකට ගෙන්නා ගන්නවාද කියලායි. ගිය සතියේ සිකුරාදා තමයි ජනාධිපතිතුමා ඒක කිව්වේ. එහෙම මාරු කරපු කෙනා නිල රථ පාවිච්චි කළේ කොහොමද?

ඒ විතරක් නොවෙයි, මාරු කරපු කෙනා දවස් ගණනක් රැඳී සිටියේ කොහොමද කියන කාරණය ගැනත් පරීක්ෂණ කරන්න ඕනෑ. ඒ වාගේම මම විශේෂයෙන් සඳහන් කරන්න අවශ්‍යයි, මේ දූෂණ ක්‍රියාවලියට සහයෝගය දක්වන අයට සමහර අවස්ථාවලදී කමනි හෙට්ටිආරච්චි මහත්මිය විදෙස් සංචාර දීලා තිබෙන බව. ඒ වාගේම කොළඹ 05 පිහිටි ගොඩනැඟිල්ලක් තිබෙනවා. මේ ගොඩනැඟිල්ල දිනේෂ් භූතානි කියලා කෙනෙකුට අයිතියි. මේ ගොඩනැඟිල්ලේ ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යාල කිහිපයක් පවත්වාගෙන යනවා. පැලවත්ත, අකුරේගොඩ ප්‍රදේශයේ පෙන්ටන්ගන් එක වාගේ ආරක්ෂක අමාත්‍යාංශයේ අලුත් පරිශ්‍රය හදනවා. ගණකාධිකාරිවරිය මේක ඕනෑකමින් ප්‍රමාද කරනවා; මුදල් ගෙවීම් ප්‍රමාද කළා. එසේ ප්‍රමාද කරලා අලුත් පරිශ්‍රය හදන එක ප්‍රමාද කරන්නේ අර භූතානිගේ ගොඩනැඟිල්ලේ තව වැඩි දවසක් කාර්යාලය පවත්වාගෙන යන්නයි. එතකොට භූතානිට ඒකෙන් ලැබෙනවා rent එක. ඒ rent එකෙන් ගණනක් කමනි හෙට්ටිආරච්චිට යනවා. ඒ ගණන කොටා ගන්න ඕනෑ නිසා විවිධ හේතු දක්වමින් ගෙවීම් ප්‍රමාද කරමින් අකුරේගොඩ ඉදිකිරීම් ප්‍රමාද කරන්න තරම් මේ නිලධාරිනිය දක්ෂ වෙලා තිබෙනවා. බලාගෙන ගියාම රට කරන්නේ, ආරක්ෂක අමාත්‍යාංශය කරන්නේ රුවන් විජයවර්ධන මැතිතුමා රාජ්‍ය ඇමති විධියටවත්, ජනාධිපතිතුමාවත්, කපිල වෛද්‍යරත්නවත් නොවෙයි. මේ "කවුද බොස්" කියන එක හරි. මොකද, අනික් ඔක්කෝම ජබොස්. අරයා තමයි බොස්. ඉතින්, මෙහෙම වෙලා තිබෙන්නේ කොහොමද? ඒ නිසා මේ පිළිබඳව පරීක්ෂණ කරන්න වුවමනායි.

ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ජී.එස්. විතානගේ, කෙරවලපිටිය බලාගාරයේ ටෙන්ඩර් සම්බන්ධයෙන් කොරියන් සමාගමවලට ටෙන්ඩර් ප්‍රදානය කිරීමට යෑමෙන් රජයට රුපියල් බිලියන 21ක් පාඩු වුණා කියලා චෝදනා ලබපු නිලධාරියෙක්. හැබැයි, පෙන්වන්නේ සාන්තුවරයෙක්, උපාසකයෙක් විධියට. ඒ නිසා මම කියනවා, තාක්ෂණ කමිටුවේ සභාපති, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සරත් කුමාර මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලිවම අවශ්‍ය මැදිහත්වීම් කරන්න ඕනෑ. ඒ වාගේම විශේෂයෙන්ම මම සඳහන් කරන්න අවශ්‍යයි, මේ කාරණයේ තවත් පැති ගණනාවක් තිබෙන බව. තමුන්ට හිතවත් නැති අයගේ අවම මිල ගණන් ඉදිරිපත් කරපුවාම ඒවා යථාර්ථවාදී මිල ගණන් නොවෙයි කියා කපා හරිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 10ක් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි.

එහෙම කපා හරින ගමන් තමුන්ට හිතවත් අයගේ මිල ගණන් වැඩි වුණත් අවම ලංසුව, දෙවන අවම ලංසුව, තෙවැනි අවම ලංසුව, සමහර වෙලාවට හතරවෙනි අවම ලංසුව ඒ ඔක්කෝම අතහැරලා පස්වෙනියාට දෙනවා. හැබැයි, හේතු දැක්වීමක් නැහැ. හේතු දක්වන්නේ නැති නිසා අර අවම ලංසු ඉදිරිපත් කරපු අයට යම් යම් ක්‍රියාමාර්ගවලට යන්න, අභියාචනා කමිටුවට යන්න, අධිකරණයට යන්න බාධා ඇති කරලා තිබෙනවා. මට උදාහරණයකින් පෙන්වන්න පුළුවන්, පොල් ගැන. අද සාමාන්‍ය වෙළඳපොළේ පොල් ගෙඩියක් රුපියල් අසූවයි, සියයයි. අසූවටත් තිබෙන්නේ එහෙමත් තැනක. ඒත් බිත්තරයක් විතර පොල් ගෙඩියක්. සමහර තැන්වල පොල් ගෙඩිය රුපියල් සියයයි. සමහර තැන්වල සියයටත් වැඩියි. හැබැයි, රුපියල් 38.50ට පොල් ගෙඩියක මිල දමා තිබෙනවා. එයාට හිතවත් නම් ඒක අතාත්වික මිලක් වෙන්නේ නැහැ. මම අහනවා, රුපියල් 38.50ට පොල් ගන්න තිබෙන්නේ කොහේද කියලා. ඒක වෙන්නේ මෙහෙමයි. රුපියල් 38.50 දමනවා. ඒත් කොහොම හරි ගැට ගහලා දෙනවා. මාස ගණනක් යද්දී රුපියල් 38.50 එකට රුපියල් 150ක් ගෙවනවා. රුපියල් 150ක් ගෙව්වාම ඒකෙන් ගණනක් ගියා accountantට; කමනි හෙට්ටිආරච්චිට. කමනි හෙට්ටිආරච්චිගේ ස්වාමිපුරුෂයා සැපයුම්කාර ආයතනයක පූර්ණකාලීනව වැඩ කළා. නමුත් පූර්ණකාලීනව වැඩ කරන බවට පඩි ලැයිස්තුවක නම නැහැ. නමුත් වැඩ කරනවා. මම අහනවා, ගණකාධිකාරිවරියගේ ස්වාමිපුරුෂයා සැපයුම්කාර ආයතනයක අනියමින් පඩි ලබන ලැයිස්තුවක වැටුප් ලබද්දී, මේක ආරක්ෂා කරන්න සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද කියලා. ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ගේ, රට මුදාගත් සාමාජිකයන්ගේ බත් පතෙන් ගසා කන මේ වගේ අයට ඉඩ දෙන්න පුළුවන්කමක් තිබෙනවාද? දැන් ආහාර ටෙන්ඩරය රුපියල් බිලියන 17ක්, 18ක් දක්වා අඩුවෙලා තිබෙනවා.

මම ගිය අවුරුද්දේ මේ ගැන කිව්වා. මම කලින් උපුටා දැක්වූ 2017 දෙසැම්බර් 09 වෙනිදා හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙනවා. එදා, අනාගතයේ ජේන කියන කෙනෙක් විධියට මම කිව්වා, "මේ විධියට ගියොත් බිලියන 2කට වැඩිය පාඩුවක් වෙනවා." කියා. ආරක්ෂක අමාත්‍යාංශය මේකට උත්තරයක් හදන්න ලැහැස්ති වෙනවා. ඒ ගැන මට ආරංචියි. මේ විස්තර ලැබුණු එකේ එහේ කථා කරන ඒවා මට දැන ගන්න ලැබෙන්නේ නැද්ද? ආරක්ෂක අමාත්‍යාංශය කියනවා, " නැහැ, නැහැ. ආරක්ෂක අමාත්‍යාංශය වෙන් කරපු මුදලට වඩා මේ විධියට ටෙන්ඩර් දුන්නොත් සියයට විසිඅටයි දශම ගණනකට වැඩිය වාසියක් තිබෙනවා." කියලා.

රුවන් විජයවර්ධන රාජ්‍ය අමාත්‍යතුමනි, එවපු උත්තරයේ මම කියන විධියේ දෙයක් සඳහන් වෙලා තිබෙනවාද කියලා ඔබතුමාට බලන්න පුළුවන්. ටෙන්ඩර් නොකර දුන්නත් දෙන්න තිබෙන ගණන බලලා, ටෙන්ඩර් කළාම සියයට 28ක් අඩුවෙනවා කියලා ආරක්ෂක අමාත්‍යාංශය ගණන් හැදුවා. මම කියනවා සියයට 28ක් නොවෙයි, සියයට 50ක් අඩුවෙන් දෙන්න තිබුණා කියලා. මම 2017 දෙසැම්බර් මාසයේ 09 වෙනිදා මේ සභාවේදී නැඟිටලා කිව්වා, "රුපියල් බිලියන එකහමාරක් පාඩු වෙනවා." කියලා. මට ඉදිරියෙන් ඇති පේළියේ කොනේ පුටුවේ තමයි මම හිටියේ. අද වෙනකොට රුපියල් බිලියන දෙකකට වැඩිය පාඩු වෙනවා කියලා ඔප්පු වෙලා තිබෙනවා. කවුරුවත් කට අරින්නේ නැහැ. මම කියන්නේ දේශපාලනඥයන් නොවෙයි, නිලධාරීන්. ඇයි ඒ ගොල්ලන්ට "හැම්පර්" ලැබිලා, තෑගිභෝග ලැබිලා, හෙට අනිද්දා විශ්‍රාම ගියාට පසුව දරුමල්ලෝ කසාද බන්දන්න, දරුමල්ලන්ට

[ගරු බුද්ධික පතිරණ මහතා]

පිටරට අධ්‍යාපනය ලබා දෙන්න. ටෙන්ඩර් මණ්ඩලයේ හිටපු සභාපති තෙන්නකෝන් මැතිතුමා මට කිව්වා, මේ ටෙන්ඩරය එක සැපයුම්කාර ආයතනයක් වෙත දෙනවා නම්; මාලබේ SAITM එකේ ඉගෙන ගන්නා එතුමාගේ දරුවාගේ සම්පූර්ණ අධ්‍යාපන වියදම දරනවායි කිව්වා කියලා. ඒ වාගේ දූෂිත තත්ත්වයක් තිබුණේ. මේකෙන් ඇති වෙච්ච තත්ත්වය මොකක්ද?

ශ්‍රී ලංකා යුද හමුදාවටත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවටත්, ශ්‍රී ලංකා නාවික හමුදාවටත් අද අමු සලාක විධිමත්ව නොලැබෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. දැන් අවුරුද්දේ මාස තුනක් අවසන් වෙන්න යනවා. තවමත් අමු සලාක ටික විධිමත්ව දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා නාවික හමුදාවටත්, ශ්‍රී ලංකා යුද හමුදාවටත් වියළි සලාක කොහොමවත් දෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ජනවාරි 31 දිනය දමා "අනේ දෙන්න." කියන තත්ත්වයට හමුදාව පත් වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ මෙහෙම දෙයක් වෙච්ච පළමුවෙනි වතාව. සමහර විට තැපැල් ඡන්දයෙන් අපි *සෙන්තුපෝව්ච්* වෙන්න ඇත්තේ ඔන්න ඔකේ ප්‍රතිඵලයක් විධියටයි.

අද හමුදා භටයන්ට හරියට කෑම ටික දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි ලජ්ජා වෙන්න ඕනෑ. හරි නම් මේ ටෙන්ඩර් වැඩ ටික දෙසැම්බර් 31න් අවසන් වෙන්න ඕනෑ. ගණකාධිකාරිවරියගෙයි, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙයි, තාක්ෂණ කමිටුවේ සභාපති, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සරත් කුමාරගේ හපන්කම් නිසා මාස තුනහමාරක් යනතෙක් මේ අවුරුද්දේ ටෙන්ඩරය විවෘත කර ගන්න බැරි වුණා.

එපමණක් නොවෙයි, හමුදාවට කන්න දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද හමුදාවට හරියට කෑම ලැබෙන්නේ නැහැ. හමුදාව නිසා, උද්ඝෝෂණ කරන්න බැරි නිසා කට පියා ගෙන ඉන්නවා. හමුදාව කැරළි ගහන තැනට පත් කරනවා. මේ, ඒකාබද්ධ විපක්ෂයේ කොන්ත්‍රාත්කාරියක්ද කියලා හොයන්න ඕනෑ. මේකට උල්පන්දම් දෙන අනෙක් නිලධාරීන් කවුද කියලා හොයන්න ඕනෑ. ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, ඉතිහාසයේ පළමුවෙනි වරට අභියාචනා ඉදිරිපත් කරන්න අවස්ථාව දුන් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටෙන්ඩර් මණ්ඩලයේ 8 දෙනෙක් හිටියා. 8 දෙනාගෙන් මුලින්ම මේකට අත්සන් කළේ සභාපතියි, තව දෙදෙනෙකුයි විතරයි. ඉතිරි දෙදෙනාත් නොමහ යවලා තමයි අත්සන් ගත්තේ. ආරක්ෂක ලේකම්තුමා මට කිව්වා, "මේකේ ප්‍රශ්නයක් තිබෙනවා. මම අත්සන් කරන්නේ නැහැ." කියලා. ජනාධිපතිතුමා තමුන්ගේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරිවරයාට කිව්වා, "අත්සන් කරන්න එපා. මේකේ දූෂිත ප්‍රශ්නයක් තිබෙනවා." කියලා. ආරක්ෂක ලේකම්තුමා අත්සන් කරපු නැති නිසා යුද, ගුවන් හා නාවික යන ත්‍රිවිධ හමුදාපතිවරු අත්සන් කළේ නැහැ. හැබැයි, අවසානයේදී මේ සියලුම දෙනා ජනාධිපතිතුමාවත් නොමහ යවලා කිව්වා, "නැහැ, නැහැ, අපි appeal කරන්න දෙනවා." කියලා. ලංකා ඉතිහාසයේ පළමුවෙනිවරට අභියාචනා මණ්ඩලයට -Appeal Board- අභියාචනා 12ක් ඇවිල්ලා තිබෙනවා විතරක් නොවෙයි, අභියාචනා කළ අභියාචනාකරුවන්ට සාධාරණව කරුණු දක්වන්න ඉඩ ප්‍රස්ථාව ලබා දීලාත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හමුදාවට දෙන සපත්තු -jogging sports shoes, high-leg boots- ප්‍රශ්නයක් ගැන මා මීට කලින් කථා කළා. මේකෙදිත් මේ දූෂිත ගණකාධිකාරිවරිය මේ ආකාරයටම කටයුතු කළා. තමුන්ට වුවමනා පරිදි ඉරෝෂා ඉන්ටර්නැෂනල් පෞද්ගලික සමාගමට මෙම ටෙන්ඩරය ලබාදීම සඳහා ලංසු ලේඛනයේ සුදුසුකම් උපමාන වගන්ති මුලින්ම තමුන්ට වුවමනා විධියට වෙනස් කළා. ඒ සඳහා අදාළ ලේඛනය මා **සභාගත*** කරනවා.

ටෙන්ඩර් කොන්දේසි අනුව සැපයුම්කාර සමාගම ආරක්ෂක අමාත්‍යාංශයට ගෙවිය යුතු තත්ත්ව පරීක්ෂණ ගාස්තු ගෙව්වේ යුද හමුදාවට. ඒ වැරැද්ද වෙලා තිබෙද්දි ඒකට සහන දුන්නා. ඒ වාගේම විරෝධතා දැක්වීමේදී මුදල් ගෙවීම සම්බන්ධයෙන් ගණකාධිකාරිවරිය ලංසුකරුවන්ට විවිධාකාරයේ වෙනස්කම් ඇති කළා.

ඊළඟට, තත්ත්ව පරීක්ෂණ නියැදි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, SLAS ආයතනයට සහ ITI ආයතනයට ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන වෙනස් කරලා, එය ඉදිරිපත් කිරීම සිද්ධ කළා. මට දැන ගන්නට ලැබුණු විධියට අඩුම ලංසුව දීලා තිබෙන්නේ, boot එකේ යට රබර් අඩංගු නැති ලී කෑලි අඩංගු ටෙන්ඩරය ඉදිරිපත් කරපු ආයතනයක්. මේකේදී ඉතා වගකීමක් ඇතිව, හොඳම ටෙන්ඩරය ඉදිරිපත් කරපු DI Leather ආයතනය ඒ ගණකාධිකාරිවරියට සැලකුවේ නැති නිසා කපා හැර තිබෙනවා.

තුන්වන කාරණය මෙයයි. එය රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙනවා, ජනවසමට තේ කොළ ටෙන්ඩරය දෙන්න. අද ගරු සභාවේ කියැවුණා, තේ කොළ පෞද්ගලික ආයතනවලට දෙන කොට ඒ තේ කොළවලට සීනි කලවම් කරලා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. "ජනවසම" කඩා වැටෙන්න ගිය ආයතනයක්. හැබැයි, පසුගිය කාලයේ ජනවසම ගොඩ ගියා. ඒ, මේ ටෙන්ඩරයේදී තේ කොළ සපයලා. 2017දී අඩුම ලංසුව ඉදිරිපත් කළ ආයතනයට ගණකාධිකාරිවරිය ටෙන්ඩරය දුන්නේ නැහැ. ජනවසමට දුන්නා. මොකද, අඩුම ලංසුව ඉදිරිපත් කරපු ආයතනය ඒ ගණකාධිකාරිවරියට ජීර්ණය වුණේ නැති නිසා. මෙවර මොකක්ද කළේ? ජනවසමේ ටෙන්ඩරයට ඉදිරිපත් කරන තැන ඉඳලා ජනවසමේ කණ්ඩායමකුත් එකතු වෙලා ටෙන්ඩරය නොලැබෙන තැනට වැඩ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ටෙන්ඩරයේදී සිදු වුණු දෙයක් කියලා මම මගේ කථාව අවසන් කරන්නම්. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාටත්, ගරු රුවන් විජයවර්ධන මැතිතුමාටත් මම කියනවා, මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 'රොඩේෂා එන්ටර්ප්‍රයිසස් ' කියන ආහාර සැපයුම්කාර ආයතනය තමුන්ගේ ආහාර වර්ගවල මිල ගණන් ඉදිරිපත් කළා. රොඩේෂා එන්ටර්ප්‍රයිසස් ආයතනය සන්නාම නාමයන් සහිතව -විශේෂයෙන් පොල් කිරි සම්බන්ධ "eos" කියන සන්නාම නාමය සහිතව- ඉදිරිපත් කරපු ඒ ලේඛන සහ සපයන බවට බලය පවරන ලිපි ටික ඒ දූෂිත ගණකාධිකාරිවරිය ඇමුණුවා, තවත් සමාගමක ලේඛන විධියට. කෙළින්ම නම කිව්වොත්, වික්‍රමරත්න සමාගමේ ලිපි විධියට ඇමුණුවා, රොඩේෂා එන්ටර්ප්‍රයිසස් ආයතනයේ ලිපි ටික. ඒ මොකද? ගතමනාවක් අරගෙන වික්‍රමරත්න ආයතනයට මේ ටෙන්ඩරය දෙන්න හැදුවේ. මේක දැන ගත්තා, රොඩේෂා එන්ටර්ප්‍රයිසස් ආයතනය. රොඩේෂා එන්ටර්ප්‍රයිසස් ආයතනය Letter of Demand එකක් මඟින් ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම්

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දුන්නා, "මමයි ඒ ලේඛන ඉදිරිපත් කළේ. ඒවා කොහොමද චිත්‍රමරත්න ආයතනයේ ලේඛනවලට ඇමුණු නේ? ඒ අයගේ ලේඛන විධියට මේවා ඇතුළු වෙන්න විධියක් නැහැ. මේවා අපේ ලේඛන" කියලා. ගණකාධිකාරිවරියට එන්තරවාසි එව්වාම භය වෙලා රොඩ්ඩෝ එන්ටර්ප්‍රයිසස් ආයතනය ගෙන්වලා කිව්වා, "වැරැද්දක් වෙලා තිබෙනවා. අපි මේක ගොඩින් බේර ගනිමු. මම ඔයාලට වෙන අයගේ ටෙන්ඩර් කපලා දෙන්නම්. මම ජනවසමට තේ කොළ ටෙන්ඩරය නොදී ඔයගොල්ලන්ට දෙන්නම්." කියලා. ඒ අතරේ ජනවසමේ සභාපතිවරයා රොඩ්ඩෝ එන්ටර්ප්‍රයිසස් ආයතන ගෙන්වලා fifty-fifty deal එකක් ගැන කථා කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මට විනාඩි දෙකක් දෙන්න. මම මේ කාරණය කියලා කථාව අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒකෙන් දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගණකාධිකාරීවරියට සල්ලි සාගරේ දිය බුං ගහන්න, ටෙන්ඩර් මණ්ඩලයේ හා තාක්ෂණ කමිටුවේ සභාපතිවරුන්ට කොමිස් සාගරේ දිය බුං ගහන්න අද ජනවසමේ 25,000ක් සේවක සේවිකාවෝ බිලි දීලා තිබෙනවා. ජනවසම වැටෙන්න ගිය, ඇවර වෙන්න ගිය ආයතනයක්. ඒ නිසා තමයි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශයට ජනවසම මරු කරලා ඇවර කරන්න ගියේ. නමුත්, මේ ටෙන්ඩර ලැබුණු නිසා ඒ ආයතනය පණ ගහලා ආවා. අද ඒ සේවකයන්ට අවුරුදු කන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම කියනවා, හෙට -අනිද්දා ජනවසමේ 25,000ක් පමණ සේවක සේවිකාවෝ පාරට බහින කෙට අපිත් ඒ ගොල්ලොත් එක්ක අරගළයට එන බව. මොකද, ඒ මිනිසුන්ට අවුරුදු කන්න විධියක් නැහැ. ආයතනය වැහිලා යනවා, ආයතනය විනාශ වනවා. මුන්ට සල්ලි කුට්ටිය හම්බ වනවා නම්, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. එහෙම නම් මේ 25,000ක් හෙට අනිද්දා පොල් ගහන කොට, - දැන් පොල් නම් ගහන්න විධියක් නැහැ. මොකද, පොල් ගණන් නිසා. ඒක වෙනම කථාවක්. - මේ තත්ත්වයත් එක්ක ජනාධිපතිතුමාට, ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමාට හා ලේකම්තුමාට මම කියනවා, මේ 25,000කගේ කඳුළුවල ශාපයෙන් ගැලවෙන්න පුළුවන් වෙන්නේ ඔබතුමන්ලා මේ සියලු කටයුතු තාවකාලිකව අත්හිටුවලා පරීක්ෂණයක් කළොත් පමණයි කියලා. ඒ සේවක සේවිකාවන් 25,000කගේ සහ සාධාරණත්වය ඉල්ලන සියලුදෙනාගේ ශාපය මේකට ගැවුණු, මේ ගණකාධිකාරිවරිය මාරු කරද්දි රැක ගත්, වාහන දීලා තව දවස් ගණනක් තියා ගෙන හුරතල් කළ, ඒ සියලුදෙනාටත්, ඒ අයගේ දරුවන්ගේ දරුවන්ටත් වදිවී. ඒ අයගේ දරුවන්ගේ දරුවන්ගේ දරුවන්ටත් හෙණ ගහයි. මිනී වලටත් හෙණ ගහයි. පණ පිටින් ඉන්න අයටත් හෙණ ගහයි. ඒ නිසා මේ ගැන සම්පූර්ණ අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න. ගරු රුවන් විජයවර්ධන මැතිතුමනි, ඔබතුමාත් පිළිගන්නවා, මමත් පිළිගන්නවා, ඔබතුමාට එවා තිබෙන මේ උත්තර හදලා එවන්නේ මේ හොර නඩය බව; පසුගිය ආණ්ඩුව කාලයේ හිටපු හොර නඩය; හොරා කාපු හොර නඩය. ඔවුන් හදලා එවන පඩංගු ඔබතුමා විශ්වාස කරන්න එපා. මේ පඩංගුවල තිබෙන දේවල් ඔබතුමා ඕනෑනම් සභාගත කරන්න. හැබැයි ඔය පඩංගු එකක්වත් විශ්වාස කරන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. නැත්නම් උත්තර දෙන්න කාලය නැති වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ නිසා මේ jogging sports shoes පිළිබඳ ප්‍රශ්නය, ඒ වාගේම high-leg boots පිළිබඳ ප්‍රශ්නය, ආහාර ටෙන්ඩරය පිළිබඳ ප්‍රශ්නය සහ ජනවසමෙන් තේ කොළ ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගැඹුරු පරීක්ෂණයක් පවත්වන්න කියලා රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ඇමතිවරයා විධියට රාජ්‍ය පරිපාලන සේවයේ -SLAS එකේ- නිලධාරීන් සම්බන්ධයෙන් ඒ ක්‍රියාමාර්ග ගන්නවා වාගේම නීතිය හා සාමය භාර ඇමතිවරයා විධියට -මගේ ළඟ තිබෙන ලියවිලිත් ඔබතුමන්ලා දෙදෙනාටම භාර දෙන්නම්.- කරුණාකරලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව -CID එක- හරහා සම්පූර්ණ පරීක්ෂණයක් කරන්න. අපේ ආණ්ඩුව විනාශ කරන- මට අගමැතිතුමා කිව්වා, මේ කමනි හෙට්ටිආරච්චි කියන තක්කඩි නිලධාරිනිය, වෞර රැජිණ නිසා නිලධාරීන් විශාල ප්‍රමාණයක් තරහ වුණා කියලා. මේ විතානගේ කියන තක්කඩි අමාත්‍යාංශ ලේකම් හොර දෙටුවා නිසා, සරත් කුමාර කියන හොර දෙටුවා නිසා -මේ තුන්දෙනා නිසා- නිලධාරීන් විශාල ප්‍රමාණයක් තරහ වුණා කියලා අගමැතිතුමා මට කිව්වා. ඒ නිසා මේ පිළිබඳව ගැඹුරු පරීක්ෂණයක් පවත්වන්න කියා මම ඉල්ලා සිටිනවා.

මා සඳහන් කළ සියලු කාරණාවලට අදාළ ලේඛන සියල්ල මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
කාලය නම් බොහොම මදි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ හිතමිත්‍ර බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉතා හැඟීම්බර, ආවේගශීලී කථාවක් කළා; හෙණත් ඉල්ලුවා. කවුරු හරි වැරැද්දක්, දූෂණයක් කරලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම දඬුවම් කළ යුතුයි. ඒ ගැන අපේ කිසිම විවාදයක් නැහැ. නමුත් තමන්ට ටෙන්ඩරය ලබා ගන්න බැරි වුණු නිසා කවුරු හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් ත්‍රිවිධ හමුදාවට මඩ ගහන්න හදනවා නම්, ඒකට කිසිසේත්ම ඉඩ දෙන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සී ලොබ්ස්ටර් වැනි සමාගම් අද මන්ත්‍රීවරුන් නොමහ යවමින්, ජනමාධ්‍ය නොමඟ යවමින්, මේ කාරණය පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය අපකීර්තිමත් කරන්න උත්සාහ කරන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

නිසා, ආරක්ෂක හමුදාවලට වෘත්තීය සමිති නැති නිසා, ඒ ආරක්ෂක හමුදා වෙනුවෙන් පෙනී සිටීම අපි අපේ යුතුකමක් විධියට සලකනවා.

කවුද, මේ ප්‍රසම්පාදන කමිටුව? එසේ මෙසේ අය නොවෙයි එහි ඉන්නේ. සභාපති වශයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා. ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්,- ඒ කියන්නේ හිටපු අතිරේක සොලිසිටර් ජනරාල්. ජනාධිපති නීතිඥවරයෙක් තමයි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්.- හිටපු අමාත්‍යාංශ ලේකම්වරයෙක් වන සුධර්මා කරුණාරත්න සහ ත්‍රිවිධ හමුදාපතිවරු වැනි ඉහළම නිලධාරීන් පිරිසක් තමයි මේ ප්‍රසම්පාදන කමිටුව විධියට ඉන්නේ. ඒ වාගේම තාක්ෂණික කමිටුවේ ඉන්නේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සරත් කුමාර මහතා, මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නියෝජනය කරන අය. ජනාධිපති ලේකම් කාර්යාලයේ නියෝජිතයා හැරුණු විට අද මේ ටෙන්ඩරයට අනෙක් සියලුදෙනාම අත්සන් කරලායි තිබෙන්නේ; ටෙන්ඩරය පිළිගෙනයි තිබෙන්නේ. මේ ප්‍රසම්පාදන කමිටුව තමයි තමන්ගේ කැපවීම නිසා 2014 වසරේ බිලියන 25කට තිබුණු මේ ටෙන්ඩරය 2017 වසර වන විට බිලියන 17 දක්වා පහතට ගෙන යාමට කටයුතු කළේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි පහයි කථා කරන්න තිබෙන්නේ. ඒ නිසා මට බාධා කරන්න එපා. ඒ වාගේම ගණකාධිකාරිවරියගේ සැමියා ටෙන්ඩරය ලබා ගන්නා සමාගමේ සේවය කරනවා කියලා චෝදනාවක් එල්ල වුණා. මෙතැන එක සමාගමක් නොවෙයි, සමාගම් 47ක් තිබෙනවා. ඒ සමාගම් 47න් එක් සමාගමක- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරනකොට අපි ඔබතුමාට බාධා කරන්නේ නැතුව අහගෙන හිටියා නේ. අවම විනය තියා ගන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒ සමාගම්වලින් සල්ලි අරගෙන කියලා මිනිසුන්ට හිතෙනවා, ඔය විධියට කථා කළාම. ඒ නිසා බාධා නොකර ඉන්න. අපි ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඇත්ත දැන ගන්න, වාඩි වෙලා අහගෙන ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා කථා කරන්න. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, එතුමාට කථා කරන්න දෙන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලනවා කියලා සී ලොබිස්ටර් වැනි සමාගම්වලින් මුදල් ගන්නා අයට මේ ගරු සභාව නොමඟ යවන්න ඉඩ දෙන්න විධියක් නැහැ. එම නිසා අපි සත්‍යය කථා කළ යුතුයි. අපි අපේ ත්‍රිවිධ හමුදාවේ කීර්ති නාමය රැකගත යුතුයි.

ගණකාධිකාරිවරියගේ සැමියා මේ සමාගම් 47න් එකක සේවය කළ බව ඇත්ත. හැබැයි මේ ගණකාධිකාරිවරිය අමාත්‍යාංශයට පැමිණියාට පසුව, ඔහු ඔහුගේ කාලය අවසන් වීම නිසා ඒ සමාගමෙන් ඉවත් වෙලා තිබෙනවා. ඒ කාරණය හරි. ප්‍රසම්පාදන මණ්ඩලයේ ලේකම්වරිය විධියට ගණකාධිකාරිවරිය වාඩි වෙනවා නම්, තමන්ගේ සැමියා මෙයින් එක් සමාගමක සේවය කළාය කියලා තමන්ගේ බැඳියාවේ තිබෙන ගැටුම හෙළි කරලා වාඩි වුණා නම් වඩාත් හොඳයි කියන එක මමත් විශ්වාස කරනවා.

ඊළඟට, මම කියන්න ඕනෑ, අඩුම ටෙන්ඩරයට දීලා නැහැ කියලා මෙතුමා දිගින් දිගටම කිව්වා. අඩුම ටෙන්ඩරයට දීලාත් නැහැ; දෙන්නේත් නැහැ; දෙන්න ඕනෑත් නැහැ.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - Procurement Guidelines - කියන්නේ මොකක්ද? ඒකට අපි කියනවා, ප්‍රශස්තතම මිල ගණන් ඉදිරිපත් කළ අයට ලබා දෙන්න ඕනෑ කියලා. තමන් ඉල්ලන ප්‍රමිතිය මුලින් සපුරා තිබෙන්න ඕනෑ. සපුරා තිබෙන ප්‍රමිතිය යටතේ අඩුම මිල ගණන් ඉදිරිපත් කළ අයටයි ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් විධියට මෙහි තිබෙනවා, වෙළෙඳ පොළ මිලට වඩා සියයට 70ට අඩුවෙන් කවුරු හරි මිල ගණන් ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඒක අත්‍යාවශ්‍යකයි කියලා. මේ දවස්වල අර්තාපල් කිලෝ එකක් රුපියල් 65යි. කවුරු හරි අර්තාපල් කිලෝ එකක් රුපියල් 35ට දෙන්නම් කියනවා නම්, ඒක අත්‍යාවශ්‍ය දෙයක්. ටෙන්ඩරයට අර්තාපල් කියලා දමලා, හමුදා කඳවුරේ ඉන්න දූෂිත නිලධාරියෙක් අල්ලලා එක්කෝ බතල දෙනවා; එක්කෝ කිරි අල දෙනවා. එහෙම නැත්නම් කිලෝ එක වෙනුවට ග්‍රෑම් 800 දෙනවා. අන්තිමට අපේ රණ විරුවන් තමයි ඒකෙන් පීඩාවට පත් වෙන්නේ. එම නිසා ආරක්ෂක අමාත්‍යාංශයෙන් නියමයක් හදලා තිබෙනවා, සියයට 70ට වඩා මිල පහළ යනවා නම්, ඒක අත්‍යාවශ්‍ය නිසා එම තැනැත්තාට ටෙන්ඩරය ලබා දිය නොහැකියි කියලා. එම නිසා අඩුම මිල ලබා දීම හොඳම දෙයක් වෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා ප්‍රශස්ත මිල ලබා දීම කළ යුතුයි. යම් සමාගමකට ටෙන්ඩරය ලැබුණේ නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශයට, ත්‍රිවිධ හමුදාවට මඩ ගහනවා වෙනුවට කළ යුතු දෙයක් තිබෙනවා. අපේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අභියාචනා කිරීමේ ක්‍රියාදාමයක් තිබෙනවා. අභියාචනාවලට යන්න පුළුවන්. එතැනදී තමන්ට අසාධාරණයක් වුණොත් අභියාචනාධිකරණයට ගිහින් රිට් නියෝගයක් ගන්න පුළුවන්. නීතියෙන් ලබා දී ඇති නියමිත ක්‍රමවේදය අනුගමනය නොකර ආරක්ෂක හමුදාවට මඩ ගහන්නේ අභියාචනා කිරීමට හෝ, අධිකරණයට ගිහින් සහනයක් ලබා ගැනීමට තමන්ට සාධාරණ වූ අවස්ථාවක් නොමැති බව මේ සමාගම් දන්නා නිසායි. මට බාධා කරපු මන්ත්‍රීතුමන්ලා වැනි මන්ත්‍රීතුමන්ලා අල්ලාගෙන මේ පාර්ලිමේන්තුවේ ආන්දෝලනයක් ඇති කරලා එම නිලධාරීන් බය කරලා - නිලධාරීන් භීතියට පත් කරලා- තමන්ගේ තීන්දුවලට බලපෑමක් ඇති කරන්නයි මේ උත්සාහය දරන්නේ.

ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමනි, කිසි යම් හෝ නිලධාරියෙක් දූෂිතව කටයුතු කර ඇත්නම් ඔහුට උපරිම දඬුවම ලබා දෙන්න. අපට කිසිම හොරෙක් රැක ගන්න කිසිම වුවමනාවක් නැහැ. නමුත්, අඩුම මිලට දුන්නේ නැහැ කියන කථා කිසිසේත්ම සිදු විය යුතු දෙයක් නොවෙයි. අපේ රණ විරුවාට පෝෂ්‍යදායී, ප්‍රණීත, ප්‍රමිතියෙන් යුත් ආහාර වේලක් ලැබිය යුතුයි. ටෙන්ඩරය දිගින් දිගටම මිල අඩු කළ මේ ප්‍රසම්පාදන කමිටුව රැක ගැනීම අපි හැමෝගේම යුතුකමක්. ඒ අතර කවුරු හරි කළු බැටළුවෙක් ඉඳලා වැරැද්දක් කරනවා නම්, ඔවුන්ට දඬුවම් දෙන්න. සමස්ත හමුදාවම දූෂිතයි කියන්න, සමස්ත ආරක්ෂක හමුදාවම දූෂිතයි කියන්න කාටවත් අවස්ථාව ලබා නොදිය යුතු බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 5.40]

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා සහ උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා බරපතළ චෝදනා ගණනාවක් ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත එල්ල කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කළා. ඒ අය මෙම ප්‍රශ්නය පිළිබඳ විස්තර ප්‍රමාණයක් මට ලබා දී තිබෙනවා.

ඒ අය මේ ටෙන්ඩරය පිළිබඳ කියලා තිබෙන්නේ මේ විධියටයි. විවෘත තරගකාරී මිල ක්‍රමය - National Competitive Bidding - උපයෝගී කර ගනිමින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙමින් 2018 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවන් වෙන වෙනම මිල කැඳවීමට පියවර ගන්නා ලදී. ලංසු කැඳවීමේ ලේඛන ත්‍රිවිධ හමුදාවන් විසින් සකස් කරන ලදී. තාක්ෂණික ඇගැයීම් කමිටුවේ පරීක්ෂාවට ලක් කර තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන මිල කැඳවීම් කරන ලදී. 2018 වර්ෂය සඳහා ආහාර ප්‍රසම්පාදනය වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවන් විසින් සකස් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම් පහත පරිදි වේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	- රු. 14,759,252,678.05
ශ්‍රී ලංකා නාවික හමුදාව	- රු. 5,300,377,786.50
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	- රු. 2,107,463,203.57

මේ අවස්ථාවේදී තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත සමස්ත නිර්දේශය ලබා දී ඇති අතර නිර්දේශිත මුළු ප්‍රසම්පාදනයේ වටිනාකම රු.20,076,955,992.59කි. 2018 වර්ෂය සඳහා වන මුළු ඇස්තමේන්තු මුදල වන රුපියල් 22,167,093,668.12ක මුදල හා සැසඳීමේදී සමස්ත අඩුවීම සියයට 28.67කි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ප්‍රසම්පාදන පිරිනැමීම සඳහා වන නිර්දේශ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත යොමු කර ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී විවිධාකාර චෝදනා එල්ල කෙරුවා. මෙම කරුණට අදාළව එතුමා සතුව තිබෙන විස්තර ටික මේ අවස්ථාවේදී මට ලබා දෙන්න පුළුවන් නම්, අනිවාර්යයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධයෙන් අපට පුළුල් පරීක්ෂණයක් කරන්න පුළුවන්. ඒ අනුව මේකේ ඇත්තක් තිබෙනවා නම්, එම නිලධාරීන් වැරදි කරලා තිබෙනවා නම්, එම නිලධාරීන්ට විරුද්ධව අනිවාර්යයෙන්ම අපට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගත හැකි වෙනවා.

මේ අවස්ථාවේදී මා තවත් කරුණක් කියන්න ඕනෑ. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලිපි ලේඛනත් ලැබී තිබෙනවා. එම නිසා ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ ගැන පොඩ්ඩක් අපට සෝදිසි කරන්න වනවා. මොකද, අමාත්‍යාංශයෙන්ම ලිපි ලේඛන පිට වනවා නම්, ඒක ආරක්ෂාවට විශාල ප්‍රශ්නයක්ය කියන එකත් මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒ ගැන විශේෂයෙන් සොයා බලා අවශ්‍ය පරීක්ෂණ පවත්වා එවැනි නිලධාරීන් මේ වාගේ වැරදි කරනවා නම්, ඒ අයට සුදුසු දඬුවම් ලබා දෙන්නටත්, නැත්නම් මේ ක්‍රියාවලියේම යම් කිසි වැරැද්දක් තිබෙනවා නම්, ඒ ගැනත් සොයා බලා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් හරි විධියට වැඩ කටයුතු කරන්නත් අපි ඉදිරිපත් වන බව මේ අවස්ථාවේදී කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.44]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரும் சட்டமும் ஒழுங்கும் அமைச்சரும்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Minister of Law and Order)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා රාජ්‍ය සේවයේ ගණකාධිකාරී සේවයේ නිලධාරිනියකගේ වැඩ පිළිවෙළක්, වංචාවක් සම්බන්ධව අද පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කළා. එතුමා ත්‍රිවිධ හමුදාවටවත්, ත්‍රිවිධ හමුදාවේ රණ විරුවන්ටවත් චෝදනාවක් කළේ නැහැ. ඒ රණ විරුවන්ගේ ආහාර සලාකය යොදා ගෙන කරපු කටයුතු ගැන තමයි එතුමා අද මේ සභාවට පැමිණිලි කළේ.

ගණකාධිකාරී සේවය අයිති වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටයි. මේ ගණකාධිකාරිවරිය 2015.12.03වෙනි දා තමයි ආරක්ෂක අමාත්‍යාංශයට සේවයට වාර්තා කරලා තිබෙන්නේ. මේ අය සම්බන්ධව නොයෙක් චෝදනා; නොයෙක් ප්‍රශ්න ඉදිරිපත් වුණු නිසා අපි රාජ්‍ය සේවා කොමිසමේ ආවරණ අනුමැතියට යටත්ව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වාර්තා කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මඟින් ස්ථාන මාරු නියෝගයක් මේ නිලධාරිනිය වෙත 2017.07.03 දින නිකුත් කරලා තිබෙනවා. එහෙත් මේ සම්බන්ධයෙන් විමසීමේදී නිලධාරිනිය 2017.07.17 දින වන විටත් එම අමාත්‍යාංශයට වාර්තා කර නොමැති බව එම අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන අංශ වෙතින් දැනුම් දෙන ලදී. රාජකාරී අවශ්‍යතාවක් සේ සලකා ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මහත්මියගේ ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම සඳහා මාසයක කාලයක් ලබා දෙන ලෙස මෙම අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් 2017.07.05 දිනැතිව යොමු කරන ලද ලිපිය මඟින් ඉල්ලීම් කර තිබෙනවා. එහෙත් මාසයක කාලයක් දීමෙන් අනතුරුවද නිලධාරිනිය මෙම අමාත්‍යාංශය වෙත වාර්තා කර නොමැති බැවින්, ඇය විධිමත් පරිදි නිදහස් කරන ලෙස දන්වමින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නැවත වරක් 2017.09.22 දිනැති ලිපියක් යොමු කරන ලදී. එහෙත් මෙම නිලධාරිනියගේ සේවය ආරක්ෂක අමාත්‍යාංශයට තව දුරටත් අත්‍යවශ්‍ය වන බැවින් නිලධාරිනියගේ ස්ථාන මාරුව අවලංගු කිරීමට කටයුතු කරන ලෙස දන්වා 2017.10.13 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අප අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර තිබිණි.

එම ලිපියෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ඉටු කිරීමට අපහසු බව 2017.11.08 දිනැති ලිපිය මඟින් අප අමාත්‍යාංශය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට දන්වා ඇත. නැවත වරක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017 නොවැම්බර් මස

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

දිනැති ලිපියක් මඟින් නිලධාරිනිය සේවයෙන් නිදහස් කිරීමට අපහසු බව දන්වා ඇත. ස්ථාන මාරු නියෝගය පරිදි නිලධාරිනිය කටයුතු කර නොමැති බැවින් ඒ පිළිබඳව විමසීමට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාතුමා හමුවන ලෙස එම අමාත්‍යාංශය මඟින් යොමු කරන ලද 2018.02.28 දිනැති ලිපිය මඟින් නිලධාරිනිය වෙත දන්වා ඇත. එහෙත් නිලධාරිනිය පැමිණියේ නැත. එදිනම, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද 2018.08.28 දිනැති ලිපිය මඟින් මෙම ස්ථාන මාරුව පරිපාලනමය හේතු මත සිදු කරන ලද්දක් බව දන්වමින් එම ස්ථාන මාරුව අනුව කටයුතු කරන ලෙසට නැවතත් අප විසින් දන්වා ඇත.

"ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ ස්ථාන මාරු" යන මැයෙන් 2018.03.05 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් යොමු කර ඇති ලිපිය මඟින් නිලධාරිනිය අනුප්‍රාප්තිකයෙකු රහිතව මුදා හැරිය නොහැකි බව නැවතත් දන්වන ලදී. මේ අනුව 2018.03.02 දිනැති ලිපිය මඟින් පී.එන්.කේ. හෙට්ටිආරච්චි මහත්මියගේ අනුප්‍රාප්තිකයා වශයෙන් තවත් ගණකාධිකාරිවරයකු යැවූ පසු මේ නිලධාරිනිය මාරු කර ඇත. ඒ අනුව අපට මාස 08ක් ගිහින් තිබෙනවා මේ නිලධාරිනිය මාරු කිරීමට. මම දන්නේ නැහැ ඒ ඇයි කියලා. මේ සම්බන්ධව අපේ අමාත්‍යාංශය මඟිනුත් පරීක්ෂණයක් කරනවා. ඊට අමතරව මම හිතන විධියට ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මඟින් ඉල්ලීමක් කළා, මෙතැන වංචාවක්, දූෂණයක් සිද්ධ වෙලා තිබෙන බැවින් ඒ සම්බන්ධයෙන් නීතිය හා සාමය අමාත්‍යාංශය මඟින් පරීක්ෂණයක් කරන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් දැනටමත් අපි මේ ගැන පරීක්ෂණයක් කරගෙන යනවා. ඒ වාගේම එතුමාගේ ඉල්ලීම පරිදි මේ සම්බන්ධව රහස් පොලීසිය මඟින් පරීක්ෂණයක් කිරීමට කටයුතු කරන බවත් මේ ගරු සභාවට දන්වන්නට කැමැතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.50ට, 2018 මාර්තු මස 22වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.50 மணிக்கு பாராளுமன்றம், 2018 மார்ச் 22, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.


Parliament adjourned accordingly at 5.50 p.m. until 10.30 a.m. on Thursday, 22nd March, 2018.

:

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 259 - இல. 07
Volume 259 - No. 07

2018 මාර්තු 22වන බ්‍රහස්පතින්දා
2018 மார்ச் 22, வியாழக்கிழமை
Thursday, 22nd March, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව සහ විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

හිමිකම් ඔප්පු ලබා දීම සඳහා මැනුම් කටයුතු ඇමෙරිකානු සමාගමකට පවරා දීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත:

නියෝග

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර හා තුන්වන වර කියවා සම්මත කරන ලදී.

කල්තැබීමේ යෝජනාව:

දේශපාලන ස්ථාවරභාවය ආරක්ෂා වන ආකාරයට පළාත් සභා මැතිවරණය පැවැත්වීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

சபாநாயகரது சான்றுரை

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு மற்றும் கணக்காய்வு சேவைகள் ஆணைக்குழுவினது செயலாற்றுகை அறிக்கைகள்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

உறுதிகள் வழங்குவதற்காக காணி அளவிடுதலை அமெரிக்கக் கம்பனிக்கு ஒப்படைத்தல்

தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்:

ஒழுங்குவிதிகள்

புலமைச் சொத்து (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம்முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

அரசியல் ஸ்திரநிலையைப் பாதுகாப்பதற்காக மாகாண சபைத் தேர்தலை நடத்துதல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA AND PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Handing over the Land Survey for Granting Title Deeds to an American Company

NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT:

Regulations

INTELLECTUAL PROPERTY (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:

Holding of Provincial Councils Election Ensuring Political Stability

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මාර්තු 22වන බ්‍රහස්පතින්දා
2018 மார்ச் 22, வியாழக்கிழமை
Thursday, 22nd March, 2018

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 මාර්තු 21වැනි දින ම'විසින්, ''බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත'' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக்கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018.03.22වන බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම අද දින පූ. භා. 11.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වෙන බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව සහ විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு மற்றும் கணக்காய்வு சேவைகள் ஆணைக் குழுவினது செயலாற்றுகை அறிக்கைகள்
PERFORMANCE REPORT OF THE HUMAN RIGHTS COMMISSION OF SRI LANKA AND PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව සහ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වගන්තිය ප්‍රකාරව, 2017 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා (2017.04.01 - 2017.06.30) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2017 වර්ෂයේ සිව්වැනි කාර්තුව සඳහා (2017.10.01 - 2017.12.31) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියමයන් ඉදිරිපත් කරමි.

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 06 දිනැති අංක 2044/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති අංක 2044/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 08 දිනැති අංක 2044/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 20 දිනැති අංක 2046/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 13 දිනැති අංක 2049/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2051/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 31 දිනැති අංක 2056/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

මෙම නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, ''පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව'' සහ ''2015 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව'' සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.බී. ඒකනායක මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රුවන් විජයවර්ධන මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

(1) තෙලිජ්ජවිල, අකුරුගොඩ පාර, රෝහණ යන ලිපිනයෙහි පදිංචි ඒ.කේ. මුදලිගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) තෙලිජ්ජවිල, ඇල්ගිරිය, වෙනුර යන ලිපිනයෙහි පදිංචි ජේ. දික්මාදුගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අකුරැස්ස, ගොඩපිටිය, ඔලීන්න වත්ත, අංක 30/සී දරන ස්ථානයෙහි පදිංචි එම්.අයි.එස්. අසීමා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 691/16 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 1228/'16 - (2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 1423/'16 - (2), ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ, පසුගිය අය වැය ලේඛනයෙන් ඩිජිටල් යටිතල පහසුකම් සඳහා වෙන් කරපු මිලියන 10,000ක් පිළිබඳවයි. දෙවැනි වතාවටයි මේ ප්‍රශ්නයට කල් අරගෙන තිබෙන්නේ. ඒ සඳහා මිලියන 10,000ක් දෙනවාය කියන එක අය වැය යෝජනාවක් නේ. මේ ආකාරයේ විකාරරූපී යෝජනා දමලා අය වැය සම්මත කරගෙන, ඒ කිසිවක් වෙන්නේ නැති තත්ත්වයේදී උත්තර දී ගන්න බැරිව අපහසුතාවට පත් වෙන්නේ, ඇමතිතුමායි. ඇමතිතුමා එවැනි අපහසුතාවකට පත් වන්නේ මුදල් අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ නිසායි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. තුන්වැනි වතාවේ අනිවාර්යයෙන්ම පිළිතුරු දිය යුතුයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඇමතිතුමා විදේශගත වෙලා සිටින නිසා ඊළඟ සතියේ උත්තර දෙනවා කියලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අනිවාර්යයෙන්ම උත්තර දිය යුතුයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 1663/'17 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පුංචි අවස්ථාවක් මටත් දෙන්න. අභාගරුවාදා මා අහපු ප්‍රශ්නයට පිළිතුර ලබා දීමටත් කල් ගත්තා; ඊයේ අහපු ප්‍රශ්නයටත් කල් ගත්තා. අද දිනයේ නම් කල් ගත්තාට කමක් නැහැ, පළමුවන වතාවට අහන නිසා. ගරු කථානායකතුමනි, මා දිගින් දිගටම ප්‍රශ්න ඇසුවා. ඔබතුමා මා ඇසූ ඒ ප්‍රශ්න අදාළ තැන්වලට යොමු කළා; ඒවා ගැන සොයා බැලීමට කටයුතු කළා.

පසුගිය පළාත් පාලන ඡන්දයේදී මුළු රටම දැක්කා පළාතේ ප්‍රධාන ඇමතිවරයා විදුහල්පතිතුමියට මොකක්ද කළේ කියන කාරණය. හැබැයි ඒ අය කඩුවලින් කැපුණේ නැහැ. රටේ ජනතාව, පළාතේ ජනතාව ඒ ඡන්දයේදී පැහැදිලි තීන්දුවක් දුන්නා, ගරු කථානායකතුමනි. මම ඉතා වගකීමකින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි. මුලසුනේ සිටින ඔබතුමාගේ වැඩ පිළිවෙළ තුළ පැහැදිලි තීන්දුවක් දෙන්න, මේ දේශපාලන නායකත්වයට. විශේෂයෙන්ම ගම් මට්ටමේ සිටින ප්‍රාදේශීය සභා නියෝජිතයන් තමයි මේ ප්‍රශ්න නිසා දුක් වින්දේ, ගරු කථානායකතුමනි. ඔබතුමා පැහැදිලිව දන්නවා, පසුගිය කාලයේ වෙච්ච ඒ සිදුවීමට අදාළව ඒ ප්‍රධාන අමාත්‍යවරයාට කිසිම දඬුවමක් දුන්නේ නැහැ කියලා. ඒ නිසා තමයි ඒ පළාතේ ජනතාව කැපෙන්නේ නැති කඩුවලට එරෙහිව තීන්දුවක් දුන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්නවලට උත්තර ලබා දීලා අදාළ අයට දඬුවම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අලුත් ස්ථාවර නියෝග ආවාට පසුව ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා තුන්සැරයකට වඩා කල් ගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා, එහි ඒ බව සඳහන් වෙලා තිබෙනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය කාර්යාල සහ කාර්ය මණ්ඩල: විස්තර

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சு அலுவலகங்கள் மற்றும் ஆளணி: விபரம்

OFFICES AND STAFF OF MINISTRY OF LAW AND ORDER AND SOUTHERN DEVELOPMENT : DETAILS

2004/'17

5. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන් කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන් කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரின் அமைச்சு அலுவலகங்களின் முகவரிகள் யாவை என்பதையும்;

(ii) அந்த அலுவலகங்களுக்காக வாடகை குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

(iii) 2015 - 2017ஆம் ஆண்டுவரை செலுத்தப் பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அமைச்சரின் பிரத்தியேக பதவியணி உத்தியோ கத்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அந்த பிரத்தியேக பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

ஒவ்வோர் அமைச்சுக்கு ஏற்ப வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

Hon. Bimal Rathnayake,- To ask the Minister of Law and Order,-(1)

(a) Will he inform this House-
  (i) the addresses of ministerial offices of the Minister of Law and Order and Southern Development;
  (ii) if rent or lease is paid for the said offices, the monthly rental/lease; and
  (iii) the total rent/lease paid from the year 2015 up to the year 2017?

(b) Will he also inform this House, separately in respect of each Ministry-
  (i) the number of officials in the personal staff of the Minister;
  (ii) the number of vehicles allocated for the said personal staff; and
  (iii) the number of vehicles allocated to the Minister?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා. නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ කාර්යාලවල ලිපිනයන් ආදි විස්තර තමයි මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ.

(අ) (i) 2018.02.25 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල සංශෝධනය මඟින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය භාරව කටයුතු කළ ගරු අමාත්‍යවරයා හා අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනයට ලක්ව ඇත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ආ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ආපසු ඒ ප්‍රශ්නය යොමු කරන්න වේවි නේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අමාත්‍යාංශ වෙන් කරලායි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒවා නම් ඉතාම කාර්යක්ෂමව කරන්න ඔබතුමන්ලා දන්නවා. නමුත් මා අහලා තිබෙන්නේ 2017 වර්ෂය දක්වා විස්තර.

එතකොට මේ වෙනස බලපාන්නේ නැහැ, ගරු අමාත්‍යතුමා. මොකද, මේ ළඟදි තේ මේ වෙනස්කම සිද්ධ වුණේ. තිබුණු දෙයක් ගැනයි මේ අහන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම නම් ඒකට නැවත පිළිතුරු හොයන්න වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ප්‍රශ්නය නැවත යොමු කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඊළඟට මම අහන කාරණයත් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයටම අදාළයි. ගරු ඇමතිතුමනි, අපි දන්නවා, බරපතළ වංචා, දූෂණ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිසමට අනුව වැරදිකරුවන් කරපු පුද්ගලයන් රාශියක් ඉන්නවා, Bond Commission එකේ වාගේම. වැරදිකරුවන් වූ එවැනි පුද්ගලයන් 200ක් පමණ ඉන්නවා. කොමිසමට අනුව සිටින සමහර චූදිතයන්ගෙන්, වැරදිකරුවන්ගෙන් එක්කෙනකු ජනාධිපතිවරයා සමඟ ජපන් නිල සංචාරයක නිරත වෙලා ඉන්නවා අප දුටුවා. ඒ තමයි පියසිරි විජේනායක. එවැනි 14 දෙනකු නම් කර තිබෙනවා. විමල් වීරවංශ, ජයන්ත රොද්‍රිගෝ ඇතුළු ගණනාවක් ඉන්නවා. දැන් මේ පියසිරි විජේනායක කියන පුද්ගලයා මේ කොමිසමට අනුව වැරදිකරුවෙක්. ඉතින් කොහොමද, නිල රාජ්‍ය සංචාරයකට ජනාධිපතිවරයා ඔහු ගෙන යන්නේ? ජපන් අගමැතිවරයා සමඟ කළ සාකච්ඡාවේ මේ දූෂිත පුද්ගලයන් ඉන්නවා. ඒ නිසා අපි දැන ගන්න කැමැතියි, මේවාට අදාළ නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා. ඒ විතරක් නොවෙයි. මේ තුළින් සදාචාරමය හා අනියම් බලපෑමක් අධිකරණයට සහ පොලීසියට සිද්ධ වෙන්නේ නැද්ද කියන එකත් අපි අහනවා. මේ සම්බන්ධයෙන් නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාට ලියලා, ඔබතුමා අපට දන්වනවා නම් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමා ඒ ප්‍රශ්නය යොමු කරනවා ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔව්, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 2072/'17 - (1), ගරු ඩග්ලස් දේවානන්ද මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

2015 වසරේ වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ සිසුන්: ඌව පළාත
2015இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றோர்: ஊவா மாகாணம்
STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: UVA PROVINCE

2135/'17

7. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டில் க.பொ.த. (உயர்தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் மொனறாகலை மற்றும் பதுளை மாவட்டங் களிலிருந்து தோற்றியுள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the G.C.E. (A/L) Examination in the biology stream in 2015 from the Monaragala and the Badulla Districts;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

බදුල්ල දිස්ත්‍රික්කය - 2012

මොනරාගල දිස්ත්‍රික්කය - 1034

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

බදුල්ල දිස්ත්‍රික්කය - 983

මොනරාගල දිස්ත්‍රික්කය - 447

එම සංඛ්‍යාව අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස:

බදුල්ල දිස්ත්‍රික්කය - 48.86%

මොනරාගල දිස්ත්‍රික්කය - 43.23%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;

බදුල්ල දිස්ත්‍රික්කය - 39

මොනරාගල දිස්ත්‍රික්කය - 20

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

බදුල්ල දිස්ත්‍රික්කය - 3.97 %

මොනරාගල දිස්ත්‍රික්කය - 4.47 %

(iv) ඇමුණුම යටතේ දක්වා ඇත.

ඇමුණුම

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරාගනු ලැබූ වෛද්‍ය පීඨය
6437389	ඩී.එම්.එස්.පී.කේ. දිසානායක	බදුල්ල	පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට ඉදිරිපත්ව ඇත.	භෞතික විද්‍යාව	B	1.7161	යාපනය විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
6577725	ඩී.එම්.ජී.ඊ.ජේ. බණ්ඩාර	මොනරාගල	පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට ඉදිරිපත්ව ඇත.	භෞතික විද්‍යාව	B	1.6087	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	B		

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මේකෙනුත් පෙනෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් වෛද්‍ය පීඨයට ඇතුළත් වෙලා තිබෙන අවම සුදුසුකම බවට පත්වෙලා තිබෙන්නේ "A" 1යි, "B" 2යි. මොනරාගල දිස්ත්‍රික්කයේ "B" 3යි. "B" 3 සමාර්ථය මොනරාගල දිස්ත්‍රික්කය වගේ දිස්ත්‍රික්කයකත් අවම සුදුසුකම වෙලා තිබියදී, මම නැවතත් අහන්නේ, "S" 3 සමාර්ථය අවම සුදුසුකම කරන්න තමුන්නාන්සේලා මෙපමණ ධෛර්යයක් දමන්නේ මොකටද? පහසුකම් නැතිව, සමහර විට ගුරුවරුත් නැතිව, මෙවැනි අවම සුදුසුකම් තිබෙන මොනරාගල දිස්ත්‍රික්කයේ ළමයිනුත් "B" තුනක සමාර්ථයක් ලබාගෙන තමයි වෛද්‍ය පීඨයට ඇතුළත් වෙලා තිබෙන්නේ. හැබැයි, තමුන්නාන්සේලා දශමයක් අඩුවෙලා වෛද්‍ය පීඨයට ඇතුළත් වෙන්න බැරි අය ගැන කිඹුල් කඳුළු හෙළමින්, අවම සුදුසුකම විධියට "S" 3 සමාර්ථය පිළිගන්න යනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, තමුන්නාන්සේගේ සංකල්පයෙන් පැහැදිලි කරන්නේ නැතිව වෙන මොකක් හෝ උත්තරයක් තිබෙනවා නම් කියන්න කෝ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
යථාර්ථවාදී උත්තරය මේකයි. ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම සංකල්පය එතුමා ඊයේ පැහැදිලි කළා. ඒකට අමතරව නේද දැන් කරුණු ඉදිරිපත් කරන්නේ?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඔව්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ සංකල්ප ගැන විතරයි මෙතුමා කථා කරන්නේ. වැඩ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට අමතරව නේ මේ පැහැදිලි කිරීම කරන්නේ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ගරු මන්ත්‍රීතුමනි, ඉතා සරලව කියනවා නම්, අපේ රටේ උසස් අධ්‍යාපනයට තිබෙන ප්‍රවේශයේ අඩුකම නිසා ඉතා තරඟකාරී විධියට වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත්වීමේ අවම සුදුසුකම "B"3 යි කියලා ඔබතුමා හිතනවා නම්, මම හිතන විධියට ඒක නැවත ඔබතුමා කල්පනා කළ යුතු දෙයක් නොවෙයි. ඒක වෙනම හේතු නිසා ඇති වෙච්ච දෙයක්. ඒක නිර්දේශිත අවම සුදුසුකමක් නොවෙයි නේ. නේද? අපි හිතමු යම් විධියකින් ලබන අවුරුද්දේ මොකක් හරි හේතුවක් නිසා ඔය ප්‍රතිඵල අඩුවීමක් වුණොත්, සමහර විට අවම සුදුසුකම "C"1ක්, "C"2ක් වෙන්න පුළුවන්. එහෙම වෙයිද කියලා කවුද දන්නේ. එහෙම වුණත් විශ්වවිද්‍යාල නීතිය අනුව එතැන තිබෙන අවම සුදුසුකම ගන්න වෙනවා. ඒ නිසා ඒක විචලනවීමක් වෙන්නේ. මේක අචල එකක් නොවෙයි. එම නිසා අපි එක අවුරුද්දක මෙවැනි සුදුසුකමක් අරගෙන තර්ක කළ යුතු නැහැ. අපි සමස්ත අධ්‍යාපනය ගැන හිතලා, එම අධ්‍යාපනයෙන් අපි ඇත්තටම බලාපොරොත්තු විය යුතු දේ බලලා,- උදාහරණයකට ගත්තොත් එංගලන්තයේ ඕනෑම විශ්වවිද්‍යාලයක වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත් කරන්නේ සම්මුඛ පරීක්ෂණයකුත් කරලයි. ඊට අමතරව ලිඛිත සටහනක් දෙන්නත් ඕනෑ. ඒ ගොල්ලන් වෛද්‍ය විද්‍යාව තෝරා ගන්නේ ඇයි කියන එක ගැන ලියා දෙන්න ඕනෑ. එතැනදී ඒ සියල්ල පරීක්ෂා කරලා බලනවා. එම පුද්ගලයාගේ අභ්‍යන්තර ගතිගුණ, ඔහුගේ ආකල්ප, ඔහු මොන විධියට රෝගීන්ට සලකයිද, ඔහුගේ ඇඟ ඇතුළේම මේ දේවල් තිබෙනවාද කියලා හොඳ විශ්ලේෂණයක් කරලා තමයි ඔවුන්ව ගන්නේ. තමුන්නාන්සේ දන්නවා ඇති, ඔය කියන සුදුසුකම්වලින් පවා,- [බාධා කිරීමක්]

මේ ගැන කථා කළා ඇති නේද? අපි මේ ගැන කොච්චර කථා කළත් මොකක් හරි තැනකදී අවම සුදුසුකම විධියට අපට යම් ප්‍රතිඵලයක් භාර ගන්න වෙනවා. හැමදේම සලකා බලා අපි දාලා තිබෙන්නේ "S"3 නොවෙයි.

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)
2014 අවුරුද්දේ දී "S" 3න් විශ්වවිද්‍යාලයට ගියා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා ආවා, සභායට.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
2014 අවුරුද්දේ දී මන්නාරම දිස්ත්‍රික්කයෙන් "S"3 සමාර්ථය ලබාගෙන Medical College එකට තේරුණා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කොයි කාලයේද ගියේ?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
2014 අවුරුද්දේ මන්නාරම දිස්ත්‍රික්කයෙන් "S"3 සමාර්ථය ලබාගත් සිසුන් Medical College එකට තේරුණා. 2013 අවුරුද්දෙත් තේරුණා; 2012 අවුරුද්දෙත් තේරුණා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
මම මේවා සොයන්න ගියේ නැහැ. මේ ප්‍රශ්නය ඇතුළේ -

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
Check කරලා බලන්න පුළුවන් නේ. Check කරලා බලන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මන්නාරමේ අපේ ගරු මන්ත්‍රීතුමා කියනවා, "නැහැ"යි කියලා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
එතුමා දන්නේ කොහොමද? Eastern Medical Faculty එකට 2014 වනතුරු "S" 3 සමාර්ථයෙන් ඇතුළත් කර ගත්තා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හරි, තව උත්තර එන්න තිබෙනවා. තමුන්නාන්සේලා තව පළාත් හතරක් ගැන උත්තර දෙන්න ඕනෑ.

දැන් ඔබතුමා එංගලන්තයේ වෛද්‍ය පීඨ ගැන කිව්වා. ඒවායේ merit එකෙන් තමයි interview එකට call කරන්නේ. Chemistryවලට "A" එකක් ඕනෑ. ඉතිරි සුදුසුකම් ටික interview එකේ දී අමතර සුදුසුකම් විධියට බලන්නේ. තමුන්නාන්සේට bat එකක් - ක්‍රිකට් පිත්තක් - අල්ලන්න පුළුවන් වෙන්න පුළුවන්. හැබැයි ක්‍රිකට් පිත්තක් අල්ලන එක ජාතික කණ්ඩායමට ගන්න සුදුසුකමක් වෙන්නේ නැහැ නේ. හැමෝම ක්‍රිකට් පිත්ත අල්ලනවා නේ. [බාධා කිරීමක්] එහෙම නම් ජාතික කණ්ඩායමේ මහේලවයි, සංගක්කාරවයි අයින් කරලා තමුන්නාන්සේව ගන්න පුළුවන් නේ . ක්‍රිකට් සංචිතයක් තිබෙනවා, ඒ සංචිතයෙන් තමයි තෝරා ගන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමනි, අවශ්‍ය නම් මේ ගැන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා මෙය විසඳා ගන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි.

ලංගම ඩිපෝ : පුත්තලම දිස්ත්‍රික්කය
இ.போ.ச. டிப்போக்கள் : புத்தளம் மாவட்டம்
SLTB DEPOTS: PUTTALAM DISTRICT

2145/'17

8. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ලංගම ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) දැනට එක් එක් ඩිපෝව සතු ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංගම ඩිපෝවල බස් රථ ඇණිය වැඩි දියුණු කිරීම සඳහා අලුතින් ලබාදුන් බස් රථ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරියේදී පුත්තලම දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝවලබස් රථ ඇණිය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்திலுள்ள இ.போ.ச. டிப்போக்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி டிப்போக்களின் பெயர்கள் யாவையென் பதையும்;

(iii) தற்போது ஒவ்வொரு டிப்போக்களிலும் இயக்கு வதற்கு பொருத்தமான நிலையிலுள்ள பேருந்து களின் எண்ணிக்கை ஒவ்வொரு டிப்போக் களுக்கும் ஏற்ப தனித்தனியாக யாதென்பதையும்;

(iv) 2010ஆம் ஆண்டு முதல் இற்றைவரை இ.போ.ச. டிப்போக்களின் பேருந்துகளின் தொகுதியை மேம்படுத்துவதற்காக புதிதாக வழங்கப்பட்ட பேருந்துகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) எதிர்வரும் காலத்தில் புத்தளம் மாவட்டத்தில் இ.போ.ச. டிப்போக்களின் பேருந்து தொகுதியை மேம்படுத்துவதற்கு அமைச்சினால் மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform the House-

(i) the number of depots of the SLTB in the Puttalam District;

(ii) the names of those depots;

(iii) the number of buses in proper running condition in each depot, separately;

(iv) the number of buses given a new to develop the fleet of buses in the depots of the SLTB from 2010 up to date; and

(v) the steps the Ministry intends to take develop the fleet of buses in the Puttalam District in future?

(b) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඩිපෝ සංඛ්‍යාව 03කි.

(ii) පුත්තලම ඩිපෝව, හලාවත ඩිපෝව, වෙන්නප්පුව ඩිපෝව.

(iii)

හලාවත ඩිපෝව බස් රථ	53
පුත්ලම ඩිපෝව බස් රථ	58
වෙන්නප්පුව ඩිපෝව බස් රථ	48

(iv) අලුතින් ලබා දුන් බස් රථ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

වර්ෂය	බස් රථ සංඛ්‍යාව
2010	නැත
2011	10
2012	140
2013	301
2014	115
2015/ 2016	2,280
2017	18
මුළු බස් රථ සංඛ්‍යාව	**2,864**

පුත්තලම දිස්ත්‍රික්කයේ ඩිපෝ 03 සඳහා ලබාදී ඇති බස් රථ සංඛ්‍යාව

වර්ෂය	පුත්තලම	හලාවත	වෙන්නප්පුව
2010	-	-	-
2011	3	2	2
2012	2	1	3
2013	1	1	1
2014	12	13	12
2015/2016	08	07	05
2017	-	-	-
2018	-	-	-
එකතුව	26	24	23

නව එන්ජින් කට්ටල ලබාදීම

වර්ෂය	පුත්තලම			
හලාවත	වෙන්නප්පුව			
2017		6	6	4

(v) ඉදිරියේදී ශ්‍රීලංගමයට ලැබීමට නියමිත බස් රථ දහසකින් ඩිපෝවල අවශ්‍යතාව පරිදි පුත්තලම දිස්ත්‍රික්කයට හිමි බස් රථ ප්‍රමාණය හා වාර්ෂිකව ලබාදීමට නියමිත එන්ජින් කට්ටල් ප්‍රමාණය ලබාදීමට පියවර ගනු ඇත. මීට අමතරව ඩිපෝවල බස් රථ ඇණිය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කෙරේ. එසේම දැනට පවත්වාගෙන යනු ලබන බස් රථ ඇණිය වැඩිදියුණු කිරීමට ඉලක්ක කර ඇති අතර, ඒ අනුව පුත්තලම් දිස්ත්‍රික්කයේ බස් රථ ධාවන කටයුතු වැඩිදියුණු කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම පාර්ලිමේන්තුවට තේරී පත් වුණු වහාම පුත්තලම දිස්ත්‍රික්කයේ මේ ඩිපෝ පිළිබඳ ප්‍රශ්න මතු කළා. විශේෂයෙන්ම වෙන්නප්පුව ඩිපෝවේ සිදු වන අකාර්යක්ෂම බස් ධාවනය පිළිබඳව මාර්ගවල නම් එක්කම ගරු ඇමතිතුමාට ප්‍රකාශ කළා. නාත්තන්ඩිය ප්‍රධාන මාර්ගය, යද්දෙස්සාව, කුද්දිටියාව මාර්ග, ඉරනවිල පාසල් සේවය වැනි ඒවා පිළිබඳව දැනුවත් කිරීම් කීපයක් කළා. ගරු ඇමතිතුමා ඒ ගැන සොයා බලනවා කිව්වත්, දැන් අවුරුදු දෙකහමාරක් ගත වෙලා තිබෙනවා, අද වන තුරු මේ වෙන්නප්පුව ඩිපෝවේ බස් ධාවනය ක්‍රමවත්ව, පිළිවෙළට සිදු වන්නේ නැහැ.

ඒ නිසා අපි නියෝජනය කරන ප්‍රදේශයේ විශාල පිරිසක් මගී ප්‍රවාහන කටයුතු හේතුවෙන් අපහසුතාවට පත්වෙලා සිටිනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. වෙන්නප්පුව ඩිපෝවට බස් 48 තිබෙන්නේ කියලා ඔබතුමා සංඛ්‍යා ලේඛනවලදී සඳහන් කළා. ඩිපෝ එකෙන් ලැබුණු තොරතුරුවලට අනුව විශාල ජනගහනයක් ඉන්න ප්‍රදේශයකට මේ බස් රථ ඇතිද, බස් රථ ඇති නම් ඒවා මාර්ගවල ධාවනයට අවශ්‍ය කරන නිසි කාල සටහන් ක්‍රමවත්ව ඉදිරියට ගෙනි යන්න කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

කුරුණෑගල දිස්ත්‍රික්කයේ -විශේෂයෙන්ම වයඹ පළාතේ- ඩිපෝ 12ක් තිබෙනවා. මේ ඩිපෝ 12න් වෙන්නප්පුව ඩිපෝව සුවිශේෂී ඩිපෝවක්. මොකද, එම ඩිපෝව දැනටමත් ස්ථිර තැන්පතු වශයෙන් රුපියල් කෝටි 5කට වැඩි ප්‍රමාණයක් යොදවලා හොඳට පරිපාලනය කරන ඩිපෝවක් වශයෙන් අපි හඳුන්වනවා. කෙසේ වෙතත් තිබෙන ප්‍රශ්නය මෙකයි. ඒ බස් රථ 48 දැනට ධාවනය කරන බස් රථ. ඊට වඩා බස් රථ තිබෙනවා. බස් රථ අවශ්‍යයි. සාමාන්‍යයෙන් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත සහ ප්‍රාදේශීය ජනතාවගේ ඉල්ලීම මත බස් රථ ධාවනය සඳහා යොදන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, නමුත් තිබෙන ප්‍රශ්නය මෙකයි. අපි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බාර ගනිද්දි සේවකයන් 36,700ක් හිටියා. එක් බස් රථයකට සේවකයන් හත් දෙනෙකු ඉන්නවා. බස් රථයකින් හම්බ කරන්නේ දෙදෙනායි. හැබැයි, සේවකයන් හත් දෙනෙකු ඉන්නවා. ලංකාවේ ඩිපෝ 106ක් තිබෙනවා. එයින් ඩිපෝ 70කට වැඩිය සේවකයන්ට පඩි ගෙවලා තිබුණේත් නැහැ. නමුත් අපි මෙම අමාත්‍යාංශය බාර ගත්තාට පස්සේ ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ ඩිපෝ සියල්ලේම සේවකයන්ට පඩි ගෙවමින් හොඳට මේ ඩිපෝ පවත්වාගෙන යනවා. හැබැයි, ප්‍රශ්නයක් තිබෙනවා. වසර 20කටත් වඩා වැඩි ඉතා පැරණි බස් රථත් තිබෙනවා. බස් රථ 1,000ක් මිලදී ගන්නට අනුමැතිය අපි දැනට භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබෙනවා. ඒ බස් රථ ලැබුණාට පස්සේ අපි ඒවා ලබා දෙනවා. දැනට කොන්ත්‍රාත් පදනම මත පමණයි අපි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සේවකයන් බඳවා ගන්නේ. ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන වැඩසටහනක් යටතේ අපි රුපියල් බිලියන 8ක් -රුපියල් කෝටි 800ක්- වියදම් කරලා, දැනට සේවකයන් 4,000ක් පමණ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යවලා තිබෙනවා.හැබැයි, විශේෂිත ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ අනාර්ථික මාර්ග කියලා තිබෙනවා. අනාර්ථික මාර්ග කියන්නේ ආදායම් අඩු මාර්ග. මේවා

[ගරු අශෝක් අබේසිංහ මහතා]

පවත්වා ගෙන යන්න සාමාන්‍යයෙන් එක කිලෝමීටරයකට රුපියල් 60-70ක් අවශ්‍ය වෙනවා. ඔබතුමා කියන සමහර පාරවල ආදායම කිලෝමීටරයකට රුපියල් 20යි, 25යි, 30යි. එහෙම වුණාම එම ඩිපෝ පවත්වා ගෙන යෑමේ හැකියාවක් නැහැ. මොකද, ලංකා ගමනාගමන මණ්ඩලයේ එක සේවකයෙකුට රුපියල් 16,200 බැගින් වැටුප් ගෙවීම සඳහා රජයෙන් මුදල් දෙනවා. එම නිසා අපි ඉදිරියේදී නව බස්රථ ලැබුණු පසුව, පරීක්ෂා කර බලා රජයෙන් ලැබෙන මුදල් සමහත් සංසන්දනය කර බලා එසේ බස්රථ අවශ්‍ය මාර්ගවලට එම බස්රථ ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම මේ කාරණාව ඉදිරිපත් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමා මෙම අමාත්‍යාංශය තුළින් සේවාවක් ලබා දෙන්න උත්සාහ කළත්, මම නම් දකින විධියට ඒක ප්‍රායෝගිකව සිදු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මොකද, ඔබතුමාගේ කැබිනට් ඇමතිතුමා දැන් ඊට වඩා යම්කිසි සිහිනයක ඉන්නේ. නමුත් එතුමා මේ පිළිබඳව සොයා බලන්නට ඕනෑ. මොකද, කෝටි කීයක් ස්ථිර තැන්පතු - fixed deposits - විධියට තිබුණත්, කොන්ත්‍රාත් පදනම හෝ මොන පදනම මත සේවකයෝ බඳවා ගත්තත්, ජනතාවගේ ගමනාගමන පහසුකම් නියමිත පරිදි නොලැබෙනවා නම්, මහජන නියෝජිතයන් විධියටත්, මේ රටේ ජනතාව විධියටත් එය අපට ප්‍රශ්නයක්. ඒ නිසා කොපමණ ප්‍රමාණයක් ස්ථිර තැන්පතු තිබෙනවාද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. එම මාර්ගවල බස්රථ ධාවනයට අවශ්‍ය කරන මුදල් නොලැබෙන්නේ, ගමනාගමනය සඳහා යොදවන බස්රථ ටික වේලාවට නොයෙදීම නිසායි, ගරු කථානායකතුමනි. රජයක් විධියට, අමාත්‍යාංශයක් විධියට ගමනාගමන පහසුකම් ලබා දීම වගකීමකින් යුතුව කරන්න ඕනෑ. ඒක අපේ වගකීමක්. ඒ නිසා මම මුලින් සඳහන් කළා වාගේ තවත් සිහිනයක ඉන්නා ප්‍රවාහන ඇමතිතුමා මහාමාර්ගවලට අවශ්‍ය කරන බස්රථ ධාවනය සඳහා ලබා දීමට වර්තමානයේදී ඉතාම ඉක්මනින් -කඩිනමින්- පියවර අරගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වෙන්නප්පුව ඩිපෝව පිළිබඳව යළිත් වතාවක් සොයා බලා, අකාර්යක්ෂම ලෙස පවතින බස්රථ සේවාව කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීමට කටයුතු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ලංකාවේ පෞද්ගලික බස් රථ 21,000ක් තිබෙනවා. ගමනා ගමන මණ්ඩලයේ බස් රථ 5,500යි තිබෙන්නේ. සාමාන්‍යයෙන් පෞද්ගලික බස් රථ භයකට ගමනා ගමන මණ්ඩලයේ බස් රථ හතරක් තමයි තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන් පෞද්ගලික බස් රථත් ලංකාවේ ගමනා ගමනය සඳහා අනුගත වෙලා තිබෙනවා. අපේ රටේ විනාඩි පහෙන් පහට බස් රථ ගියත් බස් නැහැ කියලා තමයි කියන්නේ. ඒක සාමාන්‍ය තත්ත්වයක්. ඒක අපට වළක්වන්න බැහැ. කෙසේ වෙතත්, ඔබතුමා කියන පරිදි ඒ ගැන සොයා බලා ඉදිරියේදී වැඩ කටයුතු සලස්වන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 9 -2182/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, අපි හැමදාම ප්‍රශ්න අහනවා. ආණ්ඩු පාර්ශ්වයෙන් කල් ගන්නවා. අදවත් පිළිතුරක් ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා. එතුමාගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කරන්න පුළුවන්. තුන්වන වතාවට පෙර පිළිතුරු දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමාගේ ප්‍රශ්නයට තුන්වන වතාවට පෙර පිළිතුරු දෙන බව සහතික කරනවා

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එතුමාගේ ප්‍රාර්ථනාව හරි ගියා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -2292/'17- (1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මේක රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර සම්බන්ධව ප්‍රශ්නයක්. තව මාසයක් දෙකක් යනකොට නැවත ගංවතුර එයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය දෙවන වතාවටද ඇහුවේ?

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මේ ප්‍රශ්නය අහලා ගොඩක් කල් වෙනවා. ප්‍රශ්නය ඉදිරිපත් වෙනකොට උත්තරයක් දෙන්න ඇමතිතුමා නැහැ. ආපසු ඉක්මනින් ප්‍රශ්නය ගෙනෙන්න හෝ අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මෙතුමා කියන කාරණය මමත් පිළිගන්නවා. උත්තර දෙන්න නම් ලෙහෙසි ප්‍රශ්නයක්. නමුත් උත්තරයක් එවලා නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඒ ගැන පොඩ්ඩක් මතක් කරන්න. මොකද, තුන්වතාවකට වඩා නම් කල් දෙන්න බැහැ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 2317/'17 -(1), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා විදේශගත වෙලා සිටින නිසා එතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12-2324/'17-(1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13-2328/'17-(1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා දන්වා එවා තිබෙනවා, එම ප්‍රශ්නය එතුමාගේ අමාත්‍යාංශයට අදාළ නොවන නිසා පිළිතුරු දෙන්න බැහැ කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙමනම් මේ ප්‍රශ්නය අදාළ වෙන්නේ කාටද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මා හිතන විධියට, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට විය යුතුයි නේද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා අපි එහෙම කරමුද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාට නාගරික සංවර්ධන විෂය අයිතියි කියලා හිතාගෙන තමයි මම මෙම ප්‍රශ්නය එතුමාට යොමු කළේ. එතුමාට මෙම විෂය අයිති නැත්නම් කාටද අයිති? පළාත් පාලනයටද? එතුමා කියන දෙයක් විටින් විට පත්තරවල තිබෙනවා මම දකිනවා, "මට කුණු පිළිබඳ වගකීමක් නැහැ." කියලා. එතකොට පළාත් පාලන ඇමතිතුමා කියනවා, "මගෙත් නොවෙයි." කියලා. දැන් මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ කාටද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්නේ මේක ආපදා කළමානාකරණ අමාත්‍යාංශයට අයිතියි කියලායි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මම හිතුවේ එහෙමයි, ගරු කථානායකතුමනි. බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාට අදාළ නොවන බව දන්වා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි, මෙම ප්‍රශ්නය කුමන හෝ අමාත්‍යාංශයකට යොමු කරන්න එපායැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
දැන් ආපදාව ඉවරයි. දැන් ප්‍රශ්නය වන්නේ මේ අයට වන්දි කොතරම් ගෙවිවාද? දැන් ඉතිරි භූමිය අයිති කාටද? ඒකේ වටිනාකම කීයද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
අපි හොයලා බලලා අදාළ අමාත්‍යාංශයට යොමු කරමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නැත්නම්, මෙම ප්‍රශ්නය අයත් වන්නේ පළාත් පාලන අමාත්‍යාංශයටද දන්නේ නැහැ?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඒක තමයි ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඔබතුමා මේ ගැන සොයා බලා අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය අහන්නේ දෙවැනි වතාවටද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්. එහෙමනම්, අපට පළමුවෙනි වතාවේදීම කියන්න තිබුණා. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි, ඔබතුමා අපට ඒ ගැන දැනුම් දෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ප්‍රශ්නය අහලා තිබෙන්නේ, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන්. එම අමාත්‍යාංශයෙන් තමයි දන්වලා තිබෙන්නේ, එම ප්‍රශ්නය ඔවුන්ට අදාළ නැහැ කියලා. අපි දැන් අදාළ අමාත්‍යාංශයට ප්‍රශ්නය යොමු කරමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
අදාළ අමාත්‍යාංශය මොකක්ද කියලා ඔබතුමා අපට දන්වනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
අනිවාර්යයෙන්ම.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වනවා.

ප්‍රශ්න අංක 14, -2339/'17- (1), ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 - 2413/'17 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුණිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළ෈යිඩප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 - 1228/'16 - (2), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළ෈යිඩප්පට්ටදු.
Question ordered to stand down.

කිළිනොච්චිය විදුලිබල මණ්ඩල කාර්යාලය: විදුලි ගාස්තු මාසිකව අය කර ගැනීම

கிளிநொச்சி மின்சார சபை அலுவலகம் : மாதாந்தம் மின்கட்டணத்தை அறவிடல்

CEYLON ELECTRICITY BOARD OF KILINOCHCHI: TIMELY COLLECTION OF ELECTRICITY BILLS

2072/'17

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு டக்ளஸ் தேவானந்தா சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Douglas Devananda.)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) උතුරු පළාතේ ජනතාව නැවත පදිංචි කරන ලද ප්‍රදේශයන්හි පිහිටි නිවාස සඳහා පසුගිය කාලයේදී "උතුරු වසන්තය" වැඩසටහන යටතේ නොමිලේ විදුලිබල සම්බන්ධතාවන් ලබා දෙන ලද බවත්;

(ii) ඉන් පසුව මාසිකව විදුලි ගාස්තු අය කර ඇති බවත්;

(iii) ඒ අනුව, කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ජනතාව නැවත පදිංචි කරන ලද ප්‍රදේශයන්හිද විදුලි ගාස්තු මාසිකව අය කර ඇති බවත්;

(iv) එසේ වුවද, පසුගිය මාස 6ක කාල සීමාව තුළ කිළිනොච්චිය දිස්ත්‍රික්කයෙහි මෙම ගාස්තු අයකර නොමැති බවත්;

(v) මාසිකව විදුලි ගාස්තු අය නොකර එකවර මාස කිහිපයක් සඳහා ගාස්තු අය කිරීමෙන්, විශාල මුදලක් එකවර ගෙවීමට තරම් ආර්ථික ශක්තියක් නොමැති එම ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) විදුලි ගාස්තු මාසිකව අයකර නොගැනීමට හේතුව කිළිනොච්චිය විදුලිබල මණ්ඩල කාර්යාලයෙහි සේවක පුරප්පාඩු පැවතීමද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගන්නේද;

(iii) හිඟ මුදල් වාරික පදනමින් අය කර ගැනීමට පියවර ගන්නේද;

(iv) ඉදිරියේදී, මාසික පදනමින් අඛණ්ඩව විදුලි ගාස්තු අය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பித்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மாகாணத்தில் மக்கள் மீளக் குடியமர்த்தப் பட்ட பிரதேசங்களில் அமைந்துள்ள வீடுகளுக்கு கடந்த காலத்தில் "வடக்கின் வசந்தம்" நிகழ்ச்சித் திட்டத்தின் கீழ் இலவசமாக மின்சார இணைப்புகள் வழங்கப்பட்டன என்பதையும்;

(ii) பின்னர் மின் கட்டணம் மாதாந்தம் அறவிடப் பட்டுள்ளதென்பதையும்;

(iii) இதற்கேற்ப, கிளிநொச்சி மாவட்டத்தில் மக்கள் மீளக் குடியமர்த்தப்பட்ட பிரதேசங்களிலும் மின் கட்டணம் மாதாந்தம் அறவிடப்பட்டுள்ள தென்பதையும்;

(iv) ஆயினும், கடந்த 6 மாத காலத்தினுள் கிளிநொச்சி மாவட்டத்தில் இக்கட்டணம் அற விடப்படவில்லை என்பதையும்;

(v) மின் கட்டணத்தை மாதாந்தம் அறிவிடாமல் ஒரே தடவையில் பல மாதங்களுக்கான கட்டணத்தை அறவிடுவதனால் பெருந்தொகை யான பணத்தை ஒரே தடவையில் செலுத்து வதற்கான பொருளாதார வலு இல்லாத அம்மக்கள் இன்னலுக்கு உள்ளாகியுள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மின் கட்டணத்தை மாதாந்தம் அறவிடாதிருப் பதற்கான காரணம் கிளிநொச்சி மின்சார சபை அலுவலகத்தில் நிலவும் ஊழியர் வெற்றிடங்களா என்பதையும்;

(ii) ஆமெனில், இவ்வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) நிலுவைத் தொகையை தவணை அடிப்படையில் அறவிடுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) எதிர்வரும் காலத்தில் மாதாந்த அடிப்படையில் இடையறாமல் மின் கட்டணங்களை அறவிடு வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Is he aware that-

(i) free electricity connections were given under the "Uthuru Wasanthaya" programme lately to households located in the areas where people of the North had been resettled;

(ii) thereafter, electricity charges had been recovered monthly;

(iii) accordingly, electricity bills had been charged monthly even in the areas where people of the Kilinochchi District had been resettled;

(iv) nevertheless these bills were not sent during the past six months in the Kilinochchi District; and

(v) these people, who do not have enough financial strength to pay a large sum of money at once, have been perturbed as the payment has been demanded for several months instead of sending electricity bills monthly?

(b) Will he inform this House-

(i) whether the reason for not charging electricity bills monthly is the existence of vacancies at the office of the Ceylon Electricity Board in Kilinochchi

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) if so, whether he will take steps to fill those vacancies;

(iii) whether he will take steps to recover the arrears in bills on instalment basis; and

(iv) whether he will take steps to charge electricity bills on monthly basis continuously in future?

(c) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

අ) i. ඔව්.

ii. ඔව්.

iii. ඔව්.

iv. මානී වාසිප්පාළර්කලින් පත්‍රාක්කුරෙයාල් දූරප් පිරදේසංකලිල් මින්සාරක් කට්ටණප් පට්ටියල් මාදාන්දම් වලංගු කප්පට්ටවිල්ලෙ.

v. ඔව්. එනිනුම්, නිලුවෙත් තොකෙ තවණෙ අටිප්පටෙයිල් සෙලුත්ත, පාතික්කප්පට්ට මක්කළුක්කු අරිවික්කප්පට්ටුල්ළතු.

ආ) i. ඔව්. කිළිනොච්චි ඉ.මි.ස. අලුවලකත්තිල් කාණප්පටුම් මානී වාසිප්පාළර්කලින් වෙට්‍රි ටත්තින් කාරණමාක ඉන්නිලෙ එළුන්තුල්ළතු.

ii. ඔව්. නිලවුම් වෙට්‍රිටත්තෙ නිරප්පුවතර්කාක මානී වාසිප්පාළර්කලින් තේවෙ 2018 ඌලියර් තරවුත් තළත්තිල් උළ්ළටක්කප්පට්ටුල්ළතු.

iii. ඔව්.

iv. ඔව්. වෙට්‍රිටම් නිරප්පප්පට්ටු උටනටියාක මාදාන්ද අටිප්පටෙයිල් මින් කට්ටණංකළෙ අරවිට නටවටික්කෙ එටුක්කප්පට්ටුල්ළතු.

ඇ) පොරුත්තමට්‍රතු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 - 2339/'17 - (1), ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 23 (2) යටතේ පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

හිමිකම් ඔප්පු ලබා දීම සඳහා මැනුම් කටයුතු ඇමෙරිකානු සමාගමකට පවරා දීම
உறுதிகள் வழங்குவதற்காக காணி அளவிடுதலை அமெரிக்கக் கம்பனிக்கு ஒப்படைத்தல்
HANDING OVER THE LAND SURVEY FOR GRANTING TITLE DEEDS TO AN AMERICAN COMPANY

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ හිමිකම් ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ඇමෙරිකානු සමාගමකට පවරා දීම සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර සහ පොදුවේ මහජනතාව අතර මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ලංකාවේ පැරණිතම රාජ්‍ය දෙපාර්තමේන්තු අතරින් එකක් වන මිනින්දෝරු දෙපාර්තමේන්තුව සියවස් ගණනාවක් මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවන්ට අනුව මිනින්දෝරු සේවා සපයමින් තිබෙනවා. කාලීන, කඩිනම් අවශ්‍යතාවලට අනුව කඩිනම් සේවා සපයා ගැනීම වෙනුවෙන් කාලානුරූපව එම ආයතනය මානව, භෞතික සහ තාක්ෂණ වශයෙන් නවීකරණය කිරීමේ අවශ්‍යතාවක්ද පැහැදිලිව පැන නඟිනවා. ඒ වෙනුවෙන් සිදු කළ යුතු රාජ්‍ය ආයෝජනය කිසිසේත් හුදු වැය බරක් නොව, සංවර්ධනාත්මක අර්ථයෙන් දිගු කාලීනව වාසිදායක බව අමුතුවෙන් කිව යුත්තක් නොවෙයි.

එහෙත් ආණ්ඩු විසින් ඒ පිළිබඳ කළ හැකි කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අදාළ වෘත්තිකයන් විසින් ඉදිරිපත් කරන ලද මිනුම්කරණ යෝජනාවලිය ඉවත දමා තිබෙනවා. සැබැවින්ම එම යෝජනාවලිය රුපියල් මිලියන 4,500කින් පමණ ක්‍රියාත්මක කර ගැනීමට හැකියාව තිබූ බව ප්‍රකාශ වනවා. එහෙත් මේ සියල්ල අතහැර ආණ්ඩුව "ට්‍රිම්බල් ඉන්කෝපරේටඩ්" නම් ඇමෙරිකානු සමාගමක් විසින් සිය කැමැත්තෙන් ඉදිරිපත් කර ඇති මිනුම්කරණ හා සිතියම්ගතකරණ යෝජනාවලියක් සඳහා යොමු වී තිබෙනවා. මෙම සමාගමට අදාළ ව්‍යාපෘතිය වසර හතරක කාලයකට පැවරීමට යන්නේ ඩොලර්

මිලියන 154ක් හෙවත් රුපියල් මිලියන 23,870ක් වැනි මුදලකටයි. රුපියල් මිලියන 4,500ක් වැය කරනවා නම් දෙපාර්තමේන්තුවේ නවීකරණ කටයුතු හරහා මෙය කර ගන්න පුළුවන්.

මෙම රහසිගත පැවරීම මඟින් මතු කරනු ලබන අමතර ගැටලු, එම සමාගම විසින් යොදා ගන්නා ලද මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීම වෙනුවෙන් ඉදිරියේදී විනිමය අනුපාතිකය අනුව වාර්ෂිකව ගෙවන්න සිදු වන මුදල අදටද ගණනය කළ නොහැකියි. එසේම ව්‍යාපෘතියට අදාළව මානව සම්පත් සැපයීම, වැටුප්, කාර්යාලයීය ඉඩකඩ, යාන වාහන පහසුකම් ආදී විශාල සැහවුණු වියදම් ප්‍රමාණයක්ද මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පැටවීමට නියමිතව තිබෙනවා. තවත් වැදගත් ගැටලුකාරී තත්ත්වයක් වන්නේ, මෙම මිනුම්කරණය සහ සිතියම්කරණය මඟින් ලබා ගන්නා දත්ත විදේශීය සමාගමක් අතට පත් වීමයි.

මෙය භූදු භූමිය මැනීම පිළිබඳ කරුණක් නොව, එම භූමිය මත ඇති සම්පත්වල ස්වභාවය පිළිබඳ දත්ත විදේශීය සමාගමක් අතට පත් වීමක් වෙනවා. විශේෂයෙන් මෙම සමාගම කෘෂිකර්මය, විදුලි සංදේශනය, උපයෝගීතා සේවා වැනි ක්ෂේත්‍ර ගණනාවක කටයුතු කරන සමාගමක් වීමද සැලකිල්ලට ගත යුතුව තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු ගරු ඇමතිතුමා විසින් ලබා දෙයි කියා බලාපොරොත්තු වෙනවා.

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් යෝජනා කරන ලද ව්‍යාපෘති වාර්තාව මූල්‍යමය සහ දිගු කාලීන වශයෙන් වාසිදායක තත්ත්වයක තිබියදී, එය සලකා නොලබන ලද්දේ ඇයි?
2. ට්‍රිම්බල් ඉන්කෝපරේටඩ් නම් ඇමෙරිකානු සමාගම මෙම ව්‍යාපෘතියට ස්වකැමැත්තෙන් ඉදිරිපත් වන්නේ කෙසේද? ඔවුන්ගේ සම්බන්ධීකරණය කෙසේ සිදුවීද?
3. යෝජිත ව්‍යාපෘතිය ඇතුළත ඇති සැහවුණු වියදම් නිවැරදිව හඳුනා ගනු ලැබ තිබේද? දෙපාර්තමේන්තු වෘත්තිකයන් විසින් පෙන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගනු ලැබ ඇත්ද?
4. මිනුම්කරණය සහ සිතියම්කරණය මඟින් ලබා ගන්නා දත්ත විදේශීය සමාගමක් අතට පත්වීමේ අවදානම හඳුනා ගනු ලැබ තිබේද?
5. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වෘත්තීය සමිති සමඟ සාකච්ඡාවකට ආණ්ඩුව සූදානම්ද?
6. විදේශීය සමාගමක් ලවා මැනුම්කරණ කටයුතු සිදු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

පිළිතුර, ගරු ඇමතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ මේ ප්‍රශ්නය යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මේ යටතේ එතුමා ප්‍රශ්න කිහිපයක්ම නැඟුවා. ඒ සම්බන්ධව පිළිතුරු මෙසේයි:

1. එම යෝජනා සලකා බලා නිර්දේශ වාර්තාවක් ඉදිරිපත් කිරීමට රජයේ මිනින්දෝරු සංගමය, මිනුම්පතිතුමා සහ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය යන සියලු පාර්ශ්ව නියෝජනය කරමින් පසුගිය 19වැනි දින අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා.

   මේ සියලුමදෙනා එක තැනකට ගෙනැල්ලා මගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේදී සාකච්ඡාවක් පවත්වා ඒ සියලුම දෙනාගේ අදහස් අරගෙන වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා කිව්වා. වැඩි කාලයක් ගත්තේ නැතිව දිනපතා සාකච්ඡා කරලා දවස් තුනක් ඇතුළත ඒ වාර්තාව ඉදිරිපත් කරන්න කිව්වා. ඒ අනුව හෙට වනකොට අපට ඒ වාර්තාව ලබා දෙන්න නියමිතව තිබෙනවා. එතකොට ඒ සියලුම දේවල් ඒ වාර්තාවට ඇතුළත් වනවා.

2. මා දන්නා තරමින් පසුගිය රජය කාලයේත් ඔය ට්‍රිම්බල් ඉන්කෝපරේටඩ් සමාගම මේ සඳහා උත්සාහ කරලා තිබෙනවා. "ට්‍රිම්බල් ඉන්කෝපරේටඩ්" කියන සමාගම විසින් ඉහත කරුණට අදාළ යෝජනා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත 2015 ඔක්තෝබර් මාසයේ තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතැනින් තමයි මේ සම්බන්ධයෙන් වූ සාකච්ඡා ආරම්භ වෙලා තිබෙන්නේ.

3. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයට උත්තරය "ඔව්". මේ දෙකම අපි සැලකිල්ලට ගෙන තිබෙනවා. දැන් මේ අලුත් වාර්තාවේ මේ දවස්වල මේ කරුණු සාකච්ඡා වනවා.

   මිනින්දෝරු දෙපාර්තමේන්තුව පැත්තෙනුත් වියදම් යන ඒවා තිබෙනවා. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පැත්තෙන් වියදම් යන ඒවා තිබෙනවා. රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ පැත්තෙන් වියදම් යන ඒවා තිබෙනවා. මේ සියල්ලම වියදම් හැටියට දැකලා සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු වාර්තාවට ඇතුළත් කරනවා.

4. මෙම දත්ත රහසිගත දත්ත වන්නේ නැහැ. කෙසේ වෙතත් මෙම සියලුම දත්ත මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් තමයි කළමනාකරණය කරන්නේ. එසේ නැතිව විදේශ රටවලට අපේ ජාතික ආරක්ෂාවට බලපාන කිසි දේකට මේ තුළින් ඉඩක් සලසන්නේ නැහැ. ඒ සියල්ල කරනවා නම් කරන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවයි.

5. මේ දවස්වල ඒ කටයුතු සිද්ධ වෙනවා. අපි බොහොම හොඳට ඇහුම් කන් දුන්නා; හැමදෙනාගේම අදහස් ලබා ගත්තා. ඊට පස්සේ ඒ ගොල්ලෝ වෘත්තීය ක්‍රියාමාර්ග නතර කළා. දැන් විශ්වාසයක් ඇතිව, දෙගොල්ලන්ම රට ගැන හිතලා කටයුතු කරනවා. ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ඔප්පු ලබා ගන්න බලාගෙන ඉන්නවා. ඒ කටයුතු කරන්න ඕනෑය කියන හැඟීමෙන් දැන් සාකච්ඡා කරනවා. එයට උත්තරය තමයි, මගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා ආරම්භ කර තිබෙනවාය කියන එක.

6. මා පැහැදිලිවම කියන්න ඕනෑ, කිසි ලෙසකින්වත් විදේශීය සමාගමක් ලවා මැනුම් කටයුතු කරන්නේ නැහැයි කියලා. අපට මිනින්දෝරුවෝ ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදී කිව්වා, මිනින්දෝරු දෙපාර්තමේන්තුව ලංකාවේ එක් පැරණි දෙපාර්තමේන්තුවක්ය කියලා. ලංකාවේ පැරණිම දෙපාර්තමේන්තුව තමයි මිනින්දෝරු දෙපාර්තමේන්තුව. දෙපාර්තමේන්තුවල වැඩිමලා තමයි මිනින්දෝරු දෙපාර්තමේන්තුව. ඒ අයගේ සම්පත් තමයි අපි පාවිච්චි කරන්නේ. සියලුම මැනුම් කටයුතු කරන්නේ මිනින්දෝරුවෝ. ඒ අයත් පිළිගන්නවා, ඔබතුමාත් කියා තිබෙනවා, නවීකරණය වෙන්න ඕනෑය, ඒ සඳහා තාක්ෂණය අවශ්‍යයි කියලා. මිනින්දෝරු කටයුතුවලදී අපි දැනටත් පාවිච්චි කරන්නේ විදේශීය තාක්ෂණය තමයි. වැඩිම වුණොත් අපට ගන්න තිබෙන්නේ, තාක්ෂණයයි,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

> උපකරණයි, වාහන වැනි දේවල් තමයි. මැනුම් කටයුතු සියල්ල සිදු වන්නේ මේ අයගේ අතින්. [බාධා කිරීමක්] ඒ කොම්පැනියෙන් තමයි යටිතල පහසුකම් සපයා ගන්නේ. ඒ ගැනත් අවසන් තීරණයක් නැහැ නේ. මේ සාකච්ඡාවෙන් පසුව, "මෙහෙම කරමු"යි කියලා ඒ ගොල්ලන් සහතික වෙනවා නම්, අපට එහෙම කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් අවස්ථාවකයි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමනි, විනාඩියකින්-දෙකකින් මා තවදුරටත් පැහැදිලි කරන්නම්. ශ්‍රී ලංකාවේ ඉඩම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම අප අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වෙලා තිබෙනවා. රජයේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් ලෙස ඉදිරිපත් කරන ලද ඉඩම් නොමැති ජනතාවට හා දැනටමත් රජයේ ඉඩම්වල පදිංචි, එහෙත් ඔප්පු නොමැති ජනතාව සඳහා ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම අපේ වගකීම වෙලා තිබෙනවා. පසුගිය සියලුම රජයන් විසිනුත් මේ සඳහා විවිධ උත්සාහයන් දරා ඇතත්, මෙතෙක් අදාළ ඉලක්ක කරා ළඟා වීමට අපොහොසත් වී තිබෙන බව ඔබතුමාත් දන්නවා. රජය බලාපොරොත්තු වන මෙම කාර්ය භාරය ඉටු කර ගැනීමට පවතින ක්‍රමවේද ප්‍රමාණවත් නොවන බැවින් මේ සඳහා විශේෂ ක්‍රමවේදයන් යොදා ගන්න ඕනෑ. ඒ කියන්නේ, අවශ්‍ය භෞතික හා තාක්ෂණික වශයෙන් නවීකරණය වීම අවශ්‍යව තිබෙනවා. දේශීය දැනුමට ප්‍රමුඛතාව දෙමින් සුදුසු තාක්ෂණය යොදා ගනිමින් මෙම කාර්ය භාරය කිරීම ඉතාමත් අවශ්‍ය කාරණයක් බවයි අපේ විශ්වාසය. ඒ වාගේම පොදුවේ ගත්තාම මුළු රටම බලාගෙන ඉන්නවා, ඇත්ත වශයෙන්ම නිරවුල් ඉඩම් ඔප්පුවක් ගන්න.

අපි දන්නවා, නිරවුල් ඉඩම් ඔප්පු ලබා ගන්න ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ඉන්නවාය කියලා. සමහරු මේ ගැනම හිත-හිතා ඉඳලා මැරිලා යනවා. ඉඩම් නිරවුල් නැති නිසා ඉඩම් ප්‍රශ්න, ගැටලු, පවුල් ආරවුල් මෙතැනින් තමයි පටන් ගන්නේ. ඒ නිසා ඒ පිළිබඳව සාකච්ඡා කරලා, මිනින්දෝරුවන්ගේත් සහාය ලබාගෙන, රටට අයහපතක් නොවන විධියට ඉදිරි අවුරුදු 2 ඇතුළත කෙසේ හෝ මේ වැඩ කටයුත්ත කරන්න තමයි අපි කටයුතු කරන්නේ.

මුදල් පැත්ත විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට තමයි අධ්‍යයනය කරන්න භාර දීලා තිබෙන්නේ. කැබිනට් එක අනුමැතිය දුන්නේ pilot project එකක් කරලා කැබිනට් එකට වාර්තා කරන්න කියලායි. කිසි ලෙසකින්වත් රටට අයහපතක් වෙන දෙයක් මෙතැන සිද්ධ වෙන්නේ නැහැ. වෘත්තීය සමිතිත් සමහර වෙලාවට කියනවා, "මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඇමෙරිකානු සමාගමකට දෙන්න යනවා"ය කියලා. ඒක දේශපාලන වශයෙන් ටිකක් ලස්සන වචනයක් වුණාට, කිසි ලෙසකින්වත් එහි සත්‍යතාවක් නැහැ.

ඉන්දියාවෙන් 1990 ගිලන්රථ ගෙන්වන කොටත් ඔය වාගේනේ; "ඉන්දියාව අත දමනවා. Indian driversලා එනවා" කියලා නොයෙක් ඒවා කිව්වා නේ; බිල්ලෝ මැව්වා නේ. ඒ වාගේ මේ කථාවත් නිකම් බිල්ලෝ මවන කථාවක් විතරයි. කිසි ලෙසකින්වත් විදේශීය සමාගමකට මැනුම් කටයුතු දෙන්නේ නැහැ. ලංකාවේ මිනින්දෝරුවන් විසිනුයි මැනුම් කටයුතු කරන්නේ. තාක්ෂණය සහ වාහන වාගේ ඒවා අරගෙන, කොයි විධියකින් හරි ඉදිරි අවුරුදු දෙක ඇතුළත ලක්ෂ ගණනකගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න ඔබතුමාත් සහයෝගය දෙන්න. දැන් වෘත්තීය සමිතියත් ලැහැස්තියි; අමාත්‍යාංශයත් ලැහැස්තියි. අපි ඔක්කෝම දේශීය මිනිස්සු; ජාතික හැඟීම් තිබෙන මිනිස්සු. ඒ නිසා භය වෙන්න එපා. සාකච්ඡාවට අනුව මේ කටයුත්ත කෙරෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් වාර්තාවක් සකස් වෙමින් තිබෙනවා; හෙට අවසන් දිනය කියලා මෙතුමා කිව්වා. ඒක පාර්ලිමේන්තුවටත් සභාගත කරන්න කියලා ඉල්ලනවා. ඒක එක කාරණයක්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කොහොම හරි වැඩේ කරගෙන ඉවර වෙලා කර ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊළඟට මීට අමතරව තවත් කාරණයක් කියන්න තිබෙනවා, ගරු කථානායකතුමනි. මම ඊයේ 23 (2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා කෘෂි රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාගේ පත්වීම පිළිබඳව. ඒ වෙලාවේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා හිටියා. අද පිළිතුර ලබා දෙන බව එතුමා කිව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මතක හැටියට අද නොවෙයි, ඊළඟ වාරයේ කියලායි කිව්වේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. ඒ කිව්වේ අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රශ්නයටයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙමද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව් ගරු කථානායකතුමනි. ප්‍රශ්න දෙකක් තිබුණා. මම ජනවාරි මාසයේ 23වැනි දා ප්‍රශ්නයක් ඇහුවා, ඊඒපී ආයතනයේ මූල්‍ය ගනු දෙනුව පිළිබඳව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නයට පිළිතුර ලබන සතියේ ලබා දෙනවා කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අඩුම තරමින් ගනු දෙනුව අවසන් වෙන්න කලින් හරි මේ පාර්ලිමේන්තුවට පිළිතුරක් දෙන්න ඕනෑ.

දැන් අපට තිබෙන ආරංචි අනුව මැලේසියානු සමාගමක් වෙත මෙම ආයතනය පවරන්න සූදානම් කරමින් තිබෙනවා.

විශේෂයෙන්ම මාධ්‍ය ආයතනයක් විදේශීය සමාගමක් සතුවීම බරපතළ ගැටලුවක් හැටියට තිබෙනවා. ඒ නිසා මෙම ගනු දෙනුව සිදු වෙන්න පෙර තමයි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නය අහන්නේ. ගනු දෙනුව වුණාට පස්සේ ඇවිල්ලා මේ සභාවේ පශ්චාත් මරණ පරීක්ෂණ කථාවක් කරලා වැඩක් නැහැ. ප්‍රශ්නය අහලා දැන් මාස දෙකකට වඩා වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. අග්‍රාමාත්‍යවරයා අද උදේ පාර්ලිමේන්තුවේ ඉන්නවා මම දැක්කා. එතුමාට මේ දවස්වල වෙන වෙන කලබල ගොඩාක් ඇති. කෙසේ වුවත්, තවමත් අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඔහු යටතේ තමයි තවමත් මහ බැංකුව තිබෙන්නේ. ඒ නිසා, වගකීමෙන් යුතුව ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට පිළිතුරු ලබා දිය යුතුයි.

ඊළඟට, කෘෂි රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා පිළිබඳව ඊයේ ඇසූ ප්‍රශ්නයට වසන්ත අලුවිහාරේ නියෝජ්‍ය අමාත්‍යවරයා කිව්වා අද පිළිතුරක් ලබා දෙනවාය කියලා. ගරු කථානායකතුමනි, නමුත් තවමත් පිළිතුරක් ලබා දීලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමා ඒ ප්‍රශ්න දෙකටම අවශ්‍ය විධියට අවධානය යොමු කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා හොඳ විනිවිද පෙනෙන පිළිතුරක් දුන්නා. හොඳයි.

මීළඟට, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග අනුමත කිරීම සහ විෂය අංක 2 - බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත: නියෝග
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT: REGULATIONS

[11.13 a.m.]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Hon. Speaker, on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine, I move,

"That the Regulations made by the Minister of Health, Nutrition and Indigenous Medicine under Section 142 read with Section 118 of the National Medicines Regulatory Authority Act, No. 5 of 2015 relating to National Medicines Regulatory Authority (Ceiling on Prices) Regulations No. 2 of 2016 and published in the Gazette Extraordinary No. 2049/31 of 14th December 2017, which were presented on 23.01.2018, be approved."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න ඇමතිතුමා

[පූ.භා. 11.14]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, අද දින අපි සාකච්ඡා කරන්නේ මේ රටේ ඖෂධවල මිල ප්‍රතිපත්තිය පිළිබඳවයි. ඔබතුමා ඒ පිළිබඳව හොඳින් දන්නවා. අපේ දින සියයේ වැඩසටහන යටතේ 2015 මාර්තු මාසයේ 19වැනි දා මුලින්ම මේ රටේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත අපි මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ ප්‍රතිපත්තිය අපට ක්‍රියාත්මක කරන්න සිදු වුණේ අවුරුදු 45කට පසුවයි. හැම අවුරුද්දේම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පවත්වන මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ අනුස්මරණ රැස්වීමට හැම සෞඛ්‍ය ඇමතිවරයාම ගිහිල්ලා මේ ප්‍රතිපත්තිය හොඳයි කිව්වාට, අපට මේ ප්‍රතිපත්තිය ගේන්න අවුරුදු 45ක් ගියා. 2015 මාර්තු 19වැනි දා මුළු පාර්ලිමේන්තුවම ඒකමතිකව මේ පනත් කෙටුම්පත සම්මත කළා. ඒ අනුව 2016 ඔක්තෝබර් මාසයේ 21වැනි දා මේ රටේ අත්‍යවශ්‍ය ඖෂධ 48ක් ගණනය කරලා මම ගැසට් නිවේදනයක් නිකුත් කළා. මහාචාර්ය බිබිලේ මහත්මයාගේ ලැයිස්තුවත්, ඊට පසුව අලුතින් එකතු වුණු ඖෂධ කිහිපයකුත් අඩංගු කරලා, අත්‍යවශ්‍ය ඖෂධ 48කත් - ඒ කියන්නේ ඖෂධ නාමයෙන් 48යි,- වෙළෙඳ නාමයෙන් 402ක මිල නියාමනය කළා. අපි මේක යාවත්කාලීන කරන්න අවශ්‍යයි. අපි මිල සීමාවක් කළාම වරින් වර ඒ මිල සීමා කිරීම සංශෝධනය කිරීමට අනිවාර්යයෙන්ම සිදු වෙනවා. ඒක බස් ගාස්තුවලටත් එකයි; අනෙක් අත්‍යවශ්‍ය ඖෂධවලටත් එකයි; කිරිපිටි මිලටත් එකයි; හැම එකටම එකයි. ඉන්දියාව මේ ඖෂධ ප්‍රතිපත්තිය ගේන කොට මේ වාගේම ඖෂධ නියාමනයක් කර තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය තමයි අපි උපයෝගී කර ගත්තේ. ඒ අනුව ඉන්දියාව කරන්නේ කොහොමද කියලා අපි බැලුවා. ඉන්දියාව ඒ ඖෂධ සමාගම්වලට සියයට 10ක් වැඩි කර ගන්න අවසර දෙනවා. ඒ ඉල්ලීම තමයි ඖෂධ සමාගම්වලිනුත් අන්තිම වන කොට කළේ. නමුත් අපි ඒකට එකඟ වුණේ නැහැ. අපි කිව්වේ මෙවර සියයට 5ක් වැඩි කරන්න අපි එකඟ වෙන්නම්, ඊට පස්සේ වාර්ෂිකව ඖෂධවලට සියයට 5ක වැඩිවීමකට අපි එකඟ වෙන්නම් කියලායි.

මම මෙය සංසන්දනය කර පෙන්වන්නම්. මෙයට ඇතුළත් වෙනවා, දියවැඩියාව, හෘද රෝග, වේදනා නාශක, gastritisවලට ගන්නා ඖෂධ, antibiotics, ඇදුම වාගේ ප්‍රධාන රෝගවලට ගන්නා බෙහෙත්. අපේ මිල පාලනය අනුව රුපියල් 10ක් වුණු දියවැඩියාවට ගන්නා Metformin පෙත්ත රුපියල් 6.05කින් අඩුවෙලා රුපියල් 3.95ක් වුණා. දැන් ඒක සත 20කින් වැඩි වෙලා රුපියල් 4.15ක් වෙලා තිබෙනවා. රුපියල් 6.05කින් අඩු වුණා;

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සත 20කින් වැඩි වෙලා තිබෙනවා. එච්චරයි වෙනස. රුපියල් 19ට තිබුණු Gliclazide 80mg පෙත්ත, රුපියල් 11.30ට අඩු වුණා. ඒ පෙත්තක් රුපියල් 7.70කින් අඩු වුණා. අද ඒක සත 57කින් වැඩි වෙලා තිබෙනවා. හෘදය රෝගවලට ගන්නා Losartan ඒ කියන්නේ Cozaar පෙත්ත රුපියල් 81ට තිබුණා. ඒක රුපියල් 10.30ට අඩු වුණා. ඒ කියන්නේ, අටෙන් එකකට විතර අඩු වුණා. අද ඒක වැඩි වෙලා තිබෙනවා, සත 52කින්. Atorvastatin කියන බෙහෙත රුපියල් 215ටයි තිබුණේ. රුපියල් 17.60ට අඩු වුණා. ඒ බෙහෙත 10 ගුණයකින් නොවෙයි, 20 ගුණයකින් විතර අඩු වුණා. අද සත 88කින් වැඩි වෙලා තිබෙනවා. Rosuvastatin කියන බෙහෙත රුපියල් 150ට තිබුණා. රුපියල් 37ට අඩු වුණා. දැන් ඒක රුපියල් 1.85කින් වැඩි වෙලා තිබෙනවා. Aspirin පෙත්ත රුපියල් 21ට තිබුණා; රුපියල් 5.30ට අඩු කළා. දැන් සත 28ක් වැඩි වෙලා තිබෙනවා. Clopidogrel කියන බෙහෙත රුපියල් 34ට තිබුණේ. ඒක රුපියල් 17.50ට අඩු වුණා. දැන් සත 88කින් වැඩි වෙලා තිබෙනවා. Diclofenac Sodium -අපි හැමෝම දන්න Voltaren - රුපියල් 40ට තිබුණා. දැන් රුපියල් 13යි. රුපියල් 27කින් අඩු වුණා. ඒක දැන් වැඩි වෙලා තිබෙන්නේ සත 65කින්. Diclofenac Potassium රුපියල් 37ට තිබුණා. ඒක රුපියල් 26.05කින් අඩු වෙලා රුපියල් 10.95ට තිබුණා. ඒක දැන් සත 55කින් වැඩි වෙලා තිබෙනවා.

රුපියල් 17ට තිබුණු Ibuprofen හෙවත් Brufen රුපියල් 3.70ට අඩු කළා. ඒක දැන් සත 19කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් 28.85ට තිබුණු Omeprazole කියන gastricවලට ගන්න බෙහෙත දැන් රුපියල් 4.50යි. රුපියල් 28.85 බෙහෙත රුපියල් 24.35කින් අඩු වුණා. ඒක දැන් සත 23කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් 101ට තිබුණු Omeprazole 20mg - Nexium කියන බෙහෙත- රුපියල් 20.20ට අඩු වුණා. ඒ කියන්නේ, රුපියල් 80ක වාගේ ගණනකින් අඩු වුණා. දැන් රුපියලයි, සත 20කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් 141ට තිබුණු ඒ මිලිග්‍රෑම් 40 බෙහෙත රුපියල් 38.40ට අඩු වුණා, රුපියල් 102කින්. ඒක දැන් 1.92කින් වැඩි වෙලා තිබෙනවා. Domperidone කියන බෙහෙත රුපියල් 18ට තිබිලා රුපියල් 5.40ට අඩු වුණා. දැන් ඒක වැඩි වෙලා තිබෙන්නේ සත 28කින්. Co-amoxiclav 1.2 injection එක රුපියල් 1,068ට තිබුණේ. දැන් රුපියල් 631යි. ඒක රුපියල් 437කින් අඩු වුණා. Azithromycin රුපියල් 71ට තිබුණේ. රුපියල් 37.60ට අඩු වුණා. දැන් 1.82කින් වැඩි වෙලා තිබෙනවා.

Azithromycin තිබුණේ රුපියල් 111.83ට. එය රුපියල් 52.75ට අඩු වුණා. දැන් එය රුපියල් 8.65කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් 52කින් අඩු වූ එක රුපියල් 8.65කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් 72ට තිබුණු Cefuroxime රුපියල් 45.50ට අඩු වුණා. එහි මිල රුපියල් 26.50කින් අඩු වුණා. දැන් එය රුපියල් 2.28කින් වැඩි වෙලා තිබෙනවා. Aciclovir තිබුණේ රුපියල් 156ට. දැන් එය රුපියල් 37යි. රුපියල් 119කින් අඩු කළා. එය රුපියල් 1.85කින් වැඩි වෙලා තිබෙනවා. Salbutamol inhaler එක -Ventolin කියන එක- රුපියල් 580ටයි තිබුණේ. දැන් එය රුපියල් 310යි. රුපියල් 270ක් අඩු කර තිබෙනවා. එය රුපියල් 15.50කින් වැඩි වෙලා තිබෙනවා. Atenolol 50mg රුපියල් 27.90ටයි තිබුණේ. දැන් එය රුපියල් 4.40යි. එය ශත 22කින් වැඩි වෙලා තිබෙනවා. Atenolol 100mg රුපියල් 62ටයි තිබුණේ. දැන් රුපියල් 13යි. එය ශත 65කින් වැඩි වෙලා තිබෙනවා. Alendronic acid රුපියල් 3,179.23ට තිබුණේ. එය රුපියල් 405.60ට අඩු වුණා. එය රුපියල් 2,713.63කින් අඩු කර තිබෙනවා. Ciprofloxacin 500mg කියන බෙහෙත තිබුණේ රුපියල් 62ට. දැන් එය රුපියල් 8.50යි. එය ශත 43කින් වැඩි වනවා. Diltiazem 30mg රුපියල් 8.89ටයි තිබුණේ. දැන් එය රුපියල් 2.70යි. එය ශත 14කින් වැඩි වෙලා තිබෙනවා. Risperidone 2mg රුපියල් 25.48ටයි තිබුණේ. දැන් එය රුපියල් 9.25යි. එය ශත 48කින් වැඩි වෙලා තිබෙනවා. Clarithromycin 500mg antibiotic එක රුපියල් 235ටයි තිබුණේ. දැන් එය රුපියල් 74යි. රුපියල් 161කින් අඩු වෙලා තිබෙනවා. දැන් එය රුපියල් 3.70කින් වැඩි වෙලා තිබෙනවා. Azithromycin 500mg රුපියල් 111.83ක් ලෙස තිබුණා. දැන් එය රුපියල් 52.75යි. එය රුපියල් 3.69කින් වැඩි වෙලා තිබෙනවා. Azithromycin 500 ml solution එක තිබුණේ රුපියල් 536.75ට. දැන් එය රුපියල් 175යි. එය රුපියල් 361.5කින් අඩු වුණා. දැන් එය රුපියල් 8.75කින් වැඩි වෙලා තිබෙනවා.

මෙන්න මේ විධියට තමයි මේ මිල අනුපාතය අද වෙනස් වෙලා තිබෙන්නේ. මා බොහෝ ඖෂධ ගැන දැන් කිව්වා.

ගරු කථානායකතුමනි, මේ මිල සූත්‍රය බොහොම අගයනවා. අපි අනුගමනය කළේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මිල සූත්‍රය. "WHO Guideline on Country Pharmaceutical Pricing Policies" කියන report එකේ "Application of cost-plus pricing formulae for pharmaceutical price setting" යටතේ මෙසේ සඳහන් වෙනවා:

* Countries generally should not use cost-plus as an overall pharmaceutical pricing policy.
* Countries using a cost-plus method as an overall policy that wish to change their strategy should consider replacing or complementing the cost-plus approach with other policies, including those covered in this guideline"

ඒ කියන්නේ, සියයට ප්‍රමාණයකින් මිල අඩු කරන්න ගියොත් බොරු මිලක් ප්‍රදර්ශනය කරලා ඒ අය මේ සහන නැති කරනවා කියන එකයි.

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියා කලාපයේ 2016 වාර්තාවේ - Report of the Work of WHO in the South-East Asia Region - පැහැදිලිව වාර්තා කරලා තිබෙනවා. මේ මිල අඩු කිරීම ගැන ඒ වාර්තාවේ මේ විධියට කියනවා:

> "Consequently, the Government of Sri Lanka issued a notice by an extraordinary decree ("gazette") on 21 October 2016 that set a ceiling on retail prices for 48 medicinal products considered essential in treating NCDs -Non-Communicable Diseases- and other common ailments, based on a pricing formula. The revised pricing policy protects patients' rights to access affordable medicines in Sri Lanka."

ඒ විධියට අපට බොහොම ප්‍රශංසා කර තිබෙනවා, මේ මිල සූත්‍රය පිළිබඳව. ඒ විතරක් නොවෙයි. එතුමන්ලාගේ වාර්තාවේ 42වන පිටුවේ ශ්‍රී ලංකාව ගැන මෙසේ සඳහන් කර තිබෙනවා:

> "WHO support provided valuable insights to the NMRA and other key stakeholders on the inappropriateness of the CIF based on the pricing formula."

තවදුරටත් මේ විධියට සඳහන් වෙනවා:

> "..As a result, the Government of Sri Lanka issued a notice by an Extraordinary ....."

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. ඖෂධ මිලත් එක්කම අපි අඩු කළා, අක්ෂි කාච මිල. මම කියන්නම්, කොයි විධියටද අක්ෂි කාච මිල අඩු වුණේ කියලා. Bausch and Lomb කියන ඇමෙරිකානු අක්ෂි කාචයක පෙර පැවැති මිල රුපියල්

25,900යි. අද එහි මිල රුපියල් 16,673යි. රුපියල් 9,228කින් අපි ඒ මිල අඩු කරලා තිබෙනවා. Alcon ඇමෙරිකානු අක්ෂි කාචයක කලින් මිල වුණේ රුපියල් 25,900යි. අද ඒක රුපියල් 16,088යි. අද ඒ මිල රුපියල් 9,813කින් අඩුයි. Abbott ඇමෙරිකානු අක්ෂි කාචයේ පෙර පැවැති මිල රුපියල් 28,100යි. අද මිල රුපියල් 15,941යි. රුපියල් 12,159කින් ඒ මිල අඩු කරලා තිබෙනවා. Abbott Medical Optics ඇමෙරිකානු අක්ෂි කාචයක පෙර පැවැති මිල රුපියල් 25,000යි. ඒක රුපියල් 15,288කට අඩු කරලා තිබෙනවා. අද ඒ කාචයක් රුපියල් 9,712කින් අඩු වෙලා තිබෙනවා. Hoya සිංගප්පූරු අක්ෂි කාචයක කලින් මිල රුපියල් 25,000යි. අද ඒ මිල රුපියල් 10,608යි. රුපියල් 14,392කින් අඩු කරලා තිබෙනවා. NIDEK ජපාන අක්ෂි කාචයක පෙර පැවැති මිල රුපියල් 25,900යි. අද එය රුපියල් 9,984යි. රුපියල් 15,916කින් ඒ මිල අඩු කරලා තිබෙනවා. Alfa ඉතාලි අක්ෂි කාචයේ කලින් මිල රුපියල් 18,800යි. අද රුපියල් 11,000කින් ඒ මිල අඩු කරලා තිබෙනවා. Hanita ඊශ්‍රායල් අක්ෂි කාචය තිබුණේ රුපියල් 26,000ට. අද එය රුපියල් 8,580යි. රුපියල් 17,420කින් ඒ මිල අඩු වෙලා තිබෙනවා.

Aurolab - India අක්ෂි කාචය තිබුණේ රුපියල් 12,500කට. අද ඒක රුපියල් 4,875යි. ඒ අනුව, රුපියල් 7,625කින් මිල අඩු කරලා තිබෙනවා. අපි මේ විධියට මිල අඩු කළේ ලංකාවේ sale price එක විධියට නොවෙයි. මේ විධියට අපි ඉතාමත්ම විශාල අගයකින් මිල අඩු කළා. ඒ වාගේම අපි stentsවල මිලත් අඩු කළා. හෘදය වස්තුවේ හිරවීම් තිබෙන කොට එම blocks නැති කරන්න stents දානවා.

ගරු කථානායකතුමනි, ඒ දවස්වල Cardiology Unit එක ඉස්සරහා market එකක් වගෙයි තිබුණේ. Stents අළෙවි කරන companiesවල කට්ටිය ඇවිල්ලා bags උස්සගෙන ඉන්නවා. රෝගියා එළියට එනකොටම prescription එක බලලා මිල ගණන් කියනවා. මිල ගණන් ඇහුවාම ඒ මිනිහාට ආපහු පපුවේ අමාරුව හැදෙනවා. රුපියල් ලක්ෂ දෙකහමාරයි, ලක්ෂ තුනයි, ලක්ෂ තුනහමාරයි. එයින් තුනක් දාන්න කිව්වොත් රුපියල් මිලියනයක් ඉවරයි. අපේ රටේ දුප්පත් මිනිස්සුන්ට මොන මිලියනද?

එම මිල ගණන්වල ඇති වුණු වෙනස මම දැන් සංඛ්‍යා ලේඛනවලින් පෙන්වන්නම්. එදා Cardiology Unit එකේ cardiac stents දැම්මේ මාසයකට 50යි, 60යි අතර සංඛ්‍යාවක්. අද කීයක් දානවාද? අද 450යි - 500යි අතර සංඛ්‍යාවක් දානවා. මොකක්ද ඒකේ වෙනස? එදා සල්ලි තිබුණු මිනිස්සු 50ක, 60ක පිරිසක් තමයි stents දැම්මේ. ශල්‍යකර්මය නොමිලයේ, stent එකට මුදල් ගෙව්වා. අද 450ක් - 500ක් අතර පිරිසකට stents දානවා. Stents දමන සංඛ්‍යාව 450කින් වැඩි වුණේ කොහොමද? ඒ කට්ටියට එදා සිදු වුණේ කුමක්ද? අද cardiologistsලා survey එකක් කළා. මේ විධියමයි. ඒ වාගේම මෑතකදී Tenecteplase කියලා තවත් ඖෂධයක් ලෝකයේ නිෂ්පාදනය කළා. Myocardial infarction කියන heart attack එක හැදුණාම මිනිස්සු මිය යනවා. නමුත්, රෝගියකු රෝහලට ගෙනැවිත් පැය දෙකක් ඇතුළත මේ බෙහෙත ශරීරගත කළොත් -එන්නත් කළොත්- ඔහුගේ ජීවිතය ආරක්ෂා වෙනවා, මිය යන්නේ නැහැ.

මම හෘදය රෝග විශේෂඥ වෛද්‍යවරු එක්කත් කථා කරලා, එම ඖෂධය ගෙන්වන සමාගම් ගෙන්වලා ඒ ගොල්ලන්ගෙන් ගණන ඇහුවාම කිව්වා, රුපියල් 125,000යි කියලා. මම කිව්වා, ඔය ගණන් කථා කරන්න එපා, කෙරෙන්නේ නැහැ කියලා. මම 10,000කට වඩා ගන්නවා, හරි මිලක් දෙන්න කිව්වා. එතකොට ඒ අය රුපියල් 65,000ක් දක්වා අඩු කළා. මෙවර ටෙන්ඩරයේදී එය රුපියල් 55,000ක් දක්වා අඩු කළා. ලංකාවේ තිබෙන සියලුම රෝහල්වලට ECG machines දාලා දැන් අපි මෙම ඖෂධය නිකුත් කරලා තිබෙනවා. ඉදිරියේ දී ග්‍රාමීය රෝහල්වලටත් ලබා දෙනවා. අද නොමිලේ stents සහ Tenecteplase ඖෂධය ලබා දීම තුළ survey එකක් කරලා තිබෙනවා. වෙනදා හෘදය රෝගීන් 6දෙනෙක් රෝහලට ගෙනාවාම එයින් 5දෙනෙක් මිය ගියා. අද 6දෙනෙක් රෝහලට ගෙනාවාම මිය යන්නේ එක්කෙනයි. ඒ කියන්නේ හැම 5දෙනෙකුගෙන් 4දෙනෙකුගේම ජීවිත බේරෙනවා. මේක තමයි තිබෙන වාර්තාව.

අක්ෂි කාච ගැන කථා කළොත්, අවුරුද්දකට අක්ෂි කාච කොපමණ ප්‍රමාණයක් ඕනෑද කියලා මම ඇහුවා. 89,000ක් අවශ්‍යයි කිව්වා. නමුත්, අද අක්ෂි කාච 150,000ක් අවශ්‍යයි. 150,000කටත් වඩා වැඩියෙන් කරන්න පුළුවන්, සවස 4.00න් පසුව වැඩ කරන්න වෛද්‍යවරු ලැහැස්ති නම්. සවස 4.00න් පස්සේ වැඩ කරන්න පුළුවන් ද කියන එක ගැන මම තවමත් වෛද්‍යවරු එක්ක සාකච්ඡා කරගෙන යනවා. ඔවුන් එක එක හේතු කියනවා. සවස 4.00න් පසුවත් නැවතිලා වැඩ කරන්න එම වෛද්‍යවරු එකඟතාව පළ කරනවා නම්, මම ඔවුන්ටත් සල්ලිත් ගෙවලා, කාර්ය මණ්ඩලයටත් සල්ලි ගෙවලා, අක්ෂි කාවත් ලබා දෙන්න ලැහැස්තියි. මොකද, මේ අක්ෂි කාව නොදුන්නොත් මිලියනයයි දශම දෙකක් මිනිස්සු අවුරුද්දකට අන්ධ වෙනවා. එතකොට මෙතෙක් කල් අක්ෂි කාව නොලැබුණු හැම මිනිහාටම මොකද වුණේ? අන්ධභාවයට පත් වුණා. ඒක තමයි මේ සංඛ්‍යා ලේඛනයෙන් පෙන්වන්නේ. වෙන මොකක්වත් නෙවෙයි. ඒ, අන්ධභාවය අද අඩු වේගෙන යනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, UNICEF ආයතනය, මේ ඔක්කෝම කියන්නේ මොකක්ද? ඒ ගොල්ලන් මේ පිළිබඳව කරන වාර්තා මම පසුව ඉදිරිපත් කරන්නම්. Hon. (Dr.) Nalinda Jayathissa දන්නවා, British Medical Journal එක ගැන. ඒකේ මේ සැරේ කතෘ වාක්‍ය ගැනයි මම මේ කියන්නේ. මේ තිබෙන්නේ, 2018 මාර්තු මාසයේ BMJ එකේ editorial එක. මොකක්ද ඒ ගොල්ලන් මේ පිළිබඳව කියන්නේ?

> "Thus, we should applaud the decision of Sri Lanka Ministry of Health, taken after the survey, to provide cardiac stents to hospitals with PCI facilities and to include troponin testing as a routine examination in state sector hospitals. It is also laudable the recent introduction of state-operated ambulance services in some parts of Sri Lanka, which could lead to the reduction of the total ischaemic time, with further reduction of STEMI in-hospital mortality."

මේ, British Medical Journal එක අද ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කරන ප්‍රකාශයයි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කෝටි 7ක ඖෂධ කල් ඉකුත් වෙලා තිබෙනවා කියලා COPE වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා මම දැක්කා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කථා කරන්න, ගරු ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රෝහල්වලට හිඟයක් නැතිව ඖෂධ ලබා දීමේ වැඩ පිළිවෙළ ගෙනයන වෙලාවේ දී මම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයාට කථා කරලා කිව්වා, රෝහල්වල ඖෂධ හිඟයි, ඒ නිසා 2014 දෙසැම්බර් 31වැනි දා වන විට කල් ඉකුත් වූ ඖෂධවල ප්‍රමාණය කොපමණද කියලා ගණනය කරන්න කියලා. එතුමා මට ගණනය කරලා දුන්නු ආකාරයට අවුරුද්දකට රුපියල් මිලියන 350ක ඖෂධ කල් ඉකුත් වෙනවා. දැන් ඒ ප්‍රමාණය රුපියල් මිලියන 70ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එයින් පහෙන් එකකට අඩු වෙලා තිබෙනවා. මම කියන්නේ නැහැ, රුපියල් මිලියන 70ක් කියන්නේ පොඩි ගාණක් කියලා. මම අද උදේ මේ ප්‍රවෘත්තිය දැකලා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් විස්තර ඇහුවා. එතුමා කිව්වා, "අද කිසිම හිඟයක් නැතිව සියලුම රෝහල්වලට අපි ඖෂධ බෙදා හරිනවා. සමහර වෙලාවට අපි local purchase ගන්නවා. Local purchase ගැනීමේදී අපට අවුරුදු දෙකේ කල් ඉකුත් වීමේ සහතිකය ගන්න බැරි වෙනවා. මොකද, ඒගොල්ලන් ලංකාවේ වෙළෙඳ පොළට ගෙනාපු තොගවලින් තමයි දෙන්නේ. නමුත් ඒකේ එක කොන්දේසියක් තිබෙනවා. ඒවා අවුරුදු දෙකකට කලින් කල් ඉකුත්වෙලා ඉතුරු වුණොත් ඒ සඳහා ඔවුන් අපට නැවත ඖෂධ ලබා දෙනවා" කියලා. ඒ කැල්ල නැතිව තමයි COPE වාර්තාව එන්නේ. මම ඇහුවා, ඕගොල්ලන් ඒ ගැන සඳහන් කළේ නැද්ද කියලා. ඒ අය කිව්වා, COPE එකෙන් අප්‍රේල් මාසයේ දිනයක් දීලා තිබෙනවා කියලා, මේ පිළිබඳව කරුණු දක්වන්න. Local purchaseවලින් අපට කොපමණ නැවත ලබා දීලා තිබෙනවාද කියන එක ගැන එදාට අපි කරුණු දක්වනවා කියලා කිව්වා. හැම local purchase එකකම යම්කිසි ඖෂධයක් අදාළ period එකට පෙර කල් ඉකුත් වුණොත් ඔවුන් බැඳී ඉන්නවා; ගිවිසුම්ගත වෙලා ඉන්නවා, එම ඖෂධ ප්‍රමාණය නැවත ලබා දෙන්න. ඒ නිසා මේ රුපියල් මිලියන 70ක ඖෂධ කල් ඉකුත් වෙලා කියලා කිව්වාට, ඒක නිවැරදිම ගණන නොවෙයි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා නිර්මාණය කළේ මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා, මේ රටට ඖෂධ ගෙනෙන්න. එදා තිබුණු තත්ත්වය අනුව අද ඒක කොපමණ හොඳ තත්වයක තිබෙනවාද? අද ඒවා ගැන පත්තරවල පළ වන්නේ නැහැ. අද පත්තරවල පළ වෙන්නේ රුපියල් මිලියන 70ක් ගැන විතරයි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ආදායම කීයද, ලාභය කීයද? 2014 දී මෙහි ලාභය තිබුණේ රුපියල් මිලියන 742යි. 2015දී අපි භාර ගත්තාට පසුව අවුරුද්ද අන්තිම වන විට එහි ලාභය වැඩි වුණා, රුපියල් මිලියන 1,230කට. 2016දී ලාභය වැඩි වුණා රුපියල් මිලියන 1,940කට. ඒ අනුව ඔවුන්ගේ වැටුප සියයට 70කින් වැඩි කරන්න කියලා මම ඉල්ලුවා. අන්තිමට භාණ්ඩාගාරය එකඟ වෙලා සියයට 50කට වැඩි ප්‍රමාණයකින් ඔවුන්ගේ මූලික වැටුප වැඩි කළා. මේකේ තමයි කර තිබෙන වැඩිම වැටුප් වැඩිවීම.

මම ඖෂධ මිල අඩු කළ වෙලාවේ එක පුවත් පතකවත් ඒක headline එකක් විධියට දැම්මේ නැහැ. එක පුවත් පතක්වත් headline එක යටතේ එය වාර්තා කළේ නැහැ. සමහර පුවත් පත්වල මුල් පිටුවේ දැම්මා, සමහර පුවත් පත්වල දෙවෙනි පිටුවේ දැම්මා. රුපියල් 3ක්වූ පැනඩෝල් එක රුපියල් 1.30ක් දක්වා මිල අඩු වුණා. පැනඩෝල් එකක් රුපියල් 1.70කින් මිල අඩු වුණාම, ඒක headline එක වුණේ නැහැ. නමුත් සියයට 5කින් මිල වැඩි වෙලා, රුපියල් 1.30ට තිබුණු පෙත්ත රුපියල් 1.37ක් වුණාම; ශත 7කින් මිල වැඩි වුණාම, ඒක headline එක යටතේ පළ වුණා. මෙන්න! අපේ මාධ්‍ය.

මෙවැනිම මාධ්‍යවේදියෙක් මට හැම දාම දෝෂාරෝපණය කරනවා. අද උදෙත් දෝෂාරෝපණය කරලා තිබෙනවා, අපි laundry පද්ධතියක් ගේනවා කියලා. මේ මොනවත් දන්නේ නැතිව කවුරු හරි ඔහේ කියවනවා. මම ඒ මාධ්‍ය ආයතනයේ සභාපතිවරයාගේ නැන්දම්මාගේ අවමංගල්‍යයට ගිය අවස්ථාවේ මට එතැනදී හොරණ රෝහලේ වැඩ කරන හෙදියක් හම්බ වුණා. ඒ හෙදිය මගේ ළඟට ඇවිල්ලා කථා කළා. කථා කරලා මට කිව්වා, "සර්, ස්වයංක්‍රීය laundry - automated laundry - පද්ධතිය ගෙනෙන එක හරිම හොඳයි. මොකද, laundry එකෙන් අපුල්ලලා අපිට ගෙනා net එකක මාළුවෙක් වේළිලා හිටියා" කියලා. ඒ වෙලාවේ ඒ ගොල්ලෝ laundry එකේ අයව ගෙන්වලා අහලා තිබෙනවා, "මේවා හෝදන්නේ කොහේද?" කියලා. ඒවා ඇලේ හෝදන්නේ. ඇලේ රෙදි සෝදනවාට වඩා මේ automated laundry පද්ධතිය සම්පූර්ණයෙන් disinfected. සම්පූර්ණයෙන් ජීවානුහරණය කළ ඇදුම් ටිකක් රෝහලට ලැබෙනවා. මේවාට විරුද්ධව ලියන මාධ්‍යවේදියා රෝහලට ගියාමත් ඒ ඇඳ ඇතිරිල්ලම තමයි ලැබෙන්නේ. අද තමුන්නාන්සේලා දන්නවා, කොළඹ මහ ඉස්පිරිතාලය හැරෙන්න අනෙක් බොහෝ රෝහල්වල මේ රෙදි හෝදන්නේ බේරේ වැවේ බව. තමුන්නාන්සේලා දන්නවා බේරේ වැවේ තත්ත්වය මොකක්ද කියලා. බේරේ වැවේ මේ රෙදි හෝදන්නේ නැතිව, අපි මෙහෙම ජීවානුහරණය කරන එක හොඳ නැද්ද? ලෝකයේ දියුණු ක්‍රම මේ දෙන්න හදන්නේ. ඒ මොනවත් දන්නේ නැතිව කියනවා, මෙහේ කට්ටිය උපවාස කරනවා ලු. ඒක හරි පුදුම කථාවක්. එතැන සිටින සියලුම සේවකයන්ට මම පොරොන්දු වුණා, ඒ සියලුම දෙනාව මෙතැන රස්සාවට ගන්නවා කියලා. හැබැයි මුදලාලිලා, කොන්ත්‍රාත්කාරයෝ කීපදෙනෙක් වෙනුවෙන් මට කථා කරන්න බැහැ. සෞඛ්‍යය වෙනත් දේවල්වලට අදාළ කර ගන්න බැහැ. සියලුම ඇඳ ඇතිරිලි, කොට්ට උර ස්වයංක්‍රියව හේදිලා, ජීවානුහරණය වෙලා, tissue bagsවල වැටිලා seal වෙලා තමයි ඉස්පිරිතාලයට එන්නේ. මේ නිසා කිසිම විෂබීජයක් රෝහලට ඇතුළු වෙන්නේ නැහැ; ශල්‍යාගාරයට ඇතුළු වෙන්නෙත් නැහැ. රෝහලට අතුළු වුණත්, ශල්‍යාගාරයට විෂබීජ ඇතුළු වෙන්න හොඳ නැහැ නේ.

අලුතින්ම හදපු Epilepsy Unit එකේ operating theatre එක මට වහන්න සිදු වුණා. මොකද, microbiologist ඇවිත් කිව්වා, මේකේ විෂබීජ තිබෙනවාය කියලා. අපි වහාම එය වැහුවා. Cardiology Unit එකේ operating theatre එකේ විෂබීජ තිබෙනවා කිව්වා. ඒ නිසා එය වැහුවා. වහලා දැන් ඒක හදනවා. ඒක හදන කොට බණිනවා, "දැන් ඒක වහලා" කියලා. එහෙම නැතිව Open කරලා, heart surgery එක කළාට පසුව ඒ මනුස්සයාට විෂබීජයක් නිසා මැරෙන්නද කියන්නේ? වෛද්‍ය විද්‍යාව පිළිබඳ කිසිම අවබෝධයක් නැති නොදන්නා අය වෛද්‍ය විද්‍යාවේ සාස්තර ගැන මාධ්‍ය හරහා කථා කරනවා. එතැනයි වැරැද්ද සිදු වෙලා තිබෙන්නේ. මේ ජීවානුහරණය කියන එක ඉතාම වැදගත්. අපේ වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා, දේශපාලනඥයකු විධියට නොවෙයි වෛද්‍යවරයකු විධියට තමන් ඉගෙන ගත් වෛද්‍ය ශාස්ත්‍රය අනුව මේ දේවල් සියයට සියයක්ම පිළිගන්නවා ඇති. එතුමාත් microbiology කළා; මමත් microbiology කළා. එතුමාත් parasitology කළා; මමත් parasitology කළා. ඔය දෙකේම අපිට උගන්වපු ඒවා තමයි මම මේ කියන්නේ.

අපි ඉගෙන ගත් දේවල් ක්‍රියාත්මක කරන්න හදන කොට මේ අය නොයෙකුත් ඒවා ලියනවා. එම මාධ්‍යවේදියාම මීට ඉස්සර වෙලාත් නොයෙකුත් දේවල් ගැන විවේචන කර තිබෙනවා. මොකද, රාජපක්ෂලාට විරුද්ධව මම ඉන්න නිසා. ඒකයි මට තිබෙන නුසුදුසුකම. වෙන මොකක්වත් නොවෙයි. දිගටම විවේචන කළා. ඔහුගේ පියාටත් Cardiology Unit එකට එන්න වුණා. ඔහුට stents තුනක් දමන්න සිදු වුණා. Cardiology Unit එකේ ඉන්නේ Dr. Gotabhaya Ranasinghe. එතුමා මේ කථා මොනවත් දන්නේ නැහැ. ඔහු Consultant Cardiologist. ඔහු මේ මාධ්‍යවේදියාට කියලා තිබෙනවා, "ඔයාගේ තාත්තාට stents තුනක් දාන්න තිබෙනවාය කියලා ඔයා දන්නවාද?" කියා. එතකොට ඔහු කලබල වුණා. "කොච්චර මුදලක් ඒ වෙනුවෙන් වැය වෙනවාද?" කියලා ඔහු අහලා තිබෙනවා. එතකොට එතුමා මෙහෙම කියලා තිබෙනවා, "අපේ ඇමතිතුමා නිසා ශත පහක්වත් වියදම් වෙන්නේ නැහැ. මේ සියල්ලම ඔයාට නිකම් ලැබෙනවා. Alcon සමාගමේ stent එකම තමයි දමන්නේ. මොකද, මේ ඇමතිවරයා කියලා තිබෙනවා, දූප්පත්ය කියලා ඇහට බද්ධ කරන කිසිම දෙයක් දෙවැනි පන්තියේ ඒවා දාන්න එපා කියලා."

මේ දමන stent එකම තමයි ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමාට හෙට block එකක් ආවොත් ඇමෙරිකාවේ hospital එකේ දමන්නේත්. Alcon සමාගමේ ඇමෙරිකානු stent එක තමයි අපි ගෙනෙන්නේ. ඇමෙරිකානු අක්ෂිකාචය තමයි ගෙනැල්ලා මිනිසුන්ට දමන්නේ. රජයේ රෝහල්වල තිබෙන්නේ බාල බඩු කියලා සමහරු හිතනවා. මතක තියා ගන්න, දැන් රජයේ රෝහල්වල තිබෙන්නේ හොඳම බඩු; හොඳම ඒවා. පෞද්ගලික අංශයට වඩා රජයේ රෝහල්වල තිබෙන බඩු හොඳයි කියලා මම සහතික වනවා. ඒ කාරණය ඔබතුමන්ලා මතක තියා ගන්න.

අපි digital MRI scan යන්ත්‍රය ගෙනැල්ලා, කොළඹ මහ රෝහලට ලබා දීලා තිබෙනවා. ලංකාවේ කිසිම පෞද්ගලික රෝහලක එවැනි යන්ත්‍රයක් තිබෙනවාද කියා මම අහනවා. යාපනයට 3D echocardiography machine එකක් ලබා දුන්නා. ඔබතුමන්ලා ගිහිල්ලා බලන්න. මම සනීපවෙලා එන තුරු ඒ Cardiologist බලාගෙන හිටියා, මගේ අතින්ම ඒ යන්ත්‍රය විවෘත කරන්න ඕනෑය කියලා. අඩු පාඩුවක් වුණොත් ඒ යන්ත්‍රය හදන්නේ ලංකාවේ නොවෙයි. ඒ යන්ත්‍රය හදන්නේ නෙදර්ලන්ඩ්ස්වල Philips සමාගම. ඒ වෛද්‍යවරයා මට කිව්වා, "සර්, මේ යන්ත්‍රයේ ඔක්කොම maintenance කරන්නේ නෙදර්ලන්ඩ්ස්වලින්. මේ යන්ත්‍රයේ වැරැද්දක් වුණු හැටියේ තත්පරයෙන් එහේ ඉඳලා circuitsවලින් හදනවා. මේක තමයි සර්, ලෝකයේ තිබෙන හොඳම echocardiography machine එක. මේක තමයි මම Londonවල hospital එකේදී පාවිච්චි කළේ. ඒකයි මම ඔබතුමා එන තුරුම හිටියේ මෙම යන්ත්‍රය විවෘත කිරීමට." කියලා. මොකද, අපි මුදල් බැලුවේ නැහැ. අපිත් ඉගෙන ගත්තේ මේ වෛද්‍ය ශාස්ත්‍රය. අලුත්ම technology අපි ලංකාවට ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි මුදල් වියදම් කරන්නේ. රුපියල් බිලියන 235ක් කියලා අය වැය ලේඛනයෙන් කිව්වාට රුපියල් බිලියන 400ක් විතර අපි ගිය අවුරුද්දට වියදම් කරලා තිබෙනවා. මෙහෙම වියදම් කරලා, අපි අපේ අහිංසක මිනිසුන්ට ලබා දෙන්නේ යුරෝපයේ තිබෙන හොඳම ප්‍රතිකාර ක්‍රමයි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ - SPC එක - තත්ත්වයත් මම කියන්නම්. එය මේ විධියට ලාභ ලබනවා. 2015 අවුරුද්දේ ලැබූ ලාභය මිලියන 363යි. 2016 වනකොට මිලියන 408 දක්වා අපි ලාභය වැඩි කරගෙන තිබෙනවා. මීට අදාළ දත්ත මා ළඟ තිබෙනවා.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ ලාභය ගත්තොත්, 2014 අවුරුද්දේ මිලියන 266.48යි; 2015 අවුරුද්දේ profit එක මිලියන 414.55යි; 2016 ඔක්තෝබර් මාසය වනකොට ලාභය මිලියන 408.53යි. ඒ අනුව දෙසැම්බර් මාසය වනකොට මිලියන 500කට වැඩි ලාභයක් ලැබෙනවා.

අපි මේ වාගේ ලාභ ලබා තිබෙනවා. අපි මේ වෙනකොට සමාගම් 46ක් එක්ක එකතු වී ඖෂධ නිෂ්පාදනය ආරම්භ කිරීමට ගිවිසුම්ගත කරලා තිබෙනවා. එයින් සමාගම් තිස් ගණනක් අපි ගිවිසුම්ගත කරලා තිබෙන්නේ රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ වැඩ පිළිවෙළ යටතේයි. එහිදී අපි buyback guarantee එකක් දීලා තිබෙනවා. ඒ අනුව අපි අවුරුදු 15ක් ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන රජයට ගන්නවා. පෞද්ගලික අංශයේ තනියෙන් නිෂ්පාදනය කරන කට්ටියට අපි අවුරුදු 10ක buyback guarantee එකක් දීලා තිබෙනවා. අපි අවුරුදු 10ක් ඒ ගොල්ලන්ගේ ඒවා ගන්නවා. ඒ අනුව සමාගම් 36ක් ඇවිල්ලා තිබෙනවා. දැනට කර්මාන්තශාලා දෙකක් විවෘත කරලා, නිෂ්පාදන සිදු කරනවා. තුන්වැනි එක මේ මාසයේ හෝ එන මාසයේ හෝ විවෘත කරනවා. මේ විධියට ලබන අවුරුද්දේ -2019- අවසානය වෙනකොට මේ ඖෂධවලින් සියයට 85-90ක් ලංකාවේ නිෂ්පාදනය කරන්න මට පුළුවන් වෙනවා. මේක තමයි මහාචාර්ය බිබිලේ මැතිතුමාගේ තුන්වැනි ප්‍රතිපත්තිය, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමාගේ ගෝලයෙක් විධියට, එතුමාගෙන් ඖෂධවේදය හැදෑරූ ශිෂ්‍යයෙකු විධියට මම මගේ කාල පරිච්ඡේදයේදී එතුමාගේ ප්‍රතිපත්ති සියල්ලම මේ ආර්ථික ක්‍රමයට උචිත විධියට සකස් කරන්න පුළුවන් සෑම දෙයක්ම -එතුමාට ගෞරව වශයෙන්- සිදු කරනවා.

ඊළඟට, මේ ඖෂධ සම්බන්ධයෙන් තිබුණු මාපියාව ගැනත් සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලයේ "Trastuzumab" කියන පිළිකා ඖෂධය සම්බන්ධව මට මොන තරම් මාධ්‍යවලින් ගැහුවාද? මේ ලංකාවේ තිබෙන පළමුවැනි ප්‍රශ්නය තමයි අලුතින් දෙයක් කරන්නට එනකොට, පහරදීම. හැම වෙනසකටම විරුද්ධයි. යහපාලනයටත් විරුද්ධයි. හැම එකටම විරුද්ධයි. ඒකේ තිබෙන වැරදි ටික අල්ලා ගෙන කෑ ගහනවා. එතකොට මාධ්‍ය කරන්නේ මොකක්ද? මාධ්‍යයෙන් කරන්නේ එසේ කෑ ගැසීම පෙන්වන එකයි. මේ "Trastuzumab" කියන ඖෂධය ලංකාවේ රෝහල්වලට ලබා දීම සඳහා ලංකාවේ tender එකට දුන්නේ කීයද? 2,80,000ක් තමයි ඔය බහු ජාතික සමාගම දුන්නේ. හැබැයි, නම කිව්වොත් තමුන්නාන්සේලා කියාවි, "හරිම respected, හරි වැදගත් සමාගමක්නේ" කියලා. පිළිකා ඖෂධ විශේෂඥයෝ පවා අන්තිමට උඩ වීසි වෙලා සිටියා, මේ සිදුවුණු දෙය දැකලා. 2,80,000යි. මම දෙවැනි සමාගම ගත්තා. මේක තමයි මාපියාව. එක ඖෂධයයි, එක සමාගමයි. එකී සමාගමට ඕනෑ ගණනට ආණ්ඩුවට විකුණනවා. ගණන කීයද? බිලියන 2යි, අවුරුද්දකට. අවුරුද්දකට රුපියල් බිලියන 2ක් මේ ඖෂධයට විතරක් ආණ්ඩුව වියදම් කරනවා. මම එනකොට පිළිකා රෝගියෙකුට වියදම් කරන සීමාවක් තිබුණා, ලක්ෂ 15යි කියලා. මම අපේ නිලධාරීන්ගෙන් ඇහුවා, "ලක්ෂ 15 සීමාවෙන් පසුව රෝගියට මොකද වෙන්නේ?" කියලා. කවුරුවත් මොකුත් කිව්වේ නැහැ, බිම බලාගෙන සිටියා. ඊට පසුව රෝගියාට අයිති වෙන්නේ මරණය. Stent එක ගන්න සල්ලි නැති වුණොත්, ඊට පසුව අයිති වෙන්නේ මරණය. ඇත්ත කථාව ඒකයි. අක්ෂි කාචය ගන්න සල්ලි නැත්නම්, ඊට පසුව අන්ධභාවයට පත් වෙනවා. මෙහෙම තමයි තිබුණේ. හැබැයි, කිව්වේ, "නිදහස් සෞඛ්‍ය සේවය" කියලායි. නමුත් දැන් තමයි නියම නිදහස් සෞඛ්‍ය සේවය තිබෙන්නේ. ඒක හදනකොට, "සයිටම්" එකක් අල්ලාගෙන කියනවා, නිදහස් සෞඛ්‍ය සේවය පුද්ගලීකරණය කරනවා කියලා. වෛද්‍ය විද්‍යාල හතරක් හදනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු අමාත්‍යතුමා අවසාන කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව සුළු වේලාවක් දෙන්න. මම අවසන් කරනවා.

මම වෛද්‍ය විද්‍යාල හතරක් හදනවා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් අල්ලාගෙන මේ ඔක්කෝම ඒක යටතේ නිර්වචනය කරන්නට හදනවා. ඒකයි ක්‍රමය.

Trastuzumab 440mg injection එක රුපියල් 2,80,000යි. දෙවන ඖෂධය ආවා. "ඒක නරකයි; ඒක වැරදියි" කිව්වා. නමුත් දැන් අවුරුදු දෙකක් පාවිච්චි කරලා තිබෙනවා. එකම adverse effect එකක්වත් අද වෙනතුරු වාර්තා කරලා නැහැ; එකම වැරැද්දක් වාර්තා කරලා නැහැ. ඒ ඖෂධය ආවාම අර සමාගම මොකද කළේ? රුපියල් 2,80,000ට දුන්න injection එකේ මිල ඒ ගොල්ලන් තරගය සඳහා රුපියල් 1,65,000කට පහත දැම්මා. ඒ ඖෂධය සඳහා රුපියල් 1,15,000ක් දීලා ගත්තේ වැරදි විධියට. එතකොට ආණ්ඩුව මෙච්චරකල් සල්ලි වියදම් කළේ කාටද? නිදහස් සෞඛ්‍ය සේවය කියලා ජනතාවට දුන්නා, රුපියල් 1,65,000ක්; කොම්පැනිකාරයාට දුන්නා, 1,15,000ක්! මේ, එක injection එකකට පමණයි. ඒක නේ සත්‍ය කථාව. එතකොට රුපියල් 2,80,000ක් කියන්නේ මොකක්ද? රෝගියාට ලක්ෂ 15යි අයිති, එතකොට මෙයින් injections 5ක් ගැහුවාම මුදල ඉවරයි. එතැනින් පිළිකාව මර්දනය වුණේ නැති වුණොත් ඔහු මිය යනවා. මොකද, ඊට පස්සේ දෙන්නේ painkillers විතරයි; වේදනා නාශක විතරයි. මේක තමයි සත්‍ය කථාව.

ඊළඟට, දෙවැනි කොම්පැනිය ඇවිල්ලා මිල දුන්නා, රුපියල් 1,44,000කට. ඒ අනුව මිල රුපියල් 280,000ට තිබුණු injection එක මම රුපියල් 1,44,000ට අඩු කර ගත්තා. දැන් ආණ්ඩුවට යන්නේ වියදමෙන් භාගයයි.

2014 දී පිළිකා ඖෂධවලට ආණ්ඩුව වියදම් කළේ රුපියල් මිලියන 1,300 ගණනක්. අද මේ ආණ්ඩුව වියදම් කරනවා, මිලියන 4,800 ගණනක්. ඇත්තටම මේ ඖෂධයේ මිල රුපියල් 2,80,000 සිට රුපියල් 1,44,000ට බැස්සුවේ නැත්නම් මට ඒ සඳහා වියදම් කරන්න වෙනවා, රුපියල් මිලියන 9,600ක්. මේ වැඩෙන් මම රුපියල් මිලියන 4,500ක් විතර බේරා ගත්තා.

Bevacizumab ඖෂධය ගැන බලන්න. Bevacizumab 100mg injection එක එදා දුන්නේ රුපියල් 65,500ට. අද එහි මිල කීයද? රුපියල් 47,400යි. ලෝක වෙළඳ පොළේ අනිත් ඔක්කෝම දේවල මිල වැඩි වෙනකොට මේ මිල අඩු වෙන්නේ කොහොමද? ඩොලර් එකත් වැඩි වෙනවා. එහෙමනම් මේවායේ අද මිල අඩු වෙන්නේ කොහොමද? හිතලා බලන්න, මේ මිල අඩු වෙන්නේ කොහොමද කියලා. Lapatinib250mg tablet එක එදා රුපියල් 960.58යි. අද කීයද? අද රුපියල් 795.00යි. අඩු වෙලා. Pemetrexed disodium 100mg injection එක එදා කීයද? රුපියල් 35,200යි. අද කීයද? රුපියල් 5,500යි. රුපියල් 27,000කින් අඩු වෙනවා. මොකද, මේ තරගය නිසා. අද නියම තරගය තිබෙනවා. අද අනෙක් ඖෂධ ලියාපදිංචි කරලා වෙළඳ පොළට එන්න දෙනවා. එතැන තිබුණු මාෆියාව අපි කැඩුවා; ඒකයි. Pemetrexed di Sodium 500mg injection එකක මිල තිබුණේ කීයටද? රුපියල් 1,58,000යි. අද මිල කීයද? රුපියල් 19,750යි. එදා Abiraterone acetate 250mg tablet එක තිබුණේ කීයටද? රුපියල් 2,416.66යි. අද කීයද රුපියල් 479යි. මේකෙන් අපි විශාල ලාභයක් ලැබුවා.

2016දී මම ලක්ෂ 15ට තිබුණ සීමාව අයින් කරලා, ජීවිත කාලයම පිළිකා රෝගීන්ට පිළිකා ඖෂධ ලබා දෙන්න, stents ඔක්කෝම ටික නිකම් ලබා දෙන්න, අක්ෂි කාව ඔක්කෝම ටික නිකම් ලබා දෙන්න, රුධිර පරීක්ෂණ සියල්ල පිටට ගෙන යාම තහනම් කරලා රෝහලෙන්ම ලබා දෙන්න යනාදී වශයෙන් සියලුම දේවල් ලබා දෙන්න මුදල් වියදම් කළා. මම ශත පහක් භාණ්ඩාගාරයෙන් ගත්තේ නැහැ. 2017 වර්ෂයේදී තමයි මම භාණ්ඩාගාරයේ සල්ලි ඉල්ලුවේ, "හැමදාම මට මෙච්චර ප්‍රමාණයකින් මේවායේ මිල අඩුකිරීම් කරන්න බැහැ. ඒ නිසා මට මුදල් ලබා දෙන්න." කියලා. මේ නාස්තිය වළක්වා ගැනීම නිසා භාණ්ඩාගාරයෙන් සියලුම මුදල් ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මම එනවිට ජාතික රෝහලේ රුධිර පරීක්ෂණ කරන ස්ථානයට ගියා. ජාතික රෝහලේ තිබෙන තත්ත්වය මොකක්ද? ජාතික රෝහල වටේම එක එක පෞද්ගලික රෝහල් තිබෙනවා. ඒ පෞද්ගලික රෝහල්වල ලේ එකතු කරනවා. මම පොඩි කාලයේ Bram Stokerගේ "Dracula" කියන පොත කියවලා තිබෙනවා. මම පොඩි කාලයේ අහලා තිබුණේ, ලෝකයේ ඉන්න ලේ එකතු කරන එකම කෙනා "Dracula" කියලා. "ලේ එකතු කිරීමේ මධ්‍යස්ථානය" කියලා ඒ උදවියගේ boards විශාල ප්‍රමාණයක් ගහලා තිබෙනවා. දැන් ගිහිල්ලා බලන්න, ඒවා තිබෙනවාද කියලා? නැහැ. මම කිව්වා, "මේ මොන ලැජ්ජාවක් ද? මම වෘත්තීය සමිති නායකයෙක් විධියට අවුරුදු 15ක් දිගටම මෙතැන තමයි වැඩ කළේ. මොකක්ද මේ ලජ්ජා නැති වැඩේ?" කියලා.

මේ තරම් විශාල රසායනාගාරයක් ලංකාවේ පෞද්ගලික රෝහලක තියා වෙන කොහේවත් තිබෙනවා ද? නැහැ. මම ඇස් දෙකෙන් දැක්ක- එහි වැඩ කරන කාලයේ සතියකට හතර පස් වතාවක් මම මගේ මිත්‍රයන්ගේ වැඩ කර ගන්න රසායනාගාරයට ගියා. 21 වන ශතවර්ෂයේ මම ඇමතිවරයා ලෙස ගිහින්, මම ඒ ගොල්ලන්ගෙන් ඇහුවාම කිව්වා, "අපට මීට වඩා කරන්න බැහැ සර්. එහෙමනම් අපට Autoanalyzer කියන යන්ත්‍රය අරගෙන දෙන්න." කියලා. මේක නවීනතම යන්ත්‍රයක්. මම ඇහුවා, "ගණන කීයද?" කියලා. "ලක්ෂ 150යි." කියලා කිව්වා. මම මාසයකින් එම යන්ත්‍රය අරගෙන දුන්නා. ඒ යන්ත්‍රය ලබා දීලා, රුධිර පරීක්ෂණ ජාතික රෝහලෙන් ඉවතට ගෙන යාම මම තහනම් කළා. 2016 අවුරුද්දේ සියලුම රෝහල්වලට ඒ යන්ත්‍ර යැව්වා. මම ගිය සතියේ සෙනසුරාදා තමයි හලාවත රෝහලට ගියේ. හලාවත රෝහලෙත් Autoanalyzer කියන යන්ත්‍රයක් මම විවෘත කරලා ආවා. දැන් එම යන්ත්‍රය හැම රෝහලකම තිබෙනවා. හැම රෝහලකම රුධිර පරීක්ෂණ පිටතින් කිරීම තහනම් කරලා තිබෙනවා.

අපි ඉදිරියට ඖෂධවල ගුණාත්මකභාවය හදනවා. අපි ඖෂධ මිලදී ගන්නේ වෙළෙඳ නාමය අනුවයි. ඔන්න බලන්න, මහාචාර්ය සේනක බිබිලේ මහත්මයාගේ අනෙක් ප්‍රතිපත්තිය. තවම වෙළෙඳ නාමයෙනුයි ඖෂධ ගන්නේ. අදත් රජයේ වෛද්‍යවරු හා විශේෂඥ වෛද්‍යවරු අපේ සියලු නීතිවලට හොරෙන් රෝහලේ නැති ඖෂධ brand name එක ලියලා දෙනවා, එළියෙන් ගන්න කියලා. ඒකට හේතුව මොකක්ද කියලා මම පැහැදිලිවම දන්නවා. ඒවා හොරෙන් තමයි ලියලා දෙන්නේ. ඒක තමයි එදා තිබුණු තත්ත්වය. පිළිකා ඖෂධ සම්බන්ධයෙනුත් එහෙමයි. අද ඒ ගොල්ලෝ ඇවිල්ලා කියනවා. මේ පුංචි ලංකාවේ හොරකමක් කළොත් කියනවා නේ. හවසට දෙකක් දාලා, තුන්වෙනි එක දමනකොට කියනවා, පගාව දුන්න හැටි; පගාව දෙන්න ගිය හැටි. මේක ලංකාව. මේක දිවයිනක් නේ; දූපතක් නේ. මේ දූපතේ උදවිය හවසට drinks ගන්නකොට කථා වෙනවා, අර ඇමති මෙහෙම ගැහුවා; මේ ඇමති මෙහෙම කිව්වා කියලා. ඒවා තමයි හවසට, රෑට බයිට් එකට තිබෙන්නේ. අපි දන්නවා නේ. ඒ වෙලාවට කියනවා. ඒක තමයි යථා තත්ත්වය. මේක ඉන්දියාව නොවෙයි නේ. මේක මහා බ්‍රිතාන්‍යය නොවෙයි නේ. මේක ලංකාව; මේක දූපතක්. අද Medical Representativesලා ඇවිල්ලා සල්ලි දුන්න හැටිත් මට කියනවා. පිළිකා ඖෂධවලට ලොකු

උදවියට ලක්ෂයයි. දෙවැනි පෙළේ උදවියට රුපියල් 50,000යි. අක්ෂි කාචයට රුපියල් 15,000යි. මේවා තමයි කියන්නේ. හැමෝම නොවෙයි. ඉතා සුළු පිරිසක්. මේ පද්ධතීන් වෙනස් කරනකොට ඒ ගොල්ලෝ තමයි විශාල වශයෙන් කැලඹුණේ. තව අවුරුද්දක් හෝ හමාරක් යනකොට ඖෂධ නාමයෙන්ම -generic name එකෙන්ම- ගන්න මම ඉඩ සලස්වනවා. අද එංගලන්තයේ සියයට 80ක් බෙහෙත් ලියන්නේ generic name එකෙන්.

විවෘත ආර්ථිකයේ දේවස්ථානය තමයි, ඇමෙරිකාව. අද ඇමෙරිකාවේ සියයට 85ක් බෙහෙත් ලියන්නේ generic name එකෙන්. මේවාට අද විවෘත ආර්ථික ක්‍රම තිබෙන රටවල් කියා කියන්න බැහැ. එහෙම නම් මේ පුංචි රටේ බොරු ආර්ථික කථා කවුරුවත් කථා කරන්න එපා. අපේ රටෙත් බෙහෙත් ලියන්න ඕනෑ generic name එකෙන්. ඒකට අපට තත්ත්ව රසායනාගාරයක් ඕනෑ. යම් වෛද්‍යවරයෙක් "මේ බෙහෙත හොඳයි. මේ බෙහෙත නරකයි." කියා කියනකොට, "නැහැ, මේක හොඳයි." කියන්න මට හරියට විද්‍යාත්මක දත්තයක් ගන්න තැනක් අද ලංකාවේ නැහැ. ඒ නිසා තමයි මම ජනාධිපතිතුමාත් එක්ක චීනයට ගිය පළමු වතාවේ චීන මුදල් ඇමතිවරයාත් එක්ක කථා කරලා තත්ත්වය රසායනාගාරයක් ඉල්ලුවේ. ඒ quality lab එක ලංකාවේ ස්ථාපිත කළාට පස්සේ මට කියනැකි, "නැහැ. ඔයා කියන එක නොවෙයි. මේක තමයි නියම quality එක." කියලා. එම analysis එක කිරීමේ ඒ පහසුකම එතැනට එනවා.

මම KPMG කියන ජාත්‍යන්තර ආයතනයත් එක්ක මේ වන විට ඔක්කෝම කටයුතු අවසන්. අපි සියලුම පෞද්ගලික රෝහල්වල මිල පාලනය කරනවා. මම හැමෝටම දන්වලා තමයි තිබෙන්නේ. සෞඛ්‍ය කියන්නේ, ව්‍යාපාරයක්ම නොවෙයි. සල්ලි හම්බ කරන්න පුළුවන්. හැබැයි, මේක සේවාවක්. ලාභ වුණත්, පාඩු වුණත් කරන්න දෙයක් නැහැ. හැමෝම හිත හදා ගන්නට ඕනෑ. මේ හේතුව නිසා, ඖෂධ සමාගම් වහනවා කිව්වා.

බහු ජාතික සමාගමක් කිව්වා, ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන වියදමට වඩා මම නියම කරලා තිබෙන මිල අඩුයි. ඒ නිසා ඒ ගොල්ලන් ඒ සමාගම වහනවාය කියලා. බොරු. මම එක ප්‍රකාශයයි කළේ, "ඔබතුමන්ලාගේ නියමිත මිල හෙළිදරවු කිරීම සදාචාරාත්මක නැත. නමුත් ඔබතුමන්ලා මට අභියෝග කරන්නේ නම් හෙට දිනයේ ඔබතුමන්ලාගේ ඖෂධයේ නිෂ්පාදන මිල හෙළිදරව් කරන්න මට සිදු වෙනවා." කියලා. එදාම හවස මට කිව්වා, "හෙට දවසේ පත්තර තුනේම භාෂා තුනෙන්ම දැන්වීම් පළ කරලා, හෙට ඉඳලා අපි ඔබතුමාගේ ඖෂධ මිල ක්‍රියාත්මක කරනවා." කියලා. එච්චරයි කථාව; ඒ ගොල්ලන්ට තේරෙන භාෂාවෙන්. ලංකාවේ තිබෙන ප්‍රසිද්ධ සමාගම් තුනක් ඖෂධ නිකුත් කිරීම නැවැත්වූවා. තමුන්නාන්සේලා-අපි ගන්නා බෙහෙත් -blood pressure එකට මම ගන්නා බෙහෙත- ඒ ඔක්කෝම නිකුත් කිරීම නැවැත්වූවා. ඒ ගොල්ලන් හිතුවේ හිඟය ඇති කරන්න. මහාචාර්ය සේනක බිබිලේ එදා ඒ කටයුත්ත කරන්න ගිය වෙලාවෙත් බෙහෙත් හිඟය ඇති කළා. මම ඒකට ලැහැස්ති වෙලායි හිටියේ. මම ඒක කළේ, සමහරවිට මට ගෙදර යන්න වෙයි කියලා දැන ගෙනයි. මොකද, මෙතැන ඉන්න ඔක්කෝම උදවිය එදාට කෑ ගහන්නේ ගෙනාපු ප්‍රතිපත්තිය ගැන නොවෙයි, ඖෂධ හිඟයි කියලායි. මම ලැහැස්ති වෙලායි හිටියේ. මම දැන ගත්තා, මම මේක නොකළොත් තව සෑහෙන කාලයකට- [බාධා කිරීමක්] ඒක තමයි අභියෝගය. ඒ ගොල්ලන් වෙළෙඳ පොළට ඖෂධ නිකුත් කිරීම නැවැත්වූවා. නවත්වපු හැටියේ මම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට කිව්වා, "මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ඔබතුමන්ලාගේ ආයතනය හදලා තිබෙන්නේ මේ වාගේ තත්වයන්ට මුහුණ දීමට. අපි තමයි දැනට ලංකාවේ ඉන්න ලොකුම සමාගම. අපට තිබෙන මුදල් කාටවත් නැහැ. අපේ ශක්තිය පෙන්වන්න. ඔබතුමන්ලා වහාම bio data එක දමලා, ඒ agencies තුනම ඉල්ලලා යවන්න කියලා. Agencies තුනම ඉල්ලුවා. ඒ e-mail එක එහාට ගියා විතරයි, දෙවන දවසේ ඒ සමාගම් තුනම මට කථා කරලා කිව්වා, "සති දෙකක් දෙන්න, සියලුම ඖෂධ ලංකාවේ වෙළෙඳ පොළට නිකුත් කරනවා." කියලා. නිකුත් කළා. කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ ඔක්කෝම කථා බොරු.

සියයට 90ක් බදු ගැහුවාම දුම්කොළ සමාගම වහනවාය කිව්වා. ලෝකයේ කොහේවත් මෙහෙම බද්දක් ගහලා නැහැයි කිව්වා. මම කිව්වා, "හරි. ලෝකයේ නොකරපු ඒවා කොහේ හරි රටක පළමුවෙන් කරන්න එපා යැ." කියලා. ඊට පස්සේ නේ ලෝකයේ අනෙක් රටවල් කියන්නේ අර රටේ වාගේ අපිත් කළා කියලා. සියයට 90ක් බදු ගැහුවාම සභාපතිවරයා ලංකාවට ආවා. අගමැතිතුමා හමු වුණා. අගමැතිතුමා කිව්වා, "මම සෞඛ්‍ය ඇමතිතුමාගේ වැඩවලට අත ගහන්නේ නැහැ. ගිහිල්ලා කථා කරන්න." කියලා. මම ඇවිල්ලා එයාට ඔක්කෝම විස්තර කළා. මම බොහොම සාවධානව එයාට ඒ ගැන පහදා දුන්නා. එතකොට එයා ඒ සමාගමේ මයිකල් කියලා තවත් යුරෝපීය ජාතිකයෙකුට කථා කළා. මම අහපු ප්‍රශ්නවලට ඔහු කිව්වා, " I will come back to you" කියලා. අද වන තුරු "come back" නැහැ. සියයට 90 බද්ද ක්‍රියාත්මකයි. මෙහෙමයි මේ පද්ධතියේ කටයුතු සිදු වන්නේ.

ඖෂධ මිල පාලනය කළාම යුරෝපා සංගමයේ සියලුම තානාපතිවරු ආවා. අගමැතිතුමාට කථා කරලා, මෙහේ ආවා. අපි ඒ සියලුම උදවියට පහදා දුන්නා. අපි ඒකට ගත්තේ International Marketing Service - IMS- එකේ දත්ත. අපි වැරදි විධියට, නොසංඩාල විධියට මේ කටයුතු කරලා නැහැ. අපි බොහොම විද්‍යාත්මක විධියටයි ඒ කටයුතු කළේ. IMS දත්තය ඉතාම නිවැරදියි කියලා, ඒ දත්ත පාවිච්චි කිරීම ගැන Institute for Health Policy -IHP -එක මට ප්‍රශංසා කළා."මෙතෙක් කල් අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට කිව්වා, කළේ නැහැ. ඔබතුමා මෙය කිරීම ගැන අපි ප්‍රශංසා කරනවා" කියලා කිව්වා. මොකද, IMS දත්ත සියයට 80ක් නිවැරදියි. සියයට 81ක් නිවැරදි දත්ත තිබෙන සමාගමක් ලෝකයේ කොහේවත් නැහැ. ඒක නිසා තමයි මම IMS දත්ත අරගෙන කිව්වේ. තවම එකක්වත් වැරදිලා නැහැ. ඒ වාගේම අපි KPMG ආයතනයටත් භාර දුන්නා. ඒක ජාත්‍යන්තර සමාගමක්. නැත්නම් මෙහේ අයියලා කියනවා, "මේවා වැරදියි, අරවා වැරදියි" කියලා. ඉන් පසුව මම පුද්ගලික රෝහල් සංගමය සමඟත් සාකච්ඡා කළා. ඒ අය ශල්‍යාකර්ම සඳහා අය කරන මිල ගණන් පිළිබඳව කථා කළා. මිනිසුන් වැඩියෙන්ම සහභාගි වන, අත්‍යවශ්‍ය ඖෂධ වාගේම වැදගත් වන ප්‍රතිකාර ක්‍රම 50කට විතර අය කරන මුදල සීමා කරලා ඉදිරි දිනවලදී ගැසට් කරනවා. දැන් ඒ ගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය වෛද්‍යවරයාගේ ගණන මේකට ඇතුළත් කරනවාද නැද්ද කියන එකයි. ඒකත් සාධාරණ කථාවක්. වෛද්‍යවරු විශාල ගණන් ඇතුළත් කරනවා. එතකොට ඒ අය අපහසුතාවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාර්ය අවසන් කළ හැටියේ මාත් සමඟ සම්බන්ධ වෙලා, වෛද්‍යවරුන්ගෙනුත් ඉල්ලීමක් කරන්න කියලා මම නලින්ද ජයතිස්ස මැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක දේශපාලන පක්ෂ විධියට බැලිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. අපෙන් ඕනෑම කෙනෙකුට හෙට දවසේ අසනීප වෙලා ප්‍රතිකාර ලබා ගන්න යන්න සිදුවෙයි. අපට ලෙඩ හැදෙන්නේ නැහැ කියලා අපි කාටවත් කියන්න බැහැ. මට දොස් කියාපු මාධ්‍යවේදියාටත් යන්න සිදුවුණා. එයාට මේක කිව්වාම, එයා කියලා තිබෙනවා, "අනේ! අපි දන්නේ නැහැ නේ" කියලා. ඊට පස්සේ මට කියනවා, පැයකට ඇවිත් සාකච්ඡාවක් කරන්න කියලා. මෙහෙම තමයි මේවා යන්නේ. නොදන්නාකම!

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

අද ලෝක සෞඛ්‍ය සංවිධානය අපට විශාල ප්‍රශංසාවක් කරනවා. විශේෂඥ වෛද්‍ය කපිල ජයරත්න මහත්මයා දවස් තුනකට කලින් මට මේ e-mail එක එව්වා. මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් කළ යුතු වැඩක් තමයි එතුමා කරලා තිබෙන්නේ. අපේ රටට තිබෙන ජාත්‍යන්තර පිළිගැනීම ගැන තමයි එහි කියලා තිබෙන්නේ. මම ඒක කියවලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

යුනිසෙෆ් සහ ලෝක බැංකුව මෑතකදී නිකුත් කරන ලද වාර්තා දෙකකින්ම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ප්‍රශංසාත්මක ඇගැයීමකට ලක් කර ඇත කියලා එතුමා කියනවා. ඇගැයීමට ලක් කරලා තිබෙන්නේ මෙහෙමයි. " 'සෑම දරුවෙක්ම ජීවත් කරවමු' - "Every Child Alive"- මැයෙන් පසුගිය සතියේ එළි දැක්වූ යුනිසෙෆ් වාර්තාවේ අඩු මධ්‍යම ආදායම් රටවල් 52ක් අතරින් හොඳම නව ජන්ම මරණ අනුපාතය වාර්තා කරමින් ශ්‍රී ලංකාව පළමු ස්ථානයේ පසු වේ. ශ්‍රී ලංකාවේ නව ජන්ම මරණ අනුපාතය සජීවී දරු උපත් 1000කට 5.3ක් වන විට එම මරණ අනුපාතය දුර්වලම රට වන පාකිස්තානයේ එය 45.6කි. ඉන්දියාවේ 25.4ක් සහ බංග්ලාදේශයේ 20.1කි.

ශ්‍රී ලංකාවේ නව ජන්ම මරණ අනුපාතය තායිලන්තය, තුර්කිය, බ්‍රසීලය වැනි බොහෝ ඉහළ මධ්‍යම ආදායම් ලබන රටවලටද වඩා උසස් මට්ටමක පවතී. එය සවුදි අරාබිය, චිලී වැනි ඉහළ ආදායම් ලබන රටවලට වඩා උසස්ය. 'ඇමෙරිකාව, කුවේට් වැනි ඉහළ ආදායම් ලබන රටවල් පවා නව ජන්ම මරණ අනුපාතය අතින් ශ්‍රී ලංකාවට වඩා ඉහළින් සිටින්නේ ඉතා ස්වල්ප මට්ටමකිනි' යනුවෙන් එම වාර්තාවේ පෙරවදනේම ශ්‍රී ලංකාව ගැන සුවිශේෂී සඳහනක් තබා ඇත. රටක ආදායම් මට්ටම පමණක්ම අලුත උපදින දරුවන්ගේ ජීවත් වීම තීරණය නොකරන බව ද එහි දැක්වේ."

ඊට පස්සේ එතුමා මේ පිළිබඳව "The Guardian" පුවත් පතේ තිබුණු වාර්තාවක් උපුටා දක්වනවා. සති කිහිපයකට පෙර "The Guardian" පුවත් පත ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය ඇමෙරිකාවේ සෞඛ්‍ය තත්ත්වය සමඟ සංසන්දනය කිරීම උපුටා දක්වමින් ඇමෙරිකානු සෞඛ්‍ය පද්ධතිය විවේචනය කර තිබුණි. ඒ article එකේ ඇමෙරිකාවට දොස් කියලා තිබෙනවා, "මේ වාගේ කුඩා රටකට තම රටේ සෞඛ්‍ය මේ තරම් දියුණු කරන්න පුළුවන් නම්, ඔය ගොල්ලන්ට ඇයි බැරි?" කියලා.

ලෝක බැංකුව "සැමටම සෞඛ්‍ය ආවරණය" -Universal Health Coverage- අධ්‍යයන මාලාවේ, ශ්‍රී ලංකාව පාඩම් උගත හැකි රටක් ලෙස හුවා දක්වමින් විශේෂ වාර්තාවක් පසුගිය දා නිකුත් කර ඇත. ශ්‍රී ලංකාව දුප්පතුන් ඉලක්ක කර ගෙන සෞඛ්‍ය ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කර ඇති අතර, ඉන් වැඩි කාර්යක්ෂමතාවක් පෙන්වා ඇති බව එහි සඳහන් වනවා.

ශක්තිමත් සෞඛ්‍ය දර්ශක, හොඳ මූල්‍යමය ආරක්ෂාව හා අඩු පිරිවැය යන අංශ තුනම එකවර ළඟා කරගත් අඩු ආදායම් ලබන රටවල් ඇත්තේ ඉතාම ස්වල්පයක් බවත්, ශ්‍රී ලංකාව අඩු ආදායම් ලබන රටක් වශයෙන් මෙම පරාමිතීන් තුනම සමාන්තරව ලබා ගනිමින් සුවිශේෂී තත්ත්වයක පසුවන බවත්, ඒ අනුව අවශේෂී රටවලට ශ්‍රී ලංකාව පරමාදර්ශයන් සපයා ඇති බවත් එම වාර්තාවේ සඳහන් වනවා. එහිදී ද අඩු වියදමකින් ඉතා උසස් සෞඛ්‍ය දර්ශක ලබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාවට ප්‍රශංසා කර ඇත.

මේ අනුව ලෝක බැංකුව මට ඩොලර් මිලියන 200ක ප්‍රදානයක් ලබා දීලා තිබෙනවා, ඉදිරි අවුරුදු පහක් සඳහා සෞඛ්‍ය වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න. එලෙස ලැබී තිබෙන රුපියල් මිලියන 30,000න් මාසයකට රුපියල් මිලියන 500ක් වියදම් කරන්න මම බලාපොරොත්තු වනවා. ඒකට තමයි මම පුළුවන් තරම් වෙර දරන්නේ. අපේ පරිපාලන ක්‍රමවේදයන් අනුව ප්‍රසම්පාදන ක්‍රම, අර ක්‍රම, මේ ක්‍රමත් අස්සේ තමයි මට මේ වැඩ පිළිවෙළ ගෙන යන්න වන්නේ. ඒ වාගේම මට මිලියන 10,000කට වඩා වැඩි මුදලක් JICAවලින් දීලා තිබෙනවා. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න ආසියානු සංවර්ධන බැංකුවත් ඩොලර් මිලියන 60ක් මට දීලා තිබෙනවා.

මම ඉදිරිපත් කරන සියලුම කැබිනට් පත්‍රිකා සම්මත කරමින් මට සහයෝගය ලබා දීම ගැන අපේ රටේ ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, කැබිනට් මණ්ඩලයටත් මා විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ටත්, මේ සම්බන්ධයෙන් උදව් කරපු සියලුම දෙනාටත් මම ස්තුතිවන්ත වනවා. මේ ඖෂධ ප්‍රතිපත්තීන් ඉදිරියට ගෙන ගොස් මේ රටේ මිනිසුන්ට අනාගතයේදී හොඳ සෞඛ්‍යයක් හදා ගැනීමට අපි සියල්ලෝම එකතු වෙමු කියලා කියමින් මම නිශ්ශබ්ද වනවා.

[12.01p.m.]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)

(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Mr. Deputy Chairman of Committees, I am pleased to state today that the objective of this Intellectual Property (Amendment) Bill is to amend the Intellectual Property Act, No. 36 of 2003 in order to enhance the protection given for Geographical Indications of Sri Lanka. This Bill is not only a significant milestone in the history of intellectual property in Sri Lanka, but it is important for our export revenue as well because we are faced with the problem of fake exports from other destinations, which damage the global reputation of Sri Lankan exports sector.

A Geographical Indication -GI- is a sign which gives an item a unique identity due to its specific qualities and characteristics that could be attributable to the country or region in which it has originated. Due to the distinctive features of a GI they have a high economic and cultural value and as such, they are assets to their country of origin.

What is more important is the potential new value addition that GI gives to the products in global markets. The enhanced marketability and product reputation which comes as a result of GI is a great value proposition for the Brand Sri Lanka and well supports the future goals of our international trade.

"Ceylon Tea" and "Ceylon Cinnamon" are GIs identified by the Intellectual Property Act, No. 36 of 2003 as goods originating from Sri Lanka. These products including "Pure Ceylon Tea", "Sri Lanka Tea", "Pure Sri Lanka Tea", "Pure Ceylon Cinnamon", "Sri Lanka Cinnamon" and "Pure Sri Lanka Cinnamon" - Sri Lanka *Kurundu*- make a significant contribution to the economy of Sri Lanka.

As I said before, the value addition that GI gives to the product in the global market is the leading reason for us to move towards GI. Therefore, origin and the identity of these GIs should be protected in order to prevent unauthorized usage that could be detrimental to economic and moral rights of the original procedures and to enhance the sustainability of the unique qualities of the GIs. Goods with GI face a strong competition from counterfeits both in the global and local markets. As such producers and exporters of the same have appealed to the relevant Government authorities to introduce a registration system for GI in Sri Lanka by way of introducing new laws to the intellectual property regime which could provide the required protection for goods identified as GIs.

Accordingly, a working Committee consisting of members of the Advisory Commission for Intellectual Property and officials from different Government Departments were appointed by the Ministry of Industry and Commerce to formulate a mechanism for the protection of Geographical Indications in Sri Lanka through a registration system. The Committee identified the non-availability of a domestic legal provision for the registration of GI in Sri Lanka as the key issue faced by the exporters of Ceylon cinnamon, Ceylon tea and related products in registering Sri Lankan GI internationally, since domestic registration in the originating country is a mandatory prerequisite for international registration of GI. Further, the Committee was of the opinion that since the Act is silent as to the procedure of domestic registration, exclusive rights of owners and other related matters to GI, the scope of Section 204 does not empower the Minister to make regulations for the registration of GI in Sri Lanka. Thus, it was proposed by the Working Committee to amend Sections 161 and 204 of the Act as an interim measure until a legal framework for the protection of GI in Sri Lanka is enacted, which is being drafted at present, to resolve the issues already faced by local producers and exporters of goods identified as GI in Sri Lanka.

Accordingly, the approval of the Cabinet of Ministers was obtained on 08th of April, 2015 to amend Sections 161 and 204 of the Act, as proposed by the Cabinet Memorandum dated 23rd of March, 2015 bearing No. 15/0336/625/011. Thereafter, it was informed by the Legal Draftsman's Department that the objective of the Ministry could be achieved by amending only Section 161 of the Act. Therefore, a subsequent Cabinet Memorandum bearing No. 16/2074/723/054 was submitted by the Ministry on 04th of October, 2016, seeking approval for the inclusion of the new Subsection 161(4A) drafted by the Legal Draftsman and to submit the same for the approval of Parliament, for which the approval of the Cabinet of Ministers was given on 18th of October, 2016. Thereafter, the proposed Amendment to the Intellectual Property Act, No. 36 of 2003 was published in the Government Gazette dated 02nd of November, 2017 and it is herewith submitted for the approval of Parliament.

Sir, as I stressed earlier, GI is a great value proposition for Brand Sri Lanka and well supports the future goals of our international trade as well as increase in exports income. This is equally true for exports of both Ceylon tea and Ceylon cinnamon. According to the Tea Exporters' Association of Sri Lanka, though Sri Lanka tea export volume has not changed in 2017, the revenue earned had increased to Rs. 233.3 billion compared to Rs. 184.07 billion in 2016, registering a growth of 26.3 per cent. It is reported that 2017 recorded the highest ever local currency revenue achieved from tea exports.

Last year was a good year for our spice exports too. In 2016, our total spice exports were at US Dollars 317 million and it increased by 28 per cent in 2017 to US Dollars 406 million. Ceylon cinnamon is considered as the true cinnamon of the world. Therefore, I am pleased to inform the House that our cinnamon exports too are increasing. In comparison to 2016, the export of Ceylon cinnamon surged by 27 per cent to US Dollars 202 million in 2017.

Therefore, I request the Hon. Members of this House to approve these proposed Amendments presented today.

Thank you.

[பி.ப. 12.10]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், புலமைச் சொத்து (திருத்தம்) சட்டமூலம் என்பன பற்றிப் பேசுவதற்கு அனுமதி தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையிலே சுகாதார அமைச்சு நாட்டிலே மிகவும் முக்கியமான ஓர் அமைச்சாக இருக்கின்றது. அந்த வகையில் அமைச்சினூடாக ஏற்றுமதி, இறக்குமதி செய்யப்படுகின்ற மருந்துகள் - ஔடதங்கள் சிறந்த முறையில் சர்வதேச தரச் சட்ட நியமங்களுக்கேற்ப இருக்க வேண்டும். இன்று இலங்கையிலே இறக்குமதி செய்யப்படுகின்ற பல மருந்து வகைகள் சரியான சட்டதிட்டங்களுக்கும் தரத்திற்கும் ஏற்ப இருந்தாலும், சில மருந்து வகைகள் ஒவ்வாத தன்மையை ஏற்படுத்துவனவாகக் காணப்படுகின்றன. இந்த நிலையைக் கருத்திற்கொண்டு மருந்து வகைகளை உற்பத்தி செய்கின்ற செயற்பாடுகளின் போது ஆயுர்வேத ரீதியான மருந்து வகைகளை உற்பத்தி செய்ய வேண்டிய நிலைப்பாடு இருக்கின்றது. அந்த வகையில் இன்று இலங்கையில் காணப்படுகின்ற அரிய வகையான மூலிகைகளை அடையாளம் கண்டு, அவற்றின்மூலம் சிறந்த மருந்துகளை உற்பத்தி செய்ய வேண்டும். இந்த மூலிகைகள் மூலம் உற்பத்தி செய்யப்படுகின்ற ஔடதங்கள் பக்க விளைவுகளை ஏற்படுத்தாதவையாகக் காணப்படுகின்றன. இப்படியான ஔடதங்களுக்கு முக்கியத்துவம் கொடுத்து, அவற்றின் உற்பத்தியை ஊக்கப்படுத்தக்கூடிய ஒரு நடைமுறையை ஏற்படுத்தலாம். இன்று நாங்கள் ஆங்கில மருந்துகளைக் கூடுதலாக இறக்குமதி செய்கின்றோம். அதேநேரம் எங்களது உள்ளூர் மூலிகைகளைக் கொண்டு கூடுதலான மருந்து வகைகளை உள்ளூரில் உற்பத்தி செய்து தர நியமங்களுக்கேற்ப வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்ய முடியும். அதன்மூலம் இந்த நாடு கூடுதலான வருமானத்தைப் பெறக்கூடியதாகவும் சரியான முறையில் மருத்துவத் துறையை நடைமுறைப்படுத்தக்கூடியதாகவும் இருக்கும்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

කඩන්ත කාලංකළිල් සුකාතාර අමෙච්චින් නිති ඔදුක් කීටානදු, පක්කච්චාර්පාන මුරෙයිලේ නටෙපෙට්රිරුක්කින්රදු. අන්ත වකෙයිලේ, කිළක්කු මාකාණත්තිල් ඉරුක්කින්ර වෛත්තියචාලෙකළිල් කූටුතලාකත් තමිල් පකුතිකළිලුළ්ළ වෛත්තියචාලෙකළ් පුරක්කණික්කප්පට්ටිරුක්කින්ර නිලෙමෙ කාණප්පටුකින්රදු. අණ්මෙයිලේ foreign funded project මූලම් කිටෙත්ත නිතියානදු, විසේටමාක ආතාර වෛත්තියචාලෙකළුක්කු ඔදුක්කප්පට්ටතාකත් තෙරිවික්කප් පට්ටදු. අන්ත වකෙයිල් පොත්තුවිල්, චම්මාන්තුරෙ, ඒරාවූර්, නින්තවූර් පෝන්ර වෛත්තියචාලෙකළ් තෙරිවු චෙය්යප්පට්ටු, පල්ලායිරම් කෝටි රූපාය් නිති අවර්රුක්කු ඔදුක්කප්පට්ටදු. නින්තවූර් පිරතේචත්තිල් ඔරු වෛත්තියචාලෙ ඉරුක්කින්ර පෝතුම් අංකු ඉන්නුමොරු වෛත්තියචාලෙයෙ නිරුවුවතර්කාක 5,000 මිල්ලියන් රූපාය් නිති ඔදුක්කප්පට්ටදු. අතේනේරම් චම්මාන්තුරෙ ආතාර වෛත්තියචාලෙක්කුම් පොත්තුවිල් ආතාර වෛත්තියචාලෙක්කුම් ඒරාවූර් වෛත්තිය චාලෙක්කුම් නිති ඔදුක්කප්පට්ටිරුක්කිරදු. එනිනුම් කිළක්කු මාකාණත්තිල් ඉරුක්කින්ර මුක්කියමාන තිරුක්කෝවිල් ආතාර වෛත්තියචාලෙක්කුම් වාළෙච්චේනෙ ආතාර වෛත්තිය චාලෙක්කුම් නිති ඔදුක්කප්පටාමල් අවර්රෙප් පුරක්කණිත්තිරුක්කින්ර නිලෙමෙ කාණප්පටුකින්රදු. අන්ත වකෙයිල් ආයිරක්කණක්කිල්, ඉලට්චක්කණක්කිල්, මිල්ලියන් කණක්කිල් නිති ඔදුක්කප්පටුකින්ර ඉන්තච් චෙයර්පාටානදු පක්කච්චාර්පාකවේ නටන්තිරුක්කිරදු. නාංකළ් එල්ලෝරුම් ඉන, මත පේතමින්රිච් චේවෙ චෙය්යවේණ්ටුම්; චෙයර්රිට්ටඞ්කළෙ මුන්නෙටුක්කවේණ්ටුම් එන්රු චොල්ලුකින්ර අතේනේරම්, ඉන්ත විටයත්තිලේ කිළක්කු මාකාණත්තිල් ඉන රීතියාන ඔරු පුරක්කණිප්පු ඉටම්පෙට්රිරුප්පතෙක් කාණමුටිකින්රදු. අතන්මූලම්, තමිල් මක්කළ් චෙරින්තුවාළුකින්ර පිරතේචත්තිලුළ්ළ වෛත්තියචාලෙකළුක්කු නිති ඔදුක්කීටු චෙය්වදු මරුක්කප්පට්ටිරුක්කිරදු. ඉන්ත විටයම් යාරාලුම් ඒර්රුක්කොළ්ළප්පට මුටියාතතාකුම්.

තිරුක්කෝවිල් වෛත්තියචාලෙයානදු ආතාර වෛත්තිය චාලෙයාකත් තරමුයර්ත්තප්පට්ටුම්කූට, ඉන්රුම් වෛත්තියර්කළ්, වෛත්තිය නිපුණර්කළ් අර්ර නිලෙයිලේ වෙරුමනේ 03 වෛත්තියර්කළෙ මාත්තිරම් කොණ්ටුළ්ළතාකක් කාණප්පටු කින්රදු.

ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා)

(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)

(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் கிழக்கு மாகாணத்தில் தமிழ் மக்கள் புறக்கணிக்கப்படுவதாகச் சொன்னீர்கள். அது உண்மையாக இருக்கலாம். ஆனால், சமீபகாலம் வரை கிழக்கு மாகாண சபையை உங்களுடைய கட்சியும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸும் இணைந்து கூட்டாட்சியாக நடத்திக்கொண்டிருந்தன. தொடர்ச்சியாகக் கிழக்கு மாகாணத்தில் ஆட்சி புரிந்தது உங்களுடைய கூட்டாட்சிதான். அதை நீங்கள் மனதிற்கொண்டுதான் உரையாற்றுகின்றீர்களா? என்பது தெரியவில்லை.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)

(The Hon. Kaveendiran Kodeeswaran)

கிழக்கு மாகாண ஆட்சி இவ்வாறு நடைபெற்றிருந்தாலும், இந்த வைத்தியசாலைகள் மத்திய அமைச்சின் செயற்பாட்டின் கீழ் உள்ளடக்கப்பட்டவையாகும். நான் சொல்கின்ற வைத்தியசாலை Line Ministry - மத்திய சுகாதார அமைச்சின்கீழ் வருகின்றது. இந்த நிதிகள் மத்திய சுகாதார அமைச்சினால்தான் வழங்கப்படுகின்றன. கிழக்கு மாகாணத்தில் முஸ்லிம்கள் செறிந்து வாழ்கின்ற பகுதிகளி லுள்ள வைத்தியசாலைகளுக்கு நிதி ஒதுக்கப்பட்டிருக்கின்ற போதிலும் தமிழ்ப் பகுதியில் இருக்கின்ற ஆதார வைத்திய சாலைகள் இரண்டுக்கும் நிதி ஒதுக்கப்படவில்லை. அதாவது திருக்கோவில், வாழைச்சேனை ஆதார வைத்தியசாலைகளுக்கு நிதி ஒதுக்கப்படவில்லை. நிந்தவூரில் ஏற்கெனவே ஒரு வைத்தியசாலை இருக்கின்றபோதிலும், அங்கு புதிதாக ஒரு வைத்தியசாலையை நிர்மாணிப்பதற்கு ஐயாயிரம் மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டிருக்கிறது; சம்மாந்துறை வைத்திய சாலைக்கு 1,200 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப் பட்டிருக்கிறது. அதேபோல் பொத்துவில் வைத்தியசாலைக்கும் ஏறாவூர் வைத்தியசாலைக்கும் நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. நீங்கள் மத்திய அரசாங்கத்தின் ஓர் அமைச்சராக இருக்கின்றீர்கள். இது எந்த வகையில் நியாயம்? நீங்கள் உங்களது அரசாங்கத்தில் இருக்கின்ற அமைச்சர்களுக்கு இதனை எடுத்துச்சொல்ல வேண்டும். அமைச்சரவைக் கூட்டத்திலே சொல்ல வேண்டும். இந்த நியாயமற்ற, நீதியற்ற செயற்பாடுகள் மீண்டும் நடைபெறக் கூடாது. இந்த நாட்டிலே இதனால்தான் பிரச்சினைகள் எழுகின்றன. கடந்த காலத்திலே அம்பாறை மாவட்டத்தில் மட்டுமல்ல, கண்டியிலும்கூட இனவாதம், மதவாதம் தலைதூக்கியிருந்தது. இதனைத் தடுத்து நிறுத்த வேண்டுமென்றாலும் சமத்துவமாக, சமமாக நீதி வழங்கப்படுவது அவசியமாக இருக்கிறது.

ගරු මනෝ ගනේසන් මහතා

(மாண்புமிகு மனோ கணேசன்)

(The Hon. Mano Ganesan)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது கருத்துக்களை நான் உள்வாங்கிக் கொண்டிருக்கின்றேன். நிச்சயமாக அமைச்சரவையில் இந்த விடயத்தை எழுப்புவேன். உண்மை யிலேயே உங்களது கட்சி எங்களது அரசாங்கத்திற்கு அவசரமான நேரங்களிலெல்லாம் பாரிய அளவிலே ஒத்துழைப்பு வழங்கிக்கொண்டிருக்கிறது - அரசாங்கத்தின் கஷ்டமான நேரங்களில் எல்லாம் அரசாங்கத்தைக் காப்பாற்றிக் கொண்டிருக்கிறது. ஆகவே, உங்களது கட்சிக்கும் அரசாங்கத்தின்மீது அழுத்தம் செலுத்துவதற்கான வாய்ப்பு எப்பொழுதும் இருக்கின்றது. ஆகவே, நீங்கள் அழுத்தம் செலுத்துங்கள்! நாங்களும் உள்ளே இருந்து அழுத்தம் செலுத்துவோம். அந்தவகையில், உங்களது குறைகளை நிச்சயமாகச் சரி செய்வோம்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)

(The Hon. Kaveendiran Kodeeswaran)

நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, நான் விசேடமாக ஒன்றைக் குறிப்பிட வேண்டும். அதாவது அரசியல் கைதிகளின் விடுதலை விடயத்திலே நீங்கள் அக்கறை கொண்டிருக்கின்றீர்கள். விசேடமாக அமைச்சரவை தீர்மானத்தின்மூலம் அந்தக் கைதிகளை விடுவிப்பதற்கான ஒரு முயற்சியை மேற்கொள்ளவிருப்பதாகவும் அறிகின்றோம். அந்தச் செயற்பாட்டை நீங்கள் விரைவுபடுத்திச் செய்ய வேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கிழக்கு மாகாணத்திலே மருத்துவ ரீதியாகப் பார்க்கையில் பலதரப்பட்ட குறைபாடுகள் காணப்படுகின்றன. குறிப்பாக

மருந்து விநியோகிப்பதிலுள்ள குறைபாட்டினால் சில வைத்திய சாலைகளிலே ஔடதங்கள் இல்லாத நிலை காணப்படு கின்றது. இதனால், கிராம, பிரதேச வைத்தியசாலைகளை அண்டியிருப்பவர்கள் மிகவும் பாதிப்புக்குள்ளாகின்றார்கள். அந்த மக்கள் கூடுதலாக வறுமைக்கோட்டின்கீழே வாழ்ப வர்கள். ஆனால், இன்று அந்த மக்களுக்கான ஔடதங்கள் அங்கு இல்லாத நிலைமையில் அவர்கள் மிகுந்த அவதிக்குள்ளாகின்றனர். பணம் படைத்தவர்கள் தனியார் வைத்தியசாலைகளிலோ அல்லது ஏனைய வைத்திய சாலைகளிலோ மருந்துகளைப் பெற்றுக்கொண்டு தங்களது உயிரைப் பாதுகாத்துக்கொள்கிறார்கள். எனவே, இந்த ஏழை மக்களின் நிலைமையைக் கருத்திற்கொண்டு அங்குள்ள பிரதேச, கிராம வைத்தியசாலைகளுக்கு கூடுதலான ஔடதங் களையும் அதேபோல் வைத்திய உபகரணங்களையும் வழங்க வேண்டும்.

திருக்கோவில் வைத்தியசாலையில் தேவையான கட்டிட வசதிகள் இல்லாத ஒரு குறைபாடும் காணப்படுகின்றது. அதேநேரம், அந்த ஆதார வைத்தியசாலையில் MLT இல்லை; Radiographer மற்றும் வைத்திய நிபுணர்கள் இல்லை; தாதிமார் இல்லை. அந்த ஆதார வைத்தியசாலையில் மூன்றே மூன்று வைத்தியர்கள்தான் இருக்கின்றார்கள். ஒரு MSகூட அங்கு நியமிக்கப்படவில்லை. இவை எல்லாம் எங்களால் ஏற்றுக்கொள்ள முடியாத விடயங்களாக இருக்கின்றன. ஆனால், இந்த வைத்தியசாலை கிட்டத்தட்ட 120 வருடங்கள் பழைமை வாய்ந்ததாகும். ஆகவே, இந்த வைத்தியசாலை இப்படிப் புறக்கணிக்கப்பட்டு வருவது மிகவும் கவலைக்குரிய ஒரு விடயமாகும்.

கடந்த காலங்களில் இந்த வைத்தியசாலையின் அரைவாசிப் பகுதியினை இராணுவத்தினர் தமது கட்டுப் பாட்டில் வைத்திருந்தனர். இது, யுத்தகாலத்திலே பாதிக்கப் பட்டு பல இழப்புக்களைச் சந்தித்திருந்தது. ஆகவே, நாங்கள் அப்படிப்பட்ட வைத்தியசாலைக்குரிய சரியான வளங்களைக் கொடுக்கவேண்டியவர்களாக இருக்கின்றோம். இந்த அடிப்படையிலே அந்த வைத்தியசாலைக்குக் கூடுதலான நிதியை வழங்கி, அந்த மக்களின் சுகாதார ரீதியான செயற்பாடுகளைப் பாதுகாக்க வேண்டிய கடமைப்பாடு உங்களுக்கு இருக்கின்றது.

மேலும், அந்த வைத்தியசாலைக்குத் தேவையான Blood Bank மற்றும் X-ray Department போன்ற வசதிகள் வழங்கப் பட வேண்டும். இந்தச் செயற்பாடுகளை முன்னெடுக்கின்ற போது அது பூரணத்துவம் வாய்ந்த ஒரு வைத்தியசாலையாக மாறும். ஆகவே, இந்த நாட்டிலே சுகாதாரம் - மருத்துவம், அவற்றுக்கான வளங்கள் என்பன இன, மத பாகுபாடற்று வழங்கப்பட வேண்டும். மரணம் என்பது எல்லா இனங் களுக்கும் ஏற்படுகின்ற ஒன்றாக இருக்கின்றது. ஓர் இனத்திற்கு மட்டும் மரணம் ஏற்படுவதில்லை.

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ உறுப்பினர் கோடீஸ்வரன் அவர்கள் குறித்த ஒரு வைத்தியசாலையை அபிவிருத்தி செய்யவேண்டும் என்கின்ற அக்கறையின் காரணமாகப் பிழையான தகவல்களை இந்தச் சபையிலே கூறிக்கொண்டிருக்கின்றார். யாரோ எழுதிக் கொடுத்த விடயங்களை அவர் வாசிப்பதாகவே நான் எண்ணுகின்றேன். நான் கிழக்கு மகாண சபையிலே சுகாதார அமைச்சராக இருந்தவன். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கிழக்கு மாகாணத்தில் ஒவ்வொரு மாவட்டத்திற்கும் ஒவ்வோர் இன ரீதியாகவும் பணத்தினை ஒதுக்குவது அங்கே –

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இது point of Order இல்லை. கௌரவ உறுப்பினர் கோடீஸ்வரன் அவர்கள் தொடரலாம்!

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
கௌரவ உறுப்பினர் மன்சூர் அவர்களே, நீங்கள் மாகாண சுகாதார அமைச்சராக இருந்தகாலத்தில்கூட, தமிழ்ப் பிரதேசங் களிலுள்ள வைத்தியசாலைகளைப் புறக்கணித்து வந்துள் ளீர்கள். அவற்றுக்கான நிதிகளையும் நீங்கள் குறைவாக ஒதுக்கியிருக்கின்றீர்கள். அவற்றுக்கான ஆளணிகளைத் திட்டமிட்டு நியமித்திருக்கின்றீர்கள். அப்படி நியாயமற்ற முறையிலே நீங்கள் செய்ததை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது. நாங்கள் மீண்டும் மீண்டும் மௌனிகளாக இருக்க முடியாது. ஏனென்றால், இந்தமுறை Line Ministry இனால் நிதி ஒதுக்கப்பட்டபோது *[இடைமீடு]* திருக்கோவில் வைத்திய சாலைக்கு ஒதுக்கப்படவில்லை. பாருங்கள்! ஏறாவூர் வைத்தியசாலை முஸ்லிம்கள் வாழ்கின்ற பிரதேசத்திலுள்ளது; சம்மாந்துறை வைத்தியசாலை முஸ்லிம்கள் வாழ்கின்ற பிரதேசத்திலுள்ளது; பொத்துவில் வைத்தியசாலை முஸ்லிம்கள் வாழ்கின்ற பிரதேசத்திலுள்ளது; நிந்தவூர் வைத்தியசாலை முஸ்லிம்கள் வாழ்கின்ற பிரதேசத்திலுள்ளது. இப்படிப் பக்கச் சார்பான முறையிலே உங்களது செயற்பாடு நடைபெறு மென்றால், மீண்டும் இனக்கலவரமோ, மதக்கலவரமோ ஏற்படுவதற்கு நீங்கள் துணையாக இருக்கின்றீர்கள் என்றுதான் நான் சொல்ல விரும்புகின்றேன்.

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இனக்குழப்பத்திற்கு அல்லது இனமுறுகலுக்கு நான் காரணமாக இருப்பதாக ஒரு பிழையான கருத்தை கௌரவ உறுப்பினர் அவர்கள் கூறினார். அவர் அதனை வாபஸ்

[ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා]

පෙරවේඩුම්. කිළක්කු මාකාණත්තైප් පොරුත්තවරෙයිල්, ආළුනර් අවර්කළ් ඉන විකිතාසාරප්පඩි පණම් ඔදුක්කුවතై උරුති සෙය්ත ඔරුවරාක ඉරුක්කින්රාර්. නාන් මට්ටුමල්ල, යාර් අමෛච්චරාක ඉරුන්තාලුම් ඉනංකළුක්කිටෙයිල් පාකුපාටාන මුරෙයිලේ ඔරු කාලමුම් නිති ඔදුක්කුවතිල්ලෛ.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

இந்த நிதியானது ஆளுநர் அவர்களால் ஒதுக்கப்பட்ட நிதியல்ல. இது Line Ministry இனால் ஒதுக்கப்பட்ட நிதி. குறிப்பாக, இந்த நிதிகள் பைஸால் காசிம் அவர்களின் முன்னெடுப்பால் ஒதுக்கப்படுகின்றன. ஆகவே, இந்தச் செயற்பாடுகளை சமத்துவமாக, சமமாக முன்னெடுக்க வேண்டுமென்று கூறிக்கொண்டு, வாய்ப்புக்கு மீண்டும் நன்றி தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended for lunch till 1.30 p.m.

රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත් නිටුවන ලදින්, අ.භා. 1.30 ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු අශෝක් අබේසිංහ මහතා.

[අ.භා. 1.30]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ඉදිරිපත් කරන අවස්ථාවේදී, නිදහසින් පසු මේ රටේ සෞඛ්‍ය සේවයට අය වැයෙන් විශාලම මුදලක් වෙන් කර තිබෙන වසරක ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා. මේ රජය සෞඛ්‍ය අංශය වෙනුවෙන් 2018 වසරේ ජාතික අය වැයෙන් රුපියල් බිලියන 200කට -රුපියල් කෝටි 20,000කට- ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා අද එතුමාගේ කථාවේදී පැහැදිලි කළා, 2015 ජනවාරි 08 දිනෙන් පසුව මේ නව රජය මේ රටේ 2,12,00,000ක් වන ජනතාවගේ සෞඛ්‍යය සඳහා රජයක් වශයෙන් ඉටු කළ සේවය පිළිබඳව. විශේෂයෙන්ම 2005 වසර වන විට සෞඛ්‍යය සඳහා රුපියල් මිලියන 35,000ක් -රුපියල් කෝටි 3,500ක්- පමණ වෙන් කළා. යුද්ධය අවසන් වුණාට පසුව 2010 දී එම මුදල රුපියල් කෝටි 5,500 දක්වා වැඩි වෙලා, මෙවර ඒ මුදල රුපියල් කෝටි 20,000කට ආසන්න මුදලක් බවට පත් වෙලා තිබෙනවා. මේ අය වැයෙන් සෞඛ්‍යය සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය තුළින් අපට හිතා ගන්න පුළුවන්, මේ රජය ජනතාවගේ නිදහස් සෞඛ්‍යය වෙනුවෙන් කොපමණ මුදලක් වෙන් කරනවාද කියලා.

අපේ නව රජය බලයට පත් වුණාට පසුව මේ මෑත වකවානුවේදී බෙහෙත් වර්ග විශාල ප්‍රමාණයක මිල අඩු කළා. ඒ බෙහෙත් ද්‍රව්‍යවල මිල අඩු වීම පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවට කරුණු පැහැදිලි කළා. සාමාන්‍යයෙන් සියයට 50ත් - සියයට 60ත් අතර ප්‍රමාණයකින් බෙහෙත් වර්ග විශාල ප්‍රමාණයක මිල අඩු වුණා. අද මෙම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වනවා, යම් යම් හේතු මත ඒ බෙහෙත් වර්ගවල මිල සියයට 5කින් පමණ ඉහළට දැමීමට. එයට හේතු එතුමා පැහැදිලි කරලා කිව්වා. අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය සේවය වෙනුවෙන්, විශේෂයෙන්ම මේ රටට බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා පමණක් මේ රජය 2018 වසරට රුපියල් කෝටි 4,500ක පමණ මුදලක් වෙන් කරලා තිබෙනවා. පසුගිය කාලයේදී සමස්ත සෞඛ්‍ය සේවයට වෙන් කරපු මුදලට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීමට පමණක් වෙන් කර තිබෙනවා.

අපේ රටේ සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ගැන වසර ගණනාවක් කථා කළා. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. එසේ වුවත්, සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය මේ රටේ ජනතාවට හඳුන්වා දීලා, මේ රටේ ජනතාවට අවශ්‍ය බෙහෙත් වර්ග ලබා දීමට නව සෞඛ්‍ය ඇමතිතුමාට හැකි වුණා. අපේ රටේ 700කට ආසන්න රෝහල් ප්‍රමාණයක තවම තිබෙන්නේ 77,000කට ආසන්න ඇඳන් ප්‍රමාණයක්. සාමාන්‍යයෙන් අපේ රටේ සමස්ත ජනතාවගෙන් සියයට 18ක් පමණ කුමන හෝ දීර්ඝ කාලීන රෝගයකින් පෙළෙනවා. වයස අවුරුදු 20ට වැඩි තරුණ කොටස්වලින් සෑම හතරදෙනකුගෙන් එක් කෙනකුම එවැනි රෝග තත්ත්වයකින් පෙළෙනවා. වයස අවුරුදු 60ට ඉහළ පිරිසෙන් දෙදෙනකුගෙන් එක් කෙනෙක්ම දීර්ඝ කාලීන රෝගයකින් පීඩා විඳිනවා. ඒ නිසා සෞඛ්‍ය සේවය සඳහා අතිවිශාල මුදලක් වැය කිරීමට අපට සිද්ධ වනවා. එසේ කරන්නේ මේ රටේ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ඇති කිරීම සඳහායි.

නව රජය බලයට පත් වුණාට පසුව අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය වසරේ අපේ රටේ ඉන්න දරුවන් 45,00,000ක් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළා. ඒ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය තවම ජනතාව අතරට ගිහින් තිබෙනවාද, නැද්ද කියන්න බැහැ. පාසල් දරුවනුත් පාර්ලිමේන්තු ගැලරියේ ඉන්න අවස්ථාවේදීයි මා මේ කාරණය කියන්නේ.

විශේෂයෙන්ම දෙමව්පියන් මේක හරියට තේරුම් ගන්නේ නැද්ද දන්නේ නැහැ. සෑම දරුවෙක්ම දැන් රුපියල් ලක්ෂ දෙකක රක්ෂණයකට යටත් කරලා තිබෙනවා. ඒක සෞඛ්‍ය රක්ෂණයක්. මේ රටේ පාසල් දරුවෙක් අසනීප වෙලා රජයේ රෝහලකට ඇතුළත් කළාම ඒ රෝහලෙන් නොමිලේ බෙහෙත් දෙනවා. නමුත්, මේ රජය ඒ විධියට නොමිලේ බෙහෙත් දීලා නතර වෙන්නේ නැහැ, සල්ලිත් දෙනවා. පාසල් දරුවෙක් අසනීප වෙලා රජයේ රෝහලක නැවැත්තුවාම, දවසකට රුපියල් 1,000 ගණනේ රුපියල් 30,000ක මුදලක් මාසයක් යනකල් ඒ රක්ෂණයෙන් ලබා දෙනවා. මම හිතන විධියට නොමිලේ බෙහෙත් දීලා, දවසකට රුපියල් 1,000ක් දෙන රටක් ලෝකයේ කොහේවත් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත්, ඒක මේ රජය කළා. ඒ වෙනුවෙන් අපේ සෞඛ්‍ය ඇමතිතුමාටත්, විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාටත් අපේ ස්තුතිය පුද කරනවා.

ඒ විතරක් නොවෙයි, පෞද්ගලික ආරෝග්‍යශාලාවක දරුවෙක් නැවැත්තුවොත්, ඒ දරුවා වෙනුවෙන් වැය වන මුදල රුපියල් ලක්ෂයක් දක්වා ඒ රක්ෂණයෙන් ගෙවනවා; ඒ වාගේම හදිසි අනතුරකට භාජනය වුණොත්, ඒ දරුවාට අවශ්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා රුපියල් 50,000ක් ගෙවනවා; ඒ වාගේම, දෙමාපිය මරණයකදී මුදල් ගෙවනවා. දරුවන් සඳහා මෙවැනි සෞඛ්‍ය

රක්ෂණයක් ඇති කිරීම පිළිබඳව අපි නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

මම දැක්කා මේ ඊයේ-පෙරේදා ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියනවා,"රජයේ රෝහල්වලින් බෙහෙත් ගන්නා අයට නොමිලේ බෙහෙත් දීලා බිලක් නිකුත් කරනවා" කියලා. ඒක ඉතා හොඳ කාරණයක්. රජයක් වශයෙන් නිදහස් සෞඛ්‍ය සේවයෙන් ජනතාවට කොපමණ මුදලක් වියදම් කරනවාද කියලා ජනතාව දැනගන්න ඕනෑ. සමහරවිට රෝහලෙන් බෙහෙත් අරගෙන ගිහිල්ලා විසි කරන අවස්ථා තිබෙන බව අපි දන්නවා.

මමත් බෙහෙත් ව්‍යාපාරයකට සම්බන්ධ කෙනෙක් වශයෙන් අපේ වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීවරයා මේ සභාවේ ඉන්න නිසා මට මේ කාරණය කියන්න හිතුණා. වෛද්‍යතුමනි, අපේ රටේ හුඟක් අය ඉතාමත් අනවශ්‍ය විධියට බෙහෙත් සහ විටමින් ලබා ගැනීමට පුරුදු වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ ඇමතිතුමා කිව්වා වාගේ, එක එක ආයතනවල බෙහෙත් වර්ගවල සන්නාම නාමයන් ප්‍රචලිත කිරීම සඳහා වෛද්‍යවරු යම් යම් දේවලට පෙළඹිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආයතනය පවත්වා ගෙන යද්දී පුද්ගලයෙක් කියපු කථාවක් මට මතක් වුණා. එක්කෙනෙක් ඇවිල්ලා කිව්වා "මට වෛද්‍ය සහතිකයක් ගන්න ඕනෑ" කියලා. ඒ කාලයේ විශේෂඥ වෛද්‍යවරයෙක් හම්බ වෙන්න අවශ්‍ය වෙලා තිබුණේ රුපියල් 60යි. මම මේ කියන්නේ එක්දහස් නවසිය අසූ ගණන්වල කථාවක්. මම ඒ පුද්ගලයාට වෛද්‍යවරයෙකුගේ නමක් කියලා, මෙයා ළඟට ගිහිල්ලා රුපියල් 60ක් දීලා, පසුව ටිකක් රිදෙනවා කියලා කියන්න. ඊටපස්සේ ඔයාට බෙහෙත් වට්ටෝරුවක් - prescription එකක් - ලියලා දෙයි. ඊටපස්සේ කියන්න, මට වෛද්‍ය සහතිකයක් ඕනෑ කියලා. එතකොට වෛද්‍ය සහතිකය රුපියල් හැටෙන් ගන්න පුළුවන් කියලා කිව්වා. තවදුරටත් මම කිව්වා, ඒ වෛද්‍යවරයා ලියන බෙහෙත් වට්ටෝරුව මට බලන්න ඕනෑ නිසා මට ගෙනත් දෙන්න කියලා.

ඊට පස්සේ එතුමා ගිහිල්ලා රුපියල් 60ක් බැඳලා ඒ වෛද්‍යවරයාට කියලා තිබෙනවා, "මගේ පසුව ටිකක් රිදෙනවා" කියලා. වෛද්‍යවරයා එතුමාව පරීක්ෂා කරලා බෙහෙත් වට්ටෝරුවක් ලියලා තිබුණා. එක්දහස් නවසිය අසූ ගණන්වල ඒ බෙහෙත් වට්ටෝරුවේ වටිනාකම රුපියල් 1,100යි. නමුත්, රුපියල් 60යි ඒක ලියා ගන්න වියදම් වුණේ. ඒ පුද්ගලයා මට ඇවිල්ලා වෛද්‍ය සහතිකයක් අවශ්‍යයි කියද්දී එතුමාට ලෙඩක් තිබුණේ නැහැ. එතුමාට ලෙඩක් නොතිබුණත්, ඒ විධියට පරීක්ෂා කරලා රුපියල් 1,100ක බෙහෙත් දීලා තිබුණා. සාමාන්‍යයෙන් සෞඛ්‍ය සේවයේ එහෙම තත්ත්වයකුත් තිබෙනවා.

මට තව කාරණයක් මතක් වෙනවා. තවත් රෝගියෙක් වෛද්‍යවරයෙකුගෙන් බෙහෙත් වට්ටෝරුවක් අරගෙන ඇවිල්ලා මගෙන් බෙහෙත් ගත්තාම, ඒකේ "Diazepam 2mg" කියලා ලියලා, "SPC" කියලාත් වරහන් ඇතුළේත් ලියලා තිබුණා. ඔය කාලය, සන්නාම නාමයත් එක්ක බෙහෙත්වල නාමයත් ලියන්න කියන සේනක බිබිලේ ප්‍රතිපත්තිය ගැන කථා කළ කාලය. එතුමා ලියලා තිබුණේ "Diazepam 2mg (SPC)" කියලා. ඒ පෙති හතට වැය වෙන්නේ සත 15යි. "සත 15ක්" කියලා කිව්වාම, ඒ පුද්ගලයා, "මම රුපියල් 60ක් බැඳලා සත 15ක බෙහෙත් ගන්නද ගියේ" කියලා ඒ බෙහෙත් වට්ටෝරුව ඉරලා විසි කළා. මම ඒ රෝගියාට ඒ වෙලාවේ තව වෛද්‍යවරයෙකුගේ නමක් කියලා, එහෙමනම් එතුමා ළඟට ගිහින් කියන්න. ඔයාට බෙහෙතක් දෙයි. ඔයා ඒ බෙහෙත් වට්ටෝරුව අරන් එන්න කිව්වා. එතැනට ගිහිල්ලා කිව්වාම නලින්ද ජයතිස්ස වෛද්‍යතුමනි, ඒ වෛද්‍යවරයා කියලා තිබුණා, "Valium 2mg, one *nocte* - 7"; රෑට එකක් වශයෙන් පෙති 7ක් ගන්න කියලා.

ඒ වෙලාවේ Valium පෙත්තක් රුපියල් 2.50යි. එතැන ගණන රුපියල් 16ක් 17ක් වෙනවා. එතකොට ඒ ලෙඩා බෙහෙත ගත්තා. ශත 15 බෙහෙත ගත්තේ නැහැ. හැබැයි, දෙකම එක බෙහෙත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා කියන එක ඇත්ත. එහෙම මාෆියාවක් තිබෙනවා. ඉතින්, ඔබතුමාගේ ෆාමසිවලින්ම ඒක පටන් ගන්න පුළුවන් නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

අපේ ෆාමසිවල පටන් අරගෙනයි තිබෙන්නේ. අපි කියලා තිබෙන්නේ-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම හිතන විධියට ඔබතුමා කුරුණෑගල ප්‍රධාන ෆාමසි ජාලයකම හිමිකරුවෙක්. ඒ නිසා ඔය අදහස ඔබතුමාගේ ෆාමසිවලින් පටන් ගන්න පුළුවන් නම් හුඟක් හොඳයි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

අපි එහෙමයි. ඇත්තම කියනවා නම් අපිත් හැම වෙලාවේම කියන්නේ බෙහෙත් වර්ගය සන්නාම නමින් ලියන්නේ නැත්නම් ඒක ජනතාවට හුඟක් වටිනවා කියන එකයි. මම මේක කියන්නමයි හිටියේ. අනවශ්‍ය විධියට බෙහෙත් ගන්න අය විශාල සංඛ්‍යාවක් ලංකාවේ ඉන්නවා. අනවශ්‍ය විධියට බෙහෙත් ගන්න සංඛ්‍යාව අඩු වුණොත් විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි වෙනවා. මම කිව්ව විධියට, එහෙම වුණොත් බෙහෙත් ගෙන්වන්න වැය වන රුපියල් කෝටි හාරදහස් ගණනක මුදල් ප්‍රමාණයත් අපට අඩු කර ගන්න පුළුවන්. ඒ වාගේම ඒ බෙහෙත් වර්ගය සන්නාම නමින් ලියන්නේ නැතිව බෙහෙතේ නමින් ලියන්න වෛද්‍යවරු පෙලඹෙනවා නම් වැය වන මුදල් ප්‍රමාණය හුඟක් අඩු කර ගන්න පුළුවන් වෙනවා. හැබැයි, ජනතාව අතරට ඒක යන්න ඕනෑ. මොකද, එකම බෙහෙත වැඩි මිලට ගන්න ජනතාව කැමැතියි. මිල අඩු වුණොත් බාල බෙහෙත් කියන අදහසක් ජනතාව අතර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි ජනතාව අතර ප්‍රචලිත කරන්න ඕනෑ, බෙහෙත්වල නම වෙනස් වුණාට ගුණාත්මකභාවයේ වෙනසක් නැහැයි කියලා. මේ කරන කාර්යය තුළම වෙළෙඳ නාමයත්, බෙහෙතේ නාමයත් අතර තිබෙන ප්‍රශ්නය පිළිබඳව ජනතාව දැනුවත් කළොත් හොඳයි කියලා මම විශේෂයෙන්ම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා මෙතැන නැතත්, විශේෂයෙන්ම අපේ රෝහල්වල බෙහෙත් ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳව කියන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මොකද, රුපියල් බිලියන 200කට ආසන්න මුදලක් සෞඛ්‍ය සේවය සඳහා වෙන් කරද්දී රෝහල්වල බෙහෙත් ගබඩා කිරීමේ පහසුකම් වැඩි දියුණු කළ යුතුයි. මොකද, තැන් තැන්වල ගබඩා කිරීම නිසා බෙහෙත්වල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමේ අපහසුතාවක් තිබෙනවා. මොකද, අවශ්‍ය තරම් ශීතාගාර සහිත ගබඩා පහසුකම් නැතුව ආලින්දයේ බෙහෙත් ගබඩා කරන අවස්ථා අපි දැක තිබෙනවා. ඒ නිසා ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා අපේ සෞඛ්‍ය ඇමතිතුමා විශේෂ උත්සාහයක් දරාවිය කියා මම බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.43]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය සමඟ ඉදිරිපත් කර තිබෙන මේ අති විශේෂ ගැසට් නිවේදනයට අදාළ විවාදයේදී, මම මුලින්ම මතක් කරන්න කැමැතියි, 2015 ජනාධිපතිවරණයෙන් පසුව දින සියයේ වැඩසටහන යටතේ රට හමුවේ තබන ලද බොහෝ පොරොන්දු ප්‍රමාණයක් තවම ඉෂ්ට වෙලා නැහැයි කියන එක. ඒවා ඔහේ වතුරේ ගසාගෙන ගිහිල්ලා තිබෙනවා. දින සියය ඇතුළත ලබා දුන් එක පොරොන්දුවක් තමයි ඖෂධ මිල අඩු කරලා ජනතාවට සහනයක් ලබා දෙනවාය කියන එක. නියමිත කාල වකවානුව තුළ සිද්ධ නොවුණත්; ජනතාව බලාපොරොත්තු වුණු ප්‍රමාණයට සිද්ධ නොවුණත් තෝරා ගත් ඖෂධ 48ක මිල අඩු කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කළා. දැන් අපි සාකච්ඡා කරන්නේ නැවත වතාවක් ඒ ඖෂධ මිල සියයට 5කින් වැඩි කිරීම සම්බන්ධයෙනුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොහොම වුණත් ජනතාවට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීම රජයේ වගකීමක්. ජනතාව බදු ගෙවනවා. බදු ගෙවන ජනතාවගේ ජීවිතය ආරක්ෂා කරන්න, ඔවුන්ගේ සෞඛ්‍ය සහ පෝෂණය නහාසිටුවන්න අත්‍යන්ත වූ බැඳීමක් රජයට තිබෙනවා. ඒ බදු ගෙවන ජනතාවට තමන්ට තනිවම රෝහලක් ගොඩනඟාගෙන; ඖෂධ නිෂ්පාදනය කරගෙන; එන්නත් හදාගෙන; සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පුරුදු පුහුණු කරගෙන තමන්ගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රතිකාර කර ගන්න බැරි නිසා, ශල්‍යකර්ම කර ගන්න බැරි නිසා තමයි ඔවුන් බදු ගෙවලා ආණ්ඩුවට කියන්නේ තමන් වෙනුවෙන් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යන්න කියලා.

ඖෂධ ගුණාත්මකභාවය වැඩි කිරීම, ඖෂධ මිල අවම මට්ටමක පවත්වා ගනිමින් ජනතාවට එය ලබා ගත හැකි තත්ත්වයකට පත් කිරීම, ප්‍රතිකාර කිරීමේදී හා රෝග නිශ්චය කිරීමේදී අදාළවන පරීක්ෂණ පහසු මට්ටමින් කර ගැනීමට ජනතාවට පහසුකම් සලසා දීම, සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම ඇතුළු සෞඛ්‍ය සේවාවේ භෞතික සහ මානව සම්පත් වැඩිදියුණු කිරීම පිළිබඳව ආණ්ඩුවක් නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතුයි. එය ආණ්ඩුව සතු වගකීමක්. මම දැක්කා, සෞඛ්‍ය ඇමතිතුමාත් මේ කාරණය කියලා තිබෙනවා. මීට කලිනුත් විවිධ අවස්ථාවල ඒ යෝජනාව ආවා. රෝහල්වල නිකුත් කරන ඖෂධවලට එහෙම නැත්නම් ශල්‍යකර්මයක් කළාට පස්සේ රෝගියා ප්‍රතිකාර ලබාගෙන රෝහලෙන් එළියට යනකොට කොතරම් මුදලක් රජය ඒ පුද්ගලයා වෙනුවෙන් දැරුවාද කියලා බිලක් දෙන්න ඕනෑ කියලා.

රජයේ රෝහල්වලට ඇතුළු වෙන රෝගියා-රෝගියා ගණනේ බිල් දෙන්න ගියාට පස්සේ ඒකට යන වියදමයි, ඒ බිල් ලියන්නයි, කඩන්නයි කාර්ය මණ්ඩලයක් යොදාගෙන ඔවුන් නාස්ති කරන කාලයයි, ශ්‍රමයයි සියල්ලම සෞඛ්‍ය සේවාව දියුණු කරන්න යොදා ගත්තා නම්, අපට මීටත් වඩා තව හුඟක් ඉස්සරහට යන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. දැන් ආණ්ඩුවට මෙච්චර කැක්කුමක්, වුවමනාවක් තිබෙනවා නම් බදු ගෙවන ජනතාවගේ ඒ බදු මුදල්වලින් කොටසක් වියදම් කරලා ඒ ජනතාව වෙනුවෙන් සපයන සේවාවට බිලක් දෙන්න. එහෙම නම් ඒ බදු ගෙවන ජනතාවගේ මුදලින් නඩත්තු වෙන අමාත්‍යාංශයක්-අමාත්‍යාංශයක් ගණනේ ලියන්න වෙයි, කොච්චර ඒවාට මාසයකට කුලිය ගෙවනවාද කියලා. එහෙම නම්, පාර්ලිමේන්තුවේ ඉඳලා යන කොට අමාත්‍යාංශ ගොඩනැඟිලිවල ගහලා තිබෙන්න ඕනෑ, මේ අමාත්‍යාංශයට මාසික කුලිය රුපියල් ලක්ෂ 247යි; සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාසික කුලිය ලක්ෂ 110යි; ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ කුලිය මාසයකට රුපියල් ලක්ෂ 103යි කියලා. මේ ආදී වශයෙන් අමාත්‍යාංශ බිල්ඩිමෙන්-බිල්ඩිමට ගහන්න ඕනෑ කුලිය මෙච්චරයි කියලා. නැත්නම් ඒවාත් යන්නේ ජනතාවගේ බදු මුදල්වලින්. ඒ වාගේම මේ මැති-ඇමතිවරුන් ගමන් කරන, ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ගමන් කරන, ඔවුන්ගේ නෝනලා සහ දූ දරුවෝ ගමන් කරන රජයේ බදු මුදල්වලින් ගත්තු වාහනවලත් ගහන්න වෙනවා, මෙන්න මේ වාහනයට ජනතාවගේ බදු මුදල් මෙච්චර ප්‍රමාණයක් -ලක්ෂ 350ක්, 400ක්- වියදම් කරලා තිබෙනවා කියලා.

අපි දන්නවා, සමහර අමාත්‍යාංශවල නියෝජ්‍ය ඇමතිවරුන් පාවිච්චි කරනවාට වඩා වටිනා වාහන තමයි අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් හෝ, පෞද්ගලික ලේකම් විධියට පත් කරලා ඉන්න ඇමති බිරිඳ පාවිච්චි කරන්නේ කියලා. ජනතාවගේ බදු මුදල් වියදම් කරන එක ජනතාවට දනවන්නට ආණ්ඩුවට මෙච්චර වුවමනාවක් තිබෙනවා නම්, ඒවාත් ප්‍රදර්ශනය කරන්න ඕනෑ. ඒවායින් තමයි පටන් ගන්න ඕනෑ.

"සුරක්ෂා" රක්ෂණය පිළිබඳවත් අපේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. එතුමා කථා කරපු එක රටට වාර්තා වෙනකොට නම් ජනතාවට හිතෙන්නේ ඕනෑම රෝගයකට රෝහල්ගත වෙන ශිෂ්‍යයෙකුට ආණ්ඩුවෙන් ප්‍රතිකාරත් කරලා අතටත් කීයක් හෝ දෙනවා කියලා. ඒක එහෙම වෙන්නේ නැහැ. අපි දන්නේ නැහැ, ඔය රක්ෂණය ආවරණය කිරීම සඳහා කොහෙන්ද ඒ රෝග හය, හත හොයා ගත්තේ කියලා; ඒ මොන නිර්දේශ මතද කියලා. සාමාන්‍යයෙන් ඉතාම කලාතුරකින් අපේ රටේ පාසල් දරුවෝ ගොදුරු වෙන රෝග ප්‍රමාණයක් වාර්තා කරලා, ඒවාට තමයි රක්ෂණය දෙන්නේ. සාමාන්‍යයෙන් ඩෙංගු හැදිලා රෝහල්ගත වෙන, බඩේ අමාරුවක් හැදිලා රෝහල්ගත වෙන, ශ්වසන ආබාධයක් හැදිලා රෝහල්ගත වෙන, ආහාර මාර්ග පද්ධතියේ ආබාධයක් වෙලා රෝහල්ගත වෙන දරුවන්ට මේ රක්ෂණාවරණය ලැබෙන්නේ නැහැ. "ආණ්ඩුව දරුවෙක් රෝහල්ගත වුණාම කීය කීය හරි දෙනවා" කියලා ෂෝක් එකට දෙමව්පියෝ බලාගෙන හිටියාට, එහෙම දෙන්නේ නැහැ.

සාමාන්‍යයෙන් සියයට 75කට වඩා පිලිස්සුණොත් තමයි ඔය රක්ෂණාවරණය ලැබෙන්නේ. මීට කලිනුත් මම සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂ අවස්ථාවේදී ප්‍රශ්න කෙරුවා, මේකට අඩු තරමේ අපේ රටේ සෞඛ්‍ය වෘත්තිකයන්ගෙන් උපදෙස් ගත්තාද කියලා. එහෙම නැත්නම් මේ තිබෙන සංඛ්‍යා ලේඛනවලින් ගත්තාද අපේ දරුවන් වැඩි ප්‍රමාණයක් රෝහල්ගත වෙන්නේ මොන කාරණා මතද කියලා. Sri Lanka Medical Association එක අපට දන්වා එව්වා, "ඔවුන් සාකච්ඡා ඉල්ලුවා, මේ ගැන ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කරන්න. කිසිදු අවධානයක් ආණ්ඩුව යොමු කළේ නැහැ." කියලා. ඒක නිසා ඔය කියන තරම් ඔය සුරක්ෂා එකත් එච්චර සුන්දර නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කියන්නට කැමැතියි. අපි වසරක්-වසරක් ගණනේ තෙල් සූත්‍රය වාගේ, බස් ගාස්තු වැඩි කරන්න වාගේ, ගෑස් මිල වැඩි කරන්න වාගේ ඖෂධ මිලත් වැඩි කරන්න මේ පාර්ලිමේන්තුවේ විවාද කරනවා.

ඖෂධ සමාගම් හිතුමතේ ඖෂධ මිල ඉහළ දමනවාට වඩා හොඳයි, අඩු තරමින් ඖෂධ 48ක හෝ මිල පාලනය කරලා, ඒ මිල වැඩි කරන කොට හෝ පාර්ලිමේන්තුවේ විවාදයක් ගැනීම. ජාතික ඖෂධ නියාමන අධිකාරිය ඒ ඖෂධ 48 තෝරා ගැනීම ගැන

ඇත්තටම අපේ ඇගයීමක් තිබෙනවා. එය නිකම්, ඔහේ, අහඹු ලෙස තෝරා ගෙන නැහැ. ලෝකය පිළිගන්නා විද්‍යාත්මක ක්‍රමවේදයක් මත, ඒ ඒ ඖෂධය කොතරම් ප්‍රමාණයකට පාවිච්චි කරනවාද කියන නිර්ණායකය මත තමයි මේ සූත්‍රය ගොඩ නහා තිබෙන්නේ. මිල වසරෙන් වසර සියයට 5කින් වැඩි කිරීම වෙනුවට ඊට වඩා අඩු මට්ටමක ප්‍රතිශතයක් ගැන සාකච්ඡා කරන්න ඇයි අපට බැරි? අපි පිළිගන්නවා, ඖෂධ සමාගම්වල පිරිවැය යම්කිසි ආකාරයකින් වැඩි වනවා කියන එක. නමුත් සියයට 5 කියන නිශ්චිත අගය වෙනුවට ඊට වඩා අඩු ප්‍රමාණයක් ගැන සාකච්ඡා කරන්න හෝ අපට අවස්ථාවක් තබා ගන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය මම අහන්න කැමැතියි. ඒ විතරකුත් නොවෙයි, තමුන්නාන්සේලා මෙසේ සියයට 5ක් මිල වැඩි කරන්න යෝජනා ගෙනෙන කොට, මේ අත්‍යවශ්‍ය ඖෂධ 48 තවත් වැඩි කරන අවස්ථාවක් ගැනත් සාකච්ඡා නොකරන්නේ ඇයි? මේ ප්‍රමාණයටම අත්‍යවශ්‍ය නොවුණත් ජනතාව විශාල වශයෙන් පාවිච්චි කරන තවත් ඖෂධ ප්‍රමාණයක් තිබෙනවා. අඩුම ගණනේ අවුරුද්දකට තවත් ඖෂධ 12ක්, 15ක් හෝ මේ ලැයිස්තුවට ඇතුළත් කරගන්න පුළුවන් නම් ඒ සහනයත් ජනතාවට ලැබෙනවා. ඒ පිළිබඳව මේ සාකච්ඡාවේ කිසි තැනක සඳහන් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අහගෙනයි සෞඛ්‍ය අමාත්‍යතුමාත් කියනවා, අලුතින් ඖෂධ නිෂ්පාදනය සඳහා යම් යම් ආයෝජකයන් කැඳවා ගන්නවා කියා. ඒ අතරම අපේ අමු ද්‍රව්‍ය යොදාගෙන අපේ රටේ සෞඛ්‍ය සේවාව වෙනුවෙන්, අපේ රෝහල් පද්ධතියට අත් වැසුම් නිෂ්පාදනය කරන, ගෝස් නිෂ්පාදනය කරන කර්මාන්ත පද්ධතියක් අපේ රටෙත් තිබෙනවා. හැබැයි දැන් තමුන්නාන්සේලා අලුතින් ආයෝජකයන් කැඳවා ගන්න යන වෙලාවේ ඒ විදේශීය ආයෝජකයන්ට දෙන සහනය අපේ දේශීය නිෂ්පාදකයන්ට ලබා දෙන්නේ නැහැ. අප දැන් විශාල වශයෙන් ආයෝජකයන්ට සහන ලබා දීලා, බදු සහන ලබා දීලා, ඉඩම් දීලා - සමහර විට අක්කරය රුපියල් 100ට, රුපියල් 150ට දීලා- ගෙන්වා ගන්නේ එක්කෝ ඉන්දියාව, එහෙම නැත්නම් බංග්ලාදේශය ආදි අපේ කලාපයේම රටවලින්; සෞඛ්‍ය තත්ත්වය ගුණාත්මකව එතරම් සංවර්ධනය නොවුණු, එම නිෂ්පාදන සම්බන්ධයෙනුත් බරපතළ ප්‍රශ්න තිබෙන රටවලින්. මොකද, ඔවුන් ආසියානු කලාපයට නිෂ්පාදනය කරන්නේ එක් වර්ගයක්, එක් කාණ්ඩයක්; යුරෝපයට නිෂ්පාදනය කරන්නේ වෙනත් කාණ්ඩයක්. එවැනි සමාගම්වලට තමයි එන්න කියන්නේ.

පසුගිය කාලයේ සමාගම් බොහෝ සෙයින් blacklist වුණා. එහෙම තියෙද්දීත් ඒවා කෙරේ තමයි වැඩි අවධානයක් යොමු කර තිබෙන්නේ. පසුගිය කාලය පුරා අපේ ජනතාවට රැකියා ලබා දෙමින්, ඒ වාගේම සමහර විට රටට යම්කිසි ආකාරයකට විදේශ විනිමය උත්පාදනය කරපු දේශීය නිෂ්පාදකයන්ට මීට වඩා සහනයක් දිය යුතුයි කියන යෝජනාව මම කරනවා.

ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑමේදී ඖෂධ මිල, ඖෂධවල ගුණාත්මකභාවය ආදි සියලු කාරණාවලට සේම සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධවත් වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. පසුගිය කාලය පුරාම අප සෞඛ්‍ය හෝ උසස් අධ්‍යාපනය ගැන පාර්ලිමේන්තුවේ කවර විවාදයක් ගත්තත් එය ඇදිලා තිබුණේ SAITM ප්‍රශ්නයත් එක්කයි. තවමත් ඒ ප්‍රශ්නයට සාධාරණ සහ සාර්ථක විසඳුමක් ලබා දෙන්න ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. පසුගිය අගෝස්තු මාසයේ SAITM රෝහල රජයට පවරා ගත්තා කිව්වා. ජනාධිපතිතුමාත් ගිහින්, සෞඛ්‍ය අමාත්‍යතුමාත් ගිහින්, උසස් අධ්‍යාපන අමාත්‍යතුමාත් ගිහින් ඒ පරිශ්‍රයේ ලොකු උත්සවයක් තියලා ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කරලා, "ඔන්න දැන් රෝහල රජයට පවරාගත්තා. දැන් ප්‍රශ්නයක් නැහැ. දැන් මේ රෝහල දියුණු කරලා ආසියාවේ හොඳම රෝහලක් බවට පත් කරන්න පුළුවන්" කියා තමයි ඒ වෙලාවේ පාරම් බැන්දේ. මම කැමැතියි, සෞඛ්‍ය අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ සිටියා නම් අහගන්න, අත්සන් කරපු ඒ ගිවිසුම දැන් කෝ කියා.

මා දන්නවා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඒ ගිවිසුම ඉල්ලුවා කියා. එතකොට සෞඛ්‍ය අමාත්‍යාංශය කිව්වේ, "එහෙම ගිවිසුමක් නැහැ. එකඟතා ලියවිල්ලක් - Letter of Intent - පමණයි තිබෙන්නේ." කියන එකයි. නමුත් අපට මාධ්‍ය මඟින් වාර්තා වුණේ ඒ පාර්ශ්වයන් තුන ගිවිසුමක් අත්සන් කළා, අත්සන් කරලා එය දැන් රජයට පවරාගත්තා කියායි.

පවරා ගත්තා විතරක් නොවෙයි, මම දන්නා හැටියට එතැන් සිට සෞඛ්‍ය අමාත්‍යාංශය මාසයකට රුපියල් මිලියන 300කට ආසන්න මුදලක් මාලබේ SAITM රෝහලේ කාර්ය මණ්ඩලයට පඩිනඩි ගෙවන්නත්, එහි සෞඛ්‍ය පහසුකම් වෙනුවෙනුත් වියදම් කළා. සමහර කාලවල රජයේ රෝහල්වලට ඖෂධ සැපයූ, සමහර ශල්‍ය උපකරණ සැපයූ, අත්වැසුම් - gloves - වැනි දෑ සැපයූ අයට අදාළ කරන මුදල් ගෙවීම මාස ගණන් පෝලිමේ තබාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය SAITM රෝහල වෙනුවෙන් රුපියල් මිලියන 300කට ආසන්න ප්‍රමාණයක් මාසයකට වැය කළා. දැන් මාස අටක් තිස්සේ ගෙවා තිබෙනවා. හැබැයි, දැන් මේ රජයට පවරා ගත්තායි කියන රෝහල විකුණන්න ලෑස්තියි කියලා එක පාරටම පුවත් පත් දැන්වීමක් දමා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයට අයිති දේපොළක්, රජය විසින් නඩත්තු කරන දේපොළක්, ජනතාවගේ බදු මුදල්වලින් වැටුප් ලබන සේවකයින් ඉන්න තැනක්, රජයේ ආයතනයක්ය කියලා ආණ්ඩුව කියන තැනක් ගැන පුවත් පත් දැන්වීම් දාලා "දැන් අපි මේ ආයතනය විකුණන්න ලෑස්තියි" කියන්න පෞද්ගලික අංශයේ පාලන අධිකාරියට, කළමනාකාරිත්වයට පුළුවන්ද?

මම ඊයෙත් මේක ගැන ඇහුවා, පාර්ලිමේන්තුවේදී. ආණ්ඩු පාර්ශ්වයේ කිසි කෙනකු උත්තර දුන්නේ නැහැ. මම කැමැතියි, සෞඛ්‍ය ඇමතිවරයා හෝ වර්තමාන උසස් අධ්‍යාපන ඇමතිවරයා හෝ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිවරයා හෝ -එතුමා මේකට විශාල වශයෙන් කර ගහපු කෙනෙක්.- මෙයට සම්බන්ධ හෝ අදාළ කවුරු හෝ ඇවිල්ලා මේකට උත්තර දෙනවා නම්. පසුගිය අගෝස්තු මාසයේදී මේ පාර්ලිමේන්තුවට වාර්තා කරපු ආකාරයට රජයට පවරා ගත්තායි කියන රෝහල පුවත් පත් දැන්වීම් දාලා විකුණන්න ලෑස්තියි කියලා දැන් නෙවිල් ප්‍රනාන්දු මහත්මයා කියන්නේ කොහොමද? මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව කටයුතු කරනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම දැන්වීමක් දැමීම සම්බන්ධයෙන් අපි නෙවිල් ප්‍රනාන්දු මහත්මයා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ගෙන්වා ප්‍රශ්න කරන්න ඕනෑ.

ඊළඟට, මම දිගින් දිගටම මතු කළා, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යාමේදී සෞඛ්‍ය වෘත්තිකයන්ගේ දැනුම, කුසලතාව සහ විශේෂඥභාවයත් අතිශයින්ම වැදගත් කියන එක. දොස්තර කෙනකු වෙන්න කැමැති කෙනකුගේ, හෙදියක් වෙන්න කැමැති කෙනකුගේ, වෙනත් ඕනෑම සෞඛ්‍ය වෘත්තිකයකු වෙන්න කැමැති කෙනකුගේ කැමැත්ත තිබූ පළියට මේ ක්ෂේත්‍රයට ගෙනැල්ලා ජනතාවට සෞඛ්‍ය පහසුකම් සපයන්න, වෛද්‍ය ප්‍රතිකාර කරන්න දෙන්න බැහැ. ඒ නිසා තමයි පසුගිය කාලයක් තිස්සේ අපි විශාල අරගළයක් කළේ, මේ සෞඛ්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැක ගන්නට. ආණ්ඩුව ඒ වෙලාවේ බොහොම උද්ධච්ච ලීලාවෙන් හිටියා, තමන්ට මොනවා වුණත් SAITM මුදලාලි රැක ගැනීමයි ඒ ගොල්ලන්ගේ පරමාර්ථය කියලා. මේ සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් පාර්ලිමේන්තුවට යොමු කර

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තිබෙනවා. ආණ්ඩුව කියනවා, අපේ රටේ අපොස (උසස් පෙළ) විභාගයේ ලකුණක්, දෙකක් අහිමි වන "A" තුනත් අරගෙන වෛද්‍ය පීඨයට යන්න බැරි වන, Z-score අගයේ දශමයක් දෙකක් අහිමි වන දරුවන් කෙරෙහි අනුකම්පාවෙන්, ඔවුන් පිළිබඳව හෘදයාංගමව නැඟෙන දුක, වේදනාව නිසා තමයි අපි -මේ ආණ්ඩුව - බෙල්ල තියලා හෝ මෙවැනි SAITM වාගේ ආයතනය පවත්වාගෙන යන්නේ කියලා. හැබැයි, අවුරුද්දෙන් අවුරුද්ද අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අරගෙන බැලුවොත්, 2015 ප්‍රතිඵල අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් රජයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වී තිබෙන අවම සුදුසුකම් බවට පත් වෙලා තිබෙන්නේ "A" දෙකයි, "B" එකයි; ගම්පහ දිස්ත්‍රික්කයේ "A" එකයි "B" දෙකයි; කළුතර දිස්ත්‍රික්කයේ "A" දෙකයි, "B" එකයි; කෑගල්ල දිස්ත්‍රික්කයේ "A" එකයි, "B" දෙකයි; රත්නපුර දිස්ත්‍රික්කයේ "A" එකයි, "B" දෙකයි; අද උදේ මම ඇහුව විධියට බදුල්ල දිස්ත්‍රික්කයේ "A" එකයි, "B" දෙකයි; මොනරාගල දිස්ත්‍රික්කයේ "B" තුනයි. තව ඉස්සරහට උතුරු, උතුරුමැද පළාත් දිස්ත්‍රික්කවල ප්‍රතිඵල එන්න නියමිතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කරනවා, අපේ රටේ බොහෝ දිස්ත්‍රික්කවල ජීව විද්‍යා අංශය හැදෑරූ දක්ෂ දරුවන්ගේ වෛද්‍ය පීඨයට ඇතුළත් වීමේ අවම සුදුසුකම් බවට පත් වෙලා තිබෙන්නේ "A" එකයි, "B" දෙකයි බව. මොනරාගල දිස්ත්‍රික්කයේ තමයි දැනට එම සුදුසුකම "B" තුනක් කියලා වාර්තා වෙලා තිබෙන්නේ. එවැනි ප්‍රතිඵල වාර්තා වෙද්දී, තමන්ගේ ඇස් පනා පිට පෙන්වන්න පුළුවන් සත්‍ය කරුණු තිබියදී තමයි "ලකුණක් දෙකක් මදි වුණු ශිෂ්‍යයින් ඇතුළත් කිරීම සඳහායි පෞද්ගලික වෛද්‍ය පීඨ ආරම්භ කරන්නේ" කියලා ආණ්ඩුව අදෝනා ගහන්නේ. හැබැයි, එහි අවම සුදුසුකම බවට පත් කරලා තිබෙන්නේ මොකක්ද? "S" 3යි. අඩු ගණනේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011දී සම්මත කරගත් "C" 2යි, "S" 1වත් නොවෙයි. "C" 2යි "S" 1යි පැත්තක තියලා අවම සුදුසුකම හැටියට "S" 3 යෝජනා කරලා, මුදල් තිබෙනවා නම් වෛද්‍ය අධ්‍යාපනය සඳහා ඔවුන්ව ඇතුළත් කර ගන්න හදනවා.

මේ රටේ තිබෙන රාජ්‍ය අධ්‍යාපනයත් කඩාකප්පල් කරලා, විකුණලා දාලා, මුදල් ඇති හැකි අයට පමණක් වෛද්‍ය අධ්‍යාපනය විවෘත කිරීමට නේද මේ හදන්නේ කියන එක මම අහන්න කැමැතියි. අඩුම තරමින් අවම සුදුසුකම "B" 3ක් කළා නම් සාධාරණයි. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා කිව්වාට පස්සේ ගරු මොහාන් ලාල් ග්‍රේරු රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, එක් එක් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කය තත්ත්වය වෙනස් වෙනවා කියලා. එහෙම නම් කරන්න තිබෙන්නේ, වසරින් වසර වෙනස් වන ආකාරයට, ඒ කියන්නේ එක් දිස්ත්‍රික්කයකින් එක් වසරකදී වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු අවම සුදුසුකම සලකා බලා වසරින් වසර, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අවශ්‍ය සුදුසුකම් නිර්දේශ කිරීමයි. එහෙම නැතුව යුද්ධය කාලයේ කිලිනොච්චියේ ඇත ගම්මානයකට බෝම්බ වැටෙනකොට, විදුලි බලය නැති අවස්ථාවේ අමාරුවෙන් පාඩම් කරලා වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු දරුවෙකුගේ අධ්‍යාපන සුදුසුකම් දඩමීමා කරගෙන, සියලු පහසුකම් තිබෙන අයටත් වෛද්‍ය පීඨය ඇතුළට යන්න මාර්ගයක් හදාගන්නවා නම්, ඒක ඒ තරම් සාධාරණ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරවන්න කැමැතියි.

පසුගිය නොවැම්බර් මාසයේ විතර SAITM ප්‍රශ්නයට විසඳුමක් ලබා දීමේදී ආණ්ඩුව විවිධාකාර යෝජනා ඉදිරිපත් කළා. අවසානයේදී ජනාධිපතිතුමා කියනවා මම දැක්කා, SAITM එක කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරනවා කියලා. මම දන්නා හැටියට තවමත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අරගෙන නැහැ. ඒ වාගේම තවමත් එතැන රෝහලක් විවෘත කරලාත් නැහැ. එහි ඉගෙන ගන්නා ශිෂ්‍යයින්ට තිබෙන රෝහල ප්‍රමාණවත් බවකුත් නැහැ. ඒක නිසා අපේ රටේ රජයේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවල සිටින දරුවන්ගේ අධ්‍යාපනය නැවත වතාවක් කඩාකප්පල් කරන්නේ නැතුව වාගේම, රැවටීමට ලක් වූ SAITM එකේ සිසුන්ටත් සාධාරණයක් වන විධියට මෙය කඩිනමින් විසඳයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු අමාත්‍යතුමා කිව්වා, සෞඛ්‍ය අමාත්‍යාංශය කරන හොඳ වැඩ පිළිබඳව මාධ්‍ය මඟින් වාර්තා වෙන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, අපේ රටේ සාක්ෂරතාවට සාපේක්ෂව, ජනතාව විටින් විට විවිධ මිථ්‍යාවන්ට ගොදුරු වෙනවා සහ ගොදුරු කරනවා. මීට මාසයකට පමණ කලින් වඳ පෙත්තක් සම්බන්ධයෙන් මහා ආන්දෝලනයක් ඇති වුණා. වඳ පෙත්තට කලින් වඳ spray එකක් ගැන රට තුළ ලොකු භීතියක් හදලා තිබුණා. හැබැයි, වඳ පෙත්ත නිසා ජාතිවාදී ගැටුමක් ඇතිවෙලා, ගෙවල් ගිනි තියාගන්නකල් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වෙලා අඩු ගණනේ නිවේදනයක්වත් නිකුත් කරනවා මම දැක්කේ නැහැ. පසුව හෝ නිකුත් කරපු එක හොඳයි. හැබැයි, ඇඳුම්වලට spray එකක් ගහනවා, අරවා ගහනවා, මේවා ගහනවා කියන වෙලාවේ, ඒක නිවැරදි කරන්න, ඒ සම්බන්ධයෙන් සොයා බලන්න සෞඛ්‍ය අමාත්‍යාංශයට වග කීමක් තිබුණා. ඒ වාගේම මීට කාලයකට කලින් කුරුණෑගල ප්‍රදේශයේ දරුවෙකුට ඒඩිස් රෝගය වැලඳුණා කියලා ඒ දරුවා පාසලෙන් පිටමන් කරද්දී, අධ්‍යාපන ඇමතිවරයාත් ඒඩිස් රෝගය සුළඟින් බෝවෙනවා කියලා පිළිඅරගෙන කටයුතු කරද්දී සෞඛ්‍ය අමාත්‍යාංශය එයට නිවැරදි ලෙස මැදිහත් වුණේ නැහැ. ඖෂධ සම්බන්ධයෙන් විතරක් නොවෙයි, ඖෂධ මිල අඩු කළාට පස්සේ එම ඖෂධ මිල අඩු කිරීම සම්බන්ධයෙන් එන ජනප්‍රියතාව ගන්නට මාධ්‍ය දැන්වීම් පළ කරනවාට වඩා වැඩි බරකින් සහ අවධානයකින් ජනතාවගේ මෙවැනි මිථ්‍යා දෘෂ්ටීන් පරාජය කිරීම සඳහා, වෛද්‍ය විද්‍යාත්මක පැත්තෙන් එන මෙවැනි දේවල් පරාජය කිරීම සඳහා මැදිහත් වෙන්න සෞඛ්‍ය අමාත්‍යාංශයට වාගේම ආණ්ඩුවටත් වග කීමක් තිබෙනවා. ඒවා ගොඩ ගැහිලා, ගොඩ ගැහිලා ආවාට පස්සේ අර වාගේ ප්‍රතිඵලවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය භාරය, ඒ කියන්නේ ජනතාවට ගුණාත්මක සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යෑම සඳහා පුද්ගලයා කේන්ද්‍ර කරගත් සිතීමක් දක්වා එම ප්‍රතිපත්තිය සකස් විය යුතුයි කියා මම යෝජනා කරනවා.

අදටත් බොහෝ රෝහල්වල සේවකයන් රෝගියා කේන්ද්‍ර කරගත්ත, පුද්ගලයා කේන්ද්‍ර කර ගත්ත සෞඛ්‍ය පහසුකම් සපයන එක පැත්තක තියලා, සමහර වෘත්තීන් අතර සට්ටනවලට මැදිහත් වෙනවා. කවුරු හරි රෝහලකට ගියාට පස්සේ ඒ රෝගියාගේ ECG එක ගන්නේ කවුද කියන කඹ ඇදිල්ල තවමත් බොහෝ රෝහල්වල තිබෙනවා. ඒක ECG technician ගන්න ඕනෑද? හෙදිය ගන්න ඕනෑද? එහෙම කවුරුවත් නැත්නම් leads ටික ගහලා වෛද්‍යවරයා ගන්න ඕනෑද කියන ආකාරයේ ප්‍රශ්නත් පැන නඟිනවා. එයින් පීඩාවට පත් වන්නේ වෙන කවුරුවත් නොවෙයි, රෝගියායි; අදාළ පුද්ගලයායි; බදු ගෙවන පුරවැසියායි. එම නිසා මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඒ ඒ ශ්‍රේණි අතර තිබෙන පුංචි පුංචි සට්ටන වළක්වලා, ඒ අයගේ අවධානය මේ රෝගියා, පුරවැසියා සුවපත් කිරීම වෙනුවෙන් යෙදවිය යුතුයි කියන යෝජනාවත් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.06]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දවසේ ඉතාම වැදගත් යෝජනාවක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව

ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග කිහිපයක් ඉදිරිපත් කරන මේ වෙලාවේ අපේ රටේ සෞඛ්‍ය අංශයට සම්බන්ධ ප්‍රධාන කරුණු කීපයක් ගරු සභාවේ අවධානයට යොමු කරවන්න කැමැතියි. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අපේ ගරු ඇමතිතුමාත්, මේ ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුනුත් තමුන්ගේ කථාවලදී කියන්නේ මහාචාර්ය සේනක බිබිලේ ප්‍රතිපත්තිය ගැනයි. මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා උත්සාහ කළේ බහු ජාතික සමාගම්වල ඖෂධ මාෆියාවෙන් අපේ රටවල් බේරා ගැනීම සඳහායි. එතුමා අරගළයක් කළේ ඒ සඳහායි. අද ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන්නේ අපේ රටේ දේශීය ඖෂධ නිෂ්පාදනය විනාශ වී යාමයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ නායකත්වය යටතේ පවතින අමාත්‍යාංශය ඉන්දියානු මැදිහත්වීම් මත ඉන්දියානු බහුජාතික සමාගම්වලින් ඖෂධ ගෙන්වන ව්‍යාපාරයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අපේ රටේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පැවතුණා. මේ රටට අවශ්‍ය දේශීය බෙහෙත් බොහොමයක් එහි නිෂ්පාදනය වුණා. අද වන විට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඇණ හිටලා තිබෙන්නේ; වහලා දාලා තිබෙන්නේ; නිෂ්පාදන කටයුතු කෙරෙන්නේ නැහැ. ඒ වුණාට සේනක බිබිලේ ප්‍රතිපත්තිය ගැන තමයි කථාව. ඇමතිතුමාගේ ඥාති මිත්‍රාදීන් එක්ක එකතු වෙලා "ටිල්" කියලා සමාගමක් ආරම්භ කරලා, රටේ ඖෂධ නිෂ්පාදනය නවත්වලා දාලා ඉන්දියානු සමාගමක් හරහා බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වනවා. මේ පිළිබඳව මම ගරු සභාවේ සාධක ඇතිව කියලා තිබෙනවා. ඉන්දියානු බෙහෙත් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්න තිබුණාට මිල අඩුවීමක් තිබෙන බව අපි දන්නවා.

අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග යටතේ ඖෂධ වර්ග රාශියක මිල අඩු කරන්න පුළුවන් නිසා ඇමතිතුමාට හරි සතුටුයි. හැබැයි, මේ බෙහෙත් වර්ගවල ගුණාත්මකභාවය පිළිබඳව කවුද සහතික කරන්නේ? ඒ නිසා මම නැවතත් කියනවා, මේ ඖෂධ මිල අඩු කරලා තිබෙන බව ඇත්ත. නමුත් මිල අඩු ලෙඩ වැඩි ප්‍රතිපත්තියක් තමයි ඇමතිතුමා අනුගමනය කරලා තිබෙන්නේ. දේශීය කර්මාන්ත විදේශ ආයෝජනත් එක්ක සම්බන්ධ වෙලා මේ රට තුළ ක්‍රියාත්මක කරපු ඖෂධ නිෂ්පාදන සියල්ලක් දැන් කඩා වට්ටලා ඉවරයි. ගරු ඇමතිතුමනි, එම නිසා වර්ෂයකට රුපියල් බිලියන ගණනක ඖෂධ අපට ඉන්දියාවේ සමාගම්වලින් ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉන්දියාවෙන් ගෙන්වනවා. ඒ නිසා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉන්දියානුකරණය කරලා තිබෙන්නේ. බෙහෙත් ද්‍රව්‍ය විතරක් නොවෙයි, රෝහල්වල සියලුම කටයුතු අද ඉන්දියානු සමාගම්වලට පවරන්න යනවා. පසුගිය සතියේ අපි දැක්කා, අපේ රටේ රෝහල්වල ඇඳ ඇතිරිලි ටික, රෙදි ටික හෝදන එකත් ඉන්දියානු සමාගමකට පවරන්න යන බව. මහ ලොකුවට සේනක බිබිලේ ප්‍රතිපත්තිය ගැන කථා කරන්නේ. රෙද්ද හෝදන්නත් ඉන්දියානු සමාගමකට පවරනවා. මොකක්ද මේ රටේ ප්‍රතිපත්තිය? මේ ප්‍රතිපත්ති පිළිබඳව ලජ්ජා වෙන්න ඕනෑ. මොකක්ද මේ කරන්නේ? දේශීය ප්‍රතිපත්තියක් ද මේ අනුගමනය කරන්නේ?

ඉන්දියානුකරණය සඳහා වූ ප්‍රතිපත්තියක් තමයි මේ අනුගමනය කරන්නේ. ඇමතිතුමා අවංකද, වංකද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, එතුමා දැනුවත්ව, එතුමා නියෝජනය කරන, "ටිල්" කියන සමාගම, -මම චෝදනා කරනවා, හේතු සාධක සහිතව- සමඟ එකතු වෙලා මේ රටේ ඖෂධ නිෂ්පාදනය නවත්වලා ඉන්දියාවෙන් ඖෂධ ගෙන්වීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන බව මම කියනවා. ඇමතිතුමා ගරු සභාවට පැමිණි නිසා මම නැවත කියනවා. ගරු ඇමතිතුමා සභාවේ ඉන්න නිසායි මම මේ කියන්නේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වහලා දමලා ඉන්දියාවෙන් ඖෂධ ගෙන්වන ව්‍යාපාරයක් තමයි දැන් කරන්නේ. ඖෂධ මිල අඩු කරන එක හොඳ දෙයක්. ඉන්දියාවෙන් හෝ වෙනත් රටකින් හෝ ඖෂධ ගෙනාවාට කමක් නැහැ. හැබැයි, එවායේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සහතිකයක් දෙන්නට ඕනෑ. ඒ සහතිකය දෙනවාද කියන කාරණය ගැන අපට ගැටලුවක් තිබෙනවා. රටේ දේශීය ඖෂධ නිෂ්පාදනයට දෙවියන්ගේ පිහිටයි කියලා විතරයි අද කියන්නට තිබෙන්නේ. දේශීය ඖෂධ නිෂ්පාදනයක් මේ රටේ සිද්ධ වෙන්නේ නැහැ, එය නැති කර දමලායි තිබෙන්නේ.

අපි දන්නවා, ඇමෙරිකානු ඩොලරයේ අගය දවසින් දවස වැඩි වෙන බව. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ රුපියල් 131ක් ගෙව්වා ඇමෙරිකානු ඩොලර් එකට. අද ඒ ප්‍රමාණය රුපියල් 157 දක්වා වැඩි වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ සියලු දේවල් පිට රටින් ආනයනය කරන්නේ නම්, ඒ සියලු දේවල මිල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව වැඩි විය යුතුයි. ඒකෙන් පිට පනින්න කාටවත් බැහැ. ඇමතිතුමා ඒ භාණ්ඩ සඳහා සහනාධාර දෙනවා වෙන්න පුළුවන්. හැබැයි ඒ හා සමාන පරිමාණයකින් රටේ ජාතික ආර්ථිකයට බලපාන විධියට රටින් විනිමය බැහැර වීමක් වෙනවා. දවසින් දවස ඇමෙරිකානු ඩොලරයේ අගය වැඩි වෙන රටක, දේශීය ඖෂධ නිෂ්පාදනයටත්, රෝගියාටත් එන්න එන්නම බර වැඩි වීම තමයි සිද්ධ වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම SAITM ආයතනය පිළිබඳව අපේ රටේ විශාල සාකච්ඡාවක්, ශිෂ්‍ය අරගළයක්, ශිෂ්‍යයන්ගේ අදහස් දැක්වීම් රාශියක් තිබුණා. අපි දැක්කා, SAITM විරෝධී ජන අරගළයක්. ඒ වාගේම වෛද්‍ය ශිෂ්‍යයන්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, වෛද්‍ය ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් එකතු වෙලා මාරාන්තික උපවාසයක් කළා. ඒ මාරාන්තික උපවාසය නැවතුණා, රජය ලබා දුන් නිශ්චිත පොරොන්දු මත. හැබැයි, තවම මේ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නවලට විසඳුම ලබා දීලා නැහැ.

මගේ අතේ තිබෙනවා, වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව අප වෙත ඉදිරිපත් කරලා තිබෙන ලිපියක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉතාම ඕනෑකමින් එහි සඳහන් එක වාක්‍යයක් කියවනවා;

> "මේ වන විට SAITM ආයතනයේ ඉගෙන ගන්නා සිසුන්ට MBBS උපාධිය ලබා දී SAITM හොර උපාධි කඩය කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට අදාළ යෝජනාවලියකට කැබිනට් අනුමැතිය ලබාගෙන ඇති අතර, එය එළැබෙන දින කිහිපයේ පාර්ලිමේන්තුව හරහා සම්මත කර ගැනීමේ කුමන්ත්‍රණයක් වත්මන් ආණ්ඩුව කරමින් සිටී."

ආණ්ඩුව නැවත නැවතත් ඒ ශිෂ්‍යයන් අන්දනවා, දෙමවුපියන් අන්දනවා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නොමහ යවනවා. ආණ්ඩුවේ හිතුවක්කාරී වූ ක්‍රියාමාර්ගය දිගටම අනුගමනය කරමින් ඒ ශිෂ්‍යයන් මර්දනය කිරීම සඳහා වූ උත්සාහයක තමයි සිටින්නේ. පසුගිය කාල පරිච්ඡේදය තුළ වෛද්‍ය පීඨවල ඉගෙන ගන්න ශිෂ්‍යයන්ට මාස හත අටක්ම මහපොළ ශිෂ්‍යත්වය ලබා දීම නවත්වලා තිබුණා. නමුත් අපි මේ ගරු සභාවේ පැහැදිලිව ඔප්පු කරලා පෙන්වූවා මහපොළ භාරකාර අරමුදලේ රුපියල් මිලියන 500කට වඩා හොරකමක් සිද්ධ වෙලා තිබෙන බව. ශිෂ්‍යයන්ගේ මහපොළ දීමනාව කපනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍යයන්ගේ මහපොළ ශිෂ්‍යාධාරය කපනවා. හැබැයි, මහපොළ භාර අරමුදලට භානි කරමින් තිබෙනවා. කාටද මේවා කියන්නේ? ආණ්ඩුව අද ඒ විධියේ ඉතුවක්කාර ගමනක් යනවා. SAITM ආයතනය විකිණීම සඳහා නෙවිල් ප්‍රනාන්දු මහත්මයා දැන්වීම් පළ කරන බව අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා. හැබැයි අද ගරු ඇමතිතුමාත් ප්‍රකාශ කර තිබුණා, රජයත් ප්‍රකාශ කරනවා ඒ ආයතනය එහෙම විකුණන්නේ නැහැ කියලා. කොහොමද මේ දේවල් සිද්ධ වෙන්නේ? මේ ආණ්ඩුව අද මේ රටේ ජනතාවගේ කිසිම ප්‍රශ්නයක් විසඳන්නේ නැති ආණ්ඩුවක් බවට පත්වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඖෂධ වර්ග තිබෙන්නේ රෝග නිවාරණය සඳහා වන වැඩ පිළිවෙළක් වශයෙන් පමණයි කියා අපි දන්නවා. ඒ නිසා රෝග ඇතිවීමේ නිධානය වළක්වන්න අපි රටක් විධියට මීට වඩා මැදිහත්වීමේ අවශ්‍යතාව තිබෙනවා. අපේ රටේ මෙතෙක් පැවැති නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තිය හා ඊට සම්බන්ධ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය කියන කාරණා දෙක එක්තැන් වීම සහ අපේ වෛද්‍යවරුන්ගේ කැපකිරීම්, රජයන් විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට දෙන ලද සහනාධාර, ආදිය නිසා අපේ රට බෝ වන රෝග පාලනය කිරීමේ සුවිශේෂ රටක් බවට පත් වෙලා තිබෙනවා. ඒක අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ. රටක් විධියට අපි විශාල ජයග්‍රහණයක් ලබා තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ බෝ වන රෝග අවම මට්ටමකින් පවත්වා ගන්න අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට හැකියාව ලැබී තිබෙනවා. හැබැයි, ඒ එක්කම බෝ නොවන රෝග වැඩිවීමේ බරපතළ ගැටලු සහගත තත්ත්වයක් අපේ රටේ ඇති වෙලා තිබෙනවා. වකුගඩු රෝග, හෘදය රෝග, අධික රුධිර පීඩනය, රුධිරගත සීනි ප්‍රමාණය නිසා ඇතිවන දියවැඩියාව බෝ නොවන රෝග අතරින් ප්‍රධානයි. ඒ නිසා රටක් විධියට අපේ ජීවන රටාවේ වෙනස්කම් සිදුකිරීමේ ක්‍රියාවලියට සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට වඩ වඩාත් මැදිහත් වීම අවශ්‍ය වෙලා තිබෙනවා. මෙම තත්ත්වය නිසා අද පිළිකාව, හෘදය රෝග, අධික රුධිර පීඩනය, දියවැඩියාව බෝ වන රෝග බවටම පරිවර්තනය වෙලායි තිබෙන්නේ. අපේ ජීවන ක්‍රියාවලිය සහ ආහාර ක්‍රියාවලිය වෙනස් කිරීම වාගේම ආර්ථික සහ මානසික සෞඛ්‍යය පිළිබඳව වඩ වඩාත් හිතන්න ඕනෑ යුගයකයි අපි පසුවන්නේ. එහෙම නියෙද්දීත් අද සිද්ධ වන්නේ මොකක්ද? අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් පටන් අරගෙන, මේ ආණ්ඩුවේ සියලුදෙනාම ප්‍රකාශ කරන අදහස් අරගෙන බලන්න. ඒ අදහස්වලට ඇහුම්කන් දුන්නොත්, වෛරය, පළිගැනීම, වධ බන්ධනවලට ලක් කිරීම, සිර භාරයට ගැනීම් වැනි ඒවා තමයි ඇහෙන්නේ. ඒ නිසා මේ ක්ෂේත්‍රවල ඉන්න ඇතැම් ප්‍රධානීන්ගේ කථා ඇහුවාම මේ රටේ ජනයාගේ මානසික සෞඛ්‍යය පිරිහෙනවා. හොඳ කරන්න බැරි ලෙඩවලින්, වෛරයෙන්, පළිගැනීමෙන්, ක්‍රෝධයෙන්, පුපුරා යන ආවේගවලින් අපේ සමාජය තෙත් වෙලා නම්, අපේ රටේ කොහොමද හොඳ මානසික සෞඛ්‍යයක් පවතින්නේ? මේ රටම අද ලෙඩ වෙලා තිබෙන්නේ; අසරණ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මීට වඩා වැඩි මැදිහත්වීමක් මේ සම්බන්ධයෙන් සිදු කළ යුතුය කියන යෝජනාව ඉදිරිපත් කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.20]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේදී ගොඩක් මන්ත්‍රීවරු කථා කළේ සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධව ඉදිරිපත් වෙලා තිබෙන නියෝග පිළිබඳවයි.

මම බලාපොරොත්තු වෙනවා, ගරු රිෂාඩ් බදියුදීන් ඇමතිතුමා ඉදිරිපත් කළ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළව අදහස් කීපයක් ඉදිරිපත් කරලා, ඉන් පසුව තවත් පොදු වැදගත්කමක් තිබෙන කරුණු කීපයක් ගැන කෙටියෙන් සඳහන් කරන්න. 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසු, ශ්‍රී ලංකාවට ආවේණික භූගෝලීය දර්ශකවල ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් යම් යම් පියවර ගන්න කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවා.

භූගෝලීය දර්ශක කියලා කියන්නේ ඇත්තෙන්ම අපේ රටටම විශේෂ වූ, අපිටම ලොකු සම්පතක් වෙලා තිබෙන යම් යම් භාණ්ඩයි. මේවා දේශීය වෙළෙඳාමේදී සහ විදේශීය වෙළෙඳාමේදී ඉතාම වැදගත් භාණ්ඩ හැටියට සන්නාම වෙලා තිබෙනවා. ඒවා අපිට නම් කරන්න පුළුවන්. "Ceylon Tea" කියන නාමය -brand එක-, "Ceylon Pure Tea" කියන නාමය වාගේම කුරුඳුවලට "Ceylon Cinnamon" කියන brand එක තිබෙනවා. විදේශ වෙළෙඳාමේදී අපි විශේෂයෙන්ම ආඩම්බර වෙන්නේ අපට තිබෙන මෙන්න මේ ජාතික සන්නාම නිසයි. මේ ජාතික සන්නාම ගැන අපි ලොකුවට කථා කරනවා. නමුත් ඇත්තෙන්ම ගත්තොත් එහෙම අපට මේ අතළොස්සක් වූ භූගෝලීය දර්ශක නිසා ප්‍රශ්න රාශියක් මතුවෙලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, අපේ තේ සම්බන්ධයෙන් මතුවෙලා තිබෙන ප්‍රශ්නය ගැන ඊයේ මේ ගරු සභාවේ දී බොහොම හොඳ විස්තරයක් කළා. තේ කර්මාන්තශාලා ගණනාවක් ආශ්‍රිතව කරපු වැටලීම් දිහා බැලුවාම පෙනෙනවා, එම කර්මාන්තශාලාවලින් විශාල ප්‍රමාණයක් මේ කසළ තේ ජාවාරමට එකතුවෙලා තිබෙන බව. පිරිසිදු ලංකා තේ -"Ceylon Pure Tea"- නැත්නම් "Ceylon Tea" කියන සන්නාමයට මොකක්ද වෙලා තිබෙන්නේ? අපිම ඒ පිරිසිදු තේවලට කසළ එකතු කරලා තිබෙනවා. ඒ නිසා මෙය ජාතික උවදුරක් බවට පත්වෙලා

තිබෙනවා. ළඟ එන ලාභය දිහා බලලා, විදේශ වෙළෙඳාම විනාශ කරන මට්ටමට රටේ ඉන්න යම්කිසි කෑදර පිරිසක් වැඩ කරගෙන යනවා. මේවා නිකම්ම හුදකලාව තේ ඇසුරුම් කරන ෆැක්ටරි තුළ විතරක් සිදු වෙන දෙයක් නොවෙයි. විශාල මාෆියාවක් මේ වනකොට රටේ ඇතිවෙලා තිබෙනවා. පෙරේදා මම කිව්වා වාගේ ලොකු වංක සහයෝගයකින් තමයි මේ කටයුත්ත කරගෙන යන්නේ. එම නිසා අද අපේ තිබෙන සන්නාම -brands- ටික ආරක්ෂා කර ගන්නත් අපිට දේශීය වශයෙන් විශාල අරගළයක් කරන්න සිදුවෙලා තිබෙනවා. ඇත්තෙන්ම අපි අවුරුදු සිය ගණනක් තිස්සේ ශ්‍රී ලංකා තේ සම්බන්ධයෙන් වන මේ සන්නාමය අත් පත් කරගෙන තිබෙනවා. නමුත් මේ ජාවාරම් රංචුව මේ වැඩේ නවත්වන්නේ නැති බව අපට පෙනෙනවා. කසළ තේ පිළිබඳ ප්‍රශ්නය හැමදාමත් මතු වන ප්‍රශ්නයක්.

විශේෂයෙන්ම තේ වැවෙන පළාත් නියෝජනය කරන අය හැටියට මම මේ කාරණයත් කියන්න කැමතියි. මේ කර්මාන්තය කඩාගෙන වැටෙනවා නම්, බාල භාණ්ඩ ඉදිරිපත් කරලා මිල මට්ටම අඩු වෙලා තිබෙනවා නම්, එය ජනතාවගේ ජීවන ක්‍රමය පිළිබඳව ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා භූගෝලීය දර්ශක ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉදිරිපත් වෙලා තිබෙන මේ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත ඉතාම වැදගත් දෙයක් හැටියට අපි දකිනවා. නමුත් මෙතැන ඉදිරිපත් වෙලා තිබෙන්නේ "Ceylon Tea", "Ceylon Cinnamon" වාගේ brands කීපයක් සම්බන්ධයෙන් පමණයි. එලෙස භූගෝලීය දර්ශක අත් පත් කර ගන්න පුළුවන් තවත් නිෂ්පාදන ගොඩක් අපේ රටේ තිබෙනවා. එවැනි බෝගවලින් එකක් තමයි, ගම්මිරිස්. ගම්මිරිස්වල මිල සෑහෙන දුරට අඩු වුණේ ඇත්තටම මොන ප්‍රශ්නයක් නිසාද? ලෝකයේ ගම්මිරිස්වලට තිබෙන ඉල්ලුම අඩු වෙලාලු. කිසිම ආකාරයකින් ගම්මිරිස්වලට තිබෙන ඉල්ලුම අඩුවෙලා නැහැ. ගම්මිරිස්වලට තිබෙන ඉල්ලුම එන්න එන්න වැඩි වෙනවා. ආහාර, සුවඳ විලවුන්, බෙහෙත් කියන මේ අංශ තුනටම ලෝකයේ තිබෙන ඉල්ලුම වැඩි වනවා. ආහාර සංස්කෘතිය වේගවත් වෙන්න, ව්‍යාප්ත වීම වැඩි වෙන්න - වැඩි වෙන්න මේ කුළු බඩුවලට තිබෙන ඉල්ලුමත් වැඩි වෙනවා. සුවඳ විලවුන් වාගේ දේවල්වලට තිබෙන ඉල්ලුම අඩු වෙනවා නොවෙයි, වැඩි වෙනවා. ලෙඩ හැදෙන්නේ ලෝකයාටම නේ. එන්න - එන්න හැමෝටම ලෙඩ හැදෙනවා. එතකොට බෙහෙත් අලුතින් හදනවා. එම නිසා ගම්මිරිස්වලට තිබෙන ඉල්ලුම වැඩි වනවා. හොඳ ගම්මිරිස්වලට කොහොමත් ඉල්ලුමක් තිබෙනවා.

ලෝකයේ හොඳම ගම්මිරිස් තිබෙන්නේ ලංකාවේ කියන කාරණය සම්බන්ධයෙන් අපි ආඩම්බර වනවා. මේවා හොයාගෙන තමයි පෘතුගීසීන් සහ ලන්දේසීන් අපේ ලංකාවට ආවේ. අපි ඒ ගැන ආඩම්බර වනවා. අපි ලොකු නිෂ්පාදනයක් හදා ගත්තාට අපිට මේවා අළෙවි කර ගන්න බැරිවෙලා තිබෙනවා. මොකක්ද, දැන් සිදුවෙලා තිබෙන්නේ? මෙතැන ජාවාරමක් සිදු වෙලා තිබෙනවා. ඇත්තෙන්ම වියට්නාමය වාගේ රටවලින් ගම්මිරිස් විශාල තොගයක් ආවාට වඩා, මෙතැන සිදුවෙලා තිබෙන්නේ මේවාත් කසළ ගම්මිරිස් බවට පත් කරලා තිබීමයි. ලංකාවේ හැදුවාය කියන නාමයෙන් "Country of origin" කියන සහතිකය මුහුදු මැදදීම ගහලා, ලංකාවේ ගම්මිරිස් හැටියට පිට රට පැටෙව්වා කියලා විශාල කථා බහක් පසු ගිය කාලයේ ඇති වුණා. අපි මේ කාරණය පිළිබඳව මහ මහ පැවති උද්ඝෝෂණවලදී, රක්වාන, කොළොන්න වාගේ ප්‍රදේශවල පැවති රැස්වීම්වලදී, ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදී වාගේම මේ පාර්ලිමේන්තුවේදීත් කථා කළා.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේවා භාර දෙනවාය කියලා කිව්වා. හැබැයි, ඒවායේ ප්‍රතිඵල මොනවාද කියලා අපි තවම දැක්කේ නැහැ. එම නිසා ගම්මිරිස්වලටත් භූගෝලීය දර්ශක සන්නාමයක් අත්පත් කර ගැනීම සඳහා අපි අද රටක් හැටියට වැඩ කරන්න ඕනෑය කියන එක මේ වේලාවේදී මතක් කරන්න කැමැතියි. ඒක තමයි brands සම්බන්ධයෙන් - [බාධා කිරීමක්] කියන්න, මන්ත්‍රීතුමා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වියට්නාමයෙන් හොඳ නැති ගම්මිරිස් ගෙනැල්ලා අපේ ඒවාත් එක්ක මිශ්‍ර කරලායි දෙන්නේ. ඒකට වග කියන්න ඕනෑ කවුද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

කිසියම් ඉඩක් ලබා ගෙන තිබුණා, කිසියම් ප්‍රතිශතයක් ගෙනැල්ලා අගය එකතු කළ වටිනාකමක් හැටියට මේවා ප්‍රතිඅපනයනය කරන්න ඉඩ දෙන්න. ඒක මෙම ප්‍රශ්නයේ කොටසක් හැටියට ආපු නිසා රජය ඒ දිහා බලා, ඒවාත් නවත්වා තිබෙනවා කියන එකයි මගේ අවබෝධය, ගරු මන්ත්‍රීතුමනි. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. ලංකාවට ගෙන්වන්නේම නැතිව, ලංකාවේ නාමයෙන් "Country of origin" කියන සහතිකය ගහලා මුහුදු මැදදීම ජාවාරමක් කරලා මේවා යවපු එක තමයි ප්‍රශ්නය. ඒකට අදාළ තොරතුරු අපි ඇමතිතුමාට ලිපිලේඛනාදිය මඟින් ලබා දීලා තිබෙනවා. එම පරීක්ෂණවලට මොකද වුණේ කියලා වගකිව යුතු අමාත්‍යාංශයෙන්ම අපිත් අහනවා. එම කාරණය අපි මතක් කරලා තිබෙනවා. හැබැයි, මේ ප්‍රතිඅපනයනය නවත්වා ගම්මිරිස්වලට මිලක් ලබා ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා කියලා අපි පසුගිය කාලයේ තොරතුරු දැක්කා. මිල මට්ටමේ පොඩි වැඩිවීමක් සිදුවෙලා තිබෙනවා. නමුත් ලෝකයේ හොඳම ගම්මිරිස් හදන රටට ලැබිය යුතු මිල මෙක නොවෙයි. ඒකයි අපේ තර්කය වෙලා තිබෙන්නේ. ගම්මිරිස්වලට පවතින ලෝක ඉල්ලුම අඩු වෙලා නැහැ, වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් හොඳම ගම්මිරිස් සපයන අපට මීට වඩා හොඳ මිලක් ලැබෙන්න ඕනෑ. ගම්මිරිස් සඳහාත් සන්නාම දර්ශකය අත්පත් කර ගැනීම අපේ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කියන මේ සියලු දෙනාගේම ලොකු වගකීමක් වෙලා තිබෙනවා. එහෙම වුණොත්, "Ceylon Tea" වාගේ, "Ceylon Cinnamon" වාගේ "Ceylon Pepper" කියන brand එකටත් අපට යන්න පුළුවන්කමක් තිබෙනවා. මේක අන්නාසිවලටත් අත්පත් කර ගන්න පුළුවන් කියලා එම නිලධාරීන් සමඟ කථා කරනකොට අපට කිව්වා. මේ ඉලක්කය සඳහා අපි යන්න ඕනෑ.

Brands ගැන කථා කරනකොට, මාතෘකාවෙන් ටිකක් බැහැර වුණත් මම මේ වේලාවේ තවත් brand එකක් ගැන කථා කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි මේ රටේ brand එක. රටක් හැටියට මොන වාගේ brand එකක්ද අපට තිබෙන්නේ කියන එක ගැන මම කථා කරන්න කැමැතියි. අපේ රටේ නම, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය". මේ රටට මේ නම ලැබුණේ කොහොමද? එක්සත් ජාතික පක්ෂයෙන් තමයි මේ නම ගෙනාවේ. මම පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගිහිල්ලා 1972 ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ විවාදය මුළුමනින්ම කියවා ගෙන යනකොට, රටේ නම හැටියට "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය" කියන යෝජනාව එදා එක්සත් ජාතික පක්ෂය ගෙනැවිත් තිබෙන බව දැක්කා. එදා ඒකට පිළිගැනීමක් ලැබුණේ නැති වුණත්, 1978 ව්‍යවස්ථාව හදනකොට, ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා රටේ නම හැටියට මේ නම යෙදුවා. මේ නමට ගැළපෙන හැටියට රට දැන් තිබෙනවාද කියලා අපි සොයා බලන්න ඕනෑ.

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රිකයි කියනවා. මේ රට ප්‍රජාතාන්ත්‍රිකද? අපි ඡන්ද පවත්වනවා; ආණ්ඩු එනවා; ආණ්ඩු මාරු වෙනවා. නමුත් ඒක පමණක්ද, ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ? අපේ රටේ දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදීද? අපේ එදිනෙදා ජීවන පැවැත්ම ප්‍රජාතන්ත්‍රවාදීද? එහෙම ගත්තායින් පසුව ලොකු අඩුපාඩුවක් තිබෙන බව පෙනී යනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන විශේෂ ලක්ෂණය තමයි වැරදි හදාගෙන ඉස්සරහට යන්න ඉඩ දෙන එක; ප්‍රතිසංස්කරණවලට ඉඩ දෙන එක. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන විශේෂ ලක්ෂණය.

අනෙක් ක්‍රමවලට එහෙම බැහැ. ක්‍රමයක් ගත්තා නම්, ඒ ක්‍රමය එහෙමම එතැන ගල් වෙනවා. ඒ නිසා තමයි ඒවා කඩා ගෙන වැටෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය ඉස්සරහට යන්නේ ප්‍රතිසංස්කරණවලට ඉඩ දෙන ගතියක් ප්‍රජාතන්ත්‍රවාදයේ ඇතුළේ තිබෙන නිසායි. රටක් හැටියට අපිට පරාජයන් ගොඩකට මුහුණ දෙන්න වුණා. සිවිල් යුද්ධවලින්, නැත්නම් වෙනත් දේශපාලන ප්‍රශ්නවලින්, දේශපාලන ක්‍රමවලින් පරාජයන් සිදු වුණාට, අපි ප්‍රතිසංස්කරණවලට දක්වන්නේ ඉතාම මන්දගාමී ස්වභාවයක්.

ඊළඟ කාරණය තමයි, "සමාජවාදය" කියන කොටස. න්‍යායවල තිබෙන සමාජවාදය නොවෙයි, අද තිබෙන්න පුළුවන් සමාජවාදයක් ගැනයි අපි කථා කරන්න ඕනෑ. සමාජවාදය කියලා අද ඇත්තටම දකින්න පුළුවන් වෙන්නේ සමාජ සාධාරණත්වයයි. රාජ්‍යයක් හැටියට අපි ඒ සමාජ සාධාරණත්වය දිහා බලා තිබෙනවාද? අද ඇති එක්කෙනාට එක නීතියක්, නැති එක්කෙනාට තව නීතියක්. මහා හොරු, තක්කඩි නීතියේ හිල්වලින් පැන යනවා. දුප්පතා හසු වෙනවා. එහෙම ගත්තායින් පසුව රාජ්‍ය තුළ හැම ක්ෂේත්‍රයකම විශාල අසමානතාවක්, අසාධාරණභාවයක් පැලපදියම් වෙලා තිබෙනවාය කියන එක පෙනෙන්නට තිබෙනවා.

ඊළඟට, "ජනරජය" කියන කාරණය ගැන බලමු. ජනරජයක් වුණාට අපට තවම තිබෙන්නේ රාජාණ්ඩුවාදී මානසිකත්වයක්. පාලකයෝ හැටියට ඉල්ලන්නේ මහ රජවරු. හැම දෙනා තුළම තිබෙන්නේ ඒ වාගේ බොහොම වැඩවසම් ආකල්ප. එහෙම ගත්තායින් පසුව "ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය" කියන එකට එම අර්ථය ලබා දෙන ඒ brand එකත් අපි හරියාකාරව හදා ගෙන නැහැ කියන කාරණය පෙනී යනවා. ප්‍රජාතන්ත්‍රවාදයට කසළ එකතු කරගෙන තිබෙනවා.

"ජනරජය" කියන අදහසට අසූචි - මල පහ- එකතු කරගෙන තිබෙනවා. "සමාජවාදී" අදහසට වෙන කුණුකන්දල් එකතු කරලා තිබෙනවා. මේ branding සම්බන්ධයෙන් කියනකොට ගම්මිරිස්වලට, තේවලට, කුරුඳුවලට පමණක් නොවෙයි, රාජ්‍ය පිළිබඳ අදහසටත් එහෙම වෙලා තිබෙනවා. මට මතක් වෙන්නේ තෝමස් කාලයිල් කියලා ඉතිහාසඥයෙක් හිටියා. ඔහු ශුද්ධ රෝම අධිරාජ්‍ය කියන යෙදුම උපහාසයට ලක් කළා. මුලින් තිබූ රෝම අධිරාජ්‍ය නොවෙයි, පසුව තිබුණු ශුද්ධ රෝම අධිරාජ්‍යය. ඔහු ඒකට කිව්වේ මේක ශුද්ධත් නැහැ; මේක රෝමනුත් නොවෙයි; මේක අධිරාජ්‍යයකුත් නොවෙයි කියලා. අන්න ඒ වාගේ තත්ත්වයක් අපේ රටේ නමට අත්පත් කර දෙන්න හොඳ නැහැ. මේ රාජ්‍යයට අලුත් brand එකක් අවශ්‍ය වෙලා තිබෙනවා. මම පෙරේදාත් පාර්ලිමේන්තුවේදී කිව්වා වාගේ හොරකම් නොකරන, මීනි නොමරන, පවුල්වාදය නැති, ගජමිතුරු සංග්‍රහය නැති, වෙලාවට වැඩ කරන, වැඩ කල් දාන්නේ නැති, ජනතාවගේ වුවමනාවන්වලට වේගවත්ව ප්‍රතිචාර දක්වන ප්‍රායෝගිකව වැඩ කරන රාජ්‍යයක් හැටියට මේක rebrand කරන්න වෙලා තිබෙනවා. අලුත් brand එකක් අවශ්‍ය වෙලා තිබෙනවා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට. නැත්නම් ඒවා නිකම් බෝඩ් ලෑලි බවට පත් වෙනවා.

ගරු රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමා මේ බුද්ධිමය දේපළ නීතිය සංශෝධනය කරන්න ආපු වෙලාවේ අපට හොඳ brands ටිකක් අවශ්‍ය වෙලා තිබෙනවා; හොඳ සන්නාම අවශ්‍ය වෙලා තිබෙනවා; භූගෝලීය දර්ශක අවශ්‍ය වෙලා තිබෙනවා. රාජ්‍යයටත් එහෙම එකක් අවශ්‍ය වෙලා තිබෙනවා කියන එක තමයි මාගේ යෝජනාව. ඒ අදහසත් කියන්න අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් මම බොහොම සතුටු වෙනවා. මට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට මගේ ගෞරවනීය ස්තුතිය මේ වෙලාවේ පුද කරන්න කැමැතියි.

[පි.ප. 2.32]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான இன்றைய இந்த விவாதத்தில் கலந்துகொண்டு பேசச் சந்தர்ப்பம் தந்ததற்கு உங்களுக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன். இன்று மருந்துகள் விடயத்தில் சுகாதார அமைச்சரால் சில ஆரம்பகட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன. அதற்கு நாங்கள் பாராட்டுத் தெரிவிக்க விரும்புகின்றோம். அந்த வகையில் இன்று குறிப்பிட்ட 48 வகையாக மருந்துகளுக்கான விலைகள் நிர்ணயம் செய்யப்பட்டிருக்கின்றன. ஒரு மருந்தை இரண்டு வகைகளாகப் பார்க்கலாம். அதாவது மருந்துகளைப் பொறுத்தவரை அதன் pharmacological content - உள்ளடக்கத்தை pharmacological name என்று சொல்வோம். ஒரே மருந்து வெவ்வேறு கம்பனிகளிடமிருந்து வரும்போது அதன் trade name என்று வெவ்வேறு பெயர்களில் வருகின்றது. அதாவது, generic name ஆனது trade name ஆக மாறுகின்றது. உதாரணமாக ஒன்றைச் சொல்லலாம். Amoxicillin அல்லது clavulanic acid என்பது ஒரு மருந்து. அதே மருந்து வெவ்வேறு கம்பனிகளிலிருந்து வரும்போது Augmentin, Rapiclav, Novaclav, Betaclav, Curam, Dioclav என வெவ்வேறு மருந்துகளாக அடையாளப்படுத்தப்பட்டு விற்பனைக்கு வருகின்றன. தற்பொழுது அதன் 625 மில்லிகிராம் மருந்துக்கான விலை 63 ரூபாய் எனத் தீர்மானிக்கப்பட்டிருக்கிறது. இது ஒரு நல்ல விடயம்தான்! அதாவது, எந்தக் கம்பனியிடமிருந்து மருந்துகள் வந்தாலும் அதன் விலைகளில் மாற்றமில்லாது அதன் உச்ச விலை தீர்மானிக்கப்பட்டிருக்கிறது.

முன்னர் அப்படியல்ல! சில மருந்துகளின் விலைகளில் இரண்டு - மூன்று மடங்கு அதிகரிப்புக் காணப்பட்டது. அவற்றை அறிமுகப்படுத்தும் நிறுவனங்கள் தங்களது மருந்துதான் மிகவும் சிறந்த மருந்தெனக் கூறி, அவற்றுக்கான விலைகளை அதிகரித்து வியாபார நோக்கில் இலாபமீட்டிய தைப் பார்க்கக்கூடியதாக இருந்தது. எமது அமைச்சர் அவர்கள் குறிப்பிடும்பொழுது, அது ஒரு medical mafia என்று குறிப்பிட்டார். அதுதான் உண்மை! அதேநேரம் குறிப்பிட்ட நிபுணர்கள் குறித்த மருந்தைச் சிபாரிசு செய்வதற்காக அவர்களின் குடும்பங்களை வெளிநாடுகளுக்குக்கூட அனுப்பினார்கள். அதை விற்பனை செய்யும் medical representative களின் குடும்பங்களையும் வெளிநாடுகளுக்கு அனுப்பினார்கள். ஆனால், இன்று மருந்துகள் விடயத்தில் வியாபார நோக்கில் செயற்படுவது இந்த ஒழுங்குவிதிகளின்மூலம் தடுக்கப் பட்டிருக்கிறது. இது ஓர் ஆரம்பம்தான். ஆனாலும் மருந்து களுக்கு விலை நிர்ணயம் செய்யும் செயற்பாடு இன்னும் விரிவடைய வேண்டிய தேவையிருக்கின்றது.

நான் சுகாதாரத் திணைக்களத்தில் சேவையாற்றுகையில், ஒரு தடவை தாய்லாந்துக்குச் சென்றிருந்தபோது, அங்கு மலேரியாத் தடை மருந்துகள் ஒரே trade name இல் fake drugs - போலியாகத் தயாரிக்கப்பட்டு விற்பனை செய்யப்பட்டமை கண்டுபிடிக்கப்பட்டது தொடர்பில் அறியக்கூடியதாக இருந்தது. போலியான மருந்தில் அதற்குரிய chemicals - இரசாயனக் கலவைகள் இருக்கவில்லையென்பது உறுதிப் படுத்தப்பட்டது. அதன் பின்னர் குறித்த அடையாளங்கள் கொண்ட மருந்துகள் போலியானவை எனத் தாய்லாந்து அரசாங்கம் வெளிப்படையாகத் தெரிவித்தது. அந்த வகையில் மனிதனுக்கு ஏற்படுகின்ற மலேரியா நோய்க்கான மருந்துகள் தாய்லாந்தில் போலியாகத் தயாரிக்கப்பட்டமை அங்கு வெளிப்படுத்தப்பட்டது. அதேபோலான செயற்பாடுகள் எமது இலங்கையிலும் உள்ளதா? என்பது குறித்து நாங்கள் கவனிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். அதுபற்றியும் அமைச்சர் அவர்கள் கவனம் எடுக்கவேண்டும்.

இன்று சில மருந்துகளைச் சில சமயங்களில் அதிகப்படியான விலைகளில் விற்கின்றார்கள். அதற்காக அதிக promotions செய்வதற்கான வசதிகளையும் சம்பந்தப் பட்டவர்கள் செய்து கொடுக்கின்றார்கள். ஆனால், அந்த மருந்துகள் உண்மையான மருந்துகள்தானா? என்பது கேள்விக்குறியாக இருக்கின்றது. எனவே, இப்படியான பிழையான விடயங்களைத் தடுப்பதற்கான ஓர் ஆரம்ப கட்ட நடவடிக்கையாக இந்த ஒழுங்குவிதிகள் அமைவதால் இதனை நான் ஏற்றுக் கொள்ள விரும்புகின்றேன்.

அண்மையில் சில சம்பவங்கள் இடம்பெற்றமை யாவரும் அறிந்ததே. அதாவது கிழக்கு மாகாணத்தில் ஆண்களுக்கான சில கருத்தடை மாத்திரைகளை உணவுடன் சேர்த்து வழங்கியதாக ஒரு கதை வெளிவந்தது. உண்மையில், கிழக்கு மாகாணத்தில் அப்படி நடந்திருப்பதற்கான சந்தர்ப்பங்கள் மிகவும் குறைவாக இருந்தாலும், ஆண்களுக்கான கருத்தடை முறைகள் என்று பார்க்கும்போது இரண்டு முறைகளே தற்பொழுது உள்ளன. இரண்டுமே ஆண்களுக்கான செயற்பாட்டியல் - physiological ரீதியில் அவர்களைப் பாதிக்கின்ற முறைகளாகும். எனவே ஆண்களது உடற்றொழிலியல் ரீதியாகப் பாதிப்பற்ற கருத்தடை முறைகள் தேவையென்பது உலகில் அறியப்பட்டது. அந்த வகையில் ஆண்களுக்கான சில கருத்தடை மருந்துகள் androgen and progestin சேர்ந்த கலவைகளாகக் கண்டுபிடிக்கப்பட்டன. அவை ஆண்களின் sperm உற்பத்தியைக் குறைப்பதற்காக கண்டுபிடிக்கப்பட்டிருக்கின்றது. அந்த மருந்தின் பெயர் Dimethandrolone Undecanoate - DMAU - என்பதாக உள்ளது. Last Sunday, 18th of March, 2018, the Endocrine Society's 100th Annual Meeting - ENDO 2018 - was held. இந்தக் கூட்டம் அண்மையில் Chicago இல் நடைபெற்றபோது இது வெளிப்படுத்தப்பட்டது. 85 க்கும் மேற்பட்ட மனிதர்களில் பரிசோதனை செய்யப்பட்டு இந்த ஆண்களுக்கான கருத்தடை மாத்திரைகள் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றன.

Guinea pig என்பது பன்றி எலி இனமாகும். உலகில் ஒரு மருந்தைக் கண்டுபிடித்தால் முதலில் அதனை எலிகளில் செலுத்தி, அந்த எலியின் ஈரல் பழுதடைகின்றதா அல்லது உடலில் ஏதாவது மாற்றம் ஏற்படுகிறதா? என்பதை அவதானிப்பார்கள். அதன் பின்னர் அதை மனிதனில் பரிசோதிப்பார்கள். எனவே, இதில் எமது மக்கள் மிகவும் தெளிவாக இருக்கின்றார்கள், எச்சரிக்கையாக இருக்கின் றார்கள் என்பதை இந்த இடத்தில் கூறிவைக்க விரும்புகின்றேன். ஆகவே, ஆண்களுக்கான கருத்தடை மாத்திரைகள் இல்லையென்று மறுத்துவிட முடியாது. ஆனால், அது இலங்கைக்கு இன்னமும் கொண்டுவரப்படவில்லை என்பதுதான் உண்மை! உலகிலும் அது பெரியளவில் வெளியே வரவில்லை என்பதுதான் உண்மை! ஆனால், எமது மக்கள் guinea pig - பன்றி எலி இனத்தைப்போல பரிசோதனையில் பாதிக்கப்பட்டுவிடக்கூடாது என்பதில் நாம் மிகவும் கவனமாக இருக்கவேண்டியவர்களாக இருக்கிறோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order please! මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මහතාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ''මේ අවස්ථාවේදී ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය''යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA left the Chair and THE HON. EDWARD GUNASEKARA took the Chair.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் இப்பொழுது இருக்கின்றபடியால், எமது வட மாகாணத்தின் சுகாதாரத் துறையில் காணப்படுகின்ற சில பிரச்சினைகள் பற்றியும் சொல்ல விரும்புகின்றேன். கௌரவ அமைச்சர் அவர்களே! அங்கு 21 Divisional Hospitals டாக்டர்கள்கூட இல்லாது இருக்கின்றன என்பது கவலைக்குரிய ஒரு விடயமாகும். உதாரணமாக முல்லைத்தீவிலுள்ள ஒரு சில வைத்திய சாலைகளைக் குறிப்பிடலாம். அதாவது நட்டாங்கண்டல், ஐயங்கண்குளம், துணுக்காய் போன்ற Divisional Hospital கள் எந்தவிதமான டாக்டர்களும் அற்ற நிலையில் இருந்து வருகின்றன. அந்த வகையில் சுகாதாரத் துறையில் நிபுணத்துவ சேவையற்ற நிலையில் எமது வன்னி மாவட்டம் தளம்பல் நிலையில் இருந்துவருகின்றது. இன்றுவரை மன்னார் வைத்தியசாலையில் நிரந்தர மகப்பேற்று வைத்திய நிபுணர் இல்லை. முல்லைத்தீவு மாவட்ட பொது வைத்தியசாலையும் இன்றுவரை பதில் வைத்திய நிபுணர்களுடன்தான் இயங்கி வருகின்றது.

வவுனியா மாவட்டப் பொது வைத்தியசாலையில் கடமையாற்றிய நிரந்தரப் பொது வைத்திய நிபுணர் வருடாந்த இடமாற்றம் பெற்றிருக்கின்றார். அவர் விரும்பாமலேயே அவரை அங்கிருந்து வலுக்கட்டாயமாக வெளியேற்ற முயற்சித்திருக்கின்றார்கள். பதில் வைத்திய நிபுணரின்றி அந்த இடமாற்றத்தைச் செய்ய வேண்டாம் என்று நான் சொன்னேன். பதில் வைத்திய நிபுணர்கள் - replacement வந்த பின்னர்தான் நிரந்தர வைத்திய நிபுணர்கள் இடமாற்றம் செய்யப்பட வேண்டும் என்று வட மாகாண சுகாதார அமைச்சருக்குக்கூட

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

Director General of Health Services - DGHS அறிவித்திருக்கின்றார். இது DGHS இன் நிலைப்பாடாக இருக்கின்றது. ஆனால், DDG - Medical Services இன் நிலைப்பாடு இதற்கு மாற்றமாக இருக்கின்றது. அதாவது நிரந்தர வைத்திய நிபுணர்கள் வருடாந்த இடமாற்றம் பெறும்பொழுது foreign training க்குப் போகவிருக்கின்ற Senior Registrar களைப் பதிலீடாகக் கொண்டு குறித்த நிபுணர்களின் இடமாற்றத்தைச் செய்யுமாறு வற்புறுத்தப்பட்டிருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே! எமது வைத்தியசாலை களிலுள்ள நிரந்தர வைத்திய நிபுணர்களை replacement இன்றி நீக்கிவிடுவது சிறந்ததாக அமையாது என்பதை இந்த இடத்திலே கூறிவைக்க விரும்புகின்றேன். எனவே, அது பற்றிய அறிவுறுத்தல்களை நீங்கள் வழங்கவேண்டும்.

அதுமட்டுமல்ல, அங்கு இருப்பிட வசதிகளற்ற நிலையிலேயே வைத்திய நிபுணர்கள் சேவை செய்து வருகின்றார்கள். அதாவது அங்குள்ள பத்தே பத்து விடுதிகளில் மட்டும்தான் வசதிகள் உள்ளன. அங்கு Senior Registrar உட்பட 30க்கும் மேற்பட்ட வைத்திய நிபுணர்கள் வரவேண்டி யிருக்கிறது. ஆனால், அவர்களுக்கு விடுதி வசதிகள் அற்ற நிலையே அங்கு காணப்படுகின்றது. அங்கு ஒரு நிரந்தர கண் வைத்திய நிபுணர் நியமிக்கப்பட வேண்டும் என்றும் எதிர்பார்க்கப்படுகின்றது. அதுமட்டுமல்ல, pharmacists 36 பேருக்குரிய வெற்றிடங்கள் காணப்படுகின்றமையும் ஒரு குறையாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் மல்லாவி, புதுக்குடியிருப்பு வைத்தியசாலைகளை ஆதார வைத்தியசாலைகளாகத் தரமுயர்த்தியமைக்காக நான் அவருக்கு நன்றி கூறக் கடமைப்பட்டிருக்கிறேன். அதேநேரம், அதற்கான ஆளணிகளைச் சீர்செய்ய வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன்.

தாதியர் உத்தியோகத்தர்களைப் பொறுத்தவரை, எமது பிரதேசங்களில் மிகவும் ஓர் இக்கட்டான நிலைமை காணப்படுகின்றது. அதாவது, அங்கு 150க்கும் மேற்பட்ட தாதியர் வெற்றிடங்கள் காணப்படுகின்றன. அங்கு தாதிப் பயிற்சிக்காக வருபவர்கள் தென்மாகாணத்தைச் சேர்ந்தவர்கள். 95 வீதமானவர்கள் தமிழ் மொழி தேர்ச்சி பெற்றவர்கள் அல்லர். இது ஒரு பிரச்சினையாகவே இருக்கின்றது. இதற்கு ஒரு தீர்வைக் காண வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே! தாதியர்களை ஆட்சேர்ப்பதற்குக் கோரும் கல்வித் தகைமைகள் Advanced Level இல் மூன்று பாடங்களில் சித்தியடைந் திருப்பதுடன், Ordinary Level இல் ஆங்கிலம், விஞ்ஞானம், தமிழ், கணிதம் ஆகிய நான்கு பாடங்களில் "C" சித்தி பெற்றிருக்கவேண்டும் என்பதுமாகும்.

அடுத்ததாக, ஒரு மருத்துவக் கல்லூரிக்கு நுழையும் மாணவனுக்குக்கூட GCE Ordinary Levelஇல் ஆங்கிலம் தேவையெனக் கோரப்படுவதில்லை; அது பற்றிப் பரிசீலிக்கப் படுவதுமில்லை. அடிப்படைத் தகமையாக GCE Advanced Levelஇல் அவர் பெற்ற புள்ளிகளின் அடிப்படையில் தெரிவு செய்யப்படுகின்றார். ஆனால், தாதிய உத்தியோகத்தர் பயிற்சிக்கு GCE Ordinary Levelஇல் ஆங்கிலம் கோரப் படுவதால், யுத்தத்தால் மிகவும் பாதிக்கப்பட்ட எமது பிரதேச மாணவர்கள் அந்தப் பயிற்சிக்கு உள்வாங்கப்பட முடியாத ஒரு நிலைமை காணப்படுகின்றது. அதேநேரம், புதிய முறைமையில் உயர்தரப் பரீட்சையில் விஞ்ஞான பாடங்களில் சித்தி பெற்றவர்களுக்குத்தான் தாதிய உத்தியோகத்தர்களுக் கான பயிற்சி வழங்கப்பட முடியும் என்றிருக்கின்றது. எனவே, முன்னர் இருந்ததுபோல் எமக்காக ஓரிரு தடவையாவது விதிவிலக்காக "உயர்தர பாடங்களில் எந்த stream ஆக இருந்தாலும் தாதிய உத்தியோகத்தர் பதவிக்குரிய பயிற்சிக்குச் செல்ல முடியும்" என்று இந்த முறைமையில் மாற்றம் செய்துதரவேண்டும் என்றும் அதேபோல், ஆங்கிலத்தில் 'C' என்பதை 'S' என மாற்றித் தரவேண்டும் என்றும் கேட்டுநிற்கின்றேன். இது எமது நீண்டகாலக் கோரிக்கை யாகவும் இருந்துவருகின்றது.

இறுதியாக, புகையிலை உற்பத்தி தொடர்பில் பார்ப்போம். மிக விரைவில் புகையிலை தடை செய்யப்பட இருக்கின்றது. இது நல்ல விடயம். ஏனெனில், தொற்றாநோய்களில் புகையிலை முக்கிய பங்கெடுப்பதாகக் கருதப்படுகின்றது. அதுமட்டுமல்ல, புகைத்தலுடன் மதுவும் சேர்ந்து தொற்றா நோய்களுக்குக் காரணமாகின்றது. ஆனால், புகையிலையைத் தடை செய்வதற்கு முன் சில முன்னேற்பாட்டு நடவடிக்கைகளைச் செய்யவேண்டும் என்று இந்த அரசைக் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், புகையிலை உற்பத்தி யாழ்ப்பாணத்தில்தான் பிரதானமாக நடைபெறுகின்றது. புகையிலை உற்பத்தி செய்யும் குடும்பங்களின் வாழ்வாதாரத்திற்கு மாற்றுவழி கண்டுபிடிக்கப்பட வேண்டும் அல்லது அதற்கான மாற்றுத் திட்டமிடல் செய்யப்படல் வேண்டும். அதாவது, அவர்களுக்கான நிவாரண வசதிகள் செய்துகொடுக்கப்பட்டு, வேறு பயிர்ச்செய்கைகளில் அவர்கள் ஊக்குவிக்கப்பட வேண்டும். அந்த நடவடிக்கையின் தொடர்ச்சியாகப் புகையிலையைத் தடை செய்வதில் யாருக்கும் எந்த இடையூறும் ஏற்படாது. எனவே, இந்த அரசு அதற்கான சில மானிய வகைகளையும் அடையாளங்காண வேண்டும் எனக்கேட்டு, விடைபெறுகின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, tobacco cultivation will be banned in two years time. So, as an alternative, you can grow ayurvedic plants. About 90 per cent of the ayurvedic products are imported from India. What we have thought now is - actually this programme is initiated by the President - to get the farmers to plant ayurvedic plants as an alternative. We can give subsidies and all that. Please give me details as to how many farmers have to give up tobacco cultivation and the acreage of tobacco cultivation. Then, we can arrange a relief scheme for those people.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

Thank you very much. That will be ideal. Anyhow, whatever ayurvedic plants that you are trying to introduce, the government will have to purchase.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

At the moment, we give a buyback guarantee for whatever pharmaceuticals manufactured in Sri Lanka by the private sector. If they come and join the government sector, the buyback guarantee is for 15 years. If they are doing it independently, it is 10 years. So, we can give the same buyback guarantee for them also for about 15 years.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

That is a good idea. If they grow tobacco, lorries will go and purchase all the tobacco. If you change that to ayurvedic plants, nobody will go there. The concept has to come from the government.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

We have started District Purchasing Centres. I started one in Anuradhapura. Until we start a centre in Jaffna, we can ask the Anuradhapura centre to purchase the whole produce. Let me know a place - an abandoned government building or some other place with a reasonable rent - we will purchase that and start the District Purchasing Centre there.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

At the same time- I mentioned this in Tamil also earlier- there is a shortage of consultants in the Vanni District. Some consultants are on annual transfer order. Please do not release them until we get a permanent replacement. The DDG -Deputy Director General of Medical Services-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

There are a lot of problems with this DDG. That is why they are doing these transfers. Even yesterday, the AMS- the Association of Medical Specialists- met me and they were also complaining, because still the transfer orders have not been issued. So, I will tell them not to take out consultants until we replace them with permanent consultants. What is the station you referred to?

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

Vavuniya. I referred to one of the VPs in Vavuniya. He is asking to get the release immediately, but he is the only permanent consultant there. The other one was also replaced. But, there are two divisions. They are asking to replace him with the Senior Registrar who is waiting to go for foreign training. Any time, he will leave Vavuniya. We cannot allow the permanent consultants to be transferred until we get the replacements. If the replacements come, we are ready to release them.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

I have instructed them not to create any vacancies, especially in the Northern Province, because there were a lot of problems and the cadre is also less there. So, I will look into this matter.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

Yes, this problem is mainly in the Northern Province. The situation is different in Colombo and other areas. There are a lot of consultants there. But this is a problem in the Northern Province. That is why I am telling this.

Thank you.

[අ.භා. 2.53]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට නම් ඒ රටේ ජනතාවට හොඳ සෞඛ්‍ය සම්පන්නභාවයක් තිබෙන්නට ඕනෑ. ඒ නිසා ලෝකයේ සෑම රටක්ම ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා වාර්ෂිකව විශාල මුදලක් වියදම් කරනවා. වෙන් කළ යුතු ප්‍රමාණය අගයක් වශයෙන් දක්වනවා නම්, සාමාන්‍යයෙන් යම් රටක දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4 - 9 අතර ප්‍රමාණයක් සෞඛ්‍යය සඳහා වියදම් කළ යුතු බව තමයි පිළිගැනීම.

පසුගිය රජය කාලයේ සෞඛ්‍යය සඳහා වෙන් කරපු ප්‍රතිපාදන ප්‍රමාණය බැලුවොත්, 2009දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.48යි; 2010දී සියයට 1.15යි; 2011දී සියයට 1.24යි; 2012දී සියයට 1.13යි. ඒ විධියට දළ දේශීය නිෂ්පාදිතයෙන් බොහොම සුළු කොටසක් තමයි පසුගිය රජය සෞඛ්‍යයට විදයම් කළේ. නමුත්, වත්මන් ආණ්ඩුව 2015දී බලයට ඇවිල්ලා ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිකම භාර ගත්තාත් සමඟම සෞඛ්‍යය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරගෙන එම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා එතුමා නායකත්වය සැපයුවා. 2015දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.62ක්ද, 2016දී සියයට 1.57ක්ද, 2017දී සියයට 1.92ක්ද සෞඛ්‍ය සඳහා වෙන් කළා. ඒ සම්බන්ධව මම විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වනවා. මුළු සෞඛ්‍ය සේවයම හදන්න එතුමාට ඇති වෙන්න සල්ලි හම්බ වුණාය කියා මම කියන්නේ නැහැ. නමුත්, එදාට වඩා ලොකු ප්‍රවණතාවක් අද ඇති කර ගැනීමට අපට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවන්න අපි පියවර රාශියක් ගත්තා. ශ්‍රී ලංකා ඉතිහාසය ගත්තාම ජනතාවගේ සෞඛ්‍යය ගැන හොයා බලපු, වැඩ කරපු කාලය විධියට අපට පසුගිය කාලය හඳුන්වන්න පුළුවන්. මම හිතන විධියට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය තමයි පසුගිය අවුරුදු තුන. අපි රුපියල් 300, 400, 500ට තිබුණු ඖෂධ මිල රුපියල් 3ට විතර බැස්සෙව්වා. ලෝක ඉතිහාසයේ එහෙම මිල බැස්මක් කවදාකවත් දකින්න ලැබුණේ නැහැ. අපි ඖෂධ වර්ග 48ක මිල අඩු කළා. ගර්භිණී මව්වරුන්ට රුපියල් 2,000ක වටිනාකමක් ඇති පෝෂණ මල්ලක් මාස 10ක් ලබා දුන්නා. ඒ කියන්නේ, රුපියල් 20,000ක දීමනාවක් ලබා දුන්නා. හදවත් සැත්කම් සඳහා භාවිත කරන stentsවල මිල විශාල වශයෙන් - එසේ මිල අඩු කළේ රුපියල් 5කින්, 10කින්, 50කින්, 100කින් එහෙම නොවෙයි.- පහත දැම්මා. අක්ෂි කාච රෝහල්වලින් නොමිලේ දෙන්න පටන් ගත්තා. හැබැයි, මම ගරු ඇමතිතුමාගේ අවධානයට මෙම කාරණය යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, මහ ආණ්ඩුවේ රෝහල්වල අක්ෂි කාච නොමිලේ දුන්නත් පළාත් සභාවලට අයත් සමහර රෝහල්වල, ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලෙත් සමහර වෙලාවට අක්ෂි කාචයක් ගන්න ගියාම, රෝහලේ ඉන්න කට්ටිය කියනවා, "ගිහින් ඕවා දෙනවාය කිව්ව කට්ටියගෙන් ඉල්ල ගන්න.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මෙහේ ඇති දෙයක් නැහැ" කියලා. එහෙම එළවා දමන අවස්ථා තිබෙනවා. ඒ කියන්නේ, ඔබතුමා කොච්චර සක්‍රියව කටයුතු කරන්න ගියත් සමහර දේශපාලන මතිමතාන්තර නිසා සමහර නිලධාරීන්ගෙන් ලැබෙන ප්‍රතිචාරය ඒකයි. එවැනි කකුලෙන් අදින ස්වභාවයක් අපි දකිනවා. මේ ගැන එදා ඔබතුමාට කිව්වාම, ඒවා ටෙන්ඩර් කරලා ගැනීමට කටයුතු කරන්න කියලා කිව්වා. දැන් ඒ සඳහා කටයුතු කරගෙන යනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මම ගම්පහ මහ රෝහලේ අධ්‍යක්ෂතුමාට කථා කළා. එම රෝහලේ කිසිම ගැටලුවක් නැහැ. අක්ෂි කාචවල කිසිම අඩුවකුත් නැහැ. අපි අක්ෂි කාච ගෙන්වන්නේ ඇමෙරිකාවෙන්. ඒක අංක එකේ අක්ෂි කාචය.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, අධ්‍යක්ෂතුමා ඔබතුමාට අසත්‍යක් ප්‍රකාශ කර තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නමුත්, එතැන ඉන්න හෙද නිලධාරිනියයි, වෛද්‍යවරයයි තනිකරම විපක්ෂයට කත් අදින දෙදෙනෙක් බව මට ආරංචි වුණා. මම වහාම පරීක්ෂණයක් පවත්වන්න නියම කර තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, අපි කොච්චර හොඳට වැඩ කළත්, ඒ නිලධාරීන්ගෙන් අපට ලැබෙන සහයෝගය ගැනත් අප සිතිය යුතු වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, එතුමාගේ නෝනා ඉන්නෙත් Gampaha General Hospital එකේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔව්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි අනතුරකදී හා ආපදාවකදී භාවිත කළ හැකි ලෙස ජංගම ගිලන් රථ සේවයක් මේ රටේ පැය 24 පුරා ක්‍රියාත්මක වනවා. අපි දන්නවා, GMOA එක පවා ඒකට විරුද්ධව උද්ඝෝෂණය කළා; එම සේවාව ගෙනෙන්න දුන්නේ නැහැයි කියන එක. නමුත්, අද ඉතාමත් විශිෂ්ට ගිලන් රථ සේවාවක් බස්නාහිර සහ දකුණ ප්‍රදේශවල ඇති කර තිබෙනවා. අද ජනතාව එම පහසුකම බුක්ති විඳිනවා.

සිගරට් පැකට්ටුවක මුහුණත ඇතුළත් කළ යුතු රූපමය අවවාද සියයට 60 තිබුණු ප්‍රමාණය සියයට 80 දක්වා වැඩි කිරීමට මොන අභියෝග ආවත් ඔබතුමා එඩිතරව ක්‍රියා කළා. පසුගිය දවස්වල එම තීන්දු ඔබතුමා ගත්තේ බාධක මැද්දේ සහ විරෝධතා මැද්දේ බව අපි දන්නවා. ඔබතුමා එඩිතරව ගත් මේ සියලු ක්‍රියා මාර්ග සෞඛ්‍ය ක්ෂේත්‍රයට ස්වර්ණමය යුගයක් එළඹීමට හේතු වෙලා තිබෙනවා.

සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීමට රජය කොපමණ මුදලක් වියදම් කළත්, දළ දේශීය නිෂ්පාදිතයෙන් කොපමණ පංගුවක් වැය කළත් ජනතාවට දැරිය නොහැකි ලෙස ඖෂධ සඳහා මිලක් නියම වී තිබෙනවා නම්, ඒක ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් අපි බලාපොරොත්තු වන අරමුණට - target එකට- යන්න බැරි වනවා. ලෝකයේ සිදු කරන ජාවාරම් අතරින් දෙවැනි තැනට තිබෙන්නේ, ඖෂධ ජාවාරම. පළමු තැනට තිබෙන්නේ, අවි ආයුධ ජාවාරම. ඒක දරුණුම එක. දෙවැනි තැනට තිබෙන දරුණුම ජාවාරම තමයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඖෂධ ජාවාරම. මේක තමයි ලෝකයේ දෙවැනියට තිබෙන දරුණුම ජාවාරම වෙලා තිබෙන්නේ. ලෝකයේ ජනතාව මෙම ජාවාරමෙන් බේරා ගන්න මුල් වතාවට ඖෂධ ප්‍රතිපත්තියක් ඇති කළේ ශ්‍රී ලංකාවේ. ඒ, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමායි. මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය පදනම් කරගෙන ලෝකයේ ඖෂධ ප්‍රතිපත්ති සකස් කරගත් රටවල් ගණන අද සියයකට ආසන්න වනවා. ඖෂධ මාෆියාව විසින් මාහාචාර්ය සේනක බිබිලේ මහතාව ඝාතනය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බාධා ඇති වුණා. ඖෂධ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන්න කවුරුත් බිය වුණා.

ඖෂධ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා දැනට අපි වසරකට රුපියල් මිලියන 45,000ක් පමණ වැය කරනවා. සාමාන්‍යයෙන් අපේ රටේ දිනකට අළෙවි වන ඖෂධ ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන 400ක් පමණ වනවා. දියවැඩියා රෝගය සඳහා විතරක්ම දවසකට රුපියල් මිලියන 20ක ඖෂධ තොගයක් විකිණෙනවා කියන එක අපි අහලා තිබෙනවා. කොහොම නමුත්, ශ්‍රී ලංකාව වැනි රටකට සාමාන්‍යයෙන් අවශ්‍ය වන ඖෂධ ප්‍රමාණය 2,500ක්, 3,000ක් පමණ වුවත්, ඖෂධ වර්ග 15,000ක් විතර ආනයනය වෙමින් පැවතුණා. පසුගිය යුගයේ අපේ රටේ ඖෂධ මාෆියාව තදින් ක්‍රියාත්මක වීම නිසා ජ්‍යෙෂ්ඨ පුද්ගලයින්ට -වැඩිහිටි පුද්ගලයින්ට- තම ආදායමෙන් වැඩි කොටසක් ඖෂධ සඳහා වියදම් කරන්න සිද්ධ වුණා. එදා රටට ගෙන්වපු ඖෂධ දිහා බැලුවාම එක්කෝ කල් පැන ගිය ඖෂධ; එහෙම නැත්නම් ඉන්ජෙක්ෂන් බෝතලයේ බෝතල් කටු. එවැනි තත්ත්වයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒ විතරක් නොවෙයි, ඖෂධ විෂ වීම නිසා වසරකට පුද්ගලයන් සියයක් පමණ මිය ගියා. මොකද, ඖෂධ විෂ වීම නිසා; වැරදි ඖෂධ ගෙනෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ගෝලයෙක් වන අපේ ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වීම එඩිතර ක්‍රියාවක්. ඒක රට වෙනුවෙන් ගත්තු පියවරක්. මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා 1976 ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වා දීලා අවුරුදු 40ක් වාගේ කාලයක් ගත වුණත් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න පුළුවන් කොන්ද කෙළින් තිබෙන රජයක්, කොන්ද කෙළින් තිබෙන ඇමති කෙනෙක් හිටියේ නැහැ. හැම රජයක්ම බලයට එන කොට දෙන දේශපාලන පොරොන්දුවලට කියනවා, "මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා" කියලා. නමුත්, කරන්න කෙනෙක් හිටියේ නැහැ. එඩිතරව එම පියවර ගැනීම ගැන ගරු ඇමතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ සඳහා ශක්තිය, සවිය ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් ස්තුතිවන්ත වනවා.

එදා ජනාධිපතිවරණයේදී අපේ ඡන්ද පොරොන්දුවක් විධියට තමයි සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා කියන කථාව කිව්වේ. අපි ඒ ඡන්ද පොරොන්දු අනුවම කටයුතු

කළා. ඡන්ද පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේදී සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී අපට පළමුවෙනියටම තිබුණේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවන්නයි.

ඉතාම සක්‍රීය විධියට අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවා තිබෙනවා. මේ අධිකාරියෙන් ඖෂධවල මිල තීරණය කෙරෙනවා. ඖෂධ වර්ග 48ක මිල අපට අඩු කරන්න පුළුවන් වුණේ ශත පනහකින්, රුපියලකින් නොවෙයි. විශාල ප්‍රමාණයකින් මිල අඩු කරලා පෙන්වන්න පුළුවන් වුණේ මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසායි. අද මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග තිබෙන්නේ විශාල වශයෙන් අඩු කරපු ඖෂධවල මිල වසරක් ගියාට පස්සේ සියයට 5කින් වැඩි කිරීම ගැනයි. ඩොලරයේ අනුපාතය අනුව, ලෝක වෙළෙඳ පොළ මිල අනුව, රුපියල කඩා වැටීම කියන ප්‍රශ්න නිසා සියයට 5කින් මිල වැඩි කරන්න යනවා කියන කථාවක් තමයි තිබෙන්නේ. නමුත් එදා තිබුණු මිලත් එක්ක බැලුවාම තවමත් මේ මිල, අලියෙක් ඉස්සරහා ඉන්නා කුඹියෙක් වාගේ තමයි. එහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙත් වර්ග 48ක මිල සුවිශේෂී විධියට අඩු කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් දියවැඩියා රෝගීන් "බෙහෙත්වල මිල මෙච්චර අඩු කරලා අපට දුන්නා" කියලා ගරු ඇමතිතුමාට සහ රජයට පින් දෙනවා. නමුත් මම තව කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ මිල අඩු කිරීම ඖෂධ 48කින් නවත්වන්න එපා. අසල්වැසි ඉන්දියාව දිහා බැලුවොත් ඖෂධ 600ක මිල මේ වාගේ පාලනය වෙනවා. අඩු ගණනේ ඒ වාගේ කාල වකවානු ඇතුව තව බෙහෙත් වර්ග සියයකටවත් යන්න පුළුවන් නම් හොඳයි. අපි මේ කාලය ඇතුළත තව සියයකට යනවා; දෙසියය දක්වා යනවා; තුන්සියය දක්වා යනවා කියලා මිල පාලනය තව තව ඉස්සරහට ගෙනියන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒ නිසා ඖෂධ වර්ග 48කින් නවතින්න දෙන්නේ නැතුව මේ මිල පාලනය ඉදිරියට ගෙනයන්න කටයුතු කරන්න කියා විශේෂයෙන්ම ඉල්ලනවා. මොකද, අපේ රටේ බෙහෙත් වර්ග - ඖෂධ වර්ග- 1000ක් විතර පාවිච්චි වෙනවා. ගෙනෙන ඖෂධවල ආරක්ෂාව; තත්ත්වය; තිබෙන කාර්යක්ෂමතාව මොකක්ද? ඒ වාගේම මේ ඖෂධ රටට කොච්චර අවශ්‍යද; රටේ ජනතාවට දැරිය හැකි මිල ගණන්වලටද එන්නේ කියන කාරණා පිළිබඳ සොයා බැලීම විශේෂයෙන් මේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු වගකීමක් වෙනවා.

අද ගරු ඇමතිතුමාත් මුලදී කිව්වා, කොච්චර කිව්වත් රසායන නාමයෙන් තවම බෙහෙත් ලියවෙන්නේ නැහැ කියන කාරණය පිළිබඳව. ව්‍යාපාර නාමයෙන් - trade name එකෙන්- තමයි බොහෝ විට බෙහෙත් ලියැවෙන්නේ. ඒ නිසා නීති හැදුවාට ඒ නීතිය ක්‍රියාත්මක කර ගන්නේ කොහොමද කියන එක ගැන අපිට වැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. මොකද, මේ නීති ක්‍රියාත්මක කිරීම ලෙහෙසි නැහැ. වෛද්‍යවරුන්ගේ මානියාවක් එතැනත් තිබෙනවා. ඇමතිතුමාට කොච්චර දුරට කෑ ගහලා මේ තත්ත්වය පාලනය කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. කොහොමද රසායන නමින් බෙහෙත ලියන්න හරි ගස්සන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපට තව අභියෝගයක් තිබෙනවා. එනම්, රසායන නාමයෙන් බෙහෙත් ලිව්වත් මේ එන බෙහෙත් වර්ග test කර ගන්න විධිය මොකක්ද? මේ බෙහෙත් හොඳ quality එකට තිබෙනවාද, ගුණාත්මකභාවය හොඳයි ද කියන එක දැනට test කරන්නේ ඉන්දියාවේ තිබෙන ආයතනවලින් කියලා මම අහලා තිබෙනවා. නමුත්, ලංකාවේ ජාතික ඖෂධ නියාමන අධිකාරියට මේ වාගේ රසායනාගාරයක් - test laboratory එකක් - හදා ගන්න බැරිද? රටට එන බෙහෙත් සංඛ්‍යාව දිහා බැලුවොත්, අපට එක් රසායනාගාරයකින් නම් පිරිමහන්න බැහැ. නමුත් පෞද්ගලික අංශයට වුවත් කමක් නැහැ, අපි ඔවුන්ට වගකීම් භාරදීලා රසායනාගාර 10ක් හෝ හදලා, ඉන් එකක් model රසායනාගාරයක් විධියට ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතුව තියා ගෙන, batch එකෙන් batch එකට එන ඖෂධ ගැන පරීක්ෂා කරන්න කටයුතු කරන්න ඕනෑ. එතකොට අපි ඉන්දියාවෙන් එන report පිළිගන්න ඕනෑ නැහැ, අපේ report ගන්න කියලා ඖෂධ සපයන අයට කියන්න පුළුවන්. එක පැත්තකින් අපට විදේශ විනිමය එනවා. අනෙක් පැත්තෙන් අපටම ආවේණික වෙච්ච අපටම විශ්වාස කරන්න පුළුවන් method එකක් එනවා.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගේ අවධානයට විශේෂයෙන් යොමු කරනවා, අලුත් ආණ්ඩුව බලයට ආවාට පසුව, ඔබතුමා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමති ධුරය භාරගත්තාට පසුව බාල ඖෂධ ඇවිල්ලා නැහැ; ඉස්සර වාගේ, inject කරන බෙහෙත් අඩංගු කුප්පිවලින් වීදුරු කටු ලැබිලා නැහැ කියන කාරණය. මේ පරීක්ෂණ කිරීමත් අපේ අතට ගන්න පුළුවන් නම් හොඳයි කියලායි මම විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙත් ගබඩා කිරීමේ තත්ත්වය කොහොමද කියන එක ගැන ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් පරීක්ෂා කරන්නේ ෆාමසිවල, එහෙම නැත්නම් private hospitalsවල විතරයි. ඒ ගැන රජයේ රෝහල්වලත් පරීක්ෂා කරන්න පටන් ගන්න ඕනෑ. රජයේ රෝහල්වල මේ ගැන පරීක්ෂා වෙන්නේ නැහැ. ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගේ අවධානයට විශේෂයෙන් යොමු කරවනවා, රජයේ රෝහල්වලත් බෙහෙත් ගබඩා කිරීම කොහොමද, ඖෂධවල quality එක පවත්වාගෙන යාම කොහොමද කියන එක පිළිබඳ පරීක්ෂණ කරන්න ඒ අධිකාරියට බලය දෙන්න ඕනෑ කියන කාරණයට.

ගම්පහ දිස්ත්‍රික්කයට බෙහෙත් ගබඩාවක් අවශ්‍යයි කියලා පළාත් සභාව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළා. අපි ඉඩමක් ලබාදුන්නා. මොකද, බෙහෙත් ගබඩා කිරීම ගම්පහ ප්‍රදේශයට වැදගත් දෙයක් වන නිසා. නමුත්, ඒ ඉඩම ලබාගත්තා විතරයි. ඒ කටයුත්ත කිරීමට පළාත් සභාවෙන් උනන්දුවක් වෙලා නැහැ. තවමත් ඒ ඉඩම එහෙමම තියා ගෙන ඉන්නවා. ඒ ගබඩාව හැදුවේ නැහැ. ගරු අමාත්‍යතුමනි, එම නිසා මම ඔබතුමාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරවනවා.

ගරු අමාත්‍යතුමනි, මේ අධිකාරිය පනත ආවාට පසුව තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ෆාමසි දෙක-තුනක් තිබෙන්න බැහැ. ඒ සංඛ්‍යාව ජනගහනය අනුවයි තීරණය වෙන්න ඕනෑ. ගම්පහ ආසනය දෙස බැලුවාම අපට ප්‍රශ්නයක් ආවා. ගම්පහ, මාකවිට හන්දිය ජනගහනය ගැවසෙන හන්දියක්. එහි නීතියෙන් තියෙන්න පුළුවන් එක ෆාමසියක් විතරලු. මේ පනත අනුව එතැන තව කෙනෙක්ට ෆාමසියක් හදන්න බැරිලු; දෙකක් තිබෙන්න බැහැලු. එතකොට එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන ඒකාධිකාරියක් බිහි වෙන අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මා මෙය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මොන නීතිය තිබුණත් ටවුන් එකක අඩුම තරමේ ෆාමසි දෙකක්වත් තිබෙන්න ඕනෑ. ඊට පසුව ජනගහනය අනුව හෝ දුර අනුව හෝ වෙනස් කළාට කමක් නැහැ. නමුත්, නගරයක එක ෆාමසියකට සීමා කරන්න එපා කියලායි මම කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. දැන් කථාව කෙටි කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ අවධානයට තවත් කරුණක් යොමු කරවන්න කැමැතියි. මෙය ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. පසුගිය දවස්වල පළාත් සභාවට අයත් ගම්පහ රෝහලේ lift එකෙන් එළියට බහින්න ගිහිල්ලා හිරවෙලා එක්කෙනෙක් මිය ගියා. අම්මායි, තාත්තායි තමන්ගේ දරුවාට බෙහෙත් ගන්න කියලායි ගියේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා හොඳ පණිවිඩයක් දෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු අමාත්‍යතුමනි, ගම්පහ රෝහලේ හැම වෙලාවේම power cuts සිදුවෙනවා. Operations කරන්න බැහැ, air conditioners කැඩෙනවා. මේ වාගේ ප්‍රශ්න ගම්පහ රෝහලේ තිබෙනවා. ඒ තාත්තා lift එකෙන් එළියට බහින්න ගිහිල්ලා හිරවෙලා, lift well එකට වැටිලා එතැනම මිය ගියා. ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න. මොකද පළාත් සභාවල දෙයක් වුණත්-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමා, මේක එම රෝහලේ තිබෙන ප්‍රශ්නයක් විතරක් නොවෙයි. අපි මුදල් දීලා මෙවැනි විශාල රෝහල් හදලා පළාත් සභාවට දුන්නාට, ඒවා පවත්වා ගැනීමේ ශක්තිය පළාත් සභාවට නොමැති තත්ත්වයක් ඇති වුණා. මෙම රෝහල් නොවෙයි, මම ඉදිරියේදී හදන රෝහල් ඔක්කෝම ටික යුරෝපීය රෝහල්වල තත්ත්වයේ ඒවා. එම රෝහල් දිස්ත්‍රික්ක 15ක විතර හදනවා. ඒවා පළාත් සභාව මඟින් කොහොම පාලනය කරන්නද? අපි මාස තුනකට වරක් පළාත් සභා ඇමතිවරුන් එක්ක සාකච්ඡා කරනවා. එහිදී අපට තීන්දුවක් ගන්න ඕනෑ, කොයි රෝහල්ද එතුමන්ලාට පාලනය කරන්න පුළුවන් වන්නේ කියලා. අනෙක් රෝහල් මහ ආණ්ඩුවට අරගෙන හරි පාලනය කරන්න වෙනවා. ගම්පහ රෝහලට අවශ්‍ය සියලුම දේවල් මම දීලා තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

දීලා තිබෙනවා, ගරු ඇමතිතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නමුත් දෛනිකව රෝහල පවත්වා ගැනීම සඳහා අපට මුදල් දෙන්න බැහැ. අනික් ඕනෑ එකක් අරගෙන දෙනවා. නමුත් අපට දෛනිකව මුදල් දෙන්නට බැහැ නේ. ඒක ඒ ගොල්ලන් කරන්න ඕනෑ. පළාත් සභාවේ එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති වෙච්ච වෙලාවේ එදා හිටපු මන්ත්‍රීවරයා -ලයනල් ගුණවර්ධන මැතිතුමා- ප්‍රකාශ කළා, මේ රෝහල මහ ආණ්ඩුවට ගන්න කියලා. ඊට පසුව මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවෙලා ඉන්න වෙලාවේ එවකට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා -පණ්ඩු බණ්ඩාරනායක මැතිතුමා- ඉල්ලීමක් කළා, මේ රෝහල මහ ආණ්ඩුවට ගන්න කියලා.

ඊට පසුව මේ ඊයේ-පෙරේදා අතිගරු ජනාධිපතිතුමා රැස්වීමක සිටියදී ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් මා ඉල්ලීමක් කළා, මේ රෝහල මහ ආණ්ඩුවට ගන්න කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන කථාව ඇත්ත. ඒ ගොල්ලන් මේක බදා ගන්නවා, රැකී රක්ෂා පිරවීමේ අරමුණෙන්. නමුත් ඒ ගොල්ලන්ට නඩත්තු කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනින් ඒ රෝහල මහ ආණ්ඩුවට ගන්න. දැන් ඔබතුමා අපි ඉල්ලන හැම දේම දෙනවා. අපි ඉල්ලන්නේ මොනවාද, ඔබතුමා නත්තල් පප්පා වාගේ ඒ ඔක්කෝම දෙනවා. කවදාවත් බැහැ කියලා නම් නැහැ. හැමදේම දෙනවා. හැබැයි ඒවා දුන්නාට, මුදල් ලබා දුන්නාට එදිනෙදා නඩත්තු කර ගැනීමේ හැකියාව නැහැ. පොඩි රෝහල් වශයෙන් ඒ ගොල්ලන්ට capacity එකක් නැහැ. නමුත් ගම්පහ රෝහල ගත්තාම ගම්පහ දිස්ත්‍රික්කයේ අනෙක් රෝහල් ඔක්කෝම එකතු කළත් ගම්පහ රෝහලෙන් භාගයක් විතර ඇති. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියලාත් ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වාගේම ඒ රෝහලේ lift එක ක්‍රියාත්මක නොවීම නිසා මිය ගිය පුද්ගලයා වෙනුවෙන් වන්දියක් ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පළාත් සභාවට හරි බල කරලා ඉතා ඉක්මනින් ඒ වෙනුවෙන් වන්දියක් ගෙවන්න. මොකද, පොඩි දරුවෙක් ඉන්නේ. ඒ දරුවාගේ අනාගතය හැදෙන්න ඕනෑ. ඒ වාගේම ඒ මිය ගිය පුද්ගලයා වරාය අධිකාරියේ වැඩ කළ මහත්මයෙක්. ඒ පවුලේ පියා මිය ගිය නිසා අද මුළු පවුලම අනාථ වෙලා තිබෙනවා. ඒ දරුවාගේ අම්මාට සෞඛ්‍ය සේවයේ රැකියාවක් ලබාදෙන්න. ඇය තරුණ අම්මා කෙනෙක්. තරුණ පියෙක් තමයි මිය ගියේ. ඒ දරුවාගේ අම්මාට සෞඛ්‍ය සේවයේ රැකියාවක් දෙන්න. පළාත් සභාවේ රස්සාවලට ඕනෑ තරම් අය දමනවා, ආතක් බූතක් නැතුව. ඒ මිය ගිය පුද්ගලයා වෙනුවෙන් ඒ පුද්ගලයාගේ බිරිඳට රැකියාවක් ලබා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියන එකත් මතක් කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ප.ප. 3.10]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

ගරු ඇමතිතුමනි, සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට මා එහිදී බොහෝ විට අහනවා, එක් එක් රෝග සම්බන්ධයෙන් තිබෙන වර්ධනයන් ගැන. එක් එක් සම්බන්ධීකරණ කමිටුවලදී මා ඒ ගැන අහනවා. ඒ නිසා පසුගිය කාලයේ ඩෙංගු වසංගතය වර්ධනය වෙමින් එනකොට රජයක් හැටියට මේ රජයටත්, ඒ වාගේම ඔබතුමාටත් එයට සාර්ථකව පිළිතුරු දෙන්න පුළුවන් වුණා. පසුගිය දවසක සම්බන්ධීකරණ කමිටුවෙන් ඇහුවාම මට දැන ගන්නට ලැබුණා, අපේ ප්‍රදේශවල වකුගඩු රෝගීන්ගේ ව්‍යාප්තිය වැඩියි කියලා. එයට අදාළ බලධාරීන්ගෙන් මා ඇහුවා, වකුගඩු රෝගය වර්ධනය වීම වළක්වන්න ඔබතුමන්ලා ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. ගරු ඇමතිතුමනි, වකුගඩු රෝගීන් සඳහා රෝහල් හදන එක, වකුගඩු රෝගීන්ට ලබා දෙන ආධාර දීමනා වැඩි කරන එක දැනටමත් අපේ රජයෙන් කර ගෙන යනවා. නමුත් ඒ තුළින් පමණක් වකුගඩු රෝගය නැති කරන්න පුළුවන්කමක් නැහැ; වකුගඩු රෝගයට ගොදුරු වන පිරිස අවම කරන්න පුළුවන්කමක්

නැහැ. එහෙම නම් රෝග නිවාරණය ඉතාම වැදගත්. "අපේ කොටියාසවලින් වර්ෂයකට වකුගඩු රෝගීන් කොතරම් ප්‍රමාණයක් අලුතින් හඳුනා ගන්නවාද? ඒ අය වකුගඩු රෝගවලට ලක් වෙන්න හේතුවෙලා තිබෙන්නේ මොන කාරණාද කියා සොයා බලා යම්කිසි විධියක රෝග නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද?" කියා මා සම්බන්ධීකරණ කමිටුවේ නිලධාරීන්ගෙන් ඇහුවාම ඒ සම්බන්ධයෙන් මට සතුටුදායක පිළිතුරක් ලැබුණේ නැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කළා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමා, වකුගඩු රෝගය දෙයාකාරයකට හැදෙනවා. එකක් තමයි හේතුව හඳුනා ගත් වකුගඩු රෝගය. දියවැඩියාව, අධික රුධිර පීඩනය වැනි රෝග නිසා ඇති වන වකුගඩු රෝග තත්ත්වය. ඊට අමතරව හඳුනා නොගත් වකුගඩු රෝගයක් ලංකාවේ තිබෙනවා. මේ පිළිබඳව තමයි ලංකාව විශේෂිත වෙලා තිබෙන්නේ. හඳුනා ගත් වකුගඩු රෝගය සඳහා අපි දැන් දැවැන්ත වැඩ පිළිවෙළක් ගෙනයනවා. අපි ලබන මාසය වන විට ගමින් ගමට යමින් හඳුනා ගත් බෝ නොවන රෝග, non-communicable diseases - NCDs - පිළිබඳ වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා. මම උදේ කිව්වා වාගේ ඒ වෙනුවෙන් ලෝක බැංකුව රුපියල් මිලියන 30,000ක් ලබා දීලා තිබෙනවා. අපි ඒ මුදලත් උපයෝගි කරගෙන මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

අනෙක් එක තමයි හඳුනා නොගත් බෝ නොවන වකුගඩු රෝගය. අපි ඒකට එක හේතුවක් ලෙස ග්ලයිෆොසේට් කියන වල්නාශකය හඳුනා ගෙන තිබෙනවා. අපේ ආණ්ඩුව ග්ලයිෆොසේට් ආනයනය තහනම් කළා. පසුගිය රජයට දිගින් දිගටම කරුණු ඉදිරිපත් කළා, ග්ලයිෆොසේට් තහනම් කරන්න කියලා. ඒ සඳහා අපේ පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ තමයි නායකත්වය ගත්තේ. නමුත් දුම්කොළ සමාගම් වාගේ සමාගම් එක්ක එකතු වෙලා හිටියා මිසක් ඒ වැඩ කටයුත්ත කළේ නැහැ. අපේ වර්තමාන ජනාධිපතිතුමා ග්ලයිෆොසේට් ආනයනය කිරීම තහනම් කළා. දැන් ඔබතුමන්ලාත් මේ සඳහා සම්බන්ධ වෙන්න. මේ වන විට නැවතත් ග්ලයිෆොසේට් ආනයනය කිරීමට බලපෑම් තිබෙනවා. මම ඒකට දැඩිව විරුද්ධ වෙනවා. ඒක එක ප්‍රශ්නයක්. මෙම රෝග තත්ත්වය කොපමණ උත්සන්න වුණත් අවුරුදු ගණනාවකට ලංකාවට ගෙනැත් තිබුණේ dialysis machines 228යි. මම එක අවුරුද්දකට dialysis machines 278ක් ආණ්ඩුවෙන් ගෙනැත් දුන්නා. මෙම වසර අවසන් වනවිට dialysis machines ගණන දහස දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉන්දියානු සමාගමක් එක්ක අපි කථා කරගෙන තිබෙනවා. ඒ අය තව මාසයකින්, හමාරකින් වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා. ඒ අය තව dialysis machines 900ක් ගෙනෙනවා. ඒ dialysis machines 900ට අපි මුදල් ගෙවනවා. අපි රෝගීන්ට dialysis treatment පහසුකම් ලබා දෙනවා. මොකද, වකුගඩු රෝගීන් දැන් අමාරු තත්ත්වයේ ඉන්නේ.

අනෙක් එක තමයි වකුගඩු බද්ධ කිරීම. මේ වන විට වකුගඩු බද්ධ කිරීම විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. දැන් ඒ සඳහා අවශ්‍ය පහසුකම් තිබෙනවා. ඔබතුමා ඒ ගැන කිව්වේ නැහැ. අපි දැන් කරාපිටිය ශික්ෂණ රෝහලට වෙනම Nephrology Unit එකක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම Dental Unit එකක්, Cancer Unit එකක් සහ මාතෘ සහ ළමා ඒකකයක් ලබා දීලා තිබෙනවා. වෛද්‍ය පීඨය පුළුල් කිරීම අරමුණු කරගෙන විශේෂඥ සේවා ඔක්කොම ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේ හැම අංශයකින්ම වකුගඩු රෝගය සම්බන්ධයෙන් අපි ක්‍රියා කරලා තිබෙනවා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මම ඔබතුමාට සඳහන් කළේ අර සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කළාම, සමහර නිලධාරීන්ගෙන් කරුණු විමසුවාම ඒ ගොල්ලෝ එවැනි වැඩ පිළිවෙළක් ගැන සතුටුදායක පිළිතුරක් ලබා දුන්නේ නැති නිසායි. දැන් ඔබතුමා එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා කියන එක හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයකුයි තිබෙන්නේ.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මගේ කාලය අඩු කරන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමා ගත්ත කාලය මගෙන් අඩු කරන්න එපා. එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වීම සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

මගේ මීළඟ ඉල්ලීම මට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් කළා. ඒ තමයි, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල් ලබා දෙන්න කියන ඉල්ලීම. ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල නගරයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල් පිහිටුවලා තිබෙනවා. නමුත්, අපේ ප්‍රදේශවලත් -බද්දේගම වැනි නගරයෙන් ඇතුළත ප්‍රදේශවලත්- අඩුම තරමින් ප්‍රධාන නගර කිහිපයකට එකක් හෝ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල් පිහිටුවන්න පුළුවන් නම්, ඔබතුමා ඖෂධ වර්ගවල මිල අඩු කළා වාගේම, ජනතාවට නියම ප්‍රමිතියෙන් සහ කිසිදු ආකාරයක වෙනත් බාධාවකින් තොරව ඖෂධ මිලදී ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ නිසා, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසල් පිහිටුවන්නත් ක්‍රියා කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙය ඔබතුමාට අදාළ, ඔබතුමාට ඍජුව මැදිහත් වෙන්න පුළුවන් කාරණයක් නොවුණත්, මම සඳහන් කරන්න ඕනෑ වැදගත්ම දෙයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, විනාඩියකින් කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

බරපතළම ප්‍රශ්නයක් මේ සඳහන් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රශ්න විශාල ප්‍රමාණයක් සටහන් කර ගෙන තිබුණත්, ඒවා ඉදිරිපත් කිරීමට මට කාලය ප්‍රමාණවත් නැහැ.

ගරු ඇමතිතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, ගාල්ල දිස්ත්‍රික්කයේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඈත එපිට අපේ අහිංසක මනුස්සයෙකුගේ මරණයක් ග්‍රාමීය රෝහලක සිද්ධ වුණාම, එම රෝහල්වල මෘත ශරීරාගාර තිබුණත්, මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය කරාපිටිය රෝහලට ගෙන යන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කඩිනමින් අවසන් කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ඉතාම කඩිනමින් අවසන් කරනවා.

අදාළ පහසුකම් සියල්ල තිබෙනවා. මෙවැනි අභිංසක ජනතාවකට මේ කටයුත්ත කර ගැනීමට සමහර අවස්ථාවල විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙනවා. සාමාන්‍ය දුප්පත්, අභිංසක මනුස්සයෙක් වුණොත්, මෘත ශරීරයක් කරාපිටියට ගෙන ගිහිල්ලා ආපහු ගමට ගෙනෙන්න විශාල මුදලක් වියදම් කරන්න ඕනෑ. එහෙම ගෙනයන්න හේතුව අහලා බැලුවාම, බොහොම සුළු ප්‍රශ්නයක් තිබෙන්නේ. සමහර තැන්වල තිබෙන්නේ cutter කෙනෙක් නැති ප්‍රශ්නය. මම මේ කාරණය පළාත් සභාවත් එක්ක කථා කළාම ඒ ගොල්ලෝ කියනවා, මේවාට බඳවා ගන්න, වැටුප් ගෙවන්න ඒ අයට ක්‍රමවේද නැහැ කියලා.

ගරු ඇමතිතුමනි, පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අපේ මධ්‍යම රජයත් සම්බන්ධ වෙලා විසඳිය යුතු ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒවා විසඳන්න ක්‍රියා කරන්න කියන ඉල්ලීමත් කරනවා.

මට ප්‍රශ්න රැසක් ගැන කථා කරන්න තිබුණත් කාල වේලාව නැහැ. ඒ නිසා, මම පටන් ගත්ත තැනින්ම මගේ කථාව අවසන් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා නැහෙනහිර පළාතට යනවා වාගේම, අපේ සෑම පළාතකටම ඇවිල්ලා මේවාට මැදිහත් වෙලා, මේ ගැටලු විසඳා ගන්න උදවු කරන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.08]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර තුනක පමණ අපේ රජයේ කාල පරිච්ඡේදය තුළ විශාලතම සේවාවක් ඉෂ්ට කරමින්, අලුත් බලාපොරොත්තු රැසක් තබාගෙන තිබෙන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිළිබඳව කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වනවා. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාගේත්, නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් කැපවීම තුළින් විශාල සේවාවක් පසුගිය කාල පරිච්ඡේදය තුළ සිද්ධ වුණා. 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, 142 වගන්තිය යටතේයි ගරු අමාත්‍යතුමා විසින් මේ නියෝග ඉදිරිපත් කර තිබෙන්නේ.

මට පෙර කථා කළ ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා මගේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. එතුමා කිව්වා වාගේ මා දන්නා හැටියට, 1982 වර්ෂයේ පමණ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ, සෞඛ්‍ය අමාත්‍ය රංජිත් අතපත්තු මැතිතුමාගේ කාලයේයි ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහල ස්ථාපිත වුණේ. එදා මෙදාතුර කාලය තුළ වැඩිම සේවාවක් ඉෂ්ට වුණේ මේ අවුරුදු තුනක කාලය තුළ කියා මම භය නැතිව කියනවා. 2017 වර්ෂය වෙන කොට රුපියල් ලක්ෂ 90,000ක වැඩ කොටසක් ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ ක්‍රියාත්මක වුණා; සෑම අංශයක් තුළින්ම විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. අපේ ගරු ජනාධිපතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට පටන් ගත්ත වකුගඩු රෝහල් ඒකකය ගරු ඇමතිතුමා පත්වී එන කොටත් ඉබි ගමනින් තිබුණේ. අඩුම ගණනේ මේ අවුරුද්ද අවසානය වෙන කොටවත් එහි වැඩ කටයුතු අවසන් කරන්න කියලා අපි ඉල්ලීමක් කරලා තිබෙනවා. මෙමඟින් ඌව පළාතේ ඉඳලා ගාල්ල දක්වා තිබෙන පළාත් කිහිපයක ජනතාවට විශාල සේවාවක් ඉෂ්ට වනවාය කියා අප දන්නවා.

අදත් මොණරාගල ඉඳලා, අදත් බදුල්ලේ ඉඳලා එන ලෙඩුන්, ලෙඩුන් බලන්න එන පිරිස රැගත් බස් රථ ගමන් කරන්නේ කරාපිටිය ශික්ෂණ රෝහලටයි. ඒ විතරක් නොවෙයි, ඔබතුමා පිළිකා රෝහලට විශේෂ යන්ත්‍ර සූත්‍ර ගෙනැත් දීලා තිබෙනවා.

මෙතෙක් කාලයක් රෝහල තුළ මහාචාර්ය ඒකකයක් තිබුණේ නැහැ. වෛද්‍ය පීඨයේ ඉඳලා තමයි මහාචාර්යවරු රෝහලට ආවේ. ඔබතුමා මහාචාර්යවරුන් සඳහා Professorial Unit එකක් හදන්න විශාල මුදලක් වෙන් කරලා ඒ සඳහා කටයුතු කරමින් යනවා. මේ මොහොත වන විට ඔබතුමා තවත් තට්ටු 10ක රෝහල් සංකීර්ණයක් ඉදි කරන්න කටයුතු කර තිබෙනවා. මේ විධියට ගත්තොත් අපි මේ අවුරුද්ද වන විට විශාල වැඩ කොටසක් ඉෂ්ට කර තිබෙනවා.

මෙම නියෝග ගෙන එනකොට ඔබතුමා තවත් සුවිශේෂී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. එදා සුනාමි ව්‍යසනය වෙලාවේ ලංකාවට පැමිණ සිටි, ඒ බෛදවාචකයට මුහුණ දුන්, ඒක ඇහින් දැකපු ජර්මනියේ හිටපු චාන්සලර් හෙල්මුට් කෝල් මැතිතුමා මහමෝදර මාතෘ රෝහල කඩා වැටී තිබෙනවා දැකලා, එම රෝහල වෙනුවට ආරක්ෂිත ස්ථානයක නව රෝහලක් හදන්න "හෙල්මුට් කෝල් පදනම" මඟින් රුපියල් කෝටි 3,000ක පමණ විශාල මුදලක් එවා තිබුණා. නමුත් ගරු ඇමතිතුමනි, අවුරුදු 9ක් 10ක් යන තෙක් එහි foundation එක විතරයි තිබුණේ. ඔබතුමා 2015 අගෝස්තු මැතිවරණයට කලින් දින සියයේ වැඩ සටහන යටතේ අපේ ඉල්ලීම මත ඒ රෝහලේ කටයුතු නැවත ආරම්භ කළා. ඒ Steering Committee එකේ සාමාජිකයකු හැටියට මාත් පත් කර තිබෙනවා. මම ඉතාම සතුටින් කියනවා, මේ වන විට තට්ටු 6ක ගොඩනැඟිලි 6ක් -තට්ටු 36ක්- හදලා ලබන අවුරුද්දේ මාර්තු වන විට සියලු වැඩ අවසන් වෙන බව. මේවා තමයි වැඩ කියන්නේ.

අද සමහරු අහනවා, මොනවාද කරපු වැඩ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු අපට චෝදනා කරනවා මොනවාද කරපු වැඩ කියලා. අපට විවේචන එල්ල කරන ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මේවා කියන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ නව මාතෘ රෝහල දකුණු ආසියාවේ තිබෙන ඉතාම විශිෂ්ට ගණයේ රෝහලක්. මේ රෝහලත් එක්ක 25,000කට වැඩි පිරිසක් කරාපිටියට එනවා. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා මේ සඳහා ඔබතුමා යුරෝ මිලියන 39ක්, ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ හැත්තෑපන්දහසක් පමණ මේ සඳහා වැය කරන බව. මේ සඳහා රුපියල් ලක්ෂ හැත්තෑපන්දහසක් වියදම් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මම කියනවා, එතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට හිටපු අවස්ථාවේ රුහුණු විශ්වවිද්‍යාලයට ඉඩම් ලබා දීලා, දහවැනි පීඨයක් හැටියට සම සෞඛ්‍ය විද්‍යා පීඨය ස්ථාපිත කරන්න කටයුතු කර තිබෙනවා. අදත් විශ්වවිද්‍යාල උප කුලපතිවරු ඇවිල්ලා ඒ පිළිබඳ සාකච්ඡාවක් තිබුණා. ඒ සඳහා අවශ්‍ය මුදල් පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පීඨය තුළින් හෙද උපාධි, MLT වාගේ විශේෂිත පාඨමාලා හදාරන්න පුළුවන්. ඒ සඳහා ජපානය වාගේ විදේශ රටවලින් ඉල්ලුමක් තිබෙනවා. අද මෙතැන ඉන්නවා, ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. එතුමා එම කමිටුවේ මූලාසනයේ සිටියා. එතුමා කිව්වා nurses‍ලා 10,000කට ආසන්න

පිරිසක් ජපානයට දෙන්න පුළුවන් කියලා. එහෙම නම් මේ වාගේ ව්‍යාපෘතියක් ආරම්භ කරන කොට තමුන්නාන්සේගේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත් අවශ්‍ය ප්‍රතිපාදන ටිකක් අපට දුන්නොත් හොඳයි. මොකද, යම් ප්‍රමාදයක් නිසා 2018 අය වැය ලේඛනයට මේ යෝජනාව ඇතුළත් කරන්න බැරි වුණ නිසා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා එතුමාගේ කාලය තුළ මේ පීඨය ආරම්භ කරන්න ලොකු උත්සාහයක් ගත්තා. දැන් ගරු කබීර් හාෂිම් ඇමතිතුමා ඒ අමාත්‍යාංශයේ වගකීම භාරගෙන ඒ කටයුත්ත භාරගෙන තිබෙනවා. ඒ නිසා අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ කටයුත්ත ඉක්මනින් ආරම්භ කරන්නය කියලා. එතුමාත් මේ කෙරෙහි විශේෂ අවබෝධයක් ඇතිව කටයුතු කරන කෙනෙක්. ඒ නිසා ඒ අවස්ථාව උදා කර දෙන්න කියලා අපි එතුමාටත් ආරාධනා කරනවා.

ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකාවට ඖෂධ ගෙන්වීමේදී ඒකාධිකාරයක් හැටියට කටයුතු කරනවාය කියලා අද බොහෝ දෙනෙක් චෝදනා කරනවා. නමුත් අදත් ඉන්දියාවෙන් තමයි වැඩිම ඖෂධ ප්‍රමාණයක් ලංකාවට ගෙන්වන්නේ. ඉන්දියාව විතරක් නොවෙයි, සිංගප්පූරුව, පිලිපීනය, සයිප්‍රසය, චීනය, කොරියාව, තායිලන්තය වාගේ රටවල සමාගම් කිහිපයකින් - සමාගම් 74කින් පමණ- අද ලංකාවට ඖෂධ වර්ග ගෙන්වනවා. ඒ අතරින් සමහර සමාගම් ඔබතුමන්ලා blacklist කර තිබෙනවා. මොකද, ඒ සමහර ඖෂධ ප්‍රමිතියෙන් අඩුවෙලා තිබෙන නිසා; සමහර ඖෂධ expire වෙලා තිබෙන නිසා. මම පළාත් සභාවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා හැටියට හිටපු කාලයේත් මේ දේවල් දැක්කා. ගරු රාජිත සේනාරත්න මැතිතුමා හැම දාමත් කියන එකක් තමයි කල් පසු වුණු බෙහෙත් බොහෝ ගබඩාවල තිබෙනවාය කියන එක.

ගාල්ල දිස්ත්‍රික්කයට බෙහෙත් සපයන උණවටුන බෙහෙත් ගබඩාවට වරක් ගියාම මම දැක්කා ලක්ෂ ගණනක, කෝටි ගණනක බෙහෙත් වර්ග පැත්තකට දාලා තිබුණා, expire වෙලා. මෙන්න මේකට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කල් ඉකුත් වූ මේ බෙහෙත් සමහර තැන්වලට යනවා. බෙහෙත් මේ විධියට කල් ඉකුත් වෙන්න ඉඩහරින එක මහා අපරාදයක්. රටේ ජාතික ධනයෙන් විශාල මුදලක් මේ සඳහා වැය වෙනවා. මේ බෙහෙත් විදේශ සමාගම්වලින් ගෙන්වනවා. සමහර වෙලාවට මේ බෙහෙත් කල් පසු වෙන්න ඔන්න මෙන්න තියලා ගෙන්වනවා. ඒවාට ප්‍රමිතිය දෙන නැත්නම් ඒවා පිළිබඳ තත්ත්ව පාලන කරන අයගේ යම් දුර්වලකම් නිසා ඉතාම කෙටි කාලයක් තුළ ඒ බෙහෙත් මේ තත්ත්වයට පත් වෙනවා.

ඒ විතරක් නොවෙයි, අවශ්‍ය නොවන ඖෂධ වර්ගත් ලංකාවට ගෙන්වනවා. එදිනෙදා පාවිච්චි කරන බෙහෙත් වර්ග ගොඩක් තිබෙද්දී, අවශ්‍ය නොවන බෙහෙත් වර්ග ගෙන්වනවා. ඒ පිළිබඳව යම් කිසි ක්‍රමානුකූල ක්‍රමවේදයක් නැතිකම නිසා බෙහෙත් වර්ග විශාල ප්‍රමාණයක් වාර්ෂිකව ගිනි තියලා දමන තත්ත්වයට පත් වෙනවා. මේ ක්‍රමය වහාම නතර කරන්න ඕනෑ. මේ තත්ත්වය සෑම දිස්ත්‍රික්කයකම තිබෙන ඒ සැපයීම් අංශවල, ඒ බෙහෙත් වර්ග ගබඩා කරන ස්ථානවල දකින්නට ලැබෙන දෙයක්.

ඒ විතරක් නොවෙයි. අපි මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. මෙතැනදී මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ගැන කථා කරලා අපට චෝදනා කළා, "එතුමාගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අසමත් වෙලා තිබෙනවා. ඒකෙන් කිව්වේ මේකයි. මේකෙන් වුණේ මේකයි" කියලා. මම ඒ අයට කියන්නේ මෙයයි. වසර ගණනාවක් තිස්සේ මේ සේනක බිබිලේ වාර්තාවේ අබ මල් රේණුවක දෙයක්වත් ක්‍රියාත්මක කරන්න බැරිව සිටියදී, කොන්දක් ඇතුව ඒ වැඩේට අත ගැහුවේ වත්මන් ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමතිවරයා වන රාජිත සේනාරත්න ඇමතිතුමා විතරයි කියන එක මම පැහැදිලිව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. කොළඹ අධිකරණ වෛද්‍ය, ඒ වාගේම කලින් ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහත්මයා කියලා තිබෙනවා, ඖෂධ විෂ වීම නිසා 10,000ක් පමණ රෝහල්ගත වෙනවා කියලා. ඒ ප්‍රමාණයෙන් සියයක් මිය යනවා. ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ කරාපිටිය රෝහලේදී එක්තරා දැරියක් ඖෂධ විෂ වෙලා මිය ගියා. ඒ පිළිබඳවත් සැලකිලිමත් වෙන්න ඕනෑ. සමහර ඖෂධ පාවිච්චිය පිළිබඳව සමහරු වෛද්‍යවරුන්ගේ උපදෙස් ගන්නේ නැහැ. සමහරු වෛද්‍ය උපදෙස්වලට පිටින් ගිහිල්ලා මෙවැනි කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

ශ්‍රී ලංකාවට ගෙන්වන සමහර බෙහෙත් වර්ග පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඔබතුමා ඒක දන්නවා. ලංකාවට අවශ්‍ය ඖෂධ වර්ග 2,500ත් - 3,000ත් අතර ප්‍රමාණයක් වන බව වාර්තා වන විට ඖෂධ වර්ග 15,000ක් පමණ ආනයනය කරනවා. ඇමොක්සලීන් කියන බෙහෙත් වර්ගය පමණක් විවිධ නම් වලින් -වර්ග 150කින්- ලංකාවට එනවා. එකම ඖෂධීය ගුණය තිබෙන, එකම ඖෂධීය තත්ත්වය තිබෙන ඇමොක්සලීන් කියන බෙහෙත් වර්ගය, වර්ග 150කින් ලංකාවට එනවා. අපේ සාමාන්‍ය ගම්බද අහිංසක මිනිස්සු ගියාම දෙන්නේ ඒවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තව මාෆියාවක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා sales repලා canvass කරන බව. අපි පෞද්ගලික රෝහල්වලට, සමහර channeling centresවලට ගියාම ටයි දාගෙන, බෑග් අරගෙන sales repලා පෝලිමේ ඉන්නවා. ඒ මොකටද? මේ බෙහෙත් වර්ගවලට ඒ වෛද්‍යවරුන් නම්මා ගැනීම සඳහා. මේ මාෆියාව නැති කරන්න ඕනෑ. විදේශ රටවල් මේවා පාලනය කරනවා. Sales repලා canvass කරලා වෛද්‍යවරුන්ට තමන්ගේ වටිනා බෙහෙත් වර්ගය දෙනවා. මරණාසන්නව ඉන්න වෙලාවේ වෛද්‍යවරු තමයි දෙව්වරු හැටියට අපි සලකන්නේ. එතුමන්ලා ලියලා දෙන්නේ මොකක්ද, ඒ බෙහෙත ගන්න ඉඩම හරි, වෙන මොනවා හරි උකස් තියලා හරි අපි ලෑස්තියි. අපි එවැනි තත්ත්වයකට පත් වෙනවා. ඔබතුමා ඖෂධ වර්ග 48ක මිල අඩු කිරීම තුළින් ඉතාම ලොකු ජයග්‍රහණයක් මේ රටේ ඇති කරලා තිබෙනවා. හැබැයි, ඒ ක්‍රමය අධීක්ෂණය වෙන්නට ඕනෑ.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පනත්වල තිබෙනවා, "එක තැනක ෆාමසි එකක් හෝ දෙකක් පමණයි තිබෙන්න පුළුවන්, ඊට වැඩිය තිබෙන්න බැහැ." කියලා. ඒ වාගේ යම් යම් පාලනය කිරීම් තුළ නැවත වරක් මේ මාෆියාව එනවා. ඒ නිසා අපි පැහැදිලිව මේ කාරණය කියන්නට ඕනෑ. බෙහෙත් වර්ග නිකුත් කිරීමේ වැඩ පිළිවෙළේදී ඒ අවශ්‍ය නියාමනය තිබෙන්නට ඕනෑ. විශේෂයෙන්ම පාරිභෝගිකයාට -ඒ රෝගීන්ට හෝ රෝගීන්ගේ ඥාතීන්ට- ඒ බෙහෙත ලබා ගන්න පුළුවන් අඩුම මිලට දෙන්න ඕනෑ. ඔබතුමා මේ බෙහෙත්වල මිල අඩු කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාට, ඒ සහන ජනතාව අතරට යෑමේදී යම් යම් ප්‍රශ්න තිබෙනවා. හැම තැනම කළු කඩ බිහි වෙනවා. රෝහල්වල හැම බෙහෙතක්ම තිබෙනවා. නමුත් රෝහල්වල සමහර බෙහෙත් නැහැ. ඒවා ගන්න විශාල මුදලක් යනවා. ශික්ෂණ රෝහල් තිබෙන තැන්වල හෝ ඔසුසල වාගේ ආයතන හදන්න. ඔබතුමන්ලා රාජ්‍ය ඔසුසල හදා තිබෙනවා. අපි ඒ ගැන බෙහෙවින්ම සතුටු වෙනවා. නමුත් හැම තැනම රාජ්‍ය ඔසුසල් නැහැ. විශේෂයෙන් ශික්ෂණ රෝහල්, ශල්‍යකර්ම කරන

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

රෝහල්, විශාල වශයෙන් රෝගීන් සිටින රෝහල් ආශ්‍රිත නගරවල රාජ්‍ය ඔසුසල වාගේ ආයතනයක් එළිවන තුරු -පැය 24 පුරා-විවෘත කර තබන්න පුළුවන්කමක් තිබෙනවා නම් ඇත්ත වශයෙන්ම එය ඉතා වැදගත් කියා මා හිතනවා. මොකද, හැන්දෑවට සමහර වෙලාවට pharmacy එකක් සොයා ගන්න නැහැ. ගාල්ල දිස්ත්‍රික්කයේ ලංකාගම වැනි ඈත එපිට ප්‍රදේශයක ඉඳලා ලෙඩකු රෝහලට ඇතුළු කළා වෙන්නට පුළුවන්. සමහර වෙලාවට ලෙඩා ළඟ කාටවත් ඉන්න දෙන්නේත් නැහැ. ලෙඩාගේ පවුලේ අය පදිංචිව ඉන්නේ නෙළුව සිංහරාජ අඩවියේ වන්නට පුළුවන්. ඒ අය පාන්දර 2.00ට දුරකථනයෙන් කතා කරලා, "අනේ මන්ත්‍රීතුමා, බෙහෙත් ටිකක් ගන්න තිබෙනවා. මේ කියන බෙහෙත දැන් රෝහලේ නැහැ. ඒ නිසා මේ බෙහෙත අරගෙන දෙන්න" කියපු අවස්ථා තිබෙනවා. ඒ වාගේ වෙලාවක අපි ඇවිල්ලා බෙහෙත් අරගෙන දෙන්න බලන කොට, සමහර වෙලාවට බෙහෙත් ගන්න තැනක් නැහැ. එවැනි අවස්ථාවල සල්ලි තිබුණත් අවශ්‍ය ඖෂධ වර්ගය ගන්න ෆාමසියක් සොයා ගන්න බැරි ප්‍රශ්නය දැඩි ලෙස අපට තිබෙනවා. සමහර බෙහෙත් වර්ග ගාල්ල නගරයේ කොහේවත් ගන්න නැහැ. ඒ සඳහා එන්න ඕනෑ කොළඹ එක තැනකට විතරයි. එවැනි සොයා ගන්න අපහසු බෙහෙත් වර්ගත් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම දේශීය ඖෂධවලට මූලිකත්වයක් දීලා රාජ්‍ය ඔසුසල මාර්ගයෙන් ඒවා මිලදී ගන්න හැකි වන පරිදි කටයුතු සලස්වන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමන්ලාත් පෙන්වා දීපු ආකාරයට විශේෂයෙන්ම මේ ඖෂධ වර්ග සම්බන්ධයෙන් එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා පාලන මිල පිළිබඳව නියෝගයක් දීලා පාලන මිල පිළිබඳ මිල දර්ශනයක් විවිධ තැන්වලට නිකුත් කර තිබෙනවා. එදිනෙදා පාවිච්චි කරන විශේෂිත ඖෂධ වර්ගවල මිල ගණන් රාජ්‍ය ඔසුසල්වල සහ අනෙක් ෆාමසිවල ප්‍රදර්ශනය කරන්න යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් එය ඉතාම වැදගත් කියා අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා වෛද්‍ය සැපයුම් අංශයට වියදම් කරපු මුදලත් විශාල ප්‍රමාණයක්. මෙහිදී අද කතා කරපු සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා "සෞඛ්‍යයට දෙයියන්ගේ පිහිටයි! අධ්‍යාපනය ඉවරයි!" කියා. අපි එතුමන්ලාට -දැන් මෙතැන සිටින තාරක බාලසූරිය මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාට- කියනවා, තමුන්නාන්සේලා 2005 වර්ෂයේ ඉඳලා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මිල දී ගැනීම් සඳහා -උපකරණ සහ ඖෂධ වර්ගවලට- වියදම් කරපු මුදල ගෙන බැලුවත්, මේ රජය තමුන්නාන්සේලා වියදම් කළ මුදලට වඩා හත්ගුණයක් වැඩි කර තිබෙනවා කියා. 2005 වර්ෂයේ වැය කළ රුපියල් මිලියන 7,100ක් වූ මුදල 2017 වර්ෂය වන කොට රුපියල් මිලියන 45,576ක් දක්වා වැඩි කර තිබෙනවා. 2018 වර්ෂය වන කොට එය රුපියල් මිලියන 45,523ක් වෙලා තිබෙනවා. මෙයින්ම කාරණය පැහැදිලිව පෙනෙනවා. ඔබතුමන්ලාගේ කාලයේ -2013 වර්ෂයේ- තිබුණාට වඩා දෙගුණයකට ආසන්න ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. 2012 වර්ෂය වන කොට වෙන් කළේ රුපියල් මිලියන 17,000යි. 2013 වර්ෂය වන කොට ඇස්තමේන්තුව වෙලා තිබුණේ රුපියල් මිලියන 25,000ක් ලෙසයි. අද එය රුපියල් මිලියන 45,523ක් වෙනවා. මෙයින්ම පැහැදිලිව පෙනෙනවා, මේ රටේ සෞඛ්‍ය ආරක්ෂණය සඳහා, නීරෝගිකම ආරක්ෂා කිරීම සඳහා, ලෙඩ සනීප කිරීම සඳහා අමාත්‍යාංශය මොන තරම් හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද කියා. සමහර වෙලාවට මේවා පෙනෙන්නේ නැතිව ඇති; ඇඟට දැනෙන්නේ නැතිව ඇති. හැබැයි මැරෙන කොට තමයි ඇඟට දැනෙන්නේ. මොකද, වැඩි පිරිසක්- [බාධා කිරීමක්] ඩෙංගු සඳහාත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. "ඩෙංගු" කියන වසංගතය එන කොට කවුරුත් හිතුවේ රට ඉවර වෙයි කියලායි. නමුත් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විශාල ව්‍යාපෘතියක් හැදුවා, හැම ගමක්ම ආවරණය වන පරිදි. අපේ හැම මන්ත්‍රීවරයකුම- [බාධා කිරීමක්] අපේ කොට්ඨාසයෙන් අඩුම ගණනේ 10ක් වත් දාලා තිබෙනවා, ඩෙංගු මර්දන වැඩ පිළිවෙළට. [බාධා කිරීමක්] නැහැ. මා ඒ ගැන ඔබතුමාට කියන්න ඕනෑ. ඒ අය ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලවල ඉඳලා ලේඛනයක් හදාගෙන දිනපතා ඇවිදලා, ගෙවල්වලට ගිහින් කටයුතු කරන හැටි මා දන්නවා.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ඒත් ලෙඩ්ඩු අඩු වුණේ නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔබතුමන්ලාට ඕනෑ තරම් විවේචන කරන්න පුළුවන්.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
බෝඩ් දාලා-

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
බෝඩ් නොවෙයි. ඕනෑ නම් තමුන්නාන්සේ එන්න බලන්න යන්න. ගරු අමාත්‍යතුමා ඒ වාගේ වැඩ පිළිවෙළක්, ව්‍යාපෘතියක් හදලා තිබෙනවා. ඩෙංගු වසංගතය මේ රටින් තුරන් කරන්න අවශ්‍ය ව්‍යාපෘතියක් හදලා, ඒ සඳහා බල හමුදාවක් ගෙනැල්ලා තිබෙනවා. ගොවි හමුදාව වගේ බල හමුදාවක්. මැලේරියාව මර්දනය කරන්න හැදුවා වාගේ. බල හමුදාවක් ගෙනැල්ලා, ගෙයින් ගෙට යවනවා. ඒ තරුණයෝ පිළිකනු ගණනේ යනවා. එය ඉතාම හොඳින් මර්දනය කරන්න වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. තමුන්නාන්සේලා හිතුවා, ඩෙංගුවලින්ම ආණ්ඩුව ඉවරයි කියලා. "දැන් ආණ්ඩුව ඉවරයි" කිව්වා. මේ වසංගත අපි ගෙනාපු ඒවා නොවෙයි. කුණු කඳු ඇති කරලා තමුන්නාන්සේලා ගෙනාපු ඒවා. අපට තමයි ඒවා සෝදන්න සිදුවෙලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේ දී සෞඛ්‍ය අංශ තුළ විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්න තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා. කවුරු මොනවා කිව්වත්, ගැබිනි මරණ සංඛ්‍යාව අඩු, බිලිඳු මරණ සංඛ්‍යාව අඩු, ඉතාම හොඳ සෞඛ්‍ය පහසුකම් තිබෙන රටක් හැටියට අද ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පමණක් නොවෙයි මුළු ලෝකය පුරාම ප්‍රචලිත වෙලා තිබෙනවා. ඒවා ගැන තමුන්නාන්සේලා කතා කරන්නේ නැහැ. ඒවා කාලයක් තිස්සේ මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, වෛද්‍යවරුන්ගේ, වෛද්‍ය විශේෂඥයන්ගේ කැපවීමෙන් සිදු වූ දේවල්. ඒ එක්කම තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේත් යම් සේවාවක් කළා. "එහෙම නැහැ" කියලා අපි කියන්නේ නැහැ. හැබැයි තමුන්නාන්සේලා කළා වාගේ දහගුණයක සේවාවක් අප ඉෂ්ට කර තිබෙනවා කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමනි, එඩිතර තීරණ ගත් නායකයකු හැටියට ඉදිරියේ දී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යම් පරිවර්තනයක් කරන්න ඔබතුමාට පුළුවන් කියා මා හිතනවා. ඉතාම ඉක්මනින් මේ ක්ෂේත්‍රයේ යම් වෙනසක් ඇති කරලා, මේ රට නීරෝගීමත් ජනතාවක් සිටින රටක් බවට පත් කරලා, අඩු මරණ සංඛ්‍යාවක් තිබෙන -අඩු බිලිඳු මරණ සංඛ්‍යාවක් තිබෙන, අඩු ගැබිනි මරණ සංඛ්‍යාවක් තිබෙන- රටක් බවට, පෝෂණ තත්ත්වය නහා සිටුවන ලද, මන්ද පෝෂණය තුරන් කරන ලද රටක් බවට මේ රට පත් කරන්න තමුන්නාන්සේට පුළුවන්කම ලැබේවි කියා මා විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු තිලකරාජා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[4.27p.m.]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

Mr. Presiding Member, thank you very much for the opportunity given to me to take part in this Debate. Since the Hon. Minister has been carefully listening to our speeches, I hope he will use the headphone to listen to the interpretation of my speech because I am going to continue my speech in my mother tongue as the Tamil people who are listening to my speech do not have such interpretation facilities, if I speak in English.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுகாதார அமைச்சின்மீதான மிக முக்கியமான விவாத மொன்றில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இங்கு எதிர்த்தரப்பிலே எனக்குப் பக்கத்தில் அமர்ந்திருக்கின்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சகோதர பாராளுமன்ற உறுப்பினர்களுக்கும் சுகாதாரப் பிரதி அமைச்சருக்கும் இடையே சற்றுநேரத்திற்கு முன்பு இடம்பெற்ற விவாதத்தில் கௌரவ அமைச்சர் அவர்கள் பதிலளித்த விதத்தை ஆச்சரியத்துடன் நான் பார்த்துக்கொண்டிருந்தேன். அந்த அளவுக்கு அவர் ஒவ்வோர் உறுப்பினரினது பிரச்சினையையும் மிகவும் கவனத்தில் எடுத்து அவர்களின் கோரிக்கைகளுக்கு உரிய தீர்வுகளைப் பெற்றுக்கொடுக்கின்றார். அதேநேரம் இரண்டு தரப்பினருக்கும் இடையில் இடம்பெற்ற அந்த விவாதம் ஒரு சண்டைபோல் தெரிந்தாலும், அது ஜனநாயக பூர்வமான கருத்துக்களூடாக இடம்பெற்ற சண்டையாக இருந்ததை நான் பார்த்தேன்.

அதேநேரத்தில், நான் பிரதிநிதித்துவம் வகிக்கின்ற நுவரெலியா மாவட்டத்தில் இப்போது சுகாதாரத்துறை சார்ந்து இடம்பெற்றுக்கொண்டிருக்கின்ற சண்டை ஜனநாயகபூர்வ மானது அல்ல. இந்த விடயம் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்திற்கு வந்திருக்குமென நினைக்கின்றேன். அதாவது, அங்கே கடந்த வாரம் மாகாண சபை உறுப்பினரொருவர் கொட்டகலை வைத்தியசாலைக்குச் சென்று வைத்தியர்களை அடித்துத் துன்புறுத்திப் பல்வேறு பிரச்சினைகளை ஏற்படுத்தியிருக்கிறார். இந்தச் செயற்பாட்டை அரசியல்மயப் படுத்தியிருக்கிறார்கள். முன்னர் பாராளுமன்றத்தில் அமைச்சர்களாக இருந்தவர்கள் அந்த வைத்தியசாலையில் சண்டித்தனம் காட்டியிருக்கிறார்கள். அவர்கள் இவ்வாறு சண்டித்தனம் காட்டுவதனூடாகத் தங்களது பிரச்சினை களுக்குத் தீர்வுகளைப் பெற்றுவிடலாமென நினைக்கின் றார்கள். ஆனால், அதிகாரிகளுடன் அல்லது மக்களுக்குச் சேவையாற்றுகின்ற வைத்தியர்களுடன் சண்டித்தனம் காட்டுவதனூடாகப் பிரச்சினைகளுக்குத் தீர்வு காணமுடியாது. பாராளுமன்றம் இருக்கின்றது; அங்கே எமக்கு ஆதரவளிக்கக் கூடிய உறுப்பினர்கள் இருக்கின்றார்கள்; அதேநேரம் அமைச்சர்களும் இருக்கின்றார்கள். ஆகவே, இந்த இடத்தில் நாங்கள் பிரச்சினைகளை முன்வைத்துத்தான் அவற்றுக்கான தீர்வுகளைக் காணவேண்டும் என்ற அடிப்படையில், தோட்டத்துறைச் சுகாதாரம் சம்பந்தமான நெடுங்காலப் பிரச்சினையை இந்தச் சபையில் நான் பலமுறை எடுத்தியம்பியிருக்கின்றேன். கடந்த ஒரு விவாத நேரத்திலும் நான் உரையாற்றியபோது கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையில் இல்லாததனால் அவரைத் தனிப்பட்ட முறையில் சந்தித்து இவ்விடயம் குறித்து உரையாடினேன்.

தோட்டத்துறை மருத்துவமானது 200 வருட காலமாக அரசாங்கப் பொறுப்பில் இல்லாது தனியே RPCsஇன் - பெருந்தோட்டக் கம்பனிகளின் பொறுப்பிலிருப்பதனால் அங்கே பல சுகாதாரப் பிரச்சினைகள் தொடர்ச்சியாக இடம்பெற்று வருகின்றன. இன்று நாட்டின் சுகாதாரத்துறை தொடர்பான புள்ளிவிபரங்களை எடுத்துக்கொண்டால், பெருந் தோட்டப் பகுதிகளிலே மந்த போசாக்கு, இரத்தச்சோகை மற்றும் வேறுவிதமான நோய்கள் காணப்படுவது பற்றிய பல்வேறு சுகாதாரக் குறிகாட்டிகள் அதிகளவில் இருக்கின்றன என்பதைப் பலமுறை நாங்கள் சுட்டிக்காட்டியிருக்கின்றோம். இது வெளிப்படையாகத் தெரிகின்ற உண்மையும்கூட. ஆனால், எங்களுக்குக் கிடைத்திருக்கின்ற அரசியல் அங்கீகாரத்தைப் பயன்படுத்தி அதிகாரிகளிடம் சண்டித்தனம் காட்டாது, இந்த நிலைமையைச் சீர்செய்வதற்கான சில முயற்சிகளைப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் இயன்றவரை எடுத்திருக்கின்றேன். இந்தச் சபையில் அந்த முயற்சிகளைப் பற்றிக் கூறுவதனூடாக அமைச்சரிடம் சில கோரிக்கைகளையும் முன்வைக்க விரும்புகின்றேன்.

இந்த நல்லாட்சி அரசாங்கத்தின் எட்டாவது பாராளு மன்றத்திலே புதிதாக அறிமுகப்படுத்தப்பட்ட Sectoral Oversight Committee - துறைசார் மேற்பார்வைக்குழுவில் சுகாதாரம், வீடமைப்பு, சமூக நலன்புரி சார்ந்ததாக உள்ளவற்றில் நானும் ஓர் அங்கத்தவனாக இருக்கின்றவன் என்ற வகையிலே, சுகாதார விடயத்தில் குறிப்பாக, பெருந்தோட்டச் சுகாதாரத் துறையைத் தேசியமயப்படுத் துவதற்கு - அரசமயப்படுத்துவதற்குத் தேவையான நடவடிக்கைகளை எடுக்கும்விதமாக, கௌரவ அமைச்சர் அவர்களுக்கு உதவியளிக்கின்ற வகையில் அதில் உப குழுவொன்றைக் கோரி, அந்த உப குழுவின் தலைவராக இருந்து செயற்பட்டு, கடந்த ஒன்றரை வருட காலத்திற்கு மேலாகப் பல கூட்டங்களை நடத்தி - சம்பந்தப்பட்ட அதிகாரிகளை, உரிய பொறுப்பானவர்களை அழைத்து, பல்வேறு பேச்சுவார்த்தைகளை நடத்தி - உச்ச சபையான இந்தப் பாராளுமன்றத்தின் குழு அறையிலே நாங்கள் இதற்கான உடன்பாட்டினை எட்டியிருக்கின்றோம்.

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

அந்தவகையில், சுகாதார அமைச்சின் பணிப்பாளர் நாயகம் உள்ளிட்ட அதிகாரிகள், சுகாதார அமைச்சிலே இருக்கின்ற Estate and Urban Health Unit - தோட்ட மற்றும் நகர சுகாதாரப் பிரிவு, இப்போது பெருந்தோட்டச் சுகாதாரப் பகுதிக்குப் பொறுப்பான Plantation Human Development Trust -PHDT, அந்த நிறுவனத்திற்குப் பொறுப்பான மலைநாட்டுப் புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு, மாகாணச் சுகாதாரப் பணிப்பாளர்கள், Regional Directors - பிராந்தியச் சுகாதாரப் பணிப்பாளர்கள், தோட்டச் சுகாதாரத் துறைக்குப் பொறுப்பான, வைத்தியர்கள் மட்டத்திலிருந்து செயற்படக் கூடிய EMA -தோட்டச் சுகாதார அதிகாரிகளின் சங்கம் என சம்பந்தப்பட்டவர்கள் அனைவரையும் அழைத்து, அவர்களுடன் தோட்டத்துறை சார்ந்துள்ள - கேகாலை, இரத்தினபுரி, மாத்தளை போன்ற பல்வேறு மாவட்டங்களைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களையும் அந்தக் குழுவில் அங்கத்தவர்களாக இல்லாத உறுப்பினர்களையும் வரவழைத்து, அனைவரையும் உள்ளடக்கியதான தொடர் கலந்துரையாடல்களை நடத்தி, ஓர் அறிக்கையினைத் தயார் செய்துகொண்டிருக்கின்றோம். இந்த அறிக்கையின் முடிவாக - இதில் கலந்துகொண்ட அத்தனை அக்கறையாளர்களினதும் கருத்தாக இருப்பது, தோட்டத்துறைச் சுகாதாரத்தை நிச்சயமாக அரசாங்கம் பொறுப்பேற்றுத் தேசிய மயமாக்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்பதாகும்.

இதற்கு முன்னர் 2006ஆம் ஆண்டு பாராளுமன்றத்திலே இந்த விடயம் பேசப்பட்டு, அமைச்சரவைத் தீர்மானமும் நிறைவேற்றப்பட்டு, ஏறக்குறைய 50 வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்று நடத்துவதாக உறுதியளித்தது. பின்னர் 40 வரையான வைத்தியசாலைகளையே பொறுப்பேற்றது. அவற்றில் தற்போது 30 மாத்திரமே செயற்பாட்டில் உள்ளன. அவ்வாறு செயற்பாட்டில் உள்ள வைத்தியசாலைகள் பல பல்வேறு குறைபாடுகளுடன் இயங்கி வருவது தொடர்பாகவும் கவனம் செலுத்தியுள்ளோம். இது 2006ஆம் ஆண்டில் சாத்தியமாவதற்கான வாய்ப்புக் கிடைக்குமென்று அப்போது நாங்கள் நினைத்திருந்தோம். அந்த நேரத்தில் பதுளை மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்கள் சுகாதார அமைச்சராகவும் இங்கே இப்போதும் உறுப்பினராக இருக்கின்ற அதே மாவட்டத்தைச் சேர்ந்த வடிவேல் சுரேஷ் அவர்கள் சுகாதாரப் பிரதி அமைச்சராகவும் இருந்தபோது அந்த மாவட்டத்தைச் சேர்ந்தவர்கள் என்ற வகையிலே தீர்மானங்களை எடுத்து, ஓரளவு அந்த வேலைத்திட்டங்களை முன்னெடுத்திருக்கிறார்கள். அதற்குப் பின்பு 2015ஆம் ஆண்டு அந்த அரசாங்கம் கலைக்கப்பட்டு வேறு அரசாங்கம் ஆட்சிக்கு வந்ததற்குப் பின்னர் அந்தத் திட்டம் முற்றுமுழுதாகக் கைவிடப்பட்டது. இன்றும் அந்த நிலையில்தான் இருக்கின்றது. அந்தத் திட்டம் முழுமையாக நிறைவேறாது என்ற பல செய்திகளையும் நாங்கள் அவதானிக்கின்றோம். அங்கே 300க்கு மேற்பட்ட வைத்திய நிலையங்கள் காணப்படுகின்றன. அவற்றை இன்று நாங்கள் ஒன்று சேர்த்திருக்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
Sir, I will take the time allotted to the Hon. Velu Kumar also, if needed.

இந்தக் குழுவின் அறிக்கையைத் தயார் செய்துகொண்டிருக்கின்ற சந்தர்ப்பத்திலே, மலைநாட்டு தமிழ்ச் சமூகத்தின் விவகாரங்களை அலசி ஆராய்ந்து அதற்குத் தீர்வு காண்பதற்கான ஒரு விசேட குழுவை கௌரவ பிரதமர் அவர்கள் நியமித்திருக்கின்றார். அந்தக் குழுவின் அங்கத்தவராக நானும் கலந்துகொண்டு கடந்த மார்ச் மாதம் 8ஆம் திகதி பிரதமர் அவர்களின் காரியாலயத்திலே அவருடன் உரையாடுவதற்கான வாய்ப்புக் கிடைத்தது. அங்கும் இந்த விடயத்தை நாங்கள் குறிப்பிடும்போது, அவரும் அந்த அறிக்கையைக் கோரியிருந்தார். கௌரவ அமைச்சர் அவர்களின் மேலான கவனத்திற்கும் இதனைக் கொண்டுவந்து இந்த வேலைத்திட்டத்தை முன்னெடுப்பதற்கான அடுத்த கட்ட நடவடிக்கையைச் செய்யுமாறும் எங்களிடம் பணித்திருந்தார். திறந்த மனதுடன் மக்களுக்குச் சிறந்த சேவையைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்ற எண்ணத்துடன் பல்வேறு பிரச்சினைகளையும் தெரிந்துகொண்டு, புரிந்துகொண்டு செயற்படக்கூடிய கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன போன்றவர்கள் இந்த உரிய பொறுப்பிலிருக்கும்போதுதான் இந்தக் கோரிக்கை ஏற்றுக்கொள்ளப்பட்டு, நடைமுறைப் படுத்துவதற்கான வாய்ப்புகள் அதிகமாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். இதற்கான நடவடிக்கை எடுப்பதாக பல்வேறு சந்தர்ப்பங்களில் கௌரவ அமைச்சர் அவர்கள் எங்களுக்கு உறுதியளித்துள்ளபோதும், இன்னமும் அதற்கான எந்தவித சமிக்ஞையும் கிடைக்காத நிலையில் மிகுந்த எதிர்பார்ப்போடு இருக்கின்றோம்.

கிழக்கு மாகாணத்தில், அதேபோல வடக்கு மாகாணத்தில் மற்றும் ஏனைய மாவட்டங்களில், செயற்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்ற வேலைத்திட்டங்களை அவதானிக்கும் போது, அங்கே பில்லியன் கணக்கிலே பணத்தொகைகள் செலவழிப்பது பற்றிப் பேசப்படுகின்றது. என்னைப் பொறுத்தவரைக்கும், நான் இந்த வேண்டுகோளை விடுப்பது, 200 வருட காலமாக இருந்த சுகாதார முறைமை மாற்றம் பெற்று அந்த மக்களையும் தேசிய நீரோட்டத்தில் இணைக்க வேண்டும் என்று சிந்தித்ததனாலாகும். குறிப்பாக சுகாதாரம் என்பது ஓர் அடிப்படையான விடயம். எனவே, பெருந் தோட்டத்துறையின்கீழ் - தனியாரின்கீழ் இயங்கிக் கொண்டிருக்கின்ற இந்தச் சுகாதாரத் துறையை கொள்கைத் திட்ட அடிப்படையில் அரச மயப்படுத்துவதற்கு - அரச பொறுப்பில் கொண்டுநடத்துவதற்கான வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டும். அதனை முன்னெடுப்பதற்குப் பொருத்தமான ஓர் ஆளுமையாக - ஓர் அமைச்சராக கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்களை நான் கருதுகின்றேன். இந்தச் சந்தர்ப்பத்தில் இதனை நான் கௌரவ அமைச்சர் அவர்களின் அவதானத்திற்கு கொண்டுவந்து, இந்த அறிக்கையை உத்தியோகபூர்வமாகப் பாராளுமன்றத் தினூடாக என்னால் சமர்ப்பிக்க முடியும். அதேபோல, கௌரவ அமைச்சர் அவர்கள் தனது அமைச்சுமட்ட அதிகாரிகளுடன் தொடர்புகொண்டு இதுதொடர்பாக நடந்திருக்கக்கூடிய வேலைத்திட்டங்களைத் தெரிந்துகொள்ளக்கூடியதாக இருக்கும். இதுவே இன்று அவசியமான தேவைப்பாடாக இருக்கின்றது.

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர் கௌரவ பழனி திகாம்பரம் அவர்களை நாங்கள் அந்தக் குழுவுக்கு அழைத்து,

அவரிடம் சில கோரிக்கைகள் பற்றிய உதவிகளைக் கேட்டிருந்தோம். குறிப்பாக அந்த வைத்தியசாலைகளுக்குச் செல்லும் வீதிகளைப் புனரமைத்துத் தருமாறு விடுத்த வேண்டுகோளின் அடிப்படையில், இதுவரை மலையக மாவட்டங்களில் - பெருந்தோட்டங்கள் உள்ள மாவட்டங்களில் 12 வீதிகளை அடையாளம் கண்டு, கடந்த வருடம் புனர்நிர்மாணம் செய்வதற்கான வேலைத்திட்டங்களை அவர் முன்னெடுத்திருந்தார். அதேபோல், பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சோடும் இணைந்து வேலைசெய்ய வேண்டியிருக்கின்றது. அங்கே இருக்கின்ற வைத்திய நிலையங்களை விஸ்தரிப்பதற்கு மாகாண சுகாதார அதிகாரிகள் தயாராக இருக்கின்றபோதும்கூட, தோட்டக் கம்பனிகள் அதற்கு இடமளிப்பதில்லையென்ற குற்றச்சாட்டை குழு அறையிலே எங்களிடம் சம்பந்தப்பட்டவர்கள் முன்வைத்தார்கள். எனவே, பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சோடு கலந்துரையாடி, இவ்வைத்தியசாலைகளுக்குரிய நிலங்களைப் பெற்றுக்கொள்ள வேண்டிய தேவை யிருக்கின்றது. அதேபோல, வைத்தியர்களை அங்கு நியமிப்ப தாக இருந்தால் அவர்களுக்குத் தங்குமிட வசதிகளை ஏற்படுத்திக்கொடுக்க வேண்டிய தேவையிருக்கின்றது. இவ்வாறான சிக்கல்கள் நிவர்த்திக்கப்படும்பொழுதுதான் இந்த அரச வைத்திய சுகாதார முறைமை பெருந்தோட்டப் பகுதிகளுக்கு நடைமுறையில் சென்றுசேர்வதற்கான வாய்ப்பிருக்கின்றது. எனவே, அங்கு தற்போதுள்ள முறைமை மாற்றப்படுவதாக இருந்தால், அரச மட்டத்தில், தேசிய மட்டத்தில் ஒரு தேசிய கொள்கைத் திட்டம் வகுக்கப்பட வேண்டியிருக்கின்றது. அதனைச் சரியாக அடையாளம் காண வேண்டியிருக்கின்றது.

இந்த நாட்டில் சுமார் ஒரு மில்லியன் மக்கள் பெருந் தோட்டத்துறை சார்ந்து வாழ்கிறார்கள். அங்கே வாழ்கின்ற தொழிலாளர்களின் எண்ணிக்கை 2 - 3 இலட்சமாக இருந்தபோதும்கூட, அவர்களோடு தங்கி வாழ்பவர்கள், அவர்களோடு இணைந்ததாக வாழ்ந்துகொண்டிருப்பவர்கள் அந்த மருந்தகங்களை அல்லது சிறிய வைத்தியசாலைகளையே நம்பியிருக்கிறார்கள். எனவே, 10 இலட்சம் வரையாக இருக்கின்ற மக்களின் சுகாதார வசதி என்பது தேசிய சுகாதார முறைமையிலிருந்து தனித்துவிடப்பட்டிருக்கிறது - இந்த நாட்டில் சுகாதார ரீதியாக தனித்துவமாக அந்த மக்கள் கையாளப்படுவது வேதனைக்குரிய விடயமாகும். நாங்கள் அந்தத் துறையில் இருந்து வந்தவர்கள்; நான் அத்தகைய ஒரு வைத்தியசாலையில் பிறந்தவன். எங்களுக்கு அந்த வேதனை இருக்கிறது. நாங்கள் அவ்வாறான சூழலில் பிறந்து வளர்த்திருக்கிறோம்! இன்று எங்களை யார் கவனிக்கின் றார்கள்?

இதுவரை காலமும் EMA என்று சொல்லப்படுகின்ற மருத்துவர்கள்தான் - தோட்ட வைத்திய அதிகாரிகள்தான் குறித்த காதாரத் துறையை நடத்தி வந்திருக்கிறார்கள். அவர்களுக்கு நாங்கள் நன்றி தெரிவிக்கவேண்டும். அதேசந்தர்ப்பத்தில் ஒன்றை ஞாபகப்படுத்த வேண்டும். அதாவது, இனிவரும் காலங்களில் EMA எனப்படுகின்ற தோட்ட வைத்திய அதிகாரிகளை ஆட்சேர்ப்புச் செய்வதற்கான பரீட்சை முறைமையும் இந்த நாட்டிலே நிறுத்தப்பட்டிருக்கிறது. எனவே, எதிர்வருகின்ற பத்தாண்டு காலத்தில் ஒரு பெரிய சவால் காத்திருக்கிறது. அதாவது, EMA முறைமையும் இந்த நாட்டில் இல்லாமலாக்கப்பட்டு, இத்துறையும் அரச வைத்திய முறைமைக்கு உள்வாங்கப்படாதிருந்தால், அந்தப் பத்து வருட காலத்தில் இப்போது சேவையில் இருப்பவர்கள் தொழிலை விட்டுச்செல்கின்ற வயது வருகின்றபொழுது பெருந்தோட்டச் சுகாதார முறைமைக்கு என்ன நடக்கும்? என்ற பாரிய கேள்வி எம்முன் இருக்கிறது.

கௌரவ அமைச்சர் அவர்களே! இந்தப் பாராளு மன்றத்திலே உங்களது கவனத்தையும் பெற்று, எனது உரையை மிக விரிவாக ஆற்றியதன் பிரதான நோக்கம், இது நீண்ட கால நோக்கில் பார்க்கப்படவேண்டிய விடயம் என்பதனாலாகும்; இது மிக முக்கிய பிரச்சினையாகக் கருதப்பட்டுப் பேசப்பட வேண்டியது. மேல்மட்டத்தில் இத்தகைய பிரச்சினைகளை வைத்துக்கொண்டு, அடிமட்ட இடங்களில் கடமையாற்றுகின்ற அதிகாரிகளிடம் - வைத்தியர்களிடம் சண்டித்தனம் காட்டிப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு அரசியலைப் பயன்படுத்துவதானது, நாடு தற்பொழுது இருக்கின்ற நிலையில் சகவாழ்வைக் குழப்புகின்ற ஒரு விடயமாக மாறிவிடும்; சக வாழ்வை வேறு திசைக்குத் திருப்பிவிடும். எனவே, அடிமட்டத்தில் அத்தகைய சூழ்நிலைகளை ஏற்படுத்தாது, உயர்மட்டத்தில் - பாராளு மன்றம், அமைச்சரவையில் இவ்வாறு விரிவாகக் கலந்துபேசித் தீர்மானித்துச் செயற்படுத்துவதனூடாக நல்லதொரு தீர்வை நோக்கிச் செல்லலாம்.

இந்த அடிப்படையிலேயே நான் கடந்த ஒன்றரை வருட காலமாகப் பாராளுமன்றத்தில் வேறு விடயங்களுக்குக் கொடுக்கின்ற முக்கியத்துவத்தைவிட, இந்த விடயத்துக்குத் தனிப்பட்ட முறையில் அதிக முக்கியத்துவம் கொடுத்துச் செயற்பட்டு வந்தேன். இந்த அறிக்கையை நான் விரைவில் உங்களிடம் கையளிப்பதற்குத் தயாராக இருக்கிறேன். அதேபோல, பிரதமர் அவர்களின் கோரிக்கைக்கு ஏற்ப, அவரிடமும் அதனைக் கையளிப்பதற்குத் தயாராக இருக்கிறேன். அமைச்சர் என்கின்ற வகையில், நீங்கள் இந்த அறிக்கையை முழுமையாகப் பொறுப்பேற்று - அதில் கண்டிருக்கின்ற தீர்வுகளையும் அவதானித்து - இயலுமான வரை அதிலுள்ள பரிந்துரைகளை ஏற்று, எங்களது ஆலோசனைகளையும் பெற்று, பெருந்தோட்ட சுகாதார முறைமையைத் தேசிய சுகாதார முறைமைக்குள் கொண்டு வருவதற்கான ஏற்பாடுகளைச் செய்துதரவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இறுதியாக, இந்த விவாதத்தில் கலந்துகொண்டு எனது கோரிக்கையைச் செவிமடுத்தமைக் காக கௌரவ அமைச்சர் அவர்களுக்கும் அதற்கு வாய்ப்பளித்தமைக்காக கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கும் தனது நேரத்தைப் பயன்படுத்து வதற்கு ஒத்துழைப்புத் தந்தமைக்காகச் சகோதர உறுப்பினர் வேலு குமார் அவர்களுக்கும் நன்றி தெரிவித்து, விடைபெறு கின்றேன். நன்றி, வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Item No. 1 - Regulations under the National Medicines Regulatory Authority Act. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Item No. 2

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත
புலமைச்சொத்து (திருத்தம்) சட்டமூலம்
INTELLECTUAL PROPERTY (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
*[*MR. PRESIDING MEMBER *in the Chair.]*

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1இலிருந்து 3வரையான வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන් වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කාරක බාලසූරිය මන්ත්‍රීතුමා.

දේශපාලන ස්ථාවරභාවය තහවුරු වන ආකාරයට පළාත් සභා මැතිවරණය පැවැත්වීම
அரசியல் ஸ்திரநிலையைப் பாதுகாப்பதற்காக மாகாண சபைத் தேர்தலை நடத்துதல்
HOLDING OF PROVINCIAL COUNCILS ELECTION ENSURING POLITICAL STABILITY

[අ.භා. 4.42]

ගරු කාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පළාත් සභා මැතිවරණ සංශෝධන පනත ප්‍රකාරව මෙම සභාව හමුවට ඉදිරිපත්කොට තිබෙන පළාත් සභා සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ මඟින් ඡන්ද දායකයා තුළද, සමාජය තුළද විශාල අවිනිශ්චිතබවක් නිර්මාණයකොට තිබේ.

ඉතා හදිසියේ සම්මතකොට ක්‍රියාත්මක කළ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත මඟින් මේ වන විට නිර්මාණයකොට තිබෙන දේශපාලන ව්‍යාකූලභාවය සහ සභාවන්හි අස්ථාවරබව නිසා පළාත් සභා මැතිවරණය පිළිබඳව ද ජනතාව තුළ ඇති සැක සංකාවන් තීව්‍ර වී ඇත.

කොටියාස මට්ටමින් සියයට 50ක මන්ත්‍රී පිරිසක්ද, සමානුපාත ක්‍රමය යටතේ සියයට 50ක්ද වශයෙන් තෝරා ගැනීමට නියමිත පළාත් සභාවන් තුළ අස්ථාවර වූ සභා නිර්මාණය වීම වැළැක්විය නොහැක.

එබැවින්, අප මෙම සභාවට යෝජනා කර සිටින්නේ, ජන සම්මතවාදය උපරිමයෙන් සුරැකෙන ලෙසත්, දේශපාලන ස්ථාවරභාවය ආරක්ෂා වන සංශෝධන සහිතව මෙන්ම, ජනවාර්ගික සාමය ආරක්ෂා වන සීමා නීර්ණය යටතේ මැතිවරණය පැවැත්වීම සඳහා වහාම ආණ්ඩුව පියවර ගතයුතු බවයි.

දැනටමත් මාස පහකින් (05) ප්‍රමාද වී තිබෙන මැතිවරණය ඉදිරි මාස 03 ඇතුළතදී ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුව වහා ක්‍රියාත්මක විය යුතු බවද මෙම සභාවට යෝජනා කර සිටිමි."

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම.

[අ.භා. 4.44]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරමින් අදහස් කිහිපයක් කෙටියෙන් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම ඉතා හදිසියේ සම්මත කරගෙන ක්‍රියාත්මක කළ පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත මඟින් මේ වන විට දේශපාලන ව්‍යාකූලතාවක් සහ සභාවන්වල අස්ථාවරතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල අනුව බහුතර බලයක් නොමැතිව සභාවක් හදාගෙන යන්න උත්සාහ කරන බව අද අපට පෙනෙනවා. මෙම සීමා නීර්ණයන් ගෙනඒම සඳහා කටයුතු කර තිබෙන ආකාරය දෙස බැලුවාම, පළාත් සභා ඊටත් වඩා ව්‍යාකූලතාවට පත් වෙනවාය කියන කාරණය අපට මේ අවස්ථාවේ කියන්න පුළුවන්.

විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන, ප්‍රජාතන්ත්‍රවාදය රකින කණ්ඩායමක් හැටියට අපි කියන්න ඕනෑ, සියයට 50ට 50ක් වන මෙම මැතිවරණ ක්‍රමය අනුව, ඒ කියන්නේ කොටියාස මට්ටමින් සියයට 50ක් සහ සමානුපාතික මට්ටමින් සියයට 50ක් වන පරිදි මැතිවරණය පැවැත්වුවහොත් කිසිම ආකාරයකින් ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේ අවස්ථාවේ ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ ප්‍රකාශ කරන්න පුළුවන්.

විශේෂයෙන්ම ජනප්‍රිය පුද්ගලයෙක්ව තෝරා පත් කරගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එහෙම නැත්නම්, තමන්ගේ පක්ෂයේ අභිමතය අනුව පුද්ගලයා කොයි තරම් ජනප්‍රිය වුණත්, සමහර වෙලාවට කොටියාස මැතිවරණවලදී පරාජය වෙන්න පුළුවන්. කොයි තරම් ජනප්‍රිය පුද්ගලයෙක් වුණත් ජන වර්ගය අනුව, ආගම අනුව, ඒ වාගේම කුලය අනුව පරාජයට පත්වෙන්න පුළුවන්. ඇත්තටම මෙම ක්‍රමවේදය තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න අපට හැකියාව ලැබෙනවාද නැද්ද කියන එක ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරලා, මේ යෝජනාව ගෙනැල්ලා ඒ සඳහා ඡන්දය ලබාදුන් අයගෙන් අපි අහනවා. ඒක අද තිබෙන ලොකු ගැටලුවක්. විශේෂයෙන්ම සීමා නීර්ණ වාර්තාව එනතුරු පළාත් සභා 3ක මැතිවරණය පවත්වන්නේ නැතිව දැනටමත් මාස 5කට වඩා වැඩි කාලයක් ගතවෙලා තිබෙනවා. මේ වන විට සීමා නීර්ණ වාර්තාව පාර්ලිමේන්තුවට ඇවිල්ලා, කථානායකතුමාට ඉදිරිපත් කර තිබුණත්, අද වන තෙක් එම වාර්තාව පාර්ලිමේන්තුවට -අපට- ඉදිරිපත් කරලා නැහැ වාගේම එය විවාදයකට භාජනය කරන්න කටයුතු කරලා නැහැ.

විශේෂයෙන්ම අපි මෙම මැතිවරණ ක්‍රමයේ තිබෙන ගැටලු පිළිබඳව කිව්වොත්, ජයග්‍රහණය කරන පක්ෂයට, ඒ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවගේ අභිලාෂය අනුව ඡන්දය ලබා දුන් පක්ෂය නොවෙයි අවසාන වශයෙන් සභාව පාලනය කරන්නේ. ජයග්‍රහණය කළ පක්ෂයට වඩා වැඩි මන්ත්‍රීවරු ප්‍රමාණයක් විපක්ෂයේ සිටින කණ්ඩායම නියෝජනය කරනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ප්‍රාදේශීය සභාවේ ඒ ආකාරයට සිද්ධ වුණා. ඊළඟට පිහිටුවනු ලබන පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට පළාතේ තිබෙන අවශ්‍යතා, එහෙම නැත්නම් පළාතේ තිබෙන සංවර්ධන කටයුතු සහ අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් නොවෙයි කටයුතු කරන්න වෙන්නේ; මන්ත්‍රීවරයාගේ සහ මන්ත්‍රීවරයාගේ පෞද්ගලික අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න තමයි අමාත්‍යවරුන්ට සහ ප්‍රධාන අමාත්‍යවරයාට සිද්ධ වෙන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය.

මෙම කොටියාස ක්‍රමයට ආවාම දූෂණ, වංචා සඳහා ඇති බලය අඩු කරනවා කිව්වා. අද අපට ලොකු ගැටලුවක් තිබෙනවා. පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ මන්ත්‍රීවරයෙක් ලක්ෂ ගණන්වලට අළෙවි වෙනවා. ලක්ෂ 25කට වෙන්න පුළුවන්. පළාත් සභා මැතිවරණයත් මේ ආකාරයෙන් පැවැත්වුවහොත්, ඉන් පසු පළාත් සභා මන්ත්‍රීවරයෙක් අඩුම තරමින් ලක්ෂ 50කට, ලක්ෂ 100කටවත් අළෙවි වෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ස්වාධීන කණ්ඩායම්වලට, සියයට 1ක්වත් නැති අයට ප්‍රාදේශීය සභාවට එන්න අවස්ථාව තිබෙනවා. පළාත් සභා මැතිවරණයත් මේ ආකාරයෙන්ම ක්‍රියාත්මක වුණොත්, ඒ කියන්නේ සියයට 50ට 50 වන පරිදි ක්‍රියාත්මක වුණොත් වංචා, දූෂණ නැති කරන්න නොවෙයි අවසානයේදී වෙන්නේ, ජනතාවගේ ඡන්දය අරගෙන අවසාන වශයෙන් ඒ මන්ත්‍රීවරයාට පක්ෂවල තිබෙන මුදල්වලට යට වෙන්න සිදු වෙනවා. එම නිසා මෙම මැතිවරණ ක්‍රමය වෙනුවට පසු ගිය කාලයේ තිබුණු මැතිවරණ ක්‍රමය ගෙන එන්න කියා අපි යෝජනා කරනවා. එහෙම කරන්න හැකියාවක් තිබෙනවා නම් ඒකාබද්ධ විපක්ෂය හැටියට ඒ සඳහා අපි සියලුදෙනාම එක කණ්ඩායමක් හැටියට අත උස්සලා තුනෙන් දෙකේ බලයක් ගන්න අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. මේකේ නොයෙකුත් ගැටලු තිබෙනවා. පසුගිය පළාත් පාලන මැතිවරණයේ cut-off mark එක සියයට 3කට, 5කට වත් තිබුණේ නැති නිසා නොයෙකුත් ගැටලු ඇවිල්ලා තිබෙනවා.

අද නගර සභා, ප්‍රාදේශීය සභා පිහිටුවා ගන්න තවම හැකියාවක් ලැබිලා නැහැ. පළාත් සභා මැතිවරණයත් ඒ වාගේම තමයි. පළාත් සභා මැතිවරණයේදී අඩුම තරමින් සියයට 3ක් හෝ සියයට 5ක් අතර ප්‍රමාණයක cut-off mark එකක් තියන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මේ ජයග්‍රහණය කරන පළාත් සභාවේ දිස්ත්‍රික්ක මට්ටමින් හෝ පළාත් මට්ටමේ ඒ ජයග්‍රහණය කරන කණ්ඩායමට බෝනස් මන්ත්‍රීවරු අඩුම ගණනේ 3ක් හෝ 4ක් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මේ කොටියාස සහ සමානුපාතික ක්‍රමය සියයට 50:50 නොවෙයි, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදීව නම් අඩුම තරමේ සියයට 60:40වත් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. සියයට 70:30ක් තමයි අපි යෝජනා කරන්නේ. නමුත්, 60:40වත් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මේ සීමා නිර්ණය තුළින් අපි බලාපොරොත්තු වුණු කාරණය සැබවින්ම ඉෂ්ට වෙලා තිබෙනවා ද කියන එක අද ගැටලුවක් වෙලා තිබෙනවා. ජනවාර්ගික සාමය ආරක්ෂා කරන්න සීමා නිර්ණය ක්‍රියාත්මක වුණත්, මේ සීමා නිර්ණය දෙස බැලුවාම

[ගරු කනක හේරත් මහතා]

තේරෙන කාරණය තමයි ජනවාර්ගික ගැටලු ඇති කිරීම සඳහා යම්කිසි කණ්ඩායමක් උත්සාහ දරන බව. ඒක කරන්නේ බොහෝ දුරට දේශපාලන නායකයින් වෙන්න පුළුවන්. ඒ දේශපාලන නායකයින් බලපෑම් කරලා වෙන වෙනම ජනවර්ග කණ්ඩායම් වෙන් කරන්න ගිහිල්ලා මේ සීමා නිර්ණය තුළින් අපේ සමාජයේ ජනවාර්ගික ගැටලු ඇති වෙයිද කියන බිය අපේ සිත්වල තිබෙනවා.

අපි උදාහරණයක් හැටියට කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තාම ඒකේ කොට්ඨාස 9ක් තිබෙනවා. තේරී පත් වෙන්නේ 18 දෙනෙක්. මේ කොට්ඨාස 9ම ජයග්‍රහණය කළත්, එහෙම නැත්නම් කොට්ඨාස 8ක් එක කණ්ඩායමක් ජයග්‍රහණය කරලා එක කොට්ඨාසයක් පරාජය වුණොත් අවසාන වශයෙන් ඒ ප්‍රතිඵලය අර පරාජය වෙච්ච පැත්තට තමයි යන්නේ. පරාජය වෙච්ච විපක්ෂයේ ඉන්න කණ්ඩායමට වැඩි මන්ත්‍රීවරු ප්‍රමාණයක් නියෝජනය කරන්න අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මෙම මැතිවරණ ක්‍රමය ඉතාමත් අවුල් සහගත ක්‍රමයක්. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා පැවතිච්ච මැතිවරණ ක්‍රමය ගෙන එන්න කටයුතු කළා නම්, ඒක වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඉදිරියට මේ නව ක්‍රමය ගෙනෙන්න අවශ්‍යතාව තිබෙනවා නම්, ඒ අවශ්‍ය කරන සීමා නිර්ණයන් කරලා ඒ තුළින් ඉදිරියට ගෙන එන්න හැකියාවක් තිබෙනවා. මොකද, සියයට 50:50 කොට්ඨාස සහ සමානුපාතික ක්‍රමය ලබා දෙන එක අසාධාරණයි කියන එකට අද සෑම කෙනෙක්ම එකඟ වෙනවා. එතකොට හැම පක්ෂයක්ම යෝජනා කරලා අඩුම තරමින් සියයට 60:40ක් හෝ සියයට 70:30ක් කොට්ඨාස සහ සමානුපාතික ක්‍රමය ලබා දුන්නොත්, අවසානයේ මාස 4ක් ගිහිල්ලා කරපු මේ සීමා නිර්ණය නැවතත් වෙනස් කරන්න වෙනවා. ඒක නිසා ප්‍රජාතන්ත්‍රවාදය සුරකින, දේශපාලන ස්ථාවරභාවයක් තිබෙන, ජනවාර්ගික සාමය ආරක්ෂා කරන්න පුළුවන් ආකාරයට අඩුම තරමේ සියයට 70:30ක් වන විධියට කොට්ඨාස හා සමානුපාතික ක්‍රමයක් යටතේ සංශෝධනය කරන්න පුළුවන් නම් ඒකත් වැදගත් වෙනවා. ඒ සඳහා සර්වපාක්ෂික කමිටුවක් හෝ හදලා මාස 5ක් කල් ගිය පළාත් සභා මැතිවරණය ඒ ක්‍රමය තුළින් ඉතාමත් කඩිනමින් පවත්වන්න කටයුතු කරන්න කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.53]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ "පළාත් සභා සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ" පිළිබඳ පවත්වන මේ විවාදයට එකතුවීමට ලැබීම ගැන මුලින්ම සතුටු වෙනවා. දැනටමත් පළාත් සභා තුනක මැතිවරණය පැවැත්විය යුතු කාල සීමාව මාස 5කට වඩා එක පැත්තකින් කල් ගිහිල්ලා තිබෙන බව අපි දන්නවා. අනෙක් පැත්තෙන් මේ පළාත් සභා ඡන්ද විමසීම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කළ නින්දිත ආකාරය අපට මතක් වෙනවා. පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම නින්දිත ලෙස, අපකීර්තිමත් ලෙස තමයි පළාත් සභා ඡන්ද විමසීම් පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කරගනු ලැබුවේ.

අපට මතකයි, එදා සවස 5.30 වන විට ඡන්ද විමසීම සිදු කළ යුතුව තිබුණු බව. කථික ලැයිස්තුව අවසානයට ගිහින් තිබුණා. පක්ෂ, විපක්ෂ දෙපාර්ශ්වයේම කථිකයෝ කථා කරලා අවසන් වෙලා තිබුණා. හැබැයි ඡන්ද විමසීම ගත්තේ නැහැ. ඡන්ද විමසීම ගන්නේ නැතිව පාර්ලිමේන්තුව අයාලේ ගියා. එහෙම ගිහින් තමයි, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම, පළාත් සභා ඡන්ද විමසීම කියන සියලු මැතිවරණ 60:40 ක්‍රමයට සිදුවිය යුතුය කියා තිබුණු එකඟතාව, ස්ථාවරය බිඳලා, 50:50 කියන අරුම පුදුම අනුපාතයට, කේවල මිශ්‍ර එකතුවක් හැටියට මේ ඡන්ද ක්‍රමය පාර්ලිමේන්තුවේ සම්මත වෙලා පැවැත්මට එන්න පටන් ගත්තේ. ඇයි එහෙම වුණේ? එදා පාර්ලිමේන්තුවට මේ පළාත් සභා තුනේ ඡන්දය කල්දමා ගන්න ඕනෑකම තිබුණා. එම නිසා ඡන්දය කල් දමාගන්න තිබුණු වුවමනාව ඇතිව, මේ රටේ සුළු ජාතිවාදය නියෝජනය කරන කල්ලි කණ්ඩායම්වලට ඒ ගොල්ලන්ගේ ජාතිවාදී, බෙදුම්වාදී වුවමනා ඉෂ්ට කර ගන්න, එහෙම නැත්නම් ඒ ගොල්ලන්ගේ පළාත් සභා බලය ශක්තිමත් කරගන්න; නියෝජනය හදා ගන්න ඕනෑ නිසා තමයි අද මේ 50:50 ක්‍රමය ඇවිත් තිබෙන්නේ.

මේ 50:50 ක්‍රමය ඇවිත් අද මොකද වෙලා තිබෙන්නේ? 60:40 ක්‍රමයට ඡන්දය පැවැත්වූවා නේ. ඒ ක්‍රමයට ඡන්දය පවත්වලා, පළාත් පාලන ආයතන ගණනාවක් ජයග්‍රහණය කළාට පසුව අද එම ආයතනවල ජයග්‍රාහකයා පරාජිතයා බවට පත් වෙලා, පරාජිතයා ජයග්‍රාහකයා බවට පත් වෙලා තිබෙනවා. පළාත් පාලන මැතිවරණයෙන් අපි අද අත් විඳින්නේ මොකක්ද? පළාත් පාලන මැතිවරණයේ මහජන අභිලාෂය සභාව ඇතුළෙන් පිළිබිඹු වන්නේ නැහැ. සාර්ථක ඡන්ද ක්‍රමයක් කියන්නේ මහජන මතයේ ප්‍රකෘතියයි. එය පළාත් පාලන ආයතනයෙන් හෝ පළාත් සභාවෙන් හෝ පාර්ලිමේන්තුවෙන් පිළිබිඹු වෙන්න ඕනෑ. ඉකුත් පෙබරවාරි 10වැනි දා පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඡන්ද දායකයාගේ මතයේ ප්‍රකෘතිය නොවෙයි, ඔහුගේ මතයේ විකෘතියක් තමයි එම පළාත් පාලන ආයතනවලින් පිළිබිඹු වෙන්නේ. ඒ 60:40 ක්‍රමයට ඡන්දය තියලා. තව 50:50 ක්‍රමයට තැබුවොත් කොහොම වෙයිද? පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමිය මේ ගරු සභාවේ දැන් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණය අපි මෙම ගරු සභාවට අවධාරණය කරනවා. ලංකාවේ එක පළාතක්වත් ස්ථාවරව පවත්වාගෙන යන්න බැරි මැතිවරණ ක්‍රමයක් තමයි මේ ඇවිත් තිබෙන්නේ. එම නිසා මැතිවරණ කොමිසම අද මේ ක්‍රමයට සංශෝධන ගෙනෙනවා. ඒ වාගේම "පැෆරල්" වැනි ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් කියනවා, "මේ මැතිවරණ ක්‍රමය හොඳ නැහැ; ඵලදායී නැහැ; එයින් මහජන මතය පිළිබිඹු වෙන්නේ නැහැ; මෙය මහජන පරමාධිපත්‍යයට පයින් ගහපු මැතිවරණ ක්‍රමයක්" කියලා. ඒ ඇයි? 50:50 ක්‍රමය තුළ ඡන්ද දායකයා තෝරන්නේ මන්ත්‍රීවරු 50යි. ඉතිරි 50දෙනා තෝරන්නේ කවුද? පක්ෂ නායකයෝ. පක්ෂ නායකයන්ට මහ ජනයාගේ පරමාධිපත්‍යය පවරපු මැතිවරණ ක්‍රමයක් බවට අද මේ 50:50 ක්‍රමය පත්වී තිබෙනවා. අපි කළුතර දිස්ත්‍රික්කය අරගෙන බලමු. එම දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරු 22ක් ඉන්නවා. එයින් 11දෙනෙක් ඡන්ද දායකයා තෝරන කොට, අනික් 11දෙනා තෝරන්නේ ඒ ඒ පක්ෂවල නායකයෝ. පක්ෂ නායකයා කැමැති මන්ත්‍රීවරයාත් එක්ක තමයි ජනතාවට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා දෙනවාය කියපු ප්‍රජාතන්ත්‍රවාදය ඒකද?

තමුන්නාන්සේලා පාරම් බෑවේ ලෝකයේ සුපිරි ප්‍රජාතන්ත්‍රවාදය දෙනවා කියලා නේ. ඒකද මේ දුන්නේ; 50:50 ක්‍රමය? සුළු ජාතිවාදී කණ්ඩායම්වල ඕනෑවට මැතිවරණ ක්‍රමය 50:50 කරලා -එක ප්‍රශ්නයකට උත්තර හොයන්න ගිහින්- අද ප්‍රශ්න කන්දරාවක් ඇතිවී තිබෙනවා. මුළු මැතිවරණ ක්‍රමයම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

අනික් කාරණය තමයි, සීමා නිර්ණය වාර්තාව. මාස හතරකින් දෙන්න කියලා මේ මොකක්ද කර තිබෙන්නේ? අපේ රටේ දිස්ත්‍රික්ක වෙන් වෙලා තිබෙන්නේ භූගෝලීය සීමා අනුවයි. එක්කෝ ගඟවල්, එක්කෝ දොළවල්, එක්කෝ ඇළවල්, එක්කෝ කඳු පන්ති ආදී වශයෙන් නිශ්චිත භූගෝලීය සීමාවන් අනුව තමයි මැතිවරණ කොට්ඨාස, මැතිවරණ දිස්ත්‍රික්ක වෙන් වෙලා තිබෙන්නේ. මේ ක්‍රමය අද එක පැත්තකින් ජාතිකත්ව කුළල් කා ගැනීමකට මඟ පාදනවා. ජාතීන් අතර සැකය, භීතිය, වෛරය, අවිශ්වාසය අවුළුවන; පතුරුවන, තවත් පැත්තකින් සංවර්ධනයට කිසිසේත් දිරි නොදෙන, අස්ථාවරභාවය වැඩිදියුණු කරන අවුල් ජාලාවක් බවට එක පැත්තකින් මේ සීමා නිර්ණය කිරීමේ වාර්තාව අද පත් වෙලා තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල කියන,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කථාව අවසාන කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මට විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල මැතිවරණ කොට්ඨාසය ගත්තොත් එය පළාත් සභා ඡන්ද විමසීම අනුව කොට්ඨාස දෙකකට වෙන් කරලා තිබෙනවා. ඒ අනුව බේරුවල නගර සභාවත්, බේරුවල ප්‍රාදේශීය සභාවේ ග්‍රාම සේවා කොට්ඨාස 35කුත් "බේරුවල" නමින් කොට්ඨාසයක් බවට පත්වෙලා තිබෙනවා. මෙහි මුස්ලිම් ජනතාව සියයට 55කුත්, සිංහල ජනතාව සියයට 45කුත් තමයි ඉන්නේ. හරි නම් මේක විය යුතුව තිබුණේ බහු කොට්ඨාසයක් හැටියටයි. අද වෙලා තිබෙන්නේ එහෙම නොවෙයි. අද සිංහල ජනතාව තුළ මුස්ලිම් ජනතාව කෙරෙහි සැකයකුත්, මුස්ලිම් ජනතාව තුළ සිංහල ජනතාව කෙරෙහි සැකයකුත් ඇතිවෙලා තිබෙනවා.

අනික් පැත්තෙන් බේරුවල මැතිවරණ කොට්ඨාසයේ ඉතුරු ග්‍රාම සේවා කොට්ඨාස ටික දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එකතු කරලා තිබෙනවා. බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් කොටසක් දොඩන්ගොඩ මැතිවරණ කොට්ඨාසයට වෙන් කරලා, -කළු ගහෙන් ඔබ්බට ගිහිල්ලා- කළුතර මැතිවරණ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස හයක් ඒකට එකතු කරපු මැතිවරණ කොට්ඨාසයක් බවට එය පත්වෙලා තිබෙනවා. එය කිසිසේත් විද්‍යාත්මක නැහැ; කිසිසේත් සංවර්ධනයට දිරි දෙන්නේ නැහැ. මේකෙන් කිසිසේත් ජාතීන් අතර සමගිය ගොඩ නැහෙන්නේ නැහැ; පළාත් සභාවන් ස්ථාවරව පිහිටුවන්න බැහැ. ඡන්ද දායකයාත්, ඒ ඒ දේශපාලන පක්ෂත්, නිලධාරීනුත් -කවුරුත්- අත් විඳින මේ අවුල් වියවුල්වෙලා තිබෙන මැතිවරණ ක්‍රමය වෙනස් කරලා නව මැතිවරණ ක්‍රමයක් ඇති කරන්න කියලා අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එහෙම බැරි නම් පැරණි මැතිවරණ ක්‍රමයට හෝ වහාම පළාත් සභා ඡන්දය පවත්වලා, ඡන්දය දීමට ජනතාවට තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ක්‍රියාවට නඟන්න අවස්ථාව සලසන්න කියා අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාටත් ස්තුතිය පළ කරමින් නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 5.01]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුදුරේදී පැවැත්වීමට නියමිත පළාත් සභා මැතිවරණයන්හිදී සීමා නිර්ණය, එහි සංයුතිය සම්බන්ධයෙන් ඇති විය යුතු වෙනස්කම් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම පළමුවෙන්ම ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. නමුත් එතුමාට කථා කිරීමට අවශ්‍ය අදහස් මට දෙන්න බැරි වුණා. එක්සත් ජාතික පක්ෂය හැටියට වුණත් මෙවැනි අවස්ථාවකදී මෙතුමාට මේ කටයුත්ත සඳහා ශක්තියක් දෙන්න මම කල්පනා කළා. ඒ වෙනුවෙන් මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමියට ස්තුතිවන්ත වනවා, ගරු ඇමතිතුමියනි.

අපේ ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා මේ මැතිවරණ ක්‍රම පිළිබඳව, මේවායේ තිබෙන අඩුලුහුඬුකම් ගැන, පළාත් පාලන මැතිවරණය ගැන ප්‍රකාශ කළා. ඒවායේත් අඩු පාඩුකම් අපි දකිනවා. හැබැයි, මේ ක්‍රමය මුලින්ම ගෙනාවේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලය තුළ පසු ගිය අවුරුදු දෙක, තුනක කාලයක් කොට්ඨාස ක්‍රමයක් ගෙනෙන්න ඕනෑය කියා වැඩකටයුතු කර අපි ආණ්ඩුව බාර ගන්න කොට ඒක අනලා තිබ්බේ. අපිටත් ඒ කටයුත්ත කරන්න අවුරුදු දෙකක් විතර ගත වුණා. නමුත් මොන සියයට ගණන වුණත් තමුන්නාන්සේලාට මේ වාගේ ක්‍රමයක් වෙනස් කරන්න ඕනෑ නම් ඒකට තව කල් අරගෙන කටයුතු කරන්න තිබුණා. තමුන්නාන්සේලා බෙරිහන් දුන්නේ "වහාම ඡන්දය තියවු! වහාම ඡන්දය තියවු!" කියලායි. "ප්‍රජාතන්ත්‍රවාදය අතු ගාලා දාන්න එපා" කියලා කෑ මොර ගහලා, මේ ඡන්දය ඉල්ලා ගත්තා. නමුත් ඇත්ත වශයෙන්ම කඩිමුඩියේ ගෙනා මේ ක්‍රමය නිසා අද ඉතාම දරුණු අගාධයකට මේ රටේ පළාත් පාලන ක්ෂේත්‍රය පත්වෙලා තිබෙනවා. මහජන නියෝජනය නැතිව තිබුණා නම් මීට වඩා හොඳයි. මම පෞද්ගලිකව මේ ක්‍රමයට විරුද්ධයි. මොකද, මේ ක්‍රමය තුළින් අද හරියට ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු තෝරන්න බැරිවෙලා තිබෙනවා. මේ ක්‍රමය නිසා ඡන්දය ඉල්ලපු අපේක්ෂකයන් බොහෝ දෙනෙකු සංවිධායකවරුන් එක්ක උරණවෙලා තිබෙනවා. පැරදුණු කණ්ඩායමට තමයි ඒක බරපතළ ලෙස ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ කියා මම හිතනවා. මේ ආණ්ඩුවට අවුරුදු දෙක හමාරක් ගත වනකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිකමින් ඉවත් කරන්න විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න කඩිමුඩියේ දහලන, රටේ මතවාදයක් හදන තමුන්නාන්සේලාට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න මත වාදයක් හදන්න බැරි වුණා. නමුත් තමුන්නාන්සේලා අද කයිවාරු ගහනවා. අදවත් එවැනි මතවාදයක් හදන්න තමුන්නාන්සේලා ප්‍රවේශවෙලා නැහැ. පළාත් සභා ඡන්දයේ මේ අඩු පාඩුකම් තිබෙනවා නම් තමුන්නාන්සේලාට තිබුණේ ඒ වෙනුවෙන් මත වාදයක් ගෙනෙන්නයි. උදේ ඉඳලා හැන්දෑ වනතුරු රනිල් වික්‍රමසිංහ ගෙදර යවන්න කථා කරන තමුන්නාන්සේලා මේ රටේ ඉතිහාසය -එක්සත් ජාතික පක්ෂය ගෙනාපු මැතිවරණ ක්‍රමය- දෙස හැරී බලන්න.

ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට පින්සිද්ධ වෙන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනාවා. මේවාට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වුණා. නමුත් ඔවුන් අද කියනවා, "මේක තමයි හොඳම ක්‍රමය.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට පින්සිද්ධ වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිබුණු නිසා තමයි යුද්ධය අවසන් කළේ" කියලා. නමුත් සංවාදයක් ඉස්සරහට ගෙනි යන්න තමුන්නාන්සේලාට තිබුණා. කරුණාකරලා පළාත් සභාව ගැනත් කථා කරන්න. ඉදිරි මාස තුනේ කෙසේ හෝ අරහෙන් මෙහෙන් මාට්ටු කරලා මේ ඡන්දය පැවත්වන්න කටයුතු කළත් ඒකේත් මේ ස්ථාවරත්වය නැහැ.

මැතිවරණ ක්‍රමයක සාධාරණ ස්ථාවරත්වයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම එය ජනතාවට වඩාත් ළං විය යුතුයි. ඒ බව ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා කියාවි කියලා මා හිතනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාත් එහෙම තමයි. මෙතැනදී ජනවාර්ගික ගැටලු ඇති වෙන්නේ නැහැ. උදාහරණයක් හැටියට ගාල්ල දිස්ත්‍රික්කය ගත්තාම, අනිවාර්යයෙන්ම මුස්ලිම් අපේක්ෂකයෙකුට ජයග්‍රහණය කරන්න පුළුවන්. මතක තබා ගන්න. ඒ, එම ප්‍රදේශයේ තිබෙන ජන සංයුතිය අනුවයි. ඒ නිසා ඉදිරි පළාත් සභා මැතිවරණය පවත්වන්න කලින් සංශෝධනයක් ගෙනැල්ලා පැරණි විධියටම පැවැත්වීම සඳහා එක්සත් ජාතික පක්ෂය තීන්දුවක් ගන්න වෙයි කියලා මා පෞද්ගලිකවම හිතනවා. ඒක තමයි ක්‍රමය. ඒ තුළින් ආරාවුලක් ඇති වුණේ නැහැ. ඒ තුළින් මහ ඇමතිවරයාට ඇමති මණ්ඩලය පත් කරගෙන ලස්සනට කටයුතු කරගෙන යන්න පුළුවන්. අද තමුන්නාන්සේලා බලය ගත්තාට වැඩක් නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාසේලාට සභා පිහිටුවන්න පුළුවන්කමක් නැහැ. දඩිබිඩි ගාලා හදපු යම් යම් ක්‍රම තුළින් තමුන්නාන්සේලා තමයි මේක අරාජික වීමේ පළමුවැනි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. මම ඒ ගැන කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව හිතන්නට ඕනෑ. "තව මාස තුනක් යන්න ඉස්සෙල්ලා වහාම පළාත් සභා මැතිවරණය තියව්, සබරගමුව පළාත් සභා මැතිවරණය තියපියව්" කියලා දැනුත් මේ අය කියාවි. එහෙම නේ කියන්නේ. කථා කරලා, බෝඩ් ලෑලි උස්සා ගෙන යයි. හැබැයි, එසේ තිබ්බාට පසුව ඇති වෙන ප්‍රශ්නයට මුහුණ දිය යුත්තේ ආණ්ඩුවක් හැටියට අපියි. අපි අද ඒ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. [බාධා කිරීම්] අපි මුහුණ දීලා තිබෙනවා.

පොඩි මේස දෙකක් විතර තබා ගෙන හතරවටේ මන්ත්‍රීවරුන් 12 දෙනෙකු විතර වාඩි වී කටයුතු කරපු පුංචි ප්‍රාදේශීය සභාවක අද තත්ත්වය කොහොමද කියලා බලන්න. අද ඒවායේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 23-25 බවට පත් වෙලා තිබෙනවා. බලන්න, අද කොළඹ මහ නගර සභාව දිහා. අද එය පාර්ලිමේන්තුවක් වාගේයි. ඉඩකඩ තිබෙනවාද? [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සංශෝධනයක් ගෙනෙන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
සංශෝධන? තමුන්නාන්සේලා මේක ගෙනාවේ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීවරුනි, එතුමාගේ කථාවට බාධා කරන්න එපා. [බාධා කිරීම්]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
දිනේෂ් ගුණවර්ධන මහත්මයාලා මේකට වග කියන්න ඕනෑ. කමිටු හැදුවා. එහෙම කරලා අද ලජ්ජා නැතුව කථා කරනවා. අද කියනවා, සභා පිහිටුවා ගන්න බැරිලු. පිහිටුවා ගන්න බැරි නම්, මේවා ගෙනාවේ මොකටද? ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනා පැරණි ක්‍රමයට පිහිටුවන්න තිබුණා. ප්‍රේමදාස මහත්මයාගේ ක්‍රමයට පිහිටුවන්න තිබුණා. ඒ ක්‍රමවලට අනුව හොඳින් ප්‍රාදේශීය සභා පාලනය වුණා. නිවැරදි විධියට සභාපතිවරු බිහි වුණා. හොඳින් ජනප්‍රිය වෙලා මනාපවලින් ගිහිල්ලා ප්‍රාදේශීය සභාවලට තේරී පත් වුණා, පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණා. මතක තබා ගන්න, මේ ක්‍රමයෙන් ඒ අවස්ථාව නැති වුණා. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුනි, එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
දකුණේ ආණ්ඩුකාරවරිය හැටියට කටයුතු කරන්න ගරු තාරක බාලසූරිය මැතිතුමන්ගේ ආදරණීය මැණියන්ට පුළුවන්කමක් ලැබුණා. මේ අය මහ ලොකුවට කයිවාරු ගහනවා. තකහනියේම ගරු අගමැතිතුමාට විශ්වාසභංගයක් ගෙනෙන අය ගෙනෙන්න කෝ, මේකටත් කතිකාවතක්; ගෙනෙන්න කෝ, සංශෝධනයක්. [බාධා කිරීම්] කෝ, ගෙනෙනවා? ඒවා නොවෙයි කරන්නේ. අර නරියා සහ මීදි වැලේ කථාව වාගේ බලාගෙන ඉන්න. ආණ්ඩුව වැටෙයි කියලායි තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කරදර කරන්නේ නැහැ. ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාවට වැඩිමනත් අදහසක් සපයන්නයි මා කරුණු-කාරණා ඉදිරිපත් කළේ. මම පෞද්ගලිකව ඉල්ලීමක් කරනවා. මම හිතන හැටියට නම් මේ මැතිවරණ ක්‍රමය යා යුත්තේ කලින් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ යුගයේ ගෙනා පළාත් සභා ක්‍රමයට අනුවයි. ඒකෙන් සුළු ජාතීන්ට අසාධාරණයක් වුණේ නැහැ. හැබැයි, අපේ සමහරු පවා සමහර වේලාවට ජේවීපී එකේ ලණු කෑවා. මම ඒක පිළිගන්නවා. ජේවීපී එකට අවශ්‍ය සුළුතරය ගන්න ඕනෑ නිසා, මුළු රටම අරාජික වුණා. හැම දාමත් අරාජික වැඩ කරන්නේ එතුමන්ලා. මම ඒ ගැන කනගාටු වෙනවා. මේවාට ගිහිපු අපේ සමහර අය මේ සමහර දේවල්වලට හසු වුණා. ඇත්තටම මේ කටයුතුවලට ප්‍රායෝගික දැනුමක් තිබෙන අය මේ තැන්වල වාඩිවෙන්න ඕනෑ. ජේවීපී එකේ ඕනෑකම ඒ අය ඉෂ්ට කර ගත්තා. හැබැයි, ඒ අයට කවදාවත් සභා පිහිටුවන්න බැරි බව ඒ අය දන්නවා. කිසි දවසක සභාපතිකමේ හෝ උපසභාපතිකමේ කෙනෙකු වාඩි කරවන්න ඒ අයට බැහැ. ඒ අයට මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙකු කොහේ හරි වැඩි කරගෙන, ගණන තබාගෙන ඉන්න පුළුවන්. ඒ නිසා ඒ අය මේ ක්‍රමයට සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ කියලා මා කියනවා.

හොඳ යමක් කරනවාය කියලා කයිවාරු ගැහුවාට, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ පළාත් පාලන මැතිවරණයට කරපු අපරාධයට, ඒ තුළින් ඇති කරපු විනාශයට, ඒ තුළින් පළාත් පාලන ආයතන අරාජික කළ එකට ඒකාබද්ධ විපක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑය කියලාත් මා හිතනවා. මේවා ගෙනාවේ අපි නොවෙයි. බැසිල් ක්‍රමයක් ගෙනාවා. ඊට පසුව ඒක නැති කළා. ඊට පසුව අවුරුදු දෙකක් ගත වුණා. තමුන්නාන්සේලා මෙතැන දැහලුවා. මෙතැන

දහලා, "මේවා ඉක්මනින් පවත්වන්න" කියලා කිව්වා. ඊට පසුව තිබ්බා. තියපු ගමන් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා අද දන්නවා. රටක ස්ථාවර බවක් තිබෙන්න ඕනෑ. ඒක ඉතාම වැදගත්. ආයතනයක ස්ථාවරබවක් තිබෙන්න ඕනෑ. මේ කිසි දෙයක ස්ථාවරබවක් එන්නේ නැහැ. තමුන්නාන්සේලා මහ ලොකුවට කයිවාරු ගැහුවා, "අපි -පොහොට්ටුව- තමයි බහුතරය අරගෙන තිබෙන්නේ" කියලා. හැබැයි, පොහොට්ටුව පිපෙන්න ටිකක් කල් යයි. අවුරුදු 4ක් යනතෙක් පිපෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒ සඳහා මේ තිබෙන ක්‍රමවේදයත් එක්ක තමුන්නාන්සේලාගේ සභාපතිවරුත්, උපසභාපතිවරුත්, තමුන්නාන්සේලාගේ කණ්ඩායමත්, අපේ කණ්ඩායමත් දැඩි අසීරුතාවට පත් වෙනවා.

අවසාන වශයෙන්, මම ගරු රාජ්‍ය ඇමතිතුමියට කියන්න කැමැතියි, ඉදිරි පළාත් සභා මැතිවරණය එක දවසක පවත්වන්න කියලා. තකහනියේ පවත්වන්න කියනවා නොවෙයි. තමුන්නාන්සේලා සලාක ක්‍රමයට ඒක පැවැත්වූවා, තැනින් තැන. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඉදිරියේදී එක දවසක මේ සියලු පළාත් සභා සඳහා මැතිවරණය පවත්වන්න.

ඒකට අපි කැමතියි. මැතිවරණය පවත්වන්න. හැබැයි, නියම විධියට ස්ථාවරව පළාත් සභා පිහිටුවන්නට අවශ්‍ය පසුබිම සකස් කරන්න. ඒ සඳහා අවශ්‍ය වටාපිටාව හදන්න. එහෙම හදලා මැතිවරණය පවත්වන්න. එහෙම නැතුව මේකත් අර පළාත් පාලන ආයතන මැතිවරණය වාගේ ක්‍රමයකට ගෙනැල්ලා, මහජන නියෝජිතයන් වැලේ වැල් නැතුව ඉබාගාතේ යන තත්ත්වයට පත් කරන්න එපා කියලා ඉල්ලා සිටිමින් මේ යෝජනාව ගෙනා ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. අපි දන්නවා, කාන්තා නියෝජනය පිළිබඳ ප්‍රශ්නයක් අරගෙන තමයි මේ පළාත් සභා මැතිවරණය කල් දැම්මේ. මට කලින් කතා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රාදේශීය සභා මැතිවරණය ගෙනාවේ අපි සකස් කරපු මැතිවරණ ක්‍රමයට කියලා. අපි සකස් කරපු මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න තමයි තමුන්නාන්සේලා අවුරුදු තුනක් කල් අරගෙන, අලුතින් පනත් හදාගෙන -ඒ සියල්ලම කරලා- කටයුතු කළේ. අපි හදපු මැතිවරණ ක්‍රමය වැරදියි කියලා, ඒ ක්‍රමය වෙනස් කරලා මැතිවරණය පවත්වලා තමයි අද මේ ප්‍රාදේශීය සභා පිහිටුවා ගන්න බැරිව ඉන්නේ. ඒ නිසා ඒ ක්‍රමය අසාර්ථකයි.

මුලසුනේ සිටින ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්නම්. රත්නපුර මහ නගර සභාවේ කොට්ඨාස 14යි. අපි කොට්ඨාස 11ක් දිනුවාම අපට ලැබුණේ මන්ත්‍රී ධුර 12යි. අපි කොට්ඨාස 3ක් පැරදුණාම, විපක්ෂයට මන්ත්‍රී ධුර 13යි! මෙන්න නියම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය! ඒ නිසා මේක ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් නොවෙයි. මේක පැරදිච්ච අයගේ ගොඩ වැඩි කර ගන්න හදා ගත්ත මැතිවරණ ක්‍රමයක්. ඒ නිසා පළාත් සභා මැතිවරණ ක්‍රමයටත් 50:50 අනුපාතය ගෙනාවොත් එක පළාත් සභාවක්වත් හරියට පිහිටුවන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමය හදන්න එච්චර කල් යන්නේ නැහැ. මම බැලුවා, මගේ මැතිවරණ කොට්ඨාසය බෙදුණු ආකාරය. [බාධා කිරීමක්] පරණ මැතිවරණ ක්‍රමය ගෙනෙනවා නම් මම කැමැතියි. ඒ පරණ මනාප ක්‍රමය හරි ගෙනැල්ලා, පළාත් සභා මැතිවරණය සාධාරණව තියනවා නම් මම කැමැතියි. දැන් නිවිතිගල ආසනයෙන් කොටසයි, රක්වාන ආසනයෙන් කොටසයි, කලවාන ආසනයෙන් කොටසයි, කොලොන්න ආසනයෙන් කොටසයි වශයෙන් ආසන හතරකින් කොටසක් අරගෙන කිලෝමීටර් 70ක් විතර දිග එක කොට්ඨාසයක් කඩලා තිබෙනවා. ඒ කොට්ඨාසයේ මන්ත්‍රීවරයාට අඩු ගණනේ මාසයකින්වත් ඒ කොට්ඨාසයේ ඇවිදින්න බැහැ. ඒ අනුව බැලුවාම විද්‍යාත්මක පදනමකින් මේ කොට්ඨාස කැඩුවේ කොහොමද කියලා අපි නම් දන්නේ නැහැ.

මගේ මැතිවරණ කොට්ඨාසය හතර අතට කඩලා තිබෙනවා. එක පැත්තක් රක්වානට කඩලා. අනික් පැත්තෙන් නිවිතිගලට කඩලා. තවත් පැත්තකින් ඇහැළියගොඩට කඩලා. එක පළාත් සභා කොට්ඨාසයක් ප්‍රාදේශීය සභා හතරකට කඩලා අඩු ගණනේ ප්‍රාදේශීය සභා මට්ටමින් මේ කොට්ඨාස කැඩුවා නම්, ඒත් කමක් නැහැ. එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොට්ඨාස ගැසට් කරන්න පුළුවන්. මේ සඳහා ආයෙමත් සීමා නිර්ණය කමිටු ඕනෑ නැහැ. ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තිබෙනවා. එහෙම නැත්නම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තිබෙනවා. ඒ එක ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයකට හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකට එක මන්ත්‍රීවරයෙක් පත්වෙන ආකාරයට කොට්ඨාස කඩන්න පුළුවන්. ඉතුරු ටික ලැයිස්තුවෙන් පත් කරන්න පුළුවන්. පළාත් පාලන මැතිවරණයේදී වෙච්ච එකම අසාධාරණය තමයි, දිනපු පැත්තට bonus seat එකක් දුන්නේ නැති එක. එහෙම දුන්නා නම්, අද මේ ඇතිවෙලා තිබෙන තත්ත්වය ඇති වෙන්නේ නැහැ. මම කලවානේ කොට්ඨාස 10ම දිනලා ලැබුණේ නියෝජිතයන් 10 දෙනයි. නියෝජිතයන් 16යි හිටියේ; 17ක් කරලා ජේවීපී එකට තව එකක් දුන්නා. ඡන්ද 8,000ක් අරගෙන කොට්ඨාස 10ක් මම දිනුවා. නමුත් මගේ ලැයිස්තුවෙන් එක්කෙනෙක්වත් තේරෙන්නේ නැහැ. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. එක කොට්ඨාසයක්වත් දිනා ගන්න බැරිවුණ, ඡන්ද 8,000කින් ප්‍රාදේශීය සභාව පැරදුණු ඒ ගොල්ලන්ට නියෝජිතයන් 6ක් ලැබුණා. ඒක නියෝජිතයන් 7ක් දක්වා වැඩි කරලා දුන්නා. ඒ නිසා මේ ක්‍රමය අසාර්ථකයි. ඒ නිසා අපි කියනවා, ආපසු මොකක් හරි වෙන ක්‍රමයකට කල් දාන්නේ නැතුව පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා. මගේ පෞද්ගලික මතය, අපේ ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ පැරණි ක්‍රමයට හරි මැතිවරණය තියන්න කියන එකයි. අලුත් මැතිවරණ ක්‍රමයක් හදන්න අවුරුදු හතරක් ගන්න; පහක් ගන්න. අරගෙන හරි ක්‍රමයක් හදන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසාන කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් දෙන්න.

ගැටුම් නැහැ කියලා තමයි මේ මැතිවරණ ක්‍රමය ගෙනාවේ. නමුත් ගැටුම් තිබුණා. කලවාන ප්‍රාදේශීය සභාවට කලවාන කොට්ඨාසයෙන් විමල් කුමාරතිලක කියලා කෙනෙක් තරග

[ගරු ජානක වක්කුඹුර මහතා]

කළා. මැරයෝ ගෙනැල්ලා දාලා එතුමාගේ ගෙදරට ගහලා, ඒ ගේ කුඩු කළා. එහෙම කරලා දිනන්න හැදුවා. නමුත් එතුමා වැඩිම වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ඒ කොට්ඨාසය ජයග්‍රහණය කළා. අපි ඒ වෙලාවේ රත්නපුර DIG ටත් කිව්වා, මෙහෙම ආයුධ අරගෙන මැරයෝ ඇවිල්ලා ඉන්නවා කියලා. නමුත් ගණන් ගත්තේ නැහැ. ඡන්දය පහුවෙලා සතියක් යනකොට කොළඹින් ගිහින් මිනීමරුම් 10කට සම්බන්ධ පුද්ගලයෙක් ආයුධත් එක්ක ඇල්ලුවා. ඔහු අද රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මැරයෝ දමලා, පාතාලය ගෙනියලා ඒ මැතිවරණය දිනන්න හැදුවා. ආණ්ඩුව කරන්න පුළුවන් ඒ සියල්ලම කරලාත් එක කොට්ඨාසයක්වත් ජයග්‍රහණය කරන්න බැරි වුණා. ඒ නිසා අපි කියනවා, ඉක්මනින්ම පළාත් සභා මැතිවරණය සාධාරණ විධියට පවත්වන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ගරු ඇමතිතුමියගේ පිළිතුරු කථාව.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමියනි, පැහැදිලි කිරීමකට එතුමාට අවස්ථාව දෙනවාද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government)
ඔව්, දෙන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ස්තුතියි ගරු ඇමතිතුමියනි.

අපට හැම කෙනාම සතුටු කරන්න පුළුවන් ඡන්ද ක්‍රමයක් හදන එක එච්චරම ලෙහෙසි පහසු දෙයක් නොවෙයි කියන එක මම කියන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කරුණ පැහැදිලි කරන්නකෝ. ඇමතිතුමිය පිළිතුරු දෙයි.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියපු අන්දමට ලංකාව වාගේ රටකට වැදගත්ම වන්නේ ස්ථාවරභාවයයි. ඇත්තවශයෙන්ම, මේ මැතිවරණ ක්‍රමයේදී අස්ථාවරභාවයක් ඇති වෙන්න හේතු දෙකක් තිබෙනවා. පළමු හේතුව තමයි cut-off එක අයින් කරපු එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කෙටියෙන් පැහැදිලි කරන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමු හේතුව තමයි සියයට 5ට තිබුණු cut-off එක අයින් කරපු එක. අනෙක් හේතුව තමයි, bonus seats හරහා දීපු නියෝජනය ඉවත් කිරීම. තවත් හේතුවක් තමයි 70: 30ට තිබුණු අනුපාතය වෙනස් කරපු එක. අපේ යෝජනාව හැටියට තිබුණේ 70යි, 30යි අනුපාතය. ඊට පසු එය සියයට 60යි, 40යි කළා. පළාත් සභා මැතිවරණයේදී එය කොට්ඨාසවලින් සියයට 50යි, සමානුපාතික ක්‍රමයෙන් සියයට 50යි කළා. ඉතින්, ඒ විධියට සියයට 50යි, 50යි ගන්නකොට තවත් අස්ථාවරභාවයක් එනවා. ඒ නිසා ගරු ඇමතිතුමියනි, මේ ප්‍රතිශතය වෙනස් කරන්න හෝ bonus seat එකක් දෙන්න හෝ ඉදිරියේදී අදහස් කරනවාද කියලා තමයි මම ඔබතුමියගෙන් අහන්නේ?

[අ.භා. 5.18]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා රටේ පවතින, සාකච්ඡා කළ යුතු කාරණයක් සම්බන්ධ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලය මත පදනම්ව තමයි මේ සියලු කාරණා ඉදිරිපත් කළේ. ඒ වාගේම, මෙම පනත ගැන ප්‍රශ්නයක් ඇහුවා. අපි පළාත් පාලන මැතිවරණ ක්‍රමයේදී සියයට 60:40 කියන නිර්ණායකය යටතේ මැතිවරණය තියලාත්, පිහිටුවන සභාවල අස්ථාවරභාවක් තිබෙනවා. ඇත්තටම මගේ පෞද්ගලික මතය නම්, මේ අනුපාතය පනහට පනහ දක්වා ගෙන ගියොත් මේ සභාවල ස්ථාවරය පවත්වාගෙන යන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ කියන එකයි. මේ තත්ත්වය යටතේ මේ පාර්ලිමේන්තුවට පූර්ණ බලය ලැබිලා තිබෙනවා ඒ පිළිබඳ තීරණයක් ගන්න. සීමා නිර්ණ කමිටුවේ වාර්තාව විවාදයට ගන්නා අවස්ථාවේදී එය තුනෙන් දෙකක ඡන්දයකින් සම්මත වෙන්න ඕනෑ. ඒ අවස්ථාවේදී මීට අවශ්‍ය සංශෝධන ගෙනෙන්න දැන් කවුරුත් පාඩමක් ඉගෙන ගෙන තිබෙනවා.

මේ මැතිවරණ ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්නේ නැහැ කියන කාරණය සම්බන්ධයෙන් මම උත්තරයක් දෙන්න

ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය කියන සංකල්පය ආරක්ෂා වෙලා තිබෙනවා. ස්ථාවර පාලන ආයතන බිහිවීමයි දුර්වල වෙලා තිබෙන්නේ. මොකද, හැම කොට්ඨාසයකටම නියෝජනයක් ලැබිලා තිබෙනවා. එම නිසා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කියන කාරණය සියයට සියයක්ම සමානුපාතික වන ආකාරයට ඉෂ්ට කරන්නට මේ මැතිවරණ ක්‍රමය ඉවහල් වෙලා තිබෙනවා. නමුත්, සභා පිහිටුවීමේදී අපි-

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

කොට්ඨාසවල ඉන්න සියයට 50ක් පමණයි ඡන්දය පාවිච්චි කරන්නේ. ඊළඟට, සමානුපාතික ක්‍රමය අනුව එන නියෝජිතයන් සියයට 50ක් පත් කරන්නේ පක්ෂයක් මඟින්. සමහර වෙලාවට ඒ එක පක්ෂයකින් එක් පුද්ගලයෙක් වෙන්න පුළුවන්, පුද්ගලයන් දෙන්නෙක් වෙන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදයේ හැටියට ඡන්දය පාවිච්චි කරනවා නම්, සියයට 50යි, 50යි කියන එක මම හිතන හැටියට ලොකු අසාධාරණයක්.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මම ඒකට උත්තරයක් දෙන්නම්. පක්ෂයකට නියෝජිතයන් නම් කරන්න ලැබෙන්නේ පරාජිත ඡන්ද සංඛ්‍යාව වෙනුවෙන්. පරාජයට පත් වූ ආසනවල එකතු වූ, නියෝජනයක් නොලැබෙන ඡන්ද සඳහා නියෝජිතයන් පත් කිරීමේ අවස්ථාව තමයි පක්ෂවලට ලැබෙන්නේ. එහිදී-

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, පක්ෂ නායකයන් විසින් නම් කරන ලද පුද්ගලයන් තමයි පක්ෂ නියෝජිතයින් විධියට ඉදිරිපත් කරන්නේ. ඒ සියලුදෙනා ජනතාව තෝරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ ක්‍රමයෙන් ප්‍රජාතන්ත්‍රවාදය යම්කිසි මට්ටමකට ඉවත් කරලාත් තිබෙනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

පක්ෂ නායකයින් ප්‍රජාතන්ත්‍රවාදී නැහැ කියන කාරණය මමත් පිළිගන්නවා. ඒක හරි. නමුත්, දැන් ඡන්ද ක්‍රමයක් හදලා තිබෙනවා. හදලා තිබෙන මේ ඡන්ද ක්‍රමය නිවැරදි කර ගන්න සියලු දෙනා එකතු වෙලා කටයුතු කරන්න වෙනවා. ඇත්තටම සියයට 70ක් කොට්ඨාස ක්‍රමයටත්, සියයට 30ක් සමානුපාතික ක්‍රමයටත් නියෝජනය වන ක්‍රමයක් ඇති වුණා නම් මීට වඩා ස්ථාවර සභාවන් පත් කර ගන්නට පුළුවන් වෙයි කියන විශ්වාසය තුළ මම ඉන්නවා.

මේ පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යන්න නම්, පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව පිළිබඳ යෝජනාව ඡන්ද විමසීමේදී තුනෙන් දෙකකින් සම්මත වෙන්න ඕනෑ. මම හිතන විධියට එහිදී සියලුම පක්ෂවලට එකතු වෙලා තීරණයක් ගන්න ඉඩකඩ තිබෙනවා.

අපේ ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කිව්වා, ජාතිවාදී ප්‍රශ්නත් එක්ක මේ සියයට 50 කාරණාව ගෙනාවා කියලා. එහෙම තත්ත්වයක් තිබුණා. හැබැයි අපි දැක්කා, හැම ජාතියකම ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කයක් විධියට මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේත් කොට්ඨාස ක්‍රමයට ඡන්දයක් පවත්වන අවස්ථාවකදී, ඇත්තටම එයින් ජාතිවාදී සංකල්පය බොහෝ දුරට ඇත් වන ඉඩකඩ හැදීගෙන ආවා. ඒ නිසා කොට්ඨාස ක්‍රමය රටකට හොඳයි කියලා මා හිතනවා. මොකද, රටක් විධියට අද අපේ රට ජාතිවාදී ප්‍රශ්නවලින් මිරිකිලා සිටිනවා. හැම ජන කොට්ඨාසයක්ම ඒ ආකල්පවලට එකතු වෙමින් යන අවස්ථාවක - බේරුවල ඇති වූ සිද්ධිය උදාහරණයකට ගත්තා.

කොට්ඨාස ක්‍රමය ආවාම එහෙම වෙන්නේ නැහැ. කොට්ඨාස ක්‍රමයේදී ජනතාව පක්ෂයක් එක්ක දේශපාලනය කරන්නට කටයුතු කරනවා. ඒක අපි පළාත් පාලන ඡන්දයේදී දැක්කා. ජනතාව එක කණ්ඩායමක් එක්ක නොවෙයි, පක්ෂ එක්ක දේශපාලනය කළා. ජනතාව පක්ෂයක් එක්ක දේශපාලනය කරන තත්ත්වයට පත් කරන්න, ජාතිවාදයෙන් මුදා ගන්න පුළුවන් අවස්ථාවක් විධියටයි මා කොට්ඨාස ක්‍රමය දකින්නේ. හැබැයි පක්ෂ නායකයන් නම් කරන එකෙන් නම් සාධාරණත්වයක් ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක මමත් පිළිගන්නවා. නමුත් පක්ෂ නායකයින්ට නිර්ණායක දීලා, නිර්ණායක එකතු කරලා, ක්‍රියා කරන්න ඕනෑ ආකාරය කියලා කටයුතු කළොත්, අපට මේ හැම දෙයකටම - එහෙම නැත්නම් මෙහෙම වෙන්න ඕනෑ කියන කාරණාව කියන්න - නීතියකට ව්‍යතිරේකයක් හදන්න පුළුවන් කියලා මා හිතනවා. ඉතින් ඒ විධියට මේවා පිළියෙල කර ගත්තොත්, පක්ෂ නායකයින්ට තිබෙන අසීමිත බලය අඩු කරලා, ජනතාවගේ ඡන්ද බලය නිරූපණය වන විධියට ඒ සභා නියෝජනය කරන්න අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. එහෙත් මේ 50 : 50 කියන නිර්ණායකය නම් වෙනස් විය යුතුයි කියන ස්ථාවරයේ මා ඉන්නවා. මම මගේ පෞද්ගලික මතය මේ ප්‍රකාශ කරන්නේ. ඒ මතයේ මා ඉන්නවා.

කමිටු වාර්තාවට අදාළ යෝජනාව ඉදිරියේ දී මේ සභාවට ඉදිරිපත් කරන්නට මේ වන විට කටයුතු සූදානම් කරලා තිබෙනවා. පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව පාර්ලිමේන්තුවට භාර දීලායි තිබෙන්නේ. එම යෝජනාව ඉදිරියේ දී ඉදිරිපත් කරන්නට නියමිතයි. මේ සංශෝධනත් එක්ක පනත් කෙටුම්පත සම්මත කර ගත්තොත්, පළාත් සභා ඡන්දය පවත්වන්නට පුළුවන්. එහෙම නැත්නම් අග්‍රාමාත්‍යවරයා විසින් සර්ව පාර්ශ්වික සමුළුවක් නොවෙයි, පනත ප්‍රකාරව සියලු ජාතීන් නියෝජනය කරන කමිටුවක් පත් කරන්නයි තිබෙන්නේ. ඒ කමිටුව පත් කරලා, ඒ කමිටුවේ නිර්දේශ මත තීරණයක් ගන්නට වෙනවා. ඒක ජනාධිපතිවරයාට ඉදිරිපත් කරලා, ඒ කාර්ය පටිපාටිය ඉදිරියට ගෙන යන්නට කටයුතු කළ යුතු වෙනවා. අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට ජනතාවගේ නියෝජිතභාවය ලබා ගන්නවා වාගේම, රජයක් විධියට සියලු පක්ෂවලට දේශපාලනයේ අයිතිය ලබා දීමටත්- ඒ වාගේම ස්ථාවර ආණ්ඩු, පළාත් පාලන ආයතනයක හරි පළාත් සභාවක හරි- ඇත්තටම මගේ පෞද්ගලික මතය නම් පළාත් සභා ක්‍රමය, පළාත් සභාව කියන එක ඇත්තටම මේ රටට අනවශ්‍ය බරක් බවයි. ඒක මේ රටට ඕනෑ නැති දෙයක්. ඒක මා දරන පෞද්ගලික මතය. නමුත් මේ රටේ එහෙම නීතියක් තිබෙනවා. ඒ නිසා පළාත් සභා ක්‍රමය තුළ යමක් වෙන්න නම්, වැඩක් වෙන්න නම්, ස්ථාවර ආණ්ඩුවක් බිහි වෙන්නට ඕනෑ. ස්ථාවර ආණ්ඩු බිහි වන විධියට මෙය වෙනස් කරගෙන, සංශෝධනය කරගෙන ඉදිරියට ගෙන යන්නට ඉඩකඩ ලබා දීමට මේ පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව විවාදයට ගැනෙන දවසේ අපේ සභාවට බලය පැවරිලා තිබෙනවා. මේ සභාවට එම තීරණය ගන්නට කටයුතු කරන්න පුළුවන් කියන කාරණය සඳහන් කරනවා.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු රාජ්‍ය ඇමතිතුමිය, ඔබතුමියගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. අපි කෑගල්ල වාගේ දිස්ත්‍රික්කයක් ගත්තොත්, කෑගල්ල නගර සභාවේ කොට්ඨාස 12ක් තිබෙනවා. අපි ඒ කොට්ඨාස 12න්, 10ක් දිනුවා. නමුත් මන්ත්‍රී ධුර තිබෙන්නේ අපට 10යි, විපක්ෂයට 10යි වශයෙනුයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ වාගේ ව්‍යාකූල තත්ත්වයක් තිබෙනවා.

විශේෂයෙන්ම මාවනැල්ල වාගේ ආසනයක සමහර මන්ත්‍රීවරුන්ට අනෙක් පැත්තට ඡන්දය දෙන්න කියලා ලක්ෂ 25ක් දෙන බව අපට දැනගන්නට තිබෙනවා. අනෙක් අතට මෙතැන රහස් ඡන්දයක් පවත්වනවා නම්, ඒ රහස් ඡන්දයෙන් පත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී විධියට නොවෙයි. මුදල් මත පත් වෙන ඡන්දයක් තමයි පැවැත්වෙන්නේ. රහස් ඡන්දය පවත්වන එකෙත් යම් සංශෝධනයක් කළොත් හොඳයි කියලා මා හිතනවා. එතකොට කොයි පක්ෂයටද ඡන්දය දීලා තිබෙන්නේ කියලා මිනිසුන් දන්නවා නම්, ඒ අයට ගමට යන්නත් බැහැ. රහස් ඡන්දයක් තියලා ලක්ෂ 25ක් දුන්නොත් අනිවාර්යෙන්ම ඡන්දය දෙනවා. එතැනදී ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ නැහැ කියන එක තමයි මගේ මතය.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

විවෘත ඡන්දයක් තියන්න කියලා අපේ රටේ හැම පක්ෂයකටම තීරණය කරන්න පුළුවන්. රහස් ඡන්දයක් නොතියන්න හැම පක්ෂයක්ම තීරණය කරනවා නම්, කවුද ඡන්දය දෙන්නේ කියන කාරණය හෙළිවෙනවා. ඒ, එක කාරණයක්. මන්ත්‍රීවරු මුදලට අලෙවි වෙනවා නම් ඒ සම්බන්ධයෙන් පක්ෂයක් විධියට විනය ක්‍රියාමාර්ග ගන්නත් පුළුවන්කම තිබෙනවා. මේ මොන දේ කළත් සියයට සියයක් හරියටම හරි වෙන්නේ නැහැ. නීතියක වුණත් අසාධාරණ කොටස් තිබෙනවා. එම නිසා මම හිතන්නේ-

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

සභාපති තෝරන විට මුදල් දුන්නත්, කාටද මුදල් ලැබිලා තිබෙන්නේ කියන එක අපි දන්නේ නැහැ. ඒ අය කාටද ඡන්දය දෙන්නේ කියලා ජනතාව දන්නේ නැති නිසා. ඒකයි මම ඔබතුමියගේ අවධානයට යොමු කළේ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමා, ඒකයි මම කිව්වේ රහස් ඡන්දය නැතිව විවෘත ඡන්දයක් තියන්න මේ පක්ෂ සියල්ලටම අයිතියක් තිබෙනවා කියලා. විවෘත ඡන්දයකට ඉල්ලීමක් කරන්න. විවෘත ඡන්දයක් තියනකොට රහසිගතව කෙරෙන වැරදි වැඩ බොහොම අඩු වෙයි. එවැනි වැරදි ක්‍රියාමාර්ගවල යෙදී සිටින මන්ත්‍රීවරු පක්ෂයකින් ඉවත් කරන්නත් පුළුවන්. මෙම යෝජනාවේ පළාත් සභා ගැන නිබුණාට, පළාත් පාලන ආයතන ගැන නේ කථා කළේ. වැරදි ක්‍රියාමාර්ගවල ඉන්න මන්ත්‍රීවරු ඉවත් කරලා අලුත් මන්ත්‍රීවරු පත් කරන්න පුළුවන්. ඒ වාගේ නීතිමය කරුණු කාරණාවලින් බැඳිලා ඉන්නකොට ඒ අය යම් යම් සීමාවන්ට ලක් වෙනවා. එම නිසා අපි නිවැරදි උපදෙස් ලබා දීලා එම කණ්ඩායම් මෙහෙයවීම සිදු කළ යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.28ට, 2018 මාර්තු මස 23වන සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 5.28மணிக்கு பாராளுமன்றம், 2018 மார்ச் 23, வெள்ளிக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 5.28 p.m. until 10.30 a.m. on Friday, 23rd March, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 259 - இல. 8
Volume 259 - No. 8

2018 මාර්තු 23වන සිකුරාදා
2018 மார்ச் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd March, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

මූල්‍ය ආයතන මුහුණ දී තිබෙන අර්බුදය:
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය:
අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු විනිශ්චයකාරවරුන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත:
සංශෝධන සහිතව දෙවන වර හා තුන්වන වර කියවා සම්මත කරන ලදි.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:
නියම

කල්තැබීමේ යෝජනාව:
විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩල විසින් ආරම්භ කර ඇති අඛණ්ඩ වැඩ වර්ජනය

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

நிதி நிறுவனங்கள் எதிர்நோக்கும் நெருக்கடி:
அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரின் கூற்று

அரசியலமைப்பின் கீழான தீர்மானம்:
பிரதம நீதியரசர் மற்றும் உயர் நீதிமன்ற நீதிபதிகளுக்கான சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல்

தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்):
கட்டளைகள்

ஒத்திவைப்புப் பிரேரணை:
பல்கலைக்கழகங்களில் கல்விசாரா ஊழியர்களின் தொடர் வேலைநிறுத்தம்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

CRISIS FACED BY FINANCE COMPANIES:
Statement by Minister of Public Enterprises and Kandy Development

DETERMINATION UNDER THE CONSTITUTION:
Revision of Salaries and Allowances of Chief Justice and Judges of Superior Courts

ACTIVE LIABILITY MANAGEMENT BILL:
Read a Second, and the Third time, and passed as amended

EXCISE (SPECIAL PROVISIONS) ACT:
Orders

ADJOURNMENT MOTION:
Continuous Strike Action by Non-Academic Staff of Universities

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 මාර්තු 23වන සිකුරාදා
2018 மார்ச் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd March, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස්විය
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

(1) Mr. Speaker, I present the Annual Report of the Board of Investment of Sri Lanka for the year 2015.

I move that this Report be referred to the Sectoral Oversight Committee on International Relations.

(2) I present the Order made by the Minister of Development Strategies and International Trade under Section 3(4) of the Strategic Development Projects Act, No. 14 of 2008 and published in the

[ගරු මලික් සමරවික්‍රම මහතා]

Gazette Extraordinary No. 2049/59 of 15th December, 2017 amended by the Gazette Extraordinary No. 2062/47 of 16th March, 2018.

I move that this Order be referred to the Sectoral Oversight Committee on Economic Development.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව එකඟ විය.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දුමින්ද දිසානායක මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) දර්ගා නගරය, කුට්ටිවැලිගොඩ, "උදය" යන ලිපිනයෙහි පදිංචි ජී.අයි.ඩී. රාජිත මධුසංක යහම්පත් මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(2) අලවිව, දොඩම්කුඹුරවත්ත, අංක 344 දරන ස්ථානයෙහි පදිංචි මතුගමගේ පේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අනුරාධපුර, පණ්ඩුලගම, අංක 45 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. කසුන් එරංග ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-692/'16-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2-1229/'16-(2), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අපනයන සැකසුම් කලාප නවීකරණය : ක්‍රියාමාර්ග
ஏற்றுமதி தயாரிப்பு வலயங்களின் நவீனமயப்படுத்துகை : நடவடிக்கை
UPGRADING OF EXPORT PROCESSING ZONES: ACTION TAKEN

1425/'16

3. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) 2016 අය වැයෙහි අංක 200 යෝජනාවට අනුව අපනයන සැකසුම් කලාප නවීකරණය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) අප රටෙහි දැනට ක්‍රියාත්මක අපනයන සැකසුම් කලාපයන්හි ප්‍රගතිය කවරේද;

(iii) නව අපනයන සැකසුම් කලාප ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මැදිහත් වී සිටින්නේද;

(iv) වර්ෂ 2000 සිට 2016 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කාර්ය සාධනය කවරේද;

(v) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අපිවිරුත්ති උපාය මාර්ගයන් සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා විසින් පිළිතුරු දෙනු ලබන්නේ,

(අ) (i) 2016 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 200 වැනි ව්‍යවස්ථාවට අනුව අපනයන සැකසුම් කලාප නවීකරණය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳව;

(ii) අප රටෙහි දැනට ක්‍රියාත්මක අපනයන සැකසුම් කලාපයන්හි ප්‍රගතිය පිළිබඳව;

(iii) නව අපනයන සැකසුම් කලාප ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මැදිහත් වී සිටින බවත්;

(iv) වර්ෂ 2000 සිට 2016 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කාර්ය සාධනය පිළිබඳව;

(v) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරුන් පිළිබඳව;

(ආ) නොවන බවත්

(iii) புதிய ஏற்றுமதி தயாரிப்பு வலயங்களை ஆரம்பிப்பதற்கு இலங்கை முதலீட்டுச் சபை தலையிட்டுள்ளதா என்பதையும்;

(iv) 2000ஆம் ஆண்டு தொடக்கம் 2016ஆம் ஆண்டுவரை இலங்கை முதலீட்டுச் சபையின் செயலாற்றுகை யாதென்பதையும்;

(v) இலங்கை முதலீட்டுச் சபையின் பணிப்பாளர் யார் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House -

(i) the actions taken to upgrade the export processing zones as per Proposal No. 200 of the 2016 Budget;

(ii) the progress of the export processing zones which are operating in our country at present;

(iii) whether the Board of Investment of Sri Lanka has intervened in commencing new export processing zones;

(iv) the performance of the Board of Investment of Sri Lanka during the period from the year 2000 up to 2016; and

(v) the Directors of the Board of Investment of Sri Lanka?

(b) If not, why?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

Hon. Speaker, the Answer is as follows:

(a) (i) The 2016 Budget Speech and the subsequent Proposal made in the 2017 Budget proposed to establish private sector managed export processing zones with a view to improving Sri Lanka's competitiveness in attracting more FDIs. While managing 14 zones, it is prudent for the BOI to explore new models of highly performing zones with greater efficiency. In the 2017 Budget, Rs. 500 million was allocated to initiate infrastructure for establishment of a new EPZ with Public-Private Partnership. Initial steps have been taken to develop an Industrial Park at Millaniya in the Bandaragama Electorate in the Kalutara District with an experienced overseas zone developer, Rojana Industrial Park Public Company Limited from Thailand, a company engaged in the development of privately operated parks and zones. They operate about six or seven zones in Thailand. The necessary infrastructure such as electricity, water, access roads et cetera, up to the boundary of the zone, will be provided by the Government. The Ceylon Electricity Board - CEB - the Road Development Authority - RDA- and the National Water Supply and Drainage Board - NWS&DB - have already commenced development of infrastructure facilities and Rs. 336.7 million has been incurred in 2017. The 2018 Budget allocated a further Rs. 2,900 million for that Project.

Further, similar support to be extended to the proposed Industrial Zones in Bingiriya and Charley Mount Estate in Weligama. But the zone development and management models are yet to be finalized and a suitable investor has to be identified. The BOI, with the relevant line agencies and the newly established PPP - Public-Private Partnership - Unit of the Ministry of Finance collaborates in facilitating such ventures.

(ii) After commencing the Katunayake Export Processing Zone under the purview of Greater Colombo Economic Commission in 1978, 11 Export Processing Zones - EPZs- and 3 Industrial Parks -IPs- have been established. Export Processing Zones are located at Katunayake, Biyagama, Koggala, Horana, Seethawaka, Mawathagama, Polgahawela, Mirigama, Wathupitiwala, Mirijjawila and Wagawatta. Industrial Parks are located at Malwatta, Pallekele and Wagawatta.

As at 31st December 2017, there are 265 commercially operated industries within 14 Export Processing Zones - EPZs- and Industrial Parks - IPs - ruling under the purview of BOI and 137,868 persons are employed within these EPZs/IPs. As compared to the last few years, overall employment in these 14 Zones has progressively improved. The total land extent available in the 14 Zones is 3,641 acres, out of which 2,013 acres, about 55 per cent, have been allocated as industrial lands. Out of the total industrial land extent, 1,600 acres which represents 80 per cent has been utilized for industrial purposes.

The major industries in operation are garments and textile, gloves, footwear, electronic equipment, gems and jewellery, pharmaceutical products, tobacco products, printing industries, textile accessories and food processing. During the year 2016, total export value generated through Export Processing Zones amounted to US Dollars 2,658 million. The Board of Investment of Sri Lanka has spent Rs.344 million for infrastructure development in commercially operated Export Processing Zones in 2017.

(iii) Yes.

[ගරු මලික් සමරවික්‍රම මහතා]

(iv) I table * Attachment 1.

If you want the figure for the year 2017 which is not here, it is US Dollars 1.7 billion from the FDIs. - [*Interruption.*] No, No. Money received. Total FDI received is US Dollars 1.7 billion, and in the non BOI sector, I am told there is another US Dollars 200 million. The Central Bank is finalizing the figures.

(v) Following members have been appointed to the Board of Directors with effect from following mentioned dates.

		Date of Appointment
Mr. Dumindra Ratnayaka	Chairman	18.07.2017
Mr. Mangala Prema Banda Yapa	Board Member	18.07.2017
Mr. Ajit Gunewardene	Board Member	18.07.2017
Mr. Thilak Sagara Jayasinghe Gunawardana	Board Member	27.07.2017
Mr. Hemantha Wickramasinghe	Board Member	27.07.2017

(b) Does not arise.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, නායකත්ව ආදර්ශයක් දෙමින් මේ ප්‍රශ්නයට උත්තර දීම ගැන ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අය වැය යෝජනාවල කියලා තිබෙන්නේ, මෙය අපේ රටේ මෙතෙක් පැවති නිදහස් වෙළෙඳ කලාපවලට, අපනයන සැකසුම් කලාපවලට වඩා වෙනස් ක්‍රමවේදයක් යටතේ පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය ඒකාබද්ධව අරඹනු ලබන අපනයන සැකසුම් කලාප යෝජනා ක්‍රමයක් ලෙසයි.

ගරු ඇමතිතුමනි, මෙහිදී රජය ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 300, මිලියන 900 යනාදී වශයෙන් ඔබතුමා සඳහන් කළා. මේවායේ මංමාවත්, විදුලිය, ජල බස්නා ජලාපවහන ක්‍රම වැනි යටිතල පහසුකම් ඇති කිරීම සඳහා පෞද්ගලික අංශයෙන් ආයෝජනය කළ ආයෝජකයන් කවුද කියලා පසුව හෝ වාර්තාවක් දෙන්න ඔබතුමාට පුළුවන්ද? ඒ වාගේම, ඒ අපනයන සැකසුම් කලාප ගොඩනැංවීම සඳහා පෞද්ගලික අංශය කොයි වාගේ දායකත්වයක්ද දෙන්නේ කියන එක මේ ගරු සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

මම මුලිනුත් කිව්වා වාගේ බණ්ඩාරගම ආසනයේ මිල්ලනියේ අපනයන සැකසුම් කලාපය පිළිබඳව තමයි දැනට සාකච්ඡා කර ගෙන යන්නේ. මිල්ලනියේ Industrial Park එක සඳහා අපි අක්කර 400ක් විතර develop කරන්න තමයි දැන් කථා කරගෙන යන්නේ. මේ විධියේ privately managed zones තායිලන්තයේ තිබෙනවා. අපි joint venture එකක් හැටියට මේ කටයුතු කරන්නේ කොහොමද කියලා දැන් සාකච්ඡා කරගෙන යනවා. කොහොමටත් විදුලිය, වතුර වාගේ දේවල් ආණ්ඩුවෙන්, අපේ මුදලින් දෙන්න ඕනෑ. ඒවා අපේ මුදලින් දෙන්න ඕනෑ. හැබැයි, zone එක develop කරන කොට අපි කල්පනා කරන්නේ, ඒ ඉඩමේ වටිනාකම අපේ investment එක හැටියට අරගෙන, ඒ ගොල්ලන්ට යටිතල පහසුකම් develop කරන්න කියන්නයි. එහෙම තමයි දැනට සාකච්ඡා කරගෙන යන්නේ. තවම ඒ කටයුතු finalize වෙලා නැහැ. ඒගොල්ලන්ගේ proposal එකක් එන තෙක් අපි බලාගෙන ඉන්නේ. මම හිතන විධියට මාසයක් තුළ අපට ඒක කර ගන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හොරණ ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමට යෑමේදී ඔබතුමා මුහුණ පෑ ගැටලුව ඔබතුමා දන්නවා නේ. ඒ නිසා රජයේ තක්සේරුකරුගෙන් හෝ පිළිගත් වටිනාකමක් ලබා ගෙන, ඒ ආයෝජනයේ රජයේ කොටස වැඩි කර ගැනීම සඳහා ඔබතුමා මැදිහත් වෙයි කියලා අපි හිතනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම තමයි බලාපොරොත්තු වෙන්නේ. අපි ආණ්ඩුවේ Chief Valuerගෙන් තමයි තක්සේරුව ගන්නේ. හොරණ ඉඩම ගන්න කොට වුණත් එහෙම තමයි ගත්තේ. පිටින් ගත්තේ නැහැ. යටිතල පහසුකම් සංවර්ධනය කර, පාරවල් එහෙම හැදුවාට පස්සේ එහි වටිනාකම වැඩි වෙනවාය කියලා අපි හිතනවා. ඒවා develop කළාට පසුව තක්සේරුව සඳහා දමන්න කියලායි අපි හිතුවේ. එතකොට ඒ ඉඩමේ value එකත් ඊට වඩා වැඩි වෙයි කියලා අපි හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, BOI එක පිළිබඳව ඔබතුමාගේ වාර්තාව ගැන මම දන්නවා. අද රට තුළ ඉතා විශාල ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා. 350,000ක් විතර දේශීය පාවහන් නිෂ්පාදකයෝ ඉන්නවා. ලංකාව පාවහන් නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. එහෙම තිබෙන තත්ත්වයක් තුළ BOI හිටපු සභාපතිතුමා මහා පරිමාණ ඉන්දියානු සමාගමකට දේශීය වෙළෙඳ පොළට පාවහන් සපයන්න පුළුවන් වෙන විධියට අනුමත කරලා තිබෙන ව්‍යාපෘතිය ගැන මොකක්ද කරන්නේ?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම නොවෙයි ඒක වෙලා තිබෙන්නේ. අපේ නීතිය අනුව තිබෙනවා, ඕනෑම කෙනෙකුට ඩොලර් ලක්ෂ දෙකහමාරක -US Dollars 250,000- invest කෙරුවොත් මෙහේ ඇවිල්ලා industry එකක් කරන්න පුළුවන් කියලා. දැන් අපි මේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගැන සාකච්ඡා කරලා තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒ, සමාගමට පාවහන් නිෂ්පාදනය කරන්න දීලා තිබෙන්නේ මිලියන දෙකක් පමණයි. බලන කොට ඒක පොඩි ප්‍රමාණයක්. දැනටමත් පිට රටින් පාවහන් මිලියන තුනක් import කරනවා. BOI එකෙන් ඉස්සෙල්ලා දීලා තිබෙන්නේ මිලියන දෙකක් විතරක් මෙහේ නිෂ්පාදනය කරන්න කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කරගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඇයි, ඔබතුමා මේ දේශීය පාවහන් නිෂ්පාදකයන් සියලු දෙනාත් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ගේ කර්මාන්තයට ආරක්ෂාවක් සැලසෙන වැඩ පිළිවෙළක් යොදන්නේ නැත්තේ? ඒකට විශාල විරෝධයක් රට ඇතුළේ තිබෙන නිසායි මම මේ ඉල්ලීම කරන්නේ. දේශීය නිෂ්පාදකයෝ එක්කත් මේ ගැන කථා කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මට තේරෙනවා. අප මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. දැනටත් සාකච්ඡා කරගෙන යනවා. ඒ වාගේම අපි තීරණයක් ගෙන තිබෙනවා, මින් ඉදිරියේදී ඒ Act එක ගැනත් සාකච්ඡා කරලා එය සංශෝධනය කරන්න ඕනෑය, එහෙම නැත්නම් එය අවලංගු කරන්න ඕනෑය කියා. ඒකත් කරනවා. මින් ඉදිරියටත් මේ විධියේ ඒවා දෙන කොට Ministry of Industry and Commerce එකෙන් අනුමැතිය ලබාගෙන, මෙහේ නිෂ්පාදකයන් සමඟ සාකච්ඡා කරලා කටයුතු කරන්න තමයි අප බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1665/'17- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මෙය, මේ ප්‍රශ්නය අසන පළමුවන වාරයද; දෙවන වාරයද?

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
පළමුවන වාරයයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි 5 ක් පමණ විවේක සඳහා කථානායකතුමා විසින් සභා මණ්ඩපය භාර ගන්නා ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -2005/'17- (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි 5 ක් පමණ විවේක සඳහා කථානායකතුමා විසින් සභා මණ්ඩපය භාර ගන්නා ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -2112/'17- (1) ගරු ඩග්ලස් දේවානන්දා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -2136/'17- (1) ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -2152/'17- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි 5 ක් පමණ විවේක සඳහා කථානායකතුමා විසින් සභා මණ්ඩපය භාර ගන්නා ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 2183/'17 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 2293/'17 - (1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා විදේශගත වී සිටින බැවින් එතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 2325/'17 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය : වැටුප් සහ දීමනා
இலங்கை உரக் கம்பனியின் தலைவர் மற்றும் பணிப்பாளர் சபை : சம்பளங்கள் மற்றும் கொடுப்பனவுகள்
CHAIRMAN AND BOARD OF DIRECTORS OF CEYLON FERTILIZER COMPANY LTD.: SALARIES AND ALLOWANCES

2340/'17

12. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත ලංකා පොහොර සමාගමේ වර්තමාන සභාපතිවරයාගේ නම කවරේද;

(ii) එම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) වර්තමාන සභාපතිවරයා විසින්, එම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව, වෙනත් වෘත්තීය සුදුසුකම් සපුරා තිබේද;

(iv) එසේ නම්, ඒ කවරේද;

(v) සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(vi) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vii) සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ලබන වැටුප් සහ දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட இலங்கை உரக் கம்பனியின் தற்போதைய தலைவரின் பெயர் யாதென்பதையும்;

(ii) அந்தப் பதவிக்குரிய கல்வித் தகைமைகள் யாவை என்பதையும்;

(iii) தற்போதைய தலைவர் அப்பதவிக்குரிய கல்வித் தகைமைகளுக்கு மேலதிகமாக வேறு தொழில் சார் தகைமைகளைப் பூர்த்தி செய்துள்ளாரா என்பதையும்;

(iv) ஆமெனின், அவை யாவை என்பதையும்;

(v) வரையறுக்கப்பட்ட இலங்கை உரக் கம்பனியின் பணிப்பாளர் சபை அங்கத்தவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) பணிப்பாளர் சபை அங்கத்தவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(vii) தலைவர் மற்றும் பணிப்பாளர் சபையினர் பெறுகின்ற சம்பளங்கள் மற்றும் கொடுப்பனவுகள் தனித்தனியாக யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state -

(i) the name of the present chairman of the Ceylon Fertilizers Company Ltd;

(ii) the educational qualifications in respect of aforesaid post;

(iii) whether the present chairman has accomplished other professional qualifications other than the qualifications that are pertinent for aforesaid post;

(iv) if so, as to what they are;

(v) the number of members in the board of directors of the Ceylon Fertilizers Company Ltd;

(vi) the names and addresses of the members of the director board; and

(vii) separately, of the salaries and the allowances that the chairman and the board of directors receive?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ගොතටු වඩුගේ රුවිත් රෝෂණ.
(ii) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් විදේශ විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු වීම හෝ පිළිගත් වෘත්තීය සුදුසුකම්.
(iii) ඔව්.
(iv) ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය KEISIE අන්තර්ජාතික විශ්වවිද්‍යාලය, කොරියාව. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව - Australian College of Business and Technology මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාව - ජපානය.
(v) සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් දෙදෙනකු (02) සමඟ සාමාජික ගණන හතකි.
(vi)

අනු අංකය	නම	තනතුර	ලිපිනය
01	ගොතටු වඩුගේ රුවිත් රෝෂණ	සභාපති	අංක 51/9B, 9වෙනි පටුමග, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.
02	මාධව සංජීව වත්තේගම	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	අංක 07, නිදහස් වත්‍රස්‍රය, කොළඹ - 07.
03	ගොන්ගොඩගම ආරච්චිගේ ක්‍රිශාන්ත ජයවර්ධන	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	අංක 48/6A, පතිරගොඩ පාර, පමුණුව, මහරගම
04	මහවිදානලාගේ ඉන්ද්‍රජිත් උපුල් පීරිස්	අධ්‍යක්ෂ	අංක 351 K, පන්නිපිටිය පාර, තලවතුගොඩ.
05	හේමක ලසිත් බාලසූරිය	අධ්‍යක්ෂ	අංක 19/8, බෝගහහේන පාර, බත්තරමුල්ල.
06	දිසානායක කිරිබණ්ඩාර මුහන්දිරම්ගේ රංජිත් කුමාරසිරි	අධ්‍යක්ෂ (නිල බලයෙන්)	අංක 21/12 B, බණ්ඩාරවත්ත, ගම්පහ.
07	ජූව මණ්ඩලගේ ශිරන්ති ධම්මිකා රත්නායක	අධ්‍යක්ෂ (නිල බලයෙන්)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ - 01.

(vii)

අනු අංකය	නම	තනතුර	මාසික දීමනාව
01	ගොතටු වඩුගේ රුවිත් රෝෂණ	සභාපති	මාසික වැටුප රු.100,000/- ඉන්ධන දීමනාව රු.18,700/-
02	මාධව සංජීව වත්තේගම	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	මාසික වැටුප රු.75,000/- ඉන්ධන දීමනාව රු.16,500/-
03	ගොන්ගොඩගම ආරච්චිගේ ක්‍රිශාන්ත ජයවර්ධන	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	මාසික වැටුප රු.75,000/- ඉන්ධන දීමනාව රු.17,550/-
04	මහවිදානලාගේ ඉන්ද්‍රජිත් උපුල් පීරිස්	අධ්‍යක්ෂ	මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා රු.10,000/-ක දීමනාවක්.
05	හේමක ලසිත් බාලසූරිය	අධ්‍යක්ෂ	මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා රු.10,000/-ක දීමනාවක්.
06	දිසානායක කිරිබණ්ඩාර මුහන්දිරම්ගේ රංජිත් කුමාරසිරි	අධ්‍යක්ෂ	මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා රු.10,000/-ක දීමනාවක්.
07	ජූව මණ්ඩලගේ ශිරන්ති ධම්මිකා රත්නායක	අධ්‍යක්ෂ	මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා රු.10,000/-ක දීමනාවක්.

(ආ) අදාළ නොවේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු ඇමතිතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් නේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න. අපි එම ප්‍රශ්න ගරු ඇමතිතුමාට යොමු කරන්නම්.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දැන් මෙතැනදී සභාපතිවරයාට අදාළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ඔබතුමා ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ සුදුසුකම්වලින් මට ඇහුණු විධියට, මට තේරුණු විධියට ජපානයේ මෝටර් කාර්මික පාඨමාලාවක් සහ කොරියාවේ තවත් මොනවාද උපාධියක් ගැනයි කියැවුණේ. විශේෂයෙන්ම පොහොර සම්බන්ධ කටයුත්ත බොහොම විද්‍යානුකූල කටයුත්තක්. එය රටට ගැළපෙන ආකාරයට යල, මහ දෙකන්නයටම හරියට ලබා දිය යුතුයි. පසුගිය කන්න කීපයකම රජයට විශාල අපවාදයන්ට මුහුණ දෙන්න සිද්ධ වුණේ මෙවැනි අදක්ෂ සභාපතිවරුන් පත් කිරීම තුළ ඇති වූ විපතේ ප්‍රතිඵලයක් හැටියට නේද? ගොවි ජනතාවට අවශ්‍ය කරන පොහොර ටික කලට වේලාවට ගෙන ඒමට නොහැකිවූයේත්, ඒ වාගේම පොහොර හිඟයක් රටේ ඇතිවූයේත්, ඒ තුළින් රජය විශාල අප්‍රසාදයට ලක්වීමට සිදුවූයේත් මෙවැනි තනතුරුවලට සුදුසුකම් නොමැති පුද්ගලයින් පත් කිරීම නිසා කියන එක ඔබතුමා පිළිගන්නවා ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "එම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් කවරේද?" කියලයි. එම තනතුරට ඉල්ලා තිබෙන සුදුසුකම් තමයි, "ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් විදේශ විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම හෝ පිළිගත් වෘත්තීය සුදුසුකම්". එතුමා ඒක සපුරා තිබෙනවා.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පොහොර සහ රසායනික ද්‍රව්‍ය සම්බන්ධව බොහෝ විට සාකච්ඡාවට ගැනෙන මේ වෙලාවේ රට තුළ යම් යම් ආකාරයේ මෙවැනි ව්‍යාකූල තත්ත්වයක් ඇති වන ආකාරයට කටයුතු කිරීමත්,- ඒ වාගේම, පසුගිය දිනක රජයේ නායකයින් ප්‍රකාශ කරපු ආකාරයට එන වගා කන්නයේදී හෝ පොහොර සහනාධාරය ඒ ආකාරයෙන්ම ගොවියාට ලැබෙන්න සලස්වනවා ද? ජනමාධ්‍යවලින් කියන ආකාරයට වී වගාවට යොදන පොහොර මිටියක් රුපියල් 500කටත්, වෙනත් භෝගවලට

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

යොදන පොහොර මිටියක් රුපියල් 1,500කටත් ලබා දෙන බව පවසනවා. ඒක ස්ථිර වශයෙන්ම ලබා දෙනවාද කියන ප්‍රකාශය මම ඔබතුමාගෙන් අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ විධියට ලබා දෙන්න අපි තීන්දුවක් අරගෙන තිබෙනවා.

අමාත්‍ය සරත් ෆොන්සේකා මහතා : ෆීල්ඩ් මාර්ෂල්වරයෙකු ලෙස දැරිය හැකි බලතල

அமைச்சர் சரத் பொன்சேகா : 'பீல்ட் மார்ஷல்'க்குரிய அதிகாரங்கள்

MINISTER SARATH FONSEKA: POWERS GRANTED AS FIELD MARSHAL

2369/'17

13. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍ය සරත් ෆොන්සේකා ෆීල්ඩ් මාර්ෂල්වරයෙකු ලෙස මේ වන විටත් ශ්‍රී ලංකා යුද හමුදාවට අනුයුක්තව සිටින්නේද;

(ii) ඔහුට සම්බන්ධ විය හැකි හමුදා ක්‍රියාකාරිත්වයේ කටයුතු කවරේද;

(iii) ඔහුට හමුදා නිළ ඇඳුමින් සහභාගී විය හැකි කටයුතු කවරේද;

(iv) හමුදා කටයුතුවලදී ඔහුට ලැබෙන හෝ ලැබිය හැකි බලතල කවරේද;

(v) හමුදාවේ නිලධරයෙකු ලෙස ඔහුට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක් ඉසිලිය හැකිද;

(vi) හමුදාවේ නිලධරයෙකු ලෙස සිටිමින් ඔහුට අමාත්‍ය ධුරයක් දැරිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சர் சரத் பொன்சேகா பீல்ட் மார்ஷல் என்ற வகையில் தற்பொழுதும் இலங்கை இராணுவத்திற்கு இணைப்புச் செய்யப் பட்டுள்ளாரா என்பதையும்;

(ii) இவர் பங்குபற்றக்கூடிய இராணுவ செயற்பாட்டு நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இவர் இராணுவ சீருடையில் பங்கேற்கக்கூடிய நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) இராணுவ நடவடிக்கைகளின்போது இவருக்குக் கிடைக்கின்ற அல்லது கிடைக்கக்கூடிய அதிகாரங்கள் யாவை என்பதையும்;

(v) இராணுவ அலுவலர் என்ற வகையில் இவர் பாராளுமன்ற உறுப்பினர் பதவியை வகிக்க முடியுமா என்பதையும்;

(vi) இராணுவ அலுவலராக இருக்கின்ற நிலையில் இவர் அமைச்சர் பதவியை வகிக்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether Minister Sarath Fonseka even at present is attached to Sri Lanka Army in the capacity of a Field Marshal;

(ii) the type of activities relating to military affairs in which he can be involved;

(iii) the nature of the functions that he can carry out wearing his uniform;

(iv) the powers that is granted to him or that can be given to him in military affairs;

(v) whether he has the right to hold the membership of Parliament while being a military officer; and

(vi) whether he has the right to hold a ministerial portfolio while being a military officer?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.

(ii) හමුදා ක්‍රියාකාරිත්වයේ කටයුතුවලට සම්බන්ධ වීමට ඔහුට බලතල නොමැත.

(iii) ආරාධනා කරනු ලබන උත්සව අවස්ථා සඳහා නිල ඇඳුමින් සහභාගි විය හැකිය.

(iv) හමුදා කටයුතු සඳහා සම්බන්ධ වීමට ඔහුට බලතල නොමැත.

(v) විශ්‍රාමික හමුදා නිලධාරියකු බැවින් අදාළ නොවේ.

(vi) විශ්‍රාමික හමුදා නිලධාරියකු බැවින් අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අපේ ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමාට පාර්ලිමේන්තුවේ උත්සව අවස්ථාවකට නිල ඇඳුම ඇඳගෙන සහභාගි වීමට අයිතිය තිබෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම හිතන විධියට ඔබතුමා ඒ කාරණය අපේ ගරු කථානායකතුමාගෙන් ඇහුවා නම් හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා දුන් පිළිතුරේදී කිව්වා, "ආරාධනා කරනු ලබන උත්සව අවස්ථා සඳහා නිල ඇඳුමින් සහභාගි විය හැකිය." කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ආරාධනා කරන උත්සව අවස්ථා සඳහා එතුමාට නිල ඇඳුමින් සහභාගි වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවට එන එක ගැන; මන්ත්‍රීවරුන්ට අදින්න පුළුවන් ඇඳුම් පිළිබඳව යම් නිර්ණායකයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන සොයා බලලා මට ඔබතුමාට කියන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා මේ ගැන අපිට තීරණයක් දුන්නොත් හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අහන්නේ පාර්ලිමේන්තුවට පැමිණෙන විට අඳින ඇඳුම සම්බන්ධව නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පාර්ලිමේන්තුව පිළිගත් ඇඳුම් මොනවාද කියලා තිබෙනවා නේ. අනික් කාරණය තමයි, පාර්ලිමේන්තුවේ උත්සව තිබෙනවා. ඒ අවස්ථාවලදී හෝ ඔබතුමාගේ තීරණයක් අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පුළුවන් වුණොත් මම අදම ඒ ගැන ඔබතුමා දැනුවත් කිරීමට උත්සාහ කරන්නම්.

තැලසීමියා රෝගීන් : කුරුණෑගල දිස්ත්‍රික්කය
தலசீமியா நோயாளிகள் :குருநாகல் மாவட்டம்
THALASSEMIA PATIENTS: KURUNEGALA DISTRICT

2397/'17

14.ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) වයඹ පළාත තුළ තැලසීමියා රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර සිදු කරනු ලබන රෝහල් කවරේද;

(iv) එම රෝගයට අවශ්‍ය ප්‍රතිකාර පහසුකම් අනෙකුත් රෝහල් සඳහාද ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

(v) එම රෝගීන් සඳහා ශල්‍යාගාරයක් සහ ජාන බැංකුවක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිබේද;

(vi) මෙම රෝගීන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර හා වෛද්‍ය පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டிலிருந்து இற்றைவரை குருநாகல் மாவட்டத்தில் பதிவாகிய தலசீமியா நோயாளிகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி நோயாளிகள் பதிவாகிய பிரதேச செயலாளர் பிரிவுகள் யாவை;

(iii) வடமேல் மாகாணத்தில் தலசீமியா நோயாளி களுக்கு அவசியமான சிகிச்சைகள் அளிக்கப் படுகின்ற வைத்தியசாலைகள் யாவை;

(iv) மேற்படி நோய்க்கு அவசியமான சிகிச்சை வசதிகளை ஏனைய வைத்தியசாலைகளுக்கும் வழங்க அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை கள் யாவை;

(v) இந்த நோய்க்கு இரையானவர்களுக்கான சத்திர சிகிச்சைக் கூடமொன்றும் மரபணு வங்கி யொன்றும் குருநாகல் மாவட்டத்தில் உள்ளதா;

(vi) இந்த நோயாளிகளுக்கு அவசியமான சிகிச்சை களையும் மருத்துவ வசதிகளையும் வழங்க அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) the number of Thalassemia patients reported from Kurunegala District from the year 2010 to date ;

(ii) the Divisional Secretary's divisions from which the said patients have been reported;

(iii) the hospitals where treatments for Thalassemia patients are available within the North Western Province;

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

(iv) the steps that will be taken by the Ministry to extend the Thalassemia treatment facilities to other hospitals as well;

(v) whether an operation theatre and a gene bank is located in the Kurunegala District to facilitate the Thalassemia patients; and

(vi) the steps taken by the Ministry to provide the treatments and medical facilities required by these patients?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 665කි. (හයසීය හැට පහකි.)

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම රෝගීන් වාර්තා වී ඇත.

(iii) පළාත් මහ රෝහල, කුරුණෑගල

මූලික රෝහල, කුලියාපිටිය

දිස්ත්‍රික් මහ රෝහල, හලාවත

මූලික රෝහල, පුත්තලම

මීට අමතරව නිකවැරටිය, දඹදෙනිය, ගල්ගමුව සහ මාරවිල රෝහල්වලද මේ සඳහා පහසුකම් සපයා ඇත.

(iv) පළාතේ ඇති සියලුම මූලික රෝහල්වල මෙම රෝගීන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට පහසුකම් සපයා ඇත.

පළාත තුළ මූලික රෝහලක් ලෙස වැඩිදියුණු කරන රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ.

(v) නැත.

(vi) රුධිරය ලබා දීම.

රුධිරය ලබා දීම මඟින් ඇති වන සංකූලතා වැළැක්වීමට විශේෂිත වූ පරීක්ෂණ සිදු කිරීම.

අදාළ රෝහල්වලට අවශ්‍ය ඖෂධ නොකඩවා ලබා දීම.

යකඩ නික්ෂේපණය සඳහා අවශ්‍ය වන ඖෂධ හිඟයකින් තොරව ලබා දීම.

තැලසීමියා නික්ෂේපණ යන්ත්‍ර රෝගීන්ට ලබා දීම.

දැනට අපි මේ යන්ත්‍ර ඔක්කොම රෝගීන්ට නොමිලේ ලබා දීලා තිබෙනවා.

ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් සියලුම රෝහල්වලට පත් කිරීම.

කුරුණෑගල රෝහලේ තැලසීමියා ඒකකය නවීකරණය කිරීම.

මීට අමතරව මෙම රෝගීන්ට අන්තරා සර්ග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහාය, හෘද විශේෂඥවරුන්ගේ සහාය ලබා දීමට කටයුතු කිරීම.

තැලසීමියා රෝගය සඳහා වැඩි පහසුකම් ඇති මධ්‍යස්ථාන තවදුරටත් වැඩි කිරීමට ක්‍රියා කරන අතර, අඩු පහසුකම් ඇති මධ්‍යස්ථානවල තත්ත්වය තවත් ඉහළ දැමීමට අවශ්‍ය වන උපකරණ සහ මානව සම්පත් ලබා දීමට කටයුතු කිරීම.

ඇට මිදුලු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට මේ වනවිට මහනුවර ශික්ෂණ රෝහල තුළ මුල්ගල් තබා ඇති අතර, එහි ජාන බැංකුවක් ආරම්භ කිරීමටද බලාපොරොත්තු වේ.

තැලසීමියා රෝගීන් ඇති වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව පුරා තැලසීමියා රෝගී වාහකයන් හඳුනා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

එහි මූලික පියවරක් වශයෙන් සියලු පාසල්වල 10 වසර අධ්‍යාපනය ලබන සියලුම දරුවන් රුධිර පරීක්ෂාවට ලක් කිරීම.

රෝහල්වල ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණෙන රෝගීන්ගේ රුධිර වාර්තා පරීක්ෂා කර බලා, ඔවුන්ට තැලසීමියා රෝගය වැළඳීමේ අවදානමක් පවතී නම්, එම රෝගීන් දැනුවත් කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු ඇමතිතුමනි, මෙම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ලංකාවේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරුන් අතර විශේෂයෙන් ඔබතුමා ඉතාම විශිෂ්ට සේවයක් කරනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන් උනන්දුවක් දක්වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ -අනුරාධපුර දිස්ත්‍රික්කයට පසුව වැඩිම තැලසීමියා රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වෙන දිස්ත්‍රික්කයක් තමයි කුරුණෑගල දිස්ත්‍රික්කය. -මීට ඉහත අවස්ථාවක තැලසීමියා රෝගීන් වෙනුවෙන් වැඩිදුර ප්‍රතිකාර සඳහා රෝහලක් ඉදිකිරීමට මුල්ගල තබනු ලැබුවා. ඒක කළේ අපේ මේ රජයෙන් නොවෙයි. හැබැයි, ඒ මුල්ගල තවම එහෙමම තිබෙනවා. විශේෂයෙන්ම අනුරාධපුර, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල සිටින රෝගීන්ගේ පහසුව සඳහා එවැනි රෝහලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු අර කලින් මුල්ගල තබන ලද තැනින්ම හෝ ආරම්භ කර ඉදිරි පියවරක් තබන්න පුළුවන්ද කියලා මා අසා සිටිනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය ගැන හොඳින් අධ්‍යයනය කර බැලුවා. තැලසීමියා රෝගීන්ට අවශ්‍ය විශේෂ ඒකකය හදනවා වාගේම, ඒකට අවශ්‍ය අනෙක් සේවා ගැනත් බලන්න ඕනෑ. ඒකට අවශ්‍ය අනෙක් විශේෂඥ සේවා සියල්ලක්ම තිබෙන්නේ මහනුවර. තැලසීමියා කවයත්, අපේ වෛද්‍යවරු සියලුදෙනාත්, මමත් එකතු වෙලා මේ සම්බන්ධයෙන් රැස්වීමක් පැවැත්වුවා. එතැනදී තීන්දු කළා, මෙම ඒකකය සෑදිය යුත්තේ මහනුවර මිසක්, කුරුණෑගල නොවෙයි කියලා. කුරුණෑගල හැදුවොත් අනෙක් පහසුකම් ලැබෙන්නේ නැහැ. මහනුවර රෝහල, ශික්ෂණ රෝහලක්. එතැන සියලු පහසුකම් තිබෙනවා. එතැන තමයි තැලසීමියා විශේෂ ඒකකය හදන්නේත්. තැලසීමියා විශේෂ ඒකකය හදලා වැඩ අවසන් කර, ඔක්තෝබර් මාසය වෙනකොට ලබා දෙනවා කියලා

මට පොරොන්දු වෙලා තිබෙනවා. ඒක තට්ටු අටක ගොඩනැඟිලි සංකීර්ණයක්. එතැන ශල්‍යාගාරය, දැඩි සත්කාර ඒකක යනාදි සියල්ල තිබෙනවා.

අපි එතැනින් ඇට මිදුලු බද්ධ කිරීම ලංකාවේ ප්‍රථම වරට ආරම්භ කරනවා. මේක තමයි ස්ථිර විසඳුම. ඇට මිදුලු බද්ධ කිරීම සිදු නොවන තාක්, දරුවෝ මිය යනවා. අද සල්ලි තිබෙන කෙනාගේ දරුවා ඉන්දියාවට අරගෙන ගිහින් ලක්ෂ 66ක් පමණ වියදම් කරලා ඇට මිදුලු බද්ධ කිරීමේ ශල්‍යකර්මය කරනවා. නමුත් දුප්පත් මිනිසුන්ගේ දරුවන්ට ඇට මිදුලු බද්ධ කිරීම සම්බන්ධයෙන් කිසිම දෙයක් මේ රජය පැමිණෙනතුරු කරලා තිබුණේ නැහැ. කිසිම ඇට මිදුලු බද්ධ කිරීමක් -bone marrow transplant - තිබුණේ නැහැ. ඒ නිසා අපි තැලසීමියා රෝගීන් වෙනුවෙන් මහනුවර රෝහලේ විශේෂ ඒකකයක් ආරම්භ කරනවා. මම හිතනවා, විශේෂ ඒකකය ආරම්භ කරලා ඇට මිදුලු බද්ධ කිරීම අවුරුදු දෙක තුනක් කරනකොට -මේ දරුවෝ ඔක්කෝගේම ඇට මිදුලු බද්ධ කිරීම කළොත්- ඒ සියලු ජීවිත අපට බේරා ගන්න පුළුවන් කියලා. අද ලියුකේමියා රෝගය නිසා රෝගීන් මිය යන්නේ නැහැ. අද ඇත්ත කථාව bone marrow transplant එක කරනවා. මම ඒක අපේක්ෂා රෝහලේ ආරම්භ කළා. අපේක්ෂා රෝහලේ ඇට මිදුලු බද්ධ කිරීම ආරම්භ කළ නිසා දැනටත් දරුවෝ 60, 70ක් ජීවත් වෙනවා. දෙවන ඒකකය ළමා රෝහලේ ආරම්භ කරනවා. තව ටික දවසකින් ඒ වාට්ටු සංකීර්ණයත් හදලා ඉවර කරනවා. Cardiothoracic Unit එක. ඒ Unit එක හැදුවාම heart surgeonsලාත් එක්ක එකතු වෙලා ඒ ඇට මිදුලු බද්ධ කිරීම ළමා රෝහලේ ආරම්භ කරනවා. එතකොට හොඳ කරන්න බැහැ කියපු ලියුකේමියා, මයිලෝමා වාගේ රෝග ඔක්කෝම හොඳ කරනවා. අද සල්ලි තිබෙන අය විතරක් මේ රෝග සුවකර ගැනීම සඳහා පිට රට ගෙනියනවා. මේ ඒකක හදන තුරු මම ඒ අයටත් මගේ National Health Development Fund එක මඟින් ඉන්දියාවට ගිහිල්ලා අවශ්‍ය ප්‍රතිකාර කර ගැනීමට ආධාර දෙනවා. මේ වෙනකොට අපි ඒ Fund එකෙන් ඒ ගොල්ලන්ට අඩු මුදල සම්පූර්ණයෙන්ම ලබා දෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ඔබතුමාට බොහොම ස්තුතියි. "Derana Little Star" තරගයට සහභාගිවෙලා දිනපු වයඹ පාසල් දරුවාත් තැලසීමියා රෝගයෙන් පීඩා ලැබුවා. මම ඔබතුමාට ඒ දරුවා ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමා මුදල් ලබා දුන්නා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අසන දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. තැලසීමියා රෝගය කියන්නේ මානුෂික වශයෙන් ඉතාම සංවේදී කාරණයක්. තැලසීමියා වාහක දෙමව්පියන් දෙපළකගේ එක්වීම තුළින් ඒකට වග කිව යුතු නැති දරුවෙක් තැලසීමියා රෝගියෙක් බවට පත් වෙනවා.

අපි සමාජයක් හැටියට, ඒ ඒ දෙමව්පියන්ගේ වරදින් හෝ නොදැනුවත්කමින් බිහිවන අපේ රටේ පුරවැසියා වෙනුවෙන් පවුලකට දෙනවා කියලා කිව්වේ රුපියල් 1,000ක වාගේ දීමනාවක්. ගරු ඇමතිතුමනි, විශේෂයෙන් රුධිරය මාරු කිරීමේ කටයුතු සහ ඔවුන්ගේ දෛනික කටයුතු සඳහා ඊට වැඩිය ආධාරයක් ලැබෙනවා නම් ඉතා හොඳයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ විතරක් නොවෙයි, ඒ ගොල්ලන්ගේ උපකරණ, ඖෂධ සියල්ලක්ම අපි නොමිලේ ලබා දෙනවා. පාසල්වල 10 වසරේ සිසුන්ගේ ඉඳලා blood group එක මොකක්ද කියලා තීන්දු කරනවා වාගේම, තැලසීමියා positivesද නැද්ද කියලාත් අපි හොයා ගන්නවා. ඊටපසු හැම දරුවෙක්ටම කාඩ් එකක් දෙනවා. කෙනෙක් විවාහ වෙනකොට එය බැලිය යුතුයි. තැලසීමියා රෝගය තිබෙන දෙන්නෙක් එකතු වුණොත් විතරයි ඔවුන්ගේ දරුවන්ට තැලසීමියා රෝගය ඇතිවන්නේ. තැලසීමියා රෝගය තිබෙන කෙනෙක් සාමාන්‍ය කෙනෙක් විවාහ කර ගත්තොත් ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා තමයි අපි තීන්දු කළේ, දහය වසරේ සිට සියලුම පාසල් ළමුන් screen කරන්න. දැන් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා තැලසීමියා රෝගය වෙනුවෙන් එම කාර්ය ආරම්භ කරලා තිබෙනවා. ඊටපසුව තැලසීමියා රෝගය තිබෙන අයට අපි කාඩ් එකක් දෙනවා. මෙන්න මේ තත්ත්වය යටතේ, තැලසීමියා රෝගය තිබෙන කෙනෙක් එම රෝගය තිබෙන තවත් කෙනෙක් එක්ක විවාහ වෙන්න එපා කියලා අපි ඒ අයට කියලා දෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මට ඇමතිතුමාගෙන් දැන ගන්න තිබෙන්නේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ගරු ඇමතිතුමා කැමැති නම් පැහැදිලි කරන්න පුළුවන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මේක කුඩා දරුවන්ට අදාළ වූ ප්‍රශ්නයක්. කුඩා දරුවන්ගේ හදවත් සැත්කම් කිරීමේ අවශ්‍යතාව 3,000කට විතර තිබෙනවා. නමුත් දැන් තිබෙන ශල්‍යාගාර තුළ කර ගන්න පුළුවන්කමක් නැහැ. Little Hearts Fund එකෙන් අරමුදලක් හදනවා. ඔබතුමාත් රුපියල් මිලියන 350ක් ගියවර අය වැයෙන් දීලා තිබුණා. ඒ සඳහා රුපියල් මිලියන 2,000යි ඕනෑ වෙන්නේ. ගරු ඇමතිතුමනි, එම මුදල ඉක්මනින් ලබා දීමට ඔබතුමා කල්පනා කළොත් දරුවන් 1,000කගේ පමණ ජීවිත බේරා ගන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, Little Hearts Fund එක හදලා, ශල්‍යාගාරත් හදලා ඉවරයි. දැන් තිබෙන්නේ වෛද්‍යවරුන්ගේ ප්‍රශ්නයක්. ඒකට Rotary International එකෙන් funds ලබා දෙනවා. ඒ ගොල්ලෝ රුපියල් ලක්ෂයක් දෙනවා. Heart surgeriesවලදී හවස හතරෙන් පස්සේ වැඩ කරනවාට අපි සල්ලි ගෙවන්න පටන් ගත්තා. අපි ගාල්ලේ පටන් ගත්තා නේ. වෛද්‍යවරයාගේ ඉඳලා සාමාන්‍ය සේවකයා දක්වා එහි වැඩ කරනවා. මේ විධියට කරගෙන යන්න ඒ ගොල්ලෝ ඩොලර් 1,000ක් ගෙවනවා. ඩොලර් 1,000ක් කියන්නේ, රුපියල් 150,000ක් විතර. මෙතැන ප්‍රශ්නයක් ඇති කරගෙන තිබෙනවා; anesthetistsලා කියනවා, ඒ ගොල්ලන්ටත් 50 per cent ඕනෑ කියලා. සාමාන්‍ය ක්‍රමය surgeonට 50,000 නම්, anesthetistට 25,000යි. එහෙම තමයි තිබුණේ. දැන් ඒ ගොල්ලෝ පෞද්ගලික අංශයේ නම් තුනෙන් එකකටත් වැඩ කරනවා; නැත්නම් භාගයටත් වැඩ කරනවා. ඉස්සර තිබුණේ, one-third; දැන් 50 per cent ඉල්ලනවා. ඒකට එකඟ වෙන්නේ නැහැ. Anesthetistsලා කියනවා, "දොස්තරවරයාට 50,000 නම් අපටත් 50,000ක් ගෙවන්න" කියලා. මෙන්න මේ තරගය, මේ ගෝරිය නිසා මට තවම ආරම්භ කර ගන්න බැරි වෙලා තිබෙනවා. දැන් අරමුදලත් හදලා, ශල්‍යාගාරත් විවෘත කරලා ඉවරයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 – 2463/'17- (1), ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]* දෙවන වටය.

2015 වර්ෂයේ වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ සිසුන් : උතුරු මැද පළාත
2015இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றோர்:வடமத்திய மாகாணம்
STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: NORTH CENTRAL PROVINCE

2136/'17

7. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்கு உயிரியல் பாடத் துறையில் அனுராதபுரம் மற்றும் பொலன்னறுவை மாவட்டங்களிலிருந்து தோற்றியுள்ள மாணவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately -

(i) the number of students who sat for the GCE (A/L) Examination in the biology stream in 2015 from the Anuradhapura and the Polonnaruwa Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර සභාගත කරන්න. දෙවන වටයේදී අපි සාමාන්‍යයෙන් කරන්නේ පිළිතුර සභාගත කිරීමයි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(මාණ්පුමිකු මොහාන් ලාල් කිරේරු)
(The Hon. Mohan Lal Grero)
ගරු කථානායකතුමනි, මෙය වෛද්‍ය වෘත්තියට අදාළ වැදගත් ප්‍රශ්නයක් නිසාත්, ගරු මන්ත්‍රීතුමාත් ඉන්න නිසා මට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රතිපත්තියක් වශයෙන් එසේ කරන්නේ නැහැ. එය වෙනස් කළොත් පසුව ප්‍රශ්නයක් වනවා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(මාණ්පුමිකු මොහාන් ලාල් කිරේරු)
(The Hon. Mohan Lal Grero)
ගරු කථානායකතුමනි, 2015 වසරේ උසස් පෙළ ප්‍රතිඵල අනුව වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීමේ අවම සුදුසුකම "බී" සාමාර්ථ දෙකක් හා "සී" සාමාර්ථයක් කියමින් මෙතුමා දවස් ගණනක් කිස්සේ මතයක් ගොඩනහන්න හැදුවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පිළිතුර සභාගත කළාම එතුමාට ඒක දැන ගන්න පුළුවන් නේ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

මේ සභාව දැන ගන්න ඕනෑ, පසුගිය වසර දහය තුළ අවම සුදුසුකම් සහිතව සුදුසුකම් ලබා තිබෙන්නේ -වැඩි හරියක්- "සී" සාමාර්ථ දෙකයි, "එස්" සාමාර්ථයයි හා "එස්" සාමාර්ථ තුන ලැබූ ශිෂ්‍යයින්. මම ඒ සම්පූර්ණ වාර්තාව ගෙනැත් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, පිළිතුර සභාගත කරන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ඒ නිසා මෙතුමා දවස් හතරක්-පහක් තිස්සේ ගොඩ නහන්න හදපු මතය සංඛ්‍යානය පැත්තෙන් බැලුවත්, සාමාන්‍ය බුද්ධියෙන් බැලුවත් සම්පූර්ණයෙන් වැරදි මතයක් බව සඳහන් කරමින්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,
අනුරාධපුර දිස්ත්‍රික්කය - 1993
පොළොන්නරුව දිස්ත්‍රික්කය - 821

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,
අනුරාධපුර දිස්ත්‍රික්කය - 904
පොළොන්නරුව දිස්ත්‍රික්කය - 390
එම සංඛ්‍යාව අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,
අනුරාධපුර දිස්ත්‍රික්කය - 45.36%
පොළොන්නරුව දිස්ත්‍රික්කය - 47.50%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,
අනුරාධපුර දිස්ත්‍රික්කය - 41
පොළොන්නරුව දිස්ත්‍රික්කය - 22
එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,
අනුරාධපුර දිස්ත්‍රික්කය - 4.54%
පොළොන්නරුව දිස්ත්‍රික්කය -5.64%

(iv) ඇමුණුමෙහි* දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 2112/'17 - (1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 2183/'17 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

**** ඇමුණුම:***
**** இணைப்பு:***
**** Annex:***

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරාගනු ලැබූ වෛද්‍ය පීඨය
5727774	එම්.සී.එෆ්. නව්රින්	අනුරාධපුරය	කුලි/කැකුණගොල්ල මුස්ලිම් ම.ම. විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.6617	නැහෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	A		
6008879	කේ.ආර්.එම්. ඉම්රාන්	පොළොන්නරුව	පො/රාජකීය ම.ම. විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.729	යාපනය විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15 - 2463/'17 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "ස්ථාවර නියෝග 22(3) යටතේ තිබෙනවා, "කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටි විස්තරාත්මක ප්‍රකාශයක් කළ හැකි ය." කියලා. ඒ යටතේ මා දැන ගන්න කැමැතියි,- අද දිනයේදී අති විශේෂ ගැසට් පත්‍රයක් සභාගත කර තිබෙනවා. ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි, ඔබතුමාට තමයි මේ ප්‍රශ්නය අදාළ වෙන්නේ. ඔබතුමා ඔබතුමාගේ ආසනයට ගියොත් මට උත්තරය ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, 2017.12.15 දිනැති අංක 2049/59 දරන ගැසට් පත්‍රයේ මෙසේ සඳහන් වනවා:

"(4) බස්නාහිර පළාතේ කොළඹ 3 ගාලුපාර අංක 116 දරන ස්ථානයේ සේවා මහල් නිවාස 90ක් සහිත කාමර 475කින් සමන්විත නගර හෝටලයක් ඉදිකර පවත්වාගෙන යෑම සඳහාවූ ව්‍යාපෘතිය 2012 ජූලි 19 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරනු ලැබූ දින සිට 2018 දෙසැම්බර් 31 දිනයෙන් අවසන්වන මාස හැත්ත හතක (77) කාලසීමාවක් තුල දී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතුය."

ගරු ඇමතිතුමා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ. මෙම නගර හෝටලය මොකක්ද, මේකට ඔබතුමා ලබා දෙන්න බලාපොරොත්තු වන බදු සහන තිබෙනවා නම්, ඒවා මොනවාද කියලා ඔබතුමාට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද? මොකද, මා සඳහන් කළ ස්ථාවර නියෝග 22.(3) යටතේ ඔබතුමාට එය කළ හැකියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
මේ ගැන සොයා බලා තමයි මට පිළිතුරු දෙන්න වෙන්නේ. මම මේ සම්බන්ධයෙන් දැනුයි දැනගත්තේ. මට සතියක් කල් දුන්නොත්, මම ඒ ගැන සොයා බලා කියන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. කොහොමත් Debate එකේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න පුළුවන් නේ, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඇමතිතුමා පිළිතුරු දෙන්න කල් ගත්තා නේ? බොහොම ස්තුතියි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, Debate එක මොකක්ද කියලා මම දන්නේ නැහැ. මේක අදට නියමිත විෂයයට අදාළ පනතක් සම්බන්ධ දෙයක් නොවෙයි. අමාත්‍යතුමනි, අමාත්‍යවරයෙකු වශයෙන් ඔබතුමාට කථානායකතුමාගේ අවසරය මත ඕනෑම අවස්ථාවක මේ සම්බන්ධව ප්‍රකාශයක් කරන්න පුළුවන්. ඒ අනුව මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලනවා. මොකද, Debate එකේදි මම හැම වෙලාවේම මෙතැන නොසිටින්න පුළුවන්. නමුත්, උදේ වරුවේ අනිවාර්යයෙන් මා මෙතැන ඉන්නවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට දැන් මේ සම්බන්ධයෙන් පිළිතුරු දෙන්න බැහැ නේ?

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම)
(The Hon. Malik Samarawickrama)
මේ සම්බන්ධයෙන් සොයා බලා තමයි පිළිතුරු දෙන්න වෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
මේක "ස්වර්ණවාහිනිය" පිළිබඳව අහපු ප්‍රශ්නයක්. අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභා ගර්භයේ නැතිව පිළිතුරු දුන්නාට කමක් නැද්ද?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ප්‍රශ්නයක් නැහැ, උත්තර දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමා ඊයේත් ඔය සම්බන්ධයෙන් ඇහුවා නේ?

මූල්‍ය ආයතන මුහුණ දී තිබෙන අර්බුදය: රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நிதி நிறுவனங்கள் எதிர்நோக்கும் நெருக்கடி: அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரின் கூற்று

CRISIS FACED BY FINANCE COMPANIES: STATEMENT BY MINISTER OF PUBLIC ENTERPRISES AND KANDY DEVELOPMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprises and Kandy Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23.(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් 2018.01.23 දින අසනු ලැබූ ප්‍රශ්නයට මා අද දින පිළිතුරු ලබා දෙනවා.

ඊට්අයි ෆිනෑන්ස් ලිමිටඩ් හා ස්වර්ණමහල් ෆයිනෑන්සල් සර්විසස් පීඑල්සී යන ආයතන දෙකෙහි තැන්පත්කරුවන්ගේ භිමිකම සුරක්ෂිත කිරීම සඳහාත්, මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහාත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් පහත දැක්වෙන පියවරයන් ගෙන ඇත.

1. මෙම ආයතන දෙකෙහි කළමනාකරණ කටයුතු කර ගෙන යෑම සඳහා මණ්ඩලයක් පත් කිරීම.
2. කල් පිරෙන තැන්පතු ආපසු ගැනීම සීමා කිරීම සහ එම තැන්පත් මාස හයක කාලයක් දක්වා දීර්ඝ කිරීම.
3. තැන්පතු සඳහා ගෙවිය යුතු මුළු පොලිය එකඟ වූ කොන්දේසි අනුව සිදු කිරීම හා ඉතිරි කිරීම් තැන්පතු සාමාන්‍ය පරිදි ආපසු ගෙවීම සිදු කිරීම.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ඉහත ආයතන දෙක අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර, අවශ්‍ය විටකදී නිසි නියාමන පියවරක් තවදුරටත් ගනු ලැබේ. මේ අතර, මෙම ආයතනයන්හි ඇතිවන හදිසි ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා ණය අය කර ගැනීම උපයෝගී කර ගන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදෙස් ලබා දී ඇත. මේ අතර, මෙම ආයතන දෙකේ ප්‍රධාන කොටස්කරුවන් විසින් එම ආයතන සතු ආදායම් නොලබන වත්කම් විකිණීම මඟින් ආයතනය සඳහා අවශ්‍ය මුදල් මෙම ද්‍රවශීලතා තුළින් ලබා ගැනීමට ඇති හැකියාව සලකා බලමින් පවතී.

මුදල් සමාගමකට අයත් කිසිදු වත්කමක් විකිණීමට හෝ පැවරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට නෛතික බලයක් නොමැති අතර, එය අදාළ ආයතනයන්හි කොටස් හිමියන්ගේ තීරණයක් වේ. මේ වන විට මූල්‍ය පද්ධතියේ අර්බුදකාරී තත්ත්වයක් නොමැති අතර, ඊට්අයි ෆිනෑන්ස් ලිමිටඩ් හා ස්වර්ණමහල් ෆයිනෑන්සල් සර්විසස් පීඑල්සී යන ආයතනයන්හි මුළු වත්කම් ප්‍රමාණය මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වලින් දශම 13ක් තරම් කුඩා අගයක් ගනියි. අර depositorsලාගේ වත්කම්වල ප්‍රමාණය 0.13යි. ඒක ස්වර්ණවාහිනි ආයතනයේ මුළු වත්කම්වලින් දශම 13කි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු ආරක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක වැඩසටහන යටතේ මුදල් සමාගමක අර්බුදකාරී තත්ත්වයකදී පවත්නා නීති රෙගුලාසිවලට අනුව තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම සිදු කරන අතර, මෙම වන්දි මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් උපරිමය ලක්ෂ 3 සිට ලක්ෂ 6 දක්වා මෑතකදී ඉහළ නංවන ලදී. මීට අමතරව අවස්ථානුකූල කරුණු අනුව පීඩාවට පත් සමාගම්වල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් විශ්වසනීය හා මූල්‍ය වශයෙන් ශක්තිමත් උපාය මාර්ගික ආයෝජකයන් සමඟ සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අදාළ ආයතනවලට අවසර ලබා දීම සිදු කෙරේ. තවද, ඉදිරියේදී බලපත්‍රලාභී මුදල් සමාගම්වල ද්‍රවශීලතා ගැටලු ඇති වීම වළක්වා ගැනීම සඳහා මුදල් සමාගම්වල ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් මිලියන 2.5 දක්වා ක්‍රමානුකූලව ඉහළ නැංවීම වැනි නව නියාමනයන් හා විධානයන් හඳුන්වා දීම මුදල් මණ්ඩලය විසින් ගන්නා ලද ඇතැම් ක්‍රියාමාර්ග වේ.

ගරු කථානායකතුමනි, මෙහි හරය වන්නේ තැන්පත්කරුවන්ගේ මුදල් ගැන ප්‍රශ්නයක් නැහැ කියන එකයි. මොකද, සමාගමේ වත්කම් තිබෙනවා; they have assets. So, those can be sold and the depositors can be paid as much as possible. වත්කම් තිබෙනවා. තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවන්න වත්කම් තිබෙනවා. ඒවා විකුණන්න පුළුවන්.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. පැහැදිලි කර ගැනීමට පමණක් අවස්ථාව දෙන්නම්. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔය කරුණ මතු කිරීමේදී අපි නිශ්චිතව යම් කරුණක් ඇසුවා ඔබතුමාට මතක ඇති. EAP ආයතනය සතුව ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන බලපත්‍ර තිබෙනවා. තැන්පත්කරුවන්ට මුදල් ගෙවීම සම්බන්ධයෙන් කිසිදු විවාදයක් නැහැ. ඒ මුදල් ගෙවන්න ඕනෑ. නමුත් මෙම ආයතනය විදේශීය සමාගමකට විකිණීමේදී රූපවාහිනී සහ ගුවන් විදුලි බලපත්‍ර විදේශීය සමාගමක් සතු කිරීමට අපේ රටේ නීතිය අනුව බලයක් නැහැ. ඒක තමයි මෙතැනදී මතු කරපු ප්‍රධානම කාරණාව. ඒ සම්බන්ධව ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

මේ ස්වර්ණවාහිනී ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත්කරු වෙලා ඉන්නේ මහ බැංකුව - Central Bank - සහ භාණ්ඩාගාරය. ඒ අය මැදිහත් වෙලා ලංකාවේ නීති-රීතිවලට අනුකූලව තමයි මේක කරන්නේ, ගරු කථානායකතුමනි. ශ්‍රී ලංකාවේ නීතියට පටහැනි කිසිම දෙයක් කරන්නේ නැහැ. All steps will be taken in accordance with the Sri Lankan law. The Treasury and the Central Bank are acting as mediators because they want the depositors safeguarded. Also, they want the institution to continue because it has a very good name.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සහතික වනවාද මේ තැන්පත්කරුවන්ට ඒ අදාළ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවනවාය කියා?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තැන්පත්කරුවන්ගේ මුදල් ලබා ගන්න වත්කම් තිබෙනවා. ඒකයි මම කියන්නේ. There are assets. තැන්පත්කරුවන්ට අගතියක් වෙන්නේ නැහැ, අද තිබෙන තත්ත්වය අනුව. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගන්න පුළුවන්ද කියන එකයි අහන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් depositorsලා ඉන්නවා, ඒගොල්ලන්ගේ deposits mature වෙලා තිබෙන්නේ. ඒගොල්ලන්ගේ deposits -[බාධා කිරීමක්]

ගරු අමාත්‍යතුමනි, මම ඒකයි ඔබතුමාගෙන් අහන්නේ. දැන් ඔබතුමා කියන විධියට තැන්පතුවල වටිනාකම තිබෙන වත්කම්වලින් සියයට 1.1 නම් ඉතාමත් ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සියයට දශම 13යි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දශම13යි. ඒ කියන්නේ දාහෙන් එකක් නේ. ඒ කියන්නේ ඉතාම ශක්තිමත් මූල්‍ය ආයතනයක්. ඔක්කොටමත් වඩා ශක්තිමත් එකක්. එම නිසා mature වෙච්ච deposits, depositersලාට ගන්න දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි මම කිව්වේ. වත්කම් තිබෙනවා. තැන්පත්කරුවන්ට භය වෙන්න දෙයක් නැහැ. වත්කම් තිබෙනවා. දැන් හුහාක් ෆිනෑන්ස් සමාගම්-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
භය වෙන්න නොවෙයි. දෙනවා ද කියා කියන්න. ගන්න පුළුවන්ද මුදල්?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක ආණ්ඩුවේ සමාගමක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේක පෞද්ගලික සමාගමක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක අපි දන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුව හදන්නේ මේකට උදවු කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කෙටියෙන් කියන්න ඇමතිතුමා. ඔබතුමා සයිටම් දුන්නා වාගේ. මේක දෙනවාද නැද්ද? Depositorsලාට මුදල් ගන්න පුළුවන් ද? බැරි ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගෙවීමට අවශ්‍ය වත්කම් තිබෙනවා. පසුව ඒ වත්කම් විකුණා දමා ඒ කටයුත්ත මහා භාණ්ඩාගාරයට කරන්නට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බෙහොම ස්තුතියි. Now, it is clear.

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 7 දක්වා. එනම්;

1. අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය අනුමත කිරීම;
2. සක්‍රිය බැරකම් කළමනාකරණ කිරීමේ පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම; සහ
3. 3 සිට 7 දක්වා නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත යටතේ නියමයන් 5ක් අනුමත කිරීම.

Hon. Leader of the House, please.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය:අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම

அரசியலமைப்பின் கீழான தீர்மானம்:பிரதம நீதியரசர் மற்றும் உயர் நீதிமன்ற நீதிபதிகளுக்கான சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல்

DETERMINATION UNDER THE CONSTITUTION: REVISION OF SALARIES AND ALLOWANCES OF CHIEF JUSTICE AND JUDGES OF SUPERIOR COURTS

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"Whereas the salaries of the Judges of the Supreme Court and the Judges of the Court of Appeal shall be determined by Parliament, in

terms of Article 108 (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka as amended by the Nineteenth Amendment to the Constitution;

And whereas the approval of the Cabinet of Ministers has been granted on 20.02.2018 according to the Cabinet Memorandum dated 17.02.2018 submitted by the President, to revise the salaries and allowances of the Chief Justice and the Judges of the Superior Courts with effect from 01.01.2018 as follows :-

(a) To revise the salaries of the Chief Justice, Judges of the Supreme Court, President of the Court of Appeal and Judges of the Court of Appeal as set out in the Management Services Circular No. 3/2017 as mentioned in the document prepared by the Salaries and Cadre Commission and appended as Annexe I, with effect from 01.01.2018 and salary conversion to be effected on step by step basis;

(b) To increase the pensionable allowance of 25% of the salary hitherto paid, up to 50% with effect from 01.01.2018 and to calculate the said allowance on the basis of the salary step of the newly revised salary; and

(c) To pay a monthly professional allowance of Rs.150,000/- per month which is reckoned for pension purposes in place of the special non-pensionable allowance of Rs. 15,000/- per month which was paid.

Accordingly, that this Parliament determines that the salaries and allowances of the Chief Justice and the Judges of the Superior Courts be revised as aforementioned in terms of Article 108 (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka."

Annex-I

The salary scales to be made applicable to Hon. Chief Justice and Judges of the Superior Courts effective 01.01.2018

සේවා ගණය			අභියාචනාධිකරණ විනිසුරුවරුන්	ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්/ අභියාචනාධිකරණයේ සභාපති	අගවිනිසුරු
Service Category			Appeal Court Judges	Puisne Judges/ President CA	Chief Justice
වැටුප් කේත අංකය			ජේ.එස්. 3-2016	ජේ.එස්. 4-2016	ජේ.එස්. 5-2016
Salary Code			JS 3-2016	JS 4-2016	JS 5-2016
1	2	3	4	4	4
			6,750	7,000	7,500
			5	5	5
1			135,000	140,000	150,000
2			141,750	147,000	157,500
3			148,500	154,000	165,000
4			155,250	161,000	172,500
5			162,000	168,000	180,000
6			168,750	175,000	187,500

- To increase up to 50% effective 01.01.2018 the pensionable allowance which is hitherto paid as 25% of the salary and calculation of the said allowance based on the salary point of this new salary.
- Payment of a professional allowance of Rs. 150,000/- per month which is reckoned for pension in place of the special non -pensionable of Rs. 15,000/- per month which was paid.

අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපමාධිකරණ විනිශ්චයකාර වරයන්ගේ වැටුප් හා දීමනා සම්බන්ධයෙන් සියලු දෙනාගේම එකඟත්වය තිබෙනවා නම් අපට එය සම්මත කර ගන්නට පුළුවන්.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එවුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පුළුවන්, ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Item 1 සඳහා සියලු දෙනාම එකඟයි. Sir, I Move Item 2 and 3

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පළමුවන අයිතමයට එකඟයි, ගරු කථානායකතුමනි. දෙවැනි අයිතමයට එහෙම නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අංක 1 දරන අයිතමයට සියලු දෙනාම එකඟයි. අංක 2 සහ 3 විවාද කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අයිතම අංක 1ට සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ විෂය අංක 2, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි ඒකාබද්ධ විපක්ෂය වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ අනුව එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීරණය ඔබතුමා ප්‍රකාශය කළා. ඒක හරි.

ඊට පස්සේ අපි මේ රටේ ණය ක්‍රමය, මුදල් ක්‍රමය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙන බැවින් මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කළා. ඒ අවස්ථාවේදී ජනාධිපතිතුමා සඳහන් කළා, මෙය සම්මත කිරීම පොඩ්ඩක් කල් දමන්න කියලා. ඊට පස්සේ අපි සභානායකතුමා සමඟත් සාකච්ඡා කරලා කල් දමා ගත්තා. නමුත් හදිසි අවශ්‍යතාවක් තිබෙනවාය කියලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අද දින ආංශික අධීක්ෂණ කාරක සභාව රැස් කළා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මමත්, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් සාමාජිකයන් වශයෙන් ඉන්නවා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් පැමිණියා. එහිදී සංශෝධන ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, ඒ ඇතැම් සංශෝධන අපි බලාපොරොත්තු වුණු ආකාරයට තිබුණා. ඇත්තටම ඒ සංශෝධන හොඳයි. මොකද, මේ පනත අවශ්‍යයි කියලා අපි පිළිගන්නවා. මේ පනත් කෙටුම්පත තුළ තිබෙන සමහර කොටස්වලින් අහිතකර දේශපාලන බලපෑම් ඇති වනවාය කියන එක තමයි අපේ ප්‍රධාන තර්කය. හදිසියේ, අද මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන නිසා ආංශික අධීක්ෂණ කාරක සභාවේදී තර්ක කරලා එකඟ වෙන්න බැරි වුණු කාරණා සම්බන්ධයෙන් අපට සංශෝධන ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කියපු කථාව නිවැරැදියි. අපි අද නැවතත් අධීක්ෂණ කාරක සභාව රැස්වෙලා තීරණය කළා, මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාදයට ගන්න. මොකද, ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු කාරණාත් සලකා බලා ඒ අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කළා. ඔබතුමන්ලා මේ විවාදයෙන් පස්සේ තවත් සංශෝධන ඉදිරිපත් කරනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. රජය වශයෙන් අපට භාර ගන්න පුළුවන් සංශෝධන තිබෙනවා නම් අපි භාර ගන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා අපට වෙලාවක් දෙන්න ඕනෑ, මේ වෙලාවට පෙර සංශෝධන ඉදිරිපත් කරන්න කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් අපි දන්නවා නේ, මොකක්ද අවශ්‍ය කියලා. මූලික සංශෝධනවලට අපි එකඟ වුණා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එකඟ වුණු කරුණු හැර. උදාහරණයක් විධියට කියනවා නම්, වාණිජ බැංකුවක මුදල් තැන්පත් කරනවාය කියන එකට අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒවා ඉදිරිපත් කරන්න. ඒවා ඉදිරිපත් කරන්න වෙලාවක්ද අහන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්. දහවල් 12.00ට පෙර දෙන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දහවල් 12.00ට පෙර දෙන්න.

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත
தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம்
ACTIVE LIABILITY MANAGEMENT BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of National Policies and Economic Affairs, I move,

"That the Bill be now read a Second time."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Harsha De Silva will start the Debate.

[ප.භා. 11.19]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කරන්නේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ඒ තමයි, සක්‍රීය බැරකම්

කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත. මෙය ඉදිරිපත් කරන්නේ අපේ රටේ රාජ්‍ය ණය කළමනාකරණය කර ගන්නයි. අපි කවුරුත් දන්නවා, ණය තමයි අප මුහුණ දෙන ප්‍රධානම අභියෝගය කියලා. අපි දන්නවා, 2019, 2020, 2021, 2022 යන අවුරුදුවලදී ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක විතර ප්‍රමාණයක ණය ආපසු ගෙවීම් කරන්න සිද්ධ වෙලා තිබෙන බව. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය කාලයෙන් කාලය අඩු වැඩි වනවා. සියයට 20ක් විතර තිබුණු ණය ප්‍රතිශතය, කාලයත් සමඟ අද සියයට 80 දක්වා වැඩි වෙලා තිබෙනවා. ණය කිව්වාම, මේ සියලු ණය එකම ණය නොවෙයි. ඉස්සර ණය ගත්තේ ලෝක බැංකුවෙන් හා ආසියානු සංවර්ධන බැංකුවෙන්. සංවර්ධනය නොවුණු රටවල් සඳහා වූ ණය නැවත ගෙවන්න සමහර විට අවුරුදු 40ක්, අවුරුදු 50ක් තිබෙනවා. සමහර අවස්ථාවල ඒ ණය සඳහා පොලියක් අය කරන්නේ නැහැ. පොලියක් අය කරනවා නම් සියයට කාල, සියයට භාගය වැනි සහනදායී පොලියක් මත තමයි ඒ ණය ගත්තේ. අපි වාණිජ ණය ගන්න පටන් ගත්තේ 2006 - 2007 අවුරුදුවලයි. ඒ කාලයේ තමයි අපි මුලින්ම ජාත්‍යන්තර බැඳුම්කර - International Sovereign Bonds - ඉදිරිපත් කළේ.

මේ ණය, අර පරණ ගත්ත ණයවලට වඩා ගොඩක් වෙනස්. කොහොමද වෙනස් වෙන්නේ? පළමුවන කාරණය තමයි, ගෙවන්න තිබෙන කාලය අවුරුදු තිහ, හතළිහ, පනහ වෙනුවට අවුරුදු පහකින්, bullet payment එකකින්, ගෙවන්න සිද්ධ වන එක. වැඩිම වුණොත්, අවුරුදු දහයකින් ගෙවන්න තමයි ඒ ණය ගත්තේ.

ගරු කථානායකතුමනි, දැන් මේ කාරණය කල්පනා කරන්න. ඉස්සර කාලයේ අපි ඩොලර් මිලියන සියයක ණයක් ගත්තා නම්, අවුරුදු හතළිහක්, පනහක් තිස්සේ ටික ටික ගෙවනවා. ඒවායේ පොලී අනුපාතය සියයට කාලයි, සියයට භාගයයි. නමුත්, 2006න් පටන් ගත්ත මේ අලුත් වැඩ පිළිවෙළ යටතේ ඩොලර් මිලියන සියයක ණයක් ගත්තා නම්, එකවර, කෙටි කාලයකින් ගෙවන්න ඕනෑ. මුලින්ම එවැනි ණය ගන්නකොට පොලිය හැටියට ගත්තේ සියයට 8.75යි. ඊට පස්සේ සියයට 7යි, සියයට 6.75යි, සියයට 6.8යි. ඔන්න ඔය වාගේ ඉතා විශාල පොලී අනුපාතවලට තමයි ඒ ණය ගත්තේ. ඒක තමයි සාමාන්‍යයෙන් අපි කථා වෙන්නේ නැති දේ. අද එක පැත්තකින් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. නමුත්, ඊටත් වඩා ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, පොලී අනුපාතය සියයට කාලක, භාගයක ඉඳලා සියයට 6ට, සියයට 7ට නොවෙයි, ඊටත් වඩා වැඩි ප්‍රමාණයක් වන සියයට 8ටත් ගිහින් තිබෙන එක. ඒ වාගේම, ඒ ණය එකවර, bullet payment එකකින්, ගෙවන්න ඕනෑකම. මෙන්න මේ විශාල අභියෝගයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අද, අපි රජයේ ඉන්නවා. හෙට වෙන කවුරු හරි රජයේ ඉන්න පුළුවන්. ඒකට ප්‍රශ්නයක් නැහැ. මේ ණය ගෙවීමේ වගකීමක් රජයට තිබෙනවා. අපේ ජනරජය ගත්ත ණයක් කිසිම දවසක නොගෙවලා නැහැ. ගෙවිය යුතු පොලී අනුපාතවලට, ඒ ගෙවන්න තිබෙන කාලීන ගෙවීම් අතපසු කරලා නැහැ. ශ්‍රී ලංකා රජය කිසිම දවසක ණය ගෙවීම් පැහැර හැරලා නැති නිසා ලෝකයේ අපට ලොකු පිළිගැනීමක් තිබෙනවා. මම හිතන විධියට සියලු රජයන් ඒ කටයුත්ත ඉතාම ඕනෑකමින් ඉදිරියටත් කර ගෙන යන දෙයක්. එහෙම නොවුණොත් අපට ජාත්‍යන්තර ණය ගැනීම පිළිබඳව ගැටලු මතු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ අලුත් පනත අවශ්‍ය වෙන්නේ ඇයි? මේ පනත් කෙටුම්පතට විරුද්ධව පෙත්සම්කරුවන් සුප්‍රීම් අධිකරණයට -ශ්‍රේෂ්ඨාධිකරණයට- ගියා. අපේ රජය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව කිසිම විධියකට හදිසි පනතක් - Urgent Bill - ගෙනෙන්න බැහැ. ඔබතුමන්ලාට මතක ඇති, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේත් හදිසි පනතක් හැටියට බව. ඒ සම්බන්ධව කිසිම විධියකට කාටවත් උසාවියට යන්න වෙලාවක් තිබුණේ නැහැ. නමුත්, යහ පාලන රජය යටතේ සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ශක්තිමත් කළ නිසා, ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මත ඉදිරිපත් කරන්න තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන ඔවුන් මේ පනත් කෙටුම්පතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. එතැනදී මේ පිළිබඳව ඉදිරිපත් කළ කරුණු කාරණාවලට ඇහුම් කන් දීලා, ඒ පිළිබඳව කල්පනා කරලා, සිසිර ආබෘ, නලින් පෙරේරා, මලල්ගොඩ යන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමන්ලා තීන්දුවක් දුන්නා. ගරු කථානායකතුමා ඒ තීන්දුව පාර්ලිමේන්තුවට දැන්වුවා. ඒ අනුව මෙම පනත් කෙටුම්පත අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවට කිසිම විධියකට පටහැනි වන්නේ නැහැ. මුදල් පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන සම්පූර්ණ බලය ඒ ආකාරයෙන්ම තිබෙන බව කියා තිබෙනවා. ඒ අනුව එහි සෝදාපාළුවක් වෙනවාය කියලා විපක්ෂයේ සමහර පුද්ගලයන් කරපු චෝදනා බැහැර කරන්න හැකිවෙලා තිබෙනවා. එහෙම නම් මේක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ගෙන ආ පනත් කෙටුම්පතක්.

ගරු කථානායකතුමනි, අපට තිබෙන අභියෝග ගැන මා මුලින්ම පැහැදිලි කළා. දැන් මම කියන්නම්, මේ පනත් කෙටුම්පත හරහා අපි මේ අභියෝග ජයග්‍රහණය කරන්නේ කොහොමද කියලා. පෞද්ගලිකව දකින විධියට මේ පාර්ලිමේන්තුව පටන් ගත් දවසේ සිටම තිබෙන යම් කිසි අඩුපාඩුවක් මම කියන්නම්. අපි ව්‍යවස්ථා සම්බන්ධයෙන් මාසයක් තිස්සේ මේ ගරු සභාවේ වාද විවාද කරනවා. මේ අමාත්‍යාංශයට කොච්චර ව්‍යවස්ථා කරනවාද; අනෙක් අමාත්‍යාංශයට කොච්චර ව්‍යවස්ථා කරනවාද; එදිනෙදා ව්‍යවස්ථාවලට කොපමණද; ප්‍රාග්ධන ව්‍යවස්ථාවලට කොපමණද කියලා සාකච්ඡා කරනවා. නමුත් අපේ Appropriation Act එකේ එක වාක්‍යයි තිබෙන්නේ, "මෙන්න මේ සීමාව යටතේ ජනරජයට මේ අවුරුද්ද සඳහා මෙපමණ ණය ගත හැකියි" කියලා. ගරු කථානායකතුමනි, 2013 දී විතර එම වසරට ඉදිරිපත් කරන අය වැය ලේඛනයෙන් කොච්චර ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවාද කියලා පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුයි කියලා, අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කිව්වා ඔබතුමාටත් මතක ඇති. මොකද, ඒ ගැන දැනුවත් කරලා තිබුණේ නැහැ. ඒ අවස්ථාවේ දී රජයේ ව්‍යවස්ථාව හැටියට පෙන්නුම් කරන්න උත්සාහ කළේ, එම වසරට කරන ව්‍යවස්ථා පමණයි. ණය ගෙවීම ඇතුළත් කළේ නැහැ. ඒ නිසා තමයි අය වැය ලේඛනයට අලුත් schedule එකක් අනුගත කරලා දැන් සියලු විස්තර පාර්ලිමේන්තුවට ලබා දෙන්නේ. නමුත් කිසි වෙලාවක මේ පාර්ලිමේන්තුවේ අපි වාද විවාද කරන්නේ නැහැ, මේ ණය ගත යුතුද, මේ ණය ගන්නා ක්‍රමවේදය මොකක්ද, අපි ණය ගන්නේ සියයට කීයේ පොලියටද කියලා. ඒක මේ පාර්ලිමේන්තුවේ කිසිම සංවාදයකට ඇතුළත් වන්නේ නැහැ. කිසි දවසක අපි ඒ පිළිබඳව සාකච්ඡා කරන්නේ; වාද විවාද කරන්නේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Please, go ahead.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනයට යන්න. එතකොට ඔබතුමාට අවස්ථාව ලැබෙයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම කියන්න හැදුවේ මේ කාරණයයි. ඔබතුමා දැන් මේ ගැන කිව්වා. පොලිය කීයක්ද, ගන්නේ කොහෙන්ද කියන ඒවා ගැන අපි කවදාවත් මේ පාර්ලිමේන්තුවේදී වාද කරන්නේ නැහැ. ඒක එසේ විය යුතුයි නේ. ඒ කටයුත්ත සම්පූර්ණයෙන්ම භාර මහ බැංකුවට. අඩුම පොලියට මේවා ගත යුතුයි කියලා Monetary Board එක මහ බැංකුවට කියලා තිබෙනවා. Operational පැති ගැන අපි මෙතැන වාද කරන්න ඕනෑ නැහැ . අපි මෙතැන policy එක ගැන විතරයි කියන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එතුමා කියන කථාව හරි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Deputy Chairman of Committees, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කියන කථාව හරි. අපි මේ පාර්ලිමේන්තුවේ operational දේවල් ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. අපි ප්‍රතිපත්තිය ගැන විතරයි කථා කරන්න ඕනෑ. මහ බැංකුව කියන්නේ, රජයේ මේ ණය ගැනීමට සිටින ඒජන්තවරයෙක් පමණයි. ඔවුන්ට තමයි තාක්ෂණික දැනුම තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ස්වාධීනයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ස්වාධීන ඒජන්තවරයෙක්. ලෝකයේ රටවල, මහ බැංකුව පමණක් නොවෙයි රජය වෙනුවෙන් ණය ගන්නේ. බොහෝ රටවල මහ බැංකුවට එම ඒජන්ත කාර්ය භාරය නැහැ. බොහෝ රටවල ස්වාධීන ණය දෙපාර්තමේන්තුවක් තිබෙනවා. ඒ හරහා තමයි ණය ගන්නේ. ඇත්ත වශයෙන්ම මෙතැන ළබැඳියාවන්ගේ ගැටුමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. පක්ෂ-විපක්ෂ අපි සියලු දෙනාම සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය ඉස්සරහට ඇති නොවන විධියට විසඳාගන්න ඕනෑ කියලා මා හිතනවා. ඒකට හේතුව මම කියන්නම්. ඒජන්තවරයෙක් හැටියට අර්ථසාධක අරමුදල කළමනාකරණය කරන්නේත් මහ බැංකුව. මහ බැංකුවේ මූලික කාරණාවලට, රජය වෙනුවෙන් ණය ගැනීමේ ඒජන්ත කාර්ය භාරයවත්, වැඩ කරන ජනතාවගේ අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීමේ ඒජන්ත කාර්යවත් අදාළ වෙන්නේ නැහැ. ඒ දෙකම මහ බැංකුවේ මූලික කටයුතුවලට පරිබාහිර කාරණා. මහ බැංකුවේම තව ඒජන්තවරයෙක් හැටියට අර්ථසාධක අරමුදල හරහා මහ බැංකුවම ණය ගන්නවා නම්, රජය වෙනුවෙන් එතැන ළබැඳියාවන්ගේ ගැටුමක් තිබෙනවා. There is a conflict of interest. That has happened ever since the Central Bank was established in this country and thereafter having transferred the management of the Employees Provident Fund to the Central Bank. That is a separate matter, which you and I both have to agree to change at some point in the future. But, -

සුප්‍රීම් උසාවියේ 2014 වර්ෂයේ තීන්දුවක් තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අනුකූලව, ණය ගන්න කලින් හැම අවස්ථාවේම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා එයට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්න කියලා. නමුත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එය practically කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අපේ පාර්ලිමේන්තුව තිබෙන්නේ ප්‍රතිපත්තිමය වශයෙන් මේ සම්බන්ධයෙන් -ණය සම්බන්ධයෙන්- සාකච්ඡා කරලා ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන මහ බැංකුවේ ඒජන්ත කාර්ය භාරය ස්වාධීනව කරන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියාගෙන ආවේ මේකයි. අපි Appropriation Act එකෙන් එක වාක්‍යයයි කියන්නේ. ඒ වාක්‍යය කියලා අපි කියනවා, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂ ප්‍රමාණයක ණය ගන්න අපට පුළුවන් කියා. 2003 වර්ෂයේ ගෙන ආ Fiscal Management (Responsibility) Act එක හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන බලය තවත් ශක්තිමත් කර තිබෙනවා. ඒ හරහා රජයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු අපි කාර්තුවක් පාසා ඉදිරිපත් කරන්න ඕනෑ. අය වැයකට කලින් ඉදිරිපත් කරන්න ඕනෑ, ඒ අය වැය හරහා බලාපොරොත්තු වන්නේ මොනවාද, ඒ මූල්‍ය කටයුතු කොයි ආකාරයටද උච්චාවචනය වන්නේ කියලා. ඉස්සර එම අයිතිවාසිකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබුණේ නැහැ. එය 2003 වර්ෂයේ Fiscal Management (Responsibility) Act එක යටතේ ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එමඟින් ඉදිරිපත් කරපු, නමුත් සිදු වුණේ නැති තවත් කාරණාවක් තිබෙනවා. මේ ළඟදී විගණකාධිපතිවරයා -Auditor-General- අසා තිබුණා, යම්කිසි ණය ප්‍රමාණයක් මේ රට අරගෙන තිබෙනවා, නමුත් ඒ ගත් ණය ප්‍රමාණය ප්‍රකාරව වත්කම් -assets- කෝ කියලා. "ට්‍රිලියන 10ක ණය තිබෙනවා, හැබැයි ට්‍රිලියන 1ක වත්කම් පමණයි තිබෙන්නේ" කියා එතුමා කියා තිබෙනවා. එහිදීත් ලොකු ආන්දෝලනයක් ඇති වුණා, 'දේශපාලන කථාවක්ද ඒ කළේ' කියා. ඇත්ත වශයෙන්ම Fiscal Management (Responsibility) Act එකෙන් වගකීමක් දීලා තිබෙනවා. අප ණයක් ගත්තාම ඒ ණය හැම එකම assetsවලට යන්නේ නැහැ. සමහර ඒවා assetsවලට යනවා. සමහර ණය එදිනෙදා වියදම්වලට යනවා. සමහර ණය පරණ ණය ගෙවන්න පාවිච්චි කරනවා. එතකොට ඒවා assets වන්නේ නැහැ.

මම අහලා තිබෙනවා, දේශපාලන වේදිකාවල පුද්ගලයින් කිව්වා, "අපි ඉන්න කාලයේ අපි ණය ගත්තේ සංවර්ධනය සඳහා පමණයි" කියලා. බොහෝ කට්ටිය එහෙම කියනවා අපේ කන්

දෙකට ඇහිලා තිබෙනවා. නමුත්, එය සත්‍යයක් නොවෙයි. ඒක සත්‍යයක් වුණා නම් අර ට්‍රිලියන 10ට සමගාමීව ට්‍රිලියන 10ක වත්කම් තියෙන්න ඕනෑ. නමුත්, වත්කම් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you have two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, please give me five more minutes, because I have to explain this. Then, I will finish my speech.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Then, that time will be deducted from the time of the other speakers' of your Party.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay, we will arrange that.

අපි මේ කරන්න හදන්නේ ඒ asset register එක හදන එකයි. මේක කියන්න සිද්ධ වුණාට සමාවෙන්න ඕනෑ. ඒ asset register එක හදන එක පසුගිය රජයට කර ගන්න බැරි වෙලා තිබෙනවා. දැන් තමයි asset register එක හදන්න පටන් අරගෙන තිබෙන්නේ. තව අවුරුදු හතරක්, පහක් යන කොට මේ asset register එක complete වුණාට පස්සේ දැන ගන්න පුළුවන්, අපි සංවර්ධන වැඩ කටයුතු සඳහා කොච්චර ණය පාවිච්චි කළාද, පරණ ණය ගෙවන්න කොච්චර ණය පාවිච්චි කළාද කියලා. එතකොට මේ පනත් කෙටුම්පතින් සිද්ධ කරන්නේ, අර අපට තිබෙන අභියෝගය, ගෙවන්න තිබෙන අභියෝගය ජයග්‍රහණය කරන්න මහ බැංකුවට අවස්ථාවක් ලබා දෙන එකයි. Appropriation Act එකෙන් තබා තිබෙන සීමාවට එහා ගිහිල්ලා, තව සියයට 10ක්, - රටේ ණය ට්‍රිලියන 10ක් තිබෙනවා. එතකොට ට්‍රිලියන 1ක්- වනතුරු ජාත්‍යන්තර වෙළෙඳ පොළේ උච්චාවචනයන් හරහා හෙට අනිද්දා වනකොට ලෝක වෙළෙඳ පොළේ තිබෙන පොලී අනුපාතය - interest rate - ඉහළ යනවා කියලා අපි බලාපොරොත්තු වෙනවා නම්, අපට දැන් ණය ගන්න පුළුවන්, එන අවුරුද්දේ ණය ගෙවන්න. මොකද, දැන් තිබෙන නීතිය අනුව, එන අවුරුද්දේ ණය ගෙවන්න මේ අවුරුද්දේ ණය ගන්න හැකියාවක් නැහැ. උදාහරණයක් හැටියට අර ඩොලර් මිලියන සියයේ ණය ගනිමු. ඒක අපි bullet payment එකක් හැටියට එන අවුරුද්දේ ගෙවන්න ඕනෑ. මොකද, මේක අවුරුදු පණහක් තිස්සේ ගෙවන්න තිබුණා නම් ගැටලුවක් නැහැ. එන අවුරුද්දේ ගෙවන්න ඕනෑ. අපි අද දන්නවා ඇමෙරිකාවේ FOMC එක හරහා තව හතර වතාවක් මේ අවුරුද්දේ ජාත්‍යන්තර පොලී අනුපාතය වැඩි වන බව. එතකොට එන අවුරුද්දේ ගෙවන්න තිබෙනවා නම් අපට එන අවුරුද්ද වන කොට අද තිබෙන පොලී අනුපාතයට වඩා සියයට එකකින්, දෙකකින් ඒ පොලිය වැඩි වෙනවා නම් ඇයි අද අපිට ඒ ණය අරගෙන ආයෝජනය කරලා, එන අවුරුද්දේ ගෙවන්න හැකියාවක් හදා ගන්න බැරි? මේක තර්කානුකූලව ඉතාම හොඳ දෙයක්. බොහෝ රටවල මේවා කරනවා. ඒක තමයි අපි කියන්නේ සක්‍රීය බැරකම් කළමනාකරණය - Active Liability Management - කියලා.

This is a Treasury operation as a matter of fact because we know we have to pay these loans next year. This law provides the Government to borrow that money, invest that money and make sure that we have the money available at a lower rate of interest so that we do not have to borrow the same amount of money next year at a higher rate of interest.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔන්න ඔය කටයුත්තට තමයි සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. අපේ වගකීම, අපේ බැරකම් කළමනාකරණය කරගන්න අවශ්‍ය නීතිය මේ හරහා අපට ලැබෙනවා. නමුත් මම කියන්න ඕනෑ, මෙම අලුත් පනත් කෙටුම්පත හරහා තමන්ට ඕනෑ ඕනෑ විධියට ණය ගන්න ඇමතිවරයාට කිසිම විධියකට හැකියාවක් නැති බව. ණය ගන්නා සෑම අවස්ථාවකදීම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුයි. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කරලා, ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා "සද්භාවයෙන් සිදු කරන ක්‍රියාවන් සඳහා ආරක්ෂාව" කියලා අපි එක සංශෝධනයක් ඉදිරිපත් කරනවා. "ඇමතිවරයා සහ අමාත්‍යාංශයේ නිලධාරින්ටත් ආරක්ෂාව ලැබිය යුතුයි" කියන වාක්‍යයත් මේකට එකතු කරලා තිබුණා. ඒකට හේතුවක් තිබුණා. ජාත්‍යන්තර ණය ගන්නකොට මහ බැංකුව පමණක් නොවෙයි, ඊට අදාළව කොටස්කරුවෝ බොහෝදෙනෙක් ඉන්නවා. සද්භාවයෙන් යම් කිසි දෙයක් කළා නම්, ඔවුන්ටත් අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න කියලා වගන්තියක් තිබුණා. අපි ඒ වගන්තිය වෙනස් කරලා Committee Stage Discussion එකේදී සංශෝධනයක් ඉදිරිපත් කරනවා. එතකොට, ඇමතිවරයා සහ අමාත්‍යාංශයේ පුද්ගලයන්ට තිබෙන ආරක්ෂාව අයින් කරලා මූල්‍ය නීති පනතේ තිබෙන ආරක්ෂාව පමණක් ලබා දෙන්න පුළුවන්. එතකොට මහ බැංකුවේ නිලධාරින්ට පමණයි ඒ ආරක්ෂාව ලැබෙන්නේ. කාලය පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා මම මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්. මට තව විනාඩියක කාලයක් දෙන්න.

මෙය අපේ ණය කළමනාකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ නීතියක්. ඒ නීතිය අපි ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා කරලා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහ ජනාධිපතිවරයාගේ අදහස් නැවතත් ලබාගෙන, අධීක්ෂණ කාරක සභාව එක්වරක් නොවෙයි දෙවරක් රැස්වෙලා, ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රවාදීව තමයි මේ වැඩ කටයුත්ත කරන්නේ. මෙයට සම්බන්ධ වෙච්ච මහ බැංකුවේ නිලධාරින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ සියලුම දෙනාට අපේ ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මම බලාපොරොත්තු වෙනවා, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගේ දායකත්වය මේ පනත් කෙටුම්පත සම්මත කරගන්න අපට ලැබේවි කියලා. බොහොම ස්තුතියි.

[11.41a.m.]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
Thank you, Hon. Deputy Chairman of Committees. I am presenting for approval of Parliament five Gazette Notifications issued under the Excise (Special Provisions) Act, No. 13 of 1989.

[ගරු මංගල සමරවීර මහතා]

Sir, actually, I would like to start off my speech with some words on the new tax policy of the Government. In fact, the Government's tax policy has focused on some key principles and objectives over the last few years.

First of them is to increase the share of Government revenue which had declined to around 11 per cent of GDP by 2014. This would enable us to better meet our debt repayments without compromising the Government expenditure on health, education and so on.

Second one is to increase the share of direct taxes. We have one of the lowest direct taxes in the world, which is at 18 per cent and our objective is to increase it to 40 per cent to create a more progressive and relevant tax structure. The current 82 per cent share of indirect taxes results in the burden of taxes being disproportionately borne by the poorest sections of society and I think we need to rectify this situation as quickly as possible.

Third one is to broaden the tax base to bring in the informal economy into the formal sector. This would create a level playing field by ensuring that everyone complies and shares the burden of taxes.

Last one is to reduce discretion in tax policy and shift to a simple, transparent and rules-based framework. This is required to minimize potential corruption and reduce tax leakages due to *ad hoc* exemptions.

In fact, the new Inland Revenue Act, which will come into operation on the 1st of April in a few weeks' time, actually ensures that tax holidays and tax exemptions can no longer be given under the whims and fancies of the Minister of Finance. Now, we have created an actual level playing field and a rules-based framework for such decisions.

Since I took over as the Minister of Finance last May, we have adopted these principles in the major tax-related legislation that has been passed in this House and also in the Budget 2018.

The new Inland Revenue Act, which comes into force on the 1st of April, as I said, will go a long way towards increasing the share of direct taxes. This will enable the Government to achieve its revenue targets in an equitable manner by ensuring the higher income earners absorb a larger share of the tax burden.

In the past, Hon. Deputy Chairman of Committees, Sri Lanka's taxation policy has been characterized by *ad hoc*, subjective taxes, as I said, on the whims of politicians and other senior officials. This has resulted in a plethora of exemptions and concessions often without any rational basis. The cost of these exemptions has been estimated at almost 1.6 per cent of GDP in 2015.

One of the key objectives of our tax policy is to rationalize these exemptions, thus broad basing the tax collection.

We are also beginning to see the results of technological interventions in the tax collection process. RAMIS has been in operation since January of last year and the impact on revenue has already been positive. Once key Government institutions are fully integrated with RAMIS in the coming months, the positive impact on revenue will even be greater. The collective impact of these measures will enable the reduction in tax rates once there is an improvement in collection.

That said, it would be imprudent to reduce tax rates prematurely. We have in the last 18 months begun to see an improvement in Government revenue. In 2017, the Government achieved a primary surplus in the Budget for the first time since the 1950s. This fiscal consolidation process has enabled the Government to regain the confidence of markets and stabilize economy. Market interest rates have begun to decline with the Prime Lending Rate falling by 144 basis points since July of last year, which will pave the way for investment-led growth.

A premature interruption of the fiscal consolidation process will destabilize the economy and erase the gains that have been made. Whilst being committed to fiscal consolidation, the Government has always found room to ease taxes on essential items to ensure public welfare. When the drought resulted in an increase in food prices last year, we reduced taxes on a number of food and related items to provide relief to the public as a people friendly-Government.

Once the Inland Revenue Act begins to show results and direct tax collection improves, we will be able to make meaningful downward adjustments to the rate of indirect taxes such as VAT on a permanent basis. But this must be done at the correct time in a responsible manner.

Let us remind ourselves why we are in this position today. Why do we need to raise Government revenue? Why do we need to focus on improving our tax collection? In the years 2019-2022, we will face external debt repayments of approximately US Dollars 15 billion. This is an unprecedented burden that this Government has inherited.

ඇත්ත වශයෙන්ම, ඊළඟ වසර කීපය තුළදී ඇමෙරිකන් ඩොලර් බිලියන 15කට ආසන්න ණය ප්‍රමාණයක් අපි ගෙවිය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ අවුරුද්දේ ලංකා ඉතිහාසයේ වැඩිම ණය ප්‍රමාණය -රුපියල් ට්‍රිලියන 1.9ක්- අපිට ගෙවන්න තිබෙනවා. එන අවුරුද්දේ Foreign Debt Services වශයෙන් ට්‍රිලියන 4.2ක් ගෙවන්න තිබෙනවා. ඒ ප්‍රමාණය මේ අවුරුද්දේ ගණනටත් වඩා වැඩියි. 2020දී රුපියල් ට්‍රිලියන 3.7ක් ගෙවන්න තිබෙනවා. මේ ගෙවන්න තිබෙන ණයවලින් වැඩි ප්‍රමාණයක් - උදාහරණයක් වශයෙන් කිව්වොත්, 2019දී ගෙවන්න තිබෙන ට්‍රිලියන 4.2න් සියයට 82ක්ම- 2015දී අපේ රජය පත් වෙන්න ඉස්සර වෙලා ලබාගත් විදේශ ණයවලටයි ගෙවන්න වෙලා තිබෙන්නේ. 2020දී ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයෙන් සියයට 83ක්ම 2015ට ප්‍රථම ගත්ත ණයවලටයි ගෙවන්නේ. 2021දී අපිට ගෙවන්න තිබෙන ණයවලින් සියයට 85ක්ම ගෙවන්න වෙන්නේ 2015ට ඉස්සර වෙලා ගත්ත ණයවලටයි.

The previous regime spent increasing amounts of money on projects with little or no economic return, including the Mattala Airport and the Hambantota Port. Whilst expenditure increased, the government revenue

collapsed. In 2006, government revenue as a percentage of the GDP was 17.6 per cent and in 2014, eight years after the last administration took over, it had declined to 11.6 per cent of the GDP. The resultant deficit was financed increasingly by commercial foreign debt.

However, whilst external liabilities increased, our foreign earnings were on the decline. In the year 2005, when the last regime took office, exports as a percentage of GDP was 26 per cent. But, in 2014, nine years later, it had declined to just 13 per cent of the GDP; it had declined from 26 to 13 per cent of the GDP. In fact, we inherited an economy in shambles, a flawed economic model that was bound to fail.

Since January 2015, we have begun the process of reversing this flawed model. Our focus has been on shifting the economy to an outward-oriented model in order to create external inflows to meet our external financial obligations.

In 2017, export earnings grew by 10.2 per cent to reach US Dollars 11.4 billion which is a record by itself. FDI reached a record level of US Dollars 1.7 billion. These trends will only increase as we continue the economic programme that this Government has put in place.

Let us also remind ourselves that we have made these gains in macroeconomic stabilization whilst ensuring continued focus on Government expenditure and improving the quality of that expenditure. The Government's expenditure on education, higher education, and skills development has increased from 1.9 per cent in 2014 to 2.4 per cent in 2017. අපි අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට වාගේම පුහුණු කිරීම්වලට 2014 රාජපක්ෂ රජය යටතේ වෙන් කළ සියයට 1.4, මේ වනකොට සියයට 2.4 දක්වා වැඩි කරලා තිබෙනවා.

Similarly, expenditure on public health has increased from 1.39 per cent in 2014 to 1.74 per cent in 2017. සෞඛ්‍යය සඳහා වෙන් කළ සියයට 1.39, 2014දී සියයට 1.74 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වැඩි වීම අධ්‍යාපනය තරම් නොවුවත්, අපේ සෞඛ්‍ය ඇමතිතුමා ඉතාම විශිෂ්ට ලෙස දුප්පත් ජනතාව ගැන හිතලා, සෞඛ්‍යය අංශය වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. අද එම ජනතාවට ඒ හරහා හිතන්න බැරි තරම් සහන ලැබෙනවා. ඒ ගැන එතුමා කථා කරයි. We will continue to invest in our people and invest in our future.

Mr. Deputy Chairman of Committees, I would also like to say very quickly a few words on the vehicle tax reform. This Government came into power in 2015 on a platform of good governance and eradication of corruption. One of the hotbeds of corruption in Sri Lanka has been in the importation of motor vehicles. Without painting all players with the same brush, I believe everyone will accept that there has been rampant corruption in this industry. This has resulted in significant revenue leakage and a highly distorted, uneven playing field.

The previous tax structure left room for under-invoicing and under-valuation to avoid tax payment, and the discretion in the hands of officials compounded this problem of corruption.

It is for this reason that in the 2018 Budget, I proposed a comprehensive reform in vehicle tax policy. A new excise duty policy was introduced where the tax is based only on the engine capacity of the vehicle. This eliminates all room for discretion and treats all vehicles on the same basis. I believe this was a very important revolutionary step forward in order to minimize the leakage.

The duty brackets are based on a transparent, objective formula. This is a shift from the distortions which were characteristic of previous taxation structures.

Naturally, in the process of shifting from an *ad-hoc* tax structure to one based on a rules-based criteria, there will be large initial price displacements. In some cases, the price of vehicles that were previously given an unfair advantage have increased, and those vehicles which were discriminated against have seen price declines.

On aggregate the tax changes are expected to be revenue positive as the opportunity for price undervaluation declines significantly.

In addition to the primary changes in the tax structure, several other important vehicle import policy changes were proposed:

i) The duty on electric vehicles was revised downwards as an environmentally-friendly policy measure as part of the Blue and Green Budget.

ii) Duty benefits are provided to hybrid vehicles over regular internal combustion engine vehicles.

iii) Whilst the prices of some of the lower-end vehicles have declined with the new tax structure, measures are being taken to ensure that only good quality vehicles are now imported into Sri Lanka. Accordingly, new vehicle safety regulations will be mandatory, and minimum emission standards have been imposed for vehicle imports.

iv) The new tax structure may also result in some of the higher-end vehicles seeing tax reductions, to compensate for which, a luxury tax will be imposed on the Super Luxury vehicles category.

Sir, whilst we have made a conscious effort to minimize the burden of indirect taxes on the public, there are certain sectors where taxes have been imposed in line with government policy. For example, in the 2018 Budget a tax on sugar-added beverages was proposed.

Sri Lanka has high and increasing incidence of diabetes and other non-communicable diseases. Childhood obesity is also emerging as a new health risk. The Ministry of Health, The Minister of Health and the International Research has identified the causative linkages between excessive sugar consumption and certain non-communicable diseases. As excess sugar consumption is a clear negative externality, the argument for a tax is well justified.

Similarly, the negative environmental implications of plastic products have also been well established. Thus we have in the 2018 Budget imposed a tax of Rs.10 per kilogram on the raw material which is plastic resin.

[ගරු මංගල සමරවීර මහතා]

Mr. Deputy Chairman of Committees, in conclusion I would like to say, it is clear that we have made solid progress in stabilization of the economy in the last three years:

Government finances had its first primary surplus, as I said earlier, in decades; exports and FDI hit record levels in 2017; foreign reserves have reached comfortable levels of US Dollars 7.9 billion and national inflation in February 2018 was down to 3.2 per cent with monthly prices declining in January and February.

The results of this stabilization have not translated into GDP growth levels yet because of the climatic disruptions we have faced. I am confident that the benefits of the policy measures we have put in place will materialize in the near term.

There continues to be significant investor interest in Sri Lanka, with a number of projects ear marked by the BOI for 2018. We will soon be launching the Enterprise Sri Lanka Programme which will give a kick start to entrepreneurs and small business which forms the backbone of the Sri Lankan economy. This will translate into more jobs, higher earnings, and improved quality of life of all Sri Lankans on a sustainable basis.

The government will continue to invest in health, education, public infrastructure, housing and social welfare transfers for the needy.

We will not however engage in wasteful expenditure on vanity projects which end up as white elephants in the guise of development.

We are in the process of creating an economy which empowers Sri Lankan entrepreneurs, Sri Lankan SMEs and Sri Lankan youth to take the future into their own hands. We are creating an economy based on principles of equality, fairness and justice. These are the principles that brought this Government to power, and these are the principles we must strive to take forward in the face of all challenges.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you, Hon. Minister. Next, the Hon. Sunil Handunnetti.

[මධ්‍යාහ්න 12.00]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දින දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව අදහස් කීපයක් දක්වන්න මා බලාපොරොත්තු වනවා.

මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආ මූලික විවේචනයක් තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා වාගේ මේ පනත් කෙටුම්පත, අනාගත ණය ගෙවීම සඳහා වර්තමානයේ තිබෙන පොලී අනුපාතවලට ණය ලබා ගැනීමටත්, අගයක් හැටියට වඩා ප්‍රතිශතයක් හැටියට පසුගිය අවුරුද්දේ අවසානයට එකතුවෙලා තිබෙන ණයවල එකතුවෙන් සියයට 10ක් ණය ගැනීමටත් බලය ලබා ගැනීමේ පනත් කෙටුම්පතක්. ආණ්ඩුව මේ මොහොතේ මුහුණ දෙන ආර්ථික අර්බුදය තමයි දැන් අපිට තිබෙන ප්‍රශ්නය. ණය ගෙවීමේ අර්බුදය කාලාන්තරයක් තිස්සේ ගොඩ නැඟුණු ඒ වාගේම ගොඩ ගැහුණු අර්බුදයක් බව අපි දන්නවා. ඒ අර්බුදයට උත්තර හොයන ක්‍රමවේදය, එක පැත්තකින් පාර්ලිමේන්තුව නොසලකා හැරලා, විසර්ජන පනත් විසින් පාර්ලිමේන්තුවට දීලා තිබෙන බලය නොසලකා හැරලා, ඇමතිවරයා අතට ඒ බලය අත්පත් කරගෙන, ඇමතිවරයාගේ අභිමතය පරිදි ඒ කටයුත්ත කරනවා නම් ඒකට අපි එකඟ වෙන්නේ නැහැ. ඒක අපේ විරෝධයේ මූලික පදනමක්. ඒ ණය ලබා ගන්නා ආකාරයත්, ණය තැන්පත් කරන ආකාරයත්, එහිදී මහ බැංකුව සතු කාර්ය භාරය පිළිබඳවත් අප බැලිය යුතුයි. මහ බැංකුවේ අතීත අත්දැකීම් එක්ක, "මහ බැංකුව" කියලා කිව්ව ගමන් අපි දන්නවා, අද එය විශ්වාසය බිඳ වැටිච්ච තැනක් බව. මහ බැංකුව සම්බන්ධයෙන් තිබෙන ඒ විශ්වසනීයත්වය නැවත ගොඩ නඟන්නේ නැතිව, මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විශ්වසනීයත්වය ගොඩ නඟන්නේ නැතිව, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව, ස්වාධීනව කටයුතු කරන්න තිබෙන ඉඩකඩ සකස් කරන්නේ නැතිව මේ කටයුත්ත කරනකොට ඇති වන තත්ත්වයන් තමයි මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පතට අදාළව ගොඩ නැඟී තිබෙන විවේචනවල මූලික හරය වන්නේ.

ආර්ථිකය සම්බන්ධයෙන් ගත්තොත් අපේ රටේ ආර්ථිකය ගැන ඔබතුමන්ලා අපි කවුරුත් දන්නවා. විවෘත ආර්ථිකය තමයි රටට හොඳම ආර්ථිකය කියලා විවෘත ආර්ථික මොඩල් එක ලංකාවේ ක්‍රියාත්මක කරපු ආණ්ඩුවල ඉන්න ඔබතුමන්ලාටම අද කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා, "අපි ණය කන්දක් උඩ ඉන්නේ, අපි ගිනි කන්දක් ළඟ ඉන්නේ" කියන එක. දැන් ඇමතිතුමාම කියපු විධියට අපට ණය ගෙවන්න කොච්චර ණය ගන්න සිද්ධ වෙනවා ද? 2019 අවුරුද්දේදී අපි ට්‍රිලියන 4.2ක්, -බිලියන 4,200ක්- ණය ගෙවන්න ඕනෑ. අපේ රටේ වර්තමාන දළ දේශීය නිෂ්පාදනය වගේ තුන්ගුණයක් අපි ණය ගෙවන්න ඕනෑ. අපේ රටේ ජාතික ආදායම වගේ දෙතුන් ගුණයක් අපි ණය ගෙවන්න ඕනෑ කියලා අද ඔබතුමන්ලාටම කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක මේ රටේ ජනතාවගේ වරදක් නොවෙයි. "මේක තමයි හොඳම ක්‍රමය, ණය ගැනීම තමයි හොඳම ක්‍රමය" කියලා පසුගිය කාලයේ ඔබතුමන්ලා කිව්වා මට මතකයි. පසුගිය රාජපක්ෂ පාලනය කාලයේදී මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා, "ලෝකයේ අපි තරම් හොඳට ණය ගන්න රටක් වෙන නැහැ. ණය ගන්න හැකියාව ලැබීම ගැන අපි ආඩම්බර වෙනවා" කියලා. ඔබතුමන්ලාත් දැන් ඒකම කියනවා. හැබැයි, ණය ගැනීම ගැන ආඩම්බර වෙනවා කියපු ආණ්ඩුවලටම අද කියන්න සිද්ධ වෙලා තිබෙනවා, "අපට මේ ණය දැන් ගෙවාගන්න ක්‍රමයක් නැහැ, ණය ගෙවන්න උත්තරයක් හොයන්න ඕනෑ" කියලා.

දැන් මේ හදන්නේ ණය ගෙවන්න උත්තරයක් හොයන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හොයන උත්තරය "අතීසාරයට අමුඩ ගහනවා" වාගේ උත්තරයක්. හේතුව, අද අපි ඉන්න තැන කොතැනද? 2016 අවුරුද්දේදී අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8යි. 2017 අවසානයේදී එය සියයට 3.3යි. සියයට 4.8ක්ව තිබූ ආර්ථික වර්ධන වේගය අවුරුද්දක් ඇතුළතදී සියයට 3.3ක් වුණා. 2016 අවුරුද්දේදී ඔබතුමන්ලාගේ

උද්ධමන වේගය සියයට 4යි තිබුණේ. එම උද්ධමන වේගය 2017දී සියයට 7.3ක් දක්වා වැඩි වුණා. 2016දී ඩොලරය හුවමාරු වුණේ රුපියල් 149කටයි. 2017 අවසාන වෙනකොට ඩොලරය රුපියල් 150යි. අද වන විට එය රුපියල් 156 ඉක්මවා තිබෙනවා.

අපේ ආයෝජන දිහා බලන්න. 2016දී ඔබතුමන්ලාට ඍජු විදේශ ආයෝජන ලැබුණා, ඇමෙරිකානු ඩොලර් මිලියන 898ක්. 2017දී හම්බවුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 397යි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, මම ඒ කාරණය නිවැරදි කරන්න කැමැතියි. 2017දී ඍජු විදේශ ආයෝජන වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,800ක් ලැබුණා. අපේ ඉතිහාසයේ වැඩිපුරම ඍජු විදේශ ආයෝජන ප්‍රමාණයක් ලැබුණේ 2017 අවුරුද්දේයි. බොහොම ස්තුතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කොහොම වුණත්, ඔබතුමන්ලා 2017 අවුරුද්දේදී විතරක් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 88,200ක් වෙනවා. ඔබතුමන්ලාට රුපියල් බිලියන 882ක් ණය ගන්න සිද්ධ වුණා. එසේ ණය අරගෙන, ඒ ණය ගෙවන්න ණය ගත්තාද, පාරවල් හදන්න ණය ගත්තාද කියන තර්කය වෙනම තිබෙනවා. හැබැයි, ගිය අවුරුද්දේ -අවුරුද්දක් ඇතුළත- රුපියල් බිලියන 882ක් ණය ගන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් ඔබතුමන්ලාම කියනවා, "2019දී අපි ට්‍රිලියන 4.2ක් ණය වාරිකයේ පොලිය ගෙවන්න ඕනෑ" කියලා. ඒ, දැන් ගන්නා ණයවලටත් එක්ක; අතීතයේ ගත් ණයවලටත් එක්ක. මෙතුමා කියපු ආකාරයටම මේ ණයවලට bulk එකක් හැටියට, bullet payment එකක් හැටියට ණය ගෙවන්න සිද්ධ වුණාම, ඒක කරන්නේ කොහොමද කියන එකට දැන් උත්තරයක් හොයනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම අපි මෙයට විරෝධතාව දක්වන්න එක හේතුවක් තිබෙනවා. මෙම පනත් කෙටුම්පතෙහි 2වන පිටුවේ 5වන වගන්තියේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් කර තිබෙනවා:

> "ආණ්ඩුවේ රාජ්‍ය ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව මූල්‍යනය කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව සඳහා හෝ ආණ්ඩුව වෙනුවෙන් එකතු කරගනු ලබන යම් ණයක්, 2017 අංක 30 දරන විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් ද එසේ ම 2017 අංක 30 දරන විසර්ජන පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයෙන් පසු පනවනු ලබන යම් වාර්ෂික විසර්ජන පනතක විධිවිධාන අදාළ වීමෙන් ද නිදහස් විය යුතු ය."

මේ කියන්නේ මොකක්ද? 2017 අංක 30 දරන විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තියේ සඳහන් කර තිබෙන්නේ මොකක්ද? මේ අවුරුද්ද අවසානයේදී රුපියල් එක් දහස් අටසිය අනූතුන් බිලියන අටසිය හතළිස් හතර මිලියන අටසිය දහඅට දහසක් ණය නොඉක්ම විය යුතුය කියා. ඒක 2003දී ඔබතුමන්ලාගේ ආණ්ඩුවම ගෙනා මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ - Fiscal Management (Responsibility) Act එකේ- 13වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. විසර්ජන පනත විසින් උපරිම සීමාවක් පනවා තිබෙනවා, "මෙන්න මෙපමණක් පමණයි ණය ගත හැක්කේ" කියලා.

දැන් ඔබතුමන්ලා යෝජනා කරනවා, 2017 අවුරුද්දේ සම්මත කරපු විසර්ජන පනතත් අදාළ නොකර ගන්න; - ඒක එක බරපතළ තත්ත්වයක්- මේ පාර්ලිමේන්තුව බහුතරයෙන් සම්මත කරපු ඒ විසර්ජන පනතත් අදාළ කර ගන්නේ නැතුව, ඊළඟට, 2018 විසර්ජන පනත, 2019 විසර්ජන පනත ආදී වශයෙන් මින් ඉදිරියට එන විසර්ජන පනත්වල මේ වගන්තිය අදාළ කර නොගන්න. ඒ කියන්නේ මොකක්ද? පාර්ලිමේන්තුවට තිබෙන විසර්ජන පනතක බලය අබිබවා කාටද බලය දෙන්නේ? ඇමතිවරයාට. [බාධා කිරීමක්] අපි මේ ගැන සාකච්ඡා කළා. කාරණා ගොඩක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා කියන දේ නිවැරදි නැහැ. මොකද, විසර්ජන පනත අබිබවා ගිහිල්ලා, පාර්ලිමේන්තුවට තිබෙන බලය ඉවත් වෙනවා කියන කාරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුවක් ඉදිරිපත් කළාම එහි තීන්දුව තමයි "එහෙම වෙන්නේ නැහැ" කියන එක. අනික් එක තමයි ඇමතිවරයාට මේකෙන් බලය ලැබෙන්නේ නැහැ. ඇමතිවරයා කැබිනට් අනුමැතිය අරගෙන, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ සම්මත වුණොත් පමණයි මේ වැඩිපුර ණය ගන්න වෙන්නේ. විසර්ජන පනතේ තිබෙන්නේ එන අවුරුද්දට පමණයි; දවස් 365කට පමණයි. අපිට තිබෙන්නේ දවස් 365 අභියෝගයක් නොවෙයි, මේ bullet payment එකත් එක්ක. ඉදිරියේ තිබෙන එක. ඒකයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔය කාරණා තමයි කාරක සභා අවස්ථාවේදී අප අතර ඇති වෙච්ච සාකච්ඡාව; මතවාදය; විවාදය. එතකොට තිබෙන ප්‍රශ්නය තමයි දැන් ඔබතුමන්ලා ඔය කියන ආකාරයේ කටයුත්ත ඇමතිවරයා කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරගෙන පාර්ලිමේන්තුවට ගෙනැල්ලා පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගෙන නම් කරන්නේ, මේ විසර්ජන පනත අබිබවන්නේ ඇයි කියන එක; විසර්ජන පනතේ තිබෙන මේ කොටස මෙතැනට එකතු වුණේ ඇයි කියන එක. ඒක තමයි මේ සාකච්ඡාව. ඒ නිසා අපි අහන දේ තමයි එන විසර්ජන පනත් කෙටුම්පතේ තිබෙන මේ තත්ත්වයම තියලා, අපි සම්මත කරපු, මේ පාර්ලිමේන්තුවෙන්ම සම්මත කරපු විසර්ජන පනතේ මේ තත්ත්වයම තියලා ඔබතුමන්ලාට අවශ්‍ය කරන ඔය bullet payment එක ගෙවා ගන්න වෙන උත්තරයක් නැද්ද කියන එක. මොකද හේතුව, "ඇමතිවරයාට අදාළ නොවෙනවා, ඇමතිවරයාට තනි අභිමතයක් නැහැ" කියලා දැන් මෙතුමා කිව්වාට ප්‍රායෝගිකව සිද්ධ වෙන දේ මොකක්ද කියලා අපි දන්නවා. මේ පනත් කෙටුම්පත ගත්තත් ඒක තිබෙනවා. හතරවෙනි වගන්තියේ තිබෙනවා, "අමාත්‍යවරයා විසින්" කියලා. ඒක ඇත්ත. ඒ වාගේම තිබෙනවා, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට ගැළපෙන ආකාරයට ණය මඟින් එකතු කර ගත යුතු මුදල් ප්‍රමාණය, එම ණය ගනු ලබන ආකාරය, පවත්නා ණය පෙරාතු මිල දී ගැනීම, පවත්නා ණය අලුත් ණය සමඟ හුවමාරු

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කිරීම ඇතුළු, එකී ආණ්ඩුවේ එම ගෙවීමේ වගකීම් පියවීම සඳහා යෝග්‍ය බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන ආකාරයට කරන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි මෙහි තවත් ගැටලුවක් මතු වෙනවා. අපි ඒක ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කළා. මේ පනත් කෙටුම්පතේ 4. (2) උප වගන්තියේ මෙසේ සඳහන් වනවා:

" (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මඟින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය."

හැබැයි, "අමාත්‍යවරයා" යන්නෙන් අර්ථකථනය කරන්නේ කවුද? දැන් මෙහි අර්ථ නිරූපණය තුළ අමාත්‍යවරයා කියන්නේ කවුද? මෙම පනත් කෙටුම්පතේ 6වන පිටුවේ 14වන වගන්තිය යටතේ, 20වන පේළියේ මෙසේ සඳහන් වනවා:

" "අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;"

එතකොට "මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා" කියලා අමාත්‍යවරයා හඳුන්වනවා. ප්‍රායෝගිකව ගත්තොත් අපේ මංගල සමරවීර අමාත්‍යතුමා. මංගල සමරවීර අමාත්‍යතුමනි, ඔබතුමා තමයි මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා. එතකොට ණය ගන්න ඕනෑ ප්‍රමාණය කොපමණද -විසර්ජන පනතේ තිබෙන සීමාවන්වලට යටත්ව ඒවා අභිභවන්නේ නැතිව- කියා තීරණය කිරීම, ඒ ණය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම, පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගැනීම, ණය සියයට 10ක් ගන්නවා කියන එක මේ පාර්ලිමේන්තුවට කියන එක කරන්න ඉන්නේ ඔබතුමා. ඔබතුමා තමයි මේ පනත් කෙටුම්පත අනුව අමාත්‍යවරයා. හැබැයි, මේ පනත් කෙටුම්පතේ 4. (2) උප වගන්තියේ සඳහන් කරනවා, " (1) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මඟින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය" කියලා. එතකොට, ඒ කවුද?

"රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම දැන්වීමෙහි නියම සහ අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව-" කියලා 4.(3) වන වගන්තියේ සඳහන් වනවා.

එතකොට, ඒ අමාත්‍යවරයාගේ විධානයන්. ඒ, මොන අමාත්‍යවරයාද? ප්‍රායෝගිකව ගත්තොත්, වර්තමාන තත්ත්වය යටතේ මහ බැංකුව භාර අමාත්‍යවරයාත්, මුදල් අමාත්‍යවරයාත් එක තත්ත්වයක් යටතේ වෙන තත්ත්වයක්. නමුත්, අද මේ තත්ත්වය යටතේ මහ බැංකු විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ඉන්නේ අග්‍රාමාත්‍යවරයා. මම කියන්නේ වර්තමානයේ. හැමදාම මේක මෙහෙම තියේවි කියලා මම හිතන්නේ නැහැ. මේ පනත් කෙටුම්පතේ 4. (3) උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

"(අ) එම ණය එකතු කර ගැනීමට අවශ්‍ය විය හැකි එවැනි සියලු සැලසුම් සකසනු ලැබිය හැකි ය; සහ

(ආ) ආණ්ඩුවේ යහපත උදෙසා ලබා ගත හැකි වඩාත් වාසිදායක නියමයන් මත ආණ්ඩුවේ වගකීම පියවීම සඳහා එම සැලසුම් බලාත්මක කරනු ලැබිය හැකි ය."

ඒ කටයුත්ත භාර වෙන්නේ, මහ බැංකු විෂයභාර අමාත්‍යවරයාට. එතැන ගැටුමක් තිබෙනවා. මම කියන්නේ මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කරනවා නම්, මුදල් අමාත්‍යවරයා විධියට මේ පනතේ කටයුතුවලට මැදිහත් වෙන්න ඔබතුමාට පුළුවන්කමක් ලැබෙන්නෙ නැහැ. ඒක ප්‍රයෝගික තත්ත්වයක්. ඒක හැමදාම තිබෙන තත්ත්වයක් කියලාත් මම හිතන්නෙත් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, මට ඔබතුමාට කියන්න තිබෙන්නේ-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අනේ! මට බාධා කරන්න එපා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒක කියන්න. [බාධා කිරීමක්] නැහැ. මම ඒකට ඉඩ දෙන්නේ නැහැ. මොකද, තවත් වෙලාව තිබෙන නිසා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපි මෙතැන ඉන්නේ අදහස් ඉදිරිපත් කරන විට නිවැරදි කරන්නයි.

පාර්ලිමේන්තුවට යම් අදහසක් ඉදිරිපත් වන කොට ඒක නිවැරදි නැත්නම් එය කියන්න අපට හැකියාවක් තිබෙන්න ඕනෑ. ඒකයි මම අවස්ථාව ඉල්ලන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශය භාර මුදල් ඇමතිවරයාට. මහ බැංකුව භාර සමහර විට මුදල් ඇමතිවරයාට; සමහර විට ජනාධිපතිවරයාට; එහෙමත් නැත්නම් තවත් ඇමතිවරයෙක්ට. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාට තිබෙන කාර්යය භාරය යටතේ මුදල් අමාත්‍යාංශය තිබෙනවා කියලා කොහේවත් පැහැදිලිවම දක්වලා නැහැ. මුදල් ඇමතිවරයා කියලා එක තැනක සඳහන් වනවා. තවත් තැනක ජනාධිපතිවරයා කියලා සඳහන් වනවා. හැබැයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා, මුදල් ඇමති මහින්ද රාජපක්ෂම වුණා. මහ බැංකුව තිබෙන්නේ කවුරු යටතේද කියලා ව්‍යවස්ථාවේ කොහේවත් සඳහන් වෙලාත් නැහැ. ජනාධිපතිවරයාට ඒක තීරණය කරන්න පුළුවන්. ඒක එහෙම තිබෙනවාද, නැද්ද කියලා අපි දන්නෙත් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන මතු වෙලා තිබෙන ප්‍රශ්නය ජනාධිපතිවරයා මුදල් අමාත්‍යාංශය තමා යටතේ තියාගෙන ඉන්න එක නොවෙයි. මෙතැන තිබෙන්නේ, මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන මුදල් මණ්ඩලයේ නියෝජිතයා හැටියට මහ භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහභාගී වන කොට මහ බැංකුව අගමැතිවරයා යටතේ හෝ වෙනත් කාගේ හෝ යටතේ තිබෙන කොට මතු වන ගැටලුව. විෂයය භාර ඇමතිවරයා හැටියට මුදල් ඇමතිවරයා යටතේ මහ බැංකුව තිබෙනවා නම්, "අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කරන්නේ, "මුදල් විෂය භාර අමාත්‍යවරයා" යි කිව්වාට පස්සේ, ආයේ අමුතුවෙන් මහ බැංකුව අයිති අමාත්‍යවරයා කවුද කියලා පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඕනෑ නැහැ. දැන් පනත් කෙටුම්පතට ඒක ඇතුළත් කරන්නම වෙන්නේ මොකද, මේකේ තීන්දු තීරණ ගැනීමේ බලය මහ බැංකු විෂයය භාර අමාත්‍යවරයාට පැවරීම අභිලාෂය කරගෙනම මේ පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන නිසා. එතකොට මේකේ අභිලාෂයම මොකක්ද?

පාර්ලිමේන්තුව සම්මත කරපු විසර්ජන පනතේ හුටපටය වෙනම තියා ගත්තත්, ඒ අනුව ණය ගැනීමේ කාරණාව වෙනම

පැත්තකට ගත්තත්, ණය ගැනීමේ අභිලාෂය -වුවමනාව- හා ඒක තීරණය කරන්න බලය පවරන්නේ මේ පනත් කෙටුම්පතට අනුව මහ බැංකු විෂයය භාර ඇමතිවරයාට. ඒක තමයි ගැටලුව. ඒ ගැටලුව මතු වෙලා තිබෙන්නේ ප්‍රායෝගික වර්තමානයේ. හැබැයි, ප්‍රායෝගික වර්තමානයට ගැළපෙන්න මේ පනත් කෙටුම්පත හදලා වැඩක් නැහැ. ඒක නිසා සංශෝධනයක් අවශ්‍යයි. ඔබතුමන්ලා සංශෝධන පිළිගන්නේ නැත්නම් ඒක වෙනම කාරණාවක්. පනත් කෙටුම්පතේ 4. (2) උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

"(1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මඟින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය"

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "මහ බැංකු විෂයය භාර අමාත්‍යවරයා" කියලා අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ කියලායි මා කියන්නේ. මහ බැංකු විෂයය භාර අමාත්‍යවරයා කියන කොටම හැඟීමක් එනවා වර්තමානයේ නම්, අග්‍රාමාත්‍යවරයාට මේ ණය ගැනීමේ, ණය එකතු කර ගැනීමේ කටයුත්ත තීරණය කිරීම සඳහාම මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා කියලා.

ඇමතිවරයෙකුගේ විෂයයන් දිහා බලලා පනත් කෙටුම්පතක් සකස් කරන්න බැහැ. "මුදල් ඇමතිතුමා" කියලා සඳහන් කළොත්, ඒක හරි. එහෙම නම් ඔබතුමන්ලා අර්ථ නිරූපණයක් දමන්න, ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය භාර ඇමතිවරයා කවුද කියලා. ඔබතුමන්ලා මංගල සමරවීර ඇමතිතුමාට බයද? මංගල සමරවීර ඇමතිතුමාට මහ බැංකුව භාර දෙන්න ඔබතුමන්ලා බයද? එහෙම එකක් නැහැ නේ?

ගරු මංගල සමරවීර මහතා
(*மாண்புமிகு மங்கள சமரவீர*)
(The Hon. Mangala Samaraweera)
එහෙම එකක් නැහැ. ඇත්ත වශයෙන්ම අපේ අමාත්‍යාංශ දෙක තීන්දු ගැනීමේදී සාකච්ඡා මාර්ගයෙන්, බොහොම සුහදව කටයුතු කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)
ඔව්. ඔබතුමා හොඳින් කටයුතු කරගෙන යනවා නේ. ඇත්තටම කලින් හිටපු මුදල් අමාත්‍යවරයා යටතේ අමාත්‍යාංශය තිබෙනකොට නම් ටිකක් බය වුණාට කමකුත් නැහැ. කලින් හිටපු මුදල් අමාත්‍යවරයා යටතේ තිබෙනකොට නම් විෂය භාර ඇමතිවරයා මහ බැංකුව භාර ඇමතිවරයා කියලා දමන එකේ යථාර්ථයක් තිබුණා, වෙන කොහේ හරි ගිහිල්ලා buildings ගන්නයි, වෙන වෙන දේවල්වලට යෙදවෙන්නයි ඉඩ තිබුණු නිසා. නැව් ගන්නත් ඉඩ තිබුණා. ඒ නිසා ඔබතුමන්ලා අගමැතිතුමා දිහාත් බලනවා නම්, මංගල ඇමතිතුමා දිහා බලලාත් මේ පනත හදන්න පුළුවන්. ඒක විශ්වාස කරන්න. ඒකයි මම කියන්නේ. මේ කථාව මීට වඩා ඉදිරියට ගෙන යන්න මා කැමැති නැහැ. නමුත් මේ පනත් කෙටුම්පත හිටපු මුදල් ඇමතිතුමා දිහා බලලා හදපු එකක් නොවෙයි. ඒ නිසා වර්තමාන මුදල් ඇමතිතුමා දිහා බලලා හැදුවාද කියන සැකය තමයි මට නම් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(*மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா*)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇත්ත වශයෙන්ම මාත් ඔබතුමා සමඟ එකඟ වෙනවා. ව්‍යවස්ථා සංශෝධනයකදී අනාගතයේ මේ ආයතන කොයි ආකාරයටද තාක්ෂණිකව ගළපන්නේ කියන අදහසට පාර්ලිමේන්තුවේදී අපට එකඟ වෙන්න පුළුවන් නම්, මේ ප්‍රශ්නය එන්නේ නැහැ. අලුතෙන් අමාත්‍යාංශ හැදෙනවා. තිබෙන අමාත්‍යාංශ වැහෙනවා. Subjects මාරු වෙනවා. නමුත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිම තැනක ඒවා ලියලා නැහැ. මම හිතන්නේ අපට පුළුවන් වෙයි, කවදාහරි එවැනි සංශෝධනයක් ඉදිරිපත් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)
ඒක වෙනම සාකච්ඡාවක්. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, කාරක සභාවේදී අපේ යෝජනා පිළිගැනීම ගැන. අපි එහිදී මතු කළ ප්‍රධාන කාරණයක් තමයි, මේ නව වන වගන්තියේ, "අපරාධ හෝ සිවිල් නඩු කටයුතුවලින් ආරක්ෂාව" කියන කරුණ යටතේ, "ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධාරියෙක්, සේවා නියුක්තිකයෙක්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නිලධාරියෙක්, සේවා නියුක්තිකයෙක්...." යනුවෙන් තමයි යොදලා තිබෙන්නේ. අපේ සංශෝධනය භාරගෙන ඔබතුමන්ලා ඒ කොටස ඉවත් කළත්, ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත සකස් කරලා ඉදිරිපත් කරද්දී කියා තිබෙන දෙයම නැවත මා කියවනවා. මොකද, අන් අයගේ දැන ගැනීමට ඒ කොටස වැදගත් වන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පතේ 9 වගන්තියේ මෙසේ සඳහන් වනවා:

"(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු, සේවා නියුක්තකයකු, සේවකයකු හෝ නියෝජිතයකු; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නිලධරයකු, සේවා නියුක්තකයකු, සේවකයකු හෝ නියෝජිතයකු වන්නා වූ කිසිම තැනැත්තකු,

තමා විසින් සද්භාවයෙන් ක්‍රියාකොට ඇති බව ද සියලු නිසි උද්‍යෝගය, සාධාරණ සැලකිල්ල සහ නිපුනතාව දක්වා ඇති බව ද ඔප්පු කරන්නේ නම්, ඔහු විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, නියමයක්, තීරණයක් හෝ විධානයක් යටතේ ඇති සිය වගකීම් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවකට හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වගන්තිය කියවන කොට මට නම් දැනුණේ අර්ජුන් මහේන්ද්‍රන් හිතේ තියාගෙන මේ වගන්තිය ඇතුළු කළාද කියලායි. ඒ කියන්නේ, මහ බැංකුවේ අධිපතිවරයා හෝ නිලධාරියෙකු හෝ මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු හෝ කවුරු හෝ කෙනෙකු ණය ගන්න කටයුතු කරන්නේ සද්භාවයෙන්ය කියලා ඔප්පු කරනවා නම්, සාධාරණ සැලකිල්ලකින් කටයුතු කළාය කියලා ඔප්පු කරනවා නම්, නිපුණතාවෙන් කටයුතු කළාය කියලා ඔප්පු කරනවා නම්, මේ පනත් කෙටුම්පතේ තිබෙන වගන්තිය අනුව හෝ අපරාධ හෝ සිවිල් නඩු තීන්දුවකින් ඒ නිලධාරියා වැරදිකරුවෙකු කරන්න බැහැ. මේ නීතිය අතීතයට බලපෑවොත් එහෙම, අර්ජුන් මහේන්ද්‍රන් මහතා බැඳුම්කර නිකුත් කළේ සද්භාවයෙන් කියා සිතුවොත්, එතැන නඩුවක් නැහැ. බැඳුම්කර නිකුත් කළේ රජයේ ණය අවශ්‍යතාව වෙනුවෙන් නම්, ඒක සද්භාවයෙන් කරපු කටයුත්තක් නම් ඔහුට විරුද්ධව නඩුවක් නැහැ. එතකොට අපට මේ සම්බන්ධයෙන් මෙහෙම නේ හිතෙන්නේ. මේ ණය ගැනීමේ කටයුත්තට මැදිහත් වන නිලධාරීන් වැරදි කරාවි කියලා හිතාගෙන මෙම පනත් කෙටුම්පතට මේ වගන්තිය ඇතුළු කළාද? එහෙම නැත්නම් මේ පනත් කෙටුම්පතට මේ වගන්තිය ඇතුළු කිරීමට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තිබෙන වුවමනාව මොකක්ද? මෙයින් ඉතා පැහැදිලි ලෙසම කියන්නේ මේකයි. "නිලධාරීන් වැරදි කරනවා, වැරදි කරන නිලධාරීන් ආරක්ෂා කර ගන්න ඕනෑ, ඔවුන් ආරක්ෂා කර ගන්න නම්, ඔවුන් ණය ගන්න බැඳුම්කර නිකුත් කළොත්, ණය අවශ්‍යතාව සඳහා බැඳුම්කර නිකුත් කළාය" කියලා ඔවුන් බෙරන්න පුළුවන් වගන්තියක් හැටියට තමයි මේ වගන්තිය ඇතුළු කර තිබුණේ. මේ පනත කෙටුම්පත් කරන අයට මේ වගන්තිය ඇතුළු කිරීමට හේතුව වශයෙන් යම් අදහසක් තිබෙන්න එපායැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ වගන්ති 13යි තිබෙන්නේ. 14වෙනි වගන්තියේ තිබෙන්නේ අර්ථ නිරූපණය. වගන්ති 13කින් යුක්ත පනත් කෙටුම්පතක 09වෙනි වගන්තියේ සම්පූර්ණයෙන්ම තිබෙන්නේ මොකක්ද? අමාත්‍යාංශයේ නිලධාරියෙකු, මහ බැංකුවේ නිලධාරියෙකු මේ පනත යටතේ ණය ගන්න බැඳුම්කර නිකුත් කළා නම්, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කළා නම්, ඒ නිකුත් කිරීමේදී වරදක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ වරද සිද්ධ වීම ණය ගැනීම සඳහා උත්සාහ කිරීමේ පින්වන්ත කටයුත්තක් හැටියට සලකා, යහපත් කටයුත්තක් හැටියට සලකා නිදහස් කරන්න පුළුවන් ඉඩකඩක් තමයි මේ වගන්තියේ තිබුණේ. එයට විපක්ෂය විසින් ඉදිරිපත් කරපු සංශෝධන අනුව, සද්භාවයෙන් සිදු කරන ක්‍රියා සඳහා ආරක්ෂාව ලබා දීමට මුදල් පනතේ -Finance Act- තිබෙන කොටස ආදේශ කරලා යම් කිසි ප්‍රමාණයකින් මේ වගන්තිය නිවැරදි කර තිබීම ගැන මා සතුටු වනවා. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරීන් හෝ වරදක් කළා නම්, ඒ වරදට අපරාධ හෝ සිවිල් නඩු තීන්දු අදාළ වන විධියට මේ වගන්තිය සංශෝධනය කර තිබෙනවා. මෙය යම් සංශෝධන වෙනුවෙන් වූ සාකච්ඡාවට සම්බන්ධ වූ විපක්ෂයේ මන්ත්‍රීවරු විසින් ඉදිරිපත් කරපු යෝජනා පිළිගත් අවස්ථාවක් සහ ඔවුන් ලබා ගත් යම් ජයග්‍රහණයක් හැටියට මා සලකනවා.

ඊළඟට, මා මතු කරන්න ඕනෑ තවත් වැදගත් කාරණාවක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා ලබා ගන්නා ණය සම්බන්ධයෙන් ගෙනෙන තර්කය ගැන මා කියන්න ඕනෑ. ඒක හරි. ඒක තර්කයක් හැටියට හොඳ තර්කයක්. ඒ කියන්නේ, අනාගතයේදී පොලී අනුපාත වැඩි වෙනවා යැයි සිතා වර්තමානයේදී අපි ණය ගන්නවා. එලෙස වර්තමානයේ ණය අරගෙන ඒ මුදල් අපි තැන්පත් කරනවා. තැන්පත් කරලා, ඒ තැන්පතුවලින් අනාගතයේ ණය ගෙවනවා. ඒක නේ කථාව. දැන් තිබෙන නීතිය අනුව පුළුවන් අදාළ වර්ෂයට ණය ගන්න පමණයි. හැබැයි, "අනාගතයේ පොලී අනුපාතය ඉහළ යනවා" යැයි කරන උපකල්පනය මත අපි වර්තමානයේ ණයක් ගන්නවා. එලෙස ගන්නා ඒ ණය අපි තැන්පත් කරනවා. තැන්පත් කර ඒ මුදලින් අනාගතයේ ණය ගෙවනවා. ඒක තමයි මෙහි තිබෙන මූලික අරමුණක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(*மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா*)
(The Hon. (Dr.) Harsha De Silva)

තවත් පුළුවන්. හිතන්න, අපට ලබන අවුරුද්දේ මිලියන 100ක bullet payment එකක් ගෙවන්න තිබෙනවා කියලා. සමහර විට අපට මේ අවුරුද්දේ ඒ ණය ගෙවා දැමීමේ හැකියාව තිබෙන්නත් පුළුවන්. නමුත්, දැන් තිබෙන ක්‍රමවේදය අනුව ඒක කරන්න බැහැ. මොකද, විසර්ජන පනතින් අපට ඒ අයිතිවාසිකම නැහැ. ඒ සඳහා දැන් අපට ණය ගන්න බැහැ. ඒ කියන්නේ, අපට මේ අවස්ථාවේදී ඒක හොඳ නම්, රටට වඩා යෝග්‍ය නම්, දැන් එම ණය මුදල අරගෙන මීට කලින් විශාල පොලියකට ලබා ගත් ණය අපට නියමිත කාලයට කලින් ගෙවා අවසන් කරන්න පුළුවන්. ඇයි, ඒක වැරදි? ඒක වැරදි වෙන්න බැහැ නේ?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)

ඒක වැරදි නැහැ. තිබෙන යථාර්ථය අනුව, අපට එදා වේල කන්න බැරිව ඉන්න වෙලාවේ අනාගත ණය ගෙවා ගන්න බැහැ නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(*மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா*)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි අපට ලැබුණු දායාදය. ගරු මුදල් ඇමතිතුමා කියපු විධියට ඒ දායාදය තමයි, අපට ඩොලර් බිලියන 15ක ණයක් ගෙවන්න තිබෙන එක.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)

හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා, ඔකට අපි සාමාන්‍යයෙන් කියන්නේ මොකක්ද දන්නවාද? ගමේ භාෂාවෙන් කියන්නේ "නැව් ටෝක් දෙනවා, හබලක් ගන්න සල්ලි නැතිව" කියලා. නැව් ගන්න කථා කරනවා, හබලක් ගන්න සල්ලි නැතිව. එහෙම කට්ටිය ඉන්නවා. "නැව් ටෝක්" දෙනවා, හබලක් ගන්න සල්ලි නැතිව.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
මේකේ නැව් ගත්ත කට්ටිය ඉන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)

ඒක හින්දා අපි "නැව් ටෝක්" දීලා වැඩක් නැහැ, හබලක් ගන්න සල්ලි නැතිව. අපි බලන්න ඕනෑ ගිලෙන්නේ නැතිව කොහොමද මේක බේරා ගන්නේ කියලායි. මම කියන්න ගියේ ඒක නොවෙයි. මම කියන්න ගියේ, අනාගතයේ ණය ගෙවන්න කියලා අපි වර්තමානයේ ණය අරගෙන, මේ ගන්න ණය මුදල් අපි තැන්පත් කරන්නේ කොහේද කියන එක ගැනයි. ඔබතුමන්ලා තැන්පත් කරන්න හිතාගෙන ඉන්නේ කොතැනද?

සක්‍රිය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පතේ 6. (1) (අ) හි මෙසේ සඳහන් වෙනවා.

> "මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අවස්ථාවක, (422 වන අධිකාරිය වූ) මුදල් නීති පනතේ 107 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින්, තත්කාර්ය සඳහා, ලිඛිතව නම් කරනු ලැබිය හැකි නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ පවත්වාගෙන යනු ලබන එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාවක රඳවා ගත යුතු ය;"

මෙහි එක හොඳක් තිබෙනවා. මේ ණය ගන්නේ නැවත ණය ගෙවන්නම කියලා මේ අය කියනවා. ණය අරගෙන වෙන වැඩ කරන්න බැහැ කියලා තිබෙන එක හොඳයි. ඒක අපි අගය කරන්න ඕනෑ දෙයක්. හැබැයි, මේ ණය මුදල් වාණිජ බැංකුවල තැන්පත් කළාට පස්සේ පෞද්ගලික බැංකුවලත් තැන්පත් කරන්න පුළුවන්. රාජ්‍ය බැංකුවල තැන්පත් කරන්නත් පුළුවන්; පෞද්ගලික බැංකුවල තැන්පත් කරන්නත් පුළුවන්. මොකද, බලපත්‍රලාභී වාණිජ බැංකු කියලා මේක විවෘත කරලා තිබෙනවා. සමෘද්ධි මුදල් පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කරලා සිදු වුණු අයථා ගනුදෙනු සම්බන්ධයෙන් සමෘද්ධි අමාත්‍යවරයාට චෝදනාවක් තිබුණු බව ඔබතුමාත් දන්නවා ඇති. අපට යුරෝපියාවක කථා කරන්න බැහැ නේ. අපට මනඃකල්පිත රාජ්‍යයක මේ සංකල්පය කථා කරන්න බැහැ. මේක කථා කරන්න වෙන්නේ යථාර්ථයක.

යථාර්ථය ගත්තොත් මේවා ණය ගෙවන්න ගන්න සල්ලි. ඔබතුමාට තිබෙන තර්කය මොකක්ද කියලා මම දන්නවා. මුදල් පනත යටතේ බලපත්‍රලාභී බැංකුවල මේ මුදල් තැන්පත් කරන්න පුළුවන් කියලා කියන්න තමයි ඔබතුමා නැඟිට්ටේ. හැබැයි, ඒ ගන්නේ ඔක්කොම සල්ලි. සංවර්ධන කටයුතුවලට ගන්න ඒවා, පාරවල් හදන්න ගන්න ඒවා, ඕනෑම කටයුත්තකට ගන්න ඒවා. හැබැයි, අපි මේ ණය ගන්නේ මොකටද? මේ ණය ගන්නේ ණය ගෙවීම සඳහා. මේක වෙනත් කටයුත්තකට යොදවන්න බැහැ. අපි කියන්නේ ණය ගෙවන්න ගන්න ණයක් නිසා මේ මුදල් රාජ්‍ය බැංකුවක තැන්පත් කරන්න කියලායි. ඒක අපේ සංශෝධනයක්. වාණිජ බැංකුවක නොවෙයි. වාණිජ බැංකු කියන එක වෙනුවට රජයේ වාණිජ බැංකුවක. එතකොට තිබෙන වාසිය මොකක්ද? අපි ඒක ණය ගෙවන්න ගන්න ණයක් නිසා ඒකට පොලියක් ලැබෙනවා නම් ලැබෙන්නේ රාජ්‍ය බැංකුවලටමයි. පොලිය ලැබෙන්නේ ජනතාවට. පෞද්ගලිකව කාට හරි ලැබෙනවා නොවෙයි. හිතන්න කෝ, අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයා වාගේ පූර්වාදර්ශයක් සහිත කෙනෙක් ඉඳලා ඇලෝසියස් වාගේ බෑනා කෙනෙක් ඉන්න පෞද්ගලික බැංකුවක මේ ණය මුදල තැන්පත් කළොත් මොකද වෙන්නේ කියලා. අපට පූර්වාදර්ශයක් තිබෙනවා නේ. නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් කියන තනතුරේ අර්ජුන් මහේන්ද්‍රන් හිටියා කියලා හිතන්න කෝ. එතකොට මේක තැන්පත් කරනවා, බෑනාගේ පෞද්ගලික බැංකුවක. අපි licence එක දීලා තිබෙනවා; අපි ඉඩ හදලා දීලා තිබෙනවා. අපි ඒක වහමු. අපි සද්භාවයෙන් ඉදිරිපත් කරන යෝජනාව පිළිගන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මොකක්ද? රාජ්‍ය බැංකුවක තැන්පත් කරමු. මොකද, ණය ගෙවීම සඳහායි මේ ණය ගන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමා, මේක පුංචි ගණනක් නොවෙයි. බිලියන ගණනක්. බිලියන ගණනක් ණය ගන්න පුළුවන්. එම නිසා ඔබතුමන්ලාට එකඟ වෙන්න බැරි ඇයි? ණය ගෙවන්න ණයට ගන්න සල්ලි -ලංකා බැංකුවේ වෙන්න පුළුවන්, මහජන බැංකුවේ වෙන්න පුළුවන්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙන්න පුළුවන්- රාජ්‍ය වාණිජ බැංකුවක තැන්පත් කරමු කියන යෝජනාව ප්‍රතික්ෂේප කරන්න හේතුවක් තිබෙනවාද? අපි සංශෝධනයක් ගෙනෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමන්ලා ඒ සංශෝධනය 12.00ට කලින් ඉදිරිපත් කරන්න. මූල්‍ය නීති පනතේ 107වැනි වගන්තිය අනුව මුදල් මණ්ඩලයට තමයි ඒ අනුමැතිය දෙන්න පුළුවන්. The Section 107 (2) of the Monetary Law Act states, I quote:

> "The Monetary Board shall advise the Government regarding the distribution of official deposits between the Central Bank and commercial banks and the effects of such distribution on monetary conditions in Sri Lanka."

එම තීරණය ගන්නේ මුදල් මණ්ඩලය. මුදල් මණ්ඩලය ගන්න තීරණය මත තමයි තැන්පත් කරන්නේ. ඔබතුමන්ලාගේ දර්ශනයට වඩා අපේ දර්ශනයේ යම් කිසි පරස්පරයක් තිබෙනවා නේ. ඔබතුමන්ලා කියන්නේ රජය පමණයි කියලා. නමුත් අපි පිළිගන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සියලුම දෙනා මේ රට දියුණු කිරීමට සක්‍රීයව දායක වෙන්න ඕනෑ කියලායි. එතකොට දේශපාලන මතභේදයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම මේ යෝජනාව ගෙනාවේ සමාජවාදයද, ධනවාදයද කියන සාකච්ඡාව යටතේ නොවෙයි. රාජ්‍ය බැංකුවලත් හොරු ඉන්න පුළුවන්; ධනවාදයේත් හොරු ඉන්න පුළුවන්; සමාජවාදයේත් හොරු ඉන්න පුළුවන්.

ඒ සාකච්ඡාව නොවෙයි මේ ගෙනාවේ. අර්ජුන මහේන්ද්‍රන් වැනි කෙනෙක් සිටියොත් මොකද වෙන්නේ කියා හිතුවොත් ඔබතුමාට උත්තරය ලැබෙනවා. මේ තීරණය ගන්නේ Monetary Board එක නම්, ඔබතුමන්ලාගේ සුපිරි system එක යටතේත් Monetary Board එක ඉක්මවා ගත්ත තීරණ තිබෙනවා නේද කියලා බලන්න කෝ. Monetary Board එකට දැනුම් දුන්නේ පස්සේ නේ. අපට වෙන උදාහරණයක් ඕනෑ නැහැ. "මම මාමා නිසාත්, ආරක්ෂාව හොඳ නිසාත් මා මගේ බෑනාගේ සමාගමේ මේ ණය මුදල් දැම්මා"යි කියලා Monetary Board එකට දැනුම් දුන්නොත් මොකද වෙන්නේ? මා කියන්නේ, මේක සරල නැහැ කියලායි. ඔබතුමා මෙයට සමාජවාදය, ධනවාදය පටලවා ගන්න එපා. මෙය දර්ශනය සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. මේ සිදු වී තිබෙන දේවල් නිසා අගමැතිතුමාගේ අගමැති ධුරයටත් තට්ටු වෙන්න යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, can you continue your speech after the lunch break?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මා අවසන් කරන්නම්.

විශේෂයෙන්ම මේ සංශෝධනය පිළිගන්න බැරි හේතුවක් නැහැයි කියලා අපි හිතනවා. ශ්‍රී ලංකා මහ බැංකුවටත් ඒක හොඳයි. ණය ගෙවන්න ණයට ගන්න මුදල් රාජ්‍ය වාණිජ බැංකුවල තැන්පත් කරන්නය කියන යෝජනාව ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. The Sitting is suspended for lunch till 1.30 p.m.

රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා.1.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. (Dr.) Rajitha Senaratne, please.

[අ.භා. 1.31]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම නැඟී සිටියේ, අද සාකච්ඡා කරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් අනුව ඉදිරිපත් කර තිබෙන ගැසට් පත්‍රයෙන් පනවනු ලබන බදු අතර සීනිවලටත් අලුත් බද්දක්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

පනවා තිබෙන එක ගැන කරුණු කිහිපයක් ප්‍රකාශ කරන්නටයි. අපි යෝජනා කළේ, මිලි ලීටර් සියයකට ග්‍රෑම් 6කට වඩා සීනි ප්‍රමාණයක් තිබෙනවා නම් ඒ හැම ග්‍රෑමයකටම රුපියලක බද්දක් පනවන්න කියලායි. නමුත් ගරු මුදල් ඇමතිතුමා එහෙම වෙනසක් නැතිව පළමුවන ග්‍රෑම් එකේ සිටම ශත 50 ක බද්දක් පැනවීමට තීන්දු කළා. ඒක ඉතා හොඳ අදහසක් වශයෙන් අපි ඒකට බෙහොම එකඟ වුණා. ඒ කියන්නේ සීනි ග්‍රෑම් එකක් තිබුණත් අද බද්දක් අය කරනවා. අද එම නිසාම ඒ බහුජාතික සමාගම්වලින් එන බීම සීනි පොඩ්ඩක්වත් නැතිව වෙළඳ පොළට ඇවිත් තිබෙනවා. කෘත්‍රිම සීනිවත් පාවිච්චි කරන්නේ නැතිව "sugar-free" කියා ඒ සමාගම්වල තිබෙන ප්‍රධාන බීම වර්ග කිසිදු සීනි ප්‍රමාණයක් නැතිව අද වෙළඳ පොළට නිකුත් කර තිබෙනවා. එය ඉතා වැදගත්. මොකද, අද ලංකාවේ පමණක් නොව ලෝකයේම ප්‍රධානම සෞඛ්‍ය ප්‍රශ්නය වෙලා තිබෙන්නේ බෝ නොවන රෝගයි. රෝහල්වල මිනිසුන් සියයට හැත්තෑවක් මිය යන්නේ බෝ නොවන රෝගවලින්. එයින් ප්‍රධාන රෝගය තමයි දියවැඩියාව. එයට මූලික හේතුවක් වන්නේ සීනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 වසරේදී හෘද රෝග විශේෂඥවරුන්ගේ සම්මේලනයට ගිහින්, එහි තිබුණු දත්ත සංඛ්‍යාලේඛන විමසා බලා මම ඉස්සෙල්ලාම ප්‍රකාශ කළා, සීනි ඇතුළු තෙල් සහ ලුණු මිශ්‍රිත සියලුම ආහාරවලට අලුත් බද්දක් පනවන්නට ඕනෑය කියා. ඒ අවස්ථාවේදී මාධ්‍ය නොයෙකුත් විවේචන කළා. සෞඛ්‍ය ඇමතිවරයා සැරසෙන්නේ මේ හරහා බඩු මිල වැඩි කරන්නටය කියා ප්‍රකාශ කළා. නමුත් අවසානයේදී අපේ ආණ්ඩුව එය කරන්නට ඉස්සෙල්ලා, 2016 වර්ෂයේදී බ්‍රිතාන්‍යය පළමුවන වරට සීනි කැට ගණනට මේ සීනි බද්ද පැනෙව්වා. ඒ අනුවයි අපි මුදල් අමාත්‍යාංශයට යෝජනා කළේ මේ බද්ද පනවන්නටය කියා. මේ බද්ද පනවන්නට පෙර, " 'traffic light' labelling system" කියන එක අපි ඉදිරිපත් කළා. ලෝක සෞඛ්‍ය සංවිධානයත් නිර්දේශ කළ ඒ පළමුවන පියවර හැටියට තමයි, " 'traffic light' labelling system" යනුවෙන් කොළ, කහ, රතු යන වර්ණයන්ගෙන් නිර්ණායකයන් ඉදිරිපත් කළේ. මිලි ලීටර් සියයකට ග්‍රෑම් දෙකක් දක්වා කොළ පාට. එහි අහිතකරභාවය අඩුයි. සීනි ග්‍රෑම් 2 සිට ග්‍රෑම් 11 වනතුරු කහ - තැඹිලි පාට. සීනි ග්‍රෑම් 11කට වැඩි ඒවා රතු පාට. මෙන්න මේ විධියට තමයි අපි නිර්ණායක ඉදිරිපත් කළේ. එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉතාමත් ප්‍රශංසාවට ලක් වී තිබෙනවා.

2016 වර්ෂයේ ශ්‍රී ලංකාව පිළිබඳ ඔවුන්ගේ වාර්තාවේ highlightsවල මෙසේ සඳහන් වෙනවා. I quote:

> "Sri Lanka becomes first country in the Region to mandate sugar content labels on sugary drinks as a diabetes prevention measure."

කලාපයේම එවැනි දෙයක් ක්‍රියාත්මක කළ පළමුවන රට වශයෙන් ඔවුන් අපට ප්‍රශංසා කර තිබෙනවා. දෙවන කාරණය, ඔවුන් මෙසේ කියා තිබෙනවා. I quote:

> "In August 2016, Sri Lanka became the first country in the WHO South-East Asia Region to successfully introduce a “traffic light” labelling system to raise awareness about the sugar content of packaged food and beverages in an effort to reduce the incidence of diabetes in the country."

මෙම " 'traffic light' labelling system" එකට ඉදිරි පියවරක් වශයෙන් මේ විධියට ඉදිරිපත් වීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ දෛනික සීනි අවශ්‍යතාවය බලන විට දිනකට මිනිහෙකුගේ ඇඟට සීනි ග්‍රෑම් 6 සිට ග්‍රෑම් 11 දක්වා අවශ්‍යයි. නමුත් සාමාන්‍යයෙන් අපේ රටේ ජනයා දවසකට ඒ වාගේ දහ ගුණයක් -ග්‍රෑම් 60ක්- පරිභෝජනය කරනවා. ඒ වාගේම ලුණුවල අවශ්‍යතාව තිබෙන්නේ, එක් පුද්ගලයකුට දවසකට ග්‍රෑම් 5යි. ඒ කියන්නේ තේ හැඳි 1යි. නමුත් අපේ රටේ එක් පුද්ගලයකු ලුණු ග්‍රෑම් 10 - 25 දක්වා පාවිච්චි කරනවා. ඒක තමයි නරක. " 'Traffic light' labelling system" එක ඇති කළ අවස්ථාවේ මේ රටේ තිබෙන බහු ජාතික බීම සමාගමේ සියලුම බීම වර්ග රතු පාට ලේබලයට ඇතුළත් වුණා. ග්‍රෑම් 100ක බීම ප්‍රමාණයකට ග්‍රෑම් 11කට වඩා සීනි ප්‍රමාණයක් තිබුණා. මේ අනුව බීම ලීටරයක සීනි විතරක් ග්‍රෑම් 110කට වඩා තිබුණා. ග්‍රෑම් 110ක් කියන්නේ සීනි හැඳි 20ක් විතර ප්‍රමාණයක්. එතකොට බීම ලීටරයේ බෝතලයක සීනි හැඳි 20ක් විතර තිබුණා. ඊට පස්සේ ඒ ගොල්ලන්ගේ වෙළෙඳාම් සියල්ලම කඩාගෙන වැටුණා. එතකොට ඔවුන් කළේ මොකක්ද? ඒ බීම වර්ගවල සීනි ප්‍රමාණය සියයට 10කින් අඩු කළා. සීනි ප්‍රමාණය අඩු කරලා ඔවුන්ගේ නිෂ්පාදන රතු ලේබලයේ සිට තැඹිලි ලේබලයට ගෙනාවා. ඒ සමාගමේ විධායක අධ්‍යක්ෂවරිය විදේශීය කාන්තාවක්. පසුව ඇය මා හමු වූ වෙලාවක මට කිව්වා, ලෝකයටම නිෂ්පාදනය කරන ඒ ගොල්ලන්ගේ ප්‍රධාන සමාගමේත් මේ ක්‍රමයම ක්‍රියාත්මක කරනවාය කියලා. මේ මඟින් ශරීරයේ ස්ථූලභාවය, දියවැඩියාව, හෘදය රෝග ආදී සියල්ලම මර්දනය කිරීමට විශාල උදව්වක් වනවා. මෙවා පිළිගෙන මෙම බදු ක්‍රමය සම්බන්ධයෙන් ගැසට් පත්‍රවල පළ කරන ලද නියමයන් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාට මා ඉතාමත් ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි, මේ කාරණය ගැනත් මා එතුමාට නැවතත් ස්තුතිවන්ත වනවා. අපේ ප්‍රදේශය තමයි රා කර්මාන්තයට ප්‍රසිද්ධ වන්නේ. අපේ ප්‍රදේශයේ රා කර්මාන්තයට විශාල ප්‍රශ්නයක් තිබුණා. රා මදින්නන්ගේ එකම සමුපකාර සමිතිය තිබෙන්නේ බෙරුවල ආසනයේ. පවුල් 3,500ක් පමණ මේ තුළින් ජීවත් වනවා. රා කර්මාන්තය කඩාගෙන වැටීම නිසා දීර්ඝ කාලයක සිට මේ සමුපකාර සමිතියට කෘත්‍රිම රා ලැබෙන්න පටන් ගත්තා. අපි දන්නවා, වයඹ පළාතේ දේශපාලනඥයකුත්, අපේ දිස්ත්‍රික්කයේ දේශපාලනඥයනුත් එකතු වෙලා පොලීසි ටික අල්ලාගෙන තමයි මෙය කළේ කියලා. අපි කොපමණ කිව්වත් පසුගිය රජය කාලයේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ. ඊට පස්සේ අපේ රජය කාලයේත් ඒ සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ. හැබැයි වර්තමාන මුදල් ඇමතිවරයා පත් වුණාට පස්සේ අපි එතුමාට පැහැදිලිවම කිව්වා, "හලාවත ප්‍රදේශයේ ඉඳලා කෘත්‍රිම රා එනවා. ඒවා ඇඟට ඉතාමත් නරකයි. කෘත්‍රිම රා ස්වාභාවික රා වාගේ නොවෙයි. දවසකට කන්ටේනර් පිටින් එන්නේ. ඒවා තමයි අරක්කු කියලා, රා කියලා පාවිච්චි කරන්නේ. ඒවා දිගින් දිගටම පාවිච්චි කළාම ශරීරයට ඉතා අහිතකරයි" කියලා. එතුමා මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගත්තා. මෙන්ඩිස් අරක්කු සමාගම, DCSL එක ඇතුළු අපේ පළාතේ අරක්කු නිෂ්පාදනය කරන හැම සමාගමකටම එතුමා නියම කළා, රා ලබා ගන්නා ගස් ප්‍රමාණය දන්වන්නය කියලා. ඒ අනුව ඔවුන්ට සිදු වුණා, දවසකට එක ගහකින් කොපමණ රා ලබා ගන්න පුළුවන්ද, ඒ අනුව කොපමණ බෝතල් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්ද කියලා කියන්න. මේ ක්‍රමවේදය පිළිගත්තාට පස්සේ, ඒ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගත්තා. නිලධාරීන් යොදවා ඒ සම්බන්ධයෙන් කටයුතු කළා. අද අරක්කු නිෂ්පාදනය කරන එක සමාගමක් වසා දමා තිබෙනවා. ඒ වාගේම ලුණු සහ මේදයටත් මෙවැනිම බදු ක්‍රමයක් ගෙනැවිත් ඒවා පාවිච්චි කරන ප්‍රමාණය අඩු කරන්නත් ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා.

මේ වාගේම අපි පසුගිය අවුරුද්දේ සියයට 90ක් දක්වා දුම්කොළ බද්ද වැඩි කළා. මෙය තමයි දැනට ලෝකයේ වැඩි වශයෙන්ම දුම්කොළ සමාගමට බදු ගැසූ අවස්ථාව. ඒ වෙලාවේ දුම්කොළ සමාගමේ සභාපතිවරයා කලබල වෙලා ලංකාවට

ඇවිල්ලා අපත් සමඟ නොයෙකුත් සාකච්ඡා කළා. නමුත්, අපි ඒවාට එකඟ වුණේ නැහැ. මෙහි තිබෙන භයානකකම ගැන අපි ඔවුන්ට කරුණු පෙන්වා දුන්නා. එම ව්‍යාපාරයෙන් ඔවුන්ට සියයට එකක ලාභයක් තිබෙන බවයි ඔවුන් කිව්වේ. මේ හේතුව නිසා අවුරුදු 132ක තිබෙන ආයෝජනය ඔවුන්ට වසා දැමීමට සිදු වනවාය කිව්වා. අපි ඒවාට යටත් වෙන්නේ නැතිව අපේ කරුණු අපි ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම, අප දන්නා සංඛ්‍යා ලේඛන -දත්ත- අනුව අවසානයේදී අපි මේක ක්‍රියාත්මක කළා. "සියයට එකයි ලාභය. ඒක නිසා අපට කර ගෙන යන්න බැහැ" කියූ සමාගම තවමත් කර ගෙන යනවා. නමුත්, අපගේ එම ක්‍රියාව නිසා 2017 අවුරුද්දේ සිගරට් පාවිච්චිය -අපේ ආචාර්ය බන්දුල ගුණවර්ධනත් ඇතුළුව- බිලියනයකින් අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] දැන් බොන්නේම නැහැ නේ? සම්පූර්ණයෙන්ම දුම් බොන ප්‍රමාණය සිගරට් බිලියනයකින් අඩු වෙලා තිබෙනවා. මේ සියයට 90ක බදු ගණනය කිරීම ඔවුන් අවුරුදු 20කදී කරපු ප්‍රයත්නයට වඩා වැදගත් කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා. මේ විධියට අපි බදු පනවලා මේ කරන ක්‍රියාදාමය ඔවුන් පෙන්වා දී තිබෙන්නේ ඒ සඳහා ලබා දුන් දේශපාලන නායකත්වය පිළිබඳවයි. 2016 ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියාව පිළිබඳ වාර්තාවේ මේ ආකාරයට කියනවා.

“Sri Lanka made public health history in 2016 by achieving significant health milestones and received international accolades for its achievements in improving public health.” ඒ, පිටුව 115.

ඔවුන් කියනවා, “The country’s achievements are a testament to robust leadership, unwavering political commitment and strong partnerships dedicated to ensuring healthy lives and positive well-being for all.”

තවදුරටත් ඔවුන් කියනවා, “There is a sufficient political commitment for NCD prevention and control, -NCD කියන්නේ, Non Communicable Diseases- efforts to address these diseases have been hampered by a lack of prioritization, monitoring and evaluation. A key milestone was reached in April, 2016 with the launch of the National Multisectoral Action Plan for Prevention and Control of NCDs (2016-2020).”

ඔවුන් කියනවා, “In addition, Sri Lanka became the first country in the South-East Region to establish an NCD Alliance - a key recommendation of the Global NCD Action Plan. The Alliance, launched by the Minister of Health, His Excellency (Dr.) Rajitha Senaratne, during the WHO Regional Committee session in September, 2016, consists of major NCD-affiliated organizations,...”

තවදුරටත් 119 වන පිටුවේ ඔවුන් කියනවා, “The Government also banned smokeless tobacco products and is now planning to require plain packaging of tobacco, ban the sales of loose cigarettes, and employ a licensing system for tobacco sales.” කියලා. එවැනි ආකාරයට ඔවුන් දිගින් දිගටම අපට ප්‍රශංසා කරනවා.

ඔවුන්ගේ Universal Health Coverage Study Series No. 38 හිදී ඔවුන් පැහැදිලිවම කියනවා, “Overall, Sri Lanka’s health system is pro-poor, and except for the convenience factor it does not appear to be the case that 'health services for the poor are poor health services,' a claim sometimes voiced about other countries. A global study using benefit incidence analysis found Sri Lanka’s government health system to be the second most pro-poor out of 66 countries studied.” රටවල් 66කින් දෙවැනි ස්ථානයට ඇවිල්ලා තිබෙන්නේ අපේ දුප්පතුන්ට හිතවාදී සෞඛ්‍ය සේවය. ඔවුන් පැහැදිලිවම කියන අනෙක් කාරණය නම්, ඒ හිතවාදී සෞඛ්‍ය සේවය දුප්පත් නැති බවත් ඔප්පු කරලා තිබෙනවාය කියලායි.

වැඩිදුරටත් ඔවුන් කියනවා, “Fortunately, Sri Lanka has taken a proactive approach to tobacco control, most notably through high cigarette taxes, and therefore does not face a tobacco-related disease burden as large as many middle-income countries.” කියලා. ඒ අනුව, මේ විධියට ගත්ත ක්‍රියා මාර්ගය ඔවුන් ප්‍රශංසාවකට ලක් කරනවා.

ඊළඟට, මම කියවනවා 2016 වර්ෂයේ ශ්‍රී ලංකාව ගැන තිබෙන ඔවුන්ගේ වාර්තාවේ , "Looking Forward" කියලා අවසානයේදී ඔවුන් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ. ඒකේ තිබෙනවා, “Steadfast political commitment helped the country achieve major gains in 2016. Sri Lanka withstood pressure from the food and beverage industry and introduced traffic light labelling on sugary food and drinks. Tobacco taxation was increased significantly despite resistance.

There will be many challenges ahead as the country gears towards plain packaging, introducing stricter tobacco and alcohol control legislation and extension of the traffic light labelling system. WHO will continue to support the country in its mission to resist industry interference and address the growing challenge of NCDs.

Sri Lanka is one of six countries for targeted WHO support on NCD prevention and control from al three levels of the organization - WHO headquarters, WHO Regional Office for South-East Asia and WHO Country Office for Sri Lanka. This will provide a major boost to the country’s efforts to reduce the NCD burden.” කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මෙම ප්‍රයත්නය සඳහා මුදල් ඇමතිවරයා අපට ලබා දුන් සහයෝගයට ඉතාමත්ම ස්තුතිවන්ත වෙමින්, මෙම බදු ප්‍රමාණ දැනට මේ අන්දමින් ක්‍රියාත්මක කිරීමට එතුමාට සම්පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[අ.භා. 1.46]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්ලාගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපේ පූර්ණ අනුමැතිය සහ සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම, අපේ ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා දේශපාලනය අඩුවෙන් කරලා අමාත්‍යාංශයේ වැඩ වැඩියෙන් කරනකොට අපූරු යමක් එකතු වෙනවා. ඒ එකතු වෙන ටික නැති වෙන්නේ ඕනෑවට වඩා වැඩියෙන් දේශපාලනය කරන්න ගියාමයි. එහෙම නැත්නම්, එතුමා ගෙන යන යහපත් වූ ක්‍රියා මාර්ග සඳහා අපේ සහයෝගය දෙනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ඒ නිසා එතුමා ඉදිරිපත් කර තිබෙන මිනිස් පරිභෝජනයට අහිතකර සහ මිනිසුන්ගේ ශාරීරික සෞඛ්‍යයේ පැවැත්මට තර්ජනයක් වන දේ භාවිතය අඩු කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගවලට අපේ අනුග්‍රහය ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකාබද්ධ විපක්ෂය වශයෙන් මම ප්‍රධාන වශයෙන්ම සාකච්ඡා කරන්න බලාපොරොත්තු වන්නේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳවයි. අපේ රටේ ඉතිහාසයේ ඉතාම නරක ලෙස පාර්ලිමේන්තුව සතු බලය පෞද්ගලික දේශපාලනීකරණය විසින් උදුරාගෙන, ලංකා ආණ්ඩුවට ණය ලබා ගැනීමේදී විවිධ පෞද්ගලික න්‍යාය පත්‍ර හා අභිලාෂයන් ඉෂ්ට කර ගන්න පුළුවන් වන ආකාරයට තමයි මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙන්නේ කියන එක ප්‍රථමයෙන් සඳහන් කළ යුතු වෙනවා. එයට හේතුව මෙකයි. මේ වන විට මේ ණය පිළිබඳව විවිධ මිථ්‍යාවන් රාශියක් වපුරා තිබෙනවා. ඒවා තමයි, "ලංකාවේ ණය ප්‍රශ්නය ඇති වී තිබෙන්නේ, අපි ණය උගුලකට හසු කර තිබෙන්නේ මහින්ද රාජපක්ෂ රජයෙනුයි; මේ සියල්ලටම වැරදිකරු මහින්ද රාජපක්ෂ මැතිතුමායි; ඒ නිසා තමයි මේ ණය ගන්නා සියලු දේවල් වෙනස් කරන්න සිද්ධවෙලා තිබෙන්නේ; ආණ්ඩුවට මොකුත් කර ගන්න බැරිත් ඒක නිසායි." කියන ඒවා. මේ සියලු දෙනා අමතක කරන සත්‍යයක් තිබෙනවා.

අපි නිදහස ලැබූ දවසේ සිට මේ රටේ බලයට පත් වුණු සෑම රජයක් විසින්ම ගන්නා ලද ණය ප්‍රමාණය වර්ෂයෙන් වර්ෂය වැඩි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එයට හේතුව තමයි දීර්ඝ කාලයක් තිස්සේ එදිනෙදා පවත්වාගෙන යාමේ වියදම්, නැත්නම් පුනරාවර්තන වියදම් ටික පියවා ගන්නවත් ප්‍රමාණවත් ආදායමක් අපේ රටේ ආණ්ඩුවලට තිබුණේ නැති එක. හැමදාම අපි සටන් පාඨ කිව්වේ, "පඩි වැඩි කරන්න.", " සමෘද්ධි දීමනාව වැඩි කරන්න.", "වෙනත් සහනාධාර වැඩි කරන්න." කියලායි. වියදම් වැඩි වෙනවා. වියදම් වැඩි වීමේ වේගයට සාපේක්ෂව ආණ්ඩුවේ ආදායම් වැඩි වන්නේ නැති වුණාම, රාජ්‍ය අය වැයේ වර්තන ගිණුමේ හිඟයක් ඇති වෙනවා. පවත්වාගෙන යන්න බැරි වෙනවා. අපි කුටුම්භයක් - පවුලක්- ගත්තත්, ආයතනයක් ගත්තත්, රටක් ගත්තත් එදිනෙදා පවත්වාගෙන යාමේ වියදම්, ලැබෙන ආදායමට වඩා වැඩි නම් ණය වෙන්න සිද්ධ වෙනවා. මහින්ද රාජපක්ෂ යුගය වෙනකොට ඒ තත්ත්වය වෙනස් වුණා. අපට එදිනෙදා පවත්වාගෙන යාමේ වියදම්වලට ණය ගන්නවාට වඩා වැඩි ණය ප්‍රමාණයක් මූලික ජාතික අරමුණු දෙකක් වෙනුවෙන් ගන්න සිද්ධ වුණා. එයින් එකක් තමයි අවුරුදු තිහක් තිස්සේ කිසිම රජයකට මර්දනය කරන්න බැරි වුණු කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය. ඒ ත්‍රස්තවාදය විසින් මුහුදු වෙරළින් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වෙනම රටක් ලෙස කඩා ගැනීම සඳහා ඉතා මිලේච්ඡ ත්‍රස්තවාදී අරගලයක් පවත්වාගෙන ගියා. ඒ අයට බටහිර රටවලින් විශාල විදේශ ආධාර හා නවීන තාක්ෂණික උපකරණ යනාදිය ලැබුණ නිසා, ඒ සඳහා අවශ්‍ය යුද ආයුධ හා වෙනත් උපකරණ ගැනීමට විශාල මුදල් සම්භාරයක් ණයට ගැනීමට සිද්ධ වුණා. යුද්ධය සඳහා සාමාන්‍ය පොලී අනුපාතය යටතේ ණය දෙන්නේ නැහැ. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන යුද්ධයක් සඳහා ණය දෙන්නේ නැහැ. එතකොට ජාතික ආරක්ෂාව පිළිබඳව දිවුරුම් දී තිබෙන රජයක් හැටියට, කැමැති වුණත් නැතත් වෙළෙඳපොළේ පවතින වෙනත් පොලී අනුපාතයන් යටතේ හෝ ණය ගන්න සිද්ධ වෙනවා.

එදා අපි HSBC බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ණයක් ගන්න යනකොට, අපේ වර්තමාන අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්සත් ජාතික පක්ෂය වශයෙන්; විපක්ෂ නායක වශයෙන් ඒ බැංකුව ඉදිරිපිටට ගිහිල්ලා කිව්වා, "මේ ණය ගන්නේ යුද්ධයට. ඒ නිසා ඒ මුදල් දෙන්න එපා. දුන්නොත් මගේ ආණ්ඩුවක් ආවොත් ඒ ණය ආපසු ගෙවන්නේ නැහැ"යි කියලා. ඒ නිසා රටේ යුද්ධය නිම කරලා, සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු මනුෂ්‍යයන්ට බෝම්බ බියෙන් තොරව, ත්‍රස්තවාදී ප්‍රහාරවලින් තොරව, මිලේච්ඡත්වයෙන් තොරව ජීවත් වෙන්න අයිතිය ලබා දීම වෙනුවෙන් ණය ලබා ගන්න සිද්ධ වුණාය කියන කරුණ අප පිළිගත යුතු සත්‍යයක්.

එහෙම යුද්ධයක් ලංකාවේ තිබුණේ නැහැ වාගේයි අද එක්සත් ජාතික පක්ෂයේ මහත්වරු කථා කරන්නේ. ඒ ගොල්ලන් තමයි යුද්ධය ඇති කළේ, 83 කළු ජූලිය ගෙනැල්ලා. දෙමළ මනුස්සයන් ඝාතනය කරන්න ඉඩ දීලා, කඩ මංකොල්ල කන්න ඉඩ දීලා, ඇඳිරි නීතිය, හදිසි නීතිය දාන්නේ නැතුව මේ අර්බුදය නිර්මාණය කරපු මිනිස්සු, එය ඉවර කිරීම සඳහා කළ උත්සාහයේදී ආණ්ඩුවට සහයෝගයක් දුන්නේ නැහැ. නමුත් ණය අරගෙන හෝ ඒ යුද්ධය නිම කළා. යුද්ධය නිම වුණාට පස්සේ උතුරේ සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබුණු දුම්රිය මාර්ග, මහා මාර්ග, විදුලි බලය, සන්නිවේදන ක්‍රම නැවත සකස් කළා. අවුරුදු 30ක් තිබුණේ නැති සංවර්ධනයක් උතුර සහ නැඟෙනහිර පළාත්වලට ඇති කිරීම සඳහා 'උතුරු වසන්තය', 'නැඟෙනහිර නවෝදය' වැනි ව්‍යාපෘති වෙනුවෙන් දැවැන්ත ණය ප්‍රමාණයක් ගන්න සිදු වුණා.

බිම් බෝම්බ ඉවත් කරන්න, සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබුණු දුම්රිය මාර්ගය නැවත හදන්න, ගොවිතැනක් කරන්න බැරි ලෙස පුරන් වෙච්ච වෙල් යායවල් ගොවිතැන් කරන්න පුළුවන් වෙන්න වැව්-අමුණු ටික හදන්න, විදුලිය කොහෙත්ම නොතිබුණු ප්‍රදේශවලට සම්පූර්ණයෙන් විදුලි බලය ලබා දෙන්න, විදුලි සන්දේශ ක්‍රම නොතිබුණු ප්‍රදේශවලට විදුලි සන්දේශ ක්‍රම ලබා දෙන්න, 'උතුරු වසන්තය', 'නැඟෙනහිර නවෝදය' යටතේ, දකුණට ලබා ගත්තාටත් වඩා බොහෝ වැඩි ගුණයක ණය ප්‍රමාණයක් උතුර සහ නැඟෙනහිර ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදවන්නට සිදු වුණා. ඒක නිසා රජය ණය ගත්තු බව ඇත්ත. සාපේක්ෂව, මේ අවුරුදු තුනට තමුන්නාන්සේලාගේ රජය ඒ ණය ගැනීම පරද්දලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. 1950 ලංකාවේ ණය තිබුණේ, මිලියන 654යි; දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 17යි. 1948 අපට නිදහස ලැබුණා. නිදහස ලැබිලා ලංකාවේ පළමු මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළේ ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. එතුමා 1950 තමයි ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවුවේ. ඒ පිහිටුවපු අවස්ථාවේ නොපියවූ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය මිලියන 654යි; එවකට පැවැති දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 17යි. 1977 වෙන කොට මේ ණය ප්‍රමාණය බිලියන 24.9යි. 1977 විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය හඳුන්වා දෙන තෙක් ලංකාවේ ණය තිබුණේ බිලියන 25යි; දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 68යි. 1950-77 අවුරුදු 27කට මේ ලංකාවේ තිබුණු ණය ප්‍රමාණය රුපියල් බිලියන 25යි; එවකට තිබුණු දළ දේශීය නිෂ්පාදනය හැටියට සියයට 68.6යි. විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය හඳුන්වලා දුන්නා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. ඒ විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය යටතේ අපේ රටේ ප්‍රධාන ප්‍රශ්න දෙකක් ඇති වුණා. වෙළෙඳ පොළ විවෘත කළාට පස්සේ අපනයන ආදායම් වැඩි වෙනවාට වඩා වැඩි වේගයකින් ආනයන වියදම් වැඩි වුණා. එතකොට විදේශ විනිමය පරතරයක් ඇති වුණා. ආයෝජනය වැඩියෙන් කළා, ඉතිරි කිරීම් ප්‍රමාණයට වඩා ඉතුරුම් හා ආයෝජනය අතර පරතයක් ඇති වුණා. "Two-gap Theory of Development" කියලා එකක් තිබෙනවා. ඒ, ආර්ථික සංවර්ධනය පිළිබඳව ද්විත්ව පරතර න්‍යාය. ඒ අනුව ලෝකයේ අපි වාගේ තුන්වැනි ලෝකයේ රටවල ඉතුරුම් හා ආයෝජනය අතර පරතරයත්, විදේශ විනිමය ඉපයුම් හා ගෙවීම් අතර පරතරයත් කියන පරතරයන් විශාල ලෙස

වර්ධනය වුණා. 1977දී බිලියන 25ක් වුණු ණය බර 1989 වන විට, එක්සත් ජාතික පක්ෂ රජය සමයේ වැඩි වුණා, බිලියන 273ට. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදනය 100ක් නම්, එක්සත් ජාතික පක්ෂ රජය යටතේ රටේ ණය 108.7යි. මේක තමයි නිදහසින් පස්සේ ලංකා ඉතිහාසයේ දරුණුතම ණය අර්බුදය. රටේ දළ දේශීය නිෂ්පාදනය 100ක් නම් 1989දී නොපියවූ ණය ප්‍රමාණය 108ක්.

ඊට පස්සේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගන්න කොට, 2004දී ණය තිබුණේ බිලියන 2,139යි. දළ දේශීය නිෂ්පාදනය 100ක් නම් 102ක් ණය තිබුණා. මේ ණය අර්බුදය භාර ගත්තේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන්. මොකද ජාතියේ නිෂ්පාදනය 100ක් නම්, ඒ අවස්ථාවේදී ණය තිබුණේ 102ක්. එහෙම භාර ගත්තු රජයකට යුද්ධයක් කරන්න තිබුණා; ලෝකයේ උහුලා ගන්න බැරි ඛනිජ තෙල් අර්බුදයක් තිබුණා; ලෝක ආහාර අර්බුදයක් තිබුණා; ලෝකයේ මූල්‍ය අර්බුදයක් තිබුණා. මේ සියලු අර්බුදයන්ට මුහුණ දෙමිනුත් මේ ණය ප්‍රමාණය මහින්ද රාජපක්ෂ යුගයේදී වැඩි වුණේ ට්‍රිලියන 7ක් දක්වායි.

මේ වන විට ට්‍රිලියන 10කට වඩා වැඩි, නොපියවූ ණය ප්‍රමාණයක් තිබෙනවා. මුදල් අමාත්‍යවරයා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා, වාර්තාවක්; ප්‍රස්තාර සටහන් ද ඇතුළුව. ලංකා ඉතිහාසයේ කෙටි කාලයක් තුළදී -මේ වර්ෂ තුනේදී- වැඩිම ණය ප්‍රමාණයක්, ඓතිහාසික වශයෙන් වැඩිම ණය කන්දරාවක් ලබා ගත් රජය ලෙස මේ ආණ්ඩුව වාර්තාවක් තබා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කියනවා, "ගත්තු පරණ ණය තමයි මේ ගෙවන්නේ" කියා. මහින්ද රාජපක්ෂ රජය ගෙව්වේ අලුතින් ගත් ණය ද? ඕනෑම රජයක යුතුකම තමයි ඊට ඉස්සර වෙලා පැවැති ආණ්ඩුව ගත් ණය ගෙවීම. කලින් පැවැති ආණ්ඩුව ගත් ණය තමයි ඊට පසුව එන ආණ්ඩුව ගෙවන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 වර්ෂයේ රට භාර ගන්න කොට ගෙවා තිබෙන්නේ 1977 වර්ෂයෙන් පසුව -1970 ගණන්වල 1980 ගණන්වල- ගත් ණයයි. ඒ ණය 2005 වර්ෂයේ සිට ගෙව්වේ කවුද? ඒ, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ණය ගැනීමේ ප්‍රධාන අරමුණු තුන මොනවාද? රාජ්‍ය අය වැයේ නොපියවූ යම් හිඟයක් තිබෙනවා නම් ඒ හිඟය පියවන්න ණය ගන්න ඕනෑ. ගත් ණය වාරිකවල පොලී ගෙවන්න ණය ගන්න ඕනෑ. රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය ගන්න ඕනෑ. මේ අවශ්‍යතා සඳහා යම්කිසි රජයක් ණය අරගෙන තිබුණොත් ඒවායේ වත්කම්, වගකීම් කියන දෙකම ඊළඟ රජය භාර ගන්න ඕනෑ. නමුත් මේ තත්ත්වය තුළ ලංකා ඉතිහාසයේ මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? මූල්‍ය නීති පනත අනුව අපේ රටේ ණය ලබා ගැනීම පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවටයි. මා කැමැතියි, පහත සඳහන් කොටස කියවන්න.

"මුදල් නීති පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික කාර්යයක් වේ. කෙසේ වුවත් ණය ලබා ගැනීමේදී විමධ්‍යගත වූ ස්වරූපයක් ඇත. ණය ලබා ගැනීමේදී අවම වශයෙන් ආයතන 2ක් සම්බන්ධ වේ. එනම් ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවයි. ණය පදනම් වන්නේ රජයේ සුරැකුම්පත් වැඩ පිළිවෙළ මතය. ඒ අනුව භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා රුපියල් ණය ලබා ගැනීම් හා කළමනාකරණය කරනු ලබන්නේ මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මඟිනි. සහනදායී විදේශ ණය ලබා ගැනීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ. මීට අමතරව කලින් කලට මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය බැංකු ණය, විදේශ බැංකු ණය වැනි අනිකුත් ණය ගැනීම් ද සිදු කරනු ලැබේ. විමධ්‍යගත වීම ණය ලබා ගැනීමට බලය දෙනු ලබන බෙදී වෙන් වූ නීතිමය රාමුවේ ප්‍රතිඵලයකි. ඒ අනුව රාජ්‍ය ණයවලට අදාළ නීති සම්පාදනය පහත දක්වා ඇති පරිදි වේ.

1. 1949 මුදල් නීති පනතේ 106 (1) වගන්තියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ හෝ ලිඛිත නීතියකින් හෝ වෙනත් කවර ආකාරයකින් හෝ පිහිටුවන ලද රජය වෙනුවෙන් ක්‍රියා කරන නියෝජිත ආයතනයක රාජ්‍ය මූල්‍ය නියෝජිතයා සහ බැංකුකරුවා ලෙස ක්‍රියා කළ යුතු ය. 113 වන වගන්තියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ නියෝජිතයා ලෙස රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ වගකීම දැරිය යුතුය. 114 වන වගන්තියේ සඳහන් ආකාරයට රජය විසින් හෝ 106 වන උපවගන්තියේ (2) හි සඳහන් කරන ආකාරයට හෝ නියෝජිතයකු විසින් හෝ ඔවුන් වෙත කවර හෝ ලිඛිත නීති පද්ධතියක් මඟින් බලතල ලබා දී තිබුණද නව ණය මුදලක් ලබා ගැනීම හෝ ස්කන්ධ හෝ ණයකර නිකුත් කිරීමට පෙර එම යෝජිත ණය මුදලින් හෝ නිකුතුවෙන් ඇති විය හැකි මූල්‍යමය බලපෑම් පිළිබඳ මුදල් මණ්ඩලයේ උපදෙස් ලබා ගත යුතු ය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ අනුව මේ කාර්යය සම්පූර්ණයෙන්ම ඉතා නිවැරදි ලෙස කරන්න, ඕනෑ තරම් ණය ගන්න අවශ්‍ය බලතල සියල්ල මූල්‍ය නීති පනත මඟින් මේ ගරු සභාව ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා දී තිබෙනවා. ඒ සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් තිබෙනවා. මා කැමැතියි, 2016 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ II කොටසෙහි, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු කියන කොටසින් උපුටා දැක්වීමක් කරන්න. එහි "21. රාජ්‍ය ණය" කියන ශීර්ෂය යටතේ මෙසේ සඳහන් වනවා:

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

"රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රජයේ නියෝජිත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරයි. එම වගකීම් ඉටු කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත් සමඟ පිහිටුවන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙකියූ (LankaSecure) පද්ධතිය මඟින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම වේ.

මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය වෙළෙඳ පොළ දියුණු කිරීමෙහිලා කටයුතු කරයි."

ඒ අනුව, විසර්ජන පනතට අනුව රජයේ දළ ණය ගැනීම් සඳහා අරමුදල් රැස්කිරීම, රජයේ ණය වාරික පොලී ගෙවීම 1950 සිට මේ දක්වා කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැතිව කරලා තිබෙනවා. උදාහරණයක් වශයෙන්, "2016 වර්ෂයේදී, වසර තුළදී සිදු කරන ලද සමස්ත රාජ්‍ය ණය ගෙවීම රුපියල් බිලියන 1,334.73ක් වූ අතර, ඒ දේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,042.72කින් සහ විදේශ ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 292.01කින් සමන්විත වේ" කියලා මේ වාර්තාවේ සඳහන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත්, මේ මහා බිල්ලෙක් ලෙස මවන්නේ විදේශ ණය ගෙවා ගන්න විධියක් නැහැ කියලායි. ඉලක්කම් මොනවත් දන්නේ නැහැ. ඔක්කෝම කටවිය ගිරවුන් වාගේ කියනවා, "අලි ප්‍රශ්නයක්, මේවා ගෙවා ගන්න විධියක් නැහැ, වහ කන්නයි වෙන්නේ, මොනවත් කර ගන්න බැහැ" කියලා. මේ විදේශ ණය ගෙවන්න තිබෙන ප්‍රමාණය කීයක්ද?

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ, ගිණුම් හා කටයුතු 11 කොටසේ සඳහන් වන දත්ත ඉදිරිපත් කරන්න මම කැමැතියි. එහි සඳහන් වන ආකාරයට වසර තුළදී ණය ගෙවීම රුපියල් බිලියන 1,334. 73යි. ණය සේවාකරණ - debt service - කිව්වාම ණය වාරිකයි, පොලියයි කියන දෙකම ඇතුළත් වෙනවා. එයින් රුපියල් බිලියන 1,042ක් දේශීයව ගෙවන්න තිබෙනවා, ලංකා බැංකුවට, මහජන බැංකුවට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට, සේවක අර්ථසාධක අරමුදලට සහ වෙනත් ආයතනවලට. එතකොට විදේශ ණය සේවාකරණ සඳහා ගිහිල්ලා තිබෙන්නේ රුපියල් බිලියන 292.01යි. මේ රුපියල් බිලියන 292ක්, රුපියල් බිලියන 300ක් කියන්නේ මොනවාද?

මම අහන්න කැමැතියි, ඉතාම වැදගත් කරුණක්. මේ රජයට ලංකාවේ කිසිම රජයකට නොවුණු විධියේ වාසියක් සිද්ධ වුණා. ඒ වාසිය සිද්ධ වුණේ ලෝක වෙළෙඳ පොළේ බනිජ තෙල් මිල අඩු වීමෙනුයි. මහින්ද රාජපක්ෂ යුගයේදී තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 120, 122, 125ට ඉහළ ගියා, ලෝක බනිජ තෙල් අර්බුදය යටතේ. අපේ රට තෙලෙන් බැදුණා. 2014 බනිජ තෙල් ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 4,597යි. 2015 තමුන්නාන්සේලාගේ රජය ආපු ගමන් ඒක අඩු වුණා ඩොලර් මිලියන 2,700ට. තෙල් ආනයනයෙන් ඉතිරි වුණු විදේශ විනිමය, -රට සල්ලි ප්‍රමාණය- ඩොලර් මිලියන 1,897යි. 2014 බනිජ තෙල් ආනයන වියදම ඩොලර් මිලියන 4,597යි. 2016 මේ වියදම අඩු වුණා ඩොලර් මිලියන 2,418ට. විදේශ විනිමය ඩොලර් මිලියන 2,579ක් ඉතිරි වුණා. 2017 අවුරුද්දේ මහ බැංකු වාර්තාව හෙට අනිද්දා පිට වුණාම ඉතිරි ගණන මම කියන්නම්. මහින්ද රාජපක්ෂ යුගයේ පැවතුණු තෙල් මිලට වඩා තෙල් මිල අඩු වීම නිසා රට ඇතුළේ ඉතිරි වුණු විදේශ විනිමය ප්‍රමාණය දැනට ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට වඩා වැඩියි. ඒ ටික කෝ? අර තෙල් මිල ඒ විධියටම තිබුණා නම් තමුන්නාන්සේලාට දවසක්වත් ආණ්ඩුව කරන්න බැහැනේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පසුගිය වර්ෂ තුනේ රටේ ආර්ථිකය කළමනාකරණය පිළිබඳ වගකීම, අග්‍රාමාත්‍යතුමාට, මුදල් අමාත්‍යතුමාට, බැංකු කටයුතු අමාත්‍යතුමාට භාර දුන්නා; එක්සත් ජාතික පක්ෂයට භාර දුන්නා. භාර දුන්නාට ආර්ථිකය කළමනාකරණය කරන්න බැරි වුණා. ආර්ථිකය විනාශ වුණා. ඒක නිසා පසුගිය මැතිවරණ ප්‍රතිඵලයෙන් පස්සේ "මම ඇවිල්ලා මේක හදනවා" කියලා එතුමා කිව්වා. ඒක හදනවා කියලා තිබියදී, සිද්ධ වුණු ලොකුම ප්‍රතිඵලය විධියට ඉදිරිපත් කළ මේ පනතට අපි භය වුණේ ඇයි කියන එක මම කියන්නම්. ගමේ කථාවක් වන "ගිනි පෙනෙල්ලෙන් බැට කෑ මිනිහ කණා මැදිරියාටත් භයලු" කියන කථාව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් දන්නවා ඇති. 2015 ආණ්ඩුව ලැබුණු ගමන් දින සියයේ විප්ලවය යටතේ, මහ දවල් මහ බැංකුව කොල්ල කාපු අවස්ථාවේ සිට මේ වන විට ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංගය තෙක් පාරා වළල්ලක් ලෙස කැරකි, කැරකී එන්නේ මේ ණය ගැනීම සම්බන්ධයෙන් සිද්ධ වුණු හොරකමයි. 2015 මාර්තු මාසයේ 19වැනි දා -හරියටම මීට අවුරුදු තුනකට පෙර- "ලංකාදීප" පත්තරේ මුල් පිටුවේ සඳහන් වුණු ප්‍රවෘත්තිය කියවන්න මම කැමැතියි. එහි මෙසේ සඳහන් වෙනවා:

අයථා බැඳුම්කර ගනුදෙනුවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා වහාම එම ධුරයෙන් ඉවත් කරන ලෙස රජයට බලකරමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන් පිරිසක් කොළඹ ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානය ඉදිරිපිටදී රෑයේ උද්ඝෝෂණයේ යෙදී සිටි අයුරු.

විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මහතා, හිටපු ඇමතිවරුන් වන ජෝන් සෙනෙවිරත්න, බන්දුල ගුණවර්ධන සහ තිස්ස කරල්ලියද්ද යන මහත්වරුන් ද සමඟ උද්ඝෝෂණය පැවැති ස්ථානයට පැමිණි අවස්ථාව කුඩා ඡායාරූපයෙන් දැක්වේ."

"මහ බැංකු අධිපති ඉවත් කරනු:

සන්ධාන මන්ත්‍රීවරු මහ බැංකුව ඉදිරිපිට විරෝධතාවක"

මම මේ පුවත් පත් දැන්වීම **සභාගත*** කරනවා.

හරියටම මීට අවුරුදු තුනකට පෙර, 2015 මාර්තු මාසයේ එක්සත් ජනතා නිදහස් පන්ධානයේ මන්ත්‍රීවරුන් වන අපි ගිහිල්ලා ශ්‍රී ලංකා මහ බැංකුව වටලලා කිව්වා, "මේ සිදුවන පාඩුව වෙන්න දෙන්න එපා, මහ බැංකු අධිපති ඉවත් කරන්න" කියලා. ඒක කළා නම් අද මේ රජයට විරුද්ධව දෝෂාභියෝගයක් එන්නේ නැහැ. මහ බැංකුවේ බැඳුම්කර හොරකම ගැන පළමුවෙන්ම ප්‍රශ්න කරන්න ඉදිරිපත් වුණේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමායි, මමයි, නියෝජ්‍ය කථානායක තිලංග සුමතිපාල මැතිතුමායි. අපි කිහිප දෙනා ඇතුළු පිරිසකට විතරයි මහ බැංකුව ඇතුළට යන්න දුන්නේ. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාවට ඉස්සෙල්ලාම අත්සන් තැබිය යුත්තේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමායි. මොකද, විශ්වාස භංග යෝජනාව ගෙනෙන ප්‍රධාන කරුණ තමයි මහ බැංකු හොරකම. ඊළඟට නියෝජ්‍ය කථානායකතුමා පළමුවැනි දවසේ ඉදිරියෙන්ම අත්සන් කරන්න ඕනෑ. මොකද, මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා මේ හොරකමට විරුද්ධව මහ බැංකුව ඇතුළට ගියේ එතුමායි. 1950 සිට 2016 දක්වා භාණ්ඩාගාර

** පුස්තකාලයේ තබා ඇත.*

** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

බිල්පත්වලින් ගත් ණය ප්‍රමාණය රුපියල්වලින්, භාණ්ඩාගාර බැඳුම්කරවලින් ගත් ණය, ඒවායේ එකතුව, විදේශීය ණය, ඒවායේ එකතුව, දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය, ඒවායේ එකතුව ඇතුළත් ඒ සියලුම විස්තර මම **සභාගත*** කරනවා, ඇත්ත ණය පිළිබඳව මන්ත්‍රීතුමන්ලාට නියම ස්වරූපයෙන් බලාගන්න.

මක් නිසාද යත්, ගරු අග්‍රාමාත්‍යතුමා ණය බිල්ලා මවන්න ඇවිල්ලා කිව්වා, මහින්ද රාජපක්ෂගේ කාලයේ රුපියල් බිලියන 4,702ක ණය පොත්වල ලියලා නැහැ කියලා. පනත් කෙටුම්පත් සම්මත කළාට, එහෙම කියද්දී මිනිස්සු අපට ණය දෙයිද? ඊළඟට, ඡන්දයක් තිබියදී රජයේ විගණකාධිපතිවරයා කිව්වා, "විගණකාධිපති කළ යුත්තේ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම" කියලා. ණය තියාගෙන කිව්වා, "මේ ණයවලට මොනවා වුණාද දන්නේ නැහැ, මේක අවුල් ජාලාවක්" කියලා. ශ්‍රී ලංකා මහ බැංකුව -රාජ්‍ය ණය පිළිබඳව වගකීම දරන ආයතනය, මේ පනතෙන් බලය පවරා තිබෙන ආයතනය- ලබාගත් ණය හැම ශතයක්ම ලිව්ව ආකාරය පිළිබඳව වාර්තා කරලා තිබෙනවා. ඒක නිසා මේ ආයතනය දේශපාලනීකරණය කරලා, තව දුරටත් දේශපාලනීකරණය කිරීම සඳහා තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පතේ 4.(1) උප වගන්තියේ මෙහෙම කියනවා:

> 4. (1) "අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ, මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධාන සහ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 114 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව-
>
> (අ) ණයක් මගින් එකතු කර ගත යුතු මුදල් ප්‍රමාණය;
>
> (ආ) එම ණය ලබා ගනු ලබන ආකාරය: සහ
>
> (ඇ) පවත්නා ණය පෙරාතු මිළ දී ගැනීම සහ පවත්නා ණය අලුත් ණය සමග හුවමාරු කිරීම ඇතුළු, එකී ආණ්ඩුවේ එම ගෙවීමේ වගකීම පියවීම සඳහා යෝග්‍ය බවට අමාත්‍යවරයා විසින් සළකනු ලබන ආකාරය,
>
> ඇතුළු රාජ්‍ය ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව මූල්‍යනය කිරීම සම්බන්ධයෙන් සහ එයට අදාළ ආනුෂංගික කාරණා පිළිබඳ තීරණය කරනු ලැබිය යුතු ය.
>
> (2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මගින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය."

දැන් බලන්න, මුදල් අමාත්‍යවරයා මංගල සමරවීර මහත්මයා. ශ්‍රී ලංකා මහ බැංකු විෂය භාර ඇමතිවරයා අග්‍රාමාත්‍යතුමා. අග්‍රාමාත්‍යතුමා මේකට පටලවන කොටම අපට සාධාරණ වූ සැකයක්, අවිශ්වාසයක් සහ මහා බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, එතුමා තමයි ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය එපා කියද්දී සිංගප්පූරු ජාතිකයෙක් ගෙනැල්ලා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කළේ. මහ දවල් මහ බැංකුව බිඳපු එතුමා ආරක්ෂා කරන්න සියලු ක්‍රමවේද යෙදුවේ අග්‍රාමාත්‍යතුමායි. මහ බැංකුව බිඳලා එතුමා දැන් රටින් පිටට පැනලා ගිහින් ඉන්නවා. අල්ලන්න ක්‍රමයකුත් නැහැ. සිංගප්පූරු පුරවැසියෙකුට, මේ රටේ දිවුරුමක් දෙන්න බැරි කෙනෙකුට මුදල් නෝට්ටුවට අත්සන් කරන්න ඉඩ ලබා දීමම, ඕනෑම ආණ්ඩුවක අග්‍රාමාත්‍යතුමා ඇතුළු ඒ මුළු ආණ්ඩුවම ගෙදර යන හේතුවක් නොවෙයිද කියන එක පමණක් ඔබතුමා, ඔබතුමාගේම හෘදය සාක්ෂියට තට්ටු කරලා බලන්නය කියා මම කියන්න කැමැතියි. මේ පනත් කෙටුම්පතෙන් කරන්න හදන්නේ වඳුරන්ට දැළි පිහිය දුන්නා වාගේ අග්‍රාමාත්‍යතුමාත්, අමාත්‍යවරයාත් ශ්‍රී ලංකා මහ බැංකුවේ තිබුණු ස්වෛරීභාවයට, ස්වාධීනත්වයට, ණය කළමනාකරණය කරන්න තිබුණු හැකියාවට ඇණිලි ගහන්න නිල වශයෙන් අවස්ථාව ලබා ගැනීමක්. එම නිසා තමයි මමත් සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත් මේ පනත් කෙටුම්පතට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා, අඩු ගණනේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්වත් පිහිටක් පැතුවේ පාර්ලිමේන්තුවේ බලය මෙලෙසින් ගෙනයන්න දෙන්න එපා කියලා.

ඊළඟට, 5වැනි වගන්තිය බලන්න. අපි මේ පාර්ලිමේන්තුවේදී විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරනවා. විසර්ජන පනත් කෙටුම්පත කියන්නේ වැදගත්ම පනත් කෙටුම්පතක්. පාර්ලිමේන්තුව මාසයක් තිස්සේ විසර්ජන පනත් කෙටුම්පත විවාද කරලා තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කළත්, මේ පනතේ 5වැනි වගන්තියෙන් කියනවා, "විසර්ජන පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වීම" කියලා. එතකොට, පාර්ලිමේන්තුවේ මාසයක් තිස්සේ තර්ක විතර්ක කරලා සම්මත කළ අය වැයෙහි තිබුණු කරුණක් නිදහස් වෙනවා; 2018 අය වැයෙන් නිදහස් වෙනවා. මේක අතීතයට බලපාන නීතියක්. ඒ නිසා අපි කියනවා, මේ 5වැනි වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කරන්න, මේක අතීතයට බලපාන ලෙස ගෙනෙන්න එපා කියලා.

ඊළඟට, 9වැනි වගන්තියේ තිබෙනවා,- [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, මෙතැන කියන්නේ අතීතය ගැන නොවෙයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2017 කියන්නේ, අතීතය නොවෙයි වර්තමානය ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, වර්තමානය. 2017 අවුරුද්දේ ගෙනාවේ 2018 Budget එකනේ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ඒක හොඳට දන්නවා නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි.

ඊළඟට 9වැනි වගන්තියේ, "අපරාධ හෝ සිවිල් නඩු කටයුතුවලින් ආරක්ෂාව" කියන කාරණය යටතේ මෙලෙස තිබෙනවා.

> "මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නිලධරයකු, සේවා නියුක්තකයකු, සේවකයකු හෝ නියෝජිතයකු වන්නා වූ කිසිම තැනැත්තකු,"

ණය ගත්තාම ඇති වන තත්ත්වයක් තුළදී ඒ අයට සිවිල් හෝ අපරාධ නඩුවක් පවරන්න බැහැ. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ඇතුළු මෙම සංශෝධනවලට එකඟ වූ රජයේ අයට. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුක්තිය තියාගෙන මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි විධියට සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙන එක ගැන මා ස්තුතිවන්ත වෙනවා. ඒ සංශෝධනයට අපි එකඟ වෙනවා. එකඟ වෙන්නේ නැති වගන්තිවලට අපි සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, ඒ සංශෝධන බාර ගන්න කියලා. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සංශෝධන බාර ගැනීම තුළින් ණය ලබා ගැනීම පිළිබඳ කිසිම ප්‍රශ්නයක්, ගැටලුවක් මතුවෙන්නේ නැහැ. ඒ තුළින් අවශ්‍ය කරන ණය ප්‍රමාණය ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත්, අද මේ රටේ ණය ලබා ගැනීම පිළිබඳව, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීම පිළිබඳව මෙවැනි විශේෂ නීතියක් අවශ්‍ය වෙන්නේ ඇයි කියන කරුණට ඇත්ත උත්තරයක් තිබෙනවා.

1950 සිට 2015 දක්වා දීර්ඝ කාලයක් සමස්ත මුදල් ක්‍රමය, සමස්ත බැංකු ක්‍රමය, සමස්ත ණය ක්‍රමය ඉතාම සුරක්ෂිත ලෙස පෝෂණය කොට ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ මුදුන් මල්කඩ විධියට ශ්‍රී ලංකා මහ බැංකුව කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කිව්වා. ඒක තමයි ඇත්ත.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඉතාම කුඩා සිද්ධියක් වුණත්, චෝදනාවක් වටින් ගොඩින් එල්ල වුණත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානියා වන මහ බැංකු අධිපතිවරයා ඉල්ලා අස් වුණා. නමුත්, ඉතාම අවාසනාවන්ත ලෙස මේ රජය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ පමණක් නොවෙයි, රටේ සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය පිළිබඳ විශ්වසනීය බව සම්පූර්ණයෙන්ම පලුදු වෙලා තිබෙනවා. කවුරු කියන දේ ද පිළිගන්නේ කියන එක පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එහෙම වෙන්නේ ඇයි? රටේ වගකිව යුතු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ණය ගැන එක කථාවක් කියනවා. රටේ විගණකාධිපතිවරයා මැතිවරණයක් ආසන්නයේ ණය ගැන තව කථාවක් කියනවා. ඒ කථා දෙකටම හාත්පසින් වෙනස් කථාවක් මේ ගරු සභාවේදී කථා කරන මන්ත්‍රීවරු කියනවා. ඊට පස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව රටේ මූල්‍ය ක්‍රමය බාර ආයතනය ලෙස නිවේදනයක් නිකුත් කරනවා, ඇත්ත තත්ත්වය මේකයි කියලා. ඒකත් නිකුත් කරන්නේ බොහොම භයෙන්. ශ්‍රී ලංකා මහ බැංකුවටත් දේශපාලනඥයන් තර්ජනය කරන තත්ත්වයක් ඇති වුණොත්, රටේ සමස්ත මුදල් ක්‍රමය සුමටව පාලනය කරන්න බැහැ. අපි මන්ත්‍රීවරු වුණත් රටක මූල්‍ය ක්‍රමය වැනි ඉතාම සංවේදී කරුණුවලට කරන විවේචන විචාරණවලදී ප්‍රවේසමෙන් කටයුතු කිරීමේ වැදගත්කමක් ඇතිවෙන්නේ ඒ නිසායි. අන්තර්ජාතික ණය ශ්‍රේණිගත කිරීමේ Moody's වැනි ආයතන, Fitch වැනි ආයතනවල ක්‍රමවේදවලට අනුව මෑතකදී යුරෝපා ආර්ථික කොමිසමේ පාර්ලිමේන්තුවේ ඡන්ද 300 ගණනකින් ලංකාව අසාධු ලේඛනයට ඇතුළත් කළා, මුදල් විශුද්ධිකරණ රටක් කියලා. ඊළඟට, දූෂණය අතින් ලෝකයේ දූෂණය වඩාත් වැඩියෙන් තිබෙන රටවල් 4න් එකක් බවට අපේ රට පත් කළා.

මෙවැනි තත්ත්වයක් තුළ තමුන්නාන්සේලාගේ රජය විසින් කඩා වට්ටපු විශ්වසනීයභාවය නැවත බැංකුවට ගෙන ඒමේ අරමුණින් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේ විශ්වසනීයභාවය නැවත ඇති කරන්න නම්, දේශපාලනඥයන්ට ඇඟිලි ගසන්න ඉඩ ලැබෙන මෙම පනතට මහ බැංකුවේ සුරක්ෂිතබව ආරක්ෂා වන, පාර්ලිමේන්තුවට තිබෙන මුදල් බලය එළියට නොයන විධියට ගෙන එන සංශෝධනවලට එකඟ වෙන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.17]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආචාර්ය, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා මහ බැංකුව දැන් දේශපාලනයට යටත් වෙලා කියලා. දේශපාලනඥයෙක් තමයි එදා මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් පත් කළේ. මහ බැංකුව දේශපාලනයට තවත් යටත් කරන්න දෙයක් නැහැ. පසුගිය කාලයේ දේශපාලනඥයෙක් තමයි මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් පත් කරලා ඒ සෙල්ලම් දම දමා හිටියේ. ඒ වාගේම එතුමා කිව්වා, ශ්‍රී ලංකාව යුරෝපා පාර්ලිමේන්තුවේ blacklist එකට ඇතුළත් වෙලා තිබෙනවා කියලා. නමුත් අපි ඇතුළු වෙලා තිබෙන්නේ grey list එකට. ශ්‍රී ලංකාව එහෙම grey list එකට ඇතුළු වුණේ ඇයි? අපි grey list එකට ඇතුළු වුණේ ඇයි? එහෙම වුණේ පසුගිය කාලයේ කරපු මුදල් වංචා නිසායි. "2014 දක්වා කටයුතු සමීක්ෂණය කරලා ඒ හොරු ඇල්ලුවේ නැහැ, ඒ හොරු අල්ලන්න මීට වඩා නීති අවශ්‍යයි, ඒ නීති සම්පාදනය කරලා ඉක්මනට කියන්න, නැත්නම් dark-grey list එකට දමනවා, එහෙම කළේ නැත්නම් blacklist එකට දමනවා" කියලා ඔවුන් කිව්වා. ඒ අය කිව්වේ, 2014 දක්වා කරුණු විමර්ශනය කරලා සිදු වූ වැරදි නිවැරදි කරන්න කියායි. අපි එදා මේ කාරණය කිව්වා නේ. අපට පළාත් පාලන මැතිවරණයෙන් ප්‍රශ්නයක් ආවා. හොරු ඇල්ලුවේ නැහැ, හොරකම් කරපු සල්ලි ටික ආපහු ජනතාවට අරගෙන දුන්නේ නැහැ කියලා ජනතාව අපට කනේ පහරක් ගැහුවා. අපේ හොරු ඇල්ලීම දුර්වලයි කියලා අපට ප්‍රශ්නයක් ආවා. ඒ වාගේම ජාත්‍යන්තරය -යුරෝපීය පාර්ලිමේන්තුව- අපේ රට grey list එකට ඇතුළත් කළා. ඒ හොරු ඇල්ලුවේ නැහැ කියලා ඒ ගොල්ලොත් කියනවා. ඒ සඳහා මේ රටේ තිබෙන නීති මදි. මේ රටේ නීතිය මකුළු දැලක්; ශක්තිමත් නීති පද්ධතියක් නැහැ. මේ හොරු අධිකරණයට ගිහින් එළියට ඇවිත්, නිදහස් අරගළයට පණ පොවපු, රට බේරා ගත්ත කැප්පෙටිපොළ නිලමෙතුමන්ලා වාගේ කෑ ගහන්නේ අපේ නීතියේ තිබෙන දුර්වලතාව නිසායි.

ජාත්‍යන්තරය අපේ රට grey list එකට ඇතුළු කළේ ඇයි? 2014 දක්වා කරුණු සමීක්ෂණය කරලා ඒ හොරු ඇල්ලුවේ නැති නිසායි. රට බේරා ගත්ත වීරයෝ වාගේ තමයි ඒ හොරු කෑගහන්නේ. අන්න ඒ කෑ ගැසීම නවත්වන්න, හොරාට හොරකම ගැන බියක් හිතෙන විධියට නීති හදන්න කියලා තමයි ජාත්‍යන්තර ප්‍රජාව අපට කිව්වේ; grey list එකට අපේ රට ඇතුළු කළේ. ඔවුන් අපට කියා තිබෙනවා ඊළඟට අපේ රට dark-grey list එකට ඇතුළු කරනවා කියලා. ඊට ඉස්සර වෙලා අපි නීති හදනවා. නීතිය ශක්තිමත් කරලා එදිනෙදා නඩු අහන්න පුළුවන් වන විධියට මේ පනත ගෙනෙන්න කටයුතු කරන කොට, මේ රට ගැන විවේචනය කරන අය "එදිනෙදා නඩු අහන්න එපා, මේක වැරැදියි, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි" කියලා ඒකට

විරුද්ධව අද අධිකරණය තුළ තර්ක කරනවා. ඒ නිසා මට කියන්න තිබෙන්නේ අද මේ රටත්, සමාජයත් විකෘති වී තිබෙන බව තමයි; විකෘති කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ඒ විකෘතිය තමයි අපට නිවැරදි කරන්න වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගන්නා සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත කාලෝචිත කෙටුම්පතක්. අද මේ රටට ගෙවන්න වෙලා තිබෙන ණය ප්‍රමාණය දිහා බැලුවාම අපට තේරෙන්නේ මොකක්ද? පිදුරුතලාගල කන්ද පැත්තට ගිහින් බැලුවාම අපිට කඳු පේළි නේ පෙනෙන්නේ. එක කන්දක් උසට උසයි; අනික් තැන මිටියි; ආයෙත් තව උස කන්දක් තිබෙනවා. අන්න ඒ වාගේ කිසිම පිළිවෙළක් නැතිව තමයි ඒ ගොල්ලෝ ණය අරගෙන තිබෙන්නේ. ඒ ණය ගෙවීම ගැන කිසිම කළමනාකාරිත්වයක් නැහැ. හදිසියක් වුණු ගමන්, මැතිවරණයක් ළං වුණු ගමන් කෙටි කාලීන - short-term - ණය ගන්නවා. ඊළඟ අවුරුද්දේ බැලුවාම මේ ණය ප්‍රමාණය පිදුරුතලාගල කන්ද වාගෙයි. ඒ ණය කළමනාකරණය කරන්න තමයි අද මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ගෙනැත්, ඒ ණය 'ෆ්ලැට්' කරන්න කටයුතු කරන්න හදන්නේ. ලෝකයේ වෙළෙඳ පොළේ අඩු පොළියට ණය ගන්න තිබෙනවා නම්, කඩිනමින් ඒවා අරගෙන මේ ණය ගෙවා දමන්නයි හදන්නේ. අඩු පොළියට ණය ගන්න පුළුවන් අවස්ථාවේ ඒ විස්තර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, "මෙන්න මේකටයි අපි ණය ගන්නේ" කියලා අනුමත කරගෙන, ඒ ණය ගැනීමේ කටයුත්ත කරන්න තමයි අද මේ පනත ගෙනැත් බලය පවරන්නේ. මෙතෙක් කල් ඒ බලය තිබුණේ නැහැ.

2015දී අපි ඩොලර් මිලියන 2,031ක් ගෙව්වා. 2016දී ඩොලර් මිලියන 1,828ක් ගෙව්වා. 2017දී ඩොලර් මිලියන 2,417ක් ගෙව්වා. 2018දී ඩොලර් මිලියන 2,564ක් ගෙවන්න තිබෙනවා. 2019දී ඩොලර් මිලියන 3,992ක් ගෙවන්න තිබෙනවා. 2015ට ඉස්සර වෙලා ගත්ත ණය පිළිබඳව තමයි මම මේ කිව්වේ. මේවා අපේ ආණ්ඩුවෙන් ගත්ත ණය නොවෙයි. බලන්න, මේ ණය ගත්ත ක්‍රියාවලිය කොච්චර අක්‍රමවත්ද කියලා. එක අවුරුද්දක ඩොලර් මිලියන 2,031ක් ගෙවා තිබෙනවා. ලබන අවුරුද්දේ ඩොලර් මිලියන 3,900ක් ගෙවන්න තිබෙනවා. මේවා ඒ ගොල්ලෝ ගත්ත ණය. මේ ආණ්ඩුව ගත්ත ණය මේ ගණන්වලට එකතු කරලා නැහැ. අවුරුදු 10ක් පස්සට ගිහින් 2005 සිට 2014 දක්වා කාලය තුළ ගත්ත ණය ප්‍රමාණය එකතු කර බැලුවොත්, ඩොලර් මිලියන 9,893ක් තමයි 2005 සිට 2014 දක්වා වූ අවුරුදු 10ක කාලයට අපි ගෙවා තිබෙන්නේ. 2015 සිට 2024 දක්වා අවුරුදු 10ට පසුගිය ආණ්ඩුව ගත්ත ණයවලට විතරක් තව ඩොලර් මිලියන 27,785ක් ගෙවන්න තිබෙනවා. ඒ ණය ගෙවීම ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. කොහොමද, කෙළිය? මේවා අපි ගත් ණයද? අපිත් ණය ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 අවුරුද්දේ ගත් ණය ගෙවන්න රටේ ආදායම් මදි වෙලා අලුතින් ණය අරගෙන ඒ ණය ගෙවපු බව ඔබතුමාට මතක ඇති. ණයක් අරගෙන ණය ගෙවපු ඉතිහාසයක් පිළිබඳව මේ රටේ සඳහන් වෙන්නේ 2013 කාලයේ දීයි. ඒවා මතක නැහැ. ජේ.ආර්. ජයවර්ධන ණය ගත්තා තමයි. ජේ.ආර්. ජයවර්ධන ණය අරගෙන රට ආර්ථික වශයෙන් උඩු යටිකුරු කරලා පෙන්නුවා. ජේ.ආර්. ජයවර්ධන ණය අරගෙන මොකක්ද කළේ කියන කාරණය කවුරුත් අවිවාදයෙන් යුතුව පිළිගන්නවා. අත පය දිග හැරලා ඒ ණය ගෙවන්න පුළුවන් විධියේ මාර්ග එදා අපිට තිබුණා. ගමට විදුලිය ආවා; කර්මාන්ත ශාලා ගමට ආවා; මහවැලි ව්‍යාපාරය ඉදි වුණා; ගමේ මිනිහා ගොයම් කැපුවා; වී අස්වැන්න වැඩි වුණා, ගමේ මනුස්සයා ඇඟලුම් කර්මාන්තශාලාවලට ගිහිල්ලා ඇඳුම් මැහුවා; ඇඟලුම් අපනයනය කළා, රටට සල්ලි ආවා. ජේ.ආර්. ජයවර්ධන කාලයේ ක්‍රමවත් විධියට ණය ගත්තා. නමුත් එලෙස ණය ගත්තාට ඒ ණය ගෙවීම සම්බන්ධයෙන් කථා කරන්න තරම් ඒක කාටවත් ප්‍රශ්නයක් වුණේ නැහැ. ණය ගෙවන්න පුළුවන් ආදායම් මාර්ග ඔක්කොම අපිට ලැබිලා තිබුණා. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේ ගත් ණය දිහා බලන්න.

හම්බන්තොට වරාය සඳහා ඩොලර් මිලියන 361ක් ණය ගත්තා. අද වනකොට loss එක කීයද? මේ ණය අරගෙන ගෙව්වාද? මේ ණය ගෙවන්න පුළුවන්ද? Loss එක කීයද? රුපියල් මිලියන 46,699ක් අද වනකොට පාඩුයි. ජේ.ආර්. ජයවර්ධන ගත් ණය නිසා එහෙම ප්‍රශ්නයක් ඇති වුණාද? ඇඟලුම් කර්මාන්ත හරහා කී දෙනෙකුට රක්ෂා ලැබුණාද?

නෙළුම් කුලුන ගැන බලන්න. US Dollars මිලියන 104ක් ණය අරගෙන නෙළුම් කුලුන හැදුවා. අද වනකොට පාඩුව ඩොලර් මිලියන 2,500ක්. මත්තල ගුවන් තොටුපොළ සඳහා US Dollars මිලියන 210ක් ණය ගත්තා. අද වනකොට පාඩුව රුපියල් මිලියන 13,600යි. ණය ගෙවන්න ක්‍රමයක් නැතිවද ණය ගත්තේ? සූරියවැව ක්‍රීඩාංගණය සඳහා US Dollars මිලියන 4,500ක් ණය ගත්තා. අද වන කොට පාඩුව රුපියල් මිලියන 675,000ක්. ඒවා ලාභද? ඔබතුමන්ලා ඒවා විකුණාවි කියලා බයේ ඉන්නේ ඇයි? ඒවා විකුණන්න හෝ බදු දෙන්න හෝ තක්සේරු කරලා බැලුවාම පෙනෙනවා, එම තක්සේරුව තුළින් ගත් ණය ප්‍රමාණයවත් පියවෙන්නේ නැති බව. මේ ගොල්ලන් ගත් ණය ගණන් හදලා බැලුවාම ඒ ව්‍යාපෘතියේ, ඒ ගත් ණය ප්‍රමාණයෙන් භාගයක්වත් නැහැ. ඒ නිසා දැන් බයයි. මේවා බදු දෙන්න කියලා ජාත්‍යන්තරව තක්සේරු කළාම පෙනෙනවා, ගත් ණය මුදලවත් මේ ව්‍යාපෘති වටින්නේ නැති බව. නමුත් අපි ඒ ගැන කථා කරන්නේ නැහැ. මේවා දැනගෙන තමයි අපි මේ ණය ගත්තේ. මේ ණය අරගෙන එලදායී වාගේම සක්‍රීය ව්‍යාපාර විධියට ඒවා නිර්මාණය කරන්න අපිට හැකියාව තිබෙනවා.

අපි ආණ්ඩුව බාර ගන්න කොට අපිට තිබුණා, ණය උගුලක්. ඒ තමයි, ජීනීවා උගුල. එදා හැම මැතිවරණයේ දීම කථා කළේ ජිනීවා උගුල ගැන; ජිනීවාවල තිබෙන එල්ලුම් ගහ ගැන; විදුලි පුටුව ගැන. අපි ඡන්දය ඉල්ලුවේ අපේ නායකයන් සහ අපේ රණ විරුවන් විදුලි පුටුවෙන් බේරා ගන්න ඕනෑ නිසයි. නමුත් අපි අද වනකොට ජිනීවා උගුලෙන් අපේ රට නිදහස් කරගෙන තිබෙනවා. අද ජිනීවාවල තිබෙන එල්ලුම් ගහ ගැන කථා කරන්න දෙයක් තිබෙනවාද? ඒවා ගැන අද කථා කරන්න දෙයක් නැහැ. දැන් අපිට මේ රට ණය උගුලෙන් නිදහස් කර ගන්න තිබෙනවා. ඒ ණය උගුලෙන් අපේ රට නිදහස් කර ගන්න බැහැ කියලා අපි කියන්නේ නැහැ. අපි ඒ වෙනුවෙන් උපක්‍රම යොදනවා; විවිධ ක්‍රම යොදනවා. අඩුම පිරිවැයක් -මුදලක්- යොදලා, අඩුම පොලියක් ගෙවලා, මේ ණය උගුලෙන් අපේ රට බේරා ගන්න තමයි අද අපි සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකද, ලෝක වෙළෙඳ පොළේ අඩු පොලියට සල්ලි ගන්න පුළුවන් කියලා පෙනෙන කොට ණය ගන්න ඕනෑ. හැබැයි, ඒ ණය ගන්න ඕනෑ ඒකාධිපති විධියට නොවෙයි.

එදා SriLankan Airlines එක ණය ගත්තේ පාර්ලිමේන්තුව දැනුවත් කරලාද? SriLankan Airlines එකට ණය ගන්නකොට මහ බැංකුව තියා පාර්ලිමේන්තුවවත් දැනුවත් කරලා නැහැ. එදා Ceylon Petroleum Corporation එක ණය ගත්තේ මහ බැංකුව දැනුවත් කරලාද? අඩු ගණනේ මහ බැංකුව තියා පාර්ලිමේන්තුවවත් දන්නේ නැහැ, කෙළින්ම SriLankan Airlines, Ceylon Petroleum Corporation වාගේ ආයතන ණය ගත්තා. ඒවා ගැන පොත්වල සටහන්වෙලා නැහැ. නමුත් අද

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

එහෙම නැහැ. අද අපි යම් ණයක් ගන්නවා නම් ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කරනවා; සැලැස්මක් ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා කොච්චර කකුලෙන් ඇද්දත්, කොච්චර කොරහේ කිඹුලන් පෙන්නුවත්, අපි වාද විවාද කරලා හැම කෙනෙකුගේම අදහස් ලබා ගන්නවා. දැන් මේ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමේ දී වුණත් අපි විපක්ෂයෙන් ආපු යෝජනා සියල්ලම සැලකිල්ලට ගත්තා. එදා වාගේ ඒකාධිපති විධියට අපි මේවා අනුමත කළේ නැහැ; අනුමත කරන්නේත් නැහැ. අපි හරි දේ තෝරලා බලලා, වාද විවාද කරලා තමයි මේ පනත් කෙටුම්පත් සම්මත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී මා විශේෂයෙන්ම අවධානය යොමු කරවනවා, 2002 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ 249 වැනි පිටුවේ සඳහන් කාරණයට. ණය ගෙවීම සඳහා, රටේ ණය කළමනාකරණය කිරීම සඳහා වෙනම ස්වාධීන ආයතනයක් පත් කරන්න ඕනෑය කියලා එහි සඳහන් කර තිබෙනවා. එහි විශේෂයෙන්ම සඳහන් වෙනවා, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් වෙන් කරනු ලබන වෙනම ස්වාධීන ආයතනයක් ණය ගැනීම, ණය ගෙවීම, ඒ සඳහා වගකීම ගැනීම සඳහා පත් කරන්න කියලා. මේ කථාව කිව්වේ 2002 අවුරුද්දේයි. 2002 අවුරුද්දේ රටේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 1,630යි. එක පුද්ගලයෙක් එදා ණය වෙලා සිටියේ, රුපියල් 85,776යි. 2002දී ණය ගැන මේ අනතුරු ඇඟවීම කරනකොට; orange light එක පත්තු කරනකොට, "මහ බැංකුවෙන් පරිබාහිරව හරි කමක් නැහැ, ණය කළමනාකරණය කරන්න වෙනම ආයතනයක් පිහිටුවන්න" කියලා එදා -2002 වර්ෂයේ- මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා. එහෙම නැත්නම් මේ උගුලට අපි යට වෙන බවට අනතුරු ඇඟවීමක් කර තිබෙනවා. එසේ කියනකොට, ඒක පුද්ගල ණය ප්‍රමාණය විධියට තිබුණේ රුපියල් 85,776යි. නමුත් 2017දී එක පුද්ගලයෙකුගේ ණය ප්‍රමාණය රුපියල් 478,881ක් වුණා. **රටේ** සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 10,163ක් වුණා.

සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත යටතේ මේ ණය කළමනාකරණය සඳහා බලය පැවරීමට වෙනම ආයතනයක් පිහිටුවීම කාලෝචිත වෙනවා කියන කාරණය පිළිබඳව මම විශේෂයෙන්ම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම මම කියනවා, ඒක ස්වාධීන ආයතනයක් විය යුතු බව. ඒ විධියට රාජ්‍ය ණය කළමනාකරණය කළා නම්, අර වාගේ ණය කඳු එක කාලයකට ගොඩ ගැහෙන්නේ නැහැ. එහෙම කළමනාකරණය කළා නම්, ඡන්දයක් ළං වෙනකොට, නැත්නම් විදේශිකයකු ඇවිල්ලා "ණය දෙන්නම්" කියනකොට, දෙන්නම් පළියට ණය ලබා ගන්නේ නැහැ. මේක ගෙවන්න පුළුවන්ද, රටේ ආර්ථිකය කොතැනද තිබෙන්නේ, මෙම ව්‍යාපෘතියට ප්‍රමුඛස්ථානය ලැබෙන්නේ කොහොමද, අපිට මේවා කොපමණ වැදගත්ද, රටට දරන්න පුළුවන් ව්‍යාපෘතියක්ද කියන දේවල් ගැන කථා කරන්න; ඒවා ගැන හිතන්න විශේෂයෙන් වෙනම ආයතනයක් හදන්න ඕනෑ. ඒක විනිවිද දකින්න පුළුවන් ආයතනයක් හදන්න ඕනෑ. අද අපි විනිවිද දකිනවා. වාද-විවාද කරනවා; උද්ඝෝෂණය කරනවා. මොනවා හෝ දෙයක් ගැන, ණය ගැන කථා කළොත්, "අපේ මූල්‍ය තත්ත්වය මේකයි, අපි මෙපමණ ණයක් ගන්නවා" කියලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරනවා. නමුත් එදා එහෙම කථාවක් තිබුණේ නැහැ. අඩු ගණනේ හම්බන්තොට වරායට කොපමණ ණය ප්‍රමාණයක් ගත්තාද කියන එක අපට අහගන්න පුළුවන්කමක් තිබුණාද? එහෙම අහගන්න තබා, අපේ මන්ත්‍රීවරුන්ට හම්බන්තොට වරාය බලන්න යන්නවත් දුන්නේ නැහැ. මත්තල ගුවන් තොටුපොළ හදන්න ණය කොපමණ ප්‍රමාණයක් ගත්තාද කියලා දැන ගන්න ක්‍රමයක් අපට තිබුණාද? මත්තල ගුවන් තොටුපොළට ගත්ත ණය ප්‍රමාණය කොපමණද කියලා දැන ගන්න රටේ ජනතාවට නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටවත් හැකියාවක් තිබුණාද? එසේ දැන ගන්නවා තබා, මත්තල ගුවන් තොටුපොළට යන්න දුන්නේත් නැහැ. එසේ ගියාම අපට ගැහුවා. අපේ වාහන කුඩු කරලා, පිස්තෝල ගෙනැල්ලා, මැර කල්ලි ගෙනැල්ලා "ඒවායේ ඔය ගොල්ලන්ට බලාගන්න දෙයක් නැහැ, ඒවා අපි බලාගන්නම්, හම්බන්තොට වැඩ අපි බලාගන්නම්" කියලා අපට ගහලා එළෙව්වා. ඒ සම්බන්ධව අපි ගොනු කළ නඩුව ලබන සඳුදා දිනයේ කැඳවනවා. ඒකට සාක්ෂි දෙන්න යන්නත් තිබෙනවා. එහෙම රටක් තමයි අපි මේ ක්‍රම-ක්‍රමයෙන් හදන්න කටයුතු කරන්නේ. එහෙම හදනකොට, කකුලෙන් අදින්නේ ඇයි? අඩුපාඩු තිබෙනවා නම් කථා කරලා හදා ගන්න ඕනෑ. මොකද, අපි ඔක්කෝම මේකට මුහුණ දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි ඔක්කෝම මේකට මුහුණ දෙන්න ඕනෑ. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, අද ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත කාලෝචිත එකක් බව. එක දවසකට අර පිදුරුතලාගල වාගේ ණය කන්දක් තිබෙනවා. තව දවසක පොඩි ණය කන්දක් තිබෙනවා. එක එක විධියේ අක්‍රමවත් ණය ගෙවීම් රටාවක් තමයි මේ ක්‍රමවේදය යටතේ තිබෙන්නේ. ඒ වාගේම ලෝකයේත් එක එක දවසට ණය පොලිය වෙනස් වෙනවා. අපි දන්නවා ලබන අවුරුද්දේ -2019දී- අපිට ණය වශයෙන් ලොකු ගණනක් ගෙවන්න තිබෙන බව. ඉතිහාසයේ වැඩිම ණය කන්දරාව ගෙවන්න තිබෙන්නේ ලබන අවුරුද්දේ. අපට සල්ලි තිබෙනවා නම් හෝ කොහෙන් හරි අඩු පොලියට ණය අරගෙන ඒකෙන් භාගයක් ගෙවා දමන්න පුළුවන් නම්, ලබන අවුරුද්ද වෙනකල් ඉන්නේ නැතිව. ඒ තීන්දු ගන්න පුළුවන් බලය නිර්මාණය කරන්න නේ, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා මෙය කාලෝචිත පනත් කෙටුම්පතක් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ණය ප්‍රශ්නය කෙටියෙන්, ලෙහෙසියෙන්, සුළුවෙන් අත් හරින්න පුළුවන් දෙයක් නොවෙයි. මොකද, අපේ ආචාර්ය ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "යාපනයේ යුද්ධයටයි අපි ණය ගත්තේ" කියලා. යුද්ධයෙන් පසුව ගත් ණයයි, ගොඩක් තිබෙන්නේ. යුද්ධයට ගත් ණය ඒ තරම් ලොකු ගණනක් නැහැ. යුද්ධයෙන් පසුව ගත් ණය තමයි අපට ගෙවා ගන්න බැරි වෙලා තිබෙන්නේ. යුද්ධයෙන් පසුවයි සුද්දෙ දැම්මේ. ඒ සුද්දෙ දමන්න ගත් ණය තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අපි දැන් මේවා ගෙවන්න ඕනෑ නේ. අපි ගෙවන්න ඕනෑ. අරයා ණය ගත්තේ; මෙයා ගත්තේ, මේකෙන් පාඩුයි කියලා හරියන්නේ නැහැ. ආණ්ඩුව අපේ. ඒ සම්බන්ධව විනිවිදභාවයකින් කටයුතු කළ යුතුයි. ඒ වාගේම ඕන් ඉදිරියට මේ ණය සම්බන්ධව කටයුතු කිරීම සඳහා වෙනම ස්වාධීන ආයතනයක් අපි නිර්මාණය කර ගන්න ඕනෑය කියන එකත් යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.32]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක කාලයක් තිබෙන්නේ.

පළමුවෙන්ම ණය ආපසු ගෙවීමේ කාරණය ගැන බලමු. ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතා මහ බැංකු අධිපති වුණාට පස්සේ එතුමා කියා තිබුණා මම පත්තරේ දැක්කා, කෙටි කාලීනව ගන්න ණයවලට පොලිය වැඩියි; ඒවා ගෙවා හමාර කරන්නට අපි දිගු කාලීනව අඩු පොලියට ණය ගැනීම සුදුසුයි; ඒක දැනට මහ බැංකුව කරගෙන යනවා කියලා. මේ පනත් කෙටුම්පත ගැන අපේ විරුද්ධත්වය තිබෙනවා. මොකද, දැනට තිබෙන ක්‍රියාදාමයේ - කාර්ය ක්‍රමයේ- ස්වභාවය ණය ගැනීම සහ ණය ගෙවීමේදී වෙනස් කළ යුතු නැහැ. මහ බැංකුව දැනටත් ණය ගෙවීම් කරනවා; ණය ගැනීම් කරනවා; ණය අරගෙන ණය ගෙවීම් කරනවා. මේ ක්‍රියාදාමය දිගටම වෙමින් තිබෙනවා. ස්වාධීන ආයතනයක් ගැන මහ බැංකුව කථා කරලා තිබෙන්නේ, මහ බැංකුව ඇතුළත ස්වාධීන ආයතනයක් ගැන. මොකද, දැනට ණය දෙපාර්තමේන්තුව තිබෙනවා. ප්‍රධාන වශයෙන් ණය දෙපාර්තමේන්තුවෙන් කරන්නේ ණය ගැනීම්. මූල්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව ණය දෙපාර්තමේන්තුව ණය ගන්නවා. ණය ගෙවීම් කිරීම මහ බැංකුවේ සාමාන්‍ය පොදු වගකීමක්. ඒ වෙනුවෙන් මහ බැංකුව ඇතුළත යම් විශේෂ ආයතනයක් සෑදීම යෝග්‍ය බව තමයි ඒ වාර්තාවේ කියලා තිබෙන්නේ. ස්වාධීන ආයතනයක් කියන්නේ මහ බැංකුවෙන් පිටත ආයතනයක් ගැන නොවෙයි.

මෙතැන අපේ විරුද්ධත්වය තිබෙන්නේ මේ 4 වන, 10 වන, සහ 11 වන වගන්ති තුළින් අගමැති අතට අලුත් බලයක් එනවා, මහ බැංකුවෙන් පිට. මහ බැංකුව විසින් කරන ක්‍රියාදාමයට අගමැතිට මැදිහත්වීමට හැකි බලයක් එනවා. මම ඒ වගන්ති නැවතත් කියවාගෙන යන්නේ නැහැ. මොකද, කලින් ඒ වගන්ති කියැවුණා. වගන්ති 4, 10, 11 අනුව අගමැතිවරයාගේ තීන්දුවලට අනුව තමයි ප්‍රමාණය තීන්දු කරන්නේ; ණය ගන්න විධිය තීන්දු කරන්නේ. ඒ වාගේම ඒ සඳහා ගෙවන පොලිය තීන්දු කරන්නේ. මේ ඔක්කෝම තීන්දු කරන්නේ ඒ නියෝගයන් විධිවිධාන අනුව. [බාධා කිරීමක්] කියන්න, මොකක්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඉක්මනට කියන්න. මට විනාඩි 20යි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක නිවැරදි නැහැ, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. අගමැතිතුමා තීරණය කරන්නේ නැහැ. තීරණය කරන්නේ මුදල් මණ්ඩලය; මහ බැංකුවේ මුදල් මණ්ඩලය. අගමැතිතුමා පොලිය තීරණය කරන්නේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මම මේ පනත් කෙටුම්පතේ තියෙන එක කියවන්නම් කෝ. එතකොට ඔබතුමාට කටපියා ගන්න වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
බලමුකෝ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මෙහි කියලා තිබෙන්නේ "මුදල් මණ්ඩලයේ උපදෙස් අනුව" කියලයි. ඒ උපදෙස් පිළිපැදිය යුතු වෙයි කියන එකක් නැහැ. "උපදෙස් අනුව, ණයක් මඟින් එකතු කර ගත යුතු මුදල් ප්‍රමාණය, එම ණය ලබා ගනු ලබන ආකාරය, පවත්නා ණය පෙරාතු මිල දී ගැනීම සහ පවත්නා ණය අලුත් ණය සමඟ හුවමාරු කිරීම ඇතුළු, එකී ආණ්ඩුවේ එම ගෙවීමේ වගකීම් පියවීම සඳහා යෝග්‍ය බවට අමාත්‍යවරයා විසින් සලකනු ලබන ආකාරය," ඉතින් මට මීට වඩා සිංහල භාෂාවේ අර්ථයක් තේරුම් ගන්න අමාරුයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා කොටසක් කියෙව්වේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මොකක්ද, කියෙව්වේ නැහැ කියන්නේ. ඔබතුමා කියවන්න කෝ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා මේ කොටසයි කියෙව්වේ නැත්තේ. පනත් කෙටුම්පතේ මෙහෙම තිබෙනවා, "අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව"

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව නේන්නම් අර්ජුන මහේන්ද්‍රන්ව පත් කළේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමා මම කියවලා ඉවර නැහැ. අහගන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
අනේ! බොරුවට මගේ කාලය ගන්න එපා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
"සහ, මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධාන සහ මුදල් නීති පනතේ 114 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව" -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මුදල් නීති පනතට යටත්ව තමයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම නම් මුදල් නීති පනතේ 114 වන වගන්තියේ විවිධිවිධාන මොනවාද කියලා ඔබතුමා කියවන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මුදල් නීති පනතට යටත්ව මූල්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව තමයි. නමුත් අන්තිමට තීන්දු ගන්නේ මෙතුමා; තීන්දු ගන්නේ අගමැතිවරයා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ. උපදෙස් නොවෙයි, විධිවිධානවලට යටත්ව. මේකේ තිබෙනවා. ඇමතිතුමා තීරණය කරන්නේ නැහැ.[බාධා කිරීමක්]

එහෙම කියන්න එපා. කොයි ආකාරයටද, මොන පොලියටද ගන්නේ කියලා ඇමතිවරයා තීරණය කරන්නේ නැහැ. එහෙම එකක් නැහැ, ගරු වාසුදේව මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මේකේ කියලා තියෙන ඒවා මම කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම එකක් නැහැ. කොහේද තිබෙන්නේ අගමැතිතුමා -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමනි, මම එක පාරක් කියෙව්වා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි. කියවන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මට දෙපාරක් කියවන්න බැහැ. සිංහල භාෂාවට වෙනත් අර්ථයක් දෙන්න බැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මේකේ එහෙම දෙයක් නැහැ, කිසි ඇමතිවරයෙක්ට පොලියක් තීරණය කරන්න පුළුවන් කියලා මේකේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
කරුණාකරලා මේ කියවන ටික අහගෙන පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒවා කියන්න. එම ණය ලබා ගනු ලබන ආකාරය, ණයක් මගින් එකතු කරගත යුතු මුදල් ප්‍රමාණය, ණය හුවමාරු කළ යුතු ආකාරය සහ ඒවා අමාත්‍යවරයා විසින් සලකනු ලබන ආකාරය කියලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පතේ 4වන වගන්තිය, 10වන වගන්තිය, 11වන වගන්තිය යනාදී මේ හැම වගන්තියකින්ම අගමැතිවරයාට තමන්ගේ විධානයන්, නියමයන් කිරීමට, නියෝග කිරීමට බලය දීලා තිබෙනවා, අරයාගේ උපදෙස් මත, මෙයාගේ උපදෙස් මත කියලා කිව්වාට. මම කියන්නේ, "කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව" කියන එකේ නම් ඇති වැදගැම්මක් නැහැ කියලායි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙතුමා කියන ඒවායේ නිවැරදිතාවක් නැහැ. එවැනි දෙයක් මේ පනත් කෙටුම්පතේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මොකද, කැබිනට් මන්ඩලයේ අනුමැතිය ඇතිව තමයි අර්ජුන මහේන්ද්‍රන්ව මහ බැංකුවේ අධිපති ලෙස පත් කළේ. අද අර්ජුන මහේන්ද්‍රන් හොයා ගන්න බැහැ. අගමැතිතුමා කිව්වා, "මම ගෙන්වලා දෙන්නම් ඕනෑ වෙලාවක. මිනිහා මගේ යාළුවා. මිනිහා ගිහිල්ලා තිබෙන්නේ මහුල් උත්සවයකට. මම ඕනෑ වෙලාවක ගෙන්වන්නම්. ඕනෑ වෙලාවක මට කියන්න" කියලා. කෝ, ගෙන්වලා දුන්නාද? දැන් පොලීසිය හොයනවා. උසාවිය නියෝග නිකුත් කරලා. අගමැතිවරයා කට පියා ගෙන. ඉතින් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එක වැරදිද? විශ්වාස භංග යෝජනාව ක්‍රියාත්මක වන්න පටන් අරගෙන. කටාන නගර සභාව, මීගමුව මහ නගර සභාව, ගාල්ල මහ නගර සභාව, යූඑන්පී මන්ත්‍රීවරු යූන්පී එකට විරුද්ධව පොහොට්ටුවට ඡන්දය දීලා අපේ නායකයන් පත් කරගෙන. විශ්වාස භංග යෝජනාව ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කියන්න කල්පනා කළේ, අර්ජුන මහේන්ද්‍රන් මහත්තයා ඉවත් කරන්න කලින් මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන එක ගැන කථා නොකළේ මොකද? අර්ජුන මහේන්ද්‍රන් පලායෑමට පෙර මෙවැනි පනත් කෙටුම්පතක් ගැන මේ සභාවට නම් යෝජනාවක් ආවෙත් නැහැ. එවැනි යෝජනාවක් ගෙනෙන බවට ආරංචියක් තිබුණෙත් නැහැ. අද ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතා කිව්ව විධියට, මේ ප්‍රශ්නය පළමුවෙනිවරට සාකච්ඡා වෙමින් තිබෙන්නේ දැන් ඉන්න අධිපතිවරයාගේ කාලයේ. එතකොට මම හිතා ගන්නවා, අර්ජුන මහේන්ද්‍රන්ගේ කාලයේ මේ යෝජනාව ගෙනාවේ නැහැ කියලා. මොකද, එතකොට අර්ජුන මහේන්ද්‍රන් හරහා අගමැතිවරයාට - විශේෂ බලතල අගැමතිතුමාට නැතුවත්- වුවමනා කටයුතු යාළුවා හැටියට ඉටු කර ගන්න තිබුණා. මහ බැංකු අධිපතිවරයා පලා ගිහිල්ලා ජාත්‍යන්තරයේ කොතැනක හෝ සැඟවෙමින් ඉන්නවා. අගමැතිවරයා යෝජනා කරනවා, "අපට ණයක් ඕනෑ" කියලා. මේ ණය අනාගත ණය පියවීමට ගන්නා ණයක්. මෙවර යෝජනා කරන්නේ පොඩි ණයක් නොවෙයි, ට්‍රිලියනයකට කිට්ටු ණයක්. දැන් ඒ ණය ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග, පිළිවෙත් පිළිබඳ නියෝග, විධාන දීමට ඇමතිවරයාට බලතල තිබෙනවා. මේ අනුව කටයුතු ආරම්භ වුණාම මහ බැංකුව හරහා ක්‍රියාත්මක වෙන්න ජාත්‍යන්තර වශයෙන් මේ ණය මුදල් හොයා දෙන්නේ කවුද? ඕනෑ

කෙනෙක්. මොන පොලියටද? එදාට තිබෙන හොඳම පොලියට. හැබැයි, අර්ජුන මහේන්ද්‍රන්ගේ හොඳම පොලියට නොවෙයි. අර්ජුන මහේන්ද්‍රන් එදා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සමඟ හොඳම පොලිය වුණේ වැඩි පොලිය. මට බයක් තිබෙන්නේ, ඇමතිවරයාගේ විධානයන්ට යටත්ව මේ ණය ගැනීමේ ක්‍රියාදාමය සිදු වෙනකොට මේ ණය ලබා දීම වෙනුවෙන් අර්ජුන මහේන්ද්‍රන් කොතැන හරි ඉඳිවිද කියලායි.

He is a fugitive today and we do not know where he is. We have a fear that he would involve again in order to raise funds for the Public Debt Department of our Central Bank with the support of the Prime Minister. The Prime Minister is already a suspect and he is got to face charges in this House about his involvement in the bond scam.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අගමැතිවරයාගේ බලය ණය ගැනීමේ ක්‍රියාවලියට -මෙච්චර විශාල ණයක් ගැනීමේ ක්‍රියාවලියකට- සම්බන්ධ වුණොත්, ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තරයේ කොතැනක හෝ අර්ජුන මහේන්ද්‍රන්ගේ භූමිකාවක් තිබේවිද කියන ප්‍රශ්නයයි අපි දැන් කල්පනා කරන්නේ. මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, "නොයෙක් ආයතන ණය අරගෙන තිබෙනවා. ඒවා අපි දන්නෙත් නැහැ." කියලා. ඔව්, ඒක හරි. පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්නේ අපි අය වැයෙන් ගන්න ණය ගැන; මේ ආණ්ඩුව ගන්න ණය ගැන. එක එක සංස්ථා හා බැංකු ගන්න ණය ගැන මේ ගරු සභාවේ අය වැය යෝජනා ඇතුළේ සාකච්ඡා වෙන්නේ නැහැ. ඒක ඇත්ත. ඒවා ගැන ඒ ඒ ආයතන යටතේ සාකච්ඡා කරන්න මේ ගරු සභාවට පුළුවන්. ඒ ආයතන ගත්ත ණය ගැන දැන ගන්න විධියක්වත් තිබුණේ නැහැ කියා එතුමා කිව්වා. එක්සත් ජාතික පක්ෂයේ කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් හම්බන්තොටට කොච්චර ණය ගත්තාද, මත්තල භදන්න කොච්චර ණය ගත්තාද කියලා පාර්ලිමේන්තුවේදී අහපු ප්‍රශ්නවලට අපි උත්තර දෙන්න බැහැ කියලා තිබුණාද? නැත්නම්, උත්තර දීම මහ හැරලා තිබෙනවාද? කරුණාකරලා අපට කියන්න. අපි කියන්නේ, අසත්‍ය චෝදනාවලින් දමා ගහන්න එපා. මේ වාගේ ප්‍රශ්න අහලා, ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ කිව්වා නම් ඒක වෙනම කාරණාවක්. මේවා දැන් කවුරුත් දන්න කාරණා. එම නිසා දැන් හම්බන්තොට වරාය ගැනයි, මත්තල ගැනයි ගැන කථා කිරීමේ තේරුමක් නැහැ. හැබැයි, අපි එකක් දන්නවා. වටිනාකමක් නැහැයි කිව්ව ඒවා දැන් ලොකු වටිනාකමකට විකුණන්න පුළුවන් වෙලා තිබෙනවා. ලොකු වටිනාකම්වලට විකුණන්න දැන් හොයනවා. ඒවා වටිනාකමක් නැහැයි කියපු දේවල්; සුදු අලි. මුදල් ඇමතිතුමා කිව්වේ, "In the name of development, white elephants are what we have achieved". But, white elephants are going for good money. White elephants are being sold for good money. So, how can they be white elephants?

වරායක් හැදුව ගමන් ආදායමක් එන්නේ නැහැ. ටිකක් කල්පනා කරලා බලන්න ඕනෑ නේ. පැටවෙකුත් ලබාගෙන, ගෙදරට ඕනෑ කිරිත් සපයා ගැනීම සඳහා එතුමා එළදෙනෙක් ගෙනෙනවා. එළදෙන ගෙනැල්ලා ඊට පසුවදා කියනවා, "පාඩුයි." කියලා. එළදෙන ගෙනෙන්න වියදම් කළේ අපරාදේ; පාඩුයි. පාඩුද, ලාභද කියලා පොත්වල ගණන් භදන්න පුළුවන්. ඇයි, ගෙනෙන්න වියදම් කළ මුදල තිබෙනවා; ඒකෙන් තවම ආදායමක් ලැබී නැහැ; ඒ නිසා පාඩුයි. නමුත්, එළදෙනට පැටවා හම්බ වෙලා කිරි එරෙනකොට, කිරි දොවා ගන්නකොට තමයි පාඩුවක් කියා පොත්වල පෙන්වන දේ ක්‍රමානුකූලව ආදායමක් බවට පත් වෙන්නේ. ඒ වාගේ ඉවසාගෙන ඉන්න බැරිව අපේ හම්බන්තොට වරාය මේ විධියට ඉතා අඩු ගණන්වලට, ඉතා දීර්ඝ කාලයකට - පරම්පරා තුනකට- අහිමි වන ලෙස විදේශ සමාගම්වලට පාවා දීමේ අපරාධය අද ආණ්ඩුවට චෝදනාවක් හැටියට තිබෙනවා.

ඊළඟට, පොලී රේට්ටු අද දිගටම ඉහළ යනවා. ඒවා කොහොමද ගණන් බලන්නේ? ඇමෙරිකාවේ ඩොලරයේ පොලී රේට්ටුව ඉහළ යනවයි කියා අපට දැන ගන්නට ලැබුණා. ඇමෙරිකාවේ පොලී රේට්ටුව ඉහළ යනකොට එක පැත්තකින්, මේ රටේ ණය වෙළෙඳ පොළේ තිබෙන ආයෝජන රටින් පිට වෙලා යනවා. අනෙක් පැත්තෙන්, අපට ණය ගන්න වෙන්නේ වැඩි පොලියට. යුරෝපයේ හා ඇමෙරිකාවේ පොලී රේට්ටුවේ අද ඉහළ යෑමක් තිබෙනවා කියන එක උඩ ඒකයි සිද්ධ වෙන්නේ. නමුත් ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් පනවන ආරක්ෂණවාදී පියවරයන් එක්කලා මේ තත්ත්වය එහෙම දිගටම පවතින්නේ නැහැ. ලෝක ආර්ථිකයේ පසුගිය අවුරුදු දහයක Multifactor Productivity Ratio එක බැලුවාම සියයට එකකින් විතර ඵලදායිතාව අඩු වෙලා තිබෙනවා. එම නිසා නැමීමක් පෙන්වන ආර්ථික තත්ත්වය දිගට පවතින්න පුළුවන් එකක් නොවෙයි. ඒක තමයි විද්‍යාඥයින්ගේ මතය වන්නේ. අනෙක් අතට මුළු ලෝකයේම ජනගහනය ඉතා වේගයෙන් වයසට පත් වන බවක් පෙනෙන්නට තිබෙනවා. ඊළඟට, වැටුප් වැඩි වීමක් වෙලා නැහැ. ලෝක ආර්ථිකය ගැනයි මේ කථා කරන්නේ.

වැටුප් වැඩි වීමකුත් වෙලා නැත්නම්, ඵලදායිතාව -ශ්‍රම ඵලදායිතාව හා සර්ව සාධක ඵලදායිතාව- ඉහළ යන්නේත් නැත්නම්, ඒ වර්ධනය පවතින වර්ධනයක් නොවෙයි. ඒ නිසා තමුන්නාන්සේලා ගණන් බලන්න එපා, මේ දැන් තමයි හොඳම පොලී රේට්ටුව තිබෙන්නේ කියලා. එහෙම කියලා -මේ තමයි හොඳම අඩු පොලී රේට්ටුව තිබෙන කාලය කියලා- දුවගෙන ගිහිල්ලා රුපියල් ට්‍රිලියනයක විතර කුට්ටියක් පොලියට ගන්න නම් මේ ලැහැස්ති වෙන්නේ, මේ ලෝකයේ ඇති වන වර්ධනය - වැඩිවීම- දිහා ගැන පමණක් බලලා, මේකේ තිබෙන තිරසරභාවය ගැන මේ කිව්ව කරුණු අනුව බලලා, මේ ලෝකයේ පොලී රේට්ටුවල ඇති විය හැකි විචල්‍යය ගැන මීට වඩා හුඟක් කල්පනා කරලා බලන්න වෙයි.

ඊළඟට, ආර්ථිකය ගැනත් කථා කරන්න වෙනවා. මොකද, මුදල් ඇමතිතුමා කිව්වා, "බදු අනුපාතය 60:40ට ගෙනෙන්නයි යන්නේ." කියලා. සියයට 60ක් සෘජු බදුවලින් සහ සියයට 40ක් වක්‍ර බදුවලින් ගන්නයි යන්නේ කියලා කිව්වා. එහෙම කිය කියා වක්‍ර බදු වැඩි කරනවා. වක්‍ර බදු වැඩි වීමට හේතුවන තීන්දු තීරණ ආණ්ඩුව ගන්නවා. දුම්රිය ගාස්තු සියයට 15කින් වැඩි කළා. වැඩි කළාම වක්‍ර බදු අඩු වෙන්නේ කොහොමද? ආණ්ඩුවේ ගාස්තු වැඩි වීමත් බද්දක් හැටියට තමයි එකතු වෙන්නේ. වක්‍ර බදු කිව්වාම නිකම්ම විවිධ බඩු භාණ්ඩවලින් අය කරන ආණ්ඩුවේ බදු විතරක් නොවෙයි, අපි එහිදී ආණ්ඩුවේ ගාස්තුත් සලකා බැලිය යුතුයි. ඒ නිසා දිගටම වක්‍ර බදු අඩු කරනවාය කිව්වාට පසුගිය අවුරුදු තුනේම වක්‍ර බදු වැඩි වීමක් සිදු වී තිබෙන බව ආණ්ඩුව පිළිගත යුතුව තිබෙනවා. ආර්ථිකය ගැන නම් උදම් අනන්න එපා. ආර්ථිකය ගොඩ එනවාය කියලා උදම් ඇනුවාට තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා කියා තිබෙනවා, පසුගිය අවුරුදු තුනේම ආර්ථිකය අයාලෙ ගිහිල්ලාය කියලා. ජනාධිපතිතුමා ප්‍රසිද්ධියේ කිව්වා, කිහිප වරක්ම කිව්වා, "ආර්ථිකය අයාලෙ ගිහිල්ලාය, ආර්ථිකය නන්නත්තාර වෙලාය, මම මේ ආර්ථිකයේ වගකීම භාර ගන්නවාය." කියලා. එහෙම කියලා එතුමා භාර ගත්තා. භාර අරගෙන National Economic Council එකක් හදාගෙන වැඩ කරගෙන යනකොට, අගමැතිතුමාගේ අර පරණ ආර්ථික කමිටුව නොනැවතීම රෑස් වෙන්න හදනවා. දැන් ජනාධිපතිතුමාට සිදු වෙලා තිබෙනවා, වඩාත් බරපතළ කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරන්න. මම මෙහෙම කියන්නේ, ජනාධිපතිතුමා තමයි ආර්ථිකයට ගිය කලදසාව ගැන කියන්න ඉන්න අපේ සාක්ෂිකරු. ඇත්තටම මේ පනත් කෙටුම්පත පිළිබඳව මහින්ද රාජපක්ෂ අපේ හිටපු ජනාධිපතිතුමා තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමාට telephone එකෙන් කථා කළා. කථා කරලා

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කිව්වා, මේ පනත් කෙටුම්පත කලබලයට, පෙරේදා හෝ ඊයේ දවස තුළ ගෙනෙන්න එපා කියලා. ඒ ගැන ටිකක් සාකච්ඡා කර දෙපක්ෂයේම මන්ත්‍රීවරුන්ගෙන් කරුණු විමසා බලා අවශ්‍ය සංශෝධන කරන්න කියා කිව්වා. ජනාධිපතිතුමා ඒකට සවන් දී මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය අදට කල් තබන්නට උපදෙස් දීලා, ඒ අනුව අද මේ විවාදය සිද්ධ වෙනවා. එය මම කිව්වේ, මේ පිළිබඳව අපි ගත යුතු පියවර හැම එකක්ම ගෙන තිබෙනවා කියන එක කියන්නයි. ඒ අනුව යම් වෙනස්කම් කරන්න එකඟ වී තිබෙන බවත් පෙනෙනවා. ඒ වෙනස්කම් මේ වෙලාවේ අපට ප්‍රමාණවත් නැති බවත් කිව යුතුයි.

අගමැතිවරයාට ආර්ථිකය මෙහෙය වීමේදී හරියාකාරව එය කරන්නට බැරි වූ බව හොඳින්ම පෙනී ගොස් තිබෙනවා නම් මහ බැංකුව විෂයභාර අමාත්‍යවරයා හැටියට අගමැතිවරයාට සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට දහයක අඩු ප්‍රමාණයක් ණයක් හැටියට අරගෙන එය වෙනම ගබඩා කර තබන්නට, වෙනම තැන්පත් කර තබන්නට, අගමැතිවරයාගේ මහ පෙන්වීම හා අනුදැනුම අනුව ක්‍රියා කරන්නට ඉඩදීම කොයිතරම් දුරට ඥානවන්ත ද කියා නැවත සලකා බලන්නය කියා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසාන කරන්නටයි යන්නේ.

ආණ්ඩුවේ තුන් අවුරුදු පාලනයට පළාත් පාලන මැතිවරණයෙන් තීන්දුවක් දී තිබෙනවා. එම නිසා මෙයට වෙනත් තීරණ අවශ්‍ය නැහැ. තුන් අවුරුදු පාලනය ගැන මෙන්න ජනතාවගේ මතය කියා ජනතාව හොඳ තීරණයක් දී තිබෙනවා. ඒ සම්බන්ධව අලුත්ම ප්‍රතිඵලයක් තිබෙනවා. කටාන ප්‍රාදේශීය සභාව, මීගමුව මහ නගර සභාව, ගාල්ල මහ නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ අලුත් නාගරික මන්ත්‍රීවරු පොහොට්ටුවට ඡන්දය දී පොහොට්ටුවේ අය පත් කර ගෙන තිබෙනවා. විශ්වාසභංග යෝජනාව දැන් ඉදන්ම ක්‍රියාත්මකයි. එක්සත් ජාතික පක්ෂය තමන්ගේ නායකයාට විරුද්ධව ගහන කැරැල්ල දැන් එළියට ඇවිල්ලා තිබෙන බවත් කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 2.53]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

2018 අය වැය යෝජනාවලට අනුව, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සම්බන්ධයෙනුයි මම කථා කරන්නේ. එම නියමය අනුව විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහනවලට අය කරන බදු අඩු කර තිබෙනවා. මේ රට ලෝකයත් සමඟ යන ගමනේදී විදුලි බලය පාවිච්චි කර රටේ පමණක් නොවෙයි ලෝකයේ තිබෙන පරිසරය දියුණු කරන්නත්, පරිසරය ආරක්ෂා කරන්නත් අපේ රට බැඳී සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දන්නවා, 2030 වර්ෂය වෙනවිට තිරසර සංවර්ධන අරමුණු කරා අපේ රට ලෝකයත් සමඟ යා යුතු බව. තිරසර සංවර්ධනයේ අරමුණු 17ක් තිබෙනවා. 7 වන අරමුණ තමයි, දැරිය හැකි පිරිසිදු බලශක්තිය. මේ බලශක්තිය අපට ලබා ගන්නට වෙන්නේ, තාපයෙන්, සූර්ය බලශක්තියෙන් හෝ තවත් විවිධ ක්‍රමවලින්. එවැනි දේ පාවිච්චි කරගෙන රටේ පරිසරය ආරක්ෂා කර ගෙන කොළ-නිල් හරිත පරිසර ක්‍රමවේදකයකට යෑමට හැකිවන අයුරින් අපේ මුදල් ඇමතිතුමා 2018 අය වැය යෝජනාවලිය සකස් කර දී තිබෙනවා. මේ දෙය කර ගෙන යන කොට අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලය මේ ක්‍රමවේදවලට අනුව ඉදිරියට යන්නට ලක ලැහැස්ති වෙලා තිබෙනවාද කියන එක තමයි ප්‍රශ්නයක්ව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණයත් සමඟ ලෝකය ඉදිරියට යනකොට අප අවට පරිසරයත් හැදිය යුතුයි කියලා අපි දන්නවා. අද අපි විදුලි බලය උපයෝගි කර ගෙන වාහන ධාවනය කරමින්, පරිසරය ආරක්ෂා කිරීමේ ගමනක් යනවා නම්, විදුලියෙන් වාහනවල බැටරි චාජ් කළ හැකි ස්ථානත් ගොඩ නැඟිය යුතුයි.

අපේ ගරු මුදල් ඇමතිතුමා එදා ප්‍රකාශ කළා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයටත් විදුලිය භාවිත කර ධාවනය කළ හැකි බස් රථ හඳුන්වා දීමේ ක්‍රමවේදයක් හදනවා කියලා. ඒක ඉතා වැදගත් කාරණාවක්. ඒ මන්ද, ඩීසල් සහ පෙට්‍රල් භාවිත කිරීමෙන් පරිසරය දූෂණය වන නිසා.

තිරසර සංවර්ධන අරමුණුවල 7වන අරමුණ තමයි, දැරිය හැකි පිවිතුරු බලශක්තිය. තිරසර සංවර්ධන අරමුණුවලින් 11වන අරමුණ තමයි, තිරසර නගර සහ ප්‍රජාවන්. මේ තිරසර නගර සහ ප්‍රජාවන් ගැන අපි කථා කරන කොට නගරවල වාගේම ගම්මානවලත් විදුලියෙන් ධාවනය වන වාහන භාවිත කරන්න විදුලිය ලබා ගත හැකි ක්‍රමවේද අප හැදිය යුතුයි.

සූර්ය කෝෂ පාවිච්චි කරලා විදුලිය ලබා ගන්න වැඩ කර ගෙන යනකොට විදුලිබල මණ්ඩලය තුළ ප්‍රශ්නයක් තිබෙන බව අද අපි දන්නවා. මා හිතන්නේ ලෝකයේ අනික් රටවල කිසිම ප්‍රශ්නයක් නැතිව සූර්ය කෝෂ පාවිච්චි කරනවා. ඒ වාගේම ඒ සඳහා ඒ රටවලින් අතහිතත් දෙනවා. අද අපි දන්නවා, සූර්ය කෝෂ පාවිච්චි කරන්න බැංකුවලින් සහන පොලී ක්‍රමයකට ණය ලබා දෙන බවත්. හැබැයි, සූර්ය කෝෂ මඟින් තාපය ලබා ගෙන කටයුතු කරන්න යනකොට විදුලිබල මණ්ඩලයේ ගැටලු සහගත ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. මේ දේවල් දියුණු කර ගෙන ඉදිරියට යනකොට මේ සඳහා වග කිව යුතු ආයතනත් එම ක්‍රමවේදයන් සමඟ යා යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන ඉදිරි දැක්මත් එක්ක; තාක්ෂණයත් සමඟ ඉදිරියට යා යුතුයි කියන එකත් අපි කියන්න ඕනෑ. මොකද, ඒ තාක්ෂණය අරගෙන අපි ඉදිරියට යන්නේ නැත්නම් එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලය තවමත් මොනවාද පාවිච්චි කරන්නේ කියලා අපි දකිනවා. Excel spreadsheetsවල යන විධියට තමයි තවම මේ පාලනය සහ ඒ ක්‍රමවේද කළමනාකරණය කර ගෙන යන්නේ. හැබැයි, දැන් ඊට වඩා අලුත් තාක්ෂණ ක්‍රම හඳුන්වා දීලා තිබෙනවා. ඒවා පාවිච්චි කළොත් අපට 2030දී මේ අරමුණු කරා යා හැකියි කියන එකත් මේ වෙලාවේ මම ප්‍රකාශ කරනවා.

අපේ රටේ වත්මන් ජනතාවට පමණක් නොවෙයි, අපේ අනාගතය භාර ගන්න සිටින දරුවන්ටත් පිරිසිදු රටක්, පිරිසිදු ලෝකයක් ලබා දෙන්නයි රටක් හැටියට අපට ඕනෑ කරන්නේ. අද ඒ දේ කරනවා නම්, පරිසර හානි, පරිසර දූෂණ අවම කරන්න මේ ක්‍රමවේදී, වැඩ කටයුතු කර ගෙන යන්න වනවා. මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු පරිසර අමාත්‍යාංශයට මේ වෙනුවෙන් විශේෂ කාර්ය භාරයක් කරන්න තිබෙනවා. ඒ අනුව, මේ දේවල් සම්බන්ධයෙන් නිවැරදිව සොයා බලා මේ ක්‍රමවේද කොයි විධියටද කෙරෙන්නේ; මේක බලපත්‍රයකට පමණක් සීමා නොවෙන ක්‍රමවේදයකට කර ගෙන යන්න පරිසර අමාත්‍යාංශය කටයුතු කරන්න ඕනෑ. මේ සඳහා අනික් සියලුම ආයතනත් එකතු කර ගන්න සිද්ධ වනවා. සියලු අමාත්‍යාංශ එකතු වෙලා මේ ක්‍රමවේදය ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්න වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අද විවිධ අමාත්‍යාංශ තිබෙනවා. අද ඒ අමාත්‍යාංශ එක් එක් කාර්ය භාරයන් කළාට ඒ අමාත්‍යාංශ සියල්ල මේ තිරසර සංවර්ධන අරමුණු කරා යනකොට එකට එක් වෙලා කටයුතු කරන්නේ නැහැ. එම නිසා එතැන ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

අපි දන්නා දෙයක් තමයි, මේ කරුණු කාරණා කරන්න යනකොට ඇගැයීම කියන එක ඉතා වැදගත් දෙයක්ය කියන එක. සමහර කාර්යයන් සම්බන්ධයෙන් කිසිදු ඇගැයීමක් කරන්නේ නැතුව සමහර අමාත්‍යාංශ සහ සමහර ආයතන කටයුතු කර ගෙන යනවා. විදුලිය පාවිච්චි කරලා රථ වාහන ධාවනය කරන්න කටයුතු කරනවා නම්, එහි තිබෙන අඩු පාඩු මොනවාද, කොයි විධියටද ඒ කටයුතු කරන්න පුළුවන් කියලා ඒ සම්බන්ධයෙන් ඇගැයීම් කරලා බලන්න ඕනෑ. එම නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රමවේද ඇති කරලා විගසින්ම ඒ ක්‍රමවේදවලට යන්නත්, ඒ ක්‍රමවේද මහ ජනතාවට හඳුන්වා දෙන්නත්, ඒ සම්බන්ධයෙන් නව ආයතන බිහි කරලා, මේ දේවල් සඳහා නිවැරදි ක්‍රමයකට වියදම් කරන්නත් කියලා මම ඉල්ලා සිටිනවා.

අද මේ ගෙන එන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමත් ඉතා වැදගත්. මොකද, අපි සියලුදෙනාම එදා අය වැයේදී මෙම අදහසට අත් උස්සලා අපේ එකඟතාව පළ කළා.

ඒ මන්ද, රටේ පරිසරය ආරක්ෂා කරන එක තමයි ඉතාම වැදගත් දේ. සූර්ය තාපය තුළින් විශාල බලශක්ති ප්‍රමාණයක් අපට ලබා ගන්න පුළුවන් කියලා අද අපි දන්නවා. ඒ හරහා සිදු වෙන්නේ අවම පරිසර දූෂණයක් කියමින්, තමුන්නාන්සේ මට කාලය ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳවයි මම මේ ගරු සභාව හමුවේ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත පිළිබඳව අපේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමන්ලා මේ පනත් කෙටුම්පතේ තිබෙන ආදීනව පිළිබඳ කාරණා ගොඩක් මේ ගරු සභාව හමුවේ තැබුවා. මේ රටේ දීර්ඝ ඉතිහාසයක් තිස්සේ රාජ්‍යයට අවශ්‍ය ණය ලබා ගැනීමට මහ බැංකුව කටයුතු කර තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වැනි ආයතන ඒ සඳහා දායක වෙලා තිබෙනවා. ණය ගැනීම, ණය කළමනාකරණය කිරීම වැනි කරුණු පිළිබඳව පසුගිය දවස් වෙනකම් මේ රටේ විවේචනයක් තිබුණේ නැහැ. ඒ කියන්නේ කොයිම වේලාවකවත් ණය ගැනීමේ ක්‍රියාදාමයෙන් අයුතු ලාභයක් ඉපයූ බවට චෝදනාවක් ඇවිත් තිබුණේ නැහැ. නිදහසින් පසු කිසියම් ආණ්ඩුවකට -රජයකට- අවශ්‍ය කරන ණය ලබා ගැනීමේදී අයුතු වාසියක් ලබා ගත්තාය කියන චෝදනාව ආවේ මේ ආණ්ඩුවට පමණයි. රටට හානි කරමින් අයුතු ලාභයක් ලබා ගත්තා, එහෙම නැත්නම් ඒකෙන් අනියම් ආදායමක් උපයා ගත්තා -ඒ කියන්නේ රට නොවෙයි, පුද්ගලයන් කිහිප දෙනෙක්- කියන චෝදනාව පළමුවෙන්ම ආවේ මේ ආණ්ඩුවටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වියදම් කිරීමේදී යම් යම් අයුතු ලාභයන්, කොල්ල කෑම් සිදු වුණා කියන චෝදනා වෙන ආණ්ඩුවලට තිබුණා. ණය ගැනීමේ ක්‍රියාවලියෙන් අයුතු වාසි ගන්න යම් කිසි පුද්ගල කණ්ඩායමක් කටයුතු කළා නම් ඒ තමයි මහ බැංකු බැඳුම්කර හොරකම.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ නායකයා -රටේ ජනාධිපතිතුමා- කිව්වා, "පසුගිය අවුරුදු තුනට එක්සත් ජාතික පක්ෂය මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා" කියලා. ඒ වාගේම එතුමා කිව්වා, බැඳුම්කර හොරකම සිද්ධ වුණේ කොහොමද කියලා. "අර්ජුන මහේන්ද්‍රන්ව පත් කරන්න එපා කිව්වා, ඒත් පත් කළා. නියමිත ධුර කාලය අවසන් වෙන්න කලින් ඉවත් කරන්න කිව්වා, ඒක කරන්න එකඟ වුණෙත් නැහැ." කියලා එතුමා කිව්වා. ඒ හොරකම වෙච්ච විධිය, දිග, පළල, හැඩය ඔක්කොම දැන් එළියට ඇවිත් ඉවරයි. අර්ජුන මහේන්ද්‍රන් අද රටෙන් පැනලා ඉන්නවා. ඔහුට අයිති රටේ ඉන්නවා. ඔහුට අයිති නැති රටේ තමයි මහ බැංකු අධිපතිකම කළේ. අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවට වෙලා ඉන්නවා. සිංගප්පූරුව කියන්නේ ජාත්‍යන්තර පොලීසියට ඇතුළු වෙන්න පුළුවන් රටක් නොවෙයි. සිංගප්පූරුව එම ගිවිසුමට අත්සන් කරලා නැහැ. එම නිසා අර්ජුන මහේන්ද්‍රන් සුරක්ෂිතව අද සිංගප්පූරුවට වෙලා ඉන්නවා. මෙහේ උසාවිවලින් සිංගප්පූරු වැසියෙකුට වරෙන්තු නිකුත් කළාට වැඩක් නැහැ. ජාත්‍යන්තර පොලීසියට සිංගප්පූරුව ඇතුළට යන්න පුළුවන්කමක් නැහැ. මේ මහා හොරකම සිද්ධ වෙලා, එම හොරකමේ ප්‍රතිවිපාකයක් විධියට තමුන්නාන්සේලාට ඡන්දයෙන් බඩ ගිහිල්ලා, ඒ මහා හොරකමට එරෙහිව එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය සියයට 29ට වඩා පහළ වට්ටලා, මහජනයා ඒ හොරකමත් ඇතුළුව තමුන්නාන්සේලාගේ පාලනය පිළිබඳ නිර්දය ප්‍රතික්‍රියාවක් දක්වලා තිබියදී, මහ බැංකුවත් මහ හැරලා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවත් මහ හැරලා අගමැතිවරයා යටතට බලය අරගෙන, අයුතු ප්‍රයෝජන, අයුතු වාසි ලබන විධියට ණය ගැනීමේ ක්‍රියාදාමය පරිවර්තනය කරන්න දැන් උත්සාහ කරනවා. අර්ජුන මහේන්ද්‍රන් කියන ගජ මිතුරා දමලා මහ බැංකු හොරකම කළත්, ඒක වහගන්න බැරි වුණේ, ඒ තොරතුරු එළියට ආවේ, මහ බැංකුවේ නිලධාරීන් කට ඇරලා කියන්න පටන් ගත්තේ මහ බැංකුව කියන ආයතනය තිබුණු නිසායි. නමුත් දැන් මොකද වෙන්නේ? මහ බැංකුව අතේ තිබෙන බලය ඇමතිගේ අතට ගන්නවා. ඊට පස්සේ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳ පොළෙන් කෙටි කාලීන ණය ගන්නවා. ඒ ණය ගන්න බලය ඇමතිට ලබා දෙනවා. ඒ ක්‍රියාදාමයට නිලධාරීන් කිහිප දෙනෙක් සම්බන්ධ වෙනවා.

සිංගප්පූරුවට වෙලා ඉන්න අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙලා දුන්නු 'ගේම', සිංගප්පූරුවට වෙලා

[ගරු විමල් වීරවංශ මහතා]

ඉඳගෙන කරන්න පුළුවන් නීත්‍යානුකූල පරිසරය මේ පනත් කෙටුම්පත මඟින් හදනවා. යාළුවා නැවතත් ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිගේ භූමිකාව සිංගප්පූරුවට වී රඟ දක්වනවා. මේකයි මේකේ ඇත්ත කථාව. ගජ මිතුරු හොරා කෑමට තමයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පතට පක්ෂව අත උස්සලා තවදුරටත් කරන්නේ, මහ බැංකු බැඳුම්කර හොරකම වාගේ කිහිප ගුණයක හොරකමකට පාර කපලා දෙන එකයි. ශ්‍රී ලංකා මහ බැංකුව පළමුවන වතාවට අගමැතිතුමාගේ විෂය පථයට යටත් කර ගත්තේත් 'ගේම' දෙන්නයි. ලංකාවේ රට වැසියකු නොවන අර්ජුන මහේන්ද්‍රන් තකහනියේම ගෙන්වා ගත්තේත් වැඩේ දෙන්නයි. වැඩේ දුන්නා, අතේ පත්තු වුණා, නැටිටෙ හිටන් ගොම. අර්ජුන මහේන්ද්‍රන්ට සිංගප්පූරුවට වෙලා ඉන්න සිද්ධ වුණා.

දැන් මේ පනත් කෙටුම්පත තුළින් කරන්නේ සිංගප්පූරුවට වී සිටින අර්ජුන මහේන්ද්‍රන් හරහා මූල්‍ය වෙළෙඳ පොළෙන් වැඩි පොලියට ණය ගැනීමට පාර කපන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන ගණනක ණයක් ගන්නකොට සියයට 1ක පොලී අනුපාතයේ වෙනසක් කරලා, ඒ අයුතු ලාභය තමන්ගේ සාක්කුවට දමා ගත්තාම ඒ මුදල කීයක්ද කියලා හිතන්න. මේ පනත් කෙටුම්පත ඇත්තටම සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පතක් නොවෙයි, බැඳුම්කර හොරකමට මහ පාදන පනත් කෙටුම්පතක්; ණයවලින් හොරකම් කරන්න පොට පාදා ගන්නා පනත් කෙටුම්පතක්. මා අහන්නේ ලජ්ජා නැද්ද කියලායි. ලජ්ජා නැද්ද?

ගාමිණී දිසානායක මැතිතුමාට කිව්වා, මහවැලිය හදද්දී කොමිස් ගැහුවාය කියලා. අපේ ආණ්ඩුවට කිව්වා, highway එක හදද්දී කොමිස් ගැහුවාය කියලා. ආදායමෙන් හොරා කන්න අණපනත් අටවා ගන්න එක ලජ්ජා නැද්ද? ගාමිණී දිසානායක මැතිතුමා කොමිස් ගැහුවාද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. හැබැයි මහවැලිය ඉතුරු වෙලා තිබෙනවා. Highway එකෙන් කොමිස් ගැහුවාද නැද්ද කියන එක කෙසේ වෙතත් අධිවේගී මාර්ගය ඉතුරු වෙලා තිබෙනවා. අන්තිමට තමුන්නාන්සේලාගේ ඉතුරු වෙන්නේ මොකක්ද? විදේශීය සමාගම් සමඟ කථා බහ කරගෙන අයුතු ලෙස විශාල මුදලක් කපා ගන්න පුළුවන් වන පිළිවෙළට මූල්‍ය වෙළෙඳ පොළේ පොලී අනුපාතය කෘත්‍රිමව ඉහළ දමා ගත්තාම ඒකෙන් තමුන්නාන්සේලාගේ සාක්කු පිරෙයි. හැබැයි, මේ රටේ උසුලාගත නොහැකි ප්‍රමාණයකට ණය බර වැඩි වන එක වළක්වන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ විශ්වාසයේ හැටියට හොරකමටම හරියන විධියට අලුතින් පනත් කෙටුම්පතක් ගෙනාවා නම් ඒ තමයි මේ පනත් කෙටුම්පත. නීති වෙනස් කරගෙන, අලුතින් අණ පනත් හදාගෙන, කලින් කරපු බැඳුම්කර හොරකම එළියට ආපු නිසා දැන් කරන හොරකම් එළියට නොඑන විධියට මුක්තියෙනුත් බලයක් හදාගෙන, උසාවියට ගිහින් අභියෝග කරන්න බැරි විධියට අණ පනත් හදාගෙන, ඒ සඳහා වගන්තිත් ඇතුළු කරගෙන, -හොරකම කරන්න පුළුවන්, ඒකට විරුද්ධව නීතිය හමුවට යන්නත් බැරි විධියට- නීතිය හදා ගන්නේ රටේ ණය කළමනාකරණය කරන්නද? ශ්‍රී ලංකා මහ බැංකුවටත් නැති ආර්ථික විශේෂඥයෝ අගමැතිතුමා යටතේ ඉන්නවාද? ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්න මොළේ තිබෙන නිලධාරීන්ටත් වඩා මොළේ තිබෙන අය එතැන ඉන්නවාද? අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තනතුරට පත් වන කල් ශ්‍රී ලංකා මහ බැංකුවට විවේචනයක් තිබුණේ නැහැ, ණය කළමනාකරණය දුර්වලයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා පරණ කථාන්දර ටිකම කිය-කියා අවුරුදු 3ක් කාලය කෑවා. මිනිස්සු ඒකට උත්තර දුන්නා. ඊට පස්සේත් තවම ඒවා කියවනවා. වෙන කියන්න දෙයක් නැහැ. නෙළුම් කුලුන ගැන කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනෝදාස්වාද කර්මාන්තය කියලා එකක් ලෝකයේ තිබෙනවා. සිනමා කෘතියක් හැදුවත්, නාට්‍යයක් හැදුවත්, ටෙලි නාට්‍යයක් හැදුවත් ඒවා විනෝදාස්වාද කර්මාන්තයි. නෙළුම් කුලුන අයිති වන්නේත් විනෝදාස්වාද කර්මාන්තයට. දැනට එය හදලා ඉවරයි. නමුත් විවෘත කරන්නේ නැහැ, පොහොට්ටුව නිසා. නෙළුම් කුලුන හදන්න ණය ගත්තේ, TRC එකයි. ඒ ණය ගෙවන්නේ TRC එකයි. නෙළුම් කුලුනෙන් උපයන ආදායම යන්නේ TRC එකටයි. නෙළුම් කුලුන විවෘත කරලා බලන්න, අවුරුද්දක්, අවුරුදු දෙකක් යනකොට කොහොම ආදායමක් උපයන කුලුනක්ද කියලා. සන්නිවේදන tower එක බවට පත් වන්නේ මෙයයි.

රූපවාහිනී නාළිකාවල, ගුවන් විදුලි නාළිකාවල -ඒ සියලු නාළිකාවල- තරංග පාලනය කරන්නේ එතැනින්. පිදුරුතලාගල ඉඳලා ජාතික රූපවාහිනිය වැජඹුණාට, ස්වාධීන රූපවාහිනිය තව තැනක ඉඳලා වැජඹුණාට, මුළු ලංකාවේම මිනිසුන්ට හැම නාළිකාවක්ම එක විධියට පෙනෙන්න පටන් ගන්නේ ඒ ස්ථානයේ පටන් ගත්තාමයි. ඒ නිසා මේ "නෙළුම් කුලුන" කියලා අවමන් කරලා, එක්සත් ජාතික පක්ෂයේ මිනිස්සුත් පිළිගන්නේ නැති ගොන් කථා කියලා, ඡන්ද ලක්ෂ 29ට බැස්සා. මේක තවදුරටත් ලක්ෂ 25කට, 24කට විතර බස්සගන්න හදන්න එපා කියලා අපි එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. වරාය ගත්තත් එහෙමයි.

මේ රට නිවැරැදි ආර්ථික උපාය මාර්ගික ගමනක් ගියා. බලයට ආවා, මොළකාරයෝ ටික. මට මතකයි, ආචාර්ය හර්ෂ ද සිල්වා මහත්තයා මහ මැතිවරණ කාලයේ කියනවා, "වොක්ස්වැගන් සමාගම දැන් ගිවිසුම් අත්සන් කරලාත් ඉවරයි. සතියෙන් පටන් ගන්නවා" කියලා. අම්මපා! මෙහෙම කටට එන විධියේ බොරු කියන මේ ජාතියේ පුත්තු ටිකක් නම්, මගේ අම්මා-මුත්තා කාලයේවත් දැකලා නැහැ; කොහොම කියනවාද මම දන්නේ නැහැ. වොක්ස්වැගන් සමාගමත් නිවේදනයක් නිකුත් කළා, "අපි ලංකාවේ කිසිම ආයෝජනයක් කරන්නේ නැත" කියලා. නමුත් ආචාර්ය හර්ෂ, මට මතක හැටියට අර තුන්හුලස් ලකුණ තිබෙන රූපවාහිනී නාලිකාවේදී පණ පිහිටුවලා කිව්වා, "ගිවිසුම අත්සන් කළා, සතියෙන් වැඩ පටන් ගන්නවා" කියලා. එතුමාට ආචාර්ය පට්ටම හම්බ වුණේ ඒ ජාතියේ බොරු කීමෙන්ද කියලා මම දන්නේ නැහැ.

රවි කරුණානායක මැතිතුමා කැමතියි, ආචාර්ය හර්ෂ ගැන මම ඒ විධියට කථා කරනවාට. එතුමාගේ මුහුණේ හිනාව! මේ බැඳුම්කර හොරකමෙන් දැන් තමුන්නාන්සේට වෙච්ච දේ බලන්න. හෙණ ගැහුවා වාගේ ඇමතිකම ගැලෙව්වා. හොරකමේ මහ මොළකරු තවම ඉන්නවා අගමැතිකමේ. තමුන්නාන්සේ පිටිපස්සේ පේළියට වෙලා, කම්මුලට අත තියා ගෙන කල්පනා කරනවා. මහ බැංකුව තමුන්නාන්සේගේ විෂය පථයේ තිබුණේත් නැහැ.

අගමැතිතුමා වෙන දා මන්ත්‍රීවරු කවුරුවත් එක්ක වැඩිය කථා කරන්නේ නැහැ. අද මම දැක්කා අගමැතිතුමා පාර්ලිමේන්තුවේ සභා ගැබට ඇවිල්ලා පුටුවේ වාඩි වෙන්නේත් නැතිව හිටගෙන තැන් තැන්වලට ගිහින්, තමුන්නාන්සේලාත් එක්ක දැන් හරි සුහදව, බොහොම විවේකීව කථා කරනවා. අඩු ගණනේ බලන්න කෝ, විශ්වාස භංගයෙන් මේ දවස් කිහිපයකටවත් ඒ තත්ත්වය අපි හදලා දීපු එක හොඳ නැද්ද? අගමැතිතුමා දැන් තමුන්නාන්සේලාට සැලකිල්ලක් දක්වනවා කියලා දැනෙනවා

නේද? ඒ, 4 වැනිදා වෙනකල් විතරයි. ඊටපස්සේ එහෙම මොනවත් නැහැ. නමුත් එතෙක් හරි තමුන්නාන්සේලාට ඒ විධියට පොඩි වටිනාකමක්, අගයක්, තමුන්නාන්සේලාට ඇහුම් කන් දෙන ගතියක්, තමුන්නාන්සේලා එක්ක කථා කරන්න උනන්දුවක් දක්වන ස්වභාවයක් තිබෙන එක හොඳයි නේද? එහෙම ස්වභාවයකට මේ අගමැතිවරයා පත් කරපු එකත් කොච්චර ලොකු වැඩක්ද? විශ්වාස භංග යෝජනාව නැත්නම් ඔහොම හිටගෙන කථා කර කර ඉඳියිද? නැහැ නේ. මම දැන් පැය දෙක, තුනක් මේ සභාවේ හිටියා. එතුමා අද පුටුවේ වාඩි වුණේත් නැහැ. දැනටත් පුටුව නැහැ කියලා හිතිලා වෙන්න ඇති, එතුමා වාඩි වුණේත් නැහැ. 4 වැනිදා වෙනකල් ඒක තියෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාම ඕනෑකමින් මේ කාරණය කියනවා. මේ රටත් එක්ක සෙල්ලම් කරන පාලකයන්ට වැඩි කල් යන්න බැහැ. තමුන්නාන්සේලා බලයට ආපු දවසේ ඉඳලා මේ රටත් එක්කයි සෙල්ලම් කළේ. ජිනීවා න්‍යාය පත්‍රයට අනුව රණ විරු දඩයම පටන් ගත්තා. මේ රටත් එක්කයි තමුන්නාන්සේලා සෙල්ලම් කළේ. එහෙම සෙල්ලම් කරන පාලකයන්ට මේ රටේ වැඩි කල් අල්ලලා ඉන්න බැහැ. රාජ ඉතිහාසය පිරික්සලා බැලුවත් ඒක තමයි අපට දකින්න තිබෙන්නේ. නිවැරැදි රජවරුන්ගේ පාලන යුගය දිගයි. රටට හතුරු න්‍යාය පත්‍ර ගෙනෙන රජවරුන්ගේ පාලන යුගය කෙටියි.

දැන් තමුන්නාන්සේලාට පෙනෙනවා, එක්සත් ජාතික පක්ෂයේ සාමාන්‍ය පාක්ෂිකයා, ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී, නාගරික මන්ත්‍රී, තමුන්නාන්සේලාගේ මේ නායකත්වය පිළිගන්නේ නැහැ කියලා. නීති හදා ගෙන, හොරකම් කරන්නම අලුතින් නීති හදා ගෙන කැඟැපට ගහන ආණ්ඩුවක අගමැතිවරයෙක් තියා ගෙන තමුන්නාන්සේලා කොහොමද ඉදිරියට යන්නේ? මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට තුනටත් වඩා පහළට වැටිටුවා. ඇත්ත ආර්ථික වර්ධන වේගය සියයට 2ක මට්ටමේ තිබෙනවා කියලා තමයි ආර්ථික විශේෂඥයෝ කියන්නේ. තමුන්නාන්සේලා මේ රටට ආයෝජන ගෙනෙනවා කිව්වා. නමුත්, එක ආයෝජනයක්වත් නැහැ. දවසින් දවස රුපියල කඩා ගෙන වැටෙනවා. ව්‍යාපාරිකයාට ව්‍යාපාරයක් සැලසුම් කර ගන්න බැරිව තතනවා. අද තිබෙන රුපියල නොවෙයි හෙට තිබෙන්නේ. ඕනෑම කර්මාන්තයකට අමු ද්‍රව්‍ය එන්නේ පිට රටින්. දේශීය කර්මාන්තවලට අදාළ අමු ද්‍රව්‍යවල මිලත් ඉහළ යනවා. අමු ද්‍රව්‍යවල මිල ඉහළ යනවා විතරක් නොවෙයි, ආනයනය කරන ආහාරවල මිලත් ඉහළ යනවා. ඒ අනුව, ජන සමාජයේ සියලු දෙනාම අද ආර්ථිකමය වශයෙන් දැවැන්ත පීඩාවකට ලක් වෙලා.

ඒ බව තමයි පසුගිය පෙබරවාරි 10 වැනි දා කතිර විප්ලවයකින් මේ රටේ මහජනතාව පෙන්නුවේ. තමුන්නාන්සේලා කෙරෙහි මහජනතාව තුළ තිබුණු විශ්වාසය භංග වුණු බව පෙබරවාරි 10 වැනි දා පෙන්නුවා. දැන් සභා ගැබ තුළ තමුන්නාන්සේලාට අවස්ථාව තිබෙනවා, ඒ මහජන මතය අනුව හිටගන්නවාද නැද්ද කියලා තීරණය කරන්න. ඒ මහජන මතය අනුව හිටගන්නේ නැති කිසිම කෙනකුට මේ රටේ දේශපාලන අනාගතයක්, පැවැත්මක් ඉතිරි වන්නේ නැති බව පමණක් අපි සහතික කරලා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ගෙනෙන්න තමයි "ණය බරයි, ණය බරයි" කියලා ණය බිල්ලෙක් මැව්වේ. අගමැතිවරයා අතට මේ බලය අරගෙන, මේ හදන්නේ ඊළඟ ජනාධිපතිවරණයේදී ඡන්දදායකයා සල්ලිවලට ගන්නයි. බිලියන ගණනක් එකතු කර ගෙන, ට්‍රිලියන ගණනක් එකතු කර ගෙන ඒ සල්ලි ටික බෙදලා පට්ටම දික් කර ගන්නයි හදන්නේ. දැන් මේ කාලය තමුන්නාන්සේලාට සල්ලි මලු පිටින් හම්බ වෙන කාලයක්. මේ සල්ලි ගහ හෙල්ලෙන කාලය. අප්‍රේල් 4 වැනි දා වන කොට මන්ත්‍රීවරු කී දෙනකුට කී කෝටියක් හම්බ වෙලා තියෙයිද දන්නේ නැහැ. සල්ලි හම්බ වෙනවා නම්, ඒ සල්ලි වෙන සල්ලි නොවෙයි, බැදුම්කර හොරකමෙන් උපයපු සල්ලි. අර්ජුන් මහේන්ද්‍රන්ලා, අර්ජුන අලෝසියස්ලා -මේ සියලු දෙනාම- එකතුවෙලා ගසා කාපු සල්ලි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හදන්නේ නීතියෙන් අභියෝග කරන්න බැරි වන ආකාරයට අලුතින් බැදුම්කර හොරකම් කරගෙන, ඒකෙන් උපයා ගන්නා අයුතු ලාභය විසි කරලා මේ රටේ මහජන මතය කොල්ල කන්නයි. ඒකටයි උත්සාහ කරන්නේ. ඒකට තමයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. ඒකට තමයි මේ විශේෂ නීතිය හදන්නේ. ඒකට තමයි මේ කැසපට ගහගන්නේ. හැබැයි, වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වා, තමුන්නාන්සේලාට මේ ගමන වැඩිදුර යන්න මහජනයා ඉඩ දෙන්නේ නැහැයි කියලා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් එකතුවෙලා ගාල්ල නගර සභාවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපතිවරයෙක් - නගරාධිපතිවරයෙක්- පත් කරන්නේ ඒකට. කටාන නගර සභාවට එක්සත් ජාතික පක්ෂයේ නගරාධිපති කෙනෙක් වෙනුවට, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් රහස් ඡන්දය දීලා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නගරාධිපති කෙනෙක් පත් කරනවා. අන්න ඒ විධියට, "යන්න" කියන පණිවිඩය තමයි දෙන්නේ.

අගමැතිතුමනි, යන්න. මීගමුව මහ නගර සභාව, බලංගොඩ ප්‍රාදේශීය සභාව මේ ඔක්කොම තමුන්නාන්සේලාට බලය ගන්න තිබුණු තැන්. අද ඒ තැන්වල ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කෙනෙක් සභාපතිවරයා, නගරාධිපතිවරයා බවට පත් වෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට මුදල් බෑග් දීලා කොහොම කොහොම හරි තමුන්නාන්සේලාට මේ ටික යන්තම් ආම්බාන් කර ගෙන යන්න පුළුවන් වුණාට, පාදම ගැලවීගෙන යනවා. තමුන්නාන්සේලාගේ ඡන්ද භීතිකාව තව වැඩි වෙනවා; පළාත් සභා මැතිවරණ කල් දමන උපාය - උපක්‍රම සොයන්න පටන් ගන්නවා. ජනාධිපතිවරණයට පෙර ජනාධිපති ක්‍රමය අහෝසි කරගන්න පුළුවන් නම් ඒකටත් පොටක් පාදා ගන්න බලනවා. ඒ නිසා මීට පෙර ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂය මේ සා විශාල බිඳ වැටීමකට, පිරිහීමකට ලක්වෙලා නැහැයි කියන එක ඉතාම පැහැදිලියි. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ඕනෑ නම් මේ කොඩිවිනය කපා ගන්න, වෙනම නීති හදා ගෙන හොරකමටම ක්‍රමෝපායන් නිර්මාණය කර ගෙන එන මේ ගමන නවත්වන්න, අන්න තමුන්නාන්සේලාට ඒකට අවස්ථාව එනවා, 4වැනි දා. තමුන්නාන්සේලාට ගමේ එක්සත් ජාතික පාක්ෂිකයාගේ වුවමනාව, ඉල්ලීම නියෝජනය කරන්න ඕනෑ නම් 4 වැනි දාට ඒ සඳහා අවස්ථාව ලැබෙනවා. ගම්වල එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ අදහස තමුන්නාන්සේලාගේ ඇහ ඇතුළේ වැඩ කරනවා නම්, ඒ හැඟීම් අර සල්ලි මල්ලට යටත් කරන්න තමුන්නාන්සේලාට ඕනෑ නැත්නම්, අන්න ඒකට 4 වැනි දා අවස්ථාව ලැබෙනවා. මම දන්න විධියට නම් පසුගිය දවස්වල සල්ලි මලු හම්බ වුණු අය මේ වෙලාවේත් මේ සභාවේ ඉන්නවා. ඕනෑ නම් මට කනෙන් පෙන්වන්න පුළුවන්. අද උදේ කිංස්බරි හෝටලයේදී එක්කෙනකුට බෑග් එකක් දුන්නා. මට නම් ආරංචියි, ඒ බෑග් අරගෙනයි මේ පාර වැඩේ දෙන්න යන්නේ කියලා. මට ආරංචි විධියට තමුන්නාන්සේලා මේ පාර වැඩේ දෙන්න යන්නේ බෑග් අරගෙන. මේ ඉස්සරහ පේළියේ හතරවැනි පුටුවේ ඉන්නකෙනා තමයි බෑග් එක දුන්නේ. ඒ බෑග් එක ගත්ත කෙනාත් දැන් මේ සභාව තුළ ඉන්නවා. කමක් නැහැ, තමුන්නාන්සේලා ඒ බෑග් ගන්න. අර්ජුන් මහේන්ද්‍රන්වත් සිංගප්පූරුවේ තියාගෙන, මේ නීති වෙනස් කරගෙන බැදුම්කර හොරකම අලුත් වටයකින් කරන්න, ණයවලින් හොරකම් කරන්න කැසපට ගහන අග්‍රාමාත්‍යවරයා ඇතුළු මේ ආණ්ඩුව තවදුරටත් පැවතිය යුතු නැහැ.

[ගරු විමල් වීරවංශ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා 4වැනි දාට මේ සභාව ඒක ඔප්පු කරලා පෙන්වයි. විශ්වාසය පළ කිරීමේ එකක් අත්සන් කරගෙන යනවා නේද, කිරිඇල්ල ඇමතිතුමා? තවම හරි හමන් ගණනක් විශ්වාසය පළ කරලා නැහැ නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකට දැනට 100දෙනෙක් අත්සන් කරලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අයියෝ! 100ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ, තනිකරම එක්සත් ජාතික පෙරමුණේ මන්ත්‍රීවරු.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට ආරංචියි 68යි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ, තනිකරම එක්සත් ජාතික පෙරමුණේ අය.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට ආරංචි 68යි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තව reserve ඉන්නවා, බර ගණනක්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, හොඳයි. යූඑන්පී එකේ මන්ත්‍රීවරු 100ක් නැහැ. මන්ත්‍රීවරුන් 82යි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමේ සිටින යූඑන්පී පාක්ෂිකයාත් ඉල්ලන, හැම මිනිහෙක්ම ඉල්ලන ඒ කොඩිවිනය කපන්න 4වැනි දාට තමුන්නාන්සේලා, අපි සියලු දෙනාම කටයුතු කරමු කියන එම ආරාධනයත් කරමින්, මේ සක්‍රිය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත අලුත් බැඳුම්කර හොරකමට ගෙනෙන පනත් කෙටුම්පතක්ය කියන එක නැවතත් අවධාරණය කරමින්, එයට විරුද්ධත්වය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි. [බාධා කිරීම්] මොකද අනේ! ළදරු වලිප්පුවද? [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න. [සෝෂා කිරීම්] නිශ්ශබ්ද වෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ දී ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්න. [සෝෂා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [සෝෂා කිරීම්] මේක පාර්ලිමේන්තුවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුන් නිශ්ශබ්ද වෙන්න. [සෝෂා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම- [සෝෂා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

[අ.භා. 3.22]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාවක් කරන්න මේ අවස්ථාව උපයෝගී කර ගන්නේ මට පෙර කථා කරපු මගේ මිත්‍ර විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කරපු විලාසය නිසායි. මා පසු පෙළේ සිට එම කථාව අසාගෙන පිළිතුරක් නොදී නිහඬව සිටියා නම් එය මම කරන අගෞරවයක් කියලා මා හිතුවා. ඒ නිසා, හිටපු මුදල් ඇමතිවරයකු වශයෙන් අද රටේ තිබෙන ආර්ථික තත්ත්වය හා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න තිබෙන පසු බිම

ගැන කථා කළ යුතුයි කියලා මා සිතුවා. අද දින ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කළා. මම මේ ගැන කථා කරන්න අද සූදානමින් ආවේ නැහැ. නමුත් මම හිතුවා, මට මේ ගැන කථා කරන්න වග කීමක් තිබෙනවා කියලා. මොන වාගේ පරිසරයක් තුළද මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ කියන එක ගැන යමක් කිව යුතුයි කියා මා කල්පනා කළා. අද ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් වෙනත් වැඩ කටයුතුවල යෙදිලා ඇති. ඒක නිසා මේ සම්බන්ධයෙන් පිළිතුරක් දිය යුතුයි කියලා මා හිතුවා.

අපි 1948 දී නිදහස ලබා ගත්තා. අප විසින් අපේම අනාගතය පාලනය කළ යුතුයි කියලා 1948දී අපි ලබා ගත් බලය තුළින් 1952, 1953 වසරවල තමයි අපි ප්‍රථම වතාවට ණය ගන්න පටන් ගන්නේ. ඒ ණය ගන්න පටන් ගන්න අවශ්‍යතාව ඇති වෙන්නේ මොකක් නිසාද? අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී රටේ ප්‍රාග්ධන වියදම් හා රටේ පුනරාවර්තන වියදම් කියන දෙක සඳහා මුදල් හොයා ගන්න වෙන්නේ රටේ ආදායමෙන්. මේ ආදායමයි, වියදමයි අතර වෙනස තමයි හිඟයට එකතු වෙන්නේ. මේ හිඟය පියවන්න පුළුවන් වන්නේ කොටස් දෙකකින්. එකක් තමයි ජාත්‍යන්තර මට්ටමින්. අනෙක් එක තමයි දේශීය මට්ටමින්. දේශීය මට්ටමින් ගන්න ණයවලට පොලී ප්‍රමාණයක් ගෙවලා අවසන් වෙනවා මිසක් වෙන අතුරු ප්‍රතිඵල ඇති වෙන්නේ නැහැ. නමුත් පිට රටින් ලබා ගන්නා ණය ආපසු ගෙවීමේ දී එහි අතුරු ඵල දෙකකට මුහුණ දෙන්නට සිදු වෙනවා. එකක්, රුපියලේ අගය පිරිහීම. අනෙක් කාරණය පොලී අනුපාතය. මේ දෙකම එකතු වෙලා තමයි එම ණය මුදල ගෙවන්නට සිදු වන්නේ.

1948 දී අප නිදහස ලබා ගත් දවසේ සිට 2005 වර්ෂය දක්වා ලබා ගත් ණය ගැන බලමු. - මට මේකෙන් කිසිම දේශපාලනයක් කරන්න අවශ්‍ය නැහැ. - 1948 සිට 2005 ජනවාරි මාසය වෙන කල් බලයට පත් වූ සියලුම ආණ්ඩු ලබාගෙන තිබෙන සම්පූර්ණ ණය ප්‍රමාණය බිලියනවලින් කියනවා නම්, බිලියන 1,784යි. කෝටිවලින් කියනවා නම්, කෝටි 178,400යි.

මේක තමයි නිදහසින් පසු ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් ගත් ණයවල සම්පූර්ණ ණයබරතාව. ඊට පසුව 2005 සිට ආණ්ඩුව වෙනස් වන තුරු, ඒ කියන්නේ 2015 ජනවාරි මාසයේ 08 වැනිදා තෙක් පැවැති සියලු ණය ප්‍රමාණය වූ රුපියල් බිලියන 1,784 කියන එක වැඩි වනවා රුපියල් බිලියන 8,995ක් දක්වා. මේ රුපියල් බිලියන 8,995 වැඩි වන්නේ කොහොමද? රටේ යම්කිසි ප්‍රාග්ධන වියදමක් සඳහා වෙන් කරන්න, පුනරාවර්තන වියදම්වලට ගෙවන්න අවශ්‍යතාවක් තිබෙනවා වෙන්න පුළුවන්. මෙහිදී පක්ෂ පාට බලන්නේ නැතිව යමක් වෙලා තිබෙනවා කියා අපි කියමු කෝ. නමුත් කෙටි කාලීන ණය අරගෙන ප්‍රාග්ධන වියදම්වලට යොමු කිරීම ගැන තමයි අප මෙහිදී කතා කරන්න අවශ්‍යව තිබෙන්නේ. ඒ නිසා තමයි 2015 වර්ෂයේ ආණ්ඩුව වෙනස් වූ අවස්ථාවේ අපි වගකීමක් අනුව කටයුතු කළේ. 2018, 2019, 2021, 2022 ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය කොහොමද ගෙවන්න පුළුවන් වන්නේ? එදා අපේ ආදායම වෙලා තිබුණේ කීයද?

2015 ජනවාරි මාසයේ 08වන දා මා මුදල් ඇමති වශයෙන් එම අමාත්‍යාංශය භාර ගත් අවස්ථාවේ දී අපේ රටේ ආදායම මදි වුණා, ගත් ණයවල පොලී ප්‍රමාණය ගෙවන්න. එතකොට අපට කරන්න කටයුතු දෙකක් තිබෙනවා. ඒකක් තමයි, "මේවා මීට පෙර ආණ්ඩුව ගත් ණය" කියා ගෙවන්නේ නැතිව සිටිනවාද, එහෙම නැත්නම් අප යන ගමන වෙනස් කරලා ජනතාවට බරක් පටවන්නේ නැති වන විධියට කටයුතු කරනවාද කියන එක. මේ දෙකම කරන්න වුණා. ගත් ණය ගෙවන්නේ නැතිව ඉන්න අපට බැහැ. ඒක ලංකාවේ සිරිතක් නොවෙයි. මොකද, ගන්නා සියලු ණය ගෙවන රටක් වශයෙන් අප කටයුතු කරන්න අවශ්‍යයි. එදා අපේ ආදායම ලෙස තිබුණේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 10.2යි. අපට ගෙවන්න තිබුණු ප්‍රමාණය කොපමණද? එදා ආදායම මදි වුණා, පොලී ප්‍රමාණය ගෙවන්න. එතකොට අපි ණය ගන්නවා, ණය ගෙවන්න. මෙන්න මේ වාගේ වාතාවරණයක් තුළ තමයි මා මිත්‍ර වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත්, විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කථා කළේ. ඒ නිසා මම හිතුවා ඒ කියපු කාරණාවලට යම් එකතු කිරීමක් කරන්න. කොහොමද, කොයි ආකාරයෙන්ද මේ වෙනස ඇති කරන්න පුළුවන් වන්නේ? අවුරුදු 30ක් තිස්සේ තිබෙන යෝජනාවක්- එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1978 වර්ෂයේ ඒ වෙනස්කම කරලා ප්‍රාග්ධන වියදම්වලට යොමු කරන කොට සිතුවා ආදායම් ලැබෙන ප්‍රමාණයට වඩා අපි මුදල් වියදම් කරන්න අවශ්‍යයි කියා. එතකොට ණය ගන්න ඕනෑ. ණය ගන්නවා නම් ගෙවන්න පුළුවන් හැකියාව තිබෙන්න ඕනෑ. අන්න ඒ වාගේ දේවල් බලාගෙන තමයි කටයුතු කළේ. ඒ ක්‍රමයේ සාර්ථකත්වය නිසා තමයි මහවැලි ව්‍යාපාරයට අදාළ සියලු ණය අද ගෙවා තිබෙන්නේ. නමුත් අපට පාරක් හදන්න තිබෙනවා කියා සිතමු. ආදායම සියයට 2ක්, 3ක් ලැබෙන තත්ත්වයක් යටතේ සියයට 8ක, 9ක පොලී සහ වාරික ගෙවන කොට ඇති වන පරතරය තමයි දේශීය වශයෙන් ලැබෙන ආදායම තුළින් ගෙවන්න සිදුව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ නිසා තමයි අපට මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ගෙනෙන්න සිදු වෙලා තිබෙන්නේ. ඒකෙන් සිදු වන්නේ මොකක්ද? අද සියයට 2ක, 3ක, 4ක පොලියට ණය ගන්න පුළුවන් නම්, හෙට අනිද්දා වනකොට පොලිය සියයට 10ක්, 12ක් වනවා කියා අප දන්නවා නම්, හෙට ණය ගෙවන්න තිබෙන එක අද අරගෙන එකතු කර තබන එක තමයි කරන්නේ. ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ මෙහි යම් යම් දේවල් තිබෙනවා. එය කළමනාකරණය තමයි අවශ්‍ය වන්නේ. එයට නායකත්වය දෙන එක තමයි අවශ්‍ය වන්නේ. අන්න ඒ වෙනස තමයි කරන්න අවශ්‍ය වන්නේ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලැබුණු දායාදය තමයි පොලී ප්‍රමාණය වත් ගෙවන්න බැරි ආදායමක් ලැබීම. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් ලෙස පැවැති ආදායම අවුරුදු දෙකකින් සියයට 15.5 දක්වා වැඩි කරන්න අපට පුළුවන් වුණා. මට තිබෙන දුක ඒ වැඩි වූ ප්‍රවණතාව අඩු වීම ගැනයි. එය 2015 වර්ෂයේ වැඩි වුණා සියයට 25කින්; 2016 වර්ෂයේදී වැඩි වුණා සියයට 27කින්. නමුත් මැයි මාසය වන කල් එය සියයට 30කින් වැඩි වුණාට ඊට පසුව වැඩි වන ආදායම් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. අපි මේවා ගැන බලන්න අවශ්‍යයි. එහෙම නැත්නම් මොකද වෙන්නේ? අපි වියදමකට ලෑස්ති වන විට ඒකට ලැබෙන ආදායම මදි වුණොත් නැවත එදා වාගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට අපට සිදු වනවා. ඒ නිසා අපි ප්‍රථමයෙන්ම ආදායම ලබන ආකාරය වැඩි කරන්න අවශ්‍යයි. සුරා බදු ආදායම ඒ සඳහා හොඳ නිදසුනක්. එදා සුරා බදු ආදායම ලෙස මාසයකට තිබුණු බිලියන 4 රුපියල් බිලියන 11ක් දක්වා වැඩි වුණා. නමුත් ආයෙත් එය අඩු වන ස්වරූපයක් ඇති වෙලා තිබෙනවා. මේවා තමයි නිවැරැදි කරන්න අවශ්‍ය වන්නේ. මේ ලබාගෙන තිබෙන ණය සම්බන්ධයෙන් "මේක ගත්තේ නිල් පාට ආණ්ඩුවකින්, මේක ගත්තේ රතු පාට ආණ්ඩුවකින්, මේක ගත්තේ කොළ පාට ආණ්ඩුවකින්" කියලා අපට කියන්න පුළුවන්ද? එහෙම කියන්න බැහැ. ණය ටික ගෙවන්න අවශ්‍යයි. එසේ ගෙවන්න තිබෙන නිසා තමයි අපට මෙවැනි වගකීමක් සහිත පනත් කෙටුම්පතක් ගෙන ඒමේ අවශ්‍යතාව තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පත ගෙනෙන එකේ වැරැද්දක් නැහැ. ලෝකයේ බොහෝ දියුණු රටවල මේක තිබෙනවා. නමුත්,

[ගරු රවි කරුණානායක මහතා]

කළමනාකරණය කරන ආකාරය තමයි වැදගත් වෙන්නේ. යම් විධියකින් ඇමෙරිකාව ඒ ගොල්ලන්ගේ පොලී අනුපාතය වැඩි කරන කොට ඒක කෙලින්ම ලංකාවට බලපානවා. මම නිදසුනක් කියන්න කැමැතියි. එක රුපියලක් අවප්‍රමාණය වීමෙන් රටට වන හානිය රුපියල් බිලියන 60ක් වෙනවා. ඒ කියන්නේ රුපියල් කෝටි 6,000ක්. අපේ රට ලබාගෙන ඇති ණය නිසා, එක රුපියලක් අවප්‍රමාණය වෙනකොට රටේ අය වැයට රුපියල් බිලියන 60ක පාඩුවක් වෙනවා. ඒ වාගේම සියයට 1ක ප්‍රතිශතයක් වැඩිවීම රටට අහිතකර තත්ත්වයක් ඇති වෙනවා නම්, ඒ ප්‍රමාණය කෝටි 3,500ක් වෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 35ක්. මේක තමයි දෙපැත්තෙන්ම ක්‍රියාත්මක වන ප්‍රශ්නය. රුපියලක් අඩු වෙනවා, පොලී අනුපාතය වැඩි වෙනවා. ප්‍රංචි රටක් වන අපේ ලංකාවට මේ දෙකම බලපානවා. ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශයක් කරලා මෙක්සිකෝවල බිත්තියක් හදනවා කිව්වාම, "එහෙම නම් අපේ පොලී අනුපාතය වැඩි කරමු" කියලා ඒ අයගේ මහ බැංකුව කියනවා. එහේ සියයට දශම 0.25ක් වැඩි වෙනවා කියන්නේ ලංකාවේ පොලී අනුපාතය සියයට 1.5කින් වැඩි වෙනවා කියන එකයි. එසේ සියයට 1.5ක් වැඩිවෙන කොට අපි දේශීය වශයෙන් කිසිම ප්‍රශ්නයක් ඇති නොවන විධියට කටයුතු කළත්, අපේ රුපියල අවප්‍රමාණය වෙනවා. ඒ අනුව සියයට 1කින් පොලී අනුපාතය වැඩි වෙනවා. ලංකාවේ කිසිම ප්‍රශ්නයක් ඇති නොවන විධියට කටයුතු කළත්, මේ දෙකම බැලුවාම අපේ අය වැයට රුපියල් බිලියන 100ක ප්‍රශ්නයක් ඇති වෙනවා. එතකොට මේ අය වැයට ඒ මුදල ලැබෙන්නේ කොහෙන්ද? සල්ලි ලැබෙන්නේ දේශීය මට්ටමින්. ඒ විධියට එන ආදායම තමයි අය වැයට ලැබෙන්නේ. කිසිම රටක කටයුත්තක් කරන්නේ නැති වුණත්, imported inflation සහ rupee devaluation adjustment rate එකේ බලපෑම මත අපට ඒ බිලියන 100 සොයන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ නිසා තමයි අපට මීට වැඩිය වග කීමකින් යුතුව කටයුතු කරන්න අවශ්‍ය වෙන්නේ. ආණ්ඩු පක්ෂයට ආවාම විපක්ෂයට බණින එකත්, විපක්ෂයේ සිටින විට ආණ්ඩු පක්ෂයට බණින එකත් බොහොම සුන්දරයි. අපි අවුරුදු 70ක් මේ රට පාලනය කළත්, මෙවැනි විහිළු කිරීමේ ප්‍රතිවිපාක තමයි අද පෙනෙන්නට තිබෙන්නේ. දේශපාලනඥයෝ වශයෙන් අපි කවදාවත් රටක් ගැන හිතලා කටයුතු කරන්නේ නැහැ. අපි හැම අවස්ථාවකම ඊළඟ ඡන්දය ගැන හිතලා කටයුතු කරන එකයි කරන්නේ.

දැන් තිබෙන තත්ත්වය අනුව ඉදිරි පළාත් සභා මැතිවරණය කරන්නේ කොහොමද කියායි අපි බලන්නේ. ඊළඟට බලන්නේ 2019 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරණය කරන්නේ කොහොමද කියන එකයි. ඒ විධියට කටයුතු කරන කොට ඇතිවන ප්‍රශ්නවලට ආණ්ඩුවක් වශයෙන් උත්තර දෙන්න අවශ්‍යයි. පෙර තිබුණු ප්‍රතිවිපාක අනුව කටයුතු කරලා නිකම් බලාගෙන සිටි පරිදි, අපි ආණ්ඩුවක් ගත්තාම බලාගෙන ඉන්න අපට පුළුවන්ද? බැහැ. ජයග්‍රහණය කරන ස්වරූපයේ කටයුතු කිරීම තමයි ආණ්ඩුවක් කියන්නේ. ඒ වාගේම විපක්ෂය කියන්නේ, කොතරම් සුන්දර වුවත් අමිහිරි බවක් පෙන්නුම් කරලා ආණ්ඩුවට ප්‍රහාරයක් එල්ල කරන එකයි. මේ දෙක තුළින් තමයි ගමන් කරන්න තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි මේ වගේ රටකට කවදාවත් ඉදිරියට ගමන් කරන්න බැරිවෙලා තිබෙන්නේ. අපි සුද්දාගෙන් නිදහස ලබාගත්තා. අපි ඒ නිදහස ලබාගත්තත්, අපට සැබෑ ආර්ථික නිදහස ලැබී තිබෙනවාද? නැහැ, ගරු මන්ත්‍රීවරුනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව හෝ මුල් කරගෙන අපි සියලු දෙනාම,- රටක් ගැන හිතලා කටයුතු කරන්න අවශ්‍ය වෙලාවක් මේක. අපට විශ්වාස භංග යෝජනා ගේනවා, දෝෂාභියෝග ගේනවා. ඒවායින් නොයෙක් ප්‍රශ්න ඇති වේවි. නමුත්, ඒවායින් මේ රටේ තිබෙන බැරෑරුම් ප්‍රශ්න විසඳෙනවාද? නැහැ. මේ වගකීම අපට දායකත්වයක් වශයෙන් තමයි ලැබී තිබෙන්නේ. ණය වැඩිවෙලා තිබෙනවා. ජනතාවට දරාගන්න බැරි ප්‍රමාණයට බදු ආදායමක් ලබාගන්න අපට පුළුවන්ද? අපි ඒක කළා. සියයට 12ක්ව තිබුණු වැට් එක අපි සියයට 15ක් කළා. නමුත්, ඒ සීමිත කාලයකටයි. අපි සීමිත කාලයකට වැඩි කළාම, ඒ සියයට 15 ප්‍රමාණය සියයට 9 දක්වා අඩු කරන්න ඕනෑ කියලා අපි කිව්වා. දැන් ඒක අඩු කරන්න අවශ්‍ය කාලය ඇවිල්ලා. ඒ වාගේම රුපියල් අවප්‍රමාණය වෙන්න පටන් ගත්තොත්, ජනතාවට දෙන්න තිබෙන වාසිය නැතිවීගෙන යන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. රුපියල අවප්‍රමාණය වෙන්නේ කවුරුන් නිසාද? දේශපාලනඥයන්ද? මේක ක්‍රියාත්මක කරන්නේ කැබිනට් මණ්ඩලයද, ජනාධිපතිද, අගමැතිද? නැහැ, මෙතෙක් දුර බොහොම ආඩම්බරයෙන්, හිතුමතේ, තමාගේම පාලනයක් තිබෙනවාය කියා කටයුතු කරන මහ බැංකුව තමයි ඒක කරන්නේ. දැන් මහ බැංකුව ගැන නොයෙක් දේවල් කථා කරනවා. එක්කෙනෙක් නොවෙයි, දෙදෙනෙක් නොවෙයි, එදා පටන් ගත්ත දවසේ ඉඳලා මහ බැංකුව ඒ කියන විධියට වැඩ කරලා තිබෙනවා නම්, රුපියල මේ විධියට බාල්දු වෙයිද? මෙතෙක් කල් දේශපාලනඥයෝ ඇඟිලි ගහලා නැහැයි කිව්වත්, රුපියල් 152ට, 153ට, 154ට තිබුණු ඇමෙරිකානු ඩොලරය අද රුපියල් 158 දක්වා ඇවිල්ලා තිබෙන්නේ කොහොමද?

අන්තිමට අපට මේ ගැන ස්වයං විවේචනයක් කරන්න අවශ්‍යයි. මේක බොහොම හොඳයි, නිල් පාටින්, කොළ පාටින්, රතු පාටින් හොඳ දෙයක් ගැන කියන්න. ඒ මන්ත්‍රීවරු දෙපළම ඉතාමත් ඕනෑකමින් තමාගේ පණිවිඩය ලස්සනට තමන්ගේ ජනතාවට පෙන්වා දෙන අවස්ථාවේදී, අඩුම ගණනේ අපෙන් යුතුකමක් තිබෙනවා නිහඬව නොසිට ඒක පෙන්වා දෙන්න මේක තමයි සැබෑ තත්ත්වය කියලා. ඇයි අපට බැරි වන්නේ? මේ රටේ අපි යුද්ධයක් ජයග්‍රහණය කරලා තිබෙනවා. නමුත්, මේ යුද්ධයේ ජයග්‍රහණය සැබෑ ජයග්‍රහණයක් කරන්න පුළුවන් වන්නේ අපි ආර්ථික යුද්ධය දිනුවොත් විතරයි.

අද වෙලා තිබෙන්නේ අපි එක පැත්තකින් පමණක් ජයග්‍රහණය කරලා තිබෙන එකයි. අපට විතරක් නොවෙයි, මීට පෙර තිබූ ආණ්ඩුවටත් ඒ ආර්ථික යුද්ධය ජයග්‍රහණය කරන්න බැරි වුණා. ඒකට හේතුව තමයි කෙටි කාලීන ගමනක් කියලා හිතලා අපි මේ රට පාලනය කරලා තිබෙන එක. අපේ ආණ්ඩුවත් හිතුවා මේ සියලු ආර්ථික ප්‍රතිපත්ති දවසකින් දෙකකින් හදාගන්න පුළුවන් වෙයි කියලා. අපට සෘජු තීන්දු ගන්න බැරිකම තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ගන්න තීන්දුවත් ඉතාමත් දියාරු වන ස්වරූපයෙන් ගන්න බවක් තමයි පෙනෙන්න තිබෙන්නේ. අද ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය අවුරුදු දෙකකින් ගන්නවා නම් ඒක වැඩක් නැහැ. මෙම පනත් කෙටුම්පත ගේන්න තිබුණේ මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලායි. එදා මේ පනත් කෙටුම්පත ගෙනාවා නම්, ජාත්‍යන්තර මට්ටමේ සියයට තුනට, හතරට තිබෙන පොලී අනුපාතයට අපට ණය ගන්න තිබුණා. අද ඇමෙරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් වෙනින් විධියකට ගමන් කරනවා. ඒ නිසා පොලී ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ අවස්ථාවේදී නොයෙක් නොයෙක් දේවල් දකින්න තිබෙනවා. සමහර වෙලාවට ඒවා කියන්න මේ අවස්ථාව නොවෙයි. නමුත්, විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ කථා කිරීම තුළින්ම පෙනුණා, එතුමන්ලාට ලබන මස 4වැනි දා වෙනකම් මේ වාගේ තාවකාලික තෘප්තියක් ලබා ගන්න පුළුවන් කියලා. ඊට පසුව ඒක තුළින්ම ගම්‍ය වුණා, නැහැ, ඒක එදා ඉඳන් පටන් ගන්න ගමන තුළ අඩු ගණනේ ඒ උගන්වන පාඩම තුළින්වත් හරියට ඉදිරියට යන්න කියන එක තමයි එදා ලැබුණේ කියා. එතැන නොම්මර නැති වුණාට, අපි කොහොමද මෙතැන වෙනසක් කරන්නේ කියන එක

මම පිළිගන්නවා. නමුත්, ඒකෙන් ඔළු මාරු කිරීම නොවෙයි කළ යුතුව තිබෙන්නේ. යන ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනියන ගමන තමයි තිබෙන්නේ. රට ඉදිරියට යන ආකාරයට තමයි කළ යුතුව තිබෙන්නේ. අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සුද්දෝ මෙතැනට ඇවිල්ලා අපට කියනවා, "කොහොමද රටක් දුවන්න ඕනෑ." කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට අභියෝග කළා. ඒ නිසා තමයි සමහර ප්‍රශ්න ඇති වන්නේ. ඒ අය ඇවිත් කියනවා, "මේ මේ දේවල් කරන්න ඕනෑ" කියා. අද මේ තිබෙන ආණ්ඩුවට උපදෙස් දෙනවා ඉතාමත් හොඳට ඉදිරියට ගමන් කළ ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන්. එම ක්ෂේත්‍රය බොහොම සාර්ථකව කරගෙන ගියා. මේ සුද්දෝ ඇවිල්ලා අපට කියනවා, "සියයට 15ක බද්දක් මේකට දාපල්ලා," කියලා. අපි මේක දාන්න බැහැයි කිව්වා. නමුත්, අද දාලා තිබෙනවා. අප්‍රේල් මාසයේ පළමුවැනිදා එය ක්‍රියාත්මක වනවා. මේ අවස්ථාවේදී මම ආණ්ඩුවට ආයාචනය කරලා කියන්නේ, කරුණාකරලා මේ වාගේ ඒවා නවත්වන්න කියලයි. මොකද, මේ ඉදිකිරීමේ කර්මාන්ත ක්ෂේත්‍රය බොහොම සාර්ථකව ඉදිරියට යනවා. සියයට 15ක බද්දක් දැම්මාම දරාගන්න බැරි වෙනවා.

අපේ සුවිශේෂ පුද්ගලයන් වන ගණකාධිකාරිවරු, නීතිඥවරු, fashion designersලා පිට රට ගිහිල්ලා රටෙන් පිට සේවයක් ලබා දීලා අපේ රටට සල්ලි ගේන්න පුළුවන් මාර්ගය හදලා තිබෙනවා. දේශීය ආදායම් බදු පනතේ Section 13(c) යටතේ මේ සල්ලි අපේ රටට ගලාගෙන එන්න පුළුවන් මාර්ගයක් ඇති වුණා. මේකත් සියයට 15ක බදු ප්‍රමාණයකට යටත් වෙනවා. මේක තුළින් අන්තිමට වෙන්නේ මේ රටට එන්න පුළුවන් සල්ලි ප්‍රමාණය නවතින එකයි. අපේ රටේ අපි දන්නා දේවල්වලට වැඩිය සුද්දෝ ඇවිල්ලා ලොකුවට මේවා පෙන්වන්න හදනවා. මීට පෙර මම කරපු ප්‍රකාශයක් ගැන හුහක් දෙනා ප්‍රශ්නයක් ඇහුවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මේ වාගේ කියන්නේ ඇයි කියලා. නැහැ, මම එදා කිව්වේ රටට ඔබින විධියකට ප්‍රතිපත්ති ගෙනෙනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විතරක් නොවෙයි, කියුබාවේ ෆිදෙල් කැස්ත්‍රෝ කිව්වත් හොඳ නම් ඒක කරන්න අවශ්‍යයි. නමුත්, සුද්දෝ කියපු පළියට මේ රටට ඒක ඇදගන්න, දාගන්න අවශ්‍යතාවක් නැහැයි කියන එක තමයි ඒ අවස්ථාවේදී කිව්වේ. දැන් බලන්න, රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මුදල් ඇමතිතුමා විධියට ඉන්න කාලයේ නේද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔය එකඟතාවන්ට ආවේ?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

මම ඉන්න කාලයේ තමයි ඒ මුදල් අවශ්‍යතාව කරන්න තිබුණේ. නමුත්, ඔබතුමා ඒ තිබෙන Minutes බැලුවොත් පෙනේවි, ඒ ගෙනාපු දේට වැඩිය හුහාක් වෙනස්කම් ඇති කරලා තමයි ඒ වාගේ තත්ත්වයකට තල්ලු වුණේ කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම කියනවා, "සුද්දෝ කියන පළියට යම් යම් දේවල් කළා; ඒකයි මේ ආර්ථිකය බිඳ වැටෙන්න බලපෑවේ." කියලා. එතකොට සුද්දෝ කියන විධියට අපේ ආර්ථිකය බිඳ වැටීමට බලපාන දේවල් කවුද කළේ? එක්කෝ ඔබතුමා මුදල් ඇමතිතුමා හැටියට සිටියදී ද? නැත්නම් දැන් ඉන්න මුදල් ඇමතිතුමා ද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

මම මුදල් ඇමතිකම දරනතාක් කල් ඔය වාගේ දේවල් වුණේ නැහැ කියලා ඔබතුමන්ලාට පේනවා නේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ඒ කියන්නේ, ඊට පස්සේ තමයි වෙලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

මම එහෙම කියන්නේ නැහැ. ඊට පස්සේ ඒ විධියට වුණාද, නැද්ද කියලා හිතන්න පුළුවන්. ඊට පස්සේ මුදල් ඇමතිවරු ගණනාවක් හිටියේ නැහැ නේ. හැබැයි එකක් තිබෙනවා, අපි ඒ අවස්ථාවේදී කිව්වේ රුපියල බාල්දු කරන්න එපා කියන එකයි. ඒක තමයි මම මහ බැංකුවේ අයත් එක්ක කියන්නේ.

මහ බැංකුවේ අය අද ඩොලරයේ අගය රුපියල් 156ට තල්ලු කර තිබෙනවා. රුපියල් 153.90ට තිබුණු ඩොලරය රුපියල් 156ක් දක්වා යනකොට මා මිත්‍ර මංගල සමරවීර ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැයෙන් එතුමාට තව බිලියන 120ක ආදායමක් හොයන්න වෙනවා. ඒ මුදල සොයා දෙන්නේ කවුද? මහ බැංකුවට එතැන ඉඳන් වට්ටෝරු ඉදිරිපත් කරන්න පුළුවන්, "අරක කරන්න. මේක කරන්න." කියලා. නමුත් මුදල් ඇමතිතුමාට තමයි ඒ මුදල් හොයන්න වෙන්නේ. මෙන්න මේ නිසායි මම කියන්නේ, මේ රට කාලා දමලා තිබෙන්නේ දේශපාලනඥයෝ නොවෙයි; ඔය ස්වාධිනයි කියන ආයතනයේ -මහ බැංකුවේ- ඉන්න උදවියයි. අපි මෙතැන ඉඳගෙන කියනවා, නිර්දේශපාලනීකරණය අනුව වැඩ කරනවාය කියලා. එහෙම නම්, මේ මාසය තුළ රුපියල මෙහෙම බාල්දු වුණේ කොහොමද? මේ කටයුතු හොඳට කරගෙන යනවා නම්, කාටවත් ඇඟිලි ගහන්න ඉඩ දෙන්නේ නැත්නම්, ඇයි මෙහෙම වෙන්නේ? මේ කටයුතුවලදී ඒ ගොල්ලන්ගේ වගකීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "9 (*a*) a member of the Monetary Board;" කියා මෙහි amendment එකක් ගෙනෙනවා. ඒ කියන්නේ, මේකේ සම්පූර්ණයෙන් කරන ක්‍රියාවලිය මේ ක්ෂේත්‍රයෙන් අපි අයින් කරන්න ඕනෑය කියන එකයි. මම මේ ගැන අපේ අගමැතිතුමාගෙන් ඇහුවා. එතුමාත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණා. මීට පෙරත් මේ ප්‍රශ්නය තිබුණාය කියන එක මම දැනගෙන හිටියේ නැහැ. නමුත් එහෙම තිබෙන එකෙන් අන්තිමට වන්නේ දේශපාලනඥයාට ඇඟිල්ල දිගු කරන එකයි. නමුත් ඒක කරන අයට කිසි ප්‍රශ්නයක් නැහැ. Bond Commission වාර්තාවේ නියෝජ්‍ය මහ බැංකු අධිපතිවරු තුන්දෙනෙකුගේ නම් සඳහන් වෙලා තිබුණා. එයින් දෙදෙනෙක් retire වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ට මොකුත් ප්‍රශ්නයක් නැහැ. එක්කෙනෙකුට ප්‍රශ්නය තිබෙනවා. එයාව promote කරනවා. මේක මහ බැංකුවේ ඇඟිලි ගැසීමක් නොවෙයිද? දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කරලා, "මේ ගොල්ලෝ තමයි මේක කළේ." කියලා පෙන්වන්න හරි ලෙහෙසියි. නමුත් ඒක ඇතුළේ බොහොම ලොකුවට, වෘත්තික පදනමක් තිබෙනවාය කියලා ලක්ෂ 10ක් අරගෙන මේ අය ගැනත් කථා කරන අවස්ථාව තමයි ඇති වෙලා තිබෙන්නේ. මේ ගැන කථා කරනකොට තමයි අපිට ප්‍රශ්න ඇති වෙන්නේ. නමුත් මේ දේවල් ගැන කථා කිරීම මගේ යුතුකමක් කියලා මම හිතනවා. මොකද අපි අපේ රටට ආදරෙයි. මේක එක්කෙනෙකුගේ, දෙදෙනෙකුගේ තුන්දෙනෙකුගේ විතරක් රට නොවෙයි. මේ රටේ ආර්ථිකය ජයග්‍රහණය කිරීම තමයි අපිට අවශ්‍ය වන්නේ. ඒ තුළින්

[ගරු රවි කරුණානායක මහතා]

තමයි අපිට රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ. ඒ නිසා තමයි අපි වගකීමෙන් මෙවැනි පනත් ගෙනෙන්නේ. ඔව් කියන්න, ගරු වාසුදේව නානායක්කර මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා අද කැමැත්තෙන් ප්‍රශ්න අහනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුදල් ඇමති වුණු හැටියේම පිට රට බැංකුවල තිබෙන මුදල් - Panama Papers ගැන; Swiss බැංකුවල තිබුණු මුදල්- ගැන මම ඔබතුමාට මතක් කළා. ඔබතුමා කිව්වා, "ඒවා වෙනුවෙන් Financial Intelligence Unit එකේ නීති වෙනස් කිරීමක් කරන්න ඕනෑය." කියලා. නමුත් තමුන්නාන්සේ මුදල් ඇමති ධුරයෙන් යන තුරු Financial Intelligence Unit එකේ ඒ නීති වෙනස් වුණේ නැහැ. ඒ ඒ තැන්වල තිබෙන ඒ ඒ මුදල් එහෙමමයි. ඒවා ගැන ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලාට තිබුණේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා ඒ ප්‍රශ්නය මතු කිරීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මුදල් ඇමතිවරයා ලෙස පත් වුණු විගසම මේ ප්‍රශ්නය ඇහුවා. එතුමාට ලියලා මම ඇහුවා, "මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්තේ ඇයි?" කියලා. 1994 අගෝස්තු 25වැනි දා මම පාර්ලිමේන්තුවට එනකොට මම සමහම මේ ගරු සභාවේ ඉඳගත්ත පුද්ගලයෙක් හැටියට මම ඔබතුමාට ගරු කරනවා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි. මම ඒ ගැන සෝදිසි කර බැලූ විගසම -Panama Papersවල තිබෙන සල්ලි වෙන්න පුළුවන්; සිංගප්පූරුවේ තිබෙන සල්ලි වෙන්න පුළුවන්; ස්විට්සර්ලන්තයේ තිබෙන සල්ලි වෙන්න පුළුවන්- පුවත් පතක පළ වෙලා තිබුණු දෙයක් ඔවුන් මා ඉදිරියට එව්වා. මට මතක හැටියට මේ සම්බන්ධයෙන් නම් 54ක් වාගේ තමයි තිබුණේ. මම මේ ගැන මහ බැංකුවෙන් ඇහුවාම, "මේක පත්තරේ තිබෙන දෙයක් නිසා අපිට හොයන්න බැහැ; මේවා ගැන අහන්න නීති නැහැ; ලිව්වොත් කාගෙන්ද උත්තර ගන්න පුළුවන් වන්නේ? හැම පත්තරේකම මේවා තිබ්ලා ඒවා ගැන හොයහොයා ඉන්න ගියොත් අපිට වෙනත් වෙලාවක් නැති වෙයි." කියා ඒ ගොල්ලන් කිව්වා. මෙහෙම කිව්වේ කවුද? මහ බැංකුවයි. හැබැයි, bond issue එක ආවාම ඒ ගොල්ලෝ තොරතුරු ගත්තෙත් පත්තරේ තිබෙන විස්තරවලින්. මෙන්න මේ වාගේ දේවල් තමයි මේ අය කරන්නේ. මම මේ බොහොම හැඟීම්බරවයි කියන්නේ. මොකද, මේ රට නැති වෙලා තිබෙන්නේ ,- [බාධා කිරීමක්] අද ඔබතුමා හරි ආදරෙන් ප්‍රශ්න අහනවා නේද, විමල් වීරවංශ මන්ත්‍රීතුමනි?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, Panama Papersවල හෙළිදරව් වුණු නාමාවලියේ ජාතික ඇඳුම අඳින උස, හීන්දැරි හාදයාගේ සල්ලිත් තිබෙනවා. මම හිතන විධියට ඔබතුමා ඒක පිළිගන්නවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා හිනා වෙවී පිළිගත්තා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සමහර වෙලාවට අපි සියලුදෙනාගේම එක අරමුණක් තිබෙනවා. බැටළු හම පොරවාගෙන ඉන්න වෘකයෝ වාගේ උදව්ය ගැන හෙළිදරව් කිරීම අපේ යුතුකමක්. අපිත් ඉන්නවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. එතැනදී එවැනි දේවල් හංගන්න අවශ්‍ය නැහැ. ඒ වාගේ අයගේ සිංගප්පූරුවේ තිබෙන්නේ එක නමක්; ඒ නමමයි පැනමාවේ තිබෙන්නේ; ඒ නමමයි ස්විට්සර්ලන්තයේ තිබෙන්නේ. නමුත් මෙතැනදී ඔවුන් කථා කරන්නේ මේ රටේ සියලුදෙනාම ආරක්ෂා කරන්න හදන පුද්ගලයෝ විධියටයි. මේක තමයි සැබෑ තත්ත්වය. [බාධා කිරීමක්] ඒකට කමක් නැහැ. කවුරු වුණත් මට කමක් නැහැ . මම කියන්න තිබෙන දේ කියන කෙනෙක්. මම මේ පාර්ලිමේන්තුවේ සිටි අවුරුදු 24ක කාලය තුළ කාටවත් බය වෙලා කථා කළ කෙනෙක් නොවෙයි. මම කියන්න තිබෙන දෙය කියනවා. විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් ඒක පිළිගන්නේ නැහැ, -[බාධා කිරීමක්] වැරැදි දේවල් සියයට 90ක් තිබෙනවා. නමුත් මම හරි වෙලාවේදී හරි පුද්ගලයා සමඟ එකතු වෙන කෙනෙක්.

දේශපාලන stage එකේ කියන දෙයක් තමයි පාර්ලිමේන්තුවේදී ඇහුවේ. නමුත් උත්තර දෙන්න තිබෙනවා නම් ඒවාට උත්තර දෙන්න අවශ්‍යයි. හැබැයි, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා අහපු දෙය අපි සියලු දෙනාම එකතුවෙලා අහන්න ඕනෑ. සිංගප්පූරුවේ තිබෙන නම ස්විට්සර්ලන්තයේ තිබෙන්නේ කොහොමද? ස්විට්සර්ලන්තයේ තිබෙන නම පැනමාවේ තිබෙන්නේ කොහොමද? ඒ වාගේ දොස්තරවරුන් තමයි මේ ආර්ථිකය ගෙනි යන්න හදන්නේ. ආර්ථික ප්‍රතිපත්ති ලොකුවට හදනවා. මෙතැන කථා කිරීම විතරයි තිබෙන්නේ. නමුත් වැඩ කරන ස්වරූපයක් පෙනෙන්නට නැහැ. අපේ කැබිනට් මණ්ඩලයේ තිබෙන ප්‍රශ්නය ඒකයි. සමහර වෙලාවට කයිවාරුව තමයි තිබෙන්නේ. වැඩ කිරීම මදිකමයි තිබෙන ප්‍රශ්නය. මේ අවස්ථාව පාවිච්චි කරගෙන අපි රටේ ආර්ථිකය ඉදිරියට ගෙනි යන්න අවශ්‍යයි. මේ රටේ ආර්ථික යුද්ධය දිනන්න අවශ්‍යයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මොනවා කිව්වත් ඒ ආර්ථික යුද්ධයෙන් දිනන්න පුළුවන්. නමුත් සෘජු තීන්දු ගන්නේ නැති එක සහ ඒකට බාධා ඇති වෙන්නේ කොහෙන්ද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. අපි එකට වැඩ කරන්න අවශ්‍යයි.

ජනවාරි මාසයේ 08 වැනිදා ජනාධිපතිතුමාටත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් වරම ලැබුණේ හවුල් ආණ්ඩුවක් යටතේ රට ඉදිරියට ගෙන යෑමටයි. වැඩි කල් යන්නට මත්තෙන් ඔබ සියලු දෙනාටම ඒ මතයට එකඟවෙලා හවුල් ආණ්ඩුව තුළින් රටට ඔබින විධියට කටයුතු කරන්න අවස්ථාව ලැබෙයි කියා මම තවම විශ්වාස කරනවා. එහෙම නැති වුණොත් එක පැත්තකින් අපේ ආර්ථිකය කඩා වැටෙනවා. ලංකාවේ ආර්ථිකය හදන්න පුළුවන් අවස්ථාව ජනතාව තුළින් ගිලිහී යනවා. මේ රටේ ආර්ථිකය දිනන්න අවශ්‍ය වනවා වාගේම මේ රටට සාමය ගෙනෙන්න අවශ්‍ය වනවා. බෞද්ධකම, ඒකීය භාවය ආරක්ෂා කරලා, අලුත් ව්‍යවස්ථා ගෙනෙන්න අවශ්‍යයි. නම් නොවෙයි අපිට අවශ්‍ය වන්නේ. රටට ස්ථිරසාර සාමයක් ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී, -

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
හැම පැත්තෙන්ම ප්‍රශ්න අහනවා. මේක උසාවියක් නොවෙයි. මට කථා කරන්න අවස්ථාව දෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
මම ඔබතුමාගෙන් කාරණයක්,-

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම මෙහෙම කථා කළේ ඔබතුමන්ලා මේ පැත්තට ගන්න පුළුවන් ස්වරූපය ඇති කරන්නයි. මොකද, විමල් වීරවංශ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී මම කියපු දේට එකඟවෙලා, අඩු ගණනේ මාත් එක්ක එකතු වුණු එක ගැන මම බොහොම සතුටු වනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්ථමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
හැබැයි, කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා ළඟ තියාගෙන ලොක්කා ගැන එහෙම කියපු එක හොඳ නැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I am on a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කථා කරන්න, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කවුරු මොනෙන හිටියත් කමක් නැහැ. මට වෙනසක් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)
තනි අලියාව මතක් නොකරම බැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමතියි. ඔබතුමා මේ අවස්ථාවේදී ඉතා වැදගත් අදහස් රාශියක් කිව්වා. අපේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙනි යන්න ඕනෑ ආකාරය පිළිබඳව ඔබතුමා කිව්වා. ඇත්ත වශයෙන්ම එය ස්වාධීන මතයක්. සමහර කාරණා ගැන ඔබතුමා විවෘතව කථා කළා. ඔබතුමා මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දෙනවාද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මම මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දෙනවාද නැද්ද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. මම මෙතැන පෙන්වන්න හදන්නේ මේකයි. අපි ආණ්ඩු පක්ෂයේ වුණත්, ඔබතුමන්ලා විපක්ෂයේ වුණත් මේකෙන් තාවකාලික තෘප්තියක් ගැනීම නොවෙයි අපිට අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලා ගත් ණය අපි ගෙවන්න අවශ්‍යයි. අපි ගන්න ණය හෙට කවුරු හෝ ගෙවන්න අවශ්‍යයි. දෙගොල්ලන්ම ගත් ණය අන්තිමට ජනතාවට තමයි ගෙවන්න සිදු වෙන්නේ. සියයට 3 පොලියට ගෙවන්න පුළුවන් ණය, හෙට සියයට 5 පොලියට ගෙවන්න කටයුතු කරන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි අපිට තිබෙන්නේ. ඒ නිසා තමයි සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත යටතේ අපි අද අඩු පොලියට ණය අරගෙන ගෙවන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ඒ කියන්නේ bullet payment එකක් ගෙවන්න තිබෙන අවස්ථාව ලිහිල් -ලේසි- කිරීමයි. ඒක තමයි අපිට අවශ්‍ය වන්නේ. මම මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න කැමතියි. පැවැති ආණ්ඩුවලට අපි බැණලා වැඩක් නැහැ. දැන් තිබෙන තත්ත්වය තුළින් ඉදිරියට යන්න පුළුවන් දේ කිරීම තමයි අවශ්‍ය වන්නේ. [බාධා කිරීමක්] දැන දැන මේ ආණ්ඩුව වටටන එක නොවෙයි අපි කරන්න අවශ්‍ය වන්නේ. අන්න ඒ තත්ත්වය හදන එක තමයි අපි කරන්න තිබෙන්නේ. න්‍යායාත්මක මට්ටමට ආර්ථිකයක් හදන්න බැහැ. අද මහ බැංකුවේ පොලී අනුපාතය යටතේ ණයක් අරගෙන ව්‍යාපාර කරන්නේ කොහොමද? සියයට 16, සියයට 17, සියයට 18 පොලියට ණය අරගෙන වැඩ කරන්නේ කොහොමද? අවුරුදු 20ක්, 25ක් පාර්ලිමේන්තුවේ ආරක්ෂක නිලධාරියෙකු හැටියට වැඩ කරපු කෙනෙකුට සියයට 16 පොලිය යටතේ ණයක් අරගෙන කාර් එකක් ගන්නේ කොහොමද? සියයට 8, සියයට 9 පොලී අනුපාතයක් තමයි ඔවුන්ට දරා ගන්න පුළුවන්කම තිබෙන්නේ. ඒක තමයි අපි කරන්න අවශ්‍ය වන්නේ. කවුද, මේක නවත්වන්නේ? Monetary Policy කියලා මහ බැංකුව ඇහිලි ගහනවා. අගමැතිතුමාද, මම මුදල් ඇමති වශයෙන් හිටපු කාලයේද, දැන් ඉන්න මුදල් ඇමතිද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මූලාසනයේ සිටිමින් හැම වෙලාවේම මට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා, එතකොට ආණ්ඩුව කරන්නේ අපිද? මට නිකම් ආණ්ඩුව අපි කරනවා කියලා හිතෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔන්න ඕක නේ වරදින්නේ. ආණ්ඩුවද, විපක්ෂද කියන ප්‍රශ්නයක් නොවෙයි මම මෙතැනදී පෙන්වන්න හදන්නේ. මම කියන්නේ මේකයි. ආණ්ඩු වෙනස් වුණත් ඒ නිලධාරීන් තවම එහෙමම ඉන්නවා. ඕක තමයි තිබෙන්නේ. [බාධා කිරීමක්] ඕක සිහින මතයක්. ඕක 2025දීවත් වෙන්නේ නැති දෙයක්. අපිට වෙනස්කම් තිබෙන්න පුළුවන්. නමුත් අපිට තිබෙන්නේ ජනවාරි මාසයේ 08 වැනිදා ගත් තීරණය අනුව ඒ ගමන හරියාකාරව ඉදිරියට යන එකයි. ඒ කටයුත්ත අපි කරනවා. විමල් වීරවංශ මැතිතුමා, චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කියන ඔබතුමන්ලාගේ ඔය,-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මහ බැංකුව හැම ආණ්ඩුවක්ම අමාරුවේ දමනවා කියලාද? ඔබතුමාගේ කථාවේ අදහස ඒකද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනිවාර්යයෙන්ම. මම ඒක සියයට 100ක් පිළිගන්නවා. මේක කරන්නේ ඒ ගොල්ලන්. මීට ඉස්සෙල්ලා කිව්වා නේ, මේ ආණ්ඩුව එන තාක්කල් මහ බැංකුව ප්‍රශ්නයක් කළේ නැහැයි කියලා. ඇයි, ප්‍රශ්න කළේ නැත්තේ? කවුද, මේ රටේ පොලී අනුපාතය ඇනි කරන්නේ? ඇමතිවරුද? නැහැ, එතැන. එතැන ඉන්නා රජයේ නිලධාරීන් වෙනස් වෙන්නේ නැහැ. ඒ ගොල්ලන් කියනවා, එදා නිල් පාට පැනෙන් ලියපු එක, අද කොළ පාට පැනෙන් ලියනවා කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ වුණාට මහ බැංකු අධිපති වෙනස් වුණා නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම වෙනස් වුණත් අද ඉන්නා කෙනාගෙනුත් වෙන්නේ එම දේම නේ. [බාධා කිරීමක්]

හරි. එක්කෙනෙක් ගිහිල්ලා තව කෙනෙක් ආවා. මොනවා හෝ වෙනසක් තිබෙනවාද? [බාධා කිරීම්] එදා සියයට 2ක් වුණු උද්ධමනය, අද සියයට 8ක් වෙනවා. ඒ සියයට 8 අඩු වී ගෙන යනවා. මේක නේ, එදා පොලී අනුපාතය සියයට දෙකයි දශම - [බාධා කිරීමක්] අන්න හරි. ඒක හරි. ඒක සම්පූර්ණයෙන්ම හරි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩු ගණනේ මෙතැන -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලබා දී තිබෙන කාලයෙන් විනාඩි 5ක් මෙතුමාට ලබා දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම බැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ තරම් ආදරයක් තිබෙනවා නම්, මීට පසුව මම කථා කරන්න ඕනෑ ආකාරය කොහොමද කියලා මම දන්නවා. එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි සාමාන්‍යයෙන් කථා කරන්නේ මනසට. විපක්ෂය කථා කරලා තිබෙන්නේ පපුවට. අන්තිමට ජනතාව ඡන්දය දෙන්නේ බඩෙන්. මෙන්න මේක තමයි වෙලා තිබෙන්නේ. අපි යන ගමන තුළ, අපි රට හදනවා; ශුද්ධ කරනවා. අපි janitorial services වාගේ වැඩේ කරනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපට අවශ්‍ය වෙන්නේ ආර්ථිකය හදන්න පුළුවන් මාර්ගයක් ඇති කරන එකයි. 2009දී අපි යුද්ධය ජයග්‍රහණය කළා. ඊට පසුව අපි සියලුදෙනාම බොහොම සතුටින් හිටියා. නමුත් අන්තිමට -

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාව අවසාන කළාට පසුව ඔබතුමාට point of Order එකට අවස්ථාව දෙන්නම්.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට අපෙන් වේලාව ලබා දෙන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බැහැ, එහෙම දෙන්න බැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න, ඔහොම වේලාව දෙනවා නම්, අපේ අදහස් ටිකත් ඔහොම අරගෙන මේ පැත්තට එන්න පුළුවන් නේ. මොකක්ද, තිබෙන ප්‍රශ්නය? එතකොට 4 වැනිදාට ප්‍රශ්නයක් නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ point of Order එකට අවස්ථාව ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමත් එක්ක මට පොඩි ගැටලුවක් මතු වුණා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මම මුල ඉඳලාම ඔබතුමාගේ කථාවට බොහොම සාවධානව ඇහුම් කන් දුන්නා. ඔබතුමා ඉතාම වැදගත් ආකාරයේ අදහස් ටිකක් ඉදිරිපත් කළා. දැන් ඔබතුමාගෙන් ප්‍රකාශ වුණා, "මහ බැංකුවේ නිලධාරීන් තමයි මේ සියල්ල කරන්නේ. රජය වග කිය යුතු නැහැ" කියලා. එහෙම නම්, මහ බැංකු අධිපතිට රට භාර දීලා රටේ ඉන්නා කට්ටිය මහ බැංකුවට ගියා නම් හරි කියලා මම යෝජනා කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔවුන්ට එහෙම භාර දුන්නා නම්, අපේ රට ශීඝ්‍රගාමී ගමනින් උගන්ඩාව වාගේ රටක තත්ත්වයට ගමන් කරාවි.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා!

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ නිසා තමයි මේ ගෙනන පනත් කෙටුම්පත- [ඝෝෂා කිරීම්] 9.12ට තිබෙන එක සම්පූර්ණයෙන්ම - ඒ නිසා තමයි මේක පරිපාලනය - [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසාන කරන්න. ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතැන වේදිකාවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා නේ. ගරු මන්ත්‍රීවරුනි, මට අවශ්‍ය වෙන්නේ ඔබතුමන්ලාගේ සිහිබුද්ධියට කථා කරන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවශ්‍ය මේ අයගේ සිහිබුද්ධියට කථා කරන්නයි. මොකද, මේ 9.12 කියන එක, මම හිතන විධියට මේ කාලයේ කරන්න බැහැ. නමුත් ඒ ගොල්ලන් වගකීමෙන් කරනවා නම්, - මොකද, ඒ ගොල්ලන් ඇඟිල්ල දිගු කරන්නේ අපේ අගමැතිවරයාට, අපේ ජනාධිපතිවරයාට, හිටපු ජනාධිපතිවරයාට, හිටපු මුදල් ඇමතිට. නමුත් කවුරුවත් හිටපු මහ බැංකු අධිපතිට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. මේක තමයි තිබෙන ප්‍රශ්නය.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, පරණ මහ බැංකු අධිපතිතුමා පත් කළේ කවුද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මහතා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමාව නම් කළේ කවුද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක කළේ - මම දන්නේ නැහැ, කොහෙන් ආවාද කියලා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතකොට බබා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට යුතුකමක් තිබෙනවා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. තවම ස්විට්සර්ලන්තයේ, නම් 54 හම්බවුණේ නැහැ. සිංගප්පූරුවේ තිබෙන නම් ටික තවම හම්බවුණේ නැහැ. පැනමාවල, නම් 263 තවම හම්බවුණේ නැහැ. ඇයි, මේක කරන්නේ නැත්තේ? ඔබතුමන්ලා හරි ආදරෙන් උසාවි යනවා. මේවා ලබා ගන්නත් යන්නේ නැත්තේ ඇයි? මෙන්න මේවා තමයි තිබෙන ප්‍රශ්න. මේ නිසා තමයි මම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන්නේ - [බාධා කිරීමක්] ඒ ගොල්ලන් දේශීය මට්ටමේ ඒවාට වටෙන් ඇවිල්ලා ඇඟිලි ගහනවා. නමුත් පිට රටින් අපට එන ඒවාට ඇඟිලි ගහන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මහ බැංකු අධිපති -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට වැඩිපුරත් කාලය ලබා දීලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ගෙනාවේ ඇයි කියලා මෙතැනදී කියන්න මට යුතුකමක් තිබෙනවා. මොකද, නිදහසින් පසු ගත් ණය ප්‍රමාණය, එදා සිට 2005 වෙනකම් තිබුණු බිලියන 1,784ක ණය ප්‍රමාණය බිලියන 9,000කට, අපට වැඩි කළා. ඒ වැඩි කිරීමේ ගෙවීම තිබෙන්නේ අපට. ඒ නිසා අඩු පොලියට සල්ලි අරගෙන ණය ගෙවීමට පුළුවන් වන ස්වරූපයක් ඇති කිරීම අවශ්‍යයි. කරුණාකර රටේ ආර්ථිකයත් සමඟ සෙල්ලම් කරන්න එපා. දේශපාලනය පැත්තකට දමමු. පොලී අනුපාතය අඩු කරන්න අපට අවශ්‍යයි. මේවා ප්‍රශ්න කරන්නේ; රූපියල අවප්‍රමාණය කරන්නේ මහ බැංකුව. මේවාට ඇඟිලි ගහන්නේ ජනාධිපති,

[ගරු රවි කරුණානායක මහතා]

අගමැති, මුදල් ඇමති නොවෙයි; මහ බැංකුවේ කාර්ය මණ්ඩලය. ඒ නිසා අපේ රටේ අනාගතය උදෙසා මේ කටයුතුවල ස්වාධීනත්වයක් තිබෙන්න ඕනෑ. වෘත්තීය පදනමක් තිබෙනකොට ඇඟිලි ගසන්න වුවමනාවක් නැහැ. නමුත්, පොලී අනුපාතය අඩු කරලා, රුපියල බාල්දු වෙන්නේ නැති වන විධියට රටේ ආර්ථිකය හදන්න ඕනෑය කියන කාරණය මේ අවස්ථාවේ මතක් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ගෙන ඒමට අවශ්‍යයි.

SriLankan Airlines වාගේ ආයතනවල ඇති වී තිබෙන අලාභය නැති කරන්න අවශ්‍යයි. මෙන්න මේවා තමයි වෙනස කියන්නේ. එදා අධික අලාභයක් තිබුණා. නමුත් එහි වෙනසක් වුණා. නමුත් ඒ ඇති වූ සංවර්ධනය තවමත් ඒ මට්ටමට ඇවිල්ලා නැති එක තමයි ප්‍රශ්නය. මේ ණය එකතු වුණාම ඒකටත් ප්‍රශ්නයක් ඇති වනවා. ඒ නිසා අලුතෙන් හිතලා මේ රටේ ආර්ථිකය හදන්න අපට අවස්ථාව දෙන්න. අප්‍රේල් මාසයේ 04 වෙනිදාට මේ තිබෙන විශ්වාසය අපි අනිවාර්යයෙන්ම අති ජයග්‍රහණයක් කරලා පෙන්වනවා. එසේ ජයග්‍රහණය කළාට පසුව තේරෙනවා, මේ යන ගමන වැරදියි; ඒක නිවැරදි කරන්න ඕනෑ කියලා. ඒ ජයග්‍රහණය සඳහා අගමැතිතුමාට ශක්තිය දීලා කටයුතු කරන්න ඕනෑ කියන එක මතක් කරමින් මම නිහඬ වනවා.

[පි.ප. 3.57]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தீவிரப் பொறுப்பு முகாமைச் சட்டமூலம் தொடர்பான எனது கருத்துக்களை இந்த சபையில் முன்வைக்க விரும்புகின்றேன். கணக்காய்வாளர் நாயகம் அவர்கள் பொதுக் கடன் முகாமைத்துவ அறிக்கை பற்றிக் குறிப்பிடுகையில், இலங்கையிலுள்ள ஒவ்வொரு குடிமகனும் 4,17,913 ரூபாயினைக் கடனாகக் கொண்டிருக்கின்றாரென்ற கருத்தினைச் சொல்லியிருக்கிறார். இது மிக முக்கியமான கருத்தாகும். அதாவது, ஒவ்வொரு குடிமகனும் இவ்வளவு பெருந்தொகையான கடனைச் சுமந்துகொண்டிருக்கிறாரென்று குறிப்பிட்டிருக்கிறார். அப்படியாயின், எமது நாட்டிலுள்ள இரண்டு கோடியே இருபது இலட்சம் சனத்தொகையை 4,17,913 இனால் பெருக்கிப் பார்த்தால், நாட்டின் படுகடன் எவ்வளவு தூரம் அதிகரித்திருக்கின்றது என்பதை விளங்கிக்கொள்ளலாம். ஒரு நாட்டில் அபிவிருத்தி நடைபெற வேண்டும்; மக்களுக்குச் சேவை செய்ய வேண்டும் என்ற விடயங்கள் முக்கியமானவை. அந்த அடிப்படையில் மக்களின் சேவைக்காக, நாட்டின் அபிவிருத்திக்காகப் பணத்தை செலவிட வேண்டியதென்பது தவிர்க்க முடியாத ஒரு விடயமாகக் காணப்படுகின்றது. நமது தேசிய வருமானத்திற்கு உட்பட்டுப் பணத்தைச் செலவு செய்கின்றபோது உள்நாட்டு, வெளிநாட்டு கடன் சுமையில் சிக்கவேண்டிய அவசியம் எற்படாது. ஆனால், எமது படுகடனை தேசிய வருமானத்தின் வீதத்தோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது 108 தசமத்திற்கும் அதிகமாகக் காணப்படுவதாகப் புள்ளிவிபரம் கூறுகின்றது. அப்படியென்றால், எமது நாட்டின் படுகடன் ஒவ்வொரு குடிமகனின் தலையிலும் மிகவும் பழுவாகச் சுமத்தப்பட்டிருப்பதை எங்களால் அறியக்கூடியதாக இருக்கின்றது.

எமது நாடு சுதந்திரம் அடைந்து எழுபது ஆண்டுகள் தாண்டியிருக்கின்றன. இந்த நிலையிலும் எமது நாடு "அபிவிருத்தி அடைந்துவருகின்ற நாடு" என்ற ஒரு சொற்பதத்தின் மூலமாக வளர்முக நாடாகக் கணிக்கப்பட்டு வருகின்றது. வளர்முக நாடு என்று பார்க்கின்றபோது, நாட்டின் தேசிய வருமானத்தினைவிட நாட்டில் செய்யப்படுகின்ற செலவினம் அதிகமாக இருக்கின்றது. செலவினம் அதிகரிக்கின்றபோது பாதீட்டில் துண்டுவிழும் தொகை அதிகரித்துச் செல்கின்றது. பாதீட்டின் துண்டுவிழும் தொகையினைச் சமாளிப்பதற்காக உள்நாட்டு வங்கிகளிலிருந்து அல்லது வெளிநாடுகளிலிருந்து கடன்கள் பெறப்படுகின்றன. இவ்வாறு கடன்களைப் பெற்றதன் விளைவாக ஒவ்வொரு குடிமகனுக்கும் 417,913 ரூபாய் பழு சுமத்தப்பட்டிருக்கின்றது.

வெளிநாடுகளிலிருந்து கடன்களைப் பெறுகின்றபோது எமது தலைவர்கள் எந்த அடிப்படையில் சிந்திக்கின்றார்கள் என்பது பற்றி எனக்குத் தெரியாது. கடன்களை நன்கொடையாகப் பெறுகின்றபோது அல்லது அன்பளிப்புக்களாகப் பெறுகின்றபோது அவற்றைத் திருப்பி வழங்கவேண்டிய தேவை இருப்பதில்லை. சீனாவைப் பொறுத்தமட்டில், அது எமது நாட்டிற்கு கடன்களைத் தந்திருக்கிறது. அவை அதிக வட்டி அடிப்படையில் தரப்பட்டிருக்கின்றன. அரசு அந்தக் கடன்களைத் திரும்பவும் சீனாவுக்குச் செலுத்த வேண்டும். எந்த நாட்டிலிருந்து கடன் பெற்றாலும் இதேபோன்று செலுத்த வேண்டிய பொறுப்பு எமது நாட்டுக்கு இருக்கின்றது. கடன்கள் வட்டியோடு அறவிடப்படுகின்றபோது கடன்சுமை மேலும் அதிகரிக் கின்றது. அந்த நிலையில் கடன்களைச் செலுத்துவதற்காக மீண்டும் கடன் பெறவேண்டிய ஒரு நிர்ப்பந்த நிலைக்கு நாடு தள்ளப்படுகின்றது. அதாவது, இவ்வாறான கடன்களை வட்டியோடு இறுப்பதற்காக மேலும் கடன்களை வாங்கியதன்மூலம் எமது நாடு தொடர்ந்து கடன் சுமைக்குள் - கடன் பொறிக்குள் தள்ளப்பட்டிருக்கின்றது. இந்த நிலையில் இந்தக் கடன் விடயம் பற்றி அல்லது படுகடன்களை முகாமைத்துவம் செய்வது பற்றிச் சிந்திக்க வேண்டிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது.

கடன் விடயத்தைப் பிற நாடுகளுடன் தொடர்புபடுத்திப் பார்க்கின்றபோது, குறித்த நாடுகள் வளர்முக நாடுகளாக இருப்பதையே அபிவிருத்தியடைந்த நாடுகள் விரும்புகின்றன. அதாவது, தமது ராஜதந்திரப் பொறிக்குள் வீழ்த்திக் கொள்வதற்கு - தமது கட்டுப்பாட்டுக்குள் வைத்துக் கொள்வதற்கு, அந்த நாடுகள் தன்னிறைவானதாக இருக்காமல் அபிவிருத்தியடைந்து வருகின்ற - குறை அபிவிருத்தி நாடுகளாக இருக்க வேண்டுமென்ற எண்ணம் வளர்ச்சியடைந்த நாடுகள் மத்தியில் காணப்படுகின்றன. அந்தக் கடன்கள் மூலமாக குறித்த நாடுகளின் இறைமை ஒரு வகையில் நலிவடையச் செய்யப்படுகின்றது. இறைமை நலிவடைகின்றபோது அந்த நாடுகள் கடன்கொடுத்த நாடுகளுக்குக் கட்டுப்பட்டு கைப்பொம்மைகளாக இருக்க வேண்டிய நிலைமை ஏற்படுகின்றது.

'நவகாலனித்துவம்' என்ற ஒரு விடயம் இருக்கின்றது. நவகாலனித்துவம் என்பது வளர்ச்சியடைந்த நாடுகள் அபிவிருத்தியடைந்து வருகின்ற பிற நாடுகளைக் கட்டுப்படுத்துவதற்காக அவற்றுக்குக் கடன்களைக் கொடுக்கின்றன. இவ்வாறு கடன்களைக் கொடுத்துவிட்டு அந்தக் கடன்களுக்கு வட்டியை அறவிடுகின்றபோது அந்த நாடுகள் அபரிமிதமான பொருளாதார சுமைக்குள் தள்ளப்படுகின்றன. இவ்வாறு தள்ளப்படுகின்ற நாடுகள் தெரிந்தோ, தெரியாமலோ தமது ஜாம்பவான்களாகக் காணப்படுகின்ற அபிவிருத்தியடைந்த நாடுகளுக்குக்

கட்டுப்பட்டிருக்க வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்படுகின்றது. ஒரு காலத்தில் வளர்ச்சியடைந்த நாடுகள் அல்லது வல்லாதிக்க நாடுகள் பிற நாடுகளைக் கட்டுப்படுத்துவதற்கு நேரடியான காலனித்துவ முறைகளைப் பின்பற்றியிருக்கின்றன. நேரடியான காலனித்துவமுறை பற்றியும் எங்களுக்குத் தெரியும். அதாவது, படை அல்லது யுத்த தளபாடப் பலத்தினை வைத்துக்கொண்டு மற்றைய நாடுகளைக் காலனித்துவ நாடுகளாக அல்லது கைப்பொம்மைகளாக வைத்திருக்கின்ற போக்காகும். இன்றைய காலத்தில் குறித்த நாடுகளுக்கு ஏதோவொரு விதத்தில் கடன்களை வழங்கி அல்லது அவற்றைக் கட்டுப்படுத்தி தமது கைப்பொம்மைகளாக வைத்திருப்பதற்கு வளர்ச்சியடைந்த நாடுகள் - அபிவிருத்தியடைந்த நாடுகள் தந்திரோபாயப் பொறிமுறைகளை வகுத்துச் செயற்பட்டு வருகின்றன. ஆனால், தெரிந்தோ தெரியாமலோ எமது நாடு உட்பட வளர்முக நாடுகள் இந்தத் தந்திரோபாயப் பொறியில் வீழ்ந்துவிடுகின்றன.

கடன்கள் கிடைக்கின்றன என்பதற்காகத் தாராளமாகப் பெற்றுக்கொள்ள வேண்டுமென்ற அடிப்படையில் செயற்பட்டால், கடன் சுமையானது நிகழ்கால சந்ததியினருக்கு மாத்திரமல்லாமல், எதிர்காலச் சந்ததியினர்மீதும் சுமத்தப்படுகின்றது. எந்தப் பாவமும் செய்யாத எதிர்காலச் சந்ததியினர் அல்லது எதிர்காலத்தில் ஆட்சி செய்யப்போகின்றவர்கள் இந்தக் கடன்களையும் இறுக்க வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலையில், நிர்ப்பந்த நிலையில் இருக்கின்றார்கள். உண்மையில், தேசத்தைப் பற்றிச் சிந்திக்கின்றவர்கள் அல்லது பொறுப்புணர்ச்சிமிக்க விதத்தில் நாட்டைப் பற்றிச் சிந்திக்கின்றவர்கள் - தேசபக்தர்கள் என்றெல்லாம் கூறப்படுகின்றவர்கள் பிற நாடுகளிலிருந்து பெறப்படுகின்ற கடன் சுமையினை இறுக்கின்ற விடயத்தில் மிகவும் காத்திரமான பங்களிப்பினை வழங்க வேண்டியவர்களாக இருக்கிறார்கள்.

வெளிநாடுகளிலிருந்து பெறப்படுகின்ற படுகடன்கள் - நிதி சரியான முறையில் கையாளப்படுகின்றதா? என்ற கேள்வியும் எழுகின்றது. அதாவது, நிதி விரயம், நிதித் துஷ்பிரயோகம், வெளிநாட்டுக் கொள்வனவுகளின்போது தரகுப் பணத்தைப் பெற்றுக்கொள்ளல் போன்ற செயற்பாடுகள் மூலமாக எமது படுகடன்கள் அதிகரித்துச் செல்லுகின்ற ஒரு நிலைப்பாடும் காணப்படுகின்றது. இப்படியான சூழ்நிலையில் எமது நாடு கடன்சுமையைத் தாங்குகின்றது. ஆனால், அந்தக் கடன் சுமையினால் ஒவ்வொரு குடிமகனும் திண்டாட வேண்டிய, தள்ளாட வேண்டிய ஒரு நிலை காணப்படுகின்றது.

2005ஆம் ஆண்டு - யுத்தகாலப் பகுதியில் ஒவ்வொரு குடிமகனுக்குமான கடன் என்பது 1,08,452 ரூபாயாக இருந்திருக்கிறது. 2015ஆம் ஆண்டு காலப்பகுதியில் ஒரு குடிமகனுக்குரிய கடன் 3,79,456 ரூபாயாக அதிகரித்து, தற்காலத்தில் அது 4,17,913 ரூபாயாக மேலும் அதிகரித்திருக்கின்றது என்றால், ஒவ்வொரு குடிமகனின் தலையிலும் சுமத்தப்படுகின்ற கடனானது, அதிகரித்துக்கொண்டே செல்லும். இதனை ஒரு வகையில் பார்க்கின்றபோது நாங்கள் தெரிந்தோ, தெரியாமலோ பிற நாடுகளின் ஏகாதிபத்திய வலைக்குள் அல்லது நவகாலனித்துவ வலைக்குள் சிக்கிக்கொண்டிருக்கிறோம் என்பதை உணரமுடிகிறது.

சிலவேளைகளில், சில நாடுகளின் தேவைகளை எமது சொந்த நாட்டுக்குள் நிறைவேற்றக்கூடாது என்று இறைமை அடிப்படையில் சிந்தித்தாலும், தவிர்க்க முடியாத நிலைமையில் எமது படுகடன்களை இறுக்கமுடியாதுவிட்டால், நாட்டின் கடன் சுமையானது எங்களை ஓர் அரை அடிமை நிலைக்கு அல்லது ஒரு பொம்மை நிலைக்குத் தள்ளிவிடுவதை அவதானிக்க முடியும். படுகடன்கள் அதிகரிப்பதற்கு முக்கியமான காரணங்களில் ஒன்றாக இருப்பது, கடந்தகால யுத்தம் என்பதையும் ஏற்றுக்கொண்டுதான் ஆகவேண்டும். ஆகவே, முதலில் நாட்டின் தேசிய ஐக்கியம்-தேசிய ஒற்றுமை என்பதுதான் மிக முக்கியமான எண்ணக்கருவாக அமையவேண்டும்.

வளர்ச்சியடைந்த நாடுகளை எடுத்துப்பார்த்தால், அந்த நாடுகளில் பல்லினங்கள், பல்லின மதங்கள், பல்கலாசாரங்கள் இருந்தபோதிலும், 'தேசத்தின் மக்கள்' என்ற அடிப்படையில் தேசிய ஐக்கியத்தை முழுமையாகக் கட்டியெழுப்பியதன் பின்னரே, அந்த நாட்டு மக்கள் தமது அபிவிருத்திப் பணிகளைக் கையாண்டு நாட்டை விரைவாகக் கட்டியெழுப்பியிருக்கிறார்கள். அதாவது அமெரிக்காவாக இருக்கலாம், சுவிற்சர்லாந்தாக இருக்கலாம், பிரித்தானியாவாக இருக்கலாம், பிரான்ஸாக இருக்கலாம், ஜேர்மனியாக இருக்கலாம், அவுஸ்திரேலியாவாகக்கூட இருக்கலாம் இந்த நாடுகள் மக்கள் அனைவரையும் தமது நாட்டுப் பிரஜைகள் என்ற அடிப்படையில், இயன்றவரைக்கும் சமத்துவமாக, சம வாய்ப்பளித்து வழிநடத்தியதன்மூலமாக, அவர்கள் தேசத்தின்மீது பக்தி கொள்ளக்கூடியவர்களாகவும் தேசத்துக்காக உழைக்கக்கூடியவர்களாகவும் தேசத்திற்கு எந்த விதத்திலும் பங்கமேற்படுத்தாத விதத்திலும் செயற்பட்டார்கள். அவர்களது ஐக்கியத்தை மேம்படுத்தியதன் பின்னர், சகலரையும் ஒன்றாக இணைத்து நாட்டின் அபிவிருத்தியைக் கட்டியெழுப்பியிருக்கின்ற சரித்திரங்களிலிருந்து எமது நாடு கற்றுக்கொள்ள வேண்டும். மாறாக, நாடுகளில் இனவாதங்கள், மதவாதங்கள், அடிப்படைவாதங்கள் போன்ற பிற்போக்குவாதங்களை விதைத்து, அதன்மூலமாக அரசியல் செய்யமுற்படுவது அல்லது ஓர் இனத்தின்மீது பாதிப்பை ஏற்படுத்தி, அதன்மூலமாக அந்தப் பாதிப்பை ஏற்படுத்தியவர்கள் கதாநாயகர்களாக மாற முற்படுவது அல்லது ஓர் ஆட்சியை வீழ்த்துவதற்கு ஒரு கருவியாக இனப் பிரச்சினையைக் கையில் எடுத்துக்கொள்வது என்பன மொத்தத்தில் எல்லோருக்கும் பழுவாகவும் வேதனையாகவும் அமையக்கூடிய செயற்பாடுகளாகும். அந்த வகையில் கற்றுக்கொண்ட பாடங்கள் அதிகமாக இருக்கின்றன. அவற்றை எந்தளவுக்குப் பின்பற்றுகின்றோம் என்றால், அது மிகவும் அரிதாகவே காணப்படுகின்றது.

கடந்த காலத்தில் ஏற்பட்ட வன்முறைகளுக்குக் காரணம் என்ன? அவற்றின் பின்புலங்கள் என்ன? எதனைச் செய்யாதமையால் இந்த விளைவுகள் ஏற்பட்டன? இன்றைய தேவைகளை எவ்வாறு எதிர்காலத்தில் நிறைவேற்றப் போகின்றோம்? என்ற அடிப்படையில், மிகவும் பகுத்தறிவு ரீதியாக - அறிவியல்பூர்வமாகச் சிந்திக்கவேண்டியிருக்கின்றது. இதனை மறந்துவிட்டு, செய்த தவறுகளைத் தொடர்ந்தும் தொட்டுச்செல்லுகின்ற சிந்தனைகள், செயற்பாடுகள் மற்றும் அதிகாரத்தைக் கைப்பற்ற வேண்டும்; ஆட்சியைப் பிடிக்கவேண்டும்; மற்றவர்கள் மீது ஆதிக்கம் செலுத்தவேண்டும் என்கின்ற எண்ணங்கள், செயற்பாடுகள் தொடர்ந்தும் இந்த நாட்டில் இருக்குமாக இருந்தால், அது நாட்டிலுள்ள சகலருக்கும் பாதிப்பை ஏற்படுத்துவதாகவே அமையும்.

எனவே, நான் இந்த இடத்தில் குறிப்பிடுகின்ற முக்கியமான ஒரு விடயம் என்னவென்றால், ஒரு நாட்டின் தேசிய வருமானம் என்பது அந்த நாட்டின் செலவினத்தைவிட

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

අතිකමාක ඉරුක්ක වේණ්ටුම් එන්පතුතාන්. අතර්කු පටුකටන්කළෙක් කුරෙප්පතර්කු එන්න සෙය්ය වේණ්ටුම්; ඒර්රුමතිකළෙ අතිකරිප්පතර්කු එන්න සෙය්ය වේණ්ටුම්; ඉරක්කුමතිකළෙක් කට්ටුප්පටුත්තුවතර්කු එන්න සෙය්ය වේණ්ටුම්; සුර්රුලාත්තුරෙයෙ වළර්ප්පතර්කු එන්න සෙය්ය වේණ්ටුම්; වෙළිනාට්ටුච් චම්පාත්තියත්තෙ අතිකරිප්පතර්කු එන්න සෙය්ය වේණ්ටුම් එන්කින්ර මුර්පෝක්කාන විටයඞ්කළෙප් පර්රි නාඞ්කළ් චින්තිත්තාක වේණ්ටුම්.

අතේනේරම්, අණ්මෙයිල් එමතු නාට්ටුක්කුළ් ඉනඞ්කළුක්කු මත්තියිල් ඒර්පට්ට මිකවුම් වේතනෛක්කුරිය විටයම් - කණ්ටි, අම්පාරෙ පෝන්ර ඉටඞ්කළිල් ඒර්පට්ට තුර්ප්පාක්කියච් චම්පවඞ්කළ් - පර්රියුම් නාම් චින්තික්ක වේණ්ටුම්. ඉන්ත නිලෙයිල් එමතු ආට්චියාළර්කළුක්කු තමතු ඉරෙමෙයිනෛප් පයන්පටුත්තිච් චකල ඉන මක්කළෛයුම් උළ්නාට්ටිල් චමත්තුවමාක ආළක්කූටිය, වාළවෛක්කක්කූටිය චාතුරියම් - පලම්- කුරෙන්තුවිට්ටතා? එන්රු එණ්ණත් තෝන්රුකින්රතු. එතු එප්පටියාක ඉරුන්තාලුම් අන්ත වන්මුරෙ තොටරාමල් තටුක්කප්පට්ටතු වරවේර්කත්තක්ක විටයමාකුම්. අන්ත වන්මුරෙකළිල් ඊටුපට්ට කුර්රවාළිකළ් - චන්තේක නපර්කළ් කෛතු චෙය්යප්පට්ටමෙ, චට්ට නටවටික්කෛ එටුප්පතර්කාන චෙයර්පාටුකළෛ මුන්නෙටුත්තමෙ එන්පන එල්ලාම් වරවේර්කත්තක්ක විටයඞ්කළාක ඉරුන්තාලුම්, ඉන්ත නාට්ටිල් කාණප්පටුකින්ර චොත්තුක්කළ් මර්රුම් මනිත වළඞ්කළ් අළික්කප්පටුවතන්මූලම් මොත්තත්තිල් නෂ්ටත්තිර්කුළ්ළාවතු නාටේ ඔළිය, වේරු යාරුමල්ල.

උළ්නාට්ටු රීතියාකත් තීර්ක්ක මුටියාත පිරච්චිනෛකළ් විස්වරූපම් එටුත්තතන් කාරණමාක අවෙ උළ්නාට්ටු එල්ලෛකළෛක් කටන්තු පිර නාටුකළිල් පේචුපොරුළාක - විවාතප් පොරුළාක මාරික්කොණ්ටිරුක්කින්ර නිලෛප්පාටුකළ් පර්රියුම් චින්තික්ක වේණ්ටුම්. චොන්තප් පිරච්චිනෛකළෛච් චොන්ත නාට්ටිර්කුළ් තීර්ත්තුක්කොළ්වතර්කුරිය මනවිරුත්තියිනෛක් කොළ්ළාතිරුන්තාල්, පිරනාටුකළාල් පේචප්පටුකින්ර පිරච්චිනෛයාක, පිර නාටුකළ් එම්මීතු ආතික්කත්තෛච් චෙලුත්තක්කූටිය පිරච්චිනෛයාක, නවකාලනිත්තුවප් පොර්රිමුර්රෛයිනෛ එങ්කළ්මීතු චෙලුත්තක්කූටිය ඔරු පිරච්චිනෛයාක අතු මාරුවතර්කුරිය වාය්ප්පුකළ් ඉරුක්කින්රන. නාඞ්කළ් පට්ට වේතනෛකළෛ - කර්රුක්කොණ්ට පටිප්පිනෛකළෛච් චරියාකප් පයන්පටුත්තුකින්රපෝතුතාන් එඞ්කළුක්කු එතිර්කණියමාක ඉරුක්කින්ර මර්රෛකණියප් පෝක්කුකළෛක් කුරෙත්තුක් කොළ්වතර්කුම් අතේපෝන්රු නේර්කණියමාක ඉරුක්කින්ර - තේචත්තෛච් චෙලික්ක වෛක්කින්ර, ඉක්කියප්පටුත්තුකින්ර, තේචියප් පිරච්චිනෛකළෛ කුරිප්පාක ඉනප්පිරච්චිනෛයෛත් තීර්ත්තුක්කොළ්කින්ර චෙයර්පාටුකළිල් මුන්නේරිච් චෙල්වතර්කුම් වාය්ප්පු එර්පටුම්.

ඉන්ත නාට්ටිල් පුරෛයෝටිප්පෝයිරුක්කින්ර තේචිය ඉනප්පිරච්චිනෛ එන්කින්ර විටයත්තෛ ඔරු චාතාරණ විටයමාකක් කෛනළුවවිට්ටු අල්ලතු මර්රන්තුපෝය්විට්ටු, අතර්කු මුක්කියත්තුවම් කොටුක්කාමල් තට්ටික් කළිප්පතෙන්පතු, "පුණ්ණුක්කු මේල් පුනුකු නෙය් තටවුතල්" පෝල් ආකිවිටුම්. අතාවතු, ඔරු කායම් එර්පට්ටාල් අන්තක් කායත්තෛ මිකවුම් තූය්මෙයාක්කි අතර්කුරිය චරියාන මරුන්තිනෛක් කට්ටිවිටුවතුතාන් මේලුම් පාතිප්පු එර්පටාමල් ඉරුප්පතර්කුරිය වළියාකුම්. මාරාක, අන්තක් කායත්තිල් තුර්නාර්රම් වීචුකින්රතු එන්පතර්කාක අතර්කු 'පුනුකු නෙය්' - scent ඉප් පූචික්කොණ්ටිරුප්පතනාල් තොටර්න්තුම් අතු ආරාත වටුවාකිප් පරුත්තුච්චෙල්වතර්කාන වාය්ප්පිරුක්කින්රතු.

තේචිය පිරච්චිනෛයෙන්පතු නාට්ටින් පොරුළාතාර අපිවිරුත්තියෝටු මිකවුම් නෙරුංකිය තොටර්පෛක් කොණ්ටිරුක්කින්රතු. තේචිය පිරච්චිනෛ තීර්ක්කප්පටුකින්ර පෝතුතාන් පුලම්පෙයර්න්තවර්කළ්කූට ඉන්ත නාට්ටින් අපිවිරුත්තියිල් පංකාළර්කළාක මාරි නාට්ටෛක් කට්ටියෙළුප්පුවතර්කුම් වළර්ත්තුච්චෙල්වතර්කුම් වාය්ප්පිරුක් කින්රතු. තාංකළ් පාතික්කප්පට්ටිරුක්කිරෝම් එන්පතර්කාක වෙළිනාටුකළිල් වාතප් පිරතිවාතංකළ් නටත්තුපවර්කළෛ එමතු පංකාළිකළාක මාර්ර වේණ්ටුමාක ඉරුන්තාල්, තේචිය පිරච්චිනෛයානතු තීර්ක්කප්පට වේණ්ටුම්. තීර්ක්කප්පටුකින්ර පෝතුතාන් 'චකලරුම් ඉලංකෛයර්' එන්කින්ර උණර්වෝටු, ඉටම්පෙයර්න්තවර්කළ් - පුලම්පෙයර්න්තවර්කළ් - උට්පට පුත්තිජීවිකළ් පෝන්රවර්කළුම්කූට එමතු නාට්ටුක්කුච් චේවකම් චෙය්යක්කූටිය නිලෛමෛ ඒර්පටුම්. ඉවර්රෛයෙල්ලාම් චිරිය - අර්පමාන - විටයමෙන්රු තට්ටික්කළිත්තුක්කොණ්ටු මීණ්ටුම් මීණ්ටුම් පිළෛයාන පාතෛකළිල් චෙන්රාල්, එමතු නාටු තොටර්න්තුම් වළර්මුක නාටාක - අපිවිරුත්තියටෛන්තු වරුකින්ර නාටාකවේ ඉරුක්ක මුටියුම්.

එනවේ, තීවිරප් පොරුප්පු මුකාමෛත්තුවම් පර්රිය විටයත්තිල්, පටුකටන් මුකාමෛත්තුවම් චම්පන්තමාකක් කවනම් චෙලුත්තුකින්ර අතේවේළෛ, ආට්චියෛක් කෛප්පර්රුවතු - ආට්චියෛප් පිටිප්පතු, මාරිමාරි ආට්චි චෙය්වතු, කූටිය කාලම් ආට්චි චෙය්වතු එන්පවෛ පර්රියුම් ජනාතිපතිප් පතවි, පිරතම අමෛච්චර් පතවි, අමෛච්චර් පතවිකළ් එන්පවෛ පර්රියුම් චින්තිප්පතෛ විට, නාට්ටින් එතිර්කාලම් එව්වාරු ඉරුක්කවේන්ටුම් එන්පතු පර්රිත් තිට්ටමිට්ටුත් තූරනෝක්කෝටු චෙයර්පට වේණ්ටුම්. අතර්කු එර්රවිතත්තිල් පොරුත්තමාන චට්ටඞ්කළෛ ඉයර්රි, නාටු තන්නිරෛවු කාණ්පතර්කුම් චොන්තක්කාලිල් ඉයඞ්කුවතර්කුම් උරිය විතත්තිල් ආවන චෙය්යවේන්ටුම් එන්රුම් අතර්කු මුක්කිය තටෛකළාක ඉරුක්කින්ර අනෛත්තුක් කාරණිකළුම් අකර්රප්පට වේණ්ටුමෙන්රුම් කූරි, උරෛයිනෛ නිරෛවු චෙය්කින්රේන්. නන්රි!

[අ.භා. 4.17]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ඉදිරිපත් කර තිබෙන සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පතේ තිබුණු කාරණා ගණනාවක් පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේත්, අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේත් ඉල්ලීම අනුව, මහ බැංකු අධිපතිතුමාත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් එක්ක ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපි සාකච්ඡා කළා. එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් විධියට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අදහස් අපේ ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාට ඉදිරිපත් කළා. ඒ අනුව වැදගත් සංශෝධන ගණනාවක් සහිතව තමයි මෙම පනත් කෙටුම්පත අද ඉදිරිපත් වෙන්නේ. ඒ කාරණා පිළිබඳව ඉතාම සද්භාවයෙන් කල්පනා කරලා කටයුතු කිරීම ගැන ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වනවා.

ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේ විශාල වශයෙන් අර්බුද ඇති වුණේ පරණ පනත්වල තිබුණු නීතිමය තත්ත්වය නිසා බව නීතිඥවරයකු විධියට මම කියන්න ඕනෑ. මහ බැංකුවේ සිද්ධ වුණු ඒ දැවැන්ත වංචාවේදී අදාළ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමේදී නීතිපති දෙපාර්තමේන්තුවට විශාල අර්බුදයකට මුහුණ

දෙන්න සිද්ධ වුණා. විශේෂයෙන්ම ඔප්පු කිරීමේ භාරය පිළිබඳ සම්පූර්ණ වගකීම නීතිපති දෙපාර්තමේන්තුවට පැවරී තිබුණා. යම් නිලධාරියකු වරදක් කළාද, නැද්ද කියන එක ඔප්පු කිරීමේ කාර්යභාරය නීතිපති දෙපාර්තමේන්තුව සතු වුණා. මේ පනත් කෙටුම්පතින් එහි යම් වෙනස්කමක් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතේ 9 වන වගන්තිය යටතේ මෙසේ සඳහන්වී තිබෙනවා:

> "... තමා විසින් සද්භාවයෙන් ක්‍රියාකොට ඇති බව ද සියලු නිසි උද්‍යෝගය, සාධාරණ සැලකිල්ල සහ නිපුණතාව දක්වා ඇති බව ද ඔප්පු කරන්නේ නම්, ඔහු විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, නියමයක්, තීරණයක් හෝ විධානයක් යටතේ ඇති සිය වගකීම් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවකට හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය."

මේ අදහස සමාජයට ගලාගෙන ගියේ වෙනත් විධියකට. "තවදුරටත් හොරකම් කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන ද මේ යොදලා තිබෙන්නේ" කියලා විශාල අර්බුදයක් රට ඇතුළේ මතු වෙලා තිබුණා. නමුත් මම නීතිඥයකු විධියට කියන්න කැමැතියි, දැන් ඇත්තටම වෙලා තිබෙන්නේ, ක්‍රියාව ඔප්පු කිරීමේ භාරය - Balance of Probabilities - නීතිපති දෙපාර්තමේන්තුවේ සිට ක්‍රියාව කළ පුද්ගලයා දක්වා මාරු වී තිබෙන බව. ඒ කියන්නේ, යම් වැඩ පිළිවෙළට මහ බැංකුවේ යම් පුද්ගලයෙකු හෝ නිලධාරියකු සම්බන්ධ වනවා නම් ඔහු ඔප්පු කරන්න ඕනෑ, "මා සද්භාවයෙන් කටයුතු කළා"ය කියන එක. ඇත්තටම හොඳ දෙයක් තමයි මේ කරලා තිබෙන්නේ. නමුත්, ඒ කරුණ සමාජය පිළිගත්ත විධියේ විශාල ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා අපි කිව්වා, "මේ ගැන රණ්ඩු වෙන්න අවශ්‍ය නැහැ. Monetary Law යටතේ තිබුණු පරණ නීතියම ඒ වෙනුවෙන් තියන්න" කියලා. මොකද, සමහර අයට ඒ සංශෝධනය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණ නිසා. මෙහිදී අපට වැදගත් වන්නේ මේකයි. ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විශේෂයෙන්ම ඒ කරුණ මතු කළා. මින් පසුව යම් පුද්ගලයෙක් ගත්ත තීන්දුවක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නඩු පවරන්න පුළුවන් තත්ත්වයක් දැන් ඇති කර තිබෙනවා. දේශපාලනඥයන් එදා ගත්ත සමහර තීන්දු තීරණ පිළිබඳව ප්‍රකාශ ලබා දෙන්න අද ඔවුන්ට තමයි FCID එකට යන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ වෙලාවට ගන්න සිදු වූ අත්‍යවශ්‍ය තීන්දු නිසා, සමහර වෙලාවට එම ක්‍රියාදාමය තුළ අදාළ අමාත්‍යවරයාට වාසියක් සිද්ධ වෙලා නොතිබුණත්, සද්භාවයෙන් ගත් එම තීන්දු පිළිබඳව අද එතුමන්ලාට මේ නඩු කටයුතුවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේකම තමයි අපේ නිලධාරින්ටත් සිද්ධ වෙලා තිබෙන්නේ. ඔවුන් හොරකම් කරන්නේ නැතුව සාධාරණව ගත්, නිවැරදිව ගත් තීන්දු නිසා අද FCID ගාණේ යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ නිසා අද රාජ්‍ය පරිපාලනයේ ඉතාම අර්බුදකාරී වාතාවරණයක් ඇතිවෙලා තිබෙනවා. අද අමාත්‍යාංශයක ලේකම්වරයෙක් තීරණයක් ගන්නේ නැහැ. තීරණයක් ගන්නේ නැති හේතුව, මේ වාගේ ක්‍රියාදාමයක් තුළ ඔවුන් අසරණභාවයට පත්වෙලා තිබීමයි. මෙන්න මේක තමයි අපි මතු කර දුන් කාරණය. නීතිපති දෙපාර්තමේන්තුවට මෙහි වරද ඔප්පු කිරීමේ භාරය පිළිබඳ ඔවුන්ගේ තිබෙන ක්‍රියාදාමයෙන් පොඩ්ඩක් ඇත්වෙලා, - වරද පැටවීම නැත්නම් වරද ඔප්පු කිරීමේ කාර්යභාරය - මම වරදක් නොකළා කියන කාර්ය භාරය ඔප්පු කිරීම රාජ්‍ය සේවකයාට පැවරුණාට, ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ ඔවුන් විශාල අර්බුදයකට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවකයන් පිළිබඳව අපි ගත් නිවැරදි ක්‍රියාදාමයක් විධියටයි මම මේක සලකන්නේ.

අපේ පැත්තෙන් අපි ඒක දැඩි ලෙස මතු කෙරුවා, කරුණාකරලා මේ රටේ රාජ්‍ය සේවකයන්ට නිවැරදිව වැඩ කරන්න ඔවුන්ට තීන්දු ගන්න ඉඩ දෙන්න කියලා. මොකද, හේතුව නිවැරදිව වැඩ කරන මනුෂ්‍යයා දැන් අසරණභාවයට පත් වෙනවා. අද රණවක මහත්තයා අරගෙන ගිහිල්ලා හිරේ දාලා තිබෙනවා. මම හිතන්නේ මේ වගේ අය නිවැරදිව තීන්දු ගත්තා. අඩු තරමේ තමන්ගේ ගෙදර ඉඳගන්න පුටුවක් මේසයක් නැති මනුෂ්‍යයාටත් අද හිරගෙදර ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්. ඒ නිසා තමයි අපි කිව්වේ මේ කාරණා ඇතුළත් කරන්න කියලා. ඒ අනුව ඒවා ඇතුළත් කරලා තිබෙනවා. එම කාරණා ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම ගැන මා ස්තුතිවන්ත වෙනවා.

උදේ පැවති කමිටුවේ දීත් විශේෂ කාරණා මතු කරලා තිබුණා. උදේ පැවති කමිටුවට මට එන්න හම්බ වුණේ නැහැ. මම ඒ ගැනත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. මොකද, එහිදී වැරදි වැටහීමක් ඇති කරගෙන තිබුණා, වාණිජ බැංකුවලට මේ විවෘත කිරීම සම්බන්ධයෙන්. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, ඒ පැත්තෙන් වෙලාව ගන්න; මගේ වේලාවෙන් නම් කපන්න එපා. මොකද, මට වේලාව ඕනෑ. ඒ පැත්තෙන් ගන්න; මගෙන් නම් වේලාව ගන්න එපා.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

නිලධාරීන් සද්භාවයෙන් ඒ වැඩේ කරනවා නම්, 9 වගන්තිය ඇතුළත් කරන්න වුවමනාවක් නැහැ නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ, නැහැ, කලින් එකේ තිබුණා. ඒ තිබුණු විධියටම තමයි දාලා තිබෙන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. කලින් එකේ තිබුණු විධියට තමයි දාලා තිබෙන්නේ. Monetary Law එකේ තිබෙනවා. ඔබතුමා අරගෙන කියවන්න. එහි මේ විධියටම තිබෙනවා. ඒක තමයි ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ නිසා කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ . ඒකයි අපි කිව්වේ.

ඒ තිබුණු බාධකය අපි ඉවත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, අද උදේ. ඔබතුමා ළඟ දැන් සංශෝධන තිබෙනවා. එහි තිබෙනවා.

ඊළඟට, අනෙක් කාරණය තමයි විශේෂයෙන්ම සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාත් කිව්වා, "බලපත්‍ර වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන" කියන වචනය ඉවත් කර ඒ වෙනුවට "ශ්‍රී ලංකා මහ බැංකුව හෝ රාජ්‍ය වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන" කියලා දාන්න කියලා. මම මේකට කථා කළ යුතු නැහැ. නමුත් බොහොම පැහැදිලිව තිබෙනවා, ලංකාවේ Monetary Law Act එකේ 107 වගන්තිය යටතේ අපේ මහ බැංකුව - Central Bank එක - තමයි බැංකුවල ප්‍රධානියා විධියට කටයුතු කරන්නේ කියලා. ඒ කියන්නේ, regulatory body එක. මහ බැංකුව තමයි මේ නියාමනය කිරීම සඳහා කටයුතු කරන්නේ.

රටේ අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ දෙවැනියා - Deputy Secretary - ඒ සම්බන්ධව කටයුතු කරන්නේ මුදල් මණ්ඩලය විසින් දෙනු ලබන තීන්දුවක් මතයි. ඒ නිසා කිසිම වෙලාවක ඔහුට තනි තීන්දුවක් ගන්න හැකියාවක් නැහැ. Monetary Board එක "මෙන්න මෙතැනදී මෙය ඇතුළත් කරන්න" කියලා කියනවා නම්, මේ ක්‍රියාදාමය ඔහුට ක්‍රියාත්මක කරන්න පුළුවන්. එම නිසා මෙතැන යම් වැරැද්දක් ඇති වෙන්න විධියක් නැහැ. කිසිම වෙලාවක මෙය පෞද්ගලික වාණිජ බැංකුවලට සහයෝගය දීමේ වැඩ පිළිවෙළක් නොවෙයි. මෙය ඕනෑම බැංකුවකට බොහොම පැහැදිලිව ඔවුන්ගේ rates අනුව යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා තිබෙනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

අද මේ පවතින ණය අර්බුදය; ණය උගුල ඉතිහාසයේ ඉඳලා ආපු කාරණයක්. ඒක තව තවත් වර්ධනය වෙලා තිබෙනවා. කාට කාටත් චෝදනා තිබෙනවා. ඒ පැත්තටත් චෝදනා තිබෙනවා. මේ පැත්තටත් චෝදනා තිබෙනවා. අපි මේ ගත්ත ණය පිළිබඳ විශාල ණය උගුලක අපි සියලු දෙනාම ඉන්නවා. කවුරු හරි "ඒක එහෙම නොවෙයි, ඉතිහාසයේ මොකුත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. දැන් තමයි මේ ප්‍රශ්න ඇති කරගෙන තිබෙන්නේ" කියලා කියනවා නම් ඒක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 වර්ෂයේ දී අපට විශාල අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. එකක් තමයි, අපට යූඑස් ඩොලර් මිලියන 1806ක ප්‍රධාන ගෙවීමක් - principal payment එකක් - තිබෙනවා. එතකොට ඒකත් එක්ක interest payment එක නැත්නම් පොලිය අපට ගෙවන්න තිබෙනවා, ඩොලර් මිලියන 1013ක්. ඒක මේ ඉතිහාසය පුරාම අපි ගෙවපු විශාලම ප්‍රධාන ගෙවීම සහ පොලිය. ඊළඟට, ලබන අවුරුද්දේ -2019- ප්‍රධාන ගෙවීම විධියට ඩොලර් මිලියන 3,258ක් අපි ගෙවන්න ඕනෑ. ඒ ගෙවීමට ඩොලර් මිලියන 959ක් එකතු කළාම, අපි මේ රටේ කොහෙන් හරි සල්ලි හොයලා -පිටරටින් අරගෙන හරි- ඩොලර් මිලියන 4,217ක ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. 2020 අවුරුද්දත් ඒ වාගේම භයානකයි. අපි ගත්ත ණයවල වාරික සහ පොලී ගෙවීම් විධියට ඩොලර් මිලියන 3,699ක් පිටරටට ගෙවන්න තිබෙනවා.

ඊළඟට, 2021 ඩොලර් මිලියන 3,344ක් ගෙවන්න වෙනවා. ඊළඟට, ආපහු 2022 ඩොලර් මිලියන 3743ක් ගෙවන්න වෙනවා. කවුරු ආණ්ඩු කළත්, කවුරු ආණ්ඩු නොකළත් අපි රටක් විධියට විශාල ගෙවීමක් කරන්න වෙනවා. මේ ගෙවීම් ටික කළාට පසුව තමයි ලංකාවේ පොලී ගෙවීම් ප්‍රමාණය විශාල අඩුවීමකට එන්නේ. ඒ අනුව 2023 ඩොලර් මිලියන 2,120යි අපට ගෙවන්න තිබෙන්නේ. ඒ කියන්නේ, 2017 ගෙවූ ප්‍රමාණයට හා සමාන තත්ත්වයක් තමයි ඊළඟට ඇති වන්නේ. අපට 2019, 2020, 2021, 2022 කියන අවුරුදු හතරේ එක දිගට විශාල අර්බුදයක්; ණය අර්බුදයක් ඇති වනවා. ඒ නිසා තමයි මහ බැංකුව විශේෂයෙන්ම කල්පනා කරලා, මේ ක්‍රියාදාමය සකස් කරලා මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. මෙම පනත් කෙටුම්පත ගිය පෙබරවාරි මාසයේ 10 වෙනිදා ඉදිරිපත් කරලා තිබුණා නම්, අපට මීට වඩා අඩු ප්‍රමාණයකට ණය ගන්න තිබුණා. හැබැයි, අපි ප්‍රමාද වුණා. ඒ ප්‍රමාදයේ ප්‍රතිඵලය විධියට දැන් පොලී අනුපාතය වැඩිවේගෙන යනවා. මේ, මාස කිහිපයකට කලින් අපේ තිබුණු තත්ත්වය. අද විශාල වශයෙන් පොලී අනුපාතය ලෝක වෙළෙඳ පොළේ වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශාල අර්බුදයකට ලක්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම "සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත" සම්මත කළාට පසුව ඉතාම ඉක්මනින් අපි ණය වෙළෙඳ පොළට ගිහිල්ලා ගන්න පුළුවන් ණය ප්‍රමාණය අරගෙන, ඒ ණය පාලම් හදන්න, පඩි ගෙවන්න, අපේ අනෙක් ප්‍රශ්නය විසඳන්න නොවෙයි පාවිච්චි කරන්න තිබෙන්නේ. මෙය පැහැදිලිවම පාවිච්චි කරන්න තිබෙන්නේ, මේ රටේ ගෙවන්න තිබෙන ඉතිරි ණය ප්‍රමාණය ගෙවීම සඳහායි. ඒ නිසා මේ ක්‍රියාදාමය කවුරු ආණ්ඩු කළත් ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙළක්. මම ස්තුතිවන්ත වනවා, මෙම පනත් කෙටුම්පත ඉක්මනින් ඉදිරිපත් කරලා අපට මේ වැඩ පිළිවෙළ සකස් කිරීමට ලැබීම ගැන. කල් දැමීමට හේතුවක් නොවෙයි මෙක. අපි මෙක ඉතාම ඉක්මනින් කළ යුතු කාරණයක් විධියටයි මම දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පතේ යම් අර්ථනිරූපණයන් ගැන යෝජනාවක් කරන්න කැමතියි. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාටත් මම මේ ගැන කිව්වා. මෙම පනත් කෙටුම්පතේ සඳහන් වනවා;

> "අමාත්‍යාවරයා" යන්නෙන් මුදල් විෂය පවරා ඇති අමාත්‍යාවරයා අදහස් වේ;..." කියලා.

මම කියනවා, කරුණාකරලා මෙය අයින් කරන්න කියලා. මොකද හේතුව, දැන් මුදල් විෂයභාර අමාත්‍යාවරයාට "මහ බැංකුව" අයත් නැහැ. එතකොට, මෙම පනත් කෙටුම්පතේ පැහැදිලිවම මහ බැංකුව හා සම්බන්ධ වෙච්ච ක්‍රියාදාමයක් තිබෙන්නේ. එම ක්‍රියාදාමයට මුල් වෙන්න ඕනෑ ඇමතිවරයා විධියට, "මුදල් ඇමතිවරයා" කියලායි ඇතුළත් කර තිබෙන්නේ. එහෙම නම් මෙහි සඳහන් කරන්න ඕනෑ, "ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිවරයා" කියලා. මොකද හේතුව, මහ බැංකු අර්බුදය ආවාම මේකට අයිතිකාරයෙක් නැතිව ගියා. සමහර අය කිව්වා, "මම නොවෙයි ඒ පත්කිරීම් කළේ" කියලා. දැන් මීට කලිනුත් කතා කළා, රවි කරුණානායක මන්ත්‍රීතුමා. එතුමා කිව්වා, "පත් කළේ ජනාධිපති. නම් කරපු කෙනා නම් මම දන්නේ නැහැ" කියලා මම කියන්නේ, මේ සඳහා කවුරුහරි වගකීමක් දරන්න ඕනෑ කියලායි. ඒ නිසා මම කියන්න කැමතියි, කරුණාකලා මෙම පනත් කෙටුම්පතේ ඇතුළත් කර ඇති " "අමාත්‍යාවරයා" යන්නෙන් මුදල් විෂය පවරා ඇති අමාත්‍යාවරයා..." යනුවෙන් සඳහන් කර ඇති කොටස අයින් කරලා "ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාවරයා" යනුවෙන් යොදන්න කියලා. පසුව ඒක වෙනස් කරගන්න පුළුවන්. කරුණාකරලා ඒක ඇතුළත් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා කියන කථාව එතැනදී නිවැරදි වෙන්නේ නැහැ. මොකද, එතැන "අමාත්‍යාවරයා යන්නෙන් මුදල් විෂය පවරා ඇති අමාත්‍යාවරයා අදහස් වේ." කියා කියන්නේ, මේ හැම තැනම තිබෙන "අමාත්‍යාවරයා" යන්න නිර්වචනය කරන්නයි. නමුත් මහ බැංකුව අයිති අමාත්‍යාවරයා හඳුන්වනකොට, ඒක කෙළින්ම කියා තිබෙනවා, 4(2) උපවගන්තිය යටතේ. 4(2) උප වගන්තිය යටතේ තිබෙන්නේ, "(1) වන උපවගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යාවරයා මහින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය." කියලායි. ඒක හරි නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක හරි. හැබැයි මේ මුළු කාරණයම මතු වෙන්නේ, මහ බැංකුවත් එක්ක. මේ සියලුම කාරණා ටික අවසාන වශයෙන් ගත්තාම, ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරන්නේ මහ බැංකුව. එතකොට සක්‍රීය බැරකම් කළමනාකරණය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම තිබෙන්නේ මහ බැංකුවට. එතකොට මහ බැංකුවේ මේ ක්‍රියාදාමය යනකොට "අමාත්‍යාවරයා" යන්නෙන් අදහස් වෙන්නේ, - අර විධියට දැම්මාම යම් ප්‍රශ්නයක් තිබෙනවා. කමක් නැහැ, ඔබතුමා ඒක - මම කියන්නේ, අපි ඒ ගැන යම් අවබෝධයක් ඇති කර ගත්තොත් හොඳයි කියලායි. නැත්නම් අවසානයේදී මේ සියලු දෙනාම වගකීමක් ගන්න බැරි තැනට පත් වෙනවා. ඒ නිසා මා කියන්න කැමැතියි, කරුණාකරලා ඒ ක්‍රියාදාමය ඉස්සරහට ගෙන යන්න කියලා.

ඊළඟට, ආර්ථිකය පිළිබඳවත් යම් කාරණා කිහිපයක් මතු කරන්න මා කැමැතියි. අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා. අද condominiumsවලට සියයට 30ක විතර බද්දක් පනවා තිබෙනවා. රට තුළ විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අද ලංකාවේ විශාලම වර්ධනය තිබෙන්නේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩියක-දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සංචාරක ව්‍යාපාරයේ වාගේම අද විශාලම වර්ධනය තිබෙන්නේ අපේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ. අද ලංකාවේ හැම තැනම condominiums ඉදිවෙනවා. අද මේ කොළඹ නගරය හැම තැනම condominiums හැදෙනවා. මා හිතන විධියට දැන් ඒ හදන හැම එකකටම ලබන අප්‍රේල් පළමුවනදා ඉඳලා සියයට තිහක බද්දක් පනවන්නයි හදන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, ඒක වැරදියි. සියයට තිහක බද්දක් පැනවෙන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සියයට කීයද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සියයට 15ක වැටි බද්ද විතරයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සියයට 15ක වැටි බද්දක් පැනෙව්වාම, හැම unit එකකම ගණන රුපියල් ලක්ෂ තිහකින් වැඩි වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ. එහෙම වෙන්නේ නැහැ. මම ඒක පැහැදිලි කරන්නම්. මට විනාඩියක කාලයක් දෙන්න. ඒක වැදගත් කාරණාවක්. රුපියල් මිලියන පහළොවක් දක්වා වන apartmentsවලට වැටි එක වදින්නේ නැහැ. රුපියල් මිලියන පහළොවෙන් ඉහළ ඒවාට විතරයි වැටි එක වදින්නේ. එතකොට සාමාන්‍ය ආදායමක් තිබෙන කට්ටිය apartments ගන්නකොට වැටි එක වදින්නේ නැහැ, ගරු ඇමතිතුමනි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ, මේ ගැන අපි කල්පනා කරන්න ඕනෑ කියලායි. මොකද, රුපියල් මිලියන පහළොවකට අද ගෙයක් ගන්නේ කවුද කියලා අපි දන්නවා. රුපියල් මිලියන පහළොවකට වැඩි ගෙවල් ගන්න එකත්- අද වැඩියෙන් හැදෙන්නේ luxury ඒවා. මම දන්නා විධියට දැන් කොහේවත් රුපියල් මිලියන පහළොවකට ගෙවල් ගන්න පුළුවන් තත්ත්වයක් නැහැ, මේ කොළඹ නගරය ඇතුළේ. [බාධා කිරීමක්] මම කියන්නේ හදනකොට - මේක අපේ රටේ අලුත් කර්මාන්තයක් විධියට develop වෙන පැත්තක්. ඔබතුමන්ලා අපට වඩා බොහොම ධනාත්මක විධියට මේ විවෘත ආර්ථික ක්‍රමය ගැන දකින අය. ඒක නිසයි මම මේ කියන්නේ. අපි හිටියා නම් ඔක තවත් අඩු කරලා රුපියල් ලක්ෂ හැත්තෑපහකට විතරවත් ගහනවා, අපේ ආර්ථික ක්‍රමය අනුව. මේ ක්ෂේත්‍රයට අද විශාල ආයෝජන සංඛ්‍යාවක් ඇවිල්ලා තිබෙනවා. අපි හැමදාම, දවස ගණනේ කැබිනට් මණ්ඩලයට අලුත් ආයෝජන අවස්ථා ගෙනෙනවා. ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා අලුත් ආයෝජන විශාල සංඛ්‍යාවක් ගෙනෙනවා. මේ වාගේ apartments, condominiums තමයි හැදෙන්නේ. හැබැයි සියයට පහළොවක වැටි බද්දක් ගහපු ගමන් ඒ සඳහා රුපියල් ලක්ෂ තිහක වැටි බද්දක් ගෙවන්න ඕනෑ. රුපියල් ලක්ෂ තිහක වැටි බද්දක් ගෙවන්න සූදානම් වෙන්නේ කවුද? මෙන්න මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ පිළිබඳව ඔබතුමන්ලා යම් අදහසක් ඉදිරිපත් කරලා, අනාගතයේ මෙන්න මේක පොඩ්ඩක් නතර කරලා, මේ සම්බන්ධයෙන් යම් විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

අනෙක් කාරණය තමයි මේ පසුගිය වර්ෂ කිහිපය ඇතුළතදී- 2016 ජනවාරි ඉඳලා දෙසැම්බර් මාසය වෙනකල් ඩොලර් මිලියන 377ක රත්රන් ලංකාවට ආනයනය කරලා තිබෙනවා. 2017 ජනවාරි ඉඳලා දෙසැම්බර් වෙනකල් ඩොලර් මිලියන 649ක රත්රන් ආනයනය කරලා තිබෙනවා. ලංකාවට රත්රන් ආනයනය කිරීම සියයට 73.7කින් වැඩි වෙලා තිබෙනවා. අපේ import bill එක වැඩි වෙන්න එය ප්‍රධාන හේතුවක් බවට පත් වෙලා තිබෙනවා. මේ රත්රන් නිෂ්පාදන කොහේද ගියේ කියලා අපි පොඩ්ඩක් කල්පනා කරන්න ඕනෑ. අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඉන්නවා; ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඉන්නවා. ඔබතුමන්ලා කරුණාකරලා හොයා බලන්න, මේවායේ නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ ක්‍රමවේදයක් තිබෙනවාද, නැත්නම් ඒවාට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්]

මාත් ඒක තමයි අහන්නේ. මේක විශාල අර්බුදයක්. මම විශේෂයෙන් පැහැදිලිව මේක කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් මිලියන 649ක රත්රන් මේ රටට ගෙනැල්ලා තිබෙනවා. අපේ ජංගම ගිණුමේ හිඟය තිබෙන්නේ ඩොලර් මිලියන එක්දහස් දෙසිය ගණනක්. [බාධා කිරීමක්] මාත් කියන්නේ ඒකයි. අපේ ජංගම ගිණුමේ හිඟය තිබෙන්නේ එක්දහස් දෙසිය ගණනක්. හැබැයි ඒකෙන් 2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ඩොලර් මිලියන 649ක රත්රන් ලංකාවට ගෙනැල්ලා. ඒ රත්රන් ගෙනා එකෙන් ලංකාවේ නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඒ රත්රන් කොහාට ද ගියේ? කවුද ඒවා අරගෙන ගියේ? Smugglingවලටද මේවා පාවිච්චි වෙන්නේ? මේ රත්රන් ටික වෙන එකකට පාවිච්චි වෙනවා ද කියන එක ගැන අපට ඇත්තටම විශාල අර්බුදයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේකටත් අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගන්නය කියා. නැත්නම් අපිට මේ ජංගම ගිණුමේ හිඟය පිළිබඳව විශාල අර්බුදයක් අනාගතයේදී ඇති වෙන්නට පුළුවන්. මම ඒ පිළිබඳවත් අදහස් යොමු කරමින් මේ පනත් කෙටුම්පත සඳහා අනුමතිය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා කියන කථාව හරි. එතැනත් අපට පේන්නේ නම් මහ ලොකු smuggling operation එකක් යන බවයි. එම නිසා අපට නැවත කල්පනා කරන්නට වෙනවා. ගරු ඇමතිතුමනි, අපි මහ බැංකුව සමඟත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් මොනවාද කරන්න ඕනෑ කියන එක අපි හිතනවා. අපි ඒ ගැන හරි ක්‍රියාමාර්ගයක් ගන්නවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.36]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේ අදහස් ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී මම ආර්ථිකය ගැන පොදුවේ කරුණක් කියන්නත් අවශ්‍යයි. අපි මේ රටේ ආර්ථිකය හාර ගන්නකොට මේ රටේ ආර්ථිකයේ විශේෂයෙන්ම විශාල අය වැය පරතරයක් තිබුණා. මේ රටේ බදුවලින් එන ආදායම දළ දේශීය නිෂ්පාදනයේ සියයට 11 ත්, 12ත් අතරේ බොහොම අඩු තැනකට බැහැලා තිබුණා. අපි ඒක පුද්ගල ආදායම දෙස බලනකොට- රටේ බදු ආදායම සියයට 18කට, 20කට කිට්ටු වෙන්නට ඕනෑ, ඒක පුද්ගල ආදායමේ මට්ටමට. නමුත් ඒ වාගේ බොහොම අස්ථාවර තැනක තමයි තිබුණේ. අපි අද එය වෙනස් කර තිබෙනවා. අද ලබන බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට ඊට වඩා ඉහළ තැනකට එකතු කර ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෘජු බදු හා වක්‍ර බදු දෙස බලන විට මුළු බදු ප්‍රමාණයෙන් සෘජු බදු ප්‍රමාණය සියයට 18ක් විතර වෙනවා; වක්‍ර බදු ප්‍රමාණය සියයට 82යි. එතකොට මාසයකට රුපියල් 20ක පඩිපතක් ලබන පුද්ගලයාත්, මාසයකට ලක්ෂ 2ක පඩිපතක් ලබන පුද්ගලයාත් අතරින් සෘජු බදු වැඩි වුණාම පීඩනය වැඩි වන්නේ අඩු ආදායම් ලබන පුද්ගලයාට. මේ අසාධාරණය ක්‍රමක්‍රමයෙන් නැති කරන්න තමයි මුදල් අමාත්‍යතුමාගේ අය වැය කථාවේදී කිව්වේ, මේ සෘජු බදු ප්‍රමාණය සියයට 18 සිට 40කට ක්‍රමක්‍රමයෙන් වෙනස් කරන්න ඕනෑය කියා. මෙහෙම තමයි සමාජ සාධාරණත්වය ඇති වෙන්නේ. ඒ ගමනයි අපි මේ යන්නේ. එපමණක් නොවෙයි. අපි බදු ගෙවන පිරිසත් පුළුල් කරන්න අවශ්‍යයි. බොහෝ වෙලාවට චෝදනා කරනවා, බදු ගෙවන පිරිස බොහොම සුළු පිරිසක්, අනෙක් අය බදු ගෙවන්නේ නැහැ කියා. සාධාරණත්වයක් ඇති කරන්නට නම් බදු ගෙවන පිරිසත් පුළුල් කරන්නට අවශ්‍යයි. ඒ කියන්නේ, ආදායමක් ලැබෙන හැම කෙනෙකුටම යම් කිසි වගකීමක් තිබෙනවා. ඒ වාගේම බදු ගෙවන ක්‍රමය අපි ලිහිල් කරන්නට ඕනෑ. බදු ගෙවීම පහසු කරන්නට ඕනෑ. බදු ගෙවීම කාර්යක්ෂම කරන්නට ඕනෑ. මෙය බොහොම වැදගත් වෙනවා. එම නිසා අද ගරු මුදල් ඇමතිතුමා රජය ඇති කර ගෙන තිබෙන ක්‍රමවේදය වනාහි නීත්‍යානුකූල - නීතියේ පදනම අනුව බදු අය කරන ක්‍රමවේදයක්. එවැනි ක්‍රමවේදයක් තමයි ඇති කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු නිදහස ලබා ගන්න අද මුදල් ඇමතිතුමාගේ කාමරය ළඟට ඇවිත් වාඩි වෙන්න අවශ්‍ය නැහැ. මුදල් ඇමතිතුමාගේ අභිමතය පරිදි ව්‍යාපාරවලට බදු නිදහස දෙන්නට බැහැ. ඒ කියන්නේ, අපේ පාක්ෂිකයෙක් ද, නැත්නම් අපිට විරුද්ධව වැඩ කළ කෙනෙක් ද කියා මුහුණ බලා බදු නිදහස දෙන්න බැහැ.

පසුගිය කාලයේදී ඒකයි සිදු වුණේ. නමුත්, අපි නීතිමය පදනමට අනුවයි බදු නිදහස දීලා තිබෙන්නේ. පොතේ තිබෙන විධියට නීත්‍යානුකූලවයි ඒක කරගෙන යන්නේ. එහෙම නැතිව මුදල් ඇමතිතුමාගේ අභිමතය අනුව නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සෘජු බදු වැඩි කරලා වක්‍ර බදු අඩු කරන්න යනකොට නොයෙක් ප්‍රශ්න පැන නැඟෙනවා. ඒක කියන්න අවශ්‍යයි. හුඟක් අය අපෙන් අහනවා, "මේ බද්ද වැඩි වුණේ ඇයි? අනෙක් බද්ද වැඩි වුණේ ඇයි? එහෙම වුණේ ඇයි?" කියලා. සෘජු බදු වැඩිකරනකොට අනෙක් අයට බදු සහන දෙන්න නම් සාමාන්‍යයෙන් මුදල් තිබෙන, ධනය තිබෙන, නිවාස තිබෙන, ඉඩම් තිබෙන අයගෙන් තමයි ගන්න වෙන්නේ. ඒ අයගෙන් ගන්නේ නැතිව මේ අය වැය කළමනාකරණය කර ගන්නේ කොහොමද? අපට සමහර වෙලාවට ඇවිල්ලා කියනවා, Capital Gains Tax එකක් දමන්න එපාය කියලා. මේ රටේ කීදෙනකුට ඉඩමක අයිතිය තිබෙනවා ද? මේ රටේ කීදෙනකුට නිවසක අයිතිය තිබෙනවා ද? සාමාන්‍ය මිනිස්සුන්ට ඒවා නැහැ. අපේ කාර්යාලවල වැඩ කරන, අපේ කම්හල්වල වැඩ කරන, අපේ නිවාසවල වැඩ කරන ඒ සේවකයින්ගෙන් ඇහුවාම දැන ගන්න පුළුවන්; ඒ අයට නිවසක අයිතියවත්, ඉඩමක අයිතියවත් නැති බව. හුඟක් වෙලාවට මගේ මිතුරන් ඇවිල්ලා මා සමඟ මේ ගැන කථා කරනවා. කම්හල් තිබෙන, කාර්යාල තිබෙන, අපනයනය කරන, විශාල ලෙස මුදල් හම්බ කරන ධනපතීන් තමයි කථා කරලා කියන්නේ Capital Gains Tax එක වාගේ ඒවා දමන්න එපාය කියලා. නමුත්, සමාජ සාධාරණත්වය ඇති කරන්න යනවා නම් එහෙම කරන්නට බැහැ. මුදල් ඇමතිතුමා ඒ මාර්ගයේ යන්නේ ඒ නිසයි කියන එක සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේක පස්සට ගෙන ගියේ නැහැ. 1970 හෝ 1980 අපේ පවුලේ අයකුගෙන් -අම්මාගෙන්, තාත්තාගෙන් වෙන්න පුළුවන්- ඉඩමක් ලැබුණා නම්, ඒකට Capital Gains Tax එකක් අය කරන්නේ නැහැ කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ ලැබුණු පරිත්‍යාගයට, ඒ ප්‍රාග්ධනය ලැබීමට බදු ගෙවන්න අවශ්‍ය නැහැ. අපි සඳහන් කර තිබෙන්නේ අද ඉඳලා ඉදිරියට යනකොට ලැබීමක් තිබෙනවා නම් ඒකට පමණක් බදු ගහන එක ගැනයි. ඒ විතරක් නොවෙයි.

අපේ සංස්කෘතිය අනුව අම්මා, තාත්තා සාමාන්‍යයෙන් පුතාට හෝ දුවට නිවසක් දෙන එක අලුත් දෙයක් නොවෙයි. පවුලේ පස්දෙනකු ඉන්නවා නම්, කිසිම බද්දක් නැතිව පස්දෙනාටම නිවස බැගින් නිවාස පහක් දෙන්න අම්මාට, තාත්තාට පුළුවන්. ඊට වැඩිය සාධාරණත්වයක් ඇති කරන්න පුළුවන්ද? නිවාස 10ක් තිබෙනවා නම් පහකට බදු ගෙවන එක සාධාරණ නැද්ද කියන ප්‍රශ්නය මම අහන්න කැමැතියි. හැම දරුවකුටම බද්දක් නැතිව නිවසක් දෙන්නට පුළුවන්; ඉඩමක් දෙන්නට පුළුවන්. එක එක සමාජ ජාල බොරු කථා කියනවා. "මේ රජය බදු ගහනවා, වැරදි ලෙස මුදල් ගන්නවා." කියනවා. ඔය මතය ඇති කරන්න වෑයමක් තිබෙනවා. එහෙම එකක් නැහැ. ඊට පස්සේ කියනවා, "මැදපෙරදිග ඉඳලා එවන මුදල්වලටත් බදු ගහනවා." කියලා. ඒක අමූලික බොරුවක්. මොකද, අඩු ආදායම්ලාභීන් මැද පෙරදිග ඉඳලා මේ රටේ ඉන්න ඒ අයගේ දරු පවුල් ආරක්ෂා කරන්න මාසයට ඩොලර් සියයක් හෝ දෙසියයක් එවනවා නම් ඒකට කිසිම බද්දක් අය කරන්න බැහැ. ඇයි ඒ? අපි දුප්පතාට සංවේදී

රජයක් කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. දුප්පතාගෙන් අපි එහෙම ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. තව කථාවක් පතුරනවා, විශ්‍රාමිකයින් ගිහිල්ලා බැංකුවට මුදල් දැම්මාම ඒ අයගේ මුදලුත් අපි ගන්න හදනවා කියලා. ඔන්න, තව අමූලික බොරුවක්. බැංකු පොලිය ලක්ෂයක් හම්බ කරනවා නම් ඒ ලක්ෂයටවත් බද්දක් අය කරන්නේ නැහැ. බැංකු පොලිය ලක්ෂයක් හම්බ කරන්න ලක්ෂ කීයක් බැංකුවට දමන්න ඕනෑද? ලක්ෂ සියයක් බැංකුවට දමන්න ඕනෑ. මේ රටේ ඉන්න සාමාන්‍ය ජනතාවගෙන් කීදෙනාටද ලක්ෂ සියයක් තිබෙන්නේ, බැංකුවක තැන්පත් කරලා පොලිය ලබා ගන්න කියන එක මම අහන්න කැමැතියි. ධනපතීන්ට ඒ සල්ලි තිබෙනවා. ලක්ෂ සියයක් නොවෙයි, ලක්ෂ 1000ක් වුණත් බැංකුවේ තැන්පත් කරන්න ධනපතීන්ට පුළුවන්. මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට එහෙම කරන්න බැහැ. ඒ නිසා තමයි අපි ඒක සීමා කරලා තිබෙන්නේ. ලක්ෂයක් පොලිය ලබා ගත්තත් බදු ගෙවන්න ඕනෑ නැහැ. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැංකු පොලිය ලක්ෂයකට වැඩිය හම්බ කරනවා නම්, මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් බද්දක් අරගෙන ගමේ පාසල හදන එක, ගමේ සෞඛ්‍ය මධ්‍යස්ථානය හදන එක සාධාරණ නැද්ද කියන එක මම අහන්න කැමැතියි.

අපේ බදු ක්‍රමය අපි හදා තිබෙන්නේ ඒ ක්‍රමයටයි. හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා මොහොතකට පෙර කිව්වා, "condominiums ගහනකොට බද්දක් ගහලා තිබෙනවා." කියලා. ඔව්, සාමාන්‍ය මිනිසුන්ගේ condominiumsවලට බදු ගහලා නැහැ. ලක්ෂ 150ක් ආයෝජනය කරලා condominium එකක් ගත්තොත් කිසිම බද්දක් නැහැ. මේ බද්ද සුපිරි පන්තියේ අයට තමයි ගහලා තිබෙන්නේ. විශාල වශයෙන් මුදල් ගෙවා condominiums ගන්නවා නම්, අනිවාර්යයෙන්ම ඒ අයටත් බදු ගෙවන්න පුළුවන් වෙන්න ඕනෑ. මේ බදුවලින් සාමාන්‍ය ජනතාවගේ ජීවන රටාව නංවන වැඩ පිළිවෙළක් තමයි අපේ රජයට තිබෙන්නේ. මේක තමයි සාධාරණත්වය කියන්නේ. අවුරුදු 20කට, 30කට බලපාන යම් කිසි ක්‍රමවේදයකට තමයි මේ රටේ මෙතෙක් බදු ගහලා තිබෙන්නේ. ඒක බොහොම අසාධාරණ ක්‍රමවේදයක්. මොකද, ඒ නිසා තමයි සෘජු බදු සියයට 18ක් වෙලා වක්‍ර බදු සියයට 82ක් වෙලා තිබෙන්නේ. ඒක වෙනස් කරන්න තමයි අපි මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි.

2016 වර්ෂය එක්ක සංසන්දනය කරනකොට 2017 වර්ෂය අවසාන වනකොට අපේ අපනයනය සියයට 9කට වැඩිය වැඩි වෙලා තිබෙනවා. අවුරුදු 20කට පමණ ප්‍රථමයෙන් අපේ අපනයනය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 30 ඉක්මවා ගිය බව අපි දන්නවා. අපි රජය භාර ගන්නකොට අපනයනය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14කට තමයි අඩු වෙලා තිබුණේ. මේක අපි වෙනස් කරන්නට ඕනෑ. ඒ අනුව අපි අපනයනය වැඩි කරන්න ඕනෑ. 2017 වර්ෂයේදී තමයි අපේ අපනයනය සියයට 9කට වැඩි වෙලා තිබෙන්නේ. එපමණක් නොවෙයි.

අපට යුරෝපා මත්ස්‍ය තහනමක් තිබුණා. ඒ මත්ස්‍ය තහනම අපි ඉවත් කර ගත්තා. 2017 වර්ෂයේ පමණක් මත්ස්‍ය අපනයනය සියයට 38.9කින් අවුරුද්දක් තුළදී වැඩි වෙලා තිබෙනවා. මත්ස්‍ය අපනයනය වැඩි වනකොට විශේෂයෙන්ම වෙරළබඩ ජීවත් වන ජනතාවට ඒ තුළින් ලාභයක් ලැබෙනවා. ඒ ඇයි? ලොකු ව්‍යාපාරිකයින් මත්ස්‍ය අපනයනය කළත්, රට තුළ සිටින මත්ස්‍ය ව්‍යාපාරිකයින්ටත් ඉල්ලුමක් ඇතිවනවා. බෝට්ටුවෙන් රෑට මුහුදු ගිහිල්ලා අවදානමක් ඇතුව ධීවර කර්මාන්තයේ යෙදෙන පිරිස්වලට මේ තුළින් වාසියක් ලැබෙනවා. ඒ කෙසේද? අපේ රටේ මත්ස්‍යයින් පිට රටවලට යනකොට රට තුළ මත්ස්‍ය ව්‍යාපාරයේ යෙදෙන්නන්ටත් ඉල්ලුමක් ඇතිවනවා. ඒ අනුව රෑට මුහුදු ගිහිල්ලා බොහොම අවධානයෙන් ඒ කර්මාන්තයේ යෙදෙන අපේ අයියලාට, මල්ලිලාට ඒකෙන් වාසියක් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි.

අපි GSP Plus සහනය ලබා ගත්තා. ඒ අනුව යුරෝපයට අපනයනය කරන භාණ්ඩ 7,000කට මේ සහනය ලබා ගන්න පුළුවන්. මේ සහනයේ ප්‍රතිලාභය සම්පූර්ණයෙන්ම තවම අපට ලැබී නැහැ. 2018, 2019, 2020 වර්ෂ වනකොට මේකේ මුළු ප්‍රතිලාභයම අපට බලා ගන්න පුළුවන්. මා මේ කියන්නේ මොකක්ද? අපි ආර්ථිකය ස්ථාවර කරලා මේ කටයුතු ක්‍රමානුකූලව ගොඩ නහාගෙන යනකොට සමහර පිරිස් රටේ මොනවාද ඇති කරන්නේ? රට තුළ කලබලයක් ඇති කරනවා; ජාතිවාද ප්‍රශ්නයක් ඇති කරනවා. මේ රටේ සිටින අහිංසක මුස්ලිම් ජනතාවට කරදර කරලා ඒ අයගේ ගෙවල් කුඩු කරනවා; ඒ අයගේ ව්‍යාපාර කුඩුපට්ටම් කරනවා. මොකක්ද මේකෙන් කරන්න හදන්නේ? දේශපාලන අස්ථාවරභාවයක් ඇති කරන එකයි. මේවාට වග කියන්න ඕනෑ නිලධාරීන් ඒ අයගේ පුටුවලින් අයින් කරන්න ඕනෑය කියන එක මා අද කියනවා. ඒ අයගේ වගකීම මොකක්ද කියලා පොලීසිවල හිටපු ඕඅයිසී මහත්වරුන්ගෙන් අහන්න ඕනෑ. ඒ වාගේම පොලීසියේ උසස් නිලධාරීන් වන අයිජීපී ඇතුළු සියලු උසස් නිලධාරීන් මේවාට වග කියන්න ඕනෑ. ඔවුන් මේ සම්බන්ධයෙන් වග කීමක් ගන්න ඕනෑ. මේ වාගේ අස්ථාවරභාවයක් රටේ ඇති කරමින් අහිංසක මිනිසුන්ට පහර දෙනකොට අපේ රජය ඉක්මනින් ක්‍රියා කරලා හදිසි නීතිය දමා ඒ තත්ත්වය පාලනය කළා. ඒ විතරක් නොවෙයි. සමාජ වෙබ් අඩවි හරහා වෛරය පතුරුවන අය අපි අත් අඩංගුවට අරගෙන තිබෙනවා. නීතිමය ක්‍රමවේදවලින් ඒ අයට දඬුවම් දෙන්න ඕනෑ. නමුත්, අපි මේ වෙනකොට තාවකාලිකව නැවැත් වූ ඒ වෙබ් අඩවි සියල්ලක්ම; සමාජ ජාල සියල්ලක්ම නැවතත් නිදහස් කරලා තිබෙනවා. අපේ අදහස වුණේ ඒ අයගේ අයිතිවාසිකමට පහර දෙන එක නොවෙයි. අපේ අදහස වුණේ වෛරය පතුරුවනවා නම්, අස්ථාවරභාවයක් ඇති කරනවා නම්, කවුරු වුණත් කමක් නැහැ; නීතිය ක්‍රියාත්මක වන්න ඕනෑය කියන එකයි.

දේශපාලන අස්ථාවරභාවයක් ඇති කරලා අපේ ආණ්ඩුව පෙරළන්න වෑයමක් තිබෙනවා නම් ඒක අමතක කරලා දමන්න පුළුවන්. අද අපි ඉදිරිපත් කරන්නේ තවත් නීතියක්. ඒ, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත. මේ සම්බන්ධයෙන් බොහෝ කරුණු අද ඉදිරිපත් වුණා. නමුත් මම බොහොම කෙටියෙන් මේ ගැන සඳහන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පනත් කෙටුම්පතින් කරන්න බලාපොරොත්තු වන්නේ ණය කළමනාකරණය කිරීමයි. මා සතුව ඒ සම්බන්ධයෙන් බොහෝ දත්ත තිබෙනවා. මම ඒවා කියවන්න යන්නේ නැහැ. 2018, 2019, 2020, 2021, 2022 ගත්තාම -

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගේ කථාවට ඇහුම් කන් දුන්නා. මහනුවර, දිගන සිද්ධි සම්බන්ධව පොලිස්පතිවරයා ඇතුළු නිලධාරීන් වගකිව යුතුයි කියලා ඔබතුමා දැන් ප්‍රකාශ කළා. ආණ්ඩුවේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයා මීට වඩා වෙනස්,

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

පරස්පර මතයක් ලෝකයට දුන්නා. මෙතැනදී අපි පිළිගත යුත්තේ ඔබතුමාගේ මතයද, නැත්නම් කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයා ප්‍රකාශ කළ දෙයද? ආණ්ඩුවේ වගකිව යුතු ඇමතිවරයෙක් විධියට මේ සම්බන්ධව ප්‍රකාශයක් කරන්න කියලා මම විපක්ෂය වෙනුවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ආණ්ඩුව මත දෙකක් කියන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

බොහොම ස්තුතියි. ඔබතුමාට ඕනෑ මතය පිළිගන්න. මම මගේ අදහස මෙතැන ප්‍රකාශ කරලා තිබෙන්නේ.

වත්කම්, බැරකම් කළමනාකරණය පිළිබඳව අපි කථා කරනකොට කියන්න ඕනෑ, අපි විශාල ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා කියන එක. මෑත ඉතිහාසයේ සිදු වෙලා තිබෙන දේවල් අපි දන්නවා. ග්‍රීසිය වාගේ රටවලට සිදු වෙලා තිබෙන දේවල් අපි දන්නවා. අපේ රට කවදාවත් අපට තිබෙන වගකීම් පැහැර හැරලා නැහැ. අපි හැමදාම අපේ ණය ගෙවලා තිබෙනවා; හැමදාම අපේ පොලිය ගෙවලා තිබෙනවා. අපි එම තත්ත්වය ආරක්ෂා කර ගත යුතුයි. එම නිසා තමයි අපි මෙම තත්ත්වය හරියට කළමනාකරණය කිරීමට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පතින් අපි හඳුනාගත් ණය ප්‍රමිතිවලට ගැනීමත්, නියමිත දිනයට පෙර ණය ගෙවිය යුතු නම් එසේ ගෙවිය හැකි ක්‍රමයත්, නව කොන්දේසි මත ඇතැම් ණය සඳහා කල්පිරීමේ හෝ අපහසු ගෙවීම් කාලය දීර්ඝ කිරීමටත් ක්‍රම විධි සොයනවා. අපි ගෙවන්න තිබෙන ණය වේලාසනින් ගෙවන්න පුළුවන්; වැඩිපුර ණය ගන්නත් පුළුවන්; එහෙම නැත්නම් අලුත් ණය ගන්න පුළුවන්, පරණ ණය එක්ක අලුත් ණයක් විධියටත්. එහෙම නැත්නම් දින වකවානු මීට වැඩිය දීර්ඝ කරන්නත් අපට පුළුවන්. මුදල් ගෙවීම පහසු කිරීමට තමයි අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක ණය කළමනාකරණය කිරීම පිළිබඳ පනත් කෙටුම්පතක් කියලා කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේදී වැඩිපුරම කථා කළේ මොනවාද? බැඳුම්කරයෙන් හොරකම් කළා; අරකෙන් හොරකම් කළා; මේකෙන් හොරකම් කළා කියලා අද වැඩිපුරම කථා කළේ විදුරු ගෙවල්වල ඉන්න අයම තමයි. එක එක ජාතියේ හොරු ඉන්නවා කියලා එක එක්කෙනා කිව්වා. සමහර අය නම් කියලාම සඳහන් කළා. අපි එතැනට යන්න ඕනෑ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක තබා ගත යුතු කරුණක් තිබෙනවා. පොඩි හොරකමක් කළත්, ලොකු හොරකමක් කළත් කිසිම වෙනසක් නැහැ. මොකද, හොරකම් කරලා තිබෙනවා කියලා කියනවා. බැඳුම්කරවලින් හොරකම් කරලා තිබෙනවා කියලා කියනවා. වත්කම් බැරකම් ප්‍රකාශන දුන්නාට, ඒ වත්කම් බැරකම් ප්‍රකාශනවල තිබෙන වෙනස කියා ගන්න බැහැ. නිවාස අරගෙන තිබෙනවා; ගොඩනැඟිලි අරගෙන තිබෙනවා කියලා සමහර අයට චෝදනා තිබෙනවා. ගමන් බලපත්‍ර එකකට වඩා තිබෙනවා කියලා සමහර අයට චෝදනා තිබෙනවා. විදේශිකයන්ට පොලු තිබ්බා කියලා සමහර අයට චෝදනා තිබෙනවා. අනීත්‍යානුකූල ව්‍යාපාරවල යෙදෙනවා, කුඩු බිස්නස් එකේ යෙදෙනවා කියලා සමහර අයට චෝදනා තිබෙනවා. එක එක චෝදනා තිබෙනවා. මම, නම් කියන්න යන්නේ නැහැ. ඒක නොවෙයි මගේ පරමාර්ථය. මේක පොඩි වරදක්, අරක ලොකු වරදක් කියලා කවුරු හෝ හිතන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා දවසක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අධිනීතිඥ සරත් ජයමාන්න මහතා පාර්ලිමේන්තුවට පැමිණියා. ඔහුගේ කථාව අහන්න, ඔහු එක්ක සාකච්ඡා කරන්න එන්න කියලා අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225ටම ආරාධනාවක් තිබුණා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අටදෙනෙක් ඒ සාකච්ඡාවට සහභාගි වුණා. හැම පක්ෂයෙන්ම වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අටදෙනෙක් හිටියා. අපි ඔහුගෙනුත් ඔය ප්‍රශ්නය ඇහුවා, "ලොකු හොරකමයි, පොඩි හොරකමයි අතර වෙනසක් තිබෙනවාද?" කියලා.

එතුමා කිව්වා, "කිසිම වෙනසක් නැහැ. හොරකම නැති කරපු රටවල් වූ සිංගප්පූරුව, හොංකොං වැනි ආසියාවේ රටවල් පොඩි හොරකමයි, ලොකු හොරකමයි කියලා බැලුවේ නැහැ. හොරකම හොරකමයි. වැරැදි කරලා තිබෙනවා නම් දඬුවම් දෙන්න ඕනෑ"යි කියලා. හැම දාම පත්‍ර දිහා බැලුවාම දකින්න ලැබෙනවා, විදුහල්පතිවරයකු හෝ ගුරුවරයකු රුපියල් 1,00,000ක් ගත්තාය කියලා පොලිස් අත් අඩංගුවට අරගෙන තිබෙනවා; පොලිස් නිලධාරි කෙනෙක් රුපියල් 1,000ක් හෝ රුපියල් 10,000ක් ගත්තාය කියලා අත් අඩංගුවට ගෙන තිබෙනවා කියලා. අද විදුහල්පතිවරයකු අවුරුදු 5කට හිරේ දමා තිබෙනවා කියා තිබෙනවා. එක එක ප්‍රමාණයේ හොරකම් තිබෙනවාය කියලා එතුමා කිව්වා. මේකයි තිබෙන ගැටලුව. ලොකු හොරු අල්ලන්නේ නැත්තේ ඇයි කියලා අපි ඇහුවා. එතුමා කිව්වා, "පොඩි මිනිහෙක් රුපියල් 10,000ක් හෝ රුපියල් 1,00,000ක් දුන්නාම ඒක ඔහුගේ ඇහට දැනෙනවා. ඒක හරියට ඇහෙන් ඇටයක් ගත්තා වාගේ වැඩක්. ඉතින් ඔහු මොනවාද කරන්නේ? දුවගෙන ඇවිල්ලා පොලීසියට පැමිණිල්ලක් කරනවා, 'මෙහෙම මුදලක් මගෙන් ගත්තා'යි කියලා. එක්කෝ පොලීසිය, රහස් පොලීසිය හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් සොයා බලා ඒ මිනිසුන්ට සාක්ෂි දෙන්න කථා කරපුවාම, ඒ පොඩි මිනිසුන් අපේ උසාවිවලට ඇවිල්ලා, අපේ කොමිෂන් සභාවලට ඇවිල්ලා සාක්ෂි දෙනවා. ඒ මිනිසුන්ට සාධාරණත්වයක් කරලා, අධිකරණ මාර්ගයෙන් හොරු කියලා කියන්න පුළුවන් නම්, ඒ අය හිර කරන්න පුළුවන්. නමුත් මේ රටේ ඉන්න පොහොසත් මිනිසුන් හොරකම් කළාම ඒ විධියට කටයුතු කරන්න බැහැ. ඇයි? පොහොසත් මිනිස්සු ඒ අයගේ මිත්‍රයන්ට විරුද්ධව සාක්ෂි දෙන්න ඉදිරිපත් වන්නේ නැහැ. බොහෝ විට ඒ සාක්ෂිවල අඩු පාඩු තිබෙනවා. ඒ නිසා ඒ අය අල්ලන්න අපට අපහසුතාවක් තිබෙනවා"යි කියලා. මෙහෙම කියන්නේ කවුද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී මෙහෙම සඳහන් කළා.

ඒ විතරක් නොවෙයි. වත්කම් බැරකම් ප්‍රකාශන දෙනකොට කැබිනට් මණ්ඩලයේ නම්, රාජ්‍ය ඇමතිතුමා වන මම වත්කම් ප්‍රකාශනය දෙන්නේ රටේ ජනාධිපතිතුමාටයි. අනික් මන්ත්‍රීවරු වත්කම් බැරකම් ප්‍රකාශන දෙන්නේ කථානායකතුමාටයි. මොකක්ද, මේක? අපි සියලුදෙනාම අපේ වත්කම් බැරකම් ප්‍රකාශන කථානායකතුමාට දිය යුතුයි; විධායකයට නොවෙයි, ව්‍යවස්ථාදායකයට දිය යුතුයි. පසුගිය අවුරුදු විස්සේදී එක ඇමතිවරයකුගේ වත්කම් බැරකම් ප්‍රකාශනයක් ජනාධිපතිතුමාගෙන් ලබා ගන්න බැරි වුණා. අපි මෙය වෙනස් කරන්නට ඕනෑ. මේ වත්කම් බැරකම් ප්‍රකාශන සියල්ලම දෙන්න ඕනෑ, කථානායකතුමාටයි. ඉන් පසුව ඒ වත්කම් බැරකම් ප්‍රකාශනවල කළමනාකාරිත්වයක් තිබෙන්නට ඕනෑ. කළමනාකාරිත්වය තිබෙන්නට ඕනෑ පාර්ලිමේන්තුවටයි. අපේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන්න ඕනෑ; privacy laws must be there. නමුත් ඒවායේ සාරාංශය ජනතාවට දැන ගන්නට පුළුවන් විධියට ඒ වත්කම් බැරකම් ප්‍රකාශන දිය යුතුයි.

මට තව කෙටි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා ඉක්මනින් අවසන් කරන්නම්.

මේ වත්කම් බැරකම් ප්‍රකාශනවල, ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශනවල කළමනාකාරිත්වයක් තිබෙන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි. කැබිනට් මණ්ඩලයේ ඉන්නවා නම්, වාණිජමය අයිතීන් තබාගෙන කැබිනට් මණ්ඩලය තුළ ක්‍රියා කරන්නට බැහැ. අද දින මේ ගරු සභාවට ඇවිල්ලා නොයෙකුත් චෝදනා කළා. විපක්ෂය පැත්තෙන් ආණ්ඩු පක්ෂයට චෝදනා කළා. ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂය පැත්තට චෝදනා කළා. එක් එක් චෝදනාවන් මේ ගරු සභාවේ ඉදිරිපත් වුණා. මේ රටේ ජනතාව මේවා අහගෙන ඉන්නවා. කැබිනට් මණ්ඩලයට පත් වනවා නම්, ඒ අයට වාණිජමය අයිතීන් තිබෙන්නට බැහැ; you cannot have commercial interests if you are serving in the Cabinet. ඒ තිස්දෙනා තෝරා ගන්නට ඕනෑ මෙහෙමයි. එක්කෝ මන්ත්‍රීවරයකු වෙලා එතුමාගේ ව්‍යාපාර කර ගෙන යන්න ඕනෑ. එහෙම නැත්නම් මන්ත්‍රී ධුරයෙන් අයින් වෙලා කැබිනට් මණ්ඩලයේ සහිකයෙක් වෙන්නට ඕනෑ. මෙය පක්ෂ දේශපාලනය ගැන නොවෙයි. මේ රට වෙනස් කරනවා නම් අපි එකතු වෙලා වෙනස් කරන්නට ඕනෑ.

මා තව එක කරුණක් කියලා මගේ කථාව අවසන් කරනවා.

ඒ වාගේම, සබැඳියා ගැටුම් තිබෙනවා; නොයෙකුත් සබැඳියා ගැටුම් තිබෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. අපි ඔක්කෝම මේ රටේ නෑදෑයෝ. අපි පොඩි රටක්; පොඩි දූපතක්. කොහේ ගියත්, මොකක් හරි ක්‍රමයකින් නෑදෑකමක් තිබෙනවා. එම නිසා සබැඳියා ගැටුම් ඇති වන එක අලුත් දෙයක් නොවෙයි. නමුත්, සබැඳියා ගැටුමක් වහනවා නම්, ඒකයි තිබෙන වරද.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට 2010දී මම මේ සභාවට පැමිණියා. වාහනයෙන් බැහැලා මේ සභාවට එන කොට මම දැනගෙන හිටියා මහින්ද රාජපක්ෂ තමයි මේ රටේ ජනාධිපති කියලා. නමුත්, මෙතැනට ඇවිල්ලා වාඩි වුණාට පස්සේයි මම දැනගත්තේ කථානායක පුටුවට චමල් රාජපක්ෂ මැතිතුමාව යෝජනා කරනවා කියලා. මම චමල් රාජපක්ෂ මැතිතුමා ගැන මේ වචනය කියන්නට ඕනෑ. එතුමාට මම ගෞරව කරනවා. එතුමා සමඟ කිසිම අමනාපයක් නැහැ. ඒ නිසා එතුමා ගැන නොවෙයි මම මේ කථාව කරන්නේ. මම මේ කථාව කරන්නේ සබැඳියා ගැටුම් ගැනයි.

එක පවුලක එක්කෙනෙකු විධායකයේ ප්‍රධානියා වෙලා ඒ පවුලේම තව එක්කෙනෙක් ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා වෙන්න බැහැ. මම මේක තව විධියකට කිව්වොත්, අනෙක් සහෝදරයා අධිකරණයේ ප්‍රධානියා වෙනවා නම් -මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා වෙනවා නම්- හැමෝටම පැහැදිලි වනවා යහ පාලනයක් රට තුළ ඇති වෙන්නට, අද තිබෙන දේශපාලන විද්‍යාව අනුව විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය එකක් අනෙක් එකෙන් ස්වාධීන වෙන්නට ඕනෑය කියා. ඒක මම උදාහරණයක් හැටියට පමණයි කිව්වේ. සබැඳියා ගැටුම් තිබෙන තැන්වල ඒ සබැඳියා ගැටුම් අපි විස්තර කර දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිදුර කරුණු කියන්නට කාලය ප්‍රමාණවත් නැහැ. සාධාරණ සමාජයක් අපි ඇති කරන්නට යනවා නම්; යහ පාලනයක් ඇති කරන්නට යනවා නම්, පුද්ගලයින් ගැන කථා කරලා ඒක කරන්නට බැහැ; පුද්ගලයින් විවේචනය කරලා කරන්නට බැහැ. අපි ක්‍රමවේදය වෙනස් කරන්නට ඕනෑ. අපි එකතු වෙලා මේ ක්‍රමවේදය වෙනස් කරමු. මට කාලය ලබා දුන්නාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[5.02p.m.]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

Mr. Presiding Member, let me at the outset thank you for giving me 12 minutes, I believe, to speak on the subjects under discussion. But before I start, I must say a word about the previous speaker, the Hon. State Minister of Finance, who gave a rather vociferous speech, in which he touched on a range of subjects. I think after he has taken over the Ministry, maybe, through the influence of his senior Minister, he has learnt to sling mud at people, which is very unbecoming of him. If he sticks to the matters at hand, I think we all can have a better Debate. If the Hon. State Minister is so concerned about crime and also corruption, maybe on the 04th of next month, he should put his vote where his words are - vote against corruption to support the No-Confidence Motion.

Sir, I do not want to speak any more regarding the same, but I would like to thank you for allocating 12 minutes' time of the House to express my ideas on the Active Liability Management Bill, the Determination under the Constitution to revise the Salaries and Allowances of the Chief Justice and the Judges of the Superior Courts and the five Orders under the Excise (Special Provisions) Act. But, due to time constraints, I will comment mainly on the Active Liability Management Bill.

The Active Liability Management Bill has been contested in the Supreme Court and the Hon. Speaker read out the Supreme Court Determination, which stated that the Bill indeed is in line with the Constitution. Sir, irrespective of the legality of the Bill, without a doubt, we all can agree that this is a very powerful Bill which

[ගරු තාරක බාලසූරිය මහතා]

allows the Hon. Minister to raise up to 10 per cent of the country's total outstanding debt through Parliament. However, this can only be used for refinancing and prefinancing of existing loans.

Sir, this Bill also highlights the dire straits our economy is in. If an individual was in this situation, then the simple logic would be to earn more, spend less and try to pay more of his loans. Here again, the Government, without looking at meaningful fiscal consolidation, is adopting a philosophical change in its thinking of borrowing more in order to pay more. Sir, the Editorial of "The Island" newspaper has made an analogy, comparing this situation to giving a whimsical spendthrift who is neck-deep in debt a high limit credit card with no conditions.

Sir, I do believe that a country such as Sri Lanka, given the dire straits to which this Government has brought its economy, will do well to operate an Active Liability Management Bill. It was only in last November that the Hon. Prime Minister, in this Chamber, went on to read out the Economic Policy Statement of the Government. He pointed out that in 2016, 80 per cent of the Government's total revenue was spent for debt servicing. He further went on to tell this House that US Dollars 2.3 billion worth of Sri Lanka Development Bonds will mature this year and 30 per cent of the Treasury Bonds will mature next year. Further, US Dollars 1.5 billion in international Sovereign Bonds will mature in 2019. All in all, Sir, we have to pay US Dollars 2.3 billion in foreign loans this year, US Dollars 3.7 billion worth of foreign loans in 2019 and US Dollars 3.2 billion in 2020.

It has been talked about rather inaccurately by the Government Members who spoke before me about the "*naya ugula*" or the debt trap that was created during the Rajapaksa Regime. Sir, nothing could be more further from the truth. The Mahinda Rajapaksa Government, which inherited a debt-to-GDP ratio of 102 per cent, was able to bring that ratio down to 71 per cent when they handed over power to the *Yahapalana* Government in 2015. The previous Government, through proper debt management strategies, ensured that none of the bullet loan payments overlapped one another. It should be noted that the governments unlike individuals could carry on with a deficit over a long period of time. I believe that during the 19th Century, the Untied States had a deficit for almost 100 years.

The United Kingdom has had a budget surplus only eight times during the last six decades. We ourselves have had a budget surplus only twice since Independence. So, it is not actually the budget deficit that matters, but more importantly how we manage it and how much it costs to finance our debt. So, in this regard, the *Yahapalana Rajaya* has managed to muck things up to glorious new levels. The issuing of Short-Term Sri Lankan Development Bonds with overlapping maturity periods has resulted in the *Yahapalana* Government borrowing over Rs. 3 trillion in the first three years in power.

The ill-advised policies of defending the rupee in 2015 - I think the Hon. Ravi Karunanyake tried to defend it today also - which depleted the Foreign Reserves from US Dollars 3.4 billion to US Dollars 1.7 billion, coupled with stopping of all Chinese constructions due to politically-motivated rationale, the now infamous bond scam, the resultant dip in investor sentiments, the salary increase of the public sector employees and the simultaneous reduction in fuel tariffs are all major factors for the current plight of our economy. So, in any event - I am not going to indulge too much in the blame game - what is more important is how we are going to get out of this impending situation.

In this regard, I do think an active liability management policy is a necessity. The objective of the Active Liability Management Act, as stated, is to manage public debt to ensure the financing needs and payment obligations of the Government are met at the lowest possible cost. This Bill also provides tremendous power to an individual, in this case, the Minister, who is empowered to decide on the quantum of the loan and the mode of raising such a loan. Clause 4 of the Bill somewhat checks this power stating that the Hon. Minister can obtain loans only with the approval of the Cabinet of Ministers and according to the Section 114 of the Monetary Law Act. The Monetary Law Act states that the advice of the Monetary Board has to be first obtained upon the monetary implications of the proposed loan or issue. Therefore, I do think, Sir, as the quantum of these loans can be massive, that direct reference should be made in the Act itself on the advice of the Monetary Board. It is best, Sir, if these matters are handled through the Public Debt Department.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Actually, you are mistaken, Hon. Member, because it is governed by the Monetary Law Act. So, we do not have to restate in this Bill what is in the Monetary Law Act.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

I am just stating what was discussed during the Committee Stage of this Bill in the morning. But, I believe, because the quantum of the monies is huge in this case, that it would be better-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Member, it is specifically stated that -

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
It is specifically stated in Section 114 of the Monetary Law Act.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
That is right. So, the Monetary Law Act specifies how to go about it; it is there.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
The Hon. State Minister will agree with me that when the indemnity issue was spoken about this morning, the indemnity issue was put again in the Bill because two or three areas were not covered. So, it is just my thought that it will be better if this is included directly in the Bill, because the quantum of monies we are talking about is quite high.

Sir, this Bill enables Parliament to raise, through a Resolution, up to 10 per cent of the total outstanding debt. Our total outstanding debt is around Rs. 10 trillion. Up to Rs. 1 trillion can be raised by the Prime Minister using a mechanism to his liking. We all know what happened the last time the Hon. Prime Minister decided to use his expert knowledge on finance and changed the bidding mechanism of the bonds issued from direct placement or auction method to a 100 per cent auction method. So, it is best, through our experience in the recent past, that we put proper checks and balances to this Bill so that no collusion can take place. Sir, even after the horrendous bond scam and its impact on this struggling economy, have we not learnt any lessons?

Hon. Presiding Member, for the purpose of this Bill, "Minister" is defined as the Minister assigned the subject of Finance and it has also been the tradition all over the world that the Central Bank comes under the Minister of Finance. It was this Government, for the first time in the history of Sri Lanka, which removed the Central Bank and placed it under the Prime Minister. Even after the much-anticipated Cabinet reshuffle early this month, that anomaly was not corrected.

Clause 4 (2) of the Bill states, I quote:

> "The decision made by the Minister under subsection (1) shall be communicated in writing to the Registrar through the Minister assigned the subject of Central Bank of Sri Lanka."

What are we getting at over here? Sir, without addressing the anomaly that has been made in the first place by putting back the Central Bank under the Ministry of Finance, this Clause has been created in order for the Prime Minister to further interfere in the issuance of bonds.

Do we really want this? Is this not another mechanism where the Prime Minister can find a quick and fast method to enrich his school buddies at the expense of the country?

I have no problem with the Prime Minister except for his track record. He signed a so-called peace accord with the LTTE, recognizing them as a self-governing authority for the North and the East, for a period of 10 years. The Prime Minister neither informed the Cabinet nor did he seek the approval of this House.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Balasuriya, do not talk nonsense.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
He signed an agreement for ten years.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Do not say that. The Hon. Prime Minister never signed an agreement. No one ever signed an agreement for a self-governing authority for ten years. You would have been sleeping or you would have been on something else.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
In which country are you living?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I am living in this country.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Very good.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
You show me the agreement where the Government of Sri Lanka signed for a self-governing authority for ten years. Do not talk nonsense.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
You are taking my time. I will show it to you afterwards.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Do not come to this House and tell untruths. It is not proper. I did not expect that from a person like you.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

Is it not true that the Prime Minister signed an agreement without the approval of this House or the Cabinet? The point is, he signed it without the approval of this House or the Cabinet. You are missing the point. MoU එක sign කළේ මේ සභාවේ අවසරය නැතිවයි. කැබිනට් එකේ අවසරය නැතිවයි. [බාධා කිරීමක්] අත්සන් කළා. The Prime Minister neither informed the Cabinet nor did he seek the approval of this House. In any other country it would be treason and he would be hung.

The next time he came to power - alas illegally with only 42 MPs - within less than two months, the Prime Minister colluded with his inner cabinet and his Royal College buddies and committed the biggest financial fraud the world has ever seen perpetuated by a Prime Minister on his own people. Now this House wants to give this person the power to raise 10 per cent of our national debt or roughly Rs. one trillion, in any manner he sees best. Has this Parliament really lost its head or have we become a nation of lotus-eaters immune to corruption where Members just raise their hands predetermined by the political affiliations and not on the merits of the acts concerned. In any event, even if it was not the Prime Minister at the helm of the Central Bank, I am sure we can all agree that more sections need to be included to bring proper checks and balances.

There are also other concerns in this Bill. Section 9 of this Bill provides immunity to the members of the Monetary Board, officers of the Central Bank and employees of the Ministry from any criminal or civil proceedings.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Give me two more minutes, Sir.

This now has been agreed to be changed including immunity for officials of the Ministry. Section 10 also states that the Minister may make regulations on the advice of the Monetary Board. I think this too has to be more definitive because this does not limit the Prime Minister seeking the advice from his old friends like Arjun Mahendran and Arjuna Aloysius. If the Government is not willing to make the necessary amendments, then we must remind the President that he is indeed the President of this country, and in matters such as this it is better to be proactive and prevent another large scale malpractice taking place at the expense of the country rather than reading it in newspapers after the crime had been committed. If the President had insisted on the removal of Arjun Mahendran after the first bond scam, the second bond scam in 2016 could have been prevented. So even at a latter date, the President as the head of the Cabinet can insist on amendments. Similarly, in conclusion, I urge this House to take all necessary steps that have to be taken in order to prevent further financial malpractices.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා

[අ.භා. 5.16]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්; කාලෝචිත දෙයක්. අපි විශාල ණය උගුලක හිරවෙලා ඉන්න වෙලාවක, ඒ ණය කළමනාකරණය කර ගැනීම, ඒ ණය ආපසු ගෙවීම පිළිබඳව යම් විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම ඉතාම කාලෝචිතයි. අපි ඉතාම ඉක්මනින් ඒ සඳහා යොමු විය යුතුයි. ඉතින්, ඉතාම හොඳ දෙයක් තමයි මේ වෙන්නේ.

අපි "ණය උගුල" කියලා කථා කරනවා. අපි මේ ණය උගුලට හිර වුණේ අද ඊයේ නොවෙයි. 2010 ඉඳලා තමයි අපේ රටත් ණය උගුලක හිරවෙලාය කියන එක ලෝකය තුළ සඳහන් වෙන්න පටන් ගත්තේ. විශේෂයෙන්ම 2011 වන විට අපේ රට ලෝකය තුළ විශාල ණය උගුලක හිරවෙලායි හිටියේ. පසුගිය රජය කාලයේ යෝධ සංවර්ධන වැඩ සටහන් තිබුණා. "දැයට කිරුළ" වැඩසටහන, අධිවේගී මාර්ග, බෙලිඅත්ත වැනි පළාත්වල සංවර්ධන කටයුතු, ගුවන් තොටුපොළවල්, වරායවල් වැනි වැඩසටහන් තිබුණා. රටට දරා ගන්න බැරි තරමට තමන්ගේ ප්‍රතිරූපය පමණක් විශාල ලෙස පුම්බා ගන්නට අවශ්‍ය වන දැවැන්ත වියදම් කළා. සමහර පාලකයන්ගේ දරුවෝ අපේ රටට ඔරොත්තු දෙන්නේ නැති ලොකු වැඩ කළා. චීනයට ගිහිල්ලා රොකට් ඇරියා. රටක් හැටියට අපට දරා ගන්න බැරි දැවැන්ත වියදම් කරමින්, අරාබියේ ඉන්න සුල්තාන්වරු වාගේ, ධන කුවේරයන්ගේ කණ්ඩායම් වාගේ තමයි ඒ ගෝල බාලයන්, දරු මල්ලන් සහ විශේෂයෙන්ම ඒ පවුලේ සියලුදෙනා හැසිරුණේ. හැබැයි, ඒ ගත්ත සියලු ණය කඳුවලට - විශාල ණය කන්දරාවලට- අපි නොවෙයි ජය ඝෝෂා ලබා ගත්තේ, අපි නොවෙයි, සුබ පැතුම් ලබා ගත්තේ. මෙතෙක් කාලයක් ලබා ගත් ඒ දැවැන්ත ණය සඳහා පසුගිය ආණ්ඩුවේ හිටපු ජනාධිපතිතුමා ඇතුළු ඒ කණ්ඩායම් ජය ඝෝෂා ලබා ගත්තා; අත් පොළසන් ලබා ගත්තා; සුබ පැතුම් ලබා ගත්තා; මල් මාලා දමා ගත්තා; විසිල් ගහ ගත්තා; ඡන්ද ගත්තා; අල්ලස් ගත්තා; පගා ගත්තා; ජරාව ගත්තා. ඒ සියල්ලම ලබා ගනිමින් ජනතාවගේ ඇහැටත් වැලි ගහමින්, පාලන බලයත් දරමින් සියල්ල බුක්ති වින්දා. ඒ සියල්ල බුක්ති විඳලා, මේ ණය කන්ද අපේ කරපිට කඩා වැටුණාට පස්සේ මේ ණය කවුරු ගත්තාද, කවදා ගත්තාද කවුරු මේකෙන් වාසි ගත්තාද, නම්බු ගත්තාද කියලා අපට තර්ක කර කර ඉන්න අවශ්‍ය වන්නේ නැහැ. අපි මේ ණය ගෙවන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ "මහ නැඟුම" ආයතනයට යන කොට එතැනට ඇවිල්ලා සිටියා වලස්මුල්ල පාර, බෙලිඅත්ත, නොම්මර 1හි පදිංචි ඕ.ජේ.ජේ. ජයරත්න කියලා මහත්මයෙක්. මොකටද, එතුමා ඇවිල්ලා හිටියේ? මේ කරුණ

දැනුම් දෙන්න ඕනෑ කියලා මම එතුමා ළඟ තිබුණු ලියුමේ පිටපතක් ගත්තා. බෙලිඅත්තේ කෙනෙක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඕ.ජේ.ජේ. ජයරත්න, නොම්මර 1, වලස්මුල්ල පාර, බෙලිඅත්ත. එතුමා දවස් ගණනාවක් මෙතැනට බඩගානවා, බඩගානවා. අධිවේගී මාර්ගය සහ අනෙක් මාර්ග පුළුල් කරන කොට ඒ පුද්ගලයාගේ වෙළෙඳ ව්‍යාපාර කඩා ඉවත් කරන්න සිද්ධ වෙලා. තවමත් ඒ අයට වන්දි ගෙවලා නැහැ. "පාර පුළුල් කිරීමේදී වෙළෙඳ ආයතනය ඉවත් කිරීම සඳහා මුදල් නොලැබීම සම්බන්ධයෙනි" කියලා එයා දිග ලියවිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. මම ඒ ලියුමේ පොටෝ කොපියක් හොරෙන් ගහගත්තා. ඉතින් පසුගිය ආණ්ඩුව විසිල් ගහපු, බල්ටි ගහපු, සුබ පැතුම් ගත්ත, මල් මාලා දමා ගත්ත, අත්පොළසන් ගහගත්ත, පරණ ණයවලට මේක එක උදාහරණයක් පමණයි. දැන් අපට මේ ණය ගෙවන්න සිද්ධවෙලා තිබෙනවා. මේ ණය ගෙවීම පිළිබඳව විනිවිදභාවයකින් යුක්තව, ලොකු කළමනාකරණයකින් යුක්තව කටයුතු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. මේ කටයුත්ත කරගෙන යෑමේ අවස්ථාවට තමයි දැන් අපි පත්වෙලා ඉන්නේ.

මා විශේෂයෙන්ම කියන්නට ඕනෑ, "කවුද ගත්තේ, කවුද මේවා ගෙවන්නේ" කියන කතන්දර වැඩක් නැහැ. මේ වසරේ පමණක් ඩොලර් බිලියන 2.7ක් ණය සේවා සඳහා යොමු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. එතකොට කෑ ගහනවා. "කෝ, දැන් හම්බන්තොට වරාය විකුණලා ගත්තේ මොනවාද? ඒ සල්ලිවලින් දැන් මේ ණය ගෙවිවාද?" කියලා අහනවා. හම්බන්තොට වරායෙන් අපට ලැබුණේ ඩොලර් බිලියන 1.1ක මුදලක් පමණයි. මේ වසරේ පමණක් අපි ඩොලර් බිලියන 2.7ක්,- [බාධා කිරීමක්] මේ වසරේ පමණක් අපි ඩොලර් බිලියන 2.7ක් ගෙවන්න ඕනෑ. මෙන්න මේ කාරණා පිළිබඳව තමයි විශේෂයෙන් අපි අද මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කටයුතු කළේ. මේවා මොනවත්ම සිද්ධ වුණේ නැහැ වාගේ; මේවාට වග කියන්න ඕනෑම නැහැ වාගේ, මේවා බලා ගෙන ඉන්නවා. විශේෂයෙන්, රටක් හැටියට අපි මේ ගත්ත ණය ගෙවන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා පසුගිය කාල පරිච්ඡේදවල එක දිස්ත්‍රික්කයක්, එක පළාතක් සංවර්ධනය කරමින්, ඒ හිටපු පාලකතුමන්ලා; ඒ හිටපු දකුණේ නායකයන් කටයුතු කරපු ආකාරය. ඒ අයට ගොඩින් දකුණට යන්න පුළුවන් විධියට අධිවේගී මාර්ගයක් හදා ගත්තා. දියෙන් යන්න ඕනෑ විධියට වරායක් හදා ගත්තා. ගුවනින් යන්න ඕනෑ විධියට ගුවන් තොටුපොළක් හදා ගත්තා. තරමට වැඩිය ලොකු වැඩ කරලා අපේ රටේ ජාතික ධනය විනාශ වන විධියට කටයුතු කළා. එයාර් ලංකා ආයතනය බරපතළ විධියට පාඩු ලැබුවා. හිටපු පාලකයන් තමන්ගේ බූදලයක් හැටියට පණ අදිමින්, ගැට ගහමින්, අපේ ජාතික ධනය විනාශ කරමින් එය ගෙන යන අතරේ "මිහින් ලංකා" කියලා තවත් ගුවන් සේවාවක් ස්ථාපිත කළා.

ඒවාට අපේ රටේ සල්ලි දැවැන්ත විධියට වියදම් කළා. ඒවා අපේ රටේ ඉපදිච්ච සල්ලි නොවෙයි, අපි ණයට ගත්තු සල්ලි. තමන්ගේ සිහින සැබෑ කර ගන්න; පියාසර කිරීමේ සිහිනය සැබෑ කර ගන්න; රාවණා රජතුමා වාගේ දඩු මොණරාගෙන් යෑමේ සිහින සැබෑ කර ගන්න ඒවාට අපේ රටේ සල්ලි වියදම් කළා. මේ සංවර්ධන කටයුතු කරද්දී සැබෑ විධියටම අපේ මාතෘ භූමිය තුළ - මේ මහ පොළොව තුළ- ඒ ගත්තු මුදල්වලින් සියයට කීයක් සංවර්ධනය සඳහා යොමු වුණාද, සියයට කීයක් කොයි කොයි අතට ගියාද, යම් යම් පසුම්බිවල ඒවා ඉතුරු වුණාද කියන එකත් අපි විශේෂයෙන් බලන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුතු සඳහා තමයි අපි මේ සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීම පිළිබඳ විශේෂ පනත් කෙටුම්පතක් ගෙනැල්ලා ඒක සම්මත කරලා මේ කටයුතු සිද්ධ කරන්නට උත්සාහ කරන්නේ.

අපේ ආණ්ඩුව ගැන විශේෂයෙන් කියන්නට අවශ්‍යයි. අපි භාර ගත්තේ දෙකොන, තුන් කොන, හතර කොන ඇවිලෙන ගිනි විලක්කු. අපි මේ ආණ්ඩුව ගන්න කොට ණය කඳු විතරක් නොවෙයි, කඳු රාශියක් අපේ ඔළුව මත කඩා වැටුණා. මේ ආණ්ඩුව ගන්න කොට පසුගිය පාලනය විසින් ඉතුරු කරලා ගිය, විසඳන්නේ නැතුව හිටපු, යටපත් කරන්න තිබුණු ප්‍රශ්න තොගයක් අපේ ඔළුවට වැටුණා. 2009, 2010, 2011 පටන් ගත්තු සයිටම් අර්බුදය ගැන ඒ අය කට පියාගෙන ඉඳලා, 2015 මේ ආණ්ඩුව ආවාම ඒක අපේ ඔළුවට කඩාගෙන වැටුණා. ඒ එක්කම අවුරුදු 20ක්, 25ක් තිස්සේ ගොඩ ගහපු කොළඹ මීතොටමුල්ල කුණු කන්ද මේ රජය ආවාට පස්සේ ඒකත් අපේ ඔළුවට කඩාගෙන වැටුණා. ඒවාට අපට විසඳුම් සොයන්න සිදු වුණා. ඒ කුණු ටික අරගෙන හැඳල, වත්තල පැත්තට යන කොට මේ කුණු කඳු ගොඩ ගහපු මිනිස්සු එහේ ඉඳන් අපේ අය පන්නනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව විනාඩි දෙකක් දෙන්න.

ඒ ණය කඳු අපේ ඔළුව මත කඩා වැටුණා; කුණු කඳු අපේ ඔළුව මත කඩා වැටුණා. අපට ඔරොත්තු දෙන්නේ නැති ප්‍රමාණයට ලෝකයෙන් ණය අරගෙන ඒවා ඵලදායී නොවන, ආදායම් උත්පාදනය නොකරන දේවල්වලට යෙදවීමත්, උමා ඔය වාගේ සීමාවක්, සැලැස්මක්, විනිවිදභාවයක් නැතිව කරන්නන් වාලේ කරපු දේවල්වල ප්‍රතිඵල තමයි අද අපේ රජයට භුක්ති විඳින්නට සිදු වෙලා තිබෙන්නේ. මේක කවුද ගත්තේ, කවුද කෙරුවේ, මේවා දැන් අපි ගෙවනවාද, නැද්ද කියන එක වැඩක් නැහැ. අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි මේ කාරණය කියනවා. තමුන්නාන්සේලා මඟුල් කන්න. තමුන්නාන්සේලා බාල් නටන්න. තමුන්නාන්සේලාගේ ඒ මංගල අවස්ථාව තිබුණු කාලයේ තමුන්නාන්සේලාගේ මඟුල් ගෙවල්වලට ගත්තු ණය තමයි මේ අපි ගෙවන්නේ. ඒක නිසා විවේචනයකින් තොරව, සද්භාවයෙන් මේ කටයුතු සඳහා අපිත් එක්ක එකතු වෙන්න. තමුන්නාන්සේලාගේ බිල් ටික තමයි අපි මේ ගෙවන්නේ. තමුන්නාන්සේලාගේ බිල් ටික ගෙවන්නවත් තමුන්නාන්සේලාගේ සහයෝගය අපට දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.26]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ කාරණා දෙකක් ගැන කථා කරනවා. එකක් සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

ඔබතුමාට මේ කාරණය කියන්න ඕනෑ. ආංශික අධීක්ෂණ කාරක සභා දෙකකදී මේ පනත් කෙටුම්පත ගැන අපි සාකච්ඡා කළා. සාකච්ඡා කළා විතරක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමන්ලා ඒ ගැන අදහස් දැක්වුවා. ඒ වාගේම මහ බැංකුවේ අධිපතිතුමා ප්‍රධාන, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරු ඇතුළු සියලු දෙනා ඉදිරියේ මේ පනත් කෙටුම්පත පිළිබඳ නීතිමය කාරණා පිළිබඳවත්, මේ පනත් කෙටුම්පතින් රටට සිදු වන හානියක් තිබෙනවාද කියන එක පිළිබඳවත් පැහැදිලිව අපි අදහස් දැන ගත්තා. පළමුවැනි දවසේ සාකච්ඡාවට අපේ බන්දුල ගුණවර්ධන මැතිතුමා හිටියා; වාසුදේව නානායක්කාර මැතිතුමා හිටියා. එතුමන්ලා මේ පනත් කෙටුම්පත පිළිබඳව පැහැදිලි කිරීම් අරගත්තා.

ඒ විතරක් නොවෙයි. ඊට පස්සේ මේ පිළිබඳව තවදුරටත් කරුණු දැන ගන්න අවශ්‍යයි කියන කාරණය ගරු කථානායකතුමාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එතුමා අද උදේ නවය හමාරට ඒ ආංශික කාරක සභාවේ දී තව රැස්වීමක් කැඳෙව්වා. එතැනදී සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත්, තාරක බාලසූරිය මන්ත්‍රීතුමාත් ඒ සභාවට සහභාගී වුණා. මේ සියලු දේ පිළිබඳව සාකච්ඡා කළා. මුලින්ම මේ කාරණය පිළිබඳව කථා කරන කොට තිබුණු බොහොම හඬ වැඩි වූ ශබ්දය, සාකච්ඡාව අවසාන කරන කොට හැම කෙනාම එකඟ වෙලා තමයි, අද මේ සභාවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. ඒ විතරක් නොවෙයි, මොනවා හරි සංශෝධන තිබෙනවා නම් අද දහවල් 12.00ට ඉස්සෙල්ලා ඉදිරිපත් කරන්නත් අපි අවස්ථාව දුන්නා. එහෙම සංශෝධන ඉදිරිපත් කර තිබුණා නම් ගරු ඇමතිතුමා ඒවා සලකා බලන්නත් සූදානම්ව සිටියා.

නමුත් මේ පනත් කෙටුම්පත ගැන කතා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා රට නොමඟ යවන ප්‍රකාශ කිරීම ගැන මා කනගාටු වනවා. ඒක සදාචාරසම්පන්න නැහැ කියා මා හිතනවා. පාර්ලිමේන්තුවක් හැටියට අපි වග කියන්න ඕනෑ; කතා කරන්න ඕනෑ. නමුත් දේශපාලනය සහ සදාචාරය කියන්නේ දෙකක්. මේ කමිටු දෙකේම මා සිටි නිසා මොකක්ද වුණේ කියන එක මා දන්නවා. මෙහිදී කතා කරපු දේවල් මම අහගෙන සිටියා. මා ඒ ගැන කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන කාරණය මෙකයි. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ යම් නියමයන් කිහිපයක් පිළිබඳවත් අද දින සාකච්ඡාවට ගැනෙනවා. මම ගරු මුදල් අමාත්‍යතුමාටත් මේ ගැන කරුණු ඉදිරිපත් කළා. මීට කලින් 2017 නොවැම්බර් මාසයේ අංක 2044/36 කියන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සුරා බදු ආඥාපනතේ 102 දරන සුරා බදු නිවේදනය නිකුත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිවේදනයෙන් බලාපොරොත්තු වන්නේ එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිත කරන අමු ද්‍රව්‍ය මත සුරා බදු අනුපාත පැවරීමයි. මෙහිදී අපට බලපාන ගැටලුවක් පිළිබඳව මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙහිදී බලාපොරොත්තු වන්නේ කුමක් ද? ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන සහල් පල්ප, ඉරිඟු පල්ප, පලතුරු පල්ප සහ ඒවාට කිලෝග්‍රෑමයක් සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 10ක්ය කියා නියම කර තිබෙනවා. බොහොම සාධනීය වශයෙන් ඉදිරිපත් කර තිබෙන මේ බදු ගැන අපට ගැටලුවක් නැහැ. මොකද, රටේ නිෂ්පාදනය කරන පලතුරු, රටේ නිෂ්පාදනය කරන ඉරිඟු සහ සහල් එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිත කළොත් එමඟින් ඇත්තටම පාඩු වන්නේ රටට සහ විශේෂයෙන්ම පාරිභෝගිකයන්ටයි. ඒ නිසා මේ බදු පැනවීම ගැන ගැටලුවක් නැහැ. මොකද, සාමාන්‍යයෙන් අර්තාපල් නිෂ්පාදනය වෙළෙඳ පොළට එන කොට යම් යම් බදු පනවා රටේ මිල පාලනය කරන වැඩ පිළිවෙළක් තිබෙනවාය කියන එක අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ කාරණයේදී බැරුරුම් ප්‍රශ්නය වන්නේ, molasses සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 10ක බද්දක් පනවා තිබීමයි. මේ බද්ද පනවා තිබෙන කාරණය මෙකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ලංකාවේ රාජ්‍ය ආයතන හැටියට සෙවණගල සහ පැල්වත්ත කියන සීනි සමාගම් දෙක ක්‍රියාත්මක වූ බව ඔබතුමාත් දන්නවා ඇති. ඒවා සම්පූර්ණයෙන්ම රජයේ ආයතන. ඒවා පෞද්ගලික ආයතන නොවෙයි. මේ ආයතන දෙකෙන් අතිවිශාල ජනතාවක් ජීවත් වෙනවා. "මොනරාගල" කියන්නේ සමෘද්ධිලාභීන් අතිවිශාල පිරිසක් සිටින දිස්ත්‍රික්කයක්. ඒ වාගේම දුප්පත්කම ඉතාම වැඩි, අන්ත දුෂ්කර ජීවිත ගත කරන පිරිසක් සිටින දිස්ත්‍රික්කයක්. පවුල් 60,000ක්, 70,000ක් විතර මේ ආයතන දෙකෙන් විතරක් ජීවත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී මා කාරණා දෙකක් ගැන විතරක් ඔබතුමාට පැහැදිලි කර දෙන්නම්. 2014 වර්ෂයේ මේ ආයතනය රුපියල් මිලියන 349ක් පාඩු ලැබුවා. මා කතා කරන්නේ පැල්වත්ත සීනි සමාගම ගැනයි. ඒ වාගේම 2015 වර්ෂයේ එය රුපියල් මිලියන 823ක් පාඩු ලැබුවා. මේ තත්ත්වය වෙනස් කරන්න පුළුවන් වුණා, වර්තමාන සභාපති නවීන් අධිකාරම් මහත්මයාත්, මේ විෂය භාර වර්තමාන අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමාත් පැවැති වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් වෙනස් කළ නිසා. ඒ නිසා 2016 වන කොට රුපියල් මිලියන 461ක ලාභයක්, 2017 වර්ෂයේ රුපියල් මිලියන 297ක ලාභයක් ගන්න පුළුවන් තත්ත්වයට මේ ආයතන ගෙනෙන්න හැකි වුණා. මේ molasses නිෂ්පාදනය සඳහා බදු පැනවීම තුළ අතිවිශාල මුදලක් බදු හැටියට ගෙවන්න සිද්ධ වුණා. සමස්තයක් හැටියට ගත්තොත්, මේ අවුරුදු 4ට molasses සඳහා බදු ගෙව්වොත්, පැල්වත්ත සීනි සමාගමට විතරක් රුපියල් බිලියන 1.2ක් පාඩු වෙනවා. සෙවණගල සීනි කර්මාන්තශාලාව ගත්තොත්, 2014 අවුරුද්දේ රුපියල් මිලියන 145ක් ලාභ ලැබුවා. 2015 වර්ෂයේත් රුපියල් මිලියන 230ක් පාඩු ලැබුවා. 2016 අවුරුද්දේ ආපහු රුපියල් මිලියන 543ක් ලාභ ලැබුවා. 2017 වර්ෂයේ රුපියල් මිලියන 870ක් ලාභ ලැබුවා. මේ සමස්ත ලාභයෙන් molasses සඳහා බද්ද අඩු කළොත්, රුපියල් මිලියන 867ක් දක්වා ලාභය අඩු වනවා.

මා විශේෂයෙන් මේ ගැන කතා කරන්නේ; ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්නේත් මේ නිසායි. මේ ආයතන දැන් ස්වාධීනව රටේ පවත්වාගෙන යන ආයතන. මේ ආයතන මොන හේතුවක් නිසාවත් භාණ්ඩාගාරයෙන් ශත 5ක්වත් බලාපොරොත්තු වන්නේ නැහැ. ඒවාට ලැබෙන ලාභය තමයි නැවත වතාවක් ඒවාට යෙදවෙන්නේ. ඒවා අවුරුදු 30ක් එක දිගට ක්‍රියාත්මක වූ කර්මාන්තශාලා. මේ කර්මාන්තශාලාවලට නැවත මුදල් ලබා දෙන්න භාණ්ඩාගාරයට පුළුවන්කමක් නැති නිසා ඒ මුදල් තමයි නැවත වතාවක් එම කර්මාන්තශාලාවල වැඩිදියුණු කිරීම සඳහා, මහ ජනතාවට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා යෙදවෙන්නේ. දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන කර්මාන්තශාලා දෙකක් හැටියට ඒවායෙන් අතිවිශාල සේවයක් සිද්ධ වෙනවා. ඒ නිසා මා ගරු අමාත්‍යතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. එතුමා බලාපොරොත්තු වන බදු මුදල් සහල්, ඉරිඟු, පලතුරු සඳහා පැනවීමේ ගැටලුවක් නැහැ. නමුත් ඉතාම අඩු පහසුකම් යටතේ ජීවත් වන මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට මේ කර්මාන්තශාලා දෙක අනිශයින් වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සමස්ත කර්මාන්තශාලා දෙකට බදු පැනවීම නිසා මේ අවුරුදු 4දී සිදු වන අලාභය විතරක් මම ඔබතුමාට කියන්න ඕනෑ. රුපියල් බිලියන 1.3ක පාඩුවක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ, මහ ජනතාවට සේවයක් වන මෙම ආයතනයට අනිවාර්යයෙන්ම ඉදිරි කාලයේ

කවදා හෝ දවසක අති විශාල මුදලක් දෙන්න මහා භාණ්ඩාගාරයට සිද්ධ වෙනවා. ඒ නිසා මේක දැන්ම නැවැත්තුවොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. මීට ඉස්සෙල්ලා ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මම මේ ගැන කිව්වාම, Department of Excise එක වෙනුවෙන් පැමිණි මහත්වරුන් පිළිගත්තා, ඒක එහෙම වෙනවා කියලා. ඒක අපට දරන්න පුළුවන්කමක් නැහැ. අපේ දිස්ත්‍රික්ක ශක්තිමත් වෙන්න ඕනෑ. ඌව පළාතේ මොනරාගල වගේ දිස්ත්‍රික්ක රටේ දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන දායකත්වය ඉතාමත්ම අඩුයි. එම දිස්ත්‍රික්ක ශක්තිමත් වෙන්න නම්, බදු පනවමින් එම කර්මාන්තශාලා අකර්මණ්‍ය කරන එක නොවෙයි කරන්න ඕනෑ. එම කර්මාන්තශාලා සඳහා නැවත වතාවක් මුදල් ආයෝජනය කරලා, කර්මාන්තශාලා වැඩි දියුණු කරලා, වතුර නැති ප්‍රශ්න තිබෙනවා නම් ඒ තැන්වල වැව් හදලා එම ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න පුළුවන් තරම් උදවු කරන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මම නැවත වතාවක් මෙය ගරු මංගල සමරවීර මැතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබතුමාට මේක ලිඛිතව දෙන්න පුළුවන්. කරුණාකර මෙම බදු පැනවීම ඉවත් කරලා, එම කර්මාන්තශාලා දෙකට මහා භාණ්ඩාගාරයට බරක් නොවී, ස්වායත්තව ඉදිරියට යන්න අවශ්‍ය ශක්තිය සහ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව මූලාසනයට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වැදගත් පනත් කෙටුම්පතක් වන සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර සම්මත කරන්නට සූදානම් වන අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබාදීම පිළිබඳව මා සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විටත් ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු මා වටා වළල්ලක් වගේ සංවිධානය වෙලා තිබෙනවා. එතුමන්ලා මොන විධියට පිඹුරුපත් හැදුවත්, කැස කැව්වත්, මගේ හිත මිත්‍ර, ඒ වාගේම හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක් වන ගරු විමල් වීරවංශ මැතිතුමා මෙතැන නැහැ. මම හිතන විධියට එතුමා එළියේ ඉඳලා මේ කථාව අහගෙන ඉන්නවා. එතුමා දේශපාලන වේදිකාවක කරන කථාවක් තමයි කළේ. අද ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත පිළිබඳව නිවැරදි අවබෝධයක් ඇතිව නොවෙයි එතුමා කථා කළේ. බැදුම්කර සිද්ධිය සහ විශ්වාස භංග යෝජනාව ගැන තමයි එතුමා කථා කළේ. බැදුම්කර සිද්ධිය වාගේ සිදුවීම් ගණනාවක් මේ රටේ සිදු වුණා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, ගරු මුදල් අමාත්‍යතුමා ඉතාමත් වැදගත් කරුණු කාරණා කිහිපයක් මේ පනත් කෙටුම්පත මඟින් අද ආවරණය කරන්නට සූදානම් වෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විදේශීය වෙළෙඳ පොළ තුළ පොලී අනුපාතය අඩු වුණු අවස්ථාවලදී එයින් ණය ලබාගෙන, විශේෂයෙන්ම මහ බැංකුවේ නිර්දේශය සහ අධීක්ෂණය යටතේ ලංකාවේ බැංකුවල තැන්පත් කිරීම තමයි මෙම පනත් කෙටුම්පතේ මූලික පරමාර්ථය වෙලා තිබෙන්නේ. ඒ වාගේම එම මුදල් තැන්පත් කර තබා අවශ්‍ය අවස්ථාවලදී අපේ ණය සහ වාරික ගෙවීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මෙහිදී රජයේ ණය පිරිවැය, ඒ වාගේම අවදානම අඩු කරන්නට කටයුතු කර තිබෙනවා.

ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා කථා කළේ හරියට නින්දෙන් නැඟිටලා ඇවිල්ලා වගෙයි. ඒ කාලයේ එතුමා මන්ත්‍රීවරෙයක් වශයෙන් සිටියේ නැහැ. නමුත්, එතුමා Greek Bonds ගැන කථා කළේ නැහැ. ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ඉතා පැහැදිලිව ඉතිහාසයට එකතු වුණු ඉතාමත් නරක පූර්වාදර්ශ ගණනාවක් මේ රටේ තිබෙනවා. මට මතකයි, මහ බැංකුව දේශපාලනීකරණය වෙලා කියලා කලින් කථා කළා. හැබැයි මම කියනවා, අජිත් නිවාඩ් කබ්‍රාල් කියන මහ බැංකු අධිපතිවරයා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටියා. [බාධා කිරීමක්] මොන පක්ෂයේ වුණත් කමක් නැහැ. දේශපාලනීකරණය කියලා කියන්නේ යූඑන්පී ද, ශ්‍රී ලංකා ද කියන එක නොවෙයි. එතකොට, පර්පෙචුවල් ට්‍රෙසරීස් ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරිය කවුද? අජිත් නිවාඩ් කබ්‍රාල් මැතිතුමාගේ ආදරණීය සහෝදරිය. ඒ කාලයේ ගනු දෙනු කරන කොට ඒවාට වචනයක්වත් කථා නොකරපු විමල් වීරවංශ මහත්මයලා අද කථා කරන්නේ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, රජයක් හැටියට අපට ලොකු වග කීමක් තිබෙන බව අපි දන්නවා. මොකද, රජය සහ මහ බැංකුව ඇතුළු මුදල් අමාත්‍යාංශය මේ රටේ මුදල් කළමනාකරණය කරන්නට ඕනෑ.

Greek Bondsවලින් ඇති වෙච්ච අවදානම් ගැන අපි කියන්නේ නැහැ. ඒ වාගේම කඩා වැටිච්ච රටක ආයෝජනය කරන කොට,- [බාධා කිරීමක්] මට විනාඩි 9ක කාලයක් තිබෙන්නේ කථා කරන්න. ඒකටත් මෙතුමන්ලා බාධා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාට කථා කරන්න අවස්ථාව මීට පෙර දුන්නා. මෙතුමන්ලාට කථා කරන්න අවස්ථාව දුන්නොත් ඒ වෙලාව මට නැවත ඕනෑ. එහෙම දෙනවා නම් මම ඕනෑ තරම් වෙලා දෙන්නම් කථා කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපේ කාලය දෙන්නම්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔබතුමාගේ කාලය ගන්න වෙන්නේ ඊළඟ ආත්මයේ.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ Greek Bonds තිබිච්ච අවුරුද්දේ තමයි, - ඒක investment portfolio එකේ කොටසක්. වැඩිම ලාභයක්, - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒක point of Order එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා. ඒ ගැන අපට කියන්න ඕනෑ නැහැ. එහෙම නම් හෙජින් ගිවිසුම? මම එතුමාගෙන් ඒ ගැන අහනවා; පුළුවන් නම් උත්තර දෙන්න. හෙජින් ගිවිසුම කොහොමද කළේ? මේ අය හිතුවා ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙයි කියලා. තෙල් මිල වැඩි වෙයි කියලා හිතලා මොකක්ද කළේ? ඒකෙන් වෙච්ච පාඩුව කොච්චරද? ඒකෙන් ඇති වෙච්ච පාඩුව පියවා ගන්න අද පුළුවන්කමක් තිබෙනවා ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොයි ඇමතිතුමා හිටියත් මම අහනවා. තාරක බාලසූරිය මන්ත්‍රීතුමා පුළුවන් නම් කියන්න හෙජින් ගිවිසුමේ පාඩුව කීයද කියලා? ඒකට ඔබතුමන්ලාගේ ආණ්ඩුව වග කියනවාද කියන්න. වවන දෙකෙන් කියන්න. ඔබතුමා පුළුවන් නම් නැඟිටලා කියන්න හෙජින් ගිවිසුමේ පාඩුවට ඔබතුමන්ලාගේ ආණ්ඩුව වගකියනවා ද, නැද්ද කියලා. නැඟිටලා දේශන තියන්න දෙන්න බැහැ. පසුගිය ආණ්ඩුව හෙජින් ගිවිසුමට වගකියන්න ඕනෑ ද, නැද්ද කියලා විතරයි මට දැනගන්න ඕනෑ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාගේ දේශනවලින් නම් වැඩක් නැහැ. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමා නැඟිටලා කියන්න. ගරු මන්ත්‍රීතුමනි, නැඟිටලා දේශන දෙන්න අවශ්‍ය නැහැ. ඔව් ද, නැද්ද කියලා විතරක් කියන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඒ ගැන මගෙන් අහන්න ඕනෑ නැහැ නේ. මෙතුමාට ෆවුසි ඇමතිතුමාගෙන්ම අහන්න පුළුවන් කොයි තරම් අලාභයක් වුණා ද කියලා. ෆවුසි ඇමතිතුමා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේම නේ ඉන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ෆවුසි ඇමතිතුමා ද, කොයි ඇමතිතුමා ද කියලා මට වැඩක් නැහැ. එතකොට ඒ කාලයේ කවුද ජනාධිපති විධියට හිටියේ. කරුණාකරලා මතක තියාගන්න. [බාධා කිරීමක්] විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරපු වෙලාවේ ඔබතුමාගේ කථාවට මම බාධා කළේ නැහැ. විමල් වීරවංශ මැතිතුමාට මම කථා කළේ කථාව අවසානයේදී. ඔබතුමා කථාව හොඳට අහගෙන හිටියේ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා. කථා කරන්න ඉඩ දෙන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා මොන විධියට කිව්වත්, මම එක දෙයක් අහනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් ශිෂ්ට විධියට ඉන්න කෝ.[බාධා කිරීම්] ගාල්ල වාගේ නොවෙයි. [බාධා කිරීම්] ශිෂ්ට විධියට ඉන්න. [බාධා කිරීම්] ගාල්ල නොවෙයි, මුළු ලංකාවේම නැති වුණත් ප්‍රශ්නයක් නැහැ. ඒක මතක තියාගන්න. අපට දිනන්න අවශ්‍ය ඡන්දය අපි දිනනවා. පුළුවන් දෙයක් කරන්න. විමල් වීරවංශ මන්ත්‍රීතුමා විශ්වාස භංගය ගැන කියනවා. මම එතුමන්ලාගෙන් අහනවා, විශ්වාස භංගය ජයග්‍රහණය කරන්න බැරි වුණොත් තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ කියලා. ඉල්ලා අස්වෙනවා ද? මොකක්ද කරන්නේ? ඒකත් කියන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේට නොවෙයි, තමුන්නාන්සේගේ නායකයාටයි මම කිව්වේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON.LUCKY JAYAWARDANA *left the Chair and* THE HON.SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද point of Order එක ගරු මන්ත්‍රීතුමා?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මැතිතුමා මහ ලොකුවට කිව්වා, මෙන්න මේ මේ දේවල් කරනවා කියලා. මම එතුමාගෙන් ඇහුවා, මේ විශ්වාස භංගය අපි පැරැද්දුවොත් ඔබතුමන්ලා මොකක්ද කරන්නේ කියලා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ගේ points of Orderවලට මම අවස්ථාව දෙන්නම්. කථා කිරීමේ අයිතිය මම සියලු දෙනාටම ලබා දෙනවා. හැබැයි, ඔබතුමන්ලා නීත්‍යානුකූලව කථා කරන්න. Points of Order දෙකක් තිබෙනවා. මුලින්ම ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් ඇහුවා විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය නොකළොත් මොකද වෙන්නේ කියලා. විශ්වාස භංගය ජයග්‍රහණය කරන නිසා ඒ ප්‍රශ්නය අදාළ වෙන්නේ නැහැ. හැබැයි, එතුමාට හම්බ වෙච්ච බෑග් එකේ කීයක් තිබුණා ද කියලා මම අහන්න කැමැතියි. මලික් සමරවික්‍රම දුන්න බෑග් එකේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය මෙතැනට අදාළ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. That is not a point of Order. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මේ සභාවට මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා ආවාම ඒ මන්ත්‍රීවරයාට මේ ගරු සභාවේ කථා කිරීමේ අයිතිය තිබෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කථා කිරීමේ අයිතියට තමයි මේ අවස්ථාව දුන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, අපට පේනවා ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන සෑම අවස්ථාවකදීම හතර පස්දෙනෙක් එතුමාව වට කරගෙන කථාවට බාධා කරනවා. ඒක විශාල වැරැද්දක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට ගැටලුවක් තිබුණා. ඇත්තටම මට බාධා කරපු විනාඩි ගණනත් දෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. එහෙම නොවුණොත් එය මට කරන අසාධාරණයක්. මෙතැන දහයක්, පහළොවක් එක්ක තනිවම සටන් කරන මට තවත් විනාඩි 10ක් ඕනෑ, මේ අයට උත්තර දෙන්න. ගරු කථානායකතුමනි, මට තව විනාඩි 10ක් ඕනෑ. [බාධා කිරීම්] මෙතුමන්ලා බොරු විශ්වාස භංග කොළයක් සාක්කුවේ දාගෙන ඉන්නවා. අපට කියලා අත්සන් ගන්න ඒක කෝට් සාක්කුවේ දමාගෙන එන්නේ. [බාධා කිරීම්] ලජ්ජා නැද්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, මෙතුමා වැරැදි තැන ඉඳගෙනයි point of Order එකක් ඉල්ලන්නේ. ඔබතුමා ඔබතුමාගේ seat එකට යන්න. ගරු කථානායකතුමනි, ඕනෑ ඕනෑ විධියට, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Do not disturb him. ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා තමන්ගේ ආසනයේ ඉඳගන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ මෙතුමන්ලා ගනිපු හැටි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කරුණාකර වාඩිවෙන්න. [බාධා කිරීම්] අපේ පාසල් දරුවෝ ගැලරියේ සිට බලාගෙන ඉන්නවා. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. කරුණාකරලා තමන්ගේ ආසනය තිබෙන තැනට ගිහින් ශිෂ්ට විධියට කථා කරන්න. මටත් ලජ්ජයි. මමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියා. ඔහොම කළේ නැහැ. උගත්, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු, හිටපු ඇමතිවරු කථා කරනකොට තමන් ඉන්න ඕනෑ තැන දන්නේ නැහැ. ඉස්සර වෙලා තමන්ගේ තැන හරියට බලාගෙන එතැනට ගිහින් කථා කරන්න කියලා මම එතුමාට කියනවා.

අවසාන වශයෙන් මම කියන්නේ මෙපමණයි, ගරු කථානායකතුමනි. මෙතුමන්ලා මොන විධියට උප්පරවැට්ටි දැම්මත්, මොන විධියට පිඹුරුපත් සකස් කළත්, කන්දක් විළි ලා ලා, විළි ලා ලා අඩු ගණනේ මී පැටියෙක්වත් වදන්න බැරි වෙනවා. අවසානයේ මේ අයට මොකක්ද වෙන්නේ කියන එක අප්‍රේල් 4වැනි දා හැන්දෑවට අපි ඔප්පු කර පෙන්වනවාය කියන කාරණය මතක් කරමින්, ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු අශෝක් අබේසිංහ මහතා.

[අ.භා. 5.44]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හරියට වැස්සක් වැහැලා පෑව්වා වාගේ, බාධා කිරීම් රැසකින් පසුවයි මට කථා කරන්න ලැබුණේ.

අද අපි සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත සහ තවත් නියමයන් කිහිපයක් හා තීරණයක් පිළිබඳව තමයි කථා කරන්නේ. නමුත් ඒ දේවල් ගැන කථා කරනවාට වඩා, වෙනත් වෙනත් මාතෘකා ගැන තමයි මෙතැන සාකච්ඡා වුණේ. කෙසේ වෙතත්, ගරු මුදල් ඇමතිතුමාගේ 2017 අය වැය කථාවේ 364වැනි යෝජනාව වශයෙන් තිබුණේ මේ රටේ ණය කළමනාකරණය කිරීම සඳහා ණය කාර්යාංශයක් පිහිටුවිය යුතුය යන්නයි. එම ණය කාර්යාංශය පිහිටුවන අවස්ථාවේ මේ සක්‍රීය බැරකම්, ඒ කියන්නේ අපේ රටේ තිබෙන විශාල ණය ප්‍රමාණය ගෙවීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න මෙම සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත මඟින් විධිවිධාන සලසා තිබෙනවා.

අපි 1948දී නිදහස ලබාගත්තාට පසුව, 1950දී පළමුවැනි ණය වාරිකය ගන්නකොට අපේ රටේ තිබුණු සමස්ත ණය ප්‍රමාණය රුපියල් මිලියන 650යි. ඒ කියන්නේ, කෝටි 65යි. නමුත් ඉන් අවුරුදු 55කට පසුව -2005 වන විට- අපේ රටේ නොගෙවූ ණය ප්‍රමාණය රුපියල් කෝටි 222,000ක් -බිලියන 2,222ක්- වෙලා තිබුණා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දළ දේශීය නිෂ්පාදිතයත් කොපමණකින් වැඩි වුණාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඔව්, දළ දේශීය නිෂ්පාදිතය වැඩි වෙලා තිබෙනවා. ඒක මම කියන්නම්, ගරු මන්ත්‍රීතුමනි. 1950දී රුපියල් මිලියන 650ක් -කෝටි 65ක්- ලෙස තිබුණු අපේ ණය ප්‍රමාණය 2005 වසර වෙද්දි රුපියල් බිලියන 2,222ක් -කෝටි 222,000ක්- බවට පත් වුණා. අපි 2015දී ආණ්ඩුව භාර ගන්නකොට; 2015 වසර අවසාන වන විට අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 8,500ක් හෙවත් කෝටි 850,000කට ආසන්න වුණා. මෙවැනි විශාල ණය කන්දරාවකට ගිහින්, බිලියන 10,000කට වැඩි ණය ප්‍රමාණයක් මේ වෙනකොට අපිට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අපේ රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සමගාමීව අරගෙන බලනකොට මේ ණය ප්‍රමාණය සියයට 80ක් වුණත්, එම තත්ත්වය සාමාන්‍යයෙන් ලෝකයේ රටවල් සමඟ සංසන්දනය කළාම අපි දකින්නේ මොකක්ද? ජපානයේ ණය ප්‍රමාණය එම රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 239ක් වෙලා තිබෙනවා. ජර්මනියේ එම ප්‍රමාණය සියයට 180ට වඩා තිබෙනවා. නමුත් ඒ රටවලට ණය ගෙවන්න පුළුවන්. මොකද, ඒ රටවල ඒ ණය වාරිකය, පොලිය රාජ්‍ය ආදායමින් සියයට 20ක්, 25ක් වාගෙයි. නමුත් අපේ රටේ ණය වාරිකය සහ පොලිය රාජ්‍ය ආදායමින් බැලුවාම, එය සියයට 95ක්, සියයට 100ක්ම වෙනවා. අපේ රාජ්‍ය ආදායමට සමාන මුදලක් තමයි අපේ ණය වාරික සහ පොලිය ලෙස තිබෙන්නේ. මේ නිසා තමයි ණය ගෙවීමේදී යම්කිසි ක්‍රමවේදයකට යන්න අපිට සිද්ධ වෙලා තිබෙන්නේ. අතීතයේ අපේ රට විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතනවලින් සහනදායී පොලී ක්‍රමයට, දීර්ඝ කාලීන ණය -අවුරුදු 25, 30, 35, 40 ආදී වශයෙන්- තමයි ලබාගත්තේ. නමුත් පසුගිය කාලයේ -2005න් පසුව- මේ රට ශීඝ්‍ර වශයෙන් වාණිජ ණය ලබාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වසර කීපය තුළ විශාල ණය කන්දරාවක් ගෙවන්න අපිට සිද්ධ වෙලා තිබෙනවා. 2016-2017 සිට 2022 දක්වා වූ වසර හතර පහ තුළ ඩොලර් බිලියන 6කට වැඩි ප්‍රමාණයක් -කෝටි 110,000කට ආසන්න මුදල් ප්‍රමාණයක්- විදේශීය ණය වශයෙන් පමණක් අපිට ගෙවන්න තිබෙනවා. මේ ණය ගත්තාට පසුව ඒ ණය නොගෙවා ඉන්න අපිට යම්කිසි සහනදායී කාලයක් තිබෙනවා. ඒ සහනදායී කාලයෙන් -වසර හත අටකට- පසුව දැනට 2017 සිට 2022 දක්වා කාලයට කෝටි 110,000කට ආසන්න විදේශ ණය ප්‍රමාණයක් අපිට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු අපි බලාපොරොත්තු වන්නේ, ලෝකයේ අඩු පොලී අනුපාතයක් පවතින අවස්ථාවක ඒ විදේශ ණය ලබාගෙන, ඒ ණය අපි බැංකුවක ගිණුමක් ලෙස පවත්වාගෙන යමින්, ඉදිරියේදී එම මුදලින් මේ ණය සහ වාරික ගෙවන්නයි.

පාර්ලිමේන්තුව විසර්ජන පනත මඟින් සෑම වසරකම අවශ්‍ය ණය ප්‍රමාණය අනුමත කර ගන්නවා. සෑම වසරකම ඒ අවශ්‍ය ණය ප්‍රමාණය අනුමත කර ගත්තාම අපිට ඒ අනුමත කරන ණය ප්‍රමාණය ඉක්මවා ණය ගන්න බැහැ. සෑම වසරකම අපි ණය අරගෙන තිබෙන්නේ එලෙස අනුමත කර ගත්තාට වඩා අඩු ණය ප්‍රමාණයක්. සමහර අවුරුදුවල අනුමත කර ගත් ණය ප්‍රමාණය අරගෙන නැහැ. ඉදිරි වර්ෂයක් සඳහා අනුමත කර ගත් ණය ප්‍රමාණයට වඩා සියයට 10ක ණය ප්‍රමාණයක් ලබා ගන්න අපි මෙම පනත් කෙටුම්පත තුළින් බලාපොරොත්තු වනවා. ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි මේ කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කළා. බන්දුල ගුණවර්ධන මැතිතුමාත් එතැන හිටියා. එතුමා ඉතාම සක්‍රීය ලෙස ඊට දායක වුණා. අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා ඒ කාරණය පිළිබඳව හොඳට පැහැදිලි කළා. අමාත්‍යාංශ නිලධාරීන් ඒ කාරණා හොඳට පැහැදිලි කළා. ඒ අවස්ථාවේදී එතුමන්ලා කිව්වා, "මේ පනත් කෙටුම්පත හොඳයි. නමුත් යම් යම් සංශෝධන ගෙනෙන්න ඕනෑ." කියලා. ඒ අනුව එතුමන්ලා අද ඉදිරිපත් කරන්න සංශෝධන කීපයකුත් ගෙනැල්ලා තිබෙනවා. මම හිතන්නේ සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත අද සම්මත කර ගන්න පුළුවන් වේවි. එලෙස සංශෝධන සහිතව මෙම පනත් කෙටුම්පත සම්මත කර ගන්නට විශේෂයෙන්ම විපක්ෂය සහයෝගය ලබා දෙයි කියලා මම හිතනවා. මොකද, මේ රට ඉදිරියේදී ගෙවන්න තිබෙන අධික ණය ප්‍රමාණය ගෙවීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම සකස් කළ යුතුයි. මුදල් ඇමතිවරයා අය වැයේදී ඉදිරිපත් කළ ආකාරයට අනිවාර්යයෙන්ම ණය කාර්යාංශයක් පිහිටුවිය යුතුයි. අඩු පොලියට ණය ලබාගෙන එම ණය ගෙවන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් ඉදිරියේදී සකස් කරන්න තමයි අපි තීරණය කරලා තිබෙන්නේ. මෙම සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත තුළින් මේ රටේ ණය හරියට කළමනාකරණය කරලා, ඉදිරියේදී ප්‍රශ්නයක් ඇති නොවන විධියට ණය ගෙවන්න පුළුවන් වේවි කියලා විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වනවා.

අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආදායම පසුගිය කාලයේ එන්න එන්න අඩු වුණා. නමුත් අපේ රජය පැමිණියාට පසු අපි ඒ ආදායම ශීඝ්‍රයෙන් වැඩි කරගෙන යනවා. මේ රට නිදහස ලබා ගත්තාට පස්සේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 1979 වසරේ තමයි ආදායම වැඩියෙන්ම තිබුණේ. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 29ක් වුණු ආදායම 1980 ගණන්වලදී අඩුවෙලා, 2000 වෙද්දි ඒ ප්‍රමාණය සියයට 10, සියයට 11 දක්වා අඩුවෙලා තිබුණා. 2014 වසර වෙද්දි දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආදායම සියයට 10.6, සියයට 10.7 දක්වා අඩුවෙලා තිබුණා. නමුත් දැන් ඒ ප්‍රමාණය සියයට 14 දක්වා වැඩිවෙලා තිබෙනවා. යම්කිසි ක්‍රමවේදයකට අනුව බදු අය කිරීම තුළින් මේ රටේ ආදායම් වැඩි කරලා තිබෙනවා. නමුත් අපේ ආදායමින් සියයට 95ක්, සියයට 98ත්, 100ත් අතර ප්‍රමාණයක් ණය ගෙවීම සඳහා වියදම් වන තත්ත්වයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අශෝක් අබේසිංහ)
(The Hon. Ashok Abeysinghe)
ඒ නිසා අපි මේ පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. 2018 වසර වෙද්දි අපේ රටේ ආදායම කෝටි ලක්ෂ 2ක් - බිලියන 2,000ක්- කියලා තමයි ඇස්තමේන්තුවල තිබෙන්නේ. නමුත් බිලියන 4,100ක වියදමක් අපිට තිබෙනවා. අපේ ණය වාරිකය සහ පොලිය පමණක් 2018 වසරේ කෝටි 195,000ක්. 2018 වසර සඳහා බිලියන 1,950ක ණය වාරික සහ පොලියක් අපිට ගෙවන්න තිබෙනවා. අපේ මන්ත්‍රීවරුන්ට සහ රටවැසියන්ට දැන ගන්න පුළුවන් වන විධියට 2003ට ඉස්සෙල්ලා විසර්ජන පනතේ කොතැනකවත් ණය වාරික සහ පොලිය කීයද කියලා සඳහන් වුණේ නැහැ. නමුත් හර්ෂ ද සිල්වා මැතිතුමා වැනි අය උසාවි ගිහිල්ලා, උසාවි නියෝගයක් මඟින් එය විසර්ජන පනතට ඇතුළත් කරලා තිබෙනවා. ඒ අනුව මේ වසරේ අපේ ණය වාරිකය කෝටි 115,000ක් වනවා; ණය පොලිය කෝටි 80,000ක් වනවා. කෝටි 195,000ක් ණය වාරික සහ පොලිය වෙනුවෙන් 2018 වසරට ගෙවන්න ඕනෑ. කෝටි 200,000ක ආදායමක් තමයි තිබෙන්නේ. කෝටි 200,000ක ආදායමක් තිබිලා කෝටි 195,000ක ණය වාරිකයක් අපි ගෙවන්නේ කොහොමද? මෙවන් තත්ත්වයක් තිබෙන රටකට සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීම සඳහා මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම ඉතාම කාලෝචිතයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අවසාන කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අශෝක් අබේසිංහ)
(The Hon. Ashok Abeysinghe)
විපක්ෂයේ මන්ත්‍රීවරු රජයත් සමඟ එකතුවෙලා මේ පනත් කෙටුම්පත සංශෝධන සහිතව ඒකච්ඡන්දයෙන් සම්මත කිරීමට සහයෝගය ලබා දෙයි කියලා මම හිතනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, අග්‍රවිනිශ්චයකාර වරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය අපි අනුමත කළා.

ඊළඟට, සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත, දෙවැනිවර කියවීම - සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Aye.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
අපේ සංශෝධන පිළිගන්නවා නම් විතරයි අප එකඟ වන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගල සමරවීර)
(The Hon. Mangala Samaraweera)
සංශෝධන පිළිගන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එම සංශෝධන පිළිගන්නේ නැද්ද?

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගල සමරවීර)
(The Hon. Mangala Samaraweera)
නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
අපි බෙදීමක් ඉල්ලා සිටිනවා. Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-
පිරිවුමණි ඔලිත්තු ඉය්න්ත පින්-
At the conclusion of the division bell-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ආසනවල වාඩිවෙන්න. දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව. කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකුට ඡන්දය දීමේ අපහසුතාවක් තිබෙනවා නම්, කරුණාකර අප දැනුවත් කරන්න. ඡන්දය දීමේ අපහසුතාවක් තිබෙනවා නම්, කරුණාකර අත ඔසවන්න. Voting is in progress.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විජේතුංග මන්ත්‍රීතුමාගේ ආසනයේ ඇති උපකරණය වැඩ කරන්නේ නැහැ.

හොඳයි. දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය අවසානයි. ඡන්දය ප්‍රකාශ කිරීමට අපහසු වුණු ගරු මන්ත්‍රීවරුන් ඉන්නවාද?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - State Minister of National Integration and Reconciliation)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඒ.එච්.එම්. ෆවුසි රාජ්‍ය අමාත්‍යතුමා, පක්ෂවද, විපක්ෂවද ඡන්දය ප්‍රකාශ කරන්නේ?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඡන්දය ප්‍රකාශ කරන්න අපහසු වුණු තවත් මන්ත්‍රීවරුන් ඉන්නවාද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මෙම උපකරණය වැඩ කරන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I cannot allow you after the voting time is over. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පැමිණියේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාවට පසුව නම්, දැන් අවස්ථාව ලබා දෙන්න බැහැ. [බාධා කිරීම්]

ඒ ගැන බලන්න. Serjeant-at-arms, එතුමා පැමිණියේ පසුවද කියන එක ගැන මා දැනුවත් කරන්න. එතුමා පැමිණියේ ඡන්දය ප්‍රකාශ කිරීමට ලබා දුන් කාලය නැවැත්වූවාට පසුව නම්, දැන් අවස්ථාව ලබා දෙන්න බැහැ. [බාධා කිරීම්] අපි ඒ ගැන බලන්නම්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, "ඡන්දය ප්‍රකාශ කරන කාලය අවසානයි" කිව්වාට පසුවයි, එතුමා පැමිණියේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ ගැන බලන්නම්.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, දැන් ඔබතුමන්ලාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය අවසානයි. දැන් ඡන්ද ප්‍රතිඵල ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය වෙයි.

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද ව්‍යවස්ථාව අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 50: විරුද්ධව 32: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 50; எதிராக 32; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 50: Noes 32: Abstain 0.

G 002. S.B. Dissanayake	Yes
G 005. John Amaratunga	Yes
G 006. Lakshman Kiriella	Yes
G 009. Gayantha Karunatileka	Yes
G 019. Anura Priyadharshana Yapa	Yes
G 025. Wajira Abeywardana	Yes
G 034. P. Harrison	Yes
G 035. R.M. Ranjith Madduma Bandara	Yes
G 036. Arjuna Ranatunga	Yes
G 045. Dayasiri Jayasekara	Yes
G 049. Ravindra Samaraweera	Yes
G 059. Niroshan Perera	Yes
G 060. Ruwan Wijayawardene	Yes
G 062. Mohan Lal Grero	Yes
G 067.Wasantha Aluwihare	Yes
G 069. Eran Wickramaratne	Yes
G 071. Harsha De Silva	Yes
G 072. Ajith P. Perera	Yes
G 077. Lasantha Alagiyawanna	Yes
G 079. Faizal Cassim	Yes
G 085. Ashok Abeysinghe	Yes
G 088. Karunarathna Paranawithana	Yes
G 093. J.C. Alawathuwala	Yes
G 095. Lucky Jayawardana	Yes
G 096. Vadivel Suresh	Yes
G 099. Ananda Kumarasiri	Yes
G 103. Sirinal de Mel	Yes

G 104. Anura Sidney Jayarathne	Yes
G 105. K.K. Piyadasa	Yes
G 106. Lakshman Ananda Wijemanne	Yes
G 107. A.A. Wijethunga	Yes
G 108. Ravi Karunanayake	Yes
G 110. Ajith Mannapperuma	Yes
G 112. Hector Appuhamy	Yes
G 114. Thushara Indunil Amarasena	Yes
O 013. Dinesh Gunawardana	No
O 014. Salinda Dissanayake	No
O 015. Bandula Gunawardana	No
O 016. Janaka Bandara Tennakoon	No
O 018. Wimal Weerawansa	No
O 019. Vasudeva Nanayakkara	No
O 020. Gamini Lokuge	No
O 021. Selvam Adaikkalanathan	Yes
O 029. Mahinda Yapa Abeywardena	No
O 031. Kumara Welgama	No
O 035. S.M. Chandrasena	No
O 036. Mahindananda Aluthgamage	No
O 038. Rohitha Abeygunawardana	No
O 041. Bimal Rathnayake	No
O 042. Nalinda Jayathissa	No
O 050. Duleep Wijesekara	No
O 051. S.C. Mutukumarana	No
O 054. Wimalaweera Dissanayaka	No
O 055. Jayantha Samaraweera	No
O 056. P. Udayashantha Gunasekara	No
O 062. Velu Kumar	Yes
O 065. Kavinda Heshan Jayawardana	Yes
O 066. Mylvaganam Thilakarajah	Yes
O 073. Janaka Wakkumbura	No
O 074. Vidura Wickramanayaka	No
O 076. Shehan Semasinghe	No
O 077. Kanaka Herath	No
O 079. D.V. Chanaka	No
O 080. Sisira Jayakody	No
O 081. Sujith Sanjaya Perera	Yes
O 083. Bandula Lal Bandarigoda	Yes
O 086. Imran Maharoof	Yes
O 087. Ashu Marasinghe	Yes
O 090. Piyal Nishantha De Silva	No
O 091. Sanath Nishantha Perera	No
O 092. S. Premarathna	No
O 093. Tharaka Balasuriya	No
O 096. Prasanna Ranaweera	No
O 098. Kanchana Wijesekara	No
O 099. Indika Anuruddha Herath	No
O 101. Mujibur Rahuman	Yes
O 103. Jayampathy Wickramaratne	Yes
O 104. Thusitha Wijemanna	Yes
O 105. Rohini Kumari Wijerathna	Yes
O 106. Chaminda Wijesiri	Yes
O 108. Sandith Samarasinghe	Yes
O 110. Wijepala Hettiarachchi	Yes

Electronic Voting Result

YES	50
NO	32
ABSTAIN	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනාවට පක්ෂව ඡන්ද 51යි; විරුද්ධව 33යි. මීළඟට කාරක සභා අවස්ථාව.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු මංගල සමරවීර මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக"- [மாண்புமிகு மங்கள சமரவீர]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)
வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்.)
CLAUSE 1.- (*Short title and date of operation.*)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'1.මේ පනත 2018 අංක දරන සක්‍රීය වගකීම් කළමනාකරණය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1, as amended, ordered to stand part of the Bill.

2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ණය ලබා ගැනීම.)

வாசகம் 3.- (பொதுத் தனிசை முகாமை செய்யும் நோக்கத்துக்காகக் கடன்களைத் திரட்டுதல்.)

CLAUSE 3.- (*Raising loans for the purpose of management of public debt.*)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 12 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'3. පාර්ලිමේන්තුව විසින්, යම් නිශ්චිත මුදල් වර්ෂයක් තුළ දී, කලින් කලට, ආණ්ඩුවේ රාජ්‍ය ණය, ප්‍රතිමූල්‍යනය කිරීමේ සහ පූර්ව මූල්‍යනය කිරීමේ කාර්ය සඳහා, ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ, (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ හෝ 1957 අංක 29 දරන විදේශීය ණය පනතේ විධිවිධාන ඇතුළුව මුදල් එකතු කර ගැනීම සඳහා අදාළ වන නීති ප්‍රකාරව, එම මුදල් වර්ෂයට ඉහතින් වූ මුදල් වර්ෂයේ අවසානයට ගෙවීමට ඉතිරිව ඇති සමස්ත ණයෙන් සියයට දහයක් නොඉක්ම විය යුතු මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින් හෝ ණය මුදලක් ලෙස එකතු කර ගැනීම සඳහා යෝජනා සම්මතයක් මඟින් අනුමතය ලබා දෙනු ලැබිය හැකි ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු සභාපතිතුමනි, ගරු එස්.බී.දිසානායක මැතිතුමා මේ ගරු සභාවේ හිටියේ නැහැ. නමුත් මේ ලේඛනයේ එස්.බී. දිසානායක මැතිතුමාගේ නම ඉදිරියේ "YES" කියලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

එහෙම කොහොමද වෙන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එස්.බී. දිසානායක මැතිතුමා සභාවේ නැහැ. ගරු කථානායකතුමනි, එය replay කරන්න. එතුමාගේ නම පළමුවෙන්ම තිබෙන්නේ. ඒකට "YES" කියලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

හොර ඡන්ද දාන්න හදනවා. [සෝෂා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ඔබතුමන්ලා පොඩ්ඩක් වාඩි වෙන්න. මේ ගැන මම හොයා බලන්නම්. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

ලජ්ජයි. ලජ්ජයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

සභාවෙත් නැති එස්.බී. දිසානායක මහත්තයාගේ නමට "YES" වැටිලා. හොර ඡන්ද. [සෝෂා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ඉන්න. මම හොයලා බලන්නම්. ඔබතුමන්ලා වාඩිවෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු සභාපතිතුමනි, මංගල සමරවීර අමාත්‍යතුමාගේ නම මෙම ලැයිස්තුවේ නැහැ. එතුමාගේ නමට එස්.බී.දිසානායක මැතිතුමාගේ නම තමයි සටහන් වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මංගල සමරවීර මැතිතුමාගේ නම මෙම ලැයිස්තුවේ නැහැ. ඒ වෙනුවට එස්.බී.දිසානායක මැතිතුමාගේ නම තමයි සටහන් වෙලා තිබෙන්නේ. [සෝෂා කිරීම්] මංගල සමරවීර මැතිතුමාගේ නම නැහැ. ඒක මම හොයලා බලන්නම්. ඔබතුමන්ලා වාඩි වෙන්න.

[මේ අවස්ථාමේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ සෝෂා කරන්නට වූහ.]

[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]

[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මමයි කෑ ගහන්න ඕනෑ. මගේ නම නැහැ. [ඝෝෂා කිරීම්] මමයි කෑ ගහන්න ඕනෑ, මගේ ඡන්දය නැති නිසා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එහෙමනම් නැවතත් අපි ඡන්දය ගනිමු. [ඝෝෂා කිරීම්] නැවතත් ගණන් කරමු. පාර්ලිමේන්තුව නැවත රැස්වෙයි.

ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.
அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.
Accordingly, Parliament resumed.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මගේ නම නැහැ. මම දාපු ඡන්දය නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම කරුණාකරලා වාඩි වෙන්න. අපි ඡන්දය නැවත ගණන් කරමු. ලේඛනයේ සහ ගර්භයේ නැති මන්ත්‍රීවරයෙකුගේ නම තිබෙනවා; ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරයෙකුගේ නම නැහැ. අපි ඒක හොයලා බලන්නම්. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීවරුන් වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. අපි ඡන්දය නැවත row by row ගන්නවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි. ලජ්ජයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please ring the Division Bell.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි. ලජ්ජයි. [ඝෝෂා කිරීම්] කවුද මේවාට වග කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හොයලා බලන්නම්. එක මන්ත්‍රීවරයෙකුගේ නමක් වෙනුවට තවත් මන්ත්‍රීවරයෙකුගේ නමක් තිබෙනවා. Balance වෙලා තිබෙනවා. අපි හොයලා බලන්නම්. හොර කිරීමක් නොවෙයි, ඒක technical error එකක්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එස්.බී. දිසානායක ඇමතිතුමාගේ ඇඟිල්ල සලකුණු වුණේ කොහොමද? තව කියක් වෙලාද? නැති කී දෙනෙකුගේ ඇඟිල්ල සලකුණු වෙලා ඇද්ද? ඒ ඇඟිලි කාගේද? කොහොමද එස්.බී. දිසානායක ඇමතිවරයාගේ ඇඟිල්ල සලකුණු වුණේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන් කරුණාකරලා වාඩි වෙන්න. කැමැති නම් අපට ඡන්දය row by row ගන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඒ ඇඟිල්ල සලකුණු වුණේ කෙහොමද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරයකුගේ ඇඟිල්ල සලකුණු වෙලා තිබෙනවා; තව කෙනෙකුගේ නැහැ. ඡන්ද ගණන balance වෙලා තිබෙන්නේ. ඒක ඔබතුමන්ලා තේරුම් ගන්න. වෙලා තිබෙන්නේ, technical error එකක්. මම ඒ ගැන හොයලා බලන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කාගෙද ඒ ඇඟිල්ල?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එස්.බී. ගේ ඇඟිල්ල.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. මේක නාඩගමක් කරන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කාගෙද ඒ ඇඟිල්ල?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එස්.බී. ගේ ඇඟිල්ල.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කවුද තිබ්බේ ඇඟිල්ල?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එස්.බී.ගේ ඇඟිල්ල.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාවේ කාලය දිග් කර ගැනීමට අවශ්‍යයි. ඒ සඳහා අනුමැතිය.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will have a Party Leaders' Meeting. ඒ සඳහා සභාවේ කටයුතු මිනිත්තු 10කට අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 6.35ට නැවත පවත්වන ලදී.
අතන්පටි අමාර්ගු இடைநிறுத்தப்பட்டு, பி.ப. 06.35 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 06.35 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු මන්ත්‍රීවරුනි, අද දින සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවා ඊට අදාළ ඡන්දය ප්‍රකාශයට පත් කිරීමේදී සිදු වූ තාක්ෂණික දෝෂය හේතුකොටගෙන එම ඡන්ද විමසීම අවලංගු විය යුතු බව මම මේ ගරු සභාවට දන්වනු කැමැත්තෙමි. ඒ අනුව එම ඡන්ද විමසීම නැවතත් අද දිනයේම පැවැත්වීම සඳහා යොදා ගැනීමට ගරු සභානායකතුමා විසින් පාර්ලිමේන්තුවට යෝජනා සම්මතියක් ඉදිරිපත් කළ යුතු බවද ප්‍රකාශ කරමි.

ගරු මන්ත්‍රීවරුනි, මම සොයා බැලූවිට දැන ගන්නට ලැබුණේ, ඡන්දය ප්‍රකාශ කිරීමේදී එක ළඟ තිබුණු ආසන දෙකක නම් mix up වෙලා තිබෙන බවයි. එය technical දෝෂයක් මිස, සිතාමතා සිදු නොකළ දෙයක් බවත් මම මේ අවස්ථාවේදී ගරු සභාවට දන්වා සිටිනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමා කියනවා, "තාක්ෂණික දෝෂයක් සිදු වෙලා තිබෙනවාය" කියලා. තාක්ෂණික දෝෂයක් සිදු වෙලා තිබෙද්දී අපි කොහොමද නැවත ඡන්දය පාවිච්චි කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නිසා තමයි අත ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අත ඔසවා ඡන්දය දීලාත් වැරදියටත් ගණුන් කරපු ඉතිහාසයක් මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, පරණ ක්‍රමයට ඡන්දය ගන්න යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "අද දින සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සම්මත කිරීම සඳහා වූ ඡන්ද විමසීම තාක්ෂණික දෝෂය නිසා අවලංගු වීම පදනම් කරගෙන එහි දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම නැවත වතාවක් පැවැත්විය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරයෙකුගේ එක point of Order එකට අවස්ථාව දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා අපි නැවත ඡන්දය විමසනවා. සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමට අපි ඡන්දය ගන්නවා. We will go ahead.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අපි මානසිකව වැටිලා ඉන්නේ. මේක හොර ගුහාවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වැරැද්ද නිවැරදි කරනවා. බය වෙන්න එපා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට වඩා මානසිකව වැටිලා ඉන්නේ මමයි, මගේ නම හොරකම් කළේ කවුද කියලා. ඔබතුමන්ලාට වඩා මමයි මානසික පීඩාවට පත් වෙලා ඉන්නේ.

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු සභා ගැබෙන් පිටව ගියහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாபீடத்தி லிருந்து வெளியேறினர்.]
[At this stage, some Members of the Opposition left the Chamber.]

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව ගරු කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විනා විඩුක්කප්පට්ටது.
குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என மாண்புமிகு சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.

Question put.
THE HON. SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 53: විරුද්ධව 02 යනුවෙන් බෙදුණේය.

பாராளுமன்றம் 43 ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 53; எதிராக 02.

The Parliament divided under Standing Order No. 43: Ayes 53; Noes 02.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி சட்டமூலம், இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු මංගල සමරවීර මහතා]

තීරමානික්කප්පට්ටது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு மங்கள சமரவீர]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)
வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்.)
CLAUSE 1.- (*Short title and date of operation.*)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'1. මේ පනත 2018 අංක දරන සක්‍රීය වගකීම් කළමනාකරණය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, SAITM එකට ඇතුළත් වෙන්න අවශ්‍ය අවම සුදුසුකම "S' සාමාර්ථ තුනක්ද, එහෙම නැත්නම් විෂයයන් දෙකක් ෆේල් වෙලා "S" සාමාර්ථයක් විතරක් වුණත් ප්‍රමාණවත්ද කියන එක මගෙන් අහන්න එපා. ඒ සම්බන්ධයෙන් ඉස්සර හිටපු උසස් අධ්‍යාපන ඇමතිවරුන්ගෙන් අහන්න. ඒවා SAITM එක පටන් ගන්නකොට ඒ කාලයේදී හදපු නිර්ණායක. ඒක දැන් මගෙන් ඇහුවාට, මා තවම ඒකට අත ගැහුවේ නැහැ. පසුගිය ආණ්ඩුව SAITM එක පටන් ගන්නකොට "ෆේල්" වුණු අයත් ඇතුළත් කර ගත්තා. එයට ඇමතිවරුන්ගේ දරුවනුත්, මන්ත්‍රීවරුන්ගේ දරුවනුත් ඇතුළත් කර ගත්තා. දැන් ඒ ගොල්ලෝම තමයි උද්ඝෝෂණ කරන්නේ. නමුත් මේ ක්‍රමවේදය තුළ දුෂ්කර පළාත්වල වුණත් වෛද්‍ය පීඨයට තිබෙන ඉල්ලුම වැඩියි. මා හිතන විධියට තවත් අවස්ථා ඇති වෙන්න ඕනෑ. සමහර විට අම්පාර දිස්ත්‍රික්කයේ "A" සාමාර්ථයක්, "B" සාමාර්ථයක් හා "C" සාමාර්ථයක් ලබාගත් ඉතා දක්ෂ දරුවෙකුට වුණත් විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබෙන්න පුළුවන්.

ඒ දරුවන්ට වෙනත් විකල්ප තිබෙන්නත් ඕනෑ. මේක සංකීර්ණ දෙයක්. මා ලැහැස්තියි, ඔබතුමන්ලාත් එක්ක මේ ගැන සාකච්ඡා කරන්න. විශ්වවිද්‍යාල කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කරලා දැනට තිබෙන Z-score ක්‍රමවේදය තුළ දුෂ්කර පළාත්වල සහ අනෙක් පළාත්වල තිබෙන ගැටලු සසඳා බලා වෙනස්කම් කිරීම සඳහා ඔබතුමා හොඳ යෝජනා ඉදිරිපත් කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් පාරේ රිය අනතුරක් වුණාම, කිසිවක් නොදන්නා මිනිසුන් වුණත් අනතුරට ලක් වූ පුද්ගලයාට ප්‍රථමාධාර දීලා මිනිස් ජීවිත බේරා ගන්න උත්සාහ කරන බව ඔබතුමා දන්නවා. හැබැයි ඒ ප්‍රථමාධාර දෙන පුද්ගලයා වෛද්‍යවරයකු කරලා අපි කවුරුවත් ඔහුගෙන් බෙහෙත් ගන්න යන්නේ නැහැ නේ. ඒ වාගේම නඩුවකට ගියත් ගොඩ පෙරකදෝරුවන්ගෙන් උපදෙස් ගන්නේ නැහැ.

අධ්‍යාපනයෙන් ඉහළ සාමාර්ථ ලබන දරුවන් සිටියදී, ඉතාම අඩු සුදුසුකම් ලබන අයට වෛද්‍යවරයකු වෙන්න අවස්ථාවක් හදන්න තමයි මේ උත්සාහ කරන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගෙන් ඇහුවා නම්, එතුමා පිළිතුරු දෙයි. මොකද, මේ කියපු කරුණු පසුගිය ආණ්ඩුවේ අයට විතරක් නොවෙයි, එතුමාටත් අදාළයි. එතුමාත් "S" සාමර්ථ 3 අවම සුදුසුකම කරන්න විශාල වශයෙන් දත කාපු කෙනෙක්. මේ දරුවන්ගේ සුදුසුකම් පිළිබඳව සලකා බලා, උසස් ප්‍රතිඵල ලබා ගන්නා දරුවන්ට මේ අවස්ථාව ලබා දීම සඳහා සාධාරණ නිර්ණායකයක් හදන්න කියලායි අපි යෝජනා කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. එතුමා ඒ ගැන කථා කරනවාය කියලා කිව්වා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළ නිසා මා මේ කාරණය මතක් කරන්න කැමැතියි. බ්‍රිතාන්‍යයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නත් අවම සුදුසුකම වෙන්නේ "S" සාමර්ථ 3යි. කිසිම දෙයක් දන්නේ නැතිව ප්‍රශ්න අහනවා. බ්‍රිතාන්‍යයේ ඕනෑම විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවම සුදුසුකම "S" සාමර්ථ 3යි. "A" සාමර්ථ 2ක් සහ "B" සාමර්ථ 1ක් ලබා ගත්ත ළමයිනුත් ඇතුළත් කර ගන්නවා. But, the minimum qualification is three "S" passes.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමා වැඩිදුරටත් පිළිතුරු දෙනවාද?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්, ගරු කථානායකතුමනි.

ළමයෙක් "A" සාමර්ථ 3ක් ගත්තේ නැහැ, "S" සාමර්ථ 3ක් ගත්තාය කියලා කිව්වාම ඒ ළමයාගේ බුද්ධිය අඩුයි කියලා සලකන එක වැරදියි. අපි ළමයින්ව එහෙම හැල්ලු කරන්න ඕනෑ නැහැ.

අපොස සාමාන්‍ය පෙළ, උසස් පෙළ සමත් සමහර අයත් අද සාර්ථකව සමාජයේ ලොකු තැන්වලට ගිහිල්ලා තිබෙනවා. අපි මේ සඳහා ක්‍රමවේදයක් හදන්නේ අපට තිබෙන ඒ ඉඩ පාඩු සීමාව නිසා නේ. එහෙම නැතිව ඕනෑ තරම් ඉඩ පාඩු තිබෙනවා නම්, සුදුසුකම් තිබෙන, දක්ෂකම් තිබෙන හැම කෙනෙකුටම කොහේ හෝ ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන්. උසස් පෙළ විභාගයෙන් "S" සාමාර්ථ තුනක් ගත් අය විදේශ රටවලදී වෛද්‍ය උපාධිය ලබාගෙන ලංකාවට ඇවිල්ලා ලංකාවේ හොඳම වෛද්‍යවරු හැටියට අද වැඩ කරනවා. එතකොට අපි ඒක සසඳන්නේ කොහොමද? මේ සම්බන්ධයෙන් ලකුණුවලින්ම බලන්න අමාරුයි. නමුත් රජය විධියට අපට මේ සඳහා යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. එම නිසා අපි ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කරලා තිබෙනවා.

මීතොටමුල්ල කුණු කන්දේ ඛේදවාචකය : හානියට පත් වූවන්ට වන්දි

மீதொட்டமுல்ல குப்பை மேடு அனர்த்தம்: பாதிக்கப்பட்டோருக்கு நஷ்டஈடு

MEETIOTAMULLA GARBAGE DUMP DISASTER: COMPENSATION FOR VICTIMS

2184/'17

7. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2017 වර්ෂයේදී මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීමෙන්;

(i) මිය ගිය සංඛ්‍යාව;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව;

(iii) විපතට පත්වූවන්ට රජය විසින් ගෙවූ මුළු වන්දි මුදල;

(iv) මිය ගිය පුද්ගලයෙකු වෙනුවෙන් ගෙවූ වන්දි මුදල;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවූ උපරිම සහ අවම වන්දි මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අවතැන් වූ සියලු දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(ii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

අනර්ත්ත මුකාමෙත්තුව අමෙච්චරෛක් කේට්ට වින්නා:

(அ) 2017ஆம் ஆண்டு மீதொட்டமுல்ல குப்பை மேடு சரிந்துவீழ்ந்ததனால்,

(i) உயிரிழந்தவர்களின் எண்ணிக்கை;

(ii) அங்கவீனமுற்றோரின் எண்ணிக்கை;

(iii) பாதிக்கப்பட்டவர்களுக்கு அரசாங்கத்தினால் செலுத்தப்பட்ட மொத்த நட்டஈட்டுத் தொகை;

(iv) உயிரிழந்த ஒருவருக்குச் செலுத்தப்பட்ட நட்டஈட்டுத் தொகை;

(v) சேதமடைந்த வீடுகளுக்காகச் செலுத்தப்பட்ட அதிகபட்ச மற்றும் குறைந்தபட்ச நட்டஈட்டுத் தொகை;

எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) இடம்பெயர்ந்த அனைவருக்கும் நிரந்தர வீடுகள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இடம்பெயர்ந்த ஒரு குடும்பத்திற்கு நிரந்தர வீடொன்று வழங்கப்பட்ட அண்மித்த திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Will he inform this House -

(i) the number of people died;

(ii) the number of people got disabled;

(iii) the full amount of compensation paid for the victims by the Government ;

(iv) the compensation paid on behalf of a deceased person; and

(v) the maximum and minimum compensation paid for damaged houses;

in connection with the slide of Meethotamulla garbage dump in the year of 2017?

(b) Will he also inform this House -

(i) whether all displaced people have been provided with permanent houses; and

(ii) the most recent date on which a displaced family was provided with a permanent house?

(c) If not, why?

ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මිය ගිය සංඛ්‍යාව 32කි.

(ii) ආබාධිත වූ සංඛ්‍යාව 01කි.

(iii) විපතට පත්වූවන්ට රජය විසින් ගෙවූ වන්දි මුදල රුපියල් 1,018,606,490.00යි.

[ගරු දුනේෂ් ගන්කන්ද මහතා]

(iv) මිය ගිය පුද්ගලයකුට ගෙවූ වන්දි මුදල රුපියල් 1,000,000.00යි.

(v) හානියට පත් නිවාස වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු පදනම් කර ගනිමින් නිවාස සඳහා වන්දි ලබා ගැනීමට කැමැත්ත පළ කළ ප්‍රතිලාභීන් සඳහා වන්දි ගෙවීම් සිදු කරන ලදී. ඒ අනුව ඒ තක්සේරු පදනම් කර ගනිමින් එක් නිවසක් සඳහා ගෙවූ අවම මුදල රුපියල් 145,000.00කි.

උපරිම මුදල රුපියල් 13,342,500.00ක් වේ.

(ආ) (i) පදිංචිකරුවන්ගේ කැමැත්ත අනුව විකල්ප නිවසක් ලබා ගැනීමට හෝ පැවැති නිවසෙහි තක්සේරුව වන්දියක් ලෙස ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. ඒ අනුව විකල්ප නිවාස 170ක් ලබා දී ඇති අතර, ඒ සඳහා රජය විසින් රුපියල් මිලියන 392ක් හා කොළඹ මහ නගර සභාව විසින් රුපියල් මිලියන 288ක් ලෙස රුපියල් මිලියන 680ක් වැය කර ඇත. වන්දි ලබා ගැනීමට කැමැත්ත පළ කළ 97දෙනෙකුට රුපියල් 317,000,000.00ක් කොළඹ දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර ඇති අතර, 2017.12.31 වන විට රුපියල් 219,777,950.00ක් ප්‍රතිලාභීන් 79දෙනෙකු වෙත ලබා දී ඇත. ඉතිරි නිවාස තක්සේරු වන්දි සඳහා රුපියල් 54,251,750ක ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රතිලාභීන් 18දෙනෙකු සඳහා ගෙවීම් කටයුතු සිදු කරමින් පවතී.

(ii) විකල්ප නිවාස ලබා දීමේ තෙවන අදියරේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2017.11.08 දින විකල්ප නිවාස 72ක් ලබා දෙන ලදී.

(ඇ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ (ආ) (i) "අවතැන් වූ සියලු දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;" යන කොටසට "ඔව්." හෝ "නැහැ." යනුවෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පැහැදිලි පිළිතුරක් දුන්නේ නැහැ. කෙසේ වෙතත් තමුන්නාන්සේලා මුදල් ගෙවලා මේ ප්‍රශ්නය විසඳලා නම් තිබෙන්නේ, මීට සති දෙකකට කලිනුත් අවතැන් වූවන්ගේ සංගමය මාධ්‍ය හමු පවත්වලා, එතැන උද්ඝෝෂණ පවත්වමින් ආණ්ඩුවට විරෝධය පළ කළේ ඇයි කියලා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

මම නම් හිතන හැටියට රටේ පවතින තත්ත්වයත් සමඟ උසි ගන්වන සංකල්පයක් රට පුරා ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා මීතොටමුල්ල කුණු කන්ද ප්‍රදේශයට ගිහිල්ලා මේ ප්‍රශ්නය පිළිබඳව මීට වඩා විධිමත්ව සොයා බලලා ප්‍රශ්නය ඉදිරිපත් කළොත් අපට ඒ පිළිබඳව මීට වඩා පැහැදිලි පිළිතුරක් රජය හැටියට ලබා දෙන්නට පුළුවන් වෙයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ඒ කලබලය ඇති වුණු දවසේම ඒ ස්ථානයට ගිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියටයි මම මේ කථා කරන්නේ. බොහෝ දෙනෙක් එදා යන්නට පැකුලුණා. අපි එදාත් එතැනට ගියා. ඒ ජනතාවගේ ප්‍රශ්නය තවම විධිමත් අයුරින් විසඳී නැත, ඔවුන් සාධාරණවයි හඬ නඟන්නේ. එම නිසා මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ලිපිවල සඳහන් වන කාරණා ඇත්තටම මහ පොළොවේ සිදු වෙලාද කියලා අමාත්‍යාංශය මට්ටමින් යම් සොයා බැලීමක් කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ලේඛන සෘජුව ඉදිරිපත් කළොත් අපි ඔබතුමාගේ ප්‍රශ්නය ගැන පැහැදිලි අවධානයෙන් කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා.

විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ශ්‍රී ලාංකික ධීවරයන්: විස්තර
வெளிநாடுகளில் கைது செய்யப்பட்டுள்ள இலங்கை மீனவர்கள்: விபரம்
SRI LANKAN FISHERMEN IN FOREIGN CUSTODY: DETAILS

2228/'17

8. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වත්මන් යහපාලන රජය බලයට පත් වූ දින සිට මේ දක්වා විදේශ රටවල අත් අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකික ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවරයන් දැනට අත් අඩංගුවේ පසුවන රටවල් කවරේද;

(iii) එම ධීවරයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම ධීවරයන් මුදා ගැනීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(v) විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ධීවරයන්ගේ පවුල්වල සුභසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய நல்லாட்சி அரசு ஆட்சிக்கு வந்த நாள் தொடக்கம் இதுவரை வெளிநாடுகளில் கைது செய்யப்பட்டுள்ள இலங்கை மீனவர் களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி மீனவர்கள் தற்போது கைதுசெய்யப் பட்டுள்ள நாடுகள் யாவை;

(iii) மேற்படி மீனவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை;

(iv) மேற்படி மீனவர்களை விடுவிப்பதற்கு அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை;

(v) வெளிநாடுகளில் கைதுசெய்யப்பட்டுள்ள மீனவர் களின் குடும்பங்களின் நலன்புரிக்காக அமைச்சு எடுத்துள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan Fishermen who are languishing in the custody of foreign countries from the day the present Government of Good Governance came to power up to date;

(ii) the countries in which those fishermen are in custody;

(iii) the names and addresses of those fishermen;

(iv) the steps, the Ministry has taken to get those fishermen freed; and

(v) the measures, the Ministry has taken towards the wellbeing of the families of those fishermen?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2018.03.25 දින වන විට ලබා දුන් තොරතුරු ඇසුරිනි.

(i) යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව විදේශ රටවල අත් අඩංගුවට පත් වී සිටින ධීවරයින් සංඛ්‍යාව - 06 (ඉන්දියාව 06)

(ii) ඉන්දියාව

(iii)

රට	නම හා ලිපිනය
	1. අන්තෝනි මරියදාස්, මුරුගන් කෝවිල අසල, පේසාලේ.
	2. ඒ.ආර්. ජයන්ත ප්‍රනාන්දු, නො. 26, කුඩාමඩුවැල්ල, තොඩුවාව.
ඉන්දියාව	3. ඩී.ඩබ්ලිව්.වී. මධුසංක, කෙයාර්, සුමේදංපුර, තුනේකණ්ඩුව, චීනවරාය.
	4. පී.ඩී. මධුසංක, නො. 09, සර්වෝදය නිවාස, නුවර පාර, ත්‍රිකුණාමලය.
	5. පී.එම්. දනුෂ්ක දිල්ෂාන්, ඉදිකොස්වත්ත, ගන්දර.
	6. ඒ.එච්.ටී.ඒ. ප්‍රදීප් කුමාර, නො. 27, දෙවිගම්පුර, කපුගම, දෙවිනුවර.

(iv) තම ඥාතීන් බැලීම සඳහා මන්නාරම ප්‍රදේශයේ සිට ඉන්දියාවේ රාමේෂ්වරන් වෙත යාමේදී ඉන්දියානු ආරක්ෂක බලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන ඇති ඉන්දියාවේ අනාථ කඳවුරක සිටින මරියදාස් නම් ධීවර කාර්මිකයා පිළිබඳව ඉන්දියානු ආරක්ෂක බලධාරීන් විසින් සත්‍ය වශයෙන්ම ධීවර කාර්මිකයකුද යන වගට පරීක්ෂණ ආරම්භ කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය විස්තර ලිපි ලේඛන මේ වන විට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අදාළ බලධාරීන් වෙත යවා ඇත. ඉදිරි සති කිහිපයේදී ඔහු මෙරටට පැමිණීමට නියමිතය.

ඉන්දියාවේ අත් අඩංගුවට පත් IMUL-A-0490TLE බහුදින ධීවර යාත්‍රාවේ ධීවර කාර්මිකයින් 05 දෙනෙකු ත්‍රිකුණාමලය ප්‍රදේශයෙන් මුහුදු ගොස් ඇති අතර, 2018.03.12 දින ඉන්දියානු වෙරළ ආරක්ෂක බලකාය මඟින් අත් අඩංගුවට ගෙන ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඔවුන් නිදහස් කර ගැනීමට අවශ්‍ය ඉල්ලීම ඉදිරිපත් කර ඇත. දැනට එම ධීවර කාර්මිකයින් චෙන්නායිහි කරිකාල් පොලිස් නාවික පොලිසිය වෙත භාර දී ඇති අතර, ඔවුන් ඉදිරි අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට නියමිත අතර, ඉන් අනතුරුව දෙරටේ ඇති සහයෝගිතාව මත නිදහස් කිරීමට අවශ්‍ය පියවර සඳහා ඉන්දියානු බලධාරීන් විසින් එළඹෙනු ඇත.

(v) ඉන්දියාවේ අත් අඩංගුවට පත් ධීවරයින් සති දෙකක් වැනි කාලයක් තුළ මෙරටට ගුවන් මඟින් හෝ මුහුදු මාර්ගයෙන් ගෙන්වා ගැනීමට ද, ඔවුනට අවශ්‍ය ආහාර පාන හා ඇඳුම් පැළඳුම් චෙන්නායිහි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය හරහා -අවශ්‍ය පහසුකම්- සැපයීමට ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මේ වන විට කටයුතු යොදා ඇත.

(ආ) පැන නොනඟී.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා විස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නා. නම් සඳහන් කරන ලෙස ඉල්ලූ ලැයිස්තුවේ මා නියෝජනය කරන ලංකාවේ ලොකුම මුහුදු තීරය තිබෙන පුත්තලම් දිස්ත්‍රික්කයේ ධීවරයෝත් ඉන්නවා. ධීවරයෝ මුහුදු යන්නේ ගරු කථානායකතුමනි, අපේ බතට අවශ්‍ය කරන මාළු ලබා දෙන්නයි. අනෙක් කාරණය තමයි ඔවුන් හිතලා මුහුදු සීමාවන් උල්ලංඝනය කරන්නේ නැහැ.

මම ප්‍රශ්නයක් විධියට නොවෙයි යෝජනාවක් ඉදිරිපත් කරන්නම්. මොකද, ප්‍රශ්නයක් යොමු කළත් උත්තර දෙන්නට විෂය භාර ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ.

මම මෙය යෝජනාවක් විධියට අමාත්‍යාංශයට යොමු කරනවා. දිගම මුහුදු තීරය තිබෙන පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම කියන්න ඕනෑ, ධීවරයින් අත් අඩංගුවට ගත්තාම, ඒ ධීවරයින් පසු පස සිටින පවුල් ගණනාවක් දුක් වෙනවා සහ ඔවුන්ගේ පවුල් සියල්ල කඩා වැටෙනවා කියන එක. එම ධීවර පවුල්, හොඳ අධ්‍යාපනයක් ලබාගෙන තිබෙන පවුල් නොවෙයි. එම නිසා ධීවරයෙක් යම් කිසි රටක අත් අඩංගුවට පත් වුණාම, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත් වෙලා ඉතාමත් කඩිනමින් ඔවුන් මුදා ගන්න කටයුතු කරනවා නම් හොඳයි. එම යෝජනාව අමාත්‍යාංශයට යොමු කරන ලෙස මම ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න අවසන් නේද?

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
ඔව්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ලංගම ඩිපෝ:රත්නපුර දිස්ත්‍රික්කය
இபோச டிப்போக்கள்: இரத்தினபுரி மாவட்டம்
SLTB DEPOTS: RATNAPURA DISTRICT

2294/'17

9. ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ලංගම ඩිපෝ අතරින් දැනට ලාභ හෝ පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ එක් එක් ඩිපෝවට අලුතින් ලබා දුන් බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව හා එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු මත්‍රුම් සිවිල් විමානච් සේවෛකළ් අමෛච්සරෛක් කේට්ට වින්නා:

(அ) (i) இரத்தினபுரி மாவட்த்தில் இயங்கும் இபோச டிப்போக்களில் தற்போது இலாபத்தில் அல்லது நட்டத்தில் இயங்கும் டிப்போக்கள் வெவ்வேறாக யாவையென்பதையும்;

(ii) 2010ஆம் ஆண்டு முதல் இற்றைவரை இரத்தின புரி மாவட்டத்தில் ஒவ்வொரு டிப்போவிற்கும் புதிதாக வழங்கப்பட்ட பஸ் வண்டிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு டிப்போவிலும் நிலவும் ஊழியர் வெற்றிடங்களின் எண்ணிக்கை மற்றும் அவ்வெற்றிடங்களை நிரப்புவதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House -

(i) separately, the number of profit-making or loss incurring SLTB depots, out of the depots that are operational in Ratnapura District;

(ii) the breakdown of the number of new buses provided to each depot in Ratnapura District from year 2010 up to date; and

(iii) the vacancies in each depot and the measures that will be taken by the Ministry to fill them?

(b) If not why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ලංගම ඩිපෝ ගණන පහකි. එම ඩිපෝ නම්, රත්නපුර, ඇඹිලිපිටිය, ගොඩකවෙල, කලවාන සහ බලංගොඩ යන ඩිපෝය. එම සියලු ඩිපෝ ලාභ ලබයි.

(ii)

ඩිපෝව	බස් රථ සංඛ්‍යාව
රත්නපුර	34
ඇඹිලිපිටිය	41
ගොඩකවෙල	25
කලවාන	31
බලංගොඩ	39
එකතුව	**170**

(iii) දැනට පවතිනුයේ රියැදුරු හා කොන්දොස්තර තනතුරු සඳහා වන පුරප්පාඩු පමණකි. ඩිපෝ වශයෙන් එම පුරප්පාඩු මෙසේය

ඩිපෝව	රියැදුරු	කොන්දොස්තර
රත්නපුර	-	-
බලංගොඩ	03	06
ඇඹිලිපිටිය	-	-
කලවාන	03	04
ගොඩකවෙල	-	01
එකතුව	**06**	**11**

මේ අනුව රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ඩිපෝ 5ක් සඳහා රියැදුරු තනතුරු සඳහා පුරප්පාඩු හයක් (06) සහ කොන්දොස්තර තනතුරු සඳහා පුරප්පාඩු එකොළහක් (11) පවතින බව අදාළ ඩිපෝ වාර්තා මඟින් දන්වා එවා ඇත. පසුගිය 2018.02.10 දින පැවැති පළාත් පාලන මැතිවරණය නිසා එකී කාල වකවානුව තුළදී නව පත්වීම් ලබාදීම සිදු නොවීය.

දැනට සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරා ගත් අය සඳහා ඉදිරියේදී කොන්ත්‍රාත් පදනමින් පත්වීම් ලබා දීමට කටයුතු සූදානම් කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලසීමාව තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මේ මුළු රටේම ඩිපෝවල රියැදුරන්, කොන්දොස්තරවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය උසුලන්න බැරි ප්‍රමාණයක් ඉන්නවා අපි දැක්කා. මට මතක විධියට ඔබතුමාම කිව්වා, "එක බස් රථයකට මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා තමයි ලංකා ගමනාගමන මණ්ඩලය පාඩු ලබන්නේ" කියලා. එවැනි තත්ත්වයක් තුළ පාඩු ලබන ආයතනයක් නිවැරදි තැනට ගන්න ඔබතුමන්ලා රට පුරාම ඩිපෝවල සේවය කළ සේවකයින් විශාල ප්‍රමාණයක් වන්දි මුදලක් -දීමනාවක්- දීලා ඉවත් කළා. ඉවත් කරලා බලාපොරොත්තු වුණේ, මේ ඩිපෝ ලාභ ලබන තත්ත්වයට ගෙන එන්නයි. මම දන්නවා, ඇඹිලිපිටිය ඩිපෝව ගත්තොත් ඒ ආයතනය ලාභ ලබන්නේ Highway එකේ ධාවනය වන බස්වලින් ලැබෙන මුදලින් බව. ගොඩකවෙල ඩිපෝවත් එහෙමයි. නමුත්, ලාභ ලැබීම කියන කාරණය කෙසේ වෙතත්, ඔබතුමන්ලා අර විධියේ සේවක කළමනාකරණයක් කරලා මේ ආයතන නිවැරදි මහකට අරගෙන තිබියදී, නැවත වතාවක් මේ දිනවල පත්වීම් දීලා ඒ ආයතනවල සේවකයින් පිරුණාට පස්සේ ඔබතුමන්ලා ගත්ත ක්‍රියා මාර්ගය සාර්ථක තැනකට අරගෙන එන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංක)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 5,500ක් පමණ තමයි දිනකට ධාවනය වන්නේ. බස් රථ සියයක් ධාවනය වනවා නම් රියැදුරන් 140ක්, කොන්දොස්තරවරු 140ක් ඕනෑ, ඒ අයගේ සාමාන්‍ය නිවාඩු යාම ආදී කාරණාත් මත. දැනට ඉන්නේ රියැදුරන් 10,000යි; කොන්දොස්තරවරුන් 10,000යි. සමහර විට දැන් විනය ක්‍රියාමාර්ග ප්‍රශ්න, විශ්‍රාම යාම් වැනි කාරණා නිසා රියැදුරන්ගේ, කොන්දොස්තරවරුන්ගේ හිඟයක් තිබෙනවා. ලංකාවේම බැලුවොත් 500ක, 600ක වාගේ හිඟයක් තිබෙනවා. අපි දැනට කොන්ත්‍රාත් පදනම මත පමණයි රියැදුරන් බඳවා ගන්නේ. මොකද, රජයෙන් එක සේවකයකු වෙනුවෙන් රුපියල් 16,200ක වැටුපක් ගෙවනවා. අපි දැනට අලුතින් බඳවා ගන්නා අයට රජයෙන් ගෙවන්නේ නැහැ. කොන්ත්‍රාත් පදනම මත වැඩ කරන අයට දවසකට රුපියල් 1,000ක මුදලක් තමයි දෙන්නේ. ඒකට OT, බටා ආදී සියල්ල වෙනම එකතු වෙනවා. ඒ නිසා අලුතින් ගන්නා අයට ඒ අය ධාවනය කරන බස් රථයෙන් හම්බ කරලායි මුදල් ගෙවන්නේ. හැබැයි, ඒකටත් ඩිපෝ කළමනාකාරවරයාගේ අනුමැතිය ඕනෑ, ඒ ඩිපෝවෙන් ඒ මුදල් ගෙවන්න පුළුවන්ද කියන එක සම්බන්ධයෙන්. ඒ අනුමැතිය දුන්නාම, බස් රථ සියයක් තිබෙනවා නම් රියැදුරන් 140ක්, කොන්දොස්තරවරුන් 140ක් කියන පදනම මත කොන්ත්‍රාත් පදනමින් දැනට බඳවා ගන්නවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා, ධාවනයේ යොදවන බස් රථ ප්‍රමාණයන්. නමුත්, බස් රථ විශාල ප්‍රමාණයක් සුළු දෝෂ නිසා ධාවනයේ යොදවන්නේ නැතිව සමහර ඩිපෝවල තිබෙනවා. මේ බස් රථ ප්‍රමාණය කෙටි ගමන් ධාවනය සඳහා යොදවන්න පුළුවන් තත්ත්වයේ තිබෙනවා.

අපි සොයලා බැලුවාම දැන ගන්න තිබෙන්නේ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය පොඩි part එකක් නැත්නම්, පොඩි පොඩි දෝෂ හදා ගන්න අවශ්‍ය වන අමතර කොටස් ලබා දීමට අමාත්‍යාංශය පියවර ගෙන නැහැයි කියන එකයි. ඒ නිසා අපි හිතන විධියට අලුත් බස් රථ ලබා දෙනවා වාගේම සමහර ඩිපෝවලින් පසුගිය කාලසීමාවන් තුළ ආවරණය කළ ප්‍රදේශ ආවරණය කරන්න තිබෙන බස් රථ ප්‍රමාණවත් වන්නේ නැහැ. ගොඩකවෙල ප්‍රදේශයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ගොඩකවෙල ඩිපෝවේ ඩිපෝ අධිකාරීත් එක්ක මම කිහිප වතාවක් මේ ගැන කථා කළා. අලුත් බස් රථ දුන්නාට පසුගිය කාල සීමාවේ තිබුණු බස් රථ ප්‍රමාණයත් අඩුවෙලා තිබෙනවා. ඒ නිසා මේ වෙනුවෙන් ගන්න පුළුවන් ඉක්මන් ක්‍රියා මාර්ගය මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංක)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, බස්රථවලට අමතර කොටස් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් ලංකා ගමනාගමනය මණ්ඩලය තුළ තිබෙනවා. ඒ ක්‍රමවේදය තුළ තමයි ගන්නේ. මොකද, අපි හදිසි මිලදී ගැනීම් නවත්වලා තිබෙනවා. හැබැයි, සමහර අවස්ථාවල හදිසි මිලදී ගැනීම්වලටත් අවස්ථාව දීලා තිබෙනවා. අමතර කොටස්වල හිඟයක් තිබෙනවා නම් ඩිපෝව මඟින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කළාම විශේෂයෙන් සපයන ක්‍රමයකුත් තිබෙනවා. ඒ විධියට හදිසි මිලදී ගැනීම් සඳහාත් අවස්ථාව ලබා දී තිබෙනවා. කොහොම වෙතත් අපි ඒ අමතර කොටස් නිරන්තරව ලබා දෙනවා. ඒ නිසා එවැනි අවස්ථාවල ප්‍රධාන කාර්යාලය අමතන්න කියා ඩිපෝ කළමනාකරුවන්ට කියන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 - 2326/'17- (1), ගරු රෝහිනී කුමාරි විජේරත්න මැතිනිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 2342/'17-(1), ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 2370/'17 - (1), ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13 - 2399/'17 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මැතිතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"ළහම පාසල - හොඳම පාසල" වැඩසටහන: අ/ මනාරුල් උලුම් මහා විද්‍යාලය

"அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" கருத்திட்டம்: அ/மனாருல் உலும் மகா வித்தியாலயம்

"NEAREST SCHOOL IS THE BEST SCHOOL" PROGRAMME: A/ MANARUL ULOOM MAHA VIDYALAYA

2464/'17

14. ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අංක 309, ගම්බිරිස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අ/මනාරුල් උලුම් මහා විද්‍යාලය "පාසල් 1000 ව්‍යාපෘතිය" යටතේ ඇතුළත් කර ඇති බවත්;

(ii) මෙම විදුහලේ ළමුන් 700 ක් පමණ ඉගෙනුම ලබන බවත්;

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ මෙම විද්‍යාලයට එක් ගොඩනැඟිල්ලක් පමණක් ලබා දී ඇති අතර මේ වනතෙක් වෙනත් කිසිදු පහසුකමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) "ළහම පාසල හොඳම පාසල" යන ව්‍යාපෘතිය යටතේ හෝ මෙම පාසලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) அநுராதபுரம் வலயக் கல்வி அலுவலகத் திற்குரிய, இல. 309, கம்பிரிஸ்வெவ கிராம அலுவலர் பிரிவு, துலானே, அ/மனாருல் உலும் மகா வித்தியாலயம் 1000 பாடசாலைகள்" கருத்திட்டத்தின்கீழ் உள்ளடக்கப்பட்டுள்ள ஒரு பாடசாலை என்பதையும்;

(ii) இப்பாடசாலையில் சுமார் 700 மாணவர்கள் கல்வி பயிலுகின்றார்கள் என்பதையும்;

(iii) இக்கருத்திட்டத்தின்கீழ் இப்பாடசாலைக்கு ஒரு கட்டிடம் மாத்திரம் வழங்கப்பட்டுள்ளதுடன் இற்றைவரை வேறெந்த வசதிகளும் வழங்கப் படவில்லையென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" எனும் கருத்திட்டத்தின் கீழேனும் இந்த பாடசாலைக்கு தேவையான வசதிகள் வழங்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) A/Manarul Uloom Maha Vidyalaya of the Gambiriswewa Grama Niladhari Division (No. 309) coming under the Anuradhapura Zonal Education Office is a school that has been included in the "1000 schools project";

(ii) about 700 students are studying in this school; and

(iii) only a single building has been provided to this school under the aforesaid project and that no other facility has been provided to this school so far?

(b) Will he inform this House -

(i) whether facilities required for this school will be provided at least under the project called, "Nearest school is the best school"; and

(ii) if so, of the date on which it will be done?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2018 වර්ෂය වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 436කි.

(iii) මහින්දෝදය විද්‍යාගාර ගොඩනැඟිල්ලක් ලබා දී ඇති අතර, එම ගොඩනැඟිල්ලට අවශ්‍ය ලී බඩු හා පරිගණක උපකරණ ලබා දී ඇත. එසේම බහු මාධ්‍ය පන්ති කාමර යටතේ එයට අදාළ සියලු උපකරණ ලබා දී ඇත.

"සනීපාරක්ෂාව පෙරට" වැඩසටහන යටතේ රුපියල් මිලියන 1.9ක වැසිකිළි හා කැසිකිළි පද්ධතියක් ලබා දී ඇත.

(ආ) (i) "ළහම පාසල හොඳම පාසල" යන ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂක පහසුකම් සඳහා රුපියල් මිලියන 1.2ක වැසිකිළි පද්ධතියක් සාදා නිම කර ඇත.

ගොඩනැඟිලි අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 4.2ක මුදලක් ලබා දී අලුත්වැඩියා කටයුතු නිම කර ඇත. රුපියල් මිලියන 0.17ක් ලබා දී විදුලිය සපයා සම්පූර්ණ කර ඇත.

(ii) එම පාසල සඳහා අවශ්‍ය පහසුකම් මේ වන විටත් සපයා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු එක හරි. නමුත්, ඒ පාසලේ ගොඩනැඟිලි පිළිබඳ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ පාසලත් පාසල් දහසේ ව්‍යාපෘතියට ඇතුළත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පසුගිය කාලවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහනට ඔබතුමා උදව් කෙරුවා. පසුගිය රජයේ පාසල් දහසේ ව්‍යාපෘතියට මේ පාසල ඇතුළත් වුණා. ගම්බිරිස්වැව කියන ගම්මානයේ තිබෙන පාසලට එක ගොඩනැඟිල්ලක් විතරයි ලැබිලා තිබෙන්නේ. ඒ පාසලේ බොහොම අඩු පාඩු තිබෙනවා. දැන් ඒ පාසල, පාසල් දහසේ ව්‍යාපෘතියට අයිතිත් නැහැ; "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට ඇතුළත් වෙලාත් නැහැ. ඒ වාගේම කැකිරාව ආසනයේ, කටුකැලියාව ප්‍රදේශයේ තිබෙන ජායා මහා විද්‍යාලයේත් ඒ විධියමයි. පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ, පාසල් දාහෙන් එකක් වෙලා තිබෙන්නේ නමටයි. ගරු ඇමතිතුමනි, බොහොම අඩු පාඩුත් එක්ක තමයි දරුවෝ තමන්ගේ අධ්‍යාපන කටයුතුවල නිරත වෙන්නේ. ගොඩනැඟිලි නැති ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරනවා. ඔබතුමා ගිය අවුරුද්දේ "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහා විශාල වැඩ කටයුතු කෙරුවා. පාසල් දහසේ ව්‍යාපෘතියට ඇතුළත් වෙලා තිබුණු මේ පාසල් දෙකටම බොහොම අඩු පාඩු තිබෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් මා කාරුණික ඉල්ලීමක් කරනවා. මේ පාසල් දෙක, පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ නමට විතරයි තිබෙන්නේ. වැඩක් නැහැ. ඒ නිසා "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට මේ පාසල් දෙක ඇතුළත් කරලා ඒ පාසල් දෙක දියුණු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. ගොඩනැඟිලි සඳහා මුදල් ලබා ගැනීම සඳහා අපි එතුමාගෙනුත් ඉල්ලීමක් කරලා තිබෙනවා. අපට මේ වසරේ ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලැබුණොත්ට අලුතින් ඒ ගොඩනැඟිලි ලබා දීමට අපට හැකියාව තිබෙනවා. ගරු කථානායකතුමනි, ගිය වසරේ සහ පසුගිය වසර තුනේම අපි නිර්ණායක ටික දීලා මේ පාසල්වල ප්‍රමුඛතාව හඳුනාගෙන ගොඩනැඟිලි සහ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපට නම් කරලා එවන්න කියලා පළාත් සභාවලට කිව්වා. ගිය සතියේ අතිගරු ජනාධිපතිතුමා එක්කත් මේ ගැන සාකච්ඡා කළා. සියලුම විදුහල්පතිවරු, කලාප අධ්‍යක්ෂවරු, පළාත් අධ්‍යක්ෂවරු කැඳවලා මේ ගැන පරීක්ෂා කළා. නමුත් අපි කනගාටුවෙන් වුණත් මේ කාරණය කියන්න ඕනෑ. මේ රටේ කලාප 98හි ඉන්න සියලුම සහකාර සැලසුම් අධ්‍යක්ෂවරු ගෙන්වාගෙන, ඒ සියලුම දෙනාට දේශීය සහ විදේශීය පුහුණුවක් දීලා අපි මේ norms අනුව, නිර්ණායක අනුව මේ රටේ පාසල් 10,000ටම අඩු පාඩු, පහසුකම් සපයන්න කියලා කිව්වා. හැබැයි, උතුරු මැද පළාතේ ඒක හරියාකාරව වෙලා තිබුණේ නැහැ. අපි නිර්ණායක දීලා තිබුණත්, ඒ මත දෙන්න කිව්වත් සමහර තැන්වලදී ඒක කඩ වෙලා තිබෙනවා, විවිධ මැදිහත් වීම් නිසා. මට පාර්ලිමේන්තුවට ඇවිල්ලා විවිධ ප්‍රකාශ කරන්න බැහැ. ඇත්ත කියන්න ඕනෑ. ඒ නිසා තමයි මෙහෙම වෙලා තිබෙන්නේ.

එහෙම නොවුණා නම්, මේ වන කොට මේ රටේ කොහේවත් ටකරම් සහිත ගොඩනැඟිලි තිබෙන්න බැහැ. මේ රටේ කිසිම පාසලක පන්තිවලට අදාළව ගොඩනැඟිල්ලක අඩු පාඩුවක් තිබෙන්න බැහැ. මොකද, අප අදාළ නිර්ණායක මතයි දීලා තිබෙන්නේ. ප්‍රථමයෙන්ම මූලික අවශ්‍යතාවලට මුල් තැන දෙන්න ඕනෑ. ගොඩනැඟිලි, වැසිකිළි, කැසිකිළි, විද්‍යාගාර ආදියට පසුව තමයි auditoriums හෝ වෙනත් මොනවා හෝ හැදෙනවා නම් හැදෙන්නේ. උතුරු මැද පළාතේත් ඒ ප්‍රශ්නය තිබෙනවා, ගරු කථානායකතුමනි. අපට මේ සැරේ ගොඩනැඟිලිවලට අරමුදලක් නැහැ. අපේ ගරු මුදල් අමාත්‍යතුමා එය සපයා දුන්නොත් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට පුළුවන්. මේ වාගේ තවත් හුඟක් ගොඩනැඟිලි තිබෙනවා. කඩා වැටෙන්න ආසන්න ගොඩනැඟිලිත් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තවත් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමා? දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ අපේ ගරු මුදල් ඇමතිතුමාත් මෙහි ඉන්නවා. අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා කියපු එක ඇත්ත. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම්, දෙමළ පාසල් සියල්ලේ තවම තිබෙනවා තහඩු ගහපු buildings. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඒ කියපු නිලධාරීන් වෙලාවට කලාවට ඔබතුමන්ලාට තොරතුරු දීපු නැති එක ලොකු වරදක්. අප ඒකට සම්බන්ධ වන්නම්. ගරු මුදල් ඇමතිතුමනි, මා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. අපේ දිස්ත්‍රික්කය දුෂ්කරම දිස්ත්‍රික්කයක්, ගරු මුදල් ඇමතිතුමනි. ඒ තහඩු ටික ගලවා sheets සවි කරලා පාසලක් හදාගන්න උදවු කරාවි, ඒ සඳහා ඔබතුමා මේ සැරේ මුදල් දේවි කියා මට ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. මීට ඉස්සර වෙලාත් පළාත් සභාව තුළ මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නැඟුණාම ගරු කථානායකතුමා ආණ්ඩුකාරතුමන්ලා කැඳවා මටත් එන්න කියා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අවශ්‍ය පියවර ගත්තා. අපට ඒ දිනය ප්‍රශ්නයක් වුණා. ආපසු දිනයක ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් මේ වාගේ දේවල් සම්බන්ධයෙන් -මේ ප්‍රශ්න ගැන- ආණ්ඩුකාරතුමන්ලා එක්ක සාකච්ඡා කරලා ඔබතුමා කිව්වා වාගේ ප්‍රමුඛතාව අනුව කටයුතු කරන්න සැලැස්මක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමා, අනුරාධපුර පළාත් සභාවේ බලය තිබුණේ එක්සත් ජාතික පක්ෂයට නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරවාගන්න ඔබතුමාට ඕනෑ නම්, ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව එය කරන්න පුළුවන්.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. අපේ හිටපු මහ ඇමති වෙනත් පක්ෂයක කෙනකු නිසා තමයි එය එහෙම වුණේ. දැන් සිටින ආණ්ඩුකාරතුමා හරිම හොඳයි. ඒ නිසා එතුමා ගෙන්වා අවශ්‍ය කටයුතු කර දෙන්න කියන කාරුණික ඉල්ලීම ගෞරවයෙන් යුතුව ඔබතුමාගෙන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය.

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන : කිලිනොච්චිය දිස්ත්‍රික්කය

தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள்: கிளிநொச்சி மாவட்டம்

PLACES OF ARCHAEOLOGICAL INTEREST: KILINOCHCHI DISTRICT

1230/'16

1. ගරු විමල් වීරවංශ මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தில் அமைந்துள்ள தொல் பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இடங்களில் தற்போது பேணல் பணிகள் மேற்கொள்ளப்படுகின்ற இடங்கள் யாவை;

(iii) இதற்காக 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(iv) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் அழிக்கப்பட்ட தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள் யாவை;

(v) மேற்படி அழிவுகள் பற்றிய மதிப்பீடொன்று செய்யப்பட்டிருப்பின், மதிப்பீட்டுப் பெறுமதி வெவ்வேறாக எவ்வளவு;

(vi) மேற்படி அழிவுகள் தொடர்பாக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(vii) மேற்படி அனைத்தினதும் முழுமையானதோர் அறிக்கையை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) how many places of archaeological interest are located in the Kilinochchi District;

(ii) in how many places conservation activities are being carried out of the aforesaid sites;

(iii) what amounts were allocated in the years 2015 and 2016 for this purpose, separately;

(iv) what places of archaeological interest were destroyed by the LTTE terrorists;

(v) if an assessment of such destructions has been done, what the estimated value is in respect of each site, separately;

(vi) whether legal measures have been taken in respect of these destructions; and

(vii) whether he will submit a comprehensive report on all above?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

(අ) (i) ගවේෂණය අවසන් කර නොමැත. කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ මේ වන විට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 18කි.

(ii) දැනට සංරක්ෂණ කටයුතු සිදු කරනු නොලැබේ.

(iii) නඩත්තු කටයුතු පමණක් සිදු කරන බැවින් සංරක්ෂණය සඳහා මුදල් වෙන් කර නැත.

(iv) ස්ථාන නොමැත.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) ඔව්.

හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන 18 පිළිබඳ වාර්තාව ඇමුණුමෙහි* දැක්වේ.)

(ආ) අදාළ නොවේ.

කල්ලාරු සුනාමි නිවාස යෝජනා ක්‍රමය: යටිතල පහසුකම්

கல்லாறு சுனாமி வீடமைப்புத் திட்டம் : உட்கட்டமைப்பு வசதிகள்

KALLARU VILLAGE FOR TSUNAMI AFFECTED PEOPLE: INFRASTUCTURE FACILITIES

2115/'17

5. ගරු විමල් වීරවංශ මහතා (ගරු ඩග්ලස් දේවානන්ද මහතා වෙනුවට)

((மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு டக்ளஸ் தேவானந்தா சார்பாக)

(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Douglas Devananda)

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කල්ලාරු ගම්මානයේ සුනාමි ව්‍යසනය හේතුවෙන් පීඩාවට පත් ජනතාව සඳහා වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ ස්ථිර නිවාස 143ක් ද, නැවත පදිංචි කරන ලද ජනතාව වෙනුවෙන් විවිධ නිවාස යෝජනා ක්‍රම යටතේ ලද නිවාස 100ක් ද වශයෙන් නිවාස 243ක් ඉදි කර ඇති බවත්;

(ii) උක්ත නිවාස 243න් මේ වනවිට නිවාස 186ක පමණක් ජනතාව පදිංචි වී ඇති අතර ඉතිරි නිවාස 57හි කිසිවකු පදිංචි වී නොමැති වීමෙන් ඒවා හිස්ව පවතින බවත්;

(iii) පානීය ජලය, නිසි ප්‍රවාහන සේවාවන් සැපයීම හා මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොවීමෙන් ඉහත ගම්මානයෙහි දැනට පදිංචි වී සිටින ජනතාව දැඩි අපහසුතාවන්ට පත්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ගම්මානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) දැනට හිස්ව පවතින නිවාස, නිවාස නොමැති පවුල් සඳහා ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தின், கண்டாவளை பிரதேச செயலாளர் பிரிவுக்குரிய கல்லாறு கிராமத்தில் சுனாமி அனர்த்தம் காரணமாக பாதிக்கப்பட்ட மக்களுக்கான வீடமைப்புத் திட்டத்தின்கீழ் 143 நிரந்தர வீடுகளும் மீள்குடியமர்த்தப்பட்ட மக்களுக்கென பல்வேறு வீடமைப்புத் திட்டங்களின்கீழ் கிடைத்த 100 வீடுகளும் என்றவாறு 243 வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ளன என்பதையும்;

(ii) மேற்படி 243 வீடுகளில் இன்றளவில் சுமார் 186 வீடுகளில் மாத்திரம் மக்கள் குடியமர்ந்துள்ளதோடு, எஞ்சிய 57 வீடுகளில் யாரும் குடியேறாத நிலையில் அவை வெற்றிடமாக உள்ளனவென்பதையும்;

(iii) குடிநீர், முறையான போக்குவரத்துச் சேவைகளை வழங்குதல் மற்றும் வீதி புனரமைப்பு பணிகள் மேற்கொள்ளப்படாத காரணத்தினால் மேற்குறிப்பிட்ட கிராமங்களில் இன்றளவில் குடியேறியுள்ள மக்கள் பெரும் சிரமங்களை எதிர்கொண்டுள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இக்கிராமத்தில் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

(iii) இன்றளவில் வெற்றிடமாக உள்ள வீடுகளை, வீடு இல்லாத குடும்பங்களுக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that -

(i) in the Kallaru village belonging to the Kandawalai Divisional Secretary's Division of the Kilinochchi District, a total of 243 houses comprising of 143 permanent houses built for those affected by the tsunami and 100 houses built for resettled families under various housing schemes have been constructed;

(ii) only 186 houses out of the above-mentioned houses are occupied at present and that no one is occupying the remaining 57 houses; and

(iii) the people who are currently residing in the above village are faced with grave difficulties due to the lack of drinking water, decent transportation facilities and road repair activities;

(b) Will he inform this House -

(i) whether steps will be taken to develop the infrastructure facilities of the aforesaid village;

(ii) if so, of the date on which it will be done; and

[ගරු විමල් වීරවංශ මහතා]

(iii) whether action will be taken to offer the above-mentioned unoccupied houses to families which do not have a house?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමීනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

Sir, I **table*** the Answer for that Question.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) 143 houses were given under the tsunami housing scheme and 100 houses were given under the financial assistance of the European Union for resettled families in Kallaru village belonging to the Kandamalai Divisional Secretary's Division of the Kilinochchi District.

(ii) Housing scheme was given in Kallaru area in 2005 to those who were affected by tsunami while living in coastal areas after displaced from Jaffna District. When houses were granted in 2010 to resettle the families who have been displaced in 2009, some families resettled in Jaffna District where they were originally residing and some families migrated to other areas due to unavailability of sufficient infrastructure facilities, lack of drinking water and due to their private necessities. Therefore, 56 houses are remaining vacant.

(iii) 01. Drinking Water Problem:-

In the year 2014, UN-Habitat organization with the financial assistance of Coca-Cola Company constructed rainwater harvest tanks for 125 families residing in this village.

Karachchi Divisional Secretariat initiated the construction of a drinking water scheme costing Rs. 5.14 million under the financial allocations of Northern Provincial Council and its constructions are on the final stage by now. Once this scheme is completed, drinking water could be supplied to this village without any obstruction.

As a temporary solution, drinking water is supplied through Divisional Secretariat during drought seasons.

02. Transport Services:-

Private transport services are being continued between Kallaru village and Kilinochchi Town.

03. Road Repair Activities:-

Three damaged major bridges and two damaged culverts in Pulliampokkanai - Kallaru Road, one of the main roads which lead to this village were renovated in year 2015 by the UN-Habitat organization.

Damaged culverts in Chundikulam - Kallaru Main Road were renovated in the year 2016 under rural infrastructure facilities development programme for Rs. 1 million.

1 km length of Chundikulam - Peyiparayipitti Main Road was renovated with metal and tar. The rest is temporarily maintained with soil up to Kallaru village by the Department of Road Development. A major bridge has also been constructed. Currently, 5 km of the Chundikulam-Peyiparayipitti Main Road has been selected to be renovated under combined road development investment project.

(b) (i) and (ii) No financial provision is available in our Ministry in 2018 to provide infrastructure facilities. If allocation is received, steps will be taken to provide infrastructure facilities to this village.

(iii) Steps have already been taken to inform the owners of the unoccupied houses through Grama Niladhari to settle back in those houses and arrangement was made to provide deeds for the families who have already been granted houses. If owners of unoccupied houses are not responding, action will be taken to provide these houses to the families which do not have houses after due notice in writing and published in newspapers.

(c) Not relevant.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -2326/'17- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සමෘද්ධි ප්‍රතිලාභීන් : විස්තර
சமுர்த்திப் பயனாளிகள்: விபரம்
SAMURDHI BENEFICIARIES: DETAILS

2342/'17

11. ගරු විමල් වීරවංශ මහතා (ගරු ටී. රංජීත් ද සොයිසා මහතා වෙනුවට)

(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா சார்பாக)

(The Hon. Wimal Weerawansa on behalf of the Hon. T. Ranjith De Zoysa)

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට රට තුළ සමෘද්ධි සහනාධාරය ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සහනාධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දැනට සමෘද්ධි සහනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩු කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් නව සමෘද්ධි සහනාධාර ලබාදීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් අදාළ නාම ලේඛන ප්‍රසිද්ධ කර ඇති බවත්;

(ii) සමෘද්ධි සහනාධාර අත්හිටුවීමට අදාළ නාම ලේඛනයන්හි ඉතා දිළිඳු හා ආබාධිත පුද්ගලයන් සිටින බවත්;

එතුමා දන්නේද?

(ඇ) ඔවුන් වෙනුවෙන් වෙනත් කවර හෝ සහනයක් සලසන්නේද; නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

සමූහ වලුවූට්ටල්, நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது நாட்டில் சமுர்த்தி நிவாரணம் பெறுகின்ற பயனாளிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி நிவாரணங்களின் பெறுமதி வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) தற்போது நாட்டில் சமுர்த்தி நிவாரணம் பெறுகின்ற பயனாளிகளின் எண்ணிக்கையைக் குறைப்பதற்கு அரசாங்கம் கொள்கை ரீதியான தீர்மானமொன்றை எடுத்துள்ளதா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது பிரதேச செயலகங்கள் ஊடாக கிராம உத்தியோகத்தர் பிரிவு மட்டத்தில் புதிதாக சமுர்த்தி நிவாரணம் வழங்குதல் மற்றும் இடைநிறுத்தல் தொடர்பாக ஏற்புடைய பெயர் பட்டியல் வெளியிடப்பட்டுள்ளதென்பதையும்;

(ii) சமுர்த்தி நிவாரணங்களை இடைநிறுத்துவதற்கு ஏற்புடைய பெயர்ப்பட்டியலில் மிக வறிய மற்றும் அங்கவீன ஆட்களும் உள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(இ) இவர்களுக்கு வேறு யாதேனும் நிவாரணம் வழங்கப் படுமா; இன்றேல், அது தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment, Welfare and Kandyan Heritage:

(a) Will he inform this House -

(i) the number of Samurdhi beneficiaries in the country by now;

(ii) separately, the value of the aforesaid benefits; and

(iii) whether the Government has taken a policy decision to reduce the number of Samurdhi beneficiaries who receive the Samurdhi benefits by now?

(b) Is he aware that -

(i) the name lists concerning the grant and the suspension of new Samurdhi benefits have been publicized in Grama Niladhari Division levels through Divisional Secretariats; and

(ii) there are impoverished and disabled people in the name lists, which suspended the Samurdhi benefits ?

(c) Whether any other relief will be provided for them and if not, whether he will inform this House of the measures taken in that regard?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,390,978කි. (2018.01.31 දිනට) මිලියන 1.3කි.

(ii) පිළිතුර අමුණා ඇත. ඇමුණුම* බලන්න.

(iii) නැත.

(ආ) (i), (ii) සමෘද්ධි සහනාධාර ලබන සහ සහනාධාර ලැබිය යුතු, එහෙත් සහනාධාර නොලැබෙන පවුල් හඳුනාගෙන ඔවුන් සමෘද්ධි ව්‍යාපාරයට දායක කර ගැනීම සඳහා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ එක්ව 2016 වසරේදී අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීමේ සමීක්ෂණයක් පවත්වන ලදී. ඒ අනුව, තෝරාගත් පුද්ගලයන්ගේ නාම ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රසිද්ධ කරන ලද අතර, එම නාම ලේඛන සම්බන්ධයෙන් ඇති වූ යම් ව්‍යාකූල තත්ත්වයන් මත මාගේ උපදෙස් පරිදි නව සංශෝධන ක්‍රියාවලිය තාවකාලිකව නවතා දමන ලදී.

ඉන්පසු, අප සොයාගත් පරිදි සමීක්ෂණ වාර්තා පරිගණකගත කිරීමේදී විශාල වැරදි සිදුවී ඇති බවත්, එම නිසා සහනාධාරලාභීන් තේරීමේදීත් වැරදි සිදුවී ඇති බවත් සොයා ගන්නා ලදී. මේ වන විට එම වැරදි නිවැරදි කර ඇත. ඒ අනුව අලුතෙන් සහනාධාර දිය යුතු අයට ලබා දීමේ කටයුතු ආරම්භ කර ඇත. යමෙකුගේ ආදායම් මට්ටම ඉහළ යාම නිසා ලබා දුන් සහනාධාරය ඉවත් කළත් සමෘද්ධි සාමාජිකයෙකු ලෙස අනෙකුත් වරප්‍රසාද පහසුකම් ලබා ගනී.

එසේම සිය කැමැත්තෙන් සහනාධාරය පරිත්‍යාග කිරීමට කැමති අය සිටිති. ඔවුන්ද විශේෂ ඇගයීමකට ලක් කර එසේ ඉවත් වීමට ඉඩකඩ සැලසීමට කටයුතු කරගෙන යමින් සිටී.

(ඇ) සහනාධාරය කිසිවෙකුගෙන් සම්පූර්ණයෙන් ඉවත් නොකෙරේ. ඔවුනට රුපියල් 420/=ක් ලැබේ. ඒ අනුව ඔවුන් බැංකු ගනුදෙනු කරන්නකු ලෙසත්, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබන අයකු ලෙසත් ඉදිරියෙන් සිටී. කිසිවෙකු එම රුපියල් 420/= ද පරිත්‍යාග කරන්නේ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

නම් ඔහු විසින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට හා නිවාස ප්‍රතිලාභ ලබා ගැනීමට මාසිකව රුපියල් 420/=ක් ගෙවිය යුතු වේ. එසේ නොවන අයටත් බැංකු සාමාජිකයකු ලෙස දිගටම ගනුදෙනු කිරීමට හැකි ය.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද කියා කියන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 13වන ස්ථාවර නියෝගය අනුව තමයි මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ. ඒ, පොදු වැදගත්කමක් තිබෙන ප්‍රායෝගික කාරණයක් ගැනයි. ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවලදී විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ කාරක සභාවල කටයුතු කරන මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව දැන ගැනීමට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අපි එවැනි අවස්ථා ගණනාවකට මුහුණ දී තිබෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළ සහ විශේෂයෙන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළ. පාර්ලිමේන්තුව කල් තබා අවසන් වුණාට පසුවත් ඒ කාරක සභා සමහර විට පැය, 1 1/2, 2 පවත්වාගෙන යනවා. ඒකෙන් සිදු වන දේ තමයි මන්ත්‍රීවරුන් අපහසුතාවට පත් වීම. මොකද, අපේ පොත් පත් සාමාන්‍යයෙන් තිබෙන්නේ මේ සභාව තුළයි. ළඟදී මෙතුමාට -මේ සභාව භාරව සිටින ප්‍රධාන නිලධාරිතුමාට- සිද්ධ වුණා දෙවතාවක් එන්න. ඒ නිසා සභාව කල් තැබුවාට පසු, සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරන සිනු හඬ නැතුව වෙනත් සිනු හඬක් ක්‍රියාත්මක කිරීම හෝ නැත්නම් අඩු ගණනේ කාරක සභාවලට දැනුවත් කරන කිසියම් ක්‍රමවේදයක් හදන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ ක්‍රමවේදයක් නොමැතිකම නිසා අපි විශාල අපහසුතාවන්ට පත්වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට අවශ්‍ය පරිදි උපදෙස් දෙන්නම්.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I
ජාතික විගණන පනත් කෙටුම්පත
தேசிய கணக்காய்வுச் சட்டமூலம்
NATIONAL AUDIT BILL

"විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද; රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 අප්‍රේල් මස 19 වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 ஏப்பிரல் 19, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.

Presented by the Hon.Gayantha Karunatileka on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II
සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත
குடியியல் வான்செலவு (திருத்தம்) சட்டமூலம்
CIVIL AVIATION (AMENDMENT) BILL

"2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 අප්‍රේල් මස 19 වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 ஏப்பிரல் 19, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Transport and Civil Aviation; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

III
කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
காலவிதிப்பு (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
PRESCRIPTION (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

"2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

***2018** අප්‍රේල් මස **19** වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.*

නීති අමෙච්චර් චාර්පාක මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටතු.

2018 ඒප්පිරල් 19, වියාෆක්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙචාර් මේර්පාර්වෛක් කුලුවුක්කු ආර්රුප්පටුත්තප්පට වේණ්ටු මෙනවුම් කට්ටළෛයිටප්පට්ටතු.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice; to be read a Second time upon Thursday,19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ඡායා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சாயா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
CHAYA FOUNDATION (INCORPORATION) BILL

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ඡායා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
ඉතන්පටි, සට්ටමූලම් මුතන්මුරෙ මතිප්පිටප්පට්ටු, අච්චිටප්පටක් කට්ටළෛයිටප්පට්ටතු.

සට්ටමූලම් නිලෛක්කට්ටළෛ ඉල. 47(5) ඉන්පටි සමූක වළුවූට්ටල් මර්රුම් නලන්පුරි මර්රුම් කණ්ඩි මරපුරිමෛකළ් අමෛච්චරුක්කු අර්රික්කෛ චෙය්යප්පටුතර්කාකච් චාට්ටප්පට්ටතු.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare and Kandyan Heritage for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු. අද න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 11 දක්වා. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් 10ක් අනුමත කිරීමට සහ හයිඩ්‍රොෆ්ලෝරොකාබන් (Hydroflurocarbons - HFC) අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීම සඳහා යෝජනා සම්මතය සම්මත කිරීමට. ගරු මංගල සමරවීර අමාත්‍යතුමා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, මේ වන විට කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වහලා කියලා අපට මාධ්‍ය මඟින් දැනගන්න ලැබුණා. මේ හේතුව නිසා ජාත්‍යන්තරයට වැරැදි මතයක් යෑම සහ රට පිළිබඳව තිබෙන ප්‍රතිරූපයට ලොකු හානියක් වෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, විෂය භාර ඇමතිවරයා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ නොසිටියත් ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය ඇමතිතුමා දැන් ගරු සභාවේ හිටියා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මොකද, මේ වන විට මාධ්‍ය මඟින් අපට දැනගන්න ලැබුණේ ගුවන් තොටුපොළට ඇතුළු වන පාරවලුත් වැසී තිබෙන බවයි. ගුවන් තොටුපොළ සේවකයන්ගේ යම්කිසි අර්බුදයක් තිබෙනවා නම්, ඒකට කඩිනම් විසඳුමක් දෙන්න ගරු ඇමතිවරයා හෝ කැබිනට් මණ්ඩලය මැදිහත් වුණොත් හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම මේ කරුණ පිළිබඳව ගරු ඇමතිතුමාට වහාම දැනුම් දෙන්නම්.

බොහොම ස්තුතියි.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

[අ.භා. 1.58]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, පහත සඳහන් නියමය මා ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 06 දිනැති අංක 2044/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, first of all, I would like to submit 10 Gazette Notifications published under the Special Commodity Levy Act, No. 48 of 2007 for the approval of Parliament.

ගරු කථානායකතුමනි, අප්‍රේල් මාසයේ පළමුවැනි දා සිට ක්‍රියාත්මක වන නව දේශීය ආදායම් පනත ගැන යම් පැහැදිලි කිරීමක් කරන්න මම මේක අවස්ථාවක් කරගන්නවා. මොකද, පසුගිය දවස් කිහිපය තුළම මේ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වැරැදි තොරතුරු, විකෘති වූ තොරතුරු, සම්පූර්ණයෙන්ම අසත්‍ය තොරතුරු රාශියක් පුවත් පත්වලින් සහ අපේ දේශපාලනඥයන් ප්‍රකාශ කරලා තිබුණා. ගරු කථානායකතුමනි, පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 07වැනි දා මේ සභාවේදීම අපි නව දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්මත කළා. ජනතාවට හුරු පුරුදුවීම සඳහා යම් කාලයක් ලබා දෙන්නට අවශ්‍යයි කියලා මේ පාර්ලිමේන්තුවේන්ම ආපු යෝජනාව අනුව පනත ක්‍රියාත්මක කිරීම 2018 අප්‍රේල් මස පළමුවැනි දා දක්වා කල් යැවිවා. ඇත්ත වශයෙන්ම මේ නව දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සෑම පාර්ශ්වයක් එක්කම අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඒ අයගේ අදහස් ගත්තා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 10කට වඩා පවරා තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒවා ගැන දුන් ඒ තීන්දුවත් සැලකිල්ලට අරගෙන, පොදු මහ ජනතාවගෙන් ලැබුණු ඉල්ලීම්ද සලකා බලා, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ සිටින පක්ෂවලත් අදහස්, යෝජනා හා සංශෝධන සැලකිල්ලට අරගෙන තමයි එදා එම පනත් කෙටුම්පත සකස් කරලා මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තේ.

ඊළඟට, ඒකාබද්ධ විපක්ෂයේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ඉල්ලීම පරිදි, එතුමාත්, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාත් සමඟ අපි මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් හමු වෙලා ඒ අයගේ අදහස් පවා සැලකිල්ලට ගත්තා.

ඇත්ත වශයෙන්ම කිව්වොත්, ලංකාවේ සෘජු බදු සහ වක්‍ර බදු අතර පරතරය ඉතාම අහිතකරයි. අද මේ රටට සෘජු බදු ලෙස ලැබෙන්නේ සියයට 18ක් වැනි ඉතාම අඩු ප්‍රමාණයක්. මේ ප්‍රමාණය මුළු ලෝකයේම තිබෙන අවම ප්‍රමාණයක් හැටියට සලකන්න පුළුවන්. මම ඊට උදාහරණ කීපයක් ඉදිරිපත් කරන්නම්, ගරු කථානායකතුමනි. මැලේසියාව එරටේ ආදායමින් සියයට 72ක්ම ලබාගන්නේ සෘජු බදුවලින්. ඉන්දියාව සියයට 54ක්ම ආදායම් ලබාගන්නේ සෘජු බදුවලින්. අපේ අසල්වැසි රටක් වන බංග්ලාදේශය සෘජු බදුවලින් සියයට 33ක පමණ ආදායමක් ලබාගන්න කොට, ලංකාවේ අපට තවමත් සියයට 18කට අඩු ප්‍රමාණයක් තමයි සෘජු බදුවලින් ලැබෙන්නේ. ඒ අනුව, මේ රටේ ආදායමින් සියයට 88ක්ම එන්නේ වක්‍ර බදුවලින්. මෙහිදී වැට බද්ද හෝ වෙනත් බදු විවිධාකාර ලෙස තිබෙනවා. වක්‍ර බද්දේ තිබෙන ප්‍රශ්නය මේකයි. මහා මන්දිරවල ඉන්න, ලොකු වාහනවල යන ධනවතා කඩේට ගිහින් බඩුවක් ගන්නකොට ගෙවන බද්දම තමයි, සීනි ටිකක් හෝ වෙන මොනවා හෝ භාණ්ඩයක් ගන්න යන එදිනෙදා අමාරුවෙන් ජීවත් වන කම්කරුවාටත් ගෙවන්නේ. ඇත්ත වශයෙන්ම අපේ වැට බද්ද ඉතාම වැඩියි.

නමුත් ඒ වැට බද්ද වෙනස් කරන්න නම්, අඩු කරන්න නම් අපි මේ බදු අනුපාතය වෙනස් කරන්න ඕනෑ. 18ට 82 වශයෙන් තිබෙන බදු අනුපාතය අඩුම ගණනේ ඊළඟ වසර කීපය තුළදී 40:60 දක්වා ගෙනෙන්න ඕනෑ. ඒ හා සමාන්තරව වැට බද්ද සහ අනිකුත් බදු ක්‍රමානුකූලව අඩු කරලා, ජනතාවට තව-තවත් සහන සලසන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අපි මේ නව දේශීය ආදායම් බදු පනත ගෙනැල්ලා, විශේෂයෙන්ම ආදායම් බදු ගෙවිය යුතු අයට එම ආදායම් බදු ගෙවන්න සරල ක්‍රමයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ක්‍රමය යටතේ වසරකට රුපියල් ලක්ෂ 12ක් හෝ ඊට අඩු ප්‍රමාණයක ආදායමක් -ඒ කියන්නේ මාසයකට රුපියල් ලක්ෂයක් හෝ රුපියල් ලක්ෂයකට අඩු ප්‍රමාණයක්- ගන්න කිසිවෙකුගෙන් අපි බදු අය කරන්නේ නැහැ. ඒ වාගේම බදු අය කිරීම වඩාත් සරල කරලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය කාලවලදී ඇමතිවරු තම-තමන්ගේ හිතවතුන්ට වාගේම තමන්ගේ හෙංචයියන්ට හිතූ මතයේ බදු සහන දීලා කොමිස් ගත් විධිය අපිට මතකයි. අපි ඇමතිවරයාගේ අතින් ඒ බලය අරගෙන, නව දේශීය ආදායම් බදු පනත විධිමත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ සම්බන්ධයෙන් විවිධ මත ප්‍රකාශ කරලා තිබෙනවා. විවිධ අසත්‍ය ප්‍රකාශ කරලා තිබෙනවා. එවැනි අසත්‍ය ප්‍රකාශයක් තමයි, විදේශ රටවල රැකියා කරන අය උපයන ආදායමින්, ආදායම් බදු අය කරනවාය කියන කාරණය. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. Foreign remittances by persons working abroad are not taxable. Persons living abroad are liable to pay income tax only on their earnings in Sri Lanka. ඒ අය පිට රට රැකියාවක් කළත්, ඔවුන්ට ඒ ආදායමට වඩා ලංකාවේ ආදායමක් තිබෙනවා නම් ඒ වෙනුවෙන් විතරයි ආදායම් බදු අය කරන්නේ.

ඒ විතරක් නොවෙයි, ලංකාවේ සිටිමින් විදේශ රටවලට විවිධ සේවාවන් සපයන පුද්ගලයන් ඉන්නවා. සමහරවිට architect කෙනෙක් වෙන්න පුළුවන්, lawyer කෙනෙක් වෙන්න පුළුවන්, accountant කෙනෙක් වෙන්න පුළුවන්. එම සේවාවන් රුපියල් මිලියන 15 දක්වා බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. Up to Rs. 15 million from services rendered to persons outside Sri Lanka is exempted from tax.

විශ්‍රාම ගිය අයටත් දැන් ආදායම් බදු ගෙවන්න සිදු වෙලා තිබෙනවාය කියා කියනවා. ඇත්ත වශයෙන්ම විශ්‍රාම ගිය අය අපි සම්පූර්ණයෙන්ම ආදායම් බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. නමුත් ඒ අයට ලැබෙන පොලි ආදායම අවුරුද්දකට රුපියල් ලක්ෂ 15කට වැඩි නම්, ඒ කියන්නේ මාසයකට රුපියල් 125,000කට වැඩි නම් විතරක් ඒක Withholding Tax එකකට භාජන වෙනවා. නමුත් අවුරුද්දකට ලක්ෂ 15ක පොලියක් ලබන්න නම්, අඩුම ගණනේ කෝටි 2ක් තමන්ගේ ගිණුමේ තිබෙන්න ඕනෑ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඇමතිතුමනි, මට පොඩි අවසරයක් දෙනවා නම් යම් පැහැදිලි කර ගැනීමක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, Commuted Pension එකෙන් බද්දක් අය කරනවාද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

No, it is only if the interest is over Rs. 1.5 million. [*Interruption.*] මිලියන 1.5 ක පොලි ආදායමක් විශ්‍රාමිකයන් කී දෙනෙකුට තිබෙන්න පුළුවන්ද? [බාධා කිරීමක්] අපේ විශ්‍රාම ගිය ජනාධිපතිතුමාට නම් තිබෙන්න පුළුවන්. එතුමා මේ සම්බන්ධයෙන් පාරට බහින්නත් හදනවා ලු. නමුත් මම හිතන විධියට, ලංකාවේ විශ්‍රාමිකයන්ගෙන් සියයට 95කට මේක බලපාන්නේ නැහැ.

ඒ වාගේම, the misconception that the "Capital Gains Tax is at 10 per cent on the sale price" is also not true. This tax is applicable on the gain derived from the sale of an extra land or house and the sale price is seen as the cost. Cost is equal to market value as at 30th of September, 2017 in spite the property was acquired years ago. Gifts exempt is, in any number of gifts, land or houses to a blood relation, one house is exempted. Assume a land acquired 30 years back for Rs. 50,000, sold for Rs. 1 million on 30th April, 2018 and the market value of that land as at 30th September, 2017 is Rs. 900,000, the Capital Gains Tax on that will only be Rs. 10,000. That is very reasonable.

"Sale of a vehicle is subject to Capital Gains Tax" is again an absolute lie. Capital Gains Tax is only applicable on the capital gains from lands, buildings and security.

ඒ වගේම, "tax on employment income is excessively taxed" is also not true. Actually, those who received a monthly salary of Rs. 100,000 prior to the 4th of April this year were already taxed Rs. 1,500. නමුත්, අද ඉඳලා ඒක බිංදුවට බහිනවා. මාසයකට රුපියල් 100,000කට වඩා අඩුවෙන් ගන්නා අයට බදු ප්‍රමාණය බිංදුවයි. නමුත් පසුගිය රජය කාලයේ ඒ අයගෙනුත් එම ප්‍රමාණයට අනුව රුපියල් 1,500ක් පමණ ආදායම් බදු අරගෙන තිබෙනවා. Sir, how much time do I have?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Your actual time ends up by 2.15 p.m. Obviously, if you need more time, the Leader of the House can give.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Minister, can have more time, Sir.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Okay. In fact, as I said earlier, the Government's tax policy has focused on some key principles and objectives:

(i) Increasing the share of government revenue which had declined to 11.6 per cent of GDP by 2014. This would enable us to better meet our debt repayments without compromising government expenditure on health, education and so on.

(ii) Achieve this revenue increase by increasing the share of Direct Taxes from 18 to 40 per cent to create a more progressive tax structure. Broaden the tax base to bring in the informal economy into the formal sector. This would create a level playing field by ensuring that everyone complies and shares the burden of taxes.

(iii) Reduce discretion in tax policy and shift to a simple, transparent, rules-based framework. In future, the Minister will not be able to change the rules and regulations according to the whims and fancies of those in power. This is required to minimize potential corruption and reduce tax leakages due to *ad hoc* exemptions.

The new Inland Revenue Act goes a long way towards achieving all of these objectives.

Sri Lanka has a highly regressive tax structure with 82 per cent of tax revenue being indirect taxes and only 18 per cent being direct taxes. Indirect taxes such as VAT, NBT, Customs Duty, PAL et cetera are paid by all citizens regardless of income levels. Therefore, a citizen who earns Rs. 20,000 a month will pay the same tax on a packet of milk powder as someone earning Rs. 200,000 per month. This is a highly inequitable outcome.

In order to correct this imbalance Sri Lanka must shift its tax structure towards more direct taxes such as Income Tax, Withholding Tax, Dividend Taxes and so on.

By enhancing income tax collection, we can ensure that the burden of taxes falls more to those who have greater income levels, and who can afford to pay.

The burden of tax payment has so far shifted to the poor with ever-increasing indirect taxes.

The primary objective of the Inland Revenue Act is to shift this unjust tax burden to a more equitable balance between direct and indirect taxes.

A major objective of the Inland Revenue Act is to increase tax collection by rationalizing tax exemptions and closing out tax loopholes. Sri Lanka's biggest problem is not the tax rates, but the lack of tax compliance.

Therefore, even with the new personal income tax regime, the highest tax bracket is 24 per cent, which is a lot lower than peer countries.

For example, in Bangladesh, it is 30 per cent. In Brazil, it is 27.5 per cent. Our neighbour India charges 35

[ගරු මංගල සමරවීර මහතා]

per cent. Malaysia charges 28 per cent. Vietnam charges 35 per cent. So, as you see, our tax bracket - the one introduced- is one of the lowest in the region and in the world.

Furthermore, under the new Inland Revenue Act, all SMEs get taxed at a lower rate of just 14 per cent Corporate Income Tax.

Companies predominantly engaged in businesses such as exports, tourism, IT, agriculture, education, are all taxed at a rate of 14 per cent. This is significantly lower than again the regional averages.

Employment Income Tax has a tax-free threshold of Rs. 100,000 per month. Thus, only those earning above that are subject to any income tax at all.

At income levels above Rs. 100,000 per month**,** the tax is at brackets of 4 per cent for every additional Rs. 50,000 per month up to a maximum of 24 per cent.

Therefore, an individual earning of Rs. 150,000 per month, will pay income tax of approximately Rs. 2,000. මාසයකට රුපියල් 150,000ක් පඩි ලබන කෙනෙකුටත් ගෙවන්න වෙන්නේ රුපියල් 2,000ක් වැනි ඉතා අවම මුදලක්. This equates to just over 1 per cent of his or her total monthly earnings.

What the Inland Revenue Act does achieve is, it closes out loopholes. Previously, the corporates could avoid paying tax through various allowances such as vehicle allowance, entertainment allowance et cetera, which usually accrued to high income earning senior management. Such allowances are now captured as income and are subject to tax.

Another important source of direct income tax is the Withholding Tax. Before this Government came into power, the Withholding Tax - WHT - rate on interest income on bank deposits was up to 8 per cent. මේ ගැන බොහෝදෙනකුට අමතක වෙලා. Due to low interest rates prevailing at the time in 2015, the Government as a concessionary measure reduced the Withholding Tax to 2.5 per cent and now this has been increased to 5 per cent as per the new Inland Revenue Act. ඇත්ත වශයෙන්ම අපි සියයට 5 දක්වා වැඩි කළත්, පසුගිය රජය කාලයේ තිබුණු සියයට 8ට වඩා එය තවමත් අඩුයි.

Therefore, for a deposit of Rs. 1 million earning interest of 12 per cent per annum, the monthly interest income is Rs. 120,000 and the tax would be just Rs. 6,000. To provide context, the interest rate on an average fixed deposit in 2015 was 6.9 per cent. Today, that rate is 11.5 per cent. Therefore, interest income is a lot higher at present. ඇත්ත වශයෙන්ම අද fixed deposits වලට ගෙවන පොලියත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා එදාට වඩා අද interest income එක වැඩිවෙලා තිබෙනවා.

For senior citizens, as I mentioned before, a special concession is provided where the first Rs. 1.5 million per annum is exempt from WHT.

The WHT in the new Inland Revenue Act does apply to investment income derived from foreign currency assets. Previously, this was exempt since Sri Lanka's Balance of Payments was weak and reserves were poor. Today, the external sector is strong and the new Foreign Exchange Act has made meaningful liberalization in capital markets which will enable Sri Lanka to continue to attract foreign currency inflows which allows a Withholding Tax of 5 per cent creating equal treatment to local currency deposits.

A popular misconception, Hon. Speaker, is that the Inland Revenue Act has removed all investment incentives. This is totally incorrect. The Inland Revenue Act has done away with untargeted, open-ended tax holidays that have previously been handed out without a proper basis, causing significant erosion of the tax base and creating room for corruption.

According to the 2016 Tax Expenditure Statement, the cost of income tax exemption alone in the past era was 0.6 per cent of GDP.

The Inland Revenue Act provides targeted tax relief based directly on the level of investment. Accordingly, for every capital investment above US Dollars 3 million, there is an additional 100 per cent capital allowance provided. This means the investor can set off his or her investment amount against future taxation in effect allowing him or her to have tax relief until the investment is recovered.

This targeted tax relief is attractive for genuine investors who believe in investing in the future of Sri Lanka. As a Government, we will do our utmost to minimize upfront costs of investment, but once an investment is successful and profitable, we expect a fair contribution to society through taxes.

For investments above US Dollars 100 million, the benefits are even higher with 150 per cent capital allowance and there is also a capital allowance provided for investments below US Dollars 3 million as per Schedule 6 of the Inland Revenue Act. And also, for the North, they will be getting a 200 per cent capital in allowance as an incentive to repair and rebuild the war-torn North.

I have a few more things to say, Hon. Speaker. I would like to table the rest of my speech because there are other speakers and I do not want to take more time. Therefore, I **table*** the rest of my speech and request you to include that in the Hansard.

I thank you for the time given.

සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::
Rest of the speech tabled:

A special allowance is made for investments that do not have a major capital component, particularly the IT sector, which gets an additional deduction for their investment in employment creation.

There is also a 100 per cent additional deduction allowed for investments in R and D.

Common Misperceptions

Will remittances be subject to tax?

No. The status quo remains and remittances will not be taxed.

Investment income from foreign currency bank accounts will however be subject to the 5 per cent WHT - creating equal treatment as local currency deposits.

Will EPF be subject to tax?

No. status quo remains.

The Inland Revenue Act and the IMF

When Sri Lanka commenced its most recent EFF agreement with the IMF, our economy was in a very difficult position due to both external and domestic factors.

Looming external debt repayments accumulated during the previous regime, combined with a tightening of global capital markets, contributed to this challenging environment.

Global market confidence in Sri Lanka's ability to meet these debt repayments was veining. It was in this context that Sri Lanka entered an EFF agreement with the IMF.

This provided immediate confidence to global markets that Sri Lanka was on a credible reform track - international borrowing costs declined and we have seen the stabilization of the economy.

With the IMF, it is not the quantum of the loan that is important to Sri Lanka - but the signal it provides to the world that Sri Lanka is on the right path. This enables the market stability that is needed to attract investment, support exports and manage debt.

The principles that are adhered to in the EFF include fiscal discipline, rule-based tax and expenditure policy, transparent public reporting of fiscal outcomes. These are principles that have merit regardless of whether we are in an agreement with the IMF or not.

At the end of the day the IMF can only provide advice and technical assistance to the Government of Sri Lanka. It is up to us the extent to which we implement the advice.

The IMF for instance provided technical assistance in the development of the Inland Revenue Act - sharing global best practices in principles of taxation. But it was developed and created by our own officials and experts tailored to Sri Lanka's own development objectives and circumstances.

In fact, since I took over as the Minister of Finance, we made more than 200 amendments to the then Inland Revenue Bill in order to reflect the views of broader stakeholders and the Government's economic policy objectives.

During this near two-year period with the IMF, the economy has made important gains.

- Government finances had its first primary surplus in decades.
- Exports and FDI hit record levels in 2017.
- Foreign reserves have reached comfortable levels of US Dollars 7.9 billion.
- National inflation in February, 2018 was down to 3.2 per cent with monthly prices declining in January and February.

The results of this stabilization have not yet translated into GDP growth because of the climatic disruptions we have faced. I am confident that the benefits of the policy measures we have put in place will materialize in the near term.

Let us also remind ourselves that we have made these gains in macroeconomic stabilization whilst ensuring continued focus on Government expenditure and improving the quality of that expenditure. The Government's expenditure on education, higher education and skills developments has increased from 1.9 per cent in 2014 to 2.4 per cent in 2017. Similarly expenditure on public health has increased from 1.39 per cent in 2014 to 1.74 per cent in 2017. We will continue to invest in our people and invest in our future.

A premature interruption of the fiscal consolidation process will destabilize the economy and erase the gains that have been made. Whilst being committed to fiscal consolidation, the Government has always found room to ease taxes on essential items to ensure public welfare. When the drought resulted in an increase in food prices last year, we reduced taxes on a number of food and related items to provide relief to the public.

Whilst these tax relief measures have hurt over revenue performance - these are necessary measures to ensure public welfare, particularly at a time of drought. Once the impact of the Inland Revenue Act materializes, we will be able to gradually reduce rates on indirect taxes such as VAT, Customs duties and so on.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Eran Wickramaratne, you can commence your speech.

[අ.භා. 2.20]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අති විශේෂ ගැසට් පත්‍ර මගින් පළ කරන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් පිළිබඳව විවාද කෙරෙන මේ අවස්ථාවේදී අපේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මුදල් ඇමතිතුමා විශේෂයෙන්ම කථා කළේ, අප්‍රේල් 01 වෙනි දා සිට ක්‍රියාත්මක වෙන අලුත් ආදායම් බදු ගැනයි. මේ පිළිබඳව වාසුදේව නානායක්කාර මැතිතුමා ප්‍රශ්නයක් ඇහුවා. එයට තව සුළු වේලාවකින් පිළිතුරක් දෙන්න මා බලාපොරොත්තු වෙනවා. නමුත් මා කාරණයක් කියන්න අවශ්‍යයි. එතුමා ඇහුවා, Commuted Pension එක ගැන. එතුමා අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු දෙන්නම්. අවුරුදු 20කට වඩා අඩුවෙන් සේවය කරලා තිබෙනවා නම්, රුපියල් ලක්ෂ 20 -රුපියල් මිලියන 2- දක්වා වූ Commuted Pension එකකට කිසිම ආදායම් බද්දක් අය කරන්නේ නැහැ. ඒ මුදල රුපියල් ලක්ෂ 20 සිට රුපියල් ලක්ෂ 30 දක්වා වෙනවා නම්, ඒ මුදලට සියයට 5ක ආදායම් බද්දක් ගෙවන්න තිබෙනවා.

ඊට පසුව, වැඩියෙන් ලැබෙන ඉතිරි කොටසට සියයට 10ක බද්දක් අය කරනවා. සේවා කාලය අවුරුදු 20කට වැඩි නම්, රුපියල් මිලියන 50 -රුපියල් ලක්ෂ 500- දක්වා කිසිම ආදායම් බද්දක් අය කරන්නේ නැහැ; it will be completely tax free.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ තුළින් සල්ලි තිබෙන උදවිය තමන්ගේ මුදල් බැංකුවේ තැන්පත් කිරීම අධෛර්යයට පත් වීමක් සිද්ධ වෙන්නේ නැද්ද? එහෙම නැත්නම්, ඒ මුදල් නීත්‍යානුකූල ප්‍රවාහයෙන් තැන්පත් කරනවා වෙනුවට, වෙනත් ක්‍රමෝපායන්වලට මාරුවීමට මේ තුළින් පෙළඹවීමක් වෙන්නේ නැද්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඕනෑම බද්දක් අය කරනකොට සමහර අය එක්කෝ කොටිටේ යට මුදල් තබා ගන්න පුළුවන්, එහෙම නැත්නම් නීත්‍යානුකූල නොවන පරිහරණයක යෙදෙන්න පුළුවන්. මා හිතන හැටියට කොටිටේ යට තබා ගන්න එක නම් සිදු වන එකක් නැහැ. මොකද, බැංකුවක මුදල් තැන්පත් කළාම සෑහෙන පොලියක් ලැබෙනවා. ඒ පොලියෙන් සුළු ප්‍රමාණයයි බද්දක් හැටියට ගන්නේ. නීත්‍යානුකූල නොවන ක්‍රියා සිදු වෙනවා. එයට බොහෝ හේතු තිබෙනවා. බද්ද එක හේතුවක් පමණයි. බොහෝ විට බද්ද නිසා පමණක් නීත්‍යානුකූල නොවන ක්‍රියා සිදු වෙනවාය කියලා කියන්නට බැහැ. නීත්‍යානුකූල නොවන ක්‍රියාවල යෙදෙන්න වෙනත් හේතු තිබෙනවා. බොහෝදෙනකු බැංකු ක්‍රමය හරහා ක්‍රියාත්මක කරන්නේ කාර්යක්ෂමතාව නිසායි. බද්දක් ගෙවන්න සිදු වුණත්, ඒ අයගේ මුදල් බැංකු ක්‍රමය තුළ යොදවයි. එය විශාල ගැටලුවක් -ප්‍රශ්නයක්- හැටියට මා දකින්නේ නැහැ.

අද ආර්ථිකය ගැන කථා කරනකොට, මේ වසර දෙක තුළදී මධ්‍ය කාලීනව අපේ අය වැය පරතරය සියයට 3.5 දක්වා පහළට ගෙනෙන්න එකඟ වෙලා තිබෙනවා. පසුගිය වසරේදී ඒ ප්‍රමාණය දශම පහකින් පමණ අපේ ඉලක්කය ඉක්මවා ගියා. විශේෂයෙන්ම එය සිදු වුණේ, කාලගුණ විපර්යාස නිසායි. ජල ගැලීම නිසාත්, නියඟය නිසාත් කෘෂිකර්මයේ වර්ධනයට හානියක් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝලීය උණුසුම ගැන බලනකොට, රටක් හැටියට අපි ගෝලීය උණුසුමට දායකත්වය නොදක්වපු රටක්. ඒ කියන්නේ, ශ්‍රී ලංකාව පරිසරය නිවැරදිව කළමනාකරණය කරපු රටක් කියලා කියන්නට පුළුවන්.

අපි අතින් අඩු පාඩුවක් වුණා නම්, කැලෑ නැති කිරීමේ අඩු පාඩුව තමයි වෙලා තිබෙන්නේ. අපේ රටේ තිබුණු කැලෑ ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු වෙලා තිබෙනවා. නැවත කැලෑ ඇති කරන්න අපි වැඩ පිළිවෙළ යොදාගෙන යනවා. ගෝලීය උණුසුම වැඩි වීම හේතුකොටගෙන අපේ රටේ විපර්යාස රාශියක් ඇති වුණා. එය ආර්ථිකයටත් විශාල ලෙස බලපා තිබෙනවා. ඒ නිසා තමයි අය වැය පරතරය අපේක්ෂිත ඉලක්කයෙන් එහාට ගිහිල්ලා තිබෙන්නේ. නමුත්, මධ්‍ය කාලීනව සියයට 3.5 මට්ටම දක්වා එයි කියා සම්පූර්ණයෙන්ම පැහැදිලියි; ඒක හැමෝම පිළිගන්නවා. ඒ නිසා තමයි ජාත්‍යන්තර ශ්‍රේණිගත සමාගම් මේ ප්‍රශ්න ඔක්කෝම තිබියදී, අපේ අය වැය, ඒ වාගේම ආර්ථික කළමනාකාරිත්වය "negative" තිබුණු තැන්වල අපට "stable" කියලා දීලා තිබෙන්නේ. ඒ කියන්නේ, "ආර්ථිකය ස්ථාවරයි" කියන සංඥාව දීලා තිබෙනවා.

අපේ ප්‍රාථමික අතිරික්තය ගත්තොත්, -ආදායම අඩු කිරීම වියදම. ඒකෙන් පොලී අනුපාතය අඩු කළාම ප්‍රාථමික අතිරික්තය ලැබෙනවා.- පළමුවැනි වතාවට ධන අගයක් ගෙන තිබෙනවා. 1950 ගණන්වලට පස්සේ අපේ ඉතිහාසයේ පළමුවැනි වතාවට ප්‍රාථමික අතිරික්තය ධන වෙලා තිබෙන්නේ 2017 වසරේ කියන එක සඳහන් කරන්න අවශ්‍යයි. විදේශ සංචිත -foreign reserves- ප්‍රමාණය ගත්තොත් 2017දී ඩොලර් බිලියන 2කින් වැඩි වෙලා තිබෙනවා. අපනයන සියයට 10කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගිහින් තිබෙන බවක් අපට පෙනෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ පහළ මට්ටමක පැවැති අපනයන දැන් වැඩි වෙලා තිබෙනවා. හැම ක්ෂේත්‍රයේම පාහේ අපනයන ඉහළ ගිහින් තිබෙනවා. විශේෂයෙන්ම මත්ස්‍ය අපනයනය ඉහළ ගිහින් තිබෙනවා. මොකද, යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කළා. අපට GSP Plus සහනය ලැබුණා**.** හැබැයි, GSP Plus සහනයේ ලාභය තවම ආර්ථිකයට ලැබිලා නැහැ. යුරෝපයට GSP Plus සහනය ලැබුණ බව ඔබතුමන්ලා දන්නවා. එයට ඇමෙරිකාවේ ජනාධිපතිතුමාත් මෑතකදී අත්සන් කර තිබෙනවා. දැන් ඒක ඇමෙරිකාවටත් බලපානවා. ලබන වසර තුනේදී එම ප්‍රතිලාභය අපේ ආර්ථිකයට ලැබේවි කියා අපි බලාපොරොත්තු වනවා. GSP Plus සහනයට භාණ්ඩ ද්‍රව්‍ය 7,000ක් විතර ඇතුළත් වනවා. එම සහනය ලබාගෙන අපට භාණ්ඩ අපනයනය කරන්න පුළුවන්.

අපේ ඍජු විදේශ ආයෝජනත් වැඩි වෙලා තිබෙනවා. 2016දී ඩොලර් මිලියන 800ක් විතර වුණ ඍජු විදේශ ආයෝජන 2017දී දෙගුණයක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඩොලර් මිලියන 1,600 ඉක්මවා ගිහින් තිබෙනවා. එය පසුගිය වසරේ පමණක් දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, ඉතිහාසයේ වැඩියෙන්ම ඍජු විදේශ ආයෝජන ලැබුණු වසර 2017 වනවා. දැනට ඍජු විදේශ ආයෝජන ඩොලර් බිලියන 2 ඉක්ම වනවා. 2018 වසර අවසානයේදී ඍජු විදේශ ආයෝජන ඩොලර් බිලියන 2.5ට ආසන්න කර ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. රටේ උද්ධමනය වැඩි වෙලා තිබුණාට උද්ධමනය අඩු වෙමින් යන බව පසුගිය සතියේ නිකුත් කරපු මහ බැංකු වාර්තාවෙන් ප්‍රකාශ වෙලා තිබෙනවා. අපි දැන් බලන්න ඕනෑ trend එක; බඩු මිල දීර්ඝ කාලීනව කොයි පැත්තටද

යන්නේ කියලා. ඒ කියන්නේ, බඩු මිල අඩුවීමේ ප්‍රවණතාවක් තිබෙනවා කියලා මහ බැංකුවේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු මුදල් ලබා ගත්තාට පසුව ඒවා වියදම් කරන්නේ කොහොමද කියලා සමහර අය අහනවා. බදු මුදල් අරගෙන, අපි ඒවා වියදම් කරලා තිබෙනවා. මම සඳහන් කරන්න කැමැතියි, අපි ඒ බදු මුදල් විශේෂයෙන්ම අධ්‍යාපනයට, සෞඛ්‍යයට ක්‍රමානුකූලව වියදම් කරලා තිබෙන බව. 2014 වසරේදී අපි දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.9යි අධ්‍යාපනයට -අධ්‍යාපනයට, උසස් අධ්‍යාපනයට, නිපුණතා පුහුණුවට- වියදම් කරලා තිබුණේ. ඇත්තටම පසුගිය දශකය තුළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනයට, උසස් අධ්‍යාපනයට, නිපුණතා සංවර්ධනයට වියදම් කළ ප්‍රමාණය ක්‍රමානුකූලව පහළ ගිහිල්ලා තිබුණා. ඇත්තටම අපේ රටේ තිබෙන විශේෂතාවක් තමයි භූගෝලීය පිහිටීම. ඊට අමතරව කුඩා ජන සංඛ්‍යාවක් ඉන්නා නිසා ඒ ජනතාවගේ අධ්‍යාපනය, හැකියා සංවර්ධනය ප්‍රමුඛ කළ යුතුයි. ඕනෑම රජයක් ඒක ප්‍රමුඛ කළ යුතුයි. යටිතල පහසුකම්වලට වියදම් කරන එක වැදගත්. නමුත් ඊටත් වඩා වැදගත්, මානව සම්පත ගොඩ නැඟීමට කරන ආයෝජනය. අධ්‍යාපනයට, උසස් අධ්‍යාපනයට, නිපුණතා සංවර්ධනයට කරන වියදම, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට 2014 වසරේදී 1.9ක්ව තිබුණු අගය, 2017 වසර වන විට 2.4 දක්වා වැඩි කරන්න මේ කෙටි කාලය තුළදී අපේ රජයට පුළුවන් වෙලා තිබෙනවා. 2020 වසර වන විට එය සියයට 3 දක්වා ගෙන යන්න, 3ට කිට්ටු අගයක් දක්වා ගෙන යන්න අපි -මේ ආණ්ඩුව- බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ, එක ආණ්ඩු වාරයක් තුළදී එම අගය සියයට 1.9 ඉඳලා 3 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඉන් පසු වාරයේදී එම අගය සියයට 4ට-5ට ගෙන යා යුතුයි.

පොදු සෞඛ්‍ය ක්ෂේත්‍රය -public health sector- දිහා බලනකොට 2014 වසරේදී වියදම් කළ ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.39යි. 2017 වසර වන විට අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයට කරන වියදම සියයට 1.74ට වැඩි කරලා තිබෙනවා. මේ ආණ්ඩු කාලය තුළදී අපි එම වියදම සියයට 2ට ආසන්න අගයක් බවට පත් කරන්න බලාපොරොත්තු වෙනවා. නාස්තිය අවම කරන්නට ඕනෑ. නමුත්, ඒ වෙනුවෙන් ක්‍රමවේද බොහොමයක් යොදවන්නට අවශ්‍යයි.

අපේ මුදල් අමාත්‍යාංශය යටතේ ප්‍රධාන දෙපාර්තමේන්තු තුනක් තිබෙනවා. එකක් තමයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. දෙවැනි එක, ශ්‍රී ලංකා රේගුව. තුන්වැනි එක, සුරාබදු දෙපාර්තමේන්තුව. අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අලුත් ආදායම් බදු පනතක් ගෙනාවා. මේ වසර අවසන් වන්නට ප්‍රථමයෙන් අලුත් රේගු පනතක් ගෙන එන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. මේ කරුණු මුදල් ඇමතිතුමා සඳහන් කරලා තිබෙනවා. ඒ කියන්නේ, මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන මේ ආයතන තුන තුළ තිබෙන නීතිමය රාමුව සකස් කරන්න කටයුතු කරනවා.

ශ්‍රී ලංකා රේගුව අද විද්‍යුත් මාර්ග -online payment- භාවිත කරලා ගෙවීම් කරන්නට සලසලා තිබෙනවා. ඒ වාගේම, විද්‍යුත් අත්සන -e-signature- පිළිගැනීමේ ක්‍රමවේදයකුත් 2018 පෙබරවාරි මාසයේ 01වැනිදා ඉඳලා සකස් කර තිබෙනවා. අපි ICT - Information and Communication Technology- භාවිත කරමින් මෙය කාර්යක්ෂම කරන්න බලනවා. ඒ ආකාරයට මෙය කාර්යක්ෂම කිරීමේදී පාරිභෝගිකයා, එහෙම නැත්නම් බදු ගෙවන්නා සහ නිලධාරීන් අතර තිබෙන සම්බන්ධතාව ඉබේටම අඩු වෙනවා. එහෙම අඩු වුණාම මේ ක්‍රමය ඊට වැඩිය කාර්යක්ෂම වෙනවා. එසේ වන විට දූෂණයට තිබෙන අවස්ථාව බොහෝදුරට අඩු වෙනවා.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් ගෙනාවාම, නිලධාරීන් වෙන්න පුළුවන්; දේශපාලනඥයා වෙන්න පුළුවන්; ඇමතිතුමා වෙන්න පුළුවන්, ඇමතිතුමාට තීරණ ගන්න පුළුවන් පරාසය අඩු කර තිබෙන බව මෙහි මූලික අරමුණ වශයෙන් මුදල් ඇමතිතුමා මොහොතකට ප්‍රථමයෙන් කථා කරන කොට කිව්වා. ඒ කියන්නේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්හි ලියා තිබෙන විධියටම ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් අපි ගෙනාවා විතරක් නොවෙයි, මෙය විග්‍රහ කිරීමට, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් හා සම්බන්ධ අත් පොතක් - manual එකක්- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ නිකුත් කර තිබෙනවා. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද යන්න සම්බන්ධයෙන් එහි පැහැදිලි කිරීම් තිබෙනවා. අද ඕනෑම පුරවැසියෙකුට ඒ වෙබ් අඩවියට ගිහිල්ලා ආදායම් බදු අත් පොත ලබා ගෙන විස්තර දැන ගත හැකියි.

විනිවිදභාවය වැඩි කිරීමත්, පුරවැසියාට වැඩියෙන් තොරතුරු ලබා දීමත් අපේ අරමුණ වෙලා තිබෙන නිසා තමයි, විශේෂයෙන් මේ දෙපාර්තමේන්තු තුළ අපි ක්‍රියාත්මක කර තිබෙන වැඩපිළිවෙළ මම පැහැදිළි කළේ. ඒ දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ සාකච්ඡා කර, ජනතාවට ආදායම් බදු ගෙවීම පහසු කිරීමට තවත් වැඩ පිළිවෙළක් අනාගතයේදී ඉදිරිපත් කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ණය ගෙවීම් ගැන මොහොතකට කථා කළොත්, 2015 ජනවාරි මාසයේදී මේ ආණ්ඩුව වගකීම භාර ගන්නකොට අපි විශාල ණය බරක් ද ලබා ගත් බව අපි දන්නවා. ඒ ණය බර කළමනාකරණය කිරීමේ වැඩ පිළිවෙළ ඉටු වෙගෙන යනවා. කලට වෙලාවට අපි ඒ ණය සියල්ලක්ම ගෙවනවා. ඒ විතරක් නොවෙයි, ණය කළමනාකාරීත්වය සම්බන්ධයෙන් Active Liability Management Bill එක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමතිය ලබා ගෙන ඒ කළමනාකාරීත්වය ද කර ගෙන යනවා. ඒ ණය කළමනාකාරීත්වයේ යහපත වන්නේ මෙයයි. සාමාන්‍යයෙන් බැංකුවක ණය කළමනාකරණය කරනකොට, ගෙන තිබෙන ණයක පොලිය වැඩියි කියා හිතනවා නම්, ඒ ණය විකුණලා අඩු පොලියට අලුත් ණයක් ගන්න පුළුවන්. ඒ මුලින් ගත් ණය කාලයකට සීමා වෙලා තිබෙනවා නම්, ඒ කාල පරාසයත් දැන් වෙනස් කරන්නට පුළුවන්. ඒ කාලය අඩු කරන්නට පුළුවන්; නැත්නම් වැඩි කරන්නට පුළුවන්. වෙළඳපොළ ආර්ථිකයක් ලෝකයේම තිබෙනකොට, වෙළඳපොළේ මේ පොලිය කියන දෙය වෙනස් වෙමින් පවතිනවා. මේ ණය කළමනාකාරීත්වය සම්බන්ධයෙන් අපි ගෙනෙන සක්‍රිය බැරකම් කළමනාකරණය කිරීමේ පනත හරහා පරණ ණයක් අලුත් කරන්නත්, කාල පරාසය දීර්ඝ කරන්නත්, වෙළඳ පොළේ තිබෙන පොලී අනුපාතයට ප්‍රතිචාරය දක්වන්නත් ඉඩ සලසා තිබෙනවා. අපේ ණය බර අඩු කිරීමටත්, ඒ ණයවලට ගෙවන පොලිය අඩු කිරීමේ පරමාර්ථයෙනුත් තමයි ඒ දෙය අපි සිදු කර තිබෙන්නේ. මේ කාරණය ගැන පැහැදිලි කිරීමක් කරන්න මම මෙය අවස්ථාවක් කර ගත්තා, අපේ macro economy එක කොහොමද අපි කළමනාකරණය කර ගෙන තිබෙන්නේ, කොහොමද අත්තිවාරම දමා තිබෙන්නේ කියන කාරණා පැහැදිලි කරන්න. ඒ වාගේම ලබන වසර දෙකේදී මේ අත්තිවාරම ගොඩ නහලා විශේෂයෙන් දැන් ආර්ථික සංවර්ධන වේගය වැඩි කිරීමට මුල් තැනක් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. Next, the Hon. Vasudeva Nanayakkara.

[අ.භා. 2.38]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්තුතියි. ගරු ඉරාන් වික්‍රමරත්න අමාත්‍යතුමාගේ කථාවේ අවසාන වාක්‍යයේ අදහස තමයි, ආර්ථික සංවර්ධන වේගය වැඩිකිරීමට කටයුතු කරනවාය කියන එක. ආර්ථික සංවර්ධන වේගය සියයට 4.4 සිට සියයට 3.1ට බහිනවා. 2017 වර්ෂයේදී ආර්ථික සංවර්ධන වේගය සියයට 3.1ට බැහැලා. ආර්ථික සංවර්ධන වේගය වැඩිකිරීමේ අරමුණ තමුන්නාන්සේලාට තිබුණාට යථාර්ථ වශයෙන් එයට ප්‍රතිවිරුද්ධ දෙයක් වෙන්නේ. ඒකමයි මට දැන් කියන්න තිබෙන්නේ. ඍජු බදු සියයට 40 කරලා වක්‍ර බදු සියයට 60 කරන්නයි යන්නේ. නමුත් වැට් බදු අඩු කිරීමක් නැහැ. එක පැත්තකින් අනෙක් බදුවලට අතිරේකව වක්‍ර බදු වැඩි වෙලා තිබෙන්නේ වැට් බදු සියයට 15ට නැංවීමෙන්. තමුන්නාන්සේලා ඍජු බදු සියයට 40ට ගේනවා නම්, වක්‍ර බදු සියයට 60ට ගේනවා නම්, මේ අද තිබෙන බදු ව්‍යුහය තුළ ඒක වෙන්න බැහැ. මේ බදු ව්‍යුහයේ මූලික වෙනස්කම් වෙන්නට ඕනෑ; වක්‍ර බදු අඩු කිරීමේ මූලික පියවරයන් තිබෙන්නට ඕනෑ. කෝ, ඒවා? කෝ, වක්‍ර බදු අඩු කිරීමේ මූලික පියවරයන්? එම නිසා මේ කථාවල ඇත්ත හරය, ඇත්ත වටිනාකම අපට තේරුම් ගන්නට පුළුවන් වන්නේ ක්‍රියාත්මක වශයෙන් කටයුතු සිදු වන ආකාරය අනුවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ පනත යටතේ පසුගිය කාලයේ පනවපු නියෝග ගණනාවක් අනුමත කිරීමට අද ඉදිරිපත් කර තිබෙනවා. විශේෂ වෙළඳ භාණ්ඩ පනත යටතේ මේ නියෝග පැනවීමට ප්‍රධාන අරමුණ වුණේ, ඉහළ යන භාණ්ඩ මිල -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පැනවීමේ ප්‍රධානම අරමුණ වුණේ වැඩිවන ජීවන වියදම් බර හමුවේ ඊට බලපාන යම් යම් භාණ්ඩවල මිල මට්ටම් නියාමනය කිරීමයි. නමුත්, ඒ වෙනුවට අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හරහා ජීවන මිල අඩු කිරීමට හේතුවන නියාමනයකට වඩා බදු එකතු කිරීමේ ක්‍රියාදාමයක් ඒ තුළින් සිද්ධ වෙමින් තිබෙනවා. වැඩි වුණු වෙළඳ භාණ්ඩ බදු ප්‍රතිශතය අනුව ඒක අපට බලාගත හැකියි. ඒක මම පසුව පෙන්වන්නම්.

දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ අරමුණ ඇතිව ආනයනය කරන භාණ්ඩවලට වැඩි බදු පැනවීමක් කරන එක ඇත්ත; එය කළ යුතු බවත් ඇත්ත. නමුත්, ප්‍රමාණවත් දේශීය භාණ්ඩ සැපයුමක් නැති විට ඒවායේ මිල ගණන් විශාල වශයෙන් ඉහළ යනවා. එසේ මිල ඉහළ යෑම නිසා ජීවන වියදමට ඒක තදින්ම බලපාමින් තිබෙනවා.

වී මිලදී ගැනීම ගැන පසුගිය දිනවල පත්තරවල තිබුණා. අනුරාධපුරයේ වී මිලදී ගැනීම සඳහා ගබඩා විවෘත කර ගෙන වී අලෙවි මණ්ඩලය බලාගෙන ඉන්නවා. නමුත්, එතැනට කවුරුවත් වී ඇටයක්වත් ගෙනැල්ලා නැහැ. වී නොගයම කුඹුරේදීම, කමතේදීම, නොයෙකුත් වී මෝල්හිමියන් හා ප්‍රධාන පෙළේ මුදලාලිලා අරගෙන යනවා. වී අලෙවි මණ්ඩලයට වී ඇටයක්වත් එන්නේ නැහැ. දැන් මේකේ ඇත්ත තේරුම මොකක්ද? යථාර්ථවාදී මිලක් නියම නොකර වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගන්න පුළුවන් වන්නේ නැහැ. දැන් මේකේ ප්‍රතිඵලය මොකක්ද? මේ සියලුම වී ප්‍රධාන පෙළේ වී මෝල්හිමියන්ගේත්, ප්‍රධාන පෙළේ වී මුදලාලිලාගේත් අතට යනවා. එතකොට මොකක්ද වන්නේ? මාස් කන්නයේ වී අස්වැන්න සම්පූර්ණයෙන්ම තිබෙන්නේ පෞද්ගලික අංශය අතේයි. වී මිල නියාමනය, හාල් මිල නියාමනය කිරීමට වෙළෙඳ පොළට වී දමන්න වී අලෙවි මණ්ඩලයට වී ඇටයක්වත් නැහැ. මෙන්න මේ තත්ත්වය තුළ සහල්වල මිල නියම වෙන්නේ කොහොමද? මහා පරිමාණ වී මෝල්කරුවන්, වී මුදලාලිලා සහ සහල් මුදලාලිලා අතේ තිබෙන අතිවිශාල සහල් තොග සම්භාරයට ඒ අය තමයි මිල නියම කරන්නේ. මේ අනුව සැපයුම ප්‍රමාණවත් නොවෙනවා නම්, එසේ ප්‍රමාණවත් නොවන්නේ මේ විශාල ගබඩාවල රඳවා ගෙන තිබෙන සහල් හෝ වෙනත් පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණවත් ලෙස වෙළෙඳ පොළට නොලැබීම නිසායි.

දැන් අපි විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ගැන බලමු. 2011 වර්ෂයේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදුවලින් රැස් කර ගත් බදු ආදායම, 2010 වර්ෂයේ බදු ආදායම හා සැසඳීමේදී සියයට 53.6කින් වර්ධනය වෙලා තිබෙනවා. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ අරමුණ වුණේ මිනිසුන්ට සහනයක් වෙන පරිදි අනෙකුත් සියලුම බදුවලින් විශේෂ වෙළෙඳ භාණ්ඩ මුදා හැර -රේගු බදුවලින්, වරාය බදුවලින් මුදා හැර,- එක බද්දකට පමණක් යටත් කිරීමයි; එම බද්ද විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැටියට පමණක් නියම කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රජයේ බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්

3.7ක් වෙලා තිබෙනවා; 2014 වර්ෂයේ 4.6ක් වෙලා තිබෙනවා; 2016 වර්ෂයේ 3.8ක් වෙලා තිබෙනවා. මෙයින් පෙනී යන්නේ රජය ක්‍රමානුකූලව ඒ බදු ප්‍රතිශතය වැඩි කරමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තමන්ගේ ආදායමට එකතු කිරීම ආරම්භ කර තිබෙනවා කියන එකයි. මේ නිසා අද වක්‍ර බදුවල බලපෑම වැඩි වෙලා තිබෙනවා. මේ අනුව ක්‍රියා කරමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආණ්ඩුවේ ආදායම් මාර්ගයක් බවට හරහා ගැනීමට යාමත් එක්ක මේ රටේ ජනතාවට වක්‍ර බදු බර තවත් වැඩිපුර දැනෙන්නට පටන් ගත්තා. ඒ අනුව 2014 වර්ෂයේ සමස්ත බදු ආදායමෙන් ආනයනය පදනම් කර ගත් බදු ආදායම රුපියල් මිලියන පන්ලක්ෂ පහළොස් දහස් ගණනක් වන විට විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම රුපියල් මිලියන 47,953ක් වුණා.

සියයට 9.3කින් වැඩි වී තිබෙනවා. කාගේ ආණ්ඩු කාලයේද මේවා වුණේ කියන එක නොවෙයි මම අවධාරණය කරන්නේ. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ජනතාවගේ ජීවන බර විශේෂ මට්ටමක රඳවා තැබීමටත්, මේ රටේ දේශීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනවල ආරක්ෂාව සඳහාත් යොදා ගත හැකි යාන්ත්‍රණයක් හැටියට ආරම්භ කරනු ලැබූවත්, සංකල්පනය කරනු ලැබූවත්, අද එය ක්‍රියාත්මක වීමේදී සම්පූර්ණයෙන්ම සංකල්පය උල්ලංඝනය වෙමින් එහි ප්‍රමුඛ අර්ථයෙන් පිට ගමන් කරමින් තිබෙන බව මම කියන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම අලුත් ආදායම් බදු පනත ගැන වචනයක් කියන්නට කැමැතියි. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. කෙනෙක් අවුරුදු 20ක් රජයට සේවය කරලා විශ්‍රාම යන විට ඔහුට ලැබෙන ලොකුම උපකාරය තමයි පසුව අඩු කර ගැනීමේ පදනමින් අවුරුදු 10ක වැටුප එකවර ලැබීම. අවුරුදු 10ක වැටුප ඒකාබද්ධව එකවර ලැබෙනවා. ඒකට කියනවා ඒකාබද්ධ විශ්‍රාමික පාරිතෝෂිකය කියලා. ඒක පාරිතෝෂිකයක් නොවෙයි, ඒක අඩු කර ගන්නවා. මේකෙන් බදු ගැනීම සදාචාර විරෝධීයි. මේ මිනිස්සු අවුරුදු 20ක් සේවය කරලා තිබෙනවා. ඒ විශ්‍රාම වැටුප තමුන්නාන්සේලා අනාගතයේදී ආණ්ඩුවෙන් ගෙවන්නෙත් නැහැ. ඒ සඳහා සේවකයාගේ වැටුපෙනුත් අඩු කර ගන්නයි යන්නේ. එසේ කරමින් අනෙක් අතට මොවුන්ගේ ඒකාබද්ධ විශ්‍රාමික අරමුදලින් බදු අය කිරීමට සූදානම් වීම ඇත්ත වශයෙන්ම අමානුෂික ක්‍රියාවක් හැටියට අපි පෙන්වා දෙන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වැට්" එක ගැන බොහෝ දෙනාගේ පැමිණිලි විශාල වශයෙන් තිබෙනවා. එක ගරාජයක අයිතිකාරියක් මට හමු වුණා. ඒ ගරාජය වාහන repair කරන තැනක්. ඒ වාහන repair කරන ගරාජය ළඟ නවත්වලා තිබෙන වාහන ගණන් කරලා ඒ අනුව ගණන් බලලා "වැට්" එක අය කරන බව ඒ ගරාජය හිමි අයිතිකාරිය කිව්වා. ඒ අය කිව්වා කොයි තරම් අසාධාරණවද මේ "වැට්" එක ගණන් බලන්නේ කියලා. ඒ වාහන ගණන් කරලා ඉලක්කම්වලට හරවලා ඒ ඉලක්කම් ගුණ කරලා ඒ එන ප්‍රතිඵලය අනුව පිරිවැටුම ගණන් බලලා ඒ අනුව ඒ අයගෙන් "වැට්" එක අය කිරීමට ක්‍රියාත්මක වෙන බව ඒ අයගේ පැමිණිල්ල වුණා. ඒ අනුව ඇත්තටම සුළු ව්‍යාපාරිකයින්ට, කුඩා ව්‍යාපාරිකයින්ට අද දමා තිබෙන බදු ජාලය මරු වැලක් හැටියටයි ඒ අය කල්පනා කරන්නේ. මේ තුළින් එක්තරා විධියකට මේ බදු නියමාකාරයට නොපෙන්වන, බදු යට ගහන, නැත්නම් ආදායම් යට ගහන තැනකට මේ මිනිසුන්ව පත් කරනවා. මේ මිනිසුන්ව වියදම් කරවන්නයි යොමු කරන්නට ඕනෑ. ආර්ථිකයක් දුවන්නේ මිනිසුන් වියදම් කරන තරමටයි. මිනිසුන් වියදම් කරන්නේ මිනිසුන්ගේ වියදම් කරන ආදායමට බදු නො ගහන තරමටයි. කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ ව්‍යාපාරිකයින්, නොයෙකුත් සුළු කර්මාන්තකරුවන් කියන මේ හැමෝගේම පිරිවැටුම එක්තරා ප්‍රමාණයකින් ගණනය කළාම අද තිබෙන මුදල් වටිනාකම අනුව රුපියල් ලක්ෂයකට වඩා ආදායමක් කියලා කියන්නේ ලොකු ආදායමක් නොවෙයි. යුනිලීවර් සමාගමේ කම්කරුවෙක්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කම්කරුවෙක්, වරාය කම්කරුවෙක් සමහර විට අද රුපියල් ලක්ෂයකට වැඩි ආදායමක් මාසිකව සොයනවා. ඒ මිනිස්සු ඔක්කොම බද්දට යට වෙනවා.

ඒ වාගේම කුඩා ව්‍යාපාරිකයිනුත් මේ බද්දට යට වෙනවා. ආදායම රුපියල් ලක්ෂයක් දක්වා ලබන කාගෙන්වත් බදු අය කරන්නේ නැහැ කියලා මහ උජාරුවට කිව්වාට, අද රුපියල් ලක්ෂයක ආදායමක් කියන්නේ මොකක්ද? අද තිබෙන ජීවන වියදම් බර අනුව අපට කොච්චර වියදමක් යනවාද ජීවත් වෙන්න? අද රුපියල් 50,000කට අඩු ආදායම් ලබන ඔක්කෝම දුප්පතුන්. ඇයි ඒ? රුපියල් 50,000ක් නැතිව අද පවුලකට ජීවත් වෙන්න බැරි බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවම කියනවා. එහි සංඛ්‍යා ලේඛන අනුව රුපියල් 50,000කට වැඩිය ඕනෑ, දරුවන් දෙදෙනකු එක්ක දෙමහල්ලන්ට ජීවත් වෙන්න. ඒ කියන්නේ, අත්‍යවශ්‍ය දේවල්වලට පමණක් වියදම් කරන්නයි. මත් පැන්වලට නොවෙයි, වෙනත් වෙනත් සමාජ වියදම්වලට නොවෙයි, අත්‍යවශ්‍ය වියදම්වලටයි ඒ මුදල අවශ්‍ය වන්නේ. ඒ කියන්නේ, ගෙවල් කුලිය, වතුර බිල, දරුවන්ගේ අධ්‍යාපනය මේ ඔක්කෝම එකතු වන කොට රුපියල් 50,000කට වැඩි වියදමක් යනවා. රුපියල් 50,000කට වැඩි වියදමක් යනවා නම්, රුපියල් ලක්ෂයක් උපයන කොට ඒ මිනිස්සුන්ගෙන් අද බද්දක් අය කරන තත්ත්වයට පත් වුණොත් ඒ මිනිසුන් අධෛර්යවත් වනවා. ඒ තුළින් ඒ මිනිසුන්ගේ ඉපයීම් අධෛර්යවත් කරනවා. කුඩා පරිමාණ, සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ උදවිය තමයි ආර්ථිකයේ පිට කොන්ද කියලා හැමදාම කියනවා. ඒ තමයි මේ රටේ ආර්ථිකයේ සියයට 60ක් බර උසුලන ජනතාව. ඒ මිනිසුන් දිරිමත් කිරීමෙන් තොරව, ඒ කියන සුළු පරිමාණ, කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගන්වන්න පුළුවන්ද? ඒ අය තව තවත් දිරි ගන්වන්න නම් මේ කියන රුපියල් ලක්ෂයේ මරු වැල ඉවත් කරන්න තමුන්නාන්සේලා ක්‍රියා නොකළ යුතුද? ආර්ථිකයේ සියයට 60ක් දායකත්වය දෙන ඒ කුඩා, සුළු පරිමාණ මිනිස්සු වඩාත් ඉතිරි කිරීමට, නැවත ආයෝජනය කිරීමට යොමු කර නොගත යුතුද? ඒ මිනිසුන් උපයන ලාභය, ආදායම මඟින් ඒ මිනිසුන්ට යම්කිසි සහනයක් ඇති වනවා වෙනුවට, ඒ මිනිස්සුන්ගේ ඉපයීම්, අවසාන වශයෙන් ඒ මිනිස්සුන්ට දණ්ඩනයක් වන ආකාරයටයි දැන් කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ආණ්ඩුවේ අලුත් ආදායම් බදු පනත මේ රටේ සුළු පරිමාණ, කුඩා පරිමාණ ව්‍යාපාරිකයින් විශාල උගුලකට හසු කරලායි තිබෙන්නේ. ඉහළ කොම්පැනිකාරයින්ගෙන් අද සියයට 26, 27ට එහා බදු අය කෙරෙන්නේ නැහැ. රුපියල් මිලියන ගණන් අද හම්බ කරන අයගෙන් මීට වඩා වැඩි බදු අය කරන්න පුළුවන් වෙන්න ඕනෑ. අද මේ අල්ලන්න යන්නේ කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරිකයිනුයි. අද ලංකාවේ කළු සල්ලි තිබෙනවා සියයට 30ක්. ඒ කළු සල්ලි අල්ලන්න මේ ආණ්ඩුව මොනවාද කරන්නේ? Panama Papersවලින් හෙළිදරවු වුණු ඇමතිවරුන්ගේ ලේකම්වරුන් ගැන ආණ්ඩුව මොනවාද කරන්නේ? නොයෙකුත්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

පත්තරවලින් මෙන්ම, මම මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා හෙළිදරවු කළ, අයථා පරිදි එකතු කරගෙන, නොයෙකුත් විදේශීය බැංකුවල තැන්පත් කර තිබෙන මුදල් ගැන ආණ්ඩුව මොකද කරන්නේ? ඒ ඔක්කෝම පැත්තකින් තියලා සුළු පරිමාණ ව්‍යාපාරිකයාගේ බෙල්ල මිරිකන මේ මරු වැල මේ ආණ්ඩුවේ බෙල්ල වටේ වැටෙන මරු වැලක් වේවායි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.2.56]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මරු වැල් බෙල්ලට වැටෙන්න කියලා ඔබතුමා wish කරන්න එපා. ඒක හොඳ නැහැ. ඒක සදාචාරයට හොඳ නැහැ. අපි ආණ්ඩුවේ බෙල්ලට මරු වැල් දමා ගන්නේ නැහැ. ඔබතුමන්ලා ඒවා දමන්න කොච්චර try කළත් අපි ඒවා අයින් කරනවා. බලමුකෝ, හෙටත් ඒක ඒ ආකාරයෙන්ම සිද්ධ වේවි. මේ අවස්ථාවේදී ඔබතුමා නඟපු ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දෙන්න අවශ්‍යයි. අද යෝජනා කර තිබෙන සියලු සංශෝධනවලට අපි එකඟයි.

ඊට අමතරව ඔබතුමා අදහස් දක්වමින් කිව්වා, ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට අඩු වෙලා තිබෙනවා කියලා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මම හිතන විධියට එතැනදී දේශපාලන කෝණවලින් බලන්නේ නැතිව තාක්ෂණික කාරණා කිහිපයක් සාකච්ඡා කරන්න අපට සිද්ධ වෙනවා. දළ දේශීය නිෂ්පාදනය ගණන් කරන ක්‍රමය යාවත්කාලීන කිරීම 2016දී අවසන් කළා. ඒක සාමාන්‍යයෙන් ලෝකයේ සමහර රටවල අවුරුදු තුනකට, හතරකට වරක් කරනවා. සමහර රටවල අවුරුද්දකට වරක් කරනවා. කලින් තිබුණේ 2002ට යාවත්කාලීන කළ එක. ඊට පස්සේ 2016දී, 2010ට යාවත්කාලීන කළා. දැන් මෙතැන සිද්ධවෙලා තිබෙන්නේ මේකයි. එදා තිබුණු ආර්ථික ව්‍යුහයට වඩා අද තිබෙන ආර්ථික ව්‍යුහය වෙනස්. අපි උදාහරණයක් හැටියට ගත්තොත්, දැන් හැම තැනම "PickMe" driversලා ඉන්නවා. සමහර වෙලාවට කාර්යාලවල වැඩ කරන පුද්ගලයන් "PickMe" driver කෙනෙක් එක්ක ගෙදර යනවා. ඒ වාගේම සමහර තැන්වල හෝටල් තිබෙනවා. ඒවා තිබෙන්නේ හික්කඩුවේ වෙන්න පුළුවන්, ඇල්ලේ වෙන්න පුළුවන්, කොළඹ වෙන්න පුළුවන්. තමුන්ගේ ගෙදර කාමරයක් දෙකක් වැඩිපුර තිබෙනවා නම් internet එකට ගිහිල්ලා Airbnb එකෙන් හරි Booking.com එකෙන් හරි කියනවා, "මෙන්න මගේ කාමරයක් තිබෙනවා" කියලා. ඊට පස්සේ ඒවාට touristsලා ආවාම දවසට ඩොලර් 50ක, ඩොලර් 60ක ආදායමක් එනවා. ගරු මන්ත්‍රීතුමනි, එදා මේවා තිබුණේ නැහැ. නමුත් අද මේවා තිබෙනවා. මේ විධියට දත්ත යාවත්කාලීන කරන කොට අලුතින් නිෂ්පාදනය කරන, අලුතින් සේවා සපයන ආයතන මේ ව්‍යුහයට එකතුවෙලා තිබෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ගැටලුව තිබෙන්නේ මෙතැනයි.

අපි මේ දත්ත මනින ක්‍රමය එදා ඉඳලා අද වන තෙක් වෙනස්වෙලා නැහැ. ඒ නිසා, අලුතින් ආර්ථිකයට එකතු වන සේවා නිෂ්පාදනය කරන පුද්ගලයන්ගේ ආදායම්, ඒ හරහා ආර්ථිකයට එන දායකත්වය හරිහැටි ගණන් කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා තමයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මේ දවස්වල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්නේ. ඔවුන් දැන් මාස කිහිපයක් තිස්සේ මේ ගැන සාකච්ඡා කරනවා. මේ වෙනස් වුණු ව්‍යුහය හරියට ගණන් කර ගන්න, ඒ measurement එක හරියට ගන්න නම්, අපි කාර්තුවක් පාසා surveys කරන්න ඕනෑ. නමුත් අපි කාර්තුවක් පාසා surveys කරන්න තවම පටන් අරගෙන නැහැ. ඒ නිසා මෙතැන තිබෙන්නේ තාක්ෂණික ගැටලුවක්. අපි දළ දේශීය නිෂ්පාදනය මනින ක්‍රමවේදය නිසා ආර්ථිකයේ නිෂ්පාදනය වන සියලු දේවල් ලිස්සලා ගිහිල්ලා ඒ net එකෙන් එළියට ඇවිල්ලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට තව උදාහරණයක් දෙන්නම්. දැන් කොළඹ වරාය නගරය ඉදි වෙනවා. කොළඹ වරාය නගරය ඉදි වන්නේ වැලියි, ගලුයි දමලා. අපේ රටේ construction industry එක තුළ ඉදි කිරීම් කොච්චර වෙනවාද කියලා මනින්නේ සිමෙන්ති විකුණන ප්‍රමාණයට අනුව. මම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් මේ ගැන ඇහුවා. වරාය නගරයට දැන් සිමෙන්ති ගන්නේ නැහැ. වැලියි, ගලුයි විතරයි ගන්නේ. ඒ හරහා මේ අවුරුද්දට ඇමෙරිකන් ඩොලර් බිලියනයක - ඇමෙරිකන් ඩොලර් මිලියන 1000ක- විතර අගයක් ආර්ථිකයට එකතුවෙලා තිබෙනවා. නමුත් ඒක මේ ආර්ථික දර්ශකවල නැහැ. So, this is a technical problem, Hon. Member. Therefore, we believe that we will be able to resolve it in the next few months.

ඒ ක්‍රමය වෙනස් කරන්න කියලා කියන්න අපි කැමැති නැහැ. ඒක හරි නැහැ; ඒක වැරදියි. ඒක ස්වාධීන ආයතනයක්. ඒගොල්ලෝ කියනවා නම් වර්ධන වේගය සියයට 3.1යි කියලා, අපි කියනවා, "හරි, සියයට 3.1යි. නමුත් ඔයගොල්ලෝ නැවතත් ඒ ගැන සොයලා බලන්න, ඒක කරන ක්‍රමවේදයේ, ඒක මනින ක්‍රමවේදයේ ගැටලු තිබෙනවා" කියලා. So, I am convinced. මට සහතික වෙන්න පුළුවන් මම දන්න ආර්ථික, -[බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva)

මේ රටේ දරුවන්ගේ මන්දපෝෂණය මනිනකොට, මේ රටේ හොඳම පෝෂණය ලබන දරුවෝත් එක්ක එකට ගණන් කරලා තමයි ජාතික සාමාන්‍ය බලන්නේ. මේ විධියට ආර්ථික ප්‍රශ්න තිබෙනවා. හැම තිස්සේම ජාතික සාමාන්‍ය බලන්නේ පොහොසත්ම අයගේ දරුවෝත් දුප්පත් අයගේ දරුවෝත් එකට දමලායි. එහෙම බැලුවාම ජාතික සාමාන්‍ය හොඳයි. නමුත් අඩු ආදායම්ලාභීන්ගේ දරුවන් පමණක් අරගෙන බැලුවොත් මන්දපෝෂණ තත්ත්වය ඉතා බරපතළයි. ඉතින් ඒක තමයි, අද මේ මැනුම්වල තිබෙන වැරදි ක්‍රමය. මේ දත්ත ඛණ්ඩනය කරලා බලන්න ඕනෑ. මම ඒක පිළිගන්නවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මමත් ඒක පිළිගන්නවා. අපි සාධාරණ විවේචන කොයි වෙලාවේත් පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමා ඒක දන්නවා. අපේ ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා පිටුපස ආසනයේ වාඩි වෙලා ඉන්නවා. වෛද්‍යවරයකු හැටියට එතුමාත් ඒ කථාව හොඳට දන්නවා. ගාල්ල පැත්තේ, අපේ ගෙවල් පැත්තේ මිනිස්සු නම්

හොඳට කාලා බීලා ඉන්නවා. ඒ අයට එහෙම ලොකු ගැටලුවක් නැහැ. නමුත් සමහර තැන්වල මේ මන්දපෝෂණය තිබෙනවා. බදුල්ල පැත්තේ, නුවරඑළිය පැත්තේ තිබෙන ඒ වතුවල මන්දපෝෂණය වැඩිපුර තිබෙනවා. දැන් බලන්න දුගීකම මනින ආකාරය ගැන. දවසකට කිලෝකැලරි 2,250ක් ගන්න පුළුවන් නම්, ඒකට හරියන විධියට තමයි අපි poverty line එක බලන්නේ. ඒ පිළිබඳවත් බොහෝ දෙනා බොහෝ විවේචන ඉදිරිපත් කරනවා. කිලෝකැලරි 2,250ක් ඇත්තවශයෙන්ම ඇතිද, මදිද කියලා අපේ වෛද්‍යතුමා කියයි. නමුත් ඒ මනින ක්‍රම දේශපාලනීකරණය කරන්න ආණ්ඩුවට බැහැ. ඒකයි මම කියන්නේ. තාක්ෂණිකව මේ ක්‍රම වෙනස් කරන්න ඕනෑය කියන තැන මම ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා කියන දේටත් මම එකඟ වෙනවා. අපි ළඟදීම අලුත් ක්‍රමවේදය සමාලෝචනය කරන්නත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සහ තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් තමයි, මිනිසුන්ට අසාධාරණ ලෙස බදු ගහනවාය කියන එක. නමුත් ඇත්තවශයෙන්ම ලක්ෂයක් වෙන තෙක් ආදායමට කිසිම බද්දක් අය කෙරෙන්නේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයෙක් එක් ලක්ෂ එක් දාහක් ගත්තොත් බදු ගෙවන්න ඕනෑ කියලා. නමුත් එහෙම වෙන්නේ නැහැ. කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයෙකුගේ බද්ද මනින්නේ ආදායම මත නොවෙයි, ලාභය මත. ඒ ලාභයට අනුව තමයි සියයට 14ක බද්දක් වදින්නේ. සාමාන්‍ය බද්ද සියයට 28යි. නමුත් මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ගේ, කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයන්ගේ, භාණ්ඩ හා සේවා පිට රටට අපනයනය කරන අයගේ බද්ද සියයට 14යි. ගරු රමේෂ් පතිරණ වෛද්‍යතුමනි, ඔබතුමාත් ඉන්න නිසා මම මේ කාරණය කියන්නම්. ඊයේ මට හම්බ වුණා, මගේ ඉතාම කිට්ටු, හිතවත් වෛද්‍යවරියක්. මම එතුමියගෙන් ඇහුවා, "දැන් කොහොමද පඩිය" කියලා. එතකොට කිව්වා, "ඔය ගොල්ලන්ගේ ආණ්ඩුවෙන් තමයි වැඩි පුරම අපට වැටුප් හම්බ වෙන්නේ" කියලා. මම ඇහුවා, කීයද කියලා. "ගිය මාසයේ මගේ වැටුප රුපියල් දෙලක්ෂ පනස්දාහයි. බලන්න, ඒත් ඔයගොල්ලෝ අපේ බදු වැඩි කරලානේ" කියලා එතුමිය කිව්වා. මම මේ කියන්නේ Consultant කෙනෙක් ගැන. මම ඇහුවා, "කීයක්ද බදු වැඩි කරලා තිබෙන්නේ?' කියලා. "මාසයකට මම 12,000ක් බදු ගෙවන්න ඕනෑ" කියලා එතුමිය කියනවා. මම ඇහුවා, "කලින් ගෙව්වේ කීයද?" කියලා. "අපි භාර පන්දාහයි ගෙව්වේ. නමුත් දැන් බලන්න" කියලා එතුමිය කියනවා. මම ඇහුවා, "ඔබතුමිය කියන්නේ දෙලක්ෂ පනස්දාහක මාසික පඩියට රුපියල් 12,500ක බද්දක් ගහන එක අසාධාරණයි කියලාද?" කියා. ඒ ගණන හදලා බලන්න. ඒ බද්දේ ප්‍රමාණය සියයට 4.8යි; සියයට පහට අඩුයි. දෙලක්ෂ පනස්දාහක් උපයන පුද්ගලයෙක් මාසයකට සියයට පහක බද්දක් ගෙවන එක, මම නම් විශ්වාස කරන්නේ නැහැ, අසාධාරණයි කියලා. මොකද, ඒ හරහා තමයි, එතුමිය වැඩ කරන රෝහලේ රෝගීන්ට ප්‍රතිකාර කරන්නේ; බෙහෙත් දෙන්නේ; බෙහෙත්වල මිල අඩු කළේ; ඇස් කාවවල මිල අඩු කළේ.

මීට කලින් මහරගම අපේක්ෂා රෝහලේ රෝගීන්ට සීමාවක් - ceiling- එකක් තිබුණා. ඒ අනුව, එක රෝගියෙකුට රජයෙන් මිලියන දෙකහමාරකට වඩා වියදම් කරන්න බැහැ. නමුත් අද ඒ උපරිමය අයින් කරලා තිබෙනවා. මට ගරු සෞම්‍ය ඇමතිතුමා කිව්වා, සමහර ලෙඩ්ඩුන්ට මිලියන 100කටත් වඩා වියදම් කරලා තිබෙනවා කියලා. ඒ කථාව ඇත්ත; බොරු නොවෙයි. අධ්‍යාපනයට, සනහාධාර දෙන්න, pension දෙන්න රජයට තිබෙන ආදායම මේ බදු තමයි. ඒ නිසා හැමෝම බදු ගෙවන්න ඕනෑ. එහි සාධාරණත්වයක් තිබෙනවා. ඒ සාධාරණත්වය නැහැයි කියලා විවේචනය ඉදිරිපත් කරන අයට දැන ගන්න තමයි මම මේ ඇත්ත කථාව ඔබතුමාට මෙතැනදී කිව්වේ.

අනෙක් එක තමයි, අර්ථ සාධකයටත් බදු ගහනවාය කියන එක. මම ඉතාම ඕනෑකමින් කියන්න ඕනෑ, අර්ථ සාධකයට කිසිම ආකාරයක බද්දක් ගහන්නේ නැහැයි කියන එක. ඒ වාගේම, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගැනත් කිව්වා. අවුරුදු 20ට වඩා වැඩ කරලා තිබෙනවා නම්, Commuted Pension එකට ලක්ෂ 20ක් වෙන කල් කිසිම බද්දක් වදින්නේ නැහැ. ඊට වඩා වැඩ කරලා තිබෙනවා නම්, ලක්ෂ 50ක් වෙන කල් කිසිම බද්දක් වදින්නේ නැහැ.

ඊට වඩා වැඩි වුණොත් තමයි රුපියල් ලක්ෂ 10කට සියයට 5 ගණනේ බද්දක් වදින්නේ. එතැන මහා විශාල අසාධාරණයක් වෙලා තිබෙනවා කියා නහන තර්කයට මම එකඟ වන්නේ නැහැ.

අනෙක් එක තමයි, මැද පෙරදිග ඉඳලා ලංකාවට මුදල් ප්‍රේෂණය කරන අයගේ එම මුදල්වලටත් බදු ගහනවා කියන එක. ඒ කතාව වැරැදියි. ඒක අසත්‍යයක්. කිසිම විධියකට ඒක එහෙම වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා - කුරුණෑගල මන්ත්‍රීතුමා- කියනවා මම අහගෙනයි, "මේ බලන්න, සෑම කෙනෙකුගේම බැංකුවල තිබෙන depositsවලට සියයට 5ක් බදු ගහනවා" කියලා. මම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට කියන්න කැමැතියි, ඔබතුමාගේ කාලයේ ඔබතුමා එම බැංකු depositsවලට සියයට 8ක් බද්දක් ගැසූ බව. ඔබතුමා සියයට 8ක් බදු ගැහුවා, බැංකු depositsවලට. බදු අය නොකළේ තැන්පතු රුපියල් ලක්ෂ 5කට වඩා අඩුවෙන් තිබෙනවා කියා declaration එකක් Inland Revenue Department එකට දුන්නා නම් විතරයි. රුපියල් ලක්ෂ 5ට වඩා වැඩි තැන්පතු ප්‍රමාණයක් තිබුණා නම් මහින්ද රාජපක්ෂ හිටපු මුදල් ඇමතිවරයා ඒවාට සියයට 10ක් බදු ගැහුවා. අනේ! කොච්චර ඉක්මනට එතුමාට මේවා අමතක වෙනවාද කියා මම කල්පනා කළා. 2015 මාර්තු මාසයේ 31වන දා තමයි අපේ ආණ්ඩුවෙන් මෙය සියයට දෙකහමාර වන කල් අඩු කරලා දැන් සියයට 5 වන කල් වැඩි කර තිබෙන්නේ. ඒ, සියයට 5 කියන්නේ රාජපක්ෂ කාලයේ තිබුණු සියයට 10න් සියයට 50ක අඩු කිරීමක් කියා මේ රටේ මිනිසුන්ට මා මතක් කර දෙන්න කැමැතියි. ඒ කෙසේ වෙතත්, pension ගිහින් සිටින අයගේ බැංකු depositsවල මාසික පොලිය රුපියල් 150,000ක් වන තෙක් කිසිම බද්දක් ගහන්නේ නැහැ. රුපියල් 150,000ක් පොලිය හැටියට ගන්න නම් මහා විශාල මුදලක් තැන්පත් කරන්න ඕනෑ. පොලිය හැටියට ඊටත් වඩා ආදායම් ලබන අයට විතරයි එම සියයට 5ක බද්ද අදාළ වන්නේ.

අනෙක් කාරණය මේකයි. Apartments පිළිබඳව බොහෝ දෙනා ඔවුන්ගේ විවේචන ඉදිරිපත් කළා. "Apartmentsවලට සියයට 15ක් බදු ගහන්නේ ඇයි?" කියා ඇහුවා. ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් මගේ විවේචනත් ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කළා. ඉදිරිපත් කරලා සාකච්ඡා මාර්ගයකින් පසුව තමයි රුපියල් මිලියන 15ක් දක්වා වූ -රුපියල් ලක්ෂ 150ක් දක්වා වූ- apartmentsවලට සියයට 15ක බද්ද - VAT - අය නොකර ඉන්න අප තීරණය කළේ. නමුත් apartmentsවලට ගහන සියලු බදු අවුරුද්දකින් කල් දමන්න කියා ගරු අමාත්‍යතුමා තීරණය කර තිබෙන බව මට ආරංචි වුණා. මම විශ්වාස කරනවා එය සත්‍යයක්ය කියා.

අපේ වාසුදේව මන්ත්‍රීතුමා කියපු තවත් කතාවක් තමයි, ගරාජ් එකක් ළඟ park කර තිබෙන කාර් ගණන් කරලා VAT අය කරනවා කියන එක. ඒක ලොකු බොරුවක් නේ. එහෙම VAT ගහනවාද? එහෙම VAT ගහන්නේ නැහැ. VAT කියන්නේ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මොකක්ද? VAT කියන්නේ එකතු කළ අගය මත පනවන බද්ද විතරයි. දැන් සමහරුන්ට පැටලැවිලා තිබෙනවා, යම්කිසි භාණ්ඩයක් කඩෙකින් රුපියල් 100කට ගත්තොත් රුපියල් 15ක් VAT ගහනවා කියා. එහෙම නොවෙයි වෙන්නේ. VAT ගහන්නේ ඒ කඩේ එකතු කරන අගයට පමණයි. ඒ කියන්නේ මේකයි. ඒ කඩේ යම් භාණ්ඩයක් විකුණන්නේ රුපියල් 100ට නම්, ඒ කඩේ එය ගත්තේ රුපියල් 90ට නම්, අගය එකතු කරන්නේ රුපියල් 10 යි නම්, VAT ගහන්නේ රුපියල් 10ට පමණයි. රුපියල් 10ට පමණයි ඒ VAT එක වදින්නේ. මම හිතන විධියට ජනතාව නොමහ යවන්න ඕනෑකමින්ම වැඩ කරන කණ්ඩායමක් සිටිනවා. එම කණ්ඩායම රජය අපහසුතාවට පත් කිරීම සඳහා මේ නොමහ යැවීම සිදු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න කැමතියි. අපේ මේ වැඩ කටයුත්ත හෙටින් පසුව ඉස්සරහට කරගෙන යන්න අපට කිසිම සංකාවක්, බියක් නැහැ. අපි දන්නවා, අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව හෙට පරාජයට පත්කොට මේ රජය ඉස්සරහට යන බව. අපට එය සියයට සියයක්ම විශ්වාසයි. නමුත් මා එක දෙයක් ඔබතුමාට කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මමත් පොත පත කියවා තිබෙනවා. ලෝකයේ කිසිම රටක කිසිම ආණ්ඩුවක් විසින් එම ආණ්ඩුවටම විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු කතාවක් මම නම් මේ ඇහුවාමයි. මම දන්නේ නැහැ, ලෝක ඉතිහාසයේ කිසිම පාර්ලිමේන්තුවක, කිසිම දවසක මෙහෙම වැඩක් වෙලා තිබෙනවාද කියා. වෛද්‍ය රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එක හරි. අප එතැන සිටියා නම් අපිත් ඒක කරනවා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. එතුමන්ලාට ඕනෑ ආණ්ඩුව වවිටන්නයි. මා කියන්නේ ඒක නොවෙයි.

ආණ්ඩුවේ ඇමතිවරු වෙලා ඉන්න කට්ටියක් කියනවා, "අපේ ආණ්ඩුව වැඩක් නැහැ; අපේ ආණ්ඩුව පිළිබඳව අපට විශ්වාසයක් නැහැ; ඒ නිසා අපි අපේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙනවා." කියලා. ලෝකයේ කොහේද මෙහෙම වෙලා තිබෙන්නේ? -[බාධා කිරීම]- කැත නොවෙයි, පිස්සු වැඩක්. My God! I do not think this has happened anywhere in the world! It has never been recorded in the history that a sitting government has brought a No-Confidence Motion against itself. ලෝකයේ කොහේද මෙහෙම වෙලා තිබෙන්නේ? අනේ දෙවියනේ! මම ගැන මට විශ්වාසයක් නැත්නම් මම මොකද කරන්නේ? පියංකර ජයරත්න අපේ හිටපු රාජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් මම මොකද කරන්නේ? මට මම පිළිබඳව විශ්වාසයක් නැත්නම් මම ඉල්ලා අස්වෙනවා. ප්‍රශ්නයක් නැහැ නේ. "ඔබතුමන්ලා මට විරුද්ධව විශ්වාසභංගයක් ගෙනැල්ලා මාව පරද්දලා යවන්න" කියලා මම කියනවාද? -[බාධා කිරීම]- මේක කොච්චර විහිළුවක්ද? විහිළුකාරයොත් සිටින බව අපට පසුව වැටහුණා. ඔබතුමන්ලාත් ඒකට භූමි තෙල් දාලා, ඒකට හුළං ගහලා වැඩේ, -[බාධා කිරීම]- මෙහෙන්ද ආවේ? ඔබතුමන්ලා මේ දිහා බලාගෙන හිනා වෙන්නේ මොන පැත්තෙන්ද කියලා මම කියන්න ඕනෑ නැහැ නේ. ඔන්න ඔය වාගේ තත්ත්වයක් තමයි මේ පැන නැඟිලා තිබෙන්නේ. අපේ ආණ්ඩුවේ ඉන්න ජනාධිපති නීතිඥ තනතුරක් දරන ඇමතිවරයෙකුට මම මේක පෙන්වූවා. එතුමා කිව්වා, එතුමා මේක දැක්කේ නැහැ කියලා. මම කිව්වා, "ඔබතුමා මාර ජනාධිපති නීතිඥවරයෙක් නේ" කියලා. මම කිව්වා, කරුණාකරලා එතුමාට පෙන්වන්න කියලා. එතුමා දැක්කේ නැති වෙන්නේ කොහොමද? එක්කෝ, එතුමාගේ ජනාධිපති නීතිඥකම ගැන මට sure කරන්න බැහැ. එහෙමත් නැත්නම්, එතුමා අපට මාර බෝලයක් බස්සන්න හදනවා. ඒ නිසා මේ ගැන කිසිදේකට කලබල වෙන්න ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ කට්ටිය හෙට දිනයේදී එකතු කිරීම සම්බන්ධයෙන් අපි ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂය එකා සේ හිට ගන්නවා. එක්සත් ජාතික පක්ෂය මේ වැඩේ කරලා, ඉරිදා රාත්‍රී 9.00 වන විට අපි එක්සත් ජාතික පක්ෂයේ පූර්ණ ප්‍රතිසංවිධානය ඉවර කරලා, නායකත්වයට සහ අපේ ඉහළ නායකයන්ට අපි දන්වනවා, "මෙන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය පැය 48ක් තිස්සේ සාකච්ඡා කරලා ඉදිරිපත් කරන නායකත්වය සහ ඒ සියලු තනතුරු සම්බන්ධයෙන් පූර්ණ ප්‍රතිසංවිධානය" කියලා. අපේ නායකතුමා ඒක කරන්න කියලා අපට ඉඩ දීලා තිබෙනවා. අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක්. අපේ පක්ෂය ඔබතුමන්ලාගේ පක්ෂය වාගේ නොවෙයි. ඔබතුමන්ලාගේ පක්ෂයේ තාත්තා ඉන්නවා; බාප්පා ඉන්නවා; අනෙක් බාප්පා ඉන්නවා; කුඩා බාප්පා ඉන්නවා; ලොකු බාප්පා ඉන්නවා; පුතා ඉන්නවා; මල්ලි ඉන්නවා. අපේ පක්ෂයේ එහෙම නැහැ. අපේ පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් තිබෙන්නේ. අපි ඒක ලස්සනට කරගන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි හෙට ඉස්සරහට යනවා. මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වැඩ කටයුත්තට අපට සහයෝගය ලබාදීම පිළිබඳව විපක්ෂයේ සිටින ඔබතුමන්ලාටත් බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා.3.14]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම රටක අවශ්‍යතාව අනුව උද්ධමනයක් ඇති වන අවස්ථාවක, ඒ වාගේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල වැඩි වන වෙලාවල්වලදී මිල පාලනය කරලා ජනතාවගේ ජීවන වියදම පාලනය කිරීම සඳහා - අඩු කිරීම සඳහා - මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද යොදා ගන්නා ආකාරය අපි ඉතිහාසයේ ඉඳන් දැක තිබෙනවා. අදත් එවැනි අවස්ථාවක භාණ්ඩ වර්ග රැසක් සඳහා මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරිපත් කිරීම තමයි ගරු මුදල් ඇමතිතුමා විසින් සිදු කරලා තිබෙන්නේ. මේ ක්‍රමවේදය නිර්මාණය වුණේ 2007 අවුරුද්දේදීයි. අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තමයි 2007 අවුරුද්දේදී අය වැයෙන් හඳුන්වා දුන්නේ. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන එක දුර්වලතාවක් තමයි, භාණ්ඩවලට බදු වර්ග කිපයක් එකතු වෙලා තිබෙන එක. බොහොම සංකීර්ණ බද්දක් තිබෙන්නේ. බදු ගෙවන්නාටවත් හිතා ගන්න බැහැ, මට ගෙවන්න තිබෙන බදු ප්‍රමාණය කොච්චර ද කියලා. මොකද, ඒක ඒ තරම් සංකීර්ණයි. අපි යම් දෙයක් ආනයනය කරද්දී, ඒ සඳහා අපට කීයක් ගෙවන්න වෙයිද, ලංකාවේ ඒ සඳහා වන මිල කීයද කියලා සරලව අපට හිතා ගන්න බැහැ. විවිධ විවිධ දේවල් එකතු වෙලා සංකීර්ණ බද්දක් එනවා. එක එක අවස්ථාවලදී එක එක බදු කොටස් එකතු කරලා තිබෙනවා. නොයෙක් නොයෙක් විෂයයන් හේතුකොටගෙන බදු එකතු කරලා තිබෙනවා. එදා ඉඳන්ම තිබුණු ක්‍රමවේදය මේකයි. නව රජය විශේෂයෙන්ම උත්සාහ කරනවා, සරල බදු ක්‍රමයක් ගෙනෙන්න. එතකොට මේ බදු වංචා කියන දේ නැතිව යනවා. තමන් දෙයක් පරිහරණය කරනවා නම්, තමන් දෙයක් මිලදී ගන්නවා නම්, තමන් යම් දෙයක් ආනයනය කරනවා නම්, තමන් යම් ව්‍යාපාරයක යෙදෙනවා නම්, තමන් ගෙවන්නට

තිබෙන බද්ද කීයද කියන එක ඉතාමත්ම සරලව ගණනය කරගන්න පුළුවන් ක්‍රමවේදයක් නිර්මාණය කරන්නට ඕනෑ.

මොකද, ගොවියාගේ වගාවට ඇතිවන ප්‍රශ්නවලට වෙන්න පුළුවන්, ගොවියාගේ අස්වැන්න විකුණා ගැනීමේදී මතුවන ප්‍රශ්නවලට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් රටේ ජීවන වියදමට බලපාන ආනයනික භාණ්ඩ වෙන්න පුළුවන්, ඩොලරයේ මිල ඉහළ යාම නිසා අපට පාලනය කරගන්න බැරි බඩු මිල වෙනස්වීම් වෙන්න පුළුවන්, මේ දේවල්වලින් අපේ දේශීය ගොවියා ආරක්ෂා කරගන්න, දේශීය කර්මාන්ත ආරක්ෂා කරගන්න, ජනතාවගේ ජීවන වියදමේ යම් තත්ත්වයක පාලනයක් පවත්වා ගැනීමට තමයි 2007 වර්ෂයේ අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත මඟින් සරල බදු ක්‍රමයකට යටත් කරන භාණ්ඩ වර්ග ඉදුන්වා දුන්නේ. ඒවා ජන ජීවිතයට සෘජුවම බලපාන භාණ්ඩ ලෙස සලකා තමයි ඒ කටයුතු කළේ. කිරි පිටි, පරිප්පු, සීනි, අල, ලූනු ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ 11ක් සඳහා 2008 වර්ෂයේදී තමයි මේ බද්ද මුලින්ම පැනෙව්වේ. මේ බදු පැනවීම සඳහා ගරු ඇමතිතුමාට බලය තිබෙන්නේ දින 30ක කාලයක් සඳහා ක්‍රියාත්මක කිරීමටයි. එතැනින් එහාට එම කාලය දීර්ඝ කර ගැනීම සඳහා තමයි, එය මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ගැසට් නිවේදනයක් වශයෙන් සම්මත කර ගැනීමෙන් පසුව ඒ පිළිබඳව දීර්ඝ කාලීනව කටයුතු කරන්න පුළුවන් වන්නේ.

මෙය අපේ රටේ ප්‍රචලිත වන දෙයක් කියලා අපි දන්නවා. සමහර විට දේශීය ගොවීන්ට තමන්ගේ නිෂ්පාදන විකුණා ගන්න බැරි අවස්ථා අතීතයේ සිටම තිබුණු බව අපි දැක තිබෙනවා. අද වී මසුරන් වාගේ වටිනවා. අපේ වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සහ කලින් කථා කළ කථිකයෝ කිව්වා, පෞද්ගලික ආයතන ඇවිත්, රජය වී මිලදී ගන්න මිලටත් වඩා වැඩි මිලකට වී මිලදී ගන්නවා කියලා. ගොවියාගේ පැත්තෙන් බැලුවොත් ඒක හොඳ ප්‍රවණතාවක්. ගොවියා ආරක්ෂා කිරීම ගැන බැලුවොත්, ගොවියා රජ කරවීම පිළිබඳව හිතා බැලුවොත්, අද රජය ගෙවන මිලට වඩා වැඩි මිලකට ගොවියාගේ වී අස්වැන්න මිලදී ගැනීම ඉතාම හොඳ ප්‍රවණතාවක්. මොකද, පසු ගිය කාලයේ ඒ අය රජයට බල කළා, "අපේ වී ටික විකුණා ගන්න බැහැ. වී ටික රජය ගන්නේ නැහැ. ඒ නිසා අපි මේ වී ගොවිතැනේ යෙදෙන එකේ තේරුමක් නැහැ. වී ටික ගෙනැවිත් විකුණා ගන්න බැහැ. ඒ නිසා මහදී වී ටික පුච්චනවා"යි කියලා. වී ටික විකුණා ගන්න බැරිව රජයේ වී ගබඩා ඉදිරිපිට ලොරි රථ, ට්‍රැක්ටර් රථ පෝලිමට නවත්වාගෙන සිටි ආකාරය පසුගිය කාලයේදී අපි දැක්කා. තමන්ගේ වී ටික විකුණා ගන්න බැරිව පසුගිය කාලයේ ගොවියා වහ බිව්වා. නමුත් අද හොඳ ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අද අපට අහන්න ලැබුණු කථාව තමයි, "අද රජයේ ගබඩා විවෘත කරගෙන හිටියත්, ඒ ගබඩාවලට වී ලැබෙන්නේ නැහැ. පෞද්ගලික අංශ කමතට -කුඹුරට- ඇවිත් වැඩි මිලක් දීලා වී ටික අරගෙන යනවා"යි කියන එක. එම නිසා ගොවියාගේ පැත්තෙන් බොහොම හොඳ දෙයක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණය මා විශේෂයෙන් කියනවා. වී ගොවියා වේවා, එළවලු ගොවියා වේවා, ලූනු ගොවියා වේවා, අල වගා කරන ගොවියා වේවා මේ සියලුදෙනාම ආරක්ෂා කරගැනීම සඳහායි විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ මේ නියමයන් ක්‍රියාත්මක වෙන්නේ. මොකද, අස්වැන්න වැඩි වන කාලයට නිෂ්පාදනය වැඩි වුණොත්, ඒ භාණ්ඩ රටට අතිරික්තයක් වෙනවා. එවිට ඒවායේ මිල ගණන් පහළ යන්න පුළුවන්. ඒ නිසා ආනයනය පාලනය කරලා, එය රටට ගැළපෙන පරිදි, රටේ අවශ්‍යතාව අනුව නිර්මාණය කරගන්න දරන උත්සාහයක් තමයි මේ නියමයන් තුළින් කරන්නේ. හැබැයි මේ රටේ එදා ඉඳලාම දැකපු දෙයක් තමයි, මේ සංඛ්‍යාවන් ගණනය වීම හරියාකාරව සිද්ධ වෙන්නේ නැතිකම.

අපේ රටේ කොයි තරම් බුද්ධිමතුන් හිටියත්, තක්සේරු කරන්න පුළුවන් අය කොයි තරම් හිටියත්, කෘෂිකර්ම උපදේශකයන්, විශේෂඥයන් කොයි තරම් හිටියත්, සමහර වෙලාවට ඊළඟ කන්නයේ ලැබෙන වී ප්‍රමාණය කොපමණද කියා ගණනය කරගන්න ඉතිහාසයේ සිටම අපට හැකියාවක් තිබුණේ නැහැ. මොකද, පසුගිය ආණ්ඩුව මැතිවරණය ඔන්න මෙන්න කියා තිබියදී, 2014 වර්ෂයේ අග භාගය වන විට හාල් ටොන් ලක්ෂ 6ක් ආනයනය කළා. ඒ නිසා සතොස ව්‍යාපාර ජාලය සහමුලින්ම කඩාගෙන වැටුණා. මා හිතන හැටියට ඡන්දය ඉලක්ක කරගෙන කිසිම ඉවක් බවක් නැතිව කටයුතු කළා. "හාල් මිල වැඩි වුණොත් මහින්ද රාජපක්ෂ මහත්මයාට ආයෙත් සැරයක් ජනාධිපති වෙන්න ඡන්දය හම්බ වෙන එකක් නැහැ. ඒ නිසා කරන්න තිබෙන හොඳම දේ මෙකයි. සතොස කඩාගෙන වැටුණාට කමක් නැහැ. රට ණය වුණාට කමක් නැහැ. වී ගොවියා අසරණ වුණාට කමක් නැහැ"යි කියලා ඉතිහාසයේ ආනයනය කරනු ලැබූ වැඩිම සහල් ප්‍රමාණය වන ටොන් ලක්ෂ 6ක් 2014 අවුරුද්දේ ආනයනය කරලා, මේ රටේ සම්ස්ත වී ගොවීන් අනාථ කර දැම්මා.

2014 අවුරුද්දේ විතරක් නොවෙයි, 2015 අවුරුද්දේදීත් මේ හාල් ඇණවුම් තොගය ලංකාවට එන්න පටන් ගත්තා. 2015 අවුරුද්දේදීත් වී විකුණා ගන්න බැරිව ගොවීන් කොපමණ අතර මං වුණාද කියලා අපි දැක්කා. නමුත් අද විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් අපට අහන්න ලැබුණා, "අද එවැනි තත්ත්වයක් උදාවෙලා නැහැ. වී ගොවියා වහ බොන්නේ නැහැ. වී ටික විකුණා ගන්න බැහැයි කියලා වී ගොවියා උද්ඝෝෂණය කරන්නේ නැහැ. වී ගොවියා වී ටික විකුණා ගන්න බැහැයි කියලා වී ටික පාර මැද්දේ දමාගෙන ගිනි තියන්නේ නැහැ"යි කියලා. මොකද, පෞද්ගලික ව්‍යාපාරිකයන් කමතටම ඇවිල්ලා රජය ගෙවන මුදලට වඩා වැඩි මුදලක් දීලා, වී ගෙන යෑමේ ආර්ථිකයක් අද රටේ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා වී ගොවීන් ගැන හිතුවාම අද අපට ලොකු අස්වැසිල්ලක් ලැබෙනවා. මොකද, අපි හැම දාම කිව්වේ "ගොවියා රජ කළ යුතුයි" කියලායි.

ඒ විතරක් නොවෙයි. මේ බද්ද තුළින් මුදල් උපයා ගත් බව අපි දන්නවා. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද නිසා 2008 අවුරුද්දේ රුපියල් බිලියන 10ක්, 2009 අවුරුද්දේ රුපියල් බිලියන 18ක්, 2010 අවුරුද්දේ රුපියල් බිලියන 10ක්, 2011 අවුරුද්දේ රුපියල් බිලියන 15ක්, 2012 අවුරුද්දේ එක පාරටම රුපියල් බිලියන 33ක්, 2013 අවුරුද්දේ රුපියල් බිලියන 46ක් රජය අත් කර ගත්තා. විපක්ෂය හැම තිස්සේම මාධ්‍ය ඔස්සේ අපට චෝදනා කරනවා, "මේ රජය බදු අය කරනවා"යි කියලා. නමුත් මේ රජය කරන්නේ මොනවාද කියලා ජනතාවට පැහැදිලිව දැනගන්න පුළුවන් වන විධියට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත වැනි පනත් හඳුන්වා දීලා, බදු අය කිරීම හෝ වේවා, වෙනයම් ක්‍රියාදාමයන් හෝ වේවා විනිවිද පෙනෙන ආකාරයකින් කරන නිසා මිනිස්සු දන්නවා, රජය බදු අය කරනවාය කියලා.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ 2011 වර්ෂයේ රුපියල් බිලියන 15කුත්, 2013 වර්ෂයේ රුපියල් බිලියන 46කුත් බදු වශයෙන් එකතු කළා. නමුත් ජනතාව ඒ ගැන දන්නේ නැහැ. ජනතාවට කොළේ වහලා තමයි පසු ගිය ආණ්ඩු බදු එකතු කළේ. රජයට වාහන ආනයනය කළේ ජනතාවට කොළේ වහලා; කෑලි කෑලි එකතු කරලා. අය වැය වාර්තා, පරිපූරක ඇස්තමේන්තු දිහා බැලුවාම අපට එය පෙනෙනවා. මේ රජය විවෘතව පෙන්වා දෙනවා, අපි කරන්නේ මේකයි කියලා. කොපමණ බැණුම් ඇහුවත්, පැත්ත ගියත් ඇත්ත කියන ආණ්ඩුවක් තමයි අද තිබෙන්නේ. පැත්ත ගියත් ඇත්ත කියන ආණ්ඩුවක් නිසා අපිට අවලාද නැහෙනවා; අපවාද නැහෙනවා. මොකද, අපි ඇත්ත කියන නිසායි. නමුත් අද අපේ රජය, එදා මල් වට්ටියට වහගෙන කටයුතු කරපු රජය වාගේ නොවෙයි කියලා යම් දවසක ජනතාව තේරුම් ගනීවි.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

විශාරද නන්දා මාලනී මහත්මිය ගායනා කරන සින්දුවක් තිබෙනවා:

"දන්සල් දොරෙහි නැත යදියෝ
සල්පිල්වලය පුරවැසියෝ
පන්සිල් රකිති මැරවරයෝ
මේ කේතුමතී නුවරයි" කියලා.

අන්න ඒ සංකල්පය තුළ ඉඳගෙන තමයි පසු ගිය ආණ්ඩුව අපේ රට කේතුමතී නුවර කියලා පෙන්වා දුන්නේ. නමුත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ජනතාවට හඳුන්වලා දීලා, කොමිෂන් සභා හරහා නිලධාරින් ශක්තිමත් කළාම මේ රටේ යථාර්ථය මොකක්ද කියලා අද ජනතාව දැනගෙන තිබෙනවා. මේ තත්ත්වය වර්තමානයේ ඇති වුණු දෙයක් නොවෙයි. එදා ඉඳලා ඒ ක්‍රමවේදය මේ රටේ තිබුණා. මේ රජය බලයට පත් වුණාට පස්සේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හඳුන්වා දීම තුළින් මේ රජය කරන්නේ මොනවාද කියලා හෙළිදරව් කිරීමෙන් තමයි ජනතාව මේ කාරණය අවබෝධ කර ගත්තේ. ඒ නිසා මා රටේ ජනතාවගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ සිද්ධිය අද වුණාය කියලා විපක්ෂය පෙන්නුවාට, මෙය එදා ඉඳලාම සිදුවෙලා තිබෙන සිද්ධියක්. අද අපි විවෘතව මේ ගැන කියනවා. එදා මන්ත්‍රීවරයකු වාහනයක් විකුණුවා කියලා දන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ මන්ත්‍රීවරයකු "පර්මිට්" එකට දෙන වාහනය විකුණන්න පුළුවන් වන විධියට "පර්මිට්" එක හදලා දුන්නා. අදත් ඒ වාගේ වාහන විකුණනවා. හැබැයි, වාහනය විකුණුවාය කියලා අද සොයා ගන්න පුළුවන්. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතින් ඒ පිළිබඳව සොයා ගන්න පුළුවන්. හැබැයි අද විකුණුවාය කියන එක නොවෙයි. ඒ වාහන විකුණන්න පුළුවන් වන විධියට එදා පනත හැදුවේ කවුද? විපක්ෂය ඒ ගැන අවබෝධයක් ජනතාවට ලබා දෙන්නේ නැහැ. මාධ්‍ය තුළින් ඒ ගැන අවබෝධය ලැබෙන්නේ නැහැ.

පාරිභෝගිකයන් ආරක්ෂා කරන්න, ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන්න, ජීවන වියදම රැක ගන්න මේ පනත් ගෙනාවාට, සමහර අවස්ථාවන්හිදී ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා බඩු මිල ඉහළ යන අවස්ථා, ජීවන වියදම ඉහළ යන අවස්ථා අපට අනන්තවත් දකින්න ලැබෙනවා. මොකද, රතු ලූනු අස්වැන්න නෙළන කාලයට මේ පනත යටතේ බද්ද පැනවුවාම රතු ලූනු මිල වැඩි වන බව අපි දන්නවා. හැබැයි, ගොවියා ආරක්ෂා වනවා. නමුත් පාරිභෝගිකයාට ගෙවන්න සිදු වන මිල වැඩි වනවා. අල, මුං ඇට, කව්පි, බී ලූනු වැනි දේවල් දිහා බැලුවත් මේ තත්ත්වය උදාවෙලා තිබෙන බව පෙනෙනවා. මෙහි දෙපැත්තක් තිබෙන බව මා දකිනවා.

එක පැත්තකින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත නිසා ගොවියා ආරක්ෂා වෙන අවස්ථා තිබෙනවා. එතකොට පාරිභෝගිකයාට -ජනතාවට- යම් ප්‍රශ්නයක් ඇති වෙනවා. හැබැයි, ගොවියා ආරක්ෂා කර ගන්න අවස්ථා තිබෙනවා. සමහර වේලාවට ආනයනය කරන භාණ්ඩවල මිල ඉහළ යෑම තුළ පාරිභෝගිකයාව ආරක්ෂා කර ගැනීම සඳහා, රටේ ජීවන වියදම අඩු කර ගැනීම සඳහා මේ පනත තුළින් අවස්ථාව උදා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සම්පූර්ණ බදු ආදායමේ ප්‍රතිශතයෙන් සාමාන්‍යයෙන් හතරයි දශම පහක්-හයක් වාගේ ප්‍රමාණයක ප්‍රතිශතයක් විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තුළින් නියෝජනය කරනවා. පසුගිය රජය කාලයේ -2013-2014 කාලයේ- විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ලබා ගත් බදු ප්‍රමාණය සමස්ත බදු ප්‍රමාණයෙන් සියයට 4.6යි කියන එක අපි දැක්කා. නමුත් මේ රජය බලයට පත් වුණාට පසුව 2015-2016 වර්ෂවලදී විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ අය කරගෙන තිබෙන්නේ සමස්ත බදු ආදායමින් සියයට 3.8යි. නමුත් අපි එක දෙයක් කරනවා. ඒකයි අපිට බැණුම් අහන්න වෙන්නේ. අපේ කාලයේ බදු අය කරනවා කියනවා, අපේ කාලයේ බඩු මිල වැඩියි කියනවා. මේ කතන්දර අහන්න වෙන්නේ ඇයි? අපිට මේ කතන්දර අහන්න වෙන්නේ අපි මේවා විනිවිදව කරන නිසා; ජනතාවට අපි ඇත්ත කියන නිසා; අපේ ආණ්ඩුවේ පැත්තක් ගියත් අපි ඇත්ත කථා කරන නිසා; කොළේ වහලා ගහන්නේ නැති නිසා; ජනතාව රවටන්නේ නැති නිසා; ජනතාවගේ මුදල් pickpocket ගහන්නේ නැති නිසා. ඒ නිසා අද අපට දෝෂාරෝපණයට ලක් වෙන්න සිදු වෙලා තිබෙනවා. නමුත් අපි දන්නවා මේ රටේ ජනතාව දෙවරක් හිතන බව. මොකක්ද, මේකේ ඇත්ත කියලා එදාට තේරුම් ගනියි. සත්‍ය කවදා හෝ ජය ගන්නවා කියන එක අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ආපු ගමන් ලොකු ප්‍රාතිහාර්යයක් කළ බව අපි දන්නවා. මේ ආණ්ඩුව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල පහත දැම්මා. දේශීය කිරි පිටි මිල දිහා බැලුවාම 2014දී දේශීය කිරි පිටි කිලෝ එකක මිල තිබුණේ රුපියල් 962ට. ඒක රුපියල් 735ට පහත දැම්මා. ඔය බදු පනත් මොනවත් නැතුව ජනතාවට -අහිංසක මනුෂ්‍යයාට, දුප්පත් මනුෂ්‍යයාට, අඩු ආදායම්ලාභියාට- ජීවත් වෙන්න පුළුවන් ශක්තිය අපි ලබා දුන්නා. දැන් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා, "මේ තුළින් මේ රටේ ජනතාව මත බදු පටවලා." කියලා. නමුත් එදා මොනවාද කළේ? එතුමා ඒ ගැන කිව්වාද?

එදා මීට වඩා සංකීර්ණ, මීට වඩා අමාරු ආර්ථිකයක් රටේ තිබුණේ. ඒ නිසා තමයි අපි ආපු ගමන් රජයේ සේවකයාගේ පඩියට රුපියල් 10,000ක් එකතු කළේ. 2020 වෙනකොට රජයේ සේවකයාගේ මූලික පඩිය සියයට 70ට විතර නගිනවා, රුපියල් 10,000 නොවෙයි. රුපියල් 10,000ක් වැඩි වෙන්නේ අවම පඩිය ගන්නා -රුපියල් දහ-දොළොස්දහසක් මාසයකට පඩි ගන්නා- රාජ්‍ය සේවකයාගේ විතරයි. අනෙක් සියලු දෙනාගේම පඩිය සියයට 80ක්-90ක් වැඩි වෙනවා.

දැන් බලන්න, හයිලන්ඩ් කිරි පිටි පැකට්ටුව තිබුණේ රුපියල් 386ට. ඒකෙ මිල රුපියල් 295ට අඩු කළා. රුපියල් 386ට තිබුණු ඇන්කර් වාගේ ආනයනික කිරි පිටිවල මිල රුපියල් 325ට අඩු කළා. ගෑස් මිල දෙස බලන්න. මේ වාගේ පනත් එන්න ඉස්සෙල්ලා අපි ඒවායේ මිල අඩු කළේ නැද්ද? රුපියල් 2,650ට තිබුණු කිලෝ ග්‍රෑම් 12 ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,350ට අඩු කළා. ඊළඟට, රුපියල් 165ට තිබුණු පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 117ට අඩු කළා. රුපියල් 130ට තිබුණු ඩීසල් ලීටරයක මිල රුපියල් 95ට අඩු කළා. රුපියල් 95ට තිබුණු භූමි තෙල් මිල රුපියල් 55ට අඩු කළා. රුපියල් 220ට-240ට තිබුණු පරිප්පු කිලෝ එකක මිල රුපියල් 155ට-160ට අඩු කළා. එදා පාන් පිටි කිලෝ එකක මිල තිබුණේ රුපියල් 110ට. ඒ මිල රුපියල් 87ට අඩු කළා. රුපියල් 116ට තිබුණු සීනි කිලෝ එක, ආණ්ඩුව ගත්ත ගමන් රුපියල් 90ට දුන්නා. රුපියල් 202ට තිබුණු ග්‍රෑම් 425 ටින් මාළු ටින් එකක මිල රුපියල් 135ට අඩු කළා. මේ විධියට අපි බඩු මිල විශාල වශයෙන් අඩු කළා. නමුත් මේවා මතක නැහැ. මොකද, අපේ ප්‍රචාරණ යන්ත්‍රණය, අපේ ආණ්ඩුවේ ප්‍රචාරණ යන්ත්‍රණය ශක්තිමත් නැහැ. අපි ඒක අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. අපි වැඩ කරනවා, වැඩ කරනවා. නමුත් ඒක ජනතාවට දැනෙන්නේ නැහැ. ඒකාබද්ධ විපක්ෂයේ තිබෙන, නැත්නම් විපක්ෂයේ තිබෙන අවලාද, අපවාද විතරයි පත්තරවල පළවෙන්නේ, ටීවීවල ප්‍රචාරය වෙන්නේ.

හෙට විශ්වාස භංග යෝජනාව ගෙනෙනවා. දැන් අපිට පැහැදිලිව පෙනෙනවා, අපි ඒකෙන් ජයග්‍රහණය කරනවා කියලා. ඒකයි විපක්ෂයේ ඉන්නා මන්ත්‍රීවරයෙකු අද පාර්ලිමේන්තුව

ඇතුළේ සොයා ගන්නත් නැත්තේ. මොකද, ඔවුන් දන්නවා පරාජය වෙනවා කියා. දැන් ඔවුන්ට තේරෙනවා, මේකට උත්තරය මොකක්ද කියා. අපි ජයග්‍රහණය කළාට පසුව එක්සත් ජාතික පක්ෂයේත්, ඒ වාගේම ආණ්ඩුවේත් විශාල වෙනසක් සිදු වෙලා මේක අපට ආශිර්වාදයක් බවට පත් වෙනවා. ගරු නායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ ඉන්නා එක්සත් ජාතික පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුත් තීරණය කරලා තිබෙනවා, මේ weekend එක වෙනකොට ලොකු පෙරළියක් කරලා පෙරළිය පටන් ගන්න. අපිට මේක ආශිර්වාදයක්. වෙස්වලාගෙන ආපු ආශිර්වාදයක් අපේ පක්ෂයට; වෙස්වලාගෙන ආපු ආශිර්වාදයක් අපේ ආණ්ඩුවට.

මොකද, සිංහ හම පොරවාගෙන ආණ්ඩුව ඇතුළට ඇවිල්ලා සිටින කොටළුවෝ ටික හඳුනාගන්න පුළුවන් අවස්ථාවක් මේක. මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු විධියට ඔවුන් අපිත් එක්ක එකට ඉන්නවා. ආණ්ඩුව ගෙනයන්නේ මෙහෙමයි කියලා අපටත් උපදෙස් දීලා අපව විවේචනය කරන උදවිය ඉන්නවා. අපි එකතුවෙලා ආණ්ඩුව හරි මාර්ගයේ අරගෙන යමු කියන මේ විවේචන කරන්නේ සද්භාවයෙන් කියලා හිතලා අපි ඒ ගොල්ලන්ගේ විවේචන පිළිගන්නවා. නමුත්, ඒ අයගේ හදවත තිබෙන්නේ වෙන පැත්තක, ඇඟ තිබෙන්නේ තව පැත්තක. දැන් ඉදිරිපත් වී තිබෙන විශ්වාස භංග යෝජනාවත් එක්ක හදවත තිබෙන්නේ කොහේද, ඇඟ තිබෙන්නේ කොහේද කියලා සොයාගන්න පුළුවන්; ජනතාවට ඇස් විවර කරලා බලන්න පුළුවන්; අපටත් හඳුනාගන්න පුළුවන්. හෙට වෙනකොට විශ්වාස භංග යෝජනාව අපේ පැත්තෙන් ජයග්‍රහණය කරලා, විපක්ෂය ගෙනෙන මෙම විශ්වාස භංග යෝජනාව පරදවලා අපේ මතය ජයග්‍රහණය කරගෙන, 5වැනිදා -අනිද්දා- වෙනකොට සිංහ හම පොරවාගෙන සිටින කොටළුවෝ ටිකත් මේ ආණ්ඩුවෙන් ඉවත් කරනවා. එකා මෙන්, එක විධියට රට හදන්න, යහ පාලනය සමඟ එකතු වෙන්න පුළුවන් පිරිස සමඟ අපි එකතු වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, මෙය අපට ආශිර්වාදයක් වෙනවා. යහ පාලනයට කැමැති උදවිය කවුද, ඇමතිකම් බලාගෙන යහ පාලනයට එකතු වුණු උදවිය කවුද, යහ පාලන ප්‍රතිපත්ති දෙස බලාගෙන යහ පාලන ආණ්ඩුවට එකතු වුණු උදවිය කවුද කියන එක හෙට හැන්දෑව වෙනකොට, ඇ වෙනකොට අපටත්, මේ රටේ ජනතාවටත් දැනගන්න පුළුවන් වෙනවා. හෙටින් පස්සේ පිරිසිදු යහ පාලනයක් සඳහා එකතු වන පිරිස කවුද කියලා අපි දන්නවා. ඒ අයත් එක්ක මේ ගමන ගිහිල්ලා ඉදිරි අවුරුදු එකහමාර, දෙක තුළ අපට මේ රටේ ලොකු වෙනසක් ඇති කරන්න පුළුවන්. හදවතින් යහ පාලනයත් එක්ක සිටින අයත් එක්ක අත් වැල් බැඳගන්න පුළුවන් අවස්ථාව මෙම විශ්වාස භංග යෝජනාවත් එක්ක හෙට දවස තුළ අපට උදා වෙනවා. ඒ නිසා, අපේ ආණ්ඩුවට එකතුවෙලා සිටින සිංහ හම පොරවාගෙන සිටින කොටළුවෝ ටික හඳුනාගන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳව විශේෂයෙන්ම මම ඒකාබද්ධ විපක්ෂයට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ රටේ බදු පිළිබඳව කථා කරනකොට කොපමණ බදු වංචා සිදුවෙලා තිබෙනවාද කියලා අපි දන්නවා. ආසියාවේ ලොකුම බදු වංචාව වන රුපියල් කෝටි 400ක බදු මුදල් වංචා කළ පුද්ගලයෙකුට විරුද්ධව අපි නඩු දාලා රුපියල් කෝටි 1,198ක මුදලක් දඩය වශයෙන් අය කරගෙන ඔහුට සිර දඬුවම් දුන්නා. ආසියාවේ සිදු වුණු විශාලම බදු වංචාව තමයි මේ රටේ සිදු වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි යුගයක් අපේ රටේ තිබුණා. අපි ඒවා මැඩ පවත්වාගෙන යනවා.

ඒ විතරක් නොවෙයි, දැන් බදු වංචා සිද්ධ වෙන්න බැහැ. මොකද, අපි බදු අරගෙන කරන්නේ දුප්පත් අහිංසක මිනිස්සුන්ට සහන සලසන එකයි. හැබැයි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අපි මේ රටට ලබා දුන්නා. බදු එකතු කරලා ආණ්ඩුව මොනවාද කරන්නේ, නිලධාරීන් මොනවාද කරන්නේ කියන එක අද මේ රටේ ඕනෑම කෙනෙකුට දැක බලාගන්න පුළුවන්කම තිබෙනවා. එදා අපට ඒ නිදහස තිබුණේ නැහැ. අපෙන් බදු අය කරලා හම්බන්තොට වරාය හදන්න ගත් ණයවල පොලිය ගෙව්වා. නමුත්, අපේ මන්ත්‍රීවරු හම්බන්තොට වරායට මොකද වුණේ කියලා බලන්න ගියාම, මැරවරයෝ ගහලා එළෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවකට තිබුණු නීතිය දෙස බැලුවොත් එය හාස්‍යජනකයි. උසාවියට ගිහිල්ලා නඩු අහලා ඒ මැරවරයෝ වරද පිළිගත්තාම, ඔහුට පැනවිය හැකි උපරිම දඩය වුණේ රුපියල් 50යි. ඔන්න ඕකයි නීතිය. උපරිම දඩය රුපියල් 50යි. අපි මේ රට අලුත් යුගයකට ගෙනෙන්න ඕනෑ. අපට එක්වරම ගෙනෙන්න බැහැ. නමුත්, ටිකෙන් ටික, ටිකෙන් ටික එතැනට ඇවිල්ලා මේ රට යහ පාලන ප්‍රතිපත්තියට ගෙනෙන්න ඕනෑ.

මහා පරිමාණයේ දූෂණ වංචා කළ පුද්ගලයින් සඳහා දිනපතා නඩු අහන ක්‍රමවේදය මේ බ්‍රහස්පතින්දා වෙනකොට පාර්ලිමේන්තුවේ සම්මත වීමට නියමිතයි. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. හෙට වෙනකොට -4වැනිදා වෙනකොට- මේ රටේ නව පිටුවක් පෙරළෙනවා. හරියට රට ගෙනයන්න ඕනෑ, යහ පාලනය ගෙනයන්න ඕනෑ පුද්ගලයෝ ටික පාර්ලිමේන්තුව තුළ කැපී පෙනෙන්න පටන් ගන්නවා. 5වැනිදා වෙනකොට හොරු අල්ලන්න, වංචා අල්ලන්න එදිනෙදා නඩු අහන ක්‍රමවේදය මේ රට තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පනත පාර්ලිමේන්තුව තුළ සම්මත වෙනවා. එතකොට ජනතාව බලාපොරොත්තු වන හොරු අල්ලන ක්‍රමවේදය, හොරුන්ට දඬුවම් දීමේ ක්‍රමවේදය ඉතා කඩිනමින් ක්‍රියාත්මක කරන්න අපට හැකියාව ලැබේවි. හෙට සිට අපට හොඳ කාලයක් උදා වෙනවා. එය මේ රටේ ජනතාවගේත් වාසනාව, අපේ ආණ්ඩුවේත් වාසනාව, එක්සත් ජාතික පක්ෂයේත් වාසනාව. එතකොට අපට හරි කණ්ඩායමක් සමඟ මේ රට ඉදිරියට ගෙනයන්න හැකි වෙනවාය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.3.36]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡාවට ගන්නවා, හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීම සඳහා යෝජනා සම්මතය සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් දහයක්. ඒ සම්බන්ධයෙන් මගේ අදහස් ඉදිරිපත් කරන්න මට විනාඩි 10ක කාලයක් වෙන් කිරීම ගැන ප්‍රථමයෙන්ම මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

මොන්ට්‍රියල් ප්‍රඥප්තිය ගැන වචනයක් කියනවා නම්, ඇත්ත වශයෙන්ම එයින් මූලිකව බලාපොරොත්තු වෙන අරමුණ තමයි ozone layer එකට හානි කරන වායු තහනම් කිරීම; විශේෂයෙන්ම hydrofluorocarbons - HFCs - තහනම් කිරීම. මම හිතන්නේ අපි මේ වාගේ ප්‍රඥප්තිවලට ඇත්ත වශයෙන්ම අත්සන් කරන්න ඕනෑ. සමහර දේශපාලනඥයන්ගේ අදහසක් තිබෙනවා, සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රඥප්තිවලට අත්සන් කරනකොට, Westphalia Treaty එක නැත්නම් ඒ ගිවිසුම නිසා රටක තිබෙන ස්වාධිපත්‍යය යම්කිසි විධියකට අභියෝගයකට ලක් වෙනවා කියලා. නමුත් අපි මෙතැනදී එක කාරණයක් තේරුම් ගන්න ඕනෑ. අපට වෙන වෙන රටවල් තිබුණාට, වෙන වෙනම ගම් තිබුණාට,

[ගරු තාරක බාලසූරිය මහතා]

අපට තිබෙන්නේ එකම එක ඍතුවියයි. විශේෂයෙන්ම මුළු ලෝකයටම බලපාන දේවලින්, භානි කරන දේවල්වලින් ලෝකය ආරක්ෂා කර ගැනීම සඳහා අනිවාර්යයෙන්ම මේ වාගේ ජාත්‍යන්තර සම්මුතිවලට අපි සහයෝගය දෙන්න ඕනෑ. ඒවා අපේ රටේ නීතිය බවට පත් කර ගන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් කිහිපයකුත් අද විවාදයට ගැනෙනවා. මේ නියමයන් ගැන කථා කරනකොට අපි දකිනවා, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු විශාල ලෙස ජනතාව පිට බදු පටවලා තිබෙනවා කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගෙන් බදු ගන්නකොට සාමාන්‍යයෙන් අපි අහලා තිබෙන්නේ "මී මැස්සෙක් මලකින් රොන් ගන්නවා වාගේ" බදු ගන්න ඕනෑ කියලායි. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ජනතාවට ජීවත් වෙන්න බැරි ප්‍රමාණයට බදු ගහලා තිබෙනවා. ඒක එතරම් හොඳ ලක්ෂණයක් නොවෙයි. අපි දැකලා තිබෙනවා, අසාධාරණ විධියට බදු ගහනකොට සමහර රටවල යුද්ධ පවා ඇතිවී තිබෙන බව. ඉතිහාසයේ අපි එහෙම දැකලා තිබෙනවා. විශේෂයෙන්ම එංගලන්තයේ අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසාධාරණ විධියට බදු දැම්මා. බල්ලෙක් හිටියා නම් බද්දක් දැම්මා, සෙරෙප්පු දැම්මා නම් බද්දක් දැම්මා, ඉස්තෝප්පුවක් තිබුණා නම් බද්දක් දැම්මා. යටත්විජිත කාලයේදී තිබුණු බදු විධියට දැනුත් ජනතාව පිට බදු පනවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයකට මූලිකව බදු අවශ්‍ය වන කාරණා කිහිපයක් තිබෙනවා. මූලික කාරණාව තමයි රජයට මුදල් අවශ්‍ය වීම. දෙවෙනි කාරණාව තමයි යම් කිසි විධියකට සමාජ සාධාරණය -social equity- ඇති කරන්නත් බදු අවශ්‍ය වීම. අනික් කාරණාව තමයි යම් කිසි කාර්යයක් අධෛර්ය - discourage - කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ සඳහාත් බදු පැනවිය හැකි බව. විශේෂයෙන්ම අරක්කුවලට පනවන බදු, සිගරට්වලට පනවන බදු තුළින් අරක්කු බොන එක, සිගරට් බොන එක අධෛර්ය කිරීම තමයි බලාපොරොත්තු වන්නේ. ඒ වාගේම බදු තවත් විධියකට පාවිච්චි කරන්න පුළුවන්. ඒ, රටේ ඉන්න ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගැනීම සඳහා. හැබැයි, ආර්ථික විද්‍යාවේ පියා වන ඇඩම් ස්මිත් කියනවා, "බදු ගහන්න පුළුවන් වෙන්නේ කාරණා තුනකට පමණයි" කියලා. බදු ගහන්න පුළුවන් ඒ කාරණා මොනවාද? ලාභයකට - profit එකකට - බදු පනවන්න පුළුවන්. එහෙම නැත්නම් rent එකට බදු පනවන්න පුළුවන්. Rent එකක් කියා මෙතැනදී අදහස් කරන්නේ මොකක් හරි ප්‍රාග්ධනයක් දීලා ඒකෙන් ලාභයක් ලබා ගැනීම. එහෙම නම්, ඒකට බදු පනවන්න පුළුවන්. එහෙම නැත්නම් බදු පනවන්න පුළුවන් වන්නේ ඒ ලැබෙන පඩිවලට කියලා ඔහු සඳහන් කරනවා. හැබැයි, මේ රජය සියලුදේට අප්‍රේල් 01 වෙනිදා සිට Inland Revenue Act එක හරහා බදු ගහන්න පටන් ගෙන තිබෙනවා. ඉතාම අසාධාරණ විධියට තමයි මේ බදු ගහලා තිබෙන්නේ. Capital Gains Tax එක තිබෙනවා.

ප්‍රාග්ධනය වැඩි වෙනවාට බදු ගහන එක එච්චරම හොඳ දෙයක් නොවෙයි. මේ පනත අනුව දෙවෙනි ගෙයක් තිබෙනවා නම්, ඒ දෙවෙනි ගෙය විකුණුවොත් එයින් ලැබුණු ලාභයට මෙතැනදී සියයට 10ක බද්දක් වැටෙනවා. මේ වාගේ බදු දැම්මොත් වෙන්නේ මොකක්ද? අද තිබෙන ආර්ථික වර්ධනය එන්න එන්න අඩු වීමයි. අපි මෙතැනදී තේරුම් ගන්න අවශ්‍ය වෙනවා, ඕනෑම බද්දක් ගැහුවොත් ඒ පුද්ගලයන්ගේ හැසිරීමට යම්කිසි බලපෑමක් තිබෙනවා කියන කාරණය. බද්දක් ගැහුවාට පස්සේ ඒ පුද්ගලයන් හැසිරෙන විධිය මෙතැනදී යම්කිසි විධියකට පාලනය කරන්න පුළුවන් වෙනවා. අපි දන්නවා, මේ Capital Gains Tax එක අවසාන වශයෙන් තිබුණේ 2002 දී බව. එය රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා තමයි ඉවත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව වාගේ රටක දැනට පවතින ආර්ථික තත්ත්වය ගොඩනඟන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, මේ Capital Gains Tax එක අයින් කරන්න අවශ්‍ය වනවා. Inland Revenue Act එක අනුව පනවන බදු ඇත්තටම සාධාරණයිද කියලා අපට මෙතැනදී කල්පනා කරන්න වුවමනාවක් තිබෙනවා. ව්‍යක්තිකයන් රුපියල් මිලියන 25කට වඩා ආදායමක් ගන්නවා නම්, ඒ බද්ද සියයට 12 සිට සියයට 24 දක්වා වැඩි කරලා තිබෙනවා. ලංකාවේ විශාල ව්‍යක්තිකයන් ප්‍රමාණයක් ගෙවන්න ඕනෑ බදු ප්‍රමාණය ගෙවන්නේ නැහැ කියලා මමත් විශ්වාස කරනවා. හැබැයි, මීට වඩා ලෙහෙසියෙන්ම insurance companies හරහා මේක monitor කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවා. දොස්තරවරුන්ට ගෙවන මුදල - doctors' charges - insurance companies හරහා monitor කරන්න පුළුවන්. හැබැයි, ඒ ව්‍යක්තිකයන්ට මෙතැනදී සියයට 24ක බද්දක් අය කිරීම සාධාරණයිද කියන එක පිළිබඳවයි මම ප්‍රශ්න කරන්නේ. අපි දන්නවා, බොහෝ වෙලාවට දොස්තරවරු යම් කිසි ආදායමක් ඒ විධියට ලබා ගන්නා බව. කෑගල්ලේ 'ඔස්රෝ' නමින් රෝහලක් තිබෙනවා. ගමේ හිටපු දොස්තර කෙනෙක් හොඳට දියුණු වෙලා ඒ නමින් රෝහලක් දාලා තිබෙනවා. මේ වාගේ අයට සියයට 24ක බද්දක් ගැහුවොත් විශාල හානියක් වනවා කියලා මම විශ්වාස කරනවා.

පිට රටින් මුදල් ආවොත් Withholding Tax එකක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතෙහි ඒ සම්බන්ධයෙන් සංශෝධනයක් කළා කියලා මම විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට මුදල් ගෙන්නුවොත් සියයට 5ක Withholding Tax එකක් තිබෙනවා. එම බද්ද අනුව වෙන්නේ මොකක්ද? පිට රට වැඩ කරන සේවකයා මුදල් ලංකාවට එවන්නේ නැතිව ඉඳියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථික තත්ත්වය දිහා බැලුවොත් තිබෙන මූලික ප්‍රශ්නය තමයි balance of payment එක. Balance of payment එකේ මූලික ප්‍රශ්නය වන්නේ, අපේ trade deficit එකයි. අපේ ආනයන-අපනයන පරතරය රුපියල් බිලියන 10ක් පමණ වනවා. ඒ රුපියල් බිලියන 10 යම් කිසි විධියකට අඩු කර ගන්න හැකි වන්නේ කොහොමද? පිට රට වැඩ කරන අයගෙන් - foreign remittancesවලින් - රුපියල් බිලියන 7ක් වාගේ මුදල් ප්‍රමාණයක් අපට ලැබෙනවා. ඒ වාගේම රුපියල් බිලියන 3ක් වාගේ මුදල් ප්‍රමාණයක් අපට සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙනවා. ලංකාවට එවන රුපියල් බිලියන 7ක මුදල් ප්‍රමාණයට සියයට 5ක Withholding Tax එකක් තිබෙනවා නම්, මොකක්ද වෙන්නේ? ලංකාවට මුදල් එවන ප්‍රමාණය අඩු වෙනවා. මම හිතන්නේ මේක එතරම්ම හොඳ දෙයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, senior citizensලාටත් සියයට 5ක Withholding Tax එකක් තිබෙනවා. මේ ගරු සභාවේදී වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඒ පිළිබඳ කථා කළා. කවුරුන් හෝ පුද්ගලයෙක් අවුරුදු ගණනක් වැඩ කරලා, යම් කිසි මුදල් ප්‍රමාණයක් හොයා ගෙන ඒ මුදල් ප්‍රමාණය අතැනිව pension යනවා. ඒ මුදලට ලැබෙන interest එකටත් සියයට 5ක බද්දක් ගහනවා නම්, මම හිතන්නේ ඒක සාධාරණ දෙයක් නොවෙයි කියලායි. මොකද, ඕනෑම රටක බදු අය කිරීම සදාචාර වෙන්න ඕනෑ. මේ බදු අය කරන විධියේ නම් සදාචාරභාවයක් අපි දකින්නේ නැහැ.

දැන් අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ටිකක් භය වෙලා වාගේ කථා කළා. එතුමා කිව්වා, බදු තිබෙන ක්‍රමවේදය යම් කිසි

විධියකට සරල කළොත් රජයට මේ මුදල් ලබා ගන්න පුළුවන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ බදු ක්‍රමය සරල කරන්න ඕනෑ. ඒ වාගේම මේ පනත අනුව PAYE Tax එක දිහා බැලුවොත්, මේ ආණ්ඩුව බදු ක්‍රමය යම් කිසි මට්ටමකට සරල කරලා තිබෙන බව අපට පෙනෙනවා. ඇත්තවශයෙන්ම ඒ ගැන මම සන්තෝෂ වනවා. මේ බදු ක්‍රමය සරල කරලා තිබෙනවා කියලා ජනතාව බදු ගෙවන්නේ නැහැ. ජනතාව බදු ගෙවන්න නම් ජනතාව අපට යම් කිසි විධියකට විශ්වාසයක් දෙන්න ඕනෑ, ඒ ගෙවන රුපියලට යම් කිසි වටිනාකමක් දීලා තිබෙනවා කියලා. අද ජනතාව බදු ගෙවන්නේ නැති වෙන්න මූලික ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ඒ ගෙවන බදු මුදලට සිදු වන දේ ගැන ජනතාවට විශ්වාසයක් නොමැතිවීමයි. මොකද, රුපියලකින් හෝ බදු ගෙවිවොත්, කවුරු හෝ ඇමති කෙනෙක් ගිහිල්ලා ඒ එකතුවන මුදලින් කුමන හෝ වාහනයක් ගනීවිද, එහෙම නැත්නම් කොමිෂන් එකක් ගනීවිද, එවැනි කුමක් හෝ දෙයක් කරාවිද කියන සැකය ජනතාවට ඇති වනවා. එම නිසා තමයි රටේ ජනතාව යම් කිසි මට්ටමකට බදු ගෙවන එකට අකැමැත්තක් තිබෙන්නේ. අපි මේවා අනිවාර්යෙන්ම නිවැරදි කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

බදු ප්‍රතිපත්ති නිතර වෙනස් කරන්න බැහැ. රවි කරුණානායක මහත්තයාගේ කාලයේ electric carsවලට බද්දක් ගැහුවා. මංගල ඇමතිතුමා ආවාට පසුව ඒ බද්ද ඉවත් කළා. අවුරුදු දෙකක් වාගේ සුළු කාලයක් ඇතුළතදී මේ වාගේ ප්‍රතිපත්ති වෙනස් කරනවා නම්, අපි අපේ ආයෝජකයන්ට නිවැරදි පණිවුඩයක් දෙන්නේ නැහැ කියන එක තමයි එයින් පෙනී යන්නේ.

අපේ ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, FDIs වැඩි වෙලා තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම FDIs වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියලා අපි බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ පටන් ගත්ත හෝටල් ව්‍යාපෘති තිබෙනවා. ඒ ව්‍යාපෘතිවල ඉදි කිරීම් කටයුතු දැන් අවසන් වෙමින් යනවා. විශේෂයෙන්ම ඒ හෝටල් ව්‍යාපෘතිවලට අවශ්‍ය බඩු ගෙනාපු නිසා තමයි FDIs වැඩි වෙලා තිබෙන්නේ. නමුත්, මේ කාල සීමාවේදී අලුතෙන් ව්‍යාපෘති මේ රටේ ආරම්භ වී නැති බව අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිසුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයට අද රටේ බදු මට්ටම ඉහළ දමා තිබෙනවා. බදු තවත් වැඩි කළොත් මිනිසුන් පාරට බහින තත්ත්වයක් තමයි දැන් තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මේ කාරණය කියා අවසන් කරන්නම්.

1980 ගණන්වල රොනල්ඩ් රේගන් ජනාධිපතිවරයාගේ කාලයේදී බදු අඩු කළ බව අපි දන්නවා. බදු අඩු කළොත් විතරයි මිනිසුන්ට ආයෝජනය කරන්න පුළුවන් වන්නේ. බදු අඩු කිරීම අවශ්‍යයි. එතකොට තමයි ව්‍යාපාර දියුණු වෙන්නේ. එතකොට තමයි ආයෝජනය කරන්න මුදල් තිබෙන්නේ. බදු වැඩි කළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට ආයෝජනය කරන්න මුදල් නැති වනවා. එවිට ආර්ථිකය කඩා වැටෙනවා. බදු වැඩි කරන්න, වැඩි කරන්න, හම්බ වන මුදල් ප්‍රමාණය වැඩි වන්නේ නැති බවත් අපි තේරුම් ගන්න ඕනෑ. ප්‍රමාණය ඉක්මවා ගියාට පස්සේ බදු වැඩි කළාට ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වනවා. මම විශ්වාස කරන්නේ, දැන් අපි ඒ ප්‍රමාණය ඉක්මවා ගිහින් තිබෙනවා කියලායි. ඇත්ත වශයෙන්ම අපි ජනතාවට බදු සහනත් දිය යුතුයි. ජනතාවට බදු සහන දුන්නොත් අපේ ආයෝජන වැඩි කර ගන්න පුළුවන් බව මගේ විශ්වාසයයි. ඒ අනුව ඉතිරි කිරීම් වැඩි කර ගන්නත් පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වනවා.

[பி.ப. 3.48]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின்கீழான கட்டளைகள் பற்றியும் ஹைட்ரோபுளோரோ காபனைக் கட்டங்கட்டமாகக் குறைத்தல் சம்பந்தமாக மொன்ட்ரியெல் கூட்டமைப்பு மேற்கொண்ட கிகாலி திருத்தத்திற்கு இலங்கை இணங்கிச் செயற்படல் தொடர்பான பிரேரணை நிறைவேற்றம் பற்றியும் இடம்பெறுகின்ற விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்த உயரிய சபையில் நடைபெறும் விவாதத்தைப் பள்ளி மாணவர்கள் சற்று நேரத்திற்கு முன்னர் 'கலரி' இலிருந்து அவதானித்துக் கொண்டிருந்ததைப் பார்க்கக்கூடியதாக இருந்தது. என்னைப் பொறுத்தவரையில், இன்றைய விவாதமானது மீண்டும் என்னைப் பள்ளிக்கால நினைவுகளுக்கு அழைத்துச் சென்றிருக்கிறது. காரணம், பாடசாலைக் கல்வியை ஒன்பதாம் அல்லது பத்தாம் தரத்திலே பயிலும்போது குளோரோ புளோரோ காபனின் தாக்கம் பற்றியும் அது ஓசோன் படலத்துக்கு ஏற்படுத்தக்கூடிய தாக்கம் சம்பந்தமாகவும் பச்சை வீட்டு விளைவு - green house effect - சம்பந்தமாகவும் நாங்கள் படித்திருக்கின்றோம். துரதிருஷ்டவசமாக, பல வருடங்கள் கழித்து இன்று இந்தச் சபையிலே ஒரு பாராளுமன்ற உறுப்பினராக உரையாற்றும்போதும் அந்த விடயம் தொடர்பாக மீண்டும் உரையாடக்கூடியதாக இன்றைய நேரம் அமைந்திருக்கின்றது. எம்மை நோக்கி வருகின்ற சவால்களை அல்லது பிரச்சினைகளை எதிர்கொள்வதற்கான தீர்மானங்கள் காலம் தாமதித்து எடுக்கப்படுகின்றன என்பதைத்தான் இது நினைவுபடுத்துகின்றது.

சில இரசாயனப் பொருட்கள் வளிமண்டலத்தில் அமைந்துள்ள ஓசோன் படலத்திற்குச் சேதம் ஏற்படுத்துகின்றன என்பது 1974ஆம் ஆண்டிலேயே முதற்தடவையாகச் சுட்டிக்காட்டப்பட்டது. இன்று 44 வருடங்கள் கடந்துவிட்டன. அப்படிப் பார்க்கும்போது மனித தேவைக்காக கைத்தொழிற் சாலைகளினூடாக வெளிப்படுத்தப்படுகின்ற நச்சு வாயுக்கள் ஓசோன் படலத்தைத் தாக்குவது சம்பந்தமாக 1977, 1981, 1985, 1987, 1988ஆம் ஆண்டுகளில் சில முடிவுகள் எட்டப் பட்டன. இவ்வாறு இரண்டு அல்லது நான்கு வருடங்களுக்கு ஒருமுறை பல்வேறு தீர்மானங்கள் நிறைவேற்றப்பட்டு அந்த தீர்மானங்களை அமுல்படுத்துவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டபோதும்கூட அவை இப்போதுதான் எமது நாட்டை வந்தடைந்திருக்கின்றன. குளோரோபுளோரோ காபன் அல்லது ஹைட்ரோபுளோரோ காபனின் வெளியேற்றம் கைத்தொழிற்சாலைகளினூடாக அல்லது நாங்கள் பாவிக்கின்ற குளிர்சாதனப் பெட்டி போன்ற இலத்திரனியல் பொருட்களின் பாவனை காரணமாக ஏற்படுகின்றதென்பது பொதுவாக நாங்கள் கற்றுக்கொண்ட விடயங்கள்தான். அதேநேரம் தனியொரு நாடாக அல்லாமல், பூகோள ரீதியாக - சர்வதேச

[ගරු මයිල්වාගනම් කිලකරාජ මහතා]

රීතියාක ඒනෙය නාටුකලුටන් ඔත්තුමෙත්තු-ඉණංකිච්චෙන්රු ඉතු තොටර්පාක මේර්කොළ්ள වේණ්ටිය මාර්රු නටවටික්කෙකළෙ එටුප්පතන්මූලම් අතනෙච් චර්වතේච තීර්මානමාකක් කොළ්ள මුටියුම්. 1990ආම් ආණ්ටු ඉලණ්ටනිල් මේර්කොළ්ளප්පට්ට තිරුත්තම්, 1992ආම් ආණ්ටු කෝපන්හේකනිල් මේර්කොළ්ளප්පට්ට තිරුත්තම්, 1997ආම් ආණ්ටු මොන්ට්රියලිලේ මේර්කොළ්ளප්පට්ට තිරුත්තම්, 1999ආම් ආණ්ටු පීජිංකිලේ මේර්කොළ්ளප්පට්ට තිරුත්තම් එන ඔව්වොරු කාලකට්ටත්තිලුම් පල තිරුත්තංකළ් මේර්කොළ්ளප් පට්ටුත් තීර්මානංකළ් මේර්කොළ්ளප්පට්ටන. අන්තත් තිරුත්තංකළ් එල්ලාවර්රුක්කුම් පිරකු 2016ආම් ආණ්ටු කිකාලි තිරුත්තම් මේර්කොළ්ளප්පට්ටතු. අතන් අටිප්පටෙයිල් ඉණංකිච් චෙල්වතු චම්පන්තමාක ඉන්රු නාංකළ් විවාතිත්තුක් කොණ්ටිරුක්කින්රෝම්.

නමතු නාට්ටිර්කු අත්තකෙය ඔරු චූළල් ඉන්නමුම් වරාත නිලෙයිල්කූට නාංකළ් තෙරින්තුකොළ්ள වේණ්ටිය විටයංකළ් ඉරුක්කින්රන. අතාවතු, චීනාවිලුම් අණ්මෙ යිල් ඉන්තියාවින් ටිල්ලියිලුම් වළිමණ්ටලත් තාක්කත්තින් කාරණමාක මාචටෛන්ත වළියෙච් චුවාචිප්පතාල් ඒර්පටුම් පිරච්චිනෙකළ් තොටර්පාකප් පරවලාකප් පේචප්පට්ටු වන්තතෙ නාංකළුම් අරින්තිරුක්කින්රෝම්. වළමෙයාක, කාලනිලෙ අරික්කෙයින් පිරකාරම් නාළෙ මළෙ පෙය්යුමා? වෙයිල් අටික්කුමා? එන්පතෙත් තෙරින්තුකොණ්ටු එංකළෙත් තයාර් චෙය්තුකොළ්කින්ර නාංකළ්, ඉන්රු චුවාචිප්පතර්කු ඒර්රවාරු එංකළතු නකරම් ඉරුක්කුමා? නාංකළ් චෙල්කින්ර වළි චුවාචිප්පතර්කුප් පොරුත්තමානතාක ඉරුක්කුමා? එන්පතෙප් පර්රිත් තෙරින්තුකොළ්ள වේණ්ටිය නිලෙක්කුත් තළ්ளප් පට්ටිරුක්කින්රෝම් එන්පතු මිකවුම් තුරතිරුෂ්ටවචමානතු. චීනාවුක්කුච් චෙල්කින්රවර්කළ් අංකු තාංකළ් චෙල්ලුම් නකරංකළ් චුවාචත්තිර්කු උකන්තවෛයා එන්පතෙ මුන්කූට්ටියේ තෙරින්තුකොණ්ටු චෙල්කින්ර නිලෙමෙ ඉරුක්කින්රතු. අංකුළ්ள පීජිංකු, චාංහාය් පෝන්ර කෛත්තොළිල් චාර්න්ත පිරතේචංකළ් අව්වාරුතාන් ඉරුක්කින්රන. නාංකළුම් අංකු චෙන්රාල් අව්වාරේ නටන්තුකොළ්කිරෝම්. අණ්මෙයිල් ඉන්තියාවුක්කුච් චෙන්රිරුන්ත එංකළතු කිරික්කෙට් අණියිනර් පුතුටිල්ලියිලේ විළෙයාටික් කොණ්ටිරුන්තපෝතු චුවාචිප්පතර්කුච් චිරමම් ඒර්පට්ටු, එව්වාරාන ඉක්කට්টාන නිලෙමෙකළුක්කු උළ්ளානාර්කළ් එන්ර චෙය්ති එංකළ් එල්ලෝරුක්කුම් නිනෙවිරුක්කුම්.

ඉව්වාරාන පිරච්චිනෙකළ් টිල්ලියිලෝ පීජිංකිලෝ මාත්තිරමල්ල, එතිර්කාලත්තිල් කොළුම්පිලුම් කණ්ටියිලුම් නුවරෙලියාවිලුම් කාලියිලුම්කූට වරක්කූටිය අපායම් ඉරුක්කින්රතු එන්පතෙ ඉන්ත නාට්ටින් පොතුමක්කළුක්කුත් තෙරිවික්ක වේණ්ටුම් එන්පතර්කාකත්තාන් නාංකළ් ඉන්තත් තීර්මානත්තෙ එටුක්කින්රෝම් එන්පතු චොල්ලප්පට වේණ්ටුම්. අන්තවකෙයිල් ඉන්රෙය විවාතම් මික මුක්කියමානතු. ආකවේ, ඉන්ත විවාතත්තින් පේචුපොරුළ් ඌටකංකළි නූටාකප් පොතුමක්කළෙච් චෙන්රටෙය වේණ්ටුම්. අතේනේරම් පාරාළුමන්රත්තිල් තීර්මානම් එටුප්පතනූටාක මාත්තිරම් ඉන්ත විටයංකළුක්කුත් තීර්වු කාණ මුටියාතු. නාට්ටිලුළ්ள ඔව්වොරු මනිතනුම් - ඔව්වොරු පිරජෛයුම් ඉන්තත් තිට්ටත්තිර්කුත් තාංකළ් එව්වාරු ඔත්තුමෙක්කලාම්? එන්රු චින්තික්කවේණ්ටිය පොරුප්පිරුක්කින්රතු. එනවේ, 'ඔචෝන්' පටෙ අමිවින් තාක්කම් චම්පන්තමාන පිරච්චිනෙ කළෙ අලචි ආරාය්න්තු මක්කළෙ අරිළූට්ටි, අතනූටාකච් චර්වතේච රීතියාක ඉණංකිච්චෙල්වතු චම්පන්තමාන ඉන්තත් තීර්මානත්තිර්කු මක්කළ් පිරතිනිතියෙන්ර වකෙයිල් ඉන්ත උයිරිය චපෙයිලේ එනතු ආතරවෛප් පතිවු චෙය්ය නාන් කටමෛප්පට්ටිරුක්කින්රේන්.

අතේනේරම්, ඉන්නුමොරු විටයත්තෙයුම් ඥාපකප්පටුත්ත වේණ්ටියිරුක්කින්රතු. අතාවතු, පොතුච් චූළලුක්කුප් පාතිප්පෙ ඒර්පටුත්තක්කූටිය - මනිත වාළ්ක්කෙක්කුප් පාතිප්පෙ ඒර්පටුත්තක්කූටිය ඉව්වාරාන ඒතේනුම් ඔරු විටයම් තොටර්පාක මුටිවෙටුක්කුම්පෝතු, පාරාළුමන්රත්තිල් කලන්තුරෛයාටුවතන්මූලම් අල්ලතු මේතකු ජනාතිපති අවර්කළ් අවරතු නිරෛවේර්රු අතිකාරත්තෛක් කොණ්ටු නිරෛවේර්රුවතන්මූලම් අල්ලතු ඒතේනුම් කුළුක්කළ් තීර්මානම් එටුප්පතන්මූලම් තීර්ක්කමාක ආරාය්න්තු චෙය්යක් කූටිය චාත්තියමාන වාය්ප්පුකළින් අටිප්පටෙයිලේයේ මුටිවුකළෙ වෙළිප්පටුත්ත වේණ්ටුම්. ඉතුපෝන්ර ඔරු පිරච්චිනෙතාන් glyphosate විවකාරත්තිල් කාණප්පට්ටතු. අතාවතු, පෙරුන්තෝට්ටප් පකුතිකළිලේ අතිකළවාකක් කළෛනාචිනියාකප් පයන්පටුත්තප්පටුකින්ර glyphosate එනප්පටුකින්ර ඉරචායනප් පොරුළානතු, නීර් වළින්තෝටලිනූටාක නීර්නිලෛකළිල් චේර්න්තු කුටිනීරුටන් කලන්තු එමතු උටලුක්කුළ් චෙන්රු චිරුනීරක නෝයෙ ඒර්පටුත්තුකින්රතු එන්ර ඕර් ආය්වුමූලමාන මුටිවු කිටෛක්කප්පෙර්රතු අතන් අටිප්පටෙයිල්, ඉන්ත glyphosate චේර්ක්කප්පට්ටුළ්ள මරුන්තුප් පොරුට්කළෛත් තටෛ චෙය්ය වේණ්ටුම් එන්කින්ර නිපන්තනෛ, මේතකු ජනාතිපති අවර්කළ් ආරම්පිත්තු වෛත්ත චිරුනීරක නෝය්ක් කට්టුප්පාට්টුත් තිට්ටත්තින්කීළ් විතික්කප්පට්ටතු. අන්තත් තටෛ 2 වරුටංකළ් නටෛමුරෛයිලිරුන්තපෝතිලුම්, කටන්ත මාතම් ඕර් අමෛච්චරවෛප්පත්තිරම් තාක්කල් චෙය්යප්පට්టු, “Glyphosate එන්ර මරුන්තුප්පොරුළෛප් පයන්පටුත්තුවතිල් පිරච්චිනෙ යොන්රුම්ලිලෛ; අතනෛ මීණ්ටුම් පයන්පටුත්තලාම්” එන්ර තීර්මානම් එටුක්කප්පට්ටිරුක්කින්රතු. අප්පටියානාල් ඉන්තප් පාරාළුමන්රත්තිල් එටුක්කප්පටුකින්ර තීර්මානම් කේලික්කූට්තාක මාරිවිටුම්.

ඔරු කාලත්තිල් glyphosate චරියිල්ලෛ එන්රු තෙරිවික්කප් පට්ටතුම් කුරිත්ත ඉරණ්টු වරුටංකළින් පින්නර් අතිල් ඔරු පිරච්චිනෙයුම් ඉල්ලෛ එන්රු තෙරිවික්කප්පට්ටතුම් මක්කළෛක් කුළප්පුකින්ර ඔරු විටයමාක මාරි, පෙරුන්තෝට්ටත්තුරෛයිල් අතු පාවික්කප්පට වේණ්ටුමා? ඉල්ලෛයා? එන්ර කේල්වි ඉන්රු ඒළුත්තුළ්ளතු. පෙරුන්තෝට්ටත්තුරෛයිල් අතනෛප් පාවික්කාමල් විට්ටතන්මූලමාක එන්න නටන්තිරුක්කින්රතු? අල්ලතු අතනෛප් පාවිප්පතනූටාකක් කීළෛප් පිරතේචංකළිලේ මක්කළුක්කුච් චිරුනීරක නෝය් වරක්කූටිය ආපත්තු ඒර්පට්ටිරුක්කින්රතා? එන්පතු පර්රි එල්ලාම් තීර ආරාය්න්තු ඔට්ටුමොත්තමාන මුටිවින් අටිප්පටෙයිලේයේ අතු තොටර්පාන නටවටික්කෙ මේර්කොළ්ளප්පට්ටිරුක්ක වේණ්ටුම්. ආනාල්, ඉන්රු ඔරු පල්කලෛක්කළකප් පේරාචිරියරෙ විඥ්ඤානි එනච් චොල්ලි, අවරතු කරුත්තුප්පටිතාන් කුරිත්ත විටයම් තටෛචෙය්යප්පට්ටතු එනක් කූටප්පටුකින්ර අතේනේරම්, ඉන්නුම් 10 පේර් අතු තටෛ චෙය්යප්පට වේණ්ටියතිල්ලෛ එන්ර ඕර් අර්රික්කෛයෙ නාට්ටිල් චමර්ප්පික්කින්රාර්කළ්. ඉන්ත නිලෛමෙ මක්කළිටත්තිලේ කුළප්පත්තෛ ඒර්පටුත්තුකින්රතු. උණ්මෛයිල් පාරාළුමන්ර උරුප්පිනර්කළ් එන්කින්ර අන්තස්තු ඉන්තත් තටෛයෙ විතිප්පතර්කෝ අල්ලතු නීක්කුවතර්කෝ එන්තවිතත්තිලුම් පොරුත්තමානතාක ඉරුක්කාතු. කාරණම්, පාරාළුමන්ර උරුප්පිනර්කළ් එල්ලෝරුම් විඥ්ඤානිකළ් අල්ලර්. නාංකළ් චමූකම් චාර්න්ත විටයංකළිල් ඊටුපටුකින්රවර්කළ් අල්ලතු කතෛක්කින්රවර්කළ් එන්කින්ර වකෙයිල් චමූක විඥ්ඤානිකළාකච් චෙයර්පටලාම්. එනවේ, ඉරචායන විඥ්ඤානම් චාර්න්තවර්කළෛ - අතිල් තේර්ච්චි

பெற்றவர்களை அழைத்து அதுபற்றிய தீர்க்கமான முடிவை எடுத்துத்தான் குறித்த பொருளைத் தடை செய்வது சம்பந்தமாகவோ அல்லது நீக்குவது சம்பந்தமாகவோ நடவடிக்கை எடுக்க வேண்டும். இன்று chlorofluorocarbon தடைசெய்யப்பட வேண்டும் என்ற விடயம் இந்தப் பாராளுமன்றத்தில் விவாதிக்கப்பட்டு தீர்மானிக்கப்பட்டு, பின்னர் நாளை அதனைப் பாவிக்கலாம் என்கின்ற நிலைமை ஏற்பட்டுவிடக்கூடாது என்பதற்காகவே இந்த glyphosate சம்பந்தப்பட்ட விடயம் குறித்து நான் இங்கு குறிப்பிடு கின்றேன். எனவே, குறித்த தீர்மானம் தீர்க்கமானதாக இருக்க வேண்டும்.

பெருந்தோட்டக் கம்பனிகள் glyphosate எனப்படுகின்ற மருந்தைப் பெருந்தோட்டங்களில் களைநாசினியாகப் பயன்படுத்த ஆரம்பித்த பின்னர் களையகற்றும் தொழிலுக் காகப் பயன்படுத்தப்பட்ட ஆண் தொழிலாளர்கள் பெருந் தோட்டங்களில் அதிகளவில் ஈடுபடுத்தப்படுவதில்லை. பெருந்தோட்டக் கம்பனிகள் கொழுந்து பறிப்பதற்காகப் பெண் தொழிலாளர்களை ஈடுபடுத்துகின்ற அதேவேளை, ஆண் தொழிலாளர்களின் எண்ணிக்கையைக் குறைத்து, glyphosate கலந்த மருந்துகளைப் பாவிப்பதனூடாகக் களையகற்றி வந்ததன் காரணமாக அங்கு தொடர்ச்சியாக வேலையிலிருந்த ஆண் தொழிலாளர்கள் அந்தத் துறையிலிருந்து அகன்று மாற்றுத் தொழில்களில் ஈடுபடுகின்றனர். அதாவது, அவர்கள் இன்று முறைசாராத் தொழில்களில் - கட்டிட நிர்மாணத் துறையில் அல்லது கடைகளில் தொழில் செய்கின்றார்கள். அதேநேரத்தில், இன்று இந்தப் பெருந்தோட்டத் தொழிற்துறை யானது பெருமளவில் வீழ்ச்சி கண்டிருக்கின்றது.

மிக ஆரம்ப காலத்தில் இடம்பெற்ற ஒரு செயற்பாடு எங்களுக்கு நினைவிருக்கின்றது. அதாவது நாங்கள் சிறுவயதினராக இருந்த காலத்தில், தேயிலைச் செடிகளுக்கு இடையூறு விளைவிக்கின்ற களை - புற்கள் அல்லது கழிவுகள் ஆண் தொழிலாளர்களால் அகற்றப்பட்டு, அவை compost முறையில் பதனிடப்பட்டுப் பெருந்தோட்டப் பகுதியிலே உரமாகப் பாவிக்கப்படுவதற்கான ஏற்பாடு செய்யப்பட்டது. அப்பொழுது தோட்டங்கள் மிகச் சுத்தமாக இருந்தன. அதேநேரம் அந்தப் பெருந்தோட்டங்களில் இந்தத் தொழிலாளர்கள் நடமாடியதன் காரணமாக அந்தப் பிரதேசம் மக்கள் ஊடாடுமிடமாகவும் இருந்தது. ஆனால், இன்று அந்த நிலைமை மாறியிருப்பதன் காரணமாக - தேயிலை பயிரிட்ட பெரும் பகுதிகள் இப்பொழுது காடாக மாறியிருப்பதன் காரணமாக - தொலைவிலிருந்த மிருகங்கள் அந்தப் பிரதேசத்தையும் காடாகக் கருதி, தமது வாழிடமாக மாற்றிக் கொண்டன. இந்த நிலைமை பெருந்தோட்டப் பயிர்ச் செய்கைசார் மக்கள் அல்லது பெருந்தோட்டக் கைத்தொழில் சார் மக்கள் எதிர்நோக்குகின்ற பிரதான பிரச்சினையாக மாறியிருக்கிறது. தோட்டங்கள் காடாவதால் அங்குள்ள மக்கள் தொழில்வாய்ப்புக்களை இழப்பது மட்டுமல்ல, குறிப்பிட்ட மிருகங்கள் மக்கள் வாழிடங்களுக்கு அண்மித்ததாக இருக்கின்ற தேயிலை அல்லது இறப்பர் பயிர்களுள்ள மலைப் பிரதேசங்களுக்கு வருவதன் காரணமாகப் புதுவிதமான பிரச்சினையை எதிர்நோக்க வேண்டியிருக்கின்றது.

தினமும் வீட்டைவிட்டு வெளியே வருகின்றபோது, சிறுத்தையைச் சந்திக்கின்ற மக்களாக இந்தப் பெருந்தோட்டத் தொழிலாளர்கள் மாறியிருக்கின்றார்கள். காலையிலே பாடசாலைக்குச் செல்கின்ற சிறுவர்கள் வழியில் சிறுத்தை களை எதிர்கொள்கிறார்கள். ஆகவே, இந்த glyphosate சார்ந்து எடுக்கப்பட்ட தீர்மானமானது, பல்வேறு பக்க விளைவுகளை உருவாக்கியிருக்கின்றது. அந்தவகையில், பெருந்தோட்டங் களை நிர்வகிக்கின்ற கம்பனிகள் அல்லது அரசாங்கம் குறித்த தீர்மானங்களை எடுக்கின்றபோது இலாப நோக்கம் கருதியதாக மாத்திரமல்லாமல், அவை எந்தளவுக்குப் பக்க விளைவுகளை ஏற்படுத்துகின்றன என்ற அடிப்படையிலும் சிந்தித்தே முடிவெடுக்க வேண்டும். இவ்வாறான பொருட்களுக்கான தடை வெளிநாடுகளிலும் இருக்கிறது. தேயிலையில் மாத்திரமல்ல, நாங்கள் உண்ணுவதற்காக வாங்குகின்ற மரக்கறிகளிலும் முற்றுமுழுதாக இரசாயனப் பொருட்கள் கலந்திருப்பதை இலகுவாகத் தெரிந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. அந்தளவுக்கு இந்த நிலைமை மோசமாக இருக்கிறது. உதாரணமாக இன்று உற்பத்தி செய்யப்படுகின்ற 'கரட்' இனது தோற்றத்தைப் பார்த்தால், அது வியாபார நோக்கத்துக்காக உற்பத்தி செய்யப்படுகின்றது என்பதைத் தெளிவாகத் தெரிந்துகொள்ளலாம்.

இன்று இயற்கை விவசாயம் சார்ந்து முழு உலகமும் மாறிக்கொண்டிருக்கிறது. இவ்வாறு biotechnology ஐ நோக்கிப் பயணித்துக்கொண்டிருக்கும்போது ஏன், நாங்கள் இரசாயனம் கலந்த பொருட்களைப் பயன்படுத்த வேண்டும்? கடந்த இரண்டு வருடங்களுக்கு முன்பு இயற்கை உரம் சம்பந்தப்பட்ட திட்டத்தை ஜனாதிபதி அவர்கள் ஆரம்பித்து வைத்தார். தற்பொழுது சில மாவட்டங்களில் இந்த இயற்கை உரங்களைப் பயன்படுத்தி மேற்கொள்ளப்பட்ட பயிர்ச் செய்கைகள் வெற்றியளித்ததான ஒரு தோற்றப்பாட்டைச் சில புள்ளிவிபரங்கள் காட்டுகின்றன. அதேநேரம் தம்புத்தேகம போன்ற பகுதிகளில் சில பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. அங்குள்ள சில பகுதிகளிலே அந்தப் பயிர்ச்செய்கை முறையாக இடம்பெற்றிருப்பதாகவும் சொல்லப்பட்டிருக்கிறது. இயற்கை விவசாயத்தை நோக்கிச் செல்லவேண்டும் என்ற நிலைப்பாடுதான் இந்தியாவின் தமிழ்நாட்டிலும் அதிகமாகக் காணப்படுகின்றது. எனவே, இலங்கை போன்ற சிறிய நாட்டில் அதிகளவு இரசாயனப் பாவனையூடாக நாங்கள் எமது மண் வளத்தை இழக்கப்போகிறோமா? அல்லது அதனை முறையாகப் பயன்படுத்தி இயற்கையைப் பாதுகாக்கப் போகிறோமா? பிரித்தானியர் வருகைக்கு முன்பதாக - ஏற்றுமதிப் பொருளாதாரம் அறிமுகப்படுத்தப்படுவதற்கு முன்பதாக - எமது நாடு விவசாயப் பொருளாதாரத்திலும் கிராமியப் பொருளாதாரத்திலும் தங்கியிருந்தது. அந்த வகையில், எமது நாடு கிராமிய மக்களை அதிகளவில் கொண்டிருக்கிறது.

இந்த நாட்டில் பெருந்தோட்டங்களில் மனித வளம் பயன்படுத்தப்பட்டது. நாங்கள் எல்லாம் இந்தியாவிலிருந்து அதற்காக அழைத்து வரப்பட்ட பரம்பரையைச் சேர்ந்தவர்கள். அந்த ஊழியர்களைப் பயன்படுத்தி - மக்களைப் பயன்படுத்தி இந்தத் தொழிலை மக்கள் தொழிலாக மாற்றுவதனூடாகத் தொழில்வாய்ப்பையும் பெற்றுக்கொள்ள முடிவதுடன், இதுபோன்ற பக்க விளைவுகளையும் தவிர்க்க முடியும். அந்த அடிப்படையில், இந்த glyphosate விவகாரத்தையும் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பித்து, உரிய தீர்மானத்தை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, இன்று முன்வைக்கப்பட்டிருக்கின்ற ஹைட்ரோபுளோரோ காபனைக் கட்டங்கட்டமாக குறைத்தல் சம்பந்தமாக மொன்ட்ரியெல் கூட்டமைப்பு மேற்கொண்ட கிகாலி திருத்தத்திற்கு இலங்கை இணங்கிச் செயற்படல் தொடர்பான பிரேரணைக்கு எனது ஆதரவையும் தெரிவித்து, எனக்கு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා.4.02]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 28වන මොන්ට්‍රියල් සන්ධාන රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි, හරිතාගාර වායු වන හයිඩ්‍රොෆ්ලෝරොකාබන් නිෂ්පාදනය හා භාවිතය අදියර ගතව සීමා කිරීම පිළිබඳ එකඟත්වය පළකරමින්, රුවන්ඩාවේ කිගාලි නුවරදී 2016 ඔක්තෝබර් මාසයේ 15 වන දින මෙම සංශෝධනය කරනු ලැබුවා.

සූර්යයාගෙන් පොළොවට පතිතවන පාරජම්බුල කිරණවලින් අප ආරක්ෂා කරන්නේ, මුහුදු මට්ටමේ සිට කිලෝමීටර් 10ත්, 50ත් අතර දුරින් පිහිටා ඇති ඕසෝන් පටලය මඟින් බව සියලුදෙනා දන්නා කරුණක්. පාරජම්බුල කිරණ පෘථිවිය මත පතිත වුවහොත් ශාක හා සත්ව සම්පත්වලටද, ජල සම්පත්වලටද, කෘෂිකාර්මික කටයුතුවලටද විශාල හානියක් සිදු වෙනවා. මේ හානි සිදුවීම වළක්වන ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීම ලෝකවාසීන් වන අප සැමගේ වගකීමක් වනවා.

නවීන තාක්ෂණයේ ක්‍රියාකාරම්වල ප්‍රතිඵලයක් ලෙස හා මිනිසාගේ දියුණුවත් සමඟ භාවිත කරන රසායනික ද්‍රව්‍යවලින් ඕසෝන් පටලයට හානි සිදුවන බව කල් ගතවී හෝ හඳුනා ගැනීමට හැකිවීම අප හැමදෙනාගේම වාසනාවක්. නමුත්, මෙය බටහිර කුමන්ත්‍රණයක් ලෙස අර්ථ දක්වමින්, ජනතාව පාරට බැස්සවිය හැකි බොරු දේශප්‍රේමීන් සාටක වළලු තුළ සිටින බව අප අමතක කළ යුතු නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාටකයේ සිදුරු මෙන් නොව ඕසෝන් ස්තරයේ ඇති සිදුරු, වර්ග කිලෝමීටර් මිලියන 28.3ක් වශයෙන් සොයා ගෙන තිබෙනවා. මේ පිළිබඳව මුලින්ම ලොවට කරුණු හෙළිකළ විද්‍යාඥයන් වන ආචාර්ය මරියන් මොලිනා, ආචාර්ය ෂර්වුඩ් රිලන්ඩ් හා ආචාර්ය පෝල් කර්මිසන් යන අයට අපගේ ප්‍රණාමය හිමි විය යුතුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ආධාර ඇතිව මොන්ට්‍රියල් සන්ධානයේ බහුපාර්ශ්වීය අරමුදලෙන්, සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයන් හා ආර්ථික සංක්‍රාන්ති සමයේ පසුවන රාජ්‍යයන් වෙත මොන්ට්‍රියල් සන්ධානයේ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට ආධාර ලබා දීමද සිදුවී තිබෙනවා. ඒ අනුව, මොන්ට්‍රියල් සන්ධානයේ බැඳීම් පිළිගනිමින්, ඕසෝන් ස්තරයට හානි පමුණුවන සියලු ඕසෝන් ප්‍රභීනකාරී ද්‍රව්‍ය ආනයනය හා පරිභරණය අවම කර, මොන්ට්‍රියල් සන්ධානයේ ඉලක්කගත කාලයට පෙරාතුව 2008 වර්ෂයේදීම හයිඩ්‍රොෆ්ලෝරොකාබන් පරිභෝජනය ශූන්‍ය මට්ටමකට ගෙන ඒමට හැකිවීම අප රට ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස හඳුන්වන්නට කැමැතියි. මේ නිසා පරිසර හිතකාමී රටක් ලෙස ශ්‍රී ලංකාවට නමක් දිනාගත හැකි වූ අතර, 2008 වර්ෂයේ වියානා සම්මුතියේ සභාපතිත්වය ද අප රටට හිමි වූවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියරගතව සීමා කිරීම පිළිබඳව මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා අප රට අනුගත වීම පැසසිය යුතු කරුණක් වශයෙන් මා දකිනවා. නමුත්, මෙවැනි වැදගත් අනුගත වීම්ද වැරදි ආකාරයට අර්ථ කථනය කරමින්, "බටහිර බලවේග, ඩයස්පෝරාව, බෙදුම්වාදය, රට ජාතිය පාවාදීම, රට විකිණීම, රට බෙදීම, කැඩීම, කුඩුපට්ටම් කිරීම" වැනි වචන යොදා ගනිමින් පහළ මධ්‍යම පන්තියේ හා පීඩිත පන්තියේ ජනතාව ගොනාට අන්දවා රට අවුල් කිරීමට දහලන කණ්ඩායමක්ද අප රටේ සිටීම අවාසනාවක් ලෙස මා දකිනවා.

2015 ජනවාරි 08 වෙනිදා මේ රටේ ජනතාව ලබා දුන් ජන වරම නිසියාකාරව ක්‍රියාත්මක කළා නම්, අද මේ කඩාකප්පල්කාරීන් සිටිය යුතු වන්නේ හිර ගෙවල්වලයි. නමුත්, අප රජය මඟින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උපරිම ලෙස භුක්ති විඳීමට ඔවුන්ට අවස්ථාව ලබා දීම තුළ, නැවතත් රජ ගෙදරට රිංගවීමේ උත්සාහයක ඔවුන් නිරත වී සිටිනවා. මේ සඳහා ඔවුන්ගේ වාචාල කටවල් ඔවුනට හිතවත් පෞද්ගලික මාධ්‍ය ආයතන හරහා භාවිත කරමින්, විශාල වශයෙන් ජනතාව නොමඟ යැවීමේ කාර්යභාරයක නිරත වෙලා සිටිනවා.

රටේ මූල්‍ය තත්ත්වය හා එයට වග කිව යුත්තේ කවුද යන්න පසුගිය පළාත් පාලන මැතිවරණයට පෙර විගණකාධිපතිවරයා විසින් ප්‍රකාශ කළ බව අපට මතකයි.

එහිදී, දේශීය හා විදේශීය ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 8.9ක් වන බවත්, නමුත් ගිණුම්ගත කර තිබූ මුළු වත්කම්වල වටිනාකම ට්‍රිලියන 1.1ක් බවත් ඔහු කියා සිටියා. ණයට ගත් මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. "ඉතිරි ඒවාට මොකද වුණේ?" කියන ප්‍රශ්නය මේ ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන් පමණක් නොව, ගමේ සිටින ගොවි මහතෙකු වුණත් ඇඟිල්ල දිගු කරලා ඇසිය යුතු ප්‍රශ්නයක්. එහිදී විගණකාධිපතිවරයා වැඩිදුරටත් කියා සිටියේ, රුපියල් බිලියන 7,800කට ආසන්න වත්කම් ගැන ගිණුම් පොත්වල සඳහන්ව නැති බවයි. ඊට අමතරව නීතිරීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා ගණනාවක්ම තිබෙන බවත් එදා එතුමා සඳහන් කර සිටියා. ඒ අනුව එදා මුදල් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ රාජපක්ෂ පවුලේ නීතිරීති හා රෙගුලාසි බව අපට පැහැදිලියි.

අද කෑ ගහන ආචාර්යවරු හා මහාචාර්යවරු එදා සිටියේ කොහේද කියන එක අද අපි හැමෝටම ලොකු ප්‍රශ්නයක්. විශ්වාස භංග යෝජනා ගෙන ආ යුත්තේ එදා මෙවැනි දේවල් කරපු උදවියට විරුද්ධවයි; මෙවාට වග කිව යුත්තන්ට විරුද්ධවයි. නමුත්, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ, මේවා හෙළිදරවු කළ, ඇත්ත කියපු රජයේ විගණකාධිපතිවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආ යුතු බවයි. ඒක තමයි ඒකාබද්ධයේ න්‍යාය. වැරදිකරුවාට නොව, එම වැරැද්ද පෙන්වා දෙන්නාට දඬුවම් කිරීම තමයි එදා ඒ උදවිය ක්‍රියාත්මක කළ ක්‍රමවේදය. ඒකාබද්ධ කල්ලිය විශ්වාස භංග ගෙන එන්නේ ඒ වාගේ උදවියටයි. ඒ තුළින් ඔවුන් උත්සාහ දරන්නේ හොරුන් ඇල්ලීමට නොව, හොරුන් ආරක්ෂා කර ඔවුන්ට දේශපාලන වාසි ලබා දීමටයි. මෙවැනි ක්‍රියා මාර්ග අපි අදත්, හෙටත් මේ ගරු සභාව තුළ පරාජය කළ යුතුයි. ඒ වාගේ පසුබිමක් තුළ අද සමහරු විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා, මේ ආණ්ඩුව වටිටන්න පුළුවන් කියලා කරුණු කියන්න උත්සාහ කරනවා. අපි පැහැදිලිව කියන්නට ඕනෑ, අපි මේ ආණ්ඩුව හැදුවේ පක්ෂ කිහිපයක් එක්ක, ස්වේච්ඡා සංවිධාන විශාල සංඛ්‍යාවක් එක්ක එකතු වෙලා බව.

අපි මේ ආණ්ඩුව, වටිටන්න හදපු ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව අපි දිගටම ගෙන යන ආණ්ඩුවක්. ඒ නිසා අපට හෙට වනකොට බලාගන්න පුළුවන්, මේ විශ්වාස භංග යෝජනාවට මොකක්ද වෙන්නේ කියලා. අද විවිධ මත ඉදිරිපත් කරමින් ඒ ගොල්ලන් හිතනවා, හෙට ඉඳලා ඒ ගොල්ලන්ට සෞභාග්‍යය උදාවෙයි කියලා. අර කාලාන්තරයකට ඉස්සර වෙලා ගෙනෙන්න පොරොන්දු වුණු ආශ්චර්ය අප්‍රේල් 4 වනදායින් පසුව ගෙනෙන්න පුළුවන් වෙයි කියලා ඒ අය බලාපොරොත්තු වෙනවා. 4 වනදායින්

පස්සේ නොවෙයි, තව අවුරුදු දහයකට-පහළොවකට මේ රටට නැවතත් ආශ්චර්ය ගෙනෙන්න බැහැ. ආශ්චර්ය ගෙනෙන කාලය පහු වුණා. එදා "තාරුණ්‍යයට හෙටක්" ගෙනෙන්න හැදුවා. "තාරුණ්‍යයට හෙටක්" ගෙනෙන්න බැරි වුණා. හැබැයි අපි පෙරේදා දිනයේ තුන් වන වරටත් "යොවුන්පුරය" පවත්වලා, නැවතත් ඔප්පු කරලා පෙන්නුවා, මේ රටේ තාරුණ්‍යයට සාධාරණය ඉෂ්ට කරන්න හැකියාව තිබෙන්නේ මේ ආණ්ඩුවට විතරයි කියලා. පෙරේදා වන විට තරුණයන් 7,000ක් කැඳවලා, මේ යහපාලන ආණ්ඩුවේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ, ඒ වාගේම විෂය භාර ඇමතිතුමාගේ සහභාගිත්වයෙන් "යොවුන්පුරය" පවත්වලා, මේ රටේ තරුණ පරපුරට සාධාරණයක් ඉටු කරන්න අපට හැකියාව ලැබුණා. ඒ වාගේම ඉදිරියේ දීත් මේ රටේ තරුණ පරම්පරාවට වාගේම මේ රටේ ජීවත් වන සියලු දෙනාට, මේ රට සංවර්ධිත රටක් බවට පත් කරන්න යහපාලන ආණ්ඩුව කැප වෙනවාය කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා, ස්තුතියි.

[අ.භා.4.11]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් පිළිබඳව සාකච්ඡා කරන අද දිනයේ දී, ගරු මුදල් ඇමතිතුමා මේ විවාදය ආරම්භ කරමින්, අප්‍රේල් පළමුවනදා ඉඳලා ක්‍රියාත්මක වෙලා තිබෙන අලුත් බදු පිළිබඳව මුලින්ම කරුණු ඉදිරිපත් කළා. ඇත්තටම මේ නව බදු ක්‍රියාවලිය පිළිබඳව මේ වන විට ජනතාව අතරේ, රටේ දැඩි ආන්දෝලනයක්, කථාබහක් මතු වෙලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතිරිකිරීම් ගිණුම්වලින් බදු අය කිරීම, ඒ බදු අය කරන ප්‍රතිශතය, ඒ වාගේම Withholding Tax, PAYE Tax වාගේ රජයේ සේවකයින්ට, වැටුප් ලබන අයට බලපාන බදු පිළිබඳව, ඒ විතරක් නොවෙයි, විදේශගත ශ්‍රී ලාංකිකයින්ගෙන් බදු අය කිරීම පිළිබඳව සහ දේශීය ආදායම් පනත පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළ දවසේ අපි මතු කළ බොහෝ කාරණා පිළිබඳව අද සමාජය තුළ මහත් කතිකාවතක් -සාකච්ඡාවක්- ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 සැප්තැම්බර් 07 වනදා හැන්සාඩ් වාර්තාවේ කොටසක් මා උපුටා දක්වන්න කැමැතියි. 2017 සැප්තැම්බර් 07 වනදා තමයි මේ නව ආදායම් බදු පනත පිළිබඳව පාර්ලිමේන්තු විවාදය පැවැත්වුණේ. එදා ඒ විවාදයේ දී අපි මතු කළ බොහෝ කාරණා ඒ මොහොතේ දී සමාජය තුළ සාකච්ඡා වුණේ නැහැ. නමුත් මාර්තු 30, 31 ගත වෙලා අප්‍රේල් පළමුවනදා, ගරු ඇමතිතුමා කියපු විධියටම දේශීය ආදායම් බදු පනත ක්‍රියාත්මක වන දවස වන විට තමයි ජනතාව අතරට මේ සාකච්ඡාව යන්නේ. එදා එම පාර්ලිමේන්තු විවාදයට සම්බන්ධ වෙලා අපේ පක්ෂය වෙනුවෙන් මා කිව්වා, අවුරුදු 18ට වැඩි මේ රටේ හැම පුරවැසියෙකුටම බදු අංකයක් දෙන්න තමයි මේ ආණ්ඩුව කටයුතු කරන්නේ කියලා. ඒ විවාදයේ දීම ඒ අදහස මුදල් ඇමතිතුමා හැටියට ගරු මංගල සමරවීර ඇමතිතුමා කිව්වා. මම එතුමාගේ අදහස උපුටා දක්වන්න කැමැතියි. 2017 සැප්තැම්බර් 07 වනදා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1278හි මෙසේ සඳහන් වී තිබෙනවා:

> "අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී තමුන්නාන්සේලා සමඟ සාකච්ඡා කරලා Universal tax file නොම්මරයක් මේ රටේ හැම කෙනෙකුටම ලබා දෙන්න කටයුතු කරන්න."

සාකච්ඡා කරන්නේ කා එක්කද කියලා නම් දන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලක්ෂ් ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දේශීය ආදායම් පනත සම්මත කරද්දී මුදල් ඇමතිතුමා කිව්වේ, මේ රටේ සෑම කෙනෙකුටම බදු නොම්මරයක් ලබා දෙන්න කටයුතු කරනවා කියලායි. 2017 සැප්තැම්බර් 07 වනදා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1278 සහ 1279හි මෙසේද සඳහන් වී තිබෙනවා:

> "විශේෂයෙන්ම අවුරුදු 18ට වැඩි හැම කෙනෙකුටම tax file නොම්මරයක් තිබුණාය කියලා ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඒකෙන් කියන්නේ නැහැ tax ගෙවන්නම ඕනෑය කියලා. ඇත්ත වශයෙන්ම අපි බදු ගෙවන පෝරමයත් බෙහොම සරල කරනවා."

අපි ඒ වෙලාවේ ඇහුවා, මේක badge එකක් ද කියලා. මට මතක හැටියට බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඇහුවා, "birth certificate එකත් එක්කද දෙන්නේ" කියලා. හැබැයි ඒ වෙලාවේ අපට ඒක විහිළුවක් වුණාට, අද ඒක විහිළුවක් නොවෙයි. සෑම පුරවැසියකුටම බදු අංකයක් දෙනවාය කියලා දේශීය ආදායම් කොමසාරිස්තුමා මාධ්‍යවලට කියා තිබෙනවා මා දැක්කා. මේ අනුව, මේ රටේ හිඟන මනුෂ්‍යයකුට වුණත්, තමන්ට බත් පැකට් එක හම්බ වුණේ කොහොමද කියා ඔප්පු කරන්නට බැරි වුණොත්, ඔහු අවුරුදු 18ට වැඩි නම්, ඔහු බදු ගෙවන්න බැඳීමකට ලක්වන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මට්ටමක් තමයි මේ නියමයන් තුළ තිබෙන්නේ. එම නිසා ඇත්තටම මේ බදු ක්‍රියාවලිය පිළිබඳව, විශේෂයෙන් අප්‍රේල් 1 වැනි දා සිට ක්‍රියාත්මක වන අලුත් බදු පනත ගැන, ඒ පනතේ බලපෑම කොහොමද කියන එක පිළිබඳව, කාට, කොයි විධියට මේ බදු පැනවෙනවාද කියන එක පිළිබඳව අද මහත් ආන්දෝලනයක් තිබෙනවා. හැබැයි අපට තිබෙන කනගාටුව තමයි, රජය හැටියට රජය පැත්තෙන් ඒ පිළිබඳව කිසිදු පැහැදිලි කිරීමක් නොකිරීම. ඔබතුමන්ලා යෝජනා කරනකොට කියනවා, "බදු ක්‍රමය සරල කරනවා. ජනතාවට තේරෙන්න කියා දෙනවා. ජනතාවට දැනෙන්න කියනවා. සරල form එකක් දෙනවා. බදු අංකයක් දෙනවා"යි කියලා. මා අහන්නේ, අප්‍රේල් 1 වැනි දා සිට ක්‍රියාත්මකවන බදු මොනවාද, මේවා බලපාන්නේ කොහොමද, මේවා බලපාන්නේ කාටද, බලපාන්නේ නැත්තේ කාටද කියා පැහැදිලි කළේ කවුද කියන එකයි. කවුද, කොයි වේලාවේදීද පැහැදිලි කළේ? කිසි තැනක පැහැදිලි කිරීමක් වෙන්නේ නැහැ. ඒ නිසා අද විදේශගතව රැකියාව කරන බහුතරයක් මහා භීතියකට පත් වෙලා තිබෙනවා. සමහරු තේරුම් ගෙන තිබෙනවා, ඉතිරිකිරීමේ ගිණුමේ තිබෙන මුදලින් සියයට පහක් බදු වශයෙන් ගන්නවාය කියලා.

ඇත්තටම ගත්තොත්, ඉතිරි කිරීමේ ගිණුමට ලැබෙන පොලී ආදායම මත තමයි බදු අය කෙරෙන්නේ. හැබැයි දැන් මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් නැති නිසා විකෘති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. රජයට බදු ගන්න තිබෙන උනන්දුව, බදු පනවන්න තිබෙන උනන්දුව, මේ බදු පනත යටතේ නියමයන් පාර්ලිමේන්තුවට ගෙනෙන්න තිබුණු උනන්දුව වගේ උනන්දුවක්, අඩු තරමින් මේ බදු පනත පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න, විග්‍රහයක් කරන්න, මෙය ජනතාවගෙන් බලපාන්නේ කාටද, බලපාන්නේ නැත්තේ කාටද කියා සමාජයට කියා දීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාට නැහැ. ඒ සඳහා විශාල වියදමක් යන්නේ නැහැ. මේ බදු ක්‍රියාව තුළ ඇත්තටම අර්බුදයක් ඇති වෙන්නේ කොහොමද කියා ජනතාවට හරිහැටි පැහැදිලි කිරීමක් නොකිරීම නිසා ඕනෑම කෙනෙකුට බදු පනවන්න, ඕනෑම කෙනෙකුගෙන් බදු අය කරන්න, තමන් කැමැති විධියකට මේ පිළිබඳව විග්‍රහ කරන්න, තමන් කැමැති විධියකට ජනතාව පිට මේ බදු පටවන්න ආණ්ඩුවට ඉඩක් හදනවා. ඒකයි මේ තුළින් ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාගෙන් මා විශේෂ ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව එතුමාගේ කථාවෙන් කියන්න උත්සාහ කළාට, ඊට වඩා පැහැදිලිතාවකින් මෙය රටට ඉදිරිපත් කරන්නය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මේ අලුත් බදු පනත පාර්ලිමේන්තුවට ගෙනා අවස්ථාවේදී, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම හැටියට අපි ජනතාවට ඒ තුළින් සිද්ධවන අහිතකර තත්ත්වය වළක්වන්න යෝජනා 16ක් ඉදිරිපත් කළාය කියලා අපට මතකයි. බදු පනතේ තිබුණු අහිතකර තත්ත්වයන් වළක්වන්න ඒ අලුත් යෝජනා 16ට අමතරව සංශෝධන 65ක් අපි ඉදිරිපත් කළා. හැබැයි අපේ ඒ සංශෝධන පිළිගත්තේ නැහැ. එදා අපි කිව්වා, "මේ රටේ කලාකරුවන්ට මේ බදු බලපානවා. ටවර් හෝල් පදනමට මේ බදු බලපානවා. වෘත්තිකයින්ට මේ බදු බලපානවා"යි කියලා. ඒ ලැයිස්තුව මා දැන් නැවත වතාවක් කියන්න යන්නේ නැහැ.

අපේ රටේ බදු ක්‍රියාවලියට මෙතෙක් සම්බන්ධ නොවුණු සියලුම ආයතනවලට මේ බදු පද්ධතිය ආක්‍රමණයක් හැටියට එනවාය කියා එදා අපි කිව්වා. 2017 සැප්තැම්බර් 07 වැනි දා පාර්ලිමේන්තුවේදී කියපු දෙය අද මේ රටේ ජනතාවට මේ අප්‍රේල් 1 වැනි දා සිට බුක්ති විඳින්නට සිද්ධ වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ තමයි ඔබතුමන්ලා මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දත් ගෙනෙන්නේ. සාමාන්‍යයෙන් තිබෙන බදු සියල්ලම ඔබතුමන්ලා ගෙනෙනවා. දැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ණය දෙන ආයතන යෝජනා කර තිබෙන ක්‍රමයට ගත්තොත්, එක පැත්තකින් පිට රටින් ලංකාවට ගෙන්වන භාණ්ඩවල නිෂ්පාදනවලට තීරු බදු නොවන බදු සියල්ල බිංදුව කරන්න කියා තිබෙනවා. තීරු බදු නොවන බදු සියල්ල නිෂ්පාදන මත බිංදුව -zero- කරද්දී ඔබතුමන්ලාට රජයේ ආදායම සොයන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ජනතාව බුක්ති විඳින, කන-බොන, එහෙම නැත්නම් පරිභරණය කරන, ජනතාවගේ එදිනෙදා දෛනික ජීවිතයත් එක්ක සම්බන්ධවන සේවා සහ භාණ්ඩ මත, ආර්ථිකය මත, ජීවිතය මත බදු පැනවීමෙනුයි.

එක් පැත්තකින්, ලබන වැටුපෙන් බදු අය කර ගන්නත්, අනික් පැත්තෙන්, පිට රටකදී හම්බ කරලා ලංකාවට එවන මුදලින් බදු අය කර ගන්නත්, තවත් පැත්තකින්, ජනතාව සේවා ආර්ථිකයක් ඇතුළේ ජීවත් වන නිසා ඔවුන් ලබන සේවාවලින් බදු අය කර ගන්නත් ඔබතුමන්ලාට සිද්ධ වනවා. මේ වසරේ අප්‍රේල් පළමුවැනි දා සිට ඉතාමත්ම භයානක විධියට මේ බදු බර ජනතාව මත පැටවිලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ "විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද" කියන එක ගත්තොත්, එය මාස භයකට වතාවක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන සම්ප්‍රදායයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මෙයට පිටින් තමයි බදු ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ. අපේ සමාජයත්, අපේ රටේ ජන මාධ්‍යයත්, සමාජ ජාලාත් මේ නව දේශීය ආදායම් පනතේ තිබෙන භයානකකම පිළිබඳව දැනුවත් කළ යුතුයි කියලා මා හිතනවා. මොකද, මේ සම්බන්ධයෙන් දන්නා අය යම් ප්‍රමාණයකට හෝ තවමත් දන්නේ, මෙහි බදු ඉලක්කම් ගැන විතරයි; බදු ප්‍රතිශතයන් ගැන විතරයි. හැබැයි මේ බදු යන්ත්‍රණය ක්‍රියාත්මක කරන network එක, මේ බදු යන්ත්‍රණයේ බදු එකතු කරන්න පාවිච්චි කරන යන්ත්‍රණය, ඒ කියන්නේ අවුරුදු 18ට වැඩි හැම කෙනෙකුගෙන්ම බදු අය කරන්න, බදු අංකයක් දෙන්න, හැම පුරවැසියෙකුටම බදු file එකක් ආරම්භ කරන්න ඔබතුමන්ලා යොදවා ගන්නා යන්ත්‍රණය මොකක්ද කියලා තවම කාටවත් පැහැදිලි නැහැ. ඒ නව දේශීය ආදායම් පනත පිළිබඳ සාකච්ඡා කළ වෙලාවේදී, ඒ සංශෝධනයන් පිළිබඳව සාකච්ඡා කළ වෙලාවේදී, පෞද්ගලික අංශය හරහා හෝ එහෙම නැත්නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යන්ත්‍රණය ක්‍රියා කරලා, කොන්ත්‍රාත් ක්‍රමයකට පිටින් ගන්නා බාහිර පාර්ශ්වයන්ගෙන් හෝ මේ බදු අය කරන ක්‍රියාවලියකට යනවා නම්, ඒකෙන් වන හානිය වළක්වා ගන්න අපි වැඩිපුරම උත්සාහ කළා. මට මතකයි, ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරද්දී මේ රාජ්‍ය ව්‍යුහය අකර්මණ්‍ය කරලා, ඒ සඳහා පෞද්ගලික ව්‍යුහයක් ගෙනෙන එක වළක්වන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශාල උද්ඝෝෂණයක් කළ බව. ඔබතුමන්ලා ඒවා පිළිගත්තාය කියලා කිව්වත්, ඒවා මොන තරම් දුරට ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවාද, නැද්ද කියන එක ඉදිරියේදී තමයි පෙනෙන්නේ. කොහොම වුණත්, මේ බදු පනත තුළින් මේ වසරේ අප්‍රේල් පළමුවැනි දා සිට ජනතාවට මහා බරක් පැටවිලා තිබෙනවා.

ඊළඟට, කෙකර ගාලා - කෙකර ගාලා බොහොම අමාරුවෙන් ඔබතුමන්ලා "ජාතික විගණන පනත් කෙටුම්පත" අද දිනයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඔබතුමන්ලා ඉදිරිපත් කරපු ජාතික විගණන පනත් කෙටුම්පතත්, මාස ගණනාවක්, අවුරුදු ගණනාවක් කැබිනට් මණ්ඩලය තුළ කැරකුණු, විගණකාධිපතිතුමාත්, ඒ නිලධාරිනුත් ඇතුළුව නීතිපති දෙපාර්තමේන්තුව සකස් කරපු පනත් කෙටුම්පතත් අතර තිබෙන පරස්පරය මේ පාර්ලිමේන්තුව තුළ

සාකච්ඡා කරන එක. දැන් තිබෙන දේශපාලන තත්ත්වයත් එක්ක, මේ පාර්ලිමේන්තුවේ නව සංයුතීන් එක්ක, වඩා ජනතාවාදී, ජනතාවට හිතකර වන විධියේ ජාතික විගණන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව ඉදිරියේ විවාද කරලා සම්මත කරන්න අපට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ කෙසේ වෙතත් මේ නව බදු පනත තුළින් ඇති වෙලා තිබෙන පීඩනය; නව බදු පනත ක්‍රියාත්මක කිරීම හරහා ජනතාවට එල්ල වෙලා තිබෙන පීඩනය සම්බන්ධයෙන් මීට වඩා පුළුල් ලෙස සාකච්ඡාවට ගත යුතුයි කියන කාරණය ඔබතුමන්ලාගේ අවධානයට මා යොමු කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

II

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති අංක 2044/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

III

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 08 දිනැති අංක 2044/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to

IV

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 20 දිනැති අංක 2046/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

V

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 13 දිනැති අංක 2049/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

VI

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

VII

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2051/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VIII

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IX

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 31 දිනැති අංක 2056/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

X

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

හයිඩ්‍රොෆ්ලෝරොකාබන් (Hydroflurocarbons - HF) අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීම සඳහා යෝජනා සම්මතය

ஹைட்ரோபுளோரொகாபனை (Hydroflurocarbons-HFC) கட்டங்கட்டமாக குறைத்தல் சம்பந்தமாக மொன்ட்ரியெல் கூட்டமைப்பு மேற்கொண்ட கிகாலி திருத்தத்திற்கு இலங்கை இணங்கிச் செயற்படல் தொடர்பான பிரேரணை நிறைவேற்றம்

RESOLUTION FOR RATIFICATION BY SRI LANKA OF THE KIGALI AMENDMENT TO THE MONTREAL PROTOCOL ON PHASE DOWN OF HYDROFLUROCARBONS (HFC)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යාතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ඕසෝන් ඌණුසුම අවම කිරීම පිණිස මොන්ට්‍රියල් සන්ධානය විසින් 1990 දී ලන්ඩන් සංශෝධනය, 1992 කෝපන්හේගන් සංශෝධනය, 1997 මොන්ට්‍රියල් සංශෝධනය, 1999 බීජිං සංශෝධනය ලෙස විවිධ ඉලක්ක සපුරා ගැනීමට සංශෝධන අවස්ථා හතරක දී හඳුන්වා දී ඇති අතර, ශ්‍රී ලංකාව නියමිත කාල වකවානුවල එම සංශෝධනයන්ට අනුකූලතාවය දක්වා ඇති හෙයින්ද;

2016 වර්ෂයේ සංශෝධනය ලෙස කිගාලි සංශෝධනය හඳුන්වා දී ඇති අතර, එමඟින් 2050 වනවිට කාබන්ඩයොක්සයිඩ් ටොන් බිලියන 100කට

සමාන ගෝලීය උණුසුමට දායක වන ශීතකාරක ප්‍රමාණයක් භාවිතයෙන් ඉවත් කිරීමට හැකියාවක් ලැබෙන බැවින් ගෝලීය උණුසුම සෙන්ටිග්‍රේඩ් අංශක 0.5කින් වැඩි වීම වළක්වාලීමට අවස්ථාව උදා කරන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(ඌ) යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූද ජාත්‍යන්තර නීතිය, වාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇති බැවින් කිගාලි සංශෝධනය සඳහා අනුගත වීමට එකඟතාවය පළ කිරීම ද ජනාධිපතිවරයාගේ පරමාධිකාරය වන හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) ව්‍යවස්ථාව යටතේ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බල පවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් ද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව යුතු හෙයින්ද;

2017 සැප්තැම්බර් 29 වැනි දින ජනාධිපතිවරයා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා ලෙස ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව ගනු ලැබූ 2017 ඔක්තෝබර් මස 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මොන්ට්‍රියල් සන්ධානයේ නවතම සංශෝධනය වන කිගාලි සංශෝධනයට අනුගත වීමට අනුමතිය ලැබී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාගේ යෝජනාවක් ලෙස හයිඩ්‍රොෆ්ලෝරොකාබන් අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානය සිදු කළ කිගාලි සංශෝධනය සඳහා ශ්‍රී ලංකාව අනුගත වීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில் நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.22ට, 2018 අප්‍රේල් 04 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 4.22 மணிக்கு பாராளுமன்றம், 2018 ஏப்பிரல் 04, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 4.22 p.m. until 9.30 a.m. on Wednesday, 04th April, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 259 - இல. 10
Volume 259 - No. 10

2018 අප්‍රේල් 04 වන බදාදා
2018 ஏப்பிரல் 04, புதன்கிழமை
Wednesday, 04th April, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා කෙරෙහි විශ්වාස භංගත්වය:
යෝජනාව නිශ්ප්‍රභ විය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமானவர் மீது நம்பிக்கையின்மை :
பிரேரணை நிராகரிக்கப்பட்டது

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF NO CONFIDENCE ON PRIME MINISTER AND MINISTER OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS:
Motion Negatived

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 අප්‍රේල් 04 වන බදාදා
2018 ஏப்பிரல் 04, புதன்கிழமை
Wednesday, 04th April, 2018

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පැවැත්වෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය උසස් පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට ගරු කරමින්, ගෞරවනීය හා ආදර්ශවත් ලෙස පවත්වා ගෙන යන මෙන් සියලුම ගරු සභික මන්ත්‍රීවරුන්ගෙන් මම ඉතාම කාරුණිකව ඉල්ලා සිටිමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIII කොටස හා නවවැනි කාණ්ඩයේ VII කොටස සහ දසවැනි කාණ්ඩයේ -විශේෂ විගණන වාර්තාව- IV කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එම වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-465/'16-(10), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන: වවුනියාව දිස්ත්‍රික්කය
தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள்:வவுனியா மாவட்டம்
PLACES OF ARCHAEOLOGICAL INTEREST : VAVUNIYA DISTRICT

1231/'16

2. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) வவுனியா மாவட்டத்தில் அமைந்துள்ள தொல் பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இடங்களில் தற்போது பேணல் பணிகள் மேற்கொள்ளப்படுகின்ற இடங்கள் யாவை;

(iii) இதற்காக 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(iv) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் அழிக்கப்பட்ட தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள் யாவை;

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(v) மேற்படி அழிவுகள் பற்றிய மதிப்பீடொன்று செய்யப்பட்டிருப்பின், மதிப்பீட்டுப் பெறுமதி வெவ்வேறாக எவ்வளவு;

(vi) மேற்படி அழிவுகள் தொடர்பாக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(vii) மேற்படி அனைத்தினதும் முழுமையானதோர் அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House-

(i) how many places of archaeological interest are located in the Vavuniya District;

(ii) in how many places conservation activities are being carried out of the aforesaid sites;

(iii) what amounts were allocated in the years 2015 and 2016 for this purpose, separately;

(iv) what places of archaeological interest were destroyed by the LTTE terrorists;

(v) if an assessment of such destructions has been done, what the estimated value is in respect of each site separately.

(vi) whether legal measures have been taken in respect of these destructions; and

(vii) whether he will submit a comprehensive report on all above?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ගවේෂණය අවසන් කර නැත. වවුනියාව දිස්ත්‍රික්කය තුළ මේ වන විට හමු වී ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 50කි.

(ii) දැනට සංරක්ෂණ කටයුතු සිදු කරනු නොලැබේ.

(iii) සංරක්ෂණ කටයුතු සඳහා මුදල් වෙන් කර නැත.

(iv) ස්ථාන කිසිවක් නොමැත.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) ඔව්. දැනට අනාවරණය කර ගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන 50 පිළිබඳ වාර්තාව (ඇමුණුම 01) මම **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම :
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:
Annex tabled:

වවුනියාව දිස්ත්‍රික්කය

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ස්ථානයේ නම	
1	වවුනියාව	වවුනියාව	හූ ඔය රක්ෂිතයේ නටබුන්	අනුරාධපුර අවධිය ගල්කොරි, ගල්බැම්
2	වවුනියාව	වවුනියාව	පම්පෙමඩු නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, බුද්ධ ප්‍රතිමා කොටස
3	වවුනියාව	වවුනියාව	පෙරියකට්ටු නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, දාගැබ ගොඩැල්ල
4	වවුනියාව	වවුනියාව	නව්වි කැළයේ නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
5	වවුනියාව	වවුනියාව	කුරිසුඩ්ඩකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
6	වවුනියාව	වවුනියාව උතුර	වැඩ්වඩ්ඩුකල්ලු නටබුන්	අනුරාධපුර යුගය නටබුන් ගොඩැල්ල
7	වවුනියාව	වවුනියාව උතුර	කව්විලමොටෙයිකුලම් නටබුන්	අනුරාධපුර යුගය ස්ථූප ගොඩැල්ල
8	වවුනියාව	වවුනියාව උතුර	වෙඩ්වට්ටකල්ලු නටබුන් 02	අනුරාධපුර යුගය ස්ථූප ගොඩැල්ල 02/ගඩොල් ප්‍රාකාරයක පාදමක්
9	වවුනියාව	වවුනියාව උතුර	වෙඩ්වට්ටකුලම් නටබුන්	අනුරාධපුර යුගය ශිලා ස්ථම්භ සහිත ගොඩනැගිල්ලක නටබුන්
10	වවුනියාව	වවුනියාව උතුර	සපුමල්ගස්කඩ නටබුන්	අනුරාධපුර පබ්බතාරාම විහාරයක අංග
11	වවුනියාව	වවුනියාව උතුර	මංගලමොටෙයි නටබුන්	අනුරාධපුර අවධිය නටබුන් ගොඩැල්ල, ගල්කණු, කණු පාදම්, ක්ෂුකාවාටය
12	වවුනියාව	වවුනියාව උතුර	කොම්පාවිත්තිකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, පිළිම ගෙයක නටබුන්
13	වවුනියාව	වවුනියාව උතුර	පාලමොටෙයි නටබුන් දාගැබ	අනුරාධපුර අවධිය දාගැබ ගොඩැල්ල, නටබුන් ගොඩනැගිලි
14	වවුනියාව	වවුනියාව උතුර	කිලෙව්කුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගල්කණු හා ගොඩනැගිලි අවශේෂ
15	වවුනියාව	වවුනියාව උතුර	පරනාට්ටකල් ධනපාලන් ජනනීගේ ඉඩමේ නටබුන්	අනුරාධපුර අවධිය මැටි භාජන (කුඩා කළ) කොටස්
16	වවුනියාව	වවුනියාව උතුර	පරනාට්ටකල් ධනපාලන් ජනනීගේ ඉඩමේ නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
17	වවුනියාව	වවුනියාව දකුණ	ඌරාකුලම් අලග තිරුබාගරන්ගේ ඉඩමේ නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
18	වවුනියාව	වවුනියාව දකුණ	පාලමොට්ටෙයි නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
19	වවුනියාව	වවුනියාව දකුණ	කොන්දක්කාරකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
20	වවුනියාව	වවුනියාව දකුණ	පෙරියමඩු මුත්තුමාරි අම්බාල් කෝවිල් නටබුන්	අනුරාධපුර අවධිය සිරිපතුල් ගල

ජී.එස්.එම්. පොරුමගේ
සහකාර අධ්‍යක්ෂ (ශිල්පීය දේපල)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07

21	වවනියාව	වවනියාව දකුණ (දෙමළ කලාපය)	නවවී මහාදේවන් මහතාගේ ඉඩමේ නටබුන්	අනුරාධපුර අවධිය සිරිපතුල් ගල, ගොඩනැගිලි අවශේෂ
22	වවනියාව	නෙදුන්කේනි	මන්නාර්කුලම් නටබුන්	අනුරාධපුර අවධිය නටබුන් ගොඩැල්ල, වැලිපිටිය
23	වවනියාව	නෙදුන්කේනි	පල්ලවිලාන්කුලම් නටබුන්	අනුරාධපුර අවධිය නටබුන් ගොඩනැගිල්ල
24	වවනියාව	නෙදුන්කේනි	නෙදුන්කේනි අෂ්ණ දේවමඩු පුරාවිද්‍යා නටබුන්	අනුරාධපුර යුගය ශිලාමය කණු පාදම්, ගඩොල් කැබලි හා ගල්තලයේ
25	වවනියාව	නෙදුන්කේනි	පරම ශ්‍රී කාන්දමගේ ඉඩමේ නටබුන්	අනුරාධපුර අවසාන කාලය හා පොළොන්නරු යුගයේ නටබුන් ගොඩැල්ල
26	වවනියාව	නෙදුන්කේනි	කනකරායන්කුලම් අයියනාර් කෝවිලේ නටබුන්	අනුරාධපුර අවධිය නටබුන් ගොඩනැගිල්ල
27	වවනියාව	සම්පත් නුවර	නාගනාලි නටබුන්	අනුරාධපුර අවධිය නටබුන් ගොඩැල්ල
28	වවනියාව	සෙට්ටිකුලම	පෙරියතම්පනේ පුල්ලෙයාර් කෝවිලේ නටබුන්	අනුරාධපුර අවධිය ජනාවාස සාධක, ගොඩනැගිලි නටබුන්
29	වවනියාව	සෙට්ටිකුලම	පුලියාඩිමුරුප්පු නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
30	වවනියාව	සෙට්ටිකුලම	තම්පනේ කුරුසකෝවිල් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
31	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	වාඩිවල පුල්ලියන්කුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්,පැරණි දැගැබ
32	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	වාඩිවල අසල නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, පැරණි දාගැබ
33	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	ආනවිලුන්දාව නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, පැරණි දාගැබ
34	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනක සාලම්බකුලම් මාර්ගයේ නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, පැරණි පොකුණ
35	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සාලම්බකුලම් ගල්කොරිය	අනුරාධපුර අවධිය ගල් කොරිය සහ කේතුකාවාට
36	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සරාවිකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
37	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනක සාලම්බකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
38	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කොකුමොටකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
39	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කප්පවිවි වැව බැම්ම ඉදිරිපිට නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
40	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කප්පවිවි වාන අසල නටබුන්	ගොඩනැගිලි නටබුන්
41	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කප්පවිවි කුඹුරට යන මාර්ගයේ ජනාවාස සාධක	ජනාවාස සාධක
42	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කොනගරායන්කුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්, දාගැබ
43	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනනොච්චිකුලම් වෘත්තය හා කේතුකාවාට සාධක	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
44	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනනොච්චිකුලම් ජනාවාස සාධක	ජනාවාස සාධක
45	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනනොච්චිකුලම් නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
46	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	කප්පවිවි වාන අසල ජනාවාස සාධක	ජනාවාස සාධක

ජී.එස්.කේ. සෝරඹගේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අධ්‍යක්ෂ (සිගිරිය දේපල) විද්‍යා/ආ
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07

47	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	වව්වාලය හේනේ නටබුන්	අනුරාධපුර අවධිය ගොඩනැගිලි නටබුන්
48	වවනියාව	වෙන්ගවෙඩ්ඩියකුලම්	සෝනක සාලම්බකුලම් පැරණි ගල්කොරිය	අනුරාධපුර අවධිය පැරණි ගල්කොරිය
49	වවනියාව	පදවිය	වෙඩික්කුනාරිමලෙයි නටබුන්	අනුරාධපුර අවධිය සෙල්ලිපි සහිත කටාරම් ලෙන්, ගල්කෙමි
50	වවනියාව	සම්පත් නුවර	නිකවැව නටබුන්	අනුරාධපුර යුගය ස්තූප ගොඩැල්ල, කණු පාදම්ගල්, නටබුන් ගොඩනැගිලි, සිරිපතුල් ගල

ජී.එස්.කේ. සෝරඹගේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අධ්‍යක්ෂ (සිගිරිය දේපල) විද්‍යා/ආ
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් මම අහලා තිබෙන ප්‍රශ්නයට අදාළව ගරු ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්නට ඕනෑ. පසුගිය කාලයේ සාම්පූර් ප්‍රදේශයේ ඉතාමත් වැදගත් පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති බෞද්ධ උරුමයක් වන දා ගැබක් විනාශ කරලා තිබුණා. එල්ටීටීඊ ත්‍රස්තවාදී සමයේදී එකොළොස් අවුරුද්දක් එල්ටීටීඊ ග්‍රහණයට ලක් වෙලා තිබුණු සාම්පූර් ප්‍රදේශයේ පිහිටි මේ දා ගැබ ආරක්ෂා කර ගන්නට ඒ මොහොතේත් ශ්‍රී ලංකා යුද හමුදාවට පුළුවන් වුණා. නමුත් තමුන්නාන්සේලාගේ රජය යටතේ පසුගිය කාලයේ මේ මහා වටිනා උරුමය ඩෝසර් කරලා විනාශ කර දැම්මා. ගරු කථානායකතුමනි, මෙය පුරාවිද්‍යා ආඥාපනත යටතේ වන ඇප ලබා නොදෙන බරපතළ වරදක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මම ඇමතිතුමාගෙන් අහන්නේ මෙයයි. මෙම දාගැබත් ඇතුළත්ව පසුගිය කාලයේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සහ බෞද්ධ උරුමයන් විශාල ප්‍රමාණයක් විනාශ මුඛයට පත් වුණා. අපේ මොනරාගල දිස්ත්‍රික්කයේත් මේ වාගේ සිද්ධි වාර්තා වුණා. නමුත් අපි පැහැදිලි ලෙස දකින්නේ නැහැ, මේ සම්බන්ධව ගනු ලබන නීතිමය පියවර සහ ඒ සම්බන්ධව සෑම ආකාරයකින්ම ගත හැකි පියවර තමුන්නාන්සේලාගේ රජය විසින්

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

ගන්නවා කියලා. මේ සම්බන්ධව රජයේ තීරණය, අදහස එහෙම නැත්නම් පසුගිය කාලයේ වාර්තා වුණු මෙවැනි පුරාවිද්‍යා විනාශයන් පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව ගත් පියවර පිළිබඳව පැහැදිලි වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඉදිරියේදී ඒක කරන්න පුළුවන්.

පරිසර සංවේදී කර්මාන්ත: විස්තර
சுற்றாடல் கூருணர்வுமிக்க கைத்தொழில்கள்: விபரம்
ENVIRONMENTALLY SENSITIVE INDUSTRIES : DETAILS

1424/'16

3. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 201 මඟින් පුත්තලම, හම්බන්තොට සහ කිලිනොච්චිය වැනි විශේෂයෙන් හඳුනාගත් ප්‍රදේශවල විශාල වශයෙන් පරිසර සංවේදී කර්මාන්ත පිහිටුවන බවට කර ඇති යෝජනාවට අනුව 2016 වර්ෂයේදී එම ප්‍රදේශවල අලුතින් පිහිටවනු ලැබූ කර්මාන්ත කවරේද;

(ii) පරිසර සංවේදී කර්මාන්ත හඳුනාගැනීම සඳහා භාවිතා කරන දර්ශකයන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාප තුළ සහ ඉන් පිටත ස්ථානගත කර ඇති පරිසර සංවේදී කර්මාන්ත කවරේද;

(iv) උක්ත කර්මාන්ත මඟින් පරිසරයට ඇතිවන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා රජය විසින් නිර්දේශිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොළිල් මර්රුම් වාණිප අලුවල්කළ් අමෛච්සරෛක් කේට්ට වින්නා:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவுசெலவுத்திட்ட முன்மொழிவு இலக்கம் 201இன் மூலமாக புத்தளம், அம்பாந்தோட்டை மற்றும் கிளிநொச்சி போன்ற விசேடமாக இனங்காணப்பட்ட பிரதேசங்களில் பாரியளவில் சுற்றாடல் கூருணர்வுமிக்க கைத்தொழில்கள் தாபிக்கப் படுமென செய்யப்பட்டுள்ள முன்மொழிவுக் கிணங்க 2016ஆம் ஆண்டில் அப்பிரதேசங்களில் புதிதாக தாபிக்கப்பட்ட கைத்தொழில்கள் யாவை;

(ii) சுற்றாடல் கூருணர்வுமிக்க கைத்தொழில்களை இனங்காண்பதற்காகப் பாவிக்கப்படுகின்ற குறிகாட்டிகள் யாவை;

(iii) இலங்கையில் ஏற்றுமதி தயாரிப்பு வலயங் களினுள்ளும் அதற்கு வெளியிலும் இடம்பெறச் செய்யப்பட்டுள்ள சுற்றாடல் கூருணர்வுமிக்க கைத்தொழில்கள் யாவை;

(iv) மேற்படி கைத்தொழில்கள் மூலமாகச் சுற்றாடலுக்கு ஏற்படுகின்ற பாதகமான தாக்கங் களைத் தடுப்பதற்காக அரசாங்கத்தினால் விதந்துரைக்கப்பட்டுள்ள வழிமுறைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked Minister of Industry and Commerce:

(a) Will he inform this House -

(i) the industrial plants that have been established under the Proposal No. 201 of the Budget 2016 that proposes to set up a large number of environmentally sensitive industries in specifically identified areas such as Puttalam, Hambantota and Kilinochchi;

(ii) the indices used to identify environmentally sensitive industries;

(iii) the environmentally sensitive industries located in Export Processing Zones of Sri Lanka and outside of them; and

(iv) the measures recommended by the Government to prevent adverse effects on environment from the aforesaid industries?

(b) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Hon. Speaker, the Answer is as follows:

(a) (i) Though it was proposed in the Budget 2016 to facilitate establishment of highly-environmentally sensitive industries in designated areas, it could not be pursued since no allocation has been made by the General Treasury for this purpose.

(ii) Identification of industries as to whether they are environmentally-sensitive or not is a subject that falls under the purview of Central Environmental Authority. Industries are permitted to be established only on production of clearance certificate from the Central Environmental Authority.

(iii) Industries in Export Processing Zones do not come under the purview of the Ministry

of Industry and Commerce. There are hundreds of industries outside the Export Processing Zones and all are not registered with the Ministry of Industry and Commerce. It is, therefore, not possible to answer this Question.

(iv) Generally, the Government does not allow the establishment of industries that cause damage to the environment. When environmentally sensitive industries are established, the Government takes measures to ensure that counter measures are taken to prevent pollution of the environment.

(b) Does not arise.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමා පිළිගත යුතු වනවා, ඉතා පැහැදිලි ජාතික කර්මාන්ත ප්‍රතිපත්තියක් නොතිබීම නිසා එතුමාට අපනයන සැකසුම් කලාප තුළ පිහිටුවන පරිසර සංවේදී කර්මාන්ත පිළිබඳව පිළිතුරු දෙන්න පුළුවන්කමක් ඇතිවෙලා නැහැයි කියන එක. 2016 අංක 201 දරන අය වැය යෝජනාව අනුව පරිසර සංවේදී කර්මාන්ත පිහිටුවන ප්‍රදේශ නිශ්චිත වශයෙන් නම් කර තිබෙනවා. ඒවා තමයි පුත්තලම, හම්බන්තොට, කිලිනොච්චිය වැනි ප්‍රදේශ. පුත්තලම, හම්බන්තොට, කිලිනොච්චිය වැනි ප්‍රදේශවල මෙවැනි පරිසර සංවේදී කර්මාන්ත ආරම්භ කරනවාය කියන යෝජනාව දැම්මේ ඔබතුමා සමඟ කථා කරලාද, නැද්ද කියන එක මම දැන ගන්න කැමැතියි. මුදල් අමාත්‍යාංශය අනුමත කළේ නැත්නම් කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා සමඟ සාකච්ඡා කරලා ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවක් ඇතිවද, මුදල් අමාත්‍යාංශය ඇය වැය ලේඛනයට මේ යෝජනාව ඉදිරිපත් කළේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Minister?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු කථානායකතුමනි, ඒ දවස්වල මේ සම්බන්ධව අපේ proposals තිබුණාට අපේ අමාත්‍යාංශයයි, Central Environmental Authority එකයි සම්බන්ධ වෙලා තමයි ආරම්භක වැඩ කටයුතු ඔක්කොම කළේ. අන්තිමේදී මුදල් නැති නිසා අපට ඒක කරන්න බැරි වුණා. මේ අවුරුද්දේ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අය වැය යෝජනාවට අනුව ඒ කර්මාන්ත පිහිටුවීමට බැරි වූ බව එතුමා පිළිගන්නවා. එතුමා එය පිළිගැනීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මේ අවුරුද්දේ ආරම්භ කිරීමේදී, ඔබතුමා පරිසර සංවේදී කර්මාන්ත කියලා නිර්වචනය කරගෙන තිබෙන්නේ කොයි වාගේ කර්මාන්තද? ඒ සඳහා පාවිච්චි කරන දර්ශකය කුමක්ද? ඒවා නිශ්චිත වශයෙන් identify කරලා තිබෙනවාද? පරිසර සංවේදී කර්මාන්ත මේවායි කියලා ලැයිස්තුවක් මට පසුව දෙන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ඒ සම්බන්ධව criteria එකක් Central Environmental Authority එක ඇතුළු අපේ අමාත්‍යාංශය හදලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ Environmental Division කියලා අංශයක් තිබෙනවා. අපි එකතු වෙලා එහෙම criteria එකක් හදලා තිබෙනවා. ඒවා ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 4 - 1739/'17 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

ගරු කථානායකතුමනි, හුඟක් විස්තර එකතු කරන්න තිබෙනවා. එම නිසා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මධ්‍යම සංස්කෘතික අරමුදල : අමතර නිලධාරීන්
மத்திய கலாசார நிதியம்:மேலதிக உத்தியோகத்தர்கள்
CENTRAL CULTURAL FUND: ADDITIONAL OFFICERS

2007/'17

5. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල සහ විෂයභාර අමාත්‍යවරයා අතර සම්බන්ධීකරණය සඳහා ආයතනයේ දැනට පවතින තනතුරුවලට අමතරව වෙනත් නිලධාරීන් පත්කර තිබේද;

(ii) එසේ නම්, පත්කර ඇති නිලධාරීන් සංඛ්‍යාව සහ තනතුරු කවරේද;

(iii) එම පත්වීම් ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම පත්වීම් සඳහා සලකා බලන ලද අවම අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(v) ඔවුන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු බිමල් රත්නායක මහතා]

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய கலாசார நிதியத்திற்கும் விடயத்திற்குப் பொறுப்பான அமைச்சருக்கும் இடையிலான இணைப்புக்காக நிறுவனத்தில் தற்போதுள்ள பதவிகளுக்கு மேலதிகமாக வேறு உத்தியோகத் தர்கள் நியமிக்கப்பட்டுள்ளார்களா என்பதையும்;

(ii) ஆமெனில், நியமிக்கப்பட்டுள்ள உத்தியோகத் தர்களின் எண்ணிக்கை மற்றும் பதவிகள் யாவையென்பதையும்;

(iii) அந்த நியமனங்கள் வழங்கப்படும்போது பின்பற்றிய முறைமை யாதென்பதையும்;

(iv) அந்த நியமனங்களுக்காக கவனத்திற்கொள்ளப் பட்ட குறைந்தபட்ச கல்வித் தகைமைகள் யாவை என்பதையும்;

(v) அவர்களது சம்பளங்கள் மற்றும் கொடுப் பனவுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether other officers have been appointed in addition to the existing posts in the institution to co-ordinate between the Central Cultural Fund and the subject Minister;

(ii) if so, the number of officers appointed and their designations;

(iii) the methodology adopted in granting those appointments;

(iv) the minimum educational qualifications considered for those appointments; and

(v) their salaries and allowances?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මෙම තනතුර සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ 200වෙනි පාලක මණ්ඩලයේ අනුමැතිය මත එක් නිලධාරියෙක් පත් කර ඇත.

(ii) පත් කර ඇති නිලධාරින් සංඛ්‍යාව එකයි. තනතුර, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ.

(iii) මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 (ඉ) වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩලයේ අනුමැතිය යටතේ බඳවා ගෙන ඇත. එසේම එම තනතුර සඳහා කරන ලද පත් කිරීම පාලක මණ්ඩලයේ අනුමැතිය අනුව ආයතනයේ අවශ්‍යතාව සඳහා සීමිත කාල සීමාවක් සඳහා පමණක් කරන ලද්දකි.

(iv) බඳවා ගැනීමේ පරිපාටියේ මෙම තනතුර නොමැති බැවින් තනතුරේ කටයුතු කිරීමට හැකියාව හා දැනුම ඇති අයෙකු තාවකාලිකව මෙම තනතුරට බඳවාගෙන ඇත.

(v) පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි රුපියල් 45,130ක මූලික වැටුපක් හා රජයේ අනුමත දීමනා ගෙවීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The on. Bimal Rathnayake)

ගරු අමාත්‍යතුමනි, (අ) (iv)ට දුන් පිළිතුර ගැන, එනම් අවම අධ්‍යාපන සුදුසුකම් ගැන පැහැදිලි කිරීමක් කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අපොස (සාමාන්‍ය පෙළ) සමත් සහ අපොස (උසස් පෙළ) දක්වා තමයි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා මේ අහන්නේ අතුරු ප්‍රශ්නයක් නොවෙයි. 'අපොස (සාමාන්‍ය පෙළ) සමත් සහ අපොස (උසස් පෙළ) දක්වා' කියන දෙකේ වෙනසක් නැහැ නේ, ගරු අමාත්‍යතුමා. එක්කෝ, 'අපොස (සාමාන්‍ය පෙළ) සමත්' කියා වෙන්න ඕනෑ. එහෙම නැත්නම් 'අපොස (උසස් පෙළ) සමත්' කියා වෙන්න ඕනෑ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මම check කරන්නම්. මා දන්නා විධියට, අපොස (උසස් පෙළ) කරලා සමත් වෙලා තිබෙනවා. විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන සොයා ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන් නේද, ගරු අමාත්‍යතුමා?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු අමාත්‍යතුමා දැන් පිළිතුර ලබා දෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දැන් පිළිතුරක් ලබා දෙනවාද? එහෙම නැත්නම් පසුව ද පිළිතුර ලබා දෙන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මම පසුව පිළිතුර ලබා දෙන්නම්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -2116/'17- (1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2015 දී වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ සිසුන්: උතුරු පළාත

2015இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றோர்: வட மாகாணம்

STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: NORTHERN PROVINCE

2138/'17

7. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේදී අපොස (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

උයර් කල්වි මත්‍රුම් නෙටුඤ්චාලෙකළ් අමෛච්චරෛක් කේට්ට වින:

(අ) (i) 2015ආම් ආණ්ඩිල් ක.පොත. (උයර් තර) පරීට්චෛක්කු උයිරියල් පාඩත් තුරෛයිල් යාழ්ප්පාණම්, කිළිනොච්චි, මන්නාර්, මුල්ලෛත්තීවු මත්‍රුම් වවුනියා මාවට්ටඞ් කළිලිරුන්දු තෝර්ච්චියුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෛ යාතෙන්බතෛයුම්;

(ii) මේර්පඩි එණ්ණික්කෛයිල්, පල්කලෛක්කළක අනුමතික්කාන තකෛමෛයෛප් පෙර්ර්‍රුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෛයුම් සතවීතමුම් එව්වළවෙන්බතෛයුම්;

(iii) මරුත්තුව පීඨත්තිර්කාන තකෛමෛයෛප් පෙර්ර්‍රුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෛයුම් සතවීතමුම් එව්වළවෙන්බතෛයුම්;

(iv) මරුත්තුව පීඨත්තිර්කාන තකෛමෛයෛප් පෙර්ර්‍රුළ්ළ මාණවන් අල්ලතු මාණවියින් ආකක්කුරෛන්ත පෙරුපේරු, Z පෙරුමති, කල්වි කර්ර පාඩසාලෛ මත්‍රුම් තෙරිවුසෙය්‍යප්පට්ට මරුත්තුව පීඩම් යාතෙන්බතෛයුම්;

ඔව්වොරු මාවට්ටත්තින්පඩි තනිත්තනියාක අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the GCE (Advanced Level) Examination in the biology stream in 2015 from Jaffna, Kilinochchi, Mannar, Mullaitivu and Vavuniya Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, the Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

ගරු කබීර් හෂීම් මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Higher Education and Highways)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

යාපනය දිස්ත්‍රික්කය	-	1,232
කිලිනොච්චි දිස්ත්‍රික්කය	-	173
මන්නාරම දිස්ත්‍රික්කය	-	235
මුලතිව් දිස්ත්‍රික්කය	-	196
වවුනියා දිස්ත්‍රික්කය	-	309

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

යාපනය දිස්ත්‍රික්කය	-	743
කිලිනොච්චි දිස්ත්‍රික්කය	-	84
මන්නාරම දිස්ත්‍රික්කය	-	112
මුලතිව් දිස්ත්‍රික්කය	-	72
වවුනියා දිස්ත්‍රික්කය	-	166

එම සංඛ්‍යාව අපොස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

යාපනය දිස්ත්‍රික්කය	-	සියයට 60.31
කිලිනොච්චි දිස්ත්‍රික්කය	-	සියයට 48.55
මන්නාරම දිස්ත්‍රික්කය	-	සියයට 47.66
මුලතිව් දිස්ත්‍රික්කය	-	සියයට 36.73
වවුනියා දිස්ත්‍රික්කය	-	සියයට 53.72

[ගරු කබීර් හෂීම් මහතා]

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව.

යාපනය දිස්ත්‍රික්කය - 56

කිලිනොච්චිය දිස්ත්‍රික්කය - 5

මන්නාරම දිස්ත්‍රික්කය - 6

මුලතිව් දිස්ත්‍රික්කය - 5

වවුනියාව දිස්ත්‍රික්කය - 15

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස;

යාපනය දිස්ත්‍රික්කය - සියයට 7.54


කිලිනොච්චිය දිස්ත්‍රික්කය - සියයට 5.95

මන්නාරම දිස්ත්‍රික්කය - සියයට 5.36

මුලතිව් දිස්ත්‍රික්කය - සියයට 6.94

වවුනියාව දිස්ත්‍රික්කය - සියයට 9.04

(iv) ඇමුණුම 01 යටතේ දක්වා ඇත.



ඇමුණුම 01

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ සංඛ්‍යාතුරු

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා කාම්ර්ථය		Z අගය	තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය
7015151	කේ.ප්‍රියදර්ශන්	යාපනය	යා/හින්දු විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.8857	යාපනය විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
6965008	එම්.නියෝශිතන්	කිලිනොච්චි	කිලි/කිලිනොච්චි ම.ම.විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.5172	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	C		
6938051	ජේ.ජේ. ලෝගු	මන්නාරම	මන්/සිත්ති විනායගර් හින්දු විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.5447	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
6949223	කේ. රඩිකප්‍රිය	මුලතිව්	මු/පුතුකුඩිරුප්පු මධ්‍ය මහා විද්‍යාලය	භෞතික විද්‍යාව	C	1.4737	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	A		
6925332	එස්.සංකේත්	වවුනියා	ව/විපුලානන්ද විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.8966	යාපනය විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	A		

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, අසා තිබෙන ප්‍රශ්නයට අදාළ නොවුණත්, මේ ප්‍රශ්නය මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි.

ඔබතුමා යටතේ තිබෙන අම්පාර හාඩි ආයතනයේ ජාතික උසස් අධ්‍යාපන ඩිප්ලෝමාව හදාරන දෙවැනි වසරේ ශිෂ්‍යයන් 550ක් පමණ ඉන්නවා. අවුරුදු තිස් ගණනක් තිස්සේම ඒ අයට නේවාසිකාගාර පහසුකම් ලබාදීලා තිබුණා. දැන් හදිසියේම ඒ අය නේවාසිකාගාරයෙන් ඉවත් කරලා තිබෙනවා. මේ හේතුවෙන් අම්පාරේ නොවන ශිෂ්‍යයන් 450ක් පමණ පීඩාවට පත් වෙලා සිටිනවා. මේ සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් දැන් පිළිතුරක් බලාපොරොත්තු වන්නේ නැහැ. මා ඉල්ලා සිටින්නේ, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලායි.

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මට,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමියනි, ගරු අමාත්‍යතුමාගේ අවසරය ඇතිව ඔබතුමියට කථා කරන්න පුළුවන්.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, එතුමියට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (டாக்டர்) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)

ගරු කථානායකතුමනි, "නවක වදය" තමයි එතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඒක උපරිමයෙන්ම එතැන සිද්ධ වෙනවා. ඒ පිළිබඳව ලැබුණු පැමිණිලිත් ලොකු ෆයිල් එකක් තිබෙනවා. මම, දැනට නේවාසිකව ඉන්න ශිෂ්‍යයන් සහ නේවාසිකව නොවන එළියේ ඉන්න දෙවැනි වසරේ ශිෂ්‍යයන් මුණ ගැසුණා. නේවාසිකව ඉන්න දෙවැනි වසරේ ශිෂ්‍යයන් කියනවා, "මීට පස්සේ ඒක කරන්නේ නැහැ." කියලා. හැබැයි, ඒක කරන්නේ නැහැ කියලා කොච්චර කිව්වත් නවක වදය දෙනවා. නේවාසික නොවන ශිෂ්‍යයන් කියනවා, "නේවාසිකත්වය නැති කරන්න." කියලා. හැබැයි, එතැන ඉඩ තිබෙනවා. එතැන ඉන්න භාරකරු එක්කත් මම කථා කළා. එතැන ගොඩනැඟිල්ලක් තිබෙනවා, දෙගොල්ලන්ට සම්බන්ධ වෙන්න බැරි. ඒ ගොඩනැඟිල්ල භාවිත කළොත් පළමුවැනි වසරේ ළමයි සහ දෙවැනි වසරේ ළමයි එකට සම්බන්ධ වෙන්නේ නැහැ. තවම පළමුවැනි වසරේ ළමයි බඳවා ගත්තේ නැහැ. මැයි මාසයේ තමයි ඒ අය ගන්නේ. ඒ දෙමව්පියෝත් කැඳවලා කථා කරලා ඇමතිතුමාට ඒ ගැන දන්වන්න තමයි අපි තීරණය කරගෙන ඉන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කලින් අහපු ප්‍රශ්නයට -ඊයේත් පැන නැඟුණු ප්‍රශ්නයට- මම පිළිතුරක් දෙන්නම්. මීට කලින් -2008දී එහෙම- "එස්" සාමාර්ථ තුනක් ගත්ත එක අවම සුදුසුකම හැටියට සලකා, ඒ අය යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට හෝ Science Faculty එකට ඇතුළත් කර තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මොන දිස්ත්‍රික්කයේද ගරු ඇමතිතුමනි?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
යාපනය දිස්ත්‍රික්කයේ, 2008-2009දී. ඒ වාගේම, මුලතිව් දිස්ත්‍රික්කයෙන් "එස්" සාමාර්ථ 3ක් හෝ "සී" සාමාර්ථ 1යි, "එස්" සාමාර්ථ දෙකයි තිබෙන අයත් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර තිබෙන බවට මගේ අතේ තිබෙන මෙම ලේඛනය සහතික වෙනවා. මේ ලේඛනය ඔබතුමාට දෙන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

යුද්ධය අවසන් වෙලා අවුරුදු 6කට පසුව පවත්වන උසස් පෙළ විභාගයේදී, යාපනයේ ශිෂ්‍යයකුට වෛද්‍ය පීඨයට ඇතුළත් වෙන්න තිබෙන අවම සුදුසුකම A 1යි, B 2යි. මේ දිස්ත්‍රික්ක පහෙන් අඩුම එක ගත්තොත්, මුලතිව් දිස්ත්‍රික්කයේ ඒ සුදුසුකම A 1යි, B 1යි, C 1යි. යුද්ධය උච්චතම අවස්ථාවට පත් වුණු වෙලාවේ, යාපනය දිස්ත්‍රික්කයේ බිම් බෝම්බ මැද්දේ, බෝම්බ වැටෙද්දී පාඩම් කරලා වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු ළමයෙකුගේ "එස් සාමාර්ථ 3" කියන සුදුසුකම පදනමක් කරගෙන, කොළඹ හෝ වෙන කොහේ හෝ ඉන්න කෙනෙකුට මුදල් ගෙවලා වෛද්‍ය පීඨයට යන්න පුළුවන් විධියට දැන් ඔබතුමන්ලා අවස්ථාවක් හදනවා. ඒකෙන් මොන සාධාරණයක්ද ඉෂ්ට වෙන්නේ? යාපනයේ ඉන්න අන්ත අසරණ ශිෂ්‍යයා පෙන්වලා ඔබතුමන්ලා මේ මොකක්ද කරන්නේ? මෙහේ එවැනි කිසිම ප්‍රශ්නයක් නැතිව සියලු පහසුකම් සහිතව ඉන්න, සල්ලි විතරක් තිබෙන, හැබැයි උසස් පෙළ විභාගය සමත් වෙන්න බැරි, ඒ අසමත්කම මුදල් වලින් cover කරගන්න යන කෙනෙකු වෙනුවෙන්, කිලිනොච්චියේ හෝ යාපනයේ ඉන්න ළමයෙක් පෙන්වලා මෙවැනි නිර්ණායකය හදන එක සාධාරණද?

ගරු කථානායකතුමනි, ඊයේ සභානායකතුමා කිව්වා, එංගලන්තයේ පෞද්ගලික විශ්වවිද්‍යාලයට "S' තුනෙන් ඇතුළත් වෙන්න පුළුවන් කියලා. එංගලන්තයේ බකිංහැම් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නිල වෙබ් අඩවියේ වාර්තාව මම ළඟ තිබෙනවා. එම වාර්තාවේ මෙසේ සඳහන් වනවා:

> "In the case of applicants offering UK A-levels, they should have or be likely to obtain before the medical course begins a minimum of grades AAB in three A-levels including Chemistry, ..."

ඒ නිසා වෙන වෙන පාරවල්වල යන්න ඕනෑ නැහැ. අසරණ, අභිංසක ළමයි පෙන්වලා හරියට සමත් වෙන්න බැරි අයට අවස්ථාව හදන්න එපා. අඩු තරමින් ඊට පෙර අවුරුද්දේ අවම වෛද්‍ය පීඨ සුදුසුකම හෝ සලකා බලා, අවම නිර්ණායකය තීන්දු කරන්න කියලායි අපි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මම ඒකට කෙටි උත්තරයක් ලබා දෙන්නම්. මම ඒක සාධාරණයි කියන්න උත්සාහ කළේ නැහැ, මන්ත්‍රීතුමා. මම ඔබතුමාට පෙන්නුවේ 2008, 2009, 2010 වාගේ වසරවලත් මෙවැනි ප්‍රතිඵල ලබා ගත් සිසුන් ඇතුළත් කරලා තිබෙනවාය කියන එකයි. ඔබතුමාගේ තර්කයට අනුව එම වෛද්‍ය පීඨයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අවම සුදුසුකම් ඇතුළත් නිර්ණායක කීපයක් පිළිබඳව සලකා බලා, ඊට අවශ්‍ය සංශෝධන කරන්න තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්නා බව මම ගරු සභාවට කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. බකිංහැම් විශ්වවිද්‍යාලය කියලා කියන්නේ රජයේ විශ්වවිද්‍යාලයක් නොවෙයි. ඒ විශ්වවිද්‍යාලය සියයට සියයක් private. [බාධා කිරීමක්] ඔය විශ්වවිද්‍යාලය private. මගේ දරුවාත් ඔය විශ්වවිද්‍යාලයට ගියා. ඒකයි මම දන්නේ. It is a private university; it is not a State university. [බාධා කිරීමක්]

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මේක private university එකක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළව එක් නිලධාරියෙකුගේ සුදුසුකම ගැන ඇසුවා. එයට දැන්ම උත්තරය දෙන්න පුළුවන්ද කියලා ඔබතුමා ඇසුවා. ගරු මන්ත්‍රීතුමනි, ඔහු උසස් පෙළ ඉහළින්ම සමත් නිලධාරියෙක්; එම ක්ෂේත්‍රයේ ප්‍රායෝගික දැනුම තිබෙන කෙනෙක්. ඒ පිළිබඳව ඔබතුමා දැනුවත් කරන්න කැමැතියි. එම නිලධාරියා බඳවා ගත්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

නිසා තමයි ඇත්ත වශයෙන්ම එම ක්ෂේත්‍රයේ තිබුණු විශාල දූෂණ සහ බොහෝ දේවල් වළක්වා ගන්න පුළුවන් වුණේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. එම නිලධාරියාගේ තනතුර මොකක්ද කියලා බලන්න. එතුමාගේ තනතුර, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ. මේ ආයතනය මධ්‍යම සංස්කෘතික අරමුදල. ඉතාම ඉහළ වෘත්තීයමය සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් තිබෙන විශාල පිරිසක් මෙම ආයතනය තුළ ඉන්නවා. මේ තනතුරත් එක්ක තමයි මේ ප්‍රශ්නය පැන නඟින්නේ. මොකද, අඩු සුදුසුකම් තිබෙන පුද්ගලයෙක්. උසස් පෙළ කියන එක නොසලකා හරින්න කියලා මම කියන්නේ නැහැ. නමුත් මෙම ආයතනයේ ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ තනතුරකට එවැනි පුද්ගලයෙක් පත් කළාම, එම ආයතනය කඩා වැටෙනවා කියන එකයි මට කියන්න ඕනෑකම තිබුණේ. ගරු ඇමතිතුමා මෙම පිළිතුර ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදල දූෂිත ආයතනයක්ව තිබුණු බව ඔබතුමාත් දන්නවා. කෝටි ගණනක ගසාකෑම්, හොරකම් කිරීම් මේ ආයතනයේ දිගින් දිගටම සිදු වෙමින් තිබුණා. මම ඒවා ගැන වැඩිය කියන්න යන්නේ නැහැ. නමුත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදායම මේ වනවිට සියයට 300කින් වැඩි කරන්න පුළුවන් වුණේ මණ්ඩලය විසින් ගත් ක්‍රියාමාර්ග නිසායි. ඒ නිසා තමයි විභාරස්ථාන දහසකට බෙදා හැරීම් කරන්න පුළුවන් වුණේ. මේ නිලධාරියා තමයි පසුගිය කාලයේ online ටිකට් ක්‍රමය හඳුන්වා දුන්නේ. මධ්‍යම සංස්කෘතික අරමුදලට ආණ්ඩුවෙන් සල්ලි දෙන්නේ නැහැ.

විදේශීය සංචාරකයන්ට ටිකට්පත් විකුණා තමයි මුදල් සපයා ගන්නේ. ඉස්සර විදේශීය සංචාරකයන් රැගෙන බස් දෙක තුනක් ආවාම කටයුතු කෙරුණේ එක එක විධියටයි. මෙතුමා ඒ සඳහා අවශ්‍ය ආරක්ෂක විධික්‍රම පාවිච්චි කරලා ඒ කටයුතු සැලසුම් කර තිබෙනවා. අත්දැකීම් තිබෙන නිලධාරියෙක් මේ පත් කරලා තිබෙන්නේ. මලියදේව විද්‍යාලයට ගිය සාමාන්‍ය පෙළ විභාගය ඉහළින්ම සමත් වුණු, ඒ වාගේම උසස් පෙළ විභාගයත් ඉහළින්ම සමත් වුණු, මේ ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් තිබෙන නිලධාරියෙක් තමයි මේ පත් කරලා තිබෙන්නේ. මොකද, උපාධිධාරියෙක් පත් කළා කියලා මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්නේ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ. පාලක මණ්ඩලයේ අනුමැතියෙන් ඒ වාගේ අත්දැකීම් තිබෙන නිලධාරියෙක් පත් කරන්න පුළුවන්කම තිබෙනවා. මේ අවුරුදු තුන ඇතුළත මධ්‍යම සංස්කෘතික අරමුදලේ සිදුවෙලා තිබෙන වෙනස්කම්, ආදායම් ඉපැයීම්, ගසාකෑම් නැවැත්වීම් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 - 465/'16 - (10), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කුඩා කෘෂිකාර්මික වැව් ප්‍රතිසංස්කරණය : මුලතිව් දිස්ත්‍රික්කය

சிறு விவசாயக் குளங்கள் புனரமைப்பு: முல்லைத்தீவு மாவட்டம்

RENOVATION OF SMALL-SCALE AGRICULTURAL TANKS : MULLAITIVU DISTRICT

2116/'17

6. ගරු වාසුදේව නානායක්කාර මහතා (ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවට)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - மாண்புமிகு டக்ளஸ் தேவானந்தா சார்பாக)
(The Hon. Vasudeva Nanayakkara on behalf of the Hon. Douglas Devananda)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාමසේවා වසම් 27කට අයත් ගම්මාන 114ක කුඩා කෘෂිකාර්මික වැව් 45ක් පමණ තිබෙන බවත්;

(ii) ඉහත වැව් අවුරුදු ගණනාවක සිට ප්‍රතිසංස්කරණය කර නොමැති බැවින් යල කන්නයේදී වී ගොවීන් හා අනිකුත් ගොවීන්ට අදාළ කාලය තුළ වගා කටයුතුවල යෙදීමට නොහැකි වීමෙන් ඔවුන් බොහෝ පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් වැව්වලට ප්‍රමුඛත්වය ලබා දී, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය සතුව කිසියම් වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නීර්පාසන මට්‍රුම් නීරක වළමූල මුකාමෙත්තුව අමෙච්සරෛක් කේට්ට විනා:

(அ) (i) මුල්ලෛත්තීවු මාවට්ටත්තින් ඔට්ටුසුට්ටාන් පිරදේස සෙයලාළර් පිරිවෛච් සේර්න්ත 27 කිරාම අලුවලර් පිරිවුකළුක්කුරිය 114 කිරාමංකළිල් සුමාර් 45 සිරු විවසායක් කුළංකළ් උළ්ළන වෙන්පදෛයුම්;

(ii) මේර්පඩි කුළංකළ් පල වරුඩංකළාක පුනරමෛක් කර්පඩාද කාරණත්තිනාල් සිරු පෝකත්තින්පෝදු නෙර්සෙය්කෛයාළර්කළුක්කුම් ඒනෛය විවසායි කළුක්කුම් ඒර්පුඩෛය කාලර්පකුදියිල් පයිර්ච් සෙය්කෛ නඩවඩික්කෛකළිල් ඊඩුපඩ මුඩියාදු පෝකින්රමෛයාල් ඉවර්කළ් පෙරිදුම් පාදික්කප් පට්ටුළ්ළාර්කළ් එන්පදෛයුම්;

අවර් අරිවාරා?

(ஆ) (i) මේලේ කුරිප්පිඩප්පට්ට කුළංකළුක්කු මුන්නුරිමෛ අළිත්තු, අවර්රෛප් පුනරමෛප් පදර්කු අමෛච්සිඩම් ඒදේනුම් වේලෛත්තිට්ටම් උළ්ළදා එන්පදෛයුම්;

(ii) ආමෙනිල්, ඉක්කුළංකළෛප් පුනරමෛප්පදර්කු නඩවඩික්කෛ එඩුප්පාරා එන්පදෛයුම්;

අවර් ඉච් සපෛක්කු අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Agriculture:

(a) Is he aware that -

(i) there are approximately 45 small-scale agricultural tanks in 114 villages coming under 27 Grama Seva Divisions of Oddusuddan Divisional Secretary's Division of Mullaitivu District; and

(ii) the farmers have been severely oppressed as the paddy farmers are unable to engage in cultivations in Yala Season and the other farmers cannot engage in cultivations in respective seasons as aforesaid tanks have not been renovated since many years?

(b) Will he inform this House -

(i) whether the Ministry has a programme in order to renovate aforesaid tanks prioritizing them; and

(ii) if so, whether measures will be taken to renovate aforesaid tanks?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුළු වැව් ගණන 103 කි.

(ii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වැව් 38ක් ප්‍රතිසංස්කරණය කර ඇත. 2018 වර්ෂය සඳහා ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර ඇති වැව් ප්‍රමාණය 16 කි.

(ආ) (i) ඔව්.

- 2018 අය වැය යෝජනා අනුව, කුඩා වැව් හා ඇළ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වැය විෂය අංක 118-2-3-37-2506 යටතේ රුපියල් 500,000,000ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇත.
- කුඩා වැව් 1500ක් ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ රොන් මඩ ඉවත් කිරීම - 2018 ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන්ම වගඹ, උතුර සහ උතුරු මැද පළාත් තුළ ආරම්භ කිරීමට නියමිත අතර, ඒ සඳහා 2018 අය වැය යෝජනා මඟින් රුපියල් මිලියන 1,000ක් ද වෙන් කර ඇත.
- මීට අමතරව, 2018 අය වැය යෝජනා අනුව, සුළු වාරි මාර්ග පද්ධති සහ පුරාණකුඹුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය ශීර්ෂ අංක 281 යටතේ රුපියල් 1,500,000,000ක මුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර ඇත.
- ඒ අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා අදාළ දිස්ත්‍රික්කවල ප්‍රතිසංස්කරණය කළ යුතු වාරි මාර්ග හඳුනා ගෙන, ඇස්තමේන්තු සකස් කර, ප්‍රමුඛතා ගත කර, ඉදිරියේදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

(ii) ඔව්.

මෙම වැව්වලින් වැව් 16ක් ප්‍රතිසංස්කරණය කිරීමට 2018 වර්ෂයේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, යෝජනා අංක 1, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament, and the motions agreed to by Parliament on 08.03.2016, the hours of sittings of Parliament on this day shall be 9.30 a.m. to 9.30 p.m.. At 9.30 p.m., Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the proceedings on Item No. 1 of Public Business appearing on the Order Paper be exempted at this day's sittings from the provisions of the Standing Order No.7 of the Parliament and the motion agreed to by Parliament this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ විෂය අංක 1, අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාව.

යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා කෙරෙහි විශ්වාස භංගත්වය
பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமானவர் மீது நம்பிக்கையின்மை
VOTE OF NO CONFIDENCE ON PRIME MINISTER AND MINISTER OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

[පූ.භා. 9.55]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි ඇති වී තිබෙන විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාව, එම යෝජනාවට අත්සන් තබන ලද සියලු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් මේ අවස්ථාවේදී මා ඉදිරිපත් කරනවා:

"ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු ටී. බී. ඒකනායක මහතා
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු කනක හේරත් මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු එස්. ශ්‍රේමරත්න මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු ශ්‍රේමලාල් ජයසේකර මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු දිළුම් අමුණුගම මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ඩුලිප් විජේසේකර මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා,-

අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,-

බැඳුම්කර වංචාවක් සිදු කිරීමේ අරමුණින් සම්මතයට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් අමාත්‍යාංශයෙන් ඉවත් කර තමන් යටතට පත් කරවා ගත් හෙයින් ද;

ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවූ ද, අපකීර්තිමත් ඉතිහාසයක් ඇත්තා වූ ද, බැඳියාවන් අතර ගැටුමක් ඇත්තා වූ ද, අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට යෝජනා කළ හෙයින් ද;

මෑත යුගයේ ලෝකයේ සිදු වූ දැවැන්තම මූල්‍ය වංචාව වන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවට ඉතා පැහැදිලි ලෙස සම්බන්ධ හෙයින් ද;

එකී වංචාවේ වංචනිකයන් බේරා ගැනීම සඳහා, තම දේශපාලන හිතවතුන්ගෙන් සමන්විත පිටිපන කමිටුව පත්කර එකී වංචනිකයන් බේරා ගැනීමට උත්සාහයක් දැරූ හෙයින්ද;

මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ වංචනිකයන් ආරක්ෂා කරමින් ද, සැබෑ කරුණු යටපත් කරමින් ද, 2015 මාර්තු 17 දින විශේෂ ප්‍රකාශයක් කරමින් පාර්ලිමේන්තුව නොමග යැවූහෙයින් ද;

බැඳුම්කර වංචාව පිළිබඳ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) විසින් විමර්ශනය කරමින් තිබිය දී, එකී කමිටුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකු වෙනස් කර නව සාමාජිකයෙකු ඇතුළු කර එකී කාරක සභාව හරහා චූදිතයන් නිදොස් කිරීමට උත්සාහයක් ගත් හෙයින් ද;

බැඳුම්කර වංචාව පිළිබඳ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) විසින් විමර්ශනය කරමින් තිබිය දී ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ එකී කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ හෙයින් ද;

මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ බවට ඒ පිළිබඳ ජනාධිපති කොමිසමේ දී හෙළි වූ, නියෝජ්‍ය මහ බැංකු අධිපති පී. සමරසිරි මහතාට මුදල් අමාත්‍යාංශයේ උපදේශක තනතුරක් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කළ හෙයින් ද;

මහ බැංකු බැඳුම්කර වංචාවේ චූදිතයෙකු වූ අර්ජුන් මහේන්ද්‍රන් මහතා වෙනුවට වෙනත් අයෙකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කිරීමට ජනාධිපතිවරයා කටයුතු කරන මොහොතේ දී නැවතත් ඔහුව එකී ධුරයට පත් කර ගැනීමට දැවැන්ත වැයමක් දැරූ හෙයින් ද;

බැඳුම්කර වංචාවේ චූදිතයෙකු වීම හේතුවෙන් අර්ජුන් මහේන්ද්‍රන් මහතාට මහ බැංකු අධිපති තනතුර අහිමි වීමෙන් පසු ද ඔහුට සිය අමාත්‍යාංශයේ උපදේශක තනතුරක් ලබා දුන් හෙයින් ද;

අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකාවෙන් පිට වන තෙක් ඔහු විදේශගත වීම වළක්වන අධිකරණ නියෝගයක් ලබා ගැනීම මග හැරීමෙන් ඔහුට විදේශගත වී අධිකරණය මග හැර සිටීමට අවස්ථාව සැලසූ හෙයින් ද;

මුදල් අමාත්‍යවරයාට පමණක් බලතල ක්‍රියාත්මක කළ හැකි,

(i) 1949 අංක 58 දරන මූල්‍ය පනත

(ii) 1953 අංක 24 දරන විනිමය පාලන පනත

(iii) 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් පනත

(iv) 1937 අංක 7 දරන ලියාපදිංචි කළ ස්කන්ධ සහ සුරැකුම් ආඥාපනත

(v) 1944 අංක 16 දරන මූල්‍ය සංචිත අරමුදල් ආඥාපනත

(vi) 1988 අංක 30 දරන බැංකු පනත

(vii) 1979 අංක 35 දරන අච්චිනිශ්චිත අරමුදල් පනත

(viii) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත

(ix) 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත

යන අණ පනත් ඒ බව දනිමින් ම ශ්‍රී ලංකා මහ බැංකුව තමන් යටතට පත් කර ගනිමින් එකී අණ පනත් යටතේ බලතල ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රටේ ආර්ථිකය සහ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ඉතාම වැදගත් වන්නා වූ අණ පනත් උල්ලංඝණය කළ හෙයින් ද;

ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ද, ආර්ථික කළමනාකරණ කමිටුව හරහා මුදල් අමාත්‍යාංශය ද, ශ්‍රී ලංකා මහ බැංකුව ද, තමන් යටතට ගෙන පසුගිය තෙවසර තුළ ජාතික ආර්ථිකය මෙහෙයවීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ධනය අඩපණ වීමෙන් ද, කොටස් වෙළඳපොල කඩා වැටීමෙන් ද, උද්ධමනය පාලනය කළ නොහැකි අයුරින් ඉහළ යෑමෙන් ද, පොලී අනුපාතය සීඝ්‍ර වර්ධනයට ලක් වීමෙන් ද, විදේශීය ආයෝජකයන් ආයෝජන හකුලාගෙන ශ්‍රී ලංකාවෙන් ඉවත් වීමෙන් ද දැවැන්ත ආර්ථික අර්බුදයක් නිර්මාණය කර ජනතාව පීඩාවට පත්කර ඇති හෙයින් ද; සහ

නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍ය ධුරය දරමින් සිටි කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය හමුවේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවට ආරක්ෂාව සැලසීමට ක්ෂණික පියවර ගැනීමට අසමත්වීමෙන් ජීවිත සහ දේපළ හානි සිදු වීමෙන් ජාතික සමගිය බරපතළ ලෙස පළුදු කරමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කැළැල් කළ හෙයින් ද;

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස ද, කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව මෙන්ම එතුමා අග්‍රාමාත්‍ය ධුරය දරන ආණ්ඩුවට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව ද විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

යෝජනාවේ දෙමළ පරිවර්තනය
பிரேரணையின் தமிழ் மொழிபெயர்ப்பு
TAMIL TRANSLATION OF THE MOTION

"கௌரவ தினேஷ் குணவர்தன

கௌரவ வாசுதேவ நாணாயக்கார

கௌரவ சமல் ராஜபக்ஷ

கௌரவ விமல் வீரவங்ச

கௌரவ உதய பிரபாத் கம்மன்பில

கௌரவ டலஸ் அழகப்பெரும

கௌரவ மஹிந்த யாப்பா அபேவர்தன

கௌரவ சாலிந்த திசாநாயக்க

கௌரவ ரீ.பீ. ஏக்கநாயக்க

கௌரவ நிஷாந்த முதுஹெட்டிகமகே

கௌரவ ரீ. ரஞ்ஜித் த சொய்சா

கௌரவ மஹிந்தானந்த அலுத்கமகே

கௌரவ செஹான் சேமசிங்க

கௌரவ ஜானக வக்கும்புர

கௌரவ கனக ஹேரத்

கௌரவ தாரக்க பாலசூரிய

கௌரவ இந்திக அநுருத்த ஹேரத்

கௌரவ விமலவீர திசாநாயக்க

கௌரவ (கலாநிதி) பந்துல குணவர்தன

கௌரவ எஸ். பிரேமரத்ன

கௌரவ டி.வீ. சானக

கௌரவ நாமல் ராஜபக்ஷ

கௌரவ பிரசன்ன ரணதுங்க

கௌரவ ரோஹித அபேகுணவர்தன

கௌரவ சிசிர ஜயகொடி

கௌரவ பியல் நிசாந்த த சில்வா

கௌரவ பிரேமலால் ஜயசேக்கர

கௌரவ விதுர விக்கிரமநாயக்க

கௌரவ சீ.பீ. ரத்நாயக்க

கௌரவ (டாக்டர்) ரமேஷ் பதிரண

கௌரவ ஜயந்த சமரவீர

கௌரவ காமினி லொக்குகே

கௌரவ (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி

கௌரவ ஜோன்ஸ்டன் பர்னாந்து

கௌரவ எஸ்.சீ. முத்துகுமாரன

கௌரவ லொஹான் ரத்வத்தே

கௌரவ தேனுக விதானகமகே

கௌரவ திளும் அமுணுகம

கௌரவ கெஹெலிய ரம்புக்வெல்ல

கௌரவ கஞ்சன விஜேசேகர

கௌரவ துலீப் விஜேசேக்கர

கௌரவ விஜித பேருகொட

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

கௌரவ சனத் நிசாந்த பெரேரா

கௌரவ அருந்திக்க பர்னாந்து

கௌரவ குமார வெல்கம

கௌரவ பியங்கர ஜயரத்ன

கௌரவ ஜனக பண்டார தென்னகோன்

கௌரவ எஸ்.எம். சந்திரசேன

கௌரவ பத்ம உதயசாந்த குணசேகர

கௌரவ மொஹான் பிரியதர்ஷன த சில்வா

கௌரவ சந்திரசிறி கஜதீர

கௌரவ நிமல் லான்சா

கௌரவ கே. காதர் மஸ்தான்

கௌரவ சுசந்த புஞ்சிநிலமே

கௌரவ பிரசன்ன ரணவீர,- பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமான கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் மீது நம்பிக்கையின்மை,-

பிணைமுறி மோசடியை மேற்கொள்ளும் நோக்கத்துடன் வழமைக்கு மாற்றமாக இலங்கை மத்திய வங்கியை நிதி அமைச்சிலிருந்து நீக்கி தனக்குக் கீழ் கொண்டு வந்ததனாலும்;

இலங்கைப் பிரசை அல்லாதவரும், களங்கமான வரலாற்றைக் கொண்டவரும், அக்கறைகளுக்கிடையிலான முரண்பாடு உடையவருமான திரு. அர்ஜுன் மகேந்திரனை இலங்கை மத்திய வங்கியின் ஆளுநர் பதவிக்கு பெயர் நியமனம் செய்ததனாலும்;

அண்மைக் காலத்தில் உலகத்தில் நடந்த பாரிய நிதி மோசடியான இலங்கை மத்திய வங்கி பிணைமுறிகள் மோசடியுடன் மிகத் தெளிவாகவே சம்பந்தப்பட்டிருப்பதனாலும்;

மேற்படி மோசடியில் சம்பந்தப்பட்ட மோசடிக்காரர்களை காப்பாற்றுவதற்காக தன்னுடைய அரசியல் நண்பர்களை உள்ளடக்கிய பிட்டிபன குழுவை நியமித்து குறித்த மோசடிக்காரர்களைக் காப்பாற்ற முயற்சியெடுத்ததனாலும்;

மத்திய வங்கி பிணைமுறி மோசடி தொடர்பாக மோசடிக் காரர்களை காப்பாற்றுகின்ற வகையிலும், உண்மையான விடயங்களை மூடிமறைத்தும் 2015 மார்ச் 17ஆம் திகதி விசேட கூற்றொன்றை வெளியிட்டு பாராளுமன்றத்தை தவறான வழியில் இட்டுச்சென்றதனாலும்;

பிணைமுறி மோசடி தொடர்பாக பாராளுமன்றத்தின் அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவினால் (கோப்) விசாரிக்கப்பட்டு வந்த நிலையில் அக் குழுவை பிரதிநிதித்துவப்படுத்திய ஐ.தே.க. பாராளுமன்ற உறுப்பினரொருவரை மாற்றி புதிய உறுப்பின ரொருவரை உள்வாங்கி மேற்படி குழுவின் ஊடாக குற்றவாளிகளை குற்றமற்றவர்களாக காட்டுவதற்கு முயற்சியை மேற்கொண்டத னாலும்;

பிணைமுறி மோசடி தொடர்பாக பாராளுமன்றத்தின் அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவினால் (கோப்) விசாரிக்கப்பட்டு வந்த நிலையில் அது தொடர்பாக எவ்வாறு செயற்பட வேண்டுமென அக்குழுவின் அங்கத்துவ உறுப்பினர்களுக்கு அழுத்தங்களை பிரயோகித்ததனாலும்;

மத்திய வங்கி பிணைமுறி மோசடியுடன் தொடர்புபட்டுள்ள தாக அது தொடர்பான சனாதிபதி ஆணைக்குழுவில் வெளிப்படுத்தப்பட்ட பிரதி மத்திய வங்கி ஆளுநர் திரு. பி. சமரசிறிக்கு நிதி அமைச்சில் ஆலோசகர் பதவியொன்றை வழங்குவதற்கு அமைச்சரவைக்கு சிபாரிசு செய்ததனாலும்;

மத்திய வங்கி பிணைமுறி மோசடியின் குற்றவாளிகளில் ஒருவரான திரு. அர்ஜுன் மகேந்திரனுக்கு பதிலாக வேறு ஒருவரை இலங்கை மத்திய வங்கியின் ஆளுநர் பதவிக்கு நியமனம் செய்வதற்கு சனாதிபதி நடவடிக்கை எடுத்தபோது மீண்டும் இவரை மேற்படி பதவிக்கு நியமிப்பதற்கு பெரும் பிரயத்தனம் மேற்கொண்டதனாலும்;

பிணைமுறி மோசடியின் குற்றவாளிகளில் ஒருவராகியதனால் திரு. அர்ஜுன் மகேந்திரன் மத்திய வங்கியின் ஆளுநர் பதவியை இழந்த பின்னரும் இவருக்கு தமது அமைச்சில் ஆலோசகர் பதவியொன்றை வழங்கியதனாலும்;

திரு. அர்ஜுன் மகேந்திரன் இலங்கையிலிருந்து வெளியேறும் வரை இவர் வெளிநாடு செல்வதை தடுக்கும் நீதிமன்றக் கட்டளையொன்று பெற்றுக்கொள்ளப்படுவதைத் தவிர்த்ததன் மூலம் இவர் வெளிநாடு சென்று நீதிமன்றத்திற்கு தலைமறை வாயிருப்பதற்கு வாய்ப்பேற்படுத்திக்கொடுத்ததனாலும்;

நிதி அமைச்சரால் மாத்திரம் தத்துவங்களை அமுல்படுத்தக் கூடியதான,

i. 1949ஆம் ஆண்டின் 58ஆம் இலக்க நிதிசார் நீதிச்சட்டம்.

ii. 1953ஆம் ஆண்டின் 24ஆம் இலக்க செலாவணிக் கட்டுப்பாட்டுச் சட்டம்.

iii. 1923ஆம் ஆண்டின் 8 ஆம் இலக்க உள்ளூர் திறைசேரி உண்டியல்கள் கட்டளைச் சட்டம்.

iv. 1937ஆம் ஆண்டின் 7ஆம் இலக்க பதிவுசெய்யப்பட்ட பங்குத்தொகுதிகள் மற்றும் பிணையங்கள் கட்டளைச் சட்டம்.

v. 1944ஆம் ஆண்டின் 16ஆம் இலக்க நிதிசார் ஒதுக்கு நிதியங்கள் கட்டளைச் சட்டம்.

vi. 1988ஆம் ஆண்டின் 30ஆம் இலக்க வங்கித்தொழில் சட்டம்.

vii. 1979ஆம் ஆண்டின் 35ஆம் இலக்க எதிர்பாராச் செலவு நிதியச் சட்டம்.

viii. 2006ஆம் ஆண்டின் 5ஆம் இலக்க பணம் தூய்தாக்கல் தடைச் சட்டம்.

ix. 2006ஆம் ஆண்டின் 6ஆம் இலக்க நிதிசார் கொடுக்கல் வாங்கல்களை அறிக்கையிடல் சட்டம்

ஆகிய சட்டங்களைப் பற்றி அறிந்திருந்த நிலையில், இலங்கை மத்திய வங்கியை தமக்குக் கீழ் கொண்டுவந்து மேற்படி சட்டங்களின் கீழான தத்துவங்களை பிரயோகித்ததன் மூலம் நாட்டின் பொருளாதாரம் மற்றும் நிதிக் கட்டுப்பாடு தொடர்பில் மிகவும் முக்கியத்துவம் வாய்ந்ததான சட்டங்களை மீறியமை யினாலும்;

பொருளாதார அலுவல்கள் அமைச்சையும் பொருளாதார முகாமைத்துவ குழுவின் ஊடாக நிதி அமைச்சையும் மத்திய வங்கியையும் தமக்கு கீழ் கொண்டுவந்து கடந்த மூன்று ஆண்டு காலப்பகுதியினுள் தேசிய பொருளாதாரத்தை வழிநடத்தியதன் விளைவாக பொருளாதார வளர்ச்சி பாதிக்கப்பட்டமையின் மூலமும், பங்குச் சந்தை வீழ்ச்சியடைந்ததன் மூலமும், பணவீக்கம் கட்டுப்படுத்த முடியாத வகையில் உயர்வடைந்ததன் மூலமும், வட்டி வீதம் வேகமாக அதிகரித்ததன் மூலமும், வெளிநாட்டு முதலீட்டாளர்கள் முதலீடுகளை மீளப்பெற்று இலங்கையிலிருந்து வெளியேறியதன் மூலமும் பாரிய பொருளாதார நெருக்கடியை தோற்றுவித்து பொதுமக்களை பாதிப்புக்கு உள்ளாக்கியதனாலும்;

சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சுப் பதவியை வகித்த நிலையில் கண்டி மாவட்டத்தில் ஏற்பட்ட பதற்றநிலையின் போது சிங்கள, தமிழ் மற்றும் முஸ்லிம் மக்களுக்கு பாதுகாப்பு

வழங்குவதற்கு துரிதமாக நடவடிக்கை மேற்கொள்ளத் தவறியமையினால், உயிரிழப்புக்கள் மற்றும் சொத்துக்களுக்கு சேதம் ஏற்பட்டதன் மூலம் தேசிய ஒற்றுமை வெகுவாக பாதிக்கப்பட்டு சர்வதேச சமூகத்தில் இலங்கையின் பிரதிமைக்கு களங்கம் ஏற்படுத்தியதனாலும்;

பிரதம அமைச்சர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு தொடர்ந்தும் பிரதம அமைச்சராவும் அமைச்சரவை அமைச்சரொரு வராகவும் செயலாற்றுவதற்கான இயலுமை குறித்தும் மேலும் அவர் பிரதம அமைச்சராக பதவி வகிக்கும் அரசாங்கத்தினால் செயலாற்றுவதற்கான இயலுமை குறித்தும் நம்பிக்கையின்மை காணப்படுவதாக இப்பாராளுமன்றம் பிரேரணை நிறைவேற்றுமாக."

යෝජනාවේ ඉංග්‍රීසි පරිවර්තනය
பிரேரணையின் ஆங்கில மொழிபெயர்ப்பு
ENGLISH TRANSLATION OF THE MOTION

"Hon. Dinesh Gunawardena
Hon. Vasudeva Nanayakkara
Hon. Chamal Rajapaksa
Hon. Wimal Weerawansa
Hon. Udaya Prabhath Gammanpila
Hon. Dullas Alahapperuma
Hon. Mahinda Yapa Abeywardena
Hon. Salinda Dissanayake
Hon. T. B. Ekanayake
Hon. Nishantha Muthuhettigamage
Hon. T. Ranjith De Zoysa
Hon. Mahindananda Aluthgamage
Hon. Shehan Semasinghe
Hon. Janaka Wakkumbura
Hon. Kanaka Herath
Hon. Tharaka Balasuriya
Hon. Indika Anuruddha Herath
Hon. Wimalaweera Dissanayaka
Hon. (Dr.) Bandula Gunawardana
Hon. S. Premarathna
Hon. D. V. Chanaka
Hon. Namal Rajapaksa
Hon. Prasanna Ranatunga
Hon. Rohitha Abeygunawardana
Hon. Sisira Jayakody
Hon. Piyal Nishantha De Silva
Hon. Premalal Jayasekara
Hon. Vidura Wickramanayaka
Hon. C. B. Rathnayake
Hon. (Dr.) Ramesh Pathirana
Hon. Jayantha Samaraweera
Hon. Gamini Lokuge
Hon. (Mrs.) Pavithradevi Wanniarachchi
Hon. Johnston Fernando
Hon. S. C. Mutukumarana
Hon. Lohan Ratwatte
Hon. Thenuka Vidanagamage
Hon. Dilum Amunugama
Hon. Keheliya Rambukwella
Hon. Kanchana Wijesekera
Hon. Duleep Wijesekera
Hon. Vijitha Berugoda
Hon. Sanath Nishantha Perera
Hon. Arundika Fernando
Hon. Kumara Welgama
Hon. Piyankara Jayaratne
Hon. Janaka Bandara Tennakoon
Hon. S. M. Chandrasena
Hon. Padma Udhayashantha Gunasekera
Hon. Mohan Priyadarshana De Silva
Hon. Chandrasiri Gajadeera
Hon. Nimal Lanza
Hon. K. Kader Masthan
Hon. Susantha Punchinilame
Hon. Prasanna Ranaweera

- Vote of No Confidence on the Hon. Ranil Wickremesinghe, Prime Minister and Minister of National Policies and Economic Affairs,
- Whereas Hon. Ranil Wickremesinghe, the Prime Minister, has severed the Central Bank of Sri Lanka from the Ministry of Finance contrary to the norm and brought it under himself with the motive of committing a fraud associated with Treasury Bonds;

And whereas he has proposed a non-citizen of Sri Lanka named Mr. Arjun Mahendran, who is shrouded with an infamous track record and a conflict of interests, to the post of Governor of the Central Bank of Sri Lanka;

And whereas he has been obviously associated with the Bond fraud which occurred at the Central Bank of Sri Lanka, which is the most colossal financial fraud in the world in the recent era;

And whereas he has made an attempt to save the fraudsters involved in that fraud by appointing the Pitipana Committee comprising his political cronies to save them;

And whereas he has misled the Parliament by making a special statement on 17th March, 2015 to protect the said fraudsters involved in the Treasury Bond fraud and to conceal the true facts;

And whereas he has made an attempt to exonerate the accused persons through the Committee on Public Enterprises (COPE), which had been investigating the Treasury Bond fraud by that time, by removing a Member of Parliament of the United National Party from the said Committee and replacing the said Member with another new Member to function as a Member of the said Committee;

And whereas he has influenced upon the Members of the Committee on Public Enterprises (COPE) on how to act regarding the Treasury Bond Fraud while the said Committee was investigating the said fraud;

And whereas he has recommended to the Cabinet of Ministers to make Mr. P. Samarasiri, Deputy Governor of the Central Bank of Sri Lanka, who was revealed by the Presidential Commission as he has been involved in the Treasury Bond Fraud, to an Advisor post at the Ministry of Finance;

And whereas he has made a herculean effort to re-appoint Mr. Arjun Mahendran to the post of Governor of the Central Bank of Sri Lanka while the President was taking measures to appoint some other person in place of Mr. Arjun Mahendran, who had become an accused in the Treasury Bond Fraud;

And whereas he has given a post of Advisor to Mr. Arjun Mahendran at his Ministry even after he had lost the post of Governor of the Central Bank of Sri Lanka because he being an accused person of the Treasury Bond Fraud;

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

And whereas he has made way for Mr. Arjun Mahendran to go abroad and evade appearance before the Court by refraining, until after Mr. Arjun Mahendran left Sri Lanka, from obtaining a court order to prevent him from leaving the country;

And whereas he has violated the pieces of legislation, namely:-

(i) Finance Act, No. 58 of 1949

(ii) Exchange Control Act, No. 24 of 1953

(iii) Local Treasury Bills Ordinance No. 8 of 1923

(iv) Registered Stocks and Securities Ordinance No. 7 of 1937

(v) Financial Reserve Funds Ordinance No. 16 of 1944

(vi) Banking Act, No. 30 of 1988

(vii) Contingency Fund Act, No. 35 of 1979

(viii) Prevention of Money Laundering Act, No. 5 of 2006

(ix) Financial Transactions Reporting Act, No. 6 of 2006,

which are quite important pieces of legislation for the economy and for the financial control of the country, by taking over the Central Bank of Sri Lanka under his sway and exercising powers under such statutes, knowing that powers under such statutes can only be exercised by the Minister of Finance;

And whereas he has created a huge economic crisis by keeping under him the Ministry of Economic Affairs, taking control of the Ministry of Finance through the Economic Management Committee and keeping the Central Bank of Sri Lanka under him by managing the national economy for the past three years, resulting the retardation of economic growth, collapse of the share market, escalation of rate of inflation uncontrollably, increase of interest rates rapidly and withdrawal of investments by foreign investors, thereby putting people into hardship;

And whereas he has tarnished the image of the country before the international community by failing to take immediate measures to provide protection to Sinhalese, Tamil and Muslim people during the unrest that occurred in the Kandy District while holding the portfolio of Minister of Law and Order, resulting in loss of lives and damage to property;

That this Parliament resolves that it has no confidence in Hon. Ranil Wickremesinghe's ability to function as Prime Minister and as a Minister of the Cabinet and as well as the Government in which he holds the office of Prime Minister any longer."

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මා සඳහන් කරන්නේ මෙම යෝජනාවේ සඳහන් කරුණු මත අග්‍රාමාත්‍යවරයා කෙරෙහි තිබෙන විශ්වාසය භංගත්වයට පත්වී තිබෙන බවයි. There is no confidence in the Prime Minister. Whether the House has confidence in the Prime Minister or not, is a very serious issue.

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මා සඳහන් කරන්නට කැමැතියි, අපේ රටේ වර්තමාන ආණ්ඩුව පළමුවරට දිවුරුම් දුන්නේ, 2015 ජනවාරි මාසයේ 8 වෙනි දාය කියලා. ජනවාරි මාසයේ 8 වෙනි දා දිවුරුම් දීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව අග්‍රාමාත්‍යතුමාගේ විෂයය යටතට පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වුණාය කියලා අපි දන්නවා. ඉන් පසුව අර්ජුන මහේන්ද්‍රන් නමැති සිංගප්පූරු පුරවැසියා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හැටියට පත් කිරීම සිදු වුණා; ශ්‍රී ලංකාවේ මහ බැංකුව ආණ්ඩු ක්‍රමයට එරෙහිව විදේශිකයකු අතට පත් කිරීම සිදු වුණා. රටකට තිබෙන්නේ එක මහ බැංකුයි. බැංකු ඕනෑ තරම් තිබෙන්න පුළුවන්. මහ බැංකුවකට තිබෙන වගකීම පමණක් නොව, මහ බැංකුවේ අධිපතිවරයාට මුළුමහත් ආර්ථිකයට හා මූල්‍ය ක්‍රමයට ඉතාම දැවැන්ත බලපෑමක් කරන්නට පුළුවන් බව අපි කවුරුත් දන්නවා.

රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට බලය පවරා තිබෙන්නේ ඇයි? පාර්ලිමේන්තුව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත වන නිසායි. මූල්‍ය ප්‍රතිපාදන, මූල්‍ය පාලනය පිළිබඳව ප්‍රධාන වගකීම පැවරෙන නීතිමය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. මේ බලය අනුව අපේ රටේ ආණ්ඩු ගණනාවක් තුළ මූල්‍ය ක්‍රමය සහ පක්ෂපාතීත්වය පිළිබඳව ඇති කරගෙන තිබුණු විශ්වාසය, මූල්‍ය ක්‍රමයේ ප්‍රධානියා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම නිසා බැඳියාවෙන් කටයුතු කිරීමේ වගකීම උල්ලංඝනය කරමින්, මුදල් ඇමතිවරයාගේ විෂය යටතේ තිබුණු ශ්‍රී ලංකා මහ බැංකුව අග්‍රාමාත්‍යතුමාගේ විෂය යටතට ගැනීම සිදු වුණා. මුදල් ඇමතිවරයා යටතේ තිබුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන වශයෙන් නිර්දේශ කිරීම් හා රීට සම්බන්ධ කටයුතු ඉවත් කර, සිංගප්පූරු පුරවැසියකු වන අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හැටියට පත් කළා පමණක් නොව, ඒ සමඟම ඇති වන මූල්‍ය මණ්ඩලයේ සභාපතිත්වයත් ඔහුට පැවරුවා. රටේ ප්‍රධාන හා ජාත්‍යන්තර බැඳියාවන් ක්‍රියාත්මක කරන, රටේ මුළුමහත් ආර්ථිකයට බලපාන ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම පවරන ලද පුද්ගලයා රටේ පිළිගත් කිසිම සම්මතයකට අනුව කටයුතු කරන පුද්ගලයෙක් නොවන බව දැන-දැනම ඔහුව නිර්දේශ කිරීමේ වගකීම ගරු අග්‍රාමාත්‍යතුමා විසින් දැරුවා. ඒකේ හංගන්න දෙයක් නැහැ. අගමැතිතුමා මේ සභාවේදී පිළිගෙන තිබෙනවා, අගමැතිතුමා නිර්දේශ කරලා තමයි අර්ජුන මහේන්ද්‍රන් මහතා පත් කළේ කියලා. ඒ පිළිබඳ වගකීම අග්‍රාමාත්‍යතුමාට පැවරෙනවා.

අග්‍රාමාත්‍යතුමා නිර්දේශ කළ පුද්ගලයා කෙරෙහි ඇති විශ්වාසය හා බැඳියාව මත, රටේ මූල්‍ය ක්‍රමයට, ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණයට හා නායකත්වයට අදාළ සම්ප්‍රදායික හා පිළිගත් සම්මතයන් සියල්ල උල්ලංඝනය කරමින්, අර්ජුන මහේන්ද්‍රන්ට සම්බන්ධ, තමන්ගේ පවුලට අයිති "පර්පෙචුවල් ට්‍රෙෂරීස්" ආයතනයට සුවිශේෂ වන ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ Treasury Bonds නිකුත් කිරීමේදී සිදු කළ වංචාව නිසායි ඔහු ඉවත් කිරීම සඳහා පරීක්ෂණයක් ඉල්ලා සිටීමින් දිගටම කටයුතු කළේ.

ගරු කථානායකතුමනි, අපේ යෝජනාවේ සඳහන් පළමුවන කාරණය තමයි, "බැදුම්කර වංචාවක් සිදු කිරීමේ අරමුණින් සම්මතයට පටහැනිව ...." කියන එක. සම්මතය තමයි, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ඇමති යටතේ තිබෙන්න ඕනෑය කියන එක. නමුත් මුදල් ඇමති නොවන අගමැති යටතට ශ්‍රී ලංකා මහ බැංකුව -මධ්‍යම බැංකුව- පවරා ගත්තා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වශයෙන් විදේශිකයකු පත් කළා. ඔහු යටතට මූල්‍ය මණ්ඩලය පත් කළා.

ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවූද, අපකීර්තිමත් ඉතිහාසයක් ඇත්තාවූද, බැඳියාවන් අතර ගැටුමක් - conflict of interest - ඇත්තාවූද, තමන්ගේ පවුලේ සමාගමකට Treasury Bond එකේ සහන දෙන්න, තමන්ම විශේෂයෙන් නියෝග දෙන පුද්ගලයෙක්, තමන්ට වාසියක් කිරීමට මහ බැංකුව පාවිච්චි කරන පුද්ගලයෙක්, මුළු මහත් රටේ ආර්ථිකයට මේ ලෙස ලේ හලා ගෙන යන්න ඇති කළ අවිශ්වාසයේ බෙදවාචකය මුළු රටම අද වෙළා ගෙන ඉවරයි. රටේ මූල්‍ය ක්‍රමය කෙරෙහි; රටේ මූල්‍ය කේන්ද්‍රීය ආයතනය කෙරෙහි ඇති විශ්වාසය සම්පූර්ණයෙන් කඩ වී මේ චෝදනාවලට ලක් වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ මේ ප්‍රශ්නය මතු වූ කාලය වන විට කථානායකවරයා වශයෙන් ඔබතුමා නොවෙයි කටයුතු කළේ, ගරු චමල් රාජපක්ෂ මැතිතුමායි.

ගරු කථානායකතුමනි, ඊළඟට අපි මෙම යෝජනාවෙන් කියනවා, "මෑත යුගයේ ලෝකයේ සිදු වූ දැවැන්තම මූල්‍ය වංචාව වන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවට ඉතා පැහැදිලි ලෙස සම්බන්ධ වෙන හෙයින් ද;" කියලා. ඒ නිසායි අප මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. එයට සම්බන්ධ පුද්ගලයන් නිර්දෝෂී කරන්න බැහැ. මෙයට සම්බන්ධ නිසා අපේ රටේ හිටපු මුදල් ඇමතිවරයාට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කරලා ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණා; රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමාට ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණා. ඔබතුමන්ලා කාටවත් නැහිටලා ඒකට "නැහැ." කියන්න බැහැ. එතුමා ඉල්ලා අස් වුණු ප්‍රකාශයේ අර්ජුන් මහේන්ද්‍රන් ගැන හා ඒ ක්‍රියාවලිය ගැන සඳහන් කරනවා. ඒ වාගේම කබීර් හෂීම් අමාත්‍යතුමාටත්, මලික් සමරවික්‍රම අමාත්‍යතුමාටත් කොමිෂම ඉදිරියට යන්න සිද්ධ වුණා. මම මීට වඩා ඒ කාරණාව ගැන කියන්න යන්නේ නැත්තේ මට ලැබී ඇති කාලය ප්‍රමාණවත් නොවන නිසයි.

දෙවැන්න, ගරු කථානායකතුමනි, COPE එක ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් තිබුණු කාලයේදී එම කාරක සභාව හමුවට මේ වංචාව සම්බන්ධයෙන් කැඳවීම් සිදු කළා.

සියලු මන්ත්‍රීවරුන්ට වේගයෙන් කියවිය හැකි ඉතාම වැදගත් ලිපියක් අද -2018 අප්‍රේල් 04 දින - "ද අයිලන්ඩ්" පත්‍රයේ පළ වී තිබෙනවා. This article written by Shamindra Ferdinando appears in the "Midweek Review" of today's "The Island" newspaper. Under the caption, "The 'Great' Central Bank robbery", it gives the sequence of the events.

I quote:

> "Jan.8, 2015: Presidential election
> Jan 9, 2015: Maithripala Sirisena sworn in as President
> Jan 9, 2015: Ranil Wickremesinghe sworn in as Prime Minister
>
> "Jan.23, 2015: Then Finance Minister Ravi K recommended Arjuna Mahendan as Governor, CBSL
>
> Jan. 26, 2015: President Sirisena appointed Singaporean Mahendran as Governor, CBSL.
>
> Feb. 26, 2015: Mahendran met ministers, Ravi K, Kabir H and UNP Chairman Malik S at CBSL, allegedly to discuss a massive fund requirement of Rs 18 bn.

No one will deny it. All of you have accepted the fact you all went to the CBSL allegedly to discuss the massive fund requirement of Rs. 18 billion.

It further states, I quote:

> "Feb 27, 2015: First bond scam perpetrated. Within hours, the top financial sector knew how Primary Dealer Perpetual Treasuries Limited (PTL) had carried out the operation in connivance with Mahendran, father-in-law of Arjun Aloysius, owner of PTL. The PTL is a fully owned subsidiary of Perpetual Capital (Pvt) Limited, owned by Geoffrey Joseph Aloysius and Arjun Joseph Aloysius.
>
> Massive media coverage of the bond scam sent shock waves through the Sirisena-Wickremesinghe government."

The biggest fraud that happened in the Central Bank in our country was exposed to the world.

I further quote:

> March 10, 2015. Wickremesinghe, following consultations with Sirisena, appointed a three-member committee to probe the issuance of treasury bonds. The committee comprised attorney-at-law Gamini Pitipana, attorney-at-law Mahesh Kalugampitiya and attorney-at-law Chandimal Mendis."

It was a pro-UNP Committee.

It further goes on to state, quote:

> "May 21, 2015: The Joint Opposition made representations to Speaker Chamal R demanding a special debate on the bond scam.
>
> May 22, 2015: Special Sub Committee of COPE appointed to probe the Feb 29, 2015 issuance of treasury bonds. The 13-member Sub Committee had its inaugural meeting on the same day under the chairmanship of Dew Gunasekera."".....
>
> .....May 26,2015: Probe commenced with Treasury Secretary Dr.R.H.S.Samaratunga and Director General, Department of Treasury M.S.D.Ranasiri being questioned.
>
> June 18,23. 2015: CoPE questioned Mahendran. The Singaporean was the last to appear before the committee.
>
> June 25, 2015: Wickremesinghe alleged CoPE denied him of an opportunity to appear before the watchdog.
>
> June 26,2015: Sirisena dissolved Parliament to thwart CoPE presenting its report on treasury bond scam. General election set for Aug.17,2015."

මම ඉල්ලා සිටිනවා, දවසින් දවස සිදු වුණු මේ ක්‍රියාවලියේ නීති විරෝධීභාවය පිළිබඳව, නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳව, නීතිය පරීක්ෂා කිරීම පිළිබඳව; පාර්ලිමේන්තුව මැදිහත් වුණු හැටි, COPE එකෙන් පළමුවෙන් ඩිව් ගුණසේකර මහතා විසිනුත්, දෙවනුව සුනිල් හඳුන්නෙත්ති මහතා 2015 මහ මැතිවරණයෙන් පසුව ඉදිරිපත් කළ වාර්තා සියල්ලගෙන්, පසුව -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා. [බාධා කිරීම්] Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා සාකච්ඡා කරනවා නම්, මේ සභාවට disturb වන නිසා, කරුණාකර සභාවෙන් එළියේ ඔබතුමන්ලාගේ සාකච්ඡාව කරන්න, මෙතැන ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉක්මනින් මම කථාව අවසන් කරන්නම්. මේ පුවත්පතේ සඳහන් මේ දින ටිකත් මගේ කථාවට ඇතුළත් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්] Order, please! මෙතැන විවාදයක් තිබෙන්නේ. කරුණාකර එම විවාදයට ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! මේ විවාදය ගරුත්වයෙන් කර ගෙන යන්න ඉඩ දෙන්න. I ask you not to disturb. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මොකද, ලජ්ජයිද? අර්ජුන සිංගප්පූරුවේදී හම්බ වෙලාද ආවේ? ඔහුව සිංගප්පූරුවට අරගෙන ගියා. අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ ඉන්නේ. [බාධා කිරීම්] සිංගප්පූරුවේදී ආණ්ඩුවේ සියල්ලෝම මහේන්ද්‍රන් හම්බ වනවා. ලංකාවේ උසාවියට මහේන්ද්‍රන් ඕනෑ වෙලා තිබෙනවා. ලංකාවේ උසාවියට ගෙනැල්ලා දෙනවා කියනවා. නමුත්, සිංගප්පූරුවේ සිටින මහේන්ද්‍රන් ගෙන්වා ගන්න අගමැතිතුමාට බැහැ. මෙන්න, අද රටේ තත්ත්වය! මම ඒ නිසා ඔබතුමාට මේ කරුණ කියනවා.

ගරු කථානායකතුමනි, මේ COPE වාර්තා දෙකෙන් පස්සේ - [ඝෝෂා කිරීම්] මේ COPE වාර්තාව අතර, 2015 පෙබරවාරි 27වැනි දින Perpetual Treasuries Limited විසින් රුපියල් බිලියන ගණනක් මේ Treasury Bond එකෙන් වංචා කිරීම සඳහා ලංකා බැංකුව උපයෝගි කර ගත්තා. ලංකා බැංකුව මේ Treasury Bond එකට මුදල් දුන්නේ කිසිම පිළිවෙතක් අනුගමනය කරලා නොවෙයි. අර්ජුන මහේන්ද්‍රන්ගේ ඕනෑකමට -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
බලතල පාවිච්චි කරලා මේ යෝධ වංචාව කරලා, අදත් මේ යෝධ වංචාව ගැන පියවරක් ගෙන නැහැ. [ඝෝෂා කිරීම්]

ඊළඟට, මේ වංචකයෝ ජනතාවගේ සේවක අර්ථ සාධක අරමුදලට මේ Treasury Bond එක වික්කා. ඒ වික්ක Treasury Bond එකෙන් පමණක් බිලියන ගණනක් හොරකමට සල්ලි ගත්තා. අද වනතුරු නඩුවක් නැහැ. මේ වංචාවට EPF එකේ සල්ලි පාවිච්චි කළා.

ගරු කථානායකතුමනි, මේ කාරණා ටික මම සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය නිසා රහස් පොලිසිය විසින් 2015 මැද භාගයේදී නීතිපතිතුමාට මේ ලිපිගොනුව භාර දුන්නා. අපරාධයක් සිදු කෙරුණු බවට පරීක්ෂා කිරීමට නීතිපතිතුමා මේ ලිපිගොනුව විවෘත කළා. එය නවතා දමා තිබුණා. ඊට පසුව එම ලිපිගොනුව පිළිබඳ සිවිල් කටයුතු කළ හැකිද කියා බැලීමට තවත් අංශයකට ඒ ක්‍රියාවලිය මාරු කළා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා, යෝජනාව ස්ථිර කිරීමට.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, එතුමාට වේලාව ලබා දෙන්න. අපේ කාලයෙන් අඩු කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
එතුමාට තව කාලය ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Dinesh Gunawardena, your time is over; අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ කෑගහන අය footnote කට්ටිය බව ලංකාවම දන්නවා. වෙන අය නොවෙයි මේ කෑ ගහන්නේ. අනෙක් අය අහගෙන ඉන්නවා. මුළු රටම මේ ගැන -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, මේක වැදගත් රීති ප්‍රශ්නයක්. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, අපි 2008 වසරේ සිට Treasury Bonds සියල්ල ගෙනෙනවා. ඉස්සෙල්ලාම ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලා ටික පාර්ලිමේන්තුවට ගෙන්වන්න, ඡන්දය වෙලාවට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මම හිටපු අමාත්‍යතුමාට කියනවා, පුළුවන් නම් අද හවසට ඡන්ද 50ක් අරගෙන පෙන්වන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ points of Order ගෙනාව මන්ත්‍රීවරුන් දෙන්නාගෙන්ම මම අහනවා, පොල් ගෙඩිය රුපියල් 100ට විකුණපු කාලයක් මීට පෙර ලංකාවේ තිබුණාද කියලා. ඔබතුමන්ලාගේ ආසන දෙකෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. හැම ගෙයක්ම විලාප දෙනවා. මේ හොරකම හා ආර්ථික අර්බුදයෙන් අද පොල් මිලත් වැඩි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් අවසන් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකයි ඇත්ත තත්ත්වය.

නීතිපතිට යවපු ලිපි ගොනුවට මොකද වුණේ? [බාධා කිරීම්] ලිපි ගොනුව ක්‍රියාවිරහිත වුණා, නීතිපති විශ්‍රාම ගියා, අලුත් නීතිපති කෙනෙක් ආවා. ඒ ලිපි ගොනුවට මොකද වුණේ? මෙවැනි කාරණා නිසා තමයි අපට - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ වේලාව අවසන් වෙමින් යනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, 2015 මහ මැතිවරණය පැවැත්වීමට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ කථාවේදී ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, "අර්ජුන මහේන්ද්‍රන්ව පත් කරන්න එපා කියලා මම කිව්වා" කියන වචන ටික. ජනාධිපතිතුමාට දැනුමක් තිබුණා, අර්ජුන මහේන්ද්‍රන්ට මහ බැංකුව බාර දුන්නොත් නරියාට කුකුළු කොටුව බාර දුන්නා වාගේ තමයි කියලා. ඒ චෝදනාව කරමින් එතුමා එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ, ඩිවි ගුණසේකර වාර්තාව හෙට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට නියමිතව තිබුණා නම් අද පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ තුළින් මේ මහා වංචාව ආවරණය කළා; කල් දමමින් මහ හරින්නට අර්ජුන මහේන්ද්‍රන්ට ඉඩ දුන්නා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එකට අවස්ථාව මේ කථාව අවසානයේ දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ජූනි මාසයේ මේ ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඇහුවා. මම 2015 ජූනි මාසයේ 03 වෙනි දා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට තිබෙන ප්‍රශ්නය තමයි, සුමනදාස අමරසිංහ මහත්තයාද, විශ්වාස භංගයට නැකත හදලා දුන්නේ කියන එක. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා මුහුණ දෙන තත්ත්වය අපට තේරෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නමුත්, පාර්ලිමේන්තුව ගඳ ගස්සවලා තිබෙන තත්ත්වයක් තුළ ඔබතුමාටත් ඒ ගඳ තිබෙනවා. අන්න ඒක විතරක් මතක තියා ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ වංචාව පිළිබඳ ගඳ අද ලංකාව පුරා සහ ලෝකය පුරා ගිහිල්ලා ඉවරයි. ඊයේ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා කියනවා, "රටට විදේශ ආයෝජකයන් එන්නේ නැහැ"යි කියලා.

රටට විදේශ ආයෝජකයින් ඒවිද, මුදල් පිළිබඳව මහ බැංකුවේ ලොකුම වංචාව සිදුවන කොට, රුපියල බාල්දු වෙන කොට, මූල්‍ය ක්‍රමය අස්ථාවර වන කොට, රටේ නීතිය කඩා වැටෙන කොට, මහජනයාට ජීවත් වෙන්න බැරි වෙන තත්ත්වයක් ඇති වෙන කොට? අද අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් මේ රටේ ඇති වී තිබෙන තත්ත්වය ඒකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳයි, ගරු කථානායකතුමනි. මම අවසාන කරන්නම්. 2015 ජූනි මාසය වනවිට ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා -එතුමා මේ අවස්ථාවේ මේ සභා ගර්භයේ නැහැ- මේ පැත්තේ හිටියේ. එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා මේ සම්බන්ධව පැමිණිල්ලක් කළා. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා එදා විපක්ෂ නායකයා හැටියට මේ පිළිබඳව අපි ඔක්කෝම එක්ක එකතු වෙලා විශේෂ යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ පිළිබඳව එදින හැන්සාඩ් වාර්තාවේ සඳහන් වී තිබෙනවා. එදා ඒ වාර්තාවලින් ඉදිරිපත් කළ කරුණු මතයි අද මේ ඔප්පු වෙලා තිබෙන භයානක වංචාව පිළිබඳව සඳහන් කරන්නේ.

ඊට පස්සේ අර්ජුන මහේන්ද්‍රන් මහතාව යළිත් පත් නොකර, අලුත් කෙනකු මහබැංකු අධිපති හැටියට පත් කරන්න කියලා රටේ ජනතාව, ඒකාබද්ධ විපක්ෂය කරන ලද තදබල ඉල්ලීම පරිදි, අග්‍රාමාත්‍යතුමා නිර්දේශ කර යැවූ අර්ජුන මහේන්ද්‍රන් නොව දැන් ඉන්න මහබැංකු අධිපති කුමාරස්වාමී මහතාව පත් කරන්න ජනාධිපතිතුමාට සිදු වුණා. ඊට පස්සේ මේ වංචාව පිළිබඳව දිගින් දිගටම ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු අපේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළත්, files හංගා තිබුණු නිසා නීතිපති අංශයෙන් කිසිම දෙයක් සිදු වුණේ නැහැ. ඊට පස්සේ ජනාධිපතිතුමාට සිද්ධ වුණා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු චිත්‍රසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කොමිසමක් පත් කරන්න. දැන් ඒ කොමිෂන් සභා වාර්තාවෙන් හෙළිදරව් වෙලා තිබෙනවා, අර්ජුන මහේන්ද්‍රන් සහ පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගම මේ මහා වංචාව සිදු කර තිබෙන බවත්, ඔවුන්ගේ වත්කම් වහා අත්පත් කරගත යුතු බවත්, ඔවුන් වංචාවෙන් කළ ආයෝජන වහා අත්පත් කරගත යුතු බවත්, ඔවුන් අධිකරණය වෙත ගෙන්වා නීතිමය කටයුතු කළ යුතු බවත්. ඒ නිසා අග්‍රාමාත්‍යතුමා ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු හැටියට අර්ජුන මහේන්ද්‍රන් මහතාව මහබැංකු අධිපති හැටියට පත් කිරීමේදී වගකීම ගත්තා නම්, ඔහු ලංකාවේ ආර්ථිකයට, මූල්‍ය ක්‍රමයට, බැංකු ක්‍රමයට, මහ බැංකුවට කළ හානිදායක තත්ත්වය පිළිබඳවත්, එහි ප්‍රතිඵලයක් ලෙස මුළු මහත් ආර්ථිකය තුළ ඇති වී තිබෙන විනාශය ගැනත් වග කිව යුත්තේ අග්‍රාමාත්‍යතුමායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට පැවරී තිබෙන්නේ විශ්වාසය දිනා ගත හැකි කෙනකු අග්‍රාමාත්‍යවරයා හැටියට පිළිගැනීමයි.

ඒ විතරක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විශ්වාසය නැති වුණු තැන ඔහු ඉවත් කරන්න පාර්ලිමේන්තුවට පුළුවන්. අගමැතිවරයා කෙරෙහි විශ්වාසය නැති වූ තැන විශ්වාස භංගයකින් ඉවත් කළ හැකියි. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරයාට බලය තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, වෙනත් කරුණු යටතේ වුවද ඉවත් කරන්න. ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වී තිබෙනවා. මා ඒ ව්‍යවස්ථා එකින් එක කියවන්නේ නැහැ.

මට මතකයි මේ සම්බන්ධයෙන් අපි ලබාගත්ත විවාදයේදී විරුද්ධ පක්ෂයේ නායකත්වය දරන ගරු සම්පන්දන් මැතිතුමා කළ කථාව. එතුමා පැහැදිලිව කිව්වා, වංචාවක් කරලා තිබෙනවා නම්, හොරකමක් කරලා තිබෙනවා නම්, රටේ මහ බැංකුවට හානියක් කරලා තිබෙනවා නම් ඒ ගැන කටයුතු කළ යුතුයි; ආණ්ඩුව වග කිව යුතුයි කියලා. අද එතුමා මොනවා කියාවිද කියා මම දන්නේ නැහැ. මා ඉල්ලා සිටිනවා, මේ මහා අපරාධය ලංකා පාර්ලිමේන්තුව අනුමත නොකරන තත්ත්වයකට සියලුම ගරු මන්ත්‍රීවරුන් එකඟ වෙලා මේ විශ්වාසභංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්නය කියලා.

ගරු කථානායකතුමනි, 2015 ජූනි මාසයේ 03වැනි දා හැන්සාඩ් වාර්තාවේ 378වැනි තීරුව මම උපුටා දක්වනවා. එහි සඳහන් වන "Appointment of Mr. Arjuna Mahendran as Governor of Central Bank" යනුවෙන් මා විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ස්ථාවර නියෝග 23(2) යටතේ ඇසූ ප්‍රශ්නයට අදාළ මූලික කරුණු හත කියලා මගේ කථාව අවසන් කරනවා.

It states, I quote:

"(1) At the time of being appointed the Governor of the Central Bank, was Mr. Arjuna Mahendran a citizen of the Republic of Sri Lanka?

(2) Is he a citizen of Sri Lanka at present?

(3) Is he a citizen of any other country?

(4) Has he taken/made an oath/affirmation to any other country, renouncing loyalty to the Republic of Sri Lanka?

(5) Has he taken/made the oath/affirmation required by the laws of Sri Lanka before embarking upon the duties of the Office of Governor?

(6) Did he have the capacity to take/make the required oath/ affirmation in view of any conflicting oath/ affirmation to any other country?

(7) Does the Hon. Prime Minister agree that there are ample grounds for invoking Section 16 (c) of the Monetary Law which declares that the Governor can be removed if he has done any act or thing which, in the opinion of the President, is manifestly opposed to the objects and interests of the Central Bank and the Constitution of Sri Lanka?"

The Prime Minister answered the Question I raised that day, but he never answered these key questions I posed.

Today we are in 2018. After three years of public agitation, professionals' agitation, Parliamentary agitation, reports and commissions, no action has been taken to bring back Arjuna Mahendran to court. The Prime Minister and the Government have failed. The Prime Minster and the Government allowed him to leave the country.

අඩුම වශයෙන් ඒකවත් කරන්න ඕනෑකමක් අග්‍රාමාත්‍යතුමාට සහ ආණ්ඩුවට තිබුණේ නැහැ. ඒ තුළින් මේ මහා වංචාව පිළිබඳව කිසිම ක්‍රියාවලියක් සිදු කර නැහැ. මේ පාර්ලිමේන්තුව විසින් නිර්දේශ කරන ලද වාර්තා අනුව රට හෝ ආයතනය වෙනුවෙන් සාධාරණත්වයෙන් යුත් කිසිම පියවරක් ගන්නට කටයුතු කර නැහැ. එවැනි අග්‍රාමාත්‍යතුමෙක් ඉල්ලා අස් විය යුතුය කියන එක කියන්නේ නැතිව අපි කියන්නේ "විශ්වාසයක් නැහැ" කියලායි. ඒ නිසා එතුමාට එරෙහි විශ්වාස භංගත්වය සාර්ථක කර ගැනීම සඳහා පක්ෂ භේදයෙන් තොරව සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා.

තමුන්නාන්සේලාට වෙන වෙන යෝජනා එන්න පුළුවන්. ඒ යෝජනාවලට වඩා මේ දෙස මුළු රටම බලාගෙන ඉන්නවා; මුළු රාජ්‍ය සේවයම බලාගෙන ඉන්නවා; සියලුම මූල්‍ය ආයතන සහ ජාත්‍යන්තරය බලා ගෙන ඉන්නවා. ආර්ථිකය කඩා වැටිලා. මේ රට අරාජික වුණු රටක් බවට පත්වෙලා. වැඩක් කර ගන්න බැරි තැනට ලංකාවම වැටිලා. ඒ කනගාටුදායක තත්ත්වයෙන් ගොඩ එන්න නම් මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දීලා අද සවස ඒ විශ්වාස භංග යෝජනාව; ජනතාවගේ නාමයෙන් ගෙන එන ලද මේ යෝජනාව ජයග්‍රහණය කරවන්නය කියලා ආයාචනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 10.23]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර වශයෙන් අභිශයින්ම වැදගත් වන්නා වූ ඒ වාගේම ජාතික වශයෙන් ඉතාම ප්‍රයෝජනවත් හා වැදගත් වන්නා වූ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව මම ස්ථිර කරනවා. මේ රටේ මිලියන 22ක් වූ මහා ජනතාවගේ හෘදය ස්පන්දනය තේරුම් ගන්න, හෘදය සාක්ෂියට අවනතව කටයුතු කරන මේ සභාව තුළ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඊට පක්ෂව ඡන්දය පාවිච්චි කරන්න කියලා ඉල්ලා සිටිමින් ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම ඒ යෝජනාව ඉතාම ගෞරවයෙන් ස්ථිර කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.24]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මගේ මිත්‍ර දිනේෂ් ගුණවර්ධන මැතිතුමා බොහොම අමාරුවෙන් යහළුවාට විරුද්ධව අද කථා කෙරුවා. එතුමාගේ වෙනදා තිබුණු ස්වරය අද තිබුණේ නැහැ. විවාදය පටන් ගන්න කොටම හුළං බැහැලා. [බාධා කිරීම්] හුළං බැහැලා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධුරය භාර ගත්ත හැම අවස්ථාවකම කෝප් කමිටුවේ සභාපතිකම දුන්නේ විපක්ෂයට. එතුමා 2002දී අගමැති වෙලා ඉන්න කාලයේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා කෝප් කමිටුවේ සභාපතිතුමා හැටියට පත් කෙරුවා. ඒ පළමුවැනි වතාවටයි. චන්ද්‍රිකා මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා රට පාලනය කරපු අවුරුදු 20 තුළම කෝප් කමිටුවේ සභාපතිකම දැරුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. නමුත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අලුත් ආදර්ශයක් දෙමින් 2002දී එතුමා අගමැතිතුමා වුණායින් පස්සේත්, යහ පාලන ආණ්ඩුවේ අගමැති වුණායින් පස්සේත් කෝප් කමිටුවේ සභාපති ධුරයට පත් කෙරුවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එපමණක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව තුළ වෙනදා උපදේශක කාරක සභාවේ මූලාසනයට එන්නේ ආණ්ඩුවේ ඇමතිවරයෙක්. ඒ වෙනුවට Sectoral Oversight Committees හදලා, ඒ Committeesවල සභාපතිකම් ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දුන්නා. මෙහි අරමුණ වූයේ ආණ්ඩුවට හංගන්න දෙයක් නැහැ කියන විශ්වාසයයි. මේ බැඳුම්කර සිද්ධිය එනකොට ගරු අගමැතිතුමා පත් කරපු කෝප් කමිටුවේ සභාපති හැටියට හිටියේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක්. දින 150ක් විතර බැඳුම්කර සිද්ධිය ගැන පරීක්ෂා කෙරුවා; වාර්තාවක් දුන්නා. නමුත් අගමැතිතුමාගේ නම ඒ වාර්තාවේ කිසිම තැනක සඳහන් වෙන්නේ නැහැ. එතුමා මේ සිද්ධියට සම්බන්ධයි කියලා කිසිම තැනක සඳහනක් නැහැ. එතකොට කොහොමද විශ්වාස භංගයක් ගෙනෙන්නේ?

පාර්ලිමේන්තු "කෝප්" කමිටුවෙන් සකස් කරන ලද වාර්තාවේ ගරු අගමැතිතුමා ගැන වචනයක්වත් සඳහන් වන්නේ නැත්නම් තමුන්නාන්සේලා කොහොමද විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ? ඊට පස්සේ, ජනාධිපතිතුමා ඒ ගැන ජනාධිපති කොමිසමක් පත් කළා. මා හිතන විධියට ඒ කොමිසමත් දින 100ක් විතර කරුණු විභාග කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ ජනාධිපති කොමිසමේ වාර්තාවේවත්, "කෝප්" කමිටු වාර්තාවේවත් ගරු අගමැතිතුමාගේ නම සහිත කිසිම සඳහනක් නැහැ. ගරු කථානායකතුමනි, අන්න ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව පුස්සක්. මොකද, "කෝප්" කමිටුවෙන් වත්, ජනාධිපති කොමිසමෙන් වත් ගරු අග්‍රාමාත්‍යතුමා වැරැදිකාරයකු කරලා නැහැ. ඒවායේ එතුමා ගැන වචනයක් වත් සඳහන් වන්නේත් නැහැ.

අනෙක් කාරණය මේකයි. ගරු කථානායකතුමනි, කොමිසම ගරු අගමැතිතුමාට එන්න කිව්වේ නැහැ. නමුත් බලන්න, කොමිසමේ සභාපතිතුමා ඒ ගැන කියන්නේ මොකක්ද කියලා. ඒ ගැන නොවැම්බර් මස 21වන අහඹරුවාදා පළවූ පුවත් පතක සඳහන් වනවා, "අගමැතිට කොමිසමේ ප්‍රසාදය" කියලා. එහෙම කියන්නේ, ඒ කොමිසමේ සභාපති. "පැමිණීම අනිවාර්ය නොවූවත්

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

දිවුරුම් ප්‍රකාශ දී තිබියදීත් අගමැතිගේ පැමිණීම විශේෂයි" කියා එහි සඳහන් වනවා. අගමැතිතුමා සාක්කි දෙන්න ගියා. එතුමා සාක්කි දෙන්න ගියා, කැමැත්තෙන්. "සාක්කි දෙන්න බැහැ" කියා එතුමා කිව්වේ නැහැ. එම පුවත් පත අනුව කොමිසමේ සභාපති මෙහෙම කියනවා:

"කොමිසමට අවශ්‍ය කරනු ලබන පැහැදිලිකිරීම් සිදුකර ගැනීම සඳහා අගමැතිතුමා ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වී කොමිසම හමුවට පැමිණීම පිළිබඳ කොමිසමේ ස්තුතිය අගමැතිතුමා වෙත පළකරන බව කොමිසමේ සභාපති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මහතා කොමිසම හමුවේ ප්‍රකාශ කළේය.

අගමැතිතුමා වෙත කොමිසම විසින් යොමු කරන ලද ප්‍රශ්න සඳහා එතුමා දිවුරුම් පෙත්සමකින් කොමිසම වෙත පිළිතුරු ලබාදී තිබුණ බව පැවසූ විනිසුරු චිත්‍රසිරි මහතා අගමැතිතුමාට යොමුකර තිබුණ විසිඅට වැනි ප්‍රශ්නයට අදාළ නිරවුල් කර ගැනීමට හා තවත් ප්‍රශ්න විස්සක් සම්බන්ධව පැහැදිලි කර ගැනීමට..."

ගරු අගමැතිතුමාගේ කැමැත්තෙන් ඒ කොමිසමට ගියේ. අසා තිබුණ ප්‍රශ්න ඔක්කෝටම එතුමා උත්තර දුන්නා. ඕනෑ නම් එතුමාට යන්නේ නැතිව ඉන්න තිබුණා. අවුරුදු 20ක් රට පාලනය කළා, පොදු ජන එක්සත් පෙරමුණ සහ මහින්ද රාජපක්ෂ මහත්මයා. ඒ කාලයේ කොයි අගමැතිවරයාද කොමිසමකට ගිහින් සාක්ෂියක් දුන්නේ? කොයි ඇමතිවරයාද ගියේ?

එම ලිපියේ මෙහෙමත් කියනවා:

"අගමැතිතුමා තම වටිනා කාලය කැපකරමින් කොමිසමට සහාය දක්වමින් අදාළ ප්‍රශ්නවලට දිවුරුම් ප්‍රකාශ මගින් පිළිතුරු සැපයීමෙන් අනතුරුව වැඩිදුර නිරවුල් කර ගැනීම සඳහා කොමිසම වෙත පැමිණීම පිළිබඳ කොමිසමේ විශේෂ ස්තුතිය පිරිනැමේ."

කොමිසම විසින් ගරු ඇගමැතිතුමාට දිගින් දිගටම ස්තුති කළා. "ක්ෝප්" වාර්තාව මඟින් අගමැතිතුමා වැරදිකාරයා වෙලා නැහැ. එහි එතුමා පිළිබඳව වචනයක්වත් නැහැ. ජනාධිපති විමර්ශන කොමිසන් වාර්තාවේත් එතුමා ගැන සඳහනක් නැහැ. එතකොට කොහොමද විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ? මොන වාර්තාවෙන්ද එතුමා වැරදිකාරයා කරලා තිබෙන්නේ? මොන මණ්ඩලයෙන්ද? ඒ වාගේම අගමැතිතුමා ඒ ප්‍රශ්න 48ටම දිවුරුම් පෙත්සම් හරහා පිළිතුරු දීලා තිබෙනවා. ඒ දිවුරුම් පෙත්සම් කියැවීමෙන් පසු කොමිසම තේරුම් ගත්තා, ඇත්ත වශයෙන්ම අගමැතිතුමා මේ සිද්ධියට කිසිසේත්ම සම්බන්ධකම් නැති බව.

මගේ මිත්‍ර ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා අර්ජුන් මහේන්ද්‍රන්ගේ පත්වීම ගැන කථා කළා. කොමිසම අර්ජුන් මහේන්ද්‍රන් ගැන කියපු දේ මම ඔබතුමාට කියවන්නම්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. කොමිසම කියපු දේ තමයි මම මේ කියන්න යන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අර්ජුන් මහේන්ද්‍රන් මැතිතුමාගේ පත්වීම නීතියට පටහැනි පත්වීමක් නොවෙයි කියලා ඒ කොමිෂන් සභාවෙන් කියන්නේ. මම නොවෙයි එහෙම කියන්නේ. ඒ Commission එක කියන්නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. කොමිසමේ වාර්තාවේ 941 වන පිටුවේ මෙහෙම කියනවා:

"Mr. Arjuna Mahendran was appointed the Governor of the CBSL, on 23rd January 2015 and, thus, the appointment of Mr. Mahendran was made before the period of our Mandate commenced and we have no jurisdiction to determine the merits or demerits of that appointment."

අවසාන වශයෙන් 942 පිටුවේ මෙහෙම කියනවා:

"In these circumstances, the question of whether or not the fact that, Mr. Mahendran was not a Citizen of Sri Lanka precluded him from being appointed the Governor of the CBSL was not a 'Question of Law'..."

ඒ නිසා ඒක නීති තර්කයක් නොවෙයි. ඔහු ලංකාවේ පුරවැසියෙක්ද, නැද්ද කියන එක නීති තර්කයක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලංකාවේ පුරවැසියෙක් නොවන කෙනෙකුට ලංකාවේ මහ බැංකුවේ අධිපති හැටියට කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම ඇමතිවරයකු හැටියට ඔබතුමා අනුමත කරනවාද? ලංකාවේ අද තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව තමයි එතුමා දිවුරුම් දෙන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ Commission එක කියන එක තමයි මම කිව්වේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතකොට ගෝඨාභය රාජපක්ෂ ඇමෙරිකානු පුරවැසියෙක් නොවෙයි ද? [බාධා කිරීම්] දැන් ලෙව කකා යන්නේ. එතුමා ඇමෙරිකානු පුරවැසියෙක් නොවෙයිද? [බාධා කිරීම්] අනේ නිකම් ඉන්න. [බාධා කිරීම්]

Sir, I will take two more minutes.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දිගන සිද්ධියත් මේ විශ්වාසභංග යෝජනාවට අවසාන මොහොතේ ඇතුළත් කරලා තිබෙනවා. දිගන සිද්ධිය සම්බන්ධයෙන් කවුද අද අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ? අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ "පොහොට්ටුවේ"

මන්ත්‍රීවරු! "පොහොට්ටුවේ" මන්ත්‍රීවරු 6දෙනෙක් ඒ සිද්ධියට සම්බන්ධයි. දැනට ඒ තුන්දෙනෙක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඔවුන් "පොහොට්ටුවේ" මන්ත්‍රීවරු. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේ සිද්ධිය පිටුපස්සේ ඉඳගෙන උදවු කළා. [බාධා කිරීම්] පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් උදවු කළා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමා නොවෙයි. මොකද, ඔබතුමා ඉන්නේ නාවලපිටියෙ නේ. [බාධා කිරීමක්] ඒ සාක්ෂි ලබාගෙන ඒ අනුව අපි කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම මම කියන්න ඕනෑ, එහිදී පොලීසියෙන් අඩු පාඩුවක් සිදුවූ බව. ගරු කථානායකතුමනි, මේ සිද්ධිය වෙන්න දවස් දෙකකට කලින් පිටස්තර පුද්ගලයන් මහනුවරට ආපු බව පොලීසිය දැනගෙන හිටියා. මම දුරකථනයෙන් කථා කරලා පොලීසියට කිව්වා, "මේ වාගේ පුද්ගලයන් ඇවිල්ලා ඉන්නවා, මේ අය ගැන සෝදිසියෙන් ඉන්න." කියලා. නමුත්, පොලීසිය ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළේ නැහැ. සමහර පොලිස් ස්ථානවල අය හුඟක් මහන්සි වුණා; සමහර පොලිස් ස්ථානවල අය අහක බලාගෙන හිටියා. ඒක ඇත්ත. ඒක අපි පිළිගන්නවා. නමුත්, මේ සිද්ධිය පත්තු කෙරුවේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු කියන එක මම නිර්භයව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම, මගේ කථාවට අදාළ ලිපි ගණනාවක් ඔබතුමාගේ අවධානයට යොමු කරවමින් මා **සභාගත*** කරනවා. මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[10.34a.m.]

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Mr. Speaker, we are debating today a Motion of No-Confidence against no less a person than the Prime Minister and the Motion substantially deals with the question of corruption. Corruption has been the worst disease that has afflicted our country. There was a time when there was no complaint of corruption. But, in recent years, corruption has been the worst disease. As I said before, that has afflicted the country and it must be eradicated completely. There can be no question about it. The roots of corruption must be eradicated, and I think there is a general agreement that politicians probably constitute the roots of corruption. I think that needs to be addressed and that needs to be eradicated. Any complaint of corruption must be fully investigated and the severest punishment must be awarded to persons found guilty of corruption. There can be no compromise whatever in regard to that position.

In regard to the Central Bank Bond scam, consequent to investigations, two persons are presently in custody. There has been a warrant issued against another person and investigations are proceeding. No one should be spared. The rule of law should be applicable to everyone whoever he might be: the rule of law can be no respecter of persons.

I will now refer to the Motion before the House, which is the Motion of No-Confidence against the Prime Minister based substantially on corruption. The Motion of No-Confidence seeks to implicate the Prime Minister with the Bond scam. Statements of actions by the Prime Minister of a general nature are sought to be used in an attempt to implicate the Prime Minister with the Bond scam. The wording of the Motion and the timing of the Motion are indicative of the pursuit of a political agenda rather than fixing responsibility in regard to the Bond scam.

The question must be raised as to why the wording is so vague, lacking in any specific charge against the Prime Minister in regard to the fraud pertaining to the Bond scam *per se.* Why should this Motion be brought now, at this point of time, is another question that I would like to pose to the House. The wording is too loose and too general in nature. It could be that the Prime Minister is facing this situation because of the confidence he placed in someone who has betrayed him. But, where is the evidence or charge against the Prime Minister of involvement in the Bond scam *per se?* Is the wording of the Motion so loose and so general because of lack of specific material against the Prime Minister in regard to the Bond scam? And, if that is so, in my submission, the Motion lacks credibility.

In regard to the timing of the Motion, Sir, this Bond scam occurred three years ago. It has been the subject of total public focus for a long period of time, from early 2015. Why has this Motion of No-Confidence been brought against the Prime Minister only now? I have a duty Sir, to answer some of the questions I have raised. I want to pose the question whether this Motion against the Prime Minister is the first step in a plan to bring down totally and completely the present Government. The President, His Excellency Maithripala Sirisena, was elected in January, 2015. The Prime Minister, the Hon. Ranil Wickremesinghe, was elected in August, 2015. They were elected on a certain mandate. What was that mandate? Firstly, the resolution of the national question which has plagued this country for the past 70 years. We have had a very cruel and wicked war that had raged in this country for a thirty-year period. The Thirteenth Amendment to the Constitution was enacted in 1988. It is found to be inadequate, insufficient and ineffective. During President Premadasa's time, there were steps to bring about new constitutional proposals. There was the Mangala Moonesinghe Select Committee, and there was a Report of that Select Committee with substantial consensus. Unfortunately, President Premadasa did not have a two-thirds majority and he was assassinated.

During President Chandrika Bandaranaike Kumaratunga's time, there were various steps taken from 1994 until the August, 2000 Constitutional Proposals. They were quite advanced and a very substantial improvement on what existed. Unfortunately, she had no two-thirds majority in Parliament and she could not get that through.

Then, during President Mahinda Rajapaksa's time, there was the All-Party Representative Committee appointed by

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

President Mahinda Rajapaksa. There was an excellent speech that he made at the inaugural meeting of the All-Party Representative Committee and the Experts' Committee. Much work was done. President Mahinda Rajapaksa made several public commitments in regard to new Constitutional Proposals. He made commitments to the international community, to the Secretary-General of the UN and to world leaders. Eventually, there were the Prof. Tissa Vitharana Proposals, which were also a great advance on what existed earlier.

Sir, the second item I would like to mention as a part of the mandate that was granted to President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe was to uphold democracy in this country and avoid this country moving towards totalitarianism and dictatorship. The enactment of the Nineteenth Amendment in this Parliament was the first step in that direction.

I think the third item in that mandate of significance was uplifting the economy so as to give our people a better quality of life, and eradication of corruption and waste was one aspect of that matter. These were the main issues during the campaign.

The President and the Prime Minister were elected on the democratic verdict of the people for certain fixed periods of time under the Constitution. The opposite camp was defeated in both the Elections. Everyone knows who were defeated. What was the mandate the people gave? I think, Sir, the mandate the people gave is best reflected in the opening address made by His Excellency President Maithripala Sirisena when he addressed Parliament on the 01st of September, 2015 when he outlined and made an official Statement on Government Policy in Parliament.

Sir, I would like to read from that Statement of Policy defining the mandate, which His Excellency President Maithripala Sirisena made in Parliament. The English text of the address to Parliament by His Excellency the President states, I quote:

> "I presume that this new Parliament marks an important turning point in the Sri Lankan political history. Since we gained Independence, we had experiences only about coalition governments formed by one main party with the support of other small parties….."

He referred to the fact that in this Parliament the two main Parties have come together.

It further states, I quote:

> "The main objective of the consensual government that is formed based on the concept of national government is to build reconciliation among all the ethnic groups and achieve social and economic development simultaneously and achieve a high human development enabling us to face the new world that will dawn by 2020 and to face the national and international challenges in the similar manner."

He went on to say, I quote:

> "Hon. Speaker, the identity of a nation or a country is based on its Constitution. That is why a Constitution is considered supreme. During the 60 years after Independence, we have adopted three Constitutions. Yet, it is unfortunate that we have not been able to adopt a Constitution which enables all of us to agree as a single nation."

His Excellency President Maithripala Sirisena clearly stated that we have not been able to agree upon a Constitution which made us a nation.

During the course of his speech he further said, - I will avoid quoting the exact words to save time, Sir. - "We, Parliamentarians comprising of communities that are Sinhala, Tamil, Muslim, Burgher, Malay and *Adivasis* must live in harmony. There must be a reconciliation. We must coexist and I, as President am dedicated to the achievement of these objectives." He concluded his speech, Sir, on the same lines.

I quote:

> "From now on, I make an appeal to all of you, with respect, to pay your attention, as to how the consensus-based co-operation of both the people's representatives and all the parties that represent Parliament founded on the collaboration of the two of major political parties could be utilized in favour of the progress and forward march of the nation in a way the proper political culture which is being developed is further established."

He advocated that both the Parties come together in order to constitute the people of this country - of the Nation - and to give them a new Constitution.

I will not quote extensively from that speech, Sir, for lack of time. I will move on to my next point.

At the Local Authorities Elections held in February, 2018, a new political formation, Sri Lanka Podujana Peramuna, has done better than the President's SLFP or the UPFA or the Prime Minister's UNP or the UNF. It is our view that inadequate performance by the Government in the first half of their term was the cause of that result. If they performed better in the remaining two-and-a-half years, public disenchantment can change. Unfortunately, the Sri Lanka Podujana Peramuna does not want that to happen. They want to first defeat the Prime Minister and the next target will be the President. They want the Government brought down. We want the Government to implement the mandate given to it by the country in January and August, 2015. In these circumstances, how can we possibly support this No-Confidence Motion, Sir, when, particularly in relation to the Bond scam, the Motion does not reveal anything specific against the Prime Minister? The true intentions of the Sri Lanka Podujana Peramuna are shrouded in an environment of prejudice based upon the Bond scam. We cannot fall a victim to such machinations and allow ourselves to be used to achieve their political objectives.

We would call upon them to cooperate in the achievement of what is contained in the mandate that was granted to both the President and the Prime Minister. All of you in the Joint Opposition or most of you were Members of the Chandrika Bandaranaike Kumaratunga Government; you were Members of the Mahinda Rajapaksa Government and you were members of the Hon. (Prof.) Tissa Vitharana's All-Party Representatives Committee. You played a role in the formulation of all those constitutional proposals. Many of you have participated in that; President Mahinda Rajapaksa has

definitely participated both in President Chandrika Bandaranaike Kumaratunga's Proposals and the Proposals during his own time.

We, therefore, have to cooperate, Sir, in regard to the making of a new Constitution. This Parliament has adopted a Resolution converting itself into a Constitutional Assembly unanimously with no one opposing it to frame a new Constitution. We have done much work on that; the Steering Committee, the Subcommittees have come up with their Reports. That process must continue if you want this country to succeed economically. We are a small country, but we are both militarily and economically very strategically located in the Indian Ocean region. We can become the economic hub of the Indian Ocean area. We can have access to wide and large markets if our economy can improve and our economy can improve only if there is genuine peace in this country and if all the people in this country; whether they be Tamils, Muslims, Sinhalese, Burghers, Malays or whomever are able to live as equal citizens. So, I think Sir, your duty must be to cooperate with the Government and join together in keeping with the unanimous resolution we adopted to frame a new Constitution and we should move forward in regard to that matter. That is necessary in the interest of this country and we have to work together.

Sir, there is a view that is sought to be spread very unfortunately that we are trying to support the UNP against the SLFP. I want to put on record certain facts to disprove that. Over a period of time, in 1960 March, the UNP was installed in power. They did not have an absolute majority. We voted with the SLFP to defeat the 1960 March Government of the UNP. In 1960 July, the SLFP came into power. Between 1965 and 1970 we cooperated with the UNP to run a Government. In 1994 when Madam Chandrika Bandaranaike Kumaratunga was the SLFP candidate for Presidency and Mr. Gamini Dissanayake, for whom I have a lot of personal regard and respect, was the UNP candidate, we supported Madam Chandrika Bandaranaike Kumaratunga, the SLFP candidate. In 1999 when Madam Chandrika Bandaranaike Kumaratunga was the SLFP candidate against Prime Minister Ranil Wickremesinghe, we supported Madam Chandrika Bandaranaike Kumaratunga against the UNP. The late Mr. S. W. R. D. Bandaranaike was the first political Sinhala leader to sign a pact with the acknowledged Tamil leader, Mr. S. J. V. Chelvanayakam in 1957. He wanted to establish regional councils and he was prepared to create a Tamil-speaking region in the North-East under the Bandaranaike-Chelvanayakam Pact.

When the UNP Government sought to deprive Mrs. Sirimavo Bandaranaike of her civic rights in the 1977 Parliament we resolutely defended Mrs. Bandaranaike and opposed that Motion. We were under great pressure from UNP leaders not to defend her. I remember I was a new Member of Parliament having come to Parliament for the first time in 1977. I myself very strongly defended her.

Therefore Sir, the view that we are with the UNP and against the SLFP has no foundation whatever. My late leader Mr. S. J. V. Chelvanayakam always told me, "Sampanthan, we must work with any Sinhala political party, with the confidence and support of the Sinhala people, prepared to resolve our question."

In that respect, probably the SLFP has a greater contact with the Sinhala people than even the UNP. So, we are concerned, Sir, in the interests of this country, in the interests of all the people in this country in working together with the two main political parties, we would like all of us to come together. I will make an appeal to the Hon. Chamal Rajapaksa, the Hon. Dinesh Gunawardena and the Hon. Dullas Alahapperuma, who are senior SLFP members, we must come together and resolve this problem that the country is facing. This country has a different future; this country has a different destination. We must not lose our way. We must bring about permanent peace in this country, permanent amity in this country and permanent unity in this country. Constitute the people of this country the Sinhalese, the Tamils, the Muslims, the Burghers, the Malays into a Sri Lankan nation and move forward towards prosperity. If we do not want to do that and if we want to falter, then nobody can save you and eventually nobody will save you.

So, I would like to appeal, Sir, to all my Friends in this House, not to go against the verdict of the people that was given in 2015 to both President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe, but to come together in a spirit of cooperation in the best interest of this country to resolve this country's vital issues.

I thank you, Sir.

[පූ.භා.11.03]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)

(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කෙරෙහි විශ්වාසය පළ කිරීමේ අවස්ථාවක් ලබා දීම සම්බන්ධව මාගේ මිත්‍ර කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඒකාබද්ධ විපක්ෂයට මුලින්ම මාගේ ස්තුතිය පළ කරන්න කැමැතියි. ඩලස් අලහප්පෙරුම මැතිතුමා අතන හිනා වෙවී සිටින බව මට පෙනෙනවා. මහින්දානන්ද මැතිතුමාත් එතැන සිටිනවා.

ගරු කථානායකතුමනි, 1999 දෙසැම්බර් මාසයේ 21 වැනි දා ජනාධිපතිවරණය පැවැත් වුණු බව මට මතකයි. ඊට මාස 10කට විතර ඉස්සෙල්ලා අපේ මාධ්‍ය කමිටුව -ප්‍රචාරක කමිටුව- මුළු රටෙම ගමක්-ගමක් ගණනේ, අස්සක්-මුල්ලක් නෑර "රනිල්ට බැහැ." කියලා පෝස්ටරයක් ගැහුවා. යූඇන්පී අයටත් ඒක මතකයි, අපටත් මතකයි. ඇත්තවශයෙන්ම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය යළි පත්වීමට විශාලතම අභියෝගය තිබෙන්නේ රනිල් වික්‍රමසිංහගෙන් කියලා අපි හොඳින්ම දැනගෙන සිටි නිසා තමයි ඒ වෙලාවේ අපි "රනිල්ට බැහැ." කියලා පෝස්ටරයක් ගැහුවේ. මොකද, කවදාවත් බැරි මිනිහෙකුට කෝටි ගණනක් වියදම් කරලා පෝස්ටර් ගහන්න වුවමනා නැහැ. රනිල්ට පුළුවන් නිසා තමයි අපි

[ගරු මංගල සමරවීර මහතා]

එදා "රනිල්ට බැහැ." කියලා පෝස්ටර් ගහලා, ගහලා ඒ මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කළේ. එම සිදුවීම වෙලා එන අවුරුද්දට අවුරුදු 20ක් වෙනවා. අද මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමෙන් අපිට පැහැදිලිවම පෙනී යන්නේ, අවුරුදු 20කට පසුවත් මේ රටේ විශේෂයෙන්ම විපක්ෂයට තිබෙන ප්‍රධානතම දේශපාලන අභියෝගය වෙන කවුරුවත් නොවෙයි, රනිල් වික්‍රමසිංහ කියන එකයි. මම නම් දකින්නේ මේ ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් වඩා මීට වසර තුනකට ඉස්සෙල්ලා අපි පත් කරගත් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉලක්ක කරගත් විශ්වාස භංගයක් කියලායි.

මොකද, මේ රජයේ ප්‍රධාන ශක්තිය, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට දෝෂාභියෝගයක් ගෙනැත් එතුමා ගෙදර යවන්න තිබෙන ප්‍රධාන බාධකය, රනිල් වික්‍රමසිංහ සහ එක්සත් ජාතික පක්ෂයයි. රනිල් වික්‍රමසිංහව එළවාගෙන, එක්සත් ජාතික පක්ෂය දෙකට තුනට කැඩිලා ගියාට පසුව 2019 ඔක්තෝබර්, නොවැම්බර් මාස වන විට එන ජනාධිපතිවරණයේදී තමන්ට පහසු ජයක් ලබාගන්න පුළුවන් කියා සමහරු හිතනවා. අන්න ඒ නිසා තමයි මෙය එක්තරා දේශපාලන කුමන්ත්‍රණයක් ලෙස අපට හැඟෙන්නේ. "මෙය එක්තරා දේශපාලන කුමන්ත්‍රණයක පළමුවැනි පියවර විතරයි" කියලා සම්පන්දන් මැතිතුමා දැන් කිව්ව එකට මමත් එකඟයි. නමුත් රටේ වාසනාවකට, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු අයගේ අවාසනාවකට මෙය දැනටමත් පරාද වෙලා ඉවරයි.

ගරු කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා 2014දී කළ කැපවීම මේ වෙලාවේ අපි මතක් කරන්න ඕනෑ. අපට මතකයි, -අපේ මලික් සමරවික්‍රම ඇමතිතුමා හොඳට දන්නවා,- චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පොදු අපේක්ෂකත්වය දෙන්න කියපු අවස්ථාව. ඒ වනතුරුම රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඡන්දය ඉල්ලන්න සූදානම් වෙලා හිටියේ. නමුත් කිසිම කුහකකමක් නැතිව එතුමා ඒ යෝජනාව පිළිගත්තා. ඊළඟට මම කියන්න යන කාරණය නිකම් බොරුවට කියනවා නොවෙයි. බොහෝදෙනා මේ ප්‍රධාන පක්ෂ දෙකෙන් ජනාධිපති අපේක්ෂක වෙන්න කැමැති මොකද? 2005 මැතිවරණයට ඉස්සර වෙලා මට මේ කාරණය කිව්වේ මහින්ද රාජපක්ෂ මැතිතුමායි.

එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපේක්ෂකත්වය ලබා දීමට ප්‍රථමයෙන් තිබුණු අපේ මධ්‍යම කාරක සභා රැස්වීමේදී කථා කර කර ඉන්නකොට මහින්ද මට කියනවා, "මංගල, කොහොමහරි මේක අපි ගන්න ඕනෑ. මොකද, මේ වාගේ පක්ෂයක අපේක්ෂකයා වුණාම දිනුවත් දිනුම්; පරාද වුණත් දිනුම්" කියලා. මම ඇහුවා, "ඇයි එහෙම කියන්නේ?"කියලා. එතකොට කිව්වා, "ප්‍රධාන පක්ෂ දෙකේ අපේක්ෂකයා වුණාම පුදුම සල්ලි තොගයක් හම්බ වනවා. පැරදුණත් ඡන්දයෙන් පස්සේ පරම්පරා කීපයකට හරියන්න සල්ලි ටිකක් දාගෙන යන්න පුළුවන්" කියලා. අන්න එහෙම හිතලා අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් මේක ඕනෑමයි කියලා කියන්න තිබුණා.

මම මේ කාරණය කියන්නේ වරදක් පෙන්වන්න නොවෙයි, වමල් රාජපක්ෂ මැතිතුමනි. මොකද, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමයි මාව 1988දී දේශපාලනයට ගෙනාවේ. එතුමිය මම අදත් ඉතාම ආදරය කරන, ගරු කරන නායිකාවක්. නමුත් ඔබතුමා මට වඩා හොඳින් මේ කාරණය ගැන දන්නවා. 1988 ප්‍රේමදාස, ජනාධිපතිවරණයට මුහුණ දෙන අවස්ථාවේදී අපි Democratic People's Alliance - DPA- කියලා පොදු අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වුවා. ගරු රවුෆ් හකීම් මැතිතුමනි, ඔබතුමාගේ නායක අෂ්රොෆ් හිටපු ඇමතිතුමා ඒ අවස්ථාවේ හිටියා. ලිබරල් පක්ෂයේ නායක චානක අමරතුංග හිටියා. ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් පවා පොදු අපේක්ෂකයෙකු වෙනුවෙන් සාකච්ඡා කළා. වාමාංශික පක්ෂ එම සාකච්ඡාවට සහභාගි වෙලා හිටියා. ඒ අය හැමෝම මැතිනියට කිව්වා, "පොදු අපේක්ෂකයෙකු හැටියට වෙන කවුරු හෝ දමමු. ඔබතුමිය ඇරෙන්න" කියලා. නමුත් එතුමිය ඊට එකඟ වුණේ නැහැ. එතුමිය ඒ අවස්ථාව වෙන කොටවත් දන්නේ නැහැ, එතුමියම පොදු අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදී 1982දී කරපු දෙයම කරන්න තිබුණා. 1982 හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි වුණු වෙලාවේ අපේක්ෂකත්වය ගත්තා. ඒ වෙලාවේදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කළේ මොකක්ද? තමන්ගේම අපේක්ෂකයා දාලා පැරැද්දුවා. එතුමාව පරද්දන්න පුළුවන් හැම දෙයක්ම කළා. නමුත් එහෙම කිසි දෙයක් අපේ අගමැතිතුමා කළේ නැහැ. මම කලිනුත් කිව්වා වාගේ එතුමා කිසිම කුහකකමකින් හා ලෝබකමකින් තොරව කටයුතු කරනවා. එක්සත් ජාතික පක්ෂයේ යන්ත්‍රණයම එකතුවෙලා, මෙතැන ඉන්න හැම සංවිධායකවරයෙකුම -එකා නෑර- දිවා රෑ නොබලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා බවට පත් කරන්න කටයුතු කළා.

අන්න ඒ කාරණය අපි හැම අවස්ථාවේදීම මතක තියා ගන්න ඕනෑ. ඒ වාගේම ඒ වෙලාවේ එතුමාට පුළුවන් වුණා, අනෙකුත් පක්ෂ එක්කත් කථා කරලා, විශේෂයෙන්ම TNA සංවිධානය එකතු කරගෙන, ජනතා විමුක්ති පෙරමුණේ වක්‍ර සහයෝගයත් ලබාගෙන, මුස්ලිම් කොංග්‍රසය ඇතුළු අනෙකුත් මුස්ලිම් පක්ෂත් එකතු කරගෙන, සිවිල් සමාජය එකතු කරගෙන ශ්‍රී ලංකාවේ මෑතකදී ඇති වූ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයට නායකත්වය දීලා කටයුතු කරන්න. එතුමා ඒ සියලු දෙනා 2015 විප්ලවය සඳහා යොමු කළා. එතුමා අන්න ඒ වාගේ දක්ෂ දේශපාලනඥයෙක් කියන එක අපි 1999දී දැනගෙන හිටියා වගේම අදත් ඒ බව එතුමා ඔප්පු කරලා තිබෙනවා. නමුත් මේ රටේ ජනතාව දෙවතාවක්ම ප්‍රතික්ෂේප කරපු දේශපාලන අවතාර එතුමා ඉලක්ක කරගෙන මේ මුළු රජයටම එරෙහිව විශ්වාස භංගයක් ගෙනැල්ලා, මේ රට යළිත් වතාවක් අන්ධකාරය කරා, ආපස්සට ගෙන යන්න දරන උත්සාහයක් තමයි මේ විශ්වාස භංගය. දැන් මේ Treasury Bond කථාවක් අල්ලාගෙන මේ නායකයාට මඩ ගහනවා. ඇත්ත වශයෙන්ම Treasury Bond ගනුදෙනුවේදී එතැන හොරකමක් වෙලා තිබෙනවා කියලා මමත් හිතනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] ඉස්සෙල්ලාම මේ සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලුවේ මම නොවෙයි, හැමෝටම ඉස්සෙල්ලා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලුවේ අගමැතිතුමා. ඒ විතරක් නොවෙයි, මම තවත් කාරණයක් කියන්නම්. 2015 අගෝස්තු මාසයේ තිබුණු මහමැතිවරණයට ඉස්සෙල්ලා අගමැතිතුමා මලික් සමරවික්‍රම ඇමතිතුමාටයි, මටයි කථා කරලා කිව්වා, "අපි අලුත් ආණ්ඩුවේ කෝප් කමිටුවේ, ඒ වාගේම ගිණුම් කාරක සභාවල නායකත්වය ජනතා විමුක්ති පෙරමුණට ගන්න කියන්න ඕනෑ" කියලා. අපි ගිහිල්ලා ඇහුවා, ඔබතුමන්ලාට මතක ඇති. ඔබතුමන්ලා අපි වෙන වෙනම තරග කළත්, මම විහිළු කරලාත් කිව්වා, "ජේවීපී එක හොරු අල්ලන්න කොහොමත් දක්ෂයි. ඒ නිසා මේවා ගත්තොත් ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙනවා" කියලා.

දැන් සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා "කෝප්" කමිටුවේ ඉතාමත්ම හොඳ කාර්යයක් කරනවා. නමුත් මම අහනවා, අපි හොරකම් කරන්නම බලාගෙන ආපු ආණ්ඩුවක් නම්, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වැනි අයට කෝප් කමිටුවේ සභාපතිත්වය දෙනවාද කියා. විමල් වීරවංශ මහත්මයා සහ අනෙක් අය කෑ ගැහුවාට, අවුරුදු දහයම ඔබතුමන්ලා කළා වාගේ ආණ්ඩු පක්ෂයේ ගෝල බාලයෙක් දා ගෙන, ආණ්ඩු පක්ෂයේ

ඇමතිවරයෙක් දා ගෙන, හැම දෙයකටම "එහෙයි" කියන කෙනෙක් දාගෙන එම කමිටුව ගෙනියන්න අපටත් තිබුණා. අපටත් ඒක කරන්න තිබුණා. නමුත්, අපි එහෙම කළේ නැහැ. අපි, විශේෂයෙන්ම අගමැතිතුමා බලයට ආවේ මේ වංචා, මේ ක්‍රම නවත්වන්නයි. ඒවා සිදු වුණා කියලාත් අපි ඒවා යට ගැහුවේ නැහැ.

ඒ විතරක් නොවෙයි මේ Bond වංචාව කියලා කිව්වාට ඒ සල්ලි ඔක්කෝම බැංකුවේ freeze කරලා තිබෙනවා. ඇත්තවශයෙන්ම දැන් අලුත් නීති හදලා -නිලක් මාරපන ඇමතිතුමා දන්නවා ඇති ඔය නීති හදන්නේ කොහොමද කියලා- අපි ඒ freeze කරපු සල්ලි-

ගරු නිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப்பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Development Assignments and Minister of Foreign Affairs)
ඔක්කෝම ආපහු ගන්නවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපේ හිටපු නීතිපතිතුමා කියනවා, ඔක්කෝම ආපහු ගන්නවා කියලා. දැන් අපි නීති හදනවා. සතයක්වත් රටට අහිමි වෙන්න දෙන්නේ නැහැ. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, මගේ මිත්‍ර මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමති කාලයේ, නිවාඩ කබ්‍රාල් මහ බැංකු අධිපති කාලයේ අතුරුදහන් වෙච්ච ට්‍රිලියන ගණන් මුදල් ගැන තමුන්නාන්සේලා කථා නොකරන්නේ ඇයි ද කියලා. ඒ නිසා මේ යෝජනාව ඇත්ත වශයෙන්ම ජනතාව නොමහ යැවීමේ ඉතාමත්ම අසාර්ථක උත්සාහයක් හැටියටයි මම දකින්නේ.

ඒ විතරක් නොවෙයි, අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා මේ රට අරාජික රටක් කියලා. ඇත්ත වශයෙන්ම අපි බංකොලොත් වෙච්ච රටක්; ණයෙන් තැලුණ පොඩිවුණ රටක්. 2015දී අපි ආණ්ඩුව භාරගත් දා සිට මේ වසර තුනේදී අපි ලබා ගත්ත ජයග්‍රහණ, ආර්ථික ජයග්‍රහණ හැම එකකටම නායකත්වය දුන්නේ අපේ අගමැතිතුමා බව පැහැදිලිවම කියන්න ඕනෑ. 2015 ජනවාරි මාසයේ අපි බලයට ඇවිල්ලා සති දෙකක් යන්න කලින් 14වෙනි දා ඉඳලා යුරෝපීය සංගමයෙන් මත්ස්‍ය තහනමක් ඇති කළා, ඊට කලින් බලයේ සිටි තමුන්නාන්සේලාගේ වැරදි ප්‍රතිපත්ති නිසා. ඒ තමයි, ලංකාවේ ටූනා මාළු යුරෝපයේ විකිණීම තහනම් කළා.

මට මතකයි අගමැතිතුමා යුරෝපීය සංගමය සමඟ ඒ සම්බන්ධව සාකච්ඡා කළා. ඉස්සෙල්ලා මම ගියා. ඉන් පසුව එතුමා කීප වතාවක්ම ගියා. අපි ධීවර ඇමති ගරු මහින්ද අමරවීර මැතිතුමාගේත් සහයෝගය ඇතිව එම වසර ඇතුළතදීම ඒ මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තා. අපේ රටට GSP Plus සහනය නැති කිරීම නිසා factories ගණනාවක් වැහුණා. රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වුණා. රටට විශාල මුදලක් නැති වුණා. නමුත්, පසුගිය අවුරුද්දේ මැයි මාසයේ 22වැනි දා අපි යළි වතාවක් GSP Plus සහනය ලබා ගත්තා. ඒ විතරක් නොවෙයි ඒ නිසා මේ රටේ exportersලාට විශාල හයියක් වෙලා පසුගිය අවුරුද්දේ භාණ්ඩ මේ රටින් පිට රට යැවීමෙන් - export කිරීමෙන් - වාර්තාවක් පිහිටෙව්වා. මෙය අරාජික රටක් නම් පොඩ්ඩක් බලන්න, මේ කාලයේ අපේ ජයග්‍රහණ දිහා. අද "Mirror Business" පත්තරයේ පළ වෙලා තිබෙනවා, “Unemployment falls to 5-year low in 4Q17.” කියා. පස් අවුරුද්දක තිබුණු තත්ත්වයට වඩා අද විරැකියා මට්ටම අඩු වෙලා තිබෙනවා කියා කියනවා. ඊළඟට, සඳහන් වනවා, "Helped by higher apparel exports and agricultural activity.....” කියා. මම මීට පෙර කිව්වා වාගේ GSP Plus සහනය නිසා යළි වතාවක් රෙදිපිළි කර්මාන්තය සහ කෘෂි කර්මාන්තය දියුණු වෙලා තිබෙනවා. ඊළඟට, සඳහන් වනවා, “Labour force participation during 4Q17 at 54.1 per cent.” කියා. විශේෂයෙන්ම තරුණ කාන්තාවන්ගේ විරැකියාව ශීඝ්‍රයෙන් පහළ වැටිලා කියලා සඳහන් වනවා. In addition to that, Government finances had its first primary surplus in several decades. ලංකාවේ ප්‍රාථමික ගිණුම 1950 ගණන්වලින් පස්සේ - අවුරුදු 60කට විතර පස්සේ- ප්‍රථම වතාවට අතිරික්තයක් පෙන්නුවේ පසුගිය අවුරුද්දේයි. මෙම වසරේ පෙබරවාරි මාසය වන කොට උද්ධමනය - inflation- සියයට 3.2 දක්වා අඩු වෙලා තිබෙනවා.

Foreign reserves have reached the comfortable level of US Dollars 7.9 billion with a major contribution from earned reserves as opposed to borrowed reserves in the past.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Okay, Sir.

Money supply was brought under control with credit to the private sector moderating to a stable 14.7 per cent at the end of 2017 from 21.0 per cent a year ago. Market interest rates have declined by over 150 basis points during the last 18 months with the Prime Lending Rate falling from 12.5 per cent in mid-September, 2016 to 10.8 per cent by mid-March 2018. Already robust improvements in foreign investments with FDIs reaching a record level of US Dollars 1.7 billion in 2017, the highest since Independence, continued strong foreign interest in Sri Lankan equity and debt markets as well.

Export earnings also reached a record US Dollars 11.4 billion, growing by 10.2 per cent in 2017 enabled by GSP Plus. Greater improvements can be expected with the completion of trade agreements with India and China in addition to the recently signed FTA with Singapore.

The unemployment rate, as I mentioned earlier, has declined and in the fourth quarter of 2017, listed corporate earnings grew by 17.4 per cent. Even with adjustments for one-off earnings, the corporate profit growth was 8.7 per cent, indicating positive underlying economic activity in the economy. These macroeconomic gains - this is also important - were achieved whilst increasing public investment in social services. ඒ අය අධ්‍යාපනයට, සෞඛ්‍යයට ඉතා සොච්චමක් තමයි වියදම් කළේ. නමුත් අපි අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. The Government’s expenditure on education, higher education and skills development has increased from 1.9 per cent in 2014 to 2.4 per cent in 2017; ඒ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය 2014 වසරේ ඉඳලා මේ අවුරුද්ද වන විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට

[ගරු මංගල සමරවීර මහතා]

2.4 දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි ඊළඟ අවුරුද්දේදී ඒ ප්‍රමාණය තවත් වැඩි කරලා 2020 වසර වන විට එය සියයට 5ට ආසන්න අගයක් දක්වා ගෙන යනවා. Similarly, the expenditure on public health has increased from 1.39 per cent in 2014 to 1.74 per cent in 2017.

And finally, Sir, very briefly I would also like to just remind this House how the Prime Minister personally gave - [*Interruption*.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Minister, you got extra five minutes.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
Sir, I do not want to take too much of their time because those Hon. Members also have a lot to say.

The Hon. Prime Minister gave leadership to the Constitutional reform process and the transitional justice process. The Hon. Sampathan quoted a little while ago from the address to Parliament by the President having inaugurated the Constitutional Assembly on 01st September, 2015. The Hon. Prime Minister gave leadership to the process with vigour and dedication. Therefore, I request, as the Hon. Sampanthan did, for the Prime Minister to expedite the process and table the draft Constitution here in this House as early as possible this year. And also the transitional justice process, again to which the Hon. Prime Minister gave leadership, despite certain obstacles, is going forward now. As you know, the Office on Missing Persons has now been established and my Ministry has allocated Rs. 1.3 billion for its operationalization. At the moment, the new Commissioners are in the process of doing so and they will be going to meet the parents of the missing, especially the mothers, and get everything -

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(මාණ්පුමිකු රාජවරෝතයම් සම්පන්දන්)
(The Hon. Rajavarothiam Sampanthan)
They must do it faster.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මංගළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
Yes. In fact, we have a very dedicated new Chairman, Mr. Saliya Peiris, and I believe he will do a very good job. But, as you say, Hon. Sampanthan, we must move faster.

Then, the initial drafts of the Truth and Reconciliation Commission are now with the Hon. Prime Minister. We will be looking for it to be brought to the Cabinet and to Parliament, hopefully, during this year and also the reparations unit, I believe, is now being finalized.

ගරු කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. මා කලින් කිව්වා වාගේ අපේ අගමැතිතුමා කෙරෙහි තිබෙන විශ්වාසය පළ කිරීමට මේ මුළු පාර්ලිමේන්තුවටම අවස්ථාවක් ලබාදීම ගැන සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.11.27]

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාටත්, මෙම ආණ්ඩුවටත් විරුද්ධව ඉදිරිපත් වී තිබෙන විශ්වාස භංග යෝජනාවේදී ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් පළමුවන කථාව කරන්න මා සූදානම් වනවා. ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ සාකච්ඡාව පසුගිය සති දෙකකට පමණ ආසන්න කාලයක් තිස්සේ රටේ ප්‍රධාන දේශපාලන සාකච්ඡාව බවට පත් වී තිබුණා. නමුත් ඊට පෙර සිටම, ඒ මට්ටමේ උණුසුමක් ඇති වෙන්න කලින් සිටම, විශ්වාස භංග යෝජනාවක් භාර දීමට පෙර සිටම ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි අපේ ස්ථාවරය පැහැදිලිව ප්‍රකාශ කර සිටියා. විශ්වාස භංග යෝජනාවේ අඩංගු කරුණු දකින්නත් පෙර අපි පැහැදිලිව කිව්වා, මේ වර්තමාන පාලනය පිළිබඳව ජනතාවගේ විශ්වාසය පලුදු වී තිබෙනවාය කියලා. ජනතා විමුක්ති පෙරමුණ විධියට, අපට ඡන්දය දීලා තිබෙන මිනිසුන්ගේ බලාපොරොත්තු, නැත්නම් ඒ ජන වරම වෙනම එකක්. ඒ පදනම මත ඉඳගෙන, මෙම විශ්වාස භංග යෝජනාව දකින්නත් පෙර සිටම අපි කිව්වා, අපි මෙයට සහාය දෙනවා, ආණ්ඩුවට විරුද්ධව අපේ ඡන්දය ලබා දෙනවා කියලා.

ගරු කථානායකතුමනි, මට ලැබී තිබෙන වෙලාව තුළ මා කියන්න කැමැතියි, මේ විශ්වාස භංග යෝජනාව ජුදාස්ලා තුන් දෙනකු පිළිබඳ කථාවක් බව. මේක පාවාදීම් තුනක් පිළිබඳ කථාවක්.

රනිල් වික්‍රමසිංහ මැතිතුමාට විරුද්ධව මේ විශ්වාස භංගය ගෙනෙන කණ්ඩායමේ අරමුණු මොනවා වුණත්, එය ගෙනෙන පදනම කුමක්ද? රනිල් වික්‍රමසිංහ මහතා පාවා දී තිබෙන්නේ කුමක්ද? එතුමා පාවා දී තිබෙන්නේ, එතුමාගේ ජන වරම. ඒ නිසායි එතුමාට මේ විශ්වාස භංගය සුදුසු වෙන්නේ. එතුමා බලයට පත් වුණේ, විශේෂයෙන්ම ඉතා අන්ත දූෂිත, මඡර, රාජපක්ෂලාගේ කළු දශකයක පීඩාවෙන් ජනතාව පීඩා විඳිද්දී, ඒකට විරුද්ධව පොදු මහ ජනතාව තුළින් ආ ජන බලවේගයක් නිසා බව ඔබතුමන්ලා දන්නවා. එහිදී එක්සත් ජාතික පක්ෂය කිසිම දෙයක් කළේ නැහැ කියලා අපි කියන්නේ නැහැ. නමුත්, මේ රටේ සිවිල් සමාජය, වෘත්තීය සමිති, ශිෂ්‍ය ව්‍යාපාරය, කලාකරුවෝ, ජනතා විමුක්ති පෙරමුණ, විදේශගත ශ්‍රී ලාංකිකයෝ ඊට වඩා අතිවිශාල කාර්යභාරයක් කිරීමේ ප්‍රතිඵලයක් විධියටයි ඒ ජන වරම හිමි වුණේ. සාම්ප්‍රදායික වශයෙන් එක්සත් ජාතික පක්ෂය ඡන්ද වැඩියෙන් තිබෙන පක්ෂයක් නිසා ඒ අවස්ථාව ගත්තා වුණත්, මේ වෙනුවෙන් මහන්සි වෙච්ච මහා දැවැන්ත ජන බලවේගයක හේතුව නිසා තමයි එතුමාට බලය හම්බ වුණේ. එහෙම නැතිව, 1977 වාගේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දයෙන් පත් වෙච්ච ආණ්ඩුවක් නොවෙයි, මේ ආණ්ඩුව. ඒ වාගේම, සියයට 90ක්, 95ක් යූඑන්පී ඡන්දදායකයන්ගෙන් පත් වෙච්ච ආණ්ඩුවක් නොවෙයි. අන්න, ඒ ජන වරමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාවා දුන්නේ.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවේ අඩංගු කරුණු 14න් 13කම තිබෙන්නේ මහ බැංකු වංචාව පිළිබඳවයි. මේ වංචාව, හොරකම කළ බවට රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහිව "කෝප්" එකේදීත්, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන

කොමිෂන් සභාවේදීත් චෝදනා එල්ල වී නැහැ කියලා මංගල සමරවීර ඇමතිතුමාත්, කිරිඇල්ල ඇමතිතුමාත් කිව්වා.

ගරු කථානායකතුමනි, අපි ඉතා වග කීමෙන් මේ කාරණය කියනවා. මේ "බොන්ඩ්" හොරකම සිද්ධ වෙනවාටත් වඩා, මෙයට රනිල් වික්‍රමසිංහ මහතාගේ සම්බන්ධය ගැන විශාල සැකයක් තිබෙන බව අපි එතුමා ප්‍රමුඛ ආණ්ඩුවට දිගටම විවේචන එල්ල කළා. ඒවායින් මුදල් හොරකම් කර ගත්ත පුද්ගලයෝ දැවැන්ත මාධ්‍ය අධිරාජ්‍ය හදන්නයි උත්සාහ කළේ. ඇලෝසියස් මොකටද මහ දැවැන්ත මාධ්‍ය අධිරාජ්‍යයක් හදන්න ගියේ කියන එක බැලුවාම, ඒ යටි අරමුණ වෙලා තිබුණේ තමන්ට මේ වැඩේ කර ගන්න දුන්නු ආණ්ඩුවට, ඒ නායකයන්ට උදව් කිරීමයි කියන එක තේරෙනවා. මේ මුදලින් කොතරම් ප්‍රමාණයක් රනිල් වික්‍රමසිංහ මහතා පෞද්ගලිකව ගත්තාද යන්න තමයි මේ ආණ්ඩුවේ තර්කය වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, රටේ දේශපාලන නායකයන්ට ආණ්ඩුවක් කරන්න පෞද්ගලික ධනය පමණක් නොවෙයි අවශ්‍ය වෙන්නේ. ඉතාම අන්ත දූෂිත පාලකයන්ට උදව් කරන සමහර කළු මාධ්‍ය තිබෙන බව අද අපට පෙනෙනවා. මෙහිදී සල්ලි දීලා නැති වෙන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ මහතා මේකෙන් පෞද්ගලිකව කියක් ගත්තාද කියනවාට වඩා, ඇලෝසියස්ලා මේ හරහා වෙනත් උදව් කරන්න ගිය බව අපට පෙනෙනවා. නමුත් ඊට වඩා මේ ජනවරම පාවාදීම සිද්ධ වෙන්නේ, එතුමා දැනුවත්ව මේ දූෂිතයන් ආරක්ෂා කළ නිසායි. එතුමා ඉතා දැනුවත්ව මේ දූෂණය පිළිබඳව හොයන්න තිබෙන ආයතනවල ඒ පරීක්ෂණවලට විශාල බාධා කිරීම් කළ නිසායි.

ගරු කථානායකතුමනි, ඔබතුමාට පැහැදිලිව කියන්න කැමතියි, "කෝප්" සභාවේදී අපට දස වධ දුන්නා. ඒකයි ඇත්ත. එතුමා නායකත්වය දුන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ඉතාම කැත විධියට ඒ දූෂණය ආරක්ෂා කරන්න කටයුතු කළා. ඒක ඇත්ත. ඒක නැහැයි කියන්න රනිල් වික්‍රමසිංහ මහත්මයාට බැහැ. ඒ නිසා තමයි මම කියන්නේ එතුමා ජනවරම පාවා දුන්නා කියලා. ඒ නිසා තමයි අපි කියන්නේ එතුමා හොරුන්ට විරුද්ධ ජනවරමක් අරගෙන, හොරකමට, දූෂණයට විරුද්ධව ජනවරමක් අරගෙන, ජනතාව තුළ තිබූ ඒ විශ්වාසය සහමුලින්ම නැති කළා කියලා. ගරු කථානායකතුමනි, මේ රට දූෂණයෙන් තොර රටක් බවට පත් කරන්න පුළුවන් කියලා තිබුණ විශ්වාසය ඒ තුළින් නැති කළා. ඒ නිසා අද රටේ බුද්ධිමතුන්, සාමාන්‍ය ජනතාව මොකක්ද කියන්නේ? ඔවුන් කියනවා, "යහපාලනය " කියන වචනයත් බොරුවක් කියලා. හොඳ දේ පිළිබඳව ජනතාවට තිබෙන විශ්වාසය නැති කළා. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනවරම පාවා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට එතුමා එතුමාට ඡන්දය දුන් ජනතාව පාවා දීලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් තරුණ මන්ත්‍රීවරුන් පිරිසක් ආවා. මා හිතන තරමට එයින් සැලකිය යුතු ප්‍රමාණයක් මන්ත්‍රී වෙන්න කලින් හොරකම් කළ අය නොවෙයි. පළමු මාස දෙක තුන තුළ ඒ යූඇන්පී තරුණ මන්ත්‍රීවරුන් තුළ යම් ආකාරයක වුවමනාවක් තිබුණා, දූෂණයෙන් තොර ගමනක් යන්න. ඒ තරුණ මන්ත්‍රීවරුන්ගේ ඒ වුවමනාව, ඒ බලාපොරොත්තුව සහමුලින්ම විනාශ කළා; පාවා දුන්නා. මේ රටේ පාවෙන ඡන්දදායකයන් කවදාවත් එක්සත් ජාතික පක්ෂයේ අය නොවෙයි. නමුත් ඔවුන්ට රාජපක්ෂලා තිත්ත වෙච්ච නිසා, යහපාලනයක් හදන්න පුළුවන් කියලා තිබුණු විශ්වාසය නිසා ඡන්දය දුන්නා. එයත් පාවා දුන්නා.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංගයේ තිබෙන්නේ කරුණු භාගයයි. අපි ඉතා වගකීමකින් කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉතා දැනුවත්ව රාජපක්ෂ පාලනයේ, ඒ පවුලට සම්බන්ධ අන්ත දූෂිත පුද්ගලයන් ආරක්ෂා කළා. එතුමාට ඒ සඳහා උපාය මාර්ගයක් තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට බෙදා තබා ගැනීමෙන් තමයි එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය ස්ථිර වෙන්නේ. ඒ වෙනුවෙන් එතුමා දූෂිතයන් ආරක්ෂා කළා. ඒ දූෂිතයන්ට අදාළව නීතිය ක්‍රියාත්මක කිරීමට මහන්සි වුණේ නැහැ. එතැනදීත් ජනවරම පාවා දුන්නා. ඒ නිසා තමයි එතුමාට මේ විශ්වාසභංග යෝජනාව සුදුසු වන්නේ.

ගරු කථානායකතුමනි, මේ රටේ පොහොර සහනාධාරය අව්වාරුවක් කළා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අවුරුද්දක් පාරේ තිබ්බා. ආණ්ඩුවක් විධියට ඔවුන්ගේ අධ්‍යාපනයේ මුළු අවුරුද්දක් විනාශ කළා. ඒ වාගේම, ජාතික සම්පත් වික්කා. හම්බන්තොට වරාය හදද්දී රාජපක්ෂලා හොරකම් කළ බව රටම දන්නවා. හැබැයි ඒක විකුණද්දීත් හොරකම් කළා. ඒ නිසා මේ විශ්වාසභංගයට තව එකතු වෙන්න කරුණු තිබෙනවා. [බාධා කිරීමක්] ඒ වරාය තිබෙන්නේත් එතුමාගේ නමින්නේ, ඒකයි. ඒ ජනවරම පාවා දීමට අදාළව ගත්තොත් අනිවාර්යයෙන්ම මේ විශ්වාසභංගය එතුමාට හිමියි. ඒ වාගේම පසුගිය කාලයේ ජාතිවාදය ඇති වෙන්න වපුර වපුරා ගියා. විශේෂයෙන් මුස්ලිම් ජනතාවට විරුද්ධව, දෙමළ ජනතාවට විරුද්ධව කියද්දී, ඉතාම ද්වේෂසහගතව අසත්‍ය කරුණු කියද්දී අපි සමහර ඇමතිවරුන්ට කිව්වා, මේවායේ ඇත්ත කියන්න කියලා. කොළඹ සිට යාපනයට යන බස්වලට කොටි ගල් ගහනවා කියලා සමහර දේශපාලන නායකයෝ කිව්වා. තමිල්නාඩුවේ යන පෙළපාලිවල, රැස්වීම්වල පින්තූර පෙන්වලා කිව්වා, "මේ දේවල් සිද්ධ වන්නේ යාපනයේ" කියලා.

නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමන්ලා, රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමන්ලා ඒවා ශත පහකට ගණන් ගත්තේ නැතිව ඒ අමු ජාතිවාදය වපුරන්න ඉඩ දීලා, වෙනත් ජොලි කර කර සිටියා, ගරු කථානායකතුමනි. එම නිසා අගමැතිතුමාට මේ විශ්වාස භංගය උරුමයි. ඒක, පළමුවැනි කාරණය.

දෙවෙනි එක මොකක්ද? මේකේ දෙවෙනි පාවා දීම කළේ කවුද? ගරු කථානායකතුමනි, දෙවෙනි පාවා දීම තමයි, මෛත්‍රීපාල සිරිසේන මහතා. මේ විශ්වාස භංගයේ අත්සන් 56ක් තිබෙනවා. මා හිතන්නේ ඔබතුමාට භාර දුන් යෝජනාවේ තිබෙන්නේ අත්සන් 55යි. ඒකේ පළමුවැනි අත්සන කාගේද? ඒක මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ. මේ විශ්වාස භංගය කාගේද? මේ විශ්වාස භංගය ජනාධිපතිවරයාගේ. මේ හොරකම සිද්ධ වුණේ අවුරුදු 3කට කලින්. මේ හොරකම COPE එකේදී ඔප්පු වෙලා දැන් මාස 8කට වැඩියි. මහින්ද රාජපක්ෂ මහත්තයාවත්, වෙන කවුරුවත් මේ විශ්වාස භංගය ගෙනාවේ නැහැ. අඩු ගණනේ COPE එකේදී මේ හොරකම ඔප්පු වුණාට පස්සේවත් එතුමන්ලාට මේ විශ්වාස භංගය ගෙනෙන්න තිබුණා. නමුත්, එතුමන්ලා එය ගෙනාවේ නැහැ. මේ විශ්වාස භංගය ගෙනාවේ කවුද? මේ විශ්වාස භංගය ගෙනාවේ 2018 වර්ෂයේ පෙබරවාරි 10 වෙනි දා පැවැති පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ. එම මැතිවරණය පරාජය වීම එක්සත් ජාතික පක්ෂයට පවරන්න මෛත්‍රීපාල සිරිසේන මහතාට ඕනෑකම තිබුණා. එම නිසා ඉස්සෙල්ලා රනිල් වික්‍රමසිංහ මහතාට කිව්වා, ඉල්ලා අස්වන්න කියලා. නමුත්, එතුමා අස් වුණේ නැහැ. ඊට පස්සේ උත්සාහ කළා, එතුමාත් එක්ක සිටින ඇමතිවරු දමා රනිල් වික්‍රමසිංහව ඉවත් කරන්න. ඒ අනුව වෙනම 113ක් හදා ගන්න පුළුවන්ද කියලා බලන්න මේ ඇමතිවරු මහන්සි වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රාජපක්ෂ මැතිතුමා එක්ක ඉඳලා මෛත්‍රීපාල මහත්තයා ළඟට පැනපු අන්ත දූෂිත රැණකුත් එතැන ඉන්නවා. ඒ දූෂිතයින් එකතු වෙලා උත්සාහ කළා, 113 හදාගන්න. නමුත්, ඒක කර ගන්න බැරි වුණා. ඒක කර ගන්න බැරි වුණාට පස්සේ එතැනින් තමයි විශ්වාස භංගය ආවේ, ගරු කථානායකතුමනි.

[ගරු බිමල් රත්නායක මහතා]

නිමල් සිරිපාල ද සිල්වා මහත්තයා අගමැති කරන්න ගිහිල්ලා ඒක කර ගන්න බැරි වුණාට පස්සේ මෛත්‍රීපාල සිරිසේන කඳවුරෙන් තමයි විශ්වාස භංග යෝජනාව කියන වචනය ඉස්සෙල්ලාම ආවේ. ඒකයි ඇත්ත. ඊට පස්සේ ඒක කර ගන්න බැරිව අත් හැර දැම්මාට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කණ්ඩායමේ ඉන්නවා, "ගෝඨාභය කල්ලිය" කියලා කොටසක්. එම ගෝඨාභය කල්ලියට අවශ්‍යව තිබෙනවා, ඉතා ඉක්මන් ආණ්ඩු පෙරළියක්. මොකද, තමන්ගේ නඩු ටික බේරා ගන්න. මහින්ද මහත්තයාට මේකට වුවමනාවක් තිබෙන බව මට නම් පෙනෙන්නේ නැහැ. [බාධා කිරීමක්] මා ඒක පස්සේ කියන්නම්. එම නිසා මේ විශ්වාස භංගය මෛත්‍රීපාල සිරිසේන මහතාගේ එකක්. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒක කියලා තිබුණා, "දිවයින" පත්තරයට. මම එම පත්තරය ගෙනැවිත් තිබෙනවා. එතුමා කිව්වා, "විශ්වාස භංගය රනිල් වික්‍රමසිංහ පරදින්නේ මෛත්‍රීගේ තිබෙන උනන්දුව මතයි" කියලා. මහින්දගේ තිබෙන උනන්දුව මත නොවෙයි, මෛත්‍රීගේ තිබෙන උනන්දුව මත. මහින්ද රාජපක්ෂ මැතිතුමා විශ්වාස භංගයට තවමත් අත්සන් කරලාත් නැහැ.

මම දැක්කා, ඒකාබද්ධ විපක්ෂයේ නායක මට්ටමේ මන්ත්‍රීවරු විශ්වාස භංගය අස්සේ ඉතාලියට ගිහිල්ලා ඉන්නවා. විශ්වාස භංගයක් අස්සේ ඉතාලි යනවාද? ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංගයේ ලොකුම ජනවරම පාවාදීම කරලා තිබෙන්නේ කවුද? මේ රටේ ලොකුම ජනවරම පාවා දීලා තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි. රනිල් වික්‍රමසිංහ මහත්මයා හොරු රැකපු ප්‍රමාණයටම **මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් හොරු රැක්කා.** සමහර ඇමතිවරු ගියේ කරපු හොරකම්වලින් බේරෙන්නයි. ඒක ඇත්ත. අපි ඒක කියන්න බය වෙන්නේ නැහැ. අපි දේශපාලන වශයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට ණයත් නැහැ; බයත් නැහැ. ණයත් නැහැ; බයත් නැහැ. එම නිසා අපි කෙළින් කියනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා දූෂිතයෝ 50ක් ආරක්ෂා කළා නම්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා දූෂිතයෝ 50ක් හෝ 51ක් ආරක්ෂා කළා කියලා මම කියනවා. ඒකයි ඇත්ත. රාජපක්ෂලාත් එක්ක හොරකම් කරපු ඇමතිවරුන්ගෙන් භාගයක් - හොරකම් නොකරපු ඇමතිවරුන්ට මේක අදාළ නැහැ. රාජපක්ෂ මහත්මයාගේත් හොරකම් නොකරපු ඇමතිවරු කිහිපදෙනෙක් හරි හිටියා නේ. ඒ අයට අදාළ නැහැ. හොරකම් කරපු අයව වැඩිපුරම ආරක්ෂා කළේ ජනාධිපතිවරයා. මොකටද?

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනවරම පාවා දුන් බව. දූෂණයට විරුද්ධව එතුමාටයි ජනවරම ලැබුණේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට ලැබුණු ජනවරමක් නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ජනාධිපති ධුරය ලැබුණාම, රනිල්වික්‍රමසිංහ මහත්මයා ඒක අස්සේ ගිහින් අගමැතිකම නිකම්ම ගත්තා. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටයි දූෂණයට විරුද්ධව ජනවරම ලැබුණේ. අපි ජනාධිපතිවරයාගෙන් අහනවා, ඔය Bond Commission එකේ වාර්තාව එනකම් හොරකම් පිළිබඳ වාර්තා 34න් එකක්වත් රටට දුන්නේ නැහැ නේද කියලා. ඔබතුමා ඒ වාර්තා දැක්කා. බරපතළ වංචා දූෂණ පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තා 34 ගත්තොත්, එම විනිශ්චයකාරවරු සමහර වාර්තා භාර දීලා තිබෙන්නේ 2015 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් වාගේ මාසවලයි. ජනාධිපති වශයෙන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඒ එක වාර්තාවක් පිළිබඳවවත් කටයුතු කරලා නැහැ. එතුමා ජනවරම පාවා දී තිබෙනවා. ඊළඟ ජුදාස්.

මම website එකක තිබුණු දෙයක් ගැන කියන්නම්. ජනාධිපතිතුමා, රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු හමුවුණු අවස්ථාවේ දී අහලා තිබෙනවා, "TNA සංවිධානයේ ඡන්ද අරගෙන විශ්වාස භංගය දිනන එක ආණ්ඩුවේ පැවැත්මට, ආණ්ඩුවේ ගරුත්වයට හානියක් නොවෙයිද?" කියලා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එහෙම ඇහුවා කියලා website එකක තිබුණා; ඒක website එකක තිබුණු දෙයක්. ඒ අවස්ථාවේ මම අහගෙන හිටපු දෙයක් නොවෙයි. ජනාධිපතිවරයා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙන් අහලා තිබෙනවා, "TNA එකේ ඡන්ද අරගෙන දිනන එක ප්‍රශ්නයක් නොවෙයිද?" කියලා. එවිට එතැන සිටි ඇමතිවරයෙක්, "ඔබතුමාට ඒ අයගේ ඡන්දවලින් ජනාධිපති වෙන්න අවුලක් නැත්නම් අපටත් අවුලක් නැහැ" කියලා කිව්වා කියලා ඒ website එකේ තිබුණා.

ගරු කථානායකතුමනි, අවුරුදු තිහ හතළිහකට පසුව උතුරේ, දකුණේ, මාතර, මඩකලපුව, කොළඹ යන හැම තැනින්ම ඡන්ද ලබාගෙන පත් වුණු ජනාධිපතිවරයෙක් ඒ ජනවරමට පයින් ගහලා තිබෙනවා. එතුමා බලයට පත් කරන්න ඡන්දය දීපු එක්සත් ජාතික පාක්ෂිකයන් පාවා දීලා තිබෙනවා. එම නිසා තමයි අපි කියන්නේ මේකේ වැඩිම, දෙවැනි පාවාදීම කරලා තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි කියලා. එම නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයාට විශ්වාස භංගයක් එනවා නම්, එම විශ්වාස භංගයේ පරාජය එලෙසම මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් අදාළයි. මේ විශ්වාස භංග යෝජනාවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා පැරදුණොත්, ඒ පරාජය මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් එලෙසම අදාළයි. වෙන මොකක්වත් නොවෙයි, එතැනින් පටන් ගත් සැලැස්ම තමයි මේ යන්නේ කියන එක අපි පැහැදිලිවම කියනවා. එතුමා ජනතාව පාවා දී තිබෙනවා. එම නිසා එතුමාටත් මේ විශ්වාස භංගය අදාළයි.

ගරු කථානායකතුමනි, මා ඉක්මනින් මගේ කථාව අවසන් කරන්නම්. තුන්වැනියා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ, තුන්වැනි පාවාදීම. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුවත්, මේ විශ්වාස භංගය ගෙනෙනකොටත් මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එතුමාගේ කණ්ඩායම දිගටම ගෙනාපු විවේචනය මොකක්ද? "මේ ආණ්ඩුව රට බෙදනවා; මේ ආණ්ඩුව රට විකුණනවා; මේ ආණ්ඩුව ජනතාව පෙළනවා; මේ ආණ්ඩුව හමුදාව දඩයම් කරනවා; මේ ආණ්ඩුව විදේශවලට රට උගස් තියනවා; මේ ආණ්ඩුව එක තත්පරයක්වත් තබාගත යුතු නැහැ" කියන එක තමයි එතුමන්ලා හැම මැතිවරණ රැස්වීමකම කිව්වේ. ගරු කථානායකතුමනි, එහෙම තමයි එතුමා ඡන්ද ගත්තේ. එතුමා පසුගිය පෙබරවාරි 10වැනි දින ඡන්ද ගත්තේත් එහෙමයි. එතුමන්ලාගේ ප්‍රධාන තේමාව වුණේ රණවිරු දඩයම, බැංකු වංචාව, රට බෙදීම කියන ඒවායි.

අපි අහන දේ මෙයයි. අර ඈත පැත්තක තිබෙන නාවලපිටිය ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවා ගන්නට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ටික දරන මහන්සියවත් මහින්ද රාජපක්ෂ මහත්මයලා මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කර ගැනීම වෙනුවෙන් දැරුවාද? මොනවත් කළේ නැහැ. ගරු කථානායකතුමනි, අපි ඉතා වගකීමෙන් කියනවා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ මෛත්‍රීපාල සිරිසේන මහතා සහ ගෝඨාභය රාජපක්ෂ කල්ලියට අයත් මන්ත්‍රී කණ්ඩායම බව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ගරු කථානායකතුමනි. මට ඒ ඇති.

ඒක තමයි ඇත්ත. මහින්ද රාජපක්ෂ මැතිතුමා මොකක්ද කරලා තිබෙන්නේ? විශාල ආණ්ඩු විරෝධයක් හදලා, ආණ්ඩුවට එරෙහි විශාල ජනතා විරෝධයක් ඇති කර තිබෙනවා. ජනතාවගේ ඡන්ද අරගෙන ඒ ඡන්දවලට මොකක්ද කරලා තිබෙන්නේ? විශ්වාස භංග ක්‍රියාවලිය තුළ තමන්ට ඡන්දය දුන් මිනිසුන් පාවා දීලා තිබෙනවා. මොන පදනමින් හෝ එතුමාට මිනිස්සු ඡන්දය දීලා තිබෙනවා නේ.

අද ලංකාවේ තිබෙන ලොකුම deal එක මොකක්ද? ඒ deal එක තමයි රනිල් වික්‍රමසිංහ මහතා සහ මහින්ද රාජපක්ෂ මහතා අතර තිබෙන deal එක. ඒක පැහැදිලියි. අද විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් 55 දෙනෙකු හෝ 54 දෙනෙකු ඉන්නවා. කී දෙනෙකු දැන් මේ සභාවේ ඉන්නවාද? අඩුම තරමින් ප්‍රාදේශීය සභාවක බලය ගන්න දරපු මහන්සිය තරමටවත් රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාව දිනවන්න මහින්ද රාජපක්ෂ මහත්මයා මහන්සි වුණාද? නැහැ. මහන්සි වුණු කට්ටියක් ඉන්නවා. ඒ, ගෝඨාභය කල්ලියේ ටික දෙනෙක්. දැන් ඒ කට්ටිය එළියේ සෑහෙන්න බැණුම් අහනවා. අපට ඒක පේනවා.

ගරු කථානායකතුමනි, මේවා තමයි deals. මේ විශ්වාස භංගය මහින්ද රාජපක්ෂ මහත්මයා දිනන්න හිතුවා නම්, අඩු ගණනේ දිනන්න උත්සාහ කළා නම්, - එතුමා පළාත් පාලන ඡන්දයෙන් කොට්ඨාස මහ ගොඩක් දිනලා තිබෙනවා. ඒ එක කොට්ඨාසයකවත් අද නිල් කොඩියක් දාලා තිබෙනවාද? දැන් නම් එතුමන්ලා දාන්නේ maroon colour - කුණු ලේ පාට - කොඩි නේ. දාලා තිබෙනවාද? "05වෙනි දා උදේට මහින්ද අගමැති කරමු" කියලා එක cut-out එකක් ගහලා තිබෙනවාද? එතුමා cut-outsවලට ප්‍රසිද්ධයි නේ. එක cut-out එකක් ගහලා තිබෙනවාද? බැසිල් රාජපක්ෂ මහත්මයා දන්නවා මේ රටේ තිබෙන ලයිට් කණු ගණන. එතුමා දන්නවා, ලයිට් කණුවක අලවන්න ඕනෑ පෝස්ටර් ගණනත්. එතුමා විද්‍යාත්මකව දේශපාලනය කරන කෙනෙක්, එතුමා ගැන දේශපාලන විවේචන අපට තිබුණත්. හැබැයි අද එක cut-out එකක් නැහැ. දැන් නීත්‍යානුකූල පාරක් තිබෙනවා නේ මහින්ද මහත්මයාට අගමැති වෙන්න. පළාත් පාලන මැතිවරණය හරහා අගමැති වෙන්න ඕනෑ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ළඟට රිංගපු, රාජපක්ෂලත් එක්ක හොරකම් කළ දූෂිත ඇමතිවරුයි, ගෝඨාභය කල්ලියයි එකතු වෙලා තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කියන එක අපි පැහැදිලිව කියනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා මේකට එච්චර මහන්සි වුණේ නැහැ. එතුමා පාවිච්චි වුණා. එතුමාව මේකට ගෙනැල්ලා දැම්මා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඉතා පැහැදිලිවම එතුමාගේ ජන වරම පාවා දීලා තිබෙනවා. එතුමාට ඡන්දය දුන් මිනිසුන්ට එතුමාගේ කණ්ඩායම බොරු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒකයි මම කිව්වේ මෙතැන පාවාදීම් තුනක් තිබෙනවා කියලා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා පෙන්වලා තිබෙනවා එතුමාට හොරු අල්ලන්න බැහැ කියන එක. එතුමා හොරු රකිනවා, එතුමා හොරු අල්ලන්න අසමත්, අල්ලන්න බැහැ, අල්ලන්නේත් නැහැ, අල්ලන්න දෙන්නෙත් නැහැ කියන එක පෙන්වා තිබෙනවා. අද විශ්වාස භංග යෝජනාවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා දිනුවොත් මොකක්ද වෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වේලාව නම් අවසන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම තව විනාඩි දෙකෙන් අවසන් කරනවා.

මොකක්ද වෙන්නේ? ආයේත් ඔය හොරකම්වලට විරුද්ධව ලොකු සටනක් කරනවාද? නැහැ. ඒත් මෙහෙමම තමයි. එතුමාට ජන වරම රකින්නට බැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දිනපතා ඉතාම කුමන්ත්‍රණකාරී විධියට, ඔක්කොම පාවාදීලා ජුදාස් වාගේ වැඩ කරනවා, දෙවෙනියා විධියට. ජන වරමේ අයිතිකාරයා එතුමා. තුන්වෙනියා මහින්ද රාජපක්ෂ මහත්මයා. එතුමා දේශපාලන deals දාලා, "රට බෙදනවා; රට කනවා, එක තත්පරයක්වත් තියන්න හොඳ නැහැ"යි කියපු මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා, දැන් මොකුත් නොකර ඉන්නවා.

ගරු කථානායකතුමනි, එහෙම නම් ජනතාව වශයෙන් අපේ පදනම මොකක්ද? අපට තිබෙනවා වෙනම ජන වරමක්. අපට ඡන්දය දීපු මිනිස්සු මෙන්න මෙහෙම කියන අය නොවෙයි, " අපේ හොරා අපට හොඳා" කියලා. මම මේක කියන්නේ මේ රටේ මිනිස්සුන්ට. අපට තිබෙන්නේ වෙනම ජන වරමක්. අපට හම්බ වුණු ඡන්ද ලක්ෂ 7 වෙනම එකක්. ඒක කොළ පාට හොරකමටත් විරුද්ධයි; නිල් පාට හොරකමටත් විරුද්ධයි. සමහර අය බලාපොරොත්තු වෙනවා අපි ලව්වා, අපේ ඡන්ද ලව්වා රාජපක්ෂට ගස්සන්නට. කොළ පාට හොරු හිතනවා, අපි එකතු වෙලා රාජපක්ෂට ගහයි කියලා, කොළ පාට හොරු වෙනුවෙන්. නිල් පාට හොරු හිතනවා, අපි ලව්වා කොළ පාට හොරුන්ට ගස්සලා ඒගොල්ලන්ට එකක් හදා ගන්න. ගරු කථානායකතුමනි, ඒක වෙන්නේ නැහැ. එම නිසා අපි මේ රටේ ජනතාවට අවසාන වශයෙන් කියන්නේ මේකයි. අපට ගෙනෙන්නට තිබෙනවා විශ්වාස භංගයක්. ඒ, මොකක්ද? ඒ තමයි මේ දෙපැත්තේම කොළ පාට, නිල් පාට හොරු නම් කරලා ඒ අයට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ සිටින හොරකම් නොකරන මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ටික දෙනාත්, පොදු ජනතාවත් එකතු කරගෙන විශ්වාස භංගයක් ගෙන ඒම.

ඒක තමයි මේ රටට අවශ්‍ය විශ්වාස භංග යෝජනාව. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි මෙම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවා. ඒ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, අපේ ජන වරම - mandate එක- වෙනම එකක් නිසායි. අපි අපේ ජන වරම පාවා දෙන්නේ නැහැ. ජුදාස් වර්ගයේ දේශපාලනයට අපි එන්නේ නැහැ. මේ රට හදන්න ඉදිරියට එන්න ඒ තුන්දෙනාටම බැහැයි කියන එක ඕනෑවටත් වඩා ඔප්පු කර තිබෙනවා. ඒ නිසා අපි රටේ ජනතාවට කියනවා, "අපේ හොරා අපට හොඳයි" කියන දේශපාලනයෙන් අයින් වෙලා මේ රට හදන්න ඉදිරියට එන්නය කියලා. එසේ ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.49]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

[ගරු රවුෆ් හකීම් මහතා]

ගරු කථානායකතුමනි, අද දින විවාදයට ගෙන තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳව හරවත් කථා කිහිපයකට මා සවන් දුන්නා. ගරු මංගල සමරවීර අමාත්‍යතුමාගේත්, අපේ විපක්ෂ නායක ගරු ආර්. සම්පන්දන් මැතිතුමාගේත්, ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදර ගරු බිමල් රත්නායක මැතිතුමන්ගේත් කථාවලින් පසුව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරමින්අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මමත් කැමැතියි.

ගරු කථානායකතුමනි, මගේ පාර්ලිමේන්තු දිවියට අවුරුදු 24ක් ගතවෙලා තිබෙනවා. විශ්වාස භංගත්වය පිළිබඳ විවාද කිහිපයක් මා දැකලා තිබෙනවා. නමුත් මේ විශ්වාස භංග යෝජනාව තමයි විවාදය පටන් ගන්න කොටම හුළං බැහැපු විශ්වාස භංග යෝජනාවක් හැටියට ප්‍රථම වතාවට මා දකින්නේ. මීට කලින් අපි දැක තිබෙන විධියට සුපුරුදු පරිදි විපක්ෂය විසින් විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කරන්නේ ආණ්ඩුවේ පතාක යෝධයින් ඉලක්ක කරගෙනයි. ලක්ෂ්මන් කදිර්ගාමර්, එම්.එච්.එම්. අෂ්රොෆ් වැනි අයට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය විසින් විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවලදී මේ සභා ගර්භය තුළ තිබුණු විවාද අපි දැක තිබෙනවා; බලා තිබෙනවා. ඒවාට ඒ අය මුහුණ දුන්නු හැටිත් අපි දැක තිබෙනවා. මෙවර එක දෙයක් සිදු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මා ඒ පිළිබඳව සතුටු වෙනවා. එනම්, එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ සිත් වේදනාවන්ට, පසුතැවීම්වලට, පක්ෂය තුළ පැවැති නොයෙකුත් ප්‍රශ්නවලට විසඳුම් ලැබිලා තිබෙනවා. ඒ පිළිබඳව මා සතුටු වෙනවා. සාමාන්‍යයෙන් රජයක් තුළ පසු පෙළ මන්ත්‍රීවරුන්ට නොයෙක් ප්‍රශ්න තිබෙනවා. එක එක කණ්ඩායම් හැදෙනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී "ඉහුරු කණ්ඩායම" - Ginger Group - කියලා එකක් තිබුණා. ඒ මන්ත්‍රීවරුන් එකතු වෙලා ඒ හරහාත් තම-තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගත්තා. ඒක කළ යුතු දෙයක්. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න තිබෙනවා තමයි. නමුත් මේ විශ්වාස භංග යෝජනාව ජාතික වශයෙන් වැදගත් අවධියක අපි මුහුණ දෙන විශ්වාස භංග යෝජනාවක්.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා එක දෙයක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම මහ බැංකු බැඳුම්කර ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරපු ''කෝප්'' කමිටුවේ සාමාජිකයකු හැටියට මමත් හිටියා. කවුරුත් දන්නා පරිදි, මමත් අග්‍රාමාත්‍යතුමාගේ හිතවතෙක්. නමුත් මා ඒ කමිටු වාර්තාවට අත්සන් තැබුවා. එහි යම් යම් ප්‍රශ්න තිබුණු බව මා පිළිගන්නවා. දැන් මංගල සමරවීර අමාත්‍යතුමාත් ඒ බව පිළිගත්තා. ඒ ගැන සොයා බැලිය යුතුයි. ඒ සඳහා දඩුවම් පැමිණ විය යුතු නම් එසේ කළ යුතුයි. නමුත් එක හෙළාම අග්‍රාමාත්‍යතුමා ඉලක්ක කරගෙන ගෙන යන මේ ව්‍යාපාරයේ චේතනාව කුමක්ද කියලා අපි බලන්න ඕනෑ. අපි ජනාධිපති කොමිසමක් හරහා කරුණු සොයනවා; යම් නඩුවක් පවරන්න සාධක තිබෙනවාද කියලා සොයනවා. නමුත් වුදිතයන්ට නඩු පවරා දඩුවම් පැමිණවීම නොවෙයි, මේ ජනාධිපති කොමිසම හරහා කෙරෙන්නේ.

උදාහරණයක් හැටියට ගත්තොත්, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ සදාදරණීය නායිකාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් මේ වාගේම කොමිසමක් පත් කරලා එතුමියගේ ප්‍රජා අයිතිය උදුරා ගනු ලැබුවා. අවුරුදු විසි ගණනකට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා තමන්ගේ කනගාටුව පළ කළා, එවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව. එතුමියගේ ප්‍රජා අයිතිය උදුරා ගැනීමට හේතුව වුණේ වෙන මොකක්වත් නොවෙයි. එය, ඊළඟ මැතිවරණයට එතුමිය ඉදිරිපත් වීම වළක්වාලීම සඳහා ගත් පියවරක් බව අපි දන්නවා.

ගරු අග්‍රාමාත්‍යතුමා සම්බන්ධයෙන් කොමිසමක් පත් කරලා, එතුමා ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම වළක්වා, ඒ තුළින් යම් දේශපාලන වාසියක් ලබා ගන්න ගත්ත උත්සාහයක්ද මේ විශ්වාස භංග යෝජනාව කියලා සමහරු අහනවා. එහෙම අහන්න ඉඩ තිබෙනවා. මමත් දන්නවා, අගමැතිතුමාත් දන්නවා, මීට පෙර ජනාධිපතිවරණ දෙකකදී අපි අගමැතිතුමාට සහාය දෙනකොට, එතුමා ජනාධිපතිවරණ අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් නොවී, අපි රහසිගතව ගිහිල්ලා වෙනත් කෙනෙක් -මේ ගරු සභාවේ ඉන්නවා, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා- හමුවෙලා එතුමාව ජනාධිපතිවරණයට ඉදිරිපත් කරන්න ගත්ත වෑයම අගමැතිතුමා දන්නවා. ඒ වෙලාවේ තිබුණු වාතාවරණයට අනුව අගමැතිතුමා ඉවත් වෙලා ඒවාට ඉඩකඩ ලබා දුන්නා. මෙවැනි අවස්ථාවකදී භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ කොමිෂන් වාර්තාව ගැන නොයෙකුත් දේවල් කියන්න පුළුවන්. නමුත් ඊට වඩා වැදගත් දෙයක් මා දැන් කියන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, පසුගිය දවස් කිහිපය තිස්සේ පුවත්පත්වලත්, අනෙකුත් දේශපාලන විචාරකයිනුත් ටීඑන්ඒ පක්ෂයත්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයත් ගන්නා තීරණය පිළිබඳව, මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් මේ පක්ෂ දෙක තීරණය ගන්නේ මොන ආකාරයටද කියලා නොයෙකුත් කාරණා උඩ අනාවැකි පළ කරමින් ප්‍රවෘත්ති පළ කළා. වෙබ් අඩවිවලත් ඒ සම්බන්ධයෙන් පළවෙලා තිබුණා. මගේ පක්ෂය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයෙක් තෙල්දෙණිය සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී ආවේගයෙන් කථා කළා. "මේ අවස්ථාවේ අපේ ආරක්ෂාව තහවුරු කළේ නැත්නම් අගමැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී අපට යමක් කරන්න සිදු වෙනවා"ය කියනවා වාගේ කථාවක් එතුමා කළා.

සමහර රූපවාහිනී නාළිකා ඒ කථාව ප්‍රචාරය කරවමින් මේ ව්‍යාකූලත්වය තවත් වැඩි කරන්නටත් උත්සාහ කළා. නමුත් මා අහන්නේ, මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් සුළු ජන කොටස් නියෝජනය කරන අපේ පක්ෂ දෙකට විතරක් වෙනම මිනුම් දණ්ඩක් තිබෙනවාද කියලායි. අපට වෙනම මිනුම් දණ්ඩක් නැහැ. අපටත් දර්ශනයක් තිබෙනවා. මේ සිදු වුණු දේවල් පිළිබඳව අපටත් යම් අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම මේ වටපිටාවේ තිබෙන දේශපාලන වුවමනාවන් පිළිබඳවත් අපට යම් පැහැදීමක් තිබෙනවා. ඒවා දිහා බලා තමයි අපි තීරණය ගත යුත්තේ.

මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න කලිනුත් අගමැතිතුමා සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා. අපේ දින සියයේ ආණ්ඩුව කාලයේ අගමැතිතුමාට විරුද්ධව, ශ්‍රී ලංකා මහ බැංකු සිද්ධියත්, තවත් සිද්ධීන් කිහිපයකුත් - සංවර්ධන කටයුතු අඩාළ කිරීම, බහුතරයක් නැතිව අගමැති ධුරය දැරීම වැනි නොයෙකුත් කාරණා- සඳහන් කරමින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියාට පස්සේ ඒකත් ව්‍යර්ථ වුණා. දෙවැනි වතාවට නැවතත් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒකට පාදක කර ගත්තා, මේ ජනාධිපති කොමිෂන් වාර්තාව. ඒ වාර්තාවේ අගමැතිතුමාගේ ක්‍රියා කලාපය පිළිබඳව සඳහන් කර තිබෙන දේවල් මා උපුටා දක්වන්න ඕනෑ. එම වාර්තාවේ විශේෂයෙන්ම එතුමාට විරුද්ධව කිසිම දෙයක් සඳහන් කර නොතිබීම පිළිබඳවත් මා මෙහිදී සඳහන් කරන්න ඕනෑ.

තවත් කාරණාවක් කියන්න තිබෙනවා. ඒ කාරණයට මම පස්සේ එන්නම්. මට කෙටි කාලයක් තිබෙන බැවින් මම

පැහැදිලිව මේ කාරණය කිව යුතුයි. මේ විශ්වාස භංගයෙන් අදහස් කරන්නේ වෙන මොකුත් නොවෙයි. මේක කෙළින්ම මේ රජය ඉලක්ක කරගෙන ගෙනාපු විශ්වාස භංගයක් කියන එක කාටත් පැහැදිලිව පෙනෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා සංකේතාත්මක ඉලක්කයක් විතරයි. ඒ ඉලක්කය හරහා රජයේ ස්ථාවරභාවයට හානියක් කළ යුතුයි කියලා තමයි අදහස් කරන්නේ. එතුමන්ගේ මිත්‍රයා -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Tip of the iceberg.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
"Tip of the iceberg" කියලා කියනවා එතුමාගේ පාසල් මිත්‍රයා. බිමල් රත්නායක මැතිතුමන් හිටපු ජනාධිපතිතුමා මේකට අත්සන් නොකිරීමට හේතුව කෙළින්ම කිව්වා. අපේ හිටපු ජනාධිපතිතුමන් අත්සන් නොකිරීම පිළිබඳව අපේ විමල් වීරවංශ මැතිතුමන් පත්‍රයට කියලා තිබුණා, "එතුමා අත්සන් නොකරපු කාරණයෙන් ඕනෑ නම් ආතල් එකක් ලබා ගන්න" කියලා. යම් ආස්වාදයක්, විනෝදයක් ලබා ගන්න කියලා තිබුණා. ඒ ආතල්වලට එහා යන සිද්ධියකුත් තිබෙනවා. මම කියන්නේ,- [බාධා කිරීමක්] ඕනෑ දෙයක් වෙන්න පුළුවන්. අපට ඉතා පැහැදිලිව ඒක පෙනෙනවා. බිමල් රත්නායක මැතිතුමන් පැහැදිලිව ඒක කිව්වා. දැන් කල්ලි කිහිපයක් ඇති වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ කල්ලි තුනක් තිබෙන බව බැසිල් රාජපක්ෂ මැතිතුමන් සම්මුඛ සාකච්ඡාවේදී පැහැදිලිව කියනවා. විශ්වාස භංගයට කුමක් වේවිද කියලා ඇහුවාම එතුමා කියනවා, "පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි මාරු කිරීම වාගේ දේවල් ගැන මම හිතන්නේ නැහැ." කියලා. ඉතාම පැහැදිලිව එතුමන් මේකට එකඟ නැහැයි කියලා කියා තිබෙනවා. රාජපක්ෂ පරපුර, ඊට වඩා දුරදිග බලනා නුවණින් කටයුතු කරන අය කියන එක මේකෙන් පෙනෙනවා. නමුත් මේක කෙටි කාලීන වැයමක්. ඔබතුමන්ලාට අනාගතයක් තිබෙනවා.

පසුගිය මැතිවරණයේදී පොහොට්ටුවට විශාල ඡන්ද ගණනක් ලැබිලා තිබෙනවා. දේශපාලනයේදී, ඒ අවස්ථාව එනකොට අවශ්‍ය විධියට කටයුතු කරන්න ඕනෑ තමයි. නමුත් මන්ත්‍රීවරුන් බිලි බා ගන්න ගත්තු වෑයමෙන් ඇත්ත වශයෙන්ම ආණ්ඩුව තවත් ශක්තිමත් වුණාය කියන එක කාටත් පෙනෙනවා. ඒකට ඔබතුමන්ලා අපට උදවු කළා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. දැන් බලන්න, මේ විශ්වාස භංගයට අරගෙන තිබෙන දේවල් දිහා. කෙහෙළිය රඹුක්වැල්ල කියන්නේ මගේ මහනුවර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු සගයා; මිත්‍රයා. අපට මහනුවර වෙච්ච සිද්ධීන් උඩ, ඒකත් මේකට පාදක කරගෙන, ඒකත් ඇතුළත් කිරීම තුළ ඒකාබද්ධ විපක්ෂයේ අය වෙනත් "ආතල්" එකක් ලබා ගන්නයි බලන්නේ. මේක වෙනත් විධියක "ආතල්" එකක්.

මුස්ලිම් ජනතාවගේ වේදනාව, අපේ කම්පනය, අපට වෙලා තිබෙන හානිය පිළිබඳව දේශපාලන වශයෙන් වාසි ගන්න, මුස්ලිම් මන්ත්‍රීවරුන් බිලි බා ගන්න මේක කාරණාවක් හැටියට ඉදිරිපත් කරලා තිබෙන එක මම තරයේම හෙළා දකිනවා. ඒක හරි කැත වැඩක්. මීට වඩා කාරණාවන් තිබුණත් මේකට කිසිම සම්බන්ධයක් නැති කාරණාවක් දාලා තිබෙනවා. මෙතුමා ඒ වකවානුවේ කටයුතු කරපු ආකාරය පිළිබඳව මම එතුමාත් එක්ක රණ්ඩු කරලා තිබෙනවා. ඒ සිද්ධිය වුණායින් පස්සේ ගත්තු ක්‍රියා කලාපය පිළිබඳව අපි සතුටු වෙනවා. නමුත් සිද්ධිය වෙච්ච අවධියේ ඊට වඩා ක්ෂණිකව කටයුතු කරන්න තිබුණා කියන එක පිළිබඳව අපි එතුමා එක්ක රණ්ඩු වෙලා තිබෙනවා; කථා කරලා තිබෙනවා; ඒ පිළිබඳව අපට පසුතැවිලි තිබෙනවා. එයට වග කිව යුත්තේ දේශපාලන වශයෙන් ක්‍රියා කරන ඇමතිවරු විතරක් නොවෙයි. ආයතනික වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුව ඒ ක්‍රියාදාමයේදී කටයුතු කරන ආකාරය පිළිබඳව අපි සලකා බලන්න ඕනෑ. අපේ රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමන් දැන් පියවර කිහිපයක් අරගෙන යනවා. මොකද, නීතිය ක්‍රියාත්මක කරන්න. කවුරු වුණත් වරදක් කළොත් තරාතිරම නොබලා ඒ අයට දඬුවම් දිය යුතුයි. ඒ උදවියට රැකවරණය දෙන්න එපා.

රැකවරණය දීම තුළ තමයි ප්‍රශ්න ඇති වන්නේ. නීතිය ක්‍රියාත්මක කිරීම සහ නීතිය හා සාමය ඇති කිරීම අතර වෙනසක් තිබෙනවා. Law enforcement and law and order කියන මේ දෙක subjects දෙකක්. නීතිය හා සාමය -law and order- ස්ථාපිත කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේදී ලිහිල්භාවයක්, ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තුළ ඇති වූ හානිය මේ රටට විශාල බෙදවාචකයක් වෙලා තිබෙනවා. මේ පිළිබඳව තමයි අප කතා කරන්නේ. මෙහිදී මා කාටවත් දේශපාලනික වශයෙන් ඇඟිල්ල දිගු කරන්න යන්නේ නැහැ. නමුත් එය දඩ මීමා කරගෙන, එයත් මේ විශ්වාස භංග යෝජනාවේ කාරණාවක් හැටියට දක්වමින් අග්‍රාමාත්‍යතුමාට එරෙහිව ගෙන ඒම හරහා එතුමා සංකේතාත්මක ඉලක්කයක් කරගෙන කෙළින්ම මුස්ලිම් ජනතාවගේ ආත්ම ගෞරවයට පහරක් දුන්නා කියලායි මා කියන්නේ. එය අපට වෙච්ච විශාල හානියක්, කම්පනයක්. ඒ තුළින් යම් "ආතල්" එකක්, ආස්වාදයක් ලබන ආකාරයක් තමයි පෙනෙන්නේ. දේශපාලනික වශයෙන් දඩ මීමා කරගෙන එය කාරණාවක් හැටියට ගෙන ඒම පිළිබඳව මගේ කනගාටුව මම පළ කර සිටිනවා.

ගරු කථානායකතුමනි, යම් යම් ප්‍රශ්නවලදී පක්ෂ හැටියට අපි ප්‍රතිපත්තිගරුකව තීරණ ගන්න ඕනෑ. මේ අවස්ථාවේදී මේ රජය රැක ගැනීම සඳහා -ආණ්ඩුව රැක ගැනීම සඳහා- අප ක්‍රියා කරද්දී, මේ සිද්ධීන් ගැන කතා කරද්දී අපි එක දෙයක් පිළිබඳව සතුටු වෙන්න ඕනෑ. අපට තිබෙන ආයතන දෙස බලන්න. අපේ මේ යහ පාලන ආණ්ඩුව ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම හරහා ඒ ආයතන ටික ශක්තිමත් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have three more minutes.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
I am winding up, Hon. Speaker.

මහ බැංකු වංචාව පිළිබඳව සොයන්න පත් කරපු කොමිසමේදී අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියා කලාපය දිහා බලන්න. අග්‍රාමාත්‍යතුමා කියා නොබලා සමහර නිලධාරීන් ඒ කොමිසමේදී දැඩි ලෙස කටයුතු කළා. එතැන ස්වාධීනත්වයක් තිබුණා. එය ඇති කළේ මේ ආණ්ඩුවයි. ඒ වාගේම ස්වාධීන ලෙස පොලිස් දෙපාර්තමේන්තුවත් කටයුතු කරන්න ඕනෑ. වැරැදි කරන අයට විරුද්ධව තරාතිරම නොබලා කටයුතු කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඉතාම පැහැදිලිව එක දෙයක් කියන්න ඕනෑ. මේ කොමිෂන් සභා වාර්තාවේ අගමැතිතුමාට විරුද්ධව වචනයක්වත් කියා නැහැ. නමුත් දේශපාලන වශයෙන් වුවමනාවක් තිබුණා, එතුමා ඉලක්ක කරගෙන මේ යෝජනාව

[ගරු රවුෆ් හකීම් මහතා]

හරහා එතුමා දේශපාලනයෙන් ඉවත් කරලා යම් අපේක්ෂකත්වයක් ලබාගන්න. ඒ පක්ෂයේ අභ්‍යන්තරය තුළ ඕනෑම තීරණයක් ගන්න පුළුවන්. එතුමාගේ නායකත්වය පිළිබඳව එතුමාට තීරණයක් ගන්න පුළුවන්, ඒ පක්ෂයට තීරණයක් ගන්න පුළුවන්. පක්ෂයෙන් පිට අයට ඒවාට ඇඟිලි ගහන්න බැහැ. මේ අවස්ථාවේදී මා නම් හිතන්නේ, මේ විශ්වාස භංග යෝජනාව අග්‍රාමාත්‍යතුමාට විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් හැටියට පරිවර්තනය වෙලා ඉවරයි කියන එකයි. එම නිසා මෙම යෝජනාවේදී අගමැතිතුමාට පක්ෂව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව කියමින් මම මාගේ කතාව සමාප්ත කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

[අ.භා.12.07]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, පසු ගිය පෙබරවාරි 10වන දා මේ රටේ පවත්වපු පළාත් පාලන මැතිවරණයෙන් බහුතර ජනතාවක් මේ ආණ්ඩුව කෙරෙහි තමන්ට තිබෙන අවිශ්වාසය හෙවත් විශ්වාසය භංග වීම පැහැදිලිව ප්‍රකාශයට පත් කළා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට කතා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාව පාලනය කරලා දෙන්න, මට කතාව කරන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! Let him speak.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සභාව පාලනය කරලා දෙන්න. ඔබතුමා මේ සභාව පාලනය කරන්න. ඔබතුමාට මේ සභාව පාලනය කරන්න බැරිද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! කරුණාකර ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, කථා කරනවාට භයේ කෑ ගහන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ටික ඔබතුමා පාලනය කරලා දෙන්න. ඇයි අපේ කථාවට ඉඩ දෙන්නේ නැත්තේ? ඇයි අපේ කථාවට භය? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
You must allow him to speak.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, පෙබරවාරි 10වැනිදා ජන මතය මේ සභාව ඇතුළේ කවර ආකාරයෙන් නිරූපණය වෙනවාද කියලා අපි දන්නේ නැහැ. [බාධා කිරීම්] මේ සභාව ඇතුළේ කවර ආකාරයෙන් නිරූපණය වුණත්, "මුදල් කථා කරන විට සත්‍යය නිහඬ වන්නේ ය" කියලා රුසියානු කියමනක් තිබෙනවා. මට මීට කලින් ඇහුණා, මුදල් කථා කරන හඬ. හකීම් ඇමතිතුමා කථා කළා. ඒ කථා කළේ මුදල්. මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව, අගමැතිට පක්ෂව කථා කරන්නේ මුදල්. "මුදල් කථා කරන කොට සත්‍යය නිහඬ වන්නේ ය" කියලා කියමනක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අන්න ඒ මුදල් කථා කරන වෙලාවෙත් තමුන්නාන්සේලා වෙනුවට කථා කරන්නේ මුදල්. හෘදය සාක්ෂිය වෙනුවට මූල්‍ය සාක්ෂිය තමයි තමුන්නාන්සේලාගෙන් මතුවෙලා තිබෙන්නේ.[ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඒ විතරක් නොවෙයි මන්ත්‍රීවරුනි, මේ විශ්වාස භංග යෝජනාව හරහා තමුන්නාන්සේලා සියලුදෙනාම සමාජය හමුවේ අමු නිර්වස්ත්‍ර කරමින් තිබෙනවා. සමාජය හමුවේ තමුන්නාන්සේලාව නිරාවරණය කරලා තිබෙනවා. දිගන ප්‍රදේශයේ තමන්ගේ ජනතාවට පහර දෙනකොට පොලීසිය බකන් නිලාගෙන හිටියා කියලා එදා නහයෙන් අඬපු, මේ ආණ්ඩුව ඇතුළේ ඉන්න ලජ්ජයි කියලා එදා නහයෙන් අඬපු හකීම් ඇමතිතුමා ඇතුළු ඒ නායකයන්ගේ රෙදි දැන් මුස්ලිම් ජනතාව ඉදිරියේ ගැලවිලා, නිරාවරණය වෙලා තිබෙනවා. නීතිය හා සාමය පිළිබඳව බලය දරන අමාත්‍යවරයා පොලීසිය පාවිච්චි කරපු විධිය ගැන නහයෙන් අඬපු මුස්ලිම් ඇමතිවරු අද මුස්ලිම් ජනතාව හමුවේ රෙදි ගලවාගෙන තිබෙනවා. ඒක විශ්වාස භංග යෝජනාවේ වැදගත් ප්‍රතිඵලයක් නොවෙයිද?

මේ යෝජනාව සම්බන්ධයෙන් දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යවරයා නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, "විශ්වාස භංග යෝජනාවට පක්ෂව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දය දෙනවා" කියලා. ඒ බව මාධ්‍යය මඟින් වාර්තා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවෙන් මෙතුමන්ලාගේ ඊනියා ජාතික ආණ්ඩුව දෙදරුම්

කාලා ඉවරයි. මේ විශ්වාස භංග යෝජනාවෙන් තමුන්නාන්සේලාගේ ඊනියා ජාතික ආණ්ඩුව විතරක් නොවෙයි, ඊනියා තුනෙන් දෙකේ බලයත් නැත්තට නැති කරලා ඉවරයි. ඔය පැත්තෙන් මන්ත්‍රීවරු 22කට වැඩි සංඛ්‍යාවක් මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අත එසෙව්වාම අනිවාර්යයෙන්ම තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකේ බලය ගැලවිලා යනවා. ඒ තුනෙන් දෙකේ බලය තබාගෙන මේ රටත්, ප්‍රජාතන්ත්‍රවාදයත් වළ පල්ලට දමන්න තමුන්නාන්සේලාගේ බෙලහීන ආණ්ඩුවට තිබෙන ශක්තිය නැති වෙනවා. එදා පෙබරවාරි 10වැනි දා මේ රටේ මහ ජනතාව ලබාදුන් ඒ දැවැන්ත ජනතා ජයග්‍රහණයට අනුරූපව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව දෙදරුම් කවන්න මේ විශ්වාස භංග යෝජනාව සමත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ අගමැතිතුමා මූණවත් නොබලපු මන්ත්‍රීවරුන්ගේ මූණ බලන සති දෙකක් අපි තමුන්නාන්සේලාට උදා කරලා දුන්නා. අගමැතිතුමා කථා නොකරපු මන්ත්‍රීවරුන් එක්ක අගමැතිතුමා කථා කරවන සති දෙකක් අපි නිර්මාණය කරලා දුන්නා. අගමැතිතුමා ගණන් නොගන්නා මන්ත්‍රීවරුන්ව ගණන් ගන්නා සති දෙකක් අපි නිර්මාණය කරලා දුන්නා. ඒ විතරක් නොවෙයි, මොනර කොළ තොග පිටින් තමුන්නාන්සේලාගේ සාක්කුවට වැටෙන සති දෙකක් අපි නිර්මාණය කරලා දුන්නා. බැඳුම්කර හොරකමෙන් හොරා කාපු සල්ලි සමාජගත වන සති දෙකක් අපි නිර්මාණය කරලා දුන්නා. මේ රටේ ජනතාව බදු වශයෙන් ගෙවූ සල්ලි තමයි රුපියල් ලක්ෂ 800, ලක්ෂ 1,000 හතර වටේට බෙදන්න පටන් ගත්තේ. ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඉන්නවා, එතුමා දන්නවා. ගරු කථානායකතුමනි, ඒ තත්ත්වය නිර්මාණය කරන්න මේ විශ්වාස භංග යෝජනාව සමත් වුණා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා කියනවා, අපේ ඡන්දය ගන්න අපට සල්ලි දුන්නා කියලා. ඒක බොරුවක්, ඒක බොරුවක්, ඒක පට්ටපල් බොරුවක්. එහෙම බොරු කියන්න සල්ලි දුන්නා. ඒ සල්ලි අරගෙන ඔය කථා කරන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මගේ කථාව කරගෙන යන්න අවස්ථාව දෙන්න. මොනර කොළ තමයි ඔය කථා කරන්නේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, සල්ලි නොලැබුණා නම් කෑ කෝ ගහන්න දෙයක් නැහැ, අහගෙන ඉන්න. මොනර කොළ නොලැබුණා නම් සද්ද නැතුව අහගෙන ඉන්න. ගරු කථානායකතුමනි, අද මෙතුමන්ලා සියලුදෙනාම සමාජය හමුවේ නිරාවරණය වෙමින් යනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ විශ්වාස භංග යෝජනාවත් එක්ක දෙදරුම් කාලා තිබෙනවා. ආණ්ඩුව ඇතුළට වෙලා ඇමතිකම් ලෙව කකා ඉන්න සිද්ධ වෙච්ච උන්නැහේලාට මේ විශ්වාස භංගයට පක්ෂව ඡන්දය දීලා මේ පැත්තට එන්න පුළුවන් තත්ත්වයක් අපි නිර්මාණය කර දීලා තිබෙනවා. ඒ නිසා මේ විශ්වාස භංගය තුළින් තමුන්නාන්සේලාගේ පාලනය දෙදරුම් කවලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සභාව ඇතුළේ මහ බැංකු බැඳුම්කර වංචාව ගැන මහා ලොකු කථා පවත්වපු ආණ්ඩුව ඇතුළේ ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ටික; උදාහරණයක් විධියට රන්ජන් රාමනායක මහත්මයා, චම්පික රණවක මහත්මයා මේ අය,- [බාධා කිරීමක්]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා මගේ නම කිව්වා. මම මොනර කොළවලට කවදාවත් යටත් වෙච්ච මිනිහෙක් නොවෙයි. තමුන්නාන්සේ මගේ නම කිව්වා. තමුන්නාන්සේ තමයි පාස්පෝට් දෙකක් තියාගෙන පූස් පාට දැම්මේ. -[බාධා කිරීම්]-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මොනර කොළවලට යට වුණා කියලා මම කිව්වේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොහේවත් යන ඒවා කරේ දාගන්න එපා. ඔබතුමා මොනර කොළවලට යට වුණා කියලා මම කිව්වේ නැහැ. ඔබතුමා අනුන්ගේ දේවල් කරේ දාගන්නවා නම් මම මොකක්ද කරන්නේ? ඒ නිසා ගරු කථානායකතුමනි, අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ,-[බාධා කිරීම්]- දෙවි හාමුදුරුවනේ! මොකද මේච්චර මේ කුපිත වෙලා? මොකක්ද, කුපිත වෙන්න හේතුව? ඔබතුමා මොනර කොළ ගත්තා කියලා මම කිව්වේ නැහැ. අනුන්ට කියන ඒවා තමුන්ගේ ඇහේ ගාවා ගන්න එපා.

ගරු කථානායකතුමනි, දූෂණ විරෝධී රන්ජන් රාමනායක, මහ බැංකු බැඳුම්කර වංචාව ගැන ලොකු කථා පවත්වපු රන්ජන් රාමනායක කවුද කියලා දැන් සමාජය හමුවේ නිරාවරණය වෙන්න පටන් ගන්නවා. ඇත්ත රන්ජන් රාමනායක කවුද කියලා දැන් ජේන්න පටන් ගන්නවා. ඒක මේ විශ්වාස භංගය විසින් අරගෙන දෙන ජයග්‍රහණයක්. බොරු, ව්‍යාජ දූෂණ විරෝධීන්ගේ හෙළුව නියමානුකූලව ජේන්න පටන් ගන්නවා, මේ විශ්වාස භංග යෝජනාවට ඡන්දය දෙන විධියත් එක්ක. ඒ විතරක් නොවෙයි, සිංහල බෞද්ධ අනන්‍යතාව ගැන කථා කරන ජාතික හෙළ උරුමයේ පාඨලී චම්පික රණවක මහත්මයාගේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාට දොන් ජුවන් ධර්මපාල පෙරියබණ්ඩාර කියලා නාමකරණය කරමින් කථා කළ එතුමන්ලාගේ දූෂණ විරෝධී ස්වභාවය මනා ලෙස මේ සමාජය හමුවේ දැන් නිරාවරණය වෙන්න පටන් ගන්නවා. ඒ නිසා ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මගේ කථාවට බාධා කරන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. මොකක්ද මේ වැඩේ? අපේ කථාව අහගෙන ඉන්න බැරි නම් මේ සභාවෙන් එළියට යන්න කියන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේ නම විකෘති කරලා විමල් වීරවංශ මන්ත්‍රීතුමා වෙනත් නමක් කිව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා හැන්සාඩ් වාර්තාවෙන් මම ඉවත් කරනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විමල් වීරවංශ මන්ත්‍රීතුමාට මම කියනවා, පුළුවන් නම් ඔබතුමාගේ හරි නම කියන්න කියලා. ඔබතුමාගේ හරි නම කියන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට මගේ කාලය දෙන්න. නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, චම්පික රණවක ඇමතිතුමා කියපු නමයි මම කිව්වේ. ගරු කථානායකතුමනි, අන්න ඒ අයගේ ජාතිකත්වය, එහෙම නැත්නම් දූෂණ විරෝධී ඇත්ත හෙළුව, ඇත්ත ස්වභාවය මේ විශ්වාස භංග යෝජනාව මඟින් නිරාවරණය වෙනවා. තුනෙන් දෙකේ බලයක් තියාගෙන බෙදුම්වාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගේන්න බලාගෙන ඉන්න,- අපි දන්නවා, මාස තුනකින් බෙදුම්වාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දෙනවා කියලා දෙමළ ජාතික සන්ධානයට ලිඛිතව පොරොන්දු දුන් බව. අගමැතිවරයා දෙමළ ජාතික සන්ධානයට පොරොන්දුව දුන්නා, මාස තුනකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දෙනවා කියලා. ඒ පොරොන්දුව දීලා තමයි දෙමළ ජාතික සන්ධානයේ පක්ෂපාතීත්වය ලබා ගන්න පුළුවන්කම හදා ගත්තේ. මේ දවස ගෙවිලා ඉවර වෙනකම් ඉන්න රනිල් වික්‍රමසිංහ නොවෙයි, තමුන්නාන්සේලාට හෙට ඉඳන් ආපහු මුණ ගැහෙන්නේ. හෙට ඉඳන් ආපහු මුණ ගැහෙන්නේ පරණ රනිල්; තමුන්නාන්සේලාව ගණන් ගන්නේ නැති රනිල්; පක්ෂ ප්‍රතිසංවිධාන නොකරන රනිල්; තමුන්නාන්සේලා කියන ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ නොකරන රනිල්. අද ඉන්නේ හොඳ රනිල්; කියන දේට ඇහුම්කන් දෙන රනිල්; ප්‍රතිසංවිධාන කරන්න එකඟ රනිල්; අලුත් නායකයන් ගේන්න කැමැති රනිල්. හැබැයි, අද ය 12.00න් පස්සේ තමුන්නාන්සේලාට මුණ ගැහෙන්නේ මොන ප්‍රතිසංවිධානයක්වත් නොකරන රනිල්; සියයට 39ට UNP ඡන්ද ප්‍රතිශතය බස්සපු රනිල්; සියයට 29ට ඡන්ද ප්‍රතිශතය බස්සන රනිල් තමයි තමුන්නාන්සේලාට ඊළඟට ඉතිරි වෙන්නේ. ඒ රනිල්ව කර තියාගෙන තමුන්නාන්සේලා යන එකට අපි කැමැතියි. ඒ රනිල්ව කර තියාගෙන තමුන්නාන්සේලා දේශපාලනයේ අගාධය කරා යන එකට අපි කැමැතියි. අපි ඒකට කැමැතියි, මහත්වරුනේ. ඒ රනිල්ව කර තියාගෙන දේශපාලන කනත්තට යන්න. ඒ රනිල්ව කර තියාගෙන දේශපාලන කනත්තට යන්න. එක්සත් ජාතික පක්ෂයට අනාගතයක්,- [බාධා කිරීම්] දෙවි හාමුදුරුවනේ! මේ ගැන ඇත්ත කියන කොට නේ මෙතුමන්ලාට විස කැවිලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේවා පාලනය කරන්න. ඒ නිසා තමුන්නාන්සේලා ඒ අගමැති රනිල්ව කරේ තියාගෙන යනවා නම් යන්න. යන්න තිබෙන්නේ දේශපාලන කනත්තට මිසක් වෙන කොහාටවත් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට යන්න තිබෙන්නේ ජයග්‍රහණයේ දිසාවට නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට යන්න තිබෙන්නේ පරාජයන් දිසාවට මිසක් වෙන කොහාටවත් නොවෙයි. තමුන්නාන්සේලාගේ කැමැත්ත පරාජය කරා ගමන් කිරීම නම්; පරාජය කරා යාමට අධිවේගී මාර්ගයක් නිර්මාණය කරගැනීම නම්, ඒ මාර්ගයේ තමුන්නාන්සේලා යන්න. අපට තිබෙන්නේ සුබ පතන්න පමණයි. ඒ සුබ පැතීමේ යෝජනාව තමයි අද මේ විශ්වාස භංගය ලෙස ගෙනැත් තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු කථානායකතුමනි.

තමුන්නාන්සේලා තීරණය කරන්න. පාක්ෂිකයාට එපා වුණු රනිල්ව කරේ තියාගත්ත මන්ත්‍රීවරු කවුද කියා ගමේ එක්සත් ජාතික පාක්ෂිකයාට පෙනෙනවා. පාක්ෂිකයාට එපා වුණු අගමැතිව කරේ තියාගත්ත යූඑන්පී මන්ත්‍රීවරු කවුද කියා ඒ පාක්ෂිකයා දැන ගන්න ඕනෑ. ලක්ෂ 800ට විකිණුණු අය කවුද කියලා, ලක්ෂ 1,000ට 2,000ට විකිණුණු අය කවුද කියලා ගමේ ඉන්න එක්සත් ජාතික පාක්ෂිකයාට පෙනෙනවා. එහෙම පෙනෙන නිසා මෙතුමන්ලා කලබල වෙනවා; කලබල වෙලා කෑ ගහනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුව ඇතුළේ හිටියා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පසුගිය මැතිවරණ කාලයේ මොකද කිව්වේ? බැඳුම්කරයෙන් අගමැති ඇතුළු ඔක්කොම හොරා කෑවාය කිව්වා; බලයට ආපු ගමන් හොරා කෑවාය කිව්වා; රටේ ආර්ථිකය කාබාසිනියා කළාය කිව්වා. අපි නොවෙයි, ඔබතුමන්ලාගේ පොදු අපේක්ෂකයායි මේවා කිව්වේ. ඔබතුමන්ලාගේ හංසයා. අපි නොවෙයි, තමුන්නාන්සේලාගේ හංසයා ඒ දේවල් කිව්වේ. රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළාය කිව්වා. ඔන්න එතුමාගේ කණ්ඩායමට අවස්ථාව තිබෙනවා. ඒ කියපු දේ ඇත්තට කිව්වා නම් ඒ ඇත්ත අනුව හිටගන්නේ කීදෙනාද, ඒ ඇත්තට පිටුපාන්නේ කීදෙනාද කියා අද ය 9.30 වෙන කොට බලාගන්න පුළුවන්. ඒක දැක බලාගන්න පුළුවන් වීමම, ඒ පැත්තට ඒ දෙදරවීම ඇති කරන්න පුළුවන් වීමම මේ විශ්වාස භංග යෝජනාවේ ජයග්‍රහණයක්, ගරු කථානායකතුමනි. රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ පක්ෂය ඇතුළේ දෙදරීමක් ඇති වුණේ නැද්ද? රවුෆ් හකීම් ඇමතිතුමාගේ පක්ෂය ඇතුළේ විසංවාදයක් ඇති වුණේ නැද්ද? දෙමළ ජාතික සන්ධානය

ඇතුළේ විසංවාදයක්, දෙදරීමක් ඇති වුණේ නැද්ද? මේ විශ්වාස භංග යෝජනාවත් එක්ක, - [බාධා කිරීමක්] හරි හරි. කෝටි පහ ගණනේ බෙදුවාට පසුව විසංවාදය තාවකාලිකව තුනී වෙනවා තමයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමන්ලාට ඒක පුළුවන්. කෝටි පහ ගණනේ බෙදුවාට පසුව විසංවාදය තාවකාලිකව දුරු වෙනවා; දුරිභූත වෙනවා. ඒක හරි. හැබැයි කෝටි පහට මේක රැකලා තියාගන්න පුළුවන් කාලය සීමිතයි. අගමැතිතුමාගේ දේශපාලන ප්‍රාණය බේරුණොත්, ආණ්ඩුව පැත්තේ ඉඳගෙන අගමැතිතුමාට වැඩේ දෙන්න බලාගෙන හිටපු අයට හෙට උදේ ඉඳන් අගමැතිතුමා කොහොම සලකයිද? ඒ දෙදරීම බලබලා විපක්ෂය පැත්තට වෙලා ඉන්න එක මොන තරම් සතුටුදායක වැඩක්ද? හකීම් ඇමතිතුමනි, ඒක බලාගෙන ඉන්න එක අපිට සතුටුදායක නැද්ද? පසුගිය දවස්වල ඔය පැත්තේ ඉඳගෙන, "අපි අගමැතිතුමාට වැඩේ දෙන්නම්" කියලා කෑ ගහපු පාලිත රංගෙ බණ්ඩාර මහත්මයාට අගමැතිතුමා පිටිපස්සෙන් ගිහින් "දඩේරියං" ගාලා පොලු පහර නෙළන කොට ඒක බලාගෙන ඉන්න එක අපිට සතුටක් නොවෙයිද? ඒ ජවනිකා නිර්මාණය වීමට නියමිතයි. ඒ ජවනිකා ඉදිරියේදී ගලාගෙන ඒමට නියමිතයි. තමුන්නාන්සේලා ඇති කරගෙන තිබෙන අර්බුදය අද රෑ නවයහමාරෙන් පසුව අවසන් වන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ තුනෙන් දෙකේ බලය නැති වෙනකොට, ආණ්ඩු පක්ෂයට මෙතෙක් කල් අත උස්සපු 20කට වැඩි සංඛ්‍යාවක් මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂ වෙලා විපක්ෂය පැත්තට ඇවිත් හිටගන්න කොට තුනෙන් දෙකේ බලය තියාගෙන මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළලන්න සූදානම් වුණු ආණ්ඩුවේ පරාජයක් හැටියට ඒක පේන්නේ නැත්නම්, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ කාලය අවසානයි.

මීළඟට, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
එතුමාට එම කාලය ලබාදෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
හොඳයි. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ වෙලාව දෙන්නම්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් බණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? මෙතැන disturb කරන්න එපා. අද දවසේම අපි මේ විවාදය ගෙන යන්න ඕනෑ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් බණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මම ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගෙන් අහන්නේ මෙපමණයි. ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව දිනනවාද, නැද්ද? ඒක කියන්න ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි. ඔබතුමා නිකම් මේ බයිලා ගායනා කරන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා points of Order වැරදි විධියට පාවිච්චි කරනවා නම් මම ආපහු අවස්ථාව දෙන්නේ නැති වෙයි. Points of Order නිවැරදි ලෙස පාවිච්චි කරන්න. මේ සභාවේ ඉන්න කාටත් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, එතුමා නම් හම්බ වුණු ගණන අද රෑ කැසිනෝ -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ආයෙත් අවුස්සා ගන්න එපා. ඔබතුමාට විනාඩියක කාලයක් ලබාදුන්නේ කථා කරන්න නේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
මේ විශ්වාස භංග යෝජනාව ආණ්ඩු පක්ෂය ඇතුළේ දෙදරවීම නිර්මාණය කළා; මේ නිසා එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ විරෝධී මන්ත්‍රීවරු කවුද කියන එක එළිවෙන්න පටන් ගත්තා. සජිත් ප්‍රේමදාස මහත්මයා අලුත් සූට් මහන්න පටන් ගත්තේ නැද්ද? එතුමා නිවාස යෝජනා ක්‍රමයක් විවෘත කරනකොට, "මේක මේ ආණ්ඩුව යටතේ විවෘත කරන අවසන් නිවාස යෝජනා ක්‍රමය වෙයි" කියලා කිව්වේ නැද්ද? එතුමන්ලා සූට් මැහුවේ නැද්ද? ඒ තත්ත්වය ඇති කරපු එක නරකද? සූට් මහගෙන අඳින්න බලාගෙන සිටි අය දිහා අගමැති වික්‍රමසිංහ මහත්මයා නිකම් බලාගෙන ඉඳියිද? තමුන්නාන්සේලා එතුමාගේ දේශපාලන ප්‍රාණය බේරා දුන්නාට පසුව එතුමා ඒ කට්ටියට ඊළඟ පෝරියල් එක පටන් ගන්නවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපේ පැත්තෙන් බැලුවොත්, ඕනෑ කරන දේ අපි ඇති කර තිබෙනවා. "ඔය ගොල්ලෝ බෝම්බයක් ගැහුවා" කියලා හකීම් ඇමතිතුමා මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට කියා තිබුණා. "ඔය ගොල්ලෝ බෝම්බයක් ගැහුවා, අගමැතිතුමා පණ අදිනවා." මේ මම නොවෙයි කියන්නේ, හකීම් ඇමතිතුමායි. "ඔය

[ගරු විමල් වීරවංශ මහතා]

ගොල්ලෝ බෝම්බයක් ගැහුවා; අගමැතිතුමා පණ අදිනවා; සිරිසේන ජනාධිපතිතුමාගේ පැත්තෙත් කවල්; සම්පන්දන් මැතිතුමාගේ පැත්තත් බෙදුණා; හැම තැනම බෙදුණා; ඔය ගොල්ලන්ට කිසි තුවාලයක් නැහැ; ඔය ගොල්ලෝ ජොලියේ බලාගෙන ඉන්නවා." අද නොවෙයි, ඊයේ හිටපු හකීම් ඇමතිතුමා දීපු විග්‍රහය ඒකයි. අද ඉන්න හකීම් ඇමතිතුමා, ඊයේ හිටපු හකීම් ඇමතිතුමා නොවෙයි. මේ ඉන්නේ වෙන හකීම් කෙනෙක්.

ගරු කථානායකතුමනි, මොනර කොළවලට කරන්න පුළුවන් දේවල් තිබෙන බව අපි දන්නවා. මොනර කොළවලට සමහර මළ මිනීවලටත් පණ ලබා දෙන්න පුළුවන් ඇති. හැබැයි, ඒ මළ මිනීවලට පණ දීලා, මේ විශ්වාස භංගයට විරුද්ධව ඡන්දය දීලා, මහ ජනයා තමුන්නාන්සේලාව දේශපාලන වශයෙන් කනත්තට දක්වන එක වළක්වන්න බැහැ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පළාත් සභා මැතිවරණය පවත්වන්න; පාර්ලිමේන්තු ඡන්දය පවත්වන්න. තමුන්නාන්සේලාට ජන වරමක් නැහැ; ජන බලයක් නැහැ. ජන වරමක්, ජන බලයක් නැති බව පෙබරවාරි 10 ඔප්පු කරලා අවසානයි. මොනර කොළවලින් ආම්බාන් කර ගන්න මන්ත්‍රීවරුන්ගේ බලයක් තියාගෙන, ඒ ජන වරමක් නැති ගමන යන්න තමුන්නාන්සේලාට අයිතියක් නැහැ. ඒ නිසා අගමැතිතුමාට ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ ඔළු ගෙඩිවලින් දිනන්න පුළුවන් නම්, "දිනුවා" කියලා සාඩම්බර කථා කියා කියා ඉන්නේ නැතිව, පුළුවන් නම් පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන්න කියලා අපි අභියෝග කරනවා. පුළුවන් නම් මහ මැතිවරණයකට ඉඩ දෙන්න; පුළුවන් නම් පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න; පුළුවන් නම් මහ ජනයාගේ ඡන්දයට මුහුණ දෙන්න. තමුන්නාන්සේලාට ඊට මුහුණ දෙන්න බැහැ.

ගරු කථානායකතුමනි, මහ බැංකු හොරකම කියන්නේ සුළු පටු හොරකමක් නොවෙයි. දැන් මේ ගරු සභාවේදී කථා කරපු අය කිව්වා, "ඒ හොරකමෙන් වෙච්ච අලාභය මහ බැංකුවේ එකතු කරලා තියාගෙන ඉන්නවා" කියලා. එහෙම කරලා නැහැ. මේකෙන් වෙච්ච පාඩුව කොච්චරද කියලා ගණන් බලලා නැහැ. අර්ජුන මහේන්ද්‍රන් තවම සිංගප්පූරුවට වෙලා ඉන්නවා. අර්ජුන මහේන්ද්‍රන් ගැන වගකීම ගන්නවා කියලා කියපු අගමැතිතුමා අද ඒ වගකීම ගන්නේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන්ව ගෙන්වන්නේ නැහැ; අධිකරණය හමුවට පමුණුවන්නේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන් ජනාධිපති කොමිසමට කිව්වා, "මම සියල්ල කළේ අගමැතිතුමාගේ උපදෙස් අනුව" කියලා. මහ බැංකු බැඳුම්කර හොරකමේ මහ මොළකරුවායි තමුන්නාන්සේලා මේ ආරක්ෂා කරන්නේ. මේ හොරකම ප්‍රකෝටි ගණනක අලාභයක්; මේ රටේ ආර්ථිකයට බලපාපු හොරකමක්; බැංකු පොලී අනුපාතය ඉහළ දමපු හොරකමක්; මේ රටේ ආර්ථිකය බෙලහීන කරපු හොරකමක්. ඒ හොරකමේ මහ මොළකරුවායි තමුන්නාන්සේලා ආරක්ෂා කරන්නේ.

දිගන ප්‍රදේශයේ ඇති වුණු සිද්ධියේදී මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා, "මේ ආණ්ඩුවේ ඉන්නත් ලජ්ජයි" කියලා. මේ ආණ්ඩුවේ ඉන්නත් ලජ්ජයි කියාගෙන අගමැතිතුමාට පක්ෂව ඡන්දයත් දෙන කොට තමයි මාරම ලජ්ජා; පට්ටම ලජ්ජා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඒ අනුව මුස්ලිම් ජනතාව ඒගොල්ලන්ගේ නායකයන්ගේ තත්ත්වය තේරුම් ගනීවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තමුන්නාන්සේලා මහ බැංකු බැඳුම්කර වංචාවෙන් මුදල් හොරකම් කරලා, ඒකෙන් මඩිය තර කරගෙන, ඒ සල්ලිවලින් මන්ත්‍රීවරු මිල දී ගෙන, මේ විධියට පාර්ලිමේන්තුවේ බලය පවත්වාගෙන යන්න උත්සාහ කළාට රටේ මහ ජනතාව ඒ විධියට තමුන්නාන්සේලාට ආම්බාන් කරන්න ලැබෙන්නේ නැහැ. පසු ගිය ඡන්දයේදී තිස්සමහාරාමයේ මොන තරම් දේවල් බෙදුවාද? සිමෙන්ති දුන්නා; වෙක් දුන්නා; නිවාස ණය දුන්නා: ආධාර දුන්නා; පින්තූරය දුන්නා; බස් දුන්නා; නොදීපු දෙයක් නැහැ. අන්තිමට තිස්සමහාරාමයේ මිනිස්සු,-

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී මගේ නම සඳහන් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මන්ත්‍රීතුමා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම සඳහන් කළ නිසා මම එතුමාට කතා කරන්න අවස්ථාව ලබා දෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
විමල් වීරවංශ මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ ඉන්න එක ගැන මම ලජ්ජා වනවාය කියලා ඒ සිද්ධියේදී කියපු බව ඇත්ත. නමුත් මම ඊට වඩා ලජ්ජා වනවා, මේ පාර්ලිමේන්තුවේ මේ ගොල්ලන් එක්ක ඉන්න වීම සම්බන්ධයෙන්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, එතුමා එතුමාගේ ලජ්ජාවේ ප්‍රමාණය පෙන්නුවා. එය පෙන්නුවාට බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් කථාව කරගෙන යන්න. ඔබතුමාට කථා කරන්න තව කොච්චර වේලාව ඕනෑද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමාට පින්සිද්ධ වෙන්න කිසිම බාධාවක් නැතිව මම හොඳට කථාව කරගෙන යනවා, ගරු කථානායකතුමනි. අවසාන වශයෙන් මම තමුන්නාන්සේලාට කියනවා, අපිට ඕනෑ ප්‍රයෝජන අපි අරගෙන අවසානයි කියලා. විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා, ආණ්ඩුව පෙරළලා, ඇමතිකම්, අගමැතිකම් ගන්න නොවෙයි අපි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. අපි මුල ඉඳලාම කිව්වා, "අපි කිසිම තනතුරක් ගන්නේ නැහැ. අපි මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ මෙන්න මේ දේශපාලන රසායනික වෙනස කරන්න. දේශපාලන රසායනික පරිවර්තනය කරන්න" කියලා. ඒ දේශපාලන රසායනික පරිවර්තනය සිද්ධ වුණා. එය සිද්ධ වෙලා අවසන් වෙන්නේත් නැහැ. මෙතැනින් එහාට ඒ පරිවර්තනය තවත් දිග් ගැස්සෙනවා. ඉරි තලන ලද රේඛාවන් තව-තවත් පුළුල්ව පැතිරෙනවා. තුනෙන් දෙක ගැලවෙනවා. තමුන්නාන්සේලාගේ ජනතා ද්‍රෝහී න්‍යාය පත්‍රය හිතූ හිතූ අත දිගෙලි කරන්න තිබෙන හැකියාව නැති කෙරෙනවා. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ඒක තමයි අපි මුල ඉඳලාම කිව්වේ "දින්නත් දිනුම් - පැරදුණත් දිනුම්" කියලා. හකීම් ඇමතිතුමා කියපු විධියට බෝම්බය ගහලා කට්ටියකට තුවාල වෙයි; අපිට තුවාල නැහැ; අපි ජොලියේ බලාගෙන ඉන්නවා; ඒක තමයි අපේ දිනුම.

ගරු කථානායකතුමනි, ජනතා ද්‍රෝහී අග්‍රාමාත්‍යවරයෙකු ඇතුළු පාලනයක් වෙනුවෙන් අත උස්සන මන්ත්‍රීවරු කවුද, විකිණිච්ච මන්ත්‍රීවරු කවුද, රෙදි උනා දමා මහ ජනතාවට සහ ජාතියට පෙන්වන මන්ත්‍රීවරු කවුද කියලා අද ඊ 9.30ට බලා ගන්න හැකි වේවා! කියලා ප්‍රාර්ථනා කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා 12.28]

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)

ගරු කථානායකතුමනි, ගරු වීරවංශ මන්ත්‍රීතුමා දැන්මම පරාජය පිළිගෙන ඉවරයි. ඒකයි අපට කනගාටු. [බාධා කිරීම්] එතුමා කියනවා යහපාලනය දෙදරා යනවා කියලා. නමුත් මේ විශ්වාස භංග යෝජනාවෙන් යහපාලනය පිරිසිදු වුණා. ඒකයි අපි කියන්නේ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මගේ හොඳ මිත්‍රයා. එතුමාගේ පියාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා පසුව එක්සත් ජාතික පක්ෂයේ ඇමතිකමක් අරගෙන මේ පැත්තට ඇවිල්ලා හිටගත්තා, ඒ කාලයේ. මම තමුන්නාන්සේට කියනවා, මෙහාට එන්න කියලා. [බාධා කිරීම්] කාලය නාස්ති කරන්න එපා. බලන්න, දැන් කියපු කථාවලින්, ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛනවලින් පෙනී යනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පවා තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැහැ කියලා. දහයකට වැඩිය ඡන්දය හම්බවෙන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් මිසක්, වෙන දේවල් අහන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුවයි මම මේ රීති ප්‍රශ්නය මතු කරන්නේ. මෙතුමාගේ ඡායාරූපයක් facebook එකේ තිබුණා. ඒකට මොකක්ද දන්නේ නැහැ, වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ පක්ෂය මේකට පක්ෂව ඡන්දය දෙන්නේ නැහැ. ඒ වාගේම මනෝ ගනේසන් මැතිතුමාගේ ඡන්ද හම්බවෙන්නේත් නැහැ. ඒ අනුව අනිවාර්යයෙන්ම අපට ඡන්ද 122ක් තිබෙනවා. තමුන්නාන්සේලාට තිබෙන්නේ ඡන්ද 80යි. ඒ අනුව වැඩි ඡන්ද හතළිස් ගණනකින් මේ යෝජනාව පරාජය වෙනවා කියන එක මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. [ඝෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා!

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ නිසා තමුන්නාන්සේලා කාලය නාස්ති කරන්න එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද ඔක්කෝම හම්බවෙයි කියලා තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණා. [බාධා කිරීම්] එතැනත් පොඩි පොල්ලක් තියලා තිබෙනවා. දැන් ඉතින් කථා කරලා වැඩක් නැහැ. දැන් වේලාව දොළහමාරයි. ඔය යෝජනාව ඉල්ලා අස් කරගෙන, දවල්ට කාලා අපි ඔක්කෝම ගෙදර යමු කියලා ඉල්ලීමක් කරමින් මා නිහඬ වෙනවා. [බාධා කිරීම්]

[12.30p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Speaker, for the opportunity given to speak on the No-Confidence Motion on the Prime Minister today. A No-Confidence Motion on a Prime Minister, in any Parliament, is a very serious matter. Nobody moves a No-Confidence Motion on a Prime Minister on trivial issues. So, this Debate has to be conducted in a manner that requires the seriousness. But it is a matter of regret that those very Hon. Members who have signed this Motion have now reduced it to a joke. They themselves presented a Motion and not even half way through the Debate, we find that they have conceded that they cannot pass the Motion and they are reducing the Debate and the Parliament to a joke. When we participate in this Debate, we want to constructively engage with the issues that have been raised. The Hon. Leader of the Opposition who spoke earlier in the day, clarified our position with regard to corruption in this

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

country. I want to reiterate that fact that none of us want to allow corruption to continue in this country.

This Government, particularly, has received a mandate from the people to fight corruption. In the January, 2015 Presidential Election, that was most pronounced. That was one of the key issues on which the people of this country voted for a common Opposition candidate - to fight corruption. Not only corruption, but there were very serious issues faced by this country that had to be addressed, resolved and the direction that the country was taking had to be changed, and persons from varied political backgrounds joined hands in that exercise. All of us having realized that the direction the country was taking must be changed took that decision and a common Opposition candidate was decided upon and all of us worked together and brought about that change.

Thereafter, at the General Election held in August 2015, a National Government was formed and that was put forward to the people. During the first eight months in 2015, the idea of a National Unity Government was put forward. We had during that time the Leader of the Sri Lanka Freedom Party as the President of the country and the Leader of the United National Party as the Prime Minister of the country and they went before the people and asked for a mandate. That mandate was given. Unfortunately, some people who were elected from the United People's Freedom Alliance - UPFA - decided to go against that mandate and left the Government of National Unity that was formed by the Leaders of the two Parties and chose to sit in the Opposition. That was the first challenge that was posed to the Government of National Unity and the country had to continue in a different direction. Today, that group of MPs who worked against the mandate received by their Party Leader have forwarded a Motion of No-Confidence on the Prime Minister. That is one reason why we take the view that this is a first step in the assault against the Government of National Unity that has a popular people's mandate. Perhaps, the second would be aimed at the Speaker's Chair, and the third at impeaching the President himself. That design goes against the mandate that the people of this country from all parts, not just from one community but from all communities, granted mainly to the two main Parties of this country.

There is, in this Motion that is under debate today, a certain reference to the events that occurred in the Kandy District about which the Hon. Rauff Hakeem spoke in his address. But, Hon. Hakeem has missed a very important part in that reference in the Motion. That part says, "by failing to take immediate measures to provide protection to Sinhalese, Tamil and Muslim people." It says that the Prime Minister, as the Minister-in-Charge of Law and Order, failed to take immediate measures to provide protection to Sinhalese, Tamil and Muslim people. I wonder why Sinhalese and Tamils are mentioned in that section. Today, when the Hon. Hakeem made reference to that, the whole country knows and even those who have signed this Motion concede that that was violence against the Muslim people. This shows the minds of those who have signed this Motion. They are so reluctant to say that the Muslim people were not protected. So, they have to include the Sinhalese and the Tamils also in it. They are loath to concede that a minority people of this country were the targets of that violence. So, one can see the racist outlook of those who have signed this Motion including the Hon. K. Kader Masthan. I make mention of this because the Hon. Bimal Rathnayake referred to the fact that there is a rumour floating that says that the UNP should not win this Vote of No Confidence with the vote of the Tamil National Alliance, because that will be detrimental to them. It is the same racist thinking that put that thought forward and I heard it a moment ago from the Opposition Bench, the last speaker, mentioning the TNA by name. It is a message to the majority people of this country. It is to arouse communal racist feelings within the majority community that these thoughts are being put forward. I am asking you, what is wrong with the TNA voting in this Motion before the House? Do Tamil people not have a right? Do the Tamil people of this country not have a democratic right to participate in this process? Is that what is being said? I do not know who said it. I do not know whether President said it. Even if the President said it, I am putting the question to the President, if he said it. In fact, the rumour says that a particular Minister asked the President, "So, it was good enough for you to win with the votes of the Tamil people, but the UNP should not win with the votes of the Tamil people." I hope the President did not say it. I hope it is only a rumour. But, that thinking is prevalent and that is a matter that I want to raise. That thinking says that they will have currency if that idea is floated. This, I think, is an issue of fundamental importance. So long as people think in those lines, there is no redemption for this country; so long as people think that it is only the Sinhalese or only the Buddhists matter in this country, there is no redemption for this country and that is why we are repeatedly making mention today of the mandate that this Government got to draft and adopt a new Constitution for this country; a new social contract in which all the people of this country, for the first time, can agree upon.

The Hon. Leader of the Opposition read out the speech that the President made here saying that in the previous Constitution, there was no consensus. It is of utmost importance that the fundamental law of this country, the supreme law of this country, the social contract, has the consent of all the people. It certainly must have the consent of the Sinhala people, of the Buddhist people. After all, they are the majority in numbers. But, that is not sufficient. It must have the consent of the Muslim people; it must have the consent of the Tamil people and all other different communities that live in this country. It is only then that this country can be called a united country. It is only then that this country can move forward. The one bane that this country has suffered ever since Independence is that fact - non-acknowledgement of the fact that there are different peoples of this country who inhabit this Island.

The Resolution that was put forward on the 9th of January, 2016 and adopted on the 9th of March, 2016, was the effort that was started. This House adopted that

Resolution unanimously. I heard the Hon. Wimal Weerawansa say a moment ago that the Prime Minister has agreed with the Tamil National Alliance that a new Constitution would be adopted in three months' time. What is wrong with that? He has not given us any such guarantee, but he should. After all, it is this House that adopted that Resolution unanimously. You were in this House when this House adopted that Resolution unanimously. What were you doing then? You should be happy if it is adopted in three months' time without any further delay, because you were party to that Resolution that was adopted by this House unanimously. That is not something that the Tamil National Alliance is doing secretly with the UNP or anybody else. There is a Steering Committee in which every political party is represented in this House. He is a Member. Even the Hon. Douglas Devananda's party, which is a single-Member party, is represented in the Steering Committee. An Interim Report was submitted in September last year to the Constitutional Assembly. Seventy Six meetings were held by the Steering Committee. There were six Subcommittees and another *Ad hoc* Committee. All of them were reported to the Constitutional Assembly. It is a joint effort. Nothing was being done behind anybody's back. That is one reason why the Tamil National Alliance has consistently maintained that the new Constitution must be put to the people at a referendum. The people of this country must agree and adopt that Constitution and it should not be done behind anybody's back. It is that kind of a transparent procedure. Why is he pointing an accusing finger, if that is to be done?

We urge the Government that those proceedings must be restarted immediately. There has been a long delay, an unnecessary delay. The Constitutional Assembly procedure must be expedited and brought to an end. After all it is the unanimous view of this House that that must happen. We raise this issue with the Government now that that must be done. There are several other issues and I want to itemize them and mention them here today. Whatever happens to this Motion, this is also an opportunity for us as substantially representing the Tamil people from the North and East to openly lay before this House, before the President and the Prime Minister the various concerns that we have with regard to the performance of this Government in the last three years. Our people are most disgruntled and very disappointed. There is no problem with the direction in which the Government is moving; the direction was changed. But it is not moving most of the time or it is so slow that you cannot notice a movement. That has affected and that is seriously affecting the lives of our people.

We have constantly raised the issue of Tamil political prisoners; I used the word advisedly, "political prisoners." If it was all right for Janatha Vimukthi Peramuna, who took up arms twice against the lawfully constituted Government of this country, to be pardoned, because all they tried to do was to achieve a political objective and that is why they were "political prisoners"; so are those detained under the Prevention of Terrorism Act now. They were only attempting to achieve a political objective. Several of them have spent 20 years in prison without their case being concluded. The maximum penalty under the PTA is 20 years. Case is not concluded. That armed revolt is over; it was over nine years ago; that political objective is no more extant in this country. Thereafter in the last nine years, our people have repeatedly voted for us and they repeatedly say, "We stand for a united, undivided and indivisible country." That early political objective no longer exists. Why can you not pardon those who have been convicted under the PTA? Why can you not release the others who have been held in long detention? What the Mahinda Rajapaksa Government did, you are unable to do. They released nearly 12,000 cadres of the LTTE who fought in the final war after a two-year rehabilitation and you are still keeping people who gave a food packet to someone 20 years ago. They are still being detained. Naturally, our people are very concerned and questioning the *bona fide* of this Government.

Then, on land releases, President Maithripala Sirisena gave a written undertaking. That was the only written undertaking given. I am glad that the Hon. Patali Champika Ranawaka, Minister of Megapolis and Western Development, is here. With regard to private land releases, you will remember that you wrote the promise that was to be given by the candidate Maithripala Sirisena with your own hand and it was sent to him when he was in the East before the Presidential Election. Nobody objects to that; no one in this country objects to that. There is no war in this country. Security concerns are legitimate. For security purposes, if the military requires land, that can be held by the military. We are not opposed to that, but these are large swathes of land. Even today, we acknowledge that a lot has been done; but not enough. This should have been done in 100 days. Now, after three years, we are still struggling.

Sir, Government farms are still being held and cultivated by the military. Why does the military have to do this? Thirteen such farms in the North alone are being run by the military. They are running preschools close to those farms. Those children wear military emblems. Do we need this nine years after the war ended? How do you work for reconciliation? How do you turn the minds of those people if such intense military presence continues?

Then, there is the repeal of the Prevention of Terrorism Act. The Government promised a Counter Terrorism Act would be enacted in its place. I know that the process is on, but how long is it going to take? The PTA was brought into operation in 1979 as a Temporary Provisions Act for six months. Even today the title to that Act says, "Prevention of Terrorism (Temporary Provisions) Act" . It was extended until 1981 and then that Clause that said it is "temporary" was removed. But the title still says, "Temporary." For 30 years, it is, "Prevention of Terrorism (Temporary Provisions) Act" and nine years after the armed revolt ended, it is still extant. Why can that not be repealed immediately? Is anybody in this House opposed to that? There are serious complaints from our people in the North and the East.

For administrative structures and Local Government structures, Hon. Rauff Hakeem, there has been a longstanding demand to upgrade the Tamil Divisional

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Secretary's area in Kalmunai. A Cabinet decision was taken in 1993, but it is still not implemented. Hon. Minister, we require your intervention and cooperation in this.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Yes.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you.

There are other issues like appointing Government Agents in the North and the East. To areas that are nearly 100 per cent Tamil - you know, the language of administration there is Tamil - Government Agents who do not know Tamil are sent. So, how do they carry out their work? There was one Government Agent in Vavuniya called, Mr. Pushpakumara. He was conversant in Tamil; he worked in Tamil, but others are not. So, how can they perform? Presently, both Government Agents in Vavuniya and Mannar cannot function in Tamil. It is not that there are no officers available; there are enough Tamil officers available. So, naturally our people are telling us, "You support this Government. You say they are working for reconciliation. But see, what is happening here."

With regard to Government jobs, recently six drivers who are residents of Galle turned up in the Jaffna Kachcheri. Why should drivers to Jaffna Kachcheri be appointed from Galle?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Because the Minister is from Galle.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Yes, and peons and security guards to schools are appointed from Kuliyapitiya. In fact, one of our MPs the other day said that the reason for coconut prices to rise is that there is nobody available to pluck coconuts in Kuliyapitiya. They are all being given peon jobs and sent to Jaffna. - [*Interruption*.] Now I can see accusations being traded from this side to that. That is the culture - political patronage.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
So then, why are you voting? - [*Interruption*.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No. We do not take - [*Interruption*.] Wait. We do not take political office and no political patronage comes from us. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please do not disturb. Hon. Sumanthiran, you go ahead. Do not get entangled.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Yes, I know.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Otherwise, there will be unnecessary disturbances.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No, we have a right to participate. Again that is being questioned unnecessarily.

Sir, there were factories that were closed in the North and the East due to the war. None of it has still been resuscitated or restarted. We have been asking the Government. That would provide employment to our people. Unemployment is a very serious problem there.

Then there is a very important issue of Mahaweli development.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have only four more minutes.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Okay, thank you, Sir.

Mahaweli development scheme has been a serious issue for several decades. To the areas that are being demarcated as Mahaweli areas, the ordinary laws of land alienation, et cetera does not apply. Then, there is post-colonization that happens. This has happened in several schemes of Mahaweli development. This was the reason why through the Banda-Chelva Pact in 1957 and very particularly, through the Dudley-Chelva Pact in 1965, land alienation principles were enunciated. This is one of the root causes of the conflict. It is still being perpetuated.

We want water. So, give us only water. We have people there who need water. Presently, in the Mullaitivu District, there are efforts being taken to only bring people, not water. There are people living there who need water. Send water, we will gladly receive it. Do not send people there. If there is any land to be alienated, do it in a way with preference to the landless people of that District without affecting the demography. This is a very, very sensitive issue and I want to raise it publicly today with the Government.

With regard to migrant fishermen in the North and the East, particularly in the Mullaitivu area, there has been a practice. Migrant fishermen do come from the West on various seasons, but there have been laws and long-standing practices as to how that is done. All that is being violated with permits being given by the Director General of the Department of Fisheries and Aquatic Resources against the law with the active support of the military who is present there. This has gone on for several years and it is still happening. The Minister of Fisheries and Aquatic Resources came, had a discussion at the District Secretariat in Mullaitivu and gave orders to stop that. The very next day, that was violated.

So, these are issues that we want to publicly, transparently and openly raise with the Government today at a time when for other reasons, a Vote of No Confidence has been moved. We will not be party to further those other objectives of others who have moved this Motion as a first step towards destabilizing the National Unity Government and turning the direction of this Government back again to a destructive path. We will not lend our hand to that. We are very clear with regard to the mandate that the people of this country gave to President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe and there is yet time for them complete their mandate. We are disappointed with the progress. But, nevertheless, we want that done in the remaining two years that this Government has.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your time is running out, Hon. Member.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Therefore, we will act in this House today with a view to giving the Government that space to complete the performance of that mandate. Thank you.

[1.01p.m.]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, මෙම වැදගත් අවස්ථාවේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ස්තුතිවන්ත වනවා.

The Hon. M.A. Sumanthiran's speech was more of an eulogy on the problems of the Tamil people in the North and the East than on the No-Confidence Motion. Nevertheless, I also feel the pain in his heart, especially when he mentioned that the Mahinda Rajapaksa regime released 12,000 fighters in two years and our Government has not been able to do that. So, certainly, these are problems that we should look at constructively, objectively and most importantly humanely. Especially, if a person has been charged and if there is no evidence to proceed with the case, I just do not see why we are holding on to those people. So, those kinds of quick political and administrative decisions have to be taken.

අපේ විමල් වීරවංශ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැති වුණත් මම කියන්න ඕනෑ, එතුමා අද එතුමාගේ කථාවෙන් අඩු ගණනේ අපට එක ඡන්දයක් හෝ අරගෙන දුන් බව. වැට උඩ තිබුණු ඡන්දයක් එතුමාගේ කථාවෙන් අපේ පැත්තට හරවා දීම ගැන මම එතුමාට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාව ගරු අගමැතිතුමාට හා ආණ්ඩුවට විරුද්ධව ගෙනාපු එකක්. එය දීප ව්‍යාප්ත, ඉතාම කූට දේශපාලන ව්‍යාපෘතියක් බව මා පෞද්ගලිකව දන්නවා. මම මේ වගකීමෙනුයි කියන්නේ. මධ්‍යම පළාත නියෝජනය කරන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක ඇමතිවරයෙක් ප්‍රකාශ කරලා තිබෙනවා, අගමැතිතුමා ඉවත් කරලා රූකඩයක් දමලා, ඊට පසුව football එකකට වාගේ ඒ රූකඩයට ගහලා අයින් කරලා, අපි කැමති එක්කෙනාව අපි දමනවා කියලා. මම මේ වගකීමෙනුයි කියන්නේ. ඉතින්, මේ වාගේ දේශපාලන කුමන්ත්‍රණ සිදු වන බව අපි දන්නවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නහයෙන් පෙන්වන්න බැරිද?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මම ඉඟියක් දුන්නා නේ, මධ්‍යම පළාතේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, why do you not carry on with your speech?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මම දන්නවා, ඒ කවුද කියලා ඔබතුමා දන්නවා කියලා.

එක්සත් ජාතික පක්ෂයේ අපට යම් ගැටලුවක් තිබෙනවා නම්, ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ප්‍රශ්නය විසඳා ගන්න අපට අවකාශය තිබෙනවා; අවස්ථාව තිබෙනවා; හැඟීම තිබෙනවා. විශ්වාස භංග යෝජනාවක් හරහා අපේ පක්ෂයේ නායකයා ඉවත් කරන්න උත්සාහ කරන එක ඉතාම ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙළක් හැටියට මා දකිනවා. I look at that whole process in repugnance as an aberration of Parliamentary Democracy, because the issue of the UNP leadership, the reforms in the UNP and this particular No-Confidence Motion - I will come to the substance of it in a moment.- should not be conflicted or there should be no relationship between the two. එම නිසා අපේ එක්සත් ජාතික පෙරමුණු කණ්ඩායම ඒකමතිකව එකමුතු වෙලා, අද මේ විශ්වාස භංග යෝජනාව පරාජය කිරීමට කටයුතු කරනවා කියන එක මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ වාගේම අද උදේ තිබුණු භීතිකාව අපට නැහැ. ඒකට ප්‍රධාන හේතුව අපි දන්නවා. This has been an anticlimax because we certainly took upon ourselves to work hard and save the Government. එවැනි ලොකු challenge එකක් අද අපට පෙනෙන්නට නැහැ.

විශේෂයෙන්ම මේ විශ්වාස භංග යෝජනාව අත්සන් කළ පිරිසත් අද ඇවිල්ලා නැහැ. භාර දුන් නායකයිනුත් අද ඇවිල්ලා නැහැ. මා හිතනවා, අද හැන්දෑ වන විට එයි කියලා. නමුත් මීට

[ගරු නවින් දිසානායක මහතා]

වඩා මේ විශ්වාස භංග යෝජනාව පිටුපස සිටින්නේ, ඒකට වුවමනාව තිබෙන්නේ, නායකත්වය දෙන්නේ, විශේෂයෙන්ම නඩු හබවලට සම්බන්ධ, චෝදනා එල්ල වෙලා තිබෙන යම් කිසි පිරිසක් බව ඉතාම පැහැදිලියි. ආණ්ඩුව වැටිටවීමෙන්, ආණ්ඩුවේ ස්ථාවරභාවය නැති කිරීමෙන් එම නඩුහබ, නීතිරීති, ප්‍රශ්න, චෝදනාවලට යම් කිසි විසඳුමක් ලබා ගන්න පුළුවන් මාර්ගයක් විධියට තමයි ඔවුන් විශ්වාස භංග යෝජනාව දෙස බලන්නේ. එම නිසා එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජාතික පෙරමුණ කේන්ද්‍ර කරගෙන මේක ඒත්තු ගැන්වූවාට, යටින් තිබෙන්නේ වෙනම "ගේම්" එකක්. අපි ඒක දැනගෙන කටයුතු කරනවා. ඒ වාගේම මෙම විශ්වාස භංග යෝජනාවට යම් කිසි පිරිසක් සහාය ලබා දෙනවා නම්, සහාය ලබා දෙන්න උත්සාහ කරනවා නම්, අනුබල දෙනවා නම්, ඒ පිරිස්වලට ඇත්ත වශයෙන්ම හදවතට එකහව මේ ආණ්ඩුවේ ඉන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මතු කරන්න අවශ්‍යයි. මක්නිසාදයත්, අපගේ අගමැතිතුමා ගැන අපට විශ්වාසයක් තිබෙනවා. නමුත් ඔවුන්ට ඒ විශ්වාසය නැත්නම්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අනුව ඒ ආණ්ඩුවේ ඉන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය අපි මතු කරන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් කියන්න අවශ්‍යයි. If you look at the substance of the No-Confidence Motion, there are various allegations which are actually ridiculous. මේක ඉතාම විහිළු සහගත දෙයක්. මේකේ තිබෙන චෝදනා විහිළු සහගතයි. අඩු ගණනේ පොඩ්ඩක් research කරලා, හිතා බලා විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න අවශ්‍යයි. මෙහි තිබෙන කරුණු ගැන අපට ඉතාම කනගාටුදායක තත්ත්වයක් තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයට අදාළ Report එකේ අගමැතිතුමා වැරදිකරු - වූදිතයා- කියලා, එතුමාගෙන් වැරැද්දක් වුණා කියලා කිසිම අවස්ථාවක ප්‍රකාශ වෙලා නැහැ. ඒ පිළිබඳව බැඳුම්කර කොමිසමේ වාර්තාවේ 930 වන පිටුවේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "Mr. Mahendran and Mr. Samarasiri have deliberately and *mala fide...*

"Mala fide" කියන්නේ, "හිතා මතාම" කියන එක. "*Bona fide"* කියන්නේ, "හොඳ අදහසින්" -යම්කිසි වැරැද්දක් නැහැ- කියන එකයි. නමුත් ප්‍රධාන වශයෙන්ම ඒකේ "*bona fide"* කියන වචනය නැතුව "*mala fide"* කියලා දමලා තිබෙනවා. ඒ කියන්නේ, ද්වේෂ සහගතව බවයි.

> ... misled the Hon. Prime Minister and suppressed material facts and misrepresented the factual position when they reported the facts and events relating to the Treasury Bond Auction..."

> "The evidence establishes that, Mr. Mahendran had not been instructed or directed by the Hon. Prime Minister to act unilaterally and immediately suspend or stop Direct Placements..."

මෙම වාර්තාව ඉතාම පැහැදිලියි. අඩු ගණනේ මෙම කොමිෂන් සභා වාර්තාව කියවලාද, මේ චෝදනා ටික එතුමාට එල්ල කරලා තිබෙන්නේ? පැහැදිලිවම නැහැ. එම නිසා මට ඉතාම පැහැදිලියි, ද්වේෂ සහගතව, කුට උපක්‍රම ඇතුව තමයි මෙම විශ්වාස භංගය ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක. මෙහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Mr. Mahendran has repeatedly assured the Prime Minister that, Mr. Aloysius would not under any circumstances play any role in the business activities of Perpetual Treasuries Limited. The evidence establishes that the Hon. Prime Minister fully expected Mr. Mahendran to comply with the due procedure and conduct a comprehensive study into the matter and for this study to be considered by the Monetary Body."

එය ඉතාම පැහැදිලියි. පොඩ්ඩක් මේ වාර්තාව කියවන්න. එහෙම කියෙව්වොත් ඔබතුමන්ලාට තේරුම් යයි, අගමැතිතුමාගේ පැත්තෙන් වැරැද්දක් වෙලා නැහැ කියන එක. බාගවෙලාවට පත්වීම ගැන ප්‍රශ්නයක් ඇති. නමුත් එවැනි දේවල් නායකයන් අතින් වෙනවා. ඒකට කරන්න දෙයක් නැහැ. ගරු අගමැතිතුමා දැන් මෙතැන ඉන්නවා. අපි එතුමාට ඒ ගැන ප්‍රකාශ කරලා තිබෙනවා. දේශපාලන නායකයන් අතින් පත්වීම් සම්බන්ධයෙන් යම් යම් වැරදි සිදු වෙනවා. නමුත් අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා සම්බන්ධයෙන් ගත්තාම, මහ බැංකුවේ අධිපති වෙන්න එතුමාට සියලුම සුදුසුකම් තිබුණා. ඒ ගැනත් මෙම වාර්තාවේ සඳහන් කර තිබෙනවා.

මම අවුරුදු 18ක් මේ පාර්ලිමේන්තුවේ සිටියා. ගරු රවුෆ් හකීම් මැතිතුමා මට වඩා විශ්වාස භංග යෝජනාවලට සහභාගි වී තිබෙනවා කියලා මම හිතනවා. I have participated in about three or four No-Confidence Motions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන වේලාව අවසන් වී ගෙන එනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Sir, give me a minute.

This is one of the most ridiculous wordings of a No-Confidence Motion that I have seen. It is actually an insult to our intelligence. I am sure, when the votes are counted at night today, the victory of this Government would be ensured and also the future course of action that has to be rectified through the Prime Minister as well.

Thank you very much.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා.

[අ.භා. 1.09]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ, එතුමාත් මේ සභා ගර්භයේ සිටින අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් වචන කිහිපයක් එකතු කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනා 46ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. අග්‍රාමාත්‍යවරුන් තිදෙනෙකුට විරුද්ධව විශ්වාස භංග යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා. මේ පාර්ලිමේන්තුවේ විවාදයට භාජන වුණු විශ්වාස භංග යෝජනාවලින් දිනා තිබෙන්නේ එකයි. එසේ දිනා තිබෙන්නේ අමිර්තලිංගම් මැතිතුමාට විරුද්ධව ඉදිරිපත් වුණු විශ්වාස භංග යෝජනාව පමණයි. අනෙක් විශ්වාස භංග යෝජනා දිනලා නැහැ. නමුත්, විශ්වාස භංග යෝජනාවක් නිසා සමාජමය, දේශපාලනමය හා ආර්ථිකමය වශයෙන් ඇතිවන බලපෑම කිසිසේත් ලඝුකොට තැකීමට හෝ විහිළුවට ලක් කිරීම ප්‍රඥාගෝචර දේශපාලනයකට සුදුසු වන්නේ නැහැ. අපි කවුරුත් දන්නවා, අග්‍රාමාත්‍යතුමාට මේ සභාවේ විවිධ කරුණු සම්බන්ධව ගෞරවයක් තිබුණාය කියන එක. නමුත්, එතුමා විශ්වාසය තැබූ පුද්ගලයන්, එතුමා වටා සිටි පුද්ගලයන්, එතුමාගේ ගජ මිතුරන්, ප්‍රශස්තිකරුවන්, ආවතේවකරුවන් සියලුදෙනාගේ ක්‍රියාවලීන් සමුච්චයක ප්‍රතිඵලය ලෙස තමයි එතුමාට විරුද්ධව මෙම විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ.

ගරු කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ ප්‍රධාන වගකීම උසුලන්නේ මේ උත්තරීතර ආයතනයයි. ඒ වාගේම යුක්තිය පසිඳලීම පිළිබඳ ප්‍රධාන වගකීම උසුලන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි. රටේ සමස්ත බැංකු ක්‍රමය, ණය ක්‍රමය, මූල්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රධාන වගකීම උසුලන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව. ශ්‍රී ලංකා මහ බැංකුව කොතරම් වැදගත් ද කියනවා නම්, මේ රටේ ජේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා සෑම ගනුදෙනු කරන මනුස්සයෙක් වෙනුවෙන්ම මුදල් නෝට්ටු අච්චු ගැසීම පිළිබඳ ඒකාධිකාරී බලය තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවට පමණයි. මේක සම්පූර්ණයෙන්ම ශාස්ත්‍රීය කටයුත්තක්. මේ රටේ ව්‍යවහාරයේ පවතින කාසි හා නෝට්ටු ප්‍රමාණය කොච්චරද, ඒවා කවර වටිනාකම්වලින් නිකුත් කරනවාද, නිකුත් කරන ප්‍රමාණය කොච්චරක්ද, නිකුත් කරලා සුරක්ෂිතාගාරවල තැන්පත් කරන්නේ කොහොමද, ඒවායේ ආකෘති මොනවාද යනාදිය පිළිබඳ තීරණය කරන්න ලංකා ඉතිහාසයේ කිසිම දවසක දේශපාලනඥයන් මැදිහත් වෙලා නැහැ. එය සම්පූර්ණයෙන්ම තාක්ෂණික කටයුත්තක්. මුදල් නෝට්ටු අච්චු ගැසීම සම්බන්ධයෙන් පූංචිම සැකයක් හෝ අවිශ්වාසයක් ඇති වුණොත් ඒ වෙළෙඳ පොළ ආර්ථිකයක් රදා පවතින්න බැහැ. ඒ නිසා තමයි ඉතාම සංවේදීව ශ්‍රී ලංකා මහ බැංකුවට ස්වාධීනව කටයුතු කරන්න මේ උත්තරීතර සභාව 1949 අංක 58 දරන මුදල් නීති පනත සම්මත කරලා විශේෂිත ස්වාධීන බලතල සහිත ආයතනයක් ඇති කළේ. අපේ රටට නිදහස ලැබුණ දවසේ සිට, පළමුවෙනි මුදල් අමාත්‍ය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ සිට, විවිධ මුදල් අමාත්‍යවරුන් යටතේ මුදල් අමාත්‍යාංශය තිබිලා තිබෙනවා. ඒ තිබුණ මුදල් අමාත්‍යාංශයට පූංචිම පූංචි හෝ මතයක් ශ්‍රී ලංකා මහ බැංකුව ගැන ඇති වුණොත්, ඒ අවස්ථාවලදී මහ බැංකු අධිපතිවරු ඉල්ලා අස්වෙලා තිබෙනවා. ඒ මතය සමාජයට කාන්දු වෙන්න ඉඩ නොහැර නතර කරගෙන තිබෙනවා. අවාසනාවකට මෙවර මේ ක්‍රියාදාමයේදී අග්‍රාමාත්‍යතුමා මේ සියලු කටයුතු සම්බන්ධයෙන් අපොහොසත් වෙලා තිබෙන බව අප ඉතා පැහැදිලිව පිළිගත යුතු සත්‍යයක්.

ශ්‍රී ලංකා මහ බැංකුවට නිලධාරියෙක් පත් කර ගැනීමේදී, ලංකාවේ කිසිම දේශපාලන බලපෑමකට පුද්ගලයෙක් පත් කරන්න බැහැ. ලංකා විශ්වවිද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ පළමුවෙනි පන්තියක සාමාර්ථයක් සහිත උපාධිධරයෙක් හැර වෙන කිසි කෙනෙක් මේ ආයතනයට දේශපාලන වශයෙන් බඳවා ගෙන නැහැ. එම නිසා ඔවුන්ට දේශපාලනයක් නැහැ. ඔවුන් වෘත්තිකයන්. ඊට අතිරේකව, Master's Degrees, PhDs කරන්න හා වෙන ඒවාට විදේශ රටවල ගිහිල්ලා මේ ලෝකයේ තිබෙන මූල්‍ය ක්‍රමය පිළිබඳ විශේෂඥ අධ්‍යයනයන් ලබා ආ අය තමයි මේ කටයුතු කරන්නේ. ඒ නිසා ඔවුන්ට ගෞරවයක් හිමි වෙන්න ඕනෑ. ඔවුන්ට විශේෂ ගෞරවය හිමි විය යුත්තේ, ඔවුන් නිර්භීත ලෙස ජනාධිපති කොමිසම ඉදිරියේදී මහ දවල් මහ බැංකුවේ ඇති වෙච්ච හොරකම පිළිබඳ ඉතාම පැහැදිලිව කරුණු කිවූ නිසායි. සමහර නිලධාරීන් කිව්වා, "කිසිම මහ බැංකු අධිපතිවරයෙක් පැමිණුනේ නැති ආකාරයට පෙබරවාරි මාසයේ 27 වෙනිදා අර්ජුන් මහේන්ද්‍රන් ඇවිල්ලා, වෙන්දේසියකට මැදිහත් වෙලා රුපියල් බිලියන එකක් වෙනුවට රුපියල් බිලියන 10ක් ගන්න කියලා නියෝග කරනකොට ඒ හිටපු නිලධාරීන් 'මින් පසුව අපට රෙදි ඇඳගෙන මේ මහ බැංකුවට එන්න බැහැ' කියන ටික කිව්වා" කියලා. ඔවුන් එය සාක්ෂි වශයෙන් කිව්වා. 2015 ජනවාරි 08 වෙනිදා මේ රජය බලයට පත් වෙලා, පෙබරවාරි 27 වෙනිදා වෙනකොට දින 100 විප්ලවය යටතේ, -විධායක සභාවක ආණ්ඩුව යටතේ- මේ සිද්ධිය කරන්න පුළුවන්කම ලැබුණා. අග්‍රාමාත්‍යතුමා, මහ බැංකු අධිපති ධුරයට සිංගප්පූරුවේ පුරවැසියෙක් වන අර්ජුන් මහේන්ද්‍රන් මහතා එතුමාගේ නිර්දේශ මත පත් කළා.

කැබිනට් මණ්ඩලයේදී සම කැබිනට් ප්‍රකාශක ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා සහ ජනාධිපතිතුමාත් එම පත් කිරීම පිළිබඳව විරුද්ධත්වය පළ කරද්දී අග්‍රාමාත්‍යතුමා මහ බැංකුවේ අධිපති ධුරයට අර්ජුන මහේන්ද්‍රන් මහතා පත් කළා. එම පත් කිරීමේ වගකීම අග්‍රාමාත්‍යවරයා භාර ගත්තා. රාජ්‍ය සේවයේ තනතුරක් භාර ගන්නා විට, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුරක්ෂිත කරලා පෝෂණය කරන බව"ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දිවුරුමක් දෙන්න ඕනෑ. ඇමෙරිකාවේ පුරවැසියෙකුට ලංකාවේ හෝ වෙනත් රටක රාජ්‍ය සේවයේ තනතුරක් දරන්න පුළුවන්. මොකද, ද්විත්ව පුරවැසිභාවය අනුමත කරනවා. නමුත්, සිංගප්පූරුවේ විශේෂත්වයක් තිබෙනවා. සිංගප්පූරුවේ පුරවැසියෙකුට වෙනත් රටක පුරවැසියෙක් වෙන්න බැහැ. ඒ නිසා අර්ජුන මහේන්ද්‍රන් මහතා මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දිවුරුම දුන්නේ නැහැ. සිංගප්පූරුවේ පුරවැසියෙකුට "ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරනවා" කියලා දිවුරන්න බැහැ.

දෙවැනි කාරණය මෙයයි. විදේශිකයෙකු රාජ්‍ය සේවයේ තනතුරකට පත් කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ කොන්දේසි තිබෙනවා. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 7.2 වගන්තියේ රාජ්‍ය සේවයට පත්කිරීම් පිළිබඳ නුසුදුසුකම් යටතේ සඳහන් වනවා, "රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාළ අමාත්‍යවරයා පනවන නියමයන් හා කොන්දේසි යටතේද ඔහුගේ අනුමැතිය ඇතිවද මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන පුද්ගලයකු රාජ්‍ය සේවයට පත් කළ නොහැකිය." කියලා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා අදාළ දෙයක් අහන්න. හැම වෙලාවේම points of Order ඉදිරිපත් කරන්න එපා. Point of Order එක මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අර්ජුන මහේන්ද්‍රන් මහත්තයාව ආරක්ෂා කරන්න අපට ඕනෑකමක් නැහැ. හැබැයි, ද්විත්ව පුරවැසිභාවයක් තිබෙන කෙනෙකුට රාජ්‍ය සේවයේ තනතුරු දෙන්න බැරි නම් ගෝඨාභය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order. Hon. Bandula Gunawardane, you go ahead.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගෝඨාභය රාජපක්ෂ මහතාට එසේ තනතුරු දෙකක් දැරීමේ අයිතිය තිබෙනවා. ඇමෙරිකානු පුරවැසියෙකුට ඇමෙරිකාවේ හා ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය කියන ද්විත්ව පුරවැසිභාවය ලබන්න පුළුවන්. සිංගප්පූරුවේ පුරවැසියෙකුට එසේ කරන්න බැරි බව ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අවධානයට ගැනීම වැදගත් වනවා.

ගරු කථානායකතුමනි, අර්ජුන මහේන්ද්‍රන් මහතා පත් කිරීම ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි නිසා රජය විසින් සිදු කළ පත්වීම නීති විරෝධී වන හෙයින් ඔහුට ගෙවන ලද වැටුප්, දීමනා සහ අනිකුත් වරදාන ආපසු අය කර ගැනීම පිණිස පත් කළ නිලධාරියා වගවීමට බැඳී සිටිනවා. මොකද, කිසි දවසක ගරු වජිර අබේවර්ධන මැතිතුමා කියලා නැහැ, "අර්ජුන මහේන්ද්‍රන් පත් කිරීමේදී ආයතන සංග්‍රහය යටතේ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත අනුගමනය කළා." කියලා. ඒ නිසා තමයි මේ විශ්වාස භංගයේ සඳහන් කරලා තිබෙන්නේ, "එම පත් කිරීම දෝෂ සහගතයි. වැරදියි." කියලා.

රජයට ණය ගැනීමේ ප්‍රධාන උපකරණ කීපයක් තිබෙනවා. ඒ තමයි, භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතික පත් හා භාණ්ඩාරගාර බැඳුම්කර යනාදිය. ඒවා නිකුත් කිරීමේදී ප්‍රථමයෙන් නිකුත් කරන බැඳුම්කරය ප්‍රාථමික ගනු-දෙනුකරුවෝ - primary dealersලා - තමයි මිලදී ගන්නේ. ඔහුට තිබුණා ළබැඳියාවක්. ලියා පදිංචි ප්‍රාථමික ගනු-දෙනුකරුවෝ 13දෙනෙක් ඉන්න කොට, ඉන් එක් ප්‍රාථමික ගනු-දෙනුකරුවෙක් තමයි මහ බැංකු අධිපතිතුමාගේ බෑනණුවන් වන පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අර්ජුන් ඇලෝසියස්. තමන්ගේ බෑනණුවන් සමඟ එක වහල යට ඉන්න කොට මේ වෙන්දේසිය පිළිබඳව, රජයේ මුදල් අවශ්‍යතා පිළිබඳව අභ්‍යන්තර තොරතුරු පිට වනවා. එම තොරතුරු පිටතට ලැබෙන්න සැලැස්වීම වාසි සහගත ලෙස කළොත් ඒක ඉතා විශාල මූල්‍ය අපරාධයක් ලෙස තමයි සැලකෙන්නේ. වෙනත් පාර්ශ්වයකට ව්‍යාපාරික වාසියක් ලැබීම සඳහා අභ්‍යන්තර තොරතුරු දැන්වුවහොත් ඒක ඉතා විශාල, බරපතළ මූල්‍ය අපරාධයක් ලෙස තමයි සැලකෙන්නේ. එදා ඉතාම පැහැදිලිව වුණේ මෙයයි. මුදල් අමාත්‍යාවරයා, ගරු කබීර් හෂීම්, ගරු මලික් සමරවික්‍රම කියන ඇමතිවරු ගිහිල්ලා සාකච්ඡා කළා, රජයට මුදල් මෙච්චරක් අවශ්‍යයි කියලා. එතකොට නිකුත් කරලා තිබුණේ රුපියල් බිලියන 1ක් පමණයි. මේ තොරතුර දැනුම් දුන්නාට පස්සේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම මේ තොරතුර මත ලංසු තියලා අධික පොලියකට රුපියල් බිලියන 10 දක්වා ගැනීම තමයි එතැනදී සිද්ධ වෙච්ච බරපතළ වැරැද්ද.

බැඳුම්කර වෙන්දේසියේ තිබෙන්නේ electronic bidding system එකක්. අවුරුදු 27ක් තිබුණේ hybrid ක්‍රමයක්. කොටසක් අඩු පොලිය යටතේ වෙන්දේසියේ තීරණය වනවා. ඉතිරි ප්‍රමාණය ප්‍රාථමික ගැනුම්කරුවන් අතර බෙදා හරිනවා. ඒක private placements නොවෙයි, direct placements කියලා සෘජුව ඒ අය අතර බර තැබූ පොලී අනුපාතයකට බෙදා හැරීම කරන්නේ. කවුරු හරි අග්‍රාමාත්‍යතුමාට කිව්වා, "මේකේදී හිටපු අධිපති අජිත් නිවාඩ කබ්‍රාල් මහතා නම් කළේ, කොටසක් සෘජු ක්‍රමය යටතේ දීලා, ඉතුරු ප්‍රමාණය පාරේ යන අයට කථා කරලා, "මෙන්න ඔයගොල්ලන්ට" කියලා දීලා කීයක් හෝ හොයා ගන්නවා." කියලා.

මේ දීපු වැරදි තොරතුරු මත අගමැතිතුමා අර්ජුන් මහේන්ද්‍රන් මහ බැංකු අධිපතිවරයාට නියෝග කර සිටියා, මීන් පස්සේ බැඳුම්කර නිකුත් කරන්නේ වෙන්දේසිය මඟින් පමණයි කියලා. වෙන්දේසි ක්‍රමයේ අරමුණ තමයි වැඩිම මිලක් ලබා ගැනීම. මල් වට්ටියක් වෙන්දේසියක්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මට අනික් පැත්තෙන් වෙලාව දෙන්නම් කිව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොපමණ වේලාවක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මිනිත්තු අටක් දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි 5ක් add කළා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. සම්පන්දන් මන්ත්‍රීතුමාගේ වේලාවෙන් විනාඩි පහක් දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සම්පන්දන් මන්ත්‍රීතුමාගේ වේලාවෙන් විනාඩි 5ක් දුන්නා. වෙන කාගේද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඊටපස්සේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේලාවෙන් විනාඩි 8ක් දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාගේ වේලාවෙන්ද ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඉස්සරහට අපට වෙන්වී තිබෙන කාගේ හෝ වේලාවෙන් විනාඩි 8ක් අඩු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, අපි මේ පිළිබඳව දීර්ඝ ලෙස කරුණු අධ්‍යයනය කරලා තිබෙනවා; හොයලා තිබෙනවා. මට තිබෙන වෙලාව ප්‍රමාණවත් නැහැ. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවබෝධය සඳහා ඒ අවශ්‍ය ලියවිලි සියල්ල **සභාගත*** කරනවා.

මෙම වංචාවෙන් සිදුවෙච්ච අලාභය රුපියල් බිලියන 9යි කියලා අපි කියනවා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මොකද, මේ බැඳුම්කරය නිකුත් කළේ අවුරුදු 30කට. 2045 වෙනතුරු මේ බැඳුම්කරය ද්විතීයික වෙළෙඳ පොළේ ගනු දෙනු වෙනවා. පෙබරවාරි 27වෙනි දා පළමු බැඳුම්කර හොරකම වුණා. දෙවෙනි බැඳුම්කර හොරකම 2016 මාර්තු මාසයේ වුණා. ඒ සඳහා මහ බැංකුව විසින් රුපියල් බිලියන 40ක් මේ සමාගමට දුන්නා. ඒ දෙවෙනි හොරකම කරන්න බැංකුවේ සල්ලි දුන්නා. ඊළඟට, ලංකා බැංකුව පළමු හොරකම සඳහා රුපියල් බිලියන 10ක් දුන්නා විනාඩි කිහිපයක් ඇතුළත. ඒවා සඳහා උපදෙස් දෙන්න කෙනෙක් ඉන්න අවශ්‍යයි. මේ සිද්ධ වෙච්ච ගනුදෙනුව නිසා සේවක අර්ථසාධක අරමුදලට රුපියල් බිලියන 20ක පාඩුවක් සිද්ධ වුණා. ඊට අතිරේකව, මේ වෙනකොට ගණන් බලා තිබෙනවා, මහ බැංකුවේ මහ දවල් ඇතිවෙච්ච මහා මුදල් මංකොල්ලය නිසා සමස්ත රටට වෙච්ච අලාභය රුපියල් බිලියන 2,000කට වැඩියි කියලා. ඒ අලාභය ගණන් බලා තිබෙන්නේ මෙහෙමයි. පොලී චක්‍රය ඇතුළත් ගණනය කිරීම මා මීට පෙර සභාගත කළා. පොලී චක්‍රයේ ඇති වෙච්ච මේ ඉස්සීම තුළ සියයට 9.35 සිට සියයට 12.5ට වැඩිවීමෙන් බිලියන 145ක අලාභයක් වුණා. බැඳුම්කර හොරකම මත විදේශිකයන් ලංකාවේ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරලා තිබුණු මුදල් ටික ආපසු අරගෙන ගියා. ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක් අරගෙන ගියා. ඒ නිසා බිලියන 360ක් අලාභ වුණා. මහින්ද රාජපක්ෂ යුගයේදී ඩොලර් එකකට ගෙව්වේ රුපියල් 131යි. අද ඩොලරයක් සඳහා රුපියල් 157ක් ගෙවනවා. දිගින් දිගටම රුපියල කඩා වැටෙන්න පටන් ගත්තා. රුපියල කඩා වැටෙනකොට එය නතර කරන්න මහ බැංකුව දවසකට ඩොලර් බිලියන 50, 100, 150 යනාදී වශයෙන් සංචිතයට දැම්මා. බිලියන 8.5ක්ව තිබුණු විදේශ විනිමය සංචිතය බිලියන 5.3ට කඩාගෙන වැටුණා. මේ තත්ත්වය තුළ රුපියල බේරා ගැනීම සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් දැම්මා. ඒ ප්‍රමාණය රුපියල්වලින් කිව්වොත් රුපියල් බිලියන 600කට වඩා වැඩියි. ඇති වූ මේ සිද්ධිය කරනකොටගෙන සම්පූර්ණයෙන් ඩොලර් පිව්විමකට ලක් වුණා. ඊළඟට, රුපියල බාල්දුවීමත් සමඟ ණය පැටව් ගහනවා.

මහ බැංකු වාර්තාවේ 202 හා 285 පිටුවල ණය වැඩිවීම විතරක් රුපියල් බිලියන 585ක් වුණා. සෘජු විදේශ ආයෝජන ඇමෙරිකානු ඩොලර් බිලියන 01ක් අඩු වුණා. එය රුපියල්වලින් බිලියන 150යි. ආණ්ඩුවේ සමස්ත ණය පොලිය විතරක් 2014 -2016 කාලයේදී රුපියල් බිලියන 150ක් වැඩි වුණා. මේ සියල්ලේ එකතුව රුපියල් බිලියන 1,990ක්. රුපියල් බිලියන 2,000ක අලාභයක් මහබැංකු බැඳුම්කර හොරකම හරහා සිද්ධ වෙච්ච අතර, ගණනය කළ නොහැකි අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා.

දැන් ඔබතුමන්ලා, අපි, රට පිළිගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අද ලෝකය තුළ ලංකාවට ලැබිලා තිබෙන ගෞරවය තමයි ලංකාවේ මිනිස්සු පාවිච්චි කරන මුදල් නෝට්ටුව විශ්වසනීයභාවයෙන් තොරයි කියන එක. ලෝකයේ කොහේ හරි රටක හොරු දෙන්නෙක් අත්සන් කරපු මුදල් නෝට්ටුවක් අරගෙන කඩේට ගිහිල්ලා බඩු ඉල්ලන රටක් තිබෙනවා නම්, ඒක ශ්‍රී ලංකාව බවට පත් වෙනවා නේ. හොරකමට සම්බන්ධ වෙච්ච අය උපරිම විශ්වාසය මත රඳා පවතින මුදල් නෝට්ටු අරගෙන කඩේ යන්න තරම් අසරණ වෙච්ච මිනිසුන් බවට අපි පත්වුණා. ඊළඟට, රටේ පොලී අනුපාතය නූල කැඩුණු සරුංගලය වාගේ ඉහළට ගිහිල්ලා තිබෙනවා. ණය අරගෙන, ණය වාරික සහ පොලී ගෙවා ගන්න බැරිව සියදිවි නසා ගන්නා මිනිසුන්ගේ සංඛ්‍යාව අද ඉතා විශාලයි.

මොකද, ණය පොලී ගෙවා ගන්න බැහැ. මේ විශ්වසනීය බව අඩුවීම නිසා, සුරැකුම්පත්වල ආයෝජනය කළ ආයෝජකයෝ ලංකාවේ ආයෝජනය කරන්නේ නැහැ. ලෝකයේ අවදානම වැඩිම රටවල් පිළිබඳ දර්ශකයේ ලකුණු සියයෙන් 12යි ලංකාවට හම්බ වෙන්නේ. අවසානයේ ඒ දර්ශකය ඇතුළේ, ලෝකයේ තිබෙන, වංචා කරන දුෂිතම රටවල් හතරෙන් එකක් බවට මේ වන විට මේ රට පරිවර්තනය වෙලා තිබෙනවා. මූල්‍ය ක්‍රමයේ, ණය ක්‍රමයේ, බැංකු ක්‍රමයේ මුදුන්මල්කඩ බඳු වූ මහ බැංකුවට මේ දෙය කරන්න එල්ටීටීඊ සංවිධානයටත් බැරි වුණා. එල්ටීටීඊය මහ බැංකුවට ගැහුවා; ගොඩනැඟිලි කඩා ගෙන වැටුණා. කෙටි කාලයක් තුළදී එය නැවත ගොඩ නහන්නට පුළුවන්කම ලැබුණා. නමුත්, තමුන්නාන්සේලාගේ රජය යටතේ අග්‍රාමාත්‍යතුමා යටතට ගත්ත ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සිදු වුණු අලාභයෙන් 2015, 2016, 2017 කියන අවුරුදුවල රටේ නිමැවුම අඩු වුණා; ආදායම අඩු වුණා; සේවා නියුක්තිය අඩු වුණා; විරැකියාව වැඩි වුණා; පොලී අනුපාතය වැඩි වුණා; උද්ධමනය වැඩි වුණා; ගෙවුම් ශේෂ අර්බුදය වැඩි වුණා; සංචිත අඩු වුණා. මේ සියලු දර්ශක තුළ මුළු මහත් ආර්ථිකයම කඩා වැටුණා. මේ රටේ සමස්ත ජනතාවගේ ජීවන වියදමේ අර්බුදය උග්‍ර වුණා. රක්ෂා කරමින් සිටි ජනයා දහස් ගණනක් රක්ෂා නැති අයගේ ගොඩට එකතු වුණා. රට පිළිබඳ තිබෙන විශ්වාසවන්තභාවය පලුදු වෙලා, යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව විසින්, "ලංකාව මුදල් විශුද්ධිකරණ රටක්" කියලා අසාධු ලේඛනයට අප ඇතුළත් කළා. එවැනි තත්ත්වයකට රටක ආර්ථිකය, මුදල් ක්‍රමය කඩා වැටෙන කොට, ප්‍රතිපත්ති සැකසීමේ කාර්යයේ නියුතු අග්‍රාමාත්‍යතුමා ඒ සඳහා වගඋත්තරකරුවකු බවට පත් වෙනවා.

ආර්ථික කළමනාකරණ කමිටුව අග්‍රාමාත්‍යතුමා යටතේ තිබීමෙන් එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික න්‍යාය පත්‍රවලට අනුව රට මෙහෙයවන නිසා, එය වෙනස් කර ගැනීම සඳහා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ආර්ථික කළමනාකරණ කමිටුව තමන් යටතට පවරා ගැනීම සඳහා කටයුතු කළා; ශ්‍රී ලංකා මහ බැංකුව පවරා ගැනීම සඳහා කටයුතු කළා. මේ කාල පරිච්ඡේදය තුළ පුරා වර්ෂ තුනක් රට වැනසීම පිළිබඳ වගකීම ආර්ථික කළමනාකරණ කමිටුවට පැවරිලා තිබෙනවා. අපි නොවෙයි එය කරලා තිබෙන්නේ. ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව මැතිවරණයට කලින් රටට ප්‍රසිද්ධියේ කිව්වා, "මේ රටේ කෘෂිකර්මය ඉවරයි; කර්මාන්ත ඉවරයි; සේවා අංශය ඉවරයි; රාජ්‍ය අංශය වැඩ කරන්නේ නැහැ; රාජ්‍ය සේවකයන් ඉවරයි; රණ විරුවෝ ඉවරයි" කියලා. මේ රට තමුන්නාන්සේලා දකින්නේ නැති අගාධයකට ගිහිල්ලා තිබෙනවා. බන්ධනාගාරයේ හොඳට වැඩ කරපු බන්ධනාගාර කොමසාරිස් රක්ෂිත බන්ධනාගාර ගත වෙලා. රටේ හිටපු බන්ධනාගාර කොමසාරිස් රක්ෂිත බන්ධනාගාරයේ. වැඩිම මත් ද්‍රව්‍ය ප්‍රමාණයක් මැඩලන්න කටයුතු කළ රංගජීව මහත්මයාත් රක්ෂිත භාරයේ. නමුත්, සිරභාරයේ ඉන්න ඕනෑ අර්ජුන් මහේන්ද්‍රන්ලා ඉතා හොඳට කෝටි-ප්‍රකෝටි ගණන් හොයා ගෙනත් නිරෙන් නිදහස් වෙලා ඉන්නවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ කාලයත් ලංකා ඉතිහාසයේ ලියැවෙනවා,-

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
-මෙතරම් පිරිසක් බන්ධනාගාර ගත කරපු කාලය බවට. අපේ රටේ lawmakersලා tea makersලාගේ තත්ත්වයට පත් වෙච්ච මේ යුගයේ, පාර්ලිමේන්තුවේ මූලාසනයේ හිටපු ප්‍රධානියා ලෙස ඔබතුමාගේ නමත් ඉතිහාසයට එකතු වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, රණ විරුවන්ට, ආරක්ෂක අංශ නායකයන්ට එළව, එළවා, වෛරයෙන් ගැහීමේ ප්‍රතිඵලයක් ලෙස දිවියධම්මවේදනීය කර්මයට අනුව මේ විශ්වාස භංගය පාරාවළල්ලක් ලෙස ඇවිල්ලා තිබෙනවාය කියන කාරණය සඳහන් කරනවා. මෙලොව වශයෙන් කීර්තිය සහ පරලොව වශයෙන් පිංකම උදෙසා හෘදය සාක්ෂියට එකඟව මෙම විශ්වාස භංග යෝජනාව දිනවීම සඳහා ඡන්දය පාවිච්චි කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා.1.29]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මාස ගණනක් තිස්සේ මහා කලබලයක් කරලා, සද්දයක් දමලා, "බාලගිරිදෝෂය අද නොවෙයි හෙටයි, අද නොවෙයි හෙටයි" කියලා අද මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂයෙන්ම අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා.

අපේ රජයට, අපේ අගමැතිතුමාට ආයෙත් හොඳ පින්තාරුවක් ලබා දීලා, පරණ මකුළු දැල් ටික කඩා දමලා, ඒ දෝෂ සියල්ලම භංග කරලා අද සිට අපට අලුත් ගමනක් යන්න හේතුවන මාතෘකාවක් පිළිබඳව කථා කරන්න කටයුතු සකසා දීම පිළිබඳව මේ යෝජනාව ඉදිරිපත් කළ ඒකාබද්ධ විපක්ෂයේ සියලුදෙනාට පළමුව ස්තුතිවන්ත වෙනවා.

ඒ එක්කම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහරුන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. හැම කෙනෙකුටම නොවෙයි, සමහර දෙනෙකුට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, අපට තිබෙන මේ සියලු දෝෂ භංග කිරීම පිළිබඳව. පසු ගිය දවස් ටිකේම, ඊයේ රාත්‍රිය වෙනතුරුම මේ යෝජනාව ගැන "ලොකු ටෝක් "දැම්මා. ඒවාට කියන්නේ "කිලෝ ටෝක්" කියලායි. වහසි බස්, පුරසාරම්. "අපට මෙච්චරයි. අපට මෙච්චරයි "කියලා මහා ලොකු සද්දයක් දැම්මා. ආණ්ඩුව අතට ගත්තා වාගෙයි කථා කළේ, ඒ සද්ද ටික දැම්මේ. හැබැයි, අද උදේ සිට අපට පෙනෙනවා, මැලවෙච්ච, මළානික වෙච්ච ඒ බලාපොරොත්තු කඩවෙච්ච මුහුණු. අපට දැන් ඒක හොඳට පෙනෙනවා. ඉතින් අපට කනගාටුයි, දුකයි. අහෝ! ඛේදයකි, ඉරකි, නිතකි. [බාධා කිරීමක්] ඔව්.

මෙතැනදී තවත් සුවිශේෂී කාරණාවක් සිද්ධ වුණා. අපට තමයි මේ බෝම්බය ඇටෙව්වේ. එක්සත් ජාතික පක්ෂය මූලික කරගෙන, එක්සත් ජාතික පක්ෂය සුනේසුන් වෙන්න, කුඩෙකුඩුවෙලා යන්න, අපේ ආණ්ඩුව විනාශ වෙලා යන්න අටවපු බෝම්බයක් මේක. දැන් කාටද ඒක පත්තු වෙලා තිබෙන්නේ? අපේ පක්ෂයේ කවදාවත් නොනිබුණු එකමුතුකමක්, එක්සත්කමක්, අපි සියලුදෙනා අතර විශාල බැඳීමක් තමුන්නාන්සේලා අප විනාශ කරන්න අටවපු බෝම්බය නිසා අද ඇති වුණා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන අපි කනගාටු වෙනවා. පව්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විශාල පිරිසක් තමුන්නාන්සේලාට කඩා ගන්න, ඒ කොටසක් අපට දෙන්න තමුන්නාන්සේලා උගුලක් ඇටෙව්වා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තනි කරන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සී සී කඩ වෙන්න තමුන්නාන්සේලා උගුලක් ඇටෙව්වා.

ඊයේ ෆවුසි ඇමතිතුමා කියනවා මේ ඡන්දයෙන් වැළකී ඉන්නවා කියලා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා කියනවා,- [බාධා කිරීමක්] ඔය රුපියල් දෙකයි පණහට, රුපියල් පහේ කොළවලට රුපියල් දහයේ කොළවලට අපි අපේ ආත්මය පාවා දෙන්නේ නැහැ. අපි දැක්කා තමුන්නාන්සේලා පසු ගිය කාලයේ,- [බාධා කිරීම්] දැන් සති දෙකකට ඉස්සෙල්ලා අපට ලොකු ලොකු ගණන් කථා කළා. ඔය රුපියල් පහේ කොළවලට අපි අපේ ආත්මය පාවා දෙන්නේ නැහැ. ඔය සිල්ලර වැඩ අපේ ළඟ නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථාව කර ගෙන යන්න පැටලෙන්නේ නැතිව. මේ ඔබතුමාගේ වෙලාව.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, දැන් මොකක්ද සිද්ධ වුණේ? ගරු ෆවුසි ඇමතිතුමා කියනවා ඡන්දය දීමෙන් වළකිනවා කියලා. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා කියනවා විරුද්ධව ඡන්දය දෙනවා කියලා. අපි ඒ ගැන කනගාටු වෙනවා. ඒකාබද්ධ විපක්ෂය අපට ඇටවූ උගුලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද ගොදුරු වුණා. අද මේ ගැන මත ගොඩයි. ඒ පක්ෂය සී සී කඩ කරලා නන්නත්තාර කරලා දැම්මා. කාටද මේ බෝම්බය ගැහුවේ? මේ බෝම්බයෙන් කුඩු වෙන්න යන්නේ කවුද? මතක තියා ගන්න, අපට ගහපු බෝම්බය අනෙක් පැත්තට කැරකිලා අපි ශක්තිමත් වෙනවාය කියන එක. ඒක අපි විශේෂයෙන් කියනවා.

ගරු කථානායකතුමනි, 2015 ජනවාරි 8 වැනි දා අපි ඡන්ද ලක්ෂ 62ක් අරගෙන ජනාධිපතිවරයෙක් පත් කරලා මේ ආණ්ඩුව හැදුවා. මතක තියා ගන්න. ඊළඟ මැතිවරණයේදී ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඡන්ද ලක්ෂ 5ක් අරගෙන තමයි කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. ඒ ඡන්ද ලක්ෂ 62න් ඡන්ද ලක්ෂ පහක් ගත්ත නායකයා එතුමායි. කවුද එහෙම මනාප ඡන්ද ලක්ෂ 5ක් ගත් නායකයා? කවුද ගත්තේ එහෙම ජනතා ප්‍රසාදයක්? ඡන්ද ලක්ෂ 62න් ඡන්ද ලක්ෂ 5ක් කියන්නේ දොළහෙන් එකක්. මේ සමස්ත ආණ්ඩුව වෙනුවෙන්, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා වෙනුවෙන් ගත්ත ඡන්ද ලක්ෂ 62න් ඡන්ද ලක්ෂ පහක් අරගෙන මේ පාර්ලිමේන්තුවට ආපු නායකයා එතුමායි. එවැනි නායකයකු ගෙදර යවන්න මොකක්ද තිබෙන සදාචාරාත්මක අයිතිය? ඡන්දයෙන් පැරදිලා, ජනතා මතයක් නැතිව, ලැයිස්තුවලින් මේ පාර්ලිමේන්තුවට ඇවිත්, අඩුම තරමින් පාර්ලිමේන්තුවට එන්න තරම් මනාප ටිකක් ගන්න බැරි මිනිස්සු කණ්ඩායමක් කියපු පළියට ඡන්ද ලක්ෂ පහක් - ඡන්ද ලක්ෂ හැට දෙකෙන් දොළහෙන් එකක්- ගත්ත නායකයා ගෙදර යවන්න මොකක්ද තිබෙන සදාචාරාත්මක අයිතිය කියන එක විශේෂයෙන් මේ අවස්ථාවේදී අහන්න ඕනෑ.

එතුමා කෝප් කමිටුවේ සභාපතිකම විරුද්ධ පක්ෂයේ කෙනෙකුට දීලා,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
කෝප් කමිටුවේ සභාපතිකම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකුට දීලා, කොමිෂන් සභා පිහිටුවලා, පඩි වැඩි කරලා, ඉන්ධන සහන දීලා, සහන මිලට ඖෂධ දීලා, ඒ සියල්ල කළාටද මේ විධියට අගමැතිතුමාගේ කකුලෙන් අදින්නේ කියන එක මම අහනවා. "විද්දේ හාවාට, වැදුණේ පඳුරට." කරන්න දෙයක් නැහැ. අපි ශක්තිමත්. මේ විශ්වාසභංග යෝජනාව ඒකාබද්ධයටත් පාරාවළල්ලක් වුණාය කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ එක්කම දැන් මොකක්ද මේ කරන්න හදන්නේ? ඒකාබද්ධ විපක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පව් හෝදා ගන්නද රනිල් වික්‍රමසිංහ මහත්තයා බිල්ලට දෙන්න හදන්නේ? මුන්නේෂ්වරම් කෝවිලට ගිහිල්ලා කුකුළෙකුගේ බෙල්ල කපනවා වාගේ, එළුවෙකුගේ බෙල්ල කපනවා වාගේ, හරකෙකුගේ බෙල්ල කපනවා වාගේ දැන් මේ ඒකාබද්ධ විපක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරණ පව් ටික මේ විශ්වාස භංගයෙන් හෝදා ගන්නද රනිල් වික්‍රමසිංහ මහත්තයා බිල්ලට දෙන්න හදන්නේ? මතක තබා ගන්න, මේ තොවිලය අදින් අවසන් බව. "රාජා හෝ මා හෝ ගංගා හෝ" කියලා, අරිටිය කී වෙන්ඩු පෙරුමාල් එදා කැලණි ගඟේ විශ්වාසයක් නැති තොවිලයක් නැටුවා වාගෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මොනවා වුණත් අගමැතිතුමාට හරකෙක් කියලා කියනවාට මා නම් එකඟ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි 2යි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
මගේ වෙලාව ගත්තා, ගරු කථානායකතුමනි. මම කියන්න හදන්නේ මේකයි. "රාජා හෝ මා හෝ ගංගා හෝ" කියලා එදා අරිටිය කී වෙන්ඩු පෙරුමාල් කැලණි ගඟේ විශ්වාසයක් නැති තොවිලයක් නැටුවා. ඒකාබද්ධ විපක්ෂයේ අය විශ්වාස නැතිව "රාජා හෝ මා හෝ ගංගා හෝ මහින්ද හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ ඕනෑ එකෙකු මක බෑ විලා පල" කියලා මේ දියවන්නාවේත් තොවිලයක් නටන්න හැදුවා. ඒ නටන්න හදපු තොවිලය අදින් අවසන්. රනිල් වික්‍රමසිංහ මහත්මයා කියලා කියන්නේ කුකුළෙකුවත්, එළුවෙකුවත්, නරියෙකුවත්, කපුටෙකුවත්, හරකෙකුවත් නොවෙයි. මම කියන්නේ එතුමා තුන් කුලුදුල් නායකයෙකු කියලායි. ඒ තුන් කුලුදුල් පුද්ගලයා අපි බිල්ලට දෙන්නේ නැහැයි කියන එකත්, අපි- [බාධා කිරීම] ඔබතුමන්ලාගේ ප්‍රශ්නය මොකක්ද? තුන් කුලුදුල් පුද්ගලයෙකු බිල්ලට දෙන්න අපි සූදානම් නැහැයි කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ඒක තමයි මා මේ කියන්න හදන්නේ, ගරු කථානායකතුමනි. මේ කුකුල්ලු කෑ ගැහුවාට, මේ එළුවෝ කෑගැහුවාට, මේ passport හොරු කෑ ගැහුවාට, නරි ටික කෑ ගැහුවාට, සමස්ත ඡන්ද ප්‍රමාණය වූ ලක්ෂ 62ක්, කොළඹ දිස්ත්‍රික්කයෙන් පමණක් ඡන්ද ලක්ෂ 5ක් ගත් අපේ නායකයා මේ පාර්ලිමේන්තුවේ දී අපි බිල්ලට දෙන්නේ නැහැ, අපි එතුමාව ආරක්ෂා කරනවාය කියන එක මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. අර, "රාජා හෝ මා හෝ" කියලා ගහපු "ගේම්" එක පිළිබඳව; තමුන්නාන්සේලාගේ බංකොලොත්භාවය පිළිබඳව මාගේ බලවත් සතුට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා.

[අ.භා.1.38]

ගරු චමල් රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සමල් රාජපක්ෂ)
(The Hon. Chamal Rajapaksaa)
ගරු කථානායකතුමනි, අද ඔබතුමා පාසල් දරුවන් ගැලරියට ඒම නතර කරලා තිබෙනවා. මා හිතන විධියට ඒකත් හොඳයි. මොකද, මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමා කථා කරපු ආකාරය අපි දැක්කා. ළමයින් මේවා දැක්කා නම් ළමයි ඉන්නේ නැහැ, දුවනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද ඉන්නේ ඔක්කෝම වැඩිහිටියෝ.

ගරු චමල් රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සමල් රාජපක්ෂ)
(The Hon. Chamal Rajapaksaa)
හැබැයි, ඉතින් සජීවී ලෙස මේ ඔක්කෝම මුළු රටටම පෙනෙනවා.

ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාවක් මේ සභාවට එන පළමුවන අවස්ථාව මෙය නොවෙයි කියලා ඔබතුමාත් දන්නවා ඇති. මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමේ

[ගරු චමල් රාජපක්ෂ මහතා]

පදනම පෞද්ගලික ඊර්ෂ්‍යාවවත්, දේශපාලන වෛරයක්වත් නොවෙයි. ඒක මම පළමුවෙන්ම කියන්න ඕනෑ. මේ විශ්වාස භංග යෝජනාව යනු, පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම උරුම වෙලා තිබෙන රාජ්‍ය මූල්‍ය පාලනය අවපාලනයකට ලක්වීම හේතුවෙන් ඊට එරෙහිව මතුවන යෝජනාවක්; ඒ හරහා මේ රටේ ආර්ථිකය මුළුමනින්ම උඩු යටිකුරු කිරීම නිසාවෙන් මතු වුණු යෝජනාවක්.

විශ්වාස භංග යෝජනාවල ඉතිහාසය අරගෙන බැලුවොත්, පළමුවෙන්ම 1742 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදායේ පළමු අගමැතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. එම යෝජනාව සාකච්ඡා කළාට පස්සේ අගමැතිතුමා තම ධුරයෙන් ඉල්ලා අස් වෙලා තිබෙනවා. බ්‍රිතාන්‍යයේ 1742 සිට 1979 වන තෙක් අගමැතිවරුන් 12දෙනෙකුට විරුද්ධව විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ඇමෙරිකාවේ Watergate සිද්ධිය අනුව හිටපු ජනාධිපතිවරයකු වූ රිචර්ඩ් නික්සන් මහතාට විරුද්ධවත් විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමෙන් පසුව එතුමාත් තම ධුරයෙන් ඉල්ලා අස් වෙලා තිබෙනවා. එම නිසා පාලකයන්ට එරෙහිව ජනතාව තුළ ඇති වන කලකිරීම, අප්‍රසාදය ප්‍රකාශ කිරීමට විශ්වාසය කඩ වුණු අවස්ථාවලදී මීට පෙරද පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. අගමැතිවරයෙකුට විරුද්ධව ඉදිරිපත් වන තුන්වැනි විශ්වාස භංගය අද වර්තමාන අගමැතිතුමාට විරුද්ධව ඉදිරිපත් වෙලා තිබෙනවා. පළමුවෙන්ම 1957 වර්ෂයේ සැප්තැම්බර් මස 04වැනි දින අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණා. එය ඉදිරිපත් කළේ, සී. සුන්දරලිංගම් මන්ත්‍රීතුමා. ස්ථිර කළේ, සී. වන්නිසිංහම් මන්ත්‍රීතුමා. එම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ලැබුණේ එක ඡන්දයයි. විපක්ෂව ඡන්ද 45ක් ලැබුණා. ස්ථිර කරපු කෙනාගේ ඡන්දයවත් නැහැ. ඒක තමයි විශ්වාස භංග යෝජනාවල ස්වභාවය.

1975 වර්ෂයේ දෙසැම්බර් මස 23වැනි දින සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනාවා. ඒ යෝජනාව ඉදිරිපත් කළේ ආචාර්ය කොල්වින් ආර්. සිල්වා මැතිතුමා. ස්ථිර කළේ ප්‍රින්ස් ගුණසේකර මැතිතුමා. පක්ෂව ඡන්ද 43ක් ලැබුණා. විපක්ෂව ඡන්ද 100ක් ලැබුණා. හැබැයි, මේ විශ්වාස භංග යෝජනාවේ තිබුණු කරුණු අනුව 1977 වර්ෂයේ පැවැති මහා මැතිවරණයේදී එදා පාලක පක්ෂයට අන්ත පරාජයක් ලැබුණා. මන්ත්‍රීවරු අටදෙනායි තේරී පත් වුණේ. එතකොට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට හයෙන් පහක බලයක් ලැබුණා. ඒ විශ්වාස භංග යෝජනාවේ මතු වුණු කරුණු එදා පාර්ලිමේන්තුවේ ජයග්‍රහණය කළාට මහජනයා අතරට ගියාම, මහා මැතිවරණයේ දී ජනතාව තීන්දුවක් දුන්නා. ඒ වාගේ තමයි මේකත්. මෙතැන දිනන්න පුළුවන්. නමුත් මහා මැතිවරණයක් ඉදිරියේ දී අන්ත පරාජයකට පත් වෙන්නත් පුළුවන්. මෙම වසරේ පෙබරවාරි මස 10වැනි දින පැවැති පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල දිහා බැලුවාම අපට මේක හිතාගන්න පුළුවන්.

හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධවත් දෝෂාභියෝගයක් ඉදිරිපත් කළා. එය ඉදිරිපත් කළේ එම ආණ්ඩුවේ සිටි ප්‍රධාන ඇමතිවරු කිහිපදෙනෙක්. ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා, ගාමිණි දිසානායක ඇමතිතුමා, ප්‍රේමචන්ද්‍ර ඇමතිතුමා වැනි අය. එම අවස්ථාවේ දී එම දෝෂාභියෝගයට අත්සන් කරන්න මටත් අවස්ථාව ලැබුණා . නමුත් ඒක සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ.

කථානායකවරුන්ට විරුද්ධවත් මේ පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මගේ මතකයේ හැටියට පළමු විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් වුණේ, 1963 වර්ෂයේ ආර්.එස්. පැල්පොල මැතිතුමාට විරුද්ධවයි. 1966 වර්ෂයේ ෂර්ලි කොරයා මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණා. 1980 වර්ෂයේ එම්.ඒ. බාකීර් මාකර් මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණා. 1991 වර්ෂයේ සහ 1992 වර්ෂයේ, එම පාර්ලිමේන්තු වාරයේ විශ්වාස භංග යෝජනා දෙකක් හිටපු කථානායක එම්.එච්. මොහොමඩ් මැතිතුමාට විරුද්ධව ඉදිරිපත් වුණා. ඒ වාගේම 1981.07.23වැනි දින එවකට මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයාව සිටි ඒ.අමිර්තලිංගම් මහතාට විරුද්ධව ආණ්ඩුව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. එම යෝජනාවට ආණ්ඩු පක්ෂයේ සියලුදෙනා ඡන්දය දීලා, ඡන්ද 127ක් ලැබුණා. එතුමාට විපක්ෂ නායක ධුරය අහිමි වුණා. එදා සිද්ධිය තමයි විශේෂයෙන් උතුරත්, දකුණත් අතර මතභේදය තව තවත් වැඩි වෙන්න හේතු වුණේ. ඉන් පසුව 1983 වර්ෂයේ කළු ජූලිය ඇති වුණා. මේවා ඇති කරන්න කටයුතු කළේ එදා පාලක පක්ෂය. අද පක්ෂ අතර සංහිඳියාව ඇති කරන්න, නැත්නම් උතුර-දකුණ එකතු කරන්න උත්සාහ කළාට මේකට ඉතිහාසයක් තිබෙනවා. අපි දෙගොල්ලන් දීර්ඝ කාලයක් තිස්සේ දුරස් කර තබන්න කටයුතු කරපු නිසා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ඒ විනාඩි තුන තුළ මගේ කථාව අවසන් කරන්නම්.

ඇත්තටම මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ සිද්ධිය ඉතා දීර්ඝ කාලයක් තිස්සේ එන ප්‍රශ්නයක්. මා කථානායක ධුරය දරන කාලයේ, 2015 මැයි 20 වන බදාදා ජී.එල්. පීරිස්, බන්දුල ගුණවර්ධන, දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලා අත්සන් කරලා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා. එදා අපි ඒ ප්‍රශ්නය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට යොමු කළා. එවකට එම කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් සිටියේ ඩිව් ගුණසේකර මැතිතුමායි. ඒ කාරණය පිළිබඳව අතුරු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට නියමිතව තිබුණත්, ආණ්ඩු පක්ෂයේ විරෝධය සහ ඉල්ලීම අනුව එය කල් දමන්නට සිදු වුණා. ඉන් පසුව එම අතුරු වාර්තාව 2015 ජූලි මාසයේ 07 වෙනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස මූලාසනයෙන් දැනුම් දුන්නාම, බන්දුල ගුණවර්ධන මැතිතුමා අහලා තිබෙනවා, "ලබන මාසයේ 7 වැනි දා පාර්ලිමේන්තුව රැස් වුණේ නැත්නම් මොකද කරන්නේ?" කියලා. ඒ වාගේම එදා හවස පාර්ලිමේන්තුව විසිරුවා හැරියා. මේ සිද්ධිවලින් පෙනෙන්නේ, මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව යම්කිසි කෙනෙකුගේ සිතේ වරදකාරී හැඟීමක් තිබෙන බවයි. එම නිසා තමයි මේ සිද්ධිය පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට උත්සාහ කළ අවස්ථා කිහිපයකදීම, එය කල් දමන්නට කටයුතු කර තිබෙන්නේ කියලා අපට විශ්වාස කරන්නට පුළුවන්.

අද වන විට අවුරුදු 3ක් ගතවෙලා තිබෙන නමුත් තවමත් ඒ ප්‍රශ්නය ගැනමයි සාකච්ඡා කරන්නේ. ඒ ප්‍රශ්නයේ අවසානයක් නැහැ. එම නිසා මා හිතනවා, ඒ ප්‍රශ්නය ගැන දිගින් දිගටම කථා කරමින් ඉඳලා වැඩක් නැහැයි කියලා. ඒ වංචාව පිළිබඳව විමර්ශනය කිරීමට කොමිෂන් සභාවකට යොමු කරලා තිබෙනවා. ඒ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ගැනත් සැක ඇතිවන අවස්ථා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් තිබෙනවා.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
මා අවසන් කරන්නම්. ජනතාවගේ අවශ්‍යතාව, ජනතාව බලාපොරොත්තු වුණු දේ තමයි අද මේ අවස්ථාවේදී විශ්වාස භංග යෝජනාවක් විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින්, මෙයට පක්ෂව ඡන්දය දෙන ලෙස, රට පිළිබඳව, ජනතාව පිළිබඳව ආදරයක් තිබෙන සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ඊළඟට ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

[අ.භා. 1.48]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
ගරු කථානායකතුමනි, මා මෙම විශ්වාස භංග යෝජනාව පිළිබඳව අදහස් දක්වන්නේ, මා නියෝජනය කරන ලංකා සමසමාජ පක්ෂයේ බහුතර කණ්ඩායම සහ එක්සත් වාමාංශික පෙරමුණ වෙනුවෙනුයි. මෙම විශ්වාස භංග යෝජනාවේ අවසාන කොටසේ මෙසේ සඳහන් වනවා:

> "අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස ද, කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව මෙන්ම එතුමා අග්‍රාමාත්‍ය ධුරය දරන ආණ්ඩුවට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳවද විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

මෙම විශ්වාස භංග යෝජනාව ආණ්ඩුවට විරුද්ධවද ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාවක් බව මේ විවාදයේදී ඉතාම පැහැදිලිව කිය වුණේ නැහැ; ප්‍රමාණවත් ලෙස සඳහන් වුණේ නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30. (1) අනුව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයාද, විධායකයේ ප්‍රධානයාද, ආණ්ඩුවේ ප්‍රධානයාද වෙනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43. (2) අනුව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක්ද, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාද වෙනවා. එම නිසා මේ විශ්වාස භංග යෝජනාව අගමැතිවරයාට විරුද්ධව විතරක් නොවෙයි, මුළු ආණ්ඩුවටම විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවක් බව විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

2015 ජනවාරි 08 වැනි දා මේ රටේ පුරවැසියන් හැටදෙලක්ෂයක් ඡන්දය දීලා, විශාල බලාපොරොත්තු ඇතිව මේ ආණ්ඩුව පිහිටුවා ගත්තා. ඒක නිකම් සිදු වුණු දෙයක් නොවෙයි. කවුරුත් බලාපොරොත්තු නොවුණු, කරන්නට බැහැයි කියා හිතපු දෙයක් අපි කළා. පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ගේ නායකත්වයෙන් ගොඩ නැඟුණු සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයට දේශපාලන පක්ෂත් සම්බන්ධ වෙලා අපි ඒ වෙනස ඇති කළා.

එදා ඡන්දය දෙන කොට මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා, මූලික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයක් සිදු වේවිය කියලා. ඒ සඳහා අවශ්‍ය පළමුවැනි පියවර ගනීවි, සමාජ සාධාරණත්වය ඉෂ්ට වේවි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිද්ධ වේවි, විශේෂයෙන් කලින් සිදු වුණු දූෂණ සහ ඝාතන ආදිය පිළිබඳව ප්‍රමාණවත් ලෙස පරීක්ෂණ සිදු කර, නඩු දැමීමේ, දඬුවම් ලබා දීමේ කටයුතු කෙරෙයි කියා බලාපොරොත්තු වුණා. ඒ විතරක් නොවෙයි. අලුතින් පත් කරන ආණ්ඩුව දූෂණයට සම්බන්ධ නොවී සිටීවි කියා එදා ජනතාව බලාපොරොත්තු වුණා. මේවා ඉෂ්ට වුණාද කියන ප්‍රශ්නය පිළිබඳව අපටත් ප්‍රශ්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපට ජයග්‍රහණත් තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් ප්‍රතිසංස්කරණයක් කරන්නට අපට පුළුවන් වුණා. ඒ තුළින් ජනාධිපති ධුරයේ බලතල බොහොමයක් අඩු කරන්නට පුළුවන් වුණා. අද කථා කිරීමේ නිදහස තිබෙනවා; ආණ්ඩුව විවේචනය කිරීමේ නිදහස තිබෙනවා; සුදු වෑන් එන්නේ නැහැ; අධිකරණය කිසිම බලපෑමකින් තොරව රජයට විරුද්ධව නඩු තීන්දු දෙනවා. අපි දැක්කා, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ඉතාම ස්වාධීනව තීන්දුවක් දීලා තිබෙන බව. ඒ පනත් කෙටුම්පතේ යම් යම් සංශෝධන කරන්නේ නැත්නම් තුනෙන් දෙකක බලයකින් එය සම්මත කරන්න ඕනෑය කියලා තිබෙනවා. කලින් එවැනි දේවල් සිදු වුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අපි ඉතාම වැදගත් පනතක් වන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කළා. ඒ තුළින් අද රටේ ජනතාවට ආණ්ඩුවේ filesවල තිබෙන ඕනෑම තොරතුරක් ලබා ගැනීමට අවස්ථාව ලැබී තිබෙනවා. එම පනත කෙටුම්පත් කළ කමිටුවේ සභාපති හැටියට මා සිටි බව කියන්න සතුටුයි. අද එම පනත ලෝකයේ තොරතුරු ලබාගැනීමේ තුන්වැනි පනත ලෙස පිළිගෙන තිබෙනවා. අද නිදහස් වාතාවරණයක් තිබෙනවා. ඒ සියල්ලම හොඳයි.

ගරු කථානායකතුමනි, එසේ නමුත් අපට කර ගන්නට නොහැකි වුණු දේවල් තිබෙනවා. මෙවැනි අවස්ථාවකදී ඒ පිළිබඳවත් සඳහන් කිරීම අත්‍යවශ්‍යයි. මොකද, අපි ආපසු හැරී බලන්නට ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව අවශ්‍ය ප්‍රමාණයට ඉදිරියට යන්නට අපට තවම පුළුවන් වෙලා නැහැ. මා ඇතුළු අපේ පක්ෂය වන එක්සත් වාමාංශික පෙරමුණෙන් ඒ පිළිබඳව පැමිණිල්ලක් තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු හැටියට මා සතුටු නැහැ, අපි ගිය වේගය පිළිබඳව. පාර්ලිමේන්තුවේ අපේ පස්වැනි අවුරුද්දට මේ කටයුතු ඉතිරි කරන්නේ නැතිව ඊට වඩා වැඩි වේගයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කරන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ජාතීන් අතර සමඟිය පිළිබඳව අපට ජයග්‍රහණ තිබෙනවා. නමුත් අපි අන්තවාදයට ප්‍රමාණවත් ලෙස උත්තර දීලා තිබෙනවාද?; මුහුණ දීලා තිබෙනවාද? ඡන්දය ලබා දුන් මේ රටේ හැටදෙලක්ෂයක් ජනතාව බලාපොරොත්තු වුණා, අන්තවාදය නැති කරාවි, අන්තවාදී කොටස්වලට මුහුණ දේවි, ජාතීන් අතර අසමඟිය, වෛරය පතුරවන අයට විරුද්ධව කටයුතු කරාවි කියලා. නමුත් ඒවා ප්‍රමාණවත් ලෙස කෙරිලා නැහැ. ඒ බව කියන්න කනගාටුයි. අද මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

හොඳයි, ගරු කථානායකතුමනි. විපක්ෂය මෙම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ, මේ රට තුළ අපි ලබා ගත් ජයග්‍රහණ සියල්ල ආපසු හැරවීමටයි. එම නිසා මෙම යෝජනාවේ අන්තර්ගතය ගැන නොවෙයි මා කථා කරන්නේ. අපි ඒ දෙස බලන්නේ නැහැ. අන්තර්ගතයේ තිබෙන සමහර දේවල් ඇත්ත වෙන්න පුළුවන්; සමහර දේවල් එහෙම නොවෙන්න පුළුවන්. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ කුමන අරමුණක් සඳහාද කියන එකයි අද තිබෙන ප්‍රශ්නය. ජනවාරි 08 වන දා ආරම්භ කළ ඒ ව්‍යාපාරය, අපි කළ වෙනස්කම් ඉදිරියට රැගෙන යන්න නම්, අප මෙම යෝජනාව පරාජය කළ යුතුයි කියන එක පැහැදිලියි. මෙම යෝජනාව ජයග්‍රහණය කළොත්, -දැන් පැහැදිලියි, ජයග්‍රහණය කරන්නේ නැති බව- යම් වාසියක් එයට ලැබුණොත්, එය අපේ ජයග්‍රහණ ආපසු හැරවීමේ පළමුවැනි පියවර වෙනවා. එම නිසා එවැනි භයානක අනතුරකට කිසිම ඉඩක් තියන්නට අපට බැහැ. එම නිසා අද දින ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවට විරුද්ධව අපි කටයුතු කළ යුතුයි.

අපි ආණ්ඩුවට කියන්න ඕනෑ, "අපේ අවුරුදු තුනක වාර්තාව පිළිබඳව අපි සෑහීමට පත් වන්නේ නැහැ. අද පැහැදිලිව ආණ්ඩුවේ දිශානතිය වෙනස් කිරීමක් අවශ්‍යයි." කියන එක. Course correction එකක් අවශ්‍යයි. අද මේක ජයග්‍රහණය කරලා හෙට course correction එක කරන්නේ නැත්නම් වැඩක් වන්නේ නැහැ. අපට ආපසු යන්න දෙන්න බැහැ. එම නිසා විශේෂයෙන්ම ආණ්ඩුවට සම්බන්ධ ප්‍රධාන පක්ෂ දෙකට -එක්සත් ජාතික පක්ෂයට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට- අපි කියනවා; ඒ නායකයන්ට අපි කියනවා, "මේ අත්දැකීම්වලින් පාඩම් ඉගෙන ගෙන ආණ්ඩුව හරි පාරට ගන්න. එයට අවශ්‍ය දිශානතිය වෙනස් කරන්න. ඒ course correction එක කරන්න. 2015 ජනවාරි 08වැනිදා මේ ආණ්ඩුව පත් කළ හැටදෙලක්ෂයක් වූ ජනතාවගේ අභිලාෂයන් ඉටු කිරීමට කටයුතු කරන්න." කියලා. ඒ පිළිබඳව පැහැදිලි තීන්දු ගත යුතුයි. දූෂණයට විරුද්ධව කටයුතු කළ යුතුයි. අපි දන්නවා, හෙට අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරන්න බලාපොරොත්තු වන බව. එවැනි ආයතන පිහිටුවීම සඳහා කටයුතු කරලා අවුරුදු තුනක් තිස්සේ කරන්න බැරි වුණු දේවල් දැන්වත් කරමු. අවුරුදු තුනක් තිස්සේ ඇදුණු, පල් වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු මීට වඩා ඉක්මන් කරමු. ප්‍රජාතන්ත්‍රවාදී වෙනස්කම්, ප්‍රතිසංස්කරණයන් තවත් ඉක්මන් කරමු. ඒ වාගේම අන්තවාදයට ඉඩ දීම සම්පූර්ණයෙන්ම වළක්වා, අන්තවාදයට විරුද්ධව ජනතාවට දැනෙන ක්‍රියාකාරී පියවර- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. මොකක්ද මේ කරන්නේ? මේක ගරු සභාවක් නේ.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

සමහරු ඒ course correction එක වෙනවාට කැමැති නැහැ. අපි ඒ දිශානතිය වෙනස් කරනවාට, අපි නිවැරදි මාවතට යනවාට සමහරු කැමැති නැහැ. කැමැති නැති අය තමයි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ඒ නිසා ජනවාරි 08 ප්‍රතිසංස්කරණ සඳහා එකතු වුණු සියලු දෙනාම ඉටු කළ යුතු පරම යුතුකමක් විධියට මේ විශ්වාස භංග යෝජනාව පරාජය කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අපද එකතු වන බව කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තූතියි. මීළඟට, ගරු උදය ගම්මන්පිල මැතිතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා.1.57]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

"අසාරේ සාරමතිනෝ-සාරේ'වාසාරදස්සිනෝ
තේ සාරං නා'ධිගච්ඡන්ති-මිච්ඡාසංකප්ප ගෝචරා"

"සරු දේ නිසරු ලෙසත්, නිසරු දේ සරු ලෙසත් අවබෝධ කර ගත් පුද්ගලයා කිසිම දිනයක සරු දේ නොලබන්නේය." යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ බුද්ධ වචනය වසර 2600කට පසුව අද දිනට අදාළව කර ඇතැයි සිතීපත් කරමින් මේ විශ්වාස භංග යෝජනාවේ පසුබිමට පොඩ්ඩක් අවධානය යොමු කරවන්න මා කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට සති දෙකකට කලින් අපි ගරු කථානායකතුමාට භාර දුන් විශ්වාස භංග යෝජනාවේ කරුණු 14ක් අඩංගු වුණා. එම කරුණු 14 නිශ්චිතව අගමැතිතුමා ඉලක්ක කර ගෙන, උදාහරණ සහිතව, උපුටා දැක්විය යුතු දේ උපුටා දක්වමින් ඉදිරිපත් කළා. පසු ගිය සති දෙක පුරා ආණ්ඩුව විසින් ජනමාධ්‍ය ඉදිරියේ, ජනතාව ඉදිරියේ හඬ නඟද්දී කවුරුවත් මේ චෝදනා 14න් එකක්වත් බොරුය කියා කිව්වේ නැහැ; මේ චෝදනා පදනම් විරහිතයි කිව්වේ නැහැ. අද උදැසන සිට මේ ගරු සභාව තුළ කළ කථා අපි අහගෙන හිටියා. ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ චෝදනා 14න් එකක්වත් අරගෙන "මෙන්න මේ චෝදනාව වැරැදියි. මේ චෝදනාව අසත්‍යයි. මේ චෝදනාව පදනම් විරහිතයි." කියලා කථා කළේ නැහැ. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් තීරණය කළ යුත්තේ අද මේ විශ්වාස භංග යෝජනාවේ නඟා ඇති චෝදනාවන් අනුව අගමැතිවරයා පිළිබඳව තවදුරටත් විශ්වාසය තැබිය හැකිද, නැද්ද කියන එකයි. ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ චෝදනා 14න් එකක් ගැනවත් කිසිම හඬක් නොනඟන්නේ ඔවුන්ගේ හෘදය සාක්ෂිය හඬ නඟා පවසනවා, "ගරු අගමැතිතුමාට එරෙහිව මේ ගෙනැවිත් තිබෙන චෝදනා14ම ඇත්තයි. මීට එරෙහිව එකම එක වචනයක් කථා කරන්න අපට ආත්ම ශක්තියක් නැත්තේ ඒකයි." කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය පුංචි ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂය ලබා ගත්තේ සියයට 30ක ඡන්ද ප්‍රමාණයක් පමණයි. ඒ කියන්නේ මේ රටේ ජනතාව සියයට 70ක් එක්සත් ජාතික පක්ෂයත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාවත් ප්‍රතික්ෂේප කර තිබෙනවා. සාමාන්‍යයෙන් අගමැතිතුමා නිරන්තරයෙන් අගය කරන බ්‍රිතාන්‍ය සම්ප්‍රදාය අනුගමනය කරනවා නම් එතුමා ඉල්ලා අස් විය යුතුව තිබෙනවා. අපි දන්නවා, එතුමා අගය කරන බ්‍රිතාන්‍ය සම්ප්‍රදායේ සිටින ඩේවිඩ් කැමරන් අගමැතිතුමා යුරෝපා සංගමයෙන් ඉවත් විය යුතුද නැද්ද කියලා ජනමත විචාරණයක් පැවැත්වූ බව. එතුමා කිව්වා, "යුරෝපා සංගමයේ සිටිය යුතුය." කියලා.

නමුත් බ්‍රිතාන්‍ය ජනතාවගෙන් සියයට 52ක් කිව්වා, "නැහැ, ඔබේ මතය වැරැදියි." කියලා. වැඩි ගණනක් නොවෙයි. සියයට 70ක් නොවෙයි. "බහුතර ජනතාවට මා පිළිබඳව විශ්වාසයක් නැති නම් මේ තනතුර දැරීමට මා නුසුදුසුයි." කියලා ඩේවිඩ් කැමරන් අගමැතිතුමා ඉවත් වුණා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පසු ගිය මාස දෙක තුළ පමණක් රාජ්‍ය නායකයන් හතර දෙනෙක් ඉල්ලා අස්වෙලා තිබෙනවා. මම දින වකවානු සහිතව සඳහන් කරන්නම්. 2018 පෙබරවාරි 14වැනි දා දකුණු අප්‍රිකාවේ ජනාධිපති ජැකොබ් සුමා තමන්ට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් තමන්ගේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු පමණනින්, "ඔබේ විශ්වාසය නැති නම් මට මේ තනතුරේ තවදුරටත් සිටිය නොහැකියි." කියලා ඉල්ලා අස් වුණා. ඒ වාගේම ඉතියෝපියාවේ අගමැති හෙයිල්මරියම් ඩිසැලින් පෙබරවාරි මාසයේ 15වැනි දා හරියට පැය 24කට පස්සේ රටේ ඇති වෙච්ච ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ රැල්ල තමන්ට මර්දනය කරන්න නොහැකි වුණාය කියලා ඉල්ලා අස්වුණා. ඒ වාගේම ස්ලෝවැකියාවේ අගමැති රොබට් ෆිකෝ ආණ්ඩු විරෝධී ජනමාධ්‍යවේදියෙක් ඝාතනය කිරීමෙන් ජනමාධ්‍යවේදීන්ගෙන් ඇති වුණු උද්ඝෝෂණ රැල්ල තමන්ට පාලනය කරන්න බැරි වුණු නිසා මේ වසරේ මාර්තු මාසයේ 15වැනි දා ඉල්ලා අස් වුණා. ඒ වාගේම ස්ලෝවේනියාවේ අගමැති මිරෝ සෙරාර් තමන් නායකත්වය දුන්නු ජනමත විචාරණයේ ප්‍රතිඵල දුෂිතයි කියලා උසාවිය විසින් අභෝසි කිරීම නිසා එහි වග කීම භාර අරගෙන, "උසාවියට මාව විශ්වාස නැත්නම් මා මේ තනතුරේ තවත් ඉන්නේ නැහැ." කියලා ඉල්ලා අස්වුණා. හැබැයි, දැන් අපේ උදව්වට ජීප්සීස් සංගීත කණ්ඩායමේ ඉන්න සුනිල් එක්ක නටන්න පුළුවන්, "ඉතියෝපියාවේ... ඉතියෝපියාවේ... ඉතියෝපියාවේ එහෙම වුණත් ලංකාවේ එහෙම වෙන්නේ නැහැ." කියලා. මේ රට ඉතියෝපියාවටත් වඩා පහළ තැනක නම් තිබෙන්නේ අපි සුනිල් එක්ක නටනවාද, ජනතාවත් එක්ක අඬනවාද කියන ප්‍රශ්නයට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාම තමන්ගේ හෘදය සාක්ෂියෙන් අහන්න ඕනෑ. පසු ගිය කාලයේ මාස දෙකක් ඇතුළත රාජ්‍ය නායකයන් හතර දෙනෙක් බහුතර ජනතාව ප්‍රතික්ෂේප කළාම, තමන් ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න අපොහොසත් වුණාම, ජනතාවගේ විශ්වාසය පලුදු වුණාම, බරපතළ චෝදනා එල්ල වුණාම තමන්ගේ තනතුරෙන් ඉවත් වෙලා තිබෙනවා.

අපේ අගමැතිතුමාට මේ චෝදනා තුනම තිබෙනවා. වැඩ කර ගන්න බැරි වුණාය, පොරොන්දු ඉටු කරන්න බැරි වුණාය කියන බැරිකම තිබෙනවා. බරපතළ දූෂණ චෝදනාවකට ලක් වෙලා තිබෙනවා. රටේ ජනතාවගෙන් සියයට 70ක් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එහෙම නම් මේ රටේ මහජන නියෝජිතයන් විධියට අපට වග කීමක් තිබෙනවා, ජනතාවගේ අභිලාෂය පාර්ලිමේන්තුව තුළට ගෙනැල්ලා, ජනතාවගේ ඉල්ලීම ඉටු කිරීමට මැදිහත් වෙන්න. සිව්වන හේතුවකුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ අගමැතිතුමා ජනාධිපති සිහිනයක හිටියා. අවුරුදු විසි ගණනක් තිස්සේ එතුමා බලාපොරොත්තුවෙන් හිටියා ඊළඟ ජනාධිපතිවරණයෙන් මේ රටේ ජනාධිපති වෙන්න. ඒක නිසා එතුමා ජනතා මතය ගැන සංවේදීව සිටියා.

එතුමා රටේ ජනතාවගේ විරෝධයක් එනකොට තමන් කරගෙන ආ ව්‍යාපෘති අකුළා ගැනීමේ තත්ත්වයක සිටියා. ඒක නිසා රට බෙදීම ඉදිරියට ගියේ හෙමින්; හෙමින්. රට පාවා දීම ඉදිරියට ගියේ හෙමින්; හෙමින්. රට විකිණීම ඉදිරියට ගියේ හෙමින්; හෙමින්. වැඩ පටන් ගත්තවා. ජනතා විරෝධය දැක්කාම ආපහු අකුළා ගත්තවා. හැබැයි, පුංචි ඡන්දයේ මැතිවරණ ප්‍රතිඵලයෙන් මේ සිහිනය කුඩු පට්ටම් වුණා. අගමැතිතුමා තවදුරටත් ජනාධිපති වෙන්න සිහින දකින්නේ නැහැ. එතුමාගේ දැන් අදහස තිබෙන්නේ වසර එකහමාරක් අගමැති ධුරයේ සිටීම පමණයි. මේක එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ටත් පැවසූ දෙයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපති සිහිනය නැත්නම් ජනතා මතය පිළිබඳව එතුමා සංවේදීත් නැහැ. ඇමෙරිකානු කියමනක් තිබෙනවා, "ඇමෙරිකාවේ ජනාධිපතිවරයෙක් තමන්ගේ පළමු ධුර කාලයේ කටයුතු කරන්නේ ජනතාවට ඕනෑ විධියට. දෙවැනි ධුර කාලය ගත කරන්නේ තමන්ට ඕනෑ විධියට." කියලා. ඇයි ඒ? පළමුවැනි ධුර කාලයෙන් පස්සේ ජනතාව ඉදිරියට යන්න තිබෙන නිසා ජනතා මතය ගැන සංවේදීයි. දෙවැනි ධුර කාලයෙන් පස්සේ ගෙදර යන නිසා ජනතා මතය ගැන සංවේදී නැහැ. ඔය දෙවැනි වටයේ අගදී තමයි ජනාධිපති සමාවන් හැටහුටහමාරක් දීලා දමන්නේ.

දැන් අපට අගමැති කෙනෙක් ඉන්නවා, අනාගතයේ මැතිවරණවලට තරග කිරීමේ බලාපොරොත්තුවක් නැති; ජනතා මතය ගැන සංවේදී නැති. ඒ වාගේම තමන්ගේ සිහිනය පුංචි ඡන්දයකින් කුඩු පට්ටම් කිරීම පිළිබඳව ජනතාව පිළිබඳව කේන්තියෙන් ඉන්න අගමැති කෙනෙක් අපට ඉන්නවා. ජනතාව පිළිබඳ කේන්තියෙන් ඉන්න, ජනතා මතය පිළිබඳව සංවේදී නොවන, විජාතික න්‍යාය පත්‍රයක් අතේ තියාගෙන ඉන්න අගමැතිවරයෙකුට තවත් වසර එකහමාරක් ක්‍රියාත්මක වීමට ඉඩ දීම අතිශයින්ම භයානකයි. ඒක නිසා මොහොතකට හැරිලා බලන්න. 2018 පෙබරවාරි 10ත් පස්සේ ගත වූ මාස එකහමාර තුළ මේ රටේ සිදු වුණේ කුමක්ද? අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සාමාජිකයන් නැත්නම් කොමසාරිස්වරු පත් කළා.

රණ විරුවන් පිට රටවලට පාවා දිය හැකි ජාත්‍යන්තර සම්මුතිය පනතක් වශයෙන් පාර්ලිමේන්තුවේ සම්මත වුණා. ඉන්දියාව සමඟ ETCA ගිවිසුම පිළිබඳව සාකච්ඡා යළි ආරම්භ කළා. ඒ වාගේම ත්‍රිකුණාමලය වරාය විදේශිකයන්ට ලබා දීම පිළිබඳව සාකච්ඡා ආරම්භ වුණා. මාස එකහමාරට මෙහෙම නම් අවුරුදු එකහමාරක් සිටියොත් කෙසේද? ඒක තමයි අපට සිතාගන්න තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාවේ තිබෙන්නේ පරම ඇත්ත; කිසිවකුට විරුද්ධ නොවිය හැකි ඇත්ත. ඒ නිසා තමයි සෑම මන්ත්‍රීවරයකුම මේ යෝජනාවේ අඩංගු කිසිම දෙයක් උපුටා දක්වමින් විරුද්ධව කරුණු දක්වන්න අසමත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික හෙළ උරුමය විසින් දින 100 ආණ්ඩුව තුළ මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව අගමැතිතුමාට, ආණ්ඩුවට එල්ල කළ චෝදනා ගෙඩිය පිටින් අපි මේ විශ්වාස භංග යෝජනාවට දාලා තිබෙනවා. ඒ වාගේම, මුස්ලිම් දේශපාලන පක්ෂ මහනුවර මෑතදී ඇති වූ කලබල පිළිබඳව ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරලා නැඟූ චෝදනාව ඒ ආකාරයෙන්ම අපි විශ්වාස භංග යෝජනාවේ දාලා තිබෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමැතිවරුන් පසුගිය පුංචි ඡන්ද වේදිකාවේ අගමැතිතුමාට එරෙහිව ඉදිරිපත් කරපු චෝදනා සියල්ල මේ විශ්වාස භංග යෝජනාවේ දාලා තිබෙනවා. එහෙම නම් මේ පක්ෂවල කිසිම මන්ත්‍රීවරයකුට මේ යෝජනාවට පක්ෂ

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

වීමෙන් වැළකී සිටින්න කිසිම හේතුවක් නැහැ; කිසිම පදනමක් නැහැ. නමුත් ඡන්දය නොදෙන්නේ ඇයි? අපි හිතුවේ දෙවියන්ගේ කැමැත්ත ක්‍රියාත්මක වේවි කියලායි. බැලින්නම් දැන් ක්‍රියාත්මක වන්නේ දෙවියන්ගේ මල්ලීගේ කැමැත්තයි. "දෙවියන්ගේ මල්ලි තමයි සල්ලි" කියා අපි අසා තිබෙනවා. බුදු රජාණන් වහන්සේ දැන් වැඩ සිටියා නම් අර ධම්ම පදයේ එන ගාථාවක් වෙනස් කරලා දේශනා කරාවි, "මනී පුබ්බාගමා ධම්මා, මනී සෙට්ඨා මනීමයා" කියා. "මුදල් සියල්ලටම මුල් වෙයි, මුදල් සියල්ලට පෙරටුව ගමන් කරයි" කියා බුදු රජාණන් වහන්සේ දැන් සිටියා නම් දේශනා කරාවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ කෑම කන ගමන් හරි අපූරු කතාවක් මන්ත්‍රීවරයෙක් මගෙන් ඇහුවා. එතුමා මගෙන් ඇහුවා, "ලක්ෂ 10ට කියන වචනය මොකක්ද?" කියා. මම කිව්වා, "මිලියනය නේ" කියා. "එහෙම නම් ලක්ෂ 100ට කියන වචනය මොකක්ද?" කියා එතුමා ඇහුවා. "අනේ, ඒක කෝටිය නේ!" කියා මම කිව්වා. "ලක්ෂ 10,000ට කියන වචනය මොකක්ද?" කියා එතුමා ඇහුවා. "ඒක බිලියනය නේ" කියා මම කිව්වා. ඊට පසුව එතුමා මගෙන් ඇහුවා, "ලක්ෂ 1,000ට කියන වචනය මොකක්ද?" කියා. මම කිව්වා, "අනේ මම දන්නේ නැහැ!" කියා. එතකොට සඳහන් කරනවා-

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමා බුදු දහමේ ගාථාවක් විකෘති කරලා කිව්වා. ඒක- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගත්තා නේද?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේවාට තමයි කියන්නේ, "ඌරන් කැකුණ තළන විට හබන්කුකුළන්ට රජ මහල්" කියලා. විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ කවුරුවත්; ප්‍රකෝටි ගණනින් සල්ලි සොයා ගන්නේ තවත් කවුරුවත්. අද මේ රටේ ජනතාවගෙන් සියයට 70ක් අගමැතිතුමාට විරුද්ධ වෙද්දී මේ නහා තිබෙන චෝදනා 14න් එකම එකක්වත් අසත්‍යයක්ය, පදනම් විරහිතය කියා ප්‍රකාශ කරන්න ආණ්ඩු පක්ෂය හෝ අගමැතිතුමාට සහය දෙන සෑම මන්ත්‍රීවරයකුම අසමත් වෙද්දී මේ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවේ අද සම්මත වුණොත් මොකද වෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ විශ්වාස භංග යෝජනාව මේ පාර්ලිමේන්තුවේදි සම්මත නොවනවා කියන්නේ මේ පාර්ලිමේන්තුව තුළ රටේ ජන මතය පිළිබිඹු වන්නේ නැහැ කියන එකයි. එතුමන්ලා ලක්ෂ 62ක් ගැන කතා කළා; අගමැතිතුමා පාර්ලිමේන්තු ඡන්දයේදි ගත් ලක්ෂ 5 ගැන කතා කළා. හැබැයි 'ඒවා දැන් පිළුණු වෙලා' කියලා තමයි පසුගිය පුංචි ඡන්දයෙන් පෙන්වා දුන්නේ. ඒ ජන මතයට ගරු කරන්නේ නැත්නම් මේ පාර්ලිමේන්තුව පිළුණු වෙච්ච පාර්ලිමේන්තුවක්; විසුරුවා හැරිය යුතු පාර්ලිමේන්තුවක්; ජනතා මතයට වඩා මුදලේ බලයට යට වන පාර්ලිමේන්තුවක් කියන පණිවුඩය තමයි අප ලෝකයට ලබා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ජාතියේ අවාසනාවකට සම්මත කර ගැනීමට අපට බැරි වුණොත් අනිවාර්යයෙන්ම සිද්ධ වන්නේ හිරු නොපායන අඳුරු යුගයක් ඉදිරි වසර එකහමාර තුළ මේ රටට උදා වන එකයි. අගමැතිතුමා පසුගිය මාස එකහමාර තුළ කළ දේ අපි දැක්කා; පසුගිය වසර තුන තුළ රටට කළ දේ අපි දැක්කා. ඉදිරි මැතිවරණයට ඉදිරිපත් වීමේ අදහසත් නැතිව, ජනතාව පිළිබඳ සංවේදීත් නැතිව විජාතික න්‍යාය පත්‍රය අරගෙන එතුමා ඉදිරියට ගියොත් අපට රටක් ඉතිරි වන්නේ නැහැ.

ඒ නිසා දරුවන් සිටින තාත්තලා අම්මලාට, රට ගැන සංවේදී දේශප්‍රේමී මන්ත්‍රීවරුන්ට අපි ආරාධනා කරනවා, නිල් පාටද, කොළ පාටද, රතු පාටද, කහ පාටද කියලා හිතන්නේ නැතුව රටේ අනාගතය ගැන හිතලා මෙම විශ්වාස භංග යෝජනාව සම්මත කිරීමේ පිංකමට දායක වෙන්න කියලා. එම ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මොකක්ද point of Order එක?

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට පෙර ඉදිරිපත් කරපු කාරණය point of Order එකක් නොවෙයි කියලා ඔබතුමා කිව්වාට, බුදු දහම විකෘති කිරීම ගැන මා විසින් කළ සඳහන point of Order එකක් වෙනවා. මොකද, බුදු දහම පිළිබඳව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා. මේ රටේ බුදු දහම,-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ වාඩි වෙන්න. තමුන්නාන්සේ මන්ත්‍රීවරයෙකුත් වෙලා මොනවාද මේ කථා කරන්න යන්නේ? බුදු දහම විකෘති කරන්න එපා. [බාධා කිරීම්]

[අ.භා.2.10]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින මේ පාර්ලිමේන්තුව හමුවේ විශ්වාස භංග යෝජනාවක් තබා තිබෙනවා. එම විශ්වාස භංග යෝජනාවෙන් ඉදිරිපත් කොට තිබෙන්නේ, මේ රටේ සිදු වුණු ඉතාම දරුණු, භයානක බැංකු මං කොල්ලයක් වැනි කාරණයක් පිළිබඳවයි. මං කොල්ලය කියන අර්ථයම කියන්න බැහැ. නමුත්, යම් කිසි ආකාරයක මුදල් අවභාවිතයක් කළ බවට අතිවිශාල චෝදනාවක් ගොනු කරමින් තමයි මෙම විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මෙම විශ්වාස භංග යෝජනාවේ වග උත්තරකරු කවුද යන්න අධිකරණයක් හමුවේ තීන්දු වන තුරු මා හට ඊට නිශ්චිතභාවය දීමට නොහැකි වුවත්, යම් කිසි භික්ෂුවකට හොරකමක් කිරීම හෝ හොරකමට උදව් කිරීම හෝ හොරකම අනුමත කිරීම හෝ පාරාජිකාවකට හේතුවක්. එම නිසා මේ සම්බන්ධයෙන් ස්ථිර නිගමනයකට ඇවිල්ලා මේ ආණ්ඩුව වෙනුවෙන් -ආණ්ඩුවට පක්ෂව- ඡන්දය ප්‍රකාශ කිරීමේ නොහැකියාවක් තිබෙන බව මා ස්ථිරවම කියන්න ඕනෑ. ඒ කියන්නේ විශ්වාස භංග යෝජනාව වැරදියි කියලා ඡන්දය දෙන්න මට පුළුවන්කමක් නැහැ.

මම මෙහිදී කරුණු කිහිපයක් කියන්නට ඕනෑ. මෙම විශ්වාස භංග යෝජනාව ගෙන ඒමත් සමඟ විතරක් නොවෙයි, පසුගිය අවුරුදු තුනක කාලය තුළ මේ ආණ්ඩුව කළ සෑම දෙයක්ම අභියෝගයට ලක්වෙලා තිබෙනවා. අපි මේ ආණ්ඩුව ගෙනාවේ යහ පාලන ආණ්ඩුවක් ලෙසයි. "යහ පාලන ආණ්ඩුව" කියන සංකල්පය සමාජය තුළ සම්පූර්ණයෙන්ම පාරාජිකා වචනයක් බවට අද මේ ආණ්ඩුව විසින් පත් කර ඇති බව ඒ ආණ්ඩුව පත් කිරීමට පුරෝගාමියෙකු වූ මා හට කියන්නට සිදුවීම ගැන මා අද දින අතිශයින්ම කනගාටුවට පත් වෙනවා.

මේ ආණ්ඩුව යටතේ තිබෙන වැරදි ගණනාවක් අපි දැක්කා. උදාහරණයක් ලෙස ගත්තොත්, පසුගිය වකවානුවේ ECTA ගිවිසුම අත්සන් කරන්න තීරණය කළා. එයට විරුද්ධව අපි අපේ අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම ව්‍යාපාරික ප්‍රජාව ECTA ගිවිසුම ගෙන එන එක සම්පූර්ණයෙන්ම වැරදියි කියලා කිව්වා. ඉන්දියාවත් එක්ක ගිවිසුමක් අත්සන් කරනවා නම්, දේශීය ව්‍යාපාරික ආයතන සමඟ, අනෙක් අය සමඟ සාකච්ඡා කොට එය ගෙන එන්න ඕනෑ කියලා යෝජනාවක් ගෙනැල්ලා තිබුණා. ලංකාවේ රාජ්‍ය ආයතන විකිණීම පිළිබඳව කිසිම පක්ෂයකට කිසිම ප්‍රතිපත්තියක් නැති තත්ත්වයක් අද ඇතිවෙලා තිබෙනවා. රාජ්‍ය ආයතන විකිණීමේ වැඩ පිළිවෙළකට අද මේ ආණ්ඩුව ගමන් කරමින් සිටිනවා. අද අපේ රටේ ඉතිරි වෙලා තිබෙන ස්වල්පයක් වූ රාජ්‍ය ආයතන ටිකත් විකුණන්න තීරණය කරලා තිබෙනවා. විදේශීය ජාවාරම්කාර සමාගම්වලට අත්තනෝමතික ලෙස රටේ ඉඩම් ටික විකුණන්න අද සැලසුම් කරලා තිබෙනවා. එම නිසා මේ යහ පාලන ආණ්ඩුව ගොඩනැඟීමට දායක වූ මා මෙම විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් මගේ ස්ථාවරත්වය අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් විවෘතව ප්‍රකාශ කරලා තිබෙනවා.

දැන් රට පවතින්නේ ඉතාම අස්ථාවරභාවයකයි. පසුගිය මැතිවරණයේදී ජනතා මතය ඉතා පැහැදිලිව නියෝජනය කරලා තිබෙනවා කියලා මම හිතනවා. ඒ මහ ජන මතයෙන් ප්‍රකාශයට පත්වෙන්නේ කුමක්ද කියන එක පාර්ලිමේන්තුව හැටියට අපි සියලුදෙනාම තේරුම්ගත යුතුයි. දැන් ඇති වී ඇති තත්ත්වය අනුව රට තුළ ඉතාම බරපතළ අස්ථාවරභාවයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයට විතරක් නොවෙයි, මේ රට අරාජික කරන්නේ නැතුව ඒකමතිකභාවයක් ඇති කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව අද විපක්ෂයටත් වගකීමක් තිබෙනවා. ඒ නිසා සියලු පාර්ශ්වයන් අතර පොදු සම්මුතියකින් කෙටි කාලයකට සමඟියක් ඇති කර ගන්නේ කොහොමද කියලා මා කල්පනා කළා. ඊට අදාළ වූ යෝජනාව මා ජනාධිපතිතුමාට භාර දුන්නා; අගමැතිතුමාට භාර දුන්නා; හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් භාර දුන්නා. මා එම යෝජනාව මහින් කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. පළමුවැනි කරුණ තමයි, මේ ආණ්ඩුව කිරීමට යන රාජ්‍ය සම්පත් විකිණීම, රටට අහිතකර වෙළෙඳ ගිවිසුම්, මානව හිමිකම් නාමයෙන් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව දඩු කඳේ ගැසීම වැනි බරපතළ වැරදි නැවැත්වීම සඳහා සම්මුතියකට ඒම.

දෙවැනි කාරණාව ලෙස අපි යෝජනා කර සිටියේ මේ ආණ්ඩුව නොකළ යුතු දේවල් කුමක්ද කියන එකයි. ඊළඟට, ආණ්ඩුව කරපු දේවලුත් ආපස්සට හරවමින් යනවා. විශේෂයෙන්ම රටේ ඉඩම් සම්බන්ධ කාරණය ගත්තොත්, එදා ඩී.එස්. සේනානායක මහතාගේ කාලයේ පටන් අපි ගොවි ජනතාවට ඉඩම් ලබා දුන්නා. දැන් පනත් කෙටුම්පතක් ගේන්න යනවා, ගොවීන්ට ඕනෑ හැටියට මේ ඉඩම් විකුණන්න පුළුවන් කියලා. අදත් සමහර දිස්ත්‍රික්කවල සිටින ගොවි ජනතාවගෙන් සියයට 50ක් පමණ ඉඩම් උකස් කර තිබෙනවා. එම පනත් කෙටුම්පත සම්මත වුණොත් ඒ ඉඩම් ගොවි ජනතාවට අහිමි වෙලා යනවා. ඒ නිසා අපි ඉදිරිපත් කළා, ඒ ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්තිය අත්තනෝමතිකව වෙනස් කිරීම නැවැත්විය යුතුයි කියලා. මේ යෝජනාවලියේ නොකළ යුතු දේ හා කළ යුතු දේ පිළිබඳ ස්ථාවරභාවයක් ඉතාම පැහැදිලිව ගෙනාවා. එහිදී විශේෂයෙන්ම වැදගත් වුණේ ලංකාවේ අපි ගත්ත වැදගත් තීන්දු දෙකක්. පළමුවැනි තීන්දුව තමයි, ග්ලයිෆොසෙට් තහනම. අද එක්සත් ජනපදය ඉතා පැහැදිලිව නිල විධියට පිළිඅරගෙන තිබෙනවා, ග්ලයිෆොසෙට් කියන්නේ උග්‍ර පිළිකා කාරකයක් කියලා. මේ රටේ සමහර දේශපාලන නායකයන්ට ඒක තේරෙන්නේ නැහැ. ඔවුන් කල්පනා කරන්නේ, මේ යෝධ මාෆියාවක් වැනි ජාත්‍යන්තර සමාගම්වලට යටත් වෙලා තමන්ගේ තීරණ ගන්නයි. ඒ නිසා අපි පැහැදිලිව කිව්වා, මේ ග්ලයිෆොසෙට් තහනම ඉවත් කරන්න එපා කියලා. අද වන විට කැබිනට් මණ්ඩලයට ග්ලයිෆොසෙට් සම්බන්ධයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම, පොහොර සම්බන්ධයෙන් අපට කිසිම අවබෝධයක් නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO එක - ඉතා පැහැදිලිව කිව්වා, අපි පාවිච්චි කරපු පොහොරවල විශේෂයෙන්ම යූරියාවල අධික කැඩ්මියන් සහ ආසනික් ප්‍රමාණයක් තිබෙන බව. ඒවා වැව්වලට, ජලයට, පසට එකතු වෙලා මිනිස්සුන්ගේ ශරීරගත වීම නිසා මිනිස්සු භයානක රෝගී තත්ත්වයන්ට මුහුණ දෙන බව කිව්වා. අපි රසායනික පොහොර නවත්වන්න කිව්වේ නැහැ. රසායනික පොහොර එපා කිව්වේ නැහැ. නමුත්, අපි එකක් කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්ස, ඔබවහන්සේට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගොවීන්ට සල්ලි දෙන්න; සල්ලි දීලා ඒ අයටම තීරණයක් ගන්න දෙන්න කියලා අපි කිව්වා. මේ තින්දුව අවුරුදු දෙකක් ක්‍රියාත්මක වුණා. යම් යම් ප්‍රශ්න පැන නැඟුණා. නමුත් ගොවීන් ඉස්සරහට ගියා. ආණ්ඩුව වැරැදි දෙකක් කළා. එකක් තමයි, රසායනික පොහොර වෙලාවට වෙළෙඳ පොළේ තියාගන්න ආණ්ඩුවට බැරි වුණා. ඒක ආණ්ඩුවේ දුර්වලකමක්. ඒක අපි පිළිගන්න ඕනෑ.

දෙවැනි කාරණය තමයි, ගොවීන්ට වෙලාවට මුදල් ටික දෙන්න ආණ්ඩුවට බැරි වුණා. අපි කිව්වා, පොහොර මිල වැඩි වෙලා නම් මුදල ටිකක් වැඩි කරලා මුදල්ම ලබා දෙන්න කියලා. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් මේ වාගේ කාරණා ගැන සම්මුතියකට ඒම අවශ්‍යයි. ඇයි අපි එහෙම කියන්නේ? අපේ රටේ වකුගඩු රෝගයෙන් අද ලක්ෂ 3ක ජනතාවක් දුක් විඳිනවා. රජරට ප්‍රදේශයේ මන්ත්‍රීවරු අද මේ සභාව නියෝජනය කරනවා. කිසිම කෙනෙකුට අද ඒ සම්බන්ධයෙන් හැඟීමක් නැහැ. 2005 අවුරුද්දේදී මුළු රට පුරාම 5,000ක් වෙච්ච පිළිකා රෝගීන්ගේ ප්‍රමාණය අද 15,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ පිළිබඳව කිසිම සාකච්ඡාවක් නැහැ. මෙන්න මේ වාගේ දැවෙන, වැදගත් ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් විපක්ෂයේ කණ්ඩායම් සහ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් එකතු වෙලා යම්කිසි සාකච්ඡාවක් කරන්න ඕනෑ කියලා අපි හිතුවා. එහිදී අපි ඉතා වැදගත් යෝජනාවක් කළා, ආණ්ඩුවක් ඇතුළේ නොකළ යුතු දේවල් නොකරමු; කළ යුතු දේවල් කරමු; ආණ්ඩුවක අවුරුද්දක කාලයක් සඳහා අපි ගිවිසුමකට යමු කියා. විපක්ෂය ආණ්ඩුවට එන්න අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, විපක්ෂයට වගකීමක් තිබෙනවා, ආණ්ඩුව මේවා නොකළ යුතුයි කියලා කොන්දේසියක් දමන්න.

අවුරුද්දක් ඇතුළත මේ කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල ගුණාත්මක ඒවා තිබෙනවා. අඩු පාඩුත් තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ විශාල වියවුලක් වෙලා තිබෙනවා. ඒ වාගේම, පළාත් සභා මැතිවරණයේදී අපි මනාප ක්‍රමය වෙනස් කරන්න යනවා. ඉදිරි මහ මැතිවරණයේදී එය වෙනස් කළ යුතුව තිබෙනවා. ඒ නිසා "මේ ඡන්ද ක්‍රමය ගැන සාකච්ඡා කරලා, මනාප ක්‍රමය නැති අනුපාත ක්‍රමයේ ගුණාත්මක ලක්ෂණ ඇතුළත් වෙච්ච ඡන්ද ක්‍රමයක් ගේන්න අපි සැලසුමක් හදමු. අවුරුද්දක කාලයක් අරගෙන ඒ සියලු කාරණා නිමා කරමු" කියන යෝජනාව කරන්න මම කැමැතියි. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න කවුරුත් කථා කරනවා. ඒක අහෝසි කරන්න බැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එවැනි ගිවිසුමක් දීලාත් නැහැ.

අපේ රටේ විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කරන්න ඕනෑ වෙලා තිබෙන්නේ රාජ්‍ය නොවන සංවිධානවලටයි, මේ රට ෆෙඩරල් කිරීමට හිතන එක්තරා සුළුතර කණ්ඩායමකටයි විතරයි. ඒ නිසා මම යෝජනා කළා, විධායක ජනාධිපති ධුරයට ව්‍යවස්ථාවේ තිබෙන බලය අහෝසි කරන්නේ නැතිව, එහෙත් ඒ ධුරයේ යම් යම් සංශෝධනයන් කරන්න. ඒ තමයි ජනාධිපති ධුරයට පත් වෙච්ච පුද්ගලයා ස්වාධීන, නිදහස්, සතර අගතියෙන් තොර පුද්ගලයෙක් බවට පත් විය යුතුයි. රටේ ජනාධිපතිවරයා පක්ෂ හසුරුවන, ඡන්ද හසුරුවන පුද්ගලයෙක් වෙන්න අවශ්‍ය නැහැ. ඒ නිසා යම්කිසි ජනාධිපතිවරයෙක් බලයට පත් වූ පසු ඔහු පක්ෂයකින් තොර ස්වාධීන පුද්ගලයෙක් විය යුතුයි කියන ස්ථාවරයේ තමයි මම පළමුව සිටින්නේ. දෙවැනි ස්ථාවරය තමයි, ජනාධිපති ධුර කාල දෙකක් වෙනුවට එකක් තබා ගැනීම. එයින් විධායක ජනාධිපති ධුරයේ රැඳෙන්න තිබෙන පෙරේතකම, කෑදරකම නවත්වලා ව්‍යවස්ථානුකූලව ඔහුට බරපතළ වගකීමක් දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ අනුව තුනෙන් දෙකක් ඇතුළේ විධායක ජනාධිපති ධුරයේ කළ හැකි සංශෝධනය, ඡන්ද ක්‍රමයේ කළ හැකි සංශෝධනය, නොකළ යුතු රටට හානිකර විනාශකාරී දේවල්,-[බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්ස, ඔබවහන්සේට නියමිත කාලය දැන් අවසානයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව තත්පර 30ක් වැනි සුළු වේලාවක් ලබා දෙන්න. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. යහ පාලනය කියා කියමින් මේ ආණ්ඩුව පසුගිය ආණ්ඩුව විවේචනය කළා. පසුගිය ආණ්ඩුව පිළිබඳ විවේචන ඒ විධියටම මට අදත් තිබෙනවා.

ඒවා තිබුණත්, ඊටත් වඩා බරපතළ දේවල් මේ ආණ්ඩුව අද කර තිබෙනවා. අද ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය දිහා බලන්න. අද රටේ හමුදාව හිර ගෙට යවන තත්ත්වයට පත් කර තිබෙනවා. ත්‍රස්තවාදය පරාජය කරන්න උර දුන්, එයට නායකත්වය දුන් මිනිසුන් හිරේ යවන තත්ත්වයට අද මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. අන්න ඒ නිසා අවුරුද්දක සංහිඳියාවක් ඇතුළේ නොකළ යුතු දේවල් පිළිබඳ ලැයිස්තුවක් අපි සකස් කළා. ඒ ලැයිස්තුවට අනුව කෙටි කාලයක් තුළ අපි මේකට එකඟ වෙමු කියා තීරණය කළා. [බාධා කිරීමක්] මේ යෝජනාව දිනයිද, පරදියිද කියන එක නොවෙයි වැදගත් වන්නේ. අපි ජනතාව ඉදිරියේ පරාදයි. පාර්ලිමේන්තුවේදී දිනනවාද, නැද්ද කියන එක අපිට වැදගත් නැහැ. අපි යථාර්ථය තේරුම් ගන්න ඕනෑ. මේ රට අස්ථාවර කරලා, කාලකණ්ණි තත්ත්වයකට පත් කරන්නේ නැතිව, සියලු වාද භේද අයින් කරලා, ආණ්ඩු පක්ෂයේ අයත්, විපක්ෂයේ අයත් සියලුදෙනාම එකතු වෙලා ඒකාබද්ධ විසඳුමකට එමු.

පසුගිය කාලයේ මුස්ලිම් කෝලාහල ඇති වුණා. සංචාරක කර්මාන්තයේ ඉතාම වැදගත් කාලය අපිට අහිමි වුණා. ඉදිරි කාලය තුළ අපි ප්‍රජාතන්ත්‍රවාදයේ නමින් කිසිම ස්ථාවරභාවයකට ආවේ නැත්නම් රට විශාල කැරලිකාරී තත්ත්වයකට යනවා. අපි අවුරුදු 30ක කාලකණ්ණි යුද්ධයක ත්‍රස්තවාදී අත්දැකීම් ලබා තිබෙනවා. ජාතියක් විධියට ඒ කාලකණ්ණි තත්ත්වයට අපිට ආපසු ඇද වැටෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා දෙමළ හෝ සිංහල වේවා, යූඑන්පී එකේ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේවා, සමාජවාදී හෝ ධනවාදී වේවා, අපි සෑමදෙනාම එකතු වෙලා අවුරුද්දක කාලයක් තුළ සංහිඳියාවකට ආ හැකි ප්‍රතිපත්තියකට යමු කියා යෝජනා කරමින්, ඔබ සියලුදෙනාටම ස්තූතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි. [බාධා කිරීම්]

[අ.භා.2.23]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ඒ.ටී. සුසිල් පිරේමජයන්ත - විඥාන, තොෂිල්නුට්ප මර්‍රුම් ආරාය්ච්චි අමෛච්චර්)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මෙම විශ්වාස භංග යෝජනාව පිළිබඳව,-

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා අපේ ගෞරවනීය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේට ඉතාම ද්වේශ සහගත ලෙස යම් යම් දේවල් කිව්වා. ඒ නිසා කරුණාකරලා, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. Minister, you may continue with your speech.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, what is your point of Order?

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ වැඩියෙන්ම චරිත ඝාතන කරන, වැඩිම පිරිසකට අපහාස කරන තැනැත්තා තමයි විමල් වීරවංශ මන්ත්‍රීවරයා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order. - [*Interruption*.] Hon. Member, වාඩිවෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. [බාධා කිරීම්] Order, please! ගරු ඇමතිතුමනි, කථා කරන්න.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සුසිල් පිරේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මෙම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන පදනම ඉතාම කෙටියෙන් විස්තර කරලා, එහි හරය සඳහා පැමිණෙන්න මම බලාපොරොත්තු වෙනවා. මේ සඳහා මම උපයෝගි කරගෙන තිබෙන්නේ, මේ ප්‍රස්තුත කාරණයේ කරුණු 13ක් පදනම් වෙලා තිබෙන්නා වූ, 2015 පෙබරවාරි 27වැනි දා සිදු වූ මහ බැංකුවේ බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කළ පළමුවැනි කෝප් කමිටුවේ නිටපු සාමාජිකයෙක් හැටියට එම කාරක සභාවේ වාර්තාව. පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නිසා එම වාර්තාව ඉදිරිපත් කරන්න බැරි වුණා. ඒ එකක්. ඊළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සභාපතිත්වය දරපු දෙවැනි කෝප් කමිටු වාර්තාවත්, ජනාධිපතිතුමා පත් කළ කොමිෂන් සභා වාර්තාවත් පදනම් කරගෙන මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 20ක කාලයක් සිටි මන්ත්‍රීවරයෙක් හැටියට, නීති ඍත්තියේ යෙදුණු කෙනෙක් හැටියට මේ ගැන කරුණු ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 (2) අනුව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරෙන අවස්ථා 3ක් තිබෙනවා. මම දැන් එය විස්තර කරන්න යන්නේ නැහැ. මගේ මුළු කථාවම ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

ඊළඟට, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42, 43, 44, 45 ව්‍යවස්ථා යටතේ ජනාධිපතිවරයාට තිබෙන බලතල සඳහන් කර තිබෙනවා, කෙසේද අගමැතිවරයා ඇමති මණ්ඩලය පත් කරන්නේ; විෂයය ලබාදෙන්නේ; ඉවත් කරන්නේ කියන කාරණා. "අග්‍රාමාත්‍යවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන්, ඉල්ලා අස්වීමෙන්, අන්‍යාකාරයකින් අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වූ විට" කියලා 48 (1) අනුව්‍යවස්ථාවේ අමාත්‍ය මණ්ඩලය විසිරෙන අවස්ථා තුනක් ගැන සඳහන් වෙනවා. එතකොට අමාත්‍ය මණ්ඩලය විසිරෙනවා. එවිට 42වන ව්‍යවස්ථාව යටතේ නීතිය ක්‍රියාත්මක කරලා, ඉදිරි කටයුතු කරගෙන යන්න ජනාධිපතිවරයාට ආපහු බලතල එනවා.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(1)(අ) හා (ආ) මඟින් අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව 30ක් හා අමාත්‍ය මණ්ඩල සාමාජිකයන් නොවන අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40 දක්වා වැඩි කරන්න බලතල එනවා. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4)(1) වන අනුව්‍යවස්ථාව යටතේ සම්මුති ආණ්ඩුවක යෝජනා ස්ථිරත්වයෙන් තමයි අද මේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය සිටින්නේ. දැන් මම ඊට වඩා ඒ ගැන කියන්න යන්නේ නැහැ. මම මේ ගැන කිව්වේ පාර්ලිමේන්තුවත් නියෝජනය කරන සමහර නීතිඥ මහත්වරු එහෙම නැත්නම් නීතිඥ මහත්වරු නොවන මහජන නියෝජිතයන් ජනමාධ්‍ය ඔස්සේ වැරදි අදහසක් දෙන්න උත්සාහ කළ නිසායි. ඒ නිසා මම ඊට වඩා ඒ ගැන කියන්න යන්නේ නැහැ.

ඊළඟට අපි බලමු, මේ චෝදනා සියල්ල පිළිබඳව. මේ චෝදනා සියල්ල ආණ්ඩුවේ නායකයා හැටියට අග්‍රාමාත්‍යවරයාට තමයි ඇවිල්ලා තිබෙන්නේ. ව්‍යවස්ථාදායකය හැටියට පාර්ලිමේන්තුව පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) ව්‍යවස්ථාව යටතේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක ධුරයට රටේම ජනතාව ජනාධිපතිතුමා පත් කරනවා. ඒ නිසා අපි මේ කාරණා පටලවා ගන්න ඕනෑ නැහැ. විධායකය එකක්; ව්‍යවස්ථාදායකය එකක්. මේ යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ ව්‍යවස්ථාදායකයටයි. ඒක විධායක ජනාධිපති ධුරයට අදාළ වෙන්නේ නැහැ. ජනාධිපති ධුරයේ විධායක බලතල තමයි අග්‍රාමාත්‍යවරයාට සහ ඇමති මණ්ඩලයට අනුනියෝජනය කරලා තිබෙන්නේ.

ඊළඟට, මම මේ කාරණයත් පැහැදිලි කරන්න ඕනෑ. 2015 ජනවාරි මාසයේ 08 වැනි දා ජනාධිපතිවරණයෙන් පස්සේ 09 වැනි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

දා ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දිවුරුම් දුන්නා. ඒ ජන වරම ලැබුණේ ජනාධිපතිවරයාට. ලක්ෂ 62ක්. හැබැයි, ජනාධිපතිවරයා දිවුරුම් දුන්නාට පස්සේ ඒ ආසන්නයේම,- [බාධා කිරීමක්] ඉන්න, ඉන්න මම ඒ ගැන කියන්නම්. මම මේ ඉතිහාසය කියන්නේ. [බාධා කිරීමක්]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ඇහුම්කන් දෙන්න; ඇහුම්කන් දෙන්න. ඇහුම් කන් දෙන්න බයයි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ව්‍යවස්ථාදායකයට ජන වරමක් ලැබුණේ නැහැ. ව්‍යවස්ථාදායකය තීරණය වුණේ ජන වරම උඩ නොවෙයි.[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමන්ලා ඇමතිතුමාට බාධා කරන්න එපා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සිද්ධිය වෙලා තිබෙන්නේ දින සියය ආණ්ඩුව තුළදී. අපි ඒ ආණ්ඩුවේ හිටියේ නැහැ. අපි ඒ ආණ්ඩුවේ හිටියේ නැහැ. [බාධා කිරීම්] මේ සිද්ධිය වෙලා තිබෙන්නේ ජනවාරි මාසයේ 27 වැනි දා. සම්මුති ආණ්ඩුව හැදුවේ අගෝස්තු මාසයේ 17 වැනි දාට පස්සේ. [බාධා කිරීම්] මේ සිද්ධිය සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා කියපු කරුණු මොනවාද? ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා කියනවා, "Arjuna Mahendran is not a citizen of Sri Lanka" කියලා. ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට අනුව එතුමා මේ රටේ පුරවැසියෙක් නොවෙයි. එහෙම තමයි මේ කොමිෂන් සභා වාර්තාවේ තිබෙන්නේ. [බාධා කිරීම්] පුරවැසියෙක් නොවන පුද්ගලයෙකු ගෙනැල්ලා මේ තනතුරට නිර්දේශ කළේ කවුද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඊළඟ කාරණය තමයි, COPE කමිටුව වාර්තා දෙකක් සහ,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

පොඩ්ඩක් අහගෙන ඉන්න. දන්නේ නැත්නම් අහගෙන ඉන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, හැම එකටම points of Order ගෙනෙන්න එපා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

කොමිෂන් සභා වාර්තාවේ 391, 392, 393 පිටුවල මෙන්න මෙහෙමයි කියැවෙන්නේ. "The economic policy of the governments -

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்
(Hon. Members)

මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

සිල්වතෙක් හැටියට කථා කරන මේ ඇමතිවරයා බාල තෙල් නැව් පහක් ගෙනැල්ලා ඒවායෙන් කොල්ල කෑවා. හෙජින් ගනුදෙනුවෙන්,- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்
(Hon. Members)

මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

The Cabinet of Ministers have to decide the policy of the Government. But, there was no Cabinet decision when the Hon. Prime Minister directed Arjuna Mahendran to go for public auction. There was no government policy. It was an arbitrary decision taken by the Prime Minister. We were not part and parcel of the Government at that time. -[*Interruption.*]

රිළවු නැටුවාට මිනිස්සු කලබල වෙන්නේ නැහැ. රිළවු නටනවා. අභිකුණ්ටකයෝ පොල්ල වනන කොට රිළවු නටනවා. එහෙම රිළා මඩමක් නොවෙයි පාර්ලිමේන්තුව. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහා භාණ්ඩාගාරයෙන් මහ බැංකුවට එවනවා, බිලියන 13.55ක මුදලක් එකතු කරන්න ඕනෑය කියලා. [බාධා කිරීම්] මේ අතරතුර, 26 වැනි දා උදේ පවත්වපු සාකච්ඡාවකදී කැබිනට් එකේ නොහිටපු අයත්, කැබිනට් ඇමතිවරුත් තුන් දෙනෙකුත් එකතු වෙලා බිලියන 15ක් එකතු කරන්න ඕනෑය කියලා තීන්දු කරනවා. [බාධා කිරීම්] ඊළඟට, ලියුමක් දෙනවා. දින රහිත ලියුමක් දෙනවා, බිලියන 75ක් ඕනෑය කියලා. මෙන්න පරස්පර විරෝධිතාව. [බාධා කිරීම්] මේ පරස්පර විරෝධිතාව තමයි මේ ප්‍රශ්නය කොමිෂන් එකේ තර්කයට ලක් කළේ. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පිටිපන කොමිෂන් සභා වාර්තාව බලන්න. පිටිපන නීතිඥවරයා අපට වඩා junior. [බාධා කිරීම්] හැබැයි, එතුමාගේ වාර්තාවෙන් කියා තිබෙනවා, තවදුරටත් පරීක්ෂණ කරන්න කියලා. ඒක මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. [බාධා කිරීම්]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට රීති ප්‍රශ්නයක් මතු කරන්න අවසරද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය ඇතිව මම මේ රීති ප්‍රශ්නය යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා හොරකම් පිළිබඳව දීර්ඝ ලෙස වෝදනා කරනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම එදා ඉඳලාම කිව්වා -

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, මට දැන ගන්න අවශ්‍ය මේකයි. පසුගිය රජය කාලයේ ඔබතුමා අමාත්‍ය ධුරය දරන විට, කිලිනොච්චියේ තිබුණු petrol station එකක - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්මුතිවාදී ආණ්ඩුවකට එන්න තීන්දු කළේ ජනාධිපතිතුමාය කියන එක අපි ඉතාම පැහැදිලිව කියනවා. එදා තනියෙන් කිසි පක්ෂයකට ආණ්ඩුවක් හදන්න බැරි වුණා. එදා බැරි වුණා.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
මොකද බැරි?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඔව්, දැන් තමුන්නාන්සේලා හදා ගන්න. හෙට ඉඳලා හදා ගන්න. [බාධා කිරීම්] අපටත් ඕනෑ ඒක තමයි. තනි ආණ්ඩුවක් හදන්න. [බාධා කිරීම්] ඔව්, හදලා බලමු. හදලා බලමු. [ඝෝෂා කිරීම්] අද කෝ, ජනවරම? සියයට 32ක් ගත්ත අය ජනවරම හඳුනන්නේ නැහැ. [ඝෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please!

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ජනවරම තිබෙන්නේ ජනතාව ළඟ. ඒක ඕනෑ වේලාවට දෙනවා, ඕනෑ වේලාවට නවත්වා ගන්නවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය මැතිවරණයේදී - අවසාන පාර්ලිමේන්තු මැතිවරණයේදී- ලේකම්වරු දෙදෙනා තහනම් නොකළා නම්, අද තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ නොවෙයි ඉන්නේ. [බාධා කිරීම්] ඒක කියන්නේ මම නොවෙයි, තමුන්නාන්සේලා පත් කරපු ජනාධිපතිතුමායි කියන්නේ. "මම ලේකම්වරුන් දෙදෙනා තහනම් නොකළා නම්, තමුන්නාන්සේලා ඉන්නේ ආණ්ඩු පක්ෂයේ නොවෙයි" කියලා ජනාධිපතිතුමා තමයි කිව්වේ. [බාධා කිරීම්] ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් ඒ ගැන අහගන්න. [බාධා කිරීම්]

මම ස්තුතිවන්ත වෙනවා, ජනතා විමුක්ති පෙරමුණට. එතුමන්ලා ප්‍රතිපත්තිමය දේශපාලනයක් කරනවා. ප්‍රතිපත්තිමය දේශපාලනයක්! එතුමන්ලා අපි එක්කත් වැඩ කළා; ඉතාම විනයගරුකව වැඩ කළා. මේ වාගේ කෑ ගැහුවේ නැහැ.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසානයේ පැවැති පළාත්පාලන මැතිවරණය, නගර සභාවලට මන්ත්‍රීවරුන් තෝරා පත් කළ මැතිවරණයක් නොවෙයි. ඒක රටේ ජනමතය පිළිබිඹු කරපු මැතිවරණයක්. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උறුප්පිනර්කළ්)
(Hon. Members)
ජය වේවා!

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සූසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක තේරුම් ගන්න. මේවා හදා ගන්නයි අපි කියන්නේ. [බාධා කිරීම්] අපි හොරකම් කරලා නැහැ. හොරකම් කරපු අය ගැන කථා කරන කොට තමයි හොරුන්ට කේන්ති යන්නේ. [බාධා කිරීම්] පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී ජනාධිපතිතුමා කිව්වේ මොනවාද? මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වැනි අදියරේ කටයුතු "තයිසේ" කොම්පැනියට භාර දුන්නා. [බාධා කිරීම්] හැබැයි, දැන් "තයිසේ" කොම්පැනියේ අය දැන් හිරේ; ජපානයේ හිරේ. හිරේ ගිය අයටයි කොන්ත්‍රාත් දුන්නේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කියන්නේ ජනාධිපතිතුමා කියපු දේවල්. [බාධා කිරීම්] පසුගිය මැතිවරණයේ ප්‍රතිඵල පාර්ලිමේන්තු මැතිවරණයක් හැටියට දමලා ගණන් හැදුවොත් කොහොමද? පොදුජන පෙරමුණට ආසන 102යි. [සෝෂා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උறුප්පිනර්කළ්)
(Hon. Members)
ජය වේවා!

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සූසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)
එක්සත් ජාතික පක්ෂයට 65යි. [බාධා කිරීම්] අපිට 30යි. ඒක තමයි කිව්වේ. 2015 අගෝස්තු මාසයේ පැවැති මැතිවරණයේ ප්‍රතිඵලය විකෘති කළා. ඒ නිසායි අද මේ දේ වුණේ. [බාධා කිරීම්] මේ බැදුම්කර සිද්ධිය වුණේ විකෘති ආණ්ඩුවක් තුළ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, බාල තෙල් ගෙනැල්ලා මේ රටේ ජනතාවගෙන් හොරකම් කරගත්,- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සූසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා, එතුමාගේ කථාවට බාධා කරන්න එපා. ගරු ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සූසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)
කොස්ගම සාලාව අවි ගබඩාව පිපිරුවා. අහන්න, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන්. අගමැතිතුමා එහි එක්ක ගියේ තමුන්නාන්සේලාගේ ඇමතිවරු නොවෙයි. මට භාර දුන්නා. මාස දෙකෙන් අපි ප්‍රශ්නය විසඳුවා. ඒ විධියට තමයි ආණ්ඩුව භාරදුන් වගකීම් අපි ජනතාව වෙනුවෙන් ඉටු කළේ. [බාධා කිරීම්]අපි නිකම් කෑ ගැහුවේ නැහැ. දැන් මේ හොරුයි කියලා කෑ ගහන අය මහේස්ත්‍රාත් උසාවි ඉස්සරහට ගිහිල්ලා මිනීමැරුම් නඩු සමථයකට පත් කරගත් මිනිසුන්. [බාධා කිරීම්] මේ ගොල්ලන් බයයි, බලය අහිමිවුණොත් මේ ගොල්ලන් නවතින්නේ කොහේද කියන එක ගැන. [බාධා කිරීම්] අපි ඕවාට බය නැහැ. අපි ඔය කෑගැහිලිවලට බය නැහැ. ඔය ඔක්කෝටම මේ රටේ ජනතාව වැඩිකල් නොගිහින් පිළිතුරු දෙනවා, මිත්‍රවරුනි. ඒක තමයි පෙන්වලා දෙන්නේ. ඒ නිසා නිකම් බොරුවට කෑ ගහන්න එපා. [බාධා කිරීම්] වැරැදි හදා ගන්න. මේ වැරැදි හදා ගන්න දුන් අවස්ථාවක්. වැරැදි හදා ගත්තේ නැත්නම් ඒ වැරැද්දම දිගට කරන්න අපට දායක වෙන්න බැහැයි කියන එක ඉතා පැහැදිලිව අපි කියනවා. අපි පිනට ආපු මන්ත්‍රීවරු නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කයෙන් ඡන්ද 175,000ක් අරගෙනයි අපි ආවේ. මතක තියා ගන්න අපි "පිං ඇමතිවරු" නොවෙයි. අපි වගකියන්නේ ඡන්දය දුන් එම 175,000ක ජනතාවට මිසක් පිංගුත්තරයන්ට නොවෙයි කියන එක ඉතා පැහැදිලිව කියනවා. ඒ, ජනවරම රකින්න අපි එදත් පෙනී සිටියා; අදත් පෙනී සිටිනවා. හෙටත් ඕනෑම බලවේගයක් එක්ක අපි පෙනී සිටිනවාය කියන එක ඉතා පැහැදිලිව කියනවා. [බාධා කිරීම්]

අපි තනතුරුවලට කෑදර නැහැ. අපට ජීවත්වෙන්න ක්‍රමයක් තිබෙනවා. අපි උසාවියේ පෙනී සිටි මිනිසුන්. මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු නඩුවේ හතරවෙනි විත්තිකාරයාට පෙනී සිටියේ මම. අද මේ අය කථා කරනවා, මහාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනෙකුගේ Trial-at-Bar ගැන. [බාධා කිරීම්] ආ.. කියන්න බලන්න, Trial-at-Bar කියන්නේ මොකක්ද කියලා? නැඟිටලා කියන්න. [බාධා කිරීම්] මොකක්ද? දන්න දෙයක් නැහැ. [බාධා කිරීම්]දැන් Trial-at-Bar ගැන කථා කරනවා. Trial-at-Bar එක නඩුවක් කථා කරපු එක්කෙනෙක්වත් මෙතැන නැහැ. කවුරුවත් දැකලත් නැහැ. මොකද, වුණේ? Trial-at-Bar ගේන්න ගියා. Supreme Court එක දුන්නාද? දුන්නේ නැහැ. විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට මම අගමැතිතුමාට කිව්වා, ගෙනෙන්න එපා කියලා. ගයන්ත කරුණාතිලක මැතිතුමා ඒ සාකච්ඡාවේ හිටියා. මම කිව්වා, "ගෙනෙන්න එපා, Supreme Court එක ඕකට ඉඩ දෙන්නේ නැහැ, ජනමත විචාරණයකට යන්න කියනවා" කියලා. නමුත් ඇහුවේ නැහැ, මොකද වුණේ? විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න බැරි වුණා. දැන් මොකක්ද වුණේ? පළාත් සභාව ගෙනාවා, 50ට 50. තුනෙන් දෙක දෙන්න වුණා, ඕනෑ නැති එකකට. මෙන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගෙනාපු හැටි. දැන් මේවා ගැන මහ ලොකුවට කථා කරනවා. උසාවියක ගිහිල්ලා නඩුවක් කථා කරපු නැති මිනිසුන්. [බාධා කිරීම්] අපට වෙන කොහේවත් ගෙවල් නැහැ. තියෙන්නේ අවුරුදු හතළිහක් හිටපු පරණ ගෙදරමයි.

ලංකා බැංකුවේ සිටි කාලයේ ණය අරගෙන හදපු ගේ. [බාධා කිරීම්] එන්න, ඇවිල්ලා බලන්න. අපේ ගිණුම් ටික බලන්න. අපි අභියෝග කරනවා, පුළුවන් නම් අපේ ගිණුම් බලන්න කියලා. හැම ගිණුමක්ම OD.

දැන් මේ ආරක්ෂා කරන්න යන්නේ කාවද? මේ සියලු දෙනා ආරක්ෂා කරන්නේ අර්ජුන් මහේන්ද්‍රන්ව. දැන් කෝ? දැන් කෝ? දැන් ඔහු කෝ? ඔහුව ගෙනාවේ කවුද? ඔහුව recommend කළේ කවුද? ඔහුව තියා ගන්න හැදුවේ කවුද? ඔහුව රැක්කේ කවුද? ඔහුට රට යන්න හැරියේ කවුද? [බාධා කිරීම්] ඔහුට රට යන්න හැරියේ කවුද? ඇපකාරයා කවුද? අර්ජුන් මහේන්ද්‍රන්ගේ ඇපකාරයා කවුද? අපි ද? [බාධා කිරීම්]චිත්තිකාරයා නැත්නම් ඇපකාරයාට මොකද වෙන්නේ? වරෙන්තු. මේ ඒ වරෙන්තුව. මේ තිබෙන්නේ ඇපකාරයාට නිකුත් කරපු වරෙන්තුව. [බාධා කිරීම්] දැන් තමුන්නාන්සේලාට තිබෙන්නේ ඒක execute කරන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව කොච්චර වෙලාව තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have ten more minutes.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මගේ වේලාව දෙන්නම්. ඔබතුමා කථා කරන්න.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඊළඟට සංඝිඳියාව ගැන කථා කරනවා. මම අහගෙන හිටියා, දෙමළ ජාතික සන්ධානයේ සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය මහමැතිවරණයේ දී සන්ධානයට ජනවරමක් ඉල්ලුවා ලු සම්මුති ආණ්ඩුවක් හදලා ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න. නැහැ. මම තමයි සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවසාන කෙටුම්පත හැදුවේ. අපි ඔක්කෝම එකතුවෙලා හැදුවේ. එහි කොහේවත් නැහැ, සම්මුති ආණ්ඩුවක් හෝ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවා කියලා. [බාධා කිරීම්] තියෙන එක ගෙනෙන්නේ කොහොමද? මම නේ ඒක හැදුවේ.

ඔබතුමා කොහොමද දන්නේ? [බාධා කිරීම්] එහෙම කොහේවත් නැහැ. [බාධා කිරීම්] ඒ නිසා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවාද නැද්ද කියන එක අද තමුන්නාන්සේලා ගන්න තීන්දුවත් එක්ක තීන්දු වෙනවා, මිත්‍රවරුනි. රට බෙදන්න දෙන්න අපි සූදානම් නැහැයි කියන එකත් අපි පැහැදිලිව කියනවා. ජාතික සම්පත් විජාතිකකරණයට අපි විරුද්ධ වුණා. අපි හම්බන්තොට වරාය විජාතිකයන්ට දෙනවාට විරුද්ධව මත ප්‍රකාශ කළා. ආණ්ඩු පක්ෂයේම සමහර ඇමතිවරුන්ට ගෙදර යන්න වුණා. හැබැයි, අපි බය වුණේ නැහැ. අපි ඒ ගැන කැබිනට් එකේ කථා කරනකොට හතර, පස් දෙනෙක් නැඟිටලා අපේ හඬ යටපත් කළා. එහෙම තමයි හැසිරුණේ. ඒවා අපි ඉවසාගෙන සිටියා. මේ මන්ත්‍රීවරු ඒවා දන්නේ නැහැ. හැබැයි, ඒවා ඉවසා ගෙන හිටියේ ජනාධිපතිතුමා පක්ෂයේ සභාපති නිසා. [බාධා කිරීම්] ඔව්. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමා - මේ, ලේකම්තුමා නොවෙයි පක්ෂය කියලා කියන්නේ. මේ, එහෙන් මෙහෙන් ආපු හත්, අට දෙනෙක් නොවෙයි පක්ෂය කියලා කියන්නේ. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත්, ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාත්, අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමාත්, ඩිලාන් පෙරේරා ඇමතිතුමාත්, මමත් මේ පක්ෂයෙන් ගිය දාට ඔය පක්ෂය ඉවරයි, පැරණි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ එතකොට නැහැ. මතක තියා ගන්න, සම්මුතිය ගෙනයන්න නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් තිබෙන්න ඕනෑ බව. අද තමුන්නාන්සේලා කරන්නේ ඒක අවසන් කිරීම සඳහා අවශ්‍ය පසුබිම හැදීම. ඒ නිසා අපි අනාගතයේ දී පුළුල් සන්ධානයකට ගිහිල්ලා, මේ රටේ නියම ජනමතය පාර්ලිමේන්තුවේ පිළිබිඹු කරලා, ස්ථිරසාර ආණ්ඩුවක් හැදීමේ වැඩ පිළිවෙළකට අපි සහයෝගය දෙනවා කියන එක ඉතා පැහැදිලිව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු කබීර් හෂීම් අමාත්‍යතුමා.

[අ.භා. 2.42]

ගරු කබීර් හෂීම් මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Higher Education and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විශ්වාස භංග යෝජනාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ විවාදයට ගත් 46වෙනි විශ්වාස භංග යෝජනාවයි. 1949 වර්ෂයේ දීත් -නිදහස ලබා අවුරුද්දකින්- ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු වකවානුවක් තිබුණා. මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරපු අය විශ්වාස භංග යෝජනාවේ කියලා තිබෙනවා, "අගමැතිතුමාට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාවක්" කියලා. ඒ වාගේම අගමැතිතුමා කරන ලද ඇමතිකමට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් කියලාත් කියලා තිබෙනවා. ඒ වාගේම, මේක රජයට එරෙහිව, රජය කෙරෙහි විශ්වාසයක් නැති නිසා ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් කියලාත් කියනවා.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30. (1) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා තමයි රජයේ ප්‍රධානයා වන්නේ. ඒ වාගේම ආණ්ඩුවේ ප්‍රධානයා වන්නේ ජනාධිපතිවරයා. එම නිසා මෙම විශ්වාස භංග යෝජනාව අගමැතිවරයාට විරුද්ධව විතරක් නොවෙයි, රජයට විරුද්ධවත්, ජනාධිපතිවරයාට විරුද්ධවත් ගෙනෙන විශ්වාස භංග යෝජනාවක්. ඒ යෝජනාවේ තිබෙන කරුණු කාරණා බලනකොට විශ්වාස භංග යෝජනාව සම්පූර්ණයෙන්ම පදනම් වෙලා තිබෙන්නේ රජය, ජනාධිපතිවරයා, අගමැතිවරයා, කැබිනට් මණ්ඩලයට එරෙහිව ගෙනෙන විශ්වාස භංග යෝජනාවක් හැටියටයි. ඇත්ත වශයෙන්ම මෙය රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් හැටියට තමයි අපි දකින්නේ. ආණ්ඩුවක් විධියට -ජනාධිපති වෙන්න පුළුවන්, අගමැතිවරයා වෙන්න පුළුවන්, කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු වෙන්න පුළුවන්, රජයට අයිති මන්ත්‍රීවරු වෙන්න පුළුවන්- අප සියලු දෙනාටම සාමූහික වගකීමක් තිබෙනවා. මොකද, මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ අප සියලු දෙනාටම එරෙහිවයි. එහෙම නම් දැන් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිවරයා කථා කරනකොට එතුමාට වැටහුණාද දන්නේ නැහැ, මේ ගෙනන විශ්වාස භංග යෝජනාව එතුමාටත් එරෙහිව ගෙනාපු විශ්වාස භංග යෝජනාවක්, ජනාධිපතිවරයාටත් එරෙහිව ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් කියලා.

ඊළඟට, මේ විශ්වාස භංග යෝජනාවට පදනම් වූ චෝදනා මොනවාද? විශ්වාස භංග යෝජනාවට පදනම් වූ චෝදනා කීපයක් සඳහන්ව තිබුණා. ඊට කලින් මා අහන්න කැමැතියි, විශ්වාස භංග

[ගරු කබීර් හෂීම් මහතා]

යෝජනාවට අත්සන් කළ අය කවුද කියලා. මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ, හිහන්නන්ගේ පොකට් එකටත් ගහපු අයයි; ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැළිගොඩ කියන මාධ්‍යවේදීන් මරා දමපු, ඒවාට අනුබල දීපු අයයි; මහ දවල් සතොස මං කොල්ල කාපු, විවිධ හොරකම් හා ජඩකම් කරපු අයයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ, "මෙහෙම අයයි" කියලා ඔබතුමා කිව්වා. එහෙම නැති අයත් ඉන්නවා.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඩෙසි ආචිවිගේ මැණික් මල්ල ගැන කථා කරපු අයත් මෙම විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙනවා. නැහෙනහිර පොලිස් ස්ථානවල සේවය කළ නිරායුධ පොලිස් නිලධාරීන් සිය ගණනක් ඝාතනය කරපු, අරන්තලාවේ ස්වාමීන් වහන්සේලා සිය ගණනක් ඝාතනය කරපු පිල්ලෙයාන්, විනායගමූර්ති මුරලිදරන් වැනි අය ආරක්ෂා කරපු අය තමයි මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ. ඒ වාගේම තාජුඩීන් මරා දමපු අය තමයි මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ. ඒ නිසා මෙම විශ්වාස භංග යෝජනාවේ වටිනාකමක් තිබෙනවාද,- [බාධා කිරීමක්] භාර ගන්න පුළුවන් සදාචාරාත්මක බවක් මෙම විශ්වාස භංග යෝජනාවේ තිබෙනවාද කියලා මා මේ ගරු සභාවෙන් අහන්න කැමැතියි. [බාධා කිරීමක්] මේ විශ්වාස භංග යෝජනාවේ පදනම කුමක්ද? [බාධා කිරීමක්] මෙහි පදනම හැටියට බැඳුම්කර ගනුදෙනුව සඳහන් කරනවා. [බාධා කිරීමක්]

මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව COPE එකේ විධිමත් පරීක්ෂණයක් කළා. අගමැතිතුමාම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා COPE එකේ සභාපති වශයෙන් පත් කළා. එම පරීක්ෂණ වාර්තාව නීතිපතිවරයාට යොමු කරන්නය කියලා අගමැතිවරයාම ඉල්ලීමක් කළා. මේ රටේ පළමුවැනි වතාවට ජනාධිපති කොමිසමක් හරිහැටි ක්‍රියාත්මක කරලා, ස්වාධීනව කටයුතු කරලා, අපක්ෂපාතී තීන්දුවක් දුන්නා. එම ජනාධිපති කොමිසමට පළමුවැනි වතාවට ඇමතිවරු තුන්දෙනෙක් සාක්ෂි දෙන්න ගියා. අගමැතිවරයා ස්වේච්ඡාවෙන් සාක්ෂි දෙන්න ගියා. සමහර නිටපු ඇමතිවරුන්ට -අද මන්ත්‍රීවරුවන්ට- කැඳවීමක් කළාම, "සර්පයෙක් දෂ්ට කළා"යි කියලා කියනවා. තවත් කෙනෙක් කියනවා, "බල්ලෙක් කෑවා"යි කියලා. ගිහිල්ලා සාක්ෂි දෙන්න එතුමන්ලාට කොන්දක් නැහැ. එතුමන්ලාට හංගන්න බොහෝ දේවල් තිබුණා. අපේ ඇමතිවරු මේ රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කරලා, ගිහිල්ලා සාක්ෂි දෙනවා. අගමැතිවරයා සාක්ෂි දෙනවා.

ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ පිටු නවසිය ගණනක් තිබෙනවා. පිටු නවසිය ගණනක් තිබෙන වාර්තාවේ එක පිටුවකවත් අගමැතිවරයාට එරෙහිව චෝදනාවක් සඳහන් වන්නේ නැහැ. "අර්ජුන මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කළ පළියට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා"යි කියලා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිවරයා කිව්වා. මා කියන්නේ, එහෙම නම් මහින්ද රාජපක්ෂ මහතාට විරුද්ධව විශ්වාස භංග යෝජනා 100ක් ගෙනෙන්න තිබුණාය කියලායි. එතුමා පත් කරපු ලලිත් වීරතුංග වැරදිකාරයකු හැටියට ඔප්පු වුණා. ඒ නිසා ඔහුට උසාවියකින් දඩුවම් දුන්නා. ටී.බී. ජයසුන්දරට චෝදනා තිබුණා. ඔවුන් පත් කළේ කවුද? එහෙම නම්, මේ ගොල්ලන් ඒ කාලයේ විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැත්තේ ඇයි? මෙතුමන්ලා කටයුතු කරන්නේ එවැනි පදනමකින් නම්, ඒ දීපු වැරදි පත්වීම්වලට විරුද්ධව එදා මේ ගොල්ලන් කිසිම දෙයක් කළේ නැත්තේ ඇයි කියා මා අහන්න කැමැතියි.

2015 මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා හැම වේදිකාවකම බෙරිහන් දුන්නා, එතුමාට විදුලි පුටුවට යන්න වෙයි; ජාත්‍යන්තරයෙන් විදුලි පුටුවට යවනවාය කියලා. එතුමා බේරා දුන්නේ 2015 දී බලයට පැමිණි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවෙන් කියලා මා කියන්න කැමැතියි. ඒ නිසාද, අද මෙතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ? ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව සිදු වී තිබෙන දේවල් කියන්න මට කාල වේලාව නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා කියන්න කැමැතියි, මේ රටේ තිබුණේ "කොට්ට මාරු" දේශපාලන ක්‍රමයක්ය කියලා. අපි බලයට පත්වෙලා, ඒ ක්‍රමය වෙනස් කරලා, කොට්ටයයි, මෙට්ටයයි දෙකම මාරු කරන්න තීරණය කළා. නමුත් අපට බැරි වුණු එක දෙයක් තිබෙනවා. ඒ තමයි, කොට්ටයයි, මෙට්ටයයි මාරු කළාට ඇඳ රාමුවේ හිටපු මකුණන් ටික ශුද්ධ කරන්න අපට බැරි වුණා. ඒ මකුණන් ටික ශුද්ධ කළා නම් හරි. දැන් ඒ මකුණන් ටික වසංගතයක් වෙලා. ඒ මකුණන් ගෙනාපු විශ්වාස භංග යෝජනාව -

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්තුමා අද විදුලි පුටුව ගැන කථා කරනවා. එතුමාගේ පුටුව අද -

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙට විශේෂ අධිකරණයක් පිහිටුවා, ඒ මකුණන් ටිකත් ශුද්ධ කළායින් පසුව මේ වසංගතය අපට ඉවර කරන්න පුළුවන්. මකුණෝ රැලක් එක්ක පිනට ආපු ඇමතිවරු කණ්ඩායමක් එකතු වෙලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදීව පත් කරපු අගමැතිවරයකුට විරුද්ධව වැඩකට නැති විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාට මේ විශ්වාස භංග

යෝජනාව කිසිම දවසක සාර්ථක වෙන්නේ නැහැයි කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 2.50]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කබීර් හාෂීම් ඇමතිතුමාගේ කථාවෙන් ප්‍රධාන ලෙස චෝදනා එල්ල කළේ, මේ විශ්වාස භංග යෝජනාව අත්සන් කර තිබෙන අපටයි. විශ්වාස භංග යෝජනාව ඒකාබද්ධ විපක්ෂයෙන් ගෙනාවාට, එයට ආණ්ඩු පක්ෂයෙනුත් සහයෝගයක් තිබෙන බව ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ කථාවෙන් පෙනී ගියා. ගරු කබීර් හාෂීම් ඇමතිතුමනි, ආණ්ඩු පක්ෂයෙන් අපට ඒ වාගේ සහයෝගයක් ලැබෙන්න හේතුව මොකක්ද කියලා ඔබතුමා කල්පනා කරන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂය ගැන නේ අපි මේ කථා කරන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂය, තමුන්නාන්සේලාගේ සම්මුතිවාදී ආණ්ඩුව ගැනයි මේ කථා කරන්නේ. ඒ සම්මුතිවාදී ආණ්ඩුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව කථා කරනවා. ඒකෙන්ම මේ විශ්වාස භංග යෝජනාවේ වටිනාකම වැඩි වෙනවා. අපට "මකුණෝ" කියලා තමුන්නාන්සේට බේරෙන්න බැහැ. තමුන්නාන්සේලා සම්මුතිවාදී ආණ්ඩුව හැදුවේ ඒ ගොල්ලන් එක්කයි. ඒ අයත් මේ විශ්වාස භංග යෝජනාව වෙනුවෙන් අද කථා කළා. ඒක එක point එකක්. ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ ඒ තර්කය වටිනාකමකින් තොර තර්කයක් කියලා මා කියන්න කැමැතියි.

ඊළඟට, මංගල සමරවීර ඇමතිතුමා උත්සාහ කළා, මේ විශ්වාස භංග යෝජනාව අපේ ජනාධිපතිතුමාගේ බෙල්ලේ පටලවලා, ජනාධිපතිතුමා මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව මෙහෙයවන්න. එතුමා කිව්වා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ ජනාධිපතිතුමා තනි කරන්නය කියලා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා පරාජය කරලා, එතුමා අගමැතිකමෙන් ඉවත් කරලා, ජනාධිපතිතුමා තනි කරලා, එතුමාට විරුද්ධව දෝෂාභියෝගය ගෙනෙන්නයි මේ උත්සාහ කරන්නේ කියලා කිව්වා. කවුරු එක්කද? එක්සත් ජාතික පක්ෂයත් එක්ක එකතු වෙලායි. ඒක කොයි තරම් වැල්වටාරම් කථාවක්ද? අන්තිමට ඒ කථාව තමුන්නාන්සේලාගේ අතේම පිපිරුවා. ඇයි? ජනාධිපතිතුමා ඒ කථාව පිළිගත්තේ නැහැ. ජනාධිපතිතුමා ඒ කථාව පිළිගත්තේ නැති බව අපි දන්නේ කොහොමද? අපි දන්නේ, ජනාධිපතිතුමාගේ පක්ෂයේ මැති ඇමතිවරු අද මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව මේ පාර්ලිමේන්තුවේ පෙනී සිටින නිසායි. ඒ නිසා තමුන්නාන්සේලාගේ උගුල අද තමුන්නාන්සේලාටම උගුලක් වෙලා තිබෙනවාය කියලා මා කියන්න ඕනෑ.

ඊළඟට, මේ කාරණා මේ ගරු සභාවේදී කියවුණා වුණත් මේවා නොකියා බැහැ. ඒ නිසායි මා මේ කාරණා කියන්නේ. අපට අගමැතිතුමා සමඟ කිසිම පෞද්ගලික ද්වේෂයක් නැහැ. එතුමාට අපි පෞද්ගලිකව පරිභව කරන්නේ නැහැ. නමුත් එතුමා අගමැතිවරයා හැටියට මේ කර තිබෙන කටයුතු පිළිබඳව එතුමා වග උත්තර කිව යුතුයි. දැන් බලන්න, අර්ජුන මහේන්ද්‍රන් ගැන වගකීම සම්පූර්ණයෙන්ම භාර ගත්තේ එතුමා නේ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, "ඔය පුද්ගලයා ගෙනෙන්න එපා, ඔය පුද්ගලයා ගැන විශ්වාසයක් තැබිය නොහැකියි" කියලා. තවත් ඇමතිවරයෙකුත් එහෙම කිව්වා. ඒ ඇමතිවරුන් කියන දේ නොඅසා අගමැතිතුමා කිව්වා, "මම වග කියනවා"යි කියලා. "ජාත්‍යන්තරයේ මූල්‍ය කටයුතුවලට මැදිහත් වෙන්න මෙයාට වඩා හොඳ මිනිහෙක් නැහැ"යි කියලා ඔහු ගෙනාවා. ඔහු ගෙනාපු එක වෙනම එකක්. ඊට පස්සේ සිදු වුණු දේවල් පිළිබඳ කථාව හැමදෙනාම දන්නවා. දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? එතුමා එක වෙලාවක ලංකාවෙන් පිට වෙලා සිංගප්පූරුවට ගියා. ඔහු සිංගප්පූරුවට යන වෙලාවේදී අපි කිව්වා, ලංකාවේ පොලීසියට, අධිකරණයට ඔහු කැඳවන්න ඕනෑ වෙයි කියලා. එතකොට අගමැතිතුමා කිව්වා, "ඔහු ගියේ මහුල් උත්සවයකට"යි කියලා. එතුමා දන්නවා, යහළුවා යන්නේ මහුල් උත්සවයකටද, කොටහළු මහුලකටද කියලා. ඒ සියල්ලම එතුමා දන්නවා. "ඕනෑ වෙලාවක මා ඔහු ගෙනැල්ලා දෙන්නම්" කියලා අගමැතිතුමා කිව්වාද, නැද්ද? "අර්ජුන මහේන්ද්‍රන් ගියේ මහුල් උත්සවයකට, ඕනෑ වෙලාවක ඔහු පොලීසියට හෝ අධිකරණයට එක්කගෙන ඇවිල්ලා දෙන්නම්" කියලා අගමැතිතුමා ප්‍රසිද්ධියේ මේ පාර්ලිමේන්තුවේදී කිව්වාද, නැද්ද? එහෙම නම් දැන් ඔහු එක්කගෙන ඇවිල්ලා දෙන්න අගමැතිතුමාට බැරි ඇයි?

එතුමා කොහේද ඉන්නේ කියලා අගමැතිතුමා දන්නේ නැතිද? හැමෝම සැක කරනවා, අගමැතිතුමා සිංගප්පූරුවට ගිය වෙලාවේ තානාපති කාර්යාලයට ගෙන්වා ගෙන අර්ජුන් මහේන්ද්‍රන්ව හම්බ වෙලායි ආවේ කියලා. ඒ නිසා අර්ජුන් මහේන්ද්‍රන්ව ලංකාවට ගෙන්වා දීමේ තනි වග කීම අගමැතිතුමායි භාර ගෙන තිබෙන්නේ; ඒ වාගේම අගමැතිතුමාට ඒක භාරයි. එතුමාට එය ඉටු කරන්න බැරි නම්, අගමැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් අප ගෙන ආ යුතුද, නැද්ද? තමුන්නාන්සේලාම කල්පනා කරලා බලන්න, අර්ජුන් මහේන්ද්‍රන්ව අධිකරණයට ඕනෑ මිනිහෙක්ද කියලා? ඔහු අධිකරණයට වුවමනා කෙනෙක්. අධිකරණය ඉදිරියට එතුමාට එන්න කියලා දැනුම් දීම් යැවුවාට එතුමා එනවාද? එතුමා එන්නේ නැහැ. මේ අපරාධය සම්බන්ධයෙන් එතුමා අධිකරණය ඉදිරියට ගෙන්වා ගැනීමට කවුද එතුමා වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ? කවුද එතුමා පිළිබඳව වග කීම භාර ගත්තේ? ඒ අනුව අගමැතිතුමාට අපි කියන්නේ, "ඔබතුමා අර්ජුන් මහේන්ද්‍රන් ගෙන්වලා දෙන්න." කියලායි. ගෙන්වලා දෙන්නට පුළුවන්ද, බැරිද කියන්නේත් නැහැ. එතුමා එහෙනම් කියන්න ඕනෑ, "මට බැහැ එයාව ගෙන්වන්න. මම එදා ගෙන්වන්නම් කියලා කිව්වාට, අද මට ඒක කරන්න බැහැ." කියලා. එහෙම කියන්නේත් නැහැ. ඒ වෙනුවට, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු වන නීතිඥයන් කණ්ඩායමක් දමලා, මේ ගරු සභාවට ඇවිල්ලා දිග හැල්ලක් කියා ගෙන අර්ජුන් මහේන්ද්‍රන්ට සුදු හුණු ගෑමයි කළේ. "ඒ වාර්තාව අනුව අර්ජුන් මහේන්ද්‍රන් වැරදිකාරයෙක් නොවෙයි. ඔහුගෙන් මෙවැනි වරදක් වෙලා නැහැ." කිව්වා. ඒ වාගේම, ඉස්සර කාලයේ කබරාල් කරපු වැරදි ගැන දිග හැල්ලක් කිව්වා. නමුත්, අද අධිකරණයක් ඉදිරියට කබරාල් කැඳවලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! The Hon. Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම මේ කියා ගෙන ආවේ, අර්ජුන් මහේන්ද්‍රන් කියන හිටපු මහ බැංකු අධිපතිවරයා අධිකරණය ඉදිරියට කැඳවලා තිබීම ගැනයි. ඒ වාගේම මම කිව්වා, "කබරාල් කැඳවලා නැහැ." කියලා. එදා අගමැතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වේ, "වැරදිකාරයා අර්ජුන් මහේන්ද්‍රන් නොවෙයි, ඊට ඉස්සර හිටපු කබරාල්." කියලා. නමුත්, කබරාල් උසාවියට කැඳවලා නැහැ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම නම් ඉඩ දීලා බලාගෙනයි ඉන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ගේ point of Order එක මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මම අහනවා, මේ වෙනකොට රුසියාවේ ඉන්න උදයංග,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. වාඩි වෙන්න. ඔබතුමා හැම වෙලාවෙම point of Order වැරදි විධියට පාවිච්චි කරනවා නේ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, කථා කරන්න. [බාධා කිරීම්] ඔබතුමන්ලා වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, අර්ජුන් මහේන්ද්‍රන් දුන් ඔත්තුව අනුව තමයි බැනාට මේ විශාල අයුතු ලාභය හම්බ කර ගන්න පුළුවන් වුණේ කියලා දැන් ඔප්පු වෙලා ඉවරයි. මේ අයුතු ලාභය හම්බ කළේ, එක්තරා විධියකට මේ රටේ මහ ජන මුදල්වල හොරකමක් හැටියටයි.

ගරු කථානායකතුමනි, මේක අලාභ ගෙවීමක් නොවෙයි. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා නිතරම කියනවා, "අයියෝ! ඒ ගණන ඒ ගොල්ලන්ගේ accountsවලින් අපි මෙහේ අල්ලලා තිබෙන්නේ. ඒවා මෙහේ freeze කරලා අපට ඒක අය කර ගන්න පුළුවන්. ඔය ගණන ගණනක් නොවෙයි." කියලා. අපේ විගණකාධිපතිතුමා කියනවා, අලාභය බිලියන 11ක් කියලා. අවස්ථාවික අලාභය කීයද කියලා ගණන් බැලුවාම මිලියන දහස් ගණනක්. අවස්ථාවික අලාභය කියන්නේ, එය කරුණුකොටගෙන; ඒ නිසා කරන්න සිදු වෙන ගනුදෙනුවල අලාභය; ඒ නිසා ඉදිරි කාලයට කරන්නට සිද්ධ විය හැකි ගනුදෙනුවල මුළු අලාභය. මෙන්න මේකයි අවස්ථාවික අලාභය කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේවා බිලියන 11න් අය කර ගන්න පුළුවන්ද? බිලියන 11න් අය කර ගන්න බැහැ.

අනෙක් කාරණය, ගරු කථානායකතුමනි, මේක අය කර ගැනීමේ ප්‍රශ්නයක් නොවෙයි. ඇයි, මේ අය කර ගැනීමේ මුදල ආපසු ගැනීමේ ප්‍රශ්නයක් හැටියට දමන්නේ? මේක නොම්මර එකේ මං කොල්ලයක්; ප්‍රචණ්ඩත්වය යොදා ගෙන කරපු හොරකමක් කියන එකයි 'මං කොල්ලයක්' කියන්නේ. මෙතැන ප්‍රචණ්ඩත්වයක් තිබෙනවා. අදෘශ්‍යමාන ප්‍රචණ්ඩත්වයක්. මහ බැංකුවේ අධිපතිවරයායි, ඔහුගේ බෑනයි දෙදෙනා එකතුවෙලා අගමැතිත් හවුල් කර ගෙන කරපු කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් හැටියටයි මේ විශාල අලාභය සිද්ධ වෙන්නේ. එසේ නම් අර්ජුන් ඇලෝසියස් විතරක් නොවෙයි, ඒ චිත්ති කුඩුවේම අර්ජුන මහේන්ද්‍රන් හිටගන්න ඕනෑ; ඒ චිත්ති කුඩුවේම අගමැති රනිල් වික්‍රමසිංහ හිටගන්න ඕනෑ. දැන් හදිසියේ ආණ්ඩුවේ බලය වෙනස් වුණොත් මොකද වන්නේ? හෙට අනිද්දා වෙනකොට එය බොහෝවිට වෙන්න ඉඩ තියෙන දෙයක්. පොලීසියේ පරීක්ෂණ ආරම්භ කරනකොට ඒවා කෙළින්ම අගමැතිතුමා පිළිබඳ පරීක්ෂණයක් වීම වළක්වන්න පුළුවන්ද? අගමැතිතුමා මේ පුද්ගලයා ගැන දන්නා තොරතුරු අනුව මේ පුද්ගලයා ඉන්නේ කොහේදැයි කියා අගමැතිතුමාට කියන්නට වග කීමක් අපේ නීතිය අනුව තිබෙනවා. ඒ වග කීම ඉටු නොකරනවා නම්, ඒ අපරාධකාරයා- සැකකාරයා- වසන් කර තැබීමට තමන් දන්නා වූ තොරතුර අධිකරණයට හා පොලීසියට නොදීමේ වරද පිළිබඳව අගමැතිතුමාට චිත්ති කුඩුවට නඟින්න වෙනවා. මොකකින්ද බේරිලා ඉන්නේ? අගමැතිකමෙන්. කොහොමද අද එතුමා අධිකරණයට නොගෙනිහින් තිබෙන්නේ; කොහොමද එතුමාට විරුද්ධව පොලීසියේ පරීක්ෂණ නවත්වා ගෙන ඉන්නේ? අගමැතිකමේ බලයෙන්. එම නිසා තමයි කොහොමින් හෝ මේ අගමැති ධුරයෙන් පහ කිරීමෙන් බේරෙන්න පුළුවන් හැම උත්සාහයක්ම මේ දක්වා කර ගෙන එන්නේ. මේකට නොයෙක් දෙනා නොයෙක් දේවල් කියනවා. සල්ලි මලු පිටින් මාරු වුණාය කියනවා, හුවමාරු වුණාය කියනවා. සමහරු එහෙම කියනවා. ඒවායේ ඇත්ත, නැත්ත මම දන්නේ නැහැ.

සමහරු කියනවා, යානාන්තර -තනතුරු- දෙන්න අනන්තවත් පොරොන්දු දුන්නාය කියා. මම ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගෙන් ඇහුවා, "ඒ කියපු දේවල් ඉටු කරන බවට අලුතෙන් පොරොන්දුවක් දුන්නා ද? කියා. " ඔව්. ඔව්. ඔව්. අලුතෙන් පොරොන්දුවක් දුන්නා, ඒ ඉටු කරනවාය කිව්ව ඒවා ඉටු කරන බවට" කියා එතුමා කිව්වා. යානාන්තර දෙන බවට පොරොන්දු ගොඩක්. මේ විධියට විශාල මෙහෙයුමකින් තමයි මේ පරාජය වෙන්න ගිය තමන්ගේ ඉරණම බේරා ගැනීමට මේ යොදා ගත්-

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. M.A. Sumanthiran.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Nanayakkara asked me, but I did not say a new promise was given. I said that this is the promise that the Government made from the beginning and they will have to honour it. -[*Interruption.*] Hon. Nananayakkara, in your speech, you misrepresented what I told you down the corridor saying that "a new promise was given". I did not say it was a "new promise".

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Vasudeva Nanayakkara, you have one more minute.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Sumanthiran, I said exactly what you said. "He renewed the promise for delivery", that is what I said. Anyway, now the matter in issue is, is the Prime Minister not obliged to resign? එතුමාට සදාචාරාත්මක වශයෙන් වග කීමක් නැද්ද, නීතිය වශයෙන් නොවෙයි නම් ඉල්ලා අස් වෙන්න? ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා පෙන්නුවා, ලෝකයේ ඉල්ලා අස්වීම් පෙළක්; මොන මොන කාරණා උඩ අස්වීම් සිද්ධ වෙලා තිබෙනවාද කියා. එතුමාට අස්වීමට හේතු කාරණා මෙච්චර තිබෙද්දී එතුමා අස් නොවෙනවා නම්, අර Latimer House ප්‍රතිපත්තියද අනුගමනය කරන්නේ කියන එක අහන්න වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාලය අවසානයි. කථාව අවසාන කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මම කථාව අවසන් කරන්නයි යන්නේ. මේ විශ්වාස භංගයේ අර්ථය බොහෝ දෙනා නිරුවත් කිරීමයි. මේ විශ්වාස භංගයේ අර්ථය ආණ්ඩුවේ තිබුණු සම්මුතිය දෙපලු කිරීමයි. මේ විශ්වාස භංගයේ අර්ථය මේ ආණ්ඩුව හෙට අනිද්දා බිඳ වැටෙන අනාගත ඉරණමකට යටත් කිරීමයි. මගේ වචන කිහිපය හමාරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ඊළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා. 3.04]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, අද මට කථා කිරීමට අවස්ථාවක් නොතිබුණත් ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා මට විනාඩි පහක කාලයක් ලබා දීම ගැන එතුමාටත් ඔබතුමාටත් මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා.

ඇත්තෙන්ම පසුගිය කාල පරිච්ඡේදය පුරා විවිධ වූ කතාබස්වලට ලක් වෙමින් මේ රටේ අගමැතිතුමාට විරුද්ධව ගෙනා මේ විශ්වාස භංග යෝජනාව තුළින් සිදුවුණේ මොකක්ද? එක්සත් ජාතික පක්ෂය මෙතෙක් යම් වැරදි මාර්ගයක ගියා නම්, අපට ඒක නිවැරදි කර ගැනීමේ හැකියාව මේ තුළින් ලැබී තිබෙනවාය කියලායි මම හිතන්නේ. තරුණ මන්ත්‍රීවරු හැටියට අපි මේ පක්ෂය ඇතුළේ ශුද්ධ වූ එක්සත් ජාතික පක්ෂයක් හදා ගැනීමේ කටයුතු සිද්ධ කර ගෙන යනවා. එම නිසා ඒකාබද්ධයේ තමුන්නාන්සේලා ගෙනා මේ විශ්වාස භංග යෝජනාව තුළින් අගමැතිතුමා කෙරෙහි අපේ විශ්වාසය ගොඩ නැඟිලා හමාරයි.

ගරු කථානායකතුමනි, මුළු සභාවටම අහගන්න මම කවියක් කියන්නම්. අහගන්න.

අගමැතිදුන් පරදනවයි දැම්ම නමුත්	සද්දේ
ගැලවුණා ලු රජවරුන්ගෙ සළු සභාව	මැද්දේ
භාවා දෙසට විද්ද නමුත් පඳුරකටයි	වැද්දේ
කුරුමානම වැරදුණා ලු අද	ඒකාබද්දේ

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංගය ගෙනැල්ලා යම් කිසි කොටසක් අද -

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පියල් නිශාන්ත මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මේ සිද්ධිය සම්බන්ධව විශේෂයෙන්ම අපේ ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කටකින්ද, මොකකින්ද කථා කරන්නේ කියලා මම දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

That is not a point of Order. ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කරන්න. ගරු මන්ත්‍රීවරු points of Order වැරදි ලෙස පාවිච්චි කරන්න එපා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු අගමැතිතුමාට විරුද්ධව ගෙනා මේ විශ්වාස භංගය තුළින් අද අප සියලුදෙනාගේ විශ්වාසය ගොඩ නැඟිලා තිබෙනවා. කවුරු හෝ අපට එරෙහිව සිටියා නම් අද ඒ අයත් අපේ පක්ෂයට එකතු වෙලා මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කිරීම සඳහායි කටයුතු කරන්නේ. මම හිතන්නේ ඒකාබද්ධයත් තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දෙනවා නම්, දිය යුත්තේ අගමැතිතුමා ජයග්‍රහණය කරවීමටය කියන එක මම බොහොම පැහැදිලිව කියනවා.

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

අගමැතිතුමා කියන්නේ පරම්පරාවෙන් සල්ලි තිබෙන බොහොම වැදගත් පවුලක කෙනෙක්. එතුමා කවදාවත් හොරකමකට ලක් වූ කෙනෙක් නොවෙයි. තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට දෝෂාභියෝග කීයක් ගෙනැල්ලා තිබෙනවාද; විශ්වාස භංග යෝජනා කීයක් ගෙනැල්ලා තිබෙනවාද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු ආනන්ද අලුත්කමකේ)
(The Hon. Ananda Aluthgamage)
තමුන්නාන්සේලා දැනගන්න ඕනෑ, අද මේ ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාවේදී අගමැතිතුමාට පක්ෂව මේ සියලුදෙනා ඡන්දය දීලා අගමැතිතුමා ජයග්‍රහණය කරවනවා කියන එක. අද ගරු රවුෆ් හකීම් ඇමතිතුමා ඒ පොරොන්දුව දුන්නා. ඒ වාගේම ද්‍රවිඩ පක්ෂවල නායකයෝත් ඒ පොරොන්දුව දීලා තිබෙනවා. මේ වැදගත් අවස්ථාවේදී මම එක යෝජනාවක් කරනවා. සුළු ජාතීන් සහ සිංහල මහ ජාතිය එකතු වෙලා මේ රටේ සියලුදෙනාට නායකත්වය දෙන්නේ එක්සත් ජාතික පක්ෂය. එසේ කළ හැකි වන්නේ මේ සියලුදෙනා එකතු වුණු පක්ෂයකට විතරයි. එහෙම නැතිව වෙනත් කිසිම තනි පක්ෂයකට කිසිම දවසක ආණ්ඩුවක් පිහිටුවන්න බැහැ. අද තමුන්නාන්සේලා කෑ ගහනවා. නමුත්, තමුන්නාන්සේලාට ද්‍රවිඩ නායකයෙකු ඉන්නවාද? තමුන්නාන්සේලාට මුස්ලිම් නායකයෙකු ඉන්නවාද? අද මේ සියලු නායකයෝ එකතු වෙලා ඉන්නේ එක්සත් ජාතික පක්ෂය එක්කයි කියන එක මා බොහොම පැහැදිලිව කියනවා. තමුන්නාන්සේලා බලාගෙන සිටියා; ඒ වාගේම පසුගිය දවස්වල පත්තරවල එක එක විස්තර යනකොට තමුන්නාන්සේලා හිතුවා; "අපි කොයි පැත්තටද යන්නේ?" කියලා. නමුත්, අපි යන්නේ එක්සත් ජාතික පක්ෂයත් එක්ක; අගමැතිතුමාත් එක්ක කියන එක අපි බොහොම පැහැදිලිව කියනවා. තමුන්නාන්සේලා බලාගෙන ඉන්න ඇති, දැන් වැටෙයි; දැන් වැටෙයි; දැන් වැටෙයි කියලා. නමුත්, මේ ආණ්ඩුව කවදාවත් වැටෙන්නේ නැහැ. 2020 නොවෙයි, 2025 නොවෙයි, 2030 වන තෙක් අපි එක්සත් ජාතික පක්ෂයත් එක්ක ආණ්ඩුව ගෙන යන්න ඉන්නවාය කියන එක බොහොම පැහැදිලිව කියනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The next speaker is the Hon. Sivasakthi Ananthan. You have five minutes.

[පි.ප. 3.09]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(මාණ්පුමිකු சිවசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ சபாநாயகர் அவர்களே, பிரதம அமைச்சருக்கு எதிரான இந்த நம்பிக்கையில்லாத் தீர்மானத்தின்மீது எனக்கும் பேசுவதற்கு ஐந்து நிமிடம் தந்தமையையிட்டு உங்களுக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன். உண்மையிலே, 2015ஆம் ஆண்டு இந்த ஆட்சி மாற்றத்தைக் கொண்டுவந்ததில் பாரிய பங்கு வகித்தவர்கள் தமிழ் மக்களும் முஸ்லிம் மக்களுமாவர். இந்த ஆட்சி மாற்றம் ஏற்பட்டு மூன்று வருடங்கள் கடந்திருக்கின்றன. ஆனால், போரினால் பாதிக்கப்பட்டிருக்கின்ற மக்களினது அன்றாடப் பிரச்சினைகளைத் தீர்ப்பது மற்றும் இனப்பிரச்சினைக்கு ஒரு நிரந்தரமான அரசியல் தீர்வைக் காண்பது போன்ற விடயங்களுக்காக கடந்த மூன்று வருட காலமும் இந்த அரசாங்கத்திற்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு நிபந்தனையின்றி ஆதரவு வழங்கிவந்தபோதிலும் குறிப்பாக இந்த இரண்டு பிரதான கட்சிகளும் அந்த விடயங்களை நிறைவேற்றுவதிலே தவறியிருக்கின்றன. ஆனால், கடந்த பத்து வருட காலம் முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவினுடைய ஆட்சிக்காலத்திலே தமிழ் மக்களுக்கு இழைக்கப்பட்ட எத்தனையோ கொடுமைகள்-அநீதிகளிலிருந்து விடுபடுவதற்காகவும் அவற்றுக்கு நீதி - நியாயம் கிடைக்க வேண்டும் என்பதற்காகவுமே இந்த ஆட்சி மாற்றம் ஏற்படுத்தப்பட்டது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதாவது, இந்த நாட்டிலே நீண்ட காலமாகப் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினைக்கு இந்த இரண்டு பிரதான கட்சிகளும் ஒன்றாக இணைந்திருக்கும்போதுதான் ஒரு நிரந்தரமான அரசியல் தீர்வைக் காணமுடியும் என்று நாங்கள் மூன்று வருட காலமாக உங்களுடைய இந்த அரசாங்கத்திற்கு ஆதரவை வழங்கி வந்தோம். ஆனால், மூன்றாவது வருட காலத்திலேயே இந்த இரண்டு கட்சிகளும் எதிரும் புதிருமாக இருந்து தமிழ் மக்களுக்கு வழங்கிய வாக்குறுதிகளிலிருந்தும் சிங்கள மக்களுக்கும் முஸ்லிம் மக்களுக்கும் வழங்கிய வாக்குறுதிகளிலிருந்தும் விலகிச் செல்கின்ற விடயமானது ஒட்டுமொத்தமாக இந்தத் தேசிய அரசாங்கத்தை ஆட்சிக்குக் கொண்டுவந்த அனைத்து மக்களுக்கும் இழைக்கின்ற பாரிய அநீதியாகும்.

இன்று இந்த இரண்டு கட்சிகளும் ஒன்றாக இருந்து எதிர்வரும் இரண்டு வருட காலத்துக்குள் இந்தப் பிரச்சினைக்கு தீர்வைக் காணத்தவறினால், கடந்த காலத்திலே இந்த நாடு யுத்தத்திற்கு முகங்கொடுத்து எப்படி பாரிய ஓர் அழிவைச் சந்தித்ததோ அல்லது பொருளாதார நெருக்கடியைச் சந்தித்ததோ, அதேமாதிரியான ஒரு பாதிப்பை மீண்டும் சந்திக்கவேண்டிய ஒரு நிலைமை ஏற்படும். ஏனெனில், நீங்கள் அந்த நிலைமையை நோக்கித்தான் செல்கின்றீர்கள். ஆனால், இந்த நாட்டிலே நீண்ட காலமாக இருந்துவருகின்ற இனப்பிரச்சினைக்கு நிரந்தரமான ஓர் அரசியல் தீர்வு காணப்பட வேண்டும்; யுத்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கு ஒரு தீர்வு கிடைக்க வேண்டும்; போர்க் குற்றம், மனித உரிமைகள் மீறல்கள் போன்றவற்றுக்குத் தீர்வு - நியாயம் கிடைக்க வேண்டும் போன்ற விடயங்களின் அடிப்படையில்தான் இந்த ஆட்சி மாற்றம் கொண்டு வரப்பட்டது. இதிலிருந்து நீங்கள் இரு சாராரும் விலகியிருக்க முடியாது. ஆகவே, இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு இன்று இரு கட்சிகளும் ஒன்றுபட்டிருக்க வேண்டிய தேவை யிருக்கின்றது.

இன்று எங்களுடைய மக்களுக்கு நடைமுறையில் பல்வேறு பட்ட பிரச்சினைகள் இருக்கின்றன. இந்தப் பிரச்சினைகளை இந்தச் சபையிலே பல தடவைகள் எடுத்துக்கூறியிருக் கின்றோம். 15 - 20 வருட காலமாகியும் எங்களுடைய அரசியல் கைதிகளுக்கு விடுதலை இல்லை. குறித்த 5 மாவட்டங்களிலும் காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவுகள் தங்களுடைய கோரிக்கைகளை நிறைவேற்றுமாறு போராடிக்கொண்டு, 405 நாட்களைக் கடந்தும் தெருவோரமாக இருக்கிறார்கள்.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have only three more minutes.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

இற்றைவரைக்கும் இந்த அரசாங்கம் அவர்களிடம் இது சம்பந்தமாக ஏன் என்றுகூடக் கேட்கவில்லை. அதாவது, 405 நாட்கள் கடந்தும் அவர்களைக் கூப்பிட்டு விசாரித்து இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணவில்லை.

இதற்கு அப்பால், வடக்கு, கிழக்கில் சாதாரண சிற்றூழியர்கள் மற்றும் உயர் பதவி வகிக்கின்ற அரச ஊழியர்களைக்கூட தெற்கிலிருந்துதான் நியமிக்கின்றீர்கள். உதாரணமாக, உள்நாட்டலுவல்கள் அமைச்சர் 3 வருடங்களுக்கு முன்பு தென்பகுதியைச் சேர்ந்த ஓர் அரசாங்க அதிபரை வவுனியா மாவட்டத்திற்கு நியமித்தபோது, அவரை அங்கிருந்து ஒரு மாத காலத்திற்குள்ளே இடமாற்றம் செய்து தமிழ் பேசுகின்ற ஒருவரை அந்த இடத்துக்கு நியமிப்பதாகச் சொன்னார். ஆனால், 3 வருடங்கள் கடந்தும் மூன்றாவது அரசாங்க அதிபரையும் தென்பகுதியிலிருந்துதான் அங்கு நியமித்திருக்கின்றீர்கள். அதேபோல் வடக்கிலிருக்கின்ற சகல திணைக்களங்களிலும் தென்பகுதியிலிருக்கின்ற - தமிழ் மொழி தெரியாதவர்களைத்தான் சிற்றூழியர்களாக நியமிக்கின்றீர்கள்.

காணி விடயங்களை எடுத்துக்கொண்டால், படைத் தரப்பினர் கையகப்படுத்தியிருக்கின்ற காணிகள் இன்றும் விடுவிக்கப்படாமல் இருக்கின்றன. அதேநேரத்தில், 1987 மற்றும் 2007ஆம் ஆண்டுகளில் வெளியிடப்பட்ட இரண்டு வர்த்தமானி அறிவித்தல்கள் மூலமாக முல்லைத்தீவு மற்றும் வவுனியா மாவட்டங்களில் மாங்குளம் வரைக்கும் தமிழ் மக்களுக்குச் சொந்தமான கிட்டத்தட்ட 3,60,000 ஏக்கர் காணிகளை மகாவலி அபிவிருத்தி அதிகாரசபை கையகப் படுத்தியிருக்கின்றது. ஆகவே, நீங்கள் 1987ஆம் ஆண்டும் 2007ஆம் ஆண்டும் வெளியிட்ட வர்த்தமானி அறிவித்தல்களை இரத்துச் செய்து மகாவலி அபிவிருத்தி அதிகாரசபை கையகப்படுத்தியுள்ள காணிகளை விடுவித்துக்கொடுக்க வேண்டும். அதேவேளை, வடக்கிற்கு மகாவலி நீரைக் கொண்டுவாருங்கள்! காணி அதிகாரங்களைப் பொறுத்த வரையில், அது மாகாண சபைக்கு உட்படுத்தப்பட வேண்டும். இந்தக் காணிகளைக் கையகப்படுத்துவதாக இருந்தால் மாகாண சபையோடு - மாகாண முதலமைச்சரோடு கலந்தாலோசிக்க வேண்டும். இப்படி எங்களுடைய மக்களுக்கு நடைமுறையிலே பலவிதமான பிரச்சினைகள் இருந்து கொண்டிருக்கின்ற சூழ்நிலையில்தான் இந்த 3 வருட காலமாக உங்களுக்கு நாங்கள் ஆதரவு வழங்கி வருகின்றோம். ஆனால், நீங்களோ எந்தவொரு பிரச்சினைக்கும் தீர்வைக் காணாமல் காலத்தைக் கடத்திவருகின்றீர்கள்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, your time is almost over. Please wind up now.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

இந்த விடயத்தில் எங்களை நீங்கள் பகடைக்காய்களாகப் பயன்படுத்தியிருக்கிறீர்கள். குறைந்தபட்சம் மிகுதியாக இருக்கின்ற இந்த 2 வருட காலத்திற்குள்ளாவது நீங்கள் ஏற்கெனவே வழங்கிய வாக்குறுதிகளை நிறைவேற்ற வேண்டும். அந்தவகையில், இந்த வாக்குறுதிகளிலிருந்து நீங்கள் விலகிச் செல்ல முடியாது என்பதைக்கூறி, இந்த நேரத்தைத் தந்த கௌரவ சபாநாயகர் அவர்களுக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.15]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා. ඒ කාලයත් මම ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. එකඟයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මගේ පාර්ලිමේන්තු ජීවිතයට මේ වන විට වසර 18ක් වෙනවා. මේ වසර 18ක කාලය තුළ මම මේ පාර්ලිමේන්තුවේ කථා 500ක් විතර කරලා තිබෙනවා. අද මම කරන කථාව මගේ පාර්ලිමේන්තු ජීවිතයේ ඉතාම වැදගත් කථාවක්. ඒ වාගේම වගකීමෙන් සහ හැඟීමකින් කරන කථාවක් කියන එකත් මුලින්ම ඔබතුමාට සිහිපත් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව මෙතෙක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු විශ්වාස භංග අතරින් මේ රටේ ජනතාවගේ වැඩිම අවධානය යොමු වුණු, ඒ වාගේම දේශපාලන වශයෙන් වැඩිම වැදගත්කමක් සහිත වූ, ඒ සියල්ලට වඩා කෝටි සංඛ්‍යාත මුදලක් සංසරණය වූ, ඒ වාගේම ඉවත් කළ ඇමතිවරුන්ට ඇමතිකම් සහ නියෝජ්‍ය ඇමතිකම් පොරොන්දු වූ, ඒ වාගේම සමහර පක්ෂවලට පහකට සීමා වූ සභාපතිකම් 20ක් ලබා දෙන්න පොරොන්දු වුණු, ඒ වාගේම සමහර පක්ෂවලට රටේ කොටසක් මාස තුනකින් ලබා දෙන්න ලිඛිතව පොරොන්දු වුණු විශ්වාස භංගයක් හැටියට ඉතිහාසගත වෙනවා. මේ විශ්වාස භංගය පරාජය කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය වැය කළ මුදල ගණනය කළොත්, එය බැදුම්කර මංකොල්ලයට සමානයි. අපට මතකයි, 2015 වර්ෂයේ අගෝස්තු මාසයේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හදන්න පෙබරවාරි 17වැනි දින පැවැති බැදුම්කර මංකොල්ලය විශාල ආයෝජනයක් කළා. ඒ වාගේම 2016 වර්ෂයේ මාර්තු මාසයේ 29වැනි දින කරපු දෙවැනි බැදුම්කර මංකොල්ලයේ මුදල් විශාල ප්‍රමාණයක් අද මේ විශ්වාස භංගය බේරා ගැනීම සඳහා වැය කළා කියන එකත් අපි කවුරුත් දන්නා කාරණයක්. මේ විශ්වාස භංග යෝජනාව අපි වෛරයෙන්, එහෙම නැත්නම් තරහකට, එහෙම නැත්නම් අගමැතිතුමාට මඩ ගහන්න ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් කියලා තමුන්නාන්සේලා හිතනවා නම් ඒක වැරදියි. එහෙම ගෙනෙනවා නම් අපි මේ විශ්වාස භංගය ගෙනෙන්නේ මෙහෙම නොවෙයි. අපි මේ විශ්වාස භංගය ගෙනෙන්නේ වෙනත් ආකාරයකට. අපි මේ විශ්වාස භංගය ගෙනාවේ මේ රටට වෛර කරන පාලකයෙකුට එරෙහිවයි කියන එක තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

මේ රටට මේ විනාශය ආරම්භ වුණේ 2015 වර්ෂයේ ජනවාරි මාසයේ 09වැනි දින පස්වරු 5.00ට. ඒ තමයි 126ක බහුතරයක් තිබුණු අගමැතිවරයා ඉවත් කරලා 46ක බහුතරයක් තිබෙන අගමැතිවරයෙක් මේ පාර්ලිමේන්තුවට පත් කිරීම. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඒ පත් කිරීම නීති විරෝධියි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කියලා. ඔබතුමා දන්නවා ඒක ව්‍යවස්ථා විරෝධියි කියලා. ඒ පත් කිරීම නීත්‍යානුකූල කරන්න 2015 වර්ෂයේ අගෝස්තු මාසයේ 17වැනි දින පාර්ලිමේන්තු මැතිවරණයකට යනවා. දින සියයේ පොරොන්දු දීලා, සහන දීලා, දෙන්න පුළුවන් සියලු දොළ පිදේනි දීලා මහා මැතිවරණයකට යනවා. ඒ මහ මැතිවරණයෙන් අඩු ගණනේ 113ක, 115ක ජනමතයක් අග්‍රාමාත්‍යතුමාට ගන්න ලැබුණේ නැහැ. එහෙම නම් අපි කියන්න ඕනෑ ජනවරමක් නැති අගමැතිවරයෙක් තමයි වසර තුනක් මේ රට පාලනය කර තිබෙන්නේ කියලා. ජනවරමක් නැතිව මේ රට පාලනය කරන අග්‍රාමාත්‍යතුමා මේ අවුරුදු තුනක කාලය තුළ මොනවාද කරලා තිබෙන්නේ? අද කවුද මේ රටේ ආර්ථිකය හසුරුවන්නේ? අද මේ රටේ ආර්ථිකයට මොකක්ද වෙලා තිබෙන්නේ? චම්පික රණවක මැතිතුමන්ලා මේ ආණ්ඩුව හැදුවා. රාජිත සේනාරත්න මැතිතුමන්ලා මේ ආණ්ඩුව හදන්න කැගැහුවා. රවුල් හකීම් මැතිතුමන්ලා මේ ආණ්ඩුව හදන්න කථා කළා. අඩු ගානේ මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා සමඟ සාකච්ඡා කරනවාද? අපේ මිත්‍ර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය හර්ෂ ද සිල්වා මැතිතුමා මේ රටේ සිටින ආර්ථිකය පිළිබඳ විද්වතෙක්. එක්සත් ජාතික පක්ෂයේ උගතුන්, බුද්ධිමතුන් බොහොමයක් ඉන්නවා.

මේ රටේ ආර්ථිකය හසුරුවන්නට තමුන්නාන්සේලා මැදිහත් වෙනවාද; තමුන්නාන්සේලාගේ අදහස් ගන්නවාද? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හදන්න කොඩියක් ගහපු නැති, කොඩි වැළක් හදපු නැති, ගෙයින් ගෙට ගියේ නැති, පෝස්ටරයක් ගහපු නැති, යූඑන්පීකාරයෙක් වෙනුවෙන් කථා කරලා නැති පාස්කරලිංගම්ලායි, චරිත රත්වත්තේලායි තමයි මේ රටේ ආර්ථිකය තීරණය කරන්නේ. ඒක තමයි මේ විනාශය. පොළොවේ පය ගහපු චම්පික රණවක මහත්මයලාගෙන් අහනවා නම්, තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ, මගේ මිත්‍ර ඇමතිතුමාගෙන් අහනවා නම් මේවා වෙන්නේ නැහැ. සාමාන්‍ය මිනිහෙකුගෙන් අහන්නේ නැතිව, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදපු නායකයන්ගෙන් අහන්නේ නැතිව ආර්ථිකය හදන්න ගියාම වුණු විනාශය තමයි මේ. තමුන්නාන්සේලාගේ පක්ෂයට මොකක්ද වෙලා තිබෙන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මොකුත් වෙලා නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකුත් වෙලා නැහැ. අද තමුන්නාන්සේලාගේ පක්ෂයට මොකුත් වෙලා නැති නිසාද ප්‍රතිසංවිධානයකට යන්න ඕනෑ කියලා තමුන්නාන්සේලා කියන්නේ? තමුන්නාන්සේලාගේ පක්ෂයට මොකුත් වුණේත් නැහැ; වෙන්නේත් නැහැ. මම ඒක පිළිගන්නවා. හෙටින් පස්සේ වෙන්නේත් නැහැ. අපි ඒක පිළිගන්නවා. තමුන්නාන්සේලා ප්‍රතිසංවිධානයක් ඉල්ලුවා. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා ඉවත් කරන්න කිව්වා. මොකක්ද තමුන්නාන්සේලාට ලැබුණු ප්‍රතිසංවිධානය? අපේ මිත්‍ර ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාව පක්ෂයේ මහ ලේකම් ධුරයට යෝජනා කිරීම. අපි සතුටු වෙනවා. එතුමා මගේ පරණ මිත්‍රයා, කුලියාපිටිය ප්‍රදේශයේ. එතුමා මට කිව්වා, මම බයිසිකලයේ ගිය කාලයේ එතුමා මාව හඳුනනවා කියලා. අපි සතුටු වෙනවා, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් ධුරයට එතුමාගේ නම යෝජනා කිරීම ගැන. මම දන්නේ නැහැ මේ යෝජනාව ජයග්‍රහණය කළාට පසුව ගරු කබීර් හාෂීම් මැතිතුමාව ඒ ධුරයෙන් ඉවත් කරලා ඒ වෙනුවට ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාව පත් කරනවාද කියලා. ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාට අපි සුභ පතනවා, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් ධුරය ලැබෙන්න කියලා. ඒක තමයි වෙන්න ඕනෑ, එහෙම තමයි වෙන්න ඕනෑ.

මේ ප්‍රතිසංවිධානයේ දෙවෙනි කාරණය මොකක්ද? ගරු සාගල රත්නායක මැතිතුමා පක්ෂයේ නියෝජ්‍ය නායක. ඒවා තමයි වෙන්න ඕනෑ. අන්න ප්‍රතිසංවිධාන; තමුන්නාන්සේලාට හෙට හම්බ වෙන ප්‍රතිසංවිධාන. කට ඇරගෙන බලාගෙන ඉන්න, දත් මැදගෙන බලාගෙන ඉන්න තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිසංවිධාන දිහා. තමුන්නාන්සේලා රවි කරුණානායක මහත්මයාට බිත්තියට හේතු කරලා දුන්නා. හෙට එතුමා දිවුරුම් දෙනවා, එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක විධියට. ඊළඟට ආපහු ආණ්ඩුවේ ඇමති කෙනෙක් වෙනවා. ගරු චම්පික රණවක ඇමතිතුමනි, කොහොම තියෙයිද? කොහොමද, අපට මාර සිඟිති "චූන්" එකක් ගන්න පුළුවන් නේද? මේක තමයි වෙන්නේ. තමුන්නාන්සේලා බලාපොරොත්තුව ඉන්න, මොකක්ද වෙන්නේ කියලා. අපට හෙට උදේ වන විට බලාගන්න පුළුවන් තමුන්නාන්සේලාට වෙන්නේ මොකක්ද කියලා.

ගරු කථානායකතුමනි, මේ රට පාලනය කළ මේ අවුරුදු තුනක කාලය තුළ මේ රටේ ආර්ථිකය හැසිරෙව්වේ අගමැතිතුමායි කියන එක ඔබතුමා දන්නවා. අගමැතිතුමා මේ රටේ ආර්ථිකය හසුරුවලා ඒක අසාර්ථක වුණු නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කළේ. ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කරන්න එපා කියලා හඬනවා; ගිහින් හඬනවා; කැබිනට් එකේ හඬනවා. ජනාධිපතිවරයා කැබිනට් පත්‍රිකාවක් දානවා. මුදල් ඇමතිතුමා කියනවා ඒ කැබිනට් පත්‍රිකාව දැම්මේ නැහැ කියලා; ජනාධිපතිතුමා කියනවා දැම්මා කියලා. ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කරන්න එපා කියලා හඬනවා. ඇයි? ආර්ථික කළමනාකරණ කමිටුව තමයි හොර ගුහාව. සියලු හොරකම් ටික වෙන්නේ ආර්ථික කළමනාකරණ කමිටුවෙන්. චම්පික රණවක ඇමතිතුමනි, රාජිත සේනාරත්න ඇමතිතුමනි, හෘදය සාක්ෂියට කථා කරලා බලන්න සියලු හොරකම් ටික වෙන්නේ කොහෙන්ද කියලා. ආර්ථික කළමනාකරණ කමිටුවෙන් තමයි සියලු හොරකම් වෙන්නේ. ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කරන කොට සියලු දෙනාට දුක හිතෙනවා. ආර්ථික කළමනාකරණ කමිටුව අහෝසි කළා, මහ බැංකුව නැවත පවරා ගත්තා. ඇයි? මහ බැංකුව පවරා ගත්තේ නැත්නම් තව මාස දෙකක් යන විට මහ බැංකුවත් ඉවරයි. ඒක උගස් තියලා, විකුණලා අපට මහ බැංකුවත් නැති කරනවා. මේ තමයි තමුන්නාන්සේලාගේ ආර්ථික කළමනාකරණය.

ඊළඟට, තමුන්නාන්සේලා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කළා. අපේ කාලයේ තිබුණාට වඩා කෝටි ගණනක් පාඩු කළ නිසා ඉවත් කළා. චම්පික රණවක ඇමතිතුමනි, කවුද අලුතෙන් දැම්මේ? අලුතෙන් දාපු අධ්‍යක්ෂ මණ්ඩලයේ කෙනෙක් ඉන්නවා, එයාගේ අයියා ලංකා බැංකුවට කෝටි ගණනක පොලු තියපු කෙනෙක්. තමුන්නාන්සේලා මේ මොකක්ද කරන්නේ? මේ තමයි තමුන්නාන්සේලා ආර්ථිකය හදන හැටි, මේ තමයි තමුන්නාන්සේලා යන හැටි.

ඊළඟට, තමුන්නාන්සේලාගේ දේශපාලන වැඩ පිළිවෙළ ගැන බලමු. කවුද තමුන්නාන්සේලාගේ දේශපාලන තීන්දු ගන්නේ? තමුන්නාන්සේලාගේ දේශපාලන තීන්දු ගන්නේ මලික් සමරවික්‍රම ඇමතිතුමා, අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා, අපේ සාගල රත්නායක ඇමතිතුමා. මෙන්න තමුන්නාන්සේලාගේ දේශපාලන තීන්දු ගන්න දේශපාලන මණ්ඩලය. මේක තමයි

තමුන්නාන්සේලාට තිබෙන ප්‍රශ්නය, මේක තමයි තමුන්නාන්සේලා කථා කළේ, මේක තමයි තමුන්නාන්සේලාගේ දුක. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේදී අපිත් එක්ක තේ බොන කොට, කන කොට කථා කරනවා.

තමුන්නාන්සේලා අද ලොකු සතුටකින් ඉන්නවා. මට ඇහුණා කවුදෝ කිව්වා, මේ විශ්වාස භංග යෝජනාවේ තිබුණු උණුසුම අද නැති වෙලා, කට්ටිය නිකම් වැටිලා වාගේ කියලා. හැබැයි කට්ටියගේ වැටීම, නැඟීම බලාගන්න තිබුණා ඊයේ දවල්. ඊයේ දවාලේත් වෙවුල වෙවුලා හිටියේ. ඊයේ දවාලේ හඬ හඬා හිටියේ. ඊයේ රෑ වෙනකම් කන්නේ බොන්නේ නැතිව හිටියේ තමන්ගේ ඇමතිකම් ටිකට කෙළ වෙයි කියලා; තමන්ගේ අගමැතිකම නැති වෙයි කියලා; තමුන්ට තිබෙන වරප්‍රසාද නැති වෙයි කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්, අපට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අපට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමුන්නාන්සේලා හොඳයි. අපි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ විශ්වාස භංගය ගෙනාපු අපි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එතකොට තමුන්නාන්සේලා හොඳ මිනිස්සු. හරි, තමුන්නාන්සේලා එහෙම හිතන්නකෝ. [බාධා කිරීම්] එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලා අද මේ විශ්වාස භංගය ජයග්‍රහණය කරලා එළියේ "පෝස්ටර්" එකක් ගහන්න ලෑස්ති කරලා තිබෙනවා. අද රූපවාහිනියේ විකාශය කරන්න සින්දුවකුත් හදලා ඉවරයි. දමන සින්දුවත් අපි දන්නවා; ගහන පෝස්ටරයත් අපි දන්නවා. කුණු බිත්තර ගත්ත කණ්ඩායමක් සිරිකොතින් ඇවිල්ලා එළියේ ඉන්නවා, අපට ගහන්න. මේ සියල්ල අපි බලාගෙන ඉන්නවා. පුළුවන් නම් තමුන්නාන්සේලා ඒ සියල්ලෙන්ම අපට සලකන්න. ඒ සියලු දේ අපි බලාගෙන ඉන්නවා. තමුන්නාන්සේලා කුණු බිත්තර ගහන්න, පෝස්ටර් ගහන්න, රතිඤ්ඤා දමන්න. ඒත් තමුන්නාන්සේලා මතක තියා ගන්න, අද රාත්‍රී 9.30ට තමයි මේ ආණ්ඩුවේ දෙදරීම පටන් ගන්නේ කියන එක. තමුන්නාන්සේලා ඒක හොඳට මතක තියා ගන්න. මේ ආණ්ඩුවේ දෙදරීම පටන් ගන්නේ අද රාත්‍රියේ. තමුන්නාන්සේලාට පොරොන්දු වුණු, -[බාධා කිරීමක්] මොකක්ද, ගරු රාජිත ඇමතිතුමනි?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ඔබතුමන්ලා බැසිල් මන්ත්‍රීතුමාගේ-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බැසිල් මන්ත්‍රීතුමාගේ දෙදරීම අපි බලා ගන්නම්. බැසිල් මන්ත්‍රීතුමාගේ දෙදරීම ගැන ඔබතුමා කිසි දෙයක් ගණන් ගන්න එපා. බැසිල් මන්ත්‍රීතුමා දෙදරන්නෙත් නැහැ, දෙදරවන්නත් බැහැ. අපි ඒක බලා ගන්නම්.

ගරු කථානායකතුමනි, මා හිතන විධියට අපේ ගරු රාජිත ඇමතිතුමාට පොඩි සිහිති "චූන්" එකක් ගියා බැසිල් මන්ත්‍රීතුමා සම්බන්ධයෙන්. බොහොම හොඳයි. ගරු රාජිත ඇමතිතුමනි, එතුමා ඔළුවෙන් ගහලා වෙලාවට ඔබතුමන්ලාට වැඩේ දෙයි. ඒ නිසා ඔබතුමන්ලා සන්සුන් වෙන්න. මට ඔය විධියට කිව්වාට මේ විශ්වාස භංගය පිළිබඳව ඔබතුමාගේ අමාත්‍යාංශයේත් සාකච්ඡාවක් තිබුණා. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පෙරමුණේ පක්ෂ ඔක්කෝම එතැන හිටියා. එතැන මනෝ ගනේසන් ඇමතිතුමා හිටියා; රවුෆ් හකීම් ඇමතිතුමා හිටියා. තමුන්නාන්සේලා ඔක්කෝම කථා කළේ මොකක්ද? 2019දී රනිල් මහත්තයා එක්ක ජනාධිපතිවරණයට යන්න බැහැ කියන එකයි. අන්න ඒක තමයි තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයේ තිබුණු සාකච්ඡාව. චම්පික රණවක ඇමතිතුමාත් ඒ සාකච්ඡාවේ හිටියා. 2019දී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එක්ක ජනාධිපතිවරණයට යන්න බැහැ කියලා එක්සත් ජාතික පෙරමුණ සාකච්ඡා කළේ නැද්ද? තමුන්නාන්සේලා හිතනවා ඇති මේ ප්‍රශ්නය විසඳලා ඉවරයි කියලා.

මනෝ ගනේසන් අපේ තරුණ ඇමතිතුමා ඉන්නවා. එතුමා අපේ මිත්‍රයා. අපි උදේට එකට ඇවිදිනවා. මනෝ ගනේසන් ඇමතිතුමනි, තමුන්නාන්සේගේ හඳවතට කථා කරන්න. තමුන්නාන්සේ අද මේ ඇමතිකමේ ඉඳගෙන ඡන්දය දෙන්නේ සතුටින්ද? තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට අද වැඩ කරන්න සල්ලි තිබෙනවාද? මහනුවර චේලු කුමාර් මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. ඒත් පඩි පෙළක් හදලා දෙන්න සල්ලි තිබෙනවාද? තමුන්නාන්සේලා මේ සන්ධානය හැදුවා. නුවරඑළියේ අපේ ගරු රාධාකෘෂ්ණන් මැතිතුමාත් මෙතැන ඉන්නවා. එතුමා අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා. රක්ෂා කීයක් දීලා තිබෙනවාද? රාජ්‍ය ඇමතිතුමනි, **உங்களுக்கு எவ்வளவு கெடச்சிருக்கி? ஒன்னும் இல்லே!** මොනවත් නැහැ. සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා, කුරුණෑගල පොල් කඩන්න කවුරුත් නැහැ කියලා. ඇයි ඒ? කුලියාපිටියේ ඔක්කෝම අධ්‍යාපන අමාත්‍යාංශයේ රැකියාවලට දාලලු. මම නොවෙයි එහෙම කිව්වේ අකිල විරාජ් ඇමතිතුමනි, සුමන්තිරන් මන්ත්‍රීතුමා තමයි කිව්වේ. මම නම් එහෙම කිව්වේ නැහැ. සුමන්තිරන් මන්ත්‍රීතුමා කියනවා, කුරුණෑගල පොල් කඩන්න කවුරුත් නැහැ. ඔක්කෝම ගිහිල්ලා දැන් රැකියා කරනවා කියලා. ඒක හොඳයි. ඔබතුමා එහෙම කරන එකේ වරදක් නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඇයි ඔච්චර මගේ නමම කියන්නේ. මම ඔබතුමාගේ අනෙකා ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මට කවුරු ගැන අදහසක් ඇති වුණත් ඔබ ගැන අදහසක් ඇති වෙන්නේ නැහැ. ඒ ගැන මම හිතන්නේත් නැහැ. එහෙම හිතුවොත් මගෙ බෙල්ලත් ඉවරයි. මට යන්න වෙන්නේත් සුදු වෑන් එකකින්, එහෙම වුණොත්.

එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමාගේ හදවතට තට්ටු කරලා අහන්න කියන්න, එතුමාට හෘදය සාක්ෂියට එකඟව මේ පක්ෂයේ වැඩ කරන්න පුළුවන්ද කියලා? එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමා අද රාත්‍රී 12න් පස්සේ එතැනින් ඉවත් වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමා අද රාත්‍රියෙන් පස්සේ එතැන නැහැ. තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමා,-[බාධා කිරීම] තමුන්නාන්සේලා කෑ ගහන්න එපා. දිලිප් වෙදඅාරච්චි රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හම්බන්තොට රැස්වීමේදී මොකක්ද කිව්වේ? ඔබතුමා කිව්වා, විශ්වාස භංගයට කලින් නායකත්වයේ වෙනසක් වෙන්න ඕනෑය කියලා. දැන් ඒක වුණාද? එතකොට ඔබතුමා මේකට ඡන්දය දෙනවාද? ඔබතුමාගේ නායකයා සූට් එකත් මැහුවා. ඔබතුමාගේ නායකයා ජය ශ්‍රී මහ බෝධියටත් ගියා. ඔබතුමාගේ නායකයා ජීවිතේට නෝනා එක්ක ෆොටෝ ගහන්නේ නැහැ. නමුත්, මේ වතාවේ නෝනා එක්ක ෆොටෝ එකකුත් ගහලා පත්තරේට දැම්මා. සෝමාවතියටත් ගියා. එතුමාට නායකත්වය හම්බ වුණාද? චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමියත් කොනකින් ඉඳගෙන හිටියා. මොනවා වුණත් නායකකම ගත්තොත් "ෂේප්" කර ගන්නත් එපායැ. නැත්නම් ඒකත් මළ කෙළියක් වෙනවානේ. එහෙම නේද මගේ මිත්‍ර ඇමතිතුමිය? අර හාජ්ජියාර් මන්ත්‍රීතුමාත් සජිත් ප්‍රේමදාස මහත්තයාගේ ළඟටම වෙලා හිටියා. ඇයි ඒ? මේකෙන් පස්සේ එතුමා අනාගත නායකයා වෙයි කියලා. ඒ නිසා ගොඩක් කට්ටිය බලාපොරොත්තු තියාගෙන හිටියා. මම නම් වශයෙන් සඳහන් කරන්නේ නැහැ. පසු පෙළ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා බලාගෙන හිටියා. තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේලා කෑ ගහන්න. මම තරහා නැහැ, තමුන්නාන්සේලා එක්ක. මට ගණනක් දෙන්න, ඔබතුමන්ලාගේ ප්‍රශ්න කථා කරනවාට. යූඑන්පී එක ඇතුළේ කථා කරන්න බැරි දේවල් මහින්දානන්ද අලුත්ගමගේ කථා කරනවාට ගණනක් දෙන්න. අද එක්සත් ජාතික පක්ෂයේ ලේකම් සිරිකොතේ කාර්යාල කාර්ය සහායකයකු බවට පත් කරලා.

තමුන්නාන්සේලාගේ පක්ෂයේ අයට එහෙම කරන්න එපා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදපු රවුම් හකීම් මහත්තයලා, මනෝ ගනේසන් මහත්තයලා ඉන්නවා. අද දිගම්බරම් ඇමතිතුමා කෝ? දිගම්බරම් ඇමතිතුමා මෙතැනින් ගියා. මට එතුමාටත් කියන්න දෙයක් තිබෙනවා. තොණ්ඩමන් මන්ත්‍රීතුමා නුවරඑළියේ ප්‍රාදේශීය සභාවලින් භාගයක් පිහිටෙව්වා. නවීන් දිසානායක ඇමතිතුමා දිගම්බරම්ට ගහලා තව ටිකක් හැදුවා. දිගම්බරම්ට මොකුත් නැහැ.

அப்படித்தானே! ஒன்னும் இல்லையே! அமைச்சர், நீங்க சொல்லுங்க! என்ன நடந்தது? சொல்லுங்க, அண்ணே சொல்லுங்க!

ඔළුව වනනවා. ඔව්, පිළිගන්නවා. යූඑන්පියත් එක්ක ආණ්ඩුවක් හැදුවා, දිගම්බරම්ට මොකවත් නැත! මෙන්න එක්සත් ජාතික පක්ෂයේ වැඩ! තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවා, මේක ජයග්‍රහණය කළාට පස්සේ ඉවරයි කියලා. නැහැ. අපේ වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි බෝම්බයක් ගැහුවා; බෝම්බයෙන් සියලුදෙනාටම තුවාලයි. මේ බෝම්බයෙන් සියලුදෙනාටම තුවාලයි; බරපතළ හානි. අපට ප්‍රශ්නයක් නැහැ. රාජිත ඇමතිතුමනි, මේකෙන් අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාත් බලාගෙන ඉන්නවා, 2019දී පොදු අපේක්ෂකයා වෙන්න. අපි දන්නවා, ඔබතුමාගේත් එහෙම අදහසක් තිබෙන බව. ඒක හොඳයි. හැබැයි, ඔබතුමා එහෙම කළොත් අපේ වේදිකාවේ හොඳම කථිකයා වන්නේ ඔබතුමාගේ පුතා. ඔබතුමාගේ පුතා තමයි අපේ කථිකයා වන්නේ. [බාධා කිරීමක්] එහෙම වුණාම ජනාධිපතිවරණය 'චකබ්ලාස්' වෙනවා. ඒ නිසා ඔබතුමා ඒකට ඉදිරිපත් කරන්න සුදුසුකම් අඩුයි. පුත්‍ර රත්නය කියනවා බැහැයි කියලා. [බාධා කිරීමක්] ඔබතුමාත් මාත් ගැටුමකට යන්නේ නැතිව ඉදිමුකෝ. ඔබතුමා අපේ සෞඛ්‍ය ඇමතිතුමානේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නලු. එතුමා මට උදව් කරනවාලු. බලන්න, මේ වාගේ අවස්ථාවක් ලැබෙනවාද කියලා. ඒක නේ මම කිව්වේ, මේක මගේ ජීවිතයේ වැදගත්ම කථාවක් කියලා. 2020 ජනාධිපති අපේක්ෂක. බලන්නකෝ! [බාධා කිරීමක්] පවුල් ගැන නම් කියන්න පුළුවන්. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමනි, එහෙම වුණොත් දුවනකම්ම කියන්න පුළුවන්. [බාධා කිරීමක්] මොකක්ද කිව්වේ? මම දන්නේ නැති දෙයක් එයා ඔබතුමාට කිව්වාද? මම දන්නේ නැහැ නේ, මම දන්නේ නැතිව එයා ඔබතුමා හම්බ වෙනවා කියලා. එහෙම හම්බ වෙනවා කියලා මම දන්නේ නැහැ නේ. [බාධා කිරීමක්] මම දන්නේ නැහැ නේ. හැබැයි ඔබතුමා දන්නේ නැහැ නේ, ඔබතුමාගේ එක්කෙනා මා හම්බ වෙනවා කියලා. ඔබතුමා ඒක දන්නේ නැහැ නේද? එයා මාවත් හම්බ වෙනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි මේ අවස්ථාවේදී - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෞද්ගලික ප්‍රශ්නවලට යන්නේ නැතිව ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, රාජිත සේනාරත්න ඇමතිතුමා කියනවා හෙට අනිද්දා හිරේ යන්න ඉන්නවාලු. හිරේ යන්න ඉන්නේ කවුද? විශේෂඥ වෛද්‍යවරු කියනවා පිළිකා රෝගීන්ට ගෙනාපු බෙහෙත පිළිකා රෝගයට හොඳ නැහැ කියලා. ලංකාවේම ඉන්න පිළිකා විශේෂඥ වෛද්‍යවරු සියලු දෙනාම කියනවා පිළිකා රෝගයට මේ බෙහෙත හොඳ නැහැයි කියලා. හැබැයි, රාජිත ඇමතිතුමා - දත් දොස්තර මහත්තයා- කියනවා පිළිකා රෝගයට මේ බෙහෙත හොඳයිලු. ඉතින් ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමාත් එක්ක ගැටුමකට යන්නේ නැහැ. [බාධා කිරීමක්] හරි, හරි. ඔබතුමා 2020 ජනාධිපති අපේක්ෂක කරලාත් මට හොඳක් නැහැ නේ. තමුන්නාන්සේ 2020 ජනාධිපති අපේක්ෂක කරලාත් මට හොඳක් නැහැ නේ.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියාගෙන ආවේ තමුන්නාන්සේලාගේ කාලය තුළ මේ රටේ ආර්ථිකයට මොකක්ද කළේ කියන එකයි. තමුන්නාන්සේලා මේ රටේ උද්ධමනය, විරැකියාව, පොලී අනුපාතය, විදේශ සංචිත- [බාධා කිරීමක්] අයියෝ, පපුවේ කැක්කුම හැදෙයි. දැන් ඇති. නවත්වන්න. [බාධා කිරීමක්] හරි, හරි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයන් අවස්ථාවේ)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසානයි. අන්තිම මිනිත්තුව.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩලික මහින්දානන්ද අලුත්ගමගේ මහතා)
(The Hon. Mahindananda Aluthgamage)
මෙතුමාට පපුවේ කැක්කුම හැදිලා, මැරෙයි. මට භයයි. ඊයේ පෙරේදා බයිපාස් එකක් කරලා ගෙනාවේ.

ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගෙන් අපි අහනවා මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ඔබතුමන්ලා දශමයක දෙයක් ඉෂ්ට සිද්ධ කර තිබෙනවාද කියලා. ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා මතක තියා ගන්න අද දවසේ ප්‍රතිඵලයෙන් පස්සේ, ලබන 9 වැනිදාට පස්සේ ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂය දෙකට කැඩෙන එක නවත්වන්න බැහැයි කියලා. තමුන්නාන්සේලා ඒක හොඳට මතක තියා ගන්න.

ඒ විතරක් නොවෙයි, අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මහනුවර සිද්ධිය ගැන කථා කළා. එතුමා කිව්වා මහනුවර සිද්ධියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු සම්බන්ධයි කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සම්බන්ධයි කියලා එතුමා කිව්වා. එතුමා දිළුම් අමුණුගම මන්ත්‍රීතුමාට ඇඟිල්ල දික් කළා. රවුල් හකීම් ඇමතිතුමනි, ඔබතුමා සාක්ෂි දරයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයන් අවස්ථාවේ)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩලික මහින්දානන්ද අලුත්ගමගේ මහතා)
(The Hon. Mahindananda Aluthgamage)
මම අවසන් කරනවා. මට තව විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයන් අවස්ථාවේ)
(The Hon. Speaker)
විනාඩි භාගයක් දෙන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩලික මහින්දානන්ද අලුත්ගමගේ මහතා)
(The Hon. Mahindananda Aluthgamage)
රවුල් හකීම් ඇමතිතුමනි, ඔබතුමා සාක්ෂි දෙයි. ඊයේ හම්බවුණු වෙලාවේ ඔබතුමා මට කිව්වා "දිළුම් මට මෙකට උදව්වු කළා, මුස්ලිම් ජනතාවට ගහන කොට දිළුම් තමයි නුවර රැක්කේ" කියලා මුස්ලිම් කොංග්‍රසයේ නායකතුමා කිව්වා. එතුමා කිව්වා, "දිළුම් වැරැද්දක් කරලා නැහැ. දිළුම් තමයි මහනුවර රකින්න මැදිහත් වුණේ" කියලා. රවුල් හකීම් ඇමතිතුමා ඊයේ මට කිව්වා, "දිළුම්ව අත් අඩංගුවට ගන්න දැන් සමහරු කටයුතු කරනවා" කියලා. තමුන්නාන්සේලා මේ වාගේ පහත් පෙළේ වැඩ කරන්න එපා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයන් අවස්ථාවේ)
(The Hon. Speaker)
අවසාන වශයෙන් කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්ඩලික මහින්දානන්ද අලුත්ගමගේ මහතා)
(The Hon. Mahindananda Aluthgamage)
අවසාන වශයෙන් අපි නැවතත් ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේලාට එක එක කොන්දේසි එයි. තමුන්නාන්සේලා මොන දේ කිව්වත් තමුන්නාන්සේලා දන්නවා, මේ වසර තුනක කාලය තුළ මේ රටට වෙච්ච විනාශය. මේ විනාශය ගැන හිතලා, තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු ඡන්දදායකයන් ගැන හිතලා, තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට එකඟව මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න තමුන්නාන්සේලාගේ ඡන්දය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයන් අවස්ථාවේ)
(The Hon. Speaker)
බොහොම ස්තූතියි. මීළඟට, පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා.

[අ.භා 3.35]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු කථානායකතුමනි, අද දින ගරු අග්‍රාමාත්‍යතුමාට එරෙහිව ගෙනැවිත් තිබෙන මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අපගේ අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දීම ගැන අපි ස්තූතිවන්ත වෙනවා. විශ්වාස භංගයේ පැති කිහිපයක් පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්වලින් මේ වෙන කොටත් පැහැදිලි වෙලා තිබෙනවා. පදානුගත අර්ථයෙන් ගත්තොත් අග්‍රාමාත්‍යතුමාට එරෙහිව මේ විශ්වාස භංගයේ දී විශේෂයෙන්ම මහ බැංකුවේ සිදු වෙච්ච ඒ වංචනික ක්‍රියාවලිය සම්බන්ධයෙන් චෝදනා කර තිබෙනවා. ඒක නිසා එතුමා අග්‍රාමාත්‍ය ධුරයෙන් පහ කළ යුතුයි කියලා යෝජනා කරලා තිබෙනවා. ඒක තමයි නිලමය වශයෙන් මේ විශ්වාස භංගයේ තිබෙන අන්තර්ගතය. මෙහි තිබෙන දේශපාලන අර්ථය විවිධ පැතිවලින් සාකච්ඡාවට ලක් වුණා. එක අරමුණක්, එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අතර තිබෙන ඒ ජාතික සහාගය බිඳ දැමීම. ඒ වාගේම රටේ අස්ථාවරත්වයක් ඇති කිරීම, ඒ වාගේම දේශපාලන බලය නියමිත මැතිවරණවලට කලින් තමන්ට ලබා ගන්නේ කොහොමද කියන එක ගැන කරන සැලසුමක් හැටියට, දේශපාලන බෝම්බයක් හැටියට මේක පැහැදිලි කළා.

අපි පළමුවෙන්ම කියන්නට ඕනෑ, මේ රටේ ඉතිහාසය පුරාම අතිවිශාල වංචා සිදු වෙලා තිබෙන බව. නමුත් මහ බැංකුවේ සිදු වෙච්ච ඒ සිදුවීම් දෙක සම්බන්ධයෙන් රජය බරපතළ පියවර ගණනාවක්ම ගත්තා. එක පැත්තකින් ඒ සම්බන්ධයෙන් ගන්න තිබෙන සෑම ආකාරයකම නීතිමය පියවර අපි ගත්තා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ජනාධිපති කොමිසමක් පත් කරලා, ඒ ජනාධිපති කොමිසමේ වාර්තාව එළියට දාලා, ඒ ජනාධිපති කොමිසමේ නිර්දේශ මත යම් යම් පිරිස් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම යටතේ, යම් යම් පිරිස් රාජ්‍ය මුදල් අපහරණය කිරීම යටතේ ඒ ආකාරයට ඔවුන්ට දඩුවම් දෙන්න ක්‍රියා කළා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් අනාගත නීති සකස් කිරීම සඳහා වෙච්ච නීති ප්‍රතිපාදන සකස් කිරීමටත් අද ආණ්ඩුව ගමන් කරලා තිබෙනවා. ඒක නිසා තරාතිරම නොබලා මේ සම්බන්ධයෙන් අනාගතයේ ක්‍රියා කරන්නත් මේ ආණ්ඩුව පියවර තබලා තිබෙනවා. මේ ආණ්ඩුවට ලැබිලා තිබෙන

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ජනවරමත් ඒකයි කියන එක අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඒ වාගේම අපි මේ කාරණය අමතක කරන්න හොඳ නැහැ. මේ මහ බැංකු වංචාව හා සමාන විශාල වංචා කරපු පිරිස් අදටත් නිදැල්ලේ ඉන්නවා. එන්ට්‍රස්ට් නැමැති ආයතනය හදලා, පර්පවුවල් ට්‍රෙෂරීස් ආයතනය වාගේම ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු හැටියට ඉඳලා රටේ රාජ්‍ය අංශයේ, ජනතාවගේ අර්ථ සාධකය වංචා කරලා තිබෙනවා. කීයක්ද? මිලියන 12,000ක්. අද ඒ පිරිස් නිදැල්ලේ ඉන්නවා. එක දවසකින් ඔවුන්ට අධිකරණයෙන් ඇප ලබා ගෙන එළියට යන්න පුළුවන්කම ලැබුණා.

පොල් ගෙඩි පහට පුද්ගලයකු හිරේ යවපු රටක, රුපියල් පනස්දාහක් හොරකම් කළා කියලා විදුහල්පතිවරයකු හිරේ යවපු රටක, රුපියල් මිලියන 12,000ක අර්ථ සාධකය හොරකම් කරපු එන්ට්‍රස්ට් ආයතනයේ පිරිස අද නිදහසේ එළියට ගිහින් තිබෙනවා. මේ රටේ එවැනි සිදුවීම් දහස් ගණනක් පිළිබඳව අපට කියන්න පුළුවන්. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ඒ දූෂණ-වංචා පිළිබඳව වාර්තා කරන්න කිව්වාම එවැනි සිද්ධීන් එක්දහස් හත්සියයක් වාර්තා වෙලා තිබෙනවා. ඒවා පිළිබඳව දැන් කටයුතු කෙරී ගෙන යනවා. අපටත් තිබෙන කනගාටුව මේ සම්බන්ධයෙන් කාර්යක්ෂම ක්‍රියාවලියක් සිදු නොවීමයි. ඒක නිසා අතීතයේ වැරැදි හොයනවා වාගේම, වර්තමානයේ තිබුණු වැරැදිවලට දඬුවම් දෙනවා වාගේම, අනාගතයේ මෙවැනි දෑ ඇති නොවන්න නීති-රීති හා අධිකරණ පද්ධතියක් තැනීමේ වග කීම අප හැම දෙනාටම තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒක නිසා මේ විශ්වාස භංගයේ හරය මේ ආණ්ඩුව මේකට පියවර නොගැනීම නොවෙයි. මේ ආණ්ඩුව මේකට පියවර ගෙන තිබෙනවා.

මේ ආණ්ඩුව අලුතින් ගෙන එන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතේත් මේ සඳහා විශේෂ වගන්තියක් තිබෙනවා. ඒ අනුව එම විශේෂ මහාධිකරණය පිහිටුවීම මේ පාර්ලිමේන්තුව සම්මත කළොත් බැදුම්කර සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනය කොට ඒකට සම්බන්ධ අයට දඬුවම් දීමට කටයුතු කරනවා. මේ ආණ්ඩුව එච්චර විවෘත වෙලා තිබෙනවා.

ඒ අනුව මේ පාර්ලිමේන්තුව තුනෙන් දෙකේ බලයකින් එම අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කළොත්, එහි සඳහන් මෙම විශේෂ මහාධිකරණයේ දී මුලින්ම මේ බැදුම්කර නඩුව විමර්ශනයට ලක් කරන බවත්, ඔවුන්ට දඬුවම් දීමට කටයුතු කරන බවත් අපි ප්‍රකාශ කළා. එවැනි විවෘතභාවයක් මේ රටේ ඉතිහාසයේ වෙනත් කිසිම ආණ්ඩුවක් පළ කළේ නැහැ. ඒකත් අවධාරණය කරමින් අප මෙහි තිබෙන දේශපාලන තත්ත්වය අනිවාර්යයෙන්ම විශ්ලේෂණය කර ගන්නට ඕනෑ.

කවුද මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ? මේක ගෙනැල්ලා තිබෙන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නමින් සංවිධානය වෙලා තිබෙන රාජපක්ෂ මැතිතුමාගේ පක්ෂයේ පිරිස්. ඒ පිරිස්වල අරමුණ මොකක්ද? යුක්තිය ඉෂ්ට කර ගැනීමද? නැහැ. ඒ පිරිස්වල අරමුණ අද මෙතැන දේශපාලන වශයෙන් ප්‍රකාශයට පත් වුණා. එකක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටින පිරිසක් ඒ පැත්තට අරගෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තවදුරටත් එකමුතු කරගෙන ඉදිරියට ගෙන යන්න ඕනෑ කියන අදහස. නමුත් අපි කියන්නට ඕනෑ, මේක ඉදිරිපත් කරපු පිරිස අතරේ සිටින්නේ වෙනත් කිසි කෙනෙකු නොවෙයි, පොහොට්ටු පක්ෂයේ බැසිල් රාජපක්ෂ මැතිතුමා කොන් කිරීමට කටයුතු කරන පිරිසක් බව. ඒ පිරිස තමයි මේකට මුල් වෙලා කටයුතු කළේ. ඒ අභ්‍යන්තර දේශපාලන අරමුණත් මේක ඇතුළේ තිබෙනවා. කෙසේ වුණත් දේශපාලන වශයෙන් රට තවත් අස්ථාවර නොකර ඉදිරියට ගෙන යෑම සඳහා ක්‍රියා කිරීමට අප සියලුදෙනාටම වගකීමක් තිබෙනවා, විශේෂයෙන්ම 2015 ජනවාරි මාසයේ ලැබුණු ජන වරමත්, අගෝස්තු මාසයේ ලැබුණු ජන වරමත්, ඒ වාගේම මෙවර පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලයත් සැලකිල්ලට ගෙන. මේ ඉදිරිපත් වී තිබෙන විශ්වාස භංග යෝජනාව අද පාර්ලිමේන්තුවේ දී පරාජයට පත් වනවා. එහි කිසිම සැකයක් නැහැ. නමුත් විශ්වාස භංග යෝජනාවට වඩා පළාත් පාලන මැතිවරණයේ දී අපේ ජනතාව විසින් ලබා දෙන ලද තීන්දුවෙන් පාඩම් ඉගෙන ගෙන ක්‍රියා කිරීම එක්සත් ජාතික පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනාධිපතිතුමා ඇතුළු සියලු දෙනාගේම වගකීම වනවා.

මේ රටේ සංඛ්‍යා ලේඛන ක්ෂේත්‍රයේ විශාල වරදක් කළා, මෙවර පළාත් පාලන ඡන්දයේදි. ගරු කථානායකතුමනි, මෙවර පළාත් පාලන ඡන්දයේදි ලක්ෂ 156කට ආසන්න පිරිසකට ඡන්ද බලය ලැබුණා. ලක්ෂ 125ක් ඡන්දය පාවිච්චි කළා. වලංගු ඡන්ද ලක්ෂ 123ක් තිබුණා. ඒකෙන් වැඩිම ඡන්ද ලබා ගත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. ඒ ලක්ෂ 49ක් හෙවත් සියයට 39ක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අනෙකුත් දේශපාලන පක්ෂවලට, එක්සත් ජාතික පක්ෂයට සියයට 28ක්, ඒ වාගේම ජනාධිපතිතුමා එක්ක ගැට ගැසී තිබුණු පක්ෂවලට සියයට 12ක්, ජනතා විමුක්ති පෙරමුණට සියයට 5ක් ආදි වශයෙන් ලැබුණා. මොකක්ද මේ ඡන්ද ප්‍රතිඵලයෙන් ප්‍රකාශ වන්නේ? මේ ඡන්ද ප්‍රතිඵලයෙන් ප්‍රකාශ වන්නේ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට - මහින්ද රාජපක්ෂ මැතිතුමාට - සියයට 39 ඉඳලා සියයට 50ක් දක්වා ඡන්ද ලැබිලා තිබෙන බවයි. ජනාධිපතිවරණය ජය ගන්න නම්, එක ඡන්දයක් ඕනෑ. ඒක ජය ගැනීමට නොහැකියි කියන එකයි මෙයින් ප්‍රකාශ වන්නේ. ඒ නිසා කොතරම් ඡන්ද ලැබුවත් වැඩක් නැහැ. 2014 වර්ෂයේ පළාත් සභා මැතිවරණයේ දීත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලක්ෂ 50ක් ඡන්ද ලැබුණා. ඒ වාගේම විපක්ෂයේ පක්ෂවල - එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, දෙමළ ජාතික සන්ධානය - මේ ඔක්කෝම ඡන්ද එක්කාසු කළාම ලක්ෂ 36යි තිබුණේ. ඒ ලක්ෂ 36යි, අතැන ලක්ෂ 50යි. හැබැයි ජනාධිපතිවරණයට ගියාම ඒ සියලුදෙනාගේම එකතුව ලක්ෂ 62ක් වෙලා මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් වුණා. ඒ නිසා ඒ ඇත්තේ පැහැදිලිව දන්නවා, ඊළඟට ජනාධිපතිවරණයක් ජය ගන්න නොහැකි බව. ඒ නිසා තමයි රට තවත් අස්ථාවර කරලා, කරලා දේශපාලන වශයෙන් අවුල් ජාලයක් බවට පත් කරන්න කටයුතු කරන්නේ. අන්න ඒ නිසා 2015 වර්ෂයේ ජන වරම වෙනුවෙන් අපි පෙනී ඉන්නවා.

විශේෂයෙන්ම අපට ඡන්දය දීපු ජනතාව වෙනුවෙන් අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න අපි කටයුතු කරනවා. ඒ නිසා තමයි මාස 18ක ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළක් මා ඉදිරිපත් කර තිබෙන්නේ. සියලු දෙනා වෙනස් විය යුතුයි. වෙනස් වෙලා ඒ ජන වරමට අනුකූලව කටයුතු කරන්න අවශ්‍ය කරන වටාපිටාවක් සකස් කරගත යුතුයි.

ගරු කථානායකතුමනි, අද අලුත් තාක්ෂණ ලෝකයක් තිබෙන්නේ. හතරවන කාර්මික විප්ලවය දියත් වෙලා තිබෙනවා. සෑම 18 මාසයකටම සැරයක් තාක්ෂණය දෙගුණ වෙමින් ඉදිරියට

යනවා. අද තිබෙන්නේ Fifth Generation එකයි. තවත් මාස 18කින් Sixth Generation එක එනවා. හැබැයි අපේ රටේ දේශපාලනය minus Fifth Generation එකේ තියාගෙන අපට මේ ගමන යන්න බැහැ. විශේෂයෙන්ම තරුණ පරම්පරාවක් - තරුණයන් 50 ගණනක්- අලුතින් මේ පාර්ලිමේන්තුවට ආවා එක්සත් ජාතික පෙරමුණෙන්. ඒ පිරිස්වලට අනිවාර්යයෙන්ම මේ රාජ්‍ය පාලනයේ බලය ලැබිය යුතුයි; ඒ ප්‍රතිසංස්කරණය කළ යුතුයි.

මේ විශ්වාස භංග යෝජනාවෙන් අග්‍රාමාත්‍යවරයා පරාජය කරන්න අද මේ පාර්ලිමේන්තුවේ ඉඩ ලැබෙන්නේ නැහැ. හැබැයි ඒකෙන් අදහස් වන්නේ නැහැ අප මේ අවුරුදු තුනේ ගිය ආකාරයටම ඉදිරියට යන්න ලෑස්තියි කියන එක. අපට පැහැදිලි වෙනසක්, පැහැදිලි ප්‍රතිසංස්කරණයක් ඕනෑ. අපට ඡන්දය දීපු හැටදෙලක්ෂයක ජනතාවක් සිටිනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පෙරමුණට ඡන්දය ලබා දීපු පනස්ලක්ෂයක් ජනතාවගේ ප්‍රාර්ථනා ඉටු කරන ඉදිරි ගමනක් අවශ්‍යයි. ඒ ඉදිරි ගමන වෙනුවෙන්, විශේෂයෙන්ම අපට ඡන්දය දුන් අපේ පාක්ෂිකයන් වෙනුවෙන් අපි ක්‍රියා කරන බව කියන්නට ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් කථාව අවසන් කරන්න.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි. දේශපාලනය කරද්දී ඉතාම වැදගත් සාධක දෙකක් තිබෙනවා. ඒවා අමතක කිරීම නිසා තමයි පසු ගිය පළාත් පාලන මැතිවරණයේදී අපට එවැනි ඉරණමකට මුහුණ දෙන්න සිදු වුණේ. දේශපාලන මතවාද තුළ අපේ පාලනය ජනතාව අතරේ යුක්තියුක්ත කරන්න ඕනෑ. විශේෂයෙන්ම රටේ දැන උගත් මධ්‍යම පන්තියට අපේ පාලනය යුක්තියුක්තයි කියලා පෙනෙන්න තිබෙන්න ඕනෑ. මධ්‍යම පන්තියේ ඉන්නේ පක්ෂවලට ගැට ගැහිලා ඉන්න මිනිස්සු නොවෙයි. මධ්‍යම පන්තිය තමයි රටේ ඉරණම තීරණය කරන්නේ. පසු ගිය පළාත් පාලන මැතිවරණයේදී ජනතාව ලක්ෂ 11ක් ප්‍රධාන දේශපාලන පක්ෂවලට පිටින් ඡන්දය දීලා තිබෙනවා. රටේ ඇති වුණු බැඳුම්කර සිද්ධිය නිසා සහ අනෙකුත් සිද්ධි නිසා අපේ යුක්තියුක්තභාවයට හානියක් සිද්ධ වුණා. ඒ වාගේම අපේ පාක්ෂිකයෝ ඒක බලාපොරොත්තු වුණා. මුළු ලෝකයේම ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූපය ඒකයි. ඇමෙරිකා එක්සත් ජනපදය ගත්තාම, බලයට පත්වන පක්ෂය නිලධාරීන් 14,000ක් පත් කරනවා. එහෙම කරන්නේ, ඒ පාක්ෂිකයන්ට තමන්ගේ ආණ්ඩුවක් බලයට පත්වුණාය කියන හැඟීම, තමන්ට යමක් සිදු වුණාය කියන හැඟීම ඇතිවෙන්න ඕනෑ නිසායි. පසුගිය අවුරුදු තුන තුළ මේ කරුණු දෙකම අපෙන් ඉටු වුණේ නැහැ. එම නිසා ඉදිරි අවුරුදු එකහමාර තුළ එය ඉටුකර ගැනීම සඳහා අපි ආර්ථික, සමාජයීය සහ දේශපාලනික වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ට ලැබුණු ජන වරම අනුව ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු ජනාධිපතිතුමාත් ක්‍රියා කරයි කියා බලාපොරොත්තු වෙමින් මා නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා.

[අ.භා.3.46]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු කථානායකතුමනි, ඉතා වැදගත්වන මෙම විවාදයේදී මට පෙර කථා කළ පාඨලී චම්පික රණවක ඇමතිතුමා කියපු කථාවකට පිළිතුරු දෙන්න අවශ්‍යයි. එතුමා ගණන් හිලව් එකතු කරලා, මැතිවරණ ප්‍රතිඵලය ඔළුවෙන් හිටවලා, ඊළඟ ජනාධිපතිවරණයේදී අපට විරුද්ධව ඡන්ද ලක්ෂ 62ක් ලැබෙනවාය කියලා ප්‍රකාශ කළා. මා බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා, පසුගිය මැතිවරණයේදී අපට ඡන්ද ලක්ෂ 50ක් ලැබුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානයට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්ද ලක්ෂ 14ක් ලැබුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද හවසට අපිත් එක්ක එකතු වුණාට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද ලක්ෂ 14ත් අපට ලැබිලා, ඊළඟ මැතිවරණයේදී අපේ ඡන්ද ප්‍රමාණය ලක්ෂ 64 දක්වා වැඩි වෙනවාය කියලා. අද සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා එළියට ගියාම, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා එළියට ගියාම, අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා එළියට ගියාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් ඉතුරු වෙන්නේ නැහැ. ඒ සියලු දෙනාටම ඡන්දය දීපු ජනතාව ඊළඟ මැතිවරණයේදී අපිත් එක්ක එකතු වෙනවාය කියන කාරණය බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා. මෙම මැතිවරණ ප්‍රතිඵලය අනුව මේ රටේ ජනතාවගෙන් ලක්ෂ 30යි එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නේ. මේ රටේ ජනතාව අගමැතිතුමාට ලබා දුන්නේ ඡන්ද ලක්ෂ 30යි. ඊට විරුද්ධව තිබුණු මතය ගැන තමුන්නාන්සේලා සැලකිලිමත් වෙන්න. අන්න ඒ මතයත් එක්ක තමයි අද මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාවේ මූලික කාරණය වුණු මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව, ඒ මහා මූල්‍ය ගනුදෙනුවේ වංචාව පිළිබඳව මැති ඇමතිවරු අද උදේ ඉඳලා කථා කළා. එක කරුණක් පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරවනවා. එසේ අවධානය යොමු කරවන කාරණය මෙයයි. අපි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ රටේ ජාතීන් අතර නැවත වතාවක් වෛරය වැපිරීමේ ක්‍රියාදාමයක් මේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ ගිංතොට ප්‍රදේශයේ මේ සිද්ධිය වුණා, ඒ වාගේම මහනුවර වුණා, අම්පාරේ වුණා. මේ සිද්ධි සියල්ලේදීම පොලිසිය ක්‍රියා නොකර අඛණ්ඩව ඉතාම නිදාගිලී පිළිවෙතක් අනුගමනය කළාය කියන කාරණය මා බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගාල්ලේ ගිංතොට ඒ සිද්ධිය වුණාට පස්සේ ඒ ස්ථානයට පොලිසිය යොමු කරන්න පැය 12ක් ගත වුණා. පැය 12ක් ගතවෙලා යොමු කරපු පොලිසිය තවත් පැය 12කින් නැවත ඉවත් කළා. ගිංතොට ප්‍රදේශයේ ජනතාව ඒ ගැන දන්නවා. හවස 5.00ට පොලිසිය ඉවත් කළාට පස්සේ, රාත්‍රියේ නැවත වතාවක් ගාල්ලේ ගිංතොට ප්‍රදේශය ගිනි ගත්තා. එසේ ගිනි ගත්තාට පස්සේ තමයි ඒ ප්‍රදේශයට නැවත වතාවක් පොලිසිය යොමු කළේ. එසේ පොලිසිය යොදවා ඒ ගින්දර නිවන්නත් දවස් තුන හතරක් ගතවුණා. මහනුවර සිද්ධියේදීත් ඒ විධියටම පොලිසිය අකාර්යක්ෂමව කටයුතු කළ බවත්, රටේ නීතිය ක්‍රියාත්මක වුණේ නැති බවත් මහනුවර ජනතාව බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා. ගිංතොට සිද්ධිය වෙලා දවස් 7කට පස්සේ අගමැතිතුමා ගිංතොට සිදු වූ සිද්ධිය නිරීක්ෂණය කරන්න ගියා. එතකොට ගිංතොට සිංහල, මුස්ලිම් ජනතාව පාට පක්ෂ භේද බලන්නේ නැතුව කිව්වා, "මේ සිද්ධියට මූලික වුණු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඒ මන්ත්‍රීවරයා තමයි මේ සිද්ධියට මූලික වෙලා කටයුතු කළේ. ඒ නිසා පළාත් පාලන මැතිවරණයේදී ඔහුට

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

නාම යෝජනා දෙන්න එපා"යි කියලා. ගමේ මිනිස්සු හැමදෙනාම අගමැතිවරයාගෙන් ඒ විධියට ඉල්ලුවා. ලංකාවේ සෑම රූපවාහිනී නාළිකාවකම ඒක පෙන්නුවා. ඒ මන්ත්‍රීවරයා රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා සිටියදීත්, ඒ ප්‍රදේශයේ සියලුදෙනාම අගමැතිවරයාගගෙන් ඉල්ලීමක් කර තිබියදීත්, රිමාන්ඩ් බන්ධනාගාරයට ගිහිල්ලා තමයි පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා පත්‍රයට එතුමාගෙන් අත්සන් ලබාගෙන ආවේ. ජාතීන් අතර තිබෙන මෙම ගැටලුව විසඳන්න අගමැතිතුමාට සහ ආණ්ඩුවට වගවීමක් තිබෙනවා නම් එහෙම කටයුතු කරන්නේ නැහැ. නීතිය සහ යුක්තිය පසිඳලන්න අගමැතිතුමාට වගවීමක් තිබෙනවා නම්, මහනුවර ගිනිගෙන තිබෙන අවස්ථාවේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය තමන්ගෙන් බැහැරව වෙනත් කෙනෙකුට භාර දෙන්නේ නැහැ.

වගකිව යුතු අගමැතිවරයෙක් නම් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙනත් ඇමතිවරයකු යටතේ තිබුණත්, තමන්ගේ යටතට පවරා ගන්නවා. එසේ තමන්ගේ යටතට පවරා ගෙන ඉතා පැහැදිලිව නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. හැබැයි ඒක නොවෙයි සිද්ධ වුණේ. රටේ ප්‍රශ්නයක් තිබියදීත් අගමැතිතුමා තමන් යටතේ තිබුණු අමාත්‍යාංශයත් වෙනත් ඇමතිවරයකුට ලබා දෙනවා. අගමැතිවරයා නීතිය පසිඳලීමේ තමන්ට තිබෙන යුක්ති ධර්මයෙන්, තමන්ගේ රටවැසියා ආරක්ෂා කරගන්න තිබෙන යුතුකමින් හා වගවීමෙන් බැහැර වුණාය කියලා බොහොම පැහැදිලිව අපි ප්‍රකාශ කරනවා. මේ විශ්වාස භංග යෝජනාවේ එක කරුණක් හැටියට සඳහන් වන, දැන් මේ රටේ ඇතිවන ජාතීන් අතර අර්බුදය විසඳන්නට අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව සාධනීය ලෙස මැදිහත්වීම් නොකළ බවත්, නොකරන බවත් බොහොම පැහැදිලිව අපි ප්‍රකාශ කරනවා. මේ රටේ ජාතීන් අතර වෛරය වැපිරවීම පිළිබඳව ඉතිහාසයක් එක්සත් ජාතික පක්ෂයට තිබෙනවා. අපි අවුරුදු 30ක් දුක් විඳපු යුද්ධය පටන් ගත්තේ 1983 දීයි. ඒකට පූර්විකාව සැපයුවේ 1980 සංවර්ධන සභා මැතිවරණයේදීයි. ඒ මැතිවරණයේදී ඡන්ද පෙට්ටි ටික කොල්ල කාලා යාපනයේ දුවිඩ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහෝසි කළා.

ඊට පස්සේ මොකද වුණේ? ඊට පස්සේ යාපනයේ පුස්තකාලය ගිනි තැබුවා. යාපනයේ ජනතාවගේ හදවත බඳු යාපනය පුස්තකාලය දකුණෙන් ගිහිල්ලා ගිනි තැබුවා. එය සිදු කළේත් එවකට පාලන බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. 1983 මේ රටේ කළු ජූලිය ඇති වුණු වෙලාවේ දහස් ගණන් දුවිඩ ජනතාව ඝාතනය කළත්, සති දෙකක් යනකල් මේ රටේ පොලීසියවත්, හමුදාවවත් පාරට බැස්සේ නැහැ. මේ රටේ තිස් වසරක යුද්ධය ආරම්භ කරන්න මූලික වෙලා කටයුතු කළේ, ජාතීන් අතර වෛරය, ක්‍රෝධය වැපුරුවේ වෙනත් ආණ්ඩුවක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. එක්සත් ජාතික පක්ෂය 1977 දී ආණ්ඩු බලයට පත් වෙනකොට ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවට පත්වූ මන්ත්‍රීවරුන්ගෙන් දෙදෙනායි අද එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ. වර්තමාන අගමැතිවරයා එක මන්ත්‍රීවරයෙක්. ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා තමයි අනෙක් මන්ත්‍රීතුමා.

1977 දී එක්සත් ජාතික පක්ෂය මෙතුමන්ලාගේ කරපිටින් මේ රටේ සමාජ දේහය විනාශ කිරීමේ කර්තව්‍ය පටන් ගෙන එය අඛණ්ඩව කරගෙන යන බව අපට බොහොම පැහැදිලිව පෙනෙනවා. උතුර ගිනි තිබ්බා. 60,000ක් තරුණයින් ඝාතනය කරලා දකුණ ගිනි තියලා මේ රට දෙකොන පත්තුවන විලක්කුවක් බවට පත් කළාය කියලා කිව්වේ මා නොවෙයි, ආර්. ප්‍රේමදාස හිටපු අගමැතිවරයායි. මේ රටේ දෙකොන පත්තුවන විධියට සමාජය, දේශපාලනය, රටේ ආරක්ෂාව අස්ථාවර කළේ වෙනත් ආණ්ඩුවක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඒ නිසා තමයි ඒ ආණ්ඩුවට ඊට පස්සේ මේ රටේ සමාජ දේශපාලනයේ දෙවයේ ඉරණම තීන්දු කරන්න මේ රටේ ජනතාව අවස්ථාවක් නොදුන්නේ. එදා සිට එක්සත් ජාතික පක්ෂය අඛණ්ඩව පරාජය වුණා.

එතුමන්ලා බලයට පැමිණි 2001 වර්ෂයේදී මෙතුමන්ලා මොකක්ද කළේ? "යළි පුබුදමු ශ්‍රී ලංකා" - "Regaining Sri Lanka" - වැඩසටහන යටතේ ලංකාවේ සිංහරාජ වනාන්තරය ඇතුළු සම්පත් සියල්ල විකුණන්නට පිඹුරු පත් සකස් කළා. මේ රටේ වාසනාවට, ලංකා මාතාවගේ වාසනාවට ඒ ආණ්ඩුව තිබුණේ අවුරුදු දෙකයි. අවුරුදු දෙකකට පස්සේ ඒ ආණ්ඩුව ගෙදර ගියා. ඊට පස්සේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ පාවාදීම කරලා බලයට ඇවිත්, අපේ ආණ්ඩුව විනාශ කරලා ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ, එතුමා හරහා මේ ආණ්ඩුව පත් කරගෙන මොකක්ද කරන්නේ? එදා 2001 දී කරන්න බැරි වුණු, "යළි පුබුදමු ශ්‍රී ලංකා" - "Regaining Sri Lanka" - වැඩසටහන වෙනත් නම්වලින් නැවත වතාවක් මේ රටේ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. 2015 දී බලයට පත්වුණු තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රටේ මොකක්ද කරලා තිබෙන්නේ? මේ රටේ රාජ්‍ය සම්පත් ටික, වරාය, ගුවන් තොටුපොළ විතරක් නොවෙයි, මහඉලුප්පල්ලම ගොවි පොළවල් පවා විකුණා දමන්න තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා.

මේ ආණ්ඩුව අපේ රණ විරුවන් බොහොම පැහැදිලිව දං ගෙඩියට ගෙන යනවා. ඊයේ-පෙරේදා වෙඩි ප්‍රහාරයකට ලක්වූ පොලිස් මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ IP රංගජීව මහත්මයා මේ රටේ පාතාලය මර්දනය කරන්න විශාල මෙහෙවරක් කළා. එක පැත්තකින්, පාතාලයෙන් වෙඩි කනවා. අනෙක් පැත්තෙන්, ආණ්ඩුව හිරේ දමනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි තුනක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඒ රණ විරුවන් හිරේ දමනකොට, නීතිය ක්‍රියාත්මක කරපු රංගජීව වැනි පොලිස් නිලධාරීන් හිරේ දමනකොට, මේ රටේ සංඝරත්නය හිරේ දමනකොට, තමන්ට ජනමතයක් නොලැබුණු අවස්ථාවකදී මේ රටේ ජනතාව නොඉල්ලන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැවිත් මේ රටේ ජනතාව පිට බලහත්කාරයෙන් පටවන්න හදනකොට තමයි මේ රටේ ජනතාව පළාත් පාලන මැතිවරණයේදී "මේ ආණ්ඩුව එපා"යි කියන තීන්දුව දුන්නේ. අන්න ඒ තීන්දුවත් එක්ක එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය පිළිබඳව මේ රටේ ජනතාව බොහොම පැහැදිලි පණිවුඩයක් ලබා දී තිබෙනවා. "මේ යන ගමන් මාර්ගය සුදුසු නැහැ. මේ රටේ මූල්‍ය අපරාධ පිළිබඳව ජනතාව කම්පා වෙනවා. මේ රටේ ජාතික සම්පත් විකුණා දැමීම පිළිබඳව මේ රටේ ජනතාව කම්පා වෙනවා. මේ රටේ රණ විරුවන් නැවත වතාවක් පාවා දෙන්න කරන උත්සාහයට රටේ ජනතාව කම්පා වෙනවා"යි කියන පණිවුඩය තමයි පසුගිය මැතිවරණයේදී ජනතාව දීලා තිබෙන්නේ.

අගමැතිතුමා පසුගිය දවසක ජාතික ආණ්ඩු සංකල්පය පිළිබඳව කථා කළා. අගමැතිතුමා 2018 පෙබරවාරි මාසයේ 21 වැනි දා පාර්ලිමේන්තුවේදී සඳහන් කළා, එංගලන්තයේ ලොයිඩ්

ජෝර්ජ්ට ජාතික ආණ්ඩුවක් පවත්වා ගෙන යන්න mandate එකක් තිබුණේ නැත්නම්, ගිවිසුමක් නැති වුණාට ලොයිඩ් ජෝර්ජ් ඒ පාලනය කරගෙන ගියා නම්, වින්ස්ටන් චර්චිල් අගමැතිතුමාත් එසේ කරගෙන ගියා නම්, ලංකාවේ එතුමාටත් ජාතික ආණ්ඩුවේ අගමැතිවරයා හැටියට කටයුතු කරන්න පුළුවන්ය කියලා. එතුමා කථාවට ගියාම නම් බොහොම ඉහළ මට්ටමේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදියෙක්. එංගලන්තය ගැනම තමයි කථා කරන්නේ. හැබැයි ලොයිඩ් ජෝර්ජ්වත්, වින්සන්ට් චර්චිල්වත් සිටි කාලයේ අපි කවුරුවත් ඉපදිලා හිටියේ නැහැ. නමුත් අපේ කාලයේ එක උදාහරණයක් තිබෙනවා. ඒ උදාහරණය මෙකයි. හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක් විධියට ඩේවිඩ් කැමරන් අගමැතිතුමා ඉල්ලා අස් වුණා. එතුමා ඉල්ලා අස් වුණේ එතුමාගේ ඡන්දය පරාජය වෙලා නොවෙයි. යුරෝපා සංගමයෙන් -European Union එකෙන්- එළියට යන්න කියා එංගලන්ත ජනතාව තීන්දුව දුන්නාම, එතුමා මන්ත්‍රී ධුරයෙනුත් අස් වෙලා ගෙදර ගියා. එහෙම නම්, "අගමැතිතුමනි, මීට පස්සේ ලංකාවේ ජාතික ආණ්ඩුවක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාතිශය බහුතරය අද ඇවිත් අපිත් එක්ක එකතු වෙනවා. ඒ අය අපිට එකතු වුණාට පසුව ජාතික ආණ්ඩුවක් නැහැ. ඔබතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවත්, නැතත් අලුතින් පත් කරන තුරු ඔබතුමාට ඔය පුටුවේ රැඳිලා ඉන්න සදාචාරාත්මක අයිතියක් නැහැ. අනික් පැත්තෙන් මේ රටේ ජනතාව ඔබතුමා කෙරෙහි වූ විශ්වාසය සම්පූර්ණයෙන් බිඳ දමා තිබෙනවා. ඒ නිසා ජනතා මතයක් නැහැ. ජනතා මතයකුත් නැති මේ රටේ ජාතික ආණ්ඩුවකුත් ඉස්සරහට ක්‍රියාත්මක වන්නේ නැත්නම්, 'අවවාදයට වඩා ආදර්ශය උතුම්' කියලා විශ්වාස භංග යෝජනාවට කලින් ඉල්ලා අස් වෙන්න." කියලා අපි අගමැතිතුමාට බොහොම ගෞරවයෙන් මතක් කරනවා. ඒක තමයි එංගලන්තයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහ ඉහළින් කථා කරන අගමැතිවරයකුගේ යුතුකම කියා සඳහන් කරමින්, ගරු කථානායකතුමනි මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.56]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ අපේ මන්ත්‍රී කණ්ඩායමට අපි අද ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණයෙන් පසුව, එක්සත් ජාතික පක්ෂයේ ගරු අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට යම් විශ්වාසයක් මේ රටේ පාර්ලිමේන්තුවේ තිබෙනවාය කියා පෙන්වන්න අපිට වුවමනා වෙලා තිබුණා. හැබැයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ මන්ත්‍රීතුමන්ලා කණ්ඩායම අද අපිට ඒ අවස්ථාව උදා කර දුන්නා. අද අපිට මේක දේවාශීර්වාදයක් වෙලා තිබෙනවා. අද රාත්‍රී 9.30ට පැවැත්වෙන ඡන්දයේදී මේ විශ්වාස භංග යෝජනාව පරදවලා අපි අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබනවා.

ගරු කථානායකතුමනි, අපිට මේ විශ්වාස භංග යෝජනාව ගෙන ආවේ ඇයි? මෙම විශ්වාස භංග යෝජනාව ගෙන එන්න මූලිකම හේතුව වුණේ -මේ යෝජනාවට ඇතුළත් වෙලා තිබෙන කරුණු මොනවා වුණත්- පළාත් පාලන මැතිවරණයෙන් අපි ලබපු පරාජයයි. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු තුනකින් තමයි මෙම පළාත් පාලන මැතිවරණය පැවැත්වුයේ. අපි හිටපු ප්‍රදේශවල බොහෝ වෙලාවට අපි මේ ජාතික ආණ්ඩුව කිරීමේදී ඇති වූ යම් යම් ප්‍රශ්න නිසා සිදු වුණු ඒ සියලුම වැරැදි එක්සත් ජාතික පක්ෂයේ ගොඩට තමයි ආවේ. හොඳ ටික එක පැත්තකට ගියා. නරක ටික තව පැත්තකට ආවා. අපිට ආවේ නරක ටිකයි. හොඳ ටික වෙන පැත්තකට ගියා. කෘෂි කර්මාන්තය ගැන නොදන්නා සමහර උදවිය; පිනට ජීවත් වෙන සමහර උදවිය මේ ප්‍රදේශවල කෘෂි කර්මාන්තය හසුරුවන්න ආපු ආකාරය අපි දැක්කා. කෘෂි කර්මාන්තය ගැන මෙ ලෝ දෙයක් නොදන්න, ගොවිතැන ගැන මෙ ලෝ දෙයක් නොදන්න අය ගොවිතැන ගැන කියාදෙන්න ආවා. සමහර වෙලාවට අපි ඒ ලණු කෑවා. ගොවියාට පොහොර ටික දීමේදී, කෘමිනාශක ටික දීමේදී ඒ වාගේ කටයුතු කරන්න ගිහින් මේ වාගේ ප්‍රතිඵල අපිට ලැබුණා. අපි තවත් ඒවා පිළිගන්නේ නැහැ. අපේම එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දයෙන්, එක්සත් ජාතික පක්ෂයෙන් පිනට ඇවිල්ලා අද ඒ අය අපිව විවේචනය කරනවා. ඒ අය "පින් මන්ත්‍රීවරු" හැටියට මම සලකනවා. ඒ අය අද අපිව විවේචනය කරනවා. අපිට ඒවා බලපෑවා. අපි මැතිවරණයට යනකොට මේ තීන්දු අපිට බලපෑවා. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරලා, තනි පිරිසිදු ආණ්ඩුවක් හැටියට ඉස්සරහට යන්න අපි බලාපොරොත්තු වෙනවා. අපිට එහෙම යන්න පුළුවන්කම තිබෙනවා. අද රාත්‍රී 9.30න් පසුව මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරලා, තනි ආණ්ඩුවක් හැටියට ඉදිරි කාලයේදී මේ රටේ පාලනය ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාගේ කථාවේදී රංගජීව කියන පොලිස් පරීක්ෂකතුමා රිමාන්ඩ් කිරීමේ සිද්ධිය ගැන කිව්වා. එතුමන්ලාට ඉතිහාසය අමතකයි.

පසුගිය රාජපක්ෂ පාලන කාලය තුළදී සම්මතයට එහා ගිහිල්ලා මේ රටේ සිදු වුණු අති බිහිසුණු ඝාතනයක් නිසයි මේ සිද්ධිය සිදු වුණේ. මේ සිද්ධිය නිකම් සිදු වුණු දෙයක් නොවෙයි. අවුරුදු ගණනාවක් CID එක පරීක්ෂණ පැවැත්වුවා. මේ රටේ ප්‍රබල පුද්ගලයෙකු ඊට අණ දුන්නා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අණ දීපු නිසා තමයි 2012 අවුරුද්දේ බන්ධනාගාරයේ හිටපු 20 ගණනක් ඝාතනය වුණේ. අපේ රට බෞද්ධ රටක්. මේ රටේ තිබෙන නීතිය අනුව කෙනෙකු එල්ලුම් ගහට නියම වුණත්, මරණ දඬුවම නියම කළත් ඒ පුද්ගලයා මරන්නේ නැති බව අපි දන්නවා. ඔවුන් මැරෙන තුරු හිරේ තියා ගන්නවා. හැබැයි, මොකක්ද වුණේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
එදා බන්ධනාගාරයට ගිහිල්ලා, නම් කියලා ඇදලා අරගෙන ඒ අහිංසක මිනිසුන්ව වෙඩි තියලා මැරුවා. බන්ධනාගාරයට යන සියලු දෙනා වැරැදිකාරයන් නොවෙයි. හැබැයි, මේ රටේ හිටපු ගෝඨාභය රාජපක්ෂගේ අණට අනුව ඒ අය මරලා දැම්මා. ඒවාට උදවු කරපු රංගජීවලා, ධනසිංහලා නිකම් නොවෙයි රිමාන්ඩ් කළේ. ඔවුන් රණවිරුවන් වෙන්න පුළුවන්. හැබැයි, ඒ uniform එක දා ගත් පමණින් මනුෂ්‍ය ඝාතන කරන්න බැහැ. ඒ වාගේ uniform එක දා ගත් අය රාජපක්ෂලාගේ අණ ක්‍රියාත්මක කරමින් මේ රටේ සිදු කළ මනුෂ්‍ය ඝාතන අපි දැක්කා. තාජුඩීන්ලා, ලසන්ත වික්‍රමතුංගලා ඝාතනය කරපු හැටි අපි දැක්කා. ඒ වාගේ දේවල් නිසා තමයි අපි මේ පාලනය වෙනස් කළේ. අද මේ

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

ආණ්ඩුවේ හොඳ වැඩිවෙලා තිබෙනවා. නිකම් අය නොවෙයි, රිමාන්ඩ්ගත කරලා සිටින්නේ. ඔවුන් රණවිරුවන් වෙන්න පුළුවන්. ප්‍රගීත් එක්නැලිගොඩ පොලොන්නරුව පැත්තට අරගෙන ගිහිල්ලා තමයි ඝාතනය කරලා තිබුණේ කියන එක අපි පසු ගිය දවස්වල ජනමාධ්‍ය තුළින් දැක්කා. ඒ ඝාතනවලට සම්බන්ධ වුණු අය රණවිරුවන් වෙන්න පුළුවන්. හැබැයි, ඒ අයට අණ දුන්නේ රාජපක්ෂ පාලනය විසිනුයි. ඒ අය තමයි අණ දුන්නේ. අපි ඒ පාලනය අවසන් කරලා තිබෙනවා.

අපේ පාලනය හොඳ වැඩියි කියලා අපි හිතනවා. ඒක නිසා තමයි මේ විශ්වාස භංග යෝජනා ගරු අගමැතිතුමාට ගෙනැල්ලා තිබෙන්නේ. මට මතකයි, අද අපේ මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, 1999දී "රනිල්ට බැහැ." කියලා එතුමන්ලා පෝස්ටරයක් ගැහුවාය කියලා. ඇයි, මේ බය? රනිල්ට බැරි නැහැ. රනිල්ට පුළුවන් බව හුහක් අය දන්නවා. "රනිල්ට බැහැ." කියලා කිව්වේ ඇයි කියලා එතුමා කිව්වා. එතුමා කිව්වා, "රනිල්ට බැහැ." කියලා අපි කිව්වේ රනිල්ට පුළුවන් නිසා කියලා. රනිල්ට පුළුවන් නිසා තමයි "බැහැ." කියා කිව්වේ කියලා මංගල සමරවීර ඇමතිතුමා කථාව පටන් ගන්නකොටම කිව්වා. ඒ කියන්නේ, අද අගමැතිතුමාට බයයි. අගමැතිතුමාට තනි, පිරිසිදු පාලනයක් කරන්න තිබුණා නම් අද මේ වාගේ බාධාවන් එන්නේ නැහැ.

අද මේ ගරු සභාවේදී සමහර අය කිව්වා, "මන්ත්‍රීවරු මුදලට ගත්තා." කියලා. එහෙම මන්ත්‍රීවරු මුදලට අරගෙන තිබෙනවා නම් ඒක ඔප්පු කරලා පෙන්වන්න කියලා අපි කියනවා. අපේ කිසිම මන්ත්‍රීවරයෙකු මුදල්වලට යටවෙලා නැහැ. පසු පෙළේ කිසි මන්ත්‍රීවරයෙක් රුපියල් සතවලට යට වුණේ නැහැ. අපි පසුගිය කාලයේ දැක්කා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න රුපියල් ශතවලට මන්ත්‍රීවරු ගත් ආකාරය. අපි රුපියල් ශතවලට මන්ත්‍රීවරු ගත්තේ නැහැ. අපේ මන්ත්‍රීවරු රුපියල් ශතවලට යට වුණේ නැහැ. අගමැතිතුමාගේ තිබෙන නිහතමානිකම නිසාත්, එතුමා මේ රටේ ඉන්න අවංක නායකයෙක් නිසාත් එතුමා සහ එතුමාගේ පවුලේ අය දේශපාලනය තුළින් මුදල් හම්බ කළේ නැහැ. පරම්පරාවෙන් ලැබුණු මුදල් එතුමන්ලාට ජීවත් වෙන්න තිබෙනවා. එහෙම පිරිසිදු පාලනයක් එතුමා ගෙනි යනවා. එතුමාගේ නිවැරැදි අවංකභාවය නිසා තමයි එතුමාට මේ වාගේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ලැබී ඇති වේලාව අවසානයි.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
විශ්වාස භංගය දේවාශීර්වාදයක් වෙලා එතුමාට මෙයින් ජයග්‍රහණය කරන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා. අපි හෙට ඉඳලා එක්සත් ජාතික පක්ෂ රජය යටතේ හොඳ පිරිසිදු පාලනයක් පටන් ගන්නවා. අපිත් එක්ක ආණ්ඩුවේ ඉඳලා මේ විශ්වාස භංග යෝජනාවට යම් කෙනෙකු ඡන්දය දෙනවා නම් අපි ඒ අයට කියනවා, "කරුණාකරලා අර පැත්තට ගිහිල්ලා වාඩි වෙන්න." කියලා. අපි හොඳ පිරිසිදු පාලනයක් හෙටින් පස්සේ ගෙන යන්නම් කියලා කියමින් මම නිහඬ වනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක් සහ ඊට අමතරව විනාඩි 9ක් වශයෙන් විනාඩි 17ක් ලැබිලා තිබෙනවා.

[අ.භා. 4.04]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)
ගරු කථානායකතුමනි, අද ගරු අගමැතිතුමාට විරුද්ධව ගෙනා විශ්වාස භංග යෝජනාව ගැන විවාද කරනවා. විශ්වාස භංග යෝජනාව ගරු අගමැතිතුමාට විරුද්ධව ගෙනාවේ එතුමා ගැන ද්වේෂයකින් නොවෙයි කියලා සමහර කථිකයන් ප්‍රකාශ කළා. ඒ යෝජනාව පිටු පස විශාල හරුපයක් තිබෙන බව අපි දන්නවා. ඒ විශ්වාස භංග යෝජනාව හරහා අගමැතිතුමාගේ වැටීමත් සමඟ මේ ආණ්ඩුව දුර්වල කරන්න වාගේම මේ ආණ්ඩුව පෙරළන්න හැකි වේවි කියලා එම යෝජනාව ගෙනාපු අය බලාපොරොත්තු වනවා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කරලා තිබෙනවා මම දැක්කා, මේ විශ්වාස භංග යෝජනාවෙන් පස්සේ අගමැතිතුමා එළවනවා, ඊට පස්සේ අපි ආණ්ඩුව පෙරළනවා කියලා. ඒ කාරණය අද ප්‍රවෘත්ති පත්‍රවලත් පළවෙලා තිබුණා.

ඒකෙන් කෙසේ හෝ හෙළි වෙනවා, මේ ගොල්ලන්ගේ න්‍යාය පත්‍රය. මේ ගොල්ලන් මැතිවරණයක් එනතෙක් ඉවසා ගෙන ඉඳලා, මහ මැතිවරණයකට, ජනාධිපතිවරණයකට මුහුණ දීලා කර ගන්න අවශ්‍ය දේ ඒවා හරහා කර ගන්න පුළුවන් වේදෝ කියන අවිශ්වාසය නිසා, මේ අවස්ථාවේ වෙනත් මාර්ගවලින් එය ඉෂ්ට කර ගන්න හදනවා.

අගමැතිතුමා ගැන අපට විශ්වාසය තිබෙනවා. එතුමා අද මේ රජයේත්, මේ පාර්ලිමේන්තුවේත් ඉන්නා ප්‍රවීණතම දේශපාලනඥයෙක්. එතුමා උගත්, බුද්ධිමත් කෙනෙක්. එතුමාට හොඳ පසුබිමක් තිබෙනවා. එතුමා ආතක්-පාතක් නැතුව කොහෙන්වත් දේශපාලනයට ඇවිල්ලා හැදුණු පුද්ගලයෙක් නොවෙයි. මම එතුමාගේ හැසිරීම ගැන, පෞද්ගලික ජීවිතය ගැන කථා කරන්නේ නැහැ. යම් යම් අවස්ථාවල මඩ ගැසීම් සිද්ධ වෙනවා. නමුත් එතුමා පක්ෂ නායකයෙක් හැටියට ක්‍රියා කරන ආකාරය ගැන අපේ පැහැදීමක් තිබෙනවා. සෑම පුද්ගලයෙකුගේම යම් යම් දුර්වලතා තිබෙන්න පුළුවන්.

විශේෂයෙන්ම දේශපාලනයේ යෙදී සිටින කිසිම කෙනෙකු සියයට 100ක් සම්පූර්ණ නැහැ. නමුත් අද පවතින දේශපාලනය තුළ එක්සත් ජාතික පක්ෂයට නායකත්වය දෙන්න එතුමාට හැකියාව තිබෙනවා කියලා අපි හිතනවා. මේ අවස්ථාවේ යම් යම් අය නොයෙක්, නොයෙක් දේවල් බලාපොරොත්තු වුණා වෙන්න පුළුවන්. ඒ ගැන මෙතැනදී යම් යම් අය සඳහන් කළා. නමුත් ඒ කිසිවක් අපට අදාළ නැහැ. ඉදිරි අවුරුදු දෙක තුළ මේ රජය ඉස්සරහට ගෙන යෑම සඳහා එතුමාගේ නායකත්වය අපි අනිවාර්යයෙන් පිළිගන්නවා. එම නායකත්වයත් සමඟ අපි මේ ගමන යනවා.

එතුමාට ආර්ථික විද්‍යාව ගැන දැනුමක් තිබෙනවා, එතුමා ආර්ථිකය මෙහෙයවනවා. එතුමා දවසේ පැය 24න් පැය 18ක් පමණ වැඩ කරනවා. ඉතා කැපවීමෙන් වැඩ කරනවා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා මගේ කථාව අහගෙන ඉන්න. තව තව දේවල් ඉස්සරහට කියනවා. එතුමා මහන්සි වෙලා වැඩ කරනවා. එතුමාගේ යුතුකම ඉෂ්ට කරනවා. අතීතයේ -තමුන්නාන්සේලාගේ

පාලන සමයේ,- තව අගමැතිවරුන් සිටි බව අපි දැක්කා. එම අගමැතිවරුන්ට නිසි පිළිගැනීමක් දුන්නේ නැහැ. ඒ වාගේ නොවෙයි, අද. අද අගමැතිතුමා ආණ්ඩුව මෙහෙයවනවා; පාර්ලිමේන්තුවට වග කියනවා. එතුමාට පිළිගැනීමක් තිබෙනවා. පාර්ලිමේන්තු ඇතුළේත් පිළිගැනීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවෙන් පිටත් පිළිගැනීමක් තිබෙනවා.

අතීතය ගැන කියන්න කනගාටුයි. මම අවුරුදු තුනහමාරක් ආරක්ෂක කවුන්සිලයේ සිටියා. එතකොට හිටපු අගමැතිතුමාත් - අපේ හිතවතා- ආරක්ෂක කවුන්සිලයේ සිටියා. එතුමාට කවදාවත් වචනයක්වත් කථා කරන්න දුන්නේ නැහැ. ඊට පසුව තව අගමැති කෙනෙක් ආවා. එතුමාට වැඩක් පළක් කරන්න පුළුවන් කාලයේ එම ධුරය දුන්නේ නැහැ. එතුමා ඉතා දුර්වල වෙලා, ඔත්පල වෙලා ඉන්න කොට තමයි අගමැති ධුරය දුන්නේ. එවැනි පාලනයක් මේ රටේ තිබුණා. එවැනි පාලකයෙක් සිටියා. නමුත් අද එහෙම තත්ත්වයක් නැහැ. අද අපි හරියාකාරව ප්‍රජාතන්ත්‍රවාදය ගෙනැල්ලා ජනතා වරම ඉදිරියට ගෙනයන අතරේ, සියලුදෙනාම වගකීම් බෙදා ගෙන එම වගකීම් ඉටු කරමින් මේ පාලනය ගෙනයනවා. ඒක නිසා අගමැතිතුමා එළවා මේ රජය පෙරළන්න පුළුවන් කියලා යමෙක් හිතනවා නම්, ඒවා සාර්ථක වෙයි කියලා අපි හිතන්නේ නැහැ. ඒ ගැන අනවශ්‍ය බලාපොරොත්තු තබා ගත්තාට තමුන්නාන්සේලාට අවසානයේ හිමි වන්නේ බලාපොරොත්තු කඩවීම් පමණයි.

මේ විශ්වාංස භංග යෝජනාවේ යම් යම් කරුණු ඉදිරිපත් කර තිබෙන ආකාරය අපි දැක්කා. එයින් විශේෂයෙන් එල්ල කර තිබෙන කරුණු කිහිපයක් මගේ අවධානයට යොමු වුණා. එහිදී අගමැතිතුමාගේ කල්ක්‍රියාව නිසා ආර්ථිකය කඩා වැටුණා කියලා එක කරුණක් සඳහන් කර තිබෙනවා. නමුත් මේ රටේ ආර්ථිකය කඩා වැටුණේ මේ කාලයේදී නොවෙයි. අපි රට භාර ගන්න පෙර, ඊට කලින් තිබුණු අවුරුදු 10 ඇතුළත ආර්ථිකය ක්‍රමක්‍රමයෙන් පහළට ගියා; කඩා ගෙන වැටුණා. ඒ කාලයේ යම් යම් ස්ථානවල යම් යම් ව්‍යාපෘති කර තිබුණු ආකාරය අපි දැක්කා. ඒවා රට විශාල වශයෙන් ලෝකයට ණය කරලා කරපු ව්‍යාපෘති විතරයි. ඒ හැර මේ රටේ ජනතාවට දැනෙන, ඔවුන්ගේ බඩට දැනෙන, කුස්සියට දැනෙන සංවර්ධනයක් මේ රටේ සිද්ධ වුණේ නැහැ.

ඒ කාලයේ "ඒක පුද්ගල ආදායම ඩොලර් 2,000යි", "ආසියාවේ ආශ්චර්යය" වාගේ ලස්සන, ලස්සන කථා කියපු ආකාරය අපට මතකයි. නමුත් ඒ කථා එකක්වත් රටේ ජනතාවට, ගමේ ජනතාවට, බහුතරයක් වූ දුප්පත් ජනතාවට අදාළ වුණේ නැහැ. ඒ කාලය තුළ මේ රටේ මධ්‍යම පන්තියක් නැති වුණා. මේ රටේ සියයට 80ක් පමණ සිටියේ දුප්පත් ජනතාව. ඒක පුද්ගල ආදායම ඩොලර් 2,000ක් කියලා කිව්වාට, ඇත්තටම මාසයකට රුපියල් 35,000ක් පඩි ගන්නා ජනතාවක් තමයි රටේ සියයට 80ක ප්‍රමාණයකින් සිටියේ. ඒ කියන්නේ ඒක පුද්ගල ආදායම ඩොලර් 300ක් පමණ තමයි තිබුණේ. මේ රටේ මුදල්වලින් සියයට 90ක් පමණ පරිහරණය කළේ කොළඹ අවට දේශපාලනඥයන්ට ගැනිකම් කරපු, රාජපක්ෂ පාලනයට ගැනිකම් කරපු සියයට 10ක් පමණ වූ ජනතාවයි. ඔවුන් අතේ තමයි මේ රටේ සල්ලිවලින් බහුතර ප්‍රමාණයක් තිබුණේ. එවැනි රටක් අපි භාර ගන්න කොට ලෝකයට ණය වෙලා තිබුණා. ණය වාරිකය ගෙවන්න දළ දේශීය ආදායමෙන් සියයට 80ක් වැය වුණා. එවැනි රටක් භාර අරගෙන ආර්ථිකය ගොඩ නැඟීමට අපි උපරිම උත්සාහයෙන් වැඩ කරනවා; කැපවීමෙන් වැඩ කරනවා. ඒක දුෂ්කර කාර්යයක්. දවසින්, දෙකෙන් ඒක වෙනස් කරන්න බැහැ. අවුරුද්දෙන්, දෙකෙන් එහි ප්‍රතිඵල දකින්නට අමාරුයි. අරාජිකව තිබුණු රටක් අපි භාර ගත්තා. ඒ රට දැන් නිවැරදි මාර්ගයට ගෙනයන්න අපි උත්සාහ කරනවා.

ඒ උත්සාහයේ ප්‍රධාන කොටස්කරුවෙක් හැටියට අපි ගරු අගමැතිතුමාව දකිනවා. ඊට අමතරම එතුමාට ශක්තිය දෙන ඇමතිවරු සිටිනවා. එතුමන්ලාගේ චරිත ඝාතනය කළා, එතුමන්ලා ගැන පක්ෂය කලකිරවන්න කථා කළා, එතුමන්ලා පක්ෂය මෙහෙයවනවා කිව්වා, එතුමන්ලාට මඩ ගැහුවා. නමුත් අපට පක්ෂයක් හැටියට එතුමන්ලා ගැන විශ්වාසයක් තිබෙනවා.

ඊළඟට, තමුන්නාන්සේලා දිගින් දිගටම මහනුවර, දිගන ඇති වූ තත්ත්වය ගැන කථා කළා. ඒ තත්ත්වය පාලනය කළේ නැහැ කියලා විශ්වාස භංගයේ තිබෙනවා. ඒ අවස්ථාවේදී සිදු වූ තත්ත්වය පාලනය කිරීමේදී යම් යම් අඩු පාඩු තිබූ බව අපි දැක්කා. ඒවා මම මීට ඉහතත් යම් යම් අවස්ථාවල ප්‍රකාශ කළා. නමුත් මෙහි සම්පූර්ණ වගකීම අගමැතිතුමා මත දැමීම ඉතාම අසාධාරණයි. එතුමා නීතිය සහ සාමය මෙහෙයවීමේ ඇමති හැටියට රාජකාරි භාරගෙන සුමාන දෙකක කාලයක් ගත වුණේ. ඒක තාවකාලික පත්වීමක් කියලා තිබුණා. ඒ කාලය ඇතුළත සිද්ධ වුණු සියලුම දේවලට එතුමාට වග කියන්න බැහැ. මොකද, ඒ කාලය ඇතුළත එතුමාට පොලීසිය පුහුණු කරන්න බැහැ; පොලීසියේ පත්වීම් වෙනස් කරන්න බැහැ; සුමාන දෙකක් ඇතුළත පොලීසිය හරි මාර්ගයට ගේන්න බැහැ. ඒ අඩුපාඩු සියල්ලේම වගකිම එතුමා නොදැරිය යුතුයි. අනිවාර්යෙන්ම යම්කිසි කෙනෙක් වගකීම භාරගත යුතුයි. එහෙම නැත්නම් නම්, ඒ වගකීම ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා පහළට ගෙනෙනවා මිසක් එක පුද්ගලයෙකු විතරක් ඉලක්ක කරලා දොස් පැවරීම සාධාරණයි කියා මම හිතන්නේ නැහැ.

අපි දන්නවා, මහනුවර, දිගන ප්‍රදේශයේ ඇතිවූ සිද්ධිවලට සම්බන්ධ සමහරු දැනට අත් අඩංගුවේ ඉන්නා බව. ඒ අත් අඩංගුවේ සිටින අය අතරේ ඉන්නවා, පොහොට්ටුවේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු තුන්දෙනෙක්. තව තුන්දෙනෙක් අත් අඩංගුවට ගන්න සොයනවා. එතකොට මේ ගොල්ලන් අත් අඩංගුවට ගන්න,- [බාධා කිරීමක්] කාට හරි මේවා අහගෙන ඉන්නකොට කැක්කුමක් තිබෙනවා නම්, ඒවා ගැන බොරුවට මර හඬ දීලා වැඩක් නැහැ. තමුන්නාන්සේලා යථාර්ථය තේරුම් ගන්න; යථාර්ථයට මුහුණ දෙන්න. ගරු කථානායකතුමනි, ඒ කට්ටිය ඒක පිටුපස්සේ හිටියා; පිටුපස ඉඳගෙන මෙහෙයවුවා. දැන් මෙතැන ඇවිල්ලා, අගමැතිතුමාට දොස් කියනවා, "කරපු වැඩේ පාලනය කළේ නැහැ; පාලනය නොකරපු නිසා ගෙදර යන්න ඕනෑ" කියලා. නමුත් හරියට වෙන්න ඕනෑ, ඒවා මෙහෙයවපු එවුන් ඇල්ලීම; ඒ අයට දඬුවම් කිරීම; ඒ ගොල්ලන් නීතිය හමුවට ගෙන ඒම. ඒකයි වහාම සිදුවිය යුත්තේ කියන එකයි අපට කියන්න තිබෙන්නේ.

ඊළඟට, නැවත කියා තිබෙනවා, ඒ කාර්යයන් හරහා ජාතික සමඟිය නැති වුණා කියලා. "ජාතික සමඟිය" කියන වචනය මේ ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා මේ රටේ කථා කළේ නැහැ. ජාතික සමඟියක් ගැන කථා කළේ නැහැ. සුළු ජාතීන් අවතක්සේරු කරලා වැඩ කළා. සුළු ජාතීන්ට නිසි තැන් දුන්නේ නැහැ. හැම මැතිවරණයක්ම ජයග්‍රහණය කරපු අවස්ථාවල හෝ පරාජය වෙච්ච අවස්ථාවල මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා, හැම වේලාවේම ප්‍රකාශ කළේ මොකක්ද? "මට හම්බවුණා, සිංහල ඡන්ද. එක්සත් ජාතික පක්ෂයට හම්බ වෙනවා, සුළු ජාතීන්ගේ ඡන්ද" කියලා මතයක් ඇති කළා. පළාත් පාලන මැතිවරණයේ ඡන්ද ප්‍රතිඵල ආවාමත් එතුමා මේ වාගේ අර්ථකථන දෙන්න උත්සාහ කළා. එතුමාගේ ඇහේ පිහිටා තිබෙනවා, ජාතිවාදය. ඒක නවත්වන්න බැහැ. අද මම කැන්ටිමේදී දැක්කා, එතුමා මුලුවල සිටින මුස්ලිම් මන්ත්‍රීවරුන්ට පවා සොයා ගෙන ගිහිල්ලා කථා කරනවා. නමුත් දැන් ප්‍රමාද වැඩියි. එතුමා පිළිබඳව සුළු ජාතීන්ගේ නියෝජිතයන්, සුළු ජාතීන් ඉතා අප්‍රසන්න හැඟීමක ඉන්නේ. මම හිතන්නේ නැහැ, එතුමාගේ දේශපාලන ජීවිතය ඇතුළත එතුමාට ඒ වරද නැවත නිවැරදි කර ගන්න පුළුවන් වේවි කියලා.

ඊළඟට, ජාතික සාමයට හානි වෙන්න ඉඩ දුන්නා කියලා, ජාතිවාදය ඇවිස්සුවා කියලා, ජාතිවාදය ඇවිස්සෙන්න ඉඩ දුන්නා කියලා, මේ රටේ කීර්ති නාමයට අපකීර්තියක් වුණා කියලා නැවත

[ගරු සරත් ෆොන්සේකා මහතා]

කියනවා. ඒකටත් මට උත්තර දෙන්න තිබෙන්නේ ඉස්සෙල්ලා කියපු දෙයින්මයි. ඒවා අතීතයේ සිද්ධ වුණා. ඒවා වෙනස් කරන්න තමයි අපි උත්සාහ දරන්නේ. අතීතයේ ඒවා හරියට කෙරුණේ නැති නිසා සාධාරණව, නීත්‍යානුකූලව, මානුෂීය අයිතිවාසිකම් රකිමින් යුද්ධය කරපු අපට පවා ලෝකයා හමුවේදී නොයෙක් නිග්‍රහවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ, ඒ රටේ ඒ කාලයේ හිටපු පාලකයා සහ එතුමාගේ ගෝලබාලයින් ජාතිවාදය අවුස්සපු නිසා. ඒ නිසා මුළු ලෝකයම එකතුවෙලා හමුදාවටත් ඇඟිල්ල දිගු කරන්න පටන් ගත්තා. ඒ නිසා අපි කරපු ජයග්‍රහණ, අපි කරපු විශාල ජාතික කර්තව්‍යය, ඒ සේවය පවා අවතක්සේරු කිරීම සිද්ධ වුණා, රාජපක්ෂ සමයේ පාලන යන්ත්‍රණයේ තිබුණු දෝෂය නිසා; ඒ අවමානය නිසා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
පසුගිය දවස්වල අර කෑ ගහන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගෙදර කොල්ලෙක් මැරුණා. ඒ කොල්ලා දැන් භූතයෙක් වෙලා ගෙදරට ඇවිල්ලා ලු. සාමාන්‍යයෙන් භූතයෝ ආවාම උන්ට දෙන්නේ කරවල බැදපුවා; බත් ගුලියක්; එහෙම නැත්නම් මස් කෑල්ලක්. නමුත් ඌ ඉල්ලන්නේම ව්‍යාඝ්‍රා වාගේ දේවල් ලු.[බාධා කිරීමක්] ඒ නිසා කට පියාගෙන ඉන්න. ඕවා අහගන්න නේ කට ඇර ගත්තේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තමුන්නාන්සේ කථාව කරගෙන යන්න. ඔබතුමන්ලා සභාවේ ගෞරවය ආරක්ෂා කරමින් හැසිරෙන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
කලවැදි මුහුණක් තිබෙන්නේ. කලවැදි මුහුණක් තිබෙනවා, [බාධා කිරීමක්] බොරු කියන්නේ නැහැ. ඇත්ත කිව්වේ. ඉල්ලන් කන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
භූතයා දකිනවාලු.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
අයියෝ! පව්. ගරු කථානායකතුමනි, මෙම විශ්වාස භංගයේ කියලා තිබෙනවා අර්ජුන් මහේන්ද්‍රන් විදේශිකයෙක් කියලා. අර්ජුන් මහේන්ද්‍රන් විදේශිකයෙක් වුණාට මේ රටේ තනතුරක් දරන්න නීතියෙන් බාධාවක් නැත්නම්, ඒ ගැන අගමැතිතුමාට ඇඟිල්ල දික් කරන එකේ සාධාරණත්වයක් මම දකින්නේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ -තමුන්නාන්සේලාගේ අනාගත ජනාධිපති අපේක්ෂකයා- විදේශිකයෙක්. එතුමා ඇමෙරිකානු ජාතිකයෙක්. [බාධා කිරීම්]හයේ පැනලා දිවුවේ එයා තමයි. යුද්ධය පටන් ගන්න ඉස්සෙල්ලා පැනලා ගියා. අවුරුදු 15ක් හැංගිලා හිටියා. ඊට පස්සේ රටට ආවා. භය ගැන අපට උගන්වන්න එන්න එපා. ඒවා ගෝඨාභයගෙන් අහගන්න. ඇමෙරිකානු පුරවැසියෙක් වුණු එතුමාව ආරක්ෂක ලේකම් ලෙස ගෙනෙන්න හොඳයි. ආරක්ෂක ලේකම් කියන්නේ, රටේ ඉතා වග කිව යුතු තනතුරක්. රටේ ආරක්ෂාවට වග කිව යුතු කිහිප දෙනෙක් ඉන්නවා. එයින් එකේකෙනෙක් තමයි ආරක්ෂක ලේකම් කියන්නේ. එවැනි තනතුරක් ඇමෙරිකානු පුරවැසියෙකුට දුන්නා. ඇමෙරිකානු පුරවැසියෙක් කියන්නේ, ඇමෙරිකානු ධජය ඉස්සරහට ගිහිල්ලා දිවුරලා ප්‍රතිඥාවක් දෙනවා, ඇමෙරිකාවේ ස්වෛරීභාවයට තර්ජනයක් වුණොත් එයා ඇමෙරිකාව බේරා ගැනීමට අවිය අතට ගන්නවා කියලා. ඒ වාගේ පුද්ගලයෙකුට තමයි අනාගතයේදී රටේ ජනාධිපති ධුරය භාර දෙන්න හදන්නේ; ඒ වාගේ පුද්ගලයෙක් තමයි මේ රටේ ආරක්ෂක ලේකම් කළේ. එහෙම කරපු අය, අර්ජුන් මහේන්ද්‍රන් මේ රටේ මහ බැංකුවේ අධිපති වෙලා හිටියා කියලා ඒක අල්ලා ගෙන විශ්වාස භංග යෝජනා ගෙන ඒම විහිළුවක් හැටියටයි මම දකින්නේ.

ඊළඟට මේ යෝජනාවේ කියනවා, මහ බැංකුවේ අධිපති ධුරයෙන් අර්ජුන් මහේන්ද්‍රන් ඉවත් කළාට පසුව, අගමැතිතුමාගේ උපදේශකයෙක් හැටියට එතුමාව ගත්තා කියා. අතීතයේ සිදු වෙච්ච දේවල් සමඟ සංසන්දනය කළෝතින් මෙහි මහලොකු වරදක් නැහැ. අපට මතකයි පී.බී. ජයසුන්දර. "ආර්ථික ඝාතකයා" කියලා ඒ කාලයේ එයා එක්ක පුදුම වෛරයකින් හිටියේ. එයා තමයි ඒ කාලයේ මේ රටේ ආර්ථිකය මෙහෙයවුයේ. රටේ පාලකයා මුදල් ඇමති වශයෙන් හිටියාට, පී.බී.ජයසුන්දර තමයි ආර්ථිකය මෙහෙයවුවේ. මට එක අවස්ථාවක් මතක් වෙනවා. චීනයේ ඔලිම්පික් ක්‍රීඩා තරගය තිබෙන අවධියේ ඊට මාස 4කට කලින් චීනයෙන් අවි ආයුධ අපේ රටට එවීම නැවැත්වුවා. අවි ආයුධ ගෙනෙන නැව් එන එක නැවතුණා. යුද්ධය තදින්ම පවතින කාලයේ මගේ අවි ආයුධ තොගවල හිඟයක් තිබුණා. අපට චීනයෙන් අවි ආයුධ දුන්නේ ණයට. මම ගෝඨාභය රාජපක්ෂ ළඟට ගිහිල්ලා කිව්වා, "චීනයෙන් අවි ආයුධ නැව් එන්නේ නැහැ. මම පකිස්ථානයේ යුද හමුදාපතිට කථා කළා. මට ඩොලර් මිලියන 100ක් විතර දෙන්න. අවි ආයුධ ටිකක් එහෙන් දෙනවා කියලා පොරොන්දු වුණා" කියලා. ගෝඨාභය කිව්වා, "මම කොහොමද ඒක කරන්නේ? අපි ණයට නේ මේවා ගන්නේ. මට සල්ලි නැහැ" කියලා. මම බැසිල් රාජපක්ෂටත් ගිහිල්ලා කිව්වා, "ඩොලර් මිලියන 100ක් විතර ඕනෑ. නැත්නම් මෙතැනින් එහාට යුද්ධය ගෙනියන්න බැහැ" කියලා. එතුමාත් ඒ සිංදුවම කිව්වා. ඊට පස්සේ මම පී.බී. ජයසුන්දර ළඟට ගිහිල්ලා කථා කළා. එයා තමයි ඇත්තටම නාමිකව වාගේ ආර්ථික ඇමති වාගේ හිටියේ. එයා පැය භාගයක් ඇතුළත ඩොලර් මිලියන 100ක් වෙන් කරලා මට දුරකථනයෙන් එය සනාථ කළා. ඒ වාගේ කාලයක් තිබුණේ. එයා තමයි ආර්ථිකය මෙහෙයවුයේ. නමුත්, එයාට විරුද්ධව නඩුවක් ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය එයා ඉවත් කළා. ඊට පස්සේ ඒ තීන්දුවට එරෙහිව යමින් මහින්ද රාජපක්ෂ පාලකයා එතුමා නැවතත් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හැටියට පත් කළා. ඒ වාගේ දේවල් කරන්න පුළුවන් වුණා නම්, අගමැතිතුමා අර්ජුන්

මහේන්ද්‍රන් උපදේශකයෙක් හැටියට ගත්තා කියලා ඒකට අගමැතිතුමා ගෙදර අරින්න ඕනෑද? මේ ගොල්ලන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේ කාරණාව සාධාරණීකරණය කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, තව විනාඩි තුනක කාලයක් පමණයි තිබෙන්නේ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, පුළුවන් නම් අපේ කථිකයන්ගෙන් විනාඩි 5ක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, වෙලාව කොච්චර දෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
තව විනාඩි 5ක් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
විශ්වාස භංගය ගෙනෙන්න කටයුතු කාරණා සෙව්වා. ඒකේ අවශ්‍යතාව මුලදීම කිව්වා. එක්කෙනෙක් කිව්වා, "අපි දිනුවත් දිනුම් -පැරදුණත් දිනුම්" කියලා. ඒක නොවෙයි සිද්ධ වුණේ. ඒක නිසා අපේ සමඟිය වැඩි වුණා; අපි තවත් ශක්තිමත් වුණා; අපේ අධිෂ්ඨානය වැඩි වුණා; තමුන්නාන්සේලා දුර්වල වුණා; තමුන්නාන්සේලාගේ අධිෂ්ඨානය කඩා ගෙන වැටුණා. දැන් වෙලා තිබෙන්නේ අපි පැරදුණත් දිනුම් - දිනුවත් දිනුම්. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඉස්සෙල්ලා එක්කෙනෙක් කිව්වේ අපි දිනුවත් පරාදයි- පැරදුණත් පරාදයි කියලා. අර භූතයාට ගිහිල්ලා ඒක නැවත කියන්න, මෙන්න මෙහෙම එකක් කියලා මම අදත් ඇන ගත්තා කියලා.

තමුන්නාන්සේලා අතීතයේ වෙච්ච දේවල් අමතක කරලා, අතීතයේ මේ රටට වෙච්ච හානිය අමතක කරලා තිබෙනවා. ඒ කාලයේ කට පියා ගෙන ඉඳලා, ඒ කාලයේ ආර්ථිකයට කරපු කොඩිච්චිනය, මුදල් අවභාවිත කරපු හැටි, රටේ හොරකම් කරපු හැටි, රුපියල් කෝටි ගණන්, රුපියල් මිලියන ගණන් වංචා කරපු හැටි අමතක කරලා තිබෙනවා. මා ළඟ දීර්ඝ ලැයිස්තුවක් තිබෙනවා. මට වෙලාව තිබුණොත් මම මේ ලැයිස්තුවේ සඳහන් දේවල් කියලා අවසන් කරනවා. ඒවා ගැන අමතක කරලා මේ රුපියල් බිලියන 10ක් අල්ලා ගෙන මෙච්චර උඩ පනින එක ගැන නම් මට පුදුමත් හිතෙනවා. ඇවන්ට් ගාර්ඩ් කේස් එකෙන් පමණක් ගෝඨාභය රාජපක්ෂ රුපියල් බිලියන 11ක් රටට අහිමි කළා. මෙතැන තිබෙන්නේ රුපියල් බිලියන 10යි.

එක මන්ත්‍රීවරයෙක් මොකක්ද ඒකට ඉස්සෙල්ලා කිව්වේ? මම ඒක ලියාගත්තා. අවස්ථාවික අලාභය කිව්වා. මේකේ අවස්ථාවික අලාභයක් තිබෙනවා නම් වැඩි වේවි. ගෝඨාභය රාජපක්ෂලා ඒ හොරකම් කරපු රුපියල් බිලියන 11ත් අවස්ථාවික අලාභයක් තිබෙනවා. ඒකත් ඉතා වේගයෙන් ඉහළට යන්න ඕනෑ. ඒ රජයට නැති වුණ සල්ලි. මම කාරණා එකක්, දෙකක්, තුනක් කියනවා තමුන්නාන්සේලාට නැවත මතක් කර දෙන්න.

තමුන්නාන්සේලාට මතක ඇති හෙජින් ගිවිසුම. හිටපු පාලකයා -නිවාඩ් කබ්රාල් කියලා ඉස්සෙල්ලා ගරු සභාවේ නමක් කියැ වුණා. ඒ කාලයේ අපි ඔහුට කිව්වේ, කේවට්ටයා කියලා. ඒ නමත් ඕනෑ නම් අරයාටම දා ගන්න පුළුවන්.- නිවාඩ් කබ්රාල්ලා එක්ක එකතු වෙලා හෙජින් ගිවිසුම අත්සන් කළා. බිලියන 76යි. හෙජින් ගිවිසුම නිසා බිලියන 76ක් මේ රටට නැති වුණා. ඒ කාලයේ මේගොල්ලෝ නිදාගෙන හිටියා. ඒ කාලේ ඒ පාලකයාට විරුද්ධව දෝෂාභියෝග ගෙනාවේ නැහැ. ඒ කාලයේ ඒ පාලකයාට විරුද්ධව දෝෂාභියෝග ගෙනාවා නම් ඒ ගෙනාපු එක්කෙනාගේ හිස නිල්වලා ගඟේ තියෙයි; කඳ කළු ගඟේ තියෙයි; බඩ වලවේ ගඟේ තියෙයි. එහෙම නම්, දේපළත් නැහැ; හිටපු තැනත් නැහැ; දරු පවුලත් නැහැ. ඒ වාගේ පරිසරයක් තමයි ඒ කාලයේ තිබුණේ. තමුන්නාන්සේලා ඒ කාලයේ කට පියාගෙන හිටියා. කථා කරන්න එක්කෙනෙකුටවත් කොන්ද පණ තිබුණේ නැහැ. ඒක තමයි යථාර්ථය. [බාධා කිරීම්] ඒ කාලේ එවැනි තත්ත්වයක් තිබුණේ.

ඊළඟට, Greek Bonds. [බාධා කිරීම්] අහ ගන්න. ඒ කාලයේ ග්‍රීසියේ ආර්ථිකය කඩා වැටිලා තිබුණේ. ලෝකයේ කිසිම කෙනෙක් ඒ ආර්ථිකයට සල්ලි ආයෝජනය කළේ නැහැ. ඒ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබුණේ. අපේ කබ්රාල්ලා, මහින්ද රාජපක්ෂලා එකතු වෙලා ගිහින් ඒකටත් දැම්මා බිලියන 7ක්. ඒ බිලියන 7න් ශතයක්වත් රටට ආවේ නැහැ. මේ රටේ අභිංසක ජනතාව ඒ පාඩුව දරා ගත්තා. මේ රටේ ජනතාවට ඒ මුදල් නැති වුණා. ඒ සියලුම දේ නිසා තමයි මේ රටේ ජනතාවට තුන්වේල කන්න නැති වුණේ; අපේ දරුවන්ට සියඹලායි බතුයි කන්න සිද්ධ වුණේ; අපේ සමහර දරුවන්ට කරවිල කාලා ජීවත් වෙන්න සිද්ධ වුණේ. එදා සමහර අම්මාවරු කන්න බොන්න දෙන්න විධියක් නැහැ කියලා දරුවන් බදාගෙන ළිංවලට පැන්නා. කන්න බොන්න දෙන්න විධියක් නැහැ කියලා, සමහර තාත්තලා දරුවන් නිල්වලා ගහට විසි කළා. ඒ කාලයේ තිබුණු ආර්ථික පරිහානිය නිසා තමයි එවැනි තත්ත්වයක් ඇති වුණේ. තමුන්නාන්සේලාට ඒවා අමතක වෙලා.

"රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 2,000කින් වැඩි කරනවා. අනේ හාමුදුරුවනේ, මට නම් දෙන්න පුළුවන් එච්චරයි" කියලා හාමුදුරුවන්ටත් ඒ පාලකයා බොරු කිව්වා. අපි රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවා කිව්වා. අපි ඒ පොරොන්දුව ඉෂ්ට කළා. අපි කවදාවත් බොරු පොරොන්දු දීලා නැහැ. රජයේ සේවකයා නහා සිටුවන්න, රටේ සාමාන්‍ය ජනතාවට ශක්තියක් දෙන්න, අපි එදාත් ප්‍රාර්ථනා කළා; එදාත් වැඩ කළා. අදත් වැඩ කරනවා. ඉදිරියටත් ප්‍රාර්ථනා කරනවා.

බෙල්ල වටේ රතු පාට සාඵකය දාගෙන ඉන්න තරුණ මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එයාගේ සල්ලි ඩුබායි රටේ ගිණුම්වල තිබෙන්නේ. ඩොලර් බිලියන ගණන් තිබෙනවා. ඒවාට අදාළ පරීක්ෂණ දැන් සිද්ධ වනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
තමුන්නාන්සේ මේ කථා වළක්වන්න හැදුවාට වැඩක් නැහැ. ඒ පරීක්ෂණ සිද්ධ වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, what is your point of Order?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මේ ගරු ඇමතිතුමා මේ සභාව නියෝජනය කරන සහ නොකරන පුද්ගලයින් පිළිබඳව ද්වේෂ සහගතව අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනවා. එයට ඉඩ දෙන්න එපා. මේ, ඡන්ද 5,000ක් අරගෙන ඇමතිකම ගත්ත

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඒවා කියන්න පුළුවන්. යනවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

යන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] මොකද කියන්න බැරි? වාඩි වෙනවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලජ්ජයිද? කරපු තක්කඩිකම් කියන කොට ලජ්ජයි තමයි. ඒ කරපු දේවල් කියන කොට ජනතාව අහගෙන ඉන්න නිසා, ඒවා හැන්සාඩ්ගත වන නිසා ලජ්ජයි තමයි. ඒවා කරන්න හොඳ නම් කියන්න බැරි ඇයි? පාර්ලිමේන්තුවේ කථා කිරීමේ නිදහස අපට තිබෙනවා. [බාධා කිරීම්] ඔය ගස් කපලා හොරකම් කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අතැන මෙතැන කැලෑ පාලු කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දැන් මෙතැන ඇවිත් කෑ ගැහුවාට අපව කවදාවත් නවත්වන්න බැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කථාව කරන්න. ඔබතුමාගේ වෙලාව ගත වෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඊළඟට, තමුන්නාන්සේලා දන්නවා සිල් රෙදි බෙදපු කථාව.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මෙතුමාට තව විනාඩි පහක් දෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
තමුන්නාන්සේලා දන්නවා, ලලිත් වීරතුංග සිරගත කළා. ඒ මොකද? රුපියල් මිලියන 600ක සිල් රෙදි බෙදලා. ඒවාට නියෝග දුන්න මිනිහා එළියේ; ලේකම්තුමා හිරේ. ඒ රුපියල් මිලියන 600 තුළ විශාල වංචාවක් සිදු වුණා. ඇත්තටම සිල් රෙද්දක මුදලට වඩා තුන් ගුණයක් වැඩියෙන් බිල් දාලා තමයි රුපියල් මිලියන 600ක් පෙන්වලා තිබෙන්නේ. සිල් රෙද්ද දීලා ඒකෙනුත් හොරකම් කළා. රුපියල් මිලියන 600න් මිලියන 400ක් හොරකම් කළා. ඉතුරු මිලියන 200න් සිල් රෙදි අරගෙන බෙදුවා. මේවා කළේ ජනතාවගේ සල්ලිවලින්. මේවාට විරුද්ධව ඒ කාලයේ කවුරුවත් කථා කළේ නැහැ. මොකද, ජීවිතයට තිබෙන ආශාව නිසා.

ඊළඟට, අපි දැක්කා ළිප් බෙදුව හැටි. ළිප් බෙදන්න රුපියල් මිලියන 200ක් වියදම් කළා. එදා ගරු සභාවේ හිටියා සාධකයක් දා ගත්ත ඒ පවුලේම කෙනෙක්. එයා රුපියල් මිලියන 200ක ළිප් බෙදුවා. [බාධා කිරීමක්] මේවා කියන කොට කොහේවත් ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තද වෙලා කෑ ගැහුවාට අපට කරන්න දෙයක් නැහැ. නියම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කෑ ගැහුවාට අපට කරන්න දෙයක් නැහැ. මේවා අහගෙන ඉන්න වනවා. මේවා කරන කොට කට පියාගෙන හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේවා කරන කොට සද්ද නැතුව හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේවා කියන කොට හිතේ අමාරුවට කෑ ගැහුවාට අපට කරන්න දෙයක් නැහැ.

ඊළඟ කාරණය මොකක්ද? අම්මාගෙයි, තාත්තාගෙයි සොහොන හදන්න රුපියල් මිලියන 90ක් හොරකම් කරපු කෙනෙක් තමයි තමුන්නාන්සේලාගේ අනාගත ජනාධිපති අපේක්ෂකයා. රුපියල් මිලියන 90ක් UDA එකෙන් හොරකම් කළා. තමුනාන්සේලාට අනාගත ජනාධිපති අපේක්ෂකයා කර ගන්න ඊට වඩා හොරකම් කරපු කෙනෙක් නැද්ද? [බාධා කිරීම්] තව හොඳට හොරකම් කරපු කෙනෙක් හොයා ගන්න ඕනෑ. [බාධා කිරීම්] ඇයි, අඩුවෙන් හොරකම් කරපු කෙනෙක් දා ගත්තේ? [බාධා කිරීම්]

ඊළඟට, රණවිරුවන් ගැන කථා කරනවා. අර කොනේ ඉන්න මන්ත්‍රීතුමා කිව්වා රණවිරුවන් දඩයම් කරනවා කියලා. රණවිරුවන් දඩයම් කරනවාය කියන්න තමුන්නාන්සේලාට ලජ්ජා නැද්ද? යුද්ධය කරපු හමුදාපති ගෙනිහිල්ලා හිරේ දැම්මා. [බාධා කිරීම්] ජනරාල්වරු දහ දෙනෙක් ගෙදර යැව්වා. බ්‍රිගේඩියර්ලා දහ දෙනෙක් ගෙදර යැව්වා. යුද්ධය කරපු හමුදා නිලධාරීන් 35 දෙනෙක් ගෙදර යැව්වා. දැන් මිනී මරපු හතර පස් දෙනෙක් අල්ලලා හිරේ දැම්මාම ඒක රණවිරු දඩයමක් නොවෙයි. රටේ නීතියට උඩින් යන්න කිසිම රණවිරුවෙකුට බැහැ. මොන තනතුරක් දැරුවත් මිනිහෙක් මැරුවා නම්, මානුෂීය අයිතිවාසිකම් කඩ කළා නම් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මීට පසුව නීතියට ගරු කරන්න ඉගෙන ගන්න. රණවිරුවන් වෙනුවෙන් කථා කරන්න තමුන්නාන්සේලාට අයිතියක් නැහැ. ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව චෝදනාවක් තිබෙනවා. මිග් යානා හතරක් ගත්තා. යුද්ධයට පාවිච්චි කරපු මිග් යානාවලින් පවා වංචා කළා. මිග් යානා හතරට ඇත්තටම ගියේ ඩොලර් මිලියන 7යි. බිල දමලා, හොර සමාගමකට ගෙවා තිබෙනවා, ඩොලර් මිලියන 14ක්. [බාධා කිරීම්] තමුන්නාන්සේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

වාගේ කෑ ගැහුවාට හොරකම් කරපු සල්ලි ගැන දැන් සාක්ෂි එකතු වෙලා තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් හෙට අනිද්දා නඩු පවරනවා. එතකොට අර කොහේ හරි ඉන්න කෙනෙක් අල්ලාගෙන ගිහිල්ලා, අත්අඩංගුවට ගන්න එපා කියලා අඩාවි. නමුත් ඉදිරියට අනිවාර්යයෙන්ම මේ නඩු ක්‍රියාත්මක වෙනවා. ඩොලර් මිලියන 7ක් කියන්නේ, මිලියන 1,000ක්; ලක්ෂ 10,000ක්. යුද්ධයට වෙන් කළ ඒ සල්ලි හොරකම් කළා නම්, ඒ වාගේ අය රණවිරුවන් ගැන කථා කරන්නේ කොහොමද? ඩොලර් මිලියන 7ක්! මේවා පොඩි දේවල් නොවෙයි. [බාධා කිරීම්]

ඊළඟට, රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අය දේශපාලන වැඩ කරන්න දැම්මා. ඒකෙන් රක්නා ආරක්ෂක ලංකා සමාගමට වුණු පාඩුව රුපියල් මිලියන 7යි. රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අය 2015 ජනවාරි මාසයේ පැවැති ජනාධිපතිවරණයේදී මැතිවරණ රාජකාරිවලට යෙදෙව්වා. ඒකෙන් රුපියල් මිලියන 7ක පාඩුවක් සිදු වුණා.

ඊළඟට, ඇවන්ට් ගාර්ඩ් සිද්ධිය. මේ රටේ පොඩි එකෙක් වුණත් ඒ ගැන දන්නවා. නැගිටලා කෑ ගැහුවාට වැඩක් නැහැ. ඇවන්ට් ගාර්ඩ් සිද්ධියෙන් වුණු පාඩුව බිලියන 11යි. ඇවන්ට් ගාර්ඩ් එකෙන් රටට නැති වුණු මුදල බිලියන 11යි. [බාධා කිරීම්] කට පියාගෙන අහගෙන ඉන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කෑ ගහනවා. පාඩුව බිලියන 11යි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා, කථාව අවසන් කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
බිලියන 11ක් කියන්නේ, මේ රටේ ජනතාවගේ සල්ලි; මේ රටට ලැබිය යුතු සල්ලි.

ඊළඟට, පසුගිය ජනාධිපතිවරණයේදී දැන්වීම් ප්‍රචාරය කරපු ඒවාට ITN එකට, රූපවාහිනී සංස්ථාවට මහින්ද රාජපක්ෂ නොගෙවපු මුදල මිලියන 110යි. ඒ නඩුව දැන් විභාග වෙනවා. ඒ වරදට අවුරුදු 20ක සිර දඬුවමක් විඳින්න ඕනෑ. එතකොට නායකයෙක් හොයා ගන්න වෙනවා. එතකොට අලුතින් කෙනෙක් හොයා ගන්න වෙනවා. එළියට එන්න හම්බ වෙන එකක් නැහැ. අවුරුදු 20ක සිර දඬුවමක් එයාට විඳින්න වෙනවා.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මෙතැන ඉන්න හැමෝම එක්ක යාළුයි. ආහාර ගන්න වෙලාවට එහෙම ඇවිල්ලා අපි එක්කත් කථා කරනවා. එතුමාටත් නඩුවක් තිබෙනවා, මිලියන 60ක වංචාවක් සම්බන්ධයෙන්. අපට ඒ ගැන ටිකක් කනගාටුයි. එතුමා අද උදේ අපේ පසු පෙළ මන්ත්‍රීවරු සමඟ එකතු වෙලා, "බලපං මචෝ මට වෙන දේ, හෙට මම කූඩුවේ දමන්නයි යන්නේ මචෝ" කියලා ඉතා කනගාටුවෙන් කිව්වා ලු. හැබැයි එහෙම කියනකොට මට තව එකක් මතක් වෙනවා. 2010 වසරේදී මම ඔය පැත්තේ ඔය ඉදිරි පේළියේ, එහා කොනේ ඉඳලා දෙවන පුටුවේ වාඩිවෙලා හිටියා. 2010 සැප්තැම්බර් 30 වන දා පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් වෙන්න කිට්ටුව, හවස 5.00ට විතර මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මගේ ඉස්සරහට ඇවිල්ලා හිටගෙන කිව්වා, "තව තත්ත්පර තිහයි පාර්ලිමේන්තුවේ ඉන්න හම්බ වෙන්නේ, ඊට පස්සේ වැලිකඩ" කියලා. එදා එහෙම කියපු එතුමා අද මේ පැත්තේ පසු පෙළ මන්ත්‍රීවරුන්ට ඇවිල්ලා "බලපං මචෝ මටත් හෙට කූඩුවට යන්න වෙනවා" කියා කිව්වාම, ඒක දෛවයේ සරදමක්ද කියලා මට හිතුණා. එදා එතුමා එහෙම හිතුවේ නැහැ. කවදාවත් මේ තත්ත්වය ඇති වෙයි කියලා හිතුවේ නැහැ. අපි ඇත්තටම ඒ ගැන කනගාටු වෙනවා. එතුමා කූඩුවට යනවා නම් අපි කනගාටු වෙනවා. නමුත් එදා එතුමා එහෙම කිව්වේ මට සමව්වලයට. තමුන්නාන්සේලා ගිහිල්ලා එතුමාට ඒ ගැන කිව්වොත්, එතුමාට මතක් වෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අමතරව ලබා දුන් කාලයත් දැන් අවසන් වෙමින් පවතිනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
මට තව විනාඩි පහක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, මෙතුමාට තව වෙලාව ලබා දෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එතුමාට තව විනාඩි තුනක කාලයක් ලබා දෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා මේ සභාවේ ඉතා ආඩම්බරයෙන් කෑ ගැහුවා; දූෂණය ගැන කථා කළා.

එතුමාට විරුද්ධව තිබෙන චෝදනා එතුමාට අමතක වෙලා. මධ්‍යම පන්තියේ ජනතාවට හදපු ගෙවල් එතුමා ඥාතීන්ට බෙදලා දුන්නේ කොහොමද? මිත්‍රයන්ට බෙදලා දුන්නේ කොහොමද? රජයේ වාහන 42ක් පාවිච්චි කළේ කොහොමද? එතුමාට ඒවා අමතක වෙලා මෙතැනට ඇවිල්ලා කථා කරනවා. එතුමා කථා කළේ නම්, ඊට වඩා සුද්දෙක් මේ රටේ නැහැ වාගේයි. ලජ්ජා නැද්ද දන්නේ නැහැ. ඒ කරපු දේවල් හැම වෙලාවේම මනසේ හොල්මං කරනවා ඇති. තමුන්නාන්සේලාත් ඒ වාගේ මිනිස්සු කථා කරන කොට අත්පුඩි ගහනවා; කෑ ගහනවා. ඒ ගොල්ලන් කරන වැරදි තමුන්නාන්සේලාට පෙනෙන්නේ නැද්ද? එහෙම වංචා කළේ ජනතාවගේ සල්ලි. මහින්ද රාජපක්ෂ කියන හිටපු පාලකයාගේ vehicle fleet එකේ වාහන 1,200ක් තිබුණා; වාහන 1,200ක් පාවිච්චි කළා. අද්දැක්කා එයින් වාහන 300ක් ආ ගිය අතක් නැහැ. ඒවා කරන කොට විශ්වාස භංග යෝජනා ගෙනෙන්න තමුන්නාන්සේලාට නිතුණේ නැහැ! ඒවා ජනතාවගේ සල්ලි.

ඒක තමුන්නාන්සේලා දැන ගන්න. ඇමති කෙනෙකු හැටියට මට තවම තිබෙන්නේ එක වාහනයයි. මට ඒ වාහනයත් හම්බ වුණේ ඇමති පුටුවේ මාස 10ක් හිටියාට පස්සේයි. මාස 10ක් මම ගියේ මගේ පෞද්ගලික වාහනයේ. තමුන්නාන්සේලා එතැන හිටියා නම්,- [ඝෝෂා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
සොයිසා මන්ත්‍රීතුමා වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

[ඝෝෂා කිරීම්] අර මොනරාගල කැලෑ ටික ඔක්කෝම කාලා මෙතැනට ඇවිල්ලා කෑ ගහනවා. මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

මේ පාර්ලිමේන්තුවට ආපු එක ගැන අපි ලජ්ජා වෙනවා. [ඝෝෂා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

[ඝෝෂා කිරීම්] නමටත් ලජ්ජයි. සාමාන්‍යයෙන් 'සොයිසලා' කියන්නේ දකුණේ ඉන්න හොඳ චණ්ඩියෝ; හොඳ නිර්භීත මිනිස්සු. හැබැයි, හොරකම් කරන්නේ නැහැ. [ඝෝෂා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

කරලාමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Minister, please go ahead.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
සාමාන්‍යයෙන්, දකුණේ නම් 'සොයිසලා' කියන්නේ හොඳ පිරිසිදු මිනිස්සු. ඒ අය චණ්ඩියෝ වාගේ ඉන්නවා; චරිතය පිරිසිදුයි; කෙළින් කථා කරනවා. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

ඒ පැත්තේ නම් නැහැ.

ගරු කථානායකතුමනි, හමුදා මූලස්ථානය ගැන කියලා මම කථාව අවසන් කරනවා. සාතන ගැන කියන්න යන්නේ නැහැ. හිරගෙදර සාතන ගැන, දේශපාලනඥයන් සාතනය කරපු හැටි, රවිරාජ්ලා සාතනය කරපු හැටි, මාධ්‍යවේදීන් සාතනය කරපු හැටි කියන්නේ නැතිව මම මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්.

හමුදා මූලස්ථානයේ ඉඩම විකුණලා, එයින් ගත්ත කොමිස් අර රතුපාට බෙල්ලේ මාලය දමාගෙන හිටපු තරුණ මන්ත්‍රීවරයාගේ Cosmos Bank Account වලට, CSN Account වලට, Amtrad Accountවලට වැටුණු හැටි තමුන්නාන්සේලාට ඉදිරියේදී දැනගන්න පුළුවන් වේවි. ඒක අවුරුදු හැත්තෑවක් පරණ මූලස්ථානයක්. අපි ඒක පණ මෙන් ආරක්ෂා කර ගත්තා. අපේ අභිමානය, හමුදාවේ ගෞරවය ආරක්ෂා වන විධියට පණ දීලායි අපි ඒ ස්ථානය ආරක්ෂා කර ගත්තේ. ඒ පාලකයා ඒකත් විකුණලා කොමිස් ගැහුවා. අද්දැක්කා හමුදා මූලස්ථානය කොළඹ කුලියට ගත්ත ගොඩනැඟිලිවලයි තිබෙන්නේ; හමුදා මූලස්ථානයක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
මුදින ජයකොඩි කියලා තව 'කකුලක්' හිටියා. මල්වානෙන් රුපියල් මිලියන 200ක විතර ගෙයක් අරගෙන ඔහුගේ නමට ලියා ගත්තා. ඒ පුද්ගලයා බැසිල් රාජපක්ෂගේ ගෝලයෙක්. ඔහු තමයි අලුතෙන් හදන හමුදා මූලස්ථානයේ Architect. ඒ හමුදා මූලස්ථානයේ Architect හැටියට ඔහුට ගෙවලා තිබෙනවා රුපියල් කෝටි 32ක්! ගෝඨාභය රාජපක්ෂගේ ඥාති සහෝදරයා. [ඝෝෂා කිරීම්] මේවා ටෙන්ඩර් දීලා නොවෙයි කළේ. මේවාට විශ්වාස භංග ගෙනෙන්න නොවෙයි තිබෙන්නේ. කකුල් දෙකෙන් එල්ලන්න වටින වැඩ ඒවා. ඒ වාගේ අපරාධ කරලා

තමුන්නාන්සේලා මේ සභාවට ඇවිල්ලා ඒ නායකයා ඔළුවේ තියා ගෙන තමයි කෑ ගහන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
හොඳයි, ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න. බොහොම ස්තුතියි.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ඉඩම් හා ප්‍රජා විෂයන් පිළිබඳ ඇමතිතුමා)
(Minister of Lands and Community Affairs)
රුපියල් කෝටි 32ක් Architect ඥානි සහෝදරයාට ගෙවිවේ ටෙන්ඩර් මොනවත් නැතිවයි.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්ඩලික සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාව ගැන සාකච්ඡා වන අවස්ථාවේ,- [බාධා කිරීමක්]

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(මාණ්ඩලික සනත් නිසාන්ත පෙරේරා)
(The Hon. Sanath Nishantha Perera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ගේ point of Order එක මොකක්ද?

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(මාණ්ඩලික සනත් නිසාන්ත පෙරේරා)
(The Hon. Sanath Nishantha Perera)
ගරු කථානායකතුමනි, අපේ හිටපු හමුදාපතිතුමා බොහොම අශීලාචාර විධියට මේ සභාවේ නැති මන්ත්‍රීවරු,- [ඝෝෂා කිරීම්] පොඩ්ඩක් ඉන්න. [ඝෝෂා කිරීම්] මේ සභාවේ නැති මන්ත්‍රීවරු, හිටපු ජනාධිපතිතුමා, ඒ වාගේම අපේ හිටපු ආරක්ෂක ලේකම්තුමා ගැන නරක විධියට කථා කළා. ඒ සියලු කාරණා, ඒ වැරදි වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා කාරුණිකව ඉල්ලනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
හොඳයි, ඒක මම දැනුම් දෙන්නම්.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ඉඩම් හා ප්‍රජා විෂයන් පිළිබඳ ඇමතිතුමා)
(Minister of Lands and Community Affairs)
ගරු කථානායකතුමනි, මෙතුමාගේ ශීලාචාරකම ගැන පුත්තලමේ සියලු ජනතාව දන්නවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
හොඳයි, - [ඝෝෂා කිරීම්] වාඩිවෙන්න. [ඝෝෂා කිරීම්] අපි ඉවර කරමු.

ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමා කථාව පටන් ගන්න. [ඝෝෂා කිරීම්]

Order, please! කථා කරන්න අවස්ථාව දෙන්න. [ඝෝෂා කිරීම්] ගරු ගජදීර මන්ත්‍රීතුමා. [ඝෝෂා කිරීම්]

[අ.භා. 4.33]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්ඩලික සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමා සිය කථාවේ දී සඳහන් කළා, මේ විශ්වාසභංග යෝජනාව එතුමන්ලාව වඩාත් ශක්තිමත් කළ, ගරු අගමැතිතුමාගේ ශක්තිය තවත් පිළිබිඹු කළ විශ්වාසභංග යෝජනාවක්ය කියන එක. ගරු කථානායකතුමනි, මම එක කාරණයක් කියන්න කැමැතියි. ඒකාබද්ධ විපක්ෂයේ අපි මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළේ අපට තිබෙන වරප්‍රසාදයක් හැටියටයි. ඒක අපට තිබෙන අයිතියක්. මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට එම ජනතාවගේ සිතුම් පැතුම් මේ පාර්ලිමේන්තුව තුළ පිළිබිඹු කෙරෙන එක අවස්ථාවක් තමයි මේ විශ්වාසභංග යෝජනාව. මේ විශ්වාසභංග යෝජනාව ගැන ඒකාබද්ධ විපක්ෂය කථා කරනවා වාගේම එක්සත් ජාතික පක්ෂයේ අය අපට වඩා වේගයෙන් අග්‍රාමාත්‍යවරයා එම තනතුරෙන් ඉවත් කළ යුතුය කියලා මේ රට හමුවේ කියා සිටියා. නමුත් ඒක පාර්ලිමේන්තුවට ගෙනාවේ නැහැ. රටට කියා සිටියා. එම නිසා රටේ තිබෙන පොදු මහජන මතය තමයි අද මේ පාර්ලිමේන්තුවේ පිළිබිඹු වෙන්නේ කියන එක ඉතා පැහැදිලියි.

ගරු කථානායකතුමනි, අගමැතිවරයා තව දුරටත් එම ධුරයේ තියා ගත්තත්, යැවිවත් එය අපට අදාළ දෙයක් නොවෙයි. සාධාරණ කරුණු කිහිපයක් පදනම් කරගෙන තමයි අපි පාර්ලිමේන්තුවට මේ විශ්වාසභංග යෝජනාව ගෙනාවේ. පසු ගිය කාලයේ බැදුම්කර සිද්ධියට අදාළව ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයාත් වග කිවයුතුය කියන අදහස ජනතාව තුළ තිබුණා. එම පදනම මත මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව රටේ ජනතාවගේ විශාල උනන්දුවක් තිබුණා. යහපාලන ආණ්ඩුව රටේ ජනතාවට දුන් ප්‍රතිඥා උල්ලංඝනය කරමින් ජනතා පරමාධිපත්‍යයට පිටු පා මේ රටේ සූළුතරයක් වූ ධනපති පන්තිය ශක්තිමත් කරන ක්‍රමවේදයක් ඉස්සරහට ගෙනයන්නට කටයුතු කරනවා. මෙහෙම ආණ්ඩුවක්, මෙහෙම නායකයෙක් තව දුරටත් තියා ගත යුතුද කියන කාරණය පදනම් කරගෙන තමයි අපි මේ විශ්වාසභංග යෝජනාවට අත්සන් කළේ. අපට අග්‍රාමාත්‍යවරයාත් එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. මේ විශ්වාසභංග යෝජනාව තුළ තිබෙන්නේ ප්‍රතිපත්තිමය කරුණු. මහ බැංකුවේ මූල්‍යමය ස්ථාවය සිදුවීම මේ රටේ ආර්ථිකයට කොතෙක් බලපෑවාද? මේ රටේ ජනතාවගේ තිබෙන විශ්වාසය, ජාත්‍යන්තර වශයෙන් අපේ බැංකු පද්ධතිය -මහ බැංකුව- කෙරෙහි තිබෙන විශ්වාසය සම්පූර්ණයෙන්ම පළුදු වන තත්ත්වයක් පසු ගිය කාලයේ එම වංචනික ක්‍රියාව විසින් ඉස්මතු කළා.

ගරු කථානායකතුමනි, මීට කලින් ගරු මහින්දානන්ද මන්ත්‍රීතුමා යම් ප්‍රකාශයක් කළා. මම එය යළි කියන්න යන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමා දිවුරුම් දුන් අවස්ථාවේම ගරු රනිල්

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා හැටියට දිවුරුම් දුන්නා. දිවුරුම් දී කැබිනට් මණ්ඩලය පත් කර, එම විෂයයන් වෙන් කරනකොට මහ බැංකුව එතුමාගේ විෂය යටතට ගත්තා. එතුමාට තිබුණු විෂය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳවයි. එම අමාත්‍යාංශයේ තමයි එතුමා වග කීම් දැරුවේ. නමුත් මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන මහ බැංකුව එම අමාත්‍යාංශය යටතට ගන්න කිසිම ඕනෑකමක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම එය අපේ රටේ මූල්‍ය නීතියටත් පටහැනියි. Monetary Act එක යටතේ මහ බැංකුව තිබෙන්නට ඕනෑ මුදල් අමාත්‍යාංශය යටතේයි. මුදල් අමාත්‍යාංශයෙන් වෙන් කර, ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතට මහ බැංකුව අරගෙන විදේශිකයෙක් ඒ මහ බැංකුවේ අධිපතිවරයා හැටියට පත් කර, ඔහු පිළිබඳ විශ්වාසයක් රටේ ජනතාවට දීලා, මේ බැඳුම්කර වංචාවෙන් රටට සිදු කළ මහා දැවැන්ත ආර්ථික හානිය; ඒ ක්‍රියාදාමය පිළිබඳව අග්‍රාමාත්‍යවරයාට වග කීමක් නැද්ද කියා අපි අහනවා.

අපි මේක අහන්නේ කාගෙන්ද? ඩිව් ගුණසේකර මැතිතුමා නායකත්වය දුන් COPE එකේ ඉඳලා මේ වංචාව පිළිබඳව කරන ලද විමර්ශන වාර්තා පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කරන්න පෙර ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ මේ නිසායි. මේ සිද්ධිය යටපත් කරන්න දෙවනුව පිටිපන කමිටුව පත් කළා. පිටිපන කමිටුව තුන් මාසයක් මේ සම්බන්ධයෙන් විමර්ශනය කරලා ඊට පස්සේ කියනවා, "මෙය දිගට විමර්ශනය කිරීමේ බලයක් අපට නැහැ"යි කියලා. ඊට පස්සේ තමයි සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමාගේ නායකත්වයෙන් නැවත COPE එක පත්වන්නේ. මේ කමිටුව කරන ලද විමර්ශනයන්ගෙන් අනතුරුව ඇත්ත වශයෙන්ම මෙය ඉදිරියට යෑම වළක්වන්න ගරු අගමැතිතුමා උත්සාහ කළා. අපි මේක නීතිපතිවරයාට යොමු කරලා තිබෙනවා, එම නිසා නෛතික සාධාරණත්වයක් එතැනින් ඉෂ්ට වෙයි කියන අදහස එතුමා මේ පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කළා. ඒ ගැන විශ්වාසයක් නැති නිසා තමයි බොහෝ දේශපාලන පක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියා සිටියේ "නැහැ, විශේෂ ජනාධිපති කොමිසමකින් මෙය විමර්ශනය කරන්න ඕනෑ, මූල්‍ය අපරාධකරුවන්ට දඬුවම් දෙන්න ඕනෑ"යි කියලා. මේ සම්බන්ධයෙන් විමර්ශනය කළ මීට පෙර COPE එකේ සභාපතිවරයා හැටියට කටයුතු කළ ඩිව් ගුණසේකර මැතිතුමා පුවත් පත් සාකච්ඡාවක් පවත්වා කිව්වා, "මම දින 11ක් ඇතුළත සාක්ෂි 42ක් විමර්ශනය කරලා හදපු මේ වාර්තාව අනුව මෙහි වංචනික ස්වභාවයක් තිබෙන බව ඉතාම පැහැදිලියි, මෙවැනි වංචාවන් සිදුවනවා නම් මේ රටේ මූල්‍ය ප්‍රතිපත්තිය, ඒ වාගේම ආර්ථික පදනම ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ නැහැ. එම නිසා මේවා වහාම හෙළිදරව් කළ යුතුයි, මේ මූල්‍ය අපරාධකරුවන්ට දඬුවම් දිය යුතුයි" කියලා. මේ කොමිසම පත් කළේ ඒ පදනම මතයි.

ගරු කථානායකතුමනි, එලෙස පත් කරපු කොමිසමෙන් අද මේ සියල්ල අනාවරණය වෙලා අවසන්. මහ බැංකු අධිපතිවරයා තමන්ගේ පවුලේම බෑනාට අතිවිශාල ලාභයක් ලබන්න මහ බැංකුව හසුරවපු ආකාරය අද එම ජනාධිපති කොමිසමෙන් හෙළිදරව් වෙලා තිබෙනවා. ජනාධිපති කොමිසමේ වාර්තාවේ තිබෙන විධියට රුපියල් මිලියන 300කින් ආරම්භ කරපු පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම රුපියල් මිලියන 12,000ක -බිලියන 12ක- ශුද්ධ ලාභයක් වසරක් ඇතුළත ලබා තිබෙනවා. එවැනි ශුද්ධ ලාභයක් ලැබුවේ කොහොමද කියන එක පිළිබඳව විමර්ශනය කරන කොට පැහැදිලි වුණු දෙයක් තමයි, මහ බැංකුවේ නිලධාරීන්ගෙන් ලබා ගත් තොරතුරු පදනම් කර ගෙනයි මේ අතිවිශාල ධනස්කන්ධයක හිමිකරුවන් බවට පත් වුණේ කියන කාරණය. එම නිසා එක පුද්ගලයෙකු, දෙදෙනෙකු මේ රටේ ජාතික ධනය කොල්ල කද්දි, ඇත්ත වශයෙන්ම ඒ වෙලාවේ දිවත් මේ විමර්ශනය කරලා අවසාන වන තෙක් මහ බැංකුව තමන්ගේ අමාත්‍යාංශයෙන් වෙන් කරන්න ගරු අගමැතිතුමාට පුළුවන්කම තිබුණා. නමුත්, ගරු ජනාධිපතිතුමා මහ බැංකුව එම අමාත්‍යාංශයෙන් ගලවා මුදල් අමාත්‍යාංශයට භාර දෙන තෙක් එවැනි ප්‍රතිපත්තිමය තීන්දුවකට එන්න අගමැතිතුමාට ඍජුකමක් තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා ප්‍රතිපත්ති විරෝධී විධියට, මූල්‍ය අණ පනත්වලට පරිබාහිරව මධ්‍යම බැංකුව තමන්ගේ අතට අරගෙන තමන්ගේ ආසන්න හිතවතෙකු මහ බැංකුවේ අධිපති ධුරයට පත් කිරීම සම්බන්ධයෙන් අපට සැකයක් ඇති වන්නේ නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, අපේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සුවිශේෂ බුද්ධිමතුන් විශාල පිරිසක් ඉන්නවා. ආර්ථික විද්‍යාඥයෝ, ඒ වාගේම සියලු ක්ෂේත්‍ර ගැන අවබෝධයක් තිබෙන අය ඉන්නවා. ඒ අයට වගකීම් භාර නොදී, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාට ඒ වගකීම් භාර දුන්නා. මේ රට මහා ආර්ථික ප්‍රපාතයකට වැටී තිබෙන අවධියේ, අපේ රට විශාල ණය ගොන්නකට මුහුණ දීලා තිබෙන වේලාවේ, ඇති නැති පරතරය වර්ධනය වෙලා තිබෙන වේලාවේ - එතුමාගේම ඉදිරි දැක්මේ කියනවා, අපේ රටේ සියයට 25ක් සමෘද්ධි ප්‍රතිලාභීන් ඉන්නවාය කියලා- එක ධනපතියකු වෙනුවෙන් ක්‍රියා කරන්න ඉඩ කඩ ලබා දීම නිසා ගරු අගමැතිතුමාට අපේ විශ්වාසය ලබා ගත හැකිද? මෙය මේ රටේ මූල්‍ය අර්බුදය වර්ධනය කරන්න, ඒ වාගේම අපේ රටේ රුපියලේ අගය බාල්දු කරන්න හේතු වනවාය කියලා මා කියන්න කැමැතියි. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අද රුපියලේ අගය අඩු වෙලා තිබෙනවා. අද ඇමෙරිකානු ඩොලරයක් රුපියල් 157ක් පමණ වෙනවා. රුපියල ඒ මට්ටමට බාල්දු වුණේ, අද ජීවන බර වැඩි වෙලා තිබෙන්නේ, මේ මූල්‍ය අවදානම නිසායි. එහෙම නැතිව මේවාට බලපෑවේ ජාත්‍යන්තර සාධකම නොවෙයි. රටේ මූල්‍ය කළමනාකරණය කරන්නත්, නිසි ලෙස බැංකුවලට උපදෙස් ලබා දෙන්නත්, අපේ රටේ මූල්‍ය ක්‍රමය සහ අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නත් ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලබා දීමට තිබෙන අවස්ථාවක තමන් ආරක්ෂා වෙන්න, තමන්ගේ ධනය ගොඩ ගහගන්න උත්සාහ කරන බලයක් ගොනු කිරීම ම රටේ අග්‍රාමාත්‍යවරයෙකුට ගැළපෙන ක්‍රියාවක් නොවෙයි කියලායි මා හිතන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්.

මේ රටේ යහ පාලනය ගැන අවබෝධයක් තිබියදීත්, රටේ ආර්ථිකයේ අවදානම පිළිබඳ වැටහීමක් තිබියදීත් ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කන්න කොල්ලකරුවන්ට භාර දීම වදුරන්ට දැළි පිහිය දුන්නා වගෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු රාජිත ඇමතිතුමාත් ඒ වෙලාවේ එයට විරුද්ධ වුණා. තමන්ගේම පාර්ශ්වයේ ඇතැම් අයගේ අදහස් නොසලකා ඒකපුද්ගලව හැසිරෙමින් ක්‍රියා කරපු අගමැතිවරයකු කෙරෙහි අපි විශ්වාසය තබන්නේ කොහොමද? එහෙම විශ්වාසය තබන්න බැරි නිසා මේ රටේ ජනතාවගේ අපේක්ෂා ඉදිරියට ගෙන යෑම සඳහා තමයි අපි මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරන්න කටයුතු කළේ කියන කාරණය මේ වේලාවේ සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Mylvaganam Thilakarajah. You have five minutes.

[பி.ப. 4.48]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ சபாநாயகர் அவர்களே, வரலாற்று முக்கியத்துவம் வாய்ந்த, பிரதமர் மீதான இந்த நம்பிக்கையில்லாப் பிரேரணையின்மீது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்தப் பிரேரணை பிரதமர் மீதானதாக இருந்தாலும், இதில் பிரதான பேசுபொருளாக இருப்பது பிணைமுறி விவகாரம் ஆகும். இதனை விசாரிப்பதற்காக நியமிக்கப்பட்ட ஜனாதிபதி ஆணைக்குழு அதன் அறிக்கையிலே 2015ஆம் ஆண்டு நடைபெற்ற பிணைமுறி விவகாரம் தொடர்பாக மாத்திரம் அறிக்கையிடவில்லை. 2008ஆம் ஆண்டிலிருந்தே இந்த நாட்டில் பிணைமுறி மோசடி இடம்பெற்றிருப்பதாகவும் அழுத்தமாகச் சொல்லியிருக்கின்றது. இருந்தபோதும், கூட்டு எதிரணியினர் தாங்கள் ஆட்சி செய்த 2008ஆம் ஆண்டிலிருந்து பிணைமுறி மோசடி இடம்பெற்றிருக்கின்றது என்பதை மறந்து, இந்த நல்லாட்சிக் காலத்தில் மாத்திரம்தான் அவை இடம்பெற்றதாக நினைத்துக்கொண்டு பேசிவருகின்றார்கள். இந்தப் பிணைமுறி விவகாரம் கடந்த காலங்களில் மக்களிடையே பல சந்தர்ப்பங்களில் பலவிதமாகப் பேசப்பட்டு வந்தபோது நாங்கள் பிரதிநிதித்துவம் வகிக்கின்ற மலையகப் பெருந்தோட்டப் பகுதிகளிலே இன்னொரு விடயம் விஸ்வரூபம் எடுத்தது. அதாவது, தொழிலாளர்களின் ஊழியர் சேமலாப நிதியத்தை - EPF ஐ முழுமையாக யானை விழுங்கிவிட்டது என்பதாக கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின்போது பரவலாகப் பேசப்பட்டது. அப்படியாயின், 2008ஆம் ஆண்டிலிருந்தே அது நடந்திருக்க வேண்டும். ஆகவே, அப்போதிருந்த அரசாங்கமும் அதற்குப் பொறுப்புக்கூற வேண்டும் என்ற வகையில், பொதுவாகப் பேசப்பட்டுவந்த பிணைமுறி விவகாரம், அரசியல் இலாபங்களுக்காகவும் அவ்வப்போது பேசப்பட்டு வந்திருக்கின்றது. இந்தச் சபையிலே அதனை முன்னிறுத்தி உரையாற்றிய கௌரவ உறுப்பினர் மஹிந்தானந்த அலுத்கமகே, ஐக்கிய தேசியக் கட்சி அல்லது ஐக்கிய தேசிய முன்னணியானது, எங்களுடைய தமிழ் முற்போக்குக் கூட்டணி அல்லது தொழிலாளர் தேசிய முன்னணி சார்ந்தவர்களுக்குத் துரோகமிழைத்துவிட்டதாகக் குறை கூறினார். அதேநேரம் தொண்டமான் அவர்கள் நுவரெலியா மாவட்டத்தின் பல பிரதேச சபைகளையும் கைப்பற்றிவிட்டதாகவும் கூறினார். ஆனால், 2008ஆம் ஆண்டில் பிணைமுறி மோசடி இடம்பெற்ற காலப்பகுதியிலே, இதே மஹிந்தானந்த அலுத்கமகேதான் கௌரவ ஆறுமுகன் தொண்டமான் அவர்களைக் கண்டி மாவட்டத்திற்கு வரவிடாமல் விரட்டியவர் என்பதையும் நாங்கள் ஞாபகப்படுத்த வேண்டியிருக்கின்றது.

கௌரவ பிரதமர் அவர்களுக்கெதிராகக் கொண்டுவரப் பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணையை, ஐக்கிய தேசிய முன்னணியூடாக வந்த நாங்கள் இன்று எதிர்த்து வாக்களிக்கத் தயாராகியிருக்கின்றோம். பெருந்தோட்ட மக்களை அடையாளப்படுத்தி, அவர்களின் முன்னேற்றத்திற்கென அமைக்கப்பட்டிருந்த தோட்ட உட்கட்டமைப்பு அமைச்சைக் கடந்த கால அரசாங்கம்தான் இல்லாமலாக்கியது. ஆனால், இந்த நல்லாட்சி அரசாங்கத்திலே, குறிப்பாக பிரதமர் அவர்கள் தோட்டம் என்ற பதத்தை நீக்கி, மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு என்கின்ற ஓர் அமைச்சை உருவாக்கியதன்மூலமாக எமது மக்களின் அடிப்படைத் தேவைகளான வீடமைப்பு முதல் உட்கட்டமைப்பு வசதிகள் வரையில் அபிவிருத்தி செய்வதற்குத் தன்னால் இயன்றளவு பங்களிப்பைச் செய்து, இல்லாமலாக்கிய அந்த அமைச்சினை மீளவும் பெற்றுக்கொடுத்திருக்கின்றார் என்பதனை நாங்கள் நன்றியுடன் நினைவுபடுத்த வேண்டியிருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
அந்த அமைச்சினை உருவாக்கியது மாத்திரமல்லாமல், பிரதேச சபைகளின் அதிகரிப்பு, அதிகாரசபை உருவாக்கம் போன்ற விடயங்களை நிறைவேற்றுவது சம்பந்தமாக நாங்கள் பல்வேறு முயற்சிகளை எடுக்கின்றபோதெல்லாம் அவர் பிரதமர் என்ற நிலையிலிருந்து எங்களுக்கு வழங்கியிருக்கும் அங்கீகாரத்திற்கும் வாய்ப்புகளுக்கும் நன்றி செலுத்துமுகமாக நாங்கள் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்த இருக்கின்றோம். அதாவது, நன்றியுணர்வோடு அவருக்கு எதிராகக் கொண்டுவரப்பட்டிருக்கின்ற நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர்த்து, அவருக்கு ஆதரவாக வாக்களிக்கத் தீர்மானித்திருக்கின்றோம். அதே சந்தர்ப்பத்தில், ஐக்கிய தேசிய முன்னணியில் இணைந்திருக்கும் சக கட்சிகளை அரவணைத்துச் செல்லக்கூடிய விதத்தில் ஐக்கிய தேசியக் கட்சியின் தலைவர் என்ற வகையிலே அவர் அக்கட்சியில் மாற்றங்களைச் செய்து அதில் கூட்டணிக் கலாசாரத்தைக் கொண்டுவர வேண்டும். அந்தவகையில், கூட்டணிக் கலாசாரத்தின் உண்மை உணரப்பட வேண்டும். அதனடிப் படையில் செயற்பட்டால்தான் எதிர்காலத்தில் தொடர்ச்சியாக எங்களுக்கு ஐக்கிய தேசிய முன்னணியோடு இணைந்து செயற்பட முடியும் என்பதையும் நாங்கள் தெளிவாகக் கூறியிருக்கின்றோம். இந்த நம்பிக்கையில்லாப் பிரேரணையை இத்தகைய தெளிவுபடுத்தல்களோடுதான் நாங்கள் எதிர்கொள்கின்றோம். அவ்வாறில்லாமல், மலையக மக்களுக்கு இருந்த அமைச்சை இல்லாமலாக்கிய -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up now.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
இன்று மஹிந்த ஒரு கண் என்றும் மைத்திரி ஒரு கண் என்றும் சொல்பவர்கள் கடந்த வாரங்களில் பிரதேச சபைகளின் ஆட்சியைக் கைப்பற்றுவதற்காக ரணில் விக்கிரமசிங்க அவர்களை இன்னுமொரு கண்ணாக ஏற்றுக்கொள்வதற்கும் தயாரானார்கள். அதாவது, பிரதேச சபைகளைத் தம்வசமாக்குவதற்கு கண்பார்வை குறைந்த தொழிலாளர்களை அவர்கள் கண்மூடித்தனமாகத் தாக்குகின்ற அளவுக்கு நடந்துகொண்டார்கள். ஆனால், நாங்கள் அவர்களைப் போன்று கொள்கையற்றவர்களாகச் செயற்படாமல் நிதானமாகச் சிந்தித்து, இந்த நம்பிக் கையில்லாப் பிரேரணைக்கு எதிராக வாக்களித்துப் பிரதமர் அவர்களுக்கு எமது ஆதரவைத் தெரிவிக்க இருக்கின்றோம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.54]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, ගරු කථානායකතුමනි. බුදු රජාණන් වහන්සේගේ දේශනා ඇතුළත් "ධම්ම පදය" ග්‍රන්ථයේ එක ගාථාවක් ඉදිරිපත් කරමින් මා මගේ කථාව ආරම්භ කරන්නම්.

"අක්කොධෙන ජිනේ කොධං - අසාධුං සාධුනා ජිනෙ
ජිනේ කදරියං දානෙන - සච්චෙන අලිකවාදිනං"

එහි තේරුම වන්නේ, "ක්‍රෝධ කරන තැනැත්තා ක්‍රෝධ නොකිරීමෙන් දිනන්නේය, අසත්පුරුෂයා සත්පුරුෂකමින් දිනන්නේය, මසුරු තැනැත්තා දන් දීමෙන් දිනන්නේය, බොරු කියන්නා සත්‍යයෙන් දිනන්නේය" යන්නයි. මේක තමයි, බුදු රජාණන් වහන්සේ දේශනා කරපු දිනන ක්‍රමය. අද අපි මේ විශ්වාස භංග යෝජනාවට මුහුණ දෙන්නේත් මේ ක්‍රමය පදනම් කරගෙනයි. මොකද, අපට බොරු කියලා, සත්‍ය වසන් කරලා, ක්‍රෝධයෙන්, වෛරයෙන් මේ විශ්වාස භංග යෝජනාව දිනන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවේ නීතිය හා සාමය පිළිබඳව අගමැතිතුමාට චෝදනාවක් තිබෙනවා. පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරුන්ගෙන් මම අහන්නේ මෙයයි. එදා දිගන ඇති වුණු සිද්ධිය සම්බන්ධව පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලද අය අතර පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඉන්නවා. එක මන්ත්‍රීවරයෙක් ගාමිණී රාජපක්ෂ, අනෙක් මන්ත්‍රීවරයා අරලිය හෝටලයේ අයිතිකරු සමන්ත කියන අය. මේ දෙදෙනාම සම්බන්ධ වුණු බවට සාක්ෂි සහ වීඩියෝ දර්ශන තිබෙනවා. එම නිසා අත් අඩංගුවට අරගෙන තියාගෙන සිටිනවා. තව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් ගැන පොලීසිය විමර්ශනය කරලා අත් අඩංගුවට ගන්න සොයාගෙන යනවා. නමුත්, ඔවුන් මේ වෙලාවේ හැංගිලා තමයි ඉන්නේ. ඒ තුන්දෙනා තමයි පොදුජන එක්සත් පෙරමුණෙන් ප්‍රාදේශීය සභාවට තරග කළ දීප්ති යන අය සහ තවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රී හිමිවරුන් දෙදෙනෙක්. නමදගල පන්සලේ පියරතන හිමි, ගොඩමුන්න පන්සලේ හිමි. මේ තිදෙනාම අද වන විට ප්‍රදේශයෙන් අතුරු දහන් වෙලා හැංගිලා ඉන්නවා. අද පොදුජන එක්සත් පෙරමුණේ අය මේ ආණ්ඩුවේ අගමැතිතුමාට චෝදනා කරනවා. නමුත් ඔවුන්ගේ පහළ ක්‍රියාකාරීන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දිගන සිද්ධියට සම්බන්ධ වෙලා අද අත් අඩංගුවට පත් වෙලා ඉන්නවා. ඔබතුමන්ලා කියන්නට ඕනෑ පක්ෂය තහනම් කරලා ඔවුන් නෙරපනවාද, පක්ෂයෙන් අයින් කරනවාද එහෙම නැත්නම් ඔවුන් ගැන ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. ඒක කියන්නේ නැතුව, දිගන ප්‍රදේශයේ හිටපු පොදුජන එක්සත් පෙරමුණේ ක්‍රියාකාරීන් එකතු කරලා කරපු විනාශය ගැන කථා කරන්නේ නැතුව, එම සිද්ධිය නැවැත්වූවේ නැහැයි කියලා රජයට විතරක් දොස් කියමින් චෝදනා එල්ල කිරීම සාධාරණ නැහැ. ඒකත් අගමැතිතුමාට විතරයි. ඇයි, රටේ ජනාධිපතිතුමා ආරක්ෂක ඇමතිවරයානේ. ඇයි එතුමා ගැන කථා කරන්නේ නැත්තේ? එතුමා ගැන කථා කරන්නේ නැත්තේ එතුමා එක්ක deal එකක සිටින නිසයි. එතුමා සමඟ deal එකක සිටින නිසා ජනාධිපතිතුමාට බණින්නේ නැහැ, ඔක්කොම අගමැතිතුමාට. අගමැතිතුමා ඇතුළු අපි ඔක්කොම ආණ්ඩුවේ. ආණ්ඩුව එකතු වෙලා තමයි සියලු තීන්දු ගන්නේ. ඒවා වරදින්න පුළුවන්, හරියන්න පුළුවන්. වැරදුණොත් අගමැතිතුමා; හරි ගියොත් ජනාධිපතිතුමා. එහෙම තීන්දුවක් නැහැ. අපි 2015දී ජාතික ආණ්ඩුව හැදුවා. අපි ඉස්සරහට ආවා. එතකොට වැරදි දේවලුත් වෙලා තිබෙනවා. වැරදි දේවල් වෙලා තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගන්න වගකීම සියලු දෙනාම භාර ගන්න ඕනෑ. අගමැතිතුමාට විරුද්ධව විතරක් නොවෙයි, මේ ආණ්ඩුවට විරුද්ධවයි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. අද තමුන්නාන්සේලා ඒකාබද්ධ විපක්ෂයේ ඉඳගෙන ජනාධිපතිතුමාත් එක්ක deal දමනවා. අපි දන්නවා මේ ගරු සභාවේ කථා කළ සමහර මන්ත්‍රීවරු ජනාධිපතිතුමාත් සමඟ deal දාලා උසාවි යන්න නොදී නඩු හංගා ගත්ත බව. ඇයි ඒ? සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා අද ලොකු කථාවක් කළා. එතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණයක් තිබෙනවා. එතුමා ආණ්ඩුවට එකතුවෙලා ඒ පරීක්ෂණය යට ගැහුවා. ඒකයි මේ ආණ්ඩුවත් එක්ක එකතු වුණේ. ඒක අද ඔබතුමන්ලා පාලමක් කරගෙන තිබෙනවා. අද මොකක්ද වුණේ?

විමල් වීරවංශ මන්ත්‍රීතුමා කියනවා, "රනිල් වික්‍රමසිංහ හිනා වෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාට තුනෙන් දෙකේ බලයක් නැහැ." කියලා. මේවා බලන්න තමයි දැන් විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ, මේවා වෙක් කරන්න තමයි විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අපිත් එක්ක කථා කරනවාද, අපිත් එක්ක හිනා වෙනවාද, අපිට 'හලෝ' කියනවාද බලන්න. ඒවානේ අද කථා කළේ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මොනවාද කිව්වේ? එතුමා එක්සත් ජාතික පක්ෂය ගැන කථා කළා. එතුමාගේ පක්ෂයේ තිබෙන බැසිල් රාජපක්ෂගේයි, ගෝඨාභය රාජපක්ෂගේයි අර්බුදය ගැන නොවෙයි එතුමා කථා කළේ. එතුමා යූඑන්පී එක ගැනයි කථා කළේ. යූඑන්පී එක ගැන අපි බලා ගන්නම්. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ දේශපාලනය කරන්න.

ගරු කථානායකතුමනි, අපි 2015දී ජන වරමක් ගත්තා. නමුත්, අපේ ආණ්ඩුවට එක තැනක වැරදුණා. අපි ජාතික ආණ්ඩුවක් හැදුවා. ඒ ජාතික ආණ්ඩුව හැදුවේ ජන වරමත් එක්ක ආපු දේශපාලන සංකල්පයත් එක්කද? නැහැ, එහෙම ජාතික ආණ්ඩු

හැදුවේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කිහිප දෙනෙක් ඇමතිකම් ගන්න මේ ආණ්ඩුවට එකතු වුණා. හැමෝම නොවෙයි, කිහිප දෙනෙක්. ඒ කිහිප දෙනා කියන කථා අද අපට අහගෙන ඉන්න පුළුවන්. අද ඒ සමහර අය එක එක දේවල් කියනවා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය ඒකාබද්ධ විපක්ෂයේ සිටින විමල් වීරවංශලාගේ, උදය ගම්මන්පිලලාගේ ජාතිවාදී මතවාදයට යටත්වෙලා තමයි ඉන්නේ කියන එක මතක තියා ගන්න. අද බණ්ඩාරනායක ප්‍රතිපත්ති නැහැ. බණ්ඩාරනායක ප්‍රතිපත්තිවලට පයින් ගහලායි අද සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කථා කළේ.

එතුමා අද කියනවා, 2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් බලය විමධ්‍යගත කිරීම ගැන කථා කළේ නැහැයි කියලා. මම දන්නේ නැහැ, එතුමා පාර්ලිමේන්තුවට **ගංජා ගහලා** එනවාද කියලා. මේ මොකක්ද කියලා තිබෙන්නේ? එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 1.8.6 යටතේ මොකක්ද කියලා තිබෙන්නේ? "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ නිර්දේශ වසරක් තුළ ක්‍රියාත්මක කරන්නෙමු." කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. LLRC Report එකේ බලය බෙදීම ගැන, අලුත් ව්‍යවස්ථාව ගැන පැහැදිලිව තිබෙනවා. පක්ෂයේ ලේකම්තුමා මොකක්ද මේ කථා කරන්නේ? පක්ෂයේ ලේකම්තුමා දන්නෙත් නැහැ, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේවල්. එතුමාට අද ඊයේ නොවෙයි, හුහක් කල් ඉඳලා වයර් මාරු වෙලා කියලා අපි දන්නවා. එතුමන්ලා රාත්‍රියට විජයාරාම මාවතේ ඉන්නවා. උදේට ජනාධිපති මන්දිරයේ ඉන්නවා. එහෙම ආණ්ඩු කරන්න බැහැ. අපි ජනාධිපතිතුමාට කියනවා, තීන්දුවක් ගන්න කියලා. අගමැතිතුමාටත් අපි කියනවා, තීන්දුවක් ගන්න කියලා. මේ ආණ්ඩුවට විරුද්ධව ගෙනාපු මේ විශ්වාස භංග යෝජනාවට ඒකාබද්ධ විපක්ෂය එක්ක එකතු වෙලා පක්ෂව ඡන්දය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ඉන්නවා නම් ඒ උදවිය එක්ක මේ ආණ්ඩුවේ වාඩි වෙන්න එපාය කියන එක අපි අගමැතිතුමාට කියන්න කැමැතියි. එහෙම වාඩි වෙලා වැඩක් නැහැ. එහෙම ආණ්ඩු හදලා වැඩක් නැහැ. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියත් සමඟ එකඟ නැත්නම්, මේ ආණ්ඩුවේ ගමන් මාර්ගයත් සමඟ එකඟ නැත්නම් ඒ අයට යන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, අපි නියෝජනය කරන්නේ හැටදෙලක්ෂයක් ජනතාවගේ බලාපොරොත්තු, ප්‍රාර්ථනාවන්. අපි ඇවිල්ලා deal දමා, සල්ලි හම්බ කර ගන්න වෙන වෙන දේවල්වලට සම්බන්ධ වෙලා නැහැ. අපි හැටදෙලක්ෂයක් ජනතාවගේ බලාපොරොත්තු සමඟයි මේ ගමන ආවේ. ඒ නිසා මේ ගමන නැවත ජාතිවාදයට, ම්ලේච්ඡත්ව මතවාදයට යට කර ගන්න දෙන්න එපා. අද ඉඳලාවත් මේ ජයග්‍රහණයත් එක්ක, ඒ හැටදෙලක්ෂයක් ජනතාවගේ බලාපොරොත්තු එක්ක ඉදිරියට යමුයි කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා.5.02]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ඉදිරිපත් වී තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳව අපේ පැත්තෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාව ඇතුළේ කවර කරුණු තිබුණත්, මේක ඉතා පැහැදිලි ලෙස දේශපාලන විශ්වාස භංග යෝජනාවක්. මෙහි දේශපාලනයක් අඩංගු වෙලා තිබෙනවා. ඒ මොකද, මීට පෙරත් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාට විරුද්ධව පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවේ නිසි පරිදි සාකච්ඡාවකට බඳුන් වීමකට ඉඩ නොතබා ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා ඒ විශ්වාස භංග යෝජනාව න්‍යාය පුස්තකයෙන් ඉවත් වුණා. ගරු කථානායකතුමනි, ඒ විශ්වාස භංග යෝජනාවේදීත් ඉතා පැහැදිලි ලෙස මෙම බැඳුම්කර ගනු දෙනුව කරුණක් ලෙස සටහන්කොට තිබුණා. පාර්ලිමේන්තුව විසුරුවා හැරියාට පස්සේ න්‍යාය පුස්තකයෙන් ඒ විශ්වාස භංග යෝජනාව අයින් වුණා නම් නැවත මැතිවරණයකින් පාර්ලිමේන්තුව පත් වුණාට පසුව ඒ කරුණ පිළිබඳව විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය යුතුව තිබුණා. ඒ බැඳුම්කර ගනු දෙනුව සම්බන්ධයෙන් අවුරුදු තුනකට වඩා වැඩි කාලයක් පසු වී තමයි යළි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් වී තිබෙන්නේ. ඒ නිසා විශ්වාස භංග යෝජනාව ඇතුළේ පැහැදිලි ලෙස දේශපාලන අරමුණු තිබෙනවා. අප විශ්වාස භංග යෝජනාවට සහය දෙන්නේ ඒ දේශපාලන අරමුණු පිළිබඳව අනවබෝධයෙන් නොවෙයි. ඒ දේශපාලන අරමුණු පිළිබඳව දේශපාලනයේ සිදු විය හැකි වලනයන් පිළිබඳව ඉතාමත් හොඳ අවබෝධයක් සහිතවයි අපි මේ විශ්වාස භංග යෝජනාවට සහය දෙන්නේ. මා ඒක අවධාරණය කරන්නේ අන් කවරක් නිසාවත් නොවෙයි. අපට විටින් විට වෙනත් අය කථා කරමින් මේ පිළිබඳව කරුණු දක්වමින් තිබෙනවා. "විශ්වාස භංග යෝජනාවට සහය දීම හරහා රාජපක්ෂ කඳවුරට යම් උත්තේජනයක් ලැබෙනවා නේද? ඒ උත්තේජනයට ජනතා විමුක්ති පෙරමුණ සහය දක්වන්නේ ඇයි?" කියන සාකච්ඡාවක් තිබෙනවා. අපි දන්නවා, විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණයෙන් කෙළවර වුණොත්, රාජපක්ෂ කඳවුරට යම් දේශපාලනික උත්තේජනයක් ලැබෙන බව. ඒක නොදැන අපි විශ්වාස භංග යෝජනාවට සහය දෙනවා නොවෙයි. ඒ වාගේම අපි දන්නවා රාජපක්ෂ කඳවුර උත්තේජනයක් ලබා ගැනීමට තරම් වන පනත් ආරක්ෂා කර දුන්නෙත් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාත්, මේ ඉන්න ජනාධිපතිවරයාත් බව. ඒ නිසා අද දේශපාලනික වශයෙන් ඔවුන් ගනු ලබන උත්තේජනය ගැන අපෙන් ප්‍රශ්න කරන එක සාධාරණ නැහැ.

මම මේ කියන්නේ ලක්ෂ හැටදෙකේ ජනවරමත් එක්ක සම්බන්ධ වුණු සමහර කණ්ඩායම්වල තිබෙන මතය. "රාජපක්ෂ කඳවුර ලබා ගන්නා උත්තේජනය නිසා මෙයට සහාය නොදී ඉන්න එක නේද, වඩාත් යෝග්‍ය?" කියන යෝජනාව කරලා වැඩක් නැහැ. අපෙන් ඒක ප්‍රශ්න කරලා වැඩක් නැහැ. එම කඳවුර 2015 ජනවාරි මාසයේ 08 වැනිදා දේශපාලනික වශයෙන් යම් දුර්වලතාවක් වුණා නම්, දේශපාලනික වශයෙන් තීරණාත්මක ලෙස පරාජයට පත් කිරීමේ අවශ්‍යතාව මේ අග්‍රාමාත්‍යවරයාත්, ජනාධිපතිවරයාත්, ආණ්ඩුවත් අත්හැර තිබෙනවා. ඒ අත්හැරීම නිසා තමයි අද ඔවුන්ට උත්තේජනයක් ලබා ගැනීම සඳහාවත් මේ කරුණ ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබී තිබෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, යළිත් රාජපක්ෂ කඳවුරේ හිස එසවීමත්, එයට ලැබෙන උත්තේජනයත් කිසිසේත්ම මේ පාලනය නිසා පාලකයා විසින් දුර්වල කරාවි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ කාර්ය භාරය ඔවුන්ගෙන් අවසන් වී තිබෙනවා. ඒ නිසා රාජපක්ෂ කඳවුර පිළිබඳව භීතිකාවක් තිබෙනවා නම්, ඒ රාජපක්ෂ කඳවුරට එරෙහිව ප්‍රබල දේශපාලන කඳවුරක් ගොඩනහන්න පුළුවන් නම් ඒක තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ අත්ත් නොවෙයි; මෛත්‍රීපාල සිරිසේන අත්ත් නොවෙයි. ඒක හොඳින් තේරුම් ගන්න ඕනෑ. ඔවුන්ගේ කාල පරිච්ඡේදය අවසන්. ඒ නිසා අපි ඒ දේශපාලනය පිළිබඳව අවබෝධයකින්ම තමයි මේ විශ්වාස භංග යෝජනාවට

[ගරු අනුර දිසානායක මහතා]

සහාය ලබා දෙන්නේ. විශ්වාස භංග යෝජනාව පිළිබඳ ඡන්ද විමසීමෙන් පසුව ජයග්‍රහණයක් සිදු වුණොත් එහි ප්‍රතිඵල මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතයත් එක්ක කිසිදු සම්බන්ධයක් නොවන ප්‍රතිඵලයි. ඕනෑ නම් එක්සත් ජාතික පක්ෂයේම අග්‍රාමාත්‍යවරයෙක් හරහා මේ තිබුණු විධියටම ආණ්ඩුව ගෙන යන්න පුළුවන්. එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අග්‍රාමාත්‍යවරයෙක් පත් කරගෙන, එළියේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමේ සහාය ලබා ගනිමින් ආණ්ඩුවක් ගෙන යන්න පුළුවන්. කවර වර්ගයේ ආණ්ඩුවක් හැදුණත් මේ රටේ පතුලේ ඉන්න ජනතාව මුහුණ දී තිබෙන ගැටලුවලට විසඳුම් නොලැබෙන බව අපි දන්නවා. ඒ නිසා මේ විශ්වාස භංගයෙන් ගොවි ජනතාව, ධීවර ජනතාව, රැකියා විරහිත තරුණයන්, අපේ රටේ ව්‍යාපාරික කණ්ඩායම් තමන්ගේ ආර්ථිකයේ කර වටක් ගිලී තිබෙන එකට කිසිදු පිළිතුරක් නොලැබෙන බවත් අපි දන්නවා. ඒවා දැනගෙනම තමයි අපි මේකට සහාය ලබා දෙන්නේ. ඇයි ඒ?

මෙහි දී විශ්වාස භංග යෝජනාව පිළිබඳව විතරක් ගත්තොත් ගරු කථානායකතුමනි, මෙහි ප්‍රධාන කරුණු දෙකක් සටහන් වී තිබෙනවා. එකක් තමයි, භාණ්ඩාගාර බැඳුම්කර කොමිෂන් සභාව හරහා හෙළිදරව් වූ කරුණු, කෝප් සභාව හරහා හෙළිදරව් වූ කරුණු, ඒ වාගේම පසුගිය කාලය පුරාම බැඳුම්කර පිළිබඳව විමර්ශනයන්හිදී සාකච්ඡා වෙමින් තිබෙන කරුණු හරහා මේ වංචාවට අග්‍රාමාත්‍යවරයාගේ තිබෙන සම්බන්ධය, ඒ නිසා ඔහු කෙරෙහි තිබෙන විශ්වාසය බිඳ වැටී තිබෙනවාය කියන යෝජනාව. ඒක සාධාරණ යෝජනාවක්. බැඳුම්කරය කියන එක පසෙකින් තබලා, එහි හරය ගත්තොත් වංචාවට, දූෂණයට එරෙහිවීමක් මේ විශ්වාස භංග යෝජනාව ඇතුළේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, දෙවැනි කරුණ ලෙස ඉතා පැහැදිලි ලෙස පෙන්නුම් කර තිබෙනවා, මහනුවර ඇති වුණු සිදුවීම්වලදී නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍ය ධුර දරමින් සිටි කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය සමනය කිරීම සඳහා නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මහත්මයා අසමත් වීම. මේ කරුණු දෙක තමයි තිබෙන්නේ. එකක් හොරකම, දෙවැනි එක ජාතිවාදය. මේ විශ්වාස භංග යෝජනාවේ පදනම වෙලා තිබෙන්නේ හොරකමට එරෙහිවීමත්, ජාතිවාදයට එරෙහිවීමත්. මේ කරුණු දෙක ගත්තොත් ඉතාමත් සාධනීය කරුණු දෙකක්. හැබැයි අත්සන් කර තිබෙන පිරිස දිහා බැලුවොත් ඒ අය හොරකමේ කප්පිත්තන්, ඒකත් අපි දන්නවා; ජාතිවාදයේ කර වටක් ගිලුණු මජර දේශපාලකයන්, ඒකත් අපි දන්නවා. ඒ අය තමයි අත්සන් කර තිබෙන්නේ. හොරකමේ කප්පිත්තන් අත්සන් කර තිබෙනවා, ජාතිවාදයේ කර වටක් ගිලුණු අය මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කර තිබෙනවා. හැබැයි, බැඳුම්කර හොරකමට එරෙහිව - ඒ කියන්නේ හොරකමට එරෙහිව - මේ විශ්වාස භංග යෝජනාවේ කරුණක් තිබෙනවා. ජාතිවාදයට එරෙහිව කරුණක් මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙනවා. ඒ නිසා විශ්වාස භංග යෝජනාව වෙනම ගත්තොත් මෙහි තිබෙන කරුණුවලට අපි පක්ෂපාතියි. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මහනුවර සිදුවීම පමණක් නොවෙයි; මහනුවර සිදුවීම සමනය කිරීම සඳහා නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යවරයා හැටියට කටයුතු කිරීමට අසමත් වීම පිළිබඳව පමණක් නොවෙයි, අග්‍රාමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාව ජාතිවාදය පැත්තෙන් ආ යුතු වන්නේ.

ජාතිවාදය පැත්තෙන් විශ්වාස භංගය ආ යුතු වන්නේ, ජාතිවාදී මතයන්, ප්‍රවණතාවන් වර්ධනය වීමට ඉඩකඩ හදා නිදැල්ලේ මේ අග්‍රාමාත්‍යවරයාත්, මේ ජනාධිපතිවරයාත් කටයුතු කරපු නිසයි. එහෙම කටයුතු කළේ නැද්ද? ගිංතොටදී, අම්පාරේදී, කුරුණෑගල ප්‍රදේශයේදී -මේ ආදී ප්‍රදේශවලදී- ක්‍රමානුකූලව වර්ධනය වෙමින් ආපු ජාතිවාදය නිදැල්ලේ වර්ධනය වීම සඳහා තමුන්නාන්සේලා ඉඩකඩ සකස් කරලා දුන්නා. ඒක නිසා සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ජාතික සමඟිය දිශාවට රටේ දේශපාලනය හසුරුවනවා වෙනුවට ජාතියේ සමඟිය, ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටිනවා වෙනුවට ජාතිවාදය නිදැල්ලේ වර්ධනය වීම සඳහා තමුන්නාන්සේ ඉඩකඩ සකස් කරලා දුන්නා. ඒක නිසා නුවර සිදුවීම පමණක් නොවෙයි, ඒ දක්වා ගමන් කරපු ජාතිවාදය වර්ධනය වීම සඳහා නිදැල්ලේ ඉඩකඩ හදා දීම පිළිබඳව අග්‍රාමාත්‍යවරයාට එරෙහිව මේ විශ්වාස භංගයේ කරුණු ඇතුළත් විය යුතුව තිබුණා.

ගරු කථානායකතුමනි, මම සතුටු වෙනවා, මේ ගොල්ලන් මේ මහනුවර සිදුවීම විශ්වාස භංගයට දාපු එක ගැන. හැබැයි, කවුද මේකට සම්බන්ධකරුවන්? මා සතුව තිබෙනවා, පොලිස් වාර්තාව. මහනුවර ප්‍රදේශයේ ඇති වූ නොසන්සුන් තත්ත්වයට අදාළව අත් අඩංගුවට ගනු ලැබූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් පිළිබඳව මා සතුව විස්තර තිබෙනවා. කවුද, දැන් අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ? එක් සැකකරුවකුගේ නම, තැන්නේගෙදර ගාමිණී රාජපක්ෂ. මොහු කවුද? පොහොට්ටුවේ මන්ත්‍රී. මොකක්ද චෝදනාව? ඒ මොහොතේ ගැටුම්වලට සම්බන්ධ වීම. ඒ පිළිබඳව අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කුමාර මොහොට්ටිලාගේ සමන්ත පෙරේරා. ඔහුත් පොහොට්ටුවේ මන්ත්‍රී. ඔහුත් මහනුවර ජාතිවාදී ගැටුම් ඇවිලීම සඳහා දායක වූ බවට අත් අඩංගුවට අරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. 2018.03.06වැනි දින රාත්‍රියේ මැණික්හින්න මුස්ලිම් පල්ලියට ගිනි තැබීමට අදාළව මැණික්හින්න පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම අවස්ථාවේදීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වන ගාමිණී රාජපක්ෂ -මම කලින් කිව්ව කෙනා- හඳුනාගෙන තිබෙනවා. ඊළඟට, 2018.03.05වන දින දිගන නගරයේ මුස්ලිම් පල්ලිය සහ වෙළෙඳ සැල්වලට ගින්නෙන් හා ගල් මුල් ආදියෙන් පහර දී අලාභහානි කිරීමට අදාළව පහත සඳහන් පුද්ගලයා අත් අඩංගුවට ගැනීම සඳහා පොලීසිය විමර්ශනය කරයි. කවුද? ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වන අරලිය හෝටලේ සමන්ත. එතකොට ඔහුත් සම්බන්ධයි. ඊළඟට, පල්ලෙකැලේ පොලිස් වසමේ නත්තරම්පත ප්‍රදේශයේ වෙළෙඳ සැලකට ගිනි තබා අලාභහානි කිරීමට අදාළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ප්‍රාදේශීය සභාවට තරග කළ දීප්ති යන අය අත් අඩංගුවට ගැනීම සඳහා පොලීසිය විමර්ශන පවත්වයි.

ඊළඟට, දිගන නගරයේ පූජනීය ස්ථානවලට හා ව්‍යාපාරික ස්ථානවලට අලාභහානි කිරීමට අදාළව -ඒ පූජනීය ස්ථාන කියන්නේ මුස්ලිම් දේවස්ථාන- පොලීසිය භාරයට ගෙන තිබෙන CCTV දර්ශනවලට අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමිවරුන් දෙනමක් වන නමදගල පන්සලේ පියරතන හාමුදුරුවෝ සහ ගොඩමුන්න පන්සලේ හාමුදුරුවෝ අත් අඩංගුවට ගැනීමට නියමිතව තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ජාතිවාදය පිළිබඳව චෝදනාවක් මේ ආණ්ඩුවට තිබෙනවා. ජාතිවාදය නිදැල්ලේ වර්ධනය වෙන්න ඉඩ දුන්නා, ජාතිවාදී සිදුවීම් ඇති කරන්න ඉඩ දුන්නා. ඒ ඉඩ දීමෙන් අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා 2015 ජනවාරි මාසයේ 8වැනි දා ජනවරමට මුළුමනින්ම පිටුපා හිටගෙන තිබෙනවා. ඒක නිසා මේ විශ්වාස භංගයට නුවර සිදුවීම් සමනය කිරීමට අසමත් වීම පමණක් නොවෙයි, ජාතිවාදය නිදැල්ලේ වර්ධනය වීම සඳහා ඉඩකඩ ලබා දීමත් ඇතුළත් විය යුතුව තිබුණා.

ඒ විතරක් නොවෙයි. 2015 ජනවාරි මාසයේ 8වැනි දා ජනවරම මුළුමනින්ම අමතක කොට ඊට පිටු පා තමයි

තමුන්නාන්සේලා දිගින් දිගටම කටයුතු කරමින් තිබුණේ. ඒ අතර ගොවි ජනතාවගේ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන් විශාල නියඟයකට මුහුණ දීලා තිබුණා. ඒ නියඟය නිසා කන්න තුන-හතරකට වඩා වැඩි ප්‍රමාණයක් වගා පාළු වුණා. හැබැයි, කන්න තුන-හතරක් පාළුවෙමින් තියන කොට අග්‍රාමාත්‍යවරයා වාහන දෙකක් ගෙනෙනවා, මිලියන 600ක් -කෝටි 60ක්- දීලා. ගොවි ජනතාව තමන්ගේ ජීවිතය පවත්වාගෙන යාම පිළිබඳව ගැටලුවකට මුහුණ දී තිබියදී අග්‍රාමාත්‍යවරයා ලක්ෂ 5,997ක් දීලා වාහන ගේනවා. ආණ්ඩුවක් තීන්දුවක් ගත්තා, මාස හතරක් ඒ ගොවි ජනතාවට රුපියල් දහදාහක් ගණනේ මාස් පතා දෙනවා කියලා. හැබැයි, එක මාසයක් ඒ 10,000නුත් 1,500ක් කපාගෙන 8,500ක් දුන්නා. ඉතුරු මාස තුනටම දුන්නේ නැහැ.

ඒ වෙනුවට පොහොර සහනාධාරය කප්පාදු කළා. මිලදී ගන්නා ලද වී තොග ඉතාම කුණු කොල්ලයට වී මෝලක්වත් නැති අයට වික්කා. කතරගම බස්නායක නිලමේ කුමාරගේට -වී මෝලක්වත් නැති කෙනකුට- වී ටික වික්කා. සහල් මිල විශාල ලෙස ඉහළ දැම්මා. සහල් පාලනය කිරීම සඳහා තිබුණු වී තොග විකුණා දැම්මා, පෞද්ගලික මෝල් හිමියන් අතට. ඒ නිසා මේ රටේ ගොවි ජනතාවගෙන් තමුන්නාන්සේලාගේ අග්‍රාමාත්‍යවරයාට විශ්වාස භංග යෝජනාවක්, ජනාධිපතිවරයාට විශ්වාස භංග යෝජනාවක් ආ යුතුව තිබෙනවා. ඒක මතක තබා ගන්න. තමුන්නාන්සේලාට ගොවි ජනතාවගෙන් විශ්වාස භංගයක් එල්ල විය යුතුව තිබෙනවා. ඇයි ඒ? පොහොර සහනාධාරය කප්පාදු කරමින්, ජනතාව විශාල ලෙස පීඩාවට පත් කරමින්, වී තොග විකුණා දමමින්, වී මෝලක්වත් නැති කෙනකුට වී ටික විකුණා දමමින්, ගොවි ජනතාවට බෙදන්න ගෙනා හරක් තමන්ගේ හිත මිත්‍රාදීන්ට බෙදමින් තමුන්නාන්සේලා මේ රටේ මහ ජනයාගේ ධනය සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට අවශ්‍ය විධියට කටයුතු කළා. එය පාලනය කරන්න අසමත් වීම පිළිබඳව අග්‍රාමාත්‍යවරයා කෙරෙහි විශ්වාසය අහිමි වීමක් තිබෙනවා. එයත් මේ විශ්වාස භංගයට ඇතුළත් විය යුතුව තිබුණා. ඒ වාගේම රටක සාමකාමී තත්ත්වයක් නිර්මාණය වීමේදී සාමාන්‍ය ජනතාවට අත්‍යවශ්‍යයි නීතියේ හා විධානයේ ආධිපත්‍යය. හැබැයි තමුන්නාන්සේලා සාමකාමී රාජ්‍යයක් නිර්මාණය කරනවා වෙනුවට පොලීසිය තමන්ට ඕනෑ විධියට ක්‍රමානුකූලව හසුරුවමින්, අත් අඩංගුවට ගැනීම මහ හරවා ගනිමින් තමන්ට අවශ්‍ය වන අය අත් අඩංගුවට ගන්න, අනෙක් අය නිදහස් කරන, නීතියේ හා විධානයේ ආධිපත්‍යය බිඳ වැටුණු අපරාධකාරී රාජ්‍යයක් ගොඩ නහමින් ආවා. මැතිවරණ ව්‍යාපාරවලින් මැද කොළඹින් පාතාලය වර්ධනය වන්න පටන් ගත්තා. මැද කොළඹ මැතිවරණ ව්‍යාපාරයට පාතාලයේ ප්‍රධාන කණ්ඩායම් තමුන්නාන්සේලා සම්බන්ධ කරගත්තා. මා නොවෙයි තමුන්නාන්සේලාගේ ඇමති මනෝ ගනේසන් මහත්මයා ඒ ගැන කිව්වා. ඔහුට වැඩිපුර ආරක්ෂාවක් ඉල්ලුවා. ඒ, කාගෙන් ආරක්ෂා වෙන්නද? කාගෙන් ආරක්ෂා වෙන්නද ඉල්ලුවේ? මේ රටේ ආණ්ඩුවේ අමාත්‍යවරයකු පාතාලය මෙහෙයවමින් ඔහු ඝාතනය කරන්න ඉන්නවා කියා ආණ්ඩුවේ අමාත්‍යවරයෙක් වන මනෝ ගනේසන් මහත්මයා කියනවා.

ආණ්ඩුවේ අමාත්‍යවරයකු ගැන මනෝ ගනේසන් අමාත්‍යවරයාට එසේ කියන්න සිදු වී තිබෙනවා නම් තමුන්නාන්සේලා මේ රටේ නීතිය හා සාමය ස්ථාපිත කරන්න අසමත් වී තිබෙනවා. ඒ නිසාත් අග්‍රාමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආ යුතුව තිබෙනවා. ඇයි ඒ? එතැන ජනාධිපතිවරයාත් ඉන්නවා. මා එතුමා ගැන පස්සේ කියන්නම්. එතුමා කිසිසේත්ම මෙයින් ශුද්ධවන්තයෙක් නොවෙයි. එතුමා කිසිසේත් ශුද්ධවන්තයෙක් නොවෙයි. එතුමාත් හරි හරියට මේකට වග කියන්න ඕනෑකම තිබෙනවා, ජනාධිපතිවරයා හැටියට. ඒ විතරක්ද? ප්‍රධාන වශයෙන් ජනවාරි මාසයේ 8වන දා බලාපොරොත්තුවක් තිබුණා. මොකක්ද ඒ? ඒ තමයි, වංචාව නතර කිරීම සහ වංචනිකයන්ට දඬුවම් දීම. එය ප්‍රධාන සටන් පාඨයක් බවට පත් වී තිබුණා. හැබැයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ දේශපාලන උපක්‍රමය බවට පත් වී තිබුණේ මොකක්ද? එයාගේ දේශපාලන උපක්‍රමය වුණේ මාමාගේ දේශපාලනයයි. අග්‍රාමාත්‍යවරයා ගොඩක් පාඩම් කරලා තිබෙන්නේ ජේ.ආර්. ගේ අත්දැකීම්. ජේ.ආර්. ජයවර්ධන අවුරුදු 17ක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂයේ තැබුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදලායි. අනුර පිල, මෛත්‍රී පිල, විජය පිල ආදී වශයෙන් පිල් බෙදලා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අවුරුදු 17ක් විපක්ෂයේ තැබුවේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා අපේක්ෂා කළා, ඔහුගේ දිගු කාලීන බලය තහවුරු කර ගැනීම සඳහා කළ යුතු වැදගත්ම දේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදීමයි කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිකම් බෙදන්න බැහැ. ඕනෑම දේශපාලන ව්‍යාපාරයක් බෙදිය හැකි වන්නේ බල කේන්ද්‍ර දෙකක් තිබුණොත් පමණයි. එක බල කේන්ද්‍රයක් නිශ්චිත වශයෙන් තිබෙනවා. මොකක්ද ඒ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැටියට, ජනාධිපතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එක බල කේන්ද්‍රයක් තිබෙනවා. හැබැයි තනි බල කේන්ද්‍රයකින් පක්ෂයක් බෙදන්න බැහැ. තනි බල කේන්ද්‍රයක් තිබෙන හැම තැනකම පක්ෂය එකට සමඟි වෙනවා. ඒ නිසා බල කේන්ද්‍ර දෙකක් ඕනෑ. අනෙක් බල කේන්ද්‍රය කොහෙන්ද හදන්න ඕනෑ? අනෙක් බල කේන්ද්‍රය හදන්න ඕනෑ රාජපක්ෂ පවුලෙන්. ඒ නිසා රාජපක්ෂ පවුලෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තවත් බල කේන්ද්‍රයක් හැදුවා. ඒ බල කේන්ද්‍රය ආරක්ෂා කරන්න අග්‍රාමාත්‍යවරයා දැනුවත්ව මැදිහත් වුණා. ඒ මොකක් වෙනුවෙන්ද? ඔහු නිතුවා මාමාගේ උපක්‍රමයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදීම තමයි තමන්ගේ දිගු කාලීන දේශපාලන පැවැත්ම කියා. ඒ වෙනුවෙන් මේ පැත්තෙන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කේන්ද්‍ර කර ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බල කේන්ද්‍රයක් තිබෙන කොට ඊට ප්‍රතිපක්ෂව රාජපක්ෂලා කේන්ද්‍ර කර ගත් බල කේන්ද්‍රයක් හදන්න අග්‍රාමාත්‍යවරයා උදව් කළා. ඒ උදව්වේ ප්‍රතිඵල මොනවාද? ජනවාරි මාසයේ 8වන දා රාජපක්ෂ කඳවුර යම් ප්‍රමාණයකට දේශපාලනික වශයෙන් පරාජයට පත් වී තිබුණා නම් ඒ තත්ත්වය දේශපාලනික වශයෙන් මුළුමනින්ම වෙනස් කිරීම සඳහා එතුමා ජන වරමට පිටුපෑවා. ජන වරමට පිටුපාලා මොකක්ද කළේ? ඉතා පැහැදිලි ලෙස මෙම වංචනිකයන් ආරක්ෂා කරන්න මැදිහත් වුණා.

ඒ පිළිබඳව විශ්වාස භංගයක් අග්‍රාමාත්‍යවරයාට තිබෙනවා. මා එකින් එක ඔබට කියන්නම්. විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය විසුරුවා හැරියේ ඇයි? ඇයි ඒක නතර කළේ? දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය අපේ රටේ පැමිණිලි විශාල ප්‍රමාණයක් ගොනු කළා. අද FCID එකෙන් විභාග වන පැමිණිලි විශාල ප්‍රමාණයක ලේඛන, විස්තර සකස් කරන්න එම කමිටුව ඉතාමත් කැපවීමකින් වැඩ කටයුතු කරමින් සිටියා. හැබැයි, අග්‍රාමාත්‍යවරයා එම කමිටුව විසුරුවා හැරියා. එම කමිටුව විසුරුවා හරින්න ප්‍රධාන සාධකය බවට පත් වුණේ, එම කමිටුව සහ පොලීසිය භාර අමාත්‍යවරයා අතර ඇති වුණු ගැටුමක්. මේකයි ඇත්ත කථාව. වෙන කිසිවක් නොවෙයි. එතකොට අග්‍රාමාත්‍යවරයාට වැදගත් වුණේ මොකක්ද? අග්‍රාමාත්‍යවරයාට වැදගත් වුණේ ජනවාරි මාසයේ 8වැනි දා ජන වරමට අනුව දූෂිතයන්ට දඬුවම් දීම නොවෙයි, අග්‍රාමාත්‍යවරයාට වැදගත් වුණේ පොලීසිය භාර අමාත්‍යවරයා වූ සාගල රත්නායක මහත්මයාගේ පැත්ත ගැනීමයි. තමුන්නාන්සේලා අද වන තුරුත් මේ පාර්ලිමේන්තුවට කියලා නැහැ, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය විසුරුවා හැරියේ ඇයි කියලා. ඒක මේ පාර්ලිමේන්තුව දැනගන්න ඕනෑ.

ඊළඟට, තමුන්නාන්සේලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි

[ගරු අනුර දිසානායක මහතා]

ඩයස් මහත්මිය ඉවත් කළා. ඇය ලංකාවේ පළමුවැනි වතාවට හිටපු ආරක්ෂක ලේකම්වරයාත්, හිටපු නාවික හමුදාපතිවරු තිදෙනාත් "ඇවන්ට් ගාර්ඩ්" චූදිතයන් හැටියට නම් කර අධිකරණයේ නඩුවක් පැවරුවා. අපේ රටේ පළමුවැනි වතාවටයි එහෙම වුණේ. හිටපු නාවික හමුදාපතිවරු තිදෙනාත්, හිටපු ආරක්ෂක ලේකම්වරයාත් එම නඩුවේ චූදිතයන් බවට පත් වුණා. එතකොට ආණ්ඩුව මොකක්ද කළ යුතුව තිබුණේ? ඇය ආරක්ෂා කොට, ඇයට බලතල ලබා දෙමින්, පරීක්ෂණ මෙහෙයවීම තමයි අග්‍රාමාත්‍යවරයාගේ කාර්ය භාරය බවට පත් විය යුතුව තිබුණේ. නමුත්, ඒ වෙනුවට මොකක්ද සිදු වුණේ? එතුමිය ඉවත් කරන්න මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගෙන් ලැබුණු දායකත්වය අපි දන්නවා. හැබැයි, අග්‍රාමාත්‍යවරයා හැටියට ඇයව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඔහු මොකක්ද කළේ? අපි අහන්නේ එච්චරයි. මේ පාර්ලිමේන්තුවේදී අපි ඒ පිළිබඳව විටින් විට ප්‍රශ්න කළා. දිල්රුක්ෂි ඩයස් මහත්මිය විසින් අග්‍රාමාත්‍යවරයා නියෝජනය කරන පන්තියේ බලවත් සහ දැනුවත් අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. එම නිසා තමුන්නාන්සේලා එතැනින් එතුමියගේ ගමන නතර කළා.

ඒ විතරක් නොවෙයි, වීරකැටිය ව්‍යාපෘතිය පිළිබඳ නඩුව පොඩි නඩුවක් හැටියට තමයි අර්ථ කථනය කරමින් තිබෙන්නේ. පොඩි නඩු, ලොකු නඩු කියලා විභාග කරන නීතියක් අපේ රටේ නැහැ. අපේ රටේ නීතිය අනුව, පොඩි වුණත් ලොකු වුණත් වරද නම් වරද. එම නිසා තමයි රුපියල් 200ක් පගාව ගත් පොලිස් නිලධාරියාගේ වැඩ තහනම් කරන්නේ; සේවාවෙන් නෙරපා හරින්නේ. වීරකැටිය ව්‍යාපෘතියේ වියදම් පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර තිබෙන විගණන වාර්තාව මා ළඟ තිබෙනවා. නාවික හමුදාව හරහා වියදම් කරන ලද රුපියල් ලක්ෂ 617ක වියදමක් පිළිබඳව විගණකාධිපති දෙපාර්ත මේන්තුවෙන් ඉදිරිපත් කරන වාර්තාවේ ඉතා පැහැදිලිව තිබෙනවා. ඒ වාගේම තවත් රුපියල් ලක්ෂ 68ක වියදමක් පිළිබඳව, තවත් රුපියල් ලක්ෂ 92ක් පිළිබඳව, තවත් රුපියල් ලක්ෂ 26ක වියදමක් පිළිබඳව, ඒ වාගේම විදුලි පහන් සවි කිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 53ක වියදමක් පිළිබඳව, අදාළ ව්‍යාපෘතියේ හතරැස් කළු ගල් 15,000ක් සඳහා වියදම් කරන ලද රුපියල් ලක්ෂ 41ක් ඇතුළු රුපියල් ලක්ෂ 1,000කට අදාළ ගනු දෙනුවක් පිළිබඳව තිබෙනවා. එම ගනු දෙනුව පිළිබඳව පරීක්ෂණ පැවැත්තුවා. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මෙම ගනු දෙනුව සම්බන්ධ අවසන් පරීක්ෂණය කරලා එහි ලිපි ගොනු ගණනාවක් නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් නියෝගය මගේ ළඟ තිබෙනවා. 217.11.16 දිනැති, රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා නීතිපති වෙනුවට එවපු ලිපිය මගේ ළඟ තිබෙනවා. මොකක්ද මේ ලිපියෙන් කියන්නේ?

> "ඒ අනුව පහත නම් සඳහන් පුද්ගලයින් කුමන්ත්‍රණය කිරීමේ පදනම මත ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් රු.48,563,929.06 ක මුදලක් සම්බන්ධයෙන් සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරද සිදු කිරීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ), 102 සහ 388 වගන්ති සමග කියවිය යුතු 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 5(1) වන වගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බව අනාවරණය වේ."

ඒ අනුව මේ අය අත් අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා වාර්තා කළා. ඒ කවුද? නන්දසේන ගෝඨාභය රාජපක්ෂ, ලියන ආරච්චිගේ ප්‍රසාද් හර්ෂාන් ද සිල්වා, ගමඇති රාළලාගේ හදා උදුලාවතී කමලදාස, සුදම්මික කේවින්ද ආටිගල, සමන් කුමාර අබ්‍රහම් ගලප්පත්ති, මාරුක්කු දේවගේ මහින්ද සාලිය, මාදම්පෙරුම ආරච්චිලාගේ ශ්‍රීමතී මල්ලිකා කුමාරි සේනාධීර. ඒ අය අත් අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා නීතිපති දෙපාර්තමේන්තුවෙන් කියලා තිබෙනවා. තව කොහෙන්ද එන්න ඕනෑකම තිබෙන්නේ?

2017.11.16වැනි දා තමයි මේ ලිපිය නිකුත් කරලා තිබෙන්නේ. නමුත්, තමුන්නාන්සේලා මේ අය අත්අඩංගුවට ගත්තාද? මම අගමැතිවරයාගෙන් දැනගන්න කැමැතියි, නීතියට යටත් නොවෙන අය තමුන්නාන්සේලාගේ ඔළුවල ඉන්නවා ද කියලා. නීතියට උඩින් ඉන්න අය ඉන්නවාද තමුන්නාන්සේලාගේ ඔළුවේ? මේ අය නීතියට උඩින් ඉන්න අය නේ. කෝ! ඒ අය අත් අඩංගුවට ගත්තාද? පරීක්ෂණ නිලධාරීන් සහ නීතිපති දෙපාර්තමේන්තුව නිසි පරිදි මෙහෙයවා නම් කර තිබෙන අයත් අත්අඩංගුවට ගැනීමට මේ අග්‍රාමාත්‍යවරයා අසමත් වී තිබෙනවා. ඒ නිසා මේ අග්‍රාමාත්‍යවරයාගේ විශ්වාසය භංග වෙන්න ඕනෑ. තවත් මොකටද එතුමා විශ්වාස කරන්නේ? අද මේ විශ්වාස භංගය ගෙන ආයුතු වන්නේ කවුද? 2015 වර්ෂයේ ජනවාරි 08වැනි දා ජනවරම දෙන ලද 6,200,000ක ජනතාව තමයි ජනාධිපතිවරයාටත්, අග්‍රාමාත්‍යවරයාටත් විරුද්ධව මේ විශ්වාස භංගය අද ගෙනෙන්න ඕනෑ. ඇයි ඒ? ඒ ජනවරමට මුළුමනින්ම පිටුපාලා මේ වංචනිකයන් ආරක්ෂා කරන්න කටයුතු කළ නිසා.

ඒ විතරක් නොවෙයි, පොලිස්පතිතුමාට ලැබුණු ඉතා සුප්‍රසිද්ධ දුරකථන ඇමතුම ගැන තමුන්නාන්සේලා දන්නවා. මම ඒ ගැනත් දැනගන්න කැමැතියි. අපි දිගින් දිගටම මේ දුරකථන ඇමතුම ගැන ඇසුවා. ඒ දුරකථන ඇමතුමේ ඉතා පැහැදිලි ලෙස 'නිලමේ' කෙනෙක් ගැන සඳහන් වෙනවා. දෙවුන්දර විෂ්ණු දේවාලයේ හිටපු බස්නායක නිලමේ ගැන තමයි මේ කථා කරලා තිබෙන්නේ. ඒක ඉතා පැහැදිලිව පැමිණිලි සහිතව තිබුණා. ඔහු ඛනිජ වැලි සංස්ථාවේ හිටපු සභාපතිවරයා. ඔහු ඛනිජ වැලි සංස්ථාවේ ලක්ෂ 400ක මුදලක් හම්බන්තොට වෙරළ උද්‍යානයක් හදන්න දෙනවා. ඔහු තමයි දෙවුන්දර විෂ්ණු දේවාලයේ හිටපු බස්නායක නිලමේ ඩිශාන් වික්‍රමරත්න ගුණසේකර. මේ කරුණ පිළිබඳව පරීක්ෂණ කළා. මේ පිළිබඳව පරීක්ෂණ කළාට පස්සේ ඔහු අත්අඩංගුවට ගන්න නියමිතව තිබුණා. අත්අඩංගුවට අරගෙන කට උත්තරය ගන්න දවසේ තමයි නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මහතා පොලිස්පතිවරයාට දුරකථනයෙන් කථා කරන්නේ. ඇමතිවරයා කථා කරලා කියනවා, "නිලමේ බලා ගන්න. ෆයිල් එක බේරා ගන්න" කියලා. පොලිස්පති කියනවා, "බය වෙන්න එපා, මම බේරා ගන්නම්" කියලා. ඒ අනුව, තමුන්නාන්සේලා මහ දවල් වංචනිකයන් බේරා ගන්න මැදිහත් වුණා. පොලිස් ඇමතිවරයා පොලිස්පතිවරයා එක්ක කරපු කථා මාධ්‍යවල ගියා. මේ අගමැතිවරයා පොලීසිය බාරව හිටපු ඒ ඇමතිවරයා ආරක්ෂා කළේ නැද්ද? පොලීසිය බාරව හිටපු ඒ ඇමතිවරයා වෙනුවෙන් මේ අගමැතිවරයා පෙනී සිටියේ නැද්ද? ඒ නිසා අපි තමුන්නාන්සේලාට ඉතා වගකීමෙන් මේවා කියන්නේ. මේ වංචා, දූෂණ මර්දනය කිරීම සඳහා නිලධාරීන් තමුන්ගේ රැකියාව, තමුන්ගේ ජීවිතය, තමුන්ගේ පවුල් අනතුරට දාලා මෙහෙයුම් කරද්දී, දේශපාලනඥයන් හැටියට තමුන්නාන්සේලා මොකක්ද කළේ? තමුන්නාන්සේලා වංචනිකයන් ආරක්ෂා කළා; 'නිලමෙලා' ආරක්ෂා කළා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගෙන් "සිරිලිය" ගිණුම පිළිබඳවත් මම දැනගන්න කැමැතියි. "සිරිලිය" ගිණුම පිළිබඳ සමස්ත වාර්තාව මා සතුව තිබෙනවා. ඒ මුදල් වියහියදම් වූ විධිය, ඒ මුදල්වලට බලපෑම් කරලා තිබෙන ආකාරය, ඒ මුදල් ලැබුණු ආකාරය සියල්ල එහි සඳහන්ව තිබෙනවා. මම දැන ගන්න කැමැතියි, මේ පරීක්ෂණ කෙළවර වුණේ කොතැනින්ද කියලා. මේ පරීක්ෂණ කෙළවර වුණේ කොතැනින්ද? ජනාධිපති ආර්යාවක් අධිකරණයට ගෙන යෑම හරි නැහැ ලු! රටට අප්සට් ලු!! ජනාධිපති ආර්යාව හොරකම් කරන එක රටට හොඳයි. හැබැයි, හොරු අල්ලන්න ලංකාවේ හිටපු පළමුවැනි කාන්තාව

නීතියට හමුවට කැඳවීම රටට අපකීර්තියක් ලු. තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයේදී කථා කරලා තමයි ඒ තීරණය ගත්තේ. රාජිත සේනාරත්න ඇමතිතුමාට ඒක මතක ඇති. ඒ වෙලාවේදී ඔබතුමා කැබිනට් රැස්වීමේ හිටියේ නැතිව ඇති. කැබිනට් මණ්ඩලයේ කථා කරලා තමයි, අපේ රටේ පළමු කාන්තාවට නඩු දාන්න ඕනෑ නැහැ කියලා තීන්දු ගත්තේ. ෂුවර් එකටම එදා ඔබතුමා කැබිනට් රැස්වීමේ ඉඳලා නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
තීන්දුවක් ගත්තේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තීන්දුවක් ගත්තේ නැද්ද? හැබැයි ඒකම තමයි තීන්දුව. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ කථා කළා. මම දන්නවා කථා කරපු බව. තමුන්නාන්සේලාට මොකක්ද ඕනෑ වුණේ? අග්‍රාමාත්‍යවරයාට ඕනෑ වුණා, තමුන්ගේ දේශපාලන උපාය මාර්ගය ක්‍රියාත්මක කරන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදීම තමයි තමුන්ගේ දේශපාලන පැවැත්ම කියලා අග්‍රාමාත්‍යවරයා හිතුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදන්න නම් කඳවුරු දෙකක් තිබෙන්න ඕනෑ කිව්වා. එකක් රාජපක්ෂ කේන්ද්‍ර කරගත් කඳවුරක්. අනෙක් එක මෛත්‍රී කේන්ද්‍ර කරගත්ත කඳවුරක්. ඒ නිසා වංචනිකයන් ආරක්ෂා කරමින්, වංචනිකයන්ට දඬුවම් ලබා නොදෙමින්, වංචනිකයන්ට ආරක්ෂාව ලබා දෙමින් රාජපක්ෂලාගේ දේශපාලනය නිදැල්ලේ වර්ධනය වෙන්න තමුන්නාන්සේලා ඉඩ දුන්නා.

මම නැවතත් අහන්න කැමතියි, ගාමිණී සෙනරත්ට මොකක්ද වුණේ? අපේ රටේ එහෙම නඩු තිබෙනවාද? අපේ රටේ එහෙම නීතියක් තිබෙනවාද? ගාමිණී සෙනරත් අත්අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුමක් තිබියදී ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කියනවා, "අපි අහවල් දවසේ ඇවිල්ලා ගාමිණී සෙනරත් අධිකරණයට භාර දෙනවා" කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කියනවා, "අපි අහවල් දවසේ ඇවිල්ලා ගාමිණී සෙනරත් අධිකරණයට භාර දෙනවා" කියලා. අධිකරණයට භාර දෙන්න ඔහු ආවේ කොහේ ඉඳලාද කියලා පොලීසිය සොයා බැලුවා ද? මම ඉතා වගකීමෙන් කියන්නේ, ගාමිණී සෙනරත් හැංගිලා හිටියේ දෙනියායේ. ඒකයි ඇත්ත කථාව. රාජිත සේනාරත්න ඇමතිතුමා ඒක පිළිගන්නවා. ඔහු දෙනියායේ තමයි හැංගිලා හිටියේ. පොලීසිය භාර ඇමතිවරයා ඉන්නේත් දෙනියායේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
තුන්වේලටම කන්න දුන්නේ ෆ්‍රයිඩ් රයිස්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තුන් වේලටම කන්න දීලා ආරක්ෂා කරලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, FCID එකේ නිලධාරීන් තමුන්ගේ ජීවිත අවදානමට ලක් කරමින් මෙම වංචනිකයන් අත්අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුම් කරන කොට, වංචනිකයන් අත්අඩංගුවට ගැනීම භාර ඇමතිවරයා තුන් වේලටම ෆ්‍රයිඩ් රයිස් කන්න දීදී චූදිතයා ගෙදර තියා ගන්නවා නම්, මේ අග්‍රාමාත්‍යවරයා විශ්වාස කරන්න කියලද තමුන්නාන්සේලා අපට කියන්නේ?

තමුන්නාන්සේලා කියන්නේ විශ්වාසය භංග වෙලා නැහැ කියලාද? විශ්වාසය භංග වෙලා තිබෙනවා. මේ වංචනිකයන් ආරක්ෂා කිරීම පිළිබඳව, ඔවුන්ට විරුද්ධව නිසි පරිදි පරීක්ෂණ ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන දායකත්වය සහ මැදිහත්වීම ලබානොදී, ඒවා අඩාළ කිරීම පිළිබඳව අග්‍රාමාත්‍යවරයා කෙරෙහි තිබූ විශ්වාසය පලුදු වී තිබෙනවා. ඒ වෙන කාගේවත් නොවෙයි, 2015 ජනවාරි මාසයේ 8වැනි දා ජන්දය ලබාදුන් ජනතාවගේ විශ්වාසයයි ඒ පලුදු වෙලා තිබෙන්නේ.

තමුන්නාන්සේලා දන්නවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අමාත්‍ය මණ්ඩලයේ නම් යෝජනා කරන්නේ අග්‍රාමාත්‍යවරයා විසින් බව. ජනාධිපතිවරයා විසින් තමයි ඒ විෂයයන් බෙදන්නේ. එහෙම නේ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා - රනිල් වික්‍රමසිංහ මැතිතුමා- ඇමති මණ්ඩලය සඳහා යෝජනා කළ නම් මොනවාද? එතුමා දූෂණවලට හවුල්වූවන්ගේ නම් ඇමති මණ්ඩලයට යෝජනා කළා. ඉතින්, එතුමා ජන වරමට පිටුපෑවා නේ.

ගරු කථානායකතුමනි, මම දැන් ඒ නම් එකින් එක කියන්නම්. පළමුවැනි තැනැත්තා තමයි සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා. එතුමා ඛනිජ තෙල් කර්මාන්ත ඇමති ලෙස කටයුතු කරද්දි සිංගප්පූරු සමාගමකින් තෙල් මිලදී ගැනීමේදී තෙල් නැව් 7කින් රුපියල් මිලියන 1,037ක මූල්‍ය අවභාවිත කිරීම පිළිබඳව FCID එක මහින් විමර්ශනයක් සිදු කළ අතර, ඇමතිවරයා ඊට වග කිව යුතු බවත්, මෙහි ප්‍රසම්පාදන කටයුතුවලට ඔහු මැදිහත්වී තිබෙන බවත් එම පරීක්ෂණවලදී හෙළිදරව් වී තිබෙනවා. මම අහනවා ඒ පරීක්ෂණයට මොකක්ද වුණේ කියලා. මොකක්ද එතැන තිබුණු නීතිය? නැවට තෙල් පටවන දිනය වටා ඇති දින පහක average එක අනුව මිල තීරණය කිරීම තමයි සාමාන්‍යයෙන් අපේ රටේ තෙල් මිලදී ගැනීමේදී තිබුණු ගිවිසුම. ඒක තමයි ඉස්සර තිබුණු ගිවිසුම. අපේ ගරු අර්ජුන රණතුංග ඇමතිතුමා මේ ගැන දන්නවා ඇති. සැප්තැම්බර් 5වැනි දා නැවට තෙල් පටවනවා නම්, සැප්තැම්බර් 2, 3, 4, 5, 6 කියන දින පහේ average එකෙන් තමයි ඒ තෙල් මිල තීරණය කරන්නේ. හැබැයි, සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා ගහපු ගිවිසුම මොකක්ද? නැවට තෙල් පටවා, ඒවා තෙල් සංස්ථාව බාන තෙක් මාස එකහමාරකට ආසන්න කාලයක් තිබෙනවා. ඒ කාලය ඇතුළත ඕනෑම දින පහක් ඒ සමාගමට තෝරාගන්න පුළුවන් විධියට කටයුතු කළා. ඉතින්, ඒ සමාගම මොකද කරන්නේ? ඒ සමාගම ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩිම දින පහ තෝරා ගන්නවා, මිල නියම කරන්න. තෙල් මිල වැඩිම දින පහ තෝරාගෙන, ඒ average එකට තෙල් මිල තීන්දු කළා. ඒ නිසා සිදු වී තිබෙන පාඩුව කීයද? එහිදී සිදුව තිබෙන පාඩුව රුපියල් මිලියන 1,037යි. මම තමුන්නාන්සේලාගෙන් අහන ප්‍රශ්නය මේකයි. FCID එකේ මේ පිළිබඳ පරීක්ෂණයක් තිබුණා. FCID එකේ මේ පරීක්ෂණය තිබියදී, අග්‍රාමාත්‍යවරයා ඇමතිවරයකු හැටියට එතුමාගේ නම යෝජනා කළේ ඇයි? මේ ක්‍රියාදාමය නිසා නැවෙන් නැවට තෙල්වලින් සිද්ධ වුණු පාඩුව ගණනය කරන ලද සියලු තොරතුරු දැන් මා ළඟ තිබෙනවා. මේ FCID එකේ තිබෙන වාර්තාව. මේ FCID file එකේ තිබෙන තොරතුරු. ඒවා තමයි මම මේ කියන්නේ.

ඊළඟට, එස්.බී. දිසානායක අමාත්‍යවරයා. තමුන්නාන්සේලා මේවා අහගන්න. කොළඹ 07, හේවා ඇවනියු හි පිහිටි අංක 11 නිවස, නැසී ගිය වෛද්‍ය සිවා සින්නතම්බි මෙනෙවිය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාරයක් සඳහා අන්තිම කැමති පත්‍රයකින් පරිත්‍යාග කළ අතර, එස්.බී. දිසානායක උසස් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් එය වැඩිදියුණු කිරීම මුවාවෙන් මූල්‍ය අක්‍රමිකතාවක් සිදු කර ඇති බවත්, එම විශාල

[ගරු අනුර දිසානායක මහතා]

නිවසේ පැවති පෞරාණික වටිනාකම් හා අධික මිල ගණන් සහිත ගෘහ උපකරණ එස්.බී. දිසානායක ඇමතිවරයා සහ ඔහුගේ නෝනා මැදිහත්ව ලොරියක පටවාගෙන ගිය බවත් අනාවරණය වී තිබෙනවා. ඒ භාණ්ඩවල වටිනාකම රුපියල් මිලියන 150යි. CID එකේ මේ පිළිබඳ පරීක්ෂණය තිබෙනවා. CID එකේ මේ පරීක්ෂණය තිබියදී, අග්‍රාමාත්‍යවරයා විසින් එතුමා ඇමතිකමකට යෝජනා කරනවා. මොන අගමැතිවරුද මේ ගොල්ලෝ? තමන් යටතේ තිබෙන CID එකේ මේ අය පිළිබඳව පරීක්ෂණ තිබෙනවා; තමන් යටතේ තිබෙන FCID එකේ මේ අය පිළිබඳව පරීක්ෂණ තිබෙනවා. හැබැයි, ඒ අයට ඇමතිකම් දෙන්න කියලා යෝජනා කරනවා. ඉතින්, තමුන්නාන්සේලා කියන්නේ මේ අගමැති විශ්වාස කරන්න කියලාද? දැන් විශ්වාසය පලුදු වෙලා තිබෙන්නේ. ඒ කාගේද? 2015 ජනවාරි මාසයේ 8වැනි දා ජන්දය දීපු ජනතාවගේ විශ්වාසයයි පලුදු වෙලා තිබෙන්නේ.

අනික් එක්කෙනා තමයි, අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිවරයා. එතුමා බනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් රුපියල් ලක්ෂ 60ක මුදලක් යොදවා සතොස ආයතනයෙන් භාණ්ඩ මිලදී ගෙන මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට බෙදා දී ඇති බව විමර්ශනයේදී ඒත්තු ගියා. මේ පිළිබඳව FCID එකේ පරීක්ෂණයක් තිබෙනවා; කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර තිබෙනවා. ඒ අයට ඇමතිකම් දෙන්න කියනවා! සැප්තැම්බර් මාසයේ 2වැනි දා වන විට මේ දූෂිතයන්ට ඇමතිකම් දෙන්න ඕනෑ කියලා 2015 ජනවාරි මාසයේ 8වැනි දා දුන් ජන වරමේ තිබුණාද කියන කාරණය අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. තමුන්නාන්සේලා මේ දූෂිතයන්ට ඇමතිකම් ලබා දුන්නා. මම අනික් දූෂිතයන් ගැන කියන්නේ නැහැ. මම මේ කියන්නේ ඇමතිකම් දීපු දූෂිතයන් ගැන.

ඒ විතරක් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා වේදිකාවකදී ඉතා පැහැදිලි ලෙස කිව්වේ මොකක්ද? 2015 අවුරුද්දේ ජනවාරි මාසයේ 07 වැනිදා මිලියන 3,012ක් -කෝටි 301ක්- ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතියට ලබා දුන්නා කියලා එතුමා කිව්වා. ඒ දවස්වල පත්තරවල ප්‍රධාන ශීර්ෂ පාඨය බවට මෙය පත් වෙලා තිබුණා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා වේදිකාවේ දී කිව්වා, "ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතියට කෝටි 301ක් ලබා දීලා තිබෙනවා. නමුත් පස් පිඬැල්ලක්වත් කපලා නැහැ. සල්ලි ටික බහිරවයා ගිලලා තිබෙනවා"යි කියලා. එතකොට වාරිමාර්ග ඇමති කවුද? වාරිමාර්ග ඇමති කවුද? මේ පිළිබඳව FCID එකේ පරීක්ෂණයක් තිබුණා. FCID එක මේ ගැන පරීක්ෂණ කරමින් සිටියා. කවුද, ඒ වෙලාවේ වාරිමාර්ග ඇමති? නිමල් සිරිපාල ද සිල්වා. හැබැයි, අග්‍රාමාත්‍යවරයා යෝජනා කරනවා, එතුමාට ඇමතිකමක් ලබා දෙන්න කියලා. තමුන්නාන්සේලා කියන්නේ මේ අගමැතිව විශ්වාස කරන්න කියලාද? අපි අහන්නේ එච්චරයි. අග්‍රාමාත්‍යවරයා හැටියට දූෂිතයන් -පැරණි දූෂිතයන්- අලුත් අය ගැනත් මම කියන්නම්. එතකොටත් ඔය විධියටම හිනාවෙලා ඉන්න. හරිද? ඒ කියන්නේ, පැරණි දූෂිතයන් අමාත්‍ය ධුර ලබා දීම සඳහා නිර්දේශ කළා. ඒ නිර්දේශය අනුවත් අග්‍රාමාත්‍යවරයා ජනතාවගේ විශ්වාසය පළුදු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට විකිණීම පිළිබඳව ගනිමු. විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ ව්‍යාපෘතිය බවට පත්වෙලා තිබුණා, අපේ රටේ ජාතික සම්පත් විකිණීම. බලයට ආපු දවසේ සිට තමුන්නාන්සේලාගේ උපාය මාර්ගය වුණේ මොකක්ද? මොකක් හෝ දැක්කොත් විකිණීම. මට එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා, "අපේ ආසනයට ගෙන්වා ගන්න බයයි. එහේ පොඩි කර්මාන්ත ශාලාවක් තිබෙනවා. ඕක විකුණයිද දන්නේ නැහැ" කියලා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ඒවා බොරු; ඒවා බොරු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, කොහේටවත් ගෙන්වා ගන්න බයයි. කොහේටවත් ගෙන්වා ගන්න බය මොකද? දැක්කොත් විකුණනවා. උඩින් ගිහිල්ලා තමයි ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික දැක්කේ. ත්‍රිකුණාමලයට ගිහිල්ලා නොවෙයි ඒ තෙල් ටැංකි ටික දැක්කේ. උඩින් ගිහිල්ලා තෙල් ටැංකි ටික දැක්කාම හිතුවා, "ඒක විකුණන්න ඕනෑ" කියලා. හරිද? මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? මුළුමනින්ම සම්පත් විකිණීම පිළිබඳව න්‍යාය පත්‍රයක් සකස් කළා.

විශේෂයෙන්ම හම්බන්තොට වරාය විකිණීමේ ප්‍රතිපත්තිය කාගේද? විකිණීමේ ප්‍රතිපත්තිය අග්‍රාමාත්‍යවරයාගේ. ඒ නිසා විකිණීමේ ප්‍රතිපත්තියට එරෙහිව විශ්වාස භංගයක් තිබෙනවා. විකිණීමේ බ්‍රෝකර් කවුද? මලික් සමරවික්‍රම අමාත්‍යවරයා. එතුමා කොහොමත් බ්‍රෝකර්. විකිණීමේ අත්සන ගැහුවේ කවුද? විකිණීමේ අත්සන ගැහුවේ මහින්ද සමරසිංහ අමාත්‍යවරයා. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, එක්සත් ජාතික පක්ෂයේත් -හවුල් ආණ්ඩුවේ- අදහස් අනුව හම්බන්තොට වරාය විකිණීමේ ප්‍රතිපත්තිය අග්‍රාමාත්‍යවරයාගේ. විකිණීමේ බ්‍රෝකර් වැඩේ කළේ මලික් සමරවික්‍රම. විකිණීම සඳහා අත්සන ගහන්නේ මහින්ද සමරසිංහ. ඒ විධියටම තමයි තමුන්නාන්සේලා තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳව,-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමා, හම්බන්තොට වරාය විකුණලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. අපේ මුදල් අමාත්‍යතුමා කියනවා, හම්බන්තොට -

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා මේ කථා කරන එක විකිණීම නොවෙයි. අපි ආර්ථික ප්‍රතිපත්ති දෙකක් අනුව කටයුතු කරන්නේ. ඒ නිසා මම හිතන්නේ ඒ වාගේ චෝදනා නැඟීම අසත්‍යයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ මේකයි. අපි ඊට එරෙහිව නේ කටයුතු කරන්නේ. ඒ විශ්වාසය පළුදු වෙලා තිබෙනවා. පළමුවැනි ප්‍රශ්නය මෙයයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා කියන ආර්ථික ප්‍රතිපත්තිය තිබෙන්නේ වෙනිසියුලාවේ විතරයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ, ඔබතුමා හිතාගෙන ඉන්න විධිය. මොකද, ඔබතුමා අපේ ආර්ථික ප්‍රතිපත්ති ගැන අහලා නැහැනේ. අපේ සතුරන්ගෙන් අහලා තිබෙන්නේ. සතුරන් ඔය වාගේ චිත්‍රයක් තමයි හදලා තිබෙන්නේ. ඇත්තටම අපි ඒ ගැන පස්සේ කථා කරමු. අපි අහන්නේ මේ විකිණීම පිළිබඳවයි. මෙතුමා කියනවා, අවුරුදු 99කට හම්බන්තොට වරාය විකුණුවේ නැහැ කියලා. අවුරුදු 99ක් නේ? අවුරුදු 99කට පසුවත් වරායන්වලින් බඩු බෑම කරයි කියලා තමුන්නාන්සේලා උපකල්පනය කරනවාද? ලෝකයේ සිදු වන තාක්ෂණික දියුණුවත් සමඟ අවුරුදු 99කට පසු බඩු බාන්න වරායවල් ඕනෑ වේවිද? අවුරුදු 99ක්! කවුද, අවුරුදු 99ක් ජීවත් වෙන්නේ? ඒ කාලයේ මේ වරාය වීන සමාගමකට පවරා දුන්නා. එලෙස පවරා දීමේදී හවුල් ලෙස කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි, තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි 16ක් තෙල් සංස්ථාවට පවරාගෙන, ඒවා නවීකරණය කිරීම සඳහා කටයුතු කළා. චන්දිම වීරක්කොඩි අමාත්‍යවරයාට අපි ස්තුතිවන්ත වනවා. මොනවා වුණත්, එතුමා 2017 අප්‍රේල් මාසයේ කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒ කැබිනට් පත්‍රිකාව තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළා. තෙල් විෂය භාර අමාත්‍යවරයා හැටියට තෙල් ටැංකිවලින් යම් ප්‍රමාණයක් පවරාගෙන, තෙල් සංස්ථාව විසින් ඒවා නවීකරණය කරලා ඉස්සරහට ගෙන යන්න පුළුවන් කියලා කැබිනට් පත්‍රිකාවක් දැම්මා. එම කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කළා. හැබැයි, කැබිනට් මණ්ඩලය අනුමත කරපු කැබිනට් පත්‍රිකාවට එරෙහිව අග්‍රාමාත්‍යවරයා තවත් කැබිනට් පත්‍රිකාවක් දැම්මා. එය චන්දිම වීරක්කොඩි අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කොට අනුමත කොට තිබෙන කැබිනට් පත්‍රිකාව අහෝසි කිරීමේ කැබිනට් පත්‍රිකාවක්. එහෙම අග්‍රාමාත්‍යවරයෙක් නේ මේ. විෂය භාර ඇමතිවරයා තෙල් ටැංකි සංකීර්ණය නවීකරණය කිරීම පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් දාලා, ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණාට පස්සේ අග්‍රාමාත්‍යවරයා විසින් තවත් කැබිනට් පත්‍රිකාවක් දානවා. ඒ කැබිනට් පත්‍රිකාව, කලින් කැබිනට් පත්‍රිකාව අහෝසි කිරීමේ කැබිනට් පත්‍රිකාවක්.

Lanka IOC එකට නැවත දෙන්න තමයි ඒ කැබිනට් පත්‍රිකාව. ඒ නිසා තමුන්නාන්සේලා කරමින් සිටින්නේ මොකක්ද? තමුන්නාන්සේලාගේ එකම සැලැස්ම වන යමක් විකුණා ජීවත් වීමේ ක්‍රමවේදයට තල්ලු වෙමින් තිබෙනවා. මේ ආර්ථික ප්‍රතිපත්තියේ, මේ විකිණීමේ ක්‍රියාවලියේ උරුමක්කාරයා සහ ප්‍රධානම මෙහෙයුම්කරුවා බවට පත් වී තිබෙන්නේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයා. ඒ නිසා ඔහුට එරෙහිව ඉදිරිපත් කළ මේ විශ්වාස භංගය සාධාරණයි. හැබැයි, එම විශ්වාස භංග යෝජනාවට අපි කලින් සඳහන් කරන ලද කරුණු විශාල ප්‍රමාණයක් ඇතුළත් විය යුතුව තිබෙන බව අපි කියනවා.

ඊළඟට, බැඳුම්කර ගනුදෙනුව කෝටි 1,100ක් බව අපි දන්නවා. ඒක හරි. ඒ, එම මොහොතේ ඇති වී තිබෙන ගනුදෙනුව. එය අතිරේක වශයෙන් ආර්ථිකයට කර තිබෙන බලපෑම විශාලයි. බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වෙන වේලාව වෙනකොට, -පෙබරවාරි මාසයේ 27 වැනි දා වෙනකොට- අපේ රටේ කවර හෝ කෙනෙකු බැංකුවකින් ණයක් අරගෙන තිබුණා නම්, එක්කෝ භාණ්ඩයක් උකස් තබා තිබුණා නම්, එහෙම නැත්නම් ව්‍යාපාරික ණයක් අරගෙන තිබුණා නම්, ඒ හැම කෙනාගේම පොලී වාරිකය ඉහළ ගියා. පෙබරවාරි මාසයේ 27 වැනි දායින් පසුව කවුරු හෝ බැංකුවකින් ණයක් ගත්තා නම්, ඒ හැම කෙනාගේම පොලී වාරිකය ඉහළ ගියා. ඒ නිසා මේ බැඳුම්කර ගනුදෙනුවෙන් ඒ නිශ්චිත මොහොත් සිද්ධ වුණු පාඩුවට වඩා අපේ රටේ සාමාන්‍ය ජනතාව වෙත එල්ල කර තිබෙන ආර්ථිකයේ පීඩනය තුළින් අපේ රටේ ආර්ථිකයට මරු පහරක් එල්ල කොට තිබෙනවා. ඒ නිසා මේක සාමාන්‍ය ගනුදෙනුවක් නොවෙයි. පාලමක් හදන කොට, ඒකෙන් සියයට 10ක commission එකක් ගත්තොත්, එය එම පාලමට බලපානවා. පාලම කඩා වැටෙවි; පාලම ප්‍රමිතියෙන් තොර වේවි. එය, ඒ අවස්ථාවට විතරක් බලපාන ගනුදෙනුවක්. හැබැයි, බැඳුම්කර ගනුදෙනුව මුළු ආර්ථිකයම වෙළා ගෙන, මුළු ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයකටම පැතිරෙන ගනුදෙනුවක්. ඒ නිසා එම ගනුදෙනුවේ ප්‍රධාන චූදිතයා බවට අග්‍රාමාත්‍යවරයා පත් වී තිබෙනවා. මොන අග්‍රාමාත්‍යවරයාද, මේ? 2015 ජනවාරි මාසයේ 8 වැනි දා ජනතාව විසින් එතෙක් පැවැති වංචාව, දූෂණය හා නාස්තියට එරෙහිව ප්‍රබල මතයක් ගොඩනගා පත් කර ගත් අග්‍රාමාත්‍යවරයායි. එසේම වංචනිකයන්ට හා දූෂිතයන්ට දඬුවම් දෙන්නත්, වංචාව හා දූෂණය නතර කරන්නත් දිවුරා පොරොන්දු වූ අග්‍රාමාත්‍යවරයා තමයි පෙබරවාරි මාසයේ 27 වැනි දා එම අග්‍රාමාත්‍ය ධුරයට පත් වී දින 50ක් ඉක්මවා යන්නත් කලින් මේ ගනුදෙනුවට දායක වෙන්නේ. ඒ නිසා එම ගනුදෙනුවට දායකවීමත්, එම ගනුදෙනුවේ ප්‍රමාණයත් එක්ක අග්‍රාමාත්‍යවරයා කෙරෙහි විශ්වාසය මුළුමනින්ම භංගවීම පිළිබඳව අපට සාකච්ඡාවක් තබා ගත යුතු නැහැ කියා මා හිතනවා.

ඒ විතරක් නොවෙයි, අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව සමස්ත බැඳීම තිබෙන්නේ ඔහු අතේ. අර්ජුන මහේන්ද්‍රන්ව පත් කිරීම සඳහා අවශ්‍ය වෙන යෝජනාව ගෙනෙන්නේත් අග්‍රාමාත්‍යවරයා. ඔහු තමයි පත් කරන්නේ. ඔහු -රනිල් වික්‍රමසිංහ මහත්මයා- තමයි අර්ජුන මහේන්ද්‍රන් වෙනුවෙන් ඇපකරු. අර්ජුන මහේන්ද්‍රන් ලංකාවේ පුරවැසියෙක් නොවෙයි. ගනුදෙනුව සිද්ධ වුණාට පසුව ඔහු ආරක්ෂා කළා. ඔහු ආරක්ෂා කිරීම සඳහා විශාල මෙහෙයුමක් දියත් වුණා. බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවේ පවා සඳහන් වී තිබෙනවා, ඔහුව විශ්වාස කරමින් අග්‍රාමාත්‍යවරයා කටයුතු කරපු බව. ඉතා පැහැදිලිව බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවේ ඒ ගැන සඳහන් වී තිබෙනවා. ඒ නිසා අර්ජුන මහේන්ද්‍රන් සහ රනිල් වික්‍රමසිංහ මහත්මයා යනු මේ ගනුදෙනුවේ දී එකම කාසියේ දෙපැත්ත. මේක එකට පවතින එකක්. ඒ නිසා මේ ගනුදෙනුව පිළිබඳවත්, අර්ජුන මහේන්ද්‍රන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳවත් කිසිසේත්ම අග්‍රාමාත්‍යවරයාට මඟ හැර යන්න බැහැ.

ඒ විතරක් නොවෙයි, එක් අවස්ථාවක මේ පාර්ලිමේන්තුවේ දී අපි අර්ජුන මහේන්ද්‍රන් ගැන ඇසුවාම අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළා, අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරු ගියා කියලා. එතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "බය වෙන්න එපා, මහුල් ගෙදරකට ගියේ. ආපසු එනවා" කියලා. මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාව කියවා බලන්න. එතුමා එදාත් වගකීම භාර ගත්තා. කොහොමද? "අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරු ගියා. මහුල් ගෙදරකට ගියේ. ආපසු ගෙන්වා දෙනවා" කියලා එතුමා එදාත් වගකීම භාර ගත්තා. දැන්, කෝ? අපි අහන්නේ එච්චරයි. ඒ නිසා අග්‍රාමාත්‍යවරයාට බැඳීමක් නැද්ද? අර්ජුන මහේන්ද්‍රන්ව නැවත කැඳවීම පිළිබඳව වගකීමක් නැද්ද? එය විශ්වාසය පලුදුවීම සඳහා, විශ්වාසය භංගවීම සඳහා හේතුවක් නොවන්නේ කෙසේද? ඔහුගේ ඇපකරු බවට පත් වෙලා තිබුණු, ඔහු වෙනුවෙන්, ඔහුගේ ආරක්ෂාව වෙනුවෙන් විශාල ප්‍රකාශ කරපු, ඔහු ගෙන්වා දෙනවා යැයි කියලා ප්‍රකාශ කරපු අග්‍රාමාත්‍යවරයා අද එයට අසමත් වී තිබෙනවා. අධිකරණය විසින් අද අර්ජුන මහේන්ද්‍රන්ට රතු නිවේදන -red notices- නිකුත් කරලා තිබෙනවා නම්, ජාත්‍යන්තර වරෙන්තු නිකුත් කර තිබෙනවා නම්, මේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අග්‍රාමාත්‍යවරයාගේ විශ්වාසවන්තම මිත්‍රයාව ගෙනැවිත් දෙන්න ඕනෑ නේ. ගෙනැවිත් දෙන්නේ නැහැ. මම කියන්නේ මේක අර්ජුන මහේන්ද්‍රන්ගේ පළායෑමක් නොවෙයි. මේක දෙදෙනාම සැලසුම් කොට අර්ජුන මහේන්ද්‍රන් සැඟවීමක්. අර්ජුන මහේන්ද්‍රන් අධිකරණයක් හමුවට ඉදිරිපත්වීමෙන්,

[ගරු අනුර දිසානායක මහතා]

ජනාධිපති කොමිෂන් සභාව හමුවේ දිග හැරුණු කරුණුවලට වඩා වැඩි කරුණු ප්‍රමාණයක් දිග හැරෙන බව අප විශ්වාස කරනවා. ඒ නිසා අර්ජුන මහේන්ද්‍රන්ගේ සැඟවීමේ අවශ්‍යතාව තිබෙන්නේ අර්ජුන මහේන්ද්‍රන්ට පමණක් නොවෙයි. අපි විශ්වාස කරනවා, අර්ජුන මහේන්ද්‍රන් සඟවා තැබීමේ අවශ්‍යතාව අග්‍රාමාත්‍යවරයාටත් තිබෙනවාය කියලා. ඒ ඇයි? එසේ අවශ්‍යතාවක් නැත්නම් අර්ජුන මහේන්ද්‍රන් කැඳවා ගත යුතුයි. ඔහුට සැඟවෙන්න ඉඩ ලබාදී තිබෙන්නේ ඇයි? ඔහුට සැඟවෙන්න අවස්ථාව ලබාදී තිබෙන්නේ ඇයි? අර්ජුන මහේන්ද්‍රන් විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණුවලදී, ඔහු බැදුම්කර ගනුදෙනුව ගැන නොකියා කිව්වා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි.

බැදුම්කර ගනුදෙනුව ගැන ඔහු නොකියා කිව්වා, "මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ යුත්තේ මගෙන් නොවෙයි; අග්‍රාමාත්‍යවරයාගෙන්" කියලා. "අග්‍රාමාත්‍යවරයා ඒවාට පිළිතුරු ලබාදිය යුතුයි" කියන ප්‍රකාශය බැදුම්කර කොමිසම හමුවේදී අර්ජුන මහේන්ද්‍රන් ඉතා පැහැදිලි ලෙස ලබාදී තිබෙනවා. බැදුම්කර කොමිසම හමුවේ එසේ කියූ අර්ජුන මහේන්ද්‍රන් අධිකරණයක් හමුවේ කෙසේ කියයිද? ඔහුට තොණ්ඩුව වැටෙන අවස්ථාවේදී, ඔහු හිරවීමට ලක්වන අවස්ථාවේදී මේ කරුණු මීට වඩා වැඩියෙන් හෙළිදරව් වෙනවා. මේ ගනුදෙනුව නිසා පමණක් නොවෙයි, චුදිතයා -අර්ජුන මහේන්ද්‍රන්- ආරක්ෂා කරන්නත්, ඔහු සඟවා තබන්නත් මේ කරන ලද මෙහෙයුම නිසා මේ පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, රටේ ජනතාව තුළත් අග්‍රාමාත්‍යවරයා පිළිබඳව විශ්වාසය හංග වී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. විශාල ලෙස චෝදනාවන්ට ලක්වී තිබෙන අමාත්‍යවරු ගණනාවක් ඉන්නවා. රේගුවේ ප්‍රාඩෝ රථ වංචාවන්, -මා කියන්නේ හිටපු අමාත්‍යවරයෙක් පිළිබඳවයි.- රේගුවේ සිද්ධ වුණු ගනුදෙනු, කරුංකා ගනුදෙනු ආදී ගනුදෙනු විශාල ප්‍රමාණයකට හවුල් වුණු අමාත්‍යවරු ඉන්නවා. තමන්ගේ ඇමති මණ්ඩලයේ අමාත්‍යවරු තමන් ඉදිරිපිට, තමන් දැනුවත්ව වංචාවේ දූෂණයේ යෙදෙනකොට වංචාව, දූෂණය නතර කිරීම තේමාව කර ගත් අග්‍රාමාත්‍යවරයාට අහක බලාගැනීමේ අයිතියක් තිබෙනවාද කියලා මා අහනවා. පැරණි දූෂිතයන් ආරක්ෂා කිරීම පමණක් නොවෙයි, අලුත් දූෂිතයන් නිර්මාණය කිරීමත්, ඒ දූෂිතයන්ට නිදැල්ලේ වංචා දූෂණයෙහි යෙදීම සඳහා ඉඩකඩ ලබාදීමත් නිසා අග්‍රාමාත්‍යවරයා කෙරෙහි තිබෙන විශ්වාසය පලුදු වෙනවා. ඒ නිසා අග්‍රාමාත්‍යවරයා තවදුරටත් මේ තනතුර දැරීම සුදුසු නොවේ කියලා අපිත් විශ්වාස කරනවා. ඒ විශ්වාසය මත තමයි අපි මෙම විශ්වාස භංග යෝජනාවට සහාය ප්‍රකාශ කරලා ඡන්දය ලබා දෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඒ පිටුපස තිබෙන දේශපාලන වුවමනාවත් අපි දන්නවා. ඒ පිටුපස තිබෙන දේශපාලන වුවමනාව කවරක්ද? විවිධ පන්නයේ වුවමනාවන් තිබෙනවා. අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම හරහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුළුතර ආණ්ඩුවක් හැදේවි කියා විශ්වාස කරන එක කණ්ඩායමක් ඉන්නවා. මාසයක්, මාස දෙකක් ඇතුළත ඒ සුළුතර ආණ්ඩුව හොල්ලා තමන්ට යළි අමාත්‍ය ධුරය දැරිය හැකියි කියා විශ්වාස කරන, වරප්‍රසාද අහිමිවීම, තනතුරු අහිමිවීම නිසා මාස තුනක් විස්සෝපයෙන්, වේදනාවෙන් ඉන්න කණ්ඩායමකගේ වුවමනාවකුත් මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීම තුළ තිබෙනවා. ඒ බව අපි දන්නවා. ඒ විතරක් නොවෙයි. ආණ්ඩුවක් හැටියට නිදහසීලීව සිටියදී පවා එම නිලධාරීන් විශාල කාර්ය භාරයක් කරලා වංචා, දූෂණ පිළිබඳව යම් නඩු ප්‍රමාණයක් පවරා තිබෙනවා. ඒ නඩු පිළිබඳව බයෙනුත් තවත් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ නඩු පිළිබඳව යම් පිරිසක් බයෙන් ඉන්නවා. මොකද, ඒවා ඉතා පැහැදිලි නඩු නිසායි. ගරු කථානායකතුමනි, මහ ජනයාගේ මුදල් වියදම් කරලා, නිවාස සංකීර්ණ හදලා, තමන්ගේ හතර වරිගයට නිවාස බෙදනවා නම්, ඒක දූෂණයක් නොවෙයිද? ඒ පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිසන් සභා වාර්තාවේත් තිබෙනවා. ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේත් නඩුවක් තිබෙනවා. ඒ හා අනුබද්ධිත කරුණු පිළිබඳව FCID එකෙත් නඩුවක් තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලෝ බිය වෙන්න ඕනෑ. අපි දන්නවා, ඒ ගොල්ලන් බියවන බව.

ඒ විතරක් නොවෙයි, නේද? Passports දෙකයි, නෝනාට තුනයි, උපන් දින හතරයි. එක වතාවක 1970 ඉපදිලා, තවත් වතාවක 1967 ඉපදිලා, 1971 ඉපදිලා. මහා බ්‍රහ්මයාද දන්නේත් නැහැ!

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද, අනේ!

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එක උප්පැන්න සහතිකයක 1970 ඉපදිලා තිබෙනවා. තව උප්පැන්න සහතිකයක 1967 ඉපදිලා තිබෙනවා. තවත් උප්පැන්න සහතිකයක 1971 ඉපදිලා තිබෙනවා. දරුවාගේ එක උප්පැන්න සහතිකයක තාත්තා ඉපදිලා තිබෙන්නේ 1967 අවුරුද්දේ. අනික් උප්පැන්න සහතිකයේ තාත්තා ඉපදිලා තිබෙන්නේ 1970 අවුරුද්දේ. මේ තරම් මජර විකෘති මානසිකත්වයක් සහිත අය ඉන්නවා. අපි දන්නවා, ඒ ගොල්ලන්ටත් මෙවැනි විශ්වාස භංගයක ඕනෑකමක් තිබෙනවාය කියලා. [බාධා කිරීම්] හරිද? මේක නේ සිද්ධවෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, වාහන ගැනත් මා කියන්නම්. පසුගිය දවස්වල පැවති පළාත් පාලන මැතිවරණයේදී නිමල් ප්‍රේමවංශ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ දූෂණ විරෝධී බල කණ්ඩුවක් වෙලා සිටියා. කවුද? නිමල් ප්‍රේමවංශ. තමන් ළඟ තිබුණු කැබ් රථය තමන්ගේ නෝනාගේ නමට කුලියට දීලා, තමන් කුලිය අරගෙන, තමන් පාවිච්චි කළා. ඒ කාරණය ඔබතුමන්ලාට තේරුණාද දන්නේ නැහැ. කල්පනා කරලා බලන්න. තමන්ගේ කැබ් රථය නෝනාගේ නමට ලියලා, නෝනාගේ නමින් නෝනාගේ කැබ් රථය මහත්තයා කුලියට ලබාගෙන, මහත්තයා කුලියත් අරගෙන, වාහනයේ යනවා, අමාත්‍යාංශයෙන් සල්ලි ගන්නවා. මේ ගොල්ලන් මොන දේශ ප්‍රේමීන්ද? මොන දේශ ප්‍රේමීන්ද? ඒ ගැන කියන්න කැනයි. අපටම ලජ්ජයි. අපටම ලජ්ජයි මේවා කියන්න.

ඒ විතරක්ද? කල්පනා කරලා බලන්න. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වාහනයක් කුලියට දෙනවා. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වාහනය කුලියට දුන්නාට පසුව කුලිය ගන්නවා. කුලිය අරගෙන නෝනාගේ ගිණුමේ දමා ගන්නවා. ඒක නේ සිද්ධවෙලා තිබෙන්නේ. ඒ ගොල්ලෝ තමයි ජාතික

සංවිධායකවරු. ඒ ගොල්ලනුත් බියට පත්වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට අවශ්‍යවෙලා තිබෙනවා, තමන්ගේ නඩු ක්‍රියාවලිය යම් ප්‍රමාණයකට අඩාළ කරගන්න. තමන්ගේ නඩු ක්‍රියාවලිය අඩාළ කරගැනීම වෙනුවෙන් අනිවාර්ය ලෙස මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දුර්වල කරන ලද පාලනයකට, පරිවාස තත්ත්වයකට යටත් කරන්න වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට නියමිත කාලයෙන් ඔබතුමාට වෙලාව ලබා දී තිබෙනවා. එතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
හොඳයි. එතුමාගේ කාලයෙන් මා විනාඩි 5ක් ගන්නම්.

ඒ අයට මේ පිළිබඳව ඉතා පැහැදිලි ලෙස බයක් තිබෙන බව අපි දන්නවා. ඒ නිසා ඒ අය කලබලවන එක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. ඒ අය කලබල විය යුතුව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපි දන්නවා, විශාල ලෙස කඳවුරු දෙකක් තිබෙන බව. එකක්, "ගෝඨාභය කල්ලිය". අනෙක් එක, "බැසිල් කල්ලිය". මෙහිදී බැසිල් කල්ලිය යම් ප්‍රමාණයකට නිහඬවෙලා තිබෙනවා. ඒ ඇයි? බැසිල් කල්ලියේ විශාල ප්‍රමාණයක් -

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්ඩලික හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්ඩලික හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
ගරු මන්ත්‍රීතුමනි, බාධා කරනවා නොවෙයි. ඔබතුමා ඒ අයගේ නම් කියනවා නම් හොඳයි. මොකද, එහෙම නැත්නම් වැරැදි වැටහීම් ඇති වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
හොඳයි. හොඳයි. That is not a point of Order.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
බොහොම හොඳයි. මා දැක්කා, අර්ජුන් ඇලෝසියස්ට සම්බන්ධ දූරකථන නාමාවලියේ "හෙක්ටර් අප්පුහාමී" කියලා නමක් තිබුණු බව. [බාධා කිරීම්] මා කියන්නම්. මා කියන්නම්. පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා. "හෙක්ටර් අප්පුහාමී" කියලා නමක් එහි තිබුණා. [බාධා කිරීම්] ඒ නම් කියන්න කියලා කිව්වා නේ. මටටක්කුලියේ ගුදමක් - [බාධා කිරීමක්] "හෙක්ටර් අප්පුහාමී" කියලා නමක් තිබුණා. ඇතිද? තව ඕනෑද? [බාධා කිරීම්] ඇති.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
හොඳයි. හොඳයි. දැන් ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ අයගේ නම් කියන්න කියලා එතුමා කියපු නිසායි මා කිව්වේ. මා මේ කියමින් ඉන්නේ, - [බාධා කිරීම්] තව ඕනෑද? [බාධා කිරීම්] හොඳයි. අපි ඒ කථාව නතර කරමු. මා කියන්න යන්නේ මොකක්ද?

ගරු කථානායකතුමනි, මේ කඳවුරු දෙකෙන් එක කඳවුරක් රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක සමීපව කටයුතු කරමින් සිටිනවා.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්ඩලික හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්ඩලික හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
මා කියන්න කිව්වේ, මගේ නම නොවෙයි. මා කිව්වේ, අර ඇමතිතුමාගේ නම කියන්න කියලායි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකවරු)
(The Hon. Speaker)
හොඳයි. හොඳයි. කමක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ නම නොවෙයිද ඇහුවේ? ගරු කථානායකතුමනි, ආණ්ඩුවට සිද්ධවෙලා තිබෙන විපරිත තත්ත්වය ඒක තමයි. මෙච්චර හොඳට කියද්දි නම දන්නේ නැතිව හොරු අල්ලයිද? මෙච්චර හොඳට කියද්දි නම හොයා ගන්න බැරි නම් ඔබතුමන්ලා හොරු අල්ලයිද? ඒක තමයි සිද්ධවෙලා තිබෙන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(මාණ්ඩලික හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
දන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්ඩලික අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
තමුන්නාන්සේලා දන්නේ නැහැ තමයි. [බාධා කිරීමක්] අධිකරණ ඇමතිතුමියත් අපෙන් අහනවා කවුද කියලා. අධිකරණ ඇමතිතුමිය තමයි මේ ගරු සභාවට ඇවිල්ලා කියන්න ඕනෑ කවුද කියලා. අධිකරණ ඇමතිතුමියත් අපෙන් අහනවා ඒ කවුද කියලා. ඒක තමයි ප්‍රශ්නය.

[ගරු අනුර දිසානායක මහතා]

විශේෂයෙන්ම බැසිල් රාජපක්ෂ බේරෙන්නේ කොහොමද? මා දැන ගන්න කැමතියි, බේරෙන්නේ කොහොමද කියලා? මල්වානේ ඉඩමක්, මාලිගාවක් වාගේ ගෙයක්, ඔරුතොට පාරේ ගෙවල්, බ්‍රවුන්ස්හිල් හි අක්කරයක ඉඩමක්. ඒවා පවරා ගත්තාද දන්නේ නැහැ. ගරු මංගල සමරවීර අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා, ඒ ඉඩම තරුණ කටයුතු පිළිබඳ ව්‍යාපෘතියකට පවරා ගන්නවාය කියලා. ඒවා බොරු. ඒවා කෙරෙන්නේ නැහැ. මොකක්වත් කෙරෙන්නේ නැහැයි කියලා මතක තබා ගන්න. මට මතකයි, ඒ ඉඩම තරුණ කටයුතු පිළිබඳ ව්‍යාපෘතියකට පවරා ගන්නවාය කියලා මංගල සමරවීර අමාත්‍යවරයා කිව්ව බව. මාතර බ්‍රවුන්ස්හිල් හි අක්කරයක ඉඩමක් තිබෙනවා. ඒ ඉඩමට අයිතිකාරයෙක් නැහැ. අයිතිකාරයන් නැති ඉඩම් තිබෙනවා. අයිතිකාරයන් නැති ගෙවල් තිබෙනවා. අයිතිකාරයන් නැති ගෙවල් ඔරුතොට පාරේ තිබෙනවා. හැබැයි බැසිල් රාජපක්ෂ නිදැල්ලේ ඉන්නවා. එහෙම ඉන්නේ කොහොමද කියලා අපි දැන ගන්න කැමතියි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදන්න කලින් කඳවුරම ආරක්ෂා කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා දැන් කල්පනා කරනවා, බැසිල්, ගෝඨා කියලා ඒ කඳවුර බෙදන්න පුළුවන්ය කියලා. මේක තමයි දැන් තිබෙන සැලැස්ම. දැන් ඇති තරම් පාඩම් ඉගෙනගෙනයි තිබෙන්නේ. තමුන්නාන්සේලා හිතනවාද, නැවත නැවත ආරක්ෂා වෙලා බෙදීම හරහා දේශපාලනය කරන්න? ඒ සඳහා යුක්ති සහගත අයිතියක් තිබෙනවාද? තමන්ගේ අගමැති ධුරය රැක ගන්න, තමන්ගේ ඡන්ද ප්‍රමාණය වැඩිකර ගන්න, අනෙක් පක්ෂ දුර්වල කරලා, කඩලා, දේශපාලනය තබා ගන්න එක නොවෙයි කෙරෙන්න ඕනෑ.

2015 ජනවාරි මාසයේ 8 වෙනි දා ලැබුණු ජන වරමත් එක්ක ගනුදෙනු කළා නම්, තමුන්නාන්සේලාට දිගු කාලීන ලෙස දේශපාලනයේ ඉන්න පුළුවන් වනවා. ඒ ජන වරමට යටත්ව කටයුතු කළා නම්, තමුන්නාන්සේලාට දේශපාලනයේ ඉන්න පුළුවන්. හැබැයි දේශපාලන පැවැත්ම ම හදලා තිබෙන්නේ "යටි ඩීල්", "යටි ගේම්" හරහායි. "යටි ඩීල්", "යටි ගේම්" හරහා හදන දේශපාලනයේ අසරණභාවයට අද තමුන්නාන්සේලා පත්වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට විශේෂයෙන්ම ජනාධිපති වරයාගේ භූමිකාව පිළිබඳව කථා කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ඕපපාතික එකක් නොවෙයි කියලා අපි ඉතා පැහැදිලිව දන්නවා. මේ විශ්වාස භංගය පළමුකොටම කරළියට ගෙනාවේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි. මොකද, යළි එකට ආණ්ඩුවක් ගෙනගන්න බැරි තත්ත්වයේ එතුමාගේ ප්‍රකාශයන් තමයි මුළු මැතිවරණ ව්‍යාපාරයම මෙහෙයවූයේ.

එතුමාගේ ප්‍රකාශය බවට පත් වෙලා තිබුණේ, ජනවාරි මාසයේ 10වැනි දායින් පස්සේ අනිවාර්යයෙන් වෙන ආණ්ඩුවක් හදන බව. හැබැයි, අනපේක්ෂිත ප්‍රතිඵලයක් එතුමාට ලැබුණා. ඒ නිසා එතුමා "අග්‍රාමාත්‍යවරයාට ඉවත් වන්න." කියන යෝජනාව ඉදිරිපත් කළා. එතුමා ඉල්ලීමක් කළා, "ඔබ ඉවත් වෙන්න. ඔබට තේරෙන්නේ නැද්ද, මෙය ජනතාවගේ ජන වරමක්. ඡන්ද ප්‍රතිඵලයේ හරය තේරෙන්නේ නැද්ද, කරුණාකරලා අයින් වෙන්න." කිව්වා. අයින් වෙන්න කියලාත් එය අසාර්ථක වුණායින් පස්සේ, අයින් කිරීම සඳහා උත්සාහයක් දැරුවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඇහුවා, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට අග්‍රාමාත්‍යවරයාව අයින් කරන්න පුළුවන්ද?" කියලා. ඒකත් අසාර්ථක වුණා. ඊට පස්සේ අයින් කිරීම සඳහා මෙහෙයුමක් දියත් කළා. ඒ මෙහෙයුම සඳහා එදා ජන වරම මුළුමනින්ම පාවා දෙමින් මෑත ලංකා දේශපාලන ඉතිහාසයේ අනිනත ගත හැකි නරකම පන්නයේ දේශපාලන ගනුදෙනුවකට යන්න උත්සාහ කළා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා. රනිල් වික්‍රමසිංහ මහත්මයා සම්බන්ධව අපේ විවේචන තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව, ආර්ථිකය කඩා වැටීම පිළිබඳව, නුවර ඇති වූ ඒ ගැටුම්කාරී තත්ත්වය සමනය කිරීමට අසමත්වීම පිළිබඳව සහ තවත් කරුණු ගොඩක් පිළිබඳව අපේ විවේචන තිබෙනවා. හැබැයි, විශ්වාස භංග යෝජනාව ගෙනා පාර්ශ්වයට තිබුණේ වෙන දේශපාලන අරමුණක්. එම දේශපාලන අරමුණේ ප්‍රධාන මෙහෙයුම්කරුවා බවට පත් වුණේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. එතුමා තමන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන් මුළුමනින්ම ජන වරමට එරෙහිව කටයුතු කරමින් තිබුණා. දිල්රුක්ෂි ඩයස් ඉවත් කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී, ගෝඨාභය අත් අඩංගුවට ගැනීම සඳහා ලිපි එවා තිබියදී අත් අඩංගුවට නොගැනීම පිළිබඳ ප්‍රශ්නයේදී, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයා අත් අඩංගුවට ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව ලියුම එවා තිබියදී ඒ ලියුම සැඟවීම පිළිබඳ ප්‍රශ්නයේදී, මේ සියල්ලම ජනාධිපතිවරයාගේ අනුදැනුම මත ක්‍රියාත්මක වෙච්ච දේවල්. මෙම වංචනිකයින් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක පසෙකත්, රනිල් වික්‍රමසිංහ මහතා තව පසෙකත් ඉඳගෙන ඉදිරියටම ගෙන යමින් තිබුණා. ඒ අනුව ඉතා පැහැදිලි ලෙසම අග්‍රාමාත්‍යවරයාත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් ජනවාරි මාසයේ 8වැනිදා ලද මුළු ජන වරමම පාවා දී ඒකට එරෙහිව පිටුපා කටයුතු කරමින් තිබෙනවා. දැන් රටේ යළි පෙන්වන්න හදන්නේ මොකක්ද?

සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදය අගයන පිරිස්වලට, යහ පාලනයක් අපේක්ෂා කරන ජනතාවට ඇති කරන්න හදන භය මොකක්ද? තමුන්නාන්සේලා හැම වෙලාවේම හදන භය, "අනේ, අග්‍රාමාත්‍යවරයාට මොකක් හෝ කරන්න එපා. නැවත රාජපක්ෂලා නැගිටියි." කියන එක. රටට පෙන්වන්න හදන්නේ, "රාජපක්ෂ බිල්ලා" තමයි. මුළු අවුරුදු තුනම රාජපක්ෂලාට වර්ධනය වෙන්න, ආරක්ෂා වෙන්න මුළුමනින්ම ඉඩකඩ හදා දීලා තීරණාත්මක තැනකදී අපෙන් අහනවා, "රාජපක්ෂලා යළි නැගිටියි. ඔයගොල්ලෝ රාජපක්ෂලා එක්ක හිට ගන්නවාද?" කියලා. රාජපක්ෂලා එක්ක අපි නොවෙයි හිට ගත්තේ. මුළු අවුරුදු තුනම හිට ගත්තේ ඔයගොල්ලෝ. ඔයගොල්ලෝ තමයි මුළු අවුරුදු තුනම හිට ගත්තේ. මම කියන්නේ, හෙටත් හිට ගන්නවා. තමුන්නාන්සේලා එහෙමයි. ඒ නිසා මොකක්ද කරලා තිබෙන්නේ? ඒ බිල්ලා තවදුරටත් මේ රටට වලංගු නැහැ.

රාජපක්ෂලාගේ ඒ ක්‍රියාකාරිත්වය පිළිබඳව බරපතළ ලෙස විවේචනයක් අපට තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදය කඩ කිරීම් පිළිබඳව, විශේෂයෙන්ම ගරු කථානායකතුමනි, ඝාතනයන් පිළිබඳව මොකක්ද ගත්ත ක්‍රියා මාර්ගය? ලඝන්ත වික්‍රමතුංග ඝාතනය කළා. සමහර අය කිව්වා, "මගේ හොඳ මිතුරා" කියලා. "මගෙත් එක්ක තමයි අන්තිමට දුරකථනයෙන් ඇමතුවේ." කිව්වා. "ලඝන්ත වික්‍රමතුංග කාර් එකේ යනකොට බයිසිකලයක් පිටු පස එනවා කියලා කෝල් එක දුන්නේ මට තමයි." කියපු ඇමතිවරු ඉන්නවා. එහෙම නේද? හැබැයි, මොකද වුණේ? ඝාතනය වුණාට පස්සේ ඝාතකයන් අත් අඩංගුවට ගැනීම සඳහා ඒ පරීක්ෂණවලට තමුන්නාන්සේලා දීපු දායකත්වය මොකක්ද? තාජුඩීන් ඝාතනය වෙලා තිබෙනවා. පරීක්ෂණය ඉස්සරහාට යනවා. අත් අඩංගුවට ගැනීම් සිද්ධ වනවා. නැවත යට යනවා. ඒවා එක එක මොහොතේදී දේශපාලන "ජිමික්" බවට පත් වෙලා තිබෙනවා. දේශපාලන වුවමනාව සඳහා උඩ එනවා; යට යනවා.

මාධ්‍ය ආයතන ගණනාවකට පහර දීලා තිබෙනවා. "සිරස" ආයතනයට පහර දුන්නා; ඒකට පැමිණිල්ලක් තිබෙනවා. "සියත" ආයතනයට පහර දුන්නා; ඒකට පැමිණිල්ලක් තිබෙනවා.

රාජගිරියේ අධි ආරක්ෂිත කලාපයේ තිබෙන "හිරු දින" කාර්යාලය ගිනි තිබ්බා; ඒකට පැමිණිල්ලක් තිබෙනවා. මම දැන ගන්න කැමැතියි, ඒ පරීක්ෂණවල තත්ත්වය කුමක්ද කියා. තමුන්නාන්සේලා හිතනවා, කාලයේ වැලිතලාවෙන් දෙයක් යට කරන්න පුළුවන් කියලා. මාධ්‍ය ආයතනවලට ගිනි තිබ්බා. මාධ්‍යවේදීන් ඝාතනය කළා. මාධ්‍යවේදීන්ගේ අතපය කැඩුවා. පෝද්දල ජයන්තගේ අතපය කැඩුවා. ඒ පිළිබඳව පොලීසියේ පැමිණිල්ලක් තිබෙනවා. විභාග කළ කරුණු මොනවාද? මේවා මම තමුන්නාන්සේලාගෙන් දැන ගන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි. කීත් නොයාර්ට පහර දුන්නා. පොලීසියේ පැමිණිලි තිබෙනවා. ඒ පිළිබඳව කෙරෙන පරීක්ෂණ කෝ? ඒ විතරක් නොවෙයි. "ද නේෂන්" පත්තරේ කර්තෘවරයා ලෙස සිටි උපාලි තෙන්නකෝන්ට පහර දුන්නා. කෝ ඒ පිළිබඳ පරීක්ෂණ? ඝාතනයන්, ජනතාවට එල්ලවී තිබෙන මර්දන ක්‍රියා ඇතුළු මේ කිසිවකට තමුන්නාන්සේලා පියවරක් ගත්තේ නැහැ.

ගරු කථානායකතුමනි, යුද්ධය අවසන් වීමෙන් පස්සේ 2012 වසරේදී අපි උත්සාහ කළා යාපනයේ දේශපාලනය කරන්න. යාපනයට පූර්ණකාලීනව අපේ සහෝදරවරු යැව්වා. ඉතාම දක්ෂ තරුණයෙක් අපට හිටියා; "ලලිත්" කියලා දෙමළ සහෝදරයෙක්. ඒ වාගේම යාපනයේ ක්‍රියාකාරීව හිටියා, "කුගන්" කියලා දෙමළ සහෝදරයෙක්. අපේ පක්ෂයේ දේශපාලන ප්‍රශ්නයක් නිසා ඔවුන් දේශපාලනයෙන් යම් ප්‍රමාණයකට දුරස් වුණා. හැබැයි ඔවුන් දුරස් වුණත්, යාපනයේ දේශපාලනය කළා. ලලිත් වීරරාජු සහෝදරයා ඇතුළු අය යාපනයේ දේශපාලනය කළා. 2012 වසරේදී යුද්ධය අවසන් වුණා. හැබැයි දේශපාලනය කළ වරදට ඔවුන් පැහැර ගෙන ගිහිල්ලා, අද අතුරු දහන් වෙලා තිබෙනවා. මොකක්ද සිදු වුණේ කියලා දන්නේ නැහැ. ඇයි ඒ? ලසන්ත වික්‍රමතුංග ගැන අඩු තරමේ පත්තරවලවත් ලියැවෙනවා, ලොකු මාධ්‍යවේදියෙක් නිසා. වසීම් තාජුඩීන් ගැන කියැවෙනවා, ලොකු රගර් ක්‍රීඩකයෙක් නිසා. හැබැයි, ලලිත්-කුගන්ලා ගැන කියැවෙන්නේවත් නැහැ. යුද්ධය කාලයේ මේ ඝාධාරණය කරන්න කියලා මා කියන්නේ නැහැ. හැබැයි, යුද්ධයෙන් පසුව 2012 වසරේදී යාපනෙය්දී තමයි ඒ පැහැර ගැනීම සිදු වුණේ.

ගරු කථානායකතුමනි, යුද්ධයෙන් පසුව යාපනයේ තිබුණු තත්ත්වය මොකක්ද? අල්පෙනෙත්තක් බිම වැටුණත් හමුදා බුද්ධි අංශ නිලධාරින්ට ඇහෙන විධියට හමුදාව එළලායි තිබුණේ. හිටපු හමුදාපතිතුමා දන්නවා, යුද්ධයෙන් පසුව එල්ටීටීඊ සන්නද්ධ ක්‍රියාකාරකම් යළි පැන නහියි කියලා හැම අස්සක් මුල්ලක් නෑරම බුද්ධි අංශ යොදවලා තිබුණා. හැබැයි, කිසිසේත්ම බුද්ධි අංශ නිලධාරින්ගේ -ඔවුන්ගේ- අවබෝධයකින් තොරව, හැඟීමකින් තොරව ලලිත් සහ කුගන් පැහැරගෙන යන්න බැහැ. හැබැයි, පැහැරගෙන ගියා. මම අහනවා, තමුන්නාන්සේලා පරීක්ෂණයට මොකක්ද කළේ කියලා. අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දේශපාලනය කරන්න යාපනයට ගියා, හැම ගහක් ගානේම හමුදාව එළා තිබුණු කාලයේ. එතුමා දේශපාලනය කරන්න යාපනයට ගියාම, පහර දීලා ඔළුව පැලුවා. ඒ පිළිබඳව පැමිණිලි තිබෙනවා, පොතේ. ඒවා පොත්වලට පමණක් සීමා වුණා. මර්දනකාරී, ප්‍රජාතන්ත්‍ර විරෝධී ත්‍රාඩයන්ට, මිනී මරුවන්ට තමුන්නාන්සේලා රැකවරණය දුන්නා. මතක තබා ගන්න, තමුන්නාන්සේලා ඒ අය ආරක්ෂා කළා.

SAITM එකේ CEOගේ ප්‍රශ්නය අපි දැක්කා. තමුන්නාන්සේලා හැසිරුණේ කොහොමද? ඔහු විසින් සැලසුම්කොට ඔහුට බෝම්බ ගහ ගත්ත බව හෙළිදරව් වී තිබෙනවා. සැලසුම් සහගත ලෙස බෝම්බ ගහ ගත්ත බව හෙළිදරව් වී තිබෙනවා, නමුත් පරීක්ෂණ නැහැ. බෝම්බ ගහපු පුද්ගලයාත් එළියේ, CEOත් එළියේ. තමුන්නාන්සේලාගේ වුවමනා වෙනුවෙන් කුමන්ත්‍රණකාරී ලෙස ගිනි අවි පාවිච්චි කරන්න, බෝම්බ ගහන්න ඉඩකඩ හදා දීලා තිබෙනවා. ඝාතකයන් ආරක්ෂා කරනවා; මිනී මරුවන් ආරක්ෂා කරනවා; පරීක්ෂණ අඩාළ කරනවා. එතකොට තමුන්නාන්සේලා පිළිබඳ විශ්වාසය පලුදු වෙලා නැද්ද? තමුන්නාන්සේලා කියන්නේ, විශ්වාසය ශක්තිමත් වෙලා තිබෙනවා කියලාද? විශ්වාසය මුළුමනින්ම පලුදු වෙලායි තිබෙන්නේ. හරි නම් ජනතාව විනිශ්චය කරන ජනතා විනිශ්චය සභාවක් හමුවේ තමුන්නාන්සේලාගේ නඩු අහන්න ඕනෑ, මේ කරපු අපරාධයට.

ගරු කථානායකතුමනි, 2015 ජනවාරි මාසයේ 8 වනදා වාගේ දවසක් ආයෙත් කවදාවත් ලංකාවේ ඉතිහාසයට එකතු වෙන්නේ නැති බව මතක තබා ගන්න. 2015 ජනවාරි 08 වනදා යළි එන්නේ නැහැ. ජනවාරි මාසයේ 08 වනදා දේශපාලන ක්‍රියාමාර්ගවලට තිබුණු වලංගුභාවයත් අද නැති කරලා තිබෙනවා. දේශපාලන ක්‍රියාමාර්ගයක් හැටියට ගත්තොත් ඒක ඉතාම ප්‍රගතිගාමී ක්‍රියාමාර්ගයක්. එක එක පරස්පර මත තිබෙන කණ්ඩායම් එකතු වෙලා, තමන් තෝරා ගන්නා ලද දේශපාලන ක්‍රියාමාර්ග කිහිපයක් ගැන පමණක් එකඟතාවකට එනවා.

ගරු කථානායකතුමනි, "පොදු අපේක්ෂකයා" කියන සංකල්පය බලමු. 1982 ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයා පිළිබඳ ඝාකච්ඡාව ආවා; කර ගන්න බැරි වුණා. මංගල සමරවීර අමාත්‍යතුමාත් මේ ගැන කිව්වා. 1989 වසරේදී පොදු අපේක්ෂකයා පිළිබඳ ඝාකච්ඡාව ආවා; කර ගන්න බැරි වුණා. 2010 වසරේදී පොදු අපේක්ෂකයා පිළිබඳ ඝාකච්ඡාව ආවා; ක්‍රියාත්මක වුණා; නමුත් ජයග්‍රහණය කර ගන්න බැරි වුණා. හැබැයි 2015 වසරේදී පොදු අපේක්ෂකයාත් ආවා, ජයග්‍රහණය කර ගන්නත් පුළුවන්කම ලැබුණා. ඒවා අපේ රටේ දේශපාලන ඉතිහාසයේ ඉතාම වැදගත් අවස්ථා. ඒ වැදගත් අවස්ථාවල වටිනාකම, ඒ වැදගත් අවස්ථාවලට තිබෙන බර රැකෙන්නේ, ඒ වැදගත් අවස්ථාවේ පත් වන පාලකයා ඒ අවස්ථාවට නිසි ගෞරවය සහ වටිනාකම ලබා දුන්නොත් විතරයි. අද තමුන්නාන්සේලා ජනවාරි 08 වනදා පන්නයේ ක්‍රියාමාර්ග අවලංගු වුණු තත්ත්වයක් නිර්මාණය කරලා තිබෙනවා. ඇයි ඒ? තමුන්නාන්සේලා මුළුමනින්ම ඒක පාවා දීලා තිබෙනවා. මම දැක්කා, ලක්ෂ 62ක ජනතාවක් ඉන්නවා කියලා කියා තිබෙනවා. ලක්ෂ 62ක ජනතාවගේ ජන වරමට මුළුමනින්ම පිටුපාලා තිබෙනවා. මේ අග්‍රාමාත්‍යවරයාත්, මේ ජනාධිපතිවරයාත් ඉතා දැනුවත්ව, සැලසුම් සහගතව එම ජන වරමට පිටුපාලා තිබෙද්දී තමුන්නාන්සේලාට තව කියන්න පුළුවන්ද, අපට ලක්ෂ 62ක ජන වරමක් තිබෙනවා කියලා? එහෙම ජන වරමක් රඳා පවතින්නේ නැහැ. ජන වරම රඳා පවතින්නේ ජන වරමත් එක්ක සමගාමීව. ඒ ජනවරමත් එක්ක එකට බැඳිලා, ගැටෙන්නේ නැතුව ගමන් කළා නම් තමයි ජන වරම රඳා පවතින්නේ. හැබැයි තමුන්නාන්සේලා මුළු අවුරුදු තුනම ගමන් කළේ, ජන වරමත් එක්ක ගැටෙමිනුයි. ඒ නිසා දේශපාලනික වශයෙන් අද අපේ රටේ විශාල අරාජිකත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒක අති විශාල අරාජිකත්වයක්. දේශපාලන ව්‍යාපාරයේ යෙදෙන අය හැටියට අපි කවුරුවත් රටක මෙවැනි දේශපාලන අරාජිකත්වයක් අපේක්ෂා කරන්නේ නැහැ.

අධිකරණ පද්ධතියේ නඩු ඇහෙන විධිය අපි දැකලා තිබෙනවා. කොහොමද, එහෙම නඩු ඇහෙන්නේ? කොහොමද, නඩු ඇහෙන්නේ? ගරු කථානායකතුමනි, කවුරු හෝ අත් අඩංගුවට ගත්තාට පස්සේ අත් අඩංගුවට ගැනීම හරිද, වැරදිද කියලා විභාග කිරීමේ බලය අධිකරණයට තිබෙනවා. කවුරු හෝ අත් අඩංගුවට ගත්තාට පස්සේ අත් අඩංගුවට ගැනීම හරිද වැරදිද කියලා විභාග කරන එක ඒ ගොල්ලන්ට පැවරී තිබෙන බලයක්. හැබැයි, අපේ රටේ අද අධිකරණයේ තිබෙනවා, අත් අඩංගුවට ගැනීම වැළැක්වීම සඳහා පරීක්ෂණ ක්‍රියාවලියක්. අත් අඩංගුවට ගන්නවා කියන්නේ පරීක්ෂණ ක්‍රියාවලියේ කොටසක්. හැබැයි,

[ගරු අනුර දිසානායක මහතා]

පරීක්ෂණ ක්‍රියාවලියට, විනිශ්චය දෙන කෙනා බාධා කරමින් තිබෙනවා. එවැනි තත්ත්වයක් නිර්මාණය වුණේ මොකක් නිසාද? එවැනි තත්ත්වයක් නිර්මාණය වුණේ ජන වරමට පිටුපාපු, ජන බලයක් නැති, අරාජිකත්වයක් සහිත වැනෙන, පණ නැති පාලනයක් තිබෙන නිසායි. ඒ පාලනය මේ සංස්ථා මුළුමනින්ම අකර්මණ්‍ය කරලා තිබෙනවා. අද පොලිස් දෙපාර්තමේන්තුව කඩා වට්ටලා තිබෙනවා; නීතිපති දෙපාර්තමේන්තුව කඩා වට්ටලා තිබෙනවා. මුළුමනින්ම අද අපේ රටේ දේශපාලනයේ අරාජිකත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරයෙක් නියෝගයක් පිළිපදින්නේ නැති තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. පොලීසියේ නිලධාරියෙක් වග කීමක් සහිත කටයුත්තකට අත ගහන්න භය වෙලා තිබෙනවා. FCID එකේ නිලධාරීන් තමන්ගේ ජීවිතය පිළිබඳව තර්ජනයකට මුහුණ දී තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉතාමත් දක්ෂ නිලධාරීන්. ඒ අය විශාල කාර්ය භාරයක් කරනවා, මේ වැඩ කටයුත්තේදී. හැබැයි, ඔවුන් භීතියට පත් කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ දේශපාලන දාදු කෙළීම, තමුන්නාන්සේලාගේ දේශපාලනයේ සූදුව නිසා මේ රටේ වැදගත් මධ්‍යස්ථාන පවා අරාජිකත්වයට පත් වෙලා තිබෙනවා.

මේ රටේ ඇති කර තිබෙන දේශපාලන අරාජිකත්වයෙන් කිසිවක් සිදු නොවන තත්ත්වයට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑකම තිබෙනවා. ඒ නිසා මේ අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා එක සමානයි. සමහරවිට එක කරුණකදී ජනාධිපතිවරයාට වැඩි බරක් එනවා; අග්‍රාමාත්‍යවරයාට අඩු බරක් එනවා. තව කරුණකදී අග්‍රාමාත්‍යවරයාට වැඩි බරක් එනවා; ජනාධිපතිවරයාට අඩු බරක් එනවා. කෙසේ වුවත්, මේ දෙදෙනා එක ලෙස ජනවාරි මාසයේ 8 වැනිදා ජනවරම පාවා දී තිබෙනවා. මේ දෙදෙනා එක ලෙස ජනවාරි මාසයේ 8 වැනිදා ජනතාවත් දන්නා එකඟතාව බිඳ වට්ටලා තිබෙනවා. මේ දෙදෙනා එක ලෙස එකට ගැට ගැසී මේ රටේ දේශපාලන අරාජිකත්වයක් නිර්මාණය කොට තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි කියන්නේ එවැනි දේශපාලන අරාජිකත්වයක් සහිත පාලනයක්, අග්‍රාමාත්‍යවරයා තවදුරටත් අගමැති පුටුව ආරක්ෂා කර ගැනීමෙන් පහව යන්නේ නැහැ කියායි. අග්‍රාමාත්‍යවරයා අගමැති පුටුවේ වාඩි වීම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කල්පනා කරනවා ඇති. අපිත් එහෙම හිතනවා. අපට කමක් නැහැ. ඒවා ඔබතුමන්ලාගේ අභ්‍යන්තර ප්‍රශ්න.

මම දැක්කා, එක මන්ත්‍රීවරයෙක් විශ්වාස භංගය වෙනුවෙන් කථා කරමින් කියනවා, මේ සතියේ රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අතින් අල්ලනවාලු; හිනා වෙනවාලු කියා. අනේ! අපට නම් වැඩක් නැහැ. ඔබතුමන්ලා එක්ක රණ්ඩු වුණත් එකයි, හිනහ වුණත් එකයි. අපට මොකෝ? අපට ඒවා අදාළ නැහැ. ඔබතුමන්ලාට වැඩි වටිනාකම් දෙන්න අපට වැඩක් නැහැ. ඔබතුමන්ලාගේ නායකයා ඔබතුමන්ලාට මොන විධියට සලකනවාද, මොන විධියට ඔබතුමන්ලාගේ නායකයා ඔබතුමන්ලා එක්ක ජීවත් වෙනවාද කියන එක ඔබතුමන්ලාගේ වැඩක්; ඒක අපේ වැඩක් නොවෙයි. හැබැයි, අපි කල්පනා කරනවා, රටේ වැඩේ ගැන. විශ්වාස භංගය නිසා පක්ෂයේදී නායකයා හැසිරෙන්නේ කොහොමද? මම දැක්කා, විශ්වාස භංගයේ ජයග්‍රහණ වැලක්. විශ්වාස භංගයේ එක ජයග්‍රහණයක් තමයි, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් එක්ක රනිල් වික්‍රමසිංහ මහත්මයා කිට්ටුවෙන් වැඩ කරන්න හදනවා කියන කාරණය. ඉතින්, අපට මොකෝ? ඒවාට විශ්වාස භංග ගෙනෙන්න ඕනෑද? තව කියනවා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙක නැතිවීම විශ්වාස භංගයේ තව ජයග්‍රහණයක් කියලා. කොහොමත් තුනෙන් දෙක තිබුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ 106යි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 39යි වශයෙන් 145යි තිබුණේ. කොහොමත් තුනෙන් දෙක තිබුණේ නැහැ. තුනෙන් දෙක අහෝසිවීම ජයග්‍රහණයක් ලු . [බාධා කිරීමක්] ආ! ඒකත් එක්කද, දැම්මේ? හරි ලස්සනයි. ඕකට තමයි ඔබතුමන්ලා හැමදාමත් සිහින මැව්වේ. ඒ කියන්නේ, මෙතුමන්ලා හැමදාමත් ඉතා පැහැදිලිව වංචනිකයන්ව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්, නඩුවලින් මහහරවා ගැනීම වෙනුවෙන් ඉතාමත් හොඳ සමීප ගනුදෙනු තබා ගෙන ඉන්නවා. පොහොට්ටුවේ ගෝඨාභය කණ්ඩායමෙන් අහලා බලන්න. ගෝඨාභය කණ්ඩායම කියනවා, "බැසිල් ආරක්ෂා කරනවා. බැසිල්ගේ නඩු ඔක්කෝම බේරලා දීලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා මැදිහත් වෙලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා බැසිල් රාජපක්ෂ මහත්මයාට එකඟ වෙලා තිබෙනවා, රාජපක්ෂ පවුල බේරලා දෙන බවට" කියලා. ඒක නේ කියන්නේ. එහෙම කියලා, අපට "deal" කියනවා. මොකක්ද මේ? එළියේදී හම්බ වුණාම හැමදාම අපට ඔබතුමන්ලා කියන්නේ ඒක තමයි. ඒවා අපි නොදන්නා නොවෙයි. තමුන්නාන්සේලා අපට කියනවා නේ, "බැසිල් සහ රනිල් වික්‍රමසිංහ මහත්මයා අතර එකඟතාවක් තිබෙනවා, පවුලේ නඩු බේරලා දෙන බවට එකඟ වෙලා තිබෙනවා. අපේ නඩු තමයි නඩු. අරවා නඩු නොවෙයි ලු" කියලා. එහෙම නේ අපට කියන්නේ. එහෙම කියමින් අපට මෙහෙම කියනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ ආරක්ෂාව, තමුන්නාන්සේලාගේ නඩු බේරා ගැනීම වෙනුවෙන් ඉතාමත් ශක්තිමත් බැඳීම්, "ඩීල්" තිබෙන කණ්ඩායමක් තමයි, මේ ඉන්නේ.

ගරු කථානායකතුමනි, අපට දේශපාලන ස්ථාවරයක් තිබෙනවා. හැඟීම්වලට හෝ එකිනෙකා පුද්ගලයා මත පදනම්ව කරන දේශපාලනය ව්‍යාපාරයක් නොවෙයි, අපේ දේශපාලන ව්‍යාපාරය. අපි ජනවාරි මාසයේ 8 වැනිදා ජන වරම පිළිබඳව, ඒ ජනතාවගේ අපේක්ෂාවන් පිළිබඳව හැඟීමක් තිබෙන දේශපාලන ව්‍යාපාරයක්. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ විශ්වාස භංගය ජනවාරි මාසයේ 8 වැනිදා ජන වරමත් එක්ක සමපාතයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ඒ ජන වරමේ සිතුම් පැතුම්, වුවමනාවන් මේ විශ්වාස භංගය තුළ ඇතුළත් වී තිබෙනවා. ඒ ජන වරම නියෝජනය කරමින් තමයි අපි මෙයට සහය දෙන්නේ.

මම දැක්කා, විවිධ කට කථා ගොඩනැහෙමින් තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණ කොහොම කරයිද, ජනතා විමුක්ති පෙරමුණේ ඉන්නේ ගොඩක් දන්නේ නැති අය කියලා. ජනතා විමුක්ති පෙරමුණේ අපි හයදෙනා හිටගත්තොත් එකට; ඉඳගත්තොත් එකට. ඒක හොඳට මතක තබා ගන්න. එම නිසා ඉතා පැහැදිලි ලෙස අපේ මන්ත්‍රී කණ්ඩායම මේ විශ්වාස භංග යෝජනාවට සහාය දෙන බව ප්‍රකාශයට පත් කරනවා.

විශේෂයෙන් අග්‍රාමාත්‍යවරයා මේ රට අරාජිකත්වයට පත් කිරීම, ජාතිවාදය වර්ධනය කරන්නට ඉඩ හැරීම, වංචනිකයන් ආරක්ෂා කිරීම, වංචාවේ යෙදීම, ආර්ථිකය කඩා වැටීම, ගොවි ජනතාවගේ, ධීවර ජනතාවගේ අපේක්ෂාවන් බිඳ වැටීම ආදී කරුණු ගණනාවකින් විශ්වාසය පළුදුකොට ගෙන තිබෙනවා. එම නිසා මේ විශ්වාස භංග යෝජනාවට අපේ සහාය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 07ක් තිබෙනවා.

[අ.භා. 6.10]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ඒ වාගේම පවතින රජයටත් විරුද්ධව ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම විසින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඊයේ රාත්‍රී 12 වෙනතුරු ඔවුන් මේ ගැන බොහොම පුරසාරම් දෙඩුවා; මේ විශ්වාස භංග යෝජනාව දිනන හැටි මාධ්‍ය ඔස්සේ කිව්වා; දිනන විධිය කිව්වා; එකතුවෙලා ඉන්න මන්ත්‍රීවරු සංඛ්‍යාව කිව්වා. විවිධ පුරසාරම් දොඩවලා අද උදේ වෙනකොට හුළං බැහැලා. අද වෙනකොට ජයග්‍රහණය ගැන කථාවක් නැහැ. රෝද හතරේම හුළං බැහැලා. "ස්පෙයාර් වීල්" එකේත් හුළං බැහැලා. දැන් තිබෙන ප්‍රශ්නය විශ්වාස භංග යෝජනාවට අත්සන් කළ පණස් පස් දෙනා සොයා ගන්න එක. අද ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රධාන කාර්යය වෙලා තිබෙන්නේ ඒ පණස් පස් දෙනා කොහොමද සොයා ගන්නේ කියන එකයි; දිනන එක නොවෙයි. ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, දිනනවාය කියන්නේ විශ්වාස භංග යෝජනාව දිනන එක නොවෙයි; මේ පක්ෂවලට වෙලා තිබෙන ප්‍රෙෂර් එකම දිනීමක්" කියා. මුස්ලිම් කොංග්‍රසය දෙදරන්නට යනවාලු, එක්සත් ජාතික පක්ෂය දෙදරන්නට යනවාලු, ද්‍රවිඩ පක්ෂ දෙදරන්නට යනවාලු. නමුත් එතුමාට මතක නැහැ, එතුමාගේ පක්ෂය ඊයේ පෙරේදා දෙදරලා, ඉන්න මන්ත්‍රීවරයා පැනලා ගියා; කඩාගෙන ගියාය කියන එක. ගරු වීරකුමාර දිසානායක මන්ත්‍රීතුමාව රැක ගන්නටත් බැරි වුණා, තමුන්ගේ පක්ෂය රැක ගන්නටත් බැරි වුණා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් ඔය විශ්වාස භංග යෝජනාව ගෙනෙනකොට තමන්ට පක්ෂව හිටපු ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියවත් බෙරා ගන්නටත් බැරිව ගියා; එතුමිත් පක්ෂය කඩා ගෙන ගියා. අපට එක ඇඟිල්ලක් දික් කරනකොට තමුන්නාන්සේලාට ඇඟිලි තුනක් දික් වෙලා තිබෙන බව මතක තියා ගන්නට ඕනෑ.

අපට තේරෙනවා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ දිනන්න නොවේය කියා. ලභි ලභියේ, කඩිමුඩි වුණේ මොකද? ඊයේ පෙරේදා බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ වාර්තාව ආවා. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු රාශියකගේ නම් එහි තිබෙනවා; කරපු හොරකම් තිබෙනවා; කරපු වැරදි තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. වංචා 34ක්. ඊළඟට සභාවේ අනුමතිය සඳහා එන්නට නියමිතයි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත. ඉස්සර නම් අධිකරණයට ගියාම "පොර ටෝක්" දීලා වීර කැප්පෙට්ටිපොළලා වාගේ එළියට එන්නට පුළුවන්. මොකද හේතුව, ආයෙත් නඩු වාරය තිබෙන්නේ තවත් අවුරුද්දකින් නේ. දැන් මේ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වුණාම එදිනෙදා නඩු අහන්න පටන් ගන්නවා. මහා පරිමාණ මූල්‍ය වංචා පිළිබඳව එදිනෙදා නඩු අහන්න පටන් ගන්නවා.

අග්‍රාමාත්‍යතුමාට ඉදිරිපත් කරන්නට ඕනෑ, විශ්වාස භංග යෝජනාවක් නොවෙයි; විශ්වාසය පළ කිරීමේ යෝජනාවක්. මොකද අපි දන්නවා, මේ රට කොහොමද තිබුණේ කියා. අද විපක්ෂයේ කථාවලින්ම කිව්වා. කළු සල්ලි සුදු කරන රටක් විධියට ප්‍රචලිත වෙලා මේ රට යුරෝපීය පාර්ලිමේන්තුව blacklist කළා කියා. ඇයි blacklist කළේ? වර්තමානය ගැනද? නැහැ. එදා 2014 වෙනතුරු කළ පරීක්ෂණවල ප්‍රතිඵල වශයෙන් තමයි අද උත්තරය දුන්නේ. Blacklist කර තිබෙනවා. මේවාට වැට බැන්දේ නැත්නම්, මේවාට නීති හැදුවේ නැත්නම් ඊළඟට blacklist කරනවාය කිව්වේ එදා කරපු හොරකම් ගැන කියලායි. අපට තමයි මේවාට වගඋත්තර බඳින්නට වෙලා තිබෙන්නේ, අපට තමයි මේවා නිවැරදි කරන්න වෙලා තිබෙන්නේ. ගරු අග්‍රාමාත්‍යතුමා මේවා නිවැරදි කරන්න පියවර ගෙන තිබෙනවා.

GSP Plus සහනය අපට නැතිව ගියා. ඇයි නැතිව ගියේ? මේ රටේ මානව හිමිකම් රැකුණේ නැහැ. සුදු වැන් ඇවිල්ලා හිතෙන, හිතෙන විරුද්ධකාරයන් උස්සාගෙන ගියා. උද්ඝෝෂණය කරන මිනිසුන්ට ගැහුවා; වෙඩි තිබ්බා; මැරුවා. උද්ඝෝෂණය කරන්න මිනිස්සු භය වුණා. විරුද්ධව කථා කරන්න භය වුණා. විරුද්ධව පත්තරයක ලියන්න බැරි වුණා. මාධ්‍යවේදීන් කී දෙනෙක් මැරුවා ද? මාධ්‍යවේදීන් කී දෙනෙක් අතුරුදන් වුණා ද? මාධ්‍ය ආයතන කීයක් ගිනි තියලා කුඩුපට්ටම් කළා ද? එවැනි තත්ත්වයක් තිබුණු සමාජයක් නේද අරගෙන ගියේ? නමුත් අපි GSP සහනය යළි ලබා ගත්තා. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා දෙසීයක් හැදුවා. GSP සහනය නැති කරලා එකසිය අසූවක් වැහුණා. අද ඒවා ගොඩ නහමින් යනවා. යුරෝපය අපේ මත්ස්‍ය නිෂ්පාදන මිලදී ගන්න එක නැතිව ගියා. එම නිසා මේ රටේ ආර්ථික සංවර්ධනය නැතිව ගියා. නමුත් අපි ගරු අග්‍රාමාත්‍යතුමාට සහ විශේෂයෙන් නව රජයට ස්තුතිවන්ත වෙනවා. කෙසේ හෝ මේ තත්ත්වයට රට පත් කර ලෝකය පිළිගන්නා තත්ත්වයකට ගෙන ඒම ගැන විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

අද කියනවා, අර්ජුන ඇලෝසියස් ගැන. ඇයි, ඔබතුමන්ලාගේ කාලයේදී සිදු වුණු පාඩු ගැන කොමිෂන් සභා පත් කරන්න තිබුණා නේද? ලාභ ලබමින් තිබුණු SriLankan Airlines තමන්ගේ මස්සිනාගේ පාලනයට දීලා අවුරුද්දකට පාඩුව රුපියල් කෝටි 3,134යි.

ඇයි, ඒ කාලයේ මේවා ගැන කථා කරන්න කොමිෂන් සභා පත් කළාද? ඒ ගැන හෙව්වාද? අඩු ගණනේ ඒ ගැන හොයන්න කමිටුවක් පත් කළාද? මීග් යානා ගනුදෙනුවට සම්බන්ධ තව මස්සිනා කෙනෙක් රුසියාවේ තානාපති කාර්යාලයට යැව්වා. අද ඔහු රටින් පැනලා ඉන්නවා. ඔහු අල්ලා ගන්න විධියක් නැහැ; මස්සිනාව අල්ලන්න ක්‍රමයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ කථාව මම තවම පටන් ගත්තේත් නැහැ.

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල නුවර ඇති වූ සිද්ධිය නවත්වන්න මේ ආණ්ඩුව කටයුතු කළා. මතක නැද්ද, ඒ කාලයේ බෙරුවල, අලුත්ගම, දර්ගා නගරයේ සිදු වූ සිද්ධීන්? ඒවා නවත්වන්න පසුගිය ආණ්ඩුව කටයුතු කළාද? මේ රජය නුවර සිදු වූ සිද්ධිය නුවරින් විසඳුවා. එම සිද්ධිය නුවරින් එහාට ව්‍යාප්ත

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වන්න ඉඩ තැබුවේ නැහැ. නමුත් අපට මතකයි, 83 කළු ජූලිය කාලයේ මේ රටේ ජාතිවාදය ව්‍යාප්ත වුණේ කොහොමද කියලා. කෙසේ වෙතත් අපට එවැනි සිදුවීම් නැවැත්වීමේ හැකියාව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ගොල්ලන් කියනවා, බැදුම්කර වංචාව සිදු කිරීමේ කූට අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ එහෙම නැත්නම්, අගමැතිතුමා යටතේ තබා ගත්තා කියලා. මතක නැද්ද, පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේ මහින්ද රාජපක්ෂ කියා නම කියන්නවත් බැහැ. නම කියන්න තහනම්. හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කියනවා. TV එකක හෝ ගුවන් විදුලියක ඒ නම වෙනුවට ටීක් - ටීක් - ටීක් කියලායි යන්නේ. නම කියන්නේ නැහැ. එහෙම කෙනෙක් යටතේනේද මහ බැංකුව තිබුණේ? මතක නැද්ද? ඒ කාලයේ ජනාධිපති බලතල පාවිච්චි කරලා මහ බැංකුව තුළින් කරපු හොරකම් හෙට-අනිද්දා වනකොට එළියට එනවා. නමුත්, ඉතිහාසයේ පළමුවෙනි වතාවට තමුන්ගේ රජයක් යටතේ සිදු වුණු වංචාවක් බොහොම සද්භාවයෙන් විමර්ශනය කිරීම සඳහා කටයුතු කරපු රජය මේ රජයයි. ඒ නිසාද අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ? ඒකාධිපති පාලනයක්, දුර්දාන්ත පාලනයක් තිබුණු රටක් පිරිසිදු කරන්න අග්‍රාමාත්‍යතුමා ගත් පියවර කොපමණ තිබෙනවාද? COPE එකේ සභාපති ධුරය විපක්ෂයට භාර දුන්නා. පසුගිය ආණ්ඩුව කාලයේ COPE එකේ සභාපති ධුරය විපක්ෂයට දුන්නාද? COPE එකේ සභාපති ධුරය එදා දුන්නේ ආණ්ඩුවේ සිටි ඇමති කෙනෙකුට නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කරුණාකර ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මට තව එක විනාඩියක් දෙන්න.

අපේ රජය ස්වාධීන කොමිෂන් සභා හැදුවා; FCID එක ඇති කළා; තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කළා; සියලු මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කළා; අපරාධයක විස්තිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කළා. ඒ වාගේම අගමැතිතුමා ඉදිරියේ මුහුණට මුහුණ ඉඳගෙන එතුමාගෙන් ප්‍රශ්න කරන්න පුළුවන් අවස්ථාව අපි විපක්ෂයට ලබා දුන්නා. ඒ තුළින් අපි ප්‍රජාතන්ත්‍රවාදය ඇති කළා. ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව අගමැතිතුමාගේ විශ්වාසය පලුදු කිරීමට ගෙනා යෝජනාවක් වුණාට, අද එය අගමැතිතුමාගේ විශ්වාසය සනාථ කෙරෙන යෝජනාවක් බවට පත් වෙලා තිබෙනවාය කියන එක විශේෂයෙන්ම මා කියනවා. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි.

මේ විශ්වාස භංග යෝජනාව තුළින් අපේ යහ පාලන ආණ්ඩුව විකෘති කරන්න; විනාශ කරන්න කටයුතු කරමින්, හදවතින් යහ පාලනය නැති ගතින් යහ පාලනයට වෙලා ඇමතිකම් දරපු අය හඳුනා ගැනීමටත්, සිංහ හම පොරවා ගෙන සිටින කොටළුවන් කවුද කියලා හඳුනා ගැනීමටත් හොඳ අවස්ථාවක් අපට උදා වෙලා තිබෙන බව මා අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක් තිබෙනවා.

[අ.භා. 6.18]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මෙම විශ්වාස භංග යෝජනාව පිළිබඳව අද විවිධ අය විවිධ අදහස් පළ කළා. මා හිතුවා, කථාවක් කරනවාට වඩා ස්තුති කථාවක් කරන එක හොඳයි කියලා. ගරු කථානායකතුමනි, ඒකට හේතුව මෙයයි. 2015දී අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මෙම විශ්වාස භංගය ඉදිරිපත් වන අවස්ථාව වනකොට ඇත්ත වශයෙන්ම අපි ජාතික මැතිවරණ තුනක් ජයග්‍රහණය කරලා තිබෙනවා. එකක්, ජනාධිපතිවරණය. අනික් එක, පාර්ලිමේන්තු මැතිවරණය. අනික් එක තමයි, මේ ජයග්‍රහණය කරන්න යන විශ්වාස භංග යෝජනා මැතිවරණය. ඇත්තටම පළාත් පාලන මැතිවරණයෙන් අපි පොඩි පසු බෑමකට ලක් වෙලා සිටියේ. ඒකට ඔක්සිජන් දුන්නේ ඒකාබද්ධ විපක්ෂය ඇතුළු කණ්ඩායමයි. ගරු කථානායකතුමනි, එම නිසා මේ මැතිවරණය මෙහෙයවපු, මැතිවරණ කොමසාරිස්වරයා වශයෙන් කටයුතු කරපු හිටපු ජනාධිපති තුමාටත් අපි ස්තුතිවන්ත වන්න ඕනෑ. ඒ වාගේම මෙහිදී මැතිවරණ දෙපාර්තමේන්තුව වශයෙන් කටයුතු කරමින් මේ මැතිවරණය මෙහෙයවා අපට තව මොහොතකින් ජයග්‍රහණයක් උදා කර දීම පිළිබඳව ඒකාබද්ධ විපක්ෂයේ කාර්යාලයටත් මා ස්තුතිවන්ත වන්න ඕනෑ.

අන්ධ කෙනෙකුගේ කකුලේ මැණික් ගලක් හැපුණත් ඒක පාදා ගන්න දන්නේ නැහැ කියලා කථාවක් තිබෙනවා නේ. අන්ධ කෙනෙකුගේ කකුලේ මැණික් ගලක් හැපුණාට වාසනාව උදාකර ගන්න බැහැ නේ. ඇස් දෙක පෙනෙන්නේ නැහැ නේ. ඒ වාගේ පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මේ අය ලබා ගත් ජයග්‍රහණයත් නැති කර ගත්තා. මේ ජයග්‍රහණය ලැබුණාම මේ ගොල්ලන් මත් වුණා. මේ ගොල්ලන් හිතුවා මේකෙන් විශාල පෙරළියක් කරන්න පුළුවන් වෙයි කියලා. එහෙම නැත්නම් ඒකෙන් ආණ්ඩු පෙරළන්න හිතුවා. එම නිසා තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. විශ්වාස භංග යෝජනාව ගෙනැත් අද ජයග්‍රහණය කර ගන්න බැරුව ඉන්නවා. අපි පසුගිය කාලයේ පසුබෑමට ලක් වෙලා සිටියේ. දැන් අපට ඔක්සිජන් ලබා දීලා තිබෙනවා. අපි අද සවස ලබන ජයග්‍රහණයත් සමඟ 2020 ජාතික මැතිවරණය වන තෙක් එක්සත් ජාතික පක්ෂය විධියට නැවතත් ශක්තිමත්ව සංවිධානය වෙලා අපේ ඊළඟ සටන ආරම්භ කරනවා.

ගරු කථානායකතුමනි, අපට මේ අවස්ථාව උදා කර දුන් සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මම නම් කියපු, නම් නොකියපු අපට මේ අවස්ථාව ලබා දීමට කුමනාකාරයෙන් හෝ සහයෝගය දැක්වූ සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපට එකතු වෙන්න පුළුවන් වීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අද මේ ගරු සභාවේ සමහර අය නැහැ. අද මේ ගරු සභාවේ කථා කළ දේවල් අහගෙන හිටියාම මට හිතුණේ මේ ගොල්ලන් කොහේ ඉඳලාද මේ කථා කරන්නේ

කියලා. අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු උදව්ය බලයේ ඉන්නකොට කුඩු කන්ටේනර් පිටින් අහු වුණා තමුන්නාන්සේට මතක ඇති. හිටපු අගමැතිවරයාගේ ලියුම් දීලා ඒවා නිදහස් කර ගත්තා. කුඩු කන්ටේනර් පිටින් අහු වෙලා හිටපු අගමැතිවරයාගේ ලියුම් දීලා නිදහස් කර ගත්තා. ඒවාට කවදාවත් විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ සිදු වුණු දේවල් තමුන්නාන්සේලාට මතක ඇති. මොකක් හරි පිනකට සමහර අය - මම මේ ඔබතුමන්ලා හැමෝටම කියනවා නොවෙයි- පාර්ලිමේන්තු ඇවිත් අද කරපු සමහර කථා ගැන බලන්න. ආපු වේලාවේ ඉඳන් මඩ ගහලා, විවේචනය කරලා, විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය වෙන පැත්තකට අරගෙන යන්න කටයුතු කළා. හැබැයි, මම ඒ ගොල්ලන්ට කියන්න කැමැතියි, ඔය කියන ආකාරයේ මිනිසුන් කවුද කියලා කණ්ණාඩියක් අසලට ගිහින් බලා ගන්න කියලා. තමන්ගේ ගෙදර තිබෙන ප්‍රශ්නවලට, ගෙදර කෙනා නැති වුණාම, දමලා ගියාම, තමන්ගේ පෞරුෂය නැති වුණාම මෙතැනට ඇවිත් අනෙක් අයගෙන් පළිගන්න, අනෙක් අයට මඩ ගහන්න හදන්න එපා කියලා මම කියනවා. මට ඒ ගැන මීට වැඩිය කියන්න දෙයක් නැහැ. ඒ අයගේ තිබෙන හීනමානයට, ඒ අයගේ තිබෙන අඩු පාඩුවලට විවිධ චෝදනා කරමින් අද මේ විවාදයත් වෙන තැනකට ගෙනයන්න උත්සාහ කළා. මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර වාගේ අයට ආර්ථික ඝාතකයෝ කියලා පොත් ලියලා, අද අපේ ආණ්ඩුවේ සමහර දේවල් ගැන කථා කරනකොට ඒ කාලයේ මේ ගොල්ලන් කොහේද හිටියේ කියලා මම අහන්න කැමැතියි. සමහර දේශපාලනඥයෝ සොරකම් කරලා, ගසා කාලා, දික්කසාද නඩුවේදී මාසයකට රුපියල් ලක්ෂ 15ක් ගෙවන්න එකඟ වෙනවා. බයිසිකලයක්වත් නැතිව හිටපු මිනිසුන් කෝටිපතියන් වෙලා, billionairesලා වෙලා අද හොඳ ලස්සනට ටයි-කෝට් දාගෙන මෙතැනට ඇවිත් කථා කරනවා.

ගරු කථානායකතුමනි, මේක තමයි මජර, කුණු වෙච්ච, පිළුණු වෙච්ච, වල් වැදිච්ච දේශපාලනය. මේ මිනිසුන් වියදම් කරලා ජනතාව අතරින්ම දේශපාලනයට ඇවිත්, සමහර අය එහෙම නැතිව ඇවිත් අද මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය දුන්නා. සමහර අයට ජන පදනමක් නැහැ. අපි නම් ඡන්දය ඉල්ලලායි ආවේ. මමත් ලක්ෂ තුනකට කිට්ටු වෙන්න මනාප අරගෙන, ජනතා සහයෝගය අරගෙන ඇවිත් තමයි මේ කථා කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව අද වෙන පැත්තකට හැරිලා තිබෙනවා; පාරාවළල්ලක් වෙලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාවෙන් ඒ අය කරන්න ගිය දේවල් අද ඒ ගොල්ලන්ටම බූමරංගයක් වෙලා තිබෙනවා. මේක තමයි දිට්ඨ ධම්ම වේදනීය කර්මය. අදින් පසුව ඉදිරි කාලයේදී එක්සත් ජාතික පක්ෂය ශක්තිමත්ව ඉදිරියට යන ගමන ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ අඩු පාඩු තිබෙන්න ඇති. එම නිසා තමයි පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපට පසුබෑමට සිදු වුණේ. ඒකට හේතු තිබෙනවා. කකුලෙන් ඇදපු සිද්ධි, ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපේ අඩු පාඩු සකස් කරගෙන 2020 මැතිවරණය ඉලක්ක කරගෙන ශක්තිමත්ව ඉදිරියට යන්න අපි බලාපොරොත්තු වෙනවා. 2020 මැතිවරණයෙන් අපි ජයග්‍රහණය ලබනවා. එම නිසා අපට ඕනෑකම තිබෙන්නේ මේ රටේ ආර්ථිකය හදන්නයි; මේ රටේ තරුණයන්ට රැකියා අවස්ථා බිහි කරන්නයි; හොරකමට, වංචාවට නීත තියන්නයි. බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් ගත්තොත්, 2008 වසරේ සිට සිදුවූ බැඳුම්කර ගනුදෙනු සම්බන්ධයෙන් මේ අය කිසිවක් කථා කරන්නේ නැහැ. ඒ වාගේ ගනුදෙනු කරපු අය අද විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා.

ඒ වාගේම, මේ සිද්ධිය ඇති වුණාට පස්සේ අපි ගත්ත ක්‍රියාමාර්ග ගැන, කොමිෂන් සභාවට ඉදිරිපත් වෙලා අග්‍රාමාත්‍යතුමා එයින් නිර්දෝෂී වීම ගැන අද කථා කරන්නේ නැහැ. ඒ නිසා මම හිතන විධියට වෙනත් දේශපාලන අරමුණු හා බලාපොරොත්තු ඇතිව තමයි අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ. මේකට මූලික වුණ කාරණය මේක නොවෙයි.

ගරු කථානායකතුමනි, මට ගොඩක් දේවල් කථා කරන්න තිබුණත්, සකස් කරගෙන ආපු සම්පූර්ණ කථාව නොකරන්නට මම තීරණය කළා. මොකද, අද උදේම මේ විශ්වාස භංග යෝජනාව පුස්සක් බවට පත් වුණ නිසා. මේ විශ්වාස භංගයේ බලාපොරොත්තුව උදේම නැති වෙලා ගියා, ඒක ඉදිරිපත් කළ අයට. අපි බලයට ආවාට පස්සේ අපි දිනපු තුන්වෙනි ජාතික මැතිවරණය තමයි පසුගිය මැතිවරණය. හතරවෙනි මැතිවරණයත්, එහෙම නැත්නම් ඊළඟ ජාතික මැතිවරණයත්, තව අවුරුදු එකහමාරකින් එන ඒ මැතිවරණයත් අපි විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරමින් මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය දුන්නු නොදුන්නු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින්, මා සකස් කරගෙන ආ කථාව **සභාගත*** කරන්නට ඔබතුමාගේ අවසර ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 6.26]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කළ කෙනකු හැටියට, මම කලින් හිතාගෙන හිටියේ අද දවස අනුව මොකක්ද කරන්නේ කියලා තීරණය කරන්නයි. නමුත් පසුගිය දවස් දෙක තුළ මට දුරකථන ඇමතුම් එන්න පටන් ගත්තා, ලබා ගත්ත මුදලක් පිළිබඳව. මගෙන් ඇහුවා, ඔයාට 1,000ක්ද හම්බ වුණේ, 2,000ක්ද හම්බ වුණේ, 2,500ක්ද කියලා. මම ඇහුවා, "විමධ්‍යගත අය වැයද?" කියලා. විමධ්‍යගත අය වැය නම් 100 හම්බ වෙනවා කියලා මම කිව්වා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මම කල්පනා කළා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොටස්කාර මන්ත්‍රීවරයකු හැටියට මේ විවාදයේදී කථා නොකළොත් අපි ඔක්කටෝම විලි ලජ්ජා නැති මහා නින්දාවක් වෙනවා කියලා. ඒ අනුව, මේ කථාව කිරීමට මට විනාඩි 8ක් හෝ ලබා දීම පිළිබඳව ඔබතුමාට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා.

ඔබතුමාත් දන්නා විධියට මම රත්නපුරයේ ඉඳන් ත්‍රිකුණාමලයට ගිය කෙනෙක්. භූමිය, පොළොව හඳුනන්න බැරි නම්, මහ ජනයාගේ ගඳ - සුවඳ හඳුනන්න බැරි නම් ඒ පළාතේ මන්ත්‍රීවරයෙක් වෙන්න බැහැ. එහෙම කරපු මට තේරෙනවා මොකක්ද අපට කරන්න හැදුවේ කියලා. මම එකක් කියන්න ඕනෑ. මේ ගරු සභාවේ අපි කථා කරන හැම දෙයකටම අද මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාව බොහොම අවධානයෙන්, සාවධානව ඇහුම් කන් දෙනවා. අපි පාවිච්චි කරන වචන එකින්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

එක ගැන මිනිස්සු කල්පනා කරනවා; හිතනවා. මේ රටේ ජනතාව තමයි අවසාන තීන්දුව ගන්නේ. අපි සමහර වෙලාවට වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහනවා. ගමේ ගොඩේ වෙලේ කොරවක්කෝ කියලා ජාතියක් ඉන්නවා. කොරවක්කෝ කලබල වුණු ගමන්ම ගිහින් හැංගෙනවා. හැබැයි ඔළුව චිතරයි හංගා ගන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එළියේ. එහෙම නැත්නම් පස්ස පැත්ත, පශ්චාත් භාගය එළියේ. සමාවෙන්න ඕනෑ වැරදි වචනයක් කියැවුණා නම්. ඒ වාගේ තමයි මට මේ සමහර කථා තේරුණේ. මට අනෙක් අයට වාගේ උපාධි නැහැ. හැබැයි තිබෙනවා අවුරුදු එකහමාරක, දෙකක වැලිකඩ සහ මහර බන්ධනාගාරවල හිටපු උපාධිය. එහිදී අපි හොඳ ටික තමයි ගත්තේ. ඒ අනුව තමයි අද මම මේ කෙටි කථාව කරන්නේ. ගරු කථානායකතුමනි, ඕනෑ නම් මට පැය ගණනාවක් කථා කරන්නට පුළුවන්. එක්සත් ජාතික පක්ෂයේ නායකයා පිළිබඳව කථා කරන්න මට අයිතියක් නැහැ.

මන්ද, මම අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු නොවන නිසා. ඡන්දය දුන්නු ජනතාව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඒ වගකීම බලාගත්තුදෙන්.

බැදුම්කරය පිළිබඳ කාරණයටත් මේ රටේ නීතිය අනුව කටයුතු වෙයි. අල්ලස් පනත ශක්තිමත් කර තිබෙනවා. ඒ යටතේ ගැනෙන වැරදිවලට දෙන දඬුවම් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන ආකාරයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
හොඳයි, ගරු කථානායකතුමනි.

අද අපට තිබෙන්නේ වෙබ්සයිට්වලින් එහෙම නැත්නම් අපට ලැබුණු දුරකථන ඇමතුම්වලින් අහපු ප්‍රශ්නයට උත්තර දීලා අපි කොහොමද ශුද්ධවන්තයන් වෙන්නේ කියන කාරණයයි. අපේ ආත්ම ගරුත්වය, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බණ්ඩාරනායක ප්‍රතිපත්තිය කොහොමද ආරක්ෂා කරන්නේ කියන කාරණයයි අද අපට තිබෙන්නේ. ඒක ආරක්ෂා කරන්න මම අනිවාර්යයෙන්ම මේ විශ්වාස භංගයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරනවා. එතකොට අපට ඡන්දය දුන්නු, ඡන්දය නොදුන්නු මේ රටේ ජනතාවට සහනිකයක් ලැබෙනවා, අපි මුදල්වලට, වරප්‍රසාදවලට, තනතුරුවලට කෑදරකමට කටයුතු කරලා නැති බවට. අපට තිබෙන්නේ එපමණයි. අපි "නැහැ" කිව්වාට වැඩක් නැහැ. අපි ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. අපි හැංගිලා හිටියාට වැඩක් නැහැ; ජනතාව පිළි ගන්නේ නැහැ. මේ රටේ ජනතාව තමයි අවසාන තීන්දුව ගන්නේ. එවැනි තීන්දු ගණනාවක් ජනතාව අරගෙන තිබෙනවා.

ඔබතුමන්ලා හැම අවස්ථාවේදීම මහින්ද රාජපක්ෂ මහත්තයා ගැන මතක් කරනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ ජනාදරය දිනාගෙන හිටපු නායකයෙක්. එතුමාත් පරාජය වුණාය කිව්වාම දැන් ඉන්න අයට හිතන්න කාරණා ගොඩක් තිබෙනවා. අපි ජනතාවට වැඩ කළා ඇතිද, අපි කරලා තිබෙන්නේ මොනවාද, කොරවක්කෙක් වාගේ හැංගිලා හිටියාට අපේ පස්සා පැත්ත එළියේ තිබුණාද කියන එක හිතන්න තිබෙනවා. අන්න ඒ ගැන හිතලා හෘදය සාක්ෂියට එකඟව අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එහෙම නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරුන් කටයුතු කළොත්, අපට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමනක අවසානය වැළැක්වීමට වුවිටක් හරි ඉඩ කඩ ලැබෙයි. එහෙම නැති වුණොත් මොකද වෙන්නේ? එදා බණ්ඩාරනායක මහත්මයා නැති වුණාට පස්සේ "ගමනක අවසානය" කියලා චිත්‍රපටියක් නිෂ්පාදනය කළා. ඒක චිත්‍රපටයක්. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එහෙම නැත්නම් බුලත් කොළයෙන් ඡන්දය ලබා ගෙන හෘදය සාක්ෂියට එකඟව කටයුතු නොකළොත්, අද මේ තිබෙන තත්ත්වය චිත්‍රපටයක් වෙන්නේ නැහැ, හැබැහින්ම ගමනක අවසානය වනවා, ගරු කථානායකතුමනි. අපේ තනතුරු ගැන හිතලා අපි කථා කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසාන වෙමින් පවතිනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අපි වරප්‍රසාද ගැන හිතලා කථා කරන්නේ නැහැ. අපි මේවා ඕනෑ අවස්ථාවක දෙන්න සූදානම්. අපි ඒවා පරිත්‍යාග කර තිබෙනවා. මගේ පියා ජී.වී. පුංචිනිලමේ මැතිතුමා, මට චෝදනාවක් ආපු වෙලාවේ මහඇමතිකමින් ඉල්ලා අස් වුණා. ලංකා ඉතිහාසයේ ඒ විධියට ඉල්ලා අස් වුණු කිහිප දෙනාගෙන් එක්කෙනක් තමයි එතුමා. එහෙනම්, ඒ ලේවලින් එන මාත් ඒ විධියට වැඩ කරන්න බැඳිලා ඉන්න බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක් තිබෙනවා.

[අ.භා 6.33]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)
ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාව ගැන කථා කිරීමට ඉතාම කෙටි කාලයක් ලැබී තිබෙනවා. ඒ අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි. මට ලැබී තිබෙන්නේ විනාඩි අටක කාලයක් නිසා ඉතාම වේගයෙන් මගේ කථාව කරන්න වෙනවා.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංගය ගැන කරපු පක්ෂ විපක්ෂ කථා සියල්ලටම කන් දුන්නා. විවිධ පාර්ශ්ව, විවිධ පක්ෂවල අය තමුන්ගේ රුචි අරුචිකම් අනුව, තමුන්ගේ නායකයන්ගේ රුචි අරුචිකම් අනුව තමුන්ගේ කථාව කළා. මේ

විශ්වාස භංගය ගැන කථා කරද්දී, මේ පාර්ලිමේන්තුවේ කීදෙනකුට ජනතාව අතර විශ්වාසයක් තිබෙනවාද කියන එක ගැන නැවත නැවත හිතන්න වෙනවා.

ගරු කථානායකතුමනි, ඉතිහාසයේ නායකයෝ සිටියා. ඒ නායකයෝ ස්වයං විවේචනය කළා. මම හිතන විධියට මහත්මා ගාන්ධිතුමා තමන් කළ දේවල් ගැන, තමන්ගේ වැරැදි ගැන ස්වයං විවේචනය කළා. ඩඩ්ලි සේනානායක මහත්මයා ස්වයං විවේචනය කළා. එතුමා අස් වුණා. මම හිතන විධියට ඉන්දියාවේ දුම්රිය ඇමතිවරයෙක් තමන් සිටින කාලයේ වුණු වරදක් නිසා ඇමතිකමෙන් අස් වුණා. තමන් ස්වයං විවේචනය කරනවා නම් මේ පාර්ලිමේන්තුවේ කී දෙනකුගේ විශ්වාසය භංග වෙලා තිබෙනවාද කියලා තමන්ගේ හෘදය සාක්ෂියෙන් අහන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙතැනදී ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු අතින් කිහිප වතාවක් මගේ නම කියැවුණා. ඔවුන් කිව්වා රන්ජන් රාමනායක මේ විශ්වාස භංග යෝජනාව සහ මහ බැංකු වංචාව ගැන දරන මතය ගැන. මෙය වංචාවක් බව මම මුල සිටම කිව්වා. එය පැහැදිලිව කිව්වා. මම කවදාවත් හොරු ආරක්ෂා කරන්න ගියේ නැහැ. ඉදිරියේදීවත් කවදාවත් හොරුන් ආරක්ෂා කරන්නේ නැහැ. මෙතැන වංචාවක් සිදුවෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මෙතැන වංචාවක් සිදුවෙලා තිබෙනවා. නමුත් නියමිත අධිකරණයක් විසින් සාධාරණව චූදිතයාව වරදකරු කරන තුරු අපට කියන්න බැහැ, [බාධා කිරීම්] කසුන් පලිසේන - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේ හොරුන්ට කිසිම අයිතියක් නැහැ, හොරකම් ගැන කථා කරන්නවත්, "හොරකම" කියන වචනය කියන්නවත්.

ගරු කථානායකතුමනි, මා ගැන මම ස්වයං විවේචනයක් කරන්නම්. මා දේශපාලනයට එද්දීත් හිටියේ කුලී ගෙයක, අදත් ඉන්නේ කුලී ගෙයක. මට ලැබුණු වාහන පර්මිට් එක රුපියල් දෙකෝටි විසිලක්ෂයකට විකුණලා "පර්මිට් පදනම" කියලා නමක් දමලා ඒ මුදල් මම ජනතාවට බෙදා දෙනවා. මම තවම ඉන්නේ කුලී ගෙයක. [බාධා කිරීම්] ඒ වාගේම අද මේ පාර්ලිමේන්තුවේ විවාදය PEO TV හරහා මුළු ලංකාවේම අයත්, අන්තර්ජාලය හරහා ලෝකයේම අයත් බලනවා. ගරු කථානායකතුමනි, tax වංචා නොකළ කෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම් අත උස්සන්න කියලා මම කියනවා. මමත් tax වංචා කර තිබෙනවා. චිත්‍රපටයක රඟපෑවාම රුපියල් ලක්ෂ 15ක් ලැබෙනවා නම් මම කියා තිබෙන්නේ මට හම්බ වුණේ රුපියල් 50,000යි, නැත්නම් රුපියල් ලක්ෂයයි කියලා. ඒ විධියට tax වංචා කරන්න අපට කියලා දුන්නේ කවුද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිටපු අයයි. ඒ නිලධාරීන් අපේ ගෙවල්වලට ඇවිල්ලා කියනවා, "රන්ජන් අයියා, මේ ඔයාට ලැබෙන සැබෑ ගණන පෙන්වන්නේ ඇයි? පෙන්වන්න එපා. රුපියල් ලක්ෂ 15ක් කියන්න එපා, ලක්ෂයයි කියලා කියන්න" කියලා. ඒ විධියට මුළු ලංකාවේ බහුතරයක් දූෂිතයන් වෙලා තිබෙනවා. මම මගේ වාහන පර්මිට් එක විකුණලා තිබෙනවා. [බාධා කිරීම්] ඒකේ තිබුණා, "transferable" කියලා. මේ පාර්ලිමේන්තුවේ බොහෝ දෙනෙක් වාහන පර්මිට් එක විකුණලා තිබෙනවා. නමුත් ඒක පිළිගන්නේ නැහැ. කවදාවත් ඒක පිළිගන්නේ නැහැ. ඒක විකුණලා වෙනත් දේවල් කරලා තිබෙනවා; පොලියට දීලා තිබෙනවා; ගෙවල් අරගෙන තිබෙනවා; නොයෙකුත් business කරලා තිබෙනවා. ඒ විධියට අපගේ ස්වයං විවේචනයක් තිබෙනතුරු දූෂිත රටවල list එකේ අංක 4ට අපේ රට ආපු එක කවදාවත් නවත්වන්න බැහැ. අපට ස්වයං විවේචනයක් තියෙන්න ඕනෑ. අපේ වැරැදි කියන්න පුළුවන් වෙන්න ඕනෑ. එහෙම නැතිව ලංකව ඉදිරියට ගෙන යන්න බැහැ.

ගරු කථානායකතුමනි, මෙතැන අනිවාර්යයෙන්ම වංචාවක් වෙලා තිබෙනවා කියන එකයි මම කියන්නේ. දැනට දෙදෙනෙක් රිමාන්ඩ් භාරයේ ඉන්නවා. Bank accounts 26ක් block කරලා තිබෙනවා; රුපියල් බිලියන 12ක් block කරලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි 03ක් තිබෙනවා. [බාධා කිරීම්] එතුමාට කථා කරන්න ඉඩ දෙන්න, ගරු මන්ත්‍රීතුමා. කාටත් කථා කරන්න අයිතියක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඒ දේවල් කරන්න පුළුවන් වුණේ මේ යහපාලන සංස්කෘතිය නිසායි. අපි "කෝප්" එකට විපක්ෂයේ මන්ත්‍රීවරයකු සභාපති වශයෙන් පත් කළා. අපටත් තිබුණා, පසු ගිය රජය කළා වාගේ අපේම මන්ත්‍රීවරයෙක් සභාපති ධුරයට පත් කරලා මේවා හංගන්න. [බාධා කිරීම්] අපි එහෙම කළේ නැහැ. ජනතාව මේ විවාදය බලාගෙන ඉන්නවා. මම මේ සංස්කෘතියට කැමැතියි. හොරු ගහගන්න එකට මම කැමැතියි. ඊළඟට එන ආණ්ඩුවලට පවා දේශපාලන පළිගැනීමක් කියලා අර්ථකථනය කරන හොරු ඇල්ලීමේ ව්‍යාපෘතිය නතර කරන්න බැහැ. ඉදිරියේ දී එක දිගට විශ්වාස භංග යුගයක් එනවා. මේකෙන් නවතින්නේ නැහැ. මම මේ විශ්වාස භංගය ආවාට කැමැතියි. මොකද, ඊට පස්සේ නැවත නැවත විශ්වාස භංග යෝජනා ඇවිල්ලා එක දිගට හොරු අහුවෙන්න පටන් ගන්නවා. හොරු අහුවෙන්නේ මෙහෙමයි.

හැම දාම හොරකම් එළියට ආවේ, හොරා සහ හොරාගේ බිරිඳ ගහ ගත්තාමයි. නැත්නම් එකට හොරකමේ ගිය අය ගහගත්තා. නැත්නම් කවදාවත් හොරකම එළියට එන්නේ නැහැ. ඒ දේ අද සිදු වෙමින් පවතිනවා. ඒ දේ සිදු වෙමින් පවතින එකේ benefit එක කාටද? ඒකේ තිබෙන බලාපොරොත්තුව, ඒකේ තිබෙන සියලුම success එක කාටද? පොදු ජනතාවටයි. පොදු ජනතාවට තමයි ප්‍රතිඵලය ලැබෙන්නේ. එක දිගටම විශ්වාස භංග ගෙනෙන්න, එක දිගට විමර්ශනය කරන්න. එතකොට තමයි ලංකාවේ ජනතාවට අර හොරකම් කරපු සල්ලි ටික නැවත ලබා ගන්නට පුළුවන් වන්නේ. [බාධා කිරීම්] දරුවෝ කරපු දේට තාත්තා පළි නැහැ. අපි කවදාවත් මේ හොරුන්ව ආරක්ෂා කරන්නේ නැහැ. කවදාවත් - [බාධා කිරීම්] මේ හොරු, හොරකම් කරලා තිබෙන්නේ ලංකාවේ අහිංසක මිනිසුන්ගේ සල්ලි. ඒවා යාදෙන්නේ නැහැ. ලේ බඩ යනවා. මුන්ට හෙණ ගහන්න ඕනෑ. ඒක හින්දා මේ වංචාවට සෘජුව හෝ වක්‍රාකාරව හෝ උදව් දුන්නු හැම කෙනෙක්ම නීතිය ඉදිරියට ගෙනෙන්න ඕනෑ. මේ ආණ්ඩුව තුළ කොමිෂන් පිහිටෙව්වා; විමර්ශනය කෙරෙව්වා. ඒ වාගේම මේ වාගේ විශ්වාස භංග වාගේ දේවල් ගෙනෙන්නට ඉඩ සලස්වලා තිබෙනවා. ඒ කාලයේ මීට වඩා මහා වංචා වෙද්දී මේ සියලු දේවලට නිහඬව හිටපු කට්ටිය දැන් ඇවිල්ලා කියනවා, ඒ අය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කාලය අවසානයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මම කියන්නේ මේ සංස්කෘතිය දිගටම ගෙන යන්න කියන එකයි. මේක හොඳයි. මේකේ ප්‍රතිඵලය, මේකේ සියලු benefit එක ජනතාවට. අපි කවදාවත් හොරු ආරක්ෂා කරන්නේ නැහැ. මම මේ ක්‍රමයට කැමැතියි. අපි සියලු දෙනා එකතු වෙලා හොරු අල්ලමු කියන පණිවුඩය දෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමා.

[අ.භා.6.41]

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, විශ්වාස භංග ඉතිහාසය ගැන කථා කරන්න වෙලාවක් නැහැ. විනාඩි කිහිපයක් විතරයි තිබෙන්නේ. ඒ නිසා මම කල්පනා කළා, මගේ කථාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න පළමුවෙන්ම අවසර ඉල්ලන්න. මොකද, මේ සම්බන්ධයෙන් වැදගත් අදහස් කිහිපයක්ම ප්‍රකාශ කරන්න තිබෙන නිසා. අද උදේ ඉඳලාම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා අදහස් ප්‍රකාශ කළා. ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ලොකු පොතක්. ගරු කථානායකතුමනි, කවුරු හරි කථිකයෙකු කියනවා නම් ගරු අග්‍රාමාත්‍යතුමා වැරදි කාරයෙක් කියලා, එහෙම නැත්නම් මේකේ සාක්ෂි දීපු මලික් සමරවික්‍රම මැතිතුමා වැරදිකාරයෙක් කියලා, එහෙම නැත්නම් සාක්ෂි දීපු කබීර් හෂිම් ඇමතිතුමා වැරදිකාරයෙක් කියලා මේ පොතේ කොහේ හරි සඳහන් කරලා තිබෙනවා කියලා, අද මෙම විවාදය ඉවර වෙන්න කලින් එම පිටුව අරගෙන මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා මම කියනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි,-

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
පොඩ්ඩක් ඉන්න, විමල් වීරවංශ මන්ත්‍රීතුමනි. මට කථා කරන්න විනාඩි හතරයි තිබෙන්නේ. ඔබතුමාගේ වෙලාවේ දී කියන්න.

කවුරු හරි කථිකයකු එහෙම කියනවා නම්, එතුමාගේ වේලාවේ දී මේ පොත අරගෙන කරුණාකරලා ජාතියේ දැන ගැනීම සඳහා ඒ පිටුව කියෙව්වොත් හොඳයි කියලා මම කියන්න කැමැතියි,. පිටු 900 ගණනක් තිබෙන මේ පොතේ අග්‍රාමාත්‍යතුමා සම්බන්ධයෙන් තිබෙන සංක්ෂිප්ත වාර්තාව සඳහන් පිටු පමණක් කියවන්න මම බලාපොරොත්තු වෙනවා. සංක්ෂිප්ත වාර්තාව පිටු අංක 930, 931හි සඳහන් වෙනවා. "අර්ජුන් මහේන්ද්‍රන් මහතා සහ සමරසිරි මහතා හිතාමතා ගරු අග්‍රාමාත්‍යවරයා නොමඟ යවා ඇති අතර ඔවුන් විසින් සත්‍ය තොරතුරු අග්‍රාමාත්‍යවරයාගෙන් වසන් කර ඇත" කියලා එහි සඳහන් වෙනවා. 2015 පෙබරවාරි 27වැනි දින පැවැත්වූ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සම්බන්ධයෙන් තොරතුරු හා සිදුවීම් වාර්තා කිරීමේ දී ඒ පිළිබඳ සත්‍ය තත්ත්වය වැරදි ආකාරයට පෙන්වා දී ඇති බව එහි සඳහන් කරලා තිබෙනවා. ඒ එක්කම සඳහන් කරලා තිබෙනවා, "මහේන්ද්‍රන් මහතා සහ නියෝජ්‍ය මහ බැංකු අධිපති සමරසිරි මහතා දෙනු ලැබූ විස්තර මත විශ්වාසය නොතබා තමා විසින් ස්වාධීනව මේ පිළිබඳව තහවුරු කර ගත්තේ නම් පාර්ලිමේන්තුවේ දී කරපු ප්‍රකාශය කිරීමට ප්‍රථමව මහ බැංකුවේදී සිදු වූ දේ ගැන මීට වඩා හොඳින් දැන ගැනීමට අවස්ථාවක් තිබුණා" කියලා. ඒ එක්කම කියලා තිබෙනවා, "ගරු අග්‍රාමාත්‍යතුමා විසින් තමාගේ තනි තීරණය මත කටයුතු කර වහාම 2015 පෙබරවාරි 27වැනි දින සිදු වූ ඍජු ස්ථානගත කිරීම අත්හිටුවීමට හෝ නැවැත්වීමට හෝ මහේන්ද්‍රන් මහතා වෙත උපදෙස් දී නැති බව -නියෝග කර නැති බව- සනාථ කිරීමට සාක්ෂි කිසිවක් නොමැත" කියලා.

මෙහෙම තිබියදී තමයි, අධිකරණයේ නඩුවක් තිබියදී තමයි දැන් අග්‍රාමාත්‍යතුමාටත්, රජයටත් මඩ ගහන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු මන්ත්‍රීතුමා, මට විනාඩි කිහිපයයි තිබෙන්නේ. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ අවස්ථාව ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, සභාවේ ලිපි ලේඛන සම්බන්ධවයි මා ප්‍රශ්නය නහන්නේ. වජිර අබේවර්ධන ඇමතිතුමා දැන් ප්‍රකාශයට පත් කරනවා, බැඳුම්කර වංචාව පිළිබඳ සභාවට ඉදිරිපත් කරපු වාර්තාව. මා දන්නා තරමින්, එහි ඉංග්‍රීසි පිටපත විතරයි අපට දුන්නේ. අපට සිංහල පිටපතක් දුන්නේ නැහැ. නමුත් ඇමතිතුමා දැන් සිංහල පිටපත කියවන්නේ කොහොමද, පිටුව නවසිය ගණන් කියා?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
මා ළඟ ඒ පිටපත් දෙකම තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් මට එය දෙන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපට ලැබිලා නැහැ.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

"ඒ වෙනුවට ගරු අග්‍රාමාත්‍යතුමා බලාපොරොත්තු වී ඇත්තේ මහේන්ද්‍රන් මහතා හට නිසි ක්‍රියා පටිපාටියක් අනුව ගොස් හරි තීරණයක් ගෙන එය ක්‍රියාත්මක කිරීමට පෙර මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමයි" කියා තමයි පිටු අංක 930ත්, 931ත් සඳහන් වන්නේ. බැඳුම්කර වාර්තාව මහ පොතක්. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තුන්දෙනකුගෙන් සමන්විතව පරීක්ෂා කර සකස් කළ වාර්තාව මෙහි තිබෙනවා. මේ වාර්තාව අනුව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ නැහැ. මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 ව්‍යවස්ථාව අනුව මන්ත්‍රී ධුරය අහෝසි කිරීමට යෝජනාවක් ගෙනෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට තිබෙන අනවබෝධය සහ ඒ පිළිබඳව තිබෙන දැනුමේ මදකම නිසායි මෙසේ කරන්නේ කියා මා හිතනවා. එය මහා වංචාවක්, මං කොල්ලයක් හැටියට පෙන්නුම් කළාට රජයට සිදු වුණු අලාභයකුත් නැහැ. මොකද, පෞද්ගලික අංශය කරපු ව්‍යාපාරයක් හැටියට අදාළ සියල්ලම seal තබා තිබෙනවා. එය රාජ්‍ය අංශය කරපු ව්‍යාපාරයක් නොවෙයි. ඒ සමාගම ලියා පදිංචි කළේ 2013 වර්ෂයේදියි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය කාලයේ තමයි ඒ සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි කළේ. අපේ රජය බලයට පත් වනකොට අපි 2015 වසරේදී පැහැදිලිව සඳහන් කළා "අපි private placement ක්‍රමය අහෝසි කරනවා"යි කියා. ඒ අනුව අපි විවෘත වෙළඳ පොළ ක්‍රමය ඇති කළා. ඒ ක්‍රම දෙකටම අවුරුදු 40ක් යන කල් නීති තිබුණේ නැහැ. නීති නොතිබුණු රටේ පෞද්ගලික අංශය ලාභ ලබන්න ඇති. ඒ ලාභ ආපසු අය කරගැනීම සම්බන්ධයෙන් ජාතික වශයෙන් වෙනම ප්‍රශ්නයක් තිබෙනවාය කියා මා හිතනවා. හැබැයි ඔබතුමන්ලා බලනවා, මේ හරහා අපේ රජයට මඩ ගහන්න පුළුවන්ද කියා. මට ඔබතුමන්ලාට කියන්න තිබෙන්නේ, මේ වාර්තාව නිවැරැදි නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීමේ යෝජනාව ගෙනෙන්න පුළුවන් බවයි. මේ ගැන දැනට අධිකරණයේ නඩු පවත්වාගෙන යනවා; අධිකරණයේ නඩු විභාග වෙනවා. හැබැයි බලන්න, රජයක් හැටියට අපි එතැනිනුත් එහාට ගිහින් විවාද කරන්න අවස්ථාව ලබා දී තිබෙනවා. මේ සම්බන්ධයෙන් කිහිපදෙනෙක් දැනට අත් අඩංගුවේ ඉන්නවා.

ගරු කථානායකතුමනි, සමහර අය අහනවා, අර්ජුන මහේන්ද්‍රන් අල්ලා දෙන්න බැරිද කියා. මේ රටේ පළමුවන වතාවට නොවෙයි නේ, පුද්ගලයන් අල්ලා ගන්න බැරි වුණේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අල්ලා ගන්න බැරි වුණු අවස්ථා තිබුණා. ඒ අය දවස් දෙක, තුන, හතර, පහ හැංගිලා සිටියා. ඒ නිසා අල්ලා ගන්න බැරි වුණා. පළමුවන දවසේ TV එකේ දැම්මා, සොයා දුන්නොත් රුපියල් ලක්ෂ 10 දෙනවා කියා, දෙවන දවසේ දැම්මා, ලක්ෂ 20ක් දෙනවා කියා. දවස් 5ක් යන කල් එතුමන්ලා අල්ලා ගන්න බැරි වුණා. හැබැයි පසුව එතුමා බාර වුණා.

ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙන සියලුම කාරණා රජයට මඩ ගැහීමේ ව්‍යාපාරයක් හැටියටයි අප දකින්නේ. මේ කාරණා සම්බන්ධයෙන් විවාදයක් ලබා දීම අග්‍රාමාත්‍යතුමා කරපු ඉතාම ශ්‍රේෂ්ඨ ක්‍රියාවක්. මේ ආණ්ඩුව එවැනි ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් කර තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තුන්දෙනකුගෙන් සමන්විතව විභාග කරපු වාර්තාවේ අසවල් පිටුවේ, අසවල් වගන්තියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබෙනවා කියා, අද විවාදය අවසන් වන්න කලින් මේ පොතේ පිටු අරගෙන හැන්සාඩ්ගත කරලා කියන්න ඔබතුමන්ලාට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කරුණු කියන්න යන්නේ නැහැ. අපේ අග්‍රාමාත්‍යතුමා ගැන මුළු රටත්, ලෝකයත් දන්නවා. එතුමා තමන්ගේ දේපොළවත් බලාගත්තේ නැති රාජ්‍ය නායකයෙක්. තමුන්නාන්සේලා බලනවා - [බාධා කිරීම්] දූර්වල නම් මොනවාටද මඩ ගහන්නේ? රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා දූර්වල නම් එතුමාට ඉන්න දෙන්නකෝ. අග්‍රාමාත්‍යතුමා ශක්තිමත් නිසා තමයි ඔබතුමන්ලා බලන්නේ, 2019 වර්ෂයට ඉස්සර වෙලා එතුමාට ගහන්න. ඔබතුමන්ලාට කවදාවත් ඒ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැයි කියා මා මතක් කරන්න කැමැතියි. ඒ නිසා රජයට මඩ ගැසීම නවත්වලා, කරුණාකාරලා සාධාරණව, යුක්ති සහගතව, ඉදිරිපත් වී තිබෙන වාර්තා අනුව ක්‍රියා කරන්නය කියලා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි. මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා 6.50]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් ඒකාබද්ධ විපක්ෂය ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව දැන් භංගත්වයට පත් වෙමින් තිබෙන වෙලාවක මේ ගරු සභාව අමතන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතාමත් සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, ගමේ කථාවක් තිබෙනවා, "කන්දක් විලිලා මී පැටියෙක් වැදුවා වගෙයි" කියලා. නමුත් ඒකාබද්ධ විපක්ෂය කන්දක් විලිලාලා, විලිලාලා, විලිලාලා අන්තිමට මී පැටියකුවත් වදාගන්න බැරි වුණාය කියන කාරණය අද අපට පෙනෙනවා. ඒ විතරක් නොවෙයි. අවුරුදු 40ක් දේශපාලනය කරලා, හතර වතාවක් අගමැති ධුරය දැරූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ, දින 100 අලුත් ආණ්ඩුව යටතේ වුණු සිද්ධියකට අදාළ චෝදනාවක් පදනම් කරගෙන පමණයි. විශේෂයෙන්ම පසු ගිය ආණ්ඩුවක හිටපු අගමැතිවරයෙකුට ඒ කාලයේ විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ඒක ඉදිරිපත් කරන්නේ නැතුව, අලුත් ආණ්ඩුවක් සඳහා ජනතා පරමාධිපත්‍යයෙන් පත් වුණු, කොළඹ දිස්ත්‍රික්කයෙන් පමණක් ලක්ෂ 5කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගත් ගරු අග්‍රාමාත්‍යවරයාට විරුද්ධව අද විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න මෙතුමන්ලාට සදාචාරයක් තිබෙනවාද, ශිෂ්ටාචාරයක් තිබෙනවාද කියලා මා අහනවා. මා ඔබතුමන්ලා

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ගැන කථා කරන්න කැමති නැහැ. මේ සභාවේ ඉන්න අය ගැන කථා කරන්න මා කැමති නැහැ. මා ඒ අයගේ නම්, ගම් කියන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ පුද්ගලයන් පිළිබඳව කථා කළොත්, 2015 ජනවාරි 8 වැනි දාත්, 2015 අගෝස්තු 17 වැනි දාත් විශ්වාස භංගත්වයට පත් වුණු පනස්පස්දෙනෙකුගේ කණ්ඩායමක් විසින් තමයි අද මෙම යෝජනාව ගෙන එනු ලැබුවේ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මන්ත්‍රීවරුන් දෙසිය විසිපස්දෙනකු සිටින මේ පාර්ලිමේන්තුවේ හතරෙන් එකක්වත් මේ විශ්වාස භංග යෝජනාවට එකතු කරගන්න බැරි වුණාය කියලා. හරියට "ලාහට ගෙම්බෝ එකතු කරනවා වගේ" තමයි මන්ත්‍රීවරුන් එකතු කරලා අද මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මගේ හිත මිත්‍ර උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා දැන් මේ සභාවේ ඉන්නවාද කියලා මා දන්නේ නැහැ. එතුමා ඊයේ-පෙරේදා කිව්වේ මොකක්ද? "හෙට ඉර පායන එක විශ්වාස නම්, හෙට ඉර පායන එක සත්‍ය නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ විශ්වාස භංග යෝජනාවෙන් පරාජයට පත්වෙනවා"යි කියලා ප්‍රකාශ කළා. අද එතුමන්ලාට කථා කරන්න දෙයක් නැහැ. ඒකට උල්පන්දම් දීපු, ඒකට අත් පුඩි ගහපු අයගේ අද කටේ පිටිටුද කියලා මා අහන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

මා විශේෂයෙන්ම එක කාරණයක් කියනවා. මෙම විශ්වාස භංග යෝජනාවේ පනත් කිහිපයක් සඳහන් කරමින්, මුදල් ඇමතිවරයා විසින් නීත්‍යානුකූලව ඉටු කළ යුතු කිසිදු කාර්ය භාරයක් අග්‍රාමාත්‍යවරයා විසින් ඉටු කර නැහැයි කියලා සඳහන් කර තිබෙනවා. විශ්වාස භංග යෝජනාවේ සඳහන් පනත් කිසිවක් අග්‍රාමාත්‍යවරයා විසින් උල්ලංඝනය කරලා නැහැයි කියලා පැහැදිලිව පෙනෙනවා. විශ්වාස භංග යෝජනාවේ කරුණු 14ක් සඳහන් කර තිබෙනවා. ඒ කරුණු සියල්ලම බැඳුම්කරයට සම්බන්ධ කරුණුයි. අවුරුදු 40ක් දේශපාලනය කළ, හතර වතාවක් අගමැතිවරයකු හැටියට කටයුතු කළ මේ ශ්‍රේෂ්ඨ නායකයාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන්නේ චෝදනා දෙකක් විතරක් අඩංගු විශ්වාස භංග යෝජනාවක්. ඒ චෝදනා දෙක පමණක් මේ විශ්වාස භංග යෝජනාව ඇතුළේ එල්ලාගෙන තමයි මෙතුමන්ලා කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ නිසා මා කනගාටු වෙනවා, මේ වගේ බංකොලොත් වුණු අය, -මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා. ඔබතුමා අහගෙන ඉන්නේ නැහැනේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට ඇහෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා තව විනාඩි දෙකක් ඕනෑ. ඒ විනාඩි දෙකත් එක්ක විනාඩි 5ක් දෙන්න.

අවසාන වශයෙන් මා මේ කාරණයත් කියනවා. ගරු කථානායකතුමනි, මෙතුමන්ලා සිහින මවන්නේ අගමැති ධුරය සඳහා මහින්ද රාජපක්ෂ මහත්මයා ඉදිරිපත් කරන්නයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක් ව්‍යවස්ථාවක තිබෙනවා, ජනාධිපතිවරයකු හැටියට දෙවරක් පත් වුණු කෙනෙකුට ඊට පසළ තනතුරක් හෝ අගමැති තනතුරක් දරන්න පුළුවන්කමක් නැහැයි කියලා. මා ඒක පැහැදිලිව කියනවා. දෙවරක් ජනාධිපති ධුරයේ කටයුතු කරලා, එතුමා ජනාධිපති ධුරයට සුදුසු නැත්නම්, ජනාධිපති ධුරයේ ඉඳලා නැවත අගමැතිවරයකු වෙන්නේ කොහොමද කියලා මා අහනවා. ජනාධිපතිවරයාගේ යම් අසනීපයක් නිසා හෝ ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වීමකින් හෝ මිය යාමකින් ජනාධිපති ධුරය හිස් වුණු දවසක අගමැතිවරයා තමයි ජනාධිපති ධුරයේ වැඩ බලන්නේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳවයි මෙම ප්‍රශ්නය අහන්නේ. ස්ථාවර නියෝග යටතේ මෙතුමා කියනවා, දෙවතාවක් ජනාධිපති වෙච්ච කෙනෙකුට නැවත අගමැතිවරයෙක් වෙන්න බැහැයි කියලා. මම අහනවා,-[බාධා කිරීමක්]-

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මම කියන්න ඕනෑ, මේ විශ්වාස භංග යෝජනාව විනාශ කරලා හෙට වෙනකොට අපි ඒ අවස්ථාව උදා කරන්න කැමැතියි කියලා. -[බාධා කිරීමක්]- ඔබතුමා ගිහිල්ලා වාඩි වෙන්න. -[බාධා කිරීම්]- ඔබතුමා කථානායකතුමාද? වාඩි වෙන්න. ගරු කථානායකතුමනි, මෙතැන කථානායකවරු මහ ගොඩක් ඉන්නවා. ඔබතුමාගේ අණසකට අනුව අද කටයුතු කරන්නේ නැහැ. මේ වාගේ ඉතාමත් නිර්ලජ්ජී විධියට අද තමුන්ගේ පරාජය ඉවසා ගන්න බැරුව දැන් නන් දොඩවනවා. හරියට අර භූමිතෙල් ගෑවිච්ච ගැරඩි වාගේ නටන මේ කණ්ඩායමට තව මොහොතකින් පරාජය පෙනී පෙනී පැළ දොරින් යන්නට සිද්ධ වෙනවා කියන එකත් මතක් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
මට විනාඩි 20ක් තිබුණා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාලය කොහොම හරි අඩු වෙලා තිබෙනවා. විනාඩි 13යි වෙන් කර තිබෙන්නේ.

[අ.භා. 6.56]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. විශේෂයෙන්ම මම කාරණා කිහිපයක් මතු කරන්න කැමැතියි. පළමුවැනි එක තමයි මේ ආණ්ඩුව පිළිබඳව තිබෙන ප්‍රශ්නය. අද මේ ඉදිරිපත් වෙලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ කාරණා පිළිබඳව මුල ඉඳලාම කථා කරපු කෙනෙක් මම. ඒ වාගේම, COPE එකේ සාමාජිකයෙක් විධියට එම වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් විශාල කටයුතු ගණනාවක් කළා. ඒ සඳහා අපි විශාල කැපවීමක් කළා. එහි ආපු විවිධ වාර්තාවලට අපි මැදිහත් වුණා. ඒ වාගේම, ආපු තර්ක විතර්කවලට අපි මැදිහත් වුණා. ඒ නිසා මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව තිබෙන කාරණය ගැන කවුරු මොනවා කිව්වත්, මොන තර්ක ඉදිරිපත් කරන්න හැදුවත් පොඩි ළමයෙකුට වුණත් තේරෙනවා, මේ බැඳුම්කරයේ විශාල වංචාවක් සිද්ධ වුණා කියලා. වෙනදා "Bond" එක කිව්වාම, ජේම්ස් බොන්ඩ් ගැනයි, සේන් කොන්රි ගැනයි, නැත්නම් රොජර් මුවර්ස් ගැන තමයි අපි කථා කළේ. ඒ වෙනුවට අද අර්ජුන් ඇලෝසියස්ලා, අර්ජුන් මහේන්ද්‍රන්ලා, කසුන් පලිසේනලා ඉන්නේ. මේ විධියට 007 තිබුණු ජේම්ස් බොන්ඩ්ලා වෙනුවට අද වෙන එකක් තිබෙන්නේ. ඒ නිසා මේකෙන් සොරකම් කරපු මුදල් අපි නැවත මේ රටට ගන්න නම්, මේ සම්බන්ධව තිබෙන කාරණා ඉස්සරහට ගෙනයන්න ඕනෑ. ඒ නිසා මෙතැනදී බොහොම පැහැදිලිව මම කියන්න කැමැතියි, මේ විශ්වාස භංග යෝජනාව කවුරු ගෙනාවත්, ඒ විශ්වාස භංග යෝජනාවේ තිබෙන කාරණා පිළිබඳව මට හෘදය සාක්ෂියට අනුව එකඟ වෙන්න සිද්ධ වෙලා තිබෙන බව.

අනෙක් කාරණය පිළිබඳවත් මම කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුකරණය ගැන කථා කළාම ඔබතුමා දන්නවා, 2015 ජනවාරි 08වැනි දා අපි වැඩ කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට බව. අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට වැඩ කරපු අය නොවෙයි. නමුත් එතුමා ලක්ෂ 62ක් ඡන්ද අරගෙන මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණා. ඊට පසුව දවස් කිහිපයක් ඇතුළත එතුමා අපේ පක්ෂයේ සභාපති ධුරය භාර ගත්තා. සභාපති ධුරය භාර ගත්තාට පසුව, අපි සියලු දෙනාම ඒ පක්ෂයේ ඉන්න නායකයා කවුරු වුණත් එතුමා එක්ක එකට එකතු වෙලා ගමනක් යන්න ඕනෑ. ඒ නිසා තමයි අපි අද මේ පක්ෂයේ ඉන්නේ. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා විධියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අරගෙන යන ක්‍රියාදාමය තුළ අපි පක්ෂයක් විධියට එතුමාගේ නායකත්වය පිළිගෙන වැඩ කළා. එතකොට මේ ආණ්ඩුව පක්ෂ දෙකක් එකතු කරලා හදා ගන්න අපට හේතු වුණේ ඇයි? මම මේ රටේ ජනතාවට තමයි ඒකට පළමුවෙන්ම ඇඟිල්ල දිගු කරන්නේ. මොකද හේතුව, එදා ලක්ෂ 62ක් ඡන්දය දීලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පත් කළාට, 2015 අගෝස්තු 17වැනි දා පැවැති මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රී ධුර 106කුත්, අපට මන්ත්‍රී ධුර 95කුත් දීලා ආණ්ඩුවක් හදා ගන්න බැරි තැනකට මේ පාර්ලිමේන්තුව පත් කළා. ඒ නිසා තමයි මේ Unity Government එක එහෙමත් නැත්නම්, ඒකාබද්ධ ආණ්ඩුවක් හදා ගන්න අපට සිද්ධ වුණේ. මොකද, මේ ආණ්ඩුවේ ජනාධිපතිවරයා එක පක්ෂයක, අග්‍රාමාත්‍යවරයා තවත් පක්ෂයක. මේ ආණ්ඩුව ඉදිරියට යනකොට මේකේ මූලික ප්‍රතිපත්තිමය ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි ඉන්න මතවල නොවෙයි, එක්සත් ජාතික පක්ෂය ඉන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට සමහර ඒවාට අපට එකඟ වෙන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා සමහර කාරණා පිළිබඳව අපි කැබිනට් මණ්ඩලයේදීත් දැඩි ලෙස විරුද්ධ වුණා. ජාතික සම්පත් විකිණීම සම්බන්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්නේ වෙනම මතයක. අපි ඒ මතය කැබිනට් මණ්ඩලය ඇතුළේ බොහොම පැහැදිලිව නිරූපණය කළා. ඒ විතරක් නොවෙයි, ඒවාට විරුද්ධව කථා කරන්න තිබෙන හැම වෙලාවකම අපි කථා කළා. ඒ නිසා මේ කාරණා එකින් එක ගත්තාම මේ ගැනත් මම කියන්න කැමැතියි. අදත් මම දැක්කා, එක්සත් ජාතික පක්ෂයේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරපු ආකාරය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියටයි. එක්සත් ජාතික පක්ෂය ඉන්නේ, එක්සත් ජාතික පක්ෂය විධියටයි. මේ පක්ෂ දෙක ආණ්ඩු කරනවා නම්, ඒ ආණ්ඩු කරන පක්ෂ දෙකේ ප්‍රතිපත්ති ගලපාගෙන ඉස්සරහට යන්න ඕනෑ.

එහෙම යන්න බැරි නම්, අපි තනියම යනවාය කියලා නායකයෝ දෙදෙනා තීන්දු කරන්න ඕනෑ. අන්න ඒ තීන්දුව එනතුරු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපිට එතැනින් ඉවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි දරන මතවාදය අපි හැංගි හොරා කියන්න සූදානම් නැහැ. මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවාය කියා අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම 2වැනි දා රාත්‍රියේ තීන්දුවක් ගත්තා. හැබැයි අද වන විට සමහර අය ඒකෙන් ඉවත් වෙන්න, නැත්නම් පාර්ලිමේන්තුවට එන්නේ නැතිව ඉන්න තීරණය කර තිබෙනවා. කොන්දක් තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපිට ඒක කරන්න බැහැ, ගරු කථානායකතුමනි. මේ රටේ මිනිසුන් බැඳුම්කරය සම්බන්ධව දරන මතය අද ගම් ඇතුළේ ව්‍යාප්ත වෙලා ඉවරයි. බැඳුම්කර ගනුදෙනුව සහ තවත් කාරණා කීපයක් ගැන සඳහන් කරමින් ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව ගැන අපි පෞද්ගලික විධියට කල්පනා කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාව එම පක්ෂයෙන් අයින් කරන්න අපිට වුවමනාවක් නැහැ. ඒක ඒ පක්ෂයේ වැඩ පිළිවෙළක්. අද මේ රටේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ජනාධිපතිතුමායි. මේ යන්නේ කැබිනට් මණ්ඩලයක් සහිත ආණ්ඩුවක්. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් මේ යන්නේ. ඒක තුළ ප්‍රධානියා ජනාධිපතිවරයායි. අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ තවත් සාමාජිකයෙක් පමණයි. හැබැයි, එතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකයායි. ඒ වාගේම පාර්ලිමේන්තුවේ 106ක බහුතරයක් එතුමන්ලාට තිබෙනවා. "අපි 40දෙනෙක් මේ ආණ්ඩුවත් එක්ක එකට එකතු වෙලා යමු" කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකතුමා රටේ ජනාධිපතිවරයා විධියට අපිට ආරාධනා කර තිබෙනවා. එහෙම එකතු වෙලා යන්න ඕනෑ නැහැය කියන තීන්දුව හෙට ජනාධිපතිතුමා ගත්තොත්, අපි එතැනින් ඉවත් වෙන්න සූදානම්. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. මොකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අනන්‍යතාවක් දිය යුතුයි.

මම බොහොම පැහැදිලිව කියනවා, අපි වෙන පක්ෂ හදන්න ගියේ නැති බව. අපි ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේයි. අපි එළියට ගිහින් වෙනත් පක්ෂ හදලා, ඒවායෙන් ඡන්දය ඉල්ලලා, වෙන වැඩ පිළිවෙළක් කරන්න ගියේ නැහැ. මොකද, එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ, අනන්‍ය වුණු බැඳීම් වෙනස් විධිවලට තිබෙන පක්ෂ දෙකක්. ඒ නිසා අපි ඒ ක්‍රියාදාමය ඉස්සරහට ගෙන යන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයට බැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමන් මාර්ගය තීන්දු කරන්න. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැහැ එක්සත් ජාතික පක්ෂයේ ගමන් මාර්ගය තීන්දු කරන්න. මේ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

විශ්වාස භංග යෝජනාවෙන් පසුව එක්සත් ජාතික පක්ෂය ඇතුළේ සිද්ධ වෙන වෙනස්කම් ගැන කථා කරන්න අපිට කිසි අයිතියක් නැහැ. හැබැයි ආණ්ඩුවක් විධියට ඉස්සරහට යන්න නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි යම් ප්‍රතිපත්ති මාලාවක් යටතේ තමයි ඉස්සරහට යන්න ඕනෑ. ඒ සඳහා අපිට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ටික අපි ගන්නවා. අපිට කොන්දක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේදි විශ්වාස භංග යෝජනාවට පක්ෂව අත උස්සලා හෙට ගෙදර ගියත් අපිට ප්‍රශ්නයක් නැහැ, ගරු කථානායකතුමනි. මතවාදයත් එක්ක තමයි අපි දේශපාලනය කරන්නේ.

මම එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වෙනකොට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරය අත හැරලායි එළියට ගියේ. ඕනෑ නම් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දරමින්, ආණ්ඩුව පැත්තේ ඉඳගෙන, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ එහි කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් ලෙස නැත්නම් නියෝජ්‍ය ඇමතිවරයෙක් ලෙස හෝ නිකම් මන්ත්‍රීවරයෙක් විධියට ඉන්න මටත් අවස්ථාව තිබුණා. නමුත් මම ඒක කළේ නැහැ. ඒකට හේතුව මෙකයි. අපිට ඡන්දය දුන් ජනතාව ආපහු හැරිලා අපෙන් අහනවා, "මොකක්ද කළේ?" කියලා. එහෙම කරන්න පුළුවන් උදවියත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපි ඡන්දයක් ඉල්ලලා තමයි මෙතැනට ආවේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මිනිසුන් 136,000ක් අපිට ඡන්දය දුන්නා. අපි කිසිම පක්ෂයකට ගිහින් නැහැ. අපි යූඑන්පී එකට ගිහිල්ලාත් නැහැ; ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ගිහිල්ලත් නැහැ. අපි තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේ තමයි ඉන්නේ. අන්න ඒක මතක තියාගන්න. අපි තීරණ ටික ගන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු 40දෙනා එකට ඉඳගෙන මිසක් වෙනම නොවෙයි. හැබැයි ඒක කඩාකප්පල් කරන්න, තමන්ගේ ඇමතිකම, මන්ත්‍රීකම වෙනුවෙන් ඡන්දය නොදී තැන් තැන්වල හැංගිලා ඉන්න සමහර අයට වුවමනා වෙලා තිබෙනවා නම්, කරුණාකරලා තමන්ට ඡන්දය දුන් මිනිසුන් ඉදිරියට ගිහින් කොන්ද කෙළින් තියාගෙන කථා කරන්න පුළුවන් තත්ත්වයට පත් වෙන්න ලැහැස්ති වෙන්න කියා මම ඒ අයට කියනවා. අපේ මතවාදයේ අපි ඉන්නවා. අද අපි මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවා. මේ යෝජනාවට පක්ෂව ඡන්දය දීම නිසා අපිට ඉවත් වෙන්න කියලා හෙට ජනාධිපතිතුමා කිව්වොත්, අපි ඉවත් වෙන්න සූදානම්. ඒ තීරණය තමයි අපේ තීරණය වන්නේ.

ඒ තීරණය ගැන කාගෙන්වත් අහන්න, කවුරුන් සමඟවත් කථා කරන්න, මුදල්වලට අපේ තනතුරු පාවා දෙන්න, මුදල්වලට අපේ ඡන්දය පාවා දෙන්න අපි සූදානම් නැහැ. අද එළියට ගිහිල්ලා හිටියා නම් අපට පැහැදිලිවම කිසි ගැටලුවක් නැතිව ඉන්න තිබුණා, අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කියයි, "හරි ෂෝක්. ඔබතුමන්ලා එළියට වෙලා හිටියා; abstain කළා; හරි හොඳයි. ඔබතුමන්ලා තමයි අපිත් එක්ක ඉන්න ඕනෑ" කියලා. මම මේ අවස්ථාවේදී මේ කාරණය කියන්න කැමැතියි. අපට කොන්දක් තිබෙන නිසා අපි අද ඇවිල්ලා ඡන්දය දෙන බව ඔබතුමන්ලා මතක තියා ගන්න. අපිට කොන්දක් තිබෙන නිසා මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අපි ඡන්දය ලබා දෙනවා. අපි කවදා හෝ දවසක තීන්දුව ගන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට මිසක් එක් එක් කෙනාට ඇඟිල්ල දික් කරන්න පුළුවන් තැනක ඉඳලා නොවෙයි කියන කාරණය මම බොහොම ආදරයෙන් මේ වෙලාවේදී මතක් කරන්න කැමතියි, ගරු කථානායකතුමනි.

ඉදිරියේදී අපට කථා කරන්න තව කාරණා ගණනාවක් තිබෙන බව මම කියන්න කැමැතියි. ඔබතුමා 'එටිකා' ගිවිසුම ගැන දන්නවා, ගරු කථානායකතුමනි. මේ වනකොට රටේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මිනිසුන්ගේ විශාල විරෝධයක් තිබෙනවා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. කොළඹ වරායේ පර්යන්තයක් පිළිබඳව විශාල අර්බුදයක්, ගැටලුවක් තිබෙනවා. අපි අපේ මතය ඉදිරිපත් කරන්නේ ගරු කථානායකතුමනි, රට වෙනුවෙන් මිසක් අපේ පෞද්ගලික ප්‍රශ්න නිසා නොවෙයි.

මධ්‍යම අධිවේගී මාර්ගය හැදීම ගැන කැබිනට් මණ්ඩලයේදී මම දැඩි ලෙස විරුද්ධ වුණා. ඒ, වෙන හේතුවක් නිසා නොවෙයි. මමත් මහනුවරට ගිහිල්ලා දළදා වඳින්න කැමතියි. දළදා වඳින්න යන්න ඩොලර් මිලියන 900ක් වැය වනවා. ඒ ඩොලර් මිලියන 900 අපි ගෙවන්න ඕනෑ. දැන් අපි අනාථ වෙලා ඉන්නේ ණය මුදල් ගෙවා ගන්න බැරිව; පොලී ගෙවා ගන්න බැරිව. මේ වාගේ දැවැන්ත ව්‍යාපෘති තවදුරටත් අපි ක්‍රියාත්මක කරනවාද නැද්ද කියලා අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕනෑ. ඒක එක්සත් ජාතික පක්ෂයට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඕනෑ තීන්දුවක් නොවෙයි. අපි දෙගොල්ලන් එකතුවෙලා තීන්දු ගන්න තැනකට යනවා නම් අපට ඉස්සරහට ගිය හැකියි. නැත්නම් අපට වෙනත් මාර්ගයක් තෝරා ගන්න පුළුවන්.

අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි, අපි ඉන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක නොවන බව. ඒ කාරණය ඔබතුමන්ලා හොඳට මතක තියා ගන්න ඕනෑ. අපි එක්සත් ජාතික පක්ෂයට මුක්කු ගහන්න මෙතැනට ඇවිල්ලා නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට, අපේ පක්ෂයේ නායක ජනාධිපතිතුමා කියපු විධියට අපි එක තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ තීන්දුව වෙනස් වුණු දාට අපි ඒ තීන්දුව අරගෙන ඉදිරියට යනවා. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි, අද මේ රටේ මිනිසුන් ඡන්දය දීලා තිබෙන්නේ යම් යම් කාරණා පිළිබඳව ආපසු හැරිලා බලන්නයි. අපි ඒකටත් සූදානම් නැත්නම්, මේ ක්‍රමයේම ගියාම හරි කියලා තවදුරටත් කල්පනා කරනවා නම් ඒගොල්ලන්ට දේශපාලන මළගමට යන්න පුළුවන්; ඒගොල්ලන්ට දේශපාලන කනත්තට යන්න පුළුවන්. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට කනත්ත ළඟට ගිහිල්ලා, දොර ඇරලා, ඒගොල්ලන්ට යන්න දීලා, කනත්තෙන් මෙහා පැත්තට බැහැලා අපි අපේ ගමන යනවා.

මම බොහොම ගෞරවයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. මම අගමැතිතුමා එක්ක පෞද්ගලිකව කිසිම ප්‍රශ්නයක් තිබෙන කෙනෙකු නොවෙයි. දේශපාලන වශයෙන් අපට මතවාදී ප්‍රශ්න තිබුණා. මම එතුමාගේ නායකත්වයට ඉඩ දීලා, එතැනින් ඉවත්වෙලා එළියට ගියා. අද අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ පක්ෂ නායකයන් විධියට එතුමාත් එක්ක කටයුතු කරනවා. ඒ නිසා අපි කටයුතු කරන්නේ පක්ෂයක් විධියට මිසක එක්සත් ජාතික පක්ෂයට වුවමනා විධියට නොවෙයි කියලා මම බොහොම ගෞරවයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

අපි අපේ ගමන යන්නම්. දේශපාලන ව්‍යාපාරයේ හැඩතල අපි හදා ගන්න ඕනෑ. ඒ සඳහා ගමන් කරන මාර්ගය අපි තීරණය කරන්න ඕනෑ. ඒක තීරණය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජාතික පක්ෂයේ ගමන් මාර්ගය තීරණය කරන්න ඕනෑ. ඔබතුමන්ලා හැදෙන්න කියලා අපි කියන්නේ නැහැ. අපට හැදෙන්න කියලා කරුණාකරලා ඔබතුමන්ලා කියන්නත් එපා. මේ පක්ෂ දෙකේ නායකයන් දෙදෙනාගෙන් එක් කෙනෙකු ජනාධිපති, අනෙක් කෙනා අගමැති. මේ දෙන්නා තීන්දුවක් ගන්න ඕනෑ, කොහොමද අපි ඉස්සරහට යන්නේ කියලා.

අපි ගන්න මතවාදය හෘදය සාක්ෂියට එකඟව මේ රටේ අභිංසක ජනතාව වෙනුවෙන් ගත යුතුයි. මහ බැංකුවෙන් හොරකම් කරපු සල්ලිවලින් කවුරු හෝ මිනිහෙකු ජීවත් වෙනවා නම් ඔහුට ජීවිතයේ කවදා හෝ දවසක විඳවන්න සිදු වනවාය කියන කාරණය මා මතක් කරනවා. මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂපාතීව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අපි සියලුදෙනා අත උස්සනවා කියන කාරණයත් මතක් කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා, ඔබතුමාට විනාඩි අටක් තිබෙනවා.

[අ.භා.7.09]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු කථානායකතුමනි. ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා, ඔහු පිළිබඳව ඔහුට විශ්වාසයක් නැහැ කියලා දැන් පිළිගත්තා. මොකද, ඔබතුමා ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාවේ අවසාන කොටස මම කියවන්නම්, ගරු ඇමතිතුමා.

විශ්වාස භංග යෝජනාවේ අවසානයේ මෙසේ සඳහන් වනවා:

"අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස ද, කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව මෙන්ම එතුමා අග්‍රාමාත්‍ය ධුරය දරන ආණ්ඩුවට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳවද විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමනි, මට කථා කරන්න ලැබී තිබෙන්නේ විනාඩි අටයි. ඒ නිසා ඔබතුමාට කාලය දෙන්න බැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will give you an extra minute.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. මේ විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙන්නේ ආණ්ඩුවට - [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කළා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කළ නිසායි මම කථා කරන්නේ. මෙතුමා වැරදියට -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙය හරියාකාරව අර්ථ නිරූපණය කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම එතුමාට වැඩිය සිංහල හදාරපු මනුස්සයෙක්. මට අපොස (උසස් පෙළ) සිංහල විෂයයට "B" සාමාර්ථයක් තිබෙනවා. එතුමාට මොකක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්න හදපු දෙය කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙම යෝජනාවේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙන්නේ, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස ද, කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව මෙන්ම එතුමා අග්‍රාමාත්‍ය ධුරය දරන ආණ්ඩුවට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳවද විශ්වාසයක් අපට නැහැ කියන එකයි. ඒකයි තිබෙන තත්ත්වය. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. Hon. (Dr.) Harsha De Silva, you go ahead. [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ඉංග්‍රීසියෙන් තිබෙන විධිය කියවන්නම් කෝ.

"That this Parliament resolves that it has no confidence in Hon. Ranil Wickramasinghe's ability to function as Prime Minister and as a Minister of the Cabinet and as well as the Government in which he holds the office of Prime Minister any longer."

මම දන්නේ නැහැ, මෙතැන - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. මෙම යෝජනාව ගැන සිංහල සහ ඉංග්‍රීසි කියන භාෂා දෙකෙන්ම ඉදිරිපත් කර තිබෙන්නේ, ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ කියන අදහසයි. ආණ්ඩුව පිළිබඳව එතුමාට විශ්වාසයක් නැහැ කියලා එතුමාම කියනවා නම්, මේ පිළිබඳව එතුමා කල්පනා කරන්නේ කොයි ආකාරයටද කියලා අපි දන්නේ නැහැ. බලන්න ගරු කථානායකතුමනි, එතුමා මේ විශ්වාස භංගයට පක්ෂව ඡන්දය දීලා, ජනාධිපතිතුමා එතුමාට යන්න කියලා කිව්වේ නැත්නම්, තවදුරටත් ආණ්ඩුවේ ඇමතිවරයෙකු හැටියට ඉන්න කල්පනා කරනවා කියලා එතුමා කිව්වා. මේක ගැටලු සහගත තත්ත්වයක් ගරු කථානායකතුමනි.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
යන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තමන් ඉන්නා ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරලා, ඊට පසුව තවදුරටත් ඇමතිවරයෙකු හැටියට ඒ ආණ්ඩුවේම රැඳිලා ඉන්නේ කොහොමද කියලා මට තේරෙන්නේ නැහැ. තමන්ට විරුද්ධව ඡන්දය දීලා ඊට පසුව තමන්ම කියනවා, "මම ඉන්නවා" කියලා. ඒක වෙන්න බැහැනේ. [බාධා කිරීම්] ඒක අපහාසකාරී කථාවක් නේ. එතුමාට ශක්තිමත් කොන්දක් තිබෙනවා නම්, කියන්න පුළුවන් වෙන්න ඕනෑ, "ඔව්, මම මේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙනවා. මම විපක්ෂයට යනවා. ප්‍රශ්නයක් නැහැ" කියලා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
අන්න හරි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අන්න එහෙමයි කොන්ද තිබෙන මිනිස්සු වැඩ කරන්නේ. දැන් බලන්න, මෙතැන වෙන්නේ එහෙම දෙයක් නොවෙයි. මේක රැවුලයි, කැඳයි දෙකම බේරාගන්න හදන වැඩක්. රැවුලයි, කැඳයි දෙකම ලබා දෙන්න බැහැනේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමාට කථා කරන්න දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, කොහේද මෙවැනි දේවල් සිද්ධ වෙන්නේ? ඒ ගැන අපට තීන්දුවක් ගන්න වෙනවා.

අනෙක තමයි, අපි මේ ඡන්දය ගන්නකම් ඉන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, අපේ ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා BBC එකට ඊයේ කියලා තිබෙනවා, worst-case scenario, අවම වශයෙන් ඡන්ද 7කින් ඔවුන් ජයග්‍රහණය කරනවා කියලා. දැන් පොඩ්ඩකට කලින් එතුමා BBC එකට කියලා තිබෙනවා, ජනාධිපතිතුමා හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඔවුන්ව පාවා දුන් නිසා ඔවුන්ට මේ යෝජනාව ජයග්‍රහණය කරන්න බැහැ කියලා. මම මේ කිව්වේ එතුමා BBC එකට කියපු දෙයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. State Minister, you have three more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay.

ගරු කථානායකතුමනි, ඔවුන් මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ දේශපාලන කටයුත්තක් සම්බන්ධයෙන්ය කියන එක නැවතත් පැහැදිලි කිරීමේ අවශ්‍යතාවක් නැහැ. අපි එක දෙයක් කියන්න අවශ්‍යයි. මොවුන් චෝදනා කරන ලැයිස්තුවට අනුව [බාධා කිරීම්] යම්කිසි විධියකට, ඒ වෙලා තිබෙන ගනුදෙනුවේ දූෂිත ක්‍රමයක් තිබෙනවා නම්, ඒ සියලුදෙනාටම දඬුවම් කළ යුතුයි කියන තැන අපි ඉන්නවා.

ඒ විතරක් නොවෙයි, අර බරපතළ වංචා දූෂණ සොයා බැලීම සම්බන්ධයෙන් වූ කොමිෂන් සභාවෙන් සොයා ගත්ත කාරණා එදා මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළා. ඒ පිළිබඳවත් කටයුතු කරන්න ඕනෑ. මොකද, මේක එක පැත්තක පමණක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේදී වංචාව, දූෂණය පිළිබඳව බොහෝ දෙනා බොහෝ අවස්ථාවලදී කථා කරන බව අපි දන්නවා. නමුත් ඊට වඩා වැඩි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. අද ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ඔහු සම්බන්ධයෙන් පවා කථා කළා. මේ පාර්ලිමේන්තුවේ ඉන්නා අනෙක් 224 දෙනා ගැනත් ඔහු ප්‍රශ්නයක් ඇසුවා. එතුමා අහපු ප්‍රශ්නය සාධාරණයි කියලා මම හිතනවා.

අපි අපේ හදවතට තට්ටු කරලා බලන්න ඕනෑ, අපි හරියාකාරව ජීවත් වෙනවාද කියලා; අපි හරි විධියට බදු ගෙවනවාද කියලා. එතුමා permits ගැන කථා කළා. අපේ හදවතට කථා කරලා බලන්න ඕනෑ, අපි ඒ සම්බන්ධයෙන් කරලා තිබෙන්නේ මොනවාද කියලා. මේ පාර්ලිමේන්තුවේ කී දෙනෙක් බදු ගෙවනවාද කියලා ඇත්තටම අපි අහන්න ඕනෑ. අපි මෙතැන ඇවිල්ලා බණ කියන්න නරකයි. අපි බණ කියනවා නම්, අපි ඒ ආකාරයට ජීවත් වෙන්නත් ඕනෑ. නැතුව මෙතැන දේශපාලන වේදිකාවක් කරගෙන රහපාලා, මෙතැන කියන්න එපා "අරයා හොරා, මෙයා හොරා, නමුත් මම නම් හරිම පිරිසිදු පුද්ගලයා" කියලා. අපි හැමදාම මේ වැඩේ කරගෙන ගියොත් එහෙම මේ පාර්ලිමේන්තුව මේ තත්ත්වයටත් වඩා තවත් පහළට වැටෙනවා. ගරු කථානායකතුමනි, විපක්ෂයෙන් ගෙනා මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව අපි ඡන්දය දෙනවා කියලා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා.7.15]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මට වෙන් වී ඇති වේලාව කොපමණද කියන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මුලදී තිබුණේ විනාඩි 10යි. තවත් විනාඩි 15ක් ලැබිලා තිබෙනවා, වෙනත් කොටසකින්. ඒ අනුව ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, අද අගමැතිතුමාට එරෙහිව ගෙනෙන ලද විශ්වාස භංග යෝජනාව සම්බන්ධ විවාදයේදී ඔබතුමා මූලාසනයේ ඉන්නා අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. 2005 නොවැම්බර් මාසයේ 18වෙනි දා සිට 2015 ජනවාරි 08වෙනි දා වනතුරු විශ්වාසය නැතිවෙලා තිබුණු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ විශ්වාසය ඇති කර ගත්තේ "යහ පාලනය" කියන නම යොදලායි.

ගරු කථානායකතුමනි, එතුමාගේ නැති වෙලා තිබුණු විශ්වාසය නැවත ඇති කර ගන්න යහ පාලනය කියන නම ගෙනැල්ලා කප්පරක් බොරු මේ රටේ මිනිසුන්ට වැපුරුවා. ඒ බොරු ඉදිරියේ 2015 ජනවාරි 08ට පෙර නොගැළපෙන කණ්ඩායම් එකට ඒකරාශි වුණා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයෙන් ඉවත්වෙලා ගිහිල්ලා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක අත්වැල් බැඳගෙන ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා 2015 ජනවාරි 08වෙනි දා දේශපාලන විපර්යාසයක් සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, 2015 ජනවාරි 08වෙනි දා මේ සිද්ධිය සිද්ධ වුණාට පස්සේ මුළු රටේම මිනිසුන් බලාගෙන හිටියා, අවුරුදු ගණනාවක් විශ්වාසය නැතිවෙලා තිබුණු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා නැවත විශ්වසනීය ලෙස රටේ ජනතාවට සේවය කරයි ද කියලා. එතුමා විතරක් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් ඇතුළු මුළු යහ පාලන ආණ්ඩුවම කෙරෙහි මේ රටේ ජනතාව විශ්වාසය තැබුවා, අනිවාර්යයෙන් ජනතා බලාපොරොත්තු ඉටු කරයි කියලා. නමුත් ජනතා බලාපොරොත්තු ඉටු කළේ කොහොමද? ගරු කථානායකතුමනි, මහ බැංකු මංකොල්ලය, රාජ්‍ය සම්පත් විකිණීම, රණවිරු දඩයම, සමාජ මාධ්‍ය වාරණය, විකෘති මැතිවරණ ක්‍රමය, ආර්ථිකයේ බිඳ වැටීම, පාතාලය රජ කරවීම, අසාධාරණ ලෙස බදු බර වැඩි කිරීම, ජීවන වියදම මිනිසුන්ගේ කර මත පැටවීම, ජාතිවාදී ගැටුම් රට තුළ ඇති කිරීම, ෆෙඩරල් ව්‍යවස්ථාවක් රටට ලබාදීම කියන කාරණා මේ යහ පාලන ආණ්ඩුව විසින් ජනතාවට ලබාදීපු වරප්‍රසාද බවට පරිවර්තනය වුණා. මේ සිදුවීම් සිදුවෙන අතරතුරේ ගරු කථානායකතුමනි, 2015 ජනවරම ලබපු ආණ්ඩුව 2018 පෙබරවාරි මාසයේ 10වෙනි දා පළාත් පාලන මැතිවරණයකට යනවා. මේ විශ්වාසය පලුදු වෙච්ච එක ගැනයි ගරු කථානායකතුමනි, අපි මතක් කරන්නේ.

ගරු කථානායකතුමනි, 2015 පෙබරවාරි මාසයේ 10වෙනි දා වෙනකොට මේ ආණ්ඩුවේ වයස හරියටම අවුරුදු 3යි දින 14යි. මේ ආණ්ඩුවේ වයස අවුරුදු 3යි දින 14ක් වන විට, මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තැබූ හැට දෙලක්ෂයක ජනතාවක් හිටියා. මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබන්න ඕනෑ, පවතින ආණ්ඩුව නිසා. පවතින ආණ්ඩුව කරන්නේ පක්ෂ දෙකක් එකතු වෙලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය දෙනවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. එක්සත් ජාතික පක්ෂයට නායකත්වය දෙනවා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා. රටේ ප්‍රධානියා එක් පක්ෂයක නායකයා. රටේ දෙවැනියා අනික් පක්ෂයේ නායකයා. මේ පක්ෂ දෙකටම වයස අවුරුදු 60 ඉක්මවනවා. ලක්ෂ හැටදෙකක ජනවරමක් ලැබූ, මේ ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන්න ආපු ආණ්ඩුව, පක්ෂ දෙකේ රාජ්‍ය බලයත් එක්ක අවුරුදු 3යි දින 14ක් ඇතුළත 2018 පෙබරවාරි මාසයේ 10වෙනි දා මැතිවරණයකට යනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා බුද්ධිමත් දේශපාලන නායකයෙක් හැටියට ඔබතුමාගේ හෘද සාක්ෂියට අනුව කියන්න, පවතින ආණ්ඩුවෙන් පිටට පළාත් පාලන ආයතනයක් මේ රටේ ඉතිහාසයේ කවදාවත් දීලා නැහැ නේද කියලා. මේ රටේ දේශපාලන සිතියම් පොත බලනකොට, පවතින ආණ්ඩුවටම තමයි තමන්ගේ නගර සභාව, තමන්ගේ ප්‍රාදේශීය සභාව ඉතිහාසයේම බහුතරයක් දීලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඔබතුමාට අපි මතක් කරන්න ඕනෑ, මෙම ප්‍රබල පක්ෂ දෙකක නායකයන් දෙන්නෙක් එක්ක විශ්වාසය දිනා ගෙන හිටපු ජනතාවගේ අභිලාෂයන්ට මොකක්ද සිද්ධ වුණේ කියලා. ලංකාවේ පළාත් පාලන ආයතන 341කින්, 240කට ආසන්න ප්‍රමාණයක් ජයග්‍රහණය කරන්න තරම් ජනවරමක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ලබා ගන්න හැකිවීමෙන් පවතින ආණ්ඩුව කෙරෙහි විශ්වාසය නැති වුණා කියන එක අද මේ අය බොහොම පැහැදිලිව දැනගන්න ඕනෑ. ඒ විශ්වාසය භංගවෙලා. ගරු කථානායකතුමනි, මේ විශ්වාසය භංගවීම ගැන අපට එක්සත් ජාතික පක්ෂයට කෙරෙහි ප්‍රශ්නයක් නැහැ. ඒක ඔවුන්ගේ පක්ෂය.

ගරු කථානායකතුමනි, නමුත් අද රාත්‍රී 9.30ට විශ්වාස භංගයට පක්ෂව සහ විශ්වාස භංගයට විපක්ෂව මේ රට වෙනුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 225 දෙනාගේ අත එසවෙනවා. අද විශ්වාස භංගයට එරෙහිව එක්සත් ජාතික පක්ෂයේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, නවක මන්ත්‍රීවරුන්ගේ, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ, ඒ වාගේම රටට ජාතියට ආදරය කරන මන්ත්‍රීවරුන්ගේ අත එසවෙයි. හැබැයි, අත එසවුණත් අත යට මුක්කුවක් ඇත. අතට කරුවක් ඇත. අතට කරුවක් හේත්තු කරන්න සිද්ධ වී ඇත. හෘදය සාක්ෂියට එකඟව නොවෙයි අත එසවෙන්නේ. විශ්වාස භංගයට එරෙහිව තමන්ගේ අත වෙන කෙනෙක් ලවා උස්සවන තත්ත්වයකට පත් කරයි. ඒ ගහන කරුව අනාගත නියෝජ්‍ය ඇමතිකමක කරුවක් වෙන්න පුළුවන්. ඒ ගහන කරුව අනාගත කැබිනට් ඇමතිකමක කරුවක් වෙන්න පුළුවන්. ඒ කරුව යම් විධියකට-

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු කථානායකතුමනි, මේ කථා කරන ගරු මන්ත්‍රීතුමා එක පාරක් සර්පයෙක් කෑවා. මොකද ඒ,-[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්නේ. මේ සභාවේ අපට අපේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා මට ඒ ගෞරවය රැකලා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථාව කරගෙන යන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
හොඳයි. බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මම කථාව නැවැත්තුවේ අත එසවෙන විධිය ගැනයි; අත එසවෙන කොට කරු තියෙයි කියලායි. නියෝජ්‍ය ඇමතිකමක කරුවක්, කැබිනට් ඇමතිකමක කරුවක්, එහෙම නැත්නම් වෙනත් වරදානයක කරුවක්, එහෙම නැත්නම් වෙනත් විධියකට රටේ ඉන්න පුළුවන්කම තිබෙන කරුවක් තිබෙන්න පුළුවන්. අපි දන්නවා, අද රටේ කුකුළෙකුට මිලක් තිබෙනවා; එළුවෙකුට මිලක් තිබෙනවා කියලා. පිම්බුණ ඌරෙකුට මිලක් තිබෙනවා. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් මිල නියම වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ මිල යටතේ වෙන්දේසි භාණ්ඩයක් වෙච්ච අයගේත් අත අද එසවෙයි. හැබැයි, කෙසේ අත එසවුණත් හෘදය සාක්ෂිය දන්නවා, ඉතිහාසය. මේ බාධා කරන මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂි දන්නවා, පසුගිය මැතිවරණ පරාජය වීමට හේතු සාධකය මොකක්ද කියලා. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තු කැන්ටීන් එකේ මේසවලට කථා කරන්න පුළුවන් නම්, පිරිසි කෝප්පවලට කථා කරන්න පුළුවන් නම්, හැදි ගෑරුප්පුවලට කථා කරන්න පුළුවන් නම් මේ මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂිය එළියට එනවා. "අපි නායකත්වය නිසා තමයි පැරදුණේ, අපේ නායකත්වය නිසා තමයි පක්ෂය විනාශ වුණේ, අපේ නායකත්වය නිසා තමයි 2015ට පෙර 29 වතාවක් පැරදුණේ" කියලා ඒ අය කියනවා. අද මේ අත ඔසවන අයගේ ඒ කථා ඔබතුමාගේ භෝජනාගාරයේ තැන් තැන්වලින් ඇහුණා. ඒකයි ඇත්ත. ගරු කථානායකතුමනි, ඒකයි ඇත්ත. ඒ ඇත්ත තිත්තයි.

අද එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මාධ්‍ය ප්‍රකාශ දෙන්න වුණා. ගරු කථානායකතුමනි, මම ඒ කිසිම මන්ත්‍රීවරයකුගේ නමක් සඳහන් කරන්නේ නැහැ. අද උදේ කථා කරපු මන්ත්‍රීවරයෙක් "මව්බිම" පත්තරයට කියා තිබෙනවා, "රනිල්ට එරෙහිව දැඩි තීන්දුවක් ගන්නවා." කියලා. ඒ තමයි හෘදය සාක්ෂිය. ගරු කථානායකතුමනි, ඒ තමයි හෘදය සාක්ෂිය. හැබැයි, ඒ හෘදය සාක්ෂිය යට වෙනවා. යම් හේතු මත ඒ හෘදය සාක්ෂිය වෙනවා ගරු කථානායකතුමනි. ඒකයි ඇත්ත.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේ වන කොට මුළු රටේම ජනතාව රූපවාහිනිය ඉදිරිපිට බලාගෙන ඉන්නවා. මුළු රටේම ජනතාව රේඩියෝව අහගෙන ඉන්නවා. ඒ අය දන්නවා කොහොමත් ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 54දෙනා මේ විශ්වාස භංගයට එකඟව, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට විරුද්ධව අනිවාර්යයෙන්ම ඡන්දය පාවිච්චි කරන බව. මුළු රටේම ජනතාව විශ්වාසයකින් ඒ ගැන බලාගෙන ඉන්නවා. ඒ එක්කම අද රටේ ජනතාව බලාගෙන ඉන්නවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිහා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දිහා, ඇමතිවරු දිහා රටේ ජනතාව බලාගෙන ඉන්නවා.

අද ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා කථා කළා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කථා කළා. ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. ඒ කථාවලදී අපි එක දෙයක් දැක්කා. මොකක්ද අපි දැක්කේ? ඒ "අපි ශ්‍රී ලංකාකාරයෝ" කියන එකයි ගරු කථානායකතුමනි. ගමේ ශ්‍රී ලංකාකාරයෝ මෙහෙම කථාවක් කියනවා. "අපේ අත කැපුවත් අපේ පාට නිල්" කියනවා. එහෙම කථාවක් අපි අහලා තිබෙනවා; අපිත් කියලා තිබෙනවා. අද රාත්‍රී නවයහමාරට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අත කැපුවත් නිල් කියන අය අපට බලා ගන්න පුළුවන් වෙයි. ඒ අය මේ විශ්වාස භංගයට පක්ෂව ඡන්දය පාවිච්චි කරන බවට ලොකු විශ්වාසයක් අපට තිබෙනවා, ගරු කථානායකතුමනි. හැබැයි, අපේ පාට නිල් කිව්වත්, අනිත් අතින් කොළ පාට කොඩි වැනෙන අයගේ නාමාවලියත් අද රාත්‍රී 9.30ට බලා ගන්න පුළුවන්කම ලැබෙනවා, ගරු කථානායකතුමනි. අනිවාර්යයෙන්ම ඒකත් බලා ගන්න පුළුවන්කම ලැබෙනවා. මේ කොයි කාටත් මෙතැනදී තීන්දු තීරණ ගන්න පුළුවන්. හැබැයි, අවසාන තීන්දුව යන්නේ ජනතා අධිකරණයට. ජනතාව කියනවා, "ගන්න ඔබ තීන්දුව. අරගෙන එන්න ගමට. ගමට ආවාම ගමේදී අපි බලා ගන්නම් ඔබේ ගනුදෙනුව" කියලා. ඒ ගනුදෙනුව බේරාගන්න ජනතාව බලාගෙන ඉන්නවා, ගරු කථානායකතුමනි. අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාගේ ඔළුගෙඩි සෙල්ලමෙන් තමයි මේ විශ්වාස භංගය දිනනවාද, පරදිනවාද කියන එක තීන්දු කරන්නේ.

ගරු කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මේ කාලය ඇතුළත නොයෙක් දේවල් කිව්වා. ඔබතුමාටත් මතක ඇති 2014 දෙසැම්බර් 19වැනි දා කිව්වා, "මෛත්‍රී පාලනයක් 100 දිනකින් අලුත් රටක්" කියලා දින 100 වැඩ පිළිවෙළ ගැන. 2015 ජූලි 23වැනි දා කිව්වා, "මාස 60න් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" ගැන. අද මේවා අමතක වෙලා, ගරු කථානායකතුමනි. 2015 නොවැම්බර් 05වැනි දා කිව්වා, "රට හදන ආර්ථික වැඩ පිළිවෙළ" ගැන. 2016 ජනවාරි 29වැනි දා කිව්වා, "මෙගා පොලිස් සංවර්ධන යෝධ වැඩසටහන" ගැන. 2016 ඔක්තෝබර් 27වැනි දා කිව්වා, "රජයේ ආර්ථික සැලසුම් ප්‍රකාශනය" ගැන. 2017 ජනවාරි 04වැනි දා කිව්වා, "නිරසර යුගයක් සහ නව ආර්ථික සැලැස්මක්" ගැන. 2017 අගෝස්තු 22 වන දා කිව්වා, "තුන් අවුරුදු සංවර්ධන නව ආර්ථික සැලැස්ම" ගැන. 2017 සැප්තැම්බර් 4 වන දා කිව්වා, "2025 - පෙහොසත් රටක්" අට අවුරුදු සැලැස්ම ගැන. මේ තමයි රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා රටේ ජනතාවට දුන් පොරොන්දු.

අප තුළ විතරක් නොවෙයි, වෙන වෙන තැන්වලත් එතුමා ගැන විශ්වාසය පලුදු වෙලා තිබෙන්නේ කොහොමද කියලා අපි දැක්කා. අපේ අගමැතිතුමා වැඩියෙන්ම ආදරය කරන කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිතුමාට සැලකීම වෙනුවෙන් -එතුමා ඉන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ- වාහන නිෂ්පාදනය කරන ලෝකයේ ප්‍රසිද්ධ සමාගමක් වන ටොක්ස්වැගන් සමාගමේ අනුමැතිය ඇතුව කුලියාපිටියේ අක්කර 56ක ඉඩමක් අරගෙන- කුඹුරු අක්කර 10ක් ගොඩ කරලා, පොල් ගස් 3,500ක් කපලා, කුඹුක් ගස් 25ක් කපලා, මී ගස් 8ක් කපලා, කැටකාල ගස් 25ක් හා කොස් ගස් 30ක් කපලා- මේ වනකොට ටොක්ස්වැගන් සමාගමේ කාර් නිෂ්පාදනය කරන්න යනවා, ගරු කථානායකතුමනි. පසුගිය දිනවල අපටත් රට වටේ යන්න සිද්ධ වුණා, දේශපාලන වැඩවලට. මම කුලියාපිටියෙන් එනකොට තේ ටිකක් බොන්න පුංචි කඩයක් ළඟ නවත්වලා ඇහුවා, "අර කාර් කොම්පැනිය හදපු

නැන නිබෙන්නේ කොහේද" කියලා. ගරු කථානායකතුමනි, ඒ කඩේ හිටපු අහිංසක වයසක මාමා, "ඔව් මහත්තයෝ, ඒකේ හදන කාර් තිබෙනවා" කියලා මට කාර් එකක් පෙන්නුවා. මෙන්න, මේ මගේ අතේ තිබෙන්නේ ඒ කොම්පැනිය හදන අලුත්ම කාර් එක! මෙන්න, අලුතෙන්ම හදන වොක්ස්වැගන් කාර් එක! අර වොක්ස්වැගන් කොම්පැනිය දන්නේ නැතුව, ලංකාවේ කුලියාපිටියෙන් ගත්තා වූ ඉඩමේ නිෂ්පාදනය කළ ඒ කාර් රථයක් මමත් අරගෙන ආවා, කීයක් හරි දීලා. මේ බලන්න, කුලියාපිටියේ නිෂ්පාදනය කරලා තිබෙන වාහනය. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. බලන්න, දැන් මේ තුළින් ලබපු රැකියා ප්‍රමාණය; මේ තුළින් රටට ලැබුණු වාසි ප්‍රමාණය කොච්චරද කියලා! මේ තුළින් කොපමණ වාසි ප්‍රමාණයක් රටට ලැබුණාද?

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපේ කළුතර දිස්ත්‍රික්කයේ රත්නසිරි වික්‍රමනායක හිටපු අගමැතිතුමා එදා ඒ තිබුණු ඉඩම් ප්‍රමාණය තුළ කර්මාන්ත පුරයක් ඇති කළා. අපි හිතුවා, ඔව්, අපේ කාලයේ කරන්න බැරි වුණත් අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සහ අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංකල්පයක් අනුව ආසියාවේ විශාලම ටයර් කර්මාන්තශාලාව අපේ දිස්ත්‍රික්කයේ ඒ කර්මාන්ත පුරයේ ඉදි වෙනවා කියලා. ගරු කථානායකතුමනි, හොරණ පිහිටි ඒ කර්මාන්තශාලාවේ හදන සෙල්ලම් ටයර් මෙන්න! මේවා තල්ලු කරගෙන යන්න පුළුවන්! මෙන්න, දැන් එතැන හදන ටයර් එක. ඒ නිසා දැන් අපේ දිස්ත්‍රික්කයේ රැකියා ඕනෑ තරම් තිබෙනවා; අඩුවක් නැහැ! හැබැයි මේ ටයර්වලට ඉතිහාසයක් තිබෙනවා. 1988-1989 කාලයේ මේ ටයර්වලට වටිනාකමක් හම්බ වුණා. ඒ වටිනාකම දීපු නායකයන්ට විරුද්ධව තමයි අද මේ සභාවට විශ්වාස භංග යෝජනාවක් ඇවිල්ලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. අද මේ සභාව තුළ කථා කළ මන්ත්‍රීවරු නොයෙකුත් විධියේ දේවල් කිව්වා. යම් යම් කාලවලදී කිව්වා, විශ්වාසභංගයට අදාළ ප්‍රධාන කනිකාවත වුණු බැදුම්කර මහා කොල්ලය ගැන.

ගරු කථානායකතුමනි, බැදුම්කර කොල්ලය සම්බන්ධයෙන් කථා කරනකොට, "බය නැති අගමැති" කියලා පෝස්ටරයක් ඇලවුණා, අපි දැක්කා. එතුමා ජනාධිපති කොමිසමට සාක්ෂි දෙන්න යනකොට, "බය නැති අගමැති" කියලා කිව්වා. ගරු කථානායකතුමනි, ඔව්, එතුමා බය නැති අගමැතිවරයෙක්. නැත්නම් මහ දවාලේ කෝටි එකක්, ටයි එකක් දමලා මහ බැංකුව කොල්ල කන්න බයක් තිබෙනවාද? බය නැති නිසා නේ එහෙම කරන්නේ. ඒ නිසා නේ එහෙම යන්නේ. ඒ නිසා නේ එහෙම සාක්ෂි ගන්නේ.

ගරු කථානායකතුමනි, ඇයි නීතිය දෙවිධියක් වෙන්නේ? ඔබතුමා මේ රටේ තුන්වන පුරවැසියා. මම ඔබතුමාගෙන් බොහොම කරුණාවෙන් අහනවා, 2015 ජනවාරි 08 වන දාට පස්සේ ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට සහ සියලු රාජ්‍ය නිලධාරීන්ට මේ ආණ්ඩුව පාවිච්චි කළ ක්‍රමවේදයම මේ මහ බැංකු කොල්ලයට සම්බන්ධ වුණ අයටත් පාවිච්චි කරන්න පුළුවන් නේද කියලා. ඒ අයටත් ඒ ක්‍රමවේදයම පාවිච්චි කරන්න. අද කථා කරපු ගමන් ඔය පැත්තේ ඉන්න අය කියන්නේ, "ඒකාබද්ධ විපක්ෂයේ ඔක්කෝම හොරු" කියලායි. අපි සැකකරුවෝ. ඔව්, අපි බය නැතුව කියනවා, අපි සැකකරුවෝ කියලා. දේශපාලන වශයෙන් අපි කොන්ද කෙළින් තියාගෙන නැගිටීම වෙනුවෙන් අපට ලැබී තිබෙන පරිත්‍යාගය තමයි උසාවිය සහ නඩු.

අපි ඔක්කෝම ඒවායේ සැකකරුවෝ. ඒ සැකකරුවන් හැටියට ඉන්න අපි කවදා හරි දවසක වැරදිකරුවන් වුණොත්, අපිව අරගෙන ගිහිල්ලා හිරගෙවල් ඇතුළට දමන්න. දමලා හිර කරන්න; හිර කරලා මනදොළ පුරවා ගන්න. හැබැයි අපි සැකකරුවෝ නම්, මේ මහ බැංකු මං කොල්ලයේ ප්‍රධාන සැකකරුවෙක් තමයි මේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා. ඔහු සැකකරුවෙක්. මොකක්ද මේ තිබෙන චෝදනාව? රාජ්‍ය දේපොළ අවභාවිතය.

ගරු කථානායකතුමනි, මේ සිද්ධිය සම්බන්ධයෙන් අර්ජුන ඇලෝසියස් සහ පලිසේන යන දෙදෙනා අද රක්ෂිත බන්ධනාගාරයේ ඉන්නවා. ගරු කථානායකතුමනි, ඒ දෙදෙනාට කොහොමද රාජ්‍ය දේපොළ අවභාවිතය සම්බන්ධ චෝදනාවක් එන්නේ කියලා මට කියා දෙන්න. ඒ දෙදෙනා කවදාද රාජ්‍ය පාලනයට එකතු වෙලා තිබෙන්නේ? රාජ්‍ය පාලනයට එකතු වෙලා නැහැ. රාජ්‍ය පාලනයට එකතු වෙච්ච අර්ජුන මහේන්ද්‍රන් කියන ප්‍රධාන සැකකරුවා අද රටින් පිටවෙලා ගිහිල්ලා තිබෙනවා. අගමැතිතුමාත් එක්ක එතුමාගේ ගනුදෙනු තිබුණේ අද-ඊයේ නොවෙයි, 2001 ආණ්ඩුව කාලයේ ඉඳලායි. 2001 ආණ්ඩුවේත් අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයාව රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ගෙන්වා ගත්තා. එදාත් ගෙන්වා ගෙන කිව්වා, තමන්ගේ බොහොම හිත මිතුරු කෙනෙක් කියලා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා තමන්ගේ මිත්‍ර හිටපු මහ බැංකු අධිපතිතුමා කෙරෙහි තැබූ විශ්වාසය සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවල සඳහන් වෙලා තිබෙනවා. මොකක්ද එතුමා කොමිසමට ගිහිල්ලා කිව්වේ? හිටපු මහ බැංකු අධිපතිවරයා කියනවා, "මට උපදෙස් දුන්නේ අගමැතිතුමා" කියලා.

ගරු කථානායකතුමනි, අපි දැක්කා දප්පුල ද ලිවේරා, යසන්ත කෝදාගොඩ කියන, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රවි කරුණානායකගෙන් ප්‍රශ්න කරනවා. ඒ වාගේම වෙනත් සාක්ෂිකරුවන්ගෙනුත් ප්‍රශ්න කරනවා අපි දැක්කා. නමුත්, එම නීතිඥ මහත්වරුන්ට අගමැතිවරයාගෙන් ප්‍රශ්න කරන්න පුළුවන්කම ලැබුණාද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. එහෙම ප්‍රශ්න කරන්න ලැබුණේ නැහැ. ලැබුණේ කොහොමද? "මෙන්න මුලින්ම ප්‍රශ්න ටික, මම උත්තර හදාගෙන එන්නම්. මම දෙන්නම්, උත්තර" ඇයි, දප්පුල ද ලිවේරාට එතුමාගෙන් ප්‍රශ්න අහන්න අයිතියක් නැද්ද? මේ රටේ නීති පොතේ කොතැනක හෝ තිබෙනවාද, අගමැතිවරයා කැමති කෙනෙකුට කියලා සාක්ෂි අස්සවන්න කියලා. ගරු කථානායකතුමනි, එහෙම ලියලා තිබෙන්නේ කොහේද? අපට පෙන්වන්න ඒක. අපි නොදැක්ක නැන අපට පෙන්වන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීවරයා රක්ෂිත බන්ධනාගාර ගත වුණා, වාහන අවභාවිතයක් සම්බන්ධයෙන්. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයා ව්‍යාජ්‍ය සම්මතියක ලක්ෂ දහයක් සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගත වෙනවා. බැසිල් රාජපක්ෂ මන්ත්‍රීවරයා පළාත් පාලන ආයතන සතු බට බෙදලා රක්ෂිත බන්ධනාගාර ගත වෙනවා. උදය ගම්මන්පිල රක්ෂිත බන්ධනාගාර ගත වෙනවා. ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු ඇමතිවරයා රක්ෂිත බන්ධනාගාර ගත වෙනවා, ගරු කථානායකතුමනි. ඒ ඔක්කෝම රක්ෂිත බන්ධනාගාර ගත

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වෙන්නේ ඇයි? ඇමතිකමක ඉඳලා, ඒ ඇමතිකමේ ඉන්න කොට පහළින් සිදු වෙච්ච සිදුවීමක් සම්බන්ධයෙනුයි. ගරු කථානායකතුමනි, මේ මහ බැංකු අධිපතිවරයාව ලංකාවට ආනයනය කිරීම, එසේ ලංකාවට ආනයනය කර ලංකා ඉතිහාසයේ මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණු දෙයක් තමන්ගේ යටතට ගැනීම සහ ඔහුට භාරදීම, පළමු හොරකමින් පසුවත් ඔහු ආරක්ෂා කිරීම කියන කාරණා සම්බන්ධයෙනුත් එම ක්‍රියාවලියම ක්‍රියාත්මක වුණොත්, ගරු අගමැතිතුමා මේකේ විත්තිකරුවෙක් බවට පරිවර්තනය වෙන්න එය ප්‍රමාණවත් නැද්ද? එහෙම ප්‍රමාණවත් නැහැ. ඇයි? අගමැතිකමේ ආවරණය, බලයේ තිබෙන උෂ්ණත්වය. ඒකට තමයි අද සියල්ලම වසන් වෙලා තිබෙන්නේ. හැබැයි අපි සියල්ල කාලයට භාර දෙනවා, ගරු කථානායකතුමනි. අපි කාලයට භාර දෙනවා.

අද රෑ නවයහමාරට මේ සභාවේ විශ්වාසභංග යෝජනාවෙන් රනිල් වික්‍රමසිංහ ජයගත්තා නම් රට තුළ රතිඤ්ඤා පත්තු කරවයි. පත්තු වෙන්නේ නැහැ, පත්තු කරවයි. පෝස්ටර් අලවා ගනී. ඇලවෙන්නේ නැහැ, අලවා ගනී. ඒවා අලවන කෙනා කැමැත්තකින් නොවෙයි අලවන්නේ. ඒකයි ඇත්ත.

ගරු කථානායකතුමනි, හමුදාවේ සිට පැමිණි ඇමතිවරයෙක් කථා කළ විලාශය අපි බලා ගෙන සිටියා. මම එතුමාගේ නම කියන්නේ නැහැ. එතුමා එහෙම කථා කරන එක සාධාරණයි, ගරු කථානායකතුමනි. මුළු ලංකාවෙන්ම ඡන්ද 4,000ක්වත් ගන්න බැරි වූ කෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීකමක ඉන්දවලා, නොමේලේ පිං ඇමතිකමක් දුන්නාම, දෙයිහාමුදුරුවනේ! ඊට වැඩිය සැලකිය යුතුයි නේද? ඔහොම නොවෙයි සලකන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, කතරගම දේවාලයට ගිහිල්ලා වඳින ක්‍රම තිබෙනවා. සමහරු අත්දෙක එකතු කරලා වඳිනවා; සමහරු බිම දිගා වෙලා වඳිනවා. ඒ නිසා, එතුමා වික්‍රමසිංහ අගමැතිතුමාට බිම දිගා වෙලා වැන්දත් පව් නැත. ඔහොම නොවෙයි දොළ පිදේනි දෙන්න ඕනෑ; ඔහොම නොවෙයි වරදානවලට යට වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වේලාව අවසන් වේගෙන එනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඔබතුමා මට හරි ආදරෙයි. මට තව විනාඩියක් දෙන්න, තව විනාඩියකින් අවසන් කරන්නම්.

ගරු කථානායකතුමනි, තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කථා කරනවා මම අහගෙන හිටියා. ගරු අකිල විරාජ් මන්ත්‍රීතුමා කිව්වා, "අනේ! අපිට ඔක්සිජන් දුන්නා"යි කියලා. "මේ විශ්වාසභංග යෝජනාවෙන් අනේ! අපිට ඔක්සිජන් දුන්නා"යි කියලා කිව්වා. අපිට ඒක තේරුණේ නැහැ. අපි දන්නේ නැහැ, අගමැතිතුමා එතුමාට ඔක්සිජන් හෝ මොනවා හෝ දෙනවාද කියලා. නමුත් ඔක්සිජන් අවශ්‍ය වෙන කාලය ඇවිල්ලා තිබෙනවා. අදින් පසුව රට තුළ දේශපාලන ගනුදෙනුවේ මහ විපර්යාසයක් සිදු වෙනවා, ගරු කථානායකතුමනි. මේ ආණ්ඩුව කෙරෙහි රටේ මිනිසුන්ගේ කිසිම විශ්වාසයක් නැහැ. විශ්වාසයක් ඇති බවට අද ඔළුගෙඩිවලින්, අත් එසවීමෙන් පෙන්නුවත් රටේ ජනතාව අද රාත්‍රී 9.30න් පස්සේ තීන්දුවක් ගන්නවා. ඒ තීන්දුව තමයි "ඔබට කැමැති කාලයක් ආණ්ඩු බලය පාවිච්චි කරන්න. ඔබේ බලය පාවිච්චි කරන්න. හැබැයි ඔබට කැමැති වෙලාවක අපට ඡන්දය දීම සඳහා මැතිවරණයක් දෙන්න" කියන එක. මේ රටේ ජනතාවත් එක්ක හිටගන්න අපි ලැහැස්තියි. යහපාලන ආණ්ඩුව ගෙදර යවන්න සූදානම් කියන පණිවුඩය දෙන්න මුළු රටම බලාපොරොත්තුවෙන් සිටින බව මතක් කරමින් මම නවතිනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට. ගරු ජේ. සී. අලවතුවල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. J.C. Alawathuwala, please.

ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - Deputy Minister of Home Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථික ලැයිස්තුවේ මගේ නම සඳහන් වී තිබුණාට, එය වැරැදීමක්. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරනවා

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay. Then, the Hon. Hector Appuhamy may speak next.

[අ.භා. 7.41]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට අද විශේෂිත දවසක්. මේ පාර්ලිමේන්තුවට පත්වුණු ආධුනික මන්ත්‍රීවරයකු හැටියට එක්සත් ජාතික පක්ෂය දැවැන්ත ජයග්‍රහණයක් ලබන අද දවසේ දී මෙම විශ්වාසභංග යෝජනාව පිළිබඳව විවාදයේ දී කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී විශේෂ යමක් කියන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ පොදු විපක්ෂයේ කණ්ඩායම තුළ ජ්‍යෙෂ්ඨයන් ඉන්නවා; තරුණ

මන්ත්‍රීවරුන් ඉන්නවා. මේ අය කාලයක් තිස්සේ හොඳ වැඩසටහනක් ක්‍රියාත්මක කර ගෙන ආවා. සමහර දේවල් ගැන මේ තරුණ මන්ත්‍රීවරුන් අපිත් එක්ක කථා කරනවා. ඒ තුළ අපි අගය කරන දේවල් තිබුණා. සමහර ඒවා ගැන අපි අතර වාද භේද තිබුණා; ප්‍රශ්න තිබුණා. අපි ඒ තරුණ මන්ත්‍රීවරුන්ට කිව්වා, ඉස්සරහට එන්න කියලා. හැබැයි කවුරු හරි ලණුවක් කෑවා. ලණුවක් කාලා තමයි මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළේ. මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ගරු අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව. තමුන්නාන්සේලා ගරු අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කළාම මොකද වෙන්නේ? ගරු අග්‍රාමාත්‍යතුමා ජයග්‍රහණය කළාට පස්සේ එතුමා අතිගරු ජනාධිපතිතුමා පත් කළ අග්‍රාමාත්‍යතුමා පමණක් නොවෙයි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත්ත ඇතිව පත් වූ අග්‍රාමාත්‍යවරයා හැටියට රනිල් වික්‍රමසිංහ අගැමතිතුමා අද ඉතිහාස ගත වෙනවා. එහෙම නම් ඊට පස්සේ මේ ගැන රටේ තර්කයක් නැහැ. තමුන්නාන්සේලාට මුකුත් කියන්නත් බැහැ. එතුමා මේ උත්තරීතර සභාවේ වැඩි ඡන්දයෙන්, එනම් බහුතර මතයෙන් පත් වෙලා තිබෙන්නේ. ඒක තමුන්නාන්සේලා කරපු දෙයක්. අපිට ලබා දුන් දෙයක්. අපි තමුන්නාන්සේලාත් එක්ක තර්ක කරනවාට වඩා, අපි තමුන්නාන්සේලාට ස්තුති කරන්න ඕනෑ කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව එතුමාට මඩ ගහන්න අද කරුණු කාරණා එකොළහක් විතර ඉදිරිපත් කරලා තිබෙනවා. මෙතුමන්ලා කියනවා, අපි ඒ කරුණු වැරැදියි කියා ඔප්පු කළේ නැහැ කියලා. හැබැයි, මේ කරුණු එකක්වත් සත්‍යයි කියලා මේ ගරු සභාවේ දී ඔප්පු කරන්නත් බැහැ.

තමුන්නාන්සේලාට පුළුවන් නම් මේ චෝදනා එකක් හෝ ඔප්පු කරලා පෙන්වන්න, මේ චෝදනා නිවැරදියි කියලා. මේ එකක්වත් නිවැරදි නැහැ. මේ සියල්ලම අගමැතිතුමාට මඩ ගහන්න ඉදිරිපත් කරපු චෝදනා. තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාව තුළින් විශේෂයෙන්ම බලාපොරොත්තු වුණේ, යහ පාලන ආණ්ඩුව දෙකට තුනට කඩා, එක්සත් ජාතික පක්ෂය දෙකට තුනට කඩා, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර අයත් කඩා බිඳ දමා ඒ අයගේ අනාගතයත් විනාශ කරලා, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අනාගතයත් විනාශ කරන්නයි. ඒ සඳහා තමයි තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේ. හැබැයි මොකක්ද වුණේ? තමුන්නාන්සේලාගේ ඒ ආතල් එක අනික් පැත්තට ගියා. මේ විවාදය පටන් ගත් වෙලාවේ ඉඳලා තමුන්නාන්සේලා දන්නවා, මොකක්ද සිද්ධ වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් තව යමක් මා කියන්න ඕනෑ. එදා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඡන්දය ඉල්ලා පැරදිලා ගෙදර ගිය සමහර මන්ත්‍රීතුමන්ලා ඇමතිවරුන් හැටියට පත්වෙලා අපි හදපු මේ යහ පාලන ආණ්ඩුවේ අපිත් එක්ක ඉන්නවා. ඒ අය කවුරුන් හෝ මේ විශ්වාස භංග යෝජනාව දිනන්න ඡන්දය දෙනවා නම්, ඒ අයගෙන් මා ඉල්ලා සිටිනවා, වැදගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට, ජන මතයක් නැති අය විධියට, හෙට්න් පස්සේ ඒ තනතුරුවලින් ඉල්ලා අස් වී ගෙදර යන්නය කියලා. ඒක තමයි කළ යුත්තේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ වගකීම විය යුත්තේ ඒකයි.

ගරු අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එමින්, තමුන්නාන්සේලා එතුමා වැරදියි කියලා කියනවා නම්, ආණ්ඩුවේ ඉඳගෙන ජනතාවගේ සල්ලිවලින් සුර සැප විඳිමින්, වාහන පාවිච්චි කරමින්, ඒ වාගේම මුදල් එකතු කරමින් මේ සියලු කටයුතු කරන අය ආණ්ඩුවේ ඉඳගෙන ඊට වඩා ලොකු වැරැද්දක් කරනවා. එහෙම නම් මේ විශ්වාස භංගය හැරෙන්න ඕනෑ, ඒ සඳහා පක්ෂව ඡන්දය දෙන අයටයි. ඒ අයට අපි නැවත නැවතත් කියනවා, ලජ්ජාවක් තිබෙනවා නම්, මහ ජනතාවගේ සල්ලිවලින් සැප විඳිමින් මේ ආණ්ඩුව ඇතුළේ ඉන්න එපා, කරුණාකරලා වැදගත් විධියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වයත්, මේ පාර්ලිමේන්තුවේ ගරුත්වයත් ආරක්ෂා කරමින් තම අමාත්‍ය ධුරවලින් ඉල්ලා අස් වන්නය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ සහෝදර මන්ත්‍රීවරුන් සියලුදෙනා එකට එකතු වෙලා මේ සම්බන්ධයෙන් පැය ගණනක් තිස්සේ සාකච්ඡා කළා. අපි දැන් දන්නවා, දිනලා තිබෙන්නේ කවුද කියලා. තමුන්නාසේලාත් ඒක දන්නවා. තමුන්නාන්සේලාට දැන් ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළා. ඊට පස්සේ තමුන්නාන්සේලාගේ ආතල් එක වෙන පැත්තකට ගියා. දැන් තමුන්නාන්සේලා අතර ප්‍රශ්න තිබෙනවා. තමුන්නාන්සේලා අනුන්ගේ ලණු කෑවා. මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න මූලික වුණු අය හිතුවා, එක්සත් ජාතික පක්ෂය දෙකට කඩනවාය කියලා. අන්න, තමුන්නාන්සේලාගේ තරුණ මන්ත්‍රීවරු පොලු ටික තියාගෙන එළියේ ඉන්නවා. අපි නොවෙයි, කුණු බිත්තර ගහන්නේ? මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරපු අයට එදා තමුන්නාන්සේලාගේ කණ්ඩායම් රැස්වීමේදී කිව්වා, මෙය ඉදිරිපත් කරන්න එපාය කියලා. එතුමන්ලා පොලු ටික තියාගෙන ඉන්නවා, "වරෙල්ලා එළියට. උඹලා තමයි අප විනාශ කළේ. උඹලාට ගහලා පන්නනවා"යි කියලා. [බාධා කිරීම්] ඒක තමයි ඇත්ත. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට ඒක විඳින්න සිද්ධ වනවා. මොකද, තමුන්නාන්සේලා කළේ වැරදි ක්‍රියාවක්. පළාත් පාලන මැතිවරණය ජයග්‍රහණය කළ ඒ තරුණ මන්ත්‍රීවරුන්ට ඒ ප්‍රතිඵලවත් බුක්ති විඳින්න තමුන්නාන්සේලා ඉඩ දුන්නේ නැහැ. එහෙම නම්, මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම මේ විශ්වාස භංගයට මුහුණ දෙන වෙලාවේ විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමා -

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Mutukumarana, what is your point of Order?

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මෙතුමා ප්‍රකාශ කළා, මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙන අයට පහර දෙන්න මහ ඉන්නවාය කියලා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
වාඩි වෙන්න, ඒක point of Order එකක් නොවෙයි. මා දන්නවා, තමුන්නාන්සේ අහන්න ගියේ, ඒ ගොල්ලන් අරගෙන තිබෙන්නේ කුරුඳු පොල්ලක්ද, වෙන පොල්ලක්ද කියලායි. අපි

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

දන්නවා, ඒ පොල්ල මොකක්ද කියලා. ඒක අහගන්න, මේ තරුණ මන්ත්‍රීවරුන්ගෙන්. තමුන්නාන්සේලා එළියට ගියාම, තමුන්නාන්සේලා කරපු මේ වැරැද්ද නිසා අද පොදු විපක්ෂයට ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධව ඒ තරුණ මන්ත්‍රීවරු තමුන්නාන්සේලාගේ තටිටෙ පළයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගෙන් අහන්නකෝ. එතුමා කියලා දෙයි. එළියට ගියාම කියලා දෙයි. නිමල් ලාන්සා මන්ත්‍රීතුමාගෙනුත් අහන්න. එළියට ගියාම එතුමාත් හොඳට කියලා දෙයි. වෙන වෙන පදවලින් කියලා දෙයි. සමහර වෙලාවට අම්මලාටත් බණියිද දන්නේ නැහැ. මා දන්නේ නැහැ, එහෙම බණියිද කියලා. හැබැයි බණියි. දෙවියනේ! අපට මේ මොකක්ද කළේ කියලා බණියි. [බාධා කිරීම්] අපේ අය නොවෙයි.

තමුන්නාන්සේලා එකතු වෙලා එක්සත් ජාතික පක්ෂය කඩලා ආතල් එකක් ගන්නයි ගියේ. හැබැයි ඒක අනෙක් පැත්තට හැරිලා තමුන්නාන්සේලා දෙකට, තුනට කැඩිලා ආතල් එකක් ගන්න වැඩසටහනක් තමයි සිද්ධ වෙන්නේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
Sir, I rise to a point of Order.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
එතුමා මගේ නම ප්‍රකාශ කරලා මමත්, නිමල් ලාන්සා මන්ත්‍රීතුමාත් ගැන ප්‍රකාශයක් කළා. මා එය ප්‍රතික්ෂේප කරනවා. මොකද, එතුමාම ඇවිත් තමයි මට කිව්වේ, අගමැතිතුමාව පරද්දන්න අපි එකතු වෙලා කටයුතු කරමුයි කියලා. [සෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. [සෝෂා කිරීම්]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මේ පාර්ලිමේන්තුවේ මෝඩ චූන් ගන්න එපා; පාර්ලිමේන්තුවේ මෝඩ චූන් එපා. ජනතාව බලාගෙන ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිනිත්තුවකින් මගේ කථාව අවසන් කරන්නම්. මා ඉල්ලනවා, මෝඩ චූන් ගන්න එපාය කියලා. මෝඩ චූන් අරගෙන වැඩක් නැහැ. ජනතාව මේ සියල්ලම බලාගෙන ඉන්නවා. ජනතාව තමුන්නාන්සේලාට උත්තර දෙයි; මන්ත්‍රීවරුන්ටත් උත්තර දෙයි. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Nalin Bandara Jayamaha. - [*Interruption.*] Order, please! බාධා කරන්න එපා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමේ අරමුණ පිළිබඳව කථා කරද්දී -

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අර්ජුන් ඇලෝසියස් එක්ක එකට පන්ති ගිහින් -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

[අ.භා. 7.52]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට සම්බන්ධ කණ්ඩායම් කිහිපයක් ඉන්නවාය කියලා අපි දන්නවා. එක කණ්ඩායමක් තමයි ඒකාබද්ධ විපක්ෂය. අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒකාබද්ධ විපක්ෂය කණ්ඩායම් දෙකක් විධියට අදහස් දැක්වූවා. එක කණ්ඩායමක් තමයි, බැසිල් රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායම. දැන් බැසිල් රාජපක්ෂ මහත්මයා බලාගෙන ඉන්නවා, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරපු හාදයෝ ටික දණ ගස්සන්න. එපා කියද්දී වැරදි දේශපාලන තීන්දුවක් ගත්තාය කියන කාරණය බැසිල් රාජපක්ෂ මහත්මයා පැහැදිලිව කියලා තිබෙනවා.

අනෙක් කණ්ඩායම තමයි, මේ විශ්වාස භංග යෝජනාව පිටිපස්සෙන් ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම. ඒ කණ්ඩායම තමයි, මේ ආණ්ඩුවෙත් ඉඳගෙන අගමැතිවරයා එළවලා අගමැති ධුරය දරන්න හිටපු කණ්ඩායම.

මේ අවස්ථාවේදී ගුත්තිල කාව්‍යයේ එන පහත සඳහන් කවිය මට මතක් වෙනවා.

"ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙවිදත් නොදිටි මොක්පුර"

මොක්පුර දකින්න බලාගෙන හිටපු, අගමැතිවරුන් වෙන්න හිටපු, ඇමතිකම් තවත් වැඩි කර ගන්න හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය එහා පැත්තේ ලොබියේ හොටු පෙරාගෙන අඬනවා. එතුමන්ලා හොටු පෙරාගෙන අඬනවා. මේ දේශපාලන තීන්දු ගත්තේ අපි නොවෙයි. අගමැතිවරයා එළවන්න සැලසුම් කරපු මේ දෙගොල්ලෝම අද ඇනගෙනයි ඉන්නේ. අර පැත්තෙන්, ඒකාබද්ධ විපක්ෂයෙන් බෝලේ දැම්මා. බෝලේ දැම්මේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා out කරන්නයි. හැබැයි ආවේ full toss එකක් නොවෙයි, beamer පන්දුවක්. ගිහින් වැදුණේ විකට රූකපු අසවල් එක්කෙනාගේ ඔළුවේ. මා එතුමාගේ නම කියන්නේ නැහැ. විකට රූකපු කෙනා කවුද කියන්න කියලා මා විපක්ෂය පැත්තේ අයට කියනවා. බෝලේ දැම්මේ එක පැත්තකින්. විකට රූක්කේ එක පැත්තකින්. පන්දුවට පහර දුන්නු රනිල් වික්‍රමසිංහ මහත්මයා පන්දුව නිදැල්ලේ යන්න ඇරියා. පිටිපස්සේ විකට රූකපු කෙනාගේ ඔළුව ඉවරයි. එම නිසා අද කණ්ඩායම සුනු විසුනු වෙලායි ඉන්නේ.

ඒකාබද්ධ විපක්ෂයේ, විශේෂයෙන්ම උදය ගම්මන්පිල මහත්මයා කිව්වා, "විශ්වාස භංග යෝජනාව දිනන එක හෙට ඉර පායනවා වාගේ විශ්වාසයි" කියලා. දැන් හෙට ඉර පායනවාද කියලා අහන්න කැමැතියි. එතුමන්ලා දැනටම පරාජය භාරගෙන ඉවරයි. උදේ ඉඳලා එතුමන්ලාගේ මුහුණු මැලවිලා තිබෙනවා අපි දැක්කා. එහා පැත්තේ ඉඳගෙන ජනාධිපතිතුමාට බණිනවා. සමහර අය විශ්වාස භංග යෝජනාව ගෙනාපු අයට බණිනවා. එහා පැත්තේ ලොබිය එකම මළ ගෙයක් වෙලායි තිබෙන්නේ. මෙතැන තිබෙන මුහුණු නැහැ, එහා පැත්තේ ලොබියට ගියාම. එක් කෙනෙක් දෙපාරක් ඇඬුවා.

ඒ විතරක් නොවෙයි. හැම දාම මුලසුනේ ඉන්න, අද ඉන්නම ඕනෑ කෙනා තමයි අපේ නියෝජ්‍ය කථානායකතුමා. අද නියෝජ්‍ය කථානායකතුමාත් නැහැ. [ඝෝෂා කිරීම්] ඒකත් අපට ප්‍රශ්නයක්. මේක කුමන්ත්‍රණයක්ද කියලා අපේ කථානායකතුමාගෙන් මා අහන්න කැමැතියි. අද නියෝජ්‍ය කථානායකතුමාත් නැහැ. මේ කුමන්ත්‍රණකරුවන් දැන් බලනවා අපේ ඇමතිකම් තවදුරටත් පවත්වාගෙන යන්නේ කෙසේද කියලා. දැන් සමහරු කියනවා ජනාධිපතිතුමා කිව්වාලු, "මම බලා ගන්නම්."කියලා. සමහරු කියනවා ජනාධිපතිතුමා කිව්වාලු "මම බලා ගන්නම්, දිගටම ඇමතිකම් දරන්න පුළුවන්." කියලා. දිගටම ඇමතිකම් දරන්න පුළුවන්. හැබැයි, ගරු අගමැතිතුමා විධියට ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාමයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා විධියට ඉන්න විට එතුමන්ලාට ඇමතිකම් දරන්නට පුළුවන්ද? කලිසම් ඇඳගෙන නම් බැහැ. යට කලිසමත් නැතිව හෙලුවෙන් තමයි ඇමතිකම් දරන්න වෙන්නේ. හැබැයි, එහෙම ආවොත් අපි කනෙන් අල්ලලා එළියට විසි කරනවා කියන එකත් මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීම්] හොඳට මතක තියා ගන්න. ඒ අයට විශ්වාස භංග යෝජනා ගෙනෙන්න පුළුවන් නම් අපට විශ්වාස භංග යෝජනා 10ක් ගෙනෙන්නට පුළුවන්. ඊටත් වඩා ප්‍රබල භංග පාර්ලිමේන්තුවේ බලතල ඇතුළත තිබෙනවා. හොඳට මතක තියා ගන්න, අපි ඒවා පාවිච්චි කළේ නැහැ. විශ්වාස භංග යෝජනාව ගෙනාපු අය, මේකට අත්සන් කළ අය, මේවාට අත්සන් කරන්නට පොලඹවපු අය, මේවාට කුමන්ත්‍රණය කළ අය එක් කෙනෙකුටවත් හෙට ඉඳන් ආණ්ඩුව නියෝජනය කරන්නට බැහැ කියන එකත් භය නැතිව කියනවා. ඒ වාගේම, ඒ අය ලජ්ජා නැතිව ආණ්ඩුව නියෝජනය කරන්නට උත්සාහ කරනවා නම් අපි ඒකට ඉඩ තියන්නෙත් නැහැ. ඒකත් හොඳට මතක තියා ගන්න. මොකද, රනිල් වික්‍රමසිංහ කියන්නේ කවුද කියලා රටම දන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔය වෙන අය වාගේ නොවෙයි, එතුමා රූපලාවන්‍ය කටයුතු කරන්නේ නැහැ. එතුමාගේ වයස අවුරුදු 69යි. එතුමාට අවුරුදු 69 පෙනුම තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ඉස්සරහා පේළියේ ඉන්නවා අවුරුදු 60 පැනපු හාදයෝ. හැබැයි රුපියල් 35,000ක් වියදම් කරලා රූපලාවන්‍ය කටයුතු කරලා තමයි ඉන්නේ. වයස අවුරුදු 70 පැනපු අය ඉන්නවා. හැබැයි, කොණ්ඩය කළුයි. නමුත් අපේ ලොක්කගේ කොණ්ඩය සුදුයි. අපේ ලොක්කාගේ ආර්යාවගේත් කොණ්ඩය සුදුයි. මොකද, ඒ කොණ්ඩා පාට කරන්නේ නැහැ. එතුමන්ලා එහෙම අය නොවෙයි. හැබැයි සමහර නායකයෝ කොණ්ඩා පාට කරගෙන, ජේෂල් දමාගෙන තමයි ඉන්නේ. ඒ වාගේම තවත් උත්තේජක පාවිච්චි කරන අය ඉන්නවා. අපේ නායකයා සරල නායකයෙක්, හොරකම් කරන්නේ නැති නායකයෙක්.

මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධව කිසිදු චෝදනාවක් එතුමාට නැහැ. නමුත් මේ අය එතුමාව හොරා කරන්න හදනවා. පාර්ලිමේන්තුවේ ඉන්න හැකර කටක් තිබෙන කෙනෙක් කියනවා, මොනර කොළවලටලු දැන් මේ පාර්ලිමේන්තුවේ බලය තීන්දු වන්නේ කියලා.

අපට මතකයි පසුගිය කාලයේ තුනෙන් දෙකේ බලය ගත්ත හැටි. අපි දන්නවා තුනෙන් දෙක ගත්ත හැටි, මාලිගා හදපු හැටි. රුපියල් 100ක් තිබුණේ නැහැ සීගිරි යන්න. හැබැයි දැන් මොනර කොළ ගැන කථා කරනවා. රුපියල් 100ක් තිබුණේ නැහැ සීගිරි යන්න, දැන් මොනර කොළ ගැන කථා කරනවා. හොඳට මතක තියා ගන්න අපට මොනර කොළ ඕනෑ නැහැ. අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 107 දෙනෙකු ඉන්නවා. ඒ වාගේම අපට උදවු කරන මන්ත්‍රීවරුන් ඉන්නවා. අනෙක් පක්ෂ තිබෙනවා. එම නිසා අපට මොනර කොළ ඕනෑ නැහැ. මොනර කොළත් එක්ක සෙල්ලම් කළ අය, පසුගිය කාලයේ කෝටි ගණන් හොරකම් කළ අය, රුපියල් බිලියන 4,000ක් මහ බැංකුවෙන් හොරකම් කළ අය තමයි අද සුදනෝ වෙන්න හදන්නේ. දැන් මෙතුමන්ලාගේ සිහිනය බොඳ වුණා. මේ අය හිතුවා, "හෙට ඉඳන් අලුත් අගමැති කෙනෙක්. එතකොට අනිද්දා ඉඳන් තමන්ගේ නඩු ටික ඉවරයි. ප්‍රශ්නයක් නැහැ. පරණ කෙළි ටික ආයේ කරගෙන යන්න පුළුවන්" කියලා. හොඳට මතක තියා ගන්න ඒ කෙළි කරන්නට බැහැ.

හෙට අනිද්දා විශේෂ අධිකරණය එනවා. එතකොට මේ සභාවේ ඉන්න සමහර අයට දහඩිය දමයි. ඒවා ක්‍රියාත්මක වෙනවා. ඒ බව හොඳට මතක තියා ගන්න. අපි ඒකාබද්ධ විපක්ෂයට හිස නමා ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේදී අපට විශ්වාස භංග යෝජනාවක් ලබාදීම සම්බන්ධව. මේක තමයි හැරවුම් ලක්ෂ්‍යය. අපේ ආණ්ඩුවට තව මාස 18ක් තිබෙනවා. අපිත් පසුගිය කාලයේ යම් යම් වැරදි කළා. ඒ වැරදි නිසා තමයි පළාත් පළාන මැතිවරණයේදී අපට තීන්දුවක් දුන්නේ. මේ මාස 18දී නිවැරදි මාර්ගයක ගමන් කරන්නට අපට අවස්ථාව ලබා දුන්නාට එකාබද්ධ විපක්ෂයට අපි ස්තුතිවන්ත වෙනවා. අද මේ විශ්වාස භංග යෝජනාව ඒ අයට පාරාවළල්ලක් වෙලා තිබෙනවා. මේ රටේ ජන මතය තිබෙන්නේ කාටද කියන එක පසුගිය කාලයේ සමහරුන්ට ප්‍රශ්නයක් වෙලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

සමහරු ජනාධිපතිවරණයේදී ඡන්ද ලක්ෂ 62ක් ගත්තා. හැබැයි ඒක අමතක වුණා. පළාත් පාලන මැතිවරණයේදී ඒක ලක්ෂ 12ට, 13ට බැස්සා. මෙන්න කියනවා අගමැති අයින් වෙන්න ඕනෑ කියලා. අගමැති අයින් වෙන්න ඕනෑ කියනවා, නමුත් එක්සත් ජාතික පක්ෂය ඡන්ද ලක්ෂ 30 ගණනක් අරගෙන. එතකොට කාටද ජන මතය නැත්තේ? අගමැති අයින් වෙන්න ඕනෑ නම් ඊට ඉස්සෙල්ලා අයින් වෙන්න ඕනෑ ජනාධිපතිතුමා, ලක්ෂ 62 ලක්ෂ 13ට බැස්සාම. එහෙම නම් ඒකට විශ්වාස භංග යෝජනා ගෙනෙන්න පුළුවන්නේ, ඒකට දෝෂාභියෝගයක් ගෙනෙන්න පුළුවන්නේ. ඒකාබද්ධ කල්ලියත්, ඒකට හූ මිටි තියපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ කල්ලියත් අද තමන්ගේ දේශපාලන උපාය, උපක්‍රම තමන්ගේ දෙපතුල මත අසාර්ථක වෙලා හතර ගාතයෙන් ඇද වැටිලා ඉන්නේ කියන එක හොඳට මතක තියා ගන්න.

අපි ඉදිරි මාස 18 ඇතුළත නැවත නැඟිටලා 2019 - 2020 තුළ එක්සත් ජාතික පක්ෂයේ තනි ආණ්ඩුවක්, ජනාධිපතිවරයෙක් හදනවා. ඒ විතරක් නොවෙයි. අද ඇමතිවරුන් විධියට සිටින බහුතරයක් -අර ඉන්න අය- 2020 අප්‍රේල් මාසයෙන් පස්සේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බවට පත් කරනවායි කියන එක මතක් කරමින් එක්සත් ජාතික පක්ෂයේ ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට ජය වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

[අ.භා. 8.00]

ගරු ටී. බී. ඒකනායක මහතා (ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - காணி இராஜாங்க அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - State Minister of Lands)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහෝ මහජන නියෝජිතයින් අද දින විවාදයට ගෙන තිබෙන විශ්වාස භංගය පිළිබඳව කථා කරද්දි රටේ යථාර්ථය නොදැන කථා කරන විලාශයකුයි අපට පෙනෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙනම් අයින් වෙන්න.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
අපි අයින් වෙන්න ඕනෑම මොහොතක ලැහැස්තියි. [බාධා කිරීම්] අපට තනතුරු, තාන්න-මාන්න වැඩක් නැහැ. [බාධා කිරීම්] මේ රටේ ආර්ථිකය, ජීවන වියදම, රැකිරක්ෂා ප්‍රශ්නය ඇතුළු මේ රටේ ජනතාවට තිබෙන අතිශය බැරෑරුම් ප්‍රශ්න පිළිබඳව මේ හැම මහජන නියෝජිතයකුම වග කියන්නට ඕනෑ. ඒවාට වග කියන්න බැරි නම් අපි මහජන නියෝජිතයින් විධියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන එකේ තේරුමක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යථාර්ථය තේරුම් අරගෙනයි අපි කටයුතු කරන්න ඕනෑ. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී -ප්‍රාදේශීය සභා, නගර සභා මැතිවරණයේදී- මේ රටේ ජනතාව උත්තරයක් දුන්නා. ඒ උත්තරය අපි පැහැදිලිව තේරුම් ගන්නට ඕනෑ. ජනතාව දුන්නු මේ signal එක, ජනතාව දුන්නු තීන්දුව තේරුම් ගනිමින් පවතින තත්ත්වය නිවැරදි කරගෙන කටයුතු කිරීමේ ආත්ම ශක්තියක් දේශපාලන ව්‍යාපාරයේදී අපි හැම දෙනාටම තිබෙන්න ඕනෑ. ඒක එක්සත් ජාතික පක්ෂයේද-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Hon. Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகல்வே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, කථා කරන්න.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු කථානායකතුමනි, මා ප්‍රකාශ කරමින් සිටියේ මේ රටේ ආර්ථික හැඩතලය පිළිබඳවයි. අපට තිබෙන ප්‍රශ්නත් එක්ක, පසුගිය කාලයේ තිබුණු ජන මතයට කන් දීලා අපි එයින් හැදෙන්නේ නැත්නම් ඒකට විවිධ වචන කියමින්, විවිධ කාරණා කියමින් - [බාධා කිරීම්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, what is the point of Order? හැබැයි, ඒක abuse කරන්න එපා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, අපේ කුඩුවේ බිත්තර දාපු මුන්නැහේට අපි කියනවා ලජ්ජා නැති- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is not a point of Order. Do not disturb the State Minister.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ගරු කථානායකතුමනි, අපි කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ඡන්ද ලක්ෂ ගණනක් අරගෙන පාර්ලිමේන්තුවට ආපු මහජන නියෝජිතයින්. [බාධා කිරීම්] මේ වනකොට මේ රටේ අපනයනය කරන්න සුදුසු නැති, ආනයනය කරන්න සුදුසු නැති යම් යම් දේවල්- [බාධා කිරීම්] ආර්ථික කළමනාකරණය පිළිබඳ සමහර කාරණා නිසා අප රටේ නිෂ්පාදනය කළ බඩඉරිඟු, ගම්මිරිස් පිටින් ගෙනෙන මට්ටමට අද පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීම පිළිබඳව ගත්තොත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආරම්භ කරපු ආයතනයක් විධියට මේ රටේ රන්පවුම් වතු ජනසතු කරලා, විජාතික සමාගම් සතු ඉඩම් ජනසතු කරලා ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ ගැන හිතන්නේ නැතුව අද දේශපාලන ව්‍යාපාරයේදී පෞද්ගලීකරණය කිරීමේ යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. [බාධා කිරීම්] ඒ විතරක් නොවෙයි. රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව යෝජනා කරලා ඒ පිළිබඳව අපිත් එක්ක කථා කරපු- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙලා එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. කාටත් කථා කිරීමේ අයිතිය තිබෙනවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා ආණ්ඩු පක්ෂයට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

අක්කර දසලක්ෂයක්- [බාධා කිරීම්] ඇමෙරිකාවේ "ට්‍රම්බල්" සමාගමට විකිණීමේ පිළිබඳ කාරණය අද පාර්ලිමේන්තුවේ කමිටුවක් මඟින් සාකච්ඡා පවත්වාගෙන යනවා. ඒක වහාම රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ඒ වෘත්තීය සමිතියට ඕනෑ ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්න- [බාධා කිරීම්].

ගරු කථානායකතුමනි, කොළඹ හදවත වාගේ තිබෙන ජෝන් ද සිල්වා සමරු රඟහළ පසුගිය කාලයේ අපි රුපියල් මිලියන 400ක් පමණ වියදම් කරලා තට්ටු හතරකට හදලා, එහි දෙවැනි පියවරත්, තුන්වැනි පියවරත් ක්‍රියාත්මක කරලා ඒක පෞද්ගලික අංශයට පවරන්න පිඹුරුපත් හදාගෙන යනවා. මේ රටේ කලාකරුවන්ට, නාට්‍යකරුවන්ට අඩුම මුදලකට නාට්‍ය පෙන්වන්න තිබෙන්නේ ජෝන් ද සිල්වා සමරු රඟහළයි. මේක අප කාටත් බලපාන දෙයක් ගරු කථානායකතුමනි. එක්සත් ජාතික පක්ෂයේද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද, වෙනත් පක්ෂයකද කියන කාරණාව මෙයට අදාළ නැහැ. මේ සමාගම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි පසුගිය කාලයේ අපි බොහෝ යෝජනා සාකච්ඡා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද මේ විශ්වාස භංග යෝජනාවට අදාළව මූලික කාරණාව බවට පත් වුණු භාණ්ඩාගාර බැඳුම්කර වංචාව පිළිබඳව මම කියන්න යන්නේ නැහැ. අද මේ විවාදයේදී ඒ පිළිබඳව කාරණා රාශියක් මතු වුණා. එක්සත් ජාතික පක්ෂයේ ඉන්න අපේ හිතවතුන්, මිත්‍රයින් හැමදාම අපිත් එක්ක කථා කරන කොට මේ රටේ ජනතාවගේ හදගැස්ම පිළිබඳව, ජනතාව අතරට ගියාම මතු වන කාරණා පිළිබඳව, රාජ්‍ය සේවයේ පවතින කාරණා පිළිබඳව, මතු වුණු අර්බුද පිළිබඳව කථා කරනවා. ඒක තමයි යථාර්ථය. යථාර්ථයට මුහුණ දෙන්නේ නැතිව ඒක එහෙම නොවෙයි කියලා හිතලා කටයුතු කළොත් දේශපාලන වශයෙන් මඩ ගොහොරුවේ එරෙන්නේ අපිමයි. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ වැරදි නිවැරදි කරගෙන "රට" කියන කාරණය පෙරදැරි කර ගෙන කටයුතු කිරීමයි අපගේ මූලික අරමුණ විය යුත්තේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපේ කණ්ඩායම්වල යම් යම් හීන්දු තියෙන්න පුළුවන්. නමුත් පක්ෂයට ආදරයක් ඇති, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, යාපහුව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනතාවගේ ඡන්දවලින් බලයට පත් වුණු මහජන නියෝජිතයන් විධියට නිවැරදි දෙයක් කිරීම, යුක්ති සහගත දෙයක් ක්‍රියාත්මක කිරීම තමයි අපේ මූලික අරමුණ වන්නේ. මොන බාධාව තිබුණත්, මොන ප්‍රශ්නය තිබුණත් එම අරමුණු ජයග්‍රහණය කරවීම අපේ මූලික අරමුණ වෙනවා.

ගරු කථානායකතුමනි, කථා කරන්න තවත් කාරණා රාශියක් තිබුණත් අපි මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව කටයුතු කරන්නට යුක්ති සහගතව පෙනී සිටිනවාය කියන එක ප්‍රකාශ කරමින්, මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතයන් විධියට හැම දෙනාම රටේ ජනතාවට බලපාන සියලු කාරණා පෙරදැරි කරගෙන කටයුතු කරන්න අධිෂ්ඨාන කර ගනිමු කියන ප්‍රකාශය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු චතුර සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 8.08]

ගරු චතුර සංදීප සේනාරත්න මහතා
(மாண்புமிகு சத்துர சந்தீப சேனாரத்ன)
(The Hon. Chathura Sandeepa Senaratne)

ගරු කථානායකතුමනි, පසුගිය වසර 24ක එක්සත් ජාතික පක්ෂ ඉතිහාසයේ වැඩිම ප්‍රතිසංස්කරණ දිනා දීමට අවශ්‍ය පිටිය සකසා දීම පිළිබඳව අපේ ඒකාබද්ධ විපක්ෂයේ සහෝදරවරුන්ට මුලින්ම මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම යහ පාලන රජය නිවැරදි මාවතකට ගන්න අවශ්‍ය කරන ශක්තිය තමුන්නාන්සේලා දුන්නා. මේ රටේ සිවිල් ව්‍යාපාරවල, පොදු මහජනතාවගේ ඉල්ලීම් පිළිබඳව වසර තුනක් තිස්සේ ඇස් කන් පියාගෙන සිටි මේ නායකයන්ට, ආණ්ඩුවට පසුගිය පෙබරවාරි 10 වැනිදා මේ රටේ මහජනතාව පිළිතුරක් ලබා දුන්නා. ඒ පිළිතුර මම හැමදාම කියනවා වාගේ, මා ඕ සේතු සහෝදරයා කියපු "ජනතාව සැම විටම නිවැරදියි" කියන තැනට අද මේ රට පත් කළා. ජනතාව ගත්ත ඒ නිවැරදි තීන්දුව නිසා තමයි අද අපට මේ රජය අලුත් මාවතකට ගෙන යන්න හැකියාව ලැබී තිබෙන්නේ. මේ වාස්තවික තත්ත්වයක් එක්ක තමයි, මේ මස 7 වැනිදා සහ 8 වැනිදා ඇති කරන ප්‍රතිසංවිධාන තුළින් ඉදිරි වසර තුනේදී වෙනස් මුහුණුවරක්, අලුත් වැඩ පිළිවෙළක්, අලුත් දැක්මක් එක්ක අලුත් ගමනක් යන්න රජයට අවශ්‍ය කරන පිටිය සැකසෙන්නේ. එම නිසා මම ආඩම්බර වෙනවා, මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙන බැඳුම්කර ගනුදෙනුවට අදාළ චෝදනා පිළිබඳව මීට වසර දෙකකට ඉස්සෙල්ලා මේ පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ඒ දූෂණයට එරෙහිව හඬ නඟපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනාගෙන් එක්කෙනෙක් හැටියට කොන්ද කෙළින් නියාගෙන සටන් කිරීමට හැකිවීම පිළිබඳව; ඒ වාගේම මේ සභා ගර්භය තුළදීම ඒ බැඳුම්කර වංචාවට එරෙහිව මගේ ඡන්දය පාවිච්චි කරන්න පුළුවන් තරම් ශක්තිමත් කොන්දක් මට තිබීම

[ගරු චතුර සංදීප සේනාරත්න මහතා]

පිළිබඳව. ඒ බැඳුම්කර ගනුදෙනුවට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරපු ආණ්ඩු පක්ෂයේ එකම මන්ත්‍රීවරයා බවට මම එදා පත් වුණා. ඒ සියලු අභියෝග එක්ක අපි ආපු ගමන නිවැරැදියි කියා පෙබරවාරි 10වැනි දා මේ රටේ ජනතාව කීම ගැනත් මම ආඩම්බර වෙනවා.

මේ රටේ සිවිල් ව්‍යාපාරවල සහ මේ රටේ බුද්ධිමතුන්ගේ බලපෑමෙන් ඒ බැඳුම්කර ගනුදෙනුවට එරෙහිව ජනාධිපති කොමිසමක් ආවා; ඒ ව්‍යාපාර ආයතනයේ බැංකු ගිණුම් අත්හිටෙව්වා; ඔවුන්ගේ Bond licences cancel කෙරෙව්වා. ඊට පස්සේ මුදල් නැවත අත්පත් කර ගන්න පුළුවන් තත්ත්වයට මේ රජය කටයුතු කළා. එතැනින් එහාට අද ඒ සියල්ල නීතිය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒක හින්දා මේ ආණ්ඩුවට සම්බන්ධද, නැද්ද, තරාතිරම මොකක්ද කියලා බලන්නේ නැතුව මේ බැඳුම්කර ගනුදෙනුවට එරෙහිව අපි එදා වගේ අදත් සටන් කරනවා. ඒ වාගේම මේ කාරණයත් මතක තියා ගන්න. ඕනෑම වැරැදිකරුවෙක් නීතිය ඉදිරියට ගෙනැල්ලා දඬුවම් කරන තත්ත්වයට මේ ආණ්ඩුව අපි මෙහෙයවනවා කියලාත් අපි තමුන්නාන්සේලාට කියනවා. ඒක තමයි මේ ආණ්ඩුවට තිබෙන ශක්තිය. 1959 වර්ෂයේ බණ්ඩාරනායක මහත්තයාගෙන් පස්සේ තමන්ගේ රජයේ ඇමතිවරුන් තුන්දෙනෙක්ව අමාත්‍ය ධුරවලින් එළියට දාන්න පුළුවන් තරමේ ශක්තිමත් කොන්දක් තිබුණු එකම ආණ්ඩුව යහ පාලන ආණ්ඩුව කියලා අපි කියනවා.

ඒ ගමන ඉදිරියට යන්න නම්, මේ ආණ්ඩුවේ නායකයන්ට සහ මැති ඇමතිවරුන්ට මම ආදරයෙන් එක කාරණයක් කියනවා. ජනවාරි 8වැනි දා විප්ලවයේ තිබුණු ප්‍රධානම භූමිකාව තමයි, මේ රටේ හොරු අල්ලන්න කියන එක සහ දූෂණයට එරෙහි අරගළය. පැරණි හොරු, අලුත් හොරුත් එක්ක එකතු වෙලා අන්න ඒ ජනවරම පාවලා දෙනවා නම් ඒකට එරෙහිව අපි හෙට දවසේත් නැඟී සිටිනවා.

මගේ දේශපාලනයේදී මම විශ්වාස කරන දෙයක් තමයි, "සතුරාගේ මිතුරා මගේ සතුරා" කියන එක. ඒක හින්දා මේ රටේ හොරුත් එක්ක අත්වැල් බැඳ ගන්නා ඕනෑම නායකයෙකුට, ඕනෑම බලවේගයකට එරෙහිව නැවත නැවතත් නැඟී සිටින්න අපට කොන්දක් තිබෙනවා කියලා විතරක් අපි භය නැතුව කියනවා. අපි මේ රටේ සටන් කළේ මතවාදී අරගළයක් වෙනුවෙන්. ඒ අරගළය ජනවාරි 8වැනි දා ජයග්‍රහණය කෙරෙව්වා. ජනවාරි 8වැනි දා ජයග්‍රහණය කළා වාගේම 62 ලක්ෂයක් ජනතාවත් සමඟ මේ යන ගමනේදී අපි දූෂණයට එරෙහිව සම්පූර්ණයෙන්ම ක්‍රියා කරනවා.

අලුත්ගමගේ මන්ත්‍රීතුමා මා ගැන සඳහනක් කළා. නමුත් ආදරණීය මන්ත්‍රීතුමනි, මගේ පියා රාජපක්ෂ රජයේ ඇමතිවරයෙක් හැටියට ඉන්දෙද්දී වසර නවයක් පුරාවට මේ රටේ සියලු සිවිල් ව්‍යාපාර බලගන්වමින්, නිර්මාණය කරමින් ඒ ආණ්ඩුව පෙරළන්න පළමුව පාරට බැහැලා මුත්තයියා පිටියේ මේ රටේ පළමුවැනි පොදු වේදිකාව නිර්මාණය කරන්න එදත් අපට පුළුවන් වුණා. ඒක නිසා අපි බලයට හිස නමන පුද්ගලයන් නොවෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු චතුර සංදීප සේනාරත්න මහතා
(මාණ්පුමිකු සත්තුර සන්දීප සේනාරත්න)
(The Hon. Chathura Sandeepa Senaratne)
ඒක නිසා ඒ ගමන ඉදිරියට යන්න 62 ලක්ෂයකගේ ජනවරම පාවලා දෙන්න කාටවත් ඉඩ තියන්නේ නැහැ වාගේම ඒ 62 ලක්ෂයේ ජනවරමේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගන්නට දිවි හිමියෙන් කැප වෙලා, ලෙයින් කඳුළෙන් ගොඩ නැඟුණු ආණ්ඩුව දිවි පුදා වුව රකින්නට අපි සූදානම් කියන එකත්, අපි එක හොරෙක්වත් රකින්න සූදානම් නැහැයි කියන එකත් තමුන්නාන්සේලාට ප්‍රකාශ කරමින්, ඕනෑම අභියෝගයක් ඉදිරියේදී පරාජය කරගෙන, 62 ලක්ෂයේ ජනවරම ජයග්‍රහණය කරවන්නට අපි තමුන්නාන්සේලාත් එක්ක ඉන්නවාය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මற்றුම් පුතුப්பික්කத්තක්ක சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, වැඩිපුර විනාඩි කිහිපයක් හරින් ප්‍රනාන්දු මැතිතුමාගේ වෙලාවෙන් මට ලැබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කොච්චර වෙලාවක් දෙනවාද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
විනාඩි පහක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මට කියන්න. හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමා කොච්චර වෙලාවක් එතුමාට දෙනවාද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure and Foreign Employment)
මගේ වෙලාවෙන් විනාඩි පහක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඇමතිතුමාගේ වෙලාවෙන් විනාඩි පහක් දෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

[අ.භා 8.14]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මේ රටේ ඉතිහාසය වෙනස් කරන ඉතිහාසයේ වැදගත් විශ්වාස භංග යෝජනාවක් සම්බන්ධයෙන් කතා කරන්න ලැබීම මා ඉතා වැදගත් කොට සලකනවා. ඒ

සම්බන්ධයෙන් කථා කිරීමට ප්‍රමාණවත් කාලයක් මට ලැබීම ගැන මම සතුටු වෙනවා. ගරු කථානායකතුමනි, ජාතියම අහගෙන සිටින මේ වෙලාවේ මා කියන්න ඕනෑ, පසුගිය වසර තුනක කාලය තිස්සේ මේ රජය ආ පිළිවෙළ ගැන මගේ හිතේ සතුටක් නැති බව. මම මේ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිවරයෙක්; මේ ආණ්ඩුවේ වගකීම භාර ගන්නා කෙනෙක්; මේ ආණ්ඩුව වෙනුවෙන් සෑම දවසකම පෙනී සිටින කෙනෙක්; මේ ආණ්ඩුව හදන්න ජීවිත පරිත්‍යාගයෙන්, ශාරීරික තර්ජන, මරණ තර්ජන නොතකා පෙනී සිටි කෙනෙක්. ගරු කථානායකතුමනි, එහෙම පුද්ගලයකු විධියට, මේ ආණ්ඩුව මේ වසර තුනක කාලය තුළ ලබා තිබෙන ප්‍රගතිය ගැන මගේ හිතේ සතුටක් නැහැ.

ගරු කථානායකතුමනි, පසු ගිය පළාත් පාලන මැතිවරණයේදී මේ රටේ ජනතාව මේ රජය පිළිබඳව ලබා දීපු තීන්දුවට මම ගරු කරනවා. මේ රටේ ජනතාව ඉතාම වැදගත් පණිවුඩයක් එක්සත් ජාතික පක්ෂයටත්, අප සමඟ අවංකව සිටින හවුල්කාර දේශපාලන පක්ෂවලටත් ලබා දී තිබෙනවා. ඒ තමයි, 'මේ පාර්ලිමේන්තුවේ ඉදිරි වසර දෙකහමාරක ආයු කාලය තුළ ඔබ ඔබේ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුයි. ජනතාවට දුන් පොරොන්දු අනුව කටයුතු කළ යුතුයි. එසේ නොකළොත්, ඊළඟට එළඹෙන මහා මැතිවරණවලදී ඔබව දේශපාලන කුණු බක්කියට යවන්න අපි සූදානම්' කියන පණිවුඩය. ඒ පණිවුඩය මේ රටේ ජනතාව තීරණාත්මකව ලබා දී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒක තේරුම් ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා 'මේ රජය ආ ගමන තුළ තිබුණු යහපත් දේට ගරු කරමින්, අසාර්ථක වෙච්ච තැන් හඳුනා ගනිමින්, ඒ අසාර්ථක වෙච්ච කාරණාවලට කඩිනමින් -ඉතාම කඩිනමින්- පිළියම් කරමින් ඉදිරියට යෑමේ අවශ්‍යතාව අපි රජය තුළත්, පක්ෂය තුළත් ඉදිරිපත් කරනවා' කියන කාරණය මම කියන්න කැමැතියි. මගේ මේ මතය දරන කණ්ඩායමක් ඉන්නවා, ගරු කථානායකතුමනි. අපේ පක්ෂයේ අතිමහත් බහුතරය මගේ මතය වෙනුවෙන් පෙනී සිටිනවා. මේ, මගේ මතය නොවෙයි. මා කියන්නේ ඔවුන්ගේ මතයයි. මේ රජයේ ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; මේ රජයේ කළමනාකරණය පිළිබඳව ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; එක්සත් ජාතික පක්ෂයේ කළමනාකරණය, නායකත්වය පිළිබඳව ප්‍රතිසංස්කරණ අවශ්‍යයි; එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ඒ වෙනුවෙන් මගේ මතය දරන, මා සමඟ එකඟ වන අතිවිශාල පිරිසක් පෙනී සිටිනවා කියන කාරණය මුළු රටටත්, මේ දුෂ්කර අවස්ථාවේත් අපට ඡන්දය දෙන, අප කෙරෙහි විශ්වාසය තබන මිලියන ගණනක් වෙච්ච, අපගේ ආදරණීය පාක්ෂිකයන් ඇතුළු මේ රටේ සියලුදෙනාට සඳහන් කරන්න මා කැමතියි. අපි ඔබ තනි කරන්නේ නැහැ. මා ඔබේ අපේක්ෂාවන් වෙනුවෙන්, ඔබේ අභිලාෂයන් වෙනුවෙන් පෙනී සිටින එක්සත් ජාතික පක්ෂයේ අතිමහත් බහුතරයක් මන්ත්‍රීවරුන්ගෙන් කෙනකු වන බව ඔබට කියන්න කැමැතියි. ඒ නිසා මේ රටටත්, අපේ පාක්ෂිකයන්ටත් මා කියන්න ඕනෑ, 'අපි ඔබේ අභිලාෂයන් තනි කරන්නේ නැහැ' කියා. අපේ පක්ෂයේ කළමනාකරණය තුළ, අපේ රජයේ කටයුතුවලදී අපට වැරැදීම් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි මේ වන විට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මීට මොහොතකට කලිනුත් මා ඉදිරිපිට මේ පේළිවල ඉඳගෙන ආණ්ඩුව දෙසට හැරිලා අපට චෝදනා කළේ. මේ මොන කරුමයක්ද, ගරු කථානායකතුමනි! අපි හොඳාකාරවම දන්නවා, 'අහවල් මිනී මැරුම කළේ මේ අයයි. කුමන්ත්‍රණකරුවෝ මේ අයයි. අහවල් පහර දීම, අහවල් මංකොල්ල කෑම, අහවල් දූෂණය කළේ මේ අයයි' කියා කියන්න. මේ රටේ ජීවත් වන කරුණු දන්නා මිනිස්සු, අපි ඒ ගැන දන්නවා. ගරු කථානායකතුමනි, මේ මොන අවාසනාවක්ද? එවැනි දූෂිතයන්, අපරාධකාරයන්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අපේ පැත්තට අත දිගු කරමින් අප දූෂිතයන්ය කියා අපට චෝදනා කරන කොට මොන තරම් හිත් වේදනාවක් දැනෙනවාද, ගරු කථානායකතුමනි? අපි ඒක ඉවසාගෙන ඉන්න ලැහැස්ති නැහැ. සමහරුන් ඒවාට සංවේදී නැති බව අපි දන්නවා. හැබැයි අපි සංවේදියි. අපි සතුටට හිනා වෙනවා; දුකට අඬනවා. ඒ වේදනාව - පාක්ෂිකයාට තිබෙන ඒ වේදනාව- අපේ හදවතේත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා 'ඒ පාක්ෂිකයන්ගේ -මිලියන ගණනක් වන පාක්ෂිකයන්ගේ- ඒ අපේක්ෂා වෙනුවෙන් අපි පක්ෂය තුළ ඉඳගෙන, රජය තුළ ඉඳගෙන සටන් කරනවා' කියන කාරණය මා කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මේ රටේ අපරාධ පරීක්ෂණ අතිවිශාල ප්‍රමාණයක් සැලකිය යුතු දුරට අවසන් වෙලා තිබෙනවා. සමහර අපරාධ පරීක්ෂණ අවසන් කිරීමට නොහැකි වුණේ මේ රජයේම සිටින එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් නොවන සමහරුන් නිසායි.

අනවශ්‍ය ප්‍රශ්න ඇති කරගන්න, මම නම් කියන්න අවශ්‍ය නැහැ. මේ කියන්නේ කවුරු ගැනද කියලා අහගෙන ඉන්න අය දන්නවා; රූපවාහිනියෙන් බලාගෙන ඉන්න කට්ටිය දන්නවා. මේ රටේ සිදු වුණු ප්‍රධාන අපරාධ පිළිබඳ පරීක්ෂණ කටයුතු කිරීමේදී අවසාන අදියරට ආවාම ඒ පිළිබඳ තොරතුරු මුදා හරින්නේ නැතුව, ඒ පිළිබඳ චෝදනාවට ලක් වුණු පුද්ගලයන්ගේ, ඔවුන්ගේ ආයතනවල, පොලීසියේ, හමුදාවේ තිබෙන ඔවුන්ගේ ලිපි ගොනු මුදා හරින්නේ නැතුව ඒවා වැළැක්වූයේ කවුද කියලා මේ රටේ ජනතාව දැනගත යුතුව තිබෙනවා. එහෙම කළේ අගමැතිවරයා නොවෙයි. අගමැතිවරයා නොවෙයි ඒවා වැළැක්වූයේ. ඒක අපි දන්නවා. ඒක මතක තියාගන්න ඕනෑ. කරුණාකර ඒක දැනගන්න. අගමැතිවරයා නොවෙයි එහෙම කළේ.

ගරු කථානායකතුමනි, මේ රටේ දූප්පත්කම තුරන් කිරීමේ ව්‍යාපාරය ඉතාම අසාර්ථක වෙලා තිබෙනවා. මගේ වාසනාවට එස්.බී. දිසානායක අමාත්‍යතුමා දැන් මේ සභාවට ආවා. මගේ කථාව පටන් ගන්න කොටම ආවා. එස්.බී. දිසානායක අමාත්‍යතුමා තමයි පසු ගිය වසර තුනක කාලය තුළ මේ රටේ සමෘද්ධි ව්‍යාපාරය භාරව සිටියේ. මේ රටේ දූප්පත්කම තුරන් කිරීම පැත්තෙන් අපේ රට කර තිබෙන ආයෝජනය මොකක්ද? සමෘද්ධි ව්‍යාපාරය පැත්තෙන් අපි කර තිබෙන නිර්මාණශීලී ක්‍රියාව කුමක්ද? සමෘද්ධි ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම රාජ්‍ය විරෝධී දේශපාලන ව්‍යාපාරයක්; පොහොට්ටු කණ්ඩායමේ දේශපාලන අතකොළුවක් බවට පත් වෙන්න ඉඩ හැරියා. ඒක අකාර්යක්ෂමතාව; ඒ වාගේම දේශපාලන අරමුණක්. මේ ආණ්ඩුව වෙනුවෙන් හදවතේ කැපවීමක් නැහැ. ඒ වාගේම මේ ආණ්ඩුව ආරක්ෂා කරන්නේත් නැහැ. ආණ්ඩුව වෙනුවෙන් පෙනී ඉන්නේත් නැහැ. කොයි වෙලාවේද මේ දේශපාලන උප්පරවැට්ටි ක්‍රියාත්මක කරන්නේ කියලා බලනවා.

පසු ගිය පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලයට බලපෑ ප්‍රධානම කාරණා මොනවාද? ප්‍රධානම කාරණයක් තමයි ගරු කථානායකතුමනි, සමෘද්ධි ව්‍යාපාරය තුළ සිටින දාහතරලක්ෂයක් වන සමෘද්ධිලාභීන්ට ඡන්ද කාලයේදී සමෘද්ධි සහනාධාරය නොලැබීම. මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ ඡන්ද දායකයන්ගේ ස්වරූපය ගැන බලලා 2015 ජනාධිපතිවරණයේදී රුපියල් 7,500ක අත්තිකාරම් මුදලක් දුන්නා. ඒක වැරැදියි. ඒක

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කප්පමක්; පගාවක්. හැබැයි, ඒ මුදල හරියටම අත් පත් කරගන්නේ මේ පළාත් පාලන මැතිවරණයේ ඡන්ද ව්‍යාපාරය තුළ අන්තිම මාස දෙක තුළදීයි. ඒ දිහා බලන්න දේශපාලන සංවේදීතාවක් නැද්ද? අප සමඟ දේශපාලනය කර තිබෙන මගේ මිත්‍ර එස්.බී. දිසානායක මැතිතුමා ඒ දිහා බලන්නේ නැහැ; දන්නේ නැහැ. එහෙම නැත්නම් එතුමා වුවමනාවෙන් කරන්නේ නැහැ. වැඩිහිටි දීමනාව කැපුවා. ඒ අහිංසක මිනිසුන්ගේ රුපියල් 2,000ක් වන වැඩිහිටි දීමනාවෙන් රුපියල් 100ක් කපලා අපේ ආණ්ඩුව අප්‍රසාදයට පත් කළා. අන්තිම මාසය වෙනකොට වැඩිහිටි දීමනාව නතර කළා. ඒවායින් තමයි අපි පිරිහුණේ. පවුල් දාහතරලක්ෂයක්. ඡන්ද නම් කොච්චරද? එතකොට ඡන්දය දෙන්න හිටපු මිනිහෙක්වත් අපට ඡන්දය දෙනවාද? ඒවා ගැන සංවේදීතාවක් නැති මිනිස්සු අපේ ආණ්ඩුව පිරිහෙන විධියට කටයුතු කළා. ඒ නිසා සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනික වශයෙන් අද රාජ්‍ය විරෝධී ව්‍යාපාරයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම එය දුප්පත්කම තුරන් කිරීමේ ව්‍යාපාරයක් විධියට අසාර්ථක වෙලා තිබෙනවා. ඒවා ගැන බලන්න ජනාධිපතිතුමා, අගමැතිතුමා, අපි අසමත් වෙලා තිබෙනවා. ඒවා ගැන වග කිව යුතු ඇමතිවරයා වැඩේ කරන්නේ නැත්නම් අස් කරලා වෙන මිනිහෙක් දමාගන්න බැරිකම අපේ දුර්වලකමක්. ඒක අපේ දුර්වලකමක්. ඒ නිසා මම අගමැතිතුමාට කියනවා, මම ජනාධිපතිතුමාට කියනවා, කරුණාකරලා මේ සමෘද්ධි ව්‍යාපාරය වෙනුවට දුප්පත්කම තුරන් කිරීමේ විකල්ප නවීන ව්‍යාපාරයක් ගොඩනඟන්න කියලා. සමෘද්ධි නිලධාරි මහත්වරුන්ටත් මොකක් හෝ රස්සාවක් දෙන්න. ඒකට කමක් නැහැ. ඒ ගොල්ලන්ගේ රැකියා නැති කරන්න කියනවා නොවෙයි. දේශපාලනය නොකරන, අවංක ලෙස මේ රටේ දුප්පත් මිනිසුන්ගේ දුප්පත්කම තුරන් කරන නවීන ව්‍යාපාරයක් අපි හඳුන්න ඕනෑ. එස්.බී. දිසානායක මැතිතුමනි, පසු ගිය කාලයේ ඔබතුමා රජයට විරුද්ධව වැඩ කළා. අපට විශ්වාසයි, ඔබතුමා අපට සුබ පතලා අපෙන් සමුගෙන යයි කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
එස්.බී. දිසානායක මැතිතුමනි, ඔබතුමා විරුද්ධ පක්ෂයට යන්න. ඔබතුමාට හිමි තැනට යන්න. ඔබතුමාගේ හිමි තැන එතැනයි. ඔබතුමාට අපි සුබ පතනවා. ආණ්ඩුවට විරුද්ධව දේශපාලනමය වශයෙන් එහා පැත්තට යන එක තමයි ඔබට කරන්න තිබෙන්නේ. අපි කියන්නේ ආදරයෙන්. මොකද, ඔබතුමාට ඔය රාජකාරිය කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම තව කාරණයක් කියන්න අවශ්‍යයි. අපි මේ රටේ බලයට පත් වන විට ප්‍රධානතම කාරණා කිහිපයක් පිළිබඳ වගකීම් අපට පැවරුණා. අපට එසේ පැවරුණු වගකීම්වලින් එකක් තමයි, ඉඩම් කට්ටි සඳහා ඔප්පු ලබාදීම. ඉඩම් කට්ටි ලක්ෂ 23ක් තිබෙනවා. මේ රටේ පුරවැසියන් අද එම ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා; වගා කරනවා. නමුත් ඔප්පු ලබාදීලා නැහැ. ඔප්පු ලබාදෙන එක අපේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් වුණා. ගරු කථානායකතුමනි, බිම් කට්ටි ලක්ෂ 7ක් මැනලා ඉවරයි. මේක කරන්න පුළුවන් වැඩක්. කළමනාකරණය පැත්තෙන් අපි අසමත් වුණා. මම මේ කාරණය විශේෂයෙන්ම මතක් කරන්නේ මට කලින් කථා කරපු ටී.බී. ඒකනායක මැතිතුමා ඉඩම් විෂයය භාර රාජ්‍ය අමාත්‍යතුමා නිසායි.

ආණ්ඩුවෙන් යන්න කලින් "මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ අසාර්ථකයි" කියලා ආණ්ඩුව ඇතුළේ සටන් කරන්න තිබුණානේ. ගරු කථානායකතුමනි, මම ජනාධිපතිතුමාට කියනවා, මම අගමැතිතුමාට කියනවා, මේ ආණ්ඩුවේ අනාගත වගකීම බාර ගන්න අයට කියනවා මේ බිම් කට්ටි ලක්ෂ 23 වසරක කාලයක් තුළ ලබා දෙන්න අලුත් නීති පනවන්න ඕනෑය කියලා. ඒ සඳහා අලුත් නීති පනවන්න ඕනෑ. මේ තිබෙන නීතිවලින් ඒ කටයුත්ත කරන්න බැහැ. ජනාධිපතිතුමනි, "මේක මම කරන්නම්" කියලා බදාගෙන ඉන්න අයට මේවා කරන්න බැහැ; ප්‍රායෝගික නැහැ. එහෙම කරන්නේ කොහොමද? බිම් කට්ටි ලක්ෂ 23ක් තිබෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කරන්න ඕනෑ. අපි ඔක්කෝම එකතු වෙලා මේ වැඩේට සටන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමාට නියමිත වෙලාව අවසන් වේගෙන එනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මට මේ ටික කියන්න ඉඩ දෙන්න. මේවා හැමදාම කියන්න වෙන්නේ නැහැ. ඒ නිසා අද මේවා කියාගන්න ඕනෑ. ගරු කථානායකතුමනි, බිම් කට්ටි ලක්ෂ 23ක් කියන්නේ රටේ පුරවැසියන්ගෙන් මිලියන කීයකට අයිති ඒවාද? ඒවා බෙදා දීමේ කාර්යයේදී අපි අසාර්ථක වෙලා තිබෙනවා. අපි සියලුදෙනාගේම වගකීමක් තිබෙන අපේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුව මෙක. ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙලා මේ රටේ ඉඩම් නැති, ඔප්පු නැති අහිංසක මිනිස්සු වෙනුවෙන් මේ බිම් කට්ටි ලක්ෂ 23ට ඔප්පු දෙන නව නීතියක් අරගෙන එමු. මේක අලුත් ආරම්භයක්. මේක අලුත් ආරම්භයක්. අද අපට අලුත් පණක් ලැබෙනවා. අපේ ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන අපේ කකුලෙන් ඇදපු, අපට විරුද්ධව දේශපාලනය කරපු, අපේ පරාජය ප්‍රාර්ථනා කරපු, එහා පැත්තට පනින්නේ මොන වෙලාවේද කියලා කල්පනා කරපු, ඒ දෙපැත්ත කන කට්ටිය අපෙන් යන මොහොතයි මේ. මේක සුබ මොහොතක් නොවෙයි ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, දැන් කථාව අවසන් කරන්න ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අද අපි මේ අවස්ථාව පාවිච්චි කරලා ඒ අහිංසක මිනිසුන්ගේ බිම් කට්ටි ලක්ෂ 23ට අදාළ ඔප්පු අවුරුද්දක් ඇතුළත දෙන්න කටයුතු කරමු. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, අපි ඒකට ඉදිරිපත් වෙමු. මේ තිබෙන නීති යටතේ මේ දේවල් කරන්න බැහැ. අපි ඒකට අලුත් නීතියක් හදමු. එහෙම කළොත් විතරයි අපි මේ ආණ්ඩුව තුළ ඉන්නේ. ජයවේවා!

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ගරු හේෂාන් විතානගේ මැතිතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 4ක් තිබෙනවා.

[අ.භා. 8.26]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, අද මෙවැනි විශේෂ අවස්ථාවක අදහස් දක්වන්න විනාඩි හතරක් හරි ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපට මේක අලුත් අත්දැකීමක්. මේ රටේ සමස්ත ජනතාවම බලාගෙන ඉන්න පිළිතුරක් අද රාත්‍රී 9.30ට ඔවුන්ට දැකගන්න හැකි වෙනවා.

ගරු කථානායකතුමනි, සමහර මන්ත්‍රීතුමන්ලා මේ විශ්වාස භංගය පිළිබඳවත්, මෙහි ප්‍රතිඵලය පිළිබඳවත් මහා උජාරුවෙන් රූපවාහිනී නාලිකාවලට කථා කළ ආකාරය ඊයේ අපි දැක්කා. මේ විශ්වාස භංගයේ ජයග්‍රහණය අද ඉර පායනවා වාගේ විශ්වාසයි කියලාත් තිබුණා. තව පැයක් විතර යනකොට අද ඉර පෑයුවාද, නැද්ද කියන එක ඒ මහත්වරුන්ට පෙනෙයි. හෙට උදේට අලුතින් ඉර පායනකොට ඒ මහත්වරු කොතැනද හිටගන්නේ කියන එකත් අපට බලාගන්න පුළුවන් වෙයි.

ගරු කථානායකතුමනි, මම එක දෙයක් කියන්න ඕනෑ. 2015 ජනවාරි 8වැනි දා එක්සත් ජාතික පක්ෂයට බලයක් දීලා මේ රටේ දුප්පත් අහිංසක මිනිස්සු ලේ හලාගෙන මේ ආණ්ඩුව පත් කළේ, අවුරුදු 20ක් යූඑන්පීකාරයෝ විධියට දුක් විඳපු අයටත්, මේ රටේ සාමාන්‍ය ජනතාවටත් ඒ ලැබිය යුතු වරප්‍රසාද ටික ලබා දෙන්න කියලායි. අපේ එස්.බී. දිසානායක ගරු අමාත්‍යතුමාත් මේ සභාවේ ඉන්නවා. අවුරුදු 20ක් තිස්සේ සමෘද්ධි සහනාධාරය සාධාරණව දුන්නේ නැහැ. දැන් අපි බලයට ඇවිල්ලාත් අවුරුදු 3ක් වෙනවා, අලුතින් එක මිනිහෙකුටවත් සමෘද්ධි සහනාධාරය දුන්නේ නැහැ. ඒ පාපකර්මයේ ප්‍රතිඵල පසුගිය පළාත් පාලන ඡන්දයේදී අපට කරගහන්න සිද්ධ වෙලා, අවසානයේදී විශ්වාස භංගයකටත් මුහුණ දෙන්න මාර්ගය විවර වුණා.

අපේ ඇමතිවරු කීප දෙනෙක් මේ විශ්වාස භංගයේදී අගමැතිතුමාට විරුද්ධව කටයුතු කරනවාය කියලා අපේ mobile phonesවලට news alerts එනවා. අපි පසුපෙළ මන්ත්‍රීවරු හැටියට එකතු වෙලා මේ විශ්වාස භංගයෙන් ගරු අගමැතිතුමා ජයග්‍රහණය කරවලා, ශක්තිමත් විධියට ඉදිරි අවුරුදු දෙක තුළ මේ ආණ්ඩුව කරගෙන යන්න භයියක් දෙන්න ඕනෑය කියන අරමුණට ඇවිල්ලා කටයුතු කළේ පසුගිය අවුරුදු තුනේදී සිදුවූ දේවල් ඉදිරි අවුරුදු දෙකේදීත් සිද්ධ වෙනවා බලාගෙන ඉන්න බැරි හින්දයි.

ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග ගෙනැල්ලා රටේ ජනතාවගේ මතය මොකක්ද කියලා බලාගන්න මේක හොඳ අවස්ථාවක් කියලා සමහර අය හිතාගෙන හිටියා. හැබැයි, මෙතැන ඉන්න ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමෙත් භාගයකට වැඩි පිරිසක් මේ විශ්වාස භංගයට විරුද්ධ බව අපි දන්නවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත් එක්ක ඉන්න කල්ලියේ කට්ටියට තමයි ඕනෑ වුණේ, විශ්වාස භංගයක් ගෙනැල්ලා මේ ආණ්ඩුව පරදවලා ඉක්මනින් බලය ගන්න. අද ඒ අයගේ එක කණ්ඩායමක් මේ විශ්වාස භංගයට විරුද්ධයි. මේ ඇතුළේ සිද්ධ වෙන දේවල් අපට පෙනෙනවා. මේ අය අපේ ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලයේ ඉඳගෙන, අමාත්‍ය තනතුරු දරාගෙන වාහන සහ සියලු පහසුකම් භුක්ති විඳින්නේ, එදා අහිංසක යූඑන්පීකාරයන්ගේ කරපිටින් හදපු ආණ්ඩුව ඇතුළේ ඉඳගෙනයි. විළිලජ්ජයි කියන්න, ඒ පහසුකම් භුක්ති විඳිමින් අද ඒ මහත්වරු කියනවා, "අපි මෙකට පක්ෂව ඡන්දය දෙනවා." කියලා. අපි වග කීමෙන් කියනවා, උදය ගම්මන්පිල මැතිතුමාගේ ප්‍රකාශය කණපිට හරවලා අද රෑ 9.30ට අපි ජයග්‍රහණය කරන බව. මේ විශ්වාස භංග යෝජනාවේ ප්‍රතිඵලය ඒකයි. අපි ගරු අගමැතිතුමාට කියනවා, හෙට එළිවන විට මේ රටේ බිහිවන ආණ්ඩුව තුළ, මේ රටට වින කරන, ජනතාවගේ ඡන්දයෙන්වත් ආපු නැති ඇමතිවරු කරන මේ විහිළුවට එරෙහිව ක්‍රියා නොකළොත්, අපි ස්වාධීන මන්ත්‍රීවරු විධියට මේ ගරු සභාවේ වාඩි වෙන බව. මෙම විශ්වාස භංග යෝජනාවට පක්ෂ වන එක ඇමතිවරයෙක් හෝ මේ කැබිනට් මණ්ඩලයේ ඉන්නවා නම්, ඒ ඇමතිවරු ඉන්න ආණ්ඩුවට සහයෝගය දෙන්න අපට සදාචාරාත්මක අයිතියක් නැහැ. "මහත්වරුනේ, ඔබතුමන්ලා අවුරුදු තුනක් කැවා ඇති, මේ රටේ අහිංසක මිනිසුන් වෙනුවෙන්, මේ රටේ නියම දේශපාලනය සමාජය තුළ දකින ඉහළ තැනකට අරගෙන යන්න පුළුවන් අහිංසක මිනිසුන්ට ආදරය කරන නායකයන්ට මේ අවස්ථාව දීලා, ඔබතුමන්ලා දේශපාලනයෙන් පැත්තකට වෙන්න" කියලා මම ඒ අයට කියනවා. එහෙම නැතිව, තමන්ගේ වාසියට, වරප්‍රසාද ලබාගන්න, කොහේ හෝ කුට්ටියකට අහුවෙන තැනකට රිංගන දේශපාලනඥයන් තවදුරටත් හිටියොත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි, මේ පක්ෂ ඔක්කොම ටික එකතු වෙලා පාර්ලිමේන්තුව ගෙන ගියත් මේ රටට සෙතක් වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, "රෑ දනියෙල්, දවල් මිගෙල්" චරිතය රහපාන මහත්වරු හෙට උදේට පස්සේ මේ රටේ දේශපාලනයෙන් අතුගා දමන සටනට අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබාදෙන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා.8.31]

ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure and Foreign Employment)

ගරු කථානායකතුමනි, බොරු කියන්නේ නැති, හොරකම් කරන්නේ නැති අගමැතිවරයකුට විරුද්ධව ලංකා ඉතිහාසයේ යම් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම් ඒ මේ විශ්වාස භංග යෝජනාවයි කියා මම හිතනවා. මේ විශ්වාස භංග යෝජනාව තුළ ගොඩක් කයි කතන්දර කියා තිබුණාට -මහනුවර සිදුවීමක්, බැදුම්කර සිදුවීමක් - ඇත්ත වශයෙන්ම මෙහි අන්තර්ගත වෙලා තිබුණේ වෙන "ගේම්" දෙකක්. ගරු කථානායකතුමනි, ඒ "ගේම්" දෙක තුළම රඟ දක්වපු, තිර රචනය කරපු, ලස්සන නිර්මාණය කරපු, නළු චරිතය රහපෑ කීපදෙනෙක් ඉන්නවා. හැබැයි, ප්‍රධාන නළුවා දැන් මෙතැන නැහැ. ලජ්ජයි කියන්න ගරු කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු අයවත් මේ ගරු සභාවේ පුටුවල දැන් නැහැ. අපි මෙතැන ඉඳගෙන ඉන්නවා. මේ විශ්වාස භංග යෝජනාවට උනන්දු වුණු අය මේ සභාවේ පුටුවල දැන් ඉඳගෙන ඉන්න ඕනෑ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අපි ඉන්නවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

හතරදෙනායි ඉන්නේ. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව,- [බාධා කිරීම්] ඔන්න, මම කියන කොට සභාවට එනවා. එන්න, ඔබතුමන්ලා ඇවිත් ඉඳගන්න. ඔන්න එනවා රටේ භයිය. භයිය. මෙන්න, එක්සත් ජාතික පක්ෂයේ භයිය. ඇවිත් ඉඳගන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කථාව කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, එක එක්කෙනාගේ ගේම්වලට, ගෝඨාභය මහත්මයාගේ කල්ලියේ වුවමනාවට, මේ පිස්සු විශ්වාස භංග යෝජනාව ගෙනාවාට අද සිද්ධ වුණේ මොකක්ද? ඒකෙන් වුණේ රටේ මහ ජනතාවගේ සල්ලි වියදම් කරලා, පාර්ලිමේන්තුවේ සල්ලි වියදම් කරලා, මේ හැම තැනම ලයිට් දමාගෙන, රෑ නවයහමාර වනතුරු මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යමින් ගෝඨා කල්ලිය විහිළුවක් බවට පත් වුණු එක විතරයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සරම ගලවා ගන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මගේ සරම ගලවා ගන්න; තමුන්නාන්සේට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මේ අය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔන්න බලන්න, පොහොට්ටුවේ මිනිසුන්ගේ තරම. මන්ත්‍රීවරයකුගේ සරම ගලවා ගන්න හදනවා. මේ අය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ අය රෑ නවයහමාරට සරොම් ගලවන්නයි හදන්නේ. රෑට ගෙදර ගිහින් ඒක ගලවා ගන්න. ඒක මේ වෙලාවේ කරන්න එපා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ කතන්දරේ හොඳට තේරුම් ගන්න. "රෑ එළි වෙන්න ඉස්සර වෙලා, හිරු පායන්න ඉස්සර වෙලා... අගමැතිතුමා ඉන්නවා...." කියලා අපේ තුම්මුල්ලෙ විමලෙ අයියා මොකක්ද එකක් කිව්වා. දැන් තුම්මුල්ලෙ විමලෙ අයියාට මොකද වෙලා තිබෙන්නේ? විමලෙ අයියාට හිතාගන්නවත් බැහැ. මම හිතන විධියට විමලෙ අයියා දැන් කොහේට හරි ගිහින් වමනෙ දමනවාද කොහේද, අප්සෙට් එකට, දැන් මොකක්ද මට වුණේ කියලා. එතකොට ගමනෙ අයියා! අපේ ගම්මන්පිල අයියා මොකක්ද කිව්වේ? ගම්මන්පිල අයියා කිව්වා, අඩුම තරමින් 7යි, වැඩිම 58යි කියලා. බුදු දෙයියෝ! මෙහෙමත් ලජ්ජා වෙනවාද? චිකේයියා!

මෙහෙමත් ලජ්ජා වනවාද, මම අහන්නේ. පක්ෂයක් මෙහෙම ලජ්ජා වනවා මම දැකලා නැහැ. පෙබරවාරි 10 වැනිදා දිනපු එකත් නිකම් නා ගාත්තා නේ. අප්පිරිය වෙලා ගියා; අප්පිරිය වෙලා ගියා. ලංකාවේ මිනිසුන්ට අප්පිරියා වනවා, ලබපු ජයග්‍රහණයත්. දැන් නිකම් ඇදගෙන නැවා. කල්ලියක් කැඩුණා. මේක තමයි මේ පක්ෂය ඇතුළේ තිබෙන ප්‍රශ්නය. අයියා එකක් කියනවා; මල්ලි එකක් කියනවා. ලොක්කා එකක් කියනවා; පුතා එකක් කියනවා. මේගොල්ලන් අතර මං වෙනවා. ඕක තමයි වුණේ. අද ඉර මැද්දේ තනි වුණා. හැබැයි, මෙතැන ඊට වඩා ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ විශ්වාස භංග යෝජනාව තුළින් හතර වතාවක් අග්‍රාමාත්‍යවරයකු වෙච්ච අග්‍රාමාත්‍යතුමාගේ චරිතය කෙලසන්න ලොකු උත්සාහයක් තිබුණා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ අවස්ථාවේදී එක් කාරණයක් මතක් කරලා දෙන්න ඕනෑ. මංගල සමරවීර මහත්මයාත් එක කාලයක දී මේකට වග කියන්න ඕනෑ. සමාවෙන්න, අපේ මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමනි. මංගල සමරවීර මහත්මයා ඒ පැත්තේ ඉන්න කාලයේ "රනිල්ට බැහැ" කියලා මතයක් ගෙනාවා. "රනිල්ට බැහැ" කියලා මතයක් ගෙනැල්ලා එතුමා, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ හතර වතාවක් අගමැති වෙච්ච එකම එක් කෙනායි ඉන්නේ. ඒ, රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා විතරයි කියන එක පැහැදිලිව මම කියන්න ඕනෑ. හතර වතාවක් අගමැති වෙන්න පුළුවන් වෙච්ච වෙන කිසිවෙක් මෙතැන නැහැ. "රනිල්ට බැහැ" කියලා කිව්වාට "රනිල්ට පුළුවන්" කියලා ඔප්පු කළා. දැන් රනිල් "හොරෙක්" කියලා ඔප්පු කරන්න මේක ඇතුළේ ඉන්න සමහරුන්ට පිස්සුවක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ එක්කෙනා ඉන්නේ ඒ පැත්තේ නොවෙයි. ඒකාබද්ධ විපක්ෂයෙන් මේක කළාට අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ අය හොරු. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ, හොර රජාලා. හොර රජාලා කරන ඒවා ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ සරම අස්සේ ඉඳලා අපිම කන්න හදන අය ගැන තමයි අපට ප්‍රශ්නය තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපිට ප්‍රශ්නය තිබෙන්නේ -

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔබතුමන්ලා එක්ක ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා නේ, දෙයියෝ! [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්නකෝ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපට ප්‍රශ්නය තිබෙන්නේ අපි එක්ක ඉඳගෙනම අපිව කන්න හදන අය එක්කයි. අපේ ඇතුළේ අපි එක්කම ඉඳගෙන අපිව කන්න හදන අය එක්ක තමයි අපිට ප්‍රශ්නය තිබෙන්නේ. මගේ එහා පැත්තේ ඉඳගෙන ඉන්න කෙනා කොන්ද ගැන කථා කරනවා මම අහගෙන හිටියා. මට මතකයි, එදා -2015- ජන්දයේදී ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහත්තයාට කොන්ද කෙළින් තියාගෙන අතට අත දෙන්න බැහැ කියලා කිව්වා. එහෙන් කරනවා, මෙහෙන් කරනවා, "හිටන්" කියනවා, "හුටන්"

කියනවා කිව්වා. ඊට පස්සේ ළඟට ඇවිල්ලා, වැඳලා ඇමතිකම ගත්ත හැටි කොහොමද? ඔක තමයි අපිට කෙළවෙච්ච පළමුවැනි තැන, ගරු කථානායකතුමනි. මේ ආණ්ඩුවට වැරදිච්ච තැන ඔතැනයි; මේ ආණ්ඩුවට වැරදිච්ච තැන ඔතැනයි. අපි ආණ්ඩුවක් හැටියට මහන්සිවෙලා ජනාධිපතිවරයා ගෙනාවා. හොඳ මිනිසුන් ටිකක් මේක ඇතුලේ ඉන්නවා. එහෙම නැහැ කියලා අපි කියන්නේ නැහැ. අහ ළඟ ඉඳගෙන කන කනවාද, කන ළඟ ඉඳලා අහ කනවාද, මොකක්ද කථාවක් තිබෙන්නේ. එහෙම උන් ගොඩක් මේක ඇතුලේ ඉන්නවාය කියලා මම අද විශ්වාස කරනවා. මේ විශ්වාස භංග යෝජනාව ගෝඨා නොවෙයි කවුරු ගෙනාවත් thank you!. ඒකාබද්ධ විපක්ෂයට දහස් වාරයක් මම ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වනවා. ඒකට මම කියන්න ඕනෑ, ''අහේ ඉඳන් කන කනවා'' කියලා. මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවාට බොහොම ස්තුතියි කියලා මම කියන්න ඕනෑ. විශ්වාස භංග යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් පළමුවැනි ස්තුතිය හිමි වන්නේ කාටද? එක්සත් ජාතික පක්ෂයේත් පොඩි පොඩි කවල් ටිකක් තිබුණා. අපේ මන්ත්‍රීවරු 106ක් ඉන්නවා. ගෙඩිය පිටින් අද එකතු වෙලා ඉන්නවා. එක්කෙනෙක්වත් විරුද්ධව ඡන්දය දෙන්නේ නැතිව අපිව එකතු කරන්න ඔබතුමන්ලාට පුළුවන් වුණා. ඒක තමයි අපේ ලොකුම ජයග්‍රහණය කියන එක මම මුලින්ම කියන්න ඕනෑ.

දෙවැනි කාරණය මෙයයි. පක්ෂයේ ප්‍රතිසංවිධානවලට ඔබතුමන්ලා පාර කපලා, දිනන පාර අපිට හදලා දුන්නා. එයට thank you! ගරු කථානායකතුමනි, තුන්වැනි කාරණය මෙකයි. [බාධා කිරීම්] ඊළඟට එන ඡන්දයේ දී පොහොට්ටුවේ පෙති ටික ගලවන්න පාර හදලා දුන්නාට ඔබතුමන්ලාට බොහොම ස්තුතියි කියන එකත් මම මේ අවස්ථාවේ දී මතක් කරලා දෙනවා.

ගරු කථානායකතුමනි, ආසම දේ තමයි මේක. "ලෙඩා මැරුණත් බඩ සුද්දයි" කියලා කියනවා නේ. මේකේ හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඔක්කොම අද ගියා. අම්මා! මම එක දෙයක් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] එහෙමයි ආස. ඇත්තටම ආසයි එහෙම. [බාධා කිරීම්] එහෙම තමයි ආස. පුත්තලමටත් ආසයි, එහෙම. ගරු කථානායකතුමනි, මේ කාරණය හොඳින් මතක් තියා ගන්න ඕනෑ. මේ ගිය 13 දෙනා නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු 42ක් ඉන්නවා, මේ පක්ෂයත් එක්ක එකතුවෙලා හිටපු. දැන් මේ 13 දෙනා නොවෙයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තීන්දුව; බහුතරය. 29ක් විතර ඉන්න ඕනෑ. ගණන් හරි නේද? 42න්, 13ක් අඩු කළාම 29යි. [බාධා කිරීම්] ගණන් හරි.

මේ පාර්ලිමේන්තුවේ සිටින 94 දෙනෙකු O/Level failලු. මම නම් A/Level විභාගයත් pass. ඒ නිසා බය වෙන්න එපා. Fail වුණු 94ට ඇතුළත් කට්ටියත් ඔතැන ඇති. ඕනෑ නම්, ඒ අයගේ නම් සඳහන් කරන්නද? [බාධා කිරීම්] නිකම් වැඩේ කුණු කර ගන්න එපා.

ඔබතුමන්ලා මේක හොඳින් අහගන්න. ගරු කථානායකතුමනි, අපි මතක තබා ගත යුතු දෙයක් තිබෙනවා. මේ තීන්දුව තුළ 29 දෙනෙක් හදවතින් - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 29 දෙනෙක් කියන්නේ, ඒකයි බහුතරය. මම ජනාධිපතිතුමාගෙනුත් පැහැදිලිව ඉල්ලීමක් කරනවා. මේ ආණ්ඩුව අරාජිකත්වයට යන්නේ එකවර තීන්දු ගන්නේ නැති නිසායි. අගමැතිතුමා කෙරෙහි විශ්වාසය භංග වුණා කිව්වාට, හෙටත් මේ අගමැතිම තමයි අගමැති. එහෙම නම් හෙට මේ මිනිසුන්ට මේ ආණ්ඩුවේ ඉන්න බැහැ නේ. මේ 13 දෙනාට අද අගමැති කෙරෙහි විශ්වාසයක් නැත්නම් මේ ආණ්ඩුවේ ඉන්නේ කොහොමද? මොකද, හෙටත් ඉන්නේ මේ අගමැතිතුමාම තමයි. හෙට උදේ හිරු පායනකොටත් ඉන්නේ අගමැති රනිල් වික්‍රමසිංහමයි කියලා අර විමලේ මහත්මයාට කියන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහමයි අගමැති.

ගරු කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ ඔය 13 දෙනාට - අර, කිව්වානේ සරම ගලවා ගෙන එන්න කියලා. අන්න ඒ ගොල්ලන්ට කියන්න, හෙට එනවා නම් සරම ගලවා ගෙන එන්න කියලා. ඔබතුමන්ලාගේ භාෂාවෙන් කියන්නේ ගලවාගෙන එන්න කියලා. මොකද, ඔබතුමන්ලා ආසයි නේ එහෙම ඉන්න. ඒ නිසා එහෙම එන්න කියන්න හෙට. එහෙටත් යන්න පුළුවන්, එහෙම ගලවා ගෙන. මොකද, එහාට යනවා, මෙහාට එනවා; එහාට යනවා, මෙහාට එනවා. ඒක තමයි ඒ ගොල්ලන්ගේ දේශපාලනය.

ගරු කථානායකතුමනි, මම රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන එක දෙයක් කියනවා. එතුමා අරලියගහ මන්දිරයට අඩිය තිබ්බෙ නැති මිනිහෙක්. එතුමා අරලියගහ මන්දිරයට ගියේ රාජකාරී වැඩවලට විතරයි. ගරු කථානායකතුමනි, පසුගිය දවසක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආර්යාව ගැන මුහුණු පොතේ තිබුණු සටහනක් මම දැක්කා. එතුමිය airport එකේ VIP පැත්තෙන් යන්නේ නැතිව සාමාන්‍ය මිනිසුන් යන පර්යන්තයේ immigration පෝලිමේ දන්නේ නැහැ වාගේ ගිහිල්ලා plane එකට නැඟලා තිබුණා. අපි දන්නවා, අනෙක් ආර්යාවන් කොහොමද ගියේ කියලා. දෙකයි, දෙකයි, දෙකයි, දෙකයි කියලා ගණන් තිබුණු account ගැන අපි දන්නවා. ගරු කථානායකතුමනි, අරලියගහ මන්දිරයේ තිබුණු jacuzzi අපි දැක්කා. බලු කූඩුව පවා AC කර තිබුණා. අපි ඒවා දැක්කා. බල්ලෙක් තබා අපේ නායකතුමාවත් එහෙම දේවල් පාවිච්චි කළේ නැහැ. ගරු කථානායකතුමනි, ඉතින් මේවාද වැරදි?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පින නැහැ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
පින නැහැ? ඔය පින තමයි රටට ගහපු හෙණය. ගරු කථානායකතුමනි, මේක තමයි සත්‍ය. ඒකද මේ වැරැදියි කියන්නේ? එක්සත් ජාතික පක්ෂයේ, මේ ආණ්ඩුවේ වැරැදි තිබුණේ නැහැ කියලා මම කියන්නේ නැහැ. වැරදි තිබුණා. එසේ වැරදි ගොඩාක් තිබුණු නිසා තමයි අපට පෙබරවාරි 10 වැනි දා පාඩමක් ඉගෙන ගන්න ලැබුණේ. එහෙම නැතිව මේ ගොල්ලන් හොඳ නිසා නොවෙයි. මේ ගොල්ලන්ගේ හොඳ නිසා රටේ මිනිසුන් ඡන්දය දුන්නා නොවෙයි. අපේ වැරැදි නිසායි එහෙම වුණේ. අපේ වැරැදි නිසා අපට පුංචි පාඩමක් ඉගෙන ගන්න වුණා. හැබැයි, අද කරපු දෙයින් තමයි අපි ආයෙත් නැඟිටින්නේ කියන එක අපි ඔබතුමන්ලාට පැහැදිලිව කියනවා. ඒක මතක තබා ගන්න.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී හදවතින් කිව යුතු දෙයක් තිබෙනවා. මේ ගත් හැම තීන්දුවක් උඩම තිබුණේ මේ විශ්වංස භංගයවත්, මේ bond එකවත් නොවෙයි. දේශපාලන ගේමක් තිබුණේ. මේ ගොල්ලන්ට ඕනෑ වෙලා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩා ගන්නයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටියට ඕනෑ වෙලා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ම ආණ්ඩුව තුළ අගමැති කෙනෙක් පත් කර ගන්නයි. මේ තුළ තිබුණේ bond එක නොවෙයි, ගරු කථානායකතුමනි. මහනුවර සිද්ධියත් නොවෙයි,

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ගරු කථානායකතුමනි. ඒ දෙකම නොවෙයි තිබුණේ. ඒ දෙකම නොවෙයි, මේක ඇතුළේ තිබුණේ. දේශපාලන ගේම් තිබුණේ. අපේ අගමැතිතුමාව අයින් කරලා, UNP එකේ පොඩ්ඩක් අභිංසක නායකයෙක්ව පත් කරලා දේශපාලන පරිපාලනය අතට ගන්නයි ඕනෑ කර තිබෙන්නේ. මේවා ගැන කියන්න ලජ්ජා වෙන්න ඕනෑ නැහැ. මම බය වෙන්නේ නැහැ. මාව ගෙදර යැව්වත් කමක් නැහැ, ඇත්ත කියන්නට ඕනෑ. මේකයි ඇත්ත කථාව. ඇත්ත -යථාර්ථය- තිබුණේ එතැනයි. මහින්ද රාජපක්ෂ මහත්මයලාගේ, ගෝඨාභය කල්ලියට ඕනෑ වෙලා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුර්වල කරලා කණ්ඩායමක් ඒ පැත්තට ගන්නයි. මේක තමයි ගේම. වෙන ගේමක් තිබුණේ නැහැ, මේක ඇතුළේ. UNP එක කඩන්න, UNP එක දියාරු කරන්නයි ඕනෑ වුණේ. නමුත් කොහොම හරි ග්‍රහචාරය කැරකුණා. වේලාව කැරකුණා. එක්සත් ජාතික පක්ෂය එකට හිටගත්තා. හෙටින් පසුව අලුත් එක්සත් ජාතික පක්ෂයක් හට ගන්නවා, නැහිටිනවා කියන එකත් ඔබතුමාට පැහැදිලිව කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි.

මගේ මිත්‍ර රෝහිත අබේගුණවර්ධන මහත්මයා සෙල්ලම්බඩුකාරයෙක් වුණා. පුංචි ටයර් එකක්, සෙල්ලම් කාර් එකක් ගෙනැවිත් පෙන්වුවා. අනේ! මම එක දෙයක් ගැන කියන්න සතුටුයි. කළුතර ගැන කථා කළා. මට ඊයේ-පෙරේදා ආරංචියක් ආවා, දැන් කළුතර පැත්තේ මාල නම් කැඩෙන්නේ නැහැ කියලා. ඒක ලොකු දෙයක්. හැබැයි, මම නම් දන්නේ නැහැ. මම එතුමා නිසා නොවෙයි කිව්වේ. ඒ පැත්තෙන් ආරංචියක් ආවා. රත්තරන් බෙරිලා ලු. ගරු කථානායකතුමනි, එතුමා වොක්ස්වැගන් කාර් එක කියලා toy එකක් ගෙනැවිත් පෙන්වුවා. මේ පාර්ලිමේන්තුව joke එකක් කළා නේ. අපේ රන්ජන් රාමනායක මහත්මයා "පාර්ලිමන්ට් ජෝක්ස්" කියන චිත්‍රපටය ගෙනාවේ, මේ වාගේ මිනිසුන් නිසායි.

ගරු කථානායකතුමනි, 2017 අවුරුද්ද තමයි ලංකාවට වැඩියෙන්ම Foreign Direct Investments ගෙනාපු අවුරුද්ද කියන එක ඔබතුමාට කියන්න ඕනෑ. FDIs වැඩියෙන්ම ආපු අවුරුද්ද 2017.

[බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඔය පෙන්වන්නේ O/Level පාස් නැති 94කගේ තරමයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ O/Level පාස් නැති 94කගේ හූව පෙන්නුවා. ඒ කොහෙන්ද? පොහොට්ටුවෙන් පෙන්නුවා. ගරු කථානායකතුමනි, මේ සංඛ්‍යාලේඛන මා නොවෙයි නේ, කියන්නේ. [බාධා කිරීම්] ලංකාවේ වැඩිම exports තිබුණු අවුරුද්දත් 2017 අවුරුද්දයි.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට වැරැදුණු තව තැනක් තිබෙනවා. ඒ තමයි කරපු හොඳ දේවල් කියා ගන්න නොහැකිවීම. ඒ නොහැකිවීමෙත් එක වරදක් තිබෙනවා. මොකක්ද ඒ? මා කිව්ව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අපේ ආණ්ඩුව ඇතුළේ හිටියා. ඒ නිසා අපි කරපු හොඳ දේවල් අපට කියන්න හම්බ වුණේ නැහැ. මේ සභාග ආණ්ඩුවේත් ඉන්නවා, කකුලක් එහා පැත්තේ තියාගෙන, කකුලක් මෙහා පැත්තේ තියාගෙන ඉන්න අය. දැන් handbag එකක් ඉස්සරහින් තියාගෙන කථා කරපු එක් කෙනා කථා කරපු විලාසය දැක්ක නේද? "මේක හරි නැහැ, මේක හොරකමක්" කියලා කියනවා. හොරකමක් කරනකොට මේ ආණ්ඩුව ඇතුළේ හිටියා නේ. මෙච්චර හොරකම් වෙද්දී දැක්කේ නැද්ද? බොරු කතන්දර නේ. දැන් ඒ ගොල්ලන් හිතනවා, "ඒ පැත්තට පැන්නොත් දේශපාලනය හරි. පොහොට්ටුවට පැන්නොත් දේශපාලන අනාගතයක් තිබෙනවා"යි කියලා. ගරු කථානායකතුමනි, ඒක නොවෙයි, ප්‍රතිපත්තිය කියන්නේ. ඒකට නොවෙයි, කොන්දක් තිබෙනවාය කියන්නේ. තමන් යමක් ආරම්භ කළා නම්, එය අවසානය වන තුරු ඒ වෙනුවෙන් සටහන් කරන්න ඕනෑ; අවසානය වන තුරු ඒ ගමන යන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරු ජාතික ලැයිස්තුවෙන් පත්වෙලා, ජනාධිපතිවරයාගෙන් පුටුව අරගෙන, දැන් ආයෙත් එහෙන් මෙහෙන් මුක්කුවක් ගහලා ඒ පැත්තට පනින්න හදනවා. ඔබතුමන්ලා ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, ඒවායෙන් ඔබතුමන්ලාගේ තනතුරුමයි නැති වෙන්නේ.

ගරු කථානායකතුමනි, මා අවසාන වශයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ විශ්වාස භංග යෝජනාව ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවේ කාලය කා දැමූ, කාලය නාස්ති කළ, අද රාත්‍රී ආහාර, දවල් ආහාර, උදේ ආහාර දීලා, OT ගෙවලා, ලයිට්, ජෙනරේටර් පාවිච්චි කරලා මහා විශාල මුදල් කන්දරාවක් වියදම් කළ එකක්. මේ විවාදයට කී දෙනෙක් සහභාගි වුණත් අඩුම ගණනේ මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ සම්බන්ධයෙන් වචනයක්වත් කථා කළේ නැහැ නේ. [බාධා කිරීම්] දැක්කාද? මහින්ද රාජපක්ෂ මහත්මයා අත්සන් කළේවත් නැහැ; කථා කළේවත් නැහැ. [බාධා කිරීම්] එතුමා කැන්ටීමේ දවල් කෑම කනවා මා දැක්කා. මා හිතන හැටියට එතුමා ඡන්දය දෙන්න එයි. නමුත් එතුමා වචනයක්වත් ප්‍රකාශ කළේ නැහැ. නාමල් බේබි කථා කළේත් නැහැ. එතකොට මේක මහ අවුල් ගේමක් නේද? කොතැනක හෝ මොකක් හෝ අවුලක් තිබෙනවා. මේ ගේමට කර තිබ්බේ, අනේ! අර තුම්මුල්ලේ විමලෙ අයියයි, ගමනෙ අයියයි විතරයි. මේක මහා අවුලක්. මේක ඇතුළේ මොකක් හෝ අවුල් ජාලාවක් තිබෙනවා. කවුරුන් හෝ කාගේ හෝ ලණුවක් කෑවා. අපරාදේ පව්! ඔබතුමන්ලාට මෙහෙම වෙන්න හොඳ නැහැ. අර දිනපු ජයග්‍රහණය නිකම් ඉල්ලාගෙන නෑවා. මෙහෙම නාන්න හොඳ නැහැ. මා කිව්වාට පස්සේ නේ, එතුමා මේ සභාව ඇතුළට ආවෙත්, ගරු කථානායකතුමනි. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, නිකම් පිස්සුවට විශ්වාස භංග යෝජනා ගෙනෙන්න ඉඩ දෙන්න එපාය කියලා. එක්සත් ජාතික පක්ෂය වැනි මහා දැවැන්ත පක්ෂයක් එක්ක හැප්පෙන්න මේ ගොල්ලන්ට පොඩ්ඩක් අමාරුයි. කොච්චර හප්පන්න ආවත්, මොන මොන ගේම් ගැහුවත් හැප්පෙන්න බැහැ. [බාධා කිරීම්] අපට මහ විශාල චෝදනාවක් ගෙනාවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ද්‍රවිඩ පක්ෂවලටයි, මුස්ලිම් පක්ෂවලටයි විශාල චෝදනාවක් කළා, මේවා මොනරුවලට යන දේවල් කියලා. එකක් කියන්න ඕනෑ, මොනරුවලට හොඳට විකිණිණු මිනිස්සු තමයි මොනරු ගැන දන්නේ. මොනරුවලට විකිණිණු මිනිසුන්ට මොනරු රසත් තේරෙනවා. සමහර අය කියනවා, රුපියල් කෝටි 5කට ගත්තාය කියලා. මෙවුන් රුපියල් කෝටි 5කට ගන්න! ආපෝ! නොදකිං. ඊට වඩා හොඳයි, ඒ රුපියල් කෝටි පහෙන් දානයක් දෙන එක. ගරු කථානායකතුමනි, මෙවුන් රුපියල් කෝටි පහකට ගන්න ඕනෑ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෙවුන්, මෙවුන් කියන්න එපා. ලස්සනට කථා කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මෙවුන් කිව්වේ නැහැ. මොනරු, මොනරු. මෙවුන් කිව්වේ, මොනරුවලට. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඉල්ලාගෙන

තොප්පි දමා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. හැබැයි අපි අහලා තිබෙනවා, පුත්තලමේ නම්, මොක්කුද ඉන්නවාය කියලා. එහෙම_

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා තිබෙනවා වාගේ මට පෙනෙනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, එයාට නම් කථා ගොඩක් තිබෙනවා. ඒ ගැන මා වැඩිය කථා කරන්න කැමැති නැහැ. හැබැයි ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ, අපි මේ විශ්වාස භංග යෝජනාව අතිශාල ලෙස ජයග්‍රහණය කරනවාය කියලා. මේ ජයග්‍රහණයත් එක්කම අද අපි මුළු කණ්ඩායමම අතිගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අග්‍රාමාත්‍ය තුමාගෙනුත් එක ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසාන කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(මාණ්ඩුමිකු හරින් පර්නාන්දු)
(The Hon. Harin Fernando)
අවසන් කරනවා, ගරු කථානායකතුමනි. මා එකම එක ඉල්ලීමක් කරනවා. අද මේ කාලය නාස්ති කළාට අපි හැදෙන්න ඕනෑ. මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවාට දහස් වාරයක් ස්තුතියි. අපේ ඇස් ඇරියාට ස්තුතියි. රටේ ඇස් ඇරියාට ස්තුතියි. ඒ වාගේම මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

එළවා, අදින් පස්සේ ආණ්ඩුව ශුද්ධ කරගෙන, ඒ මිනිසුන්ට මේ ආණ්ඩුව ඇතුළේ එක දවසක්වත් ඇමතිකම් දරන්න නම් ඉඩ දෙන්න එපාය කියන ඉල්ලීම පමණක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට, ගරු තිලංග සුමතිපාල මැතිතුමා. [බාධා කිරීම්]

ගරු තිලංග සුමතිපාල මහතා (නියෝජ්‍ය කථානායකතුමා)
(මාණ්ඩුමිකු තිලංක සුමතිපාල - පිරතිච් සභානායකර්)
(The Hon. Thilanga Sumathipala -Deputy Speaker)
නමෝ බුද්ධාය! ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. Do not disturb; let him speak.

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්ඩුමිකු තිලංක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, අද මෙම විශ්වාස භංග යෝජනාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - [බාධා කිරීමක්] සරත් ෆොන්සේකා මහත්මයාට ප්‍රශ්නයක් තිබෙනවාද?

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්ඩුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
නැහැ. නැහැ. ඔබතුමා කථා කරන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්ඩුමිකු තිලංක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
මා තමයි කථා කරන්නේ. කරුණාකරලා හොඳින් හැසිරෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] Order, please! Everybody has a right to speak; දෙපාර්ශ්වයටමයි මා මේ කියන්නේ. ඔබතුමා කථා කරන්න.

[අ.භා. 8.50]

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්ඩුමිකු තිලංක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ සිට අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, මේ කරුණු පිළිබඳව විග්‍රහයක් කළා. අපි අපේ පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟත් මේ පිළිබඳව සාකච්ඡා කළා. ඒ දේශපාලන තීන්දුව ගැනීමේදී පක්ෂයක් හැටියට අපි මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු පිළිබඳව සාකච්ඡා කළා. [බාධා කිරීම්] පක්ෂයක් හැටියට අපි තීන්දු කරපු දේ තමයි, මේ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා එක්ක සාකච්ඡා කරන්න ඕනෑය කියන එක. මොකද, අපේ පක්ෂය තීන්දුවක් ගෙන තිබුණා, අපි දිගටම දරපු මතය මත මේ විශ්වාස භංග යෝජනාවට ඡන්දය දීමෙන් වළකින්න බැහැයි කියලා. ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ තීන්දුව වුණේ, අපේ පක්ෂය ගන්නා තීන්දුව පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කරන්න ඕනෑය කියන එකයි. ඊයේ දිනයේ දී අපේ පක්ෂයේ තීන්දුව පිළිබඳව ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා හරහා ගරු අගමැතිතුමා දැනුවත් කළා. [බාධා කිරීම්] ඒ වාගේම මේ පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ මතය වුණේ, මේ සම්බන්ධයෙන් අගමැතිතුමා කිසිසේත් ඉවත් නොවිය යුතුයි කියලායි. ඒ පක්ෂයේ තීන්දුව වුණේ, ඒ පක්ෂය දරන ස්ථාවරයයි. [බාධා කිරීම්] නමුත් අපේ පක්ෂයේ ඒකමතික තීන්දුව වුණේ, මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු මත අපට ඒ යෝජනාවට සහයෝගය දෙන්න සිදුවන බවයි. [බාධා කිරීම්] අපට ගරු අගමැතිතුමා එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. මේ මොකක්ද? සියලුදෙනාම බලාගෙන ඉන්නවා. සියලුදෙනාටම කථා කිරීමේ අයිතියක් තිබෙනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්ඩුමිකු තිලංක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
අපේ පක්ෂයේ තීන්දුවේ හැටියට, මෙම විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්න අපට පුළුවන්කමක් නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ඒ නිසා අපි මෙය ප්‍රකාශයට පත් කරන්නේ ප්‍රතිපත්තිමය තීන්දුවක් මතයි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, කථානායකතුමා සහ නියෝජ්‍ය කථානායකතුමා ස්වාධීනව මත දරන්න ඕනෑය කියලා අපි දන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ ගැන අපි උදේත් කථා කරලායි තිබෙන්නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට මේ ආණ්ඩුවේ ඉඳගෙන මෙතෙක් කථා කරලා තිබෙන්නේ පක්ෂග්‍රාහීව නොවෙයි ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් නියෝජ්‍ය කථානායකතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමා කථා කරන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Hon. Speaker, as you are aware, I have always served in this Parliament being very fair. Every time I presided over the Chair as a person representing all the Hon. Members. -[*Interruption.*]

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன)
(The Hon. Lakshman Ananda Wijemanne)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன)
(The Hon. Lakshman Ananda Wijemanne)
මෙතුමා නියෝජ්‍ය කථානායක හැටියට මේ ගරු සභාවේ ස්වාධීනත්වය රකින්නට ඕනෑ. එතුමා එක පැත්තක් අරගෙන කථා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order. දැන් කථා කරන්නේ එහෙම නොවෙයි නේ. [බාධා කිරීම්]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, මා හැම වෙලාවේම මේ පාර්ලිමේන්තුවේ ස්වාධීනව හැසිරිලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ගරු ලක්ෂ්මන් විජේමාන්න මන්ත්‍රීතුමා, ඔබතුමා වාඩි වෙන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මේ පාර්ලිමේන්තුවේ කිසිම මන්ත්‍රීවරයකුට, කිසිම වෙලාවක කියන්න පුළුවන්කමක් නැහැ, මා මෙම මුලසුනේ ඉන්නකොට එක පාර්ශ්වයක් ගත්තාය කියලා. මේ දියවන්නාවෙන් එළියේ මට දේශපාලනයක් තිබෙනවා. ඒක මට තිබෙන අයිතියක්. [බාධා කිරීම්] ඒ වාගේම ඒ ගත්ත තීන්දුව අපේ පක්ෂයේ තීන්දුවක්.

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன)
(The Hon. Lakshman Ananda Wijemanne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලක්ෂ්මන් විජේමාන්න මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩිවෙන්න. ලක්ෂ්මන් විජේමාන්න මන්ත්‍රීතුමා, ඉඳගන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක හැටියට මා මේ පාර්ලිමේන්තුවේ හැම අවස්ථාවකම බොහොම ස්වාධීනව හැසිරිලා තිබෙනවා. [බාධා කිරීම්] මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් කිසිම කෙනෙකුට, කිසිම අවස්ථාවක කියන්න බැහැ, මා එක පාර්ශ්වයක් ගත්තාය කියලා .

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, නොයෙකුත් අවස්ථාවන්වලදී ඔබතුමාත් මේ පාර්ලිමේන්තුවේ අභියෝගයට ලක් කරලා තිබෙන බව. මේ අවුරුදු තුන තුළම මට එවැනි ප්‍රශ්නයක් තිබිලා නැහැ.

මගේ පක්ෂයේ මාධ්‍ය ලේකම් මම. එම නිසා මාධ්‍ය කැඳවීමට, මාධ්‍යයට කථා කිරීමට මට අයිතියක් තිබෙනවා. මගේ පක්ෂය

තීන්දුවක් ගත්තා, "විශ්වාස භංගයේදී අපේ පක්ෂයට ඡන්දය නොදී ඉන්න බැහැ." කියලා. ඒ ප්‍රකාශය කරන වෙලාවේ ගරු එස්.බී. දිසානායක මැතිතුමාත් සිටියා. හැබැයි, අද අපේ පක්ෂය තීන්දුවක් අරගෙන තිබෙනවා, විශ්වාස භංග යෝජනාවට පක්ෂ වෙන්න. ඒ තීන්දුව අපි ක්‍රියාත්මක කරනවා.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
ඔය තීන්දුව ගත්ත පක්ෂයේ මහ ලේකම්තුමා කෝ? කරුණාකරලා කියන්න.

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්පුමිකු තිලඞ්ක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ සභාපතිතුමා මේ රටේ ජනාධිපති. අපේ පක්ෂයේ සභාපතිතුමා තමයි ජනාධිපති හැටියට Cabinet එකේ ප්‍රධානියා. කිසි කෙනෙක් මේක පෞද්ගලික ප්‍රශ්නයක් කර ගන්න එපා. අග්‍රාමාත්‍යතුමාට- [බාධා කිරීම්]

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
Can I have a clarification?

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්පුමිකු තිලඞ්ක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
No, I do not think. You cannot take my time.- [*Interruption.*] Allow meto speak.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
You finish your speech.

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්පුමිකු තිලඞ්ක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, අපි ප්‍රතිපත්තියක් හැටියට ඡන්දය දීලා තිබෙනවා. විශ්වාස භංග යෝජනාවේදී පක්ෂයේ ප්‍රතිපත්තියක් හැටියට අපි ඡන්දය දෙනවා. අපේ පක්ෂයේ තීන්දුව හැටියට අපි ඡන්දය දෙනවා. අපට කවදාවත් පක්ෂයේ තීන්දුව නවත්වන්න පුළුවන්කමක් නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
පොරොන්දු දුන්නාද?

ගරු තිලංග සුමතිපාල මහතා
(මාණ්පුමිකු තිලඞ්ක සුමතිපාල)
(The Hon. Thilanga Sumathipala)
ගරු කථානායකතුමනි, මෙතුමා කලබල වන්නේ ඇයි කියා මට හිතා ගන්න පුළුවන්. ඒ නිසා- [බාධා කිරීම්]

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

ගරු මලිත් ජයතිලක මහතා
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු අංගජන් රාමනාදන් මහතා
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

*පාර්ලිමේන්තුව අ. භා. **10.04**ට, **2018** අප්‍රේල් මස **05**වන බ්‍රහස්පතින්දා පූ. භා. **10.30**වන තෙක් කල් තියේය.*


பி.ப. 10.04 மணிக்கு பாராளுமன்றம், 2018 ஏப்பிரல் 05, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 10.04 p.m. until 10.30 a.m. on Thursday, 05th April, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 259 - இல. 11
Volume 259 - No. 11

2018 අප්‍රේල් 05වන බ්‍රහස්පතින්දා
2018 ஏப்பிரல் 05, வியாழக்கிழமை
Thursday, 05th April, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමු වන වර කියවන ලදී.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමු වන වර කියවන ලදී.

මෝටර් වාහන පනත:

නියෝග

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது.

பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது.

மோட்டார் வாகனச் சட்டம்:

ஒழுங்குவிதிகள்

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

NATIONAL DEFENCE FUND (AMENDMENT) BILL:

Read the First time

PRADESHIYA SABHAS (AMENDMENT) BILL:

Read the First time

MOTOR TRAFFIC ACT:

Regulations

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 අප්‍රේල් 05වන බ්‍රහස්පතින්දා
2018 ஏப்பிரல் 05, வியாழக்கிழமை
Thursday, 05th April, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අප්‍රේල් 05වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2018.01.22 සිට 2018.02.28 දක්වා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරමි.

එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගේ වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "2014 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව" සහ "2016 වර්ෂය සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமபண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரும் சட்டமும் ஒழுங்கும் அமைச்சரும்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Minister of Law and Order)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) බිබිල, මැදගම, ටැංගල් පිටිය යන ලිපිනයේ පදිංචි ආර්.එම්. සරත්චන්ද්‍ර කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්පාර, ජල සම්පාදන පෙදෙස, අංක 10 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්. චන්දන ඉන්ද්‍රජිත් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වන්දිම වීරක්කොඩි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1233/'16- (2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1426/'16- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1740/'17- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -2043/'17- (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -2117/'17- (1), ගරු ඩග්ලස් දේවානන්ද මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -2139/'17- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -2186/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. පිළිතුරු දෙන්න කවුරුත් නැහැ නේ ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Industry and Commerce, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2229/'17- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Provincial Councils and Local Government, I ask for three weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවධානය මේ පිළිබඳව යොමු කරවන්න කියලා ගරු සභානායකතුමාට මා කියනවා. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය කියන්නේ ඉතා වැදගත් අමාත්‍යාංශයක්. ඒ වාගේම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයිති විෂය පථයට තිබෙන පළාත් පාලන මැතිවරණයත් හිතා මතාම කල් දාලා දැන් ඒක jam කරලා තිබෙන්නේ. අදාළ ඇමතිවරයා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මේ සභාවට එන්නේත් නැහැ. මේ ආණ්ඩුව තවත් අපකීර්තියට පත් කරන්නේ නැතිව ගරු ඇමතිතුමාගෙන් අහලා කියන්න, එතුමා මේ රජය තුළ ඉන්නවාද, නැද්ද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අලුත් ස්ථාවර නියෝග අනුව ප්‍රශ්නයකට උත්තර දෙන්න තුන් වතාවකට වඩා කල් ගන්න බැහැ. ඊට පෙර උත්තර දෙන්න ඕනෑ. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 9 - 2343/'17 - (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 2344/'17 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. - *[සභා ගර්භය තුළ නැත.]*

කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සිදු වූ මරණ : කුරුණෑගල දිස්ත්‍රික්කය
விவசாய இரசாயனப் பொருட்களின் பாவனையால் இறந்தோர்:குருநாகல் மாவட்டம்
DEATHS OCCURRED DUE TO USE OF AGROCHEMICALS: KURUNEGALA DISTRICT

2402/'17

11.**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා වගාවේදී කෘෂි රසායනික ද්‍රව්‍ය නොසැලකිලිමත්කමින් භාවිතා කිරීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මියගිය පුද්ගලයන් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழில් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டிலிருந்து இற்றைவரை பயிர்ச் செய்கையின்போது விவசாய இரசாயனப் பொருட்களைக் கவனயீனமாகப் பாவித்தமை காரணமாக குருநாகல் மாவட்டத்தில் இறந்த ஆட்களின் எண்ணிக்கை யாது;

(ii) அவ்விதமாக இறந்த ஆட்கள் பதிவாகிய பிரதேச செயலாளர் பிரிவுகள் யாவை;

(iii) விவசாய இரசாயனப் பொருட்களின் பாவனை சம்பந்தமாக மக்களுக்கு விழிப்புணர்வூட்ட அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) the number of deaths that occurred due to the unsafe use of agrochemicals in cultivations in the District of Kurunegala from 2010 up to now;

(ii) the Divisional Secretaries' Divisions from which such deaths have been reported; and

(iii) the steps that will be taken by the Ministry to raise awareness among people about the use of agrochemicals?

(b) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

වසර	ඕගැනෝපොස්ජේ ටි හා කාබමේට් කෘමිනාශක		වෙනත් පළිබෝධ නාශක	
	විෂවීම Cases	මරණ Deaths	විෂවීම Cases	මරණ Deaths
2010	2214	115	358	16
2011	2322	75	595	07
2012	2577	67	766	10
2013	2506	76	572	12
2014	1605	45	391	04
2015	1482	45	257	05
2016	1116	37	244	02

(ii) මෙම දත්ත කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නොමැත.

(iii)
- සියලුම පළිබෝධ නාශක ඇසුරුම් සමඟ සමාන්‍ය ජනතාවගේ පරිශීලනය සඳහා භාෂා ත්‍රිත්වයෙන් පරිහරණ නිර්දේශ සහ ආරක්ෂක උපදෙස් සඳහන් කිරීම. (වර්ෂ 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 8වන වගන්තියට අනුව)
- පෙර කන්න පුහුණු වැඩසටහන් මඟින් සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් පළිබෝධ නාශක නිර්දේශ හා පරිහරණ විධි පිළිබඳ දැනුවත් කිරීම.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා ඒකාබද්ධ පළිබෝධ පාලන විධි විවිධ භෝග කාණ්ඩ සඳහා පවත්වා ගැනීම ප්‍රචලිත කිරීම.
- පළිබෝධ නාශක අළෙවිසැල් ලියා පදිංචි කිරීම හා සෑම පළිබෝධ නාශක අළෙවි සැලක් සඳහාම පුහුණු අළෙවිකරුවෙකු (කෘෂි රසායන අළෙවි හා තාක්ෂණ සහායක) පිහිටුවීම සඳහා අළෙවිකරුවෙකු (කෘෂි රසායන අළෙවි හා තාක්ෂණ සහායක) පිහිටුවීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළිබෝධ නාශක හිස් ඇසුරුම් ක්‍රමානුකූලව එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය සඳහා ක්‍රමවේදයක් ආරම්භ කිරීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙහෙයවනු ලබන ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් මඟින් කරනු ලබන දැනුවත් කිරීම.
- පළිබෝධ නාශක පරිහරණයේදී පුද්ගල ආරක්ෂක උපකරණ (personal protective equipment) හඳුන්වා දීම හා ක්ෂේත්‍රයේ ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රමුඛ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා පිළිතුර කියවාගෙන යන විට මට තේරුණේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට හෝ උසස් පෙළ විභාගයට කෘෂි විද්‍යාව කියන විෂයය ඉගෙන ගන්නා ළමයෙක් ප්‍රශ්න පත්‍රයකට උත්තර දෙන විධියයි. "ඒකාබද්ධ පළිබෝධ පාලනය", "දැනුවත් කිරීම්" කියන ඔය උත්තර ටික තමයි ඒ ළමයි කෘෂි කර්මාන්තය ගැන හැමදාම දෙන්නේ. දැන් ඔබතුමා කිව්වෙත් ඒ උත්තර ටිකයි. හැබැයි ග්‍රාමීය ප්‍රායෝගික කෘෂි කර්මාන්තයේදී ඔය කටයුතු සිද්ධ වන බවක් පෙනෙන්නේ නැහැ. විශේෂයෙන්ම අද අපේ පස නිසරු වෙලා, බොල් වෙලා, වස විසෙන් තොර ආහාරයක් අපිට පරිභෝජනයට ගන්න බැරි තත්ත්වයකට; එහෙම ආහාරයක් සොයා ගැනීමට පවා අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. හැබැයි අපි දෙපැත්තකට මුහුණ දෙනවා. වාණිජ කෘෂි කර්මාන්තයේදී සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කිරීමෙන් ලැබෙන අස්වැන්න සහ ඵලදායීතාව ඉතා අඩුයි.

වාණිජ කෘෂි කර්මාන්තයේ වාගේම මහා පරිමාණ කෘෂි කර්මාන්තයේ නිරත වෙන ගොවියෙකුට පලිබෝධ නාශක භාවිතයෙන් තොරව උසස් නිෂ්පාදනයකට -උසස් අස්වැන්නකට- යන්න අමාරුයි. වාණිජ පරමාර්ථයෙන් නිෂ්පාදනය කරන ගොවීන්ව මේ පලිබෝධ නාශක භාවිතය පාලනය කිරීම සම්බන්ධයෙන් දැනුවත් කරන හෝ ඔවුන්ව ප්‍රවර්ධනය කරන අලුත් නිර්ණායකයන් හෝ අලුත් නිර්මාණශීලී වැඩසටහන් ඉදිරියේදී අනුගමනය කරන්න අදහස් කරනවාද කියලා තමයි මම ඔබතුමාගෙන් අහන්නේ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව ආකාරයට මේ සම්බන්ධයෙන් විශේෂ දැනුවත් කිරීම් වැඩසටහන් ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක වෙනවා. කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන නිලධාරීන් එම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් අනුව ගොවිජන සේවා ප්‍රදේශ තුළ එම වැඩසටහන් සියල්ලම 2018 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට මේ වනකොට කටයුතු කරලා තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මේ පාර්ලිමේන්තුවේදී මීට ඉහතදී මේ සම්බන්ධයෙන් සංවාදයක් ඇති වුණා. මම එදාත් මේ කාරණය පැහැදිලි කරලා දුන්නා. අපේ අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ කියනවා, උන් වහන්සේ බලාපොරොත්තු වන ආකාරයට කාබනික පොහොර භාවිතා කරන ක්‍රමවේදයන්වලට නොගියොත් ආණ්ඩුව පෙරළනවාය කියලා. ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන ගම්වල සිටින බොහෝ අය ලොකු හඬක් නඟනවා, "මේ ආණ්ඩුව

තෙල් දෙන්නේ නැහැ. පොහොර දෙන්නේ නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව පෙරළන්න ඕනෑ" කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
අතුරු ප්‍රශ්නය තමයි මම අහන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
විවාදයකට යන්නේ නැතිව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය කිව්වාට, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කිව්වාට, ඔබතුමා යෝජනා කරන ඔය ක්‍රියාවලිය සම්බන්ධව ග්‍රාමීය මට්ටමින් සාමාන්‍ය ගොවීන් දැනුවත් කරන ක්‍රමවේදයක් අපට දකින්න නැහැ. ගම්වල කෘෂිකර්ම පර්යේෂණ නිලධාරියෙක් ඉන්නවා. ඔහු තමයි ගමේ ඉන්නා පහළම නිලධාරියා. සෑම ග්‍රාම නිලධාරි වසමකටම එක් නිලධාරියෙක් බැගින් ඉන්නවා. අපි දකින විධියට නම් ඒ ගොල්ලන් දේශපාලනික වශයෙන් ගමේ යම් යම් අභිමතාර්ථ ඉෂ්ට කර ගන්න දහලනවා මිසක්, කෘෂිකර්මය හෝ කෘෂිකර්මාන්තයේ වැදගත් ඉසව් සඳහා දායකත්වයක් දක්වන්නේ නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස මොකක්ද කියන එක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු වසන්ත අලුවිහාර)
(The Hon. Wasantha Aluvihare)
ගරු කථානායකතුමනි, කාබනික පොහොර සම්බන්ධව දැනුවත් කිරීම සඳහා මේ වෙනකොට ගොවිජන සේවා මධ්‍යස්ථානයකට කෘපනිස නිලධාරියෙකු බැගින් පත් කර තිබෙනවා. එම කාර්යය සම්බන්ධව අපි ඒ නිලධාරියාට වගකීම පවරා තිබෙනවා. කාබනික පොහොර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනේදී බිම් මට්ටමටම ගිහින් දැනුවත් කිරීමේ කටයුතු කරන්න කියලා අපි ඔවුන් දැනුවත් කර තිබෙනවා. විශේෂයෙන් මේ වෙනකොට ගෙවතු වගා වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. එම නිසා ඒ දැනුවත් කිරීමේ වැඩසටහන් එම බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ඔව්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න කැමැතිද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු වසන්ත අලුවිහාර)
(The Hon. Wasantha Aluvihare)
කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, අපි මෙම ප්‍රශ්නය ගරු රාජ්‍ය අමාත්‍යතුමා වෙත ගෞරවයෙන් යොමු කරනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ලෝක උරුම නකල්ස් රක්ෂිතයේ මායිමේ පිහිටි ඉඩම් අක්කර 21,000ක් හිතවතුන්ට බදු දීලා කියලා ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ අධ්‍යක්ෂතුමා අද ප්‍රකාශ කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදාළ කරුණක් නොවෙයිද? වෙනත් කරුණක් ගැනද ඔබතුමා අසන්නේ? මේ, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉදිරිපත් කරන වේලාව. එමනිසා ඔබතුමාගේ ප්‍රශ්නය ඇසීමට වෙන අවස්ථාවක් දෙන්නම්.

ප්‍රශ්න අංක 12 -2434/'17- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගංවතුරින් විපතට පත් සිසුන්: උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ අවස්ථා

வெள்ளப் பாதிப்புக்குள்ளான மாணவர்கள்: உயர்தரப் பரீட்சைக்குத் தோற்றும் தடவைகள்

STUDENTS AFFECTED BY FLOODS: NUMBER OF ATTEMPTS AT ADVANCED LEVEL EXAMINATION

2436/'17

13.**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය දිනවල ඇතිවූ ගංවතුරින් විපතට පත් ප්‍රදේශවල පදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා 04 වරක් පෙනී සිටිය හැකි බවට අග්‍රාමාත්‍යතුමා විසින් ප්‍රකාශයක් කළ බව දන්නේද;

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

(ii) එසේ වුවත්, මේ දක්වා එයට අදාළ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நாட்களில் ஏற்பட்ட வெள்ளப் பெருக்கினால் பாதிக்கப்பட்ட பிரதேசங்களில் வசிக்கும் மாணவ மாணவிகள் க.பொ.த. (உயர்தர) பரீட்சைக்கு 04 தடவைகள் தோற்ற முடியுமென பிரதம அமைச்சர் கூற்றொன்றை வெளியிட்டார் என்பதை அறிவாரா என்பதையும்;

(ii) எனினும் இதுவரை அது சம்பந்தப்பட்ட அறிவுறுத்தல்கள் இலங்கைப் பரீட்சைகள் திணைக்களத்திற்குக் கிடைக்கவில்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், அந்த அறிவுறுத்தல்களை இலங்கைப் பரீட்சைகள் திணைக்களத்திற்கு அனுப்புவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether he is aware that the Prime Minister has stated that the students residing in areas affected by recent floods can sit the G.C.E. (Advanced Level) Examination four times;

(ii) whether he admits that the Department of Examinations - Sri Lanka has not received any instructions pertaining to it nevertheless; and

(iii) if so, whether he will take action to send such instructions to the Department of Examinations - Sri Lanka?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) අ.පොෂ. (උසස් පෙළ) විභාගය සඳහා 13 වසර ඉගෙනීම් කරන ලද හා පාසලට පැමිණීමේ ප්‍රතිශතය 80% ක් සම්පූර්ණ වූ ඕනෑම ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට පාසල් අපේක්ෂකයෙකු ලෙස වාර 02කදී පෙනී සිටීමට හැකියාව ඇත. එමෙන්ම පෞද්ගලික අපේක්ෂකයෙකු ලෙස තමා කැමති ඕනෑම වාර ගණනක් අ.පොෂ. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටිය හැක.

එහෙයින් ගංවතුරින් පීඩාවට පත් ප්‍රදේශයන්හි පදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ඉහත දැක්වෙන ලද කොන්දේසිවලට යටත්ව අ.පොෂ. (උසස් පෙළ) විභාගයට ඕනෑම වාර ගණනක් පෙනී සිටීමට හැකියාව ඇත.

(iii) නැත.

(ආ) අ.පොෂ. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීම පිළිබඳ කොන්දේසි වෙනස් කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී නොමැති බැවින්, විභාග දෙපාර්තමේන්තුව වෙත නැවත වෙනස් උපදෙස් ලබා දීමට අවශ්‍යතාවක් නැත.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පිළිතුර ලබාදීම පිළිබඳව ඇමතිතුමාට ස්තුතියි.

ඒ විපතට පත් ප්‍රදේශවල ශිෂ්‍යයන් විපතට පත්වීමේ හේතුව උඩ හතරවාරයක් විභාගයට පෙනී සිටින්න ඉඩ ලබාදෙනවා කියලා ඒ ප්‍රකාශය කළේ අගමැතිතුමා. ඒ කියන්නේ පාසල් හරහා. ඔබතුමා කිව්ව කාරණය හරි. දැනට තිබෙන නීතිය අනුව පාසල හරහා පෙනී සිටින්න පුළුවන් දෙවරයි. ඒත් සියයට 80ක් පැමිණීමේ ලේඛනවල තිබෙන්නා වූ සාර්ථකත්වය උඩ. මේ ගංවතුර විපත් හේතු උඩ, නායයාම් විපත් හේතු උඩ ඒ අයට පාසලට නිසි දින ගණන එන්න බැරි වුණත්, ඒ පැමිණීමේ අඩුව නොතකා ඔවුන්ට පාසලින්ම දෙවරකට වඩා විභාගයට පෙනී සිටීමට අවස්ථාව දෙන බවක් තමයි කිව්වේ. ඒක තුන්වරක් ද, හතරවරක්ද කියන්න මම දන්නේ නැහැ.

විපතට පත් වෙච්ච දරුවෙක් මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටින්නේ දෙවනවර නම්, ඒ විපතට පත් වෙච්ච කාලයේ මුහුණ දීපු තත්ත්වය නිසා තුන්වන වරත් එම විභාගයට පාසලෙන්ම පෙනී සිටින්නට අවස්ථාවක් දෙනවාද? ඕනෑම කෙනෙකුට ඕනෑම වාර ගණනක් පෙනී සිටින්න පුළුවන් බව ඔබතුමා කිව්වා. ඒක නිවැරදියි. ශිෂ්‍යයෙකුට උසස් පෙළ විභාගයට පෙනී සිටින්නට අවසරයක් දෙන්න වුවමනා නැහැ. නමුත්, මේ අවසරය වුවමනා වන්නේ, දෙවතාවකට වඩා පාසල මඟින් පෙනී සිටීමටයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේ ප්‍රශ්නය තේරෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා, හිටපු අමාත්‍යතුමා කියන ආකාරයට, විපතට පත්, පාසල තුළින් උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට පැමිණීමේ ලේඛනයේ සියයට 80 බලපාන්නේ නැහැ. ගංවතුර තිබුණ ප්‍රදේශවල අයගේ පැමිණීම අඩු වුණත් ඒ අයට උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලැබෙනවා. දැනටමත් අපි ඒ කරුණ දැනුම් දීලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඇත්තටම මෙම ප්‍රශ්නය ඔබතුමා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඇසිය යුතු ප්‍රශ්නයක්. අපි මේ ගැන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දුන්නා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගත යුත්තේ වාර කීයකදී ද කියන එක තීරණය කරන්නේ. වාර තුනකදී ඇතුළත් කර ගත යුතු බවට නීතිය දාලා තිබෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. අපි මේ පිළිබඳව දැනුම් දීලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව මේ කාර්යය ඔබතුමාට අයිති නැති බවයි කියන්නේ. ගරු අමාත්‍යතුමනි, මම පෙන්වන්නේ ඔබතුමාගේ විෂය පථයට අයිති උසස් පෙළ විභාගයට ඉඳ ගැනීමට පාසල මඟින් ලැබෙන්නා වූ අවස්ථාව සම්බන්ධයි. විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමේ කරුණ නොවෙයි මා කියන්නේ. විපතට පත් වූ තැන්වල එවැනි ගැටලුවක් ඇති බව පෙන්වන දරුවන්ට තවත් වාරයක් හෝ දෙකක් පාසල තුළින්ම උසස් පෙළ විභාගයට පෙනී සිටින්නට -එම විභාගයට ඔවුන් පෙනී සිටියේ දෙවැනි වාරයේ නම්, තුන්වෙනි වාරයේ පෙනී සිටින්න- අවස්ථාව දෙනවාද කියලායි මම ඇහුවේ.

ගරු ඇමතිතුමනි, පාසල් අයදුම්කරුවකු ලෙස උසස් පෙළ විභාගයට පෙනී සිටීමට ඉඩක් ලැබෙනවා නම් තමයි එදා අගමැතිතුමා කියපු කාරණාව අදාළ වෙන්නේ. මා එම ප්‍රශ්නයයි ඔබතුමාට යොමු කරන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, උසස් පෙළ විභාගය සඳහා පාසල් අයදුම්කරුවකු ලෙස පෙනී සිටිය හැක්කේ දෙවරක් පමණයි. තුන්වන වර පෙනී සිටිනවා නම්, පෞද්ගලික අයදුම්කරුවකු ලෙස පමණයි ඉල්ලුම් කළ හැක්කේ. තුන්වන වර පමණක් නොවෙයි, හතරවන වර, පස්වන වර, හයවන වර ආදි වශයෙන් අවශ්‍ය නම් කීප වතාවක් වුවත් පෞද්ගලිකව විභාගයට පෙනී සිටීමේ හැකියාව තිබෙනවා. දෙවන වර පමණක් නොව, තුන්වන වරත් පාසල් අයදුම්කරුවකු ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දෙන්න කියා ඔබතුමා කියනවා නම්, අපට පුළුවන් ඒ ගැන ක්‍රියා කරන්න. හැබැයි, මට තේරෙන්නේ නැහැ-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගංවතුරෙන් විපතට පත් ප්‍රදේශවල දරුවන්ට.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්, ගංවතුරෙන් අවතැන් වූ ප්‍රදේශවල දරුවන්ට විතරයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මම දැනුම් දෙන්නම්.

හැබැයි ගරු මන්ත්‍රීතුමනි, දෙවරක් පාසල් අයදුම්කරුවකු ලෙස පෙනී ඉඳලා තුන්වන වර පෞද්ගලික අයදුම්කරුවකු ලෙස පෙනී සිටින්නත් පුළුවන්කම තිබෙනවා. තුන්වන වරත් පාසලෙන් අයදුම් කළොත් ඒ ළමයින්ව නැවත පන්තිවලට ඇතුළත් කළ යුතුව තිබෙනවා. අවශ්‍යතාවක් තිබෙනවා නම් පෞද්ගලිකව අයදුම් කරන්න පුළුවන්. මොකද, අවුරුදු දෙකක් පාසලෙන් ඉගෙන ගෙන විභාගයට ලියලා, තවත් අවස්ථාවක් දීලා පාසල තුළ ඉගෙන ගෙන නැවත පාසල තුළින්ම අයදුම් කරන්න ඕනෑද, එහෙම ඉල්ලන දරුවන් කොච්චර සිටියිද කියලා මට මේ අවස්ථාවේ කියන්න බැහැ. මම හිතන විධියට ඉතාම සීමිත දරුවන් පිරිසක් සිටියි.

සාමාන්‍ය ක්‍රමයට අනුව විභාගයට පෙනී සිටීමේ අවස්ථා තුනක් ඇතුළතදී පමණයි විශ්වවිද්‍යාලයට ඇතුළත් විය හැක්කේ. නමුත් ගරු අග්‍රාමාත්‍යතුමා කිව්වාට පසුව අපි ඒ දිනවලම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දී තිබෙනවා, ගංවතුර ආපදාව ඇති වෙච්ච ප්‍රදේශවල දරුවන්ට හතරවන වතාවටත් ඒ අවස්ථාව ලබා දෙන්න කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ, මම අද ලේකම්තුමාටයි, විභාග කොමසාරිස් ජනරාල්තුමාටයි එය නැවතත් මතක් කර උපදෙස් දුන්නා, ඒ අවස්ථාව ලබා දෙන්න කියලා.

ඒ වාගේම ඔබතුමා කිව්වා වාගේ පාසලෙන්ම ඉල්ලුම් කිරීමට අවශ්‍යතාව තිබෙනවා නම්, එහෙම කවුරු හරි ඉන්නවා නම් මම ඒකත් ලැහැස්ති කරලා දෙන්නම්. මම ඒ සම්බන්ධයෙන් අදම උපදෙස් දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයටම අදාළ ප්‍රශ්නයක්ද අහන්නේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න කැමැතියිද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ඉතා වැදගත් කාරණයක් කිව්වා, ගංවතුරට හසුවුණු ප්‍රදේශවල දරුවන්ගෙන් සියයට 80 පැමිණීම බලන්නේ නැහැ කියලා. ගරු කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය පරීක්ෂා කරන්න ඔබතුමාත් ආවා. ගරු ඇමතිතුමා මේ කාරණය මුලින්ම කියපු වෙලාවේ මම ක්ෂණිකව මගේ ජංගම දුරකථනයෙන් කථා කරලා, මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් කිහිපයකින් ඒ පිළිබඳව විමසුවා. එම ජාතික පාසල්වල විදුහල්පතිතුමන්ලා මේ වනකොටත් සියයට 80ක පැමිණීම කියන කාරණය පිළිබඳව තදින්ම ක්‍රියා කරලා තිබෙනවා. Admissionවලට නම් ලියා එවා තිබෙන්නේත් එම ප්‍රතිශතය තිබෙන අයගේ විතරයි. ඒ අනුව ගංවතුරට හසු වුණු ප්‍රදේශවල දරුවන් පිරිසක් ඉන්නවා, අපොස උසස් පෙළ විභාගයට නම් ඇතුළත් කරලා එවලා නැති. ඒ දරුවන් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙනවා. නම් ඇතුළත් කරලා එවලාත් නැහැ; දැන් නම් ඇතුළත් කරන්න වෙලාවකුත් නැහැ. විභාගය පවත්වන්න තිබෙන්නේත් තව මාස කිහිපයයි. ඒ නිසා මේ සඳහා පැහැදිලි ක්‍රමවේදයක් අවශ්‍ය වෙයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකරලා ඒ විදුහල්වල නම් මට ලබා දෙන්න. විදුහල් ඇතුළේ නොවෙයි, අධ්‍යාපන අමාත්‍යාංශය තිබෙන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තමයි පාසල්වලට චක්‍රලේඛ නිකුත් කරන්නේ; පාසල් දැනුවත්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

කරන්නේ. ඒ නිසා මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගොල්ලන් අපෙන් උපදෙස් පැතිය යුතුව තිබෙනවා. ඒ පිළිබඳව අපට වහාම දැනුම් දෙන්න.

ගරු කථානායකතුමනි, සතියේ දිනවල උදේ 7.30 සිට සවස 1.30 දක්වා පාසල් පැවැත්වෙන වේලාව තුළදී පෞද්ගලික පන්ති පැවැත්වීම තහනම් කරලා ඉදිරියේ දී මම කැබිනට් පත්‍රිකාවක් ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. දැන් අපි ගුරුවරු බඳවාගෙන තිබෙනවා. විදුහල්පතිවරු හාරදහසක් බඳවාගෙන තිබෙනවා. ඔබතුමා දන්නවා, ගොඩක් අඩුපාඩුකම් සපුරා තිබෙන බව. මේ වසර තුළත් අපි සියලුම ගුරු පුරප්පාඩු පුරවන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා උදේ 7.30 සිට සවස 1.30 දක්වා කාලය තුළ පෞද්ගලික පන්ති පැවැත්වීම තහනම් කරලා අපි ඉක්මනින්ම කැබිනට් පත්‍රිකාවක් ගෙනෙනවා. මොකද, දරුවන් පාසල වෙත යොමු කරන්න ඕනෑ. සමහර වෙලාවට මේක විලාසිතාවක් බවට පත් වෙලා තිබෙනවා.

අපි හිතාගෙන හිටියේ ගුරුවරුන්ගේ ප්‍රශ්න ආදී දේවල් නිසාය කියලායි. ඊටත් වැඩිය දැන් ඒක විලාසිතාවක් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඉදිරියේ දී අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි ප්‍රශ්නය?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එම කාරණය ඉතා හොඳයි. හැබැයි, මෙහිදී අපොස (උසස් පෙළ) පුනරීක්ෂණ පන්තිත් නවත්වන්න වෙයි. පුනරීක්ෂණ පන්තිවලට තමයි පාසල් ළමයින් ගෙන්වා ගන්නේ. නමුත්, පුනරීක්ෂණ පන්ති පවත්වන්නේ දෙවැනි වර විභාගය කරන ළමයින් සඳහායි. පුනරීක්ෂණ පන්ති නාමයෙන් තමයි පළමුවැනි වතාවට විභාගයට පෙනී සිටින ළමයිනුත් ගෙන්වා ගන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. අපි ඒ ගැන වෙනම කථා කරමු.

ප්‍රශ්න අංක 14 - 2461/'17 -(1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Provincial Councils and Local Government, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන : මුලතිව් දිස්ත්‍රික්කය

தொல்பொருளியல் பெறுமதிமிக்க இடங்கள்: முல்லைத்தீவு மாவட்டம்
PLACES OF ARCHAEOLOGICAL INTEREST: MULLAITIVU DISTRICT

1233/'16

1. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා (ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Udaya Prabhath Gammanpila on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தில் அமைந்துள்ள தொல் பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இடங்களில் தற்போது பேணல் பணிகள் மேற்கொள்ளப்படுகின்ற இடங்கள் யாவை;

(iii) இதற்காக 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(iv) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் அழிக்கப்பட்ட தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள் யாவை;

(v) மேற்படி அழிவுகள் பற்றிய மதிப்பீடொன்று செய்யப்பட்டிருப்பின், மதிப்பீட்டுப் பெறுமதி வெவ்வேறாக எவ்வளவு;

(vi) மேற்படி அழிவுகள் தொடர்பாகச் சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(vii) மேற்படி அனைத்தினதும் முழுமையானதோர் அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) how many places of archaeological interest are located in the Mullaitivu District;

(ii) in how many places conservation activities are being carried out of the aforesaid sites;

(iii) what amounts were allocated in the years 2015 and 2016 for this purpose, separately;

(iv) what places of archaeological interest were destroyed by the LTTE terrorists;

(v) if an assessment of such destructions has been done, what the estimated value is in respect of each site separately.

(vi) whether legal measures have been taken in respect of these destructions; and

(vii) whether he will submit a comprehensive report on all above?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගවේෂණය අවසන් කර නොමැත. දැනට අනාවරණය කරගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 176කි. ඉදිරි ගවේෂණ අනුව මෙම සංඛ්‍යාව වෙනස් විය හැකිය.

(ii) දැනට සංරක්ෂණ කටයුතු සිදු කරනු නොලැබේ.

(iii) සංරක්ෂණ කටයුතු සඳහා මුදල් වෙන්කර නැත.

(iv) දැනට වාර්තා වී ඇති පරිදි "අම්බකාමන්" නම් ස්ථානයේ ඇති කුඩා පැරණි චෛත්‍යය ඉංග්‍රීසි L අකුර හැඩයට කපා බංකරයක් ඉදිකර තිබුණි. මෙම ස්ථානයෙහි L.T.T.E ත්‍රස්තවාදී පුහුණු පාසලක් තිබී ඇත.

(v) තක්සේරු කර නොමැත.

(vi) නැත.

(vii) ඔව්.

*ඇමුණුම 01 - දැනට අනාවරණය කරගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන 176 පිළිබඳ වාර්තාව.

*ඇමුණුම 02 - "අම්බකාමන්" පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව.

(ආ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පසුගාමී ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම : ක්‍රියාමාර්ග

பின்தங்கிய பிரதேசங்களில் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்தல்: நடவடிக்கை
DEVELOPMENT OF INFRASTRUCTURE FACILITIES IN REGRESSIVE AREARS: MEASURES TAKEN

1426/'16

2. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා (ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට)
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில - மாண்புமிகு பந்துல குணவர்தன சார்பாக)
(The Hon. Udaya Prabhath Gammanpila on behalf of the Hon. Bandula Gunawardane)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 202ට අනුව ඇමරිකානු ඩොලර් මිලියන 10 ක් ආයෝජනය කරන හෝ නව රැකියා අවස්ථා 500 ක් ජනිත කරන පසුගාමී ප්‍රදේශවල ආරම්භ කරනු ලබන ව්‍යවසායන් සඳහා සුවිශාල බදු සානුබලයන් නිර්දේශ කරනු ලැබූ පරිදි, 2016 වර්ෂය තුළදී ආරම්භ කරන ලද ව්‍යවසායන් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත යෝජනාව ඉදිරිපත් කිරීමේදී හඳුනාගත් පසුගාමී ප්‍රදේශ කවරේද;

(iii) එකී පසුගාමීප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2000 වර්ෂයේ සිට මේ දක්වා රජය මඟින් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(iv) යටිතල පහසුකම් විශාල වශයෙන් සංවර්ධනය නොකර, පසුගාමී ප්‍රදේශවලට කර්මාන්ත ව්‍යාප්ත කළ නොහැකි බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவுசெலவுத்திட்ட முன்மொழிவு இலக்கம் 202 இன் பிரகாரம் அமெரிக்க டொலர் 10 மில்லியனை முதலீடு செய்கின்ற அல்லது 500 புதிய தொழில் வாய்ப்புகளை பிறப்பிக்கின்றதான பின்தங்கிய பிரதேசங்களில் ஆரம்பிக்கப்படுகின்ற தொழில் முயற்சிகளுக்கு பாரிய வரி ஊக்குவிப்புகள் விதந்துரைக்கப்பட்டதன் பிரகாரம், 2016ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்ட தொழில்முயற்சிகள் பற்றிய பட்டியலொன்றைச் சமர்ப்பிப்பாரா;

(ii) மேற்படி முன்மொழிவினைச் சமர்ப்பிக்கையில் இனங்காணப்பட்ட பின்தங்கிய பிரதேசங்கள் யாவை;

(iii) மேற்சொல்லப்பட்ட பின்தங்கிய பிரதேசங்களில் உட்கட்டமைப்பு வசதிகளை முன்னேற்றுவதற்காக 2000ஆம் ஆண்டிலிருந்து இற்றைவரை அரசாங்கத்தினால் கடைப்பிடிக்கப்பட்ட வழிமுறைகள் யாவை;

(iv) உட்கட்டமைப்பு வசதிகளைப் பாரியளவில் அபிவிருத்தி செய்யாமல் பின்தங்கிய பிரதேசங்

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

களுக்கு கைத்தொழில்களை விஸ்தரிக்க இயலாதென்பதை ஏற்றுக்கொள்கிறாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked Minister of Finance and Mass Media:

(a) Will he inform this House-

(i) whether a list of the enterprises commenced in year 2016 in accordance with the massive tax amnesty granted for the enterprises to be commenced in regressive areas that make an investment of US Dollars 10 million or generate 500 new employment opportunities as recommended from the Proposal No. 202 of the 2016 Budget will be submitted;

(ii) the regressive areas identified when presenting the aforesaid Proposal;

(iii) the measures taken by the Government up to now from year 2000, when developing infrastructure facilities of aforesaid regressive areas; and

(iv) it is admitted that industries cannot be expanded to regressive areas, without massive development of infrastructure facilities?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I table* the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Proposal No. 202 of the Budget 2016 was not implemented and Inland Revenue Act had to be amended to give effect to this proposal. Since the new Inland Revenue Act has been prepared on long-term policy for simplifying and justifying the tax policy by the Government, amendments have not been introduced to the existing Act.

Accordingly, a new Inland Revenue Act was drafted to provide prevailing tax concessions and anticipated tax concessions including the Budget Proposals 2016 and it is implemented from the date of 01.04.2018.

(ii) The areas with low economic growth, low per capita income, higher rate of poverty and unemployment, lack of education and health facilities, are identified as regressive areas. Accordingly, Northern, Eastern and Uva Provinces are considered as regressive areas. Also regressive areas have been identified in every province of the country.

(iii) The Government has implemented special assignments from the year 2000 in support of the programmes for strengthening of rural economy and special projects for developing infrastructure facilities including construction of highways and irrigation, providing facilities such as electricity and drinking water, improving education and health facilities, urban development and expanding communication have been carried out while special projects were implemented to develop market facilities and providing loan facilities under concessionary rates, and expanding banking network to the rural areas. As a result, the Poverty Headcount Index has been reduced from 22.7% in the year 2002 to 4.1% in the year 2016 and the poverty in regressive areas has been reduced significantly.

(iv) However, the policy of the Government is to expand the industries in regressive areas in line with development of infrastructure facilities of such areas.

(b) Does not arise.

2010 - 2014 දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මියගිය අලි ඇතුන් : විස්තර

2010-2014 வரை யானை - மனித மோதலினால் இறந்த யானைகள் : விபரம்

ELEPHANTS KILLED DUE TO HUMAN-ELEPHANT CONFLICT FROM 2010 TO 2014: DETAILS

1740/'17

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chaminda Wijesiri)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා අලි - මිනිස් ගැටුම හේතුවෙන් මියගිය අලි ඇතුන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ මියගිය අලි ඇතුන් මියගිය ස්ථාන කවරේද;

(iii) එම කාල සීමාව තුළ බරපතල තුවාල ලැබූ හා අසාධ්‍ය තත්ත්වයට පත් වූඅලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ අලි ඇතුන්ගේ මරණ සංඛ්‍යාව හා අලි මිනිස් ගැටුම අවම කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டிலிருந்து 2014ஆம் ஆண்டு வரை யானை - மனித மோதல்கள் காரணமாக இறந்த யானைகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக தனித்தனியாக எவ்வளவு;

(ii) அவ்விதமாக யானைகள் இறந்த இடங்கள் யாவை;

(iii) மேற்படி கால எல்லைக்குள் கடுங்காயமுற்ற மற்றும் உயிராபத்து நிலைக்குள்ளான யானை களின் எண்ணிக்கை யாது;

(iv) தற்போதைய நல்லாட்சி அரசாங்கத்தின்கீழ் இறந்த யானைகளின் எண்ணிக்கையையும் யானை - மனித மோதல்களையும் குறைக்க

அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife :

(a) Will he inform this House-

(i) separately, in terms of each year, the number of elephants died by reason of human - elephant conflicts from the year 2010 to 2014;

(ii) the locations where the elephants died;

(iii) the number of elephants died, got injured and got into critical conditions; and

(iv) the measures that will be taken to minimize the number of elephant deaths and human elephant conflicts, under present Good Governance Government?

(b) If not why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Sustainable Development and Wildlife, I table* the Answer.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i)

Year	Elephant Deaths
2010	227
2011	255
2012	250
2013	206
2014	231

(ii) Ampara, Moneragala, Batticaloa, Anuradhapura, Kurunegala, Puttalam, Mannar, Trincomalee, Vavunia, Badulla, Kandy, Hambantota, Rathnapura, Matale, Polonnaruwa, Mullaitivu, Nuwara-Eliya.

(iii) 1000 elephants.

(iv)
- Identifying areas where elephant-human co-existence can be maintained.
- Giving awareness on elephant-human co-existence to the people living in those areas.
- After educating the relevant wildlife officers, guide them to implement the identified methods.
- Introduction of electric fences. At present, construction of rural electric fences in

  Galgamuwa, Ehatuwewa, Mahawa, Nikaweratiya, Rasnayakapura Divisional Secretariat areas in Kurunegala District are being conducted successfully.
- Having measures to construct temporary electric fences to protect agricultural lands (paddy cultivations).
- Introduction of a system to handover the maintenance works of rural electric fences to the public.

(b) Does not arise.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Question No. 5 - 2117/'17 - (1), Hon. Douglas Devananda.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Question No. 6 - 2139/'17 - (1), Hon. (Dr.) Nalinda Jayathissa.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Higher Education and Highways, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Question No. 9 - 2343/'17 - (1), Hon. T. Ranjith De Soyza.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Higher Education and Highways, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාත්‍යන්තර සබඳතා විෂය පිළිබඳ ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා නිමකළ ශිෂ්‍යයන්: විදේශ කටයුතු අමාත්‍යාංශයට බඳවා ගැනීම

சர்வதேச நல்லுறவு விடயப்பரப்பு பற்றிய முதலாவது பட்டம் மற்றும் பட்டப்பின் பாடநெறியை நிறைவுசெய்தோர் : வெளிநாட்டலுவல்கள் அமைச்சுக்கு ஆட்சேர்த்தல்

STUDENTS COMPLETED FIRST DEGREE AND POSTGRADUATE COURCES IN INTERNATIONAL RELATIONS: RECRUITMENT TO MINISTRY OF FOREIGN AFFAIRS

2344/'17

10. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs) Rohini Kumari Wijerathna)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ විශ්වවිද්‍යාලය හා කැලණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර සබඳතා විෂය පිළිබඳ ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධි පාඨමාලාව සාර්ථකව හදාරා නිමකළ ශිෂ්‍යයන් එම විෂයය පිළිබඳව වසර තුන හතරක පමණ කාලයක් තුළ පුළුල් හැදෑරීමක් කර ඇති බැවින්, ඔවුන්ගේ දැනුම හා හැකියාව විදේශකටයුතු අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට දැනට යම් ක්‍රමවේදයක් තිබේද;

(ii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම පාඨමාලාවන් සාර්ථකව නිම කළ ශිෂ්‍යයන් ඔබ අමාත්‍යාංශයට බඳවාගෙන ඇත්නම්, ඔවුන් පිළිබඳ තොරතුරු ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී එම උපාධිධාරීන් ඔබ අමාත්‍යාංශයට බඳවා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்புப் பல்கலைக்கழகம் மற்றும் களனி பல்கலைக்கழகத்தினால் நடத்தப்படும் சர்வதேச நல்லுறவு விடயப்பரப்புப் பற்றிய முதலாவது பட்டம் மற்றும் பட்டப்பின் பாடநெறியை வெற்றிகரமாக நிறைவு செய்துள்ள மாணவர்கள் இவ்விடயப்பரப்புப் பற்றி மூன்று நான்கு ஆண்டுகள் விரிவாகக் கற்றுள்ளனரென்பதால், இவர்களின் அறிவு மற்றும் ஆற்றலை வெளிநாட்டலுவல்கள் அமைச்சுக்குப் பெற்றுக் கொள்வதற்கான ஏதேனும் முறைமை தற்போது காணப்படுகின்றதா என்பதையும்;

(ii) தற்போதைய நல்லாட்சி அரசாங்கம் ஆட்சி யேற்ற பின்னர் மேற்படி பாடநெறியை வெற்றி கரமாக நிறைவுசெய்த மாணவர்கள் தங்களு டைய அமைச்சுக்கு ஆட்சேர்க்கப் பட்டுள்ளார் களாயின், இவர்கள் பற்றிய தகவல்களைப் பெற்றுக் கொடுப்பாரா என்பதையும்;

(iii) இன்றேல், எதிர்வரும் காலத்தில் மேற்படி பட்டதாரிகளைத் தங்கள் அமைச்சுக்கு ஆட்சேர்ப் பதற்குப் பொருத்தமான முறைமையொன்றைத் தயாரிக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House-

(i) whether there is a mechanism to obtain the knowledge and skills of the students who have successfully completed the first degree and postgraduate courses in International Relations conducted by the Universities of Colombo and Kelaniya for the Ministry of Foreign Affairs, since they have undergone an in-depth study of the subject for three to four years;

(ii) whether the students who successfully completed those courses have been recruited to your Ministry following the present Good Governance Government came into power and whether information about them will be provided; and

(iii) if not, whether measures will be taken to prepare a suitable mechanism to recruit those graduates to your Ministry in the future?

(b) If not, why?

ගරු තිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப் பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Development Assignments and Minister of Foreign Affairs)

Sir, I table* the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Under the present Scheme of Recruitment of the Sri Lanka Foreign Service (SLFS), opportunities are available for those who have studied the subject of International Relations at undergraduate and at post-graduate levels to enter the Foreign Service. The new Scheme of Recruitment to join SLFS is geared to attract the best available Sri Lankan talent and capture those candidates who possess relevant qualifications and aptitude to be a diplomat representing Sri Lanka.

In doing so, those who have qualified in international relations are at an advantage at the Foreign Service recruitment examination. Further, the new Scheme of Recruitment aims to capture the aspirations and career goals of those students who study subjects such as International Relations with the intention of joining the Foreign Service.

Through the structured interview/viva voce the applicants are further tested on their practical knowledge, and applicability of academic knowledge through systematic and transparent processes. Training in International Relations of university level can be useful to perform well at their interview.

It is also to be noted that form time to time the Ministry offers short internship programmes for undergraduate students reading for specialized degrees in International Relations. Whilst this endeavor is mainly for the students to familiarize themselves with the Ministry, it provides opportunities for students to interact and engage with the Ministry officials on international relations related issues.

(ii) Among the officers recruited in 2015, following competitive examination conducted by the Department of Examinations, only two officers with a Degree in International Affairs were able to get selected and one such officer selected has followed the postgraduate degree in the same subject. The details are as follows:

i	Ms. Buddhika Wimalasena	Postgraduate Degree in International Relations	University of Colombo
ii.	Ms. P.G.P. Kaushalya	Degree in International Relations	University of Colombo
iii.	Ms. Nirosha Kumari Herath	BA Special Degree in International Studies	University of Kelaniya

(iii) Not applicable.

(b) Does not arise.

වාද්දුව-මොරොන්තුඩුව මාර්ගය සංවර්ධනය කිරීම : වන්දි

வாத்துவ - மொரொந்துடுவ வீதி அபிவிருத்தி: இழப்பீடு

DEVELOPMENT OF WADDUWA-MORONTHUDUWA ROAD: COMPENSATION

2434/'17

12. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)

(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)

(The Hon. Udaya Prabhath Gammanpila on behalf of the Hon. Jayantha Samaraweera)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, වාද්දුව හන්දියේ සිට, මොරොන්තුඩුව හන්දිය දක්වා දිවෙන වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉඩම් හා දේපළ අහිමිවන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම, ලිපිනය, අහිමි වන ඉඩම් ප්‍රමාණය හා දේපළවල ස්වභාවය කවරේද;

(iii) ඉඩම් අහිමිවන පවුල් සඳහා වන්දි ගෙවීමට එකී දේපළ හා ඉඩම් මේ වනවිට තක්සේරුකර තිබේද;

(iv) එසේ නම්, වන්දි ගෙවීමට යෝජිත පවුල් සංඛ්‍යාව, පවුල්වල නම, ලිපිනය සහ ගෙවීමට නියමිත වන්දි මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தின் வாத்துவ சந்தியி லிருந்து மொரொந்துடுவ சந்தி வரை செல்லும் வாத்துவ - மொரொந்துடுவ வீதியை அபிவிருத்தி செய்கையில் காணிகள் மற்றும் சொத்துக்களை இழக்கின்ற குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) இவர்களுடைய பெயர், முகவரி, இழக்கின்ற காணியின் அளவு மற்றும் சொத்தின் தன்மை யாவை என்பதையும்;

(iii) காணிகளை இழக்கின்ற குடும்பங்களுக்கு இழப்பீடு செலுத்துவதற்கு அச்சொத்துக்கள் மற்றும் காணிகள் இன்றளவில் விலைமதிப்பீடு செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், இழப்பீடு செலுத்தப்படவுள்ள குடும்பங்களின் எண்ணிக்கை, குடும்பங்களின் பெயர், முகவரி மற்றும் செலுத்தப்பட்டவுள்ள இழப்பீட்டுத் தொகை யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House-

(i) the number of families whose lands and property would be lost as a result of the development of Wadduwa-Moronthuduwa road of Kalutara District from Wadduwa junction to Moronthuduwa junction;

(ii) their names, addresses, extent of land dispossessed and the nature of property;

(iii) whether the said lands and property have been by now assessed in order to compensate the said families; and

(iv) if so, the number of families proposed to be compensated, their names, addresses and the amount of compensation to be paid?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Higher Education and Highways, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු කථානායකතුමනි, අද දින, එනම් 2018 අප්‍රේල් 05 වෙනි බ්‍රහස්පතින්දා "ලක්බිම" පුවත් පතේ එක්තරා ලිපියක සඳහන් වනවා, "ලෝක උරුම නකල්ස් රක්ෂිතයට මායිමේ පිහිටි ඉඩම් අක්කර 21,000ක් හිතවතුන්ට බදු දීලා"යි කියලා. විශේෂයෙන්ම Elkaduwa Plantations Limited එකටත් අයිති මේ ඉඩම් ප්‍රමාණය -අක්කර 21,000ක්- ප්‍රබල දේශපාලනඥයන් දෙදෙනෙකු විසින් බදු දීලා තිබෙනවාය කියලායි සඳහන් වන්නේ. ඒ වාගේම වැවිලි කර්මාන්තයට අදාළ නොවන පදිංචි වීම් සඳහා මෙම ඉඩම් කට්ටි බෙදා දීම් සිදු කරමින් පවතින බවත් ප්‍රකාශ කර තිබෙනවා. ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ අධ්‍යක්ෂතුමා තමයි මෙසේ ප්‍රකාශ කර තිබෙන්නේ. ඒ පිළිබඳව ගරු පාර්ලිමේන්තුවෙන් පිළිතුරක් අපේක්ෂා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ ලිපිය Lanka C News එකේ තිබෙනවා මා දැක්කා. මමත් මේවා බලනවා. Lanka C News එකේ -ඒ කියන්නේ, විමල් වීරවංශ මහතාගේ website එකේ- තිබුණු එකක් ගැන තමයි මේ මන්ත්‍රීතුමා ඇහුවේ. මේක අමූලික බොරුවක්. ලාභ නොලබන වතු පෞද්ගලික සමාගම්වලට පැවරීම සඳහා භාණ්ඩාගාරයෙන් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවෙන් නිර්දේශ කරලා තිබෙනවා, සමහර වතු -ලාභ නොලබන වතු- පෞද්ගලික අංශයට දෙන්නය කියලා. ලාභ ලබන වතු දෙන්නේ නැහැ. නමුත් අපි තවම එවැනි කිසිම පියවරක් ගෙන නැහැ. මේවා පට්ටපල් බොරු. Websitesවල තිබෙන ඒවා ගැන මේ ගරු සභාවේ අහනවා. මේවා පට්ටපල් බොරු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. The Hon. Minister has replied. ගරු මන්ත්‍රීතුමනි, හරි.

ගරු බිමල් රත්නායක මැතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 22.(3) සම්බන්ධයෙනුයි මා මෙම කරුණ අහන්නේ.

ස්ථාවර නියෝග 22.(3) හි මෙසේ සඳහන් වනවා:

"කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටි විස්තරාත්මක ප්‍රකාශයක් කළ හැකි ය. එහෙත් පිළිගැන්වීමේ අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් විවාදයක් නොපැවැත්විය යුතු ය."

ගරු කථානායකතුමනි, ඒ යටතේ මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ ගරු සභානායකතුමාටයි. අද දිනයේදී ඔබතුමන්ලා ශීර්ෂ රාශියක් යටතේ පරිපූරක ඇස්තමේන්තු කිහිපයක් table කරලා තිබෙනවා. ඒ සියල්ලේම එකතුව ගත්තොත්, රුපියල් මිලියන 7,000ක පමණ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළ රුපියල් ලක්ෂ 41ක් වෙන්කර තිබෙන්නේ විශේෂ කාර්යභාර අමාත්‍යාංශය මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වාහනයේ බදු කුලී වියදම් වෙනුවෙනුයි. මේ විශේෂ කාර්යභාර පිළිබඳ ඇමතිවරයා පසුගිය කාලය තුළ රට වෙනුවෙන් මොනවාද කළේ, වාහනයක් අවශ්‍ය වෙන්නේ ඇයි කියලා අපට කියන්නට ඕනෑ.

දෙවෙනි කාරණය ඉතාම විශේෂයි, ගරු කථානායකතුමනි. අපි මේ සම්බන්ධයෙන් පසුබිම් වාර්තාවක් ඉල්ලා සිටිනවා. 2018 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ෂැන්ග්‍රි-ලා හෝටලය සඳහා යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු හිඟ ගිවිසුම්ගත බැඳීම් නිරවුල් කිරීම වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන සැලසීම සඳහා තමයි තවත් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු කථානායකතුමනි, රාජපක්ෂ පාලනයෙන් මේ ඉඩම සින්නක්කරව ෂැන්ග්‍රි-ලා එකට දුන්නා. දැන් මෙතුමන්ලා ෂැන්ග්‍රි-ලා එකේ කටයුතු සඳහා රජයෙන් මුදල් ගෙවන්නේ ඇයි කියලා මා දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය table කරන්න. දැන් පිළිතුරු දෙන්න බැහැනේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තවත් කාරණයක් තිබෙනවා ගරු කථානායකතුමනි. මා තත්පර -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා table කරන්න. Hon. Leader of the House, will you reply?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය නම්, මේ සම්බන්ධයෙන් විවාදයක් දෙන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විවාදයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අපේ කණ්ඩායම් නායක රැස්වීමේදී ඉල්ලන්නම්. ඊට වඩා ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා, -ඒකත් අපි ඉල්ලන්නම්- මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න. උදාහරණයක් වශයෙන්, රාජ්‍ය ඇමතිවරයෙකුට වාහනයක් ගන්න රුපියල් මිලියන 43යි; අග්‍රාමාත්‍යවරයාගේ ආරක්ෂාව සඳහා වාහන ගන්න රුපියල් මිලියන 10යි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා ඒ ගැන සොයා බලා කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
මා ඒක තමයි පැහැදිලි කළේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத්நாயக්க)
(The Hon. Bimal Rathnayake)

නැහැ. නැහැ. පැහැදිලි කිරීම ඒක නොවෙයි. උදාහරණයක් වශයෙන්, ෂැන්ග්‍රි-ලා එක වෙනුවෙන් රුපියල් මිලියන 342ක් දෙන්නේ මොකටද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කෙටියෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමාට අවශ්‍ය නම් විවාදයක් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයේ විස්තර පසුව ඉදිරිපත් කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඊයේ වෙවුල-වෙවුලා හිටියේ මේ වාගේ වැරැදි නිසායි. විශේෂ කාර්යභාර ඇමතිතුමාට ගෙවන්නේ සභානායකතුමාගේ සල්ලිද? විශේෂ කාර්යභාර ඇමතිවරයෙක් මොකටද? මේ සල්ලි ගෙවන්නේ ඇයි? ඒ ගැන අහන්න අපට අයිතියක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We have given a brief description of the allocation. If they want, we can give a Debate.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Debate එකකට වඩා ඔබතුමාට වගකීමක් තිබෙනවා. රටේ සල්ලි නේ මේ නාස්ති කරන්නේ. රුපියල් මිලියන 7,000ක්!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට දැන් ඒ විස්තර දෙන්න අමාරුයි නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් එපා. දැන් දෙන්න බැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කළේ රජය වෙනුවෙනුයි. ඊයේ විශ්වාස භංග යෝජනාව පැරදිලා තරහ ගිහින්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා ඒ විස්තර ඉදිරිපත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විශ්වාස භංග යෝජනාව පැරදිලා තරහ ගිහින් අපට බණිනවා. විශ්වාස භංග යෝජනාව පැරදුණාට අපි පළි නැහැ; අපි පළි නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී, පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත
தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம்
NATIONAL DEFENCE FUND (AMENDMENT) BILL

"1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ)"

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා විසිනි.

2018 අප්‍රේල් මස 19 වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 ஏப்பிரல் 19, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Lakshman Kiriella, on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත
பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம்
PRADESHIYA SABHAS (AMENDMENT) BILL

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ)"

පිළිගන්වන ලද්දේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා විසිනි.

2018 අප්‍රේල් මස 19 වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பாக மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 ஏப்பிரல் 19, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Lakshman Kiriella, on behalf of the Minister of Provincial Councils and Local Government; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා මෝටර් වාහන පනත යටතේ නියෝග 03ක් අනුමත කිරීමට තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, Item No. 4, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත අපි අද දින විවාදයට ගන්නේ නැති බව කලින්ම ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන්න කැමැතියි. නැත්නම් ඒ ගැන කථා කරලා නිරපරාදේ කාලය නාස්ති වේවි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව අනුව ඒකට සංශෝධන කිහිපයක් ගෙනෙන්න තිබෙනවා. ඒ සංශෝධන සකස් කළායින් පසුව අපි එය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් අංක 1 සිට 3 දක්වා විෂයයන් පෙර වරු 11.30 සිට පස් වරු 12.30 වනතුරු සාකච්ඡාවට ගනිමු. පස් වරු 12.30ට අවසන් කරමු. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකුත් තිබෙනවා. අද Party Leaders' Meeting එකකුත් පැවැත්වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, Then, we will have the Party Leaders' meeting at. 12.30 p.m.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
There is an EU delegation which I am supposed to meet from 12.00 to 2.00 p.m. Shall we have the Party Leaders' Meeting at 2.00 p.m.? එතකොට පස් වරු 1.30ට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගන්න වෙනවා.[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the Hon. Member who is to move the Adjournment Motion today, says that it can be withdrawn.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then that can be withdrawn. එහෙම නම් පස් වරු 12.30ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න පුළුවන්. එහෙම නම් Party Leaders' Meeting එක පෙර වරු. 11.30ට ගනිමුද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
It is fine, if we can have it at 12.30 p.m., Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
At 11.30 a.m. I can, because from 12 to 2 p.m., I will be involved with the EU delegation. We can meet at 11.30 a.m. if you all agree.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, there is a meeting chaired by the Prime Minister at 11.30 a.m.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, we will make it at 2.00 p.m.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Okay.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. එහෙම නම් ගරු සභානායකතුමා යෝජනා 1, 2, සහ 3 ඉදිරිපත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move Item Nos. 1, 2 and 3.

මෝටර් වාහන පනත : නියෝග
மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
MOTOR TRAFFIC ACT: REGULATIONS

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, on behalf of the Minister of Transport and Civil Avation, I move,

"That the Regulations made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Sections 8, 14 and 30 of the aforesaid Act relating to Motor Traffic (Fees) Regulations and published in the Gazette Extraordinary No. 2054/6 of 15th January 2018, which were presented on 20.03.2018, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

[පූ.භා. 11.03]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෝටර් වාහන පනත යටතේ නියෝග තුනක් ඉදිරිපත් කර තිබෙනවා. 2018 ජනවාරි 15 දිනැති අංක 2054/6

දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, අංක 2054/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සහ 2054/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන්ම මේ නියෝගවලින් කියැවෙන්නේ පසු ගිය 2017 අය වැයෙන් ගරු මුදල් ඇමතිතුමා මේ රටට හඳුන්වා දුන් ත්‍රිරෝද රථ වෙනුවට භාවිත කළ හැකි රෝද හතරේ වාහනයක් හඳුන්වා දීම පිළිබඳවයි. ඒ වාහනය අපේ රටේ නීති පද්ධතියට ඇතුළත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා ඒ වාහනයට නමක් යොදලා, එය අපේ රටේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ඒ නීති පද්ධතියට ඇතුළත් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ වාගේම "මෝටර් නිවස" නමින් අලුත් වාහන පද්ධතියක් හඳුන්වා දීම සඳහා තමයි මෙම අති විශේෂ ගැසට් පත්‍රය ඉදිරිපත් කර තිබෙන්නේ. ත්‍රිරෝද රථය හා සමානකමකින් යුක්ත රෝද හතරේ වාහනය, "quadricycle" නමින් හඳුන්වලා දීලා තිබෙනවා. ඒ වාගේම "මෝටර් නිවස" යන නමින් හඳුන්වා දීලා තිබෙන්නේ, ඉංග්‍රීසි භාෂාවෙන්, "caravan" කියන වාහනය සම්බන්ධ කරගෙන, ඒකේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේ නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කථා කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම වාහන වර්ග දෙක අපේ නීති පද්ධතියට ඇතුළත් කරලා වාහන පද්ධතියට හඳුන්වාදීම සඳහා තමයි මෙම අතිවිශේෂ එක් ගැසට් පත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ "quadricycle" නමින් හඳුන්වන වාහනය ත්‍රිරෝද රථයකට සමාන නමුත් රෝද හතරේ වාහනයක්. මේ වාහනය 199cc, 499cc යි අතර තිබෙන වාහනයක්. මේ වාහනය ලියා පදිංචි කිරීමට අවශ්‍ය මුදල කොපමණද, රක්ෂණය සඳහා අවශ්‍ය මුදල කොපමණද යන කරුණු සියල්ලම මෙම ගැසට් පත්‍රයේ සඳහන් වෙනවා. ඒ වාගේම තවත් ගැසට් පත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම වාහනය අධිවේගී මාර්ගවලට ඇතුළත් නොකරන්න. ඒක නිසා අධිවේගී මාර්ග පනතේත් සංශෝධනයක් සිදු වනවා, අද දවස තුළ. ඒ වාහනය අධිවේගී මාර්ගවලට ඇතුළත් නොවිය යුතුයි කියන ගැසට් පත්‍රයත් මේ සමඟ ඉදිරිපත් කරලා තිබෙනවා.

එම වාහන දැනට ලංකාවේ විශාල ප්‍රමාණයක් නැහැ. පහක් පමණ ප්‍රමාණයක් තමයි ලංකාවට දැනට ගෙනැල්ලා තිබෙන්නේ. ත්‍රිරෝද රථ වෙනුවට රෝද හතරේ මෙම වාහනය ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා ඉදිරියේදී අපි කටයුතු කරනවා. ඒ වාගේම "මෝටර් නිවස" කියන වාහනයත් ප්‍රචලිත කරන්න ඕනෑ. මේ කාලය මේ රටට සංචාරකයන් බහුලව පැමිණෙන කාලයක්. විශේෂයෙන් දැනට මිලියන දෙකකට අධික සංචාරකයන් ප්‍රමාණයක් පැමිණෙනවා. ඒ සංචාරකයන්ගේ පැමිණීමත් සමඟ ඔවුන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් තමයි ඒ "මෝටර් නිවස" කියන වාහන පන්තිය අපි හඳුන්වලා දීලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපි අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මේ නියෝග සම්මත කිරීමට අනුමැතිය පතනවා.

තවත් එක් ගැසට් පත්‍රයක් තිබෙනවා. 2017 අය වැයේදී යෝජනා වුණා, දඩ මුදල් වැඩි කිරීමට. ඒ වෙලාවේ සමාජයේ කථිකාවක් ආවා, සමහර දඩ වර්ග සඳහා දඩ මුදල රුපියල් 25,000ක් දක්වා වැඩි කළ යුතුයි කියලා. විශේෂයෙන්ම 2017 අය වැයේදී රුපියල් 2,500කින් දඩ මුදල් වැඩි කළ යුතුයි කියන යෝජනාවේදී එවකට හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමා සමඟ අපි සාකච්ඡාවක් තිබුණා. රුපියල් 2,500කින් වැඩි කරන්න විරුද්ධ වුණු පුද්ගලික බස් රථ හිමියන්ගේ සංගම් සහ වෙනත් සංගම් ඇවිල්ලා අපිත් සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේදී තමයි මේ රුපියල් 25,000 දඩ පැනවීමේ ප්‍රශ්නය පැන නැඟුණේ.

අප මේ ගැන සාකච්ඡා කරද්දී එක් පෞද්ගලික බස් රථ සමාගමක් කිව්වා, බීමතින් රිය පැදවීම ආදි ඒවාට නම් රුපියල් 25,000ක වාගේ දඩයක් ගැහුවත් කමක් නැහැ කියා. අන්න ඒ තුළින් තමයි රුපියල් 25,000 කතිකාව සමාජයට ආවේ. නමුත් අතිගරු ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා, මේ පිළිබඳව සමාලෝචනය කරන්න. ඒ කමිටුවේ නිර්දේශ දෙකක් -දඩ වර්ග හඳුන්වා දීමට සහ ඒ දඩ මුදල් අය කිරීමට,- ලැබී තිබුණා. ඒ නිසා නැවත ඒ කමිටුව මඟින් නව දඩ වර්ගත් සමඟ දඩ වර්ග 33ක් හඳුන්වා දී තිබෙනවා. ඒ 33ට අදාළව මෝටර් රථ වාහන වැරැදි, මාර්ග වැරැදි 33ක් හඳුන්වා දී තිබෙනවා. ඒ වැරැදි 33 වෙනුවෙන් අය කරන ස්ථානීය දඩ මුදල් මෙම ගැසට් පත්‍රයේ සඳහන් වනවා. විශේෂයෙන්ම රුපියල් 25,000ක් දක්වා පැවැති දඩ මුදල - සමාජයේ එදා පැවැති ඒ සාකච්ඡාව, කතිකාව අනුව යෝජිත දඩ මුදල- ඉහත කී කමිටුව මඟින් රුපියල් 3,000 දක්වා අඩු කර තිබෙනවා. දැනට ස්ථානීය දඩයක් ලෙස උපරිම වශයෙන් රුපියල් 3,000ක් තමයි තිබෙන්නේ. ඒ වැරැදි 33ට අදාළව උපරිම දඩය ලෙස තිබෙන්නේ රුපියල් 3,000යි; අවමය රුපියල් 500යි. වැරැදි සඳහා රුපියල් 500 සිට රුපියල් 3,000 දක්වා ස්ථානීය දඩ මුදල් අය කරන්න අද මේ පාර්ලිමේන්තුවේ අවසරය, අනුමැතිය ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප මේ දඩ මුදල් සංශෝධනයෙන් විශේෂයෙන්ම බලාපොරොත්තු වනවා, විනයගරුක රියැදුරන් බිහි කිරීම, මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සහ මාර්ගයේ ගමන් කරන අයගේ ජීවිත ආරක්ෂා කිරීම ආදිය. එවැනි දේවල් තමයි මෙම දඩ මුදල් වැඩි කිරීම තුළින් අප විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ.

විශේෂයෙන්ම දඩ වර්ග 7ක් ගැන ඒ කාලයේ -2017 අය වැයෙන් පසුව,- මේ රටේ සමාජ කථිකාවතක් ඇති වුණා. බීමතින් රිය පැදවීම, අධික වේගයෙන් රිය පැදවීම, රියැදුරු බල පත්‍රයක් නොමැතිව රිය පැදවීම, ආරක්ෂණ ආවරණයක් නොමැතිව රිය පැදවීම, දුම්රිය ගේට්ටුව වසා තිබියදී දුම්රිය හරස් මාර්ගයකින් දුම්රිය මාර්ගයට අනවසරයෙන් වාහනය ඇතුළු කිරීම, වමෙන්

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ඉස්සර කිරීම කියන වැරදි 7 පිළිබඳව තමයි විශේෂයෙන්ම එහිදී සාකච්ඡා වුණේ. ඒ කෙසේ වෙතත්, අතිගරු ජනාධිපතිතුමා පත් කළ කමිටුවේ නිර්දේශ මත තමයි වැරදි 33ක් හඳුනාගෙන ඒවා සඳහා දඩ නියම කර තිබෙන්නේ. මම හිතනවා, මේ ස්ථානීය දඩ නියම කිරීම තුළින් අපේ රටේ විනයගරුක රියැදුරන් බිහි වෙලා, අපේ රටේ මඟීන්ගේ ආරක්ෂාව තහවුරු කරන වැඩ කටයුතු සාර්ථකව කර ගන්න පුළුවන් වේවි කියා.

මා මුලින් කිව්වා වාගේ නව වාහන පන්ති දෙක හඳුන්වා දීම තුළින් අපේ රටට පැමිණෙන සංචාරකයන්ට පහසුවක් වනවා. පිටරටවල භාවිත කරන "caravan" නමින් හඳුන්වන වාහනය තමන්ට පාවිච්චි කරන්න පුළුවන් දෑ -ඇඳන් සහිතව- පිටුපස අමුණාගෙන යා හැකි වාහනයක්. මෙතැන සිටින අපේ මන්ත්‍රීවරුන්ගෙන් හුඟ දෙනෙක් පිට රටවල ගිහින් තිබෙනවා. මම හිතන විධියට අපේ රටේත් සමහර ආයතනවලින් දැනටත් එවැනි වාහන නිෂ්පාදනය කර තිබෙනවා වාගේම ඒවා ආනයනය කර තිබෙනවා. ඒ තුළින් මේ රටට එම නව වාහන පන්තිය හඳුන්වා දීම තමයි අපි සිද්ධ කරන්නේ. මෙම හඳුන්වා දීම තුළින් විශේෂයෙන්ම "quadricycle" කියන වාහනය මේ රටේ ජනතාව අතර ඉතාමත්ම ජනප්‍රිය වෙයි කියලා මම හිතනවා. මක් නිසාද, එය ත්‍රිරෝද රථය වෙනුවට පාවිච්චි කළ හැකි රෝද හතරේ කුඩා වාහනයක්. සාමාන්‍යයෙන් එම රෝද හතරේ කුඩා වාහනයේ 4දෙනෙක්, 5දෙනෙක් අතර පිරිසකට ගමන් කරන්න පුළුවන්. විශේෂයෙන්ම එම "quadricycle" කියන වාහනය 199 cc‍ත්, 499 cc‍ත් අතර තිබෙන වාහනයක්. සාමාන්‍ය පුද්ගලයෙකුට මෙම රථය භාවිතයට ගන්න පුළුවන්. මීලත් ඉතාම අඩුයි. ඉදිරියේදී මෙම වාහනය ජනප්‍රිය වෙයි කියලා මම හිතනවා. අදින් පසුව මෙය මේ රටේ වාහන පද්ධතියේ නීතියක් බවට පත් වුණාම, එම "quadricycle" කියන වාහනය මේ රටේ ජනතාව අතර ඉතාම ජනප්‍රිය වෙයි කියලා අපි හිතනවා.

මම මුලින් කිව්වා වගේ මෙම වාහනය අධිවේගී මාර්ගවලට ඇතුළත් කරන්න අවසර දෙන්නේ නැහැ. අධිවේගී මාර්ගවලට ඇතුළත් කිරීම තහනම් කිරීම සඳහාත් අද නියෝග ඉදිරිපත් කර තිබෙනවා. මොකද, දැනටමත් ත්‍රිරෝද රථ අධිවේගී මාර්ගවල ගමන් කරන්න බැහැ. එම වාහනය ත්‍රිරෝද රථයට සමාන රෝද හතරේ වාහනයක් නිසා අධිවේගී මාර්ගයට ඇතුළත් කිරීම මේ මඟින් තහනම් කර තිබෙනවා. එම නිසා අද සිට එය ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම 2018 ජනවාරි 15වැනිදා තමයි මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය ඉදිරිපත් කළේ. ඒ තුළින් හඳුන්වා දී තිබෙන වැරදි වර්ග 33 සඳහා නව දඩ මුදල් අය කිරීම අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මම මුලින් කිව්වා වගේ මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම තුළින් විනය ගරුක රියැදුරන් බිහි කරලා, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව තුළින් මේ රටේ රිය අනතුරු අවම කිරීම සඳහා විශාල වැඩ කොටසක් කරනවා. මොකද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව අයත් වෙන්නේත් අපේ අමාත්‍යාංශයට. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ තිබුණු යුද්ධයෙන් මිය ගියාට වඩා වැඩි ප්‍රමාණයක් රිය අනතුරු නිසා මිය යනවා. රිය අනතුරු නිසා සාමාන්‍යයෙන් දවසකට 7දෙනෙක්, 8දෙනෙක් පමණ මිය යනවා. එම නිසා අපි කොපමණ නීති දැම්මත්, විනය ගරුක රියැදුරෙක් බිහි වුණේ නැත්නම්, එම රියැදුරා අතින් වැරදි සිදු වීමට ඉඩ තිබෙනවා. එම නිසා අපේ මෝටර් රථ දෙපාර්තමේන්තුව තවත් වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ත්‍රිරෝද රථ සඳහා රියැදුරු බලපත්‍ර ඉල්ලුම් කරන අයට දවසක වැඩ මුළුවක් පවත්වලා, එම වැඩ මුළුවෙන් සමත් වන අයට සහතික පත්‍රයක් දීමෙන් පසුව තමයි ඔවුන්ට රියැදුරු බලපත්‍රය ලබාදෙන්න බලාපොරොත්තු වෙන්නේ.

ඉදිරි කාලයේදී ජාත්‍යන්තර රියැදුරු බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමටත් අපි බලාපොරොත්තු වෙනවා. කෙනෙක් වැරදිදක් කළාම ලකුණු අඩුවීමේ ක්‍රමයක් සකස් කරලා, වැරදි වැඩියෙන් කරන අයගේ ලකුණු අඩු කරලා ඔහුට රියැදුරු බලපත්‍රය අහිමි කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපි එවැනි පනතක් සම්මත කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ඒ නිසා මෙවැනි නියෝගවලින් අපි බලාපොරොත්තු වෙන්නේ මේ රටේ සිදු වන රිය අනතුරු අවම කරලා, ජනතාවගේ ජීවිත සුරක්ෂිත කරලා විනයගරුක රියැදුරන් බිහි කිරීමයි. එම නිසා මම අද අපේ පාර්ලිමේන්තුවේ අනුමැතිය මේ සඳහා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ස්තුතියි.

මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කථා කරන්න.

[පූ.භා. 11.14]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝගයන් තුනක් ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදන සම්බන්ධයෙන් කරුණු කීපයක් කියන්න කැමැතියි. පළමුවැනි එක තමයි, මෝටර් රථ නීති ශක්තිමත් කරන එක. පාරේ විනය හදන එක සම්බන්ධව මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි දැනගන්න කැමැතියි, ඔබතුමාගේ ඇමතිතුමා කොහෙද කියලා. ඊයේ ඉඳලා එතුමා හොයා ගන්න නැහැ. පාර්ලිමේන්තුවට මෙවැනි නියෝග ඉදිරිපත් කරන කොට අදාළ ඇමතිවරයා ලංකාවේ ඉන්නවා නම් සාමාන්‍යයෙන් අපි දන්න විධියට ඒ ඇමතිවරයා තමයි මේවා ඉදිරිපත් කරන්නේ. ඔබතුමාට මේ කටයුතු දිගටම කරගෙන යන්න ලැබේවි කියලා අපි හිතනවා. ඒ වාගේම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේත් සභාවේ තනතුර ඉහළ යයි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ මේ නව ස්ථානීය දඩ යටතේ 33වැනි එක දාලා තිබෙනවා, "විමෝචන සහතිකය හෝ යෝග්‍යතා සහතිකය වාහනයේ තබා ගැනීමට අසමත්වීමට දඩයක් ගහනවා" කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විමෝචන සහතිකය - දුම් සහතිකය- ඉදිරිපත් කරලා තමයි අපි licence එක ගන්නේ. දුම් සහතිකය නැතිව licence එක ගන්න බැහැ නේ. දුම් සහතිකය ඉදිරිපත් කරන්න ඕනෑ, insurance certificate එක ඉදිරිපත් කරන්න ඕනෑ, ඉන් පසුව තමයි අපට licence එක හම්බ වෙන්නේ. Licence එක තිබෙනවා නම්, ආයෙත් මොකටද, මිනිස්සු මේ විමෝචන සහතික උස්සාගෙන යන්නේ?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක මීට පෙරත් තිබුණා. විමෝචන සහතිකය තමන් ළඟ තබා ගැනීම අනිවාර්ය කරලා තිබුණා. හැබැයි, මින් ඉදිරියට දුම් සහතිකය තමන් ළඟ නොතිබුණොත්, මේ පනත මඟින් රුපියල් 500ක දඩයක් නියම කරලා තිබෙනවා. මොකද, ඒක ළඟ තිබීම අනිවාර්යවීමක් බලාපොරොත්තු වෙලා තිබුණා. මීට කලින් මේකට සංශෝධන ඉදිරිපත් කරපු වෙලාවේත් මේ සම්බන්ධයෙන් කවුරුවත් විරුද්ධ වුණේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කවුරුවත් විරුද්ධ වෙන එක ගැන නොවෙයි මම අහන්නේ. මේ රෙගුලාසි ඉදිරිපත් කරන්නේ ඇමතිවරයා විධියට ඔබතුමා නේ. ඔබතුමාට තර්කයක් තිබෙන්න ඕනෑ නේ, licence එක ගන්න දුම් සහතිකය ඕනෑ නම්, දුම් සහතිකය ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය ද, නැද්ද කියලා. අපට licence එක ගන්න මේ දුම් සහතිකය අවශ්‍ය නම්, ඒකට අදාළ කරන supporting documents මිනිස්සු උස්සාගෙන යන්න ඕනෑ නැහැ නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

දුම් සහතිකය වාහනය ඇතුළේ තිබුණාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

වාහනය ඇතුළේ තවත් දේවල් තියා ගන්න පුළුවන්. මම කියන්නේ ඒකයි, ඔබතුමන්ලා තර්කානුකූල නැහැ. ඔය විධියට තර්ක කළොත්, අපි passport එක අරගෙන යනකොට Immigration and Emigration Department එකට කියන්න පුළුවන් නේ, "ඔයාගේ application එකයි, ඔයාගේ photo එකයි, ග්‍රාමසේවක සහතිකයයි අරගෙන එන්න." කියලා. ඇයි මේ විධියට මිනිසුන්ට වද දෙන්නේ? අනෙක් නීති-රීති සම්බන්ධයෙන් අපට විශේෂ විවේචනයක් නැහැ. සාධාරණව යම් ආකාරයක දඩ තිබෙන එකට අපේ විවේචනයක් නැහැ. වැරදිවලට යම් ප්‍රමාණයක දඩයක් කොහොමත් තිබෙන්න ඕනෑ නේ. නමුත්, මේවාගේ දේවල් ගත්තාට පස්සේ මොනවාද මේ? මෙවැනි දේවල් නිසා තමයි මිනිසුන්ට නීති රකින්න එපා වෙන්නේ. - [බාධා කිරීමක්] - ඒක මහ ලොකු දෙයක් නොවෙයි තමයි. -[බාධා කිරීමක්]- ඒක තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේවා අයින් කරන්න.

මිනිසුන්ට වද දෙන්න අවශ්‍ය නැහැ නේ. පාරේ විනය හදන්න නේ ඕනෑ. ඊට පස්සේ වන්නේ මොකක්ද? මේවාට තමයි මිනිසුන්ට පොලීසියෙන් දඩ ගහන්නේ. මටත් එහෙම සිද්ධියක් වෙලා තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ, ඒ වාහනයේ ඒක තිබුණා. මම ඒක එතුමාට දුන්නා. මීට අවුරුදු ගණනකට කලින්. "ඇයි මෙක අවශ්‍ය වෙන්නේ?" කියලා මම ඇහුවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

අපි ඒවා වෙනස් කරන්න කටයුතු කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හරි. ඔබතුමාම ඒක වෙනස් කළා.

මම කියන්න යන ඊළඟ කාරණය මේකයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මිනිසුන් කරන වැරදි නිසා ඒවාට දඩුවම් කරන එක නේ දැන් වෙන්නේ. වැරදිවලට දඩුවම් අවශ්‍යයි නේ. නමුත් පාරේ තිබෙන අඩු පාඩුකම් නිසා සිදුවන අනතුරුවලට ඔබතුමන්ලා අමාත්‍යාංශය වශයෙන් වග කියන්නේ නැහැ නේ. පාරේ තිබෙන අඩු පාඩුකම් නිසාත් අනතුරු සිද්ධවෙනවා. මම කියන්නේ පාරවල් හැම එකක්ම කාපට් කර නොනිබීම වාගේ දේවල් නොවෙයි. සමහර අවශ්‍යතාවලට කොළඹ නගරයේ පාරවල් මැද්දෙන් කානු කපා තිබෙනවා. අපි ඒක එපා කියන්නේ නැහැ. නමුත් ආපසු ඒවා හදලා නැහැ. එතකොට මිනිසුන් ගිහින් ඒ කානුවලට වැටෙනවා; වාහන ගිහින් වැටෙනවා. ඒවා ඔබතුමන්ලාගේ පැත්තෙන් කරන වැරදි. එහෙම නම් ඒ නිසා සිදුවන අනතුරුවලටත් මිනිසුන්ට වන්දි ගෙවන්න ඕනෑ.

Highway එකේ සමහර වෙලාවට accidents වෙනවා. ඒවා සිද්ධ වන්නේ ජනතාවගේ වැරැද්දෙන් නොවෙයි. සත්තු පනින නිසායි ඒ සමහර අනතුරු සිදු වන්නේ. Highway එක උඩින් කුරුල්ලෝ පියාඹන එක ආණ්ඩුකට නතර කරන්න බැරි වෙන්න පුළුවන්. නමුත් අපි දන්නවා ඒ මාර්ගවල බල්ලන් වැනි සතුන් පැනීම වාගේ සිද්ධීන් වෙන බව. මම නිශ්චිත සිද්ධියක් දන්නවා. ඒ, නරියෙක් පැනලා වුණු හානියක්. එතකොට වාහනය accident වෙනවා. ඒ වැරැද්ද කාටද? ඒ නිසා, highwaysවල; අඩු ගණනේ "ඒ" සහ "බී" ශ්‍රේණියේ මාර්ගවල - ඒවා ගැන මධ්‍යම ආණ්ඩුවෙන් බලනවා නේ.- තිබෙන විශේෂ වැරැදි, විශේෂ අඩු පාඩුකම් නිසා සිද්ධ වන වැරැදිවලටත් ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලාගේ පැත්තෙනුත් මිනිසුන්ට යම් වන්දියක් ගෙවන්න ඕනෑ. මොකද ඒවා දැක දැක ඉන්නවා, හදන්නේ නැහැ. අපි පුංචි කාලයේ ඉස්කෝලේ යන කොට පාරේ තිබුණු රැල්ල සමහර තැන්වල තවම තිබෙනවා. මට ඒ ගැන හොඳ උදාහරණයක් කියන්න පුළුවන්. වැඩි ඈතක නොවෙයි, කොළඹ High Level පාරේ, අනුලා විද්‍යාලය අසල ගැට්ටක් අවුරුදු විසි ගණනක් තිස්සේ තිබුණා. දැනට මාස දෙකකට කලින් තමයි ඒක අයින් කළේ. ඒ නිසා ඔබතුමන්ලාගේ පැත්තෙන් එවැනි දේවල් සඳහාත් යම් දෙයක් කරන්න. ඒවාටත් ඔය පනතේ බලතල ඇති.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොලීසියේ සමහර නිලධාරි මහත්වරු -හොඳ මහත්වරු ගොඩක් ඉන්නවා- කරන දෙයක් ගැනයි මම ඊළඟට කියන්නේ. පාරේ වේගයෙන් යද්දි හෝ වාහන බලපත්‍රය check කරන්න එතුමන්ලා වාහන නතර කරනවා. හැබැයි එහෙම වාහන නතර කරද්දි, අපි අහලා තිබෙන දේ තමයි - පනතේ තිබෙන්නේ කුමක්ද කියා මම දන්නේ නැහැ- වාහනය එන්නේ පාරේ වම් පැත්තෙන් නම් අදාළ පොලිස් නිලධාරියා සිටිය යුත්තේත් වම් පැත්තේයි. හැබැයි සමහර වෙලාවට පොලිස් නිලධාරියා ඉන්නේ දකුණු පැත්තේ.

ඇත්තටම ගත්තොත්, වාහනයේ රියැදුරු වැරැද්දක් කළාද, නැද්ද කියන එකවත් හරියාකාරව එතුමාට පෙනෙන්නේ නැහැ. නමුත් ජනතාවට ඒවායින් විශාල වශයෙන් හානි පැමිණෙනවා; බාධා පැමිණෙනවා. ඒ නිසා රියැදුරන්ගේ වැරදි සම්බන්ධව කටයුතු කරද්දී පොලීසියේ මහත්වරුන් මෙන්න මෙහෙම කටයුතු කළ යුතුයි කියලා ඔබතුමන්ලා පොලීසිය භාර අමාත්‍යාංශය හරහා හෝ යම්කිසි චක්‍රලේඛයක් නිකුත් කරන්න ඕනෑ.

ඊළඟට, තවත් කාරණයක් ගැන කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් හැම හතරමං හන්දියකම වාගේ නගර සභාවලින්, විවිධ ආයතනවලින් ලොකුවට LED පුවරු සවිකර තිබෙනවා. මම ඒ වාගේ එක සිදුවීමක් සම්බන්ධව කිරුළපන පොලීසියේ Traffic OICට පැමිණිලි කළා. කිරුළපන හන්දියේ බෙස්ලයින් රෝඩ් එක පටන් ගන්නා තැනම advertisements පළ කරනා අති දැවැන්ත LED screen එකක් තිබෙනවා. ඒකේ ආලෝක මට්ටම ඉතාම ඉහළයි. එතැන ඉන්න ඉතාම අමාරුයි. මනුෂ්‍යයෙකුට එතැන traffic එකේ විනාඩි දෙකක් ඉන්න වුණොත්, ඔළුවේ කැක්කුම හැදෙනවා. මම එතැන ඉන්නා traffic police මහත්වරුන් එක්ක කථා කළා. ඒ අයට පිස්සු හැදිලා වාගේ එතැන ඉන්නේ. අධික අලෝකය කියන්නේ දූෂණයක්. ඒක, ආලෝක දූෂණයක්. ඒ නිසා චක්‍රලේඛ වෙනස් කරනකොට, ඒවා ගැනත් බලන්න. ඒ වාගේ තවත් තැන් කිහිපයක් තිබෙනවා. ඒ වාගේම මිනිසුන්ගේ අවධානය ඉතාම නරක විධියට වෙනස් වෙන පරිදි දැන්වීම් පළ කර තිබෙන ස්ථාන තිබෙනවා. ගරු නියෝජ්‍ය

[ගරු බිමල් රත්නායක මහතා]

ඇමතිතුමනි, අන්න ඒ වාගේ දේවල් සම්බන්ධවත් අවධානය යොමු කරන්නය කියලා අපි ඔබතුමාට යෝජනා කරනවා.

අපිට වැඩිපුර මේ වාගේ මාතෘකා සම්බන්ධව කථා කරන්න හම්බවෙන්නේ නැහැ. මොකද, විශ්වාස භංග වාගේ, හොරකම් වාගේ ලොකු ඒවා ගැන තමයි කථා කරන්න වෙන්නේ. ඒ නිසා මේ වාගේ අවස්ථාවකදී තමයි මෙවැනි දේවල් ගැන සැලකිලිමත් වෙන්න කියලා ඔබතුමන්ලාට කියන්න අපිට අවස්ථාව ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, තුන්වැනි කාරණය විධියට මම ඔබතුමාගෙන් යම් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඔබතුමන්ලාගේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය තිබෙන්නේ නුගේගොඩ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතැන මට සමීප ස්ථානයක් නිසා, මට හැමදාම පෙනෙන දෙය තමයි එතැනට පැමිණෙන මිනිසුන් මහා විශාල දුකක් විඳිනවා කියන එක. මිනිසුන් එතැන පෝලිමේ ඉන්නවා. අපි කියන්නේ මේක පෞද්ගලික අංශයට දෙන්න කියලා නොවෙයි. මේක විමධ්‍යගත කරන්න. Medical certificates ලබා ගැනීම සඳහා කොළඹ නගරයේ තව තැන් දෙක-තුනක් ආරම්භ කරන්න. මොකද, මිනිසුන් උදේ ඉඳලා එතැන පෝලිම්වල රස්තියාදු වෙනවා. ඒ වාගේ දේවල් ලොකු දේවල් නොවෙයිනේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේක අධිවේගී මාර්ග හදන්න මහන්සි වෙන තරම් මහන්සි වෙන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒ නිසා ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඔබතුමන්ලාට යෝජනා කරනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, එම යෝජනාව හොඳයි. දිස්ත්‍රික්ක කිහිපයක ඒ වාගේ කාර්යාල තිබෙනවා. අපි ඉදිරියේදී කොළඹ වාගේ විශාල දිස්ත්‍රික්ක තුළ ඒ වාගේ තව කාර්යාල ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අනිවාර්යයෙන්ම කොළඹට නම් තව ඒ වාගේ ස්ථාන තුන-හතරක්වත් ඕනෑ වෙයි. මොකද, එතැනට පැමිණෙන මිනිසුන් අතර විශාල යුද්ධයක් තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අංක 1796/22 දරන ගැසට් පත්‍රය යටතේ කලින් තිබුණු "වෙළෙඳුන් විසින් මෝටර් වාහන විකුණනු ලැබූ දින සිට" කියන කොටස ඔබතුමන්ලා ඉවත් කරලා තිබෙනවා. වාහනයක් ලියා පදිංචි කිරීමේදී "ආනයනය කිරීමේ දින සිට..." කියලා තිබුණු එකට - මෙය වෙළෙඳුන්ට ලැබී තිබුණු යම්කිසි සහනයක් කියලා තමයි මට මේක කියවද්දී තේරුම් ගියේ. මට පෙනෙන විධියට එය ඉවත් කරලා තිබෙනවා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී මා දැනගන්න කැමතියි, ඒකට බලපෑ හේතුව මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා quadricycle කියලා අලුත් වාහනයක් ගැන කිව්වා. එම වාහනයේ අවශ්‍යතාව පිළිබඳව අපව දැනුවත් කිරීමක් කළොත් හොඳයි. ඒ වාගේම මා දැනගන්න කැමතියි, මේ වාහනය ආනයනය කිරීම පිටුපස ඉන්නේ කවුද කියන එක. ඔබතුමා ඒකත් පැහැදිලි කරන්න ඕනෑ. මම මේ වාහනයට විරුද්ධ නැහැ. මට එහෙම පුද්ගලික ප්‍රශ්නයක් කොහෙත්ම නැහැ. හැබැයි, අලුත් වාහනයක් එක්ක ගැසට් වෙනස් වෙලා එනකොට කවුරුහරි ආණ්ඩුවේ ඒජන්තයෙක් ද මේ ව්‍යාපාරය පිටුපස ඉන්නේ කියන එකත් ඔබතුමා පැහැදිලි කරනවා නම් හොඳයි. එම වාහනය ගෙන්වන්න යන සමාගම කවුද කියන කාරණය ඔබතුමා පැහැදිලි කරන්න. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ දේශීය නිෂ්පාදනයක් වශයෙන් මයික්‍රෝ වාහන නිෂ්පාදනය පටන් ගත්තා. පස්සේ ඒක වෙන වෙන පැත්තවලට ගියා. ඒ අතර සමහර අය දූෂණවලටත් සම්බන්ධ වුණා. නමුත් ඒක ලංකාවේ නිෂ්පාදනය කරනකොට අපි දැක්කා, ඒකට විශාල වශයෙන් බාධා කරන්න යම් යම් වෙනත් දේවල් කළ බව. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

තව කාරණයක් ගැනත් මම ඔබතුමාට කියන්න කැමැතියි. මම මෙහිදී පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයේ නිලධාරි මහත්ම මහත්මීන්ට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔවුන් ඉතා මහන්සිවෙලා රිය අනතුරු පිළිබඳව තොරතුරු සොයා දුන්නා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2017 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා ගත්තොත්, රිය අනතුරු 28,388ක් වෙලා තිබෙනවා. ඒකෙන් මරණ 2,120ක් සිද්ධ වෙලා තිබෙනවා. මේ මරණ 2,120න් 805ක්ම සිද්ධවෙලා තිබෙන්නේ යතුරුපැදි අනතුරුවලින්. ලොරි රථවලින් සිද්ධවෙලා තිබෙන අනතුරු 298ක් තිබෙනවා. ත්‍රිරෝද රථ අනතුරු 270යි. අවුරුදු තුනක දත්ත මට ඒ පර්යේෂණ නිලධාරිතුමිය සොයලා දුන්නා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ අවුරුදු තුනේම ගත්තොත්, හැම අවුරුද්දකම වැඩියෙන්ම තිබෙන්නේ -සියයට 40 ගණනක්ම තිබෙන්නේ- මෝටර් සයිකල් අනතුරු. ඊළඟට, තිබෙන්නේ ත්‍රීවීලර් අනතුරු. ඊට පස්සේ තිබෙන්නේ ලොරි රථ අනතුරු. බරපතළ අනතුරුවල තත්ත්වය ගත්තත් එහෙමයි. අනතුරු වළක්වා ගන්න රියැදුරන් පුරුදු කිරීම සම්බන්ධ වැඩමුළුවක් කරනවා කියලා ඔබතුමා කිව්වා. ඇත්තටම මෝටර් සයිකල් අනතුරු සම්බන්ධව ඔබතුමන්ලා සොයා බැලුවොත්, මෝටර් සයිකල් අනතුරුවලට සැලකිය යුතු වශයෙන් හේතු වෙනවා, මහා මාර්ගවල තත්ත්වය. රියැදුරන්ගේ නොසැලකිල්ල කියන කාරණය කොහොමත් පොදුයි. මෝටර් සයිකල් අනතුරුවලට බලපාන ප්‍රධාන හේතුවක් තමයි පාරේ තත්ත්වය. පාරේ පොඩි වෙනසක් තිබුණත් ඒ නිසා මෝටර් සයිකලය අනතුරට ලක් වෙනවා. නිතර අනතුරු සිද්ධවන ස්ථාන සම්බන්ධයෙන් ඔබතුමන්ලා කරන්නේ "අනතුරුදායකයි" කියලා බෝඩ් එකක් ගහන එක. ඒවා ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.26]

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා වැදගත් මෙන්ම කාලෝචිත විෂයයක් සම්බන්ධව සාකච්ඡා කරන මේ අවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරීමට මටත් අවස්ථාවක් සලසා දීම ගැන ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා. අපේ රජය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය තුළින් පසුගිය කාලයේ වැදගත් අණ පනත් කිපයක්ම ඉදිරිපත් කරමින් මේ ක්ෂේත්‍රයට යම් සේවාවක් කරන්නට ක්‍රියා කරපු අපේ ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය අමාත්‍ය ගරු අශෝක් අබේසිංහ මැතිතුමාටත් මම විශේෂ ස්තුතිය පුද කරනවා. එතුමා ප්‍රායෝගික අත්දැකීම් ඇතිව මෙම අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව අවධානය යොමු කරමින් ක්‍රියා කිරීම ඉතාම වැදගත් කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ නියෝගවලින් දඩ මුදල් අඩු කිරීම සඳහාත් යෝජනා කර තිබෙනවා. පසුගිය කාලයේ දඩ මුදල් අධික ලෙස

වැඩි කිරීම නිසා සමාජයේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා. එම නිසා ඒ දඩ මුදල් අඩු කරන්නට අවශ්‍ය නියෝග අද ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වනවා. මෙම නියෝග පැනවීමේදී කල්පනා කරලා, ප්‍රායෝගික වන සේ කළොත් ගැටලු අවම කර ගන්නට පුළුවන් කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි. ඒ කෙසේ වෙතත් මාර්ග නීති උල්ලංඝනයේදී රුපියල් 25,000ක්ව තිබූ දඩ මුදල රුපියල් 3,000 දක්වා අඩු කිරීමටත්, ස්ථානීය වැරදි සඳහා රුපියල් 500 සිට රුපියල් 3,000 දක්වා දඩ මුදල් අය කරන්නටත් නියෝග ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා කටයුතු කරපු සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා.

මා හිතන විධියට මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් අමාත්‍යාංශය බලාපොරොත්තු වෙන්නේ, රිය අනතුරු අවම කර ගැනීමයි. නමුත් කියන්න කනගාටුයි, මේ දිනවලත්, පසුගිය කාලය තුළත් මේ රටේ වැඩියෙන්ම ජීවිත හානියට පත් වුණේ රිය අනතුරුවලින්. ඒක අපි කවුරුත් පිළිගත යුතු වනවා. රිය අනතුරු අවම කර ගැනීම මෙම අමාත්‍යාංශයේ පමණක් නොවෙයි, පොලීසියෙත් වග කීමක් වනවා. ඒ වාගේම රථ වාහන පදවන අයගේත් එය විශේෂ වගකීමක් විය යුතු බව මතක් කරන්න ඕනෑ. මහ මහ වැඩියෙන්ම අනතුරට භාජන වෙන්නේ ත්‍රිරෝද රථ බව අපි දකිනවා. ත්‍රිරෝද රථවල ගමන් කළ හතර පස්දෙනා, හය හත්දෙනා එකවර මිය ගිය අවස්ථා අප දැක තිබෙනවා. නීතිය හරියට ක්‍රියාත්මක වනවා නම් මෙවන් මරණ අඩු කර ගන්න පුළුවන් නේද කියලා අපි කල්පනා කළ යුතු වනවා.

මේ නීති පැනෙව්වාට මදි. ඒ නීති හරියාකාරව, නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුත් සම්පාදනය කළ යුතුයි. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්න ගරු ඇමතිතුමා කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

මාර්ග තදබදය අඩු කිරීමත් මේ අමාත්‍යාංශයේ විශාල වගකීමක් වෙලා තිබෙන බව මා කියන්න ඕනෑ. මාර්ග තදබදය අඩු කරන්න යම් යම් කටයුතු කළත්, අදාළ අණ පනත් ඉදිරිපත් කළත් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. ත්‍රීවීල් රථ සම්බන්ධව පසුගිය දවස්වල නියාමන කොමිසමක් පත් කරන්න කටයුතු කළා. නමුත් ඒ නියාමන කොමිසම තවමත් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා අද ත්‍රීවීල් ව්‍යාපාරය ඉබාගාතේ යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ නියාමන කොමිසමේ කටයුතු කඩිනම් කරන්න කියලාත් මා ඉල්ලීමක් කරනවා.

දඩ මුදල් අඩු කරන්න යෝජනා කර තිබෙන මේ අවස්ථාවේදී අලුත් වාහනයක් සම්බන්ධවත් යෝජනා කරලා තිබෙනවා. ඒ යෝජනා පිළිබඳව අපේ බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් මතක් කළා. මම හිතන විධියට එය නරක දෙයක් නොවන්න පුළුවන්. ත්‍රීවීලරයලට මෙන් නොව, මේ වාහනයට රෝද හතරක් තිබෙන නිසා අනතුරු අඩු වෙයි කියලා අපි විශ්වාස කරනවා. නමුත් ඒ රථය වුණත් ඕනෑවට වඩා මේ රටට ආනයනය කළොත්, ඒ තුළිනුත් යම් අපහසුතාවක් ඇති වෙන්න පුළුවන් බව අපි කල්පනා කළ යුතු වෙනවා. ඒ නිසා ඒ සම්බන්ධවත් සීමා පැනවීම වැදගත් බව මතක් කළ යුතු වනවා. ගමනාගමනය සඳහා වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවාව යොදා ගන්නවා නම්, මේ රටේ අනතුරු මෙන්ම වාහන තදබදයත් අඩු කර ගන්න අවස්ථාව තිබෙනවාය කියා සිතිය යුතු කාලය අද පැමිණ තිබෙන බව මා මතක් කරන්න ඕනෑ. ඒවාට අවශ්‍ය කටයුතු සකස් කිරීම වැදගත්.

මේ අමාත්‍යාංශයට තමයි ලංකා ගමනාගමන මණ්ඩලය පැවරිලා තිබෙන්නේ. නමුත් ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සිදු වන සේවාව පිළිබඳව අපට සතුටු වෙන්න බැහැ. ඩිපෝ ගැන කථා කළොත්, අද ඒ ඩිපෝවල තිබෙන බස් රථ ධාවනය කරන්න ප්‍රමාණවත් තරම් රියදුරන් සහ කොන්දොස්තරවරුන් නැතිකම නිසා බස් රථ ගාල් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, රියදුරන් සහ කොන්දොස්තරවරුන් නැති නිසා යටිනුවර ඩිපෝවේ බස් රථ 18ක් ධාවනය කරන්න බැරිව තිබෙනවා. බස් රථ 18ක් ධාවනය කරන්නේ නැතුව නිකම් තිබෙනවා. ඒ හේතුවෙන් ගම්වල ජීවත් වන ජනතාව අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ගමේ මාර්ගවල බස් රථ ධාවනය වන්නේ නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. වැඩියෙන්ම බස් රථ ධාවනය වන්නේ කොළඹ-නුවර වාගේ මාර්ගවල. ඒ නිසා ගමට බස් රථයක් ලබා දෙන්නත් මේ අමාත්‍යාංශය තුළින් යම් වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඒ රියදුරු පුරප්පාඩු, කොන්දොස්තර පුරප්පාඩු ඉතා ඉක්මනින් පුරවලා, ඒ බස් රථ ධාවනයේ යොදවන්න කටයුතු කරන්න කියලාත් මා ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන්ම, තවත් කරුණු-කාරණා කිහිපයක් පිළිබඳව අද දවසේ ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ හිඟයක් අද තදින්ම තිබෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ. අද සුළු අනතුරක් වුණත්, ඒ අනතුර පරීක්ෂා කරන්නට මෝටර් රථ පරීක්ෂකවරු නැතිකම නිසා විශාල පාඩුවක් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කටයුතු සඳහා විශාල කාලයක් ගන්නවා. ඒ කාර්යයට වැඩි කාලයක් ගැනීම නිසා, ඒ තුළින් මේ රටේ ආර්ථිකයට විශාල පාඩුවක් වෙනවා. ඒ නිසා, මෝටර් රථ පරීක්ෂකවරු බඳවා ගන්නට ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් කඩිනම් වැඩ පිළිවෙළක් ඇති කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, අපි මෝටර් රථ පරීක්ෂකවරු 500ක් පමණ බඳවා ගන්නවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

හොඳයි. ඒක බොහොම කඩිනමින් කරන්න සිද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. එහෙම නොකළොත් ඒ තුළින් නොයෙක් අයුතු වැඩ රාශියක් සිද්ධ වෙනවා. වාහනයක් පරීක්ෂා කරන්න examiner කෙනෙක් ගෙන්වා ගන්න රුපියල් 5,000ක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මෙවැනි දේ තුළින් රටේ ජනතාවට අපහසුතා සිදුවී තිබෙනවාය කියන කාරණය මතක් කරනවා. මේ වන විටත් ඒ විභාග පවත්වලා තිබෙනවාය කියා ඔබතුමා ප්‍රකාශ කළා. ඒ කටයුතු කඩිනම් කරලා, එම පත්වීම් ඉක්මනින් ලබා දීලා ඒ අවශ්‍යතාව සපුරන්න කියා මා මේ අවස්ථාවේ විශේෂ ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද තිබෙන වාහන තදබදයත්, ඒ වාගේම අනතුරු පිළිබඳවත් රියැදුරන් මෙන්ම වාහන අයිතිකරුවන් දැනුවත් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම වැදගත් වෙනවා. මේ කාර්යය බොහොම පහසුවෙන් කරන්න පුළුවන්. අවුරුද්දකට වතාවක් වාහන බලපත්‍ර නිකුත් කරන කොට ජනතාව දැනුවත් කරන්න පුළුවන් අවස්ථා තිබෙනවා. ඒ අවස්ථාවේදී ඒ කරුණු ඇතුළත් අත් පත්‍රිකාවක් -leaflet- ලබා දීම තුළින් ඒ ජනතාව වසරෙන් වසර දැනුවත් කරන වැඩ පිළිවෙළකට යන්න පුළුවන් කියන කාරණය මතක් කරන්නට ඕනෑ.

අද පාරේ යන විධියත් උගන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. වාහන තදබදය ගැන අපි කල්පනා කරනවා නම්, වාහන තදබදය

[ගරු ලකී ජයවර්ධන මහතා]

වැඩියෙන් ඇති වෙන්නේ මංසන්ධිවල. ඒ නිසා, එවැනි මංසන්ධිවල වාහනය පැදවිය යුතු ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ කටයුතු කරන්නට අවශ්‍ය වෙනවා. අනතුරු වළක්වා ගැනීමට උපදෙස් දීම වර්ෂයක් කරන්න පුළුවන් කියන කාරණය මතක් කරන්නට ඕනෑ. ඒ ආකාරයෙන් කටයුතු කිරීම වැදගත්. ඒවාට විශාල වශයෙන් වියදම් යන්නේ නැහැ. විශේෂයෙන්ම, වාහන බලපත්‍ර -licence- ලබා දෙන අවස්ථාවේදී ඒ අය දැනුවත් කරන විධියේ පත්‍රිකාවක් ලබා දීම තුළින් එය ක්‍රියාත්මක කරන්න පුළුවන් කියන කාරණය මා මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ තිබෙන අපහසුව තවත් ප්‍රශ්නයක් ලෙස මා දකිනවා. අද විරැකියාව විශාල වශයෙන් බහුල වේ ගෙන යනවා. අද රියදුරු පුරප්පාඩු තිබෙනවා. නමුත්, අද රියදුරු බලපත්‍ර දීමේදී පොඩි ප්‍රමාදයක් තිබෙනවා. සැහැල්ලු වාහන සඳහා licence එක අරගෙන, බර වාහන සඳහා licence එක ගන්නට අවුරුදු තුනක් ඉන්නට ඕනෑ.

සැහැල්ලු වාහනයක් පදවන්න පුළුවන් මනුස්සයෙක් අවුරුදු තුනක් ඉන්න ඕනෑ නැහැ බර වාහන පැදවීමේ ලයිසන් එක ගන්න.[බාධා කිරීමක්]

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංහ)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, බලපත්‍රය අවුරුදු පහක් පරණ වුණාට පස්සේ තමයි අපි වාහනයක් පදවන්නට දෙන්නේ. මගීන්ගේ ආරක්ෂාව සඳහා තමයි මේ වාගේ තීන්දු අරගෙන තිබෙන්නේ. කෙසේ වෙතත් රියැදුරු බලපත්‍රයක් ගන්න අවස්ථාවේදී වෛද්‍ය සහතිකයක් ලබා ගන්නවා නේ. ඒක ඉක්මන් කරන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(මාණ්පුමිකු ලක්කි ජයවර්තන)
(The Hon. Lucky Jayawardana)

ඒක තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අවුරුදු තුනක් කියන එක ලොකු කාලයක් නේද? සැහැල්ලු වාහන පදවන්න පුළුවන් කෙනාට බර වාහනයක් පදවන්න තව මාස හයක් දුන්නොත් ඇති. අඩුම වශයෙන් අවුරුද්දක් දක්වාවත් ඒ කාලය කෙටි කරලා ඒ ලයිසන් එක ලබා දුන්නොත් විරැකියාවටත් යම් විසඳුමක් දෙන්න පුළුවන්. රියැදුරන්ගේ පුරප්පාඩු හුඟක් තිබෙනවා. නමුත් සුදුසු රියැදුරන් නැහැ. රජයේ සේවයට වුණත් ඉල්ලන්නේ පළපුරුද්ද. අවුරුදු තුන හතරක පළපුරුද්ද ඉල්ලනවා. නමුත් කෙනෙකුට බර වාහනයක් පදවන ලයිසන් එකක් ගන්න අවුරුදු තුනක් ගතවීම විශාල කාලයක්ය කියන එක මතක් කරන්න ඕනෑ. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මේ අමාත්‍යාංශය තුළින් ජනතාවට ප්‍රයෝජනවත් වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මතක් කළ ආකාරයට, අනතුරු බහුල වන්නට ඇති විවිධ කාරණා අවම කර ගැනීම වැදගත්. විශේෂයෙන් අද පෞද්ගලික බස්වල එළියෙන් ලයිට් වැල් තුන හතරක් දාලා තිබෙනවා. මේවායින් අනෙක් රියැදුරන්ට අපහසුතා ඇති වෙනවා. වෙසක් තොරණවල වාගේ සම්භර බස්වලට ලයිට් දාලා තිබෙනවා. මේවා ගැන අවධානයක් යොමු නොවීම ගැන අපි කනගාටු වෙනවා. මේ පිළිබඳවත් අවධානය යොමු කොට ඒවාට අවශ්‍ය නීති සම්පාදනය කිරීම වැදගත් බව මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය තුළින් කෙරෙන වැඩ පිළිබඳව සතුටු වෙනවා. අද දින ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව අපේ ප්‍රසාදය පළ කරන අතර, විශේෂයෙන් මේ දඩ මුදලින් සාධාරණ සේවාවක් ඇති කරන්න ඕනෑ බව මතක් කරනවා. දඩ ගැසීමටම බලාගෙන සිටින පිරිසක් රටේ ඉන්නවා. එම නිසා ජනතාවට කරදරයක් වෙන ආකාරයට දඩ ගැසීම වළක්වන්නටත් මේ අමාත්‍යාංශය තුළින් යම් වැඩ පිළිවෙළක් ඇති කර, ඒවා පරීක්ෂා කරන්නටත් කටයුතු සලස්වන්න කියා ඉල්ලනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[ම.ප. 11.37]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கையில் நடக்கின்ற விபத்துக்களைக் குறைப்பதற்காகக் கொண்டுவரப்பட்ட மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான இந்த விவாதத்தில் கலந்து கொண்டு பேச என்னையும் அனுமதித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். போக்குவரத்து அமைச்சு இன்று விபத்துக்களைக் குறைப்பதற்காகக் கடந்த காலங்களில் இருந்த சட்டங்களைவிட, தற்போதைய போக்குவரத்து விதிமுறைகளுக்கமையச் சட்டங்களை உருவாக்குகின்றபோதும் இலங்கையில் விபத்துக்கள் அதிகரித்துக்கொண்டே செல்கின்றன. அதாவது, விபத்துக்களைக் குறைப்பதற்காகச் சட்டங்களை உருவாக்கினாலும் விபத்துக்கள் அதிகரித்தவண்ணமே இருக்கின்றன. தற்பொழுது எந்தப் பத்திரிகையை எடுத்தாலும், ஒரு மாவட்டத்தில் எங்காவது ஓரிடத்தில் விபத்து நடைபெற்று இழப்புக்கள் ஏற்பட்டதான செய்திகளையே காணக்கூடியதாக இருக்கிறது. ஆகவே, சட்டங்களை உருவாக்குவதோடு மட்டுமல்லாமல், எப்படியாவது அவற்றை நடைமுறைப்படுத்தி அந்த விபத்துக்கள் ஏற்படுவதைத் தடுக்க வேண்டும். அதாவது, எந்த அடிப்படையில் விபத்து ஏற்படுகின்றது என்பதைக் கவனித்து - கண்காணித்து விபத்து மீண்டும் ஏற்படாவண்ணம் சட்டங்களை நடைமுறைப்படுத்த வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே! இன்று பொலிஸ் திணைக்களத்தின் வீதிப் போக்குவரத்துப் பொலிஸ் அதிகாரிகள் பொதுவாக விபத்துக்கள் நிறைய ஏற்படுகின்ற இடங்களில் குறிப்பாக, விபத்துக்கள் ஏற்படக்கூடிய வாய்ப்புக்கள் இருக்கின்ற நாற்சந்திகளில் கடமையில் ஈடுபட்டு விபத்துக்களைத் தவிர்ப்பதற்கு அல்லது போக்கு வரத்துக்களை ஒழுங்குபடுத்துவதற்கு முயற்சிப்பதில்லை. எவர் அதிவேகமாக வாகனம் செலுத்தி வருவார், எவர் வெள்ளைக் கோட்டின்மீது வாகனத்தைச் செலுத்திவருவார் என்ற சிந்தனையில் அவரைப் பிடிக்க வேண்டும் என்பதற்காக ஏதோ ஓரிடத்தில் அவர்கள் நிற்பார்கள். ஆனால், அவர்கள் விபத்துக்கள் ஏற்படுகின்ற இடங்களில் அவற்றைத் தடுப்பதற்குரிய நடவடிக்கைகளில் ஈடுபடுவதில்லை. அதாவது, வேகமாக வாகனங்களைச் செலுத்துகின்ற சாரதிகளைப் பிடிப்பதுதான் அவர்களுடைய நோக்கமாக இருக்கின்றதே ஒழிய, விபத்துக்கள் ஏற்படுகின்ற இடங்களில் தங்களுடைய கடமைகளைச் செய்வதில்லை. கௌரவ அமைச்சர் அவர்கள் போக்குவரத்துக்குப் பொறுப்பான பிரதிப் பொலிஸ் மாஅதிபரிடம் இது தொடர்பாகத் தெளிவுபடுத்தி, விபத்துக்கள் ஏற்படக்கூடிய இடங்களில் குறித்த பொலிஸார் தங்களுடைய கடமைகளைச் செய்வதற்கு ஏற்ற நடவடிக்கைகளை

මේற்கொள்ளவேண்டும். இவ்வாறான சட்டங்கள் உருவாக்கப் படுவதன்மூலம் விபத்துக்கள் குறைவடையும் என்பதால், இந்த ஒழுங்குவிதிகளுக்கு என்னுடைய ஆதரவைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே! வடக்கு மாகாணத்தில் மட்டுமல்ல, 12 பிராந்திய போக்குவரத்துச் சபைகளின் சாலை ஊழியர்களுக்கான EPF பணம் 2011 நவம்பர் முதல் 2015 ஓகஸ்ட் வரை தங்களுடைய அமைச்சினால் செலுத்தப்படவில்லை. தற்பொழுதுதான் சப்ரகமுவ, வயம்ப ஆகிய இரண்டு பிராந்தியங்களின் சாலை ஊழியர்களுக்கான EPF பணம் செலுத்தப்பட்டிருக்கின்றது. மிகுதியான 10 பிராந்தியங்களின் ஊழியர்களுக்கான EPF பணம் செலுத்தப்படவில்லை. ஆகவே, இந்த EPF பணம் செலுத்தப்படுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். வடக்கு மாகாணத்தில் சாலை ஊழியர்கள் சார்பில் 322 மில்லியன் ரூபாய் செலுத்த வேண்டியிருக்கிறது.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

රුපියල් බිලියන 10.5ක EPF මුදල් බැර කරලා තිබුණේ නැහැ. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මේ වනකොට ඒ මුදල් බැර කරලා තිබෙනවා. තව සුළු ප්‍රමාණයක් තමයි ඉතිරි වෙලා තිබෙන්නේ. අපි මේ වසර තුළ සියලුම සේවකයන්ගේ EPF මුදල් බැර කරන්න බලාපොරොත්තු වනවා. දැනට ඉතා සුළු ප්‍රමාණයක් තමයි ඉතිරිව තිබෙන්නේ. ඒ වාගේම සේවකයකු ඉවත් වුණු ගමන්ම ඔහුගේ පාරිතෝෂික මුදල ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා. එම නිසා දැන් කිසි ප්‍රශ්නයක් නැතිව පාරිතෝෂික මුදලත් ලැබෙනවා. ලබා දිය යුතු EPF මුදල්වලින් තව ඉතා සුළු මුදලක් තමයි ඉතිරිව තිබෙන්නේ. රුපියල් බිලියන 10.5ක් arrears තිබුණා. දැන් ඒවා අපි ලබා දෙනවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒකට බොහොම ස්තුතියි. දැන් උතුරු පළාතට දෙන්න තිබෙන්නේ රුපියල් මිලියන 322යි. ඒ මුදලත් මේ මාසය තුළ ලබා දෙනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

අපි කොහොමත් මැයි මාසයේ 20 වෙනි දිනට පෙර එම ඉතිරි මුදල් එවන්නම්.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே! இலங்கைப் போக்குவரத்துச் சபையின் வடக்கு மாகாண ஊழியர்கள் சார்பாக இதற்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று அந்த ஊழியர்கள் பல சிரமங்களுக்கு மத்தியில் பணியாற்றுகின்றார்கள். எங்களுடைய பிரதேசங்களில் பாதைகள் சீராக இல்லை; அங்குள்ள பஸ்கள் நன்கு ஓடக்கூடிய நிலையில் பொருத்தமானவையாக இல்லை. இருந்தாலும், தங்களுடைய சேவைகளை அவர்கள் செய்து கொண்டிருக்கின்றார்கள். அந்தவகையில், அவர்களுக்குரிய ஊழியர் சேமலாப நிதி செலுத்தப்படாதிருப்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும்.

மேலும், தற்பொழுது நீங்கள் கிழக்கு மாகாணத்தில் நடத்துநர், சாரதி போன்ற நியமனங்களை வழங்கியிருக் கிறீர்கள். என்ன விகிதாசாரத்தில் அந்த நியமனங்கள் வழங்கப்பட்டன என்பதும் எனக்குத் தெரியும். ஆனால், வடக்கைப் பொறுத்தளவில் அங்கு அதிகமான வெற்றிடங்கள் இல்லை. ஆனாலும் 40 சாரதி வெற்றிடங்களும் 40 நடத்துநர் வெற்றிடங்களும் 38 'மெக்கானிக்' வெற்றிடங்களும் காணப்படுகின்றன. இந்த வெற்றிடங்களுக்கான நியமனங் களை நீங்கள் புனர்வாழ்வளிக்கப்பட்ட அங்குள்ள இளைஞர் களுக்கு முழுமையாக வழங்கவேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன்.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

විශේෂයෙන්ම උතුරේ අයට උතුරු පළාතත්, නැහෙනහිර අයට නැහෙනහිර පළාතත් තමයි පත්වීම් ලබා දෙන්නේ. එම පත්වීම් ලබා දෙන්නේ contract basis මත. මොකද, ඒ ඩිපෝවලින්ම තමයි ඒ අයට මුදල් ගෙවන්න ඕනෑ. උතුරු නැහෙනහිර පළාත්වල ඩිපෝවලින් අපි ලාභ ලබනවා. සාමාන්‍යයෙන් රුපියල් මිලියන 200ක් පමණ උතුරු පළාතේ ඩිපෝවල fixed deposit අපට තිබෙනවා. අපි ඉදිරියේදී ඔබතුමා කියපු 40 ප්‍රමාණය ගැන සලකා බලනවා. හැබැයි, අපි mechanicsලා බඳවා ගන්නේ නැහැ. අපි දැනට තීන්දු කරලා තිබෙනවා, mechanicsලා බඳවා ගන්නේ නැතිව driversලා සහ conductorsලා බඳවා ගන්න. ඒ තිබෙන පුරප්පාඩු ටික බලා අපි අවශ්‍ය අයව බඳවා ගන්නවා. ඔබතුමන්ලා දන්නා හඳුනන එවැනි අය ඉන්නවා නම්, මේ තනතුරු සඳහා ප්‍රධාන කාර්යාලයට ඉල්ලුම් කරන්නය කියන්න. අවශ්‍ය සුදුසුකම් තිබෙන අයට අපි තනතුරු ලබා දෙනවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රධාන කාර්යාලය කියන්නේ කොළඹටද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඔව්, CTB Head Office එකට.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ මේකයි. යුද්ධය පැවැති කාලයේ හිරේ ඉඳලා ආපු අය ඉන්නවා නේ? ඒ අය අතර හොඳ driversලාත් ඉන්නවා, ඔවුන්ට licenceනුත් තිබෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

රියදුරු තනතුර සඳහා සාමාන්‍යයෙන් බඳවා ගන්නේ අට ශ්‍රේණිය සමත් අය. බර වාහන පදවා අවුරුදු පහක පළපුරුද්දක් තිබෙන්නත් ඕනෑ. අවුරුදු 45ට වඩා අඩු වන්නත් ඕනෑ. Conductor තනතුරට අ.පොස. සාමාන්‍ය පෙළ විභාගය සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වෙලා තිබෙන්න ඕනෑ. විශේෂයෙන් ගණිතය විෂයට simple pass එකක් හෝ තිබෙන්න ඕනෑ. එහෙම සුදුසුකම් තිබෙන අය ඉන්නවා නම්, අප වෙත යොමු කරන්න. ඒ ප්‍රදේශවලට අවශ්‍ය පත්වීම් අපට ලබා දෙන්න පුළුවන්, contract basis මත. ඔවුන්ට දවසකට රුපියල් 1,000ක් ගෙවනවා, overtime, batta දෙනවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

නන්‍රි. කෙළරව ප්‍රතිති අමෙච්චර් අවර්කළේ, නීංකළ් කූරියතුපෝන්‍රු අන්‍ත වෙර්‍රිටිංකළ් අප්ප්‍රතේසත්තිලිරුක් කින්‍ර ඉළෙංඥර්කළෛක්කොණ්ටේ නිරප්පප්පට වේණ්ටුම්. තර්පෝතු පුනර්වාල්වළික්කප්පට්ටු ජනතායක නීරෝට්ටත්තිල් ඉණෛවතර්කු ආයත්තමාක ඉරුක්කින්‍ර එංකළතු ඉළෙංඥර්කළ් වේලෛවාය්ප්පින්මෛ කාරණමාක මිකවුම් සිරමප්පට්ටුක්කොණ්ටිරුක්කින්‍රාර්කළ්. කුරිප්පාක අවර්කළුක්කු අන්‍ත වේලෛවාය්ප්පෛ වළංකුවතු මිකප් පෙරියතෝර් උතවියාක ඉරුක්කුම් එන්පතෛයුම් නාන් ඉංකු කූරික්කොළ්ළ විරුම්පුකින්‍රේන්.

අණ්මෛයිල් අංකේ ඒර්පට්ට කුළප්පංකළෛත් තොටර්න්තු එංකළුටෛය ආලෝසනෛක්කු අමෛවාක වට පිරාන්තිය මුකාමෛයාළරෛක් කෙළරව අමෙච්චර් අවර්කළ් කටන්ත ටිසම්පර් මාතම් අංකිරුන්තු ඉටමාර්රම් සෙය්තතනාල්, අන්තප් පතවික්කාන වෙර්‍රිටම් අංකු කාණප්පටුකින්‍රතු. අන්තප් පතවියිල් තර්පෝතු පතිර්කටමෛයාර්රුකින්‍ර කේතීස් එන්පවර් පිරාන්තිය මුකාමෛයාළරුක්කුරිය මුළුත් තකුතියුමුටෛයවරාක ඉරුක්කින්‍රාර්. අණ්මෛයිල් අන්තප් පතවික්කාන නේර්මුකත් තේර්වු නටෛපෙර්‍රපෝතු වටක්කිලිරුන්තු වන්තු තෝර්‍රිය ඔරේයොරු නපරුම් අවරේයාවාර්. ආකවේ, තයවුසෙය්තු අවරෛ නිරන්තර මුකාමෛයාළරාක නියමික්ක වේණ්ටුම් එන්‍රු තමිල්ත් තේසියක් කූට්ටමෛප්පින් සාර්පාක කෙළරව අමෙච්චර් අවර්කළිටම් කේට්ටුක්කොළ්කින්‍රේන්. ඏනෙන්‍රාල්, තර්පෝතු වටක්කු මාකාණත්තිලුළ්ළ පෝක්කුවරත්තුච් චාලෛකළ් අරසියල් කට්සිකළින් තලෛයීටුකළ් ඉල්ලාමල් සරියාන ඔරු නිර්වාකත්තින්කීල් චට්ටංකළෛච් සරියාකප් පේණි නේර්මෛයාකච් සෙයර්පටුකින්‍රන. අන්තවකෛයිල්, අංකු පතිර්කටමෛ පුරියුම් පිරාන්තිය මුකාමෛයාළරෛ නිරන්තරප් පිරාන්තිය මුකාමෛයාළරාක නියමික්කුම්පටි කේට්ටුක් කොළ්කින්‍රේන්.

අතේනේරම්, අංකුළ්ළ පෝක්කුවරත්තුච් චාලෛකළිල් පෙරුම්පාලුම් එල්ලාක් කට්සිකළිනියුම් තොළිර්සංකංකළ් තංකළුටෛය කූට්ටංකළෛ නටත්තිවරුකින්‍රන. කුරිප්පාක ශ්‍රීලංකා සුතන්තිරක් කට්සි, ඉක්කිය තේසියක් කට්සි, EPDP පෝන්‍ර පල කට්සිකළින් ඌළියර් තොළිර්සංකංකළ් අංකු ඉයංකිවරුකින්‍රන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

කෙළරව උරුප්පිනර් අවර්කළේ, උංකළතු නේරම් මුටිවටෛන්තුවිට්ටතු.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

කෙළරව කුළුක්කළින් ප්‍රතිති තවිසාළර් අවර්කළේ, ඔරු නිමිටම් තාරුංකළ්!

අතේනේරම්, අංකු ඉලංකෛත් තමිළරසුක් කට්සියිනතු තොළිර්සංකම් ඉයංකුවතර්කුත් තංකළුටෛය අමෙච්චරින් අනුමති තේවෛයාක ඉරුක්කින්‍රතු. අතාවතු, තොළිර් සංකංකළ් පතිවුසෙය්යප්පට්ටු ඌළියර් චාර්න්ත නන්මෛයාන විටයංකළිල් ඈටුපටුවතර්කාන අනුමති, තංකළුටෛය අමෙච්චරාල් පෝක්කුවරත්තුච් චාලෛයින් තවිසාළරූටාක වළංකවේණ්ටියිරුක්කින්‍රතු. ඉන්තත් තොළිර්සංකංකළ් චම්පන්තමාන කූට්ටම් වරුකින්‍ර මාතම් නටෛපෙර විරුප්පතනාල්, අතර්කිටෛයිල් අතර්කුරිය අනුමතියෛ වළංකුමාරු නාන් තංකළිටම් කේට්ටුනිර්කින්‍රේන්.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයාටත්, අමාත්‍යාංශයේ ලේකම්වරයාටත් ඒ ඉල්ලීම් ලබා දෙන්න. අපි ඒ පිළිබඳවත්, ඔබතුමා කිව්ව ප්‍රාදේශීය කළමනාකරු පිළිබඳවත් සාකච්ඡා කර තීන්දුවක් ගන්නම්.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

නන්‍රි, අමෙච්චර් අවර්කළේ! කුරිත්ත විණ්ණප්පම් ඉලංකෛත් තමිළරසුක් කට්සියින් තලෛවරූටාක මික විරෛවිල් චමර්ප්පික්කප්පටුම් එන්පතෛත් තෙරිවිත්තුක්කොණ්ටු, ඉන්තප් පෝක්කුවරත්තුච් චට්ටම් තොටර්පාකප් පේසුවතර්කු අනුමිතිත්තමෛක්කාක මීණ්ටුම් නන්‍රිකූර්, එන්නුටෛය උරෛයෛ නිරෛවු සෙය්කින්‍රේන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Wijepala Hettiarachchi.

[පූ.භා. 11.50]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා වෙනුවෙන් මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය අමාත්‍ය අශෝක් අබේසිංහ මැතිතුමා විසින් මෝටර් රථ ප්‍රවාහනයට අදාළව, අනුමත කිරීම සඳහා 2018 ජනවාරි 15 දිනැති ගැසට් නිවේදන මඟින් ඉදිරිපත් කර තිබෙන ඉතාම වැදගත් නියෝගවල කරුණු කිහිපයක් පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ පැවැති විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් වූ විවාදයට අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා නොපැමිණීම සම්බන්ධයෙන් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය මගේ හිතවත් ගරු මනුෂ නානායක්කාර මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. පිවිතුරු හෙළ උරුමය පක්ෂයේ නායක ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා ඊයේ ප්‍රකාශ කළා, ඉර පායන එක සත්‍යය නම්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විශ්වාස භංග යෝජනාවෙන් පරාජයට පත් වෙනවාය කියා. එතුමා මේ අවස්ථාවේදී සභා ගැබෙන් එළියේ ඉන්නවාද කියා මා දන්නේ නැහැ. අද ඉර හොඳට පායා තිබෙනවා. ඒ වාගේම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් විශ්වාස භංග යෝජනාව පරාජයට පත් කරලා අලුත් ගමනක් යන මේ අවස්ථාවේදී මා එතුමාට නැවත වරක් සුබ පතනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමාට ඉර පායලා නැහැ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

කොහොම වුණත්, දැන් කථා කරන්නට දෙයක් නැති වෙනකොට නන් දොඩවන ඔබතුමා කථා කරනකොට ඒ ගැන ප්‍රකාශ කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇතැම් අණ පනත් ගෙනෙනවා. ඉදිරියේදී අපි ජනතාවාදී වැඩ පිළිවෙළකටයි යන්නේ. ජනතාවාදී වැඩ පිළිවෙළකට යනකොට නොයෙකුත් බදු පැනවීම්, දඩ මුදල් අය කර ගැනීම් පිළිබඳව ජනතාව තෘප්තිමත්වන විධියටයි ඒ කටයුතු සිද්ධ වෙන්නට ඕනෑ.

VAT එක ඉදිරිපත් කරන වෙලාවේදී මේ විධියටම අපේ ලොකු විරෝධයක් පෞද්ගලිකව තිබුණා. ඒ විරෝධය නොතකා එය ගෙන ඒම තුළ රජයත්, මේ රටේ ජනතාවත්, ව්‍යාපාරිකයින් විශාල පිරිසකුත් දැඩි අපහසුතාවට පත් වුණා. රජයක් හැටියට අපි දැඩි ලෙස පීඩාවට පත් වුණා. එම නිසා දඩ මුදල් සහ වෙනත් අණපනත් ගෙනෙන විට මේ රටේ ජනතාව ගැන හිතන්නට ඕනෑ. මල නොතලා රොන් ගන්නවා වාගේ මිනිසුන්ට නොදැනෙන ආකාරයට තමයි බදු අය කළ යුත්තේ කියලා අපේ බෞද්ධ සාහිත්‍ය තුළ අහන්නට ලැබෙනවා. යම් බද්දක් හෝ දඩ මුදලක් අය කිරීමේදී ජනතාව පෙළන්නට හොඳ නැහැ. රජයට බදු මුදල්, -වක්‍ර බදු සහ ඍජු බදු- අය කර ගැනීම අවශ්‍යයි. ඊට අමතරව නොයෙක් විධියේ බදු ක්‍රම තිබෙනවා. පාරට බැස්සාම බදු ගහනවා, කඩේ ඉන්නකොට බදු ගහනවා, පාරේ ගමන් කරනකොට බදු ගහනවා. මේ සියලු දේවලදී අපි සාධාරණ සහ යුක්ති සහගත ලෙස කටයුතු කරන්නට ඕනෑ.

මේ නියෝග මඟින් අලුත් මෝටර් රථ දෙකක් හඳුන්වා දීම ගැන මා සතුටු වෙනවා. ගරු බිමල් රත්නායක මැතිතුමා කිව්වා වාගේ නොයෙකුත් විධියේ විච්චූර්ණ වාහන මේ රටට හඳුන්වා දෙනවා. ඒ තුළින් ලැබෙන ප්‍රයෝජනය කොපමණද, ඒවායින් ජනතාවට කොපමණ වාසියක් තිබෙනවාද කියා බලන්නට ඕනෑ. දැන් hybrid වාහන හඳුන්වා දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි hybrid වාහන ගන්න විට නම් කියන්නේ, මෙපමණ කිලෝමීටර් ගණනක් ධාවනය කරන්න පුළුවන්, පෙට්ල්වලින් මෙපමණ දුර ධාවනය කරන්න පුළුවන්, කරන්ට් එකෙන් මෙපමණ දුර ධාවනය කරන්න පුළුවන්ය කියලායි. නමුත් සමහර විට පරණ වාහනයේ තත්ත්වයටම මේ අලුත් වාහනත් පත්වන අවස්ථාත් තිබෙනවා.

මේ රටට හඳුන්වා දෙන වාහන සම්බන්ධව ප්‍රමිතියක් තිබෙන්නට ඕනෑ. අපි වාහනයක් මිලදී ගන්නා විට වාහන අලෙවි කරන සමහර ස්ථානවලින්, sales ආයතනවලින් කියන දේ නොවෙයි, අපි වාහනය පාවිච්චි කරන විට දකින්නට ලැබෙන්නේ. එම නිසා මේ තත්ත්වයන් ඉතාමත් පැහැදිලි වෙන්නට ඕනෑ. ඔබතුමා අද හඳුන්වා දුන් අලුත් වාහන පන්තිය කුමන ආකාරයට ජනතාවට ප්‍රයෝජනවත් වෙනවාද කියන එක ගැන අපි සැලකිලිමත් වෙන්නට ඕනෑ.

මේ රටේ ත්‍රී වීලර් රථ ලක්ෂ 12කට, ලක්ෂ 15කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. මේ රටේ මාර්ග අනතුරු දිහා බලන විට, වැඩිම ප්‍රමාණයක් ජීවිත හානි සිදුවෙලා තිබෙන්නේ ත්‍රී වීලර් රථ අනතුරුවලින් බව පෙනෙනවා. ඊයේ පෙරේදා පත්‍රයක තිබෙනවා මා දැක්කා, ත්‍රී වීලර් රථයේ රියැදුරුට නින්ද යාම නිසා අනතුරට පත්වීමෙන් එකම පවුලේ හතර දෙනෙකු මිය ගොස් තිබෙන බව. මා දන්නේ නැහැ, ඒ අයට රියැදුරු බලපත්‍රයක් තිබෙනවාද කියලා. බොහෝ ත්‍රීරෝද රථ රියැදුරන්ට රියැදුරු බලපත්‍රයක් නැහැ. මේ තුළින් ඇති වුණු නොයෙක් අපහසුතාවන් තිබෙනවා. එම නිසා මේවා සම්බන්ධව නියාමනයක් සිද්ධ වෙන්නට ඕනෑ.

ත්‍රීරෝද රථ ධාවනය පිළිබඳ, බලපත්‍ර ලබා දීම පිළිබඳ, නවත්වන ස්ථාන පිළිබඳ පළාත් පාලන ආයතනයකින්වත් කිසිම නියාමනයක් සිදු වන්නේ නැහැ. ඒ සඳහා විනයක් තිබෙන්න ඕනෑ. අපි සමහර රටවලට ගියාම පාපැදිවලට වෙනම මංතීරුවක්, යතුරු පැදිවලට වෙනම මංතීරුවක්, බස් රථ සඳහා වෙනම මංතීරුවක් ආදී වශයෙන් මංතීරු වෙන් කර තිබෙන ආකාරය දකින්න ලැබෙනවා. එවැනි ක්‍රමයක් මේ රටෙත් හදන්න ඕනෑ. අපි මේ ක්‍රමවේදය සකස් නොකර අනතුරු අඩු කිරීම සඳහා දඩ මුදල් වැඩි කිරීම ආදී නොයෙක් දේවල් කළාට හරියන්නේ නැහැ. අපට කිසිම නගරයක රථ වාහන හැසිරවීමේ වැඩ පිළිවෙළක් නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. රාජගිරියේ ගුවන් පාලම අපට දුන්නා. රාජගිරියේ ගුවන් පාලම හැදුවාට පස්සේ අපි හිතුවා මින් ඉදිරියට මෙතැනින් ශීඝ්‍රයෙන් යන්න පුළුවන් කියලා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? අද වෙනකොටත් සමහර වේලාවට එතැන පැය භාගයක් විතර රැඳෙන තත්ත්වයක් තිබෙනවා. අපි නිර්මාණශීලීව වැඩ කටයුතු කළත් ඒකේ ප්‍රතිඵලය අපට ලැබෙන්න ඉඩ නැහැ. සමහර තැන්වල රථ වාහන හසුරුවන පොලිස් නිලධාරීන් නිසාම අපි දැඩි ලෙස අපහසුතාවට පත් වෙනවා කියලා මම දන්නවා. මම දන්නේ නැහැ මේකට හේතුව මොකක්ද කියලා.

ඒ එක්කම අපි අධිවේගී මාර්ග ගැන බලමු. කෝටි ගණන් දීලා වාහන ගන්නවා. සාමාන්‍ය වාහනයකට, ප්‍රාඩෝ රථයකට පැයට කිලෝමීටර 130ක, 140ක වේගයෙන් යන්න පුළුවන්. හැබැයි, අද අධිවේගී මාර්ගයේ එම වේගයෙන් ගමන් කළොත් පොලීසියෙන් අල්ලන තත්ත්වයක් තිබෙනවා. අපි වාහනයට tax එක දෙන්න ඕනෑ. Licence එකට, insurance කරනකොට රුපියල් 250,000ක් දෙන්න ඕනෑ. ඒ වගේම අපි ඉක්මනින් යන නිසා ගාස්තුවක් ගෙවනවා. හැබැයි, මතක තියා ගන්න, අධිවේගී මාර්ගයේ පැයට කිලෝමීටර 100ට වැඩි වේගයෙන් ගියොත් අපව නතර කරනවා. මම කියන්නේ ඒක හරි. නමුත් හැම තිස්සේම ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ -හිටපු මහාමාර්ග අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා.- අධිවේගී මාර්ගයේ නඩත්තුව තවම හරියට සිදු වෙන්නේ නැති නිසායි. අධිවේගී මාර්ගයට මුදල් ලබා ගන්න ආකාරයට මාර්ග නඩත්තුව සිදු වන්නේ නැහැ. අධිවේගී මාර්ගයේ සමහර පාලම් දැන් බැහැලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගාල්ලට යනකොට සමහර පාලම්වලින් උඩින් ගිහින් වැටෙන්නේ. මෙන්න මේ වාගේ තැන්වල අනතුරුදායක තත්ත්වයන් තිබෙනවා. සමහර ස්ථාන බැහැලා තිබෙනවා. අපි යම් යම් බදු මුදල්, දඩ මුදල් අය කරනකොට ගරු බිමල් රත්නායක මැතිතුමා කිව්වා වාගේ ඒ පිළිබඳවත් කටයුතු කරන්න ඕනෑ. එතුමා වාහන අනතුරු තත්ත්වයන් පිළිබඳව කිව්වා. විශේෂයෙන්ම මරණ සංඛ්‍යාව පිළිබඳ කිව්වා. මම අපේ පාර්ලිමේන්තු පුස්තකාලයේ Research Unit එකට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එහි සියලු දෙනා අපට උදව් කරනවා.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ 2017 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මස 30වැනි දින දක්වා අනතුරු 28,388ක් වෙලා, එයින් 2,120ක් මිය ගිහින් තිබෙනවා. වැඩිම අනතුරු ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන්නේ අනුරාධපුර නගරය ආශ්‍රිතවයි. දිස්ත්‍රික්ක වශයෙන් බැලුවාම කුරුණෑගල, මහනුවර, ගම්පහ දිස්ත්‍රික්කවල තමයි වැඩි අනතුරු ප්‍රමාණයක් සිදු වෙලා වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගම්පහ, කැලණිය, නුගේගොඩ වාගේ ප්‍රදේශවලත් අනතුරු වැඩියි. ගාල්ලේ අනතුරු අඩු වෙලා තිබෙනවා.

මේ කාරණය පිළිබඳවත් සොයා බලන්නට ඕනෑ. ඉතාමත් දරුණු, අනතුරුදායක තත්ත්වයන් ඇති වන විශේෂිත ස්ථාන තිබෙනවා. මේ පනතේදී ගරු අමාත්‍යතුමා "ආබාධිත" කියන වචනය සඳහන් කරලා තිබෙනවා. එහි පොඩි සංශෝධනයක් කළොත් හොඳයි. "ආබාධිත" කියන වචනය මම හිතන්නේ දැන්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මේ සමාජයෙන් ඈත් වෙන්නට ඕනෑ. අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු අශෝක් අබේසිංහ මැතිතුමා එතුමාට හිමි ආසනයේ නැති නිසා අපි මනුෂ නානායක්කාර නියෝජ්‍ය අමාත්‍යතුමා එක්ක ඒ ගැන කථා කර ගන්නම්. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ පනතේ "ආබාධිතයින් සඳහා" කියලා සඳහන් වෙනවා. ආබාධ සිදු වන විවිධ තත්ත්වයන් තිබෙනවා. උපතින් ආබාධිත වෙච්ච අය ඉන්නවා. ඒකට දැන් අලුතින් පාවිච්චි කරනවා, "විශේෂ අවශ්‍යතා ඇති අය වෙනුවෙන්" කියලා. ඒ ආකාරයට මේ වචනය වෙනස් කළොත් වඩා හොඳයි කියලා මම විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

"විශේෂ අවශ්‍යතා ඇති අය වෙනුවෙන්" කියලා ඒ වචනය වෙනස් කළොත් වඩාත් වැදගත් වනවාය කියලා මම හිතනවා. එසේ වෙනස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඔබතුමා ප්‍රවාහන පද්ධතිය වෙනුවෙන් විශාල සහයෝගයක් ලබා දෙනවා. හැබැයි, එක් කාරණයක් මට කියන්න තිබෙනවා. අපේ ලකී ජයවර්ධන මැතිතුමා කිව්වා වාගේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගැන නම් අපිට කොහොමටවත් සතුටු වෙන්නට බැහැ. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මෙච්චර ශ්‍රම හමුදාවක් ඉන්නවා. මෙච්චර රියදුරන් ඉන්නවා. ගණන් pass වෙච්ච අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. හැබැයි, රියදුරු සහ කොන්දොස්තරවරු නැහැ. බස් තිබෙනවා. රියදුරු, කොන්දොස්තරවරු නැහැ. අවුරුදු තුනක් ගිහිල්ලාත් තවම අපිට කොන්දොස්තරවරුන් එක් කෙනෙකු, දෙදෙනෙකු තමයි දමා ගන්න පුළුවන් වුණේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. රැකියා වියුක්ත භාවයක් තිබෙනවා. හැබැයි, ඔබතුමා කරුණාකරලා මේ කාරණයත් මතක තියා ගන්න. ගාල්ල සහ නුවර ඩිපෝවල විතරක් නොවෙයි, සෑම ඩිපෝවකම සේවකයන් 20ක, 30කගේ අඩුකමක් තිබෙනවා. මේකට කඩිනම් පියවරක් ගන්න. කොන්ත්‍රාත් පදනම මත හෝ කමක් නැහැ, ඒ සේවකයන් ලබා දෙන්න.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
රියදුරන් සහ කොන්දොස්තරවරුන්ගේ අඩුවක් නැහැ. අපේ cadre එකට අනුව රියදුරන් 10,500ක් සහ කොන්දොස්තරවරු 10,500ක් ඉන්න ඕනෑ. බස් 5,500යි තිබෙන්නේ. නිවාඩු සියල්ල සලකා බැලුවාම සාමාන්‍යයෙන් බස් 100කට රියදුරන් 140ක් හා කොන්දොස්තරවරු 140ක් ඉන්න ඕනෑ. විනය පිළිබඳ ප්‍රශ්නය එක්ක තමයි රියදුරු ප්‍රශ්නයත් ඇතිවෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් අපි දැන් තීන්දු කරලා තිබෙනවා, කොන්ත්‍රාත් පදනම මත ඒ ඩිපෝවලට අවශ්‍ය සේවකයන් ප්‍රමාණය බඳවා ගන්න. හැබැයි, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගනිද්දි ඒ ඩිපෝ එකේ Depot Manager තමයි පඩි ගෙවන්න ඕනෑ. සමහර විට එහෙම පඩි ගෙවලා සේවකයන් ගන්න ඒ ගොල්ලන් අකැමැතියි. මොකද, රජයෙන් සාමාන්‍ය සේවකයෙකුට රුපියල් 16,200ක් ගෙවනවා. නමුත් දැන් අපි එහෙම කරන්නේ නැහැ. දවසකට රුපියල් 1,000 ගණනේ සමස්ත පඩියම ගෙවන්න ඕනෑ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා කියන ඒ පුරප්පාඩු ප්‍රමාණය පුරවන්න අපි බලාපොරොත්තු වනවා. [බාධා කිරීමක්]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
තවත් වේලාව ලබා දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය අපි හැම දාමත් දකින දෙයක්. මේ අවුරුදු තුන තිස්සේ ඔබතුමන්ලා ඔය කාරණයම කිව්වා. නමුත් මේ ප්‍රශ්නය කවදාවත් විසඳෙන්නේ නැහැ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක, ඒ ඩිපෝවල තිබෙන අකාර්යක්ෂමතාව. අපි රියදුරන් කොච්චර යැව්වත්, ඔවුන් නිවාඩු යවලා, අවශ්‍ය සේවක ප්‍රමාණය "නැහැ." කියලා කියනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඩිපෝවල අකාර්යක්ෂමතාවක් තිබෙනවා නම්, එහි පරිපාලනය හරියාකාරව කරගන්න බැරි නම් ආණ්ඩුව හැටියට අපි වග කියන්න ඕනෑ. ඒ නිසා මා ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න කියලා. බොහොම ස්තුතියි.

[අ.භා.12.02]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග කිහිපයක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මුලින්ම අහන්න කැමැතියි, දුම් බද්ද සහ කාබන් බද්ද කියන්නේ බදු දෙකක්ද, ඔබතුමන්ලා මෙය අය කරන්නේ එකම බද්දක් හැටියටද, එහෙම නැත්නම් බදු දෙකක් හැටියටද කියලා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
අය කරන්නේ එක බද්දක්.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
එතකොට ඉස්සෙල්ලා අය කරපු දුම් බද්ද අය කරන්නේ නැද්ද? ඔබතුමන්ලා මෙවර අය වැයෙන් අලුතින් බද්දක් ගෙනාවා. දුම් බද්ද අපි දැනට ගෙවනවා. දැන් මේ අලුත් බද්දත් එක්ක බදු දෙකක් අය කරනවාද, නැත්නම් අය කරන්නේ එකක්ද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
එකයි අය කරන්නේ.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
එහෙම නම් ප්‍රශ්නයක් නැහැ. මොකද, වාහන ලයිසන් කරන ගාස්තුත් වැඩි කර තිබෙනවා; තෙල් මිලත් වැඩි කරනවා; බදුත් වැඩි කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
තෙල් මිල වැඩි කළේ නැහැනේ?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ඇයි, ඊයේ පෙරේදා වැඩි කළේ? තමුන්නාන්සේ තෙල් ගහන්න නැතිව ඇති. තමුන්නාන්සේට ආණ්ඩුවෙන් තෙල් ගහලා දෙනවා ඇති. හැබැයි, IOC එකෙන් තෙල් ගහනකොට වැඩියෙන් මුදල් ගෙවලයි ගහන්නේ. කොහොම හරි බදු වැඩි කරන එක නොවෙයි කරන්න ඕනෑ. දැන් මේකෙන් යම් කිසි අඩු කිරීමක් කර තිබෙනවා. මේ රටේ ජනතාව පෙබරවාරි 10වැනිදා තීන්දුවක් දුන්නා. ආණ්ඩුවකට පුළුවන් බදු ගහලා සල්ලි එකතු කරන්න. ඒ විධියට බදු ගහලා මිනිස්සු හිර කරපු නිසා තමයි පෙබරවාරි 10 වැනිදා තමුන්නාන්සේලාට ජනතාව තීන්දුවක් දුන්නේ, මේ ක්‍රමය වැරදියි කියලා. ඒ නිසා යම් කිසි අඩු කිරීමක් කරනවා නම් අපි සතුටුයි. හැබැයි, ගරු ඇමතිතුමනි, නීති දාලා, දඩ ගහලා මේ රටේ රිය අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවාද? එකක්වත් අඩු වෙලා නැහැ. අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා දඩ ගහලා මේක කරන්න පුළුවන්කමක් නැහැ. විනීත රියදුරන් හඳන වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි.

අපේ රටේ මහාමාර්ග පද්ධතිය සහ අලුතින් එන වාහන ටිකත් එක්ක බැලුවාම පාරවල් ලොකු කරන්නේ නැතිව කොච්චර දඩ ගැහුවත් වැඩක් නැහැ. අපේ ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමා පානදුර පාරේ එනවා නම්-

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා අහනවා, මම තෙල් ගහන්නේ නැද්ද කියලා. නමුත්, එතුමා දන්නවා 2015න් පස්සේ කාලය තුළම තෙල් මිල වැඩි කළේ නැහැ කියලා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
නැහැ, නැහැ. මම කිව්වේ IOC එකේ තෙල් මිල වැඩි කිරීම ගැනයි. ඔබතුමා කිව්වා, "තෙල් මිල වැඩි කළේ නැහැ කියලා. ඒ නිසයි මම කිව්වේ "IOC එකේ තෙල් මිල වැඩි කළා" කියලා. ඒකයි මම කිව්වේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මන්ත්‍රීතුමිය ඉන්නවා-

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
හරි, හරි.

මම එතුමාට කිව්වේ පානදුර - රත්නපුර පාරේ තිබෙන වංගු ටිකත් එක්ක හැමදාම රිය අනතුරු සිදු වෙනවාය කියන එකයි. එක දවසක් ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත් ඒ වංගුවකදී හැප්පිලා ඉන්න කොට මමත් එතැනට ආවා. ඒ නිසා මේ පාරවල් ලොකු කරන්නේ නැතිව අනතුරු වළක්වා ගන්න ක්‍රමයක් නැහැ. එක බස් රියැදුරෙක් පොලීසියට කිව්වා, "ඔබතුමාට පුළුවන් නම් සුදු ඉර කපන්නේ නැතිව මෙතැනින් මගේ බස් එක අරගෙන දෙන්න" කියලා. එතැන හරියටම වංගුවක් තිබෙනවා; පාර පුංචියි; ඉස්සරහට ගන්නේ නැතිව එතැනින් බස් එකක් ගන්න බැහැ. "පුළුවන් නම් සුදු ඉර කපන්නේ නැතිව අරගෙන පෙන්වන්න" කිව්වා. ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාරවල් ලොකු කරන්නේ නැතිව සුදු ඉරි ගහලා, ඒ තැන්වල traffic police ඉඳලා අල්ලලා මේ වැඩේ කරන්න පුළුවන්කමක් නැහැ. "අනතුරු සහිත වංගුවක්" කියලා බෝඩ් එකක් ගහනවා. බෝඩ් එක ගැහුවාට අනතුර වැළැක්වෙන්නේ නැහැ. එතැන වංගුව ලොකු කරන්න ඕනෑ. ඒ විධියට පාර ලොකු කරන වැඩේ කරන්නේ නැතිව මුල්ලක ඉඳලා "හොරා පොලිස්" වැඩේ කරලා අල්ලනවා. අපි බැලුවොත්, වැඩි හරියක් high speed යන අය අල්ලන්නේ කොහොමද, "හොරා පොලිස්" කරලායි. අධිවේගී මාර්ගයේ පාලම් යට පොලීසියෙන් හැංගිලා ඉන්නවා. පොලීසිය තිබෙන්නේ හැංගිමුත්තන් කරන්න නොවෙයි. ඒ වරද කරන එකෙන් කවුරු හෝ වළක්වා ගන්න නම් පොලීසිය පෙනෙන්න ඉන්න ඕනෑ. එහෙම පෙනෙන්න ඉන්න කොට පොලීසියෙන් ඉන්නවා කියලා හෝ අනෙක් රියැදුරන් හෙමින් යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දඩ ගැහුවාට ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒක නිසා අඩුම ගණනේ පොලීසිය පෙනෙන්නවත් හිටියොත් අනෙක් රියැදුරන් වැරදි කරන්නේ නැහැ. හැබැයි, වැඩිවෙලා ඉන්න වෙන්නේ නැහැ, ලයිට් ගහගෙන යන කොට වැඩේ සවුත්තු වෙනවා. අපි කියන්නේ පොලීසිය දමලා ආණ්ඩුව දඩ ගහනවාට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියන එකයි. දැන් වාහන දෙකක් හැප්පුණොත් දෙදෙනාටම නඩු දෙකක් දමනවා. මම හරියට පාරේ යන කොට, තව කෙනෙක් වැරදි විධියට ඇවිල්ලා හැප්පුවොත් මොකද කරන්නේ? අපරීක්ෂාකාරී ලෙස රිය පැදෙව්වා කියලා පොලීසියෙන් දෙදෙනාටම නඩු දමනවා. එතකොට හරියට යන මිනිහාටත් දඩුවම් ලැබෙනවා. එහෙම නේද, ගරු අජිත් පී පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි? වැරදි විධියට ගිය එක්කෙනාටත් දඩුවම් ලැබෙනවා. හරියට රිය පදවන එක්කෙනාට මොකද කරන්නේ? එයාටත් නඩුවක් දමනවා. එයාට උසාවි ගිහිල්ලා පෙරකදෝරු මහත්වරුන්ට සල්ලි දීලා දඩයකුත් ගෙවලා ගෙදර එන්න වෙනවා. ඒ නිසා මේ ක්‍රමය වැරැදියි. වැරැද්ද කරපු එක්කෙනාට දඩුවම් දෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව මම මේක කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, එතැනදී ඇත්තටම දමන චෝදනාව තමයි "අනතුර වළක්වා ගැනීමට නොහැකි වීම" කියන එක. වරදක් නොකළ අහිංසක මනුස්සයාට විරුද්ධව පොලීසිය චෝදනාවක් ඉදිරිපත් කරනවා, "අනතුරක් වළක්වා ගැනීමට නොහැකිවීම" කියලා.

ඒක ඉතාම වැරැදියි. අහිංසකයයි, වැරදිකාරයයි දෙන්නාම එක ළඟ නඩු නොම්මර දෙකට උසාවි යනවා. ඇත්ත වශයෙන්ම මේ ගැන පොලිස් දෙපාර්තමේන්තුව අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම රථ වාහන අංශවල ඉන්න නිලධාරි මහත්වරු ඒ හරි වැරැද්ද තෝරා ගන්න ඕනෑ. මොකක් හෝ දේකට අහිංසක පාර්ශ්වයක් වරදකරු කරන්න උසාවි දැම්මාම ඒ අය ඒ වරද පිළිගන්නවා. අද තිබෙන තත්ත්වය අනුව, කිහිප දවසක් උසාවි යන්න බැරි නිසා වරද පිළිගන්නවා. ඔබතුමා කියන දේ ඉතාම නිවැරැදියි. මේ පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ නඩු පිළිබඳව අධ්‍යයනය කළොත් පෙනෙනවා, හැම අවස්ථාවකම වාගේ දෙපැත්තට නඩු දාලා තිබෙනවා. මේක අධ්‍යයනය කරලා ඒ විධියේ ප්‍රවණතාවක් තිබෙනවා නම් ඒක වළක්වා ගන්න පොලීසිය කටයුතු කරන්න ඕනෑ. ඔබතුමා කියන එක හරි.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

බොහොම ස්තුතියි, ඇමතිතුමා. මම කියන්නේත් එතුමා කිව්ව දේම තමයි. නිවැරැදිකරුත් ගිහිල්ලා උසාවියේ දවසක් රස්තියාදු වෙනවා. සල්ලි ගෙවලා වැරදිකාරයා වෙලාත් එනවා. ඒක නිසා අපි මේ නීතියේ තිබෙන අඩු පාඩු සම්පූර්ණ කරන්න ඕනෑ. ගොඩක් රියැදුරන් දන්නේ නැහැ, තමන්ට ලයිසන් එකක් තිබුණාට පාරේ යන්න. ඉස්සරහ යන වාහනයට කොච්චරක් දුරින් යන්න ඕනෑද කියලාවත් දන්නේ නැහැ. එහෙම බැලුවොත් එක්කෙනෙක්වත් අද ඒ කටයුත්ත කරන්නේ නැහැ. අධිවේගී මාර්ගයේ තිබෙනවා, මීටර් 50ක පරතරයක් තියාගෙන යන්න ඕනෑ කියලා. අඩි 150කවත් පරතරයක් තියාගෙන යන්න ඕනෑ. එහෙම යන්නේ නැහැ. අපේ රියැදුරන් ඒ ගැන දැනුවත් කමක් නැද්ද කියන්න දන්නේ නැහැ. හැම එක්කෙනාම මෙහෙම තමයි යන්නේ. අපි colour light එකක නතර කරගෙන ඉන්න කොට අපේ වාහන අස්සෙන් බයිසිකල් කට්ටිය ඉස්සරහට එනවා. පොඩ්ඩක් ඉඩ තිබුණොත් කොහොම හෝ ගිහිල්ලා ඒ ගොල්ලන් ඉස්සරහ බයිසිකලය ගහගෙන ඉන්නවා. අර colour light එකේ බලාගෙන ඉන්න-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
කාලය අවසන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔව්, ඔව්.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

බයිසිකල් එහෙන් මෙහෙන් දාලා යනවා. එහෙම කටයුතු කරන අයටත් මොකක් හෝ කරන්න ඕනෑ. හරියට නීතියේ ඉන්න කෙනා පැය ගණනක් බලාගෙන ඉන්න වෙනවා. මොකද, බයිසිකල් එහෙන් මෙහෙන් දාලා යන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව දෙයක් කියන්න ඕනෑ. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ quartersවල සිට පාරට වාහන දාන කොට හැම දාම වාගේ වාහන හප්පා ගන්නවා. මහා මාර්ග සම්බන්ධව හිටපු ඇමතිතුමා තමයි දැන් මේ සභාවේ ඉන්නේ. ඉන්න ඇමතිතුමාටවත් කියලා සුදු ඉරි ටිකක් හරි ගහන්න ඕනෑ. මේ දවස් ටිකේම වාහන හැප්පෙනවා. හරහට දාන කොටම ප්‍රධාන පාරෙන් එන එක වාහනයක්වත් නවත්වන්න නැහැ. හප්පාගෙන යනවා. මේ අනතුරු වැඩියෙන් වෙන කැන් බලලා ඒ අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. අදත් අපේ ඇමතිතුමා ඇවිල්ලා නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. අදත් නැවිත් ඉන්නේ අදත් විශ්වාස භංගයක් තිබෙනවාය කියලා හිතුවාද දන්නේ නැහැ. අද විශ්වාස භංගයක් නැහැ. ඒක නිසා ඒ අයට දැන්වත් එන්න කියන්න.

ජනතාව ඡන්දය දුන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට හැංගිමුත්තන් කෙළින්න නොවෙයි. කොන්දක් තිබෙන්න ඕනෑ. කොන්ද තියාගෙන ඇවිල්ලා, එක්කෝ පක්ෂයි කියන්න ඕනෑ; නැත්නම් විපක්ෂයි කියලා කියන්න ඕනෑ. නැත්නම් මෙතැනට ඇවිල්ලා කියන්න ඕනෑ, ඡන්දය දීමෙන් වැළකී ඉන්නවා කියලා. අපි කියනවා, ආපු නැති සියලුදෙනාටම කොන්දක් නැහැ කියලා. කොන්දක් තිබෙන්න ඕනෑ, කොන්දක් තිබෙන නායකයෙක් එක්ක හිටියා නම්. එහෙම නම් කොන්ද තියාගෙන ඇවිල්ලා මෙතැන තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරනවා. 225දෙනෙකුට රටේ ජනතාව ඡන්දය දීලා තිබෙන්නේ පාර්ලිමේන්තුවට එන්න මිසක් හැංගිමුත්තන් කෙළින්න නොවෙයි. ඒ කට්ටිය ආවේ නැත්තේ අසනීපව ලෙඩ වෙලා මොනවා හෝ වෙලාද කියලා කියන්න අපි දන්නේ නැහැ. එහෙම නැත්නම් ඒ අය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා බදු අඩු කිරීම පිළිබඳව සතුටු වෙමින් අර මම කියපු කාරණාව පිළිබඳව ඇහුම්කන් දීලා කටයුතු කරන්න කියලා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
විශ්වාස භංගයට පක්ෂව ඡන්දය දීපු අයට කොන්දක් තිබුණාද?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

අපට කොන්දක් තිබෙනවාද, නැද්ද කියලා රටේ ජනතාව දන්නවා. ඔය කෑ ගහන අයට කොන්දක් තිබෙනවාද කියලා ගමට ගියාම තේරුම් ගන්න පුළුවන්. අඩුම ගණනේ දිනපු නගර සභාව රැක ගන්න බැරි වුණු අය තමයි ඔය කෑ ගහන්නේ.

[අ.භා.12.11]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාර්ග නීති කඩ කිරීමේදී රුපියල් 25,000ක දඩ මුදලක් අය කරන්න ඕනෑ කියලා යෝජනා කරපු අවස්ථාවේදී එම කාරණය පිළිබඳව සමාජයේ විශාල උද්ඝෝෂණයක් මතු වුණා; විරෝධයක් මතු වුණා. පක්ෂ, පාට භේදයක් නැතුව බොහෝ දෙනෙකුගේ අදහස වුණේ මේ රුපියල් 25,000ක දඩ මුදල වැඩියි කියන එක. මොකද ඉතාම නොසැලකිල්ලෙන් -බරපතළ නොසැලකිල්ලෙන්- රියැදුරු බලපත්‍ර නොමැතිව, මත්පැන් බී ධාවනය කිරීම වැනි බරපතළ තත්ත්වයන් හැරෙන්නට නීත්‍යානුකූලව නිසි සිහියෙන් ධාවනය කරන රියැදුරන් අතින් පවා මාර්ග නීති කඩ වෙන්න පුළුවන්. එවැනි වෙලාවක රුපියල් 25,000ක් දඩ ගැහුවොත් විශාල පීඩාවක් ඇති වෙනවා. ඒ අය ණය වෙලා, නීතිඥ ගාස්තු ගෙවලා, උසාවියේ දඩත් ගෙවලා අවුරුදු ගණනක් යන කල් ඒ අහිංසක රියැදුරන්ට තමන්ගේ වැඩ කටයුතු කරගෙන යන්න බැරි වෙනවා.

මම ස්තුතිවන්ත වෙනවා ගරු අශෝක් අබේසිංහ මැතිතුමාට, ජනතාවගේ ඒ කාරණා පිළිබඳව අවධානය යොමු කරලා, ඒ පිළිබඳව අධ්‍යයනයක් කිරීමට කමිටුවක් පත් කරලා, එමඟින් ලැබුණු නිරීක්ෂණ අනුව සාධාරණ මට්ටමකට ඒ දඩ මුදල් අඩු කරලා උපරිම දඩය රුපියල් 3,000 බවට පත් කර තිබීම ගැන. උපරිම දඩය රුපියල් 3,000යි නේද, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඔව්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මා හිතන්නේ මේ දඩ මුදල අඩු කිරීම වැරැදි කිරීමට ධෛර්යය දීමක් නොවෙයි කියායි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් අනවශ්‍ය තරමට වැඩි දඩ පැනවීම සමාජ අසාධාරණත්වයට හේතුවක් වනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ පිළිබඳව සංවේදී වීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම වැදගත් කරුණක් ගැන කියන්න තිබෙනවා. අද හවස් වරුවේ විවාදයට ගැනීමට නියමිතව තිබුණා, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත. දූෂණ විරෝධී මහාධිකරණ පිහිටුවීම අරමුණු කරගෙන ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් හරහා -Trial-at-Bar ක්‍රමයට- දිනපතා නඩු විභාග කරලා බරපතළ දූෂණ නඩු අවසන් කිරීම සඳහා වූ කාර්ය පටිපාටියයි එහි තිබෙන්නේ. මේ පිළිබඳ විවාදය අද දින පවත්වන්න අපට බැරි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එසේ විවාදය පවත්වන්න බැරි වෙලා තිබෙන්නේ එක් වැදගත් කාරණයක් නිසායි. ශ්‍රේෂ්ඨාධිකරණයේ 2018 අංක 7 දරන නඩු තීන්දුව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවට දැනුම් දී තිබෙනවා, එම පනත් කෙටුම්පත සාමාන්‍ය බහුතරයකින් සම්මත කිරීම සඳහා ප්‍රධාන සංශෝධන තුනක් සිදු කරන්න අවශ්‍යයි කියා. -ඒ පිළිබඳව ගරු කථානායකතුමා එදා ප්‍රකාශ කළා.- ඒ පිළිබඳව වැරැදි මතයක් ඇති වන්න පුළුවන් නිසායි මා මෙය පැහැදිලි කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ශ්‍රේෂ්ඨාධිකරණය ත්‍රිපුද්ගල ස්ථිර මහාධිකරණ පිහිටුවීමේ යෝජනාව -permanent Trial-at-Bar යෝජනාව,- ඒ ප්‍රතිපත්තිය අනුමත කර තිබෙනවා. ඒක ඉතාම පැහැදිලිව කියන්න අවශ්‍යයි. එය කිරීමේදී මේ පනත් කෙටුම්පතට තුනෙන් දෙකක කැමැත්තක් තිබෙනවා නම් මෙය මේ ආකාරයටම සම්මත කර ගන්න පුළුවන්. මොකද, අපි දන්නවා, තුනෙන් දෙකක කැමැත්තක් ලබා ගැනීමට යම් අසීරුතාවක් තිබෙන්න පුළුවන් බව. ඒ නිසා අපි කැමැතියි, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පරිදිම මෙය සාමාන්‍ය බහුතරයකින් සම්මත කරන පනත් කෙටුම්පතක් බවට පත් කර ගන්න. මොනවාද මේ කර තිබෙන යෝජනා? මා මේ කාරණා කියන්නේ, වැරැදි මත ඇති වීම වැළැක්වීමටයි. පළමුවන එක මේකයි. දැනට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ තිබෙන්නේ ශ්‍රී ලංකාවේ මහාධිකරණය -High Court of Sri Lanka- කියන අධිකරණ වර්ගයට අයිති ස්ථාවර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලයක් හෝ කීපයක් පිහිටුවීම ගැනයි. ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, සාමාන්‍ය බහුතරයකින් සම්මත කිරීමට නම් මෙම ස්ථිර දූෂණ විරෝධී මහාධිකරණ -permanent Trial-at-Bar- පිහිටුවීම කළ යුත්තේ පළාත්බද මහාධිකරණ වර්ගය යටතේයි කියා. ඒ කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග. ව්‍යවස්ථාව යටතට වැටෙන පළාත්බද මහාධිකරණ කියන වර්ගීකරණයට වැටෙන ආකාරයට මේ කෙටුම්පත සංශෝධනය කළොත් තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍ය නැහැ, සාමාන්‍ය බහුතර කැමැත්තෙන් සම්මත කරන්න පුළුවන් කියන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඒ සඳහා මේ පනත් කෙටුම්පත සංශෝධනය කළ යුතු වනවා.

තවත් වැදගත්ම කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව අභියෝගයක් එල්ල වුණා, නීතිපතිතුමා සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ අධිචෝදනා පත්‍ර මේ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලවලට යොමු කිරීමට ඉඩ නොදිය යුතුය කියා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ ප්‍රතිපත්තිය -එසේ යොමු කිරීමට හැකියි කියන එක- පිළිගෙන තිබෙනවා. හැබැයි, යුක්තිය ඉටු වීම පිණිසත්, මේ ශීඝ්‍රගාමී ක්‍රියා දාමය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීම පිණිසත් අතිරේක කොන්දේසියක් එකතු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ තමයි නීතිපතිතුමා හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ අධිචෝදනා පත්‍රය ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චයකාර මණ්ඩලය වෙත යොමු කිරීමේදී ඒ සඳහා පූර්වයෙන් ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ අවසරය ලබා ගත යුතුය කියන කොන්දේසිය. අපට ඒ ගැන ගැටලුවක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අග්‍ර විනිශ්චයකාරතුමාට එය යොමු කළ විට එතුමා ඒ කරුණු අනුව සලකා බලා, පනතේ තිබෙන අවශ්‍යතා අනුව සලකා බලා ඒ පිළිබඳව තීරණ ගන්නවා ඇති.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඒක වැදගත් දෙයක්. මෙම වේගවත් ක්‍රියා පටිපාටිය වැරැදි ලෙස පාවිච්චි කිරීම වැළැක්වීමටයි ඒ ප්‍රතිපාදනය තිබෙන්නේ. අපි එය සංශෝධනය කරන්න සූදානම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අනුව මේ පනතේ මෙම උපදෙස් අනුව වගන්ති ගණනාවක් සංශෝධනය කිරීමට තිබෙනවා. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට මේ සඳහා දින දෙකක කාලයක් පමණයි තිබුණේ. ඔවුන් විසින් අමතර කාලයක් ඉල්ලා තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, දූෂණ විරෝධී මහාධිකරණ පිහිටුවීම කියන එක කාලීන අවශ්‍යතාවක් බව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉතාම බරපතළ විධියට අභියෝග කළා. මේ දූෂිතයන්, දූෂිතයන්ගේ හිතවතුන්, දූෂිතයන් වෙනුවෙන් පෙනී සිටින අය මේ සිදු වන ශීඝ්‍රගාමී ක්‍රියාදාමය ඉවසන්නේ නැහැ. එහිදී කිසිම ගාස්තුවක් නොමැතිව ස්වේච්ඡාවෙන් පෙනී ඉඳලා මේ සම්බන්ධව කටයුතු කරපු ජනාධිපති නීතිඥ ජේ.සී. වැලිඅමුණ, ජනාධිපති නීතිඥ සාලිය පීරිස්, නීතිඥ සුරේන් ප්‍රනාන්දු, ජනාධිපති නීතිඥ ජයම්පති වික්‍රමරත්න, පුලස්ති හේවාමාන්න, නීතිඥ නාගහනන්ද කොඩිතුවක්කු, නීතිඥ විරාන් කොරෙයා, ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම් සහ නීතිඥ ෂනික ජයවර්ධන කියන මහත්වරුන්ටත් අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ.

ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉතාමත් දක්ෂ විධියට තර්ක විතර්ක ඉදිරිපත් කරලා මේ ප්‍රතිපත්තිය අනුමත කර ගැනීමට කටයුතු කරපු ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මැතිතුමාත්, ජනාධිපති නීතිඥ ප්‍රියන්ත නාවාන මැතිතුමාත්, රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරුන් වන නෙරිල්පුල්ලේ මැතිතුමා සහ යුරේෂා ද සිල්වා මැතිනියටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ ප්‍රතිපත්තිය අනුමත කර ගැනීමට ඉතාම හොඳින් කටයුතු කිරීම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අනුව මේ පනත් කෙටුම්පත මැයි මස මුල් සතියේ අපි කොහොම හරි සම්මත කර ගැනීමට කටයුතු කර ගන්නවා කියන කාරණයත් කියන්න ඕනෑ. රටේ නීතිය අනුව, නීතියේ ක්‍රියාදාමය අනුව සාධාරණ නඩු විභාග හරහා දූෂිතයන්ට ඉක්මනින් දඬුවම් කිරීමට අවශ්‍ය ක්‍රියා පටිපාටිය අපි ක්‍රියාත්මක කරනවා. ඉදිරියේදී අප්‍රේල් නිවාඩු කාලය නිසා, ඊට කලින් මේ පනත් කෙටුම්පත් සම්මත කර ගැනීමට අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ක්‍රියාදාමය වෙනුවෙන් සහයෝගය ලබාදීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය පැහැදිලි කිරීමට මට වේලාව ලබාදීම සම්බන්ධයෙන් මම ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 12.20]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශය ගත්තාම ප්‍රධාන වශයෙන්ම එයින් කාර්යයන් දෙකක් සිදු වන බව අපි දකිනවා. පළමුවැනි එක තමයි, ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවයක් අපේ මගී ජනතාවට ලබාදීම. දෙවැන්න තමයි, කාර්යක්ෂම සහ ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවයක් ලබාදීම. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොදු ප්‍රවාහන සේවයේදී අපේ මගීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම තිබෙන ගැටලුවක් තමයි, බස් එකකට නැගලා මගියෙක් කොන්දොස්තරවරයාට සල්ලි දුන්නාම ඒ මගියාට නැවත මාරු සල්ලි නොදෙන එක. ඒ වාගේම, ඒ මගියාට සමහර අවස්ථාවල ටිකට් එක දෙන්නෙත් නැහැ. සමහර වෙලාවට මගීන්ට මාරු සල්ලි වෙනුවට ටොෆි දෙනවා. ඒ වාගේම, අපේ කාන්තා පාර්ශ්වය හිංසනයට ලක් වෙනවා. බස් එකක තිබෙන සීට් ගණන 40ක් හෝ 50ක් නම් මගීන් 60ක්, 70ක් විතර නග්ගා ගන්නවා. එවිට මගීන් බස් රථය තුළ තෙරපිලා, දාඩිය දාගෙන බොහොම අමාරුවෙන් ගමන් කරන ස්වභාවය අපි දැකලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ වාගේම, සමහර බස් රථ රියැදුරන් ඉතාමත් අධික වේගයෙන් බස් රථ පදවා ගෙන යන ආකාරය අපි දැකලා තිබෙනවා. ඒ වාගේම, සමහර බස් රථ රේස් යනවා. පෞද්ගලික බස් රථ වාගේම CTB බස් රථත් ඊළඟ halt එකේ ඉන්න පිරිස් බස් එකට පටවා ගන්න ඉතාමත් වේගයෙන් රේස් යන ආකාරය අපි දැකලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ බස් රියැදුරන් සහ කොන්දොස්තරවරුන් පොදු මගී ජනතාවත් එක්ක හැම වෙලේම ගැටෙන පිරිසක්. මේ අයගේ විනය කොහොමද, ඔවුන්ට යම්කිසි විනයක් තිබෙනවාද, ඒ පිළිබඳව ඔවුන්ට දැනුවත් කිරීමක් කරනවාද, ඒ වාගේම, රියැදුරන්ට රියැදුරු බලපත්‍ර තිබුණාට මාස 6කට, අවුරුද්දකට, අවුරුදු දෙකකට සැරයක් ඔවුන්ගේ හැකියාවන් පරීක්ෂාවට ලක් වෙනවාද කියන එක පිළිබඳව පොඩි ගැටලුවක් අපට මතු වෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම මේ සම්බන්ධයෙන් යෝජනාවක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යුරෝපය ඇතුළු අනෙකුත් බොහෝ රටවල හැම බස් එකකම, කෝච්චියකම CCTV කැමරා සවි කරලා තිබෙන ආකාරය අපි දැක තිබෙනවා. හදිසියේවත් යම්කිසි අනතුරක්, නැත්නම් ගැටලුවක් ඇති වෙච්ච අවස්ථාවකදී ඒ වීඩියෝ පට බලන්න පුළුවන්. එය මගීන්ගෙත්, රියැදුරන්ගේත්, කොන්දොස්තරවරුන්ගේත්, පාරේ ගමන් කරන අනික් අයගේත් ආරක්ෂාවට සුබදායී දෙයක් කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ railway crossings අද රට පුරාම තිබෙනවා. මේ ගැන -විශේෂයෙන් ජාඇල සහ ඒ අවට ප්‍රදේශවල දුම්රිය හරස් මාර්ග සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නවලදී- මම සමහර අවස්ථාවලදී අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලීම් කර තිබෙනවා. ඒවායේ ලයිට් තිබෙන තැන්වල සමහර වෙලාවට ඒ ලයිට් එක වැඩ කරන්නේ නැහැ. ඒ වාගේම bell එක තිබෙන තැන්වල සමහර වෙලාවට ඒ bell එක වදින්නේ නැහැ. එහෙම නැත්නම් ගේට්ටුව නැහැ. මේ අනාරක්ෂිත තත්ත්වය නිසා අද අහිංසක පුද්ගලයන්ගේ ජීවිත අහිමි වෙලා තිබෙන ආකාරය අපිට අහන්න, දකින්න ලැබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජාඇල ඩිපෝ එකේ රියැදුරන්ගේ අඩු පාඩුවක් තිබෙනවා කියා මට දැනගන්න ලැබුණා. ඒ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්ඩලික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය අවර්කල්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(මාණ්ඩලික (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොහොට්ටුවේ එක්තරා පළාත් සභා මන්ත්‍රීවරයෙක් බස් රියැදුරෙකුට අල්ලාගෙන ගහන ආකාරය පසුගිය දිනවල මාධ්‍ය තුළින් අපි දැක්කා. එයාගේ බිරිඳ පිස්තෝලය අරගෙන ඔහුට වෙඩි තියනවාය කිව්වා. මේක දැකපු කොන්දොස්තර මහත්වරු, රියැදුරු මහත්වරු උද්ඝෝෂණය කරනවා අපි දැක්කේ නැහැ. අද යහ පාලනයේ පොඩි දෙයක් දැක්කොත්, පොඩි අතපසුවීමක් වුණොත් පුළුවන් තරම් උද්ඝෝෂණ කරනවා. අද පොහොට්ටුව ප්‍රාදේශීය සභාව දිනපු නිසා ඒ අය පොහොට්ටුවට බය වෙලාද්ද කියන අවංක හැඟීමක් මේ වෙලාවේ අපිට එනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ කැබිනට් ඇමතිතුමා අපේ අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා, ඉල්ලා අස් වෙන්න කියලා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්ඩලික අසෝක් අබේසිංහ)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ බස් රියැදුරා පැමිණිල්ල ඉල්ලා අස් කරගෙන. ඒක ඉතාම වැරැදි ක්‍රියාවක්. ඒක පෞද්ගලික බස් රථයක් නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(මාණ්ඩලික (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
බලන්න ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද මේ ගොල්ලෝ නීතිය අතට අරගෙන තිබෙන විධිය. පොහොට්ටුව ප්‍රාදේශීය සභාවක් ජයග්‍රහණය කරලා අද මහ පාරේ පිස්තෝල අරගෙන මොනවාද මේ කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය මම ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. ඒ පිස්තෝලයට licence එකවත් නැහැ; බලපත්‍ර නැති පිස්තෝලයක්. අවුරුද්දක් තුළ ලයිසන් කරලා නැහැ. ඒ වාගේ කෙනෙකුට ඇප දුන්නේ කොහොමද? ඒ ගැන පෞද්ගලික බස් රියැදුරන් සහ කොන්දොස්තරවරුන් උද්ඝෝෂණය නොකළේ ඇයි? දේශපාලන හස්තයට, දේශපාලනඥයාට, පොහොට්ටුවට බයේ තමයි ඒ අය උද්ඝෝෂණ නොකළේ. අපි ඒකයි කියන්නේ, මේ රටේ ජනතාවට ඒක තේරුම් ගන්න කියලා.

අගමැතිතුමාට ඉල්ලා අස් වෙන්න කියා කැබිනට් අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කිව්වාය කියා අපිට ආරංචියක් ලැබුණා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ අයට හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, ලජ්ජාවක් කියලා දෙයක් ඇහේ ගැවිලා තිබෙනවා නම්, අපේ කැබිනට් මණ්ඩලයේ තවදුරටත් රැඳී ඉන්න ඒ අයට සදාචාරාත්මක අයිතියක් නැහැ. යූඑන්පී එකට යහ පාලන ප්‍රතිපත්තීන් එක්ක කටයුතු කරන්න ඉඩ දෙමින් ඉල්ලා අස් වෙන්න කියා අපි එතුමන්ලාට කියනවා. ඡන්දය දෙන්න ආවේ නැහැ. හැංගිලා හිටියා. අපේ රටේ ආදරණීය ජනතාව අපහසුතාවට ලක් කරලා මාස එකහමාරක් මේ රට අකර්මණ්‍ය කළේ ඔය කණ්ඩායමයි. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ඒ කැබිනට් ඇමතිකම ලැබිලා, එත්සත් ජාතික පක්ෂයට මේ ආණ්ඩුව කරගෙන යන්න ඉදිරියේදී පුළුවන්කම ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. ස්තුතියි.

[පි.ප 12.26]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්ඩලික இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று மோட்டார் வாகனச் சட்டத்தின் கீழ் ஒழுங்குவிதிகள் சம்பந்தமாகப் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டுச் சந்தோசப்படுகின்றேன். அதேவேளை, தமிழ்ப் பாடசாலை மாணவர்கள் தற்போது பார்வையாளர் 'கலரி'யில் அமர்ந்திருப்பதனால், எனது உரையையும் தமிழில் நிகழ்த்த ஆசைப்படுகின்றேன்.

இந்த நாட்டிலே பதிவு செய்யப்பட்ட motorbikes 3.3 மில்லியனாகவும் three-wheelers 1.3 மில்லியனாகவும் உள்ளன. அந்த அடிப்படையில் மொத்தமாக 4.6 மில்லியன் motorbikes, three-wheelers என்பன பதிவுசெய்யப் பட்டுள்ளன. அதேநேரம், மற்றைய எல்லா வாகனங்களையும் சேர்த்தால் மொத்தமாக 7.1 மில்லியன் வாகனங்கள் இலங்கையிலே பதிவு செய்யப்பட்டுள்ளன. ஆனால், இந்த நாட்டின் சனத்தொகையோ 21.2 மில்லியனாக இருக்கின்றது. இந்த நாட்டிலே எவ்வாறான சட்டதிட்டங்களைக் கொண்டு வந்தாலும் சாரதிகள் ஒழுக்கமான முறையில் வாகனத்தைச் செலுத்தினால் மாத்திரமே விபத்துகளால் ஏற்படுகின்ற உயிராபத்துக்களிலிருந்து எமது மக்களைப் பாதுகாக்க முடியும்.

எங்களுடைய நாடு வளர்ந்துவருகின்ற ஒரு நாடாக இருக்கின்றது. இன்று எங்களுடைய கௌரவ அமைச்சர் அவர்களுக்குப் பதிலாகப் பிரதி அமைச்சர் கௌரவ அசோக் அபேசிங்க அவர்கள்தான் இங்கே இருக்கின்றார். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, காலத்திற்குக் காலம் ஆட்சி மாற்றங்கள் நடைபெறுகின்றன; அமைச்சரவை மாற்றங்கள் நடைபெறுகின்றன. இருந்தபோதிலும் இந்த நாட்டிலே சரியான, தீர்க்கமான ஒரு போக்குவரத்து முறைமையைக் கைக்கொள்ள முடியாமல் இருப்பது மிகவும் வருந்தத்தக்கதும் வெட்கப்படக்கூடியதுமான ஒரு விடயமாகும்.

இந்த நாட்டிலே 30 வருட கால யுத்தத்தினால் பாதிக்கப்பட்டு மக்கள் உயிரிழந்ததை அறிந்தோம். ஆனால், இப்பொழுது இந்த வாகன விபத்துக்களின் மூலமாக அதிக உயிரிழப்புக்களைப் பற்றி நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. எனவே, கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் போக்குவரத்துத் தொடர்பாகச் சிறப்பான ஒரு முறைமையைக் கையாண்டால் மட்டுமே இந்த நாட்டில் உயிராபத்துக்களைத் தடுக்க முடியும்.

மேலும், அநுராதபுரம் மிகவும் பின்தங்கிய ஒரு மாவட்டமாகும். அங்கு பாடசாலைப் பிள்ளைகள் மணித்தியாலக் கணக்கில் நடந்துதான் பாடசாலைகளுக்குச் செல்கின்றார்கள். இதனையிட்டு இந்த நல்லாட்சியில் இதுவரை எவருமே கவனத்திற்கு எடுக்கவில்லை. ஆகவே, அந்தப் பாடசாலை மாணவர்களுடைய போக்குவரத்தைச் சீர்செய்து தருமாறு அநுராதபுரம் மாவட்டத்தைப்

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர் என்ற வகையில், கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் நான் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், அந்த அளவுக்கு அம்மாவட்டத்திலே இருக்கின்ற 7 தேர்தல் தொகுதிகளும் போக்குவரத்து விடயத்தில் மிகவும் பின்தங்கிய நிலையில்தான் காணப்படுகின்றன. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கின்ற விடயங்கள் வெறுமனே படிவங்களில் மட்டும் இருந்துவிடாமல், அவை ஒழுங்கான முறையில் சீர்திருத்தம் செய்யப்பட்டு நடைமுறைப்படுத்தப்பட வேண்டும். அந்தவகையில், இருக்கின்ற இரண்டு வருட நல்லாட்சிக் காலப்பகுதியிலாவது மற்றைய உலக நாடுகளுடன் ஒப்பிடக்கூடிய வகையில் சிறப்பான ஒரு போக்குவரத்து முறைமையைச் செய்து தருவீர்கள் என்று எதிர்பார்த்து, எனக்கு வாய்ப்பளித்ததற்கு கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Transport and Civil Aviation, I move,

"That the Regulations made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Section 143 of the aforesaid Act relating to Motor Traffic (Expressway) Regulations and published in the Gazette Extraordinary No. 2054/8 of 15th January 2018, which were presented on 20.03.2018, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Transport and Civil Aviation, I move,

"That the Regulations made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Section 215A of the aforesaid Act relating to spot fine Regulations and published in the Gazette Extraordinary No. 2054/9 of 15th January 2018, which were presented on 20.03.2018, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 12.30ට, 2018 අප්‍රේල් 06 වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.


அதன்படி பி.ப. 12.30 மணிக்கு பாராளுமன்றம், 2018 ஏப்பிரல் 06, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 12.30 p.m. until 10.30 a.m. on Friday, 06th March, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

259 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 259 - இல. 12
Volume 259 - No. 12

2018 අප්‍රේල් 06වන සිකුරාදා
2018 ஏப்பிரல் 06, வெள்ளிக்கிழமை
Friday, 06th April, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
සභාපති නාමාවලිය: සාමාජිකයන් ආදේශ කිරීම

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ශෝක ප්‍රකාශ:
ගරු එස්. අලවි මවුලානා මහතා
ගරු කරුපයියා වේලායුදම් මහතා
සුරනිමල් රාජපක්ෂ මහතා
යූ.බී. විජේකෝන් මහතා

වරප්‍රසාද:
වෙබ් අඩවි හරහා අපහාස කරන්නන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමු වන වර කියවන ලදී.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමු වන වර කියවන ලදී.

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
தவிசாளர் குழாம் : உறுப்பினர் பதிலீடு

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு எஸ். அலவி மௌலானா
மாண்புமிகு கருப்பையா வேலாயுதம்
மாண்புமிகு சுரநிமல் ராஜபக்ஷ
மாண்புமிகு யூ.பி. விஜேகோன்

சிறப்புரிமை:
இணையத்தளங்களூடாக அவதூறு செய்வோர்மீது சட்ட நடவடிக்கை

தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது.

குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது.

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Chairman's Panel : Substitution of Members

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon S. Alavi Moulana
Hon. Karuppaiah Velayudam
Hon. Suranimal Rajapakse
Hon. U.B. Wijekoon

PRIVILEGE:
Legal Action Against Persons Making Defamatory Remarks through Websites

PENAL CODE (AMENDMENT) BILL:
Read the First time

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
Read the First time

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 අප්‍රේල් 06 වන සිකුරාදා
2018 ஏப்பிரல் 06, வெள்ளிக்கிழமை
Friday, 06th April, 2018

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස්විය
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

සභාපති නාමාවලිය: සාමාජිකයන් ආදේශ කිරීම
தவிசாளர் குழாம்: உறுப்பினர் பதிலீடு
CHAIRMAN'S PANEL: SUBSTITUTION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ අංක 139වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය තුළදී සේවය කිරීම පිණිස 2015 ඔක්තෝබර් මස 07වැනි දින මා විසින් නම් කරන ලද සභාපති නාමාවලියේ ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා සහ ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය වෙනුවට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා සහ ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීම පිණිස මවිසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් කළ ප්‍රකාශය අනුව මට පැහැදිලි කර ගැනීමට අවශ්‍ය කාරණයක් තිබෙනවා. සභාපති නාමාවලිය සඳහා අලුතින් නම් කරන ලද දෙදෙනා අපේ ඒකාබද්ධ විපක්ෂයෙන් නොවෙයි පත්කර තිබෙන්නේ. ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය මීට කලින් සිටියේ ඒකාබද්ධ විපක්ෂයේ. අපේ ඉල්ලීම මත විපක්ෂය වෙනුවෙන් තමයි ඇයව නම් කළේ. එතුමිය සභාපති මණ්ඩලයෙන් ඉවත් කරනවා නම්, ඒ වෙනුවෙන් නම් කළ යුත්තේ අපේ මන්ත්‍රීවරයෙක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාන්තාවක් පත් කළ යුතු නිසයි එහෙම පත් කර තිබෙන්නේ. නමුත් ඒක වෙනස් කරන්න පුළුවන්. ඒකට අවස්ථාව තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි කාන්තාවක් සොයා ගනිමු. කාන්තාවක් නැත්නම් පිරිමියෙක් හෝ නම් කරන්න අවශ්‍යයි නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට ඒ ගැන බලන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අසාධාරණයේ සීමාවක් තිබිය යුතුයි. ඒකයි මම කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම හදලා නොවෙයි ඒක වුණේ. එහෙම වුණේ කාන්තාවක් අවශ්‍යයි කියන යෝජනාව නිසයි. ඒක ප්‍රශ්නයක් නැහැ. කිසිම අසාධාරණයක් නැහැ, ඒක අවශ්‍ය විධියට වෙනස් කරන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපට හිමි ඒ අයිතිය ආරක්ෂා කරන්න කියලායි අපි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, නම් කරන්න. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් නම් කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි නම් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මන්ත්‍රීවරියක් ඉන්නවා නම්, නම් කරන්න වෙයි. එහෙම නැත්නම් මන්ත්‍රීවරයෙක් වුණත් කමක් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ. එතකොට ගැටලුවකුත් නැහැ. අපි එහෙම පිටින්ම ඒකට එකඟ වෙනවා. මේක හිතා මතා කරපු දෙයකුත් නොවෙයි.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

I

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on,

(i) Orders under Section 27 (1) of the Universities Act, No. 16 of 1978;

(ii) Order under Section 25 A of the Universities Act, No. 16 of 1978;

and

(iii) Order under Section 27 (1) (b) of the Universities Act, No. 16 of 1978"

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

II

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ නියමයන්" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ටී. බී. ඒකනායක මහතා (ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரி.பி. ஏக்கநாயக்க - காணி இராஜாங்க அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - State Minister of Lands)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 1184/1 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ. පමුදිනී ජයලත් මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මකුල්පොත, නිකවැහැර යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. වසන්ත දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයෙහි විශේෂ විමර්ශන අංශයේ සේවයේ නියුතු කේ.ආර්.පී. දුල්වල මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள்: திருகோணமலை மாவட்டம்
PLACES OF ARCHAEOLOGICAL INTEREST: TRINCOMALEE DISTRICT

1232/'16

1. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் அமைந்துள்ள தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இடங்களில் தற்போது பாதுகாப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்ற இடங்கள் யாவை;

(iii) இதற்காக 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(iv) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் அழிக்கப்பட்ட தொல்பொருளியல் ரீதியில் பெறுமதிமிக்க இடங்கள் யாவை;

(v) மேற்படி அழிவுகள் பற்றிய மதிப்பீடொன்று செய்யப்பட்டிருப்பின், மதிப்பீட்டுப் பெறுமதி வெவ்வேறாக எவ்வளவு;

(vi) மேற்படி அழிவுகள் தொடர்பாக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(vii) மேற்படி அனைத்தினதும் முழுமையானதோர் அறிக்கையை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) how many places of archaeological interest are located in the Trincomalee District;

(ii) how many places conservation activities are being undertaken out of the aforesaid sites;

(iii) what amounts were allocated in the years 2015 and 2016 for this purpose, separately;

(iv) what places of archaeological interest were destroyed by the LTTE terrorists;

(v) if an assessment of such destructions has been undertaken, what the estimated value is in respect of each site separately;

(vi) whether legal measures have been taken in respect of these destructions; and

(vii) whether he will submit a comprehensive report on all above?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) තවදුරටත් ගවේෂණය කෙරෙමින් පවතින බැවින්, නිශ්චිතව ප්‍රමාණය කිව නොහැක. මේ වන විට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක සංඛ්‍යාව 173කි.

(ii) - දෙහිවත්ත දාගැබ සංරක්ෂණය.

- විල්ගම්වෙහෙර සංරක්ෂණය.

- සිරිමංගලපුර කැණීම් කරන ලද ගොඩනැඟිල්ල. (තවම කැණීම් සිදු කෙරෙමින් පවතී.)

- සාම්පූර් ස්තූපය -(තවම කැණීම් සිදු කෙරෙමින් පවතී)

- කින්නියා උණු වතුර ළිං ආශ්‍රිත චෛත්‍ය ගොඩනැඟිල්ල - ප්‍රතිපාදන වෙන් වී ඇත. 2018 වර්ෂයේ සංරක්ෂණය කෙරේ.

(iii) දෙහිවත්ත දාගැබ සංරක්ෂණය (2016) - රුපියල් 1,364,301.00

විල්ගම්වෙහෙර දාගැබ සංරක්ෂණය - දාගැබ සංරක්ෂණයේ අධීක්ෂණ කටයුතු පමණක් දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබයි.

(iv) දැනට හඳුනාගෙන ඇති පරිදි එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද ස්ථාන නැත.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) නැත.

(ආ) දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි විධිමත් විස්තීර්ණ ගවේෂණයක් සිදු කර සියලු පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනා ගත යුතුය. නමුත් මෙතෙක් එලෙස විධිමත් ගවේෂණයක් සිදු කර නොමැත. එබැවින් එලෙස පූර්ණ වාර්තාවක් ලබා දීමට හැකියාවක් නොමැත.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)

(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මම මීට පෙර දිනයකත් වවුනියා දිස්ත්‍රික්කයට සම්බන්ධ ප්‍රශ්නයක් ඇහුවා. ඒ අවස්ථාවේදීත් අධ්‍යාපන අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. එදාත් මෙතුමා තමයි මගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නේ. නමුත්, ඊට ටික වේලාවකට පසු අධ්‍යාපන ඇමතිතුමා මේ පාර්ලිමේන්තු සභා ගැබට පැමිණියා. මම මේ පාර්ලිමේන්තුවට යොමු කරලා තිබෙන පුරා විද්‍යාවට සම්බන්ධ ප්‍රශ්නවලට උත්තර දෙන්න සහ අතුරු ප්‍රශ්න අසන වෙලාවේ ඒවාට උත්තර දෙන්න වග කිව යුතු විෂය භාර අමාත්‍යවරයෙක් නොසිටියොත් වෙන්නේ ඒ අසන ප්‍රශ්නය අදාළ අමාත්‍යවරයාට නැවත යොමු කිරීමයි. ගරු කථානායකතුමනි, මේ නිසා මගේ වරප්‍රසාදයක් උල්ලංඝනය වෙනවා. මොකද, මා ඇසූ ප්‍රශ්නයට මෙතුමා උත්තර දීලා විනාඩියකින් පමණ අමාත්‍යතුමා මෙතැනට පැමිණියා. මා මේ අසන ප්‍රශ්න මේ රටේ පුරා විද්‍යාත්මක ඓතිහාසික උරුමයන්ට සිදුවෙලා තිබෙන විනාශයන් පිළිබඳ ප්‍රශ්නාවලියක්. ඇමතිතුමාගේ වගකීම තමයි ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම. මේ රටේ යහ පාලනය, සහජීවනය හදන්න ආපු මේ ආණ්ඩුව, ඒ වාගේම ජාතික සමගිය ගැන මහා තොරම්බල් කථා කරන මේ ආණ්ඩුව අපේ වටිනා බෞද්ධ උරුමයන්ට සිද්ධ වෙලා තිබෙන විනාශය පිළිබඳ අප මේ පාර්ලිමේන්තුවේ අසන අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දීමට වග කිව යුතුයි. අදත් මා අසන අතුරු ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ඇමතිතුමා මේ සභාවේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව එතුමා දැනුවත් කරන්න.

ගරු කථානායකතුමනි, මම අසන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙතුමා දැන් සඳහන් කළ පිළිතුරේදී කිව්වා, සාම්පූර් ප්‍රදේශයේ විනාශ වෙච්ච දාගැබ ගැන. මම එදාත් ඒ පිළිබඳව ඇහුවා. අදත් ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න මේ

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

පාර්ලිමේන්තුවේ වග කිව යුතු ඇමතිවරයා නැහැ. ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ පිහිටි දාගැබ තමයි මෙසේ විනාශ වුණේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මේ සඳහා මැදිහත් වන බවට ප්‍රකාශයක් කරලා තිබුණා. අවුරුදු 11ක් තිස්සේ එල්ටීටීඊ ත්‍රස්තවාදී පාලනය යටතේ තිබුණු, අපේ ත්‍රිවිධ හමුදාව විසින් බේරාගත් දාගැබක් තමයි මේ දාගැබ. ඒ වටිනා ඓතිහාසික උරුමය තමයි එක රැයකින් ඩෝසර් කරලා, විනාශ කර දැම්මේ. බුදුගල ජීනවංශ ස්වාමීන්වහන්සේ විසින් 2017.12.27වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට යොමු කරන ලද ලිපිය මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, 1940 පුරා විද්‍යා ආඥා පනත යටතේ ඇප ලබා දිය නොහැකි වරදක් මේ සිදු කර තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, දාගැබ හදනවා කියලා ඔබතුමන්ලා කියනවා. මම අහන ප්‍රශ්නය තමයි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කුමන නිර්ණායක මතද දාගැබ හදන්නේ? මේකට මුදල් වෙන් කරලා තිබෙනවා නම් එම ප්‍රමාණය සහ දාගැබේ ඓතිහාසිකත්වය රැකෙන පරිදිද හදන්නේ කියලා අඩු ගානේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න පුළුවන්ද?

ගරු කථානායකතුමනි, මේ රටේ ඓතිහාසික ස්ථානවල සිදු වෙච්ච විනාශයන් සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වගකීම අද අත්හැරිලා තිබෙන්නේ. ඒ වගකීම අත්හැරිලා විතරක් නොවෙයි. සමහර ව්‍යාපෘති යෝජනා සඳහා හානි පූර්ණ ඇගයීම් වාර්තා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හොරට සකස් කරනවා කියලා මා ළඟ තොරතුරු තිබෙනවා. මේ රටේ අවුරුදු 2500කට ආසන්න ඉතිහාසයක් ඇති උරුමයක් විනාශ වනතෙක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නිදා ගන්නවා. විෂයය භාර අධ්‍යාපන ඇමතිවරයා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න එන්නේත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි මේ ප්‍රශ්නය එතුමාට යොමු කරමු. යොමු කරලා දැනුවත් කරමු.

ප්‍රශ්නවලට පිළිතුරු දීමට අදාළ අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ සිටිය යුතුයි කියලා තමයි අලුත් ස්ථාවර නියෝගවල තිබෙන්නේ. ඒ සම්බන්ධව මම අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් දැනුවත් කරනවා. ඉදිරියට ඒ අනුව ක්‍රියා කෙරෙයි. ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එතුමාට දන්වලා ඔබතුමා දැනුවත් කරයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, 2018.03.23 දින "රිවිර" පත්තරේ මෙසේ පළ වී තිබෙනවා:

"මැදවෙල රජමහ විහාරයේ අවු-800ක් පැරණි පුස්කොළ පොත් හොරු අරගෙන"

ඒ පුස්කොළ පොත් නැති වීම පිළිබඳව පසුගිය 20වැනි දා පූජාපිටිය පොලීසියට පැමිණිලි කරලා තිබෙනවා. මේවා සම්බන්ධව අහන්නවත් අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ නැහැ. පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන පිළිබඳව අහන්න මම පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ගණනාවක්ම දැම්මා. එතුමා එන්නේම නැහැ. එතුමා පාර්ලිමේන්තුවට එන්න ඕනෑ අපට අතුරු ප්‍රශ්න අහන්න. මෙතුමා කරුමයක් ගෙවන්නේ. මෙතුමාට අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. ගරු කථානායකතුමනි, මාඝ කීයක්, අවුරුදු කීයක් යයිද මේ පාර්ලිමේන්තුවට අදාළ උත්තරය දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ලිපියත් table කරන්න. අධ්‍යාපන ඇමතිතුමා නම් සාමාන්‍යයෙන් බොහෝ අවස්ථාවල පිළිතුරු දෙන්න මේ සභාවට එනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්] මට ඒකෙන් වැඩක් නැහැ. මම කියන්නේ, මම අහපු වග කිව යුතු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ ලිපිය table කරන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, "මැදවෙල රජමහ විහාරයේ අවු-800ක් පැරණි පුස්කොළ පොත් හොරු අරගෙන" යනුවෙන් 2018.03.23 දින "රිවිර" පත්තරේ පළ වූ ලිපිය මා **සභාගත*** කරනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා කැමැති නම්, පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න මා කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතැනදී පැහැදිලි කිරීමක් අවශ්‍යද?

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මෙතුමා ඌව පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නිසායි මා අහන්නේ. පුරා විද්‍යා ස්මාරක ආරක්ෂා කිරීම සම්බන්ධව මෙතුමා කථා කළා. හැබැයි පසුගිය කාලයේ මහියංගනය වෛත්‍යයට මෙහායින් වැවක් හාරනවා කියලා -අඩි සියයක් විතර- පුරා විද්‍යා ගවේෂණයක යෙදුණා. එතකොට මෙතුමන්ලා සද්ද කළේ නැහැ. ඒක හොයා ගත්තාද, නැද්ද දන්නේ නැහැ. අනාථ වෙලා තිබෙනවා. එතැන බුදුරජාණන්වහන්සේ වැඩම කළ තැනක්. එතැන පුරාවිද්‍යා ගවේෂණයක යෙදෙනකොට මෙතුමන්ලා සද්දයක් නැතුව හිටියා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. අපට දැන් ඒ ගැන විවාදයක් අවශ්‍ය වන්නේ නැහැ.

මිශ්‍ර කිරීමට ආනයනය කරන තේ සඳහා සීමා ලිහිල් කිරීම : ක්‍රියාමාර්ග

கலப்பதற்காக இறக்குமதி செய்யப்படும் தேயிலைக்கான வரையறைகளைத் தளர்த்துதல்: நடவடிக்கை

LIFTING RESTRICTIONS ON TEA IMPORTED FOR BLENDING: MEASURES TAKEN

1429/'16

2. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක158ට අනුව, තේ මිශ්‍ර කිරීම සඳහා ආනයන සීමා ලිහිල් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) උක්ත අය වැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී මිශ්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකාවට ආනයන කළ තේ ප්‍රමාණය, මිල සහ ආනයනකරුවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවට තේ ආනයනය කරන ලද ප්‍රධාන තේ ආනයනකරුවන් දස දෙනාගේ නම් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டப் பிரேரணை இலக்கம் 158இன்படி, தேயிலையை கலப்பதற்காக இறக்குமதி வரையறைகளை தளர்த்துவதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்கூறிய வரவு செலவுத்திட்டப் பிரேரணைக் கமைய 2016ஆம் ஆண்டில் கலப்பதற்காக இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட தேயிலையின் அளவு, விலை மற்றும் இறக்குமதியாளர்களின் பெயர்ப்பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) 1977-2016வரை இலங்கைக்குத் தேயிலையை இறக்குமதி செய்த பிரதானமான தேயிலை இறக்குமதியாளர்கள் பத்துப் பேரின் பெயர்கள் ஒவ்வொரு வருடத்துக்கு அமைய வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked Minister of Plantation Industries:

(a) Will he inform this House -

(i) the measures taken to lift the restrictions on importation of tea for blending, as per Proposal No. 158 of the 2016 Budget;

(ii) whether he will submit a list which includes the quantity of tea imported to Sri Lanka in the year 2016 as per the aforesaid Budget Proposal, the price and the names of the importers; and

(iii) the names of the ten main tea importers who imported tea to Sri Lanka in each year during the period from the year 1977 up to 2016, separately?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, පිළිතුර තිබෙනවා. ඇමතිතුමා නම් නැහැ. පළමුවන වතාවට අහපු නිසා ඊළඟ අවස්ථාවේදී පිළිතුර දෙන්නද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක් නිසා පිළිතුර ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අතුරු ප්‍රශ්න යොමු කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2016 අය වැය යෝජනා 158ට අනුව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ලබාගෙන නොමැති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව, ආනයන සීමා ලිහිල් කර නොමැත.

(ii) උක්ත අය වැය යෝජනාව ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

කෙසේ වෙතත් 2016 වර්ෂය තුළ සාමාන්‍ය පරිදි අගය එකතු කිරීම සඳහා සහ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොවන විශේෂිත තේ ආනයනය කිරීම හා සම්බන්ධ තොරතුරු ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(iii) 2006 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවට තේ ආනයනය කරන ලද ප්‍රධාන තේ ආනයනකරුවන් දස දෙනාගේ නම් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

2006 වර්ෂයට පෙර වර්ෂවල තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව නොමැති බව දැනුම් දී ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මෙය ජාතික වශයෙන් ඉතා වැදගත් ප්‍රශ්නයක්. මක්නිසාද යත්, පසුගිය අය වැය ලේඛනයෙන් ලංකාවේ ප්‍රධානතම අපනයන කෘෂිකර්ම භෝගය වන තේවලට මිශ්‍ර කිරීම සඳහා විදේශ රටවලින් තේ ආනයනය කරන්න ඉඩ දෙන බව තමයි මේ ගරු සභාවට යෝජනා කළේ. හිතුවක්කාර ලෙස, වක්කඩ කැඩුවා වාගේ මුදල් අමාත්‍යාංශය පිට රටින් තේ ගෙනෙනවා. වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යතුමාවත් මෙවැනි දෙයකට අනුමැතිය දුන්නාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අපි සාම්ප්‍රදායිකව තේ අපනයනය කරන රටක්.

මෙලෙසින්, දේශීය වශයෙන් නිපදවන භාණ්ඩවලට මිශ්‍ර කරන්න එවැනි ආදේශක විදේශ රටවලින් ගෙනෙන්න ඉඩ ප්‍රස්ථාලබා දීමෙන් දේශීය ගම්මිරිස් කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැටුණා. විදේශ රටවලින් ආනයනය කරන ගම්මිරිස් සමඟ අපේ ගම්මිරිස්වලට කලවම් කිරීම නිසා රුපියල් 1,600ට තිබුණු අපේ ගම්මිරිස් මිල රුපියල් 600 දක්වා පහතට වැටුණා. කජුවලටත් ඒකයි වෙන්නේ. ඉන්දියානු කජු ගෙනැල්ලා ශ්‍රී ලංකා කජු එක්ක ආනයනය කළාම, ශ්‍රී ලංකා කජුවල වෙළෙඳ පොළ කඩා ගෙන වැටෙනවා. තේවලට වෙන්නේත් ඒකයි.

මේවා සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ රජයට ජාතික ප්‍රතිපත්තියක් නැති නිසා, එක එක ජාවාරම්කරුවන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න දේශීය අපනයන කර්මාන්ත කඩා වට්ටන මේ වැරදි ප්‍රතිපත්තිය අනුගමනය කරන්න මුදල් අමාත්‍යාංශයට හෝ ආර්ථික කළමනාකරණ කමිටුවට ඉඩ දෙන්න එපාය කියලා ඇමතිතුමාට දන්වන්න කියන එක තමයි මගේ පළමු ඉල්ලීම. මෙය, ලංකාවේ ඉන්න සමස්ත තේ කර්මාන්තකරුවන්, ගම්මිරිස් අපනයනකරුවන්, එහෙම නැත්නම් වෙනත් සුළු කෘෂි භෝග වර්ග අපනයනකරුවන් සියලුදෙනා මුහුණපාන ජාතික ප්‍රශ්නයක්.

මේ සම්බන්ධයෙන් රජයට ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. එවැනි කිසිදු ප්‍රතිපත්තිමය එකඟතාවකින් තොරව ජාතික ආර්ථිකයට බරපතළ හානිකර වන මෙවැනි තීන්දු තීරණ ගන්න එපා කියලා ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි ඉල්ලා සිටින බව විෂය භාර ගරු ඇමතිතුමාට දැනුම් දෙන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මටත් යමක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයටම සම්බන්ධ දෙයක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔව්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එම ප්‍රශ්නයට කන් දෙන්න කැමැතිද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මේ හා සම්බන්ධ ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් මා මේ ප්‍රශ්නය ඇහුවා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමියගෙන්. දැන් 'Ceylon Tea' කියලා brand කරලා තමයි ලංකාව තේ පිට රට යවන්නේ. ' Ceylon Tea' කියලා brand කර පිට රට යවන තේවලට, මේ විධියට අඩු ගුණාත්මක වටිනාකමක් ඇති තේ මිශ්‍ර කරලා 'Ceylon Tea' නමින් පිට රට යැවීමත් සමඟ ඒ ගුණාත්මකභාවයේ වැටීම නිසා අපේ 'Ceylon Tea' කියන brand name එක විශාල තර්ජනයකට මුහුණ දෙනවා නේද කියන එකයි මම අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3-1741/'17-(1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4-2140/'17-(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5-2205/'17-(1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6-2230/'17-(1), ගරු අශෝක ප්‍රියන්ත මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය හා වාහන: විස්තර

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரின் ஆளணி மற்றும் வாகனங்கள்: விபரம்

PRIVATE STAFF AND VEHICLES OF MINISTER OF FISHERIES AND AQUATIC RESOURCES DEVELOPMENT: DETAILS

2234/'17

7. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப் பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஒவ்வோர் உத்தியோகத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Fisheries and Aquatic Resources Development and has been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) පෞද්ගලික කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ තොරතුරු පහත දැක්වේ.

අංකය	නිලධාරියාගේ නම	තනතුර	වෙන් කර ඇති වාහන වර්ගය	ලියාපදිංචි අංකය	එම වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් නිලධාරියා
1.	ජී.ජී.කේ. ගාමිණී මයා	පෞද්ගලික ලේකම්	මෝටර් රථ	KY-4964	ලේකම්
2.	චමින්ද හේවාකොපර කුමාරසිංහ මයා	සම්බන්ධීකරණ ලේකම්	මෝටර් රථ	PG-2479	ලේකම්
3.	එච්.කේ. තිලකරත්න මයා	සම්බන්ධීකරණ ලේකම්	මෝටර් රථ	CAE-9881	ලේකම්
4.	ඒ.වී.කේ. සනත් මයා	මහජන සම්බන්ධතා නිලධාරී	කැබ් රථ	PB-6029	අතිරේක ලේකම් (පාලන)
5.	එස්.කේ.පී. ඉන්ද්‍රසේන මයා	මාධ්‍ය ලේකම්	කැබ් රථ	PB-5419	අතිරේක ලේකම් (පාලන)
6.	ඕ.ජී. කුසුම් මිය	පෞද්ගලික සහකාර	-	-	-
7.	එන්.එස්. සුමේධනී ලක්මාලි මිය	කළමනාකරණ සහකාර	-	-	-
8.	ආර්.ඊ.ආර්.ඒ. කේසිලා මධුවන්ති මෙය	කළමනාකරණ සහකාර	-	-	-
9.	කේ.ජී. නුවන් කුමාර මයා	කළමනාකරණ සහකාර	-	-	-
10.	වී. පැතුම් රසාංජන මයා	කළමනාකරණ සහකාර	-	-	-
11.	ඩබ්.එච්. හෂාන් චතුරංග මයා	කළමනාකරණ සහකාර	-	-	-
12.	ඒ.වී.කේ. පියතිලක මයා	කාර්යාල සේවක සේවය	-	-	-
13.	එච්.එල්. මහේෂ් කුමාර මයා	කාර්යාල සේවක සේවය	-	-	-
14.	රසික සංජය පෙරේරා මයා	රියැදුරු (ගරු අමාත්‍යතුමාගේ)	-	-	-
15.	නාලක ප්‍රසන්න මයා	රියැදුරු (ගරු අමාත්‍යතුමාගේ)	-	-	-
16.	ඒ.ආර්.කේ. බොතේජු මයා	රියැදුරු (ගරු අමාත්‍යතුමාගේ)	-	-	-
17.	සංජීව උපුල් සම්පත් මුතුකුමාරණ මයා	රියැදුරු (සම්බන්ධීකරණ ලේකම්ගේ)	-	-	-
18.	එල්. අතුර මයා	රියැදුරු (මහජන සම්බන්ධතා නිලධාරීගේ)	-	-	-
19.	කේ.ජී. හේමන්ත මයා	රියැදුරු (සම්බන්ධීකරණ ලේකම්ගේ)	-	-	-
20.	ඩබ්.පී. උපාලි මයා	රියැදුරු (පෞද්ගලික ලේකම්ගේ)	-	-	-
21.	ඒ.ඒ. සුරංග ලක්මාල්	රියැදුරු (මාධ්‍ය ලේකම්)	-	-	-

(ආ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කරනවාට අමතරව මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වශයෙනුත් කටයුතු කරනවා. එම නිසා මේ කාර්ය මණ්ඩලයට අමතරව ඔබතුමා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙනුත් පෞද්ගලික කාර්ය මණ්ඩලයක් සිටිනවාද කියලා දැන ගන්න කැමතියි. ඒ වාගේම දැනට ඔබතුමා සඳහන් කළ කාර්ය මණ්ඩලයේ තොරතුරු අනුව සම්පූර්ණ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ප්‍රමාණය කීයද කියලාත් දැන ගන්න කැමැතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

සම්පූර්ණ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ එකතුව 21යි. මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා විධියට කාර්ය මණ්ඩලයක් ඉන්නවා. එම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට වාහනයක් හෝ ඉන්ධන දීමනා හෝ කිසිවක් ලබා ගෙන නැහැ. කාර්ය මණ්ඩලයක් කටයුතු කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මට මේ සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අතුරු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා.

එකක් තමයි ජනාධිපතිවරයාගේ චක්‍රලේඛය අනුව අමාත්‍යවරයකුට තබා ගත හැකි පෞද්ගලික කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය මා දන්නා පරිදි 15යි. ඔබතුමා දුන් පිළිතුරේ 21ක් ගැන සඳහන් කර තිබෙනවා. මා මේක මහින්ද අමරවීර කියන අමාත්‍යවරයා ඉලක්ක කොට අසන ප්‍රශ්නයක් පමණක් නොවෙයි. අද මේ රටේ ජනාධිපතිවරයා දැන දැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා, ගරු කථානායකතුමනි. අපි දන්නවා, අමාත්‍යවරු සංඛ්‍යාව 30යි, නැත්නම් 40යි කියලා තීරණය කර තිබෙන බව. ජාතික ආණ්ඩුවක නම් ඒක වරින් වර වැඩි කර ගන්නවා. දැන් මේක ජාතික ආණ්ඩුවකුත් නොවෙයි. නමුත්, ජාතික ආණ්ඩුවක් කියලා කියා ගත්තත්, අමාත්‍යවරු සංඛ්‍යාව නිශ්චිත කළාට පස්සේත් එකම ඇමතිවරයාට -එකම පුද්ගලයාට- කාර්ය මණ්ඩල දෙක, තුන දෙනවා. එක ඇමතිවරයකුට අමාත්‍යාංශ දෙක තුනක්, එහෙම නැත්නම් විෂයන් කිහිපයක් සම්බන්ධ කරන එකේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? අපට කිව්වාට ඇමතිවරු ප්‍රමාණය 93යි කියලා, රාජ්‍ය මුදල් පැත්තෙන් ගත්තොත්, ඇමතිවරුන් 100කට, 105කට රටේ ජනතාව මුදල් ගෙවනවා. එතකොට ජනාධිපතිවරයා, අගමැතිවරයා දැන දැන නීති කැඩීමක්, රාජ්‍ය මුදල් විනාශ කිරීමක් මේ තුළ තිබෙනවා. ඒක ඇමතිතුමාගේ පෞද්ගලික කාරණයක් ලෙස මා සලකන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මේ කාර්ය මණ්ඩලය ප්‍රමාණය 21ක් කරගෙන තිබෙන්නේ කොහොමද කියන එකත්, ඒ සඳහා ඔබතුමාට මහ පෙන්වා තිබෙන චක්‍රලේඛය කුමක්ද කියන එකත් මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, අදාළ චක්‍රලේඛන අංකය මා වෙනම ගෙනැවිත් දෙන්නම්. කිසිම ආකාරයකින් අපට අනුමත කාර්ය මණ්ඩලය හැර වෙනත් කාර්ය මණ්ඩලයක් පත් කරගෙන නැහැ. මා ඒක ඉතා වගකීමෙන් කියනවා. චක්‍රලේඛනවලට අනුව පත්කර ගත යුතු කාර්ය මණ්ඩලය තමයි පත් කරලා තිබෙන්නේ. ලේකම්වරුන් ඉන්නවා; ලේකම්වරුන්ගේ රියැදුරන් ඉන්නවා. ඒ වාගේම කළමනාකරණ සහකාර නිලධාරීන් ඉන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අනුමැතියෙන් තොරව බඳවාගෙන නැහැයි කියලා ගරු ඇමතිතුමා කිව්වා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්ට නොවෙයි අනුමැතිය තිබෙන්නේ. ඒක ජනාධිපති චක්‍රලේඛයක්. එම ජනාධිපති චක්‍රලේඛය අනුව ඉන්න පුළුවන් කාර්ය මණ්ඩලය 15යි. ඔබතුමා 21ක් පත් කරගෙන තිබෙන්නේ නීති විරෝධී ලෙසයි. ඔබතුමා කිව්වා නේ අනුමැතිය තිබෙනවායි කියලා. ඒ නිසා ඔබතුමා කරුණාකරලා එම චක්‍රලේඛය ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, මම ඉතා වගකීමෙන් කියනවා චක්‍රලේඛයට පිටින් කිසිදු ආකාරයක පත් කිරීමක් කරලා නැහැයි කියලා. මේක තමයි සියලුම අමාත්‍යවරුන්ට අනුමැතිය ලැබී තිබෙන පත්වීම් ප්‍රමාණය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් සභාවට අයත් මාර්ග : ප්‍රතිසංස්කරණය

இரத்தினபுரி மாவட்டத்தில் மாகாண சபைக்குரிய வீதிகள்: புனரமைப்பு

ROADS IN RATNAPURA DISTRICT UNDER THE PROVINCIAL COUNCIL: RECONSTRUCTION

2295/'17

8. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-

(1).

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සබරගමුව පළාත් සභාවට අයත් මාර්ග කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(ii) එම මාර්ග අතරින් වර්ෂ 2010 සිට මේ දක්වා පළාත් සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් මාර්ගය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පළාත් සභාවට අයත් මාර්ග බොහෝ ප්‍රමාණයක් මේ වන විට ඉතා අබලන් වී ඇති බැවින්, එම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் உள்ள சப்ரகமுவ மாகாண சபைக்கு சொந்தமான வீதிகளின் கிலோமீற்றர் அளவு எவ்வளவென்பதையும்;

(ii) மேற்படி வீதிகளில் 2010ஆம் ஆண்டிலிருந்து இற்றைவரை மாகாண சபையின் மூலம் புனரமைக்கப்பட்ட வீதிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு வீதிக்கும் செலவிடப்பட்ட நிதித் தொகை வெவ்வேறாக எவ்வளவென் பதையும்;

(iv) இரத்தினபுரி மாவட்டத்தில் அமைந்துள்ள மாகாண சபைக்குச் சொந்தமான அநேகமான வீதிகள் இன்றளவில் கடும் சேதமுற்று காணப்படுவதால், அவ்வீதிகளைத் துரிதமாகப் புனரமைப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the length of roads in kilometres in Ratnapura District belonging to the Sabaragamuwa Provincial Council;

(ii) out of the above roads, of the number of roads repaired by the provincial Council from the year 2010 to date;

(iii) separately the amount of money spent on each of the aforesaid road; and

(iv) the steps taken by the Ministry to expeditiously repair these roads, since most of the roads belonging to the provincial council located in the Rathnapura district are in a dilapidated condition?

(b) If not, why?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සබරගමු පළාත් සභාවට මාර්ග කිලෝමීටර් 1460.72ක් අයත් වේ. ඇමුණුම 01 බලන්න.

(ii) එම මාර්ග අතරින් වර්ෂ 2010 සිට මේ දක්වා පළාත් සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සංඛ්‍යාව 1428කි. ඇමුණුම 02 බලන්න.

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා පළාත් සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇමුණුම අංක 03 මඟින් දක්වා ඇත.

(iv) 2018 වර්ෂය සඳහා වාර්ෂික අය වැය මඟින් සබරගමුව පළාත් සභාවට පළාත් මාර්ග සංවර්ධන සංරචකය හා පළාත් මාර්ග නඩත්තු සංරචකය සඳහා අනුමත ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීමට රත්නපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරුවන් මඟින් ප්‍රමුඛතාව මත යෝජනා කැඳවා ඇත. එම ප්‍රමුඛතා යෝජනා අනුව මාර්ග සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

2018 වසරේ අමාත්‍යාංශයට වෙන්වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය,

පළාත් මාර්ග සංවර්ධනය සඳහා -රුපියල් මිලියන 400

මාර්ග නඩත්තු සඳහා - රුපියල් මිලියන 502

මීට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන iRoad ව්‍යාපෘතිය යටතේ පළාත් මාර්ග සංවර්ධනය සිදු කරන අතර රත්නපුර දිස්ත්‍රික්කය තුළ iRoad ව්‍යාපෘතියට අදාළව සංවර්ධනය කරනු ලබන මාර්ග ලැයිස්තුව ඇමුණුම් අංක 04 මඟින් දක්වා ඇත.

ඒ හැර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය පළාත් සභා පාරවල් ප්‍රතිසංස්කරණය සඳහා 2018 වසරේ ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, අපේ රාජ්‍ය ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා, පිළිතුරක් ලබා දීම සම්බන්ධව. ගරු කථානායකතුමනි, සබරගමුව පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයකු විධියට මා මේ කාරණය මතක් කරන්න කැමැතියි. සබරගමුව පළාත් සභාව විටෙක යෝජනාවක් සම්මත කර ගත්තා, පළාත් සභාවේ ප්‍රතිපාදන මඟින් මාර්ග සංවර්ධනය කරනකොට බොරලු යොදා මාර්ග සංවර්ධනය කරනවා නම්, අතිවිශේෂ අවශ්‍යතාවක් තිබෙන අවස්ථාවකදී පමණක් ගරු අමාත්‍යවරයා හෝ ප්‍රධාන අමාත්‍යවරයා ප්‍රධාන කණ්ඩායම විසින් අනුමත කරන මාර්ග විතරයි සංවර්ධනය කරන්නේ කියලා. නමුත් මා ළඟ වාර්තාවක් තිබෙනවා. පසුගිය කාල සීමාව තුළ රුපියල් ලක්ෂ 20 බැඟින් පාරවල් 1,293ක් සඳහා බොරලු යොදා මාර්ග සංවර්ධනය කරන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මේ වෙන් කිරීම් හැම එකක්ම වුණේ පසුගිය පළාත් පාලන මැතිවරණය අරභයායි. ඒ ගම්වල ඉන්න සංවිධායකවරුන්ට තමයි අවස්ථාව දුන්නේ බොරලු යොදා ඒ මාර්ග සංවර්ධනය කරන්න. ඇඹිලිපිටිය, මා නියෝජනය කරන රක්වාන වැනි මැතිවරණ කොට්ඨාසවල ඒ කොන්ත්‍රාත් එක කරන පුද්ගලයාගේ ෆොටෝ එක තමයි ඒ හදන පාරවල මහා මාර්ග ඇමතිතුමාගේ ෆොටෝ එකත් එක්ක ගහන්නේ.

අපට මේ සම්බන්ධයෙන් වෙනත් ප්‍රශ්නයක් නැහැ. මොකද, සතියක් යනකොට බොරලු ටික හේදිලා ගියාට පසුව සමහර මාර්ග නැවතත් පැවැති තත්ත්වයටම පත් වෙනවා. මා අහන්නේ, පළාත් සභාව එවැනි තීන්දුවක් ගෙන තිබියදී, මෙවැනි සංවර්ධනයක් කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නැවත සැකසුණේ කොහොමද කියලායි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, බොරලු යොදා සංවර්ධනය කිරීම් ගැන තොරතුරු මට ලැබිලා නැහැ. ඉදිරියේදී එම ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කටයුතු කරන්නම්. ඒ සම්බන්ධයෙන් මට තොරතුරු ලැබිලා නැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්ඩලික හේෂාන් විතානගේ)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. රක්වාන මැතිවරණ කොට්ඨාසයේ රංවල-අකරැල්ල මාර්ගයට අවුරුදු 35කින් තාර ටිකක්වත් යොදා නැහැ. එය පළාත් සභා මාර්ගයක්. අපි කිහිප විටක් ඉල්ලීම් කළා, "මේ මාර්ගය සංවර්ධනය කරන්නේ නැත්නම් මධ්‍යම රජය වෙත පවරා දෙන්න"යි කියා. නමුත් එයත් පළාත් සභාවෙන් සිදු වන්නේ ඉතාම හෙමින්. මා ගරු රාජ්‍ය අමාත්‍යතුමියගෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියා. එය ජනතාව විශාල සංඛ්‍යාවක් භාවිත කරන මාර්ගයක්. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා මහාමාර්ග අමාත්‍යවරයා ලෙස සිටි අවස්ථාවේදී එතුමා උත්සාහ කළා, එය මධ්‍යම රජයට පවරාගෙන සංවර්ධනය කරන්න. මා ගරු රාජ්‍ය අමාත්‍යතුමියගෙන් ඉල්ලීමක් කරනවා, පළාත් සභාව එම මාර්ගය සංවර්ධනය කරන්නේ නැත්නම්, අඩුම තරමින් ඒ මාර්ගයේ අබලන් ස්ථාන හෝ සංවර්ධනය කර දෙන්න කටයුතු කරන්න, එහෙම නැත්නම් ඒ මාර්ගය මධ්‍යම රජයට පවරාගෙන මධ්‍යම රජය හරහා හෝ සංවර්ධනය කරන්න අවස්ථාව ලබා දෙන්නය කියා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -2345/'17- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්ඩලික (திருமதி) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

"ගජමුතු පියස" නිවාස යෝජනා ක්‍රමය : විස්තර
"கஜமுத்து பியச" வீடமைப்புத் திட்டம் : விபரம்
"GAJA MUTHU PIYASA" HOUSING SCHEME: DETAILS

2412/'17

10. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්ඩලික துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල, අනුරාධපුර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා "රිදීබැඳි ඇල්ල" නමින් ඉඩමක් තිබෙන බවත්;

(ii) එම ඉඩමේ "ගජමුතු පියස" නමින් නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මේ වන විට මුදල් එකතු කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එවැනි නිවාස යෝජනා ක්‍රමයක් එම ස්ථානයේ ඉදිකිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමතිය ලබා ගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(ii) මෙම ඉඩමෙහි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මුදල් එකතු කිරීම ද කර ඇති බැවින් කිසියම් නීති විරෝධී කටයුත්තක් සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் - அனுராதபுரம் பிரதான வீதியை நோக்கியதாக "ரிதீபெந்தி எல்ல" என்ற பெயரில் காணியொன்று உள்ளதென்பதையும்;

(ii) அந்தக் காணியில் "கஜமுத்து பியச" என்ற பெயரில் வீடமைப்புத் திட்டமொன்றை நிர்மாணிப்பதற்காக தற்போது பணம் சேகரிக்கப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறான வீடமைப்புத் திட்டமொன்றை அந்த இடத்தில் நிர்மாணிப்பதற்காக வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சினதும் தேசிய வீடமைப்பு அதிகாரசபையினதும் அங்கீகாரம் பெறப்பட்டிருப்பின் அது தொடர்பான விபரங்கள் யாவை;

(ii) இந்தக் காணியில் வீடமைப்புத் திட்டமொன்றை நிர்மாணிப்பதற்காக பணம் சேகரிக்கப்பட்டுள்ளதால், ஏதேனும் சட்ட விரோத செயல் இடம் பெற்றிருப்பின், அது தொடர்பாக அமைச்சு எடுக்கும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Is he aware that -

(i) a land called, "Rideebendi Ella" is situated facing the Kurunegala, Anuradhapura main road; and

(ii) money has been collected by now to construct a housing scheme called "Gaja Muthu Piyasa" on the said land?

(b) Will he inform this House of -

(i) the details in that regard, if approval has been obtained from the Ministry of Housing and Construction and the National Housing Development Authority for the construction of such a housing scheme at the said location; and

(ii) the steps taken by the Ministry, if some unlawful act has taken place, as money has also been collected for the construction of a housing scheme on this land?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.
(ii) නැත.

(ආ) (i) මෙවැනි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා දී නොමැත.
(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙය අනුරාධපුරය-කුරුණෑගල මාර්ගයේ තිබෙන වාණිජ වටිනාකමකින් යුක්ත අක්කර 23ක විශාල ඉඩමක්; විශාල ආන්දෝලනයකට ලක් වුණු ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් චෝදනාව එල්ල වෙන්නේ, ඉඩම් අමාත්‍යාංශය භාරව කටයුතු කරන රාජ්‍ය ඇමතිවරයෙකුටයි. මේ ඉඩම පුද්ගලයින්ට බෙදාදීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විරුද්ධ වුණා. හැබැයි ඒ පළාතේ, ඉඩම් පිළිබඳව ඔබතුමාගේ රාජ්‍ය ඇමතිවරයා තමයි දේශපාලනික වශයෙන් ඇඟිලි ගැසීමකින් මේ කටයුත්ත කළේ. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව විශාල කථාවක් දැන් මතු වෙලා තිබෙනවා. මේ නිවාස යෝජනා ක්‍රමය සංවර්ධනය කරන්න කියලා එක් අයෙකුගෙන් රුපියල් ලක්ෂයක් බැගින්, 60දෙනෙකුගෙන්, 70දෙනෙකුගෙන් පමණ මුදල් එකතු කරලා තිබෙනවා. එතකොට රුපියල් ලක්ෂ 60ක්, රුපියල් ලක්ෂ 70ක් පමණ මුදලක් එකතු වෙනවා. මේ මුදල්වලින් මොනවාද සිද්ධ වුණේ, ඒ පිළිබඳව නිසි විගණනයක් තිබෙනවාද, මේ මුදල් කාටද ගියේ, කොහේටද ගියේ, රජයක් යටතේ පවතින අමාත්‍යාංශයක් හැටියට ගරු ඇමතිතුමා මේ පිළිබඳව දැනුවත්ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් තමයි අසා තිබෙන්නේ. එහෙම මුදල් එකතු කිරීමක් එම අමාත්‍යාංශයෙන් සිදු වෙලා නැති බව එතුමා කියා තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නාම ලේඛනයක් ලබාදෙන්න කියා කුරුණෑගල දිස්ත්‍රික් කළමනාකරු හරහා මහව ප්‍රාදේශීය ලේකම්ගෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් ඉල්ලුම් කර තිබෙන බව තමයි දන්වා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඊට අමතරව මෙතුමා කියන පරිදි කවුරු හෝ වංචාවක් කර තිබෙනවා නම් ඒ ගැන පරීක්ෂා කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා ඒ ගැන ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න, ගරු ඇමතිතුමනි. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න අහලා ඉවරද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
නැහැ, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ඒ මුදල් එකතු කිරීම පිළිබඳව නිසි පරීක්ෂණයක් කෙරෙයි කියා මා හිතනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමා ගරු ඇමතිතුමාට එය යොමු කරාවි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රජයේ සේවකයන් අරමුණු කරගෙන, ඔවුන්ට නිවාස ලබාදීමේ ව්‍යාපෘතියක් හැටියට තමයි මේ නිවාස යෝජනා ක්‍රමය හඳුන්වා තිබෙන්නේ. හැබැයි නිවාස දෙක තුන තිබෙන අයටත් මේ නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස ලැබෙනවාය කියා අපිට ආරංචි වෙලා තිබෙනවා. මුදල් තිබෙන ධනවත් අයටත්, විවිධ දේශපාලනික හිතවත්කම් තිබෙන අයටත් මෙහි නිවාස ලැබී තිබෙනවාය කියාත් ආරංචියි. මේ නිවාස ලබාදීම සඳහා අනුගමනය කළ නිර්ණායකය මොකක්ද කියා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඒ පළාතට අදාළ රාජ්‍ය ඇමතිතුමා දැන් උත්තරයක් දෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ටී.බී. ඒකනායක රාජ්‍ය ඇමතිතුමා.

ගරු ටී. බී. ඒකනායක මහතා
(මාණ්පුමිකු ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු කථානායකතුමනි, මෙය යාපහුව මැතිවරණ කොට්ඨාසයේ ආරම්භ කළ නිවාස යෝජනා ක්‍රමයක්.

ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සම සභාපතිවරයා මම. එම යෝජනාව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අනුමත කරලා, මෙම විෂය භාරව කටයුතු කරන සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය භාර අරගෙන තිබෙනවා. මේ කාර්යයේදී සම්මුඛ පරීක්ෂණය පවත්වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් එකතු වෙලායි. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විධිමත්ව රාජ්‍ය නිලධාරීන් කටයුතු කරගෙන යනවා. මීට අමතරව යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමට අදාළවත් විවිධ ආයතනවලින් මේ පිළිබඳව සැලසුම් සකස් කරලා මේ කාර්ය ක්‍රියාත්මක වෙනවා. මොකද, අපි පසුගිය කාලයේ මේ වාගේ ඉතාමත් සාර්ථක නිවාස යෝජනා ක්‍රම 18ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේකත් සාර්ථක ව්‍යාපෘතියක්. පසුගිය කාලයේ ඉඩම් බලෙන් ඇල්ලුවා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්වරයා උසාවි ගියා. ඒත් ඒ ඉඩම් විවිධ අය බලෙන් අත්පත්

[ගරු ටී. බී. ඒකනායක මහතා]

කර ගැනීම නිසා පවරා ගන්න බැරි වුණා. ඒ නිසා ඉතාමත් ඵලදායී යෝජනා ක්‍රමයකට මේවා යොදවන්න ඕනෑ. ඉඩම් නොමැති රජයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මේ අයට ලබා දීම සඳහා තමයි මේ කාර්ය ක්‍රියාත්මක කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් එකතුවෙන් කුරුණෑගල ඒකාබද්ධ කරන ව්‍යාපෘතියක් හැර වෙනත් කිසිදු ක්‍රමවේදයක් මේ තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. පැහැදිලි කර ගැනීමක් කර ගන්න විතරයි. අතුරු ප්‍රශ්නය අහලා අවසන්. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු ඉඩම් රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ සිටීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම ඉඩමෙහි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත්ද, නැද්ද? මොකද, රුපියල් ලක්ෂයක් වාගේ මුදලක් හැම කෙනෙකුගෙන්ම එකතු කළා කියන එක ඒ අය පැහැදිලිවම කියනවා.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු කථානායකතුමනි, මේ නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළාම මේකේ නිවාස කමිටුවක් හදලා තිබෙනවා. ඒ කමිටුවේ ඉන්නේ නිවාස ලාභී නිලධාරීන්. රජයේ නිලධාරීන් ඉන්නවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඉන්නවා. මේ අය ක්‍රියාත්මක කරන වැඩසටහන්වලදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ණයක් ගන්නවා මිසක් මේ අයගෙන් මුදලක් එකතු වෙන්නේ නැහැ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ වුණාට මුදලක් එකතු කරලා තිබෙනවා.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා නේ එවැනි මුදලක් එකතු කරලා නැහැ කියලා. ඒ බව පිළිතුරේ සඳහන් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව විවිධ දේශපාලන කතන්දර තමයි මේවායේ තිබෙන්නේ. ඒ නිසා නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කරපු ගම්මාන 18ක් ගරු කථානායකතුමනි පසුගිය කාලයේ හදලා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහනේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒ පිළිතුරේදී පැහැදිලිව ප්‍රකාශ කළා, එහෙම මුදල් එකතු කිරීමක් ක්‍රියාත්මක වෙලා නැහැ කියලා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒක අදාළ අමාත්‍යතුමා වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාට කියන්නම්. දැන් අපි කරුණාකරලා- [බාධා කිරීමක්]අපි දැන් බොහෝ වෙලාවක් වාද කළා. මම අවස්ථා හතරක් දුන්නා නේ. සාධාරණ වෙන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, තත්පරයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තත්පරයට කථා කරන්න බැහැ. ඔබතුමා අවසාන වශයෙන් කියන්න. [බාධා කිරීමක්] දැන් පිළිතුරක් ලබා දීලා කිව්වා නේ. ඉන්පසු ඒක අදාළ ඇමතිතුමාට යොමු කරන්න පුළුවන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මේ හිටපු රාජ්‍ය ඇමතිතුමාගේ ලේකම්වරයෙක් මුදල් එකතු කළා කියලා විශාල- [බාධා කිරීමක්]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ අංක 2 ප්‍රශ්නයට අදාළව වචනයක් කියන්න මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ප්‍රමාද වී පැමිණීම ගැන මට සමාවෙන්න, ගරු කථානායකතුමනි. 2016 වසරේ දී මුදල් අමාත්‍යාංශය දාලා තිබුණ යෝජනාව අපි දැනට ක්‍රියාත්මක කරලා නැහැ. අපි ක්‍රියාත්මක කරන්නෙත් නැහැ. මොකද, විශේෂයෙන්ම තේ ආනයනය කිරීම ගැන විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් තමයි තිබෙන්නේ. වාසුදේව නානායක්කාර මහත්තයා මේ ගැන ප්‍රකාශයක් කළා. එතුමාගේ කථාව මම රේඩියෝ එකේ අහගෙන හිටියා. අපි ඒකට ඉඩ දෙන්නේ නැහැයි කියන එක ගැන පැහැදිලිවම ප්‍රකාශයක් කරන්න කැමැතියි.

වාර්ෂික රබර් නිෂ්පාදනය: විස්තර
வருடாந்த இறப்பர் உற்பத்தி: விபரம்
ANNUAL RUBBER PRODUCTION: DETAILS

2437/'17

11. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ශ්‍රී ලංකාවේ,

(i) රබර් වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක කවරේද;

(ii) රබර් වගා කර ඇති මුළු හෙක්ටයාර ප්‍රමාණය කොපමණද;

(iii) වාර්ෂික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් කොපමණද;

(iv) වැවිලි සමාගම් හා කුඩා වගාකරුවන් විසින් වාර්ෂිකව නිෂ්පාදනය කරන රබර් කිලෝග්‍රෑම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොෂිල් අමෙච්චරෛ කේට්ට විනා:

(අ) இலங்கையில்,

(i) இறப்பர் செய்கை மேற்கொள்ளப்படுகின்ற பிரதான மாவட்டங்கள் யாவையென்பதையும்;

(ii) இறப்பர் செய்கை மேற்கொள்ளப்பட்டுள்ள மொத்த ஹெக்டயர்களின் அளவு யாதென்பதையும்;

(iii) வருடாந்த இறப்பர் உற்பத்தி எத்தனை மெற்றிக் தொன் என்பதையும்;

(iv) பெருந்தோட்டக் கம்பனிகள் மற்றும் சிறு அளவிலான செய்கையாளர்களால் வருடாந் தம் உற்பத்தி செய்யப்படுகின்ற இறப்பர் கிலோகிராமில் தனித்தனியாக எவ்வளவென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House-

(i) the major rubber cultivating districts of Sri Lanka;

(ii) he total number of hectares under rubber cultivation;

(iii) the annual rubber production in metric tons; and

(iv) separately, the number of kilograms of rubber produced by plantation companies and smallholders?

(b) If not, why?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කෑගල්ල, මහනුවර, කුරුණෑගල, මාතලේ, ගම්පහ, කොළඹ, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, හම්බන්තොට, අම්පාර.

මීට අමතරව වව්නියාව, පොළොන්නරුව හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල පරීක්ෂණ මට්ටමින් වගාවන් සිදු කරනු ලැබේ.

(ii) 2017.12.31 දිනට බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 136, 632 (එක්ලක්ෂ තිස් හයදහස් හයසිය තිස් දෙක) ක් වේ.

(iii) 2017.12.31 දිනෙන අවසන් වූ වර්ෂයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 83,072 (අසූ තුන් දහස් හැත්තෑ දෙක)ක් වේ.

(iv) කුඩා රබර් වතු හිමියන් -2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 56,488 (පනස් හය දහස් හාරසිය අසූ අට)කි. වැවිලි සමාගම් - 2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 26,582 (විසිහයදහස් පන්සිය අසූ දෙක) කි.

(ආ) අදාළ නොවේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වන විට ලංකාවේ රබර් වගා කරලා, ඉතා විශාල කිලෝග්‍රෑම් ප්‍රමාණයක රබර් කිරි නිෂ්පාදනය කළත්, රබර්වල මිල ඉතාම දරුණු ආකාරයට පහත වැටීම නිසා අද රබර් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 200ක පමණ මිලකට පහත වැටිලා තිබෙනවා. ඒ නිසා මේ රටේ දහස් ගණනක් සිටින කුඩා රබර් ඉඩම් හිමියන්ට තමන්ගේ ජීවනෝපාය සලසාගත නොහැකි මට්ටමට පත් වෙලා තිබෙනවා. වැවිලි සමාගම් ආර්ථික වශයෙන් පාඩුදායක මට්ටමට පත් වෙලා තිබෙනවා. මෙන්න මේ තත්ත්වය තුළ 2015 ජනවාරි 08වැනි දා පැවැති ජනාධිපතිවරණ ප්‍රකාශනයේදී "මෛත්‍රී පාලනයක්-ස්ථාවර රටක්" යටතේ රබර් කිලෝග්‍රෑම් එකකට රුපියල් 350ක් දෙනවා කියලා ජනතාව හමුවේ දීපු ප්‍රසිද්ධ ප්‍රකාශය 6,200,000ක ජනතාවක් අනුමත කළා. ඒ අනුව රුපියල් 350ක සහනික මිල හෝ ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කුමක්ද යන්න පිළිබඳව මම ගරු ඇමතිතුමාගෙන් විමසා සිටිනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, දැනට රබර් කිලෝවක් රුපියල් 270කට ආසන්නයේ මිලක දෝලනය වෙනවා. මෙය සම්පූර්ණයෙන්ම පාලනය වෙන්නේ ලෝක වෙළෙඳ පොළේ පවතින රබර් මිල මතයි. අපි දැනට එවැනි ස්ථාවර මිලක් ලබාදීමට ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයක් අරගෙන නැහැ. විශේෂයෙන්ම ජනතාවගේ බදු මුදල්වලින් තමයි මේ ස්ථාවර මිල ලබා දෙන්න වෙන්නේ. එම නිසා ස්ථාවර මිලක් ලබාදීමට ඒ තිබෙන සම්පත්වලින් රුපියල් බිලියන 4ක් පමණ වියදම් වෙන බව අනුමාන කර තිබෙනවා. මෙවැනි සහනාධාර ක්‍රමයකට මුදල් යෙදවීම ගැන අපට කිසිම ගැටලුවක් නැහැ; කිසිම ප්‍රශ්නයක් නැහැ. එය ඉතාමත්ම හොඳ දෙයක්. නමුත්, තවත් තැනකට යොදවන මුදල්, සම්පත් කපා දාලා, ඉතාමත් අමාරු ආර්ථික වාතාවරණයක් තුළ මෙය ලබාදීමට දැනට අමාරුයි. නමුත්, අපි ඒ ගැන අනිවාර්යෙන්ම සලකා බලන බව පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයට පෙරාතුව නැවතත් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මේ වන විට බොහොම අමාරුවෙන්, දරිද්‍රතාවෙන් තමයි කම්කරුවන් සහ කුඩා රබර් ඉඩම් හිමියන් ජීවත් වෙන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

කරන්න. කරන්න බැරි දෙයක් පිළිබඳව 2015 ජනවාරි 08වැනි දා මැතිවරණයට කලින් ප්‍රකාශ කරපු එක වැරැද්දක් හැටියට අපි දකිනවා. එහෙම නැත්නම්, දීපු පොරොන්දුව ඉෂ්ට කරනවා ඇතැයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ කරුණ මා ඔබතුමාගේ අවධානය පිණිස යොමු කරන්න කැමැතියි. ඒ තමයි, ඊළඟට, ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාගේ අවධානය පිණිස යොමු කරනවා, පසුගිය විශ්වාස භංග යෝජනාව පැවැති 4වැනිදා මේ පාර්ලිමේන්තුවේ සිදු කළ විවාදයේදී ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා මා පිළිබඳ අසත්‍ය අභූත චෝදනාවක් නැඟීම. මෙවැනි ආකාරයේ චෝදනා නැඟීම රූපවාහිනිය මඟින් සජීවී විකාශය වීම තුළ මා හට බරපතළ හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා රජයේ වග කිව යුතු ඇමතිවරුන්ට අප වැනි මන්ත්‍රීවරුන්ට අපහාස කරමින් අපේ චරිතය විනාශ කිරීමට කටයුතු කරන්න දෙන්න එපා කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ලිඛිතවත් දීලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා මට ඒ සම්බන්ධයෙන් ලිඛිතව බාර දෙන්න. මම ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Sir, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Navin Dissanayake, do you want to respond?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Sir, this is regarding what is being raised by the Hon. T. Ranjith De Zoysa. On the 04th of April, there was another incident which happened between me and the Hon. Thilanga Sumathipala, the Deputy Speaker. I think, he has made a formal complaint to you. I just want to inform the House that I will also be sending a letter to you about what actually happened. After that, you can have an inquiry on it. I have absolutely no problem. You can have an impartial inquiry on this and find out the truth about what happened.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. That is fine.
ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, the Floor is yours now.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක්, දෙකක් පැහැදිලි කර ගන්න කැමැතියි. විශේෂයෙන්ම පසුගිය දවස්වල ලොකු ප්‍රශ්නයක් මතු වුණා, තේවලට සීනි කලවම් කරලා නිෂ්පාදනය කරනවාය කියලා. ඔබතුමාත් මේ ගැන දන්නවා, ගරු ඇමතිතුමා. ඇත්තටම ඒ චෝදනාවට ලක් වෙච්ච අයත් මේ නිසා දැඩි අපහසුතාවට පත් වුණා. මොකද, මේ පරීක්ෂණය කරපු ක්‍රමවේදය පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා කියලා තමයි මතු වෙලා තිබෙන්නේ. වාර්තාවන් එළි දක්වනවාට වඩා මේ ක්‍රමවේදය පිළිබඳව හරියට හොයලා බලලා, ඔබතුමා විසින් රටට පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා. මොකද, තේ මිලදී ගන්නා ආයතනවලට සහ රටවලට මේ කාරණය ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඔබතුමාට ලිඛිතව මම මේ කාරණය පිළිබඳව දැනුම් දුන්නා. අඩු තරමින් එක්වරම චෝදනාවට ලක් කරන්නේ නැතිව, යම්කිසි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳව පරීක්ෂණයක් කරන එක ගැටලුවක් නොවෙයි. නමුත් ඒ ක්‍රමවේදයත් හරියට දන්නේ නැති නිසා විශාල ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවාය කියන කාරණය පිළිබඳව මම හිතන්නේ ඔබතුමාටත් හොඳ අවබෝධයක් ඇති.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ඔබතුමා අහන කාරණය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. නමුත් ඔබතුමා මගෙන් මේ කාරණය ගැන අහන නිසා මම ප්‍රකාශයක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ඔබතුමාත් නිතරම මට ප්‍රකාශ කරලා තිබෙනවා, තේ නිෂ්පාදනයේදී සීනි මිශ්‍ර කරනවාය කියලා. ඒක විශාල ගැටලුවක්. මේක අපේ "Pure Ceylon Tea" නාමයට වුණු විශාල කැලඹීමක් ලෙස මම සලකනවා. ඒ වාගේම පෞද්ගලික තේ කර්මාන්ත හිමියන් මාව හමුවෙලා මේ ගැන ප්‍රකාශයක් කළා. ඊට සති දෙකකට පසුව කියන්නේවත් නැතිව, ඉතාම ක්ෂණිකව ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා කම්හල් 80ක් raid කළා. "Dhool test" කියලායි අපි ඒකට කියන්නේ; ඒක අලුත් test එකක්; machine එකකින් කරන ඉතාම සරල test එකක්. ඒ test එකෙන් අපි සීනි තිබෙනවාද නැද්ද කියලා හොයා බැලුවා. ඒකෙන්ම සතුටු වෙන්නේ නැතිව අපි මේ samples ටික TRI එකට යැව්වා. තේ පර්යේෂණ ආයතනයෙන් -TRI එකෙන්- සනාථ වුණා, තේවල සීනි මිශ්‍රවෙලා තිබෙනවාද නැද්ද කියලා. සාමාන්‍යයෙන් තේවලට සීනි අඩංගු කරලා තිබෙනවාද නැත්නම් ස්වභාවයෙන්ම එහි සීනි තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මේ ක්‍රමවේදය ගැන ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. නමුත් තේවලට සීනි මිශ්‍ර කිරීම නවත්වන්න මම හිතන්නේ ඔබතුමාත්, මමත් ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයක් ගන්න අවශ්‍යයි.

මම මේ ගොල්ලන් සමඟ සාකච්ඡා කළා. අපි එම තේ කම්හල් හිමියන් පණස් තුන්දෙනාම තේ මණ්ඩලයට ගෙන්වා සාකච්ඡා

කළා. ඒ ගොල්ලන්ට අසාධාරණයක් වෙන්න ඉඩ තබන්නේ නැහැ කියන පැහැදිලි ප්‍රතිඥාව මම ලබා දෙනවා. ඒ වාගේම මේක නැවැත්වීමටත් මම දැඩි ලෙස කටයුතු කරනවා කියන එක පැහැදිලිව කියන්න අවශ්‍යයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා. ඔබතුමා අසන්නේ මේ ප්‍රශ්නය සම්බන්ධ කරුණක්ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ, ගරු කථානායකතුමනි. මම මීට කලින් ගරු ඇමතිතුමාට ප්‍රශ්නයක් යොමු කරලා තිබිලා එතුමා ඒකට පිළිතුරක් ලබා දුන්නා.

ගරු ඇමතිතුමනි, මට දැන ගන්න අවශ්‍ය මෙයයි. මීශ්‍ර කිරීම සඳහා ලංකාවට තේ ආනයනය කරන්නේ නැහැ කියන සහතිකය ඔබතුමා ලබා දුන්නා. නමුත් දැන් ටිකකට කලින් ලබාදුන් පිළිතුරෙහි සඳහන් කර තිබෙනවා, මීශ්‍ර කිරීම සඳහා ලංකාවට තේ ආනයනය කරන ආයතන 10ක නම්. මම හරිද?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඉතාම විශේෂිත තේ වර්ග ලංකාවට ගෙන්වීම සඳහා 1980 ගණන්වල තේ මණ්ඩලයෙන් අවසර දුන්නා. ඒක වෙන්නේ මේ ප්‍රතිපත්තිය නිසා නොවෙයි, එදා -1980 ගණන්වල- මොන්ටෙගු ජයවික්‍රම මැතිතුමාගේ කාලයේ ගත් තීරණය මතයි. ඒ අනුව Assam tea, Darjeeling tea වැනි තේ ඉතාම සුළු ප්‍රමාණයක් ගෙනෙනවා, මීශ්‍ර කිරීමට. නමුත් ඒක වෙන්නේ සම්පූර්ණයෙන්ම අපේ තේ මණ්ඩලයේ අවසරයත්, අනුබැලීමත් සමඟයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, 2016 අය වැය යෝජනා අංක 158හිත් මෙය සඳහන් වනවා, ඔබතුමන්ලා ප්‍රතිඥාව දුන්නේ, මීශ්‍ර කිරීම සඳහා නිදහසේ තේ ආනයනය කරන්න තිබුණු ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්නේ නැහැ කියලා නේද?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
අපි එහෙම තීරණයක් අරගෙන නැහැ.

මම හිතන විධියට 2016 අය වැයේදී තමයි ඔය ගැන ප්‍රකාශ කළේ. නමුත් තේ මණ්ඩලය හා අපේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දැනට මේකට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වෙලා නැහැ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අය වැය යෝජනාව සකස් කරන අවස්ථාවේදී ඔබතුමාගේ අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශයට මෙහෙම දෙයක් ගැන කිව්වේ නැද්ද? අය වැය යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ මුදල් අමාත්‍යාංශය ඔබතුමන්ලාගෙන් එවැනි විමසීමක් කළේ නැද්ද?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
මට ඒ ගැන හරියට මතක නැහැ. අපෙන් අදහස් ලබා ගත්තා කියලා මම හිතන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ඒ ගැන සොයා බලා දැනුවත් කරන්න.

මාමිණියාව වැව ප්‍රතිසංස්කරණය වීමෙන් පසු ගොවීන් මුහුණ දෙන ගැටලු : පියවර

மாமினியாவ வாவி மறுசீரமைக்கப்பட்டதன் பின்னர் விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்: நடவடிக்கை

PROBLEMS FACED BY FARMERS DUE TO REHABILITATION OF MAMINIYAWA LAKE: STEPS TAKEN

2462/'17

12.ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලංකුට්ටිගම ග්‍රාම නිලධාරි වසමේ, මාමිණියාව වැව "වාරි පුබුදු" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද බවත්;

(ii) එහිදී කුඹුරු අක්කර 60ක පමණ ප්‍රමාණයක් ජලයට යටවීමෙන් එම ගොවීන් අන්ත අසරණ තත්ත්වයට පත්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு கெக்கிராவ பிரதேச செயலாளர் பிரிவில், கொல்லங்குட்டிகம கிராம அலுவலர் பிரிவில் மாமினியாவ வாவி "வாரி புப்புது" கருத்திட்டத்தின்கீழ் மறுசீரமைக்கப்பட்டது என்பதையும்;

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

(ii) இதன்போது சுமார் 60 ஏக்கர் வயற்காணிகள் மூழ்கியதனால் மேற்படி விவசாயிகள் மிகவும் நிர்க்கதியான நிலைமைக்கு ஆளாகியுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி பிரச்சினையைத் தீர்த்துவைப்பதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that -

(i) Maminiyawa Lake of Kollankuttigama Grama Niladhari Division in Kekirawa Divisional Secretar's Division was renovated in the year 2010 under the "Vari Pubudu" Project; and

(ii) the farmers have been rendered helpless due to the inundation of paddy fields of about 60 acres?

(b) Will he inform this House of the measures that will be taken to solve aforesaid matter?

(c) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රතිසංස්කරණය කර ඇති බවත්

(ii) වැව් ඉස්මත්තේ පිහිටි පූර්ණ සැපයුම් හා අධි ගංවතුර මට්ටමට අයත් කුඹුරු අක්කර 60ක් පමණ වැව වාන් දමන අවස්ථාවේදී ජලයෙන් යටවන බවත් දන්නෙමි.

(ආ) අනවසරයෙන් ඉඩම් වගා කරන ලද ගොවීන් හඳුනාගෙන ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දීමට අපේක්ෂා කරමි.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹ்மான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, ඒක අනවසර ඉඩමක් නොවෙයි. ඒ අයගේ පුරාණ ඉඩමක්. මමත් ගිහින් බැලුවා. ඔබතුමාත් මට ලියුමක් දුන්නා, ඔබතුමාගේ අධ්‍යක්ෂතුමාට දෙන්න කියලා. මම ගිහින් දුන්නා, ඒක බලා කඩා අයින් කරන්න කියලා. නමුත් ඔබතුමාත්, මමත් යාන්ඔය පළාතට ගිය වේලාවේදී ඔබතුමාගේ අධ්‍යක්ෂතුමාට, "මේක ඉක්මනින් කරන්න" කියලා වෙන වැඩක් ගැන කිව්වා.

මේකත් ඒ වාගේ වැඩක්. ගරු ඇමතිතුමනි, මේ අනවසරයෙන් අල්ලාගත් ඉඩමක් නොවෙයි. අක්කර 60ක පුරාණ ඉඩමක්. උස්සලා තිබෙන කොන්ක්‍රීට් එක කඩලා අහල් 6ක් පහත් කෙරුවොත් ඒ අක්කර 60ම වගා කරන්න පුළුවන් වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත කර දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව, අපි ජලය ඉක්මනින් බැස යාම සඳහා bunt එක උඩ තාක්ෂණිකව උමං හතරක් සාදා තිබෙනවා. මෙතැන අක්කර 60 ගණනක් තිබෙනවා. අපේ මේ අලුත් එසවීම තුළ අක්කර 150ක් වගා කිරීමට හැකිවෙලා තිබෙනවා. ඒ නිසා රජයට කන්නයකට බුසල් 12,000ක් ලැබෙනවා. එතකොට රුපියල් මිලියන 7.2ක අතිරේක ආදායමක් ලැබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, වැවක වැව් තාවුල්ල පිළිබඳව වගකීම තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට. කෙසේ නමුත් යම් හෙයකින් ඉඩම් අහිමි වෙනවා නම්, ඒ අයට විකල්ප ඉඩම් ලබාදීමටත් අපි කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තව ප්‍රශ්න අහන්න තිබෙනවාද?

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹ்மான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, තව අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය වැව ඔබතුමාගේ වාර්මාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත් වැවක්. ඒ වැව පාමුල තිබෙනවා, පොඩි වැව් තුනක්. කිලෝමීටර් තුනක පමණ ඇළක් කපන්න තිබෙනවා. ඒ ඇළවේලි කපා ගත්තොත්, කුඹුරු කරන්න පුළුවන්. දැන් කන්න හතරක් කුඹුරු කර ගන්න බැරි වුණා. ඔබතුමා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න. ඒ වාගේම සිංහල කටුකැලියාව බල ප්‍රදේශයේ මහ විශාල වැවක් තිබෙනවා. ඒක එක්දහස් අටසිය ගණන්වල පැරණි රජවරු හැදූ වැවක්. මේ දෙකම ඔබතුමාගේ කාලයේදී ප්‍රතිසංස්කරණය කරලා දෙයි කියා බලාපොරොත්තු වනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් දෙන උත්තරය මොකක්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් අනුග්‍රහය යටතේ අපි මේ රටේ තිබෙන සියලු ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා PEISEIP ව්‍යාපෘතිය යටතේ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුව යටතේ කුඩා වැව් සියල්ලම ප්‍රතිසංස්කරණය කරන්න ලබන අවුරුද්ද වෙනකොට අපට මුදල් ලැබෙනවා. ඒ අනුව මේ රටේ වාරි ක්ෂේත්‍රයේ අලුත් නැම්මක්, අලුත් යුගයක් උදා කිරීමට මේ යහ පාලන ආණ්ඩුව තුළ අපට හැකියාව ලැබී තිබෙනවා. එතුමාගේ ඉල්ලීම ඉෂ්ට කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. මීළඟට, 13වන ප්‍රශ්නය.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මට තව -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා. පැහැදිලි කිරීමක් කරගන්න ඕනෑ නම් කියන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, ඔබතුමායි මමයි පසුගිය මාසයේ යාන් ඔය ආශ්‍රිත බල ප්‍රදේශයට ගියා. එම බල ප්‍රදේශයේ පළාත් සභා පාසලක දරුවන් තමන්ට ගොඩනැඟිල්ලක් ලබා දෙන ලෙසට ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටියා. ඔබතුමා ගොඩනැඟිල්ලක් හදලා දුන්නා. ඒ ගොඩනැඟිල්ල මදි කියලා දරුවෝ තව ගොඩනැඟිල්ලක් ඉල්ලුවා. ඒ වාගේම ඉස්කෝලෙට යන පාර අබලන් වෙලා කියලා ඒකත් සාදා දෙන ලෙස ඉල්ලුවා. පාසල වටේ වැටක් ගසා දෙන ලෙසත් ඉල්ලුවා. ගරු ඇමතිතුමනි, ඒ පළාතේම යාන් ඔය ආශ්‍රිතව ඇති ගම්මානයක මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා 1974දී හදපු රෝහලක් වසා දමා තිබෙනවා. අද ලෙඩ්ඩු එහේ ඉඳලා කැබිතිගොල්ලෑව දක්වා එනවා. ඒකත් ඔබතුමාගේ විශේෂ අවධානයට මා යොමු කරවනවා. මොකද, ඔබතුමා ගැන විශාල බලාපොරොත්තුවක් යාන් ඔය බල ප්‍රදේශයේ ජනතාව තුළ තිබෙනවා. ඔබතුමා ඉතා ඉක්මනින් මෙම ඉල්ලීම් ඉටු කර දෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, අපි වාරි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන කොට ගොවි ජනතාවගේ අනෙකුත් පහසුකම් ගැනත් බලනවා. ඒ අනුව අපි පාසලට අවශ්‍ය ගොඩනැඟිලි හදලා දුන්නා. විද්‍යාගාරයක් හදන්නත් ලැහැස්ති කළා. මම ඒක පොරොන්දු වෙලා ආවේ. අපි ඒකත් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, අබලන් වූ මාර්ගය හැදීම පිළිබඳ කටයුතු කරන්නට ඕනෑ, පළාත් සභාවෙන් හෝ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්. අපි වාරි ව්‍යාපෘතිකයකදී බලාපොරොත්තු වෙන්නේ, ගොවි ජනතාවගේ ආර්ථික හා සමාජ තත්ත්වය උසස් මට්ටමකට ගෙනෙන්නයි. ඔබතුමා කියන සමහර කාරණා අපට ඉටු කරන්න පුළුවන්. අපේ විෂයයට අදාළ නොවන ඒවා අදාළ ඇමතිවරුන්ට යොමු කරලා කටයුතු කරන්න මම පොරොන්දු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම හොඳයි, ඇමතිතුමනි.

රේගු අපනයන හා ආනයන භාණ්ඩ නිෂ්කාසනය කරන වෙළෙඳ දැන්වීම්: වැය කළ මුදල
சுங்க ஏற்றுமதி/இறக்குமதிப் பொருட்களை விடுவிப்பதற்கான வர்த்தக அறிவித்தல்: செலவிட்ட பணம்
ADVERTISEMENTS ON CLEARANCE OF CUSTOMS EXPORTS AND IMPORTS: MONEY SPENT

2473/'17

13. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රේගු අපනයන භාණ්ඩ පැය 24කින් ද, ආනයන භාණ්ඩ පැය 48කින් ද, නිෂ්කාසනය කරන බව ප්‍රචාරය කළ වෙළෙඳ දැන්වීම් සඳහා රේගු කළමනාකරණ අරමුදලින් රුපියල් මිලියන 40ක් වියදම් කර ඇති බව පිළිගන්නේද;

(ii) රේගු අපනයන හා ආනයන අංශ වෙත භාර දෙන ලියවිලි නිවැරදිව සම්පූර්ණ කර භාර දෙන්නේ නම්, එම භාණ්ඩ පැය 06කට අඩු කාලයක් තුළ නිදහස් කළ හැකි බව සත්‍යයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுங்கம் ஏற்றுமதிப் பொருட்களை 24 மணித்தியாலங்களிலும், இறக்குமதிப் பொருட்களை 48 மணித்தியாலங்களிலும் விடுவிப்பதாக மேற் கொள்ளப்பட்ட வர்த்தக அறிவித்தல்களுக்காக சுங்க முகாமைத்துவ நிதியத்திலிருந்து ரூபாய் 40 மில்லியன் செலவிடப்பட்டுள்ளதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) சுங்க ஏற்றுமதி மற்றும் இறக்குமதி பிரிவு களுக்குக் கையளிக்கப்படும் ஆவணங்கள் சரியாகப் பூர்த்தி செய்யப்பட்டு கையளிக்கப் படுமானால் அப்பொருட்களை 06 மணித்தியா லயங்களுக்குள் விடுவிக்க முடியுமென்பது உண்மையா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House-

(i) whether it is admitted that Rs. 40 million has been spent out of the Customs Management Fund for the advertisements which publicized that the Customs exports and imports would be cleared within 24 hours and 48 hours respectively; and

(ii) whether it is factual that there is a possibility to clear the aforesaid goods within a period of less than six hours, provided that the documents submitted to the Customs Export and Import Divisions are duly and accurately filled?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මුදල් අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අංක MF/CUS/02/ CM/206/203 හා 2016.12.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද 2017.01.04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ආනයනකරුවන් නැවත ලියා පදිංචි කිරීම සඳහා මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට වෙළඳ දැන්වීම් ප්‍රචාරක ආයතනයක් තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ සඳහා රේගු කළමනාකරණ අරමුදලින් මුදල් වියදම් කර නොමැති අතර, ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව රුපියල් මිලියන 20ක් වූ එම මුදල වාර්ෂික අය වැය ප්‍රතිපාදන යටතේ වියදම් කර ඇත.

(ii) ඔව්.

රේගු අපනයන හා ආනයන අංශ වෙත භාර දෙන ලියවිලි නිවැරදිව සම්පූර්ණ කර භාර දෙන්නේ නම් පහත සඳහන් ආකාරයේ භාණ්ඩ පැය 06කට අඩු කාලයක් තුළ රේගුවෙන් නිදහස් කළ හැකිය.

අපනයන අංශය:- විධිමත් රේගු පරීක්ෂාවට ලක් කෙරෙන හා රජයේ අනෙකුත් ආයතනවලින් අවසර ලබා ගත යුතු භාණ්ඩ හැර අනෙකුත් භාණ්ඩ.

ආනයන අංශය:- විධිමත් රේගු පරීක්ෂාවට ලක් කෙරෙන හා රජයේ අනෙකුත් ආයතනවල අනුමැතිය අවශ්‍ය වන භාණ්ඩ හැර පහත දැක්වෙන භාණ්ඩ.

1. ඉක්මනින් නරක් වන සුළු භාණ්ඩ.
2. ආයෝජන මණ්ඩලයේ අනුමැතිය යටතේ ගෙන්වන භාණ්ඩ.
3. ආනයනකරුගේ පරිශ්‍රයේදී පරීක්ෂාවට ලක් කෙරෙන භාණ්ඩ.
4. රේගු පරීක්ෂාවෙන් නිදහස් කරන ලද (Green Channel Facility) ආයතනයන් මඟින් ආනයනය කළ භාණ්ඩ.

(ආ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, දැන් තිබෙන Green Channel ක්‍රමය කරණ කොට ගෙන, රේගුව හරහා ලංකාවට ආනයනය කරන භාණ්ඩ හැම එකක්ම පරීක්ෂාවකට යටත් නොකර, විටින් විට සමහර ආනයනික containers පරීක්ෂා කිරීමේ හේතුව මත ලංකාවට ආනයනය නොකළ යුතු භාණ්ඩ රහසිගතව ආනයනය කිරීමට ඉඩක් ලැබෙනවා නේද? තමුන්නාන්සේලා ඒ සඳහා scanners යොදා ගනිමින්, සෑම container එකක්ම පරීක්ෂා කිරීමට ගෙන තිබුණු තීන්දුව ක්‍රියාත්මක නොකරන්නේ මන්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

වරාය පරිශ්‍රය තුළ scanners යෙදීම ආරම්භ කරලා තිබෙනවා. එහෙම කළත්, සෑම එකක්ම scanners හරහා පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව කරන්න බැහැ. Green Channel Facility එක, නැත්නම් නිදහස් කරන facility එක, පුද්ගලයින්ට තිබෙන facility එක වාගේම තමයි. ඒ කියන්නේ, පුද්ගලයෙක් කටුනායක ගුවන් තොටුපොළෙන් ආවාම Green Channel එකෙන් හරි Red Channel එකෙන් හරි යන්න පුළුවන්. අද සමහර කර්මාන්ත අවුරුදු 5ක්, 10ක්, 15ක්, 25ක් තිස්සේ භාණ්ඩ නිෂ්පාදනය කරලා අපනයනය කරනවා. ඒ ගොල්ලන් සැපයුම් ජාලයේ කොටසක් පමණයි. ඒ ගොල්ලන්ගේ නිෂ්පාදනයට අවශ්‍ය බඩු භාණ්ඩ ඉක්මනට ආනයනය කර ගන්න ඕනෑ.

Just in time, ඒ කියන්නේ, කලට වේලාවට බඩු භාණ්ඩ වෙළෙඳ පොළට ගෙන යන්න තිබෙනවා. උදාහරණයක් හැටියට ඇඟලුම් කර්මාන්තය ගත්තොත්, ඒ වෙනුවෙන් හුහක් දේවල් ආනයනය කරන්න වෙනවා. අද ප්‍රවාහනය තුළත් නිෂ්පාදන සිදු වෙනවා. ඒ කියන්නේ, නැවට බඩු දැම්මාම නැව තුළත් සිදු වෙන ක්‍රියාවලි අද තිබෙනවා. Green channels ඕනෑම තැනක ඇරලා තිබෙන්නේ විශ්වාසයේ පදනම උඩයි. Check කිරීමේදී random check එකක් තිබෙනවා. ඒ කියන්නේ, ගණිතමය ක්‍රමවේදයකට check කිරීමක් තිබෙනවා. ඊට අමතරව සැකයක් තිබුණොත්, ඒ සැකය අනුවත් check කිරීමක් සිදු වෙනවා. ඒ පදනම උඩ තමයි මෙය කරලා තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ආනයන භාණ්ඩ හා අපනයන භාණ්ඩ සඳහා රේගු පරීක්ෂණ අවසන් කිරීමට ගත වන සාමාන්‍ය කාලය දැන් වන විට කොපමණද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන දන්නේ නැති නිසා මට ඒකට නිශ්චිත පිළිතුරක් දෙන්න බැහැ. මම මෙහෙම කියන්නම්. ඒ කාලය ගැන සෑහීමට පත් වෙන්න බැහැ. Variation එකක් තිබෙනවා. සමහර අය ඉක්මනට ඒවා එළියට ගන්නවා. සමහර තැන්වල ලොකු ප්‍රමාදයක් තිබෙනවා කියලා කලින් කලට මුදල් අමාත්‍යාංශයට දන්වනවා. ඒ ගැන සොයා බලන්න අපි මැදිහත් වෙන්නේ එවැනි අවස්ථාවක පමණයි. ඒ නිසා, මට ඒ පැය ගණන කීයද කියලා නිශ්චිත පිළිතුරක් දෙන්න අපහසුයි. [බාධා කිරීමක්] පසුව මම සොයා දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

සාමාන්‍ය ගණන, average time එක කියන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Average time එක මම පසුව සොයා බලා කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 - 2496/'17 - (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 3 - 1741/'17 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මුලතිව් වෙරළ තීරය: ප්‍රදීපාගාරයක් ඉදිකිරීම
முல்லைத்தீவுக் கடற்கரை: கலங்கரைவிளக்கம் நிர்மாணித்தல்
MULLAITIVU COASTAL BELT: CONSTRUCTION OF A LIGHTHOUSE

2205/'17

5. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ තුන්දහස් හාරසියකට අධික පවුල් සංඛ්‍යාවක් ධීවර කර්මාන්තයේ යෙදී සිටින බවත්;

(ii) මෙම ධීවරයන් කිලෝමීටර් 73ක් පමණ දිග වෙරළ තීරය සහ ගැඹුරු මුහුදු භාවිත කරමින් මෙම කර්මාන්තයේ යෙදී සිටින බවත්;

(iii) මෙම ප්‍රදේශයේ ප්‍රදීපාගාරයක් නොමැතිවීම හේතුවෙන්, ධීවර යාත්‍රා වැරදි දිශාවලට ගමන් කිරීම ඇතුළු නොයෙකුත් ගැටලුවලට ධීවර ජනතාවට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ප්‍රදේශයේ ප්‍රදීපාගාරයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කටපොළොව් මත්‍රුම් නීරක වළමූල අපිවිරුත්‍රි අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් මූවායිරත්තු නානූරුක්කුම් අතිකමාන කුටුම්බංකළ් මීන්පිටික් කෛත්තොළිලිල් ඊටුපට්ටුල්ළනර් එන්පතෛයුම්;

(ii) මේර්පටි මීනවර්කළ් ඒරත්තාළ 73 කිලෝමීට්රර් නීළමාන කටර්කරෛ මර්රුම් ආළ්කටලෛප් පයන්පටුත්ති ඉක්කෛත්තොළිලිල් ඊටුපට්ටු වරුකින්රනර් එන්තෛයුම්;

(iii) ඉප්පිරතේසත්තිල් කලංකරෛවිළක්කම් ඉන්මෛයාල්, මීන්පිටිප් පටකුකළ් තවරාන තිසෛයිල් සෙල්ලුතල් උළ්ළිට්ට පල පිරච්සිනෛකළුක්කු මීනවර්කළ් මුකම්කොටුක්ක නේරිටුකින්රතෙන්පතෛයුම්;

අවර් අරිවාරා?

(ஆ) (i) මේර්පටි පිරතේසත්තිල් කලංකරෛවිළක් කමොන්රෛ නිර්මාණිප්පතර්කු නටවටික්කෛ එටුප්පාරා එන්පතෛයුම්;

(ii) ආමෙනින්, අත්තිකති යාතෙන්පතෛයුම්;

අවර් ඉච්සපෛයිල් අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Is he aware that -

(i) more than three thousand four hundred families in Mullaitivu District engage in fisheries industry;

(ii) these fishermen engage in this industry in the deep sea and the coastal belt , which is 73 kilometers long; and

(iii) the fishermen have had to encounter various problems including the wrong navigation of fisheries vessels due to the non-availability of a lighthouse in this area ?

(b) Will he inform this House -

(i) whether action will be taken to construct a lighthouse in this area; and

(ii) if so , the date on which it will be done ?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් මීන්පිටික් කෛත්තොළිලිල් ඊටුපට්ටුවරුම් මීනවක් කුටුම්බංකළින් එණ්ණික්කෛ 2,894 ආකුම්.

(ii) මාවට්ටත්තිලුළ්ළ කරෛයෝරප් පරප්පින් නීළම් 77 කිලෝමීට්රරාකුම්.

(iii) මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් මීනව මක්කළ් කටර්කරෛ මර්රුම් තිසෛයෛ අරින්තුකොළ්වතර්කුප් පොරුත්තමාන මුරෛමෛයෛප් පෙට්රුත්තරුමාරු මීනව මක්කළ් මර්රුම් මීනව අමෛප්පුකළිනාල් විණ්ණප්පම් ඔන්රු සමර්ප්පික්කප්පට්ටුළ්ළතු.

(ஆ) (i) ඉන්තප් පිරතේසත්තිල් වෙළිච්ච විළක්කු නිර්මාණිප් පතර්කාන නටවටික්කෛ ඉලංකෛත් තුරෛමුක අතිකාරසපෛයිනාල් මේර්කොළ්ළප්පට්ටාලුම්, ඉන්ත මාවට්ටත්තින් මීනව මක්කළින් මීන්පිටි නටවටික්කෛක්කු වෙළිච්ච විළක්කුකළ් අවසියමර්රතාක උළ්ළන. ඉතර්කාක 60 අටි උයරමාන කලංකරෛ විළක්කුකළ් 03,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

மாவட்டத்தின் கொக்கிளாய், கள்ளப்பாடு, மாத்தளன் ஆகிய பிரதேசங்களில் ஆசிய அபிவிருத்தி வங்கியின் நிதி உதவியின்கீழ் ஆரம்பிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது.

(ii) இந்தக் கலங்கரை விளக்குகளை நிர்மாணிக்கும் செயற்றிட்டம் இந்த வருடத்தின் ஜூன் மாதத்தில் ஆரம்பிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது.

(இ) ஏற்புடையதன்று.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 2230/'17 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බස්නාහිර පළාතේ වගා කළ/නොකළ කුඹුරු ඉඩම්: විස්තර
மேல் மாகாணத்தில் பயிரிடப்பட்ட/ பயிரிடப்படாத வயற்காணிகள்: விபரம்
CULTIVATED AND UNCULTIVATED PADDY LANDS IN WESTERN PROVINCE: DETAILS

2496/'17

14. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Indika Anuruddha Herath)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෙම වර්ෂයේ මුල් කන්නයේදී බස්නාහිර පළාතේ වගා කරන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) බස්නාහිර පළාතේ වගා නොකළ පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය කොපමණද;

(iii) වගා නොකර පුරන් වූ කුඹුරුවලින් රටට අහිමි වූ වී මෙට්‍රික්ටොන් ප්‍රමාණය කොපමණද;

(iv) වගාකළ එහෙත්, හානි වූ කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(v) සිදු වූ හානිය නැවත වරක් සිදුනොවීමට/අවම කිරීමට ගත් කාලීන ක්‍රියාමාර්ග කවරේද;

(vi) වගා හානි සිදුවීමෙන් අසරණ වූ ගොවීන්ට හානි පූර්ණය ලබා දෙන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වගා නොකරන කුඹුරු වෙනත් ආර්ථික කටයුත්තකට යෙදවීමට අවසර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයනයෙහි නිගමනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இந்த ஆண்டின் முதல் போகத்தில் மேல் மாகாணத்தில் பயிரிடப்பட்ட மொத்த வயற் காணிகளின் பரப்பளவு எவ்வளவென்பதையும்;

(ii) மேல் மாகாணத்தில் பயிரிடப்படாது தரிசு நிலமாக மாறிய வயற்காணிகளின் பரப்பளவு எவ்வளவென்பதையும்;

(iii) பயிரிடப்படாமல் தரிசு நிலமாக மாறிய வயற்காணிகளின் மூலம் நாடு இழந்த நெல் மெற்றிக் தொன் அளவு எவ்வளவென்பதையும்;

(iv) பயிரிடப்பட்ட நிலையில், சேதமடைந்த வயற் காணிகளின் ஹெக்டெயார் பரப்பளவு எவ்வள வென்பதையும்;

(v) ஏற்பட்ட சேதம் மீண்டும் ஏற்படாமலிருப்பதற்கு/ குறைப்பதற்கு எடுக்கப்பட்ட காலத்திற்குப் பொருத்தமான நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) பயிர் சேதமடைந்தமையால் நிர்க்கதியான விவசாயிகளுக்கு இழப்பை ஈடுசெய்வது எப்போது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) பயிரிடப்படாத வயல்களை வேறு பொருளாதார செயற்பாடுகளில் ஈடுபடுத்த அனுமதி வழங்கப் படுமா என்பதையும்;

(ii) ஆமெனின், இதுபற்றி சாத்தியவளக் கற்கை யொன்று மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(iii) மேற்படி சாத்தியவளக்கற்கையின் முடிவு யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) the total extent of paddy lands cultivated in the Western Province during the first season this year;

(ii) the total extent of uncultivated fallow paddy lands in the Western Province;

(iii) quantity of paddy the country lost due to uncultivated fallow paddy lands in metric tons;

(iv) the cultivated but destroyed paddy lands in hectares;

(v) the timely measures taken to prevent/ minimize the recurrence of damage experienced; and

(vi) when will the farmers whose crops were damaged will be compensated ?

(b) Will he also inform this House-

(i) whether permission will be granted to use uncultivated paddy lands for any economic purpose;

(ii) if so, whether a feasibility study has been done; and

(iii) the conclusion of that feasibility study?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017 යල කන්නයේ බස්නාහිර පළාතේ වගා කරන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය

දිස්ත්‍රික්කය	හෙක්ටයාර
කොළඹ	6,193.32 (හයදහස් එකසිය අනූ තුනයි දශම තුනයි දෙක)
ගම්පහ	3,119.87 (තුන්දහස් එකසිය දහනවයයි දශම අටයි හත)
කළුතර	5,924.24 (පන්දහස් නවසිය විසිහතරයි දශම දෙකයි හතර)
එකතුව	15,237.43 (පහළොස්දහස් දෙසිය තිස්හතයි දශම හතරයි තුන)

(ii) බස්නාහිර පළාතේ වගා නොකළ පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය.

දිස්ත්‍රික්කය	හෙක්ටයාර
කොළඹ	1,503.55 (එක්දහස් පන්සිය තුනයි දශම පහයි පහ)
ගම්පහ	13,823.84 (දහතුන්දහස් අටසිය විසිතුනයි දශම අටයි හතර)
කළුතර	6,968.07 (හයදහස් නවසිය හැටඅටයි දශම බින්දුවයි හත)
එකතුව	22,295.46 (විසිදෙදහස් දෙසිය අනූපහයි දශම හතරයි හය)

(iii) වගා නොකර පුරන් වූ කුඹුරුවලින් රටට අහිමි වූ යැයි උපකල්පනය කළ හැකි වී මෙට්‍රික් ටොන් ප්‍රමාණය.

දිස්ත්‍රික්කය	මෙට්‍රික් ටොන්
කොළඹ	4,924.45 (හාරදහස් නවසිය විසිහතරයි දශම හතරයි පහ)
ගම්පහ	45,276.12 (හතළිස්පන්දහස් දෙසිය හැත්තෑහයයි දශම එකයි දෙක)
කළුතර	22,821.96 (විසිදෙදහස් අටසිය විසිඑකයි දශම නවයයි හය)
එකතුව	73,022.54 (හැත්තෑතුන්දහස් විසිදෙකයි දශම පහයි හතර)

අක්කරයට සාමාන්‍ය ඵලදාව බුසල් 65ක් වශයෙන් දළ ඇස්තමේන්තුවකට අනුව, පුරන් වූ කුඹුරු ප්‍රමාණයට අදාළව අහිමි වූ මෙට්‍රික් ටොන් ප්‍රමාණය ගණනය කරන ලදී.

හෙක්ටයාර් 01 - 2.47 අක්කර

සාමාන්‍ය ඵලදාව අක්කර 01 - බුසල් 65

බුසල් 01 - මෙට්‍රික් ටොන් 0.02.04

ඒ අනුව,

පුරන් කුඹුරු හෙක්ටයාර් ගණන x 2.47 x සාමාන්‍ය ඵලදාව බුසල් (65)/0.02.04 = පිළිතුර

උදා - කොළඹ දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු ගණන
= 1503.55 x 2.47 x 65/0.02.04 = 4924.4

(iv) වගා කළ, එහෙත් හානි වූ කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය

දිස්ත්‍රික්කය	හෙක්ටයාර
කොළඹ	හානි නැත.
ගම්පහ දශම බින්දුවයි අට)	347.08 (තුන්සිය හතළිස්හතයි
කළුතර අටයි පහ)	328.85 (තුන්සිය විසිඅටයි දශම
එකතුව	675.93 (හයසිය හැත්තෑපහයි දශම නවයයි තුන)

(v) කොළඹ - අදාළ නැත.

ගම්පහ - ගං වතුර පාලන වැඩසටහන යටතේ හඳුනාගත් ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක කිරීම.

ගම්පහ වැඩසටහන - ගං වතුර හානි

අනු අංකය	ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන
01	ගොත්තගහ අමුණ ප්‍රතිසංස්කරණය
02	කනු වැටිය අමුණ ප්‍රතිසංස්කරණය
03	උඩුමුල්ල අමුණ ප්‍රතිසංස්කරණය
04	පබදළුව යායේ අමුණ ප්‍රතිසංස්කරණය
05	ඉහළ බියන්විල මධ්‍යම ඊරියගහ කුඹුර පිටවෙල්ල ප්‍රතිසංස්කරණය
06	පහළ බියන්විල නැහෙනහිර පිටරවෙල්ල ප්‍රතිසංස්කරණය
07	හෙයියන්තුඩුව උතුර ඇළ ප්‍රතිසංස්කරණය
08	මාකොළ උතුර ඉහළ වැල්ලමුගාර ගොඩවෙල්ල ප්‍රතිසංස්කරණය
09	උඩවෙල අමුණේ ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය
10	සියඹලා ගහ මුල අමුණේ ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය
11	මුත්තෙට්ටුව අමුණ ප්‍රතිසංස්කරණය

කළුතර - සුළු වාරිමාර්ග අලුත්වැඩියා කර ඇත.

(vi) 2018 අය වැය යෝජනා පරිදි, රක්ෂණයට දායක වී හානි වූ වගාවලට මෙන්ම රක්ෂණයට දායක නොවී හානි වූ වගාවලට වන්දි ගෙවීමට අවශ්‍ය මූලික තොරතුරු මේ වන විට ලැබෙමින් පවතින අතර, ගොවිජන සේවා මට්ටමින් හානි වාර්තා කරන ලද විගස අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i) ගොවිජන සංවර්ධන පනතේ විධි විධාන මත කටයුතු සිදු කරනු ලබයි.

(ii) ගොවීන්ගෙන් ලැබෙන ඉල්ලීම්වලට අනුකූල වන පරිදි විවිධ ආයතනවලින් නිර්දේශ ලබාගෙන, එම නිර්දේශ සලකා බලා අවස්ථානුකූලව තීරණය ගනු ලැබේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) කුඹුරු ඉඩම් වෙනත් ආර්ථික කටයුත්තකට යෙදවීම කෘෂි හා පරිසර හිතකාමී ආකාරයට සිදු කළ යුතු බැවින්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් සුදුසු පරිදි සාකච්ඡා කර කාලීන වක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඊට පෙර ඔබතුමාගේ අවධානයට ලක් කරන්නට අවශ්‍යයි, පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑමේදී මතු වී තිබෙන බරපතළ ප්‍රශ්නයක් සම්බන්ධව.

දැන් මුළු රටටම ඒ බරපතළ ප්‍රශ්නය ප්‍රචාරය වී හමාරයි, අද දින ප්‍රචාරය වූ ප්‍රවෘත්ති මඟින් සහ පසුගිය දිනවල ප්‍රචාරය වූ විවිධ ප්‍රවෘත්ති මඟින්. පාර්ලිමේන්තුවේ කථානායකවරයෙක් සිටිනවා. ඒ වාගේම, නියෝජ්‍ය කථානායකවරයෙක් සහ කාරක සභා සභාපතිවරයෙක් සිටිනවා. ඒ අය පත් කරන්නේ පාර්ලිමේන්තුවෙන්. ඔබතුමන්ලාට පැවරී තිබෙන කටයුතු කරගෙන යෑමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඔබතුමාට තර්ජනය කිරීම, නියෝජ්‍ය කථානායකතුමාට තර්ජනය කිරීම හෝ නියෝජ්‍ය කාරක සභාපතිතුමාට තර්ජනය කිරීම නිසා ඒ ධුරයේ කටයුතු කරන්න බැරි වුණොත් පාර්ලිමේන්තුව මහා අර්බුදයකට පත් වෙනවා.

මම බොහොම සතුටු වෙනවා අගමැතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, සභානායකතුමාත් මේ සභාවේ සිටීම ගැන. දැන් රටම දන්නවා පෙරේදා, -අප්‍රේල් 04 වෙනි දා- විශ්වාස භංග යෝජනාව පිළිබඳ ඡන්ද විමසීමෙන් පසු, කථානායකතුමාගේ නිල කාමරය ඉදිරියේදී නියෝජ්‍ය කථානායකතුමා තර්ජනය කිරීමකට ලක් වුණු බව. එතුමා නිලයෙන් පහ කරන බවටත්, එතුමාගේ කටයුතු කරගෙන යෑමට ඉඩ නොදෙන බවටත් සියලු මන්ත්‍රීවරුන් ඉදිරියේ විදුලි සෝපාව ඉදිරියේදී තර්ජනය කර තිබෙනවා. දැන් මේක විවෘත රහසක්. ඔබතුමාට කථානායක ධුරයේ වැඩ කටයුතු කරගෙන යන්නට බැරි තත්ත්වයක් තිබේ නම් ඔබතුමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සියලු මන්ත්‍රීවරුන්ගේ යුතුකමක්. ඒ වාගේම, නියෝජ්‍ය කථානායකතුමාට එතුමාගේ ධුරයේ කටයුතු කරගෙන යන්නට බැරි තත්ත්වයක් පවතිනවා නම් එතුමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම අප සියලුදෙනාගේ බැඳීමක්, වගකීමක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)
Hon. Speaker-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Please allow me to present this. This is a very serious matter. Do not try to suppress. You always try to suppress what has happened. This is an open secret today. -[*Interruption.*] Please sit down! නාඩගම් කරන්නේ නැතිව ඉඳගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, let him finish. Next, I will give you the floor.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේක, කන්ද උඩරට පාරවල ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, I will give you the floor. Let the Hon. Member finish. I will give you time to speak.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේක කන්ද උඩරට පාරවල්වල මිනිසුන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මේක ලංකාවේ උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේ,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම නමක්, ගමක් කිසි දෙයක් නැතිව ගරු කථානායකතුමාට සහ ගරු නියෝජ්‍ය කථානායකතුමාට ඉතාම ගෞරවය සහිතවයි මේ කාරණය ඉදිරිපත් කරන්නේ, පාර්ලිමේන්තුවේ ගෞරවය සඳහා.

කවුරුන් හෝ ධුරයෙන් ඉවත් කරන්න ඕනෑ නම් ඉවත් කරන විධියක් තිබෙනවා. ඒක වෙනම කාරණාවක්. නමුත් නියෝජ්‍ය කථානායකතුමාට තර්ජනය කොට, එතුමාගේ කටයුතු කරගෙන යෑමට ඉඩ නොදී, එතුමාගේ ජීවිතයට තර්ජනයක් කර තිබෙන බවට එතුමා දැන් පොලීසියට පැමිණිලි කර තිබෙනවා.

මේක ලොකු ප්‍රශ්නයක්. මේක පොලීසියට යා යුතුව තිබූ ප්‍රශ්නයක් නොවෙයි. ගරු කථානායකතුමා ඉදිරියේ විසඳිය යුතුව තිබූ ප්‍රශ්නයක්; පක්ෂ නායකයන් ඉදිරියේ විසඳිය යුතු ප්‍රශ්නයක්. බොහොම කනගාටුයි. මම නම් කියන්න උත්සාහ දැරුවේ නැත්තේ මෙහි බරපතළකම නිසයි. මෙය ඔබතුමාටත් very embarrassing. මම සිංහල භාෂාවෙන් ඒක කිව්වේ නැත්තේ මුළු ලංකාවම දැන ගනිවි කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න. කමක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නවීන් දිසානායක ඇමතිතුමා නැඟිටලා ප්‍රකාශයක් කළා, මේ සිද්ධියට එතුමා තමයි සම්බන්ධ කියලා. මේ සිද්ධිය සම්බන්ධ විස්තර අද උදේ විවෘතව රටටම විකාශය වුණා.

ගරු කථානායකතුමනි, අහඹරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා, අද -සිකුරාදා- යන මේ දිනවල ඔබතුමා කථානායක ආසනයෙන් නැඟිට යන විට නියෝජ්‍ය කථානායකතුමා ආසනයට එන්නේ නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා අපි දැක්කා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒ ගැන මම පැහැදිලි කරන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මම පැහැදිලි කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලන්නේ නැහැ. මම මේ කියන්නේ අපි දකින දේ. ඔබතුමාට අපහසුතාවක් ඇති කිරීමට නොවෙයි මේ උත්සාහ කරන්නේ. පාර්ලිමේන්තුවට අපහසුතාවක් ඇති කිරීම වළක්වා ගන්නයි අපි උත්සාහ කරන්නේ. එතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට නිල කාමරයට ඇවිත් ගෙදර යනවා නම්, ඔබතුමා ඔය ආසනයෙන් නැඟිටින අවස්ථාවේ එම ආසනය ලබා නොදෙනවා නම් පාර්ලිමේන්තුවේ ලොකු අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මොකද, අපි ඡන්දයෙන් තේ පත් වුණේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒ ගැන මම දැන් පැහැදිලි කරන්නද, අවසානයේ පැහැදිලි කරන්නද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට කැමති දෙයක් කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය කථානායකතුමා මීට මාසයකට විතර කලින් මට ඇවිත් කිව්වා, එතුමා දේශපාලන වැඩ කටයුතුවල යෙදෙන නිසා නියෝජ්‍ය කථානායක තනතුරේ වැඩ කටයුතුවලට සහභාගි වෙන්නේ නැහැ කියලා. ඒකත් එතුමා නියම විධියටයි කිව්වේ. ඒ අනුව එතුමා ස්වේච්ඡාවෙන්මයි මේ කටයුතුවලට ඉදිරිපත් නොවුණේ. එතුමා ඒක චාරිත්‍රානුකූලව ඉෂ්ට කළා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා කිව්වා, මම දැන් directly දේශපාලන කටයුතුවල යෙදෙන නිසා මේ පුටුවේ වාඩි වෙන එක හොඳ නැහැ කියලා. වෙන එකක් තියා, මාසයකට විතර කලින් ඉල්ලා අස්වීමේ ලිපියත් ජනාධිපතිතුමාට යැව්වා කියලාත් කිව්වා. එහෙම පැත්තකුත් තිබෙනවා. මගේ නිල කාමරයේ මේ සිද්ධිය වුණා කියලා මම දැනුයි දන්නේ. එහෙම සිද්ධියක් වුණා කියලා මට ආරංචි වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාගේ නිල කාමරයේ නොවෙයි, නිල කාමරය ඉදිරියේ. නියෝජ්‍ය කථානායක තිලංග සුමතිපාල මැතිතුමා 2018.04.05වැනි දින දුන් ලිපිය ඔබතුමා ළඟ තිබෙනවා නේ. මම දැන් මෙක කියවන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඔව්. මා ළඟ තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ ප්‍රවෘත්තිය ප්‍රවෘත්ති පත්‍රවල පළ වෙලා, අද උදේ ඒක කියවනු ලැබුවා.

ඉතින් මේ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක්. නියෝජ්‍ය කථානායකතුමා-

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒ ගැන අවධානය යොමු කරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඒ වාගේම නියෝජ්‍ය කථානායකතුමා ඉල්ලා අස් වුණාද, නැද්ද, ඒ ලියුම ජනාධිපතිතුමා ළඟ තිබෙනවාද, නැද්ද කියන එක අපට අදාළ නැහැ. මෙතැනට ඇවිත් ඒ ලිපිය කියවනතුරු එවැනි දෙයක් ගැන අපට දැන ගැනීමට අවශ්‍ය නැහැ. ඉල්ලා අස්වීමක් තිබෙනවා නම්, ඔබතුමා විසින් ඒක සභාවට කියවන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මට එහෙම එකක් ලැබිලා නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
එහෙම නැතිව වෙනත් තැන්වලට භාර දෙන ඉල්ලා අස්වීම් අපි කවුරුවත් භාර ගන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
බොහොම ගරුත්වයෙන් එතුමා සඳහන් කර තිබුණා, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඒ, කියපු කථාවල් ඔක්කොම මම කියන්නේත් නැහැ. මමත් පක්ෂ නායක කමිටුවට සහභාගි වුණා. නමුත් ඒ කියපු කතන්දර ඔක්කොම මම මෙතැන ඇවිත් කියන්නේ නැහැ නේ. ඒක ඔබතුමාත් දන්නවා නේ. යම් යම් සිදු වීම් ගැන එතැන වෙච්ච කථාවල් මම කියන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නියෝජ්‍ය කථානායකතුමා හෝ නියෝජ්‍ය කාරක සභාපතිතුමා එම තනතුරු දරන තුරු එතුමන්ලාට එම තනතුරුවල කටයුතු කිරීමට හැකි තත්ත්වයක් ඇති කර දීම හා එම කටයුතු කිරීමේ දී ඇති වෙන කරදරවලින් ආරක්ෂා කර දීම පාර්ලිමේන්තුවේ හා කථානායකතුමාගේ වගකීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මගේ යුතුකමක් ලෙස මා පිළිගන්නවා. එහෙම අවස්ථාවක් ඇති වීමට ඉඩ දෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ඉල්ලන්නේ එයයි. මෙම ලිපිය පොලිසියට පැමිණිල්ලක් හැටියට ගිහින් තිබෙන නිසා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒ ගැන අවධානය යොමු කළා. පරීක්ෂණයකුත් පැවැත්වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙය ඔබතුමා වහාම මැදිහත් වියයුතු බරපතළ ප්‍රශ්නයක් ලෙස සලකන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පියවර ගන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමා අද උදේ මේ සිද්ධිය ගැන පරීක්ෂණයක් කරන්න පොරොන්දු වුණා. මූලාසනයෙන් එහෙම පොරොන්දුවක් වෙලා තිබෙද්දී මෙතුමා හදන්නේ මේ සිද්ධියට අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබාදෙන්න. පාර්ලිමේන්තුවේ කීර්තිනාමය නැති කරන්නයි මෙතුමා හදන්නේ. ඔබතුමා පොරොන්දුවක් වෙලා තිබුණා. You promised to conduct an inquiry.

අනෙක් කාරණය, මේකයි. ඔබතුමාත් දන්නවා, පක්ෂ නායක රැස්වීමේ දී ප්‍රශ්නයක් ඇති වුණු බව. මමයි ඒ ප්‍රශ්නය ඇදලා ගත්තේ. ඔබතුමා දන්නවා, ඒකට හේතුව. [බාධා කිරීමක්] මම කියන්නම්, පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)ෙෙf
පොඩ්ඩක් එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කියන්නම්. තිලංග සුමතිපාල මැතිතුමා නියෝජ්‍ය කථානායක හැටියට ආණ්ඩුවේ ඇමතිවරයෙකුගේ press conference එකකට සහභාගි වුණා, අගමැතිතුමාට විරුද්ධව. එපමණක් නොවෙයි. එතුමා press conference එකට ගිහිල්ලා, Standing Orders වැරැදියට අර්ථ නිරූපනය කළා. එතුමා කිව්වා, මේ විශ්වාසභංගයට රහස් ඡන්දයක් ගන්න පුළුවන් කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. රහස් ඡන්දයක් ගන්න පුළුවන් අවස්ථා දෙකකදි පමණයි. එකක් කථානායකවරයා පත් කිරීම. අනෙක් එක, ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවෙන් පත් කිරීම. ඒවාගේ පක්ෂග්‍රාහී විධියට වැඩ කළ නිසා තමයි මම පක්ෂනායක රැස්වීමේ දී මේ ප්‍රශ්නය මතු කළේ. මොකක්ද ඔබතුමා දුන් උත්තරය? ඔබතුමා කිව්වා, "මම නියෝජ්‍ය කථානායක නම් ඒ අවස්ථාවට සහභාගි වන්නේ නැහැ" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතකොට එතුමා දැනුවත් කර තිබුණා, දේශපාලන කටයුතුවලට සහභාගි වෙන්නේ නැහැ කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමාගේ ක්‍රියා කලාපය නිසා තමයි මේක ඇති වුණේ. හැබැයි මෙතුමා උදේ පාන්දර මේක ඇදලා he washed his dirty linen in public. එතුමා පාර්ලිමේන්තුවේ ගරුත්වය ගැන කථා කරනවා. උදේ පාන්දර පාර්ලිමේන්තුවේ වෙන සිද්ධීන් ගැන - [බාධා කිරීමක්] Hon. Dinesh Gunawardena, you are washing dirty linen in public.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Navin Dissanayake please. - [*Interruption.*] Hon. Dinesh Gunawardena, please let him explain.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
Can I have the floor, please?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.[බාධා කිරීමක්] අද දිනයේ මීළඟට ශෝක යෝජනා ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ නිසා අපි මේ ගැන ඉක්මනින් සාකච්ඡා කර අවසන් කරමු.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි. මේ, මම පාර්ලිමේන්තුව නියෝජනය කරන දහඅට වන අවුරුද්ද. 2000 වර්ෂයේ තමයි මා ප්‍රථම වරට ආධුනික මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවට පත් වුණේ. එදා සිට අද දක්වා මම පාර්ලිමේන්තුවේ සෙසු මන්ත්‍රීවරයකුගේ නම කෙලෙසෙන විධියට, ආත්ම ගෞරවය නැති වෙන විධියට කිසිසේත්ම වචනයකින්වත් ක්‍රියා කරලා නැහැ. මට එය පැහැදිලිව ප්‍රකාශ කරන්නට පුළුවන්. ඒ වාගේම මගේ නම නොකෙලෙසෙන විධියට මගේ ආත්ම ගෞරවය ආරක්ෂා කර ගෙන මා වැඩ කර තිබෙනවා. පැහැදිලිව මට එය ප්‍රකාශ කරන්නට පුළුවන්.

විශේෂයෙන් මගේ පියා මේ රටේ කීර්තිමත් දේශපාලනඥයෙක්. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකයා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ හොඳ මිත්‍රයා. එතුමා මගේ පවුල ගැන දැනගෙනත්, මා ගැන දැනගෙනත්, මගේ ඉතිහාසය ගැන දැනගෙනත්, මම කිසිසේත්ම මෙවැනි දේවලට සම්බන්ධ නොවෙන බව දැනගෙනත් එතුමා මෙතැනට ඇවිත් මෙවැනි ප්‍රකාශයක් කරන එක ගැන මා කනගාටු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම අපක්ෂපාති පරීක්ෂණයක් කරනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි. එතුමා, ඔබතුමාව මේකට සම්බන්ධ කරගන්න අවශ්‍ය නැහැ. ඔබතුමා සහ මා අතර වෙනම සම්බන්ධයක් තිබෙනවා. ඒක අපේ පවුල් සම්බන්ධයක්. ඒක වෙනම කථාවක්. එය මේ කාරණයට අදාළ කර ගන්න අවශ්‍ය නැහැ නේ. එතුමා, ඔබතුමාගේ නම කියලා, එම සම්බන්ධය ගැනත් ප්‍රකාශ කළා. එය සම්පූර්ණයෙන්ම වැරැදියි. මෙතුමා එන්න ඉස්සෙල්ලා මම ප්‍රකාශයක් කළා, කරුණාකර මේ ගැන ස්වාධීන පරීක්ෂණයක් පවත්වන්න කියා. මට කිසිම ප්‍රශ්නයක් නැහැ.

මෙතැන CCTV footage තිබෙනවා. එතැන හිටපු පොලිස් නිලධාරීන් දෙදෙනාත් ඒ සිද්ධිය දැක්කා. මේ සම්බන්ධයෙන් පොලීසියට ගිහිල්ලා තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. මමත් පොලීසියට ගිහිල්ලා ප්‍රකාශයක් කරන්නම්. ඒක ගැන ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, මම මේ ගැන ඔබතුමාට ලිඛිතව දෙන්නම්. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ ප්‍රකාශය ගැන මා සතුටු වෙනවා. සම්පූර්ණයෙන් ඒ ගැන මා එකඟ වෙනවා. තිලංග සුමතිපාල මහත්මයා එතුමාගේ තනතුර කෙලෙසෙන විධියට, අපක්ෂපාතීව කටයුතු කළාය කියන එක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් නැඟුවා. ඒ සම්බන්ධයෙන් ගරු නවින් දිසානායක ඇමතිතුමා පිළිතුරු දීලා තිබෙනවා. මේක ගැන වැඩිදුරටත් විවාද කරන්න ගියොත් සභාවේ කටයුතු කරගෙන යන්න බැරි වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට විනාඩි 20ක් පරක්කු වෙලා තිබෙන්නේ. මේ ගැන මෙතැනින් එහාට වාද කරන්න ඉඩ දෙන්න බැහැ. දැන් ශෝක ප්‍රකාශ යෝජනාවලට යන්න තිබෙනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් point of Order ඉදිරිපත් කරන්න බැහැ. මා ඒ ගැන පරීක්ෂණයක් කරන්නම්. ශෝක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා දැනටත් විනාඩි 20ක් ප්‍රමාද වෙලා තිබෙනවා. කරුණාකර, සභාවේ කටයුතු කරගෙන යන්න සහයෝගය දෙන්න.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද කාරණය?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவின் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රකාශයේ දී "අපක්ෂපාතීව" යන වචනය කියැවුණේ වැරදීමකිනුයි. "පක්ෂපාතීව" කියලා මා එය නිවැරදි කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ශෝක ප්‍රකාශ යෝජනා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු අලවි මවුලානා මහතා-[බාධා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර, වාඩි වෙන්න. We have to go ahead. විනාඩි 20ක් පරක්කු වෙලායි තිබෙන්නේ. කරුණාකර, සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ඒ ගැන පරීක්ෂණයක් පවත්වනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, වග කිව යුතු කාරණාවක් තිබෙනවා ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය සම්බන්ධයෙන්ද? මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා මා දැනුවත් කරන්නම්. අද විනාඩි 20ක් පරක්කු වෙලායි තිබෙන්නේ. හිටපු ගරු මන්ත්‍රීවරුන්ගේ ඥාතීන්

[ගරු කථානායකතුමා]

ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා මේ අවස්ථාවේදී වෙනත් කරුණු මතු කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකර, සභාවේ කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ද සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, කාරණයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මට mike එක දෙන්න කියන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේකට අදාළව ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ද සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ශෝක ප්‍රකාශ පිළිබඳවද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ද සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මොකක්ද? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
අපි දැන් ශෝක ප්‍රකාශවලට යමු. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක තමයි මම කියන්නේ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා සාධාරණ වෙන්න ඕනෑ. මොකක්ද, මේ විපත්තිය? ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එතුමන්ලාට පැහැදිලි කරලා සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න අවස්ථාව ලබා දෙන්න. දැන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන්න තිබෙනවා. හිටපු ගරු මන්ත්‍රීවරුන්ගේ පවුලේ අය ඇවිල්ලා බලාගෙන ඉන්නවා. [බාධා කිරීම්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මොකක්ද කාරණය? [බාධා කිරීම්] සාධාරණයක් තියෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මීට කලින් මතු කරපු කාරණාව ගැන නොවෙයි මා මේ ප්‍රශ්නය මතු කරන්නේ. පළමුවෙන්ම ගරු අලවි මවුලානා හිටපු ඇමතිතුමාගේ පවුලේ උදවිය ඇතුළු අනෙකුත් හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ පවුල්වල උදවියගෙන් මම සමාව ඉල්ලා සිටිනවා, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම යම් වේලාවක් ප්‍රමාද වීම ගැන.

ගරු කථානායකතුමනි, මෙයට කිසිසේත්ම අදාළ නැති, ව්‍යවස්ථාමය වශයෙන් බරපතළ කාරණයක් ගැනයි ඔබතුමාගේ අවධානය යොමු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපි සැප්තැම්බර් මාසයේ 20වැනිදා පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අංක 17 විධියට සම්මත කරනු ලැබුවා.

එම පනත සංශෝධනය වීම පිළිබඳව පළාත් පාලන මැතිවරණයේ දී වාගේම මේ ගරු සභාව තුළත්, සභාවෙන් පිටතත් විශාල මතවාද කිහිපයක් ගොඩනැඟුණා. ඒක අපි කවුරුත් දන්නවා. එදා ගරු අගමැතිතුමා පොරොන්දු වූ ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබුවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද පෙර වරු 11.30ට ඒ සම්බන්ධයෙන් රැස්වීමක් පැවැත්වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ඒකට වැදගත් වන නිසායි මම කියන්නේ. අපි ඒ රැස්වීමට යන්නේ නැහැ නේ, ගරු කථානායකතුමනි. මම හිතන විධියට මේක ඉතා වැදගත් කාරණාවක්. සභානායකතුමාත් ඒකට එකඟ වෙයි. ගරු කථානායකතුමනි, ඒ පනතේ 3(ආ) (2) වගන්තිය අනුව "කමිටුව විසින් එම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම වාර්තාව තමා වෙත ලැබීමෙන් පසු සති දෙකක කාලයක් ඇතුළත පැමිණ නොසිටින මන්ත්‍රීවරුන්ද ඇතුළුව ඒ සඳහා පක්ෂව ඡන්දය දෙනු ලබන මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් අනුමත කරනු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය."

ගරු පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ඊයේත් සාකච්ඡා කළා. අවශ්‍ය පියවර ගැනීම සඳහා අද රැස්වීම පැවැත්වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, චේතනාන්විතව හෝ බරපතළ ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමක් තිබෙනවා. මේ අවස්ථාවේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරු රාශියක් මේ පාර්ලිමේන්තුවේ සිටිනවා. එහි 2 වන වගන්තියේ තිබෙන්නේ "වාර්තාව සභාගත කිරීමෙන් පසු එක් මාසයක් ඇතුළත දෙවන උප වගන්තියේ නියමයන් ප්‍රකාරව එම වාර්තාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු

නොලබන විට කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ප්‍රධාන ජන වර්ගයන් නියෝජනය කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් යුත් කමිටුවක් පත් කළ යුතුය."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒක කථා කළා, පියවර ගත්තා. මේක දිගට යන්න ඕනෑ නැහැ. ඒක සාකච්ඡා කළා. [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මට අවසන් කරන්න දෙන්න. ඔබතුමා සමාවෙලා මට මේක අවසන් කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහි වටිනාකම අපි තේරුම් අරගෙනයි ඉන්නේ. අපි තේරුම් ගත්තා. තේරුම් අරගෙන තමයි සාකච්ඡා කරලා අවශ්‍ය පියවර ගන්න කමිටුවක් පත් කරන්නට තීරණය කළේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. ඒ අනුව මාර්තු මාසයේ 22 වැනිදා න්‍යාය පත්‍රයේ මේ පනත් කෙටුම්පත විවාද කිරීමට නියමිත වෙලා තිබුණා. හැබැයි, ආණ්ඩුවේ ඉල්ලීම පරිදි ඒ විවාදය පැවැත්වුවේ නැහැ. ගරු කථානායකතුමනි, දැන් එම මාසයක කාලය ඉකුත්වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නිසා තමයි කමිටුවක් පත් කරන්න තීරණය කළේ. ගරු සභානායකතුමා පැහැදිලි කරන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
කමිටුවක් පත් කරන්න බැහැ. සභාවේ මතය විමසන්නේ නැතිව කමිටුවක් පත් කරන්න බැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද පක්ෂ නායක රැස්වීමක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අයට ආරාධනා කර තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද පෙර වරු 11.30ට පක්ෂ නායක රැස්වීමක් තිබෙනවා. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි ඔබතුමන්ලා තුනෙන් දෙක දෙනවාද කියලා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඒක වෙනම ප්‍රශ්නයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තුනෙන් දෙක ගන්න ඡන්දය දෙනවාද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් අවසාන වශයෙන් ඉල්ලන්නේ, - කෝ, මට කථා කරන්න මයික් එක දෙන්නේ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තුනෙන් දෙක ගන්න ඡන්දය දෙනවාද? ඒකට උත්තරයක් දෙන්න කෝ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මට කථා කරන්න මයික් එක දෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඊයේම මේ ප්‍රශ්නය ගත්තා. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මමයි ඊයේ ඔය ප්‍රශ්නය ගත්තේ. ඒක දැන ගෙනයි, මා ඒ ප්‍රශ්නය ගත්තේ. ඒකට අවස්ථාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙතුමා තුනෙන් දෙකක් ගැන කථා කරනවා. තුනෙන් දෙක ගන්න ඡන්දය දෙනවාද කියලා මා එතුමාගෙන් ඇහුවාම එතුමාට දෙන්න උත්තරයක් නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක ඔබතුමාගේ වැඩක් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ වැඩක් තමයි. මම සභානායක. දන්නේ නැද්ද, මම සභානායක කියලා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකොළහමාරෙන් පස්සේ මා අවශ්‍ය පියවර ගන්නවා. අවශ්‍ය නම්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමකුත් කැඳවන්නම්. ඔබතුමන්ලාත් සහභාගි වෙන්න. ඩලස් අලහප්පෙරම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මට කථා කරන්න මයික් එක දෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මා කියන්නේ, ඒ රැස්වීමට කිසිදු ව්‍යවස්ථානුකූල හැකියාවක් හෝ අයිතියක් නැහැ කියන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන සොයා බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේ පනතේ පැහැදිලිව තිබෙනවා, ගරු කථානායකතුමනි. මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙච්චරයි. ඔබතුමා මේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන කටයුත්තට මුද්‍රාවක් බවට පත් වෙන්න එපා. මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අපි මේ විධියටම කිව්වා, පළාත් පාලන මැතිවරණය වෙලාවේදී. ඊයේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා, ඒක සංශෝධනය කරන්න ඕනෑය කියලා. අපි පාර්ලිමේන්තුවේදී කිව්වාම ඇහුවේ නැහැ. පළාත් පාලන ආයතනවලින් හරි අඩක් අක්‍රිය වෙලා -අඩ පණ වෙලා- තිබෙනවා. ගරු කථානායකතුමනි, මා මේ කාරණය කියන්නේ මේ නිසායි. සමාජය කවදා හෝ දවසක කියාවි, නීතිපති ජයන්ත ජයසූරිය මැතිතුමාත්, කථානායක කරු ජයසූරිය මැතිතුමාත් මේ රටේ නීතිය, ව්‍යවස්ථාව පිළිබඳව වැරැදි අර්ථකථන දෙනවාය කියලා. එතකොට ඔබතුමාට වැරැදි නාමයක් එයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මට අවබෝධයක් තිබෙනවා.

ඊළඟට ශෝක ප්‍රකාශ යෝජනා. නිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු අලවි මවුලානා මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව. [බාධා කිරීම්] කරුණාකරලා වාඩි වෙන්න. මේ ශෝක ප්‍රකාශ යෝජනා අවස්ථාවට ඉඩ දීලා, කරුණාකරලා වාඩි වෙන්න. [බාධා කිරීම්] Order, please! ගරු මනෝ ගනේෂන් ඇමතිතුමා වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගෞරවනීය මන්ත්‍රීවරයකු ගැනයි කථා කරන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආරක්ෂාව හම්බ වෙනවා. මාව හම්බවෙලා ඒ ගැන කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අලවි මවුලානා මැතිතුමා ගැන කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මිය ගිය මන්ත්‍රීවරුන් ගැනයි මේ කථා කරන්නේ. [බාධා කිරීම්] වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අලවි මවුලානා මැතිතුමා ගැනයි කථා කරන්නේ. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලාට යම්තම්වත් කනගාටුවක් හිතෙන්නේ නැද්ද? මේ පාර්ලිමේන්තුවට සේවය කරපු ගරු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ගැන කථා කරනකොට මෙහෙම කරදර කරන්නේ ඇයි? [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ ආරක්ෂාව ගැන මා බලාගන්නම්. [බාධා කිරීම්] විසඳුවා. [බාධා කිරීම්] මාව හම්බ වෙන්න. මම ඒ ගැන කියන්නම්.

ශෝක ප්‍රකාශ :
ගරු එස්. අලවි මවුලානා මහතා
அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு எஸ். அலவி மௌலானா
VOTE OF CONDOLENCE :
HON. S. ALAVI MOULANA

[පූ.භා. 11.49]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙම උත්තරීතර සභාව නියෝජනය කරන ලද අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, 1932 ජනවාරි මාසයේ 01 වන දා කොළඹදී උපත ලද අලවි මවුලානා මැතිතුමාගේ දයාබර පියාණන් වූයේ සෙයිඩ් අහමඩ් මවුලානා මැතිතුමායි. සිත්ති රහුමානියා මවුලානා මැතිතුමිය එතුමාගේ දයාබර මෑණියන් වුණා.

ගරු කථානායකතුමනි, එතුමා අධ්‍යාපන කටයුතු හදාරනු ලැබුවේ, බම්බලපිටිය ශාන්ත පීතර විදුහලෙන් සහ මරදාන සහිරා විදුහලෙන්. අධ්‍යාපන කටයුතු මෙන්ම විෂයය බාහිර කටයුතුවලින්ද පාසලේ දීප්තිමත් ශිෂ්‍යයකු වූ එතුමා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසුණේ 1948 වර්ෂයේදීයි.

පසු කලෙක ෆැතුමා හිබ්ෂියා මහත්මිය සමග යුග දිවි ගමනට පිවිසි මවුලානා මැතිතුමා එස්.ඒ. නකීබ් මවුලානා, එස්.එම්. නජීබ් මවුලානා, එස්. හුස්නියා මවුලානා, එස්. අසභානිම් මවුලානා යනුවෙන් පුතුන් දෙදෙනකු සහ දියණියන් දෙදෙනකු මෙලොවට දායාද කළ දයාබර පියකු බවටත් පත් වුණා.

දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල සාමාජිකයකු මෙන්ම පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උපසභාපතිවරයකු වශයෙන්ද කටයුතු කළ මවුලානා මැතිතුමා, 1980 දශකයේ අග භාගයේ සිට කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් මහත් කැප වීමකින් හා උනන්දුවකින් වැඩ කටයුතු කළා. ඊට පසුව එතුමා 1994 වර්ෂයේදී ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවට තේරී පත් වී නියෝජ්‍ය ජනමාධ්‍ය අමාත්‍ය ධුරයටද පත් වුණා. 1997 වසරේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ මවුලානා මැතිතුමා 2000 වසරේදී කම්කරු අමාත්‍යවරයා ලෙසද කටයුතු කළා. එතුමා කම්කරු ඇමතිවරයා ලෙසත්, වෘත්තීය සමිති නායකයකු ලෙසත් කම්කරුවන්ගේ අයිතීන් දිනා ගැනීමට මහත් කැප වීමකින් ක්‍රියා කළ නායකයකු ලෙසත් පෙන්වා දීමට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ධුරය දැරූ එතුමාට දශක භයහමාරක් වැනි දිගු කාලයක් තිස්සේ නිරතව සිටි වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ කිසිදු විටෙක කිසිවකුගෙන් හෝ චෝදනා එල්ල නොවීම එතුමාගේ අවංකභාවය පෙන්නුම් කිරීමට කදිම නිදසුනක් වුණා. එතුමාගේ දේශපාලන සහ වෘත්තීය සමිති කටයුතුවල නිරතව සිටි දීර්ඝ කාලය තුළ, නොසැලීම, වපල නොවීම, දැඩි ප්‍රතිපත්තිගරුක බව යන ගුණාංග එතුමා තුළ අඛණ්ඩව කැපී පෙනුණු ප්‍රධානතම ලක්ෂණයක් සේ අපි දකිනවා.

ගරු කථානායකතුමනි, තම අරමුණු වෙනුවෙන් දීර්ඝව කැප වී දරා සිටීමේ හැකියාවද එතුමා තුළින් දිගටම විද්‍යමාන වූ තවත් නායකත්ව ගුණාංගයක් වුණා. අවස්ථාවාදී හැසිරීම් සැම විටම ඔහුගේ හෙළා දැකීමට ලක්වූ අතර, වසර අසූහතරක ජීවිතයේ කිසිදු විටෙක අවස්ථාවාදී වූ බවට කිසිම චෝදනාවක් එතුමාට එල්ල නොවීම අලවි මවුලානා මැතිතුමාගේ චරිතයේ විශේෂත්වයක් හැටියට අපි දකිනවා. පටු සීමාවන් තුළ සිර නොවුණු අලවි මවුලානා මැතිතුමා මුස්ලිම් ජනතාවට පමණක් නොව මුස්ලිම් නොවන ජනතාවටද සුවිශාල මෙහෙවරක් ඉටු කළ සැබෑ මහජන නියෝජිතයෙක්. නිරතුරුවම සුහද සිනහවෙන් යුතු, මනා පෞරුෂයකින් හෙබි, උසින් වැඩුණු, ජවසම්පන්න දේහයකින් පිරිපුන් මෙතුමා අවුරුදු 84ක් ආයු වළඳා 2016 ජූනි මස 15 වැනි දින මෙලොවින් සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1994 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා අවුරුදු 07ක පමණ කාලයක් පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු ලෙසත්, ඇමතිවරයෙකු ලෙසත් කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට මෙන්ම වෘත්තීය සමිති සාමාජිකයන් වෙනුවෙන්ද සුවිශාල මෙහෙවරක් ඉටු කළ ගරු අලවි මවුලානා මැතිඳුන්ට ජෙන්නතුල් ෆිර්දවිස් හිමි වේවායි! ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව සහ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

[පූ.භා. 11.54]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු අලවි මවුලානා මැතිතුමා පිළිබඳව ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ශෝක යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු අලවි මවුලානා මැතිතුමාගේ ජීවිත කාලය ගැන ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා දීර්ඝ වශයෙන් කථා කළ නිසා මා ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මා අලවි මවුලානා මැතිතුමා හඳුනා ගත්තේ කොළඹ නගර සභාවේ මන්ත්‍රීවරයකු හැටියට සිටියදීයි. එතුමා වෘත්තීය සමිති නායකයෙක් හැටියට ප්‍රසිද්ධියක් ලබා තිබුණා. ඒ වාගේම එතුමා කොළඹ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියටත් ප්‍රසිද්ධියක් ලබා තිබුණා. ඒ කාලයේ නගර සභාවේ යම්කිසි ප්‍රශ්නයක් විසඳා ගන්න ඕනෑ නම්, හැම එක්කෙනාම ගියේ අලවි මවුලානා මැතිතුමා මුණ ගැහෙන්නයි.

එතුමාට කොළඹ ප්‍රදේශයේ ඒ තරම් ප්‍රසිද්ධියක් තිබුණා. ඒ වැඩ කටයුතු කරන අතරේ, මූලික වශයෙන් වෘත්තීය සමිති ව්‍යාපාර ගණනාවක් එක්ක එතුමා කටයුතු කළා. බොහෝ විට අපි හිටපු ආණ්ඩුවට විරුද්ධව වැඩ වර්ජන යොදවන්න එතුමා ක්‍රියා කළා. ඒ නිසා මට විටින් විට එතුමා මුණ ගැහෙන්නත් අවස්ථාව ලැබුණා. නමුත් එතුමා සමඟ ළඟින් ආශ්‍රයක් ඇති වුණේ පාර්ලිමේන්තුවට පැමිණියාට පසුවයි. එතුමා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වෙලා මේ ගරු සභාවට පැමිණියා. ඒ කාලයේ අපි විපක්ෂයේ ඉන්දෙද්දි, එතුමාත්, අපි ජාතික ලැයිස්තුවෙන් පත් කළ අස්වර් මන්ත්‍රීතුමාත් අතරේ අවස්ථා ගණනාවකදී මේ ගරු සභාවේ ගිය වාද විවාද ගැන මම මෙතැන කියන්න වුවමනා නැහැ. එහෙම වුණොත් මේ කාලයේ ඉතිහාසය ලියනකොට ඒ දේවලුත් එතැනට ඇතුළු වෙයි.

අලවි මවුලානා මැතිතුමා නියෝජ්‍ය ඇමති හැටියට ජනමාධ්‍ය වැඩසටහන් සම්බන්ධවත් ක්‍රියා කළා. කම්කරු ඇමති හැටියට එතුමා කම්කරු ප්‍රශ්නවලට දැක්වූ උනන්දුව මම දන්නවා. අපි විපක්ෂයේ ඉඳගෙන අපේ වෘත්තීය සමිති පිළිබඳව එතුමා එක්ක සාකච්ඡා කරද්දි හැම අවස්ථාවේදීම එතුමා අපිට ඒ ආධාර උපකාර කළා. පසුව එතුමා කටයුතු කළේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හැටියටයි. දේශපාලන වශයෙන් අපි කණ්ඩායම් දෙකකට අයිති වුණාට, එතුමාට ඒ දේශපාලනය ප්‍රශ්නයක් වුණේ නැහැ. සමහර විට මට කථා කරනවා; ප්‍රශ්න ගැන අහනවා. මම අගමැති වෙලා සිටියදීත්, විපක්ෂ නායකවරයා වෙලා සිටියදීත් කොළඹ ගැන එතුමා මා සමඟ කථා කළා.

එතුමා සොයා බැලූ තවත් කාරණයක් තිබුණා. අපේ හිටපු ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරමින්, පලස්තීනය ගැන විශේෂ උනන්දුවක් දක්වමින් තමයි එතුමා ක්‍රියා කළේ. එතුමා එක්ක තිබුණු ඒ ආශ්‍රය නිසා මේ ප්‍රදේශවල තිබෙන ප්‍රශ්න ගැන එතුමාට වාගේම මට තිබුණු අවබෝධය තවත් වැඩි වුණා. එතුමා ඕනෑම ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුවේ කථා කරනවා. එතුමාට ඒ දැනුම තිබුණා. එතුමා භය නැතිව කථා කළා. පාර්ලිමේන්තුව ඇතුළේ විතරක් නොවෙයි, මාධ්‍ය තුළත් ඒ කාලයේ ඔක්කොම දැනගෙන සිටි නමක් තමයි අලවි මවුලානා කියන නම. වෘත්තීය සමිති

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

නායකයෙක් හැටියට, නගර සභිකයෙක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට, ඇමතිවරයෙක් හැටියට, ආණ්ඩුකාරවරයෙක් හැටියට අපි හැමෝම එතුමා ගැන දැනගෙන හිටියා. අපිට එක අවස්ථාවක ගැටලුවක් මතු වුණා, ආණ්ඩුකාරවරයා හැටියට එතුමා දේශපාලනයට සම්බන්ධ වෙන්න ඕනෑද කියලා.

එතුමා දේශපාලනයට සම්බන්ධ වීම ගැනත් විරුද්ධ වුණා. එතුමාගේ මුළු ජීවිතයේම තිබුණේ දේශපාලනය. දේශපාලනයෙන් පිට ජීවිතයක් අලවි මවුලානාට තිබුණේ නැහැ. එතුමාට දේශපාලනය නැත්නම් ජීවත් වන්න හේතුවක් නැහැ. කෙසේ හෝ එතුමාගේ කාලය තුළ සාමාන්‍ය ජනතාව වෙනුවෙන්; වැඩ කරන ජනතාව වෙනුවෙන් එතුමා විශාල සේවයක් කළා. ඒක අපි මේ ගරු සභාවේදී සඳහන් කරන්න ඕනෑ. එබැවින් එතුමා කළ සේවය ගැන ස්තුති කරමින්, ඉස්ලාම් ආගම අනුව එතුමාට ස්වර්ගය ලැබේවා කියා මා ප්‍රාර්ථනය කරනවා.

ගරු කථානායකතුමනි, මට අද දවල් වරුවේ මේ ගරු සභාවට පැමිණිය නොහැකි නිසා අද දිනට නියමිත අනික් ශෝක යෝජනා තුන ගැනත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්න මා කැමැතියි.

යූ.බී. විජේකෝන් මහතා 1978දී මාත් සමඟ පාර්ලිමේන්තුවට පැමිණියා. මා කැලණියේ සංවිධායක වන අවස්ථාවේදී එතුමා දඹදෙනිය ආසනයේ සංවිධායක හැටියට සිටියා. 1952න් පස්සේ එක්සත් ජාතික පක්ෂය දඹදෙනිය ආසනය දිනා තිබුණේ නැහැ. කවුරුවත් හිතුවේවත් නැහැ, එක්සත් ජාතික පක්ෂයට නැවත දඹදෙනිය ආසනය දිනන්න පුළුවන් වෙයි කියලා. 1970දී ආර්.ඩී. සේනානායක මහතා දඹදෙනිය ආසනයට ස්වාධීනව තරග කරද්දි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දඹදෙනිය ආසනය දිනුවා. එහෙත්, එතුමා ඒ කාලයේ දඹදෙනිය ආසනයට කරපු වැඩ කටයුතු පිළිබඳව මා දන්නවා. එතුමා හැම දාම වාගේ දඹදෙනිය ආසනයට ගියා; ජනතාව සංවිධානය කළා; පක්ෂ සංවිධාන ඇති කළා. 1977දී මහ මැතිවරණයේ ප්‍රතිඵල සමඟ විජේකෝන් මැතිතුමාත් පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමා රාජ්‍ය සේවයේ හිටපු නිසා විටින් විට එතුමායි, මායි පරණ පාර්ලිමේන්තුවේදී මුණ ගැසී දඹදෙනියේ තිබෙන වැඩ කටයුතු ගැන කථා කළා.

විශේෂයෙන්ම හිටපු ඇමතිතුමකු වූ දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අපනයන ගම්මාන ආරම්භ කළේ දඹදෙනියෙන්. දඹදෙනිය ආසනයේ අපනයන ගම්මාන ආරම්භ කරන්න ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ලොකු උනන්දුවක් දැක්වූවා. මේ කාලය තුළදී මාත්, විජේකෝන් මැතිතුමාත් එකතුව අපි සියලුදෙනා පාර්ලිමේන්තුව තුළදී අලුත් ව්‍යවස්ථාවක් සම්මත කළා. අපි මේ පාර්ලිමේන්තුවටත් ආවා. 1983දී කෝලාහලවලටත් මුහුණ දුන්නා. එදා සිට අපට තිබුණේ අමාරු තත්ත්වයක්. නමුත්, අපි කෙසේ හෝ වැඩ කටයුතු කර ගෙන ආවා.

මට විශේෂයෙන්ම විජේකෝන් මැතිතුමා හම්බ වුණේ එතුමා යාපනයේ දිස්ත්‍රික් ඇමතිතුමා හැටියට පත් වෙලා සිටි කාලයේදියි. යාපනය දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ප්‍රශ්න ගැන බලන්න මට විටින් විට යාපනයට යන්න වුණා. එතුමා එක්ක එකට එකතු වෙලා තමයි මම ඒ වැඩ කටයුතු කළේ. අමාරු කාලයක තමයි එතුමා යාපනයේ දිස්ත්‍රික් ඇමති විධියට සිටියේ. යාපන දිස්ත්‍රික් සංවර්ධන සභාව එක කාලයක වැඩ කටයුතු කළා, තව කාලයක වැඩ කටයුතු කළේ නැහැ. ඒත් එතුමා හැම වෙලාවේම ඒ ගැන කලබල වෙන්නේ නැතිව ඒ අදාළ තීරණ ගත්තා. සමහර විට ඒ ගත් සමහර තීරණ ගැන දකුණෙන් එතුමාට විවේචනත් ඉදිරිපත් කළා.

එතුමා ගත්ත තීරණ හරි කියලා දැන් මම හිතනවා. අපි ඒ වෙලාවේ හිතුවේ එතුමා ශීඝ්‍රයෙන් තදින් තීරණය නොගත්ත එක ප්‍රශ්නයක් කියලා. ඒත් එසේ නොකිරීම නිසා තමයි අපට ඉදිරියට ගිහින් මේ ප්‍රශ්නය දේශපාලන වශයෙන් විසඳන්නට අවස්ථාව ලැබුණේ. ඉන්පසුවත් මට යූ.බී. විජේකෝන් මැතිතුමා එක්ක වැඩ කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. එතුමා අත් යන්ත්‍ර හා ඡේෂකර්මාන්ත ඇමති හැටියට කාලයක් වැඩ කටයුතු කළා. අපි එතුමා එක්ක අවස්ථා දෙකකදී ඇමෙරිකාවට ගියා. එහෙම ගියේ ඇමෙරිකාවේ Multi-Fibre Agreement එක යටතේ වැඩ කටයුතු කරන්නයි. අපේ ඇඟලුම් කර්මාන්තයේ සිටි අයගේ විශාල සහයෝගයක් එතුමාට ලැබුණා. ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා 200 ආරම්භ කරද්දි, යූ.බී. විජේකෝන් අමාත්‍යතුමා තමයි ඒ අමාත්‍යාංශය භාරව ක්‍රියා කළේ. මම කර්මාන්ත විද්‍යා හා තාක්ෂණ ඇමති හැටියට එතුමා සමඟ වැඩ කටයුතු කළා. එහෙම කටයුතු කළේ ඒ වැඩ කටයුතු කරන්න වුවමනා පහසුකම් ලබා දෙන්න, ඉඩම් ලබා දෙන්න. ඒ නිසා තමයි ඇඟලුම් කර්මාන්තශාලා 200ම අපට සාර්ථකව ආරම්භ කරන්න අවස්ථාව ලැබුණේ. ඒ වෙනකොට එතුමා දඹදෙනිය ආසනය විශාල ලෙස දියුණු කරලා තිබුණා. යූ.බී. විජේකෝන් මැතිතුමා පාර්ලිමේන්තුවේ හොඳට කථා කරන්නෙක්. එතුමා තර්ක කළා. අපි එතුමාට කිව්වා, "ඔනෑම වෙලාවක ඇවිල්ලා ඒ වැඩ කටයුතු කරන්න." කියලා. මම කැබිනට් මණ්ඩලයේ අගමැතිව සිටියදී එතුමාගෙන් විශාල සහයෝගයක් මට ලැබුණා. ඒ නිසා යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය අපට පාඩුවක්. එතුමාගේ පුතා හොඳ බැඩ්මින්ටන් ක්‍රීඩකයෙක් හැටියට නමක් ලැබුවා. ඒ ගැනත් එතුමා ආඩම්බර වුණා. අපි දෙන්න එකට වැඩ කළ ඒ කාලසීමාව විශේෂ පරිවර්තන යුගයක්. මේ අවස්ථාවේදී යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳ මගේ කනගාටුව ප්‍රකාශ කරනවාත් එක්කම එතුමාට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු කරුපයියා වේලායුදම් මැතිතුමා මම දැන ගත්තේ අපේ වතු කම්කරු සංගමයේ සාමාජිකයෙක් හැටියටයි. ඉන් පසුව එතුමා පළාත් සභාවට තේරුණා. පළමුවෙනි වරට පළාත් සභා ඇති කරද්දී එතුමා නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ඌව පළාත් සභාවට තේරුණා. ඊට පසුව 1991 වර්ෂයේදී මා ලංකා ජාතික වතු කම්කරු සංගමයේ සභාපති හැටියට පත් වුණා. මම සභාපති ලෙස එතුමා සහ රාජා සෙනෙවිරත්න මැතිතුමා එක්කත් වැඩකටයුතු කරන්න අවස්ථාව ලැබුණා. එදා තමයි අපි ඉතා කිට්ටුවෙන් වැඩ කටයුතු කළේ. වතුකරයට ගියා. ඒ ප්‍රශ්න දිහා බැලුවා. මමත්, රාජා සෙනෙවිරත්නත් සිංහල නිසා අපේ ප්‍රධාන ද්‍රවිඩ නිලධාරියා හැටියට වැඩ කළේ කරුපයියා වේලායුදම් මැතිතුමා. එතුමා ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඍත්තිය සම්තිය දියුණු කරන්න ගත්ත සේවය අගය කළ යුතුයි.

විශේෂයෙන්ම එතුමා වැවිලි කර්මාන්ත සමාගම් සමඟ එකතු වී පඩි වැඩි කිරීමේ ඒකාබද්ධ ගිවිසුම වෙනුවෙන් පියවර ගණනාවක් අර ගත්තා. රාජා සෙනෙවිරත්න මැතිතුමාගෙන් පසුව අපි එතුමාව ඒ සංගමයේ ලේකම් හැටියට පත් කළා. එතුමා ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ ලේකම් හැටියටත් ක්‍රියා කළා. ඒ වෙනකොට ඌව පළාත් සභාවෙන් ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් බවට පත් වෙලා, පස්සර සංවිධායක ලෙස එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණා. එතුමාට 2001 වසරේදී පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. 2001 ඉඳන් 2004 වනතුරු අපේ පාර්ලිමේන්තුවේ ද්‍රවිඩ ජනතාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් තමයි කරුපයියා වේලායුදම් මැතිතුමා. එතුමාට තරගයට එන්න ප්‍රශ්න ගණනාවක් තිබුණා. එය ජයග්‍රහණය කරනවාද කියලා ප්‍රශ්නයක් තිබුණා. කෙසේ හෝ කරුපයියා වේලායුදම් මැතිතුමා එදා හොඳ ජයග්‍රහණයක් ලබා බදුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමා 2004දී පරාජය වුණා. යළිත් පළාත් සභාවට ගියා. එතුමා ඉස්සෙල්ලා හිටියේ පළාත් සභාවේ ඇමතිවරයෙක් හැටියටයි. ඊට පසුව එතුමා පළාත් සභාවේ විපක්ෂයේයි හිටියේ.

පර්සි සමරවීර මැතිතුමාගෙන් පසු එතුමා අපේ පළමුවැනි මහ ඇමති අපේක්ෂකයා හැටියට ඉදිරිපත් කළා. ඒ තමයි පළමුවැනි වතාවට කඳුකරයේ ද්‍රවිඩ පුද්ගලයෙක් මහ ඇමති අපේක්ෂකයා වශයෙන් පත් කළ අවස්ථාව. එතුමාගේ සංවිධාන ශක්තිය නිසා කෙසේ හෝ පස්සර ආසනය අපි ආරක්ෂා කරගෙන සිටියා. 2010 මැතිවරණයේදී එතුමාට පස්සර ආසනයෙන් හොඳ ප්‍රතිඵල ලැබුණත්, දිස්ත්‍රික්කයෙන් ලැබුණු මනාප ගණන අඩුවීම නිසා පාර්ලිමේන්තුවට ඇතුළු වෙන්න අවස්ථාව ලැබුණේ නැහැ. නමුත්, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉල්ලා අස්වූ අවස්ථාවේ ගරු කරුපයියා වේලායුදම් මැතිතුමා මන්ත්‍රීවරයෙක් හැටියට යළිත් මේ සභාවට ඇවිල්ලා පළාත් සභා මැතිවරණයේත්, ජනාධිපතිවරණයේත් දෙකේම සාර්ථකව වැඩ කටයුතු කළා.

එතුමා අසනීප තත්ත්වයෙන් සිටි නිසා 2015 මැතිවරණයට ඉදිරිපත් වුණේ නැහැ. එතුමා අසනීපවීමෙන් පසු ඉන්දියාවට ගියා. පාර්ලිමේන්තු මැතිවරණයට තරග නොකරන ලෙස එතුමාට උපදෙස් පවා ලැබී තිබුණා. එම නිසා එතුමා පාර්ලිමේන්තු මැතිවරණයට තරග කළේ නැහැ. ඒ වාගේම එම මැතිවරණයේදී බලාපොරොත්තු වුණු ඡන්ද සංඛ්‍යාව නොලැබුණු නිසා එතුමාව ජාතික ලැයිස්තුවට ඇතුළු කරන්නත් බැරි වුණා. නමුත්, ඒ වෙනකොට එතුමා රෝගාතුර වෙලායි සිටියේ. එතුමාට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න අපට සිදු වුණා.

වේලායුදම් මැතිතුමා ද්‍රවිඩ දේශපාලනය තුළ නොවෙයි සිටියේ. එතුමා සිටියේ බදුල්ලේ දේශපාලනය තුළයි. සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා සමඟ එතුමා සිටියා. උතුරේ තිබුණු එතුමා පිළිගත් සමහර ප්‍රශ්න ගැන එතුමා කථා කළා. නමුත්, ලාංකිකයෙක් හැටියට එතුමා වැඩ කටයුතු කළා. මට බොහෝ අවස්ථාවල එතුමාගේ නිවසට ගොස් ආහාර ගන්නත් අවස්ථාව ලැබුණා; එතුමා සමඟ ළඟින් ක්‍රියා කරන්න අවස්ථාව ලැබුණා. එතුමා හිටපු කාලයේ වෘත්තීය සමිති ව්‍යාපාරය වෙනුවෙන් විශාල සේවයක් කළා. එතුමාගේ මරණය වෘත්තීය සමිති ව්‍යාපාරයටත්, බදුල්ල දිස්ත්‍රික්කයටත් විශාල පහරක්. හින්දු ආගම අනුව, එතුමාගේ ඊළඟ ජීවිතයට යහපත් තැනක් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, වේලායුදම් මැතිතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය පවුලේ සියලුදෙනා වෙත දන්වා යවන ලෙස මම ඉල්ලා සිටිනවා.

සුරනිමල් රාජපක්ෂ මැතිතුමා මා සමඟ තමයි දේශපාලනය කළේ. ඇත්ත වශයෙන්ම අපි දෙදෙනා එකට තමයි දේශපාලනයට ඇතුළු වුණේ. එතුමාගේ මරණය දක්වාම එතුමා මා සමඟ තමයි වැඩ කටයුතු කළේ. එතුමා මගේ දේශපාලන සගයෙක් කියලා කියන්න පුළුවන්. අපි දෙදෙනාම 1972 දී එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණෙන් කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත්වුණා. මම භාණ්ඩාගාරික වශයෙන් කටයුතු කළා, එතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් හැටියට කටයුතු කළා. එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණ සංවිධානය ප්‍රතිසංවිධානය කරන්න, ඡන්දවලට ලැහැස්ති වෙන්න, අතුරු මැතිවරණ කරන්න අපි විශාල සේවයක් කළා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට අභියෝගවලට මුහුණ දෙන්න සිදුවුණු අවස්ථාවලදී අපි එතුමාට සහයෝගය ලබා දෙමින් ක්‍රියා කළා. ඒ වාගේම ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා දොම්පේ රාජකරුණා මැතිතුමාටත් සහයෝගය දුන්නා. අපි කවරුත් හිතුවේ නැහැ, රාජකරුණා මැතිතුමාට ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමා පරාජය කරන්න පුළුවන් කියලා.

1977 මැතිවරණයේදී සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා දොම්පේ ආසනය වාගේම බියගම ආසනයේ කොට්ඨාසයකුත් භාර අරගෙන මගේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කටයුතු කළා. එම ජයග්‍රහණයෙන් පසු මම එතුමාට කිව්වා, මගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කරන්න කියලා. පළමුවෙන්ම එතුමා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, ඊට පසු තරුණ කටයුතු අමාත්‍යවරයා හැටියටත්, මගේ පෞද්ගලික ලේකම් හැටියටත් ක්‍රියා කළා. ඒ වාගේම එතුමා තරුණ සේවා සභාවේ සාමාජිකයෙක් හැටියට කටයුතු කරමින් විශේෂයෙන්ම තරුණ සේවා සභාව සංවිධානය කරන්න චරිත රත්වත්තේ මැතිතුමාට උදව් කළා. මම බියගම කරපු වැඩ කටයුතු සියල්ල කරන්න මට පුළුවන් වුණේ, සුරනිමල් රාජපක්ෂ මැතිතුමා මට ලබාදුන් ආධාර නිසයි. ගම්පහ දිස්ත්‍රික්කයේ නොදියුණුම ආසනය තමයි මම භාරගත්තේ. අපට ඒක දියුණු කරන්න පුළුවන් වුණා.

මගේ අදහස්වලට අනුව වෙළෙඳ කලාප ඇති කරන්න, කර්මාන්තශාලා බියගමට ගෙනෙන්න, පාරවල් හදන්න, විදුලි බලය ලබා දෙන්න, පාසල් දියුණු කරන්න කියන සියලුම වැඩ කටයුතු බාර අරගෙන, බියගම ආසනය කණපිට පෙරළමින්, ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබුණේ සුරනිමල් රාජපක්ෂ මැතිතුමාටයි. ඒ ආසනය තුළ මගේ එදිනෙදා දේශපාලන වැඩ කටයුතුත් මම එතුමාට බාර දුන්නා. අපි සති අන්තයේ මුණ ගැහුණා. මගේ අමාත්‍යාංශයේ එතුමා වෙනුවෙන් කාර්යාලයකුත් තිබුණා. පසුව දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයේදී මමත්, රාජකරුණා ඇමතිතුමාත් දෙදෙනාම එකට එකතුවෙලා, අපේ පොදු අපේක්ෂකයා විධියට එතුමා ඉදිරිපත් කළා. එතුමා දිස්ත්‍රික් සංවර්ධන සභාවට ගිහිල්ලා, අපට ඕනෑ වැඩ කටයුතු එතැන ඉඳගෙන ක්‍රියාත්මක කළා.

1988දී පළාත් සභා ඇමතිවරයෙකු හැටියට පළාත් සභාවේ වැඩ කටයුතු කරන්නත් එතුමාට අවස්ථාව ලැබුණා. ඒ කාල සීමාව තුළදී මට පැවරී තිබුණු වැඩ කටයුතු වැඩි නිසා බියගම ආසනයේ වැඩ කටයුතු කරන්න එතුමා තමයි බාර ගත්තේ. බියගම, මහර, දොම්පේ, ගම්පහ, කැලණිය කියන ප්‍රදේශවල එතුමා තමයි වැඩ කටයුතු කළේ. එතුමා අමාත්‍යාංශවලට ගිහිල්ලා මුදල් හොයාගෙන ආවා. ඒ දියුණුව කරා යන්න සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට තරම් වෙන කාටවත් ශක්තියක් තිබුණාය කියලා මම හිතන්නේ නැහැ. ඒ එක්කම එතුමා දේශපාලන වැඩ කටයුතුත් මෙහෙය වූවා. 1994දී මම විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් වැඩ කටයුතු කළ නිසා බියගම ආසනයේ සංවිධාන කටයුතු කරන්න සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට බාර දුන්නා. එතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණා. විපක්ෂයේ ඉඳගෙන එතුමා කරපු සේවය කියා නිම කරන්න බැහැ. එතුමා හැමදාම මේ ගරු සභාවේ හිටියා. විශාල උනන්දුවකින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා ක්‍රියා කළා. ඒ වාගේම රට වටේ ගිහිල්ලා රැස්වීම්වලත් කථා කළා.

2001දී මම අගමැතිවරයා වුණු අවස්ථාවේදී එතුමා පාසල් අධ්‍යාපන ඇමතිවරයා - කැබිනට් නොවන- හැටියට කටයුතු කළා. ඒ කාලයේ තමයි සපුගස්කන්ද විශාඛා විද්‍යාලය ආරම්භ කළේ. 2004දී පරාජය වුණු නිසා 2010දී එතුමා තරග කරන්න ඉදිරිපත් වුණේ නැහැ. නමුත් එතුමා මගේ වැඩ කටයුතු බාරගෙන ඒවා කරගෙන ගියා. විශේෂයෙන්ම 2010 සහ 2015 වසරවල පැවති ජනාධිපතිවරණයන්හිදී එතුමා ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කයන්හි ජයග්‍රහණය වෙනුවෙන් සංවිධාන ශක්තිය යෙදෙව්වා. ඒ වාගේම වෘත්තීය සමිති සංවිධානය කළා. ඒ සියලුම කටයුතු කරමින් 2015 අවුරුද්දේ මගේ ජයග්‍රහණය සඳහා ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක දෙකේම වැඩ කටයුතු කළා. එතැනින් පස්සේ එතුමා සමඟ වැඩ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වුණත් එතුමාගේ දෛවය තීරණය කරලා තිබුණේ වෙන දෙයක්. අසනීපවෙලා අන්තිමට එතුමා අප අතරින් වෙන් වුණා.

මගේ දේශපාලන ජීවිතයේ ආරම්භයේ සිටම සුරනිමල් රාජපක්ෂ මැතිතුමා හැම ප්‍රශ්නයකටම මුහුණ දෙමින් කටයුතු කළ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

බව මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. සුරනිමල් රාජපක්ෂ මැතිතුමා සමඟින් තමයි මම මේ වැඩ කටයුතු සියල්ලම කළේ. ඒ වාගේම ගාමිණී අතුකෝරල මැතිතුමා එක්ක වැඩ කරන්න මට අවස්ථාව ලැබුණා. එහෙත් දීර්ඝ කාලයක් මම වැඩ කළේ සුරනිමල් රාජපක්ෂ මැතිතුමා සමඟයි. ඒ නිසා මට එතුමා අමතක වෙන්නේ නැහැ. මම මේ අවස්ථාවේදී එතුමාට ස්තුතිවන්ත වන අතර, එතුමා වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරනවා. එතුමාගේ නැති වීම තුළින් මගේ පෞද්ගලික ජීවිතයේත්, දේශපාලන ජීවිතයේත් විශාල හිඩැසක් තිබෙනවා. මේ අවස්ථාවේදී සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට නිවන් සැප ලැබේවා! කියා මම ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මගේ කනගාටුව පවුලේ සියලුදෙනාට දැනුම් දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

[අ.භා. 12.15]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, අලවි මවුලානා මැතිතුමා ගැන මෙතෙක් මේ ගරු සභාවේ කියැවුණු සියලුම කාරණා සමඟ මම එකඟ වන අතර, එතුමාගේ අභාවය පිළිබඳව අපගේ කනගාටුවද මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

1947 අවුරුද්දේ, එතුමාගේ තරුණ කාලයේදීම එතුමා දේශපාලනයට ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බණ්ඩාරනායක මැතිතුමා සමඟ සම්බන්ධවෙලා එතුමා වැඩ කටයුතු කළා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් සමඟින් දේශපාලනයේදීත්, වෘත්තීය සමිති ව්‍යාපාරයේදීත් වැඩිපුරම කටයුතු කරපු අලවි මවුලානා මැතිතුමා අපේ ළඟ හිටපු හිත හොඳ මහත්මයෙක් කියලායි. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහත්තයෙක් වුණු පුද්ගලයෙක්. අපි ඉතාම කිට්ටුවෙන් එතුමා ආශ්‍රය කළා.

එතුමා දේශපාලනයේ විතරක් නොවෙයි, වෘත්තීය සමිති ව්‍යාපාරයේත් ඉහළම පෙත්තට ගියා. එක් අවස්ථාවකදී ජාත්‍යන්තර සංවිධානයක සභාපති ධුරය පවා ලබා ගත්තා. මම ඒ ගැන සඳහන් කරන්නම්. He was appointed as the Chairman of the Asia-Pacific Region of the International Labour Organization -ILO- for a period of three years, which was proposed by China and seconded by India. එතැනදී පැවැති විශේෂත්වය වන්නේ චීනයේ සහ ඉන්දියාවේ වෘත්තීය සමිති ව්‍යාපාරිකයන් විසින් එතුමාගේ නම යෝජනා කර ස්ථිර කිරීමයි. ඒකෙන් පෙනෙනවා, එතුමා කම්කරු ජනතාව වෙනුවෙන් ජාත්‍යන්තරව මොන තරම් වෘත්තීය සමිති ව්‍යාපාරය එක්ක ගැට ගැසී සිටියාද කියලා. එතුමා නැති වැඩ වර්ජනයක් පැවැත්තේ නැහැ. Hyde Park එකේ, එහෙම නැත්නම් ලිප්ටන් වටරවුමේ එතුමා නැති වෘත්තීය සමිති ව්‍යාපාරයක් පැවැත්වූයේ නැහැ. එතුමා එතැන නැත්නම්, ඒක වෘත්තීය සමිති ව්‍යාපාරයක එකක් නොවෙයි. එතුමා එවැනි තැනක නැත්නම්, ඒක ලොකු අඩුවක්. එතුමා ආණ්ඩුකාරවරයා වෙලා සිටියදීත් බොහොම පැහැදිලිව තමන්ගේ පන්තිය වෙනුවෙන්, කම්කරු පන්තිය වෙනුවෙන් සටන් ව්‍යාපාරයට සම්බන්ධ වෙලා තම විරුද්ධත්වය ප්‍රකාශ කළ ආකාරය මට මතකයි. ඒ වාගේම එතුමා පෞද්ගලිකව අපට උදවු කර තිබෙනවා. එතුමා පෞද්ගලිකව ඉතාම කිට්ටුවෙන් අප ඇසුරු කරලා තිබෙනවා. කම්කරු ඇමතිවරයා වශයෙන් විතරක් නොවෙයි, හැම අවස්ථාවකදීම අපට උපදෙස් දෙන්න පුළුවන් පුද්ගලයෙකු බවට එතුමා පත් වුණා.

මම නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී එළියට ඇවිත් දවස් දෙකකට පසුව එතුමා මට මඩකලපුවේ නඩුවක් භාර දුන් ආකාරය මට මතකයි. ඒක මිනීමැරුම් නඩුවක්. මඩකලපුව උසාවියේ දෙමළ භාෂාවෙන් කථා කරන ජූරි සභාවක් ඉදිරියේ මට ඒ නඩුව කථා කරන්න වුණා. මගේ වාසනාවට එම නඩුව ජයග්‍රහණය කරන්නත් පුළුවන් වුණා. [බාධා කිරීමක්] නඩුව දිනුවා. අලවි මවුලානා මැතිතුමා භාර දුන් ඒ නඩුව තමයි මගේ පළමුවැනි නඩුව. ඒ වාගේම එතුමා මට යන්න, එන්න මුදල් ප්‍රමාණයකුත් ලබා දුන්නා. ඒකත් මතක් කරන්න ඕනෑ, ඉතාම අවංකව. මොකද, එතුමා හා අප අතර ඒ වාගේ සම්බන්ධතාවක් තිබුණා.

ඒ විතරක් නොවෙයි, එතුමා හැමෝටම ආදරය කරපු, හැම ජාතියකටම ආදරය කරපු, මුස්ලිම් භක්තිකයෙක්. එතුමා ඉතාම දැඩි සේ මුස්ලිම් ආගම වැළඳ ගෙන සිටියා. එතුමාට මොන වැඩ තිබුණත් පල්ලියට යන වේලාවට යාඥා කිරීමට එතුමා අමතක කළේ නැහැ. එතුමා ඒ වේලාවට හරියට ඔරලෝසුව වැඩ කරනවා වාගේ තමයි කටයුතු කළේ. එතුමා ඉතාම සුන්දර මනුෂ්‍යයෙක්. විහිළුවක් කරන වේලාවක වුණත් -අපි එතුමාට විහිළු කළත්, එතුමා අපට විහිළු කළත්- එය ඉතාම බුද්ධිමත්ව කළා. ඒ වාගේම එතුමාට භාෂා තුනම හැසිරවීමේ හැකියාව තිබුණා. සාහිත්‍යමය විධියට භාෂා තුනෙන්ම කථා කරන්න එතුමාට පුළුවන්කම තිබුණා. එතුමාගේ පවුලේ පුතුන් සිටිනවා; දුවරු සිටිනවා; මුනුපුරන් සිටිනවා. එතුමා අප එතුමාගේ ගෙදරට එක්ක ගෙන ගිහින් ඒ සියලු දෙනා හඳුන්වා දෙන්නත් අමතක කළේ නැහැ. අපි ඒ ගෙදර සාමාජිකයන් වාගේ තමයි කටයුතු කළේ.

එතුමා අසනීපයෙන් සිටි වේලාවේත් අපි ගියා. එතුමා ආණ්ඩුකාරවරයා වශයෙන් සේවය කළා; පාර්ලිමේන්තුවේ සේවය කළා. මන්ත්‍රීවරයෙක් වශයෙන්, වෘත්තීය සමිති නායකයෙක් වශයෙන් එතුමා කළ සේවය අපට කිසිවිට අමතක කරන්න පුළුවන්කමක් නැහැ. මුස්ලිම් ජනතාවටත් එතුමාගේ නැතිවීම මහා පාඩුවක්. වෘත්තීය සමිති ව්‍යාපාරයට, දේශපාලන ලෝකයට, මේ සියල්ලටම එතුමාගේ අභිමිවීම පෞද්ගලිකව මහත් පාඩුවක් වුණා. ඔහු හැමෝගේම හොඳ මිත්‍රයෙක්.

එතුමා මිනිසුන් දෙන්නෙක් තරහ කරවන්න යමක් කළේ නැහැ. දෙන්නෙක් අතර තිබෙන භේද නැති කරන්න බොරුවක් වුණත් කියන්න ඔහු කවදාවත් පසුබට වුණේ නැහැ. යම්කිසි කෙනෙක් මට අහවලා බැන්නාද කියලා ඇහුවොත්, ඒකට එතුමා "නැහැ" කියනවා මිසක් "ඔහු මාත් එක්ක බැන්නා" කියලා කියන්නේ නැහැ. එතුමා ඒ වාගේ පුද්ගලයෙක්. ජයසිංහ මැතිතුමාත්, මමත් පලස්තීන මිත්‍ර සංගමය ආරම්භ කරනකොට අලවි මවුලානා මැතිතුමා තමයි ඒ කටයුතු සියල්ල සම්බන්ධීකරණය කළේ. අපට ඒක අමතක කරන්න පුළුවන්කමක් නැහැ. මිත්‍රයෙක් වශයෙන්, දේශපාලනඥයෙක් වශයෙන්, වෘත්තීය සමිති නායකයෙක් වශයෙන් එතුමා බොහොම හොඳින් කටයුතු කළා. මට මතකයි, එතුමා වෘත්තීය සමිති ව්‍යාපාරයේ කටයුතු කරද්දී 1977දී මාව චෙකොස්ලෝවැකියාවට යවන්න පියවර ගත්තා, වෘත්තීය සමිති පාඨමාලාවක් හදාරා එන්න කියලා. ඒවාත් මම මේ වේලාවේ මතක් කරන්න ඕනෑ. ඒවා මට එතුමා පුද්ගලිකව කරපු දේවල්. අපේ යුතුකමක් හා වගකීමක් තිබෙනවා, එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුලට අපේ කනගාටුව ප්‍රකාශ කරන්න. ඒ දරුවන් අදත් අපිත් එක්ක හැම අංශයෙන්ම සම්බන්ධකම් ඇතිව කටයුතු කරනවා. අපි සියලු දෙනාගේම ශෝකය, කනගාටුව එතුමාගේ අභාවය වෙනුවෙන් අපි මේ අවස්ථාවේ පුද කරන්න කැමැතියි.

[12.23p.m.]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy Development and Leader of the House of Parliament)

Hon Speaker, I wish to associate myself with the sentiments expressed by the Chief Government Whip and the Hon. Prime Minister. The late Hon. S. Alavi Moulana was a born trade unionist. I had a very close association with him. In the 70s, 80s or even in the early 60s, if there was a demonstration anywhere in Colombo, we would see the presence of the Hon. Alavi Moulana.

Sir, he had a great sense of humour. When we spoke with him, he would always make us laugh. Sir, once I went to see him when he was in a hospital in India as I happened to be in Madras at that time and he came out with a nice rhyming comment. He said, "This nurse is a curse; she is trying to drive me into the hearse and the doctor is trying to steal my purse". So, even at a time like that, Sir, though he was ill in a hospital in a foreign country, he never lost his sense of humour. I think those of us who associated him loved him greatly.

He entered Parliament, became a Cabinet Minister and later, a Governor. I think those of us who knew him closely miss his company very much.

Sir, I do not wish to speak at length. I wish to convey my condolences to the members of his family.

Thank you.

[பி.ப. 12.25]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே, காலஞ்சென்ற அலவி மௌலானா ஐயா அவர்களுடைய அனுதாபப் பிரேரணைமீது எனது கருத்துக்களையும் சொல்வதில் நான் பெருமை யடைகின்றேன். 1994ஆம் ஆண்டு அவர் நாடாளு மன்றத்திற்குத் தெரிவு செய்யப்பட்டார். 1998ஆம் ஆண்டு நான் தெரிவு செய்யப்பட்டேன். அந்த வகையிலே இந்தச் சபையில் அவரோடு பழகுகின்ற சந்தர்ப்பம் எனக்குக் கிடைத்தது. தமிழ் - முஸ்லிம் உறவை மிகவும் பேணுகின்ற வகையிலே அவருடைய செயற்பாடுகள் காணப்பட்டன. பிரச்சினைகள் வருகின்றபோது தமிழ் - முஸ்லிம் உறவை எவ்வாறு மேம்படுத்தலாம் என்று எங்களோடு இணைந்து அடிக்கடி பேசுவார். அவர் தனிப்பட்ட முறையிலே உதவி செய்கின்ற மனப்பான்மை கொண்டவர். யாருக்குப் பிரச்சினை ஏற்பட்டாலும் தனிப்பட்ட முறையில் அவர்களை அணுகி, அதனைத் தீர்ப்பதற்கான ஆலோசனைகளைக் கூறுவார். அவ்வாறான சந்தர்ப்பம் எனக்கும் கிடைத்தது. எனது மனைவி புற்றுநோயால் பாதிக்கப்பட்டிருந்த வேளையிலே முதன்முதல் என்னிடம் வந்து எனது மனைவியைப் பற்றிச் சுகம் விசாரித்த ஒரு மனிதர் என்றால், அது எங்களுடைய அலவி மௌலானா ஐயா அவர்கள்தான். அந்த வகையிலே அவருடைய இழப்பானது இந்த நாட்டுக்குப் பெரியதோர் இழப்பாகவே நாங்கள் பார்க்கின்றோம். எனவே, அவரைப் போன்று தமிழ் - முஸ்லிம் உறவை மேம்படுத்துகின்ற செயற்பாட்டிலே எல்லோரும் இணைந்து செயற்படுகின்ற தன்மையை உருவாக்க வேண்டும். அதுதான் மறைந்தவர்களை நாங்கள் நினைவுகூருவதற்கான ஒரு விடயமாக அமையும்.

மேலும், நாங்கள் அவரைப் பற்றிப் பேசுவது பெரிதல்ல. அவர் விட்டுச்சென்ற பணிகளை, அவர் விட்டுச் சென்ற நன்மையான விடயங்களை, அவர் விட்டுச்சென்ற பாதையைப் பின்பற்றுவதுதான் அவர் வாழ்ந்த வாழ்க்கையை அர்த்தப் படுத்துகின்ற செயற்பாடாக அமையும். நாங்கள் அவரைப் பற்றி இங்கு பேசுவதானது, அவருடைய குடும்பத்தாருக்கு ஓர் அனுதாபச் செய்தியாகச் செல்லுமே ஒழிய, அவருடைய ஆத்மாவுக்கு சாந்தியைக் கொடுக்காது. எனவே, நாங்கள் அவருடைய செயற்பாட்டைப் பின்பற்றுவது, அவர் விட்டுச் சென்ற நன்மையான பணிகளை இனம்கண்டு அவற்றைத் தொடர்வது போன்ற விடயங்களைச் செய்தால் தான் அது அவருக்கு ஆத்ம சாந்தியைக் கொடுக்கும். அந்த வகையிலே, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாக அவருடைய குடும்பத்தாருக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்து, எனது இரங்கல் உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

දිවා ආහාර විවේකය සඳහා පස් වරු 1.30 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවනු ලබනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

[අ.භා.1.31]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)

(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයකු වාගේම, ව්‍යක්තීය සමීති ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයකු වූ ගරු එස්. අලවි මවුලානා මැතිතුමාගේ ශෝක ප්‍රේඡනාව සම්බන්ධයෙන් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. මට පෙර කථා කළ සියලු දෙනාගේම කථා අනුමත කරමින් මම කියන්න කැමැතියි, එතුමා අපට දේශපාලනයේ අපූරු චරිතයක් වාගේම, ජනමාධ්‍යවලත්, රටේ ජනතාව අතරත් ඉතාම ජනප්‍රිය පුද්ගලයකු වූ බව.

[ගරු මහින්ද අමරවීර මහතා]

ගරු අලවි මවුලානා මැතිතුමා වෘත්තීය සමිති ක්ෂේත්‍රය තුළින් තමයි දේශපාලන කටයුතුවලට ප්‍රවේශ වුණේ. වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ කටයුතු කළ කාලය තුළදී එතුමා ඒ වෙනුවෙන් ඉතාමත් ඉහළ කැප කිරීමක් කළා. මැයි රැලියක් එනවා නම්, අලවි මවුලානා මැතිතුමා එහි ඉස්සරහින්ම හිටියා. වෘත්තීය අරගළයක් වනවා නම්, එතුමා එම අරගළයේ ඉස්සරහින්ම හිටියා. ආණ්ඩු බලය තිබෙන වෙලාවට වඩා නැති වෙලාවට තමයි අලවි මවුලානා මැතිතුමාගේ ක්‍රියාකාරීත්වය රටේ ජනතාවට දකින්නට ලැබුණේ. එතුමා දේශපාලනයට ප්‍රවේශ වුණේ වෘත්තීය සමිති ක්ෂේත්‍රය තුළ තිබූ ජනප්‍රියතාව සහ ඉල්ලීම නිසාමයි. එතුමා මුලින්ම පළාත් පාලන මන්ත්‍රීවරයකු විධියට පත් වෙලා, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපත් සමඟ දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව තුළ කටයුතු කළා. එතුමා අමාත්‍ය ධුර දැරුවත්, මොන තනතුර දැරුවත් වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ තමන්ගේ කම්කරු ජනතාව වෙනුවෙන්, වැඩ කරන ජනතාව වෙනුවෙන් නැඟූ හඬ කිසිසේත්ම යටපත් වුණේ නැති බව අපට පැහැදිලිව සඳහන් කරන්න පුළුවන්. රජය නියෝජනය කරමින් කැබිනට් අමාත්‍යවරයෙක් විධියට කටයුතු කළ අවස්ථාවලදීත්, රජය මඟින් ගත් තීන්දුවලදී වෘත්තීය සමිති ක්ෂේත්‍රයට, කම්කරුවන්ට යම් ගැටලුවක් ඇති වුණා නම් එතුමා ඉඳ ගත්තේ රජයේ පැත්තේ නොවෙයි, කම්කරුවන්ගේ පැත්තෙයි කියන එක මට නොබියව කියන්න පුළුවන්.

එතුමාට දේශපාලන ක්ෂේත්‍රයෙන් වාගේම, වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ කටයුතු කරනකොටත් විවිධ තර්ජන එල්ල වුණා. විශේෂයෙන්ම වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ කටයුතු කරන කොට එතුමාට පිහියෙන් ඇනපු අවස්ථාවක් පවා තිබුණා. එතුමාව ඝාතනය කරන්න උත්සාහ ගත්තු අවස්ථා තිබුණා. එතුමාට පහර දීම් විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා. ඒ සියල්ල මධ්‍යයේ වුණත් පසු බට වෙන්නේ නැතිව අලවි මවුලානා මැතිතුමා වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ කම්කරු නායකයෙක් විධියට පෙනී සිටි බව අප සියලුදෙනාම හොඳින් දන්නවා.

එතුමාට ප්‍රතාපවත් පෙනුමක් තිබුණා. එතුමා හොඳ පෞරුෂයක් තිබුණු පුද්ගලයෙක් විධියට මම දකිනවා. නිතරම සිනා මුසු මුහුණින් සිටි එතුමාගේ විශේෂත්වය තමයි, සෑම කෙනෙකු සමඟම විහිළු කරමින්, සිනා ගස්වමින්, අනෙක් අය සතුටු කිරීම. එතුමාට භාෂා තුනම ඉතාමත් හොඳින් හැසිරවීමේ හැකියාව තිබුණා. මුස්ලිම් ජාතිකයකු වුණත් සිංහල භාෂාවේ සංස්කෘත වචන මෙන්ම, විවිධ උපහරණ විශාල ප්‍රමාණයක් ගැන එතුමාට දැනුමක් තිබුණා. වචන ගැළපීමේ හැකියාව ඉතා ඉහළින් එතුමාට තිබුණු බව අපි හොඳින්ම දන්නවා. එතුමා යම් අමාත්‍යාංශයක් භාරව කටයුතු කළත්, එම අමාත්‍යාංශය තුළ සිටි කම්කරු ජනතාව වෙනුවෙන් නිරන්තරයෙන්ම ඉදිරිපත් වෙලා කථා කරපු බව මම හොඳින්ම දන්නවා.

අලවි මවුලානා මැතිතුමා දේශපාලන ක්ෂේත්‍රයේ තනතුරු කොපමණ ප්‍රමාණයක් ඉසිලුවත් එම තනතුරුවලින් උද්දාම නොවුණු දේශපාලනඥයෙක් විධියට තමයි අපි එතුමාව හඳුන්වන්නේ. එතුමා කැබිනට් මණ්ඩලයේ ඉහළම කැබිනට් අමාත්‍ය ධුරය දරපු වෙලාවෙත් කම්කරුවෙක් තමන්ගේ ළඟට ආවිට කරට අත දමාගෙන "සහෝදරයා" කියන වචනයෙන් පමණක් නොව, හැඟීමෙන්ම කටයුතු කළ බව මේ රටේ සියලු දෙනාම දන්නවා. එතුමා දේශපාලන ක්ෂේත්‍රයේ පළාත් පාලන මන්ත්‍රීවරයෙක් විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට, ඒ වාගේම කැබිනට් අමාත්‍යවරයෙක් විධියට කටයුතු කළා. ඒ වාගේම ආණ්ඩුකාරවරයෙක් විධියටත් එතුමා කටයුතු කළා. සාමාන්‍යයෙන් ආණ්ඩුකාරවරු වෘත්තීය සටන්වලට, පාරේ සටන්වලට ප්‍රවේශ වෙනවා අඩුයි. නමුත් අලවි මවුලානා මැතිතුමා මොන තනතුරේ හිටියත් පාරේ සටන අත හැර නොගිය නායකයෙක් විධියට අපි දන්නවා.

විටී සටනට ඔහු හැම වෙලාවේම ප්‍රවේශ වුණා. ආණ්ඩුවේ මොන තනතුර දැරුවත් ඒ සියල්ලේ දීම ඔහු ඉදිරියෙන් සිටි බව අපේ මතකයේ තිබෙනවා. ඒ වාගේම තමයි අලවි මවුලානා මැතිතුමා දීර්ඝ කාලයක් දේශපාලනයේ සිටියාට එතුමා හරිහම්බ කරගත්තු දෙයක් නැහැ. එතුමාගේ ජීවිතයේ අවසාන කාලයේ එතුමා රෝගාතුර වෙලා සිටි අවස්ථාවේ මම එතුමා බලන්න ගියා. එතුමා හිටියේ තමන්ගේ දරුවෙකුට අයත් වුණු නිවසක. එතුමාට කියලා වෙනම නිවසක් හදා ගත්තේ නැති, එතුමාට කියලා දේපළක් රැස් කර ගත්තේ නැති, එතුමාට කියලා වස්තු සම්භාරයක් රැස් කර ගත්තේ නැති දේශපාලනඥයෙක්, වෘත්තීය සමිති නායකයෙක් විධියට අලවි මවුලානා මැතිතුමා අපට හඳුන්වන්න පුළුවන්. එතුමා ආරම්භ කරලා පවත්වාගෙන ගිය වෘත්තීය සමිතිවල යම් වගකීමක් මා වෙතත් පැවරී තිබෙනවා. එම වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ දැනට කටයුතු කරන නායකයන් සියලු දෙනාම වාගේ නිතරම මතක් කරන නමක් තමයි අලවි මවුලානා මැතිතුමාගේ නම. එතුමාට අදාළ නොවන ප්‍රශ්නයක් වුණත්, සමහර වෙලාවට ඒක වෙනත් කාරණයක් වුණත්, වෙනත් ක්ෂේත්‍රයකට අදාළ දෙයක් වුණත් එතුමාට ඇවිල්ලා කිව්වොත් ඊට ඇහුම්කන් දීමේ ශක්තිය ඉහළින්ම එතුමාට තිබුණා.

අපේ දේශපාලනඥයන්ට සමහර වෙලාවට නැහෙන චෝදනාවක් තමයි ඇහුම්කන් දීමේ අඩුපාඩුව. නමුත් එතුමා ඇහුම්කන් දීමේ ශක්තිය ඉහළින්ම තිබුණු දේශපාලන නායකයෙක්. ඒ වාගේම කිසිම දේකට කේන්ති යන්නේ නැති නායකයෙක්. ඕනෑම චෝදනාවක් එල්ල කරන මොහොතක වුණත් සිනහවෙලා පිළිතුරු දෙන්න පුළුවන් ශක්තියක් අලවි මවුලානා මැතිතුමාට තිබුණු බව මා හොඳින්ම දන්නවා. එතුමා පිළිබඳව පැය ගණනක් අපට කථා කරන්න පුළුවන්. එතුමා පිළිබඳව බොහෝ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් මම ඒකට අවස්ථාව ගන්නේ නැහැ. මොකද, තව ගොඩක් කථික මන්ත්‍රීවරු ඉන්න නිසා. එතුමා අපට දේශපාලනයේ ආදර්ශයක් ලබා දුන්නු චරිතයක්. එතුමා වෘත්තීය සමිතිවල ඒ කටයුතු කරන අයට ආදර්ශයක් ලබා දුන් චරිතයක්. එතුමා පිළිබඳව තව අවුරුදු ගණනාවක් කථා කරාවි; කාලපරිච්ඡේදයක් කථා කරාවි. ඒ වාගේම අලවි මවුලානා සිහි වෙන්නේ නැති මැයි දිනයක් වමේ දේශපාලනයේ ඇතිවෙයි කියා මා හිතන්නේ නැහැ. දේශපාලනයේ සිටි නායකයෙක් විධියට අලවි මවුලානා මැතිතුමාගේ ඒ ගුණය අපි අගය කරනවා.

පක්ෂයේ වෘත්තීය සමිති භාරව සිටි අලවි මවුලානා මැතිතුමා සමඟ එවකට පක්ෂයේ ලේකම්වරයා විධියට කටයුතු කළ වර්තමාන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉතා සමීපව කටයුතු කළා. එතුමා ඇතුළු අප පක්ෂයේ සියලු දෙනාගේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

[අ.භා. 1.39]

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ, අභාවප්‍රාප්ත මන්ත්‍රීවරුන් පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී, පළමුවෙන්ම අභාවප්‍රාප්ත ගරු එස්. අලවි මවුලානා මැතිතුමා පිළිබඳව අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. එතුමා ළඟින් ඇසුරු කළ ගරු මහින්ද රාජපක්ෂ

මන්ත්‍රීතුමා එතුමා පිළිබඳව දීර්ඝ විස්තරයක් කළා. අලවි මවුලානා මැතිතුමා කියන්නේ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කළ දවසේ ඉඳලාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක ඉතා ළඟින් කටයුතු කළ කෙනෙක්. එතුමා දේශපාලනය පිළිබඳවත්, ඒ වාගේම ව්‍යාපාරික සමිති ව්‍යාපාරය පිළිබඳවත් දැනුමක් තිබුණු, විශාල කැපවීමකින් පක්ෂයට සේවය කළ කෙනෙක්. හැබැයි එතුමා වැඩ කරගෙන යන අවස්ථාවේදී දේශපාලනයත්, ව්‍යාපාරික සමිති ව්‍යාපාරයත් පටලවා ගත්තේ නැහැ. 1977 වසරෙන් පසුව අපේ රටේ ව්‍යාපාරික සමිති ව්‍යාපාරය බිඳ වැටුණු අවස්ථාවේදී වැඩ කරන ජනතාව වෙනුවෙන් ව්‍යාපාරික සමිති ව්‍යාපාරයට යළි ජීවයක් ලබා දීමට අලවි මවුලානා මැතිතුමා කටයුතු කළේ, ඉතාමත් භක්තියකින් සහ කැප වීමකින්. එතුමා විරෝධතා සටන්වලදී ඉදිරියෙන්ම හිටපු කෙනෙක්. ඒ වාගේම එතුමාට විරුද්ධවාදීන්ගෙන් ගුටි බැට කන්න සිදු වුණු අවස්ථාත් තිබෙනවා. එක අවස්ථාවකදී එතුමා පිහි ඇනුමකට පවා ලක් වෙලා රෝහල්ගතවත් හිටියා. නමුත් ඒ කිසිවකින් ව්‍යාපාරික සමිති කටයුතුවලින් එතුමා නතර කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. එතුමා එතුමාගේ කටයුතු කරගෙන ගියා.

1985 වසරේ පැවැති මුල්කිරිගල අතුරු මැතිවරණයේදී මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ අවස්ථාවේදී, එතුමා එම මැතිවරණ කොට්ඨාසයේ මුස්ලිම් ජන නියෝජනයක් තිබෙන යක්ගස්මුල්ල ප්‍රදේශය භාරව කටයුතු කළ බව මට මතකයි. ඒ කාලයේ එතුමා මාස දෙක-තුනක්ම ඒ ප්‍රදේශයේ ගත කරමින්, පක්ෂයේ ජයග්‍රහණය සඳහා විශාල කැප වීමකින් කටයුතු කළා. ඒ මැතිවරණයේදී එතුමා අනුර බණ්ඩාරනායක මැතිතුමා සමඟ විශාල කාර්ය භාරයක් ඉටු කළා. මේ අවස්ථාවේදී ඒ පිළිබඳව මතක් කිරීම එතුමාට කෘතවේදීවීමක් හැටියට මා දකිනවා.

මා නියෝජනය කරන තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාසයේ හම්බන්තොට නගරයේ එතුමාගේ ඥාති සහෝදරියක් ඇතුළු පිරිසක් ජීවත් වනවා. ඒ පිරිසත් එතුමාගේ අඩි පාරේ යමින්, දේශපාලනික වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඉතාමත් කිට්ටුවෙන් කටයුතු කරන බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා. එතුමා ඉතාමත් සරල දිවි පෙවෙතක් ගත කළ කෙනෙක්; හොඳ තීක්ෂණ බුද්ධියකින් කටයුතු කළ කෙනෙක්; සමාජශීලී බව ඉතාමත් ඉහළින් තිබුණු කෙනෙක්. ඒ නිසාම තමයි එතුමා - දේශපාලන පක්ෂ අතර මතභේද තිබුණත්, මතවාද තිබුණත්- එතුමාගේ සියලු පාක්ෂිකයින් අතර ගෞරවයට, ආදරයට පාත්‍ර වූ කෙනෙක් බවට පත් වුණේ; ජනප්‍රියත්වයට පත් වුණේ.

මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ සියලුදෙනාම මේ පාර්ලිමේන්තු ගැලරියේ ඉන්නවා. එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ සියලුදෙනාටම අපගේ ශෝකය පුද කරමින්, එතුමාට දෙවියන්ගේ ආශීර්වාදය ලැබේවා!යි කියා මා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.44]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)

The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භයේ සිටම පතාක යෝධයෙක් විධියට කටයුතු කළ, අදත් අපි ගරු කරන ගරු අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී, ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

එතුමාගේ දේශපාලන ජීවිතයත්, සමාජ සේවයත් පිළිබඳව මේ සභාව තුළ බොහෝදෙනෙක් කථා කළා. ඒ වාගේම තවත් බොහෝදෙනෙක් කථා කරන්න නියමිතව තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාටම එතුමා පිළිබඳව කථා කරන්න පුළුවන්. පැය ගණනාවක් කථා කළත් එතුමාගේ සේවය හා එතුමාගේ ගුණයන් පිළිබඳව කථා කරලා නිම කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

එතුමා පිළිබඳව ඉතාමත් කෙටියෙන් කියනවා නම්, වර්තමානයේ රටක් දේශපාලනඥයෙකුගෙන් බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයේ දේවල්ද, කුමන ආකාරයේ චරිතයක්ද, එහෙම නැත්නම් දේශපාලනඥයෙක් කියන්නේ කවුද යන්න නිර්වචනය කළොත්, අලවි මවුලානා මැතිතුමා වැනි කෙනෙක් තමයි දේශපාලනඥයෙක් කියලා කියන්න පුළුවන් වන මට්ටමට දේශපාලන ජීවිතය තුළ එතුමා ආදර්ශවත් වුණා.

විශේෂයෙන්ම, සෑම වසරකම මැයි 1 වැනි දා සහ අපේ පක්ෂයේ නිර්මාතෘ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ ජන්ම දිනය වන ජනවාරි 8 වැනිදා, බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ ගුණානුස්මරණ දිනය වන සැප්තැම්බර් 26 වැනි දා එතුමා සිහි කරනවා. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ ගුණානුස්මරණ කමිටුවේ සභාපතිවරයා විධියටත් එතුමා කටයුතු කළා.

තම පක්ෂයේ ආණ්ඩුවක් තිබුණත්, නැතත්, එතුමා විපක්ෂයේ සිටියත්, රටේ කුමන දේශපාලන වාතාවරණයක් තිබුණත් මැයි දිනයට, බණ්ඩාරනායක ජන්ම දිනයට, බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනයට එතුමා අඛණ්ඩව නායකත්වය ලබා දුන්නා. එතුමාගේ ජීවිතයේ අවසාන අවුරුදු කිහිපයේදී එතුමාට දුර බැහැර යන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් බණ්ඩාරනායක ගුණ සමරු උත්සවයට එතුමා ඉතාමත් අමාරුවෙන් ඇවිල්ලා පුෂ්පෝපහාර දැක්වූ බව මට මතකයි. එතුමාගේ කළගුණ දැක්වීමේ ගුණයයි එතුමා එයින් ප්‍රදර්ශනය කළේ. එතුමාට දේශපාලන ක්ෂේත්‍රයේ හතුරන් කවුරුවත් සිටියේ නැහැ. විවිධ අය ව්‍යාපාරික සමිති ව්‍යාපාරවලදී හතුරුකම් කළා. විශේෂයෙන්ම හිරේ විලංගුවේ දැම්මා. එවැනි කටයුතු කළත්, අපේ රටේ කිසිදු දේශපාලන පක්ෂයක කෙනෙකුට වුණත් හදවතින් වෛර කරන්නට, තරහවක් ඇති කර ගන්නට එතුමාට පුළුවන්කමක් තිබුණේ නැහැ. එයට හේතුව එතුමාගේ චරිතය තුළ තිබුණු අවංකකම හා කැප කිරීමයි.

ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය පිළිබඳව අපගේ කනගාටුව එතුමාගේ පවුලේ සියලුදෙනාට මා පළ කරනවා. විශේෂයෙන්ම වර්තමානයේ දේශපාලන ක්ෂේත්‍රය තුළ කටයුතු කරන අයට එතුමාගේ ශ්‍රේෂ්ඨ චරිතය ආදර්ශවත් චරිතයක් වෙනවා. අපි ඒ චරිතය ආදර්ශයට ගත යුතුයි. එය දැනුමකට පමණක් සීමා කරන්නේ නැතිව, එතුමාගේ චරිතය, එතුමාගේ ක්‍රියාකාරිත්වය අපේ දේශපාලන ජීවිතය තුළදී භාවිතයට ගත්තොත්, අපටත් මේ රට තුළ හොඳ දේශපාලනයක් කරන්නට හැකියාව ලැබෙනවාය කියන එක සඳහන් කරන්නට ඕනෑ. එතුමාගේ අභාවය පිළිබඳ ශෝකය එතුමාගේ පවුලේ සියලුදෙනාටම නැවතත් පළ කරන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ සමස්ත ජනතාවගේම ශෝකයත් මේ අවස්ථාවේදී ඒ පවුලේ සියලුදෙනාටම පළ කරමින් මා නිහඬ වනවා.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

[අ.භා. 1.50]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය තුළ සිටින ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන්, අපගේ හිතාදර, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අලවි මවුලානා මැතිතුමා -අපට හුරු වචනයෙන් අපේ 'සහෝදරයා'- අපෙන් වෙන් වී යාම වෙනුවෙන්, එතුමාගේ අභාවය පිළිබඳව මේ ගරු සභාවේ අපේ සංවේගය පළ කිරීමට ලැබුණු මේ අවස්ථාව ගැන මා ස්තුතිවන්ත වෙනවා. අප පළ කරන්නේ සංවේගයයි. 'ශෝකය' කියන වචනයට වඩා වෙනස් අර්ථයක් 'සංවේගය' කියන වචනයේ තිබෙනවා. එතුමාගේ අභාවය අපේ හදවතට දැනෙනවා. එම නිසා අපට හටගන්නා වූ හැඟීම, එදා එතුමා විශ්වාස කළ, ක්‍රියාත්මක වශයෙන් දායකත්වය දුන් දේශපාලන ක්‍රියාදාමයට අපගේ සංවේගයේ ශක්තිය හැරවීම තමයි 'සංවේගය' කියන වචනයේ අර්ථය වන්නේ.

එතුමා ගැන කථා කරන්න මට නම් පැය ගණනක් වුණත් මදි. එතුමාගේ පවුලේ දරුවන්, ඒ වාගේම එතුමාගේ සියලු ඥාතීන් මෙහි සිටින අවස්ථාවේදී මා මේ කරුණ කිව යුතුයි. එතුමාගේ නිවස හැම දාම ආගන්තුක සත්කාරයට විවෘත වූ නිවසක්. ආගන්තුක සත්කාරය මවුලානා මැතිතුමාගේ ජීවිතයේ මූලික ලක්ෂණයන් අතරේ තිබෙන එක ලක්ෂණයක්. සියලු ජන වර්ගයන් අතර සහෝදරත්වය ගොඩ නැඟීම එතුමාගේ ජීවිතයේ එකම අභිලාෂය වුණා. එනම්, සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර සහෝදරත්වය ගොඩ නැඟීම. ජන වාර්ගික කලබල, නොසන්සුන්තාවන් තිබුණු යම් අවස්ථාවල එතුමා හමුවූවාම මා දැක්කා, එතුමාගේ ඇස්වල කඳුළු පිරී තිබුණු බව. "අනේ! මේ අසමඟිය අවසන් කරන්න ඔබට කළ හැකි දෙයක් ඔබ කරන්න." කියන ඉල්ලීම එතුමා නිරන්තරයෙන් ඉතාමත්ම උණුසුම් හැඟීමෙන් යුතුව හැම දාම වාගේ කළා. ජන වර්ග අතර අසමඟිය ඇතිවන අවස්ථාවලදී එතුමා ඉන්නේ බොහොම හිතේ අමාරුවෙන්; හිතේ වේදනාවෙන්. එතුමා තරම් ජන වාර්ගික සමඟියේ සංකේතයක් වූ වෙනත් අයෙක් මෑත කාලයේ සිටියේ නැහැ. එතුමාට දේශපාලන අදහස් ඇති වුණේ, ඒ දේශපාලන අදහස් මෝරා ගියේ 1950 ගණන්වල මැද පෙරදිගින් නැඟී ආ අධිරාජ්‍ය විරෝධී ජනතා ව්‍යාපාරයත් එක්කයි. එතුමාගේ එක පුතෙකුගේ නමත් නජීබ්. ඒ මිසරයේ හිටපු පළමුවෙනි ජනාධිපතිතුමාගේ නමයි.

අධිරාජ්‍ය විරෝධී නැඟිටීමෙන් පසු අලවි මවුලානා මැතිතුමාට ඉතා පැහැදිලිව තේරුම් ගිය දෙයක් තිබුණා. එනම්, පලස්තීනයේ ප්‍රශ්නය වේවා, ඉරාකයේ ප්‍රශ්නය වේවා, ලිබියාවේ ප්‍රශ්නය වේවා, අද සිරියාවේ ප්‍රශ්නය වේවා, මැද පෙරදිග අධිරාජ්‍යවාදය මැද පෙරදිග ජනතාවට විරුද්ධවත්, මැද පෙරදිග ඉස්ලාමීය ශිෂ්ටාචාරයට විරුද්ධවත් විශාල විනාශයක් සිදු කරන බව. ඒ රටවල ජනතා ව්‍යාපාරයෙන් පැන නැඟුණු නායකයින් අධිරාජ්‍යවාදය විසින් විනාශ කර දමන ආකාරය ගැන එතුමාට හොඳ තේරුමක් තිබුණා. පර්සියාවේ -අද ඉරානයේ- එදා මොසඩෙග් ගේ ආණ්ඩුව ඇමෙරිකාව ඇතුළු බටහිර රටවල කුමන්ත්‍රණ මඟින් පෙරළා දැමූ ආකාරය; ඒ පසුබිම තමයි එතුමාගේ දේශපාලන ජීවිතයට තිබුණු ජාත්‍යන්තර පසුබිම.

දේශීය වශයෙන් එතුමා මහත් සේ උත්තේජනයක් ලැබූ දේශපාලන පසුබිම මතු වන්නේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බිහිවීමත් පසුවයි. පසු කලෙක එම පක්ෂය වාමාංශික පක්ෂ සමඟ එක්සත් වී, එකතු වී ඇති කරපු ආණ්ඩු මඟින් මේ රටේ අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ ඇති කර ගෙන තිබුණු පාලනයේ යම් ලක්ෂණ වෙනස් කරමින්, අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ අත් පත් කර ගෙන තිබුණු මේ රටේ ජාතික සම්පත් අධිරාජ්‍යවාදී සමාගම්වලින් නැවතත් මේ රටේ ජනතාවගේ අයිතියට ගනිමින් ක්‍රියාත්මක වුණු ආණ්ඩු තුළිනුත් මවුලානා මැතිතුමාට ඉමහත් ආස්වාදයක් ලබා දුන්නා. හැම ජාත්‍යන්තරවාදී පෙළපාළියකම අධිරාජ්‍යවාදයට විරුද්ධව එතුමා සිටියා. එතුමාගේ උත්තුංග දේහය හැම තිස්සේම කැපී පෙනුණා. ඒ වාගේම හැම පිකට්ං විරෝධයකම එතුමා සිටියා. 1980දී මහා වැඩ වර්ජනය කැඳවීමේ එක කැඳවුම්කරුවෙකු වුණේ එතුමායි.

එතුමා එහි කැඳවුම්කරුවෙකු වුණා පමණක් නොවෙයි ඒ වැඩ වර්ජනය දරුණු ලෙස මර්දනය කිරීමෙන් පසුව ජනතාවගේ විරෝධය පළ කරන දවසේ එතුමා මමත් සමඟ සමීපව කොටුවේ විරෝධතා ක්‍රියාකාරීත්වයේ හිටියා. ඒ විරෝධතාවත් මර්දනය කරමින් අපිව අත් අඩංගුවට ගත්තා. මම වරාය පොලීසියේ එක සිර මැදිරියක ඉන්න අතරේ මට දැන ගන්නට ලැබුණා අල්ලපු සිර මැදිරියට ගෙනාවේ අපේ මවුලානා සහෝදරයාව කියලා. ඉන් පසුව අපි රිමාන්ඩ් භාරයේ දිගු කලක් හිටියා. ඒ කාලය තුළ අපට විරුද්ධව නඩුවක් අහන්නට පටන් ගත්තා. රාජ්‍ය විරෝධී කටයුතු කිරීම, දේපොළවලට අලාභ කිරීම, නීති විරෝධී රංචු ගැසීම, කෝලාහල තත්ත්වයක් ඇති කිරීම තමයි අපට තිබුණු චෝදනා. මම ඒ නඩුවේ පළමුවෙනි විත්තිකාරයා, දෙවෙනි විත්තිකාරයා තමයි මවුලානා සහෝදරයා. අපි හිර ගෙදරදීත් එකට සහෝදරත්වයෙන් හිටියා. එදා අපේ ඒ නඩුව දිනපතා ඇහුවා. දැන් කථා කරනවා ත්‍රී පුද්ගල විනිශ්චයකාර මණ්ඩල දිනපතා නඩු අහන පිළිවෙතක් හැදීම ගැන. ඔය නීති කිසිවක් නැතිව වරායේ විශේෂ උසාවියක් හදලා පහළ උසාවියේ අපේ නඩුව දිනපතා හය මාසයක් ඇහුවා.

අවසානයේ මහාධිකරණයට අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කළ වෙලාවේ මවුලානා සහෝදරයාත්, මමත්, අනෙකුත් විත්තිකරුවනුත් ඒ චෝදනාවලින් සම්පූර්ණයෙන්ම නිදහස් වුණා. ඒ හැම අවස්ථාවකම, දුක්මුසු අවස්ථාවල වාගේම සතුටෙන් පිරී සිටි අවස්ථාවලත් අපි එකට හිටියා.

එතුමා රජයේ සේවකයින්ගේ නිවාඩු කප්පාදුවට විරුද්ධව "පිකට්" එකකට, -විරෝධතාවකට- එකතු වෙලා සිටි වෙලාවේ ඇති වුණු ගැටුමකදී එතුමාගේ බඩට පිහියෙන් ඇන්නා. බොහොම අමාරුවෙන්, සැත්කම් රාශියකින් පසු එතුමාගේ ජීවිතය බේරා ගත්තා. නමුත් එතුමා කවදාවත් ප්‍රචණ්ඩ ලෙස හැසිරුණේ නැහැ. මට මේවායේ අර්ථයයි කියන්නට ඕනෑ. එතුමා ප්‍රචණ්ඩත්වයට ගොදුරු වුණා, නමුත් කවදාවත් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණේ නැහැ.

මහත්මා ගාන්ධිතුමා කියලා තිබෙන විධියට අපේ නිර්භීතකම තිබෙන්නේ අපි යටත් නොවීමට තිබෙන අධිෂ්ඨානය උඩයි. පහරදීමකදී වේවා ප්‍රචණ්ඩත්වයකදී වේවා යටත් නොවී අපේ අභිමතාර්ථය වෙනුවෙන් අධිෂ්ඨානය ඇතුව ඉන්නවා නම් ඒක තමයි නිර්භීත භාවය කියලා මවුලානා සහෝදරයා ක්‍රියාවෙන් පෙන්වූවා, ඒ ධර්මය අනුව ක්‍රියාත්මක වුණා. එතුමා කවුරුවත් කෙරෙහි හිතෙන්වත් ප්‍රචණ්ඩ හැඟීමක් ඇති කර ගත්තේ නැති මහා උතුම් පුද්ගලයෙක්. එක්තරා විධියකට සාන්තුවරයෙක් වාගේ ඉතා සරල, චාම් ජීවිතයක් ගත කළ එතුමා මහා කරුණාව හැම කෙනා කෙරෙහිම පැතිරූ කෙනෙක්.

එතුමා සතු ඉතා උසස් හාස්‍ය රසය හිර ගෙදර සිටි කාලයේදී පවා අපි බොහෝ දෙනෙකුට මහත් සේ විනෝදය ලබා දුන්නා. එතුමා එකට එක පැහෙන වචන මාලාවක් මඟින් එළිවැට ඇති වෙන පරිදි, දේශපාලන උපහාසය හෝ සමාජ උපහාසය ඇති වන පරිදි, ඉංග්‍රීසි වාක්‍ය පමණක් නොව සිංහල වාක්‍යයත් කියමින් ඒවා තුළ අර්ථයක් ගැබ් කරනවා. ඒ ආකාරයට ඉතාමත්ම රසවත් වැකි

කියූ එතුමා අපට ජීවිතයේ කවදාවත් අමතක නොවන චරිතයක්. මේ චරිතය මුස්ලිම් සමාජයට මහත් වූ සම්පතක්. ඒ වාගේම මට දුකයි කියන්නට එතුමාගේ ඒ ආදර්ශවත් ජීවිතය අනුව, ආදර්ශවත් චරිතය අනුව දෙවෙනි පෙළක නායකත්වයක් මුස්ලිම් ප්‍රජාව අතරින් මතු වුණේ නැහැ. මුස්ලිම් ප්‍රජාව අතරට අධිරාජ්‍ය විරෝධී හැඟීම ගෙන ගියේ එතුමායි. එදා බදියුදීන් මහමුද් මැතිතුමා ඇතුළු නායකත්වයෙන් පසුව මුස්ලිම් ප්‍රජාවට මතු වුණු නායකයා මවුලානා සහෝදරයායි.

ඉතා පැහැදිලිව අපට ප්‍රශ්න තිබෙනවා. නමුත් අපට බෙදුම් රේඛාවක් තිබෙනවා. ලංකාවේ දේශපාලනය තුළ අධිරාජ්‍යවාදය නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ නිසා එතුමා කවදාවත් හීනෙකින්වත් හිතුවේ නැහැ, එක්සත් ජාතික පක්ෂයත් සමඟ සමාදාන වෙන්න. ඒ නිසා එතුමා හැම දේශපාලන කුණාටුවක් හරහා හරියටම මේ බෙදුම් රේඛාව තේරුම් කරගෙන අධිරාජ්‍යවාදයටත්, එක්සත් ජාතික පක්ෂයටත් විරුද්ධව තම දේශපාලනය නොනවත්වා ඉදිරියට ගෙන ගියා. මේ වේලාවේ මෙහි පැමිණ සිටින එතුමාගේ පවුලේ දරුවන් ඇතුළු සියලු සාමාජිකයන්ට එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපගේ ඉමහත් සංවේගය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, එතුමා වෙනුවෙන් ඉදි කරන ස්මාරකය කුමක්ද යන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

"ලිප්ටන් වටරවුම" ලෙසට අද ඇති ඒ වටරවුම "මවුලානා වටරවුම" ලෙස නම් කිරීමට කොළඹ නගර සභාව කටයුතු කරනු ඇතැයි කියා මම විශ්වාස කරනවා. මවුලානා සහෝදරයා ආණ්ඩුකාරවරයා හැටියට ඇවිත්, ආණ්ඩුකාර සහෝදරයා හැටියට "ලිප්ටන් වටරවුම" වටේ picket එකකට එකතු වුණා. එතුමාගේ දේශපාලන අදහස් අනුව ක්‍රියාත්මක වෙන්න එතුමා ආණ්ඩුකාරවරයා වීම එතුමාට බාධාවක් වුණේ නැහැ.

"ලිප්ටන් වටරවුම" නමින් හැඳින්වෙන තැන "මවුලානා වටරවුම" නමින් හැඳින්වීමට කටයුතු කිරීමට නගර සභාවෙන් මම ඉල්ලා සිටිනවා. මේ රටේ වැඩ කරන ජනතාවගේ වෘත්තීය සමිති ව්‍යාපාරය, අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය සහ ජාත්‍යන්තර වශයෙන් ආසියානු, අප්‍රිකානු ජාතික සහෝදරත්වය වෙනුවෙන් මේ රටේ වැඩ කරන පන්තියේ ජනතාව හැම මැයි දිනයකම එතුමාගේ නාමය සිහිපත් කරනවා නෝ අනුමානයි. ඒ නිසා හැම මැයි දිනයක්ම එතුමාද සිහිපත් කරන මැයි දිනයක් බවට පත් වේවි කියා විශ්වාස කරමින්, මුස්ලිම් ප්‍රජාව අතරින් දෙවැනි නායකත්වයන් මතු වී එත්වා! යි ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ නාමයෙන් ජාතික සමඟිය දිනේවා! යි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

[අ.භා.2.03]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අපේ රටේ ජාතික දේශපාලනයේ ගෞරවනීය නායකත්වයක් හෙබ වූ අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවේදී එතුමාගේ වියෝවේ ශෝකය පමණක් නොව, එතුමාගේ ජීවිතයේ වීරත්වය අපි මේ අවස්ථාවේ එතුමාට ගෞරවයක් වශයෙන් සිහිපත් කරනවා. එතුමා ජනතාව අතර ජීවත් වුණු නායකයෙක් බවට පත් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති ව්‍යාපාරය සමඟ එක් වෙමිනුයි. ඒ වාගේම අපේ රටේ දුප්පත් අහිංසක ජනතාවගේ දුක නැති කිරීමට හැකි සමාජයක් නිර්මාණය කිරීමට එතුමා අධිෂ්ඨාන සහගත කැපවීමක් කළා. ප්‍රගතිශීලි කඳවුරේ දේශපාලන ව්‍යාපාරය හැටියට ඒ ශක්තිය සමඟින් අලවි මවුලානා මැතිතුමා 'හැමදෙනාගේම සහෝදරයා' කියන නාමය දිනා ගැනීමට හැකි වුණු කර්තව්‍යයට හේතු සාධකය, ප්‍රධානත්වය වූයේ එයයි.

වැඩ කරන මිනිසුන් වස්තුව, ධනය හම්බ කරනවා. ඒ හම්බ කරන වස්තුවට, ධනයට ඔවුනට ඇති හිමිකමක් නැහැ. ඒ තත්ත්වය වෙනස්කොට වැඩ කරන ජනතාවගේ ජන ජීවිතයත්, ජාතික ආර්ථිකයට තිබෙන උරුමයත්, ඒ වාගේම ආර්ථිකය වඩා යහපත් ආර්ථිකයක් බවට පත් කළ හැකි සමාජයක් නිර්මාණය කරන්නත් අලවි මවුලානා මැතිතුමා වෘත්තීය සමිති ව්‍යාපාරය ශක්තිමත් කළා; සංවිධානය කළා; ඒ වෙනුවෙන් සටන් කළා; සටන් නායකත්වය දුන්නා. ඒ වෙනුවෙන් එතුමාට මුහුණ දෙන්නට වුණු අතවර, තර්ජන, ගර්ජන, ශාරීරික වධ හිංසා හරහා නොපසුබටව ඉදිරියටම ගමන් කළා. අලවි මවුලානා සහෝදරයා මහා වෘත්තීය සමිති සටනකින් පසුව කොළඹ මහ රෝහලේ ඇඳක් මත ලේ වැගිරෙමින් සිටි අවස්ථාව අපි ඉතාම ශෝකයෙන් සිහිපත් කළා. නමුත්, කොයි තරම් ලේ ගලා ගියත් එතුමා ඒ ගැන නැකීමක් නොකර, සුව වූ පසු යළිත් ජනතාවට සේවය කරන්න ප්‍රතිඥාවී කඳවුරට මුහුණ දුන්නා. එතුමා කොළඹ මහ නගර සභා මන්ත්‍රීවරයකු මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්වී කම්කරු ඇමතිවරයා, ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා බවටත් පත් වෙමින් පාර්ලිමේන්තු දේශපාලනය තුළ මහජන සහයෝගය හා නායකත්වය ඉදිරියටම ගෙන ගියා. බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට කටයුතු කළ කාලය තුළ කිසි විටෙකත් තමන් නායකත්වය දුන් සහෝදර ජනතාවගේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ අරගළයකට, උද්ඝෝෂණයකට සහභාගි නොවී සිටියේ නැහැ. ආණ්ඩුකාරවරයකු වුණත්, මැති ඇමති තනතුරක් දැරුවා වුණත්, අලවි මවුලානා මැතිතුමා මහජනයා සමඟ පාරට බැහැපු සැබෑ ජනතා නායකයෙක් වුණා. එතුමාට කවුරුත් "සහෝදරයා" කියන්නේ සැබැවින්ම එතුමා සහෝදරයකු ලෙස දුන් ඒ නායකත්වය නිසයි. යුග ගණනාවක් හරහා ඒ අරගළය ඉදිරියට ගෙනෙන්න ශක්තිය දෙන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. එවකට කුමන ආණ්ඩු පැවතියත් බණ්ඩාරනායක අනුස්මරණ සංවිධාන සංගමයේ නොසැලෙන පුරුකක් ලෙස සිටිමින් ඒ පුද කළ යුතු ගෞරවනීය ආචාරය පුද කරන්න සංවිධාන කටයුතු මෙහෙයවපු ආකාරය අපට මතකයි.

ඒ විතරක් නොවෙයි. ආණ්ඩුව විසුරුවන්න අමාරුකමින් විශාල අර්බුදයක් ඇති වූ වෙලාවක ජනාධිපතිතුමිය හැටියට කටයුතු කළ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය කැඳවා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ගැසට් නිවේදනය අත්සන් කළා. ඒ නිවේදනය මුද්‍රණාලයාධිපතිවරයා අතට මහ රාත්‍රියේ ගෙන ගොස් දී එය මුද්‍රණය කිරීමෙන් පසු පළමුවැනි පිටපත ගෙනැල්ලා ජනාධිපතිතුමියට භාර දීමේ මහා පෙරළිය කරන්න විශ්වාසය තැබුවේ එදා අලවි මවුලානා මැතිතුමා කෙරෙහියි. එතුමා වෘත්තීය සමිති නායකයකු හැටියට, දේශපාලන නියෝජිතයකු හැටියට එදා -2004- පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ මහා පෙරළිය සාර්ථක කරන්න කර දුන්නා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟද, ඊට පසු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සමඟද, විශේෂයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙන්නට කලින් අග්‍රාමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ වැඩ කරන ජනතාවගේ ධවල පත්‍රිකාව, කම්කරු ප්‍රඥප්තිය පෝෂණය කරන්න කටයුතු කළා වාගේම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අද දින සඳහන් කළ පරිදි, වෘත්තීය සමිති ව්‍යාපාරයේ දීර්ඝ කාලයක් ඉටු කළ මෙහෙය වෙනුවෙන් එතුමාට සදාදරණීය ගෞරවයක් හිමි විය යුතු බව මා යළිත් සඳහන් කරන්නට කැමැතියි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

වරක් ගරු අලවි මවුලානා සහෝදරයාගේ උපන් දින සාදයකදී එතුමාට සුබ පතන අය එතුමාගෙන් වයස ඇහුවාම, "මම ආපහු අවුරුදු 50 ඉඳන් මේ පටන් ගන්නේ" කියලා එතුමා කිව්වා. එතුමා එවැනි හාස්‍යජනක කථා කියමින් බොහොම විහිළුවෙන් සියලුදෙනා ආශ්‍රය කළ, බොහොම හොඳ මිත්‍රශීලී ගුණාංගවලින් පිරුණු චරිතයක්. දේශපාලන පොර පිටියේ මොන තරම් තර්ජන ගර්ජන, ගැටුම්වලට මුහුණ දුන්නත් මොහොතකින් ඒවා අමතක කොට මනුෂ්‍ය ගුණාංගයන්ගෙන් පිරුණු ජනතා නායකයකු ලෙස කටයුතු කළ හැකි ආදර්ශය එතුමා සැමදෙනාට එකතු කළා.

ප්‍රගතිශීලී දේශපාලන පෙරමුණු කැඩී ගිය අවස්ථාවේදී අලවි මවුලානා සහෝදරයා එය වළක්වන්න හැදුවා. ප්‍රගතිශීලී දේශපාලන පෙරමුණු එකතු කිරීම සඳහා කළ හැම කටයුත්තකදීම අලවි මවුලානා සහෝදරයා ඒ උත්සාහයට හවුල් වුණු නිසා එතුමා ලංකා ඉතිහාසය නිර්මාණය කිරීම සඳහා කර්තව්‍යයක් ඉටු කළ නායකයකු බව ප්‍රගතිශීලී ව්‍යාපාරය වෙනුවෙන් අපි සඳහන් කරන්න ඕනෑ. මෑත කාලයේ අපි පරාජය වෙලා - ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය වුණාට පස්සේ- ඇති වුණු පසු බෑම නිසා පළමුවැනි මැයි දිනය පවත්වන්නට අලවි මවුලානා සහෝදරයා පාරට බැස්ස හැටි අපට මතකයි. එතුමාගේ වයස නොතකා, ශරීර සෞඛ්‍ය නොතකා අභියෝග මැද ඒ පළමුවැනි මැයි දිනය සාර්ථක කර ගනිමින්, ඒ දේශපාලන ගමන ශක්තිමත් කරමින් ලංකාවේ දේශපාලනය යළිත් වෙනස් කරන්න අවශ්‍ය පියවර ගත්තා. වරෙක එතුමාගේ සහෝදරයකුගේ දරුවෙක් අතුරුදහන් වුණා. ඒ අවස්ථාවේත් අලවි මවුලානා සහෝදරයා නොසැලී සිටියා. මට මතකයි ඒ අවස්ථාවේ අපි එතුමා හමුවෙන්න ගිය වෙලාවේ එතුමා නොසැලෙන පර්වතයක් සේ සිටියා. එතුමා, තමන්ගේ ජීවිතයට මොන තරම් තර්ජන, ගර්ජන ආවත් අපි කැප වී සිටින්නේ වැඩ කරන ජනතාවගේ යහපත සඳහා වූ ගමනක් යන්නට මිස, අපේ පෞද්ගලික වාසිය සඳහා හෝ පෞද්ගලිකව තනතුරු ලබාගැනීම සඳහා නොවන බව පෙන්නුම් කළ ආදර්ශවත් නායකයෙක්. එතුමාගේ පවුලේ සියලු දෙනා සමඟ අපිත් එකතු වෙලා ඒ ශෝකය බෙදා ගන්නවා. ඒ දරුවන් විශාල කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා නිරත වෙලා සිටිනවා. ජාත්‍යන්තරව වෘත්තීය සමිති ව්‍යාපාරයට; ජාත්‍යන්තරව සාමය සඳහා වූ ව්‍යාපාරයට; විශේෂයෙන්ම පලස්තීන ජනයාගේ අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරයට අලවි මවුලානා මැතිතුමා නොසැලී සිටි මිත්‍රයකු ලෙස දුන් ආදර්ශය අද දේශපාලනයේ නිරත වන සැම දෙනාටම ඉතාමත් වැදගත් ආදර්ශයක්. ජීවිතයේ අවසාන අවස්ථාවේදී තමන් කැප වුණු කර්තව්‍ය වෙනුවෙන්, වැඩ කරන ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කළ අලවි මවුලානා සහෝදරයාට අපි සදා නිසංසල සුවය ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ඒ පවුලේ දරුවන් සහ ඥාතීන් සමඟ ඒ ශෝකය බෙදා ගැනීමට අප ද එක් වෙනවා.

ගරු කථානායකතුමනි, භූතපූ අමාත්‍ය යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ශෝක යෝජනාව සම්බන්ධයෙනුත් කෙටියෙන් සඳහන් කරන්න මට අවසර දෙන්න. තරුණ මන්ත්‍රීවරුන් හැටියට අපි පාර්ලිමේන්තුවට එන කොට යූ.බී. විජේකෝන් මැතිතුමා රාජ්‍ය පරිපාලනය පිළිබඳ අමාත්‍ය ධුරය දැරුවා. එතුමා පේෂකර්මාන්තය පිළිබඳ අමාත්‍ය ධුරය දැරුවා. ඈත එපිට ගම්මානයකින් පැමිණ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයෙන් ලැබූ සුවිශේෂී සමර්ථකම් නිසා එතුමා උගතකු විධියට රාජ්‍ය සේවයට බැඳිලා, ඉන් පසුව රාජ්‍ය සේවය අතහැරලා ජනතා සේවය සඳහා මැතිවරණයට ඉදිරිපත් වුණා. 1977 දඹදෙණිය ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි යූ.බී. විජේකෝන් මැතිතුමා ඉතා ආදර්ශවත්, අදහස් සමුදායකින් පිරුණු දේශපාලනඥයෙක් හැටියට අපට සිහිපත් වෙනවා. එතුමාගේ වියෝව පිළිබඳව අපද ශෝක වෙනවා. අවසාන කාලයේ එතුමා ගාන්ධි ව්‍යාපාරයේ අදහස් ප්‍රචලිත කරමින්, පක්ෂ දේශපාලනයෙන් තොර මහජන නියෝජිතයන් ඇති කිරීමේ කර්තව්‍යය සඳහා ලංකාව පුරා ගියා.

මා පාර්ලිමේන්තුවේ මැතිවරණ කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන විට ඒ කොමිටිය ඉදිරියට පැමිණි යූ.බී. විජේකෝන් මැතිතුමා කියා සිටියේ දේශපාලන පක්ෂ අත්හැරලා ඇති කරන ඡන්ද ක්‍රමයක් පළාත් පාලනයට ඇති කළ යුතුයි කියලායි. ගාන්ධි සංවිධානය වෙනුවෙන් එතුමා එහෙම සාක්ෂි දුන්නා මට මතකයි. මෑත කාලයේදීත් -පසු ගිය වසරට පෙරාතුව- මේ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදීත් එතුමා ඒ අදහස් පළ කළා.

ඊළඟට සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ගැනත් වචනයක් සඳහන් කළ යුතුයි. එතුමා පාර්ලිමේන්තුවේ හිටියා; පළාත් සභාවේ හිටියා. අපේ ගමේ ගහෙන් එහා පැත්තේ තමයි එතුමා ජීවත් වුණේ. ඒ නිසා එතුමා නිතර දෙවේලේ අපට හංවැල්ලේදී හම්බ වුණා. දේශපාලන භූමියෙන් ඉවත් වෙලා ඉන්න කොටත් එතුමා හම්බ වුණා. මහජන සේවාවට එතුමා ඉටු කළ කර්තව්‍ය සුවිශේෂීයි. කැලණි ගං ඉවුරේ දෙපාර්ශ්වයම ආශ්‍රය කළ මහජන නියෝජිතයෙක් හැටියට අපි සුරනිමල් රාජපක්ෂ මැතිතුමාව ආශ්‍රය කළා. දීර්ඝ කාලයක් මහරගම තරුණ සේවා සභාව තුළ දහස් ගණන් තරුණයන්ගේ වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කරන්න එතුමා දායාද කළ ශක්තිය අපි මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහි කරනවා.

අපේ රටේ අයුක්තියට, අසාධාරණයට ලක් වුණු, තවමත් තම අයිතිවාසිකම් සම්පූර්ණයෙන් දිනා ගැනීමට බැරි වුණු ලක්ෂ ගණනක් වූ වතු කම්කරු ජනතාවගේ නියෝජිතයෙක් වූ කේ. වේලායුදම් මැතිතුමාවත් අපි මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. කුමන දේශපාලන කඳවුරක හිටියත් එතුමා වෘත්තීය සමිති ප්‍රශ්නවලදී, වෘත්තීය සමිති අරගළවලදී, වෘත්තීය සමිති සාකච්ඡාවලදී පොදු අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් දක්වන ලද ආදර්ශය සියලු වෘත්තීය සමිති ක්ෂේත්‍රයටත්, උඩ රට එතුමා නියෝජනය කළ ප්‍රදේශයේ ජනතාවටත් ලැබුණු ශක්තියක්. ගරු කථානායකතුමනි, එලෙස සඳහන් කරමින් අද දින මේ ශෝක යෝජනාවලට එක්වෙමින් මා නවතිනවා.

[2.19 p.m.]

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Bismillahir Rahmanir Raheem.

Mr. Speaker, I rise today to deliver, probably the most difficult speech I have ever delivered in this House.

The late Hon. Marhoom Al-Haj As-Seyed Alavi Moulana was, to our nation, one of its greatest sons; to the working class, their champion and most colourful, fearless and successful trade unionist; to the Sri Lanka Freedom Party, a devoted tower of strength; to this House and Governments of the past, a notable Cabinet Minister of Labour, Provincial Councils and Local Government and Governor of the Western Province, and personally to me, my dear uncle and closest mentor.

Sir, it is impossible to sum up in a few words the yeoman service he had rendered to our country and also the profound and fearless acts he undertook on behalf of

the common man, which brought about change within the overall political fabric of our country, by way of enacting our pivotal reforms and legislation which we now, several years later, take for granted.

Throughout his long and arduous career, he was called many things. Many called him "Moulana *mahaththaya",* "Moulana *amathithuma",* "Moulana *aandukarathuma*" and so on. However, what most befitted him was probably his being referred to as the "Picketing Governor", a true testament to his lifelong commitment towards taking to the streets, particularly to Lipton Circus, as very rightly mentioned by the Hon. Vasudeva Nanayakkara, to fight for what was right even till his last days. His most preferred title, however, was "Moulana *Sahodaraya*" or "Comrade Moulana", a true display of a man of deep humility. By the members of our family and me, he was always affectionately addressed as "Alavi uncle" and he was "Alavi *appa*" to the younger generations. Alavi uncle was a one-man show, a physically towering force of nature, who boldly and confidently took to the streets on countless occasions at the helm of many protests to fight tirelessly for the common man till his last breath.

The Vote of Condolence being taken up today in his honour in this august House is testament to the life and times of Alavi uncle. While those speaking about him today shall most likely speak of his lifelong, arduous and exhilarating service as a revolutionary trade unionist and a progressive senior statesman of our country, I wish to take a more personal route.

Born on New Year's Day in 1932 to Seyed Ahamed Moulana and Sithy Rahma, Alavi uncle, like me, hailed from a noble lineage, the House of Ahl al-Bayt, being the 36th direct descendant of the Holy Prophet Muhammad, *sal allahu alaihi wa sallam,* may peace be upon him, through his grandson Hussain.

The origins of our ancestry can be traced back to the Southern tip of the Arabian Peninsula, in Hadramaut, in present-day Yemen, from where our seafaring ancestors embarked on a journey in search of the famed land of Serendib, present day Sri Lanka. In true testament to this noble ancestry, and in somewhat of an ironic context, Alavi uncle chose to live his life by the actions of his most revered ancestor, the Holy Prophet of Islam, who himself fought tooth and nail for the liberation of the oppressed and the downtrodden, and who was probably one of the earliest notable propagator of labour rights in modern history. In fact, Alavi uncle incessantly repeated the words of the Holy Prophet Muhammad, *Sallallahu alaihi wa sallam* , may peace be upon him, which were "Pay the worker his dues even before his sweat dries."

Thus, Alavi uncle chose to be different, simply because he was different. Choosing to answer a higher calling of what was expected of him and his family, Alavi uncle rose to the occasion at the young age of 15 by attending rallies of Pieter Keuneman, Dr. S.A. Wickramasinghe and Dr. Colvin R. De Silva after school hours while at St. Peter's College and Zahira College. He was inspired by the Socialist movement's ability to mobilize the downtrodden working classes in the attempt to uplift their lives, and further obtain Independence for our country from the imperialists.

In fact, Alavi uncle was probably among the youngest arrested by the police for protesting against the Motion of No-Confidence against Kumaran Ratnam, the then Mayor of Colombo who was a champion of workers' rights at that time. Even at that very young age of 19, the deep rooted conviction instilled in him that there should be equal opportunities for all, always surpassed any obstacle that attempted to prevent him from doing what he thought was right, and this mindset prevailed throughout his six decades of public service. In fact, I recall that fateful day on July 16, 1980, when Alavi uncle, ever at the forefront of the movement for the downtrodden, was targeted by thugs for his leadership, and was assaulted mercilessly. Those harrowing days that followed at the ICU at the General Hospital is a dark period in the memories of our family, as we stood by his bedside and saw him narrowly escaping the jaws of death. But again, after making a full recovery, he went back to doing what he did best, the rest being history.

Moreover, I must state at this juncture that it was not only Alavi uncle, but it was our entire family that paid the ultimate sacrifice on numerous occasions for the sake of doing what was righteous: his youngest brother Saheed lost his life due to political expediency, his brother-in-law and faithful companion, Seyed Mohammed Mashoor Moulana disappeared during the 1990 May Day rally at Campbell Park and was never to be seen again, and further, the healthy business of his two sons, Naqeeb Moulana and Najeeb Moulana were subject to state victimization leading to dire straits.

Hon. Speaker, while I shall allow for my fellow Colleagues in this House to speak more about his contribution towards the trade union movement and that of the exponential growth of Sri Lanka Freedom Party, I wish to speak on more of the character of Alavi uncle, and that of the man himself. Today, throughout the country, the household name "Alavi Moulana" is synonymous to a one-of-a-kind trade union leader, a great statesman, more recently a poet, whose affable rhymes were always coupled with reason and a serious advocate for unity and integration amongst all communities. This definition is a true testament to a man of principles who did his best towards what he knew was right with no complaint or fanfare.

In carrying out responsibilities entrusted to him, he never came under criticism by anyone who worked with him for having flouted his duties, nor was he ever implicated in any fraudulent or corrupt activity. He held many positions throughout his career and carried out his duties meticulously.

I credit my entry into the political sphere to Alavi uncle who upon my return from my studies in the United States, insisted that I accompany him to meet the then Prime Minister, the Hon. (Mrs.) Sirimavo Bandaranaike. At his insistence, she appointed me as the District Organizer for Batticaloa for the SLFP in 1988. From that point onwards, Alavi uncle was always my greatest and

[ගරු සෙයිඩ් අලී සාහීර් මවුලානා මහතා]

closest mentor. I recall countless fond memories of me as a young and sometimes frustrated politician going to him for advice when he would begin by gently addressing me affectionately as “Seyed Ali” and thereafter offer me the most relevant and apt counsel, usually peppered with lively poetry.

Despite his seniority, in his true unique style, he never chased the limelight. We both entered Parliament for the first time in 1994. Although we were then on the opposite sides of the divide, him with the SLFP-led People’s Alliance Government and me in the Opposition with the UNP, there was no greater honour for me than to serve in the Parliament alongside Alavi uncle. In fact, the Hansard will exhibit numerous times how we both engaged in healthy banters of substance from across the aisles and even our Colleagues at the time would egg us on watching amusedly as uncle and nephew were debating on issues of the day in this very House. However, Alavi uncle never ever compromised his principles and moreover, always put the family first ensuring that whenever such debates did happen between us in the Chamber, he would always embrace me in a fatherly fashion in the Lobby thereafter with pride and humility.

As a Governor, he delivered an unprecedented service to the people domiciled in his jurisdiction of the Western Province. I recall when he was offered the position for the very first time, he in fact turned it down, a rare trait in modern politics, preferring to revert to his trade unionist activities at his office at the SLFP Headquarters. He famously quipped in his own flair, “I have never governed and do not want either myself or my workers governed. I prefer to negotiate, meditate, mediate and agitate.” This is, again, another testament to the honour and loyalty to a lifelong commitment to the dispossessed whom he dedicated his life to. Although he rubbed shoulders with royalty, heads of State and the elite, he was always at home and most comfortable with the working class, whom he fought for all his life.

At this juncture, I must state of the exemplary life Alavi uncle led, particularly of his daily commitment to follow the *Sunnah - Sunnah wa'l-Jamā'ah-* or the daily traditions and practices of the Holy Prophet Muhammed, *sal allahu alaihi wa sallam,* may peace be upon him.

No matter how immersed he was in public life, his lifestyle, poise and character reflected as to how much he followed the traditions of the Holy Prophet, *Sallallahu Alaihi wasallam*, may peace be upon him, and ensured that this was conveyed and transferred to all those around him to the best of his ability in a manner of peace and contentment.

The light that shone on his face, the permanent smile, and his genuine, jolly, affable character is a true depiction to that of the Holy Prophet's way. I can clearly state at this point, that as a member of his family, and thereby a descendant of that same noble lineage, I am simply humbled to have known and to have been in association with such a man who above all, possessed true love for the Holy Prophet, *sal allahu alaihi wa sallam*, may peace be upon him, and his continued reverence for *Allah Subhanahu Wa Ta'ala.*

Alavi uncle, nothing gives me more pride than to speak in this House about your glorious contribution to our country, to the lives of our fellow citizens and to our family. Today, I am joined by your children, Naqeeb Mowlana, Najeeb Mowlana, Husniya and Azzahanim, your grandchildren and great-grandchildren, and members of your extended family, in this very hallowed Chamber which you lit up time and again with your passionate discourse, to memorialize, commemorate and felicitate all that is now and forever, the legend of As-Seyed Alavi Mowlana, the People's Governor.

The members of the Holy Mowlana families are here. They are known as "Ahl ul-Bayt families" because they are brought up in a very holy, deeply religious, conservative, orthodox and a highly refined background. His children have acquired uncle As-Seyed Alavi Mowlana's good qualities. They are extremely good and I personally witness them following our rich Islamic culture and human values towards all communities just as their late father used to practise.

May the Almighty Allah have mercy on his soul, honour his reception, continue to elevate his status further, and grant him the beautiful gardens of *Jannatul Firdous.*

Ameen!

Having said that *dua,* let me take the liberty in saying a few words in Tamil.

கௌரவ சபாநாயகர் அவர்களே, "தோன்றிற் புகழொடு தோன்றுக" என்றார் வள்ளுவர்.

அந்த அடிப்படையிலே,

அரிது! அரிது! மானிடராகப் பிறத்தல் அரிது!
அதிலும் கூன் குருடு செவிடு நீங்கிப் பிறத்தலரிது!

என்று குறிப்பிடுகிறார், தமிழிலே மிகவும் புகழ்பெற்ற புலவரான ஔவைப் பிராட்டியார்.

இவ்வேளையில் அரிதான பல முக்கியமான நிகழ்வுகளை இங்கே சொல்ல வேண்டும். தனக்கும் தான்சார்ந்த சமூகத்திற்கும் மட்டும் குரல் கொடுக்கும் தலைவர்களைத்தான் நிதமும் கண்டுகொண்டிருக்கிறோம். தனது சமூகத்தோடு ஏனைய சமூகம் பற்றியும் சிந்திக்கும் தலைவர்களைக் காண்பது அரிது. அந்தவகையில் அரிதான, ஒரு தவமான மர்ஹூம் அஸ்ஸெய்யித் அலவி மௌலானா அவர்கள் புகழோடு தோன்றிய ஒரு மகான். அந்த மகானுக்கான அனுதாபப் பிரேரணைமீது சில கருத்துக்களைத் தெரிவிப்பதற்கு எனக்கும் சந்தர்ப்பம் கிடைத்ததற்காக நான் அல்லாஹ்வுக்கு நன்றி செலுத்துகின்றேன். அல்லாஹ் மிகத் தூய்மையானவன். அல்ஹம்துலில்லாஹ்!

மனிதர்களில் அதிபெரும்பான்மையினர் சாதாரணமானவர்களே! மிகவும் சொற்பமானவர்களே சாதனை படைத்தவர்கள். மனித குலத்தில் சாதனை படைத்தவர்கள் நட்சத்திரங்களைப் போன்றவர்கள். அந்த நட்சத்திரங்கள் ஜொலிக்கும் மனித வானத்திலே பிரகாசித்தவர்கள் விரல்களின் எண்ணிக்கைக்குள் அடக்கமானவர்களே! நமது நாட்டின் முஸ்லிம் சமூகத்து வானிலே குளுமையான ஒளி வழங்கிப் பிரகாசித்த ஒரு நிலவுதான் மர்ஹூம் அல்ஹாஜ் அஸ்ஸெய்யித் அலவி

மௌலானா அவர்கள். முஸ்லிம்கள் சிறுபான்மையாய் இருக்கின்ற ஒரு நாட்டிலே முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த ஒருவர் எவ்வளவுதூரம் கௌரவிக்கப்படுகிறார் என்பதை எண்ணும்போது, இங்கிருந்த அரசாங்கங்களுடனும் பல்லினங் களின் மத்தியிலும் எவ்வளவு உயர்வாக அவர் நடந்திருக் கின்றார் என்ற உண்மையும் கூடவே புலப்படுகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, அவர் கொழும்பு மாநகர சபையின் மக்கள் பிரதிநிதியாக அரசியலை ஆரம்பித்து, ஒரு நாட்டின் அதிமுக்கிய தலைவர்களில் ஒருவராகப் பதவி வகித்தார். இந்த நாட்டு முஸ்லிம்களுக்கு அந்தப் பெருமையைத் தந்த மர்ஹூம் அஸ்ஸெய்யித் அலவி மௌலானா அவர்களுக்கு முஸ்லிம்கள் தங்களது நன்றி மலர்களைச் சொரிகின்றார்கள். ஒரு முட்டையை இட்டுவிட்டு அகங்காரத்தில் ஊரெல்லாம் கொக்கரித்துத் திரியும் கோழியைப் போன்ற அகம்பாவத் தலைவர்களைப் போலல்லாது, எளிமையும் பணிவும் விசுவாசமும் தேசாபிமானமும் கொண்டு உயர்ந்தவர் அவர். முஸ்லிம்கள் சிறுபான்மையினராக வாழ்கின்ற ஒரு பல்லின நாட்டில் உண்மையாலும் உழைப்பாலும் உயர்ந்தார். இந்த அடிப்படையிலே அவரது நல்ல செயற்பாடுகள்மூலம் பௌத்த, இந்து, கிறிஸ்தவ, முஸ்லிம் உறவை வளர்த்து சேவையாற்றி வந்தார். பல இக்கட்டான நிகழ்வுகள் இடம்பெற்ற போதெல்லாம் முஸ்லிம்களின் தனித்துவத்துக்கும் கௌரவத்துக்கும் பாதிப்புகள் ஏற்படாதவகையில் பல உபதேசங்களைச் செய்து தனது சிறப்பான அணுகுமுறையால் சகல சமூகங்களினதும் மத்தியில் ஒற்றுமையாக வாழ்வதற்கு வழிகாட்டினார்.

அது மட்டுமல்ல, அவரது மத நம்பிக்கையில் தூய்மை இருந்தது; அவரது தேசாபிமானத்தில் பரிசுத்தம் இருந்தது. அவரது அரசியலில் சாந்தியும் சமாதானமும் முக்கியத்துவம் பெற்றிருந்தன; நாட்டில் முன்னேற்றமும் மக்களின் திருப்தியும்தான் அவரது இலக்காக இருந்தது; அவரது ஒவ்வொரு செயலிலும் ஜனநாயகமும் அஹிம்சையும் இருந்தது. இனியொரு நீண்ட காலத்துக்கு இவரைப்போல் ஒருவர் வாழக்கூடிய சந்தர்ப்பம் இப்போதுள்ள யாருக்கும் கிடைக்காதென்று கூறுமளவுக்கு, அரசியலிலும் ஆத்மீகத்திலும் ஒருங்கே உயர்ந்தவராக அவர் வாழ்ந்து பிரகாசித்தார்.

அவர் ஒரு குட விளக்கல்ல! ஒரு குல விளக்கு! அவரது ஒளியைப் பார்த்த ஒரு சமூகத்துக்கு அவரைப் பார்க்க ஒளி தேவையில்லை; அவரது செயல்களுக்கும் சேவைகளுக்கும் பட்டியல் போடத் தேவையில்லை. அவரது சாதனைகளை இந்தச் சபை இன்று கூறிக் கொண்டாடுகின்றது. சில வருடங்களுக்கு முன்னர் நானும் மர்ஹூம் அலவி மௌலானா அவர்களும் இந்திய ஜனாதிபதி அப்துல் கலாம் ஆஸாத் அவர்களைச் சந்திக்கச் சென்றபோது அவரை ஒரு நிறைகுடம் என்று விளித்து, "நிறைகுடம் என்றும் தளம்பாது" என்றார்கள். ஆனால், இன்று குறைகுடங்களாக இருக்கின்ற பலர் தங்களை நிறைகுடங்களாக நினைத்துப் பெருமை கொள்கின்றனர். அதாவது, The full pot neither stumbles nor rumbles and will never grumble. Therefore, be simple என்று சொல்லிச் சிரித்தார்கள்.

உலக வரலாற்றிலும் முஸ்லிம் உலகிலும் அவரது பெயர் பொன்னெழுத்துக்களால் பொறிக்கப்படும். அவரது ஆத்மீகப் போக்கும் எளிமையும் பணிவும் தாழ்மையும் நாட்டுப்பற்றும் சமூக சேவையும் மறு உலகிலும் அவருக்கு அழகிய வாழ்வையும் உயர்ந்த பதவியையும் கொடுக்குமென்று அல்லாஹ்வின் நல்லருளில் ஆதரவு வைத்து நான் பிரார்த்திக்கின்றேன். அவருக்கு அல்லாஹ், ஜன்னத்துல் பிர்தௌஸை உரித்தாக்கி வைப்பானாக! அவரது உயர்ந்த குணங்களுக்காக அல்லாஹ், தன்னுடைய 'லிகாஹ்' எனும் சந்திப்பை அளிப்பானாக என்று பிரார்த்தித்து விடைபெற்றுக்கொள்கின்றேன். அல்ஹம்துலில்லாஹ்! நன்றி.

[අ.භා. 2.41]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ගරු අලවි මවුලානා මැතිතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ඉතාම අගය කොට සලකනවා. එතුමා ඉතාම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වාගේම ඉතාම ගැඹුරු දැනුමක් තිබුණු ව්‍යක්තීය සමිති නායකයෙක්. මා එතුමාට ප්‍රතිවිරුද්ධ දේශපාලන මතයක් දැරූ කාලයේ සිටම එතුමා එක්ක සම්බන්ධ වන කල්ම එතුමාගේ ව්‍යක්තීය සමිති කටයුතුත් එක්ක බෙහෙවින් සම්බන්ධ වෙලා සිටියා. එතුමා නාගරික මන්ත්‍රීවරයකු හැටියටත්, පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියටත්, පාර්ලිමේන්තුවේ ඇමතිවරයකු හැටියටත් විවිධ අවස්ථාවල කටයුතු කළත්, වැඩ කරන පන්තිය වෙනුවෙන් කටයුතු කිරීම එතුමාගේ ජීවිතයෙන් කවදාවත් ඉවත් වුණේ නැහැ. එතුමා කම්කරු ඇමතිතුමා වශයෙන් කටයුතු කළ කාලයේ කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් ඉතාම වැදගත් නීති රීති ගෙන එනවා මා දැක්කා. හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කම්කරු ඇමතිතුමා වශයෙන් සිටි කාලයේ කම්කරු නීති රීති ඉදිරිපත් කරනකොට, ඒවාට ශක්තිය දීලා ඒවා ක්‍රියාත්මක කරන්න අලවි මවුලානා මැතිතුමා කටයුතු කළා. එතුමාට ඒ පිළිබඳව ඉතාම ගැඹුරු දැනුමක් තිබුණා. කෙනකුට ප්‍රශ්නයක් මතු වුණාම ඒ ප්‍රශ්නය දිහා නිවැරැදිව බලා ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න ක්‍රියා කරපු නායකයෙක් තමයි එතුමා. ඒ වාගේම ව්‍යක්තීය සමිති ව්‍යාපාරයේදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳව ගැඹුරු දැනුමක් එතුමාට තිබුණා. ව්‍යක්තීය සමිතියක කටයුතුවලට, ව්‍යක්තීය සමිතිවල සාමාජිකයන්ගේ කටයුතුවලට එතුමා හැම දාම තමන්ගේ කාලය මීඩංගු කළා. මොන කටයුත්තක් තිබුණත් එතුමා ඒවා මඟ හැර ගියේ නැහැ. ඇමතිවරයකු හැටියට සිටියදීත්, අග්‍රාණ්ඩුකාරවරයකු හැටියට සිටියදීත් එතුමා ඒ කටයුතු කළා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තනතුරෙන් ඉවත් වුණාට පසුව එතුමා එක්ක කිට්ටුවෙන් සම්බන්ධ වන්න මට අවස්ථාව ලැබුණා. අපි අලුත් ව්‍යක්තීය සමිති ව්‍යාපාරයක් ආරම්භ කළා. අලවි මවුලානා මැතිතුමා එයට උපදෙස් දුන්නා පමණක් නොවෙයි, එයට නායකත්වයත් දුන්නා. සෑම ව්‍යක්තීය අරගලයකදීම ඒවාට අවශ්‍ය උපදෙස් එතුමා ලබා දුන්නා. ලිප්ටන් වට රවුමේ පැවැති ව්‍යක්තීය සටන් ව්‍යාපාරවලට Governor කෙනකු හැටියට සහභාගි වූ එකම නායකයා එතුමායි. එතුමා මැයි දින රැලිවලට නායකත්වය දුන්නා; මැයි දින රැලි සංවිධානය කරන්න මූලිකත්වය දුන්නා. මෙවැනි ඉතාම පුළුල් වැඩ පිළිවෙළක් එතුමා ආරම්භ කළා. වැඩ කරන පන්තිය වෙනුවෙන් එතුමාගේ ජීවිතයේ, දේශපාලන ජීවිතයේ මුළු කාලයම මීඩංගු කළා. වමේ දේශපාලන නායකයන් එක්ක අත් වැල් බැඳගෙන ඒ ව්‍යාපාරය ජයග්‍රහණය කරවන්න, වමේ ව්‍යාපාරය ජයග්‍රහණය කරවන්න එතුමා ඉතාමත් විශිෂ්ට සේවාවක් කළා. එතුමා එහෙම කළේ කිසිම ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් නොවෙයි. වැඩ කරන පන්තියේ යහපත පිණිසයි එතුමා ඒ කටයුතු කළේ. එවන් නායකයකුගේ අභාවය පිළිබඳව අපි කනගාටු වනවා. ඒ වාගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ව්‍යක්තීය මධ්‍යස්ථානයේ ශෝකයත් එතුමාගේ පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ සභාවේ සිටින විවිධ නායකයෝ එතුමා ගැන කථා කළා. මා ඒ කරුණු සියල්ලම අනුමත කරනවා.

එතුමාගේ ජාතිය වෙනුවෙන්, එතුමාගේ නම ගෙනයන්න, මේ වතාවේදී දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට වාසුදේව

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

නානායක්කාර මැතිතුමා විසින් නම් කරන ලද ෂරීනා ලසීබ් මැනිනිය අද නාගරික මන්ත්‍රීවරියක් හැටියට පත්වී සිටින බව මා ඉතාමත් ගෞරවයෙන් කියන්න කැමැතියි. එතුමාගේ අභාවය පිළිබඳව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෘත්තීය මධ්‍යස්ථානයේ ශෝකයත්, එතුමාත් එක්ක වෘත්තීය සමිති ව්‍යාපාරයේ කටයුතු කළ කෙනෙක් හැටියට මගේ ශෝකයත්, මේ පාර්ලිමේන්තුවේ ශෝකයත්, පවුලේ සියලුදෙනාට පුද කරමින්, බෞද්ධයින් හැටියට අපි එතුමාට නිවන් සුව ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ගැනත්, අභාවප්‍රාප්ත යූ.බී. විජේකෝන් මැතිතුමා ගැනත්, තවත් වෘත්තීය සමිති නායකයකු වන අභාවප්‍රාප්ත ගරු කරුපයියා වේලායුදම් මැතිතුමා පිළිබඳවත් වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු අපි සියලුදෙනාම තරුණයන් හැටියට එක්සත් ජාතික පක්ෂයට බැඳිලා, එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයකු හැටියට පත්වෙලා, 1977 දී එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණ ව්‍යාපාරයේදී අපි ඉතාම කිට්ටුවෙන් අත් වැල් බැඳගෙන කටයුතු කළ ආකාරය මට මතකයි. ගරු අගමැතිතුමා සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ගැන කියපු සියලුම කරුණු මා අනුමත කරන අතර එතුමා මන්ත්‍රීවරයකු හැටියටත්, පාසල් අධ්‍යාපන කැබිනට් නොවන ඇමතිවරයකු හැටියටත්, පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිවරයකු හැටියටත් ඉතාම විශාල වැඩ කොටසක් කළ බවත් මතක් කරන්න ඕනෑ. එතුමා දොම්පේ ප්‍රදේශයට පමණක් නොව ජාතියක් හැටියට රටටම අධ්‍යාපන සේවය පිළිබඳ මහඟු සේවාවක් කළා. එතුමා අපට කල්‍යාණ මිත්‍රයෙක් වුණා. එතුමාගේ අභාවය පිළිබඳව ඒ පවුලේ උදවියට අපගේ ශෝකය පුද කරනවා.

ගරු කථානායකතුමනි, ගරු කරුපයියා වේලායුදම් මැතිතුමා ගැනත් වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. එතුමා මමත් එක්ක වෘත්තීය සමිති ව්‍යාපාරයේ කටයුතු කළා. පෞද්ගලික අංශය, රාජ්‍ය සේවය සහ ගුරු සංගමය එකතු කරලා රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයක් හදලා, එය ජාත්‍යන්තර කම්කරු සංවිධානයටත් ගෙන ගිහින්, ඒ තුළ වෘත්තීය සමිති වෙනුවෙන් වැඩ කළා; ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. මන්ත්‍රීවරයකු හැටියටත්, අපගේ සහෝදරයකු හැටියටත් එතුමා මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය පිළිබඳවත් අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, ගරු යූ.බී. විජේකෝන් මැතිතුමා පිළිබඳවත් වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. අපගේ ජ්‍යෙෂ්ඨයකු හැටියට 1977 දී පාර්ලිමේන්තුවට පත් වෙලා, ඇමතිවරයකු හැටියටත්, ඉතාම හොඳ මිත්‍ර මන්ත්‍රීවරයකු හැටියටත් එතුමා කටයුතු කළා. ඒ වාගේම එතුමා යාපනය දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. එතුමා මේ රටට ඉතාම විශිෂ්ට සේවාවක් කළා. ඒ වාගේම එතුමාගේ දරුවන් දක්ෂ ක්‍රීඩකයන් බවට පත් කරලා රටට මහත් කීර්තියක් අත් කර දුන්නා. එතුමාගේ අභාවය පිළිබඳවත් එතුමාගේ පවුලේ උදවියට අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 2.49]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම අද ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. අලවි මවුලානා මැතිතුමාත්, එක්සත් ජාතික පක්ෂ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කරුපයියා වේලායුදම් මැතිතුමාත්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමාත් සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී යූ.බී. විජේකෝන් මැතිතුමා පිළිබඳවත් කථා කිරීමට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මේ ශෝක යෝජනාව පිළිබඳව කථා කරන්න කලින් ඔබතුමාට යම් කරුණක් මතක් කරන්න තිබෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම දැනට මාස කිහිපයකට පෙර අපේ නියෝජ්‍ය කථානායකතුමා එතුමාගේ ඉල්ලා අස්වීමේ ලිපිය ජනාධිපතිතුමාට භාර දුන්නාය කියලා වාර්තාවක් පළ වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ශෝක ප්‍රකාශ යෝජනා ගැනයි මේ කථා කරන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මගේ කථාව පටන් ගන්න කලින් ඔබතුමාගේ අවධානයටයි මේ කාරණය යොමු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ශෝක ප්‍රකාශ යෝජනා ගැන කථා කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමා ඒ පිළිබඳව පොඩ්ඩක් සොයා බලන්න කියලා තමයි අපි ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මා අද උදේත් සඳහන් කළා. ඔබතුමා දැන් ශෝක යෝජනා පිළිබඳ කථාව කරගෙන යන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමාගේ අවධානයටයි, ඒ කාරණය යොමු කළේ. මොකද, ඒ පිළිබඳව අපිත් දැනගන්න, -[බාධා කිරීමක්]-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලායි තිබෙන්නේ. දැන් කථාව කරගෙන යන්න, ගරු මන්ත්‍රීතුමා. දැන් කාල වේලාවත් ගොඩක් පහුවෙලායි තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව අවධානය යොමු කරන එක ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

අලවි මවුලානා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, හිටපු ආණ්ඩුකාරතුමා, දීර්ඝ කාලයක් මැද කොළඹ ආසනයේ දේශපාලනයේ නිරත වෙලා, කොළඹ නගර සභාවෙන් දේශපාලනය පටන් ගෙන, දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළ, ඒ පක්ෂයේ ක්‍රියාකාරී මන්ත්‍රීවරයකු හැටියට තමන්ගේ මුළු ජීවිත කාලයම ඒ පක්ෂය වෙනුවෙන් කැප කළ දේශපාලන නායකයකු හැටියට අපට හඳුන්වන්න පුළුවන්. මා එතුමාව දේශපාලනිකව හඳුනා ගන්නේ 1991-1992 වර්ෂවලදීයි. මා දේශපාලනයට පිවිසෙනකොට එතුමා වීදි සටන්කරුවෙකු හැටියටත්, අසාධාරණයට විරුද්ධව නිතර කථා කරන නායකයකු හැටියටත්, සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින නායකයකු හැටියටත් කටයුතු කළා. හැම කටයුත්තකදීම පක්ෂ දේශපාලනයෙන් එහාට ගිහින් එයට තමන්ගේ නායකත්වය ලබා දෙමින් මේ සමාජය තුළ විශාල මෙහෙවරක් කරපු නායකයකු හැටියටත් එතුමා හඳුන්වන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අපි සියලු දෙනාම එතුමා ව්‍යක්තීය සමිති නායකයකු හැටියට තමයි හඳුන්වන්නේ. ව්‍යක්තීය සමිති නායකයකු හැටියට එතුමා මේ රටේ ව්‍යක්තීය සමිති කටයුතුවලදී විශාල ප්‍රසිද්ධියක් හා විශාල දායකත්වයක් ලබා දුන්නා. මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරපු නායකයෙක් හැටියටත් එතුමා ඉතිහාසගත වෙනවා.

විශේෂයෙන්ම අධිරාජ්‍ය විරෝධී අරගළවලදී -විශේෂයෙන්ම මැද පෙරදිගට විරුද්ධව එල්ල වන ප්‍රහාර, තර්ජන බටහිරෙන් එල්ල වුණු හැම අවස්ථාවකදීම- කොළඹ ඇතුළුව රට පුරාම රැස්වීම් තියමින්, ඒවාට විරුද්ධව ජනතාව පෙළ ගස්වමින්, අධිරාජ්‍යවාදයට විරුද්ධ නායකයෙක් හැටියටත් එතුමා අපි සියලුදෙනා අතර පෙනී සිටියාය කියන කාරණය මම මතක් කරන්න ඕනෑ. ඒ විධියට හැම ක්ෂේත්‍රයකදීම එතුමාගේ වගකීම ඉටු කරන්න, ඒ ක්ෂේත්‍රයේ ජනතාව වෙනුවෙන් පෙනී සිටින්න එතුමා අමතක කළේ නැහැ. ඒ නිසා ලංකාවේ දේශපාලනය තුළත්, කම්කරු ව්‍යාපාරය තුළත්, වැඩ කරන ජනතාව අතරත් හොඳ කීර්ති නාමයක් දිනාගත් නායකයෙක්; අවංකව වැඩ කළ නායකයෙක් හැටියට එතුමා ඉතිහාසගත වෙනවා කියන එක අප සියලු දෙනාම දන්නා කාරණයක්.

ගරු කථානායකතුමනි, එතුමාගේ දේශපාලන ජීවිතයෙන් අපිට ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා. එතුමාගේ අදහස්, ඒ දැනුම, එතුමාට තිබුණු අත්දැකීම්වල විස්තර ආදී හුඟක් දේවල් සමහර අවස්ථාවලදී අපිට එතුමා ලබාදී තිබෙනවා. ඉතාම වාම් ජීවිතයක් තමයි එතුමා ගත කළේ. ඕනෑම කෙනෙකුට එතුමාව මුණ ගැහෙන්න පුළුවන්කම තිබුණා. එතුමා ආණ්ඩුකාරතුමා වුණාය කියා එහි තිබෙන බලය හරහා ව්‍යාජ ලෙස ගොඩනහාගත් ආඩම්බරකමක් එතුමා ආරූඪ කර ගත්තේ නැහැ. එතුමා එවැනි දේවල් ඇඟට අරගෙන ගමන් කළේ නැහැ. එතුමාගේ නිවසට ගියාම, සාමාන්ය පුරවැසියෙක් හම්බ වෙනවා වාගේ ඕනෑම වෙලාවක එතුමා හම්බ වෙන්න පුළුවන්කම තිබුණා. එවැනි වාම් ජීවිතයක් තමයි එතුමා ගත කළේ. මේ රටේ එවැනි දේශපාලන නායකයන් කීපදෙනායි ඉන්නේ. එයින් එක්කෙනෙක් තමයි අලවි මවුලානා මැතිතුමා. ඒ බව අපි සියලුදෙනාම දන්නවා. ඉතාම සරල දිවියක් ගත කරමින්, ජනතාව සමඟ ජීවත් වෙමින්, ඔවුන්ගේ සිතුම් පැතුම් හඳුනාගෙන, තමන්ට යම් බලයක් ලැබුණොත් ඒ බලයත් එක්කම ජනතාව සමඟ ඉන්න නායකයෝ ඉතාම අල්ප මාත්‍රයක් පමණයි මේ රටේ ඉන්නේ. ගරු අලවි මවුලානා මැතිතුමා කියන්නේ එහෙම කෙනෙක්. තරුණ දේශපාලනඥයෝ හැටියට අද අපිට එතුමාගේ ජීවිතයෙන් ඉගෙන ගන්න හුඟක් දේවල් තිබෙනවා.

ගරු අලවි මවුලානා මැතිතුමා කියන්නේ දීර්ඝ දේශපාලන ඉතිහාසයක් තිබෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ විශාල වැඩකොටසක් කළ නායකයෙක්. නමුත් සමහර අවස්ථාවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතුමාට සාධාරණත්වය ඉෂ්ට කළාද කියන ප්‍රශ්නය තිබෙනවා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කැප කිරීම් රාශියක් කළා. ඒ කැපකිරීම් දිහා බලනකොට, යම් යම් අවස්ථාවලදී එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ කලකිරුණු අවස්ථා තිබුණා. මොකද, එතුමාට ලැබෙන්න ඕනෑ තැන් සමහර වෙලාවට එතුමාට ලැබුණේ නැහැ. එතුමා මහහැරුණු අවස්ථා රාශියක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ එතුමාට ඒ වාගේ කෙනෙහිලිකම් කළ අවස්ථා තිබුණා. මම ඒ ගැන පෞද්ගලිකව දන්නවා. මොකද, අපේ මේ හිටපු ආණ්ඩුකාරතුමා -අලවි මවුලානා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා- එක්ක මගේ ඒ තරම් ළඟින් හොඳ සම්බන්ධයක් තිබුණා. එතුමාට කෙනෙහිලිකම් වුණත්, යම් යම් අඩු ලුහුඬුකම් වුණත්, එතුමා කොයිම අවස්ථාවකවත් පක්ෂය හැර ගියේ නැහැ; පක්ෂය මාරු කරන්න හින්දු කළේ නැහැ. තමන් විශ්වාස කරන ඒ දේශපාලන අදහස වෙනුවෙන්, ඒ දේශපාලන මතවාදය වෙනුවෙන් තමන්ගේ අවසාන ගමන යන තෙක්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ රැඳී සිටිමින්, ඒ පක්ෂය වෙනුවෙන් විශාල පරිත්‍යාග කරමින් තමන්ගේ ජීවිත කාලයම දේශපාලනය වෙනුවෙන් කැප කළ, ඒ ඉන්න නායකයන් කීපදෙනාගෙන් එක්කෙනෙක් ලෙස එතුමා අපිට හඳුන්වන්න පුළුවන්.

ගරු අලවි මවුලානා මැතිතුමා විශේෂයෙන්ම මේ රටේ වැඩ කරන ජනතාව වෙනුවෙනුත් විශාල වැඩ කොටසක් කර තිබෙනවා. මේ රට වෙනුවෙන්, මේ සමාජය වෙනුවෙන් එතුමා විශාල වැඩ කොටසක් කර තිබෙනවා. අද එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවට පැමිණ සිටින එතුමාගේ පවුලේ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. ජෙන්නතුල් ෆිර්දව්ස්හි එතුමාට හිමි ස්ථානය ලබාදෙන්න කියා අපි විශ්වාස කරන අල්ලා දෙවියන් වහන්සේගෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මම යම් කිසි ප්‍රමාණයකට හඳුනා ගත් එක්සත් ජාතික පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුරනිමල් රාජපක්ෂ මැතිතුමාත් පක්ෂය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. අපි පසුගිය කාලයේ පක්ෂයේ යම් යම් ප්‍රතිසංවිධාන කටයුතු කරනකොට පක්ෂ මූලස්ථානයේ හිඳිමින් පක්ෂයේ අපිව ධෛර්යවත් කරමින්, ශක්තිමත් කරමින් හැමතිස්සේම පක්ෂයත් එක්ක ගමන් කරන්න උපදෙස් ලබා දෙමින් විශාල වැඩ කොටසක් කළා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ උදවියට මම ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මම ගරු කරුපයියා වේලායුදම් මැතිතුමාව කෙටි කාලයක් හඳුනා ගෙන හිටියා. එතුමා එක්කත් අපි සිරිකොත මූලස්ථානයේ පැවති යම් යම් වැඩසටහන්වලදී එකට වැඩ කළා. ඒ වාගේම එතුමා නියෝජනය කළ බදුල්ල දිස්ත්‍රික්කයේ යම් යම් ස්ථානවලදී, පළාත් සභා මැතිවරණවලදී, ඡන්ද ව්‍යාපාරවලදී එතුමාත් එක්ක අපි එකට වැඩ කළා. ඒ ගැන අපට මතක සටහන් තිබෙනවා. එතුමාත් අපේ පක්ෂයට විශාල වැඩ කොටසක් කරපු වතු කරයේ හිටපු ද්‍රවිඩ නායකයෙක්. ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ උදවියට ශෝකය ප්‍රකාශ කරන අතර, මේ අවස්ථාව මට ලබා දුන්නාට ඔබතුමාට ද ස්තුතිවන්ත වනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ස්තුතියි.

මීළඟට, ගරු ඒ.එච්.එම්. ෆවුසි රාජ්‍ය අමාත්‍යතුමා.

[2.58p.m.]

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A. H. M. Fowzie - State Minister of National Integration and Reconciliation)

Hon. Speaker, it is with a deep sense of sorrow that I rise in this House today to speak on the Condolence Motion of my best friend and Colleague, late Hon. Seyed Alavi Moulana who was a trade union and political giant who stood against capitalism and racism nationally and internationally.

Reminiscing on trade union activities and political activities of the past, late Alavi Moulana occupies a significant place in the society for his deep commitment to serve the people of his generation. Hailing from the well popular Moulana family in the country, he had a humble beginning in his early life. He was deeply committed to serve the people of the generation, amidst the multi-ethnic background of our motherland. He devoted most of his time with the less fortunate and the poorer section of the people to whose benefit he dedicated his political career.

Late Moulana entered the trade union movement in early 1940s and continued his struggle for the working force until his last breath. Nearly six decades, he was in the forefront fighting for the rights of the workers and the down-trodden masses. He was the Vice President of the Sri Lanka Nidahas Sevaka Sangamaya.

He joined the Sri Lanka Freedom Party in 1956 and continued his trade union activities with the Sri Lanka Freedom Party trade unions. He was the main figure in organizing SLFP May Day rallies for over 30 years. For his commitments and services for decades to the trade unions, he was conferred with national and international awards. He was the Chairman of Asia and the Pacific Region of the International Labour Organization and was also a member of the World Federation of Trade Unions.

Late Moulana, underwent harassments and great hardships during the regime of late President J.R. Jayewardene in 1980. He was attacked with bicycle chains. He was also taken into custody with other trade union leaders and jailed. During this period, as a revenge, his brother was kidnapped by unknown gangs and he is missing until now. He had all the protest meetings, demonstrations and picketing at the Colombo Lipton Circle which was most popular as "Moulana Circle"

Late Alavi Moulana entered Colombo Municipal Council as a Member and served for more than 10 years. In 1994, he entered Parliament as a National List Member from the Sri Lanka Freedom Party and was appointed the Deputy Minister of Mass Media. Later, he became the Minister of Local Government and Provincial Councils. He also held the portfolio of Minister of Labour under President Chandrika Bandaranaike Kumaratunga Government.

Late Moulana who was an ardent supporter and a family friend of Bandaranaike family was entrusted and took keen interest in organizing Bandaranaike Commemorations over three decades.

From 2002, late Hon. Alavi Moulana was appointed as Governor of the Western Province and he continued to be the Governor till 2015. During this period too as the Governor, he never forgot trade union activities.

He was a very pious person in religious activities. He has a strong faith in Islamic Socialism and stood with socialist countries and he was involved in anti-imperialist activities.

I was very closely associated with my best friend late Moulana in all political and community matters. We both were engaged in organizing the arrangements of Sri Lankan Haj Pilgrims for several years. We both represented Sri Lanka in many international Islamic Conferences. He was the Secretary of the Sri Lanka Muslim Federation for a long time in which I was the President. He was a founder of the Sri Lanka Committee for Solidarity with the Palestinian People and played a main role in championing the rights of the Palestinians.

May I Sir, in conclusion, offer my deepest sympathies to the beloved members of his family. My fervent *Du'a* is that the Late Alavi Moulana be blessed with Allah's mercy and be granted *Jennathul Firdouse! A 'ameen.*

Thank you, Sir.

[අ.භා.3.04]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ශෝක ප්‍රකාශ යෝජනා පිළිබඳව කථා කෙරෙන අද දවසේ, විශේෂයෙන්ම අපේ රටේ හිටපු ඉතාම කීර්තිමත් දේශපාලනඥයෙකු වාගේම අපි ශ්‍රේෂ්ඨ නායකයෙකු ලෙස සලකන ගරු අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳව පළමුවෙන්ම අපි අපේ ශෝකය රත්නපුර දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතු වනවා.

අලවි මවුලානා මැතිතුමා එක්ක දීර්ඝ කාලයක් අපට දේශපාලනික වශයෙන් කටයුතු කිරීමට ඉඩ ප්‍රස්ථාවක් ලැබුණේ නැහැ. නමුත් මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් වශයෙන් සහ පළාත් සභාවක ඇමතිවරයෙකු ලෙස කටයුතු කළ කාල සීමාව තුළදී එතුමා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ රජයේ වගකිව යුතු තනතුරු දරපු ඇමතිවරයෙකු ලෙස කටයුතු කළා. පසු කාලයේ එතුමා බස්නාහිර පළාතේ

ආණ්ඩුකාරතුමා හැටියට කටයුතු කළා. අන්න ඒ කාල සීමාවලදී අපි යම් යම් රාජකාරි අවශ්‍යතා සඳහා එතුමා හමු වුණා. ඒ හැම වෙලාවකදීම දේශපාලනඥයන් හැටියට දුර ගමනක් යන්න අපගේ ආශීර්වාදය තිබෙනවා කියලා එතුමා ප්‍රකාශ කළා. ඒ ආකාරයට බොහොම ආශීර්වාදාත්මකව අපිට සලකපු, සංග්‍රහ කරපු නායකයෙකු විධියට අලවි මවුලානා මැතිතුමා පිළිබඳව අපේ හදවතේ තිබෙන්නේ ගෞරවනීය හැඟීමක්. මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ සැබෑ ප්‍රතාපවත් වෘත්තීය සමිති නායකයෙකු ලෙස එතුමා කටයුතු කළා කියන කාරණය දේශපාලනයේ නිරත වෙලා හිටපු කෙනෙකු හැටියට අපි දන්නවා. බොහෝ විට මේ රටේ වෘත්තීය සමිති නායකයන් වැඩි දෙනෙකු හඳුන්වන්නේ "මුට්ටි කාසි මුදලාලිලා" කියලායි. වෘත්තීය සමිති නායකයන්, වෘත්තීය සමිතිවල තිබෙන අරමුදල් තමන්ගේ සුඛ විහරණය සඳහා ලබාගෙන සුඛෝපභෝගී ජීවිත ගත කරනවා කියන මතය කම්කරු පන්ති අතර තිබෙනවා. හැබැයි, වෘත්තීය සමිති නායකයෙකු හැටියට සෑම විටම කම්කරු පන්තියේ සුඛ විහරණය වෙනුවෙන්, ඒ අයගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ලබා දීම වෙනුවෙන් බොහෝ සේ ඇප කැප වෙලා, වෙහෙස මහන්සි වෙලා කටයුතු කරපු කෙනෙකු හැටියටයි අපි අලවි මවුලානා මැතිතුමා හඳුනාගෙන තිබෙන්නේ. ඒ නිසා කම්කරු පන්තිවලින් එතුමාට හිමි වී තිබෙන්නේ එවැනි ගෞරවනීය හැඟීමක්.

අද මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් සමඟ සමකාලීනව මේ රටේ වාමාංශික වෘත්තීය සමිති ව්‍යාපාරයට ප්‍රබල නායකත්වය දීපු නායකයෙකු හැටියට තමයි අපි මවුලානා හිටපු ඇමතිතුමා දැන හඳුනාගෙන තිබෙන්නේ; අහලා දැකලා තිබෙන්නේ. එතුමා, විශේෂයෙන්ම 80 ජූලි මහා වැඩ වර්ජනයේදී ඒ වැඩ වර්ජනයට නායකත්වය දීපු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිවලට සැබෑ නායකත්වයක් ලබා දෙමින් කටයුතු කරපු වෘත්තීය සමිති නායකයෙක්. එවකට පැවතුණු රජයේ මැර ප්‍රහාරවලට -පිහි පහරවල්වලට- ලක්වෙලා, මරණාසන්නව රෝහල්ගත වෙලා සිටියදීත් එතුමා තමන්ගේ සටන අත් හරින්නේ නැතිව කම්කරු පන්තියේ ජයග්‍රහණය වෙනුවෙන් බොහෝ සේ ඇප කැප වෙලා කටයුතු කළා. සැබෑ, අවංක වෘත්තීය සමිති නායකයෙකු ලෙස එතුමා පිළිබඳව අපි තුළ තිබෙන්නේ ගෞරවනීය හැඟීමක් කියන කාරණය මම නැවතත් ප්‍රකාශ කරන්න ඕනෑ. ජාතින් අනුව, ආගම් අනුව, ප්‍රදේශ අනුව යම් යම් කුලකයන්ට කඩාගෙන, තමන්ගේ දේශපාලන ගමන සකස් කර ගැනීමට උත්සාහ දරන වකවානුවක් තමයි වර්තමානයේ අපේ රටේ තිබෙන්නේ. උපතින් මුස්ලිම් ජාතිකයෙකු වුණත් කිසිම අවස්ථාවක ජාතිවාදය වපුරලා, ඒ හා සමගාමී සංවිධාන හදාගෙන, මේ රටේ ස්වෛරීත්වයට, ඒකීයභාවයට හානියක් වන ආකාරයේ කිසිදු දේශපාලන මතයක් නොදරපු, සැබෑ ලෙසම මේ රටේ ජාතික සමගිය, සංහිඳියාව වෙනුවෙන් කටයුතු කරපු සැබෑ ජාතික නායකයෙකු ලෙස අලවි මවුලානා මැතිතුමාගේ නාමය ශ්‍රී ලාංකීය ඉතිහාසයට එකතු වෙනවා. අලවි මවුලානා මැතිතුමා කිසිම දවසක මුස්ලිම් ජාතිවාදය, අන්තවාදය කරපින්නා ගත්, ඒ වෙනුවෙන් පෙනී නොසිටපු නායකයෙකුය කියන කාරණය අපි සඳහන් කළ යුතුයි. අධිරාජ්‍ය විරෝධී, බටහිර විරෝධී මතය ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරපු, ඒ වෙනුවෙන් පෙනී හිටපු, ජාතික සංවර්ධනය, ජාතික සමගිය උදෙසා ප්‍රගතිශීලී කඳවුර නියෝජනය කරපු, සැබෑ නායකයෙකු හැටියට අපි නැවත නැවතත් අලවි මවුලානා මැතිතුමාව සිහිපත් කරනවා. එමෙන්ම තමන්ට ලැබෙන වරදාන, වරප්‍රසාද, ඇමති තනතුරු වෙනුවෙන් තමන්ගේ ආත්මය පාවා නොදුන්නු සැබෑ ජාතික නායකයෙකු ලෙස අපි අලවි මවුලානා මැතිතුමා හඳුන්වනවා. අද සමහර නායකයන් වරදාන, වරප්‍රසාද වෙනුවෙන් තමන්ගේ ආත්මය පවා පාවා දෙනවා. එවැනි අයට මෙතුමා සැබෑ අභියෝගාත්මක චරිතයක්. ඔවුන් අලවි මවුලානා මැතිතුමාගේ චරිතය හැදෑරිය යුතුව තිබෙනවා. එවැනි චරිත ශ්‍රී ලාංකීය දේශපාලනයේ අඩුයි. එතුමාට තිබුණේ එවැනි ආදර්ශවත් චරිතයක්.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරයෙකු හැටියට, සැබෑ ලෙසම බණ්ඩාරනායකවාදියෙකු හැටියට බණ්ඩාරනායක ප්‍රතිපත්ති අකුරටම ක්‍රියාත්මක කරන්නත්, මෑතකදී දේශපාලනයට එකතු වෙච්ච උදවිය හැටියට අපට ඒ සම්බන්ධව අධ්‍යයනය කිරීමටත් අනුබල දුන්, සැබෑ දේශපාලන ගමනකින් ඉස්සරහට යන්න අපට අත දුන් නායකයෙකු ලෙස නැවත නැවතත් මම අලවි මවුලානා මැතිතුමා පිළිබඳව හඳුන්වන්න ඕනෑ. ඒ වාගේම තමන් ඉදිරියේ ජයගත නොහැකි අභියෝග ඇති වුණු බොහෝ අවස්ථාවල එම අභියෝගවලට අභියෝග කර, සැබෑ ලෙසම අභියෝගය ජය ගන්න පුළුවන් ආකාරයේ මහත් වූ ආත්ම ශක්තියක්, ආත්ම ධෛර්යයක් තිබුණු නොසැලෙන පෞරුෂත්වයකින් හෙබි සැබෑ මහත්මයෙකු හැටියට අපි එතුමා පිළිබඳව නැවතත් හඳුන්වා දෙනවා.

2006-2007 වාගේ කාලසීමාව තුළ -අපේ හිටපු ගරු ජනාධිපතිතුමා එවකට ජනාධිපති හැටියට සිටි කාලසීමාව තුළ- ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා රජයෙන් ඉවත් වෙලා යනවාත් එක්කම බරපතළ අභියෝගයක් ඇති වුණා අපට මතකයි. අන්න ඒ අවස්ථාවේ එම ගැටුම නිරාකරණය කිරීම සඳහාත්, අනුර බණ්ඩාරනායක මැතිතුමාත් හිටපු ජනාධිපතිතුමාත් නැවත සමඟි කිරීම සඳහාත්, පක්ෂය ශක්තිමත් කිරීම සඳහාත් මහත් වූ මෙහෙවරක්, කැපවීමක් කිරීමට අලවි මවුලානා ඉදිරිපත් වී කටයුතු කළා. ඒ අවස්ථාවේ එතැන හිටපු කෙනෙක් හැටියට එය මා පෞද්ගලිකව දන්නා දෙයක්. ඒ වාගේම එතුමා හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සැබෑ ලෙන්ගතු හිතවතෙක්, මිතුරෙක්, වැඩිහිටියෙක්. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ නිරන්තරයෙන් අත්වැල් බැඳගෙන හිටපු අතළොස්සක් පිරිස අතර අලවි මවුලානා මැතිතුමාටත් හිමි වන්නේ අද්විතීය ස්ථානයක්. ඒ නිසා එතුමා අපිට හිටපු, මේ රටේ දේශපාලනය තුළ හිටපු ආදර්ශවත් චරිතයක්; නිර්භීත චරිතයක්; ජාතිවාදය ප්‍රතික්ෂේප කරපු චරිතයක්; මහත්මා චරිතයක් බව අපි නැවතත් ප්‍රකාශ කරන්න ඕනෑ.

දේශපාලන ජීවිතයේ නිකැළැල් මිනිසෙක් ලෙස අවසානය දක්වාම කටයුතු කරමින් සිය වගකීම් රටේ ජනතාව, සිය වර්ගයා වෙනුවෙන් ඉටු කරපු අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක වෙන මේ මොහොතේ අපි අපේ ශෝකය සහ කනගාටුව ඒ පවුලේ සියලු දෙනා වෙත ප්‍රකාශ කර සිටින අතරම, අලවි මවුලානා වැනි ජාතිවාදය ප්‍රතික්ෂේප කරපු සැබෑ නායකයින්ගේ අවශ්‍යතාව අද කාලයේ පවතින බවත් අපි නැවත නැවතත් ප්‍රකාශ කරනවා. අලවි මවුලානා මැතිතුමා කියන්නේ අද සංහිඳියාව ගැන කථා කරන ව්‍යාජ නායකයන්ට සැබෑ ලෙසම අධ්‍යයනය කළ යුතු මහත් වූ චරිතයක්.

එතුමා විසින් මේ ජීවිත කාලය තුළ කළ පොදුජන සේවය, ඒ මහා සමාජ මෙහෙවර වෙනුවෙන් හිමි විය යුතු සියලු කුසල කර්ම එතුමාට හිමිවෙලා, අපි අදහන ආගමේ හැටියට -මා බෞද්ධයෙක් හැටියට- අලවි මවුලානා මැතිතුමාට උතුම් වූ නිර්වාණ සුවය අත්වේවා! කියලා ප්‍රාර්ථනා කරමින්, අපගේ ශෝකය එතුමාගේ පවුලේ සියලු ඥාතීන්ට දන්වා යැවීමට කටයුතු කරන්න යැයි ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.3.12]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, අලවි මවුලානා මැතිතුමා කියන්නේ අදීන වෘත්තිය සමිති නායකයෙක්; කෘතහස්ත දේශපාලකයෙක්; සැම දෙනා සිනා සයුරේ ගිල්වූ රසකාමියෙක්; යුක්තිය වෙනුවෙන් අහිතව නැඟී සිටි සටන්කාමියෙක්. මේ සියල්ලටම වඩා ගුණදම සපිරි හිත හොඳ මනුෂ්‍යයෙක්. අද මට විදේශගතවීමට නියමිතව තිබුණත්, මේ අවස්ථාවට සහභාගි නොවී මා ගියා නම්, මගේ සිතේ කිසිදා සුව නොවෙන තුවාලයක් ඇති වෙන නිසා මා කෙසේ හෝ මෙම අවස්ථාවේ කථා කළ යුතුමයි කියලායි රැඳී සිටියේ.

ගරු කථානායකතුමනි, අලවි මවුලානා මැතිතුමා නිරන්තරයෙන් කියපු දෙයක් තමයි එතුමාගේ තනතුර ආණ්ඩුකාර සහෝදරයා, ලිපිනය - ලිප්ටන් වටරවුම කියන එක. එතුමා ආණ්ඩුකාර ධුරයේ සිටියත් කවම කවරදාවත් පුංචි කම්කරුවාගෙන්, පුංචි මිනිසාගෙන් ඈත් වුණේ නැහැ. ඕනෑ වේලාවක, ඕනෑම කෙනෙකුට එතුමාව හමු වෙන්න පුළුවන්. හමු වෙන්න එන කිසිම කෙනෙකුගේ සිත නරක් කරලා, කෑ ගහලා, බැණලා ගෙදර යවන්න එතුමා කවදාවත් කටයුතු කරලා නැහැ. ප්‍රශ්නය විසඳන්න බැරි වුණත්, ඇහුම් කන් දීලා ඔවුන්ගේ දුක බෙදා ගෙන ඔවුන්ගේ සිත සනසා යවන්නට එතුමා හැම දාම කාරුණික වුණා. කෙනෙකුගේ සිත සැනසීම එතුමාට නොහැකි දෙයක් නම් නොවෙයි. එතුමාගේ වචනවලට පුදුම හැකියාවක් තිබුණා, හැමෝම හැම මොහොතේම සිනහ සයුරක ගිල්වන්න. විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාවේ පද වරනැගීම තුළින් සෑම කථාවක්ම කවියක් බවට පත් කරන්න -rhyme කරන්න- එතුමාට ලොකු හැකියාවක් තිබුණා. මට මතකයි, දවසක් මම එතුමාට උත්සවයකට ආරාධනා කරද්දී, එතුමා වෙන උත්සවයක් ඒ වේලාවේම හාර අරගෙන තිබුණා. එතුමාට කියන්න ඕනෑ වුණා, මම පොඩ්ඩකට ඇවිල්ලා යන්නම් කියලා. එතුමා ඒක මට කිව්වේ, “Minister barrister, I have a prior commitment. I will just appear and disappear.” කියලායි.

ඒ වාගේ හරිම ලස්සනට, ඕනෑම අවස්ථාවක බස හැසිරවීමේ පුදුම හැකියාවක් එතුමාට තිබුණා. එතුමා හරිම සුභදශීලියි. එතුමා කවම කවරදාකවත් කේන්තියෙන් ඉන්නවා අප දැක්කේ නැහැ. එතුමාගේ වයසට එතුමා දරපු ආණ්ඩුකාර ධුරය කවදාවත් බරක් කර ගන්නේ නැතුව ඉතාම සැහැල්ලුවෙන් එතුමා කටයුතු කළා. අපට එතුමා සමීපව ආශ්‍රය කරන්න ලැබුණේ එතුමා බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ධුරය දරන කාලයේයි. ඒ කාලයේ පළාත් අමාත්‍යවරයෙක් විධියට කටයුතු කරන්න මට පුළුවන් වුණා. ඒ කාලයේ අපට හැම තැනකින්ම නිතර ඇහෙන දේ තමයි ආණ්ඩුකාරතුමායි ඇමති මණ්ඩලයයි ගැටුම් කියන කථාව. හැම පළාතකින්ම ඇහෙන කථාව ඒකයි. ආණ්ඩුකාරතුමන් ඇමතිවරුන්ගේ බලතල භාවිත කරනවාය, ආණ්ඩුකාරතුමන් ඇමතිවරුන්ගේ විෂයන්වලට ඇඟිලි ගහනවාය කියා හැම තැනින්ම චෝදනා, පැමිණිලි පැමිණියා. නමුත් අපට කවදාවත් එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ආණ්ඩුකාරතුමා අපට කථා කරන්නේ යම් නියෝගයක් දෙන්න වුණත්, එය කරන්නේ ඉල්ලීමක් කරන ආකාරයෙන්. ඉතාම ගෞරවයෙන්, ආදරයෙන් තමයි එතුමා අපට කථා කළේ. අපි එතුමාව සැලකුවේ අපි හැමෝගේම තාත්තා කෙනෙක් විධියටයි. එතුමා අපට සැලකුවේ එතුමාගේ දරුවන් විධියටයි. හැමදාම ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය එනකොට එතුමා මට දුරකථනයෙන් කථා කරලා කියනවා, "ඇමතිතුමා, ඔබතුමා මගේ වැය ශීර්ෂය ගැන කථා කරනවා නම්, මට වෙන කවුරුවත් කථා කරන්න අවශ්‍ය නැහැ" කියලා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ හිටපු වසර හය පුරාවටම මම සෑම වසරකම ආණ්ඩුකාර වැය ශීර්ෂයේදී එතුමා වෙනුවෙන් කථාවක් කරන්න අමතක කළේ නැහැ.

එතුමා මගේ අමාත්‍යාංශයේ උත්සවවලට ආවාම කථාවක් පවත්වන හැම අවස්ථාවේම කිව්වේ, "ඔබතුමා සිටිය යුත්තේ පාර්ලිමේන්තුවේ; මගේ සිහිනය ඔබතුමා පාර්ලිමේන්තුවේ දැකීමයි" කියලා. මම හිතුවා, මේවා මේ දේශපාලකයෙක් කියන ආටෝප වචන -sugary words- කියලා. අර කෙනෙක් සතුටු කරන්න කියන ලස්සන වචන තිබෙන්නේ. එහෙම කථාවක් තමයි මෙතුමා මේ කියන්නේ කියලා. 2015 අගෝස්තු මාසයේ පැවැත්වුණු පාර්ලිමේන්තු මැතිවරණයට මාව ඉදිරිපත් කරන්න තීරණය කරනකොටත් අලවි මවුලානා මැතිතුමා අසනීප වෙලා හිටියේ. හැබැයි එතුමා, එතුමාගේ දරුවන්ට, මුණුබුරන්ට, හිතවතුන්ට කිව්වා, මගේ ඡන්ද ව්‍යාපාරයට උදව් කරන්න කියලා. මම නාඳුනන අය සල්ලි අරගෙන ඇවිල්ලා කියනවා, "අලවි මවුලානා මහත්තයා කිව්වා ඔබතුමාට උදව් කරන්න කියලා. ඒ නිසා මෙන්න අපෙන් පරිත්‍යාගයක්" කියලා. ඊළඟට තව කොටසක් ඇවිල්ලා අහනවා, "අලවි මවුලානා මහත්තයා කිව්වා, ඔබතුමා වෙනුවෙන් රැස්වීමක් ලැහැස්ති කරන්න කියලා. වෙලාවක් ගන්න පුළුවන්ද?" කියලා. එතුමාගේ දරුවන්, මුණුබුරන් මාව හොයාගෙන ඇවිල්ලා කිව්වා, "අපේ ඩැඩී, අපේ සීයා, ඔබතුමාගේ ඡන්ද ව්‍යාපාරයට උදව් කරන්න කිව්වා. ඒ නිසායි අපි ආවේ" කියලා. එදායි මම තේරුම් ගත්තේ ඒ කියූ වචනය තවත් එක් දේශපාලකයෙක්ගේ වචනයක් නොවෙයි කියලා. අද නම් ගරු කථානායකතුමනි, දේශපාලකයන් දෙන වචන ගැන, දෙන ප්‍රතිඥා ගැන සතපහකට විශ්වාස කරන්න බැරි යුගයක්; දේශපාලකයාගේ විශ්වසනීයත්වය බින්දුවට වැටුණු යුගයක්. තමන් දෙන වචනය, තමන් කෙතරම් දුර්වල තැනක හිටියත් ඒ ලෙසම ඉටු කරන්න පෙළඹුණු අලවි මවුලානා වැනි මැතිතුමන්ලා අද පරම්පරාවේ දේශපාලකයන්ට මේ පාර්ලිමේන්තුව ඇතුළෙන් හොයා ගන්න බැරි තරමට විශිෂ්ට ගණයේ ආදර්ශයක් විධියට අපි දකිනවා. අද කාලයේ සිටිය යුතු අලවි මවුලානා මැතිතුමන්ලා අපෙන් සමුගනිද්දී, නොසිටිය යුතු අය අප අතර වැජඹීම ඇත්තෙන්ම අවාසනාවක්; කනගාටුවට කාරණයක්.

අපට මතකයි, නුගේගොඩින් "මහින්ද සුළඟ" රැස්වීම පටන් ගන්න තීරණය කරපු වෙලාවේ අපට ශක්තියක් විධියට අපි ගිහිල්ලා එතුමාට ආරාධනා කළා. ඒ කාලයේ එතුමා ලෙඩ ඇඳේ හිටියේ. එතුමා කිව්වා, මට හිටියේ ලොකුම යාළුවෝ දෙන්නායි. එක්කෙනෙක් අනුර බණ්ඩාරනායක මැතිතුමා. එතුමා අද මිය ගිහිල්ලා. අනික් කෙනා මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා එතුමා යළි දේශපාලනයට ගෙනෙනවා කියන්නේ මම හරිම කැමති දෙයක්. ඒ නිසා අනිවාර්යයෙන්ම මම නුගේගොඩ රැස්වීමට එනවා කියලා. ගරු කථානායකතුමනි, නුගේගොඩ රැස්වීමට අසීමිත සෙනඟක් ආවා. අලවි මවුලානා මැතිතුමාට රැස්වීම් වේදිකාවට පැමිණෙන්න බැරි තරමට ලොකු සෙනඟක් හිටියා. එතුමාගේ අසනීප තත්ත්වය නිසා එදා එතුමාට වේදිකාවට ගොඩවෙන්න බැරි වුණා. මට මතක විධියට අපේ එක වේදිකාවකට කොහේදී හෝ එතුමා ගොඩ වුණා. මට ස්ථානය මතක නැහැ. හැබැයි 2015 මැයි 01වෙනි දා අපි පැවැත්වූ මැයි රැළියේ අපේ මූලසුන හෙබවූයේ අලවි මවුලානා මැතිතුමායි. එතුමා ඉතාම අසනීප තත්ත්වයෙන් සිටියදීත්, දෙන්නෙක් දෙපැත්තෙන් අල්ලාගෙන ඇවිල්ලා මුලසුනේ වාඩි කෙරෙව්වා. එතුමා එදා අපට ශක්තියක් වෙන්න තමන්ගේ අසනීප තත්ත්වය නොතකා අපේ වේදිකාවට ගොඩවුණා.

මට මතකයි, 2014 නොවැම්බර් මාසයේ 18වෙනි දා මම ශල්‍යාකර්මයකට භාජන වන්න ලංකා රෝහලට ඇතුළු වෙලා සිටිද්දී, එතුමා මාව බලන්න ආවා. එදා තමයි අපේ පක්ෂය තීරණය

කරලා තිබුණේ, අපි මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ඉවත් වෙනවා කියලා. ඒ අනුව, එතුමා රෝහලට පැමිණි වෙලාවේ මගේ අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය මම එතුමා අතට දුන්නා. එතුමා එය භාර ගැනීම ප්‍රතික්ෂේප කළා. මම කිව්වා, ඔබතුමාට මේක භාරගන්නම වෙනවා. මම රෝහලේ ඉන්නේ. මම ඇවිල්ලා භාරදිය යුතු දෙයක්. ඔබතුමා මම ළඟට ආපු වෙලාවේ දුන්නේ කියලා. මට තවම හොඳට මතකයි, එතුමා ඒ ලිපිය අතට ගත්ත වෙලාවේ එතුමාගේ ඇස් දෙකෙන් කඳුළු කඩා වැටුණු බව.

ගරු කථානායකතුමනි, මම ඇමති ධුරයෙන් ඉවත් වුණ අවස්ථාවේ මගේ පියාටවත් නොදැනුණු දුකක් එදා අලවි මවුලානා මැතිතුමාට දැනුණා. ඒ නිසා තමයි මම කිව්වේ, එතුමා අපට පියෙකු මෙන් සැලකුවා, එතුමාගේම දරුවන් සේ ආදරයෙන් අපට සැලකුවා කියලා.

ගරු කථානායකතුමනි, එතුමන්ලා වාර්ෂිකව "ඉෆ්තාර්" කියලා භෝජන සංග්‍රහයක් පවත්වනවා. ඒ කියන්නේ, නෝම්බි උපවාසය අවසන් කරන්න පවත්වන උත්සවය. එතුමා මට ඒකට ආරාධනා කරද්දී කියනවා, "මැතිතුමනි, ඔබතුමා එන්න. අපි vegetarian foods ලෑස්ති කරනවා" කියලා. මා දැක්ක ගමන් ඇවිත් අත්දෙකෙන් අල්ලාගෙන කියනවා, "ඔබතුමා වෙනුවෙන් vegetarian foods ලෑස්ති කරලා තිබෙනවා" කියලා. මම කෑම කන අතරේ හොයාගෙන ඇවිල්ලා අහනවා, "ඔබතුමාට vegetarian foods ලැබුණාද?" කියලා. මම උත්සවය අවසානයේ යන්න හදනකොට අහනවා, "ඔබතුමාට ලැබුණු vegetarian foods හොඳද?" කියලා. තමන් ආශ්‍රය කරන එක් එක් පුද්ගලයාගේ ගති පැවතුම් සියල්ල මනසේ රඳවා ගෙන, ඒ සියලුදෙනාගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කරලා, ඔවුන් සතුටින් සිටින බවට වග බලා ගැනීමේ පුදුම වුවමනාවක් හා පුදුම හැකියාවක් අලවි මවුලානා මැතිතුමාට තිබුණා.

අපේ ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා සිහිපත් කළා වාගේම, ගරු අලවි මවුලානා මැතිතුමා මුස්ලිම් අන්තවාදයක් වෙනුවට ශ්‍රී ලාංකික අනන්‍යතාව වෙනුවෙන් තදින්ම පෙනී සිටියා. පාරවල් නම් කරද්දී, මුස්ලිම් පල්ලි ඉදිකිරීමේදී, පන්සලේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයේදී ඇතිවන විවිධ ගැටුම් අරගෙන එතුමාගේ කාර්යාලයට සිංහල සහ මුස්ලිම් ජනතාව නිතරම එනවා. එතුමා දුරකථනයෙන් කථා කරලා මට කියනවා, "මෙන්න පුංචි ගැටුමක් තිබෙනවා. මම මේ අය ඔබතුමාගේ කාර්යාලයට එවනවා. ඔබතුමා මැදිහත් වෙලා විසඳන්න" කියලා. එවිට මම කියනවා, "ආණ්ඩුකාරතුමනි, සිංහල හා මුස්ලිම් පාර්ශ්ව දෙකම ඉන්න නිසා ඔබතුමායි මායි දෙදෙනාම එතැන ඉන්න ඕනෑ. ඒ නිසා මම එන්නම් ඔබතුමාගේ කාර්යාලයට" කියලා. "නැහැ, ඔබතුමාගේ කාර්යාලයට මම ඒ පිරිස එවන්නම්. මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමා හිටියාම ඇති. ඔබතුමා හෙද බෞද්ධයෙක්. ඔබතුමාගෙන් මුස්ලිම්වරුන්ට අසාධාරණයක් වෙන්නේ නැහැ කියලා මට විශ්වාසයයි" කියලා එතුමා කියනවා. ඒ නිසා එතුමා තමන්ගේ බලය වෙනුවෙන් ඡන්ද කුට්ටිය වැඩි කර ගැනීමට ජාතීන් අතර ප්‍රශ්න ඇති කිරීම වෙනුවට, සැබැවින්ම මේ රටේ ජාතික සමගිය වෙනුවෙන් අවංකව පෙනී සිටි ආදර්ශවත් මුස්ලිම් නායකයෙක් කියන එක අපි ඉතාම ආඩම්බරයෙන් මේ අවස්ථාවේ සඳහන් කළ යුතුමයි.

එතුමා අද අපෙන් සමු ගෙන තිබුණත්, එතුමාගේ ඒ ගති ලක්ෂණ තිබෙන දරු පිරිසක්, මුණුබුරන් පිරිසක් හැදීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා. එතුමාත් අපිත් එකට ආරම්භ කරපු යුක්තිය සඳහා වූ අරගළය, පීඩිත පැගෙන මිනිසා සඳහා වූ අරගළය ජයග්‍රහණයෙන් කෙළවර කිරීමට පෙරයි එතුමා අපෙන් සමුගත්තේ. එතුමා ආරම්භ කරපු ඒ අරගළය ජයග්‍රහණයෙන් කෙළවර කරගැනීම සඳහා එතුමා යළිත් අප අතර ඉපදේවායි කියා ප්‍රාර්ථනා කරමින්, අපේ හදවතේ එතුමා වෙනුවෙන් නැගෙන්නා වූ ශෝකය පවුලේ සියලුදෙනාටම පළ කරමින් මම නිහඬ වනවා.

[අ.භා.3.22]

ගරු නිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

ගරු කථානායකතුමනි, හිටපු ආණ්ඩුකාරතුමෙකු වූ මා අතිශය ගෞරව කරන ගරු අලවි මවුලානා මැතිතුමා පිළිබඳව, අපේ පවුලේ හිතවතා පිළිබඳව අද මා මේ අවස්ථාවේ කථා කරන්නේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක විධියට නොවෙයි. මම අද කථා කරන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති කටයුතු හා සම්බන්ධව අලවි මවුලානා මහතා සමඟ කටයුතු කරපු භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍රගේ දියණිය විධියටයි.

අද එතුමාගේ පවුලේ උදවිය මේ ගැලරියට ඇවිත් ඇති. ඔබ සියලුදෙනාත්, මෙතැන ඉන්න උදවියත් දන්නවා එතුමා අපේ පවුලත් එක්ක තිබුණේ මොන වාගේ සම්බන්ධයක්ද කියලා. එතුමා අපේ පවුලත් එක්ක දැඩි මිත්‍රකමකින්, සෙනෙහසකින් කටයුතු කළා. එතුමාගේ දේශපාලන ඉතිහාසය ගැන කථා කරන්න, එතුමා ගැන කථා කරන්න මම තවම ළාබාල වැඩියි. මෙතෙක් එතුමා වෙනුවෙන් කථා කළ ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු සියලුදෙනා එතුමාගේ දේශපාලනය ගැන කථා කරපු නිසා, මනුස්සයෙක් විධියට එතුමා මොන වාගේ පුද්ගලයෙක්ද කියලා කියන ගමන්, එම පවුලටත් අප හැර ගිය එතුමාටත් ගෞරවයක් දැක්වීමට මම බලාපොරොත්තු වනවා.

2011දී මගේ පියාගේ ඝාතනයෙන් පස්සේ අපි ගොඩක් අසරණ වුණා. ඒක මීනී මැරුමක් නිසාම ගොඩක් අය අප අත්හැරියා. දේශපාලනඥයන් අප අත්හැරියා; ජනතාව අප අත්හැරියා. අපි ගොඩක් අසරණ වුණා. ඇත්තටම දේශපාලනඥයන් ගත්තොත්, අතේ ඇඟිලි ගණනට සමාන පිරිසක් තමයි ඒ කාලයේ අපට පිහිට වුණේ. වාසුදේව නානායක්කාර මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම මෙතැන ඉන්න කවින්ද ජයවර්ධන මැතිතුමාගේ තාත්තා වාගේ කිහිප දෙනෙක් පමණයි හිටියේ. එදා අපට යන්න වාහනයක් තිබුණේ නැහැ. මගේ අම්මාට හදිසියකට බෙහෙත් ගන්න යන්න වාහනයක් නැති තරමටම අපි අසරණ වුණා. ඒ දවස්වල අපේ දුරකථන ඇමතුමකටවත් කවුරුවත් පිළිතුරු දුන්නේ නැහැ. එක අවස්ථාවක මම නිකම් සැකේට "අලවි අන්කල්ට" දුරකථන ඇමතුමක් ගත්තා. මම එතුමාට කථා කළේ, "අලවි අන්කල්" කියලා. විනාඩි 10ක් ගත වුණේ නැහැ, එතුමාගේ පුතා මැදිහත් වෙලා ඒ මොහොතේම ඔවුන්ගේ පෞද්ගලික රථය අපට හදිසියට පාවිච්චි කරන්න දුන්නා, එක වතාවකදී පමණක් නොවෙයි වාර ගණනාවකදී. අපි තනි වෙලා හිටපු අවස්ථාවේදී නිතරම අප බලන්න ආවා; අපට උදව් කළා.

2014 වසරේ පැවැති පළාත් සභා මැතිවරණයේදී මම යෞවනියක විධියට ප්‍රථම වතාවට දේශපාලනයට එනකොට එතුමා උපරිම කැපවීමෙන් මට උදව් කළා. එතුමා දේශපාලනය කළේ මගේ පියා එක්ක නොවෙයි, මගේ සීයා එක්ක. එම්.වයි. ප්‍රේමචන්ද්‍ර කියන සමසමාජ පක්ෂයේ හිටපු වෘත්තීය සමිති නායකයා එක්ක. ඉන් පසුව එතුමා වෘත්තීය සමිති කටයුතු කළේ මගේ පියා එක්කයි. ඒ දවස්වල හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වෘත්තීය සමිති කටයුතුවලදී, වෘත්තීය සමිති නායකයන් එක්ක කරට කර හැප්පිලා, වෘත්තීය ගැටලු විසඳා ගන්න උදව් කළ ප්‍රධාන පෙළේ දෙදෙනෙක් තමයි අලවි මවුලානා මැතිතුමා සහ මගේ පියා. ඉන් පසුව මා වාසනාවන්ත වුණා, මගේ සීයා එක්ක දේශපාලනය කළ, මගේ පියා එක්ක දේශපාලනය කළ අලවි මවුලානා මැතිතුමාගේ දායකත්වය, උදව්ව මගේ ප්‍රථම

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

මැතිවරණයටත් උපරිම ලෙස ලබා ගැනීමට. එතුමා මට උදව් කළා. ඒ අනුව අපේ පවුලේ පරම්පරා තුනකට එතුමාගේ සහයෝගය ලබා දීලා තිබෙනවා.

මා මේ අවස්ථාවේ දේශපාලනය ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද, මා කලින් කිව්වා වාගේ ඒ ගැන කථා කරන්න මම ළාබාල වැඩියි. මම තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්න ළාබාලම මන්ත්‍රීතුමිය. මගේ වයසටත් වඩා වැඩියි, එතුමාගේ දේශපාලන ජීවිතය. ඒ නිසා එතුමාගේ දේශපාලන ජීවිතය ගැන කථා කරන්න මා එතරම් සුදුසු නැහැ. පුද්ගලයෙක් ජීවත් වුණු විධිය කොහොමද කියලා මනින්න පුළුවන් වන්නේ, ජනතාව මොන විධියටද ඒ පුද්ගලයාට ප්‍රතිචාර දක්වන්නේ කියලා දැන ගන්න පුළුවන් වන්නේ, ඒ පුද්ගලයා මැරුණු දවසටත්, මරණයෙන් පසුවත්. මා දැක්කා, එතුමාගේ අවසන් කටයුතු කළ දවසේ ඒ නිවසේ තිබුණේ තනිකරම හිස් ගොඩක්. ඒ තරම් ජනතාවක් එතුමාට අවසන් ගෞරව දක්වන්න ආවා. අද මේ පාර්ලිමේන්තුව ගත්තත් පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව, ජාති-ආගම් භේදයකින් තොරව සියලු දේශපාලනඥයන් එතුමා වෙනුවෙන් වචනයක් කථා කරන්න නැගිට්ටා. ඒ එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මේ හැම කෙනාටම සහෘදයෙක් වුණු නිසායි; වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සමාජ සේවකයෙක්, හොඳ මනුස්සයෙක් වුණු නිසායි.

දෙවයේ මොන සරදමකටද දන්නේ නැහැ, එතුමා වෙනුවෙන් මගේ පියා විසින් කළ යුතුව තිබුණු කථාව මට කරන්න සිද්ධ වුණා. අද මගේ පියා ජීවත් වෙලා හිටියා නම් එතුමා ගැන මීට වඩා දේවල් කියයි. එතුමා එක්ක ඒ දවස්වල පාරට බැහැලා කම්කරුවන් එක්ක සටන් කළේ කොහොමද, සටන් වැදුණේ කොහොමද කියන කරුණු ඉතාම අපූරුවට කියයි. මා හිතන විධියට අලවි මවුලානා මහත්මයාගේ පුතාලා, මුනුපුරන් මේ ගැලරියේ ඉන්නවා. ඔබගේ පියා, ඔබගේ සීයා මේ මුළු රටේම කම්කරු ජනතාව වෙනුවෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්, විශේෂයෙන්ම දුක් විඳින සාමාන්‍ය ජනතාව වෙනුවෙන් ඉටු කළ සේවයට මගේ පියා වෙනුවෙන්, මගේ පවුල වෙනුවෙන්, මගේ සීයා වෙනුවෙන් මා හිස නමා ආචාර කරනවා.

එතුමා කළ ඒ සේවාව වෙනුවෙන් ඔබ සැවොම පවුලක් විධියට ලොකු කැප කිරීමක් කරන්න ඇති. ඒ වෙනුවෙන් ඔබටත් ආචාර කරන අතර, ඔබලාගේ ආගම අනුව එතුමා විසින් කරන ලද සියලුම කුසල් අනුමෝදන් වෙලා ස්වර්ගයට යන්න එතුමාට හැකියාව ලැබෙවා! කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමිය.

මීළඟට, ගරු මයන්ත දිසානායක මැතිතුමා.

[අ.භා.3.30]

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය මුලින්ම ප්‍රකාශ කරන්නට ඕනෑ. මම අලවි මවුලානා මැතිතුමාව පෞද්ගලිකව හඳුනා ගත්තේ 2007 වර්ෂයේ දීයි. එතුමා බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට කටයුතු කළ කාලයේ තමයි මුලින්ම එතුමා මුණ ගැහිලා පෞද්ගලිකව එතුමාව හඳුනා ගත්තේ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අද වැනි දිනයක මෙවැනි ශෝක යෝජනා සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට ඇවිල්ලා ලෙහෙසියෙන් වෙලාව ලබා ගන්න පුළුවන්. නමුත්, අද විශේෂයෙන්ම අලවි මවුලානා මැතිතුමා සහ යූ.බී. විජේකෝන් මැතිතුමා සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව නිසා මන්ත්‍රීවරු 20 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් මේ සභාවේ කථා කරනවා. මේ නායකයන් දෙපළ ගැන තිබුණු ජනතා මතය සහ ජනතා ආදරය එයින්ම අපට තේරුම් ගන්න පුළුවන්.

2010 වර්ෂයේදී අලවි මවුලානා මැතිතුමා පෞද්ගලිකව මට උදවු කරලා තිබෙනවා. ඒ ආකාරයට කරන ලද උදවු එකින් එක සඳහන් කරන්න මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නේ නැහැ. හැබැයි, දේශපාලනයේදී එතුමා මට උදවු කළේ දිවංගත මගේ පියා වන ගාමිණී දිසානායක මැතිතුමාට තිබුණු ආදරය සහ ගෞරවය නිසායි. ගාමිණී දිසානායක මැතිතුමා සහ අලවි මවුලානා මැතිතුමා ඉතා කිට්ටුවෙන් වැඩ කළා. ඒ දෙපළ දේශපාලන පක්ෂ දෙකක හිටියත්, පක්ෂ භේදයකින් තොරව එකට වැඩ කළා. එතුමාගේ අභාවය ගැන මම කනගාටු වන අතර, ගාමිණී දිසානායක මැතිතුමාගේ පවුල වෙනුවෙන්, ශ්‍රීමා දිසානායක මැනිනිය, නවීන් දිසානායක මැතිතුමා සහ සහෝදරියගේ ශෝකය අලවි මවුලානා මැතිතුමාගේ පවුලේ සැමට පුද කරනවා.

My condolences to the entire family. Hon. Alavi Moulana has helped me immensely. I have been a visitor and a guest at your house. So I will never forget and I will never allow the Dissanayake family to forget what your great father has done for us.

මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ නකීම් මවුලානා මැතිතුමා ප්‍රමුඛ ඒ පවුලේ සියලුම සහෝදරයන්ට මම යෝජනා කරනවා, ඒ අයගේ පියා ගැන පොතක් ලියලා, විශේෂයෙන්ම එතුමා විසින් කරන ලද ප්‍රකාශ එළිදක්වන්න කියලා. Hon. Alavi Moulana is a very, very funny man. He was so entertaining. තිබෙන ප්‍රශ්නයකට විහිළු-තහළු කරලා ක්ෂණික විසඳුමක් ලබා දෙන්න එතුමාට හැකියාව තිබුණා. අද සිටින දේශපාලනඥයන් දිහා බලන කොට, සමහරු තරහෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන් තමයි ප්‍රශ්නයකට විසඳුම් හොයන්න උත්සාහ කරන්නේ. හැබැයි, අලවි මවුලානා මැතිතුමා ඕනෑම ප්‍රශ්නයක් ආවාම, ඒ ගැන කල්පනා කරලා විහිළු තහළුවෙන් විසඳුමක් ලබා දීමේ හැකියාව එතුමාට තිබුණා. ඒක එතුමා තුළ තිබුණු දක්ෂතාවක්. එතුමා කළ නොයෙකුත් විහිළු ප්‍රකාශ මට මතක් වෙනවා. එක් අවස්ථාවක යම් කෙනෙක් එවකට සිටි ඉන්දියානු තානාපති ඩික්සිත් මැතිතුමා ගැන එතුමාගෙන් ඇහුවා, "What to you think of Dixith?" කියලා, එතුමා ප්‍රකාශ කළා, "ඩික්සිත් ළඟදීම exit වෙනවා" කියලා.

එතුමාගේ දේශපාලන ගමන දිහා බලන කොට ජාති, ආගම් භේදයකින් තොරව තමයි අලවි මවුලානා මැතිතුමා කටයුතු කළේ. එවැනි නායකයන් වර්තමානයේ අප අතර බිහි වේවා! කියා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, එතුමා වැනි නායකත්වයක් දෙන්න පුළුවන් නායකයන් අප අතර බිහි වේවා! කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, යූ.බී. විජේකෝන් මැතිතුමා පිළිබඳවත් මේ අවස්ථාවේ දී මම වචනයක් කථා කරන්නට ඕනෑ. එතුමා මගේ පියාගේ කල්‍යාණ මිත්‍රයෙක්. එතුමා දිගටම අපත්

සමඟ කටයුතු කළා. එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත ගාම්භීර දිසානායක මැතිතුමාගේ පවුලේ අපගේ ශෝකය, අපගේ කනගාටුව ප්‍රකාශ කරනවා. දීර්ඝ වශයෙන් කථා කළ හැකි කරුණු කාරණා රාශියක් තිබුණත්, මන්ත්‍රීවරු ගණනාවක් අද දින කථා කරන්නට සිටින නිසා ඒ මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙනවා. අපේ බෞද්ධාගමේ හැටියට අලවි මවුලානා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, යූ.බී.විජේකෝන් මැතිතුමාටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා.3.35]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මේ රටේ ජීවත් වුණු ඒ වාගේම අප සියලුම දෙනා අතර සුහදව කටයුතු කළ, අලවි මවුලානා මැතිතුමාගේ අභාවය වෙනුවෙනුයි අපි අද මේ ගරු සභාවේ ශෝකය පළ කරන්නේ.

එතුමා මට මුලින්ම මුණ ගැසුණේ 1978 අවුරුද්දේ වෘත්තීය සමිති අරගලයක යෙදී සිටියදී සිදු වූ පහරදීමකින් එතුමා රෝහල් ගතව සිටි අවස්ථාවකයි. එතුමා රෝහල්ගතව සිටියදී අපි බලන්න ගියා. එතුමාත් සමඟ වූ පෞද්ගලික හිතවත් කමකටත්, හැඳුනුම්කමකටත් වඩා එදා අප අතර තිබුණේ, "අලවි මවුලානා" කියන නම පිළිබඳව ගෞරවයක්. එතුමා මහජනයා වෙනුවෙන් මොනතරම් විශාල සේවයක් කළ පුද්ගලයෙක්ද කියන එක ගැන, රට පුරාම සිටින හැම කෙනෙකු ගැනම හොඳ අවබෝධයක් තිබුණු නායකයකු හැටියට අපි එතුමාව හඳුනාගෙන තිබුණා. එම නිසා එතුමාට එදා සිදු වූ ඒ කරදරයේදී අපි දැඩි ලෙස කම්පා වුණා. මේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයාට, ජනතාව වෙනුවෙන් මේ තරම් කටයුතු කරන නායකයාට මේ විධියට සැලකීම යුක්තිසහගතද කියා අපි සියලු දෙනාම ශෝක වුණා. ඊට පසුව විවිධ අවස්ථාවලදී අපි එතුමාත් සමඟ ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ හැම වෙලාවේම හැම කෙනෙකුගේම සහෝදරයෙක්, ඥාතියෙක්, හිතවතෙක් හැටියට තමයි එතුමා කටයුතු කළේ. එම නිසා එතුමාගේ අභාවය අපි කාටත් ලොකු කනගාටුවක්.

අද සිටින සමහර නායකයන්ට, විශේෂයෙන්ම සමහර මුස්ලිම් නායකයන්ට ආදර්ශයක් ගන්න පුළුවන් චරිතයක් තිබුණු නායකයෙක්. මනුෂ්‍යයෝත් එක්ක මනුෂ්‍යයෙක් හැටියට ජීවත් වෙන්නේ කොහොමද කියන එක අපේ රටේ අද තිබෙන ලොකු ප්‍රශ්නයක් නේ. මනුෂ්‍යයන් හැටියට මේ රටේ සියලු දෙනාම එකතුවෙලා ජීවත් වෙන්නේ කොහොමද කියන එක තමයි තිබෙන ප්‍රශ්නය. දේශපාලන අවශ්‍යතාවන් වෙනුවෙන්, දේශපාලන අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් මනුෂ්‍යත්වය පාවා දෙන යුගයකයි අපි අද ජීවත් වන්නේ. නමුත් අලවි මවුලානා මැතිතුමා කවදාවත් මනුෂ්‍යත්වයෙන් එපිටට නොගිය පුද්ගලයෙක්. පුදුමාකාර ගතිගුණ තිබුණු පුද්ගලයෙක්. ජාතික සංහිඳියාව, මනුෂ්‍යයන් අතර සංහිඳියාව, පක්ෂ අතර සංහිඳියාව මේ සියල්ලටම හොඳම ආදර්ශයක් ගන්න පුළුවන් නායකයෙක් හැටියටයි මම එතුමාව දකින්නේ.

හැම වෙලාවකම සිනහ මුසු මුහුණින් කිසිම ජාති ආගම් භේදයක් නැතිව පැහැදිලිවම අපේ රටේ නායකයෙක් හැටියට කටයුතු කළ නායකයා කවුද කියා මගෙන් ඇහුවොත් මම කියන්නේ, "අලවි මවුලානා " කියලා යි. ඒ තරම්ම ශ්‍රේෂ්ඨ ගතිගුණ තිබුණු මනුෂ්‍යයෙක්. මේ රටේ අපි සියලු දෙනාටම ආදර්ශයක් දෙන්න පුළුවන්, රටේ ජනතාවට දැවැන්ත පිහිටක් වෙන්න පුළුවන් නායකයෙක් හැටියටයි අපි එතුමාව දකින්නේ.

ගරු කථානායකතුමනි, අලවි මවුලානා මැතිතුමාගේ පවුලේ දරුවන් ඇතුළු සියලු දෙනා වෙත අපේ හදපත්ලෙන් නැහෙන ශෝකය පළකර සිටිනවා. එතුමගේ අවසාන කටයුතු අවස්ථාවේත් අපට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණ. ඒ හැම වෙලාවේදීම සත්‍ය වශයෙන්ම එතුමා වෙනුවෙන් දැවැන්ත කනගාටුවක්, හදවතේ වේදනාවක් අප සියලු දෙනාටම ඇති වුණා. මේ වාගේ මනුෂ්‍යයෝ නැති වුණාම අපේ රටේ අනාගතයට මොකද වෙන්නේ කියා එදා ඇති වුණු සැකය අද අපට තහවුරු වෙලා තිබෙනවා. අද රටේ ජාතීන් වශයෙනුත් විවිධ අංශ වශයෙනුත් අපි එකිනෙකාට විරුද්ධ වෙලා , එකිනෙකාගෙන් බෙදිලා, එකිනෙකාට වෛර කරන තැනට අප රට අද පත්ව තිබෙන්නේ මේ වාගේ නායකයන් අද නැති වීම නිසායි.

අද අපි දකින බොහෝ නායකයෝ ඒ ගොල්ලන්ගේ දේශපාලන වුවමනාවන්, ඉලක්කයන් සඳහාම පමණයි කාලය ගත කරන්නේ කියලා අපට පෙනෙනවා. නමුත් අලවි මවුලානා මැතිතුමා එහෙම කෙනෙකු නොවෙයි. එතුමාට දේශපාලන ඉලක්කයක් තිබුණා. ඒ දේශපාලන ඉලක්කය තිබුණේ දේශපාලන වශයෙන් මිසක් පෞද්ගලිකව නොවෙයි. ගරු අලවි මවුලානා මැතිතුමා කියන්නේ, කවදාවත් පෞද්ගලික ඉලක්කයක් තිබුණු මනුෂ්‍යයෙක් නොවෙයි. ඒ තරම් ශ්‍රේෂ්ඨ ගතිගුණ එතුමාට තිබුණා. එතුමා ජාතිය වෙනුවෙන්, රට වෙනුවෙන් කැප වුණු ජීවිතයක් ගත කළා. වෘත්තීය සමිති කටයුතුවලදී පමණක් නොවෙයි, අනිකුත් කටයුතුවලදීත් ඉතාමත් සංවේදී මනුෂ්‍යයකු හැටියටයි එතුමා තම ජීවිතය ගත කළේ. ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක එතුමා සමඟ කථා කරන්න පුළුවන්, ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක උදව්වක් කරන්න පුළුවන්, ඕනෑම කෙනෙකුගේ හිත සැනසෙන්න වචනයක් කියන්න පුළුවන් නායකයෙකු හැටියටයි අපි එතුමා දැක්කේ.

මේ අවස්ථාවේදී එතුමා වෙනුවෙන් එම මැනිනිය, නකීබ් මවුලානා ඇතුළු දූ දරුවන් හා අනිකුත් ඥාතීන් සියලුදෙනාටමත් අපගේ ශෝකය ප්‍රකාශ කරන අතර මෙවැනි ශ්‍රේෂ්ඨ නායකයෙකුගේ දරුවන් වීම ගැන ඒ දරුවන් හතරදෙනාටම ආඩම්බර විය හැකි බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මා හමාර කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

දිවංගත අලවි මවුලානා මැතිතුමා සම්බන්ධයෙන් කථා කිරීමට ඉල්ලා සිටි සියලුදෙනාටම අද දිනයේ මා අවස්ථාව ලබා දුන්නා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ඒ වාගේම හිටපු අමාත්‍ය, හිටපු ආණ්ඩුකාර අභාවප්‍රාප්ත ගරු එස්. අලවි මවුලානා මැතිතුමාගේ අභාවය පිළිබඳ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා මා අනුමත කරනවා.

ගරු එස්. අලවි මවුලානා මැතිතුමාගේ ඉතා විශිෂ්ට චරිතාපදානය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බොහෝදෙනෙක් අදහස් ප්‍රකාශ කළා. එතුමා සම්බන්ධයෙන් මා පෞද්ගලිකවත් සඳහන්

[ගරු කථානායකතුමා]

කළ යුතුයි. මොකද, එතුමා සමඟ ඉතාමත්ම කිට්ටු සම්බන්ධයක් මට තිබුණා. මා එතුමාට බොහොම ගරු කළා. අපි දේශපාලන මත දෙකක් දැරුවත්, ජාතික වැදගත්කමින් යුතු අවස්ථාවලදී අපට බොහෝ විට එක මතයකට එන්න පුළුවන් වුණා. ඒ වාගේම මා කවදාවත් අමතක නොකළ දෙයක් තමයි, මා කොළඹ නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී, එතුමා පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා වශයෙන් අපට තිබුණු බාධක ඉවත් කර දමා, කොළඹ නගරය දියුණු කරන්න එතුමාගේ පූර්ණ සහාය අපට ලබා දුන් බව. මා එම කරුණත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහි කරනවා.

විශේෂයෙන්ම එතුමන්ගේ දරුවන් ඇතුළු පවුල සමඟ මා ඉතාමත් කිට්ටු සම්බන්ධතාවක් පවත්වනවා. ඒ ගැනත් සඳහන් කරමින්, අවසාන වශයෙන් දැන පිරිසිදු අවංක දේශපාලනඥයෙකු වශයෙන් මා එතුමා හඳුන්වමින්, අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

මීළඟට පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු කරුපයියා වේලායුදම් මැතිතුමා වෙනුවෙන් කෙරෙන ශෝක ප්‍රකාශ යෝජනාව.

ශෝක ප්‍රකාශය:
ගරු කරුපයියා වේලායුදම් මහතා
அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு கருப்பையா வேலாயுதம்
VOTE OF CONDOLENCE:
HON. KARUPPAIAH VELAYUDAM

[අ.භා.3.42]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙම උත්තරීතර සභාව හොබවන ලද කෘත හස්ත දේශපාලනඥයෙකු වූ කරුපයියා වේලායුදම් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මෙම අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරනවා.

කරුපයියා තේවර් මහතාට සහ අවත්තාල් මහත්මියට දාව 1950 අප්‍රේල් මස 06 වැනි දින -හරියටම අද වාගේ දිනක- වේලායුදම් මැතිතුමා උපත ලැබුවේ උඩුපුස්සැල්ලාව, කර්කලීස් වතුයායේදීයි. හින්දු භක්තිකයෙකු වූ එතුමා පසු කලෙකදී ධනලක්ෂ්මී මෙනවිය සමඟ විවාහ දිවියට එළඹ, වී. ප්‍රදීපරාජා, වී. රුද්‍රදීපන්, වී. දිනේෂ් කුමාර සහ වී. නිමලරූපන් යන දරුවන් සිව්දෙනා මෙලොවට දායාද කරනු ලැබුවා. ඔවුන් මේ වන විටත් ව්‍යාපාරිකයන් හා ක්‍රියාකාරී දේශපාලනඥයන් වශයෙන් කටයුතු කරමින් සිටිනවා.

ගරු කථානායකතුමනි, බදුල්ල විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද වේලායුදම් මැතිතුමා ප්‍රජා කටයුතු සඳහා වූ සමාජසේවා ඩිප්ලෝමාව, පරිගණක යෙදවුම් පිළිබඳ ඩිප්ලෝමාව, ජනමාධ්‍ය ඩිප්ලෝමාව, කර්මාන්ත සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව වැනි පාඨමාලාවන් රැසක් හදාරා බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කරලීමේ අරමුණින් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසියේ 2001 වසරේදීයි. එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්ව ප්‍රදේශයේ ජනතාවගේ පොදු යහපත වෙනුවෙන් ඉතා කැප වීමෙන් කටයුතු කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා.

භාෂා ත්‍රිත්වයම දක්ෂ ලෙස හැසිරවීමේ මනා හැකියාවන් එතුමාට තිබූ අතර, ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ පහළම සිට ඉහළම ස්තරය දක්වා විවිධ වගකීම් දරා, අත් දැකීම්වලින් පිරිපුන් වේලායුදම් මැතිතුමා ප්‍රදේශයේ ජනතාවගේ උන්නතිය වෙනුවෙන් මහ හඬක් නැඟූ අභීත නායකයෙකු ලෙස පෙන්වා දිය හැකියි. ඒ අතර, අසංවිධිත කම්කරුවන් සංවිධානය කිරීම, වෘත්තීය පුහුණු වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරවීම හා පහසුකම් සැපයීම, කම්කරුවන්ගේ වැටුප් ඉහළ නංවාලීමට කටයුතු කිරීම පිණිස විවිධ සාකච්ඡා පවත්වමින් කටයුතු කිරීම වැනි කටයුතු මඟින් කාර්මික සබඳතා ඉහළ නැංවීමට එතුමා ගත් උත්සාහයන් අප මේ අවස්ථාවේදී ඉතා කෘතවේදීව සිහිපත් කළ යුතු වෙනවා.

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂ සාමාජිකයෙකු වශයෙන් වසර 38ක නොබිඳුණු දේශපාලන අත් දැකීම් ඇත්තෙක් වූ එතුමා වරෙක වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ධුරය උසුලනු ලැබුවා. වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ධුරය දරමින් වැවිලි ක්ෂේත්‍රයටද එතුමා ඉටු කරන ලද්දේ විශාල සේවාවක්. දුගී බවින් පෙළුණු, වරප්‍රසාද නොමැති කම්කරු පන්තියේ ජීවන මට්ටම ඉහළ නංවාලීම සඳහා කටයුතු කළ එතුමා සෙසු අයගේ අදහස් හා ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් අගය කරනු ලැබුවා. එම අරමුණුවලට ගරු කරමින් හා ඒවා නංවාලමින් උදාර නික්මුණු මානුෂීය ජීවිතයක් ගත කිරීමට අප සමාජයේ සියලු දෙනාට හැකිවේවා යන ප්‍රාර්ථනය පෙරදැරිව කටයුතු කළ අයෙක් ලෙසද එතුමා හඳුන්වා දිය හැකියි.

ගරු කථානායකතුමනි, කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, මැලේසියාව, තායිලන්තය, ඉතාලිය, ඊශ්‍රායලය, මැද පෙරදිග, බෙල්ජියම, නෙදර්ලන්තය ආදී ලෝකයේ බොහෝ රටවල සංචාරය කිරීමේ වරප්‍රසාදය ලැබූ එතුමාට ලොව විවිධ ජන කොටස් හමු වී ඔවුන්ගේ සංස්කෘතිය හා චර්යා රටාවන් හැදෑරීමටද මහඟු අවස්ථාවක් හිමි වුණා. ඒවායින් ලද අත් දැකීම් සමුදාය තම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමට යොදා ගැනීමටද එතුමා අමතක කළේ නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ වරප්‍රසාද නොමැති හා සුළු සේවාවන්හි නිරත ජන කොටස්වල සේවක අයිතිවාසිකම් ලබා දීම වෙනුවෙන් එතුමා ඔවුන්ගේ හඬ බවට පත් වුණු අවස්ථා අනන්තවත් අපට සිහිපත් වෙනවා. එතුමා විසින් කරන ලද මෙම කැප වීම ශ්‍රී ලංකාවේ පීඩිත පන්ති ව්‍යාපාරය තුළ තබා ඇත්තේ සදානුස්මරණීය සටහනක්. එසේම ජනතාව වෙනුවෙන් අගනා මෙහෙවරක් කළ කරුපයියා වේලායුදම් මැතිතුමා අවුරුදු 65ක් ආයු විත්දනය කර මෙලොව හැර ගියේ 2015 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 13 වෙනි දායි.

ගරු කථානායකතුමනි, 2001 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වාත්, නැවත 2014 සිට 2015 වර්ෂයේ මැද දක්වාත් අවුරුදු 03කට වැඩි කාලයක් පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට සුවිශාල මෙහෙවරක් ඉටු කළ හිටපු

පාර්ලිමේන්තු මන්ත්‍රී හා රාජ්‍ය අමාත්‍ය ගරු කේ. වේලායුදම් මැතිතුන්ට, ආත්ම ශාන්ති ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරනවා.

[ප.ප. 3.49]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ வேலாயுதம் அண்ணன் அவர்களுடைய அனுதாபப் பிரேரணைமீது உரையாற்றும்போது எனக்கு மிகவும் கவலையாக உள்ளது. வேலாயுதம் அண்ணனை எனக்கு நன்றாகத் தெரியும். இந்தப் பாராளுமன்றத்திலே பல சந்தர்ப்பங்களிலே அவரோடு நான் பணியாற்றியிருக்கிறேன். பல சந்தர்ப்பங்களிலே பாராளுமன்றக் குழுவினூடாக வெளிநாடு சென்றபோது அவரோடு பயணித்திருக்கிறேன். உண்மையிலே பழகக்கூடிய ஒரு நல்ல மனிதர்! மலையகத்தைப் பொறுத்தமட்டிலே, அங்கிருக்கின்ற மக்களை வழிநடத்தக்கூடிய இளம் தலைவர்கள் இப்பொழுது அங்கே உருவாகி வருகின்றார்கள். வேலாயுதம் அண்ணனைப் போன்றவர்கள் ஆரம்ப காலத்திலே அந்த மக்களை வழிநடத்துவதில் மிகுந்த துன்பங்களையும் சிரமங்களையும் சந்தித்திருக்கிறார்கள். உண்மையிலே அந்த நாட்களில் மலையக மக்களைத் துன்பத்திலிருந்து விடுவித்து வழிநடத்துகின்ற பணி என்பது மிகச் சிரமமானதாக இருந்திருக்குமென்று நான் கருதுகின்றேன்.

மலையகத்தைப் பொறுத்தமட்டிலே, அங்குள்ள எமது மக்கள் அன்றாடம் தேயிலைக் கொழுந்துகளைப் பறிப்பதனூடாக இந்த நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக் கொடுக்கின்ற மாபெரும் செயற்பாட்டைச் செய்துகொண்டிருக் கின்றார்கள். அந்த மக்களுடைய அன்றாட வாழ்க்கை என்பது 'லயன்' காம்பராக்கள் என்று சொல்கின்ற எந்தவொரு வசதியுமில்லாத தொடர் வீட்டுத் திட்டத்திலேதான் அமைந்திருக்கின்றது. குடும்பங்களில் ஐந்து பேர் இருந்தாலென்ன, இரண்டு பேர் இருந்தாலென்ன! தங்களுடைய குமர்ப்பிள்ளைகளுடன் ஒன்றாக அந்த லயனிலே வாழ்க்கையை நடத்துகின்ற ஒரு துர்ப்பாக்கிய நிலையில்தான் அந்த மக்கள் இருக்கிறார்கள்.

மலையக நகரான ஹற்றன் - தலவாக்கலையில் எங்களுடைய சித்தப்பாவின் கடையிலே ஒரு வருட காலம் நான் வேலை செய்தேன். அப்பொழுது, அந்த மக்கள் எங்களுடைய கடையிலே கடனுக்குத்தான் சாமான் வாங்குவார்கள். அவர்களுக்குச் சம்பளம் கிடைக்கின்ற நாளைக்கு நான் அந்தப் பணத்தைப் பெறுவதற்காக அவர்களுடைய வீடுகளுக்குச் செல்வதுண்டு. உண்மையிலே அந்தப் பணத்தை அவர்களிடமிருந்து பெறுவது என்பது மனதுக்கு மிகவும் கஷ்டத்தைக் கொடுக்கும். அவர்களுடைய வாழ்க்கையைப் பார்த்து நான் பல இடங்களிலே அந்தப் பணத்தைப் பெறாமல் திரும்பி வந்ததுண்டு. அன்றாடம் ரொட்டியோடு வாழ்க்கையை நடத்துகின்ற குடும்பங்களாக அவை இருந்துவந்தன. இப்பொழுது, அந்த மக்களுடைய வாழ்க்கையிலே பல முன்னேற்றங்கள் காணப்படுகின்றன. இன்றைக்கு அவர்களுக்கு வீட்டுத் திட்டங்கள் பகிர்ந்தளிக்கப்படுகின்ற நிலை இருந்தாலும், அன்று கௌரவ வேலாயுதம் அண்ணன், ஆறுமுகன் தொண்டமான் ஐயா உட்பட மலையகத்தைக் கட்டியெழுப்புகின்ற பணியைச் செய்கின்ற அனைவரும் அந்த மக்களுடைய வாழ்க்கையோடு இணைந்து செயற்பட்டார்கள்.

நான் அவரை வேலாயுதம் அண்ணன் என்றுதான் அழைப்பதுண்டு. அவருடைய மகனை எனக்கு நன்றாகத் தெரியும். ஒரு குறிப்பிட்ட காலம் அவருடைய மகனோடு பழகக்கூடிய வாய்ப்பு எனக்குக் கிடைத்தது. அவர் என்னைச் சந்திக்கின்ற போதெல்லாம் மகனைப் பற்றியும் மலையக மக்களுடைய வாழ்க்கையைப் பற்றியும் பகிர்ந்துகொள்வது வழக்கம். வேலாயுதம் அண்ணன் அவர்களின் மறைவு மலையகத்தைச் சார்ந்த எல்லோருக்கும் பாரிய இழப்பாகவே இருக்கின்றது. அவரது இழப்பினால் இன்று அவருடைய குடும்பத்தினர் பாரிய துன்பத்தை அனுபவிக்கிறார்கள். நான் முன்பு சொன்னதுபோல ஒருவரை நினைவுகூரும் செயலானது, அவரது நல்ல நடத்தைகளையும் அவரூடாகப் பெற்ற அனுபவங்களையும் அவர் முன்கொண்டு சென்ற நன்மையான காரியங்களையும் நாங்கள் தொடர்ந்துசெய்வதாக இருக்க வேண்டும். இதுதான் நினைவுகூர்தல் என்பதற்கு அர்த்தமாக இருக்கும். வெறும் வார்த்தைகளால் அவர்களுக்கு அஞ்சலி செலுத்துவது என்பது, ஏற்புடையதாக இருக்காது. ஆகவே, அவருடைய சிந்தனை, அவருடைய செயற்பாடு - அந்த மக்களுடைய விடுதலை சம்பந்தமானவை - எந்தெந்த வழிகளில் இருந்தனவோ, அந்த நன்மையான வழிகளை இனம்கண்டு அதன்படி செயற்படுவதனூடாகத்தான் அவருடைய ஆத்மா சாந்தியடைய வாய்ப்பு இருக்கிறது. எனவே, வேலாயுதம் அண்ணனுடைய குடும்பத்துக்கு தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாகவும் எனது சார்பாகவும் ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றேன். மேலும், அவருடைய இழப்பு ஒருபோதும் ஈடுசெய்ய முடியாதது. இருந்தாலும், மலையக மக்களுக்கு குரல் கொடுப்பதற்காக நாங்கள் இருக்கிறோம்; அவர்களுடைய நலன்களுக்காக நாங்களும் செயற்படுவோம். அந்த வகையில் இங்கே இருக்கின்ற மலையகத்தைச் சேர்ந்த கௌரவ உறுப்பினர் களுக்கும் எங்களுடைய அனுதாபத்தைத் தெரிவித்து, விடைபெறுகிறேன். நன்றி!

[අ.භා. 3.56]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)

(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, උෂ්ව පළාත නියෝජනය කරමින් කම්කරු ජනතාව වෙනුවෙන් අති විශාල සේවයක් කළ කේ. වේලායුදම් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මෙම සභාවට ඉදිරිපත් කළ ශෝක යෝජනාව සාකච්ඡා කරන අවස්ථාවයි, මේ. එම අවස්ථාවේදී කේ. වේලායුදම් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අයට මගේ ශෝකය පළ කරමින් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

එතුමාත්, මමත් වසර 15ක්, 20ක් පමණ කාලයක් බොහොම කිට්ටුවෙන් දැන හඳුනා ගත් අය. තමන් නියෝජනය කළ ජනතාව වෙනුවෙන් ඉතාම උනන්දුවෙන්, ඉතාම වුවමනාවෙන්, දැවැන්ත කැපවීමකින් තමන්ගේ කාර්ය භාරය ඉටු කළ කෙනෙක්. මා දන්නා තරමින්, අභාවප්‍රාප්ත ගරු ගාමිණී දිසානායක මැතිතුමාගේ මහ පෙන්වීම යටතේ මුලින්ම ව්‍යාත්තීය සමිති ක්ෂේත්‍රයට පැමිණිලා, අපේ පක්ෂයේ දැවැන්තයින් සමඟ ඉතා කිට්ටුවෙන් වැඩ කළ කෙනෙක්. ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී.බී.

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

වර්තමානයේ දේශපාලන පක්ෂයක් තුළ සිටිනවා නම් පක්ෂය රැකගත යුතුයි; නායකත්වය සමඟ කටයුතු කළ යුතුයි; පක්ෂය බලයේ සිටින අවස්ථාවේදී පමණක් නොවෙයි, විපක්ෂයේ සිටින අවස්ථාවේදීත් පක්ෂ නායකත්වය සමඟ කටයුතු කළ යුතුයි කියන එක අපි දන්නවා. ඒ ආදර්ශය දෙමින්, සුරනිමල් රාජපක්ෂ මැතිතුමා දේශපාලනය පටන් ගත්ත දවසේ සිට අවසානය දක්වාම පක්ෂයත්, නායකත්වයත් සමඟ අවංකව සිටියා. එය විශේෂයෙන්ම වර්තමාන දේශපාලනඥයින්ට ආදර්ශයක් විධියටයි මා දකින්නේ. නායකත්වය එවැනි අය කෙරෙහි විශ්වාසය තබන්නේ දේශපාලන ක්‍රියාවලියේදී අවංකව, නායකයාට විශ්වාසයක් ඇති වන පරිදි, පක්ෂයට සිය දායකත්වය ලබා දෙමින් අවංකව කටයුතු කිරීම නිසායි. එතුමා ඒ කාර්ය භාරය අවංකව ඉටු කළාය කියන එක බොහොම පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම, දොම්පේ කියන ආසන එතුමා සෘජුව නියෝජනය කළත්, එතුමාගේ සේවය ඒ ආසන දෙකට පමණක් සීමා කළේ නැහැ.

අත්තනගල්ල, මීරිගම ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම ආසනයකටම සිය නායකත්වය, සිය සේවය ලබා දීමට එතුමා කටයුතු කළා. ඒ වාගේම දිස්ත්‍රික්කය තුළ ඕනෑම ගමක්, ඕනෑම කෙනෙකුගේ නමක් පෞද්ගලිකව මතක තබා ගැනීමේ හැකියාව -දහස් සංඛ්‍යාත දෙනෙකුගේ නමින් ආමන්ත්‍රණය කිරීමේ හැකියාව - වැනි සුවිශේෂ වූ කුසලතාවන් රැසකින් එතුමා සමන්විත වුණා. එතුමා ප්‍රායෝගික දේශපාලනඥයෙක්. එම නිසා තමයි එතුමා සාර්ථක දේශපාලනඥයෙක් විධියට ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඒ ගෞරවාදරයට පත් වෙලා තිබුණේ. කඩවත ප්‍රදේශයේ අද ඇති වෙලා තිබෙන ශීඝ්‍ර දියුණුවට, මුල් කාලය තුළදී ඒ ආරම්භක කටයුතු වෙනුවෙන් බියගම ආසනයේ සංවිධායකවරයා විධියට එතුමා වෙහෙස මහන්සි වුණා. මම නියෝජනය කරන ආසනය වන කඩවත ප්‍රදේශයේ මේ වන විට ඇති වෙලා තිබෙන ශීඝ්‍ර දියුණුවට වර්තමානයේ අපි ඒ නායකත්වය, කැප වීම, දායකත්වය ලබා දුන්නා වාගේම එහි ආරම්භක සැලසුම් සකස් කරන අවස්ථාවේදී සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ඒ බියගම ආසනයේ සංවිධායකවරයා විධියට සිය දායකත්වය ලබා දුන්නා කියන එක අපි ගෞරවයෙන් සිහිපත් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී එතුමාට ගම්පහ දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවගේම ගෞරවය ඒ වාගේම ශෝකය පළ කරන්න ඕනෑ. මෙම අවස්ථාවේදී මට දුරකථනයෙන් කථා කරපු දොම්පෙ ආසනයේ අපේ හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාත් ඒ වාගේම උපාලි ගුණරත්න අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමාත් සඳහන් කළා, ඒ අයගේ ශෝකයත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කියලා. එතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේත් ඒ වාගේම අපේ පක්ෂයේ සභාපතිවරයා විධියට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත් ශෝකය, කනගාටුව එම පවුලේ සියලුම දෙනා වෙත මේ අවස්ථාවේදී පළ කරමින්, සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට නිවන් සුව අත්වේවා!යි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ගරු කවින්ද ජයවර්ධන මැතිතුමා.

[අ.භා. 4.56]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් මමත් නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන්, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ක්‍රියාකාරී දේශපාලනයට අවතීර්ණ වෙච්ච සුරනිමල් රාජපක්ෂ මැතිතුමා, මගේ පියා වන දිවංගත දොස්තර ජයලත් ජයවර්ධන මැතිතුමන්ලා සමඟ 1994දී පාර්ලිමේන්තුවට පැමිණිලා, විපක්ෂයේ දේශපාලනය කරලා තම පක්ෂය ආරක්ෂා කරන්න, පක්ෂයේ නායකත්වයට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න වැඩ කටයුතු කර 2002 මහ මැතිවරණය ජයග්‍රහණය කරන්නට ඒ වාගේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් නිර්මාණය කරන්නට විශාල දායකත්වයක් ලබා දුන්නා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ශක්තිය ලබා දෙමින් 2002 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළ අමාත්‍ය ධුරයක් ලබාගෙන එතුමා මේ රටේ

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

තරුණ-තරුණියන්ට මෙන්ම මේ රටේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කරගන්නට අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නා. ඒ වාගේම එතුමා එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණෙන් දේශපාලනයට අවතීර්ණ වෙලා, මේ රටේ මුළුමහත් තරුණ ප්‍රජාවටම ආදර්ශවත් දේශපාලනඥයෙක් හැටියට කටයුතු කළා. ඒ වාගේම එතුමා ගරු අග්‍රාමාත්‍යතුමාට ශක්තියක් වෙච්ච පුද්ගලයෙකු හැටියට, 2015 ජනවාරි 8 වැනි දා මහා විප්ලවය කරන්නට එතුමාගේ ශක්තිය ලබා දුන්නා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්වරයෙක් හැටියටත්, සම්බන්ධීකරණ ලේකම්වරයෙක් හැටියටත් කටයුතු කළා.

ගරු කථානායකතුමනි, ඉතාම කෙටි කාලයක් තමයි මා එතුමා දැනගෙන සිටියේ. මට මතක් වෙනවා 2013-2014 කාලයේ පැවැති වයඹ පළාත් සභා මැතිවරණය. ඒ කාල සීමාව තුළ අපි පුත්තලම දිස්ත්‍රික්කයේ රැස්වීමකට යන අවස්ථාවකදී එතුමා රිය අනතුරකට ලක් වුණා. එතුමාගේ අත කැඩුණා. නමුත් එතුමා ඒ යන ගමන අත් හැරියේ නැහැ. මම කිව්වා, "ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමනි, අපි රෝහලට යමු." කියා. එතුමා ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළා, "නැහැ, අපි අගමැතිතුමා එන රැස්වීමට යන්න ඕනෑ. ඒ රැස්වීම අවසන් කළාට පසුව මම රෝහලට යන්නම්." කියා. ඉන් පසුව එතුමා අත එල්ලා ගෙන, දැඩි වේදනාවකින් සිටියත් එය යටපත් කරගෙන, දැඩි අධිෂ්ඨානයකින් යුතුව ඒ මැතිවරණ සමය අවසන් වන කල්ම සිටියා. එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරවන්න, එක්සත් ජාතික පක්ෂයේ නායකයා ජයග්‍රහණය කරවන්න, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් නිර්මාණය කරන්න දැඩි වුවමනාවක් තිබුණු නිසා එතුමා ඒ මැතිවරණය සම්පූර්ණයෙන්ම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මෙහෙයවුවා. එවැනි ශ්‍රේෂ්ඨ නායකයෙක්, එතුමා.

මා ආඩම්බර වෙනවා, එතුමාගේ ආදරණීය පුත්‍ර නීතිඥවරයකු වන මගේ මිත්‍ර කනිෂ්ක රාජපක්ෂ මැතිතුමා අද අපත් එක්ක එකතු වෙලා ජාතික යොවුන් පෙරමුණේ විධායක කමිටුවේ සාමාජිකයකු හැටියත්, ඒ වාගේම ජාතික යොවුන් පෙරමුණේ නියෝජ්‍ය ලේකම්වරයා හැටියටත් එතුමාගේ පියා කරගෙන ගිය ඒ සේවය, අපේ පක්ෂයට ලබා දුන් ශක්තිය තරුණ දේශපාලනඥයකු හැටියට එක්සත් ජාතික පක්ෂයට අද ලබා දීම ගැන. එතුමාත් අනාගතයේදී එක්සත් ජාතික පක්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් අපත් සමඟ මැතිවරණවලට සම්බන්ධ වෙලා මේ ගරු සභාව නියෝජනය කරන්න ඉදිරිපත් වේවි කියා අපි බලාපොරොත්තු වෙනවා, අපි විශ්වාස කරනවා. එතුමාගේ දියණිය වෛද්‍යවරියක්. ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා තමන්ගේ දේශපාලන දිවිය සාර්ථකව කළා වාගේ තමන්ගේ පෞද්ගලික දියුණුව සහ තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ද කාලය ගත කළා කියන එක මේ අනුව අපට පැහැදිලි වෙනවා. මා හිතන්නේ එතුමා උගත් පරපුරක් නිර්මාණය කර තිබෙනවා කියායි. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් දේශපාලනඥයන්ගේ ළමයින් ගැන -ඇමතිවරුන්ගේ පුතුන් ගැන- කථා කරද්දී අපේ සමාජය ඔවුන් දෙස සමහර වෙලාවට පිළිකුලෙන් බලනවා. නමුත් ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා අප සියලුදෙනාට උදාහරණයක් ඉතිරි කර තිබෙනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට බලාපොරොත්තුවක් ලබා දී තිබෙනවා. මම විශ්වාස කරනවා, එතුමාගේ ආදරණීය පුත්‍රයා වන මගේ සහෝදර මිත්‍රයා එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කරන්න අපත් සමඟ තවදුරටත් එකතු වේවි කියා. ඒ වාගේම මම විශ්වාස කරන ආකාරයට, ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරන ගමන්, එතුමාගේ ආගමානුකූලව එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු ලකී ජයවර්ධන මහතා.

[අ.භා.5.02]

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, දිවංගත සුරනිමල් රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ ගරු සභාව තුළ මටත් අවස්ථාවක් සලසා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 70 දශකයේ හඳුනාගත් දේශපාලන සගයෙකු වන මගේ මිත්‍ර සුරනිමල් රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳව මගේ සාතිශය සංවේගය මම පළ කරනවා. ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේම ශෝකයත් පළ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, 1970 දශකයේ එතුමා මුලින්ම මට හඳුනා ගන්න අවස්ථාව ලැබුණා. එක්සත් ජාතික පක්ෂ යොවුන් පෙරමුණේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයකු වශයෙන් එතුමාත් සමඟ කටයුතු කරන්න මට අවස්ථාව සැලසුණා. එතුමාගේ ක්‍රියාකාරකම් ඉතාම වැදගත්ය කියන එකත් මා මේ අවස්ථාවේ සඳහන් කරනවා. 1973 වර්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් වුණු එතුමා එවකට - 1975 වර්ෂයේදී- පැවැති රජයේ දේශපාලන පසු බිම තුළ, මේ රට තුළ සිදු වූ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලට එරෙහිව අභීතව සටන් වැදුණු දේශපාලනඥයකු විධියට හඳුන්වන්න පුළුවන්. එවකට පැවැති රජය මැතිවරණය වසර දෙකකට කල් දැමීම දේශපාලන ඉතිහාසයේම, මැතිවරණ ඉතිහාසයේම මැතිවරණයක් කල් දැමූ පළමුවන අවස්ථාව 1975 වර්ෂය විධියට මම දකිනවා. එදා එතුමා මැතිවරණ දිනා ගන්න කළ කැපවීම අගය කළ යුතු වනවා.

එවකට එක්සත් ජාතික පක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙන ගිය දේශපාලන ක්‍රියාකාරකම් තුළ මෙතුමා ඉදිරියෙන්ම සිටියාය කියන කාරණයත් මම මේ අවස්ථාවේ මතක් කරනවා. 1977දී එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා වැදගත් සාධකයක් වුණා. එක්සත් ජාතික පක්ෂයේ හත්වැනි නායක, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ජයග්‍රහණයේ පසුපස සිටිමින්, එතුමා ජයග්‍රහණය කරවන්නටත් කැපවුණු පුද්ගලයෙක් විධියට එතුමා අපට හඳුන්වන්න පුළුවන්.

ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමා1988 වසරේ පැවති මුල්ම පළාත් සභා මැතිවරණයට තරග වැදිලා, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබලා, පළාත් සභාවටත් තේරී පත් වුණා. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවට ඉදිරිපත් වෙලා මටත් එදා ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා. එම පළාත් සභාවල කටයුතු කරන අවස්ථාවලදීත් අපි අතර සුහදතාව තව තවත් වර්ධනය කරගනිමින් කටයුතු කරන්න එහිදී අවස්ථාව ලැබුණා. එතුමා එදා බස්නාහිර පළාතේ අධ්‍යාපන, තරුණ හා වනිතා කටයුතු, ක්‍රීඩා, ග්‍රාමීය සංවර්ධනය වැනි කටයුතු භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. එහිදී විශේෂයෙන්ම එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයට විශිෂ්ට සේවාවක් කළා. පසුව 1993දී පැවති පළාත් සභා මැතිවරණයෙනුත් ජයග්‍රහණය කරලා එතුමා එම පළාත් සභාවේ කටයුතු කරමින් සිටියදී, 1994 වසරේ පැවැති මහ මැතිවරණයට ඉදිරිපත් වෙලා ගම්පහ දිස්ත්‍රික්කයෙන් ජයග්‍රහණය කළා. එහිදී එතුමා පාර්ලිමේන්තුවට පිවිසෙන කොට එතුමා සමඟ

පාර්ලිමේන්තුවට පිවිසෙන්න මටත් වරම් ලැබුණා. එදා අපි ඇති කරගත් මිත්‍රත්වය ඒ තුළින් තවදුරටත් ශක්තිමත්ව ගෙන යමින් අපි කටයුතු කළා. තුන්වන පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා සහ මම සිව්වන පාර්ලිමේන්තුවත් නියෝජනය කරන්න අත්වැල් බැඳගත්තා. ඒ වාගේම එතුමා පස්වන පාර්ලිමේන්තුවේත් මන්ත්‍රීවරයෙක් විධියට පත් වෙලා කටයුතු කරන්න යෙදුණා. එතුමා එදා පාසල් අධ්‍යාපන කැබිනට් නොවන ඇමතිතුමා විධියට කටයුතු කරද්දි, මටත් කැබිනට් නොවන අමාත්‍යාවරයෙක් විධියට කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. ඒ තුළ අපි බොහොම සමීපව කටයුතු කරමින්, විශේෂයෙන්ම එතුමාගේ ක්ෂේත්‍රය තුළින් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඒ සේවාවන් ලබාගන්න මට අවස්ථාව ලැබුණාය කියන කාරණයත් මේ අවස්ථාවේ මම ගෞරව පූර්වකව සිහිපත් කරනවා.

තමන්ට ලැබුණු කාර්යය තුළ විශේෂ සේවාවන් කරන්න කැප වුණු දේශපාලනඥයෙක් විධියට මා එතුමා දකිනවා. එතුමා අද අපි අතර නැතත්, එතුමා කළ සේවාව මේ රටේ සදානුස්මරණීයව පවතිනවාය කියන විශ්වාසය අපි තුළ තිබෙනවා.

එතුමා 1994දී පාර්ලිමේන්තුවට පිවිස, වසර 10කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුවේ කටයුතුවල නියැලෙමින්, කා සමඟත් සුහදව කටයුතු කරමින්, පක්ෂයේ උන්නතිය වෙනුවෙන් නිරතුරුවම කැප වුණා. අපි 1994දී විපක්ෂය ලෙස ඇවිත්, 2000දීත් විපක්ෂය ලෙස ඇවිත්, වසර 7ක් වාගේ කාලයක් ගත කරන කොට, විධායක ජනාධිපති යටතේ මැතිවරණයක් දිනන එක අපහසු වුණත්, එක්සත් ජාතික පක්ෂයට වසර 7කින් මේ රටේ බලය ගන්න අවස්ථාව ලැබුණේ මෙවන් මහත්වරු නිසාය කියන කාරණය මම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. එවන් අයගේ කැපවීම තුළ අපට ඒ අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාව අද අපට එතුමාගෙන් ලබාගන්න බැහැ. අපේ පක්ෂයටත්, පාක්ෂිකයන්ටත්, අපේ නායකත්වයටත් එතුමාගේ අභාවය විශාල පාඩුවක්.

මරණය පොදු ධර්මතාවක්. ඒ පොදු ධර්මතාවට එතුමා මුහුණ දුන්නත්, එතුමා කළ ඒ සේවාව තවත් ඉදිරියට ගෙන යන්න ඉතා වැදගත්, ගුණවත්, නැණවත් දරුවන් දෙපළක් මේ සමාජයට එතුමා දායාද කර තිබෙනවා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. අපේ කවීන්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා මතක් කළා වාගේ, ඒ පුතණුවන්ට ඉදිරියට යන්න අවස්ථාව තිබෙනවා. පියාණන් ගිය ඒ දේශපාලන ගමන් මඟේ ශක්තිමත්ව ඉදිරියට යන්න කියා කණිෂ්ක රාජපක්ෂ නීතිඥතුමාගෙන්; ඒ පුතණුවන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා. ඒක අපේ පක්ෂයටත්, රටටත් ශක්තියක්.

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන් හතරදෙනෙකුගේ අභාවයන් පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනා ගැන අද දවසේ කථා කරනවා. ඒ හැමදෙනෙක් ගැනම කථා කරන්න මට අවස්ථාව නැති වුණත්, එතුමන්ලා සියලුදෙනාගේම අභාවයන් පිළිබඳව අපේ කනගාටුව සහ ශෝකය පළ කරනවා. විශේෂයෙන්ම සුරනිමල් රාජපක්ෂ මැතිතුමා මේ රටටත්, ජාතියටත්, පක්ෂයටත් කළ සේවාව පිළිබඳව මේ අවස්ථාවේ අපේ ගෞරවය පුද කරනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ දයාබර බිරිඳ, දයාබර දියණිය, දයාබර පුතණුවන් ඇතුළු පවුලේ සියලුදෙනාටත්, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටත් අපගේ ශෝකය පළ කරමින්, අභාවප්‍රාප්ත ගරු සුරනිමල් රාජපක්ෂ මැතිතුමාට උතුම් වූ අමාමහ නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා.

[අ.භා.5.08]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, සුරනිමල් රාජපක්ෂ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක යෝජනාව ඉදිරිපත් කරන මේ මොහොතේ, විශේෂයෙන්ම එතුමාගෙන් අපේ පක්ෂයට වුණු සේවය පිළිබඳ අපි ගෞරවයෙන් සිහි කරන්න ඕනෑ. අපට රජයක් නොපැවති අවධියේ -අවුරුදු 20ක කාලය තුළ- එතුමා රට පුරා ඇවිදිමින් අපේ පක්ෂය ශක්තිමත් කරන්න දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ඨ කළා. ඒ කාර්ය භාරය ඉෂ්ට කරන අතරේ දේශපාලන වශයෙන් යම් සහයෝගයක් ලබා ගන්න එතුමාට පුළුවන්කම ලැබුණා. අපි පක්ෂයක් හැටියට දුර්වලව පැවති අවධියේදී, සාමාන්‍යයෙන් අපට සාමාජිකයෙක් එකතු කර ගන්න බැරි අවස්ථාවකදී, විශේෂයෙන්ම ඌව පළාතේ ගමින් ගමට ගිහිල්ලා, මැතිවරණ කොට්ඨාසයෙන් කොට්ඨාසයට ගිහිල්ලා, සංවිධායකවරු ශක්තිමත් කරලා, පක්ෂයේ සාමාජිකයෝ ශක්තිමත් කරලා කොහොම හෝ මේ පක්ෂය ශක්තිමත් කරන වැඩ පිළිවෙළට මූලිකත්වය, නායකත්වය දෙන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ගරු අගමැතිතුමා වෙනුවෙන් එවකට එතුමා තමයි ඒ කාර්ය භාරය මුළු රට පුරා ඇවිදිමින් ඉදිරියට ගෙන ගියේ. ඒ නිසා ඒ ගෞරවය එතුමාට දෙන්න ඕනෑ. අද අපි රජයක් පිහිටුවුවා නම් ඒකේ මූලාරම්භය සහ මූලික බීජය පැළ කරන්නට මූලිකත්වය ගත්තේ එතුමා කියන එක මම මෙතැනදී මතක් කරන්න ඕනෑ.

අවසාන කාලයේ එතුමාට කොයි තරම් අසනීප තත්ත්වයක් තිබුණත් ඒ සියල්ලම පැත්තකින් තියලා එතුමා අපට සහයෝගය දැක්වුවා. එතුමා ලබා තිබූ දේශපාලන පන්නරයෙන් අපේ පක්ෂයට සහයෝගය ලබා දුන්නා. අපේ අගමැතිතුමාත් සමඟ එකතු වී 1970 ගණන්වල සිට එතුමා පක්ෂයට කරපු කාර්ය භාරය ඉදිරියට ගෙනයමින් අද අපට මේ රජය පිහිටුවලා මේ තත්ත්වයට හෝ එන්න පුළුවන් වන විධියට මහ පෑදුවේ එතුමාය කියන එක මම මෙතැනදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමන්ලා විශාල පිරිසක් එකතු වෙලා එතුමාගේ ශෝක යෝජනාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් කථා කළා. ඌව පළාත වෙනුවෙන්, මොනරාගල දිස්ත්‍රික්කය වෙනුවෙන් කථා කරන්නට රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා අසනීප තත්ත්වයෙන් සිටීම හේතුවෙන් අද මෙම ගරු සභාවේ නොමැති වුවත්, එතුමා වෙනුවෙනුත්, ඌව පළාතේ සියලුමදෙනා වෙනුවෙනුත්, පක්ෂය වෙනුවෙනුත් මම සුරනිමල් රාජපක්ෂ මැතිතුමා කළ කාර්ය භාරය සහ විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඌව පළාතට පළාත් සභාවේ ඇමතිවරයෙක් විධියට එතුමා ගෙන ගිය වැඩ පිළිවෙළ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. එතුමාගේ අභාවය පිළිබඳව ඒ පවුලේ සියලුදෙනාටම අපේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු සුරනිමල රාජපක්ෂ මැතිතුමාගේ අභාවය පිළිබඳ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් ඒ සමඟ මමද එකතුවීමට කැමැත්තෙමි. අද දවස පුරාම අතිගරු ජනාධිපතිතුමා, ගරු මැති ඇමතිවරුන් රාශියක් ඒ සම්බන්ධයෙන්

[ගරු කථානායකතුමා]

කරුණු ඉදිරිපත් කළා. පෞද්ගලිකව මටත්, එතුමාත්, එතුමාගේ පවුලේ අය සමහත් ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කිරීමට ලැබුණා. එතුමා මම බොහොම ගරු කරන මහජන නියෝජිතයෙක්. එතුමා අවංක මහජන නියෝජිතයෙක්.

මෙහිදී එක් කරුණක් ගැන මා විශේෂයෙන් සඳහන් කළ යුතුයි කියලා හිතුවා. 2002දී කඩවත නගරය පළල් කිරීම සම්බන්ධයෙන් මුලින්ම රුපියල් මිලියන 200ක් වෙන් කරපු අවස්ථාවේදී විශාල විරෝධයක් ආවා. මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරනවා, සුරනිමල් රාජපක්ෂ මැතිතුමා ඒ අවස්ථාවේ සෑම කඩයකටම ගිහිල්ලා අයිතිකාරයන්ට කථා කරලා, ''මෙලෙස නගරය පළල් කිරීමෙන් මේ නගරයට වෙන්නේ ඉතාමත්ම වටිනා දෙයක්" කියලා ඒ අයට තේරුම් කර දුන් බව. ඒ අනුව තමයි එහි ආරම්භය සිදු වුණේ. ඒ ගැන අපේ ලඝන්ත අලගියවන්න මැතිතුමාත් සඳහන් කළා.

සුරනිමල් රාජපක්ෂ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම මැතිනියටත්, ආදරණීය පුත්‍ර රත්නයටත්, දියණියටත්, අලුත් ඥාතීන්ටත් මාගේ කනගාටුව ප්‍රකාශ කරමින් එතුමාට නිවන්සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

අද රැස්වීමට අදාළ හැන්සාඩ් වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මා නියෝග කරනවා.

ඊළඟට, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව; ගරු ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ශෝක ප්‍රකාශය :
ගරු යූ.බී.විජේකෝන් මහතා
அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு யூ.பி. விஜேகோன்
VOTE OF CONDOLENCE: HON. U.B. WIJEKOON

[අ.භා.5.13]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිය ආසනයේ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු ලෙස ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මේ අවස්ථාවේදී ගරු සභාවට මම ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, 1934 වර්ෂයේ ඔක්තෝබර් 14 වන දින මාදෝවිට, වැලිමඩදී උපත ලද යූ.බී. විජේකෝන් මැතිතුමාගේ දයාබර පියාණන් වූයේ, ඩබ්ලිව්.එම්. කිරිබණ්ඩාර මහතායි.

එතුමාගේ දයාබර මෑණියන් වූයේ ඩබ්ලිව්.එම්. හින්මැණිකේ මහත්මියයි.

වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා එම විදුහලෙන් පළමුවෙන්ම උසස් පෙළ සමත් වූ ශිෂ්‍යයා ලෙසත්, පළමුවම විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ ශිෂ්‍යයා ලෙසත් නමක් දිනා ගත්තා. පසුව පේරාදෙනිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව එහි අධ්‍යයන කටයුතු ඉතා සාර්ථකව නිම කළ මෙතුමා උපාධිය ලබා ගැනීමෙන් පසු දහසක් දු දරුවන්ගේ දෙනෙත් පාදමින් මාතලේ ශාන්ත තෝමස් විදුහලේ ගුරුවරයෙකු ලෙස සේවයට එක් වුණා. පසුව මෙතුමා රාජ්‍ය සිවිල් සේවා විභාගය සමත්ව වවුනියාව ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් පාලක ලෙස බොහෝ කලක් කටයුතු කරනු ලැබුවා.

එම්. විජේකෝන් මහත්මිය සමඟින් යුග දිවිය ගත කළ එතුමාගේ ආදරණීය පුතණුවන් වූයේ නිරෝෂන විජේකෝන් මහතායි. රැකියාවෙන් ඉවත් වී දේශපාලනයට පිවිසි යූ.බී. විජේකෝන් මැතිතුමා 1977 වසරේදී දඹදෙනිය ආසනය නියෝජනය කරමින් මහ මැතිවරණයට ඉදිරිපත් වී ඉන් ජයග්‍රහණය කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමේ භාග්‍යය උදා කර ගත්තා. එතැන් සිට තම ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ජනතාවගේ වුවමනාවන් සපුරාලමින් ඔවුන්ගේ දියුණුව උදෙසා කටයුතු කිරීමට එතුමාට හැකි වුණා.

ගරු කථානායකතුමනි, දිවංගත අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය පැවති කාල වකවානුව තුළ යාපනය දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරයා ලෙස කටයුතු කළ යූ.බී. විජේකෝන් මැතිතුමා 1989 වර්ෂයේ නැවත පාර්ලිමේන්තුවට තේරී පත් වී රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු ඇමතිවරයා ලෙසත්, ඉන්පසු අත්යන්ත්‍ර ජේෂකර්ම හා ජේෂකර්මාන්ත ඇමතිවරයා ලෙසත් කටයුතු කළා. පසුව 2003 වසරේදී එතුමා රුසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙසද සේවය කරනු ලැබුවා.

තරුණ-තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් වශයෙන් දඹදෙනිය ප්‍රදේශයේ කර්මාන්ත පුරයක් ආරම්භ කර විවිධ කර්මාන්ත ශාලා බිහි කරලීමට මූලිකත්වය ගෙන කටයුතු කළේ යූ.බී. විජේකෝන් මැතිතුමා වීමද විශේෂත්වයක්. ප්‍රදේශයේ ජනතාව උදෙසා සෑම විටම තම සේවය කැප කළ සැබෑ මානව හිතවාදියෙකු වූ යූ.බී. විජේකෝන් මැතිතුමා දඹදෙනිය ආසනයේ මාර්ග සංවර්ධනය කිරීම, නිවාස යෝජනා ක්‍රම කිහිපයක් ඇති කිරීම, ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම කීපයක්ම ඇති කිරීම, ජල යෝජනා ක්‍රම ඇති කිරීම, උදාගම් ඇති කිරීම වැනි කටයුතු සිදු කරමින් ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් සුවිශාල දායකත්වයක් සපයනු ලැබුවා.

පෞරාණික වැදගත්කමකින් යුතු බෞද්ධ සිද්ධස්ථාන රැසක් වැඩිදියුණු කිරීම, දඹදෙනිය රජමහා විහාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ කර පූජා නගරයක් බවට පත් කර එය සංවර්ධනය කිරීම එතුමා අතින් ඉටු වූ ශාසනික මෙහෙවරක්. ඊට අමතරව දඹදෙනි ශ්‍රී දළදා පෙරහැර ආරම්භ කර බෞද්ධයෙකු වශයෙන් භික්ෂූන් වහන්සේලා සමඟ සමීප සම්බන්ධතා පවත්වමින් ශාසනයේ දියුණුව වෙනුවෙන් තවදුරටත් සහයෝගය ලබා දුන් යූ.බී. විජේකෝන් මැතිතුමා ආගමික දියුණුව වෙනුවෙන් තමන්ගෙන් විය යුතු කාර්ය භාරය නොපිරිහෙළා ඉටු කළ දේශපාලනඥයෙක්.

ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, ජපානය, සෝවියට් රුසියාව ආදී විවිධ රටවල චාරිකා කරමින් ඒවායින් ලබා ගන්නා ලද අත්දැකීම් හා දැනුම් සම්භාරයද මෙරට ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා යොදා ගැනීමටද එතුමා අමතක කළේ නැහැ. මෙසේ මහ ජනතාවට සේවය කළ එතුමා අවුරුදු 82ක් ආයු වළඳා මෙලොව හැර ගියේ 2016 ජූනි මස 11වන දායි.

ගරු කථානායකතුමනි, 1977 වර්ෂයේ සිට 1994 දක්වා අවුරුදු 16කට අධික කාලයක් පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු හා අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කළ යූ.බී. විජේකෝන් මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, පුතණුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට මම මේ වෙලාවේදී යෝජනා කරනවා.

[අ.භා.5.18]

ගරු ලකී ජයවර්ධන මහතා
(*மாண்புமிகு லக்கி ஜயவர்தன*)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් උක්කුබණ්ඩා විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳව වූ ශෝක ප්‍රකාශ යෝජනාව අද දින මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළා. එතුමා විසින් ඉදිරිපත් කළ කරුණු කාරණා සියල්ලම මම මේ අවස්ථාවේදී අනුමත කරනවා.

මේ රටට විශිෂ්ට සේවාවක් ඉටුකළ යූ.බී. විජේකෝන් මැතිතුමා අවසාන කාලයේ ජීවත් වුණේ මහනුවර ප්‍රදේශයේ. ඒ නිසා එතුමාගේ අභාවය පිළිබඳව මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත් එක් කරමින් මේ අවස්ථාවේ එතුමා පිළිබඳව කරුණු කාරණා කියන්නට අවස්ථාව සලසා දීම පිළිබඳව ගරු කථානායකතුමාට මා පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

යූ.බී. විජේකෝන් මැතිතුමා ගුරු වෘත්තියෙන් රාජ්‍ය සේවයට පිවිස, ආදායම් පාලකවරයෙක් වශයෙන් වවුනියාව, දඹදෙනිය, වලපනේ වාගේ ඉතා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල කටයුතු කරමින්, එම ග්‍රාමීය ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා විශිෂ්ට ගණයේ සේවාවක් ඉටු කළ උදාර පුද්ගලයෙක් විධියට. ඒ වාගේම රාජ්‍ය ක්ෂේත්‍රයට රජයේ සේවකයෙකුගෙන් විය යුතු සේවාව හා යුතුකම ඉෂ්ට කරන්නට එතුමා විශාල කැපවීමක් කළාය කියන එක 1977දී දඹදෙනිය මැතිවරණ කොට්ඨාසයට ඉදිරිපත් වෙලා ලැබූ ජයග්‍රහණය තුළින්ම මනාව පිළිබිඹු වෙනවා. 1977 මහ මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලබා ගනිමින් දඹදෙනිය මැතිවරණ කොට්ඨාසය තුළ එක්සත් ජාතික පක්ෂය දිනවන්නට එතුමාට ශක්තිය ලැබුණේ දඹදෙනිය කොට්ඨාසයට රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විධියට එතුමා ඉටු කළ සේවය නිසායි. ඒ නිසා එතුමා රාජ්‍ය සේවයට පූර්වාදර්ශයක් දෙන රාජ්‍ය සේවකයෙකුය කියන එක අපි පිළිගත යුතු වෙනවා.

ගරු කථානායකතුමනි, 1977දී පාර්ලිමේන්තුවට පිවිසි එතුමා යාපනයේ දිසා ඇමතිවරයා විධියට පත් වී යාපනය ප්‍රදේශයට විශිෂ්ට සේවාවක් ඉටු කරන්නට කටයුතු කළාය කියන එක අපට දැක ගන්නට, දැන ගන්නට කරුණු කාරණා තිබෙනවා. ඒ වාගේම දිසා ඇමතිවරුන් අතරින් ලංකාවේ හොඳම දිසා ඇමතිවරයා විධියට එතුමා ප්‍රසාදය ලබා තිබෙනවා. එතුමාට ලැබුණු තනතුර තුළ, එතුමාට මොන තනතුර ලැබුණත් එතුමා ඉතා සාර්ථක අන්දමට කටයුතු කර තිබෙනවා. දඹදෙනිය මන්ත්‍රීවරයා විධියට දඹදෙනිය ප්‍රදේශයට විශිෂ්ට ගණයේ සේවාවක් කරන්නට එතුමා කැප වුණා. අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කළ කථාව තුළ ඒ සියලු කාරණා ගැබ් වෙලා තිබුණා. ඒ වාගේම එතුමා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විධියට කාලයක් කටයුතු කළා. ඒ කාලයේත් එතුමා විශිෂ්ට ගණයේ සේවාවක් ඉටු කරන්නට කටයුතු කළ ආකාරය අපි දැක්කා. ඒ වාගේම එතුමා අත්යන්ත්‍ර පේෂකර්ම හා පේෂකර්මාන්ත අමාත්‍යවරයා විධියට මේ රටට විශිෂ්ට ගණයේ සේවාවක් කරන්නට, මේ රටේ විරැකියාවට විසඳුම් දෙන්නට ක්‍රියාකාරීව කටයුතු කළා. හිටපු ජනාධිපති දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ උදාර සංකල්පයක් අනුව ගම් මට්ටමින් ඇති කළ කර්මාන්ත 200 ඉතාම යුහුසුලුව ක්‍රියාත්මක කරන්නට එතුමා කටයුතු කළා. ඒ තුළින් කර්මාන්ත 164ක් ඇති කර තිබෙනවා කියන එක අපට වාර්තා වී තිබෙනවා. එම වැඩ පිළිවෙළට එතුමා ලබා දුන් දායකත්වය නිසා අපේ රටේ ඇහලුම් කර්මාන්තය විශාල දියුණුවක් ලැබුවා කියන එක අපි දකිනවා.

රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කර්මාන්තශාලා විවෘත කරමින් ගමින් ගමට ගිහිල්ලා ඒ පිළිබඳව කළ කථා තුළින්, ක්‍රියාත්මක කළ ඒ වැඩ පිළිවෙළ තුළින් මේ රටේ විශාල ප්‍රබෝධයක් ඇති වුණු බව අපි දැක්කා. ඒ වාගේම කර්මාන්තයක් ඇති කරන කොට, ඒ කර්මාන්ත ආශ්‍රිතව එක් නගරයකට ඔරලෝසු කණුවක් බැගින් ඉදිකිරීමේ සංකල්පය ඉදිරිපත් කළේත් මෙතුමායි. ඒවා අදත් ක්‍රියාත්මක වෙනවා. එසේ ඔරලෝසු කණු ඉදිකිරීමේ සංකල්පයත් අලුත් වැඩ පිළිවෙළක්. ඒ ආකාරයට එතුමා යමක් කරන්නට හැකියාව තිබුණු නිර්මාණශීලී දේශපාලනඥයෙක්.

එතුමා වාම් ගතිපැවතුම් ඇති, නිහතමානී නායකයෙක්. දඹදෙනියේ මන්ත්‍රීවරයා විධියට කටයුතු කළත් එතුමාට දඹදෙනියේ එක බිම් අඟලක් නැහැ කියන එක අපි දකිනවා. එතුමා ජීවිතයේ අවසාන කාලයේ නුවර ප්‍රදේශයේ ඉතා කුඩා වපසරියක පිහිටි නිවසක් තුළ ජීවත් වෙමින් කටයුතු කළා. එතුමා නුවර ජීවත් වෙන කාලයේ වුණත් සෑම කෙනෙක් සමඟම හොඳින් කටයුතු කරමින්, රටට, ගමට, සමාජයට වැඩදායක අයුරින් කටයුතු කළාය කියන එකත් මා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. මහනුවර පළාත එතුමාට නුහුරු-නුපුරුදු තැනක් වුණත් සෑම අවස්ථාවකම එතුමා මහජනයා සමඟ ගැවසෙමින්, විශේෂයෙන්ම හැම කටයුත්තකටම එක් වෙමින් සමාජයේ දියුණුවට කටයුතු කළ උදාර නායකයෙක්. ඒ නිසා එතුමාගේ අභාවය රටටත්, ගමටත්, අපටත් සිදුවුණු විශාල පාඩුවක්; ඒ වාගේම අපේ පක්ෂයට සිදුවුණු පාඩුවක්. එතුමා කාලයක් රුසියාවේ තානාපති විධියට කටයුතු කළා. මම හිතන විධියට හිටපු ජනාධිපතිනිය වන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තමයි එතුමාට ඒ අවස්ථාව ලබා දුන්නේ. එතුමා එක්සත් ජාතික පක්ෂයේ වුණත් දේශපාලන වශයෙන් සෑම අවස්ථාවකම සර්ව සාධාරණව කටයුතු කළ නායකයෙක් විධියට අප දකිනවා.

ගරු කථානායකතුමනි, යූ.බී. විජේකෝන් මැතිතුමා වැනි දේශපාලනඥයකුගෙන් දේශපාලනඥයන් වන අපට වටිනා ආදර්ශයක් ලැබෙන බව එතුමාගේ අභාවය පිළිබඳව අද මේ උත්තරීතර සභාවේ ශෝකය පළ කරන අවස්ථාවේ මතක් කරනවා. එතුමාගේ අභාවය ගැන අප සියලුදෙනාම කනගාටු වන බව සඳහන් කරන අතර, එතුමාට උතුම් වූ අමා මහ නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා.5.24]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(*மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி*)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේ මටත් වවන කීපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

එතුමා ඌවේ පුත්‍රයෙක්. එතුමා වැලිමඩ ප්‍රදේශයේ ජන්මය ලබලා, මේ රටේ ඉහළම තලයකට යන්න පුළුවන් හැකියාව

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

එතුමාගේ දක්ෂම තුළින් ලැබුවා. වැලිමඩ මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ එතුමා එම පාසලෙන් විශ්වවිද්‍යාලයට ඇතුළු වුණු පළමු ශිෂ්‍යයා හැටියට තම දක්ෂකම මැනවින් පිළිබිඹු කළා.

ඒ විතරක් නොවෙයි. 1977 වසරේ පිහිටවපු රජයේ, මන්ත්‍රීවරයකු හැටියට දඹදෙනිය මැතිවරණ කොට්ඨාසයෙන් පාර්ලිමේන්තුවට පත් වෙන්න එතුමාට හැකියාව ලැබුණා. මා මෙතැනදී විශේෂයෙන්ම මතක් කරන්න අවශ්‍යයි, 1977 වර්ෂයේ එතුමාත් සමඟ මගේ පියාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වුණ බව. එතුමාත් මගේ පියාත් සමකාලීනව පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරු. එම නිසා අපට එතුමා නිතරම හමු වුණා. අප අතර බොහොම ළෙන්ගතුකමක් මෙන්ම ඥාති සම්බන්ධයකුත් තිබුණා. ඌවේ පුතෙකු හැටියට එතුමා ඉපදුණු ප්‍රදේශයට විතරක් නොවෙයි, ඒ පළාතට විතරක් නොවෙයි මුළු රටටම සේවය කළ බව මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ඇහලුම් කර්මාන්තය සඳහා මූලික පදනම දැම්මේ විජේකොන් මැතිතුමාය කියන එක අපි බොහොම ආඩම්බරයෙන් මතක් කිරීම අවශ්‍යයි. ආරම්භයේදී ඇහලුම් කර්මාන්තයට විවිධ උසුළු විසුළු ආවා. නමුත්, මේ රටේ අතිවිශාල පිරිසක් ජීවත් වන්නේ ප්‍රේමදාස මැතිතුමා අගමැතිවරයා හැටියට සිටියදී ආරම්භ කරපු ඇහලුම් කර්මාන්තය තුළින්.

ගරු කථානායකතුමනි, දිසා ඇමතිවරු පත් කරපු වෙලාවේ අපේ පළාතෙන් දිසා ඇමතිවරු තුන්දෙනෙක් පත් වුණා. ඉන් එක්කෙනෙක් තමයි යූ.බී. විජේකෝන් මැතිතුමා. අනෙක් දෙදෙනා තමයි අභාවප්‍රාප්ත ආර්.එම්. අප්පුහාමි මැතිතුමා සහ ආර්.එම්. අබේකෝන් මැතිතුමා. ඒ යුගයේ හිටපු ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන් හැටියට එතුමන්ලාට පුළුවන්කම ලැබුණා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ රජයෙන් ගෙන ගිය සංවර්ධන වැඩ පිළිවෙළට නායකත්වය හා මූලිකත්වය දීලා දිස්ත්‍රික් මට්ටමෙන් අතිවිශාල සේවයක් කරන්න. මේ රටේ බිහි වුණු එවැනි නායකයන් රටට වටිනා ආදර්ශ දීලා, රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය මූලික පදනම දැමීම අපි විශේෂයෙන්ම අගය කරනවා.

ගරු යූ.බී. විජේකෝන් මැතිතුමා බොහොම සරල ජීවිතයක් ගත කළ පුද්ගලයෙක්. ඌව පළාතේ මාදෝවිට කියන ගමේ ඉපදුණු එතුමා ඒ ගැමි පරිසරය කිසි දවසක අමතක කළේ නැහැ. එතුමා පක්ෂ දේශපාලනයේ පවතින අවාසිය ගැන හැම විටම කථා කළා. ඒ ගැන එතුමා පොත් ලියුවා. පක්ෂ දේශපාලනය තුළ එකිනෙකා හැප්පෙනවා, ගැටෙනවා, රට ඉස්සරහට යන ගමනට මේ දේශපාලන ක්‍රමවේදය සහ ගමන ගැළපෙන්නේ නැහැ කියන එක එතුමාගේ හිතේ හැම දාම තිබුණා. කොහේදී හෝ හම්බ වුණොත්, "ආ මල්ලි එන්න" කියලා කථා කරලා, ආනන්ද කුමාරසිරි කියලා මගේ නම ලියලා, අත්සන් කරලා, එතුමා ලියපු පොතේ පිටපතක් දෙන සිරිතක් එතුමාට තිබුණා. එතුමා මොන තනතුර දැරුවත්, මේ රටේ මොන ඇමති ධුරය දැරුවත් ඒ ළෙන්ගතුකම හා සරල බව කිසි දවසක අමතක කළේ නැහැ. එම නිසා ඌවේ පුතෙකු හැටියටත්, මන්ත්‍රීවරයකු හැටියත් මම විශේෂයෙන්ම එතුමාට මගේ ගෞරවය පුද කරනවා, මේ රටට දුන් ආදර්ශයට, මේ රටට දුන් නායකත්වයට.

ගරු කථානායකතුමනි, එතුමාගෙන් මේ රටට වූ සේවය ඌවේ නියෝජිතයන් වශයෙන් අපි විශේෂයෙන්ම අගය කරනවා. අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් එතුමා ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළ බව මා කියන්න ඕනෑ. එතුමා ඇතුළු ඌවේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් අභාවප්‍රාප්ත ගරු යූ.බී. විජේකෝන් මැතිතුමාගේ ආදර බිරිඳට හා පුතණුවන්ට මගේ ශෝකය ප්‍රකාශ කරන අතර, එතුමාට නිවන් සැප ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු යූ.බී. විජේකෝන් මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන ලද ශෝක යෝජනා මා අනුමත කරන අතර ඒ අදහස් සමඟ එකතු වීමට කැමැත්තෙමි.

අද දවස පුරාම ගරු අග්‍රාමාත්‍යතුමා, ඒ වාගේම ඇමතිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විශාල පිරිසක් එතුමා පිළිබඳව අදහස් ඉදිරිපත් කළා. මම බොහොම ගරු කරපු දේශපාලනඥයෙක් තමයි යූ.බී. විජේකෝන් මැතිතුමා කියන්නේ. දඹදෙනියත් මගේ ගම් ප්‍රදේශයත් කිට්ටුවෙන් තිබෙන්නේ. ඒ නිසා දඹදෙනියට එතුමා කරපු සේවාව මා විශේෂයෙන්ම දන්නවා. ආදර්ශවත් රාජ්‍ය සේවකයකු මෙන්ම මහත්මා දේශපාලනය කළ මහජන නියෝජිතයකු වශයෙන් අපි එතුමාට ගරු කළා.

ඊට අමතරව, එතුමාට උතුරේ ජනතාව කොයි තරම් ආදරය කළාද, ගෞරව කළාද කියන කරුණ මා පෞද්ගලිකව දන්නවා. එතුමා පසුගිය කාලයේ විශාල වශයෙන් කාලය ගත කළේ ජාතික සමඟිය ඇති කරන්නයි. ඒ වාගේම නව මැතිවරණ ක්‍රමයක්, බලය බිම් මට්ටමට විමධ්‍යගත කරන මැතිවරණ ක්‍රමයක් ඇති කිරීම සඳහා එතුමා විශාල වශයෙන් කැප වුණා; ඒ ගැන පොත් ලිව්වා; ඒ ගැන ලිපි ලිව්වා. මිය යන්නට දින කිහිපයකට පෙර එතුමා විසින් ඒ ගැන ලියන ලද ලිමනක් මගේ ළඟ තබාගෙන ඉන්නවා. ඒ තරමටම ඒ ගැන එතුමාගේ කැපවීම තිබුණා. එතුමා දැන පිරිසිදු, අවංක දේශපාලනඥයකු බවද මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

එතුමාගේ අභාවය වෙනුවෙන් එම මැතිනියට, පුත්‍ර රත්නය ඇතුළු පවුලේ සියලුදෙනාටම මාගේ ශෝකය පළ කරන අතර, අද රැස්වීමට අදාළ නිල හැන්සාඩ් වාර්තාවේ පිටපතක් එතුමාගේ පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තු මහලේකම්වරයාට මා නියෝග කරනවා.

මීළඟට, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න, ගරු ෆයිසාල් කාසීම් මැතිතුමා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතුරින්පිටතු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

වරප්‍රසාද : වෙබ් අඩවි හරහා අපහාස කරන්නන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග

சிறப்புரிமை: இணையத்தளங்களூடாக அவதூறு செய்வோர்மீது சட்ட நடவடிக்கை

PRIVILEGE: LEGAL ACTION AGAINST PERSONS MAKING DEFAMATORY REMARKS THROUGH WEBSITES

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரசைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் 07 பேரும் 2018.04.04, புதன்கிழமை நடைபெற்ற பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள்மீதான நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர்த்து வாக்களிப்பதற்காக ஒவ்வொருவரும் தலா 750 மில்லியன் ரூபாய் பெற்றுக்கொண்டதாக கௌரவ உறுப்பினர் விஜயதாச ராஜபக்ஷ அவர்களின் மகன் ராகித ராஜபக்ஷ தனது முகநூலில் குறிப்பிட்டிருந்தார். இது பாராளுமன்ற உறுப்பினர்களினது சிறப்புரிமையை மீறும் செயல் மட்டுமன்றி, கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களின் வெற்றிக்குச் சேறு பூசும் நோக்கத்துடன் திட்டமிட்டுச் செய்யப்பட்ட அவதூறெனவும் நான் கூற விரும்புகின்றேன்.

ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் பாராளுமன்ற உறுப்பினர்கள்மீது மக்களிடத்திலுள்ள நல்ல அபிப்பிராயத்தை இல்லாமல் செய்யும் நோக்குடன் வேண்டுமென்றே இட்டுக் கட்டப்பட்ட இந்தச் செய்தி, பாராளுமன்ற உறுப்பினர்களது 46 மேலதிக வாக்குகளால் வெற்றி பெற்ற கௌரவ பிரதமர் அவர்களது சிறப்புரிமைகளையும் மீறுகின்ற ஒரு செயல் என்பதனால் இதற்கு எதிராக உரிய சட்ட நடவடிக்கை எடுக்கப்படல் வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மேற்கூறிய தகவலினை மேற்கோள்காட்டி ஒருசில இணையத்தளங்கள் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரசைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் 07 பேர் மீதும் அவப்பெயர் ஏற்படுத்தி மக்கள் மத்தியில் தப்பபிப்பிராயத்தைப் பரப்பும் நோக்குடன் செய்திகளை வெளியிட்டுள்ளன. நாடு முழுவதும் வாழும் முஸ்லிம்களினது பிரதான பிரச்சினைகளை எழுத்துமூலம் கௌரவ பிரதமர் அவர்களுக்கு முன்வைத்து, அவற்றினை நிவர்த்தி செய்ய அவர் சம்மதித்ததன் பின்னரே எமது கட்சி இப்பிரேரணையை எதிர்க்கத் தீர்மானித்தது. அதுமட்டுமன்றி, கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள்மீது வைத்துள்ள நன்னம்பிக்கையினாலும் இந்நாட்டின் அரசியல் ஸ்திரப்பாட்டில் திட்டமிட்டு ஏற்படுத்தப் பட்ட தளம்பல் நிலையை இல்லாமல் செய்து திடமான ஒரு நிலையை மீண்டும் கொண்டுவர வேண்டுமென்ற நன்னோக் கிலும் நாம் எடுத்த வரலாற்று முக்கியத்துவம் மிக்க ஒரு தீர்மானமே இதுவாகும். எனவே, இத்தீர்மானத்தை கொச்சைப்படுத்தும் வஞ்சக நோக்குடன் எடுக்கப்பட்ட கீழ்த்தரமான நடவடிக்கையின் சட்ட ரீதியான பாரதூரத்தை உணர்ந்து அதற்கெதிரான உறுதியான சட்ட நடவடிக்கை எடுக்கப்படல் வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் என்ற அரசியல் கட்சி மீது மக்கள் கொண்டுள்ள அபார நன்மதிப்பிற்குச் சேறு பூசுமுக மாகவும் அதன் தலைவர் ரவூப் ஹக்கீம்மீது இந்த நாட்டு மக்கள் வைத்துள்ள பெரும் கௌரவத்தைச் சீரழிக்கு முகமாகவும் செயற்படும் இத்தகைய இணையத்தள முகவர் களுக்கு சில அரசியல் கட்சிகள் மக்களது வரிப்பணத்திலிருந்து மாதந்தோறும் கொடுப்பனவும் அவர்களின் சுகபோக வாழ்வுக்கு அரச திணைக்களங்களைச் சேர்ந்த சொகுசு வாகனங்களும் வழங்கி வருகின்றன.

அத்துடன், மேற்படி சேறுபூசும் இணையத்தளங்கள் வெளியிடுகின்ற அவதூறுகளைப் பரபரப்பான செய்திகளாக்கி அரசாங்க ஊடகங்களில் முக்கியத்துவம் வழங்கி, அதற்கு உண்மை போன்ற ஒரு வடிவத்தை உருவாக்கும் நடவடிக்கை களையும் சில ஊடகங்களிலுள்ள அரசியல்வாதிகளின் கையாட்கள் மேற்கொண்டு வருகின்றனர். ஆகவே, அரசாங்கம் இவ்வாறான மக்கள் விரோத இணையத்தளங்களுக்கும் அவ்வாறு அவதூறு செய்யும் தனிநபர்களுக்கும் எதிராக உரிய சட்ட நடவடிக்கை எடுக்கவேண்டுமென்று இந்த உயரிய சபையில் கௌரவ சபாநாயகர் அவர்களிடம் நான் வலியுறுத்தி வேண்டிக்கொள்கின்றேன். அத்துடன், ராகித ராஜபக்ஷவினு டைய 'வெப்சைட்'டில் இச்செய்தி வந்திருக்கின்றபடியால் அவரை உடனடியாக விசாரணைக்குட்படுத்தி, இதற்குத் தக்க நடவடிக்கை எடுக்க வேண்டுமென்றும் கேட்டுக் கொள்கின்றேன். நன்றி.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்

BILLS PRESENTED

I

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත

தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்

PENAL CODE (AMENDMENT) BILL

"(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 අප්‍රේල් 19 වන බුහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති අමෙච්චර් සාර්ථක මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2018 ඒප්‍රිල් 19, වියාෆක්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙසාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආර්රුප්පටුත්තප්පට වේණ්ටු මෙනවුම් කට්ටළෙයිටප්පට්ටදු.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

II

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 අප්‍රේල් 19 වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති අමෙච්චර් චාර්පිල් මාණ්පුමිකු කයන්ත කරුණාතිලක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2018 ඒප්‍රිරල් 19, වියාෆුක්කිමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙචාර් මේර්පාර්වෛක් කුමුවුක්කු ආර්‍රුප්පටුත්තප්පට වේණ්ටු මෙනවුම් කට්ටළෛයිටප්පට්ටදු.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice; to be read a Second time upon Thursday, 19th April, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House I move,

"That this Parliament at its rising this day do adjourn until 10.30 a.m. on Thursday, April 19, 2018."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 5.34ට, අද දින සභා සම්මතිය අනුව 2018 අප්‍රේල් 19 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.

අතන්පටි පි.ප. 5.34 මණික්කු පාරාළුමන්ත්‍රම්, අතනුඩ ඉන්‍රෛය තීර්මානත්තිර්කමෛය 2018 ඒප්‍රිරල් 19, වියාෆුක්කිමෙ මු.ප. 10.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටදු.

Parliament adjourned accordingly at 5.34 p.m. until 10.30 a.m. on Thursday, 19th April, 2018, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.